# මහත් බලාපොරොත්තුව

*ක්‍රිස්තුස්වහන්සේ සහ සාතන් අතර කාලාන්තරයක් පවතින මහා අරගලයෙහි ක්‍රිස්තියානි යුගයේ ගැටුම් සහ ජය ගැනීම්*

**එලන් ජී. වයිට්**

**ප්‍රකාශකයෝ**

ලක්පහන පබ්ලිෂිං හවුස්
නො: 8, දේවාල පාර,
පාගොඩ,
නුගේගොඩ.

**2012**

# මහත් බලාපොරොත්තුව

*එලන් ජී. වයිට් මුද්‍රිත මාධ්‍ය*
*ප්‍රකාශන මණ්ඩලය විසින්*
*1888 දී නිකුත් කළ පිටපතෙහි*
*සිංහල පරිවර්තනය*

**පළමුවන මුද්‍රණය - 2012**

**සංස්කරණය**

ඉන්ද්‍රානි ආරියරත්නම් මහත්මිය සහ ඩබ්. ඩී. ඇන්තනී දේවගැතිතුමා

**පරිවර්තනය**

**වැරැල්ලගම ගාමිණී වීරතුංග විසිනි.**



# පෙර වදන

මෙම පොත ප්‍රකාශනයට පත්කිරීමේ අරමුණ අප ජීවත් වන ලෝකයෙහි පාපය, කාලකණ්ණිකම සහ විපත් ඇති බව කියා පෑම නොවේ. එවැනි දෑ ඇති බව අපට රහසක් නොවේ.

අඳුර සහ ආලෝකය අතර, පාපය සහ ධර්මිෂ්ඨකම අතර, වරද සහ නිවැරැදි භාවය අතර, මරණය සහ ජීවිතය අතර සමථයකට පත් කළ නොහැකි මත අරගලයක් පවතින බවට ඔබ දැනුවත් කිරීම මෙම පොතෙහි අභිප්‍රාය නොවන්නේය. ඔබත් මාත් මෙම අරගලයෙහි ක්‍රියාකාරී සාමාජිකයන් වන බව අපි ඉඳුරාම දනිමු.

මෙම මහත් අරගලයෙහි වැඩි විස්තර දැනගැනීමේ ආශාවක් සමහරවිට අප සැමගේ හදවත්හි පැන නගියි. එම අරගලය පටන්ගත්තේ කෙසේද? එසේත් නැතිනම් එය සැමදාම මේ ලෝකයෙහි පැවතුණේද? එහි බිය ජනක සංකීර්ණ පැවැත්මට අදාළ වන්නාවූ පැතිකඩ මොනවාද? එයට මා සම්බන්ධ වන්නේ කෙසේද? මේ පිළිබඳව මාගේ වගකීම කුමක්ද? මා මේ ලෝකයට ජනිත වුණේ මාගේම කැමැත්තෙන් නොවේ; මාගේ තෝරා ගැනීමෙන්ද නොවේ. එයින් අදහස් වන්නේ මට අයහපතක් හෝ යහපතක් සිදුවේද? යන්නය.

එම අරගලයට කුමන විශිෂ්ඨ නියමයන් සම්බන්ධ වී තිබේද? මෙම මහා අරගලය කොපමණ කාලයක් පවතීද? එහි අවසානයේදී සිදුවන්නේ කුමක්ද? සමහර විද්‍යාඥයන් පවසන පරිදි මෙම පොළොව හිරු එළිය නැති, අධික ශීතලෙන් කැටි ගැසුණු, සදාතන අන්ධකාරයෙන් යුතු ආගාධයකට ගිලා බසින්නට යන්නේද? එසේත් නැත්නම් දෙවියන්-වහන්සේගේ සදාතන ප්‍රේමයෙන් උණුසුම් වූ, ජීවිතාලෝකයෙන් ප්‍රභාව විහිදුවන්නාවූ අනාගතයක් මෙම පොළොවෙහි ඉරණම වන්නේද?

ප්‍රශ්නය තවත් සමීප වේ. මාගේ හදවත තුළ කැකෑරෙමින් පවතින්නාවූ මමත්වය, ආත්මාර්ථකාමී ජීවිත රටාව හා හද පත්ලෙන් ගලා එන්නාවූ ආදරයත් අතර පවතින්නාවූ ගැටුම යහපත ඉටු කරමින් තීරණාත්මකව විසඳෙන්නේ කෙසේද? මෙම විෂය පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්ද? සෑම පුද්ගලයෙකුටම සදාතනය පුරා වැදගත් වන්නාවූ මෙම ප්‍රශ්නය පිළිබඳව අපට ඉගැන්වීම සඳහා දෙවියන්වහන්සේට ඇත්තේ මොනවාද?

මෙවන් ප්‍රශ්න සෑම පැත්තකින්ම අප ඉදිරියේ පැන නගී. අපගේම හදවත්හි ඉතා ගැඹුරු තැන්වලින් එම ප්‍රශ්න ඉදිරිපත් වේ. නිශ්චිත පිළිතුරක් ලබාගැනීමට එම ප්‍රශ්න බල කරයි.

සත්‍යතාව දැනගැනීම සඳහා අප තුළ ආශාවක් නිර්මාණය කළ දෙවියන්වහන්සේ මෙකී අවශ්‍යතාවන් සඳහා වූ දැනගැන්ම අපගෙන් වළක්වා නොතබන සේක. "සැබවින්ම ස්වාමි වූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන් වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරන සේක."

එබැවින් පාඨකය, මෙවන් ප්‍රශ්න නිසා කරදරයට පත් හදවතට සත්‍යවූ ද, නිවැරැදිවූ ද විසඳුමක් ලබාදීම මෙම ග්‍රන්ථයේ එල්ලය වන්නේය. මෙම ග්‍රන්ථය කරණකොටගෙන ඔබට සෙතක් වේවා! දෙවියන්වහන්සේ යහපත් බව රස බලා දැනගත් තැනැත්තියක් ලෙස මෙම පොතෙහි කතුවරිය හඳුන්වා දීමට පුළුවන. දෙවියන්වහන්සේ සමග සහභාගිකම් පවත්වමින් උන්වහන්සේගේ ලිඛිත වදන් අධ්‍යයනය කළ ඒ තැනැත්තිය විසින් මෙම ග්‍රන්ථය ලියා ඇත. දෙවියන්වහන්සේට භය වන්නාවූ අය සමග දෙවියන්වහන්සේගේ රහස පවතින අතර, උන්වහන්සේ ඔවුන්ට තමන්වහන්සේගේ ගිවිසුම පෙන්වා දෙන සේක.

විශ්වයක ජීවිතය හා බැඳි මෙම වැදගත් අරගලයේ තතු සහ මුල් පැතිකඩ පිළිබඳව කතුවරිය වඩාත් හොඳින් අපව දැනුවත් කර ඇත. වැදගත්කමින් යුතු මෙම විෂය අපගේ ග්‍රහණයට තදින් හසුකර ගැනීමට හැකිවන පරිදි ශත වර්ෂ විස්සක ඉතිහාසය ඇය අප ඉදිරියෙහි තබා ඇත.

දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟට විමුක්තිය උදාකර දීමට පැමිණි කල්වාරියේ මනුෂ්‍ය පුත්‍රයාණන්ව එම ජනතාව ප්‍රතික්ෂේප කළෝය. එයට පසුව විශිෂ්ට ජනතාවගේ අගනුවර වූ යෙරුසලමෙහි පුරා වෘත්තයේ අවසන් ශෝචනීය දසුන් මගින් මෙම පොත ආරම්භ වේ. ජාතීන්ගේ ඉදිරි ගමන් මඟෙහි විශිෂ්ට සිදුවීම් අනාවරණය කරමින් පොත ඉදිරි පියවර තබයි. දෙවියන්වහන්සේගේ සෙනඟට පළමු ශතවර්ෂවල පමුණුවන ලද හිංසා පීඩා, උන්වහන්සේගේ සභාව විසින් දහමට පිටු පා කළ ක්‍රියාදාමයන්, ධර්මයේ මාර්ගය හැර යාම, ප්‍රතිසංස්කරණය මගින් ඉටුකළ ලෝක ව්‍යාප්ත ආත්මික පුබුදුවාලීම, ප්‍රංශය විසින් නිවැරැදි ප්‍රතිපත්ති එපා කිරීමෙහි භයානක පාඩම්, ශුද්ධ ලියවිලි පිළිබඳව වූ ආත්ම පිබිදීම මෙන්ම එම වදන් ඔසවා තැබීම, ශුද්ධ ලියවිල්ලෙහි ඇතුළත් හිතකර වූ ජීවිත



රැකදීමෙහි බලපෑම, දේව වචනයෙහි ප්‍රභාව විහිදුවන උල්පත මතවූ බැමි බිඳ දැමීම යන තේමාවන් චිත්තාකර්ෂණීය ලෙස මෙම පොතෙහි ඇතුළත්ය. අඳුරෙහි බලවේගයන් විසින් ගෙන එන්නාවූ විපත්තියක මුළාකිරීම් සහ නොමඟ යැවීම් පිළිබඳව දැනුම සහ ආලෝකය මෙහි මනා ලෙස එළිදරව් කර ඇත. අඳුරෙහි ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට එකී පැහැදිලි කිරීම් සැමට මහත් සේ උපකාරී වේ.

ඉතා වැදගත් ප්‍රඥප්ති සහ ප්‍රතිපත්ති පිළිබඳව වූ, මෙම වර්තමාන මත අරගලය සම්බන්ධව කිසිම අයෙකුට මධ්‍යස්ථ පිළිවෙතක් අනුගමනය කළ නොහැකිය. මෙම දේවල් පිළිබඳව සරල ලෙසින් මෙන්ම ඉතා ප්‍රබල අයුරින්ද, පැහැදිලි ලෙසද කාරණා ඉදිරිපත් කර තිබේ.

අවසන් වශයෙන් සදාතනිකවූ ද, තේජශ්‍රීයවූ ද අනාගතයක් අප ඉදිරියෙහි විස්තර කරදී තිබේ. එකල නපුර පරදවා යහපත ජයග්‍රහණය කරන්නේය; වරද අභිබවා සත්‍යතාව ජය ගන්නේය; අඳුර මැඩ පවත්වා ආලෝකය විහිදී යන්නේය; දුක් කම්කටොළු යටපත් කර ප්‍රීතිය පැතිර යන්නේය; බලාපොරොත්තු නැතිකම් පාගා දමමින් බලා-පොරොත්තුව නැඟී සිටින්නේය; ලජ්ජාව ඉවත් කරමින් තේජස ඉදිරියට පැමිණෙන්නේය. මරණය ජය ගනිමින් ජීවනය රජකම් කරන්නේය, පළිගැනීමේ වෛරය සුනු විසුනු කරමින් සදාතනික ඉවසිලිවන්ත ප්‍රේමය සැමට සැමදා භාග්‍යයක් වන්නේය.

ප්‍රකාශන ආයතනයේ සැමගේ යාච්ඤාව නම් මෙම පොත කියවීම තුළින් ආත්ම මහත් ගණනාවක් සත්‍යය වූ එඬේරාණන් වෙත පැමිණීම සිදුවේවා යන්නය. සදාතන යහපත සඳහා මෙම පොත ඔබට ආශිර්වාදයක්ම වේවා!

***ප්‍රකාශකයෝ.***

# පටුන

පිටු අංක

1. යෙරුසලමෙහි විනාශය ........................................ 1
2. මුල් ශතවර්ෂයන්හි පැවති හිංසා පීඩා ..................... 26
3. ධර්මයේ මාවතින් ඉවත්ව යාම ................................ 38
4. වෝල්ඩන්සිවරු ........................................................ 52
5. ජෝන් වික්ලිෆ් ........................................................ 73
6. හස් සහ ජෙරෝම් ..................................................... 94
7. ලූතර් රෝම සභාවෙන් ඉවත් වෙයි ............................. 122
8. ලූතර් ධර්මාධිකරණය ඉදිරියෙහි ............................. 153
9. ස්විස්ටර්ලන්තයේ ප්‍රතිසංස්කරණවාදියා ..................... 184
10. ජර්මනියේ ඇති වූ ප්‍රතිසංස්කරණයේ ප්‍රගතිය ............. 201
11. කුමාරවරුන්ගේ විරෝධතාවය .................................. 215
12. ප්‍රංශ පුනරුදය ........................................................ 232
13. නෙදර්ලන්තය සහ ස්කැන්ඩිනේවියාව ........................ 265
14. පසුකාලීන ඉංග්‍රීසි ජාතික ප්‍රතිසංස්කරණවාදීහු ........... 275
15. ශුද්ධවූ බයිබලය සහ ප්‍රංශ විප්ලවය ........................ 299
16. වන්දනාකාර පියවරු ............................................... 327
17. අරුණෝදයෙහි පෙරමග සිටි දූතයෝ ........................ 340
18. ඇමෙරිකානු ප්‍රතිසංස්කාරකයෙක් .............................. 361
19. අඳුර පළවා හරිමින් ආලෝකය උදා වේ .................. 391
20. විශිෂ්ට ආගමික පිබිදීමක් ....................................... 405
21. අනතුරු ඇඟවීමක් ප්‍රතික්ෂේප කෙරේ ........................ 429

පිටු අංක

22. අනාවැකි ඉටුවෙයි .................................................... 448
23. ශුද්ධස්ථානය යනු කුමක්ද? ....................................... 469
24. අති ශුද්ධස්ථානය ..................................................... 485
25. වෙනස් නොවන වෙනස් කළ නොහැකි දේව නීතිය .... 496
26. ප්‍රතිසංස්කරණ ක්‍රියාවේදයක් ...................................... 516
27. වත්මන් නව ජීවන පිබිදීම් ......................................... 528
28. සෝදිසි කිරීමේ විනිශ්චය .......................................... 551
29. නපුරෙහි උපත .......................................................... 567
30. මිනිස් වර්ගයා හා සාතන් අතර සතුරුකම ............... 584
31. දුෂ්ට ආත්මයන්ගේ ක්‍රියාකාරකම් ............................... 592
32. සාතන්ගේ මළපත් ...................................................... 601
33. ප්‍රථම මහා මුළාව ..................................................... 618
34. භූත විද්‍යාව ............................................................. 642
35. පාප් බලයේ ස්වභාවය හා අරමුණු ........................... 656
36. එන්ට තිබෙන්නාවූ අරගලය හා එය ඇතිවීමට හේතූන්... 675
37. ශුද්ධ ලියවිල්ල රැකවරණයකි.................................... 687
38. අවසාන අවවාදය ....................................................... 698
39. පීඩාවන් පවතින කාලය ............................................ 708
40. දෙවියන්වහන්සේගේ සෙනඟ මුදාගනු ලැබීම .............. 731
41. පොළොව පාළු වී පවතියි ........................................... 749
42. අරගලය අවසාන වෙයි .............................................. 758

# හැඳින්වීම

පාපය ඇතුල්වීමට පෙර දෙවියන්වහන්සේ සමග මුහුණට මුහුණ ලා කථා කිරීමේ භාග්‍යය මිනිසා සතුව තිබුණේය. ආදම් ස්වකීය මැවුම්කාරයාණන් සමග බාධාවකින් තොරව කථා බහ කළේය. පව් කිරීමෙන් මිනිසා සහ දෙවියන්වහන්සේ අතර වෙන්වීමක් ඇති වූ නිසා මිනිස් වර්ගයාට මෙම විශේෂ වරප්‍රසාදය අහිමි විය. එසේ වුවද, මිදීමේ සැලැස්ම කරණකොටගෙන මිනිසාට සහනය ලැබුණේය. මෙලොව මනුෂ්‍යයන්ට සගය සමග තවදුරටත් සබඳතාව පවත්වා ගෙන යෑමට මඟක් එමගින් විවෘත විය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ මගින් මනුෂ්‍යයන් සමග සබඳතාවය පවත්වන සේක. උන්වහන්සේගේ තෝරාගත් සේවකයන් මගින් දිව්‍ය ආලෝකය මිනිස් සතහට එළිදරව් කරනු ලැබීය. "මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ දෙවියන්-වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය." 2 පේතෘස් 1:21.

මිනිස් ඉතිහාසයෙහි මුල් වසර දෙදහස් පන්සියයක් ගතවන තුරු, දේව එළිදරව් කිරීම් ලිඛිතව තිබුණේ නැත. දෙවියන්වහන්සේ පිළිබඳව ඉගෙනීමක් ලැබූ අය තම දැනුම අනෙකුත් අය සමග බෙදා ගත්තෝය. පරම්පරා ගණනාවක් පුරා පියා තම දරුවාට එම දැනුම ලබා දුන්නේය. දේව පණිවිඩ ලියා තැබීම පටන් ගත්තේ මෝසෙස්ගේ කාලයේදීය. දේවානුභාවයෙන් දෙන ලද එළිදරව් කිරීම් දේවානුභාවයෙන් යුත් පොතක ලියා තබන ලදී. මෙම පිළිවෙත වසර එක්දහස් හය සියයක කාලයක් පුරා පැවතුණේය. මැවීමේ සහ නීති පද්ධතියේ ඉතිහාසඥයා වන මෝසෙස්ගේ කාලයේ සිට ශුභාරංචියේ අති උදාර සත්‍යතාවන් වාර්තා කරන යොහන් දක්වා වූ කාලය පුරා, දේව එළිදරව් කිරීම් වාර්තා ගත කරනු ලැබීය.

ශුද්ධ වූ බයිබලයේ නියම කතුවරයාණෝ දෙවියන්වහන්සේ බවට එහිම ප්‍රකාශ කිරීම් ඇතුළත්ය. එහෙත් එම ශුද්ධ වූ පොත ලියන ලද්දේ මිනිස් හස්තයෙන්ය. බයිබලයේ වූ විවිධ පොත් තුළ එකිනෙකට වෙනස් වූ රචනා ශෛලියන් දකගැනීමට පුළුවන. රචකයන් ගණනාවකගේ විවිධ චරිතාංග එය තුළින් විකාශනය වන්නේය. එසේ වුවද, එළිදරව් කර ඇති සත්‍යතාවන් සියල්ල "දේවානුභාවයෙන්" 2 තිමෝති 3:16 ලබා දී තිබේ. එහෙත් එම වදන් ප්‍රකාශ වී තිබෙන්නේ මිනිස් වචන වලින්ය. අනන්ත වූ තැනැන්වහන්සේ තමන්වහන්සේගේ ශුද්ධ වූ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තම සේවකයන්ගේ මනස් සහ හදවත් තුළට ආලෝකය දෙවා වදාළ සේක. උන්වහන්සේ



ඔවුන්ට සිහින හා දර්ශන මගින්ද, ලකුණු සහ රූපක මගින්ද පණිවිඩ ලබා දුන්සේක. මෙසේ සත්‍යතාවය එළිදරව් කරනු ලැබූ අය එකී පණිවිඩ මිනිස් වචන මගින් ලියා තැබුවෝය.

දෙවියන්වහන්සේම ස්වකීය මුඛයෙන් දසපනත ප්‍රකාශ කළසේක, තමන්වහන්සේගේම ඇඟිලිවලින් ඒවා ලියූ සේක. එම වචන දිව්‍යමය වදන්ය, නමුත් මිනිසා විසින් රචනා කරන ලද නිර්මාණයක් නොවේය. මිනිස් භාෂාවෙන් විස්තර කර ඇති දෙවියන්වහන්සේ විසින් දෙනු ලැබූ සත්‍යතාවන් අඩංගු ශුද්ධ වූ බයිබලය දිව්‍ය මිනිස් සබඳතාවන් ගෙනහැර දක්වන්නේය. මෙවන් එකමුතුකමක්, ඒකත්වයක්, ක්‍රිස්තුස්වහන්සේගේ ස්වභාවය තුළ ගැබ් වී තිබුණේය. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වූ අතරම මනුෂ්‍ය පුත්‍රයාද වූසේක. ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධව එවැන්නක් සත්‍ය වුවා සේම බයිබලය පිළිබඳවද එය සැබෑවකි. මෙසේ "වාක්‍යයාණෝ මාංශවත් වී ... අප අතරෙහි වාසය කළසේක." යොහන් 1:14.

නොයෙක් කාලවල, විවිධ තරාතිරම්වල වූ, විවිධ වෘත්තීන්වල යෙදුණු පුද්ගලයන් විසින් බයිබලය රචනා කරන ලදී. ඔවුන්ගේ මානසික සහ ආත්මික කුසලතා විවිධාකාර විය. මහත් සේ වෙනස්වූ රචනා ශෛලියන්ද, මහත් සේ වෙනස්වූ තේමාවන්ද බයිබලය තුළ දකගැනීමට හැකිය. යම්කිසි විෂයක් ගැන එක් ලේඛකයෙක් තවත් ලේඛකයෙකුට වඩා සිත් ඇදගන්නා ලෙස ගළපා සත්‍යතාවන් ඉදිරිපත් කර තිබේ. විවිධ ලේඛකයෝ වෙනස් වෙනස් දෘෂ්ටිකෝණවලින් සහ වෙනස් පැතිකඩවලින් යම්කිසි විෂයක් ගැන කරුණු ඉදිරිපත් කර ඇත්තාහ. ගැඹුරු ලෙස හදාරන්නේ නැති, සැලකිල්ලෙන් යුතුව අධ්‍යයනය කරන්නේ නැති, අවිචාර සිතුවිල්ලක් ඇති පුද්ගලයෙකුට ශුද්ධ බයිබලය තුළ එකිනෙකට වෙනස්වූ ද පරස්පර විරෝධීවූ ද ප්‍රකාශන ඇතැයි පෙනී යා හැකිය. එසේ වුවද, විමර්ශණශීලී මනසක් ඇති ගෞරව භක්තිය ඇති සිසුවෙකුට එහි අන්තර්ගතය තුළ එකඟතාවක්, එකම කල්පිතයක් ඇති බව පැහැලිවම දකගැනීමට හැකිය.

විවිධ පුද්ගලයන් කරණකොටගෙන ඉදිරිපත් කර ඇති, ශුද්ධ බයිබලයේ ඇතුළත් වී ඇති සත්‍යතාවන් විවිධාකාරයෙන් ඉදිරිපත් කර ඇත. එක්තරා විෂයයක් පිළිබඳව යම්කිසි පැතිකඩක් එක් ලේඛකයෙකුට සුවිශේෂ වූවේය. ඔහු එකී කරුණු ඉදිරිපත් කරන්නේ තමාගේ අත්දකීම් සහ අවබෝධ කරගැනීමේ ශක්තිය සමග සාපේක්ෂිතවය. ඒ අතර තවත් ලේඛකයෙක් එම විෂයෙහි තවත් පැතිකඩක් ඉදිරිපත් කරයි. ඔව්හු ශුද්ධාත්ම ආනුභාවය තුළින් තමාගේ මනසට ඉතා හොඳින් කාවැදී ගිය කරුණු ඉදිරිපත් කළහ. එසේ

වුවද මෙම සියලු කරුණු තුළ අනුකුලතාවක් පවතී. මෙයාකාරයෙන් ඉදිරිපත් කර ඇති සියලු සත්‍යතාවන් සම්පූර්ණ වූ ඒකකයක් ලෙස මිනිසාට ඉදිරිපත් කර තිබේ. ඒවා ජීවිතයේ සියලු අත්දැකීම්වලදීද, සියලු අවශ්‍යතාවන්වලදීද මිනිස් උවමනාවන්ට සහාය විය හැකි ලෙස සුවිශේෂ කාර්ය සාධනයක් ඉටු කරයි.

තමන්වහන්සේගේ සත්‍යතාව ලෝකයට ලබාදීමට මිනිස් නියෝජනය භාවිතා කිරීමට දෙවියන්වහන්සේ ප්‍රසන්න වූසේක. උන්වහන්සේම තමන් ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් පුද්ගලයන් තෝරාගෙන, මෙම කාර්යය ඉටුකිරීමට ඔවුන්ට හැකියාව ලබා දුන්සේක. ඔවුන් විසින් ප්‍රකාශ කළ යුතු දේ සහ ලේඛණ ගත කළ යුතු දේ තෝරා බේරාගැනීමට දෙවියන්වහන්සේ ඔවුන්ගේ මනසට මගපෙන්වූ සේක. සත්‍යතාවයේ සම්පත භූමික බඳුන්වලට පවරනු ලැබුණේ වුවද එය ස්වර්ගයෙන් විය. මිනිස් භාෂාවේ අසම්පූර්ණ වූ පද යෙදීම් සහ විස්තර කිරීම් මගින් දේව සාක්ෂිය ප්‍රකාශ කෙරිණ. එහෙත් එය දෙවියන්වහන්සේගේ සාක්ෂිය වන්නේය. ශුද්ධ බයිබලයේ අඩංගු දෑ කියවන්නාවූ කීකරු විශ්වාසී දේව දරුවෙකුට එය තුළ දිව්‍ය බලයක තේජස්ශ්‍රීයක් දකගැනීමට පුළුවන. එය තුළ අනුග්‍රහය සහ සත්‍යතාව අනූන බව ඔහු දකින්නේය.

මිනිසාගේ ගැළවීම සඳහා අවශ්‍ය වන්නාවූ දැනුම දෙවියන්වහන්සේ විසින් ස්වකීය වචනය තුළ බහා ඇත. ශුද්ධ ලියවිල්ල වනාහි දෙවියන්වහන්සේගේ කැමැත්ත අධිකාරී බලයෙන් යුතුවද වැරදිය නොහැකි ලෙසද එළිදරව් කිරීමකි. එය එසේ පිළිගත යුතුය. මෙම ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු ප්‍රඥප්ති සහ අණපනත් චරිතයෙහි ප්‍රමිතිය වන්නේය, ධර්මතාවයන්හි ප්‍රකාශනය වන්නේය, අත්දැකීම්වල පරීක්ෂණ වන්නේය. "දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස "දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨ කම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ." 2 තිමෝති 3: 16,

මෙසේ දේව වචනය තුළින් දෙවියන්වහන්සේ සිය කැමැත්ත මිනිසාට එළිදරව් කර ඇත. එසේ වුවද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිති පවතින්නාවූ අඛණ්ඩ වැඩසිටීම සහ මගපෙන්වීම අවශ්‍ය නැතැයි එයින් පසක් නොකෙරේ. තමන්වහන්සේගේ සේවකයන් හට වචනය විවෘත කරමින් ඔවුන්ව ආලෝකමත් කිරීම සඳහාත් එහි ඉගැන්වීම් අදාළ කිරීම සඳහාත් සත්‍ය වශයෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ අප සමග සිටින බවට අපගේ මිදුම්කරුවාණෝ පොරොන්දු වූසේක. ශුද්ධ බයිබලය ලිවීමේදී ඒ සඳහා ආනුභාවය සපයා දුන්නේ



ශුද්ධාත්මයාණන්වහන්සේය. එම නිසා කිසිම අවස්ථාවකදී උන්වහන්සේගේ ඉගැන්වීම් දේව වචනයට විරුද්ධ වන්නේ නැත.

බයිබලය අභිභවා යෑම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේව දානය කර නැත, එසේ වන්නේද නැත. මක්නිසාදයත් සියලු ඉගැන්වීම් සහ අත්දැකීම් පිරික්සීමේ ප්‍රමිතිය දේව වචනය බව ශුද්ධ ලියවිලි නිසැකවම ප්‍රකාශ කරයි. අපෝස්තුළු යොහන් මෙසේ පවසයි: "බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින්, සියලු ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන් දැයි පරීක්ෂා කරන්න." (1 යොහන් 4:1). ඒ අතර යෙසායාද මෙසේ ප්‍රකාශ කර තිබේ: "ව්‍යවස්ථාව ද, සාක්ෂිය ද වෙතට යමු! ඒ වචනයේ හැටියට ඔවුන් නොකීවොත් ඔවුන්ට පහන් වීමක් නැත."යෙසායා 8:20

දෙවියන්වහන්සේගේ වචනයේ මගපෙන්වීම තවදුරටත් අවශ්‍ය නැතැයි ද, තමන්ට ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලෝකමත් කිරීම් ලැබී ඇතැයි ද පවසන්නාවූ බැතිමතුන් පිරිසක් වෙති. මේ අයගේ වැරදි ඉගැන්වීම් කරණකොටගෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාකාරිත්වයට මහත් අගතියක් සිදුවී ඇත. තමන්ගේ ආත්මයෙහි ඇතිවන්නාවූ හැඟීම් සහ සංකල්ප දෙවියන්වහන්සේගේ හඬ යයි ඔවුහු විශ්වාස කරමින් ඒ අනුව ක්‍රියාකරති. එහෙත් ඔවුන්ව පාලනය කරන්නාවූ ආත්මය වූකලී දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නොවේ. ශුද්ධ ලියවිල්ල අමතක කර දමා සිතුවිලි වලට සහ හැඟීම්වලට වහල් වී ක්‍රියාකිරීම කරණකොටගෙන වියවුල, මුළාව සහ අන්තිමේදී විනාශයද පමණක්ම ඇතිවන්නේය. එමගින් සිදුවන්නේ නපුරාගේ (සාතන්ගේ) සැලසුම් ව්‍යාප්ත කිරීමක් පමණකි. ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට ශුද්ධාත්මයාණන්ගේ මෙහෙවරය ඉතා වැදගත්ය. එම නිසා ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය කෙරෙහි නිග්‍රහ කිරීමක් පැමිණවීම සාතන්ගේ උපක්‍රමයකි. හැඟීම්වලට යටත්ව ක්‍රියා කරන්නාවූ මෙම ආගමික අන්තවාදීන්ගේ වැරැදි ඉගැන්වීම් සහ ක්‍රියාකිරීම් නිසා ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකිරීම නොතකා හැරීමට දෙවියන්වහන්සේගේ ජනතාව යොමුවී තිබේ. කිතුණු බැතිමතාව ශක්තිමත් කරන්නාවූ මාධ්‍යයක් ලෙස ස්වාමින්වහන්සේ විසින් සපයා දී ඇති මෙම ක්‍රමය අතපසු කරන්නට බැතිමතුන්ව යොමු කිරීම සාතන්ගේ උපක්‍රමය වන්නේය.

දෙවියන්වහන්සේගේ වචනයට අනුකූලව ශුද්ධාත්මයාණන්වහන්සේ ස්වකීය කාර්ය භාරය ඉටුකිරීම ශුභාරංචි සේවයේ අවසානය දක්වාම අඛණ්ඩව ක්‍රියාත්මකව පවත්වාගෙන යා යුතුව තිබුණේය. පරණ තෙස්තමේන්තුව සහ අලුත් තෙස්තමේන්තුව ලිවීමේ කාලවලදී

ශුද්ධාත්මයාණන්වහන්සේ සෘජුවම ලේඛකයන් සමග ක්‍රියා කළසේක. එම කාලවලදී ශුද්ධාත්මයාණන්වහන්සේ යම් යම් පුද්ගලයන්ගේ මනස්වලට ආලෝකය ලබාදීම දිගටම ඉටු කළසේක. ශුද්ධ ලියවිලිවල අඩංගු එළිදරව් කිරීම්වලට අමතරව ශුද්ධාත්මයාණන්වහන්සේ කරුණාකොටගෙන මිනිසුන් හට අනතුරු ඇඟවීම්, තරවටු කිරීම්, අනුශාසනා කිරීම් සහ ගුරු හරුකම්ද ලබාදුන් බව ශුද්ධවූ බයිබලයම සවිස්තරව දක්වයි. තවද විවිධ යුගයන්හි විසූ අනාගතවක්තෘන් ගැන ශුද්ධ ලියවිල්ලෙහි සඳහන්ව ඇති නමුත්, ඔවුන් කියන ලද දේවල් ගැන කිසිම සඳහනක් නැත. ශුද්ධ බයිබලය සැකසීම සඳහා පොත පත එක් රැස්කර හමාර කිරීමෙන් පසු කාලවලදී පවා ශුද්ධාත්මයාණන්වහන්සේ තම වැඩ කොටස දිගටම කරගෙන යමින් දෙවියන්වහන්සේගේ දරුවන්ගේ මනස් ආලෝකමත් කරමින්, ඔවුන්ට අනතුරු අඟවමින්, ඔවුන්ට සැනසීම ලබා දෙමින් ක්‍රියාත්මක වීම අදහස් කරන ලදී.

යේසුස්වහන්සේ තමන් ගෝලයන්ට මෙසේ පොරොන්දු වූසේක. "මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන් වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහි කරවන සේක." "උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වන සේක ... උන්වහන්සේ ... පැමිණෙන්නට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක." යොහන් 14:26, 16:13. මෙම පොරොන්දු අපෝස්තුළුවරුන්ගේ කාලයට පමණක් සීමා නොවීය. සෑම යුගයකම වූ කිතුණු සභාව උදෙසා මෙම පොරොන්දු සහතික බව ශුද්ධ ලියවිලි පැහැලිවම උගන්වයි. මිදුම්කරුවාණන් තම අනුගාමිකයන්ට මෙසේ පොරොන්දු වූසේක: "මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමි." මතෙව් 28:20. ආත්මයාණන්වහන්සේගේ දීමනා සහ ප්‍රකාශවීම් සභාවට ලබා දී ඇති බව පාවුල් තුමා පවසයි. ඒවා ලබා දී ඇත්තේ "ඇදහීමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දන ගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය." එපීස 4:12,13.

එපීසියෙහි ඇදහිලිවන්තයන් උදෙසා අපෝස්තුළුවරයා මෙසේ යාච්ඤා කළේය. "එසේ කරන්නේ මහිමයේ පියාණන් වන අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවියන්වහන්සේ, උන්වහන්සේ ගැන දනගැනීමට ප්‍රඥාවේද එළිදරව් කිරීමේද ආත්මයක් නුඹලාට දෙන



ලෙසත්, උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියාත්, ශුද්ධවන්තයන් තුළ වූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත්, අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දනගන්න පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය." එපීස 1:17-19. දිව්‍ය ආත්මයාණන්-වහන්සේගේ මෙහෙවරය වනාහි දනගැනීම ආලෝකමත් කිරීමත්, දෙවියන්වහන්සේගේ වචනයෙහි ගැඹුරු දේ මනසට විවෘත කිරීමත්, අවබෝධ කරගැනීමෙහි ප්‍රඥාව ලබාදීමත්ය. එපීසියෙහි සභාව වෙනුවෙන් පාවුල් තුමා ඉල්ලා සිටි ආශිර්වාදය මෙය වන්නේය.

පෙන්තකොස්ත දවසෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ විස්මිත ප්‍රකාශ වීමෙන් පසුව, පේතෘස්තුමා ශ්‍රාවකයන් උනන්දු කළේ පව් කමාව ලබාගන්නා පිණිස පසුතැවිලි වී ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාගන්නා ලෙසය. "එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවන සේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත් යයි කියා" පේතෘස් තුමා පැවසුවේය. ක්‍රියා 2:38,39.

දෙවියන්වහන්සේගේ මහත් දවසෙහි සිදුවීම් සම්බන්ධව ස්වාමින්-වහන්සේ තමන්වහන්සේගේ ආත්මයාණන්ගේ විශේෂ ප්‍රකාශවීමක් සිදුවන බව යෝවෙල් දිවැසිවරයා මගින් පොරොන්දු වී ඇත. යෝවෙල් 2: 28. මෙම අනාගතවාක්‍යයෙහි කොටසක් පෙන්තකොස්ත දවසෙහිදී සිදු වූ ශුද්ධාත්ම වැගිරීමේදී ඉටු විය. ශුභාරංචි මෙහෙවරය අවසන් වීමේ කාලය සමඟ අත්වැල් බැඳ ක්‍රියාත්මක වන්නාවූ දිව්‍ය අනුග්‍රහය පහළ වීමේදී යෝවෙල්ගේ මෙම අනාවැකියේ පූර්ණ ඉටුවීම සිදුවේ.

කාලයාගේ අවසානය කරා ලෝකය යොමුවත්ම යහපත සහ නපුර අතර පවතින්නාවූ මහා අරගලය ඉතා දැඩිව ක්‍රියාත්මක වේ. ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට එරෙහිව සාතන්ගේ උදහස සෑම යුගයකම ක්‍රියාත්මක වී ඇත. නපුරාගේ බලයට විරුද්ධව නැගී සිටීම සඳහා තමන්වහන්සේගේ සෙනඟ ශක්තිමත් කිරීමට දෙවියන්වහන්සේ තම අනුග්‍රහය සහ ආත්මයාණන්වහන්සේ ඔවුන්ට ලබා දී ඇත, වගුරුවා ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය උන්වහන්සේගේ අපෝස්තුළුවරුන් විසින් ලෝ පුරා ප්‍රකාශ කිරීමේදී ද, අනාගත පරපුර සඳහා එකී සිදුවීම් වාර්තා කර තැබීමේදී ද ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් වූ ප්‍රඥාව ලබාදීම සහ මනස ආලෝකමත් කිරීම ඔවුන්ට නොඅඩුව ලැබී තිබුණේය. එහෙත් සභාව ඇයගේ අවසන් මිදීම කරා ළඟාවත්ම සාතන්ද තම ක්‍රියාකාරිකම් මහත් බලයෙන් යුතුව සිදු කරනවා ඇත.

"යක්ෂයා තමාට ඇත්තේ ස්වල්ප කාලයක් බව දන්න බැවින්, මහත් උදහසින් යුක්තව" මිනිස් වර්ගයා වෙත බැස එන්නේය. එළිදරව් 12:12. "බොරු වූ සියලු ආකාර ආශ්චර්යවලින්ද, ලකුණුවලින්ද, පුදුමවලින්ද" ඔහු ක්‍රියා කරන්නේය. 2 තෙසලෝනික 2:9. දෙවියන්-වහන්සේගේ දූතයන් අතර එක් කලෙක උසස්වූ ප්‍රඥාවන්තයාවූ සාතන් වසර හය දහසක් පුරා තමාගේ සෑම අවධානයක්ම යොමු කළේ මුළාව සහ විනාශය උදාකිරීම සඳහාය. අරගලය පැවති යුගයන් පුරා සාතන් විසින් ප්‍රගුණ කළ ඉතා සියුම් කූට මායාකාරී ක්‍රියාවේදයන් සියල්ලම ඒකරාශී කර අරගලයේ අන්තිම ප්‍රහාරයේදී දෙවියන්-වහන්සේගේ සෙනඟට විරුද්ධව මුදා හැරේ. මෙම කාලය මහත් උපද්‍රව සහිත යුගයක් වන අතර කිතුණු අනුගාමිකයන්ගේ වැඩ කොටස වන්නේ ස්වාමින්වහන්සේගේ දෙවෙනි ඊමේ පණිවිඩය අනතුරු ඇඟවීමක් ලෙස ලෝක වාසීන් හට ප්‍රකාශ කිරීමය. "කැළැල් රහිත, නිදොස්," ජනතා කණ්ඩායමක් සූදානම් කිරීම ඔවුන්ගේ කාර්ය භාරය වන්නේය. 2 පේතෘස් 3:14. මෙම විශේෂිත ජන කොටස දෙවෙනි ඊමේදී උන්වහන්සේ ඉදිරියෙහි නැගී සිටිනවා ඇත. මෙම කාලයේදී අපෝස්තුළුවරුන්ගේ දවස්වලට වඩා නොඅඩුව දිව්‍ය අනුග්‍රහය සහ බලය ඔවුන්ට අවශ්‍ය වනවා ඇත.

ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවය කරණකොටගෙන යහපතෙහි සහ නපුරෙහි දිගු කාලීන සංග්‍රාමික සිදුවීම් මේ පොතේ පිටු ලියූ තැනැත්තිය වන මා ඉදිරියෙහි විවෘතව දර්ශනය විය. මිදීමේ කර්තෘවරයාණන් වූද, ජීවනයේ කුමාරයාණන්වූද, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මුල්වරට බිඳ දමුවාවූද, පාපයේ නිර්මාතෘ වූද, නපුරේ කුමාරයා වූද සාතන් අතර නොයෙක් යුගවල පැවති මහා අරගලයේ ක්‍රියාකාරකම් කලින් කලට දකගැනීමේ අවසරය මා හට ලබාදෙන ලදී. ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව සාතන් තුළ තිබූ වෛරය උන්වහන්සේගේ අනුගාමිකයන් කෙරේ එල්ල විය. දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ප්‍රඥප්තිවලට විරුද්ධව එම වෛරයම ක්‍රියාත්මක වෙමින් එම ආකාරයේ මුළාකිරීම් මගින් බොරුව සත්‍යතාව ලෙසින් පෙන්වා දීමට වෑයමක් විය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ආඥා වෙනුවට මිනිස් අණපනත් ආදේශ කර ඇත. මැවුම්කාරයාණන්ට නමස්කාර කිරීම වෙනුවට මැවිල්ලට නමස්කාර කිරීමට සෑම යුගයක් පුරාම මනුෂ්‍යයන්ට මගපෙන්වා ඇති බව ඉතිහාසය කියා පාන්නේය. දෙවියන්වහන්සේගේ චරිතය වැරදි ආකාරයෙන් හුවා දක්වීමට සාතන්ගේ උත්සාහයන් මැවුම්කාරයාණන් පිළිබඳව ව්‍යාජ ආකල්පයක් මිනිසුන් තුළ ඇති කරවාලීමට හේතු විය. උන්වහන්සේට ප්‍රේම කිරීම වෙනුවට බියෙන් සහ වෛරයෙන් යුතුව එලෙස ක්‍රියාකිරීමට ඔහු ඔවුන්ට සලස්වා තිබේ. ඔහු දිව්‍ය ව්‍යව්‍යවස්ථාව පසෙක ලමින් එහි ඉල්ලීම්



වලින් තමා නිදහස් යයි සිතීමට සලසා මිනිසුන්ව නොමග යවයි. ඔහුගේ මුළාවන්ට විරුද්ධව ක්‍රියා කරන්නන්ට සෑම යුගයකදීම නිරතුරුව හිංසා පීඩා පමුණුවා ඇත. මේ දේවල් සියල්ලක්ම ලෝක ඉතිහාසයේ ආරම්භයේ පටන්ම සිදුවී ඇත. ආදී පීතෘවරුන්ගේද, අනාගතවක්තෘවරුන්ගේද, අපොස්තුළුවරුන්ගේද, වේදසාක්ෂිකාරයන්ගේද, ප්‍රතිසංස්කරණ වාදීන්ගේද ජීවිතවල එම සිදුවීම් දක්නට ඇත.

අවසන් මහා සටනෙහිදී සාතන් විසින් එම ප්‍රතිපත්තියම අනුගමනය කරනවා ඇත, එම ස්වභාවයම පෙන්වනවා ඇත, පෙර යුගවල මෙන්ම එම අරමුණම කරා ළඟාවීමට ක්‍රියා කරනවා ඇත. ඇත අතීතයේදී සිදුවූ දයම නැවතත් සිදුවෙනවා ඇත. එහෙත් අනාගත සැලසුම්, බලයෙන් සහ පරිමාණයෙන් විශාල වන්නේය. එකල්හි සිදුවන ක්‍රියාකාරිත්වය ලෝක ඉතිහාසයේ මින් පෙර කිසිම දවසක සිදුවී නැත. සාතන්ගේ මුළාවන් හා ප්‍රහාර වඩාත් සූක්ෂ්ම හා තීරණාත්මක වන්නේය. හැකිනම්, ඔහු තෝරාගනු ලැබූවන් පවා මුළා කරන්නේය. මාර්ක් 13:22.

දෙවියන්වහන්සේගේ වචනයෙහි ඉතා අගනා සත්‍යතාවන් උන්වහන්සේගේ ආත්මයාණන් විසින් මාගේ මනසට එළිදරව් කරදී ඇත. අතීතයේදී සිදුවූ සිද්ධීන් මෙන්ම අනාගත සිදුවීම් පිළිබඳ දර්ශන මා හට ලබා දී එලෙස එළිදරව් කළ දේ පිළිබඳව අනෙකුත් අයව දැනුවත් කරන්නැයි දෙවියන්වහන්සේ මාගෙන් ඉල්ලූ සේක. පසුගිය යුගයන්හි සිදුවූ මහා අරගලයෙහි ඉතිහාසය සොයා බලා ඒවා ඉදිරිපත් කර අනාගතයේදී පැමිණෙන්නාවූ ගැටළු පිළිබඳව මනුෂ්‍යයන් ආලෝකමත් කිරීම දේව අභිප්‍රාය වේ. මෙම අභිමතාර්ථය ඉටුකිරීම උදෙසා සහා ඉතිහාසයෙහි සනිටුහන් වී ඇති සමහර සිදුවීම් තෝරාගැනීමට හා එක්කාසු කිරීමට මා උත්සාහ කර ඒවා සූදානම් කළෙමි. විවිධ අවස්ථාවන්හිදී ලෝකයට දෙනු ලැබූ විශිෂ්ට අගනා සත්‍යතාවන් එළිදරව් කරනු ලැබූ ආකාරය කියාපෑමට කරුණු ගොනු කිරීම අවශ්‍ය විය. මෙකී සත්‍යතාවන් එළිදරව් කිරීම ගැන සාතන්ගේ උදහසද ලෝකයට ප්‍රේම කරන සභාවෙහි වෛරයද ඒ සත්‍යයන්ට විරුද්ධව නැගී සිටියේය. සත්‍යයට ඇලුම් කළ අය එය රැකගැනීම උදෙසා තම ජීවිත පවා පූජා කළෝය.

මෙම වාර්තාවල අපට දකිය හැකිවන්නේ ඉදිරි අනාගතයේදී සිදුවන්නාවූ ගැටුමෙහි පෙර නිමිත්තකි. දෙවියන්වහන්සේගේ වචනය හා ශුද්ධාත්මයාණන්ගේ ආලෝකමත් කිරීම තුළින් අනාවරණය කර ඇති උපක්‍රමයන් මගින් නපුරාගේ උපක්‍රමයන් අපට දකගත හැකි

වේ. ස්වාමින්වහන්සේගේ පැමිණීමෙහිදී "කිසිම වරදක් නැති"වූ අය විසින් මෙවන් අන්තරාකාමී දේවල් එපා කළ යුතුය.

අතීත යුගයන්හිදී ප්‍රතිසංස්කරණයෙහි වර්ධනය පිළිබඳව වූ විශිෂ්ට සිද්ධීන් හා බැඳි වාර්තා සටහන් දන් ඉතිහාසයේ පිටුවල ලේඛණ ගත කර තිබේ. ප්‍රොතැස්තන්ත ලෝකය එම වාර්තාවන් පිළිබඳව හොඳින් දන ගෙන සිටියි. එම සිද්ධීන් ලෝකයට රහසක්ද නොවේ. මෙම සත්‍ය කරුණුවලට විරුද්ධව කථාකිරීමට කිසිවෙකුට නොහැකිය.

මෙම පොතෙහි අරමුණ සාක්ෂාත් කරගැනීමට එම ඉතිහාසය සංක්ෂිප්තව ඉදිරිපත් කොට ඇත. එම කරුණු භාවිතයට ගැනීමේදී මහත් සැලකිල්ලක් යොදා ඇත. එම කරුණු අදාළ කිරීමේදී මනා අවබෝධයක් ලබාගැනීම පිණිස යම් යම් සත්‍ය කරුණු ඉතා කෙටියෙන් සුළු ඉඩ ප්‍රමාණයන්ට ගැළපෙන සේ යොදා ඇත. ඉතිහාසඥයෙකු විසින් කරුණු ගොනුකර සාරාංශය ඉදිරිපත් කර ඇති සමහර අවස්ථාවන්හිදී, එකී පාඨ ඔහුගේම වචනවලින් මෙම පොතෙහි ඇතුළත් කර තිබේ. එසේ වුවද, සමහර අවස්ථාවන්හිදී උපුටා ගැනීම් පිළිබඳව සඳහනක් කර නැත. එම උපුටා ගැනීමේ පරමාර්ථය එම සිද්ධියෙහි තතු ඉදිරිපත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති විෂයක් එවන් කතුවරයෙකු විසින් ප්‍රමාණවත් ලෙස විස්තර කර දී තිබේ නම්, එය මෙම පොතට ඇතුළත් කර තිබේ. අපගේ කාලයේදී ප්‍රතිසංස්කරණ වැඩ කටයුතුවල නියැළී සිටින්නාවූ අයගේ අත්දැකීම් සහ අදහස් ඉදිරිපත් කිරීමේදී ඔවුන්ගේ ප්‍රකාශන එලෙසින්ම උපුටා ගෙන මෙම පොතෙහි ඇතුළත් කර තිබේ.

ඈත අතීතයේදී සිදුවූ ගැටුම් පිළිබඳව අළුත් දෙයක් ඉදිරිපත් කිරීම මෙම පොතෙහි පරමාර්ථය නොවන අතර, මතු පැමිණෙන්නාවූ සිදුවීම් කෙරෙහි බලපාන්නාවූ කරුණු සහ ප්‍රඥප්ති අදාළ කරගෙන විස්තර සැපයීම එහි පරමාර්ථයයි. ආලෝකයෙහි බලවේගයන් සහ අඳුරෙහි බලවේගයන් අතර පවතින්නා වූ අරගලයෙහි විවිධ පැතිකඩ ලෙසින් වූ පූර්ව වාර්තාවන්වල අලුත් වැදගත්කමක් තිබෙන බව පෙනී යන්නේය. එම සිදුවීම් කරණකොටගෙන අනාගතය ආලෝකමත් කිරීමත් පැහැදිලි ලෙස දකගත හැකි වේ. අතීතයේ සිටි ප්‍රතිසංස්කරණ වාදීන් මෙන්ම මතු දවසකදී ද මෙවන් ප්‍රතිසංස්කරණයන්ට මුහුණ පෑමට සිදුවන්නාවූ අයට ශක්තිමත්ව සිටීමට උපකාරයක් වන පිණිස ඈත යුගයන්හි ඉතිහාසය දක්වා ඇත. ලෞකික සියලු සම්පත් පරදුවට තබා, "දෙවියන්වහන්සේගේ වචනය සහ යේසුස්වහන්සේගේ සාක්ෂිය" උදෙසා නොසැළී සිට සාක්ෂි දැරීමට ඔවුන්ව කැඳවනු ලබනවා ඇත.



මෙම ග්‍රන්ථයෙහි අරමුණ වන්නේ සත්‍යය හා වරද අතර ඇති මහා අරගලයේ දර්ශන විවෘත කිරීමය; සාතන්ගේ කපටි උපක්‍රම එළිදරව් කිරීම හා ඔහුට විරුද්ධව නැඟී සිට ජයග්‍රාහීව ඔහුව පරාජය කිරීමට උපකාරයක් වන ක්‍රම ඉගෙනීමය; නපුර නමැති මහා ගැටළුවට සතුටුදායක විසඳුමක් ඉදිරිපත් කරමින් පාපයේ ආරම්භය හා අවසානය පිළිබඳව විශාල ආලෝකයක් විහිදුවා එය සකල විශ්වයෙන්ම තුරන් කරන ආකාරයද දෙවියන්වහන්සේ තම මැවිල්ල සමග සාධාරණව හා පරිත්‍යාගශීලීව කටයුතු කරන ආකාරය හා උන්වහන්සේගේ ශුද්ධවූ ව්‍යවස්ථාවේ වෙනස් නොවන ස්වභාවය පෙන්නුම් කිරීමද මෙම ග්‍රන්ථයේ අදහසය. මෙම ග්‍රන්ථයෙහි බලපෑමෙන් මනුෂ්‍යයන් අඳුරේ බලවේගයෙන් මුදනු ලැබ ආලෝකයේ ශුද්ධවන්තයන්ගේ උරුමයට ඔවුන් පංගුකාරයන් වී අපට ප්‍රේම කළාවූ අප උදෙසා තමන්ව දුන්නාවූ උන්වහන්සේට ප්‍රශංසාව පැමිණවීම කතුවරියගේ උද්‍යෝගිමත් යාච්ඤාවයි.

එලන්. වයිට්.

# 1

## යෙරුසලමෙහි විනාශය

"අහෝ නුඹේ සමාදානයට අයිති කාරණා මේ දවසේදී වත් නුඹ දනගෙන සිටිනවා නම් යහපත! එහෙත් දන් ඒවා නුඹේ ඇස්වලින් සැඟවී තිබේ. නුඹ විමසා බලන කාලය නුඹ නොදන සිටි බැවින්, නුඹේ සතුරන් විසින් නුඹ වටේට පස් වැටියක් නඟා, නුඹ වට කොට, සියලු දිසාවෙන්ම නුඹ කොටු කරගෙන නුඹ සහ නුඹ තුළ සිටින නුඹේ දරුවන් ද පොළොවේ ගසා, නුඹ තුළේ ගලක් පිට ගලක් තිබෙන්ට නාරින දවස් පැමිණෙන්නේය." (ලූක් 19:42-44).

යේසුස්වහන්සේ ඔලීව කන්ද මුදුනේ සිට යෙරුසලම දෙස බැලූසේක. උන්වහන්සේ ඉදිරියෙහි වූ දර්ශනය පැහැපත්ව සාමකාමීව පැවතුණි. මේ පාස්කු සමය විය. මෙම සුවිශේෂී ජාතික උත්සවය සැමරීම සඳහා යාකොබ්ගේ දරුවෝ මෙම ස්ථානයට එක්ව සිටියහ. දසත පිහිටි සැම රටකින්ම ඔවුහු යෙරුසලමට පැමිණ සිටියහ. උයන් සහ මිදි වතුද වන්දනාකරුවන්ගේ කූඩාරම් විසිරව පැවති කොළ පැහැති කඳු බෑවුම්ද පඩි පෙළක් මෙන්වූ කඳුවැටි ද අතරෙන් ඉශ්‍රායෙලයේ අගනුවර සැරසූ රජ මාළිගා සහ විශාල ගොඩනැගිලි අහස දෙසට දිස් විය. සියොන් දියණිය තම අභිමානයෙන් උදම් වී මෙසේ පවසන්නට වූවා සේ පෙනේ. "අපේ දෙවියන්වහන්සේගේ නුවර වන උන්වහන්සේගේ ශුද්ධ කන්දෙහි ස්වාමින්වහන්සේ උතුම්ය; බොහෝ සෙයින් ප්‍රශංසා කටයුතුය" (ගීතාවලිය 48:1) යනුවෙන් ගීතිකාකාරයා මෙසේ ගායනා කළ අවස්ථාවේදී මෙන්, සියොන් දියණිය තම අභිමානයෙන් උදම් වී මෙසේ පවසන්නට වූවා සේ පෙනේ. 'මම බිසවක්ව වැඩ හිඳ ශෝකයද කිසිසේත් නොදනිමි.' ඇය සගයේ වරප්‍රසාදවලට හිමිකම් කී ආකාරයෙන් වත්මන් කලද ඇයට එම ගෞරවණීය ස්ථානය හිමිව ඇතැයි සියොන් දියණිය සිතුවාක් මෙන් පෙනේ. දේව මාළිගයෙහි අනගිභවනීය ගොඩනැගිලි පැහැදිලිව දකගත හැකි විය. බැස යන හිරුගේ රැස් දහරාවන් කිරි ගරුඬින් තැනූ දේවමාළිගාවේ බිත්ති මත පතිත වෙමින් ඒවා ආලෝකමත් කළේය. එකී රැස් දහරා රනින් නිම වූ දොරටු මතද, උස් කුළුණු සහ කොත් කැරැල්ල මතද පතිත වී පරාවර්තනය වෙමින් අති මනරම් සිරියක් මවා පෑවේය. එය යුදෙව් ජාතියේ අභිමානය විය. දේව මාළිගාවේ 'පූර්ණ අලංකාරය' මෙම දර්ශනය දෙස නෙත් හෙළන්නාවූ සැම ඊශ්‍රායෙලිතයෙකුගේ ගත සිත ප්‍රීති ප්‍රමෝදයෙන් සහ ජාතික මහන්තත්වයේ හැඟීම් වලින් පිරී ඉතිරී යෑම පුදුමයක්ද! එසේ වුවද, යේසුස්වහන්සේගේ සිත තුළ තෙරපෙමින් තිබුණේ වෙනස් ආකාර සිතුවිලිය. උන්වහන්සේ ළංවී නුවර දක හැඬූසේක. (ලූක් 19:41) යේසුස්වහන්සේ ජයග්‍රාහන්විත ලෙස නගරයට



ඇතුළු වූසේක. අවට රැස්ව සිටි සැම අයෙක්ම ප්‍රීතිය ප්‍රකාශ කළෝය. ඔවුහු තල් අතු වනමින් ප්‍රීති ඝෝෂා පැවැත්වූහ. ඔවුන්ගේ හෝසන්නා හඬ කඳු අතර දෝංකාරය දුන්නේය. මෙම සුවිශේෂ පුද්ගලයාණෝ රජතුමා යයි පැවසූ දහස් සංඛ්‍යාත ජනතාවගේ හඬ ගුවනට එක් විය. ඒ ඝෝෂාකාරී ජනතා හඬ මධ්‍යයේ ලෝකයේ ගැළවුම්කාරයාණෝ හදිසි විස්මිත දුකකින් වේදනාවට පත්ව සිටිසේක. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වූද, ඊශ්‍රායෙලිතයන්ගේ පොරොන්දුවේ තැනැන්වහන්සේ වූද උන්වහන්සේ තම බල අධිකාරිය මගින් මරුවා පරාජයට පත්කොට ඒ ග්‍රහණයට හසුව සිටි අය සොහොන් ගෙවලින් පිටතට හඬ ගැසූසේක. උන්වහන්සේගේ ශ්‍රී දෙනෙතින් ඇද හැලුණු කඳුළු දෙකොපුල් දිගේ රූරා ගලන්නට විය. එය ඉතා දැඩිවූ මැඩපැවැත්විය නොහැකි වේදනාවක් විය.

ක්‍රිස්තුස්වහන්සේගේ නෙතින් ගලා ආ කඳුළු තමන්වහන්සේ උදෙසා වගුරුවනු නොලැබීය. තමන්වහන්සේගේ ඉදිරි ගමන් මග පිළිබඳව උන්වහන්සේ මනා ලෙස දනසිටි සේක. උන්වහන්සේ ඉදිරියෙහි ගෙත්සෙමන පිහිටා තිබුණේය. තමන්වහන්සේගේ දුක් ගාවිනාවෙන් යුතු ආත්මයේ වේදනාව වැගිරවීම සඳහා එහි දොරටු විවෘතව තිබෙන අයුරු උන්වහන්සේට දකගත හැකි විය. බැටළු දොරටුවද උන්වහන්සේගේ නෙතට ගැටුණේය. යාග පූජාවන් උදෙසා මරණයට පත්කරනු ලැබීමට මෙම දොරටුව තුළින්, වසර සිය ගණනාවක් පුරා මරණයට බිලි වූ සතුන් ඇතුළට ගෙන යනු ලැබීය. "මරන්ට ගෙන යන බැටළු පැටවෙකු මෙන්" (යෙසායා 53:7) තමන්වහන්සේද ඉදිරි දිනකදී මෙම දොරටුව තුළින් ගමන් කළ යුතු බව උන්වහන්සේට පැහැදිලි විය. ඒ අතර කුරුසිපත් කරන ස්ථානයවූ කල්වාරියද නුදුරින් පිහිටා තිබුණේය. එහිදී උන්වහන්සේ තමන් ආත්මය පාප පූජාවක් ලෙස ඔප්පු කරන අතර එම පූජාව ඔප්පු කිරීම සඳහා තමා ඉදිරි දිනයක ගමන් කරන්නාවූ මාර්ගය අන්ධකාරයේ ඡායාවලින් වැසී යනවා ඇත. එහෙත් මෙම දර්ශන මෙනෙහි කිරීමෙන් උන්වහන්සේගේ ප්‍රීති ප්‍රමෝද අවස්ථාව යටපත් නොවීය. යේසුස්වහන්සේගේ චින්තනය මහත් සන්තාපයකට පත්ව තිබුණේ මේ දර්ශන ගැන කල්පනා කිරීමෙන් නොවීය. උන්වහන්සේගේ පරාර්ථකාමී ආත්මය තැවුලට පත්වූයේ තමන්වහන්සේට පැමිණෙන්ට තිබුණාවූ වේදනාවන් පිළිබඳව නොවීය. උන්වහන්සේ පැමිණියේ ඔවුන්ට ගැළවීම ලබාදීමටය. නමුත් ඔවුන් අන්ධකාරයේ ගිලී සිටි නිසාද, පසුතැවිල්ල එපා කළ නිසාද, යෙරුසලමේ දහස් ගණන් ජනතාව මත පැමිණෙන්ට යන ශෝචනීය ඉරණම නිසාද උන්වහන්සේ වැළපුණ සේක.

තමන්වහන්සේගේ තෝරාගත් ජනතාව වෙනුවෙන් දෙවියන්වහන්සේ ඔවුන් මත පතිත කළ විශේෂ වරප්‍රසාද මෙන්ම රැකවරණයද පිළිබඳව වූ අවුරුදු දහසකට වඩා දිගු ඉතිහාසය යේසුස්වහන්සේගේ දසුනට

යොමු විය. මොරියා දේශයෙහි පූජනීය කන්ද උන්වහන්සේගේ දෙනෙතට යොමු විය. එහි තිබූ පූජාසනයක් මත තරුණයෙකු හොවා සිටියේය. කිසිම විරුද්ධතාවයක් ඔහුගෙන් නොවීය. ඔහු පොරොන්දුවේ පුත්‍රයා විය. දේව පුත්‍රයාණන්ගේ පූජාව එයින් සංකේත විය. (උත්පත්ති 22; 16-18). එතැනදී, මහිමශ්‍රීය මෙසියස්වහන්සේ පිළිබඳ පොරොන්දුව, ආශිර්වාදයේ ගිවිසුම, ඇදහිලිවතුන්ගේ පියා සමග ගිවිස ගන්නා ලදී. යෙබූසීය ඕර්ණාන්ගේ කමතට උන්වහන්සේගේ දසුන යොමු විය. එතැනදී ස්වර්ගය කරා විහිදී ගිය පූජාවෙහි ගිනි දල්, විනාශකාර දූතයාගේ කඩුපහර ඉවතට හැරවීමෙහි සමත් විය. වරදට යටත් වූ මිනිසා වෙනුවෙන් ගැළවුම්කාරයාණන්වහන්සේගේ පූජාවත්, ඔවුන් වෙනුවෙන් වූ උන්වහන්සේගේ මැදහත්කාර සේවාවත් එයින් සංකේතවත් විය. (1 ලේකම් 21). ලොව අන් කිසිම ස්ථානයකට වඩා යෙරුසලම දෙවියන්වහන්සේගේ ගෞරවයට භාජනය වී තිබුණේය. ස්වාමීන්වහන්සේ සියොන් තෝරාගෙන සිටිසේක. ස්වකීය නිවාසය ලෙස ඊට ආශා වූසේක. (ගීතාවලිය 132:13). එහිදී යුගයන් ගණනාවක් පුරා ශුද්ධ වූ අනාගතවක්තෘවරු තමන්ගේ අනතුරු ඇඟවීමේ පණිවිඩ ප්‍රකාශ කළහ. එහිදී පූජකයෝ දුම් භාජන ඔසවා ඔබ මොබ වැනුවෝය. එතැනින් අහසට නැගී සුවඳ දුම් බැතිමතුන්ගේ යාච්ඤා සමග මුසුව දෙවියන්වහන්සේ වෙත පැමිණියේය. එහිදී දිනපතාම මරනු ලැබූ බැටළුවන්ගේ රුධිරය පූජා කරනු ලැබීය. දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාණන්ගේ පූජාවට එය පෙර දැක්මක් විය. එතැනදී ගිවිසුම් පෙට්ටියෙහි පියන්පත වූ කරුණාසනය මත වූ තේජසෙහි වලාකුළ මගින් යෙහෝවඃවහන්සේ තමන් වැඩසිටීම එළිදරව් කළසේක. අහසත්, පොළොවත් සම්බන්ධ කළ අද්භූත හිණිමගෙහි දෙපා පිහිටා තිබුණේ එතැනය. එම හිණිමගෙහි දේව දූතයෝ ඉහළටත්, පහළටත් යමින් එමින් සිටියෝය. (උත්පත්ති 28:12, යොහන් 1:51) ස්වර්ගයෙහි අති ශුද්ධස්ථානය කරා වූ මාර්ගය ඒ මගින් පොළොවට විවෘත විය. ඊශ්‍රායෙල් ජනතාව ජාතියක් වශයෙන් සදහටම පවතිනවා නිසැකය. යෙරුසලමද වැටී නොයනවා ඇත. (යෙරෙමියා 17:21-25). ඉමහත් සැලකිල්ලට පාත්‍ර වූ එම ජනතාවගේ ඉතිහාසය හඬ ගා පැවසුවේ එම සෙනඟ කැරලි ගසමින් දේව පටිපාටියට විරුද්ධව ක්‍රියා කළ කථාන්තරයයි. ඔවුහු ස්වර්ගයේ කරුණාවට එරෙහිව ක්‍රියා කළෝය. ඔවුහු තමන්ගේ වරප්‍රසාද වැරදි ලෙස පරිහරණය කළෝය, තමන් ලැබූ ශුභවාදී අවස්ථාවන් එපා කළෝය.

ඊශ්‍රායෙල් ජනතාව 'දෙවියන්වහන්සේගේ පණිවිඩකාරයන්ට සරදම් කර, උන්වහන්සේගේ වචන සුළු කර, උන්වහන්සේගේ ප්‍රොපේතවරුන්ට නින්දා කර' (2 ලේකම් 36:16) උන්වහන්සේගේ ආයාචනා නැවත නැවතත් එපා කළද කරුණාවෙන් යුක්ත වන උන්වහන්සේ තවදුරටත් කරුණාවෙන් යුක්තව ඔවුන්ට ආයාචනා කළසේක. ඒ අතර උන්වහන්සේ



ඔවුන්ට ප්‍රකාශ වූයේ, "අනුකම්පාවෙන් පූර්ණ වූ, දයාවන්ත වූ, උදහස් වීමට ප්‍රමාද වන්නාවූ, අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ" දෙවියන්වහන්සේ ලෙසය." (නික්මයාම 34:6). කරුණාභරිත පියෙකු තම රැකවරණයෙහි වූ පුත්‍රයෙකුට සලකනවාටත් වඩා වැඩි අවධානයකින් දෙවියන්වහන්සේ ඔවුන්ට අනුකම්පා කරමින්, (2 ලේකම් 36:15). "ස්වාමින්වහන්සේ ස්වකීය සෙනඟටත්, ස්වකීය වාසස්ථානයටත් අනුකම්පා කළ නිසා උන්වහන්සේ.... පණිවිඩකාරයන් අත ඔවුන්ට කියා ඇරිය සේක." තරවටු කිරීම්, ආයාචනා සහ බැගෑපත් ඉල්ලීම් වලින් ප්‍රයෝජනයක් නොවූ කල්හි පියවූ දෙවියන්වහන්සේ ස්වර්ගයෙහි වූ උත්තරීතර අගනා තෑග්ග ජනතාවට පූජා කළසේක, එසේය, සකල ස්වර්ගයම එකම තෑග්ගකට පොදි බැඳ දෙවා වදාළ සේක.

පසුතැවෙන්නේ නැති නගරයට ආයාචනා කිරීම සඳහා ඔවුන්ට මනුෂ්‍ය පුත්‍රයාවම එවනු ලැබූසේක. ඊශ්‍රායෙල් දරුවන් මිසර දේශයේ සිට යහපත් මිදි වැලක් ලෙස කැඳවා ගෙන පැමිණියේ ක්‍රිස්තුස්වහන්සේමය. (ගීතාවලිය 80:8). ඔවුන් ඉදිරියෙන් මිසදිටු ජාතීන් පළවා හැරියේද උන්වහන්සේය. උන්වහන්සේ එය "ඉතා සාරවත් කන්දක" සිටෙවූ සේක. ස්වකීය ආරක්ෂාව මැද එය රැකබලා ගැනීමට උන්වහන්සේ එය වටා තාප්පයක් ඉදි කළසේක. එය පෝෂණය කිරීමට උන්වහන්සේ තම සේවකයන් එවූ සේක. මාගේ මිදිවත්ත උදෙසා මා විසින් නොකළාවූ වෙන කුමක් කරන්ට පුළුවන්ව තිබුණේද? කියා උන්වහන්සේ අසන සේක. (යෙසායා 5:1-14.) එහි හොඳ මුද්‍රික ඵල හටගන්නවා ඇතැයි උන්වහන්සේ බලා සිටි නමුත්, එහි වල් මුද්‍රික ඵල හට ගත්තේය. එසේ වුවද, යහපත් ඵල හට ගන්නවා ඇතැයි යන දැඩි බලාපොරොත්තුවෙන් උන්වහන්සේම මිදිවත්ත වෙත පැමිණි සේක. එය විනාශ කර දමන්නේ නැතිව බේරා ගැනීම උන්වහන්සේගේ දැඩි ආශාව විය. උන්වහන්සේ මිදිවත්ත වටා අගලක් කැපූසේක; එහි මිදි අතු කප්පාදු කර, ආදරයෙන් එය රැකබලා ගත් සේක. තමන්වහන්සේම රෝපණය කළ මෙම මිදිවත්ත බේරා ගැනීමට උන්වහන්සේ මහන්සි නොබලා ප්‍රබල වෑයමක යෙදුණු සේක.

ආලෝකයේ සහ තේජසේ ස්වාමින්වහන්සේ වසර තුනක් පුරා තම ජනතාව අතරට ගොස් ඔවුන් සමග කටයුතු කළසේක. "උන්වහන්සේ යහපත්කම් කරමින් ද, යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලන් සුව කරමින්ද, හැසුරුණු" සේක. (ක්‍රියා 10:38). තවද, උන්වහන්සේ බිඳුණු සිත් ඇති දනන් හට සැනසීම ලබා දෙමින්ද, මඩනා ලද්දවුන්ට නිදහස ළඟා කර දෙමින් ද, කොරව සිටි අයට ඇවිදීමට සලස්වමින්ද, බිහිරි වූවන් හට ඇසීම උදාකර දෙමින්ද, කුෂ්ඨ රෝගීන්ට සුවය ලබා දෙමින්ද, මළවුන් හට ජීවත්වීම අත්කර දෙමින්ද, දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරමින්ද, ගම් නියම්ගම් සිසාරා සැරි සැරූ සේක. (ලූක් 4:18; මතෙව් 11:5). සෑම තරාතිරකම අයට උන්වහන්සේ දයාබරිත

ආයාචනයක් කළ සේක. "වෙහෙස වන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට එන්න. මම නුඹලාට සහනය දෙමි"යි යන්න උන්වහන්සේගේ ඉල්ලීමය. (මතෙව් 11:28).

තමා කළාවූ යහපත් ක්‍රියාදාමයනට උන්වහන්සේට ලැබුණේ නපුරු ප්‍රතිචාරයකි; ප්‍රේමයට ලැබුණේ වෛර කිරීමකි. (ගීතාවලිය 109:5). එසේ වුවද, උන්වහන්සේ ස්වකීය කරුණාවේ සේවය නොකඩවා සිදු කළසේක. උන්වහන්සේගේ දයාව සහ අනුකම්පාව බලා-පොරොත්තුවෙන් පැමිණි කිසිවෙකු හෝ හිස් අතින් ආපසු හරවා යැවීමක් කිසිවිටෙක හෝ සිදු නොවීය. නිශ්චිත නවාතැනක් නැතිව තැනින් තැන යමින් දිවි ගෙවීම සමග අවලාදයට ලක්වීම සහ දිළිඳුකම උන්වහන්සේගේ දිනපතා කොටස විය. ජනතාවගේ අවශ්‍යතාවයන්ට සරණ වීම සහ ඔවුන්ගේ ජීවන බර සැහැල්ලු කිරීම උන්වහන්සේගේ සේවයේ අරමුණ විය. ඒ අතරම ජීවනයේ දීමනාව පිළිගන්නා ලෙස ඉල්ලීමක් කිරීමද ඒ සේවයේ කොටසක් විය. දැඩි නොහික්මුණු හදවත් මගින් ආපසු හරවනු ලැබූ කරුණාවේ රළ පෙළ අනුකම්පාවේ සහ මිණිය නොහැකි ආදරයේ රළ පතර හා එකතුව එම හදවත් කරා නැවත නැවතත් යොමු විය. නමුත් ඊශ්‍රායෙලිතයෝ තමන්ගේ අතිඋතුම් මිතුරාණන්ගෙන්ද, එකම සහන-දායකයාණන්ගෙන්ද ඉවත්ව සිටියහ. උන්වහන්සේගේ ආදරබර ආයාචනා සුළුකොට සලකනු ලැබීය. ඔවුහු උන්වහන්සේගේ අනුශාසනා ගැරහීමට ලක් කළහ, උන්වහන්සේගේ අනතුරු ඇඟවීම් අවමානයට ලක් කළෝය.

බලාපොරොත්තුවේ සහ සමාවීමේ පැය කඩිනමින් ගෙවී යමින් තිබුණෝය. බොහෝ කලක් වගුරන්නේ නැතිව රඳවා ගෙන තිබූ දෙවියන්වහන්සේගේ උදහසෙහි කුසලාන පිරී ඉතිරී යෑමට ආසන්න වී තිබුණෝය. දේව වචනයට පිටුපා ක්‍රියාකිරීම් සහ කැරලි ගැසීම් විශාල වශයෙන් සියවස් ගණනාවක් පුරා සිදුවෙමින් පැවතිණ. මේ ශෝචනීය කළු වලාව වරදකාර ජනතාව මත පුපුරා යාමට ආසන්න විය. මෙම ව්‍යසනයෙන් එම ජනතාව මුදවා ගැනීමට හැකි එකම තැනැන්වහන්සේව ඔවුහු එපා කළෝය; උන්වහන්සේට නින්දා කළෝය; අපවාදයට ලක් කළෝය. ඉදිරි දවස් කිහිපය තුළදී උන්වහන්සේව කුරුසියෙහි ඇණ ගසා මැරීමටද නියමිතව තිබුණි. ක්‍රිස්තුස්වහන්සේ කල්වාරි කුරුසිය මත එල්ලනු ලබන සිද්ධිය දෙවියන්වහන්සේගේ තෝරාගත් ආශිර්වාදලත් සෙනඟ වූ ඊශ්‍රායෙල්වරුන්ගේ අවසානය වනු ඇත. මුළු ලෝකයෙහි සියලු වස්තු සම්පත් ලැබීම ඉදිරියෙහි එක ආත්මයක හෝ විනාශ වීම ඉමහත් අලාභයකි, දැරිය නොහැකි අනන්ත පාඩුවකි. යෙරුසලම දෙස නෙත් හෙළන්නාවූ ක්‍රිස්තුස්-වහන්සේගේ සිතුවිල්ලට හසු වූයේ මුළු නගරයෙහි, සමස්ථ යුදා



ජාතියෙහි විනාශයයි. එම නගරය, එකී ජාතිය, වරක් දෙවියන්-වහන්සේගේ තෝරාගත් සම්පත වූවාය, විශිෂ්ටතම වස්තුව වූවාය.

ඊශ්‍රායෙලිතයන් දේව වචනයට පිටු පා ක්‍රියාකිරීම ගැනද ඔවුන්ගේ පාප නිසා ඔවුන් මතට පැමිණීමට නියමිත වූ දඬුවම, මහත් සෝදා පාළුව සහ ජාතික විනාශය පිළිබඳවද අනාගතවක්තෘවරු වැළපුණෝය. දෙවියන්වහන්සේගේ රළ වහල්කමට ගෙන යනු ලැබීය. එම ගැටුමේදී විශාල සෙනඟක් මරණයට පත් වූහ. මේ ගැන යෙරෙමියා අනාගතවක්තෘවරයා මහත් කම්පාවට පත් විය. තම ජනතාවගේ දියණියන් මරා දමනු ලැබීම ගැන දිවා රෑ වැලපීමට තමාගේ දෑස් කඳුළු උල්පතක් වන්නැයි යෙරෙමියා ඉල්ලා සිටියේය. (යෙරෙමියා 9:1; 13:17). වසර කිහිපයක් නොව යුගයන් ගණනාවක් දිවැසින් දුටු තැනැන්වහන්සේගේ දුක හා ශෝකය කුමන ආකාරයේ එකක් වූයේද! කාලයක් පුරා යොහෝවඃවහන්සේගේ වාසස්ථානය වූ යෙරුසලම් නගරය විනාශ කිරීම සඳහා විනාශයේ කඩුව ඔසවාගෙන සිටි දූතයාව උන්වහන්සේ දුටුසේක. පසුකාලයේ තීතස් හා ඔහුගේ හමුදාව රැඳී සිටි ස්ථානය වූ ඔලීව කන්දේ සිට නිම්නයට ඔබ්බෙන් පිහිටි ශුද්ධවූ ගොඩනැගිලි දෙස උන්වහන්සේ බැලූසේක; කඳුළින් බරවූ නෙත්වලින් යුතුව උන්වහන්සේ භයානක ආකාරයකින් බලකොටුව වටා රඳවා තිබූ විදෙස් හමුදාව දුටුසේක. යුද්ධය සඳහා පැමිණෙන්නාවූ සතුරු හමුදාවෙහි පියවර හඬ උන්වහන්සේගේ සවන්හි පතිත විය. සතුරන් විසින් වටකරනු ලැබූ නගරයෙහි සිටි මෑණිවරුන් තම දරුවන්ගේ කුසගිනි නිවීමට රොටී ඉල්ලා කරන්නාවූ ආයාචනාත්මක හඬ, ළතෝනි හඬ උන්වහන්සේට ඇසුණෝය. ගෘහ නිර්මාණයේ ශ්‍රේෂ්ඨ කෘතියක් වූ දේව මාළිගාව සහ ඒ අවට පිහිටි ශුද්ධ වූ ගොඩනැගිලිද ගිනි දැල් මගින් සිපගන්නා අයුරු උන්වහන්සේ දුටුසේක. තව ස්වල්ප දිනකින් එම ගොඩනැගිලි තිබූ ස්ථානවල ඉතිරිව තිබෙන්ට යන්නේ ගින්නෙන් දැවී ගිය සුන්බුන් පමණක් බව උන්වහන්සේගේ දිවැසට පෙනී ගියේය.

වසර ගණනාවක් අනාගතයට නෙත් හෙළූ උන්වහන්සේගේ දර්ශන පථයට හසුවූයේ ගිවිසුමේ ජනතාව ලෝ පුරා නන් පෙදෙස්හි විසුරුවා හැර දිවි ගෙවන්නාවූ ආකාරයයි. වැඩි ඈතක් නොවූ දවසක යෙරුසලමෙහි වැසියන් කරා පතිත වන්නාවූ දඬුවම් දීම තාවකාලික විනිශ්චයක් පමණකි. ලෝකය මත පතිත වන්නාවූ අන්තිම විනිශ්චයේ උදහසේ පාත්‍රය අන්තිම බිංදුව දක්වා වගුරුවනු ලබන හැටි උන්වහන්සේ දිවැසින් දුටුසේක. මේ සියල්ල දුටු යේසුස්වහන්සේගේ මුවින් පිට වූ ළයාන්විත වදන් තුළ දිව්‍ය අනුකම්පාවේ සහ ප්‍රේමයේ බැගෑපත් හඬ මුසුව තිබුණෝය. "අනේ අනාගතවක්තෘවරුන් මරන්නාවූ, නුඹ ළඟට එවූවන්ට ගල් ගසන්නාවූ යෙරුසලම, යෙරුසලම, කිකිළී ඇගේ

පැටවුන් පියාපත් යටට එකතු කරගන්නාක් මෙන් නුඹේ දරුවන් එකතු කරගන්ට මම කී වරක් කැමති වුණෙම්ද?" (මතෙව් 23:37). අහෝ! වෙනත් කිසිම ජාතියකට වඩා වරප්‍රසාදයට ලක් වූ ජනතාවෙනි, ඔබ කරා පැමිණෙන්නට යෝජිත දඬුවම ඔබ දන සිටියා නම්! ඔබගේ සමාදානයට අයිති සම්පත් ඔබ දන සිටියා නම්! විනිශ්චයේ දූතයාගේ දඬුවම් පැමිණවීම මම නවතාලීමි. මම ඔබට පසුතැවෙන ලෙස ආයාචනා කළෙමි. එහෙත් එම වෑයම නිෂ්ඵල විය. ඔබ විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ මා එවූ සේවකයන්, නියෝජිතවරුන් පමණක් නොවේය. ඔබගේ මිදුම්කරුවාණන් වූ ඊශ්‍රායෙලිතයන්ගේ ශුද්ධ වූ තැනැන්වහන්සේවද එපා කළහුය. ඔබ විනාශ වන්නෙහි නම් එහි සම්පූර්ණ වගකීම ඔබ බාරගත යුතු වන්නේය. "නමුත් නුඹලා ජීවනය ලබන පිණිස මා ළඟට එන්න කැමැති නැත." (යොහන් 5:40.)

ක්‍රිස්තුස්වහන්සේ යෙරුසලම තුළ දුටුවේ අවිශ්වාසයෙහි හා කැරලි ගැසීමෙහි සිත දැඩි කරගත් ලෝකයක් ඉක්මණින් දෙවියන්වහන්සේගේ විනිශ්චයට පාත්‍ර වන සලකුණකි. පාපයට වැටුණාවූ මිනිස් වර්ගයාගේ දුක් වේදනාවන් උන්වහන්සේගේ ආත්මය තුළ දැඩි තෙරපීමක් ඇති කරමින් උන්වහන්සේගේ තොල්වලින් අති තිත්ත වූ හඬක් නික්මවීමට සැලැස්වීය. පාපයේ කුරිරු වාර්තා මිනිස් වර්ගයාගේ කාලකණ්ණි අත්දැකීම් තුළින්, කඳුළු තුළින් සහ රුධිරය තුළින්ද සනිටුහන් වී තිබුණු බව උන්වහන්සේ දුටුසේක. පීඩාවනට ලක් වූ දුක් විඳීම්වලට ගොදුරු වූ ලෝවැසි ජනතාව උදෙසා උන්වහන්සේගේ හදවත අනන්ත අනුකම්පාවෙන් සසල විය. ඔවුන් සෑමට සහනය උදාකර දීමට උන්වහන්සේ තුළ මහත් කරුණාවක් පහළ විය. එහෙත් මිනිසා කරා ලුහුබැඳ එන්නාවූ විපතෙහි බිහිසුණු විපාකය වෙනතකට හැරවීමට උන්වහන්සේගේ ශ්‍රී හස්තය යොමුවන්නේ නැති බව පෙනේ. උපකාර කළ හැකි එකම මාධ්‍යය කෙරෙහි සරණ පතා යන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි. මිනිසුන්ට මිදීම ළඟාකර දීමට තමන්ගේ ජීවිතය පවා පූජා කිරීමට උන්වහන්සේ කැමැත්තෙන් සිටිසේක. එහෙත් ජීවනය ලැබීමට උන්වහන්සේ ළඟට ඒමට කැමැති වන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි.

ස්වර්ගයේ සර්වබලධාරී උත්තමයාණෝ හැඬූ කඳුළින් සිටි සේක! දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ සිත් වේදනාවෙන් යුතුව, සන්තාපයෙන් තෙරපී පීඩිතව සිටිසේක! මෙම දසුන මුළු ස්වර්ගයම විස්මයට පත් කළේය. එම දසුන අපට එළිදරව් කරන්නේ පාපයේ ඇති බිහිසුණු පාපිෂ්ට ස්වභාවයයි. එයින් පෙන්නුම් කරන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරදකාරයන් වූ අයව මුදාගැනීම ඉමක් කොනක් නැති දිව්‍ය බලයට පවා අසීරු කාර්යයක් බවයි. යෙරුසලමේ විනාශයට හේතුවූ මුළාවන්ට සමාන මුළාවක



ලෝකයේ අවසාන පරම්පරාව පැටලී ඇති බව යේසුස්වහන්සේ දුටුසේක, සර්වඥනය තුළින් ලෝක ඉතිහාසයේ අවසන් යුගයේ දිවි ගෙවන්නාවූ අයව දුටුසේක. යුදෙව් ජනතාව සිදුකළ ඉතා මහත් වූ පාපය වූයේ ඔවුන් විසින් ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කිරීමය. ස්වර්ගයේ සහ පොළොවේ උන්වහන්සේගේ රාජ්‍යයේ අත්තිවාරම වන දේව ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කිරීම ක්‍රිස්තියානි ලෝකයේ මහත් පාපය වේ. යෙහෝවඃවහන්සේගේ ශික්ෂා අවමානයට ලක් කර එහි වලංගුභාවය අහෝසි කරනු ලබනවා ඇත. පාපයේ බන්ධනයට යටවූ, සාතන්ගේ වහලුන් බවට පත්ව ඇති මිනිස් වර්ගයා ගණනින් විශාලය. මෙම කෝටි සංඛ්‍යාත මිනිස් ජනකාය දෙවැනි මරණයට ගොදුරු වීමට ඉරණම්ව සිටිති. ඔවුහු සත්‍යතාවයේ වචනවලට ඇහුම්කන් දීම එපා කරති, කෙතරම් භයානක අන්ධභාවයක්ද! කෙතරම් බිහිසුණු මුළාවකින් මත්වී සිටීමක්ද!

පාස්කු මංගල්‍යයට දින දෙකකට පෙර ක්‍රිස්තුස්වහන්සේ අවසන් වරට දේව මාළිගාවෙන් නික්ම ආ සේක. එහිදී උන්වහන්සේ යුදෙව් නායකයන්ගේ වංචාකාරකම් දෝෂාරෝපණයට ලක් කළසේක. ඉක්බිතිව උන්වහන්සේ තමන් ගෝලයන් සමග ඔලීව කන්ද මතට ගමන් කළසේක. එහි කඳු බෑවුමක එක්තරා ස්ථානයක් තෝරාගත් උන්වහන්සේ එහි බිම වාඩි ගත්සේක. එතැනට නගරය මනාව දර්ශනය විය. නැවත වරක් උන්වහන්සේගේ බැල්ම එහි පවුරු, කොත් සහිත ගොඩනැගිලි සහ එහි වූ මාළිගාද වෙත යොමු විය. දේව මාළිගාව අලංකාර ස්වභාවයකින් දීප්තිමත්ව බැබළෙමින් තිබිණ. අලංකාර කිරීටයක්; පැවතියාක් මෙන් වූ ශුද්ධවූ කඳු මුදුන ඔටුනු පැළඳි සිරියාවක් කියා පෑවේය.

ඊශ්‍රායෙල් සෙනඟගේ ශුද්ධ වූ නිවස දෙවියන්වහන්සේගේ වාසස්ථානය බවට පත්කිරීමෙන් ගීතිකා රචකයා විසින් වසර දහසකට පෙරදී තම ජාතිය උදෙසාවූ දේව වරප්‍රසාදය මහත් සේ වර්ණනාවට ලක් කළේය. ඒ මෙසේය: "උන්වහන්සේගේ මණ්ඩපය සාලෙම්හිය. උන්වහන්සේගේ වාසස්ථානය සියොන්හිය. "යුදා ගෝත්‍රය, තමන් ප්‍රේම කළ සියොන් කන්ද තෝරාගත් සේක. උන්වහන්සේ උස් වූ ස්ථාන මෙන්ද සදාකාලේට තමන් පිහිටෙවූ පොළොව මෙන්ද ස්වකීය ශුද්ධ ස්ථානය ගොඩනැඟූ සේක." (ගීතාවලිය 76:2; 78:68,69). පළමු දේව මාළිගාව සාදන ලද්දේ ඊශ්‍රායෙලිතයන්ගේ ඉතිහාසයෙහි ඉතාමත්ම සමෘද්ධි කාල වකවානුවේදීය. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා විශාල වස්තු සම්භාරයක් දාවිත් රජතුමා විසින් එක්රැස් කර තිබුණේය. ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලැස්ම දිව්‍ය ආනුභාවයෙන් ලබාදෙනු ලැබීය. (1 ලේකම් 28:12,19) ඊශ්‍රායෙලයේ රජවරුන් අතුරෙන් ඉතාමත්ම ප්‍රඥාවන්ත රජතුමා වූ සාලමොන් ඉදිකිරීමෙහි කටයුතු

නිම කළේය. ලෝකයේ එතෙක් ඉදිකරන ලද ශ්‍රී විභූතියක් තිබූ විශිෂ්ටම ගොඩනැගිල්ල දේවමාළිගාව විය. එහෙත් ස්වාමීන්වහන්සේ හග්ගයි අනාගතවක්තෘවරයා මගින් දෙවැනි දේව මාළිගාව ගැන මෙසේ පැවසූ සේක, "මේ ගෘහයේ අන්තිම තේජස පළමු එකේ තේජසට වඩා මහත් වන්නේය." "සියලු ජාතීන් සොලවන්නෙමි. සියලු ජාතීන් ආශාවෙන දේද පැමිණෙන්නේය. මේ ගෘහය තේජසින් පුරවන්නෙමියි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක." (හග්ගයි 2:9,7)

මුල් දේවමාළිගාව නෙබුකද්නෙශර් විසින් විනාශ කරන ලදී. ක්‍රිස්තුස්වහන්සේගේ උපතට අවුරුදු පන්සියයකට පමණ පෙර එය නැවත වරක් ගොඩ නගන ලදී. ජීවිත කාලයක් පුරා විදේශයක යටත් වැසියන් ලෙස විසූ ඊශ්‍රායෙල් ජන කොටසක් ආපසු සිය නිජ බිම වෙත පැමිණියෝය. ඔවුන්ගේ දේශය පාළුව මුඩු බිමක් බවට පත්ව තිබුණේය. ඔවුහු සංවිධානය වී දේවමාළිගාව නැවත වරක් ගොඩ නැගීමට ක්‍රියාත්මක වූහ. එම ගොඩනැගිල්ලෙහි අත්තිවාරම දමන විට එහි සිටි වයෝවෘද්ධ සමහර අය සාලමොන්ගේ දේව මාළිගාවෙහි තේජශ්‍රීය දැක තිබූ නිසා වර්තමාන ගොඩනැගිල්ල මුල් දේව මාළිගාවට වඩා තේජසින් අඩු බව දැක වැලපෙන්නට වූහ. ඔවුන්ගේ සිත් තුළ තිබූ හැඟීම් ස්වභාවය අනාගතවක්තෘවරයා මෙසේ තදින් අවධාරණය කරයි. "මේ ගෘහය එහි පළමු තේජස ඇතුව තිබෙද්දී එය දුටු අයගෙන් නුඹලා අතරේ ඉතිරිව සිටින්නේ කවුද? මේක දැන් නුඹලාට පෙනෙන්නේ කොහොමද? මේක කිසිත් නැත්තාක් මෙන් නුඹලාගේ ඇස්වලට පෙනෙනවා නොවේද?" (හග්ගයි 2:3) එවිට දෙවැනි ගෘහයේ තේජස් මහිමය මුල් ගෘහයේ තේජසට වඩා උතුම් වන බවට පොරොන්දුවක් දෙන ලදී.

එහෙත් දෙවැනි දේවමාළිගාව අලංකාරත්වයෙන් පළමුවැන්නට සම නොවුණාක් මෙන්ම පළමු මාළිගාව හා බැඳුනු දිව්‍ය වැඩසිටීමේ දෘශ්‍යමාන ලකුණුවලින් ශුද්ධ කරනු නොලැබීය. එහි කැපකිරීම සනිටුහන් කිරීමට දිව්‍යමය බලයක් ප්‍රදර්ශනය නොවුණි. අලුත ගොඩනගන ලද දේව මාළිගාව තේජසේ වළාකුලකින් පිරී තිබෙන බව නොපෙනුණි. පූජාසනය මත තිබූ යාග පූජාව දවාලීමට ස්වර්ගයෙන් ගිනි බැස ආවේ නැත. අතිශුද්ධස්ථානයෙහි කෙරුබ්වරුන් අතරෙහි ෂෙකයිනා මහිමය වැඩසිටියේ නැත. ගිවිසුම් පෙට්ටිය, කරුණාසනය, සාක්ෂියේ ගල් පුවරු, අලුත් දේවමාළිගාව තුළ සම්බ නොවීය. පූජකයෙකු විසින් යෙහෝවඃවහන්සේගේ කැමැත්ත පවසන විට එයට ප්‍රතිචාර වශයෙන් ස්වර්ගයෙන් හඬක් නොපැමිණියේය.

හග්ගයි අනාගතවක්තෘ තුමා තුළින් දෙවියන්වහන්සේ දෙවා වදාළ පොරොන්දුව ඒ ආකාරයෙන්ම ඉටු වී ඇතැයි, පෙන්නුම් කිරීමට,



යුදෙව් ජනතාව සියවස් ගණනාවක් පුරා නිෂ්ඵල වෑයමක යෙදුණාහ. අනාගතවක්තෘ තුමාගේ වදන්හි සැබෑ අර්ථය අවබෝධ කරගැනීමට අහංකාරය සහ අවිශ්වාසය ඔවුන්ගේ මනස් අන්ධ කළේය. දෙවැනි දේව මාළිගාව යෙහෝවඃවහන්සේගේ තේජසෙහි වළාකුල මගින් ගෞරවයට ලක් නොවීය. එහෙත් ශාරීරිකව පැමිණියාවූ පූර්ණ දේවත්වයේ දේව පුත්‍රයාණන්ගේ පැමිණීමෙන් දෙවැනි දේව මාළිගාව ඉමහත් ගෞරවයට මෙන්ම මහිමයටද ආශිර්වාදයටද යොමු විය. නාසරීය මනුෂ්‍ය පුත්‍රයාණෝ දෙවැනි දේවමාළිගාවට වැඩම කර එහි උගන්වමින්ද රෝගීන්ට සුවය ලබාදෙමින්ද සේවය කරමින්ද "සකල ජාතීන්ගේ ආශාව"වූ උන්වහන්සේ සැබවින්ම තම මාළිගාවට පැමිණි සේක. දෙවැනි දේව මාළිගාව පළමුවැනි දේව මාළිගාවට වඩා තේජසේ මහිමාලංකාරයෙන් උත්කෘෂ්ටතාවට පත්වුණේ ක්‍රිස්තුස්වහන්සේ එහි පැමිණීම නිසාය. එහෙත් ස්වර්ගය විසින් දානය කළ අති උතුම් තෑග්ග ඊශ්‍රායෙල් ජනතාව එපා කළෝය. ඒ ඓතිහාසික දිනයේදී නිහතමානී ගුරුතුමාණෝ දේව මාළිගාවේ රන් දොරටු වෙතින් පිටතට පැමිණීමත් සමගම දේව මාළිගාවේ තේජශ්‍රීය මහිමය සදහටම ඇයගෙන් ඉවත්ව ගියේය. "නුඹලාගේ ගෘහය නුඹලාට පාළුකොට අත්හරිනු ලැබේ" යන (මතෙව් 23:38) ගැළවුම්කරුවාණන්ගේ වදන් සම්පූර්ණ වී තිබුණේය.

දේව මාළිගාව විනාශ කර දමනු ලබන බවට ක්‍රිස්තුස්වහන්සේගේ අනාවැකිය ඇසීමෙන් තැති ගත් ගෝලයෝ බියටත් විස්මයටත් පත් වූහ. උන්වහන්සේ පැවසූ දෙය වැඩි විස්තර සහිතව අවබෝධ කරගැනීමට ඔවුන් තුළ ආශාවක් විය. දේවමාළිගා ගොඩනැගිල්ල අලංකාර ශෝභාවෙන් වඩ වඩාත් මහිමයට පත්කිරීමට විශාල ධනස්කන්ධයක්ද, මහා පරිමාණයේ මිනිස් ශ්‍රමයද ගෘහ නිර්මාණ ශිල්පයේ සියුම් තාක්ෂණවේදයද වසර හතළිහකට වැඩි කාලයක් පුරා වැය වී තිබුණේය. මහා හෙරොද් රජ රෝම ධනය මෙන්ම යුදෙව් මහා ධන සම්පත්ද නිර්ලෝභීව එය ඉදිකිරීම සඳහා යොදවා තිබුණේය. එසේම, ලෝකයේ රජතුමා විසින් තමන්ගේ පුද්ගලික තෑගි පවා ගොඩනැගිල්ලෙහි අලංකාරය සඳහා දානය කර තිබුණේය. විශාල පරිමාණයේ කිරිගරුඬ කුට්ටි රෝමයේ සිට යෙරුසලම වෙත එවා තිබුණේය. එම ගල් කුට්ටි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා භාවිතා විය. ගොඩනැගිල්ලෙහි ශ්‍රී විභූතිය සඳහා යොදාගත් මෙම අගනා දේවල් කෙරෙහි ගෝලයෝ තම ස්වාමියාණන්ගේ අවධානය යොමු කළහ. "ආචාරිනී, බැලුව මැනව, කොයි ආකාර ගල්ද, කොයි ආකාර ගොඩනැගිලිද!", කියමින් ගෝලයෝ විස්මය පළ කළෝය. (මාර්ක් 13:1).

මෙවදන් ඇසූ යේසුස්වහන්සේ එයට පිළිතුරු වශයෙන් මෙම ගාම්භීරවූ ද, බියජනකවූ ද ප්‍රකාශය කළසේක: "සැබවක් නුඹලාට

කියම් - කඩා දමනු නොලැබ ගලක් පිට ගලක් මෙහි ඉතුරු නොවන්නේය." (මතෙව් 24:2)

යෙරුසලමෙහි විනාශයත් සමග යේසුස්වහන්සේගේ පුද්ගලික දෙවන පැමිණීමේ සිද්ධීන් එකට සිදුවන බවත්, විශ්වයේ සිහසුන දැරීමට උන්වහන්සේ තේජසින් යුතුව පැමිණ පසුතැවිලි නොවන්නාවූ යුදෙව්වන්ට දඬුවම් කර, රෝම බන්ධනයෙන් යුදෙව් ජාතිය ගළවා ගන්නා බවත් උන්වහන්සේගේ ගෝලයෝ සිතූහ. තමා දෙවෙනි වර පැමිණෙන බව ස්වාමීන්වහන්සේම ඔවුන්ට ප්‍රකාශ කර තිබුණේය. එහෙයින්, යෙරුසලම පිට විනිශ්චය පැමිණෙන බව ඇසූ විට ඔවුන්ගේ සිතුවිලි දෙවෙනි ඊමෙහි සංසිද්ධිය කෙරෙහි යොමු විය. උන්වහන්සේ ඔලීව කන්දෙහි වැඩ හුන් කළ ගෝලයෝ උන්වහන්සේ වෙතට පැමිණෙන "ඒ දේ කොයි කලෙක සිද්ධ වන්නේද? ඔබවහන්සේගේ ඊමටත්, ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්දැයි අපට කිව මැනව" යි ඔවුහු ඉල්ලා සිටියෝය. (මතෙව් 24:3)

අනාගතය කරුණාවෙන් යුතුව ගෝලයන්ගෙන් වසන් කර තිබුණි. මිදුම්කරුවාණන්ගේ දුක්විඳීම් සහ මරණයත්, ඔවුන්ගේ නගරයේ සහ දේවමාළිගාවෙහි විනාශයත් යන සිද්ධීන් දෙක පිළිබඳව මනා අවබෝධයක් ඔවුන්ට ලැබුණේ නම් ඔවුන් භීතියෙන් මුසපත් වීමට ඉඩ තිබුණි. කාලයේ අවසානය සිදුවීමට පෙර ඉටුවිය යුතු වැදගත් සිද්ධීන් පිළිබඳව කටු සටහනක් උන්වහන්සේ ඔවුන් ඉදිරියෙහි තැබූසේක. උන්වහන්සේ වදාළ වචන ඒ අවස්ථාවේදී ගෝලයින් පූර්ණ ලෙස වටහා ගත්තේ නැත. එහෙත් ඒවායේ තේරුම් දිගහරිනු ලබන්නේ ඒවා ගැන උපදෙස් තම ජනතාවට අවශ්‍ය වන විටය. ක්‍රිස්තුස්වහන්සේ ඒ අවස්ථාවේදී වදාළ අනාවැකියෙහි අදහස් දෙකක් ගැබ්ව තිබුණේය. යෙරුසලමෙහි විනාශය පිළිබඳ සිද්ධීන් එහි ඇතුළත් විය. තවද, වත්මන් ලෝක ඉතිහාසයෙහි අන්තිම කාලයේ දී සිදුවන්නාවූ භයංකාර සිද්ධීන්ද එම අනාවැකියට ඇතුළත්ව තිබුණේය.

අසා සිටියාවූ ගෝලයන්ට කරුණු පැහැදිලි කළාවූ යේසුස්වහන්සේ ඔවුන්ට පවසා සිටියේ දේව සැලැස්මට විරුද්ධව ක්‍රියා කළ ඊශ්‍රායෙල් සෙනඟ මත වැටෙන්නාවූ විනිශ්චයන් පිළිබඳවය. ඔවුන් විසින් මෙසියස්වහන්සේව එපාකර කුරුසිපත් කිරීම නිසා පැමිණෙන්නාවූ පලිගැනීමේ විපාකය පිළිබඳ විශේෂ සඳහනක් කිරීමට උන්වහන්සේ අතපසු කළේ නැත. එම භයංකාර සිද්ධියට පෙර නොවරදින ලකුණු ඇතිවන්නේය. එම බියකරු පැය දැනුම් දීමකින් තොරව හදිසියේ පැමිණෙනවා ඇත. තවද, ගැළවුම්කරුවාණෝ තම අනුගාමිකයන්ට මෙසේ අනතුරු ඇඟවීමක්ද කළසේක: "එබැවින් අනාගතවක්තෘ වූ දානියෙල් විසින් කියන ලද පාළුකරන පිළිකුළ ශුද්ධස්ථානයෙහි තිබෙනවා නුඹලා යම් කලෙක දක්නහුද (කියවන්නා තේරුම් ගනීවා)



එකල යුදයේ සිටින්නෝ කඳුවලට පලා යෙත්වා." (මතෙව් 24:15, 16; ලූක් 21:20) රෝම වැසියන්ගේ රූප වන්දනීය ධජය ශුද්ධ භූමියෙහි පිහිටුවා නගර සීමාවෙන් පිටත ඔවුන්ගේ හට හමුදා ආක්‍රමණයට සූදානම්ව සැදී පැහැදී සිටින විට ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් එම දේශයෙන් ඉවත්ව යමින් තම ආරක්ෂාව සලසාගත යුතු විය. අනතුරු ඇඟවීමේ ලකුණු දකගන්නට හැකි වූ වහාම පලායාම කඩිනමින් සිදුවිය යුතු විය. යුදා දේශය පුරාම මෙන්ම යෙරුසලමෙහිද සිටියාවූ ක්‍රිස්තු අනුගාමිකයන් පමාවකින් තොරව එම සංඥවට කීකරු විය යුතු විය. එම අනතුරු හඬ නිකුත්වන විට යම්කිසි අයෙකු ගේ උඩ සිටින්නේ නම් හෙතෙම ගේ ඇතුළත තිබෙනා ඉතා අගනා වස්තුව වුවද ගැනීමට ගේ ඇතුළට නොයා යුතු විය. කෙතෙහි හෝ මිදි වත්තෙහි හෝ සේවය කරන්නාවූ අයෙක් දවසේ උෂ්ණත්වයෙන් පීඩා නොවිඳීමට තමාගේ පළඳිනාව, ගළවා තිබූ එම පිටත සළුව ගැනීමට කාලය නොගත යුතු විය. මහත් විනාශයට හසු නොවන පිණිස ඔවුන් මොහොතක් හෝ ප්‍රමාද නොවිය යුතු විය.

හෙරොද්ගේ රාජ්‍ය කාලය තුළදී යෙරුසලම අලංකාරයෙන් ඉතා උසස් මට්ටමකට ගෙනෙනු ලැබ තිබිණ. නගරය පුරා ගොඩනැගිලි මත ඉදි කරන ලද කොත් කැරළි විය. නගරය වටාවූ තාප්ප සහ බලකොටු මගින් එය සුරක්ෂිත කර තිබුණේය. පවුරු බිඳ ඇතුළට පිවිසිය නොහැකි බවක් විද්‍යාමාන විය. නෝවාගේ කාලයේ ඔහු විසින් ලෝක විනාශය පිළිබඳව අනාවැකියෙන් පැවසූ කල්හි ඔහුව කථා පතුරවන්නෙක් යයි හඳුන්වන ලදී. එසේම, මේ කාලයේදී ද යමෙක් මේ විනාශය ගැන ප්‍රකාශ කළේ නම් ඔහු වැරදි අවවාද ඉදිරිපත් කරන්නාවූ උමතුවෙකු හැටියට සලකනු ලබන්නට තිබුණි. "අහසත් පොළොවත් පහ වන්නේය. නුමුත් මාගේ වචන පහ නොවන්නේය"යි ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කළසේක. (මතෙව් 24:35) ඇයගේ පාප නිසා යෙරුසලම කෙරෙහි උදහස ප්‍රකාශ කර තිබුණේය. තවද, ඇයගේ මුරණ්ඩු අවිශ්වාසය ඇගේ ඉරණම සහතික කළේය.

මීකා අනාගතවක්තෘ තුළින් ස්වාමීන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක. "යුක්තියට පිළිකුල් කොට, සියලු යුතුකම් පෙරලා, සියොන් ලේ වලින්ද යෙරුසලම අධර්මිෂ්ඨකමෙන්ද ගොඩ නගන්නාවූ, යාකොබ්ගේ වංශයේ ප්‍රධානියෙනි, ඉශ්‍රායෙල් වංශයේ ආණ්ඩුකාරයෙනි, මේක අසන්න. එහි ප්‍රධානියෝ තෑග්ගක් නිසා විනිශ්චය කරති, පූජකයෝ කුළියට උගන්වති, එහි අනාගතවක්තෘවරුද මිලේට පේන කියති. එහෙත් ඔවුහු ස්වාමින්වහන්සේ කෙරෙහි පිහිටා සිට: ස්වාමින්වහන්සේ අප අතරෙහි සිටිනවා නොවේද? අප පිටට විපත්තියක් නොපැමිණෙන්නේ යයි කියති." මීකා 3:9-11.

යෙරුසලමෙහි විසූ ජනතාවගේ දූෂිත ජන දිවිය සහ ඔවුන් තුළ තිබූ තමන් ධර්මිෂ්ඨ යයි යන චින්තනය මෙම වදන් මගින් මනාව විස්තර කර තිබේ. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි නීති රීති අකුරටම පිළිපදින බව අවධාරණය කළ ඔවුහු සත්‍ය වශයෙන්ම ව්‍යවස්ථාවේ සෑම ප්‍රතිපත්තියක්ම කඩකරමින් ජීවත් වූහ. ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයෙහි නිර්මලතාව සහ ශුද්ධ භාවය ජනතාවගේ පව් සහ දූෂ්‍යතාව එළිදරව් කළ නිසා ඔවුහු උන්වහන්සේට ද්වේෂ කළහ. ඔවුන්ගේ පාපවල ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට මුහුණ දීමට සිදුවූ කරදරවලට මූලික හේතුව යේසුස්වහන්සේ යයි ඔවුහු උන්වහන්සේට චෝදනා කළෝය. උන්වහන්සේ පව් කර නැතැයි ඔවුන් දන සිටියත් ජාතියක් වශයෙන් තමන්ගේ අනාගතය ආරක්ෂා කරගැනීමට නම් යේසුස්-වහන්සේ මරණයට පත්වීම අවශ්‍ය යයි ඔවුහු ප්‍රකාශ කළෝය. "අපි ඔහුට මෙසේ ඉඩ හැරියෙමු නම් සියල්ලන් ඔහු කෙරෙහි අදහාගන්නවා ඇත. එවිට රෝමවරුන් ඇවිත් අපේ ස්ථානයත්, අපේ ජාතියත් පැහැර ගන්නවා ඇත" යි ඔවුහු පැවසූහ. (යොහන් 11:48) ක්‍රිස්තුස්වහන්සේව පූජා කළා නම් ඔවුන් නැවත වරක් ශක්තිමත් ඒකීය ජාතියක් වනු ඇතැයි ඔවුන් තර්ක කළෝය. සකල ජාතියම විනාශයට පත්වනවාට වඩා එක් මිනිසෙකු මරණයට පත්වීම යෝග්‍ය යයි පැවසූ තම උත්තම පූජකයාගේ තර්කයට ඔවුහු එකඟ වූහ.

මෙසේ යුදෙව් නායකයෝ "සියොන් ලේවලින්ද, යෙරුසලම අධර්මිෂ්ඨකමෙන්ද" ගොඩ නැඟුවෝය. (මීකා 3:9) උන්වහන්සේ ඔවුන්ගේ පාප පිළිබඳව ඔවුන්ට තරවටු කළ නිසා, ඔවුහු තම ගැළවුම්කරුවාණන් මරණයට පත් කළහ. තමා දෙවියන්වහන්සේගේ වරප්‍රසාද ලත් සෙනඟක් යයි සලකමින් ස්ව ධර්මිෂ්ඨකමින් පූර්ණවූ ඔවුහු ස්වාමීන්වහන්සේ ඔවුන්ව ඔවුන්ගේ සතුරන්ගෙන් මුදාගනු ඇතැයි කල්පනා කළහ. "එබැවින් නුඹලා නිසා සියොන් කෙතක් මෙන් හානු ලබන්නේය, යෙරුසලම ගොඩවල්ද ගෘහයේ කන්ද කැළෑ මුදුන්ද වනවා ඇතයි අනාගතවක්තෘවරයා තවදුරටත් පැවසුවේය." (මීකා 3:12)

ක්‍රිස්තුස්වහන්සේ විසින්ම යෙරුසලමෙහි විනාශය ප්‍රකාශයට පත් කළසේක. ස්වාමීන්වහන්සේ නගරය මත සහ ජාතිය මත විනිශ්චය පැමිණවීම අවුරුදු හතළිහක් පමණ පමා කළසේක. උන්වහන්සේගේ ශුභාරංචිය එපා කළාවූ අය ගැන, උන්වහන්සේගේ පුත්‍රයාණන් මරා දැමූ අය ගැන, දෙවියන්වහන්සේගේ ඉවසීම පුදුම සහගත විය. එල නොදරන ගස පිළිබඳව වූ උපමාව මගින් පෙන්වා දෙනු ලැබුවේ යුදෙව් ජාතිය සමග දෙවියන්වහන්සේ ක්‍රියාකරන ආකාරයයි. "ඒක කපා දමන්න; පොළොවට බරව තිබෙන්නෙත් මක්නිසාද?" යන අණ නිකුත් විය. (ලූක් 13:7) එසේ වුවද, දිව්‍ය කරුණාව, එම අණ



ක්‍රියාත්මක කිරීම තවත් මඳ කලක් පමා කළේය. ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ උන්වහන්සේගේ ක්‍රියාකිරීම් පිළිබඳව කිසිම දැනගැනීමක් නොතිබූ බොහෝ දෙනෙක් යුදෙව්වන් අතර සිටියෝය. දෙමාපියන් විසින් එපා කළ ආලෝකය ඔවුන්ගේ දරුවන්ට ලැබී තිබුණේ නැත. දෙමාපියන් භුක්ති විඳි වරප්‍රසාද දරුවන්ට ලැබී තිබුණේ නැත. අපෝස්තුළුවරුන් සහ ඔවුන්ගේ සහායකයන් විසින් මෙම පණිවිඩය ඔවුන්ට දේශනා කරනු ලබනවා ඇත. එමගින් ශුභාරංචි ආලෝකය දරුවන් මත පතිත වන්නට දෙවියන්වහන්සේ ක්‍රියා කරනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ උපත සහ දිවි ගෙවීම පිළිබඳව පමණක් නොව උන්වහන්සේගේ මරණය සහ මළවුන්ගෙන් නැගිටීම පිළිබඳවද පල වී තිබූ අනාවැකි ඉටු වී තිබෙන ආකාරය දරුවන්ට දකගන්නට ඉඩහැරීම දේව අභිප්‍රාය විය. දෙමාපියන්ගේ පාප ගැන දරුවන් වරදකරුවන් බවට පත්කරනු නොලැබීය. එහෙත් දෙමාපියන්ට දෙනු ලැබූ මහත් ආලෝකය පිළිබඳව දරුවන් දැනුවත්ව සිටින්නාවූ අතරේ, ඔවුන්ට ලැබුණ අමතර ආලෝකය දරුවන් ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔවුන් තම දෙමාපියන්ගේ පාපවලටද හවුල්කාරයන් වන අතර ඔවුන්ගේ අපරාධ නමැති කුසලානද සම්පූර්ණ වේ.

යෙරුසලම කෙරෙහි දෙවියන්වහන්සේගේ ඉවසීම යුදෙව් ජනතාවගේ පසුතැවිලි නොවීමේ දරදඬු පටිපාටිය ස්ථිර කළේය. යේසුස්-වහන්සේගේ ගෝලයන් කෙරෙහි ඔවුන් තුළ පැවති වෛරය සහ ද්වේෂය නිසා ඔවුහු තමන් ලද කරුණාවේ අවසාන දීමනාව ප්‍රතික්ෂේප කළෝය. මේ නිසා දෙවියන්වහන්සේ යුදෙව් ජාතිය කෙරෙහි වූ තමන්වහන්සේගේ රැකවරණ ක්‍රියාවේදය ඉවත් කළසේක; ඊශ්‍රායෙල් ජාතියට එරෙහිව සාතන් සහ ඔහුගේ දූතයන් විසින් එල්ල කළ ප්‍රහාරය නොවැළැක්වූ සේක. එම ජාතිය විසින් තෝරාගත් බලධාරියාගේ පාලනය යටතේ ක්‍රියාත්මක වීමට ඔවුන්ට ඉඩහරිනු ලැබීය. ඇයගේ දරුවෝ ක්‍රිස්තුස්වහන්සේගේ කරුණා අනුග්‍රහයට ගැරහුම් කළෝය. මෙම ක්‍රියාව කරණකොටගෙන නපුරෙහි චිත්ත පෙළඹවීම් යටපත් කර පාලනය කරගැනීමේ හැකියාව ඔවුන්ට අහිමි විය. ඒනිසාම මෙම පෙළඹවීම් යුදෙව් දරුවන් පාලනය කරන්නට විය. ඉතා දරුණු ගණයේ පහත් මට්ටමේ රාගාධික හැඟීම් සාතන් විසින් මිනිස් සිත් සතන්හි ඇවිස්සුවේය. මිනිස්සු විචාරණශීලී භාවයෙන් කටයුතු නොකළහ. ඔවුන් විචාරණශීලීභාවයෙන් ඔබ්බට ගොස් ආවේගශීලී හැඟීම්වලින් සහ බලවත් අන්ධ කෝපයකින් යුතුව ක්‍රියා කළහ. ඔවුන්ගේ කුරිරු භාවයෙන් ඔවුහු සාතනික වූහ. සැකය, ඊර්ෂ්‍යාව, වෛරය, ගැටුම්, කැරලි ගැසීම්, සහ මරණය පවා සුලභ දෙයක් විය. පවුලේ සාමාජිකයන් අතරේද, ජාතියේ වැසියන් අතරේද මේ ගුණාංග දෛනික ජීවිතයේ කොටසක් බවට පත්ව තිබුණේය. ඉහළ තත්ත්වයේ අය අතර මෙන්ම සමාජයේ පහළ මට්ටමේ අය අතරද මෙම ගුණාංග

එක සේ දකගත හැකි විය. කිසිම තැනක ආරක්ෂාවක් නොවීය. නෑදෑ හිත මිතුරන් පවා එකිනෙකා පාවා දුන්නෝය. දෙමාපියන් තම දරුවන් මරා දමූ අතර දරුවෝද තම දෙමාපියන් ඝාතනය කළෝය. ජනතාව පාලනය කළ පාලකයන්ට පවා තමාවම පාලනය කරගැනීමේ හැකියාවක් තිබුණේ නැත. පාලනය කරගත නොහැකි වූ ආශාවන් නිසා පාලකයෝ කුරිරු දුෂ්ඨ අය බවට පත් වූහ. වරදක් නොතිබූ දේව පුත්‍රයාණන් වරදකරුවෙකු ලෙස තීරණය කිරීමට යුදෙව්වෝ බොරු සාක්ෂි ඉදිරිපත් කළෝය. ඒ අතර දැන් එල්ල වූ බොරු චෝදනා නිසා ඔවුන්ගේම ජීවිත පවා අවදානමට ලක්ව තිබුණේය. ඔවුන්ගේ ක්‍රියාදාමයන් නිසා ඔවුහු බොහෝ කාලයක් පුරා මෙසේ කියමින් සිටියහ. "ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේ අප ඉදිරියෙන් පහකරන්න" (යෙසායා 30:11) දැන් ඔවුන්ගේ ආශාවට ඉඩ ඇරිණ. දෙවියන්වහන්සේ කෙරෙහි බිය තවදුරටත් ඔවුන්ගේ සිත්වලට බාධාවක් නොවීය. සාතන් ජාතියේ නායකත්වය දැරීය. සිවිල් බලඅධිකාරීහු මෙන්ම ආගමික නායකයෝද ඔහුගේ අධිකාරී බලයට යටත්ව සිටියෝය.

එකිනෙකාට විරුද්ධවූ බලසේනාවල නායකයෝ සමහර අවස්ථාවන්හිදී සන්ධාන වී දෙවියන්වහන්සේගේ බැතිමතුන්ට විරුද්ධව ක්‍රියා කරමින්, ඔවුන්ගේ සම්පත් කොල්ලකමින්, ඔවුන්ට වධ හිංසා වේදනා පැමිණවීමට යුහුසුළුව ක්‍රියා කළෝය. ඒ අතරම ඔව්හු එකිනෙකාගේ පාක්ෂිකයන් සමග සටන් කරමින් තම විරුද්ධවාදීන් අනුකම්පා විරහිතව ඝාතනය කළෝය. දේව මාළිගය හා බැඳි ශුද්ධ තත්ත්වයට පවා ඔවුන්ගේ භයංකාර ක්‍රියාකාරකම් නවතාලීමට නොහැකි විය. පූජාසනය ඉදිරියෙහිදී පවා නමස්කාරයෙහි යෙදෙන්නන් මරා දමන ලදී. මරා දමනු ලැබූ බැතිමතුන්ගේ මෘත ශරීරවලින් දේව මාළිගාව දූෂ්‍ය විය. අන්ධ දේව අපහාසාත්මක උඩඟුකමින් යුතුව මෙම භයානක ක්‍රියා කළවුන් දෙවියන්වහන්සේගේ නගරය වන යෙරුසලම විනාශ කර දමනු නොලබනවා ඇතැයි කියා කිසිම බියක් නොමැතිව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළහ. රෝම හට හමුදා දේවමාළිගාව වටලා සිටියදී තම බලය තවදුරටත් තහවුරු කරගැනීම පිණිස ඔව්හු ව්‍යාජ අනාගතවක්තෘන් කැඳවා ඔවුන්ට අල්ලස් දී දෙවියන්වහන්සේගෙන් පැමිණෙන්නාවූ ගැළවීම දෙස සෙනඟ බලා සිටිය යුතු යැයි අනාවැකි කීමට ඔවුන්ට උපදෙස් දුන්නෝය. සතුරන් පරාජය කර, ඔවුන්ව මුදවා ගැනීමට මහෝත්තමයාණන්වහන්සේ ඉදිරිපත් වනවා ඇතැයි විශාල ජනකායන් අන්තිම මොහොත දක්වාම බලාපොරොත්තුවෙන් සිටියෝය. එහෙත්, ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ රැකවරණය එපා කළ බැවින් ඔවුන්ට දැන් ආරක්ෂාවක් නොවීය, අහෝ අභ්‍යන්තර කුළල් කා ගැනීම් නිසා භේද භින්නවූ ප්‍රීතියෙන් තොරවූ යෙරුසලම! එකිනෙකාගේ අතින් මරා දමනු ලැබූ ඇයගේ දරුවන්ගේ රුධිරයෙන් වීදි රතු පැහැ



ගැන්වී තිබුණේය. ඒ අතර විදේශීය හමුදාව ඇගේ ආරක්ෂක පවුරු බිඳ දමමින් ඇගේ හමුදා භටයන් ඝාතනය කළේය.

යෙරුසලමෙහි විනාශය පිළිබඳව ක්‍රිස්තුස්වහන්සේ පැවසූ සෑම කරුණක්ම අකුරටම ඉටු විය. "යම් මිම්මකින් නුඹලා මැන දෙන්නහුද එයින්ම නුඹලාටත් මැන දෙනු ලබන්නේය"යි උන්වහන්සේගේ අනතුරු ඇඟවීමේ වදන්වල සත්‍යතාව යුදෙව්වෝ අත්දැකීමෙන්ම අවබෝධකර ගත්තෝය. (මතෙව් 7:2)

මහත් විපතක සහ විනාශයක පෙර නිමිති ගෙනහැර පාමින් ලකුණු සහිත අද්භූත දේ දසත පෙනෙන්නට විය. දේව මාළිගාවට සහ පූජාසනයට ඉහළින් අස්වාභාවික එළියක් මැදියම් රැයේදී ආලෝකය විහිදුවන්නට විය. ඉර බස්නා වේලෙහි වලාකුළු මත අශ්ව රථ සහ හමුදා භටයන් යුද්ධයකට එක් රැස්වෙන අයුරු සිත්තමක් ලෙස දකගැනීමට හැකි විය. රාත්‍රී කාලයේ දේව මාළිගාවේ සේවය කළ පූජකයෝ අභිරහස් ගුප්ත හඬවල් නිසා තැති ගැන්මට පත් වූහ. භූමිය සෙලවෙන්නට විය. "අපි දැන් ඉවත්ව යමුය"යි කියන්නාවූ මහත් සමූහයකගේ හඬක් ගුවනට මුසු විය. බලකොටුවට අයිති විශාල දොරටුවක් නැගෙනහිර දිශාවෙහි විය. එය මහත් බරකින් යුතු විය. එය වසා දැමීමට මිනිසුන් විසි දෙනෙකු පමණ අවශ්‍ය විය. කළු ගලින් නිම වූ දොරටුව දෙපස වූ වේදිකාවෙහි ගැඹුරට ගිල්වන ලද විශාල යකඩ පොලු මත දොරටුව සවි කර තිබුණේය. හදිසි හස්තයක් මගින් මැදියම් රැයේදී එම දොරටුව විවෘත කරන ලදී. Milman The History of the  Jews  book 15.

වසර හතක් පුරා එක්තරා මනුෂ්‍යයෙක් යෙරුසලමෙහි වීදි දිගේ ඉහළටත්, පහළටත් සක්මන් කළේය. එම නගරය මත පැමිණෙන විපත් සහ ඛේදජනක සිද්ධීන් පිළිබඳ ශෝචනීය වදන් පෙළක් ඔහුගේ මුවින් පිට විය. රෑ දහවල් පුරාම ඔහු මෙම ලතෝනිය  නොනවත්වා පැවසීය. "පෙර දිගින් හඬක් නික්ම එන්නේය! අපර දිගින් හඬක් නික්ම එන්නේය! සතර දිග් භාගයේ සුළංවලින් හඬක් නික්ම එන්නේය! යෙරුසලමට සහ දේව මාළිගාවට විරුද්ධව හඬක් නික්ම එන්නේය! මනාලයන්ටත් මනාලියන්ටත් විරුද්ධ වූ හඬක් වන්නේය! මුළු මහත් ජනතාවට විරුද්ධව ඒ හඬ නික්ම එන්නේය!" (Milman, The History of the Jews, book 13). මෙම පුදුමාකාර අමුත්තාව අල්ලා සිරගෙයි දමා කස පහර දෙන ලදී. එහෙත් ඔහුගේ දෙතොලින් කිසිම පැමිණිල්ලක් පිට නොවීය. නින්දා අපහාස මධ්‍යයේ ඔහු දුන්නාවූ එකම පිළිතුර 'යෙරුසලමට දුක් වේ, දුක් වේ! එහි වැසියනට දුක් වේ, දුක් වේ!' යන්න විය. ඔහු විසින් අනාවැකි වලින් පල කළ ආක්‍රමණයේදී ඔහු මරා දමනු ලැබූ මොහොත දක්වා ඔහුගේ ලතෝනිය නැවතුණේ නැත.

යෙරුසලමෙහි විනාශයේදී එකම කිතුණු බැතිමතෙකු හෝ මරණයට පත් නොවීය. ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට අනතුරු අඟවා තිබූ අතර, උන්වහන්සේගේ වචන විශ්වාස කළාවූ සියලුදෙනා එම ලකුණ ඉටුවන දිනය බලා සිටියහ. "එහෙත් යම් කලෙක සේනාවන් විසින් යෙරුසලම වටලා සිටිනවා නුඹලා දකින්නහුද, එකල එහි විනාශය ආසන්න බව දැනගන්න. එකල යුදයෙහි සිටින්නෝ කඳුවලට පලායත්වා; එහි තුළ සිටින්නෝ පිටතට යත්වා; ගම්බද සිටින්නෝ එහි ඇතුල් නොවෙත්වා" (ලූක් 21:20,21) රෝම හමුදාපති සෙස්ටියස් යටතේ පැමිණි යුද්ධ හමුදාව නගරය වටා කඳවුරු බැඳ ගත්තේය. එහෙත් බලාපොරොත්තු නොවූ විරු අයුරින් වහාම පහරදීමට සුදුසු වාතාවරණයක් තිබුණද සතුරු හමුදාව තම ආක්‍රමණය නවතා දැමූහ. වටකරන ලද ජනතාව, තම සතුරන්ට විරුද්ධව නැගී සිටීමේ ශක්තියක් තමාට නැති බව තීරණය කරගෙන යටත් වීමට සූදානම්ව සිටියෝය. එම තීරණාත්මක මොහොතේදී රෝම සේනාධිපතියා, දැනගත නොහැකි යම්කිසි හේතුවක් නිසා තම හමුදාව රැගෙන ආපසු සියරට බලා ගමන් ගත්තේය. මෙහිදී දෙවියන්වහන්සේ තමන් සන්තක සෙනඟගේ යහපත වෙනුවෙන් දේවාරක්ෂාව සලසා දීමට කටයුතු මෙහෙය වූසේක. පොරොන්දු ප්‍රකාර ලකුණක් බලාපොරොත්තුව සිටි කිතුණුවන්ට එකී ලකුණ ලැබුණේය. කැමති සෑම අයෙකුටම ගැළවුම්කාරයාණන්ගේ අනතුරු ඇඟවීමේ වදන්වලට කීකරුවීමට අවස්ථාව උදා විය. රෝමවරුන්ගෙන් හෝ යුදෙව්වන්ගෙන් කිසිම බාධාවක් නැතිව කිතුණුවන්ගේ පලායාම සිදුකර ගැනීමට දිව්‍ය මැදිහත්වීම මගින් කාරණා සිදුවිය. සෙස්ටියස් තම හමුදාවත් රැගෙන ආපසු යන්නාවූ අතරේදී, හදිසියේ තම නගරයෙන් පිටතට පැමිණි යුදෙව් සොල්දාදුවෝ ආපසු යන රෝම හමුදාව ලුහුබැඳ ගියෝය. හමුදා දෙක සටන් වැදී සිටියදී කිතුණුවන්ට නගරය හැර පලායාමට අවස්ථාව පැදුණේය. යෙරුසලම වටකරනු ලැබූ මේ අවස්ථාවේ යුදා දේශය සතුරන්ගෙන් තොරව තිබුණේය. යුදෙව්වෝ තම කූඩාරම් මංගල්‍යය පැවැත්වීමට යෙරුසලමට රැස්ව සිටියෝය. මෙසේ දේශය පුරා සිටි කිතුණුවන්ට කරදරයකින් තොරව දේශයෙන් ඉවත්ව යාමට ඉඩකඩ උදා විය. ඔවුහු තවත් පමා නොවී යෝර්දානෙන් එතෙර පිහිටි පෙරියා දේශයේ පෙල්ල නම් නගරය වෙත ආරක්ෂාව සොයා පැන ගියෝය.

සෙස්ටියස් සහ ඔහුගේ හමුදාව පසුපස හඹා ගිය යුදෙව් හමුදාවෝ රෝම බල ඇණියට දරුණු ප්‍රහාරයක් එල්ල කළහ. ඔවුන් සහමුලින්ම විනාශ වෙතැයි බියක් පැතිර ගියේය. රෝම හමුදාව බේරී ආපසු ගියේ මහත් අපහසුවෙන්ය. යුදෙව්වන් අතර සිදුවූ ජීවිත හානිය ඉතා අල්ප විය. ඔවුහු තම යුද්ධ කොල්ලයද ඇතිව ජයග්‍රාහී ලීලාවෙන් යෙරුසලම වෙත පැමිණියෝය. ජයග්‍රහණයක් ලෙස පෙනුණු මේ



සංග්‍රාමය යුදෙව් ජනතාව වෙත ගෙන ආවේ නපුරක් පමණකි. රෝමවරුන්ට එරෙහිව දරදඬු ලෙස ඔවුන්ට විරුද්ධව ඒකරාශී වීමට යුදෙව්වරු එම ජයග්‍රහණයෙන් උදම් වූහ. එයට ප්‍රතිචාරය වූයේ විනාශයට ඉරණම් වූ එම දේශය කරා පැමිණි කිව නොහැකි ඛේදජනක විපතකි.

යෙරුසලම ආක්‍රමණය කිරීමේ ප්‍රයත්නය පසු දවසක තීතස් විසින් දියත් කරන ලදී. එහිදී යෙරුසලම මත පතිත වූ විනාශය ඉමහත් විය. පාස්කු මංගල්‍ය සමයේ නගරය සියල්ලෙන් සම්පූර්ණව තිබිණි. එම උළෙල සැමරීමට දශ ලක්ෂ ගණන් යුදෙව්වෝ යෙරුසලම් කොටුව තුළ රැස්ව සිටියහ. එම නගරය තුළ වූ ආහාර ගබඩා නිසි ආකාරයෙන් පුරවා තිබුණා නම් එය නගරවාසීන්ට වසර ගණනාවක් පුරා ආහාර සැපයීමේ හැකියාවක් වන්නට තිබුණි. එහෙත් විරුද්ධවාදී කණ්ඩායම් අතර පැවති ගැටුම් නිසා එම ආහාර ගබඩා කුටි විනාශයට පත්ව තිබුණේය. දැන් ඔවුන් සාගින්නේ භයානකත්වය අත්දුටුවෝය. තිරිඟු නැළියක් සඳහා තලෙන්තයක මිලක් ගෙවීමට සිදුවිය. සාගින්න තදින් මිනිසුන් කෙරේ බලපාන්නට විය. කුසගින්න නිවාගැනීම සඳහා මිනිස්සු තම බඳපටි, පාවහන් සහ පලිහවල් ආවරණය කර තිබූ හම් වැස්ම සපා කෑවෝය. බොහෝ අය රාත්‍රී කාලයේ නගරයෙන් පිටතට ගියේ වල් පැළෑටි යනාදී කුමක් හෝ නෙලා ගැනීමටය. එසේ ගොස් සිටියදී රෝම සොල්දාදුවන්ට හසු වීමෙන් ඔවුන් තද හිංසා පීඩාවන්ට ලක් කොට මරා දමන ලදී. භයානක තත්ත්වයකින් බේරී මහත් අසීරුවෙන් ආපසු පැමිණියාවූ අය පරෙස්සම් කර ගෙනාවාවූ පැළෑටි නගරය තුළදී සොරා ගනු ලැබිණි. බලයේ සිටි අය තමන්ගේම යටත්වැසියන් සඟවාගෙන සිටි ආහාර ද්‍රව්‍ය බලෙන් ලබා ගත්තෝය. මෙම කුරිරු ක්‍රියාවන්හි යෙදුනු සමහර අය සතුව කෑම සඳහා ප්‍රමාණවත් ආහාර තොග තිබූ නමුත් අනාගතය සඳහා ආහාර ගබඩා කර තබාගැනීම ඔවුන්ගේ ආශාව විය.

සාගතය සහ වසංගතය නිසා දහස් ගණන් ජනයා මරණයට පත්වූහ. ස්වභාවික සෙනෙහස විනාශයට පත්ව ඇති බව පෙනී ගියේය. ස්වාමි පුරුෂයෝ තම බිරින්දන් සතුව තිබූ දෑ සොරා ගත්හ; බිරින්දන් සැමියන් සතු දෑ එසේම කොල්ලකා ගත්හ. දරුවෝ තම වයස්ගත දෙමාපියන් මුවට ගත් ආහාර බලෙන් ඩැහැ ගත්තෝය. "ස්ත්‍රියෙක් ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතක නැති කරන්ට ඇට පුළුවන්ද"යි දිවැසිවරයා ප්‍රශ්නයක් නැගීය. (යෙසායා 49:15) විනාශයට ලක් වූ එම නගරය තුළදීම එම පැණයට පිළිතුරු ලැබුණේය. "දයාවන්ත ස්ත්‍රීහු තමුන්ගේ අත්වලින් සිය දරුවන් පිසුවෝය; උන් මාගේ සෙනඟ වන දුවණියගේ විනාශයේදී ඔවුන්ට කෑම විය" (විලාප ගී 4:10) යනුවෙන් සියවස් දහ හතරකට

පෙර පැවසූ අනතුරු ඇඟවීමේ අනාවැකිය නැවත වරක් ඉටුවිය. "මෘදුකම සහ සිවිමැළිකම නිසා පතුළ බිම තබන්ට අකමැති වූ නුඹලා අතරේ සිටින මෘදු වූ සිවිමැළි වූ ස්ත්‍රියගේ බැල්ම... ඈ බිහි කරන්නාවූ ළදරුවන් පිළිබඳයෙන්ද ඇගේ ළයෙහි පුරුෂයා කෙරෙහිත් ඇගේ පුත්‍රයා කෙරෙහිත් ඇගේ දුව කෙරෙහිත් අප්‍රසන්න වන්නේය. මක්නිසාද නුඹේ සතුරා නුඹේ නුවර දොරටුවලදී නුඹ වටලා අවහිර කිරීමෙන් වන තද පීඩාවේදී, ඈට කිසිවක් නැති බැවින් ඈ ඔවුන් රහසින් කන්නීය." (ද්විතීය කථාව 28:56,57)

යුදෙව්වන් භීතියට පත්කොට ඔවුන්ව යටත් වීමට පොළඹවා ගැනීමට රෝම නායකයෝ උත්සාහ දැරුවෝය. සිරභාරයට ගැනීමේදී වධහිංසාවන්ට විරුද්ධතාවයක් දක් වූ අයට කසපහර දී ඔවුන් නගරයේ පවුරු ඉදිරියෙහිදී මරාදමන ලදී. මෙයාකාරයෙන් දවස්පතා සිය ගණනක් මරා දමනු ලැබූහ. යෙහෝෂාපාත් මිටියාවතෙහිද, කල්වාරියෙහිද සිය ගණනින් කුරුස ඉදිකර තිබුණේය. කෙතරම් විශාල කුරුස ප්‍රමාණයක් ඉදි කර තිබුණේද යත් ඒ කුරුස අතරෙහි මිනිසෙකුට යාමට ප්‍රමාණවත් ඉඩක්ද නොවීය. මෙම මිනිස් ඝාතන අඛණ්ඩව සිදුවිය. පිලාත්ගේ විනිශ්චයාසනය ඉදිරියෙහිදී යුදෙව් ජනතාව එක් හඬින් මෙසේ පැවසුවෝය. "ඔහුගේ ලේ අප පිටද අපේ දරුවන් පිටද වේවා!" (මතෙව් 27:25) මෙම ප්‍රකාශයට පිළිතුරු වශයෙන් දෙවියන්වහන්සේගේ උදහස මෙහිදී මනාව දකගත හැකි විය.

මෙම බියකරු දර්ශනය නවතා දැමීමටද යෙරුසලමෙහි සම්පූර්ණ විනාශය තරමක් දුරට අඩුකරලීමටද තීතස් කැමති විය. මිටියාවත්වල ගොඩ ගැසී තිබූ මිනිස් මළ සිරුරු දුටු තීතස් භීතියෙන් මුසපත් විය. භ්‍රාන්තවූ අයෙකු මෙන් තීතස් තමා සිටි ඔලීව කන්ද මුඳුනේ සිට අති අලංකාර දේව මාළිගාව දෙස නෙත් හෙළීය. එම ගොඩනැගිල්ලෙහි එක ගල් කැටයකට හෝ අත නොතබන ලෙස ඔහු තම සොල්දාදුවන්ට අණ කළේය. මෙම බලකොටුවෙහි අයිතිය තහවුරු කරගැනීමට පෙර හෙතෙම යුදෙව් නායකයන්ට බැගෑපත් ආයාචනයක් කළේය. ශුද්ධ මාළිගාව රුධිරයෙන් අපවිත්‍ර කිරීමට තමාට බලකරන්න එපා යැයි ඔහු ඉල්ලා සිටියේය. ඔවුන් එම ශුද්ධ භූමියෙන් වෙනත් තැනකට පැමිණ සටන් කරන්නේ නම් කිසිම රෝම ජාතිකයෙක් දේව මාළිගාවෙහි පාරිශුද්ධතාව අපවිත්‍ර කරන්නේ නැතැයි සහතික වෙමින් තීතස් තවදුරටත් ඉල්ලීමක් කළේය. ජොසිපස් නමැති ඉතිහාසඥයාද චතුර ආයාචනයක් කළේය. යුදෙව් ජාතියෙහි ගැළවීම උදෙසාද, ඔවුන්ගේ නගරය බේරා ගැනීම සඳහාද, ඔවුන්ගේ පූජනීය ස්ථානය ආරක්ෂා කරගැනීම සඳහාද යටත් වන්නැයි ඔහු ඉල්ලා සිටියේය. එහෙත්, ඔහුගේ වදන්වලට ලැබුණු ප්‍රතිචාරය නම් කුරිරු ශාප කිරීම් පමණකි. යුදෙව් ජනතාව උදෙසා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීමට ඉදිරිපත් වූ අන්තිම



මනුෂ්‍යයා ජොසිපස්ය. පිළිතුරු වශයෙන් උස් තියුණු ආයුධ ඔහු දෙසට යොමු කරන ලදී. යුදෙව් ජනතාව දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ආයාචනා ප්‍රතික්ෂේප කර තිබුණේය. අවවාද කිරීම් සහ ආයාචනා මගින් දන් සිදුවූයේ ඔවුන්ගේ සිත් තව තවත් දැඩිවීමය. අන්තිමය දක්වා සතුරාට විරුද්ධව නැගී සිටීමට ඔවුහු දැඩි අධිෂ්ඨානයක පිහිටා සිටියෝය. දේව මාළිගාව බේරාගැනීමට තීතස් දැරූ වෑයම නිෂ්ඵල විය. ගලක් පිට ගලක් රැඳී සිටින්නේ නැතැයි ඔහුට වඩා බලවත් කෙනෙක් විසින් තීන්දුවක් දී තිබුණේය.

යුදෙව් නායකයෝ අන්ධ හිතුවක්කාර ආකල්පයක පිහිටා සිටියෝය. වටකරනු ලැබූ මේ නගරයේ දූෂිත අපරාධ සිදුවිය. මෙයින් රෝමවරු තැති ගැනීමට පත්වූහ, කෝපයට පත්වූහ. අන්තිමේදී තීතස් තීරණය කළේ වැරෙන් පහර දී දේව මාළිගාව අත්පත් කරගැනීමටය. එහෙත් හැකිනම් ගොඩනැගිල්ල විනාශ නොකර අත්පත් කරගැනීමට ඔහු තීරණයක් ගත්තේය. එසේ වුවද, ඔහුගේ ආඥා නොතකා හරින ලදී. රාත්‍රිය ළඟා වූ නිසා තීතස් තම කූඩාරම වෙත ගියේය. ඉක්බිතිව දේව මාළිගා දොරටු තුළින් පිටතට පැමිණි යුදෙව්වෝ පිටත සිටි රෝම යුද්ධ භටයන්ට ප්‍රහාරයක් එල්ල කළහ. අරගලය පවතින්නාවූ අතරතුරේ දී ගිනි හුළක් අතින්ගත් රෝම සොල්දාදුවෙක් ද්වාර මණ්ඩපයේ විවෘත කවුළුවක් තුළින් එය දේව මාළිගාවට එල්ල කළේය. දේවදාර ලෑලිවලින් ඇතුළත සකසා තිබූ දේව මාළිගාව අවට ගොඩනැගිල්ල ක්ෂණයකින් ගිනි දැල්ලෙන් වෙළී ගියේය. තීතස් හනික එතැනට දිව ආවේය. ඔහු පසුපස අවශේෂ යුද්ධ නිලධාරීහුද දිව ආවෝය. ගින්න නිවා දමන ලෙස ඔහු සොල්දාදුවනට අණ කළේය. ඔහුගේ වදන්වලට කීකරුවන බවක්, පෙනෙන්නට නොවීය. කෝපයට පත්ව සිටි භේවායෝ ගිනි හුළු ගෙන දේව මාළිගාව වටා තිබූ කුටිවලට එල්ල කළෝය. සිය කඩු සූරතට ගත් සොල්දාදුවෝ එකී කුටි වෙත කඩා පැන එහි ලැගුම් ගෙන සිටි විශාල සංඛ්‍යාත යුදෙව්වන් සමූහයක් මරා දැමුවෝය. දේව මාළිගා පඩි පෙළ දිගේ ජල දහරාවක් මෙන් රුධිරය පහතට ගලා ආවේය. යුදෙව්වෝ ලක්ෂ ගණනින් විනාශයට පත්වූහ. යුද්ධ ඝෝෂා හඬ දෙබෑ කරමින් "ඊකාබොද්" - තේජස පහ වී ගියේ යැයි යන හඬ ගුවන පුරා දෝංකාරය දුන්නේය.

"සොල්දාදුවන්ගේ බලවත් කෝපය මැඩපවත්වා ලීමට තීතස්ට නොහැකි විය. හෙතෙම තම නිලධාරීන් සමග ශුද්ධස්ථානය ඇතුළට ගොස් විනාශය පරීක්ෂා කර බැලුවේය. එහි අලංකාර ශෝභාව ඔවුන් පුදුමයට පත් කළේය. ගිනි දැල් තවමත් ශුද්ධස්ථානය ඇතුළට ගොස් නොතිබුණේය. එම ගොඩනැගිල්ල බේරා ගැනීමට ඔහු අන්තිම වෑයමද ක්‍රියාත්මක කළේය. ඔහු නැවත වරක් ඉතා කඩිනමින් සොල්දාදුවන් වෙත ගොස් ගිනි සිළු පැතිර යාම නවතා දමන ලෙස

අණ කළේය. රෝම හමුදාවේ ශතාධිපතියෙකු වූ ලිබේරාලීස් තමාගේ නිල බලය යොදවමින් කීකරු වන්නැයි හමුදාවේ අයට නියෝග කළේය. එසේ වුවද, අධිරාජයාට වූ ගෞරවය අභිභවා යුදෙව්වන්ට එරෙහිව තිබූ කෝපාග්නිය තව තවත් සොල්දාදුවන් තුළ ඉස්මතුව නැගී ආවේය. තමන් අවට තිබෙන්නාවූ සෑම දෙයක්ම රනින් බබළනවා හේවායින් දුටුහ. ගිනි සිළු නිසා රන් ඇතිරිලි වඩාත් දීප්තියෙන් බබළන්නට විය. දේව මාළිගාව තුළ මුදලින් වටිනාකම තක්සේරු කළ නොහැකි සම්පත් ඇති බව ඔවුනට හැඟී ගියේය. ඒ අතර එක් සොල්දාදුවෙක් ගිනි පන්දමක් ගෙන දොරෙහි සරනේරු අතරින් එය ඇතුළට දම්මේය. ක්ෂණයකින් මුළු ගොඩනැගිල්ලම එකම ගිනි ජාලයක් විය. ගොඩනැගිල්ල ඇතුළත වූ ගින්න සහ තද දුම, ඇතුළත සිටි නිලධාරීන්ට ගොඩනැගිල්ලෙන් පිටතට පැමිණීමට බලකළේය. මේ මන්දිරය එහි ඉරණමට හසු විය.

එම දසුන රෝමවරුන්ට බියකරු තැති ගන්වන සුළු එකක් විය. එය යුදෙව්වාට කුමන සිතුවිලි උදාකරන්නට ඇද්ද? කඳු මුඳුනක් මත ගොඩනගා තිබූ නගරය ගිනි කන්දක් පුපුරා ගිය ආකාර පෙනුමක් ගෙන දුන්නේය. ගොඩනැගිලි එකින් එක මහත් ශබ්දයකින් යුතුව පොළොවට සමතලා විය. ඒවා ගිනි විල විසින් ගිලගන්නා ලදී. දේවදාර ලෑලිවලින් තනා තිබූ ගොඩනැගිලි පියසි ගිනි ඇතිරිලි ලෙස දිස්විය. රන් ආලේපිත කොත් කැරළි රතුපාට ආලෝකය විහිදුවන කූරු ලෙස පෙනුණේය. දොරටු හා බැඳි කුළුණු මගින් යැවූ දුම් වළාවන් සහ ගිනි දැල් අහස සිප ගත්තේය. අවට තිබූ කඳු ගින්න නිසා ආලෝකමත්ව තිබුණේය. විනාශයේ වර්ධනය නරඹමින් මිනිස් කණ්ඩායම් එම කඳුවල සිටිනවා පෙනී ගියේය. අවුල් සහ තැවුල් සිතින් යුතුව ඔවුහු එම බියකරු දසුන දෙස බලා සිටියහ. කඳු මුදුනෙහි වූ ගෙවල ජනේල තුළින් මුහුණු විශාල සංඛ්‍යාවක් ශාප කරමින් සිටිනවා පෙනුණේය. තවත් අය බලාපොරොත්තු සුන් වූ වේදනාවෙන් පිරී සිටියෝය. ඔබ මොබ සිටියාවූ රෝම සොල්දාදුවන්ගේ කෑකෝ ගැසීම ඝෝෂාවක් ඇති කළේය. ගින්නෙන් විනාශ වන්නාවූ කැරැළිකාරයන්ගේ ලතෝනි තවත් පසෙකින් ඇසෙන්නට විය. ගිනිගෙන දැවෙන ශබ්දය සමග ඇද හැලෙන්නාවූ ලෑලි ශබ්දය අනෙක් ශබ්ද සමග මුසු වී ඉමහත් ඝෝෂාවක් ඇති කළේය. උස් තැන්හි සිටි අයගේ ලතෝනි හඬ අවට කඳුවල හැපී දෝංකාරය දෙමින් ශබ්ද අතරට එක් විය. මිනිසුන්ගේ යටි උගුරෙන් වන කෑගැසීම් පවුර පුරා ඇසෙන්නට විය. සාගින්නෙන් මියැදෙමින් සිටි අය තමන්ට ඉතිරිව තිබූ ශක්තිය යොදවමින් බලවත් වේදනාවෙන් යුතුව ශෝකබර හඬක් නැගූහ.

"පිටතින් දකින්නට ලැබුණු දසුනට වඩා ඇතුළත සිදු වූ මිනිස් ඝාතනය ඉතා භයංකාර විය. පිරිමි අය මෙන්ම කාන්තාවන්ද,



වැඩිමහළු අය මෙන්ම බාලයන්ද, කැරැලිකරුවන් මෙන්ම පූජකයන්ද, සටන් කළ අය මෙන්ම අනුකම්පාව යදින්නන්ද කිසිම වෙනසකින් තොරව ඝාතනය කර දමන ලදී. මිනී මැරූ අයට වඩා මරණයට පත් වූ අය ගණනින් වැඩිවිය. විනාශය සම්පූර්ණ කිරීම සඳහා රෝම සොල්දාදුවන්ට මළමිනී උඩින් ගමන් කරන්නට සිදුවිය" Milman, History of the Jews," book 16.

දේව මාළිගාවේ විනාශයෙන් පසුව මුළු නගරයම රෝම හමුදාව අතට පත් විය. යුදෙව් ජන නායකයෝ බිඳ හෙළිය නොහැකි තම බලකොටු අත්හැර දැමූහ. එම ගොඩනැගිලි හුදෙකලාව තිබෙනවා තීතස්ට දකගත හැකි විය. ඔහු පුදුමයෙන් යුතුව එම ගොඩනැගිලිවල සිරි නැරඹීය. දෙවියන්වහන්සේ විසින් එකී සියල්ල තමන්ගේ අතට පවරා දී ඇති බව ඔහු ප්‍රකාශ කළේය. මක්නිසාදයත් කොයිතරම් බල ශක්තිය තිබුණද, කිසිම යන්ත්‍රයකට එම ගොඩනැගිලි පවුරු බිඳ හෙළිය නොහැකි බව ඔහුගේ කල්පනය විය. නගරය සහ දේව මාළිගාව බිමට සමතලා කර දමනු ලැබීය. අත්තිවාරම් සමහරක් පමණක් ඉතිරි විය. ශුද්ධ වූ දේව ගෘහය තිබූ බිම් පෙදෙස "කෙතක් මෙන් හානු ලැබීය". (යෙරෙමියා 26:18.) මෙම වටලෑමත් පසුව සිදුවූ මිනිස් ඝාතනයත් නිසා මිනිස් ජීවිත දශ ලක්ෂයකට වඩා විනාශ විය. ඉතිරිව සිටි අය යුද්ධ සිරකරුවන් ලෙස රෝමයට ඇදගෙන ගොස් අධිරාජයාට තිළිණයක් ලෙස ඔප්පු කරන ලදී. තවත් අය වහලුන් ලෙස විකුණා දමන ලදී. තවත් අය රංගන මණ්ඩපවලදී සතුන්ගේ ආහාරය ලෙස එහි මැදට වීසි කරන ලදී. ඉතිරි අය නිවෙස් නැති ඔබ මොබ යන්නන් ලෙස ලොව පුරා විසුරුවා දමනු ලැබීය.

යුදෙව් ජනතාව තමන්ගේ විලංගු තමන් අතින්ම නිපදවූහ. තමන්ගෙන් පලිගැනීමේ කුසලාන ඔවුන් විසින්ම පුරවා ගන්නා ලදී. ජාතියක් වශයෙන් ඔවුන්ට හිමි වුණේ අන්ත විනාශයකි. තවද, විසුරුවා හරිනු ලැබීමෙන් පසුව ඔවුන්ට අත් වූ විපත්ති සහ ඛේදජනක සිදුවීම් මහත්ය. මේ සියල්ලෙහිදී ඔවුන් තමන් විසින්ම වැපිරූ දැයෙහි අස්වැන්න නෙළා ගනිමින් සිටියෝය. අනාගතවක්තෘවරයා මෙසේ පවසයි: "අනේ ඉශ්‍රායෙල්, නුඹ විනාශයට පැමිණ සිටින්නේ නුඹේ ආධාරකාරයා වන මට විරුද්ධව සිටීමෙන්ය... මක්නිසාද නුඹේ අයුතුකම් නිසා නුඹ වැටී ඉන්නෙහිය" (හොෂෙයා 13:9; 14:1) ඉශ්‍රායෙල්වරුන්ට විඳින්නට සිදුවූ දුක් විපත් දෙවියන්වහන්සේගේ ඍජු දඬුවම් දීමේ ආඥාව නිසා සිදුවන බව කියනු ලැබීය. මහා රැවටිලිකාරයා මිනිසුන්ට මෙසේ සිතීමට යොමු කරවන්නේ තමාගේ ක්‍රියාවේදය සඟවා තබාගැනීමටය. යුදෙව් ජනතාව හිතුවක්කාර ලෙස දිව්‍ය ප්‍රේමය සහ කරුණාව ප්‍රතික්ෂේප කළෝය. එම නිසා එකී ජනතාව කෙරෙහි තිබූ දිව්‍ය රැකවරණය ඔවුන්ගෙන් ඉවත් කරනු

ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස තම කැමැත්ත පරිදි ඔවුන්ව පාලනය කිරීමට සාතන්ට අවසර ලැබුණේය. යෙරුසලමේ විනාශයෙහිදී මහත් භයානක කුරිරුකම් සිදුවිය. සාතන්ගේ බලය යටතට පත්වන්නාවූ අයට අත්වන්නාවූ ඉරණම එමගින් ප්‍රදර්ශනය වන්නේය.

අප භුක්ති විඳින්නාවූ සමාදානය සහ රැකවරණය ගැන අප ක්‍රිස්තුස්වහන්සේට කොයිතරම් ණයගැති දැයි අපට දැනගත නොහැකිය. සාතන්ගේ අධිකාරී බලයට සම්පූර්ණ ලෙසින් යටපත්වීමෙන් වැළකීමට මිනිස් සතහට සරණ වන්නේ දෙවියන්වහන්සේගේ මැඩ පැවැත්වීමෙහි බලයයි. අකීකරු අය මෙන්ම ස්තූතිවන්ත නොවන්නාවූ අයද දෙවියන්වහන්සේට කෘතඥතාව දක්විය යුත්තෝය. ඒ සඳහා කරුණු එමටය. ඔවුන් දෙවියන්වහන්සේගේ කරුණාව ගැන ස්තූතිවන්ත විය යුතුය. නපුරාගේ කුරිරු දුෂ්ට බලය ඔවුන් කෙරෙහි යෙදවීමට වූ සාතන්ගේ වෑයම වළක්වාලීමට උන්වහන්සේ ඉවසිල්ලෙන් කටයුතු කරන සේක. එහෙත්, දිව්‍ය ඉවසීම සහ දරා සිටීමේ සීමාව යම් අයෙකු විසින් පසුකළ කල්හි ඒ වලක්වාලීමෙහි බලය නැති වන්නේය. පාපයට විරුද්ධව තීන්දුව ක්‍රියාත්මක කිරීමේ කෙනෙක් ලෙස දෙවියන්වහන්සේ පව්කාරයා ඉදිරියේ පෙනී සිටියේ නැත. එහෙත්, උන්වහන්සේගේ කරුණාව එපා කළ අයට ඔවුන් වැපුරූ දේ කපා ගැනීමට උන්වහන්සේ ඉඩහරින සේක. සෑම ආලෝක ධාරාවක්ම එපා කරනු ලැබූ විට, සෑම අනතුරු ඇඟවීමක්ම නොසලකා හැර එපා කළ විට, මිනිසා සදාචාරාත්මක නොවන ක්‍රියාවල යෙදුණු විට, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකරන විට, මේ සියල්ල වපුරන ලද බීජ වන බැවින් එහි අස්වැන්න කපාගැනීම අනිවාර්යයෙන්ම සිදුවන්නේය. අවසානයේදී දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේව නිරන්තරයෙන්ම ප්‍රතික්ෂේප කරන්නාවූ අයගෙන් ශුද්ධාත්මයාණන්ව ඉවත් කරගනු ලැබේ. එවිට මිනිසාගේ ආත්මයේ නපුරු සිතැඟියාවන් පාලනය කිරීමට බලය ඉතිරි වන්නේ නැත. එකල්හි එම තැනැත්තාට සාතන්ගේ ද්වේෂයෙන් සහ සතුරුකමෙන් බේරී සිටීමට කිසිම ආකාරයක හෝ ආරක්ෂාවක් නොමැත්තේය. දිව්‍ය අනුග්‍රහය සුළු කොට අවතක්සේරු කරමින් දිව්‍ය කරුණාවේ ආයාචනා එපා කරන සියල්ලන්ට යෙරුසලමට අත් වූ භයංකාරවූ ද, ශෝචනීයවූ ද ඉරණම කදිම අනතුරු ඇඟවීමකි. මෙම සංසිද්ධිය තුළින් පාපයට එරෙහිව පවතින දෙවියන්වහන්සේගේ ද්වේෂය ගැන කදිම සාක්ෂියක් ලැබෙන්නේය. එසේම වරදකරුවන්ට දඬුවම් අනිවාර්ය බවද එම සිද්ධිය සාක්ෂි දරන්නේය.

යෙරුසලම කෙරෙහි විනිශ්චය පැමිණවීම පිළිබඳව ගැළවුම්කරුවාණන් ප්‍රකාශ කළ අනාවැකියට තවත් ඉටුවීමක්ද ඇතුළත්ය. යෙරුසලමට අත් වූ භයානක විනාශය සහ පාළුව, හිමිවන්නට ඇත්තාවූ දඬුවමෙහි ඡායා මාත්‍රයක් පමණකි. දෙවියන්වහන්සේගේ



කරුණා-අනුග්‍රහය එපා කර උන්වහන්සේගේ ව්‍යවස්ථාව පාගා දමා ඇති ලෝකය කරා පැමිණෙන්නාවූ භයංකාර විනාශකාරී ඉරණම ගැන, තෝරාගත් නගරය වූ යෙරුසලමේ විනාශය තුළින් අපට දකගැනීමට හැකිවේ. ලෝක ඉතිහාසය පුරා දරුණු අපරාධ සිදුවී ඇත. මිනිස් වර්ගයාගේ දුක්ඛිත ශෝචනීය තත්ත්වය පිළිබඳ ඉතිහාසගත වාර්තා අඳුරෙන් වැසී ඇත. මෙම සිදුවීම් ගැන සිතන්නාවූ හදවත කම්පාවට පත්වේ. මනස භීතියට පත්වේ. ස්වර්ගයේ ආධිපත්‍යය එපා කළ විට අත්වූ ප්‍රතිඵල ඉතා භයානකය. අනාගතය පිළිබඳව වූ එළිදරව් කිරීමෙහි තවත් අඳුරු දසුනක්ද ඉදිරිපත් කර ඇත. අතීතයේ වාර්තාවන්හි, ඉතිහාසය පුරා සිදුවූ කෝලාහල, ගැටුම් සහ විප්ලවීය අරගලවල ප්‍රමාණය ඉමහත්ය. "කෝලාහලයට පැමිණෙන යුද්ධකාරයාගේ .... ලෙයෙහි පෙඟූ වස්ත්‍ර" පිළිබඳ සටහන් නරකය. එහෙත්, (යෙසායා 9:5) සියලු ආකාර නපුරෙහි ක්‍රියාවන් මර්ධනය කරමින් ඒවා වලක්වාලන දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මේ ලෝකයේ නපුරන්ගෙන් ඉවත් කර ගැනීමෙන් පසුව පොළෝ තලය මත ඇතිවන්නාවූ අති භයානක ක්‍රියාදාමයන් ඉහත කී කාරණ සමඟ සැසඳිය නොහැක. මෙතෙක් සිදුව ඇති දාමරිකකම්වලට මෙන් තහංචි පැනවීම්වලට හෝ පාලනය කිරීම්වලට ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලපෑම ක්‍රියාත්මක වන්නේ නැත. සදාචාරය බිඳක් හෝ නොගැවුණු දූෂිත හැඟීම් සීමාවකින් තොරව ක්‍රියාවට නැඟේ. සාතන්ගේ උදහසද සීමා රහිතව ක්‍රියාත්මක වේ. සාතන්ගේ පාලන තන්ත්‍රයේ රඟ එවිට ලෝකයාට මින්පෙර කිසිදාක නුදුටු ආකාරයට දකගත හැකි වේ.

යෙරුසලම විනාශ කර දමනු ලැබූ වකවානුවේදී සිදු වූ ආකාරයට ඒ කාලයේදී ද, "ජීවනය පිණිස ලියවී සිටින සියල්ලෝ" (යෙසායා 4:4) එනම් දෙවියන්වහන්සේගේ සෙනඟ, මුදවා ගනු ලබනවා ඇත. තමන්වහන්සේට විශ්වාසවන්තව සිටින්නාවූ අය තමන්වහන්සේ වෙතට රැස්කර ගැනීමට තමා දෙවෙනි වර පැමිණෙන බව ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කර ඇත." "එවිට පොළොවේ සියලු ගෝත්‍රයෝ වැලපෙන්නෝය. ඔවුහු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද මහත් තේජසින්ද අහසේ වළාකුල් පිට එනවා දකින්නෝය. උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන් එවන සේක. ඔවුහු අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා සතර දිගින්ම උන්වහන්සේගේ තෝරා ගත්තවුන් රැස් කරන්නෝය." (මතෙව් 24:30,31) ශුභාරංචි පණිවිඩයට කීකරු නොවන්නාවූ අය ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමේදී උන්වහන්සේගේ මුඛයේ හුස්මෙන් දැවී යන්නෝය, එම ඊමේ තේජසින් විනාශ වී යන්නෝය. (2 තෙසලෝනික 2:8) අතීතයේ සිටි ඉශ්‍රායෙල් සෙනඟ මෙන්, නපුර කරන්නෝද තමන්වම විනාශ කර ගනිති. ඔවුහු තමුන්ගේ අපරාධ නිසා වැටී යන්නෝය. පාපයේ ඇලී ගැලී ගත කළ ජීවිත නිසා ඔවුහු දෙවියන්වහන්සේගෙන් ඈත්ව සිටිති. ඔවුන්ගේ ජීවිත

ස්වභාවය නපුරෙන් දූෂ්‍ය වී ඇත. යේසුස්වහන්සේගේ අභිමුඛයෙහි තේජස ඔවුන් විනාශ කරන්නාවූ ගින්නක් වන්නේය.

ක්‍රිස්තුස්වහන්සේගේ වචන මගින් ගෙනහැර දක්වූ පාඩම පැහැර නොහරින්නට මිනිස්සු වග බලා ගනිත්වා! උන්වහන්සේ ස්වකීය ගෝලයින්ට යෙරුසලමෙහි විනාශය ගැන පැවසූ සේක, පැමිණෙන්නාවූ විපත්තිය ගැන නිමිත්තක්ද දුන්සේක. ඔවුනට එම ස්ථානයෙන් පිටස්තර පෙදෙසකට පලායාමට එම නිමිත්ත උපකාර වන බවද, උන්වහන්සේ පැවසූ සේක. මෙයාකාරයෙන්ම, ලෝකාන්තිමයේදී සිදුවන විනාශය ගැන ලෝ වාසී ජනතාවට අනතුරු අඟවා පෙර නිමිතිද ලබා දී ඇත. එම සංසිද්ධිය ආසන්නවත්ම, මෙම පෙර නිමිති ගැන අවදියෙන් සිටින්නාවූ අයට, පැමිණෙන්නාවූ උදහසින් පලායාමට හැකියාවක් උදා වේ. යේසුස්වහන්සේ මෙසේ පවසන සේක් - "ඉර, සඳ හා තාරකාවන් කෙරේ ලකුණු ... නිසා වන වියවුලින් පොළොවේ ජාතීන්ට දුක් වේදනාද වන්නේය." (ලූක් 21:25) "එසේම නුඹලා මේ සියල්ල දකින කළ, 'උන්වහන්සේ දොරටු සමීපයෙහි බවත් දැනගන්න" (මතෙව් 24:33) "අවදිව සිටින්න" (මාර්ක් 13:35) යන්න යේසුස් වහන්සේගේ අනුශාසනාවයි. උන්වහන්සේගේ අනතුරු ඇඟවීම්වලට අවධානය යොමු කරන්නාවූ අය අන්ධකාරයෙහි නොසිටිනවා ඇත. එම දවස ඔවුන් නොදැනුවත්ව ළඟා නොවන්නේය. එහෙත් ඒ දවස කෙරෙහි අවධානය යොමු නොකරන්නාවූ අයට "රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන් ස්වාමින්වහන්සේගේ දවස" පැමිණෙන්නේය. (1 තෙසලෝනික 5:2)

යෙරුසලම පිළිබඳව වූ අනතුරු ඇඟවීමට අවධානය යොමු කිරීමට යුදෙව් ජනතාව කැමති නොවූහ. එසේම මෙම කාලයට අනිවාර්ය වන්නාවූ පණිවිඩයට වැදගත්කමක් ලබාදීමට වත්මන් ලෝකයා සූදානම් නැත. උන්වහන්සේගේ පැමිණීමේ දවස කවර දවසක හෝ වේවා, දෙවියන්වහන්සේ සමග සබඳතාවයක් නැති අයට ඒ දවස සොරෙකු මෙන් පැමිණෙනවා ඇත. සුපුරුදු ලෝක රටාව අනුව යමින් ජීවිත ගෙවන්නාවූ අයගේ ආරක්ෂාවක් සලසා නැති ගෙදරකට සොරෙකු මැදියම් යාමයේ ඇතුළු වන්නාවූ ආකාරයෙන් විනාශය පැමිණේ. එකල්හි මිනිස්සු සැප සෙල්ලම්වල ගිලී සිටිති; වෙළඳාමෙහි නියුතුව සිටිති; ගනු දෙනු සිදුකරති; මුදල් උපයා ගැනීමෙහි යෙදී සිටිති; ඒ අතර ආගමික නායකයෝ ලෝකයේ දියුණුව ගැන හුවා දක්වති; බුද්ධි ප්‍රවර්ධනය ගැන කරුණු ඉදිරිපත් කරති. මේ අතරේදී ජනතාව ව්‍යාජ ආරක්ෂාවකට යොමු කරනු ලදුව උදාසීනව කල් ගෙවති. "රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන් ස්වාමින්වහන්සේගේ දවස හදිසියේම ඔවුන් පිටට" පැමිණේ. "ඔවුහු කිසිසේත් නො-ගැළවෙන්නෝය." (1 තෙසලෝනික 5:2-5)



# 2

# මුල් ශතවර්ෂයන්හිදී පැවති හිංසා පීඩා

යේසුස්වහන්සේ තමන් ගෝලයන්ට, යෙරුසලමෙහි ඉරණම සහ උන්වහන්සේගේ දෙවන පැමිණීමේ දර්ශන එළිදරව් කළ විට, තමන්-වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබීම සහ තම ජනතාව මුදාගැනීම සඳහා බලයෙන් සහ තේජසින් යුතුව පැමිණීමත් අතර කාලයේදී තමන්වහන්සේගේ ජනතාවට මුහුණ පාන්නට සිදුවන අත්දැකීම් ගැන උන්වහන්සේ දිවැසින් පැවසූ සේක. අපොස්තලික සභාව මත නුදුරු අනාගතයේදී පතිත වන්නාවූ කරදර සහ හිංසා පීඩාකාරී සිද්ධීන් ඔලීව කන්දෙහි වැඩ සිටි ගැළවුම්කරුවාණන්ට දර්ශනය විය. උන්වහන්සේගේ දෑස අනාගතයට ගැඹුරින් එබී බලත්ම අනාගත අඳුරු යුගයන්හි සිදුවන දෑ දකගැනීමට උන්වහන්සේට හැකි විය. තම අනුගාමිකයන් මත පතිත වන්ට යන්නාවූ දරුණු විනාශකාරී වධ හිංසා දෙස උන්වහන්සේගේ දසුන යොමු විය. ලෝක බලධාරීන් විසින් දෙවියන්වහන්සේගේ සභාව වෙත එල්ල කරන්ට යන්නාවූ භයංකාර දේවල් ගැන යේසුස්වහන්සේ වචන ස්වල්පයකින් සංක්ෂිප්ත කර වදාළ සේක. (මතෙව් 24:9, 21,22) තම ස්වාමියාණන් ගමන් කළ මාර්ගයේම ක්‍රිස්තු අනුගාමිකයන්ද ගමන් කළ යුතු වන්නේය. එම මාර්ගය තුළ නින්දාව, ලජ්ජාව, දොස් නැගීම අවලාද සහ දුක්විඳීම් බහුලය. ඔවුන් ඒවා විඳ දරාගත යුතුය. ලෝකයේ මිදුම්කරුවාණන්ට එරෙහිව පුපුරා ගිය සතුරුකම උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහන්නන්ට විරුද්ධවද ක්‍රියාත්මක වනවා ඇත.

ගැළවුම්කරුවාණන්ගේ වචන සැබෑ ලෙස ඉටු වූ බව මුල් කාල සභා ඉතිහාසය සාක්ෂි දරයි. පොළොවේ සහ නිරයේ සියලු බලවේගයන් එකමුතුව ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව නැගී සිටියේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට එල්ල කළ පීඩා තුළිනි. යම්කිසි අයුරකින් ශුභාරංචිය ජයග්‍රහණය කළහොත් එහි ප්‍රතිඵලයක් ලෙස තම දේවාල සහ පූජාසන නැත්තටම නැතිවෙනවා ඇතැයි මිථ්‍යාදෘෂ්ඨිකත්වය දුර තියා දැනසිටි නිසා කිතුණු දහම විනාශ කරන්නට ඇය තම බලවේග කැඳෙව්වාය. හිංසා පීඩා වධ බන්ධන ගිනි දැල් අවුලුවාලනු ලැබීය. කිතුණුවා සතු ඉඩකඩම් ගේදොර, සම්පත් ඔවුන්ගෙන් බලෙන් අත්පත් කරගෙන ඔවුන්ගේ නිවෙස් වලින් ඔවුන්ව පන්නා දමන ලදී. ඔවුහු "දුක් නැමැති මහත් පොර බැදීමක්" ඉසුලුවෝය. (හෙබ්‍රෙව් 10:32) ඔවුහු "සරදම්වලින්ද, පහරවලින්ද, එසේය බැඳුම්වලින් සහ හිරගෙයි දමනු ලැබීමෙන්ද පරීක්ෂා කරනු

ලැබුවෝය." (හෙබ්‍රෙව් 11:36) බොහෝ දෙනෙක් තම රුධිරයෙන් තමන්ගේ සාක්ෂි මුද්‍රා කළෝය. වංශාධිපතීන් මෙන්ම වහලුන්ද, පොහොසත් අය මෙන්ම දුප්පතුන්ද, උගතුන් මෙන්ම නූගතුන්ද එක සේ කරුණා විරහිතව ඝාතනය කරනු ලැබූහ.

මෙම හිංසා පීඩා ආරම්භ වූයේ නීරෝගේ පාලන කාලයේදීය, පාවුල් තුමා වේද සාක්ෂිකරුවෙක් වශයෙන් ජීවිතය පූජා කළ සමයේදීය. එය ශත වර්ෂ ගණනාවක් පුරා ප්‍රබල අයුරින් හෝ සුළු අයුරින් හෝ පැවතියේය. ඉතා දරුණු අපරාධ, කිතුණුවන් මත ව්‍යාජ ලෙස පටවන ලදී. විවිධාකාර විපත්ති, එනම් සාගත, වසංගත සහ භූමිකම්පාවලට හේතුව කිතුණුවන් යයි ප්‍රකාශයට පත්කරන ලදී. පොදු ද්වේෂයට සහ සැකයට භාජනය වීම කිතුණුවන්ගේ කොටස විය. එවන් තත්ත්වයක් යටතේ අසරණයින් පාවා දී යමක් ලබාගැනීමට තොරතුරු සපයන්නෝ සැදී පැහැදී සිටියහ. අධිරාජ්‍යයට විරුද්ධව කැරලි ගසන්නන් ලෙස කිතුණුවන් වරදකරුවන් බව තීන්දු කරන ලදී. ආගමේ විරුද්ධවාදීන් සමාජයේ වසංගතයක් ලෙස වරදකරුවන් කරනු ලැබූහ. නාට්‍ය ශාලාවලදී බොහෝ කිතුණුවන් සතුන් විසින් මරා කන පිණිස උන්ට ගොදුරු කරන ලදී. එසේ නැතිනම් ඔවුන්ට පණ පිටින් ගිනි තබන ලදී. තවත් සමහරෙකු කුරුසිපත් කරන ලදී. තවත් අයට වනසතුන්ගේ හම් අඳවා රංග පීඨවලදී බල්ලන් ඉදිරියට දමන ලදී. මෙම දඬුවම් දීමේ ක්‍රියාවලිය මහජනයාගේ විනෝදය පිණිස ප්‍රධාන අංගයක් විය. විශාල මහජන සමුදායක් මෙම දර්ශන නැරඹීමට පැමිණ මරණීය වේදනාව විඳින්නන් දෙස බලා ප්‍රීතියෙන් අත්පොලසන් දෙමින් විනෝද වූහ.

කිතුණු අනුගාමිකයන් රැකවරණය සෙවූ අතර විවිධ තැන්වල ගොදුරු සොයමින් සතුන් දඩයම් කරන්නාක් මෙන් විරුද්ධවාදීහු කිතුණුවන් දඩයමේ යෙදුණාහ. සැඟවී සිටීම පිණිස ඔවුහු ජනශූන්‍ය පෙදෙස්වල සහ හුදෙකලා තැන්හි රැකවරණය පැතූහ. "ඔවුහු අසරණකමද, පීඩාද, නපුරුකමද විඳිමින් ... ඔබ මොබ ගියෝය. ඔවුහු කාන්තාරවලද, කඳුවලද, ගුහාවලද, පොළොවේ බෙනවලද ඇවිද්දෝය; ඔවුන්ගේ විසීමට ලෝකය නොවටනේය." (හෙබ්‍රෙව් 11:37-38) පොළොව යට තැනූ බිංගෙවල්, දහස් ගණනාවකට රැකවරණය ලබා දුන්නේය. රෝම නගරයෙන් පිටත වූ කඳු යට ඉතා දිගු බිම්ගෙවල් හාරා තිබුණේය. මෙම අඳුරු දිගු බිම්ගෙවල් ජාලය පස් සහ ගල් හාරා සෑදූ කුහර තුළින් නගරයෙන් සැතපුම් ගණනාවක් ඈත පෙදෙස් කරා යොමු වී තිබුණේය. පොළෝ මට්ටමෙන් යට පිහිටි මෙම ආරක්ෂිත ආලින්ද තුළ කිතුණු අනුගාමිකයෝ මරණයට පත් තම හිත මිතුරන් තැන්පත් කළෝය. සැකයට ලක් වී සමාජ



තහංචි ලැබූ අයට මෙම බිම්ගෙවල් තම වාසස්ථාන විය. යහපත් යුද්ධයෙහි නිරත වූ අයව ජීවනදායකයාණන් නින්දෙන් පුබුදුවාලන අවස්ථාවේදී මෙම අඳුරු බිම්ගෙවල් තුළින් බොහෝ වේද සාක්ෂිකරුවන් පිටතට පැමිණෙනවා ඇත.

දරුණු වධ හිංසා මධ්‍යයේ මෙම සාක්ෂිකරුවෝ යේසුස්වහන්සේ උදෙසා තමන්ගේ ඇදහිල්ල කැළැල් නොකර ආරක්ෂා කරගෙන සිටියෝය. සැප පහසුකම් කිසිවක් නැතිව හිරු රැස් වැටෙන්නේ නැති බිම්ගෙවල ජීවත් වෙමින් භූමිය ඇතුළෙහි තම නිවෙස් සාදා ගනිමින් ජීවත් වූ මොවුන් කිසිම දොස් පැවරීමක් කළේ නැත. අගහිඟකම් සහ දුක් පීඩා මධ්‍යයේ ජීවත් වූ නමුත් ඔවුහු ඇදහිල්ලේද ඉවසීමේ හා බලාපොරොත්තුවේ ද වචනවලින් එකිනෙකා දිරිමත් කළෝය. සෑම ලෞකික ආශිර්වාදයක්ම අහිමි වුවද, ඔවුන් තුළ තිබූ ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල අත්හැර දැමීමට ඒ කිසිවක් සමත් නොවීය. විඳ දරන්නට සිදු වූ පරීක්ෂා සහ හිංසා පීඩා වනාහි ඔවුන්ගේ නිවාඩුව සහ තෑග්ග වෙත ඔවුන් ළඟා කරන්නාවූ පියවර විය.

පුරාණයේ විසූ දේව සේවකයන් මෙන් "වෙන අය වඩා උතුම් නැවත නැගිටීමක් ලබන පිණිස, මිදීම පිළිනොගෙන වධ කරනු ලැබුවෝය." (හෙබ්‍රෙව් 11:35) මෙම වධ හිංසා මධ්‍යයේ ඔවුන්ගේ මනසට ළඟා වුණේ තම ස්වාමීන්ද්‍රයාණන් පැවසූ වදන්ය. ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පීඩා කරනු ලබන විට ඔවුන් මහත් සේ ප්‍රීති විය යුතු බව උන්වහන්සේ පැවසූ සේක. ඒ මක්නිසාදයත් ස්වර්ගයේදී ඔවුන්ට ලැබෙන්නට යන්නාවූ තෑග්ග ඉතා අගනා වන නිසාය. එම වකවානුවට ඉහත කාලවලදී ද අනාගතවක්තෘවරු වධ හිංසා පීඩාවලට මුහුණ පෑවෝය. සත්‍යතාව වෙනුවෙන් දුක් විඳීමට ඔවුන් යෝග්‍ය යයි තෝරාගෙන තිබීම ගැන ඔවුහු ප්‍රීති වූහ. ගිනි පිපිරෙන හඬ මධ්‍යයේ ඔවුන්ගේ ජයග්‍රහණයේ ගී හඬ ස්වර්ගය කරා යොමු විය. ඉහළ අහසට ඇදහිල්ලෙහි දෙනෙත් යොමු කළ ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ සහ දේව දූතයන් ස්වර්ගයේ කවුළු තුළින් ඔවුන් දෙස බලාගෙන සිටිනවා දකගන්නට පුළුවන් විය. මහත් සැලකිල්ලකින් තමන් දෙස බලාසිටින සඟ පිරිස ඔවුන්ගේ ස්ථිරතාවය ගැන අනුමැතිය පලකරන බව දැන ඔවුහු ප්‍රීති වූහ. දෙවියන්වහන්සේගේ සිහසුනෙන් ඔවුන් වෙතට පැමිණියේ "මරණය දක්වා විශ්වාසව සිටින්න. එවිට මම ජීවනයේ ඔටුන්න නුඹට දෙන්නෙමි" (එළිදරව් 2:10) යන වචනය.

අධම්තේට්ටම් සහ සැහැසිකම් කිරීමෙන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව විනාශ කර දමන්නට සාතන් ගත් උත්සාහය අසාර්ථක විය. යේසුස්-

වහන්සේගේ ගෝලයන් තම ජීවිත පූජා කළ ඒ මහත් අරගලයේ කාලය විශ්වාසවන්ත ලෙස දෙවියන්වහන්සේ උදෙසා ජීවත්වූ අයවලුන්ගේ දිවි පිදීමත් සමග අවසන් නොවීය. දෙවියන්වහන්සේගේ සේවකයන්ව මරාදමනු ලැබූ නමුත් ඒ පරාජය කරණකොටගෙන ඔවුහු ජයග්‍රාහක වූහ. උන්වහන්සේගේ සේවය අඛණ්ඩවම ඉදිරියට ගියේය. ශුභාරංචිය ව්‍යාප්තව පැතිරෙන්නට වූ අතර, එය පිළිගෙන, ජීවිත රටාව ඒ අනුව හැඩගස්වා ගත් සංඛ්‍යාවද වර්ධනය වන්නට විය. සාමාන්‍යයෙන් ඇතුළු විය නොහැකි තැන්වලට පවා පණිවිඩය ව්‍යාප්ත විය. රෝමයේ රාජාලින්ට පවා ඇතුල් විය නොහැකිවූ ස්ථාන තුළද ගැළවීමේ ශුභාරංචි පණිවිඩය සටහන් තැබීය. වධ හිංසා, හිංසා පීඩා දේශය පුරා ව්‍යාප්ත කළ යුතු යයි නිර්දේශ කළ මිථ්‍යාදෘෂ්ඨික පාලකයන් සමග තර්ක කළ එක්තරා කිතුණු බැතිමතෙක් පවසා සිටියේ මෙවැන්නකි. "ඔබට අපව මරා දමන්නට පුළුවන. අපට වධ වේදනා පමුණුවන්නට හැකියාව ඔබට ඇත. අපව වරදට පත්කරන්නට බලය ඔබ සතුය... එහෙත් ඔබගේ අයුක්ති සහගත ක්‍රියා සාක්ෂි දරන්නේ අප නිර්දෝෂ බවයි... ඔබගේ කුරිරුකම් ඔබට යහපතක් සලසා දෙන්නේ නැත. වෙනත් අයටත් සත්‍යය උදෙසා නැගී සිටීමට එය ප්‍රබල ඇරයුමක් වන්නේය. අපව බිමට සමතලා කරදමන්නට ඔබ වැඩි වැඩියෙන් උත්සාහ කරන විට අපිද වැඩි වැඩියෙන් ගණනින් වර්ධනය වෙමු. කිතුණු බැතිමතුන්ගේ රුධිරය බීජය වන්නේය" Tertullion, Apology, Paragraph 50.

කිතුණුවන් දහස් ගණනින් සිරගත කර මරා දැමුවද, මරණයට පත්වන අයගේ "ස්ථාන" පිරවීමට වෙනත් අය කිතු දහම වැළඳ ගත්තෝය. තම ඇදහිල්ල වෙනුවෙන් දිවි පිදූ අය ක්‍රිස්තුස්වහන්සේට භාරකරන ලදුව ඔවුන් ජයග්‍රාහකයන් ලෙස උන්වහන්සේ විසින් ගණන් ගන්නා ලදී. ඔවුහු යහපත් සටනේ යෙදී සිටියෝය. ක්‍රිස්තුස්-වහන්සේ නැවත පැමිණෙන විට තේජසේ කිරුළ ඔවුන් ලබනවා ඇත. කිතුණුවෝ විඳ දරා ගත් දුක් වේදනා තුළින් ඔවුහු එකිනෙකා වෙතද මිදුම්කරුවාණන් වෙතද සමීප බැඳීමකට යොමු වූහ. ඔවුන්ගේ ජීවත් වීමේ ආදර්ශයත් මරණ මංචකයේ සාක්ෂියත් සත්‍යතාවය වෙනුවෙන් වූ කැපී පෙනෙන සාක්ෂියක් විය. බලාපොරොත්තු නොවූ ස්ථානයන්හි විසූ සාතන්ගේ යටත් වැසියෝ ඔහුට ගැති වූ සේවය අත්හැර දමා ක්‍රිස්තුස්වහන්සේගේ ධජය යටතේ සේවයට බැඳුණෝය.

මේ සංසිද්ධීන් නිසා දෙවියන්වහන්සේගේ රාජ්‍ය පාලන තන්ත්‍රයට එරෙහිව වඩාත් සාර්ථක ලෙස යුද්ධ කිරීම සඳහා සැලසුම් දියත් කිරීමට තීරණය කළ සාතන් තමන්ගේ ධජය ක්‍රිස්තියානි සභාව ඇතුළත තැන්පත් කිරීමට අදිටන් කරගත්තේය. කිස්තුස්වහන්සේගේ



අනුගාමිකයන්ව මුළා කරන්නට හැකිවේ නම්, එමගින් ඔවුන්ගේ ජීවිත රටාව සහ ක්‍රියා කලාපය දෙවියන්වහන්සේ ඉදිරියෙහි අප්‍රසාදයට පත්වනවා නියතය. එවිට ඔවුන්ගේ ශක්තියත්, ආරක්ෂාවත්, ස්ථිරව සිටීමත් බිඳ වැටෙනවා ඇත. එකල්හි ඔවුන් පහසුවෙන්ම සාතන්ගේ ග්‍රහණයට නතු වෙනවා ඇත.

බලය යෙදවීමෙන් ලබාගැනීමට නොහැකිවූ දේ දැන් මායා ප්‍රයෝග මගින් ලබාගැනීමට ප්‍රබල එදිරිවාදියා උත්සාහ දැරිය. වධහිංසා පැමිණවීම නතර විය. ඒ වෙනුවට ලෞකික සමෘද්ධියත්, ලෝක ගෞරවයත් යන භයානක මායාවන් ඇතුළු විය. කිතුණු ඇදහිල්ලෙහි කොටස්කරුවන් වීමට රූප වන්දනා කරන්ට යොමු වූවන්ට මග පෙන්වන ලදී. ඔවුහු කිතු දහම වැළඳ ගත්තද එහි සමහර වැදගත් සත්‍යතාවන් ප්‍රතික්ෂේප කළෝය. යේසුස්වහන්සේ වනාහි දෙවියන්-වහන්සේගේ පුත්‍රයාණන් බව තමන් පිළිගන්නවා යයිද, උන්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම කෙරෙහි තමා විශ්වාස කරනවා යයිද ඔවුහු කියා සිටියෝය. එසේවී නමුත් පාපය පිළිබඳව නිශ්චිත වැටහීමක් ඔවුන්ට දැනුණේ නැත. පසුතැවිලි වීමේ උවමනාකමක් හෝ ජීවිත රටාව වෙනස් කිරීමේ අවශ්‍යතාවක් ඔවුන්ට තිබුණේ නැත. මෙසේ කිතු දහම් වැළඳ ගැනීමට ඉදිරිපත් වූ මිසදෙටුවෝ තමන්ගේ සමහර විශ්වාස ක්‍රම අත්හැර දැමීමට කැමැති බවද, ඒ අතරම කිතුණුවන්ද තමන් දැඩිව අල්ලාගෙන සිටින සමහර ඇදහිලි ක්‍රම අත්හැර දැමිය යුතු යයිද ඔව්හු යෝජනා කළහ. එයට හේතුව වශයෙන් ඔවුන් දැක්වූයේ එවිට දෙපාර්ශ්වයේම අයට ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන එකම වේදිකාවක් මත සිටින්නට හැකිවන බවය.

දැන්, කිතුණු සභාව මහත් අර්බුදකාරී විපතකට මුහුණ පා සිටියාය. මේ හා සංසන්දනය කිරීමේදී, සිරගෙය, වධ හිංසා, ගිනි මැලය සහ කඩුව ආශිර්වාදයන් විය. තමා කිසිම ඇදහිල්ලක් පාවා දෙන්නේ නැතැයි කියමින් සමහර කිතුණුවෝ ස්ථිරතාවයකින් නැගී සිටියෝය. තවත් අය තම විශ්වාසයන් පාවා දීමට කැමැත්ත පළ කළෝය. තවත් අය තමන්ගේ ඇදහිලි ප්‍රකාශනයේ සමහර විශේෂ ලක්ෂණ වෙනස් කිරීමට කැමති වූහ. මේ පිළිබඳව ඔවුහු එක්තරා තර්කයක්ද ඉදිරිපත් කළෝය; එනම්, මෙයාකාරයෙන් ඔවුන් කිතුණු ඇදහිල්ලෙහි සමහර අංග පිළිගැනීම නිසා, පසු දවසක සම්පූර්ණ හැරීමකට යොමු විය හැකි බවය. ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය අනුගාමිකයනට මෙම කාලය සිත් වේදනාවෙන් සහ සන්තාපයෙන් පිරී ගිය සමයක් විය. කිතුණු දහම වැළඳ ගන්නවා යැයි ව්‍යාජ ලෙස පවසන්නාවූ බැතිමතුන් කරණකොටගෙන සාතන් උපායශීලීව සභාව ඇතුළට රිංගා ගත්තේය. ඇදහිල්ල දූෂ්‍ය කරමින් සභාවේ

අනෙකුත් බැතිමතුන්ගේ මනස් සත්‍යතාවෙන් ඉවතට හරවමින් ක්‍රියාකිරීම ඔහුගේ අභිමතාර්ථය විය.

අන්තිමේදී තමන්ගේ ප්‍රමිතිය පහත හෙළීමට බොහෝ කිතුණුවෝ කැමැත්ත පළ කළෝය. මෙසේ කිතුදහම සහ මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රම අතර සන්ධානයක් ඇති විය. දේවතා පිළිමවලට සහ රූපවලට වන්දනා කළ අය තමා කිතු දහම වැළඳ ගත් බව පවසා සභාවට එකතු වුවත් තවදුරටත් තමන් වන්දනා කරන්නාවූ ප්‍රතිමා සහ පිළිම තමන්ගේ නමස්කාරයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් නොකළෝය. ඔවුන් කළේ තමන් වන්දනා කළ රූප වෙනුවට යේසුස්වහන්සේගේ ප්‍රතිමාද මරිය තුමියගේ මෙන්ම ශාන්තුවරයන්ගේ පිළිමද නමස්කාරය සඳහා යොදා ගැනීමය. රූප වන්දනාවේ පිළිකුල් දූෂිත මුහුන් මෙසේ සභාව තුළ නොකඩවම ක්‍රියා කළේය. පදනම් විරහිත ධර්මතාවන්, මිථ්‍යා ඇදහිලි ක්‍රම සහ රූප වන්දනීය මංගල්‍යයනුත් සභාවේ ඇදහිල්ලට සහ නමස්කාරයට එකතු විය, ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් රූප වන්දනීය බැතිමතුන් සමග සන්ධාන ගතවීමත් සමගම ක්‍රිස්තියානි ආගම දූෂ්‍ය භාවයට පත් විය. ඒ අතර සභාව තමන්ගේ පාරිශුද්ධතාවයද, බලයද නැති කරගත්තීය. මෙම රැවටිලි මගින් මුළාවට පත් නොවූ අයද සිටියහ. ඔවුහු තවදුරටත් සත්‍යතාවයේ නිර්මාතෘවරයාණන්ට තම, පක්ෂග්‍රාහිකත්වය දක්වමින් උන්වහන්සේට පමණක් නමස්කාර කළෝය.

ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන්නාවූ බැතිමතුන් කණ්ඩායම් දෙකකි. මෙය මුල පටන්ම පැවත එන්නකි. එක කණ්ඩායමක් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය අධ්‍යයනය කරති. ඔවුහු උන්වහන්සේගේ ජීවිත ආකෘතිය තම ජීවිත හා අනුකූලතාවක් ඇති කරගැනීම් වස් තමන්ගේ වැරදි සහ අඩු ලුහුඩුකම් නිවැරදි කර ගනිති. ඒ අතර අනෙක් කණ්ඩායම තමාගේ වැරදි පෙන්වා දෙන්නාවූ ප්‍රායෝගික සරල සත්‍යතාවන් එපා කරති. සභාව ඉතා උපරිම ගුණාත්මක භාවයෙන් පැවති වකවානුවේදී පවා සභාවේ බැතිමතුන්වූ සෑම අයෙක්ම සත්‍යවූ ද, පරිශුද්ධවූ ද අවංකවූ ද අය නොවූහ. දන දන පාපයේ ඇලී ගැලී ජීවත් වන්නාවූ අය සභාවට එකතු කරන්න එපා යැයි ගැළවුම්කාරයාණෝ ඉගැන්වූ සේක. එසේ වුවද, උන්වහන්සේ චරිත දුර්වලකම් තිබුණාවූ අය ඇසුරු කළසේක. ඔවුන්ට උන්වහන්සේගේ ඉගැන්වීම්වල ප්‍රයෝජන සහ ආදර්ශය ලබා දුන්සේක. එමගින් උන්වහන්සේ බලාපොරොත්තු වුණේ ඔවුන්ට තම තමන්ගේ වරද දකගන්නට අවස්ථාවක් ලබා දී එම වරද හරිගස්වා ගැනීමට ඉඩ ප්‍රස්ථාවක් ලබාදීමය. යේසුස්වහන්සේගේ ගෝලයන් දොළොස් දෙනා අතර තම ස්වාමියාව පාවාදුන් ද්‍රෝහියෙක්ද විය. උන්වහන්සේ යූදස්ව



පිළිගත්තේ ඔහුගේ චරිතය තුළ වැරදි දේ තිබුණ නිසාම නොවීය. එවැනි දේ තිබියදීත් උන්වහන්සේ ඔහුව ගෝලයන් අතරට භාරගත් සේක. තමන්වහන්සේගේ ගුරුහරුකම් සහ ආදර්ශය කරණකොටගෙන ක්‍රිස්තියානි චරිතයක ගුණාංග ඔහු ඉගෙන ගන්නවා ඇතැයි උන්වහන්සේ විශ්වාස කළසේක. මෙමගින් ඔහුගේ වැරදි පෙනී යාමට සලස්වා ඔහුව පසුතැවීමට යොමු කර දිව්‍ය අනුග්‍රහයේ උපකාරයෙන් "සත්‍යතාවට කීකරුවීම තුළින්" ඔහුගේ ආත්මය පිරිසිදු කිරීම ක්‍රිස්තුස්වහන්සේගේ අභිප්‍රාය විය. එහෙත් යූදස් ඔහුට ලබා දුන් ආලෝකය තුළ ගමන් නොකළේය. හෙතෙම පාපය තුළ ජීවත් වෙමින්, තමා පරීක්ෂා කිරීමට සාතන්ට ඉඩ සලසා දුන්නේය. ඔහු තුළ තිබූ නපුරෙහි චරිතාංග ඉස්මතු විය. අඳුරේ බලවේගයනට ඔහුගේ මනස පාලනය කරන්නට ඔහු ඉඩ හැරියේය. වැරදි පෙන්වා දෙනු ලැබූ අවස්ථාවන්හිදී ඔහු කෝපයට පත් විය. අන්තිමේදී ඔහු තමාගේ ස්වාමියාණන්ව පාවාදීමේ භයානක ද්‍රෝහිකම කරන්නට යොමු විය. භක්තිමත් අය යයි පවසමින් පාපිෂ්ට ක්‍රියාවන් ඇලුම් කරන්නාවූ සැවොම, තමන්ගේ වැරදි ක්‍රියා මාර්ගයන්හි වරද පෙන්වා දෙන විට, තමාගේ සමාදානයට බාධා කළා යයි ඒ අයට ද්වේෂ කරති. තමාගේම යහපත සඳහා තම වරද ගැන තරවටු කළ අයට ඔවුහු දොස් පවරති. වඩා යෝග්‍ය අවස්ථාවක් උදාවූ කල්හි ඔවුහුද යූදස් කළාක් මෙන්, තරවටු කළ අයව පාවා දෙති.

රහසිගත ලෙස පාපය ඇලුම් කරමින් තමා දේව භක්තික සුදනන් යයි පවසන්නාවූ අය සභාවේ සිටිනවා ගෝලයන්ට දකගත හැකි විය. අනනියස් සහ සප්පිරා රැවටිලිකාර කොටසක් රහ දක්වූහ. දෙවියන්වහන්සේට සම්පූර්ණ පූජාවක් කරන බව පෙන්වීමට ඔවුහු ක්‍රියා කළෝය. එහෙත් ඔවුහු ලෝභකමින් යුතුව, විකිණීමේ මුදලින් කොටසක් තමන් වෙත තබා ගත්තෝය. මෙම රැවටිලිකාරයන්ගේ නියම තත්ත්වය සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ ප්‍රේරිතයන්ට එළිදරව් කළසේක. සභාවේ පිරිසිදුතාවට හා නිර්මලතාවට පිළිකුල් ලපයක් සනිටුහන් කළ මෙම ක්‍රියාවට දායක වූ අය දේව විනිශ්චයන් මගින් ලොවින් තුරන් කර දමන ලදී. ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ මෙකී කරුණු විචාරීමේ ආත්මය සභාව තුළ සිටි වංචාකාරයන්ටත් නපුරු ක්‍රියා කරනවුන්ටත් මහත් භීතියක් ඇති කළේය. තමන්ගේ ක්‍රියා කලාපයෙන්ද එහි පුරුදු තුළින්ද තමන් ක්‍රිස්තුස්වහන්සේගේ නියෝජිතයන් යයි පෙන්නුම් කළ අය සමග වංචාකාරයන්ට වැඩිකලක් සමගි සමාගම් පවත්වන්නට නොහැකි විය. උන්වහන්සේගේ අනුගාමිකයන් කරා දරුණු පරීක්ෂා සහ පීඩා පැමිණි විට සත්‍යය වෙනුවෙන් සිය සම්පත් අත්හැර දැමීමට කැමති වූ අය පමණක් ක්‍රිස්තු අනුගාමිකයන් වීමට ආශා කළහ. මෙලෙස

හිංසා පීඩා, වධ වේදනා පැවති තාක් කල් සභාව සැහෙන ප්‍රමාණයකට පාරිශුද්ධව සිටියාය. එම තත්ත්වය සිඳී ගිය කල්හි, වඩාත් අවංක නොවූ අය, දැහැමිතාවට වැඩි තැකීමක් නැති අය, සභාවට එක්වූහ. සභාව තුළ බලපෑමක් කිරීමට සාතන්ට අවකාශයක් උදා විය.

එහෙත්, ආලෝකයේ කුමාරයාණන් සහ අඳුරේ කුමාරයා අතර සබඳතාවයක් නැත්තේය. තවද, එම දෙපාර්ශ්වයේ අනුගාමිකයන් අතරද එකමුතුකමක් නොතිබිය හැකිය. මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රමවලින් නියම හැරීමක් නොමැති අය සමග එකතු වීමට කිතුණු බැතිමත්හු කැමැත්ත පළ කළ විට සත්‍යයෙන් ඈත්ව යන්නාවූ මඟකට ඔවුහු ඇතුළු වූවෝය. ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් එතරම් විශාල සංඛ්‍යාවක් රැවටීමට හැකිවීම ගැන සාතන් මහත් ප්‍රීතියට පත් විය. ඉක්බිතිව මෙම අය මත තම බලය වඩාත් පූර්ණ ලෙස යෙදවීමට ඔහු ක්‍රියාත්මක විය. දෙවියන්වහන්සේට සත්‍යවාදීව සිටින්නාවූ අය මත පීඩා පැමිණවීමට ඔහු තම බලය යටතට පත්ව සිටියාවූ අය පෙළඹවීය. කලක් කිතුණු සභාවේ ආරක්ෂකයන්ව සිටි අයට තරමට වෙනත් අයට සත්‍ය වූ ක්‍රිස්තියානි ඇදහිල්ලට විරුද්ධ වීම ගැන මනා අවබෝධයක් තිබුණේ නැත. දහම හැර ගියාවූ මෙම අය අඩ හැරීමකට භාජන වූ මිථ්‍යා දෘෂ්ටිකයන් හා එක්වෙමින් ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මතාවයන්හි ඉතා වැදගත් මූල අංගවලට එරෙහිව තමන්ගේ සංග්‍රාමය එල්ල කළෝය.

සභාව තුළට මායාකාර රැවටිලි සහ අතිශයින් පිළිකුල් ක්‍රමවේදයන් ඇතුළු විය. ව්‍යාජ පෙනුමකින් සත්‍යය වසන් කර, සමහර අවස්ථාවන්හිදී පූජක ඇඳුමින් සඟවාගෙන, මෙම ව්‍යාජ ධර්මතා සභාවට හඳුන්වා දෙනු ලැබීය. මෙවන් ව්‍යාජ ක්‍රමයනට විරුද්ධව නැඟී සිටීමේදී සත්‍යයට විශ්වාසවන්තව සිටි අයට මහත් පොර බැදීමකට මුහුණ දීමට සිදුවිය. ඇදහිල්ලෙහි ප්‍රමිතිය ලෙස ශුද්ධ වූ බයිබලය පිළිගනු ලැබුවේ නැත. ආගමික නිදහස යන දහම ආගම් විරෝධීත්වය ලෙස සලකන ලදී. එම දහමට ගරු කළ අයට ද්වේෂ කර ඔවුන්ව එපා කරන ලදී. ඔවුන්ව සභා සාමාජිකත්වයෙන් ඉවත් කරන ලදී.

අසත්‍ය ඇදහිලි ක්‍රමවේදයන් සහ රූප වන්දනාව අත්හැර දැමීම සභාව තවදුරටත් ප්‍රතික්ෂේප කළොත්, දැඩි දිගු අරගලයකින් පසුව වුවද ඇදහිලිවන්ත සුළු කණ්ඩායම, දහමට පිටුපා ක්‍රියා කරන්නාවූ සභාව සමග තිබූ සිය සබඳතා අත්හැර දැමීමට තීරණය කළහ. තමා දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වෙනවා නම් වෙන්වීම අනිවාර්ය බව ඔවුන්ට පෙනී ගියේය. තමන්ගේ ආත්මවලට මරණීය තර්ජන



එල්ල කරන්නාවූ බොරු ඉගැන්වීම් තවත් ඉවසා දරා සිටීමට ඔව්හු කැමති නොවූහ. තමන්ගේ දරුවන්ගේද දරුවන්ගේ දරුවන්ගේද ඇදහිල්ල අන්තරායට පත්කිරීමට හේතුකාරක වන ආදර්ශයක් තැබීමට ඔවුහු කැමති නොවූහ. සාමය සහ එකමුතුකම රැකගැනීමට අවශ්‍ය වන්නාවූ කුමන ආකාර හෝ සහනයක් ලබාදීමට ඔවුන් තුළ සූදානමක් විය. එහෙත් එයද දෙවියන්වහන්සේට වූ අචල භක්තියේ පක්ෂපාතිකම තුළ පමණකි. එහෙත් සාමය ලබාගැනීම සඳහා මූලධර්ම පාවාදීමට සිදුවනු ඇතැයි ඔවුන්ට හැඟුණි. එක්සත්කම ලබාගත හැක්කේ සත්‍යය සහ ධර්මිෂ්ඨකම පාවාදීමෙන් පමණක් නම් දෙපක්ෂය අතර වෙනස්කම් සහ යුද්ධ තිබුණාට කම් නැතැයි ඔව්හු තීරණය කළහ.

ස්ථිර බැතිමත්හු ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ, එම ඇදහිල්ලේ ප්‍රතිපත්ති දෙවියන්වහන්සේගේ විශේෂිත වූ ජනතාවගේ හදවත් තුළ පුනර්ජීවනයක්, යළි පිබිදීමක් ඇතිකරන්නේ නම් එය සභාවටත් ලෝකයටත් විශාල යහපතක් වනවා ඇත. කිතුණු ඇදහිල්ලෙහි ප්‍රධාන ධර්මතාවන් පිළිබඳව අද ඇත්තේ බිය උපදවන සුළු නොසැලකිල්ලකි, උදාසීනතාවකි. මෙම ධර්මතාවන් එතරම් වැදගත් නැතැයි යන කල්පිතයක් ව්‍යාප්ත වෙමින් පවතී. මේ පිරිහීම සාතන්ගේ නියෝජිතයන්ගේ අත් ශක්තිමත් කරයි. ව්‍යාජ මත හා මරණීය මායාවන් හේතුකොටගෙන ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් යයි කියාගන්නාවූ දහස් ගණන් අය අද ඒවා පිළිගැනීමට පත්වී ඇත. මෙම සිද්ධාන්ත සහ ව්‍යාජ මතවලට එරෙහිව පැරණි ඇදහිලිවන්තයන් නැඟී සිටියේ තම ජීවිත පවා පරදුවට තබමින්ය.

පුරාණයේ විසූ කිතුණුවෝ ඇත්තෙන්ම පුදුමාකාර පිරිසක් වූහ. ඔවුන් තුළ වූ නිර්මල ජීවිත රටාවත්, හැසිරීමත්, නොසැලෙන ඇදහිල්ලත් පව්කරුවාගේ සමාදානයට බාධා කරන්නාවූ නිරන්තර වරද තැබීමක් විය. ධන සම්පත්, රාජ්‍ය තාන්ත්‍රික නිලතල සහ ගෞරවණීය සම්මාන සතු නොවූ මෙම කිතුණුවන්ගේ සංඛ්‍යාව ස්වල්පයක් වුවද, ඔවුන්ගේ චරිත සොබාවත්, ඔවුන් දැරූ ආගමික දහම් මාලාවත් යම්තැනක ප්‍රචලිත වීද ඒවා නපුර කරන්නනට බිය ඇති කළේය. දේව භය නොතිබූ කායින් තම සහෝදර ආබෙල්ට ද්වේෂ කළාක් මෙන් නපුරු අය සත් ගුණවත් දැහැමි ජීවිතයක් ගතකළ අයට ද්වේෂ කළෝය. කායින් විසින් ආබෙල්ව මරා දැමූ අයුරින්ම ශුද්ධාත්මයාණන්ගේ හික්මවීම සහ මැඩ පැවැත්වීම නොරිස්වූ අය දේව ජනතාව මරා දැමූහ. ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයෙහි ශුද්ධතාව යුදෙව්වන්ගේ ජීවිත තුළ දකගන්නට තිබූ ආත්මාර්ථකාමීත්වයටත්, දූෂිත භාවයටත් තරවටු කිරීමක් වූ නිසා ඔවුහු උන්වහන්සේව ප්‍රතික්ෂේප කර කුරුසිපත්

කළෝය. ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේ පටන් අද දක්වාම උන්වහන්සේගේ ඇදහිලිවන්ත ගෝලයන්, පාපයේ ක්‍රියා මාර්ගයන් අනුගමනය කරන්නාවූ, එම ක්‍රමයට ප්‍රිය මනාපයක් දක්වන්නාවූ අය තුළ ද්වේෂයක් සහ විරුද්ධතාවක් පුබුදුවා ඇත.

එසේ නම් ශුභාරංචියට සමාදානයේ පණිවිඩය යයි කිව හැක්කේ කෙසේද? මෙසියස්වහන්සේගේ උපත ගැන අනාවැකි ප්‍රකාශ කළ යෙසායා උන්වහන්සේට "සමාදානයේ කුමාරයාණෝය" යන තනතුරු නාමය යොදා තිබුණේය. ක්‍රිස්තුස්වහන්සේගේ උපත දේවදූතයන් විසින් එඬේරුන්ට සැල කළ අවස්ථාවේදී බෙත්ලෙහෙමේ තැනිතලා පෙදෙස් ඉහළින් දේව දූතයන්ගේ ප්‍රශස්ත ගී හඬ දෝංකාරය විය. ඔවුන්ගේ ගී හඬ ප්‍රකාශ කළේ - "ඉතා උසස් තැන්හි දෙවියන්වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද වේවා"යි කියාය. (ලූක් 2:14) මෙම අනාවැකි ප්‍රකාශන සහ ක්‍රිස්තුස්වහන්සේ වදාළ වදන් අතර පරස්පර විරෝධතාවක් දකගත හැකි වේ. "පොළොවෙහි සමාදානය දෙන්ට මම ආවෙමියි නොසිතන්න. සමාදානය නොව කඩුවක් දෙන්ට ආවෙමි" යි (මතෙව් 10:34) ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කළසේක. යථාර්ථවාදීව අවබෝධ කරගන්නේ නම් ප්‍රකාශන දෙක අතර ඇත්තේ සම්පූර්ණ එකඟතාවකි. ශුභාරංචි පණිවිඩය සාමයේ පණිවිඩයකි. මනුෂ්‍යයන් ක්‍රිස්තියානිය නමැති විධිමත් ඇදහිලි පද්ධතිය පිළිගෙන එයට කීකරු වන්නේ නම් එයින් සාමය, ප්‍රීතිය, සුහදතාවය සහ එකමුතුකම ලෝ පුරා ව්‍යාප්ත වෙනවා ඇත. කිස්තුස්වහන්සේගේ ආගම පිළිගන්නා වූ සැවොම සහෝදරත්ව බැම්මකින් සමීප එකමුතුතාවකට පත්කරනු ලබති. මිනිසුන්ව දෙවියන්වහන්සේ සමඟත් එකිනෙකා සමගත් සමඟි කිරීම යේසුස්වහන්සේගේ මෙහෙය වේ. එහෙත් බහුතර ලෝක ජනතාව ක්‍රිස්තුස්වහන්සේගේ පරම සතුරාගේ පාලනය යටතේ කල් ගෙවති. ජීවිතයේ ශුභවාදී ප්‍රතිපත්ති ශුභාරංචිය මගින් ඉදිරිපත් කෙරේ. එම ප්‍රතිපත්ති ඔවුන්ගේ පුරුදුවලට සහ ආශාවන්ට සම්පූර්ණයෙන්ම වෙනස්ය. එම නිසා ඔවුන් ශුභාරංචියට විරුද්ධව කැරළි ගසමින් නැඟී සිටිති. ඔවුන්ගේ පාප එළිදරව් කරන්නාවූ හෙළා දකින්නාවූ පවිත්‍රත්වයට ඔවුහු ද්වේෂ කරති. ශුභාරංචියෙහි සාධාරණවූ ද, ශුද්ධවූ ද අයිතිවාසිකම් පිළිගැනීමට ඔවුන්ව යොමු කරමින් ඔවුන් උනන්දු කරන විට ඔවුහු එවන් අයට එරෙහිව නැඟී සිට ඔවුන්ට පීඩා කොට ඔවුන් විනාශ කර දමති. ශුභාරංචිය උත්කෘෂ්ඨ සත්‍යතාවයන් ගෙන හැර දක්වන නිසා එම පණිවිඩය සමහර අයගේ ද්වේෂයට සහ සමහර විටෙක සටනට පවා හේතු වේ. මෙම හේතුන් මත, ශුභාරංචිය කඩුවක් යයි නම් කර ඇත.



දුෂ්ටයන්ගේ අතින් ධර්මිෂ්ඨයන් පීඩාවට පත්කිරීමට අවසර දෙන අද්භූත දේව ක්‍රියාකාරිත්වය ඇදහිල්ලෙන් දුර්වල වූ බොහෝ අයට සැක උපදවන මහත් අවුලක් බවට පත්ව ඇත. අධම ගති ඇති සදාචාර සම්පන්න නොවූ පුද්ගලයෝ සමෘද්ධිමත් ජීවිත ගත කරති, සැප සම්පත් භුක්ති විඳිති. ඒ අතර ධර්මිෂ්ඨවූ ද, ඉතා යහපත්වූ ද බැතිමත්හු දුෂ්ටයන්ගේ කෲර ක්‍රියාකාරිත්වය නිසා හිංසා පීඩා විඳිති, දුක් ගැහැටවලට මුහුණ දෙති. මෙම ගුප්ත ක්‍රියාදාමය නිසා සමහර අය දෙවියන්වහන්සේ කෙරෙහි තිබූ විශ්වාසය අතහැර දැමීමට පවා සූදානම්ව සිටිති. සාධාරණවූ ද, කාරුණිකවූ ද, එසේම සර්ව බලධාරී බලය ඇත්තාවූද තැනැන්වහන්සේ කෙනෙක් අසාධාරණවූ ද, මෙවන් බලවත්වූ ද, හිංසා පීඩා පැමිණවීම් ඉවසා දරා සිටින්නේ කෙසේද? මෙම ප්‍රශ්නය පිළිබඳව අපට කළ හැකි දෙයක් ඇත්තේම නැත. තමන්වහන්සේගේ ප්‍රේමය ගැන දෙවියන්වහන්සේ ප්‍රමාණවත් සාක්ෂි අපට ලබා දී ඇත. ඒ අතර දේවාරක්ෂාව සහ දේව මගපෙන්වීම ක්‍රියාත්මක වන ආකාරය අපට තේරුම් ගත නොහැකිය. මේ නිසා උන්වහන්සේගේ යහපත්කම ගැන අපි අනුමාන නොකළ යුතු වෙමු. පරීක්ෂාවෙන් පිරි අඳුරු දවස්වලදී ගෝලයන්ගේ ජීවිතවල ඇතිවන සැකය කල් තියා දුටු ගැළවුම්කරුවාණෝ ඔවුන්ට මෙසේ පැවසූ සේක. "දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නොවේ යයි නුඹලාට මා කී වචනය සිහි කරන්න. ඔවුහු මට පීඩා කළෝ නම් නුඹලාටත් පීඩා කරන්නෝය." (යොහන් 15:20) දුෂ්ට මිනිසුන්ගේ කුරිරුකම් කරණකොටගෙන යේසුස්වහන්සේගේ අනුගාමිකයන් අතරෙන් සමහර අයට පමුණුවනු ලබන්නාවූ දුක් පීඩාවලට වඩා වැඩි පරිමාණයේ දුක් යේසුස්වහන්සේ අප උදෙසා වින්ද සේක. වධ හිංසා පීඩා විඳීම සහ ඇදහිල්ල උදෙසා දිවි පිදීම උදෙසා කැඳවනු ලැබූ අය කරන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය පුත්‍රයාණන් ගිය මාර්ගයෙහි ගමන් කිරීමය.

"ස්වාමීන්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක." (2 පේතෘස් 3:9) උන්වහන්සේ තම දරුවන් අමතක නොකරන සේක, නොසලකා පැහැර නොහරින සේක. දුෂ්ටයන්ට ඔවුන්ගේ නියම චරිතය එළිදරව් කරන්නට උන්වහන්සේ අවසර දෙන සේක. එමගින් උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ තමන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට ආශාවක් දක්වන්නාවූ කවරෙක් හෝ දුෂ්ටයන් පිළිබඳව මුළාවට නොපැමිණීමය. ධර්මිෂ්ඨයන් පවිත්‍ර කරන පිණිස වධ බන්ධන නමැති ගිනි උඳුනට ඔවුන්ව යොමු කරනු ලැබේ. ඔවුන්ගේ ආදර්ශය මගින් ඇදහිල්ලේ සහ භක්තිවන්තකමේ යථාර්ථය අනෙකුත් අය ඒත්තුගත යුතුය. තවද, ඔවුන්ගේ අවංක වූ නොසැලී සිටීමේ ක්‍රියා මාර්ගය කරණකොටගෙන දෙවියන්වහන්සේ කෙරෙහි

විශ්වාස නොකරන්නාවූ අය සහ අධර්මිෂ්ඨයන්ව වරදකරුවන් බවට පත්කරනු ලැබේ.

දෙවියන්වහන්සේ දුෂ්ටයන්ට දියුණු වී සඵලත්වයට පත්වී උන්වහන්සේ කෙරෙහි ඔවුන් තුළ ඇති සතුරුකම එළිදරව් කිරීමට ඔවුන්ට අවසර දෙන සේක. මෙමගින් ඔවුන්ගේ අපරාධකමෙහි කුසලාන සම්පූර්ණ වී පිරී ඉතිරී යන විට ඔවුන්ගේ සම්පූර්ණ විනාශයේදී දෙවියන්වහන්සේගේ සාධාරණය සහ කරුණාවත් සැමට දර්ශනය වන්නේය. දේව උදහසෙහි පලිගැනීමේ දවස කඩිනමින් පැමිණේ. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව උල්ලංඝනය කළ සහ උන්වහන්සේගේ සෙනඟට වධ හිංසා කළ සැවොම තම තමාගේ ක්‍රියා අනුව සාධාරණ වන්දි ගෙවීමක් (දඬුවමක්) ලැබීමට නියමිතය. දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත සෙනඟට කළ සෑම ආකාර කුරුරිකමක් උදෙසා ද සෑම අසාධාරණ ක්‍රියාවක් උදෙසාද වරදකරුවන් වන්නාවූ සැමට දඬුවම් පමුණුවනු ලබනවා ඇත. එකී සතුරු ක්‍රියාදාමයන් සලකනු ලබන්නේ ක්‍රිස්තුස්වහන්සේටම විරුද්ධව කළ කුරුරිකම් ලෙසය!

වත්මන් සභාවන්ගේ අවධානයට යොමු විය යුතු වඩා වැදගත් ප්‍රශ්නයක්ද ඇත. "ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත් වන්නට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය,"යි (2 තිමෝති 3:12) පාවුල්තුමා ප්‍රකාශ කර ඇත. එසේ නම් දේව දරුවන්ට හිංසා පීඩා කිරීම් ඇල්මැරුණු විලාශයක් දරන්නේ ඇයි? මෙයට දිය හැකි එකම හේතුව ලෙස දක්විය හැක්කේ වත්මන් සභාව ලෝකයේ ප්‍රමිති සහ ප්‍රතිපත්ති සමග අත්වැල් බැඳ සිටින බැවින් විරුද්ධවාදිකම් පැන නගින්නේ නැති බවය. ක්‍රිස්තුස්වහන්සේගේ සහ අපොස්තුළු-වරුන්ගේ දවස්වල තිබූ කිතුණු ඇදහිල්ල පිරිසිදු එකක් විය, ශුද්ධ එකක් විය. එහෙත් අද පවතින ක්‍රිස්තියානි ඇදහිල්ල තුළ එම ගුණාංග දක ගැනීමට හැකි වන්නේ ඉතාම අල්ප වශයෙන්ය. අද ඇත්තේ පාපය හා එකඟතාවයෙන් කටයුතු කිරීමකි. මෙම ප්‍රතිපත්තිය කරණකොටගෙන දේව වචනයේ අඩංගු වැදගත් සත්‍යතාවන් උදාසීන ලෙසින් සැලකීමට භාජන වී ඇත. සභාව තුළ ජීවමාන දේව භක්තියත්, දේව ගරුත්වයත් ඇත්තේ මඳ වශයෙන්ය. කිතු දහම අද ලෝකයෙහි ජනප්‍රියව ඇත. මුල් කාලීන සභාවෙහි තිබූ ඇදහිල්ල සහ බලය පිළිබඳව පිබිදීමක් සභාව තුළ වේවා; එවිට හිංසා පීඩාවේ ගිනි දැල් හිස ඔසවනවා ඇත. පීඩා කිරීමේ ගින්නද නැවත දල්වෙනවා ඇත.



# 3

# ධර්මයේ මාවතින් ඉවත්ව යාම

ඇදහිල්ලෙන් වැටීයාමේ ප්‍රතිඵලයක් වශයෙන් පාප් බල අධිකාරිය ඇතිවීම පිළිබඳව පාවුල් විසින් තෙසලෝනිකවරුනට යැවූ දෙවන ලිපියෙහි සඳහන් කර ඇත. ඒ මෙසේය: "ඇදහිල්ලෙන් වැටී යාමත්, විනාශයේ පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා එළිදරව් වීමත් පළමුවෙන් වුණොත් මිස ඒක නොපැමිණෙන්නේය. ඔහු, දෙවියන්වහන්සේ යයි කියනු ලබන්නාවූ නොහොත් නමස්කාර කරනු ලබන්නාවූ සියල්ලන්ට විරුද්ධව සිට, ඒ සියල්ලන්ට වඩා තමාම උසස් කරගෙන, දේව මාළිගාවෙහි වාඩි වී හිඳ, තමා දෙවිව සිටින්නේ යැයි පෙන්වන්නේය." තවද, ඔහු තම සහෝදරයන්ට අනතුරු ඇඟවීමක්ද කරමින්: "නොපනත්කමේ අභිරහස දැනටම ක්‍රියා කරන්නේය" යි පවසා තිබේ. (2 තෙසලෝනික 2:3,4,7) එවැනි මුල් දවස්වලදී පවා සභාව තුළට වැරදි ඉගැන්වීම් ක්‍රම ක්‍රමයෙන් ඇතුළු වී පාප් බල අධිකාරියෙහි වර්ධනයට පසුබිම සකස් වන බව ඔහු දුටුවේය.

මුලදී රහසිගතවද, කූට අයුරින්ද සුළු වශයෙන්ද ආරම්භ වූ මෙම ව්‍යාජ දහම් සභාවට ඇතුල්වී පසුව එම ක්‍රියාදාමය ශක්තිමත් වී එළිපිටම මිනිස් මනස් පාලනය කිරීමට සමත් විය. මෙම "නො-පනත්කමේ අභිරහස" තම මුළාකිරීම් සහ දේව අපහාසාත්මක ක්‍රියාකිරීම් ඉදිරියටම කරගෙන ගියේය. කිතුණු බැතිමතුන්ට තේරුම් ගත නොහැකි අයුරින් මිථ්‍යාදෘෂ්ටික වත්පිළිවෙත් සහ පූජා ක්‍රම ක්‍රිස්තියානි සභාව තුළට ඇතුල් විය. සභාව මිථ්‍යාදෘෂ්ඨිකයන්ගෙන් පැමිණි දරුණු පීඩා දරාගත් අතර වෙනත් ඇදහිලි ක්‍රම පිළිගැනීම කලකට නොපැවතුණි. පීඩා සමය නිමවීමත් සමගම කිතුදහම රජවරුන්ගේ මාළිගාවලට සහ විනිශ්චය ශාලාවලටද ඇතුල් විය. එවිට සභාව ක්‍රිස්තුස්වහන්සේ තුළ සහ අපෝස්තුළුවරුන් තුළ පැවති සරල නිහතමානී භාවය අත්හැර දමා මිථ්‍යාදෘෂ්ඨික රජවරුන්ගේ සහ පූජකයන්ගේ උදාරම් අලංකාරයෙන් සැරසුණේය. දෙවියන්වහන්සේ විසින් නිර්දේශ කළ නියෝගයන් වෙනුවට මිනිස් සංකල්පයන් සහ සම්ප්‍රදායන් සභාව ඇදා ගත්තේය. සතර වැනි ශත වර්ෂයේ මුල් භාගයේදී කොන්ස්තන්තීනු රජතුමා නාමිකව ක්‍රිස්තියානි ආගම වැළැඳ ගැනීම බොහෝ දෙනෙකුගේ ප්‍රීතියට හේතුවක් විය. එක්තරා ධර්මිෂ්ඨකමේ වස්ත්‍රයකින් සැරසී ගත් ලෝකය සභාව අභ්‍යන්තරයටම පැමිණියේය. සභාව තුළ දූෂණය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන්නට විය. මිථ්‍යාදෘෂ්ඨිය පරාජයට පත් වූ විලාශයන් පෙන්නුම් කළද, මිථ්‍යාදෘෂ්ඨික දේවතා ඇදහිලි ක්‍රම ජයග්‍රහණය කළේය. මිථ්‍යාදෘෂ්ඨික ආත්මය සභාව

පාලනය කළේය. ඇයගේ ධර්මතාවන්, පූජා ක්‍රම, මංගල්‍යයන් සහ මිථ්‍යා ඇදහිලි ක්‍රම ක්‍රිස්තියානි ඇදහිල්ලට සහ ක්‍රිස්තුස්වහන්සේගේ විශේෂිත වූ අනු ගාමිකයන්ගේ නමස්කාරය තුළට ඒකාබද්ධ කරනු ලැබීය.

කිතු දහම සහ මිථ්‍යාදෘෂ්ඨික දහම් පිළිවෙත් අතර සිදු වූ ඒකාබද්ධතාව කරණකොටගෙන "පාපයේ මනුෂ්‍යයා" වැඩෙන්නට විය. මොහු පිළිබඳව අනාවැකි පළවී තිබුණේය. ඔහු දෙවියන්වහන්සේට විරුද්ධව නැගී සිටිමින් උන්වහන්සේට වඩා ඉහළින් තමාම උසස් කරගැනීමේ එම ආගමික ඇදහිලි ක්‍රමය වූකලී සාතන්ගේ බලයේ අග්‍ර ශ්‍රේෂ්ඨ නිර්මාණයක් විය. ස්වකීය කැමැත්ත අනුව ලෝක පාලන අධිකාරිය සියතට ගෙන, සිංහාසනාරූඪ වීමේ ප්‍රයත්නයේ ස්මාරකයක් ලෙස මෙම නමස්කාර ක්‍රමය ආරම්භ විය.

ක්‍රිස්තුස්වහන්සේ සමග සම්මුතියක් ඇති කරගැනීමට සාතන් වරක් වෑයම් කළේය. ඒ වනාන්තරයේදී ඔහු මනුෂ්‍ය පුත්‍රයාණන් පරික්ෂා කරන පිණිස උන්වහන්සේ වෙතට පැමිණියේය. මෙලොව රාජධානි සහ ඒවායේ තේජශ්‍රීය උන්වහන්සේ ඉදිරියෙහි පෙන්නුම් කරමින් අඳුරේ කුමාරයාගේ ආධිපත්‍යය පිළිගන්නේ නම් එකී රාජධානි සියල්ලම ක්‍රිස්තුස්වහන්සේගේ භාරයට පත්කරන බවට ඔහු පොරොන්දු විය. තමාව පරික්ෂා කිරීමට පැමිණි තැනැත්තාට තරවටු කළ ක්‍රිස්තුස්වහන්සේ ඔහුව පළවා හැර දැමූ සේක. එහෙත්, මෙම පරික්ෂාව මිනිසුන්ට ඉදිරිපත් කිරීමේදී ඔහු විශාල ජයග්‍රහණයක් අත්කර ගන්නේය. ලෞකික සම්පත්, තාන්න මාන්න, ගරු සත්කාර ලැබීමට සභා තොමෝ පොළොවේ බලවතුන්ගේ අනුග්‍රහය සහ උපකාර සෙවීමට මගපෙන්වනු ලැබුවාය. මෙසේ සභාව ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කරමින් සාතන්ගේ නියෝජිතයා වන රෝමයේ (බිෂොප්) පූජා ප්‍රසාදිතුමාට පක්ෂපාතකම් දැක්වීමට පොළඹවනු ලැබුවාය.

පාප් වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වීය සභාවෙහි දෘෂ්‍යමාන නායකයාය යන්න රෝම සභාවේ මූලික ධර්මතාවයකි, ප්‍රධාන පිළිගැනීමකි. ලෝ පුරා දේව සේවය කරන්නාවූ දේවගැතිවරුන් සහ අගරදගුරුන් කෙරෙහි ප්‍රධානත්වය සහ ආධිපත්‍යය පාප්වරයාට භාර දී ඇතැයි රෝමානු බැතිමත්හු විශ්වාස කරති. එපමණක්ද නොවේ, පාප්වරයාට දිව්‍යත්වයේ තනතුරු නාමද ලබා දී තිබේ. ඔහුව හැඳින්වීමට "ස්වාමිවූ දෙවියන්වහන්සේ අති උතුම් පාප් වහන්සේ" යන නාමය භාවිතා කෙරේ. ඔහුට වරදින්නේ නැති බවද ඔහු වරදක් කරන්නේ නැතැයිද ප්‍රකාශ කර තිබේ. ඔහු සියලු මිනිසුන්ගේ නමස්කාර පූර්ව ගෞරවය තමාට දීමට ඔවුන්ට බල කරයි. පාළුකරයේදී සාතන් ඉදිරිපත් කළ අයිතිවාසිකම් ද ඉල්ලීම් ද ඔහු අද රෝම සභාව



කරණකොටගෙන බැතිමතුන්ට ඉදිරිපත් කරයි. ඔහුට නමස්කාරය පුද කිරීමට මහත් ජන සමූහයක් සූදානමින් සිටිති.

කපටි රැවටිලිකාර සතුරාගේ යෝජනාව වූකලී සගයට එල්ල වූ තර්ජනයකි. තමාට පොළොවේ ආධිපත්‍යය ඇතැයි පවසමින් නමස්කාරය ඉල්ලා සිටීම දේව අපරාධයකි. එහෙත්, දෙවියන්වහන්සේට භයව උන්වහන්සේට නමස්කාර කරන්නාවූ අය ක්‍රිස්තුස්වහන්සේ සතුරාට මුහුණ දුන් ආකාරයටම ස්වර්ගය අභියෝගයට ලක්කරන මෙම ප්‍රකාශනයට මුහුණ දෙන්නේය. මෙවන් අවස්ථාවන්හිදී "නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට නමස්කාර කරව, උන්වහන්සේට පමණක් සේවය කරව" (ලූක් 4:8) යනුවෙන් ඔව්හු තම ඇදහිල්ල ප්‍රකාශ කරති. සභාවෙහි නායක අධිපති තනතුර දැරීමට කිසිම මිනිසෙකු පත්කරන බවට දෙවියන්වහන්සේගේ වචනයේ දක්වා නැත. පාප් බල අධිකාරියෙහි නායකත්වය සහ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ඉගැන්වීම ශුද්ධ ලියවිල්ලෙහි ඉගැන්වීම්වලට එක එල්ලේම විරුද්ධය. අයථා ලෙස පැහැර ගැනීමෙන් විනා අන්කිසි අන්දමකින් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව කෙරෙහි නායකත්ව බලයක් දැරීමට පාප්තුමාට කිසි අයිතියක් නැත.

බයිබලීය ඉගැන්වීම්වලට විරුද්ධව දුර්ලබ්ධි දහම් අදහනවා යයිද, සත්‍ය සභාවෙන් ඕනෑකමින්ම වෙන් වූවා යයිද කියා රෝමානු සභාව ප්‍රොතැස්තන්ත බැතිමතුන්ට චෝදනා කරයි. එහෙත් මෙම චෝදනා අදාළ වන්නේ ඔවුන්ටමය. "ශුද්ධවන්තයන්ට භාර දුන් ඇදහිල්ල" (යූදස් 3) අත්හැර දමා එයින් බැහැරව ගොස් ක්‍රිස්තුස්-වහන්සේගේ ධජය බිම හෙළා ඇත්තේ ඔවුන්මය.

තමන් ගෙන එන්නාවූ මුළාවන් වටහාගෙන, එම බලයන්ට විරුද්ධ වීමට මිනිසුන්ට ශුද්ධ ලියවිලිවලින් සහාය ලැබෙන බව සාතන් හොඳාකාරව දන සිටියි. ලෝකයේ ගැළවුම්කරුවාණන් පවා සාතන්ගේ ප්‍රහාරයනට විරුද්ධව නැගී සිටියේ දේව වාක්‍යයේ උපකාරයෙන්ය. "මෙසේ ලියා තිබේය"යි කියමින් ක්‍රිස්තුස්වහන්සේ සදාකාලික සත්‍යතාවේ පළිහ සාතන්ගේ සෑම ප්‍රහාරයකදීම ඉදිරියට දැමූසේක. විරුද්ධවාදියාගේ සෑම යෝජනාවකදීම උන්වහන්සේ එයට විරුද්ධතාව පෙන්නුම් කළේ දේව වාක්‍යයේ ප්‍රඥාව සහ බලය යොදා ගැනීමෙන්ය. මිනිසා කෙරෙහි තම අධිකාරි බලය පවත්වා ගැනීමට මෙන්ම අයථා ආකාරයෙන් බලය උදුරාගත් පාප් බල අධිකාරිය ස්ථාපිත කිරීමටද සාතන් මනුෂ්‍යයාව දේව වචනය හැදෑරීමෙන් වැලැක්විය යුතුය. බයිබලය විසින් දෙවියන්වහන්සේව උසස් කර, සීමා සහිත මිනිස් වර්ගයාට හිමි නියමිත ස්ථානය පෙන්වා දෙයි. එම නිසා ඔහු එහි අන්තර්ගත වන පාරිශුද්ධ වූ සත්‍යතාවන් සඟවා තබා ඒවා යටපත්කර තැබීම අවශ්‍ය විය. මෙම තර්කය රෝමානු සභාව විසින් පිළිගනු ලැබීය.

වසර සිය ගණනාවක් පුරා බයිබලය බෙදා හැරීම තහනමට ලක්විය. බැතිමතුන් විසින් බයිබලය කියවීම මෙන්ම එය ස්වකීය නිවෙස්වල තබාගැනීමද තහනම් විය. ඒ අතරම, ප්‍රතිපත්ති ගරුකිරීමක් නැති පූජකයන් සහ නායක පූජකවරුන් විසින් තමන්ගේ ව්‍යාජ ඉගැන්වීම් තහවුරු වන පරිදි බයිබලයේ ඉගැන්වීම්වලට සාවද්‍ය අර්ථකථන පවා ලබා දෙනු ලැබීය. සභාව සහ රජය කෙරෙහි ආධිපත්‍යය පාප්වරයාට පවරා දී ඇතැයි යන්න සභාවෙහි ඉගැන්වීම විය. මෙයාකාරයෙන් පාප් තුමා මුළු පොළොවේම, දෙවියන්වහන්සේ වෙනුවෙන් පෙනී සිටින තැනැත්තා බව ලෝවැසි බහුතරයක් පිළිගත්හ.

වරද හෙළිදරව් කරන මාර්ගය ඉවත් කර දැමීමෙන් පසුව සාතන් තම කැමැත්තට අනුව ක්‍රියා කළේය. පාප් අධිකාරී බලය විසින් "කාලවල්ද ව්‍යවස්ථාවද වෙනස් කරන්ට සිතන්නේ" යයි (දානියෙල් 7:25) අනාවැකි ප්‍රකාශ කර තිබුණේය. මෙම අනාවැකි කල්පිතය ඉක්මණින් ක්‍රියාත්මක විය. නමස්කාරය සඳහා රූප සහ පිළිම භාවිතා කළ මිථ්‍යාදෘෂ්ඨික බැතිමතුන් නාමික කිතුණු ඇදහිලිවන්තයන් බවට පත්වීමේදී ඔවුන්ගේ නැමදීම සඳහා සුරුවම්වලට සහ රූපවලට ගෞරවය දක්වීම ක්‍රම ක්‍රමයෙන් ක්‍රිස්තියානි නමස්කාරයට හඳුන්වා දෙනු ලැබීය. නයිසී යන ස්ථානයේ පැවති පූජක විධායක සම්මේලනයකදී කරන ලද නියෝගයකින් මෙම රූපවලට සහ සුරුවම්වලට වැඳීම සභාව තුළ තීරණාත්මක ලෙස ස්ථාපිත කරන ලදී. ආගම් කෙලසීමෙහි ක්‍රියාවේදය සම්පූර්ණ කිරීම සඳහා රූප වැඳීම තහනම් කරන දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි දෙවෙනි ආඥාව ඉවත් කර දැමීමට රෝමය සිතා ගත්තේය. ව්‍යවස්ථාවෙහි ආඥා දසය සම්පූර්ණ කිරීම පිණිස දසවෙනි ආඥාව ආඥා දෙකක් වශයෙන් බෙදා වෙන් කිරීමට තීරණය විය.

මිථ්‍යාදෘෂ්ඨික ආගමට මෙසේ ලැබුණ ඉඩකඩ නිසා ස්වර්ගයෙහි බල අධිකාරිත්වයට විරුද්ධව තවදුරටත් ක්‍රියා කිරීමේ මාර්ගයක් විවෘත විය. සභාවෙහි නායකත්වය දරූ කැපවීමක් නැති පුද්ගලයන් තුළින් ක්‍රියාත්මක වූ සාතන් සතරවෙනි ආඥාව කෙලසීමටද අත තැබීය. දෙවියන්වහන්සේ විසින් ආශිර්වාද කර විශුද්ධ කළ පෞරාණික සබත් දවස (උත්පත්ති 2:2,3) ඉවත් කිරීමටද ඔහු මෙසේ වෑයමක් දැරුවේය. බැතිමතුන්ගේ උත්සව දවසක් වූ මහත් භක්ති ආදරයට පත් හිරුගේ දවස උසස් කරන ලදී. මෙම වෙනස් කිරීම මුලදී එළිපිටම නොකරන ලදී. පළමු සියවස්වලදී සියලුම කිතුණු බැතිමතුන් සැබෑ සබත රක්ෂා කළෝය. දෙවියන්වහන්සේගේ ගෞරවය ගැන මහත් භක්තියක් සහ ලැදියාවක් දක් වූ ඔවුහු උන්වහන්සේගේ ව්‍යවස්ථාව වෙනස් කළ නොහැකි බව විශ්වාස කරමින් ජ්වලිතයෙන් යුතුව එම ආඥාවන්හි ශුද්ධභාවය ආරක්ෂා කළෝය. එහෙත්, තමන්ගේ කැමැත්ත



ඉටු කරගැනීමට සාතන් තම නියෝජිතයන් තුළින් ඉතා කපටි ලෙස ක්‍රියාත්මක විය. බැතිමතුන්ගේ අවධානය ඉරිදා දවසට යොමුකර ගැනීම සඳහා එම දවස "ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම" සැමරීමේ මංගල්‍යය දවස ලෙස නම් කරන ලදී. එම දවසෙහිදී ආගමික නමස්කාර මෙහෙයන් පැවත්විණ. එහෙත් එම දවස විනෝදය සඳහා වෙන් වූ දවසක් ලෙස සලකන ලදී. ඒ අතරම සැබෑ සබතද ශුද්ධ කොට පැවැත්විණ.

තමා සැලසුම් කළ කර්තව්‍යය ඉටුකර ගැනීමට මාර්ගය සූදානම් කරගැනීම සඳහා සාතන් යුදෙව්වන් තුළින් එම කටයුත්ත ආරම්භ කළේය. ක්‍රිස්තුස්වහන්සේ මෙලොව පැමිණීමටත් පෙර යුදෙව් නායකයන් තුළින් ක්‍රියාත්මක වූ සාතන් ඔවුන් ලවා සබත් දවස සඳහා දැඩි නීති රීති පනවමින් එය පැවැත්වීම උග්‍රවූ ද, බරපතලවූ ද බරක් බවට පත් කළේය. සබත බරක් ලෙස සැලකීමට යොමු කිරීමෙන් වැරදි ආලෝකයක් ලබාදෙමින් අත් කරගත් වාසියක තත්ත්වයෙන් ප්‍රයෝජනය ගත් සාතන් සබත වනාහි යුදෙව් චාරිත්‍රයකැයි අපහාසයට ලක්කළේය. ඉරිදා දවස විනෝදාස්වාදයේ දවසක් ලෙස කිතුණුවන් විසින් තවදුරටත් පවත්වා ගෙන යනු ලැබීය. යුදෙව් ජනතාව කෙරෙහි වූ වෛරය පෙන්වීම සඳහා සබත නිරාහාරව සිටීමේ දවසක් ලෙස, දුකෙහි සහ දොම්නසෙහි දිනයක් ලෙස සැලකීමට සාතන් ඔවුන්ට මගපෙන්නුවේය.

සිව් වැනි ශත වසරේ මුල් භාගයේදී කොන්ස්තන්තීනු අධිරාජයා ඉරිදා දිනය ප්‍රසිද්ධ මංගල්‍ය දිනයක් කොට අණපණවක් නිකුත් කළේය. එය මුළු රෝම අධිරාජ්‍යය පුරා බල පැවැත්විණ. රෝම ජාතික මිථ්‍යාදෘෂ්ඨික රටවැසියෝ හිරුගේ දවස ආගමික පූජා පැවැත්වීමේ දවසක් ලෙස එයට ගරු කළෝය. එම දවස කිතුණුවන්ගේද ගෞරවයට පාත්‍ර වූ දිනයක් විය. මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රම සහ කිතුදහම අතර තිබූ විරෝධතාවන් ගැන සම්මුතියක් ඇතිකිරීම අධිරාජ්‍යයාගේ ප්‍රතිපත්තිය විය. මෙසේ කරන්නැයි සභාවේ නායකයන් අධිරාජයාට පෙරැත්ත කළෝය. මෙවන් ඉල්ලීමක් තුළ ඔවුන්ගේ (බිෂොප්වරු) යටි අදහස වුණේ බලයට වූ කෑදරකමත් බල ලෝභීකමත්ය. කිතුණුවන් සමග මිථ්‍යාදෘෂ්ඨිකයන් එකම දවසක් නමස්කාරය වෙනුවෙන් කැප කරන්නේ නම්, මිථ්‍යාදෘෂ්ඨිකයන් විසින් නාමික වශයෙන් හෝ කිතුදහම වැළඳ ගෙන එය කරණකොටගෙන සභාවේ බලය සහ මහිමය වර්ධනය වනවා ඇතැයි සභා බලධරයෝ විශ්වාස කළෝය. දේව භය ඇති බොහෝ කිතුණුවන් ඉරිදා දවස තුළ යම්කිසි ශුද්ධතාවක් ඇති බවට ක්‍රම ක්‍රමයෙන් සිතීමට පුරුදු වූහ. එසේ වුවද ඔවුන් සැබෑ සබත ස්වාමීන්වහන්සේගේ ශුද්ධවූ දවස ලෙස සලකමින් එය පැවැත්වූහ. සතරවැනි ආඥාවට අනුකූලව ඔවුහු එයට කීකරු වෙමින් සබත ශුද්ධ කොට පැවැත්වූහ.

මුළා කිරීමේ මහා රැවටිලිකාරයා තම වැඩ කොටස හමාර කර තිබුණේ නැත. සියලු ක්‍රිස්තියානි බැතිමතුන් තමාගේ ධජය යටතට ගෙන තමා ක්‍රිස්තුස්වහන්සේගේ නියෝජිතයා යයි අයිතිවාසිකම් ඉදිරිපත් කළ අහංකාර පාප්වරයා තුළින්, තම බලය ක්‍රියාවට නැංවීමට ඔහු තීරණය කරගෙන සිටියේය. අර්ධ ලෙසින් කිතු දහමට හැරුණා වූ මිථ්‍යාදෘෂ්ටිකයන් තුළින්ද, බල ලෝභී ආගමික දේව සේවකයන් තුළින්ද ලෞකික සැප සම්පත් ලොල් කළ සහා සාමාජිකයන් තුළින්ද ඔහු තම අභිමතාර්ථය ඉටු කරගත්තේය. සමස්ථ ලෝකයෙන්ම පැමිණි ආගමික නායකයන්ගෙන් සැදුම්ලත් මහා පරිමාණයේ සම්මන්ත්‍රණ විටින් විට පවත්වනු ලැබීය. මෙම සෑම සමුළුවකදීම දෙවියන්වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබූ සබත ක්‍රම ක්‍රමයෙන් පහත් තලයකට පමුණුවනු ලැබූ අතර එයට සමාන්තරව ඉරිදා ඉහළ තලයකට ඔසවා තබන ලදී. මෙලෙස අන්තිමේදී මිථ්‍යාදෘෂ්ටික මංගල්‍යය දිව්‍ය නියමයක් ලෙස ගෞරවයට භාජන විය. ඒ අතර, බයිබලීය සබත යුදෙව් කෞතුක වස්තුවක් ලෙස සලකන ලදී. එය රක්ෂා කරන්නෝ ශාප ලද්දෝ යයි ප්‍රකාශයට පත් විය.

"දෙවියන්වහන්සේ යයි කියනු ලබන්නාවූ නොහොත් නමස්කාර කරනු ලබන්නාවූ" (2 තෙසලෝනික 2:4) සියල්ලන්ට වඩා තමාම උසස් කරගැනීමට වූ වෑයමෙහිදී සාතන් ජය ගත්තේය. සත්‍යයවූද, ජීවමානවූද දෙවියන්වහන්සේ වෙතට සකල මිනිස් වර්ගයාම නිවැරැදිව යොමු කරන්නාවූ දිව්‍ය ව්‍යවස්ථාවේ එකම ආඥාව වෙනස් කිරීමට තරම් ඔහු එඩිතර විය. අහස සහ පොළොව මැවූ මැවුම්කාරයාණන් ලෙස දෙවියන්වහන්සේව හතරවෙනි ආඥාවෙහි එළිදරව් කර ඇති අතර මේ නිසාම අනෙකුත් සෑම බොරු දෙවි-වරුන්ගෙන් උන්වහන්සේව වෙන් කොට දක්වනු ලැබේ. මැවීමේ කර්තව්‍යයෙහි ස්මාරකයක් ලෙස හත්වෙනි දින විශුද්ධ කර නිවාඩු දවසක් ලෙස මිනිසාට පවරා දී තිබේ. ගෞරවය සහ නමස්කාරය හිමි තැනැන්වහන්සේ හැටියටද මනුෂ්‍ය පැවැත්මේ උල්පත හැටියටද මිනිස් මනස් ඉදිරියේ ජීවමාන දෙවියන්වහන්සේව නිතර ඔසවා තැබීම පිණිස සබත නිර්මාණය විය. දෙවියන්වහන්සේට පක්ෂපාතිත්වය පුද කිරීමෙන් සහ උන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු වීමෙන් මිනිසාව ඉවතට හැරවීමට සාතන් ඉමහත් ප්‍රයත්නයක යෙදී සිටී. එමනිසා දෙවියන්වහන්සේව මැවුම්කාරයාණන් යයි පෙන්නුම් කරන්නාවූ ආඥාවට විරුද්ධව තම ප්‍රහාරක කටයුතු එල්ල කිරීමට සාතන් විශේෂ අවධානයකින් ක්‍රියා කරයි.

ක්‍රිස්තුස්වහන්සේ ඉරිදා මළවුන්ගෙන් නැගිටි බැවින් ඒ දවස ක්‍රිස්තියානි සබත බවට පත්වන්නේ යැයි ප්‍රොතැස්තන්තවරු අවධාරණය කරති. එහෙත් ඒ සඳහා ශුද්ධ ලියවිලි සාක්ෂි නොමැත. එම දවස සඳහා ක්‍රිස්තුස්වහන්සේ විසින් හෝ උන්වහන්සේගේ අපෝස්තුළුවරුන්



විසින් හෝ කිසිම ගෞරවයක් ලබා දී නැත. ක්‍රිස්තියානි ආයතනයක් ලෙස ඉරිදා දවස ශුද්ධ කර පැවැත්වීමෙහි ආරම්භය "නොපනත්කමෙහි අභිරහස" (2 තෙසලෝනික 2:7) තුළ සම්මත වූ එකකි. පාවුල්තුමාගේ දවස්වලදී පවා එහි ක්‍රියාකාරිත්වය ආරම්භ වී තිබුණේය. පාප් බල අධිකාරියේ මේ දරුවා ස්වාමීන්වහන්සේ දරුකමට හදා වඩා ගැනීම සිදුකළේ කොහේදී ද? කවදාද? ශුද්ධ ලියවිලි අනුමත නොකරන්නාවූ වෙනස් කිරීමක් සඳහා කුමන වැදගත් හේතු සාධක ඉදිරිපත් කළ හැකිවේද?

සය වැනි ශත වර්ෂය වන විට පාප් බල අධිකාරිය ඉතා ශක්තිමත් ලෙස ස්ථාපිත වී තිබුණේ ය. එහි බල කේන්ද්‍රයවූ රාජකීය අගනුවර පිහිටුවා තිබුණේ රෝමයේ විය; එහි සිටියාවූ බිෂොප්වරයා සකල කිතුණු සභාවේ නායකයා ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. පාප් බලය මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රමවල ස්ථානය ගත්තේය. "මහා සර්පයා තමාගේ පරාක්‍රමයත්, තමාගේ සිංහාසනයත් මහත් බලයත්" මෘගයාට ලබා දුන්නේය. (එළිදරව් 13:2) දානියෙල් සහ එළිදරව් පොත්වල පල කර තිබූ පාප් බල අධිකාරියේ බල පැවැත්වීමේ වසර 1260 ක කාලය මෙවිට ආරම්භ විය. (දානියෙල් 7:25, එළිදරව් 13: 5-7.) සැබෑ කිතුණුවන්ට තම ආගමික පක්ෂපාතීත්වය පිළිබඳව වූ තීරණාත්මක මොහොතක් උදා විය. පාප් ඉදිරිපත් කළ ආගමානුකූල මංගල්‍යයන් සහ නමස්කාරය පිළිගනිමින් තම ආත්මාභිමානය පාවා දෙනවාද නැතහොත් තමන්ගේ ජීවිත අඳුරු බිම් ගෙවල ක්ෂය වී යෑම, වධකාගාරවල හිංසනයට ගොදුරුවීම, කෝටුමස් කරනු ලැබීමට භාජන වීම, වධකයාගේ පොරෝ පහරට ගෙල දීම යනාදිය තෝරා ගන්නවාද කියා තීරණය කිරීමට ඔවුන්ට සිදුවිය.

මේ පිළිබඳව යේසුස්වහන්සේ පැවසූ මේ වචන දන් සම්පූර්ණ විය. "එහෙත් මවු පිය සහෝදර නෑ මිත්‍රයන් විසින්ම නුඹලා භාරදෙනු ලබන්නහුය; ඔවුහු නුඹලාගෙන් සමහරෙකු මරණයට පත් කරවන්නෝය. මාගේ නාමය නිසා සියල්ලෝම නුඹලාට වෛර වන්නෝය." (ලූක් 21:16,17) මීටපෙර කිසිම අවස්ථාවක නොවූ විරූ වධහිංසා විශ්වාසවන්ත බැතිමතුන්ට එරෙහිව ආරම්භ විය. මුළු ලෝකයම යුද්ධ පිටියක් බවට පත් විය. සිය වස් ගණනාවක් පුරා ක්‍රිස්තුස්-වහන්සේගේ සභාව අප්‍රසිද්ධියේද, හුදෙකලාවද රැකවරණය වූවාය. අනාගතවක්තෘවරයා මෙසේ පවසයි: "ස්ත්‍රීද කාන්තාරයට පලා ගියාය. එක් දහස් දෙසිය සැට දවසක් ඈ පෝෂණය කරන පිණිස දෙවියන්-වහන්සේ විසින් පිළියෙල කරන ලද ස්ථානයක් ඈට එහි තිබුණේය." (එළිදරව් 12:6)

රෝම සභාව බලයෙන් පූර්ණ වීමත් සමඟ අඳුරු යුගය ආරම්භ විය. ඇයගේ බලය වැඩිවත්ම අන්ධකාරයද වර්ධනය විය. සත්‍ය

අත්තිවාරම වන ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල රෝමයේ පාප්වරයා වෙතට මාරු කරනු ලැබීය. පව් කමාව හා සදාකාලික ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි විශ්වාස කරනවා වෙනුවට ජනතාව පාප්වරයා සහ ඔහු විසින් බලය පවරා දුන් පූජකයන් සහ ප්‍රසාදිවරුන් වෙතට යොමු විය. මිනිස් සත වෙනුවෙන් මෙලොව සිටින්නාවූ මැදහත්කාරයා පාප්වරයා බවත් එතුමා තුළින් මිස කිසිම අයෙකුට දෙවියන්වහන්සේ වෙතට ළඟාවීමට නොහැකි බවත් මිනිසුන්ට උගන්වනු ලැබීය. ඔහු මිනිසුන් ඉදිරියේ දෙවියන්වහන්සේ උදෙසා පෙනී සිටින බවත්, එම නිසා ඔහුට අචල කීකරුකම ලබා දිය යුතු බවත් පවසන ලදී. යමෙක් ඔහුගේ නියමයන්ගෙන් වෙනතකට යොමු වූයේ නම් ඒ වරදකරුවන්ගේ සිරුරට සහ ආත්මයට දැඩි දඬුවම් ලැබීමට එය ප්‍රමාණවත් හේතුවක් වනවා ඇත. මෙයාකාරයෙන් මිනිසුන්ගේ මනස් දෙවියන්වහන්සේගෙන් ඉවතට හරවා ඒවා පව්කාර, වරද කරන සුළු, කුරිරු මිනිසුන් වෙත හා මෙම මිනිසුන් තුළින් ක්‍රියාත්මක වූ අඳුරෙහි කුමාරයා වෙතට යොමු කරවන ලදී. පාපය ශුද්ධ වූ වස්ත්‍රයකින් ආවරණය කරනු ලැබීය. ශුද්ධලියවිලි යටපත් කර දමා තමා ශ්‍රේෂ්ඨ යැයි මිනිසා සිතීමට පටන්ගත් කල එතැන පවතින්නේ වංචාව, මුළාව සහ නීච අධමකම පමණකි. මිනිස් ආඥාවන්ට හා සම්ප්‍රදායන්ට මුල්තැන දීමෙන් ක්‍රියා කළ විට ප්‍රකාශ වූයේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඉවත දමා ක්‍රියාකරන සැමවිටම ඇතිවිය හැක්කේ කෙබඳු දූෂිත තත්ත්වයක්ද යන්නය.

එම දවස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට උපද්‍රව සහිත කාලයක් විය. ඇත්තෙන්ම විශ්වාසවන්තව සිටි අය ස්වල්ප දෙනෙක් පමණක් වූහ. සත්‍යය උදෙසා සාක්ෂි දරන්නාවූ අය සිටියා වුවද, සමහර අවස්ථාවලදී, වරද සහ මිථ්‍යා ඇදහිලි සම්පූර්ණයෙන් බලපවත්වන්ට යන බවත්, සත්‍ය ආගම පොළොවෙන් සදහටම තුරන් කර දමනු ලැබිය හැකි බවත් පෙනී ගියේය. ශුභාරංචිය නොතකා හැර තිබුණි. එහෙත්, ආගමික චාරිත්‍ර වාරිත්‍ර බහුලව පැවතියේය. ඒ අතර බැතිමතුන් මත දරාගත නොහැකි උග්‍ර වූ නියමයන් පටවන ලදී.

තමන්ගේ මැදිහත්කාරයා ලෙස පාප්වරයා කෙරෙහි බලා සිටින්නැයි ඔවුන්ට ඉගැන්වීමට පමණක් නොව, තමන්ගේ පාප සඳහා සමගි කිරීමක් සලසා දීමට තමන්ගේ පුණ්‍ය ක්‍රියාවන් කෙරෙහි විශ්වාසය තබන ලෙසද ජනතාව දැනුවත් කරනු ලැබීය. ඒවා නම් දිගු කාලීන වන්දනා ගමන් බිමන්, පාප නිසා තමන්ට දඬුවම් කරගැනීම්, පූජ්‍ය ධාතු නමස්කාරය, දෙව් මැදුරු, පූජනීය ස්ථාන සහ අල්තාර ඉදිකිරීම, සභාවට විශාල මුදලක් ගෙවීම යනාදියයි. මෙබඳු තවත් බොහෝ සාමාන්‍ය ක්‍රියාවන් මගින් දෙවියන්වහන්සේගේ උදහස තුනී කර උන්වහන්සේගේ අනුග්‍රහය ලබාගැනීමට හැකියාවක් උදාකර ගත



හැකි බව උගන්වන ලදී. දෙවියන්වහන්සේ සුළු දෙයක් ගැන කෝපයට පත්වන මනුෂ්‍යයන් හා සමාන බවද, තෑගි භෝග දීමෙන්, තමන්ටම දඬුවම් කරගැනීමෙන් හෝ දුෂ්කර ක්‍රියා කිරීමෙන් දේව උදහස පහ කර ගත හැකි බවක්ද මෙසේ දක්වනු ලැබීය.

රෝමානු සභාවේ නායකයන් අතර පවා නපුර පැවති නමුත් සභාවේ බලපැවැත්මේ නිත්‍ය වර්ධනයක් පවතින බව පෙනුණි. අටවැනි සියවසේ අවසන් කාලයේදී පාප් බලධාරීන් තමන් සතු බලය ගැන නව අදහසක් ඉදිරිපත් කළෝය. දැන් තමන් සතුව ඇති ආත්මික බලය ක්‍රිස්තියානි යුගයේ මුල් කාලවලදී රෝමයේ රදගුරු ප්‍රසාදීන් භුක්ති විඳි ආත්මීක බලයම බවට ඔවුහු අයිතිවාසිකම් ඉදිරිපත් කළහ. මෙම අයිතිය සහතික කිරීම සඳහා එයට අධිකාරී බලයක් ඇතැයි පෙන්නුම් කිරීමට යම් කිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු විය. බොරුවේ පියා මෙම ක්‍රමවේදය පිළිබඳව කඩිනම් යෝජනාවලියක් ලබා දුන්නේය. ආගමික පූජකවරු පැරණි දිනවල යෙදූ ව්‍යාජ ලේඛණ ඉදිරිපත් කළෝය. පෙර කිසිම දවසක අසන්නට නොලැබූ සම්මන්ත්‍රණ වාර්තා සොයාගත් බව නිවේදනය විය. මුල් කාලයේ පටන්ම පාප්වරයා හට විශ්වීය ආධිපත්‍යයක්, ශ්‍රේෂ්ඨත්වයක් තිබූ බව මෙම ව්‍යාජ ලේඛණ මගින් සනාථ විය. සත්‍යය එපා කළ සභාව මෙම වංචාකාරී වැඩ පිළිවෙල මහත් ආශාවෙන් පිළිගත්තාය.

සත්‍යවූ අත්තිවාරම (1 කොරින්ති 3:10,11) මත ගොඩ නැගෙමින් සිටි විශ්වාසවන්ත සුළු පිරිස සත්‍යය ඝාතනය කරමින් ව්‍යාප්ත වන්නාවූ බොරු ධර්මතාවන් නිසා තමන්ගේ වැඩ කටයුතුවලට බාධා පැමිණීමෙන් අවුල් සහගත තත්ත්වයකට පත් වූහ. නෙහෙමියාගේ දවස්වලදී යෙරුසලමෙහි පවුරු ගොඩ නගමින් සිටි අය මෙන්ම වත්මනදී අවුලට පත්ව සිටි අයද, මෙසේ පවසන්නට සූදානමින් සිටියහ: "බර ගෙන යන්නන්ගේ ශක්තිය හීන වී තිබේ; පස් ගොඩ ගැසී තිබේ. එබැවින් අපට පවුර ගොඩ නගන්නට බැරිය." (නෙහෙමියා 4:10) ශුභාරංචිය පතුරුවා හැරීමේ කාර්යයෙහි යෙදී සිටි අයගේ සේවා ව්‍යාප්තියට අකුල් හෙළීමට සාතන් විවිධ අවහිරකම් ඇති කළේය. වධ වේදනා, හිංසා පීඩා, වංචාව, ප්‍රයෝගය, අපරාධ, අයුක්තිය යනාදියට එරෙහිව නිතරම සටන් වැදීමට සිදු වූ නිසා වෙහෙසට පත් සත්‍යවාදී දහම් ප්‍රචාරය කරන්නෝ සිතින් අධෛර්යයට පත්ව සමාදානය, තම දේපල සහ ජීවිත, ආරක්ෂා කරගැනීම සඳහා සත්‍ය වූ පදනමෙන් ඉවතට හැරී දිවි ගෙවන්නට වූහ. ඒ අතරම තවත් සමහර අය සතුරාගේ විරුද්ධතාවන්ගෙන් නොසැලී අභීතව මෙසේ ප්‍රකාශ කළෝය. "ඔවුන් ගැන භය නොවෙන්න. මහත්ව භයංකරව සිටින ස්වාමින්වහන්සේ" සිහිකර ගන්න. (නෙහෙමියා 4:14). ඔවුහු තම තමාගේ කඩුව ඉහටියේ බැඳගෙන තම වැඩකටයුතු තවදුරටත් ඉදිරියටම කරගෙන ගියෝය. (එපීස 6:17)

සත්‍යයට වෛර කළ, එයට විරුද්ධවාදිකම් දක් වූ ආත්මයම සෑම යුගයකම සිටි දෙවියන්වහන්සේගේ සතුරන් දිරිමත් කළේය. ඒ අතරම උන්වහන්සේගේ සේවකයන් තුළද එම ආකාරයේම අවදිව හිඳීමත් පක්ෂපාතිකමත් සහ වෙහෙස නොබලා සේවය කිරීමත් අවශ්‍ය විය. තමන්වහන්සේගේ මුල් ගෝලයන්ට ක්‍රිස්තුස්වහන්සේ පැවසූ මේ වදන් ලෝකාන්තිමය දක්වා උන්වහන්සේගේ අනුගාමිකයන්ටද එක සේ අදාළ වනවා ඇත: "මම නුඹලාට කියන දේ සියල්ලන්ටම කියමි-අවදිව සිටින්න." (මාර්ක් 13:37)

අන්ධකාරය තවදුරටත් වර්ධනය වන බව පෙනී ගියේය. පිළිම වන්දනාව සාමාන්‍ය තත්ත්වයකට පත්විය. රූප ඉදිරියෙහි ඉටිපන්දම් දල්වෙන්නට විය. එම රූපවලට යාච්ඤා ඔප්පු වන්නට විය. මිථ්‍යාදෘෂ්ඨිකවූ ද, හාස්‍යජනකවූ ද අන්ධ විශ්වාසයෙන් යුතුවූ ද ඇදහිලි ක්‍රම පොදුවේ පැවතිණ. මිනිසුන්ගේ මනස් මිථ්‍යා විශ්වාසයන් මගින් කෙතරම් ප්‍රබල ලෙස පාලනය කරනු ලැබුවේද යත් ඔවුන් තුළ පැවතිය යුතුවූ තෝරා බේරා ගැනීමේ හැකියාව සහමුලින්ම නැති වී ගොස් ඇතැයි පෙනෙන්නට විය. පූජකවරුන් සහ රදගුරුවරුන් සැප සෙල්ලමට ලොල්ව අනුරාගයෙන් කුල්මත්ව, දූෂිත ජීවිත ගත කරද්දී බැතිමතුන්ගෙන් බලාපොරොත්තු විය හැකිවන්නේ ආගමික දේ පිළිබඳව දැනුමක් නැතිකමය. මගපෙන්වීම සඳහා ආගමික නායකයන්ගේ සහාය පැතූ බැතිමතුන් නොදැනුවත්කමෙහි සහ දුරාචාරයෙහි පතුලට කිඳා බසින්නේය.

පාප් බල අධිකාරියේ ඉගැන්වීම් තවත් පියවරක් ඉදිරියට යමින් රෝමානු සභාව සර්ව සම්පූර්ණ යැයි හත්වන ග්‍රෙගරි පාප්වරයා එකොළොස් වන ශතවර්ෂයේදී නිල ප්‍රකාශයක් නිකුත් කළේය. ඔහු ඉදිරිපත් කළ යෝජනාවන්ගෙන් එකක් තුළින් ඔහු තහවුරු කළේ සභාව කිසිම කලෙක ශුද්ධ ලියවිලිවලට විරුද්ධව වරදක් කර නැති බවත් ඉදිරියෙහිදීද කිසිම දවසක වරදක් කරන්නේ නැති බවත්ය. එහෙත්, තම ප්‍රකාශනය ඔප්පු කිරීමට ශුද්ධ ලියවිලි පාඨ ඉදිරිපත් කිරීමට ඔහුට පුළුවන් වූයේ නැත. ඔහු තවත් උදාරම් බස් දොඩමින් තවත් අයිතිවාසිකම් ගණනාවක්ද කියා පෑවේය. තමාගේ නිල බලය යොදවමින් අධිරාජ්‍යයන් සිහසුනෙන් පහ කිරීමට හැකි බවත්, තමා නිකුත් කළ දඬුවම් ප්‍රකාශනයක් තවත් කවර අයෙකුට හෝ අවලංගු කළ නොහැකි බවත්, වෙනත් අයෙකු විසින් නිකුත් කරන ලද ඕනෑම නියෝගයක් වෙනස් කිරීමේ බලයක් තමාට හිමි බවත් ඔහු ප්‍රකාශ කළේය.

හතරවැනි හෙන්රි නම් ජර්මානු අධිරාජයාට දෙනු ලැබූ සැලකිල්ල තුළ, වරදක් කළ නොහැකි යයි කියන්නාවූ අයෙකු ක්‍රියා කළ ආකාරය තුළ දුෂ්ටවූ ද, කුරිරු වූ ද ස්වභාවයක උදාහරණයක්



පෙන්නුම් කෙරේ. පාප්වරයාගේ අධිකාරී බලයට අවනත නොවූයේය යන අනුමාන පදනම මත ඔහු රජතුමාව සභා සාමාජිකත්වයෙන් ඉවත් කර, ඔහුව සිංහාසනයෙන්ද පහ කර දම්මේය. රජතුමා යටතේ සිටි කුමාරවරුන්ද ඔහුව අතහැර දමා ඔහුට විරුද්ධව තර්ජනද එල්ල කර පාප්වරයාගේ නියෝගයෙන් ඔහුට විරුද්ධව කැරලි ගැසීමට යොමු කරනු ලැබූ නිසා මහත් භීතියට පත්වූ රජතුමාට, රෝමය සමග සාමය පතා සම්මුතියකට එළඹීම අවශ්‍ය යයි හැඟී ගියේය. තමාගේ බිරින්ද සහ විශ්වාසවන්ත සේවකයෙකුද සමග හෙන්රි, පාප්වරයා බැහැ දකින්නට තීරණය කළේය. ශීත ඍතුවේ මැද භාගයේදී මෙම කණ්ඩායම ඇල්ප්ස් කඳුවැටිය හරහා යමින් බලාපොරොත්තු වුණේ පාප්වරයා ඉදිරියෙහි යටත් භාවය කියාපෑමටය. ඔහු පාප්වරයාගේ මාළිගාව වෙත පැමිණි අවස්ථාවේදී රජතුමෙකුට සුදුසු අයුරින් ඔහුව පිළිගනු ලැබුවේ නැත. ඔහුගේ පරිවාර ආරක්ෂක භටයන් විරහිතව රජතුමාව පිටත මළුවක රඳවා තිබීම පාප්වරයාගේ නියමය විය. ඔහුට සිටින්නට සිදුවුණේ හිස් වැස්මක් නැතිව, පා ආවරණ නැතිව, ශීත ඍතුවකට ඔරොත්තු නොදෙන ඇඳුමක්ද සහිතවය. පාප්ව මුණ ගැසීමට රජුට අවසරය ලැබුණේ මෙසේ දුක් ගැහැට විඳිමින්, නිරාහාරව, පව් කියාදෙමින් තුන් දවසක් ගත කිරීමෙන් පසුවය. පාප්වරයා ඔහුට සමාව දීමට තීරණය කළේ ඔහුට කොන්දේසියක්ද පනවමිනි. එනම්, රජු ඔහුගේ රාජකීය නිල කටයුතු ආරම්භ කිරීමට පෙර පාප්වරයාගේ අනුමැතිය ලබාගත යුතු බවය. මෙම ජයග්‍රහණයෙන් උද්දාමයට පත් ග්‍රෙගරි පාප්වරයා රජවරුන්ගේ අහංකාරය බිමට ඇද දැමීම තමාගේ වගකීම යැයි උදම් ඇනුවේය.

අහංකාරයෙන් හිස උදුම්මාගත් මෙම පාප්වරයාගේ ක්‍රියා කලාපය සහ ක්‍රිස්තුස්වහන්සේගේ මුදු මොළොක් නිහතමානීකම අතර ඇත්තේ කෙතරම් වෙනසක්ද. මිනිස් හදවත්හි දොරටුව අසල රැඳී සිටිමින් එහි ඇතුළුවීමට ආයාචනා කරන්නෙකු ලෙස ක්‍රිස්තුස්වහන්සේව පෙන්වා දී තිබේ. මිනිසාට කමාව සහ සමාදානය ලබාදීමට හදවත තුළට පැමිණීමට උන්වහන්සේ අපේක්ෂාවෙන් රැඳී සිටින සේක; උන්වහන්සේ තම ගෝලයන්ට මෙසේ ඉගැන්වූ සේක. "නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමැති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය." (මතෙව් 20:27)

වර්ෂයන් ගෙවී යත්ම රෝමය විසින් ඉදිරිපත් කළ වැරදි ධර්මතාවයන් නිරතුරුවම වැඩිවන්නට විය. පාප් බල අධිකාරිය පිහිටුවීමට පෙරදී පවා මිථ්‍යාදෘෂ්ඨික දාර්ශනිකයන්ගේ ඉගැන්වීම් සභාවේ අවධානයට භාජනය වී සභාවට බලපෑමක් ඇති කළේය. කිතු දහම වැළඳ ගත්තා යයි පැවසූ නාමික ලෙස හැරුණු බොහෝ පුද්ගලයෝ ඔවුන්ගේ මිථ්‍යාදෘෂ්ඨික ඇදහිලි ක්‍රමවල තවදුරටත් එල්ලී සිටිමින් ක්‍රියාත්මක වූවා පමණක් නොව වෙනත් මිථ්‍යාදෘෂ්ඨීන්ටද

බලපෑමක් ඇතිකිරීම පිණිස ඒවායේ පැවතීමට අන්‍යයන්ටද බල කළහ. භයානක වැරදි ඉගැන්වීම් මෙසේ ක්‍රිස්තියානි ඇදහිල්ලට හඳුන්වා දෙනු ලැබිණ. මෙසේ කිතුණු සභාවට ඇතුළු වූ ප්‍රධාන විශ්වාසකයන්ගෙන් එකක් වුණේ මනුෂ්‍යයා ස්වභාවයෙන්ම අමරණීය බවත්, මරණයේදී ඔහුගේ සිහි බුද්ධිය අඛණ්ඩව පවතින බවත්ය. රෝමය ස්ථාපිත කළ ශුද්ධවන්තයන්ගෙන් පිහිට ඉල්ලා යාච්ඤා කිරීමද කන්‍යා මරිය තුමියට නමස්කාර කිරීමද සඳහා අඩිතාලම දැමීමට මෙම ධර්මතාවය පිටුවහලක් විය. පසුතැවිලි නොවූ පව්කරුවා සදහටම ගින්නෙන් දවෙන්නේය යන වැරදි ඉගැන්වීමද මෙයින් පැන නැගුණු අතර එය මුල් දවස්වලම පාප්වාදී ඇදහිල්ලට ඒකාබද්ධ විය.

තවත් මිථ්‍යාදෘෂ්ඨික නිර්මාණයක් හඳුන්වා දීමට එවිට මාර්ගය සැලසිණ. රෝමය එයට "ශුද්ධ ගිනි ස්ථානය" යැයි නම් තැබීය. මිථ්‍යා ක්‍රමවේදයන් විශ්වාස කළ විශාල ජනකායක් භීතියට පත් කිරීමට මෙය උපයෝගී කරගන්නා ලදී. මිය ගිය තැනැත්තාට වධ හිංසා පමුණුවන්නා වූ ස්ථානයක් ඇති බව මෙම ඉගැන්වීම සාක්ෂාත් කළේය. නිරයට තීන්දු වීමට තරම් සුදුසු නැති ආත්ම තම පව්වලට දඬුවම් විඳ පවිත්‍ර වනතුරු "ශුද්ධ ගිනි" ස්ථානයේ සිටීමට පසුව ඔවුන්ගේ ආත්මය ස්වර්ගයට ඇතුළු කරගනු ලබන බව විශ්වාස කෙරිණ.

තම අනුගාමිකයන් බියට පත්කර ඔවුන්ගේ ඇදහිලි ක්‍රම තුළින් ලාභ ප්‍රයෝජන ලබාගැනීම සඳහා රෝමයට තවත් ප්‍රබන්ධයක් ගොතා ගන්නට අවශ්‍ය විය. පව්කමාව මුදලට විකිණීමේ ධර්මතාව එය පිරිමැසීය. පාප් අධිකාරියේ සීමා මායිම් පුළුල් කරගැනීම සඳහා පාප්තුමාගේ අණින් වූ "යුද්ධ" වලට හවුල් වීමෙන් එම තැනැත්තාගේ අතීත, වර්තමාන, අනාගත සියලු පාපවලට සම්පූර්ණ සමාව ඔහුට ලබාගත හැකි විය. සියලු වේදනාවන්ගෙන් සහ දඬුවමින් ඔහුට නිදහස ලැබෙන බවට පොරොන්දු දෙන ලදී. සභාවේ සතුරන්ට දඬුවම් දීමෙන්ද පාප්තුමාගේ ආත්මික අධිකාරී බලය එඩිතරව ප්‍රතික්ෂේප කරන අයව විනාශ කර දැමීමෙන්ද මෙම භාග්‍යයට හිමිකම් කීමට හැකියාව ලැබෙන බව පවසන ලදී. සභාවට මුදල් ගෙවීමෙන් කෙනෙකුට ඔහුගේ පව්වලට සමාව ලබාගත හැකි බවද එමෙන්ම එමගින්, හිංසාකාරී නිරා ගින්නෙන් පීඩා විඳින්නාවූ මිතුරන්ගේ ආත්ම එම ස්ථානයෙන් නිදහස් කර හැරීමට හැකි බවද උගන්වනු ලැබීය. මෙයාකාරයෙන් රෝමානු සභාව තම භාණ්ඩාගාරය මුදලින් පුරවා ගත්තේය. තමන්ට හිස තබන්ටවත් තැනක් නැතැයි පැවසූ තැනැන්වහන්සේගේ නියෝජිතයන් යයි කියාගත්තාවූ අය තම සුඛෝපභෝගී ජීවිත සඳහා මුදල් උපයා ගත්තේ මෙවන් කූට උපක්‍රමයන්ගෙන්ය.



ස්වාමීන්වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය සැමරීමේ ක්‍රමය ගැන වූ ශුද්ධලියවිලි ඉගැන්වීම් යටපත් කරමින් රූප නමස්කාරයට සම්බන්ධ මිථ්‍යාදෘෂ්ඨික පූජා ක්‍රමය ස්ථාපිත කරන ලදී. සත්කර්ම පූජාව සඳහා භාවිතා කරන ලද රොටී සහ මිදියුෂ රෝමානු පූජකයන්ගේ රැවටිලිකාර රහපෑමක් මගින් ක්‍රිස්තුස්වහන්සේගේ නියම "ශරීරය සහ රුධිරය" බවට පත්වන බව රෝම සභාවේ ඉගැන්වීමය. (උපුටා ගැනීම නො. 1). දේව අපහාසාත්මක චින්තනයෙන් යුත් රෝමානු පූජකයෝ සියල්ලෙහි මැවුම්කාර වූ තැනැන්වහන්සේව තමන්ගේ හස්තයෙන් නිර්මාණය කරන්නට තමන්ට බලය ඇති බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළෝය. ස්වර්ගයට නිගා දෙවන්නාවූ මෙම වැරදි විශ්වාසයන් අදහන බවට පොරොන්දු වීමට කිතුණු බැතිමතුන්ට නියම විය. එසේ නොකරන්නේ නම් මරණීය වධහිංසා පමුණුවනු ලබන බවට තර්ජන එල්ල විය. මෙම විශ්වාසය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ මහත් සමූහයක් ගින්නට දමා විනාශ කරනු ලැබීය.

පාප් අධිකාරියේ ඉතාම භයංකාර වූ මරණීය යාන්ත්‍රණය දහතුන් වැනි ශතවර්ෂයේ එළි දැක්කේය. සභාවේ ඉගැන්වීම් පිළිනොගන්නා වූ අය විනිශ්චය කර ඔවුන්ට දඬුවම් පැමිණවීම එම යාන්ත්‍රනයෙහි කාර්ය භාරය විය. අන්ධකාරයෙහි කුමාරයා පාප් බල අධිකාරියේ නායකයන් සමග එක්ව ක්‍රියා කළේය. ඔවුන්ගේ රහසිගත රැස්වීම්වලදී සාතන් සහ ඔහුගේ දූතයෝ දුෂ්ට මිනිසුන්ගේ මනස් පාලනය කළෝය. ඔවුන් අතර අදෘශ්‍යමානව සිටි දෙවියන්වහන්සේගේ දූතයෙක් විනිශ්චයෙහි බියකරු තීන්දු වාර්තා ගත කළේය. මිනිස් ඇසට දැකීමෙන් පවා ඇඟ කිළි පොලා යන දරුණු ක්‍රියාවන් ඉතිහාස වාර්තාවට එකතු කරනු ලැබීය. "මහා බබිලෝනිය" ශුද්ධවන්තයන්ගේ... ලෙයින් මත් වී" සිටියාය. තළා පොඩි කරනු ලැබූ, කැලි කැලිවලට ඉරා දමනු ලැබූ දස දහස් සංඛ්‍යාත වේද සාක්ෂිකයන්ගේ ලේ මෙම විරුද්ධ-වාදීන්ගෙන් පළිගන්නැයි දෙවියන්වහන්සේට හඬ නැගූහ.

පාප් අධිකාරිය ලෝකයේ පාලන බලය බවට පත්වී තිබිණ. රෝම පාප්වරයාගේ අණසක ඉදිරියේ රජවරු සහ අග රජවරු හිස නැමූහ. මෙම කාලය සඳහා මෙන්ම සදාතනය සඳහාද මිනිසුන්ගේ ඉරණම නියම කිරීම ඔහුගේ පාලනය යටතේ පවතින්නේ යැයි පෙනී ගියේය. සියවස් ගණනාවක් පුරා රෝමානු ධර්මතාවන් සම්පූර්ණවූ ද නිත්‍යවූ ද අයුරින් පිළිගනු ලැබීය. එම සභාවෙහි ආගමික වතාවත් භක්තියෙන් යුතුව ඉටු කරන ලද අතර ආගමික මංගල්‍යයන් බොහෝසේ සමරන ලදී. ඇයගේ පූජක පක්ෂයට ගෞරව පුද කොට ඔවුන්ගේ නඩත්තුව සඳහා නිර්ලෝභීව දීමනාවන් පුදකරන ලදී. මෙතෙක් කිසිම කලෙක රෝමානු සභාව මෙවැනි ගෞරවයකට පාත්‍ර වුණේද, ශ්‍රී විභූතියකට භාජන වුණේද, බලයක් හිමි කර ගත්තේද නැත.

"පාප් බල අධිකාරියෙහි මධ්‍යහ්නය ලෝකයේ මැදියම් රාත්‍රිය විය." (උපුටා ගැනීම නො. 2) බැතිමතුන්ට මෙන්ම පූජකයන්ටද ශුද්ධලියවිලි දැනුම නැති වී ගොස් තිබුණි. බොහෝ පුරාණයේ විසූ ඵරිසිවරුන් මෙන් මෙම පාප් සමවාදී නායකයෝද තමන්ගේ පාප එළිදරව් කරන ආලෝකයට ද්වේෂ කළෝය. ධර්මිෂ්ඨකමෙහි ප්‍රමිතිය වන දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඉවත් කර තිබූ නිසා රෝමානු නායකයෝ සීමාවකින් තොරව තම බලය පාවිච්චි කළෝය, කිසිම තහනමක් නැතිව දුරාචාරයෙහි යෙදුණාහ. වංචාව, ධන තෘෂ්ණාව සහ දුරාචාරය බහුලව තිබියදී ධන සම්පත් සහ තනතුරු ලබාගැනීම සඳහා කවර ආකාර හෝ අපරාධයක් කරන්නට මිනිසා පසුබට නොවීය. පාප්වරුන්ගේ සහ නායක පූජකයන්ගේ මාළිගාවන් අධම සල්ලාලකම් වලින් පිරී තිබුණි. සමහර පාප්වරු ඉතා දූෂිත අපරාධවලට වරදකරුවන් වූහ. ඔවුන්ව එම තනතුරුවලින් පහ කිරීමට සමහර රාජ්‍ය පාලකයන් වෑයම් කළේ ඔවුන් සමාජය විසින් ඉවසිය නොහැකි තරමට දූෂිතවූ සහ අධම වූ අයවලුන් වූ බැවිනි. සියවස් ගණනාවක් පුරා යුරෝපාකරය තුළ ඉගෙනීම, කලාව හා ශිෂ්ඨාචාරය යන ක්ෂේත්‍රයන්හි කිසිම දියුණුවක් සිදු නොවීය. අධ්‍යාත්මික සහ බුද්ධිමය පක්ෂාඝාත රෝගයෙන් කිතුණු ලෝකය පෙළෙන්නට විය.

රෝමානු බල අධිකාරිය යටතේ වූ ලෝක තත්ත්වය හොෂෙයා අනාගතවක්තෘවරයා විසින් පැවසූ අනාවැකියෙහි බියකරු ඉටුවීමක් පෙන්නුම් කළේය. හොෂෙයා මෙසේ පවසා තිබුණේය. "මාගේ සෙනඟ දැනගැන්ම නැතිකමෙන් නාස්ති වී සිටිති. නුඹ දැනගැන්ම එපා කළ නිසා මට පූජකකම් කිරීමෙන් මමත් නුඹ එපා කරන්නෙමි. නුඹ නුඹේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මතක නැති කළ නිසා මමත් නුඹේ දරුවන් මතක නැතිකරන්නෙමි." "සැබෑකමවත්, කරුණාවටත් දෙවියන්වහන්සේ ඇඳින ගැනීමවත් දේශයෙහි නැති හෙයින්... දෙස් තිබීමද බොරු කීමද මිනීමැරීමද සොරකම් කිරීමද කාමමිථ්‍යාචාරයද මිස වෙන කිසිවක් නැත; ලේ වැගිරවීම පිට ලේ වැගිරවීම වෙයි." (හොෂෙයා 4:6,1,2) දේව වචනය ඉවත දැමීමෙන් සිදුවන විපාක මේවාය.

---

උපුටා ගැනීම අංක 1 - Cardinal Wiseman"s Lectures on "the Real Presence," Lecture 8, par. 26.

උපුටා ගැනීම අංක 2 - Wylis, "History of Protentantism," book 1, Chapter.Q



# 4

# වෝල්ඩන්සිවරු

පාප් බල අධිකාරිය තම පාලන බලය හෙබ වූ දීර්ඝ කාලය තුළ භූමිය මත පතිතවූ මහත් අන්ධකාරය මධ්‍යයේ වුවද, සත්‍යතාවයේ ආලෝකය සම්පූර්ණ ලෙස නිවා දැමීමට එම බලය සමත් නොවීය. සෑම යුගයකම දෙවියන්වහන්සේ උදෙසා සාක්ෂි දරූ අය සිටියහ. දෙවියන්වහන්සේ හා මනුෂ්‍යයා අතර සිටින්නාවූ එකම මැදහත්-කාරයාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව විශ්වාස කළ ඔව්හු උන්වහන්සේ කෙරෙහි වූ තම ඇදහිල්ල ආදරයෙන් රැකගනිමින්, ශුද්ධවූ බයිබලය පමණක්ම ජීවිතයට මගපෙන්වීමේ ප්‍රමිතිය බව විශ්වාස කරමින් සැබෑ සබත් දවස ශුද්ධ කොට පැවැත්වූහ. මෙම ජන කොටසට ලෝකවාසීන් කොයිතරම් ණයගැති දැයි අනාගත පරම්පරාව කිසි කලෙක දැනගන්නේ නැත. කිතු දහමට විරුද්ධව ක්‍රියා කරන්නන් ලෙස ඔවුන්ව හංවඩු ගසන ලදී. ඔවුන්ගේ අභිප්‍රායන් පිළිබඳව පැවතුණේ සැකයකි. ඔවුන්ගේ චරිත මහත් අපහාසයට ලක් කරන ලදී. ඔවුන්ගේ ලියවිලි යටපත් කරනු ලැබීය. එම ලියවිලිවලට වැරැදි අර්ථකථන ලබාදෙමින් ඒවා විනාශ කරන ලදී. එසේ වුවද, ඔවුහු ස්ථිරවම නැගී සිටියෝය. යුගයෙන් යුගයට ඔවුහු තම ඇදහිල්ල පවිත්‍රව පවත්වාගෙන මතු පරම්පරාවන් උදෙසා ශුද්ධ වූ උරුමයක් ලෙස සත්‍යතාවය රැකවල් කළහ.

රෝම අධිරාජ්‍යය තුළ පාප් ආධිපත්‍යය උච්ඡ ස්ථානයක් කරා පැමිණීමෙන් පසු උදාවූ අඳුරු යුගයේ විසූ දෙවියන්වහන්සේගේ ජනතාවගේ ඉතිහාසය ස්වර්ගයෙහි වාර්තා ගත වී තිබේ. එහෙත් ඔවුන් පිළිබඳව සඳහන් කිරීමක් හෝ මිනිස් ඉතිහාසයෙහි නැති තරම්ය. මෙවන් ජනතාවක් ජීවත් වූ බවට සාධකයක් වන්නේ ඔවුන්ට හිංසා පීඩා සිදුකළ අයගේ චෝදනා පිළිබඳ වාර්තා සොයාගත හැකි බැවින්ය. තමාගේ ධර්මතාවන්ට හෝ ආඥවන්ට හෝ විරුද්ධතාවක් දක්වන්නාවූ අය පිළිබඳව වාර්තාවල් විනාශ කර දැමීම රෝමානුවන්ගේ ප්‍රතිපත්තිය විය. තමන්ගේ ආගම දහමට විරුද්ධ වූ යමක් වේද, යම් පුද්ගලයෙකු වේද එම විරුද්ධතාවන් විනාශ කර දැමීමට රෝමානු බලධාරීහු වග බලා ගත්තෝය. අනුමාන කිරීම ගැන අදහස් ප්‍රකාශ කිරීම, පාප් බල අධිකාරියේ සිද්ධාන්ත වශයෙන් සැලකෙන මත පිළිබඳව ප්‍රශ්න කිරීම, යනාදියේදී යමෙක් වරදකරුවෙක් වූයේ නම් පොහොසත් හෝ දුප්පත් හෝ වේවා සමාජ තලයේ උසස් මට්ටමක හෝ පහත් තලයක හෝ වේවා ඔහුට ජීවිතය අහිමි වීම එවැනි

අයගේ ඉරණම විය. පාප් බල අධිකාරිය, විරුද්ධවාදීන්ට සිදුකළ හැම ආකාරයකම කුරිරුකම් පිළිබඳ සියලුම වාර්තා විනාශකර දැමීමට වෑයම් කළේය. එවන් වාර්තා ලේඛණ ගත කළ සෑම ලියවිල්ලක් සහ පොතක්ම ගිනිබත් කළ යුතු යැයි පාප්වාදී මණ්ඩලය අණ කළේය. මුද්‍රණ ශිල්පය එළිදකින්නට පෙර සංසරණය සඳහා පැවති පොත් සංඛ්‍යාව ඉතා ස්වල්ප විය. එම පොත් සංරක්ෂණයද ඉතා අසීරු තත්ත්වයක පැවතුණි. එම නිසා රෝමානුවන්ගේ අභිප්‍රාය ඉටු කරගැනීමට එරෙහිව කළ හැකි දෙයක් නොවීය.

ඒ අතර රෝමානු ආධිපත්‍යය පැවති ප්‍රදේශ තුළ තිබූ කිසිම සභාවකට හෘදය සාක්ෂියේ නිදහස ප්‍රීතියෙන් භුක්ති විඳීමට නුපුළුවන් විය; රෝමානුවන් විසින් ඔවුන් මර්දනය කරන ලදී. පාප් සමයට අධිකාරී බලය ලැබීමත් සමගම තම විරුද්ධවාදීන් මැඩපැවැත්වීමට ඇය යුහුසුළු වූවාය. තම බල අධිකාරිය පිළිගැනීමට එකඟ නොවූ සියල්ලන්ට එරෙහිව වධ හිංසා යාන්ත්‍රණය ක්‍රියාත්මක විය. ක්‍රම ක්‍රමයෙන් සියලු සභාවන් පාප්ගේ ආධිපත්‍යයට යටත් වූහ.

මුල් කාලීන කිතු දහම මහා බ්‍රිතාන්‍යයේ දිග කාලයක පටන් ස්ථාපිත වී තිබුණේය. මුල් සියවස් කාලය තුළදී බ්‍රිතාන්‍යය පිළිගත් ශුභාරංචි පණිවිඩය සත්‍යයට විරුද්ධ වූ රෝමානු ව්‍යාජ ඉගැන්වීම් කරණකොටගෙන දූෂ්‍ය නොවූ පිරිසිදු එකක් විය. බ්‍රිතාන්‍යයේ මුල් සභාවන්ට රෝමයෙන් ලැබුණු එකම ත්‍යාගය වූයේ මිථ්‍යාදෘෂ්ටික අධිරාජ්‍යයන්ගෙන් වූ පීඩාවන්ය. මෙම පීඩාවන් දුර බැහැර පිහිටි දේශයන් කරාද ක්‍රියාත්මක විය. පීඩාවන් නිසා එංගලන්තයේ විසූ බොහෝ කිතුණුවන් රැකවරණය පතා ස්කොට්ලන්තය වෙත පැන ගියෝය. නිර්මල සත්‍යය එම ස්ථානයේ සිට අයර්ලන්තයට ගෙන යන ලදී. මේ සෑම රටක්ම ශුභාරංචි දහම මහත් ප්‍රීතියෙන් පිළිගත්තේය.

සැක්සන්වරු බ්‍රිතාන්‍යය ආක්‍රමණය කිරීමත් සමගම එම රට මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ පාලනය යටතට පත් විය. ජය ගත්තවුන් තම වහලුන් දෙන උපදෙස් හෙළා දක්කාහ. මෙහි ප්‍රතිඵලය වුණේ බ්‍රිතාන්‍ය කිතුණු බැතිමතුන් කඳුකරයට සහ වනාන්තරවල පිහිටි ඕවිටි යායවල් වලට පලායෑමය. කලකට සඟවනු ලැබූ නමුත් ආලෝකය අඛණ්ඩව දල්වෙමින් තිබුණේය. ශත වර්ෂයකට පසුව එම ආලෝකය ස්කොට්ලන්තයෙහි ප්‍රබල දීප්තියකින් බැබලෙමින් ඈත පිහිටි රටවල් කරාද විහිදුණේය. අයර්ලන්තයෙන් පැමිණි සැදැහැවත් කොලුම්බා සහ ඔහුගේ සගයෝ විසිර සිටි ඇදහිලිවතුන් එකතු කරගෙන එකමුතුවක් පිහිටුවා ගෙන ජනශුන්‍ය දූපතක් වූ අයෝන්හි තම මිෂනාරි මධ්‍යස්ථානය පිහිටුවා ගත්තෝය. මෙම දහම් ප්‍රචාරකයන් අතර වූ එක් තැනැත්තෙක් බයිබලීය සබත රක්ෂා කළ අයෙක් විය. ඔහු මෙම



සත්‍යතාව කණ්ඩායමේ අනෙකුත් අය සමග බෙදා ගත්තේය. අයෝනාවෙහි පාසලක් ස්ථාපිත කරන ලදී. මෙම පාසලේ පුහුණුව ලබා දහම් ප්‍රචාරය සඳහා පිටත්ව ගිය අය ස්කොට්ලන්තය සහ එංගලන්තය කරා පමණක් නොව ජර්මනිය, ස්විට්සර්ලන්තය සහ ඉතාලිය වෙතද ඇතුළු වූහ.

එහෙත් බ්‍රිතාන්‍යය වෙත ඇස් යොමා සිටි රෝමය, එය තම ආධිපත්‍යය යටතට පත් කරගැනීමට තීරණය කළාය. හයවැනි සියවසේදී ඇගේ ධර්ම ප්‍රචාරක ගුරුවරු මිථ්‍යාදෘෂ්ටිකයන් වූ සැක්සන් වරුන් තම ආගමට බඳවා ගැනීම තම කාර්යය කරගත්හ. ම්ලේච්ඡ මිථ්‍යාදෘෂ්ටිකයන් වූ ඔව්හු රෝමානු ගුරුවරුන්ට දෑත් දිගු කරමින් ඔවුන් පිළිගත්තෝය. එම ගුරුවරුන් විසින් දහස් ගණන් මිථ්‍යාදෘෂ්ටිකයන්ට රෝමානු ආගම වැළඳ ගැනීමට දිරි දෙන ලදී. වැඩ කටයුතු ඉදිරියට යන අතරේදී පාප්සමවාදී නායකයන්ට සහ ඔවුන්ගේ ඉගැන්වීම් යටතේ කිතුණු දහම වැළඳ ගත් අයටද මූලධර්මය ඇදහූ ප්‍රකෘති කිතුණුවන් මුණ ගැසුණාහ. දෙපිරිස අතරේ මහත් වෙනස්කම් දැකගත හැකි විය. අපොස්තුළු ඉගැන්වීම් අනුව දිවිගෙවූ බැතිමත්හු ඉතා සරල, වාම්, නිහතමානී දිවි පැවැත්මක් අනුගමනය කරමින් තම චරිත ගුණාංග, දහම් සහ ජීවිත රටාව ශුද්ධ ලියවිල්ලට අනුකූලව පවත්වා ගෙන ගියෝය. ඒ අතර රෝමානුවෝ තම පාප්වාදී නායකයන්ගේ මිථ්‍යා ලබ්ධික විශ්වාස අනුගමනය කරමින්, උදාරම් ලෙස හැසිරෙමින් පුහු ආටෝපයන්ගෙන් සැරසී අභිමානයක් ප්‍රදර්ශනය කරමින් කල් ගෙවූහ. මෙම ක්‍රිස්තියානි සභාවන් විසින් පාප් අධිකාරිවරයාගේ උත්තම නිල ආධිපත්‍යය පිළිගත යුතු යයි රෝම වරපුරුෂයෝ බලකර සිටියහ. බ්‍රිතාන්‍ය බැතිමත්හු නිහතමානීව ප්‍රකාශ කළේ සියලු මනුෂ්‍යයන්ට ප්‍රේම කිරීම ඔවුන්ගේ ආශාව බවය. සභාවේ පරම ආධිපත්‍යයකට අයිතිවාසිකමක් කීමට පාප්ට හිමිකමක් නැති බවත්, ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන්නාවූ තවත් කිතුණු බැතිමතෙකුට ලබා දෙන්නාවූ ආකාරයේ යටත්කමක් හැරෙන්නට වෙනත් ආකාර වන්දනීය යටත්කමක් ඔහුට ලබා දෙන්නට නොහැකි බවත් මෙම බ්‍රිතාන්‍ය කිතුණුවෝ ප්‍රකාශ කර සිටියෝය. මෙම අයගේ පක්ෂපාතීත්වය සහ යටත්කම ලබාගැනීමට රෝමය නැවත නැවතත් වෑයම් කළේය. රෝම සභාවේ නායකයන්ගේ අහංකාර කල් ක්‍රියාවන් නිසා පුදුමයට පත්ව සිටි මෙම නිහතමානී ක්‍රිස්තු භක්තිකයෝ ස්ථිර වශයෙන්ම අවධානය කළේ ක්‍රිස්තුස්වහන්සේ හැරෙන්නට වෙනත් ස්වාමියෙකු ගැන තමන් නොදන්නා බවයි. දැන් පාප් බල අධිකාරියේ සැබෑ ස්වභාවය එළිදරව් විය. රෝමානු බලධරයා තමාගේ අණසකට යටත් නොවීම ගැන ඔවුන්ට මෙසේ ප්‍රතිචාරය දැක්වීය: "ඔබට සාමය ගෙන එන්නාවූ සහෝදරයන් ඔබ පිළිගන්නේ නැතිනම් යුද්ධය ගෙන එන්නාවූ සතුරන් පිළිගැනීමට ඔබට සිදුවනවා ඇත. සැක්සන් වරුන්ට ජීවනයේ මාර්ගය පෙන්වා දීමට ඔබ අප සමග එකතු

වන්නේ නැතිනම් ඔබ ඔවුන්ගේ මරණීය පහර ලබාගන්නවා ඇත." [උපුටා ගැනීම අංක 1] මෙම තර්ජන හිස් වදන් නොවීය. බ්‍රිතාන්‍යයෙහි තිබූ සත්‍යතාවට ගරු කළ සභාවන් විනාශ කර දමන තෙක් හෝ ඔවුන් පාප්තුමාගේ අධිකාරී බලයට යටත් වන තෙක් බයිබලීය ඇදහිල්ල වෙනුවෙන් සාක්ෂි දරූ මෙම අයට එරෙහිව යුද්ධ, කුමන්ත්‍රණ, කූට උපායන්, සහ මුළාකිරීම් ක්‍රියාත්මක විය.

රෝම පාලනය ක්‍රියාත්මක නොවූ රටවල විසූ ක්‍රිස්තු භක්තික කණ්ඩායම් බොහොමයක් වසර සියවස් ගණනාවක් පුරා රෝම දූෂණයට ගොදුරු නොවී තම භක්තිය රැකගනිමින් දිවි ගෙවූහ. ඔවුහු මිථ්‍යාදෘෂ්ටික නමස්කාර කරුවන් මධ්‍යයේ ජීවත් වූහ. කාලයාගේ ඇවෑමෙන් ඔවුන්ටද මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රම බලපෑවේය. එසේ වුවද, ඇදහිල්ලෙහි පරම ප්‍රමිතිය බයිබලය පමණක් බව විශ්වාස කරමින් ඔවුහු එහි අඩංගු සත්‍යතාවයන් බොහොමයකට සිය අනුකූලතාවය දැක්වූහ. මෙම කිතුණුවන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ සදා පැවැත්ම විශ්වාස කළ අතර, සතරවෙනි ආඥාව අනුව සබත ශුද්ධ කොට පැවැත්වූවෝය. මෙම ඇදහිල්ල ආරක්ෂා කරගනිමින් එම චතාවත් පැවැත් වූ කිතුණුවෝ මධ්‍යම අප්‍රිකාවේද ආසියාවේ ආර්මේනියන්වරුන් අතරේද ජීවත්ව සිටියෝය.

පාප් බලයෙහි ආක්‍රමණයට යටත් නොවී එයට විරුද්ධව නැගී සිටි කණ්ඩායම් අතුරෙන් වොල්ඩන්සිවරු පෙරමුණ ගනිති. පාප් බලය ස්වකීය ආධිපත්‍යය හෙබවූ එම රටෙහිම ඔවුන්ගේ වැරදි ඉගැන්වීම්වලට මෙන්ම දූෂණයන්ටද එරෙහිව ඉතා දැඩි විරුද්ධවාදිකම් ක්‍රියාත්මක විය. සියවස් ගණනාවක් පුරා පීඩ්මොන්ට්හි වූ මේ සභාවන් තමන්ගේ නිදහස රැකගෙන ජීවත් වූහ. එහෙත් අවසානයේදී යටත් වන්නැයි රෝම ආධිපත්‍යය බල කළ කාලය එළඹියේය. බලෙන්ම තම පාලන බලය තවත් අය කෙරෙහි යෙද වූ රෝමානුවන්ට විරුද්ධව නැගී සිටීමේ අසාර්ථක ප්‍රයත්නවලින් පසුව මෙම සභාවන්හි නායකයෝ අකමැත්තෙන් වුවද සකල ලෝකයාම පාහේ ගරු සත්කාර පැවැත්වූ රෝම ආධිපත්‍යයට හිස නැමූවෝය. එහෙත්, පාප්වරයාගේ හෝ ඔහුගේ නායක පූජකයන්ගේ අණසකට යටත්වීම ප්‍රතික්ෂේප කළ සමහර අයද සිටියහ. තමන්ගේ පක්ෂපාතීත්වය දෙවියන්වහන්සේට පමණක් පුදකරමින් තමන්ගේ ඇදහිල්ලෙහි පවිත්‍රතාව සහ සරලතාව තවදුරටත් ආරක්ෂා කරගැනීම ඔවුන්ගේ අධිෂ්ඨානය විය. වෙන්වීමක් සිදුවිය. මුල් කාලීන ඇදහිල්ලට ගරු කළ අය රෝම ආධිපත්‍යයෙන් වෙන්ව ජීවත් වීමට තීරණය කර ගත්තෝය. ඔවුහු තම නිජ භූමිය වූ ඇල්ප්ස් දේශය හැර දමා වෙනත් රටවල් කරා ගොස් සත්‍යතාවේ ධජය ඔසවා තැබූහ. තවත් අය, කඳු අතර පිහිටි හුදෙකලා නිම්න භූමි වෙත ගොස් එහිදී දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ නිදහස ආරක්ෂා කර ගත්තෝය.



වෝල්ඩන්සියානු ක්‍රිස්තු භක්තිකයන් විසින් සියවස් ගණනාවක් පුරා රැක ගනිමින් අන්‍යයන්ට ඉගැන්වූ ඇදහිලි දහම රෝමය විසින් ඉදිරිපත් කළ ව්‍යාජ දහමට හාත්පසින්ම විරුද්ධ විය. කිතු දහමේ සත්‍ය පිළිවෙල වන දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය මත ඔවුන්ගේ ආගමික ඇදහීම පදනම් වී තිබුණේය. මෙම නිහතමානී ගොවියෝ තම අප්‍රසිද්ධ ආරක්ෂක ස්ථානවල සිටිමින් සෙසු ලෝකයෙන් වෙන් වී දිවි ගෙවූහ. ඔවුන් දිනපතාම තම පශු සම්පත් රැකබලා ගනිමින්, තම පලතුරු උයන් නඩත්තු කරගනිමින් ජීවත් වූහ. මිථ්‍යාදෘෂ්ටික තේවාවන් සහ ධර්මතාවන් වැළඳ ගත් සභාවෙහි සිද්ධාන්ත ඉගැන්වීම් සහ බයිබලීය සම්මතයෙන් තොර වූ දහම් පිළිනොගැනීමට වෝල්ඩන්සියානු කිතුණුවන් තීරණය කරගත්තේ, තමන්ගේම ඉගෙනීම තුළින් පිවිසි සිද්ධාන්ත පදනම් කරගෙන නොවේ. ඔවුන්ගේ ඇදහිල්ල මෑතකදී ලබාගත් අලුත් එකක් නොවීය. ඔවුන්ගේ ආගමික ඇදහිල්ල තම පියවරුන්ගෙන් ලබාගත් උරුමයක් විය. අපෝස්තලික සභාවෙහි ඇදහිල්ල උදෙසා ඔවුහු දැඩි ලෙස ක්‍රියා කළෝය. එනම් "වරක් ශුද්ධවන්තයන්ට භාර දුන් ඇදහිල්ල" (යූදස් 3) රැකගෙන ජීවත් වීම ඔවුන්ගේ අධිෂ්ඨානය විය. ලෝකයේ විශාල අගනුවරක සිහසුන් දරා සිටි උඩඟු සභාව දෙවියන්වහන්සේගේ සභාව නොවීය. එහෙත් දෙවියන්වහන්සේ විසින් ලෝකයට බෙදාදීම සඳහා උන්වහන්සේගේ ජනතාවට භාරකරන ලද සත්‍යතාවයේ නිධාන සම්පත් රැකගත් පාළුකරයේ සභාව උන්වහන්සේගේ සත්‍ය සභාව විය.

සත්‍ය සභාව රෝමානු සභාවෙන් වෙන් වන්නට සිදුවූ ප්‍රධාන හේතුවලින් එකක් නම් බයිබලීය සබතට රෝමානුවන්ගේ තිබූ ද්වේෂයයි. අනාවැකිවල පවසා තිබූ ආකාරයට පාප් බල අධිකාරිය සත්‍යතාව පොළොවට හෙළුවේය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව දූවිලි අතර පාගා දමා මිනිස් සම්ප්‍රදායන් සහ සිරිත් විරිත් ඔසවාලනු ලැබීය. පාප් බල අධිකාරිය යටතේ පාලනය වූ සභාවන්ට ඉරිදා දවස ශුද්ධ දවසක් ලෙස පැවැත්වීමට ප්‍රථමයෙන්ම බල කරන ලදී. පැවතුණාවූ වැරදි සහ මිථ්‍යා ඇදහිලි මධ්‍යයේ දෙවියන්වහන්සේගේ සත්‍යවාදී සෙනඟ අතුරෙන් බොහෝ අය මහත් වියවුලට පත්ව සබත ශුද්ධ කොට පැවැත්වූ අතරම ඉරිදා දවසෙහිදී ද වැඩකටයුතු කිරීමෙන් වැළකී සිටියහ. එහෙත්, මෙයින් පාප් බලධරයන් සෑහීමට පත්නොවූහ. ඉරිදා දවස ශුද්ධ කොට පැවැත්වීමට පමණක් නොව සබත් දවස කෙලසා කඩකිරීමටත් ඔවුහු බලකර සිටියෝය. සබත් දවසට ගරු කිරීමට නිර්භීතව උත්සාහ දරූ අයට ඔවුහු තදබල බසින් දොස් පැවරූහ. රෝම බලඅධිකාරියෙන් පැන යාමෙන් පමණක් ඔවුන්ට දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට සමාදානයෙන් යුතුව කීකරුවීමට හැකි වුණේය.

යුරෝපාකරයේ ජීවත් වූ විවිධ ජාතීන් අතරෙන් ශුද්ධලියවිලි පරිවර්තනයක් ලබාගත් පළමුවන අය වූයේ වොල්ඩන්සිවරුන්ය. ප්‍රතිසංස්කරණයට සියවස් ගණනාවකට පෙර තමන්ගේ මව් බසින් ශුද්ධ බයිබලයේ අත් පිටපත් ඔවුන් සන්තකයේ තිබුණේය. බාහිර මිථ්‍යා මත මිශ්‍ර නොවූ සුපිරිසිදු සත්‍යතාව ඔවුන් සන්තකයේ විය. මේ නිසාම ඔවුන් ද්වේෂයටත් වධ හිංසාවටත් ලක් වූහ. විශේෂිත ලෙස එළිදරව් පොතෙහි සඳහන් ඇදහිල්ලෙන් වැටී ගියා වූ බබිලෝනිය වනාහි රෝම සභාව බව ඔවුහු අභීතව ප්‍රකාශ කළෝය. ඔවුහු තම ජීවිත පරදුවට තබා රෝමානුවන්ගේ දූෂණයට එරෙහිව නැගී සිටියෝය. දිගු කාලයක් පැවති වධ හිංසා නිසා පීඩනයට පත්ව සිටි සමහරෙක් තම ඇදහිල්ල පාවා දෙමින්, එහි විශේෂිත ප්‍රතිපත්ති ටික ටික අත්හැර දමමින් ක්‍රියා කළ අතර වෙනත් අය තමන්ගේ ඇදහිල්ල තදින් ස්ථිරව අල්ලා ගෙන සිටියහ. මිථ්‍යාදෘෂ්ඨික ඇදහිලි ක්‍රම වැළඳ ගැනීම් සහ අඳුරු යුගයක් පැවති නමුත් රෝමයේ සුපිරි ආධිපත්‍යය ප්‍රතික්ෂේප කළ වොල්ඩන්සිවරුද සිටියෝය. සුරුවම් වන්දනාව රූප වැඳීමක් බව කියා ඔව්හු එය ප්‍රතික්ෂේප කළෝය; සත්‍ය සබතද ශුද්ධ ලෙස ආරක්ෂා කළෝය. ඉතා දරුණු විරුද්ධවාදී හිංසා පීඩා මධ්‍යයේ ඔවුහු තම ඇදහිල්ල පවත්වා ගෙන ගියෝය. හෙල්ලවල් මගින් ගැඹුරු ලෙස තුවාල කරනු ලැබුවද, දර මිටියක් හා බැඳ ගිනි තබා පුළුස්සා දමනු ලැබුවද ඔවුහු දෙවියන්වහන්සේගේ වචනය උදෙසාද, උන්වහන්සේගේ ගෞරවය උදෙසාද පසු නොබැස නැගී සිටියෝය,

පවුරු මෙන් පිහිටි උස් වූ කඳුවලින් වට වූ නිම්න භූමි හිංසා පීඩාවනට පත් වූ අයට සහ භීෂණයට ගොදුරු වූ අයට ක්ෂේම භූමියක් විය. මෙවන් ක්ෂේම භූමි වොල්ඩන්සිවරුන්ට සැඟවී සිටීමේ ආරක්ෂිත ස්ථානයන් විය. මධ්‍ය කාලීන යුගයේ පැතිර තිබූ අන්ධකාරය මධ්‍යයේ සත්‍යතාවයේ ආලෝකය මෙම ස්ථානයන්හි දල්වෙමින් පැවතියේය. වසර දහසක් පුරා කාලයක් මෙම ස්ථානයන්හිදී සත්‍යය වෙනුවෙන් සාක්ෂි දරන්නාවූ අය පුරාණ ඇදහිල්ල ආරක්ෂා සහිතව පවත්වාගෙන ගියෝය.

තම විශ්වාසයට භාර දී තිබූ මහත් බලසම්පන්න සත්‍යතාවනට ගැළපෙන ආකාරයට තමන්වහන්සේගේ සෙනඟට මහිමයෙන් අඩු නොවූ විභූතියෙන් පිරි අභය භූමියක් දෙවියන්වහන්සේ සපයා දුන්සේක. එම විශ්වාසවන්ත සරණාගතයන්ට තිරසාරව පිහිටූ කඳු සලකුණු කළේ යෙහෝවඃවහන්සේගේ නොවෙනස්වන සුළු ධර්මිෂ්ඨකමෙහි ස්ථිරතාවයි. උස්ව පිහිටි වෙනස් නොවන්නාවූ ශිඛරයන්ගෙන් සැදුම්ලත් කඳු දෙසට තම දරුවන්ගේ අවධානය යොමු කළ ඔවුහු තමන් අදහන්නාවූ දෙවියන්වහන්සේද එම කඳු මෙන් නොසැළී සිටින්නාවූ බවද කිසිම ආකාර වෙනස්වීමක් උන්වහන්සේ තුළ නැති බවද



උන්වහන්සේගේ වචනය සදාකාලික බවද අවධාරණය කළෝය. දෙවියන්වහන්සේ විශාල කඳු පොළොවෙහි පිහිටුවා ඒවාට ශක්තිය ලබා දී ඇත. උන්වහන්සේගේ අනන්ත වූ බලය කරණකොටගෙන මිස ඒවා වෙනත් ස්ථානයක් කරා යොමු කරවන්නට කිසිම බලයක් සමත් නොවේ. මෙයාකාරයෙන්ම උන්වහන්සේ ස්වකීය ව්‍යවස්ථාව ස්ථාපිත කර තිබේ. එය උන්වහන්සේගේ රාජ්‍ය තන්ත්‍රයෙහි ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අත්තිවාරම වන්නේය. මිනිසා තම හස්තය දිගුකොට වෙනත් අයෙකුගේ ජීවිත විනාශ කරන්නට පුළුවන. එහෙත් ඔවුන්ට සිය හස්තය දිගු කොට විශාල කඳු භූමියෙන් උදුරා දමා එම කඳු මුහුදට වීසි කිරීමට හැකියාවක් නැත. එසේම මිනිස් හස්තයට දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ එක් වගන්තියක්වත් වෙනස් කළ නොහැක. උන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නාවූ අයට උන්වහන්සේ ලබා දී ඇති පොරොන්දු එකක්වත් මකා දමන්නට කිසිවෙක් හෝ සමත් නොවේ. වෙනස් නොවෙන්නාවූ කඳු වැටි මෙන් දෙවියන්වහන්සේගේ සේවකයන්ද උන්වහන්සේගේ ව්‍යවස්ථාවට පක්ෂපාතවීමේදී ස්ථිරව නොසැලී සිටිය යුතුය.

පහත්වූ නිම්න වට කළාවූ කඳු දෙවියන්වහන්සේගේ නිර්මාණ බලයට නිරතුරු සාක්ෂියක් විය. උන්වහන්සේ සාදා දෙන්නාවූ රැකවරණය ගැන ඒවා වෙනස් නොවන සහතිකයක් විය. යෙහෝවඃවහන්සේගේ වැඩ සිටීම, පෙන්නුම් කරන්නාවූ නිහඬ සංකේතවලට ආදරය කරන්නට මෙම වන්දනාකරුවෝ ඉගෙන ගත්තෝය. තමන්ට හිමි කොටස අමාරුකම්වලින් පිරී තිබුණ නමුත්, ඔවුන් ඒ පිළිබඳව ලත වුණේවත් ශාප කළේවත් නැත. එසේම කඳු මධ්‍යයේ ඔවුන්ට තනිකමක් දැනුණේද නැත. මිනිසුන්ගේ උදහස සහ කුරිරුකම් ඉදිරියෙහි තමන්ට අභය භූමියක් සාදා දීම ගැන ඔවුහු දෙවියන්වහන්සේට ස්තූති කළෝය. උන්වහන්සේ ඉදිරියෙහි නමස්කාර කරන්නට ලැබීමේ නිදහස ගැන ඔවුහු ප්‍රීති වූහ. සතුරන් විසින් නිතර ලුහු බඳිනු ලැබූ අවස්ථාවන්හිදී මෙම කඳු වැටි ඔවුන්ට රැකවරණය උදා කර දුන්නේය. උස් වූ කඳු ශිඛර මත රැඳී සිටිමින් ඔවුහු දෙවියන්වහන්සේට ප්‍රශස්ති ගී ගැයූ අතර ඔවුන්ගේ තුති පූජා ගී නැවැත්වීමට රෝම හමුදාවන්ට හැකියාවක් නොවීය.

මෙම ක්‍රිස්තු අනුගාමිකයන්ගේ ශ්‍රද්ධාව සහ භක්තිය පවිත්‍රව, සරලව මහත් උනන්දු සහගතව පැවතුණි. ගේදොර, ඉඩ කඩම්, නෑදෑ හිතමිතුරන් යනාදියටද, එසේය තමන්ගේ ජීවිතවලටද වඩා ඔව්හු සත්‍යතාවේ ප්‍රතිපත්ති අගය කළෝය. තරුණ පරපුරේ අයගේ හදවත් තුළ මෙම ප්‍රඥප්ති තැන්පත් කර මුද්‍රාකර තැබීමට ඔවුහු මහත් උනන්දුවක් දක්වූහ. කුඩා කාලයේ පටන්ම තරුණයන්ට ශුද්ධලියවිලි උගන්වා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ඉල්ලීම්වලට

ගරු සරු ඇතිව, භක්තියෙන් යුතුව ඒවා සලකන්නැයි දරුවනට උපදෙස් දෙන ලදී. බයිබල් පිටපත් බහුල නොවීය. එම නිසා එහි අගනා පාඨ කටපාඩම් කරන ලදී. අලුත් සහ පරණ තෙස්තමේන්තුවල පාඨ විශාල ගණනාවක් කටපාඩමින් පැවසීමට බොහෝ අයට හැකියාව තිබුණේය. දිනපතා ජීවිතයෙහිදී ලැබූ ආශිර්වාද සමග මෙන්ම සොබා දහමෙහි උතුම් දර්ශන සමගද දෙවියන්වහන්සේ පිළිබඳ සිතුවිලි මුසුකොට භාවිතා විය. සෑම අනුග්‍රහයක්ම දෙන්නාවූද සෑම සැප සම්පතක්ම දෙන්නාවූද තැනැන්වහන්සේ දෙවියන්වහන්සේ බව තේරුම් ගෙන උන්වහන්සේ දෙස කෘතඥපූර්වකව බැලීමට දරුවෝ ඉගෙන ගත්හ.

මෘදුකමින් හා සෙනෙහසින් යුතුවූ දෙමාපියෝ තම දරුවන් සැප සහිත ජීවිතයනට පුරුදු කිරීමෙන් වැළකී සිටියෝය. ඔවුන් ඉදිරියෙහි තිබුණේ කරදරවලින් පිරි දුෂ්කර ජීවිත පැවැත්මකි, සමහර විට වේද සාක්ෂිකාර මරණයකි. කුඩා අවධියේ සිට දරුවන්ට පුහුණුවක් ලබා දෙනු ලැබුවේ දුෂ්කරකම් විඳ දරාගැනීමටත්, පාලනයට යටත් වීමටත්ය. ඒ සමගම පුද්ගලික ලෙස සිතමින් තමාගේම කැමැත්ත අනුව ක්‍රියාකාරී වීමටත් ඔවුන්ට උගන්වන ලදී. වගකීම් භාර ගැනීමටත් ඒවා ඉටු කිරීමටත් දරුවන්ගේ කුඩා අවධියේ සිට ඔවුන්ට පුහුණුවක් ලබා දෙන ලදී. කථාබහ කිරීමේදී පරෙස්සම් වීමටත්, නිශ්ශබ්දතාවයේ ප්‍රඥව අවබෝධ කරගැනීමටත් දරුවෝ ගුරුකම් ලැබූහ. සතුරන්ගේ ඇසීමට හසුවන පරිදි නුවණට හුරු නැති වචනයක් පැවසීම කරණකොටගෙන එම තැනැත්තාගේ ජීවිතය පමණක් නොව ඔහුගේ සහෝදරයන් සිය ගණනාවකගේ ජීවිතවලට වුවද භයානක තත්ත්වයක් උදා වීමට ඉඩ තිබුණි. කුමක්හෙයින්ද තම ගොදුර ඩැහැ ගැනීමට මාන බලමින් යන්නාවූ වෘකයන් සේ සත්‍යතාවේ සතුරෝ ආගමික ඇදහිල්ල සඳහා නිදහසක් ඇතැයි පැවසීමට තරම් නිර්භීත වූවන් සොයමින් අවදියෙන් සිටියෝය.

සත්‍යතාව උදෙසා වොල්ඩන්සිවරු තම ලෞකික සමෘද්ධිය අත්හැර දැමුවෝය. තම ආහාර වේල සොයා ගැනීම සඳහා ඔවුහු මහත් ඉවසීමෙන් යුතුව වෙහෙස මහන්සිවී වැඩ කළෝය. කඳු අතර ඇති නිම්නයන්හි වගා කළ හැකි සෑම භූමි භාගයක්ම, ඉතා ප්‍රවේසමෙන් සංවර්ධනය කරන ලදී. තැනිතලාවන් මෙන්ම නිසරු බෑවුම්ද වගාකොට අස්වනු ලබාගන්නා ලදී. තමන්ගේ එකම උරුමය ලෙස ළමුන්ට ලැබුණු අධ්‍යාපනයේ කොටසක් වුණේ ආර්ථිකය පාලනය කරගැනීම සහ දැඩි ආත්ම දමනයක් ඇතිව සිටීමය. දෙවියන්වහන්සේ ජීවිතය සැලසුම් කර ඇත්තේ හික්මවීම පෙරදැරිව බවත් ඔවුන්ගේ උවමනාකම් සපයා ගත හැකිවන්නේ පුද්ගලික වෙහෙස මහන්සියෙන් බවත් ඔවුන්ට උගන්වා තිබුණි. එකී වැඩ පිළිවෙල වෙහෙසකාරීය, අසීරුය. එසේ



වුවද, එම වැඩ පිළිවෙල වැඩදායකය, අර්ථවත්ය. පාපයට වැටුණු මිනිසාට එවැන්නක් අවශ්‍ය විය. එය වනාහි මිනිසාගේ පුහුණුව සහ වර්ධනය සඳහා දෙවියන්වහන්සේ සපයා දුන් අධ්‍යාපනයයි. වෙහෙස මහන්සි වී වැඩ කිරීමට මෙන්ම අමාරුකම් විඳ දරා ගැනීමටත්, යෞවනයන්ට පුරුදු කළ අතර, ඔවුන්ගේ බුද්ධි වර්ධනය අතපසු කරනු ලැබුවේ නැත. ඔවුන් සතු සියලු බලය දෙවියන්වහන්සේට අයිති බවත් ඔවුන් එම කුසලතා සියල්ල උන්වහන්සේගේ සේවය සඳහා වැඩි දියුණු කර, වර්ධනය කළ යුතු බවත් ඔවුන්ට උගන්වන ලදී.

පවිත්‍රතාවෙන් සහ සරල බවින් සැදී පැහැදී සිටි මේ වෝඩෝ සභාවන් අපොස්තුළුවරුන්ගේ කාලයේ තිබූ සභාවට සමාන විය. පාප්වරයාගේ සහ නායක පූජකයන්ගේ ආධිපත්‍ය ප්‍රතික්ෂේප කළ ඔවුහු ශුද්ධ බයිබලය වනාහි අති ශ්‍රේෂ්ඨවූද, වැරදිය නොහැකිවූ ද එකම අධිකාරී බලය බව විශ්වාස කළහ. මහත් උජාරුකමින් වැජඹුනු රෝමානු පූජකවරුන් ලෙස නොව වෝඩෝ සභාවේ දේවගැතිවරු තමන්ගේ ස්වාමියාණන්ගේ, "සේවය ලබන්ට නොව සේවය කරන්ටය," යන ආදර්ශය අනුගමනය කළෝය. දේවගැතිවරු දෙවියන්වහන්සේගේ රැළ පෝෂණය කරමින් උන්වහන්සේගේ ශුද්ධ වූ වචනයේ නිල් තණ බිම් කරාද ජීවමාන ජල උල්පත් කරාද ඔවුන් යොමු කළහ. මිනිස් නිර්මාණ කලාවේ විභූතිය සහ උදාර මහිමය පෙන්නුම් කරන්නාවූ විශාල දෙව් මැදුරු තුළ නමස්කාර කිරීමේ භාග්‍යය වෝඩෝ බැතිමතුන්ට හිමි නොවීය. මොවුන් නමස්කාර කළේ ඇල්පයින් නිම්නයේ කඳු සෙවනැලි යටතේය. තර්ජන එල්ල වූ කල්හි, සවන් දෙන පිණිසත් ඔවුහු ගල් බොරළු ඇති කඳු බලකොටුවල රැස්වූවෝය. එම ස්ථානවලදී ඔව්හු ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන්ගෙන් ලැබෙන්නාවූ සත්‍යතාවේ වදන්වලට ඇහුම්කන් දුන්හ. එම දේවගැතිවරු ශුභාරංචිය දේශනා කළා පමණක් නොව ලෙඩුන් බැහැ දැකීමටද ගියෝය, දරුවන්ට ඉගැන්වූහ, වැරදි කරන්නාවූ අයට අනුශාසනා කළෝය, වැරදි අවබෝධතා තිබූ අවස්ථාවන්හිදී ඒවා විසඳීමට මහන්සි ගත්තෝය, බැතිමතුන්ට සහෝදර ප්‍රේමයෙන් බැඳී සිටීමට උපකාර කළෝය. සමාදානය පැවති කාලයන්හිදී, සාමාජිකයන් සිය කැමැත්තෙන්ම ලබා දුන් සම්මාදම් මුදල්වලින් ඔවුන්ගේ යැපීම සිදුවිය. එසේ වුවද, අවශ්‍යතාවක් ඇති වී නම් කූඩාරම් සාදන්නාවූ පාවුල්තුමා තමන්ගේ නඩත්තුව සඳහා කළාක් මෙන් ඔවුහුද යම්කිසි වෘත්තියක් හෝ වෙළඳාමක් කිරීමේ යෙදුණාහ.

තරුණ කැළ තම දේවගැතිවරුන්ගෙන් උපදෙස් ලබා ගත්තෝය. පොදු අධ්‍යාපනය සඳහා අවධානය යොමුකළ අතර බයිබලීය අධ්‍යයනයට විශේෂ තැනක් හිමි විය. ඔව්හු මතෙව්ගේ හා යොහන්ගේ ශුභාරංචි දෙක හා යැවුම් පත්‍ර සමහරක්ද කටපාඩම් කළහ. ශුද්ධ

ලියවිලි පිටපත් කිරීමටද ඔවුහු නියැලුණාහ. සමහර අත්පිටපත්වල සම්පූර්ණ බයිබලයම අඩංගු වී තිබුණේය. තවත් පිටපත්වල තිබුණේ කෙටි තෝරා ගැනීම් පමණකි. ශුද්ධලියවිලි විග්‍රහ කරමින් අර්ථය විස්තර කරදීමට හැකියාව තිබූ අය විසින් ශුද්ධ ලියවිලි පාඨ සමග එම විග්‍රහයන්ද ඇතුළත් කරන ලදී. තමාව දෙවියන්වහන්සේට වඩා ඉහළින් උසස් කර තබාගැනීමට වෑයම් කළ අය විසින් කාලයක් පුරා වසන් කර තිබූ සත්‍යතාවයේ නිධාන මෙසේ බැතිමතුන් කරා ළඟා විය.

ඉතා ඉවසීමෙන් යුතුව ක්‍රියා කරමින් වෙහෙස මහන්සි නොබලා සේවය කරමින් සමහර අවස්ථාවන්හිදී ගැඹුරු අඳුරු ගුහාවල ජීවත් වෙමින් මේ භක්තිවන්තයෝ පන්දම් එළිවල ආධාරයෙන් ශුද්ධලියවිලි පිටපත් කළහ. පාඨයෙන් පාඨය ලෙසින් පරිච්ඡේදයෙන් පරිච්ඡේදය ලෙසින් ශුද්ධ ලියවිලි මෙසේ ග්‍රන්ථාරූඪ විය. පිටපත් කිරීමේ ක්‍රියාවේදය අඛණ්ඩව සිදුවිය. එළිදරව් කරනු ලැබූ දෙවියන්වහන්සේගේ කැමත්ත පවිත්‍ර රත්රන් මෙන් බැබළෙමින් තිබුණේය. ලේඛණගත කිරීමේ ක්‍රියාදාමයෙහි යෙදීමේදී මුහුණ පාන්නට වූ ගැටළු හා බාධාවන් නිසා ශුද්ධ ලියවිලි කෙතරම් දීප්තිමත්ව, පැහැදිලිව සහ බලවත්ව පවතින්නේ දැයි පෙනී ගියේ ඒ සේවයේ යෙදී සිටියාවූ අයට පමණය. ස්වර්ගීය දේවදූතයෝ මෙම විශ්වාසවන්ත සේවකයන් වටා රැකවල් කරමින් සිටියෝය.

සත්‍යතාවයේ වචනය, බිමට හෙළා එය වැරදි ඉගැන්වීම්, මිථ්‍යාදෘෂ්ටික දහම් සහ අන්‍ය ආගමික ව්‍යාජ ඇදහිලි ක්‍රම නමැති කුණු කසල මගින් වසා දමන්නැයි පාප්වාදී පූජකයන්ව සහ නායකයන්ව සාතන් විසින් පොළඹවා තිබිණ. එහෙත්, අඳුර රජ කළ සමස්ත යුගය පුරාම කිසිම දූෂ්‍ය කිරීමකින් තොරව පුදුමාකාර අයුරකින් එය ආරක්ෂා කෙරිණ. දේව වචනය මත පිහිටා තිබුණේ මනුෂ්‍ය මුද්‍රාවක් නොව දෙවියන්වහන්සේගේම ලාංඡනයයි. ශුද්ධ ලියවිල්ලෙහි පැහැදිලිවූද සරලවූද අර්ථය ව්‍යාකූල කිරීමටද, එහි සාක්ෂි පරස්පර විරෝධී යැයි හුවා දක්වීමටද මිනිස්සු උත්සාහ කර තිබේ. මුහුදු තරංග මධ්‍යයේ නෝවාගේ නැව නොසෙල්වී තිබුනාක් මෙන් දේව වචනයද එය විනාශ කර දැමීමට තර්ජනාත්මකව එන්නාවූ කුණාටු යටපත් කරන්නේය. පස් තට්ටුවට යටින් ඇති පතලේ රත්රන් සහ රිදී නිධි සැඟවී තිබෙන්නාක් මෙන් මේ ලියවිල්ලෙහි ඇති සත්‍යයේ නිධාන එළිදරව් කරගැනීමට හැකිවන්නේ දැඩි උනන්දුවකින් යුතුව, එහි අන්තර්ගතය නිහතමානීව යාච්ඤාවෙන් යුතුව සොයන්නාවූ අයට පමණක්ය. මානව වර්ගයාට පාඩම් පොතක් ලෙස ශුද්ධ බයිබලය දෙවියන්වහන්සේ විසින් සැලසුම් කර දී තිබේ. ළමා වියේදීද තුරුණු සමයෙහිදීද වැඩිහිටි වයසෙහිදීද එකාකාරව මුළු කාලය පුරාම එය අධ්‍යයනය කළ යුතුය. උන්වහන්සේ තමන්වහන්සේගේ



වචන මිනිස් සතහට ලබා දුන්නේ එය තමන්වහන්සේගේම එළිදරව් කිරීමක් ලෙසය. අවබෝධ කරගනු ලබන සෑම අලුත් සත්‍යතාවයක්ම වනාහි එහි කතුවරයාණන්ගේ තවත් චරිත ගුණාංගයක නව හෙළිදරව්වකි. තම මැවුම්කාරයාණන් සමග සමීප සබඳතාවයකට ගෙන ඒම සඳහාද උන්වහන්සේගේ කැමැත්ත පිළිබඳව සුපැහැදිලි දැනගැන්මක් සඳහාද වූ දිව්‍ය අනුග්‍රහය ලැබූ ක්‍රමවේදයක් වන්නේ ශුද්ධලියවිලි අධ්‍යයනයයි. බයිබලය ඉගෙනීම දෙවියන්වහන්සේ සහ මිනිසා අතර ඇත්තාවූ සන්නිවේදන මාධ්‍යය වන්නේය.

දෙවියන්වහන්සේ කෙරෙහි බියවීම ප්‍රඥාවේ පටන් ගැන්ම ලෙස වෝල්ඩන්සිවරු අවධාරණය කළෝය. එසේ වුවද, ලෝකය සමග සම්බන්ධකමක් තිබීමේ වැදගත්කම ගැන ඔවුහු අන්ධව නොසිටියහ. මනස පුළුල් කරමින් අවබෝධ කරගැනීමේ හැකියාව කඩිනම් කිරීම සඳහා ලෝකය පිළිබඳවත්, මිනිසුන් පිළිබඳවත් ක්‍රියාශීලී දිවියක් පිළිබඳවත් දැනුමක අවශ්‍යතාව ඔවුහු අවබෝධ කරගෙන සිටියෝය. කඳුකරයෙහි පිහිටා තිබූ ඔවුන්ගේ පාසල්වලින් සමහර තරුණයන්ව වැඩිදුර අධ්‍යාපනය සඳහා ප්‍රංශයේ හෝ ඉතාලියේ විද්‍යා පීඨ කරා යොමු කරවන ලදී. මෙම විද්‍යා පීඨවලින් තමන්ගේ නිජ භූමි ඇල්ප්ස් කඳුකරයේ පාසැල්වලට වඩා වැඩිදුර අධ්‍යාපනයක්, චින්තනයක් සහ නිරීක්ෂණයක් ඔවුන්ට ලබාගත හැකි විය. මෙසේ යවනු ලැබූ තරුණයන් හට පරීක්ෂාවනට නැඹුරු වීමේ අවස්ථා බහුල විය. ඔවුන්ට අපරාධ දැකගත හැකි විය, සාතන්ගේ කූට නියෝජිතයන් මුණගැසීමට සිදුවිය. එකී නියෝජිතයෝ ඔවුන් මත ධර්ම විරෝධී සිද්ධාන්ත සහ ඉගැන්වීම් බලෙන් පැටවීමට සහ ඉතා දරුණු මුළාවන්ට ඔවුන් හසුකර ගැනීමට වෑයම් කළහ. එහෙත්, කුඩා කල සිට ලැබූ අධ්‍යාපනය මගින් මෙම සියලු ආපදාවන්ට මුහුණ දීමේ චරිත ශක්තියක් ඔවුන් තුළ ගොඩ නගා තිබුණේය.

වෝල්ඩන්සි සිසුන් කිසියම් පාසලක අධ්‍යාපනය ලැබුවද, එතැන්හිදී ඔවුන් විසින් කිසියම් කෙනෙකු කෙරේ සම්පූර්ණ විශ්වාසය නොතැබිය යුතු විය. ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් පිළියෙල කිරීමේදී ශුද්ධලියවිලි කොටස් අඩංගු අත්පිටපත් සඟවා තබාගත හැකි ලෙස එම ඇඳුම් නිර්මාණය වී තිබුණේය. ඔවුන් සතු අගනාම වස්තුව වූ ශුද්ධලියවිලි මාස ගණන්, අවුරුදු ගණන් වෙහෙස මහන්සි වී පිටපත් කරන ලද ඒවා විය. ඔව්හු මෙම ශුද්ධලියවිලි කොටස් රැගෙන ගියෝය. යම්කිසි කෙනෙක් සත්‍යතාව පිළිගැනීමට විවෘත හදවතක් ඇති බව ඔවුන්ට හැඟී ගියේ නම් එම පුද්ගලයාට ශුද්ධලියවිලි කොටසක් ලබාදීමට මෙම තරුණයෝ කටයුතු කළෝය. ඉතා ප්‍රවේසමින් සැකයක් ඇති නොවන ආකාරයෙන් මෙය සිදුකරන ලදී. මෙම අරමුණ පෙරදැරිව වෝල්ඩන්සියානු තරුණයෝ කුඩා කාලයේ සිටම තම මව්වරුන්ගෙන් පුහුණුව ලැබුවෝය. ඔවුහු තම වැඩ කොටස වටහාගෙන විශ්වාසවන්තව

එය ඉටු කළෝය. අධ්‍යාපනය ලබා දුන් මෙම ආයතන තුළ සත්‍ය ඇදහිල්ල උදෙසා ආත්ම දිනාගැනීම් සිදු විය. විටින් විට සත්‍ය ඇදහිල්ලේ ප්‍රතිපත්ති මුළු පාසල පුරාම පැතිර ගියේය. ඉතා සමීප ලෙසින් විමර්ෂණය කළද, මෙම දූෂ්‍ය ආගම් විරෝධීන් යයි කියනු ලබන්නන්ගේ සුලමුල ගැන හෝඩුවාවක් හෝ සොයා ගැනීමට පාප් සමවාදී නායකයන්ට නොහැකි විය.

ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය වනාහි දහම් ප්‍රචාරය කිරීමේ ආත්මයකි. පුනර්ජීවය ලැබූ හදවතෙහි මුල්ම පෙළඹවීම වන්නේ තවත් අය ගැළවුම්කාරයාණන් වෙත ගෙන ඒමය. කිතුණු බැතිමතුන් වූ වෝඩෝවරුන්ගේ ආත්මය එවැන්නක් විය. තමන්ගේ සභාවල පමණක් සත්‍යතාව පවිත්‍රතාවෙන් යුතුව රැකගෙන සිටීමට වඩා වැඩි යමක් දෙවියන්වහන්සේ තමන්ගෙන් බලාපොරොත්තු වන බව ඔවුන්ට හැඟී ගියේය. අඳුරෙහි සිටින්නාවූ ජනකාය අතර තමන්ගේ ආලෝකය බැබළෙන්නට හැරීමේ භාරදූර වගකීම තමන් වෙත පැවරී තිබෙන බව ඔවුන්ගේ කල්පිතය විය. රෝමය විසින් පනවා ඇති තහංචි දෙවියන්වහන්සේගේ වචනයේ බල මහිමයෙන් බිඳ දැමීමට ඔවුහු අවස්ථාවක් සෙව්වෝය. ධර්මදූත ප්‍රචාරකයන් වීම සඳහා වෝඩෝ දේවගැතිවරු පුහුණුව ලබා තිබුණෝය. දේව සේවයට බැඳීමට අපේක්ෂා කරන්නාවූ සෑම අයදුම්කරුවෙක්ම පූර්ව සුදුසුකමක් ලෙස දහම් ප්‍රචාරකයෙකු වශයෙන් අත්දැකීමක් ලබා තිබීම අනිවාර්ය විය. තම ගමේ සභාවක දේවගැතිවරයෙකු වශයෙන් පත්වීමක් ලැබීමට පෙර එම තැනැත්තා අඩු තරමින් වසර තුනක්වත් ධර්මදූත සේවාවෙහි යෙදී සිටීම අනිවාර්ය විය. මෙම සේවය කිරීමේදී මුල සිටම ආත්ම දමනය සහ පරිත්‍යාගශීලීවීම අවශ්‍ය සුදුසුකමවූ අතර, මිනිසුන්ගේ ආත්ම තදින්ම පිරික්සනු ලැබූ ඒ කාලයේදී එය දේවගැතිවරයෙකුගේ ජීවිතයට කදිම හඳුන්වා දීමක් විය. ශුද්ධ වූ තනතුර සඳහා ආලේපය ලැබූ තරුණයන් ඉදිරියේ දර්ශනය වූයේ ලෞකික ධන සම්පත් සහ කීර්තිය නොව දැඩි වෙහෙසින් කළ යුතු සේවය සහ අනතුරුදායක සිදුවීම්ය. සමහර විටෙක වේද සාක්ෂිකරුවෙකු ලෙස ජීවිතය පරිත්‍යාග කිරීමක්ද අවශ්‍ය වන්නට පුළුවන්කම තිබුණි. යේසුස්වහන්සේ තමන් ගෝලයන් පිටත් කර යැවූ ආකාරයෙන්ම මෙම ධර්මදූත සේවකයෝද දෙදෙනා බැගින් සේවයෙහි නිරත වූහ. තරුණ දේව සේවකයෙකු සමග අත්දැකීම් ඇති වැඩිහිටි සේවකයෙක් දහම් ප්‍රචාරයෙහි යෙදුණෝය. තරුණ සේවකයා තම සහකාරයාගේ මගපෙන්වීම යටතේ ක්‍රියා කළේය. තරුණයාට පුහුණුව ලබාදීම වැඩිහිටියාගේ වගකීම විය. ඔහුගේ ගුරුහරුකම් පිළිපැදීම තරුණයාගේ යුතුකම විය. මෙම දෙදෙනාම සෑම අවස්ථාවකදීම එක්ව නොසිටියහ. නමුත් නිරතුරුවම යාච්ඤාව සහ අනුශාසනා සඳහා ඔව්හු එක් වූහ. මෙසේ එකිනෙකා ඇදහිල්ලෙහි ශක්තිමත් වූවෝය.



තමන්ගේ මෙහෙවරෙහි අරමුණ ප්‍රකාශයට පත්කිරීම වූකලී පරාජය සහතික කිරීමක් විය. එම නිසා ඔවුහු තමන්ගේ නියමිත ස්වභාවය සඟවා ගෙන කටයුතු කළෝය. සෑම දේවගැතිවරයෙක්ම යම්කිසි වෙළඳාමක් හෝ වෘත්තියක් පිළිබඳව නිපුණතාවක් ලබා සිටි අතර, මේ දහම් ප්‍රචාරකයෝ ලෞකික ව්‍යාපාරයක යෙදෙන්නාවූ අයවලුන් ලෙස තම ආත්මික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළෝය. බොහෝ විට ඔවුහු වෙළඳ බඩු රැගෙන තැනින් තැන ඇවිදිමින් බඩු අලෙවි කරන වෙළෙන්දන්ගේ වෙස් ගත්තෝය. "වෙළඳාම සඳහා ඔව්හු සේද, ආභරණ සහ වෙනත් දැයද රැගෙන ගියෝය. පාරිභෝගිකයන්ට මෙම දේවල් මිලදී ගැනීමට නම් ඈත පිහිටි වෙළඳ සැල් කරා යෑමට සිදුවිය. එම නිසාම වෙළඳුන් ලෙස ඔවුන්ට ලැබුණේ උණුසුම් පිළිගැනීමකි. ඔවුන් දහම් පතුරුවන්නන් ලෙස ගෙවල් කරා ගියේ නම් ඔවුන්ව එළවා දැමීමට ඉඩ තිබුණි." [උපුටා ගැනීම අංක 2] පාරිභෝගිකයන් හට රත්රන් හෝ මැණික්වලට වඩා වටිනා වස්තුවක් පිළිගැන්වීමට ප්‍රඥාව ඉල්ලා ඔවුහු දෙවියන්වහන්සේට නිතර අයැදුම් කළෝය. ශුද්ධ බයිබල් පිටපත් කිහිපයක් ඔවුන්ගේ භාරයේ සඟවා ගෙන තිබුණේය. එය සම්පූර්ණ බයිබලය හෝ එහි කොටසක් හෝ විය. සුදුසු අවස්ථාවක් උදා වූ කල්හි ඔවුහු තම පාරිභෝගිකයන්ගේ අවධානය මෙම පිටපත් කෙරෙහි යොමු කළෝය. දෙවියන්වහන්සේගේ වචනය කියවීමේ ආශාව බොහෝ විට මේ මගින් පුබුදුවනු ලැබීය. ලබාගැනීමට ආශාවක් තිබූ කවරෙකු හෝ සමග ශුද්ධලියවිලි කොටසක් තබා යෑම බොහෝ විට සිදුවිය.

මෙම ධර්මදූතයන්ගේ වැඩ කටයුතු ආරම්භ වුණේ තමන් දිවි ගෙවූ කඳු පාමුල පිහිටි තැනිතලා බිම්වල සහ කඳු බෑවුම්වලය. එහෙත් ඔවුන්ගේ සේවය එම මායිම් අභිබවා ඉතා ඈත පෙදෙස් කරාද ව්‍යාප්ත විය. මේ අය පා වැසුම් භාවිතා කළේ නැත. තම ස්වාමියාණන්ගේ මෙන් ඔවුන්ගේ ඇඳුම් රළු විය, ගමන් කිරීමේදී ඒවා පැල්ලම් ගැසී තිබුණේය. ඔවුහු විශාල නගර මැදින් ගොස් ඈත එපිට පෙදෙස් කරා ගමන් කළෝය; සෑම තැනකම අගනා බීජය විසුරුවා හැරියෝය. ඔවුන්ගේ මාවතේ දෙව් මැදුරු බිහිවූ අතර වේදසාක්ෂිකරුවන්ගේ රුධිරය සත්‍යතාව වෙනුවෙන් සාක්ෂි දැරීය. විශ්වාසවන්තව තම වැඩ කොටස ඉටු කළ මෙම අයගේ ක්‍රියාදාමයන් මගින් විශාල ආත්ම ගණනාවක අස්වැන්නක් දිනාගෙන ඇති බව දෙවියන්වහන්සේගේ දවසෙහිදී අනාවරණය වනවා ඇත. කඩතුරාවකින් වැසී නිහඬව දෙවියන්වහන්සේගේ වචනය කිතුණු ලොව හරහා හමා ගියේය. මිනිස් හදවත්වලින්ද ඔවුන්ගේ නිවෙස්වලින්ද ප්‍රීතිමත් පිළිගැනීමක් දේව වචනයට ලැබුණේය.

වොල්ඩන්සිවරුන්ට ශුද්ධලියවිලි වනාහි අතීතයේදී දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ සමග ක්‍රියා කළ ආකාරය පිළිබඳ වාර්තාවක් හෝ

වර්තමානයේ වගකීම් සහ යුතුකම් පිළිබඳව වූ එළිදරව් කිරීමක් පමණක් හෝ නොවීය. එහෙත් ඒවා තුළින් ඔවුන්ට කියාපෑවේ අනාගතයේදී ඇතිවන උපද්‍රව සහ තේජස පිළිබඳවය. සියල්ලෙහි අවසානය වැඩි ඈතක නොවන බව ඔවුන්ගේ විශ්වාසය විය. ඔවුන් යාච්ඤාවෙන් සහ කඳුළින් යුක්තව බයිබලය අධ්‍යයනය කළ අතර, ශුද්ධ ලියවිල්ලෙහි ඇතුළත් ප්‍රකාශන ඔවුන්ගේ හදවත් තුළට කිඳා බැස්සේය. එහි ඇතුළත් ගැළවීම උදා කරන සත්‍යතාවන් අනෙකුත් අයගේ අවධානයට යොමු කිරීම ඔවුන්ගේ යුතුකම විය. ගැළැවීමේ සැලැස්ම ඉතා පැහැදිලි ආකාරයෙන් ශුද්ධ පිටුවල එළිදරව් කර ඇති බව ඔවුන් දුටු අතර, යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය රැඳවීම කරණකොටගෙන ඔවුන්ට සැනසීම, බලාපොරොත්තුව සහ සාමය සොයා ගැනීමට හැකි විය. දහම් ආලෝකය ඔවුන්ගේ තේරුම් ගැනීම ප්‍රභාවත් කොට ඔවුන්ගේ හදවත් ප්‍රීතියෙන් පිනායන්ට සැලැස්වීය. පාප් සමවාදී වරදෙහි අන්ධකාරයේ ඇලී ගැලී සිටි අය මත එම ආලෝකයේ රැස් දහරා පතිත කිරීමට ඔවුහු බොහෝසේ ආශාවූහ.

පාප්වරයාගේ සහ පූජකයාගේ මගපෙන්වීම යටතේ තමන්ගේ ආත්මවල පාපයට කමාව ලබාගැනීම සඳහා තමන්ගේ සිරුරුවලට වේදනා ගෙන දීමේ ක්‍රියාවේදයෙහි බැතිමතුන් බොහෝ දෙනා නිරර්ථකව උත්සාහ දරමින් සිටිනවා ඔවුහු දුටුවෝය. තමාගේ පාපවලින් ගැළවීම ලබාගැනීමට තමාගේ පුණ්‍ය ක්‍රියාවන් කෙරෙහි විශ්වාසය තැබීමට ජනතාවට උගන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වුණේ මිනිසුන් තමන් කෙරෙහිම අවධානය යොමු කරගැනීමය. ඔවුන්ට පෙනී ගියේ තමාගේ පාප නිසා තමා දෙවියන්වහන්සේගේ උදහසට ලක් වී ඇති බවය. ශරීරයට සහ ආත්මයට කෙතරම් වේදනා පමුණුවා ගත්තද, ඔවුන්ට ඒවායින් සහනයක් අත් වුණේ නැත. සිහි බුද්ධියෙන් යුක්තවූ ආත්ම මෙලෙස රෝමානු ධර්මතාවයන් මගින් බැඳ දමා තිබුණේය. තම මිතුරන් සහ නෑදෑයන් අත්හැර දමූ බැතිමත්හු දහස් ගණනින් කන්‍යාරාම සහ තාපසාරාම කාමරවලට වැදී හුදෙකලාව දිවි ගෙවූහ. දොස් තබන්නාවූ හෘදය සාක්ෂිය සංසිඳුවීම උදෙසා දහස් ගණන් බැතිමත්හු විවිධ උපක්‍රමයන් භාවිතා කළෝය. පාපයෙන් මිදීම සඳහා ඇදහිලිවන්තයෝ නැවත නැවතත් නිරාහාරව සිටිමින් තම සිරුර කටු අතුවලින් සහ කසයෙන් කුරිරු ලෙස තළා ගනිමින්ද මධ්‍යම රාත්‍රිය තෙක් යාච්ඤා කිරීමෙන්ද, තමන් දිවි ගෙවූ කුටියෙහි ශීතලවූ ද, තෙත් ගතියෙන් යුතුවූ ද ගලින් වූ බිම දිගා වී පැය ගණන් ගත කරමින්ද, දිගු කාලීන වන්දනා ගමන් යාමෙන්ද තමාටම දඬුවම් සහ වධ හිංසා පමුණුවා ගනිමින්ද ක්‍රියා කළෝය. හෘදය සාක්ෂියට සමාදානය ලබාගැනීම සඳහා ඔව්හු නිරර්ථක ආයාසයක යෙදුණෝය. තමා පව්කාරයෙක්ය යන හැඟීමෙන් බොහෝ අය හදවතින් පීඩා විඳ



දෙවියන් වහන්සේගේ පළිගැනීමේ උදහසට බියෙන් යුතුව දුක් වින්දෝය. ඔවුහු කාලයත් සමගම ඉදිරියට යමින් ආලෝකයේ කිරණක් හෝ නොලැබ බලාපොරොත්තුවක් නැතිව සොහොන් ගෙවලට බැස්සෝය.

ජීවනයේ රොටී ලබාගැනීම සඳහා කුසගින්නෙන් පීඩිතවූ මෙවන් ජනතාවට, දෙවියන්වහන්සේගේ පොරොන්දු තුළ නිදන් කර ඇති සාමයේ පණිවිඩ විවෘත කර දෙන්නට, ගැළවීම ලැබීමේ එකම බලාපොරොත්තුව ලෙස ක්‍රිස්තුස්වහන්සේ වෙත ඔවුන්ව යොමු කිරීමට, වෝල්ඩන්සිවරු බොහෝ සේ ආශා කළහ. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කැඩීමේ වරද සමනය කිරීමට යහපත් ක්‍රියාවලින් හැකි වේ යැයි යන ධර්මතාවය වැරදි සිද්ධාන්ත මත පාදක වී ඇති බවද ඒ සඳහා මිනිස් කුසලතා කෙරෙහි විශ්වාසය තැබීම වැරදි බවද වොල්ඩන්සිවරු විශ්වාස කළෝය. ක්‍රිස්තුස්වහන්සේගේ අනන්ත ප්‍රේමය මගින් උදාකර දෙන්නාවූ පව් කමාවට එය නිග්‍රහයකි. පාපයට වැටී ගිය මිනිස් වර්ගයාට දෙවියන්වහන්සේ හා සමගි වීමට කිසිවක් කළ නොහැකි නිසා මිනිසා උදෙසා පූජාවක් ලෙස යේසුස්වහන්සේ මරණයට පත්වූ සේක. කුරුසිපත් කරනු ලැබ මරණයෙන් උත්ථාන වූ ගැළවුම්කරුවාණන්ගේ කුසලතාවන් ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි අත්තිවාරම වන්නේය. ක්‍රිස්තුස්වහන්සේ මත ආත්මය රැඳී සිටීම අවශ්‍යය. මිනිස් සිරුරට අවයවයන් සම්බන්ධ වී තිබීම මෙන්ද අත්තක් මිදිවැල සමග සම්බන්ධ වී තිබීම මෙන්ද උන්වහන්සේ සමග ඇත්තාවූ සම්බන්ධතාවය යථාර්ථයක් විය යුතුය.

පාප්වරයාගේ සහ පූජකයන්ගේ ඉගැන්වීම් මිනිසුන්ට මගපෙන්වූයේ දෙවියන්වහන්සේ ඉතා දරදඬු වූද, දොම්නසින් පිරි අඳුරු වූද, භය උපදවන්නාවූ ද චරිත ගුණාංග වලින් හෙබි කෙනෙක් ලෙස දැකීමටය. පාපයට වැටුණු තත්ත්වයේ සිටින්නාවූ මනුෂ්‍යයාට ගැළවුම්කරුවාණන්ගේ අනුකම්පාව නැති බව පෙන්නුම් කරමින් එම අනුකම්පාව ලබාගැනීමට නම් පූජකයන්ගේ සහ සාන්තුවරයන්ගේ මැදිහත්වීම අවශ්‍ය බව ඔව්හු පැවසූහ. දෙවියන්වහන්සේගේ වචනය කරණකොටගෙන තම මනස් ආලෝකමත් කරනු ලැබූ අය සානුකම්පිත ආදරයෙන් පිරි ඉතිරී ගිය ගැළවුම්කාරයාණන් වන යේසුස් ක්‍රිස්තුස් වෙතට ආත්ම යොමු කිරීමට ආශා වූහ. උන්වහන්සේ දෙඅත් විදහා ගෙන තමාගේ පාප බරද කරදර සහ වෙහෙස ගෙන දෙන්නාවූ හිරිහැරද රැගෙන තමන්වහන්සේ වෙතට පැමිණෙන ලෙස ඔවුන්ට ආරාධනා කරන බව ඔව්හු දක්වූහ. තමන්ගේ පව් කියා දෙමින් දෙවියන්වහන්සේ වෙත කෙළින්ම පැමිණ පව් කමාව සහ සමාදානය ලබාගන්නා ලෙස වූ පොරොන්දු සහ ඇරයුම් නොදකින පිණිස සාතන් විසින් දමා තිබූ බාධක ඉවතට තල්ලුකර, දැමීමට ඔවුහු මහත් ආශාවෙන් සිටියෝය.

වෝල්ඩෝ මිෂනාරිවරයා මහත් උනන්දුවකින් විමර්ශනශීලී මනස්වලට ශුභාරංචියේ අගනා සත්‍යතාවන් විවෘත කළේය. ඔහු ඉතා සැලකිල්ලෙන් යුතුව අත් අකුරින් ලියූ ශුද්ධලියවිලි පිටපත් ඔවුන්ට දුන්නේ ඉතා ප්‍රවේසමෙන්ය. දෙවියන්වහන්සේව පලිගන්නාවූ ද, යුක්තිය ඉටු කිරීමට බලා සිටින්නාවූ ද කෙනෙක් පමණක් ලෙස දර්ශනය කළාවූද හෘදසාක්ෂියේ බලපෑමෙන් හා පාපයෙන්ද පීඩිතවූ ආත්මයට බලාපොරොත්තුව ලබාදීම ඔහුට ඉමහත් ප්‍රීතියක් විය. වෙව්ලන තොල්වලින්ද, කඳුළු පිරී දෙඇසින්ද යුතුව බොහෝ අවස්ථාවන්හිදී ඔහු දණින් වැටී පව්කාරයාගේ එකම බලාපොරොත්තුව එළිදරව් කරන්නාවූ අගනා පොරොන්දු තම සහෝදරයන්ට කියා දුන්නේය. සත්‍යතාවයේ ආලෝකය මෙසේ බොහෝ අඳුරු මනස් තුළට කාවැදී ගියේය. ඔවුන්ගේ මනස්වලින් අඳුරු සේයා මැවූ වලාකුළු පහවී ගොස්, දෙවියන්වහන්සේගේ සුවය රැගත් ධර්මිෂ්ඨතාවේ සූර්යයාගේ කිරණ පව්කාරයාගේ හදවත තුළට වැදී බැබළුණේය. බොහෝ අවස්ථාවන්හිදී, යම් ශුද්ධලියවිලි කොටසක් නැවත නැවතත් කියවන ලදී. කියවනු ලැබූ කරුණු තමන්ට නියමාකාරව ශ්‍රවණය වී දැයි දැන ගැනීමට ශ්‍රාවකයා ආශා වූ නිසා එම කොටස් නැවත නැවතත් කියවීමට සිදුවිය. "උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස්වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය." (1 යොහන් 1:7) "මෝසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිස ඔසවනු ලබන්ට ඕනෑය" (යොහන් 3:14,15) යන වාක්‍යයන් නැවත නැවතත් ඇසීමට ඔවුන් තුළ මහත් ආශාවක් විය.

රෝමය කළ ප්‍රකාශනයන් ගැන බොහෝ අය මුළාවේ වැටුණේ නැත. පව්කාරයා වෙනුවෙන් මිනිසුන් හෝ දේවදූතයන් මැදහත්කාරකම් කිරීම කෙතරම් නිරර්ථකදැයි ඔවුන්ට පෙනී ගියේය. සත්‍යවූ ආලෝකය ඔවුන්ගේ සිත් තුළට ඇතුල්වූ කල්හි ඔවුහු මහත් ප්‍රීතියෙන් යුතුව මෙසේ පවසන්නට වූහ: "ක්‍රිස්තුස්වහන්සේ මාගේ පූජකයාණන්ය, උන්වහන්සේගේ රුධිරය මාගේ පූජාවය, උන්වහන්සේගේ අල්තාරය මාගේ පාපොච්චාරණය වන්නේය." "ඇදහිල්ල නැතිව උන්වහන්සේව ප්‍රසන්න කරන්නට නුපුළුවන." (හෙබ්‍රෙව් 11:6) "අපේ ගැළවීමට අවශ්‍ය වූ, මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේ" (ක්‍රියා 4:12) යනාදි පාඨයන් නිතර නිතර පවසමින් ඔව්හු යේසුස්වහන්සේගේ පුණ්‍ය ක්‍රියාවන් මත සම්පූර්ණ විශ්වාසය තබා උන්වහන්සේ ඉදිරියේ වැඳ වැටුණෝය.

පරීක්ෂාවනට මැදි වී පීඩිතව, අසරණව සිටි සමහර අයට ගැළවුම්කාරයෙකුගේ ප්‍රේමය පිළිබඳ සහතිකය අවබෝධ කර ගත



නොහැකි විය. මෙවන් ආලෝක කදම්බයක් තමන් මත පතිත වීම කරණකොටගෙන ඔවුන්ට ළඟා වූ සහනය අති විශාලය. තමා ස්වර්ගය වෙත ගෙන යනු ලැබී යයි ඔවුන්ට හැඟී ගියේය. ඔවුන්ගේ දෑත් විශ්වාසයෙන් යුතුව ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී හස්තය මත තබන ලදී. ඔවුන්ගේ දෙපා, යුගයන්ගේ පර්වතය මත රඳවා තබන ලදී. මරණය ගැනවූ සියලු බිය පහ කරන ලද්දේය. තමන්ගේ මිදුම්-කරුවාණන්ගේ ශ්‍රී නාමයට ගෞරවයක් ලැබෙන්නේ නම් සිර ගෙය සහ වධක යාන්ත්‍රණය තමාට අත්වෙනවාට ඔවුහු ආශා වූවෝය.

රහසිගත ස්ථානයන්හිදී දේව වචනය විවෘත කරමින් කියවනු ලැබීය. සමහර අවස්ථාවන්හිදී එය එක් ආත්මයකට පමණක් විය. එසේම තවත් සමහර අවස්ථාවන්හිදී සත්‍ය ආලෝකය සඳහා ආශා කළ කුඩා කණ්ඩායම්වලට එය විවෘත කරන ලදී. සමහර අවස්ථාවන්හිදී මුළු රාත්‍රියම මෙලෙස ගත කරන ලදී. ශ්‍රාවක පිරිසගේ විස්මිත භාවය සහ ලැදියාව කෙතරම් ප්‍රබල වීද යත්, කරුණාවේ පණිවිඩ-කාරයාට තම කියවීම ස්වල්ප වේලාවකට නවතා දමන ලෙස ඉල්ලීමක් කරන ලද්දේ ඇසූ කාරණා එනම්, ගැළවීමේ ශුභාරංචි පණිවිඩ ග්‍රහණය කරගැනීමට අවස්ථාව සලසා ගැනීමටය. බොහෝ අවස්ථාවන්හිදී මෙවැනි වදන් පවසනු ලැබීය. "සැබවින්ම දෙවියන්-වහන්සේ මාගේ පූජාව පිළිගනීවිද? උන්වහන්සේ මා දෙස බලා ප්‍රසන්න වේවිද? උන්වහන්සේ මට කමාව දෙයිද?" මෙම ප්‍රශ්නවලට පිළිතුරු බයිබලයෙන් කියවනු ලැබීය. "වෙහෙස වන්නාවූ බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි." (මතෙව් 11:28)

ඇදහිල්ල මේ පොරොන්දු තදින් අල්ලා ගත්තේය. එකල්හි මේ දීප්තිමත් ප්‍රතිචාරය ඇසුණේය: "තවදුරටත් දුර බැහැර වන්දනා ගමන් යායුතු නැත. ශුද්ධ සුරුවම් වන්දනාව සඳහා වේදනාකාරී ගමන් බිමන් උවමනා නැත. මා සිටින්නාවූ පාපිෂ්ට සහ අශුද්ධ ආකාරයෙන්ම මට යේසුස්වහන්සේ වෙතට පැමිණීමට පුළුවන් වන අතර පසුතැවිල්ලෙහි වූ යාච්ඤාව උන්වහන්සේ ඉවත දමන්නේ නැත. "ඔබේ පව් කමා කරන ලද්දේය. ඔබගේ එසේය ඔබගේම පව්වලට කමාව ලැබේ!"

ශුද්ධවූ ප්‍රීතියේ රැල්ලක් හදවත් පිරවීය. ප්‍රශංසා සහ තුති ගී කරණකොටගෙන යේසුස්වහන්සේගේ නාමය ඔසවනු ලැබීය. ප්‍රීතියෙන් පිරී ඉතිරී ගිය එම පුද්ගලයන් තම නිවෙස් කරා පැමිණියේ තමන් ලැබූ ආලෝකය තවත් අය වෙත ලබාදීමටය, තමන්ගේ නව අත්දැකීම හැකි අයුරින් තවත් අය සමග බෙදා ගැනීමටය. සත්‍යයවූ ද, ජීවමානවූ ද මාර්ගය තමන්ට ලැබී ඇති බව ඔවුහු ප්‍රකාශ කර සිටියෝය.

සත්‍යය උදෙසා මහත් ලැදියාවක් දක්වූ අයගේ හදවත්වලට සෘජුවම කථා කිරීමට ශුද්ධ ලියවිල්ලෙහි වචන තුළ පුදුමාකාරවූද, උදාරවූද බලයක් තිබුණි. එය වනාහි දෙවියන්වහන්සේගේ හඬය. එය ඇසූ අයගේ හදවත් තුළ නොසැලෙන විශ්වාසයක් ජනිත කිරීමට එය සමත් විය.

සත්‍යතාවයේ පණිවිඩකාරයා තමාගේ ගමන යන්නට ගියේය. නිහතමානි, අවංක, අව්‍යාජ සහ මහත් ලැදිකමින් යුක්තවූ ඔහුගේ පෙනුම බොහෝ අයගේ කථා බහට මාතෘකාව විය. ඔහු ආවේ කොහෙන්ද, ඔහු යන්නේ කොතැනටද කියා ඔහුට සවන් දුන් කිසිවෙක් ඔහුගෙන් ප්‍රශ්න කළේ නැත. මුලදීම පුදුමයෙන්ද, පසුව කෘතඥතාවෙන් සහ ප්‍රීතියෙන්ද ශ්‍රාවකයන් කොපමණ වශීව සිටියේද යත් දහම් ප්‍රචාරකයාගෙන් ඒ ගැන විමසීමටවත් ඔවුන්ට කල්පනා වුණේ නැත. තමන්ගේ නිවෙස් වෙත පැමිණෙන ලෙස සමහරෙක් ඔහුගෙන් ඉල්ලුම් කළ විට එම ආරාධනාවට ඔහු පිළිතුරු දුන්නේ තමා දෙවියන්-වහන්සේගේ රැළෙහි නැතිවූ, මුළාව ගියාවූ බැටළුවන් බැහැ දකීමට යා යුතුය කියාය. මෙම දහම් ප්‍රචාරකයා ස්වර්ගයෙන් පැමිණි දේවදූතයෙක් දැයි සෙනඟ ප්‍රශ්න කළෝය.

බොහෝ අවස්ථාවන්හිදී මෙම සත්‍යයේ පණිවිඩකරුවා නැවත දකගැනීමට හැකිවූයේ නැත. සමහර විට ඔහු වෙනත් දේශයන් කරා යන්නට ඇත. එසේත් නැතිනම් ඔහු අප්‍රකට බිංගෙයක වැතිරී සිටියාද විය හැකිය. ඔහු සාක්ෂි දැරූ ස්ථානයක ඔහුගේ ඇට කටු දිරාපත් වෙමින් තිබීමද සැකයෙන් බැහැර කළ නොහැකි විය. කෙසේ වුවද, ඔහු බැතිමතුන් සමග තබා ගිය වචන විනාශ කිරීමට නොහැකි විය. ඔවුහු මිනිසුන්ගේ හදවත් තුළ ඔවුන්ගේ වැඩය කරමින් සිටියෝය. මෙම ක්‍රියාදාමයෙහි අශිර්වාදලත් ප්‍රතිඵල දන ගැනීමට හැකිවන්නේ විනිශ්චයේදී පමණක්ය.

වොල්ඩන්සි මිෂනාරිවරු සාතන්ගේ රාජ්‍යය ආක්‍රමණය කරමින් සිටියහ. සිදුවෙමින් පවතින දේවල් පිළිබඳව වඩාත් පරික්ෂාකාරී වීමට අන්ධකාරයේ බලවේග ක්‍රියාත්මක විය. සත්‍යතාවය ව්‍යාප්ත කිරීමට ගත්තාවූ සෑම වැයමක් කෙරෙහි නපුරේ කුමාරයා විශේෂ අවධානයකින් යුතුව බලා සිටි අතර, ඔහු තම නියෝජිතයන් තුළ බියක් ජනිත කළේය. තැනින් තැන යමින් සත්‍යතාවයේ ආලෝකය පතුරුවන්නාවූ මෙම නිහතමානී දහම් ප්‍රචාරකයන්ගේ මෙහෙවරය තමන්ගේ වැඩ පිළිවෙලට අනතුරුදායක බව පාප් සමවාදී නායකයෝ දුටුවෝය. බාධාවකින් තොරව සත්‍යතාවයේ ආලෝකය බැබළෙන්නට ඉඩ හැරියේ නම් ජනතාව වසාගෙන සිටි මිථ්‍යා වැරදි දහම් නමැති වලාකුළු සුනු විසුණු වී යනවා ඇත. එකල්හි මිනිසුන්ගේ මනස්



දෙවියන්වහන්සේ වෙත පමණක් යොමු වන අතර, රෝම ආධිපත්‍යය ක්‍රම ක්‍රමයෙන් විනාශවී යනවා ඇත.

පුරාණ සභාවේ ඇදහිල්ල දරමින් සිටි මෙම ජනතාවගේ පැවැත්ම පවා මිථ්‍යා දහම් වැළඳගත් රෝමයට නිරන්තර සාක්ෂියක් විය. එම නිසාම, ඔවුන්ට එරෙහිව අසීමිත වෛරය එල්ල වී දරුණු පීඩා ඇතිකිරීමේ වධක යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට ඔවුහු යොමු වූහ. එම කණ්ඩායම සතුව තිබූ ශුද්ධලියවිලි තමාට භාරදීමට ඔවුන් ප්‍රතික්ෂේප කිරීමද රෝමයට දරාගත නොහැකි විය. ඔවුන්ව පොළොව මතුපිටින් අතුගා දැමීමට රෝමය තීරණය කළාය. කඳුකරයේ නිවෙස්වල විසූ දෙවියන්වහන්සේගේ සෙනඟට විරුද්ධව භයානක ආගමික යුද ගිනි ඇවිල යාම ආරම්භ විය. ඔවුන් යන එන තැන්වලට පරීක්ෂක සභාවේ චරපුරුෂයන් යොදවා මිනීමරු කායින් ඉදිරියේ අහිංසක ආබෙල් මැරී වැටෙන දර්ශනය නැවත නැවතත් සිදු කෙරිණි.

ඔවුන්ගේ සරුසාර කෙත්වතු නැවත නැවතත් පුරන් විය. ඔවුන්ගේ වාසස්ථාන සහ ආත්මික ස්ථාන පොළොවට සමතලා වී ගියේය. වරක් සරුසාර කෙත්වතුද අහිංසක ක්‍රියාශීලී සෙනඟගේ ගෙවල්ද තිබූ තැන් දන් කාන්තාර බවට පත්ව තිබුණේය. මහත් බඩගින්නෙන් පීඩිත වූ මෘගයා ලේ රස වැටීමෙන් තවත් දරුණු වන්නාක් මෙන් දුක්විඳින්නාවූ තම ගොදුර දකීම නිසා පාප්සමවාදීන්ගේ ක්‍රෝධයද වර්ධනය විය. පවිත්‍ර ඇදහිල්ල උදෙසා සාක්ෂි දැරූ මෙම පුද්ගලයන් සැඟවී සිටි ස්ථාන සොයමින් පාප් සමයවාදීහු කඳුකරය හරහා ඔවුන් ලුහුබැඳ ගියෝය. විශාල කැළෑ සහ කඳු මුදුන්වලින් ආවරණය වී තිබූ නිම්න භූමි සිසාරා රෝමානුවෝ තම බිල්ල සොයා එම බිම් තරණය කළෝය.

මෙම බැතිමතුන්ට විරුද්ධව සදාචාරය කඩකිරීම් පිළිබඳ චෝදනා කිසිවක් ඉදිරිපත් කරන්නට නොහැකි විය. මෙම පුද්ගලයන් වනාහි සාමකාමී, නිශ්චල ජීවිතයක් ගත කළ, ආගමික භක්තියෙන් යුතු ජන කොටසක් බව ඔවුන්ගේ සතුරෝ පවා ප්‍රකාශ කළෝය. ඔවුන්ට විරුද්ධව ගොනු කළ මූලික චෝදනාව වූයේ ඔවුන් පාප්තුමාගේ කැමැත්තට අනුව දෙවියන්වහන්සේට නමස්කාර නොකිරීමය. මේ අපරාධය නිසා සෑම ආකාර නින්දාවන්ට, නිග්‍රහයන්ට, අපහාසයන්ට මුහුණ පාන්නට ඔවුන්ට සිදුවිය. එපමණක් නොව, මිනිසුන් විසින් හෝ යක්ෂයන් විසින් හෝ නිර්මාණය කළ හැකි වධ බන්ධන මෙම බැතිමතුන් මත ක්‍රියාත්මක කරන ලදී.

ද්වේෂයට ලක්වූ මෙම ජන කොටස මුලිනුපුටා දැමීමට රෝමය වරක් තීරණය කළාය. එකල්හි පාප්වරයා නිල ප්‍රකාශයක් නිකුත් කරමින් මෙම ජන කොටස ධර්ම විරෝධීන් නැතහොත් මිථ්‍යා

ලබ්ධිකයන් ලෙස හංවඩු ගසා ඔවුන්ව මරා දැමීමට නියෝග කළේය. වංක අය ලෙස, කිසිම වැඩක් නොකරන අය ලෙස හෝ නීති ගරුක නොවන අය ලෙස මොවුන්ට චෝදනා කරනු නොලැබූහ. ඔවුන්ට එල්ල වූ චෝදනාව නම් ඔවුන් විසින් ශ්‍රද්ධාවේ සහ පවිත්‍රතාවේ පෙනීමකින් යුතුව සත්‍ය ඇඟළුම් පැළඳ ගෙන "සැබෑ රැළෙහි බැටළුවන්" රවටා නොමඟ යැවීමය. "මෙම දුෂ්ටවූ, අශික්ෂිතවූ සතුරු ජන කොටස පාප්වරයාගේ අණසක අනුව නමස්කාර කිරීමට කැමති වන්නේ නැතිනම් ඔවුන්ව විෂකුරු සර්පයන් මෙන් පොඩි කර දැමිය යුතුය" යි පාප්වරයා නියෝග කළේය. [උපුටා ගැනීම අංක 3] මෙම අධිකාරී බලධරයාට මෙම වචනවලටම නැවත මුහුණ දීමට සිදුවන බව ඔහු දනගෙන සිටියේද? මෙම වචන ස්වර්ගයේ පොත්වල ලියනු ලබන බවත් විනිශ්චයේදී ඔහුට විරුද්ධව මෙම වචන එල්ල වන බවත් ඔහු දන සිටියාද? මෙවන් ක්‍රියාදාමයන් පිළිබඳව යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක: "මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නුඹුත් නුඹලා ඒක කළහුද ඒක කළේ මටය." (මතෙව් 25:40)

පාප්වරයා මෙම නියමයෙන්, අණඥවෙන් ඉල්ලා සිටියේ රෝමානු සභාවේ සෑම සභිකයෙක්ම මෙම ධර්ම විරෝධීන් විනාශ කිරීමට එක්වන ලෙසය. මෙම බැතිමතුන්ට එරෙහිව කරන්නාවූ ආගමීක යුද්ධයට බැඳෙන්නාවූ අයට මහා පරිමාණයේ දීමනා පොරොන්දු විය. "ඔවුන්ට විරුද්ධව එල්ල වන්නාවූ සියලු ආගමික චෝදනා-වන්ගෙන් සහ දඬුවම්වලින් ඔවුන්ට නිදහස දානය කෙරේ. යම්කිසි අවස්ථාවක ඔවුන් දිවුරා පොරොන්දු වීමක් කර තිබේ නම්, එහි බැඳීමෙන් ඔහුව මුදා හැරේ. නීතියට පටහැනිව යම් ඉඩමක් බලෙන් අත්පත් කරගෙන තිබේ නම් එම ඉඩමට නීත්‍යානුකූල ඔප්පුවක් ඔවුන්ට ප්‍රදානය කෙරේ. යම් ධර්ම විරෝධීන් මරා දමන්නේ නම් ඔහු විසින් කර ඇති සියලු පව්වලට කමාව ලැබේ. වෝඩෝ සාක්ෂිකයෙකුට වාසිදායක ගිවිසුමක් අත්සන් කර තිබේ නම් එම ගිවිසුම අවලංගු කරනු ලැබේ. ඔවුන්ගේ ගෙදර දොර සේවයට යමෙක් ගොස් සිටියේ නම් ඔහු වහාම එම සේවයෙන් ඉවත් කෙරේ. ඔවුන්ට කිසිම ආකාරයක උපකාරයක් කිරීම තහනම් විය. ඔවුන් සතු ඉඩම් තමන් සතු කරගැනීමට බලය ලබා දෙන ලදී." [උපුටා ගැනීම අංක 3] මෙම සිදුවීම් පසුපස ඇත්තාවූ ආත්මය කුමක් දැයි මෙම ලියවිල්ල පැහැදිලිව පෙන්නුම් කරයි. එය මහා සර්පයාගේ, ගෙරවීමේ හඬ වන්නේය. ලියවිල්ලේ හඬ දෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ හඬ නොවන බව සහතිකය.

දෙවියන්වහන්සේ විසින් දෙවා වදාරා ඇති උන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ප්‍රමිතියට අනුකූලව තම චරිත හැඩ ගස්වා ගැනීමට



පාප්සමවාදී නායකයෝ අකමැති වූහ. ඔවුන් කළේ තමන්ට යෝග්‍ය වන ආකාරයට ප්‍රමිතියක් සාදා ගෙන එය රෝමයේ කැමැත්ත වූ බැවින් සෑම අයෙකුටම මෙම ප්‍රමිතියට කීකරු වන ලෙස බලකිරීමය. අති භයානක ඛේදජනක සිද්ධීන් ක්‍රියාත්මක විය. සිත් කම්පා කරවන දුක්මුසු සිද්ධීන් ඉතිහාසයට එකතු විය. දූෂ්‍යවූද, දේව අපහාසාත්මක ලෙස ක්‍රියා කළාවූද පූජකවරු සහ පාප්වරු සාතන් විසින් ඔවුන්ට අණ කළ ක්‍රියාදාමයන්හි නිරත වූහ. ඔවුන්ගේ ස්වභාවයෙහි කරුණා ගුණය ගැවී තිබුණේවත් නැත. ක්‍රිස්තුස්වහන්සේ කුරුසිපත් කර උන්වහන්සේගේ ගෝලයන් මරා දැමූ ආත්මය දන් ක්‍රියාත්මකව පැවතියේය. තමාගේ දවසෙහිදී දෙවියන්වහන්සේට විශ්වාසවන්තව සිටි අය සිඳ දැමීමට ලේ පිපාසයෙන් සිටි නීරෝට මගපෙන්වූ එම ආත්මයම දෙවියන්වහන්සේ ප්‍රේම කළ ජනතාව පොළොවෙන් අතුගා දැමීමට දන් ක්‍රියාත්මක වෙමින් පැවැතියේය.

දේව භයෙන් යුතුවූ මෙම ජනතාව මත්තට සියවස් ගණනාවක් පුරා පැමිණි හිංසා පීඩා මිදුම්කරුවාණන් හට ගෞරවය ගෙන දෙන ආකාරයෙන් දඩි භක්තියෙන් සහ ඉවසිල්ලෙන් යුතුව විඳ දරා ගනු ලැබීය. තමන්ට විරුද්ධව ආගමික යුද්ධයක් පැවතියද, තම සගයන් අමානුෂික ලෙස මරා දමනු ලැබුවද, අගනා සත්‍යය විසුරුවා හැරීමට මිෂනාරිවරුන් යැවීම ඔවුන් නතර කළේ නැත. ඔවුන්ව මරා දමන තෙක් සතුරෝ ඔවුන් ලුහු බැඳ පැමිණියෝය. ඔවුන් විසින් වපුරන ලද බීජයට ඔවුන්ගේ රුධිරය ජලය සැපයූ අතර, එය සරු අස්වැන්නක් ලබා දුන්නේය. ලූතර් තුමාගේ උපතට සියවස් ගණනාවකට පෙර මෙලෙස වෝල්ඩන්සිවරු දෙවියන්වහන්සේ උදෙසා සාක්ෂි දැරූහ. විවිධ රටවල විසුරුවා හරිනු ලැබ සිටි මෙම බැතිමත් ජනතාව ප්‍රතිසංස්කරණයේ බීජ වැපිරීම සිදු කළෝය. මෙම ප්‍රතිසංස්කරණය ආරම්භ වුණේ වික්ලිෆ්තුමාගේ කාලයේදීය. ලූතර්තුමාගේ කාලයේදී එය පුළුල් ලෙස වර්ධනය වී ගැඹුරට මුල් ඇද ස්ථාවර ලෙස පිහිටා සිටියේය. කාලයාගේ අවසානය කරා මෙම ප්‍රතිසංස්කරණ කර්තව්‍යය ක්‍රියාත්මකව පැවැතිය යුතුය. මෙයට සහභාගි වන්නාවූ අය "දෙවියන්වහන්සේගේ වචනයද යේසුස්වහන්සේගේ සාක්ෂියද" (එළිදරව් 1:9) උදෙසා සියල්ල විඳ දරාගැනීමට කැමැති විය යුතුය.

---

උපුටා ගැනීම අංක 1 - D' Ahbigne, History of the Reformation of the Sixteenth Century," b. 17, Ch. 2.

උපුටා ගැනීම අංක 2 -Wylie, b. 1, Ch. 7.

උපුටා ගැනීම අංක 3 -Wylie, b. 16, Ch. 1

# 5

# ජෝන් වික්ලිෆ්

ප්‍රතිසංස්කරණයට පෙර සමහර යුගයන්හිදී ශුද්ධ බයිබලයේ පිටපත් තිබුණේ ඉතා ස්වල්පයක් පමණකි. එහෙත් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ වචනය සම්පූර්ණ වශයෙන් විනාශ කර දමන්නට ඉඩ හැරියේ නැත. එහි අඩංගු සත්‍යතාවන් සදහටම සඟවා තැබීම දේව සැලැස්ම නොවීය. තමන්වහන්සේගේ සේවකයන්ට නිදහස ලබාදීම සඳහා සිරගෙවල දොරවල් සහ යකඩ ගේට්ටු විවෘත කිරීමට උන්වහන්සේට හැකියාව තිබුණාසේම ජීවනයේ වචන බැඳ තැබූ යදම් බිඳ දැමීමටද උන්වහන්සේට බලය තිබුණේය. සඟවා තිබූ නිදන් වස්තු සොයන්නා සේ සත්‍යතාව සෙවීමට යුරෝපාකරයේ තිබූ සමහර රටවල ජීවත් වූ මිනිසුන්ව ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පොළඹවන ලදී. දිව්‍ය මගපෙන්වීම මගින් ශුද්ධලියවිලි කරා යොමු කරවනු ලැබූ ඔවුහු ශුද්ධ බයිබලයේ අඩංගු සත්‍යතාවන් මහත් උනන්දුවකින් යුතුව අධ්‍යයනය කළෝය. තමන්ට කුමන ප්‍රතිඵලයක් උදා වුවද ආලෝකය පිළිගැනීමට ඔවුන් තුළ දැඩි ආශාවක්, කැමැත්තක් විය. සෑම දැයක්ම පිළිබඳව සම්පූර්ණ වූ පැහැදිලි අවබෝධයක් ඔවුන්ට නොලැබුණි. දිගු කාලයක් පුරා වළලා දමා තිබූ සත්‍යතාවන් ගණනාවක් ගොඩ ගැනීමට ඔවුන්ට හැකි විය. ස්වර්ගයෙන් යවනු ලැබූ පණිවිඩකාරයන් මෙන් ඔවුහු වැරදි ඉගැන්වීම් මෙන්ම මිථ්‍යා ඇදහිලි සහ සම්ප්‍රදායන් නමැති යදම් බිඳ දමමින් සත්‍යතාවෙහි ආලෝකය රැගෙන මිනිසුන් කරා ගියෝය. කාලයක් පුරා වහල් භාවයට පත්ව සිටි අයට නැගිට තමන්ගේ නිදහස තහවුරු කර ගන්නැයි ඔවුහු ඔවුන්ගෙන් ඉල්ලා සිටියහ.

බොහෝ කාලයක් පුරා දෙවියන්වහන්සේගේ වචනය වෝල්ඩන්සිවරුන්ට හැර, උගතුන්ට පමණක් සීමා වූ භාෂාවන් වලින් අගුළුලා තිබුණේය. නමුත්, විවිධ රටවල විසූ ප්‍රජාවට තමන්ගේම මව් බසින් ශුද්ධලියවිලි කියවීමට පුළුවන් වන පිණිස එය පරිවර්තනය කිරීමට කාලය උදා වී තිබුණේය. ලෝකය තම මැදියම් රැය පසුකර තිබුණේය. අන්ධකාරයේ දවස් අවරට යමින් තිබූ අතර, අරුණෝදයේ ළහිරු රැස් බොහෝ රටවල උදා වෙමින් තිබුණේය.

දස සතර වැනි සියවසේදී "ප්‍රතිසංස්කරණයේ අළුයම් තාරකාව" යන නමින් හඳුන්වනු ලබන ජෝන් වික්ලිෆ් නමැති ඉංග්‍රීසි ජාතිකයා එංගලන්තයට පමණක් නොව සකල ක්‍රිස්තියානි ලෝකයටම ප්‍රතිසංස්කරණයේ හඬ උදාකර දුන්නේය. රෝමයට එරෙහිව ප්‍රකාශ



කරන්නට අවසර ලැබූ, ඔහු නැඟූ මහත් උද්ඝෝෂණ හඬ කිසිම දවසක නිශ්ශබ්ද කළ නොහැකි විය. ඔහුගේ උද්ඝෝෂණ විශාල විරුද්ධතා දක්වීමේ අරගලයක් බවට පත්වී එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතීන්ට, සභාවන්ට සහ පුද්ගලයන්ට ගැළවීම උදා විය.

වික්ලිෆ් නිදහස් මතධාරී අධ්‍යාපනයක් ලැබුවේය. ඔහුට දෙවියන්වහන්සේ කෙරෙහි භයවීම ප්‍රඥාවේ ආරම්භය විය. දැඩි භක්තිය, ශ්‍රද්ධාව යනාදිය ගැන ඔහු විදුහලේ කැපී පෙනුණේය. සහජ හැකියාවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේදී දක්ෂතා දක්වූ ඔහු දැනුම ලබාගැනීමේ පිපාසයෙන් පෙළී සෑම විෂයක් පිළිබඳවම දැනුමක් ලබා ගැනීමට මනාපයක් දක්වීය. අධ්‍යාපන දර්ශනවාදය හා සභාවෙහි ආගමික නීතිය මෙන්ම විශේෂයෙන්ම ඔහුගේම රටේ සිවිල් නීතිය පිළිබඳවද ඔහු අධ්‍යාපනය ලැබුවේය. පසු කාලයක ඔහු සේවයේ යෙදී සිටි සමයේදී ඔහු මුල් කාලයේ ලැබූ පුහුණුවේ වැදගත්කම කැපී පෙනුණි. එවකට තිබූ අනුමානයන්ගෙන් පිරි දර්ශනවාදය පිළිබඳව මනා වැටහීමක් ඔහු සතුවූ නිසා එහි වැරදි පෙන්නුම් කිරීමට ඔහුට හැකි විය. ජාතික හා ආගමික නීතිය පිළිබඳව ඔහු ලැබූ අධ්‍යාපනය, සිවිල් හා ආගමික නිදහස ද ලබාගැනීම සඳහා මහත් අරගලයක් දියත් කිරීමට ඔහුව සූදානම් කළේය. දෙවියන්වහන්සේගේ වචනයෙන් ලබාගත් ආයුධය ප්‍රවීනයෙකු ලෙස හැසිරවීමට හෙතෙම සමත් විය. බුද්ධිමය හික්මවීම ඔහු විද්‍යා පීඨවලින් ලබා තිබුණේය. අධ්‍යාපන වේදීන්ගේ උපක්‍රම ඔහු මනාව තේරුම් ගත්තේය. ඔහුගේ බුද්ධියේ බලයත් ඔහුගේ අති විශාල දැනුම් සම්භාරයත් මිතුරන්ගේ මෙන්ම සතුරන්ගේද ප්‍රණාමය ඉල්ලා සිටියේය. තම ජාතියේ බුද්ධිමත් ප්‍රඥවන්තයන් අතරෙහි තමන්ගේ වීරයා උත්තරීතර ස්ථානයක් හිමි කරගෙන සිටීම ඔහුගේ අනුගාමිකයන්ගේ තෘප්තියට හේතු විය. ඔහුගේ ප්‍රතිසංස්කරණවාදී වැඩපිළිවෙලෙහිදී ඔහු දැනුම නැති අයෙකු ලෙස හෝ දුර්වලයෙකු ලෙස හෝ හංවඩු ගසා ඔහුට විරුද්ධව දෝෂාරෝපණ ගෙන ඊමට සතුරන්ට හැකියාවක් නොවීය.

වික්ලිෆ් සරසවියේ ඉගෙනීම ලබන්නාවූ අතරවාරයේදී ඔහු ශුද්ධලියවිලි ඉගෙනීමද ආරම්භ කළේය. එම මුල් කාලවලදී බයිබලය තිබුණේ පුරාණ භාෂාවලින් පමණක් බැවින් උගතුන්ට සත්‍යයේ උල්පත කරා යාමට හැකියාව ලැබුණේය. අධ්‍යාපනයක් නොලැබූ අයට එම භාග්‍යය උදා නොවීය. මෙලෙස අනාගතයේදී ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස ක්‍රියාත්මක වීමට වික්ලිෆ්ට මාර්ගය පිළියෙල වී තිබුණේය. අධ්‍යාපනයක් ලැබූ අය දෙවියන්වහන්සේගේ වචනය හදාරා එහි එළිදරව් කර තිබූ නොමිලයේ දෙනු ලබන්නාවූ උන්වහන්සේගේ කරුණා අනුග්‍රහය නමැති ශ්‍රේෂ්ඨවූ සත්‍යය සොයා ගෙන තිබුණේය. ඔවුන්ගේ ඉගැන්වීම්වලදී ඔවුහු මෙම සත්‍යතාව පිළිබඳ දැනුම

ශ්‍රාවකයන්ට ලබා දුන්නෝය. මෙසේ ඔවුහු අනෙක් අයටද ජීවනදායක වචනය දෙසට හැරෙන්නට මග පෙන්නුවෝය.

වික්ලිෆ්ගේ අවධානය ශුද්ධලියවිලි වලට යොමු වූ කල්හි එහි සඳහන්ව ඇති කරුණු අධීක්ෂණය කරන්නට, උසස් අධ්‍යාපන පීඨයන්හි වියතෙකු වීමට ඔහු දරූ උත්සාහයට සමාන ආකාරයෙන්ම, දේව වචනය හැදෑරීම සඳහාද  ඔහු පරිශ්‍රමයක් දැරීය. මේ වන විට, ඔහුගේ උගත්කමින් හෝ සභාවේ ඉගැන්වීම්වලින් හෝ තෘප්තියට පත් කළ නොහැකි මහත් අවශ්‍යතාවයක් ඔහුට දැනුණේය. ඔහු මීට පෙර නිරර්ථකයේ සෙවූ දේවල් දේව වචනයෙන් ඔහුට සම්බ විය. මෙහි ගැළැවීමේ සැලැස්ම එළිදරව් කර තිබෙන ආකාරයත් මිනිසා වෙනුවෙන් සිටින්නාවූ එකම මැදහත්කාරයාණන් ක්‍රිස්තුස්වහන්සේ පමණක් බව දන්වා ඇති බවත් ඔහුට එළිදරව් විය. ඔහු තමාව ක්‍රිස්තුස්වහන්සේට සේවය කිරීම සඳහා කැප කර තමා සොයාගත් සත්‍යතාවන් ප්‍රචාරය කරන්නට අධිෂ්ඨාන කරගත්තේය.

පසුකාලීන ප්‍රතිසංස්කරණ වාදීන් මෙන්, තම වැඩකටයුතුවල ආරම්භයේදී  වික්ලිෆ්ටද තම අනාගත ගමන ගැන පූර්ව දැනුමක් නොවීය. රෝමයට විරුද්ධව ක්‍රියා කිරීමට ඔහු හිතාමතාම නැගී සිටියේ නැත. එහෙත්, සත්‍යයට ඔහු තුළ තිබූ කැපවීම වැරදි ඉගැන්වීම් සමග ගැටුමකට ඔහුව යොමු කළේය. පාප් අධිකාරියේ වැරදි ඔහුට වැඩි වැඩියෙන් පෙනී ගිය කල්හි ඔහු වැඩි උනන්දුවකින් ජ්වලිතයකින් යුතුව බයිබලීය ඉගැන්වීම් ඉදිරිපත් කළේය. මිනිස් සම්ප්‍රදායන් සුරැකීම සඳහා රෝමය විසින් දෙවියන්වහන්සේගේ වචනය එපා කර දමා ඇති බව ඔහුට පෙනී ගියේය. පූජක පක්ෂය විසින් ශුද්ධලියවිලි ජනතාව වෙතින් ඉවත් කර තිබේ යැයි ඔහු අභීතව පූජකයන්ට චෝදනා එල්ල කළේය. ශුද්ධ බයිබලය ජනතාව වෙත ලබා දෙන්නැයිද එහි අධිකාරිය නැවතත් සභාව තුළ පිහිටුවන්නැයිද ඔහු බලකර සිටියේය. ඔහු හැකියාව තිබූ, උනන්දුවෙන් යුතුවූ ගුරුවරයෙක් හා ප්‍රබල දේශකයෙක්ද විය. ඔහු ඉගැන්වූ සත්‍යතාවන් පිළිබඳව ඔහුගේ දිනපතා ජීවිතය සාක්ෂියක් විය. ශුද්ධලියවිලි පිළිබඳව ඔහු තුළ තිබූ දැනුමත්, ඔහුගේ තර්ක කිරීමේ වියත් භාවයත්, ඔහුගේ ජීවිතයේ පවිත්‍රතාවත්, ඔහුගේ නොසැලෙන ධෛර්යය සහ අවංක භාවයත් නිසා ජනතාවගේ පොදු අභිමානයත් විශ්වාසයත් ඔහුට හිමි විය. රෝමානු සභාවේ තිබූ පාප දුටු බැතිමත්හු තමන්ගේ ඇදහිල්ල පිළිබඳව කළකිරීමට පත්ව සිටියෝය. වික්ලිෆ් විසින් තමන්ගේ දසුනට යොමු කළ සත්‍යතාවන් දැකීමෙන් ඔවුහු ප්‍රීති ප්‍රමෝදයට පත්වී එය එළිපිටම ප්‍රකාශ කළෝය. නමුත් තමන්ට ලැබෙන්නාවූ සැලකිල්ලට වඩා වැඩි සැලකිල්ලක් මෙම ප්‍රතිසංස්කරණවාදියාට ලැබෙන බව දුටු පාප් සමවාදී නායකයෝ මහත් උදහසින් පිරුණෝය.



වරද දැකීමේ තීක්ෂණ බුද්ධියක් වික්ලිෆ් සතු විය. රෝමානු බල අධිකාරීන්ගේ අනුමැතිය ලැබූ නින්දා සහගත දූෂ්‍ය ක්‍රියාවන් බොහෝමයකට එරෙහිව හෙතෙම අභීතව පහර දුන්නේය. ඔහු රජතුමාගේ ආගමික වතාවත් පිළිබඳ වැඩබලන නිල දේවගැතිවරයා වශයෙන් සේවය කළ අවස්ථාවේදී ඉංග්‍රීසි රජතුමාගෙන් පාප් තුමා ඉල්ලා සිටි කප්පම් මුදල් ගෙවීමට විරුද්ධව ඔහු තීරණාත්මක පියවරක් ගත්තේය. ලෞකික රාජ්‍ය පාලකයෙකුට වඩා ඉහළ බලතල පාප්තුමාට ඇතැයි කියන්නාවූ ප්‍රකාශය තර්කයටත් එළිදරව්වටත් පටහැනි බව ඔහු පෙන්වා දුන්නේය. පාප්තුමා විසින් කප්පම් ඉල්ලා කළ අණකරය ගැන තද කෝපයක් පැවතුණි. ඒ අතර වික්ලිෆ්ගේ ඉගැන්වීම් කරණකොටගෙන ජාතියේ වියතුන්ගේ මනස්වලට ප්‍රබල අනුබලයක් ලැබිණ. ලෞකික දේ පිළිබඳව පාප් තුමා අයිතිවාසිකම් කියන්නාවූ අධිකාරී බලය සහ ඔහු ඉල්ලා සිටින්නාවූ බද්ද යන දෙකම ප්‍රතික්ෂේප කිරීමට රජතුමා සහ වංශාධිපතීන් ඒකමතිකව තීරණය කර ගත්හ. මෙලෙස එංගලන්තය කෙරේ තිබූ පාප් තුමාගේ ආධිපත්‍යයට විරුද්ධව විශාල පහරක් එල්ල කරනු ලැබීය.

මෙම ප්‍රතිසංස්කරණවාදියා දිගු කාලයක් පුරා තීරණාත්මකව, විරුද්ධ සටනක් දියත් කළ තවත් නපුරක් වූයේ යාචක පූජකයන්ගේ සංවිධාන පවත්වාගෙනයාම පිළිබඳවය. මෙම සංවිධානවල පූජකයෝ එංගලන්තය පුරා විශාල වශයෙන් පැතිර ගොස්, එම ජාතියේ ශ්‍රේෂ්ඨත්වයට සහ සමෘද්ධියට අනිසි ඵල ගෙන දුන්නෝය. කර්මාන්ත, අධ්‍යාපනය සහ සදාචාරය යන සියල්ල මොවුන්ගේ පැවැත්මෙන් අහේනිය කරා යොමු විය. මෙම පූජකයන්ගේ හිඟමනට කැපවූ අලස ජීවිත රටේ ජනතාවගේ සම්පත් සූරාකෑහ. එය කම්කරු ශ්‍රමය පිළිකුලට ලක් කළේය. තරුණයෝ දුසිරිතට යොමු වී දූෂ්‍ය වූහ. මේ පූජකයන්ගේ බලපෑම මත තපස් ශ්‍රමණ දිවියකට යොමු වී හුදෙකලා කුටියකට වැද මෙබඳු ජීවිතයකට කැපවීමට බොහෝ තරුණයෝ පොළඹවනු ලැබූහ. තරුණයෝ මෙම පියවර ගත්තේ තම දෙමාපියන්ගේ අනුදැනීමකින් තොරවය. ඔවුන් දෙමාපිය අවසරය නොලැබුවා පමණක් නොව ඔවුන්ගේ කැමැත්තට විරුද්ධවද ක්‍රියා කළෝය. සහෝදර ප්‍රේමයට සහ යුතුකම් ඉටු කිරීමට වඩා ඉහළින් තපස් නිකායකට ඇතුළු වීමේ අයිතිය ගැන රෝමානු සභාවේ මුල් පූජකතුමෙක් මෙසේ පවසා ඇත. "හඬමින් සහ වැලපෙමින් ඔබගේ පියා දොරටුව ඉදිරියේ වැතිර සිටියද ඔබේ මව තම ශරීරය දක්වමින් කිරි දුන් පියයුරු පෙන්වමින් ඔබට ආයාචනා කළද ඔබට ඇත්තේ ඔවුන් දෙපයින් පාගා දමා ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඉදිරියටම යෑමය.' මාටින් ලූතර් මෙම හිඟන පූජක නිකාය හඳුන්වා දුන්නේ: "අතිභයානක අමානුෂික කුරිරු තත්ත්වය" ලෙසය, "ක්‍රිස්තියානි සහ මිනිස් ගුණාංග ඇති කණ්ඩායමකට වඩා වෘක ගතිගුණ ඇති අනුකම්පා විරහිත ආයතනයක්ද" දෙමාපියන්ට විරුද්ධව දරුවන්ගේ සිත් පිත් නැති

තත්ත්වයකට පත්කරන්නාවූ දරදඬු පාලනයක් සතු රකුස් සංවිධානයක්ද ලෙසය. [උපුටා ගැනීම අංක 1]. යේසුස්වහන්සේගේ කාලයේ සිටි ඵරිසිවරුන් මෙන් මෙම පාප් සමවාදී නායකයෝ තමන්ගේ ගතානුගතික සම්ප්‍රදායන් ඔසවා තබමින් දෙවියන්වහන්සේගේ ආඥාව බල රහිත කළෝය. මෙසේ ගෙවල් ශෝකයෙන් පිරී පාළු තැන් බවට පත් විය. තමන්ගේ දූ පුතුන්ගේ සමාගම දෙමාපියන්ට අහිමි විය.

විශ්ව විද්‍යාලවල ශිල්ප හදාරමින් සිටි සිසුන් පවා පූජකවරුන්ගේ ව්‍යාජ ප්‍රකාශනවලට මුළාව තාපස නිකායවලට බැඳීමට පොළඹවනු ලැබූහ. තාපස නිකායට, ඇතුළු වීමෙන් තමන්ගේ ජීවිත කාලකණ්ණි වූ නිසාත් තමන් ගත් තීරණය නිසා දෙමාපියන්ට දුක සහ පීඩනය ඇතිවීම ගැනත් බොහෝ දෙනා පසුව සන්තාපයට පත් වූහ. එහෙත් එහි උගුලට අසු වීමෙන් පසුව ඉන් නිදහස ලැබීම් අපහසු විය. ඔවුන්ට ඉන් ගැළවීමක් නැති විය. පූජකවරුන්ගේ බලපෑමට අසුවේ යැයි බියෙන් බොහෝ දෙමාපියෝ තම පුතුන් විශ්ව විද්‍යාලවලට යැවීමට අකමැති වූහ. විද්‍යා පීඨවල සිසුන්ගේ සංඛ්‍යාව විශාල ලෙස පහත වැටිණි. විදුහල් පිරිහීමට පත් විය, නූගත්කම සෑම තැනකම පැවැතියේය.

බැතිමතුන්ගේ පාපොච්චාරණවලට ඇහුම්කන් දීමටත් පව්වලට සමාව දීමටත් පාප් තුමා මෙම පූජකවරුන්ට බලය පවරා දුන්නේය. මෙය නපුරට මහත් රුකුලක් විය. තමන්ගේ ලාභ ප්‍රයෝජන තර කරගැනීමට නැඹුරු වී මේ පූජකවරු කුමන ආකාරයේ හෝ පව්වලට සමාව දීමට සූදානමින් සිටි නිසා විවිධ ආකාරයේ අපරාධකරුවෝ ඔවුන් වෙතට පැමිණියහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉතා දරුණු දූෂණ සහ අපරාධ සීඝ්‍රයෙන් ඉහළ නැංගේය. දුගීවූ ද, රෝගීවූ ද අයව දුක් විඳීමට හරින ලදී. ඔවුන්ට පිහිට වන්නට තිබූ මිල මුදල් පූජකයන්ගේ අතට පත් විය. තමන්ට දානය දෙන්නැයි පූජකවරු තර්ජනය කර බල කළෝය. තමන්ගේ නිකායට තෑගි භෝග ලබා දෙන්නේ නැති අය භක්තියක් නැති අය ලෙසින් පූජකයන්ගේ අවමානයට ලක් වූහ. තමන් දුගී පූජකයන් යැයි ඔවුන් පැවසුවද ඔවුන්ගේ ධන සම්පත් නිරතුරුවම වර්ධනය විය, ඔවුන්ගේ දකුම්කළු මාළිගා සහ සුඛෝපභෝගී කෑමවලින් පිරුණාවූ මේස ඔවුන්ගේ ජාතියේ දුගී භාවය වර්ධනය වන බව පෙන්නුම් කළේය. සුඛෝපභෝගී ජීවිත ගත කරමින් සැප සෙල්ලමින් දිවි ගෙවූ ඔවුහු තමන් වෙනුවෙන් ජනතාව අතරට නූගත් මිනිසුන් යවමින් ඉතා පුදුමාකාර ප්‍රබන්ධ වමාරමින්, මිථ්‍යා හෝ අද්භූත කථාන්තර පවසමින්, ජනතාව විනෝදයට පත් කිරීමට විහිළු තහළු පවසමින් ඔවුන් වෙතට ජනතාව ඇදගැනීමට ඇම දුන්නෝය. මිථ්‍යා ඇදහිලිවල ඇලී ගැලී සිටි ජනතාව කෙරෙහි තම ග්‍රහණය දැඩි ලෙසින් තද කරගනිමින් ඔවුන්ට ස්වර්ගයේ ස්ථානයක්



හිමිකර ගැනීමට අවශ්‍ය වූ ආගමික වතාවත් වන්නේ පාප් තුමාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගැනීමත්, සාන්තුවරයන්ට වන්දනා කිරීමත්, පූජකයන්ට තෑගි භෝග ලබාදීමත් බව විශ්වාස කිරීමට ඔවුහු මිනිසුන්ට මගපෙන්වූහ.

මෙම පූජක පිළිවෙල තුළට ප්‍රතිසංස්කරණයක් ගෙන ඒමට බුද්ධිමතුන් සහ සැදැහැවතුන් නිරර්ථකයේ මහත් පරිශ්‍රමයක් දරා තිබුණි. මෙම ක්‍රියාදාමය පිළිබඳව සුපැහැදිලි අවබෝධයක් තිබූ වික්ලිෆ් නපුරේ මුලටම පහර එල්ල කළේය. එම පද්ධතියම වැරදි සහගත බවත් එය අවලංගු කර දැමිය යුතු බවත් ඔහු ප්‍රකාශ කළේය. සාකච්ඡා සහ විමසීම් පිබිද එන්නට පටන් ගත්තේය. දේශයේ තැනින් තැන යමින්, පාප්තුමාගේ පව් සමාව අලෙවි කරමින් මේ පූජකවරුන් ක්‍රියාත්මක වූ විට මුදලට පව් කමාව ලබාගත හැකිවේදෝයි බොහෝ අය තුළ සැකයක් ඇති විය. රෝමයේ බලධරයාගෙන් නොව තමන් දෙවියන්වහන්සේගෙන් පව් කමාව ඉල්ලා සිටිය යුතු නොවේදැයි ඔවුහු ප්‍රශ්න කළෝය. කිසිම දිනක හෝ නොසන්සිඳෙන තෘෂ්ණාවක් තිබූ පූජකයන්ගේ ඉතා ගිජු කෑදරකම බොහෝ දෙනෙකු බියට සහ චකිතයට පත් කළේය. "රෝමයේ පූජකයෝ සහ යාචක පූජකයෝ පිළිකාවක් මෙන් අපව ගිලගනිමින් සිටිති. දෙවියන්වහන්සේ අපව මුදවාගත යුතුය, නැතිනම් අපි විනාශ වන්නෙමු" යයි බොහෝ මිනිස්සු පැවසූහ. [උපුටා ගැනීම අංක 2] මුදලට වූ තමන්ගේ කෑදරකම වසාගැනීම සඳහා මෙම හිඟන පූජකවරු විකල්පයක් ගෙන හැර දක්වූවෝය. තමා ගැළවුම්කරුවාණන්ගේ ආදර්ශය අනුගමනය කරන බවත් යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයන් ජීවත් වුණේ ජනතාවගෙන් ලැබූ දීමනාවලින් බවත් හේතු සාධකව දක්වමින් තමන්ද එසේ කරන බව ඔවුහු කීවෝය. මෙම කරුණු ඉදිරිපත් කිරීම ඔවුන්ගේ කර්තව්‍යයට බාධාවක් විය. මක්නිසාදයත් ඒ කාරණාවල යුක්තියත් එහි සත්‍යතාවත් දනගැනීමට බොහෝ දෙනෙක් බයිබලයේ අඩංගු කරුණු සොයන්නට මගපෙන්වනු ලැබූහ. එයින් උදා වූ ප්‍රතිඵලය රෝමයේ සතුටට හේතු නොවීය. මිනිසුන්ගේ මනස් සත්‍යතාවයේ උල්පත වෙත යොමු විය. එය සඟවා තැබීම සභාවේ අරමුණ විය.

මේ යාචක පූජකයන්ට එරෙහිව පත්‍රිකා ලියා පලකිරීමට වික්ලිෆ් පටන් ගත්තේය. ඔවුන් සමග මත භේදයකට යොමු වීම ඔහුගේ අරමුණ නොවීය. බයිබලයේ ඉගැන්වීම් හා එහි කර්තෘවරයාණන් වෙතට අවධානය යොමු කිරීම සඳහා ජනතා මනස පෙළඹවීම ඔහුගේ අභිප්‍රාය විය. යම් පුද්ගලයෙකුට කමාව දීම හෝ පුද්ගලයෙකු සභා සාමාජිකත්වයෙන් නෙරපා දැමීම පාප් තුමාට හිමි වූ තනි බලයක් නොව වෙනත් සාමාන්‍ය පූජකයෙකුටද එම වරම හිමි බව

ඔහු ප්‍රකාශ කළේය. යම්කිසි පුද්ගලයෙක් දෙවියන්වහන්සේගේ දෝෂාරෝපණය තමා පිටම පවරා ගන්නේ නැතිනම් ඔහුව සභා සාමාජිකත්වයෙන් ඉවත් කළ නොහැකි යැයි හෙතෙම පැවසීය. ආත්මික හෝ භෞතික ආධිපත්‍යය නමැති අති විශාල කඩතුරාව සුනු විසුණු කරදැමීමට මෙයට වඩා සාර්ථක කාර්යය සාධක පියවරක් ඔහු සතුව තිබුණේ නැත. පාප් තුමා විසින් ඉදිකර තිබූ මෙම කඩතුරාව මගින් දස දහස් සංඛ්‍යාත බැතිමතුන්ගේ ශරීර සහ ආත්ම ග්‍රහණය කරනු ලැබ තිබුණේය.

ඉංග්‍රීසි ඔටුන්නෙහි අයිතිවාසිකම් බලෙන් අත්පත් කරගැනීමට රෝමානුවන් විසින් තැත් කිරීමේදී තම රජයේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට වික්ලිෆ්ව නැවත වරක් කැඳවනු ලැබීය. රාජකීය තානාපතිවරයෙකු වශයෙන් පත්වීම් ලැබ ඔහු නෙදර්ලන්තයේ අවුරුදු දෙකක් ගත කළේය. එහිදී ඔහු පාප්තුමාගේ බලය ලත් නිලධාරීන් සමග සම්මන්ත්‍රණයන්ට සහභාගි විය. ප්‍රංශයෙන්, ඉතාලියෙන් සහ ස්පාඤ්ඤයෙන් පැමිණි ආගමික විශාරදයන් සමග සාකච්ඡා කිරීමට ඔහුට එහිදී ඉඩ ප්‍රස්ථාව ලැබුණේය. පාප් සමවාදීන්ගේ ක්‍රියාදාමයන්හි සහ ඉගැන්වීම්වල යටි අදහස්, අභ්‍යන්තර අරමුණු දැනගැනීමට මෙසේ ඔහුට හැකි විය. තිරය පසුපස අරක්ගෙන තිබූ යථාර්ථය ඔහුට පැහැදිලිව දැකගැනීමට අවස්ථාව ලැබුණේය. එංගලන්තයේ සිටියා නම් මෙම දේවල් දැනගැනීමට ඔහුට ඉඩක් ලැබෙන්නේ නැත. ඔහු විසින් පසු කලෙක නිරත වන්නාවූ සේවාවන් සඳහා භාවිතා කළ හැකි කරුණු රාශියක් ඔහු මෙසේ ඉගෙන ගත්තේය. පාප්තුමාගේ බල මණ්ඩලයේ සිට පැමිණි මෙම පාප් සමවාදී නියෝජිතයන්ගෙන් පාප් තුමාගේ බල අධිකාරියෙහි අරමුණු මෙන්ම ඇයගේ සත්‍යය වූ චරිතයද පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට ඔහුට හැකි විය. රටින් බැහැරව යාමට පෙර තමා කළ ඉගැන්වීමේ කටයුතු තවදුරටත් විවෘතව කරගෙන යාමේ අදිටනින් ඔහු පෙරළා එංගලන්තයට පැමිණියේය. රෝමයේ දෙවිවරුන් වන්නේ අනුන්ගේ දෙයට ආශාකිරීම, අහංකාරය සහ රැවටීම බව ඔහු වැඩි ජ්වලිතයකින් යුතුව අභීතව ප්‍රකාශ කළේය. පාප්තුමා සහ ඔහුගේ බදු එකතු කරන්නන් ගැන ඔහු වරක් තම පත්‍රිකාවක මෙසේ ප්‍රකාශ කළේය: "අපේ රටේ දුගී ජනතාවගේ ජීවිකාව සඳහා වූ සම්පත් ඔවුන් ඩැහැ ගන්නෝය. ආගමික වත්පිළිවෙත් සහ ආත්මික දේවල් සඳහා යැයි කියමින් වසරක් පාසා ඔවුහු රජතුමාගේ මුදල්වලින් පවුම් දස දහස් ගණනින් අය කරගනිති. මෙය වනාහි ආත්මික දේවල් මුදලට විකිණීමේ ශාපලත් ව්‍යාපාරයකි. සකල ක්‍රිස්තියානි ලෝකයම ඔහුට අවනත වීමටත්, එය පිළිගැනීමටත්, එය පවත්වා ගෙන යැමටත් ඔවුහු සලස්වති. අප රාජධානියෙහි විශාල රත්රන් කන්දක් තිබුණේය. එයින් කිසිවක් හෝ



කඩා ගැනීමට කිසිම මනුෂ්‍යයෙක් උත්සාහ කළේ නැත. එහෙත් මෙම උඩඟු ලෞකික පූජකයාගේ බදු එකතු කරන්නා කාලයාගේ ඇවෑමෙන් මෙම කන්ද වියදම් කිරීමෙහි යෙදී සිටියි. ඔහු අපගේ දේශයේ මුදල් නිරතුරුවම දේශයෙන් පිටතට රැගෙන යන්නේය. ඔහුගෙන් අපට ලැබෙන්නේ ආත්මික දීමනා විකිණීමේ ශාපය පමණය." [උපුටා ගැනීම් අංක 3].

වික්ලිෆ් නැවත තම නිජ භූමිය වෙත පැමිණීමෙන් පසු ලුටර්වර්ත් විශ්ව විද්‍යාලයේ කුලපතිවරයා ලෙස රජතුමාගෙන් ඔහුට පත්වීම ලැබුණේය. ඔහුගේ අවංක සෘජු කථාකිරීම නිසා රජතුමා තුළ අප්‍රසන්නතාවක් නැති බව මෙම පත්කිරීම සහතික කළේය. ජාතියේ ඇදහිල්ල ගොඩනැගීමේදීද රජවාසල කටයුතු සංවිධානය කිරීමේදීද වික්ලිෆ්ගේ අනුබලය මනාව දැකගත හැකි විය.

පාප් අධිකාරියේ චණ්ඩ කුණාටු ඉක්මණින් ඔහුට විරුද්ධව එල්ල විය. පාප්ගේ විශේෂ නියෝග තුනක් එංගලන්තයට යවනු ලැබීය. එකක් විශ්ව විද්‍යාලයටත් එකක් රජතුමාටත් අනෙක පූජකවරුන්ටත් විය. මෙම නියෝග තුනෙන්ම අණකර තිබුණේ ඔහුගේ හඬ වහාම ක්‍රියාත්මකවී ආගම් විරෝධී ගුරුවරයා නිහඬ කරන පිණිස වඩා තීරණාත්මක ලෙස පියවර ගැනීම අවශ්‍ය බවය. [උපුටා ගැනීම අංක 4] මෙම නියෝග ළඟාවීමට පෙර, පූජා ප්‍රසාදිවරු ජ්වලිතයෙන් පිරී ගොස් පරීක්ෂණයක් සඳහා වික්ලිෆ්ව ඔවුන් ඉදිරියට කැඳෙව්වෝය. රාජධානියෙහි බලගතු කුමාරවරු දෙදෙනෙක්ද වික්ලිෆ් සමග විනිශ්චය මණ්ඩලයට ගියෝය. විනිශ්චය ශාලාව වටා රැස්ව සිටි විශාල ජනකාය වික්ලිෆ් පසුපස එතුළට කඩා වැදුණෝය. එයින් බියට පත් විනිශ්චයකරුවෝ විභාගය කල් දමා සමාදානයෙන් යුතුව ගෙදර යාමට ඔහුට ඉඩ හැරියෝය. ප්‍රතිසංස්කරණවාදියාට විරුද්ධව බලපෑම් කිරීම සඳහා පූජකයන් විසින් යොදා ගැනීමට උත්සාහ කළ 3 වන එඩ්වර්ඩ් රජතුමා මහළු වියට පත්ව අපවත් විය. වික්ලිෆ්ගේ ආරක්ෂකයෙකු ලෙස ක්‍රියා කළ තැනැත්තා එවිට රජකමට පත්විය.

එහෙත්, ආගම් විරෝධියා වහාම සිරභාරයට ගෙන සිරගත කරන ලෙස පාප් බල අධිකාරියෙන් නියෝග ලැබීමත් සමගම එංගලන්තයට ඉතා සංවේදී ගැටළුවකට මුහුණ පෑමට සිදුවිය. මෙහිදී දිය යුතු දඬුවම වනාහි කණුවක බැඳ දමා යටින් ගිනි ඇවිලවීමය. වික්ලිෆ්ගේ ජීවිතය රෝමයේ පලිගැනීමට ඉක්මණින්ම ගොදුරු වන්නට යන බව ස්ථිරවම සැමට පෙනී ගියේය. "භය නොවන්න, මම නුඹේ පලිහ" වන්නෙමියි (උත්පත්ති 15:1) පුරාණයේදී විසූ කෙනෙකුට ප්‍රකාශ කළ තැනැන්වහන්සේ තම සේවකයා ආරක්ෂා කරගැනීමට

නැවත වරක් තම ශ්‍රී සුරත දිගු කළසේක. මරණය පැමිණියේ ප්‍රතිසංස්කරණවාදියාට නොව ඔහුගේ විනාශය නියෝග කළ පාප්තුමාටය. එකොළොස් වන ග්‍රෙගරි මළේය. වික්ලිෆ්ව විනිශ්චය කිරීමට රැස්ව සිටි විනිශ්චය මඩුල්ල විසිරී ගියේය.

ප්‍රතිසංස්කරණයේ වර්ධනය සඳහා අවස්ථාවක් ලබාදීමට දෙවියන්වහන්සේගේ මැදිහත් වීම තුළින් යම් සිද්ධීන් තවදුරටත් ක්‍රියාත්මක විය. ග්‍රෙගරිගේ වියෝවෙන් පසුව විරුද්ධවාදී පාප්වරුන් දෙදෙනෙකු තෝරා පත්කරගන්නා ලදී. පවසන්නාවූ යම් දෙයක් වේද, එය කිසිසේත්ම වැරදි විය නොහැකියයි පවසමින් එකිනෙකාට විරුද්ධවූ බලවේග දෙකක් ජනතාවගේ කීකරුකම ඉල්ලා සිටියෝය. ඇදහිලිවන්ත බැතිමතුන්ගේ සහයෝගය අනෙකාට විරුද්ධව සටන් කිරීමට තමන්ට ලබාදෙන ලෙස දෙදෙනාම ඉල්ලා සිටියහ. තමන්ට විරුද්ධව ක්‍රියා කරන්නන් අති ශාපයට යටත් වන බවටත් සහයෝගය දෙන්නන්ට ස්වර්ගයේ සම්පත් සහ තිළිණ ලැබෙන බවටත් දෙදෙනාම පොරොන්දු වූහ. මෙම සිදුවීම පාප් අධිකාරියෙහි බලය දඩි ලෙස දුර්වල කළේය. විරුද්ධවාදී පාර්ශ්වයන් දෙක එකිනෙකා සමග ඇණ කොටාගත් අතර වික්ලිෆ්ට ටික කලකට නිවාඩුවත් ලැබුණි. එක් පාප්තුමෙකුගෙන් අනෙක් පාප්තුමාට අතිශාප මෙන්ම දෝෂාරෝපණයන්ද එල්ල වන්නට විය. විරුද්ධවාදීන්ගේ අයිතිවාසිකම් ස්ථාවර කරගැනීමට රුධිරය ජල ප්‍රවාහයක් ලෙස ගලා යෑමක් සිදුවිය. අපරාධ සහ දුරාචාර පුවත් සහාව තුළ සුලභ විය. ඒ අතරතුරේදී ලූටර්වර්ත් දෙව් මැදුරෙහි විවේකීව කාලය ගත කළ ප්‍රතිසංස්කරණවාදියා මිනිසුන්ගේ අවධානය තරහවැදි පාප්වරුන් ගෙන් ඉවතට යොමු කොට සාමයේ කුමරුවන් වන යේසුස්වහන්සේ වෙත යොමු කිරීමට යුහුසුළුව ක්‍රියා කරමින් සිටියේය.

බල අධිකාරියේ මෙම බෙදීම නිසා ඇතිවූ අවුල් සහගත දූෂණවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිසංස්කරණය සඳහා දොරටු විවෘත කරමින් පාප් අධිකාරිය කුමක්දැයි මිනිසුන්ට හරියාකාරව දැනගැනීමට සැලැස්විය. වික්ලිෆ් විසින් පාප් තුමන්ලාගේ භේදය ගැන ප්‍රකාශයට පත් කළ එක් පත්‍රිකාවකින් ඔහු දක්වූයේ පූජක අර්බුදය පැවැති අතරේදී එක් පක්ෂයක් අනික් පාර්ශ්වය අන්ත ක්‍රිස්තුස් යැයි චෝදනා කළ අතර අනික් පක්ෂයද ප්‍රතිවිරුද්ධ පක්ෂය අන්ත ක්‍රිස්තුස් යැයි ප්‍රති චෝදනා කළ බවය. එබැවින් මෙම පූජකයන් දෙදෙනා මෙසේ ඔවුනොවුන්ට චෝදනා කරමින් සත්‍යය පවසනවා නොවේදැයි සලකා බලන ලෙස වික්ලිෆ් ජනතාවගෙන් ඉල්ලා සිටියේය. "යක්ෂයා එක් පූජකයෙකු තුළ පමණක් නොව දෙදෙනෙකු තුළ ක්‍රියාකරමින් සිටි බැවින් මනුෂ්‍යයන්ට පහසුවෙන්ම ක්‍රිස්තුස්වහන්සේගේ නාමය කරණකොටගෙන ඔවුන් දෙදෙනාගෙන්ම ජය ගැනීමට පුළුවන් වන්නේ"යි ඔහු පැවසුවේය." [උපුටා ගැනීම අංක 5]



තමාගේ ස්වාමියාණන් මෙන් වික්ලිෆ්ද දුගී ජනතාවට ශුභාරංචිය දේශනා කළේය. තමන්ගේ නිල ප්‍රදේශය වූ ලූටර්වර්ත්හි දුගී ජනතාවගේ නිවෙස්වලට පමණක් ආලෝකය බෙදා හැරීමෙන් තෘප්තියට පත් නොවූ හෙතෙම, සත්‍යතාවයේ ආලෝකය සමස්ත එංගලන්තය පුරාම පතුරුවාලිය යුතු යයි අධිෂ්ඨාන කර ගත්තේය. මේ සඳහා ඔහු භක්තිමත් අය කිහිප දෙනෙකු තෝරාගෙන ඔවුන් දේශක කණ්ඩායමක් ලෙස සංවිධානය කළේය. ඔවුන් සත්‍යතාවයට ඇලුම් කළ අය වූ අතර එම සත්‍යතාවය පතුරුවා හැරීම තරමට අන් කිසි දෙයකට ආශා නොවූහ. කඩ මණ්ඩියේ, විශාල නගරයන්හි වීථි දිගේ, ගම්බද මාවත් පුරා යමින් මෙම දේශනාකරුවෝ ශුභාරංචිය පතළ කර හැරියෝය. ඔව්හු වයස්ගත අය, රෝගීවූ අය හා දුගී අය සොයා ගොස් දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ ශුභාරංචිය ඔවුන්ට විවෘත කළෝය.

ඔක්ස්ෆර්ඩ් සරසවියෙහි දේවධර්ම මහාචාර්යවරයාවූ වික්ලිෆ් විශ්වවිද්‍යාලයේ ශාලා තුළ දෙවියන්වහන්සේගේ වචනය දේශනා කළේය. තමා යටතේ ඉගෙන ගත් සිසුන් ඉදිරියෙහි හෙතෙම කෙතරම් විශ්වාසවන්ත ලෙස සත්‍යතාව ඉදිරිපත් කළේද යත් ඔහු "ශුභාරංචි මහාචාර්යවරයා" යන නිල නාමයෙන් පිදුම් ලැබුවේය. ඔහුගේ ජීවිතයේ ශ්‍රේෂ්ඨතම කර්තව්‍යය වූයේ ශුද්ධලියවිලි ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීමය. "ශුද්ධලියවිල්ලේ සත්‍යතාව සහ තේරුම" යන මැයෙන් කළ කෘතියක ඔහු සඳහන් කර තිබුණේ එංගලන්ත වැසියන්ට තමන්ගේම මව් බසින් දෙවියන්වහන්සේගේ පුදුමාකාර ක්‍රියාදාමය කියවීමට අවස්ථාව ලබා දීම් වස් ශුද්ධලියවිලි ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම තමාගේ බලාපොරොත්තුව බවය.

හදිසියේම ඔහුගේ වැඩ කටයුතු නතර විය. මේ වන විට ඔහුගේ වයස අවුරුදු හැටක්වත් නොවීය. වෙහෙස නොබලා නිවාඩු නැතිව සේවය කිරීමද, ඉගෙනීමේ කටයුතුවල නිරත වීමද, සතුරන්ගේ හිංසා පීඩාවන්ද ඔහුගේ ශක්තිය කෙරෙහි අශුභ ඵල උදා කරමින් නියමිත කාලයට ප්‍රථම ඔහු මහලු බවට පත් කළේය. ඔහු භයානක රෝගයකට ගොදුරු විය. මෙම පුවත පූජකයන්ට ඉමහත් ප්‍රීතියක් ගෙන දුන්නේය. ඔහු විසින් සභාවට සිදු කළ මහත් නපුර, ව්‍යසනය ගැන ඔහු අධික ලෙස තැවෙනවා ඇතැයි කල්පනා කළ ශ්‍රමණයෝ ඔහුගේ පාපොච්චාරණය ඇසීමට ඔහු සිටි කාමරය වෙත හනික පැමිණියෝය. ආගමික නිකායන් හතරක නියෝජිතයන් සහ සිවිල් නිලධාරීන් සතර දෙනෙක් මරණාසන්නව සිටිනවා යැයි සිතූ වික්ලිෆ් වටා රැස්

වූහ. "මරණය ඔබේ තොල මත රැඳී ඇත. ඔබ කර ඇති වැරදි ගැන මෙනෙහි කරන්න. අපගේ හානියට හේතු වූ ඔබගේ ප්‍රකාශන සියල්ලම අප ඉදිරියේ ඉල්ලා අස්කර ගන්න"යි ඔව්හු පැවසූහ. ඔවුන් කියන්නාවූ සෑම දෙයක්ම වික්ලිෆ් නිශ්ශබ්දව අසා සිටියේය. තමාව ඔසවා තබන්නැයි ඔහු සාත්තු සේවකයාට පැවසීය. තමා ප්‍රකාශ කර ඇති දේ ඉල්ලා අස්කර ගන්නා තෙක් බලා සිටි අය දෙස එක එල්ලේ බැල්ම හෙලා ඔවුන්ව නිතරම වෙව්ලීමට ලක් කළාවූ දැඩි ස්වරයෙන් ඔහු ඔවුන්ට මෙසේ පැවසීය: "මම මැරෙන්නේ නැහැ. මම තවත් ඉදිරියටත් ජීවත් වෙනවා. පූජකයන්ගේ නපුරු දුෂ්ට ක්‍රියාවන් මම නැවතත් ප්‍රකාශ කරනවා." [උපුටා ගැනීම අංක 6] විස්මයටත්, ලජ්ජාවටත් පත් පූජකයෝ වහ වහා කාමරයෙන් පිටතට ගියහ.

වික්ලිෆ්ගේ වදන් ඉටු විය. රෝමයට එරෙහිව වූ ප්‍රබලතම ආයුධය ඔහු තම රටවැසියන්ගේ සුරතට පත් කළේය. මිනිස් සතහට නිදහස උදාකර දීමටත්, ඔවුන්ගේ මනස් ආලෝකමත් කිරීමටත්, ඔවුන්ව ගැළැවීමේ මාර්ගය පිළිබඳව දැනුවත් කිරීමටත් වූ ස්වර්ගීය දහම් මාලාව වූ බයිබලය ඔහු ජනතාවට ලබා දුන්නේය. මෙම ශ්‍රී පුස්තකය පරිවර්තනය කිරීමේදී ඔහුට මහත් බාධාවන්ට මෙන්ම හිරිහැරවලටද මුහුණ දෙන්නට සිදුවිය. රෝගය නමැති සතුරා ඔහුට නිතර නිතර පහර දුන්නේය. කර්තව්‍යය නිම කිරීමට තමාට ඇත්තේ තව කෙටි කාලයක් පමණක් බව ඔහු දැන සිටියේය. ඔහු තමා මුහුණ දිය යුතු බාධාවන් සහ විරුද්ධතාවන් දුටුවේය. දෙවියන්වහන්සේගේ වචනය මගින් දිරිය ලැබූ හෙතෙම පසුබට වීමකින් තොරව ඉදිරියටම කටයුතු කරගෙන ගියේය. ඔහුගේ සේවයෙහි විශිෂ්ටතම කාර්යය වූ ශුද්ධ බයිබලය පරිවර්තනය කිරීම සඳහා දෙවියන්වහන්සේගේ විශේෂ සැපයීම සහ මගපෙන්වීම කරණකොටගෙන ඔහුගේ ජීවිතය ආරක්ෂිතව තිබුණේය. ඔහුගේ බුද්ධිමය ශක්තියේ උපරිම ජවය තිබූ අවස්ථාවේදී, අත්දැකීම් බහුලව තිබූ මේ සමයේදී, දේව වචනය පරිවර්තනය කිරීමට ඔහු මනා ලෙස සූදානම් කර රැකවරණය කරනු ලැබ සිටියේය. මුළු ක්‍රිස්තියානි රාජ්‍යයම කැළඹීමට පත්ව තිබූ ඒ කාලයකදී ප්‍රතිසංස්කරණවාදියා ලූටර්වත්හි දෙව්මැදුරු නිල නිවාසයට වී අවට පැවති චණ්ඩ කුණාටු ගැන අවධානය යොමු නොකර නිදහසේ තම කාර්ය භාරය ඉදිරියටම කරගෙන ගියේය.

අන්තිමේදී ශුද්ධවූ බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම නිමාවට පත්විය. එංගලන්ත ජනතාවට දෙවියන්වහන්සේගේ වචනය විවෘත විය. සිරගෙය හෝ කණුවකට බැඳ දමා ගිනි තබනු ලැබීම ගැන ප්‍රතිසංස්කරණවාදියාට ප්‍රශ්නයක් නොවීය, බියක්ද නොවීය. කිසිම කලෙක නිවා දැමිය නොහැකි ආලෝකයක් ඔහු ඉංග්‍රීසි ජාතිකයන්



අත තැබීය. යුදපිටියේදී ලබාගන්නාවූ අති විශිෂ්ට ජයග්‍රහණයකට වඩා විශාල ජයක් ඔහු තම රටවැසියන්ට ලබා දුන්නේය. බයිබලය තම රටේ ජනතාව අතට පත්කිරීමෙන් ඔහු නූගත්කමෙහි බැමි බිඳ දමන්ටත් දූෂණයෙන් ජනතාව මුදා ගැනීමටත්, තම රටට නිදහස ලබා දී ඉහළ තලයකට රට යොමු කිරීමටත් මහ පැදූ බලවත් සේවයක් ඉටු කළේය.

මේ වන විට මුද්‍රණ ශිල්පය ලොවට බිහි වී නොතිබුණු බැවින් ශුද්ධවූ බයිබල් පිටපත් වැඩිකර ගැනීම සිදුවූයේ ඉතා සෙමෙන් සහ අමාරුවෙන්ය. පිටපතක් හිමි කරගැනීමට තිබූ ආශාව කෙතරම් ප්‍රබලවීද යත් අතින් ලියා පිටපත් සෑදීමට බොහෝ අය කැමැත්තෙන්ම ඉදිරිපත් වූහ. එහෙත් අවශ්‍යතාවට සරිලන සේ පිටපත් නිෂ්පාදනය කිරීම අසීරු විය. පොහොසත් සමහරෙක් ශුද්ධවූ බයිබලයේ සම්පූර්ණ පිටපතක් මිලදී ගැනීමට කැමැත්ත දැක්වූවෝය. තවත් අය බයිබලයේ කොටස් පමණක් මිලදී ගත්හ. බොහෝ අවස්ථාවලදී පවුල් කිහිපයක් එක් වී සම්පූර්ණ ශුද්ධවූ බයිබලයක් මිලදී ගත්තෝය. මෙසේ වික්ලිෆ්ගේ බයිබලය ජනතාවගේ නිවෙස්වලට ඇතුල් විය.

තෝරා බේරා ගැනීමට ජනතාවට කළ ආයාචනාව පාප් සමවාදී ඉගැන්වීම්වලට තිබූ අක්‍රිය යටත්වීමෙන් මිනිසා පුබුදුවාලීමට සමත් විය. වික්ලිෆ් දැන් ප්‍රොතැස්තන්ත වාදයේ, ප්‍රතිසංස්කරණවාදයේ විශේෂිත ධර්මතාවන් ඉගැන්වීය. ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ ඇදහිල්ල කරණ-කොටගෙන ගැළවීම ලැබීම සහ ශුද්ධලියවිල්ලෙහි නොවරදින සුළු ස්වභාවය එහි මුල් තැනක් ගත්තේය. ඔහු විසින් පිටත්කර හරිනු ලැබූ දේශනාකරුවෝ ශුද්ධවූ බයිබලය බෙදා හැරියෝය. ඒ සමගම ඔව්හු වික්ලිෆ්ගේ පත්‍රිකාද ජනතාව අතට පත් කළෝය. මෙම ක්‍රියාදාමය එංගලන්තය තුළ කෙතරම් සාර්ථකත්වය ලැබීද යත් එහි ජනතාවගෙන් අඩක් පමණ නව ඇදහිල්ල පිළිගත්තෝය.

ශුද්ධලියවිලි එළිදැකීම සභාවේ බලධරයන්ට විමතියක් ගෙන දුන්නේය. වික්ලිෆ්ට වඩා ප්‍රබල බල අධිකාරියකට දැන් ඔවුන්ට මුහුණ දෙන්නට සිදුවිය. එම බලයට විරුද්ධව නැගී සිටීමට ඔවුන් සතු ආයුධවලට හැකියාවක් තිබුණේ නැත. මේ වන විට ශුද්ධවූ බයිබලය තහනම් කරන්නට නීති එංගලන්තයෙහි නොතිබුණේය; මක්නිසාද යත් ශුද්ධවූ බයිබලය පොදු ජනතාවගේ භාෂාවෙන් මෙයට පෙර පළවී නොතිබුණි. පසුකලෙක එවන් නීති සම්මත වී දැඩි ලෙස ක්‍රියාත්මක විය. බයිබලය කියවීමට අකුල් හෙලීමට පූජක පක්ෂය දැඩි ප්‍රබල වෙහෙසක් දැරූ නමුත් දෙවියන්වහන්සේගේ වචනය බෙදා හැරීමේ කාර්යය සඳහා අවස්ථාවක් ලැබුණේය.

නැවත වතාවක් පාප්වාදී නායකයෝ ප්‍රතිසංස්කරණවාදියාගේ හඬ නිසල කිරීමට කුමන්ත්‍රණය කළහ. විභාගය සඳහා විනිශ්චය මණ්ඩල තුනක් ඉදිරියට ඔහුව යළි යළි කැඳවන ලදී. එහෙත් එයින් කිසි ඵලයක් නොවීය. ප්‍රසාදි පූජකයන්ගෙන් සැදුම්ලත් ධර්මාධිකාරී සභාවක් ඔහුගේ ලිඛිත ලිපි ලේඛණ ධර්මයට විරුද්ධ යයි තීරණයක් ප්‍රකාශ කළේය. දෙවන රිචඩ් නම්වූ යොවුන් රජතුමා තමන්ගේ පැත්තට දිනාගත් ඔවුහු ආගම් විරෝධී යයි තීන්දු කළ දහම් අනුගමනය කරන්නාවූ කවරෙකු හෝ වේවා, ඔහුව සිරගෙයි දැමීමට ආඥාවෙන් මග සැලසූහ.

ධර්මාධිකරණයේ මෙම තීන්දුවට විරුද්ධව වික්ලිෆ් පාර්ලිමේන්තුවට අභියාචනයක් ඉදිරිපත් කළේය. කිසිම බියක් නැතිව හෙතෙම දේව සභා නායකයන්ට දෝෂාභියෝගයක් ඉදිරිපත් කරමින් එය ජාතික පාර්ලිමේන්තුව ඉදිරියට ගෙනාවේය. සභාව විසින් අනුමැතිය ලබාදුන් මහා පරිමාණයේ නින්දා සහගත දූෂිතයන් වහාම ප්‍රතිසංස්කරණය කළ යුතු යැයි ඔහු පැමිණිලි කළේය. අයුතු ලෙස බලෙන් පැහැර ගැනීම් සහ දූෂණ ක්‍රියාදාමයන් ගැන චෝදනා එල්ල කරමින් ඔහු පාප් අධිකාරියට විරුද්ධව සිතට කාවදින ලෙස කරුණු ඉදිරිපත් කළේය. ඔහුගේ සතුරෝ වියවුලට පත්වූහ. ඔහුගේ මිතුරන් සහ සහායකයන් මේ පාප් අධිකාරියට යටත් කරනු ලැබූහ. වයෝවෘද්ධව සිටි ඔහු හුදෙකලා බවට පත්වී තනිවූ මේ අවස්ථාවේදී ඔටුන්නෙහි සහ පාදර්ශක මකුටයෙහි ඒකාබද්ධ බල අධිකාරියට දණ නැමීමට යොමු වෙනවා ඇතැයි ඔව්හු බලාපොරොත්තු වූහ. නමුත් මේ අවස්ථාවේදී පාප් ප්‍රබල සමයවාදී නායකයන්ට තමා පරාජයට පත්වන බව දැකගත හැකි විය. වික්ලිෆ්ගේ චතුර ආයාචනාවන්ගෙන් කැළඹීමට පත් පාර්ලිමේන්තුව ඔහුට විරුද්ධව ගෙනා ආඥාව නිෂ්ප්‍රභ කළේය. ඔහුට නැවත වරක් නිදහස භුක්ති විඳීමේ භාග්‍යය උදා විය.

විනිශ්චය කිරීම සඳහා ඔහුව තුන්වන වතාවටත් රාජ්‍යයේ තිබූ උපරිම ධර්මාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ධර්මාධි-කරණයේදී මිසදිටු දහම් නැතහොත් රෝමානු සභාව පිළිගත් සම්ප්‍රදායන්ට හෝ ඇදහිලි ක්‍රමයට හෝ විරුද්ධ වූ වෙනත් ඉගැන්වීමක් පිළිගනු නොලබන්ට තිබුණි. මෙහිදී රෝමය ජය ගන්නවා නියතය, ප්‍රතිසංස්කරණ වාදියාගේ වැඩ කටයුතුද නිමාවට පත්වනවා ඇත යනු පාප් සමයවාදීන්ගේ කල්පනාව විය. ඔවුන්ගේ අභිමතාර්ථය ඉටු වී නම්, වික්ලිෆ් තම ඉගැන්වීම් වැරදි යැයි දිවුරා ප්‍රකාශ කරමින් එම දහම් අත්හැර දැමිය යුතුය. එසේත් නැති නම් ඔහු අධිකරණ භූමියෙන් කෙළින්ම යන්නේ ගිනි මැළය වෙතටය.



නමුත් වික්ලිෆ් තම ඉගැන්වීම් ඉල්ලා අස්කර ගත්තේ නැත. ඔහු තමාගේ නියම හැඟීම් සඟවමින් අධිකරණය රැවටීමට වැයම් කළේද නැත. ඔහු අභීතව තමාගේ ඉගැන්වීම් නිවැරැදි බව පවසා සිටියේය; තමාට හිරිහැර කරන්නාවූ අයගේ චෝදනා නිෂ්ප්‍රභා කළේය. තමා ගැන කිසිම තැකීමක් නොකර, තමාගේ තත්ත්වය හෝ අවස්ථාව ගැන තැකීමක් නොකර ඔහු තම ශ්‍රාවකයන්ට දිව්‍ය ත්‍රී පුද්ගල අධිකරණය වෙත පැමිණෙන ලෙස ඉල්ලීමක් කළේය. ඔවුන්ගේ තර්ක සහ මුළාකිරීම් සදාතනික සත්‍යතාවයේ තරාදියෙහි දමා කිරා බලන ලෙස ඔහු කියා සිටියේය. අධිකරණ ශාලාව තුළ ශුද්ධාත්මයාණන්-වහන්සේගේ බලය සහ වැඩසිටීම සැමට දැනෙන්නට විය. ශ්‍රාවකයන් මත දෙවියන්වහන්සේගේ වශී බලයක් පැවැතියේය. එම ස්ථානයෙන් නික්ම යාමට ඔවුන්ට ශක්තියක් නොවීය. ස්වාමින්වහන්සේගේ කොපුවෙන් නිකුත් වූ හී සර මෙන් ප්‍රතිසංස්කරණවාදියාගේ වචන ශ්‍රාවකයන්ගේ හදවත් තුළට කිඳා බැස්සේය. මිසදිටු දහම් උගන්වන්නේ යැයි කියමින් ඔහුට ගොනු කර තිබූ චෝදනා ඔහු පෙරළා චෝදනාකරුවන් වෙත එල්ල කළේය. ඔහුගේ වචන සත්‍යය ඒත්තු ගන්වන බලයෙන් යුතු විය. ඔවුන් මෙම බොරු ඉගැන්වීම පතළ කිරීමට තරම් නිර්භීත වන්නේ මන්දැයි ඔහු ප්‍රශ්න කර සිටියේය. ඔවුන් එසේ කළේ වාසි ලැබීමටය. ඔවුහු දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය වෙළඳ බඩුවක් බවට පත්කරගෙන තිබුණේය.

ඔහු මෙසේ පැවසීය. "ඔබ තරඟ කරන්නේ, වාද කරන්නේ කා සමඟද? සොහොනට පය තැබීමට ආසන්නව සිටින මහල්ලෙකු සමගද? එසේ නොවේ. ඔබ වාද කරන්නේ සත්‍යතාව සමගයි. සත්‍යතාව ඔබලාට වඩා බලවත්තයි. එය ඔබ පරදා ජයගන්නවා සහතිකයි." [උපුටා ගැනීම අංක 7] මෙම ප්‍රකාශයෙන් පසුව ඔහු විනිශ්චය ශාලාවෙන් ඉවත්ව ගියේය. විරුද්ධවාදීන් කිසිවෙක් හෝ ඔහුව නවත්වන්නට වැයම් කළේ නැත.

දෙවියන්වහන්සේ විසින් වික්ලිෆ්ගෙන් බලාපොරොත්තු වූ කාර්ය භාරය නිමාවට පත්වෙමින් තිබුණේය. ඔහු මෙතෙක් ඔසවාගෙන සිටි සත්‍යතාවයේ ධජය, ඉතා ආසන්නයේදී ඔහුගේ අතින් ගිලිහී යනවා ඇත. තවත් එක්වරක් ඔහුට ශුභාරංචිය උදෙසා සාක්ෂි දැරීමට නියමිතව තිබුණේය. ජනතාව මුළාවට පත්කරන බොරුවේ රාජධානියේ බලකොටුව ඇතුළත සිට සත්‍යතාවය ප්‍රකාශයට පත්කළ යුතුය.

රෝමයේ පිහිටි ත්‍රී පුද්ගල ධර්මාධිකරණයක් ඉදිරියට වික්ලිෆ්ව කැඳවන ලදී. මෙම ධර්මාධිකරණය මගින් ශුද්ධවන්තයන්ගේ රුධිරය අනේක වාරයක් වගුරුවා තිබුණි. තමා ඉදිරිපිටවූ අනතුරුදායක තත්ත්වය ගැන ඔහු නොදැන සිටියා නොවේ. මේ අතරේදී ඔහු

පක්ෂඝාතයෙන් රෝගී විය. එහෙයින් ඔහුට රෝමය බලා ගමන් කිරීමට නුපුළුවන් විය. රෝම ධර්මාධිකරණයේදී ඔහුගේ හඬ ඇසෙන්නට නොලැබෙන්නේ වුවද ඔහුට ලිපි මගින් කථා කළ හැකි විය. එසේ කරන්නට ඔහු තීරණය කළේය. තමා සිටි දේවස්ථානය හා බැඳී නිවසේ සිට ඔහු පාප්වරයාට ලිපියක් යැව්වේය. පාප් බල අධිකාරියේ නායක තුමාට ගරුත්වයෙන් හා ක්‍රිස්තියානි ආත්මයකින් යුතුව මෙසේ ලියනු ලැබූ එම ලිපිය පාප්වරයා ආරූඪ කරගත් උදාරම් විභූතියට සහ උඩඟුකමට තරවටුවක් විය.

"මම අල්ලා ගෙන සිටින්නාවූ ඇදහිල්ල පිළිබඳව සෑම මනුෂ්‍යයෙකුටම විවෘතව ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි. මෙම කාරණය රෝමයේ අගරද ගුරුවරයාට විශේෂයෙන්ම අවධාරණය කිරීමට කැමැත්තෙමි. මම ගෙන හැර දක්වන්නාවූ කාරණා තර්කානුකූලව නිවැරැදි බවත්, බයිබලයට අනුකූල බවත් විශේෂයෙන් ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි. අගරද ගුරුවරයා ඉතා කැමැත්තෙන් මාගේ ඇදහිල්ල අනුමත කරනවා ඇත. එහි වැරැදි ඇතොත් ඒවා නිවැරැදි කරන්න ....

"ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වනාහි දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි සම්පූර්ණ ශරීරය වන්නේය. මෙලොව සිටින්නාවූ ක්‍රිස්තුස්-වහන්සේගේ පරම නියෝජිතයා වශයෙන් පෙනී සිටින රෝමයේ අගරද අනෙකුත් මිනිසුන්ට වඩා ශුභාරංචියෙහි ව්‍යවස්ථාවට ඇලුම් කළ යුතුය, එය හා එක්ව බැඳී සිටිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් අතර ශ්‍රේෂ්ඨ ලෙස, උතුම් ලෙස සැලකිල්ලට භාජනය වුණේ ලෞකික ගෞරවය සහ උදාරම් ආටෝපයන් නොවේ. ඔවුන් මහත් ලැදියාවක් පෙන්නුම් කළේ ක්‍රිස්තුස්වහන්සේගේ චරිත ගුණාංග සහ ක්‍රියාදාමයන් ඉතා කිට්ටුවෙන් අනුගමනය කිරීමටය ... වන්දනාකරුවෙකු ලෙස මෙලොව දිවි ගෙවූ ක්‍රිස්තුස්වහන්සේ ඉතා දිළිඳු පුද්ගලයෙක් වූසේක. උන්වහන්සේ ලෞකික සියලු ගෞරවය සහ පාලනය අත්හැර දැමූ සේක. එම දේවල් උසස් කොට නොසැලකූ සේක ...

"කිසිම බැතිමතෙක් පාප්වරයාව හෝ වෙනත් සාන්තුවරයෙකු හෝ අනුගමනය කිරීම යුක්ති සහගත නොවන්නේය. එම අය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන ආකාරයෙන් ඔවුන්ව අනුගමනය කළාට කම් නැත. පේතෘස් සහ සෙබදීගේ පුත්‍රයන් දෙදෙනා ද ලෞකික ගෞරවය ලැබීමට ආශා කළෝය. එහිදී ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ පියවර අනුගමනය නොකළෝය, වරදක් කළෝය. එම නිසා ඔවුන් කළ වැරදි ක්‍රියා සහ මාර්ගයන් අනුගමනය කරනු නොලැබිය යුතුය ......



"පාප්වරයා භූමික රාජධානිය සහ බලය ලෞකික බලධරයන්ට පවරා දිය යුතුය. ඔහුගේ පූජකයන්ටද එසේ කිරීමට මගපෙන්වනු ලැබිය යුතුය. ක්‍රිස්තුස්වහන්සේ එසේ කළසේක. විශේෂයෙන්ම උන්-වහන්සේගේ ගෝලයෝද එසේ කළෝය. මෙම කාරණා පිළිබඳව මා අතින් වැරැදි සිදුවී තිබේ නම්, එම වැරදි නිවැරැදි කර ගැනීමට නිහතමානීව අණසකට යටත් වෙමි. එහිදී මාගේ මරණය තීන්දු වුවද මම දඬුවම පිළිගනිමි. මාගේ කැමැත්ත අනුව ක්‍රියා කරන්නට මට හැකියාව තිබේ නම්, මම ඇත්ත වශයෙන්ම රෝම අගරද ගුරුතුමා ඉදිරියෙහි පෙනී සිටින්නෙමි. එහෙත් දෙවියන්වහන්සේගේ හස්තය එයට විරුද්ධව මා පාලනය කර ඇත. මිනිසාට වඩා උන්වහන්සේට කීකරුවීමට උන්වහන්සේ මට උගන්වා තිබේ."

ඔහු තම ලිපිය මෙසේ අවසන් කළේය. "VI වැනි අර්බන් පාප්වරයා සහ ඔහුගේ පූජකයන්ද ජීවිතයෙන් හා පැවැත්මෙන්ද ක්‍රියාවෙන්ද, අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට පොළඹවනු ලැබේවා"යි අපි දෙවියන්වහන්සේට යාච්ඤා කරමු. එය කරණකොටගෙන ජනතාවට සත්‍යය උගන්වනු ලැබේවා. එසේම ඔවුන්ද ඒ ආකාරයෙන් ඔවුන්ගේ ජීවිත පිළිවෙල අනුගමනය කෙරෙත්වා." [උපුටා ගැනීම අංක 8]

මෙසේ වික්ලිෆ් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුදු මොළොක් භාවය සහ නිහතමානීකම පාප්වරයාට සහ ධර්මාධියක්ෂකවරුනට හෙවත් කාර්දිනල්වරුන්ට ඉදිරිපත් කළේය. තමා ක්‍රිස්තුස්වහන්සේගේ නියෝජිත-වරුන් යැයි ඔවුහු කියා සිටියෝය. නමුත් ඔහු ඔවුන්ට පමණක් නොව මුළු ක්‍රිස්තියානි ලෝකයටම දක්වූයේ තමා ස්වාමීන්වහන්සේගේ නියෝජිතයන් යයි ඔවුන් පැවසූ අතර, උන්වහන්සේද ඔවුන්ද අතර පැවති වෙනස කොයි ආකාරද යන්නය.

දෙවියන්වහන්සේට පක්ෂපාතීව සිටීම ගැන වන්දිය තමාගේ ජීවිත පූජාව යැයි වික්ලිෆ් අවංකවම සිතුවේය. රජතුමා, පාප්වරයා සහ රදගුරු ප්‍රසාදීවරු ඔහුගේ විනාශය සිදු කිරීමට එකට අත්වැල් බැඳ ගත්තෝය. තව මාස ස්වල්පයකින් ඔහුගේ ඉරණම ගිනි පන්දමක් ලෙස අවසන් වේ යයි සෑම අයෙක්ම සිතුවේය. එසේ වුවද, ඔහුගේ ධෛර්යය සෙලවුණේ නැත, ඔහු හීන වුණේ නැත. "වේද සාක්ෂි-කයෙකුගේ ඔටුන්නක් සඳහා සෑහෙන කාලයක් බලාසිටිය යුතු යයි සිතන්නේ මන්ද? අහංකාර රෝමානු පූජකයන්ට ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරන්න. වේද සාක්ෂිකාර දිවි පිදීම ඔබට වරදින්නේ නැත. හා! ජීවත්ව සිටින අතර නිශ්ශබ්දව සිටීමට මට පුළුවන්ද? ... එවැනි දෙයකට කොහෙත්ම ඉඩක් නැහැ. මරණීය

පහර මා මත පතිත වේවා, එය පැමිණෙන තෙක් මම බලා සිටිනවා." [උපුටා ගැනීම අංක 9].

එහෙත් දෙවියන්වහන්සේගේ ආරක්ෂක වළල්ල තවදුරටත් තම සේවකයා වටා රැඳී තිබුණේය. තම ජීවිත කාලය පුරා සත්‍යතාව වෙනුවෙන් අභීතව නැගී සිටි මේ මනුෂ්‍යයා, දිනපතාම ජීවිතය පරදුවට තබා ක්‍රියාත්මක වූ මේ මනුෂ්‍යයා, සතුරන්ගේ ක්‍රෝධයේ බිල්ලක් වීමට ඉඩ හැරිය යුතු නොවේ. තමාව ආරක්ෂා කරගැනීමට වික්ලිෆ් කිසිම අවස්ථාවක හෝ ක්‍රියාත්මක වුණේ නැත. දෙවියන්වහන්සේ ඔහුගේ රැකවල්කරුවාණන් වූසේක. තමන්ගේ ගොදුර ගැන ඔහුගේ සතුරන් ස්ථිර නිගමනයකට බැස සිටි නමුත් දෙවියන්වහන්සේ ඔහුව සතුරන්ගෙන් ඈත් කර තැබූසේක. ලුටර්වර්ත් හි තම දේවස්ථානයේදී රාත්‍රී භෝජනය සැමරීමේ සත්කර්මය බෙදා දීමට සැරසෙත්ම ඔහු අංශභාගය සෑදී බිම වැටුණේය. ස්වල්ප මොහොතකට පසුව ඔහු ස්වාමීන්වහන්සේ තුළ සැතපුණේය.

දෙවියන්වහන්සේම වික්ලිෆ්ට ඔහුගේ වැඩ කොටස පවරා දී තිබූසේක. උන්වහන්සේ ඔහුගේ මුඛය තුළට සත්‍යතාවයේ වචන සපයා දුන්සේක. මෙම වචන ජනතාව වෙතට යෑමේ අරමුණ සහිතව උන්වහන්සේ ඔහු වටා ආරක්ෂක වළල්ලක් යෙදූ සේක. ඔහුගේ ජීවිතය රැකුණේය, ඔහුගේ සේවය දීර්ඝ කරනු ලැබීය. ප්‍රතිසංස්කරණයෙහි මහත් කර්තව්‍යය සඳහා අත්තිවාරම දමන තුරු දෙවියන්වහන්සේ ඔහු සමග ක්‍රියා කළසේක.

වික්ලිෆ් පැමිණියේ අඳුරු යුගයේ අප්‍රසිද්ධ වටපිටාවකින්ය. තමාගේ ප්‍රතිසංස්කරණ පද්ධතිය හැඩගස්වා ගැනීම සඳහා උපකාර කිරීමට ඔහුට පෙර සිටි කිසිවෙකුගේ හෝ වැඩ පිළිවෙලක් තිබුණේ නැත. යොහන් බව්තීස්ත මෙන් ඔහු ද මෙලොවට බිහි වුණේ විශේෂ මෙහෙයක් ඉටු කිරීමටය. ඔහු වනාහි නව යුගයක පෙරමග දූතයා විය. ඔහු ඉදිරිපත් කළ සත්‍යතාවය තුළ ඒකඟතාවක් තිබුණේය, එය සම්පූර්ණතාවක්ද දක්වීය. ඔහුට පසුව නැගී සිටි ප්‍රතිසංස්කරණවාදීන් කිසිවෙක් හෝ ඔහුට වඩා ඉදිරියෙන් සිටියේ නැත. අවුරුදු සියයක් ගත වූ පසුවත් ඔහු කළ මෙහෙයට සමාන වීමට කිසිවෙක් හෝ සමත් වී නැත. දමනු ලැබූ අත්තිවාරම ඉතා පුළුල්වූ ද, ගැඹුරුවූ ද එකක් විය. එහි සැකිල්ල ශක්තිමත්වූ ද සත්‍යයවූ ද එකකි. ඔහුට පසුව ප්‍රතිසංස්කරණ සේවාවෙහි යෙදුණු අයට එය අළුත්වැඩියා කිරීමට අවශ්‍යතාවක් නොවීය.

වික්ලිෆ් ආරම්භ කළ මහත් ව්‍යාපාරය තුළින් ඉටු වූ මෙහෙය ඉමහත්ය. මිනිසාගේ බැඳ දමා තිබූ හෘද සාක්ෂිය සහ කල්පනා කිරීමේ ශක්තිය එමගින් නිදහස ලැබුවේය. රෝමයේ ජයග්‍රහාන්විත



රථයට බැඳ දමා තිබූ ජනතාවට මහත් කාලයකට පසුව විමුක්තිය උදා විය. එකී ව්‍යාපාරයේ උල්පත ශුද්ධවූ බයිබලයයි. ආසිරි පැන් ගලා එන දිය දහරාවෙහි උල්පත මෙයයි. දස සතර වෙනි ශතවර්ෂයේ සිට සියවස් පුරා මෙය ජීවනයේ ආසිරි, පැන් මෙන් ගලා එන්නේය. දෙවියන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කරන්නාවූ ආනුභාවය ලත් මාධ්‍යය ලෙස වික්ලිෆ් ශුද්ධ ලියවිලි නොසැලෙන ඇදහිල්ලෙන් යුතුව පිළිගත්තේය. ඇදහිල්ල හා ජීවන රටාව සඳහා ශුද්ධ බයිබලය තුළින් ප්‍රමාණවත් අනුශාසනා ලැබෙන බව ඔහු විශ්වාස කළේය. රෝමානු සභාව වනාහි දිව්‍යමය වූ කිසිම අයුරකින් වැරදිය නොහැකි බල අධිකාරිය ලෙස පිළිගැනීමට, විශ්වාසය රැඳවීමට ඔහු අධ්‍යාපනය ලබා තිබුණේය. වසර දහසක් පුරා ස්ථාපිතව පැවති ඉගැන්වීම් සහ සම්ප්‍රදායන්, ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රණාමයෙන් යුතුව පිළිගැනීම ඔහුගේ අධ්‍යාපනයේ කොටසක් විය. එහෙත් හෙතෙම එම සියලු බැමි බිඳ දමා දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ වචනයට ඇහුම්කන් දීමට තීරණය කරගත්තේය. මිනිසුන් විසින් හිස නැමිය යුතු එකම බල අධිකාරිය ශුද්ධ බයිබලය බව ඔහු ජනතාවට ඉදිරිපත් කළේය. මිනිසා විසින් පිළිගත යුතු වන්නේ පාප්වරයා විසින් සභාව තුළින් පවසන්නාවූ හඬ නොව තමන්වහන්සේගේ ශ්‍රී වචනය තුළින් කථා කරන්නාවූ දෙවියන්වහන්සේගේ හඬය. ශුද්ධවූ බයිබලය වනාහි දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි සම්පූර්ණ එළිදරව් කිරීමක් බවත් ශුද්ධාත්මයාණන්වහන්සේ එම වචනයෙහි එකම අර්ථකථනය සපයන්නාණන් බවත් ඔහු ඉගැන්වීය. සෑම මනුෂ්‍යයෙක්ම ශුද්ධ බයිබලයෙහි ඉගැන්වීම් අධ්‍යයනය කිරීම මගින් දෙවියන්වහන්සේට හිමි විය යුතු වගකීම් ඉගෙන ගත යුතු බවද ඔහු ඉගැන්වීය. ඔහු මෙසේ ජනතාවගේ මනස පාප්වරයාගෙන් සහ රෝමයේ සභාවෙන් ඉවතට හරවා දෙවියන්වහන්සේගේ වචනය වෙතට යොමු කළේය.

ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ඉතා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු ලෙස වික්ලිෆ්ව හඳුන්වා දීමට පුළුවන. ඔහුගේ බුද්ධිමත් කමත්, සිතුවිල්ලෙහි පැහැදිලිතාවත්, සත්‍යතාවය ආරක්ෂා කිරීමේ ස්ථිරසාර අධිෂ්ඨානයත්, එය රැකගැනීමට වූ නිර්භීතකමත් ගැන සලකා බලන විට ඔහුගෙන් පසුව පැමිණි අය අතුරෙන් ඔහුට සම කළ හැකිවන්නේ ඉතා ස්වල්ප දෙනෙකුව පමණකි. ජීවිතයේ ශුද්ධතාවයද ඉගෙනීමෙහි සහ සේවය කිරීමෙහි වූ නොපසුබස්නා තත්ත්වයද දූෂිතයෙන් තොර වූ විශ්වාසවන්ත භාවය හා දේව මෙහෙයෙහි ඔහු සතුව තිබූ ආදරය සහ විශ්වාසවන්ත ස්වභාවයද මුල්ම ප්‍රතිසංස්කරණ වාදියාවූ ඔහුගේ ජීවිතයේ ගුණාංග විය. මෙම ගුණාංග වඩාත් උතුම් වන්නේ ඔහු පැමිණි වටපිටාව ගැන සැලකිල්ලට ලක් කිරීමෙන්ය. එකල පැවැතියේ බුද්ධියෙහි අන්ධකාරයක් සහ ආධ්‍යාත්මික දූෂණයෙහි පිරී ගිය සමාජයකි. එම තත්ත්වයක් තිබියදී ඉදිරිපත් වූ ඔහු සත්‍ය වශයෙන්ම ප්‍රතිසංස්කරණයෙහි පහන් තාරකාව විය.

ශුද්ධ ලියවිල්ලෙහි අනුශාසනා හා බැඳි ප්‍රඥව ලබාදීමෙහි සහ ජීවිතය යහමඟට හැරවීමෙහි බලය පිළිබඳව සාක්ෂියක් ලෙස වික්ලිෆ්ගේ චරිතය හඳුන්වා දිය හැකිය. ඔහුව වීරවරයෙකු කළේ ශුද්ධවූ බයිබලයයි. එළිදරව් කර ඇති අගනා සත්‍යතාවන් ග්‍රහණය කරගැනීමට වෑයම් කිරීමේදී සිරුරේ සෑම අවයවයකටම එයින් මිහිරියාවක් සහ අළුත් ප්‍රාණවත් ගතියක් ලැබෙන්නේය. අවබෝධ කරගැනීමේ හැකියාව එයින් තියුණු වන්නේය. මනසේ ප්‍රවණතාව හෙවත් හැකියාව එමගින් පුළුල් වන්නේය. විනිශ්චය කිරීමේදී පරිනත භාවයක් එයින් උදාවෙනවා ඇත. ශුද්ධවූ බයිබලය අධ්‍යයනය කිරීම කරණකොටගෙන සෑම සිතුවිල්ලක්ම, හැඟීමක් සහ පැතුමක්ම උතුම් බවට පත් වන්නේය, උසස් කරනු ලබන්නේය. මෙවැනි උදාර තත්ත්වයක් ලබාදීමට වෙනත් කිසිම ඉගෙනීමක් මග සලසන්නේ නැත. ශුද්ධවූ බයිබලය හැදෑරීම කරණකොටගෙන අරමුණෙහි ස්ථිරතාවක්ද ඉවසීම, නිර්භීතකම සහ දිරි ගැන්වීමක්ද ඇති වන්නේය. එය චරිතයට සත් ගුණවත් භාවයක් ලබාදෙන අතර ආත්මයද ශුද්ධත්වය කරා යොමු කරන්නේය. ශුද්ධ ලියවිලිවලට ගෞරව කරමින් උනන්දුවෙන් එය අධ්‍යයනය කළ යුතුය. එමගින් සීමිත මිනිස් මනස, අසීමිත ඉමක් කොණක් නැති මනස සමග සෘජු සබඳතාවකට පමුණුවනු ලබන්නේය. ඒ තුළින් වඩාත් ශක්තිමත්වූ ද, ක්‍රියාකාරවූ ද ප්‍රජාවක් ඇති මිනිසුන් ලෝකයට ලැබෙනවා ඇත. ඒ අතරම කිසිම මිනිස් දර්ශනවාදයකට ලබාදීමට බැරි ආකාර උදාරතර ප්‍රතිපත්ති තුළ තැන්පත් වූ මිනිස් කොටසක් එමගින් ලෝකයට හිමි වන්නේය. ගීතිකා රචකයා මෙසේ පවසා ඇත. "ඔබගේ වචන එළිදරව් වීමෙන් ආලෝකය ලැබේ; එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ." (ගීතාවලිය 119:130)

වික්ලිෆ් විසින් උගන්වන්ට යෙදුණාවූ දේව ධර්මයන් ටික කලක් යන තුරු තවදුරටත් පැතුරුණි. වික්ලිෆ්වරු සහ ලොලාඩ්වරු යන නාමයන්ගෙන් හඳුන්වනු ලැබූ ඔහුගේ අනුගාමිකයෝ එංගලන්තය පුරා ගමන් ගත්තා පමණක් නොව, වෙනත් රටවලට ද ගමන් කරමින් ශුභාරංචිය පැතිරවූහ. දැන් ඔවුන්ගේ නායකයා ඉවත් කරනු ලැබ සිටිය බැවින් ඔවුහු පෙරටත් වඩා උනන්දුවෙන් සේවය කළහ. බොහෝ මනුෂ්‍යයෝ ඔවුන්ගේ ඉගැන්වීම් ඇසීමට පැමිණියහ. රජුගේ භාර්යාව ඇතුළු උසස් පෙළේ මනුෂ්‍යයෝද සත්‍යය පිළිගත්හ. එමගින් බොහෝ ස්ථානවල මනුෂ්‍යයන්ගේ ජීවිත පිළිවෙළ බොහෝ සේ යහපත් බවට පත්විය. රෝමානු සභාවේ රූප වන්දනික සංකේතයන් දේවස්ථාන වලින් ඉවත් කරනු ලැබීය. නමුත් ඉක්මණින්ම, බයිබලය තමාගේ මාර්ගෝපදේශකය හැටියට පිළිගත් අය මත සානුකම්පාවෙන් තොර පීඩාවන් කුණාටුවක් මෙන් පතිත විය. රෝමයේ සහාය දිනාගෙන තමාගේ බලය ශක්තිමත් කරගැනීමට උනන්දු වූ ඉංග්‍රීසි රජවරු ප්‍රතිසංස්කරණය කිරීමේ නියුක්ත වූවන් පූජා කිරීමට පසුබට නොවූහ.



ඉංග්‍රීසි ඉතිහාසයේ පළමු වන වතාවට, ශුභාරංචියේ ගෝලයන් මරණයට පත් කරනු ලැබීය. නැවත නැවතත් ඔවුන්ට වේද සාක්ෂික මරණයට මුහුණ දීමට සිදුවිය. සත්‍යය ප්‍රචාරය කළාවූ ඔවුන්ට වධ හිංසා කරනු ලැබූ විට ඔවුන්ට පුළුවන් වූයේ ඔවුන්ගේ හඬ ගැසීම ස්වාමින්වහන්සේගේ සවනට යොමු කිරීම පමණය. සභාවේ සතුරන් හැටියටද, රාජ්‍යය පාවා දෙන්නන් හැටියටද ලුහු බඳිනු ලැබූ ඔවුන් රහස් ස්ථානවල දේශනා කළහ. ඔවුහු තමාට හැකි වූ තරමට යටහත් පහත් අසරණ නිවෙස්වල රැකවරණය ලබාගත්හ; නිතරම ගුහාවල සැඟවීමටද ඔවුහු යොමු වූහ.

පීඩා කිරීමේ අන්තරාව පැවති නමුත්, ශතවර්ෂ කිහිපයක් මුළුල්ලේම, මේ විශ්වාසවන්ත මනුෂ්‍යයෝ සන්සුන්ව, කැපවීමෙන් යුක්තව, උනන්දුවෙන් හා ඉවසිල්ලෙන්, ආගමික ඇදහිල්ලට ඇතුල් වී තිබුණාවූ වැරදි දේවලට විරුද්ධව කථා කළහ. ඒ මුල් කාලයේ සිටියාවූ ක්‍රිස්තු භක්තිකයන් සත්‍යය දැනගෙන සිටියේ අඩ වශයෙන්ය. නමුත් ඔව්හු දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රේම කරමින් එයට කීකරුවීමට ආශා වෙමින් ඉවසිල්ලෙන් යුක්තව මරණයට පවා මුහුණ දුන්හ. අපෝස්තුළුවරුන්ගේ කාලයේ සිටියාවූ ගෝලයන් මෙන් බොහෝ දෙනා ක්‍රිස්තුස්වහන්සේගේ සේවය උදෙසා තමාගේ ලෞකික සම්පත් පූජා කළහ. තමාගේ නිවෙස්වල ජීවත්වීමට අවසර ලැබූ අය, පිටමන් කරනු ලැබුවාවූ සහෝදරයන්ට රැකවරණය දුන්හ; එහෙත්, ඔවුන්ද පිටමන් කරනු ලැබූ විට ඔව්හු පිටමන් කරනු ලැබූවන්ගේ තත්ත්වය ප්‍රීතියෙන් පිළිගත්හ. දහස් ගණන් ජනයා තමාට පීඩා කරන්නන්ගේ කෝපයෙන් බියපත්ව තමාගේ ඇදහිල්ල පූජා කරමින් හිර ගෙදරවලින් නිදහස් කරනු ලැබූ බවද සැබෑය. තමා සත්‍යයෙන් ඉවත් වූ බව දක්වන පිණිස ඔවුන්ට පසුතැවිලි වන්නන්ගේ වස්ත්‍ර හඳවන ලදී. නමුත් අඳුරු හිර ගෙදරවල පීඩා ඉවසමින් සත්‍යය උදෙසා නිර්භීත ලෙස සාක්ෂි දැරූ අයගේ සංඛ්‍යාව ස්වල්පයක් නොවීය. උසස් පෙළේ අය මෙන්ම යටහත් පහත් අයද ඔවුන් අතර වූහ. ඔවුන් "ලොලාඩ් කුළුණු" වලට දමනු ලැබූ විටද වධ හිංසාවන්ට හා ගින්නට යොමු කරනු ලැබූ විටද ඔව්හු 'උන්වහන්සේගේ පීඩාවන්ට පංගුකාරයන්' වීමට වටින්නාවූ අය හැටියට තමා සලකා තිබීම ගැන ප්‍රීති වූහ.

වික්ලිෆ්ගේ ජීවිත කාලයේදී ඔහු ගැන තම කැමැත්තේ අන්දමට ක්‍රියාකිරීමට පාප් අනුගාමිකයන්ට නුපුළුවන් විය. ඔහුගේ සිරුර ආරක්ෂා සහිතව සොහොනේ තිබීම ගැන සෑහීමට පත්වීමට ඔවුන්ට නුපුළුවන් විය. කොන්ස්ටන්ස්හි පවත්වන ලද සභාවේ නියමය අනුව, වික්ලිෆ්ගේ මරණයට වසර හතළිහකට පසුව, ඔහුගේ ඇට කටු සොහොනින් ඉවත් කර ප්‍රසිද්ධියේ පුච්චා දමා ඒවායේ අළු ඒ අසල වූ දිය පාරකට දමන ලදී. පැරණි ලේඛකයෙක් මෙසේ කියයි: "මේ

දිය පාර ඒ අළු ඇවොන් ගඟට ගෙන ගියේය. ඇවොන් එය සෙවර්න්ට ගෙන ගිය අතර සෙවර්න් එය පටු මුහුදු තීරයකට ගෙන ගියේය. ඒ ඒවා සාගරයට ගෙන ගියේය. වික්ලිෆ්ගේ අළු ඔහුගේ ධර්මයේ සංකේතයකි. ඔහු ඉගැන්වූ ධර්මයන් ද ලොව පුරා ගෙනයනු ලැබ තිබේ." ඔහුගේ සතුරෝ ඔවුන්ගේ මේ දුෂ්ඨ ක්‍රියාවෙන් දක්වෙන දෙය වටහා ගත්තේ නැත.

වික්ලිෆ්ගේ ලියවිලි මගින්, බොහිමියාවේ සිටියාවූ ජෝන් හස්, රෝම සභාවේ වැරදි බොහොමයක් එපා කරමින් ප්‍රතිසංස්කරණයේ සේවයට යොමු විය. මෙසේ, එකිනෙකට දුරස්තරව පිහිටි මේ රටවල් දෙකෙහි සත්‍යයේ බීජ වපුරනු ලැබීය. බොහිමියාවේ සිට සත්‍යය වෙනත් දේශයන්ට ගෙන යනු ලැබීය. මනුෂ්‍යයන්ගේ සිත්, බොහෝ කාලයක් මුළුල්ලේ අමතක කරන ලද දේව වචනය වෙතට යොමු කරනු ලැබීය. දිව්‍ය හස්තයක් ඒ මහා ප්‍රතිසංස්කරණයට මාර්ගය සූදානම් කරන්නට විය.

---

### බාහිර උපුටා ගැනීම්


අංක 1 - Sears, Barna s, "Life of Luther." pp. 70, 69.

අංක 2 - D' Aubigne, b 17, Ch 7.

අංක 3 - Lewis, Rev. John, History of the Life and Sufferings of J. Wiclif," p. 37 (ed 1820).

අංක 4 - Neander, "History of the Christion Religion and Church, " Period 6, Sc 2, Part 1, Par 8.

අංක 5 - Vaughan, R, "Life and Opinions of John de Wyclffe," Vol.tr II. p. 6 (ed 1831)

අංක 6 - D' Aubigne, b. 17, Ch. 7.

අංක 7 - Wylie, b. 2, Ch. 13

අංක 8 - Foxe, "Acts and Monuments" (edited by Rev. J. Pratt) Vol III pp. 49, 50.

අංක 9 - D' Aubigne, b. 17, Ch. 8.

අංක 10 - Fuller, T., "Church History of Britain" p. 4, Sec 2, Par 54.




# 6

## හස් සහ ජෙරෝම්

නව වන ශත වර්ෂයේදී පමණ ශුභාරංචිය බොහිමියාවේ රෝපණය කරනු ලැබීය. ජනතාවගේ භාෂාවට බයිබලය පරිවර්තනය කරන ලදී. ජනතාවගේ බසින් නමස්කාර මෙහෙයන්ද පවත්වන ලදී. එසේ වුවද, පාප් බල අධිකාරියේ බලතල වැඩිවත්ම දෙවියන්වහන්සේගේ වචනය අඳුරට තල්ලු කරනු ලැබීය. රජවරුන්ගේ අභිමානය සහ මාන්නය සැහැල්ලුවට පත්කිරීමේ කාර්ය භාරය තම අතට ගත් VII වැනි ග්‍රෙගරි පාප්වරයා ජනතාව තමා යටතේ වහල් භාවයට පත් කරගැනීමට කටයුතු සකස් කර ගත්තේය. බොහිමියානු භාෂාවෙන් නමස්කාර මෙහෙයන් පැවැත්වීම තහනම් කරමින් හෙතෙම අණපණවක් නිකුත් කළේය. පාප්වරයා මෙසේ තම අදහස් ප්‍රකාශ කළේය. "නමස්කාර මෙහෙයන් මහ ජනතාව නොදත් බසකින් පැවැත්වීම සර්ව බලධාරී තැනැන්වහන්සේගේ ප්‍රසාදයට හේතු වෙයි. මෙම නීතිය නිසියාකාරව නොපැවැත්වීම නිසා බොහෝ නපුරු ක්‍රියාදාමයන්, ආගම් විරෝධී ඉගැන්වීම් සභාවට ආක්‍රමණය වී ඇත." [උපුටා ගැනීම අංක 1] මෙයාකාරයෙන් දෙවියන්වහන්සේගේ වචනයෙහි ආලෝකය නිවා දමා ජනතාව අඳුරේ සිරකර තැබීමට රෝමය තීරණය කළාය. එහෙත් සභාව සුරක්ෂිතව පවත්වා ගෙන යෑම සඳහා ස්වර්ගය වෙනත් ක්‍රමවේද සූදානමින් තබාගෙන සිටියේය. වධක යාන්ත්‍රණය තමන්ට එරෙහිව ක්‍රියාත්මක වීම කරණකොටගෙන වොල්ඩන්සියානුවරු හා ඇල්බිජෙන්සිවරු තම නිජ බිම් වූ ප්‍රංශය සහ ඉතාලිය අත්හැර බොහිමියාවට පැමිණියෝය. දේව වචනය ප්‍රචාරය කිරීම ප්‍රසිද්ධියේ නොකළ නමුත් රහසිගතව ඔවුහු දේව වචනය අනෙකුත් අය සමග බෙදා ගත්තෝය. ඔවුන්ගේ උනන්දුව ප්‍රබල විය. මෙසේ සත්‍යය වූ ඇදහිල්ල ශත වර්ෂයක් ශත වර්ෂයක් පාසා ආරක්ෂිතව පැවතුණේය.

සභාව තුළ පැවති දූෂණයන් සහ බැතිමතුන්ගේ දුරාචාර ක්‍රියාවන් හෙළා දකිමින් අභීතව ක්‍රියා කළ අය හස් නමැති තැනැත්තාට පෙරාතුව බොහිමියාවෙහි සිටියහ. ඔවුන්ගේ ක්‍රියාදාමයන් මගින් ජනතාව පිබිදීමට පත් විය. එය බොහෝ ප්‍රදේශයන් කරා ව්‍යාප්තව පැවැතියේය. ආගමික නායකයන්ගේ නීතිය මෙයින් පණගැන්වී ශුභාරංචිය ප්‍රකාශ කළ ගෝලයන්ට විරුද්ධව භීෂණය ක්‍රියාත්මක විය. ඔවුහු කඳු මුදුන්හි මෙන්ම කැළෑවලද නමස්කාරය සඳහා රැස් වූහ. එහෙත් හමුදා භටයන් විසින් ඔවුන්ව ලුහුබැඳි අතර බොහෝ අය ඝාතනයට ලක් වූහ. රෝමානු නමස්කාර මෙහෙයන්ගෙන් බාහිරව

වෙනත් ආකාරයකින් නමස්කාර කරන්නාවූ අයව පුළුස්සා මරා දැමිය යුතු යැයි කලකට පසුව ආඥාවක්ද නිකුත් විය. කිතුණු බැතිමත්හු තම ජීවිත සත්‍යතාව වෙනුවෙන් පූජා කළ අතර තමන්ගේ වැයම කරණකොටගෙන සභාවේ ජයග්‍රහණය වර්ධනය වන බව ඔව්හු බලාපොරොත්තු වූහ. "කුරුසිපත් කරනු ලැබූ ගැළවුම්කාරයාණන් කෙරෙහි වූ ඇදහිල්ල මගින් පමණක් ගැළවීම සොයා ගත හැකිය"යි ඉගැන්වූ එක් අයෙක් මරණ මංචකයේදී මෙසේ පැවසූවේය: "සත්‍යතාවේ සතුරන්ගේ දැඩි උදහස දන් අපට විරුද්ධව ක්‍රියාත්මක වෙමින් පවතී. එහෙත් එය සදහටම මෙසේ පවතින්නේ නැත. නුදුරු අනාගත දවසක පොදු ජනතාව අතරින් කෙනෙක් නැගී සිටිනවා ඇත. ඔහු අත කඩුවක් නොවන්නේය. ඔහු සතු අධිකාරිය බලයක්ද නොවන්නේය. එහෙත් ඔහුට විරුද්ධව රෝමානු බල අධිකාරීන්ට කිසිවක් හෝ කළ හැකි නොවන්නේය." [උපුටා ගැනීම අංක 2]. ලූතර්ගේ කාලය දිගු අනාගතයෙහි එන්නට තිබුණි. එහෙත් දැනටමත් කෙනෙක් ඉදිරියට පිවිසෙමින් සිටියේය. රෝමයට විරුද්ධ වූ ඔහුගේ සාක්ෂිය කරණකොටගෙන මුළු ජාතියම කලබලයට පත්වෙනවා ඇත.

යටහත් පවුලක උපත ලැබූ ජෝන් හස් කුඩා කාලයේදීම තම පියා නැති වීමෙන් අනාථයෙක් විය. ශ්‍රද්ධාවෙන් යුතු වූ ඔහුගේ මව දරුවෙකුට හිමිකර දිය යුතු වූ අගනාම සම්පත් දෙක එනම් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබාදීම සහ දෙවියන්වහන්සේ කෙරෙහි භයවීම යන සම්පත් දරුවාට උරුම කරදීමට මහන්සි ගත්තාය. ප්‍රාදේශීය පාසලකින් තම අධ්‍යාපන කටයුතු හැදෑරූ හස් එහි අධ්‍යාපනය නිම කරමින් ප්‍රාග්හි විශ්ව විද්‍යාලයට ඇතුළු වුණේ සුභ සාධක ලැබිය යුතු සිසුවෙක් වශයෙන්ය. මේ අවස්ථාවේදී ඔහුගේ මව වැන්දඹුවක්ව සිටියාය, දුප්පත් අයෙක් වූවාය. එහෙත් ඇය ඔහු සමග සරසවිය කරා ගමන් ගත්තාය. තම පුතණුවන්ට දීමට ඇය සතුව ලෞකික සම්පත් කිසිවක් හෝ තිබුණේ නැත. නමුත් ඔවුන් ප්‍රාග් නුවර ආසන්නයට පැමිණි අතර මේ මව පියා නැති තම පුතු සමග දණ ගසා සගයේ පියාණන්ගේ ආසිරි ඔහුට දෙන ලෙස අයැද සිටියා. ඇයගේ යාච්ඤාවට දෙවියන්වහන්සේ කොයිතරම් විස්මිත ආකාරයකින් පිළිතුරු දෙනවා ඇද්දැයි මව කිසිසේත්ම දැන සිටියේ නැත.

වෙහෙස මහන්සිය නොබලා අධ්‍යාපන කටයුතුවල නිරත වූ හස් සීඝ්‍ර වර්ධනයකට හිමිකම් කීවේය. ඔහුගේ ජීවිතය වරදින් තොර විය; ඔහු මුදු මොළොක් ගති ගුණ ඇති පුද්ගලයෙක් විය. ඔහුගේ ආකර්ෂණීය ගති පැවතුම් සැමගේ සැලකිල්ලට භාජනය විය. ඔහු රෝමානු සභාවෙහි විශ්වාසවන්ත අනුගාමිකයෙක් විය. ඔහු සභාව මගින් දානය කරනු ලබන්නේ යැයි කියන්නාවූ ආත්මික ආශිර්වාද



අවංකවම සොයන්නෙක් ද විය. වරක් හෙතෙම ආගමික සැමරුම් ජුබිලියකට සහභාගි විය. ඔහු පව් කමාව ඉල්ලමින් ඉදිරිපත් වී තමා සන්තකව තිබූ කාසි සියල්ලම ගෙවා දැමීය. පාප සියල්ලෙන් නිදහස් කරනු ලබන්නේය යන පොරොන්දුව ලබන පිණිස ඔහු පෙරහැරකටද සහභාගි විය. සරසවි අධ්‍යාපනයෙන් පසුව ඔහු පූජකයෙකු ලෙස අභිෂේකය ලැබීය. ඔහු ඉතා ඉක්මණින්ම විශිෂ්ට පුද්ගලයෙක් විය. ඔහුට රජ මාළිගාවේ තනතුරක් පිළිගැනීමට ඇරයුමක්ද විය. හෙතෙම විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පදවියක් ලබා පසුව තමා අධ්‍යාපනය ලැබූ ඒ විශ්ව විද්‍යාලයේම කුලපති විය. වසර කිහිපයක් ගෙවී යත්ම නිහතමානීවූ ද පුණ්‍යාධාරවලින් අධ්‍යාපනය ලැබුවාවූ ද මෙම පඬිවරයා දේශයේ අභිමානය බවට පත් විය. ඔහුගේ නාමය යුරෝපාකරය පුරා විසිර සිටි ජනතාව අතර ප්‍රකට විය.

එසේ වුවද. හස් තම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ආරම්භ කළේ වෙනත් ක්ෂේත්‍රයකය. පූජක අභිෂේකය ලබා වසර කිහිපයකට පසුව ඔහු, බෙත්ලෙහෙම් නැමති දේවස්ථානයේ පූජකයා ලෙස පත්වීමක් ලැබුවේය. මෙම දෙව් මැදුරෙහි නිර්මාතෘවරයා කර තිබූ මූලික කොන්දේසියක් නම්, දෙව් මැදුරෙහි ශුද්ධ ලියවිලි ප්‍රකාශ කිරීම කළ යුතුවන්නේ එම ජනතාවගේ භාෂාවෙන් පමණක් බවය. මෙම ක්‍රියාදාමයට විරුද්ධව රෝමය විසින් තහංචි පනවා තිබුණද, මව් බසින් ශුද්ධ ලියවිලි දේශනය කිරීම බොහිමියාවේ සම්පූර්ණයෙන්ම නැතිවී නොතිබුණේය. එහෙත් ජනතාව අතර බයිබලය ගැන දැනුම ඉතා අල්ප විය. සෑම පංතියකම පුද්ගලයන් අතර අනේක දුසිරිත් පැවතුණි. මෙම වැරදි හස්ගේ දැඩි දෝෂයට ලක් විය. ඔහු ඒවා නිර්දය ලෙස හෙළා දැක්කේය. තමා විසින් උගන්වන්නාවූ සත්‍යතාවයේ සහ පවිත්‍රතාවයේ ප්‍රඥප්ති සහ ප්‍රතිපත්ති සනාථ කිරීමට ඔහු දේව වචනයෙන් සාධක ඉදිරිපත් කළේය.

ප්‍රාග්හි පුරවැසියෙකු වූ ජෙරොම් එංගලන්තයේ සිට තම නිජ භූමිය කරා පැමිණි අතර වික්ලිෆ්ගේ ලියවිලි ප්‍රකාශනද රැගෙන ආවේය. ඔහු පසු කලකදී හස්ගේ ඉතා සමීප හිතෙෂියෙක් විය. එංගලන්තයේ රැජින වික්ලිෆ්ගේ ඉගැන්වීම් මගින් ආගමික හැරීමකට පාත්‍ර වී සිටියාය. ඇය බොහිමියානු ජාතික කුමාරිකාවක් වූවාය. ඇයගේ අනුග්‍රහය සහ දායකත්වය කරණකොටගෙන ප්‍රතිසංස්කරණවාදියාගේ ලියවිලි සහ ප්‍රකාශන තම නිජ භූමිය මුළුල්ලේ පතුරුවන ලදී. හස් මෙම ලියවිලි උද්‍යෝගයකින් යුතුව කියවීය. එම ලියවිලිවල රචකයා සැදැහැවත් කිතුණුවකු විය යුතු යැයි විශ්වාස කළ හස්, වික්ලිෆ් විසින් නිර්දේශිත ප්‍රතිසංස්කරණ පිළිබඳව ශුභවාදී ආකල්පයක් දැක්වීය. හස් නොදැන සිටි නමුත් ඔහුද මේ වන විටත් එක්තරා පුනරුද මාර්ගයකට පිවිස සිටියේය. එම මාර්ගය ඔහුව රෝමයෙන් වඩ වඩාත් ඈතට යොමු කරවන්නක් විය.

මේ කාලයේදී ප්‍රාග් නගරය වෙත අමුත්තන් දෙදෙනෙක් පැමිණි-යෝය. එංගලන්තයේ සිට පැමිණි මොවුහු උගත් පඬිවරු වූහ. ඔවුන්ට ආලෝකය ලැබී තිබුණේය. ඔවුන් මේ දුර බැහැර පිහිටි රටට ආවේ තමන් ලැබූ සත්‍යතාවන් එරට ජනයාට බෙදා දීමටය. ඔවුන් තම වැඩ පිළිවෙත පටන් ගත්තේ පාප්ගේ ආධිපත්‍යයට විරුද්ධව ප්‍රසිද්ධියේ වාග් ප්‍රහාරයක් එල්ල කරමින්ය. එහෙයින් ඔවුන්ව නිශ්ශබ්ද කිරීමට බලධාරීහු ක්‍රියාත්මක වූහ. එසේ වුවද, තමන්ගේ අරමුණ අත්හැර දැමීමට අකමැති වූ ඔවුහු තම අරමුණ සපුරා ගැනීමට වෙනත් උපාය මාර්ගයකට පිවිසියහ. දේශකයන් වුවද, ඔවුන් චිත්‍ර ශිල්පයෙහිද නිපුණත්වයක් ලැබ සිටියහ. තම කුසලතාව ක්‍රියාවට නගමින් ඔවුහු ප්‍රසිද්ධ ස්ථානයකට පැමිණ රූප දෙකක් චිත්‍රයට නැගුවෝය. ක්‍රිස්තුස්වහන්සේ යෙරුසලම වෙත පැමිණීම එක් චිත්‍රයකින් නිරූපණය විය. එම පින්තූරයෙන් උන්වහන්සේව පෙන්වා දී තිබුණේ කොටළුවෙකු පිට නැගී මොළොක් ගුණයෙන් යුක්තව පැමිණෙන විලාශයයි. උන්වහන්සේ පසුපස ගෝලයෝ පා ගමනින් යමින් සිටියෝය. ඔවුන් ඇඳ සිටියේ ගමනින් ගෙවී ගිය ඇඳුම් පැළඳුම්ය. ඔවුන් පාවහන් පැළඳ සිටියේ නැත. අනික් චිත්‍රයෙන් නිරූපණය කරනු ලැබුවේ පාප්වරයා තම පිරිවර සමගින් පෙරහැරකින් යන ආකාරයයි. ඔහු සැරසී සිටියේ ඉතා වටිනා ඇඳුම් පැළඳුම් වලින්ය. ඔහු තට්ටු තුනේ කිරීටයක් පැළඳ සිටියේය. අලංකාර වස්ත්‍රවලින් සරසන ලද අශ්වයෙකු පිට පාප්වරයා නැගී සිටියේය. ඔහු ඉදිරියෙන් හොරණෑ වාදකයෝ වූහ. ඔහු පසුපස දීප්තිමත් ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි කාර්දිනල්වරු සහ පූජක පිරිසක් ගමන් ගත්හ.

මෙම වචන නැති දේශනාව විශාල පිරිසකගේ අවධානයට යොමු විය. මේ චිත්‍ර දක බලාගැනීමට විශාල ජනකායක් ඇදී ආවෝය. එහි සැඟවී ඇති අර්ථය සියලු දෙනාට පැහැදිලි විය. චිත්‍ර දෙකෙහි නිරූපණය වූ පුද්ගලයන් දෙදෙනා අතර තිබූ වෙනස්කම් හඳුනා ගැනීම අපහසු කරුණක් නොවීය. ස්වාමියාණන් වූ ක්‍රිස්තුස්වහන්සේ තුළින් දිස් වූ නිහතමානීකම සහ මුදු මොළොක් රූප ලක්ෂණද, උන්වහන්සේගේ දාසයා යයි කියාගන්නාවූ පාප් නම් පුද්ගලයා තුළින් දකගන්නට තිබූ අහංකාරය ආරූඪ කරගත් තත්ත්වයද අතර වෙනස එය දර්ශනය කළ අයගේ මනසෙහි ප්‍රබල කල්පිතයක් මැවීමට සමත් විය. ප්‍රාග් නගරය කලබලයට පත්විය, තත්ත්වය ඉතා උණුසුම් විය. අමුත්තන් දෙදෙනාටම තම ආරක්ෂාව පතා එම පෙදෙසින් ඉවත්ව යාමට සිදුවිය. එහෙත් ඔවුන් ඉගැන්වූ පාඩම කවරෙකුට හෝ අමතක නොවීය. මෙම චිත්‍ර හස්ගේ මනසට තදින් කාවැදී ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බයිබලය සහ වික්ලිෆ්ගේ ලියවිලි ඉතා ගැඹුරින් අධ්‍යයනය කරන්නට ඔහු තුළ දැඩි අධිෂ්ඨානයක් පහළ විය. වික්ලිෆ්ගේ ප්‍රතිසංස්කරණ සියල්ලක්ම පිළිගැනීමට ඔහු මෙතෙක් සූදානම්ව නොසිටි නමුත්, එම ලියවිලි තුළින් පාප්වරයාගේ නියම



චරිතය දකගැනීමට ඔහුට හැකි විය. තමාගේ චින්තනය සහ හැඟීම් මත ඔහු ක්‍රියාත්මක විය. ඔහු නැගී සිට මහත් ජ්වලිතයකින් යුතුව පාප් බල අධිකාරියේ තිබූ දූෂිත ස්වභාවයද, උඩඟුකමද, එහි අභිමතාර්ථයන්ද ප්‍රසිද්ධියේ දෝෂාරෝපණයට ලක් කළේය.

බොහිමියාවේ දල්වනු ලැබූ ආලෝකය ජර්මනිය කරා පැතිර ගියේය. ප්‍රාග් විශ්ව විද්‍යාලයෙහි හටගත් නොසන්සුන් තත්ත්වය නිසා ජර්මානු සිසුහු සිය ගණනින් විශ්ව විද්‍යාලයෙන් ඉවත්ව ගියෝය. ඔවුන්ට බයිබලය පිළිබඳ මුල්ම දැනුම ලැබුණේ හස්ගෙන්ය. තම රටට ආපසු පැමිණි ඔවුහු ශුභාරංචිය තම පිතෘ භූමිය පුරා පතුරුවා හැරියෝය.

ප්‍රාග්හි හටගෙන තිබුණාවූ සිදුවීම් පිළිබඳ පුවත් රෝමයට දැනගන්නට ලැබුණේය. පාප්වරයා වෙත වාර්තා කරන්නැයි හස්ට සිතාසි ලැබුණේය. එම නියෝගයට කීකරුවීම මරණයට විවෘතවීමක් විය. මේ සමගම හස්ට පක්ෂපාතීව මුළු බොහිමියාවම එක හඬින් පාප්වරයාට ඉල්ලීමක් කළේය. බොහිමියාවෙහි රජතුමා සහ බිසවද විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් සහ සිසුන්ද, වංශාධිපතීන්ද, රජයේ නිල දරුවන්ද එක්ව පාප්වරයාගෙන් ඉල්ලා සිටියේ හස්ට තම රටෙහිම සිටීමට අවසර ලබාදී ඔහු වෙනුවෙන් වෙනත් පුද්ගලයෙක් රෝමයට පැමිණ උත්තර පත්‍ර ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසය. මෙම ඉල්ලීමට අවසර දෙනවා වෙනුවට හස්ට විරුද්ධව නඩු විභාගය පවත්වා ඔහු වරදකාරයා කොට ඔහුට දඬුවම් පැමිණවීමට පාප්වරයා ක්‍රියා කළේය. තවද ප්‍රාග් නගරයද තහනමට යටත් කළේය.

ඒ කාලයේදී නගරයක් තහනමට යටත් කළ විට එහි වැසි ජනතාව තුළ මහත් භීතියක් රජ කරන්නට විය. රෝමානු වැසියෝ පාප්වරයාට සලකන ලද්දේ දෙවියන්වහන්සේව නියෝජනය කරන්නාවූ උත්තම නිලධාරියා වශයෙනි. එසේ කිසියම් ප්‍රදේශයක් සහ එහි වැසියන් තහනමට යටත් කිරීම ජනතාවගේ සිත් සතන් තුළ භීතිය හටගැන්වීමෙහි ලා හේතු විය. පාප්වරයා දෙවියන්වහන්සේගේ නියෝජිතයා බවද ඔහු සතුව සගයේ සහ නිරයේ යතුරු ඇතැයිද යන විශ්වාසයක් විය. ආත්මිකවූ ද, භූමිකවූ ද විනිශ්චයන් තීන්දු කිරීමේ බලයද ඔහු සතුව ඇතැයි විශ්වාසයක්ද පැවතුණි. තහනමට තීන්දු කරනු ලැබූ දේශයේ බැතිමතුන්ට ස්වර්ගයේ දොරටු වසා දමනු ලැබේ යයිද තහනම ඉවත් කිරීම පාප්වරයාගේ සතුටට හේතුවන තෙක්, මළවුන්ට දිව්‍ය සැපත උදාකර දෙන්නාවූ දිව්‍ය භවනට ඇතුල් වීම තහනම් යයිද ඔව්හු විශ්වාස කළහ. මෙම භයානක විපත්තියේ පෙර නිමිත්තක් වශයෙන් තහනම් ප්‍රදේශය තුළ කිසිම ආකාරයක හෝ ආගමික රැස්වීම් පැවැත්වීමට අවසරයක් නොවීය. දෙව් මැදුරු

වසා දමන ලදී. විවාහ මංගල්‍ය මෙහෙයන් පවත්වන ලද්දේ දෙව් මැදුරු ගොඩනැගිල්ලෙන් පිටතදීය. ආගම විසින් කැප කළ භූමියක් තුළ මළසිරුරක් භූමදාන කිරීමට අවසරයක් නොවීය. ආගමානුකූල අවමංගල්‍යය පූජාවකින් තොරව මෘත දේහය යම්කිසි වළක හෝ පිට්ටනියක වළලා දැමිය යුතු විය. මිනිස් කල්පනාවන් තුළට මෙම මත කාවද්දා තිබූ නිසා මිනිසා භීතියෙන් භීතියට පත් විය. මෙයාකාරයෙන් රෝමය මිනිසාගේ හෘදය සාක්ෂිය කෙරේ තම බල අධිකාරිය මෙහෙය වීය.

ප්‍රාග් නගරය කලබලකාර සිරියක් ඉසිලීය. මේ මුළු කැරැළිකාර තත්ත්වයටම හස් වගකිව යුතුයයි පවසමින් බොහෝ අය රෝමයේ පළිගැනීමට ඔහුව භාරදිය යුතු යයි තරයේ ප්‍රකාශ කළෝය. කලබැගෑනිය සංසිඳුවීම සඳහා ඔහු ස්වල්ප කාලයකට තම උපන් ගම බලා නික්ම ගියේය. ප්‍රාග්හි සිටි තම මිතුරන්ට ලිපියක් යැවූ හෙතෙම එහි මෙසේ සඳහන් කළේය. "ඔබලාගේ මධ්‍යයෙන් මා නික්ම ආවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පිළිවෙත හා ආදර්ශය අනුගමනය කිරීමටයි, මා පැවසූ දේ පිළිබඳව විරෝධී අදහස් දරන්නාවූ අයට තමා මත සදාතන දඬුවම පමුණුවා ගැනීමට අවස්ථාව ලබා නොදීමටයි, සැදැහැවතුන්ට එරෙහිව හිංසා පීඩා පැමිණවීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම වැළැක්වීමටයි. දෙවියන්වහන්සේගේ වචනය ඔබ අතරෙහි දේශනා කිරීම අනිවාර්ය වන්නේය. එහෙත් මම ඔබගේ නගරයෙහි තවදුරටත් සිටියහොත් ශ්‍රද්ධාවක් නැති පූජකවරු ඔබ අතරෙහි දේව වචනය දේශනා කිරීම තව බොහෝ කාලයකට තහනම් කරාවි යන බිය මා තුළ තිබුණේය. ඒ නිසාම මම ඔබ අතුරෙන් ඉවත්ව ආවෙමි. මම ප්‍රාග් නුවරින් ඉවත්ව ආවේ දිව්‍ය සත්‍යතාව ප්‍රතික්ෂේප කළ නිසා නොවන බව ස්ථිර ලෙස කියා සිටිමි. දෙවියන්වහන්සේගේ කැමැත්තක් වේ නම් දිව්‍යමය සත්‍යතාව උදෙසා දිවි පිදීමට වුවත් මම පසුබට නොවෙමි." [උපුටා ගැනීම අංක 3] හස් තම කටයුතු අත්හැර දැම්මේ නැත. තමාගේ ගම් පළාත වටා පිහිටි පෙදෙස් කරා යමින් ඔහු සත්‍යතාව දේශනා කරන්නට පටන් ගත්තේය. ශුභාරංචිය ප්‍රකාශ කිරීම තහනම් කිරීමට පාප්වරයා ගත් ක්‍රියා මාර්ගය එය තව තවත් ව්‍යාප්ත වීමට හේතුකාරක විය. "සැබෑව උදෙසා මිස සැබෑවට විරුද්ධව කිසිවක් කරන්ට අපට බැරිය." (2 කොරින්ති 13:8).

මේ අවස්ථාවේදී හස්ගේ මනස මහත් අර්බුදකාරී වේදනාවකට පත්ව තිබුණේය. තමන්ගේ අකුණු සැර මගින් ඔහුව නිහඬ කිරීමට සභාව වෑයම් කළද, ඔහු සභාවේ ආධිපත්‍යය නිෂ්ප්‍රභා කිරීමට අදහස් නොකළේය. රෝම සභාව තවදුරටත් ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය බව ඔහු තවමත් විශ්වාස කළේය. පාප්වරයා වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ නියෝජිතයා බවත් සමය භාර දේවගැතිවරයා



බවත් ඔහු තවදුරටත් විශ්වාස කළේය. එහෙත් හස් සටන් වැදුණේ පාප්වරයා තම බලය අනිසි ලෙස යොදා ගැනීමට විරුද්ධව මිස පාප් බලයට විරුද්ධව නොවීය. මෙම අර්බුදකාරී තත්ත්වය ඔහුගේ හදවතට මහත් වේදනාවක් ගෙන දුන්නේය. ඔහුගේ හෘදය සාක්ෂිය පාප්වරයාගේ බලයෙහි අයිතිවාසිකම් ගැන ප්‍රබල ලෙස එකඟ වීමක් පළ කළේය. එහෙත් එහි ක්‍රියාකාරිත්වය ගැන හෘදය සාක්ෂිය වෙනස් සහතිකයක් ලබා දුන්නේය. බල අධිකාරිය වනාහි යුක්තිය සහ සාධාරණය ඉටු කරන්නාවූ වැරදිය නොහැකි ඒකකයක් වූයේ නම් එයට විරුද්ධව නැගී සිටීමට ඔහුගේ හෘදය සාක්ෂිය ඔහුව පෙළඹවූයේ මන්ද? එම බල අධිකාරියට කීකරුවීම පව් කිරීමක් බව ඔහුට පෙනී ගියේය. එහෙත්, වැරදිය නොහැකි සභාවකට කීකරු වීම මෙවැනි පීඩාකාරී චින්තනයකට හේතු වන්නේ මන්ද යන්න ඔහුට විසඳා ගැනීමට නොහැකි වූ ගැටළුවක් විය. මෙම අනුමාන සහිත සිතුවිල්ල ඔහුට පැයෙන් පැයටම වේදනාවක් උදා කළේය. ඔහු මුහුණ දුන් මේ ගැටළුව මෙයට පෙර එක් වතාවක් සිදුවී ඇති බව ඔහුගේ හදවත කියා පෑවේය. ගැළවුම්කාරයාණන් මෙලොව ජීවත් වූ සමයේ එය සිදුවිය. එකල සිටි පූජකයෝ දුෂ්ට පුද්ගලයන් වූහ. ඔවුහු තමන් සතු නිත්‍යානුකූල අධිකාරී බලය නීතියට පටහැනි ක්‍රියාදාමයන් සඳහා පාවිච්චි කළහ. එම තත්ත්වයම නැවත වරක් උදාවී තිබුණේය. එම නිසා තමාගේ ක්‍රියාත්මක වීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙතක් කෙරෙහි ඔහුගේ අවධානය යොමු විය. ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් ඉගැන්වීම්, අනුශාසනා, ප්‍රඥප්ති සහ නියමයන් පිළිබඳව තේරුම් ගැනීමක් මත කෙනෙකුට තම හෘදය සාක්ෂියට එකඟව තීරණයක් ගැනීමට ඉඩ දීම එකී උචිත ක්‍රමය වන්නේය. වෙනත් ආකාරයට පවසන්නේ නම් ශුද්ධ ලියවිලි ප්‍රකාශන ලෙස පිළිගත යුතු වන්නේ දෙවියන්වහන්සේ ශුද්ධ බයිබලය තුළින් කියන්නාවූ සිද්ධාන්ත මිස පූජකයන් තුළින් සභාව කියන්නාවූ දේවල් නොවන බවය. වැරදිය නොහැකි එකම මගපෙන්වීම එම ක්‍රමය වන්නේය. [උපුටා ගැනීම අංක 4].

මඳ කලකට පසුව උණුසුම් වාතාවරණය තුනී විය. ප්‍රාග් නගරය නැවත වරක් සන්සුන් විය. හස්ද නැවත තම බෙත්ලෙහෙමේ දෙව්මැදුර කරා පැමිණියේය. දේව වචනය දැඩි ජ්වලිතකමින්ද, අභීතවද දේශනා කිරීම ඔහුගේ අධිෂ්ඨානශීලී අභිලාෂය විය. ඔහුගේ සතුරෝ ක්‍රියාත්මකව බලසම්පන්නව සිටියහ. එසේ වුවද, බොහිමියාවේ රැජින සහ ප්‍රභූ පංතියේ වංශාධිපතීන්ද හස්ගේ මිතුරන් වූහ. බහුතර ජනතාවක්ද ඔහුට පක්ෂපාතීත්වය දැක්වූහ. ඔහුගේ පැහැදිලි නිර්මල ඉගැන්වීම් හා පිරිසිදු ජීවිතය රෝමානු පූජකයන් දේශනා කළ ජීවිත රටාව හා සමාන කළ විටද සල්ලාලකම අගතැන් කරගත් ඔවුන්ගේ ජීවිත සලකා බැලූ විටද පාර්ශ්වයන් දෙක අතර සැසඳීමක් කළ ජනතාව හස්ගේ පාර්ශ්වයේ සිටීම ගෞරවණීය එකක් යයි තීරණය කළෝය.

මේ තාක් කල් හස් තනිව සේවය කළේය. එහෙත් දැන් ජෙරෝම් ඔහුට එකතු විය. ඔහු එංගලන්තයේ අධ්‍යාපනය කරගෙන යන අතරේදී වික්ලිෆ්ගේ ඉගැන්වීම් පිළිගෙන තිබුණේය. දැන් දෙදෙනාම තම ජීවිත ඒකාබද්ධ කර කටයුතු කරන්නට ගිවිස ගත්තෝය. ඔවුන් දෙදෙනාව වෙන් කළ නොහැකි විය. එකල ජනතාවගේ ඉමහත් ගෞරවයට භාජනය වූ බුද්ධි ප්‍රභාව, සහජ කථිකත්වය සහ ඉගෙනීම ජෙරෝම් සතුව පැවතියේය. එහෙත්, නොසැලෙන සුළු ස්ථිර ගුණාංග සතු චරිතයකින් හස් වඩා උතුම් විය. ජෙරෝම්ගේ උද්වේගකාරීවූ ද, ආවේගශීලීවූ ද ක්‍රියාකාරිත්වය කෙරෙහි යම්කිසි හික්මවීමක් යෙදවීමට හස්ගේ සන්සුන් විනිශ්චයන් සමත් විය. හස්ගේ බුද්ධිමත් තීරණ නිහතමානීව පිළිගැනීම ජෙරෝම්ගේ වැඩ කටයුතු වඩාත් සාර්ථක වීමට ඉවහල් විය. මේ දෙදෙනාගේ ඒකාබද්ධ මෙහෙයුම් යටතේ ප්‍රතිසංස්කරණය ඉතා වේගයෙන් ඉදිරිය කරා ගමන් ගත්තේය.

තෝරාගනු ලැබූ මෙම දෙදෙනා මත සත්‍යතාවයේ මහත් ආලෝක ධාරාවන් පතිත වීමට දෙවියන්වහන්සේ ඉඩ හළ සේක. රෝමානුවේ නිදන්ගතව ඇති වැරදි ඇදහිලි සහ ඉගැන්වීම් ගණනාවක් පිළිබඳ සත්‍යය උන්වහන්සේ මොවුන්ට එළිදරව් කළසේක. එහෙත් ලෝකයට ලබා දිය යුතු සියලු ආලෝකය උන්වහන්සේ ඔවුන්ට එළිදරව් නොකළ සේක. රෝමානුවේ අන්ධකාරය විසින් ගිලගෙන තිබූ ජනතාව එයින් පිටතට ගෙන ඒමට දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ මේ සේවකයන් තුළින් ක්‍රියාත්මක වෙමින් සිටිසේක, ඔවුන්ට මග පෙන්වමින් සිටිසේක. මහත් බාධා සහ අවහිරතා ගණනාවකට මුහුණ දීමට ඔවුන්ට සිදුවන්නට තිබුණි. ඔවුන්ට දරාගත හැකි ප්‍රමාණය අනුව උන්වහන්සේ ඔවුන්ට පියවරෙන් පියවර මගපෙන්වූ සේක. සම්පූර්ණ ආලෝකය එක්වරටම ලබාගැනීමට ඔවුන් සූදානම්ව සිටියේ නැත. ඝන අන්ධකාර රාත්‍රියක සිටින්නාවූ අයෙකුට එක්වරම දීප්තිමත් ආලෝක කදම්බයකට මුහුණ දීම පහසු කාර්යයක් නොවන්නේය. එසේම අන්ධකාර ඉගැන්වීම්වල විශාල කාලයක් දිවි ගෙවූ අයට සදාකාල ආලෝකය එක්වරම ලබා දුනි නම්, ඔවුන් ඒ ආලෝකයෙන් ඉවතට හැරී යනවා ඇත. එහෙයින් මහජනයාට දරා ගත හැකි ප්‍රමාණයෙන් උන්වහන්සේ ආලෝකය කෙමෙන් නායකයන්ට එළිදරව් කළසේක. ශත වර්ෂයෙන් ශත වර්ෂයට තවත් විශ්වාසවන්ත සේවකයන් මෙම මාර්ගයට පිවිසෙනවා ඇත. ප්‍රතිසංස්කරණ මාවතේ තවත් ඉදිරියට යෑමට ඔවුන් ජනතාවට මග පෙන්වනවා ඇත.

සභාව තුළ වූ ධර්මතා සහ ඉගැන්වීම් පිළිනොගෙන, භේද වී ඉවත්ව යෑම් තවදුරටත් කෙරීගෙන ගියේය. අධිකාරී බලයට හිමිකම් කියමින් පාප්වරුන් තුන් දෙනෙක් තරඟයට බැස සිටියෝය. ආධිපත්‍යය ලබාගැනීම සඳහා වූ ගැටුම කරණකොටගෙන කිතුණු රාජ්‍යය අපරාධ



සහ කෝලාහලවලින් පිරී ගියේය. ඔවුනොවුන්ට විරුද්ධව අප්‍රසන්න ප්‍රකාශන පැවසීමෙන් නොනැවතුණු ඔවුහු ලෞකික අවි ආයුධ භාවිතයට පවා පෙළඹුණෝය. අවි ආයුධ මිලයට ගෙන තමන් සතුව යුද්ධ භට කණ්ඩායමක් තබාගැනීමට තිදෙනාම පසුබට නොවූහ. මේ සඳහා මිල මුදල් අවශ්‍ය විය. එය ලබා ගැනීම සඳහා සභාවේ ආශිර්වාදයන් සහ නිලතලද සභාවේ සම්පත්ද විකිණීම යොදා ගන්නා ලදී. මේ අතර සභාවේ අවශේෂ පූජකයෝද, තමන්ගේ නායකයන් අනුගමනය කරමින් තම විරුද්ධවාදීන් යටත් කරගැනීමටත්, තමන්ගේ පුද්ගලික බලතල ශක්තිමත් කරගැනීමටත් සභාව සතු සම්පත් විකිණීමෙහි යෙදුණෝය. නිර්භීත ගුණාංගයෙන් දිනෙන් දින වර්ධනය කරා පිය නැගූ හස් ආගමේ නාමයෙන් කරන්නාවූ අතිශයින් පිළිකුල්වූ ද, ද්වේෂ සහගතවූ ද ක්‍රියාවන්ට එරෙහිව එම ක්‍රියා හෙළා දකිමින් දැඩි ස්ථාවරයෙන් තම විරුද්ධතාවය ප්‍රකාශ කළේය. ක්‍රිස්තියානි සභාව කරා පතිත වන්නාවූ විවිධ ආකාරයේ කාලකණ්ණිකම් සහ අවැඩදායී ප්‍රතිඵලවලට හේතුව රෝමානු නායකයන් යයි ජනතාව ප්‍රසිද්ධියේම චෝදනා කළෝය.

ප්‍රාග් නගරය නැවත වරක් ලේ වැගිරෙන්නාවූ ගැටුමක එළිපත්ත උඩට පැමිණ සිටියේය. ඉතිහාසයේ අතීත දවස්වලදී සිදුවූ ආකාරයෙන්ම "ඉශ්‍රායෙල් කළඹන තැනැත්තා" (1 රාජාවලිය 18:17) වශයෙන් දෙවියන්වහන්සේගේ සේවකයා වූ හස්ට දෝෂාරෝපණය කරන ලදී. නගරය නැවත වරක් ආගමික තහනමකට ලක් කරනු ලැබීය. හස්ද තම ගම් දනව්ව බලා පලා ගියේය. ඔහු සේවය කළ බෙත්ලෙහෙම් නමැති කුඩා දෙව් මැදුරේ සිට විශ්වාසවන්ත ලෙස හඬ නැංවූ සාක්ෂි දැන් නිමාවට පත් විය. සත්‍යය වෙනුවෙන් සාක්ෂි දැරීම නිසා තම ජීවිතය පූජා කිරීමට පෙර ඔහු විසින් පුළුල්වූ ද, විශාලවූ ද වේදිකාවක් මත නැගී සිට සමස්ත ක්‍රිස්තියානි ජන සමූහයාහට සත්‍යතාව ප්‍රකාශ කළ යුතු විය.

යුරෝපය කළඹන්නාවූ නපුරු ක්‍රියාදාමයන් විසඳා පිළියමක් යෙදීමට කොන්ස්ටන්ස්හිදී රැස්වීමක් පවත්වන ලදී මෙම සභා නායක රැස්වීම කැඳවන ලද්දේ පාප්වරුන් තුන් දෙනාගෙන් එක් අයෙකු වූ XXIII වන ජෝන් විසින්ය. මේ සඳහා ආඥාව නිකුත් කළේ අගරජතුමා වූ සිගිස්මන්ඩ්ය. මෙවන් සභා නායක රැස්වීමක් කැඳවීමට ජෝන් නමැති මේ පාප්වරයා තුළ කිසිම මනාපයක් නොවීය. මෙකල විසූ සභා සාමාජිකයන්ගේ අධ්‍යාත්මික තත්ත්වය, සදාචාර ජීවිතය පහත් මට්ටමක පැවතියේය. පූජකයන්ගේ ජීවිත රටාවද එයට වඩා වෙනස් නොවීය. ජෝන් පාප්වරයාගේ චරිතයද, ඔහුගේ ප්‍රතිපත්ති වේදයද පරීක්ෂණයකට මුහුණ දීමට සුදුසු නොවීය. එසේ වුවද, සිගිස්මන්ඩ්ගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරීමට ඔහුට ශක්තියක් නොවීය.

මෙම සභා නායක රැස්වීමෙහි ප්‍රධාන අරමුණ වූයේ සභාව කැඩීයාම, කොටස්වලට බෙදීයාම වළක්වාලීමය, එයට පිළියමක් යෙදීමය, මිථ්‍යා මත සහ පිළිවෙත් මුලිනුපුටා දැමීමය. මෙම රැස්වීමට අනෙකුත් පාප්වරුන් දෙදෙනාටද කැඳවීමක් ලැබුණේය. නව අදහස් ඉදිරිපත් කළ ප්‍රධාන න්‍යායාචාර්ය වරයා වන හස්ටද එම රැස්වීමට සහභාගි වීමට නියෝගයක් ලැබුණේය. තමන්ගේ ආරක්ෂාව පිළිබඳව කල්පනා කළ අනෙක් පාප්වරුන් දෙදෙනා රැස්වීමට සහභාගි වුණේ නැත. ඔවුන් උදෙසා පෙනී සිටීමට නියෝජිතයන් ඒ රැස්වීමට යවනු ලැබීය. රැස්වීම කැඳවූයේ ජෝන් පාප්වරයා බවක් පෙන්නුම් කරනු ලැබූ නමුත් ඔහු රැස්වීමට සහභාගි වුණේ මහත් අසතුටින්ය. රැස්වීම කැඳවීමෙහි ලා අගරජ තුමාගේ රහසිගත අරමුණක් ඇතැයි ඔහු අනුමාන කළේය. රජතුමා පාප් ධූරයෙන් තමාව පහකර දමනවා ඇතැයි ඔහු කල්පනා කළේය. පාප් ධූරය ලබාගැනීම සඳහා තමන් විසින් සිදුකළ අපරාධ මෙන්ම එම තනතුරට නින්දාව ලබාදීමෙහි ලා තමන්ගේ අතින් සිදු වූ විවිධ දුරාචාර ගැනද තමන්ට උත්තර සැපයීමට සිදුවෙතැයි ඔහු තුළ බියක් විය. ඔහු කොන්ස්ටන්ස් නගරයට ඇතුළු වුණේ මහත් පෙරහැරකින්ය. ඔහු සමග විවිධ ආගමික අනුනායකවරු පෙරහැරෙහි ගමන් ගත්තෝය. පෙරහැරෙහි පසුපස, ආවතේවකරුවන් විශාල ගණනාවකගෙන් සැදුම් ලද්දේ විය. පුරවැසියන් විශාල ගණනාවක් පිරිවරා ගෙන සියලුම පූජකයන්ද රජයේ උසස් නිල දරුවන්ද ඔහුව පිළිගැනීමට එක් රැස්වූහ. ප්‍රධාන මහේස්ත්‍රාත්වරුන් සතර දෙනෙකු විසින් ඔසවා ගත් රන් උඩු වියනක් පාප්වරයාගේ හිසට ඉහළින් විය. ආගන්තුක සත්කාර කරන්නා ඔහු ඉදිරියෙහි ඔසවා ගෙන යනු ලැබීය. කාර්දිනල්වරුන්ගේ සහ වංශාධිපතීන්ගේ අගනාවූ ද, වටිනාවූ ද ඇඳුම් පෙරහැරට අලංකාරයක් එකතු කළේය.

මේ අතරතුර තවත් පුද්ගලයෙක් කොන්ස්ටන්ස් නගරය වෙත පැමිණෙමින් සිටියේය. හස් තමාට තර්ජනයක් එල්ල කළ අනතුරු ගැන දැනගත්තේය. නැවත වරක් හමු නොවන කල්පිතයෙන් යුතුව ඔහු තම මිතුරන්ට ආයුබෝවන් කියා ඔවුන්ගෙන් වෙන්ව ආවේය. තමාගේ ගමනෙහි අවසානයේදී තමාගේ සිරුර කණුවකට බැඳ ගිනි අවුලුවා ලීම සිදුවිය හැකි බව ඔහු කල්පනා කළේය. තමාට විපතක් සිදුවීමේ හැකියාව ඉතා ඉහළ බව දැන සිටි හෙතෙම බොහිමියාවේ රජතුමාගෙන් රැකවරණ සහතික වීමක් ලබාගත්තේය. තවද, ගමන් මාර්ගයේදී අනතුරක් සිදුනොවන බවට සිගිස්මන්ඩ් අධිරාජ්‍යයාගෙන්ද සහතිකයක් ඔහු ලබා ගත්තේය. ඔහු සියලු කටයුතු කළේ මේ අවස්ථාවේදී තමාට මරණය හිමි වන බව කල්පනා කරමිනි.

ප්‍රාග්හි සිටි තම මිතුරන්ට හෙතෙම මෙසේ ලිපියක් ලියා ඇරියේය. "මාගේ සහෝදරවරුනි ... මට විරුද්ධව ක්‍රියා කරන්නාවූ, අනේක



මානුෂික සතුරන් මුණගැසීමට මම මේ ගමන යන්නෙමි. ආරක්ෂාව ලබා දෙන බවට රජතුමා මට සහතික වී ඇත ... මාගේ සියලු කටයුතු මම මාගේ ගැළවුම්කාරයාණන්ට, සර්ව බලධාරී දෙවියන්-වහන්සේගේ ශ්‍රී හස්තයට භාර දෙන්නෙමි. ඔබගේ ඉතා උනන්දු යාච්ඤාවන්ට උන්වහන්සේ ඇහුම්කන් දෙන බව මම විශ්වාස කරමි. මම කථාකරන අවස්ථාවන්හිදී උන්වහන්සේගේ නැණවත් දූරදර්ශී ප්‍රඥාව මාගේ පිහිටට පැමිණෙන බව මට විශ්වාසයි. ඔවුන්ගේ චෝදනා වලට එරෙහිව කථා කිරීමට මට එවන් මගපෙන්වීමක් අවශ්‍ය වේ. උන්වහන්සේගේ සත්‍යතාවය තුළ ස්ථිරසාර ලෙස නැගී සිටීමට උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්ගේ පිහිට මම ඉල්ලා සිටිමි. මට මුහුණ දීමට ඇති ඕනෑම ආකාරයක පරීක්ෂාවකට, සිරගෙයි දමනු ලැබීමට හෝ අවශ්‍ය නම් කුරිරු මරණයකට මුහුණ දීමේදී වුවද අභීතව නොසැලී සිටීමට මට දේව මගපෙන්වීම ලැබේවා. තමන්වහන්සේගේ ආදරවන්ත ජනතාව සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දුක් විඳි සේක. එම නිසා, අපගේ ගැළවීම උදෙසා සෑම දෙයක්ම ඉවසිල්ලෙන් යුතුව විඳ දරා ගැනීමට උපකාර වන පිණිස, අප උදෙසා උන්වහන්සේ ආදර්ශයක් ලබාදීම ගැන අප පුදුම විය යුතුද? උන්වහන්සේ අපගේ දෙවියන්වහන්සේය; අපි උන්වහන්සේගේ මැවිල්ල වන්නෙමු. උන්වහන්සේ අපගේ ස්වාමින්වහන්සේය; අපි උන්වහන්සේගේ සේවකයන් වන්නෙමු. උන්වහන්සේ සකල ලෝකයේ අධිපතියාණන් වන සේක, අපි වැදගත්කමකට නැති, මරණයට යොමු වන මිනිසුන් වන්නෙමු. මේ සියලු දේ පිළිබඳව අසම සම උත්තමයාණන් වූ ඒ තැනැන්වහන්සේ අප උදෙසා හිංසා පීඩා විඳි සේක! දුක් හිරිහැර, හිංසා පීඩා විඳීම අපව පවිත්‍ර කිරීමේ එක් මාධ්‍යයක් නිසා අප එයට භාජන නොවී සිටින්නේ ඇයි? මාගේ මරණය උන්වහන්සේගේ ගෞරවයට හේතු කාරක වන්නේ නම්, එය ඉක්මණින්ම මා වෙත ළඟා වෙන්නැයි යාච්ඤා කරන්න. මාගේ සියලු විපත් ඉදිරියෙහි නොසැලී සිටීමට මට ආධාර කරන්නැයි යාච්ඤා කරන්න. මා ආපසු ඔබ අතරට පැමිණීම වඩා යහපත් යයි උන්වහන්සේ දන්නා සේක් නම්, මා කැළැල් නැතිව ඔබ අතරට පැමිණේවා කියා යාච්ඤා කරමු. ශුභාරංචියෙහි ඇතුළත් සත්‍යතාවයෙහි බිඳක් හෝ තිතක් හෝ මාගෙන් නොබිඳේවා යයි යාච්ඤා කරමි. එසේ ශුභාරංචියට කැළැලක් හෝ සිදු නොකර ක්‍රියා කිරීමෙන් මාගේ සහෝදරයන්ට අනුගමනය කළ හැකි ආදර්ශයක් තබා යෑම මගේ අධිෂ්ඨානය වන්නේය. සමහර විට ඔබට මාගේ මුහුණ ප්‍රාග්හි නැවත වරක් දැකගන්නට නොලැබිය හැකිය. මා ඔබ අතරට නැවත පැමිණීම සර්ව බලධාරී දෙවියන්වහන්සේගේ සැලැස්ම වන්නේ නම්, අපි සියලු දෙනාම අත්වැල් බැඳගෙන නොසැලෙන්නාවූ අධිෂ්ඨානයකින් යුතු හදවතක් ඇතිව උන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි දැනුම සහ ආදරය ඇතිව ඉදිරියටම යමු." [උපුටා ගැනීම අංක 5].

ශුභාරංචියෙහි ගෝලකමට පැමිණි එක් පූජකයෙකුට ලිපියක් යවමින් හස් තමාගේ අතින් සිදු වී ඇති වැරදි නිහතමානීව පවසා සිටියේය. මිල අධික ඇඳුම් පැළඳුම් භාවිතා කිරීමෙන් වින්දනයක් ලැබීම සහ නිස්සාර ව්‍යාපෘතීන්හි යෙදීමෙන් කාලය නාස්ති කිරීම ගැන ඔහු තමාටම වරද පවරා ගත්තේය. ඉක්බිතිව ඔහු සිතේ අනුකම්පාව ඇතිකරවන මෙම අනුශාසනාවන්ද ලිපියට ඇතුළත් කළේය. "දෙවියන් වහන්සේගේ තේජසත් මිනිසුන්ගේ ගැළවීමත් ඔබගේ මනසෙහි ප්‍රමුඛ ස්ථානය ගනු ලැබේවා! වතුපිටි ඉඩකඩම් අත්කර ගැනීමෙන් ද ඔබගේ ආත්මය වර්ධනය කරගැනීමට වඩා ඔබගේ නිවස අලංකාර කරගැනීමෙන් ද වැලකීමට ප්‍රවේශම් වන්න. සියල්ලටම ඉහළින් ආත්මික ප්‍රාසාද මන්දිරය රැකබලා ගැනීමට වෑයම් කරන්න. දුප්පත් අය සමග ක්‍රියා කිරීමේදී ධාර්මික වන්න, නිහතමානී වන්න. උත්සව සඳහා ඔබගේ සම්පත් වියදම් නොකරන්න. ඔබගේ ජීවිතය වෙනස් කර නොගෙන අනවශ්‍ය ලෙස අධික අයුරින් වියදම් කිරීමෙන් නොවැලකෙන්නෙහි නම් මට මෙන්ම ඔබට ද තරවටු කරනු ලබන බව නොඅනුමානය... ඔබගේ ළමා වියෙහි සිට ඔබ මාගේ අනුශාසනා ලැබුවෙහිය. එම නිසා ඔබ මාගේ ධර්මතාවන් මොනවාදැයි දන්නෙහිය. මා තවදුරටත් එම දේවල් ගැන ලිවීම අවශ්‍ය නොවේ. කිසිම ප්‍රයෝජනයක් නැති දේවල් කිරීමේ ආශාවක් මා තුළත් තිබුණි. මා ඒ වැරදි කළ බව ඔබත් දැක තිබුණි. එම නිසා එවැනි දේවල් කිරීමෙන් මාව ආදර්ශයක් කරගන්න එපා. මා කළ නිරර්ථක ක්‍රියා නොකර සිටින්නට ඔබට ස්වාමින්වහන්සේගේ කරුණාව ලැබේවා යැයි මා උන්වහන්සේගෙන් අයැද සිටිමි." එම ලිපිය බහාලූ කවරයෙහි ඔහු මෙසේ ලියා තිබුණේය: "මා මිය ගිය බවට සහතිකයක් ඔබ ලබාගත් පසුව පමණක් මෙම ලිපියෙහි මුද්‍රාව කඩා විවෘත කරන්නැයි මම ඔබගෙන් තදින්ම ඉල්ලා සිටිමි." [උපුටා ගැනීම අංක 6]

කොන්ස්ටන්ස් කරා යන ගමනේදී තමා පසුකළ ගම් දනව්වල තමාගේ ධර්මතාවන් පැතිර ගොස් තිබෙන බව දැකීමෙන් ඔහු මහත් ප්‍රීතියට පත් විය. ඔහුගේ සේවයට ලැබී ඇත්තාවූ ප්‍රතිචාරය ඉතා සතුටුදායක විය. ඔහුව මුණගැසීමට ජනතාව පොරකමින් රැස් වූහ. සමහර නගරවලදී මහේස්ත්‍රාත්වරුද ඔහු සමග වීදි දිගේ ගමන් කළෝය.

කොන්ස්ටන්ස් වෙත පැමිණි ඔහුට සම්පූර්ණ නිදහස දෙන ලදී. ආරක්ෂාව පිළිබඳව අග රජතුමාගේ සහතිකයට අමතරව ආරක්ෂාව පිළිබඳව පාප්වරයාගේ පුද්ගලික සහතික වීමක්ද ඔහුට දෙනු ලැබීය. මේ සියලු සහතිකවීම් සහ ප්‍රකාශන මධ්‍යයේ පවා ටික දවසකට පසුව ඔහුව අත් අඩංගුවට ගන්නා ලදී. පාප්වරයාගේද, ධර්මාධ්‍යක්ෂ වරුන්ගේ නොහොත් කාර්දිනල්වරුන්ගේද නියෝග පිට ඔහු සිරභාරයට පත් විය. පිළිකුල් සහගත බිම්ගෙයක කුටියක් ඔහුගේ නිවහන විය.



තමා විසින් සහතික කර දෙමින් වූ පොරොන්දුව කඩ කළ පාප්වරයාද වැඩි දවසක් ගතවීමට මත්තෙන් එම ස්ථානයෙහිම සිරකරුවෙකු බවට පත් විය. [උපුටා ගැනීම අංක 7]. වැරදි විශාල ගණනාවකට ඒ පාප්වරයා වරදකරු කරන ලදී. මිනීමැරුම, ආගමික සම්පත් මුදලට විකිණීම, කාම මිථ්‍යාචාරය, "නම් කිරීමට පවා නුසුදුසු පාප" මෙන්ම ඉතාම පහත් ගණයේ අපරාධ යනාදි චෝදනාවලට ඔහු වරදකරුවෙක් විය." සභා රැස්වීම් වාරයේදී මෙම තීරණයට එළඹ, ඔහුගේ පදවිය නිස්සාරණය කර ඔහුව සිර කුටියකට දමන ලදී. අනික් පාප්වරුන් එකී තනතුරෙන් පහකර දමා නව පාප්වරයෙකු පත් කරගන්නා ලදී.

ආගමික දහම් සහ ඉගැන්වීම් මෙන්ම තේවා කටයුතු පිළිබඳවද හස් විසින් පූජකයන්ට කරන ලද චෝදනා වලට වඩා පාප් විසින් කරන ලද අපරාධ හා දූෂණ ක්‍රියා බොහෝ සේ වැඩි විය. එහෙත් පාප්වරයා බලයෙන් සහ ධූරයෙන් ඉවත් කළ එම කමිටුවම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය උදෙසා සේවය කළ සේවකයා විනාශ කිරීමට ක්‍රියා කළේය. හස්ව සිරභාරයට තීන්දු කිරීම ගැන බොහිමියාවේ ජනතාව කෝපාවිෂ්ඨ වූහ. සාමයට තර්ජනයක් ලෙස සිදුවන්නාවූ මෙම කෝපාවිෂ්ඨ උද්ඝෝෂණ මැඩ පවත්වන්නැයි බලගතු වංශාධිපති ප්‍රභූවරු සභා නායක මණ්ඩලයෙන් ඉල්ලා සිටියෝය. හස්ට ආරක්ෂාව සැපයීමට ගිවිසුම් දී සිටි අගරජතුමා තමාගේ ප්‍රතිඥාව කඩ කිරීමට අකමැතිව ඔහුට විරුද්ධව නඩු විභාගයක් පැවැත්වීම ප්‍රතික්ෂේප කළේය. එහෙත් ප්‍රතිසංස්කරණ වාදියාගේ විරුද්ධවාදීහු ද්වේෂයෙන් යුතුව ඔහුට දඬුවම් පැමිණ විය යුතු යැයි යන ස්ථාවරයේ පිහිටා සිටියහ. රජතුමාගේ අවිචාරක හැඟීම් අතහැර දමා, හස්ට විරුද්ධ වීමට බිය නොවන්නැයි ඉල්ලමින් ඔව්හු කරුණු පැහැදිලි කළෝය. රජතුමාගේ ආගමික පක්ෂපාතකම ගැන වර්ණනා මුඛයෙන් පවසමින් සතුරෝ හස්ට විරුද්ධව දඬුවම් පැමිණවීමට රජතුමාට වක්‍රාකාරයෙන් බලපෑම් එල්ල කළෝය. "සභාවට විරුද්ධව දහම් පතුරවන්නාවූ මිථ්‍යා දෘෂ්ටිකයන් කෙරෙහි විශ්වාසය රැඳවිය යුතු නොවේ යයිද එවන් චෝදනාවකට ලක් වූ අයෙකුගේ රැකවරණය ගැන සහතිකයක් දුන් නමුත් එම පොරොන්දුවෙන් රජතුමා නිදහස් කිරීමට මේ කමිටුවට පුළුවන් බවද පවසන ලදී. [උපුටා ගැනීම අංක 8]. මෙසේ සතුරෝ තම කාර්යය ඉටු කර ගත්තෝය.

බිම් ගෙයි සිරකුටියෙහි පැවැති තෙත බරිත තත්ත්වයත්, පරිසරයෙහි වූ අපිරිසිදු වාතයත් කරණකොටගෙන හස්ට උණක් වැළඳුණේය. එය ඔහුව මරණාසන්න තත්ත්වයකට පත් කළේය. උණෙන් සහ සිරගෙයි ලැමෙන් දුර්වලව සිටි ජෝන් හස්ව අන්තිමේදී මන්ත්‍රණ සභාව ඉදිරියට කැඳවනු ලැබීය. යදමින් බැඳ දමා තිබූ හෙතෙම අගරජතුමා ඉදිරියට පමුණුවනු ලැබීය. ඔහුට රැකවරණය සැපයීමට අගරජතුමා ප්‍රතිඥා දී

තිබුණේය. තමාට විරුද්ධව පැවති දීර්ඝ නඩු විභාගයේදී සත්‍යය වෙනුවෙන් තම ස්ථාවරය මත පමණක් නැගී සිටිමින් හෙතෙම සලිත නොවී පෙනී සිටියේය. සභාවල අධිකාරිය තුළ සිදුවන දූෂණ සහ අවකල් ක්‍රියා පිළිබඳව ගරු ගාම්භීරවූ ද, විශ්වාසනීයවූ ද ප්‍රකාශයක් ඔහු ඉදිරිපත් කළේය. ආගමික සහ රාජ්‍ය නායකයන් ඉදිරියේ ඔහු කරුණු සහ සාධක ඉදිරිපත් කරමින් සභා නායකයන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළේය. තීරණය ප්‍රකාශයට පත් කිරීමට පෙර, ඔහු විසින් උගන්වනු ලබන ධර්මතාවන් වැරදි යයි පිළිගෙන ඒවා ඉල්ලා අස්කර ගැනීම හෝ මරණයට එකඟ වීම ඔහු ඉදිරියෙහි තබන ලදී. චකිතයකින් තොරව හෙතෙම වේද සාක්ෂි කරුවෙකුගේ මරණය තෝරා ගත්තේය.

දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ඔහුව රැකබලා ගත්තේය. මරණයට පත් කිරීමේ ක්‍රියාදාමය ඉටුවීමට පෙර තිබූ වේදනාවෙන් පිරී සති කිහිපය තුළදී ස්වර්ගයේ සාමය ඔහුගේ ආත්මය පුරවාලීය. ඔහු මිතුරෙකුට මෙසේ පැවැසුවේය: "මම මේ ලිපිය ලියන්නේ සිර ගෙදරක සිටය, විලංගු දමා ඇති අතකින්ය. හෙට මාගේ දඬුවම ක්‍රියාත්මක වන දිනයයි ... යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහාය ඇතිව, අපි ඉදිරි ජීවිතයේදී සාමයෙන් යුතුව මුණ ගැසෙන්නෙමු. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ කරුණාව මා වෙත දක් වූ ආකාරය ඔබට එවිට දැනගැනීමට හැකිවෙනවා ඇත. මාගේ පරීක්ෂාවන් සහ නඩු විභාග මධ්‍යයේ උන්වහන්සේ මට සහාය වූ කාර්යක්ෂම භාවය ඔබට දැනගත හැකිවෙනවා ඇත." [උපුටා ගැනීම් අංක 9].

අඳුරෙහි ගිලී තිබූ බිම් ගෙයි සිරකුටියෙහි සිටි ඔහු සැබෑ ඇදහිල්ලෙහි ජයග්‍රහණය දුටුවේය. සිහිනයෙන් ඔහු ප්‍රාග්හි පිහිටි තම කුඩා දෙව් මැදුර වෙත පිය නැගීය. ඔහු එම ස්ථානයෙහි ශුභාරංචිය දේශනා කර තිබුණේය. එහි බිත්තිවල තමා විසින් පින්තාරු කළ ක්‍රිස්තුස්-වහන්සේගේ රූප විය. පාප්වරයා සහ රදගුරු ප්‍රසාදීන් එහි පැමිණ එම පින්තූරු මකා දමන ආකාරය ඔහු එම සිහිනෙන් දුටුවේය. "මෙම දර්ශනය නිසා හෙතෙම මහත් ශෝකයට පත් විය; ඔහුගේ සිත සංවේගයෙන් පිරී ගියේය. එහෙත් පසුදින දුටු දර්ශනයෙන් ඔහු මහත්සේ ප්‍රීති ප්‍රමෝදයට පත් විය." ආගමික නායකයන් විකෘති කළ තම පින්තූරු පසුව බොහෝ චිත්‍රකරුවන් විසින් යථා තත්ත්වයට පත්කරන ආකාරයද එවැනි පින්තූරු ගණනාවක් චිත්‍රයට නගන අයුරුද ඔහු දුටුවේය. එම චිත්‍රවලට දීප්තිමත් පාට යොදා ගෙන තිබිණ. තම කාර්යය නිම කළ චිත්‍ර ශිල්පීන් වටා විශාල සෙනඟක් රැස් වූහ. එක හඬින් ඔව්හු මෙසේ පැවසූහ. "පාප්වරුන් සහ රදගුරු ප්‍රසාදීන් පැමිණියද ඔවුන්ට මෙම පින්තූරු මකා දැමීමට කිසිම අවස්ථාවක හෝ ඉඩකඩක් ලැබෙන්නේ නැත." තම සිහිනය විස්තර කිරීමෙන් පසුව ප්‍රතිසංස්කරණ වාදියා මෙසේ පැවසීය: "ක්‍රිස්තුස්-



වහන්සේගේ රූපය කවර දවසක හෝ මකා දැමීමට අවස්ථාවක් නොලැබෙන බව මම තරයේ ප්‍රකාශ කරමි. එම රූපය විනාශ කර දැමීමට ආගමික නායකයන් කල්පනා කළ නමුත් මට වඩා උදාර දේශනාකරුවකු විසින් එම රූපය සියලු හදවත් තුළ අලුතින් පින්තාරු කරනු ලබන බව සහතිකය." [උපුටා ගැනීම අංක 10].

අන්තිම වතාවට ජෝන් හස්ව බල මණ්ඩලය ඉදිරියට කැඳවන ලදී. එම රැස්වීම ඉතා දැකුම්කළු වූවකි. විශාල සාමාජික කණ්ඩායමක්ද පැමිණ සිටියෝය. අධිරාජ්‍යවාදී රජතුමා, රාජ්‍යයේ කුල දෙටුවන්, රාජකීය නියෝජ්‍ය නිලධාරීන්, කාර්දිනල්වරුන්, බිෂොප්වරුන්, සහ පූජකයන්ද රැස්වීමට සහභාගී වූවන් අතර වූහ. දවසේ සිදුවීම් නැරඹීම සඳහා විශාල ජන පිරිසක්ද සහභාගී වී සිටියෝය. හෘදය සාක්ෂිය අනුව ක්‍රියාකිරීමේ නිදහස දිනාගැනීම සඳහාවූ දීර්ඝ සටන සඳහා ජීවිත ගණනාවක් පූජා කිරීමට සිදුවන්ට තිබුණි. එම සටනෙහි මුල්ම ජීවිත පූජාව දකගැනීමට ක්‍රිස්තියානි රාජ්‍යයේ සෑම රටකින්ම පාහේ නියෝජිතයෝ පැමිණ සිටියෝය.

තමා ගත් තීරණය කුමක්දැයි කියා ප්‍රකාශ කිරීමට ජෝන් හස්ව බල මණ්ඩලය ඉදිරියට පමුණුවන ලදී. තමාගේ ඉගැන්වීම් අත්හැර දැමීමට තමා කිසිසේත්ම එකඟ වන්නේ නැතැයි ඔහු ප්‍රකාශ කළේය. ඉක්බිතිව අගරජ දෙස එක එල්ලේම බලමින් ඔහු මෙසේ කියන්නට පටන් ගත්තේය. "මම මේ බල මණ්ඩල රැස්වීමට පැමිණියේ මගේම තීරණය අනුවයි. මෙහි සිටින්නාවූ එම්ප්‍රදෝරු රජතුමා මට සියලුම රැකවරණ සපයා දෙන බව පොරොන්දු වුණා. එම සහතිකය කෙරේ සම්පූර්ණ විශ්වාසය තබමින් මම මෙතැනට ආවා." [උපුටා ගැනීම අංක 11]. සිගිස්මන්ඩ් අග රජතුමාගේ මුහුණ රතු විය. සැමගේ ඇස් ඔහු දෙසට යොමු වී තිබුණේය.

තීන්දුව ප්‍රකාශයට පත්කර තිබූ නිසා හස්ව පහත් කිරීමේ නිල කටයුතු ආරම්භ විය. බිෂොප්වරුන් විසින් ඔහුව පූජක ඇඳුමින් සරසන ලදී. පූජක ඇඳුම අතට ගත් හෙතෙම මෙසේ පැවසීය: "අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඇඟලා ගැනීමට දුන්නේ සුදුපාට වස්ත්‍රයකි. උන්වහන්සේට නිග්‍රහ කරන පිණිස හෙරොද් විසින් උන්වහන්සේ පිලාත් වෙතට යැවීමේදී එසේ කරන ලදී." [උපුටා ගැනීම අංක 12]. ඔහුගේ ඉගැන්වීම් ඉල්ලා අස් කරගන්නා ලෙස නැවත වරක් ඔහුට උපදෙස් දෙන ලදී. ජනතාව දෙසට හැරුණු ජෝන් හස් මෙවන් ප්‍රකාශයක් කළේය: "එවැන්නක් කළහොත් මා සගය දෙස බලන්නේ කුමන මුහුණකින්ද! පවිත්‍ර ශුභාරංචිය දේශනා කළ මට ඇහුම්කන් දුන් සෙනඟගේ මුහුණු බලන්නේ කෙසේද? එසේ නොවේවා! මරණයට තීන්දු වී තිබෙන්නාවූ මාගේ අසරණ ශරීරයට වඩා ජනතාවගේ ගැළවීම මම අගය කරමි." ඔහු පැළඳ සිටි පූජක

ඇඳුමෙහි කොටස් එකින් එක ඉවත් කළ අතර එක් එක් බිෂොප්වරයා ඔහුට ශාප කළේය. අන්තිමේදී ඔව්හු පිරමිඩයක හැඩය ගත් තොප්පියක් හෝ ඔටුන්නක් ඔහුගේ හිස මත තැබූහ. එම තොප්පියෙහි යක්ෂයන්ගේ බියකරු පින්තූර විය. සැමටම දැනගත හැකි පරිදි මකුටයේ ඉදිරිපස "අග්‍ර මිථ්‍යා ලබ්ධිකයා" යන වචන තිබුණේය. "යේසුස්වහන්ස, ඔබවහන්සේ මා වෙනුවෙන් කටු ඔටුන්නක් පැළඳගත් සේක. මම ඔබ උදෙසා මේ නින්දිත ඔටුන්න ඉතා ප්‍රීතියෙන් පැළඳ ගන්නම්" යයි ඔහු පැවසුවේය.

වරදට පත්කරනු ලැබූ අපරාධකරුවෙකුගේ ඇඳුමින් ඔහුව සරසනු ලැබුවාට පසු පූජකයෝ ඔහුගේ ආත්මය යක්ෂයාට භාර කළහ. තමාගේ දෙනෙත් ස්වර්ගය දෙසට එසවූ ජෝන් හස් මෙසේ පැවසුවේය. "ස්වාමිවූ යේසුස්වහන්ස, මම මාගේ ආත්මය ඔබවහන්සේගේ හස්තයට භාර කරමි. මක්නිසාදයත් ඔබවහන්සේ මට ගැළවීම ලබාදුන් සේක." [උපුටා ගැනීම අංක 13].

ඉක්බිතිව ඔහුව ලෞකික අධිකාරීන් වෙත භාර දෙන ලදුව නියමිත ස්ථානයට ගෙන යන ලදී. තමන්ගේ නිල ඇඳුමින් සැරසී ගත් බිෂොප්වරු සහ පූජකයෝද සිය ගණනින් යුත් යුද්ධ භටයෝද කොන්ස්ටන්ස්හි පුරවැසියෝ ද මහත් පෙරහැරකින් ඔහු පිටුපසින් ගමන් ගත්හ. හස්ව කණුවට තබා වෙළුම් පටි යොදන ලදී. ගිනි මැලය සඳහා සියල්ලක්ම සූදානම්ව තිබුණේය. ගින්න අවුලා ලීමට පෙර ඔහුගේ තීරණය වෙනස් කරගන්නා ලෙස ඔහුට තවත් අවස්ථාවක් දෙනු ලැබීය. තමාගේ වැරදි අත්හැර දමන බව ප්‍රකාශ කිරීමෙන් මරණින් ගැළවී යාමේ මගක් ඔහුට ලබා දෙන ලදී. "වැරැදි, මොන වැරැද්ද?"යි, හස් ප්‍රශ්න කළේය. "අත්හැර දැමීමට මා කළ වැරැද්දක් මට පෙනෙන්නේ නැහැ. ඒ නිසා මම කිසිම වැරැද්දකට වරදකරුවෙකු වන්නේ නැහැ. මා ලියූ ලිපි ලේඛණ, මා දෙසූ දහම් සියල්ලෙහි ඒකායන අරමුණ වුණේ පව්කාරයන් පාපයෙන් සහ නරකාදියෙන් ගළවා ගැනීමයි. මේ බව සාක්ෂි දැරීමට මම දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිමි. මා විසින් රචිත, දේශනා කළ සත්‍යතාවය සනාථ කරමින් මම ඒවාට මාගේ ලේ වලින් මුද්‍රා තබමි." [උපුටා ගැනීම් අංක 14]

ගින්න ඔහු අවට පැවති විට ඔහු මෙසේ ගායනා කරන්නට විය: "දාවිත්ගේ පුත්‍ර වූ යේසුස්වහන්ස, මා ගැන අනුකම්පා කළ මැනව." ඔහුගේ කටහඬ සදහටම නිශ්චල කරනු ලබන තුරුම ඔහු මෙසේ ගායනා කළේය.

ඔහුගේ වීරවන්ත ස්වභාවය ගැන ඔහුගේ සතුරෝ පවා තැති ගත්හ. හස්ගේ වේද සාක්ෂික මරණයද ඊට ස්වල්ප කලකට පසුව



මරනු ලැබූ ජෙරෝම්ගේ මරණයද දුටු උදෝගිමත් පාප් සභිකයෙක් ඒවා විස්තර කරමින් මෙසේ පැවසුවේය: "ඔවුන්ගේ අවසාන පැය ආසන්න වූ විට ඔවුන් දෙදෙනාම ස්ථිර මනසකින් යුතුව සිටියහ. ගින්නට ගොදුරු වීමට ඔවුන් සූදානම් වූයේ විවාහ මංගල්‍යයකට යන අන්දමින්ය. ඔව්හු වේදනාවේ ශබ්දයක් නිකුත් නොකළහ. ගිනි දළු නැග ආ විට ඔව්හු ගීත ගායනා කළහ. ගින්නේ බලයට පවා ඔවුන්ගේ ගායනය නැවැත්වීමට නුපුළුවන් විය."

හස්ගේ ශරීරය සම්පූර්ණයෙන්ම පිලිස්සී ගිය විට ඔහුගේ අළුද ඒ අළු යට තිබුණාවූ පස්ද එකතු කර රයින් ගංගාවට දමන ලදී. මෙසේ ඒවා මහා සාගරයට ගෙනයන ලදී. ඔහු ඉගැන්වූ සත්‍යයන් සහමුලින්ම ඉවත් කර දැමීමට තමාට පුළුවන් වූයේ යයි ඔහුට පීඩා කළාවූ අය නිෂ්ඵලයේ කල්පනා කළහ. මහා සාගරයට යොමු කරන ලද ඔහුගේ අළු, ලෝකයේ සියලු රටවලට පැතිරී යන්නාවූ බීජ මෙන් වන බව ඔව්හු සිහිනයෙන් පමණවත් කල්පනා නොකළහ. එවකට සත්‍යය නොදැන සිටියාවූ රටවල පවා ඒවා සත්‍යය උදෙසා මහත් සාක්ෂියක් වන බව ඔව්හු කල්පනා නොකළහ. කොන්ස්ටන්ස්හි වූ බල මණ්ඩලයේදී කථා කළ හඬ ඉදිරි කාලය මුළුල්ලේම ශබ්දවන දෝංකාරයක් පිබිදවීය. හස් මරණයට පත්විය; එහෙත් ඔහු යම් සත්‍යයන් උදෙසා මරණයට පත්වූයේද, ඒවා කිසිවිටෙක නැති වන්නේ නැත. ඇදහිල්ල හා ස්ථිරතාවය ගැන ඔහු දැක්වූ ආදර්ශය බොහෝ දෙනාට, පීඩාවන් හා මරණයේ ඉදිරියේ පවා සත්‍යය උදෙසා ස්ථිරව සිටීමට දිරිගැන්වීමක් වෙනවා ඇත. ඔහුව මරණයට පත්කිරීම මුළු ලෝකයටම දැක්වූයේ රෝමයේ කෲර ක්‍රියාකාරිත්වයය. සත්‍යයේ සතුරෝ, නොදැනුවත්වම, ඔවුන් විනාශ කිරීමට උත්සාහ කළාවූ සේවයම ඉදිරියටම ගෙන යන්නන් වූහ.

මරණීය දණ්ඩනය කොන්ස්ටන්ස්හිදී නැවත ක්‍රියාත්මක කරනු ලැබිය යුතු විය. තවත් සාක්ෂිකරුවෙකුගේ රුධිරය සත්‍යය උදෙසා ඉදිරිපත් වන්නට තිබුණි. ජෙරෝම් ඒ මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් වීමට පිටත්ව ගිය විට ඔහු හස්ගෙන් සමුගෙන, ධෛර්යමත්ව ස්ථිරව සිටීමට ඔහුට දිරි දුන්නේය. ඔහුට යම් කරදරයක් ඇති වුවහොත් තමා ඔහුට සහාය වීමට ඉක්මණින් පැමිණෙන බව ඔහු පැවසුවේය. හස්ව සිරභාරයට ගනු ලැබීමේ ප්‍රවෘත්තිය ඇසූ විට මේ විශ්වාසවන්ත ගෝලයා ඒ ක්ෂණයේම තමාගේ පොරොන්දුව සම්පූර්ණ කිරීමට සූදානම් විය. තමාට ආරක්ෂාව ස්ථිර කරන සහතිකයක් නොමැතිවම ඔහු එක් තැනැත්තෙකු සමග කොන්ස්ටන්ස්ට යන්ට පිටත් විය. එහි ළඟාවූ විට ඔහුට පෙනී ගියේ හස්ව බේරා ගැනීමට තමාට කිසිවක් කළ නොහැකි බවත්, එහි යාමෙන් තමාද අන්තරා අභිමුඛයට තමාව

පමුණුවා ගත් බවත්ය. ඔහු ඉක්මණින්ම නගරයෙන් පලා ගිය නමුත් තම නිවෙස වෙත යන ගමනේදී ඔහුට විලංගු දමා ඔහුව ආපසු ගෙන එන්ට යෙදුණේ සොල්දාදුවන් කාණ්ඩයක රැකවරණයද ඇතිවය. ඔහුව ඒ සභාව ඉදිරියට ගෙන යනු ලැබූ පළමුවන වතාවේදී ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනාවන්ට ප්‍රතිචාරය දීමට ඔහු සූදානම් වූ විට, "ඔහුව ගින්නට දමන්න. ගින්නට දමන්න" යන ඝෝෂාවක් පැවතුණි. ඔහුව අඳුරු හිර කුටියකට දමා පාන් සහ වතුර පමණක් ඔහුට දෙන ලදී. මෙය ඔහුට මහත් පීඩාවක් විය.

මාස කිහිපයක් ගතවූ විට ඒ හිර කුටියේ කෲර තත්ත්වය මගින් ජෙරෝම් අසනීප විය. ඒ අසනීපය ඔහුගේ ජීවිතයට තර්ජනයක් විය. ඔහු තව අවුරුද්දක් හිරගෙයි සිටි නමුත්, ඔහු තමා වෙතින් බේරෙනවා යන බියෙන් ඔහුගේ සතුරෝ ඔහුට එපමණ තදින් ක්‍රියාකිරීම නැවැත්වූහ. හස්ගේ මරණයෙන් පාප් සභිකයන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ඇති නොවීය. ඔහුට රැකවරණය දෙන බවට දෙන ලද සහතිකය අනුව ක්‍රියා නොකිරීම ගැන මහත් කෝපයක් ඇති වුණි. වඩා ආරක්ෂා සහිත ක්‍රියා පිළිවෙලක් අනුව ක්‍රියාකිරීමට තීරණය කරගත් ඒ බල මණ්ඩලය ජෙරෝම් ගින්නට දමනවා වෙනුවට තමා පැවසූ සත්‍යයන් ඉල්ලා අස්කර ගන්නට ඔහුට බලකිරීමට ඔව්හු තීරණය කළහ. ඔහුව ඒ මණ්ඩලය ඉදිරියට පමුණුවන ලදී. තමා පැවසූ කරුණු ඉල්ලා අස්කර ගැනීම නැතහොත් ඒ කණුවට බැඳ මරනු ලැබීම තෝරා ගැනීමේ හැකියාව ඔහුට ඉදිරිපත් කරන ලදී. මෙතෙක් ඔහුට විඳින්ට සිදුවූ පීඩාවන් හා සමාන කළ විට, ඔහුව හිර අඩස්සි කිරීමේ ආරම්භයේදීම ඔහු මරණයට පත්කරනු ලැබුවේ නම්, එය ඔහුට දයාන්විත ක්‍රියාවක් වෙනවා ඇත. නමුත් දැන් අසනීප තත්ත්වයෙන්ද හිරගෙයි සිටියදී දෙන ලද දරුණු පීඩා මගින්ද, ඔහු දුර්වලව සිටියේය. කනස්සල්ලෙන් හා අනාගතය ගැන අනුමානයෙන්ද, තම මිත්‍රයන්ගෙන් වෙන් කරනු ලැබීමෙන්ද හස්ගේ මරණයෙන්ද අධෛර්යයට පත්ව සිටි ජෙරෝම් මේ මණ්ඩලයට යටත් වීමට එකඟ විය. කතෝලික සභාවේ ඇදහිල්ල අනුව ක්‍රියා කිරීමට ඔහු එකඟ විය. හස් හා වික්ලිෆ් ඉදිරිපත් කළාවූ 'ශුද්ධවූ සත්‍යයන්ට' අමතරව ඔවුන් ඉගැන්වූ ධර්මයන් වරදට පත්කිරීමට ඒ මණ්ඩලය ගත් තීරණය පිළිගැනීමට ඔහු කැමති විය.

මේ ක්‍රියාව මගින් හෘද සාක්ෂියේ හඬ නිශ්චල කරමින් ඒ බියකරු ඉරණමින් ගැළවීමට ජෙරෝම් උත්සාහ කළේය. නමුත් ඔහු තනිව සිර කුටියට ගෙනයනු ලැබූ විට, තමා කළේ කුමක්ද යන්න ඔහුට පැහැදිලි විය. ඔහු හස්ගේ ධෛර්යය හා විශ්වාසවන්තකම ගැනද තමා සත්‍යයට විරුද්ධව ක්‍රියා කළාවූ අන්දම ගැනද කල්පනා



කළේය. ඒ සත්‍යයන් ඉල්ලා අස්කර ගැනීමට පෙර ඔහුට තිබුණාවූ ඒ සියලු පීඩාවලදී පවා ඔහුට, දෙවියන්වහන්සේ තමා පිළිගත්සේක යන සැනසිල්ල තිබුණි. නමුත් දැන් පසුතැවිල්ල හා අනුමානය ඔහුගේ ආත්මයට පීඩා කරන්නට විය. රෝමය සමග සාමය ඇති කරගැනීමට පෙර තමා විසින් වෙනත් ප්‍රකාශනයන්ද ඉල්ලා අස්කර ගත යුතු බව ඔහු දැනගත්තේය. ඔහු දැන් ඇතුල් වූ මේ මාවත අවසන් වන්නේ සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් ඈත්වීමෙන් බව ඔහු දැන ගත්තේය. ඔහු තීරණයක් ගත්තේය. සුළු කාලයකට පීඩා විඳීමෙන් මිදෙන පිණිස තමාගේ ස්වාමින්වහන්සේ එපා නොකිරීමට ඔහු තීරණය කර ගත්තේය.

ඉක්මණින්ම ඔහු නැවත මණ්ඩලය ඉදිරියට ගෙන එන ලදී. ඔහුගේ යටත්වීම ගැන එහි විනිශ්චයකරුවන් සෑහීමට පත්වූයේ නැත. හස්ගේ මරණයෙන් පුබුදුවනු ලැබූ ලේ පිපාසාව නව ගොදුරක් ලබා ගැනීමට ආශා විය. ජෙරෝම්ට ඔහුගේ ජීවිතය ගළවා ගැනීමේ හැකියාවක් පැවතියේ සත්‍යය සම්පූර්ණයෙන්ම එපා කිරීමෙන් පමණය. නමුත් ඔහු දැන් තීරණය කරගෙන තිබුණේ ඇදහිල්ලට ස්ථිරව සිටිමින් තම වේදසාක්ෂික සහෝදරයා මෙන් ගින්නට ගොදුරු වීමටය.

ඔහු තමා මීට පෙර සත්‍යයට විරුද්ධව පැවසූ වචන දැන් ඉල්ලා අස්කර ගනිමින්, ඔහුගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඉල්ලා සිටියේය. ඔහුගේ වචන වලින් ඇතිවිය හැකි අනුබලය ගැන බිය වූ පූජ්‍ය නායකයන් කියා සිටියේ ඔහු විසින් තමාට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනාවන් වැරදි බව හෝ නිවැරදි බව පමණක් පැවසිය යුතු බවය. ජෙරෝම් එබඳු කෲර අසාධාරණත්වයට විරුද්ධ විය. ඔහු මෙසේ පැවසුවේය: "ඔබ සැම දින තුන්සිය හතළිහක් මුළුල්ලේ මා භයානක සිරකුටියක වසා තැබුවහුය. එය ඉතා අපිරිසිදු, දුගන්ධයෙන් යුත්, නිශ්චලතාවයෙන් තොර, අඩුපාඩු වලින් පිරී ගිය ස්ථානයක් විය. ඔබ මා මෙහි ගෙනැවිත්, මා මරණයට පත්කිරීමට සූදානම්ව සිටින මාගේ සතුරන්ට සවන් දෙන නමුත් මට ඇහුම්කන් දීමට අකමැති වෙති. ඔබ ප්‍රඥාවන්ත අය නම්, ලෝකයේ ආලෝකය වන්නහු නම්, යුක්තියට විරුද්ධව පව් නොකිරීමට ප්‍රවේසම් වන්න. මම මරණීය ශරීරයක් ඇති දුර්වල මනුෂ්‍යයෙක් වෙමි. මාගේ ජීවිතය එපමණ වැදගත් නොවේ. අයුක්ති සහගත තීරණයක් නොගැනීම ගැන මා ඔබට අවවාද කරන විට මා කථා කරන්නේ මාගේම ප්‍රයෝජනයට වැඩියෙන් ඔබගේම ජීවිතවලට යහපත පැමිණෙන පිණිසය."

අවසානයේදී ඔහුගේ ඉල්ලීම පිළිගනු ලැබීය. ඔහුගේ විනිශ්චය-කරුවන් ඉදිරිපිටම ඔහු දණගසා යාච්ඤා කරමින්, දිව්‍ය ආත්මයාණන්

වහන්සේ තමාගේම සිතුවිලි හා වචන පාලනය කරමින් සත්‍යයට විරුද්ධව කිසිවක් නොපැවසීමටද තමාගේ ස්වාමින්වහන්සේ ඉදිරිපිට සුදුසු නොවන්නාවූ කිසිවක් නොපැවසීමටද තමාට උපකාර කරන ලෙස ඉල්ලා සිටියේය. යේසුස්වහන්සේ තමාගේ මුල් ගෝලයන්ට දුන්නාවූ පොරොන්දුව එදින ඔහු උදෙසා සම්පූර්ණ විය. ඒ මෙසේය: "…. නුඹලා මා නිසා ආණ්ඩුකාරයන්ද රජුන්ද ඉදිරියට ගෙනයනු ලබනවා ඇත. නුමුත් ඔවුන් නුඹලා පාවා දෙන කළ, නුඹලා කථා කරන්නේ කෙසේද, කුමක්දැයි සිතා කණගාටු නොවෙන්න. මක්නිසාද නුඹලා විසින් කිය යුතු දේ ඒ පැයේදී නුඹලාට දෙනු ලබන්නේය. මක්නිසාද කථා කරන්නේ නුඹලා නොව නුඹලා තුළ කථා කරන නුඹලාගේ පියාණන්ගේ ආත්මයාණෝය." (මතෙව් 10:18-20) ජෙරෝම්ගේ වචන අගය කරනු ලැබූ අතර ඒවායින් ඔහුගේ සතුරන් තුළ පවා මහත් විස්මයක්ද ඇතිවිය. වසරක් මුළුල්ලේම ඔහු අඳුරු කුටියක සිරකරනු ලැබ කියවීමට හෝ යමක් දකීමට පවා නුපුළුවන් තත්ත්වයක සිටියේය. එහිදී ඔහුට මහත් ශාරීරික පීඩනයක් හා මානසික කනස්සල්ලක් පැවතුණි. එහෙත් දැන් ඔහුගේ තර්කයන් ඉදිරිපත් කරනු ලැබුවේ කොපමණ මහත් බලයකින් හා පැහැදිලි ස්වභාවයකින්ද යත් එසේ වූයේ ඔහුට බාධාවකින් තොරව කරුණු සූදානම් කරගැනීමට අවස්ථාවක් තිබුණා සේය. ඔහු තමාට සවන් දෙන්නන් යොමු කළේ අයුක්ති සහගත විනිශ්චයකරුවන් විසින් වරදට පත්කරන්ට යෙදුණාවූ ශුද්ධවූ මනුෂ්‍යයන් දෙසටය. යම් අය මනුෂ්‍යයන්ගේ ජීවිත නගාලීමට උත්සාහ කළ නමුත් නින්දා කරනු ලැබ පිටමන් කරනු ලැබූ මනුෂ්‍යයෝ සෑම පරම්පරාවකම සිටියහ. ඔවුන්ට ගරු කරනු ලැබිය යුතු වූ බව පසු කාලයේදී එළිදරව් විය. ක්‍රිස්තුස්වහන්සේ පවා අධර්මිෂ්ඨ නායකයන් විසින් අපරාධකරුවෙකු ලෙස වරදට පත්කරනු ලැබූසේක.

ඔවුන්ට අවනත වූ අවස්ථාවේදී ජෙරෝම් පවසා තිබුණේ හස්ට දෙන ලද තීරණය සාධාරණ බවය. එසේ පැවසීම ගැන තමා පසුතැවිලි වන බව දැන් පැවසූ ඔහු ඒ වේද සාක්ෂිකයාගේ අහිංසක ශුද්ධ භාවය ගැන මෙසේ සාක්ෂි දැරුවේය. "ළමාවියේ සිටම මම ජෝන් හස්ව දැනගෙන සිටියෙමි. ඔහු ඉතා අනර්ඝ, යහපත්, ශුද්ධ මනුෂ්‍යයෙක් විය. ඔහු අහිංසක වූ නමුත් ඔහුව වරදට පත්කරන ලදී. …. මමද දැන් මරණයට සූදානම්ව සිටිමි. මාගේ සතුරන් හා බොරු සාක්ෂිකරුවන් මා උදෙසා සූදානම් කරන්නාවූ වධහිංසාවන් ගැන මම නොපැකිලෙමි. එක් දවසක ඔවුන්ට අපගේ අති උත්තම දෙවියන්වහන්සේ ඉදිරිපිට මේ සියල්ල ගැන ගණන් දෙන්ට සිදුවෙනවා ඇත. කිසිවකින් උන්වහන්සේව රැවටීමට නුපුළුවන."



තමා සත්‍යයට විරුද්ධව කථා කිරීම ගැන තමාටම දොස් පවරා ගනිමින් ජෙරෝම් තවදුරටත් මෙසේ පැවසුවේය: "මාගේ යෞවන කාලයේ පටන් මා කර තිබෙන්නාවූ සියලු පාපයන් අතරින් මාගේ සිතට ඉතා මහත් බරක්ව තිබෙන්නේද, මා ඉමහත් පසුතැවිල්ලට පමුණුවන්නේද මේකය. එනම්, වික්ලිෆ්ටද , ශුද්ධවූ වේද සාක්ෂිකයෙක් හා මාගේ ස්වාමියාද වූ ජෝන් හස්ටද විරුද්ධව පවසන ලද තීරණයන් හා එකඟත්වය ප්‍රකාශ කරමින් මා කළාවූ වරද, මා කර තිබෙන අන් සියළු වරදවලට වඩා ලොකුය. එසේය මම මාගේ මුළු සිතින් ඒ වරද කියා දෙමි. මා මරණයට නියම කරනු ලබනවා ඇත යන බියෙන් මා නින්දිත ලෙස ඒ වරද කළ බව මම මහත් අප්‍රසන්නතාවයෙන් පවසමි. මම ඔවුන්ගේ ඉගැන්වීම් වරදට පත් කළෙමි. එහෙයින් මාගේ මේ පාපයන්ට කමාව දෙන ලෙස විශේෂයෙන්ම මේ ඉමහත් පාපයට කමාව දෙන ලෙස මම මහෝත්තම උතුම් දෙවියන්-වහන්සේගෙන් ඉල්ලා සිටිමි."

විනිශ්චයකාරයන් දෙස අවධානය යොමු කරමින් ඔහු ස්ථිර ස්වරයෙන් මෙසේ පැවසුවේය: "ඔබ වික්ලිෆ්ව හා හස්ව වරදට පත්කළේ සභාවේ ඉගැන්වීම් සෙල වූ නිසා නොව, පූජකයන්ගේ ක්‍රියාවන් වරදට පත්කළ නිසාය, ඔවුන්ගේ උදාරම හා අහංකාරයද ඔවුන්ගේ සියලු වැරදි ක්‍රියාවන්ද වරදට පත් කළ නිසාය. මමද ඔවුන් හා එකඟ වෙමින් ඔවුන් කළ ප්‍රකාශන හරි යයි පවසමි."

ඔහුට තවදුරටත් කථා කිරීමට ඉඩ නොදෙන ලදී. පූජකයෝ හා නායකයෝ කෝපයෙන් වෙවුලමින් මෙසේ පැවසූහ: "අපට තවදුරටත් කිසි ඔප්පු සාක්ෂියක් උවමනා නැත. මේ ඉතාම මුරණ්ඩු ද්‍රෝහියා ඉවත් කරමු."

මේ කුණාටුව ගැන චංචල නොවී ජෙරෝම් මෙසේ පැවසුවේය: "මා මරණයට බිය වන්නේමැයි නුඹලා සිතනවාද? නුඹලා වසරක් මුළුල්ලේ හිරකර තැබූ ඒ අඳුරු කුටිය මරණයට පවා භයංකාර විය. තුර්කියේ වැසියෙකුට, යුදෙව්වෙකුට හා අන්‍යජාතිකයෙකුට සලකනවාට වඩා කෲර ලෙස නුඹලා මට සලකා තිබේ. මා ජීවත්ව සිටියදීම මාගේ මාංසය ඇටකටු මත කුණු වෙන තරම් විය. එහෙත් මා ඒවා ගැන නොකොඳුරමි. කුමක්හෙයින්ද යහපත් හදවතක් හා ආත්මයක් ඇති තැනැත්තෙක් වැලපීම නුසුදුසුය. එහෙත් ක්‍රිස්තු භක්තිකයෙකුට මෙපමණ කෲර ලෙස සැලකීම ගැන මා පුදුමයට පත්වන බව නොපවසා සිටීමට මට නුපුළුවන."

කෝපාකූලත්වයේ කුණාටුව නැවතත් කඩා හැලුණි. ඉක්මණින්ම ජෙරෝම්ව සිර කුටියට යවන ලදී. එහෙත් ඒ මණ්ඩලයේ සිටියාවූ සමහර අයගේ සිත්වලට ඔහුගේ වචන කාවැදී ගියෙන් ඔහුගේ ජීවිතය බේරා දීමට ඔව්හු ආශා වූහ. සභාවේ සමහර නායකයෝ ඔහු බැහැදකීමට ගොස් ඒ මණ්ඩලයේ අදහස් වලට එකඟ වන්නැයි ඔහුගෙන් ඉල්ලා සිටියහ. රෝමයට ඔහු තුළ තිබුණාවූ විරුද්ධතාවය ඉවත් කරන්නේ නම් ඒ ගැන දීමනාවක් වශයෙන් ඔහුට දීප්තිමත් අනාගතයක් දෙන බවට ඔව්හු පොරොන්දු වූහ. නමුත් ඔහුගේ ස්වාමින්වහන්සේ මෙන්ම ඔහුද, ලෝකයේ තේජස ඔහුට පුද කරනු ලැබූ විට ස්ථිරව සිටියේය.

"මා වරද කරන බව ශුද්ධවූ ලියවිලි වලින් ඔප්පු කරන්න; එවිට මම යටත් වෙන්නම්"යි ඔහු පැවසුවේය.

ඔහුට විරුද්ධව සිටියාවූ කෙනෙක් මෙසේ පැවසුවේය: "ශුද්ධ ලියවිලි ! සෑම දෙයක්ම ඒවා අනුව විනිශ්චය කරනු ලැබිය යුතුද? සභාව ඒවා විස්තර කරන අන්දම අනුව මිස ඒවා වටහා ගැනීමට පුළුවන් කාටද?"

"අපගේ ගැළවුම්කාරයාණන්ගේ ශුභාරංචියට වැඩියෙන් මනුෂ්‍යයන්ගේ නියෝග අපගේ ඇදහිල්ලේ පදනම විය යුතුද? පාවුල් තමාගේ ලියවිලි වලට සවන් දෙන්නන්ට අවවාද කළේ මනුෂ්‍යයන්ගේ නියෝගවලට සවන් දීමට නොවේ. 'ශුද්ධ ලියවිලි සොයන්න' යි ඔහු පැවසුවේය" යි ජෙරෝම් කියා සිටියේය.

"මිථ්‍යා ලබ්ධිකයා" යන ප්‍රතිචාරය නිකුත් විය. "මා මෙතෙක් නුඹට ආයාචනය කිරීම ගැන කණගාටු වෙමි. යක්ෂයා නුඹ පොළඹවන බව මට පෙනේ" යයි ඔහුට විරුද්ධව පවසන ලදී.

ඉක්මණින්ම ඔහුට විරුද්ධව නියමයක් නිකුත් කරන ලදී. හස් ඔහුගේ ජීවිතය පූජා කළාවූ ස්ථානයට ජෙරෝම්වද ගෙන යන ලදී. ඔහු ගීතිකා කරමින් ගමන් ගත්තේය; ඔහුගේ මුහුණ සාමයෙන් හා ප්‍රීතියෙන් ආලෝකමත් විය. ඔහුගේ නෙත් ක්‍රිස්තුස්වහන්සේ දෙසම යොමු විය; ඔහුට තවදුරටත් මරණය ගැන බියක් නොපැවතුණි. ඒ ස්ථානයට ගිනි දල්වන පිණිස විධායක නිලධාරියා ඔහුට පිටුපසින් සිටගත් විට මේ වේද සාක්ෂිකයා මෙසේ පැවසුවේය: "බිය නැතිව ඉදිරියට එන්න. මාගේ මුහුණ ඉදිරිපිටම ගිනි දල්වන්න. මා බියපත් වූයෙම් නම්, මම අද මේ ස්ථානයේ නොසිටිමි."



ගිනි දල් ඔහු මත නගින්නට වූ විට ඔහුගේ අවසාන වචන වූයේ යාච්ඤාවකි. ඔහු මෙසේ ඉල්ලා සිටියේය: "අති උත්තම පියවූ ස්වාමින්වහන්ස, මා ගැන අනුකම්පා කරමින් මාගේ පාපවලට කමාව දුන මැනව. මා සෑමවිටම සත්‍යයට ප්‍රේම කළ බව ඔබවහන්සේ දන්නා සේක." ඔහුගේ කටහඬ නැවතුණි. එහෙත් ඔහුගේ තොල් තවදුරටත් යාච්ඤාවෙන් සෙලවුණි.

ගින්නේ වැඩය නිම වූ විට මේ වේද සාක්ෂිකයාගේ අළු ඒවා යටින් වූ පසද සමග එකතුකර, හස්ගේ අළු මෙන්ම, රයින් ගඟට වීසි කරන ලදී. ස්වාමින්වහන්සේගේ ආලෝකය දරන්නෝ මේ අන්දමට මරණයට පත්වූහ. නමුත් ඔවුන් ප්‍රකාශ කළාවූ සත්‍යයේ ආලෝකයද ඔවුන්ගේ වීර භාවයේ ආලෝකයද නිමා දැමීමට නුපුළුවන් විය. මනුෂ්‍යයන්ට සූර්යයාගේ ගමන ආපසු හැරවීමට නුපුළුවන් වන්නා සේම, එවිට ලෝකය මත උදාවෙමින් තිබුණාවූ ඒ දවසේ උදාවීම වැලැක්වීමට මනුෂ්‍යයන්ට නුපුළුවන් විය.

හස් මරණයට පත්කිරීම නිසා බොහිමියාවේ මහත් කෝපයක හා අප්‍රසන්නතාවයක ගිනි දැල්ලක් ඇවිලුනි. ඔහු පූජකයන්ගේ දුෂ්ටකමටද රජුගේ රැවටිලිකාරකමටද ගොදුරු වූයේ යයි මුළු ජාතියම කල්පනා කළහ. ඔහු සත්‍යය විශ්වාසවන්ත ලෙස ඉගැන්වූ ගුරුවරයෙක් වූ බව පවසන ලදී. ඔහු මරනු ලැබීමට නියම කළ මණ්ඩලය මිනීමැරුම ගැන වරදකාරයන් බවට චෝදනා කරන ලදී. ඔහු ඉගැන්වූ ධර්මයන්ට දැන් පෙරට වැඩියෙන් අවධානය යොමු විය. පාප්ගේ නියමයන් මගින් ඔහුගේ ලියවිලි පුළුස්සා දමන ලදී. නමුත් දැන්, විනාශ කරනු නොලැබූ ලියවිලි ඒවා සඟවා තිබුණ ස්ථානවලින් පිටතට ගෙනවුත්, ලබාගත හැකි වූ කොටස් බයිබලයට සම්බන්ධ කර ඉගෙන ගන්නා ලදී. මෙසේ බොහෝ අය ප්‍රතිසංස්කරණය කරන ලද ඇදහිල්ල පිළිගැනීමට මගපෙන්වනු ලැබූහ.

හස්ව මැරුවාවූ අය නිශ්චලව සිටගෙන ඔහුගේ ඉගැන්වීම් ජයග්‍රාහක වෙනවා බලා සිටීමට සූදානම්ව නොසිටියහ. පාප්ද රජතුමාද ඒ ක්‍රියාවන් විනාශ කිරීමට සූදානම්ව සිටියහ. ඔව්හු සිගිස්මන්ඩ්ගේ හමුදාව බොහිමියාවට පිටත් කර ඇරියහ.

නමුත් ඔවුන් මුදාලන පිණිස කෙනෙක් නැගිටුවන ලදී. යුද්ධය පටන් ගැනීමේදී සම්පූර්ණයෙන්ම අන්ධ බවට පත්ව සිටියාවූ සිස්කා ඔහුගේ කාලයේ සිටියාවූ ඉතා දක්ෂ හමුදා නායකයෙක් විය. ඔහු බොහිමියාවේ වැසියන්ගේ නායකයා විය. දෙවියන්වහන්සේගේ උපකාරය කෙරෙහි විශ්වාසය තබමින්ද, ඔවුන්ගේ පක්ෂය ධර්මිෂ්ඨව

සිටි බව විශ්වාස කරමින්ද මේ බොහිමියන්වරු ඔවුන්ට විරුද්ධව යවන ලද ඉතා බලවත් හමුදාවට විරුද්ධව නැගී සිටියහ. රජතුමා නැවත නැවතත් හමුදාව පණ ගන්වමින් බොහිමියාවට පහර දුන් නමුත් ඔවුහු නින්දිත ලෙස පරාජය කරනු ලැබූහ. හස්ගේ අනුගාමිකයෝ මරණයට බිය නොවූහ; ඔවුන්ට විරුද්ධව සිටීමට කිසිවකට නුපුළුවන් විය. යුද්ධය ආරම්භ වීමට වසර ස්වල්පයකට පසුව නිර්භීත සිස්කා මැරුණි. නමුත් ප්‍රොකොපියස් ඔහුගේ ස්ථානය ගත්තේය. ඔහුද සිස්කා තරමටම නිර්භීත දක්ෂ හමුදා නිලධාරියෙක් වූ අතර ඔහු වඩාත් දක්ෂ නායකයෙක් විය.

අන්ධ නායකයා මැරුණාවූ බව දුටු බොහිමියාවේ සතුරෝ දැන් තමාට නැතිවූ දෙය ලබාගැනීමට අවස්ථාවක් පැමිණියේ යයි කල්පනා කළහ. පාප් දැන් හස්ගේ අනුගාමිකයන්ට විරුද්ධව ව්‍යාපාරයක් ආරම්භ කළෙන් බලවත් යුද හමුදාවක් බොහිමියාවට යවන ලදී. නමුත් ඔව්හු ද පරාජයට පත්වූහ. තවත් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. යුරෝපයේ රෝම සභාවට අයිති වූ සියලු රටවල, මනුෂ්‍යයන්ද, මුදල්ද, අවි ආයුධ ද රැස්කරන ලදී. සභාවෙන් ඉවත් ගියාවූ හස්ගේ අනුගාමිකයන් අවසාන කරනු ලබන්ට පුළුවනැයි කල්පනා කරමින් බොහෝ මනුෂ්‍යයෝ පාප්ගේ පක්ෂයට යොමු වූහ. තමාට ජයග්‍රහණය ලැබෙන බව ස්ථිර යයි කල්පනා කරමින් මහත් හමුදාවක් බොහිමියාවට ගියහ. බොහිමියාවේ ජනයා ඔවුන්ට විරුද්ධව ඉදිරිපත් වූහ. හමුදාවන් දෙක ඔවුනොවුන්ට ළඟා වූ විට ඔවුන්ට මැදින් පැවතියේ ගංගාවක් පමණය. සතුරු හමුදාවේ සංඛ්‍යාව ඉතා මහත් වූ නමුත්, එඩිතර ලෙස හස්ගේ අනුගාමිකයන්ට පහර දෙනවා වෙනුවට ඔව්හු තුෂ්ණිම්භූතව, නිශ්චලව ඔවුන් දෙස බලා සිටියහ. එවිට ඒ සේනාව කෙරෙහි මහත් බියක් ඇති විය. කිසි පහරක් නොදී ඒ මහත් හමුදාව විසිර ගියේ අදෘශ්‍යමාන බලයක් ඔවුන් විසුරුවා හැරියාක් මෙනි. ඔවුන් පසුපස ගියාවූ බොහිමියානු හමුදාව ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු විනාශ කළහ. ජයග්‍රාහක වූ මේ අයට මහත් වස්තු සම්භාරයක්ද ඔවුන්ගෙන් ලැබුණි. මෙසේ ඒ යුද්ධයෙන් දුගී බවට පත්වෙනවා වෙනුවට එය බොහිමියන් ජනයා සාරවත් කළේය.

වසර ස්වල්පයකට පසුව, අළුත් පාප්වරයෙක් යටතේ තවත් ව්‍යාපාරයක් අරඹන ලදී. පෙරදී මෙන්ම, පාප් බලයට යටත්වූ යුරෝපීය රටවලින් මනුෂ්‍යයන්ද මුදල්ද එක්රැස් කරන ලදී. මේ අන්තරාදායක ව්‍යාපාරයට සම්බන්ධ වන්නාවූ අයට බොහෝ පෙළඹීම්ද ඉදිරිපත් කරන ලදී. මේ යුද්ධයට සහභාගි වූ සැම හටයාගේම ඉතාම නරක පාපවලට පවා කමාව දෙන බව පොරොන්දු වෙන ලදී. යුද්ධයේදී මරණයට පත්වන සියල්ලන්ට ස්වර්ගයේදී මහත් විපාක දෙනු ලබන



බවද පවසන ලදී. මරණයෙන් බේරෙන අයට යුද්ධ භූමියේදීම ගෞරවය හා වස්තුව ලැබෙන බවද පවසන ලදී. මෙවරද මහත් හමුදාවක් එක්රැස් වී බොහිමියාවට ඇතුල් වූහ. හස්ගේ අනුගාමිකයන්ගෙන් යුක්ත වූ හමුදාව ඔවුන් ඉදිරියේ සිට පිටුපසට යමින් පසුබසින්නට වූයෙන් සතුරු හමුදාව වැඩි වැඩියෙන් රට ඇතුළට ගියේ තමාට ජයග්‍රහණය අත්වූ බව විශ්වාස කරමිනි. අවසානයේදී ප්‍රොකොපියස්ගේ හමුදාව සතුරු හමුදාවට මුහුණ දෙමින් ඔවුන් හා යුද්ධ කිරීමට ඉදිරියට ගියහ. සතුරු හමුදාව තමා වරදක් කළ බව වටහාගෙන ඔවුන්ගේම කඳවුරට වී ඒ හමුදාව එන තුරු බලා සිටියහ. හස්ගේ අනුගාමිකයන්ගේ හමුදාව දර්ශනය කිරීමටද පෙර, හමුදාවක් පැමිණීමේ ශබ්දය ඔවුන්ගේ සවනට යොමු වූයෙන් ඒ විරුද්ධ හමුදාව මහත් බියට පත්විය. කුමාරවරුද, හමුදා නායකයෝද, සාමාන්‍ය සොල්දා-දුවෝද තමාගේ ආයුධ පසෙකලමින් ඒ මේ අත පැන ගියහ. පාප්ගේ නායකයා බියට පත්වූ අවුල් වියවුල් වූ ඒ හමුදාව එක් කිරීමට නිෂ්ඵලයේ වෙහෙසුණේය. ඔහු කොපමණ උත්සාහ කළා වුවද, ඔහුද ඔවුන් සමග ඉවතට ඇදී ගියේය. ඔවුහු සහමුලින්ම ඉවත්ව ගියහ. නැවත වරක් මහත් ධන සම්පතක් ජයග්‍රාහක වූවන්ට අත් විය.

මෙසේ දෙවන වරටත්, යුරෝපයේ ඉතාම බලසම්පන්න ජාතීන් විසින් එවන ලද මේ හමුදාව, නිර්භීත, යුද්ධ හටයන් වූ මේ මනුෂ්‍යයෝ, යුද්ධයට පුහුණු කරනු ලැබ, අවි ආයුධ රැගෙන සිටි මේ හමුදාව, එක පහරක් පමණවත් නොදී පලා ගියේ කුඩා දුර්වල ජාතියකගේ ආරක්ෂකයන්ගෙන් ගැළවෙන පිණිසය. මෙහිදී දිව්‍ය බලය ප්‍රකාශ විය. මේ යුද්ධ හටයෝ අස්වාභාවික උසස් බලයක් මගින් බියට පත් කරනු ලැබූහ. රතු මුහුදේදී ඵාරාවෝගේ හමුදාව පරාජය කළාවූ තැනැන්වහන්සේම, ගිදියොන්ගේ තුන්සියයක් පමණක් වූ හමුදාව ඉදිරිපිට මිදියන් හමුදාවට පලායන්ට සැලැස්වූ තැනැන්වහන්සේම, උදාරමින් යුත් ඇසිරියන් හමුදාව එක රාත්‍රියකින් යටපත් වන්ට සැලැස්වූ තැනැන්වහන්සේම, නැවත වරක් තමන්වහන්සේගේම අත දිගුකොට පීඩකයන්ගේ බලය මැලවී යන්නට සැලැස්වූ සේක. "භයක් නැති තැනදී ඔව්හු බොහෝ සෙයින් භයපත් වූවෝය. මක්නිසාද දෙවියන්වහන්සේ නුඹට විරුද්ධව කඳවුරු බැඳගත් තැනැත්තාගේ ඇට විසිර වූසේක. දෙවියන්වහන්සේ ඔවුන් එපා කළ නිසා නුඹ ඔවුන් ලැජ්ජාවට පත් කළෙහිය." (ගීතාවලිය 53:5)

බලහත්කාරයෙන් මේ රට යටපත් කරගැනීමට තමාට නුපුළුවන් බව දුටු පාප් සභාවේ නායකයෝ දැන් උපායශීලී ලෙස ඒ කාරණය ඉටු කරගැනීමට සූදානම් වූහ. ඔව්හු ඔවුන් සමග එකඟතාවයකට පැමිණෙමින් බොහිමියාවේ වැසියන්ට තම හෘදය සාක්ෂිය අනුව

ක්‍රියා කිරීමට නිදහස දෙන බව දක්වූ නමුත් එමගින් ඔව්හු රෝමයේ බලයට පාවා දෙනු ලැබූහ. රෝමය සමග සමාදානය ඇති කරගැනීමේ කොන්දේසි වශයෙන් බොහිමියන්වරු කාරණා හතරක් ඉදිරිපත් කළහ. ඒවා මෙසේය: නිදහස් ලෙස බයිබලය දේශනා කිරීම, මුළු සභාවටම රාත්‍රී භෝජන මෙහෙයේදී රොටී හා මුද්‍රික පානයට සහභාගි වීමට හැකියාව ලැබීම, දිව්‍ය නමස්කාරයේදී දේශයේ භාෂාව පාවිච්චි කිරීම හා පූජකවරුන් දේශීය සේවාවන්ට ඇතුල් වීමෙන් වැළැක්වීමත් යම් අපරාධයක් පිළිබඳව ක්‍රියා කිරීමේදී මහජනයාගේ උසාවිය ගිහි පැවිදි සියල්ලන් කෙරෙහි ක්‍රියාත්මක වන බවත් මේ කාරණා මගින් පැහැදිලි කරන ලදී. පාප් බලධාරීහු මේ කරුණු පිළිගැනීමට අවසානයේදී එකඟ වූහ. එහෙත් ඔවුන් කියා සිටියේ මේ කරුණු වටහා ගැනීමද ඒවායේ නියම අර්ථය තීරණය කිරීමද සභාවේ කාර්යයක් වන බවය. මේ අනුව ඔව්හු ගිවිසුමකට ඇතුල් වූහ. නියම තත්ත්වය සඟවමින් රැවටිලිකාර ලෙස ක්‍රියා කිරීමෙන් රෝමය, අරගලයෙන් තමාට ලබාගත නොහැකි වූ දෙය ලබාගත්හ. කුමක්හෙයින්ද, බයිබලය පිළිබඳව ඔවුන් ක්‍රියා කළ අන්දමටම, මේ කාරණා හතරද ඔවුන්ගේ කැමැත්ත අනුව පිළිගැනීමෙන් ඔවුන්ට ඒවා ඔවුන්ගේම අදහස් අනුව ක්‍රියාත්මක කිරීමට පුළුවන්කම ලැබුණි.

බොහිමියාවේ බොහෝ ජනයා තමාගේ නිදහස පාවාදෙනු ලැබූ බව ඒත්තු ගනිමින් මේ ගිවිසුමට ඇතුල්වීමට අකමැති වූහ. භේද හා බෙදීම් ඇතිවුණි. ඒවා මගින් ඔවුන් අතරම අරගල හා ලේ වැගිරීම් ඇතිවිය. මේ අරගලවලදී ප්‍රොකොපියස් වැටී ගියේය. බොහිමියාවේ නිදහස ද නැතිවී ගියේය.

හස් හා ජෙරෝම් පාවා දුන් සිගිස්මන්ඩ් දැන් බොහිමියාවේ රජ බවට පත්විය. බොහිමිය ජනතාවගේ අයිතිවාසිකම් රැකවරණය කිරීමට ඔහු පොරොන්දු වී තිබුණ නමුත් දැන් ඔහු පාප් සභාවේ ප්‍රතිපත්ති එහි පිහිටුවීමට යෙදුණේය. නමුත්, රෝමයට යටත් වීම කරණකොටගෙන ඔහුට වැඩි ප්‍රයෝජනයක් ලැබී තිබුණේ නැත. වසර විස්සක් මුළුල්ලේම ඔහුගේ ජීවිතය වැඩ බහුලත්වයෙන් හා කරදර වලින් පිරී තිබුණි. ඔහුගේ හමුදාවන් නාස්ති කරනු ලැබ තිබුණි; ඔහුගේ භාණ්ඩාගාරයන් නිෂ්ඵල දීර්ඝ පොර බැදීම් මගින් පිරිහී තිබුණි. දැන් එහි එක අවුරුද්දක් රජකම් කළාට පසුව ඔහු මරණයට පත් විය. එවිට ඔහුගේ රාජ්‍යය දේශීය යුද්ධයකට සූදානම්ව සිටියේය. ඔහු අනාගත පරම්පරාවන්ට උරුම කර දුන්නේ අපකීර්තියෙන් යුත් නාමයකි.

අරගල, කැරළි හා ලේ වැගිරීම් පැවතුණි. විදේශික හමුදාවෝ නැවත බොහිමියාවට පැමිණියහ. අභ්‍යන්තරික භේද තවදුරටත් ජාතිය



තුළ පැවතුණි. ශුභාරංචියට විශ්වාසවන්තව සිටි අයට ලේ වැගිරීමෙන් යුත් පීඩාවන්ට මුහුණ දීමට සිදුවිය. මීට පෙර සිටියාවූ ඔවුන්ගේ සහෝදරයන් රෝමය සමග ගිවිසුමකට ඇතුල් වී ඇගේ වැරදිවලට කොටස්කරුවන් වූ බැවින්, තවදුරටත් ඒ පැරණි ඇදහිල්ලට විශ්වාස-වන්තව සිටියාවූ අය එක් වී නිශ්චිත සභාවක් පිහිටුවමින් එයට 'එක්සත් සහෝදරයෝ' යන නාමය යෙදවූහ. මේ කාරණය ගැන ඔවුන්ට සියලු පක්ෂයන්ගේ ශාපය ලැබුණි. එහෙත් ඔවුන්ගේ ස්ථිරතාවය සොලවනු ලැබුවේ නැත. ආරක්ෂාව සඳහා වනාන්තරවලටද ගුහාවලටද යාමට සිදුවූ නමුත් ඔව්හු තවදුරටත් දෙවියන්වහන්සේගේ වචනය කියවමින් නමස්කාරයේ යෙදෙන පිණිස එක් රැස්වූහ.

ඔවුන් නා නා රටවලට රහසිගත පණිවිඩකරුවන් යැවීම මගින් ඉගෙන ගත්තේ යම් යම් ස්ථානවල සත්‍යයට විශ්වාසවන්ත අය සිටින බවය. තමා මෙන් පීඩාවන්ගෙන් ආරක්ෂාව සොයා ගිය ඔව්හුද ඒ ඒ නගරයන්හි ස්වල්ප දෙනෙකුගෙන් සමන්විත වූහ. ඇල්පයින් කඳුකරයේ වූ පැරණි සභාවක් ශුද්ධ ලියවිල්ලේ පදනම මත පිහිටුවනු ලැබ තිබුණි. ඔව්හු ඉතා ප්‍රීතියෙන් මේ ප්‍රවෘත්ති අසා දැනගත්හ; දැන් ඔව්හු වොල්ඩන්සියානු සභාව සමග සබඳතාවයක් ඇති කරගත්හ.

මේ බොහිමියන්වරු පීඩා කරනු ලැබීමේ රාත්‍රියේදී ශුභාරංචියට ස්ථිරව සිටියහ. උදෑසන පැමිණෙන තෙක් බලා සිටින මනුෂ්‍යයන් මෙන් ඔව්හු ඒ ඉතාම අන්ධකාර පැයේදී පවා තමාගේ නෙත් ක්ෂිතිජය වෙතට යොමු කළහ. "ඔවුන්ට නපුරු දවස්වලට මුහුණදීමට සිදුවිය; එහෙත් ඔව්හු පළමුවෙන් හස් විසින් පවසන්ට යෙදුණාවූ ද ඊට පසුව ජෙරෝම්ද පැවසුවාවූ වචන සිහි කළහ. දින උදාවීමට පෙර ශත වර්ෂයක් ගතවිය යුතු යයි ඔවුන් පවසා තිබුණි. හස්ගේ අනුගාමි-කයන්ට මේ වචන යෝසෙප් වහල්කමේ සිටියාවූ ඊශ්‍රායෙල්වරුන්ට පැවසූ වචන හා සමාන විය; යෝසෙප් මෙසේ පැවසුවේය. "මම නසිමි. එහෙත් දෙවියන්වහන්සේ සැබවින් .... මේ දේශයෙන් නුඹලා ගෙනයනවා ඇත."

1470 වන විට පීඩා කිරීම නැවතුණි. එවිට පැවති කාලය ඊට පෙර පැවති කාලයන්ට වඩා සෞභාග්‍යයෙන් යුත් කාලයක් විය. "ඒ ශතවර්ෂය අවසාන වූ විට බොහිමියාවේද මොරේවියාවේද 'එක්සත් සහෝදරයන්' යන නාමයෙන් පිහිටුවන ලද සභාවන් දෙසියයක් පමණ තිබෙන බව සොයාගන්නා ලදී. ගින්නේද කඩුවේද විනාශ-කාරිත්වයෙන් ගැළවී හස් විසින් පවසන්ට යෙදුණ ඒ සාමකාමී දවසේ උදාවීම දකගැනීමට පුළුවන්කම ලැබුණාවූ අය ප්‍රීතියට පත්වූහ.

## උපුටාගැනීම් පටුන


අංක 1 - Wylie bk3,Ch 1.

අංක 2 - Wylie bk. 3, Ch. 1

අංක 3 - Bonne Clchose, “The Reformers before the Refmation” Vol. 1, p. 97 (ed. 1844).

අංක 4 - Wylie bk.3, Ch. 2.

අංක 5 - Bonnechose, Vo1. 1, pp. 147, 148.

අංක 6 - Bonnechose, Vol. 1, pp. 148, 149.

අංක 7 - Idem, p. 247 (The Previous book p. 247).

අංක 8 - Lenfant, “History of the Council of Constance,” Vol. 1, p. 516.

අංක 9 - Bonnechose, Vol II, P. 67.

අංක 10 - D’Aubigne, bk1, Ch 6.

අංක 11 - Bannechose, Vol II, P. 84.

අංක 12 - Bannechose, Vol II, p. 86.

අංක 13 - Wylie, bk. 2, Ch. 7.

අංක 14 - Whylie, bk. 2, C




# 7

## ලූතර් රෝම සභාවෙන් ඉවත් වෙයි

මාටින් ලූතර් වනාහි පාප් අධිකාරී අන්ධකාර බලපෑම් යටතේ සිට සත්‍යවාදී ඇදහිල්ල නමැති ආලෝකය කරා දේව ජනතාව මෙහෙයවීමේ කර්තව්‍යයෙහි යෙදී සිටීමට කැඳවන ලද්දන් අතර ප්‍රමුඛ තැනැත්තෙක් විය. දෙවියන්වහන්සේගේ අව්‍යාජ අමිශ්‍ර සත්‍යතාවය වෙනුවෙන් ජ්වලිතතාවෙන් දවෙමින් සිටි හෙතෙම එයට ලැදිව කැපවීමකින් ක්‍රියා කළ පුද්ගලයෙක් විය. තවද හෙතෙම තම විශ්වාසය පිළිබඳව උග්‍ර භක්තිවන්තයෙක් විය. දෙවියන්වහන්සේට පමණක් බිය පක්ෂපාතී භාවය දක්වූ හෙතෙම වෙනත් කිසිම බලවේගයකට හිස නොනැමුවේය. ආගමික ඇදහිල්ල උදෙසා පරම පදනම ශුද්ධ ලියවිල්ල පමණක් බව පිළිගත් හෙතෙම වෙනත් කිසි විග්‍රහ කිරීමකට කැමැත්තක් නොදක්වීය. ඔහු කාලීන යුග පුරුෂයෙකු විය. කිතුණු සභාවේ ප්‍රතිසංස්කරණය සඳහා ලෝකය ආලෝකමත් කිරීමට, පිබිදවීමට, දෙවියන්වහන්සේ මාටින් ලූතර් කරණකොටගෙන ඉමහත් මෙහෙවරක් ඉටු කළසේක.

ශුභාරංචි සුපුවත ලෝ පුරා රැගෙන ගිය මුල් පුරෝගාමීන් මෙන්ම ලූතර් ද දුගී පවුලක සාමාජිකයෙක් විය. ඔහුගේ ජීවිතයේ මුල් කාලය ගෙවී ගියේ ජර්මනියේ කම්කරු පවුලක නිවෙසකදීය. මාටින්ගේ අධ්‍යාපනට මුදල් සොයා ගැනීම සඳහා ඔහුගේ පියා පතල් කම්කරුවෙකු ලෙස රැකියාව කළේය. තම පුත්‍රයාව නීතිඥයෙකු කිරීම තම පියාගේ අභිලාෂය විය. එහෙත් දෙවියන්වහන්සේගේ අභිප්‍රාය වෙනස් ආකාර විය. සිය වස් ගණනාවක් පුරා දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨ දේව මාළිගාවක් ගොඩ නැගීමෙහි ලා ක්‍රියාත්මක වෙමින් සිටිසේක. ලූතර්ව එම දේව මාළිගාව ගොඩ නැගීමෙහි කොටස්කරුවෙකු කරගැනීම දේව සැලැස්ම විය. ස්වකීය ජීවිතයෙහි ඉතා උතුම්වූ ද, වැදගත්වූ ද මෙහෙවරය සඳහා ලූතර්ට අධ්‍යාපනය ලබාදීමට අනන්ත ප්‍රඥාවරයාණෝ තෝරා ගත්තේ දුෂ්කරතාවයන් අග හිඟකම් සහ ප්‍රබල හික්මවීමක් තිබුණාවූ පාසලක් හා අධ්‍යාපන ක්‍රමයක්ය.

මාටින් ලූතර්ගේ පියා ඉතා ශක්තිමත් ක්‍රියාකාරී මනසකින් යුත් පුද්ගලයෙක් විය. ඔහුගේ ප්‍රබල චරිතාංග අතර අවංක භාවය, අධිෂ්ඨාන ශක්තිය, නිර්භීතතාව සහ නොසැලී සිටීම කැපී පෙනුණේය. ස්වකීය තීරණ ගැනීම් පිළිබඳව දැඩි ස්ථාවරයක පිහිටා සිටි ඔහු, ප්‍රතිඵල කුමක් වුවද. තම තීරණය වෙනස් නොකළ පුද්ගලයෙකි.

ඔහුගේ සැබෑ වූද, අව්‍යාජ වූද බුද්ධිය පැවිදි වැඩ පිළිවෙත ගැන වැඩි ප්‍රසාදයක් නොදක්වීය. එහෙත් ඔහුගේ පුත්‍රයා පියාගේ කැමැත්ත නැතිව පැවිදි දිවියකට ඇතුල් වීම පියාගේ බලවත් නොසතුටට හේතු විය. මෙම කරුණ නිසා පියා තම පුතු සමග සමථයකට පත්වීමට වසර දෙකක් ගත වුවද, පැවිදි වැඩ පිළිබඳව පියාගේ අදහස බිඳක් හෝ වෙනස් නොවීය.

ස්වකීය දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව ලූතර්ගේ දෙමාපියෝ ඉමහත් සැලකිල්ලක් දක්වූහ. ඔවුන්ට දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමත්, ක්‍රිස්තියානි සදාචාරය සහ ගුණවත් චරිතාංග පැවැත්වීමත් කෙරෙහි ගුරුහරුකම් ලබාදීමට ඔවුහු වෙර දැරූහ. දෙවියන්වහන්සේ වෙත යොමු වූ යාච්ඤාවන් සිය පුත්‍රයාගේ සවනට හසුවන ලෙස යොදා ගැනීමට පියා සැලකිලිමත් විය. එය තුළින් ඔහු බලාපොරොත්තු වුණේ ස්වාමීන්ද්‍රයාණන්ගේ නාමය සිය දරුවාගේ මතකයෙහි රැඳී, උන්වහන්සේගේ සත්‍යතාව ප්‍රචලිත කිරීමෙහි ලා ඔහු යම් දවසක අත්වැලක් වනු දැකීමය. ඔවුහු තමන්ට ලැබෙන්නාවූ සම්පත් මගින් තම දරුවන්ට ලබාදිය හැකි උපරිම අධ්‍යාත්මික හා බුද්ධිමත් දැනගැන්ම කරා ඔවුන් ගෙන යාමටද ප්‍රයෝජනවත් දේවභක්ති ජීවිත ගතකිරීමට ඔවුන්ට උපකාර කිරීමට ද අවංකවම නොපසුබස්නා වෙහෙසක් දැරූහ. තමන් තුළ තිබූ අධිෂ්ඨානයත්, චරිතයෙහි අප්‍රතිහත ශක්තියත් නිසා ඔවුහු තරමක් දැඩිව ක්‍රියා කළද, ඔවුන් ලබාදුන් හික්මවීම පිළිබඳව මාටින් ලූතර් ඔවුන්ට දොස් නොතැබීය. සමහර අවස්ථාවන්හිදී ඔහු තම දෙමාපියන්ගේ අදහස් සමග එකඟ නොවූවද, ඔවුන් ලබාදුන් හික්මවීම ගැන ඔවුන්ට දොස් තැබීමට වඩා ප්‍රශංසාත්මකව ප්‍රතිචාරය දැක්වීම සුදුසු බව ඔහුට පෙනී ගියේය.

බාල කාලයේ සිටම පාසැල් ජීවිතයට යොමු කරනු ලැබූ මාටින් ලූතර්ට එහිදී රළු ලෙස සලකනු ලැබීය, සමහර විටෙක අඩන් තේට්ටම්වලටද පාත්‍ර කරනු ලැබීය. පාසැලට සහභාගී වීම සඳහා ලූතර්ට වෙනත් ගමකට යාමට සිදුවිය. ගෙදර පැවති අගහිඟකම් නිසා ඔහුට බඩගින්නේ සිටීමට සිදුවූ වාර බොහෝය. සාගින්න නිවා ගැනීම සඳහා ඔහු ගෙයින් ගෙට යමින් සිංදු කීවේය; එමඟින් ආහාර වේලක් සපයා ගත්තේය. එකල පැවැති අඳුරු ආගමික මිථ්‍යා ඇදහිලි සහ අන්ධ විශ්වාසයන් නිසා ඔහුගේ සිත බියෙන් ඇලලී ගියේය. දෙවියන්වහන්සේ පිළිබඳව ඔහු තුළ තිබූ ආකල්පය නිසා ඔහු නිරතුරුවම ජීවත් වූයේ මහත් භීතියකින් යුතුවය. දෙවියන්-වහන්සේ වනාහි කාරුණික ස්වර්ගීය පියාණන්වහන්සේ කෙනෙකු ලෙස ඔහු තුළ කිසිම හැඟීමක් හෝ විශ්වාසයක් නොවීය. උන්වහන්සේ වනාහි ඉතා දරදඬු අනුකම්පා විරහිත විනිසුරුවෙකි, කුරිරු පාලකයෙකි යන හැඟීමෙන් යුතුව ඔහු මහත් භීතියකින් යුතුව රාත්‍රියේ නින්දට ගියේය, ජීවත් විය. අනාගතය ගැන ඔහු තැති ගත්තේය. එහෙත් ඔහු



ඉදිරියටම ගමන් ගත්තේ බුද්ධියේ හා සදාචාරිත්වයේ අනර්ඝතාවය ලබාගැනීමේ ආශාවෙන්ය.

ජීවිතය අඳුරෙහි පාකර හැරිය හැකි කළකිරීම් සහ පසුබැසීම් මධ්‍යයේ වුවද, අධ්‍යාත්මික සහ බුද්ධිමත් සාර්ථකත්වයේ ඉහළ ප්‍රමිතිය කරා යෑමට තිබූ අධිෂ්ඨානය ඔහුගේ දසුනින් ඉවත්ව ගියේ නැත. එම දසුන ඔහුගේ ජීවිතය ආක්‍රමණය කරමින් එහි රැඳී ලැගුම් ගත්තේය. දිය දහරක් කරා දුව යන්නාවූ මුව පොව්වකු සේ ඔහු දැනුම පසුපස හඹා ගියේය. ඔහු තුළ පිහිටි අවංක වූද, ප්‍රායෝගික වූද මනස, ප්‍රයෝජනයට ගත හැකි ස්ථිරසාර දේවල් කෙරෙහි ඔහුව යොමු කළේය. බොරු ශෝබනය සහ බාහිර අලංකාරය ගැන ඔහුගේ තැකීමක් නොවීය. දහ අට වැනි වියට පා තැබීමත් සමගම ඔහුගේ තත්ත්වය වඩාත් යහපත් පැත්තකට හැරුණේය. ඔහුට එර්ෆර්ට් සරසවියට ඇතුළුවීමේ වරම හිමි විය. සාර්ථකත්වය පිළිබඳව වූ ඔහුගේ දසුන ශුභදායී විය. අගහිඟකම් මධ්‍යයේ වුවද, පරෙස්සම සහ සැකසුරුවම මධ්‍යයේ, විවිධ කර්මාන්තවල යෙදෙමින් දෙමාපියන් එකතු කරගත් සම්පත්, ඔහුගේ සියලුම විය හියදම් සඳහා අතහිත දීමට ප්‍රමාණවත් විය. පෙර වසරවල දිවියෙහි පැවති අඳුරු ස්වභාවය තුනී කිරීමට ඔහුගේ ප්‍රඥාවන්ත මිතුරන්ගේ බලපෑම හේතු කාරක විය. ප්‍රවීන වූද, සුප්‍රකට වූද ගත් කතුවරුන්ගේ කෘති අධ්‍යයනය කිරීමට ඔහු මහත් රුචිකත්වයක් දැක්වීය. එම කෘතිවල තිබූ ගැඹුරු දාර්ශනික පඬි වදන් මහත් උනන්දුවකින් යුතුව තම සිත්හි නිදන් කරගත් හෙතෙම බුද්ධිමතුන්ගේ නැණවත් ප්‍රකාශන තමාගේ ප්‍රඥාව කොට ගත්තේය. පෙරදී ගුරු හරුකම් සැපයූ ගුරුවරුන්ගේ දැඩි පීඩාකාරී දරදඬු බලපෑම්වලට හිරවී කටයුතු කිරීමට සිදුවුවද, ඔහුගේ මනස දීප්තිමත් බවක් කියා පෑවේය. ඔහුට දැන් උදා වී තිබූ ශුභදායී ආනුභාවය නිසා ඔහුගේ මනස ඉතා වේගයෙන් වර්ධනය වන්නට විය. ළමා වියෙහි පටන්ම ඔහු ඉගෙනීමට දක්ෂයෙක් විය. විෂය මාලා දැනුම පිළිබඳ තොරතුරු ධාරණය කර ගැනීමේ දක්ෂතාවක් ඔහු සතු විය. මතක තබා ගැනීමේ ශක්තිය ඔහු තුළ ප්‍රබලව පැවැතියේය. සිතිවිලි සහ සංකල්ප ඉතා ප්‍රබල ලෙස ඔහුට හිමිව තිබුණේය. තර්කානුකූල ලෙස තෝරා බේරා ගැනීමේ ශක්තිය ඔහුට දායාද වී තිබුණේය. එසේම, තත්ත්වානුබෝධ සිද්ධාන්ත ප්‍රායෝගික ජීවිත දැක්මට අදාළ කරගැනීමට ඔහු දක්ෂයෙක් විය. තමාගේ අනෙකුත් සමකාලීනයන් අතර ඔහුට ලැබී තිබූ තත්ත්වය ඉස්මතු වී පෙනෙන්නට විය. අධ්‍යාත්මික හික්මවීම ඔහුගේ අවබෝධයට රුකුලක් විය. එය ඔහුගේ මනස ක්‍රියා කරවීමට ඔහුව පිබිදෙව්වේය; නිවැරදි දේ තෝරා ගැනීමට ඔහුගේ තීක්ෂණ භාවය මුවහත්ව පැවතුණි. ජීවිතයේ අනේකවිධ ගැටළුවලට මුහුණ දීම සඳහා පුහුණු වීමට මේ සියල්ලෙන් ලැබුණේ ඉමහත් අත්වැලකි.

සමිඳුන් කෙරෙහි භීතිය ලූතර්ගේ හදවතෙහි නැංගුරම් ලා තිබිණ. තමන්ගේ අරමුණ කෙරෙහි දැඩි ලෙස පිහිටා සිටීමට ඔහුට එය ඉවහල් විය. දෙවියන්වහන්සේ ඉදිරියෙහි ප්‍රබලව නිහතමානී වීමට ඔහුට එය බලපෑවේය. දිව්‍යමය ආධාර සහ උපකාර කෙරෙහි ගැතිවීමට, රඳා පැවතීමට, නොමියන පක්ෂපාතීකමක් ඔහු තුළ පැවැතියේය. ඔහු කිසි දිනක යාච්ඤාව නැතිව දවස ආරම්භ කළේ නැත. සහාය සහ දිව්‍ය මගපෙන්වීම ඉල්ලා ආයාචනය කිරීම ඔහුගේ හදගැස්ම සමග අනුකූලතාවක් දැක්වීය. "ඉගෙනීමෙහි වඩාත් යහපත් කොටස වන්නේ මනා ලෙස යාච්ඤා කිරීමයැ"යි ඔහු නිතරම කියා සිටියේය. (D' Aubigne, "History of the Reformation of the Sixteenth Century" b 2, ch. 2).

වරක් ලූතර් සරසවි පුස්තකාලයෙහි තිබූ පොත් පිරික්සමින් සිටියේය. එහිදී ඔහුට ලතින් බසින් ලියැවුණු ශුද්ධ බයිබල් පිටපතක් හමු විය. මෙවන් පොතක් ඔහුට මින් පෙරාතුව දකගන්නට ලැබී තිබුණේ නැත. එවන් පොතක පැවැත්මක් ගැන ඔහු දන සිටියේද නැත. ප්‍රසිද්ධ නමස්කාර මෙහෙයන්හිදී කියවනු ලැබූ ශුභාරංචි කොටස් සහ යැවුම් පත්‍ර කොටස් ඔහු ශ්‍රවණය කර තිබුණේය. තමා ඇසූ දේවල් වනාහි සම්පූර්ණ බයිබලය යයි ඔහු සිතුවේය. දැන් ඔහු තම ජීවිතයේ මුල්ම වතාවට දෙවියන්වහන්සේගේ සම්පූර්ණ වචනය වෙත නෙත් හෙලා සිටියේය. භීතියෙන් සහ විශ්මයෙන් යුතුව හෙතෙම බයිබලයෙහි පිටු පෙරළා බැලුවේය. බයිබල් වදන් කියවන්නාවූ අතර ඔහුගේ හෘදයේ ස්පන්දනය වේගවත් විය, ජීවනයේ වදන් කියවන්නාවූ අතරතුර ඔහු මඳක් නැවතී, "දෙවියන්වහන්සේ මෙවන් පොතක් මටත් අත්පත් කරගන්නට දෙනවා නම්!" කියමින් සුසුම් ලෑවේය. සගයේ සුර දූතයෝ ඔහුගේ පසෙක වූහ. දෙවියන්වහන්සේගේ සිහසුන වෙතින් නික්ම ආ ආලෝක දහරා මෙන් සත්‍යතාවයේ නිධන්ගත වස්තු ඔහුගේ අවබෝධයට එළිදරව් වන්නට විය. දෙවියන්වහන්සේ ඉදිරියෙහි වරදක් කිරීමට ඔහු කවදත් භය විය. මීටපෙර කිසිවිටෙක නොපැවති අන්දමට, තමා දැඩි පව්කාරයෙක් යයි ඔහුගේ හදවත ඔහුට දොස් තබන්නට විය.

පාපයෙන් නිදහස් වීමේ ආශාවත්, දෙවියන්වහන්සේ සමග සමාදානය ඇතිකර ගැනීමේ අභිලාෂයත් ඔහුගේ හදවත තුළ තෙරපී එන්නට විය. එයින් නිදහස සොයා ගැනීම් වස් කුටියකට වී පැවිදි දිවියක් ගත කිරීමට ඔහු අදිටන් කරගත්තේය. අන්ත වහලෙකු සේ වැඩ කිරීමට ඔහුට එහිදී සිදුවිය. මනාපයක් නොදක්වූ කාර්යයන්හි යෙදීම ඔහුගේ දෛනික භාග්‍යය විය. ගෙයින් ගෙට යමින් හිඟාකෑමද ඔහුගේ දිනපතා දිවි පැවැත්මෙහි කොටසක් විය. ගෞරවය ලැබීමද, ප්‍රශංසා හිමි කරගැනීමද අගය කරන්නාවූ වයස් මට්ටමක ඔහු සිටියේය. තුරුණු වියෙහි තමන් ලබන්නාවූ සංග්‍රහය ඔහුගේ ස්වභාවික



හැඟීම් මරා දමන්නක් විය. තමන්ගේ පාප නිසා මෙවන් තත්ත්වයක් තිබීම අවශ්‍යය යන කල්පිතයෙන් යුතුව ඔහු ඒ තත්ත්වය ඉවසා ගත්තේය.

තමාගෙන් බලාපොරොත්තු වන්නාවූ කාර්යභාරයන්ගෙන් ලැබෙන්නාවූ සෑම විවේකී මොහොතක්ම ඔහු දේව වචනය ඉගෙනීමට මිඩංගු කළේය. මෙසේ ඔහු කෑම ගැනීමේ කාලයත් මෙන්ම නිදාගැනීමේ කාලයන්ද බයිබල් අධ්‍යයනය සඳහා යෙදවීය. අනෙකුත් සියල්ලට වඩා දේව වචනය ඉගෙනීම ඔහුගේ ඉමහත් ප්‍රීතියට හේතු විය. තමා සිටි ආරාමයේ එක්තරා බිත්තියකට දම්වැලකින් බැඳ තිබූ බයිබලයක් විය. විවේකය ලැබූ සෑම අවස්ථාවකදීම ඔහු එහි ඇදී ගියේය. පාපය පිළිබඳව වූ හැඟීමද තමා වරදකරුවෙකුය යන චින්තනයද දැඩි වීමත් සමගම පව්කමාව සහ නිදහස සොයා ගැනීමට තමාගේම ක්‍රියාදාමයන් මගින් හැකිවෙතැයි යන චින්තනයෙන් යුතුව ඔහු ඒ සඳහා වෙහෙසී ක්‍රියා කළේය. නිරාහාරව හිඳීම, ආගමික උපවාසය සඳහා නිදිවරා සිටීම, ස්වභාවික පැවැත්ම තුළ පැවති නපුර දමනය කිරීම සඳහා තමන්ටම වධ වේදනා පමුණුවා ගැනීම යනාදිය තුළින් පාපිෂ්ඨ ඉඳුරන් දමනය කර ජයගැනීමට ඔහු දැඩි ආයාසයකින් යුතුව ක්‍රියා කළේය. එසේ වුවද, පැවිදි දිවි පැවැත්ම මගින් ඔහු බලාපොරොත්තු වූ නිදහස ඔහුට නොලැබුණි. දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිළිගත හැකි ආකාරයෙන් යුතුව සිටීම සඳහා ඇවැසි හදවත්හි පාරිශුද්ධතාවය ලබා ගැනීමට අවශ්‍ය වූ යමක්වීද, එවැනි දෑ ඉටු කිරීමෙන් බැහැර නොවන්නට හෙතෙම දැඩි අධිෂ්ඨානයක පිහිටා සිටියේය. පසු දවසක ඔහු මෙසේ පැවසීය. "මම ඉතාමත් සැදැහැවත් බැතිමතෙක් වූයෙමි. මාගේ ආරාමයෙන් ඉල්ලා සිටි සෑම දෙයක්ම ඉටු කිරීමට මම දැඩි වෙහෙසක් දැරීම යම්කිසි පූජකයෙකුගෙන් ආරාමය ඉල්ලා සිටින්නාවූ යම් නිර්දේශයක් වූයේද, එවන් දෑ ඉටු කිරීමෙන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිර්දෝෂීව සිටීමට පුළුවන්කමක් ඇත්නම් මට එය ... ලැබිය යුතු විය. මෙම දැඩි ආරාම් ජීවිතය මම තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන ගියෙම් නම්, එය මරණය දක්වාම පවත්වා ගෙන යෑම මාගෙන් සිදුවනවා නියතය." (D. Aubigne, b. 2, Ch. 3). මෙම අධික පීඩාකාරී හික්මවීමේ ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයක් ලෙස ඔහු නිතරම සිහි මූර්ජා වීමට ගොදුරු විය. ඔහුගේ ශරීර ශක්තිය බිඳ වැටුණේය. එහි අතුරු ආබාධවලින් මිදීමට ඔහුට පසුකලෙක ද භාග්‍යය උදා නොවීය. ඔහු කරන්ට යෙදුණාවූ ඒ සියලු උත්සාහයන් තුළින් පවා ඔහුගේ ආත්මයට සහනයක් උදා වූයේ නැත. අන්තිමේදී ඔහු බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකට පත් විය.

තමා පැතූ සියල්ලක්ම සුන් වී ගියා යැයි ලූතර්ට හැඟී ගිය විට දෙවියන්වහන්සේ ඔහුට උපකාර කිරීමට මිතුරෙකු ලබාදුන් සේක. සැදැහැවතෙකු වූ ස්ටෝපිට්ස් ලූතර්ගේ මනසට දේව වචනය විවෘත

කර දුන්නේය. තමා දෙසට අවධානය යොමු කරගනිමින් තැවෙන්නාවූ ආකල්පයෙන් ලූතර්ව වෙනස් දිශාන්තියකට යොමු කිරීමට එම මිතුරා සමත් විය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකිරීම නිසා හිමි විය හැකි අනන්ත දඬුවම ගැන නිරතුරුවම කල්පනා නොකර, පව්කරුවාට සමාව දීමට උදක් බලා සිටින්නාවූ යේසුස්වහන්සේ වෙතට අවධානය යොමු කරන ලෙස මිතුරා ලූතර්ව දිරිමත් කළේය. "ඔබගේ පව් ගැන ඔබටම වධ හිංසා කරගන්නේ නැතිව ගැලවුම්කාරයාණන්ගේ ශ්‍රී හස්තය මතට ඔබගේ ජීවිතය කැප කරන්න. උන්වහන්සේ කෙරෙහි විශ්වාසය රඳවන්න. උන්වහන්සේගේ දහැමි ජීවිතය කෙරෙහිත් උන්වහන්සේගේ මරණය කරණකොටගෙන උදා කළ දෙවියන්වහන්සේ සමග සමගි කිරීමත්, පව් කමාවත් ගැන විශ්වාසය රඳවන්න. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ට සවන් දෙන්න. දිව්‍ය වරප්‍රසාදය සහ දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලැබීමේ සහතිකය ලබා දෙන්නට යේසුස්වහන්සේ මිනිස් බව ගත්සේක. ඔබට මුල සිටම ආදරය කළ තැනැන්වහන්සේට ප්‍රතිචාරය දක්වමින් පෙරළා උන්වහන්සේට ආදරය කරන්න." (Aubigne b. 2, Ch. 4). කරුණාවේ පණිවිඩකරුවා ලූතර්ට මෙසේ කරුණු ගෙන හැර දක්වූයේය. ඔහුගේ වචන ලූතර්ගේ හද පත්ලටම කිඳා බැස්සේය. ඔහු තිගැස්සීමට පත් විය. බොහෝ කාලයක් පුරා බදාගෙන සිටි වැරදි ආකල්ප අත්හැර දමා සත්‍යය පිළිගැනීමට ඔහුට මහත් සටනක යෙදීමට සිදු විය. අන්තිමේදී ලූතර් ජයග්‍රහණය කළේය. හිංසාවෙන් පීඩිතව සිටි ආත්මයට සමාදානය උදා විය.

පූජකයෙක් හැටියට ආලේප කරන ලද ලූතර්ට කුටියෙන් ඉවත්වී ආචාර්යවරයෙකු ලෙස විටන්බර්ග් විශ්ව විද්‍යාලයෙහි සේවය කිරීමට කැඳවනු ලැබීය. ශුද්ධ ලියවිලි ඒවායේ රචිත භාෂාවෙන්ම අධ්‍යයනය කිරීමට ඔහුට එහිදී භාග්‍යය උදා විය. ඔහු බයිබලයෙන් දේශනා කිරීමට පටන් ගත්තේය. ගීතාවලිය, ශුභාරංචි සහ යැවුම් පත්‍ර සාමාන්‍ය ජනතාවට තේරුම් ගත හැකි බසින් විස්තර කළ ඔහුට ශ්‍රාවකයෝ ඇහුම්කන් දුන්නේ ප්‍රීතියෙන් පිරීගිය හදවතිනි. ඔහුගේ මිතුරා මෙන්ම සරසවියේ දේව ධර්ම පීඨයෙහි අධිපතියා වූ ස්ටෝපිට්ස් ඔහුට ආරාධනයක් කළේ දේශනා කුඩුවට නැග දෙවියන්වහන්සේගේ වචන දෙව් මැදුරට පැමිණි අයට දේශනා කරන ලෙසටය. ඔහු මඳක් පසුබා සිටියේ ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ජනතාවට කථා කිරීමට තමා තුළ වටිනාකමක් නැතැයි ඔහු කල්පනා කළ නිසාය. අභ්‍යන්තරයෙහි වූ මහත් ගැටුමකින් පසුව හෙතෙම තම මිතුරන්ගේ ආයාචනයට කන් දුන්නේය. මිතුරන්ගේ ඉල්ලීමට ඔහු එකඟ විය. ඔහු දනටමත් ශුද්ධ ලියවිලි තුළ බලවත් වී සිටියේය. දෙවියන්-වහන්සේගේ ආනුභාව සම්පන්න කරුණා අනුග්‍රහය ඔහු මත ප්‍රබලව පතිත විය. ඔහුගේ කථා විලාශය ශ්‍රාවකයන්ගේ හද බැඳ ගත්තේය. ලූතර් විසින් සත්‍යතාවය ඉදිරිපත් කළ පැහැදිලි විලාශය සහ බලයද



නිසා සත්‍යතාව ඔවුන්ගේ හදවත් තුළට කිඳා බැස එහි තැන්පත් විය. සත්‍යතාව පිළිගෙන එය පිළිපැදීමට ශ්‍රාවකයන් තුළ ස්ථිර අදිටනක් විය. ඔහු තුළ තිබූ උනන්දුව බැතිමතුන්ගේ සිත් ගත්තේය.

ලූතර් තවමත් පාප් බලධර සභාවේ සැබෑ පුත්‍රයෙක් විය. රෝම සභාවේ අනුගාමිකයෙකුට වඩා වෙනස් ස්ථාවරයක පිහිටා සිටීමට ඔහු කිසිසේත්ම අදහස් නොකළේය. දෙවියන්වහන්සේගේ මගපෙන්වීම යටතේ රෝමයට යෑමට ඔහුට භාග්‍යය උදා විය. පා ගමනින් එහි යෑමට තීරණය කර ගත් ඔහු රාත්‍රී කාලයෙහි මාර්ගයෙහි වූ ආරාමයන්හි නවාතැන් ගත්තේය. ඉතාලියේ කන්‍යාරාමයකට පිවිසි ඔහු එහි තිබූ ධන සම්භාරයද, ශ්‍රී විභූතියද, සැප විහරණ ජීවිත රටාවද දකීමෙන් ඉමහත් පුදුමයට පත් විය. ඔවුන් ලද ආදායම් මගින් ධනකුවේර ජීවිත ගතකිරීමට ඔවුන්ට පුළුවන් විය. ඔවුහු අති සුඛෝපභෝගී නිවෙස්වල වාසය කළහ, අධික මිලැති සළු පිළි පැළඳ සිටියහ, රස මසවුලෙන් පිරි ආහාර අනුභව කළෝය. ආත්ම දමනයෙන් යුතුවද, කරදර මධ්‍යයේද තමා ගත කළ දිවි පැවැත්ම මෙම පැවිදි ජීවිත රටාව සමග සැසඳීමේදී ඔහු තුළ පැවතියේ දැඩි කළකිරීමකි. ඔහුගේ මනස ව්‍යාකූලතාවයෙන් පිරී ගියේය.

ලූතර්ගේ ගමනාන්තය වූ සත්ගිරි නුවර ඈතින් පෙනෙන්නට විය. භක්තියෙන් පිරී ගිය හැඟීමෙන් යුතුව ඔහු බිම දිගා වී ශුද්ධ නගරයට ආචාර කළේය. "අති ශුද්ධ ශ්‍රී රෝමය, මම ඔබට ප්‍රණාමය පුද කරමි"යි ඔහුගේ මුවින් පිට විය. ඔහු නගරයට ඇතුළු වී, එහි දෙව් මැදුරුවල නමස්කාර මෙහෙයනට සහභාගී වී, පූජකයන් සහ පැවිදි අයවළුන් දෙසූ පුදුමාකාර පුරසාරම්වලට ඇහුම්කන් දුන්නේය, කළ යුතු විවිධාකාර වතාවත් ඉටු කළේය. අවට සිසාරා බලත්ම ඇසින් දුටු දසුනින් ඔහුගේ සිත මවිතයට ද භීතියටද පත් විය. විවිධ තරාතිරම් දරූ පැවිදි පක්ෂයේ අය දුෂ්ටකම සහ අධමකම තුළ ඇලී ගැලී සිටින බව ඔහුට දකගත හැකි විය. පැවිද්දෝ අසභ්‍ය විහිළු තහළු තුළින් ප්‍රීතිවන අයුරු දුටු හෙතෙම ඔවුන්ගේ ධර්ම විරෝධී ක්‍රියා කලාපය ගැන ද්වේෂයෙන් යුතු කළකිරීමකට පත් විය. පැවිද්දන්ගේ මේ හැසිරීම ශුද්ධ ලෙස සලකන ලද ස්ථානයන්හිදී පැවතියේය. පූජක පක්ෂයේ අය සමග මෙන්ම පොදු ජනතාව සමගද ගැවසෙන්නාවූ අතර ඔහුට දකගැනීමට හැකිවුණේ දුරාචාරය නිසා අනර්ථයට පැමිණි සල්ලාල සමාජයකි. සෑමතැනම පැවතියේ දෙවියන්වහන්සේට නිගා දෙවන ක්‍රියාවන්ය. ඔහු මෙසේ තම සිතුවිලි ලිවීය. "රෝමයේ සිදුවන්නාවූ පාපිෂ්ට ක්‍රියා සහ ඇතැම් නොහික්මුණු ක්‍රියාදාමයන් විශාලය. විශ්වාස කරන්නට නම් එම ක්‍රියාවන් තම ඇසින්ම දැකිය යුතුය, තම කන්වලින්ම ඇසිය යුතුය. එහෙයින් ඒ ගැන මෙසේ පැවසිය හැකිය, එනම් නරකාදියක් තිබේ නම් රෝමය

ගොඩනගා ඇත්තේ එය මත බවය. සෑම ආකාරයකම පව් නික්මෙන්නාවූ ආගාධයක් ලෙස රෝමය හඳුන්වා දිය හැකිය." (D. Aubigne b 2. Ch. 6).

යේසු සමිඳාණෝ යෙරුසලමෙහි අධිකරණ ශාලාවේදී විත්ති-කරුවෙකු ලෙස පිලාත් ඉදිරිපිට පෙනී සිටිසේක. නඩු විභාගයෙන් පසුව උන්වහන්සේ උසාවියෙන් පිටතට පැමිණියේ, "පිලාත්ගේ පඩිපෙළ" ඔස්සේය. එම පඩිපෙළ යෙරුසලමෙහි සිට රෝමය වෙත හාස්කමකින් පැමිණ තිබුණේ යැයි රෝමානු සභාව ප්‍රචාරය කර තිබුණේය. හාස්කමින් යුතු මෙම "පූජා භාණ්ඩය" හා සම්බන්ධව කුසල් දානයක්ද නිර්දේශ කර තිබුණේය. යම් අයෙක් දණ මතින් එම පඩිපෙළ ඉහළට නගින්නේ නම් ඔහුට පව් කමාකිරීමක් හිමි වන බවට පාප් විසින් සහතිකයක් ලබා දී තිබිණ. එක්තරා දවසක මාටින් ලූතර් මහත් භක්තියකින් යුතුව එම පඩි පෙළ දිගේ නගිමින් සිටියේය. එසේ යන අතරමගදී ඔහුගේ සවනට මහත් හඬක් යොමු විය. "ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වෙයි" යන්න ඒ පණිවිඩය විය. (රෝම 1:17). දෙපයින් නැගී සිටි හෙතෙම ලජ්ජාවෙන් සහ භීතියෙන් යුතුව එම ස්ථානයෙන් පලා ගියේය. මෙම ශුද්ධවූ බයිබල් පාඨයේ බලපෑම කිසිම දවසක ඔහුගේ ජීවිතයෙන් ඉවත් නොවීය. ගැළවීම අත්පත් කරගැනීම සඳහා මිනිස් ක්‍රියාදාමයන් උපකාරයක් වන්නේය යන්න මිථ්‍යාවක් බව ඔහුට පැහැදිලි විය. ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය (කුසලතාවන්) මත නිරතුරුවම විශ්වාසය රැඳවීමේ අවශ්‍යතාව ගැන මෙනෙහි කිරීමේ පදනම ඔහුගේ සිතට පැහැදිලි විය. පාප් අධිකාරියේ මුළා කිරීම් සහ රැවටිලි පිළිබඳව ඔහුගේ දෙනෙත් විවෘත විය. එය තවත් කිසිම දවසක වැටී යාමට ඉඩක් නොවීය. ඔහු රෝමයෙන් සිය මුහුණ ඉවතට හරවා ගැනීමත් සමගම හදවතින්ම රෝමයෙන් ඉවත් වීමේ තීරණයද දැඩි විය. එතැන් පටන් ඔහු තුළ රෝමානු සමයෙන් ඉවත් වීමට ඇති අදහස පුළුල් වන්නට විය. ඔහු පාප් බලයේ සභාව සමග තිබූ සිය සබඳතා බිඳ දැම්මේය.

රෝමයෙන් ආපසු පැමිණි ලූතර් විටන්බර්ග් විශ්ව විද්‍යාලයට පැමිණ දේව ධර්මාචාර්ය පදවිය ලැබුවේය. තමා ඉතාමත්ම ඇලුම් කළ ශුද්ධ ලියවිල්ල කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කිරීමට දැන් ඔහුට නිදහස උදා විය. මෙහිදී ඔහු අධිෂ්ඨාන පූර්වක තීරණයකට එළඹී සිටියේ දෙවියන්වහන්සේගේ වචනය ප්‍රවේශමෙන් යුතුව අධ්‍යයනය කිරීමටත්, දේව වචනයට පක්ෂපාතීව එම වචනය දේශනා කිරීමටත්ය. තමාගේ ඉදිරි ජීවිත කාලය පුරා දේව වචනය, එසේය, දේව වචනයම මිස පාප්වරුන්ගේ ඉගැන්වීම් සහ දහම් ප්‍රකාශ නොකිරීමට ඔහු අධිෂ්ඨාන කර ගත්තේය. ඔහු තවදුරටත් තපස් පූජකයෙකු හෝ දේව ධර්ම ආචාර්යවරයෙකු නොවීය. ඔහු දේව වරම් ලැබූ ශුද්ධ වූ



බයිබලයේ සත්‍යතාවන් ප්‍රකාශ කරන්නාවූ පණිවිඩකරුවෙක් විය. බඩගින්නෙන් සහ පිපාසයෙන් සිටි දෙවියන්වහන්සේගේ රැළට පෝෂණය ලබා දීමේ කාර්ය භාරය සඳහා ඔහුට කැඳවීමක් ලැබී තිබුණේය. පාරිශුද්ධ වූ දේව වචනයෙහි පහස නොලැබූ කිසිම දහමකට කිතුණුවන් විසින් අනුගත නොවිය යුතු යැයි ඔහු තරයේ ප්‍රකාශ කළේය. මෙම ප්‍රකාශයන් පාප් බල අධිකාරියේ පදනමට මරු පහරක් විය. එම වචනවල ප්‍රතිසංස්කරණයේ උපරිම ප්‍රතිපත්ති අන්තර්ගත විය.

දේව වචනයේ ඉගැන්වීම්වලට ඉහළින් මිනිස් මතවාදයන් ඔසවා තැබීමෙහි අවදානම ලූතර්ගේ දර්ශන පථයට හසු වී තිබුණේය. අධ්‍යාපන වේදීන්ගේ විචාරාත්මක හෝ කල්පනික හෝ මිථ්‍යාචාර ඉගැන්වීම් වලට ඔහු අභීතව ප්‍රහාර එල්ල කළේය. මිනිසාගේ අධ්‍යාත්මය තුළ පාලන බලපෑමක් එල්ල කළ දර්ශනවාදී දේව ධර්ම ඉගැන්වීම්වලට හෙතෙම අභීතව විරුද්ධතා දැක්වීය. එවන් ඉගැන්වීම් කිසි වටිනාකමක් නැති විනාශකාරී ඒවා ලෙස ඔහු හෙළා දැක්කේය. දර්ශනවාදීන්ගේ සහ දේව ධර්ම ශූරීන්ගේ ව්‍යාජ තර්කවලින් ශ්‍රාවකයන්ගේ මනස් ඉවත හරවා දිවැසිවරුන් සහ අපොස්තුළුවරුන් ඉගැන්වූ සදාකාලික සත්‍යතාවන් වෙත බැතිමතුන්ව යොමු කිරීමට ඔහු ප්‍රබල වෑයමක් දැරුවේය.

මහත් අපේක්ෂාවෙන් යුතුව ලූතර්ගේ වදන් මත එල්බ සිටි ජනතාවට ඔහුගේ පණිවිඩ ඉතා අගනා මැණික් බඳු විය. මෙවන් ඉගැන්වීම් මින් පෙරාතුව ඔවුන්ගේ සවන්හි පතිත වී තිබුණේ නැත. ගැළවුම්-කාරයාණන්ගේ ආදරය සහ උන්වහන්සේගේ සමගි කිරීමේ රුධිරය කරණකොටගෙන දානය කරනු ලබන්නාවූ පාප සමාවෙහි සහතිකයත් උදාවන්නාවූ සමාදානයත් ශ්‍රාවකයන් තුළ අමරණීය බලාපොරොත්තුවක් පණ ගැන්වීමෙහි ලා හේතු විය. විටන්බර්ග්හි දල්වනු ලැබූ මෙම ආලෝකය පොළොවෙහි සතර දිග් භාගය පුරා ආලෝක රශ්මී දහරා විහිදුවාලීය. කාලාවසානය දක්වා එහි ආලෝකය තව තවත් දීප්තිමත්ව බැබළීම අපේක්ෂිතය.

කරුණු මෙසේ වුවද, ආලෝකය සහ අඳුර එක්ව පැවැතීමට නුපුළුවන. සත්‍යය සහ බොරුව අතර මැඩලිය නොහැකි ගැටුමක් පවතී. එක් පාර්ශ්වයක් ඔසවා තබමින් එය ආරක්ෂා කිරීම වනාහි අනෙක් පාර්ශ්වයට පහර දීම හා එය පරාජය කිරීමකි. "සමාදානය නොව කඩුවක් දෙන්ට" තමා පැමිණි සේකැයි (මතෙව් 10:34) අපගේ ගැළවුම්කාරයාණන්වහන්සේ පැවසූ සේක. ප්‍රතිසංස්කරණය ඇරඹී වසර කිහිපයකට පසුව ලූතර් මෙසේ පැවසීය. "දෙවියන්-වහන්සේ මා පාලනය කරනවා නොව, මා ඉදිරියට තල්ලු කරනවා.

මම මාගේම ක්‍රියාවන් පාලනය කරන්නා නොවෙමි. එක තැනක රැඳී සිටින්නට මම කැමතිය. එසේ වුවද කැරැළි සහ විප්ලව මධ්‍යයට මාව පමුණුවනු ලබන්නේය. (D’ Aubigne b. 5, Ch. 2). ගැටුම මැදට පැමිණීමට දෙවියන්වහන්සේම ඔහුව පොළඹවන ලදී.

දෙවියන්වහන්සේගේ කරුණා - අනුග්‍රහය වෙළඳ භාණ්ඩයක් කරගැනීමට රෝමානු සභාව මහත් පරිශ්‍රමයක යෙදී සිටියාය. ඇයගේ අල්තාර අසල මිල මාරු කරන්නන්ගේ මේස තබන ලදී. ගණු-දෙනුකරුවන්ගේ හඬින් වටපිටාව දෝංකාරය දෙන්නට විය. රෝමයේ ශාන්ත පේදුරුගේ දේවස්ථානය ගොඩනැගීම උදෙසා මුදල් රැස්කරන මුවාවෙන් පාප කමාව විකිණීමේ ක්‍රියාදාමය දෙව් මැදුරු තුළ සුලභ දර්ශනයක් විය. මෙය පාප්වරයාගේ නියමයෙන් කරන ලදී. අපරාධ සඳහා දෙන ලද මුදල් මගින් දේව නමස්කාරය සඳහා දෙව් මැදුරක් ඉදි කිරීම අදහස් කරන ලදී. එහි මුල් ගල යොදාගෙන තිබුණේ දුෂ්ටකමේ කුලියෙන්ය. බලය සහ යසස වැඩි කරගැනීමට රෝමයේ මෙම වෑයම ඇයගේ බලපරාක්‍රමයට සහ ශ්‍රේෂ්ඨත්වයට මරු පහරක් එල්ල කිරීමටද හේතු කාරක විය. මෙම අදූරදර්ශී වෑයම මගින් පාප් බල අධිකාරියේ සතුරෝ සටන් වැදීමට පුබුදුවනු ලැබූහ. එමගින් පාප්ගේ සිහසුන සෙලවූ සටනට මග පැදුණි. එය පාප්ගේ හිස මත රැඳි තට්ටු තුනකින් යුත් ඔටුන්න සෙලවීමකට පත් කළේය.

පාපය සඳහා කමාව විකිණීමට ජර්මනියේ නියෝජිතයා ලෙස ටෙට්සෙල් පත්කරනු ලැබීය. එහෙත් ඔහුට විරුද්ධව ඉතා දරුණු චෝදනා එල්ල වී තිබුණේය. සමාජයට විරුද්ධව ඉතා පහත් මට්ටමේ දුෂ්ට ක්‍රියා සිදුකිරීම් මෙන්ම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට එරෙහිව ක්‍රියා කිරීමේ වරදටද ඔහු වැරදි කරුවෙකු වී සිටියේය. එම අපරාධවලට දඬුවම් විඳීමෙන් බේරී ගත් හෙතෙම පාප්ගේ වාණිජ සහ අසම්මතවාදී කූට ව්‍යාපාරය ඉදිරියට කරගෙන යාම සඳහා පාප් විසින් සේවයේ යොදවා ගන්නා ලදී. ඔහු තම සාවද්‍ය ව්‍යාපෘතිය එළිපිටම කිසිම පැකිලීමකින් තොරව ඉතා සාර්ථකව කරගෙන ගියේය. නූගත්වූද ඇසූ පමණින් විශ්වාස කරන අන්ධ විශ්වාසය සහිතවූද ජනතාවක් මුලා කිරීමට ඔහු බොරු කථාන්තර උපකාර කර ගත්තේය. එම ජනතාවට දේව වචනය ගැන අවබෝධයක් තිබුණේ නම්, ඔවුහු එම ප්‍රලාප විශ්වාස නොකරනවා ඇත. පාප් බලධරයන්ගේ බලය සහ ධනය තර කරගැනීමේ ඒකායන පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීමේ අභිලාෂයෙන් බැතිමතුන්ව ඔවුන්ගේ පාලනය යටතේ රඳවා ගැනීම සඳහා බලධරයෝ ශුද්ධ බයිබලය ජනතාවගේ පරිහරණයෙන් ඈත් කර තැබූහ. (Gieseler, “Ecclesiastical History, “Period iv, Sec. 1, Para 5).



"දෙවියන්වහන්සේගේ කරුණා - අනුග්‍රහය සහ ශුද්ධ වූ පියවරුන්ගේ වරප්‍රසාදය මිනිසුන්ගේ දොරටු අසලටම පැමිණ ඇත"යි කියමින් පෙරමග දූතයෙක් ටෙට්සෙල් ඉදිරියෙන් මහත් උනන්දුවෙන් ගමන් ගත්තේය. (D’ Aubigne, bk 3, Ch 1). මෙම දේව අපහාසික පුද්ගලයා සෙනඟ අතරට පැමිණි කළ ඔහුව පිළිගන්නා ලද්දේ සගයේ සිට මිහිබට දෙවියන්වහන්සේම වශයෙනි. මුදලට පව් කමාව විකිණීමේ ක්‍රියාව දේවස්ථානය තුළම පිහිටුවන ලදී. දේශනා කූඩුවට නැග ගත් ටෙට්සෙල් මුදලට පව්කමාව විකිණීමේ යහගුණ වර්ණනාවක් ඉදිරිපත් කළේය. එය දෙවියන්වහන්සේගෙන් ලැබූ ඉතාම අගනා තිළිණය ලෙස කථිකයා එම දූෂිත ක්‍රියාව පැසසුමට ලක් කළේය. කමාව දානය කිරීමේ සහතික පත්, මුදල් දෙන්නන් හට තමා බෙදා දෙන බවට ඔහු සහතික විය. අනාගත දවසකදී කරනු ලබන්නාවූ පාපයකට එමගින් කමාව ලැබෙන බවත් ඔහු අවධාරණය කළේය. එවැනි ඉදිරි පව්වලට "පසුතැවීම පවා අවශ්‍ය නොවන බව" ඔහු පැවසුවේය. (D’ Aubigne b 3, Ch 1). ටෙට්සෙල් තවත් ආටෝපයක්ද එයට එකතු කළේය. තමාගෙන් ලබාගන්නාවූ පව් කමා සහතිකය වලංගු වන්නේ ජීවත් වන්නාවූ අයට පමණක් නොවන බවත් ගෙවීමක් කිරීමෙන් ශුද්ධ ගිනි ස්ථානයේ ඉන්නාවූ ආත්මවලට පවා එයින් ප්‍රතිලාභ ලැබෙන බවත් ඔහු උනන්දුවෙන් ශ්‍රාවකයන්ට පැවසීය. කැටයට දමන්නාවූ මුදල් එහි පතුලට වැටී එහි හඬ නිකුත් වීමත් සමගම මරණයට පත් අයගේ දුක් විඳින්නාවූ ආත්ම එයින් මිදී ස්වර්ගය බලා ගමන් අරඹන බවට ඔහු පුරසාරම් දෙඩුවේය. (Hangenbach, “History of the Reformation” Vol . 1, p. 96).

අපෝස්තුළුවරුන්ගේ දවස්වලදී මායාකාර සීමොන් නමැත්තා පේතෘස්ට මුදල් දී භාස්කම් කිරීමේ බලය තමාටත් ලබාදෙන ලෙස ඉල්ලීමක් කළේය. පේතෘස් ඔහුට මෙසේ උත්තර දුන්නේය. "දෙවියන්වහන්සේගේ දීමනාව මුදලට ගන්ට නුඹ සිතූ බැවින් නුඹේ මිල නුඹ සමග විනාශ වේවා" (ක්‍රියා 8:20). එසේ වුවද, ටෙට්සෙල්ගේ දීමනාව මහජනයා පිළිගත්තේ මහත් උද්‍යෝගයෙන්ය. දහස් ගණන් බැතිමතුන්ගේ රන් සහ රිදී කාසි ඔහුගේ භාණ්ඩාගාරයට ගලා ආවේය. ගැළවීම සඳහා පසුතැවීම, ඇදහිල්ල සහ පාපයට පිටුපා එයින් ජයගැනීම අවශ්‍ය වේ. එහෙත් මුදලට ලබාගත හැකි ව්‍යාජ ගැළවීම අත්පත් කරගැනීම ඉතා පහසු විය.

මුදලට පව් කමාව විකිණීමේ දහමට රෝමානු සභාවේ උගතුන් මෙන්ම භක්තිවන්ත අයද විරෝධතාව පල කළෝය. තර්ක බුද්ධියට මෙන්ම එළිදරව් කර ඇති දෙයට වඩා විරුද්ධ වූ පව් කමාව විකිණීම කෙරෙහි බොහෝ අයගේ විශ්වාසයක් තිබුණේ නැත. මෙම සාපරාධී වෙළෙඳ ගනුදෙනුවට විරුද්ධව කිසි පූජකයෙක් කිසිම

හඬක් හෝ නැගුවේ නැත. එසේ වුවද, පොදු ජනයාගේ සිත් සතන් අපහසුතාවට මෙන්ම කැලඹිල්ලකටද පත් වෙමින් තිබුණේය. දෙවියන්වහන්සේගේ සභාව පවිත්‍ර කිරීමට උන්වහන්සේ යම්කිසි මාධ්‍යයක් මගින් ක්‍රියාත්මක වන්නේ නැද්දැයි බොහෝ අය ප්‍රශ්න කරන්නට වූහ.

ලූතර් තවමත් සෘජු පාප් පක්ෂපාතී බැතිමතෙක් වුවද පව් කමාව මුදලට අලෙවි කරන වෙළෙඳුන්ගේ දේව විරෝධී ප්‍රකාශන පිළිබඳව හෙතෙම තැති ගත්තේය, සංත්‍රාසයට පත් විය. ඔහු සේවය කළ දේවස්ථානයේ සාමාජිකයන් බොහෝ දෙනෙක් පව් කමාව ලබාදෙන සහතිකපත් මිලදී ගෙන තිබුණේය. මෙවන් අය දේවගැති තුමා ඉදිරියට පැමිණ තමන් කළ පව් උච්චාරණය කරමින් තම පව්වලින් ඔවුන්ව නිදොස් කර නිදහස් කරන්නැයි බලකර සිටියහ. ඔවුන් තුළ පසුතැවීමක් හෝ එයින් ඉවත්වීමේ අභිප්‍රායක් හෝ නොවීය. පාපයේ වරදින් ඔවුන් නිදොස් කිරීම ඉල්ලා සිටියේ මිලදී ගත් පව් කමා සහතිකය මතය. ඔවුන්ව පවින් නිදහස් කිරීම ලූතර් ප්‍රතික්ෂේප කළේය. එම පව්කරුවන් තම පාප ගැන පසුතැවිලි නොවී ඔවුන්ගේ ජීවිත වෙනස් කරගන්නේ නැතිනම් ඔවුන් සිය පාප තුළ විනාශ වන බව ලූතර් අවධාරණය කළේය. මෙම බැතිමත්හු ආපසු ටෙට්සෙල් වෙත යමින් ඔහු නිකුත් කළ සහතික පත් පදනම්ව තමා සිදු කළ පාපවලින් තමාව නිදොස් කරන්නැයි තම පූජකයාගෙන් ඉල්ලා සිටි බවත් ඔහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බවත් පැමිණිලි කළහ. එම කණ්ඩායමේ සමහරෙක් තම මුදල් ආපසු ලබා දෙන්නැයි බලකර සිටියහ. මෙවදන් ඇසීමෙන් ටෙට්සෙල් කෝපාවිෂ්ඨ වී ශාප කරන්නට පටන් ගත්තේය. පණ පිටින් මිනිසුන් පුළුස්සා දැමීම සඳහා සෑම හංදියක් ගානේම ගින්නෙන් පුච්චා දමන ස්ථාන ඉදි කරමින් "තමාගේ පව් කමාව විකිණීමේ ශුද්ධ වූ ව්‍යාපෘතියට යම් ආකාරයකින් හෝ විරුද්ධ වන යමෙකු සිටී නම් එවන් අය ප්‍රසිද්ධියේ ගිනිබත් කිරීමට තමාට පාප්ගෙන් නීත්‍යානුකූල අණකරයක් ලැබී ඇතැයි" ද හෙතෙම පුරසාරම් දෙඩුවේය. (D. Aubigne, b. 3, Ch. 4).

සත්‍යතාව අභීතව ප්‍රකාශ කිරීමේ වීරයෙකු ලෙස ලූතර් දැන් තම වැඩකටයුතු ආරම්භ කළේය. උදාවී ඇති අනතුරුදායක තත්ත්වය ගැන අනතුරු ඇඟවීමේ ඔහුගේ හඬ දේශනා කූඩු වෙතින් ගුවන් තලය දෝංකාරය දෙවීය. දෙවියන්වහන්සේගේ අනාදරයට සහ ද්වේෂයට හේතුකාරක වන්නාවූ පාපයෙහි සොබාව ඔහු බැතිමතුන් ඉදිරියෙහි පැහැදිලි කර දුන්නේය. තම තමන්ගේ ක්‍රියාදාමයන් මගින් එම දඬුවම ලිහිල් කරගැනීමට හෝ ඉරණම වෙනස් කරගැනීමට හෝ හැකියාවක් නැතැයි ලූතර් ජනතාවට ඉගැන්වීය. පසුතැවීමෙන් යුතුව දෙවියන්වහන්සේ කරා පැමිණ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල රැඳවීමෙන් පමණක් මිස පව්කාරයාට ගැළවීමක් නැති බව ඔහු



පෙන්වා දුන්නේය. දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය මිලදී ගත නොහැකිය, එය නොමිලයේ ලැබෙන්නාවූ තිළිණයකි. පව් කමාව මිලේට ගන්න එපා යැයි ඔහු අනුශාසනා කළේය. ඒ වෙනුවට පව් කමාව සඳහා කුරුසිපත් මිදුම්කාරයාණන් දෙස බැලීමට ඔහු බැතිමතුන් උනන්දු කළේය. ගැළවීම ලබාගැනීම සඳහා බයාදුකමින්ද තමාටම දඬුවම් පමුණුවා ගැනීමෙන්ද කර්කශ දිවි පැවැත්මක් ගෙවමින් ගැළවීම සොයමින් තමා නිරර්ථකයේ වෙහෙස වූ අයුරු ද ඔහු නිදසුනක් ලෙස ඉදිරිපත් කළේය. තමාට සාමය සහ ප්‍රීතිය උදා වුණේ තමාගෙන් අවධානය ඉවත් කර ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාස කිරීමෙන් පමණක් බව ඔහු ශ්‍රාවකයන්ට පැහැදිලි කළේය.

ශ්‍රද්ධාවක් නැති ව්‍යාජ මවාපෑම් ඉදිරිපත් කරමින් ටෙට්සෙල් ස්වකීය වෙළඳාම නොනවත්වාම කරගෙන ගියේය. මහත් හඬින් කරන්නාවූ ඔහුගේ වංචාකාරී කථා නවතා දැමීමට වඩාත් කාර්යක්ෂම ක්‍රමයක් කෙරෙහි ලූතර්ගේ අවධානය යොමු විය. ඒ සඳහා කදිම අවස්ථාවක් වැඩිකල් නොගොස් උදා විය. විටන්බර්ග්හි පිහිටි මාළිගාවේ දෙව් මැදුරේ ශුද්ධ ධාතු ප්‍රදර්ශන යම් යම් කාලවලදී පැවැත්විණ. එම ශුද්ධ දවස්වලදී ද එම දෙව් මැදුරට පැමිණ පාප උච්චාරණය කළ සැමට සම්පූර්ණ පාප කමාව දානය කරන ලදී. පව් කමාව ලබාගැනීමේ අභිප්‍රායෙන් විශාල සමූහයක් දේවස්ථානය වෙත ඇදී ඒම සාමාන්‍ය සිරිතක් විය. "සියලු සාන්තුවරයන්ගේ මංගල්‍යය" එකී ධාතු ප්‍රදර්ශන උත්සවයන්හි ප්‍රධාන තැනක් දැරීය. මෙම මංගල්‍යය මෑත දිනක පැවැත්වීමට නියමිතව තිබුණේය. මංගල්‍යයට සහභාගී වීම සඳහා බැතිමත්හු කලින් දිනයේ සිට දේවස්ථාන භූමි භාගය කරා පැමිණෙමින් සිටියාහුය. එවන් කණ්ඩායමක් සමග එක් වූ මාටින් ලූතර් බැතිමතාද දේවස්ථානය කරා ඇදුණේය. දේවස්ථානය වෙත ළඟා වූ හෙතෙම එහි දොරටුව වෙත සමීප විය. කලින් පිළියෙල කර තිබූ ලියවිල්ලක් අතට ගත් ඔහු එය දොර මත තබා ඇණ ගැසුවේය. එහි සටහන් වූයේ පාප කමාව විකිණීමට එරෙහිව වූ වගන්ති අනූ පහකි. එම විෂය පිළිබඳව විකල්ප යෝජනා ඔහුගේ විරුද්ධතා ප්‍රකාශනයෙහි අඩංගු විය. ඉදිරිපත් කළ විකල්ප යෝජනා-වන්ට එරෙහිව කවරෙකු හෝ හඬක් නගන්නේ නම් තම යෝජනා රැකගැනීමට තමා විවාදයකට එළඹීමට සූදානම් බව ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. එය පසුදින විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය හැකි බවද ඔහු කියා සිටියේය.

ඔහුගේ යෝජනාවන් මුළු ලෝකයේම මනුෂ්‍යයන්ගේ අවධානයට භාජන විය. බොහෝ අය ඔහුගේ යෝජනා නැවත නැවතත් කියෙව්වෝය, ඔවුනොවුන්ට ඒ ගැන පැවසුවෝය. විශ්ව විද්‍යාලයේදී මෙන්ම මුළු නගරයේම ජනතාව තුළද කැළඹීමක් පැතිර ගියේය. ලූතර්ගේ යෝජනාවලියෙහි ගැබ් වී තිබූ ප්‍රධානතම තර්කය වූයේ

පාපයට කමාව දීමටත් එහි දඬුවම ඉවතලෑමටත් පාප්ට හෝ කිසිම අයෙකුට හෝ කිසිම දවසක කිසිම බලයක් ලබා දී නැති බවයි. කමාව දානය කිරීමේ සැලැස්ම සම්පූර්ණ මුළා කිරීමකි. මිනිසුන්ගේ මිථ්‍යා ඇදහිලි මතභේදයන් ප්‍රයෝජනයට ගනිමින් සැකසූ එම සැලැස්ම මුදල් උපයා ගැනීම සඳහා වූ ප්‍රයෝගයකි. එකී ව්‍යාපෘතිය මගින් පොරොන්දු වන්නාවූ ප්‍රතිපාදන හෝ ලාභ ප්‍රයෝජන විශ්වාස කිරීම වනාහි මිනිසුන් නරකාදියට තීන්දු කිරීමට වූ සාතන්ගේ උප්පරවැට්යකි. සභාවට දානය කර ඇති උපරිම සම්පත වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වන්නේය. එය ඉතා පැහැදිලිය. එයින් එළිදරව් වන්නාවූ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය පසුතැවිල්ලෙන් සහ ඇදහිල්ලෙන් ඉල්ලන්නාවූ සැමට නොමිලයේ ලැබෙන්නේය යන සත්‍යයන් එමගින් පැහැදිලි කරන ලදී.

ලූතර්ගේ ලියවිල්ල සාකච්ඡාව සඳහා අභියෝගයක් එල්ල කළේය. එහෙත් කිසිවෙක් එකී අභියෝගය පිළිගත්තේ නැත. ඔහුගේ යෝජිත ප්‍රශ්න මාලාව දවස් කිහිපයක් ඇතුළත ජර්මනිය පුරා ප්‍රචලිත විය. එසේම, සති කිහිපයක් ඇතුළත එම ලියවිලිවල අන්තර්ගතය කිතුණු ලෝකය පුරා පැතිර ගියේය. සභාව තුළ පවතින්නාවූ දුෂ්ටවූ ද, අධමවූ ද බලවත් අපරාධ ගැන සොවින් ළතැවෙමින් සිටි භක්තිමත් රෝමානුවෝ ලූතර්ගේ මේ ලියවිල්ල ගැන ඇසූහ, එය දුටුවෝය. වර්ධනය වන්නාවූ අපරාධ නවතා දමන්නේ කෙසේදැයි ඔවුහු සෝ සයුරේ ගිලෙමින් බලා සිටියහ. එම ලියවිල්ල වනාහි දෙවියන්-වහන්සේගේ හඬ ලෙස ඔවුහු පිළිගත්හ. රෝමානු සභාවේ පාදර්ශක ප්‍රදේශයේ මූලස්ථානයේ සිට නික්ම එන්නාවූ වර්ධනය වෙමින් පැවැති දූෂණ රැල්ල මර්දනය කිරීමට දෙව් සමිඳාණන් ස්වකීය ශ්‍රී හස්තය ක්‍රියාත්මක කර ඇති බව ලතවෙමින් සිටි බැතිමත්හු දැක ගත්තෝය. පාප්ගේ අනුමැතියෙන් යුතුව නිකුත් වන්නාවූ නියෝගයක් සම්බන්ධව විරුද්ධ මතයක් ප්‍රකාශ කිරීමෙන් අගතියක් සිදු වී ඇතැයිද කියමින් එවන් නියෝගයක් සම්බන්ධව විරුද්ධ මතයක් ප්‍රකාශ කිරීමේ අයිතියක් කිසිවෙකු හට හෝ නැතැයිද කියමින් හඬක් නැග ආවේය. එවන් නියෝගයක් සම්බන්ධව ආයාචනයක් ඉදිරිපත් කිරීමට හෝ ඉඩක් නොවීය. ලූතර් විසින් එම මුක්තිය බිඳ දමමින් අභියෝග කිරීම පිළිබඳව නීති බලධරයන් මෙන්ම රාජ්‍යයේ කුමාරවරුද රහසිගතව ප්‍රීතියට පත්වූහ.

මේ අතර පාපයට ගැතිකම් දක්වූද මිථ්‍යා ඉගැන්වීම් දොහොත් මුදුන් දී පිළිගත්තාවූද අය, පාපය ගැන තමන්ගේ සිත් තුළ තිබූ බිය දුරුකොට, තමන්ගේ සිත් සතන් සැනසූ ව්‍යාජ ඉගැන්වීම්වලට තර්ජනයක් එල්ල වීම ගැන මහත් සේ භීතියට පත් වූහ. එසේම රෝමානු පූජක පක්ෂයද මහත් සේ තැති ගත්තෝය. අපරාධවලට සහාය සැලසීමේ ක්‍රියාදාමයට එරෙහිව හඬක් නැගීමට පටන් ගත් නිසාද, තමන්ගේ ආදායම් මාර්ග අහිමි වී යාමේ තර්ජනයක් ආරම්භ වී ඇති නිසාද කම්පනයට පත් කපටි පැවිද්දෝ තමන්ගේ බොරු ක්‍රියාවේදය රැකගැනීමට එක්ව ක්‍රියා කිරීමට සැරසුණෝය. මේ ප්‍රතිසංස්කරණවාදියාට එරෙහිව දැඩි ක්‍රියා පිළිවෙතක් දියත් කිරීමට ඔවුහු එක හඬින් සැදී පැහැදී සිටියෝය. වියරුව සිටි පැවිද්දන්ගේ දැඩි කෝපාවිෂ්ට චෝදනාවලට මුහුණ දීමට ලූතර්ට සිදුවිය. ඔහුට විරුද්ධව විවිධ ආකාරයේ චෝදනා එල්ල වන්නට විය. ඔහු අපරීක්ෂාකාරීව කඩිමුඩියේ ක්‍රියා කළේ යැයි සමහර අය ඔහුට දොස් පැවරූහ. අයුතු ප්‍රයෝජන ලැබීමේ අරමුණින් ඔහු ක්‍රියා කර ඇතැයිද දෙවියන්වහන්සේ ඔහුට එසේ කරන්න යැයි මගපෙන්වීමක් ලබා දුන්නේ නැතැයිද චෝදනාවන් එල්ල විය. ඔහු ක්‍රියා කරන්නේ උඩඟුකමින් සහ ප්‍රතිරූපය වර්ධනය කරගැනීමේ අදිටනින් යැයි වෙනත් අය දොස් පැවරූහ. චෝදනා එකින් එක එල්ල වූ අතර ඔහුගේ ප්‍රතිචාරය මෙසේ විය. "කිසිම මනුෂ්‍යයෙක් අලුත් අදහසක් ඉදිරිපත් කිරීමේදී යම්කිසි ආකාරයක අභිමානයක හෝ ආඩම්බරයක පෙනුමකින් තොරව එසේ කරන්නේ නැති බව නොදන්නේ කවරෙක්ද? ඉදිරිපත් කරන්නාවූ අලුත් අදහස් නිසා කැළඹීම්, අඬදබර හටගන්නේ නැතැයි කවරෙකුට කිව හැකිද? ... ක්‍රිස්තුස්වහන්සේ සහ අනෙකුත් වේද සාක්ෂිකරුවන් මරා දමන ලද්දේ මක්නිසාද? එකී කාලයාගේ ප්‍රඥාව එපා කරන්නාවූ උදාරමින් යුත් මනුෂ්‍යයන් හැටියට ඔවුන් සලකනු ලැබූ නිසාය. ආදිකාලීන මත ඉදිරිපත් කළ දූරදර්ශී නැණවතුන්ගේ උපදෙස් නිහතමානීව අනුගමනය නොකර අලුත් අදහස් ඉදිරිපත් කිරීම නිසා ඔවුහු ප්‍රතික්ෂේප කරනු ලැබූහ." (D’ Aubigne, b 3, Ch. 6).

නැවත වරක් ලූතර් මෙසේ කීවේය. "මා ඉටු කරන්නාවූ යම් දෙයක් වේද, එය කරනු ලබන්නේ මිනිසුන්ගේ නුවණක්කාර පෙළඹවීම් මත නොවේ. යමක් ඉටු කෙරේද, එය දෙවියන්වහන්සේගේ අනුශාසනාවට අනුව සිදුවේ. එකී කර්තව්‍යය දෙවියන්වහන්සේගේ මගපෙන්වීම මත සිදුවේ නම්, එය නවතා දැමීමට කවරෙකුට පුළුවන්ද? එසේ නොවන්නේ නම් එවැන්නක් ඉදිරියට ගෙන යාමට හැක්කේ කාටද? මාගේ කැමැත්ත හෝ ඔවුන්ගේ කැමැත්ත හෝ අපගේ කැමැත්ත හෝ සභාවේ කැමැත්ත හෝ නොව, සගයේ වැඩ සිටින්නාවූ ශුද්ධවූ පියාණන්වහන්ස ඔබවහන්සේගේම කැමැත්ත ඉටු වේවා!" (D. Aubigne, b. 3, Ch. 6).

ලූතර්ගේ කාර්යය ආරම්භ කිරීමට දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ පෙළඹවීම ක්‍රියාත්මක වූ නමුත් එම කාර්යය ඉදිරියට ගෙන යෑමේදී විවිධාකාර ගැටුම් ඇති නොවීම අදහස් කරනු ලැබුවේ නැත. සතුරෝ ඔහුගේ හඬ යටපත් කිරීමට පසු නොබා ක්‍රියා කළෝය. ඔවුහු ඔහුට නින්දාත්මක ලෙස දෝෂාරෝපණය

කළෝය, ඔහුගේ අරමුණු විකෘති කොට දක්වූහ, ඔහුගේ චරිතයට මඩ පහර එල්ල කළෝය, ඔහුගේ ක්‍රියාදාමය අවලාදයට ලක් කළෝය. වාග් දොරටුවක් විවෘත කළාක් මෙන් සෑම පැත්තකින්ම විවිධ ආකාරයේ තර්ජන සහ ගර්ජන ඔහුට එරෙහිව ක්‍රියාත්මක විය. එමගින් ඔහුට දැඩි පීඩනයක් එල්ල නොවූයේද නොවේ. ඔහු පසුබෑමකට ලක් නොවූයේ ද නොවේ. තමාගේ පුනරුදයේ කර්තව්‍යයට ජන නායකයන් මෙන්ම සභාවේ සහ විද්‍යාලයේ නායක තනතුරු හෙබි පුද්ගලයන්ද සහයෝගය දෙනවා ඇතැයි ඔහු තුළ විශ්වාසයක් විය. ඔහු මෙතෙක් ඉටු කර ඇති කාර්යයන් පිළිබඳව ඉහළ තනතුරු දරූ නායකයන් ලබා දුන් දිරිගැන්වීම් නිසා ඔහු තුළ ප්‍රීතිය සහ බලාපොරොත්තුව ඇති විය. සභාව කෙරේ දීප්තිමත් දවසක් උදා වන බවට ඔහු තුළ ඉතා දැඩි විශ්වාසයක් තිබුණේය. එහෙත්, ක්‍රියා කරමින් තිබූ දිරිගැන්වීම් සියල්ලක්ම පාහේ දොස් පැවරීම් සහ අවලාද බවට වෙනස් වන්නට විය. සභාවේ සහ රජයේ උසස් නිලධාරීහු ඔහු ඉදිරිපත් කර තිබූ විකල්ප යෝජනා සත්‍යය බව පිළිගත්හ. එහෙත් මේ අලුත් සත්‍යතා පිළිගැනීම කරණකොටගෙන විශාල වෙනස්කම් සිදුවිය යුතු බව ඔවුන්ට පෙනී ගියේය. ජනතාව දැනුවත් කර ඔවුන් තුළ ප්‍රතිසංස්කරණයක් උදාකිරීම යනු රෝමයේ බල ආධිපත්‍යය සැහැල්ලු කිරීමක් බව නායකයෝ දුටුවෝය. එමගින් සභාවේ භාණ්ඩාගාරය වෙත ගලා එන්නාවූ මහත් ධන සම්භාරයක් නවතිනවා ඇත. එසේම පාප් නායකයන්ගේ අති සුඛෝපභෝගී සහ අධික වියදම් සහිත ජීවිත රටාවටද එල්ල වන්නේ මරු ප්‍රහාරයකි. ගැළවීම ලබාගැනීම උදෙසා ක්‍රිස්තු සමිඳාණන් කෙරෙහි පමණක් විශ්වාසය රැඳවීමට වූ ඉගැන්වීම මගින් ජනතාවට උදාවන්නාවූ සිතීමේ සහ ක්‍රියා කිරීමේ නිදහස කරණකොටගෙන පාප්ගේ සිහසුන බිඳ වැටෙනවා ඒකාන්තය. අන්තිමේදී ඔවුන්ගේ බල අධිකාරියද විනාශ වී යනවා ඒකාන්තය. මේ හේතුවෙන් ඔවුහු දෙවියන්වහන්සේ විසින් එවන ලද දැනගැන්ම එපා කරමින් ජනතාවට දැනුම් නවෝදයක් උදාකර දීමට දෙවියන්වහන්සේ එවූ මනුෂ්‍යයාව ප්‍රතික්ෂේප කරමින් ක්‍රිස්තුස්වහන්සේටත්, සත්‍යතාවටත් විරුද්ධව ක්‍රියා කළෝය.

තමා දෙසම බැලූ ලූතර් භයෙන් සැලෙන්නට විය. තනි පුද්ගලයෙකු වූ තමාට එරෙහිව පොළොවේ දැවැන්ත බලවේගයන් එක්වී ක්‍රියාකිරීම ඔහුට භීතිය ගෙන දෙවන්නක් විය. සභාවේ බල අධිකාරිත්වයට විරුද්ධව නැගී සිටීමට ඇත්තටම දෙවියන්වහන්සේ තමාට මගපෙන්වූ සේක්දැයි ඔහු සමහර අවස්ථාවන්හිදී අනුමාන කළේය. ඔහු මෙසේ ලිවීය. "රජවරු මෙන්ම සමස්ථ ලෝකයාම පාප් ඉදිරියෙහි භීතියෙන් මුසපත් වන්නාහ. එවන් පුද්ගලයෙකුගේ බල පරාක්‍රමයට එරෙහිව නැගී සිටීමට තරම් මා කවරෙක්ද? .... මෙම මුල් අවුරුදු දෙක තුළදී මා සිතින් කෙතරම් දුක් කන්දරාවක් වින්දා දැයි කිසිවෙක් දන්නේ



නැහැ. බලාපොරොත්තු සියල්ල සුන්වී කලකිරීමේ ආගාධයේ කෙතරම් ගැඹුරට මා කිඳා ගියේදැයි දන්නේ මා පමණක්ය. (D. Aubigne, b. 3, Ch. 6). චිත්ත ධෛර්යය සහමුලින්ම බිඳ වැටීමට ඉඩහැරීම ඔහුගේ ඉරණම නොවීය. මිනිස් උපකාර අහිමි වී ගිය කල්හි ඔහු දෙවියන්වහන්සේ දෙස පමණක් බලමින් එම සර්ව බලධාරී ශ්‍රී හස්තය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය රැඳවීමට හැකි බව ඒත්තු ගත්තේය.

ප්‍රතිසංස්කරණයේ මිතුරෙකුට ඔහු මෙසේ ලීවේය. "ශුද්ධ ලියවිල්ල තේරුම් ගැනීම අපගේ ඉගෙනීමෙන් සහ බුද්ධියෙන් කරගන්නට බැහැ. අප විසින් මුලින්ම කළ යුත්තේ යාච්ඤා කිරීමයි. උන්වහන්සේගේ වචනය තුළ ගැබ් වී ඇති සත්‍යය වූ යථාර්ථය අවබෝධ කරගැනීමට උන්වහන්සේගේ මහත් දයා-කරුණාව ඉල්ලා දෙවි සමිඳාණන්ට යාච්ඤා කරන්න. දේව වචනයේ කතුවරයාණන්ට වඩා හොඳින් එම වචනය තේරුම් කරදීමට වෙනත් කිසිවෙකුටවත් පුළුවන්කමක් නැහැ. ඔබට ඉගෙන ගැනීමට හැකිවන්නේ දෙවියන්වහන්සේගෙන්ම පමණක්ය. ඔබගේම වෑයමෙන්වත් ඔබගේ අදහස් මගින්වත් සාර්ථකයක් බලාපොරොත්තු වන්න එපා. දෙවියන්වහන්සේ තුළ පමණක් සම්පූර්ණ-යෙන්ම විශ්වාසය රඳවන්න. අත්දැකීමක් ඇති මිනිසෙකු කියන්නාවූ මේ වදන් කෙරෙහි විශ්වාස කරන්න." (D. Aubigne, b. 3, Ch. 7). මේ කාලය උදෙසා දෙවා වදාරා ඇති ගැඹුරු සත්‍යතාවන් අනෙකුත් අයට ඉදිරිපත් කිරීමට කැඳවා ඇති සැමට ඉතා වැදගත් වූ පාඩමක් ලෙස මෙම කරුණ තුළ පිහිටීම අගනේය. මෙම සත්‍යය වූ දහම් නිසා සාතන් කැළඹීමට පත් වේ. ඔහු නිර්මාණය කළ මති මතාන්තර ඇලුම් කරන්නාවූ අයද සසල වේ. නපුරෙහි බලවේගයන් සමග කරන්නාවූ සටනෙහිදී මිනිස් ප්‍රඥාවට සහ බුද්ධිමත් භාවයේ ශක්තියට වඩා වැඩි යමක් අවශ්‍යය.

ලූතර්ගේ සතුරෝ ඉගැන්වීම් පිළිබඳව සම්ප්‍රදායන් සහ සිරිත් විරිත් කෙරේ ද පාප්ගේ අධිකාරී බලය සහ ඔහුගේ ප්‍රකාශන කෙරෙහි ද අවධානය යොමු කළ විට ඔවුන්ට පිළිතුරු දීමට ලූතර් බයිබලය සහ බයිබලය තුළ පමණක් පිහිටා සිටියේය. ලූතර්ගේ තර්කවලට පිළිතුරු දීමට සතුරන්ට නොහැකි විය. මිසදෙටු අදහස් දරූ බාහිර චාරිත්‍ර වාරිත්‍ර පමණක් ගරු කළ ලූතර්ගේ සතුරෝ ඔහුගේ රුධිරය ඉල්ලා උද්ඝෝෂණය කිරීමට පටන් ගත්හ. ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී රුධිරය ඉල්ලා කෑගැසූ යුදෙව්වන් මෙන් ලූතර්ගේ සතුරෝද ක්‍රියා කළෝය. "ඔහු ආගම් විරෝධියෙක්" මේ පුද්ගලයා ආගමික ද්‍රෝහියෙක්. මෙවන් තැනැත්තෙකු හට තව එක් පැයක්වත් ජීවත් වීමට ඉඩහැරීම ආගමට විරුද්ධව කරන මහා අපරාධයක්, ඔහු උදෙසා පෝරකයක් ඉදිකිරීම වහා කළ යුතුය."යි රෝමානු ආගමික අන්තවාදීහු කෑගැසූහ.

(D' Aubigne, b 3, Ch. 9). එසේ වුවද, ඔවුන්ගේ සැලසුම් මගින් ලූතර් ජීවිතක්ෂයට පත්වීමට ඉඩදීමට වඩා ඔහුගෙන් ගත යුතු වැඩක් දෙවියන්වහන්සේට තිබුණේය. ඔහුව ආරක්ෂා කිරීමට සගයේ සිට දූතයන් එවනු ලැබූහ. එසේ වුවද, ලූතර්ගෙන් වටිනා ආලෝකය ලැබූ බොහෝ අය සාතන්ගේ උදහසට පාත්‍ර වූහ. ඔවුහු සත්‍යතාව වෙනුවෙන් අභීතව වධ වේදනාවට මුහුණ දුන්නෝය, හිංසා පීඩාවනට ගොදුරු වූහ, මරණයට පවා යටත් වූහ.

ජර්මනියේ සිටි විද්වතුන්ගේ මනස් ලූතර්ගේ ඉගැන්වීම්වලින් ප්‍රබෝධයක් ලැබීය. ඔහුගේ දෙසුම්වලින් සහ ලියවිලිවලින් විහිදී ගිය ආලෝක දහරා මගින් දහස් ගණන් බැතිමතුන් ආත්මික නවෝදයක් ලැබූහ, ආත්මික පිබිදීමක් ලැබූහ, සභාව තුළ පැවැති ග්‍රහණයට හසුව සිටි අය තුළ ජීවමාන ඇදහිල්ලක් උදා වෙමින් පැවැතියේය. රෝමානු සභාවේ මිථ්‍යා ඉගැන්වීම් කෙරෙහි බැතිමතුන්ගේ තිබූ විශ්වාසයද දිනෙන් දින ක්ෂය වන්නට විය, හිඳී යන්නට විය. සභාව කෙරෙහි වූ පක්ෂපාතිකම් දෙදරන්නට පටන් ගත්තේය. තමන් ඉගැන්වූ දහම් සහ ඇදහිලි ක්‍රම සියල්ලක්ම දේව වචනය මත පදනම්ව පිහිටා තිබූ බව ලූතර් නොබියව ප්‍රකාශ කළේය. එකී දේව වචනය දෙමුවහත් කඩුවක් ලෙසින් බැතිමතුන්ගේ හදවත් පසාරු කළේය. ආත්මික වර්ධනයක් ඉල්ලා සෑම පසෙකින්ම පිබිදීමක් ඇති විය. යුග ගණනාවක් පුරා නොපැවති ආකාර දැහැමිතාව උදෙසා වූ සාපිපාසාවක් සෑම පසෙකින්ම උදා වී පැවතියේය. මෙතෙක් කලක් බැතිමතුන්ගේ දෑස් යොමු වී තිබුණේ මිනිස් ක්‍රියාකාරකම් සහ භූමික මැදිහත්කරුවන් දෙසටය. දැන් එම දෑස් ක්‍රිස්තුස්වහන්සේ දෙසට පසුතැවිල්ලෙන් යුතුව යොමු වන්නට විය, කුරුසිපත් තැනැන්වහන්සේ දෙසට ඇදහිල්ලෙන් යොමු වන්නට විය.

ආත්මික පිබිදීමක් මෙයාකාරයෙන් ව්‍යාප්ත වීමත් සමගම රෝමානු ආගමික බලධරයන්ගේ බිය හඬ තවත් වර්ධනය විය. ආගම් විරෝධී ක්‍රියාවේදයන් වෙනුවෙන් නිදහසට කරුණු කීමට ලූතර්ට රෝමයට පැමිණෙන ලෙස අණඬුවක් නිකුත් විය. ලූතර්ගේ මිත්‍රයෝ මෙම අණඬුව නිසා භීතියට පත් වූහ. රෝමයට යාමේ අවදානම ඔවුහු හොඳාකාරව දන සිටියහ. එම දූෂිත නගරය යේසුස්වහන්සේගේ වේදසාක්ෂිකරුවන්ගේද රුධිරයෙන් මත් වී සිටියාය. ලූතර් රෝමයට යනවාට ඔවුහු විරුද්ධත්වය ප්‍රකාශ කළෝය. ඔහු ගැන වූ විනය පරීක්ෂණය ජර්මනියේ පවත්වන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

මෙම ඉල්ලීම එල දැරුවේය. විභාගය සඳහා පාප්ගේ තානාපති-වරයෙකු පත් කරන ලදී. පාප් විසින් මෙම තානාපතිවරයාට එවනු ලැබූ උපදෙස්හි සඳහන්ව තිබුණේ ලූතර්ව දැනටමත් ආගම් ද්‍රෝහියෙකු ලෙස තීන්දු කර ඇති බවය. එම නිසා "චෝදනාවට වරදකරු



කොට, නිදහසට කරුණු නොවිමසාම ඔහුව දඬුවමට යටත් කරන ලෙස" තානාපතිවරයාට විධාන කර තිබුණේය. ලූතර් මෙසේ යටත් වන්නේ නැතිනම්, ඔහුව පාලනය කිරීමට නුපුළුවන් නම් ලූතර්ව "වරදකරුවෙකු ලෙස ප්‍රකාශයට පත්කොට, ඔහුට ජර්මනියේ කිසිම තැනක රැඳී සිටීම තහනම් කර "ලූතර් සමග" සම්බන්ධකම් පැවැත්වූ සියල්ලන්ම දේවස්ථානයෙන් නෙරපා හරින ලෙසද ඔවුන්ට ශාප කරන ලෙසද පාප් විසින් නියම කර තිබුණේය." (D. Aubigne, b. 4, Ch. 2). වසංගතයක් ලෙස පැතිර යන්නාවූ ආගම් ද්‍රෝහී ක්‍රියාදාමය මුලිනුපුටා දමන්නටත් එයට කිසියම් ආකාරයක හෝ සබඳතාවයන් දක්වන්නාවූ යමෙකු වේද තරාතිරම නොබලා ඔවුන් සියල්ලන්ම සභාවෙන් නෙරපා හරින්නටත් පාප් අණ කර තිබුණේය. ලූතර් සහ ඔහුගේ අනුගාමිකයන් අල්ලා ගෙන ඔවුන්ව රෝමයේ උදහසට භාර නොදෙන කවරෙකු හෝ වේවා ඔහු ආගමික ද්‍රෝහියෙකු ලෙස නම් කර සභාවෙන් නෙරපා හැරිය යුතු විය. මේ නියමය වලංගු නොවූයේ අග රජතුමාට පමණය.

පාප් බල අධිකාරියේ යථා ස්වභාවය මෙයින් පිළිබිඹු වන්නේය. පාප් විසින් සිය නියෝජිතයා වෙත එවනු ලැබූ ආඥාවෙහි පොදු සාධාරණය බිඳක් හෝ මුසු වී තිබුණේ නැත. ලූතර් සිටියේ රෝමයෙන් බොහෝ ඈත ස්ථානයකය. තමාගේ ස්ථාවරය රැකගැනීමට හෝ නිදහසට කරුණු පුද්ගලිකව ඉදිරිපත් කිරීමට හෝ ලූතර්ට හැකියාවක් නොවීය. කෙසේ වුවද, ඔහුට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනා විභාග කිරීමටත් පෙර ඔහුට එරෙහිව තීන්දුව ප්‍රකාශ කර තිබුණේය. ඔහු ආගම් විරෝධියෙකු බවට නඩු තීන්දුවක් නිකුත් කර තිබුණේය. එම තීන්දුව ප්‍රකාශ කළ දිනයේදීම ලූතර්ට අවවාද කර, චෝදනා කර, විනිශ්චයකර, වරදකරුවෙකු ලෙස තීන්දුවක්ද ප්‍රකාශයට පත් කර තිබුණේය. මේ සියල්ලක්ම ඉටු කළේ තමන් ශුද්ධ වූ පියාණන් යයි කියා ගත්, සභාවේ බල අධිකාරිවරයා වූ පාප්ය!

මේ අවස්ථාව ලූතර්ට සැබෑ මිතුරෙකුගේ අනුකම්පාව සහ අනුශාසනා අවශ්‍ය වූ වේලාවක් විය. දේව මගපෙන්වීම යටතේ දෙවියන්වහන්සේ මෙලැන්ක්තොන්ව විටන්බර්ග් කරා එවූසේක. තරුණයෙකු වූ මෙලැන්ක්තොන් බොහෝ දෙනාගේ ගෞරවයට පාත්‍ර විය. ඔහු දැනුම් සම්භාරයක් තිබූ තරුණයෙක් විය. ආකර්ෂණශීලී කථිකත්වයක් තිබූ හෙතෙම සුචරිතයක් ඇති, යුතුකමට වැඩකරන, අවංක පුද්ගලයෙක් විය. එම නිසාම ඔහු සැමගේ ගෞරවයටත් සම්මානයටත් භාජනය විය. ඔහුගේ මහත්මා ගති ගුණ මගින් ඔහුගේ කුසලතා විශිෂ්ටතාවෙන් ඔප් නැඟුණේය. වැඩි කල් නොගොස් ඔහු ශුභාරංචියෙහි ගෝලයෙකු බවට පත් විය. ඔහු ලූතර්ගේ විශ්වාසදායක මිතුරා බවට පත් විය, ගුණ පිරි සහායකයා විය. ඔහුගේ නිහතමානී භාවය, පරීක්ෂාකාරී අවධානය සහ සෘජු භාවය,

ලූතර්ගේ නිර්භීතකමට සහ ශක්තියට පන්නරයක් ලබා දුන්නේය. ප්‍රතිසංස්කරණය ශක්තිමත් කිරීමට ඔවුන් දෙදෙනාගේ සම්බන්ධතාව විශාල දිරියක් විය. එයින් ලූතර්ට ඉමහත් දිරි ගැන්වීමක් ලැබුණි.

නඩු විභාගය පැවැත්වීම සඳහා ඔග්ස්බර්ග් නගරය යොදා ගෙන තිබුණේය. ඒ සඳහා මේ ප්‍රතිසංස්කරණවාදියා බියෙන් තම ගමන ඇරඹීය. ඔහුගේ ආරක්ෂාව පිළිබඳව විවිධ ආරංචි පැතිරෙන්නට විය. ඔහු යන අතරමඟදී ඔහුව බලෙන්ම පැහැරගෙන මරා දැමීමට සැලසුම් කර ඇතැයි ප්‍රසිද්ධියේම තර්ජන එල්ල වී තිබිණ. එම ගමන යන්නට එපා යයි ඔහුගේ මිතුරෝ බැගෑපත් වූහ. කලකට විටන්බර්ග් නගරයෙන් බැහැරව ගොස්, ඔහුව රැකවරණය කිරීමට කැමැත්තක් දක්වා ඇති අය සමග රැඳී සිටින්නැයි ඔහුගේ මිත්‍රයෝ ඉල්ලා සිටියෝය. දෙවියන්වහන්සේ ඔහුට ලබා දුන් අවස්ථාව පැහැර හැරීමට ඔහු තුළ කැමැත්තක් නොවීය. තමා අවට පැන නැග ඇත්තාවූ කුණාටු කෙතරම් දැඩි වුවද සත්‍යතාව රැක ගැනීමට ඔහු අඛණ්ඩව ක්‍රියා කළ යුතු විය. ඔහුගේ ප්‍රතිචාරය මෙසේ විය. "අරගලයන්ට සහ ගැටුම්වලට මැදි වූ යෙරෙමියා මෙන් මමත් එළඹෙන්නාවූ අවස්ථාවනට මුහුණ දෙනවා. විරුද්ධවාදීන්ගේ තර්ජන වැඩිවත්ම මාගේ ප්‍රීතියද ඒ හා සමානව වැඩි වේ... ඔවුහු දැනටමත් මාගේ ගෞරවය සහ නම්බුව විනාශ කර තිබේ. විනාශ කිරීමට ඔවුන්ට ඇත්තේ මාගේ මේ කාලකණ්ණි ශරීරය පමණයි. ඒකත් ඔවුන්ට ලැබේවා. පැය කිහිපයකින් ඔවුන් මාගේ ජීවිතය කෙටි කරනවා ඇත. එහෙත් ඔවුන්ට මාගේ ආත්මයට අත තබන්නට බැහැ. යමෙක් ක්‍රිස්තුස්වහන්සේගේ වචනය ලෝකයාට ප්‍රකාශ කරන්නට ඉදිරිපත් වන්නේද ඔහු ඕනෑම මොහොතකදී මරණයට මුහුණ දීමට සූදානමින් සිටිය යුතුය." (D. Aubigne, b. 4, Ch. 4).

ඔග්ස්බර්ග් නගරයට ලූතර් පැමිණ ඇතැයි යන ආරංචිය පාප් නියෝජිතයාගේ ඉමහත් සතුටට හේතු විය. මුළු ලෝකයම භීතියෙන් මුසපත් කළ ආගම් ද්‍රෝහියා දැන් රෝම බල අධිකාරියේ ග්‍රහණයට අසුවී සිටියේය. ඔහුට බේරී යාමට ඉඩක් නොතැබීමට පාප් නියෝජිතයා තීරණය කරගත්තේය. විනිශ්චය ශාලාව කරා යෑමේදී තමාගේ ආරක්ෂාව උදෙසා සුදුසු පියවර ගැනීමට ප්‍රතිසංස්කරණවාදියා කිසියම් සූදානමක් කර තිබුණේ නැත. ආරක්ෂක සහතිකයක් නැතිව නඩු විභාගයට ඉදිරිපත් වන්නට එපා යයි ඔහුගේ මිතුරෝ ඔහුට අනුශාසනා කළෝය. අග රජතුමාගෙන් එවන් ආරක්ෂක සහතිකයක් ලබාදීමට ඔවුහුම ඉදිරිපත් වූහ. ලූතර් විසින් ප්‍රකාශ කර ඇති දේවල් ඉල්ලා අස්කර ගැනීමට ඔහුට බලය යොදවන්නට පාප් නියෝජිතයා අදිටන් කරගෙන සිටියේය. මෙය කරගන්නට අපොහොසත් වුවහොත්, ලූතර්ව රෝමයට ගෙන ගොස් හස්ගේ සහ ජෙරෝම්ගේ ඉරණමට ඔහුවත් භාජනය කිරීමට ඔහු තීරණයක් ගෙන තිබුණේය. ආරක්ෂා වැඩ



පිළිවෙලක් නැතිව ලූතර්ට නඩු ශාලාව කරා පැමිණීමටත්, තමාගේ කරුණාව යටතේ පමණක් බලාපොරොත්තුව රඳවමින් පැමිණීමටත් පාප් නියෝජිතයා තම සහචරයන් මගින් ලූතර්ට බලපෑම් ඇති කළේය. පාප් තානාපතිවරයා ඉදිරියෙහි පෙනී සිටීමට පෙර අගරජතුමාගේ ආරක්ෂාව සහතික කරන්නාවූ ලේඛණය ලබා ගැනීමට ඔහු සැලකිලිමත් විය. එම ලියවිල්ල නැතිව නඩුවට පෙනී සිටීම ඔහු ප්‍රතික්ෂේප කළේය. කරුණාවේ සහ මෘදු භාවයේ මුහුණු වැස්මක් පැළඳ ලූතර්ව තම පක්ෂය වෙත දිනාගැනීමට රෝමානුවෝ වෑයම් කළෝය. පාප් නියෝජිතයා ලූතර් සමග කළ සම්මුඛ සාකච්ඡාවලදී ඔහු දැඩි මිත්‍රශීලීකමක් පෙන්නුම් කළේය. කිසිම අභ්‍යන්තර හැඟීමක් සහවා නොගෙන සම්පූර්ණයෙන්ම සභාවේ ආධිපත්‍යයට යටත් වන ලෙස ඔහු ලූතර්ගෙන් ඉල්ලා සිටියේය. කිසිම තර්කයක් හෝ ප්‍රශ්නයක් හෝ ඉදිරිපත් නොකර සෑම කරුණක්ම අත්හැර දමන බවට පොරොන්දු වන්නැයි ලූතර්ට කාරුණිකව බලපෑම් එල්ල කළ පාප් නියෝජිතයාට විනිශ්චයට ඉදිරිපත් වී ඇති මේ තැනැත්තාගේ චරිත ගුණාංග පිළිබඳව නිසියාකාර හැඟීමක් නොතිබුණි. කාර්දිනල් වරයා ඉදිරියෙහි තම පිළිතුර සපයන්නාවූ ලූතර්, තමා සභාවට ගරු කරන බවත් සත්‍යතාව හිස් මුදුනින් පිළිගන්නා බවත් කියා සිටියේය. තවද, තමා ඉගැන්වූ දහම්වලට විරුද්ධතාවන් ඉදිරිපත් කරන්නේ නම්, ඒ සියල්ලටම පිළිතුරු සැපයීමට තමා සූදානම් බව ඔහු කියා සිටියේය. තමාගේ සෑම මූලධර්ම වාදයක්ම සමහර විශ්ව විද්‍යාලයන්හි අධීක්ෂණයට භාජන කරන ලෙසත් ඔහු ඉල්ලා සිටියේය. තමාගේ ඉගැන්වීම් වැරදි යයි ඔප්පු කිරීමකින් තොරව එම දහම් ඉල්ලා අස්කර ගැනීමට කාර්දිනල්වරයා ගත් ක්‍රියා මාර්ගය ගැන ඔහු විරෝධතා දැක්වීය.

ඔහුට ලැබුණාවූ එකම ප්‍රතිචාරය වූයේ "ඉල්ලා අස්කර ගනු, ඉල්ලා අස්කර ගනු" යි තර්ජනය කිරීම පමණය. තමාගේ ඉගැන්වීම් ශුද්ධ ලියවිල්ල මත පදනම් වී ඇති නිසා සත්‍යතාවට පිටුපාමින් එම ඉගැන්වීම් ඉල්ලා අස්කර ගැනීමට තමාට කිසිසේත්ම නොහැකි බව ලූතර් තරයේ කියා සිටියේය. ලූතර්ගේ තර්කවලට පිළිතුරු දීමට අපොහොසත් වූ පාප් නියෝජිතයා ඔහුට අඛණ්ඩ වාග් ප්‍රහාරයක් එල්ල කළේය. අවලාද, නින්දා කිරීම්, සමච්චල් කිරීම්, උපහාසයට භාජනය කිරීම්, චාටු බස් කීම් යන සියල්ලක්ම ඔහුගේ ප්‍රහාරයේ ආයුධ විය. ඒ අතරම ස්වකීය වාග් ප්‍රහාරයට සම්ප්‍රදායික ඉගැන්වීම් සහ පියවරුන්ගේ ප්‍රකාශද ඔහු එකතු කර ගත්තේය. ප්‍රතිසංස්කරණ-වාදියාට කථා කිරීමට කිසිම ඉඩ ප්‍රස්ථාවක් ලබා නොදීමට ඔහු උපක්‍රමශීලී විය. මේ සම්මන්ත්‍රණය මෙයාකාරයෙන් තවදුරටත් පවත්වා ගෙන යෑමෙන් ප්‍රයෝජනයක් සිදු නොවන බව වටහා ගත් ලූතර් තම පිළිතුරු ලිඛිතව ලබාදීමට අවසර පැතීය. මහත් අකමැත්තෙන් වුවද එම අවසරය ලූතර්ට ලැබුණේය.

මිතුරෙකුට ලිපියක් ලියමින් ලූතර් මෙසේ පැවසීය. "මෙසේ කිරීමෙන් මේ පීඩිතයාට වාසි දෙකක් අත් වේ. මුල්ම වාසිය නම් ලිඛිතව ඉදිරිපත් කරන දේ තවත් අයගේ විනිශ්වයට ඉදිරිපත් කළ හැකි වීමය. දෙවැනි වාසිය නම් මානයෙන් හිස පිරී ගිය හිතුවක්කාර ලෙස දොඩන්නාවූ අනුකම්පා විරහිතව ක්‍රියා කරන්නන්ගේ භීතියට හෝ ඔවුන්ගේ හෘදය සාක්ෂියට කථා කිරීමට අවස්ථාවක් ලැබීමය. එසේ නැතිනම් මෙම සාහසිකයා තමාගේ උදාර වාග් සංදර්ශනය මගින් ජය ගන්නවා ඇත." (Martyn, “The Life and Times of Luther, pp. 271, 272).

ඊළඟ සාකච්ඡා වාරයේදී ලූතර් තම පිළිතුර ඉතා පැහැදිලිවූ ද, සංක්ෂිප්තවූද තම ඉගැන්වීම් ප්‍රබලව අඩංගුවූ ද ලේඛණයකින් ඉදිරිපත් කළේය. තම ඉගැන්වීම් සනාථ කිරීමට හෙතෙම ශුද්ධ ලියවිලි පාඨ ගණනාවක්ම භාවිතා කර තිබුණේය. සම්මන්ත්‍රණ ශාලාවේදී එම ලියවිල්ල සැමගේ සවනට ඇසෙන සේ ප්‍රසිද්ධියේ කියෙවූ හෙතෙම එය කාර්දිනල්වරයාට පිළිගැන්වීය. එම ලියවිල්ල සාවඥ ලෙස පසෙකින් තැබූ කාර්දිනල්වරයා එය ඇගයීමකට ලක් කිරීම ප්‍රතික්ෂේප කළේය. එම ලියවිල්ලෙහි ඇත්තේ වැදගත්කමකින් තොර වචන සමූහයක් බවත්, භාවිතා කර ඇති පාඨ අදාළකමක් නැති බවත් ඔහු ප්‍රකාශ කළේය. ලූතර් එඩිතරව නැගී සිට කාර්දිනල් ඉදිරිපත් කළ කරුණු එකින් එක බිඳ දැම්මේය. සම්ප්‍රදායන් සහ සභා ඉගැන්වීම් ශුද්ධ ලියවිල්ලට එක හෙලාම විරුද්ධ බව ඔහු පෙන්වා දුන්නේය.

ලූතර්ගේ තර්ක බිඳ දැමිය නොහැකි බව වටහා ගත් කාර්දිනල්-වරයාගේ ආත්ම දමනය දෙදරා ගියේය. කෝපයෙන් වියරු වැටීමකට භාජන වූ හෙතෙම කෑ ගසා මෙසේ පැවසුවේය. "ලූතර් ඔබ ඉගැන්වූ දෑ ඉල්ලා අස්කර ගන්න. නැතිනම් මා ඔබ රෝමයට යවනවා. එහිදී ඔබගේ ක්‍රියාදාමයන් විනිශ්වය කිරීමට පත් කළ ධර්මාධිකරණ විනිසුරුවන් ඔබට නියමිත දඬුවම දේවි. මම ඔබව සභාවෙන් නෙරපා හරිමි. ඔබගේ පාක්ෂිකයන්ටද එම දඬුවම තීන්දු කරමි. යම්කිසි දවසක ඔබට අනුබල දෙන තැනැත්තෙක් වේද, ඔහුටද එම ඉරණම තීන්දු වෙනවා ඇත. මේ සියල්ලන්ම සභාවෙන් නෙරපා දමනු ලබනවා ඇත." අන්තිමේදී හෙතෙම අහංකාරවූ ද, කෝපාවිෂ්ටවූ ද වදනින් මෙසේ පැවසීය. "ඉල්ලා අස්කර ගන්න. නැතිනම් තවත් මා ඉදිරියට එන්න එපා." (D. Aubigne, b. 4, Ch. 8).

මෙම ප්‍රකාශය ඇසූ ලූතර් තම මිතුරන්ද සමගින් නඩු ශාලාවෙන් පිට විය. තමා කියූ කිසිවක් ඉල්ලා අස්කර ගන්නේ නැති බව ශාලාවෙන් පිටව යාමෙන් සනාථ විය. කාර්දිනල් බලාපොරොත්තු වූයේ මෙවැන්නක් නොවේ. ඔහු බලාපොරොත්තු වූයේ ලූතර්ගේ



යටත්වීමක් බලහත්කාර කමින් හෝ ලබාගැනීමටය. ප්‍රචණ්ඩත්වයෙන් ලූතර්ව බිය ගන්වා ඔහුව තම පැත්තට නම්මවා ගැනීමට ඔහු බලාපොරොත්තු විය. ශාලාව වගඋත්තර කරුවන්ගෙන් හිස් විය. තමාගේ ආධාරකරුවන් සමග ශාලාවේ තනිවූ කාර්දිනල්වරයා තමාගේ වැඩ සැලැස්ම ව්‍යර්ථ වීම ගැන එකිනෙකාගේ මුහුණු දෙස බලමින් අප්‍රසාදය බෙදා ගත්තේය.

මෙම අවස්ථාවේදී ලූතර්ගේ වෑයම නිම වුණේ යහපත් ප්‍රතිඵලවලින් තොරව නොවේ. මේ පුද්ගලයන් දෙදෙනාගේ පැවැත්ම ඇගයීමකට ලක් කිරීමට රැස්ව සිටි විශාල ජනකායට අවස්ථාවක් උදා විය. ඔවුන් දෙදෙනා තුළ පැවැති ආත්මයන් සසඳා බැලීමට ඔවුන්ට හැකියාව ලැබුණේය. දෙදෙනාගේ පාර්ශ්වයන් තුළ සත්‍යතාවය වෙනුවෙන් තිබූ ශක්තියත්, අවංකභාවයත් සැමගේ විමර්ශනයට භාජන විය. දෙදෙනා අතර තිබූ වෙනස්කම් කෙතරම් ප්‍රබල ලෙස කැපී පෙනුණේද? ප්‍රතිසංස්කරණය දෙවියන්වහන්සේගේ ශක්තිය තුළ සරලව, යටහත් පහත්ව, ස්ථිරව නැගී සිටියේය. ඔහුගේ පාර්ශ්වයේ සත්‍යතාව ලෙළ දෙමින් තිබුණේය. පාප් නියෝජිතයා තමාගේම වැදගත් කමින්, සියල්ල තමාගේ සැරකමින් යටපත් කරගනිමින් උඩඟු කමින් යුතුව නැගී සිටියේය. ඔහුගේ ප්‍රකාශන සාධාරණ නොවීය. ඔහුගේ තර්ක සනාථ කිරීමට ඔහු එකම ශුද්ධ ලියවිලි පාඨයක් හෝ ඉදිරිපත් නොකළේය. ඔහුගේ උස් හඬෙහි එකම තේමාව වුණේ, "ඉල්ලා අස් කරගන්න, නැතිනම් දඬුවම් පැමිණවීමට රෝමයට යවනවා" යන්නය.

ලූතර්ට නීතියෙන් ආරක්ෂාව තහවුරු කර තිබූ නමුත් රෝමානු-වන්ගේ සැලැස්ම වුණේ නගරයෙන් පිටතදී ලූතර්ව අත් අඩංගුවට ගෙන සිරගෙයි ලෑමය. තවදුරටත් එම නගරයේ රැඳී සිටීම ඵලදායී නොවන බව පැවසූ ඔහුගේ මිතුරෝ විටන්බර්ග් නගරය කරා වහාම යන ලෙස ඔහුට බලකර සිටියහ. ඔහුගේ අරමුණ වසන් කර තබා ගැනීමට උපරිම ලෙස ආරක්ෂාකාරී විය යුතු බවද මිතුරෝ අවධාරණය කළහ. අඳුරත් සමගම ඔහු ඔග්ස්බර්ග් නගරයෙන් පිට විය. මහේස්ත්‍රාත්වරයා විසින් සපයා දුන් නිල ආරක්ෂා භටයෙකු සමග ඔහු අරුණ වැටෙන්නට කලින් අසු පිටින් ගම රට බලා පිටත් විය. අනතුරු සේයා දසත පැතිරෙද්දී ඔහු රහසිගතව අඳුරට මුවා වී නගරයෙන් පිට විය. ඔහුගේ කෲර සතුරෝ දැඩි අවධානයෙන් ලූතර්ව විනාශ කිරීමට සැලසුම් යොදමින් සිටියෝය. ඔහුව හසුකර ගැනීමට යොදා තිබූ මළපත් සහ උගුල්වලට ඔහු අසු වේවිද? එකී අවස්ථාවන්හිදී ඇති වූ බියත් සමගම මහත් උනන්දුවකින් යුතුව යාච්ඤාවේ යෙදීමටද ලූතර් දිරිගත්තේය. වීදියේ කෙළවර තිබූ කුඩා දොරටුවක් වෙතට දෙදෙනා පැමියෝය. ඔවුන් වෙනුවෙන් දොරටුව විවෘතව තිබූ හෙයින්

ඔවුහු අවහිරයකින් තොරව පිටතට පැමිණියහ. පිටතට පැමිණ, රහසින් පලා ගියාවූ මේ දෙදෙනා ගම රට බලා යන ගමන ඉක්මන් කළෝය. ලූතර්ගේ පලා යාමේ පුවත පාප් නියෝජිතයාගේ සවනට පතිත වන විට ලූතර් සිටියේ නිලධාරියාට අල්ලා ගත නොහැකි දුරකය. සාතන් සහ ඔහුගේ සහචරයෝ පරාජයට පත්වූහ. දඩයක්කාරයකුගේ උගුලකින් පලා යන්නාවූ පක්ෂියෙකු සේ, තමන්ගේ බලය යටතේ සිටියේ යැයි උදම් අනමින් සිර කිරීමට බලා සිටි තැනැත්තා අඳුරේම පලා ගොස් තිබුණේය.

ලූතර්ගේ බේරී පලා යාම ගැන ඇසූ පාප් නියෝජිතයා පුදුමයෙන් සහ කෝපයෙන් පිරී ගියේය. සභාව කැළැඹූ මේ ආගම් ද්‍රෝහියා පිළිබඳව දැඩිව සහ ප්‍රඥාවන්ත ලෙස ක්‍රියාකිරීම මගින් පරිමාණයේ විශාල ගරු බුහුමන් ලැබීමට ඔහු බලාපොරොත්තු විය. එහෙත් ඔහුගේ සියලු අපේක්ෂා සුනු විසුණු වී ගියේය. සැක්සනියේ ඡන්දයෙන් තේරී පත් වූ ආදිපාදවරයා වූ ෆ්‍රෙඩ්රික් වෙත ලිපියක් යවමින් කාර්දිනල්වරයා ලූතර්ට ඉමහත් සේ දොස් පවරමින් ලූතර්ව වහාම රෝමය කරා යවන්නැයි ද නැතහොත් ලූතර්ව සැක්සනියෙන් පිටුවහල් කරන්නැයි ද අණ කළේය.

නිදහසට කරුණු ඉදිරිපත් කළ ලූතර්, තමා කර ඇති වරද ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා දෙන්නැයි පාප්ගෙන් සහ කාර්දිනල්වරයාගෙන් ඉල්ලා සිටියේය. තමා ඉගැන්වූ දහම් දේව වචනයට පටහැනි බව පෙන්නුම් කළහොත් තමා ඇත්ත වශයෙන්ම එකී ධර්මතාවන් ඉල්ලා අස් කරගන්නා බව ඔහු සපථ කළේය. එවන් ශුද්ධ කාර්යයක් වෙනුවෙන් දුක් විඳීමට තමා සුදුස්සෙකු ලෙස තෝරා ගැනීම ගැන ඔහු දෙවියන්වහන්සේට කෘතඥතාව පළ කළේය.

ප්‍රතිසංස්කරණවාදී මූලධර්ම ගැන ආදිපාදවරයා දැන සිටියේ අල්ප වශයෙන්ය. එහෙත් ලූතර් තම වදන් හසුරුවා පද ගලපා ඇති ආකාරය පිළිබඳව ආදිපාදවරයා තුළ ප්‍රබල ඇගයීමක් ඇති විය. ලූතර් තම කරුණු ඉදිරිපත් කළ ඍජු භාවයද, පැහැදිලි ආකාරයද, බලයද ආදිපාදවරයාගේ ප්‍රසන්නතාවට යොමු විය. ප්‍රතිසංස්කරණවාදියා වරදකරුවෙකු යැයි තීන්දුවක් නිකුත් කරන තුරු ඔහුගේ ආරක්ෂකයා ලෙස වගකීම් භාරය දැරීමට ආදිපාදවරයා තීරණය කර ගත්තේය. තමාට ආඥාවක් එවා ඇති කාර්දිනල්ට ආදිපාදවරයා මෙසේ පිළිතුරක් යැව්වේය. "ආචාර්ය මාටින් ඔබ ඉදිරියෙහි පෙනී සිටීමට ඔග්ස්බර්ග් කරා පැමිණීම ගැන ඔබ සෑහීමට පත් විය යුතුය. ඔහු වරද ගණනාවක් කර ඇතැයි චෝදනා කරමින් ඔබ ඔහු වරදකරුවෙකු යැයි තීන්දුවක් නිකුත් කර ඇත. ඔහුගේ අදහස් වැරදි බව ඔහුට පෙන්වා නොදී ඔහු කී දැය ඉල්ලා අස්කරගන්නා ලෙස ඔබ ඔහුට බලපෑම් කරතැයි අපි කිසිවිටෙක හෝ බලාපොරොත්තු



නොවීමු. අපගේ බල පෙදෙසෙහි සිටින විද්වතුන් පවසා ඇත්තේ මාටින් විසින් උගන්වනු ලැබූ ක්‍රිස්තියානි මූලධර්ම ශ්‍රද්ධාවට විරුද්ධ නැති බවත්, ක්‍රිස්තියානි විරෝධී නොවන බවත්, ආගම් විරෝධී නොවන බවත්ය. එහෙයින්, ඔහුව රෝමයට යැවීම හෝ ස්වකීය බල ප්‍රදේශයෙන් ඔහුව පිටුවහල් කිරීම අප විසින් ප්‍රතික්ෂේප කළ යුතුය." (D. Aubigne, b. 4, Ch. 10).

සාරධර්ම මගින් පනවා තිබූ සීමාවන් සමාජය තුළ බිඳ වැටෙමින් පැවතීම ආදිපාදවරයාගේ අවධානයට යොමු විය. ප්‍රතිසංස්කරණයේ විශාල මෙහෙවරක් ඉටු වීම අත්‍යාවශ්‍යය. මිනිස්සු දෙවියන්වහන්සේගේ ඉල්ලීම් පිළිගෙන ඒවාට කීකරු වන්නෝ නම් ආනුභාවය ලැබූ හෘදය සාක්ෂියක මගපෙන්වීම්වලට අවනත වන්නෝ නම් අපරාධ මැඩීමට සහ දඬුවම් දීමට වැයවන වියදම් විශාල ලෙස අඩු කරගත හැකි වේ. මෙම අරමුණ කරා යෑමට ලූතර් වෙහෙස මහන්සි නොබලා කටයුතු කළ බව ආදිපාදවරයාට දැක ගත හැකි විය. සභාව තුළ වඩාත් යහපත් බලපෑමක් වර්ධනය වෙමින් පවතිනවා දැකීමෙන් ආදිපාදවරයා රහසේ ප්‍රීති විය.

විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වශයෙන් ලූතර් ඉටු කරන්නාවූ කාර්ය භාරය ඉතා සාර්ථක බවද ආදිපාදවරයාට දැකගත හැකි විය. මාළිගාවේ පිහිටි දෙව් මැදුරේ දොරටුවෙහි තම තර්ක විතර්ක සහිත කරුණු අනූපහකින් සමන්විත ලේඛණය අලවා වසරක් ගෙවී තිබුණේය. වෙනත් වසර වලදී සියලු සාන්තුවරයන්ගේ දවසේදී එම දේවස්ථානයට ඇදී එන්නාවූ බැතිමතුන් සංඛ්‍යාව ඉතා විශාලය. එහෙත් එම වසරේදී පැමිණීමේ සංඛ්‍යාව කැපී පෙනෙන අන්දමින් පහළ බැස තිබූ බව සැමට දැකගත හැකි විය. වන්දනාකරුවන් මෙන්ම පඬුරුද අඩුවීමෙන් රෝමයට අත් වූයේ මහත් පාඩුවකි. එම අඩුපාඩුව පුරවාලීමට දැන් වෙනත් ක්ෂේත්‍රයක පිරිසක් විටන්බර්ග් කරා පැමිණීමට පටන් ගත්හ. ඔවුන් පැමිණියේ වන්දනා කිරීමට නොව විශ්ව විද්‍යාලයේ ඉගෙනීමටය. ලූතර්ගේ ලේඛණ සහ ප්‍රකාශන කරණකොටගෙන ශුද්ධ ලියවිලි කෙරෙහි වැඩි උනන්දුවක් පිබිදී තිබිණ. ජර්මනියෙන් පමණක් නොව ලෝකයේ විවිධ රටවලින්ද ශිෂ්‍යයෝ විටන්බර්ග් සරසවිය වෙත ඇදී ආවෝය. අධ්‍යාපනය සඳහා පැමිණෙන තරුණයෝ මුල් වතාවට විටන්බර්ග් නගරය දර්ශනය කළ විට "තම අත් සගය දෙසට ඔසවා දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ. මෙම නගරයෙන් සත්‍යතාවයේ ආලෝකය බැබළෙන්නට ක්‍රියා කිරීම ගැන ඔවුහු දෙව් සමිඳාණන්ට ප්‍රශස්ත ගී ගැයූහ. සියොන් නගරයේ සිට විහිදී ගිය සත්‍යතාවේ කිරණ මුළු ලෝකය පුරා විහිදී ගිය ආකාරයෙන්ම විටන්බර්ග් සරසවියේ ප්‍රදීපාගාරයෙන් නික්මෙන සත්‍යතාවේ රැස් දහරා මුළු ලෝකයම ඒකාලෝක කරනවා නොඅනුමානය." (D. Aubigne, bk. 4, Ch. 10).

මේ වකවානුව වන විට රෝමානුවේ වැරදිවලින් ලූතර් සම්පූර්ණයෙන්ම ඉවත් වී නොසිටියේය. ශුද්ධවූ දේව වචනය සහ පාප් අණපනත්ද ව්‍යවස්ථාවද සංසන්දනය කර බැලූ විට ඔහු විස්මයට පත් විය. ඔහු මෙසේ ලිවීය. "පාප් වනාහි අන්ත ක්‍රිස්තුස්ද නැතහොත් ඔහුගේ ගෝලයෙක් දැයි මා දන්නේ නැහැ. ඔවුන් නිකුත් කර ඇති ලේඛණ මගින් ක්‍රිස්තුස්වහන්සේව ඉතා ප්‍රබල අන්දමින් වැරදි අයුරින් හුවා දක්වා තිබෙනවා. එම ප්‍රකාශන තුළ ක්‍රිස්තුස්-වහන්සේව නැවත නැවතත් කුරුසිපත් කර තිබෙනවා." (Ibd, b. 5, Ch. 1). මේ වන විටත් ලූතර් රෝමානු සභාවේ සාමාජිකයෙක්ව සිටියේය. ඇය සමග වූ සහභාගිත්වයෙන් කවරදාකවත් ඉවත් වීමේ අදහසක් ඔහු තුළ නොවීය.

මේ ප්‍රතිසංස්කරණවාදියාගේ ලිපි සහ දහම කිතුණු ලොවේ සෑම ජාතියක් පුරාම ප්‍රචලිත වී තිබුණේය. ඔහුගේ ප්‍රතිසංස්කරණ දහම් ප්‍රංශය සහ ස්පාඤ්ඤය කරාද ව්‍යාප්ත විය. එංගලන්ත වාසීහු ඔහුගේ වදන් පිළිගත්තේ ජීවනදායක වචනය ලෙසින්ය. බෙල්ජියම සහ ඉතාලිය කරාද සත්‍යතාව ව්‍යාප්ත විය. දහස් ගණන් ජනතාව තමන් මෙතෙක් සිටි, මරණය සමාන නින්දෙන් අවදි වෙමින් ඇදහිල්ලේ ජීවිතයක ප්‍රීතිය සහ බලාපොරොත්තුව අත්දකින්නට වූහ.

ලූතර්ගේ දොස් පැවරීම් සහ පහර දීම්වලට රෝමය තව තවත් ගොදුරු වන්නට විය. මේ අතර රෝමානු අන්තවාදී විරුද්ධවාදීන් සහ කතෝලික විශ්ව විද්‍යාල මහාචාර්යවරුන්ද ප්‍රකාශනයක් නිකුත් කරමින් පැවසුවේ කවරෙක් හෝ මෙම කැරලිකාර පූජකයා මරා දමන්නේ නම්, ඔහු විසින් එමගින් පාපයක් කරන්නේ නැති බවය. තමාගේ කබාය ඇතුලෙහි පිස්තෝලයක් රඳවා ගත් අමුත්තෙක් ලූතර් බැහැ දකීමට පැමිණියේය. ලූතර් මෙසේ තනියම වැඩ කරන්නේ මන්දැයි අමුත්තා විමසීය. "මම දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තයෙහි සුරක්ෂිතව ඉන්නවා" යයි ලූතර් පිළිතුරු දුන්නේය. "උන්වහන්සේ මාගේ ශක්තියයි. මාගේ පලිහයි. මිනිසුන් විසින් මට කරන්ට පුළුවන් වන්නේ මොකක්ද?" (D. Aubigne, b. 6, Ch . 2). මේ වචන ඇසීමෙන් අමුත්තාගේ මුහුණ සුදුමැලි විය. සගයේ දේව දූතයන් ඉදිරියෙන් පලා යන්නාක් මෙන් ඔහු පසුබැස ගියේය.

ලූතර්ව විනාශ කිරීමට රෝමය බොහෝ සේ උනන්දු විය. එසේ වුවද, දෙවියන්වහන්සේ ඔහුගේ ආරක්ෂකයාණන් වූසේක. ඔහුගේ දහම්, ගම් නියම්ගම් සිසාරා රැව් පිළිරැව් දුන්නේය. ගෙවල්වල මෙන්ම කන්‍යාරාම තුළද වංශාධිපතීන්ගේ මාළිගා තුළද, විශ්ව විද්‍යාලවල මෙන්ම රාජ මාළිගා තුළද ලූතර්ගේ දහම් දෝංකාරය දුන්නේය. ඔහුගේ වෑයමට සහාය පළ කරමින් වංශාධිපතියෝ සෑම පසෙකින්ම නැගී එන්නට වූහ.



මේ කාලයේදී ලූතර් විසින් හස්ගේ ලියවිලි කියවමින් සිටියේය. දහැමිතාව උදා වන්නේ ඇදහිල්ල මගින් බව ඔහුගේ කියවීම තුළින් පැහැදිලි විය. එම මූලධර්මය ඔසවා තබන්ටත්, උගන්වන්ටත්, ඔහු සාක්ෂි සොයමින් සිටියේය. මෙම දහම බොහිමියානු පුනරුදවාදියා විසින් ඔසවා තබා ඇති බව ඔහුට පැහැදිලි විය. "පාවුල්, ඔගස්තීනු සහ මම යන අපි සැවොම මෙතෙක් නොදන සිටි නමුත් හස්ගේ ඉගැන්වීම පිළිගත් අය වන්නෙමු." "මෙම සත්‍යතාව මෙයට ශත වර්ෂයකට පෙර ප්‍රකාශ කරන ලද නමුත් ලෝකයා එය වළලා දමා ඇත. මේ ගැන දෙවියන්වහන්සේ ලෝකයා මත අප්‍රසන්නතාව වගුරුවනවා සහතිකය." (Wylie, b. 6, Ch. 1).

එම්ප්‍රදෝරු තුමාට සහ ජර්මනියේ වංශාධිපතීන්ට ලූතර් ආයාචනයක් ඉදිරිපත් කළේය. එහි ගැබ්වී තිබුණේ ක්‍රිස්තියානි දහම ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳවය. ඔහු පාප්වරයා ගැන මෙසේ සඳහන් කළේය. "තමා ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිපාලකයා යැයි කියාගන්නා තැනැත්තා දෙස බැලීම පවා භීතිය ගෙන දෙවන්නේය. ඔහු ප්‍රදර්ශනය කරන්නාවූ මහේශාක්‍ය භාවය සම කිරීමට රජ කෙනෙකුටවත් හැකි නොවේ. මෙවන් දර්ශනයක් දුගී යේසුස්වහන්සේට හෝ නිහතමානී පේතෘස්ට සමාන වේද? ඔහු ලෝකයේ අධිපතියා බව සමහරෙක් පවසති! තමා ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිපාලකයා යැයි ඔහු පුරසාරම් දොඩයි. "මාගේ රාජධානිය මේ ලෝකයේ නොවේය"යි ක්‍රිස්තුස්වහන්සේ පැවසූ සේක. තමාගේ ප්‍රධානියාට වඩා පුළුල් රාජධානියක් ප්‍රති රජුට හිමි වන්නේද?" (D. Aubigne, b. 6, Ch. 3).

රටෙහි වූ සරසවි ගැන ඔහු මෙසේ ප්‍රකාශ කළේය. "සරසවි තුළ විශාල වෙනසක් සිදුවිය යුතුය. සරසවි තුළ පවතින්නාවූ අධ්‍යාපන රැල්ල අනුව එම පීඨ නරකාදියේ දොරටු බවට පත්වනවා නො-අනුමානය. ශුද්ධ ලියවිලි පැහැදිලි කිරීමේදී, එයට අර්ථකථන සැපයීමේදී, දනට වඩා වැඩි උද්‍යෝගයක් තිබීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්වී තිබේ. තරුණයන්ගේ හදවත් තුළ ශුද්ධ ලියවිල්ල මුද්‍රා කළ යුතුව ඇත. ශුද්ධ ලියවිල්ලට මූලික ස්ථානයක් නොදෙන පාසැල්වලට ළමුන් නොයවන ලෙස මම සැමට අනුශාසනා කරමි. නිරන්තරව දෙවියන්වහන්සේගේ වචනයෙහි ආභාෂය නොලබන්නාවූ ආයතන දූෂිත වනවා සහතිකය." (D. Aubigne, b. 6, Ch. 3).

මෙම ආයාචනය ජර්මනිය පුරාම ඉතා සීඝ්‍රයෙන් පතුරුවා හරිනු ලැබීය. එය ප්‍රජාව කෙරෙහි මහත් බලපෑමක් ඇති කළේය. සෑම අයෙක්ම තිගැස්සී සිටියහ. ප්‍රතිසංස්කරණයේ ධජය වටා දහස් ගණන් එක්රැස් වන්නට වූහ. ලූතර්ගෙන් පළිගැනීමේ චේතනාවෙන් පිරී ගිය ඔහුගේ විරුද්ධවාදීහු ඔහුට එරෙහිව තීරණාත්මක විසඳුමක් ගන්නා ලෙස පාප්ගෙන් ඉල්ලා සිටියහ. ඔහුගේ දහම් වහාම වරදට පත් කළ

යුතු යයි ආඥාවක් නිකුත් විය. මෙම දහම් ඉල්ලා අස් කරගැනීමට ප්‍රතිසංස්කරණවාදියාට සහ ඔහුගේ අනුගාමිකයන්ට හැට දවසක කාලයක් ලබා දෙනු ලැබීය. එසේ නොකරන්නාවූ සැවොම සභාවෙන් නෙරපා දමනු ලබන බව නිවේදනයෙහි සඳහන් විය.

මෙම නිවේදනය ප්‍රතිසංස්කරණයට මහත් අර්බුදයක් නිර්මාණය කළේය. සභාවෙන් නෙරපා හැරීමේ ක්‍රියාවලිය රජවරුන්ට පවා භීතිය උදාකර දීමෙහි සමත් විය. මෙම ක්‍රියාදාමය නිසා බලවත් රාජධානි පවා පාළුවට ගියේය, සත් සයුරේ කිඳා ගියේය. ලෝක කිතුණු ඉතිහාසයේ සියවස් ගණනාවක් තුළ මෙම නියමය නිසා මහත් භීතියෙන් සහ තැතිගැන්මෙන් අසරණ බවට පත්කරනු ලැබූ සංඛ්‍යාව සුළු පටු නොවේ. මෙම දණ්ඩනයට යටත් කරනු ලැබූ අයට තම නෑදෑයන් හෝ අසල්වාසීන් හෝ සමග කිසිම සබඳතාවක් පැවැත්වීම තහනම් විය. ඔවුන්ගේ ඉරණම වුණේ දඩයම් කරනු ලැබ මරාදමනු ලැබීම පමණක්ය. ඔවුන් ද්‍රෝහීන් ලෙස සලකනු ලැබීය. තමා වටා පුපුරා යාමට තිබූ කුණාටුව පිළිබඳව ලූතර්ට මනා දැනුමක් තිබුණේය. තමාගේ සත්‍යය සහ පලිහ ලෙස ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ ඔහු සලිත නොවී ස්ථිරවම සිටියේය. වේද සාක්ෂිකරුවෙකුගේ ඇදහිල්ලත්, ධෛර්යයත් මුසුව ඔහු මෙසේ ලීවේය. "සිදුවීමට යන්නේ කුමක්ද කියා මට තේරුමක් නැහැ. එවැන්නක් දැනගැනීමටද මට උවමනාවක් නැහැ. එවැන්නක් ගැන සිතා බියෙන් පසු නොවෙමි. අපගේ පියාණන්වහන්සේගේ කැමැත්ත නැතිව කොළයක් නටුවෙන් ගිලිහී බිමට වැටෙන්නේ නැහැ. එයට වඩා කොයිතරම් උදාරකමින් උන්වහන්සේ අපව රැකබලා ගන්නවාද! වාක්‍යයාණන් වෙනුවෙන් දිවි පිදීම එතරම් අපහසු කාර්යයක් නොවේ. මක්නිසාද වාක්‍යයාණන්ම මාංශවත් වී උන්වහන්සේම මරණයට පත්වූසේක. අපි උන්වහන්සේ සමග මරණයට පත් වෙමු නම්, උන්වහන්සේ සමගම ජීවත් වෙමු; උන්වහන්සේ ගොස් තිබෙන ගමන් මාර්ගයේ අපද ගමන් කරනවා නම්, උන්වහන්සේ දන් සිටින්නාවූ තැනට අපිද යන්නෙමු. තවද, සඳහටම උන්වහන්සේ සමග එකට ජීවත් වන්නෙමු." (D' Aubigne, b. 6, Ch. 9).

පාප්ගේ නියෝග පත්‍රය ලූතර්ට ලැබුණ විට ඔහු මෙසේ පැවසීය. "මෙය ඉතා පහත්වූ නීචවූ නියෝගයක් ලෙස මා සලකනවා. මේක ආගම් විරෝධී බොරුවක් .... මෙහි වරදට පත් කර ඇත්තේ මා නොව ක්‍රිස්තුස්වහන්සේවමයි .... යහපත් කර්තව්‍යයක් උදෙසා මෙවන් දුෂ්ට පළිගැනීම් වලට භාජනය වීම ප්‍රීතියක් කොට සලකනවා. දැනටමත් විශාල නිදහසක් මාගේ හදවත වෙලා ගෙන තිබෙනවා. පාප් වනාහි අන්ත ක්‍රිස්තුස් බව මට දන් සහතිකයි. ඔහුගේ සිංහාසනය වනාහි සාතන්ගේ සිහසුනයි." (D' Aubigne, b. 6, Ch. 9).



කෙසේ වුවද, රෝමයේ නියෝගය ඵල රහිත නොවීය. රෝමය විසින් කීකරුකම ලබාගැනීම සඳහා භාවිතා කළාවූ ආයුධ නම් සිරගෙයි ලෑම, වධ හිංසා පැමිණවීම සහ කඩුවයි. දුබලවූ ද, මිථ්‍යාවන් විශ්වාස කළා වූද අය පාප්ගේ නියෝගය ඉදිරියෙහි හයින් ගැහෙන්නට විය. ලූතර්ගේ ප්‍රතිසංස්කරණයට බොහෝ අය සහයෝගය දක්වූ නමුත් එවන් කර්තව්‍යයක් උදෙසා ජීවිතය පූද කිරීමට තරම් එහි වැදගත්කමක් ඔවුන්ට නොවීය. ප්‍රතිසංස්කරණ-වාදියාගේ මෙහෙවරය හමාර වන්නට සමීප යයි දසත සිදුවීම් ඉඟි කරන්නට විය.

මේ වන විටත්, ඉදිරි සිදුවීම් භයංකාර බව පෙනී ගියත්, ලූතර් තුළ කිසිම චකිතයක් හෝ බියක් හෝ නොවීය. රෝමය විසින් ඔහුට විරුද්ධව ශාප පිට ශාප නිකුත් කර තිබුණේය. ඔහු විනාශ වෙයිද නැතහොත් රෝම නියෝගයනට අවනත වෙයිද කියා ලෝකය බලා සිටියේය. මෙම ඉරණම් දෙකෙන් එකක් සිදුවනවා නියතයයි සැමගේ කල්පනාව විය. වරදට පත් කරන්නාවූ නියෝගය රෝමය වෙත දමා ගැසීමට තරම් ලූතර් එඩිතර විය. තමා සඳහටම රෝම සභාව අත්හැර දමනවා යයි ඔහු තම තීරණය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. සිසුන්, මහාචාර්යවරුන් සහ අනේක තරාතිරමේ පුරවැසියන් ඉදිරියේ නැගී සිටි ලූතර්, තමාට එවූ පාප් නියෝගය ගිනිබත් කළේය. ඒ සමගම පාප්ගේ බලතල හා බැඳි ආගමේ විනය නීති සංග්‍රහයද පාප් තුමාගේ ආඥා සහ තවත් නියෝගද ඔහු ගිනිබත් කළේය. "මගේ සතුරෝ මාගේ පොත් සහ ලියවිලි ගිනි ලා විනාශ කර දැමීමෙන් සත්‍යයේ ක්‍රියාවේදයට පහරක් එල්ල කළෝය, සත්‍යය වැළඳ ගැනීමට සාමාන්‍ය ජනතාවට තිබූ මාර්ගය විනාශ කළෝය. ඔවුන්ගේ ආත්ම විනාශ මුඛයට තල්ලු කර දැම්මෝය. එහෙයින් මම ඔවුන්ගේ නියෝග සහ බොරු අඩංගු ලියකියවිලි ගිනි ගොඩට දමනවා. දරුණු ගැටුමක් දන් ඇරඹෙනවා. මා මෙතෙක් කල් ගැටුණේ පාප් සමග පමණයි. මම මේ කර්තව්‍යය පටන් ගත්තේ දෙවියන්වහන්සේගේ ශ්‍රී නාමයෙන්. මා නැතිව වුවද එම කටයුත්ත උන්වහන්සේගේ බලමහිමයෙන් කෙළවරක් දකීවී." (D' Aubigne, b. 6, Ch. 10).

ඔහුගේ කර්තව්‍යයෙහි දුර්වල භාවය ගැන විසුළු කළ සතුරන්ගේ නින්දා බස්වලට පිළිතුරු දෙමින් ලූතර් මෙසේ පැවසීය. "දෙවියන්-වහන්සේ මාව තෝරා ගෙන මේ සේවය සඳහා කැඳවා නැතැයි කියා දන්නේ කව්ද? එසේ නොවේ නම් මාව එපා කරන්නාවූ අය දෙවියන්වහන්සේව එපා කරන බව දැනසිටීම යහපති. මා තනිව සිටිනවා යයි ඔව්හු පවසති; එහෙත් එසේ නොවේ, යෙහෝවඃවහන්සේ මා සමගය. ඔවුන්ගේ අදහස අනුව, මිසරයෙන් නික්ම එන්නාවූ අතරේදී, මෝසෙස් තනිව නැගී සිටියේය. ආහාබ් රජුගේ පාලන සමයේදී එලියා තනිවම දෙවියන්වහන්සේ උදෙසා පෙනී සිටියේය.

යෙරුසලෙම්හි නැගී සිටියේ යෙසායා පමණකි. බබිලෝනියේ සිටියේ එසකියෙල් පමණක්ය. දෙවියන්වහන්සේ අනාගතවක්තෘවරයෙකු තෝරා ගැනීමේදී උත්තම පූජකයා හෝ වෙනත් ප්‍රභූ පුද්ගලයෙකු තෝරා ගත්තේ නැත. උන්වහන්සේ සාමාන්‍යයෙන් තෝරා ගත්තේ සමාජ තලයේ පහත් අඩියක සිටි අවමානයට ලක් වූ පුද්ගලයෙකි. වරක් බැටළු එඬේරෙකු වූ ආමොස් උන්වහන්සේගේ තේරීම විය. ප්‍රබල රජවරුන්, කුමාරයන්, පූජකයන් සහ ප්‍රඥාවන්තයන් වැනි අයට තරවටු කිරීමට උන්වහන්සේ සෑම යුගයකදීම ශුද්ධවන්තයන්ට එම කටයුත්ත පැවරූ සේක. ඔවුහු ජීවිත පරදුවට තබා තම කාර්ය භාරය ඉටු කළෝය.... මා ප්‍රොපේතවරයෙකු යැයි කියන්නේ නැහැ. මා තනි පුද්ගලයෙක් වෙමි. සතුරෝ බොහෝ දෙනෙක් වෙති, එම නිසාම ඔවුන් බිය විය යුතු යයි මා කියනවා. දෙවියන්වහන්සේගේ වචනය මා සමග පවතින බවත් ඔවුන් සමග නැති බවත් මම සහතික ලෙස දනිමි." (D' Aubigne, b. 6, Ch. 10).

සභාවෙන් ඉවත් වීමට ලූතර් තීරණය කර ගත්තේ මහත් පොරයකින් යුක්තවය. මෙම වකවානුවේදී ඔහු මෙසේ ලීවේය. "බාල වියෙහි පටන් මාගේ ජීවිතය තුළට කාවද්දා ඇති සුළු දේ ගැන වුවද පරීක්ෂාකාරී වීමේ පුරුදු අතහැර දැමීම කෙතරම් අසීරු දැයි දිනෙන් දිනම මට ප්‍රත්‍යක්ෂ වේ. අහෝ, මට එයින් කොයිතරම් වේදනාවක් දනුණාද! ශුද්ධ ලියවිලිවල බලය මා සතුව පැවැති බව සැබෑය. එහෙත් පාප්ට විරුද්ධව හුදෙකලාව නැගී සිට ඔහු අන්ත ක්‍රිස්තුස් යයි චෝදනා කිරීම මට මහත් වේදනාකාරී කටයුත්තක් විය. මාගේ හදවතෙහි තිබූ වේදනාව කොයිතරම් මහත්ද! පාප් අධිකාරීන්ගේ තොල් මත නිතරම රැඳී ප්‍රශ්නයකින් මා කෙතරම් තික්ත පීඩනයකට පත් වුණෙම්ද. ඔවුන් නිරතුරුවම මාගෙන් ප්‍රශ්න කළේ, "එකම බුද්ධිමතා ඔබ පමණක්ද? අනෙකුත් සෑම කෙනෙක්ම වැරදි යයි ඔබ කියනවාද? එසේ වන්නේ කෙසේද? ඇත්තටම වැරැදී ඇත්තේ ඔබටයි. ඔබ සමග වැරැද්දෙහි බැඳෙන ආත්ම ගණනාවක්ම ඔබ සමග නරකාදියෙහි විනාශය කරා රැගෙන යනවාද? මෙසේ මම තමා සමගත්, සාතන් සමගත් සටන් කරලීමි. මෙම අනුමාන කිරීම් බිඳ දමමින් ක්‍රිස්තුස්වහන්සේම තම නොවරදින සුළු වචනින් මා ශක්තිමත් කරන තුරු සිතින් දුක් වින්දෙමි." (Martyn, "Life and Times of Luther," pp. 372, 373).

ලූතර් තම දහම අත්හැර දමන්නේ නැතිනම්, ඔහුව සභාවෙන් නෙරපා හරින බවට පාප් එල්ල කළ තර්ජනය දැන් ක්‍රියාත්මක විය. පාප්ගෙන් අලුත් නියෝගයක් නිකුත් විය. ලූතර් රෝමානු සභාවෙන් වෙන්වූ බවත්, ඔහු ස්වර්ගයේ ශාපයට හිමිකම් කියන අයෙකු බවත් එම නියෝගයෙහි ඇතුළත් විය. ඔහුගේ දහම පිළිගන්නා වූ සැමටම එම දඬුවම හිමිවන බවත් එම නියෝගය කියා පෑවේය. මහා සංග්‍රාමය දැන් ආරම්භ විය.



තමන්ගේ කාලයට යෝග්‍ය වූ සත්‍යතාවන් මිනිසුන්ට ඉදිරිපත් කරන්නාවූ දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන්ගේ ඉරණම විරුද්ධකාරයන් ඇති කරගැනීමය. ලූතර්ගේ පණිවිඩය එම වකවානුවේදී ජනතාවට ඉදිරිපත් කළ යුතු සත්‍යයේ කාලීන පණිවිඩය විය. එසේම, අදට බලපාන්නාවූ වැදගත්වූ වර්තමාන සත්‍යයක් සභාව උදෙසා ඉදිරිපත් වීමට නියමිතය. තමන්වහන්සේගේ කැමැත්තෙහි අනුශාසනා අනුව ක්‍රියා කරන්නාවූ තැනැත්වහන්සේ තමන්වහන්සේගේ සත්‍යතාවන් ප්‍රකාශකර හැරීමට විවිධාකාර පුද්ගලයන් තෝරා ගන්නාසේක, ඔවුන්ට විවිධ පරිසරයන් යටතේ අත්දැකීම් ලැබීමට සලස්වනසේක. ඔවුන් ජීවත් වන්නාවූ කාලයට ඉතා යෝග්‍ය වූ කර්තව්‍යයන් ඔවුන්ට දෙනසේක. ඔවුන්ට ලබා දුන් ආලෝකය ඔවුන් අගය කරන්නේ නම්, සත්‍යතාවයේ තවත් පුළුල් පැතිකඩ උන්වහන්සේ ඔවුන්ට ලබාදෙනවා ඇත. ලූතර්ට විරුද්ධ වූ පාප් බල අධිකාරීන් මෙන් බහුතර ජනතාවක් අදත් සත්‍යතාවය තුළ පැවැත්මට මනාපයක් දක්වන්නේ නැත. පෙර යුගයන්හි සිදුවූවාක් මෙන්ම ජනතාව අදත් දේව වදන් පිළිගැනීමට වඩා මිනිස් සම්ප්‍රදායන් සහ ඉගැන්වීම් අදහා ගැනීමට ප්‍රිය වෙති. වර්තමානයේදී සත්‍යය වූ දහම් ඉදිරිපත් කරන්නාවූ අයව පිළිගැනීමට ඉහත යුගයන්හි වූ ආකාරයෙන්ම මැලිකමක් දක්වීම ගැන මවිත විය යුතු නොවේ. සත්‍යය සහ වරද පිළිබඳව පවතින මහත් අරගලය, එනම්, ක්‍රිස්තුස්වහන්සේ සහ සාතන් අතර පවතින මහා අරගලය, ලෝකාවසානයේදී වඩා තියුණු මුහුණුවරක් ගන්නවා ඇත.

යේසුස්වහන්සේ තමන් ගෝලයන්ට මෙසේ පැවසූසේක: "නුඹලා ලෝකයට අයිති නම්, ලෝකයා තමුන්ගේම අයට ආදරේ වන්නෝය. නුමුත් නුඹලා ලෝකයාගෙන් නොවන නිසාත් මා විසින් නුඹලා ලෝකයෙන් තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට වෛර වෙති. දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නොවේ යයි නුඹලාට මා කී වචනය සිහිකරන්න. ඔව්හු මට පීඩා කළෝ නම් නුඹලාටත් පීඩා කරන්නෝය. මාගේ වචනය රක්ෂා කළෝ නම් නුඹලාගේ වචනයත් රක්ෂා කරන්නෝය." (යොහන් 15:19,20). ඒ අතරම අපගේ ස්වාමීන්වහන්සේ මෙසේද පවසා ඇත. "සියලු මනුෂ්‍යයන් නුඹලා ගැන හොඳ කියන කල නුඹලාට දුක්වේ! මක්නිසාද ඔවුන්ගේ පියවරු බොරු අනාගතවක්තෘන්ටත් එසේම කළෝය." (ලූක් 6:26). ලෝකයේ ආත්මය හා ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය අතර එදා පැවැති තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක් අද නොපවතී. සුපිරිසිදු කමින් යුතුව දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන්නාවූ අයව එදාට වඩා වැඩි කැමැත්තකින් පිළිගනු ලබන්නේ නැත. සත්‍යතාවට විරුද්ධ වීමේ ක්‍රමවේදයන් වෙනස් විය හැකිය. ඒවා වඩාත් සූක්ෂ්ම වන බැවින් ඒවා එපමණ විවෘත ලෙස නොපවතින්ට පුළුවන. එහෙත් ලෝකාන්තිමය දක්වාම සතුරුකම සහ වෛරය පවතින බව නියතය.

# 8

# ලූතර් ධර්මාධිකරණය ඉදිරියේ

පස්වන චාර්ල්ස් එම්ප්‍රදෝරු රජතුමා ජර්මනියේ සිංහාසනාරූඪ විය. රෝමයේ සිට පැමිණි රාජ දූතයෝ රජතුමාට ශුභාශිංසනය පුද කරන පිණිස හනික ජර්මනියට පැමිණියෝය. ප්‍රතිසංස්කරණයට විරුද්ධව ඔහුගේ බලය යොදවන ලෙසද ඔවුහු රජතුමාගෙන් ඉල්ලා සිටියෝය. චාර්ල්ස් අගරජතුමා තම ඔටුන්න හිමිකර ගැනීම සඳහා සැක්සනියේ ආදිපාදවරයාගෙන් බොහෝ උපකාර ලබා තිබුණේය. දැන් මේ ආදිපාදවරයා රජතුමාගෙන් ප්‍රබල ඉල්ලීමක් කළේය. ලූතර්ට ස්වකීය තත්ත්වය පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබාදෙන තුරු ඔහුට විරුද්ධව කිසි පියවරක් නොගන්නා ලෙස ඔහු ඉල්ලා සිටියේය.  ඒ ඉල්ලීම පැහැර හැරීමට රජතුමාට නොහැකි විය. මෙසේ රජතුමා මහත් ප්‍රශ්නයකට මුහුණ දුන්නේය. එය මහත් ගැටළුවකට මෙන්ම ලැජ්ජාවටද කාරණයක් විය. ලූතර්ට මරණීය දණ්ඩනය නියම කරන නියෝගයක් දීමට වඩා අඩු යමක් ලැබීමෙන් පාප් බලධරයෝ සෑහීමකට පත්වන්නේ නැත. ආදිපාදවරයා ස්ථිරවම ලූතර් පිළිබඳව තම ස්ථාවරය මෙසේ ප්‍රකාශ කර තිබුණේය. "අතිගරු රජතුමා හෝ වෙනත් අයෙකු හෝ විසින් ලූතර්ගේ ලියවිලි සහ ප්‍රකාශන වැරදි බව ඔප්පු කර නැත. එම නිසා ආචාර්ය ලූතර්ට සැදැහැවත් සහ අපක්ෂපාතී ත්‍රී පුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ තමාගේ ප්‍රකාශන නිවැරැදි බව ඔප්පු කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය. රජය විසින් ඔහුගේ ආරක්ෂාව තහවුරු කළ යුතුය."(D. Aubigne, b. 6, Ch 11)

පස්වන චාර්ල්ස් රජතුමා රාජ්‍යයට පත්කරනු ලැබුවාට ස්වල්ප කාලයකට පසු සමස්ත ජර්මානු ජනපද මන්ත්‍රණ සභා සැසි වාරයක් වර්ම්ස් නගරයේදී පැවැත්විණ. මෙම ජාතික මණ්ඩලයේදී ඉතා වැදගත් දේශපාලනික ගැටළු කිහිපයක් මෙන්ම ජනහිතවාදී ශුභ සාධක මෙහෙයුම් ගණනාවක්ද සාකච්ඡාවට යොමු විය යුතුව තිබුණේය. තරුණ රජතුමා මුණගැසීමේ මංගල සමුළුව මෙසේ රැස් වුණේය. ප්‍රාන්ත කුමාරවරුන්ට රජතුමා මුණගැසීමේ ප්‍රථම නිල අවස්ථාව උදා විය. පීතෘ භූමියේ නන් දෙසින් රාජ්‍ය සහ ආගමික ප්‍රභූවරු මෙම රැස්වීමට සහභාගි වූහ. තමන්ගේ පරවේණි උරුමයන් ගැන අභිමානයෙන් උදම් වූ, බලයෙන් අනූන වූ රදළයෝ ද, බලයෙන් සහ තනතුරු නිලයෙන් තමන්ට ප්‍රභූ තත්ත්වයක් ඇතැයි සිතූ ආගමික කුල දෙටුවෝද, රාජ සභාවේ උසස් නිලධාරිහූද, හමුදා බලධරයෝ ද, විදේශ රටවලින් පැමිණි තානාපතිවරුද වර්ම්ස්හි පැවති මේ මන්ත්‍රණ සභා සැසි වාරයට එක් රැස් වූහ. විශාල නියෝජිත සංඛ්‍යාවකින් සැදුම්ලත් එම රැස්වීමේදී දැඩි අවධානයට යොමු වූ විෂය වූයේ සැක්සනියේ ප්‍රතිසංස්කරණ වාදියාගේ ඉරණම පිළිබඳ කරුණය.

මන්ත්‍රණ සභාවට ලූතර්ව කැටුව එන්නැයි චාර්ල්ස් රජතුමා සැක්සනියේ ආදිපාදවරයාට පවසා තිබුණේය. ලූතර්ට සම්පූර්ණ රැකවරණය ලබාදීමත්, උද්ගතව ඇති විෂය පිළිබඳව හසල දැනුමක් ඇති ප්‍රවීණයන් සමග විවෘත ලෙස සාකච්ඡා කිරීමේ නිදහසත් රජතුමා විසින් ලූතර්ට සහතික වී තිබුණේය. රජතුමා ඉදිරියෙහි පෙනී සිටීමට ලූතර් තුළ තිබුණේ දැඩි අභිලාෂයකි. මේ වකවානුව වන විට ලූතර්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉතා දුර්වලව පැවතියේය. එසේ වුවද, ඔහු ආදිපාද තුමාට මෙසේ ලියා ඇරියේය: "මට යහපත් සුවයෙන් යුතුව වර්ම්ස් වෙත පැමිණීමට නොහැකි විය හැකිය. කෙසේ හෝ මම, රෝගී තත්ත්වයෙන් යුතුව තවත් අය විසින් ඔසවා ගනු ලැබ හෝ රැස්වීමට එනවා. රජතුමා මට කළ ඇරයුම දෙවියන්වහන්සේගේ ආරාධනයක් ලෙස මම පිළිගන්නවා. ඔවුන් මා කැඳවා ඇත්තේ විෂය පිළිබඳව තවත් විස්තර දැනගැනීමට නොවන්නේය. ඔවුන් මා තාඩන පීඩනවලට ලක් කරන්නේ නම්, ඒ ගැනත් මා පුදුම වන්නේ නැහැ. මේ පිළිබඳව සියළු කාරණා මම දෙව් සමිදාණන්ගේ ශ්‍රී හස්තයට භාර කරන්නෙමි. දසත ගිනි සිළු විහිදවූ කුඩා ගිනි මැලයෙන් තරුණයින් තුන්දෙනා බේරාගත් තැනැන්වහන්සේ තවමත් ජීවත්ව සිටින සේක, එතුමාණෝ අදත් රජකම් කරනසේක. මාව බේරා ගැනීම උන්වහන්සේගේ කැමැත්ත නොවේ නම්, මගේ ජීවිතය මට වටිනා එකක් නොවන්නේය. ශුභාරංචිය කුරිරු දුෂ්ට පුද්ගලයන්ගේ අවමානයට ලක්වීමට ඉඩ දිය යුතු නොවේ. එසේ නොකොට ඔවුන්ට ජයග්‍රාහක වීමට ඉඩ නොතබා ශුභාරංචියේ පවිත්‍රතාව රැකගැනීමට අප ලේ වැගිරවීමට පවා සූදානම් විය යුතුය. මාගේ සහෝදරයන්ගේ ගැළවීම උදෙසා මාගේ ජීවිතය රැකගත යුතුද, නැතහොත් බිලි දිය යුතුද, කියා හෝ තීරණය කිරීම මා සතු කාර්යයක් නොවේ **...** සත්‍යතාව උදෙසා මාගේ සම්පූර්ණ සහාය ලබා දෙමි. එයින් පැන යාමට හෝ පැවසූ දෙය ඉල්ලා අස්කර ගැනීමට හෝ මාගේ සහාය ලබා නොදෙමි. පැන යාමට මට බැහැ. ඉල්ලා අස්කර ගැනීම කොහෙත්ම කරන්න බැහැ. (D’ Aubigne, b 7, Ch. 1).

මන්ත්‍රණ සභාව ඉදිරියෙහි තම තතු පැහැදිලි කරදීමට ලූතර් ඉදිරිපත් වන බවට වූ පුවත පැතිරීයත්ම, ජනතාව කුතුහලෙන් පිරී ගියෝය. ලූතර් සහ පාප් බලධාරීන් අතර පැන නැඟී ඇති මතභේදය විසඳීම සඳහා පාප්ගේ නියෝජිතයා ලෙස ඇලියැන්ඩර් පත්කර තිබුණේය. ලූතර්ගේ පැමිණීම ගැන ඇසූ හෙතෙම තැති ගත්තේය, කෝපයෙන් දිලිහෙන්නට විය. මෙම හමුවේදී ලැබෙන්නාවූ තීන්දුව පාප් බල අධිකාරිත්වයට මරු පහරක් විය හැකි බව ඔහු දුටුවේය. මෙම විෂය සම්බන්ධව පාප් විසින් දැනටමත් තීන්දුවක් ලබාදී තිබුණේය.

එම තීන්දුව මගින් ලූතර්ව වරදකරුවෙකු ලෙස දඬුවමට පත්කර තිබිණ. එසේ තිබියදී එය නැවත වරක් විනිශ්වයකට පත්කිරීම යනු පරම උතුම් පාප්වරයාගේ බල අධිකාරිත්වයට අපහාස කිරීමකි. ලූතර්ගේ දක්ෂ ප්‍රකාශන කරණකොටගෙන ජනපදවල කුමරුවන්ගේ කතෝලික සමයට වූ ලැදියාව දෙදරා යනු ඇතැයි ඇලියැන්ඩර් තුළ බියක්ද පැවතියේය. විභාග කිරීමක් සඳහා ලූතර්ගේ වර්ම්ස්ට පැමිණීමට එරෙහිව ඔහු චාර්ල්ස් රජතුමාට විරුද්ධත්වය ප්‍රකාශ කළේය. ලූතර්ව සභා සාමාජිකත්වයෙන් නෙරපා හරිනු ලැබීමේ පාප් අණඥව මෙම දවස්වලදීම ප්‍රකාශ කරන ලදී. මෙම ප්‍රකාශනය සහ පාප්ගේ නියෝජිතයන්ගේ විරුද්ධත්ව ප්‍රකාශ කිරීම්ද එක්ව ක්‍රියාත්මක වීමෙන් ඔවුන්ගේ ඉල්ලීමට අවනත වීමට රජතුමාට සිදුවිය. ලූතර් විසින් පළ කර ඇති දහම් ඉල්ලා අස්කර ගන්නේ නැති නම් ඔහු විටන්බර්ග්හිම සිටිය යුතු යයි රජතුමා ආදිපාදවරයාට ලියා දන්වීය.

මෙම ජයග්‍රහණයෙන් සෑහීමට පත් නොවූ ඇලියැන්ඩර් ඉතා සූක්ෂ්ම අයුරින්, ලූතර්ව දඬුවමට පත්කිරීමට හැකි සෑම ක්‍රියාදාමයක්ම යෙදෙව්වේය. වෙනත් කාර්යයන් සඳහා යෙදවිය හැකිව තිබූ විවිධ ආකාර ක්‍රියාවේදයන් ඔහු ලූතර්ට එරෙහිව පණ ගැන්වීය. පැමිණ සිටි කුමරුවන්, ආගමික නායකයන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉදිරියෙහි ලූතර්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කළ ඇලියැන්ඩර් ලූතර් වනාහි රජයට විරුද්ධව ක්‍රියා කිරීමට ජනතාව පෙළඹූ වූ අයෙකු ලෙසින්ද, කැරලිකාරයෙකු ලෙසින්ද, භක්තියක් හෝ ශ්‍රද්ධාව හෝ විරහිත අයෙකු ලෙසින්ද, දේව අපහාසකාරයෙකු ලෙසින්ද චෝදනා කරමින් ඔහු සත්‍යතාවයෙන් තොරව කරුණු ඉදිරිපත් කළේය. ඔහු කරුණු ඉදිරිපත් කළ වේගවත් තද පරුෂ විලාශයත්, ඔහුගේ ආවේගී ප්‍රකාශන විලාශයත් මගින් ඔහු තුළ තිබූ ආත්මය මනා ලෙසින් පිළිබිඹු විය. "ඔහු තුළ පවතින්නේ ද්වේෂය සහ පළිගැනීමේ ආත්මය මිස ජ්වලිතතාව සහ ආගමික ශක්තියක් නොවේ ය"යි එක් ලේඛකයෙක් පැවසුවේය. මන්ත්‍රණ සභා රැස්වීමට පැමිණි බහුතරයකගේ නිගමනය ලූතර්ට පක්ෂපාතීව විය.

ලූතර්ට විරුද්ධව ඇති පාප්ගේ ආඥවන් ක්‍රියාත්මක කරන්නැයි ඇලියැන්ඩර් මහත් උද්‍යෝගයෙන් යුතුව රජතුමාට බලකර සිටියේය. එහෙත් ප්‍රාන්ත අධිකාරීන්ගේ සම්මුතියකින් තොරව මෙවැනි දෙයක් ක්‍රියාත්මක කිරීමට ජර්මානු නීති පද්ධතියෙන් අවසරයක් නොවීය. එහෙත් පාප් නියෝජිතයාගේ උනන්දුව නිසා තමාගේ පැමිණිල්ල මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කිරීමට චාර්ල්ස් රජතුමා ඇලියැන්ඩර්ට අවසර දුන්නේය. පාප්ගේ නියෝජිතයාට එය අභිමානී සාඩම්බරයෙන් යුත් දිනයක් විය. මන්ත්‍රණ සභා රැස්වීම විශිෂ්ට විය. එසේම විභාගයට ගෝචර වූ කරුණද විශිෂ්ට විය. සෑම සභාවකම මැණියන් සහ ප්‍රියාව වූ රෝමය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම ඇලියැන්ඩර්ගේ



කාර්ය භාරය විය. රැස්ව සිටි කිතුදහමේ බලධාරීන් ඉදිරියෙහි පේතෘස්ගේ රාජ්‍යයේ බල අධිකාරිත්වය තහවුරු කිරීම පාප් නියෝජිතවරයාට පැවරී තිබුණේය. ඇලියැන්ඩර් ව්‍යක්ත කථිකයෙක් විය. තමාට ලැබූ අවස්ථාවෙන් උපරිමය නෙලා ගැනීමට ඔහු සැදී පැහැදී සිටියේය. සම්භාවනීය උත්කෘෂ්ඨ අධිකරණයක් ඉදිරියෙහි රෝමයට විරුද්ධව තීරණයක් නිකුත් කර තිබුණේය. රෝමය උදෙසා තම ස්ථාපිතය ඉදිරිපත් කිරීමට, තර්ක කිරීමට, නිදොස් බව කියාපෑමට ඇයගේ දක්ෂතම කථිකයන් අතරෙන් එක් තැනැත්තෙකු වූ ඇලියැන්ඩර්ට භාග්‍යය යෙදී තිබුණේය. පුනරුදවාදියාට පක්ෂපාතීත්වය දක් වූ සමහරෙක් ඇලියැන්ඩර්ගේ තර්ක ඉදිරිපත් කිරීමෙහි ආදීනව උපේක්ෂාවෙන් යුතුව බලා සිටියහ. මෙහිදී රැස්වීමට සහභාගී වීමට සැක්සනියේ ආදිපාදවරයා පැමිණ සිටියේ නැත. එහෙත් පාප් නියෝජිතයාගේ දේශනයෙහි වැදගත් කරුණු ලියා ගැනීම පිණිස ඔහුගේ උපදේශකවරුන් කිහිප දෙනෙක්ම රැස්වීමට පැමිණ සිටියහ.

තමා ලැබූ අධ්‍යාපනයෙහි සහ කථිකත්වයෙහි චතුර භාවයෙහි සම්පූර්ණ බලය හසුරවමින් සත්‍යතාව පරදවා ලීමට ඇලියැන්ඩර් උදාර ලීලාවෙන් සූදානම්ව සිටියේය. සභාවෙහිත්, දේශයෙහිත්, ජීවත්ව සිටින්නාවූ ද, මරණයට පත්ව සිටින්නාවූ ද අයගේත්, පූජකයන්ගේ සහ ගිහියන්ගේත් අධිකාරී මණ්ඩල සහ පුද්ගලික කිතුණුවන්ගේත් පරම සතුරෙකු හැටියට ලූතර්ට චෝදනා පිට චෝදනා එල්ල කරමින් සැමගේ අවධානය දිනා ගැනීමට ඇලියැන්ඩර් මහත් පරිශ්‍රමයක් දැරුවේය. ලූතර් සිදුකර ඇති වරද සමූහය කෙතරම් විශාලද යත් දුර්ලබ්ධි මිථ්‍යා ලබ්ධිකයන් ලක්ෂයක් වුවද ගිනිබත් කිරීමට එය ප්‍රමාණවත්ය" යි පාප් නියෝජිතයා තර්ක කළේය.

ප්‍රතිසංස්කරණවාදී අනුගාමිකයන් කෙරෙහි අපවාදය සහ පිළිකුල ඇති කිරීමෙහි ලා ඔහු තම දෙසුම මෙසේ අවසාන කළේය. "ලූතර්වාදී ලබ්ධිකයන් යනු කවරේද? පොදු බැතිමතුන් මුළා කරමින් නොමඟ යැවීමෙහි ලා ක්‍රියා කරන්නාවූ කපටින්ගෙන් සැදුම්ලත් අධමයන් කොටසකි. ඔවුන් සැදී ඇත්තේ ගරු සරු නැති ගුරුවරුන්ගෙන්, දූෂිත පූජකයන්ගෙන්, සල්ලාල තාපසයන්ගෙන්, නූගත් නීතිඥයන්ගෙන් සහ අවමානයට ලක් වූ රදළවරුන්ගෙන්ය. ඔවුන්ට වඩා රෝමානු කතෝලිකයන් කෙතරම් ශ්‍රේෂ්ඨද? සභික සංඛ්‍යාවෙන්, හැකියාවෙන් සහ බලයෙන් කතෝලික සභාව ලූතර්වාදී ලබ්ධිකයන්ට වඩා කොයිතරම් ඉහළද! මෙම සංකීර්ණමත් මන්ත්‍රණ සභාව ලබා දෙන්නාවූ ඒකමතික තීරණයක් මගින් සාමාන්‍ය බැතිමතුන්ගේ නෙත් විකසිත වනවා ඇත; නුවණ මඳ අයට අනතුරු ඇඟවීමක් ලැබෙනවා ඇත; ස්ථිරසාර තීරණයට එළඹීමට නොහැකිව දෙපසට වැනෙමින් සිටින්නාවූ අයට තීරණයක් කරා එළඹීමට මාර්ගය සැදෙන්නේය; බලයන්ට දිරිය දෙනු ලබන්නේය." (D’ Aubigne , b. 7, Ch. 3).

සෑම යුගයකම දිවි ගෙවූ, සත්‍යතාව පැතිරවීමෙහි පුරෝගාමීන්ට මෙයාකාරයෙන්ම අවි අමෝරා ගත් විරුද්ධවාදීන්ගෙන් ගැහැට එල්ල වී තිබේ.. සත්‍යය යයි කියා ගනිමින් ස්ථාපිතව පවතින දුර්මත ඉදිරිපත් කරන්නාවූ අය ඉදිරිපිට දෙවියන්වහන්සේගේ නිර්මල සත්‍යතාව පැතිරවීමට වෙහෙසෙන්නාවූ අයට යට කී ආකාරයෙන් පවතින තර්ක විතර්කවලට මුහුණ දීමට සිදුවේ. ජනප්‍රිය ආගමක් අනුගමනය කිරීමට සිතැති අය මෙසේ විචාරති: "අලුත් ධර්මතාවන් ඉගැන්වීමට වෙර දරන්නාවූ මේ ගුරුවරුන් කව්ද? ඔවුන්ට වැඩි උගත්කමක් නැත. සංඛ්‍යාවෙන්ද ඉතා අඩුය. එහෙත් ඔවුන් සතුව සත්‍යතාව ඇතැයිද තමා දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟ යයි ද ඔවුහු පවසති. ඔවුහු දැනුම නොමැති වූ මුළා කිරීමකට භාජනය වූ අය වෙති. එහෙත් අපගේ සභාවෙහි (රෝමානු සභාවෙහි) බැතිමතුන්ගේ සංඛ්‍යාව කොයි තරම් විශාලද! අපගේ රෝමානු සභාවෙහි බලපෑම කොතරම් උසස්ද! ශ්‍රේෂ්ඨවූ ද, උගත්වූ ද කෙතරම් විශාල සංඛ්‍යාවක් අප අතරේ සිටින්නෝද! අපගේ පාර්ශ්වයෙහි ඇති බලය කෙතරම් මහත්ද!" ලෝකයේ සිටින්නාවූ ජනතාව කෙරෙහි සුපිරි බලපෑමක් ඇති කිරීමට යථෝක්ත තර්ක සමත්ය. එහෙත් එම තර්ක එදාට වඩා අද වුවද තීරණාත්මක සත්‍යතාව නොවන්නේය.

බොහෝ අය සිතන පරිදි ප්‍රතිසංස්කරණය ලූතර් සමග නිමාවට පත් නොවීය. ලෝක ඉතිහාසයෙහි අවසානය තෙක් එම කර්තව්‍යය අඛණ්ඩව පැවැතිය යුතුය. දෙවියන්වහන්සේගේ අවසරය පරිදි තමා ලද ආලෝකය පරාවර්තනය කිරීමේ මහා භාරදූර කාර්යය ඉටු කිරීමට ලූතර්ට විශාල වැඩ කොටසක් පැවරී තිබුණේය. එහෙත් ලෝකවාසීන්ට දිය යුතු සම්පූර්ණ ආලෝකය ඔහුට පවරා දෙනු නොලැබීය. එදා පටන් අද දක්වාම අලුත් ආලෝක දහරා මගින් ශුද්ධ ලියවිලි මත ප්‍රභාව පතුරවමින් අලුත් සත්‍යතාවන් එළිදරව් වෙමින් පවතී.

පාප් නියෝජිතයාගේ දෙසුම මන්ත්‍රණ සභාවේ සිටි සැමගේ හදවත් තුළ මහත් බලපෑමක් ඇති කිරීමෙහි ලා සමත් විය. පාප් නියෝජිතයාගේ තර්ක බිඳ දැමීමට ලූතර් මන්ත්‍රණ සභාවට පැමිණ සිටියේ නැත. පාප් නියෝජිතයා ඉදිරිපත් කළ ශුද්ධ ලියවිලි, ව්‍යාජ ඉගැන්වීම් බිඳ දැමීමට දේව ධර්ම වියතෙකු වූ ලූතර් නැති වීම පාප් නියෝජිතයාගේ වාසියට හේතු විය. පුනරුදවාදියාගේ පැත්තට කථා කිරීමට කිසිවෙකු හෝ ඉදිරිපත් නොවීය. ඔහු ඉගැන්වූ ධර්මතාවන් මෙන්ම ඔහුවද වරදකරු කිරීම බහුතරයේ හැඟීම විය. තවද, ඔහු විසින් උගන්වන ලද දහම් මුලිනුපුටා දැමීමටද එකඟතාවක් ඇති බව පෙනී ගියේය. තමන්ගේ ඉගැන්වීම් සත්‍යය බවට ඒත්තු ගැන්වීමටත් ඒවා මිනිස් සිත්හි ස්ථාපිත කිරීමටත් රෝමානු සභාවට මෙහිදී ලැබුණේ ඉතා ප්‍රසන්න අවස්ථාවකි. තමන් විසින් ගොනු කළ චෝදනා



සියල්ලක්ම නිවැරැදි යයි ඒත්තු ගැන්වීමට වූ ක්‍රියාදාමය විරුද්ධතාවකින් තොරව ස්ථාපිත විය. එහෙත් මෙම ජයග්‍රහණය වූකලී පරාජයේ සංඥව විය. මෙතැන් පටන් සත්‍යතාව සහ බොරුව අතර වූ වෙනස වඩාත් පැහැදිලිව කැපී පෙනෙනවා ඇත. ලොව දස දෙස්හි පවතින විවෘත ගැටුම්වලදී මෙම වෙනස පෙනී යනවා ඇත. රෝමානු සභාව මෙතෙක් කල් දැරූ සුරක්ෂිත භාවය එදින පැවති ප්‍රමාණයට වඩා ස්ථිරතාවයෙන් ඊට පසුව නොපැවතියේය.

රෝමයේ උදහසට ලූතර්ව පාවාදීමට මන්ත්‍රණ සභාවේ බහුතරයක්, විරුද්ධ නොවීමේ මතයක පිහිටා සිටියහ. සභාව ඇතුළත පවතින්නාවූ දූෂිතය සහ අපචාර ක්‍රියාදාමයන් මන්ත්‍රීන් බොහෝ දෙනෙකුගේ අවධානයට යොමු වී තිබුණේය. ආගමික බලධරයන්ගේ කෑදරකම සහ දූෂිත තත්ත්වය නිසා රෝමානු ජනතාවට විඳින්නට සිදු වී ඇති අපවාදාත්මක සහ නින්දා සහගත තත්ත්වය මැඩ පවත්වා ගැනීමට පියවර ගැනීම එකී මන්ත්‍රීවරුගේද ආශාව විය. පාප් අධිකාරී බලයේ උත්තරීතර ස්වභාවය ඉතා යහපත්, පැහැපත් රාමුවක් තුළ බහා ඉදිරිපත් කිරීමට පාප් නියෝජිතයා මහත් වෑයමක් ගත්තේය. මෙහිදී දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වූසේක. එහිදී එක් මන්ත්‍රීවරයෙකු මෙහෙය වීමට උන්වහන්සේ ක්‍රියා කළසේක. බැතිමතුන්ව කුරිරු ලෙස තලා පෙළා ගෙන යන්නාවූ අනුකම්පා විරහිත පාප් අධිකාරී පාලනය පිළිබඳව තතු හෙළිදරව් කිරීමට හෙතෙම ඉදිරිපත් විය. ප්‍රතාපවත් දැඩි ස්ථාවරයකින් නැගී සිටි සැක්සනියේ ජෝර්ජ් ආදිපාදවරයා එම මන්ත්‍රී මණ්ඩලය මධ්‍යයේ නැගී සිටියේය. පාප් පාලනයේ රැවටිලිකාර ස්වභාවය සහ වංචාවන් ඔහු අඩු නැතිව හෙළිදරව් කළේය. එමගින් ජනතාවට අත් වී ඇති ශෝචනීය ඉරණමද ඔහු පැහැදිලිව කියා දුන්නේය. මෙම කථාව අවසන් කරමින් ඔහු මෙසේ පැවසීය:

"මේවා රෝමානු සභාවට විරුද්ධව ඉදිරිපත් වන්නාවූ දූෂිත ක්‍රියාදාමයන් සමහරක් පමණය. රෝමානුව තුළ ලැජ්ජා බිය ඇත්තේම නැත. ඔවුන්ගේ එකම අරමුණ මුදල් සහ මුදල් එක්රැස් කිරීමය. සත්‍යතාව ඉගැන්වීම ඒකායන අරමුණ කොටගත් දේශකයෝ ඒ වෙනුවට දේශනා කූඩුවෙන් නිකුත් කරන්නේ බොරුව සහ මුසාවය. එය විඳ දරා ගැනීමට සෑම දෙනෙක්ම පාහේ හුරු පුරුදු වී සිටිති. එසේම පවසන්නාවූ බොරුවේ ප්‍රමාණය අනුව ලැබෙන්නාවූ පඩුරුද විශාලය. මෙම නින්දිත පිළිකුල්, උල්පතින් ගලා එන ජල ධාරාවද දූෂිතය. සල්ලාලකමට හුරු වූ පුද්ගලයෝ ධන සම්පත් සොයමින් වෙහෙස වෙති. පූජක පක්ෂය කෙරෙහි එල්ල වී ඇති මෙම දූෂිත චෝදනා නිසා අසරණ ආත්ම දහස් ගණනින් සදාතන නරකාදිය වෙත තල්ලු කරනු ලැබෙති. සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් සිදුවිය යුතුමය." (D; Aubigne, b. 7 Ch. 4).

මෙවන් ප්‍රබල අයුරින් වේගවත්ව අභියෝග ස්වරයකින් පාප් බලවතුන්ගෙන් සිදුවන අපචාර සහ අතවර ගැන කියාපෑමට ලූතර් වුවද සමත් නොවන්නේය. තවද, මෙම කථිකයා ලූතර්ගේ පරම සතුරෙකු වූ නිසා ඔහුගේ කථාවට වැඩි අනුබලයක් ලැබුණේය.

මන්ත්‍රණ සභාවේ සභිකයන්ගේ ඇස් ආත්මිකව විවෘත වූයේ නම් දෙවියන්වහන්සේගේ දූතයන් එතැන සිටි බව ඔවුන්ට දකගන්නට හැකිවනවා ඇත. එකී දූතයන් වරද නැමැති අන්ධකාරයට විරුද්ධව සත්‍යතාවේ ආලෝක දහරා පතුරවමින් රැස්ව සිටි සාමාජිකයන්ගේ මනස් සහ හදවත් සත්‍යතාව පිළිගැනීමට විවෘත කරමින් සිටියහ. ප්‍රතිසංස්කරණ විරුද්ධවාදීන් පවා මෙසේ ඉදිරිපත් කළේ සත්‍යතාවයේ සහ ප්‍රඥවේ දෙවියන්වහන්සේගේ බලය මිස වෙන කිසිවක් නොවේ. ඉදිරියෙහි ඇති සුවිශේෂී ක්‍රියාවේදය මල් ඵල ගැන්වීමට දෙවියන්-වහන්සේගේ බලය මෙසේ මාර්ගය විවෘත කළේය. රැස්වීමට මාර්ටින් ලූතර් පැමිණ සිටියේ නැත. එහෙත් ලූතර්ගේ හඬට වඩා ඉතා ප්‍රබල හඬක් ඒ රැස්වීම් ශාලාවේ ක්‍රියාත්මක විය.

මන්ත්‍රී මණ්ඩලය විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි කමිටුවක් පත්කරන ලදී. ඔවුන්ගේ කාර්ය සාධනය වූයේ ජර්මානු ජනතාව කෙරෙහිවූ පාප් බලධාරීන්ගේ තාඩන පීඩන සහ බාධා කිරීම් සෝදිසි කර බලා එකී කාරණා වෙන වෙනම සඳහන් කරමින් වාර්තාවක් පිළියෙල කිරීමය. විවිධ විෂයන් එකසිය එකකින් සමන්විත වූ මෙම ලැයිස්තුව අගරජතුමාට පිළිගන්වන ලදී. ලැයිස්තුව සමග ප්‍රබල ඉල්ලීමක්ද විය. එනම්, පාප් බලධරයන්ගේ අගතිකම් නිවැරැදි කිරීමට කඩිනම් පියවර ගන්නැයි වූ අයැදුමක්ද ලැයිස්තුව සමග මෙසේ ඉදිරිපත් විය. "කිතුණු සභාවේ නායකයා වටා ගොඩ නැගී ඇති මෙම දූෂිත ආරංචි කරණකොටගෙන ක්‍රිස්තියානි ආත්මයන්ට සිදුවන්නාවූ විපත්තිය කෙතරම් පාඩුවක්ද! මෙම ක්‍රියාවන් කුමන ආකාරයේ ආත්ම කොල්ල කෑමක්ද! කුමනාකාර බලෙන් යුතු පැහැර ගැනීමක්ද! අපගේ ජනතාව විනාශයට සහ අගෞරවයට පාත්‍රවීම වළකාලීම අපගේ පරම යුතුකම වන්නේය. පවතින්නාවූ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණයකට ලක්කර එය නිසියාකාරව සිදුවන බවට වග බලාගන්නැයි ඔබතුමාගෙන් යටහත් පහත්ව ඉල්ලා සිටින්නෙමු. මෙය කඩිනමින් ඉටුකරන ලෙසද ඉල්ලමු." (D.Aubigne, b. 7, Ch. 4).

ලූතර් සභාව ඉදිරියට පමුණුවන ලෙස මන්ත්‍රී මණ්ඩලය තදින් ඉල්ලා සිටියේය. ඇලියැන්ඩර්ගේ ආයාචනා, විරුද්ධතාවන්, සහ තර්ජන මධ්‍යයේ වුවද ලූතර්ට මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින්නැයි ආඥවක් නිකුත් කිරීමට අග රජතුමා කැමැත්ත පල කළේය. මන්ත්‍රී මණ්ඩල රැස්වීමට පෙනී සිටීමෙන් පසුව ඔහුව ආරක්ෂිත ස්ථානයක් කරා පමුණුවනු ලබන බවට වූ සහතිකයක්ද ආඥව සමගම නිකුත්



විය. මෙම ආඥව විටන්බර්ග්හි සිටි ලූතර් වෙත ගෙන යන ලද්දේ රාජකීය දූතයෙකු විසින්ය. ලූතර්ව වර්මිස් වෙත කැඳවා ගෙන ඒමේ කාර්යයද මේ තැනැත්තාට හිමිව තිබුණේය.

මෙම පුවත ඇසීමෙන් ලූතර්ගේ මිත්‍රයෝ භීතියට හා සංවේගයට පත්වූහ. ඔහුට විරුද්ධව පැවති අවිචාරාත්මක හැඟීම් සහ සතුරුකම් ගැන දන සිටි ඔවුහු, ලූතර්ට රැකවරණය ලබාදීමට වූ පොරොන්දුවට පවා ගෞරවයක් කරනු නොලබනවා ඇතැයි අනුමාන කළෝය. ඔහුගේ ජීවිතය පරදුවට තබා ඒ ගමන නොයන ලෙස මිත්‍රයෝ ඔහුගෙන් ඉල්ලා සිටියෝය. එම ඉල්ලීමට ලූතර් මෙසේ පිළිතුරු දුන්නේය: "වර්මිස් කරා මා එනවාට පාප් බලධාරීන් කිසිසේත්ම කැමති නැහැ. ඔවුන්ගේ කැමැත්ත වන්නේ මා වරදකරුවෙකු යයි තීන්දු කර මා මරා දැමීමයි. එයින් මට කමක් නැහැ. මා උදෙසා නොව ස්වාමින්වහන්සේගේ වචනය උදෙසා යාච්ඥා කරන්න ... වරද උගන්වන්නාවූ සාතන්ගේ දාසයන්ගෙන් ජයගැනීමට ක්‍රිස්තුස්-වහන්සේ තම ආත්මයාණන්වහන්සේගේ සහාය මට ලබාදෙනවා නොඅනුමානය. ජීවිතය පුරා මම ඔවුන්ව එපා කළෙමි. මගේ මරණය කරණකොටගෙන මම ඔවුන්ගෙන් ජය ගනිමි. මා පළකොට ඇති අදහස් ඉල්ලා අස්කර ගැනීමට මට බලපෑම් එල්ල කරන්නට ඔවුන් දැන් කටයුතු සූදානම් කරමින් සිටිනවා ඇත. මා විසින් ප්‍රකාශ කළ එක් දෙයක් ඉල්ලා අස්කර ගන්නම්. පාප් වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව නියෝජිතයායි මම එදා කිව්වා. නමුත් එය අද සිට වෙනස් කරනවා. පාප් වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ පසමිතුරා යයිද, සාතන්ගේ අපෝස්තුළුවරයා යයිද මම එක එල්ලේම ප්‍රකාශ කර සිටිනවා." (D. Aubigne, b. 7, Ch. 6).

මේ අන්තරාදායක ගමන තනිවම යාමට ලූතර්ගේ මිතුරෝ ඔහුට ඉඩ නොදුන්නෝය. රජතුමාගේ පණිවිඩකාරයා සමග ඔහුගේ විශ්වාස මිතුරන් තිදෙනෙක්ද ගමනට එක්වූහ. එම පිරිසට එක්වීමට මෙලැන්ක්තන් අවංකවම ඉදිරිපත් විය. ඔහුගේ හදවත ලූතර්ගේ හදවත හා එක්ව බැඳී තිබුණේය. ලූතර් සමග යාමට ඔහු තුළ දැඩි ආශාවක් විය. අවශ්‍ය වුවහොත් සිරගෙයට හෝ මරණයට වුවද ලූතර් සමග එක්ව යාමට ඔහු කැමැත්ත දැක්වීය. එසේ වුවද ඔහුගේ බැගෑපත් ඉල්ලීම්වලට අවසරය ලැබුණේ නැත. යම්කිසි ආකාරයකින් ලූතර් ඝාතනය වී නම් ප්‍රතිසංස්කරණය ඉදිරියට ගෙන යාමේ වගකීම භාරගැනීමට වඩාත් උචිත පුද්ගලයා වුණේ මෙලැන්ක්තන් නම් තරුණයාය. තම ගමන යාමට සමුගනිමින් ලූතර් මෙලැන්ක්තන්ට මෙසේ පැවසීය: "මම ආපසු ආවේ නැති නම්, මාගේ සතුරන් මාව මරා දැමුව හොත්, සත්‍යතාව තවදුරටත් ඉදිරියට ගෙන යාමට ඔබ කැපවිය යුතුය, සත්‍යය වෙනුවෙන් නැගී සිටිය යුතුය. මා වෙනුවෙන් කාර්ය භාරයට අත ගසන්න ... ඔබ ජීවත්ව සිටිය හොත් මාගේ

මරණයෙන් එතරම් පාඩුවක් සිදුවන්නේ නැහැ" (D. Aub igne, b. 7, Ch. 6). ලූතර්ගේ කුඩා කණ්ඩායම වර්ම්ස් වෙත ගමන් අරඹනවා දකීමට ඔහුගේ සිසුන් සහ නගරවැසියෝ බොහෝ දෙනෙක් පැමිණ සිටියෝය. ඔවුහු ඉතා සංවේදීව හැඟුම්බරව එහි රැස්ව සිටියෝය. ශුභාරංචියේ පහස ලැබූ හදවත් ඇති බැතිමත්හු ඔහුට සමුදුන්නේ හඬමින්ය. මෙසේ මේ ප්‍රතිසංස්කරණවාදියා සහ ඔහුගේ සමාගම්කරුවෝ විටන්බර්ග් සිට වර්ම්ස් වෙත ගමන ආරම්භ කළෝය.

අඳුරුබර අනතුරක පූර්ව නිමිති දකීමෙන් මිනිසුන්ගේ හදවත් සසල වී ඇති බව ගමනේදී ඔවුන්ට දකගැනීමට හැකි විය. සමහර නගරවලදී ඔවුන්ට ගෞරවාචාර දැක්වීමට කිසි අයෙක් ඉදිරිපත් නොවූහ. රාත්‍රියේ නවාතැන් ගැනීමට ඔවුන් නතර වූ තැනකදී මිත්‍ර පූජකයෙක් ඔවුන්ට හමු විය. ඉතාලි ප්‍රතිසංස්කරණ වාදියෙකුගේ රූපයක් ඔහු ලූතර්ට පෙන්වීය. මෙම පුනරුදවාදියා වේද සාක්ෂිකරුවෙකු ලෙසින් ජීවිතය පූජා කර තිබුණි. මෙවන් විපතකට ලූතර්ද ගොදුරු වේ යයි තමාට බියක් ඇති බව ඒ පූජකයා ලූතර්ට අනතුරු ඇඟවීය. පසුදින ඔවුන් ලැබූ පණිවිඩයකින් කියා තිබුණේ ලූතර්ගේ ලිපි සහ රචනා වර්ම්ස්හිදී දෝෂාරෝපණයට පත්කර ඇති බවය. එම්ප්‍රදෝරු රජතුමාගේ ආඥාවක් රැගත් රාජකීය පණිවිඩකරුවෝ ගම් නියම්ගම් වෙත යමින් ප්‍රකාශ කළේ ලූතර්ගේ ලිපි හා රචනා යම් අයෙකු සතුව තිබේ නම් ඒ ලේඛණ සියල්ල මහේස්ත්‍රාත්වරුන් වෙත ගෙනැවිත් භාර දිය යුතු බවයි. මන්ත්‍රී මණ්ඩලයට යාමෙහි අවදානම තේරුම් ගත් රාජකීය දූතයා ලූතර්ගේ චිත්ත ධෛර්ය චංචලව ඇතැයි සිතා ගමන තවදුරටත් ක්‍රියාත්මක කරනවාදැයි ලූතර්ගෙන් විමසීය. "සෑම නගරයකදීම තහනම් නීති පනවනු ලබන්නේ වුවද මම පසු නොබා ඉදිරියටම යමි" යනු ඔහුගේ පිළිතුර විය. (එම පොත 7 වන පරිච්ඡේදය).

එර්ෆර්ට් නගරයෙහිදී ලූතර් ඉතා හරසරින් පිළිගන්නා ලදී. ඔහුගේ රසිකයෝ ඔහු වටා එක් රොක් වූහ. මෙම නගරයේ වීදි දිගේ ඔහු මීට පෙර ගමන් කර තිබුණේ සිඟන්නෙකුගේ පාත්‍රයක් සමඟය. තමාට ලැබුණු පිළිගැනීමෙන් ඔහු දිරිමත් විය. ඔහු තමා කලක් වාසය කළ තාපසාරාමය වෙත යාමට අතපසු කළේ නැත. වත්මනයෙහි ජර්මානු දේශය පුරා ගඟක් සේ ගලායන්නාවූ සත්‍යතාවයේ ආලෝකය තම ආත්මයට ප්‍රවිෂ්ඨ වීමෙහිදී හටගත් ගැටුම් ඔහුගේ මතකය අලුත් කරමින් මැවී පෙනෙන්නට විය. දේශනාවක් කරන්නැයි ඔහුට ඇරයුමක් ලැබුණේය. එවැන්නක් කිරීමට ඔහුට නීතියෙන් තහංචි පනවා තිබුණේය. එනමුත් දේශනා කිරීමට රාජකීය දූතයාගෙන් අවසර ලැබුණේය. තමාගේ දේශනාවන් අප්‍රියතාවයෙන් යුතුව බැහැර කළ දෙව් මැදුරේ දේශනා කූඩුවට ඔහු දැන් නැග්ගේ දේශනාවක් කිරීමටය.



දේශනා කූඩුවට නැගි හෙතෙම ක්‍රිස්තුස්වහන්සේගේ වදන්වලින් දෙසුම ආරම්භ කළේය. "ඔබ සැමට සමාදානය වේවා! සදාතන ජීවිතය උදා කරගැනීමේ මාර්ගය පැහැදිලි කරදීමට දර්ශනවාදීහු, දේව ධර්මාචාර්යවරු සහ ලේඛකයෝ ඉමහත් වෑයමක් දරා ඇත. එහෙත් ඔවුන් විසින් සතුටුදායක සාර්ථකත්වයක් ලබාගෙන නැත. මම දැන් ඔබට අරුත් බර සත්‍යතාවක් ඉදිරිපත් කරනවා... ගැළවීම ඔබ සතු කිරීමට දෙවියන්වහන්සේ එක්තරා මනුෂ්‍යයෙක් මළවුන්ගෙන් නැගිටුවා තිබෙනවා. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වන එම ශුද්ධ වූ මනුෂ්‍යයාණෝ මළවුන්ගෙන් උත්ථාන කරනු ලැබුවේ උන්වහන්සේ මගින් මරණය විනාශ කර පාපය සහමුලින් උදුරා දමා නිරයේ දොරටු අගුළු ලා දැමීමටයි. ගැළවීමේ කර්තව්‍යය මේකයි ... ගැළවීමට විරුද්ධව ඇති සියලු බාධක අභිබවා ක්‍රිස්තුස්වහන්සේ ජයග්‍රහණය කළසේක. ඉතාමත්ම සතුටුදායක පුවත මෙයයි. අපට ගැළවීම ලැබෙන්නේ අපගේ ක්‍රියාවන් කරණකොටගෙන නොවේ. ක්‍රිස්තුස්වහන්සේ විසින් වගුළ රුධිරය මගින් පමණයි අපට ගැළවීම ලැබෙන්නේ ... අපගේ සමිඳාණන් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙසේ වදාළ සේක. "ඔබ සැමට සමාදානය වේවා! මාගේ දෑත් දෙස බලන්න" මෙම වදන් මගින් උන්වහන්සේ අදහස් කරන්නේ මේකය; මනුෂ්‍යයෙනි, මේ බලන්න! ඔබගේ පාප භාරගෙන ඔබව නිදහස් කළේ මම පමණයි. එසේ කරන්න පුළුවන්කම ඇත්තේද මට පමණයි. එම නිසා දැන් ඔබට සමාදානය ලැබී තිබෙනවා කියා සමිඳාණෝ පවසනවා."

තවදුරටත් තම දෙසුම ඉදිරියටත් කරගෙන ගිය ලූතර් කියා සිටියේ සත්‍යය වූ ඇදහිල්ල ශුද්ධ වූ ජීවිතයක් මගින් පෙනී යා යුතු බවය. "දෙවියන්වහන්සේ අපව ගළවා ගෙන ඇති නිසා උන්වහන්සේට පිළිගත හැකිවන පරිදි අපගේ ක්‍රියාදාමයන් හැඩගස්වා ගනිමු. ඔබ පොහොසත් අයෙක්ද? දුගී අයගේ අවශ්‍යතාවයන් සපුරා ලීමට ඔබේ සම්පත් බෙදා දෙන්න. ඔබ දුගී අයෙක්ද? ඔබගේ සේවය පොහොසතුන්ගේ ඇගයීමට ලක් වේවා! ඔවුන්ගේ පිළිගැනීමට ලක් වේවා! ඔබගේ සේවය කිරීම ඔබගේ වාසිය වෙනුවෙන් පමණක් නම්, ඔබ දෙවියන්වහන්සේට සේවය කරනවා යයි කීමෙහිදී ඔබ කියන්නේ මුසාවකි." (D. Aubigne, b. 7, Ch. 7).

වශී වූ අයුරින් ශ්‍රාවකයෝ ඔහුගේ කථාවට ඇහුම්කන් දුන්නෝය. හාමතේ සිටි ආත්මයනට ජීවනයේ රොටී බෙදා දෙන ලදී. පාප්වරුන්ට, පූජකයන්ට එම්ප්‍රදෝරුවරුන්ට සහ රජවරුන්ට ඉහළින් ක්‍රිස්තුස්වහන්සේව ඔසවා තබන ලදී. තමන් මුහුණපා සිටි අනතුරුදායක තත්ත්වය ගැන ලූතර් එකම වචනයක්වත් කථා කළේ නැත. තමා ගැන ජනමතයක් ඇති කරගැනීමට ලූතර් මහන්සි ගත්තේ නැත. ක්‍රිස්තුස්වහන්සේ ගැන ආලෝකනය කිරීමෙහිදී තමා පිළිබඳව වූ

චින්තනයට ලූතර්ගේ සිත තුළ ඉඩක් නොවීය. කල්වාරියේ මනුෂ්‍යයාණන් පිටුපස සැහවී ගත් ලූතර් පව්කරුවාගේ එකම ගැළවුම්කාරයාණන් ලෙස යේසුස්වහන්සේව ඔසවා තැබීමට ක්‍රියාත්මක විය.

පුනරුදවාදියා ස්වකීය ගමන ඉදිරියටම කරගෙන ගිය අතර, ඔහුට සෑම තැනකදීම ගෞරවයෙන් යුතුව සලකන ලදී. ජන සමූහයා ඔහුව මහත් ආශාවෙන් පිළිගත්හ. රෝමානු සභා නායකයන්ගේ අරමුණ ගැන ඔහුගේ මිතුරන්ගේ හඬ ඔහුට මෙසේ අවවාද කළේය. "ඔවුන් ඔබව ගිනිබත් කර ජෝන් හස්ට සිදුකළ ලෙසට ඔබේ සිරුර අළු බවට පත් කරාවී." මෙවන් අවවාදාත්මක ප්‍රකාශන බොහෝ අයගේ මුවින් ගලා ආවේය. ලූතර් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය. "වර්ම්ස්හි සිට විටන්බර්ග් දක්වා මුළු මාර්ගයම පුරා ඔවුන් ගිනි ඇවුළුවත්, අහස දක්වා ගිනි සිළු බුර බුරා නැඟ ආවත් දෙවි සමිඳාණන්ගේ නාමයෙන් මම ඒ සියල්ල තුළින් ගමන් කරනවා. මාගේ සතුරන් ඉදිරියේ මා පෙනී සිටිනවා. මම ඒ ගංගා හස්තියාගේ (බෙහෙමොත්ගේ) මුඛයට වැදී ඌගේ දත් සිඳ දමනවා. යේසුස් ක්‍රිස්තුස් සමිඳාණන්ගේ නාමය දරමින් මම ඉදිරියටම යනවා." (D. Aubigne, b. 7, Ch. 7).

ලූතර් වර්ම්ස් නගරය වෙත පැමිණෙන්නේය යන පුවත එම නගරයෙහි මහත් කලබැගෑනියක් ඇති කිරීමට සමත් විය. ඔහුගේ ආරක්ෂාව ගැන ඔහුගේ මිතුරෝ බියෙන් මුසපත්ව සිටියෝය. තමන්ගේ වෑයම අසමත් වේදෝහෝයි සැකයෙන් සතුරෝ තුෂ්නිම්භූතව බලා සිටියෝය. නගරයට ඇතුළු වීමෙන් ඔහුව වළකාලීමට මහත් වෑයමක් දරන ලදී. මිත්‍රයෙකු වූ වංශාධිපති නයිට් වරයෙකුගේ මාළිගාවක් කරා යන ලෙස වූ ඉල්ලීමක් විය. සුහද සාකච්ඡාවකින් පසුව එහිදී සියලු දුරාවබෝධයන් සමථයකට පත්කර ගත හැකි වේ යයි කියා අලුත් යෝජනාවක් ඉදිරිපත් විය. මෙම වංචාකාර සැලැස්ම පාප් බලධරයන්ගේ යෝජනාවක් විය. ඔහුට එල්ල වී ඇති අනතුරු ගැන ඔහුට පසක් කරදීමට මිතුරෝ දැඩි වෙහෙසක් දැරූහ. එහෙත් ඔවුන්ගේ සෑම වෑයක්ම ව්‍යර්ථ විය. කිසිම තැති ගැනීමකින් නොසැලුණු ලූතර් මෙසේ ප්‍රකාශ කළේය. "මෙම ගොඩනැගිල්ලේ වහල මත අතුරා ඇති උළු සංඛ්‍යාවට සමාන යකුන් ගණනාවක් වර්ම්ස් නගරයෙහි සිටියත් මම එහි යනවා." (D. Aubigne, b. 7, Ch. 7).

වර්ම්ස් නගරය කරා ලූතර් සම්ප්‍රාප්ත වෙත්ම විශාල ජනකායක් ඔහුව පිළිගැනීමට නගරයට රැස්ව සිටියෝය. රජතුමාව පිළිගැනීමට පවා මෙවන් විශාල ජනකායක් එක් රොක්ව සිටියේ නැතැයි ඉතිහාසය පවසයි. ජනතාව අතර තිබූ කලබල ගතිය ඉතා තියුණු විය. මෙම සියලු කලබැගෑනිය මධ්‍යයේ එක් තියුණු හඬක් ඇසෙන්නට විය. මරණයේ ළයාන්විත අඳෝනාවක් වූ එම ළතෝනිය සිදුවන්ට යන්නාවූ



ඉරණමෙහි පෙර නිමිත්තක් කියා පෑවේය. එය ලූතර්ට පැමිණෙන්ට යන්නාවූ තත්ත්වය ගැන අවවාද කිරීමක් විය. "දෙවියන්වහන්සේ මාගේ ආරක්ෂකයාණන් වනසේක"යි ලූතර් රථයෙන් බසින අතර පැවසුවේය.

ලූතර් කිසිම දවසක වර්ම්ස් හි වූ මණ්ඩලය ඉදිරියට පැමිණේ යයි පාප් බලධාරීහු විශ්වාස නොකළෝය. සියලු විරුද්ධවාදිකම් මධ්‍යයේ ලූතර්ගේ පැමිණීම ඔවුන් සංත්‍රාසයට පත් කළේය. ඔවුහු භීතියෙන් තැති ගත්හ. ගත යුතු පියවර කුමක්දැයි තීරණය කරගැනීම සඳහා රජතුමා තම මන්ත්‍රී මණ්ඩලය රැස්කරවා ගත්තේය. එහිදී නැගී සිටි තද පාප්වාදී රදගුරුතුමෙක් මෙසේ ප්‍රකාශයක් කළේය: "මෙම කරුණ සම්බන්ධව සාකච්ඡා කරමින් අපි දීර්ඝ කාලයක් ගතකර තිබෙනවා. මෙම මිනිසාව ඉවත් කිරීමට රජතුමා වහාම පියවරක් ගැනීම යහපති. ජෝන් හස්ව ගිනිබත් කිරීමට සිගිස්මන්ඩ් අණ කළේ නැද්ද? සභාවේ ස්ථාපිත දහම් ප්‍රශ්න කරන්නාවූ දුර්ලබ්ධියෙකුට ආරක්ෂාව සැලසීමට හෝ ඔහුව රැකගැනීමට අපට කිසිම අයිතියක් නැත." "එසේ නොවේවා"යි රජතුමා ක්ෂණිකව ප්‍රතිචාරය දැක්වීය. "අප දුන් පොරොන්දුවට ගරු කළ යුතුයි" ප්‍රතිසංස්කරණවාදියාගේ කරුණු දක්වීමට ඔහුට ඉඩදීමටද ඔහුට ඇහුම්කන් දීමට එහිදී තීරණය කරන ලදී.

මෙම විශේෂිත පුද්ගලයාව දැක ගැනීමට මුළු නගරයම මහත් උනන්දුවක් දක්වීය. වැඩි වේලාවක් ගතවීමට පෙර විශාල පිරිසක් ඔහු නවාතැන් ගත් ස්ථානය කරා පැමිණියේය. කලක් රෝගාතුරව සිටි ඔහු එයින් තවමත් සම්පූර්ණ සුවය ලබා නොතිබුණේය. ඔහු ගමනින් තෙහෙට්ටුවට පත්ව සිටියේය. එම ගමනට සති දෙකක් වැය වී තිබුණේය. පසුදින සිදුවන්නාවූ තීරණාත්මක රැස්වීම සඳහා ඔහු සූදානම් විය යුතුය. ඔහුට විවේකය සහ විශ්‍රාමය අවශ්‍ය විය. බොහෝ අය ඔහු බැහැ දකීමට පැමිණි නිසා ඔහුට විවේක සුවය භුක්ති විඳීමට ලැබුණේ පැය ස්වල්පයක් පමණකි. ඒ සමගම ඔහුව හමුවීමට රදළයන්, වංශාධිපතීන්, පූජකයන් සහ ප්‍රභූ පුරවැසියන් පැමිණියහ. ආගමික අපචාර මැඩීම පිණිස ක්‍රියා කරන්න යයි රජතුමාගෙන් ඉල්ලා සිටි වංශාධිපතිවරු බොහෝ දෙනෙක් මෙම හමුවට සහභාගි වී සිටියහ. "මොවුන් මාගේ ශුභාරංචිය කරණ-කොටගෙන නිදහස ලබා ඇත"යි ලූතර් මොවුන් ගැන පැවසුවේය. මිතුරන් මෙන්ම සතුරන්ද මේ නිර්භීත තාපසයා දැක ගැනීමට පැමිණ සිටියහ. ඔවුන් සියල්ලන්ම ලූතර්ව පිළිගත්තේ නොසැලෙන ශාන්ත සන්සුන් ආකාරයෙනි. සෑම විමසීමකට ඔහු පිළිතුරු දුන්නේ ගෞරවයෙන් යුතු ප්‍රඥවෙන්ය. ඔහුගේ පැවැත්ම ස්ථිරසාර විය, නිර්භීත විය. ඔහුගේ සිහින් වූ සියුමැලි මුහුණ කියාපෑවේ ශ්‍රමයෙන් සහ රෝගී භාවයෙන් ඔහු වෙහෙසට පත් වී ඇති බවයි. ඔහුගේ මුහුණ

පුරා කාරුණික භාවයත් ප්‍රීතියත් ගැබ් වී තිබුණේය. මහත් අවංක භාවයෙන් සහ ගාම්භීරත්වයෙන් පිරි ඔහුගේ වචන තුළ සතුරන්ට පවා මුහුණ දිය නොහැකි බලයක් ඇතුළත්ව තිබුණේය. ඔහුගේ ශාන්ත පැවැත්මෙන් මිතුරන් මෙන්ම සතුරන්ද විශ්මයට පත් වූහ. ඔහුට දිව්‍යමය බලපෑමක පහස ලැබී ඇත යනු සමහරෙකුගේ නිගමනය විය. එරිසිවරුන් යේසුස්වහන්සේ ගැන පැවසූ අන්දමටම තවත් අයගේ නිගමනය වුණේ ඔහු තුළ යක්ෂයෙක් ඇත යන්නය.

පසුදින පැවැති මන්ත්‍රී මණ්ඩල රැස්වීමට පැමිණෙන්නැයි ලූතර්ට අණකරයක් ලැබුණේය. රැස්වීම් ශාලාව වෙත ඔහුව කැඳවා ගෙන යාමට රාජකීය නිලධාරියෙක් පැමිණ සිටියේය. ඔහු රැස්වීම් ශාලාව කරා පැමිණියේ මහත් ආයාසයකින් යුතුවය. පාප්ගේ බල අධිකාරිත්වයට හිස නොනමා එයට විරුද්ධව අභීතව නැගී සිටි මෙම පූජකයාව දැකගැනීමට විශාල සෙනඟක් වීදිය පුරා පෙළ ගැසී සිටියෝය.

තම විනිසුරුවරයන් ඉදිරියට යාම පිණිස ඔහු නඩු ශාලාවට ළඟාවෙත්ම වයස්ගත හමුදාපතිවරයෙක් ඔහු අසලට පැමිණියේය. කාරුණික වදනින් ලූතර් ඇමතූ හෙතෙම මෙසේ කියන්නට විය. "අසරණ පූජක තුමෙණි, ඔබ විශාල සටනක තීරණාත්මක පැය කරා පැමිණ තිබෙනවා. ලේ ගලා ගිය සටන්වලදී, මා හෝ වෙනත් යුද්ධ නායකයෙකු හෝ ගත් තීරණයකට වඩා උතුම්වූ ද, ශ්‍රේෂ්ඨවූ ද තීරණයක් ගැනීමට දැන් ඔබට අවශ්‍ය වී තිබෙනවා. ඔබගේ ව්‍යායාමය සද් ගුණයෙන් පිරි එකක් නම්, ඔබට ඒ ගැන විශ්වාස නම් ඉදිරියටම පිය නඟන්න. දෙවියන්වහන්සේගේ නාමයෙන් එසේ කරන්න. කිසිදේකට බයවෙන්න එපා. දෙවියන්වහන්සේ ඔබව අත්හරින්නේ නැහැ." (D. Aubigne, b. 7, Ch. 8).

අන්තිමේදී, ලූතර් මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිටියේය. රජතුමා සිහසුන දරා සිටියේය. රජයේ ඉහළ ධූර දරූ ප්‍රභූවරු ගණනාවක් රජතුමා වටා පෙළ ගැසී සිටියෝය. මෙවන් ආනුභාව සම්පන්න රැස්වීමක් මෙයට පෙර කැඳවා නොතිබුණේය. තමාගේ ඇදහිල්ල පිළිබඳව පිළිතුරු සැපයීමට ලූතර් මුහුණ දුන්නේ මෙවන් බලගතු මණ්ඩලයක් ඉදිරියෙහිය. "මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තම චෝදනාවන්ට උත්තර බැඳීමට වූ අවස්ථාව පාප් අධිකාරී බලයට එල්ල වූ මරු පහරකි. පාප් විසින් මෙම පුද්ගලයාව වරදකරුවෙකු බවට තීන්දු කර තිබුණේය. තවත් විනිශ්චය මඩුල්ලක් ඉදිරියෙහි ඔහු දැන් පෙනී සිටීමෙන් රෝමානු අධිකාරි බලයට වඩා ඉහළ අධිකරණ බලයක් එයට ඇති බව ඉතා පැහැදිලි විය. ලූතර්ව සමාජයෙන් ඉවත්කර තැබීමටවූ තහනම් නීතියක් පාප් විසින් නිකුත් කොට තිබුණේය. එහෙත් දැන් ඔහුට මේ ලෝකයේ සුපිරි අධිකරණය වෙත



පැමිණෙන ලෙස ඇරයුම් කර තිබුණේ ගරු කටයුතු ලෙසය. ගරු සරු ඇතුව ඔහුව පිළිගන්නා ලද්දේය. ඔහු සදාතන නිශ්ශබ්දතාවයට පත්කරමින් පාප් ඔහුට දඬුවම් නියම කර තිබුණේය. ක්‍රිස්තියානි ලෝකයේ සෑම පෙදෙසකින්ම පැමිණි දහස් ගණන් වූ බලධරයන් ඉදිරියෙහි තම ඉගැන්වීම් රැකගැනීමට දැන් ලූතර්ට අවස්ථාවක් ලබාදී තිබුණේය. මෙම සම්භාවනීය අමුත්තන් සියල්ලෝම ලූතර්ට සාවධානව ඇහුම්කන් දීමට සූදානමින් සිටියහ. මෙසේ ලූතර් කරණකොටගෙන මහත් විප්ලවයකට මුලපුරා තිබුණේය. තම සිංහාසනයෙන් බැසීමට රෝමයට දැන් සිදුවී තිබුණි. මෙම ලැජ්ජාවට පත්වීමේ සංසිද්ධියට මුල් වූයේ එක් තපස් පැවිද්දෙකුගේ හඬයි. (D. Aubigne, b. 7, Ch. 8).

ඉහළ තනතුරු දරූ ප්‍රභූන්ගෙන් සැදුම්ලත් මෙවන් බලගතු මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටීමට සිදුවීම ගැන සාමාන්‍ය දිළිඳු පවුලක උපන් ලූතර් සන්ත්‍රාසයට පත් විය, වික්ෂිප්තයට පත්විය. ඔහුගේ සිතෙහි පැවැති, උද්වේගකාරී හැඟීම් තේරුම් ගැනීමට බොහෝ ප්‍රාදේශීය කුමාරවරුන්ටත් හැකි විය. එක් කුමරෙක් ඔහු වෙතට සමීපව මෙසේ පැවසුවේය. "ශරීරය නසන නමුත් ආත්මය නසන්ට නුපුළුවන් වූ අයට භය නොවන්න." තවත් අයෙක් මෙසේ පැවසුවේය: "ඔබලා මා නිසා ආණ්ඩුකාරයන්ද, රජුන්ද ඉදිරියට ගෙන යනු ලබන කළ, ඔබ කථා කළ යුත්තේ මොනවාද කියා ඔබගේ පියාණන් වූ දෙවියන්වහන්සේගේ ආත්මය ඔබව දැනුවත් කරනවා ඇත." විනිශ්චය පැයේදී ස්වකීය මෙහෙකරුවාව මෙසේ ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශන තුළින් ශක්තිමත් කිරීමට ලෝකයේ ප්‍රභූ පුද්ගලයෝ ඉදිරිපත් වූහ.

රජතුමාගේ සිංහාසනය ඉදිරියෙහි වූ ස්ථානයක් කරා ලූතර්ව යොමු කරවන ලදී. ජනයාගෙන් පිරී ගිය සභා ශාලාව තුළ ගැඹුරු නිශ්ශබ්දතාවක් රජ කළේය. එහිදී නැගී සිටි රාජකීය නිලධාරියෙක් ලූතර්ගේ ලිපි ලේඛන ගොනුවක් අතැතිව එදෙසට ඇඟිල්ල දික් කරමින් ප්‍රශ්න දෙකකට උත්තර සපයන්නැයි පූනරුදවාදියාට විධාන කළේය. මෙම පොත් පත් සහ ලිපි ලේඛන ලිවීමේ අයිතිය ඔහු භාර ගන්නවාද යන්න පළමුවැනි ප්‍රශ්නය විය. එම පොත් පත්වල පළ කළ අදහස් ඉල්ලා අස්කර ගැනීමට ඔහු සූදානම්ද යන්න දෙවැනි ප්‍රශ්නය විය. පොත්වල නම් කියවන ලදුව, පළමු වැනි ප්‍රශ්නයට උත්තර වශයෙන් තමා එම පොත් රචනා කළ බව පිළිගන්නේ යයි ඔහු ප්‍රකාශ කළේය. "දෙවැනි ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මට ප්‍රකාශ කළ හැක්කේ එම පොත්වල සඳහන් කරුණු ඇදහිල්ල සහ මිනිසුන්ගේ ගැළවීම සම්බන්ධව ප්‍රකාශ කරන බවයි. සගයේ හෝ පොළොවේ ඇති ඉතා මාහැඟි සම්පත වන දෙවියන්වහන්සේගේ වචන එහි ඇතුළත් කර තිබේ. එම පොත්වල අන්තර්ගත කරුණු ගැන පැහැදිලි කිරීමකින් තොරව පිළිතුරු දීම ඥානාන්විත නොවේ. ක්‍රිස්තුස්වහන්සේ

වදාළ බයිබල් පදයක් මාගේ මතකයට නැඟේ. "නුමුත් මනුෂ්‍යයන් ඉදිරියෙහිදී ඔහු නාඳුනම්යි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී මමත් ඔහු නාඳුනිමි"යි කියන්නෙමි." (ශු. මතෙව් 10: 33). එම නිසා මා විශ්වාස කරන්නාවූ දේ ඉල්ලා ඇති ප්‍රමාණයට වඩා අඩු විය හැකිය. එසේත් නැතිනම් සත්‍යතාව බලාපොරොත්තු වනවාට වඩා මාගේ පිළිගැනීම ප්‍රමාණය ඉක්මවා යනවා විය හැකිය. එම නිසා දෙවියන්වහන්සේගේ වචනයට හිංසාවක් නොවන ආකාරයෙන්ද, වචනයට කිසියම් ආකාරයක බාධාවක් සිදු නොවන ලෙසද, එල්ල කර ඇති ප්‍රශ්න දෙකට නිසියාකාරව උත්තර බැඳීම සඳහා, මට කල් ලබා දෙන ලෙස රජතුමණි, මම ඔබගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිමි." (D. Aubigne, b. 7, Ch. 8).

මෙම ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් ලූතර් බුද්ධිමත්ව ක්‍රියා කළේය. ඔහු ගත් මේ පියවර නිසා ලූතර් ක්‍රියා කළේ ආවේගශීලී පෙළඹීමකින් හෝ සිතේ ඇති වූ ක්ෂණික හැඟීමකින් හෝ නොවන බව මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකුට ප්‍රත්‍යක්ෂ විය. කිසිම ආකාරයක පාවාදීමක් නොකර අභීතව ක්‍රියා කළ ලූතර් ප්‍රදර්ශනය කළ හික්මීම, සන්සුන් බව, හා ආත්ම දමනය කිසිසේත් බලාපොරොත්තු විය නොහැකි තරම් විය. මෙය ඔහුගේ වාසියට අත්වැලක් විය. පසු දවසක තම උත්තර සැපයීමේදී ඥානවන්ත ලෙස බුද්ධිමත්ව සහ ගරු කටයුතු අන්දමින් තම තීරණය ප්‍රකාශ කිරීමට ඔහුට අවස්ථාව උදා විය. මෙයින් ඔහුගේ සතුරන් පුදුමයට පත්කිරීමට සහ ඔවුන්ගේ බලාපොරොත්තු බිඳ හෙළීමට ඔහු සමත් විය. තවද, ඔවුන්ගේ උදාසීනකමට සහ අහංකාරකමට එය තද පහරක් විය.

පසුදින උදා විය. තම තීරණාත්මක පිළිතුරු දීමට ලූතර්ට නියමිතව තිබුණේ මෙදිනය. සත්‍යතාවට විරුද්ධව සන්ධානගතව ඇති බලවේගයන් ගැන කල්පනා කළ ලූතර්ගේ හදවත කිඳා බැස්සේය. ඔහුගේ ඇදහිල්ල සසල විය. භීතිය කරණකොටගෙන ඔහු වෙව්ලන්නට විය. ඒ අතර විශාල සංත්‍රාසයක් ඔහු වෙළා ගත්තේය. අනතුරු සේයා ඔහු ඉදිරියෙහි මැවී පෙනෙන්නට විය. සතුරන් ජයග්‍රහණය කරන බව ඔහු ඉදිරියෙහි රූප රාමු මැවි මැවී නොපෙනී ගියේය. අන්ධකාරයේ බලවේග ජය පැන් පානය කරනවා ඔහු සිහිනෙන්ද දුටුවේය. ඔහු වටා ඒකරාශී වූ වලාකුළු ඔහුව දෙවියන්වහන්සේගෙන් වෙන් කිරීමට වෑයම් කරන බව ඔහු ඉදිරියෙහි මැවී පෙනෙන්නට විය. සේනාවල ස්වාමින් වහන්සේ ඔහු සමග රැඳී සිටිනවා දකීම ඔහුගේ පරම අභිලාෂය විය. ඒ පිළිබඳව සහතික වීමක් ලැබීම ඔහුගේ පැතීම විය. සංතාපයේ රළ පහරින් උග්‍ර ලෙස වේදනාවට පත් ඔහු මුහුණින් වැටී ඔහුගේ



මුවින් අදෝනාත්මක හඬ මාලාවක් පිට කළේය. එම ප්‍රකාශය තේරුම් ගැනීමට හැකියාවක් තිබුණේ දෙවියන්වහන්සේට පමණක් විය.

ඔහු දෙවියන්වහන්සේට මෙසේ යාච්ඤා කළේය: "සර්ව බලධාරීවූ ද, සදාතනිකවූ ද දෙවියන්වහන්ස, මේ ලෝකය කෙතරම් භයංකරද! ඇය තම මුඛය විවෘත කරමින් මා ගිල ගැනීමට සූදානමින් සිටින්නීය. ඔබ කෙරෙහි මා තුළ ඇති විශ්වාසය ඉතා අඩුය. මාගේ විශ්වාසය රැඳවිය යුත්තේ මේ ලෝකයේ ශක්තිය මත පමණක් නම් සියල්ලක්ම විනාශ වී හමාරය ... මාගේ අන්තිම හෝරාව උදා වී ඇත. මාව වරදකරුවෙකු බවට තීන්දුව ප්‍රකාශයට පත්කර හමාරය. අහෝ දෙවියන්වහන්ස, මේ ලෝකයේ සියලු ප්‍රඥවන්ට එරෙහිව මට උපකාර කරන්න. අනේ, මට උදව් කරන්න. මට උපකාර කිරීමට හැකියාව ඇත්තේ ඔබවහන්සේට පමණක්ය. මම යෙදී සිටින්නේ මාගේ වැඩ කටයුතුවල නොව, ඔබවහන්සේගේ වැඩ කටයුතුවලය. මට මෙහි කළ හැකි කිසිවක් නැත. ලෝකයේ ප්‍රබලයන් වූ මේ නිල දරුවන් සමග සටන් කරන්නට මට බැරිය; ... නමුත් මෙම වැඩය ඔබවහන්සේගේය. එය දැහැමිවූ ද, සදාතනිකවූ ද වැඩ පිළිවෙතකි. දෙවි සමිඳාණෙනි, මට පිහිට වන්න! විශ්වාසවන්තවූ ද, වෙනස් නොවන්නාවූ ද දෙවියන්වහන්ස, මම කිසිම මිනිසෙකු කෙරෙහි විශ්වාසය නොතබමි ... මිනිසා තුළ විශ්වාසය රැඳවීම අස්ථිරය, මනුෂ්‍යයාගෙන් පැමිණෙන සියල්ල නිෂ්ඵලය. මෙම කාර්ය සඳහා මාව තෝරාගෙන ඇත්තේ ඔබවහන්සේමය ... මා සමග රැඳී සිටින්න. ඔබගේ ආදරණීය වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මට උපකාර කරන්න. උන්වහන්සේ මාගේ ආරක්ෂා ස්ථානය වනසේක, මාගේ පළිහ වනසේක. මාගේ බලකොටුව වනසේක." (D. Aubigne, b. 7, Ch. 8).

තමන්ගේ ශක්තිය කෙරෙහි විශ්වාසය රඳවා අනුමානයෙන් යුතුව අනතුරට පත්වන්නෝ විරල නොවෙති. තමන්ගේ ශක්තිය කෙරෙහි විශ්වාසය රැඳවීමෙන් ලූතර්ව වළකාලීමට සර්වඥ වූ දිව්‍ය මගපෙන්වන්නාණන්වූ ස්වර්ගීය තැනැන්වහන්සේ ලූතර් ඉදිරියෙහි තිබූ අනතුරුදායක තත්ත්වය ඔහුට හැඟී යන්නට සැලැස්වූ සේක. පුද්ගලික දුක්විඳීමක් හෝ මරණයට සහ වධහිංසා පැමිණවීමකට භාජනය කරනු ලැබීමක් ගැන බියක් ඔහු තුළ නොවීය. වධහිංසා සහ මරණය වැඩි දිනක් ගතවන්නට පෙර තමා ගිලගන්නා බව ඔහු මනාව දැන සිටියේය. අර්බුදකාරී ඉසව්වකට ඔහු පැමිණ සිටියේය. එයට මුහුණ දීමට තමා තුළ ප්‍රමාණවත් ශක්තියක් නැතැයි ඔහුගේ සිත කියාපාන්නට විය. ඔහුගේ දුර්වලතාව කරණකොටගෙන සත්‍යතාවයේ කර්තව්‍යයට පාඩු පැමිණිය හැකිය. ඔහු දෙවියන්වහන්සේ සමග පොර බැදුවේ ඔහුගේම සුරක්ෂිතතාවය සඳහා නොව ශුභාරංචියේ

ජයග්‍රහණය සඳහාය. හුදෙකලා නදිය අසබඩ ඊශ්‍රායෙල්, දෙවියන්වහන්සේ සමග පොර බැදූ අවස්ථාවේදී ඔහුගේ සිත තුළ තෙරපි තෙරපී තිබූ උග්‍ර සංවේගය මෙන්ම ලූතර්ගේ සිතෙහිද තිබුණේ උග්‍ර සංතාපයකි, බලවත් සටනකි. දෙවියන්වහන්සේ සමග පොරබදා ඉශ්‍රායෙල් ජය ගත්තේය. ලූතර් දැන් දෙවියන්වහන්සේ කෙරෙහි රඳා සිටියේය. කිසිවක් කර කියාගත නොහැකිව අන්ත අසරණව සිටි හෙතෙම මහානුභාව සම්පන්න මිදුම්කරුවාණන් වන ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තම ඇදහිල්ල දැඩිව ශක්තිමත් කර ගත්තේය, ශක්තිමත්ව රඳවා ගත්තේය. මන්ත්‍රී මණ්ඩලය ඉදිරිපිටට ඔහු යන්නේ තනිවම නොවන බවට වූ සහතිකයක් නිසා ඔහුගේ ඇදහිල්ල ශක්තිමත් විය. ඔහුගේ ආත්මයට සමාදානය පැමිණියේය. ජාතියේ බලවතුන් ඉදිරියේ දෙවියන්වහන්සේගේ වචනය ඔසවා තැබීමට තමාට දුන් අවස්ථාව ගැන ඔහු ප්‍රීතියට පත් විය.

තමාගේ මනස දෙවියන්වහන්සේ තුළ ශක්තිමත්ව රඳවා ගැනීමෙන් පසුව තමා ඉදිරියෙහි තිබූ සටන සඳහා ලූතර් සූදානම් විය. උත්තර බැදිය යුතු පිළිවෙල ගැන ඔහු කල්පනා කළේය, තමාගේම කෘතිවල කොටස් මනා ලෙසින් පිරික්සා බැලීය. තමාගේ ඉගැන්වීම් සනාථ කිරීමට යෝග්‍ය ශුද්ධ ලියවිලි පද ඔහු තෝරා ගත්තේය. මේසය මත විවෘතව තිබූ ශුද්ධ වූ බයිබලය මත තම වම් අත තැබූ හෙතෙම, තම සුරත සගය දෙසට ඔසවා මෙසේ දිවුරුම් දුන්නේය: මරණයෙන් පවා මාගේ සාක්ෂියට මුද්‍රා තැබීම අවශ්‍ය වුවද ශුභාරංචියට විශ්වාසවන්තව සිටීමටත්, ඇදහිල්ල නිදහස් ලෙස ප්‍රකාශ කිරීමටත් මම පොරොන්දු වෙමි. " (D’Aubigne, b. 7, Ch. 8).

මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට ඔහුව නැවත වරක් ගෙන එනු ලැබූ කල්හි ඔහු තුළ බියක හෝ චකිතයක හෝ සේයාවක්වත් දැක ගැනීමට නොහැකි විය. සන්සුන්ව සහ සමාදානයෙන් යුතුව නැගී සිටි හෙතෙම නිර්භීත සහ උත්කෘෂ්ට අයෙකුගේ විලාශයක් පෙන්නුම් කළේය. පොළොවේ ශ්‍රේෂ්ඨ ප්‍රභූවරු අතර හෙතෙම දෙවියන්වහන්සේගේ සාක්ෂිකාරයා ලෙස නැගී සිටියේය. ඔහුගේ දහම් ඉල්ලා අස්කර ගැනීමට ඔහු තීරණයකට එළඹ තිබේ දැයි ප්‍රකාශ කරන ලෙස රාජකීය නිලධාරියා ඔහුට අණ කළේය. සිහින් හඬින් සහ යටහත් ස්වරයෙන් ලූතර් තම පිළිතුර ඉදිරිපත් කරන්නට පටන් ගත්තේය. කලහකාරී ස්වරූපයක් හෝ අධික හැඟුම්බර විලාශයක් ඔහු තුළ දැක ගන්නට නොහැකි විය. ඔහුගේ හැසිරීමේ විලාශය පැකිලීමෙන් තොර විය. එහෙත් ඔහු තුළ විද්‍යාමාන වූ විශ්වාසය සහ ප්‍රීතිය රැස්ව සිටි සැමගේ විමතියට හේතු විය.

"අති ශාන්ති වූ එම්ප්‍රදෝරු රජතුමෙණි, සංකීර්තිමත් කුමරුවෙනි, කරුණාහරිත ස්වාමිවරුනි" යනුවෙන් අවසර ගත් ලූතර් තම උත්තරය



මෙසේ ඉදිරිපත් කළේය. "ඔබ ඉදිරියෙහි මා අද පෙනී සිටින්නේ ඊයේ ඔබ මට නිකුත් කළ ආඥවට අනුකූලතාව දන්වමිනුයි. විරාජමාන මහ රජතුමෙණි, ශ්‍රීමත් වංශාධිපතියෙනි, යහපත් සහ සත්‍යවාදී වූ කර්තව්‍යයක් යයි මා විශ්වාස කරන්නාවූ සේවයක් වෙනුවෙන් නිදහසට මා ඉදිරිපත් කරන කරුණුවලට සාවධානව සවන් යොමු කරන මෙන් දෙවියන්වහන්සේගේ කරුණා හරිත ශ්‍රී නාමයෙන් ඉල්ලා සිටිමි. විනිශ්චය ශාලා ක්‍රමවේදය පිළිබඳව මට හසල දැනුමක් නැති නිසා මා අතින් යම්කිසි වරදක් සිදු වුවහොත් මට සමාව දානය කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි. මක්නිසාදයත් මම දූගී පූජකයෙක් වෙමි. මා සේවය කර ඇත්තේ දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා පමණය." (D’ Aubigne, b. 7, Ch. 8).

තවදුරටත් නිදහසට කරුණු ඉදිරිපත් කළ හෙතෙම තමාගේ සෑම ප්‍රකාශිත ග්‍රන්ථයක්ම එක හා සමාන නොවන බව කියා සිටියේය. සමහර ප්‍රකාශන මගින් ඇදහිල්ල සහ යහපත් ක්‍රියා ගැන තමා විශ්ලේෂණය කර ඇති බවත්, තම සතුරන් පවා එම කෘතීන් වරදක් නැති ප්‍රායෝගික අදහස් බව ප්‍රකාශ කර ඇති බවත් ඔහු පැවසුවේය. මෙම අදහස් ප්‍රකාශන ඉල්ලා අස්කර ගැනීම වනාහි මෙහි සිටින්නාවූ සෑම අයෙකුම පිළිගන්නාවූ ද, විශ්වාස කරන්නාවූද සත්‍යතාවය වැරදි යයි පැවසීමකි. තවත් ග්‍රන්ථවලින් වැයම් කර ඇත්තේ පාප් ව්‍යුහයේ පවතින්නාවූ දූෂණ සහ අපචාර ඉදිරිපත් කිරීමයි. මෙම ප්‍රකාශන ඉල්ලා අස්කර ගැනීමෙන් සිදුවන්නේ රෝම සභාවෙහි දුෂ්ට පාලනයක් සඳහා දොරටු විවෘත කිරීමකි. තුන්වැනි කාණ්ඩයේ පොත්වලින් කර තිබෙන්නේ පවතින්නාවූ දුෂ්ට ක්‍රියාදාමයන් ආරක්ෂා කරගනිමින් ඒවා සම්මත කළ සමහර පුද්ගලයන් හෙළිදරව් කිරීමය. දෝෂාරෝපණ එල්ල කිරීමේදී තමා යෝග්‍ය මට්ටමට වඩා දරුණු ලෙස පහරදී ඇති බව ඔහු පිළිගත්තේය. තමා වරදක් නැති අයෙකු යයි නොකියන බව ඔහු කියා සිටියේය. මෙවන් පොතක් වුවත් ඉල්ලා අස්කර ගන්නට තමා කැමති නැතැයිද, එසේ කළහොත් එය සත්‍යතාවයේ සතුරන් දිරිමත් කිරීමක් වන බවත්, එමගින් දේව සෙනඟව පාගා දැමීමට නව මං ක්‍රියාත්මක කරනු ලබන බවත් ලූතර් කියා සිටියේය.

"එසේ වුවද මම සාමාන්‍ය මිනිසෙක්ය, දෙවියන්වහන්සේ නොවේ" යයි ඔහු විත්තියේ දේශනය තවදුරටත් කරගෙන ගියේය. "එම නිසා ක්‍රිස්තුස්වහන්සේ කළ ආකාරයෙන්ම මමත් නිදහසට කරුණු ඉදිරිපත් කරනවා. මම අවැඩක් කර තිබේ නම් එකී අයහපත් දෙය ගැන සාක්ෂි දරන්න ... අති ශාන්ත වූ මහ රජතුමෙණි, සෑම තරාතිරමකම සිටින සහෝදර ජනතාවෙනි, දෙවියන්වහන්සේගේ කරුණා-මෛත්‍රීය අනුග්‍රහයෙන් මා ඉල්ලා සිටින්නේ මා ඉදිරිපත් කරන කරුණු

සාවධානව අසා සිට තීන්දුවක් දෙන්නටය. මාගේ ප්‍රකාශන වැරදිදැයි කියා, ප්‍රොපේතවරුන්ගේද, අපෝස්තුළුවරුන්ගේද ලියවිලි මගින් උරගා බලා මාගේ කියුම් වැරදි බව ඔප්පු කර පෙන්වන්න. මෙවන් ඔප්පු කිරීමක් මගින් වූ තීන්දුවක් ලැබුණු විගස මම මගේ සෑම වරදක්ම ඉල්ලා අස්කර ගනිමි. ඉන්පසු බොරු ප්‍රකාශන රැගත් පතපොත ගින්නට දමා විනාශ කර දැමීමට මුල් පියවර ගන්නේ මමයි.

"මා දන් පැහැදිලි ලෙස කළ ප්‍රකාශයෙන් පෙන්නුම් කරන්නේ මට අනතුරුදායක ඉරණමකට දොරටු ඇරී තිබෙන බව මා සලකා බැලූ බවයි. කිතුණු ඉතිහාසයේ මුල් කාලවලදී මෙන්ම, වර්තමානයෙහිදී ද, ශුභාරංචිය නිසා කරදර සහ බෙදීම ද වාද භේද සහ ආරවුල්ද ඇතිවීම ගැන මම ප්‍රීතියට පත්වෙනවා. දේව වචනයේ චරිත ස්වභාවය එයයි. දේව වචනයේ ඉරණම මෙයයි. "පොළොවෙහි සමාදානය දෙන්ට මම ආවෙමියි නොසිතන්න. සමාදානය නොව කඩුවක් දෙන්නට ආවෙමි"යි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වදාළ සේක. දෙවියන්වහන්සේගේ උපදෙස් සහ අනුශාසනා පුදුමාකාරයි, එසේම දරුණුයි. එම නිසා ආගමික මතභේද සමථයකට පත්කිරීමට වෑයම් කිරීමේදී ඔබ ඉතා පරෙස්සම් වීම වැදගත්ය. ඔබගේ ක්‍රියාවන්හිදී ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධ වචනයට හිංසා කළහොත් මුහුණ දිය නොහැකි අනතුරු කන්දරාවකට ඔබ දොරටු විවෘත කරන්නහුය. දෙගොඩ ගලා එන්නාවූ විපත්තියේ ජල කඳ ඔබගේ වර්තමානය ආපදාවට ලක් කර විනාශය පතුරුවා ඔබගේ ඉරණම සදහටම තීන්දු කරනවා ඇත... මේ පිළිබඳව දෙවියන්වහන්සේගේ වචනයෙන් නිදසුන් බොහෝ ගණනාවක් පෙන්වා දීමට පුළුවන. ඵාරාවෝවරුන්, බබිලෝනියේ රජවරුන් සහ ඊශ්‍රායෙලිතයන් ගැනද සඳහන් කරන්නට පුළුවන. ඔවුන් සාමූහික එකඟතාවක් නොසොයා තමන්ගේම වැඩ සැලසුම් ක්‍රියාත්මක කරන්නට යෑමෙන් විනාශය ළඟා කර ගත්හ. "දෙවියන්වහන්සේ කඳු පහ කරන සේක. එහෙත් ඔවුහු එය දැනගන්නේ නැත." (D’Aubigne, b. 7, Ch. 8).

ලූතර් කථා කළේ ජර්මානු බසිනි. ඔහු කළ සාක්ෂි දීම ලතින් භාෂාවෙන් කරන ලෙස ඔහුගෙන් ඉල්ලීමක් කරන ලදී. කළින් කළ කථාව නිසා හෙම්බත් වී සිටියද, ඉල්ලීම මත ඔහු තම කථාව නැවතත් ලතින් බසින් ඉදිරිපත් කළේය. කළින් වතාවේදී මෙන්ම මේ අවස්ථාවේදී ද ඔහු පැහැදිලි ලෙස තම තර්ක ඉදිරිපත් කළේය. දේව මගපෙන්වීම මෙහිදී ක්‍රියාත්මක විය. වැරදි ඉගැන්වීම්වලින් මෙන්ම මිථ්‍යා විශ්වාසයන්ගෙන් මනස අන්ධව සිටි බොහෝ කුමාරවරුන්ට මුල් වටයේදී ලූතර්ගේ තර්ක කිරීම පූර්ණාකාරයෙන් අවබෝධ කරගැනීමට නොහැකි වූ නමුත් දෙවැනි වටයේදී ලූතර් ඉදිරිපත් කළ කරුණු මනාව වටහා ගැනීමට ඔවුන්ට පුළුවන් විය.



ආලෝකය ග්‍රහණය කරගැනීමෙන් වැළැකී හිතුවක්කාර ලෙස තම දෙඇස් වසාගෙන සිටි අයද සත්‍යතාව නිසා තම සිතුම් පැතුම් වෙනස් කරගන්නට වේ යයි බිය වූ අයද ලූතර්ගේ වචනවල බලය නිසා කෝපාවිෂ්ට වූහ. ලූතර් තම කථාව හමාර කිරීමත් සමගම නැගී සිටි නඩු ශාලාවේ තෝල්කයා කථා කරන්නට විය. ඔහු රළු හඬින් ලූතර්ගෙන් මෙසේ විමසීය: "ඔබට ඉදිරිපත් කළ ප්‍රශ්නයට ඔබ පිළිතුරු ලබාදී නැහැ. පැහැදිලිවූ ද, විෂය හා බැඳී ඇත්තාවූ ද පිළිතුරක් ලබාදීමට ඔබට නියෝග කර තිබෙනවා. ඔබගේ පොත පතෙහි වූ සංකල්ප ඔබ ඉල්ලා අස්කර ගන්නවාද නැද්ද?" (D. Aubgine, b. 7, Ch. 8).

මෙවිට ලූතර් මෙසේ පිළිතුරු දීමට පටන් ගත්තේය. "අති ශාන්ති වූ මහරජතුමෙණි, සත් කීර්තිමත් කුමාරවරුනි, ඔබ මාගෙන් පැහැදිලිවූ ද, සරලවූ ද, මාතෘකාවට අදාළවූ ද පිළිතුරක් ඉල්ලා සිටින බැවින් මම මෙම පිළිතුර සපයමි. එනම් මාගේ ඇදහිල්ල පාප්ට හෝ මන්ත්‍රී මණ්ඩලයට හෝ යටත් කිරීමට මට නොහැකිය. මක්නිසාදයත්, ඔවුන්ගේ මත දැක්වීම් බොහෝ විට වැරදි සහිතය, එසේම පරස්පර විරෝධීය. එය මට හිරු එළිය මෙන් පැහැදිලිය. එම නිසා ඔවුන්ගේ මත සහ තර්ක ශුද්ධ ලියවිල්ලේ සාක්ෂි මගින් තහවුරු කළ යුතුය. මෙයාකාරයෙන් මාගේ හෘදය සාක්ෂියට පිළිගත හැකි ආකාරයක තහවුරු වීමක් සිදුවිය යුතුය. ඔබ ගෙනහැර දක්වන ඡේද වැරදි යයි ඔබලාගේ තර්ක මගින් මාගේ හෘදය සාක්ෂියට පිළිගැනීමට පුළුවන් විය යුතුය. කිතුණු බැතිමතෙකුට තමාගේ හෘදය සාක්ෂියට විරුද්ධව කථාකිරීම අනතුරුදායකය. එම නිසා හෘදය සාක්ෂියට විරුද්ධව මට කිසිවක් හෝ ඉල්ලා අස්කර ගත නොහැකිය, මා ලියා ඇති දේ ප්‍රතික්ෂේප කළ නොහැකිය. මේ මතය මත මම නැගී සිටිමි. කළ හැකි වෙනත් දෙයක් මට නැත. දෙවියන්වහන්සේ මට උපකාර කරන සේක්වා. ආමෙන්."

මෙසේ මෙම දැහැමි මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ වචනය වන ස්ථිරසාර පදනම මත නැගී සිටියේය. සගයේ ආලෝක රැස් දහරා ඔහුගේ මුහුණත ප්‍රභාවත් කළේය. වරදෙහි බලයට විරුද්ධව ඔහු සාක්ෂි දැරූ අවස්ථාවෙහිදී ඔහුගේ උදාර ස්වභාවයත් චරිතයේ පිරිසිදුතාවත් සමග ඔහුගේ හදවතෙහි රජ කළ සාමය සහ ප්‍රීතියත් සැමගේ අවධානයට යොමු විය. ලෝකය ජයගන්නාවූ ඇදහිල්ලෙහි ශ්‍රේෂ්ඨත්වය ඔහු තුළ රජ කළ බව සැමට දැකගන්නට හැකි විය.

පුදුමයට පත් මුළු මණ්ඩලයම කථාකර ගත නොහැකිව තුෂ්නිම්භූතව බලා සිටියහ. මුල් වරට ලූතර් කථා කළ අවස්ථාවෙහිදී ඔහු කථා කළේ ඉතා පහත් ස්වරයෙනි. එහි ගෞරවය මුසු බවක්

සහ අවනත කීකරු බවක් ගැබ්ව තිබුණේය. රෝමානු නියෝජිතයන් මෙම ප්‍රතිචාරය අර්ථකථනය කළේ ඔහුගේ දිරිය බිඳ වැටෙමින් තිබෙන ලෙසය. පිළිතුරු දීම සඳහා ඔහු කල් ඉල්ලා සිටියේ තමා ලියූ ලේඛණ ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රාරම්භයක් ලෙසටයයි ඔව්හු කල්පනා කළහ. තාපස පූජකයාගේ වැහිරී ගිය දේහයත්, සරල ඇඳුමත්, ඔහුගේ වාග් විලාශයෙහි සරල ස්වභාවයත් පිළිබඳව ඇගයීමක් කළ රජතුමා ප්‍රකාශ කර තිබුණේ මෙවැන්නකි: "මේ මනුෂ්‍යයාට කවරදාකවත් මාව රෝමානු ආගමට විරුද්ධව මත දරන්නෙක් කරන්නට හැකිවන්නේ නැහැ." එහෙත් ඔහු තම උත්තර බැඳීමේදී ප්‍රදර්ශනය කළ වෙනස් කළ නොහැකි ස්ථිරතාවයත්, තර්ක ඉදිරිපත් කිරීමේ බලය සහ පැහැදිලි ස්වභාවයත් සැමගේ පුදුමයට හේතු විය. මෙයින් ප්‍රීතියෙන් පිනා ගිය රජතුමා මෙසේ පැවසීය: "මෙම පූජකතුමා කථා කරන්නේ නිර්භීත හදවතක් සහ නොසෙල්වෙන ධෛර්යයකුත් ඇතිවයි." තමන්ගේ ජාතිය නියෝජනය කරන්නාවූ මෙම තාපස පූජකයා ගැන බොහෝ ජර්මානු කුමාරවරු ආඩම්බරයෙන් සහ ප්‍රීතියෙන් උද්දාමයට පත් වූහ.

රෝමානු කතෝලික නියෝජිතයෝ තම පක්ෂය පරදිනවා යයි සිතන්නට පටන් ගත්තෝය. ඔවුන්ගේ පක්ෂය මත අප්‍රසන්න ආලෝකයක් පවතින බවක් පෙනී ගියේය. තමන්ගේ බලය රැකගැනීමට කටයුතු සියල්ලක්ම කිරීමට ඔවුන් පසුබට වුණේ නැත. ඒ සඳහා ඔවුහු ලූතර්ට තර්ජන එල්ල කිරීමට පටන් ගත්හ. ශුද්ධ ලියවිල්ලෙන් උත්තර දීමට ඔවුන්ට කිසිම හැකියාවක් නොවීය. රෝමය සැම විටෙකම ක්‍රියා කළේ, තර්කවලට පිළිතුරු දුන්නේ තර්ජනය කිරීමෙන්ය. ධර්මාධිකරණයේ නිලධාරියා මෙසේ ප්‍රකාශ කළේය: "ඔබ ඉල්ලා අස්කර ගන්නේ නැති නම්, ඔබ වැනි හික්මවිය නොහැකි මුරණ්ඩු දුර්ලබ්ධියෙකුට කළ යුත්තේ කුමක්දැයි රජතුමා සහ ජනපද කුමාරවරු එක්වී තීරණය කරනවා ඇත."

ලූතර් විසින් ඉදිරිපත් කළ නිදහසට කරුණු කීමේ චතුරත්වය ගැන ඔහුගේ මිතුරන් මහත් ප්‍රීතියට පත්ව සිටි නමුත් උසාවි තෝල්කයාගේ වදනින් ඔවුන් භීතියටත් සංත්‍රාසයටත් පත් වූහ. "දෙවියන්-වහන්සේ මාගේ ආරක්ෂකයා වන සේක්වා. කිසිවක් හෝ ඉල්ලා අස්කර ගැනීමට මට බැහැ."යි ලූතර් සන්සුන් වදනින් ප්‍රකාශ කළේය.

කුමාරවරු එක්ව තීරණයක් සඳහා සාකච්ඡා කරන අතරේදී ලූතර්ට අධිකරණ ශාලාවෙන් පිටතට යෑමට නියම විය. මහත් අර්බුදයක් උදාවී ඇති බව සැමට පෙනී ගියේය. රෝමයේ ඉල්ලීමට අවනත නොවීමට ලූතර්ගේ වූ අධිෂ්ඨානය සහා ඉතිහාසය කෙරෙහි විශාල බලපෑමක් එල්ල කිරීමට සමත්වනවා ඇත. එය අනාගතය පුරාම බලපානවා ඇත. තම ප්‍රකාශන ඉල්ලා අස්කර ගැනීමට තවත්



එක් වතාවක් ඔහුට ලබාදීමට තීරණය විය. අන්තිම වතාවට ලූතර් අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබීය. ඔහු විසින් ප්‍රකාශනයට පත් කර ඇති දහම් ඉල්ලා අස්කර ගන්නවාදැයි යන ප්‍රශ්නය නැවත වතාවක් ඔහුට ඉදිරිපත් කරන ලදී. ඔහු මෙසේ ප්‍රතිචාරය දැක්වීය. "දෙන්නට මට වෙනත් පිළිතුරක් නැහැ. ප්‍රකාශ කළ යුතු සියල්ලම මම කියලා ඉවරයි." පොරොන්දු හෝ තර්ජන මගින් හෝ ඔහුව රෝමයේ ආඥාවට නම්මවා ගත නොහැකි බව පැහැදිලි විය.

රජවරුන් සහ ප්‍රාදේශීය පාලකයන් දණ ගැස්වූ රෝමානු බල අධිකාරිත්වයට අවනත නොවන්නාවූ මේ යටහත් පහත් තාපසයා යටහත් නොවීම ගැන පාප්වාදී නියෝජිතයෝ උරණ වූහ. ඔහුට පීඩා කරමින් ඔවුන්ගේ උදහස ඔහුට දැක්වීමට ඔව්හු ආශා වූහ. තමා මුහුණපා සිටි අවස්ථාවේදී වුවද ඔහු හැසිරුණේ ක්‍රිස්තියානි අභිමානයෙන් සහ සන්සුන්තාවයෙනි. ඔහුගේ වදන් අහංකාරයෙන් සහ සංවේදීකමින් තොර විය. දෙවියන්වහන්සේට අගෞරවය ගෙන දිය හැකි කිසිවක් හෝ ඔහුගෙන් සිදු නොවීය. කිසිම විටෙක හෝ ඔහු තමා ගැන කල්පනා කළේ නැත. තමා වටා සිටි ප්‍රභූ රදළයන් ගැන ඔහු අවධානය යොමු කළේ නැත. තමා සිටින්නේ පාප්වරුන්, නායක පූජකයන්, රජවරුන් සහ අගරජවරුන් ඉදිරියේ නොව ඔවුන්ට වඩා අතිශයින් ශ්‍රේෂ්ඨ වූ අති උත්තම වූ දෙවියන්වහන්සේ ඉදිරියේ බව ඔහුගේ කල්පනාව විය. ලූතර්ගේ සාක්ෂිය තුළින් ක්‍රිස්තුස්වහන්සේ බලයෙන් සහ උදාර අයුරකින් තම ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කළසේක. ලූතර්ගේ සතුරන්ගේ මෙන්ම මිතුරන්ගේද භීතියට සහ විශ්මයටද එය හේතු විය. "දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ අභිමුඛය, වැඩසිටීම, අධිකරණ ශාලාව තුළ පෙනෙන්නට විය. උන්වහන්සේ එහි සිටි බලධරයන්ගේ සිත් තුළට බලපෑම් එල්ල කරමින් සිටිසේක. ලූතර්ගේ ක්‍රියාවේදයෙහි යුක්ති සහගත භාවය පිළිගන්නා බව රාජ්‍යයේ කුමාරවරු බොහෝ දෙනෙක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළෝය. බොහෝ අයට සත්‍යතාවය ඒත්තු ගියේය. වෙනත් අයගේ සත්‍යතාවය පිළිගැනීම කෙටි කලකට සීමා විය. මොවුන් අතර තවත් කොටසක් තම පිළිගැනීම් එදා ප්‍රකාශ නොකළ නමුත් ඔවුහු පසු දවසක ශුද්ධ ලියවිලි සෝදිසි කිරීමෙන් පසුව ප්‍රතිසංස්කරණයේ හිතවැසියන් බවට පත් වූහ.

ධර්මාධිකරණය ඉදිරියෙහි ලූතර් පෙනී සිටිනවා දකීමට බලාපොරොත්තුවෙන් සිටි ෆ්‍රෙඩ්රික් ආදිපාදවරයා, හැඟීම්වලින් බරව ලූතර්ගේ කථාවට ඇහුම්කන් දුන්නේය. ආචාර්ය ලූතර් පෙන්නුම් කළ දිරියත්, අචලතාවත්, ආත්ම අභිමානයත් ආදිපාදවරයාගේ ප්‍රීතියටත්, ආඩම්බරයටත් හේතු විය. ඔහුව රැකවරණය කිරීමට ඔහු අදිටන් කර ගත්තේය. තරඟයේ දෙපස ඔහු සසඳා බැලුවේය. පාප්වරුන්ගේ, රජවරුන්ගේ සහ නායක පූජකයන්ගේ ප්‍රඥව සත්‍යතාවයේ බලය

ඉදිරියෙහි නිෂ්ඵල වී තිබෙන ආකාරය ඔහු දුටුවේය. සෑම යුගයකදීම සෑම ජාතියකටම හැඟී යන්නාවූ පරාජයක් පාප් බල අධිකාරියට අත් විය.

ලූතර්ගේ කථාව කරණකොටගෙන ඇතිවන බලපෑම තේරුම් ගත් පාප් නියෝජිතයා රෝමානු බලතල උපරිමයෙන් උපයෝගී කරගෙන ලූතර්ගේ පරාජය සාක්ෂාත් කිරීමට ප්‍රබල උත්සාහයක යෙදුණේය. තානාපති වේදයේ සියලුම උපාය මාර්ග යොදා ගනිමින් පාප් නියෝජිතයා තමාගේ චතුරත්වය ප්‍රබලව උපයෝගී කරගනිමින් ඔහු තරුණ අධිරාජ්‍යවරයාට අභියෝගයක් එල්ල කිරීමටද අමතක නොකළේය. කිසිම වටිනාකමක් නැති තාපස පූජකවරයෙකුගේ පක්ෂය ගෙන බලවත් රෝමානු ආධිපත්‍යයේ හොඳ හිත සහ සහාය නැතිකර නොගන්නා ලෙස තානාපතිවරයා අධිරාජ්‍යවරයාගෙන් ඉල්ලා සිටියේය.

ඔහුගේ වදන් ඵල රහිත නොවීය. ලූතර්ගේ උත්තර දීමට පසුදින චාර්ල්ස් රජතුමා ධර්මාධිකරණයට පණිවිඩයක් ඉදිරිපත් කළේය. තමාට පෙර සිටි අගරජවරුන් මෙන් තමාද ඔවුන්ගේ පිළිවෙත අනුගමනය කරමින් කතෝලික ආගම ආරක්ෂා කිරීමට අදිටන් කරගත් බව ඔහු පණිවිඩයෙන් ප්‍රකාශ කළේය. තම මතවාදීන්හි වූ වැරදි පිළි නොගැනීම නිසා ඔහුට සහ ඔහු විසින් ඉදිරිපත් කරන ලද මතවාදයන්ටද එරෙහිව ක්‍රියා කිරීමේ තදබල දඬුවම් මාර්ගයක් භාවිතා කළ යුතු යයිද ඔහු නිර්දේශ කළේය. "තමාගේ උමතුව ප්‍රදර්ශනය කරමින් ක්‍රිස්තු ධර්මයට විරුද්ධව එක් පූජකයෙක් නැඟී සිටී. එවන් අභක්තික දහම් ප්‍රචාරයට මම ඉඩ නොතබමි. රෝමානු කිතුණු දහම රැකගැනීමට මාගේ රාජ්‍යය, මාගේ වස්තුව, මාගේ මිතුරන්, මාගේ ශරීරය, මාගේ රුධිරය, මාගේ ආත්මය සහ මාගේ ජීවිතය වුවද පූජා කිරීමට මම පසුබට නොවෙමි. ජනතාව අතර භේද ඇති නොකර සාමකාමීව සිටින්නැයි අවවාද කරමින් මම ලූතර්ට විරුද්ධව නඩුව නිෂ්ප්‍රභා කිරීමට සූදානම්ව සිටිමි. ඒ අතරම මම ලූතර් සහ ඔහුගේ අනුගාමිකයන්, මුරණ්ඩු අහංකාර දුර්ලබ්ධිකයන් ලෙස තීන්දු කරමි. ඔවුන්ව සභා සහභාගිත්වයෙන් නෙරපා හරිමි. ඔවුන්ගේ සමාජීය තත්ත්වයන් අත් හිටුවමි. ඔවුන්ව විනාශ කිරීමට ගත යුතු වූ සෑම පියවරක්ම නිත්‍යානුකූල යැයි නියෝග කරමි. රාජ්‍යයේ සියලු පුරවැසියන් භක්තිමත් පුරවැසියන් ලෙස හැසිරෙන්න යැයි මම ඉල්ලා සිටිමි." (D.Aubigne, b. 7, Ch. 9). එසේ වුවද ලූතර්ට ආරක්ෂා සහිතව තම ගම රට බලා යෑමට ඉඩ දිය යුතු යයි කියා රජ නියම කළේය. ඉක්බිතිව ඔහුට විරුද්ධව නඩු විභාගය ක්‍රියාත්මක වනවා ඇත.

ධර්මාධිකරණයේ විනිශ්චය මඬුල්ල එකිනෙකට පටහැනි තීරණ දෙකක් නිකුත් කර තිබුණේය. ලූතර්ට ආපසු ගම රට බලා යෑමේදී ලබා දිය යුතු රැකවරණය ප්‍රතික්ෂේප කළ යුතු යයි පාප් අධිකාරියේ



නියෝජිතයෝ රාජ්‍ය දූතයාගෙන් මෙසේ ඉල්ලා සිටියහ. "මෙයට ශත වර්ෂයකට පෙර රයින් නදිය ජෝන් හස්ගේ අළු ගිලගත් සේම ලූතර්ගේ මිනී අළුද රයින් නදියට භාර කළ යුතුය." තමන් රෝමානු සභා අනුගාමිකයන් යයිද, ලූතර් තම පරම සතුරෙකු යයිද විශ්වාස කළ ජර්මානු කුමාරවරු, මහජන මතයට විරුද්ධව ක්‍රියා කරමින් ලූතර්ගේ ආරක්ෂිත ගමනට බාධා පමුණුවා ජාතියේ අභිමානය සැහැල්ලුවට පත් නොකරන්නැයි බල කළහ. හස්ගේ මරණයෙන් පසුව රටට සිදුවූ ව්‍යසනය ගැන ඔවුහු කරුණු ඉදිරිපත් කළෝය. ජර්මානු ජාතිය මත්තෙහිත් තරුණ රජතුමා මත්තෙහිත් එවන් භයානක නපුරු ක්‍රියාවන් පතිත වීමට ඇරයුම් නොකළ යුතුය යන්න කුමාරවරුන්ගේ ඉල්ලීම විය.

මෙම මූලික යෝජනාවට ප්‍රතිචාරය දක්වමින් චාර්ල්ස් පැවසුවේ මුළු ලෝකයෙන්ම ගෞරවය සහ ඇදහිල්ල අතුගා දැමුවද, එම දේ කුමාරවරුන්ගේ හදවත් තුළ සුරක්ෂිතව තැන්පත්ව තිබිය යුතු බවය. "ලූතර්ගේ පරම සතුරන් වූ පාප් සමයවාදී නියෝජිතයන් ඉල්ලා සිටියේ සිගිස්මන්ඩ් විසින් හස්ට හිමි කළ ඉරණම ම ලූතර්ටද අත්කර දෙන ලෙසය, එනම් සභාවේ මෛත්‍රී කරුණාවට ඔහුව භාර කරන ලෙසය. ප්‍රසිද්ධ මන්ත්‍රණ සභාවේදී යදමින් බැඳ සිටි ජෝන් හස් රජතුමාට පැවසුවේ ඔහු තමාට පොරොන්දු වූ රැකවරණය බිඳ දැමූ බවයි. මේ පිළිබඳව V වන චාර්ල්ස් පැවසුවේ, "සිගිස්මන්ඩ් මෙන් මම ලැජ්ජාවට පත්වන්නට අකමැති වෙමි" යන්නය.

කෙසේ වුවද, චාර්ල්ස් මෙසේ ඉදිරිපත් කරනු ලැබූ සත්‍යතාවන් උවමනාවෙන්ම ප්‍රතික්ෂේප කළේය. "මාගේ මුතුන් මිත්තන් කළ ආකාරයටම ක්‍රියා කිරීමට මම තරයේම අධිෂ්ඨාන කර සිටිමි"යි රජතුමා ප්‍රකාශ කළේය. සත්‍යයේ සහ දැහැමිතාවේ මාර්ගයේ ගමන් කරන පිණිස සම්ප්‍රදායික මාර්ගයෙන් ඉවතට පියවර ගැනීමට තමා ක්‍රියා නොකරන බවට රජතුමා අධිෂ්ඨාන කරගෙන සිටියේය. තමාගේ පියවරුන් කළ ලෙසම ඔහුද පාප් සමය ඔසවා තැබීමට තීරණය කරගෙන සිටියේය. පාප් සමය නිෂ්ප්‍රභා කර දමා පියවරුන් නොලැබූ ආලෝකයක් පිළිගැනීම රජතුමා ප්‍රතික්ෂේප කළේය. ඔවුන් නොකළ කටයුත්තක් කිරීමට රජතුමාට අවශ්‍යතාවක් නොවීය.

අද පවා බොහෝ දෙනෙක් තම පියවරුන්ගේ සම්ප්‍රදායන් සහ චාරිත්‍ර වාරිත්‍ර තදින් අල්ලා ගෙන සිටිති. දෙවි සමිඳාණන් ඔවුන්ට ආලෝක ධාරාවක් එවූ විට එය පිළිගැනීමට ඔවුහු කැමැති නොවෙති. ස්වකීය දෙමාපියන්ට එකී ආලෝකය ලබාදී නොතිබූ නිසා තමන්ට එය පිළිගැනීමට නොහැකිය යන්න ඔවුන්ගේ කල්පනාව වන්නේය. අප අද සිටින්නේ. අපගේ පියවරුන් සිටි ස්ථානයෙහි නොවේ. එම නිසා අපගේ යුතුකම් සහ වගකීම් ඔවුන්ට සමාන නොවන්නේය.

අපගේ වගකීම් තීරණය කරගැනීමට පියවරුන්ගේ ආදර්ශය දෙස බැලීම දෙවියන්වහන්සේගේ අනුමැතිය ලැබීමට හේතු කාරක නොවන්නේය. සත්‍යතාව සොයා ගැනීම සඳහා අපි දේව වචනය සෙවිය යුතු වෙමු. අපගේ පියවරුන්ට හිමිව තිබූ වගකීමට වඩා අපගේ වගකීම මහත්ය. ඔවුන්ට ලැබී තිබූ ආලෝකය උරුමයක් ලෙස අපට ලැබී තිබෙන අතර අප ඒ ගැන ගණන් දිය යුතුවාක් මෙන්ම අප ලබන්නාවූ අලුත් ආලෝක දහරාවන් ගැනද අප වගකිව යුතු වෙමු. දේව වචනය හරහා එන්නාවූ සෑම ආලෝක කදම්බයක්ම අප විසින් ග්‍රහණය කරගත යුතු වෙමු.

විශ්වාස නොකළ යුදෙව්වන් ගැන යේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක. "මමම ඇවිත් ඔවුන්ට කථා නොකළෙම් නම් ඔවුන්ට පාපයක් නැත. නුමුත් දැන් ඔවුන්ගේ පාපය ගැන ඔව්හු නිරුත්තරව සිටිති." (යොහන් 15:22). එම දිව්‍ය බලයම ලූතර් ලවා ජර්මනියේ රජතුමාට සහ කුමාරවරුන්ට කථා කර තිබුණි. දෙවියන්වහන්සේගේ ආලෝකය එදා එම අධිකරණ ශාලාවේ රාවය ප්‍රතිරාවය වෙමින් ඒක නාද වූ කල්හි, එතැන සිටි සමහර අයට ශුද්ධාත්මයාණන් ආයාචනය කළේ අන්තිම වතාවටය. මෙයට සියවස් ගණනාවකට පෙර තම අභිමානය සහ ජනප්‍රියතාවය රැකගැනීම සඳහා ගැළවුම්කාරයාණන්වහන්සේගේ අන්තිම පණිවිඩයට, පිලාත් තම හදවත විවෘත නොකළේය. බියෙන් ගැහෙමින් සිටි පීලික්ස් සත්‍යතාවේ පණිවිඩකාරයා හට මෙසේ පැවසීය; "දැනට යන්න. මට ප්‍රස්තාවක් ලැබුණාම නුඹට අඬ ගස් වන්නෙමි" යයි ඔහු කීවේය. අහංකාර අග්‍රිපා තමාට ගැළවුම්කාරයාණන්ව පිළිගැනීමට අවස්ථාව පැමිණි විට කියා සිටියේ: "වැඩි පෙළඹීමක් නැතුවම නුඹ මා ක්‍රිස්තියානිකාරයෙක් කරන්ට සිතනවා " කියාය. මේ සියල්ලෝම සගයෙන් පැමිණි පණිවිඩයෙන් ඉවතට හැරී ක්‍රියා කළෝය. V වන චාර්ල්ස් රජතුමාද ලෝකයේ අහංකාරකම සහ තම ඉදිරි පැවැත්ම අගය කරමින් සත්‍යතාවේ ආලෝකය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර ගත්තේය.

ලූතර්ට විරුද්ධව ක්‍රියාත්මක කිරීමට සැලසුම් වූ ක්‍රමවේදයන් පිළිබඳ දූෂ්‍යමාන ආරංචි විශාල වශයෙන් පැතිරෙන්නට විය. එමගින් නගරය පුරා උණුසුම් වාතාවරණයක් පැවැතියේය. තමාගේ දූෂණ හෙළිදරව් කිරීමට අභීත වන්නාවූ අයට රෝමානු ආධිපත්‍යය විසින් සලකනු ලැබුවේ ඉතාම කෲර ලෙසින්ය. මෙම ක්‍රමවේදයන් මනාලෙස දැන සිටි ලූතර්ගේ මිත්‍රයෝ ඔහුව පූජා කරනු නොලැබිය යුතු යයි තීරණය කර ගත්තෝය. වංශාධිපතියන් සිය ගණනාවක් ඔහුට රැකවරණය දීමට ප්‍රතිඥා දුන්හ. රෝමයේ බල අධිකාරිත්වයට බයාදු ලෙස යටත්වීමක් ලෙස එකී රාජකීය පණිවිඩය විග්‍රහ කළ බොහෝ අය එම ආඥාව ප්‍රසිද්ධියේම හෙළා දකීමට ඉදිරිපත් වූහ. ලූතර්ට



පක්ෂපාතිවද, ඔහුට එරෙහිවද වූ දැන්වීම් පත්‍ර ගෙවල ගේට්ටුවලද, ප්‍රසිද්ධ ස්ථානවලද ප්‍රදර්ශනය විය. එක් දැන්වීමක සාලමොන්ගේ එක් කියමනක් පමණක් දක්වා තිබුණේය. "එම්බා දේශය, නුඹේ රජ බාලයෙක්ව සිටින විට"... නුඹට දුක් වේ!" (දේශනාකාරයා 10:16). ජර්මනිය පුරා ලූතර්ට පක්ෂපාතීව සිටියාවූ මහජන උද්‍යෝගය නිසා ඔහුට විරුද්ධව කිසිම අකටයුත්තක් කිරීමට රජතුමා මෙන්ම අධිකරණ නිලධාරීන්ද ඉදිරිපත් වූයේ නැත. එසේ කළහොත් දේශයේ සාමයද සමහර විට සිංහාසනයේ ස්ථිර භාවයද බිඳ වැටිය හැකි බව බොහෝ අයගේ කල්පනාව විය.

මේ අතර ෆෙඩ්‍රික් ආදිපාදවරයා ඉතා ප්‍රවේශමෙන් තමාගේ හැඟීම් රහසේ තබාගනිමින්, පුනරුදවාදියාව ආරක්ෂා කිරීමේ පිළිවෙතක් අනුගමනය කළේය. ඒ අතරම ඔහු ලූතර්ගේ ගමන් බිමන් පිළිබඳවද, සතුරන්ගේ හැසිරීම් රටාව පිළිබඳවද දැඩි අවධානයෙන් පසු විය. ලූතර්ට තිබූ පක්ෂපාතිත්වය සඟවා තබාගැනීමට සමහර අය කිසිම වෑයමක් නොදැරූහ. ගිහියන් මෙන්ම පැවිද්දන්ද, කුමාරවරු, සිටුවරු, වංශාධිපතිවරු සහ රදළවරුද ලූතර් බැහැ දකීමට පැමිණියෝය. පැමිණි සෑම අයෙකුටම ආචාර්යවරයාගේ "කුඩා කාමරය ප්‍රමාණවත් නොවීයැ"යි ස්පැලටින් පවසා ඇත්තේය. (Martyn, Vol. 1, p. 404). මනුෂ්‍යයන් ඔහු දෙස බැලුවේ ඔහු සාමාන්‍ය මනුෂ්‍යයෙකුට වඩා උතුම් තැනැත්තෙක් වූවා සේය. ඔහුගේ දහම් කෙරෙහි කිසිම විශ්වාසයක් නොතැබූ අය පවා ඔහු තුළ පැවැති පෞරුෂත්වය ගැන ගෞරවයෙන් කථා කළෝය. මරණයට වඩා තමාගේ හෘදය සාක්ෂියට ගරු කිරීමට තරම් අභිමානයක් තිබූ මේ මනුෂ්‍යයා සැමගේ ගෞරවයට පාත්‍ර විය.

රෝමය සමග යම් ආකාරයක සම්මුතියක් ඇති කරගැනීමට ලූතර්ගේ කැමැත්ත ලබාගැනීමට මහත් වෑයමක් ක්‍රියාත්මක විය. සභාවට සහ මන්ත්‍රී මණ්ඩලවලට විරුද්ධව ලූතර් තමාගේම විනිශ්චයන් මතම පිහිටා සිටින්නේ නම්, ඔහුව රටින් පිටුවහල් කරනු ලැබීමට ඉඩකඩ ඇති බවට ඔහු බැහැදකීමට පැමිණි කුමාරවරු සහ වංශාධිපතිවරු අනතුරු ඇඟවූහ. එවිට ඔහුට ඇති රැකවරණය අහෝසි වී යනවා ඇත. එම ඉල්ලීමට ලූතර් මෙසේ පිළිතුරු දුන්නේය. "බාධා නොමැතිව ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරන්නට බැහැ. එසේ නම්, රටින් පිටුවහල් වීමකට හෝ සිරභාරයට ගනු ලැබීමට ඇති බිය දෙවි සමිඳාණන්ගෙන් සහ දිව්‍ය වචනයෙන් මාව වෙන් කළ යුත්තේ ඇයි? දිව්‍ය වචනය පමණක් සත්‍යය වන්නේය. එවන් වෙන්වීමක් සිදුවනවාට වඩා මාගේ ශරීරය, මාගේ රුධිරය සහ මාගේ ජීවිතය වුවද අත්හැර දැමීමට කැමැත්තෙමි." (D. Aubigne, b. 7, Ch. 10).

අගරජතුමාගේ විනිශ්චයට අවනත වන්නැයි ලූතර්ගෙන් නැවත වරක් ඉල්ලීමක් විය. එසේ කළහොත් ඔහුට බියවීමට කිසිම කරුණක් පැන නගින්නේ නැතැයි ඔහුට පවසන ලදී. පිළිතුරු වශයෙන් ඔහු මෙසේ පැවසීය. "රජතුමාද, කුමාරවරුද, එසේම ඉතා යටහත් ක්‍රිස්තු භක්තිකයන්ද මාගේ පොත පත විභාගයට ලක් කර තීරණයකට පැමිණිය යුතුය. එහෙත්, එසේ කිරීමට නම් මේ කොන්දේසියට යටත් විය යුතුය. එනම්, ඔවුන්ගේ ප්‍රමිතිය ලෙස දේව වචනයට පමණක් තැන දිය යුතුය. එයට කීකරුවීමට වඩා මිනිසුන් කළ යුතු වෙනත් දෙයක් නැත. මාගේ හෘද සාක්ෂිය ශුද්ධ ලියවිල්ලට බැඳී තිබේ. මම සම්පූර්ණයෙන්ම එහි බලයට යටත්ව සිටිමි." (D. Aubigne, b. 7, Ch. 10).

තවත් අයැදුමකට ලූතර් මෙසේ පිළිතුරු දුන්නේය. "මට ආරක්ෂාව සැපයීමට වූ බැඳීමෙන් මම සියලු දෙනාවම නිදහස් කරමි. මාවත් මගේ ජීවිතයත් රජතුමාගේ හස්තයට භාර දෙන්නෙමි. එහෙත් දෙවියන්වහන්සේගේ වචනය නම් අත්හැර නොදමන්නෙමි, මන්ත්‍රී මණ්ඩල තීරණයකට යටත් වීමට කැමැත්තෙමි. එහෙත් එම මණ්ඩලය ශුද්ධ ලියවිලි පදනම්ව තීරණයකට එළඹිය යුතුය. දෙවියන්වහන්සේගේ වචනය සහ ඇදහිල්ල පිළිබඳව තීරණයක් ගැනීමේදී පාප් මෙන්ම සෑම කිතුණුවෙක්ද එක හා සමාන විනිශ්චයකරුවෙක් වන්නේය. ඔහුගේ පාර්ශ්වයට මණ්ඩල දහස් ගණනාවක සහාය ලැබුණත් පදනම වෙනස් වන්නේ නැත." (Ibild, 67, Ch. 10). තවදුරටත් සම්මුතියක් ඇති කිරීමට උත්සාහ කිරීම ඵල රහිත බව මිතුරන්ට මෙන්ම සතුරන්ටද එක සේ වැටහී ගියේය.

එක කරුණකදී හෝ පාවාදීමක් සිදුවී නම් සාතන් සහ ඔහුගේ සේනාව මහත් ජයග්‍රහණයක් ලබනවා නියතය. නොපැකිළ ස්ථිරසාරව නැඟී සිටීමේ ප්‍රතිඵලයක් ලෙස සභාව විමුක්තිය ලැබුවාය; එයම අලුත් සහ වඩාත් යහපත් කාලපරිච්ඡේදයක ආරම්භයක් විය. ආගමික කරුණු සම්බන්ධයෙන් තමාගේ හෘදය සාක්ෂිය අනුව සිතීමටත්, ක්‍රියා කිරීමටත් නොබියව නොසැලී නැඟී සිටි මේ තනි මනුෂ්‍යයාගේ බලපෑම සභාව වෙනතකට යොමු කිරීමට සමත් විය, ලෝකය විපර්යාසයකට තල්ලු කිරීමකට සමත් විය. එම බලපෑම එකලට පමණක් නොව මතු පරම්පරාවන් කරාද ක්‍රියාත්මක විය. ඔහුගේ අචල ක්‍රියාවේදය සහ විශ්වාසකම සෑමට ශක්තියක් වනවා ඇත. කාලයේ අවසානයේදී ද කිතුණුවනට මෙවන් පරීක්ෂා තුළින් ගමන් කිරීමට සිදුවනවා නියතය. දෙවියන්වහන්සේගේ බලයත් මහානුභාව සම්පන්නත්වයත් මිනිස් උපදෙස් වලට සහ සාතන්ගේ අධි බලයටත් ඉහළින් ක්‍රියාකාරී විය.



ලූතර්ට තමාගේ ගම රට බලා යන්නැයි රජතුමාගේ කාර්යාලයෙන් නිවේදනයක් නිකුත් විය. තමාව වරදට පත්කරන්නාවූ නිල තීන්දුව මුල් තීන්දුව පසුපස හඹා එන බව ඔහු දන සිටියේය. තර්ජනාත්මක වලාකුළු ඔහුගේ ගමන් මගට ඉහළින් අරක්ගෙන තිබුණේය. වර්ම්ස් නගරයෙන් බැහැරව යන්නාවූ ඔහුගේ සිත ප්‍රීතියෙන් සහ ප්‍රශංසාවෙන් පිරී තිබුණේය. "පාප්ගේ බලකොටුව ආරක්ෂා කිරීමට යක්ෂයා පුද්ගලිකව ඉදිරිපත් විය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ මේ බලකොටුවෙහි විශාල පිපිරීමක් සිදුකර ඇත. තමාට වඩා දෙවි සමිඳාණන් බලවත් බව පිළිගැනීමට සාතන්ට බලකරනු ලැබීය"යි ලූතර් පැවසීය.

තමාගේ හෘදය සාක්ෂියට අවනතව දැඩි ස්ථාවරයක පිහිටා නැඟී සිටීම නිසා තමාව විප්ලවවාදියෙකු යයි නොසලකනු ලැබීම ලූතර්ගේ ආශාව විය. එහෙයින් ඔහු ඒ ගැන රජතුමාට ලිපියක් යැවීය. "හදවත් සෝදිසි කරන්නාවූ දෙවියන්වහන්සේ මාගේ සාක්ෂි-කරුවාණන් වනසේක. මම අවංකවම ඔබතුමාට කීකරු වීමට කැමති බව දෙවියන්වහන්සේ සාක්ෂි දරනවා ඇත. සියල්ලටම ඉහළින් මම දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වන්නෙමි. මට ගෞරවය ලැබුණත් නැතත්, ජීවිතය රැකුණත්, මරණය හිමිවුවත්, මම දේව වචනයට කීකරු වෙමි. මනුෂ්‍යයා ජීවත් වන්නේ දේව වචනය කරණකොටගෙනය. වර්තමාන ජීවිතයෙහි සියලු කාර්යයන්හිදී මාගේ ගැති භාවය, විශ්වාසීකම දේව වචනයෙහි රඳවා තැබීමට මම තිරසාරව ගිවිස ගෙන සිටිමි. එහි සසලවීමකට ඉඩක් නැත. මේ ලෝකයේදී ලබන්නාවූ ලාභය හෝ අලාභය, ගැළවීම කෙරෙහි බලපෑමක් දරන්නේ නැත. නුමුත් සදාතනය හා බැඳි කාරණාවලදී මිනිසාගේ පක්ෂපාතීකම ලැබිය යුත්තේ දෙවියන්වහන්සේට මිස මිනිසාගේ කැමැත්තට නොවේ. ආත්මික කරුණු පිළිබඳව දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත් වීම වනාහි නියම නමස්කාරය වන්නේය. එය මැවුම්කාරයාණන්වහන්සේට පමණක් ලබා දිය යුතුය." (D. Aubigne, b. 7, Ch. 11)

වර්ම්ස් කරා යන ගමනේදී ලූතර් ලැබූ ප්‍රශංසාවන්ට වඩා වැඩි ප්‍රමාණයේ ප්‍රශංසාවන් ආපසු එන ගමනේදී ඔහු වෙත පුද කරන ලදී. ආගමික කුමාරවරු, සභාවෙන් නෙරපනු ලැබූ මෙම පූජකයාව මහත් හරසරින් පිළිගත්තෝය. රජතුමා විසින් ප්‍රසිද්ධියේ චෝදනාවට ලක්කරනු ලැබූ ලූතර්ට ගෞරවය පුද කිරීමට සිවිල් නායකයෝ ඉදිරිපත් වූහ. දේශනා කරන්නට එපා යයි රාජකීය තහංචියක් පනවා තිබූ නමුත් ජනතා බැතිමතුන්ගේ ඉල්ලීම නිසා හෙතෙම දේශනා කරන්නට පටන් ගත්තේය. "දෙවියන්වහන්සේගේ වචනය දම්වැල් යොදා බැඳ තබන බවට මා ප්‍රතිඥාවක් දුන්නේ නැහැ. මම එසේ කරන්නේද නැහැ"යි ලූතර් පැවසීය. (Martyn, Vol. 1, p. 420)

වර්ම්ස්හි සිට පිටත්ව ගොස් වැඩි දිනක් ගතවීමට පෙර පාප් බලධාරීහු රජතුමා වෙත එළඹ ලූතර්ට විරුද්ධව නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලීමක් කළෝය. මෙම නියෝගය මගින් "ලූතර් වනාහි තාපස පූජක ඇඳුම් ඇඳ ගත් මිනිස් වෙසින් සිටින්නාවූ සාතන් වන්නේය"යි චෝදනා කර තිබුණේය. (D. Aubigne, b. 7, Ch 11). ඔහුට ලබාදී තිබුණු රැකවරණ කාල සීමාව නිම වූ විට ඔහුගේ වැඩ කටයුතු නවතා දැමිය යුතු යයි ආඥා කෙරිණ. කිසිවෙකු විසින් හෝ ඔහුට නවාතැන් නොදිය යුතු විය. ඔහුට කෑමක් හෝ බීමක් හෝ දීම නීති විරෝධී විය. ප්‍රසිද්ධියේ හෝ රහසේ හෝ ඔහුට වචනයකින් හෝ ක්‍රියාවකින් හෝ සහාය දීම සපුරාම තහනම් කරනු ලැබීය. ඔහු සිටින්නේ යම් තැනකද, ඔහුව අත්අඩංගුවට ගෙන නිලධාරීන්ට භාර කළ යුතු විය. ඔහුගේ අනුගාමිකයන් සිරගෙට යැවිය යුතු විය, ඔවුන්ගේ ඉඩකඩම් රාජ සන්තක කළ යුතු විය. ඔහුගේ පත පොත විනාශ කර දැමිය යුතු විය. මෙයට විරුද්ධව ක්‍රියා කරන්නාවූ යමෙකු වේද, ඔහුද මෙම දඬුවම්වලට හිමිකාරයෙක් වන්නේය. සැක්සන්හි ආදිපාදවරයා මෙන්ම ලූතර්ට හිතෙෂි කුමාරවරුද ලූතර් හා සමගම වර්ම්ස් අධිකරණයෙන් පිටත්ව ගම රට බලා ගියෝය. රජතුමාගේ තහනම් ආඥාව ධර්මාධිකරණය විසින් පිළිගනු ලැබුවේය. රෝමානු පාලකයෝ මෙයින් ඉමහත් ප්‍රීතියට පත් වූහ. ප්‍රතිසංස්කරණයේ අනාගතය මත මුද්‍රා තබන ලද්දේ යයි ඔවුහු උද්දාමයට පත් වූහ.

මෙම කටුක හෝරාවේදී තම සේවකයාගේ ආරක්ෂාව සාදා දීමට දෙවියන්වහන්සේ ඉදිරිපත් වූසේක. සුපරික්ෂාකාරී ඇසක් ලූතර්ගේ ගමන් බිමන් පරීක්ෂා කළ අතර එක්තරා පුද්ගලයෙක් ඔහුට පිළිසරණ වීමට අධිෂ්ඨාන කර ගත්තේය. ලූතර්ගේ මරණයට අමතර වූ කිසිම දෙයකින් රෝමය සතුටු වන්නේ නැති බව පැහැදිලි විය. සිංහයාගේ මුඛයෙන් ලූතර්ව බේරා ගැනීමට නම් ඔහුව සඟවා තබා ගත යුතු බව පැහැදිලි විය. මේ ප්‍රතිසංස්කාරකයා බේරා ගැනීම සඳහා වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට දෙවියන්වහන්සේ සැක්සනියේ ෆ්‍රෙඩ්රික්ට ප්‍රඥාව ලබා දුන්සේක. සත්‍ය වූ මිතුරන්ගේ සහාය ඇතිව ෆ්‍රෙඩ්රික්ගේ සැලැස්ම ක්‍රියාත්මක විය. මිතුරන්ගෙන් මෙන්ම සතුරන්ගෙන්ද ලූතර්ව සඟවා තබන ලදී. ලූතර් විටන්බර්ග් බලා යන ගමනේදී ඔහුව බලෙන් අල්ලා ගත් එක්තරා කණ්ඩායමක් ඔහුව සිය පරිවාර පිරිසගෙන් වෙන්කර කැලයට රැගෙන ගියෝය. එක්තරා හුදෙකලා කැලෑබද පවුරක් වූ වෝට්බර්ග් වෙත ඔහුව ගෙන යනු ලැබීය. ඔහුගේ අල්ලා ගැනීම සහ ඔහු රඳවා සිටි ස්ථානයද කෙතරම් රහසිගතව තබා ගන්නා ලද්දේද යත්, කලක් යන තුරු ෆ්‍රෙඩ්රික්ට පවා සත්‍ය තොරතුරු දැනගැනීමට නොහැකි විය. මෙය හේතු සහගත සැලැස්මක් විය. මක්නිසාදයත්, ෆ්‍රෙඩ්රික් විසින් ලූතර් සිටින තැන නොදන සිටින තාක් කල් ඔහුට ලූතර් පිළිබඳව කිසිවක් ප්‍රකාශ කිරීමට හැකියාවක් නොවීය. ලූතර් ආරක්ෂා සහිතව සිටින බව පමණක් දන සිටීමෙන් ඔහු සෑහීමකට පත් විය.

වසන්ත, ගිම්හාන, සරත් සෘතු ගත වී ශීත සෘතුව උදා විය. ඒ වනතුරුත් ලූතර් සිරභාරයේ සිටියේය. ශුභාරංචි ආලෝකය නිවා දැමීමට තමන් සමත් විය යන කල්පනාවෙන් ඇලියැන්ඩර් සහ ඔහුගේ පාක්ෂිකයෝ ප්‍රීති වූහ. එසේ වී නමුත් මේ වන විටත් පුනරුදවාදියා තමාගේ පහනට සත්‍යතාවයේ ගබඩා ගෙයින් ඉන්ධන පුරවා ගනිමින් සිටියේය. එහි ආලෝකය තව තවත් දීප්තිමත්ව ප්‍රභා රැස් විහිදවීමට තිබුණේය.

වෝට්බර්ග් පවුරෙහි සුරක්ෂිතව කල් ගෙවූ ලූතර්, සංග්‍රාමයෙහි ආරාවුල් සහ කලබලවලින් ඈත්ව සිටීමට ලැබීම ගැන කලක් ප්‍රීතියෙන් යුතුව සිටියේය. එහෙත් හුදෙකලාව විවේක ගනිමින් කාලය මැරීම ඔහුට තවත් කළ හැකි දෙයක් නොවීය. ක්‍රියාදාමයන්ගෙන් පිරි, සෘජු සටන් සමග ජීවත්වීමේ රටාවකට පුරුදුව සිටි ලූතර්ට නිසොල්මන් ජීවිතය හිංසාකාරී දෙයක් විය. ඔහු හුදෙකලාව සිටි කාලයේදී සභාවේ තත්ත්වය ගැන ඔහුගේ අවධානය යොමු විය. ඒ ගැන ඔහු බලාපොරොත්තු රහිතව, "අහෝ දෙවියන්වහන්සේගේ උදහසෙහි මේ අන්තිම දවස්වලදී දෙවිසම්දාණන් ඉදිරියෙහි පවුරක් මෙන් නැගී සිට ඊශ්‍රායෙලිතයන් මුදවා ගැනීමට කවුරුවත් නැද්ද?" කියමින් වැලපුණේය. (D. Aubigne, p 9: Ch 2). දන් ඔහුගේ අවධානය නැවත තමා වෙතම යොමු විය. තරහයෙන් ඉවත්වීම කරණ- කොටගෙන තමා බියගුල්ලෙකු වූයේය යන චෝදනාව තමා වෙත එල්ල විය හැකි නොවේදැයි ඔහු සිතන්නට විය. තමාගේ උදාසීනකම සහ තමාගේ අනාගත සුරක්ෂිතතාව සෙවීමට යොමු වීම ගැන ඔහු තමාටම දොස් පවරා ගත්තේය. එහෙත් යම් මිනිසෙකුට තනිවම කළ හැකි උපරිමයට වඩා වැඩි කාර්ය භාරයක් ඔහුගෙන් ඉටුවෙමින් තිබුණි. ඔහුගේ පෑන කිසිවිටෙකත් අක්‍රියව නොපැවැතියේය. ඔහුව නිශ්ශබ්ද කිරීමට හැකිවීම ගැන සතුරෝ අමන්දානන්දයට පත්වෙමින් සිටියදී; ඔහු තවමත් ජීවතුන් අතර සිටිතැයි පිළිගත හැකි සාක්ෂි ලැබීමෙන් ඔව්හු මවිතයට පත් වූහ, ව්‍යාකූලයට පත් වූහ. ඔහුගේ පෑන් තුඩින් එළිබට පත්‍රිකා ගණනාවක් ජර්මනිය පුරා බෙදා හැරෙමින් තිබුණේය. ඒ අතරම හෙතෙම අලුත් ගිවිසුම ජර්මන් බසට පරිවර්තනය කිරීමෙන් තම පීතෘ භූමියට අගනා සේවාවක් ඉටු කළේය. ස්වකීය කඳුකර පත්මොස්හි සිට ශුභාරංචිය පතුරුවා හරිමින්ද, එකල සිදුවන්නාවූ පාප සහ වැරැදිවලට තරවටු කරමින්ද ඔහු වසරක කාලයක් එහි ගත කළේය.

ප්‍රසිද්ධ වේදිකාවෙන් තම දාසයා කලකට ඉවත්කර තැබීමට දෙවියන්වහන්සේ සැලසුම් කළේ, ඔහුගේ සුරක්ෂිත භාවය සඳහා

පමණක් නොවීය, ඔහුට විවේකී කාලයක් ලබාදීමටද නොවීය. සතුරන්ගේ ග්‍රහණයෙන් ඈත් කර තැබීමටද නොවීය. මේවාට වඩා තවත් අගනා ප්‍රතිඵලද ආරක්ෂා කරනු ලැබිය යුතු විය. කඳුකර නිවහනෙහි හුදෙකලාව, රහසිගතව සිටි ඔහුට භූමික ආධාරවලින් තොරව ජීවත් වීමට සිදුවිය. මිනිස් ප්‍රශංසාවලින් ඔහුව වෙන් කර තිබුණේය. ජයග්‍රහණයක් මගින් උදාවන්නාවූ උඩඟුකමෙන් සහ ආත්ම විශ්වාසයෙන් ඔහුව ඈත්කර තැබීම දේව අභිප්‍රාය විය. දුක්විඳීමට සහ නින්දාවට පත්කරනු ලැබීම ඔහුගේ කොටස විය. ඒවා තුළින් ඔහු විශේෂ පුහුණුවක් ලැබීය. එයින් උදාවූ ජවය කරණකොටගෙන ඔහුව ඔසවා තබනු ලැබූ එකී ඉතා උසස් තලයේ නැවත වරක් කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව ඔහුට ලැබුණේය.

සත්‍යය උදාකර දෙන්නාවූ නිදහස ගැන මනුෂ්‍යයෝ ප්‍රීතියට පත් වෙති. මිනිසුන් යදමින් බැඳ තබන වරදින් සහ මිථ්‍යා ඇදහිලි ක්‍රමවේදයන්ගෙන් නිදහස ලබාදීමට දෙවියන්වහන්සේ ස්වකීය සේවකයන් යොදා ගන්නා සේක. මෙම අයට ප්‍රශංසාකරමින් ඔවුන්ට ගරු කිරීමට, මනුෂ්‍යයෝ යොමු වෙති. දෙවියන්වහන්සේ ගැන වූ සිතුවිලි සහ ආදරය මිනිසුන් වෙතින් ඉවතට හැරවීමට සාතන් මාන බලමින් සිටී. එම සෙනෙහස සහ චින්තනය මනුෂ්‍යයන් කෙරෙහි යොමු කිරීම ඔහුගේ සැලැස්ම වන්නේය. දේව මගපෙන්වීමේ හස්තය මගින් භාවිතා කළ මානව උපකරණයට ගරුසරු දැක්වීමට මිනිසාව යොමු කිරීම සාතන්ගේ වෑයම වන්නේය. ඒ මගින් දෙවියන්වහන්සේට හිමි විය යුතු ගෞරවය වැලැක්වේ. මෙසේ ගෞරවයට සහ ප්‍රශංසාවට පාත්‍ර වන්නාවූ ආගමික නායකයෝ දෙවියන්වහන්සේ කෙරෙහි වූ රඳා පැවැත්ම අමතක කර දමා තමන් කෙරෙහිම විශ්වාසය රඳවා ගැනීමට යොමු වෙති. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙවන් අය, තමන් යටතේ සිටින බැතිමතුන්ගේ මනස් සහ හෘදය සාක්ෂි පාලනය කිරීමට යොමු වෙති. පාපයෙන් ගැළවීමේ මාර්ගයට ගෙන එනු ලැබූ, මෙම බැතිමත්හු තමන්ට මගපෙන්වීම සඳහා දෙවියන්වහන්සේගේ වචනය කෙරෙහි රඳා නොසිට තමන්ට මාර්ගය පෙන්වා දුන් දේවගැතිවරයා කෙරෙන් මගපෙන්වීම බලාපොරොත්තු වෙති. මෙවන් ක්‍රියා කලාපයක් හා ආත්මයක් දේව සේවකයන් විසින් අනුගමනය කිරීම නිසා ප්‍රතිසංස්කරණයේ ක්‍රියාවේදය පසුබෑමකට ලක්වෙයි. මෙම අනතුරුදායක තත්ත්වයෙන් එහි මෙහෙය රැකගැනීමට දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වනසේක. ශුභාරංචිය පැතිරවීමෙහි සේවාවට මිනිස් මුද්‍රාව නොව දේව මුද්‍රාව ලැබීම දෙවියන්වහන්සේගේ අභිප්‍රාය වන්නේය. සත්‍යතාව පහදා දුන් පුද්ගලයා ලෙස මිනිසුන්ගේ ඇස් ලූතර් වෙත යොමු වී තිබුණේය. ඔවුන්ගේ දෑස් සත්‍යතාවයේ සදාතන කතුවරයාණන් වෙත යොමු කරනු වස් දෙවියන්වහන්සේ ලූතර්ව මිනිස් දර්ශනයෙන් ඉවත් කර තැබූ සේක.



# 9

# ස්විස්ටර්ලන්තයේ ප්‍රතිසංස්කරණවාදියා

## (1484 - 1531)

දේව සභාව ස්ථාපිත කිරීම දෙවියන්වහන්සේගේ සැලැස්ම මත උන්වහන්සේගේ නියමය පරිදි සිදුවිය. එසේම සභාව ප්‍රතිසංස්කරණය කිරීමේදී ඒ සඳහා යෝග්‍ය වූ ක්‍රියාකාරී භට පිරිසක් තෝරා ගැනීමද උන්වහන්සේගේ සැලැස්මෙහි කොටසක් විය. ස්වර්ගීය ගුරු දේවයාණෝ පොළොවෙහි කීර්තිධරයන් ඒ සඳහා යොදා නොගත් සේක. උසස් තනතුරු දරූ ධනවතුන් උන්වහන්සේගේ තේරීම නොවීය. එවන් අයගේ පරමාර්ථය වූයේ මහජන ප්‍රශංසාවට සහ ගෞරවයට පාත්‍ර වීම පමණය. ඔවුන් තුළ අහංකාරය රජ කළේය. තමන්ගේ හැකියාවන් කෙරේ ඔවුහු දැඩි ඇගයීමක් සහ විශ්වාසයක් තැබූහ. තම සහෝදර ජනතාව සමග සානුකම්පාවෙන් යුතුව ක්‍රියා කිරීමට ඔවුන්ව හැඩගැස්වීම උන්වහන්සේගේ තෝරා ගැනීම නොවීය. නිහතමානී නාසරීය තැනැන්වහන්සේ සමග සහායක සේවකයන් වීමට එවන් අය සුදුසු නොවීය. සභාව ස්ථාපිත කළ මුල් අවස්ථාවේදී සේවය සඳහා කැඳවීම ලැබුවෝ වැඩි උගත්කමක් නොතිබූ වෙහෙස මහන්සිව දිවි ගෙවූ මසුන් මරන්නෝය. "මා පස්සේ එන්න. මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් කරන්නෙමි" යනුවෙන් ඔවුන්ට කැඳවීම දෙනු ලැබීය. (මතෙව් 4:19). මෙම ගෝලයෝ නිහතමානී අය වූහ. උගන්වන්නාවූ දේවල් ග්‍රහණය කරගැනීමට ඔවහු යටහත් පහත් වූහ. එකල ප්‍රචලිතව පැවැති ව්‍යාජ ඉගැන්වීම් මගින් වූ බලපෑම් ඔවුන් තුළ අඩු වූ තරමට ඔවුන්ට ගුරුහරුකම් ලබාදෙමින් පුහුණු කිරීමට වූ හැකියාව වැඩි විය. ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ සත්‍යයමය වූ දහම් වටහා ගැනීමේ හැකියාව ඔවුන් තුළ වැඩි විය. අති විශිෂ්ට ප්‍රතිසංස්කරණය සිදුවූ සමයේදී ද ක්‍රියාත්මක වූයේ එවන් ක්‍රමවේදයකි. ප්‍රතිසංස්කරණයේ ප්‍රබල නායකයෝ සාමාන්‍ය පවුල් වලින් පැවත එන්නෝ වූහ. ඔවුහු තමන් දරූ තනතුරු නිසා උඩඟුකමින් හිස උදුම්මා නොගත් අය වූහ. ඔවුහු අවිචාර බුද්ධියෙන් තමන්ගේම මතයෙහි එල්බ සිටි අය නොවූහ; එසේම, දහම් ගැටළුවලින් නරක් වූ අයද නොවූහ. නිහතමානී අය යොදවා ගනිමින් විශාල මෙහෙයන් සාර්ථකව ඉටු කරගැනීම දෙවියන්වහන්සේගේ සැලැස්ම වන්නේය. එවිට කර්තව්‍යයෙහි ගෞරවය හිමි වන්නේ මිනිසුන්ට නොව ඔවුන් තුළින් තමන්වහන්සේගේ කැමැත්ත ක්‍රියාත්මක කරන්නාවූ තැනැන්වහන්සේටය. ස්වාමියාණන්ගේ කැමැත්ත ඉටුවීමෙන් සේවකයාටද එහි ප්‍රීතියට ඇතුළු විය හැකිවේ.

ලූතර් සැක්සනියේ පතල් කරුවෙකුගේ කුඩා නිවසක උත්පත්තිය ලැබුවාට සති ස්වල්පයකට පසුව යුල්රික් ස්වින්ග්ලි ඇල්ප්ස් කඳුකරයේ ගොපල්ලෙකුගේ නිවසෙහි උපත ලැබීය. ළමා කාලයේදී ස්වින්ග්ලි දිවිගෙවූ පරිසරයත්, මුල් කාලයේදී ලැබූ අධ්‍යාපනයත් තුළින් අනාගතයේ කාර්ය භාරය ඉටුකිරීම සඳහා ඔහු පුහුණුව ලැබීය. ස්වභාවික විභූතියත්, අලංකාරයත්, මනහර වටපිටාවත් මගින් ඔහුගේ මනස තුළ දෙවියන්වහන්සේගේ අති උදාර ශ්‍රේෂ්ඨත්වයත්, අසම සම බලයත්, තේජෝබල මහිමයත් පිළිබඳව සිතුවම් සනිටුහන් වී තිබුණේය. ඔහුගේ නිජ භූමිය වූ කඳුකරයෙහි පැවති නිර්භීත ක්‍රියාවන්ගේ ඉතිහාසය ඔහුගේ තුරුණු වියෙහි අභිලාෂයන් කෙරෙහි බලපෑමක් ඇති කළේය. වංශ කථා සහ සම්ප්‍රදායන් මුසු වූ දේශනා තුළින් ලබා ගත් බයිබල් කථා අගය කළ තම මිත්තණියගෙන් ස්වින්ග්ලි බයිබල් විස්තර ඉගෙන ගත්තේය. වංශාධිපති පියවරුන් සහ දිවැසිවරුන් විසින් සිදු කළ අනගි ක්‍රියාවන් ගැන ඇසීමට ඔහු මහත් උනන්දුවක් දැක්වීය. පලස්තීන කඳුකරයේ බැටළුවන් බලා ගනිමින් සිටි එඬේරුන්ට දේව දූතයන් පැවසූ විස්තරයත්, බෙත්ලෙහෙමේ බිළිඳා පිළිබඳවත්, කල්වාරියෙහි මනුෂ්‍යයාණන් සම්බන්ධවත් වූ පුවත් සියල්ලත් අසා සිටීමට ඔහු ඉමහත් කැමැත්තක් දැක්වීය.

ලූතර් මෙන්ම ස්වින්ග්ලිගේ පියාද තම පුතාට මනා අධ්‍යාපනයක් ලබාදීමට ආශා කළේය. ඒ සඳහා ළමා ස්වින්ග්ලිව ඔහු ජීවත්ව සිටි නිම්න භූමියෙන් පිටතට යවනු ලැබීය. ඔහුගේ මනස සීඝ්‍රයෙන් වර්ධනය විය. ඔහුගේ අධ්‍යාපන පරමාර්ථයන් ඉටුකර දීමේ නිපුණත්වයක් ඇති ගුරුවරුන් සොයා ගැනීම ස්වින්ග්ලිගේ පියාට ප්‍රශ්නයක් විය. දහතුන් වියෙහි සිටි ඔහුව බර්න්හි විදුහලකට යවන ලදී. ස්විට්සර්ලන්තයේ ඉතා ඉහළින් පිළිගත් පාසලක් තිබුණේ බර්න්හි පමණක්ය. ඔහුගේ ජීවිත අභිලාෂය අඳුරු කිරීමට තර්ජනයක් පාසැලේදී ඔහුට එල්ල විය. තාපසාරාමයකට ඇතුළු වන්නැයි එම පාසලේ ගුරු තාපසවරු ඔහුට බලපෑම් එල්ල කරන්නට වූහ. ජනප්‍රසාදය දිනාගැනීම් වස් ඩොමිනිකන් තාපසාරාම බලවත්හු සහ ෆ්‍රැන්සිස්කන් තාපසාරාම බලවත්හු ප්‍රබල වෑයමක යෙදී සිටියෝය. මෙම ව්‍යායාමයෙන් ජයග්‍රහණය කිරීම සඳහා ඔවුහු නෙත් සිත් ඇදගන්නා ප්‍රදර්ශන ඉදිරිපත් කළෝය. විවිධාකාර අලංකාර සැරසිලි මගින් තම දේවස්ථාන අලංකාර කිරීමට ඔවුහු තරඟ වැදුණෝය. මංගල්‍යයන් සහ උත්සව ආදිය බාහිර ආටෝපයන්ගෙන් සැරසීමට මහත් වෑයමක්ද විය. වැඳුම් පිදුම් වලට භාජනය වූ පුද්ගලයන්ගේ ධාතු සහ හාස්කම් සිදුකරන්නාවූ ප්‍රතිමා රූප මගින් තම දේවස්ථාන ආකර්ෂණය කිරීමට ඔවුහු තරඟ වැදුණාහ.

ස්වින්ග්ලි නම් වූ මෙම තරුණ විද්වතා තමන්ගේ පාර්ශ්වයට දිනාගත හොත් ලාභ ප්‍රයෝජන මෙන්ම ගෞරවයද අත්පත් කරගත



හැකිවෙනවා ඇතැයි බර්න්හි සිටි ෆ්‍රැන්සිස්කන්වාදී ආචාර්යවරු කල්පනා කළහ. මේ තරුණ විද්වතා තුළ කථනයෙහි සහ රචනයෙහි නිපුණත්වය ඉතා ඉහළ තලයක පිහිටා පැවැතියේය. දේවස්ථානයේ වූ ආත්මික මෙහෙයන් සඳහා වැඩි බැතිමතුන් සංඛ්‍යාවක් ඇදගැනීමටද ආදායම වැඩි කරගැනීම සඳහාද උපක්‍රමශීලීව කටයුතු කිරීමටද මෙම තරුණ විද්වතා පාවිච්චි කළ හැකි බව ඔව්හු කල්පනා කළහ. ඔහුගේ චතුර කථිකත්වයත් රචනයෙහි ප්‍රවීණත්වයත්, හසල සංගීත නිපුණත්වය සහ කවිත්වයත් තුළින් තම අරමුණ ඉටුකර ගැනීමට හැකිවේ යයි මේ පූජක පක්ෂය බලාපොරොත්තු වූහ. තමන්ගේ තාපසාරාමයට ඔහුව ඇතුළත් කරගැනීම උදෙසා ඩොමිනිකන්වාදී පූජක අධිපතීහු වංචාකාරකමක් ද චාටු බස් දෙඩීමද නොඅඩුව භාවිතයට ගත්තෝය. පාසල් යන සිසුවෙකුව සිටියදී මාර්ටින් ලූතර් තාපසාරාමයකට හිමිකම් කියමින් තම ජීවිතය කැප කිරීම මගින් ඔහුව ලෝකයට අහිමි වන්නට හැකියාව තිබුණේය. එහෙත් දෙවියන්වහන්සේ ස්වින්ග්ලිවද එයින් මුදා ගත්සේක. තාපසාරාම කුටියක සිරකරුවෙකු බවට පත්කිරීමේ අනතුරට භාජනය වීමට ස්වින්ග්ලිට අවසර නොලැබුණේය. තාපස ඇඳුරන්ගේ සැලැස්ම ගැන ඔහුගේ පියාට තොරතුරු ලැබෙන්නට විය. තමාගේ පුත්‍රයා පූජක තාපසයෙකුගේ වැඩකට නැති නිෂ්ඵල දිවියක් ගෙවනු දැකීම ස්වින්ග්ලිගේ පියාගේ පරමාර්ථය නොවීය. තම පුතාගේ අනාගත හැකියාවන් තීරණාත්මක සන්ධිස්ථානයක් කරා පැමිණ ඇති බව පියාගේ හැඟීම විය. හැකි ඉක්මණින් ගෙදර පැමිණෙන ලෙස ඔහු තම පුත්‍රයාට නියම කළේය.

ඉල්ලීම ක්‍රියාත්මක විය. එහෙත් තම උපන් ගමෙහි සිටීමෙන් ඔහුට සෑහීමට පත්වන්නට හැකි නොවීය. ටික කලක් එම නිම්නයේ කාලය ගත කළ ස්වින්ග්ලි තම අධ්‍යාපන කටයුතුවල නිරත වීම් වස් නැවත වරක් බේසල් නගරය කරා පිය මැන්නේය. දෙවියන්වහන්සේ නොමිලයේ දානය කරන්නාවූ කරුණා-අනුග්‍රහය ගැන ඔහුට මුල් වතාවට අසන්නට ලැබුණේ මෙහිදීය. ඔහු අධ්‍යාපනය ලද විදුහලේ සිටි ආචාර්යවරයෙකු වූ විටන්බැක් පැරණි භාෂා ඉගැන්වීමේ ප්‍රධාන ගුරුවරයා විය. ග්‍රීක් සහ හෙබ්‍රෙව් භාෂා අධ්‍යයනෙහි යෙදී සිටින අතරේදී ඔහුගේ අවධානය ශුද්ධ ලියවිලි කෙරෙහි යොමු විය. තමා ලැබූ සත්‍යතාවේ දිව්‍ය ආලෝක රැස් දහරා සිසුන්ගේ මනස් තුළට අවතීර්ණ කිරීමේ මං පෑදුණේය. පාසල් ආචාර්යවරුන් සහ දර්ශනවාදීන් විසින් ප්‍රකාශ කරන්නාවූ මතවාදයන්ට වඩා පැරණිවූ ද, අනන්ත අගනා වටිනාකමින් යුතුවූ ද සත්‍යතාවක් ඇතැයි ඔහු තම සිසුන්ට පහදා දුන්නේය. එම මාහැඟි සත්‍යතාවය නම් පව්කාරයාගේ පව්වලට වන්දි ගෙවීමක් කළ හැකි එකම මාධ්‍යය වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ මරණය කරණකොටගෙන පමණක් බව ඔහු පැවසුවේය. අරුණ උදාවට පෙර ස්වින්ග්ලිගේ මනසට ඇතුළු වූ පළමුවන ආලෝක දහරාව මෙම වදන් විය.

බේසල්හි සිටි ස්වින්ග්ලි ඇල්පයින් කඳුවැටි ප්‍රදේශයේ පූජකවරයා ලෙස සේවය කිරීමට කැඳවනු ලැබීය. එම ප්‍රදේශය ඔහුගේ නිවසට ආසන්න විය. ඔහු පූජකයෙකු ලෙස අභිෂේකය ලැබීය. "ඔහුගේ එකම අරමුණ වූයේ දිව්‍ය සත්‍යතාව සොයමින් එය පසුපස යෑමය. ක්‍රිස්තුස්වහන්සේගේ බැටළු රැළෙහි භාරය තමාට පවරාදී ඇති නිසා තමා පුළුල් ලෙස ධර්මය ඉගෙන ගෙන තිබිය යුතුය යන්න ඔහු මනාව අවබෝධ කරගෙන සිටියේය"යි සමකාලීන ප්‍රතිසංස්කාරකයෙක් පවසා ඇත. (Wylie, b. 8, Ch. 5). ඔහු තව තවත් ගැඹුරට ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරත්ම, එහි අඩංගු සත්‍යතාවයන් හා රෝමානු දහමේ ඉගැන්වීම් අතර වූ විරෝධතා ඔහුට වඩ වඩාත් පැහැදිලිව පෙනී යන්නට විය. බයිබලය වනාහි දෙවියන්වහන්සේගේ වචනය බව ඔහු හදවතින්ම පිළිගත්තේය. දහම් අධ්‍යයනයේදී බයිබලය මත පමණක් සියල්ලම පදනම් විය යුතු බවත්, ඒ සඳහා ප්‍රමාණවත්වූද, වැරැදි විය නොහැකිවූද එකම පසුතලය ශුද්ධ බයිබලය බවත් ඔහුගේ තීරණය විය. බයිබලයෙහි ප්‍රකාශනවලට අර්ථකථනය සැපයීමට එයටම ඉඩ හළ යුතු බව ඔහු දුටුවේය. සිත්හි මුල් බැසගෙන තිබූ මත සහ දහම් පදනම් කරගෙන ශුද්ධ ලියවිල්ල පැහැදිලි කරදීමට ඔහු බිය විය. බයිබලයේ අන්තර්ගත පද අනුසාරයෙන් යම් ඉගැන්වීමක සෘජු යථාර්ථ අදහස සොයා ගැනීම තම වගකීම බව ඔහුගේ කල්පනාව විය. යම් දහමක සම්පූර්ණවූද, සත්‍යයවූ ද ඉගැන්වීම කුමක්දැයි සොයා ගැනීමට ඔහු හැකි සෑම මාර්ගයකම පිහිට සෙවීය. ඔහු ශුද්ධාත්මයාණන්ගේ පිහිට ඉල්ලා සිටීමට පසුබට වූණේ නැත. හදවතෙහි අවංකතාවයෙන් සහ යාච්ඤාවෙන් ඉල්ලා සිටින්නාවූ සැමට, සත්‍යය එළිදරව් කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියා කරන බව ඔහු විශ්වාස කළේය.

ස්වින්ග්ලි මෙසේ පැවැසුවේය: "ශුද්ධ ලියවිල්ල පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන් මිස මිනිසාගෙන් නොවේය. මනස ආලෝකමත් කරන්නාවූ තැනැත්වහන්සේ දෙවියන්වහන්සේගේ කථනය වූ වදන් තේරුම් ගැනීමට ඔබට උපකාර කරනවා ඇත. දෙවියන්වහන්සේගේ වචනයට ... පරාජය වීමක් නැත. එය දීප්තියෙන් අනූනය; එය තුළින්ම ඉගැන්වීම් ඇතිවන්නේය; සියලු විමුක්තියෙන් සහ කරුණා-අනුග්‍රහයෙන් ආත්මය ආලෝකමත් කරන්නේය; ශුද්ධ වචනය දෙවියන්-වහන්සේ තුළ මිනිසා සනසන්නේය; නිහතමානී බවට පත්කරන්නේය; තමාවම අහිමි කරගනිමින් දෙවියන්වහන්සේව වැළඳ ගැනීමට මං සාදන්නේය." (Wylie, b. 8, Ch. 6). මෙම වදන්හි සත්‍යතාව ස්වින්ග්ලිටම පැහැදිලිව ඔප්පු වී තිබුණි. මෙකල ඔහුට හිමිවූ අත්දැකීම ගැන පසුකලෙක හෙතෙම මෙසේ ලියා ඇත: "ශුද්ධ ලියවිලි ඉගෙනීමට මා සම්පූර්ණ කාලය යොමු කළ විට පණ්ඩිතයන්ගේ සහ විශාරදයන්ගේ දර්ශන වේදය සහ දේවධර්ම වේදය එයට විරුද්ධව දැඩි ලෙස තර්ක විතර්ක ඉදිරිපත් කළේය. අන්තිමේදී මම මෙවන් තීරණයකට



පැමිණියෙමි. මාගේ සිතට මම මෙසේ පැවසීමි. "සිතේ තිබෙන්නාවූ සෑම කල්පිතයක්ම අයින් කරන්න. දෙවියන්වහන්සේගේ සරල වචනයෙහි ඇති තේරුම ඉගෙන ගැනීමට වෑයම් කරන්න." මට උන්වහන්සේගේ ආලෝකය ලබා දෙන්නැයි මම දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියෙමි. එකල්හි ශුද්ධ ලියවිල්ල තේරුම් ගැනීම මට පහසු විය." (Wylie, b. 8, Ch. 6).

ස්වින්ග්ලි විසින් දෙසූ දහම ලූතර්ගෙන් ලැබූ ඉගැන්වීමක් නොවීය. ස්වින්ග්ලි දේශනා කළේ ක්‍රිස්තුස්වහන්සේගේ දහමය. ස්විස්ටර්ලන්තයේ සිටි මේ ප්‍රතිසංස්කාරකයා මෙසේ පැවසුවේය. "ලූතර් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව දේශනා කරන්නේ නම්, ඔහු කරන්නේත් මා කරන දේමයි. ඔහු ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙනැවිත් තිබෙන සංඛ්‍යාව මා ක්‍රිස්තුස්-වහන්සේ වෙතට ගෙනැවිත් තිබෙන පිරිසට වඩා විශාලය. ඒ ගැන තර්කයක් නැත. මම ක්‍රිස්තුස්වහන්සේගේ සොල්දාදුවෙක් වෙමි. උන්වහන්සේ මාගේ නායකයාණෝය. උන්වහන්සේගේ නාමය හැරෙන්නට මම වෙන නාමයක් දරන්නේ නැත. මම ලූතර්ට එකම වචනයක් හෝ ලියා නැත. එසේම ලූතර් විසින්ද මට කිසිම වචනයක් හෝ ලියා එවා නැත. එසේ වන්නේ කුමක් සඳහාද? දෙවියන්-වහන්සේගේ ආත්මයාණෝ කිසිම අවස්ථාවක හෝ දෙයාකාරයකින් උගන්වන්නේ නැති බව ඒත්තු ගැන්වීමටය. එසේ අප දෙදෙනා කිසිම සබඳතාවයකින් තොරව ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මය පූර්ණ එකඟතාවකින් යුතුව ප්‍රකාශ කරමුව." (D. Aubigne, b. 8, Ch. 9).

එයින්සීඩල්හි තාපසාරාමයේ දේශනා කරන්නැයි 1516 දී ස්වින්ග්ලිට ඇරයුමක් ලැබුණේය. මෙහිදී රෝමයේ දූෂිත ක්‍රියාදාමයන් ඉතා සමීපව දැනගැනීමේ අවස්ථාවක් ඔහුට උදා විය. ප්‍රතිසංස්කාරක-යෙකුගෙන් සිදුවිය යුතු බලපෑම, ඔහු උපන් බිමෙහි පමණක් නොව ලොව පුරා ඈතට විහිදී යෑමේ ප්‍රවණතාව ප්‍රබල විය. එයින්සීඩල්හි දේවස්ථානයට බැතිමතුන් ඇදගැනීමේ සුවිශේෂී ප්‍රතිමාවක් තිබුණේය. එය වූකලී හාස්කම් සිදුකිරීමේ බලය ඇති කන්‍යා මරියාගේ රූපයකි. එකී තාපසාරාම පිවිසීමේ දොරටුවට ඉහළින් මෙම වදන් චිත්‍රගත කර තිබුණේය: "මෙහිදී ඔබේ පව්වලට සීමා රහිතව කමාව ලබාගත හැක." කන්‍යා මරියාගේ පිළිමය තිබුණාවූ මෙම පූජනීය ස්ථානයට වන්දනාකරුවෝ අවුරුද්ද පුරාම පැමිණියෝය. වාර්ෂිකව පවත්වනු ලැබූ මහා මංගල්‍යයට සහභාගී වීම සඳහා ස්විට්සර්ලන්තයේ නන් දෙසින් ඉතා විශාල පිරිසක් පැමිණියෝය. ප්‍රංශයෙන් සහ ජර්මනියෙන්ද බැතිමත්හු විශාල කණ්ඩායම් වශයෙන් එහි පැමිණියෝය. මෙම දසුනින් ස්වින්ග්ලි මහත් වේදනාවට පත්විය. අන්ධ විශ්වාසයක වහලුන් බවට පත්ව සිටින්නාවූ මෙම ජනතාවට ශුභාරංචිය තුළින් ළඟා කර දෙන්නාවූ ගැළවීම ගැන ප්‍රකාශ කිරීමට ඔහු මෙහිදී ඉදිරිපත් විය.

ඔහු මෙසේ දේශනා කළේය. "දෙවියන්වහන්සේ මැවූ මේ පෘථිවියෙහි සෑම තැනකම උන්වහන්සේ වැඩ වසන සේක. වෙනත් ස්ථානයකට වඩා වැඩි විශේෂ ආකාරයකින් උන්වහන්සේ මෙහි වැඩ සිටිනවා යයි කල්පනා නොකරන්න. ඔබ කුමන රටක හෝ වාසය කළත්, දෙවියන්වහන්සේ ඔබ සමග සිටිනසේක, ඔබට ඇහුම්කන් දෙනසේක ... පලක් නැති ක්‍රියාවන්, දුර පළාතක් කරා වූ වන්දනා ගමන්, පඬුරු දීම්, කන්‍යා මරියාට හෝ වෙනත් සාන්තුවරුනට වූ යාච්ඤා කිරීම මගින් ඔබට දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය ලබාගන්නට පුළුවන්ද? ... අපගේ යාච්ඤා තුළ ගැබ්වී ඇති විශාල ප්‍රමාණයේ වචන වලින් අත්වන සෙත් ශාන්තිය කුමක්ද? දිළිසෙන තාපස හිස්වැස්මකින්, බූගාන ලද හිසකින්, දික්වූ ලෝගුවකින් හෝ රත්රන් නූලෙන් ගෙත්තම් වූ පාවහන් යුගලකින් අත්වන්නාවූ ආනුභාවය කුමක්ද? ... දෙවියන්වහන්සේ අපගේ හදවත් දෙස බලන සේක. එහෙත්, අපගේ හදවත් තිබෙන්නේ උන්වහන්සේට හුහක් ඈතින්ය. තවද, ඔහු මෙසේද කීවේය: "ක්‍රිස්තුස්වහන්සේ එක්වරක් කුරුසිය මත පූජා වූසේක. පූජාව මෙන්ම මරනු ලැබූ බැටළු පැටවාණෝද උන්වහන්සේමය. සදාතනය පුරා ජීවත් වන්නාවූ බැතිමතුන්ගේ පාපවලට කමාව සපයා දීමට එම පූජාව සමත්ය. (D’ Aubigne, b. 8, Ch. 5).

බොහෝ ශ්‍රාවකයන්ට මෙම ඉගැන්වීම් කන් කළු නොවීය. ඔවුන් විසින් කරන ලද වෙහෙසකාරී දිග වන්දනාවන් පලක් නැති ව්‍යායාමයක් ලෙස හඳුන්වනු ලැබීමෙන් ඔවුහු සිත් තැවුලට පත් වූහ, කලකිරීමට පත් වූහ. ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ප්‍රදානය කරනු ලබන්නාවූ කමාව තේරුම් ගැනීමට ඔවුන්ට නුපුළුවන් විය. රෝමානු සභාව විසින් ඉදිරිපත් කර තිබූ සගයට යෑමේ පැරණි ක්‍රමය තුළ ඔවුහු සෑහීමට පත්වූවෝය. එයට වඩා යහපත් වූ ක්‍රමවේදයක් සෙවීමේ ව්‍යාකුලතාව ගැන ඔවුහු අසීරුවට පත් වූහ. හදවත්හි පාරිශුද්ධතාවට වඩා තමන්ගේ ගැළවීම පූජකයන්ට සහ පාප්ට භාරදීම වඩා පහසු ක්‍රමයක් විය.

ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ගැළවීම උදාකර ගැනීමේ සුපුවත, තවත් බැතිමතුන් කණ්ඩායමක් ප්‍රීතියෙන් යුතුව පිළිගත්හ. රෝමය විසින් ඉදිරිපත් කරන ලද පිළිවෙත් අනුගමනය කිරීම මගින් හදවත් තුළ සාමය උදා කළ නොහැකි විය. එම නිසා තම පාප වෙනුවෙන් වන්දි ගෙවූ ගැළවුම්කාරයාණන්ගේ රුධිරය තම පාප උදෙසා හිලව් කරගැනීමට ඔවුහු ඉදිරිපත් වූහ. තමන් ලැබූ අගනා සත්‍යතාවන් සහ ආලෝකය තම ගම් පෙදෙස්හි තවත් අයට එළිදරව් කිරීමට මොවුහු ක්‍රියාත්මක වූහ. මෙසේ ගෙයින් ගෙට, ගමින් ගමට සත්‍යතාව රැගෙන යාම නිසා කන්‍ය මරියාගේ සුරුවම වෙත පැමිණෙන්නාවූ වන්දනාකරුවන්ගේ සංඛ්‍යාව පහත බසින්නට පටන්



ගත්තේය. දේවස්ථානයට ලැබෙන්නාවූ සම්මාදම අඩු විය. සම්මාදම් අඩුවීම නිසා එයින් කොටසකට හිමිකම් කී ස්වින්ග්ලිගේ වේතනයද ක්‍රමානුකූලව පහත වැටුණේය. මේ ගැන හෙතෙම කණගාටුවට පත් නොවීය. දුර්ලබ්ධික තේවාවන් සහ ව්‍යාජ ඉගැන්වීම් බිඳවැටෙනු දැකීමෙන් ඔහු ප්‍රීතියට පත්විය.

ස්වින්ග්ලි කරගෙන යන්නාවූ මෙහෙවර පිළිබඳව පාලකයෝ අන්ධව නොසිටියහ. එයට හරස්වීම ඔවුහු මඳ කලකට පමා කළෝය. තමන්ගේ ඉලක්කය සපුරා ගැනීමේ අදහසින් ඔවුහු තරමක් නිශ්ශබ්දව සිටියහ. තමන්ගේ පක්ෂය සමග එකතු වී, එකට අත්වැල් බැඳ ක්‍රියාකිරීමට ඔහුගේ දායකත්වය ලබාගැනීම සහා පාලකයන්ගේ අභිමතාර්ථය විය. සුදුසු ප්‍රතිචාරයක් ලබාගන්නා පිණිස ඔවුහු ස්වින්ග්ලිගේ ගුණ වැනීමට ක්‍රියාත්මක වූහ, ප්‍රශංසා මුඛයෙන් ඔහු පිනවීමට තැත් කළහ. ඒ අතරම සත්‍යතාවද ජනතාවගේ සිත් ආක්‍රමණය කරමින් ව්‍යාප්ත වන්නට විය.

එයින්සීඩල්හි සේවය කළ ස්වින්ග්ලි දේව සේවයේ කටයුතු පිළිබඳව මනා පුහුණුවක් ලැබීය. මෑත අනාගතයේදී ඔහුට පැවරෙන්නාවූ විශාල කර්තව්‍යය කරගෙන යෑම් වස් එය ඔහුගේ පුහුණුවට මහත් උපකාරයක් විය. වසර තුනක් මේ ස්ථානයේ සේවය කිරීමෙන් පසුව සුරිච්හි ආසන දෙව් මැදුරේ සේවය සඳහා ඔහුට කැඳවීමක් ලැබුණේය. එවිට මේ නගරය ස්විස් සහා ආණ්ඩුවේ ඉතාම වැදගත් නගරය විය. මෙහිදී යම් බලපෑමක් කරනු ලබන්නේද එහි ආනුභාවය විශාල ප්‍රදේශයක් පුරා පැතිර යා හැකි විය. සූරිච්හි දෙව් මැදුර කරා පැමිණෙන ලෙස ඔහුට ඇරයුම් කළ බලධාරීහු අලුත් දෙයක් ක්‍රියාත්මක කිරීමෙන් ඔහුව වළකාලනු වස්, ඔහුගේ කාර්ය භාරයන් ගැන ඔහුව දැනුවත් කිරීමට කල් නොයවා ක්‍රියාත්මක වූහ.

ඔව්හු ඔහුට මෙසේ පැවසූහ. "මෙම කොට්ඨාශ මූලස්ථානය යටතේ ඇති සෑම දේවස්ථානයකින්ම උපරිමයෙන් ආදායම් එකතු කරගැනීමට සෑම වෙහෙසක්ම දැරීම ඔබගේ රාජකාරියයි. කුඩා දේවස්ථාන කිසිවක් හෝ අතහැර නොදමන්න. විශ්වාසවන්ත බැතිමතුන් ඔසවා තබන්නට වෑයම් කරන්න. එය දේශනා කූඩුවෙන්ද, පව් කියාදීමේ කුටියෙන්ද ක්‍රියාත්මක විය යුතුය. දසයෙන් කොටස සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් ගැන අනුශාසනා කරන්න. සභාවට ඇති ආදරය පෙන්වීම උදෙසා විශ්වාසවන්ත ලෙස සම්මාදම් දීමට බැතිමතුන් උනන්දු කරවන්න. රෝගී වූ බැතිමතුන්ගෙන්, සත් ප්‍රසාද පූජාවෙන් සහ පොදු ආගමික වතාවත්වලින් ද ලැබෙන්නාවූ ආදායම වැඩිකර ගැනීමට ඔබ උනන්දුවෙන් කටයුතු කළ යුතුය. සත් ප්‍රසාද සංකේත බෙදීම, දේශනා කිරීම, රැළ රැකබලා ගැනීම යන මේවාත් පූජකයාගේ කාර්ය භාරයන් වන්නේය. මේ සඳහා වෙනත් අයෙකු යොදවා ගැනීමට

ඔබට අවසර ඇත. විශේෂයෙන්ම දේශනා කිරීමේදී එසේ කළ හැකිය. වැදගත් යයි පිළිගනු ලබන අයට පමණක් සත්ප්‍රසාද පූප බෙදා දිය යුතුය. ඉල්ලා සිටින්නාවූ අවස්ථාවන්හිදී පමණක් එසේ කළ යුතුය. පුද්ගලයන්ගේ තරාතිරම් නොබලා සත්ප්‍රසාද මෙහෙයක් ඉටුකිරීම ඔබට තහනම්ය. (D. Aubigne, b. 8, Ch. 6).

වැඩ පැවරීමේ ප්‍රතිඥා පත්‍රයට නිහඬව ඇහුම්කන් දුන් ස්වින්ග්ලි පිළිතුරු දෙමින්, මෙම උසස් පදවිය තමාට ලබාදීමට ගත් පියවරට තමා ස්තුතිවන්ත වන බව පැවසීය. තවද තමා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන්නාවූ වැඩ පිළිවෙල ගැන සඳහන් කරමින් ඔහු මෙසේ පැවසීය. "ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය බොහෝ කලක් මිනිසුන්ගෙන් වසන් කර ඇත. මතෙව්ගේ ශුභාරංචිය සම්පූර්ණ-යෙන්ම දේශනා කිරීමට මම අදහස් කරනවා ... ඒ සඳහා කරුණු ශුභාරංචියේ උල්පතින් පමණක් ලබාගැනීම මාගේ අරමුණ වන්නේය. එහි සඳහන් දහම්වල ගැඹුර සොයා බැලීම මාගේ අභිලාෂයයි. ලියවිලිවල එක කොටසක් තවත් කොටසක් සමග සසඳමින් තේරුම් ගැනීම සඳහා නිරන්තරව අවංකවම යාච්ඤාවෙහි නිරත වීමට වෑයම් කරන්නෙමි. මාගේ සේවාව මා කැප කරන්නේ දෙවියන්වහන්සේගේ ගෞරවය උදෙසාය, උන්වහන්සේගේ එකම පුත්‍රයාණන්ගේ ප්‍රශංසාව උදෙසාය. ආත්මවල යථාර්ථවාදී ගැළවීම උදෙසාද, සත්‍යය වූ ඇදහිල්ලෙහි ඥානයෙන් සහ ගුණයෙන් වර්ධනය වීමට අතහිත දීම සඳහාද මාගේ සේවය කැප කරමි." (D. Aubigne, b. 8, Ch. 6). ඔහුගේ සැලසුම් අනුමත කිරීමට සමහර බලධාරීහු කැමැත්ත පළ නොකළෝය. එවැනි මාර්ගයක් ගැනීමෙන් ඔහුව වළක්වාලීමට ඔවුන් උත්සාහ දැරුව නමුත් තමාගේ අධිෂ්ඨානයෙහි නොසැලී සිටීම ඔහුගේ තීරණය විය. අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දීමට තමා තුළ චේතනාවක් දැනට නැති බවත්, මුල් කාලයේදී පිරිසිදු ලෙස සභාව විසින් ක්‍රියාවට නැංවූ පැරණි ක්‍රම අනුගමනය කිරීමට තමා වෑයම් කරන බවත් ඔහු ප්‍රකාශ කළේය.

ස්වින්ග්ලි විසින් උගන්වන ලද සත්‍යතාවන් කෙරෙහි උනන්දුවක් දැනටමත් පිබිදී තිබුණේය. ඔහුගේ දේශනාවන් ඇසීමට බොහෝ අය පැමිණියහ. බොහෝ කලෙක පටන් දේවස්ථානයට යාම අත්හැර දැමූ අයද ඔහුගේ ශ්‍රාවකයන් අතර විය. ඔහු තම මෙහෙවරය ආරම්භ කළේ ශුභාරංචි පොත් පෙළට අවධානය යොමු කරමින්ය. එහි අඩංගු පද කියවමින්, එම පද පහදා දෙමින් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය, උන්වහන්සේගේ ඉගැන්වීම සහ මරණය ගැන දේවානු-භාවයෙන් ලබාදුන් විස්තර ඔහු තම ශ්‍රාවකයන්ට බෙදා දුන්නේය. එයින්සීඩල්හි කළාක් මෙන් ඔහු මෙහිදී ද ජනතාවට ඉගැන්වූයේ දෙවියන්වහන්සේගේ වචනය නොවරදින සුළු එකම බල අධිකාරිය බවත්, එකම සම්පූර්ණ පූජාව ක්‍රිස්තුස්වහන්සේගේ මරණය බවත්ය.



"සැදැහැවතුනි, මා ඔබව යොමු කරන්නේ ක්‍රිස්තුස්වහන්සේ වෙතටය. මිදීම ළඟා කරදීමේ එකම සත්‍යය වූ උල්පත උන්වහන්සේය"යි ඔහු ප්‍රකාශ කර සිටියේය. සෑම තරාතිරමකම පුද්ගලයෝ මේ දේශනාකාරයා වටා එක් රොක් වූහ. රාජ්‍ය සභා පාලකයන් මෙන්ම විද්වතුන්ද, කම්කරුවන් මෙන්ම ගොවීන්ද ඔවුන් අතර වූහ. ඔහු පැවසූ වදන්වලට ශ්‍රාවකයෝ මහත් අවධානයකින් යුතුව සවන් දුන්නෝය. නොමිලයේ දානය කරන්නාවූ ගැළවීම පිළිබඳවද සමාජයේ පවත්නා දුෂ්ටවූ, නපුරුවූ දූෂණයන් පිළිබඳවද ඔහු කථා කළේය. බොහෝ අය දෙව් මැදුරෙන් පිටත්ව ගියේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්ය. "මෙම පුද්ගලයා සත්‍යතාවය කියා දෙන්නාවූ දේශනාකාරයෙකි. මිසරයේ අඳුරෙන් අපව ආලෝකය කරා රැගෙන යන මෝසෙස් මොහුය"යි බහුතරයක් කියන්නට වූහ. (D. Aubigne, b. 8, Ch. 6).

මුලදී ඔහුගේ සේවය මහත් උනන්දුවකින් යුතුව පිළිගනු ලැබුවද, ටික කලෙකින් එය වෙනස් වී ඔහුට විරුද්ධව හඬක් නැඟෙන්නට විය. ඔහුගේ වැඩ කටයුතුවලට බාධා කිරීමටද, ඔහුගේ ඉගැන්වීම් වරදට පත් කරන්නට ද පැවිද්දෝ පෙළ ගැසුණෝය. සමහරෙක් ඔහුට සමච්චල් කළෝය; තවත් අය අවමන් කළෝය. ඒ අතර තවත් අය ගරු සරු නැතිව ඔහුට නිග්‍රහ කිරීමටත්, තර්ජනය කිරීමටත් උත්සුක වූවෝය. ස්වින්ග්ලි මේ සියල්ල ඉවසීමෙන් යුතුව විඳ දරා ගත්තේය. මේ සියළු විරුද්ධතාවන්ට ඔහුගේ පිළිතුර වූයේ, "පව්කාරයන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගැනීමට නම්, අපගේ මාර්ගයේදී අපට බාධා කරන බොහෝ දේවලට අපගේ ඇස් වසාගෙන සිටිය යුතුය" යන්නය. (D. Aubigne, b. 6, Ch. 6).

ප්‍රතිසංස්කරණ කටයුතු ව්‍යාප්ත කරමින් එම සේවාව නහාලීමට අලුත් සංවිධානයක් ක්‍රියාකාරී විය. බේසල්හි ප්‍රතිසංස්කරණ ඇදහිල්ලෙහි සිටි අයෙක් ලූතර්ගේ ලියවිලි පොත් සමග ලූෂන් නමැති පුද්ගලයෙක් සූරිච්ට යැවීය. ආලෝකය විසුරුවා හැරීමට මෙම පොත් විකිණීමෙන් මහත් සේවයක් සිදුවෙනවා ඇතැයි ඔහු යෝජනා කළේය. ඔහු ස්වින්ග්ලිට මෙසේ ලියා ඇරියේය. "පොත් රැගෙන එන පුද්ගලයාට උදව් කරන්න. මේ තැනැත්තාට ප්‍රමාණවත් සිහි බුද්ධියක් සහ හැකියාවක් තිබේදැයි සොයා බලන්න. එවන් ගුණාංග ඔහු සතුව තිබේ නම්, ප්‍රාන්තයෙන් ප්‍රාන්තයටත්, නගරයෙන් නගරයටත්, ගමින් ගමටත්, අවශ්‍ය නම් ගෙයින් ගෙටත් යාමට ඔහුට ඉඩ දෙන්න. ස්විස්ටර්ලන්තය මුළුල්ලේ ලූතර්ගේ පොත් ගෙන යාමට ඔහුට ඉඩදෙන්න. විශේෂයෙන්ම ගිහියන් උදෙසා රචිත ස්වාමින්වහන්සේගේ යාච්ඤාව පිළිබඳව විවරණය සාමාජිකයන් අතට පත්කිරීමට උත්සාහ කරන්න. එම පොත් පිළිබඳව වැඩි ප්‍රචාරයක් ලැබෙන විට වැඩිපුර වෙළඳාමක් සිදුවනවා නියතය. (D. Aubigne, b. 8, Ch. 6). සූරිච් තුළට ආලෝකය ඇතුළු වීම මෙසේ සිදුවිය.

නූගත්කම සහ මිථ්‍යා විශ්වාසයන් නැමැති බැම් පුපුරුවා හැරීමට දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වන්නාවූ අවස්ථාවන්හිදී සාතන්ද එම බැම් තව තවත් තද කිරීමට මහත් බලයෙන් යුතුව ක්‍රියා කරයි. මනුෂ්‍යයන් අඳුරේ ගිල්වා තැබීමද ඔහුගේ දැඩි උත්සාහයයි. ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය කරණකොටගෙන මිනිසාට පව් කමාව දෙනු ලබන බවත්, මිනිසාව ධර්මිෂ්ඨ කරනු ලබන බවත් ප්‍රකාශ කිරීමට ලෝකයේ විවිධ පෙදෙස්හි පුනරුද ප්‍රතිසංස්කාරකයෝ නැගිට සිටියහ. ඒ අතර රෝමයද පව් කමාව මුදලට විකිණීමේ වෙළෙඳ සැල් කිතුණු ලෝකය පුරා විවෘත කළේ අලුත් උනන්දුවකින් යුතුවය.

විවිධ මට්ටමේ පව්වලට කමාව ලැබීම උදෙසා විවිධ ප්‍රමාණයේ මුදල් ගෙවීමක් කරන්නට සිදුවිය යුතුව තිබුණේය. මෙය අපරාධ කිරීම සඳහා අවසර පත් නිකුත් කිරීමක් විය. දේවස්ථානයේ භාණ්ඩාගාරය පිරෙනවා නම්, සෑම පාපයකටම කමාව දීමට පාලකයෝ සූදානමින් සිටියෝය. මෙයාකාරයෙන් ව්‍යාපෘති දෙකක් ඉදිරියට ආවෝය. එක් ව්‍යාපෘතියක් පව් කමාව මුදලට ලබාගත හැකි බව පැවසූ අතර අනික් ඉගැන්වීම වූයේ ක්‍රිස්තුස්වහන්සේ තුළින් පව් කමා කරනු ලබන බවය. රෝමානුව පාපයට අවසර දුන් අතර එය ඔවුන්ගේ ආදායම් මාර්ගය විය. ප්‍රතිසංස්කරණයේ ව්‍යාපෘතිය විසින් අපරාධ හෙළා දකින ලදී. පාපයට කමාව ලැබීමට මෙන්ම එයින් ගැළවීමටද ඇත්තාවූ එකම ක්‍රමය ලෙස ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ දෙසට අවධානය යොමු කළෝය.

පව් කමාව විකිණීම ජර්මනියේදී විපුල ලෙස සිදුවිය. එම ව්‍යාපෘතිය භාරව කටයුතු කළේ ඩොමිනිකන් තාපසවරුය. ටෙට්සෙල් එය මෙහෙය වීය. ඒ අතර ස්විට්සර්ලන්තයේ මෙම වෙළෙඳාම පැවරී තිබුණේ ෆ්‍රැන්සිස්කන් තාපස පැවිද්දන්ටය. එම වෙළෙඳාම් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ධූරය ඉතාලි ජාතික තාපස පැවිද්දෙකු වූ සම්සොන්ගේ භාරයේ පැවතිණ. මෙම පැවිදි තාපසයා සභාවේ භාණ්ඩාගාරය තරකිරීම සඳහා විශාල සේවයක් කළ අයෙක් විය. ඔහු ජර්මනියේ සහ ස්විට්සර්ලන්තයේ සේවය කළ වකවානුවේදී විශාල මුදල් සම්භාරයක් පාප්ගේ භාණ්ඩාගාරය වෙත ලබාදී තිබුණේය. මුදල් රැස්කිරීමේ කාර්ය උදෙසා හෙතෙම දන් ස්විට්සර්ලන්තය පුරා සංචාරය කරන්නට විය. ඔහුව පිළිගැනීමට විශාල ජන කොටස් එක්රැස් වෙන්නට වූහ. දුප්පත් ගොවියාගේ සුළු ආදායම උපක්‍රමශීලීව ලබාගැනීමට ද ධනවත් පංතිකයන්ගේ විශාල මුදල් ප්‍රමාණයක් තෑගි වශයෙන්ද ලබාගැනීමටද ඔහු සමත් විය. මේ අතර ප්‍රතිසංස්කරණයේ බලපෑම් කරණකොටගෙන පව් කමාව විකිණීම සම්පූර්ණයෙන්ම නවතාලීමට නොහැකි වුවද, රෝමයේ ආදායම් අඩු කිරීමට එම ව්‍යාපාරය සමත් විය. සම්සොන් ස්විට්සර්ලන්තයට පැමිණ තම වෙළෙඳාම ආරම්භ කළේ එයින්සිඩෙල් නගරයට ආසන්න



පෙදෙසක සිටය. ස්වින්ග්ලි මේ වන විටත් එයින්සිඩෙල් දෙව් මැදුරේ සේවය කරමින් සිටියේය. සම්සොන්ගේ ව්‍යාපාරයේ ආරම්භය පිළිබඳව දන්වන ලදුව ස්වින්ග්ලි ඔහුට විරුද්ධව ක්‍රියා කිරීමට එහි ගියේය. ඔවුන් දෙදෙනා එකිනෙකාට මුණ ගැසුණේ නැත. එහෙත් ප්‍රතිසංස්කාරකයාගේ පැමිණීම දැනගත් රෝමානුවාදියා වෙනත් කොට්ඨාශයක් කරා පිය නැගීය.

පව් කමාව විකුණන්නාවූ අයට විරුද්ධව සූරිච්හිදී දේශනා කිරීමට ස්වින්ග්ලි දැඩි ජ්වලිතයකින් යුතුව ක්‍රියා කළේය. මේ අතර සම්සොන් සූරිච් නගරය කරා පා නැගීය. නගරයට ඇතුල්වීමේදී ඔහුව හමුවීමට පණිවිඩකරුවෙක් පැමිණියේය. එම පෙදෙසේ ආගමික බල මණ්ඩලයෙන් නිකුත් කළ විධානයක් එම ලිපියේ අඩංගු විය. එම නගරයේ සම්සොන්ගේ පව් කමාව වෙළෙඳාම් නොකර වෙනත් පෙදෙසක් කරා ඔහු යා යුතු බව ඔහුට දන්වන ලදී. උපක්‍රමශීලීව නගරයට ඇතුළු වීමට සම්සොන් වෑයම් කළේය. එහෙත් කිසිම පව් කමා වෙළෙඳාමකින් තොරව එම නගරයෙන් පිටව යාමට ඔහුට සිදුවිය. වැඩි දවසක් ගතවීමට මත්තෙන් ඔහු ස්විස්ටර්ලන්තයෙන් පිටව ගියේය.

වසර 1519 දී ස්විට්සර්ලන්තය පුරා පැතිර ගිය "මහා මරණය" නම් වූ වසංගතය නිසා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට ආශිර්වාදයක් ලැබුණි. වසංගතය රැගෙන ආ මාර දූතයාගේ ක්‍රියාකාරකම් දුටු නගර වැසියන්ගේ ඇස් යථාර්ථය දෙසට යොමු විය. විශාල මුදලක් ගෙවා රෝමානු දේවස්ථානයෙන් මෑතකදී මිලදී ගත් පව් කමාව කෙතරම් නිෂ්ඵලදායක දැයි එම ජනතාව ප්‍රශ්න කරන්නට වූහ. තමන්ගේ ඇදහිල්ලට මෙයට වඩා ශක්තිමත් අත්තිවාරමක් සොයා ගැනීම ඔවුන්ගේ දැඩි අභිප්‍රාය විය. මෙම වසංගතය සූරිච්හි සිටි ස්වින්ග්ලිට ද පහරක් එල්ල කළේය. ඔහු බොහෝ දුර්වල තත්ත්වයකට පැමිණියෙන් ඔහුට සුවය නොලැබෙනවා ඇතැයි කල්පනා කරන ලදී. මේ අතර ස්වින්ග්ලි අපවත් වී යන ආරංචිය පැතිරෙන්නටද විය. එහෙත් මෙම පරීක්ෂාකාරී පැයේදී ඔහුගේ බලාපොරොත්තුව සහ ධෛර්යය නොසැලී ස්ථිරසාරව පිහිටා තිබුණේය. ඔහු ඇදහිල්ලෙන් කල්වාරි කුරුසිය වෙත අවධානය යොමු කළේය. පාපය සඳහා සම්පූර්ණ වන්දි ගෙවීමක් එහි සටහන් වී තිබුණේය. මරණයේ දොරටුවෙන් පිටතට පැමිණි හෙතෙම පෙරට වඩා වැඩි අධිෂ්ඨානයකින් යුතුව ශුභාරංචි පණිවිඩය පතුරුවා හරින්නට පටන් ගත්තේය. ඔහුගේ වචනවලට අපූරු විශේෂ බලයක් ගැබ් වී තිබුණේය. මරණ මුඛයෙන් ගැළවී ආ අයෙකු ලෙසින් සූරිච්හි බැතිමත්හු තම දේවගැතිවරයාව පිළිගත්හ. ඔවුන් එහි පැමිණියේ රෝගීවූ ද, මරණාසන්නවූ ද අයට උපස්ථාන කරන අතරවාරයේදීය. ශුභාරංචියේ වටිනාකම ඔවුන්ට තදින් දැනී ගියේය.

සත්‍යතාවන්ගේ පැහැදිලි දැනුමක් කරා ස්වින්ග්ලි පැමිණ සිටියේය. එහි නවෝත්පාදන බලය ගැන ඔහු අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කරගෙන තිබුණේය. මිනිසාගේ පාපයට වැටීමත්, ගැළවීමේ සැලැස්මත් කෙරෙහි ඔහු තම අවධානය යොමු කළේය. ඔහු මෙසේ දේශනා කළේය. "ආදම් තුළ අපි සියල්ලෝම මරණයට පත්ව සිටින්නෙමු. අපි පාපයේ අගාධයේ පතුළටම වැටී සිටින්නෙමු. මරණයේ උදහස ලැබීමට අපි තීන්දු වී සිටින්නෙමු." "කිසිම දවසක නිමාවට පත් නොවන්නාවූ ගැළවීමක් ක්‍රිස්තුස්වහන්සේ විසින් අප උදෙසා මිලදී ගෙන තිබේ. උන්වහන්සේගේ දුක්විඳීම සහ මරණය සදාතන පූජාවකි. සදාතනික සුවය ලබාදීමට එය බලයෙන් යුක්තය. යාගයක් වශයෙන් පූජා කළ උන්වහන්සේගේ මරණය කෙරෙහි, ස්ථිරවූද, නොසෙල්වන්නාවූද, ඇදහිල්ලකින් යුතුව විශ්වාසය රැඳවීමෙන් පව්කාරයාට ලැබිය යුතු දිව්‍ය දඬුවම වෙනුවට සදාතන ජීවිතය දානය කෙරේ." එසේ වුවද, ක්‍රිස්තුස්වහන්සේගේ කරුණා අනුග්‍රහය නිසා මිනිසාට තවදුරටත් පව් කරමින් ජීවත් වීමට නිදහසක් නැති බවද ඔහු ඉගැන්වීය." "යම් තැනක දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තිබේද, දෙවියන්වහන්සේද එතැන වැඩ සිටින සේක. දෙවියන්වහන්සේ යම් තැනක වැඩ සිටින සේක්ද, මිනිසාට යහපත් ක්‍රියා කිරීමට උනන්දු කරවන්නාවූ බලපෑම් ඇති කරන්නාවූ ජ්වලිතකමක් එතැන ඇත." (D. Aubigne, b. 8, Ch. 9).

මිනිසාට ශාන්තිය උදා කරගැනීමට මගපෙන්වීමක් වූ ස්වින්ග්ලිගේ දේශනා කෙතරම් ප්‍රබල ආකාරයකින් මිනිස් සිත ආකර්ෂණය කළේද යත්, දේශනා අසන්නට පැමිණි ජනතාවගෙන් ආසන දෙව් මැදුර පිරී ඉතිරී ගියේය. බැතිමතුන්ට දරාගත හැකි ප්‍රමාණය අනුව ඔහු සත්‍යතාව ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ගේ සිත් තුළට විවෘත කළේය. බැතිමතුන් තිගැස්සීමට පත්කරවන කරුණු මුලදීම ඉගැන්වීමට ඔහු තැත් නොකළේය. එසේ කළේ නම් අවිචාර හැඟීම් ඔවුන් තුළෙහි රෝපණය වන බව ඔහු දැන සිටියේය. බැතිමතුන්ගේ සිත් සතන් ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගැනීම ඔහුගේ වෑයම විය. උන්වහන්සේගේ ආදරයට ඇතුළු වීමට බැතිමතුන්ගේ සිත් සතන් මොළොක් කර ඔවුන් ඉදිරියේ ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශමත් ජීවිතය ඔසවා තැබීම ඔහුගේ මෙහෙවරය විය. එකී බැතිමතුන් ශුභාරංචියෙහි ප්‍රඥප්ති පිළිගන්නාවූ අතරේදී මිථ්‍යා ඇදහිලි සහ මිසදිටු චාරිත්‍ර චාරිත්‍ර අනිවාර්යයෙන්ම ඔවුන්ගෙන් ඉවත් වී යනවා ඇත.

පියවරෙන් පියවර තබමින් ප්‍රතිසංස්කරණය සූරිච්හි ව්‍යාප්ත වන්නට විය. බියෙන් තැති ගත් සතුරෝ එය මැඩලීමට ක්‍රියාත්මක වූහ. මෙයට වසරකට පමණ පෙර විටන්බර්ග්හි ප්‍රතිසංස්කරණවාදියා තම ඉගැන්වීම් ඉල්ලා අස්කර ගන්නේ නැතැයි පාප්ට සහ රජතුමාට කියමින් දැඩි අභියෝගී ස්ථාවරයක රැඳී සිටියේය. වර්ම්ස්හි සිදු වූ



සංසිද්ධියට සමාන සිදුවීමක් දැන් සූරිච්හි වර්ධනය වෙමින් තිබුණේය. පාප් බල අධිකාරියට එරෙහිව නැගී සිටීමක් මෙහි පැන නැඟෙමින් තිබිණ. ස්වින්ග්ලිට විරුද්ධව දොස් පැවරීම් එක පිට එක එල්ල වන්නට විය. ස්විට්සර්ලන්තයේ පාප් අධිකාරියෙහි පාලන බලය පැවැති පෙදෙස්හි ශුභාරංචිය ප්‍රකාශ කළ ගෝලයන්ට අත්වූයේ ඛේදනීය ඉරණමකි. ඔවුන් කණුවලට බැඳ ගිනි දල්වා ඝාතනය කරනු ලැබුවෝය. නමුත් ඔවුන්ට එය ප්‍රමාණවත් නොවීය. සම්මත ඉගැන්වීම්වලට විරුද්ධව වෙනස් දහමක් උගන්වන ගුරුවරයා නිශ්ශබ්ද කළ යුතු විය. සභාවේ නීති උල්ලංඝනය කිරීමට මිනිසුන්ට ඉගැන්වී යයිද, එය කරණකොටගෙන සමාජයේ සාමය සහ යහපත් පැවැත්ම අනතුරකට පත්වී යයිද යන චෝදනා එල්ල කරමින් ස්වින්ග්ලිට විරුද්ධව සූරිච්හි ආගමික බල මණ්ඩලය ක්‍රියාත්මක විය. කොන්ස්ටන්ස්හි බිෂොප් තුමා තම නියෝජ්‍ය නිලදරුවන් තුන් දෙනෙකු අත චෝදනා පත්‍රයක්ද සූරිච් බල මණ්ඩලයට යැවීය. සභාවේ අධිකාරී බලය ඉවත ලා කටයුතු කළහොත් රටම විප්ලවකාරී තත්ත්වයකට පත්විය හැකි බැව් අවධාරණය කරන ලදී. තමා සූරිච්හි වසර හතරක් පුරා ශුභාරංචිය ඉගැන්වී යයි ස්වින්ග්ලි පිළිතුරු දුන්නේය. තවද, රජයේ වෙනත් කොටසකට වඩා මෙම කොටසෙහි සාමය සහ සමාදානය පැවැති බව ඔහු අවධානයට ලක් කළේය. "එසේ නම්, මහජන සුරක්ෂිතතාව සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ක්‍රිස්තියානි ආගම නොවේද"යි ඔහු විමසා සිටියේය.

බල මණ්ඩලයේ සාමාජිකයන්ට සභාවේම පවතින්නැයි බිෂොප්ගේ නියෝජිතයෝ ඔවුන්ට අනුශාසනා කළ අතර සභාවෙන් පිටත ගැළවීමක් නැතැයිද ප්‍රකාශ කළෝය. ස්වින්ග්ලි ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය. "මෙම චෝදනා නිසා ඔබ තුළ කැළඹීමක් ඇති නොවේවා! ක්‍රිස්තුස්-වහන්සේ වනාහි ජීවමාන දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයාණෝයයි පේත්‍රුස් කළ ඇදහිල්ලේ ප්‍රකාශය මත සභාවේ අත්තිවාරම පිහිටා ඇත. පේත්‍රුස්ට එම නම දුන්නේ ඔබත් මමත් විශ්වාස කරන්නාවූ එම ක්‍රිස්තුස්වහන්සේය. උන්වහන්සේ වනාහි එම පර්වතයම වනසේක. ස්වාමි වූ යේසුස්වහන්සේ තුළ යම් අයෙක් පූර්ණ ලෙසින් විශ්වාසය රඳවන්නේ නම් දෙවියන්වහන්සේ ඔහුව පිළිගන්නා සේක. මේ අනුව සභාව පිහිටුවනු ලබන්නේය. එයින් බාහිරව කිසිවෙකුට හෝ ගැළවීම ලබාගත නොහැකිය. (D. Aubigne, b. 8, Ch 11). මෙම සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස බිෂොප්ගේ නියෝජිතයන් තුන් දෙනාගෙන් එක්කෙනෙක් ප්‍රතිසංස්කරණවාදී ඇදහිල්ල පිළිගත්තේය.

ස්වින්ග්ලිට එරෙහිව තීරණයක් ගැනීමට බල මණ්ඩලය ප්‍රතික්ෂේප කළේය. එහෙත් රෝමය නිශ්ශබ්දව සිටියේ නැත; ඔවුහු අළුත් ප්‍රහාරයක් ආරම්භ කළෝය. ප්‍රතිසංස්කාරකයා සතුරන්ගේ සැලැස්ම ගැන දැනගත්

විට ඔහු මෙසේ පැවසීය. "ඔවුන්ගේ පැමිණීමට ඉඩ දෙමු. මුහුද අද්දර පිහිටි කඳු ගැටයක් පාමුලට රළ පහර වැදී ඝෝෂාවක් කළත් කඳුගැටය එයින් සැලෙන්නේ නැත, බිය වන්නේ නැත. මමත් එසේමය." (Wylie, b. 8, Ch. 11). සභා බලධරයන් විසින් විනාශ කිරීමට වෑයම් කළ කර්තව්‍යය, විරුද්ධතා මධ්‍යයේ තව තවත් වර්ධනය වන්නට පටන් ගත්තේය. සත්‍යතාව තව තවත් ව්‍යාප්ත වන්නට විය. ලූතර්ගේ අතුරුදහන්වීම නිසා පසුබෑමකට ලක්ව සිටි ජර්මානු ජනතාව ස්විට්සර්ලන්තයේ සිදුවන්නාවූ ශුභාරංචි වර්ධනය ගැන ඇසීමෙන් නැවත ප්‍රමෝධමත් වූහ.

පුනරුදය සූරිච්හි ස්ථාපිත වීමත් සමගම එහි ප්‍රතිඵල වඩා පූර්ණව දක ගැනීමට හැකි විය. දුරාචාරය මැඩ පවත්වනු ලැබීමත් සමාජය තුළ නීති ගරුක භාවය සහ සහයෝගිතාව ඇතිවීමත් ඒ ගැන සාක්ෂියක් විය. මෙම තත්ත්වය පිළිබඳව ස්වින්ග්ලි මෙසේ ප්‍රකාශනයක් කළේය. "අපගේ නගරය තුළ සාමය වාසය කරනවා. අප අතර ගැටුම් නැහැ. වංචාකාරකම් නැහැ. ඊර්ෂ්‍යාව නැහැ, සණ්ඩු සරුවල් නැහැ. මෙවන් එකමුතුකමක් උදාවන්නේ කෙසේද? ඇත්තෙන්ම දෙවි සමිඳාණන්ගෙන් මිස මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ. අපගේ දහම් පණිවිඩය සාමයේ සහ ශ්‍රද්ධාවේ ඵලවලින් අපව පුරවාලනවා." (Wylie, b. 8, Ch. 15).

ප්‍රතිසංස්කරණය මගින් ඇතිවූ ජයග්‍රහණයන් පිළිබඳව කරුණු දැනගත් රෝමානුවෝ එය අතු ගා දැමීමට දැඩි අධිෂ්ඨානයකින් යුතුව ක්‍රියාත්මක වූහ. ලූතර් විසින් ආරම්භ කළ පුනරුද ව්‍යාපෘතිය ජර්මනියෙහි විපුල ඵල දරන්නට විය. එම ව්‍යාපාරය මැඩ පැවැත්වීමට රෝමානුවන් විසින් එල්ල කළ හිංසා පීඩා මගින් වැඩි කාර්යයක් ඉටු නොවීය. එම නිසා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ආයුධ මගින් එයට විරුද්ධව ක්‍රියා කිරීමට රහසිගත සැලැස්මක් සූදානම් කරන ලදී. ස්වින්ග්ලි සමග වාදයක් පැවැත්වීමට කටයුතු සූදානම් කිරීමට තීරණය විය. එම වාදයෙන් ජයගැනීම සඳහා උපක්‍රමශීලී පියවරක් යෝජනා විය. විවාදය පවත්වනු ලබන්නාවූ ස්ථානය පමණක් නොව, දෙපිරිස අතර වන්නාවූ විවාදය විනිශ්චය කිරීමට විනිසුරුවන්ද තමන්ම තෝරාගත යුතු යයි සැලසුම් කාර්ය සාධන සභාව ගිවිස ගත්තේය. එක වරක් හෝ ස්වින්ග්ලිව තමන්ගේ පැත්තට නංවා ගත හැකි වුවහොත්, ඔහුට බේරී පලා යෑමට ඉඩක් නොතැබිය යුතුය. ප්‍රතිසංස්කාරක නායකයා නිශ්ශබ්ද කිරීමෙන් එම ව්‍යාපෘතිය බිඳ දැමිය හැකි වන්නේය යනු ඔවුන්ගේ අදහස විය. එහෙත් මේ අදහස ප්‍රවේසමෙන් ආවරණය කරන ලදී.



බේඩන්හිදී මෙම විවාදය පැවැත්වීමට දින නියම කරගන්නා ලදී. එහෙත් ස්වින්ග්ලි එහි පැමිණියේ නැත. පාප් බලධරයන්ගේ කූට උපක්‍රමය ගැන දැනගත් සූරිච් බල මණ්ඩලය තම දේවගැතිතුමාට එහි යෑමට අවසර දුන්නේ නැත. ශුභාරංචි ප්‍රකාශයන් සඳහා පාප් බල පෙදෙස්හි ගොඩගසා තිබූ ගිනි ඇවිලූ ලී කඳන් පිළිබඳව ලැබුණාවූ ආරංචි නිසා ඔව්හු ඔහුගේ ගමන වැළැක්වූහ. රෝමයෙන් එවන්නාවූ පක්ෂවාදීන් සියල්ලන්ම සූරිච්හිදී පිළිගැනීමට ඔහු තුළ බියක් නොවීය. එහෙත් මෑතකදී පවා සත්‍යවාදී වේද සාක්ෂිකාරයන්ගේ ලෙයින් තෙත් වූ බේඩන් කරා යෑම මරණය හමුවට යෑමක් ලෙස ඔහු දැන සිටියේය. එම විවාදයේදී පුනරුදවාදීන් වෙනුවෙන් පෙනී සිටීමට ඊකොලම්පාඩියස් සහ හෝලර් යන දෙදෙනා තෝරා ගන්නා ලදී. ඒ අතර උගත් ආචාර්යවරුන්ගෙන් සහ නායක පූජකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් ප්‍රසිද්ධ මහාචාර්ය ඒක් සමග රෝමානුව වෙනුවෙන් පෙනී සිටියහ.

මෙම විවාද සම්මන්ත්‍රණයට ස්වින්ග්ලි සහභාගී නොවීය. එහෙත් රැස්වීම පුරාම ඔහුගේ අනුබලය සැමට දැකගත හැකි විය. සිදුවන දෑ වාර්තා කිරීමට ලේකම්වරුන් තෝරා ගන්නා ලද්දේ පාප් බලධාරීන් විසින්ය. ශාලාවේ රැස්ව සිටි වෙනත් කිසිම අයෙකුට සටහන් ලියා ගැනීම තහනම් විය. එයට දඬුවම මරණය බවද ප්‍රකාශයට පත්විය. මෙවන් තහංචි මධ්‍යයේ වුවද දිනපතා කෙරෙන්නාවූ කථා බස් ගැන සම්පූර්ණ වාර්තාවක් එදාම සවස ස්වින්ග්ලිට දන්වනු ලැබීය. එහි සිටි එක් ශිෂ්‍යයෙක් දිනපතාම සවස, ඒ දවසේ පැවති තර්ක වාර්තා කළේය. ඊකොලොම්පාඩියස්ගේ ලිපිද සමග මෙම සිසුවාගේ වාර්තාවද රැගෙන ගිය තවත් සිසුන් දෙදෙනෙකුගේ මාර්ගයෙන් ඒවා ස්වින්ග්ලි අතට පත්විය. අනුශාසනා සහ යෝජනා රැගත් ස්වින්ග්ලිගේ පිළිතුරු නියෝජිතයන් අතට පත්කරන ලදී. ඔහු තම පිළිතුරු ලියුවේ රාත්‍රී කාලයේදීය. පසුදා උදෑසන එම පිළිතුරු රැගත් සිසුහු සූරිච්හි සිට බේඩන් කරා පැමිණියහ. නගරයට ඇතුළු වන සෑම අයෙකුම දැඩි පරීක්ෂාවට භාජනය කරන ලදී. සිසුන් දෙදෙනා බිත්තර වෙළෙඳුන් ලෙස පැමිණි නිසා ආරක්ෂකයන්ගේ සෝදිසි කිරීමක් නොමැතිව ඔව්හු නගරයට ඇතුල් වූහ.

තම විරුද්ධකාරයන් සමග වූ සටන ස්වින්ග්ලි මෙසේ දිගටම පවත්වා ගෙන ගියේය. මෙම විවාදයේදී වූ ඔහුගේ සේවාව මිකෝනියස් නමැත්තා මෙසේ වාර්තා කරයි. "මෙම විවාදයට ස්වින්ග්ලි සහභාගී වුණේ නැහැ. ඔහුගේ භාවනා මගින්ද රාත්‍රී කාලයේදී ලියූ උපදෙස් සහ අනුශාසනා මගින්ද ඔහු පුද්ගලිකව එහි සිටීමට වඩා මහත් සේවාවක් ඉටු කළා." (D. Aubigne, b. 11, Ch. 13).

රෝමානු බලධරයෝ බේඩන් වෙත පැමිණියේ ජයග්‍රහණය අත් වේයයි උපකල්පනය කරමින්ය. ඔවුන්ගේ මුහුණු ප්‍රීතිමත් හෙට දවසක් ප්‍රදර්ශනය කළේය. ඔවුන්ගේ ලෝගු මිල අධික රෙදිවලින් නිම වී තිබුණේය. දිළිසෙන්නාවූ මැණික් ඒවා මත රඳවා තිබුණේය. ඉතා සුඛෝපභෝගී කල දවසක් ඔවුන් සතුව තිබුණේය. ඔවුන්ගේ කෑම මේස රස බොජුන්වලින් පිරී තිබුණේය. මිල අධික අගනා මත්පැන් නොමසුරුව බෙදා හැර තිබුණේය. ඔවුන්ට පැවරී තිබූ ආගමික වගකීම්වල බැරෑරුම්කම කෙළි සෙල්ලමින් සහ මධුපානෝත්සව මගින් යටපත් විය. ඒ අතර ප්‍රතිසංස්කාරකයන්ගේ පැවැත්ම එයට හාත්පසින්ම වෙනස් විය. ඔවුන් දෙස බැලූ අයගේ තක්සේරුව වුණේ ඔවුන්ගේ ඇඳුම් හිඟන්නෙකුගේ ඇඳුම්වලට වඩා බොහෝ සේ සමාන වූ බවය. කෑම ගැනීමේදී පවා ඔවුහු සකසුරුවම් ලෙස විය හියදම් කර තිබූ බව ප්‍රත්‍යක්ෂ විය. ඔවුන් මේසය වටා රැඳී සිටියේ ඉතා ස්වල්ප කාලයකි. ඊකොලොම්පාඩියස්ගේ ගෙහිමියා ඔහුගේ කාමරයට පැමිණි සෑම විටෙකම දැක ගත්තේ තම සේවාදායකයා යාච්ඤා කරමින් හෝ අධ්‍යයනයෙහි යෙදෙමින් හෝ සිටි බවය. බලධරයන්ට වාර්තා කළ ඔහු කියා සිටියේ "අඩුම තරමින් මේ අදේවදෘෂ්ටියා සැදැහැවතෙක්" වන බවය.

සම්මන්ත්‍රණය ආරම්භ විය. "මහඟු වස්ත්‍රයෙන් සහ මිල අධික ආයිත්තමින් සැරසී සිටි ඒක් නම්වූ මහාචාර්යවරයා සරසන ලද දේශනා කුඩුවක් පසුපස හිඳ ගත්තේ ගාම්භීරයෙන් යුතුවය. ඊකොලොම්පාඩියස්ට හිමිව තිබුණේ අලංකාරයෙන් තොර කුඩා බංකුවකි. අඩු වියදමින් නිම වූ ඇඳුමක් ඇඳ සිටි ඔහු තම විරුද්ධකරුට මුහුණ දී වාඩි වී සිටියේය. (D. Aubigne, b. 11, Ch. 13). ඒක්ගේ අති ගාම්භීර හඬත්, අභිමානීය විශ්වාසයත් ඒ රැස්වීම පුරාම පැවැතියේය. ජයග්‍රහණය සමග ඔහුට හිමි වන රත්රන් කුට්ටිය සහ ජනප්‍රසාදය ගැන ඔහු උද්දාමයෙන් මත්ව සිටියේය. ඇදහිල්ල ආරක්ෂා කරන්නෙකු වශයෙන් විශාල ධන සම්භාරයකට හිමිකම් කීමට ඔහුට වාසනාව පෑදී තිබුණේය. තමා ඉදිරිපත් කළ තර්ක කඩා වැටෙන බව දුටු හෙතෙම ප්‍රතිවාදීන්ට අපහාස කිරීමට, නිග්‍රහ කිරීමට සහ දෙස් දෙවොල් කීමටත් පටන් ගත්තේය.

තමා කෙරෙහිම විශ්වාසයක් නොතබා නිරහංකාරව නැගී සිටි ඊකොලම්පාඩියස් තම ප්‍රතිවාදියා සමග අරගලයකට ඇතුල් වීමෙන් වැලකී සිටි නමුත් පැහැදිලි ලෙස තම තර්ක ඉදිරිපත් කරන්නට පටන් ගත්තේය. "දෙවියන්වහන්සේගේ වචනය හැරෙන්නට වෙනස් විනිශ්චයක් හෝ නීති ප්‍රමිතියක් මම පිළිගන්නේ නැහැ." යි ඔහු පැවසුවේය. (D. Aubigne, b. 11, Ch. 13). ආචාරශීලී සහ මුදු මොළොක්



ගුණාංග පෙන්නුම් කළ හෙතෙම තර්කවලට පිළිතුරු දීමේ හැකියාවක් තමන්ට ඇති බව විදහා පාමින් නොසැලී සිටියේය. රෝමානුවාදීහු තම පුරුද්ද ලෙස සභාවේ භාවිත සිරිත් විරිත් මත පදනම් වූ අධිකාරී බලය මගින් තීරණයක් ඉල්ලා සිටි අතර ප්‍රතිසංස්කාරකයා ශුද්ධ ලියවිල්ල මත ස්ථිරව නැගී සිටියේය. "ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාව අනුව සිරිත් විරිත් මත තීරණයක් දීමේ හැකියාවක් නැත. එහෙත් ඇදහිල්ල සම්බන්ධ කරුණු පිළිබඳ තීරණ ගැනීමේදී අපගේ ව්‍යවස්ථාව වන්නේ ශුද්ධ බයිබලයයි." යනුවෙන් ඔහු පැවසුවේය. (D. Aubigne, b. 11, Ch. 13).

විවාදයෙහි ප්‍රධාන කථිකයන් දෙදෙනා අතර වූ වෙනස්කම් මගින් බලපෑමක් නිශ්චය වශයෙන්ම ඇතිවිය. ප්‍රතිසංස්කාරකයාගේ සන්සුන් පැහැදිලි තර්ක කිරීම් මෙන්ම, නිරහංකාර සහ ආචාර සම්පන්න ලෙස කරුණු ඉදිරිපත් කිරීමත් බොහෝ දෙනෙකුගේ සිත් ඇදගැනීමට සමත් විය. ඒ අතරම මහා ආචාර්ය ඒක්ගේ ආඩම්බරකාරී පාරට්ටු බස් නිසා රැස්ව සිටි බොහෝ දෙනෙක් බලවත් සේ කළකිරුණෝය. ඔව්හු ඒ ගැන අප්‍රසන්න වූහ.

විවාද සහිත සාකච්ඡාව දවස් දහ අටක් පුරා පැවැතියේය. එහි අවසානයේදී තමන් ජයග්‍රහණය කළ බව පාප්වාදීහු විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කර සිටියෝය. විනිශ්චය මඬුල්ලෙහි සෑම දෙනෙකුම වාගේ රෝමයට පක්ෂව විනිශ්චය ප්‍රකාශ කළෝය. නිකුත් කළ ධර්මාධිකරණ වාර්තාවෙන් ප්‍රකාශයට පත් කළේ ප්‍රතිසංස්කාරකයන් පරාජයට පත්කර ඇති බවත්, ස්වින්ග්ලි සමගින් ඔවුන්ද සභාවෙන් නෙරපා හරිනු ලබන බවත්ය. එහෙත් සම්මන්ත්‍රණයේ ඵලවලින් කියාපෑවේ කාගේ පක්ෂයට වැඩි වාසි හිමි වූයේද කියාය. මෙම විවාදයෙන් රෙපරමාදු පක්ෂය ගැන දැඩි උනන්දුවක් පැතිර ගියේය. වැඩි කලක් ගතවීමට පෙර බර්න් සහ බේසල් යන නගර ප්‍රතිසංස්කරණයට පක්ෂව නැගී සිටින බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලදී.

# 10

# ජර්මනියේ ඇති වූ ප්‍රතිසංස්කරණයේ ප්‍රගතිය

ලූතර්ගේ අද්භූත අන්තර්ධාන වීම ජර්මනිය පුරා භීතියක් ඇති කිරීමට සමත් විය. ඔහු ගැන විපරම් කරමින් සෑම දිශාවකින්ම විමසීම් ගලා එන්නට විය. සිත් කම්පා කරවන දූෂමාන ආරංචිද පැතිරෙන්නට පටන් ගත්තේය. ඔහු මරා දමා ඇතැයි බොහෝ අය විශ්වාස කළෝය. වැලපීමේ හඬ සෑම පෙදෙසකින්ම ගුවනට මුසු විය. ලූතර්ගේ වියෝවීමේ දුක්මුසු හඬ නැගුණේ ඔහුගේ මිතුරන්ගේ මුවින් පමණක් නොවේ. ප්‍රතිසංස්කරණය උදෙසා ප්‍රසිද්ධියේ නැගී නොසිටියාවූ දහස් ගණන් ජනයාද එක සේ කම්පනයට පත් වූහ. ලූතර්ගේ මරණයට වගකිව යුතු අයගෙන් පලිගන්නවා යයි කියමින් බොහෝ දෙනෙක් ප්‍රතිඥා දෙමින් එක් වූහ.

තමන්ට විරුද්ධව ජනතා හඬ චෝදනා එල්ල කරන බව දැනගත් රෝමානුවාදීහූ මහත් භීතියට පත් වූහ. ලූතර් මරණයට පත් වූ පුවතින් මුලදී උද්දාමයට පත් වූ රෝමානු නායකයෝ දැන් මිනිසුන්ගේ බලවත් කෝපයෙන් බේරීම සඳහා සැඟවීමට කැමති වූහ. තමන් සමග සිටියදී සිදු කළ ඉතා නිර්භීත අභියෝගයන්ට වඩා ඔහු නැතිව සිටීම සතුරන්ට බිය ගෙන දුන් සිද්ධියක් බවට පත්ව තිබුණේය. ලූතර්ගේ සතුරෝ කෝපයෙන් පිරී අභීත ප්‍රතිසංස්කාරකයාව මරා දැමීමට සෙවූ නමුත් දැන් ඔහු සිරකරුවෙකු ලෙස අසරණව සිටියදී පෙරට වඩා භීතියෙන් ඇළලී සිටියෝය. "මිනිසුන්ගේ වෛරයෙන් බේරී සිටීමට නම් අප සැවොම පන්දම් පත්තු කරගෙන මුළු ලෝකය පුරා අස්සක් මුල්ලක් නෑර පිරික්සමින් ඔහුව සොයා ගත යුතුය. ඔහුව ඉල්ලා සිටින්නාවූ ජනතාවට ඔහුව භාර දිය යුතුය' යි කෙනෙක් පැවසුවේය. (D. Aubigne, b. 9, Ch. 1). රජතුමා නිකුත් කළ ආඥව බල රහිත බවක් පෙනී යන්නට විය. ලූතර්ගේ ඉරණම විසඳීමට වඩා අඩු සැලකිල්ලක් රජුගේ ආඥවට ලැබී තිබීම ගැන පාප් තානාපතිවරු ඉමහත් කෝපයට පත් වූහ.

සිරකරුවෙකු වී සිටි නමුත් ලූතර් තවමත් ජීවත්ව සිටින බව දැනගැනීමෙන් මහ ජනතාවගේ බිය සමනය වන්නට විය. ඒ සමගම ඔහු කෙරෙහි වූ උනන්දුවද වැඩෙන්නට විය. ඔහු ලියූ පත පොත කියවීමට, පෙර නොවූ විරූ ආශාවක් මහජනතාව තුළ ඇති විය. අනේකවිධ විරුද්ධවාදිකම් සහ සතුරුකම් මධ්‍යයේ දෙවියන්වහන්සේගේ වචනය රැකගැනීමට අභීතව නැගී සිටි වීරයාගේ වැඩ පිළිවෙල සමග අත්වැල් බැඳ ගැනීමට ජනතාව වැඩි වැඩියෙන් එකතු වන්නට වූහ. පුනරුදය නිරන්තරයෙන්ම තව තවත් ශක්තිමත් වන්නට විය.



ලූතර් රෝපණය කළ බීජය සෑම තැනකම එල දරමින් පැන නැගෙන්නට විය. ඔහු මනුෂ්‍යයන් අතර සිටියදී කළාවූ සේවයට වඩා වැඩි මෙහෙයක් ඔහු නැතිව සිටියදී ඉටු විය. තමන්ගේ නායකයා තමන් අතරින් ඉවත් කරනු ලැබීම නිසා අනෙක් පුනරුදවාදීහු වැඩි වගකීමකින් යුතුව ව්‍යාපෘතියේ දියුණුවට උර දුන්හ. තමන් සතු සියලු ශක්තිය සහ කාලය උපරිමයෙන් යොදවමින් ඔවුහු නව ඇදහිල්ලකින් හා ජවයකින් යුතුව ඉදිරියට පියවර තැබූහ. උත්කෘෂ්ට අන්දමින් ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අතරමග නතර කර දැමීමට කිසිවෙක් කැමති වූයේ නැත.

කටයුතු මෙසේ සිදුවෙද්දී සාතන්ද නිශ්ශබ්දව නොසිටියේය. වෙනත් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයන් අඩපණ කිරීමට ක්‍රියා කළ ආකාරයෙන්ම මෙම කර්තව්‍යයද බෙලහීන කිරීමට ඔහු වෑයම් කළේය. සත්‍යය වූ වැඩ පිළිවෙල වෙනුවට ප්‍රති පුනරුද ව්‍යාපාරයක් මගින් ජනතාව මුළා කර ඔවුන්ව විනාශ කර දැමීම සාතන්ගේ උපක්‍රමය විය. කිතුණු සභාවේ ව්‍යාජ ක්‍රිස්තුස්වරු සිටියාක් මෙන්ම සොළොස් වැනි සියවසේදී ද බොරු දිවැසිවරු සභාව ආක්‍රමණය කළෝය.

ප්‍රතිසංස්කරණය නිසා ආගමික ලෝකයේ කැළඹීමක් ඇති විය. සමහර පුද්ගලයෝ මෙය ඉතා සංවේදීව ජීවිතයට අදාළ කරගනිමින් කියා සිටියේ තමන්ට ස්වර්ගයෙන් විශේෂ එළිදරව් කිරීම් ලැබී ඇති බවය. ලූතර් විසින් පටන් ගනු ලැබූ ප්‍රතිසංස්කාරක මෙහෙය දුර්වලව ආරම්භ වූ නමුත්, එයට නව පණක් සහ ජවයක් ලබා දෙමින් ප්‍රතිසංස්කාරක ව්‍යාපෘතිය ප්‍රගතිය කරා මොහයවීම සඳහා සගයේ අනුමැතිය තමන්ට පැවරී ඇතැයි, මොවුහු කියා සිටියෝය. එසේ වුවද, මොවුන්ගේ ක්‍රියාකාරකම් ලූතර් ගොඩ නැගූ ව්‍යාපෘතිය අඩපණ කිරීමක් පමණක් විය. ඇදහිල්ල සහ ක්‍රියා කිරීම පාදක වූ ප්‍රමාණවත් ප්‍රමිතියක් සැපයීමට ඔව්හු ප්‍රතිසංස්කරණයේ පදනම එනම් දෙවියන්-වහන්සේගේ වචනය පමණක්ම ජීවිතයේ ඇදහිල්ලේ ප්‍රතිපත්තිය විය යුතුය යන්න එපා කළෝය. දේව වචනය වෙනුවට ඔව්හු තමාගේම හැඟීම් අදහස් නමැති අස්ථිර ප්‍රගතීන් ඉදිරිපත් කළහ. මෙසේ මිනිස් මනස තමාට කැමති ලෙස පාවිච්චි කිරීමට සාතන්ට දොරටු විවෘත විය.

ගාබ්‍රියෙල් දූතයා තමාට ගුරු හරුකම් දුන්නේ යැයි, මොවුන් අතර එක්කෙනෙක් කියා සිටියේය. තමා දිවැසිවරයකු යැයි කියාගත් මෙම පුද්ගලයා සමග එකතු වූ එක් සිසුවෙක් තම අධ්‍යාපන කටයුතු නවතා දමා පසුව ප්‍රකාශ කළේ දේව වචනය පහදා දීම සඳහා දෙවියන්වහන්සේම තමාට ප්‍රඥව දානය කළේ යැයි කියාය. ධර්මෝන්මාදයෙන් හෙවත් ආගම් උමතුවෙන් කටයුතු කිරීමට නැමියාවක් තිබූ තවත් අය දිවැසි පරපුරේ නවකයන් යයි කියාගත්

අය සමග එක් වූහ. බලවත් උද්‍යෝගයෙන් යුතුව සීමාව ඉක්මවා කටයුතු කළ මොවුහු, ජනතාව අතර කලබලකාර ස්වභාවයක් ඇති කළහ. ලූතර්ගේ දේශනා නිසා, ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව කෙරෙහි පැහැදීමක් සෑම පෙදෙසකම පැවතුණි. එවන් පැහැදීමකට අවංකවම යොමු වූ සමහරෙක් මේ නව පරපුරේ ව්‍යාජ දිවැසිවරුන් මගින් නොමඟට යොමු කරනු ලැබූහ.

නව ව්‍යාපෘතියේ නායකයෝ විටන්බර්ග් වෙත පැමිණ මෙලැන්ක්තන් සහ ඔහු සමග සේවය කළ අනෙකුත් දහම් ප්‍රචාරකයන්ට තමන්ගේ අදහස් ඉදිරිපත් කළහ. ඔව්හු මෙසේ පැවසූහ: "ජනතාවට ගුරු හරුකම් දීමට දෙවියන්වහන්සේ අපව එවා ඇත." දෙව් සමිඳාණන් අපට විශේෂ ප්‍රකාශන දුන්සේක. සිදුවන්නට යන දේ මොකක්ද කියා අපි දන්නවා. අපි දෙවියන්වහන්සේගේ අපෝස්තුළුවරුන් සහ දිවැසිවරුන්ය. ආචාර්ය ලූතර්ටද අපි මේ අයැදුම ඉදිරිපත් කරනවා."" (D. Aubigne, b. 9, Ch. 7).

මෙම වදන් ඇසීමෙන් ප්‍රතිසංස්කාරකයෝ විශ්මයට පත් වූහ, ව්‍යාකූලතාවට පත් වූහ. මෙවන් සිද්ධියකට ඔවුන් මීට පෙර මුහුණ දී තිබුණේ නැත. අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය කුමක්දැයි ඔවුන්ට සිතා ගත නොහැකි විය. මෙම පුද්ගලයන් පිළිබඳව මෙලැන්ක්තන් මෙවන් විග්‍රහයක් කළේය. "මෙම මනුෂ්‍යයන් තුළ වෙනස් ආකාර ආත්මයක් තිබෙන බව නම් පැහැදිලිය. එම ආත්මය කුමක්ද? දෙවියන්වහන්සේගේ ආත්මය නිවා නොදැමීමට අප ප්‍රවේසම් විය යුතුය. එසේම සාතන්ගේ ආත්මයෙන් අපව නොමඟ යැවීමට පවතින මේ වෑයම ගැනද අප ප්‍රවේසම් විය යුතුය." (D. Aubigne, b. 9, Ch. 7).

අළුත් ඉගැන්වීම්වල ඵල වැඩි දවස් ගතවීමට පෙර දැනගත හැකි විය. බයිබලය පිළිබඳව තිබූ සැලකිල්ල තුනී වීමටත්, දේව වචනය සම්පූර්ණයෙන්ම පසෙකලා තැබීමටත් මනුෂ්‍යයෝ මගපෙන්වනු ලැබූහ. පාසල් තුළ වියවුල රජකරන්නට පටන් ගත්තේය. සියලු තහංචි ප්‍රතික්ෂේප කරමින් සිසුවෝ තම ඉගෙනීමේ කටයුතු නවතා දැමුවෝය. ඔවුහු විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූවෝය. ප්‍රතිසංස්කාරක ව්‍යාපාරයට නව ජීවයක් ලබා දෙමින් එහි කටයුතු පාලනය කිරීමට තමන්ට සමත්කමක් ඇතැයි සිතා සිටි පුද්ගලයන්ගේ ක්‍රියාවේදය මගින් සිදු වූ මහා ප්‍රතිඵලය නම්, ව්‍යාපාරය සුනු විසුනු වීමකට ලංවීමය, විනාශයට කිට්ටු වීමය. රෝමානුවෝ මෙයින් තම ආත්ම විශ්වාසය නැවත වරක් ශක්තිමත් කර ගත්හ. ප්‍රීති සයුරේ ගිලෙමින් ඔවුහු මෙසේ ජය හඬ නැඟූහ, "තවත් එක සටනක් පමණයි. ඉන්පසුව සියල්ල අපේ අතේ." (D. Aubigne, b. 9, Ch. 7).



වෝර්ට්බර්ග්හි සිටි ලූතර්ට මෙපුවත් කණ වැටුණු විට ඔහු මහත් වික්ෂෝපයට පත්ව මෙසේ පැවසීය. "සාතන් මෙම වසංගතය එවන බව මම දැන සිටියා."" තමන් දිවැසිවරුන් යැයි කියාගත් ව්‍යාජ පුද්ගලයන්ගේ සත්‍යය වූ ස්වභාවය ඔහු මනාව දැන සිටියේය. සත්‍යතාවයේ අභිවෘද්ධියට සහ පැවැත්මට එමගින් විය හැකි අනතුර ඔහුට සිතා ගත හැකි විය. මෙම නව ප්‍රවණතාව නිසා ඇති වූ චිත්ත සංතාපය සහ සංවේගය පාප්ගේ සහ රජතුමාගේ විරුද්ධතාව නිසා ඇති වූ චිත්ත පීඩාවට වඩා බොහෝ සෙයින් අධික විය. ප්‍රතිසංස්-කරණයේ මිතුරන් යයි කියා ගත් අය අතරෙන් දැන් එහි පරම සතුරන් පැන නැඟුණි. තමාට මහත් ප්‍රීතියක් සහ සැනසීමක් ලබා දුන් සත්‍යතාවයන් දැන් සභාව තුළ ගැටුම් ඇති කර වියවුල් සහිත තත්ත්වයක් උදා කිරීමට හේතු කාරක විය.

පුනරුදයේ කර්තව්‍යයන් ඉදිරියට ගෙන යාමට ලූතර්ට මගපෙන්වන ලද්දේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් විසින්ය. ඔහු කිරීමට බලාපොරොත්තු වූවාට වඩා මහත් සේවයක් ඔහුගේ මාර්ගයෙන් සිදුවී තිබුණි. එබඳු බලවත් වෙනස්කම් සිදුකිරීමට ඔහු තුළම එවන් වෑයමක් හෝ ආශාවක් තිබුණේ නැත. තමා ගෙන ඇති ස්ථාවරය මගින් එසේ විය හැකි යැයි ඔහු මුලදී සිතුවේ නැත. ඔහු වනාහි අනන්ත බලයක් විසින් මෙහෙයවනු ලැබූ මිනිස් යාන්ත්‍රණයක් පමණක් විය. උත්සාහයේ ප්‍රතිඵල ගැන සිතන විට ඔහු භීතියෙන් තැති ගත්තේය. ඔහු වරක් මෙසේ පැවසීය, "මාගේ දහම නිසා එකම එක මනුෂ්‍යයෙකුට හෝ හිංසාවක් සිදුවූවා නම්, ඒ වචන අහක් කරගෙන මම දස වාරයක් මරණයට පත් වීමට කැමැත්තෙමි. හිංසාවට භාජනය වූ තැනැත්තා කුමන තරාතිරමක අයෙකු වුවද ඉන් වෙනසක් සිදුවන්නේ නැත. මා දෙසූ දහම ශුභාරංචියක් වන නිසා එයින් කිසිවෙකුට හෝ හානියක් සිදුවිය නොහැකිය."

ප්‍රතිසංස්කරණයේ කේන්ද්‍රස්ථානය වූ විටන්බර්ග් නගරය මේ වන විට ධර්මෝන්මාදයට සහ නොපණත්කමට යට වෙමින් තිබුණේය. මෙම භයානක ව්‍යසනය හට ගත්තේ ලූතර්ගේ ඉගැන්වීම්වල ප්‍රතිඵල වශයෙන් නොවේ. එහෙත් ඔහුගේ සතුරෝ ඒ ගැන ඔහුට වරද තබන්නට වූහ. මෙවන් මුසාවාද නිසා සිත් තැවුලට පත් ලූතර් මෙසේ ප්‍රශ්න කළේය. "ප්‍රතිසංස්කරණය නමැති මහා ව්‍යාපෘතියේ අවසානය වන්නේ මේකද?" (D. Aubigne, b. 7, Ch. 7). මේ පිළිබඳව හෙතෙම යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ සමග පොර බැදුවේය. එවිට ඔහුගේ හදවතට සාමය ගලා ආවේය. ඔහු මෙසේ කියන්නට විය: "මේ වැඩය මාගේ නොවේ ස්වාමීනී, එය ඔබවහන්සේගේය. එය ආගමික උමතුවෙන් සහ මිථ්‍යාදෘෂ්ටි ඉගැන්වීම්වලින් දූෂ්‍ය වීමට ඔබ ඉඩ හරින්නේ නැති බව දනිමි." මෙවන් අර්බුදකාරී තත්ත්වයක් මතු වී තිබියදී තමා සටනින් ඈත් වී සිටීම තවත් ඉවසා සිටිය නොහැකි

බව ඔහුගේ චින්තනය විය. විටන්බර්ග් වෙත වහාම යාමට ඔහු තීරණය කළේය.

පමා නොවී මෙම අනතුරුදායක ගමනේ යෙදීමට ඔහු නවාතැනින් පිටත් විය. නගරයට ඇතුල් වීම තහනම් කරමින් රජතුමා තහංචි පනවා තිබුණේය. ඔහුව ඝාතනය කිරීමට සතුරන්ට අවසර දී තිබුණේය. ඔහුට උදව් උපකාර කිරීමට මිතුරන්ට තහනම් විය. රජතුමාගේ පරිපාලන යාන්ත්‍රණය ඔහුගේ අනුගාමිකයන්ට විරුද්ධව තදබල ලෙස නීති තිබුණේය. ක්‍රියාත්මකව ශුභාරංචි කර්තව්‍යය අනතුරකට මුහුණ පා තිබෙන බව ඔහුට දක ගැනීමට හැකි විය. එහෙයින් සත්‍යතාව උදෙසා සටන් කිරීමට හෙතෙම දෙවියන් වහන්සේගේ නාමයෙන් අභීතව ඉදිරියට ගියේය.

මෙතෙක් කල් නැවතී සිටි වොර්ට්බර්ග් වෙතින් පිටත්ව යාම ගැන සැක්සනියේ ආදිපාදවරයා දනුවත් කරමින් ලූතර් යැවූ ලිපියක මෙසේ සඳහන් වේ. "උතුමාණෙනි, මම විටන්බර්ග් බලා යන බවට ඔබව දනුවත් කරමි. කුමාරවරුන්ගේ සහ මන්ත්‍රී මණ්ඩල නියෝජිත-යන්ගේ ආරක්ෂාව යටතේ නොව මා එහි යන්නේ ඔවුන්ට වඩා ඉහළ තැනැන්වහන්සේගේ රැකවරණය යටතේය. මේ අවස්ථාවේදී මම ඔබතුමාගේ උපකාරය හෝ රැකවරණය ඉල්ලා නොසිටීම යහපතකැයි සිතමි. ඔබගේ ආරක්ෂාව මම අපේක්ෂා කරමි. උතුමාණෙනි, ඔබ මට රැකවරණය සපයා දීමට අදහස් කරන්නේ නම් හෝ රැකවරණය සපයා දෙන්නේ නම් හෝ මම විටන්බර්ග් වෙත කිසිසේත්ම නොයන්නෙමි. මෙම ගමනින් බාධක මැඩලීම සඳහා පාවිච්චි කළ හැකි කඩුවක් නැත. දෙවියන්වහන්සේ පමණක් සියල්ල ඉටු කළ යුතුය. ඒ සඳහා මිනිසෙකුගේ මැදිහත්වීමක් උන්වහන්සේ අපේක්ෂා නොකරන සේක. මහා පරිමාණයේ ඇදහිල්ලක් ඇති තැනැත්තා මහත් ලෙස රැකවරණය ලබාගැනීමෙහි සමතෙකු වන්නේය. (D. Aubigne, b. 9, Ch. 8).

විටන්බර්ග් කරා යන ගමනේදී ලූතර් තවත් ලිපියක් මෙසේ ආදිපාදවරයා වෙත යැවීය. "ඔබතුමාණන්ගේ නොසතුටත් මුළු ලෝකයේම කෝපයත් ලැබීමට මම සූදානමින් සිටිමි. විටන්බර්ග්හි සිටින්නාවූ බැතිමත්හු මාගේ බැටළුවෝ නොවේද? ඔවුන්ගේ භාරකාරත්වය දෙවියන්වහන්සේ මට පවරා නැද්ද? අවශ්‍ය නම්, ඔවුන් වෙනුවෙන් මා දිවි පිදීමට වුවද යුතු නැද්ද? ජර්මනියෙහි විශාල විප්ලවයක් ඇතිවී, අපගේ ජාතියට දඬුවම් කිරීමට දෙවියන්-වහන්සේ එවැන්නක් පාවිච්චි කරනවා ඇතැයි මම බිය වෙමි."

ආරක්ෂාකාරීව සහ නිහතමානීව ලූතර් තම වැඩ කටයුතු කිරීම ආරම්භ කළේය. අධිෂ්ඨාන පූර්වකව, දැඩි මතයක පිහිටා සිටිමින්



ඔහු සේවය ඉටු කිරීම ඇරඹීය. "බලහත්කාරයෙන් පිහිටුවා ඇති සෑම ක්‍රමයක්ම අප දේව වචනයේ බලයෙන් පරාජය කළ යුතුය, විනාශ කර දැමිය යුතුය. දුර්ලබ්ධිකයන්ට සහ අවිශ්වාසවන්ත අයට එරෙහිව බලය යෙදවීමට කැමති නොවෙමි. කිසිම ආකාරයක හෝ බලහත්කාරකමක් මම අනුමත නොකරමි. නිදහස් හෘද සාක්ෂියක් ඇතිව ක්‍රියාකරන්ට උපකාර කිරීම මාගේ සේවයේ අරමුණ වී තිබේ. ඇදහිල්ලෙහි මූල ධාතුව වන්නේ නිදහසයි." (D. Aubigne, b. 9, Ch. 8).

විටන්බර්ග් කරා ලූතර් පැමිණි ප්‍රවෘත්තිය ලැව් ගින්නක් සේ පැතිර ගියේය. ඔහු දේශනා කරන බවද ප්‍රචාරය විය. ඔහුගේ දේශනා ඇසීමට සෑම පෙදෙසකින්ම බැතිමත්හු පැමිණියෝය. දේවස්ථානය මිනිසුන්ගෙන් පිරී ඉතිරී ගියේය. දේශනා කුඩුවට නැගී හෙතෙම මුදු මොළොක් බසින් සහ ප්‍රඥාවෙන්ද යුතුව ජනතාවට ඔවදන් ලබා දුන්නේය, අනුශාසනා කළේය; බැතිමතුන් ධෛර්යවත් කරමින් වරද කරන්නවුනට දෝෂාරෝපණය කළේය. රෝමානු ආගමික සත් ප්‍රසාද පූජාව නවතා දමන ලෙසද, අවලංගු කර දමන ලෙසද කියමින් සමහරෙක් සැහැසි ලෙස ක්‍රියා කර ඇති බව අවධාරණය කරමින් ඔහු මෙසේ පැවසීය:"සත් ප්‍රසාද පූජාව නරක දෙයක්. දෙවියන්වහන්සේ එයට විරුද්ධය. එය අවලංගු කර දැමිය යුතුය. එම පූජාව වෙනුවට ශුභාරංචියෙහි හඳුන්වාදී ඇති රාත්‍රී භෝජන මෙහෙය ලොව පුරා පවත්වනවාට මම කැමතියි. එම සත් ප්‍රසාද පූජාවෙන් කිසිවෙකු හෝ බලහත්කාරයෙන් ඉවතට ඇද ගැනීමක් නොකළ යුතුය. එම කාරණය දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තයට භාර දිය යුතුය. අප නොව, උන්වහන්සේගේ වචනය ක්‍රියාත්මක විය යුතුය. එසේ විය යුත්තේ මන්දැයි කියා ඔබ අසනවා වන්නට පුළුවන. කුඹල්කාරයාගේ අතේ මැටි ගුලිය තිබෙන ආකාරයෙන් මිනිසුන්ගේ හදවත් මාගේ අතෙහි තැන්පත් කර නැත. කථා කිරීමට නිදහස අපට ඇත. එහෙත් බලහත්කාර කිරීමට අපට අයිතියක් නැත. අපි දේශනා කරමු. ඉතිරිය දෙවියන්වහන්සේට අයිතිය. බලය, පාවිච්චි කළහොත් මට ලැබෙන ලාභය මොකක්ද? මුහුණ පුළුටු කරගැනීමක්, හදවතින් නොවූ බාහිර ශාරීරික දක්වීමක්, අනුන් අනුකරණය කිරීමක්, මිනිස් නියෝගය ඉටු කිරීමක් සහ වංචනිකත්වයක් යනාදියයි. එම බාහිර ක්‍රියාකාරකමේ හදවතෙහි, ඇදහිල්ලෙහි හෝ ආදරයෙහි කිසිම අවංකකමක් ගෑවීවත් නැත. මෙම ගුණාත්මක චරිතාංග අඩු වූ විට සියල්ලක්ම අඩුය. එවන් ප්‍රතිඵලයක් සඳහා මම කාලය යොදවන්නේ ඇයි? ඔබගේත්, මාගේත්, ලෝකයේ සියලු දෙනාගේත් ශක්තියන් එකතුව යමක් කරනවාට වඩා වැඩි දෙයක් දෙවියන්වහන්සේට තමන් වචනය මගින් ඉටු කළ හැකිය. දෙවියන්වහන්සේ මිනිස් හදවත් අල්ලා ගත් විට ජයග්‍රහණය ඇති වෙයි."

"මම දේශනා කරන්ටද, සාකච්ඡා කරන්ටද, ලියන්ටද සූදානම් වෙමි. එහෙත් කිසිවෙකුට මම බල නොකරමි. ඇදහිල්ල හෙවත් විශ්වාස කිරීම ස්වේච්ඡාවෙන් සිදුවිය යුතු ක්‍රියාවකි. මා ක්‍රියා කළ ආකාරය දෙස බලන්න. මම පාප්ගේ පව් කමාව විකිණීමටද පාප් සහා ආගමික නායකයන්ට විරුද්ධවද නැගී සිටියෙමි. නමුත් මම සාහසිකව කැරළි ගසමින් ක්‍රියා නොකළෙමි. මම දෙවියන්වහන්සේගේ වචනය ඉදිරිපත් කළෙමි, දේශනා කළෙමි, පොත පත ලීවෙමි. මා කළේ එපමණයි. මම නිදා සිටියදී මා දේශනා කළ වචනය මගින් පාප් දහම පෙරළා දමනු ලැබුවේය. කුමාරවරු හෝ රජතුමා පාප් දහමට පහරක් දුන්නේ නැත. මමද කිසිවක් නොකළෙමි. වචනයේ බලය සියල්ල කළේය. (හට හමුදා) බලය ඉල්ලා මම ආයාචනයක් කළේ නම්, මුළු ජර්මනියම ලේ විලක් බවට පත්වීමට ඉඩ තිබුණි. එයින් ඇති වන ලාභය කුමක්ද? එහි ප්‍රතිඵලය ශරීරයට සහ ප්‍රාණයට විනාශය සහ පාළුව හිමි වීම පමණකි. එම නිසා මම නිශ්ශබ්දව සිටියෙමි. දේව වචනයට ලෝකය පුරා යාමට ඉඩ දුනිමි. (D. Aubigne, b.9, Ch. 8).

දවස්පතාම සතියක් පුරා මහත් උද්‍යෝගයකින් සවන් දුන් බැතිමතුන්ට ලූතර් දේව වචනය බෙදා දුන්නේය. ආගම් උමතුවෙන් උද්දාමයට පත්වූ මිනිසුන් මත තිබූ බන්ධනය දෙවියන්වහන්සේගේ වචනය මගින් බිඳ දමනු ලැබීය. ශුභාරංචියෙහි බලය කරණ-කොටගෙන නොමඟ ගියා වූ අය සත්‍යතාවේ මාර්ගයට යොමු වූහ.

මහත් නපුර වපුරමින් දුෂ්ට සංකල්ප මුදා හළ ආගමික උන්මත්තකයන් සමග ගැටුමක් ඇති කරගැනීමට ලූතර් තුළ කිසිම අභිප්‍රායක් නොවීය. සාධාරණ විනිශ්චයක් කිරීමේ බුද්ධියක් මෙම පුද්ගලයන්ට නොතිබුණ බව ඔහු දනගත්තේය. ඔවුන්ගේ හැඟීම්, සාරධර්ම මගින් පාලනය නොවීය. තමන්ගේ මතවලට විරුද්ධ වීම ගැන ඔවුන් කැමති වූයේ නැත. සගයෙන් විශේෂ ආලෝකමත් කිරීමක් ලැබූ බව පැවසූ මොවුහු කාරුණික දොස් පැවරීමක් හෝ අනුශාසනාවක් ලැබීමට සූදානම් නොවූහ. අති විශිෂ්ට සුපිරි බලතල තමාට තිබෙන බව පවසමින් සෑම අයෙක්ම තමන්ගේ ඉගැන්වීම් පිළිගත යුතු යයි ඔවුහු අණ කළෝය. ලූතර් සමග සම්මුඛ සාකච්ඡාවක් මෙම කණ්ඩායම ඉල්ලා සිටි බැවින් ලූතර් ඔවුන්ව හමුවීමට කැමැත්ත පළ කළේය. සාකච්ඡාව සඳහා දෙපාර්ශ්වය හමු වූහ. බොරුව වැපුරූ පක්ෂයේ රැවටිලිකාරකම් ලූතර් විසින් මනාලෙස එළිදරව් කරන ලදී. පරාජය ලැබූ ව්‍යාජ දිවැසිවරු ඉක්මණින්ම විටන්බර්ග් නගරයෙන් පිට වූහ.

ආගමික උන්මාදය කලකට නිහඬව තිබූ අතර, වසර කිහිපයකට පසුව නැවතත් ක්‍රියාත්මකව ඉදිරියට පිවිසියේය. මෙවර ඔවුන්ගේ



ක්‍රියාදාමය වඩාත් හිංසාකාරී විය. සිදු වූ ප්‍රතිඵල ඉතා භයානක විය. වියරු ව්‍යාපාරයේ නායකයන් සම්බන්ධව ලූතර් මෙසේ පැවසීය. "ඔවුන්ගේ ඇගයීම අනුව ශුද්ධ ලියවිල්ල ප්‍රාණයක් නොමැති ලිපියක් පමණකි. ආත්මයාණෝ, ආත්මයාණෝ කියමින් ඔවුහු කෑගසන්නට වූහ. ඔවුන්ගේ ආත්මය ඔවුන්ට මගපෙන්වන ස්ථානය වෙත යාමට මම ඉදිරිපත් නොවෙමි. එබඳු ශුද්ධවන්තයන් පමණක් සිටින්නාවූ සභාවක් සමග සම්බන්ධකම් පැවැත්වීමෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව කරණකොටගෙන මාව වළක්වන සේක්වා. තමන්ගේ පාප ගැන හැඟීමක් ඇති නිහතමානී, දුර්වලවූ රෝගීවූ අය සමග වාසය කිරීමට මම කැමැත්තෙමි. නිරතුරුවම දෙවියන්වහන්සේට කෙඳිරිගාමින්, හඬමින්, තම හද පත්ලෙන්ම උන්වහන්සේගේ සැනසිල්ල සහ ආධාරය ඉල්ලන්නාවූ අය සමග වාසය කිරීමට මම කැමැත්තෙමි." (D. Aubigne, b. 10, Ch. 10).

ආගමික උන්මාදයෙන් ක්‍රියා කළ අය අතරෙන් තෝමස් මන්සර් කැපී පෙනුණේය. විවිධාකාරයේ නිපුන් හැකියාවන් තිබූ හෙතෙම නියම මාර්ගයේ ගමන් කිරීමට මගපෙන්වනු ලැබී නම්, මහත් යහපතක් කරන්නට ඔහුට හැකිවනවා ඇත. එහෙත් සත්‍යය වූ ආගමේ මුල් ප්‍රඥප්ති ඔහු ඉගෙන ගෙන සිටියේ නැත. "ලෝකය ප්‍රතිසංස්කරණය කිරීමට ඔහු තුළ දැඩි අභිලාෂයක් තිබුණේය. දැඩි උද්‍යෝගයකින් දවෙන්නාවූ වෙනත් බොහෝ අය මෙන්ම ඔහුද අමතක කළ මූලික ප්‍රතිපත්තිය නම්, වෙනත් අයව ප්‍රතිසංස්කරණයකට කැඳවීමට පෙර තමන්ම ප්‍රතිසංස්කරණය වී සිටීම අනිවාර්ය බවය." (D. Aubigne, b. 10, Ch. 10). ප්‍රභූත්වය සහ තනතුරු ලැබීම ඔහුගේ ඒකායන අභිලාෂය විය. ලූතර්ට හෝ වෙනත් කෙනෙකුට දෙවැනියා වීමට ඔහු කැමති නොවීය. පාප්ගේ බල අධිකාරිය වෙනුවට ශුද්ධ ලියවිල්ලෙහි අධිකාරී බලය ආදේශ කරන්නාවූ ප්‍රතිසංස්කාරකයන් කරන්නේද, වෙනත් ආකාරයක පාප් බල අධිකාරියක් පිහිටුවා ගැනීමකැයි ඔහු ප්‍රකාශ කර සිටියේය. සත්‍යවාදී ප්‍රතිසංස්කරණය හඳුන්වා දීමට තමාට දිව්‍ය අණක් ලැබී ඇතැයි ඔහු දේවානුභාවයට හිමිකම් කීවේය. "මෙම ආත්මය හිමි තැනැත්තා තම ජීවිත කාලය තුළදී ශුද්ධ ලියවිල්ල දැක නැති වුවද ඔහුට සැබෑ ඇදහිල්ලක් තිබෙන්නේ ය"යි මන්සර් පැවසුවේය. (D. Aubigne, b. 10, Ch. 10).

ආගමික අන්තවාදී ගුරුවරු තමන්ගේ සිත්හි හටගත් හැඟීම් මගින් පාලනය කරනු ලැබූහ. සෑම සිතුවිල්ලක් සහ ආවේගයක්ම දෙවියන්වහන්සේගේ හඬ ලෙස ඔවුහු පිළිගත්තෝය. මේ අනුව ඔවුහු ඉතා අන්තවාදීව කටයුතු කරන්නට වූහ. "ලිඛිත නීතිය මරණය උපදවයි. එහෙත්, ශුද්ධාත්මයාණෝ ජීවනය දෙන සේක"යි කියමින් සමහරෙක් තම බයිබල් පුළුස්සා දැමූහ. ආශ්චර්යමත් සිදුවීම් බලාපොරොත්තුව සිටි මිනිසුන්ගේ අභිලාෂයන් පිනවීමට මන්සර්ගේ

ඉගැන්වීම් සමත් විය. දෙවියන්වහන්සේගේ වචනයට ඉහළින් මිනිස් අදහස් වලට සහ නිගමනයන්ට තැන දීමෙන් ඔවුන්ගේ අහංකාරකමට සතුටක් ඇති විය. දහස් ගණන් මනුෂ්‍යයෝ ඔහුගේ දහම් පිළිගත්තෝය. ප්‍රසිද්ධ නමස්කාරයෙහි ක්‍රමවේදය ඔහු මුළුමණින්ම හෙළා දැක්කේය. කුමාරවරුන්ට කීකරුවීම වනාහි දෙවියන්වහන්සේටත්, බාල්ටත් සේවය කිරීමක් බව ඔහු ප්‍රකාශ කළේය.

පාප් බල අධිකාරියේ බන්ධනය ඉවතට විසි කිරීමට සැදී පැහැදී සිටි මිනිස් සිත් සතන් සිවිල් බලධරයන්ගේ තහංචි සහ මැඩපැවැත්වීම් නිසා නොසන්සුන්තාවට පත් වෙමින් තිබුණේය. දිව්‍ය අනුමැතිය හා ආනුභාවය තමාට ලැබී ඇතැයි කියා ගත් මන්සර්ගේ විප්ලවකාරී ඉගැන්වීම තුළින් මිනිසාට තම සිතේ අශාව ලෙස ක්‍රියා කිරීමට අවසරයක් ලැබුණි. තම ආශාවන්ට සහ හැඟීම්වලට මුල් තැන දෙමින් ක්‍රියා කිරීමට එම ඉගැන්වීම අනුබලයක් විය. රජයට විරුද්ධව කැරළි ගැසීම් සහ විරෝධතා සෑම තැනකම වාගේ දකගත හැකි විය. ජර්මනියේ කුඹුරු යායවල රුධිරය ගලා යන්නට විය.

ප්‍රතිසංස්කරණයේ මුල් කාලයේදී ඇති වූ විවිධ විරෝධතා නිසා එර්පර්ට්හි විසූ ලූතර්ට ඇති වූ මහත් සිත් වේදනාවන් දන් වඩාත් බලසම්පන්න ලෙස ඔහු තුළ ඇතිවිය. කුමක්හෙයින්ද ආගමික උමතුන්ගේ ක්‍රියාදාමයන් ගැන ප්‍රතිසංස්කරණයට වරද තබනු ලැබීය. දේශය තුළ හට ගත් කැරැල්ල ලූතර්ගේ ඉගැන්වීම්වල ප්‍රතිඵලයකැයි පාප්වාදී කුමාරවරු ප්‍රකාශනයක් නිකුත් කළෝය. මෙම චෝදනාව පදනම් රහිත වුවද, එයින් ඔහුට ඇති වූ සිත් වේදනාව සහ චෛතසික පීඩනය ඉමහත් විය. ඉතා පහත් මට්ටමේ ආගමික උන්මන්තකයින්ගේ ක්‍රියාදාමයන් නිසා සත්‍යතාව පැතිර යාමට බාධාවක් ඇති වීම ගැන අවනම්බුවට පත්වීමේ සංසිද්ධිය ඔහුට දරාගත නොහැකි තරම් විය. එම කණ්ඩායමේ දහම් ප්‍රකාශන ලූතර්ගේ අප්‍රසාදයට ලක් විය. ඔහු එම දහම්වලට විරුද්ධව නැගී සිටියේය. ඔවුන්ට දිව්‍ය ආනුභාවයක් ඇතැයි යන ප්‍රකාශය ඔහු ප්‍රතික්ෂේප කළේය. තවද, ඔවුන් සිවිල් අධිකාරීන්ට විරුද්ධව කැරැළි ගසන්නාවූ අය යැයි ලූතර් කියා සිටියේය. මේ නිසා එම කණ්ඩායමේ අය ලූතර්ට ද්වේෂ කළහ. මෙම ප්‍රකාශයට විරුද්ධව පළිගැනීම් වස් ඔවුහු ලූතර් මහා රැවැටිලිකාරයෙක් යයි කියා සිටියෝය. මේ ආකාරයෙන් ලූතර් කුමාරයන්ගේ සහ ජනතාවගේ ද්වේෂය තමා කෙරෙහි පවරා ගත්තේය.

පුනරුදය ඉතා ඉක්මන් වැටී යනවා ඇතැයි සිතමින් රෝමානු-වාදීහු ප්‍රීතියෙන් පුල පුලා බලා සිටියෝය. වැරැදි ක්‍රියාවේදයන් නිවැරැදි කිරීමට ලූතර් දඩි වෑයමක නිරත විය. එහෙත් මෙම වැරදි ලූතර් විසින් කරන ලද්දේ යයි රෝමානුවාදීහු ඔහුට චෝදනා කළෝය.



තමන්ට අසාධාරණ ලෙස සලකන ලද්දේ යයි බොරු ප්‍රකාශන නිකුත් කරමින් ක්‍රියාත්මක වූ මේ අන්තවාදී කණ්ඩායම, විශාල පිරිසකගේ, ජනතාවගේ අනුකම්පාව දිනා ගැනීමට සමත් වූහ. ඔවුන්ව වේද සාක්ෂිකරුවන් ලෙස හඳුන්වා දෙනු ලැබීය. ප්‍රතිසංස්කරණයට විරුද්ධව සිය ශක්තීන් යොදවා ක්‍රියා කළ අයට අනුකම්පාව ලැබී මොවුන් හිංසනයට සහ මඩිණු ලැබීමට ලක් වූ අය ලෙස පැසසුමට ලක් වූහ. මෙය සාතන්ගේ පෙළඹවීම මත සිදුවූ ක්‍රියාවකි. සගයේදී ඔහු ප්‍රදර්ශනය කළ ආත්මයම මෙහිදී ද ක්‍රියාත්මකව තිබුණේය.

මිනිසුන්ව රැවටීමට සාතන් නිරතුරුවම ක්‍රියා කරයි. පාපය ධර්මිෂ්ඨකම යයි කීමටද, ධර්මිෂ්ඨකම පාපය යයි කීමටද ඔහු මිනිසුන්ට මඟ පෙන්වයි. ඔහුගේ වැඩය කොපමණ සාර්ථක වී තිබෙන්නේද! සත්‍යතාව ආරක්ෂා කරගැනීමට අභීතව නැගී සිටින්නාවූ දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත සේවකයන්ට බැතිමතුන් ඉදිරියෙහි අවලාදවලට සහ අපකීර්තියට මුහුණ දෙන්නට සිදුවූ වාර කොපමණද? සාතන්ගේ නියෝජිතයන් ලෙස ක්‍රියාකරන්නාවූ මිනිසුන් හට පැසසුම් හා යශෝරාවය හිමි වේ. සමහර විටෙක ඔවුන් වේද සාක්ෂිකයන් ලෙසද ගණන් ගැනේ. එහෙත් දෙවියන්වහන්සේට පක්ෂපාතීව සිටින්නාවූ පුද්ගලයන් පිළිගෙන ඔවුන්ට ගෞරවය ලැබිය යුතු නමුත් ඔවුන්ට සිදුවන්නේ හුදෙකලාව නැගී සිටීමටය. ඔවුන් නිරතුරුවම සැකයට සහ අවිශ්වාසයට භාජනය කරනු ලැබේ.

ව්‍යාජ ශුද්ධවන්ත භාවය, බොරු පාරිශුද්ධතාව, අදත් ක්‍රියාත්මකව පවතී. ලූතර්ගේ කාලයේදී මෙන්ම අදත් එම ආත්මයම විවිධ ආකාරයෙන් මිනිසුන් අතරෙහි ප්‍රදර්ශනය වේ; එය මිනිසුන්ගේ මනස් ශුද්ධ ලියවිල්ලෙන් ඉවතට හරවා තමන්ගේ හැඟීම් හා ආවේග අනුව ක්‍රියාත්මක වීමට පොළඹවමින් විනාශයට අත්වැල් සපයයි. එහෙත් කිතුණුවන් විසින් කළ යුතු වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු වෙමින් ඊට අනුගත වීමය. ශුද්ධත්වය සහ සත්‍යතාව මත අවලාද සහ නින්දාව ගෙන දීමට ව්‍යාජ ශුද්ධත්වයක් ප්‍රදර්ශනය කිරීම සාතන්ගේ සාර්ථක ක්‍රමවේදයකි.

සෑම දිශාවකින්ම පැමිණි දෝෂාරෝපණයන්ට සහ විරුද්ධ-තාවන්ට අභීතව මුහුණ දෙමින් ශුභාරංචිය රැකගැනීමට ලූතර් ක්‍රියාත්මක විය. සෑම අරගලයකදීම දෙවියන්වහන්සේගේ වචනය බලවත් අවියක් බව ඔප්පු විය. එම වචනය භාවිතයට ගනිමින් අයුතු ලෙස මතු කරගත් පාප්ගේ බල අධිකාරියට විරුද්ධවත්, ඇදුරන්ගේ තර්කාන්විත දර්ශනවාදයට එරෙහිවත් ඔහු සටන් කළේය. ප්‍රතිසංස්කරණය සමග සම්මුතියකින් යුතුව ක්‍රියා කිරීමට වෙහෙස දරූ අන්තවාදීන්ට එරෙහිව පර්වතයක් සේ නොසැලී සිටීමට දේව වචනය ඔහුට පිහිට විය.

මෙකී සෑම කණ්ඩායමක්ම ඒ ඒ අන්දමින් ශුද්ධ ලියවිලි ඉගැන්වීම් පසෙකලා ආගමික සත්‍යතාව සහ දැනගැනීමේ සම්පත ලෙස මිනිස් ප්‍රඥාව ඔසවා තැබුවෝය. තර්කාන්විත දර්ශනවාදය, යම් දෙයක් අවබෝධ කරගැනීමට ඇති ශක්තියට මුල් තැන දෙමින්  එය ආගම නිශ්චය කිරීමේදී නිර්ණායකය හෙවත් මිනුම් දණ්ඩ ලෙස දක්වීය. මේ අතර රෝමානු සමය තමන්ගේ පාප් තුමා අපෝස්තුළුවරුන්ගෙන් අඛණ්ඩව පැවතෙන්නාවූ දේවානුභාවයෙන් පහස ලැබූ අයෙකු ලෙස සැලකූහ. එකී සම්බන්ධතාව කිසි කලෙකත් වෙනස් නොවූ බවට ඔවුහු කරුණු ගෙන හැර දක්වූහ. අපෝස්තුළුවරුන්ගෙන් පැවත ඒමෙහි ශුද්ධතාව නමැති කඩතුරාවෙන් වසා ගත් සෑම ආකාරයකම දූෂණ සහ පමණ ඉක්මවූ මංගල්‍යයන් අපෝස්තලික නියමයේ ශුද්ධතාවය යටතේ ආවරණය කරන ලදී. මන්සර් සහ ඔහුගේ සගයන් අයිතිවාසිකම් කිවූ ආනුභාවය වනාහි අනුමාන සහිත සංකල්පනා - වන්ගෙන් උපත ලැබූ චින්තනයක් විය. එය දිව්‍ය හෝ මානව හෝ වේවා සෑම ආකාර බල අධිකාරිත්වයකට විනාශදායක විය. ආනුභාවයෙන් දෙන ලද සත්‍යතාවේ උත්තරීතර සම්පත් නිධානය ලෙස දෙවියන්වහන්සේගේ වචනය පිළිගැනීම නිවැරදි කිතුණු දහම වන්නේය.

වෝට්බර්ග් සිට පැමිණි ලූතර් තම නව ගිවිසුමේ පරිවර්තනය ලියා නිම කළේය. වැඩි කලක් යාමට පෙර ජර්මන් ජනතාවට ඔවුන්ගේම මව් බසින් ශුභාරංචිය කියවීමේ වාසනාව උදා විය. සත්‍යය අගය කළ සෑම දෙනෙක්ම ඉතා ප්‍රීතියෙන් යුතුව එම පරි- වර්තනය පිළිගත්තෝය. එහෙත් මිනිස් සම්ප්‍රදායන් සහ මිනිස් ආඥා පිළිගත් අය මෙම පරිවර්තන කෘතිය ගැරහීමෙන් යුතුව ප්‍රතික්ෂේප කළෝය.

දේව වචනය අතැති සාමාන්‍ය ජනතාවට දන් පූජකයන් සමග දේව වචනයේ ප්‍රඥප්ති සාකච්ඡා කිරීමට හැකියාවක් උදාවීම පූජක පක්ෂයට තර්ජනයක් විය. එමගින් තමන්ගේ නොදත්කම එළිදරව් වේ යයි පූජකයෝ භීතියට පත් වූහ. මිනිස් තර්ක මත පිහිටුවනු ලැබූ පූජකයන්ගේ අවි ආයුධ ආත්මයාණන්ගේ කඩුව අභියස බල රහිත විය. ශුද්ධ ලියවිලි රට පුරා පැතිර යාම වැළැක්වීමට රෝමය තමන් සතු සියලු බලතල යෙදවීය. එහෙත් තහනම් ආඥා, දේවස්ථානයෙන් නෙරපා හැරීම්, ශාපයට භාජනය කිරීම්, හෝ ශාරීරික හිංසා පීඩා පැනවීම් යන සෑම ක්‍රියාදාමයක්ම නිෂ්ඵල විය. බයිබලය ළඟ තබාගැනීම බරපතල වරදක් බව සභාව තීන්දු කළාය. එය නීතියෙන් තහනම් කළ ප්‍රකාශනයක් විය. එහෙත් එය පාවිච්චි කරනු ලැබූ අතරම සත්‍ය වශයෙන් බයිබලයෙහි උගන්වා ඇත්තේ කුමක්ද කියා දැනගැනීමට ජනතාව තුළ මහත් ආශාවක් හා උනන්දුවක් විය. කියවීමට හැකියාවක් තිබූ අය දෙවියන්වහන්සේගේ වචනය තමන්



විසින්ම ඉගෙන ගැනීමට විශාල ආශාවක් දක්වූහ. ඔවුහු දේව වචනය තමා යන එන තැන්වලට රැගෙන ගියෝය, හැකි සෑම අවස්ථාවකදීම බයිබල් කොටස් කියෙව්වෝය, නැවත නැවතත් බයිබල් පද කියෙව්වෝය. දේව වචනයේ බොහෝ කොටස් කටපාඩම් කරන තුරු ඔව්හු සෑහීමට පත්නොවූහ. ජනතාව විසින් අලුත් තෙස්තමේන්තුව පිළිගත් උනන්දුව දුටු ලූතර් පරණ තෙස්තමේන්තුවද පරිවර්තනය කරන්නට පටන් ගත්තේය. පරිවර්තනය කිරීමේ වේගය අනුව රචිත කොටස් ක්‍රම ක්‍රමයෙන් ප්‍රකාශනයට පත් විය.

නාගරික ජනතාව මෙන්ම කුඩා ගම්මානවල ජීවත් වූ අයද එක සේ ලූතර්ගේ පත පොත මිලදී ගත්තෝය. "ලූතර් සහ ඔහුගේ මිතුරන් රචනා කළ ප්‍රකාශන තවත් අයට බෙදා හරිනු ලැබීය. තාපසාරාම පැවිද්දන් විසින් පිළිපැදිය යුතු නියමයන්හි අයුතු භාවය දුටු පැවිද්දන් කිසිම වැඩක් නොකර ජීවත් වීමෙන් සෑහීමකට පත් නොවී ක්‍රියාත්මක සේවයක නිරත වීමට ආශා වූහ. එහෙත් ජනතාව සමග දේව වචනය බෙදා ගැනීමට තරම් ඔවුන්ට දැනුමක් නොවූයෙන් ඔව්හු ගමින් ගමට යමින් ලූතර්ගේ සහ ඔහුගේ මිතුරන්ගේ පත පොත විකුණන්නට පටන් ගත්තෝය. මෙවන් පොත් විකිණීම තුළින් දහම පතුරන්නාවූ අය ජර්මනිය පුරා දැකගැනීමට හැකි විය. (D. Aubigne, b. 9, Ch. 11).

මෙම ලියවිලි අධ්‍යයනය කිරීමට පොහොසතුන් මෙන්ම දුප්පතුන්ද, උගතුන් මෙන්ම නූගතුන්ද මහත් උනන්දුවක් දක්වූහ. ගමේ පාසලේ ගුරු භවතුන් ගිනි මැළයක් වටා රැස්වී, පැමිණ සිටි කුඩා කණ්ඩායම්වලට ලියවිලිවල අඩංගු දෑ ශබ්ද නගා කියෙව්වෝය. සෑම වෑයමකදීම සමහර ආත්ම සත්‍යතාව ගැන විශ්වාසයක් ඇති කරගත්තෝය. සතුටින් දේව වචනය පිළිගත් ඔවුහු පෙරළා එම යහපත් පුවත් තවත් අයට කියාදීමට උත්සුක වූහ.

සත්‍යතාවේ පණිවිඩය ඇසූ අය ඒවා පරීක්ෂා කර බලා ස්ථිර නිගමනයක් කරා පැමිණියෝය. එය දේව වචනය අනුව සත්‍යය බව ඔව්හු තීරණය කරගත්තෝය. "ඔබගේ වචනය එළිදරව් වීමෙන් ආලෝකය ලැබේ. එයින් නුවණ නැත්තන්ට තේරුම ලැබේ" (ගීතාවලිය 119:130) යන වචනය ස්ථිර විය. ශුද්ධ ලියවිලි ඉගෙනීම තුළින් ජනතාවගේ සිත්වල මෙන්ම මනස්වලද විශාල වෙනසක් සිදුවෙමින් තිබුණේය. පාප් බල අධිකාරිය එහි යටත් වැසියන් නොදැනුවත්කම සහ අවිද්‍යාව නැමැති කණුවට හේත්තුකොට යදමින් බැඳ තැබීය. මිසදිටු ඇදහිලි ක්‍රම පැවැත්වීම නොඅඩුව සිදුවිය. එම සේවාවෙහිදී හදවතට සහ බුද්ධියට කිසිම සෙතක් සිදු නොවීය. දෙවියන්- වහන්සේගේ වචනයෙහි අඩංගු සරල සත්‍යතාවන් ලූතර්ගේ දේශනාවල තේමාව විය. තවද, එම වචනය මුද්‍රණය කර ජනතාවගේ අතට පත් විය. මෙතෙක් අක්‍රියව තිබූ ඔවුන්ගේ බුද්ධි බලය නින්දෙන් අවධියට

පත් විය. එමගින් ජනතාවගේ ආත්මික ස්වභාවය ශුද්ධත්වයට යොමු කරනු ලැබුවා පමණක් නොව ඉහළ මට්ටමක් කරා ගෙන එනු ලැබීය. එසේම බුද්ධියටද නව ශක්තියක් සහ ජවයක්ද ජනිත විය.

සෑම තරාතිරකම අයගේ අතේ ශුද්ධ බයිබලයක් තිබුණේය. ඔවුහු පුනරුදයේ ධර්මතාවන් අගය කරමින් ඒවා රැක බලා ගත්තෝය, එම දහම් අගය කරමින් සාක්ෂි දැරූහ. ශුද්ධ ලියවිලි අධ්‍යයනය පූජකයන්ට සහ තපස් ශ්‍රමණයන්ට සීමා කළ පාප් සමය, දැන් ඉදිරියට ඇවිත්, අලුත් ඉගැන්වීම් වැරදි බව පෙන්වා දෙන ලෙස පූජකයන්ට අණ කළේය. ශුද්ධ ලියවිල්ලත්, දෙවියන්වහන්සේගේ බලයත් ගැන නොදැන සිටි පූජකයන් සහ නූගත් දුර්ලබ්ධිකයන් යැයි හෙළා දකින ලද අය අතින් ඔව්හු පරාජයට පත් වූහ. කතෝලික ලේඛකයෙක් මෙසේ ලීවේය. "ශුද්ධ වූ ලියවිලි හැර වෙනත් කිසිම ආගමික ලියවිල්ලක් කෙරෙහි විශ්වාසය නොතබන ලෙස ලූතර් විසින් තම අනුගාමිකයන්ට පවසා තිබීම දොම්නසට කාරණයක් වන්නේය." (D. Aubigne, b. 9, Ch. 11). වැඩි උගත්කමක් නැති අය විසින් සත්‍යතාව ප්‍රකාශ කරනු ලැබීම අසන්නට ජනතාව රංචු වශයෙන් එක් වූහ. උගත් සහ ව්‍යක්ත දේව ධර්මාචාරීන් සමග නූගත් අය ශුද්ධ වචනය පිළිබඳව කරන්නාවූ සාකච්ඡා ඇසීමට ජනතාව රොක් වූහ. දේව වචනය පිළිබඳව මෙම ආගමික ගුරුවරුන්ගේ දැනුම ලැජ්ජා සහගතය. ඔවුන්ගේ වියත් තර්කවලට දේව වචනයේ සරල ඉගැන්වීම් මගින් පිළිතුරු ලැබීම තුළින් ඔවුන්ගේ නොදැනුවත්කම ප්‍රදර්ශනය විය. උගත් දේව ධර්මාචාර්යවරුන්ට හා පූජකයන්ට වඩා බයිබලයේ ඉගැන්වීම් ගැන දැනුමක් කම්කරුවන්ට, සොල්දාදුවන්ට, කාන්තාවන්ට සහ දරුවන්ටද ලැබී තිබුණේය.

ශුභාරංචියේ ගෝලයන් සහ අන්ධවාදී විශ්වාසයන් බදාගෙන සිටි පාප්වාදී උගතුන් අතර ශුද්ධ ලියවිලි දැනුම පිළිබඳව පරතරය කැපී පෙනෙන්නට විය. "භාෂා අධ්‍යයනය නොසලකා හැර සාහිත්‍යය පිළිබඳ දැනුම් වර්ධනයක් කරා යොමු නොවූ පැරණි ගුරු කුලයට අයත් රෝමානු ආගමික වීරයන්ට වඩා වෙනස් මහකට යොමු වූ පරිත්‍යාගශීලී මනසකින් යුතු වූ යෞවනයෝ ශුද්ධ ලියවිලි ගැඹුරින් අධ්‍යයනය කරන්නට වෙහෙස දැරුවෝය. පෞරාණික කලා කෘති සහ ශ්‍රේෂ්ඨ නිර්මාණ ඔවුන්ගේ අධ්‍යාපන විෂය මාලාවට එක් වී තිබුණේය. ක්‍රියාකාරී මනසකින් සහ උසස් තලයක පිහිටි ආත්මයකින්ද පහස ලත් මෙම යෞවනයෝ ඉතා විශාල පරිමාණයේ දැනුම් සම්භාරයක් ලබා ගත්තෝය. ඔවුන් සමග තරඟ කිරීමට කිසිවෙකුට නුපුළුවන් විය. පුනරුදයේ මෙම යොවුන් ආරක්ෂකයෝ යම්කිසි රැස්වීමකදී රෝමානු ආචාර්යවරුන් මුණ ගැසුණු විට, මේ තරුණයන් වාග් ප්‍රහාර එල්ල කළේ ඉතා පහසුවෙන් සහ දැඩි ආත්ම විශ්වාසයකින්



යුතුවය. ඔවුන්ට මුහුණ දීමට නොහැකි වූ බයිබල් දහම් නොදත් දේව ධර්මාචාර්යවරු අවිනිශ්චිත තත්ත්වයකට තල්ලු කරනු ලැබ ලැජ්ජාවට පත්ව ජනතාවගේ උපහාසයට ගොදුරු වූහ. (D. Aubigne, b. 9, Ch. 11).

තම ශ්‍රාවකයන් අඩුවන බව දුටු විට රෝම පූජකයෝ ඔවුන් ආපසු ගෙන්වා ගැනීමට තමන්ට හැකි සෑම උපක්‍රමයක්ම ක්‍රියාත්මක කිරීමට අධිෂ්ඨාන කර ගත්තෝය. නමුත් තමන්ගේ ආත්මවලට අවශ්‍ය දේවල් සපයා දීමට අලුත් ඉගැන්වීම්වලට හැකියාව ඇති බව ජනතාව වටහා ගත්තෝය. රෝමානු ආගමේ සිටියදී තමන්ට පෝෂණය සඳහා ලැබුණේ දුර්ලබ්ධික ආගමික වතාවත් සහ මිනිස් සම්ප්‍රදායන් නමැති පිදුරු බව ජනතාව අවබෝධ කරගෙන සිටියෝය. නැවතත් මුල් ආගමට තමා කැඳවා ගෙන යාමට පැමිණි නියෝජිතයන්ට ඔවුහු පිටු පෑවෝය.

සත්‍යතාවේ ගුරුවරුන්ට එරෙහිව වධහිංසා හා ගිනි සිළු ඇවිලෙන්නට පටන් ගත්තේය. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේගේ මේ වදන්වලට අනුගත වූහ: "එක් නගරයකදී ඔබට හිංසා පීඩා කරන කළ, වෙනත් නගරයකට පලායන්න." (මතෙව් 10:23). ආලෝකය සෑම තැනකම පැතිරී යන්නට විය. සමහර අවස්ථාවන්හිදී පලා යන්නාවූ අයට ආගන්තුක සත්කාරයට ලැදි ගෙයක් සොයා ගත හැකි විය. එහි නැවතී සිටි ඔවුහු සමහර විටෙක දේවස්ථානයක එවන් අවස්ථාවක් නොලැබුණු විට නිවෙසක් නැතිනම් එළිමහනේ සිට ක්‍රිස්තුස්වහන්සේව දේශනා කළෝය. බොහෝ විට ඔවුන්ට දේශනා කරන්නට ලැබුණේ කැප කරන ලද දේවස්ථානයකි. ජවයෙන් සහ සහතිකයකින් යුතුව ප්‍රකාශ කරන ලද සත්‍යතාව විරුද්ධතා මගින් එල්ල කළ නොහැකි බලයකින් යුතුව පැතිරී යන්නට විය.

ව්‍යාප්තව පැතිර යන්නාවූ ප්‍රතිසංස්කාරක ඉගැන්වීම් මැඩලීමට රෝමානු ආගමික සහ සිවිල් බලධරයෝ නිරර්ථකයේ වෑයම් කළෝය. බලධරයෝ ප්‍රතිසංස්කාරකයන් සිරගෙයි ලෑවෝය, ඔවුන්ට වධ හිංසා පැමිණෙව්වෝය, ඔවුන් ගින්නටද කඩුවටද බිලි කළෝය, දහස් ගණන් බැතිමත්හු තම ලෙයින් ඇදහිල්ල මුද්‍රා කළෝය. එසේ වුවද, ප්‍රතිසංස්කාරක ව්‍යාපාරය ඉදිරියටම ගියේය. හිංසා පීඩා මගින් සිදුවුණේ සත්‍යතාව තව තවත් ව්‍යාප්ත වීමය. සාතන්ගේ මෙහෙයවීම මත ප්‍රතිසංස්කාරකයන් සමග ඒකාබද්ධ වීමට තැත් කළ අන්තවාදීන්ගේ ඉරණම මගින් සාතන්ගේ ක්‍රියාදාමයත්, දෙවියන්වහන්සේගේ ක්‍රියා-දාමයත් අතර වෙනස්කම් වඩාත් පැහැදිලිව දැක ගැනීමට හැකි විය.

# 11

# කුමාරවරුන්ගේ විරෝධතාවය

ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ඉතා ශ්‍රේෂ්ඨතම සාක්ෂියක් වන්නේ 1529 දී ස්පයර්ස්හි පැවැති ධර්මාධිකරණ නඩු විභාගයේදී ජර්මනියේ කිතුණු කුමාරවරුන් දක්වූ විරෝධතාවයයි. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් වූ මොවුන් ප්‍රදර්ශනය කළ එඩිතරකම, ඇදහිල්ල සහ ස්ථිරතාවය මතු පරම්පරාවන්ගේ නිදහස් චින්තනයත් නිදහස් හෘදය සාක්ෂියත් සඳහාවූ අයිතිවාසිකම් තහවුරු කළේය. මෙම කුමාරවරුන්ගේ විරෝධතාවය නිසා ප්‍රතිසංස්කරණ සභාවට "ප්‍රොතෙස්තන්ත" යන නාමය භාවිතා වන්නට පටන් ගත්තේය. එහි මූලධර්ම ප්‍රඥප්ති වන්නේ "විරෝධතාවයේ සාරයයි."

ප්‍රතිසංස්කරණයට අඳුරු සහ තර්ජනාත්මක දවසක් උදා වී තිබුණේය. වර්ම්ස්හි පැවැති අධිකරණය මගින් ලූතර්ට නීතියේ රැකවරණය අහිමි කරන ලදී. ඔහුගේ ඉගැන්වීම් සහ දහම් තුළ ඇදහිල්ල රැඳවීම දඬුවම් ලැබිය හැකි වරදක් විය. මෙම තහංචි නීතියෙන් පනවා තිබුණ නමුත් තමන් කැමති ආගමක් ඇදහීමේ අයිතියට නීතිය හරස් නොවීය. කැමති ආගමික වතාවත්හි යෙදීමට ඉඩ හැරීම රජයේ ප්‍රතිපත්තිය විය. සත්‍යතාවට විරුද්ධව ක්‍රියා කරන්නාවූ බලවේග මැඩපවත්වා ලීමට දෙවියන්වහන්සේගේ ක්‍රියාවේදය සැලසුම් කළේය. ප්‍රතිසංස්කරණය බිඳ දැමීම V වන චාර්ල්ස් රජුගේ ඒකායන අරමුණ වුවද එම විනාශකාර පහර එල්ල කිරීමට ඔහු අත ඔසවත්ම එම පහර වෙනතකට යොමු කිරීමට දේව හස්තය ක්‍රියාකාරී විය. රෝමයට විරුද්ධව ක්‍රියා කිරීමට යම් අයෙකු ඉදිරිපත් වූයේද, ඔහුව හැකි ඉක්මණින් විනාශ කර දැමීම ඇයගේ පිළිවෙත විය. තීරණාත්මක අවස්ථාවේදී තුර්කි හමුදාව නැගෙනහිර මායිමේ කඳවුරු බැඳ ගත්හ. චාර්ල්ස් රජතුමාගේ රාජ්‍ය බලය ඉතා වේගවත් වර්ධනයක් සනිටුහන් කරත්ම රජුගේ උත්තම භාවයේ වර්ධනය ගැන ඊර්ෂ්‍යා කරමින් එම රාජ්‍යය ආක්‍රමණය කිරීමට යම්කිසි බලයක් ඉදිරිපත් විය. මෙසේ ජාතීන් අතර ගැටුම් සහ කලහකාරී තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබියදී ප්‍රතිසංස්කරණයට ශක්තිමත් වීමටත් ව්‍යාප්ත වීමටත් කිසිම අවහිරයක් නොවීය.

එහෙත් ප්‍රතිසංස්කරණයට ජයෙන් ජයට වර්ධනය වීමට ඉඩ නොහැරීමට රෝමානුව වගබලා ගත්තේය. රෝම බල අධිකාරීහු තමන් අතර තිබූ ගැටුම් මැඩ පවත්වා ගෙන සියල්ලෝම එකමුතුව



ප්‍රතිසංස්කරණයට විරුද්ධව ප්‍රබල පහරක් එල්ල කිරීමට තීරණය කර ගත්හ. 1526 දී ස්පයර්ස්හි පැවැති ධර්මාධිකරණය විසින් එක් එක් ජනපදයට ආගමික කටයුතුවලදී තමන් අභිමතාර්ථය පරිදි ක්‍රියා කිරීමට අවසරය දුන්නේය. එය මහා සභා රැස්වීමක් සිදුවන තෙක් වලංගු විය. මෙම වරප්‍රසාදය ලබාදීමට හේතු කාරක වූ අනතුරු පහවයාමත් සමගම තවත් ධර්මාධිකරණයක් පැවැත්වීමට රජතුමා තීරණය කළේය. එම සැසිය 1529 දී ස්පයස්ර්හිදී පැවැත්විණ. දුර්ලබ්ධිය දේශයෙන් අතුගා දැමීම රජතුමාගේ අභිප්‍රාය විය. ප්‍රතිසංස්කරණයට විරුද්ධ පාර්ශ්වයක් ලෙස නැගී සිටිමින් තමාට සහාය ලබාදෙන ලෙස රජතුමා කුමාරවරුන් සාමකාමී ලෙස පෙළඹවීය. ඔවුන් එයට එකඟ වන්නේ නැතිනම් කඩුවේ බලයට අවස්ථාව ලබාදෙන බවට රජතුමා තර්ජනය කළේය.

පාප්වාදීහු ප්‍රීතියෙන් උද්දාමයට පත් වූහ: ඔවුහු මහත් පිරිසක් පිරිවරාගෙන ස්පයර්ස් වෙත පැමිණියෝය. තමන් ප්‍රතිසංස්කාරකයන්ට එක හෙළාම ද්වේෂය පල කරන බව ඔවුහු විවෘතව ප්‍රකාශ කර සිටියහ. ඔවුන්ට අනුග්‍රහය දක්වූ අයටද එම ද්වේෂයම එල්ල විය. මෙලැන්ක්තන් මෙසේ පැවසීය. "මුළු ලෝකයේම ශාපය බවට අපි පත්ව සිටින්නෙමු. අතුගා දමන්නාවූ දූවිලි ලෙස අපට සලකනු ලැබේ. නමුත් තමන්වහන්සේගේ අසරණ දරුවන් දෙස දෙවියන්-වහන්සේගේ බැල්ම යොමු වී උන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරනවා ඇත." (D. Aubigne, b. 13, Ch. 5). ධර්මාධිකරණ නඩු විභාගයට පැමිණ සිටි ආගමික කුමාරවරුන්ට තම නිවෙස්හිදී වුවද ශුභාරංචිය දේශනා කිරීමට අවසර නොවීය. එසේ වුවද, ස්පයර්ස්හි ජනතාව දේව වචනය උදෙසා පිපාසාවෙන් සිටියෝය. තහනමක් පැවැතියද, සැක්සන්හි ආදිපාදවරයාගේ නමස්කාර ගෘහයෙහි පැවැත්වූ නමස්කාර මෙහෙයන්ට සහභාගී වීමට දහස් ගණනින් ජනතාව රොක් වූහ.

මෙයින් අර්බුදය උග්‍ර විය. ජනතාවට හෘදය සාක්ෂිය අනුව ක්‍රියා කිරීමේ නිදහස ලබාදීම නිසා මෙවන් කලබැගෑනියක් ඇති වී තිබෙන බැවින් ඒ නිදහස ඉවත් කිරීමට රජතුමා නියෝග කළේය. රජතුමාගේ මෙම ක්‍රියාව දහම්වාදී කිතුණුවන්ගේ උදහස පුබුදුවාලීය. එක්කෙනෙක් මෙසේ තම අදහස් ප්‍රකාශ කළේය. "ක්‍රිස්තුස්වහන්සේ නැවත වරක් කායඵස්ගේ සහ පිලාත්ගේ දෑත්වලට හසු වී සිටින සේක." රෝමානු-වාදීහු තවත් සාහසික වන්නට වූහ. අවිචාර බුද්ධියෙන් තම මතයෙහිම එල්බ සිටි පාප් සමයවාදියෙක් මෙසේ කීවේය: "තුර්කි ජනතාව ලූතර්වරුන්ට වඩා හොඳයි. තුර්කිවාදීහු නිරාහාර දවස් සමරති. ලූතර්වරු ඒවා කඩකරති. දෙවියන්වහන්සේගේ ශුද්ධ ලියවිලි සහ සභාවෙහි පැරණි වැරදි අතර තෝරා ගැනීමට අපට අවස්ථාවක්

දෙන්නේ නම් අප විසින් දේව වචනය ප්‍රතික්ෂේප කළ යුතුය." ඒ අතර මෙලැන්ක්තන් මෙසේ පැවසීය: "සම්පූර්ණ බල මණ්ඩලය රැස්වන්නාවූ සැම දවසකදීම ශුභාරංචිය පතුරුවන්නාවූ අපට ජේබර් අලුත් ගලක් එල්ල කරන්නේය." (D.Aubigne, b. 13, Ch. 5).

ආගමික නිදහස නීතියෙන් ස්ථාපිත කර තිබුණේය. මෙම අයිතිවාසිකම උල්ලංඝනය කිරීමට විරුද්ධව නැගී සිටීමට දහම් ප්‍රචාරක ජනපද තීරණය කර ගත්හ. වර්ම්ස්හිදී දෙන ලද තහනම් නීතිය නිසා ලූතර්ට ස්පයර්ස්හි අධිකරණයට සහභාගි වීමට වරම් ලැබුණේ නැත. එහෙත් ඔහුගේ ස්ථානය පිරවීමට ඔහුගේ සහායක සේවකයන් සමග කුමාරවරුද ඉදිරිපත්ව සිටියෝය. මෙම හදිසි අවස්ථාවෙහිදී තමන්වහන්සේගේ කර්තව්‍යය රැකගැනීමට දෙවියන්වහන්සේ මෙම කුමාරවරුන් ඉදිරියට ගෙනැවිත් තිබූසේක. මෙම අවස්ථාව වන විට ලූතර්ගේ රැකවලා වූ සැක්සනියේ ෆ්‍රෙඩ්රික් ජීවතුන් අතර සිටියේ නැත. ෆ්‍රෙඩ්රික්ගේ තනතුරට පත් වූ ඔහුගේ සහෝදරයා වූ සැක්සනියේ ආදිපාදවරයා වූ ජෝන්, ප්‍රතිසංස්කරණය සාදරයෙන් පිළිගත්තේය. සාමය අගය කළ හෙතෙම ඇදහිල්ල සම්බන්ධ කර්තව්‍යයන්හිදී මහත් ධෛර්යකින් යුතුව ක්‍රියා කළේය. ඒ සඳහා ඔහු මහත් උනන්දුවකින් යුතුව ක්‍රියා කළේය.

පුනරුදය පිළිගත් සැම ජනපදයක්ම රෝමානු ආධිපත්‍යයට කොන්දේසි විරහිතව, යටත් විය යුතු යයි, රෝමානු පූජකයෝ ඉල්ලා සිටියෝය. එහෙත් තමන්ට නීතියෙන් ලබාදී තිබූ ආගමික නිදහස තමන්ට හිමි විය යුතු යයි, ප්‍රතිසංස්කාරකයෝ කියා සිටියෝය. මහත් ප්‍රීතියෙන් යුතුව දෙවියන්වහන්සේගේ වචනය පිළිගත් ජනපද නැවත වරක් තමා රෝම ආධිපත්‍යයට යටත් කරගැනීමට ඇය දරන්නාවූ මෙම වෑයම පිළිගැනීමට කිසිසේත් එකඟ නොවූහ.

මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට මෙහිදී එකඟතාවක් ඇති විය. මෙතෙක් පුනරුද දහම් ස්ථාපිතව නැති ජනපදයන්හි වර්ම්ස්හි නඩු නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක විය යුතු යයි තීරණය විය. ඒ අතරම මෙවන් තීරණයක්ද සම්මත කරගන්නා ලදී. යම් ජනපදයක බැතිමතුන් ප්‍රතිසංස්කරණ මාර්ගයට යොමු නොවී, තිබේ නම්, කැරැල්ලකට හෝ අනතුරුවලට මුහුණ නොදී ප්‍රතිසංස්කරණය තුළ අනුගත වීමට නොහැකි වන්නේ නම්, එම ස්ථානයන්හිදී ඔවුන් විසින් අලුත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට වෑයම් නොකළ යුතුය, විවාදයකට තුඩු දෙන කිසිම ඉගැන්වීමක් නොකළ යුතුය, සත් ප්‍රසාද පූජා මෙහෙයට විරුද්ධ නොවිය යුතුය, කිසිම රෝමානු කතෝලික බැතිමතෙකුට ලූතරන් දහම් වැළඳ ගැනීමට ඉඩ නොදිය යුතුයයි



පවසන ලදී." (D. Aubigne, b. 13, Ch. 5). ධර්මාධිකරණය විසින් තීන්දු කරනු ලැබූ මෙම නියෝගය පාප්වාදී පූජකයන්ගේ සහ රෝම බලධරයන්ගේ මහත් සතුටට හේතු විය.

මෙම නියෝගය ක්‍රියාත්මක වී නම්, "ප්‍රතිසංස්කරණය ඒ වන තුරු ඇතුළු නොවී තිබුණාවූ ස්ථානයන්හි එය ස්ථාපිත කරගැනීමේ හැකියාවක් නොවීය. ඒ අතරම එහි පහස ලැබූ ස්ථානයන්හි එය ස්ථිරසාර පදනමක් මත ස්ථාපිත කරගැනීමේ හැකියාවද නොවීය. එතැන් පටන් සත්‍යය වෙතට හැරීමට කිසිවෙකුට අවසරයක් නොමැති බව පවසන ලදී. කථා කිරීමේ නිදහසටද තහංචි වැටී තිබුණේය. සමයානුකූල හැරීමකට ඉඩ ප්‍රස්ථාවක් නොවීය. මෙම තහංචි සහ සීමා නිගමනයට වහා යටත් විය යුතු යයි, ප්‍රතිසංස්කරණයේ හිතවතුන්ට නියම විය. ලෝකයේ බලාපොරොත්තු බොඳ වී යන බවක් පෙනී ගියේය. පූර්වයෙහි සිදුවූ අක්‍රමිකතා නැවත වරක් ක්‍රියාත්මක කිරීමට රෝමානු බල අධිකාරිය නැවත ස්ථාපිත වීම මගින් පණ ලබන්නේය; දුර්ලබ්ධික ඉගැන්වීම් සහ මතභේද මගින් දැඩි සේ කම්පනයකට මුහුණ දී ඇති ප්‍රතිසංස්කාරක ව්‍යාපෘතිය සහමුලින්ම විනාශ කර දැමීමට රෝමානු සමය නැවත වරක් ක්‍රියාත්මක වෙනවා ඇතැයි බියක් පැවතුණි." (D. Aubigne, b. 13, Ch. 5).

සාකච්ඡා කිරීම සඳහා දහම් ප්‍රචාරක කණ්ඩායම එක් රැස් වූ විට ඔවුහු කලකිරීමෙන් යුතුව එකිනෙකාගේ මුහුණු දෙස බැලූහ. "අප විසින් කුමක් කළ යුතුද?යි" ඔව්හු ඔවුනොවුන්ගෙන් විමසූහ. ලෝකය උදෙසා වූ මහත් ක්‍රියාවේදයන් කිහිපයක් අනතුරට මුහුණ පා තිබුණේය. "ප්‍රතිසංස්කරණයේ නායකයෝ යටත් වී මෙම නියෝගය පිළිගත යුතුද? ඉතා ප්‍රබල ව්‍යාපෘතියක් වූ ප්‍රතිසංස්කරණය මෙම අර්බුදකාරී සංසිද්ධියේදී පහසුවෙන්ම වැරදි මාර්ගයකට පිවිසීමේ හැකියාව පැවතුණි! යටත් වීමට නම් තවත් කොපමණ බොරු හේතු සහ යුක්ති සහගත කාරණා දැක්වීමට පුළුවන්කමක් තිබුණේද? ලූතර්ගේ දහම් පිළිගත් කුමාරවරුන්ට තමන්ට කැමති ආගමක් ඇදහීමේ නිදහස ස්ථාපිත කර තිබුණේය. වර්තමාන නියෝගය නීතිගත වීමට පෙර ප්‍රතිසංස්කරණයේ දහම් පිළිගෙන තිබූ අයටද, මෙම නිදහස ස්ථාපිත කර තිබුණේය. මෙයින් ඔවුන් සෑහීමකට පත්විය යුතුද? මෙම යටත් වීම නිසා උවදුරු කොපමණ ගණනාවක් වළක්වා ගත හැකිවේද? රෝමානුවන්ගේ නියමයට විරුද්ධ වීමෙන් ඔවුන් නොදන්නාවූ උපද්‍රව සහ ගැටුම් කොපමණ ප්‍රමාණයක් ක්‍රියාත්මක විය හැකිද! අනාගතයේදී කොපමණ අවස්ථාවන් උදා විය හැකිද? අපි සාමය වැළඳ ගනිමු; රෝමය පිළිගන්වන්නාවූ ඔලීව අත්ත වැළඳ ගනිමු, එමගින් ජර්මනියේ තුවාල වසා දමමු. මෙවන් තර්ක කිරීම් මගින්

ප්‍රතිසංස්කාරකයන්ට තමන් ගත් ක්‍රමවේදය සාධාරණය ලෙස සැලකීමට පුළුවන්කම තිබුණි. එහෙත් එම ක්‍රමවේදය නිසා වැඩි කලක් යෑමට පෙර මෙම ව්‍යාපාරය පරාජයට පත්වීමේ හැකියාව පැවතුණි.

"මෙම එකඟතා සැලැස්ම පදනම්ව තිබූ ප්‍රතිපත්තියට ඔවුහු ඇදහිල්ලෙන් යුතුව තම කැමැත්ත දුන්නෝය. එකී පදනම වූ ප්‍රතිපත්තිය කුමක්ද? හෘදය සාක්ෂිය බලහත්කාරයෙන් නම්මවා ගෙන නිදහස් සහ සාධාරණ විභාගයක් පැවැත්වීම තහනම් කිරීමට රෝමයට අයිතියක් තිබෙන බවය. ඔවුන්ටත් ඔවුන්ගේ සහෝදර ප්‍රොතැස්තන්ත බැතිමතුන්ටත් ආගමික නිදහස භුක්ති විඳීමට අවස්ථාව උදා වේවිද? එය සාධාරණ අයිතියක් නොව එකඟතා ගිවිසුමෙහි සඳහන් කර ඇති ආකාරයට යටත් වූ වරප්‍රසාදයක් පමණක් විය. මෙම එකඟතා සැලැස්මට අත්සන් නොතැබූ සැමට මෙම අධිකාරී බලයට යටත් වීමට සිදුවිය. ඒ අනුව හෘදය සාක්ෂියට තැනක් හිමි නොවීය. රෝමය නොවරදින සුළු විනිශ්චයකාරයා විය, ඇයට අනිවාර්යයෙන්ම කීකරු විය යුතුය. මෙම යෝජිත සැලැස්මට එකඟ වීම මගින් පිළිගනු ලබන්නේ ආගමික නිදහස ක්‍රියාත්මක වන්නාවූ බල ප්‍රදේශය වන්නේ ප්‍රතිසංස්කරණය පැවති සැක්සනියට පමණක් බවය. කිතුණු රාජ්‍යයේ අනෙකුත් පළාත්වල නිදහස් විභාගයක් පැවැත්වීමත් ප්‍රොතැස්තන්ත ඇදහිල්ල පිළිගැනීමත් බරපතල අපරාධයක් විය. එම වරදට දඬුවම වන්නේ බිම් ගෙවල සිරකිරීම හෝ කණුවලට බැඳ ගිනි තැබීමය. ආගමික නිදහස යම් ප්‍රදේශයකට පමණක් සීමා කිරීමට රෝමානුවන්ට හැකියාවක් තිබේද? පුනරුද දහමට බැඳෙන්නාවූ අන්තිම තැනැත්තා ඇතුළු කරගෙන හමාර යයි ඔවුන්ට ප්‍රකාශ කරන්නට හැකිවේද? ප්‍රතිසංස්කරණ සමයේ අන්තිම අක්කරය බෙදා දීම අවසන් යැයි තීන්දු කළ හැකිවේද? රෝමය විසින් හිමිකම් කී සියල්ල ඇගේ රාජධානියෙහි සින්නක්කරය විය යුතුද? මෙම සැලැස්ම අනුව ක්‍රියා කිරීමේදී රෝමානු පෙදෙස්වල ජීවත් වන්නාවූ දහස් ගණනින් වූ බැතිමතුන්ගේ සංහාරය ගැන ප්‍රතිසංස්කාරකයන් වරදකරුවන් නොවේ යයි තීරණය කළ හැකිද? මෙය සාපරාධී පාවාදීමකි. මෙම අති උදාර මොහොතේදී සිදුවන්නේ ශුභාරංචියේත් ක්‍රිස්තියානි ලෝකයේත් නිදහස පාවාදීමකි." (Wylie, b. 9, Ch. 15). එවැනි පාවාදීමක් නොකර "තමන්ගේ ජනපදත්, තමන්ගේ ඔටුනුත්, තමන්ගේ ජීවිතත්, තමන්ගේ සියල්ලත් පූජාකිරීම" යහපති යයි කුමාරවරු ගිවිස ගන්නවා ඇද්ද?

මේ අතර ජනපදවල කුමාරවරු එකඟතාවකට පැමිණියෝය. "අපි මේ ආඥාව ප්‍රතික්ෂේප කරමු. හෘදය සාක්ෂිය හා බැඳි කරුණුවලදී බහුජන මතය බලය බවට පත්වන්නේ නැත." ඒ අතර නියෝජ්‍ය බලධරයෝ මෙසේ ප්‍රකාශ කළෝය. "අධිරාජ්‍ය තුළ අප භුක්ති විඳින්නාවූ



නිදහස ලබාදුන් ආඥාවට අපි ණයගැති වෙමු. එය අවලංගු කළහොත් කරදර, භේදවීම් සහ බෙදීම් මුළු ජර්මනියම ගිලගන්නවා ඇත. සම්පූර්ණ ව්‍යවස්ථාදායක මණ්ඩලය රැස්වෙන තෙක් ආගමික නිදහස ආරක්ෂා කිරීමට වඩා වැඩි යමක් කිරීමට ධර්මාධිකරණයට බලතල හිමිව නැත." (D. Aubigne, b. 13, Ch. 5). හෘදය සාක්ෂියෙහි නිදහස රැකීම රජයේ වගකීම වන්නේය. ආගම පිළිබඳ කාරණාවලදී රජයට යෙදවිය හැකි උපරිම අධිකාරී බලය එපමණකි. ආගම ඇදහීම පාලනය කිරීමට හෝ ඇදහිලි ක්‍රමවේදයක් බලෙන් ක්‍රියාත්මක කිරීමට යම් රාජතාන්ත්‍රික බලවේගයක් ක්‍රියා කරන්නේ නම්, එය වනාහි එකී නිදහසෙහි අයිතිය රැකගැනීමට ශුභාරංචි ප්‍රචාරක කිතුණුවන් උදාර ලෙස කළ අරගලය පාවාදීමකි, පූජා කිරීමකි.

මෙම "දරදඬු හිතුවක්කාරකම" මුලිනුපුටා දැමීමට පාප් සමයවාදීහු ස්ථිර අධිෂ්ඨානයක පිහිටා සිටියෝය. ප්‍රතිසංස්කාරකයන් අතර බෙදීමක් ඇති කිරීමෙන් ඔවුහු මේ ක්‍රියා පිළිවෙල ආරම්භ කළෝය. එසේම, තමන් ප්‍රතිසංස්කරණයේ සාක්ෂිකයන් යයි එළිපිටම ප්‍රකාශ නොකළ අයව බිය ගැන්වීමට පාප් සමයවාදීහු ක්‍රියා කළෝය. කවර පක්ෂයකට හෝ ගැති නොවී නිදහස්ව ක්‍රියා කළ නගරවැසි නියෝජිතයන්ට ධර්මාධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස සිතාසි නිකුත් විය. ඉදිරිපත් කර ඇති යෝජිත සැලසුම් ගිවිසුම ඔවුන් පිළිගන්නවාදැයි ප්‍රකාශ කිරීමට ඔවුන්ට අවස්ථාවක් ලබාදෙන ලදී. ඒ සඳහා කල් ලබාදෙන ලෙස ඔවුන්ගෙන් ආයාචනයක් ඉදිරිපත් විය. එය නිෂ්ප්‍රභා කරන ලදී. පිරික්සීමට යොමු කරනු ලැබූ විට ඔවුන්ගෙන් අඩක් පමණ ප්‍රතිසංස්කාරක ව්‍යාපෘතියේ පක්ෂය ගත්තෝය. හෘදය සාක්ෂියේ නිදහස පාවාදීමට කැමැත්ත පල නොකළ අය, නිදහස් තීරණ ගැනීමේ අයිතිය පාවාදීමට එකඟ නොවූ අය, මනාව දැන සිටි කාරණයක් නම් අනාගතයේ විවේචනය කිරීමට, වරදට පත්කරනු ලැබීමට සහ වධහිංසා පමුණුවනු ලැබීමට ඔවුන් ඉලක්ක වීම නියත බවය. එක් නියෝජිතයෙක් මෙසේ පැවසීය, "අපි දෙවියන්වහන්සේගේ වචනය එපා කරන්න ඕනෑ. නැතිනම් අපේ ජීවිත ගින්නට බිලි දෙන්ට ඕනෑ." (D. Aubigne, b. 13, Ch. 5).

මෙම ආඥාව පිළිගැනීමට සහ එහි සුරක්ෂිත භාවය රැකගැනීමට නම් මෙම කුමාරවරුන් ඒ සඳහා එකඟ කරවා ගත යුතුය. එසේ නොවන්නේ නම් රාජ්‍යය තුළ විනාශකාරී බෙදීම් හට ගන්නවා නියතයයි ධර්මාධිකරණයෙහි අග රජතුමාගේ නියෝජිතයා වශයෙන් පෙනී සිටි ෆර්ඩිනන්ඩ් රජතුමා දුටුවේය. කුමාරවරුන්ට පෙරැත්ත කරමින් එකඟවීමක් සඳහා ඔවුන් පොළඹවා ගැනීමේ ක්‍රම සූත්‍රය හෙතෙම මනා ලෙස හැසිරවීය. ඔවුන් තම මතයට එකඟ කරගැනීමට

බලකිරීම කළේ නම් ඔවුන්ගේ අධිෂ්ඨානය තදවී තමන්ට අවාසි වන බව ඔහුගේ ආකල්පය විය. මෙම ආඥාව පිළිගන්නා ලෙස ඔහු කුමාරවරුන්ට ආයාචනා කළේය. එසේ කරන්නේ නම් අග රජතුමා ඔවුන් ගැන අතිශයින් පැහැදෙනවා ඇතැයි ඔහු කුමාරවරුන් දිරි ගැන්වීය. නමුත් භූමික රජවරුන්ගේ බල අධිකාරියට වඩා ඉහළ අධිකාරී බලයක් ඇති බව පිළිගත් මෙම විශ්වාසවන්ත මනුෂ්‍යයෝ මෙසේ ප්‍රකාශ කළෝය. "දෙවියන්වහන්සේගේ ගෞරවයත් සාමයත් පවත්වා ගෙන යාමට උපකාර වන සෑම දෙයකදීම අපි රජතුමාට කීකරු වන්නෙමු." (D’ Aubigne, b. 13, Ch. 5). විවෘත අධිකරණයේදී ආදිපාද තුමා සහ ඔහුගේ මිතුරන් ඇමතූ රජතුමා මෙවන් නිවේදනයක් නිකුත් කළේය. "මෙම ආඥාව රාජකීය නියෝගයක් ලෙසින් නිකුත් කිරීමට දැන් සැලසුම් කරගෙන යනවා. එම නිසා ඔවුන්ට ඇති එකම මාර්ගය වන්නේ බහුතරයකගේ තීරණයට යටත් වීමයි." මෙම ප්‍රකාශය කළ රජතුමා අධිකරණ ශාලාවෙන් ඉවත්ව ගියේය; ප්‍රතිසංස්කාරකයන්ට පිළිතුරු සැපයීමට කිසිම අවස්ථාවක් ඔහු ලබා නොදුන්නේය. රජතුමාට ආපසු එන්නැයි කියමින් නියෝජිත පිරිසක් යවන ලදුව රජතුමා එම ඉල්ලීම ඉවතලමින් මෙසේ ප්‍රකාශ කළේය. "එම කාරණය පිළිබඳව තීරණයක් කර හමාරය. දැන් ඉතිරිව ඇත්තේ යටත්වීම පමණකි." (D. Aubigne, b. 13, Ch. 5).

මානව ධර්මතාවන්ට සහ ඉල්ලීම්වලට වඩා ශුද්ධ වූ ලියවිලිවලට ගැතිවීමට කිතුණු කුමාරවරුන් අනිවාර්යයෙන්ම තීරණය ගන්නා බව රාජකීය කණ්ඩායම දැන සිටියේය. යම් තැනක මෙම ප්‍රඥප්තිය පිළිගනු ලබන්නේද, එතැන රෝමානුවන් පරාජය ලබන බව ඔවුහු දැන සිටියෝය. අගරජතුමා සහ පාප් තුමා බලවත් බවත් ප්‍රතිසංස්-කාරකයන් දුර්වල බවත් ඔවුන්ගේ නිගමනය විය. මිනිස් ආධාර මත පමණක් ගැති වී සිටීමට ඔවුන් බලාපොරොත්තු වී නම්, පාප් නියෝජිතයන් සිතූ ලෙස ඔවුන් බල රහිතව යටත් වෙනවා නොඅනුමානය. නමුත් සංඛ්‍යාවෙන් අඩු වුවද, රෝමය සමග අනුගත නොවූවද ඔවුන් සතුව විශාල බලයක් තිබුණේය. "ධර්මාධිකරණයේ වාර්තාවෙන් ඉවතට හැරී ඔවුහු දෙවියන්වහන්සේගේ වචනය දෙසට යොමුවූහ. චාර්ල්ස් රජතුමාගෙන් ඉවතට හැරී රජුන්ගේ රජද, ස්වාමීන්ද්‍ර-යාණන්ද වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඔවුහු ඔවුන්ගේ අභියාචනය ඉදිරිපත් කළෝය." (D. Aubigne, b. 13, Ch. 6).

තමන්ගේ හෘදයාංගම අධිෂ්ඨානයට ඇහුම් කන්දීමට ෆර්ඩිනන්ඩ් රජතුමා ප්‍රතික්ෂේප කළ නිසා කුමාරවරු මෙවන් තීරණයක් ගත්තෝය. රජතුමා නොමැතිව වුවද තම අභියාචනය ජාතික නියෝජිත මණ්ඩලය වෙත සීමාවකින් තොරව ඉදිරිපත් කිරීමට ඔවුහු ගිවිස ගත්හ. විධිමත්



ප්‍රකාශන පත්‍රයක් සකසා ගත් ඔවුහු එය මෙසේ ධර්මාධිකරණයට ඉදිරිපත් කළෝය.

"අපගේ එකම ගැළවුම්කරුවාණන් ද, විමුක්තිදායකයාණන් ද රැකවලාණන්ද, එකම මැවුම්කාරයාණන්ද වන දෙවියන්වහන්සේ ඉදිරියෙහිද, මෙහි රැස්ව සිටින්නන් ඉදිරියෙහිද අප පිළිගන්වන්නාවූ අභියාචනයෙන් ඉල්ලා සිටින්නාවූ වග නම්, අප වෙත නිකුත් කර ඇති රාජකීය ආඥාවට අප සම්පූර්ණයෙන්ම එකඟ නොවන බව ඔබට දන්වා සිටීමය. ඉදිරි දවසකදී උන්වහන්සේ අප සැමගේ විනිශ්චයකාරයාණන් ලෙස නඩු විභාග කරන සේක. ඉදිරිපත් කර ඇති යෝජිත සැලැස්මෙහි දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ වචනයටත් යම්කිසි අයුරකින් විරුද්ධ වන කරුණුවලට අපත්, අපගේ ජනතාවත් එකඟ වන්නේ නැති බවත්, ඒවාට අනුමැතිය දෙන්නේ නැති බවත් යටහත්ව ඔබ වෙත දන්වා සිටිමු. එවැන්නක් අපගේ හෘදය සාක්ෂීන්වලට මෙන්ම අපගේ ආත්මවල ගැළවීමටද බාධකයක් වනවා නොඅනුමානය." (D. Aubigne, b. 13, Ch. 6).

"සර්වබලධාරී දෙවියන්වහන්සේ යම්කිසි මනුෂ්‍යයෙකුව උන්වහන්සේ පිළිබඳ දැනගැනීමකට කැඳවූ විට, ඔහු දෙවියන්වහන්සේව පිළිනොගෙන සිටිය යුතු යයි පැවසීමට අපට නුපුළුවන. දෙවියන්වහන්සේගේ වචනය සමග එකඟත්වයකට පත්වන්නට බැරි නිත්‍ය දහමක් නැත්තේය ... වෙනත් දහමක් ඉගැන්වීම දෙවියන්වහන්සේ තහනම් කරන සේක. ශුද්ධ ලියවිලි පහදා දීමට හැකි එකම මාර්ගය වන්නේ එහි ඇති වෙනත් පැහැදිලි පද මගින්ය. කිතුණු බැතිමතෙකුට අවශ්‍ය සෑම දෙයක්ම මෙම ශුද්ධ පුස්තකය තුළ අන්තර්ගතව තිබේ. එය තේරුම් ගැනීම පහසුය. අඳුර පළවා හැරීම එහි පරමාර්ථයයි. උන්වහන්සේගේ වචනය අන්තර්ගතව ඇත්තේ බයිබලයේ පමණකි. එකී වචන පරණ ගිවිසුමෙහි සහ අලුත් ගිවිසුමෙහි ඇතුළත්ව තිබේ. උන්වහන්සේගේ පරම පාරිශුද්ධ වූ වචනය පමණක් දේශනා කිරීමටත්, පවත්වාගෙන යෑමටත් දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය යටතේ අපි තීරණය කරගෙන සිටින්නෙමු. ශුද්ධ බයිබලයෙහි අඩංගු කිසිම කරුණකට පටහැනි වූ කිසිවක් හෝ එයට එකතු කිරීමෙන් අපි වැළකී සිටින්නෙමු. දේව වචනය පමණක් සත්‍යතාවය වන්නේය. සියලු ධර්මතාවන්ගේ සහ සියලු ජීවිතවල පැවැත්මේ පදනම සහ සාරධර්ම නීතිය බයිබලය පමණක් වන්නේය. එය අපව රවටන්නේ නැත, අපගේ බලාපොරොත්තු සුන් කරන්නේ නැත. දේව වචනය නමැති පදනම මත ගොඩ නගන්නාවූ යම් අයෙක්වේද, නරකාදියෙහි සෑම විරුද්ධ බලවේගයකට එරෙහිව නැඟී සිටීමේ හැකියාව ඔහු සතු වන්නේය. දේව වචනයට විරුද්ධව අත ඔසවන්නාවූ සෑම ක්‍රියාවක්ම උන්වහන්සේගේ මුහුණ ඉදිරියෙහි බිඳ වැටෙනවා ඇත.

"මෙම කාරණය නිසා අප මත බලෙන් පටවන ලද මේ වියගහ අපි ප්‍රතික්ෂේප කරමු. ඒ අතරම, අපේ රජතුමා ක්‍රිස්තු භක්තික කුමාරයෙකු ලෙස අප ගැන ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමු. අනෙකුත් සියලුම දේවලට වඩා හෙතෙම දෙවියන්වහන්සේට ආදරය කරමින් ක්‍රියා කරනවා නම් රජතුමාට සහ ස්වාමිවරුන් වන ඔබතුමන්ටද අපගේ සෙනෙහසත්, කීකරුකමත් ලබාදීමට අප සූදානමින් සිටින බව දන්වා සිටීමට කැමැත්තෙමු. එය අපගේ සාධාරණවූ ද, නිත්‍යානුකූලවූ ද යුතුකමයි." (D. Aubigne, b. 13, Ch. 6).

ධර්මාධිකරණයේ සාමාජිකයන් තුළ මෙම වචන කරණ-කොටගෙන මහත් හැඟීම් සම්භාරයක් පුබුදුවනු ලැබීය. විරුද්ධත්වය පෑ කුමාරවරුන්ගේ එඩිතරකම ගැන බහුතරයක් විමතියටත්, භීතියටත් පත් වූහ. ඔවුන්ගේ අනාගතය කුණාටු සහිතව අස්ථිරව පැවති බවක් පෙනුණි. ආරවුල්, මතභේද, ගැටුම්, මෙන්ම ලේ හැලීම්ද වැළැක්විය නොහැකි බව පෙනුණි. නමුත් තමන්ගේ ව්‍යාපෘතියෙහි සාධාරණකම පිළිබඳව අචල විශ්වාසයක් තිබූ ප්‍රතිසංස්කාරකයෝ සර්ව බලධාරී ශ්‍රී හස්තයෙහි රැකවරණය මත විශ්වාසය රඳවමින් දිරිමත්ව ස්ථිරව තම ගමන ඉදිරියටම පවත්වා ගෙන ගියෝය.

මේ ප්‍රකාශය මගින් මේ කුමාරවරු දිව්‍යමයවූ දේවල් සම්බන්ධයෙන් සිවිල් බලධාරීන්ගේ මැදිහත්වීම ප්‍රතික්ෂේප කළහ. "මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට අප විසින් කීකරු විය යුතුය"යි ප්‍රොපේතවරුන් සහ අපෝස්තුළුවරුන් සමග ඔව්හු එක හඬින් ප්‍රකාශ කළහ. සභාව දැක්වූ බලය එපා කරමින්, ඔවුන් ඉදිරිපත් කළාවූ නිවැරදි ප්‍රතිපත්තිය වූයේ මනුෂ්‍යයන්ගේ සියළු ඉගැන්වීම් දෙවියන්වහන්සේගේ වචනයට අනුකූල විය යුතු බවය. මේ කාරණා ඉදිරිපත් කළාවූ කුමාරවරු මානුෂික උත්තම භාවයේ වියගහ එපා කර, සභාවේදී ද දේශනා කුඩුවේදීද ප්‍රකාශ කරනු ලැබූ දේව වචනයේ අති උතුම් තැනැන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව දැක්වූහ. හෘදය සාක්ෂියේ බලය රජයේ බලයට වඩා උසස් බවද, ශුද්ධ ලියවිල්ලේ බලය එහි දර්ශනය කළ හැකි සභාවට වඩා බලසම්පන්න බවද ඔව්හු දැක්වූහ. ක්‍රිස්තුස්වහන්සේගේ ඔටුන්න පාප්ගේද රජතුමාගේද ඔටුනුවලට වඩා උසස් බව මේ ප්‍රකාශය මගින් දක්වන ලදී. (D. Aubigne, b. 13, Ch. 6). සත්‍යතාව පිළිබඳව තමන්ගේ අධිෂ්ඨාන පූර්ව විශ්වාසය බාහිර බලපෑම්වලින් තොරව නිදහස් ලෙස ප්‍රකාශ කිරීමට තමන්ට අයිතියක් ඇති බව ඔව්හු කියා සිටියෝය. දේව වචනය ඉදිරිපත් කරන්නාවූ ඉගැන්වීම් විශ්වාස කරමින් ඒවාට කීකරු වනවා පමණක් නොව, එම දහම් වෙනත් අයට ඉගැන්වීමටද තමාට නිදහස තිබෙන බව ඔවුහු ප්‍රකාශ කළෝය. එම ක්‍රියාදාමයෙහිදී



පූජකවරුන්ගේ සහ මහේස්ත්‍රාත්වරුන්ගේ මැදිහත් වීම ඔවුහු තරයේ ප්‍රතික්ෂේප කළෝය. ආගමික නිදහසට වැට කඩොළු බැඳීමට එරෙහිව වූ මේ ගාම්භීර සාක්ෂි දරීම ස්පයර්ස්හි සිදුවූ කුමාරවරුන්ගේ විරෝධතාවෙන් ප්‍රදර්ශනය විය. එය තම හෘදය සාක්ෂියේ නියෝගයන් අනුව දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ අයිතිය පිළිගැනීමක් විය.

විරෝධතාව ප්‍රකාශ කරනු ලැබීය. එය දහස් ගණනින් වූ බැතිමතුන්ගේ මනස්වල කෙටුම්පත් කරන ලදී. එම ප්‍රකාශය කිසිම මනුෂ්‍යයෙකුට කටු ගා දමිය නොහැකි ලෙස, මකා දමිය නොහැකි ලෙස ස්වර්ගයේ පොත්වල සටහන් කරන ලදී. ශුභාරංචි ප්‍රකාශක ජර්මානු ජනපද මෙම විරෝධතා ප්‍රකාශනය තමන්ගේ ඇදහිල්ලේ ප්‍රකාශනය ලෙස පිළිගත්තෝය. අලුත් සහ වඩාත් යහපත් යුගයක පොරොන්දුවක උදාවක් ලෙස මෙම ප්‍රකාශනය වෙත බැතිමතුන්ගේ අවධානය යොමු විය. ස්පයර්ස්හි රැස්ව සිටි මේ කිතුණුවන් ඇමතූ එක් කුමාරයෙක් මෙසේ ප්‍රකාශ කළේය, "මෙවන් ප්‍රකාශනයක් ධෛර්යමත්ව නිදහස් ලෙස සහ බියෙන් තොරව ඉදිරිපත් කිරීමට කරුණා-අනුග්‍රහය ලබා දුන් සර්ව බලධාරී තැනැන්වහන්සේ, මෙම අචල ක්‍රිස්තියානි ස්ථිරතාවයෙහි ඉදිරියටත් රැඳී සිටීමට හා එය සාර්ථක කරගැනීමට ඔබට සදාතනය පුරා උපකාර කරන සේක්වා." (D. Aubigne, b. 13, Ch. 6).

ප්‍රතිසංස්කරණය විසින් මෙවන් සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමෙන් පසුව ලෝකයේ අනුග්‍රහය අපේක්ෂාවෙන් විනිශ්චයකට බැසීම පමා කරනු ලැබුවේ නම්, එය දෙවියන්වහන්සේට මෙන්ම තමන්ටද බොරු කිරීමක් හා රැවටීමක් වන්නේය. එවැනි දෑ කිරීමෙන් තමන්ගේම විනාශයට දොරටු විවෘත කරගන්නට පුළුවන්කමක් තිබුණි. මතු පරම්පරාවන් සඳහා වැදගත් පාඩමක් මෙම උදාර ප්‍රතිසංස්කා-රකයන්ගේ අත්දැකීමෙහි අන්තර්ගතය. දෙවියන්වහන්සේට විරුද්ධවත්, උන්වහන්සේගේ වචනයට එරෙහිවත් පවතින සාතන්ගේ ක්‍රියාදාම ක්‍රමයෙහි වෙනසක් සිදු වී නැත. දහසය වැනි සියවසෙහිදී මෙන්ම අදත් ශුද්ධ ලියවිලි තමන්ගේ මාර්ගෝපදේශකයා කරගනු ලබනවා දැකීමට සාතන් විරුද්ධය. ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු ධර්මතාවන්ගෙන් සහ ව්‍යවස්ථාවලින් මහත් සේ ඉවත්ව යාමක් අද අපට දැකගත හැකිය. ශ්‍රේෂ්ඨ ප්‍රොතැස්තන්ත ප්‍රඥප්තිය වෙතට නැවත හැරී ඒමෙහි අවශ්‍යතාවක් අද උදා වී ඇත. ඇදහිල්ලෙහි සහ වගකීමෙහි එකම පදනම ලෙස බයිබලය සහ බයිබලය පමණක් පිළිගැනීම අදත් වලංගුව පවතී. ආගමික නිදහස විනාශ කිරීමට හැකි සියල්ල කිරීමට සාතන් තවමත් ක්‍රියා කරයි. කුමන ක්‍රමයකින් හෝ එම කර්තව්‍යය

ඉටු කරගැනීමට හෙතෙම මහත් සේ වැර යොදා ක්‍රියා කරන්නේය. ස්පයර්ස්හිදී විරෝධතාකරුවන් ප්‍රතික්ෂේප කළ අන්ත ක්‍රිස්තු බලවේගය, තමන්ගෙන් ගිලිහී ගිය ආධිපත්‍යය, නැවත වරක් දිනාගැනීමට ප්‍රබල උත්සාහයක නිරතව සිටියි. එදා විරෝධතාව දක්වීමේදී පෙන්නුම් කළ දෙවියන්වහන්සේගේ වචනය උදෙසා වූ අචල විශ්වාසය වර්තමාන ප්‍රතිසංස්කරණයට ඇත්තාවූ එකම බලාපොරොත්තුවය.

ප්‍රොතැස්තන්තවරුන්ට එරෙහිව වූ අනතුරු සේයා තැනින් තැන පෙනෙන්නට විය. එසේම, විශ්වාසවන්තකයන් රැකගැනීමට දිව්‍ය හස්තය ක්‍රියාත්මක වන ආකාරයද දක ගැනීමට හැකි විය. දේව මැදිහත් වීම ගැන අපූර්ව සංසිද්ධියක් වාර්තා වී ඇත. මෙම කාලයේදී එක් දිනක් "මෙලැන්ක්තන් තම මිත්‍රයෙකු වූ සයිමන් ග්‍රිනේයුස් සමග ඉක්මණින්ම ස්පයර්ස්හි වීදි දිගේ රයින් නදී තෙර බලා ගමන් කරමින් සිටියේය. නදියෙන් එගොඩට ග්‍රිනේයුස්ව යැවීම මෙලැන්ක්-තන්ගේ අභිප්‍රාය විය. එවැනි හදිස්සියක් දක්වීම ගැන ග්‍රිනේයුස් පුදුමයට පත් විය. මෙලැන්ක්තන් ඔහුට මෙසේ පැවසුවේය: "ගාම්භීර පෙනුමැති වයසක මිනිසෙක් මා වෙත පැමිණියේය. මම ඔහු හඳුනන්නේ නැත. ඔහු මට කථා කළේය. ඉක්මන් කරන්න, තව ස්වල්ප වේලාවකින් අධිකරණ නිලධාරීහු මෙතැනට එනවා. ෆර්ඩිනන්ඩ්ගේ අණින් ග්‍රිනේයුස්ව අත් අඩංගුවට ගැනීමට ඔවුන් මෙහේ එනවා!" යි ඔහු තමාට කීවේ යයි මෙලැන්ක්තන් පැවසුවේය. "රයින් නදියෙහි ඉවුර මත බලා සිටි මෙලැන්ක්තන් තම මිතුරා සතුරු හස්තයෙන් බේරී ගඟින් එතෙරවීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කළේය. "අහිංසකයින්ගේ ලේ පිපාසාවෙන් පෙළෙන්නාවූ අයගේ කුරිරු දැත්වලින් මාගේ මිතුරා බේරාගනු ලැබුවේය'යි ඔහු පැවසුවේය.

ග්‍රිනේයුස් පාප් සමයේ සිටියාවූ මහාචාර්යවරයෙකු සමග කිට්ටුවර මිත්‍රත්වයකින් සිටියේය. නමුත් ඔහුගේ එක් දේශනාවක් ගැන මහත් පුදුමයට පත්වූ ග්‍රිනේයුස් මේ තැනැත්තා වෙත ගොස්, තවදුරටත් සත්‍යයට විරුද්ධව සටන් නොකරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. පාප්ගේ මේ සේවකයා තමාගේ කෝපය සඟවා ගත් නමුත්, වහාම රජු වෙත ගොස් ග්‍රිනේයුස් සිර භාරයට ගැනීමට අවසර ලබාගත්තේය. ආපසු තම නිවෙසට ගිය විට මෙලැන්ක්තන්ට දැනගන්ට ලැබුණේ ඔහු නිවෙසින් ගියාට පසුව, ග්‍රිනේයුස්ව සොයන පිණිස නිලධාරීන් තමාගේ නිවෙසට පැමිණ, ගෙයි ඉහළ සිට පහළ දක්වා පිරික්සමින් ඔවුහු සෙවූ බවය. ස්වාමින්වහන්සේ තමාට අවවාද කරන පිණිස තමන්වහන්සේගේ දූතයෙකු එවා ඔහුගේ මිත්‍රයා බේරා දුන් බව මෙලැන්ක්තන් විශ්වාස කළේය. (D. Aubigne, b. 13, Ch. 6).



භූමියේ බලගතු පුද්ගලයන් ඉදිරියෙහි ප්‍රතිසංස්කරණය ප්‍රසිද්ධියට පත්කරනු ලැබීමේ කාලය උදා වී තිබුණේය. කුමාරවරුන්ගේ ඉල්ලීමට ඇහුම්කන් දීමට ෆර්ඩිනන්ඩ් රජතුමා අකමැති වී තිබුණි. එහෙත් ඔවුන්ගේ තවත් ඉල්ලීමක් අනුව තතු පැහැදිලි කරදීමට අවස්ථාවක් රාජ සභා මණ්ඩලයෙන් ලබාදෙන ලදී. එම මණ්ඩලයට මහ රජතුමාද සභාවේ සහ රාජ්‍යයේ වැදගත් නිලධාරීන්ද සහභාගීව සිටියෝය. රාජ්‍යය තුළ බෙදීම් ඇති කළ ප්‍රශ්නය සන්සුන් කිරීමට රජතුමා අලුත් ධර්මාධිකරණ සැසි වාරයක් කැඳෙව්වේය. මෙය ස්පයර්ස්හි පැවැති අධිකරණ විභාගයෙන් වසරකට පසුව ඕගස්බර්ග්හිදී පවත්වනු ලබන බවත් තමාම එහි මුලසුන දරන බවත් රජතුමා ප්‍රකාශ කළේය. ප්‍රොතෙස්තන්ත නායකයන්ටද මෙම අධිකරණ සැසියට සහභාගි වන්නැයි ඇරයුමක් ලැබුණේය.

ප්‍රතිසංස්කරණයට ඉමහත් අනතුරු ඇතිවීම පිළිබඳව තර්ජනයක් ඇතිවිය. එහෙත් එහි අනුගාමිකයෝ තමාගේ ඉදිරි වැඩකටයුතු දෙවියන්වහන්සේගේ හස්තයටම කැප කොට ශුභාරංචියට නොසැලී බැඳී සිටින බවට පොරොන්දු වූහ. එම අධිකරණය වෙත යන්නට එපා යයි සැක්සනියේ ආදිපාදවරයාගේ අනුශාසකයෝ ඔහුගෙන් ඉල්ලා සිටියෝය. කුමාරයන්ට අධිකරණය ඉදිරියට පැමිණෙන ලෙස අගරජතුමා නියෝග කර ඇත්තේ ඔවුන්ව උගුලකට හසුකර ගැනීමට යයිද ආදිපාද අනුශාසකයෝ තවදුරටත් කියා සිටියෝය. "බලවත් සතුරෙකුගේ ආධිපත්‍යය පවතින නගරයට ගොස් එහි බිත්ති හතරකට කොටු වී සිටීමට යෑම සියල්ල පරදුවට තැබීමක් නොවේද"යි ඔවුහු විචාළෝය. ඒ අතර තවත් අය මෙසේද පැවසුවෝය. "කුමාරවරුන් ධෛර්යයෙන් යුතුව ක්‍රියා කරත්වා. දෙවියන්වහන්සේගේ කර්තව්‍යය ආරක්ෂා සහිත වෙනවා නියතය." "අපගේ දෙවියන්වහන්සේ විශ්වාසවන්තය. උන්වහන්සේ අපව අත්හැර දමන්නේ නැත"යි ලූතර් පැවසුවේය. ආදිපාදවරයා තම පරිවාර සෙනඟ සමග ඔගස්බර්ග් කරා ගමන ආරම්භ කළේය. ඔහුට එල්ල විය හැකි තර්ජනාත්මක අනතුරු ගැන සැවොම දැන සිටියෝය. බොහෝ අය ඔහු සමග ඉදිරියට ගියේ ශෝකබර වතින් සහ දුක්බර හදවතිනි. එම කණ්ඩායම සමග ලූතර් ද කෝබර්ග් තෙක් ගමන් කළේය. ඔවුන්ගේ කම්පනයට පත් වූ ඇදහිල්ල දිරිගන්වමින් ඔහු ගීතයක් ගායනා කළේය. ගමන යන අතරතුරේදී ඔහු මෙම ගීතය රචනා කළේය: "අපගේ දෙවියන්-වහන්සේ ඉතා ශක්තිමත් බලකොටුවක් වනසේක." මෙම ආනුභාව සම්පන්න ගීතය තුළින් ප්‍රමුත වූ සෙනඟගේ බර හදවත් සැහැල්ලු විය. ඔවුන්ගේ සිත් තුළ පැවති සංකල්ප අත්හැර දමා ඔව්හු දිරිමත්ව ඉදිරියට ගමන් කළෝය.

ප්‍රතිසංස්කරණයේ කුමාරවරු තමන්ගේ ඉගැන්වීම් අඩංගු ඇදහිලි පිළිබඳ ප්‍රකාශනයක් ක්‍රමානුකූලව සකස් කර, එම ඉගැන්වීම් බයිබල් පද මගින් තහවුරු කොට ධර්මාධිකරණයට ඉදිරිපත් කිරීමට තීරණය කර ගත්තෝය. එම ප්‍රකාශනය සකස් කිරීම ලූතර්ට, මෙලැන්ක්තන්ට සහ ඔවුන්ගේ සහායකයන්ට පවරන ලදී. මෙම ප්‍රකාශනය තමන්ගේ ඇදහිල්ල උච්චාරණය කිරීමක් ලෙස ප්‍රොතැස්තන්ත කිතුණුවෝ පිළිගත්හ. එම ලියවිල්ලට තමන්ගේ අත්සන් යෙදීමට ඔවුහු රැස්වූවෝය. එය ඉතා ගරු ගාම්භීර වූ අවස්ථාවක් විය. තමන්ගේ මේ උදාර සේවයට දේශපාලනයේ ප්‍රශ්න මගින් වියවුලක් ඇති නොවීම ඔවුන්ගේ ආශාව විය. දෙවියන්වහන්සේගේ වචනයෙන් නික්ම එන්නාවූ බලපෑමට වඩා වෙනත් කිසිම බලපෑමක් ප්‍රතිසංස්කරණයේ විශ්වාසයට ඇතුළත් නොවිය යුතු යයි ඔව්හු කල්පනා කළහ. ඇදහිලි ප්‍රකාශනයට අත්සන් කිරීමට කුමාරවරුන් ඉදිරියට පැමිණෙත්ම මෙලැන්ක්තන් එතැනට පැමිණ ඔවුන්ට මෙසේ පැවසුවේය. "මෙම ඇදහිලි විශ්වාසයන් යෝජනා කිරීම දේවධර්මචාර්යවරුන් සහ පූජකයන් සතු කාර්යයකි. අනෙකුත් කාරණා සම්බන්ධව තීරණ ගැනීමට පොළොවේ අධිකාරීන්ට අවස්ථාව ලබා දෙමු." "එසේ නොවේවා"යි සැක්සනියේ ආදිපාදධූර ජෝන් කියා සිටියේය. "ඔබ මාව අත්සන් තැබීමෙන් අයින් කර තියන්න එපා. මාගේ ඔටුන්න ගැන දෙවරක් නොසිතා හරි දෙය කිරීමට මා අධිෂ්ඨාන කර ගතිමි. මාගේ දෙවි සමිඳාණන් පිළිගන්නා බව මම ප්‍රකාශ කරමි. මාගේ නිල හිස් වැසුමත්, වස්ත්‍රත් යේසුස්වහන්සේගේ කුරුසිය තරම් මට වටින්නේ නැහැ." මෙසේ කියා හමාර වී ඔහු තම අත්සන ප්‍රකාශනයට එකතු කළේය. පැන සුරතින් ගනිමින් තවත් කුමාරයෙක් මෙසේ අදහස් පළ කළේය. "මාගේ වස්තු සම්පත් සහ මාගේ ජීවිතයත් පුජා කිරීම මාගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෞරවයට අවශය වන්නේ නම් එසේ කිරීමට මම සූදානමින් සිටිමි. මෙම ඇදහිලි ප්‍රකාශනයෙහි සඳහන් ධර්මතාවන් හැරෙන්නට වෙනත් දහම් පිළිගන්නවාට වඩා මගේ යටත්වැසියන් සහ ජනපද අත්හැර දමා හැරමිටියක් අතැතිව ඒවායින් පිටත්ව යාමට මම සූදානම්ව සිටිමි"යි ඔහු ප්‍රකාශ කළේය.

V චාර්ල්ස් රජතුමා ඉදිරියට යෑමට නියමිත වේලාව පැමිණියේය. අගරජතුමා සිංහාසනාරූඪව සිටියේය. ඔහු වටා ආදිපාදවරු සහ කුමාරවරු අසුන් ගෙන සිටියෝය. ප්‍රොතැස්තන්ත ප්‍රතිසංස්කාරකයන්ට ඇහුම්කන් දීමට ඔවුහු සූදානමින් සිටියෝය. ඔවුන්ගේ ඇදහිලි ප්‍රකාශනය කියවන ලදී. එම ප්‍රතාපවත් සම්භාවනීය රැස්වීමේදී ශුභාරංචියෙහි සත්‍යතාවන් ඉතා පැහැදිලි ලෙස ලේඛනගතකොට තිබුණේය. ඒ අතරම පාප් සභාවේ අක්‍රමිකතාවන් ගැනද සටහන් කර තිබුණේය. "ප්‍රතිසංස්කරණයේ අති උත්කෘෂ්ට ජයග්‍රාහක දිනය හැටියටද ක්‍රිස්තියානි



දහමේ සහ මිනිස් වර්ගයාගේ තේජශ්‍රීය දවසක් ලෙසද ඒ දිනය නිසි අන්දමින් හඳුන්වා දී තිබේ." (D. Aubigne, b. 14, Ch. 7).

වර්ම්ස්හි මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි විටන්බර්ග්හි තාපස පූජකයා හුදෙකලාව පෙනී සිටි සිද්ධියෙන් පසුව වසර කිහිපයක් ගෙවී ගොස් තිබුණේය. දැන් ඔහු වෙනුවට ඉතා උදාරවූද, ඉතා බලගතුවූ ද කුමරුවෝ එම තැන ගෙන සිටියෝය. ඕගස්බර්ග් සම්මේලනයට සහභාගි වීමට ලූතර්ට අවසරයක් ලැබී නොතිබුණේය. එහෙත් වචනයෙන් සහ යාච්ඤාවෙන් ඔහු එහි සිටියේය. "මේ පැය පැමිණෙන තෙක් ජීවත්ව සිටීමට ලැබීම ගැන මම සතුටට පත්වෙමි. එවැනි තේජස්ශ්‍රීය රැස්වීමකදී එවන් සත්කීර්තිමත් පුද්ගලයන්ගේ ප්‍රකාශන මගින් ක්‍රිස්තුස්වහන්සේව ඔසවා තබනු ලැබුවේ යයි දැනගැනීම මට මහත් සතුටකි. "රජුන් ඉදිරියෙහිත් ඔබගේ ශික්ෂා ගැන ලජ්ජා නොවී කථා කරන්නෙමි." (ගීතාවලිය 119: 46) යන ශුද්ධ ලියවිලි වදන් අද සම්පූර්ණ විය"යි ඔහු ලියුවේය. (D' Aubigne, b. 14, Ch. 7).

කිතුණු සභාවේ මුල් දවස්වලදී පාවුල්ව සිරගෙට යවනු ලැබීමට හේතුකාරක වූ ශුභාරංචිය අද රාජකීය නගරයේදී ප්‍රභූවරුන් සහ කුමාරවරුන් ඉදිරියට පැමිණියේය. දේශනා කුඩුවේ සිට ප්‍රචාරය කිරීමට අගරජතුමා විසින් තහනම් කළ ශුභාරංචිය රජමාළිගාව තුළ රැව් පිළිරැව් දුන්නේය. තම ගෘහ සේවකයන්ටවත් සවන් දීමට නුසුදුසු යයි සමහරෙක් කල්පනා කළ ශුභාරංචියට රාජ්‍යයේ ස්වාමිවරු සහ ප්‍රභූවරු මහත් විස්මයෙන් යුක්තව සවන් දුන්නෝය. ඔටුණු පැළඳි කුමාරයෝ දේශනා කළෝය, රජවරු සහ අධිපතියෝ අසාගෙන සිටියෝය. දෙවියන්වහන්සේගේ රාජකීය සත්‍යතාව දේශනාවෙහි තේමාව විය. "අපෝස්තුළුවරුන්ගේ දවස් පටන් මෙවන් උදාරතර ශුභාරංචි ප්‍රකාශ කිරීමක් හෝ මෙවන් උතුම් තේජාන්විත භාවයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශ කිරීමක් සිදු වී නැතැ"යි ලේඛකයෙක් ප්‍රකාශ කර තිබේ. (D. Aubine, b. 14, Ch. 7).

"ලූතර්වාදීන් පැවසූ සියල්ලම සත්‍යයයි. එය ප්‍රතික්ෂේප කිරීමට අපට හැකියාවක් නැත"යි රෝමානු රදගුරු ප්‍රසාදිවරයෙක් පැවසීය. තවත් අයෙක් ආචාර්ය ඒක්ගෙන් මෙසේ විචාළේය. "ආදිපාදවරයා සහ ඔහුගේ මිත්‍ර පාක්ෂිකයන් විසින් ඉදිරිපත් කළ ඇදහිලි ප්‍රකාශනය බුද්ධිමත් තර්ක මගින් ඔබට බිඳ දමන්නට පුළුවන්ද?" "අපෝස්තුළු වරුන්ගේ සහ ප්‍රොපේතවරුන්ගේ ලියවිලි මගින් එසේ කරන්නට බැහැ. එහෙත් සභා නායකයන්ගෙන් සහ සභා සමුළුවලදී ගත් තීරණ මගින් නම් එසේ කරන්නට පුළුවන්"යි ආචාර්යවරයා පිළිතුරු දුන්නේය. ප්‍රශ්නය ඇසූ තැනැත්තාගේ ප්‍රතිචාරය මෙසේ විය. "ඔබ කියන ආකාරයට ලූතර්වරු ඉන්නේ ශුභාරංචිය තුළයි. අපි ඉන්නේ ශුභාරංචියෙන් පිටතයි." (D. Aubigne, b. 14, Ch. 8).

ජර්මනියේ සමහර කුමාරවරුන් ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ලට දිනා ගනු ලැබිණ. ප්‍රොතෙස්තන්ත ඇදහිලි ප්‍රකාශනය සත්‍යය මිස වෙනත් දෙයක් නොවේ යයි අගරජතුමාද ප්‍රකාශ කළේය. මෙම ඇදහිලි ප්‍රකාශනය භාෂා බොහෝ ගණනාවකට පරිවර්තනය කරන ලදුව, යුරෝපය පුරා බෙදා හරින ලද්දේය. එය ඔවුන්ගේද ඇදහිල්ලේ ප්‍රකාශනය බව පසු පරම්පරා ගණනාවක බැතිමත්හු දශ ලක්ෂ ගණනින් පිළිගත්තෝය.

දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත සේවකයෝ තනිවම කටයුතු නොකළහ. ඔවුන්ට විරුද්ධව" අධිපතිහුද, පරාක්‍රමධාරීහුද ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ සේනාවන්ද" සාමූහිකව විරුද්ධකම් පෑවද, දෙවි සම්දාණෝ තමන්වහන්සේගේ සෙනඟ අත්හැර නොදැමූ සේක. තම ඇස් විවෘත කිරීමට හැකියාවක් ඔවුන් සතු වී නම්, ආදී කාලයේදී දිව්‍යසිවරයෙකුට දකගන්නට හැකි වූ ආකාරයෙන්ම දිව්‍ය ආරක්ෂාව සහ උපකාරද, දිව්‍ය අභිමුඛයද තමන් සමග පැවැති බව ඔවුන්ට දකගත හැකිවනවා ඇත. තමා වටකර සිටි සතුරු හමුදාව දුටු එලිෂාගේ සේවකයාගේ හඬට පිළිතුරු වශයෙන් ඔහු දෙවියන්-වහන්සේගෙන් මෙසේ ඉල්ලුවේය. "ස්වාමීන්වහන්ස, දකින පිණිස මොහුගේ ඇස් පැහැදූව මැනව"යි කීවේය. එවිට එලිෂා වටේට, ගිනි අශ්වයන්ගෙන්ද, ගිනි රථවලින්ද කන්ද පිරී තිබෙන බව ඔහු දුටුවේය. (2 රාජාවලිය 6: 17). මෙසේ පුනරුදයේ සේවකයන්ද දේව දූතයන් විසින් ආරක්ෂා කරනු ලැබීය.

ලූතර් විසින් ඉතා දැඩිව ආරක්ෂා කළ එක් ප්‍රතිපත්තියක් නම්, ප්‍රතිසංස්කරණයේ සහාය සඳහා කිසිම ලෞකික බලවේගයක සහාය පැතීම නොකළ යුතු බවය. තවද, තමන්ගේ ආරක්ෂාව සඳහා කිසිම අවි ආයුධයක් ඉල්ලා නොසිටීම ඔවුන්ගේ එම ප්‍රතිපත්තියේම කොටසක් විය. අධිරාජ්‍යයේ කුමාරවරුන් විසින් ශුභාරංචිය පිළිබඳව කළ ප්‍රකාශය පිළිබඳව ඔහු තුළ විශාල ප්‍රීතියක් පැවතුණේය. ශුභාරංචි ව්‍යාපාරය රැකගැනීම සඳහා ඒකාබද්ධ සමූහ ආරක්ෂක සංගමයක් පිහිටුවා ගැනීමට ඔවුන් යෝජනා කළ කල්හි ඔහු මෙසේ පැවසීය, "ශුභාරංචියෙහි ධර්මතාවන් රැකගැනීම කළ යුතු වන්නේ දෙවියන්වහන්සේ විසින් පමණක්ය. මෙම වැඩයට මනුෂ්‍යයන්ගේ මැදහත් වීම අඩුවන තරමට එම කාර්යය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ මැදහත්වීමද, එපමණටම වැඩි වන්නේය." ඔවුන් විසින් ආචාර සම්පන්නව ඉදිරිපත් කළ සෑම ආරක්ෂක යෝජනාවක්ම ලූතර්ගේ දසුන අනුව වර්ගීකරණය කරනු ලැබුවේ උවමනා නැති භීතියක් සහ පාපිෂ්ට අවිශ්වාසයක් ලෙසය." (D. Aubigne, b. 10, Ch. 14).

ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල පරාජය කිරීමට බලවත් සතුරන් ඒකාබද්ධ වූ විටද දහසක් කඩු පහර එයට විරුද්ධව ලෙළ දීමට



සූදානමින් තිබූ විටද ලූතර් මෙසේ ලීවේය. "සාතන් ඔහුගේ උදහස අපට විරුද්ධව මුදාහරිමින් ක්‍රියා කරන්නේය. දේව අභක්තික රජවරු අපට විරුද්ධව කුමන්ත්‍රණය කරති. අපට විරුද්ධව යුද්ධ තර්ජන එල්ල වේ. ඇදහිල්ලෙන් සහ යාච්ඤාවෙන් යුතුව දෙවි සම්දාණන්ගේ සිංහාසනය ඉදිරියෙහි වික්‍රමාන්විත ලෙස ආධාර ඉල්ලා සිටීමට ජනතාව දිරි ගන්වන්න. එවිට අපගේ සතුරන් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් විසින් අභිබවා සිටීම කරණකොටගෙන ඔවුන්ට සාමය සඳහා බලපෑමක් කරනු ලබනවා ඇත. අපගේ ප්‍රධාන අවශ්‍යතාව යාච්ඤාව වන්නේය. කඩුවෙන් ජීවිතක්ෂයට පත්කරනු ලැබීමටද, සාතන්ගේ උදහසටද දැන් ජනතාව මුහුණදී සිටින බව ඔවුන්ට මතක් කර දෙන්න. යාච්ඤා කිරීමට ඔවුන්ට මගපෙන්වන්න." (D. Aubibne, b. 10, Ch. 14).

ප්‍රතිසංස්කරණයේ කුමාරවරුන් විසින් යෝජිත ඒකාබද්ධ සංගමය ගැන ප්‍රශ්නය නැවත වරක් පැන නැගි අවස්ථාවේදී ලූතර් කියා සිටියේ මෙම යුද්ධයේදී භාවිතා කළ යුතු එකම ආයුධය නම් "ස්වාමීන්-වහන්සේගේ කඩුව" පමණක් බවය. සැක්සනියේ ආදිපාද තුමාට ලිපියක් යවමින් ඔහු මෙසේ කරුණු දක්වීය. "ඒකාබද්ධ මිතුරු සන්ධානය හෘදය සාක්ෂියට එකඟව පිළිගැනීමට අපට හැකියාවක් නැත. අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ බලසම්පන්නය. අප අනතුරු-වලින් මුදා ගැනීමටද, දේව භක්තිකමින් තොර කුමාරවරුන්ගේ සිතුවිලි කිසිත් නැති බවට පත්කිරීමටද අනන්ත ක්‍රම සොයා ගැනීමට උන්වහන්සේට පුළුවන.... අප උන්වහන්සේගේ වචනයට කීකරු වෙනවාද නැද්දැයි බැලීමටද, අප එය නියම සත්‍යය වශයෙන් පිළිගන්නවා දැයි බැලීමටද උන්වහන්සේ අප සෝදිසි කරනසේක. අපගේ වැරදි ක්‍රියාවක් නිසා ශුභාරංචිය උදෙසා ලේ ගැලීමක් හෝ වේදනාවක් ඇතිවීමට වැඩියෙන් දස වරක් මිය යාම අපට හොඳය. ගීතිකාකාරයා කියන්නාක් මෙන් අපි ඉවසිල්ලෙන් පීඩාවන් දරා ගනිමින් මරණයට ගෙන යන ලද බැටළුවන් මෙන් ගණන් ගනු ලබමු. පළිගැනීමෙන් හා අපවම රැකවරණය කරගන්ට උත්සාහ කිරීමෙන් වැලකී අපි දෙවියන්-වහන්සේගේ උදහස ක්‍රියාත්මක වීමට ඉඩ දෙමු. ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය දරාගනු ලැබීය. ශ්‍රීමතාණෙනි, ඔබ බිය නැතුව සිටින්න. අපගේ සියලු සතුරන්ගේ උදාරම් බස්වලට වඩා අපගේ යාච්ඤාවලින් මහත් දේ ඉටු කළ හැකිය. ඔබගේ සහෝදරයන්ගේ රුධිරයෙන් ඔබගේ අත් තෙත් නොවේවා. තමන්ගේ ත්‍රී පුද්ගල විනිසුරු මඩුල්ලට අපව භාරදීම අග රජතුමාගේ කැමැත්ත නම්, එයට මුහුණ දීමට අපි සූදානමින් සිටින්නෙමු. අපගේ ඇදහිල්ල රැකීමට ඔබට පුළුවන්කමක් නැත. විවිධ අන්ත්‍රා උපද්‍රව වලට මුහුණ දෙමින් එකිනෙකා තමාගේ ඇදහිල්ල ගොඩ නගා ගත යුතුය." (D. Aubigne, b. 14, Ch. 1).

ලොව හෙල්ලූ ප්‍රතිසංස්කරණයේ බලශක්තිය පැමිණියේ යාච්ඤාවේ රහස් කුටිය තුළින්ය. ශුද්ධ වූ සන්සුන්කමකින් යුතුව දෙවියන්වහන්සේගේ සේවකයෝ උන්වහන්සේගේ පොරොන්දුවේ පර්වතය මත නැගී සිටියෝය. ඕගස්බර්ග්හි තිබූ පොර බැදීමේදී ලූතර් අඩුම තරමින් පැය තුනක්වත් යාච්ඤා නොකර කිසිම දවසක ගතකළේ නැත. ඉගෙනීමට ඉතා යෝග්‍ය වූ කාලය අතුරෙන් එම පැය කිහිපය තෝරා ගන්නා ලදී. බාහිර සියලු කටයුතුවලින් ඈත්ව තනිවම තම යාච්ඤා කුටියට වැදුණු හෙතෙම තම ආත්මය දෙවියන්වහන්සේ ඉදිරියෙහි වගුරුවාලීය. මිතුරෙකුට කථා කරන්නාක් මෙන් හෙතෙම නමස්කාර ආත්මයෙන් යුතුව ගරු බිය සහිතව බලාපොරොත්තු සමගින් දෙවි සම්දාණන් ඇමතීය. "ඔබවහන්සේ අපගේ පියාණන්වහන්සේය, අපගේ දෙවියන්වහන්සේය. ඔබවහන්සේ අප සමග අනතුරට මුහුණ පා සිටින නිසා ඔබගේ දරුවන්ට හිංසා පීඩා පමුණුවන්නාවූ අය විසුරුවා හරින බව අපි දනිමු. මේ සියලු කාරණා ඔබවහන්සේගේය. මෙම කර්තව්‍යයට අප අත ගැසුවේ ඔබවහන්සේගේ මගපෙන්වීම නිසාය. එම නිසා අපව ආරක්ෂා කරන්න පියාණෙනි." (D. Aubigne, b. 14, Ch. 6).

සිත් තැවුලට සහ බියට පත්ව වේදනාවෙන් දුක් විඳිමින් සිටි මෙලැන්ක්තන්ට ඔහු මෙසේ ලීවේය. "ක්‍රිස්තුස්වහන්සේ තුළ සමාදානයත්, කරුණා-අනුග්‍රහයත් ඔබට වේවා! එය ලෝකය තුළ නොව ක්‍රිස්තුස්වහන්සේ තුළ යයි ඔබට කියමි. ආමෙන්. ඔබව දවාලන්නට වැයම් කරන්නාවූ අමතර දේවල්වලටද මම දැඩි සේ ද්වේෂ කරමි. මෙම කර්තව්‍යය අසාධාරණ නම් එය අතහැර දමන්න. එය සාධාරණ නම්, බියක් නැතිව නිදාගන්න යයි අපට අණකරන තැනැන්වහන්සේගේ පොරොන්දු අපි බොරු බවට පත්කරන්නේ ඇයි? යුක්ති සහගතවූ ද, සත්‍යවූ ද වැඩ කටයුතුවලට උන්වහන්සේ අඩුවක් නොකරන සේක. උන්වහන්සේ ජීවත්වන සේක, උන්වහන්සේ රජකම් කරන සේක; එසේ නම් අපට බියක් ඇති වීමට හේතුව කුමක්ද?" (D. Aubigne, b. 14, Ch. 6).

දෙවියන්වහන්සේ තම සේවකයන්ගේ හඬට ඇහුම්කන් දුන්සේක. ලෝකයේ අඳුරු බලධාරීන් ඉදිරිපිට සත්‍යතාව ඉදිරියට ගෙන යාමට උන්වහන්සේ කුමාරවරුන්ට සහ දේවගැතිවරුන්ට දේව කරුණාව සහ ධෛර්යය ලබා දුන්සේක. දෙවි සම්දාණෝ මෙසේ පවසන සේක, "බලව, තෝරාගත් අනර්ඝ, කොණේ ප්‍රධාන ගලක් සියොන්හි තබමි. උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා ලජ්ජාවට නොපැමිණෙන්නේය." (1 පේතෘස් 2: 6). ප්‍රොතැස්තන්ත ප්‍රතිසංස්කාරකයෝ ක්‍රිස්තුස්වහන්සේ මත ගොඩ නැගුහ. ඔවුන්ට විරුද්ධව නැගී සිටීමට පාතාලයේ දොරටු සමත් වූයේ නැත.



# 12

# ප්‍රංශ පුනරුදය

ස්පයර්ස්හිදී ජර්මන් ජාතික කුමාරයන් ගෙන ගිය විරෝධතා දැක්වීම පුනරුද ව්‍යාපාරය ලැබූ ඓතිහාසික ජයග්‍රහණයක් විය. ප්‍රොතැස්තන්ත කුමාරවරුන් විසින් ඉදිරිපත් කළ ඇදහිලි ප්‍රකාශනයන් එම ජයග්‍රහණයේ සාර්ථකත්වය පිළිබිඹු කළේය. එහෙත් මෙයින් පසු ඇති වූ ගැටුම් කරණකොටගෙන ප්‍රොතැස්තන්ත ව්‍යාපාරය අඳුරු වලාවකින් වැසී ගියේය. මෙම ව්‍යාපාරයට අත හිත දුන් පක්ෂ අතර බෙදීම් හට ගත්තේය. එයට විරුද්ධව සතුරන්ද ප්‍රබල ලෙස ක්‍රියාත්මක වූහ. එහෙයින් ප්‍රොතැස්තන්ත ව්‍යාපාරය සහමුලින්ම විනාශ විය හැකි බවක් පෙනී ගියේය. මේ අතර ජර්මනියේ සිවිල් යුද්ධයක් හට ගත්තේය. දහස් ගණන් බැතිමත්හු තම රුධිරයෙන් සිය ඇදහිල්ල මුද්‍රා කළෝය. එසේම ප්‍රොතැස්තන්ත ව්‍යාපාරයෙහි ප්‍රබල අනුගාමික නායකයෙක් තම ව්‍යාපාරය පාවා දුන්නේය. ප්‍රතිසංස්කරණයට අත හිත දුන් ආගමික කුමාරවරු මේ අතර අගරජතුමාගේ ග්‍රහණයට හසු වූහ. සිරකරුවන් ලෙසින් ඔවුහු නගරයෙන් නගරයට ඇදගෙන යනු ලැබූහ. එහෙත් රජතුමාට විශාල ජයග්‍රහණයක් වූයේ යැයි පෙනී ගිය විටම අනපේක්ෂිත ලෙස ඔහුට පරාජයක් අත්විඳින්නට සිදු විය. රජතුමාගේ ඒකායන අපේක්ෂාව වී තිබුණේ ප්‍රතිසංස්කරණයේ දහම් තම රාජ්‍යයෙන් අතුගා දැමීමය. එහෙත් තමා මෙතෙක් ලද ජයග්‍රහණය තම හස්තයෙන් උදුරා ගනු ලබන්නේ යයි පෙනුණි. අකමැත්තෙන් වුවද, තමා අප්‍රසාදය පළ කළ දහම්වලට තවදුරටත් පක්ෂපාතීව සිටීමට එම ජනතාවට නිදහස දීමට ඔහුට සිදු විය. ප්‍රතිසංස්කරණයේ අසම්මත දහම් මුලිනුපුටා දැමීමට ඔහු තම රාජ්‍යයත්, තම සම්පත් සහ ජීවිතය පවා පරදුවට තබා ක්‍රියා කළේය. ඔහුගේ හමුදාව යුද්ධ නිසා විනාශයට පත්විය. ඔහුගේ භාණ්ඩාගාරය සිඳී යාමේ තර්ජනයක් පැවතුණි. ඔහු යටතේ වූ රාජධානි ඔහුට විරුද්ධව කැරලි ගැසීමට මාන බලමින් සිටියෝය. ඒ අතර, තමා මර්දනය කරන්නට වැයම් කළ දහම් වේදය ඉදිරියටම ඇදුණේය. V වන චාර්ල්ස් රජතුමා යුද්ධ ප්‍රකාශ කර සිටියේ සර්ව බලධාරී තැනැන්වහන්සේට විරුද්ධවය. "ආලෝකය වේවා"යි දෙවියන්වහන්සේ ප්‍රකාශ කර තිබූ අතර රජතුමා වැයම් කළේ අන්ධකාරය දිගටම පවත්වා ගෙන යෑමටය. ඔහුගේ අරමුණ ව්‍යර්ථ වී තිබුණේය. දිගුකාලීනව පැවති ගැටුම් නිසා හෙතෙම අකලට මහළු වී සිටියේය. මෙබඳු දිගුකාලීන පොර බැදීමකින් පීඩාවට පත්වූ ඔහු ඔටුන්න හැර දමා කුටියකට වැදී හුදෙකලාව දිවි ගෙවීමට පටන් ගත්තේය.

ජර්මනියේදී මෙන්ම ස්විට්සර්ලන්තයේදී ද ප්‍රතිසංස්කරණයට හිමි වූයේ අඳුරු යුගයකි. එහි සමහර පළාත්වල ජනතාව ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල පිළිගත් අතර, වෙනත් පළාත්වල ජනතාව රෝමානු ඇදහිලි ක්‍රමවේදයට අන්ධ ලෙසින් අවනතව දිවි ගෙවූහ. සත්‍යතාව පිළිගැනීමට කැමැත්තක් දක්වූ අයට එරෙහිව වධ හිංසා පැමිණවීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස එරට තුළ සිවිල් යුද්ධයක් හට ගත්තේය. ප්‍රතිසංස්කරණයේ දහම් පිළිගනිමින් ක්‍රියා කළ ස්වින්ග්ලි සහ ඔහුගේ සහෘදයන් බොහෝ අයද කැප්පෙල් පිටියේදී ජීවිතක්ෂයට පත්කරන ලදී. මෙම භයානක ව්‍යසනය නිසා හට ගත් කම්පනයෙන් ඊකොලැම්පේඩියස් ජීවිතක්ෂයට පත් විය. රෝමය විශාල ජයග්‍රහණයකට හිමිකම් කීවාය. නැතිවූ සියල්ල නැවත අත්පත් වේ යයි පෙනී යන්නට විය. එහෙත් සදාතනයේ සිට අනුශාසනා කරන්නාවූ තැනැන්වහන්සේ තමන් කර්තව්‍යය හෝ තමන් සෙනඟ හෝ අමතක නොකළ සේක. උන්වහන්සේගේ ශ්‍රී හස්තය ඔවුන්ට ගැළවීම සලසා දෙන්ට ක්‍රියාත්මක විය. වෙනත් රටවල මෙම ප්‍රතිසංස්කරණය ඉදිරියට ගෙන යෑම සඳහා උන්වහන්සේ සේවකයන් නැගිටවූ සේක.

ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස ලූතර්ගේ නම මිනිස් අවධානයට යොමු වීමටත් පෙර ප්‍රංශයෙහි දින උදාවෙන්නට විය. අරුණෝදයේ පහස ලැබූ ප්‍රථම තැනැත්තා වූයේ ලෙෆෙව්ර්ය. ඔහු මහළු වයසේ පසු වුවද, සිප් සතර උගත් අයෙක් විය. පැරිස් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙක් වූ හෙතෙම අවංකවූද, ජ්වලිතවූ ද පාප් සමය-වාදියෙක් විය. පුරාණ සාහිත්‍යය විෂය සඳහා වූ පර්යේෂණවලදී ඔහුගේ අවධානය ශුද්ධ බයිබලය වෙත යොමු විය. තම විෂය මාලා ශික්ෂණයේදී ඔහු ශුද්ධ බයිබලීය අධ්‍යයනය සිසුන්ට ලබා දුන්නේය. සාන්තුවරයන් කෙරෙහි දැඩි, භක්ති ප්‍රණාමයක් දක්වූ අයෙක්වූ ලෙෆෙව්ර් බැතිමතුන් අතරේ සැලකිල්ලක් දිනාගෙන සිටියේය. රෝම සභාවේ ප්‍රබන්ධ අනුව වූ නාම ලේඛනයට ඇතුළත් කර තිබූ සාන්තුවරයන්ගේ සහ වේදසාක්ෂිකරුවන්ගේ ඉතිහාසයක් සැකසීමට ලේෆෙව්ර් භාරගෙන තිබුණේය. මෙම ග්‍රන්ථය රචනා කිරීම සඳහා මහත් වෙහෙසක් දැරිය යුතුව තිබිණ. මේ වන විට ඔහු මෙය තරමක් දුරට ලියා හමාර කොට තිබුණේය. තමාගේ කෘතිය සඳහා කරුණු සැහෙන ප්‍රමාණයක් ශුද්ධ බයිබලයෙන් ලබාගත හැකි වේ යයි ඔහු අපේක්ෂා කළේය. එහි ශුද්ධවන්තයන් පිළිබඳව පුවත් සඳහන්ව තිබූ නමුත් රෝම සභා සාන්තුවරයින්ගේ දින දර්ශනයේ තිබූ නම් එකක්වත් ශුද්ධ බයිබලයේ ඇතුළත්ව තිබුණේ නැත. ඔහුගේ මනසට දිව්‍ය ආලෝකය ගලා එන්නට විය. මෙයින් විශ්මයටත් කලකිරීමටත් පත්වූ හෙතෙම තමා ස්වේච්ඡාවෙන් කරන්නට භාරගත් කර්තව්‍යය අතහැර දමා දෙවියන්-වහන්සේගේ වචනය හැදෑරීමට තීරණය කර ගත්තේය. ශුද්ධ බයිබලයෙන් සොයාගත් අගනා සත්‍යතාවයන් ඔහු තම සිසුන්ට උගන්වන්නට පටන් ගත්තේය.



ලූතර් හෝ ස්වින්ග්ලි හෝ ප්‍රතිසංස්කරණ දහම් පණිවිඩ ප්‍රකාශ කරන්නට පෙර 1512 දී ලේෆෙව්ර් මෙසේ ප්‍රකාශනයක් නිකුත් කළේය. "සදාතන දිවි පැවැත්ම උදාකර දෙන්නාවූ කරුණා-අනුග්‍රහය මගින් පමණක් මං සලසන්නාවූ ධර්මිෂ්ඨතාව ලබාදෙන්නේ දෙවියන්- වහන්සේ විසින් ඇදහිල්ල කරණකොටගෙනය." (Wylie, b. 13, Ch. 1) මිනිස් සත හට සාදා දෙන්නාවූ ගැළවීමේ අභිරහස් ගැන කථා කළ හෙතෙම මෙසේ පැවසීය. "අහෝ, එම හුවමාරුවේ ඇත්තේ වචනයෙන් විස්තර කළ නොහැකි අති උදාර මහිමාන්විතයකි! කිසිම පාපයක් නොකළ තැනැන්වහන්සේ වරදට පත්කරනු ලබන සේක, වරදකරුවා නිදොස් කොට මුදාහරිනු ලබයි. ආශිර්වාද ලත් තැනැන්වහන්සේ පාපයේ ශාපය විඳ දරාගත් සේක. ශාපයට යටත් වූ තැනැත්තේ ආශිර්වාදයට හිමිකම් කියයි. ජීවනයේ උල්පත මරණයට පත් කෙරේ, මරණයට ජීවත්වීමේ වරම් ලැබේ. තේජස්ශ්‍රීය මහිමාන්විතය අඳුරෙහි ගිලී යන්නේය, වියවුල මිස වෙනත් කිසිවක් නොදත් තැනැත්තේ තේජසින් පළඳවනු ලබන්නේය." (D. Aubigne, b. 12, Ch. 2).

ගැළවීමේ තේජස හිමි වන්නේ දෙවියන්වහන්සේට පමණක් බව ඉගැන්වූ හෙතෙම, කීකරුවීමේ වගකීම මිනිසාට හිමි වන බවද පැවසීය. තවදුරටත් ඔහුගේ ප්‍රකාශනයක මෙසේ සඳහන් වේ. "ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ සභාවෙහි සාමාජිකයෙක් නම්, ඔබ උන්වහන්සේගේ ශරීරයෙහි කොටස්කරුවකුද වන්නෙහිය. ඔබ උන්වහන්සේගේ ශරීරයෙහි කොටසක් නම්, ඔබ දිව්‍ය ස්වභාවයේ පූර්ණත්වයක් වන්නෙහිය. අහෝ, මනුෂ්‍යයාට මෙම වරප්‍රසාදය පිළිබඳව අවබෝධයකට යොමු වීමට භාග්‍යය උදා වේ නම්, ඔහු කෙතරම් ශුද්ධවන්තවූ ද, පවින් තොරවූ ද, භක්තියෙන් යුතුවූ ද, ජීවිතයක් ගත කරයිද! ඔවුන් තුළ ඇත්තාවූ තේජස හා සසඳන විට ඔවුන්ගේ ජීවිත රටාව කෙතරම් අශික්ෂිතද! එසේ නම්, මිනිසා ලෝකයේ යශෝරාවය හා කීර්ති පැසසුම් සොයා ගන්නේ වුවද එම අභ්‍යන්තරික තේජස මාංසමය ඇසට දැක ගැනීමට නොහැකිය. (D’ Aubigne, b. 12, Ch. 3).

ලේෆෙව්ර්ගේ දේශනාවලට සහභාගී වූ සමහර සිසුවෝ ඔහුගේ වදන් වලට උනන්දුවෙන් යුතුව සවන් දුන්නෝය. ඔහුව නිහඬ කරනු ලැබීමෙන් වසර ගණනාවකට පසුව මෙම ශිෂ්‍යයෝ සත්‍යතාවේ හඬ පතුරුවා හැරීමට ඉදිරිපත් වූවෝය. විලියම් ෆැරල් නමැත්තා එවැන්නෙකි. ශුද්ධවන්ත දෙමාපියන්ගේ පුතෙකු වීමේ භාග්‍යය ලැබූ හෙතෙම, සභාවේ ඉගැන්වීම් ප්‍රශ්න කිරීමකින් තොරව දේව වචන සේ පිළිගැනීමට අධ්‍යාපනය ලද්දේය. අපෝස්තුළු පාවුල් මෙන්ම ඔහුටද තමා ගැනම මෙසේ කීමට හැකියාවක් තිබිණ. "ඉතා දෘඪතර ලබ්ධිය අනුව මා ඵරිසියෙක්ව" දිවි ගෙවීමි. (ක්‍රියා 26: 5). රෝමානු සභාවෙහි ප්‍රබල බැතිමතෙකු වූ හෙතෙම, සභාවට විරුද්ධව ක්‍රියා කරන්නාවූ

සැවොම විනාශ කර දැමීමට තරම් ජ්වලිත භාවයෙන් දැවෙමින් සිටි පුද්ගලයෙක් විය. මෙම වකවානුවෙහි ඔහු ගත කළ ජීවිතය ගැන කථා කරන්නාවූ හෙතෙම මෙසේ ප්‍රකාශ කළේය. "යම්කිසි අයෙක් පාප්ට විරුද්ධව වචනයක් හෝ කථා කළේ නම්, මම කේන්තියෙන් කෝපාකුලවූ වෘකයෙකු මෙන් දත්මිටි කෑවෙමි." (Wylie, b. 13, Ch. 2). ඔහු වෙහෙස මහන්සි නොබලා සාන්තුවරයන්ට ගරු බුහුමන් පුදමින් නමස්කාර කළේය. ලෙෆෙවර් සමග එකතු වූ හෙතෙම පැරිසියේ තිබූ දෙව් මැදුරු වෙත යමින් අල්තාර ඉදිරියෙහි දණ නමමින්, ශුද්ධ වූ පූජනීය භාණ්ඩ ඉදිරියෙහි අගනා තුති පඬුරු පුද කරමින් කටයුතු කළේය. නමුත් මෙවන් වතාවත් නොපිරිහෙලා ඉටු කළද ඔහුගේ සිතට සමාදානය උදාවුණේ නැත. තමා පව්කාරයෙකු යයි ඔහුගේ සිත වධ දෙන්නට විය. පාපයට දඬුවම් පමුණුවා ගනිමින් කළ ක්‍රියාවන් මගින් පවා සිත්හි තැවීම පහ නොවීය. සගයෙන් පැමිණි හඬක් ලෙසින් ඔහු පුනරුදවාදියාගේ මේ හඬට සවන් යොමු කළේය. "ගැළවීම උදා වන්නේ දේව කරුණා-අනුග්‍රහය මගින් පමණක්ය. අහිංසක තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය, අපරාධකාරයා නිදහස් කර හරිනු ලබන්නේය. සගයේ දොරටු විවෘත කිරීමට හැකියාව ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියට පමණක්ය. එමගින්ම නරකාදියේ දොරටුද වසා දමනු ලබන්නේය."

විලියම් ෆැරල් මහත් ප්‍රීතියෙන් යුතුව සත්‍යතාව වැළඳ ගත්තේය. පාවුල් මෙන් සංවර්තනයක් (හැරීමක්) අත්දුටු හෙතෙම සම්ප්‍රදායික වතාවත් කෙරෙහි වූ බන්ධනයෙන් මිදී දේව දරුවන්ගේ නිදහසෙහි පහස ලබා ගත්තේය. තම අත්දැකීම ඔහු මෙසේ තම වචනයට නැගුවේය. "බඩගින්නෙන් වියරු වැටී සිටි වෘකයෙකු මෙන් කෝපා-විෂ්ඨව තිබූ මාගේ හදවත එයින් මිදීම ලබා වැඩි සෝෂාවක් කරන්නේ නැතිව මුදු මොළොක් සහ අහිංසක බැටළුවෙකුගේ හදවතක් ලෙස හැරීමකට පත් විය. පාප් කෙරෙහි වූ ළබැදියාවෙන් මුළුමණින්ම ඉවත් වී මම එම හදවත යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ භාරයට කැප කළෙමි." (D. Aubigne, b. 12, Ch. 3).

ලේෆෙවර් තම සිසුන් අතර ආලෝකය පතුරුවා හැරීමේ කර්තව්‍යයෙහි නිරත විය. ඒ අතර, පාප් කෙරෙහි ඉමහත් ජ්වලිත භාවයකින් යුතු ලැදියාවක් දැක්වූ ෆැරල් තම ක්‍රියා මාර්ගය වෙනස් කොට ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජ්වලිතයෙන් පිරී මහජනතාව අතරට ආලෝකය ගෙන ගියේය. සභාවෙහි ප්‍රභූ බලධාරියෙකු වූ මේයෝහි බිෂොප්වරයාද මෙම ප්‍රතිසංස්කාරකයන් දෙදෙනා සමග අත්වැල් බැඳ ගත්තේය. තමන්ගේ හැකියාවන් සහ උගත්කම පිළිබඳව ඉහළ තනතුරු දරූ ප්‍රභූවරුද ශුභාරංචිය පතුරුවා හැරීමේ කර්තව්‍යයට එකතු වූහ. කම්කරුවන් මෙන්ම ගොවි වැසියන්ද, රදළවරුන් මෙන්ම රජ මැඳුරේ අයද ශුභාරංචිය පිළිගත් අය අතර වූහ. ඔටුන්න හෙබ වූ I වෙනි ප්‍රැන්සිස් රජුගේ සොහොයුරිය ද ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල වැළඳ ගත්තාය. රජතුමා සහ මව් බිසවද ඒ දහම් කෙරෙහි කලක් ප්‍රසාදය දැක්වූහ. මහත් බලාපොරොත්තු ඇතිව සිටි ප්‍රතිසංස්කාරකයෝ මුළු ප්‍රංශයම ශුභාරංචිය වෙත දිනාගනු ලබන කාලය ප්‍රීතියෙන් අපේක්ෂා කළහ.



එහෙත් ඔවුන්ගේ බලාපොරොත්තු ඉටු නොවන බව පෙනී යන්නට විය. ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන්ට එරෙහිව නඩු විභාග සහ හිංසා පීඩා සූදානම් කොට තිබුණේය. එහෙත් මෙම අනාගතය ඔවුන්ගේ දෑස්වලින් වසන් කර තිබුණේය. සාමයේ කාලයක් උදා වී තිබුණේය. කුණාටුවට මුහුණ දීම සඳහා ශක්තිමත්ව සිටීමට ඒ කාලය ඔවුන්ට ලබා දී තිබුණේය. ඒ අතර ප්‍රතිසංස්කරණය සීඝ්‍රයෙන් වර්ධනය වන්නට විය. මේයෝහි බිෂොප්වරයාද ඉමහත් උනන්දුවකින් යුක්තව තම බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෙමින් පැවිදි පක්ෂය හා අනෙක් ජනතාව අතර ප්‍රතිසංස්කරණයේ දහම් කියා දුන්නේය. දැනුමක් නොතිබූ පූජකවරුද දුරාචාරයෙහි යෙදෙන්නාවූ පූජකවරුද ඉවත් කරනු ලැබූහ. ඔවුන් වෙනුවෙන් උගත්, ශ්‍රද්ධාව ඇති පුද්ගලයන් යොදවා ගනු ලැබිණි. දේව වචනය පුද්ගලිකව කියවීමේ වරප්‍රසාදය ජනතාවට ලබාදීමට බිෂොප්වරයා තුළ මහත් ආශාවක් විය. එම අභිලාෂය ඉතා ඉක්මණින් ක්‍රියාත්මක විය. ලෙෆෙවර් අළුත් ගිවිසුම පරිවර්තනය කිරීමේ කාර්යය භාර ගත්තේය. ලූතර්ගේ ජර්මානු බයිබලය විටන්බර්ග් මුද්‍රණාලයෙන් පිටවෙනවාත් සමගම මේයෝහිදී ප්‍රංශ අලුත් තෙස්ත-මේන්තුව ප්‍රකාශනයට පත් විය. තම බල ප්‍රදේශයෙහි සිටි බැතිමතුන් අතර ප්‍රංශ බයිබලය බෙදා හැරීමට බිෂොප්වරයා තම ශ්‍රමය සහ මුදල් වැය කිරීමට මැළි වුණේ නැත. වැඩි දවසක් ගත වීමට පෙර ශුද්ධ ලියවිල්ල මේයෝහි ගොවීන් අතට පත් විය.

පිපාසයෙන් පෙළෙන්නාවූ මගීන්, ගලා යන්නාවූ දිය උල්පතක් දකීමෙන් මහත් ප්‍රීති ප්‍රමෝදයකට පත්වන්නාවූ ආකාරයකින් දේව වචනය ගැන පිපාසාවෙන් සිටි මේයෝහි දුගී ජනතාව එම පොත් සගයෙන් ලැබූ ජීවන පැන් ලෙස පිළිගත්තෝය. කෙතෙහි වැඩ කළ ගොවියාත්, කම්මලෙහි සේවය කළ කාර්මිකයාත් වැඩෙහි යෙදී සිටි අතරේදී බයිබලයෙහි අන්තර්ගත සත්‍යතාවන් ගැන කථා බහ කර ගනිමින් වෙහෙස සමනය කර ගත්තෝය. දෛනික වැඩ කටයුතු හමාර වී මුද්‍රික පානය සඳහා බීම සැල් වෙත නොගොස් තම තමන්ගේ ගෙවල් කරා පා නැගූ කම්කරු ජනතාව දෙවියන්වහන්සේගේ වචනය කියවමින්, යාච්ඤාවේ යෙදෙමින්ද, පසස් ගී ගයමින්ද එක්ව ක්‍රියා කළෝය. මෙම ප්‍රජාවන් අතර මහත් වූ වෙනස්කම් දකගැනීමට හැකි විය. වැඩි උගත්කමක් නොතිබූ, වෙහෙස මහන්සිව වැඩ කළ මෙම දුගී ජනතාවගේ ජීවිත තුළ දිව්‍ය කරුණා-අනුග්‍රහයේ වෙනස් කිරීමේ සහ නහාලීමේ බලය විද්‍යමාන විය. නිහතමානී ආදරයෙන්

යුතු ශුද්ධ ජීවිත ගත කළ මෙම ජනතාව, අවංකවම ශුභාරංචිය ඔවුන්ගේ ජීවිත තුළට පිළිගත් විට ඇතිවන ගුණාත්මක වෙනස්වීම ගැන ප්‍රබල සාක්ෂිකරුවන් ලෙස නැගී සිටියෝය.

මේයෝහි දල්වන ලද ආලෝකය ඈත එපිට ගම් දනව් කරාද පැතිර ගියේය. සත්‍යයට සංවර්තනය වන්නාවූ (හැරෙන්නාවූ) අය දිනපතාම ගණනින් වැඩි වන්නට විය. පාප් සභාවේ බලධරයන්ගේ දැඩි උදහස රජතුමා විසින් කලකට බෙලහීන කර තිබුණේය. තමන්ගේම මනසෙහි එල්බ සිටින්නාවූ පටු අවිචාර බුද්ධියෙන් යුත් පූජකයන්ගේ ක්‍රියා කලාපය රජුගේ මනාපයට හේතු නොවීය. පූජකයන් දැඩි ක්‍රියා මාර්ගයකට නොපැමිණියේ මේ හේතුව නිසාය. එහෙත් අවසානයේදී පාප් බල අධිකාරීහු ක්‍රියාත්මක වන්නට වූහ. ගිනි පූජා සඳහා මිනිසුන් බැඳ දැමීමට කණු සිටුවන ලදී. මේයෝහි බිෂොප් තුමාට ගිනිබත් වීම හෝ උගන්වන ලද ඇදහිලි ක්‍රම වේදයන් අත්හැරීම අතර තෝරා ගැනීමක් කිරීමට අධිකරණ නියමයක් විය. බිෂොප් තුමා පහසු මාර්ගය තෝරා ගත්තේය. නායකයාගේ ඇද වැටීමක් සිදුවූවද, ඔහුගේ රැළ නොසැලී සිටියේය. තමන් අවට ගිනි දැල් පැවති විට පවා බොහෝ අය සත්‍යතාව වෙනුවෙන් සාක්ෂි දැරූහ. ගිනි මැළය මැද සිටියදී ඔවුන් දැක්වූ දිරිමත්කම සහ පක්ෂපාතීකම හඬ නගා කීවේ තමා සත්‍යය පාවා දෙන්නේ නැති බවට ගත් තීරණයයි. ගින්නට ගොදුරු කරනු ලැබීමේදී ඔවුන් දැක්වූ විශ්වාස-වන්තකම මගින්, සාමයේ දවස්වලදී ඔවුන්ගේ සාක්ෂිය නොඇසූ දහස් ගණන් ජන සමූහයකට ඔව්හු ශුභාරංචි සත්‍යතාව අවධාරණය කළෝය.

නින්දාවන් හා හිංසා පීඩා මධ්‍යයේ ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සාක්ෂි දැරීමට අභීතව ඉදිරිපත් වූවෝ යටහත් පහත් දුගී අය පමණක් නොවීය. වංශාධිපතීන් හා රාජකීය ප්‍රභූන් වාසය කළ රජ මාළිගාවෙහි සහ බලකොටුවෙහි සිටි සමහර අය තම වස්තුවට හෝ තනතුරට හෝ ජීවිතයට හෝ වැඩියෙන් සත්‍යතාව අගය කළෝය. ලෝගුව සහ පාදර්ශක මකුටය පැළඳ සිටි බිෂොප් තුමාගෙන් ප්‍රදර්ශනය වූ නිර්භීත භාවයට වඩා උදාරවූ ද නොසැලෙන්නාවූ ද ආත්මයක් රාජකීය යුද්ධ හැට්ටය වසාගෙන සිටියේය. ලුවී බර්කුවීන් නමැත්තා ප්‍රභූ පෙළපතකින් පැවත එන්නෙක් විය. රජුගේ ආරක්ෂක මුළාදෑනියෙක් වූ ඔහු නිර්භීත අයෙක් විය. ඔහු ඉගෙනීමට ලැදියාවක් දැක්වූ, ඉතා ශිෂ්ට සම්පන්නවූ, නොකැළැල් චරිතයක් තිබූ කුලවතෙක් විය. එක්තරා ලේඛකයෙක් ඔහු පිළිබඳව මෙවන් සටහනක් තබා ඇත. "පාප් අධිකාරී ව්‍යවස්ථාවන් අනුගමනය කිරීමට මහත් ලැදියාවක් දැක්වූ මෙම යුද්ධ නිලධාරියා සත් ප්‍රසාද පූජාවනට සහභාගි වීමටත් ආගමික දේශනවලට සවන් දීමටත් උපන් පුද්ගලයෙක් විය. ඔහු ලූතරන් වාදය කෙරෙහි දැක්වූයේ මහත් පිළිකුල්තාවකි. තවත් බොහෝ



අය මෙන් ශුද්ධ බයිබලය වෙත දේවානුභාවයෙන් මග පෙන්වනු ලැබීමත් සමගම ඔහුද විශ්මයෙන් දුටුවේ බයිබලයේ ඇත්තේ රෝමානු ධර්මතාවන් නොව ලූතර්ගේ ධර්මතාවන් බවය. (Wylie, b. 13, Ch. 9) මෙතැන් පටන් හෙතෙම ශුභාරංචි ව්‍යාප්තිය සඳහා තම ජීවිතය කැප කළේය.

"ප්‍රංශයේ වංශාධිපතීන් අතර ඉහළම අධ්‍යාපනය ලබා සිටියාවූ පුද්ගලයා" ලෙස ලුවී බර්කුයින් ප්‍රසිද්ධිය ලබා සිටියේය. ඔහුගේ උත්කෘෂ්ට සහජ බුද්ධි ප්‍රභාව සහ ව්‍යක්ත භාවයත් ඔහුගේ යටත් කළ නොහැකි ධෛර්යය සහ වීර වික්‍රමාන්විත උද්‍යෝගයත්, රාජ සභාව ඇතුළත ඔහුට තිබූ අනුබලයත්, රජතුමාගේ විශේෂ වරප්‍රසාදවලට හිමිකම් කිවූ තැනැත්තෙකු ලෙසත්, ඔහුට තිබූ ආශිර්වාදයන් නිසාම හෙතෙම ප්‍රංශයේ ප්‍රතිසංස්කාරක නායකයා වීමට ඉරණම් වී ඇතැයි බොහෝ අය කල්පනා කළහ. බීසා නමැති ලේඛකයා මෙසේ ලියා තිබේ. "ලූතර්ට ආදිපාද තුමාගෙන් ලැබුණු සහාය බර්කුයින්ට I වන ප්‍රැන්සිස් රජතුමාගෙන් ලැබුණේ නම් ඔහු දෙවෙනි ලූතර් කෙනෙකු වනවා ඇත." ඔහු "ලූතර්ටත් වඩා කරදරකාර කෙනෙක් ය"යි ප්‍රංශයේ පාප් වාදීහු බර්කුයින් ගැන එක හඬින් කියා සිටියෝය. ඔවුහු බර්කුයින්ව අත් අඩංගුවට ගෙන සිරගෙයි දැම්මෝය. එහෙත් රජතුමා ඔහුව නිදහස් කළේය. වසර ගණනාවක්ම මේ අරගලය පැවතුණේය. රෝමය සහ පුනරුද ව්‍යාපාරය අතරේ ප්‍රැන්සිස් අතරමං විය. හෙතෙම එක් වාරයකදී රෝම තපස් පැවිද්දන්ට සිය අදහස් ඉටු කරගන්නට ඉඩ හැරියේය; තවත් වරෙක බර්කුයින්ට නිදහසේ තම කටයුතු කරගෙන යාමට ඉඩ හැරියේය. පාප් නිලධාරීන් විසින් බර්කුයින්ව තුන්වරක්ම සිරගෙට යවන ලදී. ඒ සෑම අවස්ථාවකදීම රජතුමා ඔහුව නිදහස් කළේය. බර්කුයින්ගේ සහජ බුද්ධි ප්‍රභාව සහ ජීවිතයෙහි නො-කැළැල්කමත් අගය කළ රජතුමා ඔහුව රෝමානු නායකයන්ගේ අධිකාරී බලයට පාවා දීම ප්‍රතික්ෂේප කළේය.

ප්‍රංශයේදී මුහුණ පෑමට සිදුවිය හැකිවූ අනතුරු ගැන බර්කුයින්ව දැනුවත් කරන ලදී. ඔහුට එල්ල වී තිබූ මරණීය තර්ජනද ඔහු දැන සිටියේය. සිය කැමැත්තෙන්ම ප්‍රංශයෙන් පිටවී ගොස් වෙනත් රටක රැකවරණය සෙවූ අය මෙන් ක්‍රියා කරන්නැයි ඔහුට අවවාද කළ අය බොහෝ දෙනෙක් වූහ. ඉරැස්මස් වනාහි බයාදු ගති ඇති, තත්ත්වය අනුව ක්‍රියා කළ පුද්ගලයෙක් විය. ඔහු ඉතා බුද්ධිමත් ප්‍රවීනයෙක් විය. ජීවිතයට සහ ගෞරවයට වඩා සත්‍යතාවය අගය කිරීමේ සුචරිතානුකූල උතුම් ගුණාංග ඔහු තුළ නොතිබුණි. ඔහු බර්කුයින්ට මෙසේ ලිපියක් යැව්වේය. "තානාපතිවරයෙකු වශයෙන් විදෙස් රටකට යවන්නැයි ඉල්ලන්න. ජර්මනියට ගොස් එහි ඇවිද බලන්න. බීඩා වැනි අය ඔබ හොදින් දන්නවා ඇති ඔහු වනාහි හිස් දහසකින් යුත් රාක්ෂයෙකි. ඔහු සෑම අතකටම විෂ රැගත් හී සැර විදින්නාවූ

භූතයෙකි, දුෂ්ටයෙකි. ඔබට ඉන්නාවූ සතුරෝ අති විශාලය. ඔබ ඉටු කරන්නාවූ කාර්ය භාරය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවයට වඩා උසස් එකක් වී නම් ඔබගේ සතුරන් ඔබව සහමුලින්ම විනාශ නොකර යන්නට ඉඩ හරින්නේ නැහැ. රජතුමාගේ රැකවරණය කෙරෙහි දැඩි විශ්වාසයක් තබන්න එපා. දේව ධර්ම ශාස්ත්‍ර පීඨයට මාව ඇද ගන්න එපා. (Wylie, b. 13, Ch. 9).

අනතුරු තර්ජන වර්ධනය වෙත්ම බර්කුයින්ගේ ජ්වලිත භාවයද දියුණු විය, තව තවත් ශක්තිමත් විය. ඉරැස්මස්ගේ දූරදර්ශී සහ ස්ව-ආත්මයට සේවයක් කරගැනීමේද, තම යහපතට මුල් තැන දෙමින් ක්‍රියා කිරීමේද ක්‍රමවේදය අනුගමනය කරන්නේ නැතිව, එයට වඩා දැඩි ලෙස ක්‍රියා කිරීමට ඔහු අධිෂ්ඨාන කර ගත්තේය. සත්‍යතාව රැකගැනීමට පමණක් ක්‍රියා කරන්නේ නැතිව නිර්ධය ලෙස වරදට විරුද්ධව සිටීමටද ඔහු තීරණය කර ගත්තේය. ඔහු මත වරද පැටවීම සඳහා ගොනු කළ චෝදනා පත්‍රයෙන් එල්ල කළ ධර්ම විරෝධී මිථ්‍යා ඉගැන්වීම් පෙරළා රෝමානුවන් වෙතටම එල්ල කිරීමට ඔහු අදිටන් කර ගත්තේය. ඔහුට එරෙහිව ක්‍රියාත්මක වූ ඉතා ප්‍රබල විරුද්ධවාදීන් වුණේ පැරිස් විශ්ව විද්‍යාලයේ දේව ධර්ම පීඨයේ මහාචාර්යවරුන් සහ පැවිදි ආචාර්යවරුන්ය. මේ විශ්ව විද්‍යාලය එම නගරයෙහි මෙන්ම මුළු රටේම ආගමික විෂයන් සම්බන්ධයෙන් ඉතා උතුම් තත්ත්වයක පැවතුණි. මෙම මහාචාර්යවරුන්ගේ ප්‍රකාශන කෙරෙන් උපුටාගත් ඉගැන්වීම් සහ මත ප්‍රකාශන දොළසක් මගින් ගොඩ නගා ගත් විරෝධතා ප්‍රකාශන පත්‍රයක් බර්කුයින් සකසා ගත්තේය. එම දහම් තීරණයන් ශුද්ධ බයිබලයට පටහැනි බවත් ආගම් විරෝධී බවත්" ඔහු ප්‍රසිද්ධියේ කියා සිටියේය. මෙම මත අරගලයේදී විනිශ්චයකරු හැටියට ක්‍රියා කරන ලෙස ඔහු රජතුමාගෙන් ඉල්ලා සිටියේය.

විරුද්ධවාදී වීර පාර්ශ්ව දෙකක් අතර බලය හා දස්කම් උරගා බැලීමේ සටනක් ගැන රජතුමා වැඩි කැමැත්තක් නොදැක්වුවද, මෙම අහංකාර පැවිද්දන්ගේ උද්දාම මත බිඳ දැමීමට ලැබුණු අවස්ථාව ගැන ප්‍රීතියට පත්ව, තම ඉගැන්වීම් බයිබලය ආශ්‍රයෙන් තහවුරු කරන ලෙස ඔහු රෝමානුවන්ට ආරාධනා කළේය. මෙම ආයුධය මගින් තමාට වාසියක් නොලැබෙන බව ඔවුහු දැන සිටියහ. සිරගෙයි දැමීම, වධහිංසා පැමිණවීම, කණුවකට බැඳ ගිනි පූජාවන් කිරීම ඔවුන්ට හුරු පුරුදු ආයුධ විය. දුර්ලබ්ධි චෝදනා දැන් කණපිට පෙරලුණි. බර්කුයින්ව ඇද දැමීමට කැපූ වළෙහි දැන් තමන්ව වැටෙන්නට යන්නේ යයි බියකින් ඔවුහු වෙලී ගියෝය. විමතියට පත්ව සිටි ඔවුහු එයින් ගැළවී යාමට මාර්ගයක් සෙවූහ.



කරුණු මෙසේ උණුසුම්ව පැවැති අවස්ථාවේදී එක්තරා වීදියක තිබූ කන්‍යා මරියාගේ සුරුවමක් විනාශ කර දමනු ලැබ තිබුණි. "නගරය පුරා දැඩි අසහනකාරී තත්ත්වයක් උදා විය. විශාල ජන සමූහයක් එම ස්ථානයට එක් රොක් වූහ. ඔවුන්ගේ හැඟුම්බර මුහුණු තුළ කෝපය හා වැලපීම දැවෙමින් තිබුණේය. මෙම පුවතින් රජතුමාද කම්පාවට පත් විය. මෙම සිද්ධිය තමන්ගේ යහපතට සහ වාසියට හරවා ගැනීම උචිත යයි තීරණය කරගත් පාප්වාදීහු එම සැලැස්ම දියුණු කරගැනීමට සාකච්ඡා කළෝය. "බරකුයින්ගේ දහම්වල ප්‍රතිඵල මෙන්න" යයි ඔවුහු මොර දුන්හ. "ලූතර්වාදීන්ගේ මෙම කුමන්ත්‍රණය මගින් සියල්ලක්ම විනාශයට යොමු වෙනවා ඇත. එසේය ආගම, නීතිය සහ සිංහාසනය පවා ඇද වැටෙනවා නියතය."යි ඔව්හු මොර ගැසූහ. (Wylie, b. 13, Ch. 9).

බර්කුයින්ව නැවත වරක් අත්අඩංගුවට ගන්නා ලදී. රජතුමා පැරිසියෙන් නික්ම ගියේය. තමා කැමති පරිදි ක්‍රියා කිරීමට රෝමානු පැවිද්දන්ට නිදහස උදා විය. නඩු විභාගයකින් පසුව බර්කුයින්ව මරා දැමීමට තීරණය විය. යම්කිසි අයුරකින් රජතුමා පැමිණිය හොත් තීන්දුව ක්‍රියාත්මක කිරීමට නොහැකි වේ යයි සිතූ රෝමානු බලධරයෝ තීන්දුව දුන් දිනයේදීම බර්කුයින් මරා දැමූහ. මධ්‍යම දවාලේදී බර්කුයින්ව මරණය සිදුකරන ස්ථානය වෙත රැගෙන යන ලදී. සිද්ධිය දැක බලාගැනීමට විශාල පිරිසක් පැමිණ සිටියෝය. මරණ තීන්දුව ලැබූ තැනැත්තා දැකීමෙන් ඔවුහු තුෂ්නිම්භූත වූවෝය. ඔවුන්ගේ සිත් භීතියෙන් හා සැකයෙන් ඇලලී ගියේය. ප්‍රංශයේ සිටි ඉතා යහපත්වූ ද, නිර්භීතවූ ද පවුලක සාමාජිකයෙකුට මෙවන් ඉරණමක් අත්වීම ගැන තම ඇස් අදහා ගැනීමට ඔවුන්ට නුපුළුවන් විය. විශ්මය, භීතිය, කෝපය, පරිභවය, බද්ධ වෛරය සහ මහත් පිළිකුලක් නිසා ඔවුන්ගේ මුහුණු කළු පැහැගැන්වී තිබුණේය. එහෙත් එක් මුහුණක පමණක් අඳුරු සේයා රැඳී නොතිබුණේය. මේ වේදසාක්ෂිකයා තමා අවට සිදුවන්නාවූ දැයින් කැලඹීමකට පත් නොවීය. ස්වාමීන්-වහන්සේ තමා සමග සිටින බව ඔහු දැනගත්තේය.

මරණයට තීන්දු කරනු ලැබූ ඔහුව ගෙන ගිය රථය මාවත දිගේ ගමන් ගත්තාවූ අතර තමාට චෝදනා නැගූ පාක්ෂිකයන්ගේ රැවුම් ගැරවුම් ඔහු වෙත එල්ල වුවද, භයානක මරණයකට ඔහු මුහුණ දිය යුතු වුවද ඔහුගේ මානසික සාමය බිඳ හෙළීමට ඒ කිසිවක් සමත් නොවීය. ජීවත්ව සිටියාවූ ද, මරණයට පත්වූවාවූ ද, එහෙත් තවදුරටත් ජීවත්ව සිටින්නාවූ ද තැනැන්වහන්සේ තමන් සමග එතැන වැඩ සිටින බව ඔහු දැන සිටියේය. මරණයේ සහ පාතාලයේ යතුරු ඇති තැනැන්වහන්සේගේ අභිමුඛය ඔහු සැමට වඩා අගය කළේය. සගයෙන් වූ සමාදානයෙන් ඔහුගේ වත දීප්තිමත්ව බැබළෙමින් තිබුණේය. මරණය කරා පිය නැගූ හෙතෙම කඩවසම් ලෙස ඇඳ පැළඳ සිටියේය.

"ඔහු විල්ලුද සැට්ටයක් හැඳ, සැටින් රෙද්දෙන් නිම කළ කොට කබායකින් සැරසී, රන් නූලෙන් ගෙත්තම් කළ දිග මේස් දෙකක්ද පැළඳ ගෙන සිටියේය. (D. Aubigne, "History of the Reformation in Europe in the time of Calvin," b. 2, Ch. 16). රජුන්ගේ රජ වන රාජෝත්තමයාණන් ඉදිරියෙහිද, බලා සිටින්නාවූ සකල විශ්වීය මිනිසුන් ඉදිරියෙහිද තමාගේ ඇදහිල්ල පිළිබඳව සාක්ෂි දරීමට හෙතෙම සූදානමින් සිටියේය. ඔහුගේ ප්‍රීතිය අඳුරු කිරීමට කිසිම ආකාර හඬා වැටීමක් නොවීය.

සිරකරුවා රැගත් පෙරහැර සෙනඟ පෙළ ගැසී සිටි වීදි දිගේ ඉදිරියට ඇදෙත්ම ඔහුගේ මුහුණෙහි තිබූ සාමයේ හා ප්‍රීතිමත් ජයග්‍රහණයේ පෙනුමත්, ඔහුගේ සිරුර පුරා තිබූ සන්සුන් තැන්පත් දසුනත් සැමගේ විශ්මයට හේතු විය. කෙනෙක් මෙසේ කීවේය: "දේවස්ථානයක වාඩි වී ශුද්ධ වූ දේ පිළිබඳව භාවනා කරන්නාවූ අයෙකු සේ ඔහුගේ පෙනුම ශාන්තය." (Wylie, b. 13, Ch. 9).

කණුවට බැඳ දමා ගිනි දල්වීමට පෙර සෙනඟට වචන ස්වල්පයක් පැවසීමට බර්කුයින් වෑයම් කළේය. එයින් ඇති විය හැකි ප්‍රතිඵලය භයානක විය හැකි බව දුටු පූජකයෝ සෝෂා කිරීමට පටන් ගත්හ; සොල්දාදුවෝ තම යුද්ධායුධ එකිනෙකට ගසන්නට පටන් ගත්හ. ඔවුන්ගේ අධික ශබ්ද කිරීම් මගින් වේද සාක්ෂිකයාගේ හඬ යටපත් විය. මරණය අභියස පෝරකය පාමුල ලෑල්ල මත නැගී සිටින්නාවූ අවස්ථාවේදී අන්තිම ප්‍රකාශයක් කිරීමට අවසර නොදීමේ ජන මතය ස්ථාපිත කරන ලද්දේ 1793 දීය. ඒ සඳහා ආදර්ශයක් තබන ලද්දේ බර්කුයින්ගේ වේද සාක්ෂි මරණයත් සමගය. ඒ අනුව 1529 දී ශිෂ්ට ප්‍රබුද්ධ පැරිසියේ උගත් ආගමික අධිකාරිය බර්කුයින්ට එම අවස්ථාව නොදීමෙන් අශිෂ්ට ආදර්ශයක් ලබා දුන්නේය. (Wylie, b. 13, Ch. 9).

බර්කුයින්ගේ ගෙල හිර කොට ඔහුගේ සිරුර ගිනිමැලයට දමන ලදී. ඔහුගේ මරණය පිළිබඳ පුවත ප්‍රංශය පුරා සිටි ප්‍රතිසංස්කරණයේ මිතුරන්ගේ සාතිශය සංවේගයට හේතු විය. එසේ වුවද, ඔහුගේ ආදර්ශය කිසිවෙකුට හෝ අමතක නොවීය. සත්‍යය වෙනුවෙන් සාක්ෂි දරන්නාවූ අය මෙසේ කීවෝය: "මතු පැමිණෙන්නාවූ ජීවිතය දෙස අපගේ දෑස් රඳවා තබා ගෙන සතුටින් යුතුව මරණයට මුහුණ දීමට අපත් සූදානම්" (D' Aubigne, "History of the Reformation in Europe in the time of Calvin, b. 2, Ch. 16).

මේයෝ පෙදෙසෙහි පැවති හිංසා පීඩා සමයේදී ප්‍රොතැස්තන්ත දේවගැතිවරුන්ට දේශනා කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් නොවීය. එහෙයින් ඔව්හු වෙනත් ප්‍රදේශවලට ගියහ. ටික කලකට පසුව ලෙෆෙවර්



ජර්මනිය බලා පිටත්ව ගියේය. ෆැරල් තමාගේ උපන් ගම පිහිටි නැගෙනහිර ප්‍රංශය වෙත පැමිණියේය. තමා ළමා කාලය ගත කළ නගරය වෙත පැමිණි හෙතෙම එහි ශුභාරංචිය පතුරුවා ලීමෙහි නිරත විය. මේයෝ පෙදෙසෙහි සිදුවන්නාවූ දේ පිළිබඳව වූ පුවත් මෙහිදී පතළ වී තිබුණි. එහෙයින් ෆැරල්ගේ දේශනා ඇසීමට බොහෝ දෙනෙක් පැමිණියහ. එහෙත් මේ සහභාගිත්වය බලධරයන්ගේ උදහසට හේතු විය. දේශනාකරුවාව නිහඬ කිරීමට රෝමානුවෝ වෑයම් කළෝය. එහි ප්‍රතිඵලයක් ලෙස ෆැරල්ව එම නගරයෙන් පිටුවහල් කරන ලදී. ප්‍රසිද්ධියේ ශුභාරංචිය ඉගැන්වීමට වරම් නොතිබූ හෙතෙම ගම් නියම්ගම් තරණය කරමින් පුද්ගලිකව ගෙවල් වෙත යමින් ශුභාරංචිය කියා දුන්නේය. ලාබාල වියෙහි යහළුවන් සමග සෙල්ලම් කළ වන ලැහැබ සහ කඳු අතර සැරිසරමින් ඔහු එහි වූ බිංගෙවල රාත්‍රිය ගත කළේය. වඩා මහත් පීඩාවන්ට මුහුණ දීමට දෙවියන්වහන්සේ ඔහුව සූදානම් කළසේක. ඔහු මෙසේ පැවසුවේය. "කුරුසි, හිංසා පීඩා, සහ සාතන්ගේ උපක්‍රමශීලී ක්‍රියාදාමයන් අඩුවූයේ නැහැ. මට ලැබුණු පීඩාවන් මාගේ ශක්තියෙන් දරා ගැනීමට නොහැකි තරම් දරුණුයි. එනමුත් දෙවියන්වහන්සේ මාගේ පියාණන් වනසේක. මට උවමනා කරන්නාවූ ශක්තිය උන්වහන්සේ මට මෙතෙක් කල් ලබාදී තිබෙනවා. අනාගතයේදීත් නිතරම එසේ ශක්තිය සපයා දෙන බව මට සහතිකයි." (D. Aubigne, b. 12, Ch. 9).

අපෝස්තුළුවරුන්ගේ කාලයේදී මෙන්ම, හිංසා පීඩා, වධ වේදනා මගින් සිදුවූ ශාන්තිය නම්, සෑම දෙයක්ම ශුභාරංචියේ වර්ධනයට ඉවහල් වීමය. (පිලිප්පි 1:12). පැරිසියෙන් හා මේයෝ නගරයෙන් "විසිරවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය." (ක්‍රියා 8: 4). මෙසේ සත්‍යතාවේ ආලෝක දහරා ප්‍රංශයේ ඈත පිහිටි ගම් දනව් කරා පැතිර ගියේය.

තමන්වහන්සේගේ කාර්යය ව්‍යාප්ත කිරීම සඳහා දෙවියන්වහන්සේ තවදුරටත් සේවකයන් පුහුණු කරමින් සිටිසේක. පැරිසියේ එක්තරා පාසලක එක් දක්ෂ සිසුවෙක් ඉගෙනුම ලබමින් සිටියේය. ඉතා බුද්ධිමත් සිසුවෙකු වූ හෙතෙම තීක්ෂණ ඥානයක් සහ කඩිනමින් කරුණු වටහා ගැනීමේ හැකියාවක් තිබූ සමතෙක් විය. වැඩි කලබලකාරී ස්වභාවයක් නොතිබූ ඔහු ඉතා ප්‍රබල මනසකින්ද ඉතා යහපත් චරිතයකින්ද සැමගේ හදවත් දිනාගත් අයෙක් විය. ඔහු ආගමට ඉතා ලැදි අයෙක් විය. ඔහුගේ සහජ බුද්ධි ප්‍රභාවත්, විෂය නිර්දේශ කිරීම සඳහා වූ ඇල්මත් නිසා හෙතෙම පාසලේ ජනප්‍රියතම ශිෂ්‍යයා බවට පත්විය. ජෝන් කැල්වින් නැමැති මේ සිසුවා අනාගතයේදී සභාවේ ප්‍රබලතම සහ ගරු කටයුතු ආරක්ෂකයෙකු වේය යනු බොහෝ දෙනෙකුගේ පුද්ගලික කල්පිතය විය. කැල්වින් වටා ගොඩ

නැගී තිබූ අධ්‍යාපන ක්‍රමවේදයත්, උගන්වනු ලැබූ මිථ්‍යා විශ්වාසයත් විනිවිද යාමට දිව්‍ය ආලෝක දහරාවක් ක්‍රියාත්මක විය. ප්‍රතිසංස්කරණ සමයේ පැවති අලුත් දහම් ඇසූ හෙතෙම ඒ ගැන වෙව්ලන්නට විය. මේ මිථ්‍යා දෘෂ්ටිකයන් ගිනි මැලයට දැමීම ඉතා සාධාරණ බව ඔහුගේ මතය විය. එහෙත් මේ දහම් සහ ඉගැන්වීම් සමග මුහුණට මුහුණ ලා පිරික්සුමක් කිරීමට ඔහු නොදැනුවත්වම යොමු කරනු ලැබීය. ප්‍රොතැස්තන්ත දහම් සහ ඉගැන්වීම් ගැන පරීක්ෂණයක් කර, එහි අන්තර්ගත සාවද්‍ය කරුණු අධ්‍යයනය කර රෝමානු ධර්මය මගින් ඒ ධර්මයන් යටපත් කරනු ලැබිය හැකි දැයි සෝදිසි කිරීමට ඔහු බල කරනු ලැබීය.

ප්‍රතිසංස්කරණයේ දහම් වැළඳ ගත් කැල්වින්ගේ ඥාතී සොහොයුරෙක් වූ ඔලිවෙටන් පැරිසියට පැමිණ සිටියේය. ක්‍රිස්තියානි රාජ්‍යය කළඹන්නාවූ කරුණු පිළිබඳව මේ ඥාතීන් දෙදෙනා සාකච්ඡා කළෝය. ප්‍රොතැස්තන්තවාදී ඔලිවෙටන් මේ ගැන මෙවන් ප්‍රකාශයක් කළේය. "ලෝකයේ ඇත්තේ ආගම් දෙකක් පමණයි. එයින් එක් ආගම් පංතියක් මනුෂ්‍යයා විසින් නිර්මාණය කර ඇත. එකී ක්‍රමවේදය අනුව මනුෂ්‍යයන්ට යහපත් ක්‍රියාවන් ඉටු කිරීමෙන් හා වත් පිළිවෙත් පැවැත්වීම මගින් ගැළවීම උපයාගත හැකිය යන්න ඉගැන්වේ. අනෙක් ආගම වන්නේ බයිබලයෙන් එළිදරව් කර ඇති ක්‍රමයයි. එහි ඇතුළත් ඉගැන්වීම අනුව මිනිසාට ගැළවීම ලැබෙන්නේ දෙවියන්වහන්සේ විසින් නොමිලයේ දෙනු ලබන කරුණා-අනුග්‍රහය කෙරෙහි විශ්වාසය රැඳවීමෙන්ය."(Wylie, b. 13, Ch. 7).

"ඔබ පවසන්නාවූ එකම අලුත් දහමක්වත් පිළිගැනීමට මම කැමති නැහැ. මා ජීවත්වූ මුළු කාලය පුරාම මා වැරැද්දෙහි ජීවත් වූ බවද ඔබ කියන්නේ?" කියා කැල්වින් විචාළේය.

මෙම හමුවීම මගින් කැල්වින්ගේ සිතෙහි යම් යම් ව්‍යාකූල සිතුවිලි රෝපණය වූ අතර ඒවා ඉවත ලෑමට ඔහු සමත් නොවීය. තමාගේ කුටියට වැදුණු හෙතෙම තම ඥාති සහෝදරයාගේ වදන් පිළිබඳව කල්පනා කරන්නට විය. පාපය පිළිබඳව වූ හැඟීමක් ඔහුගේ සිත වෙළා ගත්තේය. තමා විනිශ්චයාසනය ඉදිරියෙහි තනිවම සිටින්නේ මැදහත්කාරයෙකු නැතිව බව ඔහුට හැඟී ගියේය. ශුද්ධ වූ ධර්මිෂ්ඨ වූ විනිශ්චයකාරයාණන් ඉදිරියෙහි තනිවම සිටීමට සිදුවේය යන සිතුවිල්ල ඔහු තුළ භීතියක් ජනිත කළේය. සාන්තුවරයන්ගේ මැදහත්වීම්, යහපත් ක්‍රියා සහ සභාවේ පූජා විධි, මංගල්‍යයන්, පාපය උදෙසා සමගි කිරීමක් සිදුකර දීමට අපොහොසත් බව ඔහුට පෙනී ගියේය. ඔහු ඉදිරියෙහි ඇත්තේ බලාපොරොත්තු රහිත අඳුරු වලාපටලයක් පමණක් බව ඔහුට හැඟී ගියේය. ඔහුගේ තත්ත්වයෙන් ඔහුව මුදවාලීමට සභාවේ ප්‍රවීණයන් ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථ



වී ගියේය. පාපෝච්චාරණය හා පව්වලට දඬුවම් පමුණුවා ගැනීම් මගින් ඔහු සරණක් සහ සහනයක් සෙවූ නමුත් එයින් කිසිම වැඩදායක දෙයක් සිදු නොවීය. එම ක්‍රමවේදයන් තමාගේ ආත්මය දෙවියන්-වහන්සේට සමගි කිරීමට අපොහොසත් බව ඔහුට ප්‍රත්‍යක්ෂ විය.

මෙබඳු ඵල රහිත චෛතසික අරගලයක නිරත වෙමින් සිටි කැල්වින්ට දිනක් ප්‍රසිද්ධ චතුරස්‍රයකට යෑමේ අවස්ථාවක් ලැබුණේය. එහිදී ඔහුට දැක ගැනීමට ලැබුණේ රෝමානු විරෝධී පුද්ගලයෙකු මිසදිටුවෙකු යයි හංවඩු ගසා ගින්නට බිලි දීමය. මේ වේද-සාක්ෂිකයාගේ මුහුණෙහි තිබූ සාමයේ හැඟීම් දුටු කැල්වින් මහත් විශ්මයට පත්විය. සභාව විසින් මරණයට තීන්දු කරනු ලැබූ එම පුද්ගලයාගේ මුහුණ, මරණයේ බිය පෙන්නුම් කළේ නැත. මරණ මංචකයේදී ඔහු පෙන්නුම් කළ ඇදහිල්ල සහ ධෛර්යය තරුණ සිසුවාගේ සිත කැළඹීමකට පත් කළේ එය තමාගේ සිත තුළ තිබූ බලාපොරොත්තු ශූන්‍යතාවයට සහ අඳුරට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්වූ නිසාය. එහෙත් ඔහු ජීවත් වුණේ සභාවේ අපේක්ෂාවනට අකුරටම කීකරු වෙමින්ය. දුර්ලබ්ධිකයන් යයි චෝදනා කරමින් මරා දැමූ අය බයිබලය මත තම ඇදහිල්ල රැඳවූ බව ඔහු දැනගත්තේය. ඔවුන්ගේ ප්‍රීතියේ සහ සාමයේ රහස සොයා ගැනීමේ අධිෂ්ඨානයෙන් යුතුව කැල්වින් බයිබලය අධ්‍යයනය කරන්නට තීරණය කරගත්තේය.

බයිබලය තුළ ඔහුට ක්‍රිස්තුස්වහන්සේව හමු විය. ඔහු වේදනාවත්, ප්‍රීතියත් මිශ්‍රිත හැඟීමකින් යුතුව මෙසේ කියන්නට විය. "අනේ පියාණන්වහන්ස, ක්‍රිස්තුස්වහන්සේගේ පූජාව ඔබවහන්සේගේ උදහස සංසිදෙව්වා; උන්වහන්සේගේ රුධිරය මාගේ සියලු අපවිත්‍රතාවන් සෝදා හැරියා; උන්වහන්සේගේ කුරුසිය මාගේ ශාපය විඳ දරා ගත්තා; උන්වහන්සේගේ මරණය මාගේ මරණය වෙනුවෙන් වන්දි ගෙව්වා; ගැළවීම ලබා ගැනීමට අපි අනේක මෝඩ ක්‍රියාවන් නිර්මාණය කරගෙන තියෙනවා, නමුත් විදුලි පන්දමක් ලෙස ඔබවහන්සේගේ වචනය මා ඉදිරියෙහි තබා තිබෙනවා. ඔබවහන්සේ මාගේ හදවත ස්පර්ශ කර තිබෙනවා. ඔබවහන්සේ එයින් බලාපොරොත්තු වන්නේ මා වෙනත් සියලු ක්‍රමවේදයන් පිළිකුල් ලෙස බැහැර කර දමා යේසුස්වහන්සේගේ ක්‍රමය අල්ලා ගැනීමයි." (Martyn, Vol. III, Ch. 13).

කැල්වින් අධ්‍යාපනය ලැබුවේ පූජකයෙකු වීමටය. කුඩා දෙව් මැදුරක පූජකවරයා ලෙස කටයුතු කිරීමට ඔහුව පත්කරන විට ඔහුගේ වයස අවුරුදු දොළසක් පමණ විය. ආගමේ නිගමනයනට අනුකූලව ඔහුගේ හිස මුඩු කරන ලදී. එය බිෂොප්වරයාගේ අතින් සිදුවිය. ඔහුව කැප කිරීමකට භාජන කරනු නොලැබීය. පූජක-වරයෙකුගේ යුතුකම් ඔහු ඉටු නොකළේය. එහෙත් ඔහු දේවගැතිවරුන්ගේ

සංගමයේ සාමාජිකයෙක් විය. තම තනතුරේ නිල නාමය ඔහු භාවිතා කළේය, ඒ සඳහා දීමනාවක්ද ලබා ගත්තේය.

කවරදාකවත් පූජකයෙකු වීමට තමාට නුපුළුවන් බව හැඟී ගිය හෙතෙම නීති පාඨමාලාවක් හදාරන්නට පටන් ගත්තේය. එයද අතහැර දමූ කැල්වින් ශුභාරංචිය උදෙසා තම ජීවිතය කැප කිරීමට තීරණය කර ගත්තේය. නමුත් ප්‍රසිද්ධියේ ඉගැන්වීමට ඔහු තුළ වැඩි මනාපයක් නොවීය. ඔහු ස්වභාවයෙන්ම බයාදු අයෙකු වූ නිසා ප්‍රසිද්ධ දේශකයෙකු වීමේ වගකීම් භාරයේ බර ඔහුට දැනෙන්නට විය. ඉගෙනීම සඳහා කාලය යෙදවීමට ඔහු තුළ තවමත් ආශාව ක්‍රියා කරමින් තිබුණේය. මිතුරන්ගේ අවංක ඉල්ලීම් කරණකොටගෙන ඔහුගේ සිත තුළ දැවෙමින් තිබූ ගැටුමට අවසාන තීරණයක් ලැබුණේය. "ඉතා පහත් ආරම්භයක් තිබූ කෙනෙක් එතරම් උසස් ගෞරවණීය තැනකට ඔසවනු ලැබීම පුදුමාකාර සිද්ධියකි"යි ඔහු පැවසුවේය. (Wylie, b. 13, Ch. 9).

කැල්වින් නිශ්චලව තම සේවයට ඇතුල් විය. වියලි පොළොව ප්‍රබෝධමත් කිරීමට සගයෙන් පැමිණි පිනි බිඳු සේ ඔහුගේ වදන් මිනිස් සිත් තුළ නව ජීවනයක් උදා කළේය. ඔහු පැරිසිය හැර දමා වෙනත් ප්‍රාදේශීය නගරයකට ගියේය. එහිදී ඔහු ශුභාරංචියට ඇලුම් කළ මාග්‍රට් කුමරියගේ ආරක්ෂාව යටතට පත් විය. ශුභාරංචිය දේශනා කළ ගෝලයන්ට ඇය විසින් සැපයූ ආරක්ෂාව දේව මගපෙන්වීමකින් සිදු වූවකි. මුදු මොළොක් අව්‍යාජ සම්පන්න පෙනුමැති තරුණයෙකුව සිටි කැල්වින් තම දේව සේවය ආරම්භ කළේ ගෙයින් ගෙට යමින්ය. ගෘහයෙහි සාමාජිකයන් තමා වටා සිටියදී ඔහු ශුද්ධ බයිබලය ඔවුන්ට කියා දුන්නේය. එහි අඩංගු ගැළවීමේ සත්‍යතාවන් ඔහු ඔවුන්ට විවෘත කර දුන්නේය. මෙම පණිවිඩය ඇසූ අය සුපුවත තවත් අයට කියා දුන්නෝය. වැඩි කාලයක් යාමට පෙර ගුරුතුමා නගරයට ඔබ්බෙන් පිහිටි මන්දිර සහ පැල්පත් කරා පා නගනවා දැකගත හැකි විය. සෑම තැනකදීම ඔහුට දොරටු විවෘත විය. මෙසේ තැනින් තැන යන්නාවූ හෙතෙම සභාවන් සඳහා අත්තිවාරම් දැමීමේ පුරෝගාමියා විය. එම සභාවන් තුළින් සත්‍යතාව වෙනුවෙන් අභීත සාක්ෂිකරුවෝ බිහි වූහ.

මාස කිහිපයක් ගත විය. ඔහු නැවත වරක් පැරිස් නගරයට පැමිණියේය. උගතුන් වියතුන් සහ ප්‍රවීනයන්ගේ කවය තුළ කලබලයක් නිර්මාණය වී තිබුණේය. පුරාණ භාෂා අධ්‍යයනයෙහි යෙදුණු පණ්ඩිතයන්ගේ අවධානය ශුද්ධ බයිබලයෙහි භාෂාව වෙතට යොමු විය. එහි ඇතුළත් සත්‍යතාවන්ට විවෘත නොවී සිටියාවූ අය බයිබලයෙහි අන්තර්ගතය ගැන සාකච්ඡා කරන්නට වූහ. ඔවුන්ගෙන් සමහරෙක් රෝමානු ආගමික දේව ධර්මාචාර්ය වරුන් සමග වාග් සටන්වලද නිරත වූහ, වාද විවාද පැවැත්වූහ. දේව ධර්ම මත ගැටුම්වලට



පැටලීමේ හැකියාවක් තිබූ නමුත්, කැල්වින් මෙම ඝෝෂාකාරී පණ්ඩිතයන්ගේ වාද වලට හවුල් නොවී සිටියේය. එයට වඩා උසස් කාර්ය භාරයක් ඉටුකිරීම ඔහුගේ බලාපොරොත්තුව විය. මිනිසුන්ගේ මනස් කළඹවනු ලැබ තිබුණේය. ඔවුන්ව සත්‍යතාවට යොමු කිරීමට සුදුසු වාතාවරණයක් උදා වී තිබුණේය. දේව ධර්ම වාද විවාද තරඟ ඝෝෂාවන්ගෙන් විශ්ව විද්‍යාල ශාලා පිරී ගිය අතර කැල්වින් ගෙයින් ගෙට යමින් එහි සාමාජිකයන්ට බයිබලය විවෘත කර දෙමින් කුරුසිපත් කරනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ඔවුන්ට කියා දෙන්නට විය.

දෙවියන්වහන්සේගේ මගපෙන්වීම යටතේ පැරිසියේ ජනතාවට ශුභාරංචිය පිළිගැනීමේ තවත් අවස්ථාවක් උදාකර දෙන ලදී. ලෙෆෙවර්ගේ සහ ෆැරල්ගේ කැඳවීම් පැරිසියේ වැසියෝ ප්‍රතික්ෂේප කළෝය. එම ප්‍රසිද්ධ අගනුවර වාසී සෑම පංතියකම අය හට ශුභාරංචි ඇරයුම නැවත වරක් පැමිණියේය. දේශපාලනික තත්ත්වයේ බලපෑම් අතරේ රජතුමා තවදුරටත් ප්‍රතිසංස්කරණයට එරෙහිව රෝමානුවන්ගේ පක්ෂයෙහි ගැතිවරයෙක් වී නොසිටියේය. ප්‍රොතැස්තන්ත දැනුම ප්‍රංශයේ ජයගන්නවා ඇතැයි මාග්‍රට් කුමරිය තවමත් බලා-පොරොත්තු වෙමින් සිටියාය. ඒ දහම ප්‍රංශයේ දේශනා කරනු ලැබිය යුතු යයි ඇය අධිෂ්ඨාන කරගෙන සිටියාය. රජතුමා බැහැරව සිටි අවස්ථාවකදී නගරයේ දේවස්ථානයන්හි දේශනා කිරීමට ඕතොමෝ ප්‍රොතැස්තන්ත පූජකයෙකුට විධාන කළාය. මෙවැන්නක් යථාර්ථයක් බවට පත්වීමට රෝමානු බලධරයෝ අවසර නුදුන්නෝය. මෙය දැනගත් මාග්‍රට් කුමරිය රජ මාළිගාව ඇතුළත කොටසක් දෙව් මැදුරක් ලෙස භාවිතය සඳහා සකස් කළාය. සෑම දවසකම එක්තරා නිශ්චිත පැයකදී එම මැදුරේ දේශනාවක් කරනු ලබන බවට නිවේදනයක් ඇයගේ අතින් නිකුත් විය. සෑම තරාතිරමකම පුද්ගලයන්ට එම දේශනාවලට සවන් දීමට පැමිණෙන්නැයි ඇරයුමක්ද නිකුත් විය. ශ්‍රාවකයෝ රංචු පිටින් දේශනාවන්ට සහභාගී වූහ. දෙව් මැදුරක් උදෙසා වෙන් කළ ශාලාව පමණක් නොව, අවට පිහිටි කාමරද වෙනත් ශාලාවන්ද ජනයාගෙන් පිරී ගියේය. දිනපතාම දහස් ගණන් ජනතාවක් ශුභාරංචි පණිවිඩය ඇසීමට පැමිණියෝය. වංශාධිපති කුලීනයෝ, රාජ්‍ය පාලකයෝ, නීති වේදීහු, වෙළඳ සිටුවරයෝ, සහ කාර්මික ශිල්පීහු වැල නොකැඩී රජ මාළිගා දෙව් මැදුරට එක් රොක් වූහ. මෙම රැස්වීම් තහනම් කිරීම වෙනුවට රජතුමා නියම කළේ පැරිස් නගරයේ දෙව් මැදුරු දෙකක් නැවත විවෘත කිරීමටය. මෙම නගරය මෙයට පෙර කිසිම අවස්ථාවක හෝ දේව වචනයෙන් මෙවන් කලබැගැනියකට මුහුණදී තිබුණේ නැත. සගයෙන් නික්ම ආ ජීවනයේ ආත්මය මිනිසුන් මත පතිත වී ඇති ආකාරය දැකගත හැකි විය. බීමත්කම, අනාචාරයෙහි හැසිරීම, ගැටුම් සහ අලස ජීවිත වෙනුවට අමද්‍යපය, සාරධර්ම අනුව ජීවත්වීම, සාමකාමී ලෙස දිවි පැවැත්ම සහ කර්මාන්තයක යෙදීම සමාජයේ පැවැත්ම විය.

මේ අතර රෝමානු සහා නායක මණ්ඩලයද නිශ්ශබ්දව නොසිටියේය. දේශනා කිරීම් නවතා දැමීමට රජතුමාව එකඟ කරගැනීමට බලමණ්ඩලය වැයම් කළ නමුත් රජතුමා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. එවිට ඔවුහු මහජනතාව වෙතට හැරුණෝය. වඩා උගත්කමක් නැති, මිථ්‍යා ඇදහිලි ක්‍රමයනට ගැති වූ පොදු ජනතාවගේ භීතිය, අවිචාරක හැඟීම්, සහ ආගම් උමතුව ප්‍රයෝජනයට ගෙන ජනතාව අවුස්සා කලබල ඇති කිරීමට බලමණ්ඩල සාමාජිකයෝ හැකි සෑම ක්‍රමවේදයක්ම ප්‍රයෝජනයට ගත්හ. තමන්ගේ ව්‍යාජ ගුරුවරුන්ගේ බස්වලට රැවටුණු පැරිස් ජනතාව තමන්ගේ ඉරණම තීරණය වන්නාවූ දවස ගැන හෝ ඇයගේ සාමයට ආධාර විය හැකි දේවල් ගැන හෝ නොදැන සිටියෝය. කලකට පෙර යෙරුසලමෙහිදී සිදුවූවාක් මෙන් මෙදා පැරිසියේදී ද එම ආකාරයෙන්ම කරුණු සිදු විය. වසර දෙකක් පුරා අගනුවර තුළ දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරනු ලැබීය. බොහෝ අය ශුභාරංචිය පිළිගත් අතර බහුතරයක් එය ප්‍රතික්ෂේප කළෝය. ශුභාරංචිය පතළ කර හැරීමට ප්‍රැන්සිස් ඉඩ දුන්නේ ඔහුගේ පුද්ගලික වාසිය උදෙසාය. පාප් වාදීහූ නැවත වරක් බලය තහවුරු කර ගත්තෝය. දේවස්ථාන වසා දැමුණු අතර මිනිස් පූජා කණු නැවත ක්‍රියාත්මක වීමට පටන් ගත්තේය.

තමාගේ අනාගත වැඩ පිළිවෙල සකස් කරගැනීම සඳහා ද ආලෝකය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ද සූදානම් වෙමින් කැල්වින් පැරිසියෙහි තම කාලය ගතකළේ ඉගෙනීමෙහි යෙදෙමින්, භාවනාවෙහි යෙදෙමින් හා යාච්ඤා කිරීමෙහි යෙදෙමින්ය. අන්තිමේදී ඔහුට විරුද්ධව සැක පහළ විය. ඔහුව ගින්නට බිලි දීමට රෝමානු බලධරයෝ තීරණය කර ගත්තෝය. තමා රැඳී සිටි හුදෙකලා ස්ථානයෙහි ප්‍රමාණවත් ආරක්ෂාවක් ඇතැයි ඔහු සිතුවේය. එම නිසා තමාට අනතුරක් සිදුවේ යයි ඔහු කිසිසේත්ම සිතුවේ නැත. ඒ අතර ඔහුගේ මිතුරෝ හදිසියේම ඔහුගේ කාමරය වෙත පැමිණ ඔහුව අත්අඩංගුවට ගැනීමට නිලධාරීන් පැමිණෙමින් සිටින බව ඔහුට දන්වා සිටියෝය. පිටත දොරටුවට තදින් ගසන හඬක් දෝංකාර දෙමින් පැතිර ගියේය. අපතේ හැරීමට කිසිම කාලයක් ඉතුරු වී තිබුණේ නැත. ප්‍රධාන දොර වෙත පැමිණි මිතුරන් සමහරෙක් නිලධාරීන් සමග කථාවෙහි යෙදුණෝය. තවත් මිතුරන් සමහරෙක් පුනරුදවාදියාට ජනේලයකින් බැස ගෙයින් පිටතට යාමට උපකාර කළෝය. කැල්වින්ද සීඝ්‍රයෙන් නගරයෙන් පිටතට පැමිණියේය. පුනරුදයට හිතවාදී කම්කරුවෙකුගේ නිවහනකට පැමිණි හෙතෙම ගෙවැසියාගේ ඇඳුමින් සැරසී, වෙස් වළාගෙන නගුල් පෝරුවක් කර තබාගෙන ගමනට පිටත් විය. දකුණු පෙදෙස බලාගිය හෙතෙම මාග්‍රට් කුමරියගේ රාජ්‍යය තුළ නැවත වරක් රැකවරණය ලැබුවේය.



බලගතු මිතුරන්ගේ ආරක්ෂාව යටතේ කැල්වින් තවත් මාස කිහිපයක් තම ඉගෙනීමේ කටයුතු ඉදිරියට කරගෙන ගියේය. නමුත් ප්‍රංශය පුරා ශුභාරංචිය දේශනා කිරීම ඔහුගේ මූලික අරමුණ වී තිබුණේය. එම නිසා බොහෝ කලක් අක්‍රියව සිටීම ඔහුට වධයක් විය. කුණාටුව තරමක් සංසිඳී ගිය පසු, අලුතින් සේවාවක් ඇරඹීමේ අදහසින් ඔහු පොයිටියර් වෙත පැමිණියේය. එහි තිබූ විශ්ව විද්‍යාලයෙහි සිටි පිරිස අතර ප්‍රතිසංස්කරණය ගැන පැහැදීමක් එවිටද පැවතුණි. සෑම තරාතිරකම පුද්ගලයෝ ශුභාරංචි පණිවිඩයට සතුටින් සවන් දුන්හ. ප්‍රසිද්ධ දහම් ප්‍රචාරක රැස්වීම් නොපැවැත්විණ. එහෙත් ප්‍රධාන මහේස්ත්‍රාත්වරයාගේ නිවසෙහිදී ද, කැල්වින් නැවතී සිටි නිවෙස්වලදී ද, සමහර අවස්ථාවන්හිදී ප්‍රසිද්ධ උද්‍යානවලදීද හෙතෙම ජනතාව ඇමතීය. සදාතන ජීවිතයෙහි වදන් ඇසීමට මනාපයක් දක්වූ අය ඔහු වටා රොක් වූහ. ටික කලක් ගෙවී යත්ම ශ්‍රාවක ජනතාව ගණනින් වර්ධනය වූයෙන්, නගරයෙන් පිටත රැස්වීම් පැවැත්වීම උචිත යයි තීරණය විය. එම තීරණය ආරක්ෂාව සඳහා වඩාත් යහපත් විය. කඳු අතර පිහිටි ඉතා ගැඹුරුවූ ද පටුවූ ද, දුර්ග මාර්ගයක එක් පසෙකින් පිහිටි බිං ගෙයක් රැස්වීම් පැවැත්වීමෙහි ස්ථානය ලෙස තෝරා ගන්නා ලදී. එම ස්ථානයට ලෙහෙසියෙන් පැමිණිය නොහැකි නිසාත්, ගස්වැල් සහ තවත් පර්වතවලින් එය ආවරණය වී තිබීම නිසාත් එම බිංගෙය ඉතා සුරක්ෂිත ස්ථානයක් විය. විවිධ මාර්ගයන් ඔස්සේ පැමිණි කුඩා කණ්ඩායම් එම ආරක්ෂිත ස්ථානය වෙත පැමිණියෝය. මෙම හුදෙකලා ස්ථානයේදී බයිබලය කියවා පැහැදිලි කරදෙන ලද්දේය. ප්‍රංශයේ සිටි ප්‍රොතැස්තන්ත බැතිමත්හු පළමු වතාවට මෙහිදී රාත්‍රී භෝජනය සැමරීමේ සත්ප්‍රසාද මෙහෙයට සහභාගී වූහ. මෙම කුඩා දෙව් මැදුරේ සිට විශ්වාසවන්ත දහම් ප්‍රචාරකයන් කිහිප දෙනෙක් සුපුවත පැතිරවීමට නික්ම ගියෝය.

කැල්වින් නැවත වරක් පැරිස් නගරයට පැමිණියේය. ප්‍රංශය සමස්ථයක් වශයෙන් ප්‍රතිසංස්කාරක දහම පිළිගන්නවා ඇතැයි යන බලාපොරොත්තුව ඔහුගේ සිතෙන් තවමත් පහව ගොස් තිබුණේ නැත. නමුත් ශුභාරංචියට විවෘත විය හැකි සෑම දොරටුවක්ම වැසී තිබුණේය. ශුභාරංචිය ඉගැන්වීම ජීවිත බිලි පූජාවකට පාර කැපීමක් බඳු යයි ඔහුට පෙනී ගියේය. මෙහි සේවය කිරීමට දොරටු වැසී තිබීම නිසා ඔහු තම සේවය සඳහා ජර්මනියට ගියේය. ඔහු ප්‍රංශයෙන් ඉවත්ව යාමත් සමගම ප්‍රොතැස්තන්ත සමයවාදීන්ට විරුද්ධව කුණාටුවක් නිර්මාණය විය. එම අවස්ථාවේදී ඔහු ප්‍රංශයේ සිටියේ නම්, එහිදී සිදුවූ විනාශයට ඔහුව අනිවාර්යයෙන්ම සම්බන්ධ කරනු ලැබීම අරුමයක් නොවනවා ඇත.

ජර්මනිය සහ ස්විස්ටර්ලන්තය මෙන්ම තමන්ගේ රටද අලුත් ධර්මතාවන් තුළ වර්ධනය වෙනවා දකීමට ආශා කළ ප්‍රංශ

ප්‍රතිසංස්කාරකයෝ මිථ්‍යා විශ්වාසයන්හි ඇලී ගැලී සිටි රෝමානු සමයට එරෙහිව ප්‍රබල ප්‍රහාරයක් දියත් කිරීමට තීරණය කර ගත්තෝය. එයින් මුළු මහත් ජාතියම පිබිදවීම ඔවුන්ගේ අදහස විය. සත්ප්‍රසාද පූජාවට විරුද්ධව විශාල දැන්වීම් පත්‍ර එක් රැයකදී ප්‍රංශය පුරාම ප්‍රදර්ශනය විය. සමහර ජ්වලිතවාදීන් මෙම විරෝධතා දැක්වීම, ප්‍රතිසංස්කරණයේ වර්ධනයට ආධාරයක් නොවීය. මෙම අදූරදර්ශී ක්‍රියාදාමය ප්‍රතිසංස්කරණයේ ව්‍යාපාරයට විනාශයක් අත්කර දුන්නේය. එය ප්‍රතිසංස්කරණයේ ප්‍රචාරකයන්ට මෙන්ම ප්‍රංශය පුරා සිටි ඔවුන්ගේ හිතකාමීන්ටද එක සේ බලපෑවේය. සිංහාසනයේ ස්ථිර පැවැත්මටත්, ජාතියේ සාමයටත්, ඔවුන් අනතුරුදායක බව රෝමානුවාදීන් නිරතුරුවම එල්ල කළ ප්‍රධාන චෝදනාවක් විය. ඔවුන් වනාහි ජාතිය කළඹන, සිංහාසනයට තර්ජන එල්ල කරන ජන කොටසක් නිසා ඔවුන්ව සහමුලින්ම විනාශ කර දැමිය යුතු යයි ඉල්ලා සිටීමට රෝමානුවනට මෙය කදිම අවස්ථාවක් විය. එයින් උපරිම ප්‍රයෝජන නෙළා ගැනීමට ඔවුහු උත්සුක වූහ.

යම්කිසි අදිසි හස්තයක් මගින් යටකී දැන්වීම් පත්‍රයක් රජතුමාගේ පුද්ගලික කාමරයේ දොර මත අලවා තිබුණේය. මෙය අවිචාර මිතුරෙකු විසින් කරන ලද්දක්ද නැතහොත් සතුරෙකු විසින් හිතාමතාම කරන ලද්දක්ද, කියා තේරුම් ගැනීමට කිසිවෙකුට හෝ නොහැකි විය. මෙම දැන්වීම දැකීමෙන් රජතුමා තැති ගත්තේය, සංත්‍රාසයට පත්විය. යුගයන් ගණනාවක් පුරා බැතිමතුන්ගේ මහත් භක්තියට පාත්‍ර වූ යම් යම් මිථ්‍යා විශ්වාසයන් එමගින් නිර්දය ලෙස ගැරහීමට භාජනය කර තිබුණි. පෙර නොවූ විරූ ආකාරයේ අදහස් ප්‍රකාශ කිරීම් බියක් සැකක් නැතිව රජතුමා ඉදිරියට පවා රැගෙන යාමට වූ නිර්භීත ක්‍රියාදාමය රජතුමාගේ උදහසට හේතු විය. තුෂ්නිම්භූත වූ රජතුමා බියෙන් ගැහෙමින් කථා කිසිත් නැතිව ටික වේලාවක් ගල් ගැසී බලා සිටියේය. ඉක්බිති ඔහුගේ කෝපය භයානක වචන මගින් මුවින් පිට විය. "ලූතර් දහම් පිළිගන්නා සෑම දෙනෙක්ම සිරභාරයට ගන්න. ඔවුන් සියලු දෙනාම මරා දැමිය යුතුයි." (D. Aubigne, b. 4, Ch. 10). ඉරණම තීන්දු විය. රෝම පාර්ශ්වය සමග සම්පූර්ණ වශයෙන් කටයුතු කිරීමට රජතුමා තීරණය කර ගත්තේය.

පැරිසියේ සිටින්නාවූ සෑම ලූතර්වාදියෙකුම අත්අඩංගුවට ගන්නා ලෙස ආඥාව නිකුත් විය. ප්‍රතිසංස්කරණයේ අනුගාමිකයෙකු වූ එක්තරා දුගී කාර්මිකයෙකු සිර භාරයට ගන්නා ලදී. ප්‍රතිසංස්කාරකයන්ගේ රහසිගත රැස්වීම් සඳහා එකී බැතිමතුන් කැඳවීමට මෙම බැතිමතා පුරුදුව සිටියේය. නගරයේ සිටින්නාවූ සෑම ප්‍රොතැස්තන්ත තැනැත්තෙකුගේම ගෙවල් තිබෙන තැන් පාප් සමයවාදී නියෝජිතයාට පෙන්වන ලෙස ඔහුට නියම විය. එසේ නොකරන්නේ නම් ඔහුව එතැනදීම මරා දමන බවට තර්ජනයක්ද විය. මෙම නීච යෝජනාව



නිසා කාර්මිකයා මහත් බියකට පත් විය. එහෙත් ගිනි දැල්වල දැවීමේ භීතිය නිසා තම සහෝදරයන් පාවා දීමට ඔහු අකමැත්තෙන් වුවද එකඟ විය. සත් ප්‍රසාද පූප පෙරටු කොටගත් පෙරහැර සෙමින් සෙමින් වීදි දිගේ ඉදිරියට ඇදෙන්නට විය. පූප පසුපස පූජකයෝ, සුවඳ ද්‍රව්‍ය රැගත් මංජුසා දරන්නෝ, තාපසවරු, සහ සොල්දාදුවෝද පෙරහැරට එකතු වී සිටියෝය. ඔවුන් පසුපස මොරින් නම් රාජකීය පරීක්ෂකයා සමග පාවා දෙන්නා ගමන් ගත්තේය. විරුද්ධවාදීන් විසින් සත් ප්‍රසාද පූජාව නිග්‍රහයට භාජනය කරමින් පෝස්ටර් ප්‍රදර්ශනය කර තිබුණේය. ඔවුන් කළ ඒ නිග්‍රහය මකා දමන පිණිස මෙම පෙරහැර සංවිධානය විය. "ශුද්ධ වූ සත්ප්‍රසාද" මෙහෙයට ගරු කරන පිණිස පෙරහැර ගමන් ගත්තේය. මෙම පෙරහැර පසුපස මරණීය අරමුණක් ගැබ්ව තිබුණේය. ලූතර්වාදී පුද්ගලයෙකුගේ නිවසක් ඉදිරියට පැමිණි අවස්ථාවේදී පාවා දෙන්නා සංඥවක් කළේය. එහෙත් කිසිම වචනයක් හෝ කථාවක් කෙරුණේ නැත. පෙරහැර නැවතුණේය. එම ගෙදර සෝදිසියට ලක් විය. ගෙවැසියන් ගෙයින් පිටතට ඇදගෙනැවිත් දැත්වලට මාංචු දමන ලදී. ඉක්බිතිව තවත් බිල්ලක් සොයමින් ඔවුහු නැවතත් ගමන් ආරම්භ කළෝය. "කුඩා වේවා, විශාල වේවා ඔවුහු කිසිම ගෙයක් සෝදිසි කිරීම අත්හැරියේ නැත. ඔවුහු පැරිසියේ විශ්ව විද්‍යාලය පවා සෝදිසියට ලක් කළහ. මුළු නගරයම කම්පාවකට භාජනය කිරීමට මොරින් සමත් විය, එය, භීෂණය රජ කළ යුගයේ ආරම්භය විය. (D.Aubigne, History of the Reformation in the time of Calvin," b. 4, Ch. 10).

කුරිරු වධ හිංසා පැමිණවීමෙන් පසුව, අල්ලා ගත් වරදකරුවන්ව ගින්නට දමනු ලැබීය. වේදනාවේ කාලය දීර්ඝ කිරීම පිණිස ගින්නේ සැර බාල කරන ලෙස ඉහළින් අණ ලැබී තිබුණේය. එහෙත් ඔව්හු ජයග්‍රාහකයන් ලෙස මරණයට මුහුණ දුන්නෝය. ඔවුන්ගේ ස්ථාවරය බිඳක් හෝ සලිත නොවීය. ඔවුන්ගේ සාමය බිඳ වැටුණේ නැත. ඔවුන්ගේ නොසැලෙන ස්ථාවරය සෙලවීමට නොහැකිවූ වද දෙන්නන් (වධකයන්) පරාජයට පත්වූ බවක් පැහැදිලි විය. 'පීඩා කරන ලද්දන්ගේ ශරීර බැඳ තබන්නාවූ පෝරක ගස් පැරිසියේ බොහෝ තැන්වල ඉදිකර තිබුණේය. දවස්පතා මිනිස් බිලි පූජාවන් සිදුවිය. බිලි පූජා කරන්නාවූ දවස් දිග්ගැස්සීමෙන් වධකයන්ගේ අභිප්‍රාය වුණේ භීතියට රජකම් කිරීමට තවත් කාලයක් සපයා දීමය. මෙහි වාසිය අන්තිමේදී හිමි වුණේ ශුභාරංචියටය. අලුත් ඉගැන්වීම් කරණකොටගෙන බිහිවන්නාවූ පුද්ගලයන්ගේ නියම ස්වභාවය කිනම් ආකාරදැයි දැකගැනීමට සියලු පැරිසි පුරවැසියනට අවස්ථාවක් ලැබුණේය. වේදසාක්ෂිකයෙකුගේ ගිනි ගොඩට වඩා වැඩදායක වූ ප්‍රබල දේශනා කූඩුවක් තවත් නැත. මරණයට තීන්දු වූ මොව්හු තමා මරා දමනු ලබන ස්ථාන කරා පියවර මනින්නාවූ අතරේදී ඔවුන්ගේ මුහුණුවල දකින්නට තිබූ සාමකාමී ප්‍රභාව සෑමගේ සිත් තුළ සලිත

වීමක් ඇති කළාට සැකයක් නැත. ගිනි දල් දසත නැගෙද්දී ඔවුන් වීරයන් මෙන් නිර්භීතව මරණයට මුහුණ දීම, තමන්ට කරන ලද තුවාල ගැන සමාව දීම, යන දේ දකීමෙන් හා ඇසීමෙන් බොහෝ අයගේ සිත් උදහසින් අනුකම්පාවටත්, වෛරයෙන් ප්‍රේමයටත් වෙනස් විය. ඔවුහු මෙසේ ශුභාරංචිය වෙනුවෙන් හඬ නැඟීමට යෙදුණාහ." (Wylie, b. 13, Ch. 20).

ජනතා උදහස ඉහළ තලයක රඳවා තබාගැනීම උදෙසා පූජකවරු ප්‍රොතැස්තන්ත බැතිමතුන්ට විරුද්ධව ඉතා භයානක අද්භූත චෝදනා රැසක් ඉදිරිපත් කළෝය. කතෝලිකයන් සමූලඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීම, රජය පෙරළා දැමීම සහ රජතුමා මරා දැමීම එම චෝදනා අතර මුල් තැන ගත්තේය. මේ එකම චෝදනාවක් හෝ සනාථ කිරීමට කිසිම ආකාරයක සාක්ෂි ඉදිරිපත් කිරීමට නුපුළුවන් විය. එහෙත් මෙම නපුරෙහි අනාවැකි ඉදිරි දවසක ඉටුවන්නට තිබුණි. එහෙත් එය වෙනස් සිදුවීම් මාලාවක් යටතේය. මෙයට ඉඳුරාම වෙනස්වූ පරිසරයක් තුළ මේ අනාවැකි ඉටුවීම් සිදුවිය. කතෝලිකයන් විසින් අහිංසක ප්‍රොතැස්තන්ත බැතිමතුන්ට සිදුකළ කුරිරුකම්වලට විපාකය සහ ශාපය ගොඩ නැගෙමින් තිබුණේය. පැමිණෙනවා යයි කියූ ඉරණම ශත වර්ෂ කිහිපයකට පසුව යථාර්ථයක් බවට පත්විය. එය ඉටු කරන ලද්දේ දේව ශක්තියක් නැති මිසදිටුවන් සහ පාප්වාදීන්ම විසින්ය. වසර තුන්සියයකට පසුව ප්‍රංශය මත භයානක විපත් සහ විනාශය ඇති කළේ රෝමානු ව්‍යාපාරය විසින් ප්‍රොතැස්තන්ත ව්‍යාපාරය විනාශ කිරීමට කළ කුමන්ත්‍රණය කරණකොටගෙනය.

සමාජයේ සෑම අංශයකම, පැවතියේ සැකය, අවිශ්වාසය සහ භීතියයි. අධ්‍යාපන ක්ෂේත්‍රවල උසස් ස්ථාන දරුවාවූ අයගේ මනස් තුළ ලූතර්වරුන්ගේ ඉගැන්වීම් කෙරෙහි විශාල ගැති භාවයක් තිබූ බව දකගැනීමට හැකි විය. හදිසියේම, එම තානාන්තරයන් හිස් වුණි. කාර්මිකකරුවන්, මුද්‍රණ ශිල්පීන්, පඬිවරුන්, විශ්ව විද්‍යාලයන්හි ආචාර්යවරුන්, ගත්කතුවරුන් සහ රාජ්‍ය සේවකයන් පවා අතුරුදහන් වූහ. තමන්ගේම කැමැත්තෙන් පැරිස් රටෙන් ඉවත්ව ගිය අය දහස් ගණනක් විය. බොහෝ අවස්ථාවන්හිදී එයින් පැහැදිලි වූයේ බොහෝ දෙනෙක් ප්‍රතිසංස්කරණයට කැමැත්තක් දක්වූ බවය. රෝම සභාවේ ධර්මයන්ගෙන් ඈත්වූ මෙතරම් විශාල සංඛ්‍යාවක් තමන්ගේ රටෙහි ජීවත් වූ අතර, ඔවුන් හඳුනාගත නොහැකි වීම ගැනද, ඔවුන්ට රට තුළ ජීවත්වීමට ඉඩ දීම ගැනද රෝමානුවාදීහු විශ්මිත වූහ. තමන්ගේ බලය යටතේ සිටි විශාල ගණනින් වූ අසරණ ගොදුර මත තමන්ගේ වියරු කෝපය සංසිඳුවා ගැනීමට ඔවුහු පසුබට නොවූහ. සිර ගෙවල් පිරී ඉතිරී ගියේය. ශුභාරංචිය කෙරෙහි තම විශ්වාසය රැඳවූ අය



උදෙසා අවුලන ලද ගිනි මැලවලින් නිකුත්වූ දුමාරයෙන් මුළු නගරයම අඳුරෙන් වැසී ගිය බවක් පෙනෙන්නට විය.

දහසය වැනි සියවසේ මුල් කාලයේදීම ප්‍රංශයේ අධ්‍යාපනය පිළිබඳව පැවති පිබිදීමේ ගෞරවය තමාට හිමිවන්නේ යයි I වන ප්‍රැන්සිස් රජතුමා ප්‍රීති විය. විවිධ රටවල සිටි උගත් පඬිවරුන් තම මාළිගාවට රැස්කරවා ගැනීම ඔහුට මහත් ආස්වාදයක් ලබාදුන් දෙයක් විය. අධ්‍යාපනය ලැබීමට ඔහු තුළ තිබූ ආශාවත් රෝමානු තාපස පූජකයන්ගේ නූගත්කම සහ මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි ක්‍රමවේදයන් ගැන ඔහු තුළ තිබූ අවඥවත් නිසා රජතුමාගේ පාලන තන්ත්‍රය යටතේ යම් ප්‍රමාණයක ආගමික නිදහසක් පැවැතියේය. නමුත් සෑම ආකාරයකම දුර්ලබ්ධික ඉගැන්වීම් මුලිනුපුටා දැමීමට වූ උනන්දුව අනුව මේ අධ්‍යාපනික අනුග්‍රාහකයා වූ රජතුමා ප්‍රංශයෙහි තිබූ ප්‍රකාශන ආයතනයන්හි මුද්‍රණය කිරීම් තහනම් කරමින් ආඥාවක් නිකුත් කළේය. බුද්ධිමය සංස්කෘතිය වනාහි ආගමික උපේක්ෂාව හෙවත් සෑම ආගමකටම, සහනශීලීත්වයට, හෝ හිංසා පීඩාවන්ට එරෙහිව වැට කඩොලු බැඳීමක් නොවන බව I වන ප්‍රැන්සිස් රජතුමාගේ ආදර්ශයෙන් සහ තවත් බොහෝ පාලකයන්ගේ ක්‍රියාවේදයන්ගෙන් මනාව පැහැදිලි වේ.

ප්‍රොතැස්තන්තවාදය විනාශ කරදැමීමට සියලු පියවර ගන්නා බවට ප්‍රංශය ගාම්භීර ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබුණේය. දිව්‍ය පූජාවට ප්‍රසිද්ධියේ නින්දා කරමින් සගය වෙත යොමු කළ අවඥ සහගත ක්‍රියාවට ලේවලින් වන්දි ගෙවිය යුතු යයි රෝමානු පූජක සංසදය බලකර සිටියේය. මෙම බිහිසුණු තීරණය ක්‍රියාවට නැංවීමට ජනතාව වෙනුවෙන් රජතුමා තම අනුමැතිය ප්‍රසිද්ධියේ ලබා දිය යුතු යයි රෝමානුවෝ ඉල්ලා සිටියෝය.

මෙම බිහිසුණු චාරිත්‍රානුකූල උත්සවය සඳහා 1535 ජනවාරි 21 වන දින නියම කර තිබුණේය. ප්‍රොතැස්තන්ත දහම් පිළිබඳව ජනතාව තුළ වූ අවිචාරාත්මක බුද්ධියට පණ පොවමින්ද, එය වැළඳ ගැනීම සගයට කරන නින්දාවකැයි කියමින්ද ජන මතය හැසිරවූ රෝමානුවෝ ඔවුන්ට විරුද්ධව ජනතාව පෙළඹවූහ. ප්‍රංශයේ විවිධ පෙදෙස්වලින් පැරිසිය කරා පැමිණි විශාල ජන සමූහයාගෙන් එහි වීදි පිරී ඉතිරී ගියේය. මෙම ඓතිහාසික සංසිද්ධිය සැමරීම සඳහා මවිතය උපදවන ආනුභාව සම්පන්න පෙරහැරක් සංවිධානය කර තිබුණේය. පෙරහැර ගමන් කරන්නාවූ මාර්ගය දෙපස ඇති ගෙවල ශෝකය පෙන්වන තිර යොදා තිබුණේය. තැනින් තැන අල්තාරද ඉදිකර තිබුණේය. ගෘහයෙහි ප්‍රධාන දොරටුවෙහි උළුවස්සට ඉහළින් දල්වෙන පන්දමක් සවිකර තිබුණේය. දේව ප්‍රසාද නිධානය හෙවත් ශුද්ධවූ සක්‍රමේන්තුවට ගෞරවය කිරීම උදෙසා එකී පන්දම යොදා තිබුණේය. ළහිරු රැසින්

පොළොව උණුසුම් වත්ම රජමාළිගය ඉදිරිපිට මෙම පෙරහැර සංවිධානය වන්නට විය. එක් එක් දේවස්ථානයට අයිති වූ ධජ පතාක සහ කුරුසි රැගත් බැතිමතුන් පෙරහැරේ ඉදිරියෙන්ම ගමන් ගැනීම සැලසුම් විය. ඔවුන් පසුපස පන්දම් රැගත් නගරවාසීහු දෙදෙනා දෙදෙනා බැගින් පෙළ ගැසී සිටියෝය. තාපස නිකා හතරකට අයිති යතිවරයෝ තමන්ගේ ආවේනික ඇඳුමින් සැරසී සිටියෝය. ඔවුන් පසුපස ධාතු සහ පූජා භාණ්ඩ රැගත් විශාල ජන කොටසක් වූහ. පෙරහැරෙහි අන්තිම කොටස අලංකාර කළේ රත්නිල් සහ ලෝහිත වර්ණ ලෝගුවලින් සැරසී ගත් රෝමානු පූජකයෝය. ඔවුන්ගේ මැණික් ගල් ඇල්លූ වස්ත්‍ර දිළිසෙමින් පෙරහැර අලංකාර කළේය.

"සත් ප්‍රසාද රොටී රැගත් භාජනය පැරිසියේ රදගුරු තුමන් විසින් රැගෙන යන ලදී. අලංකාර උඩු වියනක් යට රදගුරු ගමන් ගත්තේය. උඩුවියන අල්ලා ගෙන උසස් කුමාරවරුන් සතර දෙනෙක් ගමන් ගත්තෝය. රදගුරු පිටුපසින් රජතුමා පෙරහැරට එක්වී සිටියේය. I වන ෆ්‍රැන්සිස් රජතුමා එදින ඔටුන්න පැළඳ සිටියේ නැත. රාජකීය ලෝගුව පැළඳ සිටියේද නැත. ඔහු හිස් වැස්මක් පැළඳ සිටියේ නැත. ඔහුගේ දෑස් පොළොව දෙසට යොමුව තිබුණේය. දවෙන්නාවූ, ක්‍රමයෙන් හීන් වන්නාවූ ඉටි පන්දමක් ඔහු අතෙහි විය." ප්‍රංශයේ රජතුමාගේ පෙනුම පසුතැවිලි වෙන්නාවූ අයෙකුගේ චරිතයක් පෙන්නුම් කළේය. සුරුවමක් රැගත් සෑම අල්තාරයක් ඉදිරියෙහි ඔහු බැගෑපත් ලෙස නමස්කාර කළේය. ඔහු එසේ නමස්කාරය පුද කළේ තමාගේ ආත්මය විසින් කරන ලද දූෂිත ක්‍රියාදාමයන් නිසා නොව, ඔහුගේ දෑත් කැළැල් කළ අහිංසකයින්ගේ ලේ නිසා නොව. දිව්‍ය පූජාව අපහාසයට ලක් කරමින් ඔහුගේ යටත්වැසියන් සමහරෙකු සිදුකළ මරණීය අපරාධ උදෙසාය. ඔහු පසුපස රජ බිසවද, රාජ්‍යයේ ප්‍රභූවරුන්ද ගමන් ගත්හ. ප්‍රභූවරුන් දෙදෙනා දෙදෙනා බැගින් පෙරහැරට එක්වී සිටි අතර, ඔවුන් එකිනෙක්කෙනා අතද දල්වෙන පන්දමක් විය.

එම දවස සඳහා සැලසුම් කර තිබූ අංගයක් වශයෙන් රජතුමා රදගුරුගේ මාළිගාවෙහි පවත්වනු ලැබූ රැස්වීමේදී රජයේ ඉහළ නිලදරුවන් අමතා කථා කළේය. ඉතා දුක්බර මුහුණින් යුතුව නිලධාරීන් ඉදිරියේ පෙනී සිටි රජතුමා දුක්මුසු අඳෝනාවක්, විලාපයක් කියන්නට විය. ජාතිය මුහුණදී ඇති "අපරාධය, දේව අපහාසය, දුක් ශෝකයේ සහ අපකීර්තියේ දවස" ගැන ඔහු පවසා සිටියේය. වසංගතයක් බඳුවූ මෙකී මිසදිටු දහම් නිසා ප්‍රංශය ගරා වැටී විනාශ වීමේ තර්ජනයකට මුහුණදී ඇති බැවින් මෙම ව්‍යසනය අතුගා දැමීමට රජතුමා සෑම පක්ෂපාතී පුරවැසියෙකුගේම උදව් උපකාර ඉල්ලා සිටියේය. "ඔබත් නියම මහත්මයෙක් නම් රජතුමා ලෙස මම කරන්නට යන දේ ඔබත් කරන්න. මාගේ අවයවයන් මෙම දුගඳ හමන තුවාලයෙන් ආසාදනය වී තිබෙනවා නම් එම අවයවය කපා දැමීමට මම ඔබතුමන්ට



අවසර දෙනවා ... මාගේ දරුවෙක් මෙම විනාශකාරී විපත්තියට ගොදුරු වී සිටිනවා නම් මම ඔහුව මරා දමන්නට ඉඩ හරිනවා. එම දරුවාව බේරා ගන්න මම ඉදිරිපත් වන්නේ නැහැ ... මාගේ දරුවාව මමම භාරදී එම දරුවාව දෙවියන්වහන්සේට පූජාවක් ලෙස ඔප්පු කරනවා." හැඟුම්බර කථාව පවත්වන අතරේදී ඔහුගේ උගුර හිරවෙන්නට විය. රැස්ව සිටි සැමගේ නෙත් කඳුළින් තෙත් විය. "කතෝලික සභාව උදෙසා අපි ජීවත් වෙනවා, කතෝලික සභාව උදෙසා අපි ජීවිත පූජා කරනවා" යයි සියල්ලෝම එක හඬින් පැවසූහ. (D. Aubigne, b. 4, Ch. 12).

සත්‍යතාවෙහි ආලෝකය එපා කළ ජාතිය අන්ධකාරයේ ගිලී යාම භයානක විපතක් විය. "ගැළවීම ළඟා කර දෙන්නාවූ කරුණා අනුග්‍රහය" උදා වී තිබුණේය. එය දක දැකත්, එහි බලය සහ ශුද්ධතාවය දැක දකත්, එහි දිව්‍ය අලංකාරය මගින් දහස් ගණන් බැතිමතුන් පිරිසක් එයට ආකර්ෂණය වී සිටියත්, එහි ප්‍රභාවෙන් නගර සහ ගෙවල් ආලෝකමත් කරනු ලැබ තිබියදීත් ප්‍රංශය, ආලෝකය වෙනුවට අඳුර තෝරා ගෙන දිව්‍ය ප්‍රභාවයෙන් ඉවතට හැරී ගමන් ගත්තාය. ස්වර්ගීය තෑග්ග ඔවුන්ට පිළිගන්වනු ලැබූ අවස්ථාවේදී ඔවුහු එය ඉවත දැමුවෝය. ඔවුහු නපුරට යහපත යයි කීවෝය. සත්‍යතාව නපුරක් යයි කීවෝය. එසේ කරමින් අන්තිමේදී ඔවුහු ස්ව-ආත්ම රැවටීමකට ගොදුරු වූහ. දෙවියන්වහන්සේගේ සත්‍යය පිළිගත් දරුවන්ට හිංසා පීඩා කිරීමෙන් තමන් උන්වහන්සේට සේවයක් කරනවා යයි ඔවුහු කල්පනා කළෝය. ඔවුන් අවංකව එසේ සිතූ නමුත් ඔවුන් නිවැරැදිකරුවන් වන්නේ නැත. මුළාවෙන් ඔවුන්ව ගළවා ගැනීමටද ඔවුන්ගේ ආත්මවලින් ලේ පැල්ලම් ඉවත්කර තැබීමටද පුළුවන්කමක් තිබූ ආලෝකය ඔවුහු කැමැත්තෙන්ම එපා කළෝය, එය නිෂ්ප්‍රභා කළෝය.

ප්‍රතිසංස්කරණයේ දහම් මුලිනුපුටා දැමීමට දෙව් මැදුරේ පැවති එම රැස්වීමේදී එක්තරා ප්‍රතිඥාවක් සපථ කර ගන්නා ලදී. වසර තුන්සියයකට පමණ පසුව එම ජාතිය "විචාර බුද්ධියේ දෙවිදුව" සිංහසනාරූඪ කළෝය. ඔවුහු ජීවමාන දෙවියන්වහන්සේව අමතක කළෝය. පෙරහැර නැවත වරක් වීදි ගත විය. තමන් ප්‍රතිඥා දුන් කාර්ය භාරය ඉටු කිරීමට ප්‍රංශ නියෝජිතයෝ ඉදිරියට ඇදුණෝය. දරම්ටි ගොඩ ගසා ඒ මැද මිනිසෙකුව බැඳ තැබීම සඳහා කණුවක්ද සහිතව ඝාතන ස්ථාන තැනින් තැන ඉදිකර තිබුණේය. පෙරහැර එම ස්ථාන කරා යන විට යම්කිසි රෙපරමාදු කරුවෙකු එම කණුවලට තබා බැඳ තැබීමට නියම වී තිබුණේය. රජතුමා ඒ ස්ථානය පසුකරත්ම දරම්ටි වලට ගිනි අවුලන ලදී. එම දසුන දැක බලාගැනීම සඳහා පෙරහැර එම ස්ථානවල නැවතීම නිර්දේශ විය. (Wylie, b. 13, Ch. 21). ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකරුවන්ට දෙන ලද වධහිංසා පිළිබඳ

තොරතුරු විස්තර වශයෙන් වාර්තා කිරීම අතිශයින් සිත් රිදවන සුළුය. කෙසේ වුවද, මරණයට පාත්‍ර වූ තැනැත්තන් තම ඇදහිල්ල අත්හැර දම්මේ නැත. ප්‍රොතැස්තන්ත දහම් කෙරෙහි විශ්වාසය අත්හැරීමට එකඟ වන්නැයි කීවිට එක් බැතිමතෙක් මෙවන් ප්‍රකාශයක් කර ඇත. "දිවැසිවරුන් සහ අපෝස්තුළුවරුන් ඉගැන්වූ මූලධර්ම කෙරෙහි පමණක් මම විශ්වාසය රඳවමි. ශුද්ධවන්ත සමූහයාද මෙම දේවල්ම විශ්වාස කළෝය. නිරයේ සමස්ථ බලවේගයන්ට විරුද්ධව නැගී සිටිය හැකි දෙවියන්වහන්සේ තුළ රැඳවූ ඇදහිල්ලක් මට තිබේ." (D. Aubigne, b. 4, Ch. 12).

ප්‍රොතැස්තන්තකරුවන්ට වධහිංසා පමුණුවා ඔවුන් ගින්නට බිලි දෙන්නාවූ ස්ථානවලදී පෙරහැර කඩින් කඩ නැවතුණෝය. ගමන ඇරඹූ ස්ථානයේ සිට වටරවුමක් ගොස් ආපසු රජ මාළිගාව වෙත පෙරහැර පැමිණියේය. සෙනඟ විසිර ගියහ. දවසේ වැඩකටයුතු සාර්ථකව ඉටු වී යයි සතුටින් යුතුව රජතුමා සහ නායක දේවගැතිවරු තම වාසභවන් කරා පිටත්ව ගියෝය. තමන් ආරම්භ කළ කර්තව්‍යය අනුව මිසදිටු දහම් විශ්වාස කරන සැවොම ඝාතනය කරන තෙක් එය ඉදිරියට කරගෙන යාමට ප්‍රතිඥා දෙමින් ඔවුහු එකිනෙකාට ශුභ පතා ගත්තෝය.

ප්‍රංශය ප්‍රතික්ෂේප කළ සාමයේ ශුභාරංචිය ඇත්ත වශයෙන්ම මුලිනුපුටා දමුව හොත් එයින් අත්වන ඉරණම අති භයානකය. ප්‍රොතැස්තන්තකරුවන් සමූලඝාතනය කිරීමට ප්‍රංශය තීරණය කරගැනීමෙන් අවුරුදු දෙසීය පනස් අටකට පසුව එවැනිම දවසක එනම්, 1793 ජනවාරි 21 වන දින තවත් පෙරහැරක් ප්‍රංශයේ වීදි පුරා යාම සඳහා පෙළගැසී සිටියේය. එම පෙරහැරෙහි අරමුණ වෙනස් ආකාර විය. "මෙම පෙරහැරෙහි ප්‍රධාන අමුත්තා වුණේද රජතුමාය. සෙනඟ කලහකාරී ලෙස හැසිරෙන්නටද, කෑගසන්නටද වූහ. බිලි දීම සඳහා තවත් අය සොයමින් වූ කෑගැසීම් දසත ඇසෙන්නට විය. කළු පාටින් නිම වූ බිලි පූජා කණුද ඉදිකර තිබුණේය. මෙදිනද වැඩකටයුතු නිම වුණේ මහත් පිළිකුල් උපදවන මිනිස් ඝාතනත් සමගය. XVI වැනි ලුවී රජතුමා පෙරහැරෙහි ගමන්ගත් බන්ධනාගාර නිලධාරීන් සහ නිල ඝාතකයන් සමග පොර බදිමින් සිටියේය. රජතුමාව බලෙන් ඇදගෙන ගිය නිලධාරීහු ඔහුගේ හිස වධක මැස්ස මත තබා තදකරගෙන සිටියෝය. වධකයාගේ කඩුව ක්‍රියාත්මක විය. රජතුමාගේ හිස එතැනින් බිමට වැටුණේය." (Wylie, b. 13, Ch. 21). මරාදමනු ලැබුවේ රජතුමා පමණක් නොවේ. එම ස්ථානයේදීම සහ අසල තවත් තැන්හි මිනිසුන් දෙදහස් අටසිය දෙනෙක් හිස් ගසා දමන යන්ත්‍රයේ පහස වින්දෝය. චණ්ඩ බිහිසුණු දාමරිකත්වය රජ කළ මේ යුගයේදී වීදි දිගේ ලේ ගලා යාම සුලබ දසුනක් විය.



විවෘත ශුද්ධ බයිබලයක් ලෝකයාට ලබාදීමට ප්‍රතිසංස්කරණය ක්‍රියා කළේය; එමගින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ප්‍රතිපත්ති ඔවුන් ඉදිරිපිට විවෘත කරනු ලැබුවේය. දේව ව්‍යවස්ථාවේ ඉල්ලීම් ජනතාවගේ හෘද සාක්ෂියට අවධාරණය කරන ලදී. සගයේ ප්‍රඥප්ති සහ අණ පණත් මිනිසා ඉදිරියෙහි විවෘතව තැබීමට අසීමිත ආදරය වෙහෙසක් දරුවේය. මෙම දේව අපේක්ෂා ඉටුකිරීමට දේව භය ඇති මිනිසා බැඳී සිටී. මේ පිළිබඳව දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශ කර ඇත. "දෙවිවූ ස්වාමින්වහන්සේ .... අණ කළ පණත් ද විනිශ්චයන්ද.... පවත්වමින් (ක්‍රියා) කරන්න. මක්නිසාද මෙය මනුෂ්‍ය වර්ගයන් ඉදිරියෙහි නුඹලාගේ ප්‍රඥවත් නුඹලාගේ නැණවත්කමත්ය. ඔවුන් මේ සියලු පණත් අසා: සැබවින්ම මේ මහත් ජාතිය ප්‍රඥවන්ත වූ නුවණ ඇත්තාවූ සෙනඟක් යයි කියනවා ඇත." (ද්විතීය කථාව 4:5,6). ප්‍රංශය විසින් සගයේ දීමනාව ප්‍රතික්ෂේප කළ කල්හි ඇය ප්‍රචණ්ඩකාරිත්වයේ සහ විනාශයේ බීජ වැපිරෙව්වාය. එහි හේතු එල වේදය වූයේ විප්ලවයක් සහ භීතියෙහි රජකිරීමක් ඇතිවීමය.

රෝමානු වේදයෙහි මිථ්‍යා ඉගැන්වීම් පිළිබඳව විශාල පින්තූර ප්‍රදර්ශනය වන්නට පෙර නිර්භීත සහ ප්‍රබල බැතිමතෙකු වූ ෆැරල්ට තම උපන් බිම අතහැර පලායාමට සිදුවිය. හෙතෙම ස්විට්සර්ලන්තයට පලා ගියේය. එහිදී ස්වින්ග්ලිගේ වැඩ තවදුරටත් වර්ධනය කළ ඔහු ප්‍රතිසංස්කරණය වෙත ජනතා රැල්ල නම්මවා ගැනීමට දායක වුණේය. ඔහුගේ ඉතිරි කාලය ස්විට්සර්ලන්තයේම ගත කළද ප්‍රංශයේ ප්‍රතිසංස්කරණ කර්තව්‍යයෙහි සඵලත්වයට විශාල බලපෑමක් හෙතෙම එල්ල කළේය. රටින් පිටව සිටි මුල් වසර කිහිපය තුළදී තම නිජ භූමියෙහි ශුභාරංචිය පතුරුවා ලීමෙහි කටයුතුවලට ඔහු අත්වැල සැපයුවේය. ඔහු මායිම් ගම්මානවලට යමින් තමාගේ ජාතියේ ජනතාවට ශුභාරංචිය දේශනා කළේය. තම රට තුළ වර්ධනය වෙමින් පැවති රෝමානු-ප්‍රොතැස්තන්ත අරගලය පිළිබඳව දැඩි උනන්දුවක් දක්වූ හෙතෙම තම ජනතාවට වචනයෙන් සහ අනුශාසනයෙන් දිරිය ගෙන දුන්නේය. තම රටෙන් පිටව ආ තවත් බැතිමතුන් සමග එක්වූ ෆැරල් ජර්මන් ප්‍රතිසංස්කාරකයන්ගේ කෘති ප්‍රංශ භාෂාවට පරිවර්තනය කළේය. මේ පොත් සමගම ප්‍රංශ බසින් වූ ශුද්ධ බයිබලයේ පිටපත් විශාල ප්‍රමාණයක් මුද්‍රණද්වාරයෙන් එළි බැස්සේය. ගෙයින් ගෙට යමින් ආගමික පතපොත අලෙවි කරන්නන්ගේ මාර්ගයෙන් මෙම ප්‍රකාශන ප්‍රංශය පුරා සිටි ජනතාවගේ අතට පත්විය. ඉතා අඩු මුදලකට මෙම ප්‍රකාශන ලබාගත් අලෙවි නියෝජිතයෝ තමා ලැබූ මුදල් මගින් මෙම සේවාව අඛණ්ඩව කරගෙන යාමට පුළුවන්කම ලබාගත්හ.

ස්විට්සර්ලන්තයට පැමිණි ෆැරල් ගුරුවරයෙකු වශයෙන් රැකියාවක යෙදෙමින් දෙවියන්වහන්සේට වූ සේවාව කරගෙන යාමට සමත් විය.

හුදෙකලා දේවස්ථාන වසමක සේවය ආරම්භ කළ ඔහු ළමයින්ට ගුරුහරුකම් දීම ආරම්භ කළේය. අධ්‍යාපන විෂය මාලාවේ පාඩම් වලට අමතරව ඔහු දැඩි සැලකිල්ලකින් යුතුව බයිබල් සත්‍යතාවන් කියා දීමේ යෙදුණේය. දරුවන් තුළින් දෙමාපියන් වෙත ළඟා වීම ඔහුගේ අරමුණ විය. මේ අය අතරෙන් කිහිප දෙනෙක්ම ප්‍රතිසංස්කරණයේ ඉගැන්වීම් පිළිගත්තෝය. මේ අතර මෙම මෙහෙවරය නවතා දැමීමට රෝමානු පූජකවරු ක්‍රියාත්මක වූහ. මිථ්‍යා ඉගැන්වීම් විශ්වාස කළ ගම්බද ජනතාව පොළඹවා ගත් පූජකයෝ ප්‍රතිසංස්කාරකයන්ට විරුද්ධව උද්ඝෝෂණය කිරීමට ජනතාව පෙළඹවූවෝය. "මෙම ඉගැන්වීම් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වන්නට බැහැ; ඔවුන්ගේ දේශනා මගින් ඇති වන්නේ සාමය නොවේ, යුද්ධය" යි සමහර පූජකවරු පැවසූහ. (Wylie, b. 14, Ch. 3). මුල්කාලීන ගෝලයන් මෙන්, එක් නගරයකදී වධ හිංසා පැමිණි විට ඔහුද වෙනත් නගරයක් කරා පිය නැගීය. ඔහු ගමින් ගමකටද නගරයකින් තවත් නගරයකටද පයින්ම ගමන් කළේය. බඩගින්නේ පෙලෙමින්, ශීතලය විඳ දරා ගනිමින්, දැඩි තෙහෙට්ටුවෙන් පීඩිතව, සෑම මොහොතකම මරණීය තර්ජනවලට මුහුණ දීමේ අවදානමින් යුතුව ඔහු කඩ මණ්ඩියේදී දේශනා කළේය, දෙව් මැදුරුවලදීද ශුභාරංචිය බෙදා දුන්නේය. සමහර අවස්ථාවන්හිදී දෙව් මැදුරුවල දේශනා කුඩුද ඔහුට විවෘත විය. සමහර අවස්ථාවන්හිදී ඔහුට ඇහුම්කන් දීමට කිසිවෙක් හෝ පැමිණ සිටියේ නැත. සමහර අවස්ථාවන්හිදී ඔහු දේශනා කරන විට කෑගැසීම් සහ සමච්චල් කිරීම්වලින් බාධා පැමිණියේය. නැවත වරක් ඔහුව ධර්මාසනයෙන් ඉවතට ඇද දමනු ලැබීය. කිහිප වතාවක්ම ඔහු වෙත කඩා වැදුණු පූජකයෝ මැරෙන තරමට ඔහුට පහර දුන්නෝය. එහෙත් ඔහුගේ ඉදිරි ගමන නවතාලීමට මෙවන් බාධක සමත් නොවීය. බොහෝ තැන්වලින් ඔහුව පන්නා දමනු ලැබූ නමුත් ඔහු නැවත නැවතත් එම ස්ථාන වෙත පැමිණ ශුභාරංචිය දේශනා කළේය. පාප්ගේ බන්ධනයට හසුව තිබූ ගම් සහ නගර ක්‍රම ක්‍රමයෙන් ශුභාරංචිය සඳහා දොරටු විවෘත කරනවා දැකීම ඔහුගේ ඉමහත් ප්‍රීතියට හේතු විය. ඔහුගේ මුල් දෙසුම ඇසූ කුඩා දේවස්ථානයේ බැතිමත්හු දැන් ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල පිළිගත්හ. මොරා සහ නුවාටෙල් යන ස්ථානවල නගරවාසීහුද වැඩි කලක් යාමට පෙර රෝමානු වතාවත් සහ නමස්කාර ක්‍රම ඉවතලා තමන්ගේ දේවස්ථානවලින් සුරුවම් සහ පිළිම ඉවත් කළෝය.

ප්‍රොතැස්තන්ත ධජය ජිනීවාහි ඔසවා තැබීමට ෆැරල් තුළ දැඩි අභිලාෂයක් විය. මෙම නගරය දිනා ගැනීමට හැකිවන්නේ නම් එය ප්‍රංශයේ, ස්විට්සර්ලන්තයේ සහ ඉතාලියෙහි ප්‍රතිසංස්කාරක සේවයෙහි මධ්‍යස්ථානයක් සේ සැලකීමට හැකිවන්නේය. මෙම අරමුණ පෙරදැරිව ඔහු ක්‍රියා කළ අතර ජිනීවා නුවර වටා පිහිටි වෙනත් නගර සහ



ගම්මානයන් ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ලට දිනාගනු ලැබූහ. ඉක්බිතිව තවත් එක් සගයෙකු සමග ඔහු ජිනීවා නුවරට ඇතුළු විය. එහෙත් දේශනා කිරීමට ඔහුට අවස්ථාවක් ලැබුණේ දෙවතාවක් පමණකි. ඔහුව වරදකරුවෙකු සේ තීරණය කරමින් සිවිල් බලධරයන්ගේ විනිශ්චයක් ලබාගැනීමට ගත් උත්සාහය නිෂ්ඵල වූ බැවින් රෝමානු පූජකයෝ ආගමික විනිශ්චය සමුළුවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඔහුට නියෝග කළහ. පූජකයෝ තමන් ලෝගු යට මිනීමරු ආයුධ සඟවා ගෙන එහි පැමිණියෝය. රැස්වීම් ශාලාව තුළදීම ඔහුව ඝාතනය කිරීමට සැලසුම් කර තිබුණේය. කඩු මුගුරු රැගත් කෝපාවිෂ්ට කලහකාරී පිරිසක් ශාලාවෙන් පිටත රැස්ව සිටියහ. යම්කිසි අයුරකින් රැස්වීමෙන් පිටතට පැමිණීමට ඔහු සමත් වී නම්, ඔහුව ඝාතනය කර දැමීමට මෙම ප්‍රචණ්ඩ කාණ්ඩය සූදානම්ව සිටියේය. එහෙත් මහේස්ත්‍රාත්වරුද අවි රැගත් හමුදා භටයන්ද ශාලාවට පැමිණ ෆැරල්ව නිරුපද්‍රිතව පිටතට ගෙන යෑමෙන් ඔහුගේ ජීවිතය බේරුණේය. පසුදින හිමිදිරියේම ඔහුවද ඔහුගේ සහායකයාද වැවෙන් එගොඩ ආරක්ෂිත ස්ථානයක් කරා ගෙනයනු ලැබුවෝය. ජිනීවා නගරයේ ශුභාරංචිය පතල කිරීමට වූ ඔහුගේ මුල්ම වෑයම මෙසේ නිම විය.

ජිනීවාවට ශුභාරංචිය ඇතුළු කිරීමේ දෙවැනි අවස්ථාවේදී දෙවියන්වහන්සේ තෝරා ගත්තේ වෙනස් ආකාර පුද්ගලයෙකි, නිහතමානී තරුණයෙකි. ඔහුට පුනරුදවාදී මිතුරන්ගෙන් පවා ලැබුණේ ඉතා ඇල් මැරුණු ප්‍රතිචාරයකි. ෆැරල් වැනි අයෙකුව ප්‍රතික්ෂේප කරනු ලැබූ ස්ථානයක මෙවැන්නෙකුට කළ හැක්කේ කුමක්ද? අඩු ප්‍රමාණයක ධෛර්යයක් සහ අඩු ප්‍රමාණයක අත්දැකීමක් ඇති තරුණයෙකුට බලගතු කුණාටුවක් ඉදිරියේ නැගී සිටින්නට හැකියාවක් ලැබෙයිද? ඉතා ශක්තිමත්වූ ද, නිර්භීතවූ ද අය පවා බියෙන් පලා ගිය අතර පැවිද්දන්ගේ වියරුව ඉදිරියෙහි මේ තරුණයාට ඉටු කළ හැකි මෙහෙවරය කුමක්ද? "බලයෙන්වත්, ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන් යයි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක" (සෙකරියා 4: 6). "නුමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරාගත් සේක. දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරාගත් සේක." "මක්නිසාද දෙවියන්වහන්සේගේ මෝඩකම මනුෂ්‍යයන්ට වඩා ප්‍රඥාවන්තය; දෙවියන්වහන්සේගේ දුර්වලකම මනුෂ්‍යන්ට වඩා බලවත්ය." (1 කොරින්ති 1: 27, 25).

ෆ්‍රෝමෙන්ට් නමැති මේ තැනැත්තා තම ජීවන වෘත්තිය ආරම්භ කළේ පාසල් ගුරුවරයෙකු වශයෙන්ය. ඔහු විසින් දරුවන්ට පාසලේදී ඉගැන්වූ සත්‍යතාවන් දරුවන් විසින් තම දෙමාපියන්ට පවසන ලදී.

බයිබලය පැහැදිලි කරදෙනවා ඇසීමට සමහර දෙමාපියෝ පාසල් කාමරය කරා ඇදී ආවෝය. වැඩි දවසක් ගතවීමට පෙර උනන්දුවෙන් සවන් දෙන්නාවූ අයගෙන් පංති කාමරය පිරී ඉතිරී ගියේය. අලුත් තෙස්තමේන්තු පිටපත් සහ පත්‍රිකා නොමිලයේ බෙදා දෙනු ලැබීය. අලුත් දහම් ඇසීමට ප්‍රසිද්ධියේ පැමිණීමට මැළි වූ අයට මෙසේ ශුභාරංචියේ පහස ලැබීමට මං සැලසුණේය. වැඩි කලක් ගතවීමට පෙර ඔහුටද එම නගරයෙන් පිටව යන්නැයි අණ නිකුත් විය. එහෙත් ඔහු ඉගැන්වූ සත්‍යතාවන් ජනතාවගේ මනස් තුළ මනා ලෙස තැන්පත්ව තිබුණේය. ප්‍රතිසංස්කරණය රෝපණය වී තිබුණේය. එය කාලයත් සමග ශක්තිමත්ව වැඩෙමින් ව්‍යාප්ත වන්නට විය. දේශනාකරුවෝ නැවත නැවතත් ජිනීවා නගරයට පැමිණියෝය. අවසානයේදී ප්‍රොතැස්තන්ත නමස්කාරය ජිනීවාහි ස්ථාපිත කරන ලද්දේය.

විවිධ පෙදෙස්හි සැරිසරමින්ද, විවිධ අත්දකීම්වලට මුහුණ දෙමින්ද සිටි කැල්වින් ජිනීවා වෙත පැමිණෙන විට එම නගරය ප්‍රතිසංස්කාරක දහම පිළිගෙන තිබුණේය. ඔහු මෙවර ජිනීවා නගරයට පැමිණියේ තම උපන් බිම වෙත ගොස් බේසල් වෙත යන වාරයේදීය. ගම රට සිට බේසල් කරා යන සෘජු මාර්ගය සම්පූර්ණයෙන්ම V වන චාර්ල්ස්ගේ හමුදාව විසින් අත්පත් කරගෙන තිබූ නිසා ඔහුට ජිනීවා නගරය හරහා ගමන් කිරීමට සිදුවිය.

කැල්වින් නැවත වරක් ජිනීවා නගරයට පැමිණීම දෙවියන්-වහන්සේගේ ශ්‍රී හස්තයේ ක්‍රියාකාරිත්වයක් බව ෆැරල්ට අවබෝධ කරගත හැකි විය. ජිනීවාහි ජනතාව ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල පිළිගෙන තිබුණ නමුත් එහි තවත් විශාල වැඩ කොටසක් කිරීමට ඉතිරිව තිබුණේය. මිනිසුන් දෙවියන්වහන්සේව පිළිගෙන උන්වහන්සේ වෙතට පැමිණිය යුත්තේ පුද්ගලයන් වශයෙන් මිස සමූහ කණ්ඩායම් වශයෙන් නොවේ. ප්‍රතිසංස්කරණයේ ක්‍රියාදාමය හදවත තුළ ක්‍රියාකාරී වීම අනිවාර්ය වන්නේය. එය හෘදය සාක්ෂියෙහි ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය මගින් පුනරුත්ථාපනය විය යුතුය. එය සම්මේලන ආඥාවන් මගින් එල දැරිය නොහැකිය. ජිනීවාහි ජනතාව රෝම අධිකාරී බලය ඉවත දමා තිබූ නමුත්, ඇය යටතේ සමෘද්ධිමත්ව තිබූ දූෂණ අතහැර දැමීමට සූදානම්ව නොසිටියහ. ශුභාරංචියෙහි පිරිසිදු ප්‍රඥප්ති තුළ ජනතාව ස්ථාපිත කිරීමත්, දෙවියන්වහන්සේ ඔවුන්ට දුන් කැඳවීම අනුව ක්‍රියා කිරීමට ඔවුන් සූදානම් කිරීමත් පහසු කාර්යයක් නොවීය.

මෙම කර්තව්‍යය ඉටුකිරීම සඳහා කැල්වින්ගේ දායකත්වය මහත් සේ ඉවහල් වේ යැයි ෆැරල් කල්පනා කළේය. මෙම තරුණ දහම් ප්‍රචාරකයාට ජිනීවාහි නැවතී සිට සේවය කරන්නැයි ෆැරල්



දෙවියන්වහන්සේගේ නාමයෙන් කැල්වින්ගෙන් ඉල්ලා සිටියේය. විශ්මයට පත් කැල්වින් එසේ කිරීමට පසුබට විය. බයාදු ගති පැවතුම් ඇති, සාමයට ඇලුම් කළ කැල්වින්, සමහර අවස්ථාවලදී, එඩිතරව නිදහසේ ක්‍රියා කළ, සැහැසි ආත්මයක් ඇති ජිනීවාහි ජනතාව සමග කටයුතු කිරීමෙන් වැළැකී සිටීමට ආශා කළේය. සෞඛ්‍ය තත්ත්වය දුර්වලව පැවති නිසාද අධ්‍යාපනයට වැඩි කාලයක් ගතකිරීමටවූ පුරුද්ද නිසාද ඒ ඉල්ලීම ඉටු කිරීමෙන් නිදහස් වීමට ඔහු කැමති විය. ප්‍රතිසංස්කරණයේ කටයුතු වැඩි ප්‍රවණතාවයකින් යුතුව පෑනෙන් කළ හැකි බවට ඔහු තුළ පැවැති විශ්වාසය නිසා ඉගෙනීමට සුදුසු නිසොල්මන් ස්ථානයක් කරා යෑම ඔහුගේ අභිලාෂය විය. එහි සිට රචනා කරන්නාවූ ලිපි කරණකොටගෙන සභාවන් ගොඩ නගන්නටත්, සභිකයන් දැනුවත් කරන්නටත්, ඔහු කැමති විය. එසේ වුවද. දේව සේවයෙහි නිරත වීමට වූ ෆැරල්ගේ කැඳවීම ඔහුට සගයෙන් පැමිණි කැඳවීමක් බඳු වූයෙන් එය එපා කිරීමට ඔහු පසුබට විය. "දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තය සගයේ සිට තමා වෙතට යොමු වී ඇති බව ඔහුට දැනුණේය. එය ඔහුව අල්ලා ගත්තේය. ඉක්මණින් ඉවත්වී යාමට උවමනා වී තිබුණ ස්ථානයේම රැඳී සිටීම හැර වෙනත් දයක් ගැන සිතීමටවත් ඔහු තුළ හැකියාවක් තිබුණේ නැත." (D. Aubigne, b. 9, Ch. 17).

මෙම වකවානුවේදී ප්‍රොතැස්තන්ත සෙනඟ වටා මහත් උපද්‍රවකාරී වටපිටාවක් ගොඩ නැගී තිබුණේය. ජිනීවා නගරය ශාපයට යටත් කර ඇතැයි පාප් නිවේදනයක් නිකුත් කළේය. ඒ අතර ප්‍රබල රටවල් ජිනීවා නුවර විනාශ කර දමන බවට තර්ජන එල්ල කළහ. රජවරුන් සහ අධිරාජ්‍ය පාලකයන් දණ ගැස්වූ බලවත් රෝමානු පූජක බල අධිකාරියට විරුද්ධව මේ කුඩා නගරය නැඟී සිටින්නේ කෙසේද?

ක්‍රිස්තියානි රාජ්‍යයන් පුරාම ප්‍රොතැස්තන්ත දහමට මුහුණ පෑමට සිදුවුණේ බලවත් සතුරන්ට විරුද්ධවය. මුලදී යම් ජයග්‍රහණයක් අත් කරගත් නමුත් රෝමානුව විසින් එයින් සලිත නොවී, ඔවුන් සමූලඝාතනය කරදැමීම සඳහා අලුත් හමුදාවන් යොදවා ස්වකීය අභිමතාර්ථය ඉටු කරගැනීමට ක්‍රියා කළේය. මේ අවධියේදී ජේසුයිට් සංගමය (Jesuits) නැමැති නව තාපස නිකායක් ආරම්භ විය. මෙම නිකාය රෝමානු සභාවෙහි ඉතා බලසම්පන්නවූ කොටසක් විය. සභාව රැක ගැනීමට වීරයන් ලෙස ක්‍රියා කළ මොවුහු ඉතා කුරිරුවූ ද, දුෂ්ටවූ ද, කිසිම ප්‍රතිපත්තියක් ගරු නොකළාවූද කතෝලික බැතිමතුන් පිරිසක් වූහ. භූමික සබැඳියාවන් සියල්ල බිඳ දමා, මිනිසුන් උදෙසා ඇති සියලු සැලකිලි සිඳ දමා, ස්වභාවික සෙනහසෙහි ඉල්ලීම් ගැන කිසිම ආකාරයකින් හෝ තෙත් ගතියක් නැතිව, යුක්ති සහගත හේතු හා තම හෘදය සාක්ෂිය නිහඬ කළ ඔවුහු, කිසිම නීතියකට

අවනත නොවූ අතර කිසිම බැඳීමක්ද ඇති කර නොගත්හ. ස්වකීය තාපස නිකායෙහි ප්‍රතිපත්ති පමණක් හිස් මුදුනෙන් පිළිගත් ඔවුහු තමන්ගේ ඒකායන අරමුණ තමන්ගේ බලය ව්‍යාප්ත කිරීම පමණක් බවට ප්‍රතිඥා දුන්නෝය. “Concerning Jesuits”, p. 6). අනතුරට මුහුණ පාමින් දුක් විඳීම් විඳ දරා ගැනීමටද ශීතල හා බඩගින්න, දරා ගනිමින් ඉතා මහන්සි වී ශ්‍රමිකයෙකු ලෙස වැඩ කිරීමට සහ දරිද්‍රතාවෙන් පීඩාවිඳීම, වධකාගාරය, පොළොව යට ඇදිරි ගෙවල සිරකර තැබීම, කණුවලට බැඳ ගිනි බත් කිරීම යන ආපදාවලට ගොදුරු වීමෙහිදී තම භක්තිය සහ විශ්වාසය වෙනුවෙන් එම කුරිරුකම් වලට මුහුණ දෙමින් විඳ දරා ගැනීමටද ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය එහි අනුගාමිකයන්ට ශක්තිය ලබාදී තිබුණි. මේ සියලු අත්දැකීම් මධ්‍යයේ සත්‍යතාවේ ධජය උපරිම ඉහළ තලයේ ඔසවා තැබීම කිතුණුවාගෙන් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන සේක. සත්‍යතාවේ බලවේගයන්ට මුහුණ දීම සඳහා සංවිධානය වූ "ජේසුයිට්" යන තාපස නිකාය තම ශ්‍රාවකයන්ව ආගමික උමතුවක් කරා මෙහෙය වූහ. අවශ්‍ය වුවහොත් යට කී ආපදාවන් විඳ දරාගැනීමට වුවද ඔවුන් එඩිතර විය යුතු යයිද ඔවුන් උනන්දු කරන ලදී. සත්‍යතාවට විරුද්ධව ක්‍රියාත්මක කළ හැකි සෑම ආකාර මුළාවන් සහ රැවටීම් ක්‍රම භාවිතයට තම ශ්‍රාවකයන් දැනුවත් කිරීමට ඔවුන් පසුබට වුණේ නැත. සත්‍යතාව මැඩලීමට වූ කවර ආකාරයේ අපරාධයක් වුවද කම් නැත, කෙතරම් නීච මුළා කිරීමක් වුවද මහත් අරුමයක් නොවේ, කුමන ආකාර හෝ වෙස් මාරු කිරීමක් වුවද, එයින් සෙතක් සිදු වේ නම් එය කෙතරම් අසංවර වුවද එයට අවකාශ දිය යුතුය යන්න ඔවුන්ගේ අදහස විය. නිති පවත්නා දුගීකමත්, යටහත් පහත්කමත් රැකීමට ප්‍රතිඥා දුන්නද, ඔවුන්ගේ උපාය මාර්ගය වුණේ ප්‍රොතැස්තන්තවාදීන් විනාශ කිරීම සඳහා උපරිමයෙන් ධන සම්පත් හා බලය අත්පත් කරගැනීමයි. පාප් අධිකාරී බලයට මුල් තැන ලබාදීම ඔවුන්ගේ පරමාර්ථය විය.

සාමාජික කණ්ඩායමක් වශයෙන් ජේසුයිට් තාපසයෝ සමාජය ඉදිරියෙහි පෙනී සිටියේ ශුද්ධවන්ත ජන කොටසක් හැටියටය. යේසුස්-වහන්සේ මෙලොව දිවි ගෙවූ සමයේදී උන්වහන්සේ යහපත් ක්‍රියා කරමින් සැරි සැරූ බව බයිබලය පවසයි. ඒ ආකාරයෙන්ම ජේසුයිට් වරුද සිරගෙවල් හා රෝහල් වෙත යමින් එහි සිටියාවූ පීඩිතයන් බැහැ දැක්කෝය. ඔවුහු රෝගී වූ අයට සහ දුගී ජනතාවට පිහිට වූහ. ලෝකයේ සියලු සම්පත් අත්හැර දමන බවට ප්‍රතිඥා දෙමින් ඔවුහු යේසුස්වහන්සේගේ ශුද්ධ වූ නාමය දරාගන්නාවූ අය වූහ. ඔවුන්ගේ බාහිරය වරදක් නැති බව පෙන්නුම් කළද, අභ්‍යන්තරයෙහි අන්තර්ගතය වුණේ ඉතා දුෂ්ට වූ අපරාධ කිරීමේ, මිනිසුන් ඝාතනය කිරීමේ



පරමාර්ථයයි. ඔවුන්ගේ එක්තරා ප්‍රඥප්තියකින් කියැවුණේ අවසන් ප්‍රතිඵලය යහපත් නම් එය උදාකර ගැනීමෙහි ක්‍රියාවේදය කුමක් වුවද, කම් නැතැයි කියාය. මෙම න්‍යාය අනුව බොරුකීම, සොරකම් කිරීම, බොරුවට දිවිරීම, මිනිස් ඝාතන යනාදියෙන් සභාවට යහපතක් වේ නම් එවන් ක්‍රියාවන්ට සමාව ලැබෙනවා පමණක් නොව, ඒවා පැසසුම් ලැබීමටද භාජනය විය හැකි යයි ඔවුන්ට දක්වන ලදී. විවිධාකාර සුදුසුකම් ඉදිරිපත් කරමින් ජේසුයිට්වරු රජයේ පරිපාලන ව්‍යුහයේ උසස් කොට්ඨාශ කරා යෑමට සමත් වූහ. රජතුමාගේ පුරෝහිත මඩුල්ලේ නියෝජිතයන් වීමටත් ජාතියේ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවල තනතුරු දැරීමටත් ඔවුහු සමත් වූහ. තමන්ගේ ස්වාමිවරුන් වෙනුවෙන් ඔත්තුකාරයන් වශයෙන් සේවයෙහි යෙදීමටද ඔවුහු ක්‍රියාශීලී වූහ. ඔව්හු කුමාරවරුන්ගේ සහ ප්‍රභූවරුන්ගේ දරුවන් උදෙසා උසස් විද්‍යාල ආරම්භ කරමින් සාමාන්‍ය ජනතාව උදෙසාද පාසල් විවෘත කළෝය. ප්‍රොතැස්තන්ත දෙමව්පියන්ගේ දරුවන්ව රෝමානු දහමේ වතාවත් ඉටුකිරීමට යොමු කරනු ලැබීය. සිසුන්ගේ මනස් වියවුල් කිරීමට රෝමානු නමස්කාර වේදයෙහි පවත්නා මහත් අලංකාරයෙන් යුත් බාහිර උදාරම් පෙනුමට ඉහළ තැනක් ලැබුණේය. ප්‍රතිසංස්කරණයේ දරුවන්ගේ සිතුවිලි විවිධ පොරොන්දු මගින් මුළාකර ඔවුන්ව බැඳ තැබීමට පාසැල් ගුරුවරු මහත් වෑයමක් දැරූහ. දෙමාපියන් විසින් මහත් වෑයමක් දරා, ලේ පවා හලමින් ලබාගත් නිදහස දරුවන් විසින් පාවා දෙනු ලැබිණි. ජේසුයිට් නිකාය යුරෝපය පුරා ව්‍යාප්ත විය. ඔවුන් ස්ථාපිත වූ සෑම තැනකම පාප් සමයට නව පණක් ලැබුණේය.

එම තපස් නිකායට වැඩි බලතල ලබාදීම සඳහා ධර්මාධිකරණය නැවත වරක් ස්ථාපිත කිරීමට පාප්ගේ නියෝග පත්‍රයක් නිකුත් විය. ජනතාවගේ ඉමහත් පිළිකුලට භාජනය වූ මේ දඬුවම් පැමිණවීමේ ක්‍රමය වූ, මෙම ත්‍රී පුද්ගල අධිකරණ සභාව කතෝලික රටවලද අප්‍රසාදයට පත්ව තිබුණේය. දහවල් කාලයේදී එළිපිට කරන්නට පවා නොහැකි වූ කෲරතර වධ දීම් අඳුරු බිංගෙවල් තුළ ක්‍රියාත්මක විය. බොහෝ රටවල, ජාතියේ වීරයන් දහස් ගණනින් ඝාතනය කරන ලදී. නැතහොත් බොහෝ දෙනෙකුට තම නිජ භූමියෙන් පලායාමට සිදු විය. ඔවුන් අතර ඉතා පිරිසිවූ, ජනතා උපහාරයට ලක්වූ රදළයන්ද, බුද්ධිමතුන් හා උසස් අධ්‍යාපන ප්‍රවීනයන්ද, භක්තිමත් කැපවීමකින් යුතු වූ දේවගැතිවරුන්ද, කඩිසර වෘත්තීය වේදීන් සහ ජාති මාමකයින්ද, අති දක්ෂ පඬිවරුන්, ප්‍රතිභා පූර්ණ චිත්‍ර ශිල්පීන්, හා ප්‍රවීණ නිර්මාණ ශිල්පීන්ද කතෝලික නොවූ නිසාම මරා දමන ලදී. දඬුවම් විඳීමට නොකැමතිව තවත් අය විවිධ රටවල් කරා පලා ගියෝය.

ප්‍රතිසංස්කරණයේ දීප්තිමත් ආලෝකය නිවා දැමීමට රෝමය ක්‍රියාත්මක කළ සංහාරය මෙයාකාර විය. ජනතාව බයිබලයෙන් ඇත් කර තබා අඳුරු යුගයේ පැවැති ආකාරයට බයිබල් දැනුමක් නැතිකිරීම සහ මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි ක්‍රම නැවතත් පිහිටුවා ලීම රෝමානුවේ අරමුණ විය. එහෙත් දෙවියන්වහන්සේගේ ආශිර්වාද යටතේ, ලූතර්ට පසුව උන්වහන්සේ නැගිටවූ උදාර මිනිසුන්ගේ සේවය නිසා ප්‍රොතැස්තන්ත සමය නැතිකර දැමීමට හැකියාවක් නොවීය. ප්‍රොතැස්තන්ත ආගමේ ශක්තිය හිමිවන්නේ කුමාරවරුන්ගේ අනුග්‍රහයට හෝ ඔවුන්ගේ හමුදාවන්ට හෝ නොවන්නේය. කුඩා රටවල් සහ නිහතමානී වූ හා බලසම්පන්න නොවූ ජාතීන් එහි බලකොටු විය. ඇයගේ විනාශය සිදුකිරීමට යත්න දරමින් සිටි ජිනීවාව එවන් බලකොටුවක් විය. ස්පාඤ්ඤයේ කෲර පාලනයට එරෙහිව සටන් වැදී සිටි උතුරු මුහුද අසල වූ ඕලන්දය තවත් බලකොටුවක් විය. එය එකල පැවති රාජ්‍යයන් අතර ඉතාමත්ම බලවත්වූ ද, ඉතාමත්ම ධනවත්වූ ද රාජ්‍යයක් වූ ස්පාඤ්ඤයේ දරුණු ක්‍රියාකාරකම් සමග පොරබදමින් සිටියේය. නීරසවූ ද, නිස්සාරවූ ද, ස්වීඩනයද ප්‍රොතැස්තන්ත ව්‍යාපාරය වෙනුවෙන් ජයග්‍රහණය හිමි කරගත් රාජ්‍යයකි.

වසර තිහක් පමණ කාලයක් පුරා කැල්වින් ජිනීවාහි දේව සේවයෙහි යෙදුණේය. බයිබලය උගන්වන්නාවූ සාරධර්ම පිළිපදින්නාවූ සදාචාරාත්මක සභාවක් එහි ස්ථාපිත කිරීම ඔහුගේ මුල් වෑයම විය. ඔහුගේ අනෙක් සිහිනය වූයේ මුළු යුරෝපය පුරාම ප්‍රතිසංස්කරණය ව්‍යාප්ත කිරීමය. ප්‍රජා නායකයෙකු වශයෙන් ඔහු අනුගමනය කළ ක්‍රමවේදය වරද රහිත නොවීය. ඒ අතරම ඔහු ඉගැන්වූ ධර්මතාවන්ද වරදින් තොර නොවීය. එහෙත් කාලෝචිත දහම් ව්‍යාප්ත කිරීමෙහි ලා ඔහුගෙන් ඉටු වූ සේවය ඉමහත්ය. පාප් අධිකාරී බලයෙහි එන්නාවූ භීෂණ රැල්ලට එරෙහිව රෙපරමාදු ප්‍රඥප්ති පවත්වා ගෙන යෑමට ඔහු මනුෂ්‍යයන්ට මගපෙන්නුවේය. ඒ අතරම ප්‍රොතැස්තන්ත දෙව් මැදුරුවල සරල ජීවිත රටාවක් සහ ජීවිතයේ පවිත්‍රතාවක් පිළිබඳව බැතිමතුන් දැනුවත් කරමින්, එවැන්නකට ඔවුන් පෙළඹවීම ගැන ඔහු උනන්දු විය. රෝමානු ඉගැන්වීම් යටතේ ඉගැන්වුණු ජීවිත රටාව අහංකාරයෙන් යුතුවූ ද, දූෂිතවූ ද එකක් වූ අතර ඔහු පවිත්‍ර ජීවිත රටාවකට යොමුවීමට මනුෂ්‍යයන්ට මගපෙන්වූ වැදගත් සත්‍යයන් ඉදිරිපත් කළේය.

ප්‍රොතැස්තන්ත දහම් ප්‍රචාරය කිරීම පිණිස ජිනීවාහි සිට මුද්‍රිත ප්‍රකාශන සහ දහම් ගුරුවරුන්, දෙස් විදෙස් කරා යවනු ලැබීය. දැනමුතුකම් ලැබීම, අනුශාසනා සහ දිරිගැන්වීම් ලබාගැනීම උදෙසා හිංසා පීඩාවට පත්වූ අය ජිනීවාව දෙස නෙත් යොමා සිටියෝය.



ප්‍රොතැස්තන්තවාදීන් සොයමින් රෝමානුව දියත් කළ දඩයමේදී, ඔවුන්ට ආරක්ෂා සහිත ස්ථානයක් බවට කැල්වින්ගේ නගරය ප්‍රසිද්ධියට පත් විය. බටහිර යුරෝපයේ ප්‍රොතැස්තන්ත වූ කවරෙකු හට වුවද සතුරු උවදුරුවලින් පලා ගොස් ජිනීවාහි රැකවරණය ලබාගැනීමට හැකියාව උදා වී තිබුණේය. බඩගින්නෙන් පීඩා විඳිමින්, තුවාල වලින් වේදනා විඳිමින්, ගෙවල් දොරවල් සහ නෑදෑයින් නැතුව අසරණයන් ලෙසින් ජිනීවාවට පැමිණි මෙම අයව ආදරයෙන් පිළිගනිමින්, සෙනෙහසින් යුතුව ඔවුන් රැක බලා ගනිමින්, කරුණාවෙන් යුතුව සහනය සලස්වමින් ඔවුන්ට මෙහිදී ඉඳුම් හිටුම් සහ ආහාරපානද සපයනු ලැබීය. තමන්ට රැකවරණය ලබාදෙමින් ජීවත්වීමට තැනක් ලබාදීම වෙනුවෙන් එයට කළගුණ සැලකීමක් වශයෙන් ඔවුහු තමන්ගේ කුසලතා, අධ්‍යාපනය සහ ඔවුන්ගේ ශ්‍රද්ධා භක්තිය තමන් හදා වඩා ගත් රටට ලබා දුන්නෝය. මෙම නගරයෙහි රැකවරණය ලබාගත් අය ටික කලකට පසුව ආපසු තමන්ගේ ගම් රටවල් බලා ගියේ රෝමයේ කෲර ක්‍රියා කලාපයට එරෙහිව නැගී සිටීමටය. ජිනීවාහි සිට මොවුහු තම නිජ භූමි කරා සත්‍යතාවේ ආලෝකය රැගෙන ගියෝය. මොවුන් අතර වීර ස්කොට්ලන්ත ප්‍රතිසංස්කාරකයෙක් වූ ජෝන් නොක්ස්ද, එංගලන්ත ජාතික අති පාරිශුද්ධවාදීන් කිහිපදෙනෙක්ද, ඕලන්දයේ ප්‍රොතැස්තන්තවාදීන් කිහිප-දෙනෙක්ද ප්‍රංශයේ හියුගනෝවරුද ජිනීවාහි සිට තමන්ගේ රටවල් කරා ගියේ ඒවායේ පැවති අන්ධකාරය ආලෝකමත් කරන පිණිස සත්‍යයේ ආලෝක ධාරාව අතැතිවය.

# 13

## නෙදර්ලන්තය සහ ස්කැන්ඩිනේවියාව

නෙදර්ලන්තය රෝමයේ කුරිරු ඒකාධිපති පාලනයට එරෙහිව නැගී සිටියේය. මාටින් ලූතර් විසින් පුනරුදය ආරම්භ කිරීමට වසර හත්සියයකට පෙර නෙදර්ලන්තය රෝමයට විරුද්ධව නැගී සිටියාය. නෙදර්ලන්ත රජය විසින් ඇයගේ රදගුරු ප්‍රසාදීන් දෙදෙනෙකු තානාපති ගමනක් සඳහා රෝමයට යැව්වාය. එහිදී ඔවුන්ට "ශුද්ධාසනයෙහි" නැතහොත් පාප් බල අධිකාරී ව්‍යුහයේ නියම තත්ත්වය නියමාකාරයෙන් දැක බලාගැනීමට හැකි විය. මේ පිළිබඳව ඔවුන්ගේ වාර්තාවෙහි මෙසේ සඳහන් වේ. "දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජකීය අනාගත මනමාලිය ලෙස සභාව තෝරාගත් සේක. ඇයගේ පවුලේ සාමාජිකයන් උදෙසා උදාරවූ ද, සදාතනිකවූ ද, අවශ්‍යතාවන් සඳහා උමවනා කරන්නාවූ සියල්ල උන්වහන්සේ සපයා දුන් සේක. ඇයට දායාද කර ඇති දේ කාලයාගේ ඇවෑමෙන් නැති වී නොයන්නේය, ජරාවට පත් නොවන්නේය. උන්වහන්සේ ඇයට සදාතන ඔටුන්නක් සහ රාජකීය සෙංකෝලයක් හිමි කර දුන් සේක ... කතෝලික සභාවේ නායකයන් වන ඔබලා විසින් මේ සියල්ල සොරා ගෙන අත්පත් කරගෙන සිටිනවා. මේ ආශිර්වාද සාමාජිකයන් අතට පත්වීම දේව සැලැස්ම වන්නේය. ඔබ දෙවියන්වහන්සේගේ සේවයට කැප වූ දේව සේවකයෙකි. දේව සභාවේ පාලකයා වන ඔබ [පාප් තුමා] දේව මාළිගාවේ වැඩ සිටින්නේ දෙවියන්වහන්සේ ලෙසිනි. එඬේරෙකු ලෙස ක්‍රියා කරන්නේ නැතිව ඔබ ඔවුන්ට වෘකයෙකු බවට පත්ව ඇත. උත්තරීතර බිෂොප් ලෙස ඔබ කෙරෙහි විශ්වාස කිරීම ඔබ අපගෙන් බලාපොරොත්තු වෙනවා. එහෙත් ඔබ ක්‍රියා කරන්නේ කුරිරු පාලකයෙකු වාගේය. ... ඔබ සේවකයන්ගේ සේවකයෙක් විය යුතුය. තමා එසේ යයි ඔබම ඔබ ගැන පවසනවා. එහෙත් ඔබගේ වෑයම ස්වාමිවරුන්ගේ ස්වාමියා වීමටයි, ... ඔබ දෙවියන්වහන්සේගේ ආඥා නිග්‍රහයට පත් කරනවා, ... මෙම පොළෝ තලයෙහි වූ සියලුම සභාවන් ගොඩ නගන්නාවූ තැනැන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේය. ... අපගේ දෙවියන්වහන්සේගේ නගරය සගයේ ඇති සෑම ප්‍රදේශයක් වෙතම ව්‍යාප්තව පවතී. අපි එම නගරයේ පුරවැසියන් වෙමු. ශුද්ධ වූ දිවැසිවරුන් විසින් බබිලෝනිය යයි නම් කර ඇති නුවරට වඩා දෙවියන්වහන්සේගේ නගරය ඉතා විශාලය. තමන් දිව්‍යම යයි බබිලෝනිය සිතනවා. ඇය ස්වර්ගයට හිමිකම් කියනවා. තම ප්‍රඥව සදාතනික යයි ඇය පුරසාරම් දොඩවනවා. එනම් ඇය කවදාවත් වරදක් කර නැති බවත්, කවරදාවත් එසේ කරන්ට බැරි බවත් ඇය ප්‍රකාශ කරනවා. (Brandt, History of the Reformation in and about the Low Countries" b. 1, p. 6).

මෙම විරුද්ධතාව දෝංකාර කරමින් සෑම යුගයකම බැතිමත්හු ශතවර්ෂයෙන් ශතවර්ෂයට ඉදිරිපත් වූහ. මුල් යුගයේ විසූ මෙම ගුරුවරු විවිධ රටවල සංචාරය කරමින් විවිධ නම්වලින් හඳුන්වනු ලදුව, වෝඩෝ (වොල්ඩන්සියානු) ධර්මදූතයන්ගේ චරිතාංග අනුව යමින් ශුභාරංචියෙහි දැනුම සෑමතැනකම පතුරුවා හැරියෝය. ඔවුහු නෙදර්ලන්තයටද පැමිණියෝය. ඔවුහු වොල්ඩන්සියානු බයිබල් පිටපත නෙදර්ලන්තයේ බසට පරිවර්තනය කළෝය. ඔවුහු මෙසේ ප්‍රකාශ කළෝය. "එමගින් විශාල වාසියක් අත්පත් වේ. එහි කිසිම ආකාරයක නර්මාලාස නොහොත් විහිළු අන්තර්ගත නොවේ. මිථ්‍යා ප්‍රබන්ධ ඇතුළත්ව නැත. නොවටිනා දැයින් හානි සිදුවීමක් වී නැත, රැවටිලිකාර මුසාවන් එහි නැත, එහෙත් එහි ඇති අන්තර්ගතය වන්නේ සත්‍යතාවේ වචනය පමණක්ය. එහි තැනින් තැන ඝන වූ පිට පොත්තක් තිබිය හැක, නමුත් සත්‍යයවූද යහපත්වූද දේ පහසුවෙන් සොයා ගැනීමට පුළුවන. (Brandt, b. 1, p. 14). දොළොස් වැනි සිය වසරෙහි විසූ ආදිකාලීන ඇදහිල්ලෙහි මිතුරන් මෙසේ පවසා තිබේ.

රෝමානු හිංසා පීඩා ඇරඹුණි. ජීවිත නාශක ගිනි මැලය හා හිංසා පීඩා මධ්‍යයේ වුවද බැතිමතුන්ගේ සංඛ්‍යාව වැඩි වන්නට විය. ආගම සඳහා වූ එකම නොවරදින සුළු අධිකාරී බලය බයිබලය පමණක් බව ඔවුහු නොසැලෙන බසින් මෙසේ ප්‍රකාශ කළෝය: "විශ්වාස කිරීම පිණිස කිසිම අයෙකු හට බලහත්කාරකම් පෑමක් සිදු නොකළ යුතුය. දේශනා කිරීම් තුළින් ඔවුන්ව දිනාගත යුතුය." (Martyn, Vol. II, p. 57).

ලූතර්ගේ ඉගැන්වීම්වලට නෙදර්ලන්තය සුදුසු භූමියක් විය. ශුභාරංචිය දේශනා කිරීමට නිපුණත්වයක් තිබූ අවංක සේවකයෝ ඉදිරිපත් වූහ. ඕලන්දයේ එක් ප්‍රාන්තයකින් මෙනෝ සිමන්ස් ඉදිරියට පිවිසියේය. රෝමානු කතෝලිකයෙකු ලෙසින් අධ්‍යාපනය ලැබ, පූජකයෙකු ලෙස අභිෂේකය ලැබූ ඔහුගේ බයිබල් දැනුම ඉතා අල්ප විය. මිථ්‍යා දෘෂ්ටිය පිළිගැනීමට පෙළඹවීම් ඇති වේ යයි බියෙන් ඔහු ශුද්ධ බයිබලය කියවීම ප්‍රතික්ෂේප කළේය. සත්‍ය සම්මුඛ භූතිය හෙවත් සත්ප්‍රසාද ද්‍රව්‍යය සත්‍ය වශයෙන්ම ක්‍රිස්තුස්වහන්සේගේ නියම මාංශය බවටත් නියම රුධිරය බවටත් පරිවර්තනය වන්නේය යන දහම ඔහුගේ අනුමානයට භාජනය විය. එම අනුමාන සිතුවිල්ල සාතන්ගෙන් පැමිණි පරීක්ෂාවක් යයි ඔහු සිතන්නට විය. එය ඔහුගේ සිතට බරක් විය. එයින් මිදීම සඳහා ඔහු පාපෝච්චාරණය

කිරීමෙන්ද, යාච්ඤාවන් ඔප්පු කිරීමෙන්ද වෑයම් කළ නමුත් සියල්ල නිෂ්ඵල විය. හෘදය සාක්ෂියෙහි වරද පැටවීම් යටපත් කර තැබීම සඳහා හෙතෙම අනේකාකාර ක්‍රියාවන්හි යෙදුණේය. එහෙත් එයින්ද සහනයක් උදා නොවීය. ටික කලකට පසුව ඔහු අලුත් තෙස්තමේන්තුව කියවීමට පටන් ගත්තේය. එය අධ්‍යයනය කිරීම සහ ලූතර්ගේ කෘති කියවීම මගින් හෙතෙම ප්‍රතිසංස්කරණයේ දහම වැළඳ ගත්තේය. ප්‍රතිසංස්කරණයේ-බව්තීස්මයක් ලබාගැනීම නිසා එක් පුද්ගලයෙකු හිස ගසා දැමීමේ දඬුවමට ගොදුරු වූ සිද්ධියක් අසල ගම්මානයකදී ඔහුට දක ගන්නට ලැබුණේය. මෙම සිද්ධිය තුළින් ඔහුව යොමු වුණේ ළදරු බව්තීස්මය ගැන ශුද්ධ බයිබලයෙන් සත්‍යය දැන ගැනීමටය. එහෙත් ළදරු බව්තීස්මය පිළිබඳව කිසිම සාධකයක් ශුද්ධ බයිබලයෙන් සොයා ගැනීමට ඔහුට නොහැකි විය. බව්තීස්මය ලැබීමට පෙර පසුතැවිලිවීම සහ ඇදහිල්ල අනිවාර්ය බව ඔහුට වැටහුණේය.

මෙනෝ රෝමානු සභාවෙන් ඉවත් විය. තමා ලද සත්‍යතාවන් ඉගැන්වීමට ඔහු තම කාලය මිඩංගු කළේය. ජර්මනියේ සහ නෙදර්ලන්තයේ එක්තරා ආගම් උමතුවන් කණ්ඩායමක් සෙනඟ අතර කැළඹීම් ඇති කරමින් සිටියේය. ඔවුහු නිරර්ථකවූ ද, රාජද්‍රෝහීවූ ද දහම් උගන්වමින් රටේ ජනතාව ප්‍රචණ්ඩතාවයට සහ කැරැලි ගැසීමකට පොළඹවමින් ක්‍රියා කරන්නට වූහ. මෙම ක්‍රියාවේදයන් නිසා සිදුවිය හැකි භයානක ප්‍රතිඵල ගැන තැති ගත් හෙතෙම මේ අයගේ සාවද්‍ය ඉගැන්වීම් වලට සහ කූටෝපාය සැලසුම් වලට එරෙහිව දැඩි තීරණයක පිහිටා ක්‍රියා කරන්නට විය. එසේ වුවද, මෙම ආගමික උන්මන්තකයන්ගේ වසඟයට අවනතවී සිටි බොහෝ දෙනෙක් මෙම විනාශදායක දහම් අත්හැර දැමුවෝය. වොල්ඩන්සියානු දහම් සහ ඉගැන්වීම් වැළඳගත් අයගෙන් පැවත එන බොහෝ අය මෙම වකවානුවේ ජීවත්ව සිටියෝය. එම ජනතාව අතර මෙනෝ ඉතා සාර්ථක ලෙස ජ්වලිතයෙන් යුතුව සේවය කළේය.

උග්‍ර පීඩා සහ අග හිඟකම් විඳ දරා ගනිමින්, ජීවිතයේ අවදානම් තත්ත්වය සහ තර්ජන මධ්‍යයේ ඔහු තම බිරිඳ සහ දරුවන් සමග වසර විසි පහක් තැනින් තැන යමින් සේවය කළේය. නෙදර්ලන්තයේ සහ උතුරු ජර්මනියේ බොහෝ පෙදෙස් තරණය කරමින් ගමන් කළ හෙතෙම කාර්මික සහ කම්කරු පංතියේ ජනතාව අතර ප්‍රබල සේවයක් කරමින් විශාල වශයෙන් විහිදී ගිය අනුබලයක් දක්විය. සීමිත අධ්‍යාපනයක් ලැබුවද, කථාවෙහි දක්ෂයෙකු වූ හෙතෙම නොසැලෙන්නාවූ ආත්මාභිමානයක් තිබූ අයෙක් විය. ඔහු නිහතමානී ආත්මයකින්ද, මුදු මොළොක් හැසිරීම් රටාවකින්ද නිපුණවූ, අවංකවූ, අව්‍යාජ භක්තියකින් සැදුම්ලත් අයෙක් විය. ඉගැන්වූ සාර ධර්ම සහ



අණ පණත් වලට අනුකූලව තමාගේ ජීවිතය හැඩගස්වා ගෙන ක්‍රියා කළ හෙතෙම ජනතාවගේ විශ්වාසය දිනා ගත්තේය. ඔහුගේ අනුගාමිකයෝ බොහෝසේ විසිරී සිටියහ. ඔවුහු තාඩන පීඩනවලට ලක් වූහ. ඔවුන්වද ආගම් උන්මන්තකයන්වූ "මන්ස්ටරයිට් වරුන්" ලෙස හැඳින්වීම නිසාම මෙනෝගේ අනුගාමිකයෝ මහත් සේ හිංසා පීඩාවලට ලක් වූහ. එහෙත් මොහුගේ සේවයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ දෙනෙක් ප්‍රොතැස්තන්ත ආගම වැළඳ ගත්තෝය.

ප්‍රතිසංස්කරණයේ දහම් පිළිගත්තාවූ රට රාජ්‍යයන් අතර නෙදර්ලන්තය ප්‍රමුඛව සිටින්නීය. මේ දහම වැළඳ ගත් වෙනත් රටවලට වැඩියෙන් මේ රටෙහි මහත් හිංසා පීඩාවන් පැවතුණි. ජර්මනියේ V වන චාර්ල්ස් රජ ප්‍රොතැස්තන්ත ධර්මය තම රට තුළ ඇදහීම තහනම් කළේය. එම ආගමේ බැතිමතුන් සෑම අයෙකුම ඝාතනය කර දැමීමට මේ රජතුමා අදහස් කළ නමුත් එම රාජ්‍යයෙහි කුමාරවරු මෙවැන්නක් කිරීමට විරුද්ධව නැගී සිටියෝය. ඔහුගේ කුරිරු අපේක්ෂාව එයින් ව්‍යර්ථ විය. එහෙත් නෙදර්ලන්තයේ මේ ජර්මන් රජතුමාගේ බලය මහත් සේ ප්‍රබල විය. හිංසා පීඩා පැමිණවීමෙහි රාජකීය ආඥාවන් නිරතුරුවම නිකුත් විය. ශුද්ධ බයිබලය කියවීම, එයට ඇහුම්කන් දීම, හෝ දේශනා කිරීම පමණක් නොව ඒ ගැන කථා කිරීමද මරණීය දඬුවම් ලැබිය හැකි අපරාධ ලෙස හඳුන්වමින් රජ මැඳුරෙන් ආඥා නිකුත් විය. රහසිගතව දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම, සුරුවමකට හිස තබා ආචාර නොකිරීම, ගීතිකාවක් ගායනා කිරීම, මරණයට අත වැනීමක් විය. තමන්ගේ වරද දිවුරා අත් හැරිය අයද, සත්‍යයට විශ්වාස අයද දඬුවමට යටත් කරන ලදී. පිරිමි පක්ෂය වධකයාගේ කඩු පහරට යටත් විය, ස්ත්‍රී පක්ෂය පණ පිටින් වළලා දමන ලදී. චාර්ල්ස් රජතුමාගේද II පිලිප් රජතුමාගේද පාලනය යටතේ දහස් ගණන් බැතිමත්හු ජීවිතක්ෂයට පත් වූහ.

වරක් එක පවුලක සෑම සාමාජිකයෙක්ම ධර්මාධිකරණය ඉදිරියට පමුණුවනු ලැබූහ. ඔවුන්ට විරුද්ධව එල්ල වූ චෝදනාව නම් දිව්‍ය පූජාවට සහභාගි නොවීමත්, ගෙදර සිට නමස්කාර කිරීමත්ය. රහසින් ඔවුන් කළාවූ දේවල් ගැන ඔවුන්ගෙන් කරුණු විමසීමේදී බාල පුත්‍රයා මෙසේ උත්තර දුන්නේය. "දෙවියන්වහන්සේ අපගේ මනස් ආලෝකමත් කරන ලෙසත්, අපගේ පාපවලට කමාව දෙන ලෙසත් ඉල්ලා අපි දණින් වැටී යාච්ඤා කරනවා. අපගේ රජතුමා උදෙසාත්, අපි යාච්ඤා කරනවා. ඔහුගේ රාජ්‍ය පාලනය සමෘද්ධිමත් වන ලෙසත්, ඔහුගේ ජීවිතය ප්‍රීතිමත් එකක් වන ලෙසත් අපි යාච්ඤා කරනවා. දෙවියන්වහන්සේ අපගේ නඩුකාර තුමන්ව ආරක්ෂා කරන ලෙසත් අපි උන්වහන්සේගෙන් ඉල්ලා සිටිනවා." (Wylie, b. 18, Ch.

6). නඩුකාරවරුන්ගේ හදවත් මහත් සේ කම්පනයට පත්විය. එහෙත් පියා සහ එක් පුතෙක් මරණ දඬුවමට පත් කරනු ලැබූහ.

අනෙකුත් අයව වධ හිංසාවට පත්කරන්නාවූ අයගේ උදහස් වියරුව, වේදසාක්ෂිකයන්ගේ ඇදහිල්ලට සම විය. පිරිමි අය පමණක් නොව, සුකොමල කාන්තාවෝ සහ සියුමැලි තරුණියෝද පසුබට නොවන ධෛර්යයක් පෙන්නුම් කළෝය. "ස්වකීය සැමියන් ගිනි මැලය තුළ දවෙන්නාවූ අතරේදී බිරින්දෑවරු හැකි ප්‍රමාණයෙන් ඔවුන්ට සමීප වී සැනසීමේ බස් දෙඩූහ. ඔවුන්ව උද්‍යෝගිමත් කිරීමට ගීතිකා ගායනා කළෝය. මේ අතර තරුණියන් තමා බිලි ගන්නා මිනී වළවල සැතපුණේ රාත්‍රියේ නිදි යහනේ නිදිගන්නා විලාශයෙනි. ඔවුන් ගිනි මැළය තුළට පා නැගුවේ මනමාලියන් ලෙස සැරසී තම විවාහ මංගල්‍යයට පා තබන්නාවූ ආකාරයෙනි. (Wylie, b. 18, Ch. 6).

මිථ්‍යා දෘෂ්ටි දෙවි දේවතාවන් ඇදහීම සිදුවූ කාලයේදී ශුභාරංචිය විනාශ කර දැමීමට ක්‍රියා කිරීමෙහිදී සිදුවූ ලෙසම, මේ කාලයෙහිදීද කිතුණුවන්ගේ රුධිරය කිතුණු දහම රෝපණය කිරීමේ බීජය විය." (Tertullian's Apology, pa, 50).සත්‍යතාව වෙනුවෙන් වූ සාක්ෂිකරුවන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීමට හිංසා පීඩා, වධ වේදනා සහ මරණයට පත්කිරීම් හේතු කාරක විය. බැතිමතුන්ගේ අධිෂ්ඨාන ශක්තිය බිඳ දැමීමට රජතුමා කොතෙක් උත්සාහ කළද, ඒ සියල්ල ව්‍යර්ථ විය. බැතිමතුන්ගේ නොපසුබස්නා උට්ඨාන ස්ථාවරය නිසා වියරු වැටුණු රජතුමා දැඩි දඬුවම් ක්‍රියාත්මක කළද, බැතිමතුන් එයින් සලිත නොවීය. ඔරේන්ජ්හි විලියම් විසින් දියත් කළ විප්ලවය නිසා දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ නිදහස ඕලන්දයට උදා විය.

පීඩ්මොන්ට්හි කඳුකරයේද, ප්‍රංශයේ තැනිතලා බිම්හිද, ඕලන්දයේ මුහුදුබඩ පෙදෙස්හිද ශුභාරංචි ව්‍යාප්තිය සටහන් වූයේ එම බැතිමතුන්ගේ රුධිරයෙන්ය. ඒ අතර උතුරේ පිහිටි රටවලට ශුභාරංචිය ඇතුළු වුණේ සාමකාමී ලෙසින්ය. විටන්බර්ග් සරසවියෙහි අධ්‍යාපනය ලැබූ සිසුහු පුනරුද ඇදහිල්ල ස්කැන්ඩිනේවියාවට රැගෙන ගියෝය. ලූතර්ගේ ලියවිලිද ආලෝකය පතුරුවා ලීමට උපකාර විය. සරල ජීවිතයක් ගත කළ ශක්තිමත් මනුෂ්‍යයන් වූ උතුරේ ජනතාව රෝමානු සභාවේ තිබූ දූෂණ, ආටෝපය සහ මිථ්‍යා චාරිත්‍රයන්ගෙන් ඉවතට හැරී බයිබලයේ අඩංගු ජීවනය ලබා දෙන්නාවූ සත්‍යතාවත්, පාරිශුද්ධතාවත්, සරලත්වයත් ඉතා ආදරයෙන් පිළිගත්තෝය.

"ඩෙන්මාර්කයේ ප්‍රතිසංස්කරණයේ පුරෝගාමියා වූ ටෝසන් ගොවියෙකුගේ පුත්‍රයෙක් විය. තමා බුද්ධි මහිමය දායාද කරගත්



අයෙකු බව ඔහු ළමා වියෙහි පටන් පෙන්නුම් කළේය. අධ්‍යාපනය ලැබීමට ඔහු තුළ පිපාසාවක් තිබූ නමුත්, එම ආශාව සපුරා ගැනීමට ඔහුගේ දෙමාපියන්ගේ ආර්ථිකය හරස් විය. එහෙයින් ඔහු තාප-සාරාමයකට ඇතුළු විය. තාපසාරාමය තුළ ඔහු ගත කළ ජීවිතය පිරිසිදු චින්තනයක පැහැදිලි ප්‍රදර්ශනයක් විය. ඉගෙනීමට තිබූ උනන්දුවත්, කඩිසරකමත්, පෙන්නුම් කළ පක්ෂපාතකමත් නිසා ගුරුවරුන්ගේ ප්‍රසාදය දිනාගැනීමට ඔහු සමත් විය. තරඟ විභාගවලදී දක්වූ සමත්කම් නිසා ඔහු අනාගත දවසක සභාවට විශාල සේවයක් කළ හැකි කෙනෙක් බව බලධාරීන්ට පෙනී ගියේය. එම නිසා ඔහුට උසස් අධ්‍යාපනයක් ලබාදීමට අදහස් කළ සභා නායකයෝ ඔහුව ජර්මනියෙහි හෝ නෙදර්ලන්තයෙහි විශ්ව විද්‍යාලයකට යැවීමට තීරණය කර ගත්තෝය. විටන්බර්ග්හි විශ්ව විද්‍යාලය හැරෙන්නට වෙනත් අවශ්‍ය සරසවියක් තෝරා ගැනීමට ඔහුට අවසර ලැබුණේය. සභාවෙහි සිසුවා මිසදිටු දහම් මගින් දූෂ්‍ය නොවීමට බලධරයෝ සෑම පියවරක්ම ගත්තෝය. පැවිද්දෝ මෙයාකාරයෙන් පැවසූහ. "සභාවෙහි දක්ෂ සිසුවනට මිථ්‍යා දෘෂ්ටික වස විෂ ඇතුළුවීමට ඉඩ දිය නොහැකිය."

අධ්‍යාපනය ලැබීම සඳහා ටෝසන් කොලෝන් නගරය වෙත ගියේය. එම නගරය රෝමානු ආගමේ බලකොටුවක් විය. එහි සිටියාවූ පාසල්වල ආචාර්යවරුන්ගේ ගුප්ත ජීවිත රටාව ගැන මේ තරුණ ශිෂ්‍යයා කලකිරීමකට පත් විය. මේ වකවානුවේදීම ලූතර්ගේ ප්‍රකාශන ඔහු අතට පත්විය. විශ්මයෙන් සහ ප්‍රීතියෙන් යුතුව ඔහු එම ප්‍රකාශන කියෙව්වේය. ප්‍රතිසංස්කාරකයාගෙන් පුද්ගලිකව ගුරුහරුකම් ලබාගැනීමේ ආශාවක් ඔහු තුළ ඇති විය. එසේ කරන්නේ නම් ඔහුට තම ආරාමයේ නායක තාපසයාට විරුද්ධව කටයුතු කරන්නට සිදු වන්නේය. ඔහුට ලැබෙන්නාවූ සියලු ආධාර එවිට නවතින්නේය. අනාගතය පිළිබඳව ඔහු තීරණයකට පිවිසියේය. වැඩි දිනක් යන්නට පෙරාතුව හෙතෙම විටන්බර්ග්හි සිසුවෙකු බවට පත් විය.

ඩෙන්මාර්කය කරා නැවත පැමිණි හෙතෙම නැවත වරක් තම ආරාම කුටිය වෙත ගියේය. ඔහු ලූතර්වාදියෙකු යයි කිසිවෙකු හෝ සැක කළේ නැත. ඔහු තම රහස හෙළිදරව් කළේද නැත. තම සහචරයන්ගේ විරුද්ධවාදිකම් අවුස්සන්නේ නැතිව ඔවුන්ව වඩාත් පිරිසිදු ඇදහිල්ලක් වෙතටද වඩාත් ශුද්ධවූ ජීවිතයක් වෙතටද මගපෙන්වීම ඔහුගේ අරමුණ විය. ශුද්ධ බයිබලය විවෘත කළ හෙතෙම එහි යථාර්ථ අදහස තේරුම් කර දුන්නේය. පව්කාරයාගේ ධර්මිෂ්ඨකමත්, ගැළවීම අත්පත් කරගැනීමේ එකම බලාපොරොත්තුවත් ලෙස ඔහු ක්‍රිස්තුස්වහන්සේව හඳුන්වා දෙමින් දේශනා කළේය. මේ බව දැනගත් තාපසාරාමාධිපතිවරයා කෝපයෙන් දැවෙන්නට විය. රෝමානු ආගමේ

ආරක්ෂකයෙකු ලෙස මෙම සිසුවා සමත්වනු ඇතැයි ඔහු මහත් බලාපොරොත්තු තබාගෙන සිටියේය. ඔහු සිටි තාපසාරාමයේ සිට වෙනත් තාපසාරාමයක් වෙත ටෝසන්ව මාරු කර යවන ලදී. ආරාම කුටියෙන් පිටතට යෑම ඔහුට තහනම් විය.

ටෝසන්ගේ අලුත් ආරක්ෂකයන් මවිතයට සහ තැති ගැන්මට පත්කරමින් එම ආරාමයේ සිටි තාපසවරුන් කිහිප දෙනෙක්ම තමා ප්‍රොතැස්තන්ත දහම පිළිගත් බව ප්‍රසිද්ධියේ කියා සිටියෝය. තම කුටියෙහි පොලු අතරින් තම සගයන් සමග කථා බස් කළ හෙතෙම ඔවුන්ට සත්‍යතාව පිළිබඳ දැනුම ලබා දුන්නේය. සභාවේ ධර්මතාවනට විරුද්ධවූ දහම් උගන්වන්නාවූ අය මිසදිටුවන් යයි රෝමානු සභාව හෙළා දක ඇත. මිසදිටු දහම් පිළිබඳව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සභාවේ සැලැස්ම නියමිත ආකාරයෙන් ඩෙන්මාර්ක් ආගමික පියවරුන් ක්‍රියාත්මක කළේ නම්, ටෝසන්ගේ හඬ සදහටම නිශ්ශබ්ද කරනු ලබනවා ඇත. ඔහුට අඳුරු බිම් ගුහාවක තනිවම කල් ගෙවීමට සිදුකරනවා වෙනුවට ඔහුට දඬුවම් දීමක් වශයෙන් බලධරයන් කළේ ඔහුව තාපසාරාමයෙන් පන්නා දැමීමය. තවදුරටත් ඔහු කෙරෙහි රෝම අධිපතීන්ට පාලන බලයක් නොවීය. අලුත් දහම උගන්වන්නාවූ ගුරුවරුන්ට රාජ්‍ය රැකවරණය ලබා දෙමින් රජ වාසලින් නිවේදනයක් නිකුත් විය. මෙම රැකවරණ නිවේදනය නිකුත් වීමත් සමගම ටෝසන් දේශනා කරන්නට පටන් ගත්තේය. ඔහුට දේශනා කිරීමට දේවස්ථාන විවෘත විය. ඔහුට සවන් දීමට විශාල ජනකායක් දේවස්ථාන කරා ඇදී එන්නට විය. වෙනත් අයද දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන්ට පටන් ගත්තෝය. ඩෙන්මාර්ක් බසින් වූ අලුත් තෙස්තමේන්තු පිටපත බොහෝ දෙනාගේ අත්වලට පත්විය. අලුත් දහම් ව්‍යාප්තිය නතර කිරීමට පාප්වාදීන් ගත් උත්සාහයේ අතුරු ඵලයක් වශයෙන් ශුභාරංචි දහම් ප්‍රචාරය සීඝ්‍ර ලෙස වර්ධනය විය. වැඩි කලක් යාමට මත්තෙන් ඩෙන්මාර්කය ප්‍රතිසංස්කරණයේ ඇදහිල්ල පිළිගත් රටක් බවට ප්‍රකාශයට පත්විය.

විටන්බර්ග් ජල උල්පතින් දහම් රස බැලූ ස්වීඩන් ජාතික තරුණයෝද ජීවනයේ වතුර තම මව් රටට ගෙන ගියෝය. මෙම අය අතුරෙන් ඕලාෆ් සහ ලෝරෙන්ටියස් පෙට්රි සහෝදරයන් දෙදෙනා කැපී පෙනේ. ඔරෙබ්‍රෝ ගම්මානයේ කම්මල්කරුවෙකුගේ පුතුන් වූ මේ සොහොයුරන් දෙදෙනා ලූතර් සහ මෙලැන්ක්තන් යටතේ ශුභාරංචි දහම් ඉගෙන ගත්තෝය. තමා ඉගෙනගත් සත්‍යතාවන් අන් අයටත් ඉගැන්වීමට ඔවුන් තුළ පැවැතියේ මහත් උනන්දුවකි. ඕලාෆ්ගේ ක්‍රමවේදය ලූතර්ට සමාන විය. තමාගේ ජ්වලිත භාවයෙන් සහ කථිකත්වයෙන් ඔහු ජනතාව පුබුදු කළේය. ඔවුන් තුළ බලාපොරොත්තුව



සහිත උනන්දුවක් ඇති කළේය; මේ අතර ලෝරෙන්ටියස් තම ගුරුවරයා වූ මෙලැන්ක්තන් අනුව යමින් උගත්කම දියුණු කරගෙන, සිතා බලා ක්‍රියා කරන්නාවූ වැඩි කලබලකාරී නොවූ ජීවිත රටාවක් ගෙන ගියේය. සහෝදරයන් දෙදෙනාම දැඩි භක්තිය හිමි කරගත් අයවූ අතර දේව ධර්මය පිළිබඳව ඔවුන් ඉතා ඉහළ මට්ටමේ දැනුමක් අත්පත් කරගෙන සිටියෝය. සත්‍යතාව බෙදා හැරීමට ඔවුන් තුළ පැවැතියේ පසුබට නොවන නිර්භීතකමකි. පාප් වාදී විරුද්ධතාවන්ගෙන් අඩුවක් නොවීය. කතෝලික පූජකයෝ මිථ්‍යා දෘෂ්ටික වතාවත්හි ඇලී ගැලී සිටි වැඩි දැනුමක් නැති ජනතාව කළඹා ශුභාරංචියට විරුද්ධව ක්‍රියා කරන්නට ඔවුන් පෙළඹවූහ. ඕලාෆ් පෙට්රිට සැහැසි ජනයාගෙන් නිතරම අතවර සිදුවිය. කිහිප වතාවක්ම ඔහු තම ජීවිතය බේරා ගත්තේ මහත් අසීරුවෙන්ය. එහෙත්, මේ පුනරුදවාදීන් රජතුමාගේ අනුග්‍රහයට භාජනව ඔහුගේ රැකවරණ ලැබූහ.

රෝම සභාවේ පරිපාලනය යටතේ ජනතාව දරිද්‍රතාවෙන් පීඩිතව සිටියෝය, දැඩි පීඩනයට ලක් වූවෝය. ශුද්ධ ලියවිලි පිළිබඳව දැනුමක් ඔවුන්ට නොවීය. ඔවුන් තුළ පැවැතියේ වතාවත් සහ සම්ප්‍රදායික විශ්වාසයන් මත පදනම්වූ ආගමකි. එම නමස්කාර ක්‍රමය තුළින් මනසට කිසිම ආලෝකයක් ලැබුණේ නැත. ඔවුහු තම පැරැන්නන්ගේ මිථ්‍යා දෘෂ්ටික විශ්වාසයන් සහ පුරුදු කරා ක්‍රම ක්‍රමයෙන් නැඹුරු වෙමින් සිටියෝය. තරඟකාරී පාර්ශ්ව දෙකක් මැද ජාතිය අතරමං වී සිටියේය. ඔවුන්ගේ නිරන්තර ගැටුම් නිසා මහත් කාලකණ්ණිකමක් ජාතිය ගිල ගත්තේය. රජයේ සහ ආගමේ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට රජතුමා දැඩි ස්ථාවරයක පිහිටා සිටියේය. රෝමානුවට විරුද්ධව දියත් කළ සටනට ආධාර කිරීමට ඔහු මේ දක්ෂ සහායකයන් සතුටින් පිළිගත්තේය.

රජතුමා සහ ස්වීඩනයේ නායකයන්ද ඉදිරියෙහිය ඕලාෆ් පෙට්රි පුනරුද ඇදහිල්ලේ ධර්මතාවන් ඉදිරිපත් කර ඒවා රැකගත්තේය. කතෝලික පියතුමන්ලාගේ ඉගැන්වීම් පිළිගත යුත්තේ එම ඉගැන්වීම් ශුද්ධ ලියවිල්ලට අනුකූලතාවක් දක්වන්නේ නම් පමණක් යයි ඕලාෆ් කියා සිටියේය. සෑම පුද්ගලයෙකුටම තේරුම් ගත හැකිවන පරිදි ඇදහිල්ලෙහි ඉතා අවශ්‍යවූ දහම් පැහැදිලි ලෙසද සරල ලෙසද ශුද්ධ ලියවිල්ලෙහි ඇතුළත් කර තිබෙන බව ඔහු දක්වූයේය. ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පවසා තිබේ: "මාගේ ඉගැන්වීම් මාගේ නොව මා එවූ තැනැන්වහන්සේගේය." (ශු. යොහන් 7:16). එසේම, පාවුල්ද මෙසේ පැවසුවේය: "අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් ... නුඹලාට ප්‍රකාශ කරතොත් ඔහු ශාප ලද්දෙක් වේවා!" (ගලාති 1: 8). ඉක්බිතිව පුනරුද වාදියා මෙවන් ප්‍රශ්නයක්

ඉදිරිපත් කළේය. "එසේනම් සමහර අය තමන්ගේ අභිමතාර්ථය පරිදි ආගමික සිද්ධාන්ත නිර්මාණය කර ගැළවීම සඳහා එම ඉගැන්වීම් පිළිපැදිය යුතු යයි නියෝග කරන්නේ කෙසේද? (Wyhlie, b. 10, Ch. 4). සභාව විසින් පනවන ලද අණ පනත් දෙවියන්වහන්සේගේ ආඥාවන්ට පටහැනි නම් සභාවේ අණ පනත් වලංගු නැති බව ඔහු පෙන්වා දුන්නේය. ඇදහිල්ලෙහි සහ පැවැත්මෙහි එකම නීති මාලාව "බයිබලය සහ බයිබලය පමණක්" යයි ප්‍රකාශ කරන්නාවූ ප්‍රොතැස්තන්ත සභාවෙහි ශ්‍රේෂ්ඨ ප්‍රඥප්තිය ආරක්ෂා කරමින් ඔහු එය දරා සිටියේය.

වඩාත් ප්‍රසිද්ධ නොවූ ස්ථානයක පිහිටි වේදිකාවක පැවැත්වූ මෙම විවාදය අප හමුවේ ප්‍රකාශ කරන්නේ පුනරුද හමුදාවේ භට කණ්ඩායමේ සිටි අයගේ බයිබල් දැනුම සහ ස්ථාවරය කෙබඳු ආකාර වූයේද කියාය. ඔවුහු නූගත් අයද නිකායකට ගැතිවූ අයද නොවූහ, ඝෝෂාකාරී අරගලවාදීහු ද නොවූහ. ඔවුහු දේව වචනය උගත් අය වූහ. බයිබලය මගින් සපයා දෙන්නාවූ අවි ආයුධ භාවිතා කරන අන්දම ගැනද ඔවුන් මනා සේ පුහුණුව ලබා සිටියෝය. සමකාලීනයන් අතර ඔවුන්ගේ පාණ්ඩිත්‍යය ඉතා ඉහළින් කැපී පෙනුණේය. අපගේ අවධානය විටන්බර්ග් සහ සූරිච් යන සුවිශේෂ මධ්‍යස්ථාන වෙත යොමු කරන කල්හි ලූතර් සහ මෙලැන්ක්තන් ද, ස්වින්ග්ලි සහ එකොලැම්පේඩියස් ද යන සත් කීර්තිමත් පුද්ගලයන් අපගේ මතකයට නැගේ. මෙම අය ප්‍රොතෙස්තන්ත ව්‍යාපෘතියේ නායකයන් ලෙස නිරායාසයෙන්ම පිළිගැනීමට අපට සිදු වේ. ඔවුන් වනාහි පුදුමාකාර බලයක් තිබූ, විශාල බයිබල් දැනුමක්ද අත්පත් කරගෙන තිබූ පුද්ගලයන් ලෙස පිළිගැනීමට අපට සිදුවේ. ඔවුන්ගේ ගෝල බාලයන් දෙස බලමු. ස්වීඩනයේ අප්‍රකට රඟහලකට අවධානය යොමු කරමු. ඕලාෆ් සහ ලෝරෙන්ටියස් පෙට්රි සහෝදරයන් දෙදෙනා තුළ අපට දැකගත හැකිවන්නේ කුමක්ද? මෙම සොහොයුරන් දෙදෙනා ශබ්ද නගා තර්ක කරන නූගත්, පටු අදහස් ඇති අය නොවූහ. ඔවුහු උසස් අධ්‍යාපනයක් ලැබූ අය වූහ. ශුභාරංචි සත්‍යතාවන්ගේ සම්පූර්ණ ව්‍යුහය පිළිබඳව ඔවුන් ඉතා ගැඹුරට හදාරා තිබුණි. රෝමානුවන්ගේ වියතුන් සහ බොරුවට තර්ක කරන්නන් අන්ත පරාජයට පත්කිරීමට ප්‍රතිසංස්කරණයේ මේ වියතුන් සමත් වූහ. (Wylie, b. 10. ch. 4).

මෙම විවාදයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ස්වීඩනයේ රජතුමා ප්‍රොතැස්තන්ත ඇදහිල්ල පිළිගත්තේය. වැඩි කලක් ගතවීමට පෙර ස්වීඩනයේ ජාතික නියෝජිත මණ්ඩලය තමා ප්‍රොතැස්තන්ත දහමට පක්ෂපාතී බවට නිවේදනයක් නිකුත් කළේය. ඕලාෆ් පෙට්රි අලුත්



තෙස්තමේන්තුව ස්වීඩනයේ රාජ්‍ය භාෂාවට පරිවර්තනය කළේය. රජතුමාගේ ආරාධනයක් පරිදි මුළු බයිබලයම ජාතියේ මව් බසට පරිවර්තනය කිරීමට පෙට්රි සහෝදරයන් දෙදෙනා සමත් වූහ. මෙසේ පළමු වතාවට ස්වීඩන් ජාතිකයන්ට තමන්ගේ මව් බසින් දේව වචනය කියවීමේ භාග්‍යය උදා විය. රට තුළ සිටින්නාවූ දේවගැතිවරුන් විසින් ශුද්ධ ලියවිලි පහදා දිය යුතු යයිද, පාසල් සිසුන්ට බයිබලය කියවීමට ඉගැන්විය යුතු යයිද නීතිගත කරමින් පාර්ලිමේන්තුවේදී පනතක් සම්මත විය.

නොදත්කමේ සහ මිසදිටු ඇදහිල්ලේ අන්ධකාරය ක්‍රම ක්‍රමයෙන්ද ස්ථිර වශයෙන්ද දුරු කිරීමට ශුභාරංචියේ ආශිර්වාද ලත් ආලෝකයට හැකියාව ලැබුණේය. රෝමානු ආධිපත්‍යයේ පීඩනයෙන් නිදහස ලැබූ ස්වීඩනය මෙතෙක් නොවූ විරූ ශක්තියකටද, ශ්‍රේෂ්ඨත්වයකටද හිමිකම් කීවාය. ඇය රෙපරමාදු ඇදහිල්ලේ ප්‍රාකාරයක් බවට පත් විය. ශත වර්ෂයකට පසුව, ඉතා වේදනාකාරී උපද්‍රව සහිත අවස්ථාවකදී මෙම කුඩාවූ ද, ශක්තිමත් නොවූ ද, රාජ්‍යය ජර්මනියට ආධාර කරන්නට ඉදිරිපත් වූවාය. මේ වන විට ජර්මනිය වසර තිහක් පුරා යුද්ධයක පැටලී සිටියාය. ඇයට පිහිට වීමට යුරෝපයේ එකම රටක් හෝ ඉදිරිපත් නොවීය. ජර්මනියට උපකාර කරන පිණිස ඉදිරිපත් වුණේ ස්වීඩනය පමණකි. රෝමානුවන්ගේ ජයග්‍රහණයේ රැල්ල මැඩලීමට ජර්මනියේ උදව්වට පැමිණියේ ස්වීඩනයේ යුද්ධ හමුදාවන්ය. එම යුද්ධයේදී ප්‍රොතැස්තන්ත සභාවට - කැල්වින්වරුන්ට මෙන්ම ලූතර්වරුන්ටද - සහනශීලීව සැලකීමේ අවසරය හිමි විය. එසේම ප්‍රතිසංස්කරණ ධර්මයන් පිළිගත් රටවල අයට හෘදය සාක්ෂිය අනුව ක්‍රියාකිරීමේ නිදහස නැවත උදා විය.

# 14

## පසුකාලීන ඉංග්‍රීසි ජාතික ප්‍රතිසංස්කරණවාදීහූ

වසා දමා තිබූ ශුද්ධ බයිබලය ජර්මානු ජාතිකයන්ට විවෘත කිරීමේ කාර්යය ලූතර්ගේ නායකත්වයෙන් සිදුවූ ආකාරයෙන්ම, දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ එවැනිම කර්තව්‍යයක් එංගලන්තයේ සිදුකිරීමට ටින්ඩේල්ට මගපෙන්වනු ලැබීය. ලතින් පිටපත් අනුසාරයෙන් වික්ලිෆ් විසින් ඉංග්‍රීසි බසින් බයිබලය පරිවර්තනය කළ නමුත් එහි වැරැදි ගණනාවක් අඩංගු විය. එම බයිබල් පරිවර්තනයෙහි මුද්‍රිත පිටපත් එළි දුටුවේ නැත. අතින් ලියන ලද පිටපත්වල මිල ඉතා අධික විය. ධනවතුන් කිහිප දෙනෙකුට සහ වංශාධිපතිවරුන් කිහිප දෙනෙකුට පමණක් එම පිටපත් මිලදී ගැනීමේ හැකියාවක් තිබුණේය. තවද, එම බයිබල් පිටපත් බෙදා හැරීම සභාව විසින් තහනම් කර තිබූ නිසා එහි අලෙවිය ඉතා අල්ප විය. ලූතර්ගේ ප්‍රබන්ධ නිකුත් වීමට වසරකට පෙර, එනම් 1516 දී එරැස්මස් ස්වකීය ග්‍රීක සහ ලතින් අලුත් තෙස්තමේන්තු පරිවර්තන ප්‍රකාශනයට පත් කළේය. දෙවියන්වහන්සේගේ වචනය ප්‍රථම වතාවට මුල් භාෂාවෙන් මුද්‍රණය කර ප්‍රකාශයට පත්විය. කලින් නිකුත් කළ පිටපත්වල තිබූ බොහෝ වැරැදි මෙම පිටපතෙහි නිවැරැදි කර තිබුණේය. ඒ අතර අදහස් ප්‍රකාශයද පැහැදිලි ලෙස ශෝධනය කර තිබිණ. මෙම ප්‍රතිසංස්කෘත පිටපත මගින් බොහෝ උගතුන්ට සත්‍යය වඩාත් පැහැදිලි විය. සත්‍යතාව පිළිබඳව වඩාත් පුළුල් අවබෝධයක් ලබාගැනීමට ඔවුන්ට එමගින් හැකි විය. මෙයින් ප්‍රතිසංස්කරණයේ වැඩකටයුතු වලට විශාල අත්වැලක් උදා විය. කෙසේ වුවද, මේ වන තුරුත් පොදු ජනතාවට දෙවියන්වහන්සේගේ වචනය ලැබී නොතිබුණේය. වික්ලිෆ් පටන්ගත් බයිබල් පරිවර්තනය නිම කිරීම ටින්ඩේල්ගේ මෙහෙය විය. මෙයින් එංගලන්ත ජනතාවට බයිබලය තම මව් බසින් කියවීමේ භාග්‍යය උදා විය.

ඉතා කඩිසර උත්සාහවන්ත සිසුවෙකු වූ ටින්ඩේල් ඉතා අවංකව සත්‍යතාව සොයා ගිය අයෙක් විය. ඔහුට ශුභාරංචිය ලැබුණේ එරැස්මස්ගේ ග්‍රීක තෙස්තමේන්තුවෙන්ය. තමා ඒත්තු ගත් දහම් අභීත ලෙස දේශනා කිරීමට ඔහු පසුබට වුණේ නැත. සෑම දහමක්ම ශුද්ධ ලියවිලි මගින් සෝදිසි කළ යුතු යයි ඔහු නිර්දේශ කළේය. සභාවට ශුද්ධ බයිබලය ලබාදී ඇති බවත්, සභාවට පමණක් ශුද්ධ බයිබලය තේරුම් කරදීමට හැකියාව ඇති බවත් පාප්වාදීහූ ප්‍රකාශ කළෝය. ටින්ඩේල් මෙයට මෙසේ ප්‍රතිචාර දක්වීය. "රාජාලියන්ට ගොදුරු සොයා ගන්නට ඉගැන්නුවේ කව්දැයි ඔබ දන්නෙහිද? එසේ ඉගැන්වූ



දෙවියන්වහන්සේම බඩගින්නේ සිටින තමන්ගේ දූ දරුවන්ට උන්වහන්සේගේ වචනය තුළ තම පියාණන්ව සොයා ගැනීමට උගන්වනසේක. අපගේ පරිහරණය පිණිස ශුද්ධ ලියවිලි අපට ලබා දෙනවා වෙනුවට ඔබ කර තිබෙන්නේ ඒවා අපගෙන් වසන් කර තැබීමයි. ශුද්ධ ලියවිල්ල උගන්වන්නාවූ අයව ගිනි තබා මරා දමන්නේ ඔබය. හැකිනම් ඔබ ශුද්ධ ලියවිල්ල ද ගින්නට බිලි කරනවා ඇත." (D. Aubigne, b. 18, Ch. 4).

ටින්ඩේල්ගේ දෙසුම් නිසා ජනතාව උනන්දු වූහ. බොහෝ දෙනෙක් සත්‍යතාව පිළිගත්තෝය. රෝමානු පූජකයෝ නිශ්ශබ්දව බලා නොසිටියෝය. දේශනාව හමාර වී ඔහු වෙනත් පෙදෙසක සේවය සඳහා නික්ම ගිය වහාම ඔහුගේ වැඩය කඩාකප්පල් කිරීමට රෝමානු පූජකයෝ ක්‍රියාත්මක වූහ. ටින්ඩේල්ගේ දහම් වලට වැරැදි අර්ථකථන සැපයූ ඔවුහු, ටින්ඩේල්ගේ දහම් පිළිගන්නා අයට තර්ජනය කිරීමෙන්ද වැලකුණේ නැත. බොහෝ විට පැවිද්දෝ ජයග්‍රහණය කළෝය. "මේ ගැන මම මොකක්ද කරන්නේ? මම එක් තැනක බීජ වපුරන විට රෝමානු පැවිද්දෝ මා කලින් සේවය කළ තැන අලාපාළු කරනවා. මට එකවර සෑම තැනකම සිටින්න බැහැ. අහෝ! කිතුණු බැතිමතුන්ට තමන්ගේම භාෂාවෙන් ශුද්ධ වූ ලියවිලි හිමිව තිබුණා නම්, ව්‍යාජ ඉගැන්වීම් වලට විරුද්ධව නැගී සිටීමට ඔවුන්ටත් හැකි වේවි. බයිබලය නොමැතිව ගිහියන්ව සත්‍යතාව තුළ ස්ථාපිත කිරීමට කිසිසේත් නුපුළුවන," (D. Aubigne, b. 18, Ch. 4) යනුවෙන් ටින්ඩේල් පැවසුවේය.

ටින්ඩේල්ගේ මනසට අලුත් අරමුණක් ඇතුල් විය. ඔහු මෙසේ සිතන්නට විය. "යෙහෝවාඃවහන්සේගේ දේව මාළිගාවේදී බැතිමතුන් ගීතිකා ගායනා කළේ ඊශ්‍රායෙල්වරුන්ගේ භාෂාවෙන්ය. එසේම අප අතරත් ශුභාරංචිය ඉංග්‍රීසි බසින් කථා කළ යුතු නොවේද? ... අරුණෝදයේදී තිබෙනවාට වඩා වැඩි ආලෝකයක් මධ්‍යාහ්නයේදී සභාවට ලැබිය යුතු නොවේද? ... එංගලන්තයේ කිතුණුවන්ද තමන්ගේම මව් බසින් අලුත් තෙස්තමේන්තුව කියවිය යුතුය." සභාවේ සිටි ආචාර්යවරු සහ ගුරුවරු සමහර කරුණු පිළිබඳව එකම මතයක පිහිටා නොසිටියෝය. සත්‍යතාවය දැනගැනීමට ශුද්ධ බයිබලය අවශ්‍ය වේ. සත්‍යතාව වෙත ළඟා විය හැකිවන්නේ බයිබලය තුළින් පමණක්ය. "කෙනෙක් එක් දහමක් අල්ලා ගන්නවා. තවත් කෙනෙක් වෙනත් දහමක් අල්ලා ගන්නවා. මෙම අදහස් එකිනෙකට වෙනස්ය. වැරදි දේ කියන එක්කෙනාගෙන් හරි දෙය කියන එක්කෙනා තෝරා ගන්නේ කොහොමද? ... කොහොමද? ... එසේ කිරීමට පුළුවන් වන්නේ දෙවියන්වහන්සේගේ වචනය මගින් පමණක්ය." (D’ Aubigne, b. 18, Ch. 4).

ටින්ඩේල් සමග මත ගැටුමක පැටලී සිටි උගත් කතෝලික ආචාර්යවරයෙක් මෙසේ පැවසුවේය. "පාප්ගේ අණ පනත්වලට වඩා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව නැතුව සිටීම අපට ශුභදායකය." ටින්ඩේල් එයට ප්‍රතිචාරය දැක්වූයේ මෙසේය. "පාප්ටත් ඔහුගේ නීතිවලටත් මම විරෝධය ප්‍රකාශ කරනවා. දෙවියන්වහන්සේ මාගේ ජීවිතය ආරක්ෂා කළහොත්, වැඩි අවුරුදු ගණනාවක් යෑමට පෙර නගුලක් හසුරුවන්නාවූ ළමයෙකුට ඔබ දන්නවාට වඩා වැඩියෙන් ශුභාරංචි දැනුමක් ලබා දීමට මම ක්‍රියා කරනවා." (Anderson, "Annals of the English Bible" p. 19).

තමන්ගේම මව් බසින් අලුත් තෙස්තමේන්තු ශුද්ධ ලියවිලි ජනතාවට ලබාදීමට වූ ඔහුගේ සිතැහියාව ස්ථිර විය. ඔහුගේ අදහස සඵල විය. ඔහු වහ වහාම තම කර්තව්‍යය ඇරඹීය. වධ හිංසා නිසා ගෙදරින් පළවා හරිනු ලැබූ ටින්ඩේල් ලන්ඩනයට ගියේය. අවහිරතාවන්ගෙන් තොරව හෙතෙම ටික කලක් එහිදී තම කාර්යය කරගෙන ගියේය. එහෙත් පාප්වාදීන්ගේ සැහැසිකම් වැඩි වූ නිසා ඔහුට නැවත වරක් පලායාමට සිදුවිය. එංගලන්තයේ දොරටු සියල්ලක්ම ඔහුට විරුද්ධව වැසී ගිය බවක් පෙනුණි. ජර්මනියේ පිහිට පැතීමට ඔහු තීරණය කර ගත්තේය. මෙහිදී හෙතෙම ඉංග්‍රීසි අලුත් ගිවිසුම මුද්‍රණය කිරීම ආරම්භ කළේය. මුද්‍රණ කටයුතු දෙවරක්ම නවත්වන ලදී. මුද්‍රණය කිරීම එක් නගරයකදී තහනම් කළ විට ඔහු වෙනත් නගරයකට පලා ගියේය. අන්තිමේදී ඔහු වර්ම්ස් වෙත පැමිණියේය. එයට වසර කිහිපයකට පෙර ලූතර් විසින් එහිදී මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහිදී ශුභාරංචිය රැකගෙන තිබුණි. එම පුරාණ නගරයෙහි ප්‍රතිසංස්කරණයට හිතැති මිතුරෝ බොහෝ දෙනෙක් සිටියෝය. තවත් බාධා කිරීම් කිසිවකින් තොරව ටින්ඩේල් තම කාර්ය භාරය අඛණ්ඩව කරගෙන ගියේය. මුල්වරට අලුත් ගිවිසුමේ පිටපත් තුන්දහසක් මුද්‍රණ ද්වාරයෙන් පිට විය. තවත් පිටපත් ගණනාවක් එම වසරේදීම මුද්‍රණය කරන ලදී.

මහත් උනන්දුවකින් සහ නොපසුබස්නා උත්ථාන වීර්යයකින් යුතුව ටින්ඩේල් තම පරිවර්තන කටයුතු දිගටම කරගෙන ගියේය. එංගලන්ත බලධරයෝ එහි තොටුපලවල් ඉතා පරික්ෂාකාරීව රැකවල් කළ නමුත් දෙවියන්වහන්සේගේ වචනය විවිධ රහස් මාර්ග ඔස්සේ ලන්ඩනයට පැමිණියේය. දේව වචනය රැගත් මුද්‍රිත පිටපත් රට පුරාම බෙදා හරින ලදී. පාප්වාදීහු සත්‍යතාව යටපත් කර තැබීමට වෑයම් කළ නමුත් ඒ සියල්ල ව්‍යර්ථ විය. ටින්ඩේල්ගේ මිතුරෙකු වූ පොත් වෙළෙන්දෙකු ළඟ තිබූ බයිබල් පිටපත් සියල්ලම ඩර්හැම්හි රදගුරු තුමා විසින් මිලදී ගන්නා ලදී. බයිබල් පිටපත් සියල්ලම විනාශ කර දැමීම ඔහුගේ අරමුණ විය. එසේ කිරීමෙන් බයිබල් පිටපත් ප්‍රචාරයට බාධා කළ හැකි වේ යයි ඔහු සිතුවේය.



නමුත් බයිබල් පිටපත් විකිණීමෙන් ලැබූ මුදලින් එයට වඩාත් යහපත් සංස්කරණයක් මුද්‍රණය කිරීමට අවස්ථාව උදා විය. එම මුදල් ලැබුණේ නැති නම් අලුත් සංස්කරණයට වියදම් සොයා ගැනීම ගැටළුවක් වන්නට ඉඩ තිබුණේය. ටික කලකට පසුව ටින්ඩේල් සිරභාරයට පත්විය. එක කොන්දේසියක් මත ඔහුව නිදහස් කිරීමට යෝජනාවක් විය. එනම් බයිබල් මුද්‍රණය කිරීම සඳහාවූ වියදම දැරීමට ඔහුට උපකාර කළ අයගේ නාමාවලියක් සැපයීම ඔහුගෙන් බලාපොරොත්තු විය. එම මුදල් ලබාදීම සඳහා වෙනත් කිසිම පුද්ගලයෙකුට වඩා ඩර්හැම්හි රදගුරුවරයා උපකාර කළ බව ඔහු ප්‍රකාශ කළේය. ඔහු ඉතිරිව තිබූ පිටපත්වලට වැඩි මිලක් ගෙවා මිලදී ගැනීමෙන් තමාට ධෛර්යයෙන් යුතුව ඒ වැඩය තවදුරටත් කරගෙන යාමට හැකියාව ලැබූ බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.

ටින්ඩේල්ව සතුරන්ගේ අතට පාවා දෙන ලද්දේය. වරක් මාස ගණනාවක් සිර ගෙයි සිටීමට ඔහුට සිදුවිය. අන්තිමේදී හෙතෙම තම ඇදහිල්ල උදෙසා වේද සාක්ෂිකරුවෙකු ලෙස දිවි පිදීය. එතෙක් ඔහු විසින් සූදානම් කළ ආයුධ රැගත් වෙනත් සොල්දාදුවෝ අද දක්වාම සටන් බිමට වැදී සත්‍යතාව වෙනුවෙන් සටන් කරති.

වේදිකාව මත රැව් දුන් ලැටිමර්ගේ හඬ කියා සිටියේ ජනතාවගේ බසින් ශුද්ධ බයිබලය කියවීම අනිවාර්ය විය යුතුය යන්නය. ඔහු මෙසේ පැවසීය, "ශුද්ධ ලියවිලි කතුවරයාණෝ දෙවියන්වහන්සේම වනසේක. එහි කතුවරයාණන්ගේ බලපරාක්‍රමය සහ සදාතනික පැවැත්ම සමග ශුද්ධ ලියවිල්ල එක්ව සහභාගිත්වය දරයි. සෑම රජ කෙනෙක්ම, සෑම අග රජතුමෙක්ම, සෑම විනිශ්චයකාරයෙක්ම, සෑම ජන නායකයෙක්ම උන්වහන්සේගේ ශුද්ධ වචනයට කීකරු වීමට බැදී සිටිති. මානුෂික නියෝග නමැති වෙනත් මාර්ගවල ගමන් කිරීමෙන් අපි වැළකී සිටිමු. ඒ මාර්ගවල ගල්, අතු හා ගලවන ලද ගස් බොහෝය. අපි දේව වචනයේ සෘජු මාර්ගයේ ගමන් කරමු. අපට මගපෙන්වීමට දෙවියන්වහන්සේගේ වචනයට ඉඩ දෙමු. අපට වැදගත් වන්නේ අපගේ ආදි පියවරුන් ගමන් කළ ආකාරය නොව ඔවුන් විසින් කළ යුතු වූ දේවල්ය." (Latimar, First Sermon Preached Before King Edward vi).

බාර්න්ස් සහ ෆ්රිත් යන අය ටින්ඩේල්ගේ මිතුරන් දෙදෙනෙක් වූහ. ඔවුහු සත්‍යතාව ආරක්ෂා කරගැනීම සඳහා නැඟී සිටියෝය. ඔවුන්ට පසුව රිඩ්ලි සහ ක්‍රැන්මර් සත්‍ය ශුභාරංචිය දේශනා කිරීමට ඉදිරිපත් වූහ. ඉංග්‍රීසි ජාතික පුනරුදයේ නායකත්වය දැරූ මෙම අය උගතුන් වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රෝමානු ප්‍රජාවේ භක්තිය සහ ජීවිතය පිළිබඳව කීර්තිමත් නාමයක් දිනාගෙන සිටියෝය. පාප් තුමාගේ නායකත්වය යටතේ වූ රෝමානු සභාවේ තිබූ වැරදි

දුර්මත සහ ඇදහිලි ක්‍රම පිළිබඳව වූ දැනුම නිසා පාප් සමයට විරුද්ධ වීමට ඔවුහු තීරණය කළෝය. බබිලෝනියේ තිබූ ගුප්ත ක්‍රමවේදයන් ගැන මනා අවබෝධයක් තිබූ ඔවුන්ට, ඇයට විරුද්ධව සාක්ෂි දැරීමට එම දැනුම මහත් ජවයක් ලබාදුන්නේය.

ලැටිමර් තම දෙසුමකදී මෙවන් අදහස් ප්‍රකාශ කළේය. "එංගලන්තයේ සිටින්නාවූ ඉතා කඩිසරවූ ද, උනන්දුවකින් ක්‍රියා කරන්නාවූ ද රදගුරු තුමා සහ මහා නායක තුමා කව්දැයි ඔබ දන්නවාද? ... මම එම තැනැත්තාව නම් කරනවාට ඔබ බලාපොරොත්තුවෙන් ඇහුම් කන්දී සිටින බව මම දන්නවා ... මම ඔබට කියන්නම් ... ඒ තමයි සාතන්. ඔහු කිසිවිටෙක අලසව සිටිනවා ඔබට දකින්නට ලැබෙන්නේ නැහැ. ඔහු තමාගේ රාජකාරී වසමෙන් පිටතට යන්නේ නැහැ ... ඔබට කැමැති වේලාවක ඔහුව හමුවීමට යන්න ... ඔහු ගෙදර සිටින බව නියතය. ... තම රාජකාරී ස්ථානයේ ඔහු නිරතුරුවම රැඳී සිටී ... ඔහු නිකරුණේ කාලය ගත කරමින් සිටිනවා ඔබට දැකගන්නට බැහැ. මම එය සහතික කර පවසනවා ... යක්ෂයා වැඩ සිටින්නාවූ නිවහනෙහි පොත්පත් නැහැ. මේසය උඩ තිබෙන්නේ ඉටිපන්දම්ය. ශුභාරංචියේ ආලෝකය ඉවත දමා එතැන පබළු ඇට තබා තිබෙනවා. ශුභාරංචි ආලෝකය වෙනුවට එහි ඇත්තේ ඉටිපන්දම්වල ආලෝකයයි. එසේය දහවල් කාලයේ තත්ත්වය ඒ වාගේයි. ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ඉවත් කර දමනවා. එතැනට ශුද්ධගිනි ස්ථානය පිළිබඳ මුසාව සහ එම ක්‍රමවේදයේ මුදල් ගැරීම පවතිනවා; ඇඳුම් නැති අයට, දුප්පත් සහ බෙලහීන අයට අවශ්‍යතා සපයා දීම පසෙකට දමා වටිනා ගලින් සහ ප්‍රභාසම්පන්න ආයිත්තම්වලින් සරසන ලද සුරුවම් ඉහළට, ඔසවනු ලබනවා. මිනිස් සම්ප්‍රදායන් සහ මිනිස් ආඥාවන් ද අන්ධ වූ පාප්වරයෙක්ද ඉහළ මට්ටමෙන් ගරු කරනු ලබන අතර දෙවියන්-වහන්සේ හා ශුද්ධ වචනය පහළට හෙළනු ලබනවා. ... සාතන් විසින් කිරිදි සහ වල් පැලෑටි වපුරන්නාවූ කඩිසරකමින් සහ උනන්දුවෙන් අපගේ සභා පාලකයන්ද යහපත් දහම් නමැති තිරිඟු වැපිරීමට උනන්දුවක් දක්වනවා නම් එය කෙතරම් ප්‍රශංසනීයද!" (Latimer, "Sermon of the Plough" ).

මෙම පුනරුද වාදීන් විසින් දරා සිටි ශ්‍රේෂ්ඨතම ප්‍රඥප්තිය නම් වොල්ඩන්සියානුවන් විසින්ද වික්ලිෆ්, ජෝන් හස්, ලූතර්, ස්වින්ග්ලි සහ ඔවුන් සමග එක්වූ අනෙකුත් අය විසින්ද එක හඬින් ප්‍රකාශ කළ, එක හඬින් කියා සිටි ශ්‍රේෂ්ඨතම ප්‍රඥප්තිය වූ ඇදහිල්ලෙහි සහ ජීවිත රටාවෙහි ප්‍රීතිය හෙවත් නියමය වන්නේ ශුද්ධ ලියවිල්ලෙහි වූ වැරැදිය නොහැකි අධිකාරී බලය යන්නයි. ආගම පිළිබඳවවූ කාරණාවලදී හෘදය සාක්ෂිය පාලනය කිරීමට පාප්ට, ධර්මාධි-



කරණයට, පැවිදි පියවරුන්ට සහ රජවරුන්ට කිසිම ආකාරවූ අයිතියක් නැති බව ඔවුහු කියා සිටියහ. ඔවුන්ගේ අධිකාරී බලය ශුද්ධ බයිබලය විය. සෑම දහමක්ම, සෑම අයිතිවාසිකමක්ම පිළිගැනීම සඳහා ඔවුන් උරගා බැලුවේ බයිබලීය ඉගැන්වීම්ය. ගිනිටැඹ මත දිවි පිදූ මෙම ශුද්ධවූ දේව දාසයන්ව පෝෂණය කළේ, රැක බලාගත්තේ දෙවියන්වහන්සේ තුළ ඔවුන්ට තිබූ ඇදහිල්ලත්, උන්වහන්සේගේ වචනය කෙරෙහි තිබූ විශ්වාසයත්ය. තමා සමග එක්ව ගිනිටැඹට බැඳ තිබූ සිය සගයා අමතමින් ලැටිමර් මෙසේ ඔහුව දිරි ගැන්වීය, "යහපත් සැනසිලි චින්තනයකින් සිටින්න. අප අද දල්වන මේ කුඩා ඉටිපන්දම දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යටතේ එංගලන්තය ඒකාලෝක කරනවා ඇත. එය කවරදාක හෝ නිවා දමනු නොලබන බව මාගේ විශ්වාසයයි." ("Works of Hugh Latimer, "Vol.1 P. xiii).

ස්කොට්ලන්තයේ සත්‍යතා බීජ වැපිරීමේ පුරෝගාමීන් වූයේ කොලුම්බා සහ ඔහුගේ සහායක දේව සේවකයන්ය. ඔවුන්ගේ වැයම සම්පූර්ණ වශයෙන්ම විනාශයට පත් නොවීය. එංගලන්තයේ දේවස්ථාන රෝමානු ආධිපත්‍යයට යටත් වී වසර සිය ගණනාවකට පසුව වුවද, ස්කොට්ලන්ත දේවස්ථාන තම නිදහස රැකගෙන කල් ගෙවූහ. එහෙත් දොළොස් වෙනි ශත වර්ෂයේදී මෙම පාලන ව්‍යුහය වෙනස් විය. වෙනත් කිසිම රටක නොවූ විරූ ආකාරයෙන් රෝම බල අධිකාරිත්වය ස්කොට්ලන්තයේ තම විධායක බලය උපරිම ආකාරයෙන් ක්‍රියාත්මක කළේය. රෝමානු සමය එරටෙහි ස්ථාපිත විය. අන්ධකාරය මෙතරම් ගැඹුරු වූ වෙනත් ස්ථානයක් තවත් නොවීය. එහෙත් ආලෝක රැස් දහරා අඳුර දෙබෑ කරමින් මතු දිනෙක පැමිණෙන්නාවූ සෞභාග්‍යයක් ගැන අනාවැකි කීවේය. එංගලන්තයේ සිට පැමිණි ලොලාඩ්වරු තමන් සමග ශුද්ධ බයිබලයද වික්ලිෆ්ගේ ඉගැන්වීම්ද රැගෙන ස්කොට්ලන්තයට පැමිණියෝය. එරට ශුභාරංචියෙහි දැනුම රඳා පවත්වා ගැනීමට ඔවුහු උපකාර වූහ. සෑම ශත වර්ෂයකම ශුභාරංචියේ සාක්ෂිකරුවෝ සිටියෝය. එසේම වේද සාක්ෂිකරුවෝද හිඟ නොවූහ.

මහා ප්‍රතිසංස්කරණය බිහිවීමත් සමගම ලූතර්ගේ ප්‍රකාශනද. ටින්ඩේල්ගේ ඉංග්‍රීසි අලුත් ගිවිසුමද කිතුණු ජනතාව අතට පත්විය. රෝම බලධරයන්ගේ ඇසට හසු නොවී මෙම පණිවිඩකරුවෝ නිශ්ශබ්දව ගම් නියම්ගම් තුළට පිවිසුණෝය. කඳු සහ නිම්න භූමි ඔවුන්ට මගහැරී ගියේ නැත. ඔවුහු අලුත් ජීවිතවලට සත්‍යතාවයේ පන්දම ස්පර්ශ කළෝය. ස්කොට්ලන්තයේදී මෙම සත්‍යතාවයේ පන්දම මළානික වෙමින් පැවතියේය. රෝමානු සමය විසින් වසර හාර සියයක් පුරා දක්වූ විරෝධතාවයේ ක්‍රියාදාමයන් මැඩ පවත්වන්නට ඔවුහු උදාර සේවාවක් ඉටු කළෝය.

ඉක්බිතිව, වේද සාක්ෂිකරුවන්ගේ රුධිරය ප්‍රතිසංස්කරණයේ ව්‍යාපෘතියට නව පණක් ලබා දුන්නේය. හදිසියේ රෝමානු නායකයෝ අවදිවී තමන්ගේ කර්තව්‍යයට උදාවී ඇති අනතුර දැක ගත්තෝය. ගිනි ටැඹ ක්‍රියාත්මක විය. ස්කොට්ලන්තයේ සිටි කුලීනවූ ද, ඉහළම ගෞරවාදරය දිනාගෙන සිටියාවූ ද දේශාභිමානී දරුවන්ගේ ජීවිත දවා අළු කරදැමීමට ශුභාරංචි සතුරෝ ක්‍රියාත්මක වූහ. මරණයට පත්වන්නාවූ වේද සාක්ෂිකරුවන්ගේ වචන දේශය පුරා රැගෙන යාම සඳහා ඔවුහු මෙසේ අගනා වේදිකාවක් තනා දුන්නෝය. රෝමයේ විලංගු බිඳ දමන්නට අරමුණු කරගැනීමට, ආත්මයන් පුබුදුවාලීමට එම වදන් අත්වැළක් විය.

චරිත ලක්ෂණවලින් මෙන්ම උපතින්ද රාජකීය පෙළපතකට අයිති වූ හැමිල්ටන් සහ විශ්හාට්ට අනුගාමිකයන් රැසක්ද සිටිය නමුත් ඔව්හුද ගිනි කණුවලට ගොදුරු කරන ලදී. විශ්හාට්ගේ ගිනි මැළයෙන් උපත ලැබූ අයෙක් විය. ඔහුව නිශ්ශබ්ද කිරීමට ගිනි මැළයට හැකියාවක් නොවීය. හෙතෙම දෙවියන්වහන්සේ යටතේ ක්‍රියාත්මක වී ස්කොට්ලන්තයේ පැවැති පාප් අධිකාරී බලයට මරු පහරක් එල්ල කළේය.

සභාවේ පැවැති මිනිස් සම්ප්‍රදායන් සහ ගුප්ත ක්‍රියාදාමයන්ගෙන්ද ඉවතට හැරී සිටි ජෝන් නොක්ස් නමැති මේ තැනැත්තා දෙවියන්වහන්සේගේ ජීවමාන වචනයෙන් පෝෂණය වීමට ඉටා ගත්තේය. ඔහු විශ්හාට්ගේ ලියවිලිද අධ්‍යයනය කළේය. රෝමය සමග වූ සිය සම්බන්ධකම් අතහැර දමා පීඩිත ප්‍රතිසංස්කාරකයන් සමග එක්වීමට තීරණයකට බැසීමට විශ්හාට්ගේ ලියවිලි නොක්ස්ට අත්වැළක් විය.

දේශනාකාරයෙකු වන්නැයි නොක්ස්ගේ සහායකයෝ ඔහුගෙන් ඉල්ලීමක් කළෝය. එම තනතුරෙහි වගකීම් සම්භාරය හැඟී ගිය හෙතෙම තැති ගත්තේය, ඉල්ලීමට පිටුපා ක්‍රියාකිරීමට වෑයම් කළේය. එහෙත් දවස් ගණනාවක් හුදෙකලාව සිටිමින් ස්වකීය ආත්මය සමග ප්‍රබල ගැටුමක යෙදීමෙන් පසුව තමාට දෙන ලද ඉල්ලීමට එකඟවීමට ඔහු කැමැත්ත පළ කළේය. තීරණයට එළඹීමෙන් පසුව ඔහු නොසැලෙන අධිෂ්ඨානයකින්ද පසුබට නොවන්නාවූ ධෛර්යයකින්ද, නිර්භීතකමකින්ද යුතුව වැඩෙහි යෙදුණේය. ඔහු ඉදිරියටම ගියේය. මුළු ජීවිත කාලය පුරාම ඔහු මෙසේ ක්‍රියා කළේය. මෙම සත්‍යවාදී ප්‍රතිසංස්කාරකයා මිනිසුන්ගේ මුහුණුවලට බියක් නොදැක්වීය. වේද සාක්ෂිකරුවන් ගිල ගත් ගිනි සිළු නොක්ස් අවට පැන නැගෙද්දී ඔහු තුළ දියුණු වෙමින් පැවති ජ්වලිතය තව තවත් දැඩි විය. ඝාතකයාගේ කඩුව ඔහුගේ හිසට උඩින් ලෙළ දෙමින් තිබියදී ඔහු කිසිම චකිතයකින් තොරව සැදී පැහැදී සිටියේය. රූප වන්දනාව නැති කරදැමීමේ අදහසින් ඔහු දකුණුපසටත්, වම්පසටත් තදින් පහර එල්ල කළේය.



ජෝන් නොක්ස්ව ස්කොට්ලන්තයේ රැජින ඉදිරියට ගෙන යනු ලැබීය. ප්‍රොතැස්තන්ත නායකයන් කිහිප දෙනෙකුගේ ජ්වලිතය ඇය ඉදිරියෙහි පසුබෑමකට ලක්ව තිබුණේය. එහෙත් ජෝන් නොක්ස් සත්‍යතාව වෙනුවෙන් අචල සාක්ෂි දරීමක් කළේය. සෞම්‍ය වචන කථා කිරීමෙන් ඔහුව තම පක්ෂයට දිනා ගැනීමට කිසිවෙකුට නොහැකි විය. තර්ජන ඉදිරියෙහි ඔහු තැති ගත්තේ නැත. මිථ්‍යා දහම් සහ ඉගැන්වීම් පිළිගත්තේ යයි රැජින ඔහුට චෝදනා එල්ල කළාය. රජය විසින් තහනම් කරන ලද ආගමක් පිළිගැනීමට ඔහු ජනතාවට උගන්වන්නේ යයි ඇය පැවසුවාය. තවද, තමන්ගේ රාජකීය උත්තමාවන්ට කීකරු වන්නැයි දෙවියන්වහන්සේ විසින් පනවා ඇති ආඥාව ඔහු විසින් උල්ලංඝනය කර ඇතැයිද රැජින ඔහුට චෝදනා එල්ල කළාය. මේ චෝදනාවන්ට නොක්ස් මෙසේ ඍජු පිළිතුරක් දුන්නේය:

"නිරවද්‍ය ආගමට අවශ්‍ය වූ ශක්තිය සහ අධිකාරී බලය ලැබුණේ ලෞකික කුමරුන්ගෙන් නොවේ. එය දෙවියන්වහන්සේම දානය කළ දෙයකි. එසේම කුමාරවරුන්ගේ ආශාව පරිදි තමන්ගේ ආගම සඳහා ඔවුන්ගේ රාමුවකට වැදී සිටීමට යටත් වැසියන් බැඳී නැත. නිතරම දෙවියන්වහන්සේගේ සත්‍ය වූ ආගම පිළිබඳව වැඩියෙන්ම කරුණු නොදන්නේ එම කුමාරවරුන්ය. ආබ්‍රහම්ගේ වංශයේ සියලු දෙනාම ඵාරාවෝගේ යටත් වාසීන්ව සිටි බැවින්ම ඔවුන් රජතුමාගේ ආගම පිළිගත්තේ නම් රැජිණියෙනි, මා ඔබගෙන් අසන්නේ අද ලෝකයේ තිබෙන්නට යන්නේ කොයි ආගමද? අපෝස්තුළුවරුන්ගේ කාලයේ සියලු මනුෂ්‍යයෝ රෝම එම්ප්‍රදෝරු රජතුමාගේ ආගමේ බැතිමතුන් වූවා නම්, අද ලෝක තලය මතුපිට තිබිය හැකි ආගම කුමක්ද? ... එම නිසා රැජිණියෙනි, ඔටුන්න හිමි කුමාරයන්ට කීකරුවීම දෙවියන්වහන්සේගේ අණ කිරීමක් වුවද රාජකීය කුමාරවරුන්ගේ ආගමට යටත්වැසියන්ද බැඳී සිටීම හරි දෙයක් නොවන බව ඔබතුමියට පෙනෙනවා නොවේද?"

මේරි රැජින මෙසේ පැවසුවාය, "ඔබ එක්තරා ක්‍රමයකට ශුද්ධ ලියවිලි අර්ථකථනය කරනවා. එසේම ඔවුන්ද {රෝමානු කතෝලික ගුරුවරුන්ද} තවත් ක්‍රමයකට අර්ථකථනය කරනවා. මම කාව විශ්වාස කරන්නෙම්ද, කවරෙක් එය විනිශ්චය කරාවිද?"

"තමන්වහන්සේගේ වචනය තුළින් පැහැදිලි ලෙස කථා කරන්නාවූ දෙවියන්වහන්සේව ඔබ විශ්වාස කළ යුතුයි. දේව වචනයේ ඉගැන්වීමට එකඟ නොවන කාරණා පිළිබඳව ඔබ අන් කිසිවෙකු විශ්වාස නොකළ යුතුය. දේව වචනය සරලය, පැහැදිලිය. යම් කරුණක් පිළිබඳව යම් තැනක කියා ඇති දේ පැහැදිලි නැති නම් ඒ ගැන පැහැදිලි අර්ථකථනයක් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබාදී ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේ කිසිම කලෙක තමන්ට විරුද්ධව යමක් පවසන්නේ

නැත. තවත් තැනක පැහැදිලි කිරීමක් සඳහා සත්‍යවාදී දේව වචනයෙන් සොයන්නේ නැතිව කටයුතු කරන්නාවූ, මුරණ්ඩු ලෙස දේව වචනය නොදන සිටින්නාවූ අයට නිවැරැදි දේ සොයා ගැනීමේ හැකියාව නොමැත." (Laing “Works of John Knox” Vol ii pp. 281, 284). නිර්භීත ප්‍රතිසංස්කාරකයා විසින් තම ජීවිතය පරදුවට තබා රාජකීය සවනට මුසු කළ සත්‍යතාවන් එබඳුය. එවැනිම නොසැලෙන ධෛර්යයකින් යුතුව ඔහු දෙවි සමිඳාණන්ගේ සටන්හි නිරත වෙමින්, යාච්ඤා කරමින් ස්කොට්ලන්තය පාප් සමයේ බල අධිකාරියෙන් මිදීම ලබන තෙක් ක්‍රියා කළේය.

ප්‍රොතැස්තන්ත දහම එංගලන්තයෙහි ජාතික ආගම ලෙස ස්ථාපිත කිරීමේ කාර්යය පසුබැමට ලක් විය. එහෙත් එමනිසා වධහිංසා පැමිණවීම සම්පූර්ණයෙන්ම ඇණ හිටියේ නැත. රෝමානු දහම් බොහෝ ගණනක් අත්හැර දමන ලද නමුත් ඇයගේ චතාවත් සමහරක් තවදුරටත් රඳවා තබාගන්නා ලදී. පාප්ගේ අධිශ්‍රේෂ්ඨත්වය නිෂ්ප්‍රභා කරන ලදුව ඒ වෙනුවට සභාවේ නායකයා ලෙස රජතුමාට ඔටුනු පළඳවනු ලැබීය. සභාවේ මෙහෙයන් ශුභාරංචියෙහි ශුද්ධතාවෙන් සහ චාම්කමින් බොහෝ ඈත්ව තිබුණේය. ආගමික නිදහසෙහි යථාර්ථය ගැන පැහැදිලි අවබෝධයක් නොවීය. මිනිසෙකුට තමාගේ හෘදය සාක්ෂියෙහි තීරණයන්ට එකඟව දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ නිදහස දීම තවමත් පිළිගෙන තිබුණේ නැත. රෝමය ක්‍රියාත්මක කළ අන්දමේ වධ හිංසා ක්‍රියාත්මක නොකළ නමුත්, සෑම මනුෂ්‍යයාටම තමාගේ හෘද සාක්ෂියේ මගපෙන්වීම අනුව නමස්කාර කරන්ට ඉඩදීමට ප්‍රොතැස්තන්ත නායකයන්ද කැමති වූයේ නැත. ස්ථාපිත කිතුණු සභාව විසින් නියම කරන ලද නමස්කාර ක්‍රමවේදයන් සහ ධර්මතාවන් සැවොම පිළිගත යුතු යයි අපේක්ෂා කෙරිණ. එම පටිපාටිය පිළි නොගත් අයට වධහිංසා විඳින්නට සිදුවිය. යම්කිසි ප්‍රමාණයකින් මෙම තත්ත්වය තවත් අවුරුදු සිය ගණනාවක් එංගලන්තය තුළ පැවැතුණේය.

දහ හත්වන සියවසේදී, දේවගැතිවරුන් දහස් ගණනින් ස්වකීය සේවා භාරයෙන් නෙරපා හරින ලදී. සභාව විසින් අනුමැතිය ලබානොදුන් නමස්කාර මෙහෙයනට සහභාගිවීම තහනම් විය. එසේ කළ අයට දඬුවම් වශයෙන් අධික දඩ මුදලක් ගෙවීමට සිදුවිය. තවත් අය සිරගෙට නියම විය, තවත් අයව රටින් පිටුවහල් කරනු ලැබීය. දෙවියන්වහන්සේට නමස්කාර කිරීමෙන් ඈත්ව සිටීමට අකමැතිවූ විශ්වාසවන්ත බැතිමත්හු අඳුරු මුඩුක්කුවලද, අප්‍රසිද්ධ ස්ථානවල පිහිටි ගෙවල වහලයට කිට්ටුව පිහිටි උඩුමහලෙහි වූ කුඩා කාමරවලද, සමහර සෘතුවල මධ්‍යම රාත්‍රියෙහි කැළෑවලද තම නමස්කාර රැස්වීම් පැවැත්වූහ. දෙවියන්වහන්සේගේ දේව මාළිගා ගොඩනැගිල්ල වන වනාන්තරයේ ආරක්ෂිත ස්ථානයක, විසුරුවා හරිනු ලැබූ දෙවි



සමිඳාණන්ගේ දරුවෝ තම හදවත් යාච්ඤාවෙන් සහ තුති ප්‍රශංසාවෙන් වගුරුවාලීමට එක් රැස් වූහ. අප්‍රසිද්ධ ලෙස මෙසේ රැස්වූ නමුත් බොහෝ දෙනෙක් තම ඇදහිල්ල නිසා පීඩාවට ලක්කරනු ලැබූහ. සිරගෙවල් පිරී ගොස් තිබුණේය. පවුල් වෙන් කරනු ලැබීය. බොහෝ අය වෙනත් රටවලට පිටුවහල් කරනු ලැබූහ. එසේ වුවද, දෙවියන්-වහන්සේ තමන් සෙනඟ සමග සිටිසේක. ඒ අතර, වධහිංසා පැමිණවීම මගින් ඔවුන්ගේ සාක්ෂිය නවතා දැමීමට නොහැකි විය. තවත් බොහෝ පිරිසක් මුහුදින් එතෙර අමෙරිකාව බලා පිටත්ව ගියෝය. ඔවුහු එහිදී සිවිල් සහ ආගමික නිදහස වෙනුවෙන් පදනම දැමුවෝය. අද දක්වාම මෙම නිදහස එම රටෙහි ආරක්ෂාව සහ ගෞරවය වී තිබේ.

අපෝස්තුළුවරුන්ගේ දවස්වලදී මෙන්ම නැවත වරක්, හිංසා පීඩා වැඩිවත්ම ශුභාරංචියෙහි පැතිර යාමද ප්‍රබල විය. අපරාධවල යෙදුනු දුෂ්ටයන් සහ අනාචාරයෙහි හැසිර සමාජයෙන් එළවා දමනු ලැබූ අයද සමග ඉතා අප්‍රසන්න ඇඳිරි ගුහාවක දිවි ගෙවූ ජෝන් බනියන් එහිදී ස්වර්ගීය පරිසරය ආශ්වාස කළේය. එහිදී ඔහු ඉතා උසස් ගණයේ උපමා වෘතාන්ත කෘතියක් වූ "වන්දනාකාරයාගේ ගමන" රචනා කළේය. එම කෘතියෙහි තේමාව වන්නේ විනාශයේ දේශයේ සිට ස්වර්ගීය නුවර දක්වා යන වන්දනාකාරයෙකුගේ ගමන් විස්තරයයි. වසර දෙසීයකට වැඩි කාලයක් පුරා බෙඩ්ෆෝර්ඩ් සිරගෙයෙහි සිට නිකුත්ව ආවාවූ මේ ගැළවීමේ සාක්ෂිය මිනිස් හදවත්වලට බලවත් හැඟීම් ඇති කරවන හඬින් කථා කළේය. ජෝන් බනියන් කතුවරයාගේ කෘතීන් වන "වන්දනාකාරයාගේ ගමන" සහ දරුණුතම පව්කාරයාටත් තිළිණ කළ "අධික කරුණා-අනුග්‍රහය" යන කෘතීන් කරණකොටගෙන බොහෝ අයගේ පාද ජීවනයේ මංමාවත් කරා යොමු වී ඇත.

වරක් ශුද්ධවන්තයන්ට පවරා දෙනු ලැබූ ඇදහිල්ල ආරක්ෂා කරගැනීමට බැක්ස්ටර්, ෆ්ලැවෙල්, ඇලීන් සහ තවත් අය නැගී සිටියෝය. ඔවුහු දක්ෂවූ, නිර්මාණශීලීවූ උසස් අධ්‍යාපනයක් ලැබූ ගැඹුරු ක්‍රිස්තියානි අත්දැකීමක් ලැබූ අය වූහ. මෙම පුද්ගලයන් ඉටු කළ කර්තව්‍යය මේ ලෝකයේ රාජ්‍ය පාලකයන් විසින් තහනම් කරනු ලැබ නීති විරෝධී යයි නම් කරනු ලැබුවද, එම වැඩ කිසි කලෙක හෝ විනාශ වී යන්නේ නැත. තමන්ගේ ආත්ම ක්‍රිස්තුස්වහන්සේගේ රැකවරණයට භාර කරන්නේ කෙසේද කියා උපදෙස් සපයමින් ෆ්ලැවෙල් ලියූ "ජීවනයේ උල්පත" සහ "කරුණා-අනුග්‍රහයේ ක්‍රමවේදය" යන කෘති ක්‍රිස්තියානි ජීවිත වර්ධනයට මාහැඟි අත්වැළක් විය. "ප්‍රතිසංස්-කරණයට හසුවූ දේවගැති තුමා" යන බැක්ස්ටර්ගේ කෘතිය දෙවියන්වහන්සේගේ වැඩ කටයුතුවලට නව ජීවනයක් අපේක්ෂා කරන්නාවූ අයට ආශීර්වාදයක් වී ඇත. ඔහුගේම තවත් කෘතියක් වන "ශුද්ධවන්තයන්ගේ සදාතන නිවාඩුව" මගින් දෙවියන්වහන්සේගේ

ජනතාවට සූදානම් කර ඇති 'නිවාඩුව' වෙත ගමන් කිරීමට බොහෝ දෙනෙකුට මගපෙන්වීම ලැබී ඇත.

වසර සියයකට පසුව, ආත්මික අන්ධකාරය මහත් සේ බලපෑ දවසක දෙවියන්වහන්සේ උදෙසා ආලෝකය දරන්නන් ලෙස විට්ෆීල්ඩ් සහ වෙස්ලි සහෝදරවරු ක්‍රියා කළෝය. ස්ථාපිත සභාවෙහි නීති රීති යටතෙහි එංගලන්තයෙහි ජනතාව ආගමික පසුබෑමකටද, ආත්මික පරිහානියකට පත්ව සිටියෝය. මිසදිටුවන්ගෙන් කිතුණුවන්ව වෙන් කොට හඳුනා ගැනීම පවා අසීරු විය. දේවගැතිවරුන්ගේ ප්‍රියතම විෂය මාලාව වුණේ ස්වභාවික ආගම යන පාඩමයි. එයට ඔවුන්ගේ දේවධර්මද ඇතුළත් විය. සමාජයේ රදළයෝ මෙම ශ්‍රද්ධාවට සිනහසුණෝය. ආගම් උමතුව ලෙස ශ්‍රද්ධාවට කැපවූ අයව හැඳින්වූ රදළයෝ තමන්ගේ පැවැත්ම දේවගැතිවරුන්ට වඩා ඉහළ තලයක ඇතැයි උදාරම් බස් කීවෝය. සමාජයේ පහත් තලවල සිටි අය කිසිත් නොදන්නා පිරිසක් වූහ. ඔවුන්ව, අවකල් ක්‍රියාවකට නැඹුරු වූ අය හැටියට අත්හැර දමන ලදී. සත්‍යතාවයේ කර්තව්‍යය පිරිහීමට පත්ව තිබූ නිසා එය නගා සිටුවීමට, සහාය වීමට සභාවට ඇදහිල්ලක් හෝ ධෛර්යයක් හෝ තිබුණේ නැත.

ලූතර් විසින් ඉතා පැහැදිලිව ඉගැන්වූ දහමක් වන ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබීම යන්න බහුතරයකගේ මතකයෙන් ඉවත්ව ගොස් තිබුණේය. යහපත් ක්‍රියාවන් මගින් ගැළවීම උදාකර ගත හැකිය යන රෝමානු දහම මගින් ලූතර් ඉගැන්වූ දහම ගිලී ගොස් තිබුණේය. ස්ථාපිත සභාවෙහි සාමාජිකයන් වූ විට්ෆීල්ඩ් සහ වෙස්ලි සහෝදරවරුද දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය අවංකව සෙවූ අය වූහ. මෙය ලබාගත හැක්කේ සාරධර්ම වලට අනුකූලව ජීවත් වෙමින්, ආගමේ නියෝගවලටද කීකරු වීමෙන් යයි ඔවුන්ට උගන්වා තිබුණේය.

වරක් චාර්ල්ස් වෙස්ලි රෝගාතුර වූ විට, ඔහු මරණයට පත්වේ යයි සිතන ලදී. සදාතන ජීවිතය ගැන ඔහු බලාපොරොත්තුව රඳවා තිබෙන්නේ කුමක් මත දැයි කෙනෙක් ඔහුගෙන් ප්‍රශ්න කළේය. ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "මට හැකි පමණ උත්සාහයෙන් මම දෙවියන්වහන්සේට සේවය කළෙමි."" ප්‍රශ්නය නැගූ තැනැත්තා මේ පිළිතුරෙන් සෑහීමට පත්වුණේ නැත. වෙස්ලි මෙසේ සිතන්නට විය. "මොනවා! බලාපොරොත්තුව රැඳවීමට මාගේ සේවය ප්‍රමාණවත් වන්නේ නැද්ද? උන්වහන්සේ මාගේ හැකියාවන්, උත්සාහ කිරීම් මාගෙන් සොරා ගන්නට යනවාද? විශ්වාසය රැඳවීමට මට වෙනත් දෙයක් නැත." (Whitehead, John, "Life of the Rev. Charles Wesley, p. 102). සභාව මත පතිතව තිබූ ඝන අන්ධකාරය එබඳු විය. මැදහත්කාරකම් කිරීමේ ක්‍රමවේදය බැතිමතුන්ගෙන් වසන් කර,



ක්‍රිස්තුස්වහන්සේට හිමි විය යුතු ගෞරවය උන්වහන්සේගෙන් සොරාගෙන, ගැළවීමේ එකම බලාපොරොත්තුව වන කුරුසිපත් ගැළවුම්කාරයාණන්ගේ ශ්‍රී රුධිරය වෙතින් මිනිස් මනස ඉවතට හරවාලීමට සභාව ක්‍රියාකර තිබුණි.

සත්‍යය වූ ආගම තැන්පත් වී තිබෙන්නේ හදවතෙහි බවටත්, මනුෂ්‍යයාගේ චින්තනයට පමණක් නොව, වචනවලටද, ක්‍රියාවන්ටද දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව බලපාන බවටත් වෙස්ලිට සහ ඔහුගේ සහකාර සේවකයන්ටද මගපෙන්වීම ලැබුණි. හදවත්හි ශුද්ධතාවක් පමණක් නොව, බාහිර හැසිරීමෙහි නිවැරැදිතාවයක්ද අවශ්‍යවීම ගැන වැටහීමකින් පෙළී ගිය ඔවුහු අලුත් ජීවිත ඇරඹීමට අවංකවම උත්සාහ දැරූහ. ස්වභාවික හදවත වෙලා ගෙන ඇති දුෂ්ටකම සහ නපුර යටපත් කිරීමට ඔවුහු මහත් උත්සාහයෙන්ද යාච්ඤාවෙන්ද වෑයම් කළෝය. ඔවුහු ආත්ම පරිත්‍යාගී ජීවිත ගත කළෝය. අසරණ සරණ ක්‍රියාවන්හි යෙදුණෝය, මානහංග පැවැත්මක් රඳවා ගත්තෝය. ඔවුන්ගේ අභිමතාර්ථය වී තිබුණේ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය අත්පත් කරගැනීම සඳහා උචිත වූ ශුද්ධවන්තකම ලබාගැනීමය. තමන්ගේ සිතැඟියාව ලබාගැනීම සඳහා උපකාර විය යුතු යයි සිතූ සෑම ආකාර ක්‍රියාවක්ම දැඩි උනන්දුවකින් යුතුව අකුරටම ඉටු කිරීමට ඔවුහු වෑයමක යෙදුණෝය. මේ අන්දමින් ශුද්ධ භාවයට පැමිණීමෙන් පමණක්ම තමාට දෙවියන්වහන්සේගේ කරුණාව ලබාගත හැකි යයි ඔව්හු කල්පනා කළහ. එහෙත් පැතූ දේ ඔවුන්ට ලැබුණේ නැත. පාපයට වරදකරුවන් වීමෙන් මිදීමට හෝ පාපයේ බලය බිඳීමට හෝ කෙතරම් මහන්සි වී ක්‍රියාකළද, එයින් සාර්ථකත්වයක් ලැබුණේ නැත. එර්ෆර්ට්හි සිර කුටියෙහි සිටියදී ලූතර්ට පැවති අරගලයද මෙම කරුණ පිළිබඳව විය. ඔහුගේ ආත්මයට වධයක්ව පැවතියේද මෙම ගැටළුවය: එනම් "මනුෂ්‍යයා දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ වන්නේ කෙසේද?" යන්නය. (යෝබ් 9: 3).

බොහිමියානු ක්‍රිස්තියානිකරුවන් අතර දිව්‍ය සත්‍යය දැඩි ස්ථාවරයකින් පිහිටා තිබූ නමුත් රෝමානු ආධිපත්‍යය විසින් ඔවුන්ගේ ආගමික ජීවිත පාගා දමා තිබුණේය. එම ආධිපත්‍යයේ දැඩි ක්‍රියා පටිපාටිය යටතේ ඇදහිල්ලට එල්ල වූ දැඩි හිංසා පීඩා මෙන්ම මරණයට බිලි දීම නිසාද බොහිමියානු කිතුණුවන් තුළ ඇවිලෙමින් තිබූ දිව්‍ය සත්‍යතාවේ ගින්න ක්‍රම ක්‍රමයෙන් නිවී යන්නට පටන් ගත්තේය. එහෙත් එම ගින්න නැවත වරක් ප්‍රොතැස්තන්ත අල්තාරය මත දැවෙන්නට විය. සත්‍යතාව අතහැර දැමීම ප්‍රතික්ෂේප කළ අයට තම නිජබිමට ආයුබෝවන් කීමට සිදුවිය. සැක්සනියේ රැකවරණය බලා ආ සමහර අය තමන්ගේ පුරාණ ඇදහිල්ල ආරක්ෂා කරගත්හ. වෙස්ලිට සහ ඔහුගේ සහකාර දේව සේවකයන්ට ආලෝකය ලැබුණේ බොහිමියානු කිතුණුවන්ගෙන් පැවත ආ බැතිමතුන්ගෙන්ය.

ජෝන් සහ චාර්ලස් වෙස්ලි, දේවගැතිවරුන් ලෙස අභිෂේකය ලැබීමෙන් පසුව දූත මෙහෙවරක් සඳහා අමෙරිකාවට යවනු ලැබූහ. ඔවුන් ගමන් කළ නැවේ මොරේවියානු කණ්ඩායමක් වූහ. ගමන යන අතරේදී නැව තද කුණාටුවලට හසු විය. මරණ බිය බොහෝ දෙනෙකු වෙළා ගත්තේය. මේ අවස්ථාවේදී ජෝන් වෙස්ලිට හැඟී ගියේ තමා දෙවියන්වහන්සේ සමග සමාදානය ස්ථිර කරගෙන නොසිටි බවය. ඒ අතර නැවෙහි ගමන්ගත් මෙම ජර්මානු ජාතිකයන් තුළ තමාට තේරුම් ගත නොහැකි සන්සුන්කමක් හා විශ්වාසයක් ඇති බව පෙනී ගියේය.

තමාගේ අත්දැකීම ජෝන් වෙස්ලි විස්තර කරන්නේ මෙසේය: "මෙම ජර්මානු ජාතික මොරේවියානු කණ්ඩායම ගැන මගේ අවධානය යොමුව තිබුණේ සති කිහිපයක සිටයි. ඔවුන්ගේ හැසිරීම පුදුම සහගතයි. අනෙකුත් මගීන්ගේ උවමනා එපාකම් ගැන ඔවුන් සේවය කළේ දාසයන් මෙන්ය. ඔවුන් ඉතා නිහතමානීව තම සේවාවන් ඉටු කළත් එවන් සේවාවක් ලබාදීමට අප වැනි ඉංග්‍රීසි ජාතිකයන් කැමති වූයේ නැහැ. ඔවුන් එම දේවල් කැමැත්තෙන්ම ඉටු කළා. ඒ සඳහා කිසිම මුදලක් අය කළේ නැහැ. එම දේ කිරීමෙන් ඔවුන්ගේ අහංකාර මානසිකත්වයට යහපතක් සිදුවන බව ඔවුන්ගේ පිළිගැනීම වුණා. තමන්ගේ ආදරණීය ගැළවුම්කරුවාණෝ ඔවුන්ට මෙයට වඩා විශාල සේවයක් කර ඇති බවත් මොවුන් පැවසුවා. මුදු මොළොක් බව පෙන්වීමට ඔවුන්ට හැමදාම අවස්ථාවන් ලැබුණා. ඔවුන් කාටවත් හිරිහැරයක් වුණේ නැහැ. කිසිවෙක් ඔවුන්ව තල්ලු කළත්, ඔවුන්ට පහරක් ගැසුවත්, නැතහොත් බිම වැට්ටුවත් ඔවුන් නැගිට එතැනින් වෙන තැනකට ගියා. ඔවුන් ඒ ගැන කිසිම කෙනෙකුට දොස් පැවරුවේ නැහැ. බියට පත්වීමේ ආත්මයෙන් මෙන්ම උඩඟුකමේ, කෝන්ති යාමේ සහ පලිගැනීමේ ආත්මයෙන්ද ඔවුන් ජය ගන්නවා දැයි ඔප්පු කිරීමට කදිම අවස්ථාවක් උදා වුණා. එක් දවසක ඔවුන් නමස්කාර මෙහෙයකදී ගීතිකාවක් ගායනා කරමින් සිටියා. ගීතිකාව අතරමහදී, හදිසි කුණාටුවක් හටගත්තා, ප්‍රධාන රුවල කෑලි කෑලිවලට ඉරී ගියා. නැව විශාල ජල කඳකින් වැසී ගියා. ඉංග්‍රීසි ජාතිකයන් අතරින් විලාප සහ අඳෝනා හඬ ඇසෙන්නට පටන් ගත්තා. ජර්මානුවෝ ගීතිකාව දිගටම ගායනා කළා. ඔවුන්ගෙන් එක් තැනැත්තෙකුගෙන් මම මෙහෙම ඇසුවා. "ඔබට හයක් දැනුණේ නැද්ද?" "මම දෙවියන්-වහන්සේට ස්තුති කරනවා. මම හය වුණේ නැහැ"යි ඔහු පිළිතුරු දුන්නා. "ඔබලාගේ බවලත් අය සහ ළමුන් හය වුණේ නැද්ද"යි මම ආයෙත් ඇසුවා. "නැහැ, අපේ බවලතුන් සහ ළමයින් මැරෙන්න බය නැහැ"යි ඔහු මෘදු හඬින් කිව්වා. (Whitehead, "Life of John Wesly," p. 10).



සවානා වෙත පැමිණි වෙස්ලි ටික දවසක් මොරේවියන් වරුන් සමග වාසය කළේය. ඔවුන්ගේ ක්‍රිස්තියානි පැවැත්ම ගැන ඔහු තුළ මහත් පැහැදීමක් ඇති විය. ඔවුන්ගේ ආගමික මෙහෙයන්හි ක්‍රමවේදය සහ එංගලන්ත සභාවෙහි නමස්කාර ක්‍රමවේදය අතර මහත් වෙනසක් ඇති බව ඔහු දුටුවේය. එංගලන්ත සභාවෙහි පැවතියේ ජීවයක් නැති සම්ප්‍රදායික ක්‍රම සහ විධිවලට ගැතිවූ නමස්කාරයකි. "මොරේවියානු බැතිමතුන්ගේ නමස්කාර මෙහෙය ඉතා සරල විය, එහෙත් ගාම්භීර-ත්වයෙන් අඩුවක් නොවීය. කුඩාරම් සාදන්නෙකු වූ පාවුල් සහ මසුන් මරන්නෙකු වූ පේතෘස් නමස්කාරය මෙහෙය වූ ආකාරය තුළ ආත්මයාණන්ගේ මගපෙන්වීම සහ බලය නොඅඩුව දැකගත හැකි විය. ඔවුන් ක්‍රම සහ විධිවලට ගැති වූ අය නොවූහ. ඔවුන්ගේ කාලයෙන් අවුරුදු එක්දහස් හය සියයකට පසුව සිටිය නමුත් මා ඒ අපෝස්තුළු වරුන්ගේ රැස්වීමකට සහභාගි වූ බවක් ඒ අවස්ථාවේදී මට හැඟී ගියේය." (Whitehead, p p. 11, 12).

එංගලන්තයට ආපසු පැමිණි වෙස්ලි මොරේවියානු දේශනා-කරුවෙකුගේ මගපෙන්වීම යටතේ බයිබලයෙහි සඳහන් ඇදහිල්ල පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත්තේය. ගැළවීම ලබාගැනීම සඳහා තමාගේම ක්‍රියාදාමයන් මත රඳා පැවතීමේ ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම අත්හැර දැමිය යුතු යයි ඔහුට ඒත්තු ගියේය. "ලෝකයේ පාපය දුරු කරන්නාවූ දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාණන්" කෙරෙහි සම්පූර්ණයෙන්ම බලාසිටීම තමාගේ කොටස බව ඔහුට ප්‍රත්‍යක්ෂ විය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ බැතිම-තෙකුගේ හදවත තුළ ක්‍රියාකරන අන්දම පිළිබඳව ලූතර්ගේ ප්‍රකාශනයක් ලන්ඩන්හි පැවති මොරේවියානුවන්ගේ රැස්වීමකදී ඔහුට අසන්නට ලැබුණේය. වෙස්ලි එම ප්‍රකාශනයට ඇහුම්කන් දෙන්නාවූ අතරේ, ඔහුගේ ආත්මය තුළ ඇදහිල්ල දල්වෙන්නට පටන් ගත්තේය. එම අවස්ථාව ඔහු මෙසේ වචනයට නඟයි. "මාගේ හදවත පුදුමාකාර අන්දමකින් උණුසුම් වන බව මට හැඟී ගියා. ගැළවීම සඳහා මම ක්‍රිස්තුස්වහන්සේ තුළ පමණක් විශ්වාස කළ යුතු බව මට දැනෙන්නට පටන් ගත්තා. උන්වහන්සේ මාගේ පාප, එසේය, මාගේම පාප ඉවත් කළ බවට මට සහතිකයක් ලැබුණා. උන්වහන්සේ මාව පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාවෙන් මිදූ බව මම දැනගත්තා"

වසර ගණනාවක් පුරා ඔහු දෙවියන්වහන්සේව සොයමින් වෙහෙසෙමින් සැනසීමක් නොලැබ ඒ ගැන මහන්සි වී තිබුණි. ආත්ම පරිත්‍යාගයෙන් යුතුව, මානහංගත්වයට මුහුණ දෙමින් ඔහු තම සෙවීම කර තිබුණි. එහෙත් දැන් ඔහුට උන්වහන්සේව හමු විය. යාච්ඤාවෙන් සහ නිරාහාරව හිඳීමෙන්ද, දන් දීමෙන් සහ ආත්ම දමනයෙන්ද තමා වෙහෙස මහන්සි වී සොයමින් දිනාගැනීමට වෑයම් කළ කරුණා-අනුග්‍රහය වනාහි දෙවියන්වහන්සේ 'මුදල් නොගෙන' නොමිළයේ දානය කරන තෑග්ගක් බව ඔහුගේ සිතට කාවැදී ගියේය.

ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිල්ල තුළ ස්ථාපිත වීමෙන් ඉක්බිතිව වෙස්ලිගේ එකම වැයම බවට පත්වුණේ ක්‍රිස්තුස්වහන්සේ නොමිළයේ දානය කරන්නාවූ කරුණා-අනුග්‍රහය පිළිබඳ සුපුවත සෑම තැනකම ප්‍රසිද්ධ කර හැරීමය. "මුළු ලෝකයම මාගේ සේවා වසම ලෙස මම සලකනවා. එහි කිනම් ස්ථානයක හෝ මම සිටිනවා නම්, එතැන සිටින්නාවූ අසන්නට කැමති සෑම අයෙකුටම ගැළවීමෙහි ශුභාරංචිය ප්‍රකාශ කිරීම මාගේ වගකීම බව මම සලකන්නෙමි"යි ඔහු පැවසීය.

දැඩි ආත්ම දමනයෙන් යුතුව ඔහු ස්වකීය ජීවිත රටාව තවදුරටත් පවත්වා ගෙන ගියේය. එය ඇදහිල්ලට පසුබිමක් ලෙස නොව ඇදහිල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස විය. එය ශුද්ධතාවෙහි මුල නොව, එහි ඵල ලෙසින් විය. ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය ක්‍රිස්තියානි බලාපොරොත්තුවේ පදනම වන්නේය. එම කරුණා-අනුග්‍රහය කීකරුකම තුළින් පැහැදිලි ලෙස ප්‍රත්‍යක්ෂ වන්නේය. තමා ලැබූ මහත් සත්‍යතාවන් දේශනා කිරීමට වෙස්ලි තම සම්පූර්ණ කාලය කැප කළේය. ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමෙහි රුධිරය තුළ වූ ඇදහිල්ල කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලැබීම එහි ප්‍රධානතම සත්‍යයක් විය. හදවත තුළ ක්‍රියාත්මක වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය කරණකොටගෙන ලැබෙන්නාවූ නව ජීවිතය තවත් සත්‍යයක් විය. එමගින් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශයට අනුකූලතාවක් දක්වන්නාවූ ජීවිතය තුළ යහපත් ඵල දැරීමක් සිදුවන්නේය. තමන්ගේ ජීවිත විනාශයෙන් කෙළවර වේ යයි කියන්නාවූ පුද්ගලික සහ දිගුකාලීන වැටහීමක් විට්ෆීල්ඩ් සහ වෙස්ලි සහෝදරයන්ව තමන්ගේ ජීවිත වෘත්තිය සඳහා සූදානම් කර තිබුණේය. ක්‍රිස්තුස්-වහන්සේගේ යහපත් සොල්දාදුවන් මෙන් කරදර සහ දුක් වේදනා, අවඥාව, අවමානය, සමච්චල් කිරීම සහ හිංසා පීඩා දරාගන්නට ඔවුන්ට විශ්ව විද්‍යාලයේදී මෙන්ම දේව සේවයට ඇතුළු වීමේදීද, දරාගන්නට සිදුවී තිබුණි.. ඔවුන්ට සහ ඔවුන්ට අනුකම්පාව දැක්වූ කීපදෙනෙකුට "මෙතෝදිස්තවරු" යන විකට නාමය දේව භක්තියක් නැති සහෝදර සිසුන් විසින් පටබැන්දෝය. මෙම නාමය වත්මන් කාලයේදී ගෞරවණීය එකක් ලෙස එංගලන්තයේ සහ අමෙරිකාවේ විශාල නිකායක් විසින් සලකනු ලැබේ.

එංගලන්ත සභාවේ සාමාජිකයන් ලෙස ඔවුහු තම සභාවේ නමස්කාර ක්‍රමවේදයන්ට තදින් ඇලී ගැලී සිටියෝය. නමුත් දෙවි සමිඳාණෝ තමන්ගේ වචනය තුළින් එයට වඩා උසස් ප්‍රමිතියක් ඔවුන් ඉදිරියෙහි පෙන්වා දුන්සේක. ක්‍රිස්තුස්වහන්සේ එනම් කුරුසිය මත දිවි පිදූ බැටළු පෝතකයාණන් ගැන දේශනා කිරීමට ශුද්ධාත්ම-යාණන්වහන්සේ ඔවුන්ට මගපෙන්වූ සේක. උසස් තැන්හි සමිඳාණන්ගේ බලය ඔවුන්ගේ සේවය සමග ක්‍රියාත්මක විය. දහස් ගණන් ජනතාව ශුභාරංචිය ගැන පැහැදී, අවංක ලෙස අලුත් දිවි පැවැත්මකට



සංවර්තනය වූහ. ගොදුරක් ලෙස ඩැහැගැනීමට ක්‍රියාකරන වෘකයන්ගෙන් මෙම බැටළුවන් බේරා ගැනීම අවශ්‍ය විය. අලුත් නිකායක් පිහිටුවන්නට වෙස්ලි තුළ කිසිම අභිප්‍රායක් නොවීය. එහෙත් එම අලුත් බැතිමතුන් එක්කොට තබාගැනීම සඳහා ඔහු සංවිධානයක් පිහිටුවා එයට මෙතෝදිස්ත සම්බන්ධතාව යයි නම් කළේය.

ස්ථාපිත සභාවෙන් මෙම දේවගැතිවරුන්ට එරෙහිව එල්ලවූ විරුද්ධතාවන් අද්භූතවූ ද, ඉවසීමට නොහැකිවූ ද චෝදනා විය. එහෙත් මෙහිදී දෙවියන්වහන්සේ ඉදිරිපත් වී ක්‍රියාත්මක වූසේක. සිදුවන්නාවූ ක්‍රියාදාමයන් කණ පිට පෙරළා ඔවුන්ගේ සභාව තුළම ප්‍රතිසංස්කරණ ක්‍රියා ආරම්භ කිරීමට දෙවියන්වහන්සේ මැදිහත් වූසේක. එය පිටතින් පැමිණියා නම් එය ඉතා අවශ්‍ය වූ ස්ථානය වෙත කිසිසේත්ම ළඟා වන්නේ නැත. ප්‍රතිසංස්කරණ පිබිදීම ඇති වුණේ සභාව ඇතුළතින්මය. පිබිදීමේ කථිකයෝ සභාවේම දේවගැතිවරුන් විය. ඔවුන්ට උදාවූ සෑම අවස්ථාවකදීම ඔවුහු සත්‍යතාව සභාව ඇතුළතම වැපුරුවෝය. මෙවන් ව්‍යාපාරයක් පිටතින් පැමිණියේ නම් එයට දොරටු වැසෙන බව නොඅනුමානය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් හොඳ හෝ නරක පිළිබඳව තැකීමක් නැතිව නින්දට පිවිස සිටි සමහර දේවගැතිවරුන් නින්දෙන් නැගිටුවනු ලැබූහ. ඔවුහු උනන්දුවෙන්ම තමන්ගේ දේවස්ථානවල ප්‍රතිසංස්කාරක දහම් දේශනා කිරීමට පටන් ගත්තෝය. ගතානුගතික ක්‍රමවේදයන් නිසා මලානිකව තිබූ සභාවන් අලුත් ජීවයක් ලැබ ප්‍රීතියෙන් ප්‍රබෝධමත් වූහ.

සභා ඉතිහාසය පුරාම දකගත හැකි කරුණක් නම් විවිධ කුශලතා ඇති පුද්ගලයෝ අවස්ථානුකූලව ඉදිරියට පිවිස තමන්ට හිමිව තිබූ කාර්යයන් ඉටු කළ බවයි. වෙස්ලිලාගේ කාලයේදීද එසේම විය. ධර්මතාවන් පිළිබඳව ඔවුහු සෑම පැතිකඩකටම එකඟතාවක් නොදැක්වූහ. එහෙත් එකී සෑම දෙනෙක්ම ශුද්ධාත්ම-යාණන්වහන්සේගේ පෙළඹවීම යටතේ ක්‍රිස්තුස්වහන්සේට ආත්ම දිනාගැනීමෙහි නිරත වූවෝය. ඔවුන්ගේ අරමුණ එයාකාර විය. වෙස්ලි සහෝදරයන් සහ විට්ෆීල්ඩ් අතර වූ වෙනස් අදහස් නිසා ඔවුන් වෙන් කරනු ලැබිය හැකිවීමේ තර්ජනය පැවති නමුත් ක්‍රිස්තුස්වහන්සේගේ පාසලෙහි නිහතමානීකම හා යටහත් පහත්කම ඉගෙන ගැනීම හේතුවෙන්, එකිනෙකාට සමාවෙමින් ඉවසීමෙන් යුතුව එකමුතුව සේවයෙහි යෙදීමට ඔවුන්ට හැකි විය. සෑම තැනකම වරද කිරීම් සහ අයුක්තිය රජ කරන්නට විය. පව්කාරයෝ සදාතන විනාශය කරා යමින් සිටියෝය. එසේ තිබියදී මත භේදයන්හි යෙදීමට ඔවුන්ට කාලයක් තිබුණේ නැත.

දෙවියන්වහන්සේගේ සේවකයෝ දුෂ්කර මාර්ගයක ගමන් කරමින් සිටියෝය. සමාජයේ අනුබලයෙන් යුත් උගත් අය ඔවුන්ට විරුද්ධව

නැඟී සිටියෝය. ටික කලකට පසුව. පැවිදි අය බොහෝ දෙනෙක් ඔවුන්ට එරෙහිව සතුරුකම් පාන්නට අධිෂ්ඨාන පූර්වකව නැඟී සිටියෝය. මෙසේ සභාවන් විසින් පිවිතුරු සත්‍යතාවට සහ එය දේශනා කරන්නන්ට තම දොරටු වසා දැමුවෝය. දේශනා කූඩුවේ සිට පුනරුදවාදීන්ව අවමානයට ලක් කිරීම නිසා අන්ධකාරයට, නොදත්කමට සහ අපරාධවලට දොරටු විවෘත විය. ජෝන් වෙස්ලිව මරා දැමීමට තැත් කළ අවස්ථාවන් බොහෝ වුවද දෙවියන්වහන්සේ එම සියලු වැයම් කිරීම් ව්‍යර්ථ කළසේක. ඔහුට විරුද්ධව නැඟී සිටි කලහකාරී කණ්ඩායමක් ඔහුව මරා දැමීමට ඔහුව වටකර ගත්තෝය. වෙස්ලිට බේරී යාමට වූ සියලු මං අවහිරව පැවති අවස්ථාවකදී මිනිස් වෙස්ගත් දේව දූතයෙක් ඔහුට පිහිට වීමට පැමිණියේය. සැහැසි කණ්ඩායම පිටිපස්සට යමින් බිම වැටුණේය. ක්‍රිස්තුස්වහන්සේගේ දාසයා අනතුරු -දායක තත්ත්වයෙන් ඉවත්ව ගියේය.

මරණයෙන් ගැළවී ගත් එක් අවස්ථාවක් ගැන ජෝන් වෙස්ලි මෙසේ විස්තර කළේය. "අපි නගරය බලායමින් සිටියා. මාර්ගය ලිස්සන සුළුවිය. ඒ අතර බොහෝ දෙනෙක් මාව තල්ලු කිරීමට වැයම් කළා. මම බිම වැටුණා නම් ආයෙත් නැගිටීම මට පහසු නොවන්නට තිබුණා. ඔවුන්ගේ ග්‍රහණයෙන් මා සම්පූර්ණයෙන්ම ඉවත්ව යනතුරු මම ලිස්සා ගියේ නැහැ. බිම වැටුණේද නැහැ ... මාගේ කමිස කොලරයෙන් ඇද මා බිම දැමීමට සමහරෙක් වැයම් කළා. එක් තැනැත්තෙක් මාගේ කබායේ සාක්කුවේ කොටසක් අල්ලා ගත් විට එය ගැළවී ඔහුගේ අතට පත්වුණා. ඒ සාක්කුවේ තව කොටසක බැංකු පතක් තිබුණා. එය ඉරුණේ අඩ වශයෙන් පමණයි. මා පිටිපසින් සිටි මහත මිනිහෙක් මට කිහිපවරක්ම ගැහුවා. ඒ ලීය ඉතා හයිය ලීයක්. එයින් ඔළුවට පාරක් වැදුණා නම්, ඔහුට තවත් ගහන්න සිද්ධවන්නේ නැහැ. ගහපු සෑම පහරක්ම අදිසි හස්තයකින් වෙන පැත්තකට හරවනු ලැබුවා. එය කෙසේ සිදුවූයේ දැයි මම දන්නේ නැහැ. මට වමටවත්, දකුණටවත් හෙලවෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. තවත් වතාවක් එක් මිනිසෙක් සෙනඟ මැදින් දුවගෙන ආවා. අතකුත් උස්සාගෙන ඔහු ආවේ මට ගහන්ටයි. එකපාරටම ඔහුගේ අත පහළට වැටුණා. මට ගහනවා වෙනුවට, ඔහු මාගේ හිස පිරිමදිමින් ඔබගේ හිස කෙස් කොපමණ සිනිඳුද' කියා පමණක් පැවසුවා .... සත්‍යතාවේ ශුභාරංචිය පිළිගැනීමට මුලින්ම ඉදිරිපත්වූ තැනැත්තන් වූයේ නගරයේ විරුවන්ය, කළහකාරී කාණ්ඩයක නායකයන් වූයේ ඔවුන්ය. එවන් එක් අයෙක් තැබෑරුමක චණ්ඩියෙක් විය.

"ඉතා අනුකම්පා සහගත ආකාරයෙන් මෘදු ලෙසින් පියවරෙන් පියවරට උන්වහන්සේගේ කැමැත්ත උදෙසා දෙවියන්වහන්සේ අපව



සූදානම් කළ හැටි! අවුරුදු දෙකකට ඉහත ගඩොල් කැටයක් මගේ උරහිසේ යන්තම් ගෑවී ගෙන ගියා. එයට වසරකට පසුව මගේ ඇස් දෙක අතරට ගලක් වැදුණා. පසුගිය මාසයේදී කෙනෙක් මට ගැසුවා. අද සවසත් දෙදෙනෙකුගෙන් ගුටි කෑවා. ටවුමට එන්න පෙර එක්කෙනෙක් මට ගැසුවා, ටවුමෙන් පිටවී ඒමෙන් පසුව තවත් කෙනෙක් මට ගැසුවා. එහෙත් ඒවා මට දැනුණේ නැහැ. එක් අයෙක් මුළු වෙර යොදා මගේ පපුවට ගැසුවා. අනෙක් තැනැත්තා කටට ගහපු පාර කොයිතරම් වේගවත් දැයි කියනවා නම් ඒ මොහොතේදීම ලේ ගලන්නට පටන් ගත්තා. එහෙත් එම පහරවල් දෙක මට වේදනාවක් ඇති කළේ නැහැ. ඒවා මට දැනුණේ පිදුරු කැල්ලක් වැදුණා හා සමානවයි." (Wesley’s Works, Vol iii, p p. 297, 298).

මෙතෝදිස්ත සභාවේ මුල් කාලවලදී සභිකයන් මෙන්ම දේවගැතිවරුද අපහාසයට සහ හිංසා පීඩාවලට ගොදුරු වූහ. මෙම තාඩන පීඩන පැමිණියේ මෙතෝදිස්තවරුන්ගේ ප්‍රකාශනවලට වැරැදි අර්ථකථන දීම නිසා කුපිත වූ ආගමක් නැති නියමුවන්ගෙන්ය. සභා සාමාජිකයන්ගෙන්ද ඔවුන්ට පීඩාවන් ඇති විය. ඔවුන්ව උසාවි ඉදිරියටද පමුණුවන ලදී. එකල අධිකරණ පද්ධතිය, නමින් පමණක් සාධාරණ විය. යුක්ති සහගත තීන්දුවක් ලැබීම එකල විරල විය. පීඩා කරන්නන්ගේ සැහැසිකම්වලට ඔවුන්ද ගොදුරු වූ වාර බොහෝය. සැහැසිකම් කරන කාණ්ඩ ගෙයින් ගෙට යමින් ගෙවැසියනට තර්ජන එල්ල කළෝය, ඔව්හු ස්ත්‍රී පුරුෂයන්ටද දරුවන්ටද සාහසික ලෙස කරදර කළහ. ගෙදර තිබූ ගෘහ භාණ්ඩ බඩු බාහිරාදිය පොඩි පට්ටම් කළෝය. මෙතෝදිස්තවරුන්ගේ ගෙවල ජනෙල් කඩා ගෙවලට ඇතුළු වී බඩු මුට්ටු සොරකම් කිරීමට උදව් වන්න කැමති අය නිශ්චිත වේලාවක නියමිත ස්ථානයකට රැස්වන ලෙස ඉල්ලමින් ප්‍රසිද්ධ දැන්වීම් විවිධ ස්ථානවල අලවා තබන්නට තරම් තත්ත්වය දරුණු විය. මිනිස් නීතිය මෙන්ම දේව නීතියද මෙසේ උල්ලංඝනය කළද වරදකරුවන් කිසිවෙකුට හෝ තරවටු කිරීමක්වත් නොවීය. විනාශය කරා පා නගන්නාවූ පව්කාරයන්ගේ දෙපා එම මාර්ගයෙන් ඉවතට හරවා ශුද්ධවූ මාවතකට හැරවීමේ එකම චෝදනාව මත මෙතෝදිස්ත ප්‍රජාවට මෙසේ හිංසා පීඩාවනට ලක්වන්නට සිදුවිය.

තමන්ට සහ තමාගේ සහකරුවන්ට විරුද්ධව නගා ඇති චෝදනා ගැන සඳහන් කරමින් ජෝන් වෙස්ලි මෙසේ පැවැසුවේය. "අපගේ කණ්ඩායම ප්‍රචාරය කරන්නාවූ ධර්මතාවන්, සාවද්‍ය බවටද, ඒවා වරද සහිත බවටද, අපගේ ක්‍රියා කලාපය මහත් උනන්දුවක් හා බැඳි උද්‍යෝගයකින් සමන්විත බවටද චෝදනා එල්ල වී ඇත. අපගේ මේ විෂමාචාර දහම් අලුත්ය! මෙතෙක් නොඇසූ විරූය. තවද එම දහම් ක්වේකර්වරුන්ගේ ඉගැන්වීම්ය. ආගම් උන්මත්තකයින්ගේ විකාරයක්ය, පාප් සමයවාදීන්ගේ දහම් ප්‍රභේදයක්ය, යනුවෙන් අපව විවේචනය

කර ඇත. සමූහයාගේ වැඩපිළිවෙත බිම හෙළීමට අපගේ සංවිධානය නමැති ගසෙහි මුල් පවා සිඳ දමා ඇති බවත් කියැවේ. සමස්ථයක් වශයෙන් අපගේ දහම්හි සෑම පැතිකඩක්ම ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු සරල ධර්මතාවන්හි විකාශනයක් බවත් එම දහම් අපගේම සභාවේ අර්ථකථන සැපයීම් බවත් පෙන්නුම් කර ඇත්තෙමු. ශුද්ධ ලියවිල්ල සත්‍යය නම් අපගේ දහම් වැරදි යයිද, වරද සහගත යයිද චෝදනා නැගීමට නොහැකිය. තවත් අය අපට නගන චෝදනාවක් නම් අපගේ දහම් ඉතා විධිමත්ය, තදය, ඒ දැඩි ප්‍රතිපත්ති ස්වර්ගයට යෑමේ මාර්ගය බොහෝ සේ පටු කරනවා, යන්නය. ඇත්තටම අපට එරෙහිව ඇති මූලික විරුද්ධතාව මෙයයි. කලක් යන තුරු එල්ලවූ එකම චෝදනාවද මේකයි. තවත් චෝදනාවලට ප්‍රස්තූතය වන්නේද මෙම කාරණයයි. අපගේ සමිඳාණන් සහ උන්වහන්සේගේ ගෝලයන් විසින් පෙන්වා දුන් පටු මාර්ගයට වඩා අපගේ ප්‍රතිපත්ති අනුව ජීවිත හැඩගස්වා ගැනීම මගින් සමග තවත් පටුවන්නේද? අප පෙන්වා දෙන මාර්ගය ශුද්ධ බයිබලයෙහි හෙළිදරව් කර ඇති සුරපුර මාවතට වඩා පටුද? ඔවුන් දෙසූ දහම් බයිබල් දහමට වඩා දැඩිද? බයිබල් පද කිහිපයකට යොමු වෙමු. "නුඹේ මුළු හෘදයෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, නුඹේ මුළු ශක්තියෙන්ද, නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්-වහන්සේටත් නුඹට මෙන් නුඹේ අසල්වාසියාටත් ප්‍රේම කරන්න." (ලූක් 10:27) "තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිෂ්ඵල වචන ගැන විනිශ්චය දවසේදී උත්තර දෙන්ට වෙන්නේය." (මතෙව් 12:36) "එහෙයින් නුඹලා කතත්, බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරන්න." (1 කොරින්ති 10:31)

"අපගේ දහම් මෙයට වඩා දැඩි නම්, අප ඒ ගැන වරදකරුවන් වනවා ඇත. එහෙත් එය එසේ නොවන බව හෘදය සාක්ෂියට එකඟව ඔබ කිය යුතුයි. ඒ අතර, දෙවියන්වහන්සේගේ වචනය දූෂ්‍ය නොකර, අබ ඇටයක තරමින්වත් දේව වචනයේ ප්‍රමිතිය වෙනස් කරන්නේ කෙසේද? ලිහිල් කරන්නේ කෙසේද? අප වනාහි දෙවියන්-වහන්සේගේ අභිරහස් භාරකොට ඇති වචනයේ කළමනාකරුවන්ය. එම ශුද්ධ වූ වචන වෙනස් කිරීමේ අයිතියක් අපට තිබේද? එවන් අය විශ්වාසවන්ත කළමනාකරුවන් යයි හඳුන්වා දීමට පුළුවන්ද? උන්වහන්සේගේ වචනයේ බිඳක් හෝ කිසිසේත්ම ඉවත් කළ නොහැකිය. කථා කිරීමේ දැඩි ස්ථාවරය ලිහිල් කළ නොහැකිය." ඔබේ සිතට සරිලන සේ ශුද්ධ ලියවිල්ල රස ගන්වන්න මට බැහැ. එහි පවසා ඇති මට්ටමට, ප්‍රමිතියට ඔබ නැගී ඒම අවශ්‍යයි. නැතිනම් ඔබේ අවසානය සදාතන විනාශයයි! අපගේ අයව, ප්‍රේමයක්, දහමක් නැති දේව සේවකයන් කොටසක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඔවුහු දයාව සහ ආදරය විරහිත වූ අය වන්නෝද? ඔවුන් ගැන එසේ කියන්නේ කුමන දෑ සම්බන්ධවද? ඔවුන් බඩගිනි අයට කෑම ලබාදෙන්නේ නැද්ද? ඇඳුම් නැති අයට ඇඳුම් ලබා දෙන්නේ නැද්ද?



කාරණය එසේ නොවේ, ඔවුන් මෙවන් දේ කරනවා. ඔවුන්ගේ විනිශ්චය කිරීම් තුළින් ඔවුන් දැඩි ස්ථාවරයක සිටිනවා. තමන් පවසන්නාවූ ක්‍රමවේදය අනුව ජීවත්වන්නේ නැති අයට ගැළවීම ලබාගත නොහැකි යයි පැවසීම නිසා ඔවුන් ගැන මෙසේ පවසනවා." (Weslie’s Works, Vol. iii, p p. 152, 153).

වෙස්ලිගේ ඉගැන්වීම් එංගලන්තයේ ප්‍රචාරය කරනු ලැබීමට පෙර, එරට පැවැති ආත්මික පරිහානියට ප්‍රබල සාධකයක් වූයේ විරුද්ධවාදී ඉගැන්වීම්වල ප්‍රතිඵලයයි. සදාචාර නීති මාලාව ක්‍රිස්තුස්වහන්සේ විසින් අවලංගු කර ඇතැයි බොහෝ අය ස්ථිර කොට පවසා තිබුණි. දේව ආඥාවන්ට කීකරු වීමට කිතුණුවන්ට උවමනාවක් නැතැයි යන්න පැවිද්දන්ගේ ඉගැන්වීම විය. "යහපත් ක්‍රියාවන් ඉටු කිරීමේ වහල් කමින්" කිතුණුවන්ව නිදහස් කර ඇතැයිද ඔවුහු ඉගැන්වූහ. තවත් සමහරෙක් මෙසේද ඉගැන්වූහ: "ව්‍යවස්ථාවෙහි නිත්‍ය පැවැත්ම ඔවුන් පිළිගන්නා නමුත් එකී ආඥාවලට කීකරු වන්නැයි කියා පූජකයන් විසින් බැතිමතුන්ට අනුශාසනා කිරීම අවශ්‍ය නැත. මක්නිසාදයත්, ගැළවීම ලැබීම සඳහා තෝරාගනු ලැබූ අය දිව්‍ය කරුණා-අනුග්‍රහයේ විරුද්ධතාවක් දක්විය නොහැකි පෙලඹවීමේ බලය කරණකොටගෙන සුචරිතය සහ භක්තිය වෙත නැඹුරු වෙනවා නොඅනුමානය. ඒ අතර සදාතන දඬුවමට නියමවූ අයට දිව්‍ය ව්‍යවස්ථාවට කීකරු වීමේ බලයක් නැත."

මේ අතර තවත් ඉගැන්වීමක්ද ප්‍රචලිතව පැතිර ගියේය. "තෝරාගනු ලැබූ අය කරුණා-අනුග්‍රහයෙන් වැටී යන්නේවත් ඔවුන්ට දිව්‍ය පක්ෂපාතිත්වය අහිමි වන්නේවත් නැහැ"යි වෙනත් අය ඉගැන්වූහ. එම ඉගැන්වීම කරණකොටගෙන භයානක තීරණයක් කරා ශ්‍රාවකයන්ව යොමු කරවනු ලැබීය. "තෝරාගනු ලැබූවන් කරන්නාවූ දුෂ්ට ක්‍රියාවන් පව් ලෙස ගණන් ගත නොහැකිය. එම ක්‍රියාවන් දිව්‍ය ආඥාවන් කඩකිරීමක් හෙවත් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය නොහැකිය. එම නිසා ඔවුන්ගෙන් පව් කියාදීමක් අපේක්ෂා නොකෙරේ ඔවුන්ට පසුතැවිලිවීමක් මගින් සිත් බිඳී යාමකට පෙළඹීමක්ද උවමනා නැත." (Mcclintock and Strong’s Cyclopedia, art. Antinomians”). ඒ අතරම ඔවුන් මෙවන් ප්‍රකාශනයක්ද නිකුත් කළෝය. "ඔවුන් ඉතා නීච, අධම පාපයක් සිදු කළත්" එය දිව්‍ය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකැයි මුළු විශ්වයම තීන්දු කළද, එය දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාපයක් ලෙස පිළිගනු නොලැබේ." තෝරාගනු ලැබූවන් එවන් නීච අධම ක්‍රියාවක් සිදු කළද, "දෙවියන්වහන්සේට අප්‍රසන්නවූ ද, ව්‍යවස්ථාව විසින් තහනම් කර ඇත්තාවූද කිසිවක් කිරීමට ඔවුන්ට හැකියාවක් නැත. එය තෝරාගනු ලැබූ අයගේ කැපී පෙනෙන්නාවූ පරවේණි ලක්ෂණයකි, චරිතාංගයකි." යනුවෙන් ඔව්හු පැවසූහ.

මෙම භයානක දහම් වනාහි, පාප්ට ව්‍යවස්ථාවට ඉහළින් ක්‍රියාකිරීමට පුළුවන, ව්‍යවස්ථාව වෙනස් කරමින් වැරදි දෙය හරි-ගැස්සීමට ඔහුට පුළුවන, දෙවියන්වහන්සේගේද මනුෂ්‍යයන්ගේද ව්‍යවස්ථාවන්ට පටහැනි විනිශ්චයන් පැනවීමට ඔහුට පුළුවන යනුවෙන් රෝම වේදීන්ගේ සහ ධර්මාචාර්යවරුන්ගේ ඉගැන්වීම් හා සම විය. මෙම ඉගැන්වීම්වල මූල ධර්මයක්ව ඇත්තේ නිරවද්‍යතාවේ ප්‍රමිතියක් ලෙස වෙනස් නොවන සුළු දිව්‍ය ව්‍යවස්ථාවක් නැත යන පදනමයි. අධ්‍යාත්මිකතාවේ පදනම වූකලී සමාජය විසින්ම තීරණය කරනු ලබන සදාචාරාත්මක පදනමය. එකී ප්‍රමිතිය නිරතුරුවම වෙනස්කම් වලට භාජනය වන්නේය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව විසින් පනවනු ලබන ධාර්මික තහංචි බිඳ දැමීමට සගයේ වාසය කළ පව් නොකළ දූතයන්ව පවා පෙළඹවූ ආත්මය, එනම් සාතන්ගේ ආත්මය මෙවන් ඉගැන්වීම් වලට ආනුභාවය සපයන්නේය.

දිව්‍ය අණපනත් මගින් මිනිසුන්ගේ ජීවිත එක්තරා ප්‍රමිතියක් අනුව පිහිටවනු ලැබේ. මෙම කරුණ බොහෝ අයට බාධාවක් වී දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කිරීමට හේතු වී ඇත. මූලධර්ම විරෝධී ඉගැන්වීම්හි අඩංගු වැරදි දහම්වලට එරෙහිව වෙස්ලි නිතරම කථා කළේය. මෙවන් දහම් ශුද්ධ ලියවිලිවලට පටහැනි බව හෙතෙම පෙන්වා දුන්නේය. "සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙනෙන්නාවූ දෙවියන්වහන්සේගේ කරුණාව ප්‍රකාශවී තිබේ." "මෙය සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දනගැනීමට පැමිණෙනවාට කැමති වූ, අපගේ ගැළවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව ප්‍රසන්නව තිබේ. මක්නිසාද ඇත්තේ එක දෙවි කෙනෙක් සහ දෙවියන්වහන්සේටත්, මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත්ය. උන්වහන්සේ සියල්ලන් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ම දුන්නාවූ මනුෂ්‍යයා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය." (තීතස් 2:11;1 තිමෝති 2:3-6). ගැළවීමේ ක්‍රමවේදය මුළින්ම තිරසාර ලෙස ග්‍රහණය කරගැනීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේව නොමිලයේ දානය කර ඇත. මෙසේ "සත්‍යවූ ආලෝකය" වන ක්‍රිස්තුස්වහන්සේ 'ලෝකයට එන්නාවූ සියලු මනුෂ්‍යයන් ආලෝකමත් කරන සේක.' (යොහන් 1:9). ජීවනයේ තෑග්ග සිය කැමැත්තෙන්ම ප්‍රතික්ෂේප කිරීම නිසා මිනිසුන්ට ගැළවීම නොලැබී යන්නේය.

යේසුස්වහන්සේගේ මරණයත් සමගම දසපනතෙහි ආඥවන් සහ චාරිත්‍රානුකූල නීතියද අහෝසි වී යයි යන ඉගැන්වීම පිළිබඳව වෙස්ලි මෙම පිළිතුරු දුන්නේය. "දස ආඥ පනතෙහි අඩංගු සදාචාරාත්මක නීතිය දිවැසිවරුන් තවදුරටත් තහවුරු කර තිබේ. එය ක්‍රිස්තුස්වහන්සේ විසින් ඉවත් කර නැත. දස පනතෙහි කිසිම කොටසක් අවලංගු කිරීම උන්වහන්සේගේ පැමිණීමෙහි සැලැස්ම නොවීය. මෙය කිසිම දවසක උල්ලංඝනය කළ නොහැකි ව්‍යවස්ථාවකි. මෙම දශපනත



"සගයේ සිටින්නාවූ විශ්වාස සාක්ෂිකරුවාණන් ලෙස ස්ථිරසාරව පවතින්නේය"

මිනිසා මැවුම්කරුවාණන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන් නික්ම ආ දිනයේ පටන්ම මෙම ව්‍යවස්ථාව ගල්ලෑලි මත නොව ඔවුන්ගේ සිත් තුළ ලියා ඇත. දෙවියන්වහන්සේගේ ශ්‍රී ඇඟිලිවලින් ලියන ලද ව්‍යවස්ථාවෙහි අකුරු පාපය නිසා අද බොඳ වී ඇත. එහෙත් එම ආඥ සම්පූර්ණයෙන්ම මකා දැමිය හැකි නොවේ. යහපත සහ නපුර පිළිබඳව අපේ හෘදය සාක්ෂිය කරුණු පවසන තාක් කල් ව්‍යවස්ථාව වන දශපනත සම්පූර්ණ ලෙස නැතිවී නොයන්නේය. සෑම යුගයකටම බලපාන අයුරින් මිනිස් වර්ගයා කෙරෙහි මෙම ව්‍යවස්ථාවේ සෑම කොටසක්ම බල සහිතව තිබීම අනිවාර්ය වන්නේය. එය යම්කිසි ස්ථානයකට හෝ යම්කිසි කාලයකට හෝ යම්කිසි අවස්ථාවකට හෝ සීමා නොවේ. ඒ අනුව වෙනස්වීමකටද භාජනය නොවේ. එය දෙවියන්වහන්සේගේ ස්වභාවයත්, මිනිසාගේ ස්වභාවයත් ඔවුන් එකිනෙක්කෙනාගේ වෙනස් නොවන ස්වභාවයත් මත පදනම්ව ඇත.

"ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය අවලංගු කරන පිණිස මම ආවෙමියි නොසිතන්න. සම්පූර්ණ කරන්ට මිස අවලංගු කරන්නට නාවෙමි," යි යේසුස්වහන්සේ පැවසූසේක. මෙම අවස්ථාවෙහිදී උන්වහන්සේ අදහස් කළේ මෙවැන්නක් බව විවාදයකින් තොරව පැහැදිලි කළ හැක. මිනිසුන් විසින් විවිධ ආකාරයෙන් ඔප දමා තිබුණත්, දිව්‍ය ව්‍යස්ථාව එහි සම්පූර්ණත්වයෙන් ස්ථාපිත කරන්නට මා පැමිණියෙමි'යි, උන්වහන්සේ අවධාරණය කළසේක. එම ව්‍යවස්ථාවෙහි යම්කිසි අඳුරු තැනක් වීද, එහි යම්කිසි අපැහැදිලි තැනක් වීද, එය සෑමට පැහැදිලිව දකගත හැකිවන පරිදි පූර්ණ ආලෝක කදම්බයක් මධ්‍යයේ ව්‍යවස්ථාව රැඳවීම පිණිස උන්වහන්සේ පැමිණි බව අපට පැහැදිලිය. 'එහි සෑම කොටසකම පූර්ණවූ ද, සත්‍යවූ ද වැදගත්කම ප්‍රකාශ කිරීමට මම ආවෙමි'යි උන්වහන්සේ මෙයින් ප්‍රකාශ කළසේක. 'ව්‍යවස්ථාවේ අඩංගු සෑම ආඥවකම දිග හා පළල, සම්පූර්ණ අර්ථය පෙන්වා දෙන්නට මම ආවෙමි'යි උන්වහන්සේ ප්‍රකාශ කළසේක. සෑම ආඥවකම උස සහ ගැඹුරුද මිනිස් බුද්ධියට තේරුම් ගත නොහැකි එහි පාරිශුද්ධතාවද ආත්මික-තාවද ප්‍රකාශ කරන්නට උන්වහන්සේ පැමිණි සේක. (Wesley's Works, Sermon 25).

ව්‍යවස්ථාව සහ ශුභාරංචිය අතර ඇති සම්පූර්ණ ඒකත්වය පිළිබඳව වෙස්ලි මෙසේ ප්‍රකාශ කළේය: "එම නිසා ව්‍යවස්ථාව සහ ශුභාරංචිය අතර සමීප සම්බන්ධතාවක් ඇත්තේය. එක පැතිකඩකින් සලකා බලන කල්හි ව්‍යවස්ථාව, ශුභාරංචිය දෙසට අවධානය යොමු කරවමින් ශුභාරංචියට ඉස්මතු වන්නට මාර්ගය සලසන්නේය. අනික් අතට

ශුභාරංචිය අපට මගපෙන්වන්නේ ව්‍යවස්ථාව වඩා හොඳින් සම්පූර්ණ කිරීමටය. දෙවියන්වහන්සේට ආදරය කරන්ටත්, අපගේ අසල්-වැසියන්ටත් ආදරය කරන්ටත් මුදු මොළොක් ලෙස නිහතමානීව සහ ශුද්ධව ජීවත් වන්ටත් අවශ්‍ය බව ව්‍යවස්ථාව අපට දක්වයි. මෙම ඉල්ලුම සපුරාලන්නට හැකියාවක් අපට නැතැයි හැඟීමක් ඇතිවේ. එසේය, මිනිසාට මේ දෙය ඉටු කළ නොහැකිය. නමුත් ආදරය කරන්ටත්, අපව මුදු මොළොක් කරමින් නිහතමානීව සහ ශුද්ධ ලෙස ජීවත් වන්නටත් හැකියාව ලබාදෙන බවට දෙවියන්වහන්සේ අපට පොරොන්දුවක් ලබාදී තිබේ. මෙම ශුභාරංචිය අපි තදින් ග්‍රහණය කරන්නෙමු. එය අපගේ ඇදහිල්ල අනුව ඉෂ්ට වන්නේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ ඇදහිල්ල කරණකොටගෙන ව්‍යවස්ථාවෙහි ධර්මිෂ්ඨතාව අප තුළ ඉටු වන්නේය"

වෙස්ලි තවදුරටත් මෙසේ පැවසුවේය: "ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියෙහි සතුරන් අතර ඉහළ තලයේ සිටින්නාවූ නායකයෝ විවෘතව සහ ස්ථිර වශයෙන්ම "ව්‍යවස්ථාව විනිශ්චයකර" "ව්‍යවස්ථාවට විරුද්ධව කථා කරති." ඔවුන් මිනිසුන්ට උගන්වන්නේ එක ආඥවක් කඩකිරීමට පමණක් නොවේ. ඔවුහු සම්පූර්ණ ව්‍යවස්ථාවම කටුගා දමති. මෙම ප්‍රබල රැවටිල්ලට අසුවී ඇති අය සත්‍ය වශයෙන්ම සිතා සිටින්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අතුගා දැමීමෙන් තමන් උන්වහන්සේට ගෞරවය ලබාදෙනවා යයි කියාය. දෙවියන්වහන්සේගේ ධර්මය විනාශ කරමින් ඔවුන් සිතන්නේ තමා එමඟින් දෙවියන්-වහන්සේගේ ශ්‍රී විභූතිය වර්ණනා කරන බවය. එසේය, ඔවුන් උන්වහන්සේට ගෞරව කරන්නේ යූදස් කළාක් මෙන් උන්වහන්සේව සිප ගෙන "රබ්බි, ශුභසිද්ධ වේවාය" යි උන්වහන්සේට පැවසූ අන්දමටය. තමන්වහන්සේගේ ව්‍යවස්ථාවට මෙසේ නිගරු කරන්නාවූ සැමට උන්වහන්සේ මෙසේ පවසන්නට පුළුවන: "ඔබ සිඹීමකින් මනුෂ්‍ය පුත්‍රයා පාවා දෙනවාද?" ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය ගැන කථා කරමින් කුරුසිය ඉවත් කරගැනීමත් ශුභාරංචිය ව්‍යාප්ත කරනවා යයි පවසමින් උන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි යම් කොටසක් වටිනා-කමින් අඩු යයි කියමින් නොසලකා හැරීමත් යන්න යේසු සමිඳුන්ව සිඹීමකින් පාවාදීමට සමානය. මෙම චෝදනාවෙන් බේරීමට හැකිවන්නේ කවරෙකුටද? කීකරුවීමෙහි කිසියම් අංගයක් සෘජුව හෝ වක්‍රව හෝ සැලකිල්ලෙන් ඉවත් කිරීමට උපදෙස් දෙන්නාවූ ඇදහිල්ල ගැන දේශනා කරන්නාවූ කවරෙකුට හෝ මෙම චෝදනාව එල්ල නොවන්නේද? ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව දේශනා කරන්නාවූ යමෙක් දෙවියන්-වහන්සේගේ ආඥවන්හි ඉතාම කුඩා අණක් පවා යම්කිසි ආකාරයකින් නිෂ්ප්‍රභා කිරීමට හෝ දුර්වල කිරීමට ක්‍රියා කරන්නේ නම් ඔවුන්ද ක්‍රිස්තුස්වහන්සේව සිඹීමකින් පාවා දෙන්නේය යන චෝදනාවට ලක් නොවන්නෝද? (Wesley’s Works, Sermon 25).



ශුභාරංචිය දේශනා කිරීම ව්‍යවස්ථාවේ සියලු අවශ්‍යතාවන්ට උත්තරය යයි පවසන්නාවූ චෝදනාවට පිළිතුරු දෙමින් වෙස්ලි මෙසේ පැවසීය. "මෙම චෝදනාව අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. එමගින් ව්‍යවස්ථාවේ මුල්ම අවශ්‍යතාව ඉටු නොවෙනවා. ව්‍යවස්ථාව මගින් මිනිසාට තමාගේ පාප ගැන ඒත්තු ගැනීමක් ඇති වෙනවා. නරකාදියෙහි ඉවුර මත නිදා සිටින්නාවූ පව්කාරයාව එමගින් අවදි කරනවා. "පාවුල් පවසන ආකාරයට 'ව්‍යවස්ථාව මගින් සිදුවන්නේ පාපය පිළිබඳව අපට හරි අවබෝධයක් ලබාදීමයි.' මිනිසාට තම පාපය පිළිබඳව ඒත්තු ගැන්මක් ඇතිවන තුරු ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ රුධිරයෙහි අවශ්‍යතාවන් ඔහුට ඇත්තටම දැනෙන්නේ නැහැ. 'රෝගීන්ට මිස නීරෝගීන්ට වෙදාගෙන් ඕනෑකමක් නැත'යි කියා යේසු සමිඳාණන් පැවැසූ සේක. එම නිසා නීරෝගී අයෙකුට හෝ තමා නීරෝගී යයි සිතන්නාවූ අයෙකුට වෙදෙකු හඳුන්වාදීම ප්‍රඥ ගෝචර ක්‍රියාවක් නොවේය. තමා රෝගීන් යයි මිනිසුන්ට මුලින්ම ඒත්තු ගැන්විය යුතුය. එසේත් නැතිනම් ඔබේ මහන්සියට මිනිසුන් කෘතඥතාව පල නොකරනවා ඇත. කැඩී බිඳී නොගිය හදවතකට, එනම් තමා වරද රහිත යයි සිතන්නාවූ හදවතක් ඇති අයෙකුට ක්‍රිස්තුස්වහන්සේව පිළිගැන්වීම නිෂ්ඵලය." (Wesley’s Works, Sermon 35).

දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහයෙහි ශුභාරංචිය දේශනා කරන අතරම තම සමිඳාණන් මෙන් වෙස්ලිද "ව්‍යවස්ථාව උතුම් කොට ඊට ගෞරව කරන්ට" වෑයම් කළේය. දෙවියන්වහන්සේ ඔහුට භාරදුන් කාර්ය භාරය ඔහු විශ්වාසවන්තව ඉටු කළේය. තම කටයුතුවල ප්‍රතිඵල ඉතා මහිමවත් බව ඔහුට දකගත හැකි විය. අවුරුදු අසූවකට වැඩි වූ ඔහුගේ දිගු ජීවිතයේ අවසානයේදී ඔහු හා සමග එක්ව සහභාගි වූ අනුගාමිකයන්ගේ සංඛ්‍යාව පන් ලක්ෂයකට වඩා වැඩි විය. අර්ධ ශත වර්ෂයකට වඩා වැඩි කාලයක් හෙතෙම සංචාරක දේවගැතිවරයෙකු ලෙස සේවය කළේය. ඔහුගේ සේවාව කරණකොටගෙන පාපයේ විනාශයෙන් සහ අවමානයට පත්වීමෙන් ගැළවීම ලැබ උසස්වූ ද, පිරිසිදුවූ ද ජීවිතයකට හිමිකම් කී අය මෙන්ම ඔහුගේ ඉගැන්වීම් නිසා ගැඹුරුවූ ද, ඉසුරුබරවූ ද අත්දැකීමක් ලැබූ අයද ගණන් ගතහොත් එය නිත්‍ය වශයෙන්ම පැවසිය නොහැකිය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේදී දේව පවුල එක්රැස් වන තුරු වෙස්ලිගේ දිරි ගැන්වීම ලැබූ අයගේ සංඛ්‍යාව කොපමණදැයි ගණනය කිරීමට නොහැකිය. ඔහුගේ ජීවිතය තුළින් සෑම කිතුණුවෙකුටම පිළිගන්වන්නේ මිල කළ නොහැකි පාඩමකි. මෙම ක්‍රිස්තු සමිඳාණන්ගේ සේවකයාගේ කැපවීම, ආත්ම පරිත්‍යාගය, නොසිදෙන ජ්වලිතතාව, නිහතමානීකම සහ ඇදහිල්ල අද දවසේ දේව සභාවන්හි පිළිබිඹු කරනු ලබනවා නම් කොපමණ හොඳද.

# 15

# ශුද්ධ වූ බයිබලය සහ ප්‍රංශ විප්ලවය

විවෘත බයිබලයක් ජනතාවට ඉදිරිපත් කරමින් දහසය වැනි සිය වසරේදී ආගමික ප්‍රතිසංස්කරණය යුරෝපයේ සෑම රටකටම ඇතුලු වීමට අභිලාෂයක් දක්වීය. සමහර රටවල් ප්‍රතිසංස්කරණයේ පණිවිඩය මහත් සතුටින් පිළිගත්තේ සගයේ සිට පැමිණි පණිවිඩකරුවෙකු ලෙසය. සමහර රටවලට මෙම දහම් පණිවිඩය ඇතුලුවීම වලක්වා ලීමට පාප් සමයවාදීහු සමත් වූහ. මිනිස් දිවිය ඉහළට ඔසවා තැබීමේ බලපෑමක් ඇති කළ හැකි බයිබලීය දනුමේ ආලෝකය එම රටවලින් සම්පූර්ණයෙන්ම වළක්වන ලදී. එක්තරා රටකට ඇතුළු වීමට දහම් ආලෝකය සමත් වුවද, එහි පැවති අන්ධකාරයට ආලෝකය තේරුම් ගැනීමේ හැකියාවක් නොවීය. සියවස් ගණනාවක් පුරා ජයගැනීමේ අභිලාෂයෙන් සත්‍යතාව සහ අඳුර අතර අරගලයක් එහි පැවැතියේය. අන්තිමේදී නපුර ජය ගත්තේය, සගයේ සත්‍යතාව ඉවතට වීසි කරනු ලැබීය. "විනිශ්චය නම් මේය - ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නුමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය." (යොහන් 3:19). තමන් තෝරාගත් මාර්ගයෙහි ගමන් කිරීමේ ප්‍රතිඵල නෙලා ගැනීමට එම ජාතියට සිදුවිය. තමන්වහන්සේ දානය කළ කරුණා-අනුග්‍රහය එපා කළ ජනතාවකගෙන් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ බලය ඉවත් කරන ලදී. නපුරට ඵල දරීමට කාලය දෙනු ලැබීය. ස්වකීය කැමැත්තෙන්ම ආලෝකය ප්‍රතික්ෂේප කිරීමේ විපාකය ලොවටම දකගැනීමට හැකි විය.

ප්‍රංශය විසින් සියවස් ගණනාවක් පුරා බයිබලයට විරුද්ධව ගෙනගිය යුද්ධය කෙළවරක් කරා පැමිණියේ විප්ලවයක් මගින්ය. එම විපත්තිදායක භයානක විප්ලවය ඇති වූයේ, රෝමානුව විසින් ශුද්ධ ලියවිලි යටපත් කිරීම නිසාය. පාප් සමයවාදී ප්‍රතිපත්ති මත වූ ක්‍රියාවේදයන් අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ මෙම විප්ලවය ඒවා අනුගමනය කිරීම මගින් සිදුවන්නාවූ ඉරණම ලොවට හඬ ගා කීමට සමත් විය. වසර දහසකටත් වැඩි කාලයක් පුරා රෝමානු සභාවේ ඉගැන්වීම් අනුගමනය කිරීමේ වක්‍ර ප්‍රතිඵලයක් ලෙස මෙම විප්ලවය හඳුන්වා දීමට පුළුවන.

පාප් සමයවාදී ආධිපත්‍යය මගින් ශුද්ධ ලියවිලි යටපත් කරනු ලබන බව දිවැසිවරුන් විසින් ප්‍රකාශ කර ඇත. "නොපනත්කමේ මිනිසාගේ" හෙවත් "පාපයේ මනුෂ්‍යයාගේ" පරිපාලන ආධිපත්‍යය



යටතේ, විශේෂයෙන්ම ප්‍රංශයට සිදුවූ මහත් හානිදායක ප්‍රතිඵල පිළිබඳව එළිදරව්කාරයා අතීතයේදී ප්‍රකාශ කර තිබුණේය.

දෙවි සමිඳාණන්ගේ දූතයා මෙසේ පැවසීය: "ඔවුහු ශුද්ධවූ නුවර සතළිස් දෙමාසයක් පයින් පාගා දමන්නෝය. තවද මාගේ සාක්ෂිකාරයන් දෙදෙනාට (බලය) දෙන්නෙමි. ඔවුහු එක්දහස් දෙසිය හැට දවසක් ගෝනි රෙදි හැඳ අනාගතවාක්‍ය කියන්නෝය ... ඔවුන් තමුන්ගේ සාක්ෂිය නිම කළ විට පාතාලයෙන් නැගී එන මෘගයා ඔවුන්ට විරුද්ධව යුද්ධ කොට ඔවුන්ගෙන් ජයගෙන ඔවුන් මරන්නේය. ඔවුන්ගේ මළ කඳන් වනාහි සොදොම සහ මිසරයත් යයි ආත්මික අර්ථයෙන් කියනු ලබන ඔවුන්ගේ ස්වාමීන්වහන්සේ කුරුසියෙහි ඇණ ගසන ලද මහත් නුවර වීථියේ තිබෙනවා ඇත. ... මේ ප්‍රොපේතවරුන් දෙදෙන පොළොවේ වසන්නන්ට වධ කළ නිසා, පොළොවේ වසන්නෝ ඔවුන් ගැන ප්‍රීතිව සන්තෝෂ වෙමින් එකිනෙකාට තෑගි යවන්නෝය. ඒ දවස් තුනහමාරට පසු ජීවන හුස්ම දෙවියන්වහන්සේගෙන් ඔවුන් තුළට පැමිණ, ඔවුහු නැගිට සිටියෝය. ඔවුන් දුටුවන් කෙරෙහි මහත් භය පැමුණුනේය." (එළිදරව් 11:2-11).

මෙහි සඳහන් කාල නිර්ණයන් වූ "සතළිස් දෙමාස" කාලය සහ "දවස් එක්දහස් දෙසිය හැට" කාලය යන යෙදුම් දෙකම එකම කාලපරිච්දෙයක් හැඳින්වීම සඳහා භාවිතා කොට ඇත. මෙම කාලය තුළදී ක්‍රිස්තුස්වහන්සේගේ සභාව රෝමානු බලධරයන්ගේ තාඩන පීඩනවලට ලක්වන්නට තිබුණි. වසර 1260 ක කාල වකවානුව ක්‍රි: පූ: 538 දී ආරම්භව ක්‍රි: ව: 1798 දක්වා පැවැතියේය. එම අවසාන වසරේදී ප්‍රංශ හමුදාව රෝමයට ඇතුළු වී පාප්ව සිරකරුවෙකු ලෙස අත්අඩංගුවට ගත්තේය. ඔහු විදේශ රටකදී මරණයට පත්විය. හිස්වූ පදවියට අලුත් පාප්වරයෙකු පත්කරනු ලැබූ නමුත් එතෙක් රෝම සමය සතුව තිබූ බලය නැවත වරක් එම තත්ත්වයටම පමුණුවා ගැනීමට රෝමයට පුළුවන් නොවීය.

සභාවට එරෙහිව හිංසා පීඩා පැමිණවීම් අවුරුදු එක්දහස් දෙසිය හැටක් පුරාම පැවතුණේ නැත. තමන්වහන්සේගේ ජනතාවට වූ මෛත්‍රී-කරුණාව නිසා දෙවියන්වහන්සේ එම කාලය කෙටි කළසේක. සභාව මත පතිත වන්ට තිබුණාවූ මේ "මහත් පීඩාකාරී" වකවානුව ගැන සඳහන් කරන්නාවූ ගැළවුම්කාර සමිඳාණෝ මෙසේ වදාළ සේක. "ඒ දවස් ලුහුඬු නොකරන ලද්දේවී නම් කිසි කෙනෙක් නොගැළවෙන්නේය. නුමුත් තෝරාගනු ලැබූවන් උදෙසා ඒ දවස් ලුහුඬු කරනු ලබන්නේය." (මතෙව් 24:22). ප්‍රතිසංස්කරණයේ බලපෑම් කරණකොටගෙන 1798 ට ටික කලකට පෙර පීඩාවන් නිමාවට පත්විය.

මෙම සාක්ෂිකරුවන් දෙදෙනා සම්බන්ධව දිවැසිවරයා තවදුරටත් මෙසේ පවසයි. "මොවුහු පොළොවේ ස්වාමීන්වහන්සේ ඉදිරිපිට සිටින ඔලීව ගස් දෙකද පහන්රුක් දෙකද වෙති." ඒ අතරේදී ගීතිකාකාරයා මෙසේ පවසයි. "ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය, මාගේ මාවතට එළියක්ය." (එළිදරව් 11:4; ගීතාවලිය 119:105), සාක්ෂිකරුවන් දෙදෙනාගෙන් නියෝජනය වන්නේ පරණ ගිවිසුම සහ අලුත් ගිවිසුම වන ශුද්ධ ලියවිලිය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි පටන්ගැන්මත් එහි පැවැත්මත් පිළිබඳව අගනා සාක්ෂි දෙක මේ ගිවිසුම් දෙක වන්නේය. ගැළවීමේ සැලැස්මෙහි අගනා සාක්ෂිකරුවන් වන්නේද මෙම ගිවිසුම් දෙකය. පරණ ගිවිසුමේ අඩංගු පුද පූජා විධි සහ අනාවැකි පැමිණෙන්නාවූ ගැළවුම්කරුවාණන් දෙසට අවධානය යොමු කරයි. සංකේත සහ අනාවැකි මගින් පෙන්වා දී තිබූ ආකාරයෙන්ම ගැළවුම්කාරයාණන්වහන්සේ පැමිණ ඇති බව ශුභාරංචි සහ අලුත් ගිවිසුමෙහි යැවුම්පත් සාක්ෂාත් කරයි.

"ඔවුහු එක්දහස් දෙසිය සැටදවසක් ගෝනි රෙදි හැඳ අනාගතවාක්‍ය කියන්නෝය." මෙම කාල පරාසයේ විශාල කාලපරිච්දෙයක් තුළ දෙවියන්වහන්සේගේ සාක්ෂිකරුවෝ අප්‍රසිද්ධියෙන් සිටියෝය. සත්‍යතාවේ වචන මිනිසුන්ගෙන් වසන් කර තැබීමට පාප් බලධරයෝ වෑයම් කළෝය. සාක්ෂිකරුවන්ගේ දහම් ප්‍රකාශනවලට විරුද්ධවූ ඉගැන්වීම් යොදා ගනිමින් ඒවා මිනිසුන් ඉදිරියේ තබමින් සත්‍යතාව නැතිකර දැමීමට රෝමානුවෝ වෑයම් කළෝය. ආගමික සහ ලෞකික බලවේග මගින් ශුද්ධ බයිබලය තහනම් කරන ලදී. බයිබලයේ ඉගැන්වීම් අනිසි ලෙස යොදා ගනිමින් වැරැදි අරුත් ඉදිරිපත් කරන ලදී. මිනිස් මනස බයිබල් දහම් කෙරෙන් ඉවතට යොමු කිරීම සඳහා යොදාගත හැකි සෑම උපක්‍රමයක්ම ක්‍රියාත්මක විය. මෙම විධි සහ ක්‍රම මිනිසුන්ගේ මෙන්ම යක්ෂයින්ගේද නිර්මාණ විය. බයිබලයේ අඩංගු ශුද්ධ වූ සත්‍යතාවන් ප්‍රචාරය කිරීමට අභීතව ඉදිරිපත් වූ අය පසුපස වධකයෝ ලුහුබැඳ ගියෝය. ඔවුන්ව පාවා දෙනු ලැබීය, වධ හිංසාවනට පාත්‍ර කරනු ලැබීය, බිම්ගෙවල කුටි තුළ භූමදාන කරනු ලැබීය, ඇදහිල්ල නිසා ඝාතනය කරනු ලැබීය, තවත් අය මිදීම පතා කඳුකරයේ ආරක්ෂා ස්ථාන කරා පලා ගියෝය, බිම් ගුහාවල රැකවරණය ලබා ගත්තෝය. මෙලෙස සාක්ෂිකරුවෝ ගෝනි රෙදි හැඳගෙන අනාවැකි කීවෝය. කෙසේ වුවද ඔවුහු තම සාක්ෂි දැරීම අවුරුදු එකදහස් දෙසිය හැටක් පුරාම පවත්වාගෙන ගියෝය. ඉතා අඳුරු වකවානුවලදී පවා දෙවියන්වහන්සේගේ වචනයට ආදරය කළ, උන්වහන්සේගේ ගෞරවය කෙරෙහි උනන්දුවක් දැක්වූ විශ්වාසවන්ත පුද්ගලයෝ සිටියහ. මෙම අයට මේ කාලය පුරාම දෙවියන්වහන්සේගේ සත්‍යතාව ප්‍රකාශ කිරීමට බලය, අධිකාරිත්වය සහ ප්‍රඥව සගයෙන් සකසා දෙන ලදී.



"යමෙක් ඔවුන්ට අනතුරු කරන්නට කැමති වේ නම්, ඔවුන්ගේ කටින් ගිනි නික්ම ඔවුන්ගේ සතුරන් විනාශ කරයි. යමෙක් ඔවුන්ට අනතුරු කරන්ට කැමති වන්නේ නම් ඔහු මෙලෙස මරනු ලබන්ට ඕනෑය." (එළිදරව් 11:5). දඬුවම් නොවිඳ දෙවියන්වහන්සේගේ වචනය පාගා දමන්ට මනුෂ්‍යයන්ට නුපුළුවන. මෙවන් ආකාර එළදීමක් පිළිබඳව එළිදරව් පොතෙහි අවසන් පරිච්ඡේදයෙහි මෙසේ විග්‍රහ කර ඇත. "මේ පොතේ අනාගතවාක්‍ය වචන අසන සියල්ලන්ට මෙසේ සහතික ලෙස කියමි. එනම් යමෙක් ඒ වචනවලට යමක් එකතු කරන්නේ නම්, දෙවියන්වහන්සේ මේ පොතෙහි ලියන ලද පීඩා ඔහුට එකතු කරන සේක. යමෙක් මේ අනාගතවාක්‍ය පොතේ වචන වලින් යමක් අහක් කරන්නේ නම් මේ පොතෙහි ලියා තිබෙන ජීවන වෘක්ෂයෙන්ද ශුද්ධ නුවරින්ද දෙවියන්වහන්සේ ඔහුගේ කොටස අහක් කරන සේක යනුයි." (එළිදරව් 22:18-20).

තමන්වහන්සේ විසින් එළිදරව් කර ඇති විවෘත කර ඇති යම් දෙයක් වේද, ඒවා වෙනස් කිරීමට තැත් කරන්නාවූ අයගෙන් තමන් වචන ආරක්ෂා කරගැනීමට දෙවියන්වහන්සේ දී ඇති අනතුරු ඇඟවීම් එයාකාරය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවලිය සුළුකොට තැකීමට තමන්ගේ අනුබලය මගින් තවත් කෙනෙකු හට පෙළඹීමක් කරන්නාවූ යමෙක් වේද හෙතෙම මෙම භයානක චෝදනාවට ලක්වෙයි. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු වීම එතරම් වැදගත්කමක් නැති දෙයකැයි නොසැලකිලිමත් ලෙස පවසන්නාවූ අය මෙම අනතුරු ඇඟවීම් දකීමෙන් පවා භීතියට පත්විය යුතුය, අසහනයට පත්විය යුතුය. දිව්‍ය එළිදරව් කිරීම්වලට ඉහළින් තමන්ගේ නිගමනයන්ට තැන දෙන්නාවූ අයද, තමන්ගේ වාසියට ශුද්ධ ලියවිල්ලේ සරල අදහස් වෙනස් කරන්නාවූ අයද, ලෝකය හා සමග අනුකූලතාව දක්වීම පිණිස ශුභාරංචි ඉගැන්වීම් වෙනස් කරන්නාවූ අයද තමන් මත භයානක වගකීමක් පවරා ගන්නෝය. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව වනාහි, සෑම මනුෂ්‍ය-යෙකුගේම චරිතය මැනීමේ මාපකය වන්නේය. නොවරදින සුළු මෙම මිනුම් දණ්ඩ මගින් යමෙකුගේ තත්ත්වය අඩු බව පෙනී යන්නේ නම් ඔහුව වරදට පත්කරනු ලැබේ.

"ඔවුන් තමන්ගේ සාක්ෂිය නිම කළ විට" යන්න මෙසේය: මෙම සාක්ෂිකරුවන් දෙදෙනා ගෝනි හැඳ අනාවැකි කීමේ කාලය 1798 දී නිමාවට පත්විය. තමන්ගේ අප්‍රසිද්ධ කාර්ය භාරය අවසානය කරා පැමිණෙමින් තිබියදී "පාතාලයෙන් නැඟී එන මෘගයා"ගෙන් පෙන්නුම් කරනු ලබන්නාවූ බල අධිකාරිය ඔවුන්ට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරන බවය. යුරෝපයේ බොහෝ ජාතීන් අතර ශත වර්ෂ ගණනාවක් පුරා රාජ්‍ය බලය සහ ආගමික බලය පාලනය කළේ සාතන්ය. ඔහු පාප් බලය තුළින් මෙම පාලනය ක්‍රියාවට නැංවීය. නමුත් සාතන්ගේ බලය යෙදවීමේ නව ප්‍රදර්ශනය වීමක් මෙහිදී ඉස්මතුව පෙනෙන්නේය.

ශුද්ධ බයිබලය සම්බන්ධව රෝමානුවේ ප්‍රතිපත්තිය වූයේ භාවිතයේ නොපවත්නා බසකින් එය විලංගු දමා බැඳ තබා ජනතාවගෙන් දේව වචනය වසන්කර තැබීමය. මෙසේ කළේ ශුද්ධ බයිබලයට ගෞරවය දක්වීම උදෙසා යයි ඔවුහු ඒ ගැන පැවසුවෝය. ඇයගේ පාලන සමය තුළදී සාක්ෂිකරුවන් දෙදෙනා "ගෝනි රෙදි හැඳගෙන" අනාවැකි කීවෝය. තවත් බලයක්, එනම් පාතාලයෙන් නැගී ආ මෘගයා දෙවියන්වහන්සේගේ වචනයට එරෙහිව විවෘතව සටන් වැදුණේය.

සාක්ෂිකාරයන් දෙදෙනා මරා දමූ මෘගයා විසින් ඔවුන්ගේ මළකඳන් මහා නගර වීථියෙහි හොවා දමන ලදී. මෙම නගරය "ආත්මික ඊජිප්තුව" ලෙස හැඳින්වේ. බයිබලීය පුරාවෘත්තියෙහි සඳහන් ජාතීන් අතර, මිසරය හෙවත් ඊජිප්තුව ජීවමාන දෙවියන්වහන්සේගේ පැවැත්ම දැඩි ලෙස ප්‍රතික්ෂේප කළාය, උන්වහන්සේගේ ආඥාවලට විරුද්ධව ක්‍රියා කළාය. මිසරයේ රජු මෙන් සගයේ අධිකාරී බලයට එරෙහිව එළිපිටම කැරැළි ගැසූ වෙනත් නරපතියෙක් තවත් නොවීය. දෙවි සමිඳාණන්ගේ නාමයෙන් මිසරයේ ඵාරාවෝ වෙතට පණිවිඩයක් මෝසෙස් විසින් රැගෙන ගිය අවස්ථාවේදී උඩඟු ඵාරාවෝ මෙසේ පැවසීය, "ඊශ්‍රායෙල්වරුන්ට යන්ට හරින ලෙස මා විසින් ස්වාමීන්-වහන්සේගේ බසට ඇහුම්කන් දෙන්ට ඔහු කවුද? මම ස්වාමීන්-වහන්සේ නාඳුනමි. ඇරත්, ඊශ්‍රායෙල්වරුන්ට යන්ට නොහරින්නෙමි." (නික්මයාම 5:2). මෙය දෙවි කෙනෙකු නැතැයි කියන අදේව වාදයේ මූල ධර්මයකි. ජීවමාන දෙවියන්වහන්සේගේ ඉල්ලීම් එයාකාරයෙන් ප්‍රතික්ෂේප කරන්නාවූ මිසරය වැනි වෙනත් බල අධිකාරියක් අවිශ්වාසය සහ විරුද්ධව ක්‍රියාකිරීමේ ආත්මයක් පෙන්නුම් කරයි. මෙම "මහත් නගරය" ආත්මික වශයෙන්ද සොදොමට සමාන කර ඇත. සොදොම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩ කිරීම පෙන්නුම් කළේ සල්ලාල-කම්වල යෙදීමෙන්ය. මෙම ශුද්ධ ලියවිලි කොටසෙහි අඩංගු විශේෂිත චරිත ගුණාංග පෙන්නුම් කරන්නාවූ ජාතිය තුළ සල්ලාලකමේ සහ අනාචාර හැසිරීම්හි අඩුවක්ද නැත්තේය.

දිවැසි අනාවැකි වදන් අනුව 1798 වර්ෂයට ස්වල්ප කලකට පෙරාතුව සාතන්ගේ ප්‍රභවයෙන් සහ චරිත ගුණාංගවලින් යුතු බලයක් නැගී එන්නේය. එම බලය ශුද්ධ වූ බයිබලයට විරුද්ධව යුද්ධ කරන්නේය. දෙවියන්වහන්සේගේ සාක්ෂිකරුවන් දෙදෙනාගේ හඬ නිශ්ශබ්ද කරන්නාවූ දේශය තුළ ඵාරාවෝගේ අදේව දෘෂ්ටියත් සොදොම්හි සල්ලාලකමත් කැපී පෙනෙනවා ඇත.

මෙම අනාවැකියෙහි යථාර්ථයවූ ද, සත්‍යවූ ද ඉටුවීමක් ප්‍රංශ ඉතිහාසය දක්වයි. ප්‍රංශ විප්ලවය පැවති විට 1793 දී පැවැති සම්මේලනයක් ගැන මෙසේ වාර්තා වී ඇත. "මෙවන් රැස්වීමක්



ලෝකයේ පැවැති මුල්ම අවස්ථාව මෙය වන්නේය. මෙයට සහභාගිවූ මනුෂ්‍යයෝ ශිෂ්ටාචාරය තුළ උපත ලබා යහපත් අධ්‍යාපනයක් ලැබූ අය වූහ. යුරෝපාකරයේ ඉතා ප්‍රබල ජාතියක් පාලනය කිරීමේ කාර්යය තමාට අයිති බව ඔව්හු දක්වූහ. මිනිස් ආත්මයට ලබාගත හැකි ඉතා ගාම්භීර වූ සත්‍යතාව එක හඬින් ප්‍රතික්ෂේප කරමින් දෙවියන්වහන්සේ කෙනෙකු කෙරෙහි විශ්වාසයත් උන්වහන්සේට නමස්කාර කිරීමත් සම්පූර්ණයෙන්ම අත්හැර දැමීම මෙම සම්මේලනයේ ඒකමතිකව තීරණය විය." (scott, Sir Walter, “Life of Napoleon Buonaparte, Vol,1. Ch. 17). විශ්වාසය තැබිය හැකි වාර්තාවක් අනුව දකගත හැකිවන්නේ විශ්වයේ කතුවරයාණන්ට එරෙහිව එළිපිටම කැරලි ගැසූ ලොව සිටි එකම ජාතිය ප්‍රංශය පමණක් වන බවය. දේව අපහාස කරන්නන්ද මිථ්‍යා දෘෂ්ටිකයන්ද එකල මෙන්ම අදත් සිටිති. ඔවුහු එංගලන්තයේ, ජර්මනියේ සහ ස්පාඤ්ඤයේ මෙන්ම වෙනත් රටවලද වෙසෙති, එහෙත් මන්ත්‍රී මණ්ඩලයේ පනතක් මගින් දෙවි කෙනෙකු නැතැයි නීතිගත කළ එකම රට ප්‍රංශයය. මුළු විශ්වයේම මැවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේට විරුද්ධව සිය හස්තය ඔසවමින් අභියෝග කළ වෙනත් කිසිම රටක් පිළිබඳව ඉතිහාසයේ වාර්තා වී නැත. මෙම නීතිය සම්මත වීමත් සමගම පැරිසියේ නගරවාසීහු ඔල්වරසන් හඬ නැගූහ. පැරිසියේ මුළු මහත් ජනතාව මෙන්ම රාජ්‍යයෙහි වෙනත් ප්‍රදේශවල විසූ බහුතරයක්ද මෙම නීතිය සම්මත වීමත් සමගම එය පිළිගනිමින් ප්‍රීතියෙන් කුල්මත්ව කෑගසමින් නටන්නට වූහ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම එය පිළිගනිමින් ඒකාකාරව නැටුමට සහ ගැයුමට එක් වූහ. (BlackWood’s Magazine, November 1870).

සොදොම් නගරයේ පැවති අශීලාචාර ජීවිත රටාව ප්‍රංශය තුළද පැතිර පැවැතියේය. තැනිතලා පෙදෙස්හි වූ ඒ නගරයන්හි පැතිර පැවැති දුරාචාරය, දූෂිතතාව සහ අධ්‍යාත්මික අපචාර, ප්‍රංශය පුරාද ක්‍රියාත්මකව තිබූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. තැනිතලා පෙදෙස්හි තිබූ විෂමාචාර ක්‍රියාදාමයන් නිසා එම නගර දෙවියන්වහන්සේගේ උදහසට ලක්ව විනාශකර දමනු ලැබීය. ප්‍රංශයේ පැවැති අදේව ධර්ම විශ්වාසයන් සහ සදාචාර විරෝධී ක්‍රියාදාමයන් ගැන එක් ඉතිහාසඥයෙක් මෙසේ පවසා ඇත. "ආගම කෙරෙහි ඉතා සමීපව බලපාන්නාවූ නීති සමගම විවාහය පිළිබඳව බලපවත්නා නීතිද සැහැල්ලුවට පත්විය. විවාහය වනාහි මිනිසුන් අතර බැඳීමක් ඇති කළ හැකි ශුද්ධ වූ සම්මුතියකි. එහි ස්ථිරවූ කඩා දැමිය නොහැකි බැම්ම සමාජයේ ස්ථාවරයට ප්‍රබල අත්වැලකි. එම අන්‍යෝන්‍ය බැඳීම සිවිල් ගනුදෙනුවක තත්ත්වයට සීමා කරනු ලැබීය. එහි පැවැත්ම තාවකාලික විය. කැමැති වේලාවක එම ගිවිසුම අහෝසි කර දැමීමට නීතියෙන් අවසර ලැබී තිබුණේය. ගෘහස්ත ජීවිත පැවැත්මෙහි ඉතා ගරු කටයුතුවූද, ඉතා සුන්දරවූ ද, දිගු කල් පවත්නාවූ ද කසාද

බැම්ම අත්සනට පමණක් සීමා කරමින් එය විනාශ කර දැමීමට මාර්ගයක් සෙවීම යක්ෂ බලවේගයේ ඉතා සූක්ෂ්ම සොයා ගැනීමක් විය. එයින් නොනැවතුණු ඔවුහු එය පරම්පරාවෙන් පරම්පරාවට උරුමයක් කරදීමටද වගබලා ගත්තෝය. කසාද සංස්ථාව විනාශ කර දැමීමට වූ යක්ෂ කුමන්ත්‍රණය ප්‍රංශයෙන් ආරම්භ වී ජයග්‍රාහී සාර්ථකත්වයක් ලබා ගත්තේය ... හාස්‍ය රසය සහිත කියමන් ප්‍රකාශ කිරීමේ දක්ෂතාවක් තිබුණාවූ ජනප්‍රිය නිළියක් වූ සොෆී ආර්නල්ට් මෙසේ ප්‍රකාශ කළාය. "රජයේ ලියාපදිංචි කරනු ලබන්නාවූ විවාහය වනාහි කාමමිථ්‍යාචාරයේ ශුද්ධවූ පූජාවකි." (Scott, Vol, 1. Ch. 17).

"යේසු සමිඳාණන් කුරුසිපත් කළ ස්ථානයේ" යනුවෙන් අනාවැකියෙහි ඇතුළත් වූ මෙම විශේෂාංගය ප්‍රංශය තුළ සම්පූර්ණ ලෙසින් ඉටුවිය. ප්‍රංශය මෙන් ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධකම් පෑ තවත් රටක් ඉතිහාසයෙහි හමු නොවේ. ප්‍රංශයේදී මෙන් වෙනත් කිසිම රටක සත්‍යතාවට ඉතා දරුණු ලෙස විරුද්ධතාවන් දැක්වූ කුරිරු ලෙස සත්‍යතාවට පහර ගැසූ වෙනත් රටක් නැත. ශුභාරංචිය කෙරෙහි ඇදහිල්ල ප්‍රකාශ කළ අයට විරුද්ධව ප්‍රංශ රජය විසින් ගෙන ගිය හිංසාකාරී විපත් මගින්ද උන්වහන්සේගේ අනුගාමිකයන්ට වධ දීමෙන්ද ඇය ක්‍රිස්තුස්වහන්සේව කුරුසිපත් කළාය.

ශත වර්ෂයෙන් ශත වර්ෂයටම ශුද්ධවන්තයන්ගේ රුධිරය හෙලනු ලැබුවේය. පීඩ්මොන්ට් කඳුකරයේදී වොල්ඩන්සියානු වාදියෝ දෙවියන්වහන්සේගේ වචනය උදෙසාද ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිය උදෙසාද තම ජීවිත පූජා කළෝය. සත්‍යය උදෙසා මෙවැනිම සාක්ෂි දැරීමක් ප්‍රංශයේ ඇල්බිජෙන්සියන් වාදීහුද ඉටු කළෝය. ප්‍රතිසංස්කරණය රජ කළ වකවානුවේදී එකී ඇදහිලිවතුන්ට දස වධ දී ඔවුන් මරා දමනු ලැබීය. රජවරුන් සහ රදළයන්ද, කුලවත් කතුන් සහ සියුමැලි යුවතියන්ද, ජාතියේ ප්‍රෞඪත්වය සහ ධීරවීර භාවය හිමි අයද යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල නිසා දිවි පිදූ වේදසාක්ෂිකයන්ගේ දුක් අඳෝනා සහ දුක් විඳීම් අසමින්, බලමින්, තම ඇස් සහ කන් පිනවා ගත්හ. මිනිස් හදවත ආදරය කරන්නාවූ ශුද්ධවූ අයිතිවාසිකම් උදෙසා සටන් කළ වීර හියුගනෝවරු යුද්ධ පිටියේදී තමන්ගේ රුධිරය පූජාවක් මෙන් ඔප්පු කළෝය. ප්‍රොතැස්තන්තවරුන් නීතියේ රැකවරණයෙන් ඉවත් කර දමන ලදී. ඔවුන්ගේ හිස්වලට මිලක්ද නියම විය. දඩයක්කාරයන් වල් සතුන් ලුහුබැඳ යන්නාසේ, ඔවුන් පසුපස ප්‍රංශ හටයෝ හඹා ගියෝය.

තම පියවරුන්ගේ ඇදහිල්ල අත් නොහැර එය ආදරයෙන් රැකබලා ගත් පැරණි කිතුණුවන්ගෙන් පැවත ආ බැතිමත්හු ස්වල්ප දෙනෙක් දහඅට වෙනි සියවසරේදී ප්‍රංශයේ දිවි ගෙවූහ. ප්‍රංශයේ දකුණු දිශාවේ කඳුකරයේ සැඟවී සිටි මොවුහු "පාළුකරයේවූ දේව



සභාවේ" නමස්කාර මෙහෙයන්ට සහභාගී වූහ. කඳුකරය ආරක්ෂිත යයි සිතූ ස්ථානයන්හිදී රාත්‍රී කාලයේ රැස්වීම් සඳහා බැතිමතුන් පැමිණි විට ඔවුන් පසුපස හඹා ගිය අශ්වාරෝහක යුද්ධ හටයෝ ඔවුන් ඇදගෙනවිත් ජීවිතාන්තය දක්වා වහල්කමෙහි යෙදවූහ. ප්‍රංශයේ දිවි ගෙවූ ඉතා සදාචාරමත් ජීවිත ගත කළ අය, ඉතා දහැමි අය, ශිෂ්ට සම්පන්න අය සහ ප්‍රවීන බුද්ධිමත් අයද දම්වැල්වලින් බැඳ දමා සොරුන් සහ මිනීමරුවන් සමග එක්ව වධහිංසාවන්ට භාජන කරන ලදී. තවත් අයට වෙඩි තබා මරා දමන ලදී. ඔවුන් සතුව අවි ආයුධ නොවීය, පිටස්තර අයගේ පිහිටද නොවීය. වධකයන් ඉදිරිපිට දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට දණින් වැටුණු ඔවුන්ට වෙඩි තබන ලදී. වැඩිවිය පත් මිනිසුන්, අනාරක්ෂිත ස්ත්‍රීන් සහ අසරණ දරුවන් ද ඔවුන් නමස්කාර කිරීම සඳහා රැස්වූ ස්ථානයන්හිදීම කුරිරු ඝාතනයට ලක් විය. ඔවුන් රැස්වූ කඳු පෙදෙස් සහ කැළෑ වදුලු හරහා ගමන් කරන්නේ නම්, "සෑම පියවර හතරක් පාසාම තණබිම්හි මළ මිනී දැකගැනීම සුලභ දසුනක් විය. ඒ අතරතුර ගස්වල එල්ලෙමින් තිබුණු ප්‍රාණය නිරුද්ධ මෘත ශරීරද දැකගැනීමට හැකි විය. කඩුවෙන් අත් පොරොවෙන් සහ දර මිටි මත වූ පූජාසනයන්ගෙන් ඔවුන්ගේ දේශය පාළුවට ගොස් තිබුණේය." මෙම දාමරික පාපිෂ්ඨ ක්‍රියාදාමයන් සිදුවූයේ අඳුරු යුගයේදී නොව XIV වන ලුවී රජතුමාගේ දීප්තිමත් පාලන යුගකදීය. මෙම ඓතිහාසික යුගයේදී විද්‍යාවේ දියුණුවට හොඳ තැනක් සැකසී තිබුණේය. ලිවීම දියුණු වී තිබුණේය. රජ මැඳුරේ නීති සම්පාදකයන් මෙන්ම නගර සභාවේ පරිපාලකයෝ ද උගතුන් සහ දක්ෂයන් වූහ. මුදු මොලොක් කරුණා ගුණය සහ ත්‍යාගශීලීතාව රජකරන බව බොරුවට පෙන්වීමට වෑයමක්ද විය." (Wylie, b. 22, Ch. 7).

අපරාධ ලැයිස්තුවේ ඉතා දරුණුතම සංසිද්ධිය ලෙස ලෝක ඉතිහාසයෙහි තද කළු පැල්ලම් සනිටුහන් කළ අවස්ථාව ලෙස ශාන්ත බර්තොලමිව් සංහාරය සඳහන් කළ හැකිය. යක්ෂ වෙස්ගත් තිරිසන් පාලකයන් සියවස් ගණනාවක් පුරා සිදුකළ සාපරාධී අධම ක්‍රියාදාමයන් සියල්ල අභිබවමින් XIV වන ලුවීගේ පාලන සමයේදී තිබූ භීෂණය මුල් තැන ගත්තේය. එදා සිදුවූ බියගුළු අශීලාචාර ඝාතනය ගැන සිහිවත්ම බොහෝ අයගේ හදවත් බිරාන්තව තැති ගන්නේය. රෝමානු පූජකයන්ගේ සහ බල අධිකාරීන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ ප්‍රංශ රජතුමා මෙම බියකරු මිනිස් ඝාතනයට තම අනුමැතිය ලබා දුන්නේය. අන්ධකාරය රජ කළ රාත්‍රියේදී නද දුන් සීනු හඬ ඝාතනය ආරම්භ කිරීමට සංඥාව ලබා දුන්නේය. තමන්ගේ ගෙවල නිදා සිටි දහස් ගණන් ප්‍රොතැස්තන්තයන් කිසිම දැනුම් දීමකින් තොරව එළියට ඇදගෙන විත් අමු අමුවේ ඝාතනය කරන ලදී. මේ සියල්ල සිදුවුණේ ජනතාවට රැකවරණය ලබාදීමට වූ රජතුමාගේ පොරොන්දුව කෙරෙහි තැබූ විශ්වාසය උල්ලංඝනය කරමින්ය.

මිසරයේ වහල් කමින් තමන්ගේ ජනතාව මුදවාගත් ක්‍රියාදාමයේදී අදෘශ්‍යමාන ලෙස ක්‍රියාත්මක වෙමින් එයට නායකත්වය ලබා දුන්නේ ක්‍රිස්තුස්වහන්සේය. වෛද සාක්ෂිකරුවන් වැඩි කිරීමේ මෙම භීෂණකාරී විනාශය කිරීමට තම අනුගාමිකයන් මෙහෙය වූ අදෘශ්‍යමාන හස්තය වූයේ සාතන්ය. දවස් හතක් පුරා මෙම ඝාතනය පැරිසිය පුරා පැවතුණේය. පළමුවන දවස් තුන පුරා දකගන්නට හැකි වූ වියරුව වචනයෙන් විස්තර කිරීමට පවා නොහැකිය. මෙම රුදුරු ඝාතනය නගරයට පමණක් සීමා නොවීය. රජතුමාගේ විශේෂ නියෝගයක් මත ප්‍රොතැස්තන්ත අයවලුන් විසූ හැම පළාතක් සහ නගරයක් කෙරෙහිද විනාශ කර දැමීමේ නියමය ක්‍රියාත්මක විය. සාතන්ගේ ක්‍රියාවට වයස් භේදයක් හෝ ස්ත්‍රී-පුරුෂ භේදයක් හෝ නොවීය. අසරණ ළදරුවා මෙන්ම පැසුණු හිසකෙස් ඇති මහල්ලාද එකසේ ඝාතනයට ලක් වූහ. වංශාධිපතීන් මෙන්ම ගොවීන්ද බාල මහළු අයද මව්වරුන් සහ දරුවන්ද එකට කපා දමනු ලැබුවෝය. ප්‍රංශය පුරා මෙම මිනිස් ඝාතන මාස දෙකක් පුරා පැවතුණේය. දේශයේ මල්කඩක් වූ සැත්තෑ දහසක ජනකායකගේ ජීවිත විනාශයට පත්විය.

සමූහ ඝාතන පුවත රෝමයේ පැවිද්දන්ගේ කණ වැටුණු වහාම xiii ග්‍රෙගරි පාප්වරයාගේ ප්‍රීතියෙහි නිමක් නැති විය. ලොරේන්හි බැසිලිකාවෙහි කාර්දිනල්වරයා පණිවිඩය ගෙන ආ පුද්ගලයාට කුරුම දහසක් තෑගි කළේය. එහි වටිනාකම සිලිම් පන්දහසක් විය. ශාන්ත ඇන්ජෙලෝ ආසන දෙව් මැදුරෙහි අගරදගුරු තුමා ප්‍රීතියෙන් උද්දාමයට පත්ව ප්‍රංශ වැසියන්ට ප්‍රණාම ආචාරයක් පිළිගැන්වීය. සෑම දෙව් මැදුරක්ම සීනු හඬින් ඒක නාද විය. තැනින් තැන දල්වාලූ ගිනි මැළ තුළින් නිකුත් වූ ආලෝකය රාත්‍රී කළුවර පළවා හැර දවාලක එළිය ලබා දුන්නේය. xiii ග්‍රෙගරි පාප්වරයා, කාර්දිනල්වරුන් මෙන්ම තවත් ආගමික සභා පාලක පූජකවරුන්ද සමග දිගු පෙරහැරකින් ශාන්ත ලුවී දෙව් මැදුර වෙත පැමිණියේය. එහිදී ලොරේන්හි කාර්දිනල්වරයා දෙවි සමිඳාණන් හට විශේෂ ස්තෝත්‍රස්වයක් පැවසුවේය. සමූල ඝාතනය පැවතීම ගැන විශේෂ පදක්කමක්ද නිකුත් කරන ලදී. මේ අතර බිතු සිතුවම් තුනක්ද නිර්මාණය විය. මෙම බිතු සිතුවම් අදත් වතිකානුවෙහිදී දකගැනීමට පුළුවන. රජතුමා මන්ත්‍රී මණ්ඩලයත් සමග සමූල ඝාතනය සැලසුම් කිරීම්, සමූල ඝාතනය සිදුකිරීම, සහ නාවික හමුදාපති සමග සටන, මෙම බිතු සිතුවම් තුළින් විද්‍යාමාන විය. චාර්ල්ස් රජතුමා තම යුතුකම් ඉටු කළ බව දක්වමින් ඒ ගැන ඔහුට ප්‍රශංසා කරන පිණිස ග්‍රෙගරි විසින් චාර්ල්ස්ට ස්වර්ණ රෝස මල ප්‍රදානය කළේය. මාස හතරකට පසුව හෙතෙම ප්‍රංශ බසින් කළ දේශනාවකට ඇහුම්කන් දුන්නේය. මුළු නමස්කාර මෙහෙය පවත්වන ලද්දේ ප්‍රංශ පූජකවරයෙකු විසින්ය. ඔහුගේ දේශනාවට පාදක වුණේ, ප්‍රංශයේ සිදුකරන ලද ඝාතන රැල්ලයි. එම සිද්ධියෙහි ඌන පූර්ණය ඔහු මෙසේ විස්තර කළේය. "එදින ප්‍රීතිය උතුරා ගිය දවසකි. සතුට



සීමා ඉක්මවා ගියේය. අති උත්තම ශුද්ධ වූ පියතුමාට සුපුවත අසන්නට ලැබුණු විගසින්ම ඔහු ගාම්භීර භක්තියක් රඳවා ගනිමින් දෙවියන්වහන්සේටද ශාන්ත වූ ලුයිස්ට තුති පැසසුම් දීමට අල්තාරය වෙත පියවර නැගීය." (White, Henry, “The Massacre of St. Bartholomew,” Ch. 14, par. 34).

ශාන්ත බර්තොලමීව් සමූල ඝාතනය පිටුපස ක්‍රියාත්මක වූ නායක ආත්මයම විප්ලවයෙහි අනෙකුත් සාපරාධවලද සැලසුම්කරුවා විය. යේසුස්වහන්සේ බලහත්කාරයෙන් ඉදිරිපත් වන්නෙකු ලෙස හඳුන්වා දෙන ලදී. ප්‍රංශ අදේව දෘෂ්ඨිකයන්ගේ එකම හඬ වුණේ, "කාලකණ්ණි නීචයා විනාශ කර දමනු" යන්නය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඔවුන් තුළ නිර්මාණය කර තිබූ කල්පිතය එයාකාර විය. සගය පවා නොඉවසුලන්නාවූ දේව අපහාසද ඉතා පිළිකුල් සහගත සාපරාධී ක්‍රියාද අත්වැල් බැඳ ක්‍රියාත්මක විය. කුරුරිකමට සහ දූෂිත අපරාධවලට නම් දරූ සමාජ විරෝධී පුද්ගලයන් ඉහළට ඔසවා ප්‍රභූ තත්ත්වයට පත්කරනු ලැබීය. මේ සියල්ලෙහි උත්තරීතර වන්දනය සාතන්ට පුදකරන ලදී. එමගින් සත්‍යය, පාරිශුද්ධත්වය සහ පරාර්ථකාමී ආදරය මූර්තිමත් කළ ක්‍රිස්තුස්වහන්සේව කුරුසිපත් කරන ලදී.

පාතාලයෙන් නැගී එන මෘගයා ඔවුන්ට පහරදී, ඔවුන්ගෙන් ජයගෙන, ඔවුන් මරා දමනු ඇත." විප්ලවය පැවැති වකවානුව තුළදී ප්‍රංශයේ රාජ බලය හෙබ වූ අදේවදෘෂ්ඨ බලය දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ ශුද්ධවූ වචනයටත් විරුද්ධව එවන් යුද්ධයක් පවත්වා ගෙන ගියේය. එවැනි භීෂණ සමයක් ලෝකයේ තවත් නොවූ විරූය. ජාතික මන්ත්‍රී මණ්ඩලය විසින් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම අවලංගු කරන ලදී. ශුද්ධ වූ බයිබල් පිටපත් එකතු කරගත් විරුද්ධවාදීහු එම පිටපත් ප්‍රසිද්ධියේම ගිනිබත් කළෝය. සෑම ආකාර නින්දාවක්ම එකතු කිරීමට අමතක නොකරන ලදී. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පයින් පාගා දමනු ලැබීය. බයිබල් ආයතන තහනමට ලක් විය. සතියේ නිවාඩු දිනය ඉවත් කරන ලදී. ඒ වෙනුවට මාසයේ දසවෙනි දිනය දේව අපහාස කිරීම්වලට සහ ප්‍රීති උත්සව පැවැත්වීමට වෙන් කරනු ලැබීය. බව්තීස්මය සහ ශුද්ධ රාත්‍රී භෝජනය සිහිකිරීමේ මෙහෙය තහනම් විය. භූමදාන සිදුකිරීම් කළ ස්ථානයන්හි සෑමටම දකගත හැකිවන පරිදි එල්ලා තිබූ දන්වීම් හඬගා කියාපෑවේ මරණය සදාතනික නින්දක් බවය.

මෙතෙක් කල් මිනිසුන් විසින් පිළිගෙන තිබුණේ දෙවියන්වහන්සේට බිය වීම ප්‍රඥාවේ පටන්ගැන්මය කියාය. එහෙත් එය මෝඩකමෙහි ආරම්භය ලෙසට හඳුන්වනු ලැබීය. සෑම අන්දමේම ආගමික නමස්කාර මෙහෙයන් තහනමට ලක් විය. එහෙත් නිදහස සහ රට වෙනුවෙන් එම තහනම බල නොපෑවේය. රදගුරු තුමාට පැරිසියේ ජාතික

මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට එන ලෙස කැඳවීමක් ලැබුණේය. එසේ පැමිණි හෙතෙම එහි ප්‍රධාන භූමිකාවක් රඟ පෑවේය. එදා පැවැති රැස්වීම ඉදිරියෙහි ඔහු ඉතා අලජ්ජිතවූ ද, අවිනීතවූ ද, නින්දිත ප්‍රහසනයක් හෙවත් විකාර රඟපෑමක් ඉදිරිපත් කළේය. පෙරහැරකින් මන්ත්‍රී මණ්ඩලය ඉදිරිපිටට කැඳවා ගෙනැවිත් ඔහුට ප්‍රකාශයක් කිරීමට අවස්ථාවක් ලබාදෙන ලදී. තමා වසර ගණනාවක් ඉගැන්වූ ආගම සෑම ආකාරයකින්ම පූජකයින්ගේ කෛරාටික ප්‍රබන්ධයක් බවත්, එයට කිසිම ආකාරයක පදනමක් ඓතිහාසික ලෙස හෝ ශුද්ධ වූ සත්‍යතාවයක් ලෙස හෝ නොතිබූ බවත් ඔහු පැවසීය. තමාව කැප කරනු ලැබූ නමස්කාරයෙහි ප්‍රස්තුතය වූ දෙවියන්වහන්සේ ජීවමාන දෙවි කෙනෙකු නොවන බව ගාම්භීර දැඩි ස්ථාවරයකින් යුතුව ඔහු සහතික කළේය. තමා අනාගතයේදී නිදහසට, සමානතාවට, සාර ධර්මවලට සහ සදාචාරයට සිරස නමා ගෞරවය පුදකරන බව ඔහු සපථ කළේය. තමාගේ ආගමික පදක්කම් සහ සැරසිලි ගළවා ඔහු ඒ සියල්ල මේසය මත තැබුවේය. එම සම්මේලනයේ සභාපතිගෙන් සහෝදරත්ව සිප ගැනීමක් ඔහුට ලැබුණේය. තවත් බොහෝ පූජකවරු තම දේව ඇදහිල්ල ප්‍රතික්ෂේප කරමින් රදගුරු තුමාගේ ආදර්ශය අනුගමනය කළෝය. (Scott, Vol. 1, Ch. 17).

"මේ ප්‍රොපේතවරුන් දෙදෙන පොළොවේ වසන්නන්ට වධ කළ නිසා, පොළොවේ වසන්නෝ ඔවුන් ගැන ප්‍රීතිව සන්තෝෂවෙමින් එකිනෙකාට තෑගි යවන්නෝය." (එළිදරව් 11:10) සාක්ෂිකරුවන් දෙදෙනාගේ විවේචනාත්මක පැවරීමේ හඬ නිශ්ශබ්ද කිරීමට අදේව දෘෂ්ටි ප්‍රංශය සමත් වූවාය. සත්‍යතාවේ වචනය මහ නගර වීථි විනාශකර තිබුණි. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මගින් ඉල්ලා සිටි ප්‍රමිතීන්ද, එමගින් වූ තහංචි පැනවීම්ද ගැන ද්වේෂ සිතින් විරුද්ධ වූ අය එය නිශ්ශබ්ද කරනු ලැබීම ගැන ප්‍රීති ප්‍රබෝධයට පත්වූහ. මනුෂ්‍යයෝ ප්‍රසිද්ධියේම සගයේ රජතුමාණන්ට විරුද්ධකම් පෑවෝය, අභියෝග එල්ල කළෝය. පුරාණයේ සිටි එරාවෝ ලෙස ප්‍රංශ වැසියෝද කෑ මොර දෙමින් මෙසේ ප්‍රශ්න කළෝය: "දෙවියන්-වහන්සේ කෙසේ දන්නා සේක්ද? මහෝත්තමයාණන්ට දැනුම ඇද්ද?" (ගීතාවලිය 73:11).

දේව අපහාසාත්මක දිරියකින් යුතුව නව සම්ප්‍රදායෙහි පූජකයෙක් කළ මේ ප්‍රකාශය විශ්වාස කිරීමට පවා අසීරුය. "දෙවියන්වහන්ස, ඔබ ජීවත්ව සිටිනවා නම්, ඔබේ නාමයට සිදුවී ඇති අනර්ථදායක තත්ත්වය සලකා බලා පුළුවන් නම් එය සිදුකළ අයට දඬුවම් කරන්න. එසේ කරන ලෙස මම අභියෝග කරනවා. ඔබ නිශ්ශබ්දව සිටිනවා. මීට පස්සේ ඔබ ජීවත්ව සිටිනවා යයි විශ්වාස කරන්නේ කව්ද?" (Lacretelle's "History," Vol. xi, p. 309). "යෙහෝවඃවහන්සේගේ හඬට කීකරුවීමට උන්වහන්සේ කවරෙක්ද? මම උන්වහන්සේව හඳුනන්නේ



නැහැ." යනුවෙන් එරාවෝ පැවසූ අභියෝගයෙහි දෝංකාරයක් මෙයින් දක්වෙනවා නොවේද?

"අඥානයා දෙවි කෙනෙක් නැතැයි සිතින් කීය." (ගීතාවලිය 14: 1) සත්‍යතාව විකෘති කරන්නවුන් ගැන දෙවි සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කරන සේක. "මොවුන්ගේ අනුවණකමත් සියල්ලන්ට ප්‍රකාශ වෙනවා ඇත." (2 තිමෝති 3: 9.) "උසස් වූ, උත්කෘෂ්ට වූ සදාකාලයෙහි වසන්නාවූ තැනැන්වහන්සේ" වන ජීවමාන යෙහෝවඃවහන්සේව ප්‍රංශය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, ඉතා පහත් මට්ටමේ රූප වන්දනාවට ඇබ්බැහි වීමට ඇයට වැඩි කාලයක් ගතවුණේ නැත. හේතු බුද්ධිකතාවේ දෙවඟනගේ නමස්කාරයට ප්‍රංශ ජනතාව යොමු වූවෝය. මෙම දේවතාවිය නිරූපණය කරනු ලැබුවේ දුරාචාර ස්ත්‍රියකගේ විලාශයෙනි. මෙම නමස්කාර ක්‍රමය සඳහා අනුමැතිය ලබා දුන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් මෙන්ම සිවිල් සහ අධිකරණ අධිකාරිය විසින්ය. ඉතිහාසඥයෙක් මෙසේ පවසයි: "වියරු වැටී ක්‍රියා කළ මෙම කාලයේදී සිදුවූ එක්තරා රාජ්‍ය උත්සවයකදී ඇති වූ සිදුවීම් න්‍යාය විරෝධී, හාස්‍ය ජනක, අශ්‍රද්ධාවෙන් පිරි අංගයක් වූ අතර එවන් සිදුවීම් මින් පෙර කිසිම දවසක සිදුවී නොතිබුණේය. මණ්ඩලයේ සැසි වාරයේ දොරටු විවෘත විය. සංගීත කණ්ඩායමක් පෙරටු කරගෙන මහා නගර සභා මන්ත්‍රීවරු පෙරහැරකින් සභා ගැබට පිවිසුණෝය. ඔවුහු විමුක්තියේ ගීයක් ගායනා කරමින් සිටියෝය. තමන්ගේ අනාගත නමස්කාරයේ ප්‍රස්තූතය ලෙස මුහුණ දුහුල් පටකින් වසාගත් කාන්තාවක්ද පෙරහැරෙහි අංගයක් විය. ඇය හේතු බුද්ධිකතාවේ දේවතාවිය ලෙස හඳුන්වා දෙනු ලැබීය. සමුළුවේ මූලසුන වෙත ගෙනඑනු ලැබූ මෙම තරුණිය මහත් හරසරෙන් යුතුව මුහුණු වැස්ම ඉවත්කර සභාපතිගේ දකුණු පසින් නැගී සිටීමට සලස්වනු ලැබීය. සංගීත නාට්‍යයක නළඟනක් ලෙස, රැස්ව සිටි අය ඇයව හඳුනා ගත්හ. ... ප්‍රංශ ජනතාව නමස්කාර කළ හේතු බුද්ධිකතාවේ දෙවඟනගේ නියෝජිතයෙකු ලෙස මෙම නළඟනට ප්‍රංශ මන්ත්‍රී මණ්ඩලය ප්‍රසිද්ධියේ ගෞරවය දැක්වීය. ශ්‍රද්ධාවක් නොමැතිවූ ද, හාස්‍ය ජනකවූ ද මෙම කෝලම් නාටකය රඟ දැක්වීමේදී එක්තරා විලාසිතාවක් එයට පණ දුන්නේය. බුද්ධිකතාවේ දේවතාවිය නිල වශයෙන් පිහිටුවීමේ මංගල්‍යය රට පුරාම උත්සව ශ්‍රීයෙන් ස්ථාපිත කරනු ලැබීය. විප්ලවයේ උච්ඡතම ක්‍රියාදාමයට නමක්ද දෙනු ලැබීය. එම ක්‍රියාදාමයට එක සිතින් එකඟ වන බව කියා සිටි ජන කොටසක් යම් තැනක සිටියෝද, එවන් තැන්හි බුද්ධිකතාවේ දේවතාවිය පිහිටුවාලන ලදී. Cott, Vol, 1. Ch. 17).

බුද්ධිකතාවේ නමස්කාරය හඳුන්වා දෙමින් ආරම්භක කථිකයා මෙවන් දෙසුමක් කළේය. "නීති සම්පාදකයෙනි! ධර්මෝත්වාදය යල් පැනගිය එකකි. ඒ වෙනුවට දැන් එතැන තර්ක බුද්ධිය රජ කරයි.

ආලෝකයේ දීප්තිය ඉදිරියේ ආගමික අන්ධකාරයට තැනක් නැත. ගොතික් සම්ප්‍රදාය අනුව සැදූ ආරුක්කු සහිත මේ ගොඩනැගිල්ලෙහි රැස්ව සිටින අති විශාල ජනකාය ඉතිහාසයේ ප්‍රථම වතාවට අද දින සත්‍යතාවේ මූල ධර්මය මේ යැයි ජයඝෝෂා පතුරුවති. ප්‍රංශ ජනතාව අද අසමසම වූ සත්‍ය නමස්කාරය උත්සවාකාරයෙන් සමරති. මෙම නමස්කාරයෙහි මූල ධාතු වන්නේ නිදහස සහ තර්ක බුද්ධියයි. ජනරජයේ පාලන හස්තයෙහි සමෘද්ධිය සඳහා අපි අඩිතාලම දමුවෙමු. ජීවිතය නැති රූප වැඳීම අතහැර දමා අපි තර්ක බුද්ධියට පණ දී ඇත්තෙමු. ස්වභාව ධර්මයේ මුදුන් මල්කඩ වූ ජීවමාන රූපයට අපි ප්‍රණාමය දක්වමු." (Thiers, M. A, History of the French Revolution," Vol ii pp. 370, 371).

රැස්වීම් මන්දිරයට දෙවඟන කැඳවා ගෙන එනු ලැබීය. කථිකයා ඇයගේ සුරත රැගෙන රැස්ව සිටි අය දෙසට හැරී මෙසේ පැවසුවේය. "මැරෙන සුළු මනුෂ්‍යයෙනි, බිය නිසාම ඔබ සිතින් නිර්මාණය කරගෙන ඇති දෙවියන්වහන්සේ කෙනෙකුගේ ගර්ජනා හඬ ඉදිරියෙහි ගැහෙමින් සිටීම නතර කරන්න. මින්පසු බුද්ධි තර්කය හෝ හේතු කාරණා හැර වෙනත් දෙවි කෙනෙකුට නමස්කාර කරන්න එපා. එහි අති උතුම්වූ ද, ශුද්ධවූ ද රූපය මම ඔබට ඉදිරිපත් කරමි. පිළිමවලට වන්දනා කිරීම අවශ්‍ය නම් මෙවන් රූප ඉදිරියෙහි පමණක් පූජාවන් ඔප්පු කරන්න. සම්භාවනීය ප්‍රතාපවත් නිදහසේ බල අධිකාරිය ඉදිරියෙහි දණ නමන බුද්ධි තර්කය නමැති තිරය ඉදිරියෙහි වැඳ වැටෙන්න."

"ජනාධිපති තුමා මෙම දෙවඟන වැළඳ ගෙන සිප ආචාර දැක්වීමෙන් පසුව සරසන ලද මෝටර් රථයක ඇය හිඳුවන ලදී. විශාල ජන සමූහයක් මධ්‍යයේ නෝර්ටාඩාම්හි ආසන දෙව් මැදුර වෙත ගෙන යන ලදුව එහිදී ඇය දෙවි සමිඳුන් ලෙස නමස්කාරයට යොමු කරවනු ලැබීය. ඇයව උස් අල්තාරයක් මත වැඩම කරවන ලදුව පැමිණ සිටි සැමගේ වන්දාභිමානයට පාත්‍ර කරන ලදී." (Alison, Vol, 1. Ch. 7).

මෙම සංසිද්ධියෙන් වැඩි කලක් ගතවීමට පෙර ශුද්ධ බයිබලය ප්‍රසිද්ධියේ ගිනිබත් කරන ලදී. එක් අවස්ථාවකදී ප්‍රංශයේ මෙම "කෞතුකාගාර ජනප්‍රිය සංගමය" නගර සභා ශාලාව වෙත පැමිණියේය. "බුද්ධි තර්කය බොහෝ කල් දිනේවා" යයි හඬ නගමින් ඔවුහු ශාලාවට කඩා වැදුණෝය. ඔවුන් අත දිගු දණ්ඩක් විය. එහි මුදුණේ අඩක් ගින්නෙන් දැවුණු පොත් කිහිපයක ඉතිරි කොටස් විය. එහි ශුද්ධ බයිබල් පිටපත්ද විය. මානව ජාතියට ඉටුකරන්නට අණ කළ සියලු ආකාර ක්‍රියාවන්ට වන්දි ගෙවන ආකාරය මෙන්න"යි කියමින්



සභාපති තුමා අඩක් ගිනිබත් වූ අළුත් සහ පරණ ගිවිසුම් දක්වමින් ප්‍රකාශ කර සිටියේය. (Journal of Paris, 1793, No. 318).

අදේව භක්තීන් විසින් සම්පූර්ණ කරමින් තිබුණේ පාප් සමය විසින් ආරම්භ කරන ලද ක්‍රියාවේදයයි. සමාජීයවූද, දේශපාලනිකවූද, ආගමිකවූද මෙම තත්ත්වය උදා කළේ රෝමයේ ප්‍රතිපත්ති ව්‍යුහයයි. කඩිනම් විනාශයක් කරා යෑමට ප්‍රංශයට අත හිත දුන්නේ රෝමයේ ක්‍රියා කලාපයයි. විප්ලවයේ භීෂණ සහ අවිචාර ක්‍රියාදාමයන් ගැන ලේඛකයෙක් මෙසේ පැවසුවේය. "මේ සීමා රහිත බිහිසුණු ක්‍රියාවන්ට වගකිව යුත්තේ සිංහාසනය හා සභාවය." සාධාරණ ලෙස සභාව මේ සියල්ලටම වගකිව යුතුය. ප්‍රතිසංස්කරණයට එරෙහිව රජවරුන්ගේ මනස් තුළ විරෝධතාවේ වස තැන්පත් කළේ රෝම අධිකාරී බලපෑම්ය. පුනරුදය වනාහි ඔටුන්න නැතිකර දැමීමට වූ උගුලක් ලෙසද, ජාතියේ සාමයට මෙන්ම සහජීවනයටද මරු පහරක් එල්ල කිරීමට වූ ප්‍රයත්නයක් ලෙසද රෝම සමයවාදීහු ප්‍රබල ප්‍රචාරක යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළෝය. ඉතා දරුණුවූ ද, කටුක සහ බේදජනක වූද වධහිංසා ක්‍රියා කිරීම එක එල්ලේම සිංහාසනයෙන්ම නිකුත් කිරීමට බලපෑම් ඇති කළේ රෝමයේ දක්ෂතාවයයි.

නිදහසේ ආත්මය ශුද්ධ බයිබලය සමග අත්වැල් බැඳ ගත්තේය. ශුභාරංචිය පිළිගත් සෑම අවස්ථාවකදීම එම අයගේ මනස් පිබිදීමකට පත්විය. ඔව්හු නොදත්කම, දූෂිත භාවය, දුරාචාරය සහ මිථ්‍යා මත, නැමැති වහල්කමට තමා බැඳ තිබූ බැමි බිඳ දමමින් ආගම ඇදහීමෙන් වූ නිදහස අත්විඳීමට පටන් ගත්හ. මිනිසුන් ලෙස සිතමින් මිනිසුන් ලෙස ක්‍රියාකිරීමට ඔවුහු පටන් ගත්තෝය. රජවරුන්ගේ අවධානය ඔවුන් කෙරෙහි යොමු විය. තමන්ගේ අත්තනෝමතික ස්වෛරී පාලනය ගැන ඔවුහු භීතියෙන් තැති ගත්තෝය.

තමන්ගේ ඊර්ෂ්‍යා සහගත භීතියට ගිනි අවුළුවා ලීමට වූ අවස්ථාව රෝමය මගහැරියේ නැත. පාප්වරයා ප්‍රංශයේ වැඩ බලන රජතුමාට 1523 දී මෙසේ පැවසුවේය. "මෙම ප්‍රොතැස්තන්ත උන්මාදය විසින් වියවුල් කර විනාශකර දමන්නේ ආගම පමණක් නොවේ. රජවරුන්, වංශාධිපතීන්, නීති පද්ධතිය, සම ක්‍රම පටිපාටියද ප්‍රතිසංස්කරණය විසින් විනාශ මුඛයට ඇද දමනු ලබනවා ඇත." :Felice, G, de History of the Protestan France," b' 1, Ch. 2, ts of Par. 8). මින් වසර කිහිපයකට පසුව පාප්ගේ දූතයෙක් රජතුමාට මෙවැනි අනතුරු ඇඟවීමක් කළේය. "ඔබ තමාගේ රාජකීයත්වය රැකගැනීමට කැමති වන්නෙහි නම්, ජාතිය නිශ්චලතාවයෙන් ඔබට පක්ෂපාතව තබාගැනීම ඔබගේ කැමැත්ත නම්, පුරුෂ ශක්තියෙන් කතෝලික ඇදහිල්ල රැකවරණය කරන්න. ඔබගේ අවි ආයුධ මගින් එහි සියලු සතුරන් යටපත් කරන්න." (D. Aubigne, "History of the Reformation in the

time of Calvin, b. 2, Ch. 36). නිවැරදි සමය තෝරා ගැනීමේ දෝලනාත්මක මනසකින් යුතුව සිටි ජනතාවට දේව ධර්මාචාර්යවරු මෙවන් මතයක් ඔවුන්ගේ සිත් තුළට ඇතුල් කළහ. බැතිමතුන්ගේ හැඟීම් කෙරෙහි ආයාචනයක් කළ ඔවුහු ප්‍රකාශ කළේ ප්‍රොතැස්තන්ත ආගම "අලුත් වැඳුම් පිදුම් ක්‍රම සහ අනුවණ ක්‍රියාදාමයන් කෙරෙහි බැතිමතුන් රැවටීමකට පත්කර මිනිසුන් නොමඟ යවන්නාවූ ක්‍රමවේදයක් වන බවය. එම ආගම ඇදහීම නිසා යටහත් කීකරු වැසියන්ගේ භක්ති ආදරය රජතුමාට නොලැබී යනවා ඇත. එයින් රජයට මෙන්ම දේවස්ථානයටද විනාශය ඇතිවීම සහතිකය"යි පවසන ලදී. ප්‍රතිසංස්කරණයට එරෙහිව ප්‍රංශ ජනතාව පෙළගැස්වීමට රෝමානුව මෙවන් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළේය. "සිංහාසනය නඟා සිටුවීමටත්, වංශාධිපතීන් ආරක්ෂා කරගැනීමටත් රටේ නීතිය පවත්වා ගෙන යෑමටත්, ප්‍රංශය මෙසේ පළමු වරට හිංසා පීඩාවේ අසිපත ලෙළ දීම ආරම්භ කළේය." (Wylie, b. 13, Ch. 4).

රටේ අනාගත ඉරණම සැලසුම් කළ එම අත්තනෝමතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ප්‍රතිඵල ගැන දූරදර්ශී දැකුමක් ප්‍රංශ පාලකයන් හට තිබුණේ නැත. යුක්තිය, සාධාරණත්වය, පමණ දැන ක්‍රියාකිරීම, සත්‍යතාව, සමානතාව සහ ත්‍යාගශීලී ආත්මය යනාදි ගුණාංග ජීවිතය තුළ පැවැත්ම සඳහා බයිබලයේ ඉගැන්වීම් උපකාරයක් වෙනවා ඇත. ශුද්ධ බයිබලයට තැනක් දුන්නේ නම් මෙකී ගුණදාමයන් මිනිසුන්ගේ මනස්හි සහ හදවත්හි මුල්බැස ගැනීමට හේතුකාරක වනවා ඇත. මෙම මහඟු ප්‍රඥප්ති ජාතියක අභිවෘද්ධියට අත්තිවාරමක් වනවා නියතය. ශුද්ධ බයිබලය මෙසේ පවසයි: "ධර්මිෂ්ඨකම ජාතියක් උසස් කරයි." "සිංහාසනය ස්ථිර වන්නේ ධර්මිෂ්ඨකමෙන්ය." "ධර්මිෂ්ඨකමේ ක්‍රියාව සමාදානයද ධර්මිෂ්ඨකමේ ඵල සදාකාලයටම නිශ්චලය හා සුරක්ෂිත භාවයද වන්නේය." (හිතෝපදේශ 14:34; 16:12; යෙසායා 32:17). දිව්‍ය ව්‍යවස්ථාවට කීකරුකම දක්වන්නා තම දේශයේ නීති පද්ධතියට අනිවාර්යයෙන්ම කීකරු වනවා ඇත. දෙවියන්වහන්සේට භය පක්ෂපාතකම දක්වන්නා රජතුමා ක්‍රියාත්මක කරන්නාවූ සාධාරණ සහ නිත්‍යානුකූල බල අධිකාරියට අවනත වනවා සහතිකය. නමුත් ප්‍රීතිය රජ නොකළ ප්‍රංශය බයිබලය තහනම් කළාය, දෙවියන්වහන්සේගේ සේවකයන්ගේ සේවයට තහංචි පැනවූවාය. එහෙත් ප්‍රතිපත්ති පාවා නොදී අභිමානය රැකගෙන ක්‍රියා කළ අයද තියුණු බුද්ධියක් දරූ අයද අධ්‍යාත්මික දිරියක් තිබූ අයද තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කරමින් සත්‍යය උදෙසා නැගී සිටියෝය. ශත වර්ෂයක් පාසා ශත වර්ෂයක් පුරා ඔවුහු සත්‍යතාව වෙනුවෙන් දුක් විඳීමට තරම් ඇදහිල්ලකින් පූර්ණ වූ අය වූහ. මෙම බැතිමත්හු තම විශ්වාසය පාවා නොදීම නිසා නැව්වල හබල් ගෑම සඳහා වහලුන් ලෙස සේවය කළෝය, කණුවලට තබා ගිනි දල්වා ඝාතනය කරනු ලැබූවහුය, බිංගෙවල කුටි තුළ ජීවිත පූජා කළෝය. දස දහස් ගණන් ප්‍රංශ බැතිමත්හු තම ජීවිත ඇදහිල්ල වෙනුවෙන් පූජා කළෝය. තවත් දහස් ගණන් බැතිමත්හු තම රට, ගේ දොර හැර දමා විදෙස් අභය භූමි කරා පලා ගියෝය. ප්‍රතිසංස්කරණය ආරම්භ වී වසර දෙසීය පනහක් පුරා මේ තත්ත්වය පැවැතියේය.

"හිංසා පීඩා පමුණුවන්නන් ගෙන් බේරී පලා යන්නාවූ ශුභාරංචි ගෝලයන් නොදුටු ප්‍රංශ පරම්පරාවක් මෙම දීර්ඝ කාලය තුළ නොසිටියේය. රට හැර දමා ගිය මොවුහු තමන් සමග රටෙහි සම්පත්ද පිටතට රැගෙන ගියාහුය. ප්‍රඥාව, බුද්ධිය, උගත්කම, කලාවන්, කාර්මික හුරුව සහ තාක්ෂණය රටින් ඉවතට ගියේය. ඔවුහු තමන් රැකවරණය ලැබූ දේශයන්හි මෙම සම්පත් මගින් එම රටවල් පෝෂණය කළෝය. ඔවුහු තමන්ගේ හැකියාවන්ගෙන්, තාක්ෂණ ශිල්පීය දැනුමෙන් තමන්ට පිළිසරණ සැපයූ රටවල් සශ්‍රීක කළෝය. මෙම වසර තුන්සියය පුරා ප්‍රංශයෙන් බැහැරට ගිය සම්පත් තම මව් බිමෙහි රඳවා ගන්නට හැකියාවක් වී නම්, මෙම වසර තුන්සියය පුරා රටින් පිටව ගිය අයගේ කාර්මික කුසලතා මව්බිම අස්වැද්දීමට යොදාගනු ලැබී නම්, මෙම වසර තුන්සියය පුරා රට හැර ගියවුන්ගේ කලා කුසලතාවන් මව් බිමේ නිෂ්පාදනයන් සඳහා යොදා ගත්තේ නම්, මෙම තුන්සිය වසර පුරා මොවුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් සහ විශ්ලේෂණාත්මක කෘතීන් තම මව් රටෙහි සාහිත්‍යයට සහ විද්‍යාවට පිළිසරණ කරගත්තේ නම් කෙතරම් මහඟු උන්නතියක් උදාකර ගන්නට ප්‍රංශය සමත් වනවා ඇද්ද! ඔවුන්ගේ ප්‍රඥාව සහ බුද්ධිය රටෙහි පරිපාලන ව්‍යූහයට එක්වී නම්, ඔවුන්ගේ වීරත්වය ඇයගේ සටන්වලට එකතු වූවා නම්, ඔවුන්ගේ සාධාරණ විනිශ්චය රටෙහි නීති සැලසුමට දායකත්වය දුන්නේ නම් බයිබලීය ආගම ප්‍රංශයේ ජනතාවගේ බුද්ධිය වර්ධනය කරමින් මිනිසුන්ගේ හෘදය සාක්ෂිය පාලනය කළේ නම් වර්තමාන ප්‍රංශය කෙතරම් තේජස්ශ්‍රීය මහිමාන්විත රාජ්‍යයක් වනවා ඇද්ද! අනික් ජාතීන්ට කෙතරම් මහඟු ආදර්ශයක් වනවා ඇද්ද! ශ්‍රේෂ්ඨවූ ද, භාග්‍යමත්වූ ද, ප්‍රීතිමත් රාජ්‍යයක් වීමට ඇය සමත් වනවා ඇද්ද!

එහෙත් සුචරිතයෙහි සෑම ගුරුවරයෙක්ම, ක්‍රමානුකූල ක්‍රියාවේදයක් සඳහා ඉදිරිපත් විය හැකි සෑම ශූරයෙක්ම, රාජ්‍යය රැකගැනීම සඳහා පෙරමඟ ගත හැකි සෑම අවංක ආරක්ෂයෙක්ම රට තුළ රජකම් කළ අන්ධවූ ද, අනුකම්පා විරහිතවූ ද, අවිචාර පාලනය මගින් රටින් පළවා හරිනු ලැබූහ. පොළෝ තලයෙහි අතිශයින් විශිෂ්ඨ කීර්තිමත් ශ්‍රී විභූති රටක් ලෙස පවතින්නට හැකියාවක් තිබූ රටක් වූ ප්‍රංශය එකල පැවැති අවිචාරාත්මක පාලනය නිසා අපකීර්තියෙහි පත්ලටම කිඳා බැස්සාය. නැණවත්වූ බුද්ධිමතුන්ට තෝරා ගැනීමට ඉතිරිව තිබූ ඉරණම නම් ගිනි මැළයට පූජාවීම හෝ රටින් බැහැරව යාමය. කාලයත් සමගම දේශයද විනාශ මුඛයට

ප්‍රවිෂ්ඨ වූවාය. හෘදය සාක්ෂිය අනුව අභීතව නැඟී සිටි දූ පුතුන් දේශයේ ඉතිරිව නොසිටියෝය, ගිනි මැළ කරා ඇදගෙන යා හැකි බැතිමතුන් තවත් නොසිටියෝය, ජාත්‍යාලයෙන් ඔද වැටී ගිය හිතෛෂියෝ දේශයේ නොසිටියෝය." (Wylie, b. 13, Ch. 20). සංත්‍රාසය රජ කළ විප්ලවය මේ සියල්ලෙහි, වැළැක්විය නොහැකි ඉරණම විය.

"හියුගනෝවරුන් රටෙන් ඉවත්ව යැමත් සමගම ප්‍රංශය අගාධය කරා යැමේ ගමන ආරම්භ කළාය. දියුණුවෙන් සමෘද්ධිමත් නිෂ්පාදන කර්මාන්ත ශාලා නෂ්ඨාවශේෂ බවට පත්විය. සරුසාර දිස්ත්‍රික්ක වනලැහැබ් බවට පත්විය. බුද්ධිය පහත බැසීම සහ සාරධර්ම පරිහානිය මගින් රට නොපැතූ වෙනත් ආකාර ප්‍රගතියක් උදා විය. සකල පැරිසියම සිඟන්නන්ගෙන් පිරී එකම රාජධානියක් බවට පත්විය. ප්‍රංශ විප්ලවය ආරම්භ වීමත් සමගම රජතුමන්ගෙන් හිඟමන් ඉල්ලා සිටි ජන සංඛ්‍යාව දෙලක්ෂයක් පමණ වී යයි එක්තරා වාර්තාවක සඳහන් වේ. මේ සියල්ලෙහිදී ජේසුයිට් නිකාය පමණක්ම දියුණුවේ සහ සමෘද්ධියේ හිණිමහේ ඉහළටම ඇදෙමින් වැජඹුණෝය. ජාතිය විනාශයේ ප්‍රපාතයකට පියවර මණිමින් සිටියේය. පාසැල් සහ සභාවන් ජේසුයිට් නිකාය කල්ලියේ කුරිරු පාලනය යටතේ පැවතුණි. සිරගෙවල දැමූ සහ නාවික හබල්කාරයන් කරනු ලැබූ වහල්ලු දූෂිත රෝමානු ආගමික බලධරයන්ගේ ආධිපත්‍යයට යටත්ව විසූහ.

රජතුමාගේ නිපුණතාවන්ද ව්‍යවස්ථාවන්ද, අන්ද මන්ද කරමින් ප්‍රංශය දේශපාලනික සහ සමාජීය වියවුලකට ඇද දැමූ ගැට සහගත තත්ත්වය හරිගැස්සීමට ශුභාරංචියට හැකියාව තිබුණේය. එහෙත් එම පිලියම පිළිගැනීමට අකමැති වූ ප්‍රංශ මාතාව මුළු ජාතියම විනාශයේ කෙළවරටම ඇද දැම්මාය. රෝම ආධිපත්‍යයේ යදමින් බැඳ සිටි ජනතාවට ආත්ම පූජා සහ පරාර්ථකාමී ආදරය පිළිබඳව ගැළවුම්-කාරයාණන් දුන්නාවූ වටිනා පාඩම් අහිමි වූ බවක් පෙනෙන්නට තිබුණේය. වෙනත් අයගේ යහපත උදෙසාවූ ආත්ම දමනයේ ත්‍යාගශීලී පුරුදු ජනතාවගෙන් ඉවතට යොමුකර තිබුණේය. දුප්පතුන් තලා පෙළා ක්‍රියාකිරීම ගැන පොහොසත් අයට කිසි දොස් පැවරීමක් නොවීය. තමන් ඉටු කරන්නාවූ බැල මෙහෙවරට දුප්පතුන්ට නිසියාකාර ඇහයීමක් කරනු ලැබුවේ නැත. ඔවුන් දිවි ගෙවන්නාවූ නින්දා සහගත තත්ත්වයෙන් ගොඩ ඒමට ඔවුන්ට කිසිවකුගෙන් හෝ අතහිත දීමක් සිදු නොවීය. ධනවතුන්ගේ බලවතුන්ගේ හා වංශාධිපතීන්ගේ වස්තු තණ්හාව සහ දුරාචාර ක්‍රියාදාමයන් හේතුවෙන් ගොවීන්ට මහත් පීඩාවන් විඳීමට සිදුවිය. සියවස් ගණනාවක් පුරා පැවැති මෙම ශෝචනීය ක්‍රමවේදයෙහි ප්‍රතිඵලය වූයේ ධනවතුන් දිළින්දන්ට අකරුණාවන්ත ලෙස සැලකීමත් දුප්පතුන් පොහොසත් අයට වෛර කිරීමත්ය.



බොහෝ පළාත්හි තිබූ විශාල වතුපිට වංශාධිපතීන් සතු විය. ඒ අතර එම වතුවල සේවය කළ අය කුලී පදනමක් මත වැඩ කළෝය. ඔවුන්ගේ පැවැත්ම ඉඩම් හිමියන්ගේ කරුණාව මත පදනම් විය. ඉඩම් හිමියන් කළ සීමාතික්‍රාන්ත අසාධාරණ ඉල්ලීම්වලට අවනත වීම හැර කුලී කම්කරුවන්ට වෙනත් විකල්පයක් නොවීය. රජයත් දේවස්ථානයත් පවත්වාගෙන යැමේ විය හියදම් දැරීම මධ්‍යම පංතිකයන්ගේ සහ පහළ මට්ටමේ ආදායම් ලාභීන්ගේ කර මත වැටී තිබුණේය. මෙම පංතිකයන්ගේ ආදායමෙන් විශාල කොටසක් සිවිල් බලධරයන්ට හා පැවිද්දන්ට බදු වශයෙන් ගෙවීමට සිදුව තිබුණේය. "වංශාධිපතීන්ගේ සුබ විහරණය උත්තරීතර නීතිය ලෙස ගණන් ගන්නා ලදී. ගොවියා සහ අතවැසියා නිරාහාරව සිටියද ඒ ගැන කිසිම හැඟීමක් ඉඩම් හිමියන්ට නොවීය. සැම අවස්ථාවකදීම ඉඩම් හිමියාගේ අභිවෘද්ධිය සොයා බලා කටයුතු කිරීම ගොවියාගේ පරම යුතුකම විය. ගොවි කර්මාන්තයෙහි නියැලි කම්කරුවන්ගේ ජීවිත තෙරක් නැති වැඩකිරීම්වලට සීමා විය. ඔවුන්ගේ ජීවිත දුක්ඛිත කාලකණ්ණි පැවැත්මක් පමණක් විය. ඔවුන්ගෙන් යම් අයෙකු වැඩ කටයුතු පිළිබඳව චෝදනා කිරීමට අභීතව ඉදිරිපත් වුවත් එම පැමිණිලි කිසිම වගවිභාගයකින් තොරව ඉවත දමන ලදී. ඉඩම් හිමියෙකුට විරුද්ධව ගොවියෙක් අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කළ විටෙකදී නඩුකාරයා සැමවිටකම ඉඩම් හිමියාගේ පැත්ත ගත්තේය. විනිසුරුවෝ නින්දිත ලෙස අල්ලස් ගැනීමෙහි නිරත වූහ. අත්තනෝමතික වංශාධිපතීන්ගේ පාර්ශ්වයට නීතිය පක්ෂපාත විය. විශ්වීය දූෂිත භාවයේ සැලැස්ම නිසා ධනවතුන් සැමවිටම ජයග්‍රාහකයන් විය. මහ අධිපතීන් සහ පූජකයන් විසින් පොදු ජනතාවගෙන් තලා පෙළා මිරිකා ගත්තාවූ බදු මුදලින් අඩක්වත් රජයේ හෝ ආගමේ හෝ භාණ්ඩාගාරවලට ඇතුළත් වූයේ නැත. ඉතිරි බදු මුදල් දුරාචාර ක්‍රියාදාමයන් සඳහා පුද්ගලයන්ගේ සාක්කුවලට ඇතුල් විය. තමන්ගේ සහායක බැතිමතුන්ගේ මුදල් අයථා ලෙස බලෙන් ලබාගත් අය කිසිවිටෙක හෝ බදු මුදල් සඳහා බිල්පත් නිකුත් කළේ නැත. ඔවුන්ට රජයේ තනතුරුවලට පත්වීමට වරම්ද හිමි විය. මෙසේ වරප්‍රසාද හිමිවූ අය එක් ලක්ෂ පනස් දහසක් පමණ විය. ඔවුන්ගේ තෘෂ්ණාවන් සපුරාලීම සඳහා ලක්ෂ ගණනින් වූ ජනකායකගේ ජීවිත කාලකණ්ණි බවට පත්කරනු ලැබීය.

උසාවිය සුබෝපභෝගී ස්ථානයක් වූ අතර එය දුරාචාරයට යොමු විය. ජනතාව සහ පාලකයන් අතර පැවැතියේ ඉතා අල්ප විශ්වාසයකි. රජයේ සැම ක්‍රියාදාමයක් පිළිබඳව සැකයේ ඇස එල්ල වී තිබුණේ ඒවා උපක්‍රමයන් හා ආත්මාර්ථකාමී ක්‍රියාවන් වූවා සේය. විප්ලවය දියත් වන්නට අඩසිය වසකට පෙර XV වන ලුවී රජතුමා ප්‍රංශ සිහසුනට පැමිණ කිරුළ දැරීම ආරම්භ කළේය. එම විෂමාකාරී දවස්වලදී පවා රජුගේ ගුණ චරිතාංග ලෙස කැපී පෙනුණේ

ඔහු ඉතා අලස, නිරර්ථක ක්‍රියාදාමයන්හි යෙදුනු, ඉන්ද්‍රියයන් පිනවීමේ අභිරුචියක් දක්වූ පුද්ගලයෙකු බවය. දූෂ්‍යවූ ද, කුරිරුවූ ද රදළ පාලනයක් යටතේ පැවැති රජය තුළ පහළ පංතියේ සේවක ජනතාව දිවි ගෙවිවේ බලවත් කෝපයකින් යුතුවය. රටේ ආර්ථිකය බිඳ වැටී තිබුණේය. මහත් ව්‍යසනයක් අත ළඟම ඇතැයි පැවසීමට දිවැසිවරයෙකු අවශ්‍ය නොවීය. පුරෝහිතවරුන් රජතුමාට අනුශාසනා කළ අවස්ථා-වන්හිදී රජතුමා සෑම විටෙකම පිළිතුරු දුන්නේ මෙසේය. "මා ජීවත්වන තාක් කල් මේවා මෙසේම ඉදිරියටත් කරගෙන යන්න. මාගේ මරණයෙන් පසුව කුමක් සිදුවූවත් කම් නැහැ." ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බව නිෂ්ඵලයේ පවසනු ලැබීය. නපුර සහ අගතිය රජතුමාට දකගන්නට ලැබුණු නමුත් එයට මුහුණ දීමට ඔහුට ශක්තියක් නොවීය, ධෛර්යයක් නොවීය. සියල්ල ඉදිරියෙහි ඔහුගේ පිළිතුර වුණේ "මාගෙන් පස්සේ විප්ලවයක් පැමිණියදෙන්" යන්නය. ප්‍රංශයේ අඳුරු ශෝචනීය ඉරණම ගැන රජතුමාගේ පිළිතුර මනා පෙරවදනක් සැපයුවේය.

තත්ත්වය මෙසේ පැවතුණු අතර රෝමානුව තම උපක්‍රමශීලී ක්‍රියාවේදය පණගැන්වීය. රජතුමා සහ පාලක පක්ෂය අතර තිබූ ඊර්ෂ්‍යාව ප්‍රයෝජනයට ගනිමින් ජනතාව වහල්කමෙහි සිරකර තැබීමට රෝමය බලපෑම් ඇති කළාය. මෙම ක්‍රමවේදය මගින් රාජ්‍ය පාලන තන්ත්‍රය දුර්වල කළ හැකි බව ඇය හොඳාකාරව දන සිටියාය. ප්‍රතිඵලය ලෙස ඇය අපේක්ෂා කළේ පාලකයන් සහ පාලිතයන් තමන්ගේ අණසක යටතේ තබාගැනීමය. රෝමය සතුව දූරදර්ශී සැලැස්මක් විය. මිනිසුන්ව කාර්යක්ෂම ලෙස වහල් භාවයේ රඳවා තැබීමට නම් ඔවුන් මත විලංගු තදකොට බැඳ දැමිය යුතුය, කිසිම ආකාරයකින් හෝ නිදහස ලබාගැනීමට මිනිසුන්ට අල්ප වූ ඉඩකඩක් හෝ තැබීම අනුවණය. ඇයගේ ප්‍රතිපත්තිමය ක්‍රියාවේදය මගින් පැන නැගි ප්‍රතිඵලය නම් හිංසා පීඩනයනට වඩා සදාචාරය බිඳ වැටීමය. ශුද්ධ බයිබලය මිනිසුන්ගෙන් ඈත් කොට අවිචාර බුද්ධියෙහි සහ ආත්මාර්ථයෙහි ඉගැන්වීම් තුළ මිනිසුන් අතරමං කොට ගෙන ගිය පාලන සමයෙන් ජනතාව නොදනුවත්කමෙහි සහ මිථ්‍යා ඇදහිලි තුළ පෝෂණයක් ලැබුවෝය. ඔවුහු අවකල් ක්‍රියාවන්හි පත්ලටම කිඳා බැස්සෝය. මෙවන් පරිසරයක් තුළ ස්වයං පාලන ක්‍රමයක් ක්‍රියාකිරීමේ සුදුසුකමක් ඔවුන්ට නොවීය.

එසේ වුවද, රෝමය අපේක්ෂා කළ ආකාරයෙන් ප්‍රතිඵල ඇතිවූයේ නැත. තමන්ගේ චිරන්තක දෘෂ්ටියට ජනතාව අන්ධ ලෙස බැඳ තබාගැනීම ඇයගේ චින්තනය විය. විරුද්ධ මතයක් ඉවසීම ප්‍රතික්ෂේප කළ ඇය තමන් පවසන්නාවූ සිද්ධාන්ත ජනතාව විසින් එකහෙලාම පිළිගත යුතුය යන දැඩි කල්පිතයෙහි පිහිටා සිටියාය. ක්‍රිස්තියානි ආගම කෙරෙහි වූ භක්තිය සහ විශ්වාසය බිඳ වැටී ජනතාව ආගමක් කෙරෙහි විශ්වාසයක් නැතිවූ අදේවදෘෂ්ටීන් හා විප්ලවකාරීන් බවට



පත්වූහ. රෝමානු ආගම වනාහි පූජකයන්ගේ උපායශීලී ක්‍රමවේදයක් ලෙස සැලකීමට ජනතාව පෙළ ගැසුණෝය. තමන් විඳින්නාවූ තාඩන පීඩනවලට හේතුකාරක පාර්ශ්වය ලෙස රෝමානු පූජකයන් සැලකීමට ඔවුහු පෙළඹුණෝය. ඔවුන් දැනසිටි එකම දෙවියන් වූයේ රෝමයේ දෙවිඳුන්ය. ඇයගේ ඉගැන්වීම් ඔවුන්ගේ එකම ආගම විය. ඇය තුළ තිබූ කෑදරකම් සහ කුරුරිකම් බයිබලය මත පදනම්වූ නිත්‍යානුකූල ගුණාංග යයි කල්පනා කළ ජනතාව ශුද්ධ බයිබලය සමග කිසිම සම්බන්ධතාවක් තබාගැනීම එපා කළහ.

දෙවියන්වහන්සේගේ චරිතය වැරදි ලෙස හුවා දක්වීමට රෝමානුව ක්‍රියාකර තිබුණාය. ඇය උන්වහන්සේගේ ඉල්ලීම් විකෘති කර තිබුණාය. මෙම කල්පිතයන් මධ්‍යයේ ජනතාව ශුද්ධ බයිබලයත් එහි කර්තෘවරයාණන්වත් ප්‍රතික්ෂේප කිරීමට උනන්දු වූවෝය. රෝමානුවේ චිරන්තන දෘෂ්ටියට අන්දානුකරණයෙන් අනුගත වන්නැයි ඇය බලකර සිටියාය. ඒ සඳහා ශුද්ධ ලියවිල්ලෙහි අනුමැතියක් ලැබී ඇති බවට ඇය සාධක ඉදිරිපත් කළාය. මෙයට ප්‍රතිචාර දක්වමින් වොල්ටෙයාර් සහ ඔහුගේ මිතුරෝ දෙවියන්වහන්සේගේ වචනය සම්පූර්ණ ලෙසින්ම ඉවත දැමුවෝය. ඒ අතරම ඔව්හු අදේව භක්තියේ විෂමතා ඵල සෑම තැනකම වැගිරෙව්වෝය. තමාගේ යකඩ පාදය යටතේ ජනතාව පාගාගෙන සිටීමට රෝමය ක්‍රියාකර තිබිණ. තමන්ගේ ආත්ම ගෞරවය බිඳ හෙළා අවමානයට පත්කර තිබූ ජන සමූහයා රෝමානුවේ අනුකම්පා විරහිත දුෂ්ට පාලනයට එරෙහිව නැගී සිටිමින් එහි බැඳීම් කඩා බිඳ දැමූහ. තමන් මෙතෙක් කලක් ප්‍රණාමය පුද කරමින් පූජා සත්කාර කළ දිළිසෙන වංචාවේ යථාර්ථය ගැන කෝපාකූල වූ ජනකාය සත්‍යය මෙන්ම ව්‍යාජ ඉගැන්වීම්ද ප්‍රතික්ෂේප කළහ. නිදහස යනු කැමැති ආකාරයෙන් හිතුමතේ ක්‍රියාකිරීම යැයි ව්‍යාජ චින්තනයකින් උද්දාමයට පත්වූ මහා ජනකාය නොපැකිළ දුරාචාර ක්‍රියාදාමයන්හි නිරත වූහ. තමන් සිතූ ආකාර නිදහස මේ යයි ඔවුහු විශ්වාස කළෝය.

විප්ලවයේ ආරම්භයේදී මෙතෙක් රාජ්‍ය පාලනය හෙබවූ වංශාධි-පතීන්ගෙන් සහ පූජකයන්ගෙන් සැදුම්ලත් පරිපාලන ඒකකයේ බලය බිඳිමින් එම ඒකකයට මහජන නියෝජිතයන්ද පත්කරගැනීමට රජතුමා තීරණය කළේය. වංශාධිපතීන්ගෙන් සහ පූජකයන්ගෙන් සමන්විත පරිපාලන ඒකකයේ මුළු සංඛ්‍යාවට වඩා වැඩි නියෝජනයක් මහජනතාවට හිමි කරන ලදී. මෙසේ පරිපාලනයේ බල තුලනය පොදු ජනතාවගෙන් සැදුම්ලත් නියෝජිතයන් අතට පත්විය. එහෙත් තමන් ලද වරප්‍රසාද බුද්ධිමත් ලෙස සහ පමණ නොඉක්මවා කළමණාකරණය කිරීමේ හැකියාවක් මහජන නියෝජිතයන් සතු නොවීය. තමන්ට මෙතෙක් විඳින්නට සිදුවූ අක්‍රමිකතා සහ ගැහැට නවතාලීමේ ප්‍රයත්නයක් ලෙස සමාජය ප්‍රතිසංස්කරණය කිරීමේ

කාර්යයට අතගැසීමට ඔවුහු තීරණය කර ගත්තෝය. මෙතෙක් තමන්ට විඳින්ට සිදුවූ කටුක දුක් ගැහැටද, තම සිත්හි පැසව පැසවා තිබූ වැරැදි ක්‍රියාවන්ද නිසා වියරු වැටී සිටි මහජනයා තවදුරටත් එවන් අත්දැකීම් විඳ දරා ගැනීමේ අවස්ථාවන් ඇතිවීමට ඉඩ නොතැබීමට විප්ලවීය හැඟීමකින් පිබිදීමට අවතීර්ණ වූහ. තමන්ට දුක් ගැහැට වේදනාවන් ගෙනදුන් පාර්ශ්වයන්ගෙන් පලිගැනීමට මහජනතාව තුළ කැළඹීමක් විය. කුරිරු අධම පාලනයක් යටතේ පීඩාවට ලක්වූ අය ආපසු හැරී තමන්ට පීඩා කළවුන්ට අඩන්තේට්ටම් කිරීමට පෙරමුණ ගත්තෝය.

තමන් වැපිරූ බීජයෙහි අස්වැන්න රුධිරයෙන් යුක්තව නෙළා ගැනීමට අවාසනාවන්ත ප්‍රංශයට සිදුවූවාය. රෝමයේ පාලන බලයට යටත් වීමේ ප්‍රතිඵල ඉතා භයානක විය. ප්‍රතිසංස්කරණයේ ආරම්භයේදී රෝම අනුබලය යටතේ ප්‍රංශය තම මුල්ම මිනිස් ඝාතක ගිනි ටැඹ ඉදි කළාය. විප්ලවයේ ආම්භයේදීම ප්‍රංශය නැවතත් හිස් ගසා දැමීමේ යන්ත්‍රයක් ක්‍රියාත්මක කළාය. දහසය වන සිය වසරේදී ප්‍රොතැස්තන්ත බැතිමතුන් සිය ඇදහිල්ල නිසා ගිනිබත් කරනු ලැබූ ස්ථානයේදීම දහ අට වන සිය වසරේදී වරදට අසුවූ අයගේ හිස් ගසා දමන ලදී. ප්‍රංශයට සුවය ලබාදීමට හැකියාව තිබූ ශුද්ධ බයිබලය ඉවතට වීසි කිරීම නිසා ඇය මිසදෙටු මිථ්‍යාචාරයට සහ ගරා වැටීමට දොරටු විවෘත කළාය. මිනිසා මත සීමා පැනවීමේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එපා කරනු ලැබූ විට මිනිසාගේ තෘෂ්ණාවන් පාලනය කළ හැකි ප්‍රමාණවත් නීති රීති පැනවීමට කිසිවෙකු හට හෝ හැකියාවක් නොලැබෙන බව පෙනී ගියේය. එකල කැරැළි ගැසීම සහ රාජ්‍ය පාලනයෙන් ඈත් වීම පැවතුණි. ශුද්ධ බයිබලයට විරුද්ධව දියත් වූ යුද්ධයත් සමගම ඇරඹී කාලවකවානුව ලෝක ඉතිහාසයෙහි නම් කර ඇත්තේ "ඉමහත් භීතියක් රජ කළ සමය" යනුවෙනි. නිවෙසින් සහ මිනිස් හදවතින් සාමයට සහ ප්‍රීතියට ඉඩකඩක් නොවීය. කිසිවෙකුට හෝ ආරක්ෂාව පිළිබඳව සහතිකයක් නොවීය. ජයග්‍රාහකයෙකු ලෙසින් අද පිළිගනු ලැබූ තැනැත්තේ හෙට සැකයට භාජනව වරදකරුවෙකු යයි තීරණය විය. සාහසිකකම් සහ කාම තෘෂ්ණාවන් සංසිඳුවා ගැනීම දෛනික ජීවිතයේ සාමාන්‍ය දෙයක් විය.

වියරුවෙන් කුපිත වී පලිගැනීමේ චේතනාවෙන් උද්දාමයට පත්ව සිටි ජනතාවගේ දාමරික සහ සාහසික ක්‍රියාවන්ට යටත් වීමට රජතුමාටත්, පූජකයන්ට සහ රදළවරුන්ටත් සිදුවිය. ඔවුන්ගේ පලිගැනීමේ චේතනාව සංසිඳුවිය හැකිවූයේ රජතුමාගේ ප්‍රාණය නැසීමෙන් පමණකි. වැඩිකලක් ගතවීමට පෙර රජතුමාගේ මරණය තීන්දු කළ අයද මරණයට මුහුණ දුන්හ. විප්ලවයට විරුද්ධවූ යම් අයෙක් වූයේ නම් එම තැනැත්තා මරණයෙන් වන්දි ගෙවීය. විරුද්ධවාදීන්ගෙන් හිරගෙවල්



පිරී ගියේය. එක් අවස්ථාවකදී සිරගෙයි සිටි පිරිස ලක්ෂ දෙකකටත් වඩා වැඩි විය. රාජ්‍යයේ නගර පුරා භීතිය සහ සන්ත්‍රාසය රජ කළේය. විප්ලවීය එක් කණ්ඩායමක් තවත් කණ්ඩායමකට විරුද්ධ වූහ. ජයග්‍රහණය අපේක්ෂාවෙන් ඈණ කොටා ගන්නාවූ පක්ෂවලට අයත් ජනයාගෙන් ප්‍රංශයේ වීදි පිරී ගියේය. තමන්ගේ සිත් තුළ කැකෑරෙමින් පැවැති තෘෂ්ණාවන් සංසිඳුවා ගැනීමට සෑම අයෙක්ම දැඩි වෙහෙසක් දරන බවක් පෙනී ගියේය. "පැරීසියෙහි එක කැරැල්ලක් පසුපස තවත් කැරැල්ලක් හඹා ආවේය. ප්‍රංශ වැසියෝ විවිධ සංවිධාන යටතේ බෙදී ගියෝය. එකිනෙකා විනාශකර දැමීමේ අරමුණ හැර වෙනත් චින්තනයක් ඔවුන් සතු නොවීය." මෙම ශෝචනීය කාලකණ්ණි දුක්ඛිත සිදුවීම්වලට අමතරව මෙම ජාතිය යුරෝපයේ බලවත් ජාතීන් සමග විනාශකාරී දිගුකාලීන යුද්ධයකද පැටලී සිටියේය. "දේශය බංකොලොත් භාවයෙහි එළිපත්ත උඩට පැමිණ තිබුණේය. තමන්ගේ හිඟ පඩි ඉල්ලා හමුදා භටයෝ උද්ඝෝෂණය කරන්නට වූහ. පැරීසියේ නගරවාසීහු ආහාර අහේනියකට මුහුණ පා සිටියෝය. කොල්ලකරුවෝ ප්‍රාදේශීය වාසීන්ගේ දේපල බලහත්කාරයෙන් අත්පත් කර ගත්තෝය. හිතුමතේ ක්‍රියාකිරීමේ ආදීනව නිසා ශිෂ්ටාචාරය වඳවී යන තර්ජනයකට මුහුණ පා සිටියේය."

"රෝමය විසින් මහත් උපේක්ෂාවෙන් ඉගැන්වූ කුරිරුකමෙහි සහ වධහිංසා පීඩා පැමිණවීමෙහි පාඩම් ජනතාව විසින් මනාව අධ්‍යයනය කර තිබුණේය. විපාක ලැබීමේ දිනය උදාවී තිබිණ. යේසු සමිදාණන්ගේ ගෝලයන්ව බලෙන් ඇදගෙන ගොස් පොළොව යට පිහිටි දහ ගෙවල දැමීම හෝ කණුවලට බැඳ ගිනිලෑමක් හෝ මෙම සමයේ නිමිත්තක් නොවීය. ඉකුත්ව ගිය සමයේදී මොවුහු මරණයට පත්කරනු ලැබූහ. නැතිනම් රටින් පිටුවහල් කරනු ලැබුවෝය. ලේ වැගිරවීමේ ක්‍රියාදාමයෙහි රුචිකත්වයක් ඇති කරමින් එම ක්‍රියාදාමය පණගැන්වීමට රෝමය විසින් පුහුණු කරනු ලැබූ අයගේ මාරාන්තික බලය තමන්ට විරුද්ධව අත් ඔසවන බව අනුකම්පා විරහිත රෝමානුවන්ට දකගන්නට හැකි විය. "වසර ගණනාවක් පුරා ප්‍රංශයේ පූජකයන් විසින් ප්‍රදර්ශනය කළ වධහිංසා පැමිණවීමේ සන්ත්‍රාසයේ ආදර්ශය දුන් ඔවුන්ටම එරෙහිව දැඩි ශක්තියකින් යුක්තව ක්‍රියාත්මක වන්නට විය. මරණීය පලංචිය පූජකයන්ගේ රුධිරයෙන් රක්ත වර්ණයෙන් පැහැගැන්වී තිබිණ. වරක් හියුගනෝවරුන්ගෙන් පිරී තිබූ හිරගෙවල් සහ නාවික වහල් හබලකරුන්ගේ ස්ථාන දැන් ඔවුන්ට වින කළ අයගෙන් පිරී යන්නට විය. බංකුවකට යදමින් බඳිනු ලැබ, දැඩි වෙහෙසින් යුක්තව හබල් ක්‍රියාත්මක කරමින් සේවයේ යෙදීමට රෝමානු කතෝලික පූජකයන්ට සිදුවිය. තමන් අසරණ බැතිමතුන් මිසදෙටුවන් යැයි හංවඩු ගසා ඔවුන්ට සිදුකළ වධහිංසා දැන් තමන්ටම විඳින්නට සිදුවී ඇති බව ඔවුහු අත්දැකීමෙන්ම දැනගත්හ."

ත්‍රී පුද්ගල මිලේච්ඡ විනිසුරු මඬුලක් විසින් අති මිලේච්ඡ අයුරින් පරිපාලන නීති රීති හසුරුවන යුගය උදා විය. කෙනෙක් තමාගේ අසල්වැසියාට ශුභ පැතීමක් හෝ පුද්ගලික යාච්ඤා කිරීමක් වුවද මරණ දඬුවමක් දිය හැකි අපරාධයක් සේ විග්‍රහ කරන ලදී. සෑම අස්සක් මුල්ලක් පුරාම චර පුරුෂයෝ ස්ථානගතව සිටියෝය. යාන්ත්‍රික පිහි තලය උදෑසනම තම වැඩකටයුතු ආරම්භ කළේය. වහන් අහුරා තිබූ නැව් තට්ටුවක් ලෙස සිරගෙවල් තුළ වරදකරුවන් කොටුකර තිබුණේය. කාණු දිගේ ගලා ගිය උණුසුම් රුධිරය සීන් ගංගාවේ ජලයට මුසු විය ... ඉරණමට මුහුණ දීමට වරදකරුවන් කරනු ලැබූ අය දිනපතාම පැරිසියේ වීථි දිගේ රථ වාහන තුළ පුරවාගෙන යෑම සුලභ දසුනක් විය. රාජකීය නියමය පරිදි පත්කරනු ලැබූ ප්‍රාදේශීය ආණ්ඩුකාරවරුන් තමන්ගේ බල ප්‍රදේශවලට පැමිණි වරදකරුවන්ට ඉතා කුරිරු ලෙස වධහිංසා ලබාදීමට පසුබට නොවූහ. අගනුවරදී පවා මෙවන් අධිකතර වධහිංසා ගැන අසන්නටවත් ලැබී තිබුණේ නැත. හිස කඳින් වෙන් කිරීමේ යන්ත්‍රයට තිබූ ඉල්ලුමේ වේගයට අනුව ක්‍රියාකිරීමට යන්ත්‍රයට හැකියාවක් නොවීය. තුවක්කු තුළින් පිටවූ මුතිස්සම් මගින් දහස් ගණනකගේ ප්‍රාණය වා තලයට එකතු විය. පේළි ගස්වා ඔවුන් ඝාතනය කරන ලදී. සමූහ මිනී වළවල් සෑම තැනකම දිස් විය. ජනාකීර්ණ ලියොන් නගරය පාළු මුඩු බිමක් බවට හරවනු ලැබීය. සිරකරුවෙකුට කඩිනම් මරණයක් ලැබීමේ වාසනාව පවා අර්හාස් යන ස්ථානයේදී අහිමි විය. එකට බැඳ තිබූ නිර්වස්ත්‍ර මළකඳන් කපුටන්ට සහ උකුස්සන්ට රාජ භෝජන සැපයීය. ලෝයර්හි වීදි දිගේ හෝමර් සිට මුහුදු තීරය දක්වා මෙම දසුන සුලභ විය. ස්ත්‍රී පුරුෂ වේවා, බාල මහළු වේවා කිසිවෙකුටත් කිසිම කරුණාව දක්වීමක් හෝ නොවීය. දහහත් වන වියෙහිවූ තරුණ තරුණියන් සිය ගණනින් මරා දමන ලදී. මව් තුරුළෙන් ඇදගත් ළදරුවන් බිම සිටුවා තිබූ උල් යකඩ කුරු මතට වීසි කරන ලදී" වසර දහයක් වැනි කෙටි කාලයක් තුළදී සිදුවූ ජනතා සංහාරය ඉතා ඉහළ සංඛ්‍යාවක් පෙන්නුම් කළේය.

සාතන් අපේක්ෂා කළ ආකාරයෙන් මේ සියල්ලක්ම සිදුවෙමින් පැවැතියේය. යුග ගණනාවක් පුරා ඔහු උත්සාහ කළේ මෙවන් තත්ත්වයක් ඇති කිරීමටය. මළපත් මගින් මිනිසුන්ව මුළාකිරීම ඔහුගේ වෑයමෙහි ප්‍රධාන එල්ලය වූයේය. මිනිසුන් දුකට සහ කාලකණ්ණිකමට පත්කිරීම ඔහුගේ අරමුණ විය. දෙවියන්වහන්සේගේ උත්කෘෂ්ට මැවිල්ලෙහි මුහුණත විරූපී කර එය දූෂ්‍ය බවට පත්කිරීම ඔහුගේ යටි අදහස විය. ත්‍යාගශීලීත්වයෙහි සහ ආදරයෙහි දිව්‍ය අභිමතාර්ථය අවතක්සේරුවකට පත්කොට දුක්මුසු වාතාවරණයක් නිර්මාණය කිරීමට ඔහු තම ශක්තිය යෙදවීය. සාතන් තම මුළාකිරීමේ ක්‍රමවේදයන් මගින් මිනිසුන්ගේ මනස අන්ධ කරමින් තමා ක්‍රියාත්මක කළ දූෂිතයන් දෙවියන්වහන්සේ මත පැටවීමට මිනිසුන්ව යොමු කරන්නේ ලෝකයේ



පවතින්නාවූ සෑම ආකාර විපත්තියකටම හේතුව මැවුම්කාරයාණන්ගේ සැලැස්මෙහි ප්‍රතිඵලයක් යයි මිනිසුන්ට ඒත්තු ගැන්වීමට සලස්වමිනි. මෙවන් චින්තනයකට නතුවන්නාවූ අය ආත්ම අභිමානයෙන් පහත් මට්ටමකට ඇද වැටී තිරිසනුන් ලෙස සිතීමට සහ ක්‍රියා කිරීමට පටන් ගනිති. සාතන්ගේ කුරිරු පාලනයෙන් ඔවුන්ට නිදහස ලැබුණ විට ඔහුගේ පෙළඹවීම් යටතේ පමණ ඉක්මවා ක්‍රියා කිරීමටත්, දාමරිකකම් කිරීමටත් ඔහු ඔවුන් යොමු කළේය. මෙවන් ශෝචනීය යථාර්ථයක් පැවතීම නිදහසේ ප්‍රතිඵලයක් යයි දාමරිකයෝ සහ පීඩා කිරීමෙහි නිරත වූවෝ ප්‍රකාශ කරති.

යම්කිසි ආකාරයකින් ආවරණය කරන ලදුව ඉදිරිපත් කරන්නාවූ වැරැදි ක්‍රමවේදයක් එහි සත්‍ය තත්ත්වය හෙළිදරව් වීමෙන් පසුව සාතන් එම වෑස්ම ඉවත්කර වෙනත් වෑස්මකින් එම වරදම ඉදිරිපත් කරයි. එවිට බොහෝ දෙනෙක් එය වැරැදි යයි නොසිතා මහත් උනන්දුවකින් එම වරද හරි දෙයක් යයි උපකල්පනය කරමින් පිළිගනිති. රෝමානුව මුළාවකැයි විශාල ජනතාවකට දැකගත හැකි විය. මෙම ක්‍රමවේදයන් මගින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමට මිනිසුන්ව තවදුරටත් යොමු කළ නොහැකි බව දුටු සාතන් ජනතාව වෙනත් මාර්ගයකට යොමු කළේය. සෑම ආගමක්ම වංචනික බවත් ශුද්ධ බයිබලය අධ්‍යාත්මික මිථ්‍යා ප්‍රබන්ධයක් බවත් කියමින් ජන හද තුළට එය කාවැද්දීම ඔහුගේ නව උපාය මාර්ගය විය. මෙසේ දිව්‍ය ව්‍යවස්ථාව අනවශ්‍ය දෙයක් සේ සලකා එය ඉවත දැමීමට සැලැස්වීමත් සමගම අපරාධය සහ අයුක්තිය සීමා මායිම් සිඳ දමා රජකරන්නට විය.

ප්‍රංශයේ ජනතාවට මෙතරම් දුක්ඛිත යුගයක් උදා කළ මරණීය වරද වනාහි එක්තරා ප්‍රබල සත්‍යතාවකට තැන නොදීමය. එම සත්‍යය වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි සීමා තුළ ජීවිතය පවත්වා ගෙන යෑම තුළ නියම නිදහස ඇති බවය. "අනේ, නුඹ මාගේ ආඥාවලට ඇහුම්කන් දුන්නා නම් නුඹේ සමාදානය ගංගාවක් මෙන්ද, නුඹේ ධර්මිෂ්ඨකම මුහුදේ රැළ මෙන්ද වන්නේය". "දුෂ්ටයන්ට සමාදානය නැතැයි ස්වාමීන්වහන්සේ කියන සේක." "නමුත් මට ඇහුම්කන් දෙන තැනැත්තේ සුවසේ වාසය කොට, විපතට භය නොවී, නිශ්චලව සිටින්නේය." (යෙසායා 48:18,22; හිතෝපදේශ 1:33).

දෙවි කෙනෙක් නැතැයි පවසන්නාද, මිථ්‍යා දෘෂ්ටිකයාද, ධර්මයට පිටුපා ක්‍රියා කරන්නාද දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට එරෙහිව ක්‍රියා කරමින්ද, එය ප්‍රතික්ෂේප කරමින්ද කටයුතු කරයි. එහෙත් ඔවුන්ගේ අනුබලයෙහි ප්‍රතිඵලය කියාපාන්නේ මිනිසාගේ යහපත් පැවැත්ම බැඳී ඇත්තේ දිව්‍ය ව්‍යවස්ථාවට දක්වන්නාවූ කීකරුකම මතය යන සත්‍යතාවයයි. දෙවියන්වහන්සේගේ වචනයෙන් පාඩම්

ඉගෙනගන්නේ නැති අයට එය ජාතීන්ගේ ඉතිහාසයෙන් කියවීමට අණ කරනු ලැබෙයි.

මිනිස් සත දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු වීමෙන් වලක්වා ලීමට සාතන් රෝමානු සභාව කරණකොටගෙන ක්‍රියා කළේය. ඔහුගේ ක්‍රියා කිරීමේ මාධ්‍යය ආවරණය කරගනිමින් කටයුතු මෙහෙයවූ හෙතෙම එයින් සිදුවූ අනර්ථකාමී විනාශයට සහ කාලකණ්ණිකමට වූ වගකීම පවා රහස්‍ය ලෙස රැකගැනීමට සමත් විය. විනාශකාරී තත්ත්වයට හේතුව සාතන්ගේ ක්‍රියාකාරිත්වය බව තේරුම් ගැනීමට බහුතර ජනතාවට හැකි නොවීය. මේ සියල්ල සිදුව ඇත්තේ දේව ව්‍යවස්ථාව කඩකිරීම නිසා බව දකගන්නට නොහැකි වන සේ ඔහු කරුණු වසන්කර තබාගත්තේය. ඔහුගේ වෑයම ඔහු සිතූ තරමට මල් ඵල දරීමට නොහැකි වූයේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය ඔහුගේ බලයට විරුද්ධව නැගී සිටි නිසාය. උදාවී ඇති යථාර්ථ තත්ත්වයට හේතුව සොයා යෑමට මහජනයා උත්සාහ කළේ නැත. මෙම කාලකණ්ණි ඉරණම උදාකළ මාධ්‍යය සොයා ගැනීමට ඔවුහු වෑයම් නොකළෝය. විප්ලවය මගින් සිදුවූ ප්‍රබලතම ප්‍රතිඵලය නම් ජාතික නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ප්‍රසිද්ධියේම ප්‍රතික්ෂේප කිරීමය; එය පසෙක ලෑමය. එයත් සමග නැගී ආ භීෂණ සමය පැවැති කාලයේදී එය ඇතිවීමට හේතුව සහ එහි ප්‍රතිඵල සෑමට දකගත හැකි විය.

ප්‍රසිද්ධියේ දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කර ශුද්ධ බයිබලය භාවිතයෙන් ඉවත් කළ ප්‍රංශයට අත්වූ ඉරණම භයානක විය. දුෂ්ට මනුෂ්‍යයෝ අන්ධකාරයේ දුෂ්ටාත්ම සමග එකතු වී ඔවුන් බොහෝ කල් ප්‍රාර්ථනා කළ අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම ගැන උත්සුක වූහ. ඔවුන්ගේ පැතුම වූයේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් නොවන්නාවූ අනුකූලතාව නොදක්වන්නාවූ රාජ්‍යයකි. අපරාධයකට හනික දඬුවම් ලැබෙන්නේ නැති නිසා මනුෂ්‍ය පුත්‍රයන්ගේ "සිත් නපුර කිරීමට ඔවුන් තුළ නිර්භීත වන්නේය." (දේශනාකාරයා 8:11). එහෙත් සාධාරණීයවූද, ධාර්මිකවූද නීති මාලාවක් උල්ලංඝනය කිරීම නිසා කාලකණ්ණි භාවය සහ විනාශය සිදුවීම වැලැක්විය නොහැකිය. මිනිසාගේ දුෂ්ටවූ ද, නපුරුවූ ද පාප කර්මයකට ක්ෂණික දඬුවම් ලැබුණේ නැති වුවද, එමගින් අත්වන්නාවූ සදාතනික විනාශය සහ සංහාරය ඔවුන් මත පතිත වීමට සූදානම් වෙමින් තිබුණේය. වසර ගණනාවක් පුරා දහම් මාවතින් ඉවත්ව යමින් සිදුකළ දුෂ්ට ක්‍රියාදාමයනට විපාක දීමේ දවස තීරණය වෙමින් පැවැතියේය. තමන්වහන්සේගේ උදහස මුදාහැරීමට දෙවියන්වහන්සේ ඉක්මන් නොවී ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටින සේක. තවත් ඉවසා සිටිය නොහැකි තත්ත්වයකට මිනිසාගේ පාප කර්ම පැමිණි විට උන්වහන්සේගේ



විපාක දීම අනිවාර්යයෙන්ම සිදුවනවා ඇත. දිව්‍ය ඉවසීමේ කාලය ගෙවී යාමට ඉඩදීම ඉතා භයානක බව දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කළාවූ අය අවබෝධ කරගන්නා විට ඔවුන් පමාවූවා වැඩිය. සාතන්ගේ කුරිරු බලවේගයන් ක්‍රියාත්මක කිරීමට බොහෝ දුරට තහංචි පනවමින් සිටි දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ බලය විශාල ප්‍රමාණයකින් ඉවත්කර ගනු ලැබුවේය. ඉක්බිතිව මිනිසාගේ ජීවිත ඉතා අසරණ භාවයකට පත්විය. එයින් දැඩි තෘප්තියක් ලබන්නාවූ සාතන්ට ඔහුගේ අභිප්‍රාය ඉටුකර ගැනීමට අවසර දෙනු ලැබීය. කැරැල්ලෙහි පංගුකාරයන් වීමට තෝරාගත් අයට තම තමාගේ ක්‍රියාවන්හි ප්‍රතිඵල භුක්ති විඳීමට අවස්ථාව උදා වෙමින් තිබුණේය. වචනයෙන් කිව නොහැකි තරම් දූෂිත ක්‍රියාවන්ගෙන් දේශය පිරී ගියේය. වැනසී පාළුවට ගිය ග්‍රාමීය පෙදෙස්වලින් මෙන්ම ගරා වැටුණු නගරවලින්ද ඉතා ශෝචනීය බියකරු හඬක් නැගී ආවේය. ඒ හඬ නම් හදවත් කම්පා කරන්නාවූ දුකින් බර වේදනාත්මක ප්‍රලාපයකි. භූමිකම්පාවක් නිසා වන්නාවූ කම්පනයක් මෙන් ප්‍රංශය තිගැස්සීමකට පත් වූවාය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධව අත එසවූ පාපි බලවේග විසින් ආගම, නීතිය, සාමය පැවැත්ම, පවුල, රජය සහ සභාවද බිඳ දමනු ලැබීය. ප්‍රඥාවන්තයාගේ ප්‍රකාශය සැබවින්ම සත්‍යයක් බවට පත්විය. "දුෂ්ටයා තමාගේම දුෂ්ටකමෙන් වැටෙයි." (හිතෝපදේශ 11:5). "පව්කාරයෙක් සිය වරක් නපුර කර, බොහෝ කල් ජීවත් වුණත්, දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට එනම් උන්වහන්සේ ඉදිරියෙහි භය වෙන්නන්ට යහපත සිද්ධ වෙන බව සැබවින්ම දනිමි. නමුත් දුෂ්ටයා [ට] යහපත සිද්ධ වෙන්නේ .... නැත." (දේශනාකාරයා 8:12,13). "මක්නිසාද ඔවුහු (දුෂ්ටයෝ) දැනගැන්මට ද්වේෂ කොට, ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීම තෝරා නොගෙන සිටියෝය." "එබැවින් ඔවුහු තමුන්ගේම ක්‍රියාවල ඵල ලබන්නහුය. තමුන්ගේම මන්ත්‍රණවලින්ද තෘප්තියට පැමිණෙන්නාහුය." (හිතෝපදේශ 1:29,31).

පාතාලයෙන් නැගී එන මෘගයා විසින් දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත සාක්ෂිකාරයන් දෙදෙනාම ජීවිතක්ෂයට පත්කරන ලද නමුත් එම දෙදෙනා බොහෝ කාලයක් නිශ්ශබ්දව සිටීම එවිට පැවැති සැලසුම නොවීය. "ඒ දවස් තුන හමාරට පසු ජීවන හුස්ම දෙවියන්වහන්සේගෙන් ඔවුන් තුළට පැමිණ, ඔව්හු නැගී සිටියෝය. ඔවුන් දුටුවන් කෙරෙහි මහත් භයක් පැමුණුනේය. (එළිදරව් 11:11). බයිබලය පසෙක ලෑම ප්‍රංශ පාර්ලිමේන්තුව 1793 දී සම්මත කළේය. ඒ නීතිය පනවා වසර තුන හමාරකට පසු එම නීතිය අවලංගු කරන්නැයි ඉල්ලමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවක් සලකා බැලීමෙන් පසුව එම නීතිය අවලංගු කරන ලදී. ශුද්ධ ලියවිල්ලෙහි පැවැත්ම නීත්‍යානුකූල කොට තීරණයක් නිකුත් විය. ශුද්ධ වූ ලියවිලි ප්‍රකාශනය ප්‍රතික්ෂේප කිරීම නිසා උදාවූ වරදෙහි විශාලත්වය දුටු ලෝකය විශ්මිතව භීතියෙන් පිරී ගියේය. ශුද්ධ

චරිතයෙහි සහ අධ්‍යාත්මික ගුණාත්මකයෙහි පදනම ලෙස දෙවියන්-වහන්සේ කෙරෙහිද උන්වහන්සේගේ ව්‍යවස්ථාව කෙරෙහිද ඇදහිල්ල දක්වීමෙහි අවශ්‍යතාව මිනිසා හට පිළිගැනීමට සිදුවිය. දෙවි සමිඳාණෝ මෙසේ පවසන සේක, "නුඹ නින්දා කළෙත්, අපහාස කළෙත් කාටද? නුඹ හඬ නැඟුවේත්, උඩඟුවෙන් නුඹේ ඇස් එසවූවේත් කාට විරුද්ධවද? ඉශ්‍රායෙල්ගේ ශුද්ධ වූ තැනැන්වහන්සේට විරුද්ධවය." (යෙසායා 37:23). "එබැවින් මෙන්න, මේ වතාවේ පමණක් ඔවුන්ට දැනගන්නට සලස්වන්නෙමි. මාගේ හස්තයත්, මාගේ පරාක්‍රමයත් දැනගන්ට සලස්වන්නෙමි, මාගේ නාමය යෙහෝවඃවහන්සේ බව ඔවුහු දැනගන්නෝය." (යෙරෙමියා 16:21).

සාක්ෂිකාරයන් දෙදෙනා පිළිබඳව දිවැසිවරයා තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි. "මෙහි නැඟී එන්නැයි ස්වර්ගයෙන් තමුන්ට කියන මහ හඬක් ඔවුන්ට ඇසුණේය. ඔව්හුද වළාකුළෙන් ස්වර්ගයට නැඟී ගියෝය. ඔවුන්ගේ සතුරෝද ඔවුන් දුටුවෝය." (එළිදරව් 11:12). දෙවි සමිඳාණන්ගේ සාක්ෂිකරුවන් දෙදෙනාට එරෙහිව ප්‍රංශය යුද්ධ කර තිබූ නිසා පෙර තිබූ තත්ත්වයට වඩා උසස් තලයක පිහිටුවනු ලැබීමෙන් ඔව්හු ගෞරවයට පාත්‍ර වූහ. බ්‍රිතාන්‍ය සහ විදේශ බයිබල් සමාගම 1804 දී ස්ථාපිත කරනු ලැබීය. මේ සමග ශාඛා විශාල ගණනාවකින් යුත් බයිබල් සමාගම් යුරෝපය පුරා ස්ථාපිත කරන ලදී. 1816 දී අමෙරිකානු බයිබල් සමාගම උපත ලැබීය. බ්‍රිතාන්‍ය බයිබල් සමාගම උපත ලැබූ විට ශුද්ධ බයිබලය භාෂා පනසකින් මුද්‍රණය කර බෙදා හරින ලදී. වර්තමානය වන විට ශුද්ධ බයිබලය සහ එහි කොටස් භාෂා සහ ව්‍යවහාරික උප භාෂා සිය ගණනකට පරිවර්තනය කර තිබේ.

වසර 1792 ට පෙර වූ වසර පනහ තුළ විදේශීය දහම් ප්‍රචාරයට වැඩි අවධානයක් යොමු වී තිබුණේ නැත. නව සංවිධාන ආරම්භ කරනු ලැබුවේ නැත. කිතුණු ආගම ගැන දන නොසිටි මිසදෙටු දේශාන්තරයන්හි කිතුණු දහම ප්‍රචලිත කිරීමට වෑයමක් දරන ලද්දේ නිකායන් කිහිපයක් විසින් පමණකි. එහෙත් දහඅට වැනි සියවසේ අන්තිම කාලයේදී විශාල වෙනසක් දැකගැනීමට හැකි විය. පැවැති යථාර්ථ ප්‍රතිඵල තුළින් සෑහීමට පත් නොවූ මනුෂ්‍යයෝ දිව්‍ය එළිදරව්වෙහි සහ අත්හදා බැලිය හැකි ආගමක් සොයා ගැනීමෙහි අවශ්‍යතාවයෙන් පෙළෙන්නට වූහ. කැපවීමෙන් යුක්ත වූ කේරී නමැති තැනැත්තා 1793 දී ඉන්දියාවට ගිය පළමුවන ඉංග්‍රීසි මිෂනාරිවරයා විය. ඔහු මිෂනාරි සේවය ගැන එංගලන්තයේ ප්‍රබෝධාත්මක ගින්න අලුත් කළේය. වසර විස්සකට පසුව අමෙරිකාවේ ශිෂ්‍ය සමාජයක් මිෂනාරි සේවය ගැන උනන්දු වූ විට ඇඩොනිරම් ජඩ්සන් ඔවුන් අතර සිටියේය. පිටරට මිෂනාරි සේවයේ අමෙරිකානු මණ්ඩලය මේ අවස්ථාවේදී පිහිටුවනු ලැබීය. ඒ මණ්ඩලයේ මගපෙන්වීම අනුව



ජඩ්සන් අමෙරිකාවේ සිට බුරුමයට ගියේ මිෂනාරි සේවය සඳහාය. විදේශීය දහම් ප්‍රචාරක කටයුතු කෙරෙහි අවධානය යොමු වීමත් සමග පෙර නොවූ විරූ ප්‍රගතියක් පෙනී යන්නට විය.

මුද්‍රණ ශිල්පය දියුණු වීමත් සමගම බයිබලය පතුරුවා හැරීමෙහි වැඩ කටයුතු විශාල ප්‍රගතියක් ලැබීය. ලෝකය පුරා පැවැති විවිධ පෙදෙස් කරා දෙවියන්වහන්සේගේ වචනය ඇතුළු වීමට එදා පැවැති දියුණු තත්ත්වයන් හේතු සාධක විය. විවිධ රටවල් අතර සන්නිවේදනය සඳහා පහසුකම්වල දියුණුවක් උදා විය. විවිධ ජාතීන් අතර පැවැති අවිචාරක හැඟීම් සහ චින්තනද, ජාතික මමත්වයද, බිඳ වැටෙන්නට විය. පාප්ගේ ලෞකික පාලන බලය නිමවිය. දේව වචනයට ඇතුල් වීමට නොදී අගුලා තිබූ පෙදෙස්හි යට කී හේතු සාධක නිසා, දොරටු විවෘත වන්නට විය. කිසිදු බාධකයකින් තොරව ශුද්ධ බයිබලය රෝමයේ වීදි වල විකුණනු ලැබීය. ලෝකයේ සෑම ජන කොටසක් වෙතට සම්පූර්ණ ශුද්ධ බයිබලය හෝ එහි කොටස් දැන් ළඟා වෙයි.

දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිනොගත් වොල්ටෙයාර් වරක් මෙසේ සාක්ෂි දරුවේය. "මිනිසුන් දොළොස් දෙනෙකු විසින් ක්‍රිස්තියානි ආගම ස්ථාපිත කළේ යයි කියනු ඇසීමෙන් මට එය දැන් අප්‍රිය මාතෘකාවක් වී ඇත. එම ආගම බිඳ හෙළීමට අවශ්‍ය වන්නේ එකම එක මිනිසෙක් බව මම ඔප්පු කර පෙන්වන්නම්." ඔහු මෙසේ පවසා දැනට අවුරුදු සියයකට වඩා ගතවී ඇත. ශුද්ධ බයිබලයට විරුද්ධව ලක්ෂ ගණන් මිනිසුන් යුද්ධ ප්‍රකාශ කර ඇත. එහෙත් බයිබලය විනාශ කර දැමීමට කිසිම අයෙකු හෝ සමත් වී නැත. වොල්ටෙයාර්ගේ කාලයේදී තිබුණේ ශුද්ධ බයිබල් පිටපත් සියයක් පමණ විය හැකිය. එහෙත් අද ශුද්ධ බයිබල් පිටපත් දස ලක්ෂ ගණනින් භාවිතයෙහි පවතී. මුල් කාලීන ප්‍රතිසංස්කාරකයෙක් සභාව ගැන මෙසේ පවසා ඇත. "බයිබලය ඉතා ශක්තිමත් කිණිහිරයකි. එයට පහර දීමෙන් බොහෝ මිටි ගෙවී ගොස් ඇත. එහෙත් කිණිහිරය තවමත් ශක්තිමත්ව පවතී." මෙම කරුණ පිළිබඳව යෙසායා දිවැසිවරයා මෙසේ පවසා ඇත: "නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය; විනිශ්චය කිරීමට නුඹට විරුද්ධව නැගිටින සියලුම දිව් නුඹ විසින් වරදට පත්කරනවා ඇත." (යෙසායා 54:17).

"අපේ දෙවියන්වහන්සේගේ වචනය සදාකාලේටම පවත්නේය." "උන්වහන්සේගේ පනත් සියල්ල නියතය. ඒවා නිතරම සදාකාලයටම පිහිටුවා තිබේ. ඒවා සැබෑකමෙන් හා අවංක කමින් කරන ලද්දේය." (යෙසායා 40:8; ගීතාවලිය 111:7,8). මනුෂ්‍යයාගේ ආධිපත්‍යය මත ගොඩනගන ලද කවර දෙයක් වුවද බිඳ දමනු ලබනවා ඇත. එහෙත් දෙවියන්වහන්සේගේ නිත්‍ය වූ වෙනස් නොවන්නාවූ වචනය වන සදාතනික පර්වතය මත ගොඩ නගන ලද යමක් වේද එය සදාතනය පුරා පවතින්නේය.

# 16

# වන්දනාකාර පියවරු

එංගලන්තයේ ප්‍රතිසංස්කරණයේ යෙදී සිටියා වූ අය රෝමානු දහම් අතහැර දැමීමට ගිවිස ගත් නමුත් ඒ සභාවේ සමහර සම්ප්‍රදායික පිළිවෙත් අත්හැරියේ නැත. රෝමානුවේ බල අධිකාරියත් ඇයගේ ඇදහිලි ප්‍රකාශනයත් ඉංග්‍රීසි ජාතිකයන් විසින් ප්‍රතික්ෂේප කළ නමුත් රෝමානුවේ සමහර චාරිත්‍ර සහ පූජා විධි මෙන්ම මංගල්‍ය විධි ද එංගලන්ත සභාවේ නමස්කාරයට ඇතුළු විය. මෙම දේවල් හෘදය සාක්ෂිය හා බැඳී නැතැයි තර්ක ඉදිරිපත් විය. එකී පැවතුම් සඳහා ශුද්ධ ලියවිලි අනුමැතියක් ලබාදී තිබුණේ නැත. ඒ දේවල් පැවැත්වීම තහනම් කර නැති නිසා ඒවා නපුරු යයි වර්ගීකරණයද කළ නොහැකි විය. මෙම පැවතුම් පිළිගැනීම නිසා ප්‍රතිසංස්කෘත සභාවන් සහ රෝමය අතර පැවති වෙන්වීමේ පරතරය තරමක් දුරට අඩු වූයෙන් මෙම ක්‍රියාවේදයන් රෝමානුවන්ට ප්‍රොතැස්තන්ත ඇදහිල්ල පිළිගැනීමට හේතු කාරක විය හැකි යයිද අවධානයෙන් පවසන ලදී,

ගතානුගතික කල්පිත දරූ අයට මෙන්ම, සමහර විශ්වාසයන් පාවා දීමෙන් වුවද සමාදානයෙන් යුත් පැවැත්මකට කැමැතිවූ අයටද මෙම තර්ක කිරීම් තීරණාත්මක විය. නමුත් මෙයාකාරයෙන්ම කල්පනා නොකළ කණ්ඩායමක්ද සභාව තුළ සිටියේය. රෝමානුව සහ ප්‍රතිසංස්කරණය අතර වූ විශාල පරතරය හරහා පාලමක් ගොඩනගා ගැනීමට මෙම පිළිවෙත් සහ සම්ප්‍රදායානුකූල මංගල්‍යයන් පැවැත්වීම ඉවහල් වන බැවින් එම ක්‍රියාවේදයන්ට එරෙහි වීමට එයම සාධකයක් බව විරුද්ධ වූවන්ගේ මතය විය. තමා රෝමානුවන්ගේ වහල්කමින් මිදීම ලැබ සිටින නමුත් මෙම පිළිවෙත් පැවැත්වීම වහල්කමෙහි පදක්කමක් පැළඳීමට සමාන යයි ඔව්හු කල්පනා කළහ. එම තත්ත්වයට ආපසු යෑමෙහි අදහසක් කිසිසේත් ඔවුන් තුළ නොවීය. දෙවියන්වහන්සේට නමස්කාර කිරීමෙහි නියාමනයක් දේව වචනය තුළ ස්ථාපිත කර ඇති නිසා එයට යමක් එකතු කිරීමට හෝ යමක් ඉවත් කිරීමට මිනිසාට කිසිදු අයිතියක් නැතැයි ඔවුහු තර්ක කළෝය. ධර්මයෙන් ඉවත්ව යාමේ මූලාරම්භය වූයේ දෙවියන්වහන්සේගේ ආධිපත්‍යයට සභාවේ ආධිපත්‍යය එකමුසු කිරීමය. දෙවියන්වහන්සේ තහනම් නොකළ දෑ සභාවට අනුගත කිරීමට නියම කිරීමෙන් ආරම්භ වූ රෝමානුව කාලයාගේ ඇවෑමෙන් උන්වහන්සේ විසින් පැහැදිලි ලෙසින් නියම කළ දෑ පිළිපැදීම තහනම් කිරීමට කටයුතු කළාය.



කිතුණු සභාවේ මූලාරම්භයේදී තිබූ පවිත්‍රතාව සහ සරලතාව වෙත යාමට බොහෝ දෙනා අවංකවම ආශා කළෝය. එංගලන්ත සභාවෙහි ස්ථාපිත කර තිබූ බොහෝ සම්ප්‍රදායික සිරිත් විරිත් සහ පැවතුම් රූප වන්දනාවේ ස්මාරක බව ඔවුහු විශ්වාස කළෝය. ඇයගේ නමස්කාර මෙහෙයන්ට සහභාගි වීම හෘදය සාක්ෂියට එකඟව කළ නොහැකි බව ඔවුන්ගේ අදහස විය. සිවිල් පාලන අධිකාරියෙහි සහයෝගයෙන් පවත්වා ගෙන ගිය සභාව ඇය අනුගමනය කළ පිළිවෙත් ක්‍රමයට විරුද්ධව වෙනත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අවසර දීමට මැළි වූවාය. සභාවේ දේවස්ථාන තුළ පවත්වන්නාවූ නමස්කාර මෙහෙයන්ට පැමිණීම නීතියෙන් අනිවාර්ය විය. නීතියෙන් අනුමැතිය නොලැබූ කණ්ඩායම් සමග නමස්කාරයට එක්වීම තහනම් විය. මෙසේ කරන්නාවූ අයට නියමවූ දඬුවම නම් සිරගෙයි ලෑම හෝ රටින් පිටුවහල් කිරීම හෝ මරණය විය.

දහ හත්වන සියවස ආරම්භයේදී සිහසුනට පත් අළුත් රජතුමා පියුරිටන්වාදීන් යන නමින් හඳුන්වනු ලැබූ මේ මනුෂ්‍යයන් පිළිබඳව දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට තීරණයක් ගත්තේය. ඔවුන් "රාජ්‍ය ආගම සමග අනුකූලතා දක්වීම අනිවාර්යයෙන් සිදුවිය යුතුය. එසේ නොකරන්නේ නම් ඔවුන්ව දේශයෙන් පන්නා දැමිය යුතුය. එසේත් නැතිනම් එයට වඩා දරුණු ඉරණමකට මුහුණ දීමට ඔවුන්ට සිදුවෙනවා ඇත"යි පවසන ලදී. (Bancroft, George, "History of the United States of America," part 1, Ch. 12, par. 6). දඩයම් කිරීම්වලට ලක් වෙමින්, සිරගතව සිටි ඔවුන්ට, වඩා යහපත් වූ දවසක පොරොන්දුවක් කෙරේ බලා සිටීමට උපේක්ෂාවක් නොවීය. තමන්ගේ හෘදය සාක්ෂිය අනුව දෙවියන්වහන්සේට සේවය කිරීමට එංගලන්තය, අනාගතයේ කිසිම දවසක සුදුසු වාසස්ථානයක් වන්නේ නැහැ" යනු බොහෝ දෙනෙකුගේ ස්ථිර විශ්වාසය විය. (Palfrey, J. G., "History of New England, Ch. 3, Par 43), අන්තිමේදී සමහරෙක්, තමා ඕලන්දයේ සරණය පැතිය යුතු යයි තීරණය කරගත්තෝය. ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීමට බොහෝ බාධාවන් එල්ල විය. ඔවුන්ව සතුරන්ගේ හස්තයට පාවා දෙනු ලැබීය. නමුත් නොපසුබට ස්ථිරසාර අධිෂ්ඨානය අන්තිමේදී ජය ගත්තේය. ඕලන්ද ජනරජයේ හිතකාමී වෙරළ මොවුන්ට රැකවරණය ලබා දුන්නේය.

තම ගම රට හැර යන ගමනේදී ඔවුහු තමාගේ ගේදොර, බඩු මුට්ටු සහ ජීවත්වීමේ මාර්ගයද අතහැර දමා ජීවිතය පමණක් ආරක්ෂා කරගෙන පලා ගියෝය. ඔවුහු අළුත් දේශයක අමුත්තන් රැසක් වූහ. තමන් පැමිණි රටෙහි සිටි ජනතාව වෙනත් භාෂාවක් කථා කළෝය. ඔවුන්ගේ සිරිත් විරිත්ද බොහෝ වෙනස් විය. එහිදී, ජීවිතය රැක-

ගැනීම සඳහා නුපුරුදු රැකියාවන්හි යෙදීමට ඔවුන්ට සිදු විය. ජීවිතය පුරා බිම් කොටමින් වැඩ කළ තළත්තෑනි මනුෂ්‍යයන්ට යාන්ත්‍රික වෘත්තීන්හි යෙදීමට සිදුවිය. උදාවී ඇති යථාර්ථය සතුටින් යුතුව පිළිගැනීමට ක්‍රියාත්මක වූ මෙම සරණාගතයෝ තමන්ගේ තත්ත්වය ගැන කනස්සල්ලට පත්වෙමින් නිකරුණේ කාලය ගත නොකළෝය. බොහෝ අවස්ථාවන්හිදී දුගී භාවයට මුහුණ දුන් ඔවුහු ඒ පිළිබඳව කිසි කෙඳිරීමක් නොකර ඔවුන් ලබන්නාවූ ආශිර්වාද ගැන දෙවියන්වහන්සේට ස්තූති කළෝය. පීඩාවන්ගෙන් තොරවූ ආත්මික සබැඳියාවන් තුළ ඔවුහු තම ප්‍රීතිය සොයා ගත්තෝය. "තමා වන්දනාකරුවන් බව ඔවුහු දන සිටියහ. ලෞකික සම්පත් ගැන ඔවුන්ගේ වැඩි අවධානයක් නොවීය. තමන් ඉතා ඇලුම් කළ රට, රාජ්‍යය දෙසට එනම් සගය දෙසට නෙත් යොමු කළ ඔවුහු තමන්ගේ ආත්ම සැනසීමට පත් කරගත්තෝය." (Bancroft, part 1, Ch. 12, par. 15).

පිටුවහල් කරන ලදුව, දුක් ගැහැට මධ්‍යයේ දිවි ගෙවුවද ඔවුන්ගේ ආදරය සහ ඇදහිල්ල ශක්තියෙන් ශක්තියට වර්ධනය විය. ඔවුහු දෙවි සමිඳාණන්ගේ පොරොන්දු කෙරෙහි සම්පූර්ණ විශ්වාසය රැඳවූහ. ඔවුන්ගේ අවශ්‍යතාවන්වලදී උන්වහන්සේ ඔවුන්ගේ විශ්වාසය කඩ නොකළ සේක. ඔවුන්ව දිරිමත් කිරීමටත්, ඔවුන්ට සහාය වීමටත් උන්වහන්සේගේ දේව දූතයෝ ඔවුන් වටා සිටියෝය. සමුදුරෙන් එපිට පිහිටි දේශයක් දෙසට ඔවුන්ව යොමු කරවමින් දේව හස්තය ඔවුන්ට යමක් පවසන බවක්, ඔවුන්ගේ සිත් තුළට කාවැදී ගියේය. එම දේශයෙහිදී ඔවුන්ට ස්ථිර වාසස්ථානයක් සාදාගෙන, එය උරුමයක් කොටගෙන, ඔවුන්ගේ දරුවන්ට ආගමික නිදහස සම්පතක් කොට ලබාදීමට දේවානුභාවයේ මගපෙන්වීමක් ඔවුන්ට ලැබුණේය. කිසිම පසුබෑමකින් තොරව පෙන්වා දෙනු ලැබූ මාර්ගයෙහි ඉදිරියටම යෑම ඔවුන්ගේ අධිෂ්ඨානය විය.

මිනිස් සත සඳහා වූ දෙවියන්වහන්සේගේ කරුණා හරිතවූද, දයාවන්තවූද අභිප්‍රාය සපුරා ගැනීම් වස් තම සෙනඟ සූදානම් කිරීමට විවිධ ආකාර පරීක්ෂාවන්ට මුහුණ පෑමට උන්වහන්සේ ඔවුන්ට ඉඩ හළසේක; සභාව පහත් තත්ත්වයකට ඇද දමනු ලැබුවේ ඇයව ඉහළ ගෞරවාන්විත තලයකට පත්කිරීම උදෙසාය. ඇය වෙනුවෙන් අති මහත් බලසම්පන්න වූ තමන්වහන්සේගේ බල මහිමය ප්‍රදර්ශනය කිරීමක් ඉටු කිරීමට දෙවියන්වහන්සේ සූදානමින් සිටිසේක. තමන්වහන්සේ කෙරෙහි විශ්වාසය රඳවන්නාවූ අයව දෙවියන්වහන්සේ කිසිම දවසක අත් හැර දමන්නේ නැති බවට ලෝකයට තවත් සාක්ෂියක් ලබාදීමට උන්වහන්සේ කටයුතු සලසමින් සිටිසේක. තමන්ගේ උපායශීලී ක්‍රමවේදයද දුෂ්ට මිනිසුන්ගේ ක්‍රියා කලාපයන් හා සාතන්ගේ උදහස ද තමන්වහන්සේගේ තේජස්ශ්‍රීයේ මහිමය උදෙසා හරවාලීමට දෙවියන්-



වහන්සේ ක්‍රියාත්මක වූසේක. තමන්වහන්සේගේ ජනතාව ආරක්ෂා සහිත ක්ෂේම භූමියක් කරා, රැගෙන යාමට උන්වහන්සේ සැලසුම් කළසේක. හිංසා පීඩා සහ රටින් පිටුවහල් කිරීම්, නිදහසට මාර්ගයක් විවෘත කරමින් ක්‍රියාකාරී විය.

එංගලන්ත සභාවෙන් වෙන්වීමට බල කරනු ලැබූ කල්හි පියුරිටන්වාදීහූ එක්සත්ව ශුද්ධවූ ගිවිසුමකට ප්‍රතිඥා දුන්හ. දෙවි සමිඳාණන්ගේ නිදහස් ජනතාවක් ලෙස, "තමන්ට මෙතෙක් එළිදරව් කර ඇති හෝ මතුවදී එළිදරව් කරන්නාවූ උන්වහන්සේගේ සියළු මාර්ගවල එක්සත්ව ගමන් කිරීමට ගිවිස ගන්නෙමු" යයි ඔවුහු සම්මුතියක් පිහිටුවා ගත්තෝය. Brown, J. "The Pilgrim Fathers," p. 74). ප්‍රතිසංස්කරණයේ සදාතන ආත්මය මෙය විය. ප්‍රොතෑස්තන්ත සභාවේ ජීවමාන ප්‍රඥප්තිය මෙය විය. මෙම පරම අභිමතාර්ථය ඇතිව වන්දනාකාරයෝ ඕලන්දයෙන් නික්ම, අළුත් ලෝකයේ ක්ෂේම භූමියක් සොයා ගමන ආරම්භ කළෝය. ඔවුන්ගේ දේවගැතිවරයාවූ ජෝන් රොබින්සන් දිව්‍ය මගපෙන්වීමෙන්, ඔවුන් සමග යෑමේ වරප්‍රසාදයෙන් වලක්වාලනු ලැබීය. දේව සෙනඟට ශුභ පැතීමට පැමිණි හෙතෙම ඔවුන් අමතා මෙසේ පැවසීය:

"සහෝදරවරුනි, මෙතැන් පටන් ඔබත් මමත් වෙන් වන්නෙමු. ඔබතුමන්ලාගේ මුහුණු නැවත වරක් දකගැනීමට මා ජීවත්ව සිටිනවා ඇත්දැයි දන්නේ දෙවි සමිඳාණන් පමණයි. මා මෙතෙක් දෙවි තුමාණන් අනුගමනය කළ ප්‍රමාණය දක්වා ඔබත් අනුගත වන ලෙස දෙවියන්-වහන්සේ සහ ආශිර්වාදලත් දේව දූතයන් ඉදිරියෙහි ඔබගෙන් ඉල්ලා සිටිමි. වෙනත් මාර්ගයකින් දෙවියන්වහන්සේ ඔබට තවත් දේ එළිදරව් කරනසේක්නම් එම දෙය පිළිගෙන අනුගමනය කරන්න. මාගේ සේවාව කරණකොටගෙන ඔබට එළිදරව් කළ දෑ විශ්වාස කිරීමට ඔබ ගිවිස ගත් ආකාරයෙන්ම දේව පණිවිඩකාරයෙකුගේ එළිදරව් කිරීම්ද පිළිගන්න. දේව වචන තුළින් තවත් සත්‍යතාවන් සහ ආලෝකය ඔබතුමන්ලාට ලබා දෙන්නට උන්වහන්සේ ක්‍රියාත්මක වන බව මට විශ්වාසයි." (Martyn, Vol, v, p. 70).

"ප්‍රතිසංස්කරණයේ සභාවනට අයත් සභාවල තත්ත්වය ගැන ප්‍රමාණවත් ලෙස වැලපෙන්නට මට හැකියාවක් නැත. එම සභාවන් දැන් එක්තරා නැවතීමකට මුහුණ දී ඇත. ප්‍රතිසංස්කරණයක් කරා එම සභාවන්ට මගපෙන්වූ එකී ප්‍රතිසංස්කාරකයන් සිටි ආත්මික දැනුමට සහ මට්ටමට වඩා පෙරටුවට යාමට සභා සාමාජිකයන්ට හැකියාවක් නැත. ලූතර් දුටු දර්ශනයේ සීමාවට වඩා ඉදිරියට යෑමට ලූතර්වාදීන්ට හැකියාවක් නැත .... දෙවියන්වහන්සේ උදෙසා සේවය කළ කැල්වින් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. එසේ වුවද, ඔහු සෑම සත්‍යයක්ම

හොඳාකාරව දුටුවේ නැත. ඒ අනුව කැල්වින් වාදීන්ට යා හැකිවන්නේ ඔවුන්ගේ ප්‍රතිසංස්කාරක ගුරුතුමා පැමිණ සිටි මායිම දක්වා පමණකි. ඉන් ඔබ්බට නොවේ. මෙය විලාප දිය යුතු ශෝචනීය තත්ත්වයකි. ඔවුන්ගේ සේවා කාලය තුළදී ඔවුන් ගිනි ගෙන දවෙන්නාවූ ද, බැබලෙන්නාවූ ද ආලෝක වූවාට තර්කයක් නැත. එහෙත් ඔවුහු දෙවියන්වහන්සේගේ සියළු මන්ත්‍රණ පිළිබඳව සම්පූර්ණ දැනීමක් ලැබ නොසිටියෝය. නමුත් ඔවුහු අදත් ජීවත්ව සිටිත් නම් තමන්ට ලැබුණු ආලෝකය වැළඳ ගත්තාක් මෙන්ම වත්මන් කාලයේදී ඔවුන්ට ලැබෙන්නාවූ වැඩිපුර ආලෝකයද වැළඳ ගැනීමට කැමැත්තක් දක්වන බව නොඅනුමානය." (Newl D, "History of the Puritans," Vol. 1, p. 269).

"සභාව සමග ඔබ ගත් ගිවිසුම අමතක කරන්න එපා. ඔබට දෙවි සමිඳාණන් පෙන්වාදී ඇති මහෙහි හෝ ඉදිරියේදී පෙන්වා දෙන මාර්ගයෙහිද ස්වාමින්වහන්සේ සමග එක්ව යාමට ඔබ පොරොන්දු වූ බව අමතක කරන්න එපා. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙන් ඔබට ඉදිරිපත් වන්නාවූ සෑම ආලෝකයක් සහ සත්‍යතාවක්ම පිළිගැනීමට ඔබ දෙවියන්වහන්සේ සමග හා එකිනෙකා සමග පොරොන්දු වී ඇති කරගත් ගිවිසුම මතක තබාගන්න. ඒ සමගම මේ අවවාදයත් මතක තබාගැනීම ඉතා වැදගත්ය. ඔබගේ අවධානයට යම්කිසි සත්‍යතාවක් යයි කියන්නාවූ දෙයක් ඉදිරිපත් වූ විටෙක, එය පිළිගැනීමට පෙර, දේව වචනයේ වෙනත් පැහැදිලි කිරීම් සමග සසඳා බලා, මැනවින් කිරා බලා, එයින් පසුව පමණක් එම ඉගැන්වීම සත්‍ය යයි භාරගන්න. ක්‍රිස්තියානි විරෝධී දහම් නැමැති ඝන අන්ධකාරයෙන් පිටතට පැමිණි සභාවට එක්වරටම දැනුම පිළිබඳ සම්පූර්ණතාවකට පැමිණීම පහසු නොවෙනවා ඇත." (Martyn, Vol. v, pp. 70, 71).

අනතුරුදායක විපත් හා ගැටෙමින් නුපුරුදු මුහුදු තරණයක යෙදීමට මෙම වන්දනාකාර බැතිමතුන් පෙළඹවීමකට යොමු කළේ හෘදය සාක්ෂියේ නිදහසට ඇති ආශාවය. දිගු මුහුදු ගමනක යෙදෙමින් දුර කතරක යමින් දුක් ගැහැට සහ අනතුරුවලට මුහුණ දෙමින් අමෙරිකානු භූමියේ පය ගැසීමට ඔවුහු අවසානයේදී සමත් වූහ. දෙවියන්වහන්සේගේ ආශිර්වාද ඇතිව බලවත් ජාතියක් උදෙසා අත්තිවාරමක් දැමීමට මෙසේ පැමිණි වන්දනාකාරයෝ සමත් වූහ. මෙම වන්දනාකරුවෝ දෙවියන්වහන්සේට ඉතා අධික ලෙස බිය පක්ෂපාතකම් දක්වුවද සත්‍ය වශයෙන්ම අවංක වුවද ආගමික නිදහසෙහි ශ්‍රේෂ්ඨ ප්‍රඥප්ති සහ සිද්ධාන්ත මුළුමණින්ම අවබෝධ කරගැනීමට ඔව්හු අසමත් වූහ. මහත් කැපවීමකින් යුතුව, පූජාවීමකින් යුතුව ලබාගත් නිදහස පෙරළා තවත් අයට ලබාදීමට ඔවුහු එතරම් රුචියක් නොදැක්වූහ. "දහ හත්වන සියවසෙහි සිටි ප්‍රවීන බැතිමතුන්



සහ සුචරිතවාදීන් අතරින් ඉතා ස්වල්ප දෙනෙකුට පමණක් ආගමික නිදහස කුමක්ද යන්න පිළිබඳව යථාර්ථවාදී වැටහීමක් තිබුණි. එම ශ්‍රේෂ්ඨ ප්‍රඥප්තිය අළුත් තෙස්තමේන්තුව මගින් ඉදිරිපත් කළ සිද්ධාන්තයකි. දෙවියන්වහන්සේ වනාහි මිනිස් ඇදහිල්ලෙහි උත්තරීතරවූ ද, එකමවූ ද විනිශ්චයකාරයාණන් බව පිළිගැනීම මත එම සිද්ධාන්තය පදනම් වී ඇත. (Martyn, Vol. 5, p. 297). මිනිසාගේ හෘදය සාක්ෂිය පාලනය කිරීමේ අයිතිය සභාව සතුය යන දහමද ඒ සමග මිසදෙටු දහම් කවරේදැයි තීරණය කර ඒ සඳහා දඬුවම් පැමිණවීමේ අයිතියද ඇය සතුව ඇතැයි පැවසීම වනාහි පාප් සමයවාදී වැරැදි නිගමනයන්හි දැඩි ලෙස මුල්බැස ඇති වැරදි ඉගැන්වීමකි. රෝමානු ඇදහිල්ලෙහි සිද්ධාන්ත පිළිගැනීමට ප්‍රතිසංස්කරණවාදීන් ප්‍රතික්ෂේප කළද, වෙනත් අයගේ විශ්වාසයන් නොරිස්සීමේ රෝමානු ගතියද ඔවුන් තුළින් සම්පූර්ණයෙන්ම ඉවත්ව ගොස් තිබුණේ නැත. පාප් බල අධිකාරිය විසින් යුග ගණනාවක දිගු කාලයක් පුරා ඝන අන්ධකාරයෙහි සිරකර තිබූ ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණයක් කරා යොමු වූ හමුදා, මේ වන විටත් පාප්වාදී ඉගැන්වීම් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණේ නැත. මැසචූසෙට් ජනපදයෙහි සේවය කළ එක්තරා ප්‍රමුඛ දේවගැති-වරයෙක් මෙසේ ප්‍රකාශයක් කළේය. "අනෙකුත් අයගේ ඉගැන්වීම් ඉවසා දරා සිටීමේ ක්‍රමවේදය නිසා ලෝකය කිතුණු දහමට විරුද්ධවාදීව ක්‍රියා කිරීමට දිරියක් ලබා ගත්තේය. මිසදෙටුවන් ලෙස දඬුවම් ලැබීම කිතුණුවන්ට භීතියක් ඉදිරිපත් නොකළේය." (Martyn, Vol. 5, 335). අමෙරිකා භූමි තලයෙහි ජනපදයක් පිහිටුවා ගත් එංගලන්තයේ සිට පැමිණි වන්දනාකරුවෝ තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ නීතියක් නම්, සභාවේ සාමාජිකයන්ට පමණක්ම ආණ්ඩු බලයේ කොටසක් ඇතිවිය හැකි බවය. මෙසේ එක්තරා ක්‍රමයක ආගමික රාජ්‍යයක් පිහිටුවා ගන්නා ලදී. දේවගැතිවරුන්ගේ නඩත්තුව සඳහා සාමාජිකයන් විසින් මුදල් ලබාදීම කළ යුතු විය. මිසදෙටු ඉගැන්වීම් මැඩපැවැත්වීමට මහේස්ත්‍රාත්වරුන්ට බලය පවරනු ලැබීය. මෙසේ ජනතාව කෙරෙහි වූ පාලන බලය සභාව මත පැවරුණේය. මෙම ක්‍රමවේදය නිසා පැන නගින්නාවූ අනිවාර්ය ප්‍රතිඵලය වැඩිකලක් යාමට පෙර දැකගත හැකි විය. එය වධහිංසා පැමිණවීම විය.

අමෙරිකාවේ මුල්ම කොලනිය පිහිටුවා වසර එකොළහකට පසුව රොජර් විලියම්ස් අළුත් ලෝකයට පැමිණියේය. කලින් පැමිණි වන්දනාකරුවන් මෙන්ම මොහුද මෙහි පැමිණියේ ආගමික නිදහස භුක්ති විඳීමටය. එම යුගයේ දිවි ගෙවූ ඉතා ස්වල්ප දෙනෙක් පමණක් දුටු එක්තරා ක්‍රිස්තියානි සිද්ධාන්තයක් ඔහුගේ දසුන වෙලා ගත්තේය; එනම්, ආගමික නිදහස යනු සෑම අයෙකුම සතු වෙනස් කළ නොහැකි අයිතියක් යන්නය. පුද්ගලයෙකුගේ ඇදහිලි ක්‍රමය එයට බාධාවක් නොවන්නේය. රොජර් විලියම්ස් වනාහි සත්‍යය සොයා ගිය අවංක පුද්ගලයෙක් විය. දෙවින්වහන්සේගේ වචනයෙහි අඩංගු සියළු ආලෝකය

දනටමත් එළිදරව් වී ඇත යන මතය ඔහු පිළිගත්තේ නැත. තවත් එළිදරව් වීම් ඇති බව රොබින්සන් මෙන්ම රොජර් විලියම්ස් ද පිළිගත්තේය. "හෘදය සාක්ෂියේ නිදහස යන සිද්ධාන්තය මත සිවිල් ආණ්ඩු ක්‍රමයක් නූතන ක්‍රිස්තියානි ලෝකයෙහි මුල් වතාවට ස්ථාපිත කිරීමේ ගෞරවය රොජර් විලියම්ස් සතු විය නීතිය ඉදිරියෙහි මත ප්‍රකාශනයෙහි සම අයිතිය සියළු දෙනාටම අයිති විය යුතු බව ප්‍රකාශ කරන ලදී." (Bancroft Part 1, ch. 15, l cr. 16). මහේස්ත්‍රාත්-වරයෙකුගේ නිල රාජකාරී වගකීම නම් අපරාධ මැඩපැවැත්වීමට හෝ පිටුදකීමට හෝ ක්‍රියාකාරී වීමය. එහෙත් හෘදය සාක්ෂිය පාලනය කිරීමේ කිසියම් ආකාර හෝ අයිතියක් ඔහු සතු නොවන්නේය. ඔහු මෙසේ පැවසීය: "මනුෂ්‍යයෙකුගෙන් තවත් මනුෂ්‍යයෙකුට ලැබිය යුතු දේ මොනවාදයි මහජනතාවට හෝ මහේස්ත්‍රාත්වරයෙකුට තීරණය කළ හැකි වන්නේය. එහෙත් මනුෂ්‍යයෙකුගෙන් දෙවියන්වහන්සේට ලැබිය යුතු යුතුකම් ගැන තීරණයක් දීමට ඔවුහු වැයම් කරත් නම් එය වනාහි ඔවුන්ට අයිති නැති දෙයකට අත පෙවීමකි. එවන් ක්‍රියාදාමයක ආරක්ෂාවක් තිබීමට නොහැකිය. මහේස්ත්‍රාත්වරයෙක් එක්තරා අදහසක් හෝ විශ්වාසයක් ගැන යම් විනිශ්වයක් අද ප්‍රකාශයට පත්කළ හැකිය. ඒ අතරම, වෙනත් විනිශ්වයක් හෙට ප්‍රකාශයට පත්කළ හැකිය. විවිධ රජවරුන් සහ රැජිණියන් විසින් මෙවන් විනිශ්වයන් එංගලන්තයේදී ප්‍රකාශයට පත්කර ඇත. එසේම රෝමානුවේ පාප්වරුන් විසින්ද එම සමයේ බල මණ්ඩල විසින්ද එවන් පරස්පර තීන්දු ලබා දී ඇති බව ඉතිහාසය සාක්ෂි දරයි. ඉගැන්වීමක් හෝ දහමක් පිළිබඳව එවන් ද්වි-ප්‍රකාර තීන්දු ප්‍රකාශනයකදී එතැන ඉතිරි වන්නේ ව්‍යාකූල වික්ෂිප්ත පැවැත්මක් පමණක්ය." (Martyn, Vol. 5, p. 340).

ස්ථාපිත සභාවෙහි නමස්කාර මෙහෙයන්ට සහභාගි වීම නීතියෙන් අනිවාර්ය විය. නොපැමිණීමට දඩුවමක් වශයෙන් දඩ මුදලක් ගෙවීම හෝ සිරගෙයි ලෑම පැනවිණ. ඉංග්‍රීසි (එංගලන්ත) නීති සංග්‍රහයෙහි එක් වගන්තියක් මගින් දේව මෙහෙයනට සහභාගි වීම බලකරනු ලැබීය. මෙම නීතිය ශාපයකැයි විලියම්ස් තීන්දු කළේය. වෙනත් ඇදහිලි සංග්‍රහයක් ඇති අය සමග එක්වීමට යමෙකුට නීතියෙන් බල කරන්නේ නම් එය එම පුද්ගලයාගේ ස්වභාවික අයිතිවාසිකම් විවෘතව කඩ කිරීමකැයි රොජර් විලියම්ස් කියා සිටියේය. ප්‍රසිද්ධ නමස්කාර මෙහෙයක් සඳහා ආගමික ලැදියාවක් නැති අය සහ අකැමැති අයව බලහත්කාරයෙන් ඒවාට සහභාගි කරවීම වංචාවකි. තමාගේ කැමැත්තට එරෙහිව නමස්කාර මෙහෙයකට සහභාගි වීමට කිසිවෙකුට බල කරනු නොලැබිය යුතු බව විලියම්ස් ප්‍රකාශ කළේය. ඔහුගේ ප්‍රතිපත්ති මාලාව ගැන ඇසූ විරුද්ධවාදීහු මෙසේ ප්‍රශ්න කළහ. "මොනවා! සේවය කරන්නෙකුට ඔහුගේ කුළිය හිමි නැද්ද?" "ඔව්, සේවකයාගෙන්



වැඩගන්නා අයගෙන් ඔහුට හිමි වේතනය ලැබිය යුතුය" යනු රොජර්ගේ පිළිතුර විය." (Bancroft Part 1, Ch. 15, par 2).

බැතිමතුන්ගේ ප්‍රසාදයට සහ ගෞරවයට පාත්‍ර වූ රොජර් විලියම්ස් විශ්වාසවන්ත දේවගැතිවරයෙක් විය. ඉතා දුර්ලභ කුසලතා ඔහු සතුව තිබුණේය. නොනැමෙන්නාවූ අචල ආත්මාභිමානයක් ඔහුට හිමිව තිබිණ. එහෙත් සභා පරිපාලනයෙහිදී සිවිල් මහේස්ත්‍රාත්වරුන්ට අධිකාරී බලයක් ලබා නොදිය යුතුය යන්න ඔහුගේ දැඩි ස්ථාවරය වුවද ආගමික නිදහස ගැනවූ ඔහුගේ මේ ඉල්ලීම් බොහෝ අයගේ නොරිස්සුමට භාජනය විය. මෙම නවක දහම ක්‍රියාත්මක වීම මගින් "දේශයේ රජය සහ මූලික පැවැත්ම විනාශකාරී විපර්යාසයකට ගොදුරු වීම වැලැක්විය නොහැකි ය' යි දේශයේ නායකයෝ බලපෑම් ඇති කළෝය. (Bancroft, Part 1, Ch. 15, l. car 10). විලියම්ස්ව ජනපදයෙන් පිටුවහල් කළ යුතු යයි තීරණය විය. අත්අඩංගුවට පත්වීම මගහරවා ගැනීම් වස් ඔහුට එම ජනපදයෙන් පලායාමට සිදුවිය. ශීත සෘතුවේ හිම කුණාටු තිබියදී නොකපන ලද වනාන්තරයකට පලායාමට ඔහුට සිදුවිය.

"සති දහහතරක් පුරා ශීත සෘතුවේ ඔබ මොබ යමින් ජීවත්වීම සඳහා මහත් සටනක යෙදුණෙමි. පාන් ගෙඩියක් හෝ ඇඳක් කියන්නේ මොනවාද යන්න මට සිහිනයක් විය. එහෙත් වනාන්තරයේදී කපුටෝ මට කෑම ගෙනත් දුන්නා," යයි ඔහු පැවසුවේය. ගසක බෙනයක් බොහෝ අවස්ථාවන්හිදී ඔහුට සෙවන ලබා දුන්නේය." (Martyn Vol. 5, pp. 349, 350). හිම වැටී තිබූ බිම තරණය කරමින්ද අඩි පාරක් පවා නොතිබූ වනාන්තර පසුකරමින්ද ඉදිරියටම ගමන් කළ ඔහුට යථා කාලයේදී ඉන්දියානු ගෝත්‍රික කණ්ඩායමකගේ රැකවරණය ලැබීය. ඔවුන්ට ශුභාරංචියේ සත්‍යතාවන් ඉගැන්වීමට වැයම් කිරීම තුළින් ඔහු එකී ගෝත්‍රිකයන්ගේ විශ්වාසය හා සෙනෙහස දිනාගෙන තිබුණි.

විවිධ තැන්හි සැරිසරමින් අනේක දේශගුණික තත්ත්වයන්ට මුහුණ දෙමින් රොජර් විලියම්ස් තම ගමන අවසන් කරමින් මුහුදු වෙරළක් කරා පැමිණියේය. එම ස්ථානය නැරගාන්සෙට් බේ යයි නම් විය. හෘදය සාක්ෂියට එකභව සෑම පුද්ගලයෙකුටම තමන් කැමති ආගම් ක්‍රමයක් ඇදහීමේ නිදහස ගැන දැඩි ස්ථාවරයක සිටීම නිසා ඔහුව මැසචූසෙට් ජනපදයෙන් පිටුවහල් කරන ලදී. දන් ඔහුගේ විශ්වාසය අනුව ක්‍රියාකිරීමට ජනපදයක් ගොඩනගා ගැනීමට ඒ නව ස්ථානයේදී ඔහු අඩිතාලම දැම්මේය. වර්තමාන කාලයට යෝග්‍ය අයුරින් ආරම්භ කළ මෙම පෙදෙසෙහි පූර්ණ ආගමික නිදහස කෙනෙකුගේ අයිතියක් ලෙස ව්‍යවස්ථාපිත විය. රොජර් විලියම්ස් විසින් පිහිටුවා ගත් කොලනියේ මූලික ප්‍රඥප්තියක් මෙසේ සඳහන් විය. "සෑම මනුෂ්‍යයෙකු-

ටම තමාගේ හෘදය සාක්ෂිය අනුව දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ නිදහස අයිති විය යුතුය" (Martyn, Vol 5, p. 354). ඔහුගේ පුරෝගාමීත්වයෙන් පිහිටුවා ගන්නා ලද කොලනිය වූ රෝඩ් අයිලන්ඩ් පීඩාවට ගොදුරු වූවන්ට ක්ෂේම භූමියක් විය. එහි ජනගහණය වර්ධනය විය, දේශයද සරුසාර විය. එම කොලනියේ පදනම වූ සිවිල් සහ ආගමික නිදහස යන ස්ථාවරය පසුකලෙක අමෙරිකා එක්සත් ජනපදය පිහිටුවීමේදී ඇයගේ ව්‍යවස්ථාවේ මූලික අංගයක් විය.

නිදහස් නිවහල් රාජ්‍යයක් ලෙස ව්‍යවස්ථාදායකයක් පිහිටුවාගත් අමෙරිකාවට පැමිණි පුරෝගාමී ජනපද වාසීන්, තම අයිතිවාසිකම් පදනම් කරගත් නිදහසෙහි ප්‍රකාශනයක් නිකුත් කළහ. එහි මෙසේ සඳහන් වේ. "මෙහි අඩංගු සත්‍යතාවන් අපි විශ්වාස කරන්නෙමු; එනම් සෑම මනුෂ්‍යයෙක්ම සමානකමින් යුතුව මවන ලද බවය. කිසිවෙකුට පැහැරගත නොහැකි අයිතිවාසිකම් මැවුම්කාරයාණන් විසින් මිනිසාට දී තිබේ. එම අයිතීන් අතර ජීවිතය, නිදහස සහ සතුට සොයා යාමද ඇතුළත්ය." ඒ සමගම ව්‍යවස්ථාවට මිනිස් හෘදය සාක්ෂිය කෙළෙසා දැමීමට නොහැකි බවට ඒ දැඩි ක්‍රමවේදය සහතිකයක් ලබාදුන්නේය. "අමෙරිකානු එක්සත් ජනපදයෙහි රාජ තාන්ත්‍රික නිලයක් සඳහා අවශ්‍ය සුදුසුකම් අතරට, ආගමික ඇදහිලි ක්‍රම, සාධකයක් නොවිය යුතු වන්නේය" "යම්කිසි ආගමික ඇදහිලි ක්‍රමයකට, වැඩි වරප්‍රසාදයන් ප්‍රදානය කිරීමට හෝ යම්කිසි ඇදහිලි ක්‍රමයක් නිදහස්ව ක්‍රියාත්මක වීමෙහිදී එයට තහංචි පැනවීමට හෝ අදාලව නීති රීති ගෙන ඒමට ව්‍යවස්ථාවක් පිහිටුවනු නොලැබිය යුතුය."

"දෙවියන්වහන්සේ සමග මනුෂ්‍යයෙකුට ඇති සබඳතාවය මිනිස් නීතියට ඉහළින් තිබිය යුතුය යන සදාතනික ප්‍රඥප්තිය ව්‍යවස්ථාව සැකසූ ප්‍රවීනයන්ගේ අවධානය දිනාගත්තේය. තවද, මිනිසාගේ හෘදය සාක්ෂියේ අයිතිවාසිකම් වෙනත් කවරෙකු හට හෝ උදුරාගත නොහැකි යයි කියාද ව්‍යවස්ථාවට එක් කරනු ලැබීය. මෙම සත්‍යතාව සනාථ කිරීමට හේතු සාධක දැක්වීම අවශ්‍ය නොවීය. අපි හද පත්ලෙන්ම ඒ බව දැන සිටින්නෙමු. මිනිස් නීතිවලට එරෙහිව නැගී සිටිමින් වධ වේදනා සහ ගිනි දැල් විඳ දරාගැනීමට වේදසාක්ෂිකරුවන්ට ශක්තිය ලබා දුන්නේ මෙම විඥානයයි. මිනිස් නීතිවලට වඩා දෙවියන්වහන්සේට වූ තමන්ගේ යුතුකම සහ වගකීම උත්තරීතරය යනු ඔවුන්ගේ කල්පනය විය. තවද, තමන්ගේ හෘදය සාක්ෂියෙහි පිළිගැනීම් වලට ඉහළින් මිනිස් බලපෑම් ක්‍රියාත්මක කළ නොහැකි බව ඔවුන්ගේ විශ්වාසය විය. එය වනාහි මිනිසාගේ සිතෙහි උපතින්ම ස්ථාපිත කරනු ලැබූ ප්‍රඥප්තියකි. කිසිවකට හෝ එය මකා දැමිය නොහැකිය." (Congressional Documents (U.S.A), Serial No: 200, Document No.271).



තමා කරන්නාවූ ස්වකීය සේවාවන්ට නිසි ඵල ලබාගත හැකිවූ ද, තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ක්‍රියාකළ හැකිවූද, දේශයක් ඇත යන සුපුවත යුරෝපයේ රටවල් තුළ ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය; යුද්ධයෙන් හෝ සාගින්නෙන්ද, පීඩා කරන්නන්ගේ තාඩන පීඩනවලින්ද මිදීම ලබාගැනීම සඳහා දහස් ගණන් ජනයා මේ අලුත් ලෝකයට ඇදී ගියහ. අත්ලාන්තික් මුහුදින් එතෙරට පියාසර කරන්නාවූ අයට තම කොලනියට කිසිම බාධාවකින් තොරව ඇතුල් වීමටත් මහජන මුදලින් ඔවුන්ට අතහිත දෙමින් උදව් කිරීමටත් විශේෂ නීතියක් මැසවුසෙට් කොලනියේ නීති පොත්වලට ඇතුළත් කරගන්නා ලදී. කවර හෝ ජාතියක කිතුණු බැතිමතුන්ට මෙම වරම විවෘත විය. "මෙසේ රහසින් හෝ බියෙන් හෝ පැන ආ අයගෙන්ද, පීඩාවට පත්වූවන්ගෙන්ද පොදු කොලනි ජනපදය නිර්මාණ විය. (Martyn, Vol. 5, p. 417). වන්දනාකාර පියවරුන් ප්ලිමත් වෙරළාසන්නව ප්‍රථම ජනපදය පිහිටුවා ගැනීමෙන් වසර විස්සක් ගතවූ විට වන්දනාකරුවෝ දහස් ගණනින් පැමිණ නව එංගලන්තයෙහි වාසස්ථාන පිහිටුවා ගත්හ.

තමන්ගේ අපේක්ෂිත අරමුණ අත්පත් කරගැනීම සඳහා ඔවුහු වෙහෙස මහන්සි වී වැඩ කරමින්ද අරපිරිමැස්මෙන් යුතු ජීවිත ගත කරමින්ද ජීවිතයට අත්‍යාවශ්‍ය දේ පමණක් ලබාගැනීමෙන්ද සෑහීමට පත්වූහ. තමන්ගේ ශ්‍රමයට ප්‍රමාණවත් ලාභයක් ලැබීම පමණක් ඔවුහු භූමියෙන් අපේක්ෂා කළෝය. ස්වර්ණමය දර්ශනයකින් මුළාවට පත්වීමට ඔවුහු උත්සාහ නොකළෝය.... තමන්ගේ සමාජීය ආණ්ඩු ක්‍රමයෙහි ඉතා මන්දගාමී එහෙත් තිරසාර ගමන කෙරෙහි ඔවුහු සෑහීමට පත්වූහ. පාළුකරයේ පැවැති දුක් ගැහැට ඉවසිලිමත්ව විඳ දරාගත් ඔවුහු තමන්ගේ නිදහස නැමැති වෘක්ෂයට තමන්ගේම කඳුළින්ද, දහඩියෙන්ද ජලය ලබා දුන්නෝය. එම ගසෙහි මුල් පොළෝ ගැබ තුළටද, වටපිටාව තුළටද, සිසාරා යමින් ශක්තිමත් වන තෙක් ඔවුහු ඒකාග්‍රතාවකින් යුතුව ක්‍රියා කළෝය.

ඇදහිල්ලෙහි පදනම ලෙසද, ප්‍රඥවෙහි උල්පත ලෙසද. නිදහසෙහි බලපත්‍රය ලෙසද, ශුද්ධ බයිබලය පිළිගන්නා ලදී. ශුද්ධ බයිබලයෙහි අඩංගු ප්‍රඥප්ති නිවසෙහිදීද, පාසැලෙහිදීද, පල්ලියේදීද මහත් උනන්දුවකින් යුතුව උගන්වන ලදී. එහි ප්‍රතිඵලය සමාජය තුළ දැකගැනීමට හැකිවිය. එමගින් මිනිසා තුළ හැඩගැසුණාවූ සැකසුරුවම, බුද්ධිය, සාරධර්ම සහ අමද්‍යපය සමාජය පෝෂණය කළේය. පියුරිටන් ජනපද තුළ වසර ගණනාවක් පුරා ජීවිතය ගත කළ අතර, ඔවුන්ට බේබද්දෙකු දැකගැනීමටවත්, දිව්රන්නෙකු සම්මුඛ වීමටවත්, සිඟන්නෙකු මුණගැසීමටවත් අවස්ථාවක් නොලැබී යන්නට පුළුවන් විය." (Bencroft, Part. 1, Ch. 19. l. c. ar. 25). ජාතික අභිමානයේ ශ්‍රේෂ්ඨත්වය ආරක්ෂා කරන්නාවූ රැකවරණය වූයේ බයිබලයේ ප්‍රඥප්ති බව කදිමට තහවුරු

විය. තැනින් තැන පිහිටි බෙලහීන කොලනි ඒකාබද්ධ වී බලවත් ජනපද සන්ධානයක් බිහි විය. පාප්වරයෙකු නැති සභාවක සහ රජ කෙනෙකු නැති රජයක පැවති සාමය හා සඵලත්වය දෙස ලෝකයා බලා සිටියේ විශ්මිතවය.

අමෙරිකානු වෙරළබඩ පෙදෙස් කරා පැමිණෙන්නාවූ සංක්‍රමණික යන්ගේ සංඛ්‍යාව දිගින් දිගටම වර්ධනය වෙමින් පැවැතියේය. මුල් කාලවලදී පැමිණි වන්දනාකරුවන්ගේ අරමුණට වඩා වෙනත් බලාපොරොත්තු ඇතිව මෙම සංක්‍රමිකයෝ පැමිණියෝය. දේශය තුළ ආරම්භයේදීම රෝපණය කරනු ලැබූ පෞරාණික ඇදහිල්ල සහ ශුද්ධවන්ත සාරධර්ම මගින් පුළුල්වූ මිනිස් ජීවිත හැඩ ගැස්වීමේ අනුබලයක් තිබුණද එය කෙමෙන් කෙමෙන් හීන වන්නට විය. මක්නිසාදයත්, නවක සංක්‍රමිකයන්ගේ අභිමතාර්ථයන් සහ අරමුණු ලෞකික උන්නතිය කෙරෙහි නැඹුරු වී තිබීම එයට හේතුකාරක විය.

මුල්ම වන්දනාකරුවෝ තම ජනපදයන්හි පරිපාලන ව්‍යුහය සඳහා නීතිරීති සකස්කර ගත්තෝය. පාලන මණ්ඩලයට නිලධාරීන් තෝරා ගැනීමේදී ඒ සඳහා ඡන්දය දීමේ අයිතිය දේවස්ථානයේ සාමාජිකයන්ට පමණක් සීමා විය. තවද, රජයේ නිලධාරීන් තෝරා ගැනීමේදීද සභා සාමාජිකත්වය තිබීම අනිවාර්ය විය. එම ප්‍රතිපත්තිමය ක්‍රමවේදය විනාශකාරී ප්‍රතිඵල උදා කළේය. මෙම ක්‍රමවේදය පිළිගනු ලැබුවේ දේශය තුළ ශුද්ධ පවිත්‍රතාවය රඳවා ගැනීමේ අරමුණින් වුවද, එමගින් සිදුවුණේ සභාව දූෂ්‍ය වීම පමණකි. ඡන්ද බලයට හිමිකම් කීමට මෙන්ම රජයේ සේවය කිරීමටද දේවස්ථානයේ සාමාජිකත්වය තිබීම අනිවාර්ය වූ නිසාම නාමිකව ක්‍රිස්තියානිකාරයන් වූ අයගේ ගණන සුළුපටු නොවීය. සභාවේ සාමාජිකත්වය ලැබූ බහුතරයක් හදවතින් ක්‍රිස්තුස්වහන්සේව පිළිනොගත්තෝය. කිතුණු ජීවිත රටාවකට ඔවුන්ගේ නැඹුරුවීමක් නොවීය. සාමාජිකත්වය ලැබූ අය තුළ හදවතින් නැගී ආ වෙනස් වීමක් නොවීය. උදාවූ තත්ත්වය තවත් සංකීර්ණ විය. පූජ්‍ය පක්ෂයේ අය පවා සම්පූර්ණයෙන්ම සමයානුකූල හැරීමකට හිමිකම් නොකීහ. ඔවුන්ගේ විශ්වාස කිරීම් තුළ වැරැදි දහම් අඩංගු විය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ නව ප්‍රාණයක් දීමේ බලය පිළිබඳව ඔවුන් තුළ දැනුමක්ද නොවීය. මෙයින් සිදුවූ ප්‍රතිඵල ඉතා භයානක විය. කොන්ස්තන්තීනුගේ දවස පටන් වර්තමානය දක්වා වූ සභා ඉතිහාසය මෙවන් දූෂණයන්ගෙන් ගහණ වී ඇත. රජයේ ආධාර ඇතිව සභාව ප්‍රවර්ධනය කිරීමට වූ වෑයම සෑම කලෙකම දකගන්නට පුළුවන. ශුභාරංචිය ප්‍රචලිත කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාගැනීමට වෑයම් කිරීම මෙසේ එක යුගයකට පමණක් සීමාවූවක් නොවීය. ශුභාරංචිය ප්‍රකාශ කළ තැනැන්වහන්සේ පැවැසුවේ, "මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ" කියාය. (යොහන් 18:36). රජය



සහ සභාව එකමුතු වීමෙන් සෙතක් සැලසේ යයි පෙනී යන නමුත්, යථාර්ථව සිදුවන්නේ ලෝකය සභාවට සමීප වීම නොව, සභාව ලෝකයට සමීප වීමය.

රොබින්සන් සහ රොජර් විලියම්ස් යන පුරෝගාමීන් පිහිටා සිටි ප්‍රඥප්තියක් විය. එනම්, සත්‍යතාවය වනාහි වර්ධනය වන්නාවූ පද්ධතියකි. දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනයෙන් විකාශනය වන්නාවූ සෑම ආලෝක දහරාවක්ම පිළිගැනීමට ක්‍රිස්තු භක්තිකයන් සූදානමින් සිටිය යුතු යනු පුරෝගාමීන්ගේ කල්පිතය විය. එහෙත් පසු පරම්පරාවල අයගේ දසුනින් මෙම කල්පිතය ගිලිහී ගියේය. අමෙරිකාවේ මෙන්ම යුරෝපයේ ප්‍රොතැස්තන්ත සභාවන්ද ප්‍රතිසංස්කරණයේ ආශිර්වාද ලබාගැනීමට මහත් උනන්දුවක් දක්වුවද එම ප්‍රතිසංස්කරණ මාර්ගයේ ඉදිරියට යාමට එවන් උනන්දුවක් තිබුණේ නැත. කලින් කලට ස්වල්ප දෙනෙක් නැගිට අළුත් සත්‍යතාවන් ඉදිරිපත් කළෝය. සභා සාමාජිකයන් බොහෝ කලක් විශ්වාස කළ වැරැදි ඉගැන්වීම් ඔවුහු එළිදරව් කළෝය. එහෙත් ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේ සිටි යුදෙව්වන් මෙන්ද ලූතර්ගේ කාලයේ සිටි පාප් සමයවාදී කිතුණුවන් මෙන්ද අමෙරිකාවේ දිවි ගෙවූ, පසු පරම්පරාවල අය තමන්ගේ ආදී මුතුන් මිත්තන් මෙන්ම ගතානුගතික සම්ප්‍රදායන් විශ්වාස කළෝය. ඔවුන් දිවි ගෙවූ ආකාරයෙන්ම ජීවත් වීමෙන් ඔව්හු සෑහීමට පත්වූහ. මෙසේ, ආගම නැවත වරක් අභ්‍යන්තර ගුණධර්ම වගාවට වෑයමක් නොදරා, බාහිර චාරිත්‍ර විධීන්ට ගැති වන්නට විය. ආගමේ වැටීයාමක් නැවත වරක් උදා විය. දෙවියන්වහන්සේගේ වචනයෙහි ආලෝකය අනුව සභාව ඉදිරියට ගමන් කරමින් ක්‍රියා කළේ නම් වරක් ඉවත දමූ වැරැදි සහ මිසදෙටු ඇදහිලි ක්‍රම සදහටම සභාවෙන් තුරන් වී යනවා ඇත. එහෙත් ජනපදවල දිවි ගෙවූ නවක පරම්පරාව පැරණි ඇදහිලි ක්‍රම සහ මිසදෙටු දහම් නැවතත් වැළඳ ගනිමින් ඒවා අගය කරන්නට වූහ. පුනරුදය මගින් ආනුභාවය ගෙන දුන් ආත්මය ක්‍රම ක්‍රමයෙන් නැතිවී ගියේය. ලූතර්ගේ කාලයේදී රෝමානු සභාව තුළ ප්‍රතිසංස්කරණයක් ඇතිවීම අත්‍යාවශ්‍ය භූමිකාවක් වූ ලෙසම මෙම වකවානුවේදීද ඉතා ප්‍රබල සහ ව්‍යාප්ත ප්‍රතිසංස්කරණයක් ප්‍රොතැස්තන්ත සභාවන් තුළ ඇති වීම ඉතා අවශ්‍යව තිබුණේය. ලූතර්ගේ යුගයේදී පැවැති අයුරින්ම මෙම වකවානුවේදී ද ලෞකිකත්වයක් සහ ආත්මික පසුබැසීමක් සභාව ගිල ගනිමින් තිබුණේය. මිනිස් මතවාදයකට ගරු කිරීමක්ද දෙවියන්වහන්සේගේ වචනයෙහි ඉගැන්වීම් වෙනුවට මිනිස් කාල්පනිකයන් සහ සිද්ධාන්ත ආදේශ කිරීමක්ද නැවත වරක් සභාව වෙළා ගත්තේය.

දහනව වන සියවසේ මුල් භාගයේදී ශුද්ධ බයිබලය ඉතා සීඝ්‍රයෙන් ලොව පුරා අලෙවි වන්නට විය. එමගින් ලෝකය මත ඉතා ප්‍රබල

ආලෝකයක් පතිත විය. නමුත් එම ක්‍රියාවේදයන්ට සමගාමීව එළිදරව් කරනු ලැබූ ආලෝකය බෙදා හැරීමක් සිදු නොවීය. නව ආලෝකය අත්හදා බැලීමක්ද සිදු නොවීය. දෙවියන්වහන්සේගේ වචනය මිනිසා අතට පත්වීම වලකාලීමට සාතන් විසින් ගත් උත්සාහය දන් බිඳ වැටෙමින් තිබුණේය. මිනිසුන්ට දේව වචනයේ පිටපත් තමන් සතු කරගැනීමේ භාග්‍යය උදා වී තිබුණේය. එහෙත් තමන්ගේ අරමුණ සාර්ථක කරගැනීම් වස් සාතන් ක්‍රියාත්මක වෙමින් දේව වචනය ඉතා අඩු තත්ත්වයකින් සැලකීමට ඔහු බොහෝ අයට මගපෙන්වීය. ශුද්ධ ලියවිලි ගවේෂණය කරමින් අධ්‍යයනය කිරීමට මිනිසුන් තුළ උදාසීනකමක් පැතිර ගියේය. එම නිසාම බයිබල් ඉගැන්වීම්වලට ව්‍යාජ අර්ථකථන ලබාදීමට මඟ පැදුණේය. බයිබලය මත පදනම් නොවූ දහම් සතුටින් පිළිගැනීමට මිනිස්සු පෙළඹුණාහ.

වධහිංසා පැමිණවීමෙන් සත්‍යතාව මැඩ පැවැත්වීමට වූ තම වෑයම අසාර්ථක බව වටහාගත් සාතන් අන්‍යෝන්‍ය පාවාදීම් මගින් මධ්‍යම ප්‍රතිපදාවකට යාමට මිනිසුන්ව පෙළඹවීය. සත්‍යයෙන් ඉවත්ව යාමටද රෝම සභාව පිහිටුවනු ලැබීමටද මගපෙන්වූයේද මේ ක්‍රියාදාමයය. ඔහු ක්‍රිස්තු භක්තිකයන්ට දන් මගපෙන්වූයේ මිථ්‍යාදෘෂ්ටීන් හා සම්බන්ධ වීමට නොව, මේ ලෝකයේ දේවලට ඇලුම් වූ අයවලුන් හා සම්බන්ධ වීමටය. කැටයම් කර නෙළා ගත් රූප සහ පිළිම වන්දනාව මෙන්ම ලෝක දහමට නමස්කාර කිරීම එකම තලයේ වරදක් වන්නේය. පෙර යුගයන්හි තිබූ විනාශකාරී තත්ත්වය මෙන්ම නව උදාවද එයාකාරයෙන්ම විනාශදායක විය. ආගමේ සඵලත්වය මේ යයි ප්‍රකාශ කරමින් උඩඟුකම, අභිමානය සහ සැප සම්පතින් යුතු සුඛෝපභෝගිත්වය දිවි රටාවක් බවට පත්විය. සභාවන්ද මෙයින් දූෂ්‍ය වූවෝය. බයිබලීය දහම් විකෘති කිරීමේ සාතන්ගේ වෑයම අඛණ්ඩව දිගටම පැවතිණ. දස දහස් ගණන් බැතිමතුන්ගේ විනාශය තීන්දු කරන්නාවූ සම්ප්‍රදායික ගතානුගතික ක්‍රමවේදයන් සභාව තුළ මුල් ඇදෙමින් ගැඹුරට කිඳා බසින්නට විය. ශුද්ධවන්තයින්ට වරක් ලබා දුන් ඇදහිල්ල ආරක්ෂා කරගෙන එය පෝෂණය කරනවා වෙනුවට සභාව මෙම සම්ප්‍රදායික වත් පිළිවෙත් රැකගැනීමටත් ඒවාට ප්‍රමුඛ ස්ථානය දීමටත් වෑයම් කළාය. ප්‍රතිසංස්කාරක පුරෝගාමීන් විසින් මහත් හිංසා පීඩා මැද ලොවට හඳුන්වා දුන් ප්‍රතිසංස්කෘත දහම් වේදය මෙයාකාරයෙන් අවමානයට ලක් කරන ලදී.



# 17

## අරුණෝදයෙහි පෙරමග සිටි දූතයෝ

අනාගතය පිළිබඳව පැහැදිලිවූද, සුවිශේෂ වූද සත්‍ය සිදුවීම් පවසන්නාවූ ශුද්ධවූ බයිබලයෙහි ප්‍රකාශ වී ඇති ගාම්භීර තේජාන්විත සත්‍යයක් වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊම පිළිබඳව ඇත්තාවූ සත්‍යයයි. දේව ජනතාව දිගු කාලයක් පුරා "මරණ සෙවන මිටියාවතෙහි සෙවනැලි යටතේ" වන්දනාකරුවන් ලෙස මෙලොව සැරිසරමින් කල්ගත කර ඇත. එහෙත් ඔවුන්ට ඉතා මිහිරි, සිත් සතන් ප්‍රීතියෙන් උද්දාමයට පත් කරන්නාවූ බලාපොරොත්තුවක් දානය කර තිබේ. එනම් "ජීවනය සහ නැවත නැගිටීමේ" කතුවරයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ නැවත වරක් මෙලොව වෙත පැමිණෙන බවය. පළමුවන යුවළ ඒදන් උයනෙන් පිටමං කරනු ලැබූ තැන පටන් සිටින්නාවූ ඇදහිලිවන්ත ජනතාව එක්රැස් කර ගෙන ගෙදර රැගෙන යෑමේ කාර්යය එවිට ඉටුවන බවට උන්වහන්සේ දේව ජනතාවට බලාපොරොත්තුවේ පොරොන්දුවක් දෙවා වදාළ සේක. ශුද්ධ වූ ලියවිල්ලෙහි ඇතුළත් මූලික තේමාව නම් දෙවෙනි පැමිණීමේ මූලධර්මයයි. අපගේ මුල් දෙමාපිය යුවල ඒදන් උයනෙන් ඉවතට යවනු ලැබීමේ ශෝචනීය දවසේ පටන් ඇදහිල්ලේ දරුවෝ නැවත වරක් පාරාදීසය හිමිවන්නාවූ දවස මහත් උපේක්ෂාවෙන් යුතුව බලා සිටියෝය. විනාශයෙහි අධිපතියාගේ බල පුළුවන්කාරකම් විනාශ කිරීමට හැකියාවක් ඇති තැනැන්වහන්සේගේ පැමිණීම සැමගේ බලාපොරොත්තුව විය. තමන්ගේ බලාපොරොත්තුව සම්පූර්ණ වන දවස දෙස එනම් මෙසියස්වහන්සේගේ තේජස්ශ්‍රීය මෙලෝ පහළ වීම කෙරෙහි, ඉතිහාසය පුරා දිවි ගෙවූ ශුද්ධ මනුෂ්‍යයෝ ආශාවෙන් බලා සිටියෝය. ඒදන් උයනෙහි දිවි ගෙවීමට වරම් ලැබූ ආදම් පටන් හත්වෙනියාවූ ඒනොක් හට මතු එන්නාවූ ගැළවුම්කාරයාණන්ගේ පැමිණීම දසුනින් දකගැනීමට අවස්ථාවක් ලබාදෙන ලදී. මෙලොව දිවි ගෙවූ කාලයේ වසර තුන්සියය පුරා ඔහු දෙවියන්වහන්සේ සමග හැසුරුණේය. ඔහු මෙවන් අනාවැකියක් වදාළේය. "බලව, සියල්ලන් කෙරෙහි යුක්තිය ඉෂ්ට කරන්ටද ... ස්වාමින්වහන්සේ ස්වකීය දස දහස් ගණන් ශුද්ධවන්තයන් සමග" එන බව ඔහු පැවසුවේය. (යූදස් 14,15). වේදනාවෙන් මඩිනු ලැබ සිටි ආදී පිතෘවරයෙකු වූ යෝබ් එකී අත්දැකීම් තුළින් ගමන් කරන්නාවූ රාත්‍රී සමයේදී අචල විශ්වාසයකින් යුතුව ගැළවුම්කාරයාණන් ගැන මෙසේ ප්‍රකාශ කළේය. "මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද, අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි. .... මමම උන්වහන්සේ දකින්නෙමි. අන්‍යයෙක් නොව, මගේම ඇස් උන්වහන්සේ දකින්නේය." (යෝබ් 19:25-27).

ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමත් සමගම ධර්මිෂ්ඨ රාජ්‍ය සමයක් පිහිටුවනු ලබන බව ශුද්ධ ලියවිලි රචකයන් නැවත නැවතත් ප්‍රකාශ කර ඇත. විවිධාකාර දිවැසිවරු මෙම උදාර සිදුවීම ගැන ප්‍රීතියෙන් යුතුව වර්ණනා කර ඇත. කවියන් එම සංසිද්ධිය වර්ණනා කර ඇත්තේ ඉතා උදාර පද රචනයෙනි. ඊශ්‍රායෙල් රජතුමාණන්ගේ බලපරාක්‍රමය දක්වමින් ගීතිකා රචකයා කාව්‍යාලංකාර බසින් ප්‍රශස්ත ගී වැනුම් මෙසේ නිර්මාණ කර ඇත. "අලංකාරයේ සම්පූර්ණත්වයවූ සියොන්හි සිට දෙවියන්වහන්සේ බැබලූ සේක. අපේ දෙවියන්වහන්සේ වඩින සේක, නිශ්ශබ්ද නොවන සේක. උන්වහන්සේ තමන්ගේ සෙනඟ විනිශ්චය කරන පිණිස ඉහළ අහසටත්, පෘථිවියටත් හඬ ගසන සේක." (ගීතාවලිය 50:2-4) ... "ආකාශය සන්තෝෂ වේවා, පොළොව ප්‍රීති වේවා ... මක්නිසාද උන්වහන්සේ එන සේක. පොළොව විනිශ්චය කරන පිණිස එනසේක. උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් පොළොවද, ස්වකීය සැබෑකමින් මනුෂ්‍ය වර්ගයන්ද විනිශ්චය කරන සේක." (ගීතාවලිය 96:11,13).

'යෙසායා අනාගතවක්තෘවරයා මෙසේ පවසා ඇත: "ධූලියෙහි වසන්නෙනි, පිබිදී ගී කියන්න. මක්නිසාද ඔබගේ පිනි පලා ජාතිවල පිනි මෙන්ය, පොළොව හා මළවුන් පිට ඔබ ඒවා බසින්ට සලස්වන සේක." "ඔබගේ මළාහු ජීවත්වන්නෝය. මාගේ මළකඳන් නැගිටිනවා ඇත." (යෙසායා 26:19) "උන්වහන්සේ මරණය සදාකාලයටම ගිල දමූසේක. ස්වාමිවූ දෙවියන්වහන්සේ සියලු මුහුණුවලින් කඳුළු පිසදමන සේක. මක්නිසාද ස්වාමින්වහන්සේ ඒක කීසේක. ඒ දවසෙහි මෙසේ කියනු ලබන්නේය. බලව, මේ අපේ දෙවියන්වහන්සේය, අපි උන්වහන්සේ ගැන බලා සිටියෙමුව. උන්වහන්සේ අප ගළවන සේක." (යෙසායා 25:8,9).

දර්ශනයක වෙලී සිටි හබක්කුක් ගැළවුම්කාරයාණන්ගේ පැමිණීම දැක මෙසේ විස්තර කළේය. "දෙවියන්වහන්සේ තේමාන් සිටද, ශුද්ධ තැනැන්වහන්සේ පාරාන් කන්දේ සිටද එනසේක. උන්වහන්සේගේ මහිමය ස්වර්ගය වසා ගත්තේය, පොළොවද උන්වහන්සේගේ ප්‍රශංසාවෙන් පිරුණේය. උන්වහන්සේගේ දීප්තිය එළිය මෙන් විය" (හබක්කුක් 3:3). "උන්වහන්සේ සිට, පොළොව සෙළවූසේක; උන්වහන්සේ බලා ජාතීන් වෙවුලෙවූ සේක. සදාකාල කඳු විසුරුණේය. පුරාණ හෙල්ද නැමුණේය. උන්වහන්සේගේ ගමන් පුරාණෙහි මෙන් විය. " ඔබගේ අසුන් පිටද ගැළවීම නමැති ඔබගේ රථවලද ඔබ නැගී ගියේ"ය. "කඳු ඔබ දැක භය වූය; ජල ධාරාව වැගුරුණේය. ගැඹුර සිය හඬ පවත්වා සිය අත් ඉහළ එසවිය." "විහිදුණු ඔබගේ ඊගස්වල එළියටත් ඔබගේ දිලිසෙන සෙල්ලයේ දීප්තිමත්කමටත් ඉර සඳ ඒවායේ විමානවල නැවතී සිටියෝය." "ඔබගේ සෙනඟගේ ....



ගැළවීමටත් ඔබ පිටත්ව ගොස් ....ඇරියසේක." (හබක්කුක් 3:6,8,10,11,13)

ගැළවුම්කාරයාණන්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන්ගෙන් වෙන්වී යාමේ කාලය ළංවූ විට උන්වහන්සේ තමා නැවත ඔවුන් වෙතට පැමිණෙන බව පවසමින් ඔවුන්ගේ කණගාටුවේදී ඔවුන් මෙසේ සැනසූ සේක.: "නුඹලාගේ සිත් නොකැළඹේවා. .... මාගේ පියාණන්-වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය .... නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරමි නම් .... මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි." (යොහන් 14:1-3) "මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග තමන්ගේ තේජසින් එන කළ ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳිනසේක. එවිට සියලු ජාතීහු උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලබන්නෝය." (මතෙව් 25:31,32).

ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට නැගුණාට පසුව ඔලීව කන්ද මත මඳ වේලාවක් සිටියාවූ දේවදූතයෝ, උන්වහන්සේ තමාගේ නැවත පැමිණීම ගැන ගෝලයන්ට දුන්නාවූ පොරොන්දුව නැවත මෙසේ පැවසූහ: "නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාගනු ලැබූ මේ යේසුස්-වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇත." (ක්‍රියා 1:11) අපෝස්තුළු පාවුල් තුමාද දේවානුභාවයේ මගපෙන්වීම අනුව මෙසේ පැවසුවේය: "ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක. (1 තෙසලෝනික 4:16) පත්මොස්හි සිටි දිවැසිවරයාද මෙසේ පැවසුවේය: "බලන්න, උන්වහන්සේ වළාකුල් වලින් එනසේක. සියලු ඇස්ද .... උන්වහන්සේව දකින්නෝය." (එළිදරව් 1:7).

"දෙවියන්වහන්සේ ලෝකයේ පටන්ගැන්මේ සිට තමන්ගේ ශුද්ධවූ අනාගතවක්තෘවරුන්ගේ මුඛයෙන් කියෙවුවාවූ සියලු දේ නැවත පිහිටුවන්නාවූ කාලවල් දක්වා" උන්වහන්සේගේ තේජාන්විත පොරොන්දු රඳා පවතියි. (ක්‍රියා 3:21) එකල්හි දිගු කාලයක් පුරා පැවැති නපුරු පාලනය නිමාවක් දකිනවා ඇත. "එවිට ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම් කරන සේක." (එළිදරව් 11:16). "එවිට ස්වාමින්වහන්සේගේ තේජස ප්‍රකාශ වන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය." (යෙසායා 40:5). "ස්වාමිවූ දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම සහ ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියෙහි හටගන්වනවා ඇත." (යෙසායා 61:11) "ඒ දවසෙහි සේනාවල ස්වාමින්වහන්සේ තමන්ගේ ඉතිරි සෙනඟට අලංකාර ඔටුන්නක්ද දීප්තිමත් කිරීටයක්ද" වනසේක. (යෙසායා 28:5)

එකල්හි දිගු කලක් මහත් බලාපොරොත්තුවෙන් බලා සිටි මෙසියස්-වහන්සේගේ සමාදානයේ රාජ්‍යය විශ්වයෙහි, ස්ථාපිත කරනු ලබන්නේය. "ස්වාමින්වහන්සේ සියොන් සැනසූ සේක. උන්වහන්සේ ඇගේ සියලු නටබුන් තැන් සනසා ඇගේ වනාන්තරය ඒදන් මෙන්ද, ඇගේ කාන්තාරය ස්වාමින්වහන්සේගේ උයන මෙන්ද කළසේක." (යෙසායා 51:3) "ලෙබනොන්හි තේජසත් කර්මෙල් හා ෂාරොන්හි අලංකාරකමත් ඊට දෙනු ලබන්නේය." (යෙසායා 35:2). "නුඹ අත්හරින ලද්දී යයි තවත් කියනු නොලබන්නෙහිය, නුඹේ දේශයට පාළු යයි තවත් නොකියන්නෝය. නුඹ හෙප්සිබා කියාද නුඹේ දේශය බෙයුලා කියාද කියනු ලබන්නේය. ස්වාමින්වහන්සේ නුඹ කෙරෙහි ප්‍රසන්නය." "මනමාලයා මනමාලී කෙරෙහි ප්‍රීතිවන්නාක් මෙන් නුඹේ දෙවියන්-වහන්සේ නුඹ කෙරෙහි ප්‍රීතිවනසේක. (යෙසායා 62:4,5)

සෑම යුගයකම දිවි ගෙවූ දෙවියන්වහන්සේගේ සත්‍යවාදී අනුගාමික- යන්ගේ බලාපොරොත්තුව වූයේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි පැමිණීමය. ඔලීව කන්ද මස්තකයේ සිට ක්‍රිස්තුස්වහන්සේ තමන් ගෝලයන්ට ලබාදුන් පොරොන්දුව ඔවුන්ගේ සිත් සතන් ප්‍රබෝධමත් කිරීමට සමත් විය. තමන්වහන්සේ නැවත වරක් පැමිණෙන බවට දුන් ඒ පොරොන්දුව ගෝලයන්ගේ අනාගතය ආලෝකමත් කරමින්, බලා -පොරොත්තු රඳවමින් ක්‍රියාත්මක වූ නිසා ශෝකයට, එම ප්‍රීතිය සහ සතුට නිවා දැමීමට නොහැකි විය, පරීක්ෂාවනට එය අඳුරු කිරීමට නොහැකි විය. වධහිංසා සහ දුක් වේදනා මධ්‍යයේ ඒ සියල්ල විඳ දරාගෙන, "මහෝත්තම දෙවියන්වහන්සේගේද අපගේ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම" කෙරෙහි බලාසිටීම මේ සැමගේ "ආශිර්වාදලත් බලාපොරොත්තුව" විය. ස්වාමීන්-වහන්සේගේ පැමිණීම තමන්ගේ ජීවිත කාලය තුළදී සිදුවෙනවා ඇතැයි තෙසලෝනියෙහි විසූ කිතුණුවෝ අපේක්ෂා කළෝය. ඔවුන් අතර ජීවත් වූ අයෙක් මරණයට පත්වූ විට භූමදාන කිරීමේදී මෙම කිතුණු ජන කොටසෙහි සාමාජිකයන්ට මහත් දුක් වේදනාවක් දැනී යන්නට විය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම බලා සිටි අය මිය යාම ශෝචනීය අත්දැකීමක් විය. ඔවුන්ව සැනසීමට ක්‍රියා කළ පාවුල් ගැළවුම්-කාරයාණන් දෙවෙනි වර පැමිණෙන විට, සිදුවන්නාවූ මළවුන්ගෙන් නැගිටීම කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කළේය. එම සංසිද්ධියේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය නැගිටින්නෝය. ජීවත්ව සිටින්නාවූ සැදැහැවතුන් සමග ඔවුන්ද එක්ව සමිඳාණන් මුණගැසීම පිණිස අහසට ඔසවා ගනු ලැබෙති. "මෙසේ අපි නිතරම ස්වාමීන් සමග සිටින්නෙමු" යයි පාවුල් සැමට අවධාරණය කරයි. "මේ වචන වලින් එකිනෙකා සනසාගන්න" යැයි ඔහු සැමට අනුශාසනා කරයි. 1 තෙසලෝනික 4:16-18.



පත්මොස් දිවයිනේ දඬුවම් කාලය ගත කරමින් සිටියාවූ, යේසුස්වහන්සේ වඩාත් ආදරය කළ ගෝලයාට, පොරොන්දුවේ මෙම වදන් ශ්‍රවණය කරන්නට අවස්ථාව උදා විය. "සැබවින්ම මම ඉක්මණින් එමි"යි ඔහුට පවසන ලදී. එයට ප්‍රතිචාරය දක්වමින් "ආමෙන්. ස්වාමිවූ යේසුස්වහන්ස වැඩිය මැනව!" කියා යොහන් තම අපේක්ෂාව සපථ කළේය.

මෙම අපේක්ෂාව සෑම යුගයකම සිටි භක්තිමත් කිතුණු වන්දනාකරුවන්ගේ එකම පැතුම විය. සත්‍යතාව උදෙසා සාක්ෂි දරූ ශුද්ධවන්තයන්ගේ සහ වේද සාක්ෂිකරුවන්ගේ බලාපොරොත්තුව රැඳී පැවැතියේ මෙම සිදුවීම කෙරෙහිය. බිම් ගෙවල සහ උමං ගෙවල සිටද, ගිනි කුළු සහ පෝරකවල සිටද, මෙම උපේක්ෂා හඬ නද දුන්නේ, මරණය ඉදිරියෙහි පවා තම විශ්වාසය පාවා නුදුන් සැදැහැවතුන්ගේ මුවිනි. මේ පිළිබඳව එක් කිතුණු බැතිමතෙක් මෙවන් ප්‍රකාශනයක් කර තිබුණේය. "ක්‍රිස්තුස්වහන්සේ පුද්ගලීකව මළවුන්ගෙන් නැගිටි බවට ලබාදී තිබූ සහතිකයත්, උන්වහන්සේ නැවත පැමිණෙන විට තමා මළවුන්ගෙන් නැගිටින බවට වූ විශ්වාසයත් නිසා ඇදහිලිවන්තයෝ මරණයට මුහුණ දීමට බිය නොවූවෝය. ඔවුන්ගේ චින්තනය මරණයට වඩා ඉහළ තලයක ස්ථාපිත වී තිබුණේය." (Taylor, Daniel T, "The Reign of Christ on Earth; or The Voice of the Church in All Ages," p. 33). ඔවුන් මිනී වළ වෙත කැමැත්තෙන්ම ඇතුළු වුණේ, "නිදහස් ලෙස මරණින් නැගිටීමටය." "ස්වකීය පියාණන්-වහන්සේගේ මහිමාන්විත තේජස්ශ්‍රීයෙන් යුතුව, යේසු සමිඳාණන් සගයේ සිට වළාකුළු මත වඩිනු දැකීම" කිතුණුවන්ගේ පැතුම සහ බලාපොරොත්තුව විය. උන්වහන්සේ දැහැමි අය සඳහා රාජ්‍යයක් පිහිටුවනවා දැකීම ඔවුන්ගේ අභිලාෂය විය. "වොල්ඩන්සියන්වරුද මෙම විශ්වාසයම අගය කළෝය. ගැළවුම්කාරයාණන්ගේ නැවත පැමිණීම ක්‍රිස්තියානි සභාවේ බලාපොරොත්තුව බව වික්ලිෆ් ප්‍රකාශ කළේය. (Taylor, The Voice of the Church," pp. 54; 129-132; 132-134).

මෙම විෂය සම්බන්ධයෙන් ලූතර් මෙසේ පැවසීය. "තවත් වසර තුන්සියයක් ගතවෙන්නට පෙර දෙවියන්වහන්සේගේ විනිශ්චය ක්‍රියාත්මක විය යුතු බව මාගේ කල්පිතය වන්නේය. එයට වඩා දිග කාලයක් මෙම දූෂිත ලෝකය පැවැතීමට ඉඩ දෙන්නට දෙවියන්වහන්සේට හැකියාවක් නැත. උන්වහන්සේ එසේ කරන්නේද නැත. මෙම පිළිකුල් අවකල් රාජධානිය විනාශ කර දමන්නාවූ සුවිශේෂ දවස උදාවීමට ඇත්තේ දිගු කාලයක් නොවන්නේය." (Taylor, "The Voice of the Church," pp. 158, 134).

මහළු වියට පත්ව ඇති මේ ලෝකයේ අවසානයට වැඩි කාලයක් නොමැතයි මෙලැන්ක්තන් පැවසීය. කැල්වින්ගෙන් කිතුණුවන්ට ලැබුණාවූ අනුශාසනාව වූයේ "සියළු සිද්ධීන්ගේ ඉතාම ශුභදායක වූ නිමිත්ත ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේ දවසට තැන ලබා දෙමින් එය උනන්දුවෙන් අපේක්ෂා කරන්න" යන්නය. "එම දවස තම දර්ශන පථයෙන් ඉවත් නොකරගන්නා ලෙස සකල කිතුණු පවුලට අවධාරණය කරමි. ක්‍රිස්තුස්වහන්සේ ගැන අපට සාගින්නක් තිබීම වැදගත්ය. තමන්වහන්සේ රාජ්‍යයේ මහිමශ්‍රීය තේජස පූර්ණාලං-කාරයෙන් ප්‍රදර්ශනය කරන දවස උදාවන තෙක් අපි බලා සිටිය යුතු වෙමු, ඒ ගැන නිතරම සිහි කටයුතුය"යි හෙතෙම ප්‍රකාශ කළේය.

"අපගේ යේසු සමිදාණෝ සගයට ගිය අතරේ අපගේ මාංසය සගයට ගෙන ගියේ නැද්ද? උන්වහන්සේ නැවත වරක් මෙහි පැමිණෙන්නේ නැද්ද? උන්වහන්සේ එසේ පැමිණෙන බව අපි දනිමු. උන්වහන්සේගේ පැමිණීම කඩිනමින් සිදුවන බව දනිමු"යි ස්කොට්ලන්-තවාදී පුනරුදවාදියෙකු වූ නොක්ස් උනන්දුවෙන් පැවසුවේය. සත්‍යතාව වෙනුවෙන් තම ජීවිත පූජා කළ රිඩ්ලි සහ ලැටිමර්, සමිදාණන්ගේ පැමිණීම ඇදහිල්ලෙන් බලා සිටියහ. රිඩ්ලි තම අපේක්ෂාව මෙසේ ලේඛණ ගත කළේය. "ලෝකය ඉතා කඩිනමින් එහි අවසානය කරා ළඟා වෙමින් සිටී. මෙම කරුණ මම විශ්වාස කරන නිසාම එසේ පවසමි. දේව සේවකයාවූ යොහන් සමග අපගේ හිතැඟියාව මෙසේ පවසමු. "එන්න, යේසු සමිදාණෙනි ඉක්මණින් එන්න." (Taylor, "The Voice of the Church," pp. 151, 145).

"සමිදාණන්ගේ පැමිණීම පිළිබඳ චින්තනය මට ප්‍රබල මිහිරියාවක් ලබා දෙන්නේය, මාගේ ගත සහ සිත ප්‍රීතියෙන් පිනා යන්නේය"යි බැක්ස්ටර් ප්‍රකාශ කළේය. "එතුමාණන්ගේ පැමිණීම කෙරෙහි ආදරයෙන් යුතුව බලා සිටීම උන්වහන්සේගේ ශුද්ධවන්තයන්ගේ ඇදහිල්ලෙහි හරයත්, ස්වභාවයත්ය. මළවුන්ගෙන් උත්ථාන වීමෙහිදී විනාශ කර දමනු ලබන අවසාන සතුරා මරණය වන්නේ නම්, ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම කෙරෙහි උදක් බලාසිටීම සහ යාච්ඤා කිරීම බැතිමතුන්ගේ ප්‍රමුඛ අවධානයට භාජන විය යුතුය. සංග්‍රාමයෙහි සම්පූර්ණවූ ද, ඉරණම්වූ ද ජයග්‍රහණය වන මේ දවස ගැන ඇදහිලිවන්තයන් සියලු දෙනාම ආශාවෙන් බලා සිටිය යුතුය. එය ඔවුන්ගේ ආත්මවල ආශාවද උත්සාහයද විය යුතුය." (Baxter Richard, Wokers". Vol. xvii, p. 555). "ස්වාමිනි මේ දවස ඉක්මණින් ඇතිවෙන්ට සලස්වන්න," යනු අපෝස්තලික සභාවේ ආශාව විය. වනගතව සිටි සභාවේ පැතුමද එවැනිම විය, ප්‍රතිසංස්කරණවාදීන්ගේ අභිමතාර්ථයද එයම විය.

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි පැමිණීම සිදුවන ආකාරයත්, එහි මූලික පරමාර්ථයත් දිවැසි ප්‍රකාශන මගින් කියාපාන අතරම එම



උත්තරීතර සංසිද්ධියෙහි පෙර නිමිතිද, අප හමුවේ දිග හැර ඇත. එම සිද්ධියට ආසන්න වකවානුවේදී "ඉර සඳ හා තාරකා කෙරේ ලකුණු .... වන්නේය." (ලූක් 21:25). "ඉර අඳුරු වන්නේය, සඳ එළිය නොදෙන්නේය, තාරකාවෝ අහසෙන් වැටෙන්නෝය, අහසේ ඇති බලපරාක්‍රමයෝද සොලවනු ලබන්නෝය. එකල මනුෂ්‍ය පුත්‍රයා මහත් බලයෙන්ද තේජසින්ද යුක්තව වළාකුල්වල එනවා ඔව්හු දකින්නෝය." (මාර්ක් 13: 24-26). දෙවෙනි ඊමේ පෙර නිමිත්තෙහි මුල් සලකුණක් ලෙස එළිදරව් කරුවා මෙසේ තතු ඉදිරිපත් කරයි, "මහත් භූමිකම්පාවක් විය; සූර්යයා කේශකම්බලයක් මෙන් කළු විය. මුළු හඳද ලේ මෙන් විය.'" (එළිදරව් 6:12,13).

විසි එක්වෙනි සියවසට පෙර මෙම ලකුණු දක ගැනීමට බැතිමතුන්ට හැකි විය. දිවැසි ප්‍රසාදිවරුන් මගින් දෙවියන්වහන්සේ ප්‍රකාශ කළ මේ අනාවැකි සනාථ කරමින් වසර 1755 දී වාර්තා වී ඇති දරුණුතම භූමිකම්පාව ලිස්බන්හිදී සිදුවිය. එකී භූ චලනය ලිස්බන් භූමිකම්පාව ලෙස නම් කරනු ලැබුවද යුරෝපය, අප්‍රිකාව හා අමෙරිකාව වැනි රටවල්ද ඒ කම්පනයෙහි ප්‍රතිඵල භුක්ති වින්දේය. එහි කම්පනය ග්‍රීන්ලන්තය, බටහිර කොදෙව් දූපත්, මදෙයිරා දූපත, නෝර්වේ, ස්වීඩනය, මහා බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය යන රටවල්ද සලිත කිරීමට හේතු කාරක විය. එහි බලපෑම වර්ග සැතපුම් කෝටි සතරක් පුරා විහිදී ගියේය. යුරෝපාකරයේ සිදුවූ කම්පනයේ ප්‍රබලත්වය එයාකාරයෙන්ම අප්‍රිකාවද කම්පනයට පත් කළේය. ඇල්ජීරියාවේ විශාල භූමි ප්‍රමාණයක් විනාශයට පත් විය. මොරොක්කෝව ආසන්නයෙහි පිහිටි ගම්මානයක් මුළුමණින්ම භූමිය විසින් ගිලගනු ලැබිණි. එහි ජීවත්වූ දස දහසක් පමණ ජීවිත විනාශයට පත් විය. භූමි කම්පාව මගින් ඇතිවූ සුනාමියෙන් ස්පාඤ්ඤයේ සහ අප්‍රිකාවේ මුහුදුබඩ පෙදෙස් විශාල රළ පහරකින් වැසී ගොස් අති විශාල විනාශයක් ඇති විය.

කම්පනයේ බියකරු විනාශයට වැඩියෙන්ම ගොදුරු වූයේ ස්පාඤ්ඤය සහ පෘතුගාලයයි. මුහුදුබඩ පිහිටි කාඩිස් නගරය කරා එල්ලවූ රළ පහර අඩි තිහක් පමණ උස්වූ බව වාර්තාගතය. "පෘතුගාලයේ තිබූ විශාල කඳු අත්තිවාරමේ සිට සොලවනු ලැබීය. සමහර කඳු මුඳුන් පුපුරා ගියේ විස්මිත ආකාරයකටය. කැඩී බිඳී ගිය කඳු කැබෙලි පහත පිහිටි කඳු බෑවුම් කරා මහත් පීඩනයක් සහිතව භූමියට පතිත විය. විවරවූ කඳු ශිඛරයන්ගෙන් ගිනි සිළු විහිදී ගිය බව වාර්තාවන් පවසයි." (Lyell, Sir Charles, "Principles of Geology," p. 495 (ed 1858, N-Y).

ලිස්බන්හි සිදුවූ භූ චලනය පිළිබඳව මෙවන් වාර්තාවක් ඉදිරිපත් වී ඇත. "භූ ගර්භයේ හෙණයක් පුපුරන්නාක් වැනි හඬක් අසන්නට ලැබිණ. ඉක්බිතිව එම නගරයේ බොහෝ ගොඩනැගිලි බිමට සමතලා

විය. විනාඩි හයක් වැනි සුළු කාලයක් තුළදී ජීවිත සැට දහසක් මරුමුවට පත් වූහ. මුහුදු ජලය දියඹට ඇදී ගොස්, මුහුදු පතුලේ විශාල ප්‍රමාණයක් දකගන්නට හැකි විය. මෙම සිද්ධිය පැවැතියේ ඉතා ස්වල්ප වේලාවකි. ඉක්බිතිව මහා ජලස්කන්ධය සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩි පනසක් පමණ ඉහළට යමින් ඉතා අධික පීඩනයකින් යුතුව ගොඩබිම මත පතිත විය. "ලිස්බන්හි සිදුවූ මේ ඛේදවාචකය හා බැඳි ව්‍යසනය කරණකොටගෙන එහි ඉදිකර තිබූ නැව් තඩාග අංගනය සහමුලින්ම විනාශ විය. එම තඩාගය ඉදිකර තිබුණේ තනි කිරි ගරුඬ ගලින්ය, ඒ සඳහාවූ වියදමද ඉතා අධික විය. ආරක්ෂාව බලාපොරොත්තුවෙන් විශාල ජන සමූහයක් තඩාගය තුළට එක් රොක් වූහ. එය කම්පාව නිසා කඩා වැටෙන්නාවූ ගොඩනැගිලි වලින් ආරක්ෂිත ස්ථානයක් වූ නිසා ජනකාය තඩාග ගොඩනැගිල්ල වෙත ඇදී ආහ. එහෙත් හදිසියේම ඒ සම්පූර්ණ තඩාගයම එය මත සිටියාවූ සියලුදෙනා සමග මුහුදු පත්ලටම කිඳා බැස්සේය. අභාග්‍යයකට මෙන් මොවුන්ගේ එකම මළ සිරුරක්වත් පාවෙනවා දකගත නොහැකි විය."

"සිද්ධියෙන් හටගත් කම්පනය නිසා සෑම දෙව් මැදුරක් සහ සෑම කන්‍යාරාමයක්ම බිමට පතිත වීමට විනාඩියක්වත් ගතවූයේ නැත. සෑම උස ගොඩනැගිල්ලක්ම බිමට සමතලා විය. නගරයේ තිබූ ගෙවල්වලින් හතරෙන් කොටසක් විනාශයට පත් විය. කම්පනයෙන් පැය දෙකකට පසුව විවිධ දිශාවන්හි ගිනි සිළු නැගෙන්නට විය. මෙම ගින්න දවස් තුනක් පුරා විනාශයේ ගිනි දළු දසත විහිදුවා ඇරියේය. භූමිකම්පාව හට ගත්තේ ආගමික නමස්කාර දිනයකදීය. එම ඉරිදා නමස්කාරය සඳහා පැමිණි බැතිමතුන්ගෙන් දෙව් මැදුරු සහ කන්‍යාරාම පිරී පැවැතියේය. දිවි ගළවාගත් අය අතළොස්සක් පමණ විය." (Encylopaedia Americana, art. Lisban note ed. 1831). "සෙනඟ තුළ හටගත් භීතිය සහ කම්පනය වචනයට නැගිය නොහැකිය. කිසිවෙක් හෝ හැඬුවේ නැත. කඳුළු සැලීමට නොහැකි තරමට කම්පනය අතිශයින් ප්‍රබල විය. ජනතාව හිස් ලූ ලූ අත දිව යන්නට වූහ. ඔවුහු දුකින් මුහුණටත්, පපුවටත් ගසා ගත්තෝය. ඔවුහු භීතියෙන් මුසපත්ව සිටියෝය. "ලෝකාන්තිමය පැමිණ ඇත"යි ඔවුහු විලාප නගන්නට වූහ. මව්වරුන්ට තමන්ගේ දරුවන් අමතක විය. කුරුසිය සහිත සුරුවම් බදාගෙන ඔවුහු ඔබ මොබ දිව ගියෝය. අවාසනාවන්ත කාරණය නම් සුරක්ෂිත භාවය පතා බොහෝ අය දේවස්ථාන වෙත දිව ගිය බවය. අල්තාරය බදා ගත්තද ඔවුන්ගේ පැතුම සාර්ථක නොවීය. සුරුවම්ද, පූජකයන් සහ ජනතාවද යන සියල්ලම පස් යට වැළලී ගියේය." (Encylopaedia Americana art. Lisban ed. 1831). එම අවාසනාවන්ත දිනයේදී ජීවිත අනූදහසක් පමණ අවසාන ගමන ගියහ.



අනාගතවාක්‍යයෙහි අන්තර්ගත තවත් ලකුණක් වසර විසිපහකට පසුව මිනිස් හදවත් තිගැස්සීමකට පත් කළේය. එය වනාහි ඉර හා හඳ අඳුරුවූ දවසය. එය මිනිස් චින්තනය තුළ නොමියෙන සටහනක් සිත්තම් කළේය. මෙම සිද්ධියෙහි සිත් කාවදින කාරණය නම් මෙය සිදුවෙන වකවානුව නිශ්චිත ලෙස අනාවැකියෙහි සඳහන්ව තිබීමය. ඔලීව කඳු මස්තකයෙහි වැඩ සිටි ගැළවුම්කාරයාණෝ ඔලීව කන්ද උඩදී තම ගෝලයන් සමග කථාවක යෙදී සිටිසේක. සභාව මුහුණ දෙන්නාවූ දිගු කාලීන හිංසා පීඩා යුගය ගැන උන්වහන්සේ ඔවුන් දැනුවත් කළසේක. තමන්වහන්සේගේ ඊමට පෙරාතුව සභාවට මුහුණ දීමට සිදුවන්නාවූ වසර එක්දහස් දෙසීය හැටක හිංසා පීඩා කාලයක් ගැන උන්වහන්සේ ගෝලයන්ගේ අවධානය යොමු කළසේක. පාප බලධාරීන්ගේ අතවර වලට සභාව භාජනය වන පීඩාකාරී යුගය ගැන සඳහන් කළ උන්වහන්සේ එම කාලය ලුහුඬු කර කෙටි කරනු ලබන බවටද පොරොන්දු වූසේක. තමන්වහන්සේගේ ඊමට මත්තෙන් හටගන්නාවූ සිද්ධීන් ගණනාවක් සඳහන් කළ උන්වහන්සේ එම සිදුවීම් වල පළමුවැන්න දකගත හැකි නිශ්චිත වකවානුවද ස්ථිර වශයෙන්ම කියා පෑසේක. "ඒ දවස්වලදී ඒ පීඩාවෙන් පසුව ඉර අඳුරු වන්නේය, සඳ එළිය නොදෙන්නේය." (මාර්ක් 13:24). වසර 1260 ක පීඩා කාලය 1798 දී නිමාවට පත්විය යුතුව තිබුණේය. එහෙත් උවදුරු වකවානුව මෙදිනට වසර විසි පහකට පමණ පෙර සම්පූර්ණයෙන්ම වාගේ නිමාව දක්කේය. ක්‍රිස්තුස්වහන්සේගේ වචන අනුව මෙම පීඩා යුගයෙන් පසුව ඉර අඳුරුවීම සිදුවිය. වසර 1780 මැයි මස දහ නව වෙනිදා මෙම අනාවැකිය සම්පූර්ණ විය. මෙවිට පුරා හඳ පැවති හෙයින් මෙය සූර්යග්‍රහණයක් නිසා සිදුනොවූ බව පැහැදිලිය. එය ඇතිවූයේ වළාකුළු නිසා හෝ පරිසරය ඝනව පැවති නිසා නොවීය. කුමක්හෙයින්ද අඳුර පැතිරී ගිය සමහර පෙදෙස්වල අහස කොපමණ පැහැදිලිව පැවතියේද යත් තාරුකා දකගැනීමට පවා පුළුවන් විය. මෙය සිදුවීමට හේතුව විද්‍යාව මගින් විස්තර කිරීමට නුපුළුවන් වූ බැවින් නක්ෂත්‍ර විද්‍යාඥයෙක් වූ හර්ෂල් මෙසේ පැවසුවේය:

"වසර 1780 හි මැයි දහ නව වෙනිදා සිදුවූ මේ දෙය පෙර නොවූ විරූ ආකාරයේ සිදුවීමක් විය. එදින සිදුවූ ඉර අඳුරු වීම අද්භූත සිදුවීමක් විය. මෙම සිදුවීමේ යථාර්තය ගැන තවමත් විද්‍යාව හේතු දක්වා නැත. හේතුවක් දක්විය නොහැකි මෙම අඳුරුවීම නව එංගලන්ත ප්‍රාන්තයේ සම්පූර්ණ අහස මෙන්ම වට පිටාවද ගිල ගත්තේය" (Devens, R. M.; "Our First Century," p. 89).

සිද්ධිය ඇසින් දුටු මැසචූසෙට්හි භවතෙක් එම පුදුමාකාර සිදුවීම මෙසේ විස්තර කරයි:

"සුපුරුදු පරිදි ඉර වෙනදා මෙන් පැහැදිලිව ආලෝකය පතුරුවා හරින්නට විය. වැඩි වේලාවක් යන්නට මත්තෙන් වළාකුළු පැමිණ ඉර වසා ගත්තේය. පහත අහස වළාවෙන් බර විය. ක්‍රම ක්‍රමයෙන් එම වළාකුළු කළු පැහැයට බර විය. යම්කිසි විනාශයක පෙර නිමිත්තක් එයින් කියා පෑවේය. විදුලි කෙටීමද, ගර්ජනා හඬද, අහස් කුස වැලඳ ගෙන තිබුණේය. වැසි පොදක් ද පැතිරී යන්නට විය. උදෑසන නවය පමණ වන විට වළාකුළු තුනී වන්නට විය. මුළු අහස් තලය තඹ හෝ පිත්තල පැහැයෙන් වර්ණවත් විය. මෙතුවක් කල් දැක නැති මෙම අරුම පුදුම අද්භූත ආලෝකයෙන් පොළොව, කඳු, ගල් තලා, තුරුලිය, ගොඩනැගිලි, ජල ධාරා මෙන්ම මිනිසුන්ද වෙනස් පැහැ ගත්හ. විනාඩි කිහිපයකට පසුව ඝන කළු වළාකුළු මුළු අහසම වසා ගත්තේය. ක්ෂිතිජය තුළ පමණක් ආලෝක වළල්ලක් විය. ගිම්හාන සෘතුවේදී පවත්නා රාත්‍රී කාලය මෙන් මුළු පෙදෙසම අන්ධකාරයෙන් ගිලී ගියේය...

"මිනිසාගේ සිත භීතියෙන් කාංසාවෙන් සලිතව ගියේය. දොරකඩ සිටගත් කාන්තාවෝ අඳුරු වටපිටාව දෙස බලා සිටියෝය. කෙත්වල වැඩ කරමින් සිටි පිරිමි වැඩ පසෙකලා, නිවෙස් කරා පැමිණියෝය. වඩු කාර්මිකයෝ තමන්ගේ ආයුධ ද, කම්මල්කරුවෝ තම කිනීරයද, වෙළෙඳ ව්‍යාපාරිකයෝ තම සේප්පු ද වසා දමා ගෙවල් බලා පියමං කළෝය. පාසැල් වසා දමූ අතර සිසුවෝ බියෙන් ගැහෙමින් නිවෙස් කරා දිව ගියෝය. සංචාරකයෝ කිට්ටුවෙන්ම පිහිටි ගොඩනැගිල්ලක් කරා ඉක්මණින් ගමන් කළෝය. "සිදුවෙන්ට යන්නේ කුමක්ද?"යි සෑම හදවතක්ම ප්‍රශ්න කළේය, සෑම දෙතොලක්ම එම බිය, වචනයට නැගුවෝය. චණ්ඩ මාරුතයක් රට හරහා හමායතැයි සිත් සතන් භීතියෙන් සලිත විය. එසේත් නැතිනම් මෙම සිදුවීම මේ යුගයේ අවසානය දැයි යන සිතුවිල්ලද බොහෝ අය වචනයට නැගුවෝය.

සෑම නිවෙසකම ඉටිපන්දම් දල්වනු ලැබිණි. සරත් සෘතුවේ සැඳෑ සමයක සිදුවන්නාක් මෙන් ලිපවල්වල ගිනි අවුළවනු ලැබිණි ... සැවුලන් තම කැදලි කරා ගොස් නිදන්නට විය. තණ බිම්වල සිටි ගවයෝ ගාල් වෙත දිව යමින් තප්පුලන්නට විය. මැඩියෝ එළිමහනට පැමිණ කෑගසන්නට වූහ. සියොතුන් තම සැඳෑ ගී ගයන්න පටන් ගත්හ. නිශාචර පක්ෂීහු පියාසර කරන්නට පටන් ගත්හ. එහෙත් රාත්‍රිය පැමිණ නැති බව මිනිස්සු පමණක් දැන සිටියෝය ...

"සාලෙම්හි කූඩාරම් දේවස්ථානයේ ආචාර්ය නතානියෙල් විට්ටෙකර් දේවගැති තුමා උදා නමස්කාර මෙහෙය පවත්වමින් සිටියේය. ඔහු තම දේශනාව මගින් අවධාරණය කළේ මෙය අන්ධකාර ලෝකෝත්තර බලවේගයක ක්‍රියාකාරිත්වයක් ලෙසය. සෑම දෙව් මැදුරකින්ම නිකුත් වූ හඬ වූයේ මෙම අඳුර අනාවැකි හා සබඳකමක් ඇති බවය... දහවල් එකොළහෙන් පසුව, අන්ධකාරය ඉතා ඝන විය" ("The Essex



Antiquarian," Salem Mass, April 1899). බොහෝ පෙදෙස්හි ඝනඳුර කෙතරම් දැඩි වීද යත්, එය දහවල් කාලය වුවද, වේලාව දැනගැනීමට ඔරලෝසුවේ කටු බලාගැනීමට එළියක් නැතිව පවා නොහැකි විය. කෑම ගැනීමට හැකිවන ආකාරයේ ආලෝකයක් පවා තිබුණේ නැත ......

"අඳුර විහිදී ගිය පරාසය විශ්වාස කළ නොහැකි තරම් විය. නැගෙනහිර දෙසට එය ප්ලිමත් තෙක් විහිදී පැවැතුණි. බටහිර දෙසින් එය කොනෙක්ටිකට් සහ ඇල්බනියේ ඈත මායිම් දක්වා පැතිර තිබුණේය. දකුණු මුහුදු වෙරළ දක්වාම අන්ධකාරය පැතිරී තිබූ අතර උතුරුකරයේ පිහිටි අමෙරිකානු වාස භූමි කරාද එය ව්‍යාප්තව තිබිණ." (Gorden, Dr. Wm. "History of the Rise, Progress and Establishment of the Independence of the U. S. A.," Vol. iii, p. 57).

සැඳෑ සමය උදාවීමට පැයක් හෝ දෙකක් තිබියදී ඝනඳුර පහව ගියේය. දීප්තිමත් නිල් අහසක් දැකගත හැකි විය. ඉර ද බැබළෙන්නට විය. කාලවර්ණ මීදුමක් තැනින් තැන පැතිර තිබුණේය ... "ඉර බැස යාමත් සමගම වළාකුළු නැවත වරක් ඝනව දැඩිව අහස වසා ගත්තේය. නැවත වරක් දැඩි අන්ධකාරයක් පැතිර ගියේය." "එදින සඳ පසළොස්වක සඳ මෙන් පායා තිබුණේය. රාත්‍රියේ පැවැති අන්ධකාරය දහවල් කාලයේ පැවැති අඳුර මෙන් දැඩිව තිබුණේය. පැවැති තත්ත්වය අස්වාභාවික වූද, භය උපදවන්නාවූ ද ගතියක් පෙන්නුම් කළේය. කෘත්‍රිම ආලෝකයක් නැතිව කිසිම ද්‍රව්‍යයක් දැක හඳුනා ගැනීමට අපහසු විය. අසල පිහිටි ගෙවල් සහ වෙනත් ගොඩනැගිලි බලන්නාවූ අයට හැඟී ගියේ එය මිසර අන්ධකාරයේ සෙවනැල්ලක් නැවත පතිත වී ඇති සැටියක් ලෙසය. එදින හිරු රැස් හෝ සඳ රැස් පසාරු කරගෙන යාමට වළාකුළු කිසිසේත් ඉඩ දුන්නේ නැත." (Thomas, "Massachusettes Spy; or American Oracle of Liberty, " Vol x, No 472 (May 25 1780). මෙම දසුන පිළිබඳව ඇසින් දුටු සාක්ෂිකරුවෙක් මෙසේ ප්‍රකාශ කළේය. "මට හැඟී ගියේ මෙවන් සිතුවිල්ලකි. එය නිවැරදි යයි මම විශ්වාස කරමි. මට සිතුණේ සකල විශ්වයේම ඇති ආලෝකය විහිදුවන වස්තූන් සියල්ලක්ම තම ආලෝකය විහිදුවීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතා දමා ඇතැයි කියාය. ආලෝකය නිපදවන වස්තූන් සියල්ල ඝනඳුර විසින් ගිලගෙන ඇති බව මට හැඟී ගියා." (Letter by Dr. Samuel Tenney, of Exeter, N. H. December 1785). රාත්‍රියේ නවය හෝරාව වන විට සඳ මුළුමණින්ම අහස් කුස ආලෝක කරමින් බැබළෙන අයුරු දැකගත හැකි විය. එහෙත් අඳුරු සෙවනැලි මුළුමණින්ම පළවා හැරීමට සඳ සමත් වූයේ නැත. මධ්‍යම රාත්‍රිය වන විට අඳුර සම්පූර්ණයෙන්ම පහව ගියේය. සඳ ද දැකගත හැකි විය. පුදුමයට මෙන් සඳ ලේ පැහැයක් ගත්තේය.

1780 මැයි මස 19 වෙනිදා "අඳුරු දිනය" වශයෙන් ලෝක ඉතිහාසයට එකතු විය. මෙවන් විශාල පෙදෙසක් පුරා මෙතරම් දිගු කාලයක් පැවැති අඳුරු දිනයක් මෝසෙස්ගේ කාලයෙන් මෙපිට සිදු නොවීය. මෙදින පැවැති අඳුර පිළිබඳව ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මෙයට බොහෝ කාලයකට පෙර යෝවෙල් දිවැසිවරයා තුළින් දෙවි සමිඳාණන් කළ ප්‍රකාශයට වැඩි වෙනසක් නොවීය. මේ ගැන යෝවෙල් කළ අනාවැකිය ප්‍රකාශ කළේ මෙදිනට වසර දෙදහස් පන්සියයකට පෙරාතුවය. ඒ මෙසේය: "ස්වාමින්වහන්සේගේ මහත් වූ හයානක වූ දවස පැමිණෙන්ට පළමුවෙන් ඉර අඳුරු වන්නේය. හඳ ලේ වන්නේය." (යෝවෙල් 2: 31).

තමන්වහන්සේගේ පැමිණීමේ පෙර නිමිති කෙරෙහි අවදිව බලාසිටින ලෙස ක්‍රිස්තුස්වහන්සේ ස්වකීය ජනතාවට අනුශාසනා කළසේක. එම සිද්ධීන් ඉටුවනවා දකින විට ඒ පිළිබඳව ප්‍රීති වන්නැයිද, උන්වහන්සේ ජනතාව දිරිමත් කළසේක. පැමිණෙන්නාවූ රජතුමාණන්ගේ වැඩීම සැමට ප්‍රීතිමත් සිද්ධියක් වෙනවා නොඅනුමානය. කිතු සමිඳාණෝ මෙසේ පැවැසූ සේක. "මේ දේ සිදුවන්නට පටන් ගන්නා කළ නුඹලාගේ මිදීම ළංවූ බැවින් ඉහළ බලා හිස් ඔසවන්න." (ලූක් 21:28). වසන්තයේ දළු ලමින් මලින් පිරි වෘක්ෂයන් දෙසට අවධානය යොමු කළ උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක. "ඒවා දළු ලන විට ඒ දැක ග්‍රීෂ්ම කාලය දනටම ළඟ බව නුඹලා දන්නහුය. එලෙසම මේ දේ සිදුවෙනවා දකින කළ, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟ බවත් දැනගන්න." (ලූක් 21: 30, 31).

සභාව තුළ ස්ථාපිතව පැවතිය යුතු යටහත් පහත් භාවයේ සහ භක්තියේ ආත්මය යටපත් කර, අහංකාරය සහ බාහිර චාරිත්‍ර විධීන්ට ගරු කිරීම පැවතුණි. ක්‍රිස්තුස්වහන්සේ උදෙසා වූ ආදරයත්, උන්වහන්සේගේ පැමිණීම කෙරෙහි වූ ඇදහිල්ලත් අභාවයට යමින් තිබිණ. ලෞකිකත්වයේ සහ සැපසෙල්ලම් ඇගයීමේ ක්‍රමවේදයන්හි නියැලුණු දේව ජනතාව තමන්වහන්සේගේ පැමිණීමේ පූර්ව ලකුණු පිළිබඳව ගැළවුම්කාරයාණන් ලබාදුන් අනුශාසන පිළිබඳව අන්ධව සිටියෝය. දෙවෙනි ඊමේ මූලධර්මය නොසලකා හැර තිබුණේය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් තොරතුරු දක්වූ ශුද්ධ ලියවිලි පාඨයන්ට වෙනත් අර්ථකථන ගෙන දෙමින් යථාර්ථය අඳුරු වළාවෙක දවටා එම ප්‍රකාශන නොසලකා හැර අමතක කර දමන තත්ත්වයක් පැවතුණි. විශේෂයෙන් අමෙරිකාවේ තිබූ සභාවන් තුළ පැවැති තත්ත්වය මෙයාකාර විය. සමාජයේ සියලු මට්ටමේ පුරවැසියන්ට නිදහස සහ සුව පහසුකම් නොඅඩුව භුක්ති විඳීමේ අවස්ථාව හිමි වී තිබුණේය. ධනය සහ සුඛෝපභෝග සැප සම්පත් සොයා යෑම සැමගේ ආශාව විය. ධනය උපයා ගැනීමේ පහසු මං සොයමින් බොහෝ අය වෙහෙස මහන්සි වූහ. ජනප්‍රියතාව සහ බලය ලබාගැනීමේ අභිලාෂය පසුපස බොහෝ අය දුව ගියෝය. මේ සියලු දෑයක්ම ලබාගැනීමට සැම අයෙකුටම



හැකියාවක් පැවතුණි. එම නිසා සැම අයෙකුගේ ආභාෂයන් සහ පරමාභිලාෂයන් මේ ලෝකයෙහි සම්පත් ලබාගැනීම කෙරෙහි යොමු වී තිබුණේය. වර්තමානයේ පවතින සියලු ක්‍රමවේදයන් සහ ක්‍රියාකාරකම් පහව යන දවසක් පැමිණෙන්නේය. එම ගාම්භීර දවස අමතක කර දමා, වත්මන් දිවියේ වින්දනය ගැන පමණක් සැමගේ අවධානය යොමු වී තිබුණේය.

තමන්වහන්සේගේ දෙවෙනි ඊමේ ලකුණු පිළිබඳව ගැළවුම්කා-රයාණන්වහන්සේ තම අනුගාමිකයන්ට කරුණු ඉදිරිපත් කළසේක. දෙවෙනි පැමිණීම ආසන්න වන විට දේව ජනතාව ප්‍රතිපත්ති කඩ කරමින්, ඇදහිල්ලෙන් වැටී යන බව උන්වහන්සේ අවධානයට ලක් කළසේක. යුගාන්තයේ දිවි ගෙවන්නාවූ ජනතාව නෝවාගේ කාලයේදී මෙන්ම ලෞකික ව්‍යාපාරයන්හි යෙදෙමින්ද සැප සම්පත් සොයා යමින්ද, ඉමහත් වෙහෙසක් දරන බව ක්‍රිස්තුස්වහන්සේගේ අනුශාසනාවට ඇතුළත් විය. ඔවුහු විවිධ දෑ මිලදී ගනිමින් හා විකුණමින්ද, ගස් සිටුවමින් සහ ගොඩනැගිලි ඉදි කරමින්ද, අවාහ කරගනිමින් සහ විවාහ කර දෙමින්ද දිවි ගෙවූහ. දෙවියන්වහන්සේ පිළිබඳව හෝ අනාගත ජීවිතය පිළිබඳව උනන්දුවක් ඔවුන්ගෙන් බැහැර ගොස් ඇති බවක් දැකගත හැකි විය. මෙම කාලයේ දිවි ගෙවන්නාවූ ජනතාවට වූ ක්‍රිස්තුස්වහන්සේගේ අනුශාසනාව නම් මෙයයි: "එහෙත් ඒ දවස මළපතක් මෙන් හදිසියෙන් නුඹලා කෙරේ නොපැමිණෙන පිණිස අධික කෑමෙන්ද බීමත් කමින්ද මේ ජීවිතයේ වෙහෙසින්ද නුඹලාගේ සිත් බර නොවන හැටියට බලාගන්න." "එබැවින් ඒ සිදුවන සියල්ලෙන් ජයගෙන ගැළවෙන පිණිසද මනුෂ්‍ය පුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද කන්නලව් කරමින් සැම කාලයේදීම අවදිව හිඳින්නැයි කීසේක." (ලූක් 21:34,36).

වත්මන් සභාවෙහි ස්වභාවය පිළිබඳව මිදුම්කාර සමිඳාණන් පැවසූ වදන් එළිදරව් පොතෙහි මෙසේ අන්තර්ගතය. "නුඹ ජීවත්ව සිටින බවට නාමයක් ඇතුව සිටින නුමුත් නුඹ මැරිලාය." (එළිදරව් 3:1). සැලකිල්ලෙන් තොරව ආරක්ෂිත යයි කල්පනයෙන් යුතුව නිදිබරව සිටින්නාවූ සභාවට උන්වහන්සේගේ ගාම්භීර අනතුරු ඇඟවීම නම්, "නුඹ අවදිව නොසිටින්නෙහි නම්, සොරෙකු මෙන් එන්නෙමි. මා නුඹ කරා කොයි පැයේ එනවා ඇද්ද කියා නුඹ නොදැන සිටිනවා ඇත." (එළිදරව් 3:3) යන්නය.

පරිවාස කාලයෙහි අවසානය ළඟ ළඟම පැමිණේ. එහෙත් මිනිසා ඒ පිළිබඳව සිටින්නේ නිදිබර ස්වභාවකය. යුගාන්තය හා බැඳි සිදුවීම් අවබෝධ කරගැනීමට සහ ඒවාට මුහුණ දීමට සූදානම් වීමට මිනිසාව අවදි කළ යුතුය. සමිඳාණන්ගේ දිවැසිවරයා මෙසේ ප්‍රකාශ කරයි: "ස්වාමින්වහන්සේගේ දවස මහත්ව ඉතා භයංකාරව තිබේ.

එය දරන්ට කාට පුළුවන්ද?" (යෝවෙල් 2:11). "නපුර බලන්ට බැරි තරම් පවිත්‍ර ඇස් ඇත්තාවූ" වැරැදි කරන අය නුරුස්සන දෙවි සමිඳාණන් මෙලොව වෙත නැවත වඩින කල්හි එය ඉදිරියෙහි නැඟී සිටින්නට හැකිවන්නේ කවරෙකුටද? (හබක්කුක් 1:13). "මාගේ දෙවියන්වහන්ස, ... අපි ඔබ හඳුනමුව කියා" හඬ ගසන්නාවූ අය උන්වහන්සේගේ ගිවිසුම කඩ කර තිබේ. ඔවුහු උන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධව කැරළි ගසා ඇත. ඔවුහු වෙනත් දෙවිවරුන් පසුපස ගොස් ඇත. (හොෂෙයා 8:1,2). තමන්ගේ අපරාධ හදවත්හි සඟවා ගෙන සිටින්නාවූ අයට, අදමිටුකමේ මාර්ගයන් ඇලුම් කරන්නාවූ අයට, "ස්වාමින්වහන්සේගේ දවස එළිය නොව අඳුර නොවන්නේද? දීප්තියක් නැතිව ඉතා කළුවරව නොතිබෙන්නේද?' (ආමොස් 5:20). දෙවි සමිඳාණෝ මෙසේ පවසන සේක. "ඒ කාලයේදී මම පහන් දල්වා යෙරුසලම සෝදිසි කරන්නෙමි .... ස්වාමින්වහන්සේ යහපතවත් නපුරවත් කරන්නේ නැතැයි සිත් තුළ සිතාගන්නාවූ මනුෂ්‍යයන්ට දඬුවම් කරන්නෙමි." (ශෙපනියා 1:12). "මම ලෝකයාට ඔවුන්ගේ නපුරුකම් නිසාත්, දුෂ්ටයන්ට ඔවුන්ගේ අයුතුකම් නිසාත්, දඬුවම් කරන්නෙමි. උඩඟු අයගේ අහංකාරය නවත්වා බලාත්කාර කරන්නන්ගේ ආඩම්බරය පහකරන්නෙමි." (යෙසායා 13:11). ඒ දවසේදී "ඔවුන්ගේ රිදී නිසාවත්, රන් නිසාවත් ඔවුන්ට ගැළවෙන්ට නුපුළුවන." "ඔවුන්ගේ සම්පත් කොල්ලයක්ද ඔවුන්ගේ ගෙවල් පාළුවක්ද වන්නේය." (ශෙපනියා 1:18,13).

පැමිණෙන්නාවූ බියකරු දවස ගැන කම්පිතව යෙරෙමියා මෙසේ හඬ නැඟීය: "මාගේ සිත තුළ වේදනා විඳිමි. මාගේ සිත මා තුළ කැළඹෙන්නේය; මට නිශ්ශබ්දව සිටින්ට බැරිය; මක්නිසාද හොරණෑ හඬත් යුද්ධ ඝෝෂාවත් අහෝ මාගේ ආත්මය නුඹට ඇසුණේය. නාස්තියක් පිට නාස්තියක් ප්‍රකාශ කරනු ලබන්නේය." (යෙරෙමියා 4:19,20).

"ඒ දවස වනාහි උදහස් දවසක්ය. දුක්ඛිත විපත්ති දවසක්ය. නාස්ති වීමේ හා සුනත්වීමේ දවසක්ය. අන්ධකාරවූ කළුවරවූ දවසක්ය. වළාපටලද ඝනාන්ධකාරය ද ඇති දවසක්ය." (ශෙපනියා 1:15,16). "දේශය පාළු කර එහි සිටින පව්කාරයන් එයින් නැතිකර දමන පිණිස ස්වාමින්වහන්සේගේ දවස .... එන්නේය." (යොසායා 13:9).

පැමිණෙන්නාවූ ඒ දවස පිළිබඳව දේව වචනය ඉතා සිත් කාවදින ගාම්භීර වදනින් පව්කරුවා අමතයි. දේව ජනතාව තමන්ගේ ආත්මික නිදිමතින් අවදි වී, පසුතැවිල්ලෙන් සහ යටහත් පහත්කමින් යුතුව දෙවියන්වහන්සේගේ පිළිගැනීම සොයන ලෙස දේව වචනය බැතිමතුන් දිරි ගන්වයි. "සියොන්හි හොරණෑව පිඹ, මාගේ ශුද්ධ වූ කන්දෙහි මහත් ශබ්දයක් පවත්වන්න. දේශයේ සියලු වැසියෝ වෙවුලත්වා. මක්නිසාද ස්වාමින්වහන්සේගේ දවස පැමිණෙයි, ඒක ළංව තිබේ."



"සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධ වූ උපවාසයක්ද, රැස්වීමක්ද ප්‍රසිද්ධ කරන්න. සෙනඟ රැස් කර, ශුද්ධ වූ සභාවක් පවත්වන්න. මහල්ලන් එකතු කර, ළමයින්ද කිරි දරුවන්ද එක්කාසු කරන්න. මනමාලයා තමාගේ ගෙයින්ද, මනමාලී ඇගේ ඇතුල් ගෙයින්ද, පිටතට එත්වා. ස්වාමින්වහන්සේගේ සේවක වූ පූජකයෝ ද්වාර මණ්ඩපය සහ පූජාසනය අතරෙහි සිට අඬමින් ... කියත්වා." "එහෙත් දැන්වත් නුඹලාගේ මුළු සිතින්ද නිරාහාරව සිටීමෙන්ද ඇඬීමෙන්ද වැලපීමෙන්ද මා වෙතට හැරී එන්නැයි ස්වාමින්වහන්සේ කියන සේක. එසේය, නුඹලාගේ වස්ත්‍ර නොව නුඹලාගේ සිත් ඉරාගන නුඹලාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ වෙතට හැරෙන්න. මක්නිසාද උන්වහන්සේ දයාවන්තවූ, අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ, ඉතා කරුණාවන්ත වූ කෙනෙක්ය." (යෝවෙල් 2:1, 15-18,12,13).

දෙවි සමිඳාණන්ගේ උදාර දවසෙහිදී උන්වහන්සේ ඉදිරියෙහි නැඟී සිටීමට නම් විශාල පරිමාණයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයක් ඉටුවීම අවශ්‍ය වේ. දෙවියන්වහන්සේගේ දරුවන් යයි කියාගන්නාවූ බොහෝ දෙනෙක් සදාතනය උදෙසා ජීවිත ගොඩ නගන්නේ නැති බව උන්වහන්සේගේ දර්ශන පථයට හසු විය. නිමග්න වී සිටින්නාවූ නිදිබර ස්වභාවයෙන් ඔවුන් අවදි කිරීමට අනතුරු ඇඟවීමේ පණිවිඩයක් යැවීමට දෙවියන්වහන්සේ අදහස් කළසේක. උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව නිසාම එවැන්නක් කිරීමට දෙවි සමිඳාණෝ උත්සුක වූසේක. සමිඳාණන්ගේ පැමිණීම සඳහා සූදානම් වීම් වස් බැතිමතුන්ට මගපෙන්වීම උන්වහන්සේගේ අභිප්‍රාය විය.

එකී අනතුරු ඇඟවීමේ අනුශාසනාත්මක පණිවිඩය එළිදරව් 14 හි එළි දක්වා තිබේ. සගයේ දේව දූතයන් මගින් විකාශනය වන කොටස් තුනකින් යුත් එම පණිවිඩය ලෝවැසි ජනතාව වෙත යොමු කර තිබේ. එම පණිවිඩය ප්‍රකාශ කර හමාර වූ පසු, මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ දෙවෙනි ඊම සිදුවීම නියතය. උන්වහන්සේ පැමිණෙන්නේ පොළොවේ අස්වැන්න නෙළා ගැනීමටය. අනතුරු ඇඟවීමෙහි පළමු ප්‍රකාශනයෙන් පැමිණෙන්නාවූ විනිශ්චය පිළිබඳව පුවත අප ඉදිරියේ දිග හැරේ. අහස මැද පියාසර කරන්නාවූ දූතයෙකු දිව්‍යසිවරයාට දකගන්නට ලැබිණ. "පොළොවේ වසන්නන්ටත්, සියලු ජාතීන්ටත්, ගෝත්‍රයන්ටත් භාෂාවන්ටත් සෙනඟටත් ප්‍රකාශ කරන පිණිස සදාකාල ශුභාරංචියක් ඇතුව, සිටින තවත් දේවදූතයෙක් අහස මැද පියාසර කරනවා දුටිමි. ඔහු මහත් ශබ්දයකින් කථා කරමින්: "දෙවියන්වහන්සේට භය වී, උන්වහන්සේට ගෞරව දෙන්න; මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුනේය. අහසත් පොළොවත්, මුහුදත් ජල උල්පතුත් මැවූ තැනැන්වහන්සේට නමස්කාර කරන්න." (එළිදරව් 14:6,7).

මෙම පණිවිඩය "සදාතන ශුභාරංචියෙහි" කොටසක් බව ප්‍රකාශ වේ. ශුභාරංචිය ප්‍රචාරය කිරීමේ කාර්යය භාරදී ඇත්තේ දේව දූතයන්ට

නොව මනුෂ්‍යයන්ටය. මෙම කර්තව්‍යය හැසිරවීම සඳහා දේව දූතයන් ක්‍රියා කර තිබේ. මිනිසුන්ගේ ගැළවීම සඳහා වූ ක්‍රියාකාරකම් මෙහෙයවීම ශුද්ධ වූ දූතයන්ගේ වැඩ කොටසට අයත් වේ. නමුත් පොළොව මත ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ සක්‍රිය වැඩ කොටස ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් විසින් ඉටුකළ යුතුය.

දෙවි පියාණන්ගේ ආත්මයාණන්වහන්සේගේ පෙළඹවීම් වලටද, උන්වහන්සේගේ වචනයේ අඩංගු ඉගැන්වීම් වලටද කීකරු වන්නාවූ විශ්වාසවන්ත බැතිමතුන්ට මෙම අනතුරු ඇඟවීමේ පණිවිඩය ලෝකයාට ප්‍රකාශ කිරීමේ කර්තව්‍යය භාරදී තිබේ. විශේෂ වූ මෙම ජන කොටස වනාහි සත්‍ය බවට ඔප්පු වූ දිවැසි වදන්” හෘදයාංගමව පිළිගෙන එම දෙවි වදනේ ප්‍රකාශන,” පහන් තරුව පායන තෙක් අඳුරු තැනක බබළන පහනක්” ලෙසින් අවධානය යොමු කළ අය වන්නාහ. සඟවා ඇති වස්තු සම්පත් වලට වඩා ඔවුන් තම අවධානය යොමු කළේ දෙවියන්වහන්සේ පිළිබඳව දැනුම් සම්භාරයක් ලබාගැනීමටය. ප්‍රඥාව හා නුවණ ලබාගත් විට එහි ප්‍රයෝජනය රිදීවල ප්‍රයෝජනයටත් එහි ලාභය රනටත් වඩා හොඳ බව ඔවුන්ගේ ඇගයීමට ලක් විය. රාජධානියෙහි විශිෂ්ඨ දේ දෙවි සමිඳාණෝ ඔවුන්ට එළිදරව් කළසේක, "ස්වාමින්ගේ රහස උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන් සමගය. උන්වහන්සේ ස්වකීය ගිවිසුම ඔවුන්ට දක්වන සේක." (ගීතාවලිය 25:14).

මෙම සත්‍යතාව වටහා ගෙන එම දැනුම පතුරුවා හැරීමට ක්‍රියා කළාවූ අය උපාධිධාරී දේව ධර්මාචාර්ය වරු නොවූහ. ධර්මාචාර්යවරු විශ්වාසවන්ත රැකවලුන් ලෙස ක්‍රියා කළෝ නම්, දැඩි උනන්දුවකින් හා යාච්ඤාවෙන් යුතුව ශුද්ධ ලියවිලි සොයා බලමින් අධ්‍යයනය කළෝ නම්, ගතවෙමින් පවතින්නේ දේව කාලසටහනෙහි කුමන හෝරාවදැයි ඔවුන්ට දැනගැනීමට ලැබෙනවා ඇත. ක්‍රියාත්මක වීමට ආසන්න සිදුවීම පිළිබඳව වූ අනාවැකි ඔවුන්ට විවෘත කර දෙනු ලබනවා ඇත. මෙම ස්ථාවරය කරා පැමිණීමට ඔවුන් අපොහොසත් වූ නිසා මෙම පණිවිඩය නිහතමානී වූවන්ට පවරා දෙන ලදී. "අන්ධකාරය නුඹලා කරා වහාම නොපැමිණෙන පිණිස නුඹලාට ආලෝකය තිබෙන කළ ඇවිදින්න." (යොහන් 12:35) යි යේසුස්වහන්සේ පැවසූ සේක. ආලෝකයේ මාර්ගයෙන් ඉවතට හැරී ගමන් කරන්නාද, ආලෝකයට ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව තිබියදී ඒ ගැන සැලකිලිමත් නොවෙන්නාද අඳුරේ පසුවෙනවා ඇත. ගැළවුම්කාරයාණන්වහන්සේ මෙසේද ප්‍රකාශ කරන සේක: "මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය" (යොහන් 8:12). දෙවි සමිඳාණන්ගේ කැමැත්ත කිරීමේ ඒකායන අරමුණින් යුතුව ක්‍රියා කරන්නාවූ තැනැත්තේ තමාට ලැබී ඇති ආලෝකයට අනුගත වීමට වෑයම් කරයි. ඒ අතරම යථා කාලයේදී ඔහුට තවත් ප්‍රබල ආලෝක



දහරාවන් ලබා දෙනු ලැබේ. එකී බැතිමතාට සම්පූර්ණ ආලෝකය කරා මගපෙන්වීමට ස්වර්ගීය ප්‍රභාවෙන් යුත් යම්කිසි තාරකාවක් එවනු ලබනවා ඇත.

ක්‍රිස්තුස්වහන්සේ පළමුවෙන් මෙලොව දිවි ගෙවූ සමයේදී ශුද්ධ නගරයේ පූජකවරුන්ට සහ දහම් පඬිවරුන්ට දෙවියන්වහන්සේගේ වචන රැකවල් කිරීමේ භාරය පවරා දී තිබිණ. කාලයාගේ ලකුණු අවබෝධ කරගැනීමේ යටිතල පහසුකම් ඔවුන්ට දානය කර තිබිණ. පොරොන්දුවූ තැනැන්වහන්සේගේ පැමිණීම ප්‍රකාශයට පත්කිරීමට ඔවුන්ට පුළුවන්කම තිබුණි. මීකා දිවැසිවරයා උන්වහන්සේ උපදින්නාවූ ස්ථානය ප්‍රකාශ කර තිබුණේය. (මීකා 5: 2). දානියෙල් දිවැසිවරයා උන්වහන්සේ මෙලොව ජනිත වන වකවානුව සඳහන් කර තිබුණේය. (දානියෙල් 9: 25). දෙවියන්වහන්සේ මෙම අනාවැකි යුදෙව් නායකයන්ට භාර කළසේක. මෙසියස්වහන්සේගේ පැමිණීම අත ළඟ බව දන එම පුවතින් ජනතාව දැනුවත් නොකිරීම පිළිබඳව යුදෙව් නායකයන්ට නිදහසට කරුණු දක්වීමට හැකියාවක් නොතිබුණි. පව්කරුවන් අවදි කිරීමේ කාර්ය භාරය අතපසු කිරීමෙහි ප්‍රතිඵලය වූයේ ඔවුන් කාලෝචිත ලෙස යථා තත්ත්වය නොදන සිටීමය. මරා දමන ලද ප්‍රොපේතවරුන් සඳහා යුදෙව්වෝ ස්මාරක ඉදි කරමින් වෙහෙසුණාහ. ලෞකික ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට ගෞරවය දක්වීම් මගින් ඔව්හු සාතන්ගේ සේවකයන්ට පුද සත්කාර පැවැත්වූහ. යුදෙව් නායකයෝ ජනතාව අතර ජනප්‍රියතාව සහ ස්වාභිමානය පුළුල් කරගැනීම සඳහා සමාජයේ ප්‍රභූ තනතුරු සහ බලය සොයමින් වෙහෙසුණෝය. එසේ කිරීම කරණකොටගෙන සගයේ රජතුමාණන් විසින් දානය කිරීමට පුල පුලා සිටි දිව්‍ය ගෞරවය ගැන ඔවුන්ගේ අවධානය ගිලිහී ගියේය.

ලෝක ඉතිහාසයෙහි ශ්‍රේෂ්ඨතම සිදුවීම වන්නේ, මිනිසාට ගැළවීම ලබා දීමට දේව පුතුණුවන්ගේ පැමිණීමය. උන්වහන්සේ මෙලෝ ජනිත වන ස්ථානය, කාල වකවානුව එම සිද්ධිය හා බැඳි පරිබාහිර සිදුවීම් පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක යෙදීම ඊශ්‍රායෙල් නායකයන්ගෙන් බලාපොරොත්තු වන ලදී. හෘදයාංගම විචක්ෂණයකින් සහ දුර්වාබෝධ ආගමික භක්තියකින්ද, එසේ කරනු ලැබීම ආගමික නායකයන්ගේ කාර්ය භාරය විය. ලෝක ගැළවුම්කාරයාණන් පැමිණි විට අනෙකුත් අයට වඩා පළමුවෙන් උන්වහන්සේව පිළිගැනීමට දේව ජනතාව සෝදිසියෙන් යුතුව බලා සිටීම අපේක්ෂිත විය. නමුත් ඛේදයකි, එවැනි දෙයක් සිදුවූයේ නැත. නාසරෙත්හි කඳුකරයේ සිට බෙත්ලෙහෙම කරා පැමිණෙන විඩාපත් යුවලක් අප නෙත ගැටේ. ඔවුහු බෙත්ලෙහෙමෙහි පටු වීථි දිගේ යමින් නවාතැන් පොළක් ලබාගැනීමට වෙහෙසුණහ. විඩාව නිවා ගැනීමට සහ රාත්‍රිය ගතකිරීමට තැනක් සොයමින් ඔවුහු එම ගම්මානයේ නැගෙනහිර ඈත කෙළවරටම ගමන් ගත්හ. ඔවුන්ට කවාතැන් ගැනීමට එකම ගෙයක් දොරක් හෝ

විවෘත නොවීය. ගව මඩුවක ඈත කොණක සකසාගත් ස්ථානයක ලෝකයේ ගැළවුම්කාරයාණෝ මෙලොවට බිහි වූසේක.

භෞතික ලෝකයේ උපතට පෙර දේව පුත්‍රයාණෝ ස්වකීය පියාණන් වූ දෙවි සමිඳාණන් සමග සගයේ රජකම ඉසිලූ සේක. මෙම දසුන දේව දූතයන්ගේ පැසසුමට ලක් විය. දේව පුතණුවන් මිනිසෙකු ලෙස මෙලෝ උපත ලබන්නාවූ අවස්ථාවේදී සකල ලෝවාසීන් සුවිශේෂ ප්‍රීතියට පත්වනු ඇතැයි දේව දූතයෝ මහත් උනන්දුවකින් සහ අපේක්ෂාවකින් බලා සිටියෝය. දේව පුතණුවන්ගේ ලෝ පහළවීම අපේක්ෂාවෙන් සිටි අයට එම සුපුවත රැගෙන යාමට දේව දූතයන් තෝරා ගන්නා ලදී. ඔවුන් තුළින් එම පුවත ලෝවාසී ජනතාවට ලබාදීම ඒ සිද්ධියේ තවත් අංගයක් විය. මිනිසාගේ ස්වභාවය දරාගැනීමට ක්‍රිස්තුස්වහන්සේ තමන් වරප්‍රසාද සහ පදවි තානාන්තර අත්හැර දමූසේක. පාපය උදෙසා පූජාවක් ලෙස තමන් ජීවිතය ඔප්පු කිරීමේදී දුක් වේදනාවන්ගේ අනන්ත බරක් දැරීමට උන්වහන්සේට නියම විය. දේව දූතයෝ මේ බව දන සිටියහ. මනුෂ්‍ය පුත්‍රයාණන් අධික නින්දා සහගත අවමානයකට ලක් කරනු ලැබිය යුතු වුවත්, මිනිසුන් අතරට ඊමේදී තමන්වහන්සේගේ චරිත ගුණාංග වලට අනුරූපී අභිමානවත් උතුම් බවකින් සහ තේජසකින් යුතුව උන්වහන්සේ පැමිණීම දේවදූතයන්ගේ ආශාව විය. උන්වහන්සේ මෙලොවට එන්නාවූ අතරේදීද, පොළොවේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෝ උන්වහන්සේව පිළිගැනීමට ඊශ්‍රායෙල් අගනුවරට රැස්ව සිටිත්ද? බලාපොරොත්තුවෙන් සිටි ප්‍රභූවරුන්ට මනුෂ්‍ය පුත්‍රයාණන්ව හඳුන්වා දීම දේව දූතයන් දහස් ගණනකින් සමන්විත කණ්ඩායමක් විසින් සිදුකරනු ලබන්නේද?

යේසුස්වහන්සේව පිළිගැනීමට සූදානමින් සිටින්නවුන් සොයා බැලීමට දේව දූතයෙක් පොළොව කරා පැමිණේ. එවන් බලා-පොරොත්තුවක් ඇතිව මිනිසුන් උපේක්ෂා සහගතව බලාසිටින බවක් ඔහුගේ නිරීක්ෂණයට හසු නොවීය. මෙසියස්වහන්සේගේ පැමිණීමේ හෝරාව ළං ළංව උදාවන බව සමරමින් පැසසුමෙහි සහ ජයග්‍රහණයෙහි හඬක් නොනැඟෙන බව ඔහුට සපථ විය. යුගයන් ගණනාවක් පුරා දිව්‍ය අභිමුඛයෙහි තේජස රැඳී පැවැති තෝරාගත් නගරයට හා දේව මාළිගාවට ඉහළින් පියාසර කරමින් පැමිණි දූතයා ටික වේලාවක් එහි රැඳී සිටියේය. මෙසියස්වහන්සේගේ ලෝ පහළ වීම ගැන එතැන්හිදී උනන්දුවක් තිබෙන බවක් ඔහුට දකගත නොහැකි විය. මහත් අභිමානයෙන් යුතුව උදාර ලෙස හැසිරෙමින් පූජකයෝ දේව මාළිගාවෙහි පූජාසන මත දූෂ්‍ය වූ පූජා ඔප්පු කරමින් සිටියහ. ඵරිසිවරු මහත් හඬින් සෙනඟට කථා කරමින් සිටියහ; නැතහොත් ඔව්හු මංසන්ධිවල සිටගෙන පාරට්ටු කිරීමේ යාච්ඤාවන් පවසමින් සිටියහ. ගැළවුම්-කාරයාණෝ ලෝ පහළ වීමේ නිමිත්ත ඉතා කඩිනමින් සිදුවන්නට තිබුණි. මෙම විස්මපත් පුවත ඇසීමෙන් සකල ස්වර්ගයම ප්‍රීතියෙන්



සහ ප්‍රශංසාවෙන් පිරී ගියේය. කරුණු එසේ වුවද, රජවරුන්ගේ මාළිගාවල, දර්ශනවාදී විද්වතුන්ගේ රැස්වීම්වල, ආගමික ගුරුවරුන්ගේ පාසල්වල, මේ විස්මපත් සුපුවත ගැන කිසිම හඬක් අසන්නට ලැබුණේ නැත. සගය උද්දාමයට පත් කළ පුවත ගැන මිහිතලයෙහි මිනිසාට කිසිම වැදගැන්මක් නොතිබුණි.

ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටින බවට කිසිම සාක්ෂියක් නොතිබුණි. ජීවනයේ කුමාරයාණන් පිළිගැනීමට කිසිම සූදානමක් හෝ තිබුණේ නැත. මෙම අවමාන සහගත ලැජ්ජාශීලී ශෝචනීය පුවත රැගෙන සගය කරා ආපසු යැමට දේව දූතයා සැරසෙත්ම, ඔහුගේ නෙත එඬේරුන් කණ්ඩායමක් වෙත යොමු විය. ඔවුහු රාත්‍රී කාලයේ තමන්ගේ රැළවල් බලාගනිමින් සිටියහ. ඔවුහු තරු පිරි අහස දෙස බලමින් මෙසියස්වහන්සේගේ පැමිණීමේ අනාවැකි පිළිබඳව ආවර්ජනය කරමින් සිටියහ. ලෝකයේ ගැළවුම්කාරයාණන්ගේ පැමිණීම කෙරෙහි ඔවුහු මහත් ලැදියාවකින් බලා සිටියෝය. මෙන්න! ස්වර්ගීය සුබසුන ලැබීමට සුදුසු බැතිමතුන් කණ්ඩායමක්. මොහොතකින් දේව දූතයා ඔවුන් ඉදිරියෙහි පෙනී සිටියේය. ප්‍රීතිය උතුරා යන ඒ දෙව් බිළිඳාණන්ගේ උපතෙහි පුවත ඔවුන්ට ප්‍රකාශ කරනු ලැබීය. සග මහිමශ්‍රීය තැන්න පුරා පැතිර ගියේය. දේව දූතයන් සමූහයක් එහි සිටිනවා දකගත හැකි විය. ඔවුහු ජය ගීයක් ගායනා කරමින් සිටියහ. මෙම ආගමික ගීතය ගැළවීම ලබන සියලු දෙනාම මතු දිනකදී එක හඬින් ගායනා කරනවා ඇත. ඒ මෙසේ විය: "ඉතා උසස් තැන්හි දෙවියන්වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද වේවා." (ලූක් 2:14).

මෙම විස්මපත් බෙත්ලෙහෙම් කථාන්තරයෙහි ඇත්තේ කෙතරම් දන මන පිනවන පාඩමක්ද! අප තුළ පවත්නා අවිශ්වාසයට, අපගේ අහංකාරකමට, බාහිර උපකාරයක් අවශ්‍ය නැත යන චින්තනයට මෙම සංසිද්ධිය කෙතරම් මහත් තරවටුවක්ද. මෙම සිද්ධිය හා බැඳි ආගමික නායකයන්ගේ ධර්මාචාර්යවරුන්ගේ සහ බැතිමතුන්ගේ නොදැනීම සහ සූදානම් නැතිකම අපට කිනම් ආකාරයේ පාඩමක්ද! බෙත්ලෙහෙම් උපත අපට අනතුරු අඟවයි. අපගේ සාපරාධී උදාසීනකම නිසා කාලයාගේ ලකුණු තේරුම් ගැනීමට අපද පසුබට වන්නට පුළුවන. එසේ වුවහොත්, විපාකය පැමිණෙන්නාවූ දවස පිළිබඳව දැනගැනීම අපගෙන් ගිලිහී යනවා නියතය.

මෙසියස්වහන්සේගේ මෙලෝ වැඩීම අපේක්ෂාවෙන් සිටින්නවුන් සොයා ගිය දූතයාට එවැනි අය මුණගැසුණේ යුදා කඳුකරයේ සිටි එඬේරුන් අතරේ පමණක් නොවේ. දෙවියන්වහන්සේට නමස්කාර නොකළ මිසදෙටු දේශයේ පවා මෙසියස්වහන්සේව අපේක්ෂා කළ අය නොසිටියේද නොවේ. එවැනි අය අතර සිටි බුද්ධිමතුන් කණ්ඩායමක්

ගැන වාර්තා වී ඇත. ඔවුහු පොහොසත්, බුද්ධිමත් සහ වංශවත් අය වූහ. ඔවුහු පෙරදිග ලෝකයේ පඬිවරු වූහ. දෙවියන්වහන්සේගේ හස්ත කර්මාන්ත තුළින් උන්වහන්සේව හැඳින ගෙන සිටි ඔවුහු සොබා දහමේ සිසුන් වූහ. යාකොබ්ගෙන් නැගී එන්නාවූ තාරකාව ගැන ඔවුහු හෙබ්‍රෙව් ශුද්ධ ලියවිලි අධ්‍යයනයෙන් හදාරා තිබුණෝය. එම ප්‍රකාශනය කෙරෙහි විශ්වාසය තැබූ ඔවුහු උන්වහන්සේගේ පැමිණීම බලා සිටියෝය. අපේක්ෂා කළ තැනැන්වහන්සේ, "ඊශ්‍රායෙල්හි සැනසීම" පමණක් නොව, අන්‍යජාතීන්ට එළිදරව් වන පහනක්" සහ "ලොව හැම කෙළවරකටම ගැළවීමේ මාධ්‍යය වන තැනැන්වහන්සේය" යන්න ඔවුන්ගේ විශ්වාසය විය. ඔවුහු ආලෝකය සොයන්නාවූ අය වූහ. දෙවියන්වහන්සේගේ සිහසුනෙන් නිකුත් වූ ආලෝකය ඔවුන්ගේ පාදවලට එළිය ලබා දුන්නේය. සත්‍යතාවේ භාරකරුවන් සහ ඒවා පැහැදිලි කරදෙන්නවුන් වූ යෙරුසලමෙහි පූජකවරුන් සහ ගුරුවරුන් අඳුරෙහි ඇලී ගැලී සිටි අතර අළුත උපන් රජතුමාණන්ගේ උපන් ස්ථානය වෙත යෑමට සගයෙන් එවනු ලැබූ තාරකාව මෙම අන්‍යජාතික අමුත්තන්ට මගපෙන්වීය.

"බොහෝ දෙනෙකුගේ පව් උසුලන පිණිස එක වරක් පූජාවූ ක්‍රිස්තුස්වහන්සේත්, උන්වහන්සේගේ ඊම බලා සිටින්නන්ට ගැළවීම පිණිස පාපය නැතුව දෙවෙනි වර ප්‍රකාශ වනසේක." (හෙබ්‍රෙව් 9: 28). ගැළවුම්කාරයාණන්ගේ උත්පත්තිය පිළිබඳ පණිවිඩය මෙන්ම, උන්වහන්සේගේ දෙවන ඊමේ පණිවිඩයද ජනතාවගේ ආගමික නායකයන්ට භාරකොට නැත. ඔවුහු දෙවියන්වහන්සේ සමග තිබිය යුතු සම්බන්ධතාව ආරක්ෂාකර ගැනීමට අපොහොසත් වූහ. ඔවුහු සගයේ ආලෝකය එපා කළෝය. එහෙයින්, අපෝස්තුළු පාවුල් විසින් මෙසේ විස්තර කර ඇති කණ්ඩායමට ඔවුහු ඇතුළත් නොවෙති: "නුමුත් සහෝදරයෙනි, ඒ දවස සොරෙකු මෙන් නුඹලා කෙරේ පැමිණෙන්ට නුඹලා අන්ධකාරයෙහි සිටින්නෝ නොවෙති. කුමක්හෙයින්ද නුඹලා සියල්ලෝ ආලෝකයේද දවාලේද පුත්‍රයෝය. අපි රාත්‍රියටවත් අන්ධකාරයටවත් අයිති නොවෙමු." (1 තෙසලෝනික 5:4,5).

ගැළවුම්කාරයාණන්ගේ මෙලොව පැමිණීමේ සුපුවත මුල්ම වතාවට දැනගැනීමේ කාර්ය භාරය හිමිව තිබුණේ සියොන්හි පවුර මත මුරකාවල් කළ සේවකයන්ටය. උන්වහන්සේගේ පැමිණීම කඩිනම් බව මුල් වතාවට හඬ ගා කීම භාර දී තිබුණේ ඔවුන්ටය. උන්වහන්සේගේ පැමිණීම සඳහා සූදානම් වන්නැයි ජනතාව මුලින්ම අවදි කළ යුතුව තිබුණේ ඔවුන්ය. නමුත් ඔවුහු විවේකීව හිඳිමින් සාමය සහ ආරක්ෂාව ගැන සිහින මවමින් සිටියෝය. ඒ අතර ජනතාව තමන්ගේ පාපවල නිදා සිටියෝය. තමන්ගේ සභාව ඵල රහිත අත්තික්කා ගසක් හා සමානව සිටින බව යේසුස්වහන්සේ දුටුසේක. එම ගසෙහි රැවටිලිකාර කොළ පමණක් තිබිණ. අගනා ගෙඩි කිසිවක් නොවීය. ආගමික



වතාවත් සහ තේවාවන් අකුරටම ක්‍රියාත්මක කරන බව සභාව ආඩම්බරයෙන් යුතුව දක්වූවාය. එහෙත් දෙවියන්වහන්සේ විසින් පිළිගන්නාවූ සත්‍යවාදී යටහත් පහත්කමේ පශ්චත්තාපයේ සහ ඇදහිල්ලෙහි ආත්මය ඔවුන් තුළ දකගැනීමට පවා නොමැති විය. ආත්මයාණන්වහන්සේගේ මෛත්‍රී, කරුණා අනුග්‍රහයන් වෙනුවට සභාව තුළ අරක් ගෙන තිබුණේ අහංකාරය, සම්ප්‍රදායන්ට නතු වීම, නිෂ්ඵල තේජස, ආත්මාර්ථකාමීත්වය සහ අන්‍යයන් පාලනය කිරීමේ ආශාව යන ගුණාංගයන්ය. ප්‍රතිපත්ති කඩමින් විනාශය කරා යන්නාවූ සභාව කාලයාගේ ලකුණු වලට ඇස් වසාගෙන සිටියාය. එහෙත් දෙවියන්වහන්සේ ඔවුන්ව අත්හැර නොදැමූ සේක; තමන්වහන්සේගේ විශ්වාසවන්තකම අත් නොහැරිය සේක. එහෙත් දේව ජනතාව උන්වහන්සේගේ ආදරයෙන් වෙන් වූහ. ලබාදී ඇති කොන්දේසි හා සමග අනුගතවීම ඔවුහු ප්‍රතික්ෂේප කළෝය. එම නිසාම උන්වහන්සේගේ පොරොන්දු ඔවුන්ට ඉටු නොවීය.

දෙවියන්වහන්සේ ලබා දෙන්නාවූ ආලෝකය සහ වරප්‍රසාද අතපසු කිරීමෙන් ඒවා වර්ධනය කරගැනීම අතපසු කිරීම නිසා උදාවන්නාවූ ප්‍රතිඵල එයාකාර වන්නේය. විවෘත වන්නාවූ දේව මගපෙන්වීම් අනුගමනය කිරීමට සභාව සූදානමින් සිටීම වැදගත්ය, ලැබෙන්නාවූ සෑම ආලෝක දහරාවක්ම පිළිගත යුතුය. එළිදරව් වන්නාවූ සෑම වගකීමක්ම ඉටු කළ යුතුය. සභාව එසේ නොකරන්නී නම් එය වත් පිළිවෙත් පමණක් ඉටුකිරීමේ තත්ත්වයකට ඇද වැටෙනවා නො-අනුමානය. ඒ අතරම ජීවමාන දහැමි භක්තියෙහි ආත්මය අතුරුදහන් වී යනවා වැළැක්විය නොහැකිය. මෙහි සත්‍යතාව සභා ඉතිහාසයෙහි නැවත නැවතත් සිදුවී තිබේ. ලබාදී ඇත්තාවූ ආශිර්වාද සහ වරප්‍රසාද අනුරූපීව ඇදහිල්ලෙහි සහ කීකරුකමෙහි ක්‍රියාදාමයන් සිදුවෙනවා දැකීම දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක. කීකරුකම ක්‍රියාත්මක කිරීමට පූජාවක් කිරීම අවශ්‍යය. එම පූජාවීමේ ක්‍රියාදාමයට කුරුසියක්ද ඇතුළත්ය. මෙසේ නොවීම නිසාම ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරනවා යයි කියන්නාවූ බොහෝ අය සගයෙන් එන්නාවූ ආලෝකය ලැබීම ප්‍රතික්ෂේප කළහ. ආදි කාලයේ දිවි ගෙවූ යුදෙව්වන් මෙන්ම මෙම බැතිමත්හුද ඔවුන්ට ලබාදුන් මිදීමේ අවස්ථාව හැඳින නොගත්හ. (ලූක් 19: 44). යුදෙව්වන් තුළ තිබූ අහංකාරය සහ අවිශ්වාසය නිසා දෙවි සමිඳාණෝ ඔවුන් මග හැර යමින් බෙත්ලෙහෙමේ එඬේරුන් වැනි අයට තමන්වහන්සේගේ සත්‍යතාව එළිදරව් කළසේක. මෙම එඬේරුන් මෙන්ම පෙරදිග පඬිවරුද තමාට ලැබුණු සියළු ආලෝක දහර පිළිගත් නිසා ඔවුන්ට තව තවත් ආලෝකය ලබාදීමට දෙවියන්වහන්සේ ක්‍රියා කළසේක.

# 18

# අමෙරිකානු ප්‍රතිසංස්කාරකයෙක්

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊමේ පණිවිඩය ලෝ දන හට ලබා දීම දේව සැලැස්ම විය. එම සුපුවත ප්‍රකාශ කිරීමේ පෙරමග-දූතයන් ලෙස දෙවියන්වහන්සේ විවිධාකාර පුද්ගලයන් තෝරාගත් සේක. මේ සඳහා තවත් ප්‍රතිසංස්කාරකයෙකු තෝරා ගැනීමට අදහස් කළ උන්වහන්සේ අමෙරිකාවේ විසූ විලියම් මිලර් නමැති තැනැත්තා වෙත තමන් අවධානය යොමු කළසේක. විලියම් මිලර් වනාහි යුතුකම අගය කළ අවංක ගොවියෙක් විය. ශුභාරංචියෙහි දිව්‍යමය බල අධිකාරිය ගැන හෙතෙම මුලදී අනුමාන කළ නමුත් සත්‍යතාව දනගැනීමේ අවංක ආශාවක් ඔහු තුළ ජනිතව තිබිණි. අනෙකුත් ප්‍රතිසංස්කාරකයන් මෙන්ම විලියම් මිලර් ද දිළිඳු ජීවිතයක් ගත කළේය. ජීව ශක්තිය වැය කරමින් වැඩ කිරීමටද ආත්ම පරිත්‍යාගයෙන් යුතුව ජීවත් වීමටද ඔහු බාල වියෙහි සිටම හුරු පුරුදු විය. ඔහුගේ පවුලේ අය තුළ පැවැති චරිතාංග අතර නිවහල්ව ජීවත් වීමේ චින්තනය ඔහුගේ ඉදිරි කාර්ය භාරයට රුකුලක් විය. තවද, නිදහස්ව දිවි ගෙවීමේ ආත්මය මෙන්ම සියළු කරදර විඳ දරාගැනීමට ශක්තියක්ද, දේශාභිමානයෙන් දවෙන්නාවූ ආත්මයක්ද ඔහුට ජන්මයෙන්ම උරුමව තිබුණේය. ඔහුගේ පියා අමෙරිකානු යුද්ධ හමුදාවෙහි කපිතාන්වරයෙක් විය. යුද්ධ සමයේ ඔවුන් මුහුණ පෑ අසීරුතා සහ කම්කටොළු මිලර්ගේ තරුණ වියෙහි ජීවිත රටාව හැඩ ගැස්වීමෙහි ලා බලපෑවේය.

ශාරීරික වශයෙන් මනා සෞඛ්‍ය සම්පන්න දේහයක් දරූ හෙතෙම කුඩා කළ සිටම බුද්ධිමය වශයෙන්ද ප්‍රගුණ ස්වභාවයක් පෙන්නුම් කළේය. වයසින් මුහුකුරා යත්ම මෙම බුද්ධිමය ප්‍රඥාව කැපී පෙනෙන්නට විය. ඔහුගේ මනස ක්‍රියාශීලී වූ අතර එය මනාව වර්ධනයව තිබුණේය. දනුම ලැබීමේ පිපාසයක් ඔහු තුළ විය. උසස් අධ්‍යාපනයක් ලැබීමේ වාසනාව ඔහු සතු නොවීය. එසේ වුවද විවිධ විෂයන් හැදෑරීමේ ආශාවද විමර්ශනශීලී චින්තනයකින් කරුණු හැදෑරීමේ ශූරත්වයද මගින් ඔහු අපක්ෂපාතී වූ විනිශ්චයක් කිරීමට හැකියාවක් ඇත්තාවූ පුළුල් දර්ශනයකින් යුත් තැනැත්තෙක් විය. ඔහුට සදාචාර සම්පන්නවූ කැළැල් රහිත චරිතයක්ද තිබුණි. අවංකකම, සැකසුරුවම, කරුණාව සහ ත්‍යාගවන්තකම පිළිබඳව ඔහු ජනප්‍රිය පුද්ගලයෙක් විය. ශ්‍රම ශක්තිය වැයමකින් යුතුව යෙදවීමෙන් හෙතෙම බාල කාලයේ පටන්ම කැපී පෙනුණේය. මෙම සියළු වැයම් මධ්‍යයේ වුවද ඉගෙනීමේ පුරුද්ද ඔහු අත් නොහළේය. ඔහු සම්මාන සහිතව සිවිල් හා යුද්ධමය වගකීම් ගණනාවක් ඉටු කළේය. ධන සම්පත් සහ ගෞරවය ලැබීමේ මාවත ඔහු ඉදිරියේ විවෘතව තිබුණේය.



විලියම්ගේ මව අව්‍යාජ භක්තියෙන් යුත් සැදැහැවතියක් වූවාය. ඇයගේ ශ්‍රද්ධාව මිලර්ගේ ළමා ජීවිතය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා සමත් විය. තරුණ විය පසු කිරීමත් සමගම හෙතෙම දේව භක්ති අයගේ සමාගමට සම්බන්ධ විය. යහපත් අවංක පුරවැසියන් වූ ඔවුහු කාරුණිකවූ ත්‍යාගශීලී අය වූහ. ඔවුන්ගේ ගුණාංග ඔහුගේ දිවියට මහත් බලපෑමක් ඇති කළේය. කිතුණු ආයතන මධ්‍යයේ දිවිගෙවූ ඔවුන්ගේ ජීවිත රටාව ඒ පරිසරය අනුව හැඩගස්වනු ලැබීය. අනෙකුත් අයගේ ගෞරවාදරයට සහ විශ්වාසයට ඔවුහු භාජන වූහ. එවන් ජනප්‍රියතාවක් අත්කර ගැනීමට උපකාරයක් වූයේ බයිබලීය ගුණ දහම් අනුගමනය කිරීමය. එහෙත් මෙවන් යහපත් තිළිණ මත කෙතරම් දුරට අප්‍රසන්න බලපෑමක් එල්ල කරනු ලැබුණේද යත් ඔවුන්ගේ සිත් සතන්හි දෙවියන්වහන්සේගේ වචනයට විරුද්ධව මතවාදයක් ගොඩ නගනු ලැබීය. මෙවන් ජන කොටසක් සමග සහභාගිත්වය පැවැත්වීම කරණකොටගෙන එම මතවේදයන් සහ චින්තන පිළිගැනීමට මිලර්ද මගපෙන්වනු ලැබිණ. බයිබලීය විෂයන් අර්ථකථනය කිරීමේදී එකල පැවැති විග්‍රහයන් පිළිගැනීම ඔහුට අසීරු කරුණක් විය. එම ඉගැන්වීම් මගින් ගොඩ නැගුණු ඇදහිලි ක්‍රමවේදයද ඔහුගේ සිතට පහන් වීමක් ලබාදීමට අසමත් විය. බයිබලයේ ඉගැන්වීම් පසෙක ලා ගොඩ නැගුණු එම නූතන ඇදහිලි ක්‍රමය ඔහුගේ සිතට අස්වැසිල්ලක් නොවීය. නූතන දර්ශන වේදය තුළ ඔහු අවුරුදු දොළසක් පමණ පැවතුණි. මේ වන විට හෙතෙම තිස් හතර වන වියට පා තබා තිබුණේය. එකල ශුද්ධාත්මයාණෝ ඔහුගේ සිතට කථා කළසේක; ඔහු තවමත් පව්කාරයෙකු බව උන්වහන්සේ ඔහුට ඒත්තු ගැන්වූ සේක. මිනී වළට ඔබ්බෙන් ප්‍රීතිය ඇතිවන බවක් ඔහුගේ දහම් වේදය තුළ දකගැනීමට හැකියාවක් නොවීය. අනාගතය තුළ අඳුර පිරී පැවැතියේය. එකල ඔහුගේ චින්තනයෙහි රජකළ හැඟීම් පිළිබඳව ඔහු පසු කාලයේදී මෙසේ විස්තර කළේය:

"මිනිසා විනාශ වන්නේය යන චින්තනය බියකරු සිත සලිත කරවන එකකි. සියළු දෙනාම ජීවිත සිදුවීම් පිළිබඳව ගණන් දිය යුතුය. මාගේ හිසට ඉහළින් තිබූ අහස පිත්තල වියනක් මෙන් විය; මා පය ගසා සිටි පොළොව යකඩ පලසක් බඳු විය. සදාතනය-එය කුමක්ද? ඒ අතර, මරණය - එය පැවතුණේ ඇයි? මා මේ ගැන ගැඹුරටම කල්පනා කළ අතර ප්‍රශ්නය වඩ වඩාත් ව්‍යාකූල වන්නට විය. මේ ගැන වැඩි වැඩියෙන් හේතු කාරණා සොයන්නාවූ අතර තීරණයක් කරා පැමිණීම අපහසු විය. කල්පනා සිතුවිලි නවතා දමීමට උත්සාහ කළද, ඒවා පාලනය කරගැනීම අපහසු විය. මම ඉතා අවාසනාවන්ත තත්ත්වයකට පත්ව සිටි නමුත් එයට හේතුව ගැන අවබෝධයක් මට නොවීය, මම මැසිවිලි කීවෙමි, දෝෂාරෝපණය කළෙමි. එහෙත් එය කවරෙකු ගැනදැයි නොදනිමි. වැරැද්දක් ඇති බව මට දනී ගිය නමුත් හරි දෙය සොයා ගන්නේ කෙසේද, එය ඇත්තේ

කිනම් තැනකදැයි දන නොසිටියෙමි. මම ශෝක විලාප නැගුවෙමි, නමුත් කිසිම බලාපොරොත්තුවක් පහළ නොවීය."

අනාගත ස්ථාවරයක් නැති මෙවන් තත්ත්වයක් උඩ ඔහු මාස ගණනාවක් රැඳී සිටියේය. හදිසියේම එම තත්ත්වය වෙනස් විය. ඔහු එම තත්ත්වය වචනයට නගන්නේ මෙසේය: "හදිසියේම ගැළවුම්කාරයාණන්ගේ චරිතය මාගේ මනසෙහි ස්ථානගත විය. එය ඉතා පැහැදිලි විය. ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමෙන් අප විසින් කරන ලද පාපයේ ශාපයේ දුක් විඳීම්වලින් අපව මුදවාලීමට ඒ සඳහා තමන්වහන්සේ විසින්ම වන්දිය ගෙවීමට තරම් කාරුණිකවූ ද, යහපත්වූ ද, තැනැත්තෙක් සිටින බව මට පෙනී ගියේය. එවන් තැනැත්තෙක් කෙතරම් මනෝහර සෙනෙහෙබර ආදරණීය අයෙක් දැයි මට එම මොහොතේදීම දනී ගියේය. එවැනි උත්තමයෙකුගේ දෑත්වලට වැටී එතුමාණන්ගේ දයා-කරුණාව විශ්වාස කරන්නට මට හැකි වේ නම් එය අගනා මිහිරි අත්දැකීමක් වනවාට සැකයක් නැති බව මට දැනුණි. ඒ සමගම ප්‍රශ්නයක් නැගී ආවේය. එවන් තැනැත්තෙක් ජීවත්ව සිටින බව ඔප්පු කළ හැක්කේ කෙසේද? එවන් ගැළවුම්කාරයෙක් ජීවත් වූ බවට සාක්ෂියක් හෝ අනාගතයේදී එවන් අයෙක් සිටිය හැකි යයි යන්නට සාක්ෂියක් ශුද්ධ බයිබලයෙන් හැරෙන්නට වෙනත් මාධ්‍යයකින් සොයා ගැනීම අපහසු බව මට පෙනුණි.

" මට අවශ්‍ය වන මෙබඳු මිදුම්කරුවාණන් කෙනෙකු සිටින බව ශුද්ධ බයිබලය තුළින් මට දකගැනීමට හැකියාව උදා විය. වැටී ගියාවූ ලෝකයේ අවශ්‍යතාවන්ට පරිපූර්ණ අයුරින් පිහිට විය හැකි ප්‍රඥප්ති මාලාවක් වර්ධනය කර ඉදිරිපත් කිරීමට ලෝකෝත්තර ආනුභාවයකින් පහස ලැබූ පොතකට හැකියාවක් අත්විය හැක්කේ කෙසේද යන්න මට මහත් ගැටළුවක් විය. ශුද්ධ ලියවිලි වනාහි දෙවියන්වහන්සේගෙන් ලැබුණු එළිදරව් කිරීමක් බව පිළිගැනීමට මට පුළුවන් විය, එම ලියවිලි මාගේ එකම ප්‍රීතිය විය. යේසුස්වහන්සේ තුළ මට මිත්‍රයෙකු සොයා ගැනීමට හැකි විය. දස දහසක් සහෝදරයන් අතරෙන් මාගේ ජීවිතයේ මුල් තැන මිදුම්කරුවාණන්ට හිමි විය. ඊට-පෙර අඳුරුව තිබූ පරස්පර විරෝධීන්ගෙන් ගහණ වූ ශුද්ධ ලියවිලි දැන් මාගේ පාදයන්ට පහනක් විය. මාගේ මාර්ගයට ආලෝකයක් විය. මාගේ මනස තැන්පත් ස්ථාවරයකට පත් විය. මාගේ ආත්මයට තෘප්තියක් උදා විය. සැඩ රළ පහරින් පීඩාවට පත්වූ මාගේ ජීවිතයට දෙව් සමිඳාණන් නොසැලවෙන්නාවූ පර්වතයක් බව මට සාක්ෂාත් විය. ශුද්ධ බයිබලය හැදෑරීම මාගේ ඒකායන අභිමතාර්ථය විය. මම ශුද්ධ බයිබලය ඉගෙන ගත්තේ මහත් ප්‍රීතියකින් බව නොපැකිළ පවසමි. ශුද්ධ බයිබලයේ අඩංගු ධර්මතාවන්ගෙන් අඩක් හෝ එතෙක් මා නොදන සිටි බව මට දකගත හැකි විය. බයිබලයෙහි අලංකාරයත් තේජස්ශ්‍රීයත් මා මෙතෙක් කලක් දක නොතිබුණේ මන්දැයි මම විස්මිත



වීමි. ශුද්ධ බයිබලීය කරුණු මා ප්‍රතික්ෂේප කර තිබුණේ කෙසේද යන්න මට ප්‍රහේළිකාවක් විය. මාගේ හදවතට අපේක්ෂා කළ හැකි සැම දෙයක්ම ශුද්ධ බයිබලයෙහි එළිදරව් කර ඇති බව මට පැහැදිලි විය. මාගේ ආත්මයෙහි ඇති සෑම රෝගයකටම පිළියමක් ශුද්ධ බයිබලයෙහි එළිදරව් කර ඇති බව දක මම විස්මිත වීමි. වෙනත් ප්‍රකාශන කියවීමෙහි ආශාව මාගෙන් ඉවත්ව ගියේය. දෙවියන්-වහන්සේගෙන් ප්‍රඥාව ලබාගැනීම මාගේ වෑයම විය." (Bliss, S; "Memoirs of Wm. Miller," p p. 65-67).

තමා විසින් කලින් ප්‍රතික්ෂේප කළ ආගම දහම තමා දැන් සිය කැමැත්තෙන්ම ප්‍රත්‍යක්ෂ ලෙස පිළිගත් බව මිලර් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. ශුද්ධ ලියවිල්ලෙහි පසුතලය වූ දිව්‍ය අධිකාරී බලයට එරෙහිව ඔහු විසින් ප්‍රබල තර්ක ඉදිරිපත් කර තිබිණ. ඔහුගේ දේව භක්තියෙන් තොර මිතුරෝ දැන් ඔහුට එරෙහිව එම තර්ක ඉදිරිපත් කරමින් පිළිතුරු ඉල්ලා සිටියහ. ඔවුන්ට පිළිතුරු දීමට එම අවස්ථාවේදී ඔහු තුළ සූදානමක් නොවීය. එහෙත් ඔහු මෙසේ තර්ක කළේය. 'ශුද්ධ බයිබලය දෙවියන්වහන්සේගෙන් වූ එළිදරව් කිරීමක් නම්, එහි ඇතුළත් ප්‍රකාශන තුළ එකිනෙක සමග සබඳතාවයක් ඇත, විෂයන් සම්බන්ධව පරස්පර විරෝධී මත ඇතුළත් විය යුතු නොවේ. තවද, එම හෙළිදරව් කිරීම් මිනිසාට ගුරු හරුකම් දීම සඳහා දෙන ලද්දේ නම්, එකී ඉගැන්වීම් තමාට තේරුම්ගත හැකි වන පරිදි යෝග්‍ය වීම අනිවාර්ය වන්නේය. එම නිසා ශුද්ධ ලියවිල්ල තමා විසින්ම අධ්‍යයනය කළ යුතු යයි ඔහු තීරණය කර ගත්තේය. මතු පිටින් පෙනෙන්නාවූ ශුද්ධ ලියවිලිවල විරෝධතා ප්‍රකාශන සමනය කර එකඟතාවකට පත්කිරීම ඔහුගේ ඒකායන වෑයම විය.

කලින් තිබූ සියලුම මති මතාන්තර ඉවතලමින් ශුද්ධ බයිබල් අටුවාවන් පසෙකලමින් ශුද්ධ බයිබලීය පද පමණක් උපකාරී කරගනිමින් බයිබලයේ අඩංගු ධර්මතාවන් ඉගෙන ගැනීමට ඔහු වෑයම් කළේය. යම්කිසි ආකාර පදනමක් මත, ක්‍රමානුකූලව තම අධ්‍යයනය කරගෙන යාමට ඔහු අදිටන් කරගත්තේය. තම අධ්‍යයනය උත්පත්ති පොතෙන් ආරම්භ කළ හෙතෙම පදයෙන් පදය විග්‍රහ කරමින් යථාර්ථය සොයා ගැනීමට වෙහෙසුණේය. බයිබල් විෂයන් සම්බන්ධව අනාගතයේදී කිසිම විටෙක ලැජ්ජාවට පත් නොවන අයුරු පුළුල් දැනුමක් ලබාගැනීමට ඔහු උත්සුක විය. යම්කිසි විෂයක් ගැන නොපැහැදිලි තත්ත්වයක් මතු වූ විට එම විෂය පිළිබඳව අදහස් දක්වා ඇති අනෙකුත් සෑම ශුද්ධ ලියවිලි පාඨ සමග එය සංසන්දනය කරමින් සුපැහැදිලි අර්ථයක් ගොඩ නගා ගැනීමට ඔහු වෑයම් කළේය.

යම්කිසි පාඨයක වූ සෑම පදයක්ම එහි අන්තර්ගත විෂය සමග ගැලපීමකට ලක් කර එය එම විෂය පිළිබඳව ලියවී තිබූ වෙනත්

බයිබල් පද හා ගැළපෙන්නේ නම් පමණක් ඔහු සෑහීමට පත් විය. යම්කිසි පාඨයක් අවබෝධ කරගැනීමෙහි අපහසුතාවක් උදාවූ විට, එම විෂය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නාවූ තවත් පාඨයක් හමුවන තුරු ඔහු අවංක විග්‍රහයක යෙදුණේය, සෑහීමකට පත්වන තුරු ඔහු අධ්‍යයනය අවසන් නොකළේය. දිව්‍යමය ආලෝකමත් කිරීමක් ඉල්ලමින් යාච්ඤාවෙන් යුතුව විලියම් මිලර් ශුද්ධ බයිබලය අධ්‍යයනය කළ අතරේදී කලින් අඳුරේ ගිලී තිබූ ධර්මතාවන් සහ ඉගැන්වීම් දැන් පැහැදිලිව පෙනෙන්නට පටන් ගත්තේය. "ඔබවහන්සේගේ වචනය එළිදරව් වීමෙන් ආලෝකය ලැබේ; එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ" යන ගීතිකාකාරයාගේ වදන්හි සත්‍යතාව ඔහුට අත්දකින්නට හැකි විය. (ගීතාවලිය 119:130)

දැඩි උනන්දුවකින් යුතුව හෙතෙම දානියෙල් සහ එළිදරව් පොත් අධ්‍යයනය කරමින් වෙනත් බයිබල් පාඨ අධ්‍යයනය කළ ක්‍රමවේදයම අනුගමනය කළේය. ඔහු දරූ වෑයම සාර්ථක ඵල දරමින් දිවැසි වැකි හා සංකේත තේරුම් ගැනීමට පුළුවන් වීමෙන් ඔහු ඉමහත් ප්‍රීතියට පත් විය. මීටපෙර පවසන ලද අනාවැකි වචනානුසාරයෙන්ම ඉටු වී ඇති බව ඔහු දුටුවේය. අනාවැකි තුළ ගැබ්වී ඇති විවිධ රූපාලංකාර, උපමාලංකාර, උපහැරණ, ප්‍රතිරූපාකාර ආදියෙහි තේරුම එම පද යෙදුම් හා බැඳිව විස්තර කර දී ඇති බව හෝ වෙනත් පාඨයන්හි එම යෙදුම් විස්තර කර දී ඇති බව ඔහුට වටහාගත හැකි විය. මෙසේ ඉදිරිපත් කර ඇති විස්තර, වචන අනුසාරයෙන් තේරුම්ගත යුතු බව ඔහුට සාක්ෂාත් විය. "ශුද්ධ බයිබලය වනාහි එළිදරව් කරනු ලැබූ සත්‍යතාවන් පද්ධතියක් බව තේරුම් ගැනීමෙන් මම සෑහීමකට පත් වීමි. එහි අඩංගු දෑ කෙතරම් සරලව පැහැදිලිව ඉදිරිපත් කර ඇත්තේද යත් එම දෑ ගවේෂණයට යෙදෙන තැනැත්තේ මෝඩයෙකු වුවද, ඔහුට කිසිසේත්ම වරදින්නට හැකි නොවේය" යි ඔහු පවසයි. ("Bliss, Memoirs of W. m. Miller" p. 70). පුරුකෙන් පුරුක සම්බන්ධ වෙමින් ඉදිරිපත් වූ සත්‍යතා දම්වැල ඔහුගේ වෑයම ඵල ගැන්වීමෙහි ලා ඉවහල් විය. අනාවැකි මාවතේ පෙරටම යන්නාවූ අතරේදී ඔහුට ලැබුණු ප්‍රගතිය ඔහුගේ සතුටට හා සෑහීමට හේතු විය. ස්වර්ගීය දූතයෝ ඔහුගේ මනස හසුරුවමින් ශුද්ධ ලියවිලි ඔහුට විවෘත කරමින් යථාර්ථය තේරුම් ගැනීමට ඔහුට උපකාර වූහ.

අතීතයේදී අනාවැකි සම්පූර්ණ වී තිබුණ අන්දම අනුව අනාගතයේදී සම්පූර්ණ විය යුතු අනාවැකිද සම්පූර්ණ වෙනවා ඇතැයි ඔහු තීරණය කළේය. එකල පැවැති ජනප්‍රිය සංකල්පයක් වූයේ ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික රාජ්‍ය පාලනය පිළිබඳ ඉගැන්වීමය. එම දසුන අනුව ලෝකයේ අවසානයට පෙර ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණ අවුරුදු දහසක් භූමික රාජ්‍ය පාලනයක් කරනවා ඇතැයි යන්න පවසන ලදී. මෙවන් ඉගැන්වීමක් ශුද්ධ බයිබලය තුළ අන්තර්ගතව නැති බව තම



අධ්‍යයනයෙන් තහවුරු වීමෙන් ඔහු සෑහීමට පත් විය. බයිබලීය ඉගැන්වීම අනුව යේසු සමිඳාණන් පුද්ගලිකව මෙලොවට පැමිණෙන දවසක් ඇත. එහෙත් ඉහත සඳහන් ඉගැන්වීම අනුව උන්වහන්සේගේ පැමිණීමේ දවසට පෙරාතුව මෙම භූතලය මත අවුරුදු දහසක සාමයෙන් පිරි ධර්මිෂ්ඨ රාජ්‍යයක් පිහිටුවනු ලබනවා ඇත, එමගින් ස්වාමින්වහන්සේගේ මහත් දවස, බිහිසුණු දවස, මිනිස් අවධානයෙන් තවත් ඈතට යොමු කරනු ලබනවා ඇත යන මෙම ඉගැන්වීම මිනිස් සිතට සැනසිලිදායක චින්තනයක් උදාකර දෙන නමුත්, එම දහම ක්‍රිස්තුස්වහන්සේගේ හා උන්වහන්සේගේ ගෝලයන්ගේ දෙසුම්වලට පටහැනි වූවක් බව ශුද්ධ බයිබලය සාක්ෂි දරයි. මක්නිසාදයත් කිතු සමිඳාණන් ඉගැන්වූයේ ලෝකයේ අවසන් දවස, එනම් අස්වනු නෙළීම උදාවන තෙක් තිරිඟු සහ කිරිඳි එක්ව වැඩෙන බවයි. (මතෙව් 13: 30, 38-40). එම කාල වකවානුවේදී "නපුරු මනුෂ්‍යයොත් රැවටිලිකාරයොත් රවටමින්ද රැවටෙමින්ද වඩ වඩා නරක්" වන බවද, "අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව" ද අපට දක්වා තිබේ. (2 තිමෝති 3:13,1). අන්ධකාරයෙහි රාජ්‍යය කිතු සමිඳාණන්ගේ දෙවන පැමිණීමේ දවස දක්වා ක්‍රියාත්මකව පවතිනවාය යන ඉගැන්වීම සත්‍යයකි. ඒ ඉරණම් දවසේදී, අඳුරේ රාජධානියෙහි පංගුකාරයෝ කිතු සමිඳුන්ගේ ශ්‍රී මුඛයේ හුස්මෙන් දැවී යන්නෝය, උන්වහන්සේගේ ඊමේ ප්‍රකාශ වීමෙන් ඔව්හු විනාශ කරනු ලබති. (2 තෙසලෝනික 2:8).

සකල ලෝ වැසි ජනතාව කිතුණු දහම පිළිගනු ලැබීම සහ කිතු සමිඳාණන් ආත්මික ලෙස රාජ්‍ය පාලනයක නිරත වීම යන දහම අපෝස්තුළුවරුන් විසින් ආරම්භ කළ මුල් සභාවෙහි ඉගැන්වීමක් නොවීය. මෙම ඉගැන්වීම මුල් කිතුණුවන් විසින් පිළිගත් සම්මතයක්ද නොවීය. එහෙත් දහ අට වැනි සියවසේ මුල් කාලයේදී මෙම ඉගැන්වීමෙහි පිළිගැනීමක් ගැන කිතුණු ඉතිහාසයෙහි සඳහන්ව ඇත. වෙනත් ව්‍යාජ ඉගැන්වීම් මෙන්ම මෙම ඉගැන්වීමෙහි ප්‍රතිඵලයද නපුරුදායක විය. ස්වාමින්වහන්සේගේ පැමිණීම බොහෝ දීර්ඝ කාලයකට පසුව සිදුවන්නේ යයි මෙම ඉගැන්වීම මගින් සහතික කරනු ලැබීම නිසා උන්වහන්සේගේ පැමිණීමේ පෙර නිමිති පිළිබඳව තැකීමක් නොකිරීමට මිනිස් අවධානය වෙනතකට යොමු කරනු ලැබීය. සත්‍යය විකෘති කරමින් ඉදිරිපත් කරනු ලැබූ එම ඉගැන්වීම මගින් දේව ජනතාවට ආරක්ෂිත භාවයක් සහ සැක රහිත උසස් බලාපොරොත්තුවක් ඇති විය. යේසු සමිඳාණන්ගේ පැමිණීම උදෙසා අවශ්‍ය සූදානම් වීමේ උවමනාව මෙම ඉගැන්වීම මගින් අතපසු කරනු ලැබීය.

ක්‍රිස්තුස්වහන්සේ පුද්ගලිකව මෙලොවට පැමිණීම ගැන ශුද්ධ ලියවිල්ලෙහි උගන්වා ඇති බව මිලර්ට ඒත්තු ගියේය. ඒ පැමිණීමේ

සංසිද්ධිය ගැන පාවුල් මෙසේ පවසයි: "මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක." (1 තෙසලෝනික 4:16,17). ගැළවුම්කාරයාණන්වහන්සේ මෙසේ පැවසූ සේක: "ඔව්හු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද මහත් තේජසින්ද අහසේ වළාකුල් පිට එනවා දකින්නෝය." "මක්නිසාද යම්සේ විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා පෙනේද මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එසේම වන්නේය." (මතෙව් 24: 30,27) උන්වහන්සේ ස්වර්ගීය සේනාව සමග එනවා ඇත. "මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග තමන්ගේ තේජසින් එන කළ," "උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන් එවන සේක. ඔව්හු .... උන්වහන්සේගේ තෝරා ගත්තවුන් රැස් කරන්නෝය." (මතෙව් 25:31;24:31).

යේසු සමිඳාණන්ගේ පැමිණීමේදී මිය ගියාවූ ධර්මිෂ්ඨයෝ මළවුන්ගෙන් නැගිටුවනු ලබති; ජීවත්ව සිටින්නාවූ ධර්මිෂ්ඨයෝ අමරණීය භාවයට වෙනස් කරනු ලබති. මෙම සිද්ධිය පාවුල් වාර්තා කරන්නේ මෙසේය: "අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නුමුත් අන්තිම හොරණෑව පිඹින කළ මොහොතකින්, ඇසිපිය හෙලන ක්ෂණයකින්, අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය. එකළ මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය. අපිද වෙනස් කරනු ලබන්නෙමුව. මක්නිසාද දිරන සුළු වූ මේක නොදිරන බවට පැමිණෙන්ට ඕනෑය. මරණීය වූ මේක අමරණීය භාවයටත් පැමිණෙන්ට ඕනෑය." (1 කොරින්ති 15:51-53). යේසු සමිඳාණන්ගේ දෙවෙනි පැමිණීම විස්තර කරමින් තෙසලෝනිකවරුන්ට යැවූ ලිපියෙහි පාවුල් මෙසේ පවසයි: "ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල් වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතර ස්වාමීන්වහන්සේ සමහ සිටින්නෙමුව." (1 තෙසලෝනික 4:16,17).

ක්‍රිස්තු සමිඳාණන් පුද්ගලිකව පැමිණෙන තුරු, උන්වහන්සේගේ සෙනඟට රාජ්‍යය ලබාගත නොහැකිය. කිතු සමිඳාණෝ මෙසේ වදාළ සේක: "මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග තමන්ගේ තේජසින් එන කළ, ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳින සේක. එවිට සියලු ජාතීහු උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලබන්නෝය. උන්වහන්සේ එඬේරෙකු විසින් එළුවන් කෙරෙන් බැටළුවන් වෙන් කරන්නාක් මෙන් ඔවුන් වෙන් කොට, බැටළුවන් තමන්ගේ දකුණු පැත්තේද එළුවන් වම් පැත්තේද සිටුවන සේක. එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියන සේක්: මාගේ පියාණන්ගෙන් ආශිර්වාද ලත්තෙනි, එන්න, ලෝකයේ පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුම කරගන්න." (මතෙව් 25:31-34). මෙසේ අප ඉදිරිපත්



කර ඇති ශුද්ධ ලියවිලි පාඨයන්ගෙන් සනාථ වන්නේ මනුෂ්‍ය-පුත්‍රයාණන් නැවත වඩින්නාවූ කල්හි මිය ගියාවූ දමිටුවන් අමරණය පැළඳ ගෙන, මළවුන්ගෙන් පිබිදී එන බවත්, ජීවත්ව සිටින්නාවූ දමිටුවන් වෙනස් කරනු ලබන බවත්ය. මෙම විශිෂ්ඨ වෙනස් කරනු ලැබීම මගින් ඔවුන්ව රාජ්‍යය ලබාගැනීම සඳහා සූදානම් කරනු ලැබේ. පාවුල් මේ පිළිබඳව මෙසේ පවසයි: "මාංසයට හා රුධිරයට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුම කරගන්ට බැරි බවත් දිරන ස්වභාවට නොදිරන ස්වභාව උරුම කරගන්ටත් බැරි බවත් කියමි." (1 කොරින්ති 15:50). මිනිසාගේ වර්තමාන ස්වභාවය මරණයට ගොදුරු වන සුළුය. ඔහු ජරාවට පත් වන්නේය. එහෙත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය අමරණීයය; එය සදාකල් පවතියි. එහෙයින් වර්තමාන ස්වභාවය සමගින් මිනිසාට දෙවියන්වහන්සේගේ මනරම් රාජ්‍යයට ඇතුළු විය නොහැක. නමුත් යේසු සමිඳාණන් නැවත පැමිණි විට උන්වහන්සේ තමන් ජනතාවට අමරණ භාවය හිමි කරදෙන සේක. මෙතෙක් උරුමක්කාරකම පමණක් හිමිව සිටින ජනතාවට දේව රාජ්‍යයෙහි අයිතිය හිමි කරදීමට උන්වහන්සේ ඔවුන්ට ඇරයුම් කරන සේක.

එකල පැවැති පොදු කිතුණු දහමක් වූයේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමට පෙරාතුව විශ්වය පුරා සාමය පවතින්ට යන බවට වූ ඉගැන්වීමය. විලියම් මිලර්ගේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය එම ඉගැන්වීම වැරදි බව සාක්ෂාත් කළේය. ක්‍රිස්තු සමිඳාණන්ගේ ඊමට පෙර සිදුවන බවට වූ ඒ ඉගැන්වීමෙහි සිද්ධීන් සත්‍ය වශයෙන්ම සිදුවන්නේ උන්වහන්සේගේ නැවත පැමිණීමෙන් පසුව බව මිලර්ගේ මනසට ප්‍රබල අයුරින් ඒත්තු ගියේය. ඒ සමගම එකල ලෝකයේ පැවති තත්ත්වයන්ද කාලයාගේ ලකුණුද අනාවැකියෙහි සඳහන්ව ඇති අයුරින් පවතින බවද, ඔහුගේ අධ්‍යයනය මගින් සනාථ විය. මෙම පෘථිවිය වර්තමාන ආකාරයෙන් පැවැතීමට නියම කර ඇති කාලය අවසන් වීමට ආසන්නය යන නිගමනය කරා එළඹීමට ඔහුගේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය ඔහුට බල කළේය.

"මාගේ මනසට තදින් කාවැදී ගිය තවත් සාක්ෂියක් නම් ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් සිද්ධීන් ඉටුවීමේ කාල පිළිවෙලය," යනුවෙන් ඔහු පවසයි. "අනාගතයේදී සිදුවන්නේ යයි කියා ඇති දිවැසි පැවසීම් බොහෝ අවස්ථාවන්හිදී, කියා ඇති කාල පරාසයක් තුළ ඉටු වී තිබේ. එවන් සිද්ධීන් සමහරක් මෙසේය: ජලගැල්මට පෙර දවස් හතක කාලය සහ කලින් කියා ඇති දවස් හතළිහක තද වැස්ස, (උත්පත්ති 7:4;) ආබ්‍රහම්ගේ වංශය අවුරුදු හාරසියයක් විදේශගතව තම ස්වාමිවරුන්ට සේවය කරන අයුරු (උත්පත්ති 15:13.) රජ්ජුරුවන්ගේ කුසලාන දරන්නාගේද පූප සාදන්නාගේද සිහින තෙදිනක් ඇතුළත ඉටුවන බව, (උත්පත්ති 40:12-20); ඵාරාවෝගේ අවුරුදු හත, (උත්පත්ති 41:28-54;) කාන්තාර පාළුකරයේ අවුරුදු හතළිහක් ඔබ මොබ

යාම, (ගණන් කථාව 14:34;) අවුරුදු තුනහමාරක සාගතය (1 රාජාවලිය 17:1) වසර හැත්තෑවක වහල්කම (යෙරෙමියා 25: 11;) නෙබුකද්නෙශර්ගේ කාල සත, (දානියෙල් 4:13-16;) යුදෙව්වන් වෙනුවෙන් නියම කරන ලද සති හත සමග තවත් සති හැට දෙකක් සහ සතියක කාල පරාසය-සති හැත්තෑවක කාලය, (දානියෙල් 9:24-27) මෙවන් ජීවිත කාල වකවානුවක් තුළ ඉටුවේ යයි අනාවැකි බසින් කී සිද්ධීන් එකී නියමිත කාලයන් තුළදීම ඉටුවීම මාගේ තීරණ ගැනීම් කෙරෙහි මහත් බලපෑමක් ඇති කළේය." (Bliss, "Memoirs of Wm. Miller," pp. 74,75).

මෙලෙස තමාගේ බයිබලීය අධ්‍යයනය කරණකොටගෙන ඔහුට සැකයෙන් තොරව සාක්ෂාත් වූයේ ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් අනාවැකි කාල වකවානු ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම තෙක් විහිදී පවතින බවය. එකී ලකුණු වනාහි දෙවියන්වහන්සේ විසින් තමන් දිවැසිවරුන් ලවා පවසා ඇති "උන්වහන්සේ පිළියෙල කළ කාලවල්" පිළිබඳව කර ඇති ප්‍රකාශන බව ඔහු විශ්වාස කළේය. දිවැසිවර මෝසෙස් මේ පිළිබඳව විස්තරයක් කර ඇත "රහස් වූ දේ අපේ දෙවිවූ ස්වාමීන්-වහන්සේට අයිතිය. එහෙත් ... එළිදරව් කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය" (ද්විතීය කථාව 29:29). මේ අතර දෙවි සමිඳාණන් ආමොස් දිවැසිවරයා ලවා මෙසේ පවසනසේක. "සැබවින්ම ස්වාමි වූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන් වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරන සේක." (ආමොස් 3:7). එම නිසා දේව වචනය අධ්‍යයනය කරන්නාවූ සිසුන්ට සත්‍යතාවේ ශුද්ධ ලියවිලි මගින් මනාව තේරුම් යන්නේ ආශ්චර්ය සම්පන්න මෙම සංසිද්ධිය පිළිබඳවද විස්තරාත්මක කරුණු එළිදරව් කරනු ලැබ ඇත යන්නය.

තම අධ්‍යයනය තුළින් පැමිණි තීරණය ගැන විලියම් මිලර් මෙසේ පවසයි: "දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ... ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16) "මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසිකලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්-මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය." (2 පේතෘස් 1:21) "මක්නිසාද ඉවසිල්ල කරණ-කොටගෙනද ලියවිලිවලින් හටගන්න සැනසිල්ල කරණකොටගෙනද අප බලාපොරොත්තු ඇතුව සිටින පිණිස, පූර්වයෙහි ලියන ලද සියල්ල අපගේ ඉගෙනීම සඳහා ලියන ලද්දේය." (රෝම 15:4) ශු. බයිබලයේ අඩංගු කාල නිර්ණයන් පිළිබඳව වූ කොටස් බයිබලයේ අනෙකුත් ප්‍රකාශන හා සමානව අපගේ අවධානයට යොමු විය යුතු බව මට සාක්ෂාත් විය. දෙවියන්වහන්සේ ස්වකීය මෛත්‍රී-කරුණාව කරණකොටගෙන අපට එළිදරව් කිරීමට සුදුසු යයි තීරණය කර දෙවා වදාරා ඇති කාල නිර්ණ අනාවැකි කිසිම අයුරකින් හෝ



නොසලකා හැරීමට නොහැකි බව මට ඒත්තු ගියේය. (Bliss "Memoirs of Wn. Miler," p. 79).

දෙවෙනි පැමිණීම පිළිබඳව පැහැදිලිව එළිදරව් කර ඇති අනාවැකිය දානියෙල් 8: 14 විය. ඒ මෙසේය: "රෑ දහවල් දෙදහස් තුන්සියයක් පසුවන තුරුය. එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය." ශුද්ධ බයිබලයේම පාඨයන් මගින් අනාවැකි වටහාගැනීම විලියම් මිලර්ගේ අදහස වූ නිසා අනාවැකි සංකේතවල දවසක් මගින් අවුරුද්දක් පෙන්නුම් කරන බව ඔහු තේරුම් ගත්තේය. (ගණන් කථාව 14:34; එසකියෙල් 4:6). මේ අනුව දීවැසි දවස් 2300 ක් හෝ අවුරුදු 2300 ක් වූ කාල පරාසය යුදෙව්වන්ට දෙවියන්වහන්සේ දුන් නියමයෙන් ලබා දී තිබූ නිශ්චිත කාලයට වඩා ඉදිරියට විහිදී යන බව ඒත්තු ගිය මිලර් දිවැසි කාලයේ අවසානය යුදෙව්වන්ගේ දේව මාළිගාව හා සම්බන්ධව නැති බව තේරුම් ගත්තේය. ක්‍රිස්තියානි යුගයට අදාළ වූ ශුද්ධස්ථානය වන්නේ මෙම භූමිය බව එකල පැවැති පොදු පිළිගැනීම විය. ඒ අනුව විලියම් මිලර් මෙම නිගමනයට පැමිණියේය. පොළොව දේවස්ථානය නම් එය පවිත්‍ර කිරීම යනු භූමිය ගින්නෙන් පවිත්‍ර කරනු ලැබීම යයි ඔහු තීරණය කළේය. දවස් දෙදහස් තුන්සියයක් වූ අනාවැකි කාලයේ ආරම්භය සොයාගත හැකිවේ නම් දෙවෙනි ඊම සිදුවන කාලය තීරණය කරගත හැකිවන බව ඔහුගේ විශ්වාසය විය. එවිට ගින්නෙන් දැවී විනාශ වන්නාවූ ඒ අග්නි ජාලය සිදුවන දවස එළිදරව් කරගත හැකිවන බව ඔහු විශ්වාස කළේය. වර්තමාන තත්ත්වයේ විනාශය දකින්නාවූ ඒ දවසේදී "සෑම ආකාර උඩගුකමක් සහ බල තණ්හාවක්ම, උදාරම් ලෙස හැසිරීමක් සහ නිෂ්ඵලතාවක්ම, දුෂ්ටකමක් හා තාඩන පීඩනයන්ට ලක් කිරීමක්ම නිමාව දකින්නේය." ඒ දවසෙහිදී "ශාපය පොළෝ තලයෙන් ඉවත් කරනු ලබන්නේය, මරණය විනාශ කරනු ලබන්නේය, දේව සේවකයන්ටද, දිවැසිවරුන්ට සහ ශුද්ධවන්තයන්ටද උන්වහන්සේගේ නාමයට බිය ගරුසරු දක්වූ අයටද තිළිණ දානය කරනු ලබන්නේය, පොළොව විනාශ කළ අයව විනාශ කර දමනු ලබන්නේය." (Bliss, "Memoirs of Wm. Miller " p. 76).

ඉමහත් උනන්දුවකින් යුක්තව විලියම් මිලර් අනාවැකි පිරික්සා බැලීමට ප්‍රබල උත්සාහයක යෙදුණේය. ශුද්ධ ලියවිලි පිරික්සමින් දහවල් කාලයේ පමණක් නොව නිදි මරමින් රාත්‍රී කාලයද ඔහු මේ සඳහා මිඩංගු කළේය. මහා පරිමාණයේ වැදගත්කමක් දරු අළුත් විෂය මාලාව කෙරෙහි හෙතෙම මහත් අවධානයක් යොමු කළේය. දානියෙල් 8 වැන්නෙහි දවස් දෙදහස් තුන්සීයෙහි ආරම්භය සොයා ගැනීමට හේ අසමත් විය. දානියෙල් හට ලබාදුන් දසුන ඔහුට තේරුම්ගත හැකිවන අයුරින් පහදා දීමට ගාබ්‍රියෙල් දූතයා අණ ලැබූ නමුත් හෙතෙම දානියෙල්ට ලබා දුන්නේ අඩ විස්තර කිරීමක් පමණකි.

සහාව මත පතිත වන්නාවූ භයානක හිංසා පීඩා සංහාරය එළිදරව් කිරීමත් සමගම දානියෙල්ගේ කාය ශක්තිය ඔහු කෙරෙන් පලා ගියේය. හෙළි කරන්නාවූ දේවල් තවදුරටත් දරාගැනීමට දානියෙල්ට හැකියාවක් නොවූයෙන් දේව දූතයා ඔහුගෙන් ඉවත්ව ගියේය. අනාගතය ගැන ඇසීමෙන් දානියෙල් ක්ලාන්ත විය, ඔහු දවස් ගණනක් ලෙඩ වී සිටියේය. "මම දර්ශනය ගැන විශ්මපත්ව සිටියෙමි; නුමුත් කිසිවෙක් ඒක තේරුම් නොගත්තේ"යයි දානියෙල් පවසයි. (දානියෙල් 8:27).

"ගාබ්‍රියෙල් මොහුට මේ දර්ශනය තේරුම් කරදෙන්න"යි දෙවියන් වහන්සේ තම පණිවිඩකරුවාට පවසා තිබුණේය. මෙම අණ පිළිපැදිය යුතුය. එයට කීකරුවීමෙන් ටික දිනකට පසුව දේවදූතයා දානියෙල් වෙතට පැමිණියේය. ගාබ්‍රියෙල් දූතයා දානියෙල් අමතමින් මෙසේ පැවසීය: "එම්බා දානියෙල්, තේරුම් ගැනීමේ දක්ෂකම නුඹට දෙන්ට දැන් පිටත්ව ආවෙමි... ඒ නිසා කාරණය කල්පනා කොට දර්ශනය තේරුම් ගන්න." (දානියෙල් 9:22,23). දානියෙල් අටවැන්නෙහි වූ දර්ශනයෙහි එක්තරා වැදගත් කොටසක් පමණක් විස්තර නොකර තිබිණ. දර්ශනයෙහි කාලය පිළිබඳව නිශ්චිතයක් දූතයාගේ විස්තර කිරීමෙහි අඩංගු නොවීය. එහෙයින් දර්ශනය තේරුම් කරදීමට දෙවන වර පැමිණි දූතයා කාලය පිළිබඳ ප්‍රශ්නය තේරුම් කරදීමට විශේෂ අවධානයක් යොමු කළේය.

දූතයා ස්වකීය විස්තර කිරීම මෙසේ කරගෙන ගියේය. "නුඹේ සෙනඟත්, නුඹේ ශුද්ධවූ නුවරත් ගැන සති හැත්තෑවක් නියම කර තිබේ. එබැවින් නුඹ මෙසේ දැනගෙන තේරුම් ගන්න. එනම් යෙරුසලම නැවත පිහිටුවා ගොඩ නගන්ට ආඥාවක් ලැබෙන තැන් පටන් අධිපතියා වූ ආලේප ලත් තැනැත්තා දක්වා සති හතක්ද, සති හැට දෙකක්ද තිබෙන බවය. කැළඹීම් සහිත කාලවලදී වුවත්, වීදියත් අගලත් (ප්‍රාකාරයත්) නැවත ගොඩ නගනු ලබනවා ඇත. සති සැට දෙකකට පසු ආලේප ලත් තැනැත්තා සිඳ දමනු ලැබේ. කිසිවෙක්ද ඔහුට නොවන්නේය. (එසේ වන්නේ තමා වෙනුවෙන්ම නොවේ).... ඔහු සතියකට බොහෝ දෙනෙකු සමග ගිවිසුමක් ස්ථිර කොට සතිය මැදදී යාගයත්, ආහාර පූජාවත් නවත්වන්නේය." (දානියෙල් 9:24,25-27)

දානියෙල් අටෙහි සඳහන් දර්ශනයෙහි දානියෙල්ට තේරුම් ගැනීමට නොහැකි වූයේ කාලය පිළිබඳවය, එනම් "රෑ දාවල් දෙදහස් තුන්සියයක් පසුවන තුරුය, එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය," යන්නය. මෙම දර්ශනයෙහි අර්ථකථනයක් දීමට දෙවන වර පැමිණි ගාබ්‍රියෙල් දූතයා "කාරණය කල්පනා කොට දර්ශනය තේරුම් ගන්න"යි දානියෙල්ට පැවසුවාට පසුව හෙතෙම දානියෙල්ගේ අනවබෝධයට හේතු වූ දෑ විස්තර කිරීමට පටන් ගත්තේය. "නුඹේ සෙනඟත්, නුඹේ ශුද්ධවූ නුවරත් ගැන සති සැත්තෑවක් නියම කර තිබේ." මෙහි "නියම කර



තිබේ" යන්නෙහි මුල් අදහස වන්නේ වෙන්කර තිබේ යන්නය. සති හැත්තෑවකින් අදහස් වූයේ අවුරුදු හාරසිය අනූවක් යුදෙව්වන් උදෙසා වෙන් කර තිබෙන බවය. දේව දූතයා පැවසූ පරිදි අවුරුදු හාරසිය අනූවක් කපා හැර ඇත්තේ කුමකින්ද? අට වන පරිච්ඡේදයෙහි සඳහන්ව ඇති කාල වකවානුව වන්නේ දවස් 2300 යේ අනාවැකිය පමණකි. එම නිසා වසර හාරසිය අනූවක් කපා හැර ඇත්තේ වසර දෙදහස් තුන්සීයෙන් බව පිළිගත හැක. එසේම, මෙම කාලපරිච්ඡේද දෙකම එකම වසරකින් ආරම්භ විය යුතු යයි නිගමනය කළ හැකිය. දේව දූතයාගේ විග්‍රහය අනුව, සති හැත්තෑවක කාලයේ ආරම්භය වන්නේ යෙරුසලම නැවත පිහිටුවා ගොඩ නගන්නට ආඥාවක් නිකුත් වීමේ සිද්ධියත් සමගය. මෙම ආඥාව නිකුත් කළ දිනය තහවුරු කරගත හැකි වේ නම් දවස් දෙදහස් තුන්සියයක් වූ දීර්ඝ කාලීන අනාවැකියෙහි ආරම්භයත් තීරණය කරගත හැකි වන්නේය.

මෙම ආඥාව එස්රා 7: 12-26 දක්වා වූ පදවල අන්තර්ගතව ඇත. සෑම පැතිකඩක්ම ඇතුළුව මෙම සම්පූර්ණ ආඥාව නිකුත් කරනු ලැබුවේ පර්සියාවේ අධිරාජයා වූ අර්තක්ෂස්තා විසින් ක්‍රි: පූ: 457 දීය. නමුත් යෙරුසලමෙහි පිහිටි දෙවි සමිඳාණන්ගේ මාළිගාව "කෝරෙෂ්ගේ ද, දාරියුස්ගේ ද, පර්සියාවේ රජවූ අර්තක්ෂස්තාගේ ද නියෝගය හැටියට ගොඩනගා"නිම කරන ලද බව එස්රා 6:14 දක්වයි. මෙම රජවරුන් තිදෙනා විසින් වසර 2300 යේ අනාවැකියෙන් ඉල්ලා සිටි නියෝගය පරිපූර්ණ ලෙසින් නිකුත් කරන ලදී. එම නියෝගය ඔවුන්ගේම කැමැත්තෙන් ස්ථාපිත කරන ලදුව අඩු ලුහුඬුකමින් තොරව නිකුත් වීමත් සමගම වසර 2300 යේ පටන්ගැන්ම ආරම්භ විය. ආඥාව සම්පූර්ණ වශයෙන් නිකුත් කළ දිනය වන ක්‍රි: පූ: 457 අනාවැකියේ ආරම්භය ලෙස ගණන් ගනු ලබන්නේ නම් සති හැත්තෑවක කාලය තුළදී ඉටුවිය යුතු සිද්ධීන් අකුරටම ඉටුවී ඇති බව සාක්ෂාත් විය.

"යෙරුසලම නැවත පිහිටුවා ගොඩ නගන්ට ආඥාවක් ලැබෙන තැන් පටන් අධිපතියා වූ ආලේප ලත් තැනැත්තා දක්වා සති හතක්ද, සති හැට දෙකක්ද තිබෙන බව" දක්වන ලදී. මෙයින් දක්වෙන්නේ එම කාල පරාසය සති 69 ක් නැතහොත් අවුරුදු 483 ක් වන්නේය යන්නය. ආඥාව නිකුත් වූ දිනය ක්‍රියාත්මක වූයේ ක්‍රි: පූ: 457 සරත් සෘතුවේදීය. මේ දිනයේ සිට වසර 483 ක් ගෙවී ගිය කල්හි ක්‍රි: ව: 27 සරත් සෘතුව උදා වන්නේය. ඒ අවස්ථාවේදී මෙම අනාවැකිය සම්පූර්ණ විය. මෙසියස්වහන්සේ යනු ආලේප ලත් තැනැන්වහන්සේය. ක්‍රි: ව: 27 හි සරත් සෘතුවේදී ක්‍රිස්තුස්වහන්සේ යොහන් වෙතින් බව්තීස්මය ලබා ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභිෂේකය නැතහොත් ආලේපය ලැබූ සේක. "දෙවියන්වහන්සේ, ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද, නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බව" පේතෘස් ප්‍රකාශ කරයි. (ක්‍රියා

10:38). ගැළවුම්කාරයාණන්වහන්සේ තමන් පිළිබඳව මෙසේ ප්‍රකාශ කළසේක: "ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළසේක" (ලූක් 4:18). තමන්ගේ බව්තීස්මයෙන් පසුව, "යේසුස්වහන්සේ ගලීලයට පැමිණ, දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරමින් කාලය සම්පූර්ණ විය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය"යි ප්‍රකාශ කළසේක. (මාර්ක් 1:14,15).

ඔහු සතියකට බොහෝ දෙනෙකු සමග ගිවිසුමක් ස්ථිර කරන බව පවසන ලදී. මෙම වලංගු ගිවිසුමෙහි සතිය අනාවැකියෙහි සඳහන් සති හැත්තෑවේ අන්තිම සතියයි. යුදෙව්වන් සඳහා දෙනු ලැබූ කාලයෙහි අන්තිම සතිය මෙය වන්නේය. ක්‍රි: ව: 27 සිට ක්‍රි: ව: 34 දක්වා වූ මෙම වකවානුවෙහි මුල් කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ පුද්ගලිකවත්, පසුව උන්වහන්සේගේ ගෝලයෝත් යුදෙව්වන්ට ශුභාරංචිය ප්‍රකාශ කළහ. රාජ්‍යයේ ශුභාරංචිය රැගෙන ගෝලයන් යන්නාවූ අතරේදී ගැළවුම්කාරයාණෝ ඔවුන්ට මෙවන් උපදෙසක් ලබා දුන් සේක. "අන්‍යජාතීන්ගේ කිසි මාවතකට නොගොස්, සමාරියයන්ගේ කිසි නුවරකට ඇතුල් නොවී, ඉශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතට යන්න" (මතෙව් 10:5,6).

"සතියේ මැදදී යාගයත්, ආහාර පූජාවත් නවත්වන්නේය."" යේසුස්වහන්සේගේ බව්තීස්මයෙන් පසුව වසර තුන හමාරක් ගෙවී ගිය විට ක්‍රි: ව: 31 දී අපගේ ක්‍රිස්තු සමිඳාණෝ කුරුසිය මත තම ජීවිතය පූජා කළසේක. කල්වරියේදී පුදකරන ලද මෙම අති උත්කෘෂ්ට පූජාවත් සමගම වසර හාර දහසක් පුරා දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාණන් වෙත යොමුව පැවැති පුද පූජා පද්ධතිය නිමාවට පත් විය. සංකේතයක් වූ පූජා මාලාව මූර්තියට ඉඩ දී නිමාවට පත්විය.

යුදෙව් ජනතාව වෙනුවෙන් වෙන් කරන ලද සති හැත්තෑව නොහොත් අවුරුදු 490 අප දක ඇති පරිදි ක්‍රි: ව: 34 දී නිමාව දැක්කේය. මෙම වසරේදී යුදෙව් "සැන්හෙන්ඩ්‍රින්" මන්ත්‍රණ සභාව නොහොත් යුදෙව් ආගමික ශ්‍රේෂ්ඨාධිකරණය යේසුස්වහන්සේ වදාළ ශුභාරංචිය ප්‍රතික්ෂේප කළේය. ඔවුහු ස්තේඵන්ව වේදසාක්ෂිකරුවෙකුගේ මරණයට පත් කළෝය, කිතුණු අනුගාමිකයන්ට හිංසා පීඩා කළෝය. දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟට පමණක් මෙතෙක් සීමා කර තිබූ ගැළවීමේ පණිවිඩය එදා පටන් සකල ලෝකයා සඳහා දානය විය. පැමිණි වධ හිංසා පීඩා නිසා යෙරුසලමෙන් පලා යන්නට බල කරනු ලැබූ ගෝලයෝ "ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය" "පිලිප් සමාරිය නුවරට ගොස් එහි සිටියවුන්ට ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශ කළේය." දිව්‍ය මගපෙන්වීමක පහස ලැබූ පේතෘස් සේවා කණ්ඩායම් සියයකට මුළාදෑනියෙක් වූ දේව බිය තිබූ කොර්නේලියස්ට ශුභාරංචිය



විවෘත කරමින් එය පහදා දුන්නේය. දේව පණිවිඩය බෙදා දීම සඳහා දැඩි උත්සාහයක් ගත් පාවුල්ට ක්‍රිස්තුස්වහන්සේ කථා කරමින්, "මම නුඹ මෙයින් බොහෝ ඈතට අන්‍යජාතීන් වෙතට යවන්නෙමි"යි කියා විශේෂ වැඩ කොටසක් ඔහුට පවරා දුන්සේක. ඔහු එකී කාර්ය භාරය විශිෂ්ඨ ආකාරයෙන් ඉටු කළේය.

දිගු කාලීන අනාවැකියෙහි සිද්ධීන් මෙතෙක් අකුරටම ඉටු වී තිබිණ. මතභේදයකින් තොරව සති හැත්තෑවේ වකවානුව ක්‍රි: පූ: 457 දී ආරම්භ වූ බවද එය ක්‍රි: ව: 34 දී නිමාවට පත්වූ බවද සාක්ෂාත් විය. මේ අනුව දවස් දෙදහස් තුන්සියයක් වූ කාල පරාසය අවසන් වන දිනය නිශ්චිතවම තීරණය කරගත හැකි වන්නේය. සති හැත්තෑවක් - දවස් 490 - අනාවැකියෙහි දවස් 2300 න් කපා හැරිය කල්හි දවස් 1810 ක් ඉතිරි වන්නේය. දවස් 490 ක් ඉකුත්ව යැමත් සමගම තවත් දවස් 1810 ක සිද්ධීන් ඉටුවිය යුතුව තිබේ. ක්‍රි: ව: 34 සිට වසර 1810 ගෙවී යාමත් සමගම ක්‍රි: ව: 1844 වසර වෙත අවධානය යොමු වන්නේය. ඒ අනුව දානියෙල් 8: 14 හි අන්තර්ගත දවස් 2300 ද 1844 දී නිමාව දකින්නේය. මෙම දිගුකාලීන අනාවැකිය එහි නිමාව දකිත්ම දෙවියන්වහන්සේගේ දේව දූතයාගේ සාක්ෂිය අනුව "ශුද්ධ-ස්ථානය පවිත්‍ර කරනු ලබනවා ඇත." ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ ක්‍රියාදාමය සිදුවන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමේදී බවට විශ්වීය චින්තනයක් විය. අනාවැකිය තුළින් ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ සිද්ධිය ඉටුවන්නාවූ කාලය නිශ්චිත වශයෙන්ම පෙන්නුම් කර දී ඇත.

විලියම් මිලර් සහ ඔහුගේ සහකරුවන් විශ්වාස කළේ අනාවැකියෙහි දවස් 2300 නිමවන්නේ 1844 වසන්ත සමයේදී බවයි. එහෙත් අනාවැකිය අනුව එය එම වසරේ සරත් කාලයේ නිමවීම පෙන්නුම් කළේය. ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම 1844 වසන්ත සමයේ සිදුවේ යයි බලාපොරොත්තුව සිටි දහස් සංඛ්‍යාත බැතිමතුන්ගේ බලා-පොරොත්තු සුන්වී ගියේය. සැවොම මහත් වියවුලකට පත් වූහ. කෙසේ වුවද දවස් 2300 යේ අනාවැකිය 1844 දී නිමාවට පත්වන්නේ යයි වූ පදනමට සෘතුව වෙනස් වීම මගින් කිසිම හානියක් සිදු නොවීය. ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ විශිෂ්ඨ කර්තව්‍යය 1844 දී සිදුවිය යුතු බවට වූ කල්පිතය කිසිසේත් වෙනස් නොවීය.

ශුද්ධ ලියවිලි අධ්‍යයනයෙන් විලියම් මිලර් ස්වකීය අදහස් ගොඩනගා ගත්තේය. ශුද්ධ ලියවිලි ඉගෙනීමට පටන්ගත් විට තමා මෙබඳු තීරණයකට පැමිණෙනවා ඇතැයි මිලර් කිසිසේත් කල්පනා කළේ නැත. තමාට එළිදරව් කිරීම ලැබුණේ දෙවියන්වහන්සේගෙන් බව ඔහු විශ්වාස කළේය. තමාගේ තීරණාත්මක නිශ්චිතයන් තමාගේම වෑයමින් සොයාගත් මතයන් යයි ඔහු පිළිගත්තේ නැත. ශුද්ධ ලියවිලි ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ සාක්ෂි, නොසලකා හැරීමට බැරි තරම් ප්‍රබල විය.

බයිබලය හැදෑරීම සඳහා ඔහු වසර දෙකක් අඛණ්ඩව කාලය ගත කළේය. එයින් පසු හෙතෙම ගාම්භීර නිගමනයකට පැමිණියේය. දේව වචනයෙන් ලැබූ ස්ථිරසාර ප්‍රකාශන සහතිකය නිසා ඔහු එම නිගමනය නිවැරැදි යයි විශ්වාස කළේය. තමන්ගේ ජනතාව මුදාගැනීම උදෙසා ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙන බව ඔහු ප්‍රකාශ කළේය. මෙම නිගමනය කරා ඔහු පැමිණියේ 1818 දීය. වසර දෙකක් පුරා බයිබලය හදාරා ඔහු ප්‍රකාශ කළේ තවත් අවුරුදු විසි පහකින් පමණ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සිදුවන බවය. විලියම් මිලර් මෙසේ පවසයි. "සමෘද්ධිමත් නව යුගයක උදාව බලාපොරොත්තුවෙන් මාගේ සිත ප්‍රීතියෙන් උතුරා ගියේය. මිදීම ලැබූවන්ගේ සිත් සතන්හි ජනිත වන්නාවූ මහත් ආනන්ද ජනක ආශ්වාදය සමග පංගුකාරකමක් ඇති කරගැනීමට මාගේ හදවත ඉමහත් බලාපොරොත්තුවකින් උතුරා ගියේය. ශුද්ධ බයිබලය මට අළුත් පොතක් බවට පත් විය. බයිබලය තර්කානුකූල ප්‍රකාශනවලින් පිරි රස බොජුන් බඳුනක් යයි මට හැඟී ගියේය. අඳුරුවූ ද, ගුප්තවූ ද, නොපැහැදිලිවූ ද ඉගැන්වීම් බයිබලයෙහි අඩංගු යයි මා මෙතෙක් කල් සිතා සිටි නමුත් ඒ ඉගැන්වීම් පිළිබඳව වූ අඳුර මාගේ සිතෙන් පහව ගියේය. ශුද්ධවූ පිටු තුළින් ප්‍රභාමත් වූ පැහැදිලි ආලෝක දහරාවන්ගෙන් සකල අඳුරු දෑ ඉවත්ව ගියේය. කෙතරම් තේජස්ශ්‍රී මහිමතාවෙන් සහ දීප්තියෙන් සත්‍යතාව බැබළෙන්නට වීද යත් පූර්වයෙහිදී දේව වචනය තුළ මා දුටු පරස්පර විරෝධතා මෙන්ම නොගැළපීම්ද පහව ගියේය. ශුද්ධ බයිබලයෙහි සමහර ඉගැන්වීම් පිළිබඳව මා සෑහීමකට පත් නොවූවද, එකී කරුණු ගැන පූර්ණ අවබෝධයක් මට ඇති විය. කෙසේ වුවද, මෙතෙක් අඳුරේ ගිලී තිබූ මාගේ මනස ශුද්ධ බයිබලයෙන් නික්ම ආ ප්‍රභාසර ආලෝකයකින් කොපමණ දීප්තිමත් වීද යත් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීම මට සතුට හා සාමය උදා කළේය. බයිබලයෙහි අඩංගු ඉගැන්වීම් තුළින් එවන් අත්දැකීමක් උදා වේ යයි මින් පෙර කිසිදිනක මට කල්පනා නොවීය." (Bliss "Memoirs" of Wm Miller" pp. 76, 77).

"ඉදිරියෙහි ඇත්තාවූ ඉතා කෙටි කාලය තුළදී ක්‍රියාත්මක වීමට නියමව ඇති ඉතා භාරදූර සිද්ධීන් පිළිබඳව මා තුළ වූ වගකීමක චින්තනයකින් මාගේ සිත වෙළී ගියේය. මාගේ මනසෙහි ඉතා ප්‍රබල ආකාරයකින් වෙනසක් ඇති කිරීමෙහි ලා හේතු කාරක වූ සාක්ෂි අනුව ලෝකයාට මාගෙන් ඉටු විය යුතු වූ වගකීම් භාරය ගැන වූ සිතුවිල්ලෙන් මාගේ සිත සලිතව ගියේය." (Bliss "Memoirs of Wm. Miller", p. 81). තමා ලැබූ ආලෝකය තවත් අයටත් බෙදා දිය යුතු යයි ඔහුගේ සිත ඔහුට වද දෙන්නට විය. දේව බිය නැති අයගෙන් බාධා පැමිණෙතැයි ඔහු කල්පනා කළ අතර තමන් ආදරය කරන්නාවූ ගැළවුම්කරුවාණන් මුණගැසීමේ බලාපොරොත්තුවෙන් දිවි ගෙවන්නාවූ කිතුණු සැමගේ සහයෝගය තමාට ලැබෙනවා ඇතැයි ඔහු විශ්වාස කළේය. ස්වර්ගීය පණිවිඩය පිළිගැනීම පිළිබඳව ඔහුගේ සිත එක්තරා



බියකින් සලිත වී ගියේය. ඉතා ඉක්මණින් යථාර්ථයක් බවට පත්වන්නාවූ මහිමාන්විත මුදවා ගැනීමේ ක්‍රියාවලියෙන් දේව ජනතාව උද්දාමයට පත්වනවා නියතය. ප්‍රමාණවත් ශුද්ධ ලියවිලි අධ්‍යයනයක් මගින් සත්‍යතාව පැහැදිලිව අවබෝධ කරගත්තේ නැතිව, ඇසූ පමණින් මෙම දෙවන ඊමේ දහම බොහෝ අය පිළිගන්නවා ඇද්ද යන්න ගැන ඔහු තුළ චකිතයක් විය. බයිබලීය අධ්‍යයනය මගින් තමා ලැබූ දහම් ආලෝකය තවත් අය සමග බෙදා ගැනීමට ඔහු තරමක් පසුබා සිටියේය. යම් හෙයකින් තමාගේ තීරණය සත්‍යය නොවේ නම් තමාගේ ඉගැන්වීම් මගින් තවත් අය නොමඟ යැවීමේ වරදට තමා පාත්‍ර වේ යයි බියක් ඔහු තුළ ඇති විය. තමා ගත් තීරණය නැවත වරක් පුනරීක්ෂණය කිරීමට ඔහු සිතා ගත්තේය. තමාගේ සිතට පැමිණි සෑම ගැටළුවකටම විසඳුම් සෙවීමට ඔහු අමතක කළේ නැත. ළහිරු රැසින් තුෂාර බිංදු පලා යන්නාක් මෙන් දෙවියන්වහන්සේගේ වචනය නැමැති ආලෝක රැස් වළල්ල ඉදිරියෙහි සෑම විරුද්ධතාවක්ම පහවී ගිය බවට ඔහුගේ හදවත සාක්ෂි දැරීය. දහම් හරය නැවත නැවතත් නිරීක්ෂණය කරමින් අවුරුදු පහක් ගත කළ හෙතෙම තමා බැසගත් තීරණ නිවැරැදි යයි සෑහීමට පත් විය.

තමා ඉගෙන ගත් දහම් මාලාව ශුද්ධ ලියවිල්ලෙහි පැහැදිලිව උගන්වා තිබෙන බව තහවුරු වීමෙන් පසුව මෙම ධර්මතාවන් තුළ තවත් අයව දැනුවත් කළ යුතුය යන්න දැඩි ලෙසින් ඔහු තුළ පෙළඹීමක් ඇති කළේය. "මාගේ රාජකාරී කටයුතුවල යෙදී සිටියදී මාගේ සවන්හි නිරතුරුවම රැව් පිළිරැව් දුන් විධානයක් විය. 'ලෝකයා මුහුණ පා සිටින්නාවූ අවදානම ගැන ඔවුන් දැනුවත් කරන්න'යි මාගේ සිත මට බල කළේය. එසකියෙල්ගේ පොතෙහි බයිබල් පද දෙකක් මාගේ චින්තනයෙහි නව බලපෑමක් ඇති කරන්නට විය. "එම්බා දුෂ්ටය නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාද කිරීමට නුඹ කථා නොකර සිටියොත්, දුෂ්ට වූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි. එසේ වී නුමුත් තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ ගැන දුෂ්ටයාට අවවාද කළ කල්හි ඔහු තමාගේ මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. නුඹ නුඹේ ප්‍රාණය ගළවා ගත්තෙහිය." (එසකියෙල් 33:8,9). දුෂ්ටවූ පව්කරුවන්ට හරියාකාරව අනතුරු ඇඟවීම ලබා දුනහොත් ඔවුන් විශාල වශයෙන් පසුතැවිලි වෙනවා නොඅනුමාන බවද මම ඔවුන්ට මෙම භයානක තත්ත්වය කියා නොදුනහොත් ඔවුන්ගේ ලේ වල වගකීම මාගෙන් ඉල්ලා සිටිනවා නියතය යන්නද මට හැඟුණි. (Bliss, p. 92).

අවස්ථාවන් උදාවූ පරිදි ඔහු තම දැකුම විවිධ අයට ඉදිරිපත් කළේය. යම්කිසි දේවගැතිවරයෙක් තමාගේ පණිවිඩයෙහි භාරදූර

ස්වභාවය වටහාගෙන එම ඉගැන්වීම් ප්‍රචාරය කිරීමට තම කාලය මිඩංගු කිරීමට ඉදිරිපත් වෙනවා දකින්නට පුළුවන්කම ලැබෙන ලෙස ඔහු යාච්ඤා කළේය. එසේ වුවද, පණිවිඩය ලබාදීමට තමන්ගේද පුද්ගලික වගකීමක් ඇති බව ඔහුගේ චින්තනය ඔහුට බල කළේය. ඔහුට එම බල කිරීමට අවනත නොවීමට නුපුළුවන් විය. 'ගොස් ලෝකයාට අනතුරු ඇඟවීම කරන්න. ඔවුන්ගේ මරණය ගැන, නුඹ වගකිව යුතුය. ඔවුන්ගේ ලේ වල වන්දිය නුඹෙන් ලබා ගන්නෙමි.' යන වදන් මාගේ සිතෙහි දෝංකාරය දෙන්නට විය. සිතට වද දෙන්නාවූ මෙම චින්තනය දරා ගනිමින් හෙතෙම වසර නවයක් කල්ගත කළේය. 1831 වන වසරේදී ඔහු තමාගේ ඇදහිල්ලෙහි හේතු කාරණා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමේ කර්තව්‍යය ආරම්භ කළේය.

එලිෂා තමාගේ ගොවිපළෙහි කෙතක් හාමින් සිටියදී දේව සේවයට ඔහුව කැඳවනු ලැබීය. අනාගතවක්තෘ තනතුරට කැපවීමට ඔහුට කැඳවීම ලැබුණේය. තමාගේ නගුල අතහැර මිනිසුන් අතරට ගොස් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ අභිරහස් විවෘත කරන්නැයි විලියම් මිලර්ටද කැඳවීමක් ලැබුණේය. බියෙන් ගැහෙමින් හෙතෙම තම කාර්ය භාරය ඉටුකිරීමේ සේවයට අවතීර්ණ විය. දිවැසි ප්‍රකාශන පියවරෙන් පියවර ඉදිරියට ගෙන යමින් ඔහු තම ශ්‍රාවකයන්ගේ අවධානය ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමට යොමු කළේය. තමාගේ වචනවල පහස ලැබූ ජනතාවගේ උනන්දුව සහ සැලකිලිවන්ත භාවය වර්ධනය වීමත් සමගම ඔහු ශක්තිය සහ දිරිය ලැබීය, එඩිතරකමින්ද වර්ධනය විය.

ස්වකීය සහෝදර බැතිමතුන්ගේ ඉල්ලීම අනුව පමණක්ම ඔහු දෙවියන්වහන්සේගේ හඬ අසමින් තම බයිබලීය සොයා ගැනීම් ප්‍රසිද්ධියේ කියාදීමට එකඟ විය. හෙතෙම දැන් පනස් වියෙහි පසුවූ පුද්ගලයෙක් විය. ප්‍රසිද්ධියේ දේශන පැවැත්වීම ඔහුට නුහුරු දෙයක් විය. තමා ඉදිරියෙහි ඇති කර්තව්‍යය ඉටු කිරීමට සුදුසුකමක් තමාට නැති බව ඔහුගේ හැඟීම විය. එසේ වුවද, කාර්ය භාරය ඉටුකිරීමේ කටයුත්තට අත ගැසූ මුල් දිනයේ පටන්ම දෙවියන්වහන්සේ වෙත ආත්ම දිනාගැනීමේ කාර්යය මහත් සාර්ථකත්වයක් පෙන්නුම් කළේය. ඔහුගේ පළමු දෙසුමත් සමගම ආත්ම පිබිදීමේ ක්‍රියාදාමයක්ද උදා විය. එහි ප්‍රතිඵලයක් ලෙස දෙදෙනෙකු හැර පවුල් තිහක සියළුම පුද්ගලයෝ සමයානුකූල හැරීමකට ඇතුළු වූහ. දේශනා කිරීමේ ඇරයුම් ඔහු ළුහු බැඳ ආවේය. විවිධ ස්ථාන වෙත පැමිණ දෙසුම් පවත්වන්නැයි බැතිමත්හු ඔහුට ආරාධනා කළහ. සෑම ස්ථානයකදීම වාගේ ඔහුගේ වෑයමට ප්‍රතිඵලයක් ලෙස දෙවියන්වහන්සේගේ වැඩ උදෙසා ආත්ම පිබිදීමක් ඇති විය. පව්කරුවෝ ක්‍රිස්තුස්වහන්සේව ගැළවුම්කරුවාණන් ලෙස පිළිගත්තෝය. කිතුණු බැතිමත්හු වඩාත් ගැඹුරු කැපවීමක් කරා යොමු වූහ. බයිබලයේ සත්‍යතාව සහ කිතුණු ආගම පිළිගැනීමට දේව දෘෂ්ඨීකයන්ට සහ



මිථ්‍යා දෘෂ්ඨීකයන්ට එකසේ බලපෑම් ඇති විය. ඔහු සේවය කළ ජනතාව මෙවන් සාක්ෂියක් දීමට පැකිලුණේ නැත. වෙනත් දේශනාකරුවන්ට ළඟා විය නොහැකි පංතියක මනස්වලට ළඟා වීමට ඔහු සමත් විය. ආගමේ සම්පත් වූ විශිෂ්ඨ දේවල් කෙරෙහි පොදු ජන මනස පිබිදවීමට ඔහුගේ දේශනා යොමු වී තිබිණ. ලෝක සැප සම්පත් කෙරෙහි යොමු වී තිබූ මිනිස් අවධානයටද ඉන්ද්‍රියයන් පිනවීම සඳහා වූ මිනිස් අපචාරයන්ටද විරුද්ධව හඬක් නැගීමද ඔහුගේ දෙසුමින් සිදු විය.

ඔහුගේ දහම් ප්‍රචාරක දෙසුම් කරණකොටගෙන සෑම නගරයකම පාහේ සියයකට ආසන්න බැතිමත්හු හෝ සමහර අවස්ථාවන්හිදී සිය ගණන් බැතිමත්හුද ගැළවීමේ මාර්ගයට පිවිසියහ. එම ජනපදවල පිහිටි සෑම ප්‍රොතෙස්තන්ත නිකායකටම අයිති දෙව් මැදුරු, ඔහුට විවෘත විය. ඔහුගේ සේවය ඉල්ලා වැඩිපුරම ඇරයුම් ලැබුණේ දේවස්ථානවල දේවගැතිවරුන්ගෙන්ය. ඇරයුමක් නොලද ස්ථානයක් වෙත ගොස් සේවය කිරීම ඔහුගේ සම්මුතියට පටහැනි විය. ඒ අතර ඇරයුම් ලැබූ සංඛ්‍යාවෙන් අඩක් හෝ ඉටුකිරීමට තරම් ඔහුගේ කාලය ප්‍රමාණවත් නොවීය.

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම සිදුවන නිශ්චිත වකවානුව ගැනවූ විලියම් මිලර්ගේ ඉගැන්වීමට බොහෝ දෙනෙකුගේ එකඟතාව දිනාගැනීමට නොහැකි වුවද ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමේ නිශ්චිතතාවද, එහි ආසන්නතාවද ගැන බොහෝ දෙනා කල්පනා කරන්නට වූහ. ඒ සඳහා සූදානම් වීමේ අවශ්‍යතාවයට බොහෝ දෙනාගේ අවධානය යොමු විය. ඔහුගේ සේවාව පිළිබඳව සමහර විශාල නගරයන්හි ප්‍රබල උනන්දුවක් දකගත හැකි විය. සමහර රේන්දකරුවෝ තම මත්පැන් සැල් වසා දමා එම ස්ථාන ආගමික රැස්වීම් ශාලා බවට පරිවර්තනය කළෝය. සූදු පොළවල් වසා දැමිණ. දෙවියන්වහන්සේව විශ්වාස නොකළ අයද, දුරාචාරය නිසා සමාජයෙන් කොන් කරනු ලැබූ අයද දේවස්ථාන කෙරෙහි උනන්දුවක් දක්වන්නට වූහ. දේවස්ථානයට යෑමේ පුරුද්ද අත්හැර දමා තිබූ අය නැවත දේවස්ථානයන්හි පහස ලබන්නට උත්සාහ කළෝය. විවිධ කිතුණු නිකායන් යාච්ඤා රැස්වීම් පැවැත්වීම ආරම්භ කළෝය. සෑම පැයකදීම විවිධ පෙදෙස්හි යාච්ඤා රැස්වීම් විය. මධ්‍යහ්නයේ දේවස්ථාන කරා පැමිණි ව්‍යාපාරිකයෝ දෙවිඳුන්ට ප්‍රශංසා කරමින් උන්වහන්සේට යාච්ඤා කළෝය. අතිශයෝක්ත ආගමික කැළඹීමක් නොතිබූ අතර සෑම අයෙකුගේම මනසෙහි ආගමික හැඟීම් රජ යන්නට විය. ඔහුගේ ආගමික සේවාවද මුල් කාලීන ප්‍රතිසංස්කාරකයන්ගේ සේවාව හා සම විය. ඔවුන්ගේ අරමුණ වූයේද බැතිමතුන්ට දැනුම ලබාදී ඔවුන්ගේ හෘදය සාක්ෂියට තට්ටුකර පිබිදීමක් ලබාදීමය.

වසර 1833 දී දේශනා කිරීම සඳහා බලපත්‍රයක් විලියම් මිලර් සතු විය. ඔහු සාමාජිකත්වය දැරූ බැප්ටිස්ට් සභාවෙන් එම බලපත්‍රය ලැබිණ. එම නිකායේ බොහෝ දේවගැතිවරුන්ගේ අනුමැතිය මිලර්ගේ සේවය සඳහා ලැබුණේය. ඔවුන්ගේ නිල අවසරය ඇතිව මිලර් තම සේවා කටයුතු දිගටම පවත්වාගෙන ගියේය. ඔහු විවිධ ස්ථානයන් වෙත යමින් දේශනා කිරීමේ කර්තව්‍යයෙහි යෙදුණේය. එසේ වුවද, ඔහුගේ සේවය ප්‍රධාන වශයෙන් යොමු වූයේ නිව් ඉංග්ලන්ඩ්හි සහ මධ්‍යම ජනපදයන්හි ජනතාව වෙනුවෙන්ය. මුල් කාලයේ වසර ගණනාවක්ම ඔහුගේ විය හියදම් සඳහා වැය වුණේ ඔහුගේම පසුම්බියේ මුදල්ය. පසු කලෙක වුවද, ඔහුට ඇරයුම් ලබා දුන් පෙදෙස් කරා යාමට පවා ප්‍රමාණවත් මුදලක් ඔහුට කිසි දවසක ලැබුණේ නැත. ඔහුගේ ප්‍රසිද්ධ රැස්වීම් මගින් ඔහුට ප්‍රමාණවත් ආදායමක් හිමි වෙනවා වෙනුවට සෑම රැස්වීමක්ම ඔහුගේ සම්පත් හීන කිරීමෙහි ලා සමත් විය. ඔහුගේ ජීවිතයේ සැඳෑ සමයේදී ඔහු මහත් අග හිඟකම්වලින් ගැහැටට පත් විය. ඔහු ලොකු පවුලක පියෙක් විය. සැවොම එක්ව සහභාගිත්වයෙන් යුතුව ඔහුගේ ගොවිපළෙහි සේවය කළෝය. අරපරෙස්සම් සහිතව කටයුතු කිරීම මගින් ඔවුන්ට ගොවිපළේ ආදායමෙන් ජීවත් වීමටද ඔහුගේ සේවය කරගෙන යාමටද පුළුවන් විය.

ක්‍රිස්තුස්වහන්සේගේ කඩිනම් පැමිණීමේ සාක්ෂි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් විලියම් මිලර් වසර දෙකක් සේවය කරන අතරේදී, ක්‍රිස්තුස් වහන්සේ විසින් දක්වන ලද තමන්ගේ පැමිණීමේ පෙර නිමිතිවල අන්තිම ලකුණු සිදුවිය. උන්වහන්සේ මෙසේ පැවසූ සේක: "තාරකාවෝ අහසෙන් වැටෙන්නෝය." (මතෙව් 24: 29). දෙවියන්වහන්සේගේ දවස උදාවීමට පෙරාතුව සිදුවන්නාවූ පෙර නිමිති පෙන්වා දෙමින් යොහන් ස්වකීය එළිදරව් පොතෙහි මෙසේ පවසා ඇත. "අත්තික්කා ගසක් තද සුළඟින් සෙලවී, එහි අකාල ඵල වැටෙන්නාක් මෙන් අහසේ තාරකා පොළොව පිට වැටුණේය." (එළිදරව් 6:13). 1833 නොවැම්බර් 13 වනදා මෙම අනාවැකිය අකුරටම ඉටු කරමින් තාරකා වර්ෂාව සිදුවිය. එම සංසිද්ධිය ප්‍රදේශ ගණනාවක් පුරා දර්ශනය විය. එතෙක් වාර්තා වී තිබූ ඉතා පුදුමාකාර තාරකා ඇදහැලීම එදා සිදුවිය. අමෙරිකා එක්සත් ජනපදය පුරාම සකල අහස්තලය පැය ගණනාවක් පුරා තාරකා යුද්ධයක සිරි ඉසිලීය. මෙම දේශයෙහි ජනපද පිහිටුවා ගෙන විදෙස් ජාතීන් එහි පදිංචි වීමෙන් පසුව මෙදින ඇතිවූ අන්දමේ සංදර්ශනයක් ඊටපෙර සිදුවී තිබුණේ නැත. ජනතාවගෙන් සමහරෙක් මෙම තාරකා සංදර්ශනය දැඩි ප්‍රීතියෙන් සහ කුතුහලෙන් බලා සිටිමින් වින්දනයක් ලැබූ අතර තවත් සමහරෙක් භීතියෙන් සහ චකිතයෙන් කැළඹීමට සහ කම්පනයට පත් වූහ. ඒ සිද්ධියෙන් ඇතිවූ උත්කෘෂ්ටතාවය අද පවා බොහෝ අයගේ සිත් සතන්හි තවමත් රැඳී පවතී. උතුර, දකුණ, නැගෙනහිර සහ බස්නාහිර යන සිව් දිශාවේම



තද වර්ෂාපතනයකට වඩා ඝණත්වයකින් තාරකා කඩා වැටෙන්නට විය. නිලඹරම චලනය වන්නාක් සේ පෙනී ගියේය .... මෙම තාරකා ප්‍රදර්ශනය පිළිබඳව මහාචාර්ය සිලිමන්ගේ සඟරාවේ සඳහන් කර ඇත්තේ උතුරු අමෙරිකාව පුරා එය දකගත හැකි වූ බවයි .... වළාකුළු රහිත එදින අහස ශාන්ත භාවයක් දැරීය. අළුයම දෙවන හෝරාවේ සිට උදෑසන තද එළිය වැටෙන තුරු අතිශය දීප්තිමත් කාන්තියක් විහිදුවන ප්‍රභා සම්පන්න ආකාශ වස්තූන් නිමක් නැති සංදර්ශනයක් අහස පුරා පැවැත්වූ බව පැවසිය හැකිය." (Devens, R. M. "American Progress; The Great Events of the Greatest Century," Ch. 28, par. 1-5).

"උත්කෘෂ්ටාලංකාරයෙන් කිසිම අඩුවක් නොතිබූ ඒ සංදර්ශනයෙහි ශෝභා විභූතිය විස්තර කිරීමට කිසිම භාෂාවක් සමත් නොවේ ..... එම දසුන නුදුටු කවරෙකු හට හෝ එහි මහිමාලංකාරයෙහි ශ්‍රේෂ්ඨත්වය ගැන කල්පනා කිරීම පවා අපහසුය. සමස්ත තාරකා මණ්ඩලයම අහසෙහි මුදුනට එක් රොක් වී එකවරම තාරකා සෑම දිශාවකටම විදුලි වේගයෙන් මුදා හරින බවක් දක්වුණි. සංදර්ශනයෙහි භූමිකා පෑ තාරකා දහස් ගණන් පසුපස තවත් දහස් ගණන් හඹා යන්නට විය. මෙතරම් විශාල තාරකා ගණනාවක් මෙම අවස්ථාව සඳහාම නිර්මාණය කර ඇති බවක් පෙනී ගියේය. සැඩ සුළං පහරකට ලක් වූ අත්තික්කා ගසක් සැඩ පහරට ඔරොත්තු දීමට නොහැකිව එහි ඵලදාව බිම හෙලන්නාක් මෙන් අහස් ගැබද තාරකා පොළොව වෙත හෙලන්නට විය." (Reed, F. in Christian Advocate and Journd, Dec 13, 1833.

1833 නොවැම්බර් 14 වැනි දින නිව්යෝර්කයේ වාණිජ පුවත් සඟරාවේ පළවූ දීර්ඝ ලිපියකින් හෙන්රි ඩානා වෝඩ් මෙසේ පැවසුවේය: "ඊයේ උදෑසන හටගත් සිද්ධිය වැනි සිදුවීමක ලිඛිත වාර්තාවක් හෝ ප්‍රකාශනයක් කිසිම දර්ශනවාදියෙක් හෝ විද්වතෙක් හෝ කර නැතැයි මම විශ්වාස කරමි. එහෙත් මෙම සංසිද්ධිය සම්බන්ධව විස්තරාත්මක අනාවැකියක් මෙයට වසර එක්දහස් අටසියයකට පෙර අනාගතවක්තෘවරයෙකු විසින් පවසා තිබුණේය. තාරකා වැටෙනවා ඇත යන ප්‍රකාශනයෙන් අදහස් වූයේ වැටෙන්නාවූ මේ තාරකා ගැන නම්, එය අපට තේරුම් ගැනීමට පුළුවන් විය යුතුය."

තමන්වහන්සේගේ දෙවන පැමිණීමට පෙරාතුව හටගන්නා නිමිති ගැන යේසුස්වහන්සේ ප්‍රකාශ කළ අන්තිම පෙර නිමිත්ත මෙසේ ඉටු විය. පෙර නිමිති පැවසූ ක්‍රිස්තුස්වහන්සේ මෙසේද පැවසූ සේක: "එසේම නුඹලා මේ සියල්ල දකින කළ, උන්වහන්සේ දොරටු සමීපයෙහිම බවත් දැනගන්න." (මතෙව් 24:33). මෙම ලකුණු සිදුවීමෙන් අනතුරුව ඊළඟට හටගන්නා වූ සිද්ධිය ලෙස යොහන් දුටුවේ අකුළන ලද

පොතක් මෙන් අහස පහකරනු ලැබූ බවය. ඒ අතර පොළොව කම්පා විය, කඳු හා දූපත් ඒවායේ ස්ථානවලින් ඉවත් කරනු ලැබීය. භීතියට පත් දුෂ්ටයෝ මනුෂ්‍ය පුත්‍රයාණන් කෙරෙන් සැඟවීමට උත්සාහ කරන බවද ඔහු දුටුවේය. (එළිදරව් 6: 12-17).

තාරකාවන්ගේ වැටීම ඇසින් දුටු බොහෝ අය කල්පනා කළේ එම සිද්ධිය පැමිණෙන්නාවූ විනිශ්චයෙහි පෙර නිමිත්තක් බවය, "මෙම තාරකා වැටීම" පැමිණෙන්නාවූ භයංකර විනිශ්චයෙහි කාරුණික ලකුණක් බවය. (The Old Countryman, " Nov. 26, 1833) මෙසේ මිනිස් අවධානය අනාවැකි ඉටුවීම් කෙරෙහි යොමු කරවනු ලැබිණි. දෙවෙනි ඊමේ අනතුරු ඇඟවීම් වලට ඇහුම්කන් දීමට බොහෝ අයට මෙමගින් පෙළඹවීමක් කරනු ලැබීය.

සතර දිග් භාගයෙහි විසූ ජනතාවගේ සිතුවිලි කැළඹූ තවත් අනාවැකි ඉටුවීමක් 1840 දී සිදුවිය. මෙයට වසර දෙකකට පෙර දෙවෙනි ඊම පිළිබඳ දේශනාකරුවෙකු වූ ජොෂියා ලිච් එළිදරව් 9 වෙනි පරිච්ඡේදය පාදක කරගනිමින් එළිදරව් කිරීමක් තුළින් කියාපෑවේ ඔට්ටොමන් අධිරාජ්‍යයේ වැටීයාම ඉතා ළඟදී සිදුවන බවය. ඔහුගේ නිගමනය අනුව ඔට්ටොමන් අධිරාජ්‍යය "1840 අගෝස්තු මාසයේදී පහකර දමනු ලබන" බව කියමින් ලිච් පත්‍රිකාවක් ප්‍රසිද්ධ කළේය. දහස් ගණන් ජනයා එහි තත්ත්වය ගැන විමසිලිමත් වූහ. "තුර්කිවරුන්ගේ අවසරය ඇතිව රාජ පදවි ප්‍රාප්ත වීමට ප්‍රථමයෙන් වූ වසර 150 ක කාලය පිළිබඳ අනාවැකිය අකුරටම ඉටුවීමෙන් පසුව ඉතිරි වසර 391 සහ දවස් පහළොව 1840 හි අගෝස්තු 11 වන දින නිමාවට පත් විය යුතුය. එදින කොන්ස්තන්තිනෝපල්හි පිහිටි ඔට්ටොමන් බලය නිමාවට පත්වීම සිදුවිය යුතුය. මෙය සහතික වශයෙන් සිදුවන බව මට ඒකාන්තයෙන්ම විශ්වාසයි." (Licth, Josiah, Article in Sings of the Times August 1, 1840.

අනාවැකියෙහි සඳහන්ව තිබූ නියමිත වකවානුවේදී තුර්කි රජය තමන්ගේ විදේශීය තානාපතිවරුන්ගේ මාර්ගයෙන් යුරෝපාකරයේ මිතුරු හමුදාවන්ගෙන් සහාය ඉල්ලා සිටියාය. මෙසේ ඇය ක්‍රිස්තියානි ජාතීන්ගේ පාලන බලය යටතට පත් වූවාය. මෙම සිද්ධිය මගින් අනාවැකිය අකුරටම ඉටු විය. ඔට්ටොමන් (තුර්කි) රාජ්‍යයේ වැටී යාම ගැන මිලර් සහ ඔහුගේ සහායකයන් විසින් අනාවැකි කාලවකවානු විග්‍රහ කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රමවේදයේ නිවැරදිතාව ජනතාවගේ අවධානයට සහ සැලකිල්ලට භාජන විය. මේ සිද්ධිය දෙවෙනි ඊම ගැන ප්‍රකාශ කිරීමේ ව්‍යාපාරයට විශාල උනන්දුවක් ලබා දුන්නේය. වියතුන් සහ ප්‍රභූවරුන් විලියම් මිලර් සමග එකතු වූහ. මිලර්ගේ චින්තන දර්ශනය දේශනා කරමින්ද, එම ඉගැන්වීම් ප්‍රකාශයට පත් කරමින්ද, ක්‍රියාකිරීම නිසා දෙවෙනි ඊමේ ව්‍යාපාරය 1840 සිට 1844 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය විය.



චින්තනයෙන් සහ අධ්‍යයනයෙන් පෝෂණය කරනු ලැබූ තියුණු ශක්තිමත් මානසික බලයක් මිලර් සතු විය. ප්‍රඥවේ උල්පත සමග සම්බන්ධතාවක් ඇති කර ගැනීමෙන් මෙම කුසලතාවට හෙතෙම සගයේ ප්‍රඥව සම්බන්ධ කර ගත්තේය. මිලර් වනාහි සැබෑ අව්‍යාජ පිරිසිදු හදවතක් තිබූ යුග පුරුෂයෙක් විය. චරිතවත් අභිමානය හෝ සදාචාරාත්මක චරිතය පිළිබඳව ඇගයීමක් කරන්නේ නම් ඒ පිළිබඳව ඉතා ඉහළ තලයේ ගෞරවයක් ලබාගැනීමට ඔහුට හැකියාවක් විය. අව්‍යාජ කාරුණිකතාවත් ක්‍රිස්තියානි නිහතමානීතාවත් මුසු කරගත් ආත්ම දමනයක් උරුම කරගෙන සිටි හෙතෙම සැමට ඇහුම්කන් දෙන, සැමට උපස්ථාන කිරීමේ ලැදියාවක් දක්වූ මහත්මයෙක් විය. ප්‍රියශීලී ගති පැවැතුම් තුළින් ජීවිතය සරසා ගෙන තිබූ හෙතෙම අනෙකුත් අයගේ මතවාදයනට සවන් දෙමින් ඔවුන්ගේ තර්ක විතර්ක ගැඹුරින් විග්‍රහ කර තීරණයකට බැසීමට පුරුදු වූ අයෙක් විය. ඉදිරිපත් වූ සෑම ආකාර මතවාද සහ ධර්මතාවන් දෙවියන්වහන්සේගේ වචනය සමග උරගා බැලීම ඔහුගේ ක්‍රියා පිළිවෙල විය. එහිදී චිත්තාවේගයනට ගැති වී ඉක්මණින් කලබල වීමක් ඔහු තුළ නොවීය. ඔහුට හිමිව තිබූ බුද්ධිමත් තර්ක කිරීමේ හැකියාවත්, ශුද්ධ ලියවිලි සම්බන්ධව ඔහුට තිබූ විශාරද දැනුමත් කරණකොටගෙන වරද නිෂ්ප්‍රභා කර බොරුව සහ මුසාවාදය එළිදරව් කරමින් සැබෑව පැහැදිලි කර දෙන්නට ඔහු තුළ දක්ෂ හැකියාවක් විය.

ස්වකීය සේවය කරගෙන යාමේදී ඔහුට දැඩි විරෝධතාවන් එල්ල නොවූයේද නොවේ. පෙරදී සිටි ප්‍රතිසංස්කාරකයන් ඉදිරිපත් කළ මූලධර්ම බොහෝ අය සතුටින් භාර නොගත්තාසේ මිලර් විසින් ඉදිරිපත් කළ ආගමික දහම් පිළිගැනීමටද එකල විසූ ආගමික ගුරුවරුන් මනාපයක් දක්වූයේ නැත. තමන්ගේ ඉගැන්වීම් ශුද්ධ ලියවිලි මගින් තහවුරු කළ හැකි නොවූ නිසා ජනප්‍රිය ආගමික ගුරුවරු මිනිස් දහම් හා ඉගැන්වීම්වල සහ පියවරුන්ගේ සම්ප්‍රදායන්හි පිහිට පැතූහ. එහෙත් දෙවෙනි ඊම පිළිබඳ සත්‍යතාව ඉගැන්වූ දේශනාකරුවෝ දේව වචනය හැරෙන්නට වෙනත් කිසිම සාක්ෂියක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගේ එකම පදනම වූයේ 'ශුද්ධ බයිබලය සහ බයිබලය පමණක්ය," යන්නය. විරුද්ධවාදීන්ට තම තර්ක ශුද්ධ ලියවිලි මගින් සනාථ කළ නොහැකි වූ නිසා ඔවුහු ඒ අඩුව පිරිමසා ගත්තේ ප්‍රතිසංස්කාරකයන් අවමානයට ලක් කිරීමෙන් සහ උපහාසාත්මක ලෙස ඔවුන් හෙළා දැකීමෙන්ය. ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊම සිදුවීම කෙරෙහි ප්‍රීතියෙන් යුතුව බලා සිටි බැතිමත්හු ශුද්ධ ජීවිත රටාවක් ගතකිරීමට දැඩි ප්‍රයත්නයක යෙදුණෝය. දෙවෙනි ඊම උදෙසා අනෙක් අයද සූදානම් කිරීම් වස් ඔවුන් දැනුවත් කිරීම සහ දිරිගැන්වීමද ඔවුන්ගෙන් සිදු විය. මෙය උසුලාගත නොහැකි වූ විරුද්ධවාදීහු සත්‍යවාදී බැතිමතුන්ගේ අගුණ කීමේ ප්‍රචාරක කටයුතු සඳහා තමන්ගේ කාලයත්, ධනයත්, කුසලතාවනුත් නොමසුරුව වැය කළහ.

දෙවෙනි ඊම පිළිබඳව, විශේෂයෙන් බැතිමතුන්ගේ මනස් වෙනතකට යොමු කිරීමට විරුද්ධවාදීහු බොහෝ උත්සාහ කළහ. ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන පැමිණීම සහ ලෝකාන්තිමය යන විෂයන් පිළිබඳව වූ අනාවැකි අධ්‍යයනය කිරීම පාපයක් ලෙස පෙන්වා දීමේ වෑයමක්ද විය. එසේ කරන්නාවූ අය ඒ ගැන ලැජ්ජා විය යුතු යයිද හුවා දක්වන ලදී. එකල විසූ ජනප්‍රිය දේවගැති සංවිධානය දෙවියන්වහන්සේගේ වචනය කෙරෙහි වූ ඇදහිල්ල අවමානයට ලක් කළේය. ඔවුන්ගේ ඉගැන්වීම් කරණකොටගෙන මිනිස්සු ඇදහිල්ල අත්හැර සත්‍යතාවයෙන් බැහැරව ගියෝය; තමන්ගේම තෘෂ්ණාවන් අනුව ජීවත් වීමට පෙළඹුණෝය. නපුරෙහි නිර්මාතෘවරයෝ දුරාචාරය ඇතිවීම ගැන දෙවෙනි ඊම විශ්වාස කළ අයට වරද තැබූහ.

විලියම් මිලර් දේශනා කළ ශාලාවන් කරා බුද්ධිමත්හු සහ සාවධාන ශ්‍රාවකයෝ ඇදී ආහ. ආත්මික පිබිදීමකට පත් විවිධ ආකාර ශ්‍රාවකයෝ මිලර් සොයා එන්නට වූහ. විශාල ආගමික පිබිදීමක් ඇති වුවද, මිලර්ගේ නාමය පැසසුමට ලක් කරමින් කිසිම වාර්තාවක් ආගමික පුවත්පත්වල පල නොවීය. එසේ වුවද ඔහුව සරදමට ලක් කරමින් ප්‍රසිද්ධියේ චෝදනාවලට ලක් කරමින් ලිපි සහ වාර්තාවන් පලවීය. දේව භක්තියක් නොමැතිවූ කිසි යහපත් දෙයක් ගැන තැකීමක් නොමැතිවූ පුද්ගලයෝ ආගමික ගුරුවරුන් දක්වූ අදහස් මගින් උද්දාමයට පත්ව නින්දා සහගත ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්හ. ඔවුහු දේව අපහාසාත්මක සිනහ උපදවන වචන කියමින් මිලර්වත්, ඔහුගේ සහායකයන්වත් උපහාසයට ලක් කළෝය. සුවපහසු නිවසක් හිමිව තිබූ හිස කෙස් පැසුණු මෙම මනුෂ්‍යයා තමාගේම වියදමින් නගරයක් නගරයක් පාසා යමින් නිමක් නැති වෙහෙස මහන්සි දරා ගනිමින් ළඟ ළඟම පැමිණෙන්නාවූ විනිශ්චය පිළිබඳව බරපතල අනතුරු ඇඟවීමක් කරගෙන ගිය අතර ඒ වෙනුවෙන් ඔහුට ලැබුණේ ගැරහිලි පමණකි. පිස්සෙකු, බොරුකාරයෙකු සහ අනුමාන චින්තනයකින් යුත් තැනැත්තෙකු ලෙස ඔහුව දක්වනු ලැබිණි.

විලියම් මිලර් අවඥවට, අසත්‍ය චෝදනාවන්ට සහ නින්දාවට පත්කිරීම යනාදියට එරෙහිව දේශීය පුවත්පත් කුපිතයට පත්ව විරෝධතා පලකිරීමට පිවිසියේය. ඉතා ගාම්භීරවූ ද, බියකරු විපාක ගෙන දෙන්නාවූ ද විෂයක්" එයාකාර සැහැල්ලු ලෙස සලකමින් එම ඉගැන්වීම ප්‍රචාරය කරන්නාවූ ද, එම විෂය පිළිගන්නැයි කියන්නාවූ ද අයව අවමානයට පත්කිරීම ඉතා නින්දිතය. දෙපාර්ශ්වයට තර්ක විතර්ක ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම මානුෂික සත්ගුණයකි. තමන් එකඟ නොවන්නාවූ ඉගැන්වීමක් සහ එය ප්‍රචාරය කරන්නවුන්ද ගැරහීමට පත්කිරීම නින්දා සහගතය. "විනිශ්චය දවස සමච්චලයට පත්කිරීම මෙන්ම දිව්‍ය තැනැන්වහන්සේට ගැරහීමද උන්වහන්සේගේ විනිශ්චාසනයෙහි ගෞරවාන්විතය සහ දෙන්නාවූ තීන්දු සිනහවට



ලක් කිරීමද භයානක විපාක ලැබිය යුතු දෙයක් බව කල්පනාවට යොමු කරන ලදී." (Bliss "Memoirs of Wm . Miller," p. 183).

සෑම නපුරකම නිර්මාතෘ වූ තැනැත්තේ ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊමේ පණිවිඩයට විරුද්ධව ක්‍රියා කළා පමණක් නොව, එහි පණිවිඩකරුවාව විනාශ කර දැමීමටද සැලසුම් කළේය. ස්වකීය ශ්‍රාවකයන් හට ශුද්ධ ලියවිලි සත්‍යතාවන් ප්‍රායෝගික ලෙස අදාළ කරගත හැකිවන පරිදි විස්තර කරදීමට විලියම් මිලර් උත්සාහ කළේය. ශ්‍රාවකයන්ගේ පාපයන්ට සෘජුවම තරවටු කරමින්ද ඔවුන් තුළ තිබූ තත්ත්වය ගැන සෑහීමට පත්වීම කළඹමින් ක්‍රියා කළ නිසාද සරලව කථා කළ නිසාද බොහෝ අය විලියම් මිලර්ගේ සතුරන් බවට පත්වූහ. ඔහුගේ පණිවිඩයට එරෙහිව සභා සාමාජිකයන් නැගී සිටීම නිසා මිලර්ට විරෝධීව සිටියාවූ කණ්ඩායමට නව දිරියක් සහ පන්නරයක් අත්විය. එමගින් උද්දාමයට පත් ඔවුහු තම ක්‍රියාදාමය තව තවත් ව්‍යාප්ත කළෝය. විලියම් මිලර් රැස්වීමක අවසානයේදී පිටතට පැමිණෙනවාත් සමගම ඔහුව ඝාතනය කිරීමට ඔහුගේ විරුද්ධවාදීහු සැකසුම් කළහ. ඒ අතර දේවදූතයෝද එම නොහික්මුණු සමූහයා අතර රැඳී සිටියෝය. මිනිස් වෙස් ගත් එක් දූතයෙක් විලියම් මිලර්ගේ අතින් අල්ලාගෙන ආරක්ෂිත ස්ථානයක් කරා ඔහුව රැගෙන ගියේය. දෙවියන්වහන්සේ ඔහුගෙන් බලාපොරොත්තුවූ කාර්ය භාරය නිමාවට පත්ව නොතිබුණේය. සාතන් සහ ඔහුගේ සහචරයෝ තමන්ගේ කුමන්ත්‍රණය ව්‍යර්ථ වී යාම ගැන කලකිරීමට පත් වූහ.

විරුද්ධවාදිකම් මධ්‍යයේ වුවද, දෙවෙනි ඊම ප්‍රකාශ කිරීමේ ව්‍යාපාරය තව තවත් වර්ධනය වන්නට විය. විස්සක්, හෝ සියයක් පමණවූ ඇදහිලිවතුන් සිටි කණ්ඩායම්, සංඛ්‍යාවෙන් වර්ධනය වෙමින් දහස් ගණනින් ව්‍යාපාරයට එක්වන්නට වූහ. නවක බැතිමත්හු විවිධ දේවස්ථාන කරා එක් රොක් වූහ. එහෙත් සංවර්ධනය වූ මෙම අළුත් බැතිමතුන්ට එරෙහිව විරුද්ධවාදි ආත්මය ක්‍රියාත්මක වන්නට විය. මිලර්ගේ ඉගැන්වීම් පිළිගත් මෙම නවකයන්ට විරුද්ධව ක්‍රියා කිරීමට දේවස්ථාන බලධාරීහු තීරණයක් ගත්තෝය. මෙයට ප්‍රතිචාරය දක්වමින් මිලර්ගේ පෑන ක්‍රියාත්මක විය. අනේක නිකායන්ට අයිති වූ ක්‍රිස්තු භක්තිකයන්ට ඔහු ප්‍රතිචාරයක් යැව්වේය. ඔහු ඉගැන්වූ ධර්මතාවන් වැරදි නම් ඒ බව ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා දෙන ලෙස ඔහු උදක්ම ඉල්ලා සිටියේය.

"අප විශ්වාස කරන්නාවූ ධර්මතාවන් දෙවියන්වහන්සේගේ ශුද්ධ වචනය මත පිහිටා තිබේ. එය ඔබගේ ඉගැන්වීම්වලද එකම පදනම වෙනවා නොවේද? අපගේ විශ්වාසයෙහි හා පිළිපැදීමෙහි පදනම හා එකම නීතිය එය පමණක් විය යුතු නොවේද? දේශනා කූඩුවෙන් සහ මුද්‍රණ මාධ්‍යයෙන් අපට මෙතරම් දරුණු ලෙස විෂමාචාර දක්වීමට

අප කළ වරද කුමක්ද? අපගේ සාමාජිකයන් (දෙවෙනි ඊම විශ්වාස කරන්නවුන්) ඔබගේ දේවස්ථානවලින් බැහැර කිරීමට, සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට ඔබට ඇති සාධාරණ චෝදනා මොනවාද? අප වැරැදි නම් අප වැරදි කර ඇත්තේ කුමන දහම් පිළිබඳව දැයි යන්න අපට පෙන්වා දෙන්න. අප වරදෙහි බැඳී සිටින බව දේව වචනයෙන් පෙන්වා දෙන්න. ඔබ තුමන් විසින් අපට කර ඇති අවමන් කිරීම් ප්‍රමාණවත්ය; අප වරදෙහි ගැලී ඇති බව පවසන ඔබගේ ක්‍රියාදාමයන් මගින් අපගේ සිතට බලපෑමක් ඇති වන්නේ නැත. අපගේ මූලධර්ම ඉගැන්වීම් වෙනස් කළ හැකිවන්නේ දේව වචනයට පමණක්ය. අප මෙම තීරණයට පැමිණියේ යාච්ඤාවෙන් යුතුව හොඳින් කල්පනා කර බැලීමෙන් අනතුරුවය. ශුද්ධ ලියවිල්ලෙහි සාක්ෂි මත අප පිහිටා සිටින බව අවධාරණය කරනු කැමැත්තෙමු" (Bliss, "Memoirs of Wm. Miller," p. p. 250, 252).

යුගයෙන් යුගයට දෙවියන්වහන්සේ විසින්, විවිධාකාර අනතුරු ඇඟවීම් ස්වකීය දාසයන් මගින් ලෝකයාට එවා තිබේ. නමුත් ලෝකයා එම පණිවිඩ භාරගත්තේ සැක මුසුවය, අවිශ්වාසයෙන් යුතුවය. ලෝ ව්‍යාප්ත මහා ජලගැල්මට පෙර විසූ අයව ගංවතුරකින් විනාශකර දැමීමට දෙවියන්වහන්සේ බල කරනු ලැබුසේක. එම අරමුණ ක්‍රියාත්මක කිරීමට පෙර තමන්ගේ නපුරු මාර්ගවලින් එම ජනතාවට ඉවත් වන්නැයි උන්වහන්සේ ඔවුන් දැනුවත් කළසේක; ක්‍රියාත්මක වීමට පෙර ස්වකීය අරමුණ ඔවුන්ට ප්‍රකාශ කළසේක. දෙවියන්වහන්සේගේ උදහස එකී ජනතාවට විරුද්ධව ඇවිලී යන්නට පෙරාතුව පසුතැවිලි වන්නැයි යන අනතුරු ඇඟවීම වසර එකසිය විස්සක් පුරා ඔවුන්ගේ සවනට යොමු විය. නමුත් එම පණිවිඩය නිෂ්ඵල කථාවක් යයි කල්පනා කළ ඔවුහු එය විශ්වාස නොකළෝය. කිසිදු පැකිලීමකින් තොරව තම නපුරු ක්‍රියාදාමයන්හි ඇලී ගැලී සිටීමට එඩිතර වූ ඔවුහු දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවාට උසුළු විසුළු කළෝය, ඔහුගේ ආයාචනාවන් සුළුකොට සැලකූහ. අනුමාන කරන්නාවූ සිද්ධියක් පිළිබඳව ඔහු ප්‍රලාපයක්, හිතළු මුසාවක් කියන්නේ යයි දේව පණිවිඩකරුවාට දොස් පැවරූහ. ලෝකයේ සියළුම බලවත් ප්‍රභූ කණ්ඩායම්වලට විරුද්ධව එක් මිනිසෙක් නැගී සිටින්නේ කෙසේද? නෝවාගේ පණිවිඩය සත්‍යය වූයේ නම් මුළු ලෝකයාම එය පිළිනොගත්තේ මක්නිසාද, එය විශ්වාස කළේ නැත්තේ මක්නිසාද? කිසියම් පුද්ගලයෙකුගේ ප්‍රකාශ කිරීමක්, දහසකගේ ප්‍රඥාවට එරෙහිව තිබිය හැකිද! අනතුරු ඇඟවීමේ හඬ, සත්‍යතාවේ හඬ බව එකල විසූ ජනතාව විශ්වාස නොකළෝය. එම නිසාම නෝවාගේ නැවට ඇතුළු වී ආරක්ෂාව ලබාගැනීමට ඔවුහු උත්සාහ නොකළෝය.

සමච්චල්කරුවෝ තම ඇනුම් පද කීමේ ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන ගියෝය. ඔවුහු සොබා දහම දෙසට ජනතා අවධානය



යොමු කළෝය. වෙනස් නොවන්නාවූ සෘතු චක්‍රය, කිසි දිනෙක හෝ වැසි නොවැසි නිල් අහස, රාත්‍රියේ පින්නෙන් පෝෂණය ලබන්නාවූ නිල් කෙත් යායන් පෙන්නුම් කරමින් ඔවුහු ජනතාවගෙන් මෙසේ ප්‍රශ්න කළෝය: "මොහු (නෝවා) උපමාවලින් කථා කරනවා නොවේද"යි ඔව්හු විචාළෝය - දැහැමිතාවේ දේශකයාව අපහාසයට ලක් කරමින් ඔවුන් පැවසුවේ නෝවා මිථ්‍යා සිහිනයක් පසුපස හඹා යන්නෙකු කියාය. එසේ පවසමින් ඔවුහු තවත් උනන්දුවෙන් යුතුව, පෙර සිටියාටත් වැඩියෙන් තෘෂ්ණාවන්හි හා දූෂිතයෙහි නියැලී කල්ගත කළෝය. එසේ වුවද කල් සිටම ප්‍රකාශයට පත්කරන ලද සංසිද්ධිය ක්‍රියාත්මක වීමට ඔවුන්ගේ නොඇදහිල්ල බාධාවක් නොවීය. දෙවියන්වහන්සේ මිනිසුන්ගේ නපුරුකම් බොහෝ කලක් ඉවසිල්ලෙන් දරාගෙන සිටිසේක. පසුතැවිලි වීම සඳහා උන්වහන්සේ ඔවුන්ට මහා පරිමාණයේ අවස්ථාවන් ලබා දුන්සේක. උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව ප්‍රතික්ෂේප කළ අය මත නියම කළ කාලයේදී විනිශ්චයන් පමුණුවනු ලැබීය.

තමන්වහන්සේගේ දෙවන පැමිණීම සම්බන්ධයෙන්ද එවන් ආකාර අවිශ්වාසයක් පවතින බව ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කළසේක. නෝවාගේ දවස්වල ජීවත් වූ ජනතාව, "ජලගැල්ම පැමිණ සියල්ලන්ම ගසාගෙන යනතුරු ඔව්හු නොදැන සිටියෝය." තවද අපගේ ගැළවුම්කාරයාණන්ගේ ප්‍රකාශයෙහි අඩංගු වන්නේ, "මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එලෙසම වන්නේය" යන්නය. (මතෙව් 24: 39). දෙවියන්වහන්සේගේ පවුලේ අය යයි කියන්නාවූ සෙනඟ ලෝකයේ ජනතාව සමග එකමුතුකම් පවත්වමින්, ඔවුන්ගේ ජීවිත රටාවට සමාන දිවි පැවැත්මක් අනුගමනය කරමින් දේව අනුමැතිය නොලැබූ ලෝකයාගේ සැප සෙල්ලම් හා සමග සම්බන්ධතාවන් පවත්වමින් කල් ගෙවන්නාවූ අතරේදී, ලෝකයේ සුඛෝපභෝගී සැපෙහි ඇලුණු ජීවිත දක්ම සභාවෙහි පවතින අතරේදී, ආවාහ කරගනිමින් විවාහ කර දෙමින් මංගල සීනු හඬ රැව්පිළිරැව් දෙන්නාවූ අතරේදී, ලෝ වැසි සියලු ජනතාව ලෞකික සමෘද්ධියෙන් සහ සෞභාග්‍යයෙන් පිරි දිගු අනාගත කාලයක් ගැන සිහින මවමින් සිටින්නාවූ අතරේදී, කිසිත් පූර්ණ දැනුම් දීමකින් තොරව, විදුලි කෙටීම ක්ෂණයකින් සිදුවන්නාවූ ආකාරයකින් ඔවුන්ගේ පැතුම් නිමාව දකින්නේය, ඔවුන්ගේ බලාපොරොත්තු සුණු විසුණු වී යන්නේය.

පැමිණෙන්නාවූ මහා ජලගැල්ම ගැන ලෝකයාට දැනුම් දීම පිණිස දෙවියන්වහන්සේ ස්වකීය සේවකයා යැවූ ආකාරයෙන්ම, උන්වහන්සේ කඩිනමින් පැමිණෙන්නාවූ අන්තිම විනිශ්චය ආරම්භ වන්නාවූ දවස ගැන මිනිසුන් දැනුවත් කිරීමට උන්වහන්සේ විසින් තෝරාගත් පණිවිඩකරුවන් ලෝ පුරා පිටත්කර හරින සේක. නෝවාගේ දවස්වල සිටි සමකාලීනයන් දැහැමිතාවේ දේශකයාගේ අනාවැකි වලට සමච්චල් කරමින් ඔහුව ගැරහීමට පත් කළ ආකාරයෙන්ම, මිලර්ගේ

දවස්වලදී ද, බොහෝ දෙනෙක්, දෙවියන්වහන්සේගේ ජනතාව යයි කියාගන්නාවූ අය අතරේ සිටි බොහෝ දෙනෙක්, ඔහුගේ අනතුරු ඇඟවීමේ වදන් ගැන ඔහුට සමච්චල් කළෝය.

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමෙහි දහම සහ ඉගැන්වීම කිතුණු සභාවන්හි බැතිමතුන්ට ප්‍රසන්න ප්‍රීතිමත් පණිවිඩයක් බවට පත්නොවූයේ මන්ද? ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊම දුෂ්ටයන්ට විපතක් සහ වියෝගයක් ළඟා කර දෙන අතර ධර්මිෂ්ඨයන්ට එම ගමන සපිරුණු ප්‍රීතියක් සහ බලාපොරොත්තු ඉටුවීමක් අත්පත් කර දෙයි. සෑම යුගයකම දිවි ගෙවූ දෙවියන්වහන්සේගේ විශ්වාසී දරුවන්ට මෙම ශ්‍රේෂ්ඨ සත්‍යතාව මහත් සැනසිල්ලක් විය. එහෙත් තමා දෙවියන්වහන්සේගේ දරුවන් යයි කියාගත් සෙනඟට එම පණිවිඩය පැකිලීමේ කඩුල්ලක්ද විරුද්ධ වීමේ බාධකයක්ද වූයේ මක්නිසාද? "මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි" යනුවෙන් සිය ගෝලයන්ට පොරොන්දු වූයේ අපගේ ස්වාමින්-වහන්සේය. තමන්වහන්සේගේ වෙන්ව යාම නිසා අනුගාමිකයන්ට දැනෙන්නාවූ තනිවීම සහ ශෝකය පිළිබඳව සංවේදී වූ මහා කාරුණික ගැළවුම්කාරයාණන් ස්වර්ගයට නැඟී ගිය අවස්ථාවේදී තමාගේ අනුගාමිකයන්ට සැනසීම ලබාදීම පිණිස දේව දූතයන්ට අණ කළේ තමන්වහන්සේ ගිය ආකාරයෙන්ම නැවත පුද්ගලිකවම පැමිණෙන බව කියමින් ඔවුන්ට ඒ ගැන සහතිකයක් ලබාදෙන ලෙසටය. තමා ආදරය කළ තැනැන්වහන්සේ ස්වර්ගය වෙතට ඔසවා ගන්නා ආකාරය දෙස බලා සිටි ගෝලයන්ට, උන්වහන්සේ ඔවුන්ගේ දර්ශන පථයෙන් ඉවත් වීමත් සමග සුදු වතින් සැරසුණු මිනිසුන් දෙදෙනෙක් ඔවුන්ට කථා කරන්නට විය: "ගලීලයේ මනුෂ්‍යයෙනි, නුඹලා ස්වර්ගය දෙස බල බලා සිටින්නේ මක්නිසාද? නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුන්ට කීවෝය." (ක්‍රියා 1:11). දේව දූතයන්ගේ පණිවිඩයෙන් ඔවුහු අස්වැසිල්ලක් ලැබූහ. අළුත් බලාපොරොත්තුවකින් ඔවුන්ගේ හදවත් ආලෝකමත් විය. "ඔව්හු උන්වහන්සේට නමස්කාර කොට මහත් ප්‍රීතියෙන් යෙරුසලමට හැරී ඇවිත් නිතරම දේව මාළිගාවෙහි දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් සිටියෝය." (ලූක් 24:52,53). ඔවුන්ට ඉමහත් ප්‍රීතියක් පැවතියේ යේසුස්වහන්සේ තමන්ගෙන් වෙන් වී යාම නිසා නොව, උන්වහන්සේ නැවත වරක් පැමිණෙන බවට දේව දූතයන් සහතිකයක් ලබා දුන් නිසා විය.

බෙත්ලෙහෙමේ එඬේරුන් හට දේව දූතයන් විසින් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැනවූ පණිවිඩය ප්‍රකාශ කළාක් මෙන්ම උන්වහන්සේගේ දෙවන ඊමේ පණිවිඩයද අද ලෝ පුරා ඉමහත් ප්‍රීතියෙන් යුතුව ප්‍රකාශ



කළ යුතු වන්නේය. ක්‍රිස්තුස්වහන්සේ පළමුවර පැමිණි විට ලෝකයා උන්වහන්සේව එපා කළෝය. උන්වහන්සේට නිග්‍රහ කළෝය, උන්වහන්සේට අවමන් කළෝය. නුමුත් උන්වහන්සේ දෙවන වර පැමිණෙන්නේ බලයෙන් සහ තේජසින් යුතුවය, තම ජනතාවට විමුක්තිය ලබාදීමටය. එම නිසා දෙවියන්වහන්සේට ආදරය කරන්නාවූ අය දේව වචනය මත පදනම් වූ මේ පණිවිඩය ප්‍රීතියෙන් යුතුව ප්‍රචාරය කර හැරීම විනා තවත් කළ හැකි වැදගත් කාර්යයක් නැත. තමන්ට සදාතන ජීවය ලබා දෙන්නාවූ තැනැන්වහන්සේ දෙවන වර පැමිණෙන සේක. එය දේව ජනතාවගේ බලාපොරොත්තුව වන්නේය. උන්වහන්සේ නැවත් සිටිනවාට කැමැති අය නම් ගැළවුම්කරුවාණන්ට ආදරය නොකරන්නාවූ අය වෙති. සගයෙන් දෙනු ලැබූ මේ පණිවිඩය ගැන අප්‍රසන්නව ද්වේෂ සහගත වෛරයකින් යුතුව ක්‍රියා කරන්නාවූ කිතුණු සභාවන් දෙවියන්වහන්සේගේ පහසින් ඉවත්ව ගොස් ඇති බවට එය හේතු සාධක සාක්ෂියක් වන්නේය.

දෙවන ඊමේ දහම පිළිගත් අය පසුතැවිලි වී දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිහතමානී වීමට පොළඹවනු ලැබූහ. බොහෝ අය තමන්ගේ ස්ථාවරය දෙවියන්වහන්සේ හා ලෝකය අතර දෝලනය කරමින් කල් ගෙවූහ. පණිවිඩය ලැබීමත් සමගම ඔවුන්ට හැඟී ගියේ තමා දැන් නිශ්චිත තීරණයක් ගත යුතු බවය. සදාකාලය පිළිබඳව වූ දේවල් ඔවුන්ට පෙනී තිබුණේ අනවශ්‍ය දේවල් හැටියටය. නමුත් සගය ඔවුන් කරා සමීප කරනු ලැබිණ. දෙවියන්වහන්සේ ඉදිරියෙහි තමන් වරදකරුවන් වන්නේය යන හැඟීමකින් ඔවුහු වෙළී ගියහ. (Bliss, "Memoirs of Wn. Miller," p. 146). අළුත් ආත්මික දිවි පැවැත්මක් සඳහා කිතුණුවන්ව පිබිදීමකට පත් කරනු ලැබිණි. තම සහෝදර ජනතාව වෙනුවෙන් තමන්ගෙන් ඉටු විය යුතු සේවා කාර්ය හැකිතාක් ඉක්මණින් ඉටුවිය යුතු බව ඔවුන්ට හැඟී ගියේය. ඒ සඳහා වැඩි කාලයක් නැති බවත්, ඔවුන්ට දැනී ගියේය. ලෝකය පසෙකට තල්ලු වෙමින් ස්වර්ගය ඔවුන් ඉදිරියෙහි විවෘතව ඇති බවක් ඔවුන්ට පෙනී ගියේය. සදාතනික අභිවෘද්ධිය හෝ ශෝචනීය විපත හා සම්බන්ධ දේවල් කෙරෙහි නැඹුරු වූ මිනිසාට භෞතික සම්පත් ගැන සිතීමටවත් අවශ්‍යතාවක් නොවීය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔවුන් මත්තෙහි පිහිටා සිටිසේක. දෙවියන්වහන්සේගේ දවස උදෙසා සූදානම් වන්නැයි තම සහෝදර බැතිමතුන්ට හෝ පව්කාරයන්ට හෝ මහත් උනන්දුවකින් යුතුව ආයාචනා කරන්නාවූ අතරේදී උන්වහන්සේ ඔවුන්ට බලය ලබා දෙමින් ඔවුන්ව ශක්තිමත් කළසේක. නව පිබිදීමක් ලැබූ අයගේ දෛනික ජීවිත මගින් ඇතිවූ නිහඬ සාක්ෂිය හුදෙක් චාරිත්‍රානුකූල වූද, අවංක කැපවීමකින් තොරවූ ද දිවි පැවැත්මක් ගත කළ සභා සාමාජිකයන්ට නිරන්තර තරවටුවක් හා දොස් පැවරීමක් විය. දැහැමි ශුද්ධ කැපවීමකින් යුතු ජීවිතයක් ගත නොකළ මෙම කිතුණුවෝ විනෝදාස්වාදය සොයමින් සැප සෙල්ලම්හි යෙදෙමින්

වින්දනයක් ලැබූ අය වූහ. මුදල් පසුපස හඹා යාම ඔවුන්ගේ අභිමතාර්ථය විය. ලෝකයාගේ ගෞරවයට පාත්‍ර වීම ඔවුන්ගේ අභිලාෂය විය. මේ නිසාම දෙවෙනි ඊම කෙරෙහි ඇදහිල්ලටත්, එම පණිවිඩය ප්‍රකාශ කළ අයටත් විරුද්ධව, ද්වේෂයත්, සතුරුකමත් එම අයගේ සිත් සතන්හි දළු ලා ලියලමින් වැඩී එල දරන්නට විය.

අනාවැකි වලින් පළ කළ කාලවකවානු බිඳ දැමිය නොහැකි නිසා අනාවැකි විෂය පිළිබඳව සෝදිසි කරන්නවුන් පසුබට කිරීමට විරුද්ධ කාරයෝ අළුත් උපාය මාර්ගයක් අනුගමනය කිරීමට පෙළඹුණහ. දිවැසි ප්‍රකාශන මුද්‍රා කර ඇති නිසා ඒ පිළිබඳ ඉගෙනීම තහනම් යයි ප්‍රකාශයක් නිකුත් විය. මෙසේ ප්‍රොතැස්තන්ත ආගමික නායකයෝ රෝමානු ආගමික නායකයන්ගේ අඩි පාරේ ගමන් කරන්නට වූහ. ශුද්ධ බයිබලය ජනතාවගේ භාවිතයෙන් ඉවත්කර තැබීමට රෝම සභාව ක්‍රියා කළ අතර ප්‍රොතැස්තන්ත සභාව ප්‍රකාශ කළේ ශුද්ධ බයිබලයේ සමහර කොටස් විශේෂයෙන්ම වත්මන් යුගයට අදාළ වූ සත්‍යතාවන් අඩංගු කොටස් වටහාගැනීමට නුපුළුවන් බවය.

දානියෙල් සහ එළිදරව් යන පොත් යුගලෙහි අන්තර්ගත අනාගතවාක්‍යයන් වටහාගත නොහැකි අභිරහස් යයි පූජකවරු සහ ගිහියෝද එකසේ ප්‍රකාශ කර සිටියෝය. එසේ වුවද, ඔවුන්ගේ කාලයේදී ඉටුවිය යුතු සිද්ධීන් පිළිබඳව දානියෙල් කියා ඇති අනාවැකි දෙසට ක්‍රිස්තුස්වහන්සේ තමන් ගෝලයන්ගේ අවධානය යොමු කළසේක. එසේ කළ උන්වහන්සේ මෙසේද පැවසූ සේක: "කියවන්නා එය තේරුම් ගනීවා." (මතෙව් 24:15). එළිදරව් පොත අභිරහස් තොරතුරු රැගත් ප්‍රකාශනයක් යයිද එය තේරුම් ගත යුතු පුස්තකයක් නොවේ යයිද චින්තනයක් පවතී. එසේ වුවද, එම පොතේ නම පවා එයට පටහැනි සාක්ෂියක් දරයි. එහි මෙසේ සටහන් වෙයි: "ඉක්මණින් වෙන්ට ඕනෑ දේවල් එනම් දෙවියන්වහන්සේ තමන්ගේ දාසයන්ට දක්වන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේට දුන්නාවූ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේගේ එළිදරව් කිරීමය.... මේ අනාගතවාක්‍යයේ වචන කියවන්නාද ඒවා අසන්නෝද එහි ලියන ලද කාරණා පවත්වන්නෝද ආශිර්වාද ලද්දෝය. මක්නිසාද කාලය ළඟය." (එළිදරව් 1:1-3)

"කියවන්නාවූ අය ආශිර්වාද ලද්දෝය"යි දිවැසිවරයා ප්‍රකාශ කරයි. මෙයින් දක්වෙන්නාවූ තවත් පැතිකඩක්ද ඇත; එනම්, මෙම පොත නොකියවන්නාවූ අයද සිටින බවයි: ඔවුන්ට මෙහි සඳහන් ආශිර්වාද හිමි නොවේ. "අනාගතවාක්‍යයේ ලියා ඇති දේ අසන්නෝද" දිවැසි ප්‍රකාශන ඇසීමට අකැමැති වන්නෝද සිටිති; ඔවුන්ට මෙහි සඳහන් ආශිර්වාද අත් නොවන්නේය. "එහි ලියන ලද කාරණා පවත්වන්නෝ"- එළිදරව් පොතේ ප්‍රකාශනයෙහි ඇති අනතුරු ඇඟවීම් සහ අනුශාසනාවලට අනුගත වීමට බොහෝ අය ප්‍රතික්ෂේප කරති. එවන් කිසිවකුට හෝ පොරොන්දු වී ඇති ආශිර්වාදයන්ට හිමිකම්



ඉදිරිපත් කළ නොහැක. මෙම අනාවැකි ලියවිල්ලෙහි ඉදිරිපත් කර ඇති විෂයන් අවමානයට ලක් කරන්නාවූ අයටද, මෙහි ඇතුළත් සංකේත සරදමට ලක් කරන්නාවූ අයටද අනාවැකියෙහි සඳහන් ප්‍රමිතීන්ට අනුව තමන් ජීවිත වෙනස් කර නොගන්නාවූ අයටද මෙසේ මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පැමිණීම සඳහා සූදානම් නොවන්නාවූ අයටද ආශිර්වාද නොලැබී යන්නේය.

දේවානුභාවයෙන් සාක්ෂි දරමින් සම්මත කරන ලද මෙම ලියවිල්ල අභිරහසක් යයිද, අවබෝධ කරගැනීමට මිනිස් ප්‍රඥවට නොහැකි යයිද පැවසීමට කිසිවෙක් එඩිතර වන්නේ කෙසේද? මෙම දිවැසි ලියවිල්ල වනාහි අභිරහස සරලව එළිදරව් කිරීමකි. එය විවෘත පොතකි. එළිදරව් පොත අධ්‍යයනය මගින් මනුෂ්‍යයා දානියෙල් පොතෙහි අනාවැකි වෙත යොමු කරනු ලබයි. මෙම පොත් දෙකෙහිම ඇතුළත්ව තිබෙන්නේ දෙවියන්වහන්සේ විසින් මිනිස් සතහට ලබා දී ඇති ඉතා වැදගත් අනුශාසනාවන්ය. ලෝක ඉතිහාසයේ අවසානයේදී සිදුවන්නාවූ දේවල් එයින් එළිදරව් කර දී ඇත.

සභා ඉතිහාසය තුළ අත්දකින්නට සිදුවන්නාවූ ගැඹුරුවූද, විශ්මය ජනකවූ ද කාරණා යොහන්ට අනාවරණය කරන ලදී. දේව ජනතාවගේ තත්ත්වයද, ඔවුන්ට මුහුණ පාන්නට සිදුවන්නාවූ අනතුරුදායක අත්දකීම් සහ ඔවුන් මුහුණ දෙන්නාවූ ගැටුම්ද අවසානයේදී ඔවුන් මුදවා ගනු ලැබීම යන දැද ඔහු දසුනින් දුටුවේය. භූමියේ අස්වැන්න පැසීම පිණිස දෙවා වදාරා ඇති පණිවිඩ යොහන් වාර්තා කර ඇත. ඒ අස්වැන්නෙන් සමහරක් මිටි බැඳ සගයේ ධාන්‍ය ගබඩාවටද, ඉතිරිය විනාශකර දමන පිණිස ගින්නටද යොමු කරනු ලබන බව ඔහු වාර්තා කරයි. ඉතා වැදගත් විෂය මාලාවන් ගණනාවක් ඔහුට එළිදරව් කරන ලදී. අන්තිම සභාවට, එනම් ඉතිරි සභාවට වැදගත්වූ දේවල් බොහොමයක් එළිදරව් පොතෙහි අඩංගුය. වරදෙහි මාර්ගයෙන් හැරී ඉවත්වී සත්‍යතාවේ මඟට පිවිසෙන්නාවූ බැතිමතුන්ට සමහර විටෙක මුහුණ පාන්නට සිදුවිය හැකි උපද්‍රව සහ ගැටුම් ද එහි සඳහන්ය. පොළොව මතුපිටට පැමිණෙන්ට යන්නාවූ සිද්ධීන් පිළිබඳව කිසිවෙකු හෝ අඳුරෙහි සිටිය යුතු නොවේ.

ශුද්ධ ලියවිලි අතර වැදගත් ස්ථානයක් දරන්නාවූ මෙම පොත පිළිබඳව මෙතරම් නොදැනුවත්කමක් පවතින්නේ මොන හේතුවක් නිසාද? එළිදරව් පොතෙහි ඇති ඉගැන්වීම් පිරික්සා බැලීමට බොහෝ අය පසුබා සිටින්නේ ඇයි? මෙය නපුරේ කුමාරයාගේ දහම් ගැටයකි; ඔහු විසින් මෙහෙයවනු ලබන මුළාකිරීම් ආවරණය වීම හා යටපත් කරනු ලැබීම ඔහුගේ වෑයමයි. එළිදරව් පොත හැදෑරීමට විරුද්ධව අනාගතයේදී දියත් වන්නාවූ ගැටුම් දිවැසින් දුටු ක්‍රිස්තුස්වහන්සේ වන එළිදරව් පොතේ කතුවරයාණෝ මෙම ලියවිලි කියවන්නාට අසන්නාට සහ පවත්වන්නාට ආශිර්වාද ලබාදෙන බව සඳහන් කළසේක.

# 19

# අඳුර පළවා හරිමින් ආලෝකය උදා වේ

යුගයෙන් යුගයට, විවිධාකාර වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයන් සහ ආගමික පිබිදීම් මගින් දෙවියන්වහන්සේ අපගේ ලෝකය පිළිබඳව කටයුතු කිරීමේදී ඒකාකාර ක්‍රමවේදයන් මෙහෙයවන සේක. මිනිසුන් සමග කටයුතු කිරීමේදී දෙවියන්වහන්සේගේ ප්‍රඥප්ති වෙනස් නොවේ. වත්මනදී භූමිකා මවන්නාවූ ව්‍යාපෘතීන් හා සමාන්තර ක්‍රියාදාමයන් අතීතයේද පැවැතියේය. පෙර කාලවලදී සභාව මුහුණ දුන් අත්දැකීම්වල අපගේ කාලයටද බොහෝ සේ අදාළ වන පාඩම් තිබේ.

ගැළවීමේ සැලැස්ම ඉදිරියට යා යුතුය. ඒ සඳහා දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් තම සේවකයන්ට මගපෙන්වන සේක. මේ සත්‍යතාවය ශුද්ධ බයිබලයේ ඉතාම පැහැදිලි ලෙස දක්වා තිබේ. තමන්වහන්සේගේ මෛත්‍රී-කරුණාවේ සහ දයා-අනුග්‍රහයේ අරමුණු ඉටුකරගැනීම සඳහා දෙවියන්වහන්සේ මිනිසුන්ව භාවිතා කරගන්නා සේක. සෑම අයෙක් විසින්ම ඉටුකළ යුතු කාර්ය භාරයක් තිබේ. සෑම අයෙකුටම එක්තරා ප්‍රමාණයක ආලෝක කදම්බයක් ලබාදී තිබේ. එම ආලෝකය ඔහු සතු කාලයට ඔබින අන්දමින් ලබාදී ඇත. දෙවියන්වහන්සේ එවන් අයගෙන් බලාපොරොත්තු වන්නාවූ මෙහෙය සපුරාලීමට එම ආලෝකය ප්‍රමාණවත්ය. එහෙත් සගයේ ඉහළ තලයේ ගෞරවයට පාත්‍ර වූ කවරෙකු හට වුවද ගැළවීමේ සැලැස්මෙහි පූර්ණ අවබෝධයක් හෝ දැනුමක් කරා පැමිණීමට හැකියාව උදාවී නැත. යමෙකුට පවරන ලද වැඩ කොටසෙහි දිව්‍ය අභිමතාර්ථය පිළිබඳව පූර්ණ ඇගයීමක් කිරීමට පවා එම තැනැත්තන්ට පුළුවන්කමක් නැත. කෙනෙකුට දෙවියන්වහන්සේ පවරන්නාවූ කාර්ය භාරය මගින් උන්වහන්සේ ඉටු කරන්නාවූ වැඩයේ පරිමාණය ගැන තක්සේරු කිරීමට හෝ සම්පූර්ණ අවබෝධයක් කරා පැමිණීමට මිනිසා සමත් නොවේ. දෙවියන්වහන්සේගේ නාමයෙන් යමෙක් ප්‍රකාශ කරන්නාවූ පණිවිඩයෙහි සෑම පැතිකඩක්ම වටහා ගැනීමට ඔහු සමත් වන්නේ නැත.

"දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් දැනගන්ට නුඹට පුළුවන්ද? සර්වපරාක්‍රමයාණන්වහන්සේ සම්පූර්ණ ලෙස දැනගන්ට නුඹට පුළුවන්ද?" "මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය, නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේ යයි ස්වාමින්වහන්සේ කියන සේක. අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ." "මක්නිසාද මමම දෙවියන්වහන්සේය, මා සමාන කෙනෙක් නැත; මම වනාහි අන්තිමය මුල පටන්ද තවම සිද්ධනූණදේ පුරාණයේ පටන්ද දන්වන්නාවූ .... තැනැන්වහන්සේය." (යෝබ් 11:7; යෙසායා 55:8, 9; 46:9,10).



ශුද්ධාත්මයාණන්වහන්සේගේ විශේෂ කාරණා පැහැදිලි කිරීමක් ලැබීමෙන් වරප්‍රසාදය ලැබූ දිවැසිවරුන් පවා තමාට භාරදුන් එළිදරව් කිරීම් පිළිබඳව සම්පූර්ණ විස්තීර්ණ දැන සිටියේ නැත. දෙවා වදාරණ ලද ප්‍රකාශනයන්හි තේරුම යුගයෙන් යුගයට කල්ගත වීමෙන් පසුව පැහැදිලි කරදෙනු ලැබුවේය. එම දිවැසි ප්‍රකාශනයන්හි අඩංගු අනුශාසනා දේව ජනතාවට කාලෝචිත වන පරිදි පැහැදිලි කරදෙන ලදී.

ශුභාරංචිය මගින් ආලෝකමත් කරනු ලැබූ ගැළවීම පිළිබඳව පේතෘස් මෙසේ පවසයි. "නුඹලාට පැමිණෙන්ට තිබුණු අනුග්‍රහය ගැන අනාගතවාක්‍ය කී අනාගතවක්තෘවරු ඒ ගැළවීම ගැන බොහෝ සෙයින් විභාග කොට සෙවුවෝය. ඔවුන් තුළෙහිවූ ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේට නියමවූ වධ විඳීම ද ඊටපසු පැමිණෙන තේජසද ගැන කලින් සාක්ෂිදුන් විට, කවර කාලයක් නොහොත් කොයි ප්‍රකාර කාලයක් හැඟවූ සේක්ද කියා ඔව්හු සෙව්වෝය. ඔවුන් ඒ දේවල් ගැන සේවය කරන්නේ තමුන්ට නොව නුඹලාට බව ඔවුන්ට එළිදරව් කරන ලද්දේය." (1 පේතෘස් 1:10-12).

දෙවියන්වහන්සේ විසින් දිවැසිවරුන්ට එළිදරව් කරන ලද දේ පිළිබඳව පූර්ණ වටහා දීමක් ඔවුන්ට ලබාදෙනු ලැබුවේ නැත. එසේ වුවද, දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට ලබාදීමට කැමති වූ සෑම ආලෝක දහරාවක්ම ලබාගැනීමට එම දිවැසිවරු උනන්දුවෙන් ක්‍රියා කළෝය. ඔවුහු 'ඉතා ඕනෑකමින්ද මහත් සැලකිල්ලෙන්ද' (දිවැසි වැකි) පිරික්සා බැලූහ. 'ඒ අනාවැකි වලින් එතුමාණන් පෙන්නුම් කළේ කවර කාලයක් ගැනද, කවර සිද්ධීන් ගැන දැයි සොයා දැනගන්නට' (ඔවුහු) උත්සාහ දැරූහ. තමන්වහන්සේගේ සේවකයන්ට දෙවා වදාළ මෙම අනාවැකි ක්‍රිස්තියානි යුගයේ ජීවත් වන්නාවූ දේව දරුවන් සඳහාය. එම නිසා එම අනාවැකි අපගේ අවධානයට භාජන වීම කෙතරම් වටිනා භාග්‍යයක්ද! ඔවුන් ඒ දේවල් ගැන සේවය කරන්නේ තමුන්ට නොව නුඹලාට බව ඔවුන්ට එළිදරව් කරන ලද්දේය. එහෙත් උපත ලබා නැති පරම්පරාවන්හි ප්‍රගතිය සඳහා දෙනු ලැබූ මෙම අනාවැකි ඒ ශුද්ධවූ දේව දාසයන් ඉතා ඕනෑකමින් සහ මහත් සැලකිල්ලෙන්" පිරික්සා බැලූ අන්දම ගැන සැලකිලිමත් වන්න. සගයෙන් දානය කරන ලද මෙම දීමනාව පිළිබඳව දිවැසිවරුන් තුළ පැවතියේ ශුද්ධ වූ ජ්වලිත ඇලුම් කිරීමකි. එහෙත් වත්මන් යුගයන්හි සිටින්නාවූ දේව කරුණා-අනුග්‍රහය ලැබූ දේව දාසයන් දිවැසි ප්‍රසාදි ප්‍රකාශන පිළිබඳව දක්වන්නේ කෙතරම් ඇල්මැරුණු ආකල්පයක්ද. සැප පහසු

සැහැල්ලු ජීවිත පැවැත්මක් ඇත්තාවූ ද ලෞකික සම්පත් කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන්නාවූ ද දේව සේවකයන් ලෞකික දීමනාවන්ගෙන් සෑහීමට පත්ව පවසන්නේ දෙන ලද අනාවැකි තේරුම්ගත නොහැකිය කියාය. මෙය ඔවුන්ට කොපමණ මහත් තරවටුවක්ද.

අපරිමිතවූ ද, අනන්තවූ ද තැනැන්වහන්සේගේ මන්ත්‍රණයට සහභාගී වීමට සීමිතවූ මිනිස් මනසට හැකියාවක් නොවේ. උන්වහන්සේගේ අරමුණු ඉටුකරගැනීමට ක්‍රියාත්මක වන්නාවූ ක්‍රමවේදයන් සම්පූර්ණ- යෙන්ම තේරුම් ගැනීමට මිනිසාට හැකියාවක් නැත. එසේ වුවද, සගයේ පණිවිඩ තේරුම් ගැනීමේ හැකියාව මිනිසාට නොලැබෙන්නේ ඔහුගේ පැත්තෙන් වූ යම්කිසි වරදක් හෝ අතපසු වීමක් හෝ නිසාය. සාමාන්‍ය මිනිසුන්ගේ මෙන්ම දේව සේවකයන්ගේද මනස් බොහෝ අවස්ථාවන්හිදී මිනිස් නිගමනයන්ගෙන්ද, සම්ප්‍රදායන්ගෙන්ද, වැරදි ඉගැන්වීම් වලින්ද පදම්වී ඇති නිසා, තමන්වහන්සේගේ ශුද්ධ වචනය තුළින් එළිදරව් කර ඇති මහා පරිමාණ තොරතුරු මිනිසාට ග්‍රහණය කරගත හැක්කේ ඉතා ස්වල්ප ප්‍රමාණයෙන් පමණකි, අඩ වශයෙන් පමණකි. ගැළවුම්කාර සමිඳාණෝ තමන් ගෝලයන් සමග සිටි කාලයේදී පවා ඔවුන්ගේ වටහා ගැනීමද මෙයාකාරම විය. ඔවුන්ගේ මනස් තුළ මුල්බැස ගෙන සිටි සංකල්පය වූයේ මෙසියස්වහන්සේ මෙලොවට පැමිණෙන්නේ ලෞකික කුමාරයෙකු වශයෙන්ය කියාය. එම චින්තනය එකල පැවති ජනප්‍රිය සංකල්පය විය. එම කුමාරයා විසින් ඊශ්‍රායෙල් ජාතිය විශ්වීය රාජධානියෙහි සිහසුන කරා මෙහෙයවනු ලැබේය යන්න ඊශ්‍රායෙලිතයන්ගේ බලාපොරොත්තුව හා විශ්වාසය විය. එහෙයින් උන්වහන්සේගේ මරණය හා දුක්විඳීම පිළිබඳව උන්වහන්සේ පැවසූ දේවල් ඔවුන්ට වටහාගත නොහැකි විය.

"කාලය සම්පූර්ණ විය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලි වී ශුභාරංචිය අදහාගන්න" (මාර්ක් 1:15) යන පණිවිඩයත් සමග ක්‍රිස්තුස්වහන්සේම ඔවුන් පිටත් කළසේක. එම පණිවිඩය දානියෙල් 9 හි අනාවැකිය මත පාදක වී තිබිණ. දේව දූතයා ප්‍රකාශ කළ පරිදි සති සැට නවයක් වූ කාලවකවානුව "අධිපතියා වූ ආලේපලත් තැනැත්තා" දක්වා විහිදී යාමට නියමිත විය. මුළු භූමි තලයම පාලනය කරමින් මෙසියානු රාජධානිය යෙරුසලමෙහි පිහිටුවනු ලබනවා ඇතැයි ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෝ මහත් ප්‍රීතියෙන් යුතුව, බලාපොරොත්තුවෙන් යුතුව අපේක්ෂා කළෝය.

ක්‍රිස්තුස්වහන්සේ විසින් ගෝලයන්ට භාර කළ පණිවිඩය දේශනා කරමින් ගෝලයන් ක්‍රියා කළ නමුත් ඒ ගැන නිසියාකාර අවබෝධයක් ඔවුන් සතු නොවීය. දේව රාජ්‍යය පිළිබඳව වූ සංකල්පය දානියෙල්



9: 25 මත පාදක විය. එහෙත් ආලේපලත් තැනැත්තා සිඳ දමනු ලබන බව 26 වෙනි පදයෙහි අඩංගුව ඇති බව ඔවුන්ගේ අවධානයට හසු නොවීය. උත්පත්තියේ පටන්ම දේව දාසයන්ගේ හදවත් තුළ මුල් බැස තිබූ සංකල්පය වූයේ භූමික අධිරාජ්‍යයක් පිළිබඳව තේජස්ශ්‍රීය විශ්වාසයකි. ක්‍රිස්තුස්වහන්සේගේ වචනවල සහ දිව්‍යසි ප්‍රකාශනයෙහි නියත විස්තර මෙම විශ්වාසය කරණකොටගෙන අඳුරු සේයා පටලයකින් ආවරණය වී තිබිණ.

දයා-කරුණාවෙහි කැඳවීම යුදෙව් ජනතාවට ලබාදෙමින් ගෝලයෝ තමන්ට භාරදෙන ලද කාර්ය භාරය ඉටු කළෝය. එසේ වුවද, තමන්ගේ ස්වාමීන්වහන්සේ දාවිත්ගේ සිහසුනෙහි රාජාතිරජාණන් ලෙස පදවි ප්‍රාප්ත වීම අපේක්ෂා කළ අතරම උන්වහන්සේව අපරාධකාරයෙකු ලෙස අත්අඩංගුවට ගෙන කස පහරදී, උපහාසයට ලක් කර මරණ දණ්ඩනයට යටත් කරන ලද ආකාරය ඔවුන්ට දකගැනීමට සිදු විය. තවද, උන්වහන්සේ කල්වරියෙහි කුරුසිය මත දිවි පුදන ආකාරයද ඔවුහු දුටුවෝය. ක්‍රිස්තු සමිඳාණෝ සොහොන් ගැබෙහි සැතපී සිටි කාලය තුළදී ඔවුන්ගේ හදවත් කොපමණ මහත් බලාපොරොත්තු සුන්වූ ආකාරයකින් සහ උග්‍ර වේදනාවකින් පීඩනයට පත්ව තිබුණේද.

දිව්‍යසි ප්‍රකාශනයෙහි දක්වා තිබූ ආකාරයෙන්ද නියමිත කාලවකවානුවේද ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට වැඩි සේක. උන්- වහන්සේගේ මෙහෙය හා බැඳි සෑම ප්‍රකාශිත සිද්ධියක්ම අකුරටම ඉටුවී තිබුණේය. උන්වහන්සේ ගැළවීමේ පණිවිඩය දේශනා කර තිබුණේය. තවද උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්ත විය. උන්වහන්සේගේ වචන සගයෙන් දෙවා වදාළ වචන බවට ශ්‍රාවකයන්ට සැකයක් නොවීය. පුත්‍රයාණන්වහන්සේ විසින් ගෝලයන් හට ඔවුන්ගේ කාර්ය භාරයෙහි වගකීම පවරා දුන් අවස්ථාවේදී පියාණන්වහන්සේගේ හඬ සහ ආත්මයාණෝ එය සහතික කළසේක.

උන්වහන්සේගේ ගෝලයෝ තම ප්‍රේමණීය ගුරුවරයාණන්ට ඉත සිතින් ආදරය කිරීම අඛණ්ඩව කරගෙන ගියෝය. එසේ වුවද, ඔවුන්ගේ මනස් අනුමානයෙන් සහ සැකයෙන් පිරී තිබුණේය. සිත් තැවුලෙන් පෙළී සිටීම නිසා ක්‍රිස්තුස්වහන්සේ පැවසූ වදන් ඔවුන්ගේ මතකයට ආවේ නැත. තමන්වහන්සේගේ දුක්විඳීම සහ මරණය ගැන යේසුස්- වහන්සේ විසින් ඔවුන්ව දැනුවත්කර තිබුණ නමුත් ඔවුන්ගේ මතකයට ඒ වචන යොමු වූයේ නැත. නාසරීය යේසුස්වහන්සේ සැබෑ මෙසියස්- වහන්සේ වූසේක් නම්, තමන් මෙසේ සෝ සයුරේ සහ කළකිරීමේ ගිලී යනවා ඇද්ද? ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ උන්වහන්සේගේ උත්ථානය අතරේ තිබූ සබත් දවසෙහි ක්‍රිස්තුස්වහන්සේ සොහොන් ගැබෙහි සිටි අතර ගෝලයන්ගේ සිත් වේදනාවට පත්කළ ප්‍රශ්නය වූයේ එයයි.

දුක් දොම්නසෙහි රාත්‍රියේදී දැඩි අඳුරු වළාවක් ගෝලයන් වසාගෙන සිටි නමුත් යේසුස්වහන්සේ ඔවුන් අත්හැර දමා තිබුණේ නැත. දිවැසිවරයා මෙසේ පවසයි: "මා අඳුරෙහි හිඳින කළ ස්වාමීන්වහන්සේ මට එළියක්ව සිටින සේක.... උන්වහන්සේ මා ආලෝකයට පමුණුවනවා ඇත. මමද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දකින්නෙමි" "අන්ධකාරය ඔබගෙන් කිසිවක් නොසඟවයි, රාත්‍රියද දවල් මෙන් බබළයි. අන්ධකාරයත් එළියත් ඔබට එක සමානය" "සත්පුරුෂයාට අන්ධකාරයේදී ආලෝකය උදාවේ," "අන්ධයන් ඔවුන් නොදත් මාර්ගයකින් ගෙන යන්නෙමි; ඔවුන් නොදන්නා මාවත් වලින් යන්ට සලස්වන්නෙමි. ඔවුන් ඉදිරියෙහි අන්ධකාරය එළිය කොට ඇද තැන් ඇද අරින්නෙමි. මම මේ දේවල් කරන්නෙමි. ඔවුන් අත් නාරින්නෙමි." (මීකා 7:8,9; ගීතාවලිය 139:12; 112:4; යෙසායා 42:16).

දෙවි සමිඳාණන්ගේ ශ්‍රී නාමයෙන් ගෝලයන් විසින් කරන ලද ප්‍රකාශන දැනුම් දීම සෑම අංගයකින්ම නිවැරැදි විය. එම ප්‍රකාශනයන්හි අඩංගු සිද්ධීන් ඒ වන විටත් සිදුවෙමින් පැවැතියේය. "කාලය සම්පූර්ණ විය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය" යනු ඔවුන්ගේ පණිවිඩය විය. කාලයේ අවසානය, එනම් දානියෙල් 9 හි සඳහන් සති සැට නවයක් ගෙවී ගිය පසු මෙසියස්වහන්සේ එනම් ආලේපලත් තැනැන්වහන්සේගේ දවස උදා විය. මෙම අවස්ථාවේදී ක්‍රිස්තුස්වහන්සේ යොහන් වෙතින් යොර්දාන් නදියෙහිදී බව්තීස්මය ලැබූසේක. ළංව තිබෙන්නේ යයි ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද දෙවියන්වහන්සේගේ රාජ්‍යය ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සමගම ස්ථාපිත කරනු ලැබීය. ඔවුන්ට උගන්වා තිබූ පරිදි එම රාජ්‍යය භූමික දහනක් නොවීය. එහෙත් එවැන්නක් ගැන ඔවුහු විශ්වාස කළෝය. එය අනාගතයේදී එන්ට තිබෙන්නාවූ රාජධානිය පිළිබඳවද නොවීය. "අහස යට තිබෙන රාජ්‍යවල රජකමද ආණ්ඩුවද මහත්කමද මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්තයන් වන සෙනඟට දෙනවා ඇත." ඒ අතර මේ පණිවිඩය ඒ ගැන නොවීය. එම සදාතනික රාජ්‍යයේ "සියලුම ආණ්ඩුද උන්වහන්සේට සේවයකර කීකරු වෙනවා ඇත." (දානියෙල් 7:27). "දෙවියන්වහන්සේගේ රාජ්‍යය" යනුවෙන් ශුද්ධ බයිබලයේ භාවිතා කරන්නාවූ වචන දක්වන්නේ අනුග්‍රහයේ රාජ්‍යය හා තේජසේ රාජ්‍යයක්ය. කරුණා-අනුග්‍රහයේ රාජ්‍යය ගැන පාවුල් හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියේ සඳහන් කරයි. අනුකම්පාවෙන් නොඅඩුව සගයේ සිටින්නාවූ මැදහත්කාරයාණන් වූ ක්‍රිස්තුස්වහන්සේ ගැන හැඳින්වීමක් කරන්නාවූ පාවුල් අපට මෙසේ අනුශාසනා කරයි. "එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බ වෙන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු." (හෙබ්‍රෙව් 4:16). කරුණා-අනුග්‍රහයේ සිංහාසනයෙන් කරුණා-අනුග්‍රහයේ රාජ්‍යයක් නිර්දේශ කෙරේ. මක්නිසාද සිංහාසනයක් ඇති තැනෙක රාජ්‍යයක්ද



තිබේ. උපමාවක් කියාදීමේදී "ස්වර්ග රාජ්‍යය" යන්න ක්‍රිස්තුස්වහන්සේ බොහෝ අවස්ථාවලදී යොදාගත් සේක. මිනිස් හදවත් තුළ දිව්‍ය කරුණා-අනුග්‍රහයේ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කිරීමට උන්වහන්සේ එයින් අදහස් කළසේක.

එසේම තේජසේ සිංහාසනය මගින් නිරූපණය කරන්නේ තේජස් මහිමශ්‍රීයේ රාජ්‍යයයි. ගැළවුම්කාරයාණන්ගේ වදන්හි එය මෙසේ විස්තර කෙරේ. "මනුෂ්‍ය පුත්‍රයා සියලු දේව දූතයන් සමග තමන්ගේ තේජසින් එන කළ, ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳින සේක. එවිට සියලු ජාතිහු උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලබන්නෝය." (මතෙව් 25:31, 32). මෙම රාජ්‍යය පිහිටුවීම තවමත් අනාගතයේදීය. ක්‍රිස්තුස්-වහන්සේගේ දෙවන පැමිණීමෙන් පසුව පමණක් මෙම රාජ්‍යය පිහිටුවනු ලබන්නේය.

මිනිසා පාපයට වැටීමත් සමගම කරුණා-අනුග්‍රහ රාජ්‍යය පිහිටුවනු ලැබීය. වරදකාර ජාතියට ගැළවීම ලබාදීම උදෙසාවූ වැඩ සැලැස්මක් එවිට ස්ථාපිත කරන ලදී. එය දෙවියන්වහන්සේගේ පොරොන්දුව මතද, උන්වහන්සේගේ අභිප්‍රාය උදෙසාද නිර්මාණය කරන ලද රාජධානියකි. ඇදහිල්ල කරණකොටගෙන මිනිසාට එම රාජ්‍යයෙහි යටත්වැසියන් වීමට අවස්ථාව ලැබේ. එහෙත් එය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම ක්‍රිස්තුස්වහන්සේගේ මරණය තෙක් සිදු නොවීය. තම සේවා-මෙහෙවරය තම භූමි තලයෙහි ආරම්භ කිරීමෙන් පසුව වුවද, මිනිසුන්ගේ දැඩි මුරණ්ඩුකම සහ අකෘතඥකම නිසා වෙහෙසට පත් ගැළවුම්කාරයාණෝ ස්වකීය පූජාව ඉටු නොකර සගයට ආපසු යාමට වූ සිතුවිල්ලකින් පෙළී යන්නට පුළුවන්කම තිබුණි. දුක් විපත්තියෙහි ශෝචනීය කුසලාන ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී හස්තයෙහි වෙවුලන්නට විය. දැඩි සිත් වේදනාවකින් ගෙත්සෙමන උයනෙහි සිටි උන්වහන්සේ දැඩි මානසික චින්තනයකින් කම්පා වූසේක. තමන් දෙන්නාවූ දීමනාව පිළිගැනීමට තරම් මිනිසා කෘතඥ වන්නේ නැතිනම් තම නළලෙහි වූ රුධිරය මුසු දහඩිය පිස දමා මනුෂ්‍යයාට තමන්ගේ දුෂ්ටකමෙහිම විනාශ වෙන්නට ඉඩ හැර ආපසු සගයට යාමට උන්වහන්සේට පුළුවන්කම තිබුණි. උන්වහන්සේ එසේ කළසේක් නම්, වැටී ගිය මිනිස් වර්ගයාට ගැළවීමක් කිසිම කලෙක උදාවන්නේ නැත. එහෙත් ගැළවුම්කාර සමිඳාණෝ තම ජීවිතය පූජාවක් ලෙස ඔප්පු කරමින් "තීන්දු වුණේය" කියමින් අවසන් හුස්ම හෙළූ විට ගැළවීමේ සැලැස්මෙහි ඉටුවීම සහතික විය. ඒදන් උයනෙහි සිටි යුවළට වූ ගැළවීමේ පොරොන්දුව වලංගුතාවට පත්විය. දෙවියන්-වහන්සේගේ පොරොන්දුව මත පිහිටුවනු ලැබූ කරුණා-අනුග්‍රහ රාජ්‍යය එවිට ස්ථාපිත විය.

ගෝලයන්ගේ බලාපොරොත්තුව වූයේ ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත දේව රාජ්‍යය පිහිටුවනවා ඇත යන්නය. උන්වහන්සේගේ මරණයත් සමගම ඔවුන්ගේ සියලු ප්‍රාර්ථනා සුණු විසුණු වී ගියේය. එහෙත් සත්‍යය වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ මරණය මගින් දේව රාජ්‍යය සදහටම පිහිටුවනු ලැබීමය. ඔවුන්ගේ බලාපොරොත්තු සුන්කිරීමක් ලෙස සලකන ලද එම සංසිද්ධිය ඔවුන්ගේ විශ්වාසය නිවැරැදි බවට වූ සාක්ෂියක් විය. ශෝකයෙන් වැලපීමටත්, බලාපොරොත්තු නැතිවීමටත් හේතු වූ එම සිද්ධියම, ගෝලයන්ටත් එසේය මිනිස් පරපුරේ ආදම්ගේ සෑම දරුවෙකුටත් සුගතිය උදාකර දෙන්නාවූ දොරටු විවෘත කිරීමක් බවට පත්විය. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය නම් වූ එම සිද්ධිය නිසාම අනාගත ජීවිතයත්, ප්‍රීතියත් සෑම පරම්පරාවකම විසූ දෙවියන්-වහන්සේගේ දරුවන්ට දොරටුව විවෘත කර දුන්නේය.

ගෝලයන්ගේ සිත් සතන් බලාපොරොත්තු කඩවීමකින් අව-පාතයකට පත්වුවද, අනන්ත වූ මෛත්‍රී-කරුණාවෙහි අභිමතාර්ථය ඉටුවෙමින් පැවැතියේය. ඔවුන්ගේ හදවත් කරුණා-අනුග්‍රහයෙන් කිතුණු සමිඳාණන් විසින් දිනාගෙන තිබුණද, වෙනත් කිසිම මිනිසෙක් කථා නොකළ ආකාරයේ බලයක් උන්වහන්සේගේ ඉගැන්වීම තුළ දකගැනීමට හැකියාව තිබුණද, යේසු සමිඳාණන් කෙරෙහි වූ ආදරය නැමැති අමිශ්‍ර රත්රන් සමග ලෞකික අභිමානයත් ආත්මාර්ථකාමී කීර්තිය සහ යසස් අභිලාෂයත් ඔවුන් තුළ කලවම්ව තිබුණේය. අන්තිම පාස්කු මංගල්‍යය පැවැත්වූ කාමරය තුළ ගත කළ ශුද්ධ වූ අන්තිම පැයෙහිදීද ගෝලයින්ගේ ගුරු දේවයාණන් ගෙත්සෙමනේ සෙවනැලි අතරට පිවිසෙමින් සිටි ඒ පැයේදීද ඔවුන් අතරින් වඩා උත්තමයා ලෙස සැලකිය යුත්තේ කවුරුන් දැයි යන්න ගැන ගෝලයන් අතරේ විවාදයක් ඇති විණි. (ලූක් 22:24). ඔවුන්ගේ චින්තනය තුළ රජකම් කළේ සිහසුන, ඔටුන්න සහ තේජස යන කරුණුය. එහෙත් ඔවුන් ඉදිරියෙහි භූමිකා මැවීමට නියමව තිබුණේ උයනෙහි විඳින්නට සිදුවන්නාවූ ලැජ්ජාව සහ දොම්නසත්, විනිශ්චය ශාලාවෙහි දුක් කන්දරාවත්, කල්වාරි කුරුසියෙහි සංතාපයත්ය. එකල ජනප්‍රියව පැවති සාවද්‍ය ඉගැන්වීම් දැඩිකොට අල්වා ගෙන සිටි ඔවුන්ට එයින් බැහැර වීමට ඔවුන්ගේ සිත් තුළ තිබූ අහංකාරයත් ලෝක යසෝරාවයට වූ පිපාසාවත් ඉඩ දුන්නේ නැත. එහෙත් තමන්වහන්සේගේ රාජ්‍යයෙහි සත්‍ය යථාර්ථය ගැළවුම්කාරයාණෝ පෙන්වා දී තිබූසේක. එම රාජ්‍යය ස්ථාපිත කිරීමට නම් තමන් දුක් වේදනා විඳිය යුතු බවත්, තමන් ජීවිතය පවා පූජා කළ යුතු බවත් උන්වහන්සේ ප්‍රකාශ කොට තිබුණි. එහෙත් උන්වහන්සේගේ වචන තැකීමට ඔවුන්ගේ සිත් ඉඩ දුන්නේ නැත. ගෝලයන්ගේ චින්තනය නිවැරැදි මාවතට ගැනීමට නම් ඔවුන්ව පරීක්ෂාවට භාජන වීමට ඉඩ හැරීම අවශ්‍යතාවක් විය. තමන් විසින් ප්‍රකාශයට පත් කළ යුතු පණිවිඩය පිළිබඳවවූ දුර්වාබෝධය නිසා



ඔවුන්ගේ බලාපොරොත්තුව ඉටු වූයේ නැති වුවද ගෝලයෝ දෙවියන්වහන්සේ විසින් දෙවා වදාළ අනතුරු ඇඟවීමේ පණිවිඩය දේශනා කළෝය. ඔවුන්ගේ ඇදහිල්ලට දෙවි සමිඳාණෝ ඔවුන්ට විපාක දුන් සේක; ඔවුන්ගේ කීකරුකමට ගරු කළ සේක. මළවුන්ගෙන් නැගිටි තම ක්‍රිස්තු සමිඳාණන්ගේ තේජස්ශ්‍රී ශුභාරංචිය සෑම ජන කොටසකටම ප්‍රකාශ කිරීමේ කාර්ය භාරය ඔවුන්ට පවරා දීමට නියමිතව තිබුණේය. මෙම උදාර කටයුත්ත ඉටුකිරීමට ඔවුන් සූදානම් කරනු වස් මෙම තික්ත අත්දැකීමට මුහුණ දීමට ඔවුන්ට ඉඩ හරිනු ලැබීය.

මළවුන්ගෙන් නැගිටීමෙන් පසුව එම්මාවුස් මාර්ගයේදී තමන් ගෝලයන් මුණ ගැසුණු යේසුස්වහන්සේ, "මෝසෙස්ගෙන්ද සියලු අනාගතවක්තෘවරුන්ගෙන්ද පටන් ගෙන, සියලු ලියවිලි වල තමන් ගැන තිබුණු කාරණා ඔවුන්ට තෝරා දුන්සේක." (ලූක් 24:27). ගෝලයන්ගේ හදවත් සසල විය, ඇදහිල්ල නව පිබිදීමකට පත්විය. යේසුස්වහන්සේ තම අනන්‍යතාව පැහැදිලි කිරීමටත් පෙර ඔවුහු "ජීවමාන බලාපොරොත්තුවකින්, නැවතත් අළුත් දිවියකට" පිවිසුණාහ. ඔවුන් සමග කළ කථාබහේදී උන්වහන්සේගේ අභිමතාර්ථය වූයේ ඔවුන්ගේ දැනුම අවදිකර ඔවුන්ගේ ඇදහිල්ල හා විශ්වාසය "ස්ථිර කරන ලද අනාගතවාක්‍යය කෙරෙහි" ස්ථාපිත කිරීමය. ඔවුන්ගේ මනස් තුළ සත්‍යතාව මනාලෙස මුල්බැස ගෙන ස්ථාපිතව පිහිටුවාලීමට උන්-වහන්සේ බලාපොරොත්තු වූසේක. තමන්වහන්සේගේ පුද්ගලික සාක්ෂි දැරීම නිසාම පමණක් සිදුවූ කාරණා විශ්වාස කිරීම ප්‍රමාණවත් නොවේ. නමුත් ඒ සඳහා ප්‍රශ්නයකින් තොර සාක්ෂියක් ආදර්ශයක් ලෙස ලබාදී ඇත. ව්‍යවස්ථාවෙහි සංකේත සහ සෙවනැලි මගින් ඉදිරිපත් කළ සාක්ෂි මෙන්ම පරණ ගිවිසුමෙහි අන්තර්ගත දිවැසි වැකි මගින්ද ලබාදී ඇති සාක්ෂි නිසා දිවැසි වැකි විශ්වාස කිරීම පැහැර හැරිය නොහැකිය. ක්‍රිස්තු අනුගාමිකයන්ට තම බුද්ධිය මත පදනම් වූ ඇදහිල්ලක් තිබීම අවශ්‍ය වන්නේය. එය ඔවුන් සඳහාම පමණක් නොව ලෝකයේ වසන්නවුන්ට ක්‍රිස්තුස්වහන්සේව හඳුන්වා දීමටත්, එවැන්නක අවශ්‍යතාවක් පවතී. මෙම දැනුම විකාශනය කිරීමේ ප්‍රථම පියවර ලෙස ක්‍රිස්තුස්වහන්සේ ස්වකීය ගෝලයන්ව යොමු කළේ මෝසෙස්ගේ හා අනික් අනාගතවක්තෘවරුන්ගේ ලියවිලි දෙසටය. පරණ ගිවිසුමෙහි ශුද්ධ ලියවිලිවල ගුණාත්මකතාව සහ වැදගත්කම ගැළවුම්කාරයාණන් විසින් අගය කරමින් සාක්ෂි දැරුවේ එලෙසින්ය.

තමන්ගේ ස්වාමිවූ සමිඳාණන්ගේ ආදරණීය මුහුණෙහි ස්වභාවය දෙස නැවත වරක් බැල්ම හෙළූ ගෝලයන්ගේ හදවත්හි කුමනාකාර වෙනස්වීමක් ඇති කිරීමට එය ඉවහල් වීද! මෙයට කළින් තිබූ දැනුමට වඩා පූර්ණවූ ද, උතුම් ගුණයකින් යුක්ත වූද හැඟීමක් තුළින්

"මෝසෙස්ගේ ව්‍යවස්ථාවන්හි සහ අනාගතවක්තෘවරුන්ගේ ප්‍රකාශනයන්හි" පෙන්වා දෙනු ලැබූ තැනැන්වහන්සේ ඔවුන්ට හමු විය. ඔවුන්ගේ සිත්හි තිබූ අවිනිශ්චිතය, සංතාපය, සහ බලාපොරොත්තු නැතිකම පලා ගොස් සැක රහිතකම, සම්පූර්ණ සහතිකය සහ අඳුරු වළාවලින් තොරවූ ඇදහිල්ල රජ යන්නට විය. ක්‍රිස්තු සමිදාණන් කුරුසිපත් වීමෙන් පසුව ඔවුහු "නිතරම එක්රැස්ව දේවමාළිගාවෙහි දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්ද ආශිර්වාද කරමින්ද සිටීම පුදුමයක් නොවේද. ගැළවුම්කාරයාණන්ගේ අපකීර්තිමත් මරණය ගැන පමණක් දන සිටි අය ගෝලයන්ගේ මුහුණුවල දුක, වියවුල සහ පරාජය දකීමට බලාපොරොත්තු වූහ. නමුත් එවැනි දකුමක් බලාපොරොත්තු වූ ඔවුන්ට දකගන්නට ලැබුණේ ඉමහත් ප්‍රීතිය සහ ජයග්‍රාහික ස්වභාවයකි. තමන් ඉදිරියෙහි ඇත්තාවූ කාර්ය භාරය සඳහා ගෝලයන්ට ලැබුණු සූදානම් වීම කෙතරම් මහත්ද! අත්විඳිය හැකි ඉතාමත් කටුක පරීක්ෂණයක් හරහා ඔවුන් ගමන්කර සිටියහ. මිනිස් දසුන ඉදිරියෙහි බලාපොරොත්තු සියල්ල සුනු විසුණු වී ගිය බව දකගන්නට ලැබුණද, දෙවියන්වහන්සේගේ මෙහෙය ජයග්‍රාහී ලෙස ඉටුවී තිබුණි. ඉදිරි කාලයෙහිදී කුමන ආකාර ක්‍රියාවකට හෝ, ඔවුන්ගේ ඇදහිල්ල කලකිරීමකට පත් කළ හැකිවේද? දුක් සයුරෙහි අන්තයට ගිලී සිටි ඔවුන්ට දන් ඉමහත් සැනසීමක් උදාවී තිබිණි, බලාපොරොත්තුවක් ලැබී තිබුණි. එම බලාපොරොත්තුව ඔවුන්ගේ දිවියට ස්ථිරවූත්, සුරක්ෂිතවූත් නැංගුරමක්" හා සමාන විය. දෙවියන්වහන්සේගේ ප්‍රඥ මහිමයටත්, බලයටත් ඔවුහු සාක්ෂිකරුවන් වූහ. එම නිසාම ඔවුහු ජයෙන් ජයටද සුපිරි ජයටද පත් වූහ. "මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්, ගැඹුරටවත්, අන් කිසි මැවිල්ලකටවත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්ට නොහැකි වන්නේය"යි ඔව්හු ස්ථිර වශයෙන්ම දන ගත්තෝය. මේ සියල්ලේදී තමා "අතිශයින්ම ජයගන්නෝ වමුව" යි ඔව්හු පැවසූහ. (රෝම 8:38, 39, 37). "ස්වාමින්වහන්සේගේ වචනය සදාකාලේටම පවතින්නේය." (1 පේතෘස් 1:25) අප "වරදට පත්කරන්නේ කවුද? මැරුණෙත් ඒ ඇර මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය." (රෝම 8:33,34).

"මාගේ සෙනඟ කිසි කලෙකත් ලැජ්ජාවට පත් නොවන්නෝය"යි දෙවි සමිදාණන් වදාරණ සේක. (යෝවෙල් 2:26). "රාත්‍රියේ හැඬීම් පවතින නුමුත් උදය ප්‍රීතිය පැමිණෙන්නේය." (ගීතාවලිය 30:5). යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටියාවූ අවස්ථාවේදී තමන්ගේ මිදුම්කාර සමිදාණන් මුණ ගැසුණු ගෝලයෝ උන්වහන්සේගේ වදන්වලට ඇහුම්කන් දුන් විට ඔවුන්ගේ සිත් දැවී ගිය බව පැවසේ. තමන් වෙනුවෙන් තුවාල කරනු ලැබූ උන්වහන්සේගේ හිසත්, අත් දෙකත්, පා දෙකත් දෙස ගෝලයෝ අවධානයෙන් යුතුව නෙත් හෙළූහ. ස්වර්ගාරෝහණයට පෙර උන්වහන්සේ තම ගෝලයන්ව බෙතානිය තෙක් කැන්දාගෙන ගිය සේක. එවිට උන්වහන්සේ දෑත් ඔසවා ඔවුන්ට ආශිර්වාද කරමින් ඔවුන්ට මෙසේ අණ කළසේක. "නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න." ඒ සමගම උන්වහන්සේ මෙසේද පැවසූ සේක: "මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමි." (මාර්ක් 16:15; මතෙව් 28:20). පොරොන්දු ප්‍රකාර පෙන්තකොස්ත දවසෙහි සැනසිලිදායකයාණන් ගෝලයන් මත පැමිණි කළ, ඉහළින් පැමිණෙන්නාවූ බලය ඔවුන් මත්තෙහි පිහිටා සිටිසේක. ඉහළට ඔසවා ගනු ලැබූ ස්වාමීන්වහන්සේගේ අභිමුඛය තමන් සමග සිටින්නේය යන දනගැන්ම මගින් ඇදහිලිවන්තයන්ගේ ආත්ම මහත් උද්දාමයට පත්විය. යේසු සමිදාණන්ගේ ගමන් මග මෙන්ම ඔවුන්ගේ ඉදිරි මාර්ගයද වධ හිංසා සහ මරණය ඉරණම් වූ ක්‍රියාවේදයක් විය. එහෙත් උන්වහන්සේගේ කරුණා-අනුග්‍රහයේ ප්‍රචාරක සේවාවේ අවසානයේදී හිමිවන්නාවූ "තේජස් මහිමශ්‍රීයේ ඔටුන්න" වෙනුවට ඔවුන් මුලදී අපේක්ෂා කළ ලෞකික සිහසුනක යසස්ශ්‍රීය හුවමාරු කරගැනීමට ඔවුන් තුළ සූදානමක් නොවීය. දමිටුකමේ ජයග්‍රාහක කිරුළ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමේදී ප්‍රදානය කරනු ලබන්නේය. අපගේ දෙවියන්වහන්සේ "අපි ඉල්ලන නොහොත් සිතන හැම දේට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේ"ය. උන්වහන්සේ ස්වකීය ගෝලයන්ට තමන්වහන්සේගේ දුක් විඳීම්හි සහභාගිකමත්, ස්වකීය ප්‍රීතියෙහි එක්සත්කමත් ලබා දුන්සේක. එකී සහභාගිකමෙහි ප්‍රීතිය නම්, බොහෝ දෙනෙකු දෙවියන්වහන්සේගේ දිව්‍ය තේජසට ගෙන ඒමය. පාවුල් මෙසේ පවසයි: "මොහොතකට පවතින අපේ සැහැල්ලු දුක" මෙම තාවකාලික කරදර - බාධක අතිශයින් ඉක්මවා සදාතනික තේජස් සම්භාරයට මග සලසයි.

යේසුස්වහන්සේගේ පළමු පැමිණීමේදී "රාජ්‍යයේ ශුභාරංචිය" දේශනා කිරීමෙන් ලැබූ අත්දැකීම හා සමානවූ අත්දැකීමක් දෙවන ඊමේ පණිවිඩය ප්‍රකාශ කළාවූ අයටද අත් විය. කාලය එළඹ ඇත. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළංව තිබේ යයි කියමින් ගෝලයන් සුබසුන රැගෙන ගම් නියම්ගම් කරා ගමන් ගත් ලෙසම විලියම් මිලර් සහ ඔහුගේ සහායකයෝද දිවැසි ප්‍රකාශන පණිවිඩය රැගෙන නා නා පෙදෙස් කරා පා නැගූහ. ශුද්ධ බයිබලයේ අන්තර්ගත වඩාත්ම දිගු කාලයක් හා සම්බන්ධ අනාගතවාක්‍යය සඳහන් කළ කාලවකවානුව

නිමවීමට ආසන්න බවද, විනිශ්චය එළඹ ඇති බවද, සදාතන රාජ්‍යය පිහිටුවීමේ දවස ළංව තිබේයයිද කියමින් ඔවුහු දම් දෙසූහ. යේසුස්වහන්සේගේ දහම් පණිවිඩය පදනම්ව තිබුණේ දානියෙල් 9 වන පරිච්ඡේදයේ සති හැත්තෑවෙහි කාලය සම්පූර්ණ වීම මතය. දානියෙල් 8:14 හි සඳහන් දවස් 2300 හි වකවානුව නිමාවට පත්වීමේ කාලය එළඹ ඇතැයි මිලර් සහ ඔහුගේ සහායකයෝ දේශනා කරන්නට වූහ. මේ පණිවිඩය සඳහා පදනම වූයේ ඒ දිගුකාලීන අනාවැකියෙහි වෙනත් කොටසක් සම්පූර්ණ වීමය.

මුල් කාලීන ගෝලයන් මෙන්ම විලියම් මිලර් සහ ඔහුගේ හවුල්කරුවෝද තමන්ගේ දෙසුම්හි අන්තර්ගතය පිළිබඳව මුළුමණින්ම මනා සේ අවබෝධ කරගෙන නොසිටියෝය. සභාව තුළ දිගු කලක් මුල්බැස තිබූ වැරදි ආකල්පයක් නිසා දිගු කාලීන අනාවැකියෙහි විශේෂ සංසිද්ධියක් පිළිබඳව නිවැරදි තීරණාත්මක නිගමනයකට පැමිණීමට ඔවුන්ට නොහැකි විය. දෙවියන්වහන්සේ ඔවුන්ගේ භාරයට පත් කළ පණිවිඩය ලෝකයා වෙත ගෙනයාමට ඔවුන් ක්‍රියා කළ නමුත් එහි තේරුම පිළිබඳව වූ වැරදි අවබෝධයක් නිසා ඔවුහු මහත් කළකිරීමකට පත් වූහ.

"රෑ දාවල් දෙදාස් තුන්සීයයක් පසුවන තුරුය; එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය" යන දානියෙල් 8:14 හි අනාවැකිය පැහැදිලිකර දීමේදී එකල පැවති ජනප්‍රිය ඉගැන්වීම අනුව යමින් ශුද්ධස්ථානය යනු අපගේ පොළෝතලයය යන තීරණයෙහි ඔවුහු පිහිටා සිටියෝය. ඒ අනුව ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යනු ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊමේදී පොළෝ තලය ගින්නෙන් පවිත්‍ර කරනු ලැබීම යයි මිලර් විශ්වාස කළේය. දවස් 2300 දිවැසි ප්‍රකාශනයෙහි අවසන් දිනය පැහැදිලිව ගණනය කර බලා ඔහු තීරණය කළේ එම දිනය යේසුස්වහන්සේගේ දෙවන ඊමේ දවස වනවා ඇත යන්නය. ශුද්ධස්ථානය යන්න කුමක්දැයි ජනප්‍රිය මතය අනුව තීරණය කිරීම නිසා ඔහුගේ නිගමනය වැරදි විය.

ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිත පූජාව සහ පූජක කර්තව්‍යය පෙන්නුම් කර දීම ශුද්ධස්ථාන සේවා පද්ධතියෙහි අරමුණ විය. චක්‍රීය ලෙස අවුරුද්ද පුරාම කරන ලද සේවාවන්හි අන්තිම මෙහෙය වූයේ උත්තම පූජකයා විසින් ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමය. එය සමගි කිරීමේ කර්තව්‍යයෙහි අන්තිම ක්‍රියාදාමය විය. ඊශ්‍රායෙල් ජනතාවගේ පාප ඉවත් කිරීම එම ක්‍රියාවෙන් පෙන්නුම් කළේය. තවද අපගේ උත්තම පූජකයාණන් සගයේ කරන්නාවූ මැදහත්කාරකම් කිරීමේ සේවාවෙහි අවසන් කාර්යය එයින් සංකේතවත් විය. ස්වර්ගීය ලේඛණයන්හි වාර්තා කර ඇති දේව ජනතාවගේ පාප මකා හැරීම එයින් පෙන්නුම් කළේය. මෙම කර්තව්‍යය සෝදිසි කිරීමක් හා විනිශ්චයක් සිහිගැන්වීය.



සගයේ සිදුවන්නාවූ මෙම සේවා මුරය අවසන් වීමත් සමගම මහත් බලයෙන් සහ තේජස්ශ්‍රීය මහිමයෙන් යුතුව වළාකුළු වලින් මෙලොව කරා පැමිණෙන්නාවූ ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන ඊම සිදුවීමට නියමිතය. මක්නිසාද උන්වහන්සේගේ දෙවන ඊම සිදුවන්නේ සෑම කිතුණුවෙකුම පිළිබඳ ඉරණම් තීරණය ප්‍රකාශ කිරීමෙන් පසුවය. යේසු සමිඳාණෝ මෙසේ පවසන සේක: "එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ හැටියට දෙන පිණිස මා සමග විපාක තිබේ." (එළිදරව් 22:12). පුනරාගමනයට පෙර සිදුවිය යුතු සේවාව වන්නේ මෙම විනිශ්චයෙහි නිමාවයි. මේ පිළිබඳව එළිදරව් 14: 7 හි ප්‍රකාශ කර ඇත. ඒ මෙසේය: "දෙවියන්වහන්සේට භය වී උන්වහන්සේට මහිමය දෙන්න. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය."

මෙම පණිවිඩය ප්‍රකාශයට පත්කළ අය නිවැරදි පණිවිඩය නියමිත වෙලාවට ප්‍රචාරය කර හැරියෝය. "කාලය සම්පූර්ණ විය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය" යන ප්‍රකාශයෙහි තේමාව දානියෙල් 9 හි අනාවැකිය මත පිහිටා තිබිණ. එහෙත් ඔවුන්ට අවබෝධ කරගත නොහැකි නිමිත්ත වූයේ මෙසියස්වහන්සේගේ මරණයද එම අනාවැකියෙහි පෙන්නුම් කර දී ඇති කරුණය. මෙයාකාරයෙන්ම මිලර් සහ ඔහුගේ සහායකයන් දානියෙල් 8: 14 හි සහ එළිදරව් 14:7 හි පණිවිඩය ප්‍රකාශයට පත් කළද එම පණිවිඩය හා බැඳි තවත් පණිවිඩ එළිදරව් 14 හි ඇති බව ඔවුන්ගේ අවධානයට හසු නොවීය. එම පණිවිඩද ක්‍රිස්තු පුනරාගමනයට පෙර ප්‍රකාශයට පත්කිරීම අනිවාර්ය බව ඔහු ඒත්තු නොගත්තේය. සති හැත්තෑව අවසානයේදී පිහිටුවීමට නියමිත රාජ්‍යය පිළිබඳව ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් තුළ වැරදි අවබෝධයක් තිබූ ආකාරයෙන්ම දවස් 2300 හි අවසානයේදී ඇතිවන්නාවූ සිද්ධිය සම්බන්ධයෙන්ද දෙවෙනි ඊම බලා සිටියාවූ අයවලුන් අතරද දුර්වාබෝධයක් විය. ජනප්‍රිය වැරදි මත පිළිගැනීම හෝ ඒවාට ගැතිවීම දෙපාර්ශ්වයටම එකාකාරව බලපෑ නිසා බැතිමතුන්ගේ මනස් සත්‍යතාව කෙරෙහිව අන්ධ ලෙස ක්‍රියාත්මක විය. ලෝකයාට ලබාදිය යුතු පණිවිඩ ඔවුන්ට ලබා දෙමින් කණ්ඩායම් දෙකම දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කළෝය. දෙපාර්ශ්වයම තමන්ගේ වැරදි අවබෝධය නිසා කළකිරීමට පත් වූවෝය.

විනිශ්චය පිළිබඳව අනතුරු ඇඟවීමේ පණිවිඩය එය ලබා දුන් ආකාරයෙන් මිනිසුන්ට ලැබීමට ඉඩහැරීම මගින් දෙවියන්වහන්සේ තමන්ගේම අරමුණ ඉටුකර ගත්සේක. එම සුවිශේෂී දිනය ළංව තිබුණේය. නියමිත දවසකදී සිදුවන්නාවූ විනිශ්චයක් ගැන දැනුම් දීම මගින් මිනිසුන්ගේ හදවත්හි තිබූ දෑ එළිදරව් කිරීම දේව මගපෙන්වීමේ අරමුණ විය. සභාවෙහි යථාර්ථ තත්ත්වය සෝදිසි කිරීමත් ඇයව පවිත්‍ර ස්වභාවයකට ගෙන ඒමත් පණිවිඩයෙහි පරමාර්ථය විය. ඔවුන්ගේ ඇල්ම හා බැඳීම් යොමු වී ඇත්තේ මේ භෞතික ලෝකය

කෙරෙහිද නැත්නම් ක්‍රිස්තුස්වහන්සේ හා සගය කෙරෙහිද යන්න තීරණය කරගැනීමට මගපෙන්වීමට මෙම පණිවිඩය උපකාරී විය. බැතිමතුන් සැවොම තමන් ගැළවුම්කාර සමිඳාණන්ට ආදරය කරන බව ප්‍රකාශ කළද එය ඔප්පු කිරීමට දැන් කාලය එළඹ තිබුණේය. තමන්ගේ ලෞකික බලාපොරොත්තු සහ පැතුම් අතහැර දමා තම මිදුම්කාර සමිඳාණන්ගේ දෙවෙනි පැමිණීම ප්‍රීතියෙන් යුතුව පිළිගැනීමට ඔවුන්ට හැකියාවක් වේද? ඔවුන්ගේ සත්‍යවාදී ආත්මික තත්ත්වය බුද්ධිමත් ලෙස වටහා ගැනීමට උපකාරී වීම මෙම පණිවිඩයෙහි අරමුණ විය. එම පණිවිඩය සගයෙන් මෙලොව ජනතාවට එවන ලද්දේ කරුණා-මෛත්‍රියෙන් යුතුවය. එහි අරමුණ වූයේ සෑම අයෙකුම පසුතැවීමෙන් සහ යටහත් පහත්කමින් යුතුව දෙවි සමිඳාණන් සොයා යෑමය.

පණිවිඩය පිළිබඳව අනවබෝධයේ ප්‍රතිඵලයක් නිසා ඇතිවූ කළකිරීම ඔවුන්ගේ යහපත සඳහා යොදවන ලදී. පණිවිඩය පිළිගත්තා යයි ප්‍රකාශ කළ හදවත් සෝදිසියට ලක් කිරීමට එම පණිවිඩය මාර්ගෝපකාරී විය. කළකිරීමට පත්වූ ජනතාව තමන්ගේ අත්දැකීමට ආයුබෝවන් කියා දෙවියන්වහන්සේගේ වචනය කෙරෙහි තිබූ විශ්වාසය අතහැර දමාවිද, එසේත් නැත්නම්, යාච්ඤාවෙන් සහ නිහතමානීකමින් යුතුව දිවැසි ප්‍රකාශනයේ වැදගත්කම වටහා ගැනීමට තමන්ට නොහැකි වුණේ මන්දැයි සොයා ගැනීමට වෙහෙසෙයිද? කී දෙනෙක් බියෙන් මුසු විශ්වාසයකින් ක්‍රියා කළෝද, එසේත් නැතිනම් හදිසි චෛතසික පෙළඹවීමක් නිසා හෝ සිතෙහි ඇතිවූ ආවේගයක් නිසා හෝ එසේ කළෝදැයි දැනගැනීමට බලාපොරොත්තු කඩවීමට පසුව වූ පැවැත්මෙන් විද්‍යාමාන විය. ක්‍රිස්තු සමිඳාණන්ගේ පැමිණීම දැකගැනීමට විශාල සංඛ්‍යාත ජනතාවක් බලාපොරොත්තු වූ බව නොරහසකි. එහෙත් ඔවුන්ට ලෝකයාගෙන් අවලාද සහ ගැරහුම් එල්ල වූ අතර ඒවා විඳ දරාගනිමින් බලාපොරොත්තුව රැකගැනීමට ඔවුන් සූදානම්ද? අපේක්ෂිත සංසිද්ධිය ඉටුවීමට තවත් දිගු කාලයක් ගත වුවහොත්, ඔවුන්ගේ විශ්වාසයට කුමක් වේද? ඔවුන් අතරෙන් කොපමණ ප්‍රතිශතයකගේ විශ්වාසය නැතිවී ප්‍රකාශ කළ ඇදහිල්ල අවිශ්වාසයෙන් අත්හරිනවා ඇද්ද? ඔවුන් පසුකලෙක තම ඇදහිල්ල ප්‍රතික්ෂේප කරන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරාවිද? දෙවියන්වහන්සේ තමන් ජනතාව සමග ක්‍රියා කරන්නාවූ ආකාරය පිළිබඳව ඔවුන්ට එම අවස්ථාවේදීම තේරුම්ගත නොහැකි වීම නිසා උන්වහන්සේගේ වචනයෙහි පැහැදිලි සාක්ෂි මත පදනම් වූ සත්‍යතාවන් පසෙක ලෑමට ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් පියවර ගනීද?

දෙවියන්වහන්සේගේ වචනය මගින් සහ ශුද්ධාත්මයාණන්ගේ ඉගැන්වීම් මගින් ඉදිරිපත් කරන ලද්දේ යයි විශ්වාස කළ සත්‍යතාවන්



පිළිගනිමින් ඒවා කෙරෙහි ඇදහිල්ල රඳවමින් ඒවාට කීකරුවූ අයගේ අවංක භාවය සහ ශක්තිය මේ පරීක්ෂණය මගින් දක්වනු ලබනවා ඇත. ශුද්ධ බයිබලයෙහි අන්තර්ගත සත්‍යයන් පැහැදිලි කරදීමට ශුද්ධ බයිබලයටම ඉඩ හැරිය යුතුය. ශුද්ධ බයිබල් ඉගැන්වීම් වෙනුවට මිනිස් මතවේදයන් සහ විස්තර කිරීම් පිළිගැනීමෙහි අන්තරාව දැනගැනීමට ඔවුන්ට පුළුවන් වන්නේ මෙබඳු අත්දැකීම්වලින් පමණක්ය. ඇදහිලිවන්ත අයගේ වැරදිවලින් ඇතිවන වියවුල හා කණගාටුව මගින් ඔවුන්ගේ වැරදි හරිගස්සනු ලබනවා ඇත. ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම සහ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම එකම සිද්ධියක සන්ධි - ස්ථානයකැයි වැරදි උපකල්පනයක පිහිටීම නිසා හටගත් ව්‍යාකූල තත්ත්වය සහ ශෝචනීය අත්දැකීම ඇදහිල්ලෙහි දරුවන්ට උදා කළේ වෙනත් අත්දැකීමකි. තමන්ට වැරදුණේ කොතැනදැයි සෙවීමට එම අත්දැකීම ඔවුන්ට බලපෑමක් ඇති කළේය. නිවැරැදි අර්ථකථනය සොයා යෑමට ඔවුන්ව පොළඹවාලනු ලැබීය. දිවැසි ප්‍රකාශන වඩාත් සමීපව අධ්‍යයනය කිරීමට ඔවුන්ව දිරිගන්වනු ලැබිණි. ස්වකීය ඇදහිල්ලෙහි පදනම සුපරික්ෂාකාරීව හදාරා බැලීමට ඔවුන්ට මගපෙන්වන ලදී. කිතුණු ලොවේ බහුතර ජනතාවක් යමක් පිළිගත්තද, විෂයක් සම්බන්ධව ජනප්‍රිය මතවේදයක් පැවතියද, එවන් ඉගැන්වීමක් සත්‍යතාවේ ශුද්ධ ලියවිලි මත පදනම් නොවන්නේ නම් ඒ සියල්ල ප්‍රතික්ෂේප කිරීමට ඇදහිල්ලේ දරුවෝ තීරණයක පිහිටා සිටියෝය.

මුල් කාලීන ගෝලයන් පරීක්ෂාවේ පැයට මුහුණ දීමේදී එහි නිශ්චිත යථාර්ථය නොදැන සිටි ආකාරයෙන්ම මෙකල සිටි බැතිමතුන්ටද තමන් බලාපොරොත්තු වූ වකවානුවේදී ක්‍රිස්තුස්වහන්සේ නොපැමිණියේ මන්දැයි වටහාගැනීමට නුපුළුවන් විය. එසේ වුවද, ගෝලයන්ට මෙන්ම මොවුන්ටද යථා කාලයේදී සියල්ලක්ම පැහැදිලිව අනාවරණය කරන ලදී. දෙවියන්වහන්සේගේ මගපෙන්වීම ඔවුන්ට දැකගැනීමට අවස්ථාව උදාවූ කල්හි තමන්ගේ වැරැදි උපකල්පනය නිසා ඇතිවූ කම්පනය සහ වියවුල වුවද දෙවියන්වහන්සේගේ ආදරයේ අභිප්‍රාය ඔවුන් කෙරෙහි නිශ්චිතව ඉටුවෙමින් තිබෙන බව, ක්‍රියාත්මක වෙමින් තිබෙන බව ඔවුන්ට පැහැදිලිව දැකගැනීමට හැකි විය. ඔවුන් ලැබූ ශෝචනීය අත්දැකීම මගින් ඔවුන්ගේ ඇදහිල්ල ඔවුන් දිරිමත් කරමින් සාක්ෂාත් කළේ උන්වහන්සේ "දයානුකම්පාවෙන්ද කරුණා-අනුග්‍රහයෙන්ද පරිපූර්ණව සිටින" බවය. තවද, "සමිඳාණන්ගේ ගිවිසුමද ශික්ෂාද රකින්නවුනට උන්වහන්සේගේ සියලු මාවත් කරුණාව හා සැබෑකමද වෙති."

# 20

# විශිෂ්ට ආගමික පිබිදීමක්

එළිදරව් පොතෙහි 14 වන පරිච්ඡේදයෙහි පළකොට ඇති පරිදි පළමුවන දේව දූතයාගේ ප්‍රකාශයෙහි විශිෂ්ඨ ආගමික පිබිදීමක් පිළිබඳව අනාවැකියක් අඩංගු වී ඇත. "පොළොවේ වසන්නටත් සියලු ජාතීන්ටත් ගෝත්‍රයන්ටත් භාෂාවන්ටත් සෙනඟටත් ප්‍රකාශ කරන පිණිස සදාකාල ශුභාරංචියක් ඇතුව සිටින දේවදූතයෙක් අහස මැද පියාසර කරනවා" දර්ශනය කරන ලදී. "ඔහු මහත් ශබ්දයකින් කථාකරමින්: දෙවියන්වහන්සේට භයවී, උන්වහන්සේට ගෞරව දෙන්න; මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය. අහසත් පොළොවත් මුහුදත් ජල උල්පතුත් මැවූ තැනැන්වහන්සේට නමස්කාර කරන්නැයි කීය." (එළිදරව් 14:6,7).

මෙම පණිවිඩය ප්‍රකාශයට පත්කරන්නේ දේව දූතයෙකු විසින් යයි සඳහන් වීම විශේෂ කරුණකි. ස්වර්ගීය පණිවිඩකරුවාගේ පරිශුද්ධතාවත්, තේජසත්, බලයත් එයින් සංකේතවත් විය. මෙම පණිවිඩය මගින් සාක්ෂාත් කරන්නාවූ විශිෂ්ඨවූ ද, උදාරවූ ද මෙහෙවරයත් එයට අත්වැල් සපයමින් ලබාදෙන්නාවූ බලයත්, මහිමශ්‍රීයත් පෙන්නුම් කිරීමට දේව දූතයෙකු යොදා ගැනීමට දිව්‍ය ප්‍රඥව සතුටු විය. දේව දූතයා "පියාසර කළේ අහස මැදය." අනතුරු ඇඟවීමේ පණිවිඩය ප්‍රකාශ කළේ "මහත් හඬක් නගමින්ය." එම පණිවිඩය 'පොළොවේ වසන හැම ජාතියකටම, හැම ගෝත්‍රයකටම, හැම භාෂාවකට හා හැම සෙනඟකටම' ලබා දිය යුතු විය. මෙම පණිවිඩය ලෝ පුරා ප්‍රචාරය කර හැරීමත් එය ඉටුකිරීමේ සීඝ්‍රතාවත් දේව දූතයාගෙන් පෙන්නුම් කරන ලදී.

මෙම මෙහෙය ආරම්භ විය යුතු වකවානුව පිළිබඳව පණිවිඩයෙහි සඳහනක් විය. එම පණිවිඩය නම් කර ඇත්තේ "සදාකාල ශුභාරංචිය" යනුවෙනි. එය විනිශ්චයේ පටන්ගැනීම ගැන දැනුම් දීමකි. ගැළවීමෙහි පණිවිඩය සෑම යුගයක් පාසාම ලෝ පුරා රැව් පිළිරැව් දෙමින් මිනිස් හදවත්වලට කථා කර තිබේ. එහෙත් මෙම දේව දූතයාගේ පණිවිඩය ප්‍රකාශයට පත් කළහැකි වන්නේ අන්තිම දවස්වලදී පමණක්ය. මක්නිසාදයත් විනිශ්චයේ පැය පැමිණෙන්නේ අන්තිම දවස්වලදීය. විනිශ්චයේ පැය ආරම්භ වීමට පෙරාතුව එකින් එක සිදුවිය යුතු සිද්ධීන් ගණනාවක් දිවැසි ප්‍රකාශනයන්හි ඇතුළත්ව තිබේ. දානියෙල්ගේ පොතෙහි මේ බව පැහැදිලිව දක්වා ඇත. අන්තිම දවස් හා බැඳි



දිවැසි ප්‍රකාශන කොටසෙහි අඩංගු වචන වසා "අන්තිම කාලය දක්වා" පොත මුද්‍රා කර තබන්නැයි දානියෙල්ට උපදෙස් දෙනු ලැබීය. මෙම දිවැසි ප්‍රකාශන ඉටුවීම හා බැඳි විනිශ්චය පිළිබඳ පණිවිඩය අන්තිම කාලය උදාවන තෙක් ප්‍රකාශ කළ නොහැකිය. අන්තිම කාලවකවානුව ගැන දිවැසිවරයා මෙසේ පවසයි: "බොහෝ දෙනෙක් එය කියවා බලනවා ඇත, දැනගැන්මද වැඩි වන්නේය." (දානියෙල් 12: 4).

තමාගේ දවස්වලදී ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම සිදුවේතැයි බලාපොරොත්තු නොවිය යුතු බව පාවුල් සහාවට තරයේ ප්‍රකාශ කර තිබිණ. "ඇදහිල්ලෙන් වැටී යාමත් විනාශයේ පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා එළිදරව්වීමත් පළමුවෙන් වුණොත් මිස ඒක නොපැමි-ණෙන්නේය" යි පාවුල් පැවසුවේය. (2 තෙසලෝනික 2:3). දෙවියන්-වහන්සේට විරුද්ධ වූ ආගමික ධර්ම විරෝධතා මෙහෙයුම පවතින තුරුත්, "නොපනත්කමේ මිනිසා" විසින් ගෙනයනු ලබන්නාවූ දීර්ඝ කාලීන පාලනය සිදුවී අවසන් වන තුරුත් අපගේ ස්වාමීන්වහන්සේගේ දෙවන පැමිණීම අපට අපේක්ෂා කළ නොහැකිය. ඒ වන විටත් ඇදහිල්ලෙන් වැටී යාමක් සිදුවීම නියතය. "නොපනත්කමේ මිනිසා" වෙනත් නම්වලින්ද හඳුන්වා දී ඇත. "නොපනත්කමේ අභිරහස් බලය," "විනාශයේ පුත්‍රයා" ලෙසින් නම් කර ඇත. මෙම විවිධ නම්වලින් පෙන්නුම් කරන්නාවූ පාප් අධිකාරී බලය වසර 1260 ක් තම අණසක පතුරුවන බව දිවැසි ප්‍රකාශනයෙහි සඳහන්ය. මෙම කාල පරාසය 1798 දී නිමාවට පත්විය. මෙම කාලයට පෙර ක්‍රිස්තු ආගමනය සිදුවිය නොහැකි විය. මෙම ඉරණම් වසරට පෙර ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමේ පණිවිඩය ලෝ පුරා ප්‍රකාශයට පත් කළ යුතුය.

මෙවන් පණිවිඩයක් ඊට පෙර යුගයන්හි කිසිකලෙකවත් ප්‍රකාශ කොට නොතිබුණේය. අප දැක තිබෙන අන්දමට පාවුල් ඒ පිළිබඳව දේශනා නොකළේය. ඔහු තම සහෝදරයන්ගේ අවධානය දීර්ඝ කාලීන අනාගතයක් කරා යොමු කරමින් ඉක්බිතිව දෙවෙනි ඊම සිදුවෙනවා ඇතැයි කියා පෑවේය. ප්‍රතිසංස්කරණය කළාවූ අය දෙවන ඊම ගැන ප්‍රකාශ කළේ නැත. තමාගේ දවස්වල සිට අවුරුදු තුන්සීයයකට පසුව විනිශ්චයේ දවස පැමිණෙන බව මාටින් ලූතර්ගේ පිළිගැනීම විය. කරුණු මෙසේ පවතින්නාවූ අතරේදී 1798 දී දානියෙල්ගේ පොතෙහි මුද්‍රාව විවෘත කරනු ලැබීය. දිවැසි වැකි පණිවිඩ පිළිබඳ දැනුම වර්ධනය විය. ළඟ ළඟම එන්නාවූ විනිශ්චය පිළිබඳව බොහෝ අය ප්‍රකාශ කරන්නට වූහ.

දහසය වැනි සියවසේදී ලෝ කැළඹූ උදාර ප්‍රතිසංස්කාරක මෙහෙයට සමාන්තරව කිතුණු ලොවෙහි විවිධ රට රාජ්‍යයන්හි දෙවන පැමිණීමේ පණිවිඩයද ප්‍රකාශ කරනු ලැබීය. යුරෝපාකරයේ සහ අමෙරිකාවේ

දිව්ගෙවූ ඇදහිල්ලෙහි සහ යාච්ඤාවේ සැදැහැවත්හු බයිබලයේ අන්තර්ගත දිවැසි ප්‍රකාශන අධ්‍යයනය කරන්ට වන්හ. දේවානුභාවයෙන් දෙන ලද වාර්තා විමසිලිමත්ව සෝදිසි කිරීමෙන් පසුව ඔවුන් පැමිණි නිගමනය නම් සියල්ලෙහි අවසානය ආසන්න බවය. විවිධ රටවල සිටි හුදෙකලා කිතුණු කණ්ඩායම් ශුද්ධ ලියවිලි පමණක් පරිශීලනය කිරීමෙන් පසුව ගැළවුම්කාර සමිඳාණන්ගේ දෙවෙනි ඊම ඉතා ආසන්න යයි තීරණයකට එළඹුණාහ.

විලියම් මිලර් බයිබලීය අනාවැකි විමර්ශනය කිරීමෙන් පසුව විනිශ්චය කාලය ආසන්න බව ප්‍රකාශ කරන්නට විය. එයින් අවුරුදු තුනකට පසුව, එනම් 1821 දී "ලෝක දහම් ප්‍රකාශක" ආචාර්ය ජෝශප් වුල්ෆ් ස්වාමින්වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳව දේශනා කරන්නට පටන් ගත්තේය. වුල්ෆ් උපත ලැබුවේ ජර්මනියේය. ඔහුගේ දෙමාපියෝ හෙබ්‍රෙව් ජාතිකයෝ වූහ. ඔහුගේ පියා යුදෙව් ආගමික ගුරුවරයෙක් විය. කුඩා කාලයේදීම කිතුණු දහම සත්‍ය යයි ඔහු තරයේ විශ්වාස කළේය. ක්‍රියාකාරී විමර්ශනශීලී මනසකින් යුතුව මේ සිරිමල් වියෙහි යෞවනයා තම පියාගේ ගෙදර සිදුවූ කථාබහට සාවධානව ඇහුම්කන් දීම සිරිතක් කොට ගත්තේය. ආගමික ශ්‍රද්ධාවෙන් යුත් භක්තික හෙබ්‍රෙව්වරුන් දිනපතාම රැස්වී තම ජාතිකයන්ගේ බලාපොරොත්තු සහ පැතුම් ආවර්ජනය කිරීම සිරිතක් විය. පැමිණෙන්නාවූ මෙසියස්වහන්සේගේ තේජසත් ඊශ්‍රායෙල් ජනතාව නැවතත් රාජ්‍ය පාලන තන්ත්‍රයකට පත්කරනු ලැබීමත් ගැන ඔවුන්ගේ අවධානය යොමු විය. නාසරීය යේසුස්වහන්සේගේ නම වැඩිහිටියන්ගේ කථාබහේදී ප්‍රකාශ විය. එතුමාණන් කවරෙකු දැයි ජෝසප් ප්‍රශ්න කළේය. "ඉමහත් කුසලතාවන්ගෙන් පිරි යුදෙව්වෙක්" යනු ඔහු ලැබූ පිළිතුර විය. "තමා මෙසියස්වහන්සේ යයි එතුමා කියාගත් නිසා යුදෙව් ත්‍රී පුද්ගල, අධිකරණය විසින් ඔහුට මරණීය දණ්ඩනය පමුණුවන ලද්දේය යන්න පිළිතුරට එකතු කරන ලදී. "එසේ නම් යෙරුසලම විනාශයට පත්වුණේ ඇයි? අප තවමත් අධිරාජ්‍යයක යටත්වැසියන් වී සිටින්නේ ඇයි?" යන්න තරුණයාගේ මුවින් පිට විය. "අහෝ මේ ඛේදවාචකයට හේතුව නම් යුදෙව්වරුන් විසින් දිවැසිවරුන් මරා දැමූ නිසාය"යි පියා උත්තර දුන්නේය. තරුණයාගේ සිත තුළ එක්තරා අදහසක් දෝංකාරය දෙමින් දෝලනය වන්නට විය. "සමහර විට යේසුස්වහන්සේද දිවැසිවරයෙකු වන්නට ඇත. උන්වහන්සේ නිර්දෝෂී අයෙකු බව දැන දැනත් යුදෙව්වෝ උන්වහන්සේව මරා දමන්නට ඇත." කිතුණු පල්ලියක් ඇතුළට යෑම ඔහුට තහනම් වුවද, ඔහුගේ හැඟීම් ඉතා උත්සන්න වූ නිසා ජෝශප් වුල්ෆ් නිතර නිතර කිතුණු පල්ලි වෙත ගොස් ගොඩනැගිල්ලෙන් පිටත සිටගෙන දේශනාවලට කන්දී ගෙන සිටීම පුරුද්දක් කර ගත්තේය.



එකල ජෝශප්ගේ වයස අවුරුදු හතක් පමණ විය. වයෝවෘද්ධ කිතුණුවෙකු සමග ඊශ්‍රායෙල් ජාතියේ ජයග්‍රහණය පිළිබඳව ඔහු අභිමානී ලෙස කථා කරමින් සිටියේය. වයසක මනුෂ්‍යයා කරුණා භරිතව ඔහුට මෙසේ කීවේය. "දයාබර පුතණුවෙනි, සත්‍යවාදී මෙසියස්වහන්සේ කවුරුන් දැයි මම ඔබට කියා දෙන්නම්. නාසරෙත්හි යේසුස්වහන්සේ එම තැනැන්වහන්සේයි. පෙරදී ජීවත්වූ දිවැසිවරුන්ව මේ ළමයාගේ මුතුන් මිත්තන් විසින් මරාදැමූ ලෙසින්ම යුදෙව්වන් උන්වහන්සේවත් මරා දැම්මා. ගෙදර ගිහින් යෙසායාගේ පොතේ පනස්තුන් වන පරිච්ඡේදය කියවන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වනාහි දෙවියන්-වහන්සේගේ පුතණුවන් බව පැහැදිලිව ඔබට වැටහේවී." සැකයකින් තොරව එම සිද්ධාන්තය ඔහුගේ සිතෙහි ස්ථිරව තැන්පත් විය. ඔහු ගෙදර ගොස් ශුද්ධ ලියවිල්ල කියවා බැලුවේය. එහි සඳහන් කරුණු සියල්ල නාසරීය යේසුස්වහන්සේගේ ජීවිතයෙහි අකුරටම ඉටුවූ ආකාරය දැක ඔහු විස්මිත විය. තමා සමග කථා කළ කිතුණු බැතිමතාගේ ප්‍රකාශය සත්‍යයද? දිවැසි වැකිය පැහැදිලි කර දෙන්නැයි හෙතෙම තම පියාගෙන් ඉල්ලීමක් කළේය. එහෙත් ඔහු තරවටු ස්වරූපයකින් යුතුව නිශ්චල විය. බියට පත් ජෝශප් මෙම මාතෘකාව පිළිබඳව නැවත කිසිම දිනෙක පියාගෙන් විචාළේ නැත. මෙම සිදුවීමත් සමගම කිතුණු දහම වඩා හොඳින් දැනගැනීමට ඔහුගේ සිත වැඩි වැඩියෙන් ආශා විය.

එම සෙවිල්ල සාර්ථක කරගැනීමට ජෝශප්ගේ යුදෙව් නිවෙස පිටිවහලක් නොවීය. වයස අවුරුදු එකොළහක් වත්ම ඔහු තම පියාගේ නිවෙසින් පිට විය. අධ්‍යාපනයක් සොයා ගෙන තමාගේ ආගම තෝරා ගෙන ජීවන වෘත්තියක යෙදීමට විවෘතව ඔහු ලෝකයට පිවිසියේය. කලක් නෑදැයින්ගේ ගෙවල විසූ හෙතෙම යුදෙව් දහමට විරුද්ධව ක්‍රියා කරන්නෙකු ලෙස හංවඩු ගසනු ලැබ එම ස්ථානයන්ගෙන් ඉවත්ව යන ලෙස අණ ලැබීය. නෑදෑ හිතවත් කිසිවෙකුගේ හෝ හව්හරණක් නැතිව අතේ මිටේ මිල මුදල් කිසිවකුත් නැතිව ඔහු ආගන්තුකයන් අතර තනි විය. ඔහු තැනින් තැන යමින්, හෙබ්‍රෙව් බස උගන්වමින් ජීවිකාව ගැට ගසා ගත්තේය. ඒ අතර ඉඩ ලද සෑම අවස්ථාවකදීම තම අධ්‍යාපනය වර්ධනය කරගැනීමටද ඔහු වග බලා ගත්තේය. කතෝලික ගුරුවරයෙකුගේ අනුබලය යටතේ ජෝශප් වුල්ෆ් රෝමානු දහම වැළඳ ගත්තේය. ඔහුගේ අරමුණ වූයේ තමාගේ ජාතියේ වැසියන්ට දහම් ප්‍රචාරකයෙකු වීමය. මෙම අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම් වස් ඔහු වසර කිහිපයකට පසුව රෝමයේ තිබූ ආගම් ප්‍රචාරක විදුහලකට ඇතුළුව අධ්‍යාපනය හදාරන්නට විය. නිදහස් චින්තනයත්, තමාගේ මත අභීත ලෙස ප්‍රකාශ කිරීමේ පුරුද්දත් නිසා ධර්ම විරෝධී ලබ්ධිකයා යන නාමය ඔහුට පට බැඳුණේය. සභාව තුළ පැවැති අනිසි ක්‍රියාවේදයන් ගැන හෙතෙම විවෘතව දොස්

පැවරීය, ප්‍රතිසංස්කරණයක් වහාම ඇති කරන්නැයි බල කළේය. මුල් කාලයේදී රෝම ප්‍රභූන්ගේ විශේෂ සැලකිලි ලැබූ ඔහුට පසු කාලයේදී එකී සැලකිලි නැතිවී ගොස් රෝමයෙන් වෙනත් පෙදෙසකට මාරු කර යවන ලදී. සභාවේ දඬි සෝදිසිය යටතේ ඔහුව තැනින් තැනට යොමු කරනු ලැබුවද රෝමානු බලධරයන්ගේ අණසකට යටත් වීමට ඔහුව ගෙන ඒමට නොහැකි බව බලධාරීන්ට එත්තු ගියේය. හික්මවීමකට යටත් කළ නොහැකි අයෙකු ලෙස සභා පාලනයෙන් ඉවත් කරනු ලැබූ ඔහුට, තමා කැමැති අයුරින් ක්‍රියාකිරීමට නිදහස දානය කරනු ලැබීය. එංගලන්තයට ගිය හෙතෙම ප්‍රොතැස්තන්ත ඇදහිල්ල ප්‍රකාශ කරමින් එංගලන්ත සභාවට එක් විය. වසර දෙකක් ඉගෙනීමෙන් පසුව 1821 දී හෙතෙම තම සේවාව සඳහා පිටත්ව ගියේය.

"මනුෂ්‍යයන් විසින් සුළුකොට එපා කරනු ලැබ වේදනා ඇත්තාවූ දුක දන්නාවූ" අයෙකු ලෙස ක්‍රිස්තුස්වහන්සේ පළමු වර පැමිණි බව ජෝශප් වුල්ෆ් පිළිගත්තේය. ඒ සමගම ඔහුට සාක්ෂාත් වූයේ දිවැසි ප්‍රකාශන මගින් පෙන්වා දී ඇති පරිදි උන්වහන්සේ බලයෙන් සහ තේජස් මහිමශ්‍රීයෙන් යුතුව දෙවන වර පැමිණෙනවා ඒකාන්ත බවය. පොරොන්දු වූ තැනැන්වහන්සේ වන නාසරෙත්හි යේසුස්වහන්සේ වෙත මිනිස් අවධානය යොමු කිරීමේ කාර්ය භාරය ඔහුගෙන් ඉටු විය. නිහතමානීකමින් යුතුව නින්දාවට භාජනය කරන ලදුව, උන්වහන්සේ පළමුවර පැමිණියේ මිනිසුන්ගේ පාප උදෙසා බව ඔහු ඉගැන්වීය. රජෙකු සහ ගැළවුම්කාරයෙකු ලෙස උන්වහන්සේ දෙවන වර පැමිණෙන බවද ඔහු ඉගැන්වීය.

ජෝශප් වුල්ෆ් මෙසේ කියමින් ජනතාව අවදි කළේය. "නාසරෙත්හි යේසුස්වහන්සේ සත්‍යය වූ මෙසියස්වහන්සේය. උන්වහන්සේගේ අත් සහ පාද සිදුරු කරන ලදී. වේදනා ඇත්තාවූ දුක දන්නාවූ මනුෂ්‍යයෙකුවූ උන්වහන්සේව බැටළු පැටවෙකු ලෙස මරන්ට ගෙන යනු ලැබීය. යුදයාවෙන් රාජ බලය ඉවත් කරනු ලැබීමෙන් පසුව ව්‍යවස්ථාදායක බලය දෙපා අතරින් ඇදගනු ලැබීමෙන් පසුව, උන්වහන්සේ පළමුවර මෙලොවට වැඩියසේක. අග්‍ර දේව දූතයාගේ හොරණෑ ශබ්දය ඇතුව උන්වහන්සේ දෙවන වර වළාකුළු මතින් මෙලොව බලා පැමිණෙ-නසේක." :Wolff, "Researches and Missionary Labors," p. 62). උන්වහන්සේ එසේ පැමිණ ඔලීව කඳු මස්තකය පිට වැඩ හිඳින සේක. මැවිල්ල කෙරෙහි වූ ආධිපත්‍යය ආදම් අහිමි කරගත් නමුත් (උත්පත්ති 1:26; 3:17) එම බල අධිකාරිය යේසුස්වහන්සේට පවරා දෙනු ලබනවා ඇත. උන්වහන්සේ මුළු පොළෝ තලය කෙරෙහි රජකම් කරනවා ඇත. වේදනාවෙන් කෙඳිරි ගාන්නාවූ මැවිල්ලේ හඬ නිමාවට පත්වන්නේය. ඒ වෙනුවට ප්‍රශංසා හඬ සහ තුති දීමේ හඬ අහස පුරා පැතිර යන්නේය. පියාණන්වහන්සේගේ තේජසින් යුතුව දේව දූතයන් පිරිවරා යේසුස්වහන්සේ පැමිණෙන කළ ක්‍රිස්තුස්වහන්සේ තුළ මරණයට



පත්වූ සැදැහැවත්හු පළමු කොට නැගිටින්නෝය. (1 තෙසලෝනික 4:16; 1 කොරින්ති 15:23). මෙම සිදුවීම පළමු මළවුන්ගෙන් නැගිටීම ලෙස කිතුණු අපි හඳුන්වන්නෙමු. එකල්හි සත්ව රාජධානියේ ස්වභාවය වෙනස් කරනු ලැබ (යෙසායා 11:6-9) ක්‍රිස්තුස්වහන්සේට යටත් කරනු ලැබේ. (ගීතාවලිය 8) විශ්වීය සමාදානය රජ කරනවා ඇත. ස්වාමීන්වහන්සේ නැවත පොළොව දෙස බලමින් "එය ඉතා යහපත්ය"යි උන්වහන්සේ ප්‍රකාශ කරනවා ඇත. (එම පොත 294 පිටුව).

යේසු සමිඳාණන්ගේ දෙවනි ඊම ඉතා ආසන්න බව ජෝශප් වුල්ෆ් විශ්වාස කළේය. ඔහු විසින් දිවැසි ප්‍රකාශනයන්ට ලබා දුන් අර්ථකථනය අනුව ලෝකයේ අවසානය ළංව තිබෙන බවත් එම දවස විලියම් මිලර්ගේ විග්‍රහයට ඉතා සමීප බවත් දකගැනීමට පුළුවන. "ඒ දවසවත්, ඒ පැයවත් කිසිම මනුෂ්‍යයෙක් දන්නේ නැතැ"යි යන ශුද්ධ ලියවිලි පාඨය තරයේ පිළිගත් අයගේ කල්පනය අනුව පැමිණීමේ ආසන්නතාවය පිළිබඳව මිනිසුන්ට කිසිවක් දැනගැනීමේ අයිතියක් නැතැයි ප්‍රකාශ විය. මෙම චින්තනයට වුල්ෆ් මෙසේ පිළිතුරු දුන්නේය. "පැමිණීමේ ඒ දවස සහ පැය ගැන මිනිසුන්ට කවරදාකවත් දැනගැනීමේ අයිතියක් නැතැයි අපගේ දෙවි සමිඳාණෝ ප්‍රකාශ කළසේක්ද? අත්තික්කා ගසක දළු හටගන්නාවූ අවස්ථාවේදී ගිම්හානය ළඟ බව දැනගැනීමට ඕනෑම අයෙකුට හැකියාව ඇත. එසේම ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන ඊම ළඟ බව දැනගැනීමට අප සමිඳාණන් පෙර නිමිති අපට ලබාදී නැද්ද? (මතෙව් 24:32). දානියෙල්ගේ පොත කියවා එහි අන්තර්ගතය තේරුම් ගන්න යයි අනුශාසනා කළ තැනැන්වහන්සේ එම කාල වකවානුව අප විසින් කිසිම කලෙක දැනගත යුතු නැතැයි අදහස්-කළසේක්ද? දානියෙල් පොතේම කියා ඇත්තේ එම පොත අන්තිම කාලය දක්වා වසා තබන ලෙසය. (එය උන්වහන්සේ නියම කර ඇති වකවානුවයි). 'බොහෝ අය එය කියවා බලනවා ඇත.' හෙබ්‍රෙව් භාවිතය අනුව මෙයින් පැහැදිලි වන්නේ ඒ කාලය ගැන මනාව නිරීක්ෂණය කර කල්පනාවට භාජන කරනු ලබන බවය. (ඒ කාලයේදී) "දැනගැන්මද වැඩි වන්නේය", යි පවසා තිබේ. (දානියෙල් 12:4). අප සමිඳාණන් මෙයින් අදහස් කරන්නේ ඒ කාලයේ (අවසන් කාලයේ) පැමිණීම අපට දැනගැනීමට හැකියාවක් උදාවන්නේ නැතැයි කීම නොව එම නිශ්චිත දවස සහ නිශ්චිත පැය මිනිසාට එළිදරව් නොකරන බවය. නෝවා නැව පිළියෙල කරන්නාවූ අතරේදී නැවට ඇතුළුවීම සඳහා සූදානම් වන්නැයි සෙනඟට පෙළඹවීමක් කළ ආකාරයෙන්ම තමන්වහන්සේගේ ඊම සඳහා සූදානම් වීමට අවශ්‍ය තරම් ලකුණු සහ පෙර නිමිති යේසු සමිඳාණෝ අපට ලබාදී ඇත." (Wolff, "Reseaches and Missionary Labors" pp. 404, 405).

ශුද්ධ ලියවිලි වටහා ගැනීම නිවැරදි විය හැකිය, සමහර විට එය වැරදි විය හැකිය. සමහර අර්ථකථන ඉතා ජනප්‍රිය විස්තර කිරීම්

වන්නටද පුළුවන. ශුද්ධ ලියවිල්ල විග්‍රහ කරනු ලබන අන්දම පිළිබඳව ජෝශප් වුල්ෆ් මෙවන් පැහැදිලි කිරීමක් කළේය. "කිතුණු සභාවේ බහුතරයක් ශුද්ධ ලියවිලි ප්‍රකාශනයන්හි අන්තර්ගතය වූ සරල පැහැදිලි හරයන් වෙනස් මඟකට යොමු කරමින් බුදු දහමෙහි අන්තර්ගත ක්‍රමයන් කරා නැඹුරු වී සිටිති. එම දහම්වල දර්ශනය අනුව මිනිසාගේ අනාගත ප්‍රීතිමත් සෞභාග්‍යය රඳා පවතින්නේ වාතයෙහි ඔබ මොබ ගමන් කිරීමෙහිය. මෙම කිතුණුවන් ශුද්ධ ලියවිල්ල කියවන්නාවූ අතර යුදෙව්වන් යන වචනය හමු වූ විට, එයින් වටහා ගන්නේ අන්‍යජාතීන් යන්නය. යෙරුසලම යන්න කියවන විට එයින් ඔවුන්ට දක්වෙන්නේ සභාව යන්නය. පොළොව යයි සඳහන් වන විට එය අහස යයි ඔව්හු කල්පනා කරති. ස්වාමින්වහන්සේගේ පැමිණීම පිළිබඳව සඳහන් වන විට එයින් ඔවුන්ට ප්‍රකාශ වන්නේ දහම් ප්‍රචාරක සංගම්වල අභිවෘද්ධියයි. සමිඳාණන්ගේ නිවසේ කන්ද කරා යෑම යන්නෙන් ඔවුන්ට පෙනී යන්නේ මෙතෝදිස්ත වරුන්ගේ අභිනන්දන පංති හමුවකි." ("Journal of the Rev. Joseph Wolff" p. 96).

1821 සිට 1845 දක්වා වූ වසර විසිහතර තුළ වුල්ෆ් අප්‍රිකාවේ විවිධ ප්‍රදේශයන් කරා යමින්, විශාල සේවයක් ඉටු කළේය. ඔහු මිසරය මෙන්ම ඇබිසීනියාවද තරණය කළේය. ආසියාතිකය කරා පැමිණි හෙතෙම පලස්තීනය, සිරියාව, පර්සියාව, බොක්හාරාව සහ දඹදිවටද පැමිණියේය. හෙතෙම අමෙරිකා එක්සත් ජනපදයෙහිද දහම් ප්‍රචාර සේවයෙහි නිරත විය. එහි යන අතරේදී ඔහු ශාන්ත හෙලේනා දූපතටද ගොඩ බැස දහම් පතුරුවාලීය. 1837 දී නිව්යෝක් නගරයට පැමිණි ඔහු එම නගරයෙහි දහම් දෙසීමෙන් පසුව පිලදෙල්පියාවෙහි සහ බැල්ටිමෝර්හිද දහම් දෙසුවේය. අන්තිමේදී ඔහු වොෂින්ටන් නගරයට පැමිණියේය. එහිදී තමා ලැබූ අත්දකීම ඔහු මෙසේ විස්තර කරයි. "මාගේ සේවය ගැන සඳහන් කරමින් හිටපු ජනාධිපති ජෝන් ක්වින්සි ඇඩම්ස් මන්ත්‍රී මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළේය. දෙසුමක් කිරීම සඳහා කොන්ග්‍රස ශාලාව මට ලබාදීමට වූ එම යෝජනාව ඒකමතිකව සම්මත විය. එක් සෙනසුරාදා දිනෙක පැවැති මාගේ දෙසුමට කොන්ග්‍රසයේ සෑම මන්ත්‍රීවරයෙක්ම පැමිණ සිටියේය. එපමණක් නොව, වර්ජීනියාවේ රදගුරු තුමාද පූජක පක්ෂ බවතුන් මෙන්ම, පුරවැසියන්ද ශ්‍රවණය සඳහා රැස්ව සිටියෝය. නිව් ජර්සිහි මෙන්ම පෙනිසිල්වේනියාවේද රාජ්‍යයන් විසින් කථා කිරීමේ අවසරය මට ලබා දුන්හ. එහිදී මම ඔවුන්ට ආසියාවේ මා කළ පර්යේෂණ වාර්තාවන් ඉදිරිපත් කළෙමි. තවද ක්‍රිස්තුස්වහන්සේගේ පුද්ගලික රාජ්‍යය පාලනය පිළිබඳව පැවැසීමටද, අමතක නොකළෙමි." ("Journal of the Rev. Joseph Wolff," pp. 398, 399).

වනචාරී ම්ලේච්ඡ මිනිසුන් සිටි රටවල සංචාරය කිරීම වුල්ෆ්ට අමුත්තක් නොවීය. එවන් සංචාරයන් සඳහා ඔහු යුරෝපීය ආරක්ෂා



බලධාරීන්ගේ රැකවරණය ඉල්ලා නොසිටියේය. එම ගමන්වලදී ඔහු ඉමහත් අනතුරුදායක උපද්‍රවයන්ට මුහුණ දුන්නේය. සතුරන්ගේ ග්‍රහණයට හසුවූ ඔහුට දඬුවම් කරන පිණිස ඔහුගේ යටි පතුල්වලට පහර දෙනු ලැබීය; නිරාහාරව සිටීමටද නියම කරනු ලැබිණ. සතුරෝ ඔහුව වහලෙකු ලෙස විකුණා දැම්මෝය, තුන්වතාවක්ම මරා දමනු ලැබීමටද නියම විය. සොරුන්ගෙන්ද ඔහුට පීඩා එල්ල විය. සමහර අවස්ථාවන්හිදී ඔහු පිපාසයෙන් මරණාසන්නව සිටියේය. වරක් ඔහු සතු සියල්ල සොරුන් විසින් පැහැර ගන්නා ලදී. කඳුකර පෙදෙසක් තුළින් සැතපුම් සිය ගණනක් ගෙවා යන්නට ඔහුට සිදුවිය. ඔහුගේ මුහුණට හිමෙන් පහර එල්ල විය. පා වැසුම් නැතිව හිමෙන් වැසී ගිය පොළොවෙහි ගමන් කිරීම නිසා දෙපා හිරි වැටී ගියේය.

වනචාරීවූ විරුද්ධවාදීවූ මිනිසුන් අතරෙහි ආයුධ රහිතව ගමන් යෑම ගැන ඔහුට අනතුරු ඇඟවීමක් කරනු ලැබූ විට ඔහු කියා සිටියේ "තමා ආයුධ මඟින් සන්නද්ධව" සිටින බවය. "මාගේ උදව්ව සඳහා යාච්ඤාව, ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජ්වලිතතාවය සහ උන්වහන්සේගේ රැකවරණය කෙරෙහි විශ්වාසය මට ප්‍රමාණවත්ය"යි ඔහු ප්‍රකාශ කළේය. "දෙවියන්වහන්සේගේ ආදරය මට නොඅඩුව පොරොන්දු වී තියෙනවා. අසල්වැසියන් කෙරෙහි ආදරයක් මගේ සිතේ පවතිනවා. ශුද්ධ බයිබලය මගේ අතේ තියෙනවා" යයි ඔහු පැවසුවේය. (Adams, W. H. D. "In Perils oft," p. 192). ශුද්ධ බයිබලයේ ඉංග්‍රීසි සහ හෙබ්‍රෙව් පරිවර්තන ඔහුගේ ගමන් මල්ලේ සෑම විටෙකම තිබිණ. එක් ගමන් වාරයක් පිළිබඳව ඔහු මෙසේ පවසයි. "මම ශුද්ධ බයිබලය විවෘත කොට මගේ අත්ල මත තබාගෙන සිටියෙමි. මෙම පොත තුළ මාගේ බලය රැඳී තිබෙන බව මට හැඟී ගියා. එහි බලය මත මාගේ රඳා පැවැත්ම පැවති බව සහතික ලෙස දැනී ගියා." (එම පොත වග 201).

ලෝ දෙරණ මත මිනිස් වාසස්ථාන පිහිටි බොහෝ දේශයන් වෙත විනිශ්චයේ පණිවිඩය රැගෙන යාමෙහි ලා ජෝසප් වුල්ෆ් පුරෝගාමී විය. ඔහුගේ ශ්‍රාවකයන් අතර යුදෙව්වන්, තුර්කි ජාතිකයන්, පර්සිවරුන්, හින්දු බැතිමතුන්, තවත් ජාතීන් සහ ගෝත්‍රිකයන් බොහොමයක ජනතාවක්ද වූහ. පැමිණෙන්නාවූ මෙසියස්වහන්සේගේ රාජ්‍ය තන්ත්‍රය ගැන හෙතෙම විවිධ ජාතීන්ට ඔවුන්ගේ බසින් දේව වචනය බෙදා දුන්නේය.

බොක්හාරාහි සංචාරය කරන අතරේදී, අප්‍රසිද්ධ හුදෙකලා දිවි පැවැත්මක් ගත කළ ජනාවාසයක සිටි මිනිසුන් ක්‍රිස්තු සමිඳාණන්ගේ කඩිනම් පැමිණීම පිළිබඳ විශ්වාසයක් තබා සිටි බව ඔහුට දැකගන්නට ලැබුණේය. ඒ පිළිබඳව ඔහු මෙසේ පැවසීය. "යේමනයෙහි සිටින්නාවූ අරාබි ජාතිකයන් සතුව "සීරා"යන නමින් වූ පොතක් තිබේ. ක්‍රිස්තුස්-

වහන්සේගේ දෙවන පැමිණීමත් තේජස් මහිමයෙන් යුතු වූ උන්වහන්සේගේ රාජ්‍ය පාලනයක් පිළිබඳවත් එහි සඳහන් වී තිබෙනවා. 1840 අවුරුද්දේ මේ විශේෂ අපූර්ව සිදුවීම් තිබෙන්නට යන බව එම ජනතාව විශ්වාස කරනවා. රේබබයිට්වරුන් සමග මම යේමනයේ දවස් හයක් ගත කළා. ඔවුන් වයින් බොන්නේ නැහැ. මිදි වතු වගා කරන්නේ නැහැ. ඔවුන් බීජ වපුරන්නේ නැහැ. ඔවුන් වාසය කරන්නේ කූඩාරම්වලය. රේබාබ්ගේ පුත්‍ර වූ යොනාදාබ් පැවසූ වචන ඔවුන් නිතරම මතක් කරනවා. ඔවුන් සමගම දාන්ගේ ගෝත්‍රයේ ඊශ්‍රායෙලිතයන්ද සිටිනවා. මෙසියස්වහන්සේ ඉක්මණින් වළාකුල් මතින් එනවා ඇතැයි මෙම ඊශ්‍රායෙල් ජාතිකයෝ රේබාබ්වරුන් සමග එක්ව විශ්වාසය තබාගෙන සිටිනවා." Journal of the Rev. Joseph Wolff", p. 377, 380).

ටාර්ටරියේද මෙවැනිම විශ්වාසයක් පවතින බව වෙනත් දහම් ප්‍රචාරකයෙකුට දකගන්නට ලැබුණි. ක්‍රිස්තුස්වහන්සේ දෙවන වර පැමිණෙන්නේ කවදා දැයි ටාර්ටර්හිදී පූජකවරයෙක් මෙම දහම් ප්‍රචාරක දේවගැතිවරයාගෙන් විමසා ඇත. ඒ ගැන තමා කිසිවක්වත් දන්නේ නැතැයි දේවගැතිවරයා පැවසූ විට පූජකවරයා විමතියට පත්වී ඇත. බයිබල් ගුරුවරයෙකු වූ එවන් තැනැත්තෙක් උන්වහන්සේගේ පැමිණීම ගැන නොදනීම ගැන පුදුමය පල කළ පූජකයා තමාගේ දිවැසි ප්‍රකාශන අධ්‍යයනය තුළින් එම පැමිණීම 1844 දී සිදුවන බව තමාගේ විශ්වාසය යයි ප්‍රකාශ කර සිටියේය.

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම පිළිබඳ පණිවිඩය එංගලන්තයේ ප්‍රකාශයට පත්කිරීම ආරම්භ වූයේ 1826 වන වර්ෂයේදීය. එහෙත් මෙම පණිවිඩය පිළිබඳ මෙහෙයුම අමෙරිකාවේ මෙන් ස්ථිරසාර පදනමක් මත පාදකව පිහිටා නොතිබුණේය. බලයෙන් සහ තේජසින් යුතුව ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙනවාය යන උදාර සත්‍යතාව ස්ථිර ලෙස එංගලන්තය පුරා ප්‍රකාශයට පත්කරනු ලැබුවද, පැමිණීමේ කාලවකවානුව ගැන අමෙරිකාවේ මෙන් නිශ්චිතයක් එම පණිවිඩයෙහි අඩංගු නොවීය. එංගලන්ත සභාවේ ඉගැන්වීම් සහ අනාවැකි නොපිළිගත් අය හා විරුද්ධවාදීන් අතරද දෙවන ඊම කෙරෙහි විශ්වාසයක් තිබූ බව රහසක් නොවේ. ඉංග්‍රීසි ලේඛකයෙකු වූ මෝරන්ට් බ්‍රොක් පවසන අන්දමට එංගලන්ත සභාවෙහි හත්සීයයක් පමණ දේවගැතිවරු මෙම "රාජ්‍යයෙහි ශුභාරංචිය" ප්‍රචලිත කිරීමේ කාර්යයෙහි නිරතව සිටි බව කියැවේ. ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම 1844 දී සිදුවන බව මහා බ්‍රිතාන්‍යයේද දේශනා කරනු ලැබූ බවට සාක්ෂි ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම පිළිබඳව විස්තර පත්‍රිකා පුළුල් ලෙස එක්සත් ජනපදයේ බෙදා හරිනු ලැබූ අතර එම පොත් සහ සඟරා එංගලන්තයේදී නැවත ප්‍රකාශයට පත්කරනු ලැබීය. එංගලන්තයේ උපත ලැබූ රොබර්ට් වින්ටර් අමෙරිකාවේ සිටියදී දෙවන ඊමේ පණිවිඩය



ඇදහිල්ලෙන් පිළිගත්තේය. එම සුවිශේෂ පණිවිඩය සමග 1842 දී තම නිජ භූමිය කරා පැමිණි හෙතෙම ක්‍රිස්තු සමිදාණන්ගේ දෙවෙනි ඊමේ පණිවිඩය ප්‍රකාශ කරන්ට පටන් ගත්තේය. බොහෝ දෙනෙක් මෙම පණිවිඩය බෙදා හැරීමට ඔහු හා අත්වැල් බැඳ ගත්හ. මෙසේ එංගලන්තයේ බොහෝ පෙදෙස් වලටද විනිශ්චයෙහි පණිවිඩය ප්‍රකාශ කරන ලදී. එමගින් ජනතාව ආත්මික නවෝදයක් ලැබූහ.

දකුණු අමෙරිකාවේ ජීවත් වූ ම්ලේච්ඡ වනචර මිනිසුන් අතරද පූජක උපාය මාර්ගයන්ගේ අණසකට යටත්ව සිටි මිනිසුන් අතරද විසූ ස්පාඤ්ඤ ජාතිකයෙක්ද ජෙසුවිට් නිකායේ පූජකයෙක්ද වූ මැනුවෙල් ලකුන්සා ශුද්ධ ලියවිලි අධ්‍යයනය තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ කඩිනම් පැමිණීම ගැන සත්‍යතාව අවබෝධ කරගත්තේය. මෙම සොයා ගැනීම ගැන තවත් අය දනුවත් කිරීමට ඔහුගේ සිත ඔහුට බල කළේය. ඒ අතරම තමා රෝම සභාවේ විනයට යටත් කරනු ලැබේ යයි බියක්ද ඔහුගේ හදවත වෙළා ගත්තේය. මෙයට උපක්‍රමශීලී විකල්පයක් ලෙස තමා සොයාගත් සත්‍යතාවන් ප්‍රචාරය කිරීමට ඔහු "බෙන්-ඉශ්‍රායෙල් ගුරුවරයා" යන ආරූඪ නමකින් ප්‍රකාශන නිකුත් කරන්නට පටන් ගත්තේය. තමා කිතුණු දහම පිළිගත් යුදෙව්වෙක් යන හැඟීම ඔහු තම පාඨකයන්ට ලබා දුන්නේය. දහ අට වැනි සියවසේ දිවි ගෙවූ ලකුන්සාගේ ග්‍රන්ථය 1825 දී පමණ ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන ලදුව, මුද්‍රණ ද්වාරයෙන් පිට විය. දෙවන පැමිණීම පිළිබඳව එංගලන්ත ජනතාවගේ තිබූ උද්‍යෝගය මෙම පොත කරණකොටගෙන තවත් දියුණු විය.

දෙවන පැමිණීමේ ඉගැන්වීම ජර්මනියේ ජනතාව වෙත පැමිණියේ දහ අට වන සියවසේදීය. ලූතරන් සභාවේ පූජකයෙක් වූ බෙන්ගල් නමැත්තා මෙම සත්‍යතාව ප්‍රචලිත කළේය. ඔහු ප්‍රවීන බයිබල් වියතෙක් මෙන්ම විචාරකයෙක්ද විය. ස්වකීය පාසල් අධ්‍යාපනය නිම කිරීමෙන් පසුව බෙන්ගල් දේව ධර්මය හැදෑරීමට අවධානය යොමු කළේය. දේව ධර්මය ගැඹුරින් හැදෑරීමට ඔහුගේ මනස ඔහුට බලපෑම් ඇති කළේය. කුඩා කාලයේ සිටම ඔහු ලැබූ ආභාෂය සහ හික්මවීම ඔහුගේ තීරණයට රුකුලක් විය. සිතා බලා ක්‍රියා කරන්නාවූ චරිතාංග තිබූ අයට මුහුණ පෑමට සිදුවූ අසීරුතා මෙන්ම ඔහුටද ආගමික කරුණු පිළිබඳව ගැටළු සහ අනුමානයන් සමග සටන් කරන්නට සිදු විය. හැඟීම්වලින් බරව සිටි ඔහු ගැන මෙසේ සඳහන් වී ඇත. "ඔහුගේ දුප්පත් හදවත ඊතල බොහොමයක් මගින් පසාරු කරනු ලැබීය. යෞවන සමය සතුටින් භුක්ති විඳීමට එය මහත් බාධාවක් විය." (Encyclopaedia Britannica art Bengal). වර්ටෙම්බර්ග්හි පූජක කාරක සභාවේ සාමාජිකත්වය ලබාගත් හෙතෙම ආගමික නිදහස පිළිබඳව වූ විෂයෙහි ක්‍රියාකාරී ප්‍රබලයෙකු විය. "තමන්ගේ හෘදය සාක්ෂියෙහි නිර්දේශ මත සභාමාතාව සමග සම්බන්ධතාවන් පවත්වා

ගෙන යාම අහිමි වූ අයට සාධාරණ නිදහසක් ලබාදීමට වෙහෙසව වැඩකිරීම ඔහුගේ උත්තරීතර වෑයම විය. ඒ සමගම සභාවේ අයිතිවාසිකම් හා වරප්‍රසාද පාවා නොදීමටද හෙතෙම වෑයමක් දැරීය." මෙම ප්‍රතිපත්තියෙහි යහපත් ප්‍රතිඵල අදටත් ඔහුගේ නිජ භූමියෙහි දකගත හැකිය.

"මෙලොව වැඩමවීමේ ඉරුදින" යන මාතෘකාව මත දේශනයක් එළිදරව් 21 ආශ්‍රයෙන් සූදානම් කරමින් සිටියදී ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳ ආලෝකය මුල්වරට බෙන්ගල්ගේ මනසට ඇතුළු විය. මෙතෙක් නොවූ විරූ ආකාරයෙන් එළිදරව් පොතෙහි අනාවැකි ඔහුගේ දැනුම ඉදිරියෙහි අනාවරණය වන්නට විය. දිවැසිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සිදුවීම්හි ඉමහත් තේජසත් අති විශාල වැදගත්කමත් පිළිබඳ හැඟීම් නිසා මුසපත්වූ ඔහුට එම විෂය පිළිබඳව පූර්ණ අවධානය යොමු කිරීමට එම අවස්ථාවේදී හැකියාවක් නොවීය. ඒ ගැන ක්‍රියාකිරීම මඳ කලකට පමා කිරීමට ඔහුට සිදුවිය. දේශනා කූඩුවෙහි සිටියදී දිවැසි ප්‍රකාශනයන්හි වැදගත්කම ඉතා පැහැදිලි අයුරින් සහ බල සහිතව, ඔහුගේ සිතට කාවැදී ගියේය. එයින් පසු අනාවැකි අධ්‍යයනය කිරීම සඳහා කැපවීමකින් යුතුව කාලය යෙදවීමට ඔහු තීරණය කරගත්තේය. එළිදරව් පොතෙහි අනාවැකි ඔහුගේ විශේෂ අවධානයට යොමු විය. එම අධ්‍යයනය මගින් ඔහු පැමිණි නිගමනය නම් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම ඉතා ආසන්න බවය. එම සුවිශේෂ සිද්ධිය ඉටුවන්නේ යයි ඔහු තීරණයට බැසගත් වර්ෂය විලියම් මිලර් ප්‍රචලිත කළ වර්ෂයට ඉතා සමීප විය.

බෙන්ගල්ගේ ලියවිලි කිතුණු ලෝකය පුරා පැතිර ගියේය. දිවැසි ප්‍රකාශන පිළිබඳව ඔහුගේ මත සහ අදහස් පොදුවේ බොහෝ දෙනෙකු විසින් පිළිගන්නා ලදී. විශේෂයෙන්ම ඔහු දිවි ගෙවූ වර්ටෙම්බර්ග් ප්‍රාන්තයේ ජනතා ප්‍රතිචාරය එසේ විය. ජර්මනියේ තවත් පෙදෙස්වලද ඒවා පිළිගැනීම එසේම විය. ඔහුගේ මරණින් පසුවද එම මෙහෙයුම ඉදිරියටම පිය නැගීය. දෙවෙනි ඊමේ පණිවිඩය වෙනත් රටවල නද දෙන්නාවූ කාලයට සමාන්තරව එම හඬ ජර්මනියේද රැව් පිළිරැව් දුන්නේය. කඩිනම් දෙවෙනි ඊම විශ්වාස කළ සමහර බැතිමත්හු රුසියාවේ පදිංචියට ගියෝය. එම රටෙහි ජනපද පිහිටුවා ගත් ඔවුහු එම රටෙහි ජර්මානු දේවස්ථානයන්හි එම විශ්වාසය අඛණ්ඩව පවත්වා ගෙන ගියෝය. ඒ විශ්වාසය මේ වන තුරුත් ඔවුන් අතර පවතියි.

දෙවන ඊමෙහි ආලෝකය ප්‍රංශයෙහි සහ ස්විට්සර්ලන්තයේද රැස් දහරා පැතිරවීමට සමත් විය. ප්‍රතිසංස්කරණ සත්‍යතාවන් ප්‍රචලිත කිරීමට ෆැරල් සහ කැල්වින් ජිනීවාහි සිට ක්‍රියාත්මක වූ ආකාරයෙන්ම ගෝසන්ද දෙවන ඊමෙහි ඉගැන්වීම පතුරාලීමෙහි සමත් විය. දසඅටවන



සියවසේ අවසන් කාලයේදී සහ දහනවවන සියවසේ මුල් කාලයේදී හේතු වාද දර්ශනය යුරෝපාව ගිල ගැනීමට ක්‍රියාත්මක වන්නට විය. සිසුවෙකු ලෙස ගෝසන් පාසල් ගිය අවධියේ ඔහුද මේ දසුනෙහි ආත්මය හා ගැටුණේය. දේව සේවයට බැඳුණු මුල් සමයේදී ඔහුට සත්‍යයවූ ඇදහිල්ල පිළිබඳව මනා දැනුමක් තිබුණේ නැත. සත්‍යය ගැන අවිශ්වාසයක් ඔහු තුළ තිබුණේය. තරුණ කාලයේදී හෙතෙම දිවැසි ප්‍රකාශන හැදෑරීමට මහත් උනන්දුවක් හා ආශාවක් දක්වීය. ඒ අතර ඔහුට රෝලින්ගේ "පුරාණ ඉතිහාසය" නැමැති පොත කියවන්නට අවස්ථාව ලැබුණේය. ඒ පොත කියවන්නාවූ අතරතුරේදී ඔහුගේ අවධානය දානියෙල්ගේ දෙවන පරිච්ඡේදය වෙත ඇදී ගියේය. දෙවියන්වහන්සේ දෙවා වදාළ අනාවැකි අකුරටම ඉටුවී ඇති ආකාරය දකීමෙන් ඔහු විස්මයට පත් විය. ඉතිහාසය මගින් අනාවැකි ඉටුවූ ආකාරය දකීමෙන් දෙවිඳුන්ගේ අනාවැකි කෙරේ විශ්වාසය තවත් තහවුරු විය. ශුද්ධ ලියවිල්ලෙහි දේවානුභාවය සාක්ෂාත් කිරීමෙහි මෙය වැදගත් සාක්ෂියක් විය. පසු දිනවල ඔහුට මුහුණ පාන්නට සිදුවූ මහත් උවදුරු විඳ දරාගෙන ඇදහිල්ලෙහි රැඳී සිටීමට ඒ පොත කියවීමෙන් ලද තහවුරු වීම් ඔහුට විශාල ශක්තිමත් පදනමක් විය. හේතු වාදයෙහි ඉගැන්වීම් මගින් සෑහීමට පත්වන්නට ඔහුට හැකියාවක් නොවීය. ඔහු ශුද්ධ බයිබලය හදාරන්නට පටන් ගත්තේය. පැහැදිලි ආලෝකය සොයන්ට වූ ඔහුට ටික කලකට පසුව ධනාත්මක ඇදහිල්ලක් ඇති විය.

දිවැසි ප්‍රකාශන විමර්ශනය කරගෙන යන අතරේ ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන පැමිණීම ඉතා ආසන්න යයි ඔහු ඒත්තු ගත්තේය. මෙම ශ්‍රේෂ්ඨ සත්‍යතාවෙහි ගාම්භීරතාවත්, එහි වැදගත්කමත් පිළිබඳව වගකීමක් හැඟී යාමෙන් මෙම පණිවිඩය ජනතාව වෙතට ගෙන යාමට ඔහු තුළ මහත් ආශාවක් ඇති විය. නමුත් එකල පැවැති පිළිගත් ජනමතය වූයේ දානියෙල් පොතෙහි අන්තර්ගත දිවැසි ප්‍රකාශන රහස් දේවල් බවය. එම ප්‍රකාශන තේරුම් ගත නොහැකි බවටද විශ්වාසයක් තිබිණ. අනෙකුත් අය සමග සත්‍යතා පණිවිඩය බෙදා ගැනීමට ගෝසන්ට මෙය බාධාවන් විය. පෙර දවස්වලදී ජිනීවාවේ දේව ධර්මය ප්‍රකාශ කිරීමට ෆැරල් ක්‍රියා කළාක් මෙන්, දරුවන් සමග දහම් ප්‍රචාරක කටයුතු ඇරඹීමට ගෝසන්ද තීරණය කරගත්තේය. ඔවුන්ගේ මාර්ගයෙන් දෙමාපියන්ගේ උනන්දුව දිනාගැනීම මෙම උත්සාහයෙහි අරමුණ විය.

මෙම ක්‍රමවේදය තෝරා ගැනීමේ අභිමතාර්ථය ඔහු පසු දවසක මෙසේ විස්තර කළේය. "මෙම කාරණාව තේරුම් ගන්නවාට මම කැමතියි. මම මෙසේ කරන්නේ ඉදිරිපත් කරන විෂය මාලාව වැදගත්කමින් අඩු ඉගැන්වීමක් නිසා නොවන්නේය. ඇත්ත වශයෙන්ම

මෙම විෂය මාලාව ඉතා වැදගත් එකකි. මෙම ක්‍රමවේදය මගින් දරුවන්ට කරුණු පහදා දී ඇසීමේ ප්‍රවනතාවක් ලබාගැනීමට මම අදහස් කළා. මුලින්ම වැඩිහිටි අයට කථා කළා නම් ඔවුන් මට ඇහුම්කන් දෙන්නේ නැහැ කියා මට හිතුණා." "එම නිසා කුඩා දරුවන් වෙත මුලින්ම යොමු වීමට මා අදහස් කළා. මම ළමුන්ගේ කුඩා කණ්ඩායමක් එක් රැස් කර ගනිමි. මම යම්කිසි දෙයක් උගන්වන්නාවූ අතරේදී, ඔවුන් එයට ඇහුම්කන් දෙන බව මට පෙනී ගියොත්, මා කියන දේ ගැන උනන්දුවක් දක්වන බවත්, එයින් සතුටට පත්වන බවත්, පෙනී ගියොත් කියන දේ ඔවුන් තේරුම් ගන්නා බවත් මට හැඟී යන්නේ නම් වැඩිහිටියන්ට කථා කිරීමට යොදාගත් උපාය මාර්ගය සාර්ථක වන බව මම දනිමි. වැඩි දිනක් යන්නට පෙර වැඩිහිටි අයට කථා කිරීමේ අවස්ථාව උදාවන බව මට විශ්වාසයි. කරුණු පැහැදිලි කරදීමත් සමගම ඔවුන් සමග වාඩිවී විෂය මාලාවක් අධ්‍යයනය කිරීම මාගේ බලාපොරොත්තුවයි. මෙසේ කිරීමත් සමගම මාගේ වෑයම සාර්ථක වේ." (Gaussen, L, "Daniel the Prophet," Vol ii Preface)

ගෝසන්ගේ වෑයම සාර්ථක විය. ඔහු දරුවන්ට කථා කිරීමට පටන්ගත් විට වැඩිහිටි අයද දෙසුම් ශ්‍රවණය කිරීමට පැමිණියෝය. ඔහුගේ දේවස්ථානය පිරී ඉතිරී ගියේය. පැමිණි අය ඔහුගේ දෙසුම් ඉතා ඕනෑකමින් අසා සිටියහ. ඔවුන් අතර සමාජයේ ප්‍රභූන්ද, උගතුන්ද වූහ. ජිනීවා නුවරට පැමිණි අමුත්තන් සහ විදේශිකයන්ද දෙසුම් ඇසීමට පැමිණියහ. මෙයාකාරයෙන් දෙවන පැමිණීමේ සුපුවත වෙනත් ස්ථාන කරා යෑමේ භාග්‍යය උදා විය.

ක්‍රියාත්මක කළ ක්‍රමවේදය සාර්ථක වීමෙන් දිරිගත් ගෝසන් තම පාඩම් මාලාව ප්‍රකාශයට පත් කළේය. ප්‍රංශ භාෂාව කථා කළ දේවස්ථානයන්හි, දිව්‍යැසි ප්‍රසාදි පොත් අධ්‍යයනය කරන්ට පෙළඹවීම ඔහුගේ අභිමතාර්ථය විය. ඔහු තම චින්තනය මෙසේ වචනයට නඟයි. "දරුවන්ට ලබාදුන් අනුශාසනා මුද්‍රණය කර ප්‍රචාරය කිරීම මගින් වැඩිහිටි අයගේ අවධානය දිවැසි ප්‍රසාදි පොත් අධ්‍යයනය කිරීමට අත්වැලක් සපයයි. මෙම පොත්වල ප්‍රකාශන තේරුම් ගත නොහැකි යයි බහුතරයක් පවසති. මම වැඩිහිටියන්ට මේ ප්‍රශ්නය යොමු කළෙමි: 'එම ප්‍රකාශන දරුවන්ට වටහාගැනීමට පුළුවන් නම් වැඩිහිටියන්ට ඒවා වටහාගැනීමට නුපුළුවන් වන්නේ ඇයි?' අපගේ සාමාජිකයන් අතර දිවැසි වැකි පිළිබඳව අවබෝධයක් ඇති කිරීම මාගේ අරමුණය. කාලයාගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවශ්‍ය අධ්‍යයනයක් කිරීමට මගපෙන්වන්නාවූ වෙනත් කිසිම ක්‍රමවේදයක් අප අතර නැත යන්න මාගේ හැඟීමයි. පැමිණෙන්නාවූ විපත්ති



කාලයට මුහුණ දීම සඳහා සූදානම් වීමටත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම අවදියෙන් යුතුව බලා හිඳිමින් එයට සූදානම් වීමටත්, දිවැසි වැකි අධ්‍යයනය උපකාරයක් වන්නේමය."

ගෝසන් ප්‍රංශ බසින් දේශනා කිරීමේදී ඔහු ඉතා ජනප්‍රියවූ, ශ්‍රාවක ආදරය දිනාගත්තාවූ දේවගැතිවරයෙක් විය. දේවස්ථානයේ කතිකිස්මය හෙවත් ප්‍රශ්නෝත්තරීය අනුශාසනා පොතින් ඉගැන්වීම පසෙකලා ශුද්ධ බයිබලයෙන් දහම් දෙසීම නිසා දේවගැති තනතුරෙහි සේවය කිරීම ඔහුට තහනම් කරන ලදී. කතිකිස්මය වනාහි නීරසවූ ද, හේතු වාදය ඉස්මතු කරන්නාවූ ද, අත් පොතක් වූ අතර එය ඇදහිල්ල ශක්තිමත් කරමින් ගුණාත්මක වර්ධනයක් ලබා දෙන්නක් නොවේය. තරුණයන්ට ඉගැන්වීමේදී ඔහු ශුද්ධ බයිබලය තම අත් පොත ලෙස යොදා ගත්තේය. දේව සේවය අහිමි වූ පසුව දෙවි සත් දහම් විදුහලක ආචාර්යවරයෙකු ලෙස සේවය කිරීම හෙතෙම ආරම්භ කළේය. ඒ අතරම ඉරිදා දිනයන්හි ඔහු දරුවන්ට ආගම ඉගැන්වීම දිගටම කරගෙන ගියේය. ඒ සඳහා ඔහු යොදා ගත්තේ ශුද්ධ බයිබලය පමණකි. දිවැසි වැකි ප්‍රකාශන පිළිබඳව ඔහුගේ අධ්‍යයන, වාර්තා සහ පාඩම් මගින් බැතිමතුන් තුළ උද්‍යෝගයක් සහ අවධානයක් නිර්මාණය විය. මහාචාර්ය වරයෙකු ලෙසද, මුද්‍රිත මාධ්‍යය මගින්ද, දරුවන්ට පාඩම් කියාදීම මගින්ද ඔහු ඉතා ප්‍රබල බලපෑමක් ඇති කිරීමෙහි ලා සමත් විය. ඔහු මෙම සේවාව වසර ගණනාවක් පුරා කරගෙන ගියේය. මෙසේ අනාවැකි ඉගෙනීම මගින් ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන පැමිණීම ආසන්න බවට බොහෝ දෙනාගේ අවධානය යොමු කිරීමට ඔහුට පුළුවන් විය.

දෙවන ඊමේ පණිවිඩය ස්කැන්ඩිනේවියාවේද මහජන සැලකිල්ලට යොමු විය. ඇතිවූ උනන්දුව සිත් ගන්නා සුළු විය. වැරැදි ඉගැන්වීම් මත පදනම් වූ ආරක්ෂාවක් කෙරෙහි විශ්වාසය තැබූ බොහෝ දෙනෙක් සත්‍යතාව අවබෝධ කරගෙන තමන්ගේ පව් කියා දෙමින් ඒවා අතහැර ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් කමාව ලබාගැනීමට පොළඹවනු ලැබුවෝය. එහෙත් එම දේශීය ආගමේ පූජක පක්ෂය මෙම මෙහෙයුමට විරුද්ධ විය. ඔවුන්ගේ බලපෑම් යටතේ දෙවන ඊමේ පණිවිඩය ප්‍රචලිත කළ සමහරෙක් සිරගෙයි දමනු ලැබුවෝය. දෙවන ඊමේ දහම දෙසූ අය බොහෝ පෙදෙස්හි නිශ්ශබ්ද කරනු ලැබූහ. ඒ අතර ක්‍රියාත්මක වූ දෙවියන්වහන්සේ හාස්කම් සිදු කරමින් දරුවන් ලවා එම පණිවිඩය දේශනා කරන්නට ක්‍රමවේදයක් සකසා ගත්සේක. බාල වයස්කරුවන්ට නීතිය මගින් තහංචි පැනවීමේ අයිතියක් නොතිබූ නිසා හිරිහැරයට ගොදුරු නොවී දේශනා කිරීමට ඔවුන්ට හැකි විය.

මෙම මෙහෙයුම විපුල අයුරින් එල දැරුවේ සමාජයේ පහළ මට්ටමේ මිනිසුන් අතරය. අනතුරු හැඟවීමේ පණිවිඩය ඇසීමට ජනයා

රැස්වූයේ නිහතමානී කම්කරු පංතියේ සේවකයන්ගේ නිවෙස්වලය. ළමා දේශකයන්ද දුගී පවුල්වලට අයත් වූවෝ වූහ. ඔවුන්ගෙන් සමහරෙක් වයස අවුරුදු හයත් අටත් අතර විය. ඔවුන් ගැළවුම්කාරයාණන්ට ආදරය කළ බවට ඔවුන්ගේ ජීවිත සාක්ෂි දැරීය. ඔවුහු දෙවියන්වහන්සේගේ ශුද්ධ අණසකට කීකරුව දිවි ගෙවීමට වෑයම් කරමින් සිටියෝය. ඔවුන්ගේ බුද්ධිමය හැකියාවන් සාමාන්‍යයෙන් එම වයසේ දරුවන්ට වඩා වෙනස් නොවීය. එහෙත් ජනතාව ඉදිරියෙහි නැගී සිට කථා කරන්නට පටන් ගත් කල්හි ඔවුන්ගේ සහජ හැකියාවන්ට වඩා ප්‍රබල වූ ලෝකෝත්තර බලවේගයකින් ඔවුන්ව හසුරුවනු ලබන බව දකගත හැකි විය. ඔවුන්ගේ කථිකත්ව විලාශය සහ ස්වර ලාලිත්‍යය සුපුරුදු ක්‍රමයට වඩා වෙනස් බවක් පෙන්නුම් කළේය. විනිශ්චය පිළිබඳව ඔවුන් ගරු ගාම්භීර හඬකින් අනතුරු හැඟවීම් ඉදිරිපත් කළේ ශුද්ධ ලියවිල්ලෙහි ඇති වචනම භාවිතා කරමින්ය. ඔව්හු මෙසේ පැවසූහ. "දෙවියන්වහන්සේට භය වී, උන්වහන්සේට ගෞරව දෙන්න. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය." ළමා-දේශකයෝ මිනිසුන්ගේ පාප ගැන තරවටු කළෝය. ඒ, මිනිසුන්ගේ දුශ් චරිතය හා අවකල් ක්‍රියාවන් ගැන පමණක් නොවීය. මිනිසුන් ලෞකික ආශාවනට ගැතිවීමද, දහමෙන් ඉවත්ව ක්‍රියා කිරීමද ගැන ඔවුහු ජනතාවට චෝදනා එල්ල කළෝය. පැමිණෙන්නාවූ දේව උදහසින් හැකි ඉක්මණින් පලායන්නට මේ ළමා දේශකයෝ තම ශ්‍රාවකයින්ට ඔවා බස් දුන්නෝය.

ජනතාව මෙම වදන් ඇසුවේ භීතියෙන් සලිත වෙමින්ය. සත්‍යය ඒත්තු ගන්වන්නාවූ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔවුන්ගේ සිත්වලට කථා කළසේක. අළුත් උද්‍යෝගයකින් හා ගැඹුරු උනන්දුවකින් ශුද්ධ ලියවිලි සෙවීමට මිනිසුන්ව පොළඹවනු ලැබීය. පමණ ඉක්මවා ක්‍රියාකිරීම් සහ සාර ධර්මයන්ට පටහැනිව කළ ක්‍රියා කිරීම් අත්හැර දමන ලදී. තවත් අය තමන්ගේ වංචාකාර වූ ක්‍රියා කලාපයන් අත්හැර දමූහ. සිදුවූ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය කෙතරම් ප්‍රතිඵල දායකවීද යත් රාජ්‍ය පූජකයන් පවා එම තත්ත්වය පිළිගත්තේ දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තය එම මෙහෙවරය සමග සිටින බව ප්‍රකාශ කරමින්ය.

ස්කැන්ඩිනේවියානු රටවලටද ගැළවුම්කාරයාණන් පැමිණීමේ ශුභ ආරංචිය දෙනු ලැබීම දේව කැමැත්ත විය. තම සේවකයන්ගේ හඬ නිශ්ශබ්ද කරනු ලැබූ විට දෙවියන්වහන්සේ තම ආත්මය දරුවන් මත ක්‍රියාත්මක කළසේක. ඔවුන් තුළින් තම අභිමතාර්ථය ඉටු කරගැනීම උන්වහන්සේගේ අරමුණ විය. යේසුස්වහන්සේ තේජසින් යුතුව විජයග්‍රාහී ලෙස යෙරුසලම ආසන්නය කරා පැමිණි අවස්ථාවේදී උන්වහන්සේ



පිරිවරාගෙන පැමිණි සතුටින් පිරි ජනයා ජය ඝෝෂා නංවමින් තල් අතු වනමින් දාවිත්ගේ පුත්‍රයාණන් ලෙස උන්වහන්සේට ආචාර සමාචාර කළෝය. එම යශෝරාවය නවතා දමන ලෙස අණකරන්නැයි ඊර්ෂ්‍යාවෙන් වෙලී ගිය ඵරිසිවරු උන්වහන්සේගෙන් ඉල්ලා සිටියෝය. එවිට යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් පවසා සිටියේ සිදුවන්නාවූ සෑම දයක්ම දිවැසි වැකි සම්පූර්ණ වීමක් බවය. ජනතාව නිශ්චල වෙත් නම් ගල් වුවද, ජය හඬ නඟනවා ඇතැයිද උන්වහන්සේ පැවසූසේක. පූජකයන්ගේ සහ ජන නායකයන්ගේ තර්ජනාත්මක හඬට බියපත් වූ වැඩිහිටි ජනකාය නිහඬව සිටීමට තීරණය කරගත් නමුත්, දේව මාළිගාවේ මණ්ඩපවල සිටි ළමුන් තල් අතු වනමින් මහ හඬින් පැසසුම් ගී හඬ නංවාලමින්, "දාවිත්ගේ පුත්‍රයාට හෝසන්නා!"යි ජය ඝෝෂා නැඟුවෝය. (මතෙව් 21:9). මෙම ජය ඝෝෂා හඬින් කුපිත වූ නායක පූජකයෝ සහ දහම් පඬිවරු උන්වහන්සේ වෙතට සමීපව, "මේ දරුවන් කියන දේ ඔබට ඇහෙනවාද"යි ප්‍රශ්න කළෝය. ඔවුන්ට පිළිතුරු දෙමින් යේසුස්වහන්සේ මෙසේ කීසේක. "එසේය, බාලයන්ගේද, කිරි බොන දරුවන්ගේද මුඛයෙන් ඔබ ප්‍රශංසාව සම්පූර්ණකර තිබේය යන්න නුඹලා කිසිකලක කියෙව්වේ නැද්ද"යි ඇසූ සේක. ක්‍රිස්තුස්වහන්සේගේ පළමු ගමනේදී දෙවියන්වහන්සේ ළමුන් කරණකොටගෙන ක්‍රියාත්මකවූ ආකාරයෙන්ම, දෙවන ඊමේ පණිවිඩය ප්‍රකාශ කිරීමටද උන්වහන්සේ දරුවන් තුළින් ක්‍රියා කළසේක. දෙවියන්වහන්සේ පවසා ඇති දෑ ඉටු විය යුතුය. ගැළවුම්කාරයාණන්ගේ දෙවන පැමිණීමේ පණිවිඩය සෑම මනුෂ්‍යයන්ටත්, භාෂාවන්ටත්, ජාතීන්ටත් ලබාදීම අනිවාර්ය වේ.

විනිශ්චය සහ දෙවන ඊම පිළිබඳ අනතුරු ඇඟවීමේ පණිවිඩය අමෙරිකාව පුරා ප්‍රචලිත කිරීමේ වරම ලබාදෙනු ලැබුවේ විලියම් මිලර්ට සහ ඔහුගේ සහකාර දේව සේවකයන්ටය. අමෙරිකාව දෙවන ඊම එළිදැක්වීමේ මෙහෙයුම ක්‍රියාත්මක කිරීමේ මධ්‍යස්ථානය බවට අනිවාර්යයෙන්ම පත් විය. පළමුවන දේව දූතයාගේ පණිවිඩය රැගත් දිවැසි ප්‍රකාශය සෘජුවම ඉටු වූයේ මෙම රටෙහිය. මිලර් සහ ඔහුගේ සහකාරයන් විසින් රචිත පතපොත විවිධ රටවලට රැගෙන යනු ලැබීය. දහම් ප්‍රචාරක දේව සේවකයන් ගියාවූ ලෝකයේ සියලු පෙදෙස්වල ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊමේ ශුභාරංචිය ගෙන යන ලදී. "දෙවියන්වහන්සේට භය වී උන්වහන්සේට ගෞරව දෙන්න. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය" යන සදාකාල ශුභාරංචි පණිවිඩය ඈත මෑත සෑම පෙදෙස් පුරා විකාශනය විය.

වසර 1844 හි වසන්ත සමයෙහි ක්‍රිස්තුස්වහන්සේ දෙවන වර පැමිණෙන බව අනාවැකි මගින් ප්‍රකාශ කර ඇත යන අදහස බොහෝ අයගේ සිත් වලට කාවැදී ගියේය. ජනපදයෙන් ජනපදයට

මේ පණිවිඩය පැතිරී යත්ම සෑම තැනම දැඩි උනන්දුවක් ජනිත වන්නට විය. අනාවැකි මගින් ඉදිරිපත් කළ කාලවකවානුවට ලබාදුන් අර්ථකථනය නිවැරැදි බව බොහෝ අය පිළිගත්හ. තමන් නිවැරැදිය යන සාවද්‍ය තීරණය මත පිහිටා සිටි අය පවා තමන්ගේ චින්තන අභිමානය අත්හැර දමා ප්‍රීතියෙන් යුතුව සත්‍යතාව පිළිගත්හ. සමහර දේවගැතිවරු තමන්ගේ නිකායික ඉගැන්වීම් සහ හැඟීම් පසෙකලා තම දේවස්ථාන සහ වැටුප අත්හැර දමා යේසුස්වහන්සේගේ පැමිණීමේ පණිවිඩය ප්‍රචලිත කිරීමට එක් වූහ. එසේ වුවද, සත්‍යතාව වැළඳ ගැනීමේ තීරණයෙහි රැඳී සිටියේ දේවගැතිවරුන් ස්වල්ප දෙනෙක් පමණකි. එහෙයින් මේ පණිවිඩය රැගෙන යාමේ කාර්ය භාරය නිහතමානී ගිහියන්ට පවරන ලදී. ගොවියෝ තම කුඹුරු සහ වතු වගා අත්හැර දැමුවෝය. කාර්මිකවේදීහු තම ආයුධ පසෙක දැමූහ, වෙළෙඳ ව්‍යාපාරිකයෝ තම අලෙවිය නවතා දැමුවෝය, වෘත්තීය වේදීහු තම තනතුරුවලට ආයුබෝවන් කීහ. එසේ වුවද ඔවුන්ගෙන් සැදුම්ලත් ප්‍රචාරක කණ්ඩායම කළ යුතු කාර්යය ඉදිරියේ ඔවුන්ගේ සංඛ්‍යාව ඉතා අල්ප විය. දෙවියන්වහන්සේගේ පහස නොලබන්නාවූ සහාවක සහ දුෂ්ටකමේ මෙන්ම දුරාචාරයේද ඇලී ගැලී සතුට ලබන්නාවූ ලෝකයක තත්ත්වයද සත්‍යවාදී අවංක මුරකරුවාගේ හදවත වේදනාවට පත් කළේය. ගැළවීම ලබන පිණිස පසුතැවිලි වීමට මිනිසුන්ව කැඳවීම සඳහා දේව සේවක මුරකරුවෝ කැමැත්තෙන්ම ඉතා මහන්සිව වැඩ කළෝය. ඔවුහු අහ හිඟකම් විඳ දරා ගත්තෝය, දුක් වේදනා සහ හිංසා පීඩාවලට පාත්‍ර වූවෝය. සාතන්ගේ බාධා විරෝධතා මධ්‍යයේ දෙවන ඊමේ පණිවිඩය පසු නොබා ඉදිරියටම ගමන් කළේය. දෙවන පැමිණීමේ සත්‍යතාව දහස් ගණන් බැතිමතුන් විසින් පිළිගන්නා ලදී.

සිත් සෝදිසි කිරීමේ සාක්ෂි දැරීම සෑම පසෙකින්ම අසන්නට ලැබිණ. පැමිණෙන්නාවූ දේව උදහසින් මුදනු ලැබීමේ අනතුරු ඇඟවීමේ හඬ ලෝකයට ඇලුම් කළ අයට මෙන්ම කිතුණු බැතිමතුන්ටද එකසේ ඇසීමට සලස්වන ලදී. ක්‍රිස්තුස්වහන්සේගේ පෙර ගමන් දූතයා වූ යොහන් බව්තීස්ත මෙන්ම පුනරාගමන දේශකයෝ පසුතැවීමෙහි ඵල ගෙනෙන ලෙස සැමගෙන් ඉල්ලා සිටියෝය. ජනප්‍රිය දෙව් මැදුරු වල දේශනා කූඩු මගින් මිනිස් සත හට ලබාදුන්නාවූ පණිවිඩය නම් බිය නොවන්න, සාමය සහ ආරක්ෂාව ඔබට සහතිකය යන්නය. එහෙත් ඒවාට වෙනස්වූ දෙවන ඊමෙහි පෙරමඟ දූතයන්ගේ අයැදුම් සැමගේ සිත් සතන් සලිත කළේය. පණිවිඩය ප්‍රකාශ කරනු ලැබූ සෑම ස්ථානයකම මිනිසුන් එය විශ්වාස කරන්ට පටන් ගත්හ. ශුද්ධ ලියවිලි තුළින් මතු කොට පෙන්වා දෙනු ලැබූ සරල ඍජු සාක්ෂි දැරීම් සමග ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලපෑමද ක්‍රියාත්මකවූ නිසා



සත්‍යතාවට පිටුපා ක්‍රියා කළේ ස්වල්ප දෙනෙක් පමණය. ධර්මාචාර්යයන් වූ අය ඔවුන් සිටි ව්‍යාජ ආරක්ෂිත කල්පනයෙන් පුබුදුවනු ලැබූහ. තමා දේව ධර්මයට පිටුපා ක්‍රියා කර ඇති ආකාරයද, ලෝකය සමග අනුගත වී අවිශ්වාසයට ඉඩදීමද, තමන්ගේ උඩඟුකම සහ ආත්මාර්ථකාමීත්වයද ඔවුන්ට දැකගැනීමට හැකි විය. පසුතැවීමකින් හා යටහත්කමින් යුතුව බොහෝ දෙනෙක් දෙවි සමිඳාණන් සොයා ගියෝය. ලෞකික දේවල් කෙරෙහි ඔවුන් තබා තිබූ ඇල්ම දැන් ඔවුහු ස්වර්ගය වෙත යොමු කළෝය. දෙවියන්වහන්සේගේ ආත්මය ඔවුන් මත පිහිටා තිබුණේය. "දෙවියන්වහන්සේට භය වී උන්වහන්සේට ගෞරව කරන්න. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය" යන පණිවිඩය ප්‍රකාශ කිරීමට ඔවුහු ඉදිරිපත් වූහ.

"ගැළවීම ලබන පිණිස අප කුමක් කළ යුතුද?"යි පව්කාරයෝ හඬමින් විමසූහ. වංචනික ලෙස ජීවත් වූ අය එම ක්‍රියාවලට වන්දි ගෙවීමට ඉදිරිපත් වූහ. ක්‍රිස්තුස්වහන්සේ තුළ සමාදානය ලැබූවාවූ අය එම සාමය තවත් අය සමග බෙදා ගැනීමට ආශාවක් දැක්වූහ. දෙමාපියන්ගේ හදවත් දරුවන් වෙත යොමු කරනු ලැබූ අතර දරුවන්ගේ හදවත්ද දෙමාපියන් වෙත නැඹුරු විය. අහංකාරය සහ වෙන්ව සිටීමේ චින්තනය නිසා ගොඩ නැඟී තිබූ බාධක බිඳ දමනු ලැබීය. හෘදයාංගම පාපොච්චාරණය නොඅඩුව දැකගැනීමට හැකි විය. තමන්ගේ ආදරවන්ත ඥාතීන්ගේ සහ හිත මිතුරන්ගේ ගැළවීම උදෙසා ක්‍රියා කිරිමට බැතිමතුන්ගේ සිත් යුහුසුළු විය. මැදහත්කාරකමේ හඬ බොහෝ අවස්ථාවලදී ඇසෙන්නට විය. සංතාපයෙන් සහ සංවේගයෙන් වේදනාවට පත් ආත්ම, තමාව පිළිගන්නැයි දෙවියන්වහන්සේට ආයාචනා කරන්නට වූහ. තමන්ගේ පාපයන්ට සමාව දී ඇතැයි සහතිකයක් ලබාගැනීමේ අභිලාෂයෙන් බොහෝ දෙනෙක් රාත්‍රිය පුරා නිදි වරමින් දෙවියන්වහන්සේට කන්නලව් කළෝය. තමන්ගේ නෑදෑයින්ගේ සහ අසල්වැසියන්ගේ වෙනස්වීම උදෙසාද බොහෝ අය රාත්‍රිය පුරා යාච්ඤාවෙහි යෙදුණෝය.

දෙවෙනි ඊමේ පණිවිඩය ඇසීමට සෑම සමාජ පංතියකම මනුෂ්‍යයෝ එම රැස්වීම්වලට පැමිණියෝය. පොහොසතුන් මෙන්ම, දුප්පතුන්ද, ප්‍රභූන් මෙන්ම කුලහීනයන්ද, විවිධ හේතූන් නිසා දෙවන ඊමේ පණිවිඩය තමන්ගේම දෙසවනින් ඇසීමට රැස්වීම් ශාලා වෙත පැමිණියෝය. තමාගේ ඇදහිල්ලට හේතුවූ කාරණා දේව සේවකයන් විසින් ජනතාවට තේරුම් කරදෙන්නාවූ අතරවාරයේදී දෙවියන්වහන්සේ සතුරන්ගෙන් එල්ල වන බාධකයනට තහංචි පනවා තිබූසේක. සමහර අවස්ථාවන්හිදී පණිවිඩය දීමේ මාධ්‍යය දුර්වල වූවා විය හැකිය. එසේ වුවද, සත්‍යතාවට දෙවියන්වහන්සේගේ බලයෙහි පහස ලැබුණේය.

ශුද්ධ වූ දේව දූතයන් එම රැස්වීම් ශාලාව තුළ සිටින බව බොහෝ අයට හැඟී ගියේය. දිනපතාම බොහෝ දෙනෙක් ඇදහිලිවතුන් සමග එකතු වූහ. ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊම පිළිබඳ පණිවිඩය නැවත නැවතත් උච්චාරණය කරනු ලැබූ අතර විශාල සමූහයක් නිහඬව මහත් උනන්දුවෙන් යුතුව පණිවිඩයට සවන් දුන්නෝය. සගයත්, පොළොවත් එකිනෙකට ළංව ඇති බවක් පෙනෙන්නට තිබුණේය. වැඩිහිටියන් සහ බාලයන් කෙරෙහිද, මැදි වයස් අය මත්තෙහිද දෙවියන්වහන්සේගේ බලය පතිත වූ බවට ප්‍රබල හැඟීමක් විය. බැතිමතුන් තම නිවෙස් කරා පිවිසියේ පැසසුම් ගීතයකින් යුතුවය. රාත්‍රී කාලයේ නිසල බව දෙබෑ කරමින් දෙවි තුමන්ට තුති දීමේ හඬ ගුවන් තලය පුරා පැතිර ගියේය. මෙම රැස්වීම් වලට සහභාගී වූවනට ඒවායේ පැවැති දැඩි උනන්දුව කිසි කලෙකත් අමතක නොවේ.

ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සිදුවෙතැයි පවසමින් එයට නිශ්චිත දිනයක් නියම කිරීම සෑම තරාතිරමකම සිටියාවූ වෙනත් පුද්ගලයන්ගේ දෝෂාරෝපණයට හේතු විය. දේශන වේදීන්ගේ මෙන්ම සගයට අභියෝග එල්ල කළ දුෂ්ටයන්ගේද විරුද්ධතාව දසතින් ප්‍රකාශ විය. මේ ගැන දේව වචනයේ අනාවැකිද පල කර තිබේ. "අන්තිම දවස්වලදී තමුන්ගේ තෘෂ්ණා ලෙස හැසිරෙන්නාවූ: පියවරුන් සැතපුණු පසු මැවීමේ පටන්ගැන්මේ සිට සියලු දේ තිබුණාක් මෙන් පවතින බැවින්, උන්වහන්සේගේ ඊමේ පොරොන්දුව කොතැන්හිදැයි සරදම්කරමින් කියන්නාවූ කවටකම්කරන්නෝ පැමිණෙන්නෝය" (2 පේත්‍රුස් 3:3,4). යන අනාවැකිය අකුරටම ඉටු විය. ගැළවුම්කාරයාණන්ගේ පැමිණීම විශ්වාස කරන බව ප්‍රකාශ කළ බැතිමතුන් පවා පැවසුවේ තමා දෙවන පැමිණීමේ දහමට කිසිසේත්ම විරුද්ධතාවක් දක්වන්නේ නැති නමුත්, නිශ්චිත දිනයක් නියම කිරීම ගැන තමා සම්පූර්ණයෙන්ම විරුද්ධ වන බවය. එහෙත්, සියල්ල දකින්නාවූ සර්වඥ තැනැන්වහන්සේගේ ශ්‍රී දෙනෙත් ඔවුන්ගේ හදවත් විමසා බැලුවේය. ධර්මිෂ්ඨකමින් ලෝකය විනිශ්චය කිරීමට ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙන පුවත ඇසීමට ඔවුන් තුළ කිසිම කැමැත්තක් නොතිබිණ. ඔවුන් ඇත්ත වශයෙන්ම දෙවි සමිඳාණන් මුණ ගැසීමට බියක් දක්වූහ. ඔවුහු විශ්වාසවන්ත දේව දරුවන් නොවූහ. ඔවුන්ගේ ක්‍රියාදාමයන්ට දෙවියන්වහන්සේගේ අනුමැතිය නොලැබෙන බව ඔවුහු දන සිටියෝය. ක්‍රිස්තුස්වහන්සේගේ මුල් පැමිණීමේදී යුදෙව්වන් උන්වහන්සේව පිළිගැනීමට සූදානම්ව නොසිටි ආකාරයෙන්ම මෙම අයද උන්වහන්සේව පිළිගැනීමට සූදානමින් සිටියේ නැත. ශුද්ධ බයිබලය ඉදිරිපත් කළ සරල තර්ක පිළිගැනීම ඔවුහු ප්‍රතික්ෂේප කළා පමණක් නොව, ස්වාමීන්ගේ පැමිණීම බලා සිටි අයව උපහාසාත්මක ලෙස හෙළා දැකීමටද ඔවුහු පසුබට නොවූහ. තමා ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ යයි කියන්නාවූ අය



උන්වහන්සේට ප්‍රේම කළේ ඉතා ස්වල්ප වශයෙන් බවද ඔවුන් උන්වහන්සේගේ පැමිණීමට ආශාවක් දක්වන්නේ නැතැයිද ඇනුම් පද කියමින් සාතන් සහ ඔහුගේ දූතයෝ ක්‍රිස්තුස්වහන්සේට සහ උන්වහන්සේගේ දූතයන්ට අපහාස කරන්නට වූහ.

දෙවන ඊමේ පණිවිඩය ප්‍රතික්ෂේප කළාවූ අයගේ තර්කය වූයේ 'කිසි මනුෂ්‍යයෙක් ඒ දවස හෝ පැය දන්නේ නැත' යන්නය. ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ කියා තිබේ. "ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත. ස්වර්ගයෙහි දේවදූතයන්වත් පුත්‍රයාවත් දන්නේ නැත." (මතෙව් 24:36). ක්‍රිස්තුස්වහන්සේගේ පුනරාගමනය අපේක්ෂා කළ අය මෙම පාඨය ගැන පැහැදිලි තාත්ත්වික තේරුම් කිරීමක් ලබාදෙමින් විරුද්ධවාදීන් ඒවා වැරදි අන්දමට පාවිච්චි කරන බවද දක්වූහ. යේසුස්වහන්සේ අන්තිම වතාවට යෙරුසලම් දේව මාළිගයෙන් ඉවත්ව ඔලීව කඳු මස්තකයට පැමිණ තම ගෝලයන් සමග සාකච්ඡා කරමින් සිටි අතර "ඒ දේ කොයි කලෙක සිද්ධ වන්නේද ඔබවහන්සේගේ ඊමටත් ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්ද" යි ගෝලයෝ උන්වහන්සේගෙන් විමසූහ. (මතෙව් 24: 3). පෙර නිමිති වදාරා දුන් යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. "එසේම නුඹලා මේ සියල්ල දකින කළ, උන්වහන්සේ දොරටු සමීපයෙහි බවත් දනගන්න." (මතෙව් 24:33). ගැළවුම්කාරයාණන්ගේ එක් ප්‍රකාශනයක් උන්වහන්සේගේ තවත් ප්‍රකාශනයක් කටුගා දමන්නට භාවිතා කළ යුතු නොවේ. උන්වහන්සේගේ පැමිණීමේ නිශ්චිත දවසවත්, නිශ්චිත පැයවත් කිසිම මනුෂ්‍යයෙක් නොදන්නා නමුත් එම දවස කෙතරම් ආසන්න දැයි දනගැනීමට අපට ගුරු හරුකම් දෙවා වදාරා ඇත. එය දනගැනීම අපගෙන් බලාපොරොත්තු වේ. මෙම අනතුරු ඇඟවීම පිළිබඳව කිසිම තැකීමක් නොකිරීම හෝ එය පිළිබඳව සැලකිල්ලක් දක්වීම ප්‍රතික්ෂේප කිරීම හෝ උන්වහන්සේගේ පැමිණීම ආසන්න බව නොසලකා හැරීම වනාහි ඉරණම තීන්දු කරන්නාවූ මරණීය බේදවාචකයක් බව අපට උගන්වා තිබේ. නෝවාගේ කාලයේදී ජල ගැලීම ආසන්න බව නොදන සිටි නිසා එම සෙනඟට අත්වූ ඉරණමම යේසුස්වහන්සේගේ දෙවෙනි ඊම කඩිනමින් සිදුවන්නේ යයි නොසලකන්නාවූ අයටද සිදුවන්නේමය. එම පරිච්ඡේදයේම උපමාවක් ඇතුළත්ය. එහි විශ්වාසී සේවකයා සහ අවිශ්වාසී සේවකයා අතර සැසඳීමක් කර ඇත. "මාගේ ස්වාමියා ප්‍රමාද වන්නේය"යි තමාටම කියාගනිමින් කටයුතු කරන්නාවූ තැනැත්තා විනාශයට පත්වෙනවා ඇතැයි යේසු සමිඳාණෝ කරුණු පැහැදිලි කරමින් වදාළ සේක. තමන්වහන්සේගේ දෙවෙනි ඊම සිදුවේ යයි බලා සිටිමින් ඒ ගැන අනෙකුත් අයට කියා දෙන්නාවූ තැනැත්තාට ක්‍රිස්තුස්වහන්සේගේ

සැලකිල්ලත්, ඵල විපාකත් ලැබෙන බව උන්වහන්සේ මනා ලෙස පැහැදිලි කර දුන්සේක. අනෙකුත් අයට එවන් වරප්‍රසාද හිමි නොවේ. "ස්වාමියා එන කළ යම් දාසයෙකු එසේ කරනවා දක්නේද, ඒ දාසයා ආශිර්වාද ලද්දෙක්ය." (මතෙව් 24:46). "එබැවින් නුඹලාත් සූදානම්ව සිටින්න. මක්නිසාද නුඹලා නොසිතන පැයකදී මනුෂ්‍ය පුත්‍රයා එන්නේ යයි කීසේක." (ලූක් 12:40).

එක්තරා ජන කොටසකට ස්වාමීන්වහන්සේගේ පැමිණීම, නොසිතන්නාවූ මොහොතක සිදුවන බව පාවුල් මෙසේ ප්‍රකාශ කර ඇත: "මක්නිසාද රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන් ස්වාමින්-වහන්සේගේ දවස පැමිණෙන බව නුඹලාම හොඳ හැටි දනිහුය. සමාදානයය, අනතුරක් නැත කියා කියන විට .... හදිසියෙන් ඔවුන් පිටට විනාශය පැමිණේ. ඔව්හුද කිසිසේත් නොගැළවෙන්නෝය." එහෙත් ගැළවුම්කාරයාණන්ගේ අනතුරු ඇඟවීමට ඇහුම්කන් දෙන අය ගැන පාවුල් මෙසේ පවසයි. "නුමුත් සහෝදරයෙනි, ඒ දවස සොරෙකු මෙන් නුඹලා කෙරේ පැමිණෙන්ට නුඹලා අන්ධකාරයෙහි සිටින්නෝ නොවෙති. කුමක්හෙයින්ද නුඹලා සියල්ලෝ ආලෝකයේද දවාලේද පුත්‍රයෝය. අපි රාත්‍රියටවත් අන්ධකාරයටවත් අයිති නොවෙමුව." (1 තෙසලෝනික 5: 2-5).

ක්‍රිස්තුස්වහන්සේගේ ඊමෙහි කඩිනම් ඉටුවීම පිළිබඳව නොදැනුවත්ව සිටීමට ශුද්ධ ලියවිල්ල ඉඩ නොතබන බව මෙසේ දක්වන ලදී. එහෙත් සත්‍යතාව ප්‍රතික්ෂේප කිරීම උදෙසා නිදහසට කරුණු සෙවූ අය මෙම විග්‍රහයට තම කන් විවෘත නොකළෝය. "පැමිණීමේ දවස හෝ පැය හෝ කිසිම මනුෂ්‍යයෙකු දන්නේ නැත"යි යන ප්‍රකාශනය තවදුරටත් සරදම් කරුවන්ගේ මුවින් දිගටම ගිලිහෙන්නට විය. ක්‍රිස්තුස්වහන්සේගේ දේව දාසයන් යයි කියාගන්නාවූ අය පවා, දේශනා කුඩුවේ සිට ගැරහුම්කරුවන්ට සම්බන්ධ වූහ. මිනිසුන්ගේ හදවත් නව පිබිදීමකට පත් වී ඔව්හු ගැළවීමේ මාර්ගය සොයන්නට පටන් ගත්හ. ඒ අතර ආගමික ගුරුවරු ඔවුන් හා සත්‍යතාව අතරට පැමිණ දෙවියන්වහන්සේගේ වචනයට අසත්‍ය වූ විවරන සපයා දෙමින් බැතිමතුන්ගේ බිය සමනය කිරීමට වෑයම් කළෝය. තම දරුණු මුළාකාරයාගේ ක්‍රියාදාමය සහ අත්වැල් බැඳගත් අවිශ්වාසී මුරකරුවෝ සාමය, සාමය යයි හඬ නැඟුවෝය. එහෙත් ක්‍රිස්තුස්වහන්සේ සාමයක් ගැන පවසා තිබුණේ නැත. ක්‍රිස්තුස්වහන්සේගේ දවස්වල සිටි ඵරිසිවරුන් මෙන් මොවුහු සගයේ රාජ්‍යයට ඇතුළු වීම ප්‍රතික්ෂේප කළා පමණක් නොව, ඇතුළු වන්නාවූ අයටද බාධා කළෝය. මෙසේ ස්වර්ග රාජ්‍යය අත්පත් කරගැනීමට නොහැකිවූ අයගේ ලේ වල පළිය බාධා කරන්නවුන්ට ගෙවීමට සිදුවෙනවා ඒකාන්තය.



වෙනත් අයට වඩා ප්‍රථමයෙන් පණිවිඩය පිළිගත් අය වූයේ සභාවන්හි සිටි කැපවීමකින් යුක්තව ඉතා නිහතමානී බැතිමතුන්ය. ස්වෝත්සාහයෙන් ශුද්ධ බයිබලය හැදෑරූ අයට ප්‍රත්‍යක්ෂ වූයේ දිවැසි ප්‍රකාශන පිළිබඳව පවසන ලද ජනප්‍රිය විග්‍රහයන් ශුද්ධ ලියවිල්ලට කෙතරම් පටහැනිද යන්නය. පූජක පක්ෂයේ දේව සේවකයන්ගේ බලපෑම මගින් පාලනය නොවූ අය පුද්ගලිකවම දේව වචනය විමර්ශනය කළ විට ඔවුන්ට ප්‍රත්‍යක්ෂව වැටහී ගියේ දෙවන ඊමේ පණිවිඩයෙහි දිව්‍යමය බල අධිකාරිත්වය ස්ථාපිත කරගැනීමට නම් කළ යුතුව ඇත්තේ ශුද්ධ ලියවිලි සමග එම පණිවිඩය සංසන්දනය කිරීම පමණක්ය යන්නය.

සත්‍යය පිළිනොගත් සහෝදරයන්ගේ තාඩන පීඩනවලට බොහෝ අය ගොදුරු වූහ. තමන්ට සභාවේ හිමි ස්ථානය රැකගැනීම සඳහා සමහරෙක් තමන්ගේ බලාපොරොත්තුව ගැන නිශ්චල වීමට තෝරාගත්හ. ඒ අතර තවත් සමහරෙක්, කල්පනා කළේ දෙවියන්වහන්සේ තමන්ගේ විශ්වාසයට භාර කළ සත්‍යතාවන් සඟවා තබාගැනීමට තමන්ගේ පක්ෂපාතීත්වය ඉඩ නොදෙන බවය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම කෙරෙහි විශ්වාස කළ නිසාම සභා සහභාගිකමින් නෙරපා හරිනු ලැබූ අයගේ සංඛ්‍යාව සුළුපටු නොවීය. ස්වකීය ඇදහිල්ල නිසාම මෙවන් විනිශ්චයකට මුහුණ දුන් අයට යෙසායා දිවැසිවරයාගේ මේ වදන් මහත් දිරියක් විය, "මාගේ නාමය නිසා නුඹලාට වෛර වී නුඹලා පන්වා දමුවාවූ නුඹලාගේ සහෝදරයෝ: ස්වාමින්වහන්සේ ගෞරව ලබාගන්නා සේක්වා. එවිට නුඹලාගේ ප්‍රීතිය අපට දකින්ට ලැබේ යයි කියති; නුමුත් ඔවුන්ම ලජ්ජාවට පැමිණෙනවා ඇත" (යෙසායා 66:5).

අනතුරු ඇඟවීමේ හඬ මගින් ඉටු වූ සේවාවෙහි ප්‍රතිඵල දෙස දෙවියන්වහන්සේගේ දූතයෝ මහත් උනන්දුවෙන් යුතුව බලා සිටියෝය. සමහර සභාවන් විසින් දෙවෙනි ඊමේ පණිවිඩය පොදුවේ ප්‍රතික්ෂේප කළ විට දුකට පත් දේව දූතයෝ කණගාටුවෙන් ඉවතට හැරුණෝය. එහෙත් දෙවන පැමිණීමේ පණිවිඩය පිළිබඳව පරීක්ෂණයට මුහුණ නුදුන් බොහෝ අයද සිටියෝය. දෙවන ඊම පිළිබඳව උගන්වන්නාවූ අයගේ දුර්මතයන්ට ඇහුම්කන් දීම පවා පාපය කැයි කියා විශ්වාස කිරීමට බොහෝ දෙනෙකුව සැමියන්, බිරිඳන්, දෙමාපියන් සහ දරුවන් විසින්ද නොමඟ යවනු ලැබීය. මෙම අයව මනාව නිරීක්ෂණය කරන්නැයි දේව දූතයන්ට අණ කරන ලදී. මක්නිසාදයත්, දෙවියන්-වහන්සේගේ සිහසුන වෙතින් තවත් ආලෝකයක් ඔවුන් කෙරෙහි බැබළෙන්නට නියමිතව තිබුණේය.

පණිවිඩය ලැබූ අය කිව නොහැකි ආශාවකින් යුතුව ගැළවුම්-කාරයාණන්ගේ පැමිණීමේ සිද්ධිය බලා සිටියෝය. උන්වහන්සේව සම්මුඛ වීමේ දවස අත ළහටම පැමිණ තිබුණේය. ඔව්හු ඉතා සන්සුන් ගාම්භීරත්වයෙන් යුතුව මෙම පැය වෙත ළහා වූවෝය. ඔවුහු දෙවියන්වහන්සේ සමග සුමිහිරි සන්නිවේදනයක් තුළ විවේකීව සිටියෝය. දීප්තිමත් අනාගතයක් භුක්ති විඳින්නට වරම් ලැබේවා යයි ඔවුහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියෝය. මෙම බලාපොරොත්තුව අත් දුටු කවරෙකුට හෝ එම අපේක්ෂිත පැය හා සම්බන්ධ අත්දැකීම අමතක වන්නේ නැත. මෙම නිශ්චිත දවස උදාවීමට සති කිහිපයකට පෙර සිට සමහරෙක් තම ව්‍යාපාර කටයුතු නවතා දැමුවෝය. තම මරණ මංචකය ළහා වී ඇතැයි සිතන්නාවූ ආකාරයක් හා සමානව අවංක බැතිමත්හු තමන්ගේ හදවත්හි චිත්තාවේග හා සිතුවිලි ප්‍රවේශමෙන් පිරික්සා බැලුවෝය. ඔසවා ගැනීමේ අවස්ථාවට සහභාගී වීම සඳහා විශේෂ ලෝගු සාදා ගැනීමක් සිදුනොවීය. එහෙත් ක්‍රිස්තු සමිඳාණන් හමුවීමට තමන් සූදානම් යයි අභ්‍යන්තර සාක්ෂි දැරීම තමාගේ අවශ්‍යතාවය බව සියල්ලන්ට හැඟී ගියේය. එම පරිශුද්ධතාවය වූ ආත්මයේ පවිත්‍රතාවය ඔවුන්ගේ සුදු වස්ත්‍රය විය යුතු බව එනම් ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ රුධිරය කරණකොටගෙන පවිත්‍ර කරනු ලැබූ චරිතයන් විය යුතු බව ඔව්හු ඒත්තු ගත්හ. දෙවියන්-වහන්සේගේ සෙනහ යයි කියන්නාවූ අය අතර අදත් එවන් හදවත් සෝදිසිකර බැලීමේ ආත්මයක් පවතිනවා නම් කොපමණ හොඳද. ස්වාමින්වහන්සේ ඉදිරියෙහි නිහතමානීව හිඳිමින් ඔවුහු දහමට ලැදිව කටයුතු කළෝ නම්, කරුණාසනය වෙත තම ඉල්ලීම් අඛණ්ඩව ඉදිරිපත් කළෝ නම්, ඔවුන් දැනට භුක්ති විඳින්නාවූ අත්දැකීමට වඩා බොහෝසේ සශ්‍රීක වූ සමෘද්ධිමත් වූ ජීවිතයක් ඔවුන්ට ලැබෙන්ට තිබුණ බව ස්ථිරය. අපගේ ගැළවුම්කාරයාණන් විසින් නොමඳව සපයා දී ඇති කරුණා-අනුග්‍රහය භුක්ති විඳීම බොහෝ අයට අහිමි වී ඇත්තේ ඔවුන් ඉතා මඳ වශයෙන් යාච්ඤා කරන නිසාය, පාපය ගැනවූ සත්‍ය අවබෝධය ඉතා මඳ නිසාය, ඔවුන් සතුව ජීවමාන ඇදහිල්ලක් නැති නිසාය.

තමන් සෙනහ පිරික්සා බැලීමට දෙවියන්වහන්සේ වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කළසේක. දිවැසි කාලවකවානු ගණන් බැලීමේදී සිදුවූ වැරැද්දක් උන්වහන්සේ තම ශ්‍රී හස්තයෙන් ආවරණය කළසේක. දෙවන පැමිණීම අපේක්ෂාවෙන් පූර්ණව බලාපොරොත්තු වූ බැතිමතුන්ටද කාලවකවානු නිර්ණය කිරීමේදී ඇතිවූ දෝෂය ඔවුන්ගේ විරුද්ධවාදීන්ටද හසු නොවීය. විරුද්ධවාදීහු මේ පිළිබඳව මෙසේ පැවසූහ. "අනාවැකි කාලය පිළිබඳව ඔබගේ ගණනය කිරීම් නිවැරැදිය. යම්කිසි වැදගත් සිද්ධියක් ඉටුවීම අනිවාර්ය වන්නේය. නමුත් එම සිද්ධිය මිලර්



මහතා ප්‍රකාශ කළ පරිදි ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊම නොවන්නේය. එම සිද්ධිය නම් ලෝකයා ක්‍රිස්තුස්වහන්සේව පිළිගැනීම වන්නේය."

තමන්වහන්සේගේ සෙනහ ගළවා ගැනීම පිණිස ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙතැයි අපේක්ෂා කළ දවස පැමිණියේය. එහෙත් එදින උන්වහන්සේ පැමිණියේ නැත. තම ගැළවුම්කාරයාණන් දැකගැනීමට අවංක විශ්වාසයකින් හා ආදර භක්තියකින්ද බලාපොරොත්තුවකින්ද සිටි අය මහත් විශ්වාස භංගත්වයකට පත් වූහ, කලකිරීමකට භාජනය වූහ. කෙසේ වුවද, දෙවියන්වහන්සේගේ අරමුණ ඉටුවෙමින් තිබුණේය. උන්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිනවා යයි කියා සිටි අයගේ හදවත්හි අවංක භාවය උරගා බැලීම සඳහා දෙවියන්වහන්සේ විසින් එම ජනතාව පිරික්සීමට යොමු වූසේක. බලා සිටියවුන් අතර බොහෝ දෙනෙක් එසේ කළේ උදාර පරමාර්ථයකින් නොව භීතිය නිසාය. ඔවුන්ගේ ඇදහිලි ප්‍රකාශය මගින් ඔවුන්ගේ හදවත් හෝ ජීවිත හෝ වෙනස් වීමකට යොමු වී තිබුණේ නැත. බලාපොරොත්තුවූ සංසිද්ධිය යථාර්ථයක් බවට පත් නොවීම නිසා තමා කලකිරීමකට පත් නොවූ බව ඔවුහු ප්‍රකාශ කළෝය. ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණේ යැයි ඔවුහු කිසි දවසක හෝ විශ්වාස කර තිබුණේ නැත. සත්‍යවාදී ඇදහිලිවතුන්ව උපහාසයට හා අවමානයට ලක් කිරීමට ඔවුහු පෙරමහ ගත්තෝය.

එහෙත් විශ්වාස භංගත්වයට පත්ව සිටි, පිරික්සුමට ලක් කරනු ලැබූ ඇදහිලිවතුන් දෙස යේසුස්වහන්සේ සමග සකල සග සේනාවද ආදරයෙන් සහ අනුකම්පාවෙන් යුතුව බලා සිටියෝය. දෘෂ්‍යමාන ලෝකය හා අදෘෂ්‍යමාන ලෝකය අතර පවත්නා කඩතුරාව පසෙකට තල්ලු කරදැමීමට හැකියාවක් වී නම්, අවංකව ස්ථිරව නැගී සිටි ආත්ම වෙතට දේව දූතයන් සමීප වන්නාවූ ආකාරයත් සාතන්ගේ දණ්ඩ ප්‍රහාරයෙන් ඔවුන්ට රැකවරණය සාදා දෙන්නාවූ විලාශයත් දැකගැනීමට පුළුවන්කම තිබුණි.

# 21

# අනතුරු ඇඟවීමක් ප්‍රතික්ෂේප කෙරේ

දෙවන ඊම පිළිබඳ දහම දේශනා කිරීමේදී විලියම් මිලර් සහ ඔහුගේ සහායක සේවකයන් ක්‍රියා කළේ විනිශ්චය සඳහා මිනිසුන් සූදානම් කිරීමේ ඒකායන අරමුණකින් යුතුවය. සභාවෙහි සත්‍යවූ බලාපොරොත්තුවත්, ඒ සඳහා ගැඹුරු ක්‍රිස්තියානි අත්දැකීමක අවශ්‍යතාවත් උදෙසා ආගම අදහනවා යයි කියූ ජනතාවක් පුබුදුවා ලීමට දේව සේවකයෝ වෑයම් කළෝය. සභාව තුළ හැරීමකට භාජන නොවූ අයව කඩිනම් පසුතැවීමකට පොළඹවා දෙවියන්වහන්සේ වෙතට ඔවුන්ව යොමු කරන්ට ක්‍රියා කිරීමට දේව සේවකයෝ උනන්දුවක් දැක්වූහ. යම්කිසි ආගමික නිකායකට හෝ කණ්ඩායමකට හෝ ඔවුන්ව හැරවීම ඔවුන්ගේ උත්සාහය නොවීය. එහෙයින් ඔව්හු සෑම ආකාර ලබ්ධීන්ට සහ නිකායන්වලට අයත් වූවන් අතර සේවය කළෝය. සේවය ලැබූ අයගේ සංවිධානයනට හෝ ශික්ෂණයනට කිසිම ආකාරයකින් මැදිහත් වීමට ඔවුන් තුළ ආශාවක් නොවීය."

විලියම් මිලර්ගේ හදබැදි චින්තනය මෙසේ ප්‍රකාශ කෙරේ. "පවතින්නාවූ සභාවන්ගෙන් බාහිරව වෙනත් සංවිධානයක් නිර්මාණය කිරීම හෝ එක සංවිධානයකට හානි සිදු කරමින් වෙනත් සංවිධානයකට ප්‍රයෝජනවත් වන අයුරින් ක්‍රියාකිරීම කිසිවිටෙක මාගේ ආශාව නොවීය. සියල්ලන්ට ආශිර්වාදයක් වීම මාගේ අදහස විය. ක්‍රිස්තුස්-වහන්සේගේ පැමිණීම ගැන දනගැන්ම සෑම අයෙකුගේම ඉමහත් සතුටට හේතු වේ යයි මම කල්පනා කළෙමි. මාගේ චින්තනයට අනුකූලව යථාර්ථය දකීමට නොහැකිවූ අය, දහම වැළඳ ගන්නාවූ අයට අඩුවෙන් ආදරය කිරීමට යෙදෙනවා ඇතැයි මම කල්පනා නොකෙළෙමි. එහෙයින්  එක් එක් කොටසට වෙනම රැස්වීම් තැබීම අවශ්‍ය වන බවක් මට පෙනුණේ නැත. මාගේ පරමාර්ථය වූයේ ආත්ම දෙවියන්වහන්සේ වෙතට හැරවීමය, පැමිණෙන්නාවූ විනිශ්චයන් ගැන ලෝකයට දනුම් දීමය. තවද මාගේ සහෝදර ජනතාවට සමාදානයෙන් යුතුව දෙවියන්වහන්සේව හමුවීම සඳහා හදවත් සූදානම් කරගැනීමට උදව් වීම මාගේ ආශාව විය. මාගේ සේවය කිරීම යටතේ සංවර්ධනය වූ බොහෝ අය පවතින්නාවූ සභාවන් හා එක්වූහ." (Bliss, Meirs of Wm, Miller" p. 328).

ඔහුගේ වෑයම නිසා සභාවන්හි සාමාජිකත්වය වර්ධනය වන්නට විය. කලක් එයට ශුභවාදී ප්‍රතිචාරයක් ලැබුණි. එහෙත් දේවගැතිවරුන් සහ ආගමික නායකයන් දෙවන පැමිණීමේ දහමට එරෙහිව තීරණයක් ගැනීම නිසාද එම විෂය පිළිබඳව සියළු ආකාර පිබිදීම් යටපත් කර



දැමීමට කැමති වූ නිසාද දෙවන ඊම උගන්වන්නාවූ රැස්වීම්වලට සහභාගි වීමට සාමාජිකයන්ට තහංචි පැනවිණි. දේවස්ථානයේ කිසිම රැස්වීමකදී හෝ තමන්ගේ බලාපොරොත්තුව පිළිබඳව කථා කිරීම පවා ඔවුන්ට තහනම් විය. එහෙයින් බැතිමතුන්ට ව්‍යාකූළ ගැටළුවලට මුහුණ දීමට සිදුවිය. ඔවුහු තම සභාවන්ට ආදරය කළෝය; ඒවායින් ඉවත් වීමටද කැමති නොවූවෝය. එහෙත් දේව වචනයෙහි සාක්ෂිය යටපත් කර දමනු ලැබ දිවැසි වැකි සෝදිසි කර බැලීමේ අයිතිය ඔවුන්ට තහනම් වූ විට සභාවේ ඉල්ලීම්වලට අවනත වීම දෙවියන්-වහන්සේට වූ පක්ෂපාතිකම ප්‍රතික්ෂේප කිරීමක් බව ඔවුන්ට හැඟී ගියේය. දේව වචනයේ සාක්ෂි මැඩ පැවැත්වීමට ක්‍රියා කරන්නාවූ අය ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ සාමාජිකත්වය දැරීමට සුදුසු අය නොවන බව ඔවුන්ගේ කල්පිතය විය. ක්‍රිස්තුස්වහන්සේගේ සභාව වනාහි "සත්‍යතාවේ අත්තිවාරම සහ කුළුණ" විය. එහෙයින් සභාවන් සමග තමාට තිබුණාවූ සම්බන්ධකම් අත්හැර දැමීම යුක්ති සහගත යයි ඔව්හු කල්පනා කළහ. 1844 ගිම්හාන කාලයේදී සාමාජිකයන් පනස් දහසක් පමණ තමන් සිටි සභාවන්ගෙන් ඉවත් වූහ.

මෙම වකවානුවේදී අමෙරිකා එක්සත් ජනපදයේ තිබූ කිතුණු සභාවන්හි කැපී පෙනෙන වෙනසක් දැකගත හැකි විය. බැතිමතුන් ලෞකික ක්‍රියාවේදයන්ට අනුකූලතාව දක්වමින් ආත්මික ජීවිතයෙන් අඩු බවට පත්වීමක් පැවතුණි. මේ තත්ත්වය වසර ගණනාවක් පුරා සිදුවෙමින් පැවතියේය. ඒ අතර වසර 1844 දී කැපී පෙනෙන්නාවූ පරිහානියක් සහ පසුබෑමක් සෑම සභාවක් තුළම විද්‍යාමාන විය. මෙයට හේතුව කුමක් දැයි පැවසීමට කිසිවෙක් හෝ සමත් නොවීය. නුමුත් මේ තත්ත්වය පිළිබඳව පුවත්පතින් සහ දේශනා කූඩුවෙන් ප්‍රමාණවත් ලෙස පැහැදිලි කිරීම් වලින් නම් අඩුවක් නොවීය.

පිලඩෙල්පියාවෙහි පැවැති පාලක සභා වැඩිමහල්ලන්ගේ රැස්-වීමකදී එකල බහුලව පරිහරණය කරනු ලැබූ බයිබල් අටුවාවක කතුවරයාද එම නගරයෙහි ප්‍රමුඛ ස්ථානයක් දරූ දේවස්ථානයක දේවගැතිවරයාද වූ බාර්න්ස් මහතා මෙවන් ප්‍රකාශනයක් කළේය. තමා වසර විස්සක් දේවගැතිවරයෙකු ලෙස සේවය කර ඇති බවත් සත්කර්ම මෙහෙය පවත්වනු ලැබූ සෑම අවස්ථාවකදීම අළුත් සාමාජිකයන් සභාවට බඳවා ගනු ලැබූ බවත් ඔහු පැවසීය. එහෙත් පසුගිය වතාවේදී කිසිම අළුත් සාමාජිකයෙකු බඳවා ගැනීමක් සිදු නොවීය. එය ඔහුගේ විමතියට හේතු විය. ඒ දවස්වලදී කිසිම ආකාරයක ආත්ම පිබිදීම්ද වාර්තා නොවීය. මිනිසුන් ආගමට හැරීමක් සිදු නොවීය. බැතිමතුන් තුළ කරුණා-අනුග්‍රහයේ වර්ධනය වීමක් පෙනෙන්නට නොවීය. තමන්ගේ ගැළවීම උදෙසා කරුණු දනගැනීමට කිසිවෙක් හෝ ඔහුගේ බයිබල් පංතිවලට පැමිණියේ නැත. ලෞකික ව්‍යාපාරයන්හි දියුණුවක් සිදු විය, වෙළහෙළදාම් සහ නිෂ්පාදන

ක්‍රියාවලිය ප්‍රගතියක් පෙන්නුම් කළේය. අනාගතය දීප්තිමත් යයි සියල්ලක්ම හඬ ගා පැවසීය. ලෞකික දේවල් පිළිබඳ ආශාවෙහි මානසිකත්වය ඉතා ඉහළ මට්ටමක පැවතියේය. සෑම නිකායකම තත්ත්වය මේ ආකාරම විය." (Congregational Journal, May 23, 1844).

එම වසරේම පෙබරවාරි මාසයේදී ඔබර්ලින් විද්‍යාලයේ සිටි ෆිනී නමැති මහාචාර්යවරයා මෙසේ පැවසීය. "මෙම යුගයේ සියළු ආකාර සදාචාර ප්‍රතිසංස්කරණයන්ට අපගේ රටේ ප්‍රොතැස්තන්ත සභාවන් දක්වන්නේ උදාසීනවූ ද, විරෝධීවූ ද ආකල්පයක් බව අපට පෙනෙයි. වෙනස්වූ ආකල්ප දරන්නාවූ ස්වල්ප කොටසක් නැත්තේද නොවේ. පොදුවේ පවතින තත්ත්වය මේ යයි පවසා සිටීමට මේ ස්වල්ප කොටස ප්‍රමාණවත් නොවේ. තවත් තහවුරු කළ යුතු කරුණක්ද ඇත. කිසිම සභාවක ආත්මික පිබිදීමකට බලපෑමක් නැති බව තර්ක විරහිතව පැවසිය හැකිය. ආත්මික උදාසීනතාවය සෑම තැනකම පවතී. එය ඉතා භයානක ගැඹුරුකමක් පෙන්නුම් කරයි. ආගමික මුද්‍රිත මාධ්‍යය මේ ගැන සාක්ෂි දරයි. සභා සාමාජිකයෝ විලාසිතා ලෝකයේ ප්‍රබල අනුගාමිකයන් බවට පත්වෙමින් සිටිති. ඔවුහු අන්‍ය ආගමිකයන් සමග අත්වැල් බැඳගෙන සැප සෙල්ලම්හි යෙදෙමින් ප්‍රිය සම්භාෂණයන්ටද බාල් නැටුම්වලටද මංගල්‍ය උත්සවයන්ටද සහභාගි වෙති. මෙම වේදනාකාරී විෂය පිළිබඳව දිගින් දිගට කථාකිරීම තවත් යෝග්‍ය නොවේ. ලැබෙන්නාවූ සාක්ෂි පවසන්නේ සෑම සභාවක්ම පාහේ දුක්මුසු ලෙස පිරිහෙමින් පවතින බවය. ඔවුහු ස්වාමින්-වහන්සේගෙන් බොහෝ ඈතට ගොස් සිටිති. උන්වහන්සේද ඔවුන්ගෙන් ඉවත්ව සිටින සේක."

ආගමික දුරදක්නය නමැති සඟරාවේ ලේඛකයෙක් මෙසේ සාක්ෂි දරා ඇත. "වර්තමාන කාලයේදී පවතින අන්දමේ ආගමික පසුබෑමක් ගැන අපට මීට පෙර අසන්නට පවා ලැබුණේ නැත. ඇත්ත වශයෙන්ම සභා තොමෝ අවදි වී මෙම විපත්තියට හේතු කාරණා මොනවා දැයි සොයා බැලිය යුතුය. සියොන්ට ආදරය කරන්නාවූ සෑම අයෙක්ම මේ ගැන විමසිලිමත් වීම වැදගත්ය. සත්‍යවාදීව සභාව වෙත හැරෙන්නාවූ අයගේ සංඛ්‍යාව ඉතා සුළු ප්‍රමාණයක් බවත් එය සිදුවන්නේ විශාල කාල පරාසයක් තුළ බවත් අපගේ චින්තනයට ඇතුළු වේ. එයට සමගාමීව පව්කරුවන්ගේ නොහික්මුණු ජීවිත රටාවත් ඔවුන්ගේ දඩබ්බරතාවත් දකින විට අපගේ මුවින් ඉබේටම පිටවන්නාවූ වචන නම් 'කරුණා-අනුග්‍රහය දක්වීමට දෙවියන්වහන්සේට අමතකව ගොස් තිබේද? උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාවේ දොරටුව වැසී ගොස් තිබේද?' යන්නය. (Congregational Journal, May, 23, 1844).

එවන් තත්ත්වයක් සභාව තුළ නිර්මාණය වීමට සභාව තුළම හේතුවක් තිබීම අනිවාර්යය. ජාතීන්, සභාවන් හෝ පුද්ගලයන් මත



ආත්මික අඳුර පතිත වීමට හේතුව දෙවියන්වහන්සේගේ පාර්ශ්වයෙන් දිව්‍ය කරුණා-අනුග්‍රහය ඉවත් කරගැනීම නොව, මිනිසාට දානය කළ දිව්‍ය ආලෝකය ඔහු විසින් එපාකිරීම හෝ නොසලකා හැරීම නිසා උද්ගත වන ප්‍රතිඵලයයි. ක්‍රිස්තුස්වහන්සේ මෙලොව දිවි ගෙවූ සමයෙහි යුදෙව් ජනතාවගේ ඉරණමට හේතු කාරකවූ සිද්ධීන් මගින් මෙම කාරණාව ඉතිහාසයෙන් දර්ශනය කළ හැකිය. ලෝකය අනුගමනය කිරීමත් දෙවියන්වහන්සේව සහ උන්වහන්සේගේ ශ්‍රී වචනය අමතක කරදමීමත් නිසා ඔවුන්ගේ විචක්ෂණ ශක්තිය හීන වී තිබුණි. ඔවුන්ගේ අවබෝධ කරගැනීමේ හැකියාවද අඳුරු විය. ඔවුන්ගේ හදවත් ලෞකිකත්වයට බරවී කාමුක ආශාවන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබුණේය. මෙසේ ඔවුහු මෙසියස්වහන්සේගේ පැමිණීම පිළිබඳව දැනුමක් නැතිව සිටියෝය. අභිමානයෙන් උදම්ව අවිශ්වාසයට යොමුව සිටි ඔවුහු ගැළවුම්කාරයාණන් මෙලොව වැඩි අවස්ථාවේදී උන්වහන්සේව ප්‍රතික්ෂේප කළෝය. ඒ අවස්ථාවේදී වුවද, දෙවියන්වහන්සේ යුදෙව් ජාතිය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොකළ සේක. ගැළවීමෙහි ආශිර්වාද පිළිබඳව දැනුම ලබාගැනීමටත්, ආශිර්වාද ලබාගැනීමටත් වූ මාර්ගය එම ජාතියට තවදුරටත් විවෘතකර තැබීමට උන්වහන්සේ පසුබට නොවූ සේක. එහෙත් සත්‍යතාව එපා කළ පුද්ගලයන්ට සගයේ තිළිණය ගැන තිබූ සෑම ආශාවක්ම නැතිවී ගියේය. ඔවුහු "එළිය වෙනුවට අඳුරත්, අඳුර වෙනුවට එළියත්" පිළිගෙන තිබුණි. අන්තිමේදී ඔවුන් තුළ තිබූ එළිය අඳුර බවට පත් විය. ඒ අඳුර කෙතරම් භයානකද!

මනුෂ්‍යයන් ආගමික චාරිත්‍ර වාරිත්‍ර සහ සම්ප්‍රදායන් නාමික ලෙස පවත්වන අතර ඔවුන් තුළ ජීවමාන, භක්තිමත්, ධාර්මික ජීවිත රටාවක ආත්මයක් නැති වීම සාතන්ගේ ක්‍රමවේදයට සමීපය. යුදෙව්වෝ ශුභාරංචිය ප්‍රතික්ෂේප කිරීමෙන් පසුවද තමන්ගේ පුරාණ ආගමික වත්පිළිවෙත් මහත් ජ්වලිතයකින් පවත්වා ගෙන ගිය නමුත්, අනෙකුත් අයගෙන් වෙන්වූ ජාතික අනන්‍යතාවත් රැකගත් නමුත්, දෙවියන්-වහන්සේගේ අභිමුඛය තවදුරටත් තමන් සමග පවතින්නේ නැති බව ඔවුහු දන සිටියෝය. කිසිම අවිනිශ්චිත තාවයකින් තොරව, මෙසියස්වහන්සේගේ පැමිණීමේ දවස දානියෙල් දිවැසිවරයා විසින් පවසා තිබුණේය. උන්වහන්සේගේ මරණය ගැනද සෘජුව ප්‍රකාශ කර තිබුණේය. ඒ පිළිබඳව ඉගෙන ගැනීමට යුදෙව්වන්ට කිසිම දිරිගැන්වීමක් විවෘත වී නොතිබිණ. යේසුස්වහන්සේගේ ජීවිතය හා සම්බන්ධවූ සිද්ධීන් අළලා, දින වකවානුවක් ගණන් බැලීමට යමෙක් වෑයම් කළහොත් ඔවුන් මත ශාපයක් ප්‍රකාශ කිරීමට යුදෙව් පූජකයෝ තීරණයක පිහිටා සිටියෝය. ශුභාරංචි ආශිර්වාද සමග ගැළවීමේ කරුණාබර දීමනාව ගැන වසර එක් දහස් අටසියයක් පුරා යුදෙව්වරු කිසි තැකීමක් නොකළහ. අන්ධකාරයෙහි ජීවත් වෙමින් පසුතැවිලි වීමෙහි ඡායා මාත්‍රයකුදු නැතිව ඊශ්‍රායෙල් ජනතාව ශුභාරංචියෙහි

ආශිර්වාද ගැන කිසිම හැඟීමක් නොවූ ජීවමාන රිද්මයක් අනුකරණය කරමින් කල් ගෙවූ නිසා ඔවුන්ට අත්වූ ශෝචනීය ඉරණම වත්මන් බැතිමතුන්ටද අනතුරු අඟවයි.

සත්‍යතාව ප්‍රතික්ෂේප කිරීමක් යම් තැනෙක සිදුවේද එහි ප්‍රතිඵලද එයාකාරම වන්නේය. තමන්ගේ සිතැඟියාවන් සපුරා ගැනීමට වෑයම් කිරීමේදී සිය හෘදය සාක්ෂිය එයට විරුද්ධව හඬක් නගන විට සමහරෙක් එම හඬ උවමනාවෙන්ම මැඩ පවත්වා කටයුතු කරති. එවන් පුද්ගලයෙකුට නම් කාලයාගේ ඇවෑමෙන් සත්‍යතාව සහ වරද අතර වෙනස තෝරා බේරා ගැනීමක් කිරීමට ඇති හැකියාව නැතිව යන්නේය. එවන් අයෙකුගේ වටහා ගැනීම අඳුරු වන්නේය, හෘදය සාක්ෂිය අනුකම්පා රහිත වන්නේය, හදවත දැඩි වන්නේය, අන්තිමේදී ආත්මය දෙවියන්වහන්සේගෙන් වෙන් කරනු ලබන්නේය. දිව්‍ය සත්‍යතාවේ පණිවිඩය සුළු ලෙස ප්‍රතික්ෂේප කෙරේ නම් සභාව අන්ධකාරයෙන් වසාගනු ලබනවා ඇත, ඇදහිල්ල සහ ප්‍රේමය ශීතලව යනවා ඇත. සභා සාමාජිකයෝ තම අවධානය සහ ශක්තිය ලෞකික ව්‍යාපාර සහ විනෝදාස්වාදයන් දෙසට යොමු කෙරෙති. ඒ අතර පව්කාරයෝ පසුතැවිලි වීම නොසලකා හැර පාපයෙහිම ගිලී විනාශය කරා යොමු වෙති.

එළිදරව් 14 හි පළමු දේව දූතයාගේ පණිවිඩය දෙවියන්වහන්සේගේ විනිශ්චයේ පැය පිළිබඳව නිවේදනයක් නිකුත් කරයි. උන්වහන්සේට භය වී නමස්කාර කරන්නැයි එම නිවේදනය ඉල්ලා සිටී. එම පණිවිඩයෙහි අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ ලෝකයේ දූෂණයන්ගෙන් ඉවත් කරගැනීමය, ඔවුන් තුළ පවත්නා ලෞකිකත්වයේ බලපෑමෙන් ඉවත්ව ක්‍රියා කිරීමේ සත්‍යවාදී යථාර්ථය පෙන්නුම් කරදීමය. මෙම පණිවිඩය මගින් දෙවියන්වහන්සේ සභාවට අවවාදාත්මක අනතුරු ඇඟවීමක් නිවේදනය කළසේක. එම පණිවිඩය සභාව විසින් පිළිගන්නා ලද්දේ නම්, දෙවියන්වහන්සේගෙන් ඈයව වෙන් කරනු ලැබූ දුෂ්ටවූ ද, අයහපත්වූ ද තත්ත්වයෙන් ඈයව මුදවා ශුභ ඵලදායී තත්ත්වයකට ඈයව ගෙන එනු ලබනවා ඇත. සභා සාමාජිකයෝ සගයෙන් එවනු ලැබූ පණිවිඩය පිළිගත්තෝ නම්, දෙවියන්වහන්සේ ඉදිරියෙහි තම හදවත් යටහත් පහත් තත්ත්වයකට පත් කරගනිමින් උන්වහන්සේගේ අභිමුඛය ඉදිරියෙහි පෙනී සිටීම සඳහා අවංකවූ සූදානම් වීමක් කළෝ නම්, ඔවුන් අතරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහ දෙවියන්වහන්සේගේ බලයද දැක ගැනීමට හැකිවනවා ඇත. එසේ වූයේ නම්, අපෝස්තුළුවරයන්ගේ දවස්වලදී සභාව තිබූ තත්ත්වයට, පණිවිඩය ලැබූ සභාවද පත්වනවා ඇත. එම ආශිර්වාදලත් තත්ත්වය යටතේ එක්සත්කම, ඇදහිල්ල සහ ප්‍රේමය රජ කරනවා ඇත. එකල සභාවෙහි සිටි, "අදහාගත් සමූහයා



එක සිතකින් හා එක ආත්මයකින් යුක්ත වූහ." දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය." "ස්වාමින්වහන්සේ වනාහි ගැළවෙන්නාවූ අය දවස්පතා ඔවුන්ට එක් කළසේක." (ක්‍රියා 4:32,31; 2:47).

දෙවියන්වහන්සේගේ වචනය තුළින් විකාශනය වන්නාවූ ආලෝකය දෙවියන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ ජනතාව පිළිගනිත් නම්, ක්‍රිස්තුස් වහන්සේගේ යාච්ඤාව තුළින් ඉල්ලා සිටි එක්සත්කම සභාව විසින් භුක්ති විඳිනවා නියතය. අපෝස්තුළුවරයා එම බැඳීම විස්තර කරන්නේ "සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම" පවත්වාගැනීම හැටියටය. ඔහු තවදුරටත් මෙසේ පවසයි: "ඇත්තේ එක ශරීරයත් එක ආත්මයාණන්වහන්සේත් එක ස්වාමින්වහන්සේත් එක ඇදහිල්ලත් එක බව්තීස්මයත් .... සියල්ලන්ට එකම පියවූ දෙවියන්වහන්සේත්ය." (එපීස 4: 3-5).

නැවත පැමිණීමේ පණිවිඩය පිළිගත්තාවූ අයගේ අත්දැකීම වූයේද එවන් ආශිර්වාදලත් ප්‍රතිඵලයන්ය. මොවුහු තමන් සිටි විවිධ නිකායන් අතහැර දමා ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊමට සහභාගි වීමට පැමිණියහ. ඔවුන්ගේ නිකායන් මගින් පනවා තිබූ බාධක ඔවුහු පොළොවට වීසි කළෝය; මත ගැටුම් වලට ලක්වූ ඇදහිලි ප්‍රකාශන ඉවත් කළෝය. මෙලොව පැවතීමට යන්නාවූ සහස්‍ර වර්ෂ කාලය වැනි ශුද්ධ ලියවිලි මත පදනම් නොවූ දහම් ඉගැන්වීම් ඔවුහු අත්හැර දැමුවෝය, ප්‍රතික්ෂේප කළෝය. දෙවන පැමිණීම පිළිබඳව වූ සාවද්‍ය මත ඔවුහු නිවැරැදි කර ගත්තෝය. ලෝකයේ ක්‍රියාදාමයන් සමග අනුගත වීම සහ අහංකාරකම ඔවුහු අත්හැර දැමුවෝය. කළ වැරදි ක්‍රියාවන් නිවැරැදි කර ගනු ලැබීය. ඉතා සුමිහිරි සහභාගිකමකින් ඔවුන්ගේ හදවත් වෙලී තිබුණේය. ප්‍රේමය සහ ප්‍රීතිය ඔවුන්ගේ සිත් තුළ රජ කරන්නට විය. මෙම දහම් පණිවිඩය පිළිගත් ස්වල්ප දෙනාට එවන් අත්දැකීමක් ලබාගන්නට හැකියාවක් ලැබුණේ නම්, එම පණිවිඩය පිළිගත් සියලු දෙනාටමත් එවන් ආසිරි අත්පත් කරගත හැකිවනවා නියතය.

එසේ වුවද, සෑම සභාවක්ම පොදුවේ එම අනතුරු ඇඟවීමේ පණිවිඩය පිළිගත්තේ නැත. 'ඊශ්‍රායෙල්වරුන්ගේ ගෘහයෙහි මුරකරුවන්" ලෙසට' පත්කරනු ලැබ සිටි දේවගැතිවරුන් අනෙකුත් අයට වඩා ඉක්මණින් යේසුස්වහන්සේගේ පැමිණීමෙහි නිමිති තේරුම් ගත යුතුව තිබුණි. ඔවුහු සත්‍යතාව ඉගෙනීමට අසමත් වූහ. තත්ත්වය අවබෝධ කරගැනීම සඳහා ඔවුන්ට දිවැසිවරුන්ගේ සාක්ෂි තිබුණේය, කාලයාගේ ලකුණු තිබුණේය. එහෙත් ඔවුන්ගේ හදවත් පිරී තිබුණේ ලෞකික බලාපොරොත්තු සහ බලය හිමි කරගැනීමේ ආශාවන්ගෙන්ය. එම නිසාම දෙවියන්වහන්සේ කෙරෙහි ආදරයත්, උන්වහන්සේගේ වචනය කෙරෙහි ඇදහිල්ලත් ඔවුන් තුළ සීතලවී තිබුණේය. ඒ අවස්ථාවේදී

ක්‍රිස්තුස්වහන්සේගේ ඉක්මණින් පැමිණීමේ දහම් පණිවිඩය ප්‍රකාශ කරනු ලැබූ විට එයට ඔවුන්ගේ විරුද්ධතාවකුත් එම පණිවිඩය ගැන අවිශ්වාසයකුත් ඇති විය. මෙම දහම් පණිවිඩය විශාල වශයෙන් දේශනා කළේ ගිහි සාමාජිකයෝය. එම නිසාම එයට විරුද්ධ වීමට එම කරුණත් සාධකයක් විය. ආදි කාලවලදී මෙන්ම දෙවියන්-වහන්සේගේ වචනයෙන් සරල සාක්ෂි දරීමක් ඉදිරිපත් වූ විට ඒ සම්බන්ධව මෙවන් ප්‍රශ්නයක්ද විමසනු ලැබීය. "එරිසිවරුන් හෝ කිසියම් නායකයෙක් මෙම ඉගැන්වීම් විශ්වාස කරනවාද?" දිව්‍ය ප්‍රකාශනවල කාලවකවානු සම්බන්ධව ඉදිරිපත් වූ තර්ක බිඳ හෙළීමට බොහෝ ආගමික ගුරුවරුන් අසමත් වූ නිසා තම ලැජ්ජාව වසා ගැනීමට ඔවුහු වෙනත් ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන්නට වූහ. දිවැසි ප්‍රකාශන අධ්‍යයනය අධෛර්යයට පත් කිරීමට ඔවුහු වෑයම් කළෝය. එකී දිවැසි පොත මුද්‍රා කර ඇති බවත්, තේරුම් නොගත යුතු බවත්, ප්‍රචාරය කෙරිණ. තම දේවගැතිවරුන් කෙරෙහි අචල විශ්වාසයක් තැබූ විශාල සමූහයක් අනතුරු ඇඟවීමේ දහම් පණිවිඩයට ඇහුම්කන් දීම පවා ප්‍රතික්ෂේප කළෝය. තවත් අය එම පණිවිඩය සත්‍ය බව දන දනත්, "සිනගෝගයෙන් නෙරපා දමනු ලැබේය" යන බියෙන් තම විශ්වාසයන් ප්‍රකාශ නොකර සිටියෝය. සභාව පිරික්සීමත්, පවිත්‍ර කිරීමත් අරමුණු කරගෙන දෙවියන්වහන්සේ විසින් එවනු ලැබූ මෙම දහම් පණිවිඩය ප්‍රබල මෙහෙයක් ඉටු කළේය. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි නොව ලෝකය කෙරෙහි තම හිතෛෂිතාවය සහ ආදරය රඳවා ඇති බැතිමතුන් සංඛ්‍යාව කෙතරම් වූයේ දැයි ඒ පණිවිඩයට දක්වූ ප්‍රතිචාරයන්ගෙන් දැකගත හැකි විය. ඔවුන් ලෝකයට සම්බන්ධ කළ බැමි ස්වර්ගය වෙතට ඔවුන්ව ඇදගැනීමට යොදා තිබූ පෙළඹීම් වලට වඩා ශක්තිමත් විය, බලසම්පන්න විය. ලෝක ප්‍රඥාවේ වදන්වලට ඇහුම්කන් දීම තෝරාගත් ඔවුහු සත්‍යතාවේ හදවත විමසන්නාවූ පණිවිඩයෙන් ඉවත්ව ගියෝය.

පළමු දේව දූතයාගේ අනතුරු ඇඟවීමේ පණිවිඩය ප්‍රතික්ෂේප කිරීමෙන් එම මනුෂ්‍යයෝ ඔවුන්ව නැවතත් ජීවන මාර්ගයට ගෙන යන පිණිස සගයෙන් එවනු ලැබූ ක්‍රමවේදය නැති කරගත්තෝය; දෙවියන්වහන්සේගෙන් වෙන් කරන්නාවූ සියළු ආකාර නපුරෙහි මාර්ගයන්ගෙන් ඔවුන්ව යහමඟට යොමු කළ හැකිවූ කරුණාබර පණිවිඩය ගෙන ආ තැනැත්තාව එපා කළෝය. එසේ කරමින් ඔවුහු ලෝකයේ මිත්‍රත්වය ලබාගැනීමට මහත් උනන්දුවෙන් ක්‍රියා කරන්නට වූහ. මේ තත්ත්වය නිසා 1844 දී ක්‍රිස්තියානි සභාවන්හි ලෞකිකත්වයක්, දහම් මගින් ඉවත්ව යෑමක්, සහ ආත්මික මරණය නමැති භයානක තත්ත්වයක් පැවතුණි.

එළිදරව් 14 වන පරිච්ඡේදය අනුව පළමු වන දේව දූතයා පසුපස දෙවන දේව දූතයෙක්ද පැමිණියේය. ඔහු ප්‍රකාශයට පත් කළ



පණිවිඩය මෙයයි. "තමාගේ වේශ්‍යාකමේ කෝපය නමැති මුද්‍රිකපානය සියලු ජාතීන්ට පෙව්වාවූ මහත් බබිලෝනිය වැටුණේය, වැටුණේය" යන්නය. (එළිදරව් 14: 8). "බබිලෝනිය" යන වචනය "බාබෙල්" යන වචනයේ නිරුක්තියකි. එහි අර්ථය "ව්‍යවුල" යන්නය. ව්‍යාජ වූද සත්‍යය වූ භක්තියෙන් ඉවත්ව ගියාවූද ආගම් හැඳින්වීම පිණිස ශුද්ධ ලියවිල්ලෙහි බබිලෝනිය යන නාමය යොදා ඇත. එළිදරව් 17 හි බබිලෝනිය නියෝජනය කිරීමට කාන්තාවකගේ ලාංඡනය යොදා ගෙන ඇත. සභාවක් සංකේත කිරීම සඳහා ශුද්ධ බයිබලය යොදා ගෙන ඇත්තේ ස්ත්‍රියකගේ සංකේතයයි. පාරිශුද්ධ සභාව පෙන්නුම් කර ඇත්තේ නිර්මල යුවතියක් ලෙසිනි. ධර්මයට පිටුපා ක්‍රියා කරන්නාවූ සභාව හැඳින්වීමට, පිළිකුල්කමින් යුත් ස්ත්‍රියක් යොදා ගෙන ඇත.

ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර පවතින්නාවූ ශුද්ධවූද, ස්ථිරවූද, චරිත ගුණාංග පෙන්නුම් කිරීමට සරණ මංගල්‍යයක ඇත්තාවූ එක්සත්කම භාවිතයට ගෙන ඇත. දෙවි සමිඳාණන් තමන්වහන්සේගේ ජනතාව තමාටම අමරණීය ගිවිසුමක් මගින් සම්බන්ධ කරගන්නා සේක. උන්වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන බවට ප්‍රතිඥා දී තිබේ. උන්වහන්සේගේ සෙනඟද තමා අයිති වන්නේ එම දෙවියන්වහන්සේට පමණක් වන බවට ප්‍රතිඥා ප්‍රකාශ කළ යුතුය. උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරන සේක. "මම නුඹ සදාකාලේටම පාවා ගන්නෙමි; එසේය, ධර්මිෂ්ඨකමද, විනිශ්චයද, කරුණාවද, අනුකම්පාවද, ඇතුව නුඹ පාවා ගන්නෙමි." (හොෂෙයා 2:19). නැවත වතාවක් උන්වහන්සේ මෙසේ පවසන සේක. "මම නුඹලාට ස්වාමි පුරුෂයෙක්ය." (යෙරෙමියා 3:14). මෙම භාෂාලංකාරයම අළුත් තෙස්තමේන්තුවේ යොදා ගන්නා පාවුල් මෙසේ පවසයි. "පිරිසිදු කන්‍යාවකු මෙන් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ වන එක පුරුෂයෙකුට පාවාදීම පිණිස ... දිව්‍යවූ ජ්වලිතයකින් නුඹලා ගැන මම ජ්වලිතව සිටිමි." (2 කොරින්ති 11:2).

ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තබා තිබූ විශ්වාසය සහ ප්‍රේමය පසෙකට යොමු කොට ලෞකික සම්පත්වලට තම ආත්මයේ භාරකාරත්වය පුදකොට සහා තොමෝ ක්‍රියාකිරීම විවාහ ප්‍රතිඥාව කඩකිරීමක් ලෙස හඳුන්වා දී තිබේ. ඊශ්‍රායෙල් ජනතාව දෙවි සමිඳාණන්ගෙන් ඉවත්ව යෑම මෙම රූපාලංකාරයෙන්ම විස්තර කර දී ඇත. ඒ අතරම ඔවුන් එපා කළ දෙවියන්වහන්සේගේ පුදුමාලංකාර ආදරය මෙසේ සිත් ඇදගන්නා අයුරින් ඉදිරිපත් කර ඇත: "නුඹට දිවුරුම් දී නුඹ සමග ගිවිසුමක් කරගත්තෙමි. නුඹද මට අයිති වූයෙහි යයි ස්වාමි වූ දෙවියන්වහන්සේ කියන සේක." "නුඹ අතිශයින්ම ලක්ෂණ වී, රාජ්‍යයක් වෙන හැටියට වර්ධනය වූවෙහිය. නුඹේ ශෝභනකම නිසා නුඹේ කීර්තිය ජාතීන් අතරේ පැතිර ගියේය. මක්නිසාද මා විසින් නුඹ කෙරෙහි තැබූ මාගේ තේජස නිසා ඒක සම්පූර්ණව

තිබුණේ යයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේක. නුමුත් නුඹේ ශෝභනකම කෙරේ නුඹ විශ්වාස කොට, නුඹේ කීර්තිය නිසා වේශ්‍යාකම් කරමින් ළඟින් යන එක්නෙකාටම නුඹේ වේශ්‍යාකම වැගිරෙව්වෙහිය." "ඉශ්‍රායෙල් වංශය භාර්යාවක් ඇගේ පුරුෂයාට ද්‍රෝහිකම් කරන්නාක් මෙන්, නුඹලා මට විරුද්ධව ද්‍රෝහිකම් කළහු යයි ස්වාමින්වහන්සේ කියන සේක." නුඹ "කාමමිථ්‍යාචාරය කරන භාර්යාවක්ය. තමාගේ පුරුෂයා වෙනුවට අන්‍යයන් ගන්න ස්ත්‍රියෙක්ය!" (එසකියෙල් 16:8; 13-15; 32; යෙරෙමියා 3:20).

දෙවියන්වහන්සේට ඇලුම් කරනවාට වඩා ලෝකයාගේ මිත්‍රත්වය සහ පහස සොයා එන්නාවූ නාමික කිතුණුවන්ව හඳුන්වා දීමට අළුත් තෙස්තමේන්තුවේද යට කී ආකාර වදන් භාවිතා කර ඇත. යාකොබ් අපෝස්තුළුවරයා මෙසේ පවසයි: "කාමමිථ්‍යාචාරික (තැනැත්තෙනි) තැනැත්තියෙනි, ලෝකය සමග මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නුමුත් ලෝකයට මිත්‍ර වෙන්ට තැමැත්තේ නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක් වන්නේය."

එළිදරව් 17 හි ස්ත්‍රිය (බබිලෝනිය) වර්ණනා කර ඇත්තේ "රත්තිල් සහ රතුපාට වස්ත්‍ර පැළඳ රනින්ද අනර්ඝ ගල් සහ මුතුවලින්ද සැරසී" සිටින්නියක් හැටියටය. "පිළිකුල්කම්වලින්ද ඇගේ වේශ්‍යාකමේ අපවිත්‍රකම්වලින්ද පූර්ණවූ රන් කුසලානයක් ඇගේ අතේ තිබුණේය. ඇගේ නළල පිට: රහසක්ය, මහා බබිලෝනිය, පොළොවේ වේශ්‍යා-වන්ගේද පිළිකුල්කම්වලද මවුය යන නාමයක් ලියා තිබුණේය. ඒ ස්ත්‍රී ශුද්ධවන්තයන්ගේද, යේසුස්වහන්සේගේ වේද සාක්ෂිකයන්ගේද ලෙයින් මත් වී සිටිනවා දුටිමි"යි දිවැසිවරයා ප්‍රකාශ කරයි. "පොළොවේ රජුන් කෙරෙහි රජකම් කරන මහත් නුවර" ලෙසද බබිලෝනිය හඳුන්වා දී ඇත. (එළිදරව් 17:4-6, 18). ක්‍රිස්තියානි ලෝකයේ රජවරුන් කෙරෙහි අත්තනෝමතික ලෙස පාලන බලයක් දැරූ එකම බල අධිකාරිය රෝමයයි. රතු සහ රත් තිල් පැහැයෙන්ද, රත්රන්, සහ අගනා මුතු මැණික් වලින් සැදී පැහැදී සිටීමෙන්ද පෙනී යන්නේ රාජ්‍ය පාලනයෙන්ද අභිමානයෙන්ද උදම් වූ පාප් අධිකාරි බලයයි. "ශුද්ධවන්තයන්ගේද, වේදසාක්ෂිකයන්ගේද ලෙයින් මත්වී" සිටී යයි කිවහැක්කේ කිතුණු ආගමිකයන්ට ඉතා කුරිරු ලෙසින් වධ හිංසා පැමිණ වූ රෝම සභාවට හැරෙන්නට අන් කවරෙකුටද? පොළොවේ රජවරුන් සමග අයථා සබඳතාවන් පවත්වා ගැනීමේ පාපය ගැනද ඇයට චෝදනා එල්ල වී තිබේ. දෙවි සමිඳාණන්ගේ ඇසුරින් ඈත් වී මිසදෙටුවන් සමග සන්ධානගත වීමෙන් යුදෙව් සභාව වෙසඟනක් බවට පත් වූවාය. රෝම සභාවද එසේම, ලෞකික බලධරයන්ගේ ආධාර උපකාර ලබාගැනීමෙන් තම ආධිපත්‍යය තර කරගත් නිසා වරදට පත්කරනු ලැබුවාය.



"වේශ්‍යාවන්ගේ මව" යයි බබිලෝනිය ගැන පවසා තිබේ. ඇයගේ ධර්මතාවන්, අනේක චාරිත්‍ර සහ සම්ප්‍රදායන් අනුගමනය කරන්නාවූ සභාවන් ඇයගේ (බබිලෝනියෙහි) දරුවන් යයි හඳුන්වා දීමට පුළුවන. ඔවුහු මවගේ ආදර්ශය අනුව යමින් සත්‍යතාවද දෙවියන්වහන්සේගේ අනුමැතියද පාවා දී ක්‍රියා කරති. ලෝකය සමග අනිසි සන්ධානයක් ඇති කරගැනීමට එම සභාවන් තම මව් සභාව අනුගමනය කරති. බබිලෝනියෙහි වැටීම ගැන එළිදරව් 14 හි පවසන්නාවූ පණිවිඩය අදාළ වන්නේ වරක් ශුද්ධව පවිත්‍රව සිට ක්‍රම ක්‍රමයෙන් දූෂිත වූ සභාවන් බවට පත්වූ නිකායන් සහ ලබ්ධි වලටය. විනිශ්චය පිළිබඳව අනතුරු ඇඟවීමෙන් පසුව බබිලෝනියෙහි වැටීම හා සම්බන්ධ පණිවිඩය නිකුත් වූ නිසා එම වැටීම අන්තිම කාලයේදී සිදුවීම අනිවාර්ය වන්නේය. එම නිසා එම පණිවිඩය රෝමානු සභාවට පමණක් අදාළ වන්නේ නැත. මක්නිසාද යත්, රෝම සභාව ඒ වන විටත්, වැටී ගොස් ශත වර්ෂ ගණනාවක් ගෙවී ගොස් තිබිණි. ඒ අතර දහ අට වැනි පරිච්ඡේදයෙහි අන්තර්ගත පණිවිඩයෙන් ඉල්ලා සිටින්නේ දේව ජනතාවට බබිලෝනියෙන් ඉවතට පැමිණෙන ලෙසය. මෙම ශුද්ධ ලියවිලි පාඨය මගින් සපථ කරන්නේ දේව දරුවන් බොහෝ දෙනෙක් එතෙකුත් බබිලෝනියෙහි සිටින්නාවූ බවයි. ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් බහුතරයක් බැඳී සිටින්නාවූ කිතුණු ආගමික සංවිධාන මොනවාද? සැකයකින් තොරව පවසන්නට හැකිවන්නේ ඒ ආගමික සංවිධාන වනාහි ප්‍රොතැස්තන්ත ඇදහිලි වේදය අනුගමනය කරන සභාවන් බවය. මෙම කිතුණු නිකායවල් ස්වකීය මූලාරම්භයේදී දෙවියන්වහන්සේටත්, සත්‍යතාවටත් අනුගැති වෙමින් ඒ උදෙසා නැඟී සිටින බව ප්‍රකාශ කළෝය. උන්වහන්සේගේ ආශිර්වාද ඔවුන් මත විය. ශුභාරංචියෙහි ප්‍රඥප්ති පිළිගැනීම නිසා එහි අනුගාමිකයන්ට යහපත් ප්‍රතිඵල ඇතිවූ බව පිළිගැනීමට දෙවියන්වහන්සේව විශ්වාස නොකළ ලෝකයට වුවද සිදුවිය. දිවැසිවරයා ඊශ්‍රායෙල් ජනතාවට මෙසේ ප්‍රකාශ කළේය: "නුඹේ ශෝභනකම නිසා නුඹේ කීර්තිය ජාතීන් අතරේ පැතිර ගියේය; මක්නිසාද මා විසින් නුඹ කෙරෙහි තැබූ මාගේ තේජස නිසා ඒක සම්පූර්ණව තිබුණේ යයි ස්වාමි වූ දෙවියන්වහන්සේ කියන සේක." එසේ වුවද, ඊශ්‍රායෙලිතයන්ගේ ශාපය සහ විනාශය බවට පත්වූ එම ආශාවන්ම කෙරේ කිතුණු නිකායන්ද යොමු වූහ. එම ආශාව වනාහි දේව භක්තිය නැති අදේව දෘෂ්ටීන්ගේ චත්පිළිවෙත් අනුගමනය කිරීමත් එම අයගේ මිත්‍රත්වයේ පහස ලැබීමත්ය. "නුමුත් නුඹේ ශෝභනකම කෙරේ නුඹ විශ්වාස කොට, නුඹේ කීර්තිය නිසා වේශ්‍යාකම්" කළෙහිය. (එසකියෙල් 16:14, 15).

බොහෝ ප්‍රොතැස්තන්ත සභාවන් රෝමය ආදර්ශය කොට ගනිමින් පොළොවේ රජවරුන් සමග දුෂ්ටවූ ද, අධමවූ ද සබඳතාවයන් පවත්වති. මෙම විවිධ නිකායන් මෙන්ම ලබ්ධිද තමන්ගේ මූලධර්මයන්හි පදනම

ශුද්ධ බයිබලය බව පවසති. එහෙත් ඔවුහු විවිධ කණ්ඩායම්වලට බෙදී සිටිති. ඔවුන්ගේ ඇදහිලි වේදය සහ පිළිගත් ධර්මතාවන් මෙන්ම පිළිගත් සිද්ධාන්තද අතර ඇත්තේ ඇදහිය නොහැකි ගැටුම් සහගත වෙනස්කම්ය. "බබිලෝනිය" සඳහා වූ "වියවුල" නැමැති පදය මොවුන්ට යොදනු ලැබේ.

රෝමයෙන් වෙන්ව ගියාවූ සභාවන්, ලෝකය සමග සන්ධානගත වීමේ පාපයට අමතරව මව් සභාවේ වෙනත් චරිතාංගද අත්හැර දමා නැත.

රෝමානු කතෝලික කෘතියක් මෙවන් තර්කයක් ඉදිරිපත් කරයි. "රෝමානු කතෝලික සභාව, ශාන්තුවරයන් කෙරේ දක්වන්නාවූ නමස්කාරය නිසා රූප වන්දනය පිළිබඳව වූ ආඥාව කඩකිරීමෙහි වරදකරුවන් වන්නේ නම් ඇයගේ දියනියක් වන එංගලන්ත සභාවද, එම පාපයටම වරදකාරියක් වන්නීය. ඔවුන්ගේ එක් දේවස්ථානයක් ක්‍රිස්තුස්වහන්සේට කැප කර ඇති අතර තවත් දේවස්ථාන දහයක් මරියාට කැප කර ඇත. (Dr. Challoner, "The Catholic Christian Instructed," Preface pp. 21, 22 Ed. 1897).

සහශ්‍ර වර්ෂය පිළිබඳව ශාස්ත්‍රීය ග්‍රන්ථයක් රචනා කළ ආචාර්ය හොප්කින්ස් මෙසේ ප්‍රකාශයක් කරයි. "රෝමානු සභාව ලෙස අද හඳුන්වනු ලබන කිතුණු සභාවට පමණක් ඇයගේ ක්‍රියාදාමයන් ගැන දොස් පැවරීමට නුපුළුවන. ප්‍රොතැස්තන්ත සභාවලද ක්‍රිස්තු විරෝධී ක්‍රියාවේදයන් එමට ඇත. එම සභාවන්ද දූෂිතයෙන් සහ පාපිෂ්ඨ ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වී නැත." CH. Hopkins, Samuel,"Works" Vol. ii p. 328).

රෝම සභාවෙන් ප්‍රෙස්බිටීරියන් සභාව ඉවත්වීම ගැන අදහස් දක්වන ආචාර්ය ගුත්රි මෙසේ පවසයි: "වසර තුන්සියයකට පෙර අපගේ සභාව රෝමයේ දොරටු තුළින් පිටතට පැමිණියාය. ඇයගේ ධජය, විවෘත ශුද්ධ බයිබලයක් පෙන්නුම් කළේය. ඇයගේ හස්තයේ තිබූ ලියවිල්ලේ "ශුද්ධ බයිබලය සොයන්න" යන උපදේශ වාක්‍යය මුද්‍රා කොට තිබිණ." ඉක්බිතිව ආචාර්යවරයා මෙම වැදගත් පැනය අසා සිටී. "ඔවුන් බබිලෝනියෙන් සර්ව සම්පූර්ණ ලෙසින් ඉවත්ව ආවේද?" (Guthrie, John, "The Gospel in Ezekiel," p. 237).

ස්පර්ජන් මෙවැනි අදහසක් පළ කරයි.: "එංගලන්ත සභාව සක්‍රමේන්තු පිළිපදින්නන්ගේ තෝතැන්නක් බවට පත්ව ඇත. සත්‍යයෙන් ඈත්වීම සභාව තුළ ගැටළුවක් බවට පත්ව ඇත. තවද, ඇයගේ දර්ශනය මිථ්‍යාචාරය හා සංකලනය වී ඇත. සභාවේ ඇදහිලි වේදය වූ මුල් ධර්මතාවන් තුළ ස්ථාපිතව සිටිතැයි අප සිතූ අය අතරෙන්



එකිනෙකා එම දහම් මාලාවෙන් ඉවත්ව යන බව පැහැදිලි ලෙස දකගැනීමට පුළුවන. නින්දනීය මිථ්‍යාදෘෂ්ඨික වේදය මගින් එංගලන්ත හදවතෙහි සෑම අංශුවක්ම සිදුරු වී ඇත. දෙවි සමිඳාණන් කෙරෙහි වූ භක්තිය අප සභාව තුළින් සිඳී ගොස් ඇති බව පෙනෙයි. මෙයින් නොනැවතුණු එම ද්‍රෝහිකම දේශනා කුඩුවේදීද එඩිතර ලෙස පවසන්නේ තමා ක්‍රිස්තු භක්තිකයන් බවය."

භක්තිය හැරදමා එයින් ඉවත්ව යෑමේ ආරම්භය වූයේ කුමක්ද? ශුභාරංචියෙහි සරල පැවැත්මෙන් සභාව මුලින්ම ඉවතට හැරී ක්‍රියාත්මක වූයේ කෙසේද? මිථ්‍යා දෘෂ්ටිකයන් කිතු දහම පිළිගත් විට ඔවුන්ට උපකාරයක් වන පිණිස මිථ්‍යාදෘෂ්ටික සිරිත් විරිත් සහ පුරුදුවලට සභාවට ඇතුල්වීමට ඇය ඉඩ හැරියාය. මේ සියල්ල සිදුකළේ අන්‍ය ආගමික බැතිමතුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහාය. "නොපනත්කමේ අභිරහස දැනටමත් ක්‍රියාකරන්නේය" (2 තෙසලෝනික 2:7) යයි පාවුල් එදා ඔහුගේ කාලයේදී පවසා ඇත. අපෝස්තුළුවරුන් ජීවත්ව සිටි කාලයේදී සභාව තුළ යම්කිසි ආකාරයක පාරිශුද්ධතාවක් පැවතුණි. එහෙත් "දෙවන ශත වර්ෂයේ අග භාගය වන විට සෑම සභාවක්ම වෙනස් පැවැත්මකට යොමු විය; මුලින් පැවති චාම්භාවය නැති වී ගියේය. කාලය ගෙවී යත්ම මහළු වියට පත්ව සිටි ගෝලයෝ සමාදානයෙන් සැතපුණෝය. ඒ අතර ඔවුන්ගේ දරුවන් සහ අළුතෙන් සභාවට එක්වූ බැතිමතුන් එක්ව ආගම නවීකරණයට ලක් කළෝය." (Robinson, Robert, "Ecclesiastical Researches" Ch. 6, lcar 17). අන්‍ය ආගමික බැතිමතුන් කිතුණු දහමට හරවා ගැනීමේ ක්‍රමෝපායක් ලෙස කිතුණු ඇදහිල්ලෙහි ප්‍රමිතීන් පහත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් "මිසදෙටු ජලගැල්මක් සභාව කරා ගලා ආවේ ඇයගේ සිරිත්, චාරිත්‍ර, වත්පිළිවෙත් සහ දේවතා රූපද සමගය" (Garazzi's Lectures, p. 278 (ed 1854). ලෞකික නරපතීන්ගේ ආධාර සහ අනුග්‍රහය කිතුණු සභාවට ලැබුණු විට, එම රජයන් යටතේ සිටි පුරවැසි ජනතාවද නාමික ලෙස කිතුණු භක්තිය පිළිගත්තෝය. බාහිර පෙනුමෙන් මෙම අය කිතුණුවන් යයි පෙනී ගිය නමුත් බොහෝ අය "මිසදෙටු ඇදහිලි ක්‍රමවේදයන් අතහැර දම්මේ නැත. ඔවුහු දිගටම රහසේ තම දෙවි දේවතාවුන්ගේ රූපවලට නමස්කාර කිරීමෙහි යෙදී සිටියෝය." (Gerazzi's Lectures, p. 278).

තමා ප්‍රොතැස්තන්ත යයි කියාගන්නාවූ සෑම සභාවක්ම මෙම ක්‍රමවේදය අනුගමනය නොකෙරෙත්ද? ප්‍රතිසංස්කරණයේ සත්‍යවාදී ආත්මය තිබූ නිකායන්හි නිර්මාතෘවරයන් අභාවයට යෑමත් සමගම ඔවුන්ගෙන් පැවත එන්නෝ ඉදිරියට පැමිණ "සභාව නවීකරණය කිරීමට" යොමුවූහ. තම පියවරුන්ගේ ඇදහිලි ප්‍රකාශය අන්ධානු-කරණයෙන් අල්ලා ගෙන තමන් දකින්නාවූ සත්‍යතාවේ වැඩිපුර

ආලෝකය පිළිගැනීමට නොකැමැතිව ප්‍රතිසංස්කරණයන්ගේ දරුවෝ පියවරුන් තුළ තිබූ යටහත් පහත්කම, ආත්ම පරිත්‍යාගය සහ ලෞකික දේවලට හිමිකම අත්හැර දැමීම යන ගුණාංගයන්ගෙන් ඉවත්ව ගියෝය. මෙසේ "මුල් සරලතාව නැති වී ගියේය." සභාව කරා ගලා ආ මිසදෙටු ජල කඳ ඇයගේ සිරිත් විරිත්, චාරිත්‍ර, වත්පිළිවෙත් සහ දේවතා රූප නමස්කාරයද සභාව තුළ තැන්පත් කළාය.

"දෙවියන්වහන්සේ සමග සතුරුකමක් ඇති කරන්නාවූ" ලෝකයා සමග වූ මිතුරුකම අගය කරන්නාවූ, කිතුණු අනුගාමිකයෝ කෙතරම් භයංකාර ලෙස සභාවන් තුළ ව්‍යාප්ත වෙමින් ක්‍රියා කරත්ද! නිරහංකාරය, ආත්ම-පූජාව, සරලතාව සහ දේව ගතිගුණ ඇති ජීවිතය යන බයිබලීය ප්‍රමිතීන්ගෙන් කිතුණු ලොවේ ජනප්‍රිය සභාවන් කොතෙක් දුරට බැහැරව ගොස් තිබේද! මුදල් පරිහරණයේ නිවැරැදි ක්‍රමය පිළිබඳව කථා කරමින් ජෝන් වෙස්ලි මෙසේ පැවසුවේය. "ඔබ සතු මුදල් දෙවියන්වහන්සේ ලබාදී ඇති තලෙන්තයකි. එවන් වටිනා දීමනාවක් ඇසෙහි තෘෂ්ණාව සංසිඳුවා ගැනීම සඳහා හෝ අලංකාර වස්ත්‍රාභරණ සඳහා හෝ අනවශ්‍ය සැරසිලි සඳහා හෝ පාවිච්චි කරන්න එපා. ඔබගේ ගෙදර අලංකාර කිරීම පිණිස, අනවශ්‍ය දැයින් එය සරසන පිණිස මුදල් වැය කරන්න එපා. අත්‍යාධික හෝ අධික වියදම් සහිත ගෘහ භාණ්ඩ සඳහා මුදල් වියදම් කරන්න එපා. අභිමානය උදෙසා මිල අධික පින්තූර, චිත්‍ර සහ බාහිරාලංකාරයෙන් ඔප දැමූ කැටයම් භාණ්ඩ වලින් ගේදොර සරසන පිණිස මුදල් වියදම් කරන්න එපා. ජීවිත අභිමානය පෙන්නුම් කිරීමට කිසිවක් හෝ කරන්න එපා. ඔබ යහපත් ක්‍රියා කරනවා නම්, මිනිසුන් ඔබගේ ගුණ කියනවා ඇත. ඔබ 'රත් නිල් වස්ත්‍රයෙන් සහ සිහින් හණ නූලෙන් නිමි ඇඳුම් හැඳ,' සැමදාම රසනහර පිනා යන කෑම බීම ආහාරයට ගන්නේ නම්, සුඛෝපභෝගී දිවි පැවැත්මක් ගත කරන්නේ නම්, ඔබගේ ශෝභනත්වය, දාන පාරමිතාව සහ ත්‍යාගශීලිත්වය ගැන බොහෝ අය ඔබට පැසසුම් කරනවා ඇත, ඔබේ යශෝරාවය ගයනවා ඇත. ඔවුන්ගේ අත්පොළසන් සහ යශෝරාවය ලබාගන්නා පිණිස මුදල් වියදම් කරන්න එපා. ඒ වෙනුවට දෙවියන්වහන්සේගෙන් පැමිණෙන්නාවූ ගෞරවයෙන් සෑහීමට පත්වන්න. (Wesley's Works, Sermon 50, "The use of Money"). නුමුත් අපගේ බොහෝ දේවස්ථානවල මෙම ඉගැන්වීම් වලට තැනක් නැත, ඒවා ක්‍රියාත්මක කිරීමට කැමැත්තක් නැත.

තවදුරටත් මෙසේද පවසා තිබේ: "තමන් යම්කිසි ආගමක අනුගාමිකයන් යයි පැවසීම අද ජනප්‍රිය විලාසිතාවක් බවට පත් වී ඇත. රාජ්‍ය පාලකයන්, දේශපාලඥයන්, නීති වේදීන්, වෙළෙඳ ව්‍යාපාරිකයන්, වෛද්‍යවරුන් සභාවට බැඳී සාමාජිකත්වය ලබාගන්නේ සමාජයේ ගෞරවය සහ විශ්වාසය ලබාගන්නා පිණිසය. ඔවුන්ගේ අරමුණ වන්නේ තමන් කරන්නාවූ සියළු ආකාර අදමිටු ගනුදෙනු



ක්‍රිස්තියානි නාමය යටතේ සඟවා තබාගැනීමය. බව්තීස්මය ලැබූ මෙවන් පුද්ගලයන්ගේ වස්තුවෙන් සහ ආනුභාවයෙන් බලවත් කරනු ලැබූ ආගමික කොටස්, ජනප්‍රියතාව සහ අනුග්‍රහය පසුපස හඹා යති. විශිෂ්ඨ අලංකාරයෙන් ප්‍රශස්ථ වූ ශෝභාවසම්පන්න දෙව් මැඳුරු ජනප්‍රිය වීථිවල ඉදිකරනු ලැබේ. නමස්කාරය සඳහා පැමිණෙන අය මිල අධිකවූ ද, නව විලාසිතාවන්ගෙන් අනූණ වූද, ඇඳුමින් සහ පැළඳුම්වලින් සැරසී සිටිති. ජනතාව පිනවීමටත්, තවත් විශාල ජනකායක් දේවස්ථානය වෙත ඇදගැනීමටත් හැකිවන්නාවූ දේවගැති වරයෙකුට ඉතා අධික වැටුපක් ගෙවනු ලැබේ. ජනතාව අතින් සිදුවන්නාවූ පව් ගැන කථා නොකර කණට මිහිරි සුමුදු දේශනාවන් ඉදිරිපත් කිරීම ඔහුගේ කාර්ය භාරයයි. මෙසේ නව විලාසිතාවන්ට හිමිකම් කියන පව්කරුවන් සභාවේ නාම ලේඛණයට ඇතුළත් වී තිබේ. දේව භක්තිය නමැති කඩතුරාවෙන්, නවීන විලාසිතාවන් අනුව පවතින පව් වසා දමනු ලැබ තිබේ."

ලෝකය හා සම්බන්ධව කිතුණුවන් යයි කියන්නාවූ අයගේ ආකල්පය විග්‍රහ කරන්නාවූ අනාගමික සඟරාවක් මෙසේ පවසයි: "වත්මන් යුගයේ තත්ත්වයට සභාව යටත් වී ඇත. ඇයගේ නමස්කාර ක්‍රමවේදය වත්මන් ඉල්ලීම් අනුව හැඩගස්වා ගෙන ඇත. ආගම ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කිරීමට උපකාර කරන්නාවූ සෑම දෙයක්ම සභාව තම ක්‍රමයට ඇඳා ගෙන ඇත." මෙතෝදිස්ත සමය පිළිබඳව නිව්යෝර්ක් ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පතෙහි ලේඛකයෙක් මෙවන් විග්‍රහයක් පල කොට ඇත. "දේව භක්තිකයන් සහ එසේ නොවන්නාවූ අය අතර ඇත්තාවූ වෙන් කිරීමේ රේඛාව ඡායා මාත්‍රයක් තරමට තුනී වී ඇත. දෙපාර්ශ්වයේම සිටින්නාවූ අය තමන්ගේ ක්‍රියාදාමයන් සහ විනෝදාස්වාදය අතර ඇති වෙනස්කම් අතුගා දමන්නට ජ්වලිතයෙන් යුතුව ක්‍රියාත්මකව සිටිති. වගකීම් පිළිබඳව හැඟීමක් නොකොට ප්‍රතිලාභ පමණක් බලාපොරොත්තුවෙන් ජනප්‍රිය ආගමික කණ්ඩායම් කරා ඇදී එන්නාවූ සාමාජිකයන්ගේ ගණන ඉතා විශාලය"”

හවර්ඩ් ක්‍රොස්බි නම් දේශන වේදියා මෙසේ පවසයි. "දෙවි සමිඳාණන්ගේ සැලැස්ම ඉටු කිරීමෙහි ලා ක්‍රිස්තියානි සභාව ගෙන යන ක්‍රියාදාමයන් ගැන අපට ඇත්තේ සතුටු විය හැකි තත්ත්වයක් නොවේ. පෙර යුගයන්හි සිටි යුදෙව් ජාතිකයෝ රූප වන්දනීය ජාතීන් සමග සුහද සබඳතා පවත්වමින් ඔවුන්ගේ හදවත් දෙවියන්වහන්සේගෙන් සොරා ගැනීමට ඉඩ දුන් ආකාරයෙන්ම වත්මන් යේසුස්වහන්සේගේ සභාවද, අදේව භක්ති ලෝක ජනතාව සමග ව්‍යාජ හවුල්කාරත්වයක් පවත්වා ගෙන යමින් සත්‍යවාදී ජීවිතය හා බැඳී දිව්‍යමය ක්‍රමවේදයන් පාවා දෙමින් ක්‍රියා කරති. ඒ සමගම සත්‍යය මෙන් පෙනෙන නමුත්, කිතුණු සමාජයක නොතිබිය යුතු

විනාශදායක හුරු පුරුදුද ඔව්හු දැත් යොමා වැලඳ ගනිති. තමන්ගේ ක්‍රියාදාමයන් නිවැරැදි යයිද තමන් ගන්නාවූ තීරණ හරි යයිද ඔවුහු තර්ක කරති. එසේ වුවද, ඔවුන්ගේ තීරණය ගැනීම් දෙවියන්වහන්සේගේ එළිදරව් කිරීම්වලට පටහැනිය, අනුග්‍රහය තුළ වැඩීමේ සෑම පද්ධතියකටම එක එල්ලේම විරුද්ධය." (The Healthy Christian: An Appeal to the Church" pp. 141, 142).

ලෝකය සමග මිතු දමින් වෙලී සැප සෙල්ලම් සොයා යෑමේ රැල්ල නිසා ආත්ම-පරිත්‍යාගය සහ ආත්ම පූජාවද සම්පූර්ණයෙන්ම නැතිව ගොසින්ය. "අද සභාවේ ක්‍රියාකාරී ජීවිත ගතකරන්නාවූ පුරුෂයන් සහ ස්ත්‍රීන් වනාහි තම ළමා කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ උදෙසා යමක් දීමට හෝ යමක් කිරීමටද පූජාවන් දීමටද මහපෙන්වනු ලැබූ අය වූහ." නමුත් "අද ප්‍රතිපාදන සහ අරමුදල් අවශ්‍ය නම් ඒ සඳහා සම්මාදම් සහ දීමනා කරන්නැයි කවරෙකුට වුවද ඉල්ලීමක් කරනු ලබන්නේ නැත. එසේ කරන්න එපා. කරන්නට අවශ්‍ය වන්නේ සල්පිලක් සංවිධානය කිරීම, චිත්‍රාභිමනයක් හා යම්කිසි සිද්ධියක් ජීවමාන සිද්ධියක් මගින් දක්වීම, කවටකමින් පිරි නඩු විභාගයක් පැවැත්වීම, පුරා වස්තු ප්‍රදර්ශනයක් පැවැත්වීම නැතිනම් කුමන ආකාරයේ හෝ සංග්‍රහයක් පැවැත්වීම යනාදි ක්‍රමයක් මගින් මුදල් උපයා ගැනීමයි. කළ යුතු වන්නේ පැමිණි අය විනෝදයට පැමිණවීම සඳහා කුමක් හෝ කිරීමය," යනුවෙන් පවසනු ලැබේ.

විස්කන්සින් ප්‍රාන්තයේ ආණ්ඩුකාර ධූරය දරූ වොෂ්බර්න් තම ජාතිය අමතමින් නිකුත් කළ වාර්ෂික පණිවිඩයෙහි ඔහු මෙසේ ප්‍රකාශනයක් නිකුත් කළේ 1873, ජනවාරි 9 වනදාය. "සූදුවට ඔට්ටු තබන්නාවූ අයට පුහුණුවක් ලබාදෙන්නාවූ ආයතන විසුරුවා හැරීම සඳහා නීති සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුය. මෙම ස්ථාන බොහෝ තැන්හි විසිර පවතින්නේය. දේවස්ථාන පවා සමහර අවස්ථාවන්හිදී යක්ෂයාගේ වැඩවලට යොදවනු ලබන බව දකගැනීමට හැකිවේ. තෑගි පිරිනමන විවිධ ප්‍රසංග, තෑගි ලබාදෙන සූදු ක්‍රීඩා හා ලොතරැයි යනාදි සූදුව දේවස්ථානයේ අනුග්‍රහය යටතේ පැවැත්වේ. මෙම මුදල් ඉපයීමේ ක්‍රීඩාවන් ආගමික හෝ සමාජ සේවා හෝ ආධාර දීම් සඳහා පැවැත්වේ. එසේ වුවද, බොහෝ අවස්ථාවන්හිදී මුදල් ගැරීම ඒවායේ අරමුණු වන්නේය. ලොතරැයි, ටිකට් පත් විකුණා තෑගි ඇදීම, යනාදි සියළුම ආකාර විනෝදාංශ සඳහා සෑම අයෙකුට මුදලට සරිලන කිසිවක් හෝ නොලැබේ. මහන්සි වී වැඩනොකර මුදල් හෝ ද්‍රව්‍යමය භාණ්ඩ හෝ ලබාගැනීම දේව න්‍යායට ගැළපෙන්නේ නැත. මෙවැනි දෑ යොවුන් පරපුර දූෂිත භාවයට පත්කරන්නාවූ සාතන්ගේ උපක්‍රම වන්නේය. අහම්බෙන් ත්‍යාගයක් ලැබෙන මෙවන්



ක්‍රීඩාවන්හි යෙදෙන්නාවූ වැදගත් නම්බුකාර උදවිය තමුන්ගේ හෘද සාක්ෂිය සමනය කරගන්නේ මෙම මුදල් යහපත් ව්‍යාපෘතියක් සඳහා යොදවා ගන්නවාය යන චින්තනයෙහි පිහිටා සිටය. ඒ අතර දේශයේ තරුණ පරපුර මෙම ක්‍රීඩාවල යෙදීම පුරුද්දක් කර ගනිති. එම ක්‍රීඩාවන්හි යෙදීමෙන් ලැබෙන ආශ්වාද ජනක වින්දනය අවසන් වන්නේ විපත්තියක් සමගය."

ලෞකික දයට අනුකූලතාව දක්වීමේ ආත්මය කිතුණු ලෝකයේ සභාවන් පවා ආක්‍රමණය කරමින් පවතී. ලන්ඩන්හි දෙව් මැදුරක දේශනාවක් කළ රොබර්ට් ඇට්කින්ස් එංගලන්තයේ සිදුවෙමින් පවතින ආත්මික ගරා වැටීම ගැන අපූරු චිත්‍රයක් මෙසේ පින්තාරු කළේය. "සැබෑ දහැමි අය පොළොවෙහි අඩු වෙමින් පවතී. ඒ ගැන කිසිවෙකු හෝ සිතන්නටවත් ඉදිරිපත් වන්නේ නැත. ආගමක් අදහනවා යයි කියන්නාවූ වර්තමාන ජනතාව, ඔවුන්ගේ නිකාය හෝ ලබ්ධිය හෝ කුමක් වුවද, ඔවුහු ලෝකයට බොහෝ සේ ඇලුම් කරති. ලෝකයේ හුරු පුරුදු සහ විනෝදාංශ සමග අනුගත වෙති. ඔවුන්ට අවශ්‍ය වන්නේ සුවපහසු දිවි පැවැත්මක් හා සමාජයේ ගෞරවණීය ස්ථානයක්ය. කිතුණුවන් කැඳවා ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේ සමග දුක් විඳීමටය; එහෙත් මොවුහු දෝෂාරෝපණය කිරීමකට හෝ අවලාදයකට හෝ මුහුණ දීමට මැළි වෙති. සෑම දේවස්ථානයක් ඉදිරියෙහි කැටයම් කර ඇති වචන පේළිය නම් 'භක්තිය හැර යාම, භක්තිය හැර යාම, භක්තිය හැර යාම' යන්නය. ඔවුන් ඒ බව දන්නේ නම්, ඔවුන්ට ඒ බව හැඟී යන්නේ නම්, ඔවුන්ට බලාපොරොත්තුවක් තිබීමට පුළුවන. නමුත් අහෝ! ඔවුන්ගේ හඬ වන්නේ, "මම ධනවත්මී. මම ධනය අත්කරගෙන සිටිමි. මට කිසිවකින් අඩුවක් නැත" යන්නය. (Second Advent Library, Tract N0 39).

බබිලෝනියට එරෙහිව ඉදිරිපත් වී ඇති අධි චෝදනාව වන්නේ ඇය පොළොවේ වැසියන්ට ඇගේ වේශ්‍යාකම නමැති මුද්‍රික පානයෙන් පෙවීම පිළිබඳ පාපයයි. ඇය ලෝකයාට පිළිගන්වන්නාවූ මත්ද්‍රව්‍ය අඩංගු කුසලාන වනාහි පොළොවේ බැතිමතුන් සමග ඇයගේ වූ සම්බන්ධකම්වල ප්‍රතිඵල ලෙසින් ඇය පිළිගත් බොරු ධර්මතාවන්ය. ලෝකය සමග වූ මිත්‍රකම ඇයගේ ඇදහිල්ල දූෂ්‍ය කළාය. එයට සමගාමීව ඇය ලෝකයා කෙරෙහි විෂමාකාර බලපෑමක් කරන්නේ ඇයගේ ධර්මතාවන් ලෝකයාට උගන්වමින්ය. එම ඉගැන්වීම් ශුද්ධ බයිබලයේ ප්‍රකාශනයන්ට විරුද්ධය.

මනුෂ්‍යයන්ට ශුද්ධවූ බයිබලය පරිහරණය කිරීම තහනම් කළ රෝමය ඒ වෙනුවට ඇයගේ ඉගැන්වීම් පිළිගැනීමට ඔවුන්ට නියම

කළාය. දෙවියන්වහන්සේගේ වචනය මිනිසුන්ගේ අතට නැවත පත්කිරීම ප්‍රතිසංස්කරණයේ පුමුඛතම කාර්ය භාරය විය. එහෙත් අද තත්ත්වය එතරම් සතුටුදායක නොවේ. වත්මන් කාලයේ ඇති සභාවන් බැතිමතුන්ට උගන්වන්නේ ඔවුන්ගේ ඇදහිල්ල හා විශ්වාසය සභාව විසින් උගන්වන දහම් මත සහ සභාවෙහි ඇදහිල්ලේ ප්‍රකාශනය මත රැඳවීමට නොවේද? එහෙත් කළ යුතු වන්නේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ වචනය මත පමණක් රැඳවීමය. ප්‍රොතැස්තන්ත සභාවන් ගැන ප්‍රකාශයක් නිකුත් කරන චාර්ල්ස් බීචර් මෙසේ පවසා තිබේ: "ඔවුහු සභාවෙහි ඇදහිලි ප්‍රකාශනයන්ට විරුද්ධව එක වචනයක් හෝ කීමෙන් වැලකී සිටීමට වෙර දරති. එවැනි වචනයක් කීමට බිය වෙති. එසේම ඔවුන්ගේ පියවරුද නැගී එන්නා වූ ශාන්තුවරයන්ගේ සහ වේද සාක්ෂිකරුවන්ගේ නමස්කාරයට විරුද්ධව එක වචනයක් හෝ කීමෙන් වැලකී සිටියෝය. විරුද්ධ වීමකට නොව නමස්කාරයෙහි යෙදීමට ඔවුන්ගෙන් ලැබුණේ අනුබලයකි ... දහම් ප්‍රචාරක ප්‍රොතැස්තන්ත නිකායන් විසින් කොපමණ දුරට මනුෂ්‍යයන්ගේද ඔවුන්ගේමද අත් බැඳ තබා ඇත්තේද යත් දහම් ප්‍රචාරක කටයුතුවල යෙදෙන තැනැත්තේ එසේ කරන්නට පෙර ශුද්ධ බයිබලය හැර වෙනයම් පොතක්ද පිළිගත යුතුය යන්න නියම කර තිබේ. ප්‍රොතැස්තන්ත සභාවන්ද රෝමය මීටපෙර කළාවූ අන්දමටම බයිබලය පරිහරණය කිරීම තහනම් කර ඇත්තේය යන්න මනඃකල්පිත ප්‍රකාශයක් නොවේ."

යම් යම් විශ්වාසවන්ත ගුරුවරු ඉදිරියට පැමිණ දෙවියන්වහන්සේගේ වචනය පැහැදිලි කරදෙන්නට ආරම්භ කළ වහාම, වියතුන් මෙන්ම ශුද්ධ ලියවිලි තේරුම් ගැනීමේ ප්‍රවීනයන් යයි කියාගන්නා දේවගැතිවරුද නැගිට ඉදිරිපත්ව ඇති නිරවද්‍ය දහම මිථ්‍යා ප්‍රබන්ධයකැයි හෙළා දකීමට ක්‍රියා කළහ. ඒ අනුව සත්‍යතාව පිළිබඳව විපරම් කරන්නන් වෙනත් පසෙකට යොමු කරවනු ලැබිණ. බබිලෝනියේ මුද්‍රික පානයෙන් ලෝකයා මත්වී නොසිටියෝ නම් සත්‍යතාවයේ සරල දහම් සිතට කාවැදී යෑම මගින් බොහෝ අය දෙවියන්වහන්සේගේ වචනයේ සත්‍යය අනුව ගැළවුම්කාරයාණන් පිළිගන්නවා ඇත. එසේ වී නමුත් ආගමික ඇදහිල්ල කෙතරම් දුරට වියවුල් කොට විසංවාදී වී තිබුණේද යත් සත්‍යය ලෙස විශ්වාසය තැබිය යුත්තේ කුමක් කෙරෙහි දැයි යන්න තෝරා ගැනීමට ජනතාවට හැකියාවක් නොවීය. පසුතැවිලි නොවන ලෝකයාගේ පාප සභාවේ දොරටුව ඉදිරියෙහි ලැගුම් ගෙන සිටී.

එළිදරව් 14 හි සඳහන් දෙවන දේව දූතයාගේ පණිවිඩය මුල් වතාවට දේශනා කරනු ලැබුවේ 1844 හි ගිම්හානයේදීය. එය විශේෂාකාරයෙන් අමෙරිකා එක්සත් ජනපදයේ දේවස්ථානවලට



බලපෑවේය. විනිශ්චය තේමා කරගත් පණිවිඩය බහුලව ප්‍රචලිත කරනු ලැබුවේ එම රටෙහිය. එසේම එම පණිවිඩය එරට කිතුණු ජනතාව බහුතරයක් වශයෙන් ප්‍රතික්ෂේප කළහ. ඒ අතරෙහි එම වකවානුව තුළ සභාවන්හි තත්ත්වය බොහෝසේ පහළ බැස්සේය. එසේ වුවද දෙවන දේව දූතයාගේ පණිවිඩය 1844 දී සම්පූර්ණ වශයෙන් ඉටු නොවීය. දෙවෙනි ඊමේ පණිවිඩයෙහි ආලෝකය ප්‍රතික්ෂේප කළ නිසා සභාවන් තුළ අධ්‍යාත්මික පිරිහීමක් දළු ලා වැඩෙන්නට විය. එහෙත් එම අවස්ථාවේදීද සම්පූර්ණ වැටීයාමක් සිදු නොවීය. කාලයාගේ අවශ්‍යතාවයන් සඳහා විශේෂ ආලෝක දහරා එවන ලදුව එම පණිවිඩ පිළිනොගැනීම දිගටම කරගෙන ගිය නිසා ඔවුන් තව තවත් පහළට කිඳා බසින්නට විය. මේ වන තුරුත් "බබිලෝනිය වැටී ගියේය"යි පැවසීමේ අවස්ථාව උදා වී නැත. ඇයගේ වේශ්‍යාකමේ මුද්‍රික පානයෙන් ඇය තවමත් මුළු ලෝකයම මත් කරවන්නට ක්‍රියාත්මක වී නැත. ලෝකය සමග අනුගත වීමේ ආත්මයක්ද අපගේ කාලයට අත්‍යාවශ්‍ය වූ සත්‍යතාවන් නොසලකා හැරීමක්ද සෑම රටකම එකාකාරව සිදුවෙමින් පවතියි. කිතුණු රාජ්‍යයේ ප්‍රොතැස්තන්ත ඇදහිල්ල රජකරන රටවලද එම අහිතකර තත්ත්වය ප්‍රබල ලෙස වර්ධනය වෙයි. දෙවන දේව දූතයාගේ පණිවිඩයෙහි වූ භයානක තරවටුවට මෙම සභාවන්ද ඇතුළත්ය. එසේ වුවද, නිමල දහමට විරුද්ධව ක්‍රියා කිරීමේ වැඩය මෙතෙක් උච්ඡ ස්ථානය කරා පැමිණ නැත.

ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය සිදුවීමට පෙර සාතන්ගේ මුළා කිරීමේ ප්‍රයත්නයක් ගැන ශුද්ධ බයිබලය අනාවරණය කරයි. "සියලු ආකාර ආශ්චර්යවලින්ද, ලකුණුවලින්ද, පුදුමවලින්ද..... අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලිවලින්ද" සාතන් ක්‍රියා කරනවා ඇත. 'ඔවුන් එසේ විනාශ වන්නේ ශුභාරංචියේ සත්‍යයට ප්‍රේම කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් ගැළවීම නොලද බැවින්ය.' මෙවන් අයට සිදුවන්නේ මුසාවේ බලයෙහි ක්‍රියාකාරිත්වය නිසා සත්‍යය වෙනුවට බොරුව විශ්වාස කිරීමටය. (2 තෙසලෝනික 2:9-11). මෙම තත්ත්වය උදාවන තෙක්ද කිතුණු ලෝකය පුරා සභාව සහ ලෝකය පූර්ණ ලෙස එක්සත් වීමක් සිදුවන තෙක්ද බබිලෝනියෙහි වැටීම සම්පූර්ණ නොවන්නේය. මෙම වෙනස ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නකි. එළිදරව් 14 හි අනාවැකිය ඉටුවන්නේ ඉදිරි කාලකයකදීය.

බබිලෝනිය නමැති සන්ධානයෙහි පාර්ශ්වකරුවන් වන සභාවන් ආත්මික අන්ධකාරයෙහි ගිලී දෙවියන්වහන්සේගෙන් ඉවත් වී කටයුතු කළද, ක්‍රිස්තු සමිඳාණන්ගේ සත්‍යවාදී අනුගාමිකයන්ගෙන් සැදුම්ලත් බැතිමතුන් විශාල සංඛ්‍යාවක් ඔවුන් අතරෙහි සිටිති. වත්මන් කාලය සඳහා දෙනු ලැබූ විශේෂ සත්‍යතාවන් පිළිබඳව කිසිම දැනුමක් හෝ

නැති බොහෝ අයද, මේ අතර සිටිති. පවතින්නාවූ වත්මන් තත්ත්වය ගැන සෑහීමකට පත් නොවූ බොහෝ දෙනෙක් පැහැදිලි ආලෝකයක් බලාපොරොත්තුවෙන් උපේක්ෂාවෙන් යුතුව බලා සිටිති. තමන් සහභාගිකම් පවත්වන්නාවූ සභාවන් තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිරූපකය දකගැනීමට ඔවුහු නිරර්ථකයේ වෙහෙසෙති. මෙම සභාවන් සත්‍යතාවෙන් ඉවතට හැරී තව තවත් ඈතට යමින් ලෝකයට තව තවත් ළං වෙමින් සන්ධානගත වෙත්ම පක්ෂ දෙක අතර වෙනස්කම්හි පරතරය විශාල වේ. මෙම ක්‍රියාදාමය කරණකොටගෙන සිදුවන්නාවූ ප්‍රතිඵලය වන්නේ සත්‍යවාදී බැතිමත්හු තමන් මෙතෙක් සිටි සභාවන්ගෙන් ඉවතට පැමිණීමය. උත්තරීතර ලෙස දෙවියන්වහන්සේට ආදරය කරන්නාවූ අයට තවදුරටත් "නවීකරණයවූ" ලෝකයට ගැති සභාවන් සමග එක්ව නමස්කාර කරන්නට නොහැකි කලක් උදාවෙනවා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් සභාවන්ගෙන් වෙන් වෙනවා ඇත. සභාවේ අය "දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේම කරන්නෝව දේව භක්තියේ වේසය දරන නමුත් එහි බලය එපා කළ අය" වන බැවින් තවදුරටත් ඔවුන්ට සම්බන්ධව සිටීමට මේ බැතිමතුන්ට නුපුළුවන් වෙනවා ඇත.

එළිදරව් 14: 6-12 හි අනතුරු ඇඟවීමේ පණිවිඩය පිළිනොගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දෙවන දූතයා සඳහන් කරන තත්ත්වයට සභාව පැමිණීමත් සමගම, සත්‍යවාදී බැතිමතුන්ට සභාවලින් ඉවත්ව පිටතට පැමිණෙන්නැයි එළිදරව් 18 හි පණිවිඩයෙන් කියැවේ. මෙතෙක් කලක් ඔවුහු බබිලෝනිය සමග සමාගම් පැවැත්වූ නමුත්, තවත් එසේ සිටීමට නොහැකි වන නිසා වෙන්වීමට ඔව්හු තීරණය කර ගනිති. ලෝකයට ලැබෙන්නට යන අන්තිම පණිවිඩය මෙය වනවා ඇත. එම පණිවිඩය සිය කාර්ය භාරය ඉටු කරනවා ඇත. සත්‍යය විශ්වාස නොකොට දුෂ්ටකම තුළ ප්‍රීති ප්‍රමෝදවූ අය මහත් මුළාකිරීමකට පත්වී මුසාවක් විශ්වාස කිරීමට සැලසෙනවා ඇත. එවිට සත්‍යතාව පිළිගැනීමට තමන් හදවත් විවෘත කර සිටින අය මත සත්‍යයේ ආලෝකය පතිත වනවා ඇත. ඒ වන තුරුත් බබිලෝනියේ සිටින්නාවූ දෙවි සමිඳාණන්ගේ දරුවන් "මාගේ සෙනඟෙනි .... ඇගෙන් ඉවත්වී එන්න" (එළිදරව් 18: 4) යන කැඳවීම පිළිගන්නවා ඇත.



# 22

# අනාවැකි ඉටු වෙයි

කිතුණු ජනතාව ඉමහත් උද්‍යෝගයකින් යුතුව ක්‍රිස්තු සමිඳාණන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියෝය. 1844 වසන්ත සමයේදී එම සංසිද්ධිය ඉටු වෙතැයි ඔවුහු උපේක්ෂාවෙන් යුතුව බලා සිටියෝය. වකවානුව පැමිණි නමුත් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සිදුනොවීය. බොහෝ අයගේ විශ්වාසය සුනු විසුණු වී ගියේය. අනුමානය සහ අස්ථිරතාව රජ කරන්නට විය. යේසුස්වහන්සේගේ පැමිණීම කෙරෙහි බලාපොරොත්තුව රැඳවූ අය පරාජයකට ගොදුරු වූ බව ලෝකයාගේ චින්තනය විය. එසේ වුවද, පැමිණීම අපේක්ෂා කළ අයගේ සැනසීම වූයේ දේව වචනය පමණක්ය. තමන්ගේ විශ්වාසය හා ඇදහිල්ල රැඳවූ සිද්ධිය පිළිබඳව කරුණු සොයා බැලීමට ඔව්හු ශුද්ධ ලියවිල්ලට තම අවධානය නැවත වරක් යොමු කළහ. වැඩිපුර ආලෝකය ලබාගැනීමට ඔවුහු දිවැසි ප්‍රකාශන නැවත නැවතත් අධ්‍යයනය කළෝය. ඔවුන්ගේ අධ්‍යයනයෙන් සාක්ෂාත් වූයේ ඔවුන් පැමිණ තිබූ තීරණය පැහැදිලි වූද, ස්ථිරසාරවූ ද නිමාවක් බවය. අනුමාන රහිත ලකුණු පෙන්නුම් කළේ ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනය වැඩි ඈතක නොවන බවය. පව්කරුවන් ආගමට හැරීමද කිතුණුවන් අතරේ ආත්මික පුබුදුවක් ඇතිවීමද යන ආශිර්වාද මගින් පැහැදිලි වූයේ මෙම පණිවිඩය සගයෙන් පැමිණි එකක් බවය. තමන් ලැබූ බලාපොරොත්තු කඩවීමේ අත්දකීමට හේතුව බැතිමතුන්ට තේරුම් ගත නොහැකි වුවද, තමන්ගේ මේ අත්දකීම දෙවියන්වහන්සේගේ මගපෙන්වීම අනුව දෙනු ලැබූ බව ඔව්හු ස්ථිර ලෙස විශ්වාස කළහ.

දෙවන පැමිණීම පිළිබඳව වූ අනාවැකි හා බැඳිව ඔවුන් පත්ව සිටි අවිනිශ්චිතතාව සහ දෙගිඩියාව කෙරෙහි අවධානය යොමුවූ උපදෙස්ද තිබූ බව අධ්‍යයනයේදී ඔවුන්ට පැහැදිලි විය. එමගින් ඔවුන්ව දැනුවත් කර තිබුණේ ඇදහිල්ල අත නොහැර එය තුළ රැඳී සිටින ලෙසය; දැන් අඳුරුව පෙනෙන දේ යථා කාලයේදී යථා අයුරින් පැහැදිලි කරදෙනු ලබන බවය.

මෙම අනාවැකි අතර හබක්කුක් 2:1-4 විශේෂ ස්ථානයක් දැරීය. "මම මාගේ මුරපළ උඩට පැමිණ, බලකොටුව උඩ සිටගන, උන්වහන්සේ මට කියන්නේ මොකද කියාත් මාගේ පැමිණිල්ල ගැන මා විසින් මොන උත්තරයක් දිය යුතුද කියාත් දැනගන්ට බලා සිටින්නෙමි. ස්වාමින්වහන්සේ මට උත්තර දෙමින්: දර්ශනය කියවන්නා

ඉක්මණින් කියවන්ට පුළුවන් වන පිණිස එය ලැලිවල පැහැදිලි ලෙස ලියන්න. මක්නිසාද දර්ශනය නියම කාලය දක්වා තව ප්‍රමාද වේ. එහෙත් එය බොරු නොවී ඉක්මණින් තීන්දුවට පැමිණෙන්නේය. එය ප්‍රමාද වෙතත් ඒ ගැන බලා සිටින්න; මක්නිසාද  එය පසු නොබැස පැමිණෙනවාම ඇත. බලව, ඔහුගේ සිත උඩඟුය, එය ඔහු තුළ අවංකව නැත. ධර්මිෂ්ඨයා තමාගේ විශ්වාසකමෙන් ජීවත් වන්නේයයි කීසේක."

'දර්ශනය කියවන්නාට ඉක්මණින් කියවන්ට පුළුවන් වන පිණිස එය ලැලිවල පැහැදිලි ලෙස ලියන්න' යන මගපෙන්වීම 1842 මුල් කාලයේදීම චාර්ල්ස් ෆිච්ගේ අවධානයට යොමු කරනු ලැබීය. අපේක්ෂකයාට දිවැසි වැකි පැහැදිලි ලෙස දකගැනීමට හැකිවන පිණිස දිවැසි වැකි ප්‍රකාශනවල සටහනක් පිළියෙල කිරීමට ඔහුට දේව මගපෙන්වීමක් ලැබිණි. දානියෙල් සහ එළිදරව් පොත් ඒ සඳහා මූලික කරුණු සපයා දුන්නේය. මෙම අනාවැකි ඇතුළත් සටහන ප්‍රකාශයට පත්කිරීම හබක්කුක්ට දෙනු ලැබූ අණසක ඉටුකිරීමක් ලෙස ගණන් ගන්නා ලදී. බලා සිටීමේ කාලයක් අනාවැකිය හා බැඳී තිබුණ බව කිසිවෙකුගේ හෝ අවධානයට යොමු නොවීය. බලා-පොරොත්තු සුන්වීමෙන් පසුව මෙම ශුද්ධ ලියවිලි අන්තර්ගතය කැපී පෙනෙන්නට පටන් ගත්තේය: "මක්නිසාද දර්ශනය නියම කාලය දක්වා තව ප්‍රමාද වේ. එහෙත් එය බොරු නොවී ඉක්මණින් තීන්දුවට පැමිණෙන්නේය. එය ප්‍රමාද වෙතත් ඒ ගැන බලා සිටින්න, මක්නිසාද එය පසු නොබැස පැමිණෙනවාම ඇත. .... ධර්මිෂ්ඨයා තමාගේ විශ්වාසකමෙන් ජීවත් වන්නේය."

එසකියෙල්ගේ අනාවැකියෙහි එක් කොටසක්ද බැතිමතුන්ට ශක්තිය හා සැනසුම උදාකර දුන්නේය. ඒ මෙසේය: "තවද ස්වාමින්වහන්සේගේ වචනය මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, දවස් පසුවන්නේය, දර්ශන සියල්ල නැති වන්නේය කියා ඉශ්‍රායෙල් රටෙහි නුඹලා අතරෙහි ව්‍යවහාර වන උපමා කීම කිමෙක්ද? එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේකැයි ඔවුන්ට කියන්න .... එසේය ඒ දවස්ද සියලු දර්ශනවල කාරණාද ළංවී තිබේ යයි ඔවුන්ට කියන්න .... මම කියන දේ කියන්නෙමි. එය තවත් පමා නොවී ඉෂ්ට වන්නේය." "ඉශ්‍රායෙල් වංශය කථා කොට ඔහු දකින දර්ශනය ඉෂ්ට වෙන්ට බොහෝ දවස් යන්නේය. ඔහු අනාගතවාක්‍ය කියන්නේ දුර කාලවල් ගැන යයි කියති. එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේකැයි ඔවුන්ට කියන්න. මාගේ කිසි වචනයක් තවත් ප්‍රමාද නොවී මා විසින් කියන වචනයක් සිදුවන්නේමය කියා ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේක." (එසකියෙල් 12:21-25,27,28).



බලා සිටියාවූ බැතිමත්හු ප්‍රීති ප්‍රමෝදයට පත් වූහ. දෙවියන්-වහන්සේ ආරම්භයේ සිට අවසානය දක්වා සියල්ලක්ම දන්නා සේකැයි ඔවුන්ට ප්‍රත්‍යක්ෂ විය. අනාගතය දකින්නාවූ තැනැන්වහන්සේ ඔවුන්ගේ බලාපොරොත්තු කඩවීම දක දිරිමත් කිරීමේ සහ බලාපොරොත්තුවේ මෙම වදන් ඔවුන්ට ලබා දී ඇති නිසා එය ඔවුන්ට සැනසුමක් විය. ඉවසීමෙන් යුතුව බලා සිටින ලෙස දුන් ඔවා බස් ශුද්ධ ලියවිලි අතර නොතිබුණේ නම් එම පිරික්සුමේ පැයේදී ඔවුන්ගේ ඇදහිල්ල විනාශ වන්නට පුළුවන්කම තිබුණි.

යේසුස්වහන්සේගේ පැමිණීම බලාසිටියාවූ මේ අයට ඇඩ්වෙන්ටිස්ත වරුන් යයි කියනු ලැබේ. මතෙව් 25 හි කන්‍යාවන් දස දෙනාගේ උපමාවෙන් ඔවුන්ගේ අත්දකීම මනාවට නිදසුන් විය. තම ස්වාමින් වූ ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනයත් ලෝකාන්තිමයත් පිළිබඳව ගෝලයන්ගේ ඉතා වැදගත් ප්‍රශ්නයකට පිළිතුරු දෙන්නාවූ ක්‍රිස්තු සමිදාණෝ තමන්වහන්සේගේ මුල් පැමිණීම සහ දෙවන පැමිණීම අතර ලෝකයේ සහ සභාවේ හටගන්නාවූ සිදුවීම් ගණනාවක් මතෙව් 24 න් පෙන්වා දුන්සේක. යෙරුසලමෙහි විනාශයත්, මිසදෙටු රෝමයෙන් මෙන්ම පාප් බල අධිකාරියෙන්ද දියත් කළ හිංසා පීඩා යුගයත් හිරු සහ සඳුගේ අඳුරු වීමත්, තාරකාවන්ගේ වැටීමත් ඒවාට ඇතුළත් විය. ඉක්බිතිව තමන්වහන්සේ ස්වකීය රාජ්‍යයෙන් යුතුව පැමිණීමත් උන්වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටි පන්ති දෙකක සේවකයනුත් ගැන උපමාවද උන්වහන්සේ පැවසූ සේක. 25 වන පරිච්ඡේදය මෙසේ ඇරඹේ, "එකල තමුන්ගේ පහන් රැගෙන මනමාලයාගේ පෙරමඟට ගිය කන්‍යාවන් දස දෙනෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කරනු ලැබේ." මෙම උපමාව නිර්දේශ කරන්නේ ලෝකාන්තිම දවස්වලදී සභාව තුළ පවතින්නාවූ ජීවන රටාවය. 24 වන පරිච්ඡේදයේ අවසානයේද මේ ගැන දක්වනු ලැබේ. පෙරදිග විවාහ මංගල්‍යයකදී වන්නාවූ සිදුවීම් තුළින් මොවුන්ගේ අත්දකීම් විමර්ශනයට ලක් කෙරේ.

"එකල තමුන්ගේ පහන් රැගෙන මනමාලයාගේ පෙරමඟට ගිය කන්‍යාවන් දස දෙනෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කරනු ලැබේ. ඔවුන්ගෙන් පස් දෙනෙක් නුවණ නැත්තියෝය, පස්දෙනෙක් නුවණ ඇත්තියෝය. මක්නිසාද නුවණ නැත්තියෝ තමුන්ගේ පහන් ගෙනයද්දී තමුන් සමග තෙල් නොගෙන ගියෝය. නුවණ ඇත්තියෝ තමුන්ගේ පහන් සමග තමුන්ගේ භාජනවල තෙල් ගෙන ගියෝය. මනමාලයාගේ ඊම ප්‍රමාද වූ කළ, ඒ සියල්ලෝම නිදිබරව නිදා ගත්තෝය. මධ්‍යම රාත්‍රියේ: අන්න, මනමාලයා එනවා! ඔහුගේ පෙරමඟට එන්නැයි හඬක් වූයේය."

පළමු දේව දූතයාගේ පණිවිඩය මගින් ප්‍රකාශ කරනු ලැබුවේ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම බවද එය මනාලයාගේ පැමිණීම මගින්

පෙන්නුම් කරනු ලැබුවේ යයිද ඒ මනුෂ්‍යයෝ කල්පනා කළහ. උන්වහන්සේගේ කඩිනම් පැමිණීම පිළිබඳ ප්‍රකාශන යටතේ සිදුවූ ව්‍යාප්ත ප්‍රතිසංස්කරණය මනාලයා හමුවීමට පෙරමඟට ගිය කන්‍යාවන්ගෙන් නිරූපණය විය. මතෙව් 24 හි මෙන්ම මෙම උපමාවෙහිද කාණ්ඩ දෙකක් පෙන්නුම් කෙරේ. සෑම අයෙක්ම තමන්ගේ පහන්, එනම් ශුද්ධ බයිබලය රැගෙන එහි ආලෝකයෙහි පිහිටෙන් මනාලයා හමුවීමට ගියෝය. 'නුවණ නැති කන්‍යාවන් පහන් රැගෙන ගිය නමුදු ඒ සඳහා තෙල් ගෙන ගියේ නැත. එහෙත් නුවණ ඇත්තියෝ තමන්ගේ පහන් සමග භාජනවල තෙල්ද ගෙන ගියෝය.' මේ දෙවන කාණ්ඩයට දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය ලැබී තිබුණේය. ඒ වනාහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රකෘතිමත් කරන්නාවූ, ආලෝකමත් කරන්නාවූ බලයයි. එමගින් උන්වහන්සේගේ වචනය පාදයට පහනක්ද, මාවතට ආලෝකයක්ද, වන්නේය. දෙවියන්වහන්සේට වූ ගරු බිය ඇතිව ඔවුහු සත්‍යය සොයා ගැනීම සඳහා ශුද්ධ ලියවිලි සෙවූහ. ඔවුහු තම හදවතේ ජීවනයෙහි පවිත්‍රතාව අවංකව සෙවූ අය වූහ. මෙම අයට දෙවියන්වහන්සේ තුළ සහ උන්වහන්සේගේ වචනය තුළ පුද්ගලීක ඇදහිල්ලක අත්දැකීමක් තිබිණ. අපේක්ෂා භංගත්වයකට හෝ පමාවීමකට හෝ එම ඇදහිල්ල විනාශ කර දැමීමට හැකියාවක් නොවීය. පහන් රැගෙන ගිය නමුදු අවශ්‍ය තෙල් රැගෙන නොගිය අය ක්‍රියා කර තිබුණේ හදිසි ආවේගයකිනි. චිත්තාවේග මගින් පොළඹවනු ලැබූ හදිසි තීරණ නිසා ඔවුහු දේව මාර්ගය තෝරාගත් අය වූහ. ගාම්භීර පණිවිඩය ඇසීමෙන් ඔවුහු පෙළඹවීමකට පත් වූවෝය. එහෙත් ඔවුහු තමන්ගේ සහෝදරයන්ගේ ඇදහිල්ල මත යැපී සිටියෝය. සත්‍යය ගැන පූර්ණ අවබෝධයකින් තොරව, කරුණා-අනුග්‍රහය මගින් හදවත අවංකවම වෙනස්වීමකට භාජනය නොවී ඔවුහු යහපත් චිත්තාවේග නැමැති ළෙල දෙන පහන් සිළුවෙන් සෑහීමකට පත්ව සිටියෝය. ඔවුහු ක්ෂණික විපාක බලාපොරොත්තුවෙන් සමිඳුන් මුණ ගැසීමට ඉදිරියට ගියෝය. නමුත් බලාපොරොත්තු කඩවීමකට හෝ පමාවීමකට මුහුණ දීමකට සූදානමක් ඔවුන් තුළ නොවීය. පරීක්ෂාවන් පැමිණි විට ඔවුන්ගේ ඇදහිල්ල බිඳ වැටුණේය, ඔවුන්ගේ ආලෝකය නිවී යන්නට විය.

"මනාලයාගේ ඊම ප්‍රමාදවූ කළ ඒ සියල්ලෝම නිදිබරව නිදාගත්තෝය" මනාලයාගේ පමා වීමෙන් පෙන්නුම් කළේ ක්‍රිස්තු සමිඳාණන්ගේ පැමිණීමේ අපේක්ෂාව ඉටු නොවීම, කාලය ගෙවී යාම, බලාපොරොත්තු බිඳ වැටීම සහ පෙනෙන්නාවූ පමාවයි. අවිනිශ්චිතවූ මෙම කාලය තුළදී අතිශයෝක්ත උනන්දුවක් දක්වූ එහෙත් අඩ හදවතකින් විශ්වාසය රැඳවූ අය දෙගිඩියාවකට පත් වූහ; නමුත් ශුද්ධවූ බයිබලීය ප්‍රකාශන පිළිබඳව පුද්ගලික දැනුමක් මත ඇදහිල්ල රැඳවූ අයගේ පාද ශක්තිමත් ගලක් මත පිහිටා තිබිණ. බලාපොරොත්තු කඩවීමේ රැල්ලට ඔවුන්ව ගසාගෙන යාමට නුපුළුවන්



විය. "ඔවුන් සියල්ලෝම නිදිබරව නිදාගත්තෝය." එක් කණ්ඩායමක් කිසිදු හැඟීමක් නැතිව, තමන්ගේ විශ්වාසය අත්හැර දමමින්ද ක්‍රියා කළ අතර අනෙකුත් අය තවත් පැහැදිලි ආලෝකය ලැබෙන තෙක් ඉවසීමෙන් යුතුව බලා සිටියෝය. එහෙත් පරීක්ෂාවේ අඳුරු පැයේදී දෙවන පාර්ශ්වයේ අයද යම් ප්‍රමාණයක ජ්වලිත භාවයෙහි සහ භක්තියෙහි අඩුවීමක් පෙන්නුම් කළහ. අඩ වශයෙන් විශ්වාස කළ අයට තම සහෝදරයන්ගේ ඇදහිල්ල මත තවදුරටත් රැඳී සිටීමට නොහැකි විය. සෑම අයෙකුම තමා උදෙසා නැඟී සිටිය යුතු විය, නැතහොත් වැටී යාමට ගොදුරු විය යුතු විය.

මෙම වකවානුවේදී භක්ති උන්මාදය නැඟී එන්නට විය. පණිවිඩය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වමින් ක්‍රියාකාරීව සිටි සමහර අය දේව වචනය සහමුලින්ම ප්‍රතික්ෂේප කළෝය. දේව වචනය තමන්ගේ නොවරදින මගපෙන්වන්නා ලෙස අවිවාදයෙන් පිළිගත් ඔවුහු තමා ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම ලැබුවා යයි කියා තමන්ගේම හැඟීම්, චිත්තරූප සහ සංකල්පනාවන්ට පාලන බලය ලබාදී සත්‍ය දහම හැරපියා කටයුතු කරන්නට වූහ. ඒ අතර තවත් සමහරෙක් අන්ධ වූ, ජ්වලිතතාවක් පෙන්නුම් කරමින් අවිචාර බුද්ධියෙන් යුතුව ස්ව මතයෙහිම එල්බ සිටිමින් තමන්ගේ මාර්ග පිළිනොගන්නා සැමට දොස් පවරන්නට වූහ. ඔවුන්ගේ වෑයම් කිරීම් සහ අන්ධ භක්තියෙන් යුතු ජ්වලිතතාව බහුතර ඇඩ්වෙන්ටිස්තවරුන්ගේ අනුකම්පාව දිනාගැනීමට අසමත් විය. එසේ වුවද, ඔව්හු සත්‍යතාවේ කාර්යයට නින්දාව සහ අපකීර්තිය ඇති කළහ.

දෙවියන්වහන්සේගේ වැඩකටයුතු වලට විරුද්ධව ක්‍රියා කරමින් ඒවා විනාශ කර දැමීමට සාතන් මෙම ක්‍රමය මගින් වෑයම් කළේය. ඇඩ්වෙන්ටිස්ත මෙහෙයුම මගින් විශාල ජනතාවක් උනන්දුවකට පත් වූහ. පව්කාරයන් දහස් ගණනින් දේව මාර්ගයට පැමිණියෝය. බලා සිටින්නාවූ වකවානුවේදී වුවද, බොහෝ විශ්වාසවන්ත සෙනඟක් සත්‍යතාව ප්‍රචාරය කිරීමේ සේවාවෙහි යෙදුණාහ. නපුරේ කුමාරයාගේ යටත් වැසියන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ යන්නට විය. දෙවියන්-වහන්සේගේ මෙහෙවරය උපහාසයට ලක් කිරීම පිණිස ඇදහිල්ල තුළ පිහිටා සිටි සමහර අයව අන්තවාදී තත්ත්වයකට යොමු කිරීමට සාතන් යත්න දැරීය. ඉක්බිතිව මෙම අන්තවාදීන් තම නියෝජිතයන් ලෙස යොදාගත් සාතන් ඔවුන් ලවා ඇඩ්වෙන්ටිස්ත බැතිමතුන්වත්, ඔවුන්ගේ ඇදහිල්ලත් නින්දා අපහාසයට ලක් කිරීමට වෑයම් කළේය. සාතන්ගේ නියෝජිතයෝ ඇඩ්වෙන්ටිස්තවරුන්ගේ සෑම වැරදි ක්‍රියාවක්ම, ඔවුන්ගේ සෑම පසුබෑමක්ම, සෑම අශෝභන භූමිකාවක්ම අතිශ-යෝක්තියෙන් රස කරමින් ජනතාව ඉදිරියේ කියා පෑවෝය. දෙවන ඊම කෙරෙහි විශ්වාස කරනවා යයි පවසන්නාවූ සමූහයක් එක් රැස්කොට තමන්ගේ බලය උපකාර කරගනිමින් ඔවුන්ගේ හදවත්

පාලනය කරමින් සාතන් උපක්‍රමශීලීව භූමිකාවක් දියත් කළේය. මෙම අසමත්ජාතී කණ්ඩායම නියම ඇඩ්වෙන්ටිස්ත සභාව නියෝජනය කරන්නේ යයි කියමින් ඇඩ්වෙන්ටිස්ත විරෝධී ක්‍රියාවන්හි යෙදීමට මොවුන්ව පෙළ ගස්වා එයින් ඇඩ්වෙන්ටිස්ත කණ්ඩායමට නිගා ගෙන දීම සාතන්ගේ ක්‍රමවේදය විය.

සාතන් වනාහි "සහෝදරයන්ට වරද තබන්නාය." දේව ජනතාවගේ වැරදි සහ දුර්වලකම් සොයමින් ඒවා පොදු ජනතාව ඉදිරියෙහි දක්වීමට ඔහු ක්‍රියා කළේය. එහෙත් දේව දරුවන්ගේ යහපත් ක්‍රියාවක කිසිම සඳහන් කිරීමක් හෝ නොවීය. ආත්මයන්ට ගැළවීම ලබාදීමේ දෙවියන්වහන්සේගේ වැඩ පිළිවෙතට එරෙහිව ක්‍රියා කිරීමට සාතන් සැමවිටම සූදානමින් සිටී. දෙවියන්වහන්සේගේ පුත්‍රයන් දෙවියන්-වහන්සේගේ අභිමුඛය ඉදිරියෙහි රැස්වූ අවස්ථාවේදී සාතන්ද ඔවුන් සමග පැමිණියේය. යම් තැනෙක ආත්මික පිබිදීමේ සැසි වාරයක් ක්‍රියාත්මක වේද, ආත්මික කැපවීමක් නැති අය හා මානසික දුබලතාවයක් ඇති අය එතැනට ගෙන ඒමට සාතන් නිතරම සූදානමින් සිටී. දහම් ප්‍රචාරක රැස්වීම් මාලාවනට සාතන් විසින් එවනු ලබන්නාවූ මෙවන් පුද්ගලයන් සමහර දහම් පිළිගත් විට මොවුන් තුළින් ක්‍රියා කරන්නාවූ සාතන් පරික්ෂාකාරීව කටයුතු නොකරන්නාවූ අයව මුළා කිරීම සඳහා ව්‍යාජ ධර්මයන් ඉදිරිපත් කරයි. දෙවියන්වහන්සේගේ දරුවන් සමග නමස්කාර ගෘහයෙහි මෙහෙයන්ට සහභාගී වීම නිසා හෝ සමිඳුන්ගේ මේසය වටා සත්කර්ම මෙහෙයන්ට සහභාගී වීම නිසා හෝ කිසිම පුද්ගලයෙකු අව්‍යාජ කිතුණුවෙකු යැයි ඔප්පු නොවේ. සාතන් තමන්ගේ නියෝජිතයන් ලෙස ක්‍රියා කළ හැකි අය තුළින් ගාම්භීර රැස්වීම් වලට පැමිණෙයි.

ස්වර්ගීය නගරය කරා දෙවියන්වහන්සේගේ සෙනඟ ගමන් කරන්නාවූ මාර්ගයෙහි සෑම බිම් අඟලක් පුරාම නපුරේ කුමාරයා ක්‍රියා කරයි. සභා ඉතිහාසයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාමාලාවන් වුවද, ඉදිරියට ගියේ මහත් හිරිහැර බාධකවලටද මුහුණ දෙමිනි. පාවුල්ගේ දවස්වලදී ද එසේ සිදු විය. අපෝස්තුළුවරයා විසින් යම් තැනෙක සභාවක් ස්ථාපිත කරනු ලැබීද, එම ස්ථානවල සිටි සමහර අය තමන් එම ඇදහිල්ලෙහි ධර්මතාවන් පිළිගන්නා බව ප්‍රකාශ කර සිටියද, ඔවුන් ඒ අතරතුර සභාව තුළට මිසදෙටු ඉගැන්වීම් ඇතුළු කිරීමට වෑයම් කළෝය. එම දහම් පිළිගනු ලැබී නම් සත්‍යතාවට වූ ආදරය ඉවත ලෑමක් සිදුවන්නේය. ලූතර්ටද මහත් ව්‍යාකූලතාවයන්ට මුහුණ දීමට සිදුවිය. එමගින් හෙතෙම මහත් දුක් පීඩාවන්ට පත් විය. ආගමික උමතුවන් කණ්ඩායමකගේ වැඩ පිළිවෙල ඔහුට මහත් හිසරදයක් විය. දෙවියන්වහන්සේ තමා තුළින් සෘජුවම කථා කර ඇතැයි පැවසූ ඔවුහු තමන්ගේ මතවාද සහ අදහස් ප්‍රකාශන ශුද්ධ ලියවිල්ලෙහි



සාක්ෂිවලට වඩා වැදගත් යයිද, පැවසූහ. සභාව තුළ ක්‍රියාත්මකව තිබූ ශුද්ධ ලියවිල්ලට පටහැනි ක්‍රියාදාමයන්ට එරෙහිව ප්‍රබල හඬක් නැගූ ලූතර් ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දෙමින් දෙවියන්වහන්සේ උදෙසා විශාල මෙහෙවරක් ඉටු කළේය. සාතන්ගේ උපක්‍රමශීලී මුළාවන් යටතේ මෙහෙයවනු ලැබූ ඉහත සඳහන් අන්දමේ පුද්ගලයෝ දෙවියන්වහන්සේ උදෙසා ලූතර් විසින් ගොඩනැගූ ප්‍රතිසංස්කරණ දහම් උදුරා දැමීමට ක්‍රියා කළෝය. තමන්ගේ ඇදහිල්ලෙන් සහ අනුබලයෙන් ලොවට සෙතක් උදා කළ, වෙස්ලි සහෝදරයන්ට සහ තවත් අයටද ඔවුන්ගේ සෑම පියවරකදීම සාතන් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අයගේ විරුද්ධවාදිකම් වලට මුහුණ දීමට සිදුවිය. සාතන් විසින් මෙම අයව සෑම ශ්‍රේණියකම ආගමික උමතුවන් බවට පත්කර තිබිණ.

ආගමික උමතුවෙන් ක්‍රියා කළ බලවේගයන් කෙරේ විලියම් මිලර්ගේ කිසිම අනුකම්පාවක් නොවීය. ලූතර් සමග ඔහුද ප්‍රකාශ කළේ සෑම ආත්මයක්ම දෙවියන්වහන්සේගේ වචනය මගින් පිරික්සා බැලිය යුතුය කියාය. "වත්මන් කාලයේ සිටින්නාවූ සමහර අයගේ මනස් කෙරෙහිද මහත් බලයකින් යුතුව ක්‍රියා කරමින් ඔවුන් තුළින් අනුබලයක් ඇතිකිරීමට යක්ෂයා ක්‍රියා කරනවා ඇත"යි මිලර් ප්‍රකාශ කළේය. "එම ආත්ම කුමන ආකාරයේ ආත්මයන් දැයි අපට දැනගැනීමට හැකිවන්නේ කෙසේද? ඔවුන්ගේ ඵල වලින් ඔවුන්ව හඳුනා ගත හැකි වනවා ඇතැයි ශුද්ධ බයිබලය පවසයි. විවිධ ආකාරයේ ආත්ම ලෝකය පුරා විසිර ගොස් සිටිති. එම ආත්ම පිරික්සා බලන ලෙස දෙවියන්වහන්සේ අපට අණකර තිබේ. මධ්‍යස්ථ ලෙස තැන්පත්ව, දැහැමිව සහ දේව භය ඇතිව වත්මන් ලෝකයේ දිවි ගෙවීමට අපට බල නොකරන්නාවූ ආත්මයක් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන් නොවෙයි. මෙම ක්‍රියාදාමයන් මෙහෙය වන්නේ සාතන් බව මට නැවත නැවතත් පැහැදිලි වන්නේය... ශුද්ධාත්මයාණන්වහන්සේගේ පහස කරණකොටගෙන පරිශුද්ධතාවයට පත්ව ඇතැයි පවසන්නාවූ අප අතරෙහි සිටින්නාවූ බොහෝ අය මිනිස් සම්ප්‍රදායන් අනුගමනය කරති. මෙම අයද, එසේ නොපවසන්නාවූ අය මෙන්ම සත්‍යතාව ගැන වැඩි දැනුමක් ඇති අය නොවෙති." (Bliss, "Memoirs of Wm. Miller, pp. 236, 237, 282). "සාවද්‍යතාවේ ආත්මය සත්‍යතාවයෙන් ඉවතට මගපෙන්වයි. දෙවියන්වහන්සේගේ ආත්මය සත්‍යතාව කරා මගපෙන්වයි. මිනිසෙක් වැරදි ඉගැන්වීමක් අනුගමනය කළද, තමාට සත්‍යතාව ඇතැයි සිතන්නට පුළුවන. එවිට තත්ත්වය කෙසේද? අප මෙසේ පිළිතුරු දෙමු: ආත්මයාණන්වහන්සේ සහ දේව වචනය එකඟ වේ, විරෝධී නොවේ. යම්කිසි මනුෂ්‍යයෙක් දේව වචනය පදනම් කරගෙන තමාවම විනිශ්වය කරගන්නේ නම්, ඔහු දේව වචනයේ ප්‍රකාශන සමග සම්පූර්ණ එකඟතාවක් පවත්වන්නේ නම් තමා සතුව

සත්‍යතාව ඇතැයි ඔහු විශ්වාස කළ යුතුය. ඒ අතර යම්කිසි අයෙකුට තමා විශ්වාස කරන්නාවූ දහම් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සමගද උන්වහන්සේගේ දහම් පුස්තකය සමගද අනුකූලතාවක් හා පූර්ණ එකඟතාවක් නැති බව පෙනී යතොත් ඔහු ඉතා ප්‍රවේශමෙන් තම ඉදිරි ගමන සැලසුම් කර ගනීවා. නැතහොත් හෙතෙම යක්ෂයාගේ මළපතට හසු වෙනවා ඇත." (The Advent Herald and Signs of the Times Reporter," Vol viii, No. 23 (Jan. 15, 1845)." ක්‍රිස්තියානි ලෝකයේ බැතිමතුන් විසින්, මහත් හඬ නගමින් කෑ මොර දෙමින් තමන්ට අභ්‍යන්තර ශ්‍රද්ධාවක් ඇතැයි ප්‍රකාශ කරන්නාවූ අය තුළ නොව, ඇසෙහි කඳුළු බිඳක් ඇති, තෙත් වූ කම්මුල් ඇති, කථා කරන්නට බැරි තරම් උගුරෙහි හිරවීමක් ඇති අය තුළ ගැඹුරු ශ්‍රද්ධාවක් සොයා ගැනීමට මට හැකිවී තිබේ." (Bliss Memoirs of Wm, Miller").

ප්‍රතිසංස්කරණය ප්‍රබල ලෙස ව්‍යාප්තව පැවති වකවානුවේදී එම කර්තව්‍යයෙහි සතුරෝ ආගම් උමතුවෙහි සෑම ආකාර නපුරක්ම ප්‍රතිසංස්කාරකයන්ට විරුද්ධව එල්ල කළෝය. දෙවෙනි ඊමේ ප්‍රකාශන මෙහෙයුමට එරෙහිවද මෙයාකාර විරෝධතා එල්ල විය. විරුද්ධවාදීහු මෙම අයගේ වැරදි අතිශයෝක්තියෙන් හුවා දක්වමින්ද ඔවුන්ගේ ක්‍රියාවන්ට වැරදි අර්ථකථන සපයමින්ද මුළු ව්‍යාපාරයම විවේචනයට ලක් කළෝය. එයින් නොනැවතුණු ඔවුහු සත්‍යතාවෙන් තොර අශුභවාදී වාර්තාද පතුරුවා හැරියෝය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම දොරටුව අභියසය යන ප්‍රකාශය නද දීමත් සමගම විරුද්ධවාදීන් තුළ කැළඹිල්ලක් ඇතිවී ඔවුන්ගේ සමාදානය චංචල විය. ප්‍රකාශය නිවැරදි විය හැකි යයි ඔවුන් තුළ භීතියක් ඇති වුවද, එය එසේ නොවේවා යනු ඔවුන්ගේ පැතුම විය. ඇඩ්වෙන්ටිස්තවරුන්ටත්, ඔවුන්ගේ ඇදහිල්ලටත් විරුද්ධව ක්‍රියා කිරීමේ රහස මෙය විය.

පාවුල්ගේ දවස්වලදී ද ලූතර්ගේ දවස්වලදී ද ආත්ම භක්තිකයන් හා උන්මාද භක්තිකයන් සභාව තුළට රිංගා ගත්තෝය. මෙවැනි අය ඇඩ්වෙන්ටිස්තවරුන් අතරේ සිටීම මෙම ව්‍යාපාරය දෙවියන්-වහන්සේගෙන් නොවන බව තීරණය කිරීමට හේතුවක් නොවන්නේය. දේව ජනතාව නින්දෙන් පිබිදිය යුතුය. ඔවුන් විසින් අවදිව පසුතැවිලිව ජීවිතය වෙනස් කරගත යුතුය. යේසුස්වහන්සේ තුළ වූ සත්‍යතාව දැන ගැනීමට ඔවුන් ශුද්ධ ලියවිලි සොයත්වා; දෙවියන්වහන්සේට සම්පූර්ණ ලෙස කැපවීමකට ඔවුන් ක්‍රියා කරත්වා. සාතන් තවමත් නිදි නැතිව ක්‍රියාත්මකව සිටින බව දකගැනීමට සාක්ෂි වලින් අඩුවක් වන්නේ නැත. සෑම ආකාරයකම මුළා කිරීම් මගින් ඔහු තම බලය පෙන්නුම් කරනවා ඇත. මෙම කාර්යය ඉටු කරගැනීම සඳහා ඔහු තමා යටතේ වූ වැටී ගිය සියළු දේව දූතයන්ගේ දායකත්වය ලබා ගන්නවා ඇත.



දෙවන පැමිණීමේ පණිවිඩය ප්‍රකාශ කළ කල්හි ආගම් උමතුව හා පක්ෂවලට බෙදීම් සිදුවූයේ පණිවිඩය ප්‍රකාශ කිරීම නිසා නොවේ. මෙම අන්තවාදී බෙදීම් හටගත්තේ 1844 හි ගිම්හානයේදීය, තමන්ගේ නියම තත්ත්වය පිළිබඳව ඇඩ්වෙන්ටිස්තවරු අනුමානයෙන් සහ වියවුල් සහගත හැඟීමකින් පෙළෙන්නට වූ විටය. පළමු දේව දූතයාගේ පණිවිඩයද "මැදියම් රාත්‍රියේ හඬද" එක එල්ලේම ආගම් උමතුවට සහ භේදයන්ට පහරක් එල්ල කළේය. මෙම පණිවිඩ ප්‍රකාශ කිරීමෙහි නිරතවූ අය එක්සත්ව ක්‍රියා කළහ. ඔවුන්ගේ හදවත් එකිනෙකා වෙනුවෙන් වූ ආදරයෙන් පිරී තිබුණේය. තමන් ළඟදීම දකින්නට බලාපොරොත්තුව සිටි යේසුස්වහන්සේ වෙනුවෙන්ද ඔවුන් තුළ ආදරය පිරී ඉතිරී තිබුණේය. ඔවුන් තුළ තැන්පත්ව තිබූ එකම ඇදහිල්ලත්, එකම ආශිර්වාදලත් බලාපොරොත්තුවත් නිසා ඔවුන්ව කිසිම මිනිස් බලපෑමකට ග්‍රහණය කරගැනීමට හැකියාවක් නොවීය. තවද, එම ගුණාත්මක ශ්‍රද්ධාව සාතන්ගේ ප්‍රහාරයන්ගෙන් බේරී සිටීමට අගනා පලිහක් විය.

"මනාලයාගේ ඊම ප්‍රමාදවූ කළ ඒ සියල්ලෝම නිදිබරව නිදාගත්තෝය. මධ්‍යම රාත්‍රියේ අන්න, මනමාලයා එනවා! ඔහුගේ පෙරමඟට එන්නැයි හඬක් වූයේය. එවිට ඒ සියලු කන්‍යාවෝ නැගිට තමුන්ගේ පහන් හරි ගැස්සුවෝය." (මතෙව් 25:5-7). දවස් 2300 අනාවැකි කාලය නිම වූයේ යයි මුලින්ම නිර්ණය වූයේ 1844 හි ගිම්හාන කාලයේදීය. පසුව එම කාලය සරත් සෘතුව දක්වා දීර්ඝ කරන ලදී. මෙම කාලවකවානු දෙක අතරේදී මෙම පණිවිඩය ප්‍රකාශ කරන ලද්දේ "අන්න මනමාලයා එනවා" යන වචනම යොදා ගනිමින්ය.

වසර 2300 අනාවැකි ප්‍රකාශයෙහි ආරම්භක දිනය ලෙස අර්තක්ෂස්තාගේ යෙරුසලම ගොඩ නැගීමේ ආඥාව නිකුත් කළ දිනය යොදා ගනු ලැබිණි. යේසුස්වහන්සේ දෙවන වර පැමිණෙන පණිවිඩය දියත් කළ සංවිධානයෙහි ආරම්භය මෙම දිවැසි කාල ආරම්භක දිනය සොයාගැනීමත් සමගම සිදුවිය. මෙම ආඥාව ක්‍රියාත්මක වූයේ ක්‍රි: පූ: 457 හි සරත් සෘතුවේදී මිස කළින් සිතූ ලෙස වසර පටන් ගැනීමේදී නොවීය. ක්‍රි: පූ: 457 සරත් සෘතුවේ සිට වසර 2300 ක් ගෙවී ගිය පසු උදාවන්නේ 1844 සරත් සෘතුවයි. අනාවැකි කාල වකවානුව මේ දවස්වලදී නිමාවට පත්වේ.

"ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ" සංසිද්ධිය හා බැඳි පරණ තෙස්තමේන්තු මූලික දර්ශනය සිදුකරන ලද්දේ සරත් සෘතුවේ නිසා වසර 2300 හා බැඳි ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ යථා සිද්ධියද එම සෘතුවේදීම සිදුවිය යුතුය. ක්‍රිස්තුස්වහන්සේගේ මුල් ගමනේදී මූලික දර්ශන ඉටුවූ ආකාරය පිළිබඳ අධ්‍යයනයේදී සාක්ෂාත් වූ ආකාරයෙන්ම මෙම තීරණයට එළඹීම පැහැදිලි ලෙස පෙනී යන්නට විය.

පාස්කු බැටළු පැටවා මරනු ලැබීම ක්‍රිස්තු සමිඳාණන්ගේ මරණය පෙන්නුම් කරන්නාවූ ඡායා සිද්ධියක් විය. "අපගේ පාස්කුව එනම් ක්‍රිස්තුස්වහන්සේ යාග කරන ලද්දේය" (1 කොරින්ති 5:7) කියා පාවුල් පවසයි. පාස්කු සමයෙහිදී ප්‍රථම ඵල මිටියක් ස්වාමින්වහන්සේ ඉදිරියෙහි වැනීමෙන් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම පෙන්නුම් කරන ලදී. ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සෙනඟගේ මළවුන්ගෙන් නැගිටීම ගැන පාවුල් මෙසේ පවසයි: "ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලයය; ඉන්පසු, ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී, උන්වහන්සේ සන්තකවූවෝ (නැගිටින්නෝ) ය." (1 කොරින්ති 15:23). වනා තේවා කරන ලද අස්වැන්න මිටිය මෙන්, ක්‍රිස්තුස්වහන්සේ ගැළවීම ලැබූවන්ගේ අමරණීය අස්වැන්නෙහි ප්‍රථම ඵල වූසේක. අස්වැන්න වන මිදීම ලැබූවන් මතු දවසකදී දෙවියන්වහන්සේගේ අටුවට එකතු කරනු ලබනවා ඇත.

මෙම සංකේතයන් සම්පූර්ණ වූයේ සිද්ධීන් අනුව පමණක් නොවේ. කාලය අනුවද ඒවා ඉටු විය. පාස්කු බැටළුවා මරනු ලැබුවේ යුදෙව් දින දර්ශනයේ පළමු මාසයේ දහ හතර වෙනිදාය. ශත වර්ෂ පහළොවක් පුරා මෙම මාසයේ මෙම දිනයේදී යුදෙව් ජනතාව මෙම තේවාව ඉටු කළෝය. මෙම නිශ්චිත දිනයේදී ක්‍රිස්තුස්වහන්සේ තමන් ගෝලයන් සමග පාස්කු රොටී මගින් තමන්වහන්සේගේම මරණය සිහිවීම සඳහා රාත්‍රී භෝජන මංගල්‍යය පිහිටුවාලූ සේක. තමන්වහන්සේ වනාහි "ලෝකයේ පාපය දුරු කරන්නාවූ දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාණන්" බව උන්වහන්සේ නැවත වරක් සාක්ෂාත් කළසේක. එම රාත්‍රීයේදීම කුරිරු දෑත් උන්වහන්සේව අල්ලා ගෙන උන්වහන්සේව කුරුසිපත් කොට මරණයට පත්කළහ. වනනු ලැබූ ධාන්‍ය මිටිය මූර්තිමත් කරමින් අපගේ ක්‍රිස්තු සමිඳාණෝ මරණයට පත්වී තුන්වෙනි දවසේදී මළවුන්ගෙන් නැගුටුණු සේක. "සැතපුණු ඇදහිලිවතුන්ගේ නාඹුල් ඵලය" ලෙස උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු සේක. මිනිස් අපගේ පහත් සිරුරු එතුමාණන් හා සමාන තේජාන්විත තත්ත්වයට පත් කරමින් මළවුන්ගෙන් නැගුටුවනු ලබන දැහැමි අයගේ ආදර්ශයක් බවට උන්වහන්සේ මරණින් නැගුටුණ සේක.

සංකේත සේවාව මගින් පෙන්වා දුන් කාලවකවානුවේදීම දෙවන පැමිණීම හා සම්බන්ධ යථාර්ථයන්ද ඉටුවිය යුතුය. මෝසෙස්ගේ ක්‍රමවේද පද්ධතිය අනුව හත්වන යුදෙව් මාසයේ දස වැනිදා සමගි කිරීමේ උදාර දවස මංගල්‍යයක් ලෙස පැවැත්වීමට නියමිත විය. එදින, භෞමික ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ දවස විය. (ලෙවී කථාව 16: 29-34) මුළු ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන් සමගි කිරීමක් ඉටු කිරීමෙන් අනතුරුව ශුද්ධස්ථානයේ වාර්තාගතව තිබූ ජනතාවගේ පාප එයින් ඉවත් කරනු ලබන්නේය. ඉක්බිතිව උත්තම පූජක තෙමේ පිටතට පැමිණ ජනතාවට ආශිර්වාද කළේය. මේ අනුව තම චින්තනය මෙහෙය වූ දේව දාසයන් කල්පනා කළේ අපගේ අති උත්තම



පූජකයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ පාපය සහ පව්කරුවන් විනාශ කර දමා, බලාසිටින්නාවූ උන්වහන්සේගේ ජනතාවට අමරණය ලබා දෙමින් ආශිර්වාද කිරීමට මෙලොවට වැඩම කරන බවය. 1844 හි යුදෙව්වරුන්ගේ හත්වන මාසයේ දසවන දිනය වූයේ ඔක්තෝම්බර් විසි දෙවෙනිදාය. සමගි කිරීමේ දවස වන එදින ක්‍රිස්තු සමිඳාණන් මෙලොවට වඩිනු ඇතැයි දහම් විචාරකයෝ කල්පනා කළෝය. මෙතෙක් ඉදිරිපත් කරනු ලැබූ සාධක අනුව මෙම තීරණය නිවැරදි විය; ඒ බව එපා කිරීමට නුපුළුවන් බවක් ඒ බැතිමතුන්ගේ හැඟීම විය.

මතෙව් 25 හි සඳහන් උපමා කථාව අනුව, බලාසිටීමේ හා නිදාගැනීමේ කාලයට පසුව මනමාලයාගේ පැමිණීම සිදු විය. ඉදිරිපත් කර ඇති තර්ක අනුවද දිවැසි ප්‍රකාශන සහ සමගි කිරීමේ දවසෙහි න්‍යාය පත්‍රය සමගද කරුණු ගැලපීමේදී 1844 හි ඔක්තෝම්බර් මස 22 වනදා මනාලයාගේ පැමිණීම සිදුවිය යුතු විය. පැමිණීම බලා සිටි අය මෙම දිනය උපේක්ෂා සහගතව බලා සිටියහ. මෙම යථාර්තය සත්‍යය බව ඔවුහු විශ්වාස කළහ. මෙම සත්‍යය අනෙකුත් අය සමග බෙදා ගැනීමට දහස් ගණනින් බැතිමත්හු "මැදියම් රාත්‍රියේ හඬ" වූ පණිවිඩය රැගෙන ගම් නියම්ගම් බලා පියවර නැගූහ.

චණ්ඩ මාරුතයක් ලෙස මෙම මෙහෙයුම දේශය පුරා පැතිර ගියේය. නගරයෙන් නගරයටද, ගමින් ගමටද, ඈත එපිට පිහිටි ගම් දනව් කරාද මෙම පණිවිඩය විකාශ වන්නට විය. පැමිණීම බලාපොරොත්තුව සිටි දෙවියන්වහන්සේගේ සෙනඟ නව උදාවකින් ප්‍රබෝධ කරනු ලැබ ඒ සඳහා ඉක්මණින් සූදානම් වන්නට වූහ. ළහිරු රැසින් පිනි බිඳු දියවී යන්නාක් මෙන් මෙම ප්‍රකාශ කිරීම ඉදිරියෙහි ආගමික උන්මත්තකයෝ සහමුලින්ම ඉවත් වූහ. බැතිමතුන් තුළ තිබුණාවූ අනුමානය සහ ව්‍යාකූලතාවය මගහැරී ගොස් ඒ වෙනුවට දිරිය සහ බලාපොරොත්තුව රජ යන්නට විය. දෙවියන්වහන්සේගේ වචනයෙහි සහ ශුද්ධාත්මයාණන්ගේ පාලන බලයෙහි අනුබලය නැතිව මානව චින්තනය තුළ ඇතිවන ඇවැස්සීම් සහ පෙළඹවීම් නිසා හටගන්නාවූ අන්තවාදී හැසිරීම් හා ක්‍රියාකිරීම් නොපැවතුණි. දේව දාසයන් මගින් දෙවියන්වහන්සේ පුරාණයේ සිටි ඊශ්‍රායෙලිතයන් හට තරවටු කිරීම සහ දොස් පැවරීම ලබාදුන් කල්හි මෙන් ඔවුහු යටහත් පහත්කමින් යුතුව උන්වහන්සේ වෙතට පැමිණියහ. "මැදියම් රාත්‍රියේ හඬ" ගුවනට මුසුවත්ම දේව භක්තිකයෝද සියලු භේද දුරලමින් දෙවියන්වහන්සේ වෙතට පැමිණීමට පියවර ගත්හ. සෑම යුගයකදීම දෙවියන්වහන්සේගේ ක්‍රියාදාමයන්හි තිබූ ගුණාත්මක ලක්ෂණ මෙහිදී ද දැකගත හැකි විය. උදාවූ තත්ත්වය තුළ ප්‍රීතියෙන් කුල්මත් වීමක් නොතිබිණ. හදවත් විමර්ශනයට ලක් කරගැනීමත්, පව් කියාදීමත් ලෝකයට වූ ඇල්ම එපා කිරීමත් සෑම බැතිමතෙකු

තුළ විද්‍යාමාන විය. සන්තාපයෙන් පිරී ගිය හදවත්හි එකම පරිශ්‍රමය වූයේ පැමිණෙන්නාවූ ස්වාමින්වහන්සේව මුණගැසීමට සූදානම් වීමය. නොපසුබස්නා ධෛර්යයෙන් යුක්තව ඔවුන් සම්පූර්ණ ජීවිත කැපවීමක් දෙවියන්වහන්සේට පුද කිරීම සැම තැනකම දිස් වන්නට විය.

මෙම සිදුවීම් ගැන මිලර් මෙසේ විස්තර කළේය. "ප්‍රීති ප්‍රමෝදයේ විශේෂාකාර වූ ප්‍රකාශ කිරීමක් දක ගැනීමට නොහැකි විය. එළඹෙන්නාවූ ආසන්න දවසකදී සකල ස්වර්ගය සහ පොළොව කිව නොහැකි තරම් වූ ප්‍රීතියකින් සහ අනූණ වූ තේජස්ශ්‍රීයකින් යුතුව ප්‍රීති සයුරේ ගිලීමට බලා සිටින්නට වූ නිසා වත්මන් සියලු සතුට ඒ වෙනුවෙන් ඉතිරි කර තැබූ බවක් පෙනෙන්නට විය. උස් හඬින් වූ කෑගැසීම් කිසිවක් හෝ සිදු නොවීය. එම හඬ නැඟීම්ද සගයේ සිදුවීම සඳහා ඉතිරි කර තැබූ බවක් පෙනී ගියේය. ගායක ගායිකාවෝ ගීත ගායනය නතර කළෝය. සගයේ ගායක කණ්ඩායම සමග එක්ව ගී ගැයීමට හඬ ඉතිරි කර තබාගත් බවක් පෙනී ගියේය. හැඟීම් සහ මත ගැටීමේ හඬ රාවයක් ඇසෙන්නටවත් තිබුණේ නැත. සැම අයෙකුම එකම හදවතකින් හා එකම මනසකින් බැඳී සිටියෝය" (Bliss, "Memoirs of Wm. Miller, " pp. 270, 271).

මෙම බලාපොරොත්තුවේ ව්‍යාපාරයට සහභාගී වූ තවත් පුද්ගලයෙක් මෙසේ සාක්ෂි දුන්නේය. "ඉහළ අහසේ වැඩ වසන්නාවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි හදවත් යටහත් පහත්ව නිහතමානීව වැඳ වැටුණේය. ඉතා ගැඹුරු ලෙසින් හදවත් සෝදිසියකට භාජනය කරනු ලැබිණි. පණිවිඩයට ප්‍රතිචාර දක්වමින් මෙවන් ප්‍රතිඵල සැම පෙදෙසකම දිස් වන්නට විය... මෙම ලෝකය හා බැඳි සියලු ආශාවන් පහවී යන්නට විය. මතභේද හා විරුද්ධවාදිකම් සමනය කරගන්නා ලදී. කරන ලද වැරදි කියාදී කමාව ඉල්ලීම රජ යන්නට විය. කමාව ඉල්ලා වැඳ වැටෙමින් තමා පිළිගන්නා ලෙස වූ ආයාචනා ගුවන සිප ගත්තේය. දෙවියන්වහන්සේ ඉදිරියෙහි පසුතැවිලිව බිඳ වැටීමට පත් හදවත්වලට සහනය ඉල්ලා කළ යැදුම් සුලභ විය. පෙර නුදුටු ආකාරයේ ආත්ම-නිහතමානී වීමක්, යටහත් වීමක් ප්‍රදර්ශනය වන්නට විය. දෙවියන්වහන්සේ යෝවෙල් දිවැසි ප්‍රසාදිවරයා මගින් ප්‍රකාශ කර ඇති පරිදි ස්වාමින්වහන්සේගේ භයානක දවස පැමිණෙත්ම බැතිමත්හු නිරාහාරව සිටීමෙන්ද, ඇඬීමෙන්ද, වැලපීමෙන්ද යුතුව වස්ත්‍ර නොව සිත් ඉරාගෙන උන්වහන්සේ වෙතට හැරීමක් සිදුවීම අනිවාර්යයෙන්ම ඇති විය යුත්තක් විය. තවද, දෙවියන්වහන්සේ සෙකරියා දිවැසිවරයා තුළින් කී පරිදි උන්වහන්සේගේ දරුවන් කෙරෙහි කරුණාවේ හා කන්නලව් කිරීමේ ආත්මය වගුරුවනු ලැබීය. ඔවුන් තමන් විසින් ඇන්නාවූ තැනැත්තාණන් දෙස බලා දේශය පුරාම



වැලපීමේ හඬක් නගනවා ඇත .... දෙවි සමිඳාණන් කෙරෙහි බලා සිටින්නාවූ අය උන්වහන්සේ ඉදිරියෙහි තම ආත්ම පීඩාවට පමුණුවා ගත්හ." (Bliss, In the Advent Shiled and Review, Vol, 1. p. 271 (Jan. 1845).

අපෝස්තුළුවරුන්ගේ කාලයේදී පටන් පැවති ආගමික නවෝදයක උදාවීමේ ව්‍යාපෘති ගැන සලකා බලන විට, 1844 සරත් සෘතුවේදී වූ ප්‍රකාශනයේදී තරමට මානුෂික අසම්පූර්ණතාවයන්ගෙන් සහ සාතන්ගේ ප්‍රයෝගයන්ගෙන් අවහිරතා කිසිවක් සිදුනොවූ එකම නවෝදය මෙය විය. අවුරුදු ගණනාවක් පසුවී අද දවසේ පවා එම ව්‍යාපෘතිය අත්දුටු අය, සත්‍යතාවේ වේදිකාවේ ස්ථිරවම පසුබට නොවී නැගී සිටි අය, එම මෙහෙවරයේ ශුද්ධවූ බලපෑම අදටත් ප්‍රීතියෙන් සිහි කරති. එය දෙවියන්වහන්සේගේ ආනුභාවය ලැබූ එකක් වූ බවට ඔව්හු අදටත් සාක්ෂි දරති.

"අන්න, මනමාලයා එනවා! ඔහුගේ පෙර මහට එන්න" යන හඬ සවන් වැටෙත්ම බලා සිටි අය "නැගිට තමුන්ගේ පහන් හරිගැස්සුවෝය." දෙවන පැමිණීම බලා සිටි අය අතර මෙම හඬ පැතිර යත්ම පෙර නොතිබුණ උනන්දුවකින් යුතුව ඔවුහු දෙවියන්-වහන්සේගේ වචනය හැදෑරීමට පටන් ගත්තෝය. අධෛර්යයට පත්වූ අයව දිරිමත් කරමින් පණිවිඩය ලැබීමට ඔවුන්ව සූදානම් කිරීම පිණිස සගයේ සිට දේව දූතයන්ව එවන ලදී. මේ සේවය මානුෂික ප්‍රඥාවෙන් හා මනුෂ්‍යයන්ගේ උගත්කමින් නොව දෙවියන්වහන්සේගේ බලයෙන් ඉදිරියට ගියේය. පණිවිඩය අසා එයට කීකරු වීමට මුලින්ම ඉදිරිපත් වූවෝ කුසලතාවන්ගෙන් පිරි අය නොව නිහතමානීවූ ද, භක්තිවන්තවූ ද අය වූහ. ගොවියෝ තම වතුපිටි පාළුවට හැර දමා, කාර්මිකයෝ තම මෙවලම් කට්ටල පසෙක තබා, හැඬුමෙන් සහ ප්‍රමෝදයෙන් යුතුව පණිවිඩය ප්‍රකාශ කිරීමට නික්ම ගියහ. මුලින්ම මෙම පණිවිඩය ප්‍රකාශ කිරීමෙහි ප්‍රමුඛත්වය දරූ බොහෝ දෙනා නව උදාවේ පණිවිඩයට සම්බන්ධ වීමට දක්වූයේ ඉතා අල්ප උනන්දුවකි. දේවස්ථාන බොහොමයක් මෙම පණිවිඩයට ප්‍රතිචාර දක්වීමට නොකැමතිව තම දොරටු වසා ගත්තෝය. ඒ අතර පණිවිඩය පිළිගත් බොහෝ අය තම සභාවන් හා තිබූ සබඳතාවන් අත්හැර දමා පිටතට පැමිණියෝය. දේව මගපෙන්වීම යටතේ මෙම පණිවිඩය දෙවන දේව දූතයාගේ පණිවිඩය හා එක්සත්ව එකී ව්‍යාපෘතියට නව උනන්දුවක් හා වැඩි බලයක් ලබා දුන්නේය.

ශුද්ධ ලියවිලි සපයන්නාවූ සාධක ඉතා පැහැදිලි වුවද, තීරණාත්මක වුවද, "අන්න මනමාලයා එනවා" යන පණිවිඩය තර්ක කිරීමකට

මාතෘකාවක් නොවීය. එම පණිවිඩය සමග ආත්මය තීරණයක් කරා යොමු කරවන්නාවූ පෙළඹවීමේ බලයක්ද ඇතුළත්ව තිබිණ. මේ පිළිබඳව අනුමානයක් නොවීය, ප්‍රශ්න කිරීමක්ද නොවීය. ක්‍රිස්තුස්වහන්සේ විජයග්‍රාහී ලෙසින් යෙරුසලමට ඇතුළු වූ අවස්ථාවේදී පාස්කු මංගල්‍යය සැමරීමට නන් දෙසින් පැමිණි විශාල බැතිමතුන් සංඛ්‍යාවක් ඔලීව කන්දට එත්රොක් වූහ. යේසුස්වහන්සේගේ ගමනෙහි පෙරමඟ දූතයන් ලෙස ක්‍රියාත්මකවූ මහා ජනකාය සමග එක්වූ විදේශීය බැතිමත්හු එම පැයෙහි සිදුවීම් මගින් ආනුභාවය ලැබ, "ස්වාමින්වහන්සේගේ නාමයෙන් එන තැනැත්තේ ආශිර්වාද ලද්දේය"යි කියන්නාවූ හඬට අත්වැල් සැපයූහ, ඔල්වරසන් හඬ එකතු කළෝය. එසේම කුතුහලයෙන් යුතුව හෝ උපහාසයට ලක් කිරීමට හෝ ඇඩ්වෙන්ටිස්ත රැස්වීම්වලට පැමිණි අභක්තිකයන්ට "අන්න මනමාලයා එනවා" යන පණිවිඩය සමගවූ විශ්වාසය උපදවන ඒත්තු ගැන්වීමේ බලයෙහි ආනුභාවය හැඟී නොගියේ නොවේ.

ඒ සමයේදී, යාඥාවන්ට පිළිතුරු ලැබෙන ඇදහිල්ලක් බැතිමතුන් තුළ පැවතියේය. විපාක ලැබීමට තරම් එම ඇදහිල්ල ගුණාත්මක-තාවෙන් උසස් විය. පිපාසාවෙන් පෙළී ගිය පොළොව මතට වර්ෂාව ඇද හැලෙන්නාවූ අයුරින් සත්‍යය සොයා ගිය බැතිමතුන් මත්තට මෛත්‍රී කරුණාවේ ආත්මයාණන්ගේ පහස ගලා ආවේය. වැඩි දවස් නොගොස් තම ගැළවුම්කාරයාණන් ඉදිරියෙහි මුහුණට මුහුණට ලා නැගී සිටීමට අපේක්ෂා කළ අය වචනයෙන් කිව නොහැකි ප්‍රීති උද්දාමයකට පත්ව සිටියහ. මොළොක් කරන්නාවූ, අභිභවනය කරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය හදවත් දමනය කරමින් විශ්වාසවන්ත ඇදහිලිවතුන්ට තමන් ආසිරි විශාල පරිමාණයෙන් දුන්නේය.

පණිවිඩය පිළිගත් අය සුපරික්ෂාවෙන් සහ ගරු ගාම්භීරත්වයෙන් යුතුව ස්වාමින්වහන්සේ මුණගැසීමේ දවස වෙත ළඟා වෙමින් සිටියෝය. දෙවියන්වහන්සේ විසින් තමා පිළිගනු ලැබී යයි සාක්ෂි ලැබෙන තෙක් ඔව්හු සැම උදෑසනකම සමිඳුන් යැදීම පුරුද්දක් කර ගත්තෝය. ඔවුන්ගේ හදවත් එකිනෙකා සමග තදින් වෙළී තිබුණේය. එකිනෙකා සමගද එකිනෙකා උදෙසාද ඔවුහු බොහෝ සේ යාච්ඤා කළෝය. දෙවියන්වහන්සේ සමග කථිකා කරගැනීමට ඔවුහු හුදෙකලා තැන්හි රැස් වූහ. කෙත් වතුවලින් නැගෙන්නාවූ මැදහත්කාරකමේ හඬ සගය කරා නැගී ගියේය. ගැළවුම්කාරයාණන්ගේ අනුමැතියෙහි සහතිකය දෛනික ආහාරයට වඩා ඔවුන්ට වැදගත් විය. යම්කිසි අවස්ථාවකදී ඔවුන්ගේ මනස අඳුරු වළාවකින් වැසී ගියේ නම්, එය පහව යන තුරු ඔවුන් සැනසීමට පත්වූයේ නැත. පව් කමා කරන්නාවූ මෛත්‍රී-කරුණාවෙහි සාක්ෂි ඔවුන් තුළ හැඟීමක් ඇති කළාවූ සැම අවස්ථාවක්



පාසාම, තමන්ගේ ආත්මවලින් ආදරය කළ තැනැන්වහන්සේව දකගැනීමට ඔවුන් තුළ ඉමහත් ආශාවක් ඇති විය.

එසේ වුවද, බලාපොරොත්තු කඩවීමේ ඉරණමකට ගොදුරු වීම ඔවුන්ට නියමව තිබිණි. ඉමහත් බලාපොරොත්තු අපේක්ෂා රැඳවූ දවස පහවී ගියේය, ඔවුන්ගේ ගැළවුම්කරුවාණෝ නොපැමිණි සේක. අචල විශ්වාසයකින් යුතුව ඔවුහු උන්වහන්සේගේ පැමිණීම බලා සිටියෝය. ක්‍රිස්තු සමිඳාණන් භූමදාන කිරීමෙන් තෙදිනකට පසුව සොහොන් ගෙය වෙත පැමිණි මරියා එය හිස්ව තිබෙනු දැක, හැඬීමෙන් යුතුව ප්‍රකාශ කළේ "මාගේ ස්වාමින්වහන්සේව අහක් කොට ගෙන ගොස් කොතැන තබන ලද්දේදැයි" මා නොදනිමි යි කියාය. එසේම ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය බලා සිටි අයගේ බලාපොරොත්තු මරියාගේ බලාපොරොත්තුව මෙන් සුනු විසුණු වී ගියේය.

මෙම පණිවිඩය සත්‍යයක් විය හැකි යයි යන බියක් එය විශ්වාස නොකළ ලෝකයාව කලකට නිශ්ශබ්ද කිරීමට සමත් විය. කාලය ගෙවී යාමත් සමගම මෙම ගරු බිය එකවරම නැති වී නොගියේය. බලාපොරොත්තු සුන්ව ගිය අය කෙරෙහි ජයග්‍රහණය ප්‍රකාශ කිරීමට ඔවුන් මුලදී අභීත නොවූහ. කාලය ගෙවී යාමෙන් දෙවියන්වහන්සේගේ උදහස ඔවුන් මත පතිත නොවීම නිසා ඔවුන්ගේ බිය දුරු විය. ඔවුහු බැතිමතුන්ට ගැරහීමටත් ඔවුන්ව උපහාසයට ලක් කිරීමටත් ආරම්භ කළෝය. ක්‍රිස්තු සමිඳාණන්ගේ කඩිනම් ආගමනය කෙරෙහි විශ්වාසය රැඳවූ බොහෝ අය තම ඇදහිල්ල අත්හැර දැමුවෝය. දෙවන පැමිණීම කෙරෙහි විශාල විශ්වාසයක් රැඳවූ සමහර අය තමන්ට සිදුවූ අවමානයෙන් හදවත් පෑදී ගොස් ලෝකයා කෙරෙන් දුව යාමට තරම් චින්තනයකට ගොදුරු වූහ. යෝනා මෙන්ම ඔවුහුද දෙවියන්වහන්සේට පැමිණිලි කරමින් ජීවිතයට වඩා මරණය අගය කළෝය. දෙවියන්වහන්සේගේ වචනය මත නොව වෙනත් අයගේ ප්‍රකාශන කෙරෙහි තම විශ්වාසය රැඳවූ බොහෝ දෙනෙක් නැවත වරක් තම දසුන වෙනස් කිරීමට සූදානමින් සිටියෝය. දුබල වූ අය මෙන්ම බියසුළු අයද තම පාර්ශ්වය වෙත දිනාගැනීමට සමච්චල් කරන්නෝ සමත් වූහ. මෙම සියලු දෙනාම එකමුතුව කියා සිටියේ බියවීමට හෝ බලාපොරොත්තු රැඳවීමට තවදුරටත් උවමනාවක් නැතැයි යන්නය. බලාපොරොත්තු වූ දවස ගෙවී ගියේය, ක්‍රිස්තු සමිඳාණන් ආපසු පැමිණියේ නැත. පවතින ලෝකය තවත් අවුරුදු දහස් ගණනාවක් එලෙසම පවතින්නට පුළුවන.

අවංකවූ ද, සත්‍යවාදිවූ ද බැතිමත්හු තමා සතු සියල්ල ක්‍රිස්තුස්-වහන්සේ උදෙසා අත්හැර දමා තිබුණි. පෙර නොවූ විරූ පරිදි

උන්වහන්සේගේ අභිමුඛය බෙදා ගැනීමට ඔවුහු සමත් වූහ. තමා විශ්වාස කළ පරිදි ඔවුහු තමා සතු අන්තිම අනතුරු ප්‍රකාශය ලෝකයට ලබා දුන්නෝය. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ තමන්ගේ දිව්‍ය ස්වාමින්වහන්සේගේ සහ ශුද්ධවූ දේව දූතයන්ගේ සමාගමට තමා කඩිනමින් පිළිගනු ලැබීමය. ඒ අතර ඔවුහු දේව දූත පණිවිඩ පිළිනොගත් අයගේ ඇසුරෙන්ද ඉවත්ව සිටියහ. "වඩින්න යේසු සමිඳාණෙනි ඉක්මණින් වඩින්න"යි ඔවුන් උපේක්ෂා සහගතව යාච්ඤා කර තිබුණේය. නමුත් උන්වහන්සේ පැමිණියේ නැත. නැවත වරක් ලෝකයට ගොස් ජීවත් වීමේ සටනට සහ චිත්ත වික්ෂේපයට මුහුණ දීම ඔවුන්ට ඉතා අසීරු වැයමක් විය. තවද, සමච්චල්කරුවන්ගේ ගැරහීම්වලට සහ නින්දා අපහාසයනට මුහුණ දෙමින් ඒවා විඳ දරාගනිමින් දිවි ගෙවීම ඔවුන්ගේ ඇදහිල්ලට හා ඉවසීමට මහත් පරික්ෂාවක් විය.

එහෙත් ක්‍රිස්තුස්වහන්සේගේ පළමු පැමිණීමේදී ගෝලයන්ට මුහුණ දීමට සිදුවූ බලාපොරොත්තු භංගත්වය මෙන් දෙවන ඊම බලා සිටි අයගේ මේ බලාපොරොත්තු සුන්වීම එතරම් බරපතල නොවීය. යේසුස්වහන්සේ ජයග්‍රාහක ලීලාවෙන් යෙරුසලමට ප්‍රවිෂ්ඨ වූ අවස්ථාවේදී උන්වහන්සේගේ අනුගාමිකයන්ගේ අපේක්ෂාව වූයේ උන්වහන්සේ දාවිත්ගේ සිංහාසනයට ගොඩ වී ඊශ්‍රායෙලිතයන් තම පීඩකයන්ගෙන් ගළවා ගැනීමට ඉදිරිපත් වන බවය. මහත් අපේක්ෂණයෙන් යුතුවද, ඉමහත් බලාපොරොත්තු ඇතිවද ඔවුහු තම රජතුමාණන්ට ගෞරව දක්වීමට පොරකමින් ඉදිරිපත් වූහ. උන්වහන්සේගේ ගමනට පලසක් ලෙස ඔවුහු තම බාහිර ඇහළුම් බිම ඇතුරූහ; නැතහොත් උන්වහන්සේ ඉදිරියෙහි තල් අතු බිම දමමින් පාවඩයක් නිර්මාණය කළෝය. උද්‍යෝගයෙන් මුසපත්ව සිටි ඔවුහු "දාවිත්ගේ පුතණුවන්ට හෝසන්නා!" යයි හඬ නැගුවෝය. සෙනහගේ ප්‍රීති ඔල්වර හඬින් අසහනයට සහ කෝපයට පත් ඵරිසිවරු ගෝලයන්ගේ හඬ නැගීම නවතා දමන්නට අණ කරන්නැයි ඉල්ලා සිටියෝය. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "ඔවුන් නිශ්ශබ්ද වුණොත් ගල් මොර ගසන්නේය"යි පැවසූසේක. (ලූක් 19:40). දිවැසි වැකි ප්‍රකාශන ඉටුවීම අනිවාර්ය වන්නේය. ගෝලයෝ දෙවියන්වහන්සේගේ අරමුණු ඉටු කරමින් ක්‍රියාත්මකව සිටියෝය. එහෙත් කටුක බලාපොරොත්තු භංගත්වයක් ඔවුන්ට ඉරණම්ව තිබුණේය. වැඩි දවසක් ගතවීමට පෙර තම සමිඳුන්ගේ දුක්වේදනා බර මරණය දකගන්නට ඔවුන්ට සිදු විය. ඉක්බිතිව ඔවුහු උන්වහන්සේව සොහොන් ගැබක තැන්පත් කළෝය. කිසිම විෂයක් සම්බන්ධව හෝ ඔවුන්ගේ සිතුම් පැතුම් ඉටුවුණේ නැත. ඔවුන්ගේ බලාපොරොත්තු සියල්ල යේසුස්වහන්සේගේ මරණයත් සමග නැත්තටම නැති විය.



යේසුස් සමිඳාණන් ජයග්‍රාහක සොහොනෙන් නැගිටීම දක්වා "ක්‍රිස්තුස්වහන්සේ දුක් විඳින්ටත් මළවුන්ගෙන් නැගිටින්ටත් ඕනෑය." යනුවෙන් මෙම සිද්ධීන් සියල්ල අනාවැකි මගින් පවසා ඇති බව ඔවුන්ට වැටහුණේ නැත. (ක්‍රියා 17:3).

වසර පන්සියයකට පෙර ස්වාමීන්වහන්සේ සෙකරියා තුළින් මෙසේ ප්‍රකාශයක් දෙවා වදාරා තිබූසේක. "සියොන් දියණියෙනි, බොහෝ සෙයින් ප්‍රීතිමත් වෙන්න. යෙරුසලම් දියණියෙනි, ශබ්ද පවත්වන්න. බලව, නුඹේ රජ නුඹ වෙතට එනසේක. උන්වහන්සේ ධර්මිෂ්ඨය; ගැළවීම ඇත්තාය; උන්වහන්සේ යටහත්ය. කොටළුවෙකු එනම් කොටළු දෙනෙකුගේ පැටියෙකු පිට නැගී එනසේක" (සෙකරියා 9:9). ක්‍රිස්තුස්වහන්සේ විනිශ්චයකට මුහුණ දී, එහි තීන්දුව ලෙසින් මරණ දඬුවම ලැබීමට නියමිත බව ගෝලයන්ට වැටහී තිබුණේ නම් ඔවුන්ට මේ අනාවැකිය සම්පූර්ණ කිරීමට නුපුළුවන් වෙනවා ඇත.

මෙයාකාරයෙන්ම මිලර් සහ ඔහුගේ සහායකයෝද අනාවැකි ඉටු කළෝය. ලෝකයට ලබා දිය යුතු යයි දේවානුභාවයෙන් කියා තිබූ පණිවිඩය ඔවුහු එලෙසම ඉටු කළෝය. දිවැසි ප්‍රකාශනයෙහි කියා තිබූ පරිදි ඔවුන්ට මහත් බලාපොරොත්තු කඩවීමක් ඉරණම් වන්ට යන බව ඔවුන් තත්ත්වාකාරයෙන් දැන සිටියේ නම් ඔවුන්ට එම පණිවිඩය දීමේ හැකියාව උදා නොවනවා ඇත. ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනයට පෙර මුළු ලෝකය පුරා සකල ජනතාවටම තවත් පණිවිඩයක් දේශනා කරන්නට ඇති බව ඔවුන් දැන සිටියේ නැත. පළමු සහ දෙවන දේව දූතයන්ගේ පණිවිඩ නියමිත කාලයට අනුකූව ලෝ පුරා විසුරුවා හරිනු ලැබුවේය. එමගින් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වූ කාර්ය භාරය ඒ අයුරින්ම ඉටු විය.

බලාපොරොත්තුව සිටි කාල රාමුව නිමාවට පැමිණි නමුත් ක්‍රිස්තුස්වහන්සේ නොපැමිණි සේක. මෙවන් පසුබිමක් තුළ සකල ඇඩ්වෙන්ටිස්ත ව්‍යුහයම බිඳ වැටේ යැයි ලෝකය බලාගෙන සිටියේය. මහත් පරික්ෂාවන් යටතේ බොහෝ දෙනෙක් තම ඇදහිල්ල අත්හැර දැමූ අතර සමහරෙක් තිරසාරව ඇදහිල්ල තුළ නැගී සිටියෝය. ඇඩ්වෙන්ටිස්ත මෙහෙයුමෙහි ප්‍රතිඵල සාක්ෂි දැරුවේ එය දෙවියන්-වහන්සේගේ සැලැස්මක් බවටය. යටහත් පහත් නිහතමානීකමෙහි ආත්මයත්, හදවත් සෝදිසි කරගැනීමත්, ලෝකය එපා කිරීමත්, ජීවිත වෙනස් වීමත් දෙවියන්වහන්සේගේ වැඩ පිළිවෙතක් බව ඒ ප්‍රතිඵල ප්‍රකාශ කළහ. දෙවන ඊම පිළිබඳව දේශනා කිරීම්වලදී ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය සාක්ෂි දැරූ බව කිසිවෙකුටත් නිෂ්ප්‍රභා කළ නොහැකි විය. අනාවැකි කාල සූත්‍රය නිගමනය කිරීමේ කිසිදු වරදක්

තිබූ බව කිසිවෙකුටත් පෙන්වා දීමට නොහැකි විය. ඉතා දක්ෂතම විරුද්ධවාදියාට පවා ආගමන විශ්වාසකයින්ගේ අනාවැකි අර්ථකථන වැරදි යයි දක්වීමට හැකියාවක් නොවීය. ඇඩ්වෙන්ටිස්තවරු ස්වකීය තීරණ කරා පැමිණියේ අවංකව යාච්ඤාවේ පහස ලබමින් ශුද්ධ ලියවිලි අධ්‍යයනයෙන් පසුවය. ඔවුන්ගේ මනස් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ මගින් ප්‍රබුද්ධ කර තිබුණේය, ආලෝකමත් කර තිබුණේය. ඔවුන්ගේ හදවත් ජීවමාන බලයෙන් පණගැන්වී තිබුණේය. එවන් ස්ථාවරයකට එළඹ සිටි ඔවුන්ට බයිබලීය සාක්ෂි වලින් තොරව තමන්ගේ විශ්වාසයන් අත්හැර දමීමට එකඟ විය නොහැකි විය. ඔවුන් දරු විශ්වාසයට එරෙහිව දැඩි විවේචනාත්මක පහර එල්ල වුවද ඔවුහු පසු නොබා සිටියෝය. ජනප්‍රිය ආගමික ගුරුවරුන්ගේ මෙන්ම ලෞකික බුද්ධිමතුන්ගේද තර්ක හා විරුද්ධතාවන් ඉදිරියේ ඔවුහු නොසැලී සිටියෝය. ඔවුන්ට විරුද්ධව දන උගත්කම සහ කථිකත්වය එක්ව අවි අමෝරා ගෙන නැගී සිටියද, වංශාධිපතීන්ගෙන් මෙන්ම හීනයන්ගෙන් නින්දා අපහාස සහ ඇනුම් පද එල්ල වුවද, ඇඩ්වෙන්ටිස්තවරු ඒ සියල්ල විඳ දරාගනිමින් ඇදහිල්ලෙහි පිහිටා සිටියෝය.

බලාපොරොත්තුව රැඳවූ සංසිද්ධිය ඉෂ්ඨ නොවූ නමුත් ඇඩ්වෙන්ටිස්තවරුන් දෙවියන්වහන්සේගේ වචනය තුළ තැබූ විශ්වාසය බිඳක් හෝ සෙලවීමට එම සිද්ධියට හැකියාවක් නොවීය. මීට ඉහත කලකදී යෝනා නිනිවයේ වීථි දිගේ ඇවිදිමින්, තව දවස් හතළිහක් ගතවූ පසුව එම නගරය දෙවියන්වහන්සේ විසින් විනාශ කර දමනවා ඇතැයි ප්‍රකාශ කර සිටියේය. නිනිවයේ පුරවැසියෝ එක සිතින් දෙවියන්වහන්සේ ඉදිරියෙහි යටහත් පහත්ව වැඳ වැටෙමින් පසුතැවිලි වූ පසුව උන්වහන්සේ ඔවුන්ගේ පරිවාස කාලය දිගු කළසේක. එහෙත් පණිවිඩය පැමිණියේ දෙවියන්වහන්සේගෙන්ය. උන්වහන්සේගේ කැමැත්ත ප්‍රකාර නිනිවය පරික්ෂාවට භාජනය කරනු ලැබිණි. විනිශ්වය පිළිබඳව අනතුරු ඇඟවීමේ පණිවිඩයක් ලොවට ලබාදීමටද උන්වහන්සේම තමන්ට මගපෙන්වා ඇතැයි ඇඩ්වෙන්ටිස්තවරු විශ්වාස කළෝය. "පණිවිඩය ඇසූ සැමගේ හදවත් පරික්ෂා කරනු ලැබිණ. ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය උදෙසා ආශාවක් ජනිත කිරීමට එම පණිවිඩය සමත් විය. එසේත් නැතිනම්, එම පණිවිඩය ඇසූ ශ්‍රාවකයන් තුළ ඒ ගැන ද්වේෂයක් හෝ ඇති විය.. ඒ පිළිබඳව දෙවියන්වහන්සේ දන්නා බව නොඅනුමාන විය .... පණිවිඩය මගින් තීරණයක් කරා යැමටම ඔව්හු මගපෙන්වනු ලැබූහ.. තම හදවත් පිරික්සීමෙන් තමන් සිටින්නේ කිනම් පාර්ශ්වයේ දැයි ශ්‍රාවකයන්ට තීරණය කරගැනීමට හැකි විය. එම අවස්ථාවේදී ක්‍රිස්තු සමිඳාණන් පැමිණියේ නම් ඔවුන් පවසන්නේ කුමක්ද? එක් කණ්ඩායමක් මෙසේ පවසයි: 'මේ අපේ



දෙවියන්වහන්සේය. අපි උන්වහන්සේ ගැන බලා සිටියෙමුව. උන්වහන්සේ අප ගළවන සේක.' අනෙක් කණ්ඩායම කඳුවලටත්, පර්වතවලටත් කථාකොට මෙසේ පවසයි: 'අප පිට වැටී සිංහාසනයෙහි වැඩ ඉන්න තැනැන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අපව සඟවා ගනිල්ලා.' අපගේ විශ්වාසය අනුව දෙවියන්වහන්සේ තමන් සෙනඟ පරික්ෂා කර ඇත, ඔවුන්ගේ ඇදහිල්ල පිරික්සා ඇත, ඔවුන්ගේ කැපවීම සෝදිසි කර ඇත. තීරණාත්මක පරික්ෂා පැයේදී ඔවුන් පසුබැමට හසු වේද! ඔවුන්ට සුදුසු යයි උන්වහන්සේ තීරණය කරන ස්ථානයේදී ඔවුන් ජය ගනීද! ඔවුහු මේ ලෝකය හා සියළු සබඳතා අත්හැර දමා දෙවියන්වහන්සේගේ වචනය කෙරෙහි අචල විශ්වාසයක් තබා ක්‍රියා කරත්ද?" (The Advent Herald and Signs of the Times Reporter, Vol viii No. 14).

තමන්ගේ අතීත අත්දැකීම්වලදී දෙවියන්වහන්සේ තමන්ට මගපෙන්වූ බව තවදුරටත් විශ්වාස කළාවූ අයගේ හැඟීම් විලියම් මිලර් තමාගේම අත්දැකීම මගින් මෙසේ විස්තර කරයි. "මාගේ ජීවිතය නැවත වරක් ගතකරන්නට සිදුවන්නේ නම් මට ලැබී තිබූ සාක්ෂි එම ආකාරයේම වන්නේ නම්, එදා ක්‍රියා කළ ආකාරයෙන්ම නැවතත් ක්‍රියාකරන බව දෙවියන්වහන්සේට සහ මනුෂ්‍යයන්ට මම අවංකවම ප්‍රකාශ කරමි." "ආත්මයන්ගේ ලේ වල වගකීමෙන් මාගේ ඇඟළුම් සෝදා පවිත්‍ර කරගෙන සිටින්නෙමි යයි මම බලාපොරොත්තු වෙමි. තවත් අය වරදට පත් කරනු ලබන්නේ නම්, මම එයට වරදකරු නොවෙමි. ඔවුන්ට ගැළවීමේ මාර්ගය පහදා දීමට මට කළ හැකි සැමදෙයක්ම කළ බව මාගේ හැඟීමයි." දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා තවදුරටත් මෙසේ පවසයි. "මම දෙවතාවක්ම බලාපොරොත්තු කඩවීම්වලට ගොදුරු වීමි. එහෙත් මම තවමත් අධෛර්යයට පත් නොවී සිටිමි. සියලු බලාපොරොත්තු අත්හැර නොදැමුවෙමි." "ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය ගැනවූ මාගේ බලාපොරොත්තුව තවමත් බොඳ වී නැත. වසර ගණනාවක් පුරා අධ්‍යයනය කර, කරුණු කිරා බලා තීරණයක් ගෙන, මා විසින් ඉටු කළේ මාගෙන් සිදුවිය යුතු වගකීමය. මා වැරදි කළා නම්, එසේ කළේ මිනිසුන්ට උදව් උපකාර කිරීමෙන්, මාගේ සහෝදර ජනතාවට ආදරය කිරීමෙන් සහ දෙවියන්වහන්සේ වෙනුවෙන් වූ මාගේ වගකීම ඉටු කිරීමෙන්ය." "මා දේශනා කළේ මා විශ්වාස කළ දේවල් පමණක් බව මම දනිමි. තවද දෙවියන්වහන්සේ මා සමග සිටි බවද, හොඳාකාරව දනිමි. මා ඉටු කළ කාර්ය භාරයන්හිදී උන්වහන්සේගේ බලය විද්‍යාමාන වී ඇත. බොහෝ යහපත් දේ සිදුව තිබේ. කාලයාගේ දේශනා කිරීම් කරණකොටගෙන දහස් ගණනින් වූ ජනකායකට ශුද්ධ ලියවිලි ඉගෙන ගැනීමට බලපෑමක් ඇති කරන ලදී. එකී මාර්ගය මගින් ඇදහිල්ල සහ ක්‍රිස්තුස්වහන්සේගේ

රුධිරය ඉසීම කරණකොටගෙන බොහෝ අය දෙවියන්වහන්සේට සමගි කරනු ලැබ සිටිති." (Bliss "Memoirs of Wm. Miller" pp. 256, 255, 277, 280, 281). "උඩඟු වූවන්ගේ සිනහව මම කිසි කලෙක ඉල්ලා නොසිටියෙමි. ලෝකයා මට රැවූ කළ මම කම්පා නොවීමි. ඔවුන්ගේ උදව් උපකාර ලබාගැනීමට මම මිලයක් නොගෙව්වෙමි. ඔවුන්ගේ ද්වේෂයට භාජනය වීමට මාගේ වගකීම් ඉක්මවා ක්‍රියා නොකරමි. මාගේ ජීවිතය රැක දෙන්නැයි මම ඔවුන් නොයදිමි. ජීවිතය නැති වුවද මාගේ කාර්ය භාරයෙන් පැන නොයමි. දෙවියන්වහන්සේගේ තීරණය හිස නමා භාර ගන්නෙමි." (White, J. "Life of Wm. Miller" p. 315).

දෙවියන්වහන්සේ තමන් සෙනඟ අත් නොහළසේක. තමන් ලැබූ ආලෝකය දුර දිග නොබලා අත්හැර දමන්නේ නැතිව, ඇඩ්වෙන්ටිස්ත දහම් මාලාව ප්‍රතික්ෂේප නොකර, ක්‍රියා කළ අය සමග උන්වහන්සේගේ ආත්මයාණෝ තවදුරටත් රැඳී සිටි සේක. මෙම අර්බුදකාරී අවස්ථාවේදී පිරික්සීමට භාජනය කරනු ලැබුවද තවදුරටත් ආගමනය බලා-පොරොත්තුවෙන් සිටි බැතිමතුන්ට දිරිගන්වන වදන් හෙබ්‍රෙව් යැවුම් පත්‍රයේ මෙසේ ඇතුළත්ය. "එබැවින් මහත් විපාකයක් ඇත්තාවූ නුඹලාගේ නිසැකකම අත්නාරින්න. මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමත්ත කළ පසු පොරොන්දුව ලබන පිණිස නුඹලාට ඉවසිල්ල ඕනෑය. මක්නිසාද එන්නාවූ තැනැන්වහන්සේ ප්‍රමාද නොවී, තව ස්වල්ප කාලයකින් එනසේක. ඉදින් මාගේ ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ. නුමුත් ඔහු පසුබටවන්නේ නම් මාගේ ආත්මය ඔහු කෙරෙහි ප්‍රසන්න නැත. නුමුත් අපි වනාහි විනාශවන ලෙස පසුබටවීමට නොව ප්‍රාණය ගැළවෙන ලෙස ඇදහීමට අයිතිවමුව." (හෙබ්‍රෙව් 10:35-39).

මෙම අනුශාසනාව අන්තිම දවස්වලදී පවතින්නාවූ සභාවට යොමු කරන ලද්දක් බව එහි අඩංගු මේ වචනවලින් තහවුරු වේ: "එන්නාවූ තැනැන්වහන්සේ ප්‍රමාද නොවී තව ඉතා ස්වල්ප කාලයකින් එනසේක." ස්වාමීන්වහන්සේගේ පැමිණීම මඳ කලෙකින් ප්‍රමාද වන බව දක්වීමක්ද මෙහි ඇත. මෙම කාලයේදී දිවිගෙවූ ඇඩ්වෙන්ටිස්ත වරුන්ගේ අත්දකීමට මෙම අනුශාසනාව කදිමට ගැළපෙන්නේය. මෙම ලිපිය ලැබීමට යෝජිත ජනතාව තමන්ගේ ඇදහිල්ල සුනු විසුනුව යැමේ අවදානමකට ලක්ව සිටියෝය. දෙවියන්වහන්සේගේ ආත්ම-යාණන්ගේ සහ උන්වහන්සේගේ වචනයෙහි මගපෙන්වීම යටතේ මෙම බැතිමත්හු දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කර තිබුණෝය. නමුත් තමන්ට සිදුවූ අත්දකීම තුළ දේව අභිප්‍රාය ගැන අවබෝධයක් ඔවුන් සතු නොවීය. තමන් ඉදිරියෙහි තිබූ මාර්ගය පිළිබඳව දක්මක්ද



ඔවුන්ට පෙනෙන්නට නොතිබුණේය. මෙම චින්තනය නිසා ඇත්තටම දෙවියන්වහන්සේ තමන්ට මගපෙන්වූ සේක්දැයි අනුමාන කිරීමට ඔවුන්ට සිතුවිලි පහළ විය. "ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත්වේ" යන වදන් මෙහිදී මොවුන්ට යථාර්ථවාදීව අදාළ විය. "මැදියම් රාත්‍රියේ හඬ" නමැති දීප්තිමත් ආලෝකය ඇඩ්වෙන්ටිස්ත වරුන්ගේ මාර්ගයට එළිය සපයා දුන්නේය. දිවැසි ප්‍රකාශන පැහැදිලි ලෙස එළිදරව් වූ බව ඔවුන්ට දකගත හැකි විය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම ඉතා ආසන්න බව ඉටුවන්නාවූ ලකුණු මගින් හඬ ගා කියන්නට විය. මේ සියළු සාධක මධ්‍යයේ ඔවුන් ගමන් කළේ අඳුරේ නොව පැහැදිලි ආලෝකයක් මධ්‍යයේය. නමුත් දැන් බලාපොරොත්තු සුන්වීමකට පත්ව සිටි ඔවුන්ට නැගී සිටීමට සිදුවූයේ දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ වචනය වන ඇදහිල්ල මත පමණකි. මේ අතර අවලාද නගන්නාවූ ලෝකයා ඔවුන්ට ගරහන්නට විය. "ඔබලා අසුවී සිටින්නේ මහත් රැවටිල්ලකටය. ඔය විකාර විශ්වාසය අත්හැර දමන්න. ඇඩ්වෙන්ටිස්ත ව්‍යාපාරය සාතන්ගේ මගපෙන්වීම යටතේ වූ එකක් යයි පිළිගන්න, ප්‍රකාශ කරන්න"යි ඔව්හු පැවසූහ. ඒ අතර දෙවියන්වහන්සේගේ වචනය මෙසේ ප්‍රකාශ කරයි. "යම්කිසි මනුෂ්‍යයෙක් පැකිළී පසුබට වේ නම් මාගේ ආත්මය ඔහු සමග ප්‍රසන්න නැත"' ඇදහිල්ල ප්‍රතික්ෂේප කිරීමත්, ඔවුන්ගේ දහම් ප්‍රකාශන මත සුදත් ගුරුන්ගේ පහස තිබූ බව ප්‍රතික්ෂේප කිරීමත් වනාහි විනාශය කරා නැවත ඇදී යාම හා සමාන වීමකි. ස්ථිරව සිටින්නැයි කී පාවුල්ගේ වදන් ඔවුන්ව දිරිමත් කළේය. "මහත් විපාකයක් ඇත්තාවූ නුඹලාගේ නිසැකකම අත්නාරින්න." "නුඹලාට ඉවසිල්ල ඕනෑය." "මක්නිසාද එන්නාවූ තැනැන්වහන්සේ ප්‍රමාද නොවී තව ඉතා ස්වල්ප කාලයකින් එනසේක." ඔවුන්ගේ එකම ආරක්ෂාකාරී මාර්ගය වූයේ දෙවියන්වහන්සේගෙන් මෙතෙක් ලැබූ ආලෝකය ආදර භක්තියෙන් යුතුව දැඩි ලෙසින් ග්‍රහණය කරගැනීමත්, උන්වහන්සේගේ පොරොන්දු ග්‍රහණය කරගැනීමත්ය. තවද, ඔවුන් විසින් ශුද්ධ ලියවිලි සෙවීම අඛණ්ඩව කරගෙන යමින් තවත් වැඩිපුර ආලෝකය අපේක්ෂාවෙන් ඉවසිලිවන්තව බලාසිටිය යුතු විය.

# 23

## ශුද්ධස්ථානය යනු කුමක්ද?

දෙවෙනි ඊම ගැන බලාසිටි බැතිමතුන්ගේ ඇදහිල්ලෙහි පදනමත්, ප්‍රධානතම විශ්වාසයත් වූයේ දානියෙල් 8:14 හි වූ ප්‍රකාශනයයි, එනම් "රෑ දාවල් දෙදාස් තුන්සීයයක් පසුවන තුරුය; එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය" යන්නය. කඩිනමින් සිදුවන්නාවූ ස්වාමීන්-වහන්සේගේ ආගමනය කෙරෙහි විශ්වාසය රැඳවූ සෑම බැතිමතෙකුගේම මුවෙහි රැව් පිළිරැව් දුන් මෙම වදන් ඔවුන්ගේ අපේක්ෂාව පෙන්නුම් කළේය. තමන්ගේ ඇදහිල්ලෙහි ප්‍රමුඛ පරමාර්ථය ලෙස මෙම අනාවැකිය දහස් ගණනකගේ මුවින් ජනතාවගේ අවධානයට යොමු කරන ලදී. මෙම දිවැසි ප්‍රකාශනයෙහි අනුගත සිදුවීම් මත තමන්ගේ දීප්තිමත් බලාපොරොත්තුවත් ආදරයෙන් හා භක්තියෙන් රැකබලා ගත් අපේක්ෂාවත් රඳා පවතින බව සෑමගේ චින්තනය විය. ගණනය කිරීම් අනුව මෙම දිවැසි කාලය 1844 හි සරත් සෘතුවේදී නිමාවට පත්වන බව තීරණය විය. කිතුණු ලෝකයෙහි අනෙකුත් ක්‍රිස්තියානි බැතිමතුන් සමගම ඇඩ්වෙන්ටිස්ත වරුන්ද පිළිගත් මතය වූයේ මේ ලෝකය නැතහොත් එහි කොටසක් ශුද්ධස්ථානය වන බවට වූ අර්ථකථනයයි. ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යනු ලෝකාන්තිමයේ දවසේදී මෙම පොළෝ තලය ගින්නෙන් දවා පවිත්‍ර කිරීම යයි කිතුණු ලෝකයා විශ්වාස කළෝය. මෙම සංසිද්ධිය ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊමේ දවසෙහිදී සිදුවන බව ඔව්හු විශ්වාස කළහ. මේ අනුව ක්‍රිස්තුස්-වහන්සේගේ දෙවන ඊම 1844 දී සිදුවන්නේ යැයි නිගමනය විය.

නිගමනය වූ දිනය ගෙවී ගියේය, එහෙත් ක්‍රිස්තු සමිඳාණන් මෙලොවට වැඩියේ නැත. දෙවියන්වහන්සේගේ වචනය නිෂ්ඵල නොවන බව විශ්වාසවන්තිකයෝ දැන සිටියහ. ඔවුන් විසින් කරන ලද දිවැසි ප්‍රකාශන අර්ථකථනයෙහි වැරදි නිගමනයක් මත එසේ වූවා යයි සිතීමට ඔව්හු යොමුවූහ. එහෙත් වැරැද්ද සිදුවූයේ කොතැනද? ගැටළුවට පිළිතුරක් ලෙස බොහෝ අය පැවසුවේ 2300 කාලවකවානුව 1844 දී නිමාවට පත්වීමක් නොවූ බවය. මෙයට හේතු සාධක ඉදිරිපත් කිරීම සිදුකළ නොහැකි විය. කෙසේ වුවද, ඔවුන් බලාපොරොත්තුව රැඳවූ ලෙස එම කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ නැත. දිවැසි ප්‍රකාශන කාලය 1844 දී නිමාව දක්කේ නම්, පොළොව ගින්නෙන් පවිත්‍ර කිරීමට, එනම් ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමට ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සිදුවිය යුතුමය. එහෙත් උන්වහන්සේගේ පැමිණීම සිදුවූයේ නැතිනම් කාලය සම්පූර්ණ වී නැතැයි බොහෝ දෙනෙක් තර්ක කළෝය.



මෙම නිගමනය පිළිගන්නවා නම්, දිවැසි කාලවකවානුව ගැන කළ ගණනය කිරීම් අත්හැර දැමීමක් අනිවාර්ය විය. යෙරුසලම ගොඩ නගා එහි පරිපාලනය ස්ථාපිත කිරීම සඳහා අර්තක්ෂස්තා රජු විසින් නිකුත් කළ ආඥාව ක්‍රියාවට නංවන ලද්දේ ක්‍රි. පූ. 457 සරත් සෘතුවේදීය. එය වසර 2300 දිවැසි ප්‍රකාශනයේ ආරම්භය ලෙස ගණන් ගත්  විට එම කාල පරිච්ඡේදය පිළිබඳව දානියෙල් 9: 25-27 හි ලබාදී ඇති විස්තරයෙහි කියා ඇති පරිදි සෑම සිද්ධියක්ම අනුකූල ලෙස ඉටුවී ඇති බවට සැකයක් නොතිබිණ. වසර 2300 කාලවකවානුවෙහි පළමු කොටස සති හැට නවයක් නොහොත් වසර 483 ක් විය. එම කාලය මෙසියස්වහන්සේ වූ ආලේප ලත් තැනැත්තාණන් දක්වා විහිදී යා යුතු විය. ක්‍රිස්තුස්වහන්සේගේ බව්තීස්මයත්, උන්වහන්සේව ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අභිෂේක කිරීමත් ක්‍රි. ව. 27 දී සිදුවිය. දිවැසි ප්‍රකාශනයෙහි අඩංගු විස්තර කිරීම් අනුව එය අකුරටම සිදුවිය. සැත්තෑ වන සතියේ මැදදී මෙසියස්වහන්සේ කපා දමනු ලබන්නට නියමව තිබිණ. බව්තීස්මයෙන් වසර තුන හමාරකට පසුව, ක්‍රි. ව. 31 හි වසන්ත සමයේදී උන්වහන්සේ කුරුසිපත් කරන ලදී. සති හැත්තෑව නොහොත් වසර 490 යුදෙව් ජාතිය උදෙසා යොමුව තිබිණ. මෙම කාලයේ අවසානයේදී යුදෙව්වන් විසින් යේසුස්වහන්සේගේ ගෝලයන්ට වධහිංසා පැමිණවීමත් සමගම ඔවුහු මෙසියස්වහන්සේව ප්‍රතික්ෂේප කිරීම මුද්‍රා කළෝය. ඒ සමගම අපෝස්තුළුවරු ශුභාරංචිය අන්‍යජාතීන් වෙත ගෙන යාමට නැඹුරු වූහ. එම සිදුවීම වූයේ ක්‍රි. ව. 34 දීය. 2300 ක් වූ කාල පරිච්ඡේදයෙන් වසර 490 ක් ගෙවී ගිය කල්හි ඉතිරි වන්නේ තවත් වසර 1810 කි. ක්‍රි. ව. 34 සිට වසර 1810 ගෙවී ගිය කල්හි නිශ්චිත ඉරණම් වසර 1844 දක්වා දිගු වේ. "එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේ ය"යි දේව දූතයා පැවසීය. පවසා තිබූ ආකාරයට දිවැසි ප්‍රකාශනයෙහි අනුයුක්ත වූ සෑම සිද්ධියක්ම නියමිත කාලයේදී සම්පූර්ණ විය.

ගණනය කිරීම් අනුව, සෑම සිදුවීමක්ම පැහැදිලි ලෙසම පවසා තිබූ ආකාරයෙන්ම ඉටු වී තිබිණ. එහෙත් 1844 දී ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම පිළිබඳව කිසිම සංසිද්ධියක් ක්‍රියාත්මක වූ බවට කිසිම වාර්තාවක් නොවීය. මෙම නිශ්චිත කාලයේදී දිගු කාලීන දිවැසි ප්‍රකාශන වකවානුව නිමාවට පත් නොවූයේ යැයි පිළිගතහොත් එයින් පැන නගින්නේ මහත් වියවුලකි. දිවැසි ප්‍රකාශනයෙහි අනුගත සිදුවීම් නියමිත කාල රාමුව තුළ ඉටුව තිබූ නිසාම මෙම අන්තිම සිද්ධිය පිළිබඳව වියවුලක් තිබීම වසර 2300 පිළිබඳව සැපයූ අර්ථකථනය දෙදරා යෑමක් විය.

ගරුමය වූ මහා ඇඩ්වෙන්ටිස්ත මෙහෙයුමෙහි මගපෙන්වීම දෙවියන්වහන්සේගේ අනුදැනුම යටතේ විය. උන්වහන්සේගේ බලය සහ මහිමය මෙම කාර්යයට එකතුව තිබුණේය. එය අඳුරෙහි සහ

කලකිරීමෙහි සේදී යාමට උන්වහන්සේ ඉඩ හරින්නේ නැත. එම මෙහෙයුම ව්‍යාජ වූද, ආගමික උන්මත්තකයන්ගේ ව්‍යායාමක් යයිද කියා සමච්චලයකට භාජන වීමට දෙවියන්වහන්සේ අවසර දෙන්නේ නැත. උන්වහන්සේගේ වචනය පිළිබඳව අනුමානයක් හෝ අවිශ්වාසයක් ඇතිවීමට දෙවියන්වහන්සේ ඉඩ නොදෙනසේක. දිවැසි ප්‍රසාදි ප්‍රකාශනය පිළිබඳව ලබා දී තිබූ අර්ථකථනය පිළිබඳව සෑහීමට පත් නොවූ සමහරෙක් තමන් මෙතෙක් දරූ ස්ථාවරය අත්හැර දමා තම ඇදහිල්ලට ආයුබෝවන් යයි කීහ. තවත් අය තම ඇදහිල්ලෙහි කරුණු අත්හැර දමීමට කැමති නොවූවෝය. තමන් දරන්නාවූ ස්ථාවරය ශුද්ධ ලියවිලි මගින්ද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ සාක්ෂි දැරීම මගින්ද තහවුරුව ඇති බව ඔවුන්ගේ විශ්වාසය විය. දිවැසි වැකි අධ්‍යයනයේදී තමන් තහවුරු කරගත් අර්ථකථන සැපයුමේදී මෙතෙක් සනාථව ඇති සිද්ධීන් තරයේ අල්ලා ගෙන සිටිය යුතුය යනු ඔවුන්ගේ තීරණය විය. බයිබලීය කරුණු විමසීම තවදුරටත් එලෙසම කරගත යුතුය යන්න ඔවුන්ගේ නිගමනය විය. අවංක චින්තනයකින් යුතුව ඔවුහු ඉතා උනන්දුවෙන් තමන්ගේ ස්ථාවරය ගැන නැවත වරක් අධ්‍යයනයෙහි යෙදුණෝය; තමන්ට වැරදී ඇත්තේ කොතැනදැයි යාච්ඤාවෙන් යුතුව විමසා බැලුවෝය. දිවැසි ප්‍රකාශනයෙහි කාලවකවානු පිළිබඳව තමන්ට වැරදී නැත යන චින්තනයෙන් යුතුව එහි සඳහන් ශුද්ධස්ථානය සහ විෂය පිළිබඳව ගැඹුරින් හදාරන්නට ඔවුහු වෑයම් කළෝය.

ඔවුන්ගේ පරීක්ෂණයන්ගෙන් ඔවුන්ට සනාථ වූයේ ශුද්ධස්ථානය යන්න මෙලෝ භූමිය යයි ශුද්ධ ලියවිල්ලෙන් ස්ථිර නොවන බවය. ශුද්ධස්ථානය යන්නෙහි යථාර්ථ ස්වභාවයත්, සේවයත් එය පිහිටා ඇති ස්ථානයත් පිළිබඳ පුළුල් විස්තර කිරීමක් ශුද්ධ බයිබලීය අධ්‍යයනය මගින් ඔවුන්ට ලබාගත හැකි විය. හෙබ්‍රෙව්වරුන්ට පාවුල් යැවූ ලිපියෙහි නියම ශුද්ධස්ථානය ගැන යොමු කිරීමක් ඔහු විසින් මෙසේ දක්වා ඇත. "තවද පළමුවෙනි ගිවිසුමට පවා දේව මෙහෙයේ නියෝගද භූමික ශුද්ධස්ථානයද තිබුණේය. මක්නිසාද ශුද්ධස්ථානයය කියන පළමුවෙනි මණ්ඩපය සාදන ලද්දේය, එහි පහන් රුකද, මේසයද, පිදීමේ රොටීද තිබුණේය. ඊට ශුද්ධස්ථානයයි කියන ලදී. දෙවෙනි තිරය ඇතුළෙන් අති ශුද්ධස්ථානය යයි කියන ලද මණ්ඩපය තිබුණේය. එහි රන් දුම් භාජනයක්ද, මුළුල්ලම රනින් වැසූ ගිවිසුම් පෙට්ටියද තිබුණේය. ඒ පෙට්ටියේ මන්නා දමූ රන් භාජනයක්ද දළු ලැවාවූ ආරොන්ගේ සැරයටියද ගිවිසුමේ ගල් ලැලිද තිබුණේය. ඒක උඩ තේජසේ කෙරුබ්වරු කරුණාසනය වසාගෙන සිටියෝය." හෙබ්‍රෙව් 9: 1-5.

පාවුල් මෙහි සඳහන් කරන පූජ්‍ය ස්ථානය නම් දෙවියන්වහන්සේගේ අණසක යටතේ මෝසෙස් ඉදි කළ ශුද්ධස්ථානයයි; එය මහෝත්තමයාණන්ගේ භූමික වාසස්ථානය විය. දෙවියන්වහන්සේ



මෝසෙස්ට මෙසේ අණ කළසේක. "මා ඔවුන් අතරේ වාසය කරන පිණිස ඔවුහු මට ශුද්ධස්ථානයක් සාදත්වා." නික්මයාම 25:8. ඊශ්‍රායෙලිතයෝ කාන්තාරය මැදින් ගමන් කරමින් සිටියහ. ඔවුන් තැනූ පූජ්‍ය ස්ථානය වනාහි තැනින් තැනට ගෙන යා හැකි සේ නිමවූවක් විය. එසේ වුවද, එය තේජස්ශ්‍රීයකින් යුත් උත්කෘෂ්ටාලංකාර නිර්මාණයක් විය. එහි බිත්ති රනින් ආලේප කරන ලද ලෑලි කෙළින් සිටුවා සාදන ලද්දක් විය. එක එක ලෑල්ල එකටෙකට යා කිරීම පිණිස රිදී කුඩුම්බි විය. ගොඩනැගිල්ලෙහි වහලය තිර ගණනාවකින් සැදුම් ලද්දේ විය. ඉහළින් පිහිටි තිර සම්වලින් වූ අතර ඇතුළත තිරය කටින ලද හණ නූලෙන් නිමකර කෙරුබ් රූප ගෙත්තම් කර තිබිණ. පිටත මළුවේ ගිනි පූජාසනය විය. පූජ්‍ය ස්ථානය මණ්ඩප දෙකකින් සමන්විත විය. එම මණ්ඩප දෙක ශුද්ධස්ථානය සහ අති ශුද්ධස්ථානය ලෙසින් නම් කර තිබුණේය. මේ මණ්ඩප දෙක අතර ඉතා අලංකාර තිරයක් විය. ඒ හා සමාන කඩවැස්මක් පළමු මණ්ඩපයට ඇතුළු වන දොරටුවටද යොදා තිබුණේය.

ශුද්ධස්ථානයේ දකුණු පස පහන් රුක ස්ථානගත කර තිබුණේය. පහන් රුකේ තිබූ පහන් හතෙන් නිකුත් වූ ආලෝකය මුළු ශුද්ධස්ථානයටම දිවා රෑ එළිය ලබා දුන්නේය. පිදීමේ රොටී මේසය පිහිටා තිබුණේ උතුරු පසෙහිය. මණ්ඩප දෙක අතර යොදා තිබූ තිරය ඉදිරියෙහි රනින් ආලේපිත දුම් පූජාසනය ස්ථානගත කර තිබුණේය. ඊශ්‍රායෙල් බැතිමතුන්ගේ යාච්ඤාවන් සමගින් මෙම දුම් පූජාසනයෙන් ඉහළ නැගුණු සුවඳ දුමාරය දිනපතාම දෙවියන්වහන්සේ ඉදිරියට ළඟා විය.

අති ශුද්ධස්ථානයේ ගිවිසුම් පෙට්ටිය තබා තිබුණේය. එය අගනා ලීයෙන් සාදන ලද්දේ විය. එහි ඇතුළත සහ පිටතද රන් ආලේප කර තිබුණේය. දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන් ලියන ලද දස පනත රැගත් ගල් ලෑලි දෙක මෙම පෙට්ටිය තුළ තබන ලද්දේය. පෙට්ටියේ වැසුම් පියන කරුණාසනය විය. එය තනි රනින් සෑදූ අගනා කර්මාන්ත භාණ්ඩයක් විය. කරුණාසනය දෙපස තනි රනින් නිර්මාණය කළ කෙරුබ් වරුන් දෙදෙනෙකු සවි කර තිබුණේය. මෙම අති ශුද්ධස්ථානයේ තිබූ කෙරුබ් වරුන් දෙදෙනා අතරෙහි දේව අභිමුඛය පෙන්නුම් කරන තේජසේ වලාකුළ විය.

මිසරයෙන් පිටත ආ හෙබ්‍රෙව්වරු කානාන් දේශයෙහි වාසස්ථාන පිහිටුවා ගත්තෝය. තැනින් තැන ගෙන යා හැකි පූජ්‍ය ස්ථානය වෙනුවට සාලමොන් රජතුමා දේව මාළිගාවක් නිර්මාණය කළේය. එය ස්ථිරසාර ගොඩනැගිල්ලක් වූ අතර ප්‍රමාණයෙන්ද විශාල විය. එසේ වුවද, එය දිගින් පළලින් හා උසින් මණ්ඩපය හා අනුකූල විය. එසේම එම දේව මාළිගාව තුළ තිබූ පූජ්‍ය භාණ්ඩද මුල් ආකෘතිය

අනුවම ස්ථානගත කර තිබුණේය. මේ ආකාරයෙන් දේව මාළිගාව ක්‍රි. ව. 70 දී රෝමවරුන් විසින් විනාශ කරන තෙක් පැවැතියේය. එහෙත් දානියෙල්ගේ කාලයේදී එය නටබුන් ලෙස පමණක් පැවැතියේය.

මේ භූමි තලයේ පිහිටා තිබූ එකම ශුද්ධස්ථානය මෙය පමණක් විය. ශුද්ධ බයිබලයේ සඳහන්ව ඇත්තේද මෙම පූජ්‍ය ස්ථානය ගැන පමණකි. මෙය පළමු ගිවිසුම අනුව වූ ශුද්ධස්ථානය ලෙස පාවුල් ප්‍රකාශ කර තිබේ. අළුත් ගිවිසුම අනුව ශුද්ධස්ථානයක් නැත්තේද?

සත්‍යතාව සොයා ගිය බයිබල් ගවේෂකයෝ හෙබ්‍රෙව් පොත වෙත තම අවධානය යොමු කළෝය. එහිදී ඔවුන්ට සොයා ගැනීමට හැකිවූයේ දෙවෙනි ශුද්ධස්ථානයක් ගැන, අළුත් ගිවිසුමේ ශුද්ධස්ථානයක් ගැන, පාවුල් පවසා ඇති බවය. "තවද පළමුවෙනි ගිවිසුමට පවා දේව මෙහෙයේ නියෝගද භූමික ශුද්ධස්ථානයක්ද තිබුණේය." "පවා" යන වචනය භාවිතයෙන් පෙනී යන්නේ මෙම ශුද්ධස්ථානය ගැන පාවුල් මීට ඉහතදී සඳහන් කර ඇති විලාශයයි. මීට කළින් පරිච්ඡේදයට අපගේ අවධානය යොමු කරමු. එහි මෙසේ සඳහන් වන්නේය. "ඉතින් අප කියන දේවලින් ප්‍රධාන එක නම් ස්වර්ගවල මහෝත්තමයාණන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තේ හිඳගත්තාවූ, මනුෂ්‍යයා විසින් නොව ස්වාමින්වහන්සේ විසින් පිහිටුවන ලද ශුද්ධස්ථානයේ හා සැබෑවූ මණ්ඩපයේ සේවකයෙක් වූ උත්තම පූජකයෙක් අපට සිටින බවය." (හෙබ්‍රෙව් 8:1, 2).

නව ගිවිසුමෙහි ශුද්ධස්ථානය මෙහි එළිදරව් කර ඇත. ප්‍රථම ගිවිසුමෙහි ශුද්ධස්ථානය පිහිටුවනු ලැබුවේ මිනිසුන් විසින්ය. එය මෝසෙස්ගේ අධීක්ෂණය යටතේ ඉදි කරනු ලැබීය. නමුත් මෙම ශුද්ධස්ථානය පිහිටුවනු ලැබුවේ මිනිසා විසින් නොව දෙවි සමිඳාණන් විසින්ය. භෞමික පූජ්‍ය ස්ථානයේ සේවය ඉටු කළේ මිනිස් පූජකයන් විසින්ය. එහෙත් ස්වර්ගීය දේවස්ථානයේ මෙහෙවර කරන්නේ දෙවියන්වහන්සේගේ දකුණුපස වැඩ හිඳින්නාවූ අපගේ උත්තම පූජක ක්‍රිස්තුස්වහන්සේය. එක ශුද්ධස්ථානයක් පොළොවේ පිහිටියේය. අනෙක ඇත්තේ ස්වර්ගයේය.

මෝසෙස් විසින් ඉදිකරනු ලැබූ මණ්ඩපය, පෙන්නා දෙනු ලැබූ ආකෘතියට අනුව සාදනු ලැබීය. එහි වැඩකටයුතු දෙවියන්වහන්සේගේ මගපෙන්වීම යටතේ ඉටු විය. "මා විසින් නුඹට පෙන්වන සියල්ල ලෙස එනම් මණ්ඩපයේ ආදර්ශයද එහි සියලු බඩුවල ආදර්ශයද ලෙස එය සාදන්න." නැවත වරක්ද තවත් උපදෙස් ලැබිණි. "කන්දේදී නුඹට පෙන්වන ලද ආදර්ශය ලෙස ඒවා සාදන්ට බලා ගන්න." (නික්මයාම 25:9, 40). පළමු කූඩාරම් දෙවි මැදුර නොහොත් මණ්ඩපය ගැන පාවුල් මෙසේ පවසයි. "ඒ මණ්ඩපය වර්තමාන කාලයට



උපහැරණයක්ය." භූමික ශුද්ධස්ථානයෙහි පූජකයන් තුටු පඬුරු ඔප්පු කළේ සගයේ තේවාවන් ආදර්ශයට ගනිමින්ය. "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සැබෑ ශුද්ධස්ථානයේ ආදෘශවන, අතින් සෑදූ ශුද්ධස්ථානයකට නොව අප උදෙසා දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි දැන් පෙනී සිටින පිණිස ස්වර්ගයටම ඇතුල් වූසේක." (හෙබ්‍රෙව් 9: 9, 24).

අප උදෙසා දෙවියන්වහන්සේ ඉදිරියෙහි මැදහත්කාරකම් කරන්නාවූ යේසුස්වහන්සේ සේවය කරන්නාවූ සගයේ පූජ්‍ය ස්ථානය වනාහි මූල නිර්මාණය වන්නේය. මෝසෙස් සෑදූ කූඩාරම් ශුද්ධස්ථානය එහි ආකෘතියක් විය. භෞමික දේවස්ථානය සෑදීමේදී දෙවියන්වහන්සේ එහි ගොඩනැගීමේ නිලධාරීන් මත තමන්වහන්සේගේ ආත්මය තැබූසේක. එම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී පෙන්නුම් කරන ලද නිර්මාණාත්මක නිපුණතාව දිව්‍ය ප්‍රඥාවේ පැහැදිලිවූ දක්මකි. එහි බිත්ති විශාල රත්රන් කුට්ටියක් විලසින් පෙනී ගියේය. රනින් කළ පහන් රුකෙහි වූ පහන් හතෙන් විහිදුවන ලද්දාවූ ආලෝකය බිත්ති මගින් සෑම අතටම පරාවර්තනය වී මුළු ශුද්ධස්ථාන මණ්ඩපයටම එළිය ලබා දුන්නේය. පිදීමේ රොටී මේසය සහ සුවඳ දුම් පූජාසනය ඔප දැමූ රත්රන් මෙන් දිලිසෙමින් තිබිණ. ගොඩනැගිල්ලෙහි සිවිලිම සඳහා යෙදූ අතිශයින් මනස්කාන්ත වූ තිරය නිල් පාට, දම් පාට, සහ තද රතු පාට නූල්වලින් ගෙත්තම් කරන ලද කෙරුබ් රූපවලින් අලංකාර කර තිබිණ. දෙවෙනි තිරයෙන් ඔබ්බෙහි දෙවියන්වහන්සේගේ තේජස් මහිමාලංකාරය විදහා දක්වන උන්වහන්සේගේ වැඩසිටීම පෙන්නුම් කරන ෂෙකයිනා නමැති ශුද්ධවූ ආලෝකය විය. එම ස්ථානයට යෑමට අවසර තිබුණේ උත්තම පූජකයාට පමණකි. උත්තම පූජකයාට පමණක්ම එහි ඇතුල්වී ජීවත්වන්නට පුළුවන් විය.

දෙවියන්වහන්සේගේ සිහසුන ඉදිරියෙහි අප උදෙසා මෙහෙවරයෙහි යෙදෙන ක්‍රිස්තුස්වහන්සේ සේවය කරන ස්වර්ගීය දේවස්ථානයේ මහිමාලංකාරයෙන් බිඳක් භෞමික පූජ්‍ය ස්ථානයෙහි දකගත හැකි විය. එසේ වුවද, එය ලෝකයේ තිබූ ඉතාමත් අලංකාර නිර්මාණයක් විය. රාජාති රාජ මහෝත්තමයාණන් වැඩ වසන්නාවූ ස්වර්ගීය ශුද්ධස්ථානයේදී ලක්ෂ සංඛ්‍යාත පිරිසක් උන්වහන්සේ ඉදිරියෙහි උන්වහන්සේට උපස්ථාන කරමින් සිටියෝය. කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත පිරිසක් උන්වහන්සේ ඉදිරියෙහි සිටියෝය. එම ශුද්ධස්ථානය සදාතනික සිංහාසනයෙහි තේජසින් ඒකාලෝකව තිබිණ. එහි දිලිසෙන මුරකරුවන් වූ සෙරප්වරු තමන් පියාපත් වලින් මුහුණු ආවරණය කරගෙන උන්වහන්සේට වැඳ වැටෙමින් නමස්කාර කරති. එම තේජසාලංකාරයෙන් බිඳක් භෞමික දේවස්ථානය තුළින් දිස් විය. භෞමික පූජ්‍ය ස්ථානයත් එහි තේවා මෙහෙවරත් මගින් අගනා සත්‍යතාවන් ගණනාවක් ඉගැන්විණි. එමගින් සගයේ වූ ශුද්ධස්ථානය ගැනත්, මිනිසාගේ මිදීම සඳහා එහි කෙරෙන්නාවූ විශිෂ්ඨතම වූ මෙහෙවර

ගැනත් මෙලෝ ශුද්ධස්ථානය සහ තේවාවන්ද මගින් නියෝජනයක් ඉදිරිපත් විය.

ස්වර්ගීය පූජ්‍ය ස්ථානයේවූ ශුද්ධවූ ස්ථාන දෙක පෙන්නුම් කරමින් භෞමික පූජ්‍ය ස්ථානයේ මණ්ඩප දෙක නිර්මාණය වී තිබුණේය. සගයේ පිහිටි දෙවියන්වහන්සේගේ දේව මාළිගාව දසුනකින් දකගැනීමට යොහන්ට අවස්ථාව සලසා දෙන ලදී. තමා දුටු දේ ඔහු මෙසේ වාර්තා කරයි: "සිංහාසනය ඉදිරියෙහි ගිනි පහන් සතක් දැල්වෙමින් තිබුණේය." (එළිදරව් 4:5). "දේව දූතයෙක් රන් දුම් භාජනයක් රැගෙන ඇවිත් පූජාසනය ඉදිරිපිට සිටියේය. සිංහාසනය ඉදිරියෙහි තිබුණු රන් පූජාසනය පිට සියලු ශුද්ධවන්තයන්ගේ යාච්ඤා සමග ඔප්පු කරන පිණිස බොහෝ සුගන්ධ ද්‍රව්‍ය ඔහුට දෙන ලද්දේය." (එළිදරව් 8: 3). මෙසේ සගයේ තිබූ ශුද්ධස්ථානයෙහි පළමු මණ්ඩපය දකගැනීමට ප්‍රොපේතවරයාට වරම් ලැබිණ. එම මණ්ඩපය ඇතුළත 'ගිනි පහන් සතක්' සහ 'රන් පූජාසනයක්' ඔහුට දකීමට හැකි විය. එයින් නියෝජනය වූයේ පොළොවේ තිබූ දේව මාළිගයෙහි වූ රන්මය පහන් රුකද, සුවඳ දුම් පූජාසනයද විය. නැවත වරක් "දෙවියන්වහන්සේගේ මාළිගාව අරින ලද්දේය." (එළිදරව් 11:19). තිරයෙන් ඔබ්බෙහි පිහිටි අති ශුද්ධස්ථානය වෙත ඔහුගේ දැස් යොමු විය. දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය එම ස්ථානයේ තිබෙනවා ඔහුට දකගැනීමට අවස්ථාව ලැබුණේය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලේඛණගත කළ ගල්ලැලි දෙක බහාලූ මෝසෙස් සෑදූ ශුද්ධවූ ගිවිසුම් පෙට්ටියෙහි මුල් කෘතිය එයින් පෙන්නුම් කරන ලද්දේය.

විෂය පිළිබඳව අධ්‍යයනයෙහි යෙදුනු ගවේෂකයන්ට කිසිම සැකයකින් තොරව සාක්ෂාත් වූයේ සගයේද ශුද්ධස්ථානයක් පිහිටා තිබෙන බවය. භෞමික පූජ්‍ය ස්ථානය මෝසෙස් විසින් ඉදිකරන ලද්දේ ඔහුට පෙන්වූ ආදර්ශය අනුවය. එහි දර්ශනය වූයේ ස්වර්ගයෙහි වූ දේව මාළිගයයි. එය සගයෙහි තිබූ නියම දේව මාළිගය බව පාවුල් පවසයි. එය සගයේ තිබෙනවා තමා දුටු බවට යොහන් සාක්ෂි දරයි.

දෙවියන්වහන්සේගේ වාසස්ථානය වූ සගයෙහි පිහිටි මාළිගයෙහි, දමිටුකම හා විනිශ්චය පදනම් කරගෙන උන්වහන්සේගේ සිහසුන පිහිටුවා ඇත. එහි අති ශුද්ධස්ථානයෙහි උන්වහන්සේගේ ව්‍යවස්ථාව කෙටුම්පත් කර ඇත. මිනිස් සත මනිනු ලබන්නාවූ උත්තරීතර මිණුම් දණ්ඩ එම ව්‍යවස්ථාව වන්නේය. ව්‍යවස්ථාවේ පුවරු දෙක තැන්පත් කර තිබූ ගිවිසුම් පෙට්ටියෙහි පියන්පත කරුණාසනය නමින් හැඳින්විණි. එය ඉදිරියෙහි ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ ශ්‍රී රුධිරය පව්කාරයා



වෙනුවෙන් ආදේශ කරමින් මෙහෙවරෙහි යෙදී සිටින සේක. මිනිසාගේ ගැළවීම උදෙසා යුක්තිය, සාධාරණය, සහ මෛත්‍රී-කරුණාව ඒකාබද්ධව ක්‍රියාත්මක වන ආකාරය එමගින් පිළිබිඹු විය. මෙම ඒකාබද්ධතාව නිර්මාණය කිරීමට හැකිවන්නේ අනන්ත වූ ප්‍රඥාවට පමණක්ය. එය ක්‍රියාත්මක කිරීමට අනන්ත බලයක් යෙදවීම අවශ්‍යය. එම ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය මුළු සගයම විශ්මයෙන් සහ ගෞරව භක්තියෙන් පිරී ඉතිරී යාමට හේතුවක් විය. භෞමික දේව මාළිගයෙහි කරුණාසනය දෙස නෙත් හෙළා බලා සිටින්නාවූ කෙරුබ් රූප යුගලක් විය. සමස්ත ස්වර්ගීය දේව දූත සේනාව ගැළවීමේ කාර්යය දෙස ඉතා උනන්දුවෙන් සැලකිලිමත් වන ආකාරය එයින් ප්‍රදර්ශනය විය. දේව දූත සේනාව අවධානය දක්වන්නාවූ කරුණා-මෛත්‍රීයෙහි අභිරහස මෙයයි; එනම් පසුතැවෙන්නාවූ පව්කාරයාව දැහැමියෙකු කිරීමෙහිදී දෙවියන්වහන්සේ සාධාරණ ලෙස ක්‍රියාකරමින්, පාපයට වැටී ගිය මිනිස් වර්ගයා සමග අන්‍යෝන්‍ය සබඳතාවක් නැවත ගොඩනගා ගෙන, ඔහුට ගැළවීම දීම සඳහා මාර්ගයක් සම්පාදනය කිරීමය. මෙය දේව දූතයන්ට අභිරහසක් විය. විනාශයේ ආගාධයෙන් ගණන් කළ නොහැකි සංඛ්‍යාත පව්කාරයන් මුදවාලීම සඳහා ක්‍රිස්තුස්වහන්සේ සගයේ රාජශ්‍රීය සැප සම්පත් අත්හැර දමා පාපිෂ්ඨ ලෝකයට පැමිණ දිවි පුදා පාපයට වන්දිය ගෙවීම සකල ස්වර්ගීය දූත කැළගේ විස්මයට සහ භක්ති ගෞරවාදරයට හේතු විය. එම පූජාව තුළින් පව්කාරයාට තමන්ගේම දැහැමිතාව නමැති කැළැල් රහිත සළු හඳවා, වැටී නොගිය දේව දූතයන්ගේ සමාගමට ඔවුන් එක්සත් කර දෙවියන්වහන්සේගේ අභිමුඛය ඉදිරියෙහි සදහටම වාසය කරන්නට සැලැස්වීම ඉතා විස්මිත අභිරහසක් විය.

"පැළෑටිය නම්වූ මනුෂ්‍යයා"යි සෙකරියා දිවැසිවරයාගේ මනහර අනාගතවාක්‍ය ප්‍රකාශනයෙහි හඳුන්වා දෙනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේ විසින් ඉටු කරනු ලබන්නාවූ මැදහත්කාරකමෙහි සේවාව ගැන දිවැසිවරයා මෙසේ පවසයි. "උන්වහන්සේම ස්වාමින්වහන්සේගේ මාළිගාව ගොඩනගා, උන්වහන්සේම මහිමය දරමින්, තමන් සිංහාසනයෙහි වැඩහිඳ ආණ්ඩු කරන සේක; තමන් සිංහාසනයෙහිම පූජකයෙක්වද සිටිනසේක. ඒ දෙදෙනා අතරේද සමාදාන මන්ත්‍රණය තිබෙයි." (සෙකරියා 6:13).

"උන්වහන්සේ (ක්‍රිස්තුස්වහන්සේ) ස්වාමින්වහන්සේගේ මාළිගාව" ගොඩ නගනවා ඇත. තමන්වහන්සේගේ ජීවිත පූජාව සහ මැදහත්කාරකම් කිරීමේ සේවාව නිසා ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ සභාවෙහි අත්තිවාරම සහ ගොඩ නගන්නාණන්ද වන බව පාවුල් පවසයි. "ක්‍රිස්තුස් යේසුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටින

සේක. උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතු කරනු ලදුව, ස්වාමින්වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක්ව සෑදීගන යන්නේය. උන්වහන්සේ තුළ නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගන ලද්දහුය." (එපීස 2:20-22).

"උන්වහන්සේ තේජස දරනවා ඇත." පාපයට ඇද වැටුණාවූ මිනිස් වර්ගයාගේ මිදීම සලසා දුන් ක්‍රිස්තුස්වහන්සේට ගෞරවය සහ තේජස හිමිය. සදාතනය පුරා ගැළවීම ලැබූවන්ගේ ප්‍රශස්ති ගීතය මේකය. "අපට ප්‍රේම කරන්නාවූ, තමන්ගේ ලෙයින් අපේ පාපවලින් අප මිදුවාවූ .... තැනැන්වහන්සේට ගෞරවයද පරාක්‍රමයද සදාකාලේටම වේවා" යන්නය. (එළිදරව් 1:5,6).

උන්වහන්සේ තමන් සිංහාසනයෙහි වැඩ හිඳ ආණ්ඩු කරන සේක. තමන් සිංහාසනයෙහිම පූජකයෙක්වද සිටින සේක. තමන් වහන්සේගේ තේජස්ශ්‍රීය සිංහාසනයෙහි වැඩ හිඳීම දැන් නොව ඉදිරි කාලයෙහිදීය. තේජෝ මහිම රාජ්‍යය තවමත් ආරම්භ වී නැත. ඒ සඳහා මැදිහත්වීමේ සේවාව අවසන් විය යුතුය. "උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ ස්වාමින්වහන්සේ උන්වහන්සේට දෙනසේක." "උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේය." (ලූක් 1: 32, 33). දැන් පූජකවරයෙකු ලෙස ක්‍රිස්තුස්වහන්සේ පියාණන්-වහන්සේගේ සිහසුනෙහි වැඩ හිඳිනසේක. සදාතන ස්වයංභූ මහෝත්තම-යාණන්වහන්සේ සමග එම සිංහාසනයෙහි වැඩ හිඳින තැනැත්තේ වනාහි 'අපගේ දුක් උසුලන්නාවූ අපගේ ශෝකය දරාගත්තාවූ' තැනැන්වහන්සේම වනසේක. තවද උන්වහන්සේ "පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ" බැවින් "පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිට වෙන්ට උන්වහන්සේට පුළුවන." "යමෙක් පව් කළොත් ධර්මිෂ්ඨවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මැදහත්කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටිනසේක." (යෙසායා 53:4; හෙබ්‍රෙව් 4:15; 2:18; 1 යොහන් 2:1.) උන්වහන්සේ මැදහත්කාරකම් කරන්නේ සිදුරු කරනු ලැබ බිඳී ගියාවූ ශරීරයක්යද නොකැළැල් ජීවිතයක්ද ඉදිරිපත් කරමින්ය. තුවාල කරනු ලැබූ දෑත්, සිදුරු කරනු ලැබූ ළපැත්ත, ඇණ ගසනු ලැබූ දෙපා, පාපයට වැටී ගිය මිනිසාට පව් කමාව ලබාදෙන්නට කන්නලව් කරයි; මිල කළ නොහැකි වන්දියක් ගෙවා ලබාගත් මිදීමට හවුල් වන්නැයි උන්වහන්සේ ආයාචනය කරනසේක.

"ඒ දෙදෙනා අතරේද සමාදාන මන්ත්‍රණය තිබෙයි." විනාශය කරා යොමු වූ වැටී ගිය මිනිසාගේ ගැළවීමෙහි උල්පත වන්නේ



පියාණන්වහන්සේගේ ආදරයයි. පුත්‍රයාණන්වහන්සේගේ ආදරයද ඒ හා සමානය. ගෝලයන්ගෙන් සමුගෙන පිටත්ව යාමට පෙර යේසුස්-වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක. "නුඹලා උදෙසා පියාණන්-වහන්සේට යාච්ඤා කරන්නෙමියි නොකියමි. මක්නිසාද ... පියාණන්වහන්සේම නුඹලාට ප්‍රේම වනසේක." (යොහන් 16: 26,27) "දෙවියන්වහන්සේ .... ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ලෝකයා තමන්වහන්සේට සමගි කරගනිමින් සිටියසේක." (2 කොරින්ති 5:19). ඉහළ සගයේ පිහිටි ශුද්ධස්ථානයේ මෙහෙවර කිරීමේදී, උන්වහන්සේලා දෙදෙනා අතරේද 'සමාදාන මන්ත්‍රණය' පවතින්නේය. "දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය." (යොහන් 3:16).

ශුද්ධස්ථානය යනු කුමක්දැයි යන ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් ශුද්ධ ලියවිල්ලෙහි අන්තර්ගතය. ශුද්ධ ස්ථානය යන වචනය මුලින්ම බයිබලයෙහි භාවිතා කර ඇත්තේ මෝසෙස් විසින් ඉදි කළ කූඩාරම් මණ්ඩපයටය. එය සගයේ ඇති දේවල ආදර්ශයක් විය. දෙවනුව එම පදය භාවිතා කර ඇත්තේ සගයේ පිහිටි "සත්‍යයමය වූ දේව මාළිගාවටය." ක්‍රිස්තුස්වහන්සේගේ මරණයත් සමගම සංකේතයක් ලෙසවූ තේවාවන් සහ සේවාවන් නිමාවට පැමිණියේය. අළුත් ගිවිසුමෙහි සත්‍යවූ දේව මාළිගය වනාහි සගයේ පිහිටි ශුද්ධස්ථානයයි. දානියෙල් 8:14 හි සඳහන් දිවැසි ප්‍රකාශනය සම්පූර්ණවීමේදී ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යන්නෙන් දක්වනු ලබන්නේ අලුත් ගිවිසුමේ ශුද්ධස්ථානය විය යුතුය. වසර 2300 ක කාල පරිච්ඡේදය 1844 දී නිමාව දක්කේය. ඒ වන විටත් ශත වර්ෂ ගණනාවක් පුරා භූමි තලය මත දෙවියන්වහන්සේගේ දේව මාළිගාවක් පිහිටා නොතිබිණ. එම නිසා මේ අනාවැකිය එනම්, "රෑ දාවල් දෙදාස් තුන්සියයක් පසුවන තුරුය; එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය" යන්නෙහි අන්තර්ගතය යොමු වන්නේ සගයේ ඇත්තාවූ ශුද්ධස්ථානයට බව අවිවාදයෙන් පිළිගත යුතුය.

එසේ වුවද, මේ හා සම්බන්ධව ඉතා වැදගත් ප්‍රශ්නයට පිළිතුරක් ලැබිය යුතුය. එය නම් ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? යන්නය. භෞමික පූජ්‍ය-ස්ථානය හා සම්බන්ධව පවිත්‍ර කිරීමේ සේවාවක් පැවති බවට පරණ තෙස්තමේන්තුව තොරතුරු සපයා දී තිබේ. එහෙත් පවිත්‍ර කිරීම සඳහා ස්වර්ගයේ කිසිවක් හෝ තිබේද? භූමියේ මෙන්ම ස්වර්ගයේද ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමක් ගැන පැහැදිලි වූ සඳහනක් හෙබ්‍රෙව් 9 හි ඇත. "ව්‍යවස්ථාවේ ප්‍රකාරයට

සියලු දේවල්ම ලෙයින් පවිත්‍ර කරනු ලැබේ යයි කියන්ට පුළුවන්වා වාගේ පෙනේ. ලේ වැගිරීමක්ද නැතුව ක්ෂමාකිරීමකුත් නැත. එබැවින් ස්වර්ගයේ තිබෙන දේවල සටහන් මේවායින් පවිත්‍ර කරන්ට ඕනෑව තිබුණේය. නුමුත් ස්වර්ගීය දේවල්ම මේවාට වඩා උතුම් පූජාවලින් පවිත්‍ර කරනු ලබන්ට යුතුය" එනම්, ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් ඒවා පවිත්‍ර කළ යුතුය. (හෙබ්‍රෙව් 9:22,23).

භූමික දේවස්ථානයේ මෙන්ම ස්වර්ගීය දේවස්ථානයේද පවිත්‍ර කිරීම කළ යුතුවන්නේ ලේ මගින් පමණකි. භූමික ශුද්ධස්ථානයේ එය සිදුකළේ සත්ව ලේ වලින්ය. ස්වර්ගීය දේවස්ථානයේ එය කරනු ලබන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී රුධිරය කරණකොටගෙනය. මෙම පවිත්‍ර කිරීමේ කාර්යය ලේ මගින් කළ යුතුවන්නේ කුමක් නිසාදයි පාවුල් පවසා තිබේ. එනම්, ලේ වැගිරීමක් නැතිව පව් කමාවක් නැති බව ඔහු කියයි. ඉටුවිය යුතු කාර්ය භාරය නම් පාපය ඉවත් කිරීම හෝ පාපයට කමාව දීමය. එසේ නම්, භූමික දේවස්ථානයේ හෝ වේවා, සගයේ ශුද්ධස්ථානයේ හෝ වේවා එම ස්ථාන හා සම්බන්ධව පාප තිබෙන්නේ කෙසේද? සංකේතයක් වශයෙන් භූමික දේවස්ථානයේ සිදුවූ තේවා මෙහෙය හා සිද්ධීන් මගින් මේ ගැන විස්තර ඉගෙන ගැනීමට පුළුවන. එහි සේවය කළ පූජකයෝ "ස්වර්ගීය වූ දේවල සටහනක්ව, ඡායාවක්ව තිබෙන දෙයට" සේවය කළහ. (හෙබ්‍රෙව් 8:5).

භූමික දේවස්ථානයේ සිදුකරන ලද සේවාවන් කොටස් දෙකකින් සමන්විත විය. පූජකයෝ දිනපතාම ශුද්ධස්ථානයේ පූජා කටයුතු ඉටු කළෝය. එහෙත් උත්තම පූජකයා වසරකට වරක් අති ශුද්ධස්ථානයට පැමිණ සමගි කිරීම නමැති විශේෂිත පූජා මෙහෙයක් ඉටු කළේය. එය ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම සඳහාවූ පූජා මෙහෙයක් විය. පසු තැවෙන්නාවූ පව්කාරයා තමාගේ පාපයට කමාව අපේක්ෂාවෙන් ලේ පූජාවක් සඳහා පූජාවක් ගෙනාවේය. මෙම ක්‍රියාදාමය සැමදාම සිදුවිය. හෙතෙම තම පූජාව සමග දෙව් මැදුරේ දොරටුව වෙත පැමිණියේය. හෙතෙම පූජකයා ඉදිරියෙහි සිට පූජාවෙහි සතාගේ හිස පිට සිය අත තබා තමාගේ පාප කියා දුන්නේය. මෙසේ කිරීමෙන් ඔහු පූජාවට තම පාපය පවරා දුන්නේය. ඉක්බිතිව පූජාවේ සතා මරනු ලැබීය. "ලේ වැගිරීමකින් තොරව පව් කමාවක් නැත"යි අපෝස්තුළුවරයා පවසයි. තවද, "මාංසයේ පණ තිබෙන්නේ ලෙයෙහිය"යි පවසා ඇත. (ලෙවී කථාව 17:11). යමෙක් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩ කළහොත් එම පුද්ගලයා තම ජීවිතයෙන් වන්දි ගෙවිය යුතු යයි එම ව්‍යවස්ථාව ඉල්ලා සිටී. පූජාවක් රැගෙන ආ පව්කාරයාව ඒ පූජාවේ ලේ වලින් පෙන්නුම් කරනු ලැබීය. පව්කාරයාගේ



ජීවිතය පෙන්නුම් කරන රුධිරය පූජකයා ශුද්ධස්ථානය වෙත ගෙන ගියේය. ඔහු එම ලෙය අති ශුද්ධස්ථානය වෙන් කරන්නාවූ තිරය ඉදිරියෙහි ඉස්සේය. තිරයේ අනෙක් පසෙහි ගිවිසුම් පෙට්ටිය පිහිටුවා තිබුණි. පව්කාරයා කඩ කර ඇත්තේ එහි තබා ඇති ව්‍යවස්ථාවය. මෙම ක්‍රමවේදය මගින් ලෙය කරණකොටගෙන පාපය ශුද්ධස්ථානය වෙත පවරනු ලැබූ බවක් පෙන්නුම් කෙරේ. සමහර අවස්ථාවන්හිදී රුධිරය ශුද්ධස්ථානය වෙත ගෙන යනු ලබන්නේ නැත. ඒ වෙනුවට පූජකයා එම පූජාවෙහි මාංසය අනුභව කරමින් පාපය දරා ගත්තේය. මේ ගැන මෝසෙස් ආරොන්ගේ දරුවන්ට මෙවන් නියමයක් ප්‍රකාශ කළේය. ''නුඹලා සභාවේ අයුතුකම පහ කරන පිණිසද, ස්වාමින්වහන්සේ ඉදිරිපිට ඔවුන් උදෙසා සමගිකමක් කරන පිණිසද උන්වහන්සේ එය නුඹලාට දී තිබේ." (ලෙවී කථාව 10:17) මෙම ක්‍රමවේදයන් දෙකින්ම පෙන්නුම් කළේ පසුතැවිලි වන්නාවූ පව්කාරයාගේ පාපය ශුද්ධස්ථානය වෙත පවරනු ලැබූ ආකාරයයි.

වසර පුරාම දිනපතාම මෙම කාර්යයන් ශුද්ධස්ථානය හා සම්බන්ධව ඉෂ්ට විය. ඊශ්‍රායෙලිතයන්ගේ පාපය මෙසේ ශුද්ධස්ථානයට පවරන ලදී. එම පව් ශුද්ධස්ථානයෙන් ඉවත් කිරීමට විශේෂ ක්‍රමවේදයක් අවශ්‍ය විය. ශුද්ධස්ථානයේ මණ්ඩප යුගලය සඳහා සමගි කිරීමක් කරන්නැයි දෙවියන්වහන්සේ අණ කළසේක. "එසේ ඔහු ඊශ්‍රායෙල් පුත්‍රයන්ගේ අපවිත්‍රකම් නිසාද ඔවුන්ගේ සියලු අපරාධයන් එනම් ඔවුන්ගේ සියලු පව් නිසාද ශුද්ධස්ථානය උදෙසා සමගිකමක් කරන්නේය. ඔවුන් අතරේ ඔවුන්ගේ අපවිත්‍රකම් මැද පිහිටා තිබෙන සම්මුඛ වීමේ කූඩාරමටත්, එසේම කළ යුතුය." පූජාසනය උදෙසාද සමගි කිරීමක් කළ යුතු විය. "ඔහු ශුද්ධස්ථානයද සම්මුඛවීමේ කූඩාරමද පූජාසනයද උදෙසා සමගිකමක්" කළ යුතු විය. 'පූජාසනය මත "ලේ ඉස ඒක පවිත්‍ර කොට ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ අපවිත්‍රකමෙන් ඒක විශුද්ධ කෙරේවා." (ලෙවී කථාව 16:16,19,20).

විශේෂ දේව මෙහෙයක් වූ වාර්ෂික සමගි කිරීමේ දවසෙහිදී පූජකයා අති ශුද්ධස්ථානය තුළට ගොස් ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ මෙහෙවර ඉටු කළ යුතු විය. මෙම මෙහෙයත් සමග එකී වර්ෂය සඳහාවූ මෙහෙවර නිමාවට පත් විය. සමගි කිරීමේ විශේෂිත දවසේදී එළු පැටවුන් දෙදෙනෙකු දේව මාළිගාවේ දොරටුව වෙත රැගෙන එනු ලැබිණ. එම එළුවන් ගැන පස ඇට දමනු ලැබීය. "ස්වාමින්-වහන්සේට එක පස ඇටයක්ය, අශාශෙල්ට එක පස ඇටයක්ය." (ලෙවී කථාව 16: 8). පස ඇට දැමීමෙන් දෙව් සමිඳුන්ට වූ එළුවාගේ ගෙල සිදීමෙන් පසුව ඒ සතා ජනතාව උදෙසා පාප පූජාවක් ලෙස ඔප්පු කිරීමට නියම විය. එම එළුවාගේ ලෙය පූජකයා විසින්

තිරයෙන් ඇතුළට රැගෙනවිත් එම රුධිරය කරුණාසනය මත්තෙහි සහ එය ඉදිරිපිට ඉසිනු ලැබීය. තවද එම ලෙය තිරයෙන් මෙපිට ඇති සුවඳ දුම් පූජාසනය මතද ඉසීමට නියම විය.

"ආරොන්ද තමාගේ අත් දෙක පණ පිටින් සිටින එළුවාගේ හිස පිට තබා ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු අයුතුකම්ද ඔවුන්ගේ සියලු අපරාධයන්ද එනම් ඔවුන්ගේ සියලු පව් කියාදෙමින් ඒවා එළුවාගේ හිස පිට තබා සූදානම්ව සිටින මනුෂ්‍යයෙකු අත ඌ වනාන්තරයට යැවිය යුතුය. එළුවාද ඔවුන්ගේ සියලු අයුතුකම් දරාගෙන පාළු දේශයකට යන්නේය." (ලෙවී කථාවේ 16:21,22). මෙම එළුවා තවත් කිසිම දවසක ඊශ්‍රායෙල් කඳවුර වෙත නොපැමිණියේය. ඒ අතර එළුවාව දක්කා ගෙන ගිය තැනැත්තා කඳවුරට ඇතුළු වීමට පෙර තම සිරුරද ඇඳුම්ද සෝදා ගත යුතු විය.

දෙවියන්වහන්සේගේ අති ශුද්ධතාවයත්, උන්වහන්සේ පාපයට කෙතරම් දඩිව පිළිකුල් කරනසේක්ද කියාත් ඊශ්‍රායෙලිතයන් තුළ ධාරණය කිරීම මෙම නමස්කාර මෙහෙයේ අරමුණු විය. තවද, ඔවුන් පාපය සමග යම් සබඳතාවයක් දක්වන්නේ නම් දූෂණය වීම වැළැක්විය නොහැකි බවද එම මෙහෙය මගින් අවධාරණය විය. සමගි කිරීමේ මෙහෙය සිදුවෙන්නාවූ අතරේදී සෑම මනුෂ්‍යයෙක්ම තමාගේ ප්‍රාණයට පීඩා කරගත යුතු බවට දෙවියන්වහන්සේ උපදෙස් දුන්සේක. සියලු දෛනික වැඩකටයුතු නවතා දැමීමටද නියම විය. මුළු ඊශ්‍රායෙලිත සමූහයා එදින දෙවියන්වහන්සේ ඉදිරියෙහි යටහත් පහත්ව යාච්ඤාවෙන්, නිරාහාරව හිඳීමෙන්, ගැඹුරින් හදවත් සෝදිසි කරගැනීමෙහි නිරත වෙමින් එදින ගතකිරීම නිර්දේශ විය.

මෙම නියමානුකූල ආදර්ශනීය මෙහෙය මගින් සමගි කිරීම පිළිබඳ අගනා සත්‍යතාවන් උගන්වනු ලැබීය. පව්කාරයා වෙනුවට ආදේශයක් පිළිගන්නා ලදී. එහෙත් මරනු ලැබූ පූජාවෙහි රුධිරය කරණකොටගෙන පාපය අවලංගු නොවීය. එම පාපය ශුද්ධස්ථානය වෙත පවරා දීමට මෙසේ ක්‍රමයක් නිර්මාණය කරදෙනු ලැබීය. රුධිරය පූජා කිරීමෙන් පව්කරුවා ව්‍යවස්ථාවේ බලඅධිකාරීත්වය පිළිගත්තේය, ව්‍යවස්ථාව කඩකිරීමේ පාපය උච්චාරණය කළේය, මතු පැමිණෙන්නාවූ ගැළවුම්කාරයාණන් කෙරෙහි ඇදහිල්ල රඳවමින් පාපයට කමාව ලැබීමට වූ ආශාව පෙන්නුම් කළේය. එසේ වුවද, ව්‍යවස්ථාව කඩකිරීමේ වරදින් ඔහු සම්පූර්ණයෙන්ම නිදොස් කර නිදහස් කර තිබුණේ නැත. සමගි කිරීමේ දවසෙහිදී උත්තම පූජකයා සෙනඟගෙන් පූජාවක් ගෙන, එම පූජාවේ රුධිරය සමග අති ශුද්ධස්ථානය වෙත පා නැගීය. තිරයෙන් ඔබ්බට ගිය හෙතෙම රුධිරය ගෙන කරුණාසනය මත



ඉසිය යුතු විය. එම ලෙය ඉසිනු ලැබුවේ සෘජුව ව්‍යවස්ථාවට ඉහළින්ය. ව්‍යවස්ථාව ඉල්ලා සිටි වන්දිය මෙසේ ගෙවා දමන ලදී. මැදහත්කාරයා ලෙස මෙහෙවරය ඉටු කළ පූජකයා සියලු පාප තමා මත දරාගෙන, ශුද්ධස්ථානයෙන් පිටතට පැමිණෙන දොරටුව වෙත පැමිණියේය. ඉක්බිතිව අශාශෙල්ට කැපවූ එළුවාගේ හිස මත තම දෑත් තැබූ පූජකයා තමා දරාගත් පාප සියල්ල එළුවාට පැවරුවේය. පාප රැගත් එළුවා වනාන්තරයට මුදා හරිනු ලැබීය. මෙසේ, ජනතාවගේ සියළු පාප ඔවුන් වෙතින් සදහටම ඉවත් කරනු ලැබුවේ යයි සලකනු ලැබීය.

"ස්වර්ගීය වූ දේවල සටහනක්ව ඡායාවක්ව" තිබෙන ලෙසින් පැවැත්වූ සමගි කිරීමෙහි මෙහෙය එයාකාර විය. මූලිකාදර්ශයක් ලෙස භූමික ශුද්ධස්ථානයේ සිදුකරනු ලැබූ මෙහෙවරය යථාර්ථ වශයෙන්ම සගයෙහි ශුද්ධස්ථානයේ සිදුවන්නේය. සගයට ඔසවා ගනු ලැබීමෙන් පසුව අපගේ ගැළවුම්කාර සමිඳාණෝ අපගේ උත්තම පූජකයාණන් ලෙස කටයුතු ඇරඹූ සේක. පාවුල් මේ ගැන මෙසේ පවසයි. "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සැබෑ ශුද්ධස්ථානයේ ආදෘශ වන අතින් සෑදූ ශුද්ධස්ථානයකට නොව අප උදෙසා දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි දැන් පෙනී සිටින පිණිස ස්වර්ගයටම ඇතුල් වූසේක." (හෙබ්‍රෙව් 9: 24).

ශුද්ධස්ථානයේ පළමුවන මණ්ඩපයේදී, වසර පුරාම, පූජකයෝ තේවා කටයුතු ඉටු කළෝය. ඔවුන් එසේ සේවය කළේ "තිරය ඇතුළතය". මෙම තිරය ශුද්ධ මණ්ඩපය පිටත මළුවෙන් වෙන් කරන දොරටුව විය. ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට නැගී යාමෙන් පසුව කළ කාර්ය භාරය මෙයින් නිරූපණය විය. පූජකයන්ගේ දිනපතා තේවා කටයුතුවලදී පාප-පූජාවෙහි රුධිරය දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඔප්පු කිරීම පූජකයාගේ වැඩකොටසට අයිති වූවකි. ඊශ්‍රායෙලිතයන්ගේ යාච්ඤාවන් සමග සගය කරා නගින්නාවූ සුවඳ දුම් ඔප්පු කිරීමද ඔහු සතු රාජකාරියෙහි කොටසක් විය. මෙසේම ක්‍රිස්තුස්වහන්සේද පව්කාරයා වෙනුවෙන් තමන්ගේම ලේ ඉදිරිපත් කරමින් ඔහුට කමා වන්නැයි පියාණන්වහන්සේ ඉදිරියෙහි ආයාචනා කළසේක. තවද, පසුතැවෙන්නාවූ පව්කාරයාගේ යාච්ඤාවන් තමන්වහන්සේගේම දැහැමිතාව නමැති අගනා සුවඳින් නහවා ක්‍රිස්තුස්වහන්සේ ස්වකීය පියාණන්වහන්සේ ඉදිරියෙහි ඔප්පු කළසේක. සගයේ තිබෙන්නාවූ දේව මාළිගයේ මුල් මණ්ඩපයෙහි සිදු කරන ලද මෙහෙවරය මෙයාකාරය.

ගෝලයන්ගේ දර්ශන පථයෙන් ඉවත්වී සගය කරා ගිය ක්‍රිස්තුස්-වහන්සේ සමගම ගෝලයන්ගේ ඇදහිල්ල උන්වහන්සේ සමග සගයට

පිවිසියේය. ඔවුන්ගේ බලාපොරොත්තු මෙම සිද්ධීන් සමග කේන්ද්‍රගත විය. අපට ඇති බලාපොරොත්තුවද මෙය බව පාවුල් පවසයි. "ඒ බලාපොරොත්තුව ආත්මයේ සත්තකවූ, ස්ථිරවූ, තිරයෙන් ඇතුළට යන්නාවූ නැංගුරමක් මෙන් අපට ඇත්තේය. යේසුස්වහන්සේ .... සදාකාලේටම උත්තම පූජකයෙක් වී, අප උදෙසා පෙරටුව යන්නෙක් මෙන් එහි ඇතුල්වූ සේක." "එළුවන්ගේත් වස්සන්ගේත් ලේ කරණකොටගෙන නොව, තමන්ගේම ලේ කරණකොටගෙන අප උදෙසා සදාකාල මිදීම ලබාගෙන එකම වරක් ශුද්ධස්ථානයට ඇතුල්වූ සේක." (හෙබ්‍රෙව් 6: 19, 20; 9: 12).

ශුද්ධස්ථානයේ ප්‍රථම මණ්ඩපයේ සිදුවූ මෙම සේවා කටයුතු සියවස් දහඅටක් පුරාම අඛණ්ඩව පැවැතියේය. පසුතැවෙන්නාවූ පව්කාරයාට කමාව දෙන ලෙස ආයාචනය කළ ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය පව්කරුවාට කමාවත් පියාණන්වහන්සේ විසින් පිළිගනු ලැබීමත් සපයා දුන්නේය. එහෙත් පව්කාරයන්ගේ පාප වාර්තා තවදුරටත් පොත්වල ලේඛණගත කර තිබිණ. මූලිකාදර්ශ මෙහෙයන්හිදී, වසර අවසානයේදී සමගි කිරීමේ මෙහෙයක් ක්‍රියාත්මක විය. මිනිස් වර්ගයාගේ ගැළවීමේ වැඩ සැලැස්ම සම්පූර්ණ වීමට පෙර ශුද්ධස්ථානයෙන් පාපය ඉවත් කිරීම සඳහා සමගි කිරීමක් කිරීමට ක්‍රිස්තුස්වහන්සේට නියම වී තිබුණේය. දවස් 2300 දිවැසි ප්‍රකාශන අනාවැකිය අවසානයේදී මෙම සේවය ආරම්භ විය. දානියෙල් දිවැසිවරයා ප්‍රකාශ කර තිබූ පරිදි, ඒ අවස්ථාවේදී අපගේ උත්තම පූජකයාණන්වහන්සේ සමගි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා සගයේ ශුද්ධස්ථානයේ අතිශුද්ධ මණ්ඩපයට ඇතුළුවී ශුද්ධස්ථානය පවිත්‍ර කිරීමේ කාර්යය ආරම්භ කළසේක.

අතීතයේදී භෞමික ශුද්ධස්ථාන සේවා කටයුතු සිදුවූ සමයේදී මිනිසුන්ගේ පාප, ඇදහිල්ල කරණකොටගෙන පාප පූජාව මත පවරන ලදී. එහි රුධිරය කරණකොටගෙන සංකේත ලෙස පාපය භෞමික ශුද්ධස්ථානය වෙත පවරා දෙනු ලැබිණ. එසේම අළුත් ගිවිසුම අනුව පසුතැවිලි වන්නාවූ තැනැත්තාගේ පාප ඇදහිල්ලෙන් ක්‍රිස්තුස්වහන්සේ මත පවරන ලදී. එහිදී නියම ලෙස සිදුවන්නේ එම පාප ස්වර්ගීය ශුද්ධස්ථානයට යොමු වීමය. භෞමික ශුද්ධස්ථානය තුළට යොමු වූ පාප සියල්ල මගින් දූෂ්‍ය වූ ශුද්ධස්ථානය, සමගි කිරීමේ දවසෙහිදී පවිත්‍ර කිරීමට භාජනය වූ අයුරින්ම ස්වර්ගීය ශුද්ධස්ථානයේදී වාර්තාගත වී තිබූ සෑම පාපයක්ම මකා හැරීම සඳහා ක්‍රියාදාමයක් සිදුවීම අනිවාර්ය විය. මෙය සිදුකිරීමට පෙර වාර්තා පොත් පිරික්සා බැලීමක් සිදුවිය යුතුය. කළ පව් ගැන පසුතැවිලි වී ගැළවීම පතා ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල රඳවීම මගින් සමගි කිරීමේ ක්‍රමවේදය



තුළින් එහි ප්‍රතිපාදන ලැබීමට සුදුස්සන් වන්නේ කවර අයදැයි තීරණය කරගත යුතුය. මෙසේ පරීක්ෂා කර බැලීම නොහොත් විනිශ්චය මේ සඳහාය. තමන්වහන්සේගේ ශුද්ධවූ ජනතාව මුදා ගැනීමට පැමිණීමට පෙරාතුව මෙම විනිශ්චය කිරීම සිදුකළ යුතුය. මක්නිසාදයත් උන්වහන්සේ පැමිණෙන විට "එකිනෙකාට තමාගේ ක්‍රියාවේ හැටියට දෙන පිණිස මා සමග විපාක තිබේ" යයි පවසා තිබේ.

දිවැසි ප්‍රකාශන වචනයෙහි ආලෝකය අනුගමනය කරමින් ඉදිරියට පා තැබූ අයට නව ප්‍රවේශයක් දකගැනීමට අවස්ථාව උදා විය. දවස් 2300 ක දිගු අනාවැකි කාලය 1844 දී නිමාවට පත් විය. එකල පැවති පොදු කිතුණු චින්තනය වූයේ එම වසරේ නියමිත දිනයකදී ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණේය කියාය. නමුත් ශුද්ධ ලියවිලි අධ්‍යයනයේදී පසක් වූයේ ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේගේ පැමිණීමට පෙරාතුව සමගි කිරීමේ කාර්ය භාරයේ අවසන් කටයුතු ඉටුකිරීම සඳහා සග දෙව් මැදුරේ අති ශුද්ධස්ථානයට ඇතුළු වූ බවය.

පාප පූජාවක් ලෙස ක්‍රිස්තුස්වහන්සේ තමන් ශ්‍රී රුධිරය වගුළ සේක. එසේම උත්තම පූජකයාණන් වූ ක්‍රිස්තුස්වහන්සේ මැදහත්කාරයාණන්ද වනසේක. අශාශෙල්ට වූ එළුවා සාතන් යයි නිර්දේශ විය. ඔහු වනාහි පාපයේ නිර්මාතෘවරයාය. පසුතැවිලි වන්නාවූ සියළු පව්කරුවන්ගේ පාප අන්තිමේදී ඔහු මත තබනු ලබන්නේය. පාප පූජාවේ රුධිරයේ ආනිශංසනය කරණකොටගෙන උත්තම පූජකයා විසින් ශුද්ධස්ථානයේ ගොඩගැසී තිබූ පාප එතැනින් ඉවත් කර, ඒ ස්ථානය පවිත්‍ර කර එම පාප එළුවාගේ හිස මත පැටවීම කළ යුතු විය. ක්‍රිස්තුස්වහන්සේද තමන්ගේම රුධිරයෙහි සද්ගුණය මගින් ස්වර්ගීය ශුද්ධස්ථානයේ එක්රොක් වී තිබූ, පසුතැවිලි වූ ශුද්ධවන්තයන්ගේ පාප තමන් සේවා කාලයේ අවසානයේදී සාතන් මත පවරනවා ඇත. එසේම විනිශ්චය අවසන් කර දඬුවම් පැමිණවීමේදී සාතන්ට දඬුවම් දෙනු ලබනවා ඇත. මිනිසුන්ට පව් කරන්නට සැලැස්වීම නිසා ඔහු පාපයේ සම්පූර්ණ වගකීම දැරිය යුතුය. ඊශ්‍රායෙල් කඳවුරට නැවත නොපැමිණෙන පිණිස මිනිස් වාසයක් නැති පාළුකරයකට ඒ එළුවා පිටත් කර යවනු ලැබූ ලෙසම සාතන්ද දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ සෙනඟ ඉදිරියෙන් සදහටම ඉවත්කර දමනු ලබන්නේය. යුගයේ අවසානයේදී පාපයත් පව්කරුවාත් විනාශ කර දමන විනිශ්චයේදී සාතන් සදහටම ජීවිතයෙන් තුරන් කර දමනු ලබනවා ඇත.

# 24

# අති ශුද්ධස්ථානය

දේව ජනතාව 1844 දී මුහුණ දුන් බලාපොරොත්තු කඩවීමේ අභිරහස හෙළිදරව් කිරීමට, ශුද්ධස්ථානය පිළිබඳව වූ විෂයෙහි නව අරුත් ගැන්වීම තුළින් ආලෝකය උදා විය. එමගින් සත්‍යතාව පිළිබඳ සම්පූර්ණ ක්‍රියා පද්ධතියක් පෙනී ගියේය. එහිදී ඇඩ්වෙන්ටිස්ත මෙහෙයුමට දෙවියන්වහන්සේගේ ශ්‍රී හස්තය සෘජුවම මගපෙන්වූ ආකාරය මනාව දකගැනීමට හැකි විය. ඒ සමගම උන්වහන්සේගේ ශුද්ධවූ අනුගාමිකයන්ගෙන් බලාපොරොත්තු වන්නාවූ කාර්ය සාධනයත් ඔවුන්ගේ තත්ත්වය පිළිබඳවත් වත්මන් වගකීම එම අධ්‍යයනය මගින් තහවුරු විය. යේසුස්වහන්සේගේ ගෝලයන් සත්‍යතාවයෙන් සහ සිතේ උග්‍ර වේදනාවෙන්ද, සංවේගයෙන් සහ බලාපොරොත්තු කඩවීමෙන්ද අමිහිරි රැයක් ගත කළ නමුත්, "ස්වාමින්වහන්සේ දකීමෙන් ප්‍රීතියට" පත් වූහ. එසේම, ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවන ඊම ගැන බලා-පොරොත්තුවෙන් ඇදහිල්ල රඳවා සිටි බැතිමත්හුද සත්‍යය අනාවරණය වීමත් සමගම උද්දාමයට පත් වූහ. ස්වකීය සේවකයන්ට තිළිණ ලබාදීම පිණිස ක්‍රිස්තුස්වහන්සේ තේජසින් යුතුව පැමිණෙනවා ඇතැයි ඔවුහු අපේක්ෂා කළෝය. තම බලාපොරොත්තු සුන්වී යාමත් සමගම ඔවුන්ගේ සිත්වලින් යේසුස්වහන්සේගේ දසුන අහෝසි වී ගියේය. 'ඔවුන් ස්වාමින්වහන්සේව සොහොන් ගෙයින් අහක් කොට ගෙන ගොස් තිබේ. උන්වහන්සේව කොතැන තැබුවාද කියා අපි නොදනිමු'යි කියමින් හිස් වූ සොහොන් ගෙය අසල සිටි මරියා හඬමින් වැලපුණාක් මෙන්, බලාපොරොත්තු සුන්වූ බැතිමතුන්ගේ දර්ශනයට යේසුස්-වහන්සේව හමු නොවීය. නමුත් දන් සගයේ අති ශුද්ධස්ථානයේ උන්වහන්සේ වැඩසිටිනවා ඔවුන්ගේ දසුනට යොමු විය. උන්වහන්සේ වනාහි මහා කාරුණික උත්තම පූජකයාණෝය, ළඟදීම වඩින්නාවූ ගැළවුම්කරුවාණෝය, මහෝත්තම රාජාධි රාජාණෝය. ශුද්ධස්ථානය පිළිබඳ අධ්‍යයනය බැතිමතුන්ගේ අතීතයත්, වර්තමානයත්, අනාගතයත් ආලෝකමත් කළේය. නොවරදින්නාවූ මගපෙන්වීම තුළින් දෙවියන්-වහන්සේ ඔවුන්ව ගෙනැවිත් ඇති බව ඔව්හු දනගත්හ. තමන් දේශනා කළ පණිවිඩය හරියාකාරව අවබෝධ කරගැනීමට මුල් කාලීන ගෝලයන්ට නොහැකිවූවාක් මෙන් ඔවුන්ටද එම පණිවිඩය හරියාකාර නොවැටහුණ නමුත්, එය සෑම පැතිකඩකින්ම සත්‍යවූ ප්‍රකාශයක් විය. එම පණිවිඩය ප්‍රකාශ කිරීමෙන් ඔවුහු දේව අරමුණ ඉටුකළෝය. ඔවුන්ගේ ක්‍රියාකාරී සේවාව සමිඳුන් තුළ නිෂ්ඵල වෑයමක් නොවීය. දෙවියන්වහන්සේ ඔවුන්ට "ජීවන බලාපොරොත්තුවක්" දුන්සේක. 'එවිට



ඔව්හු කියා නිම කළ නොහැකිවූ තේජසින් පූර්ණවූ මහත් ප්‍රීතියකින් ප්‍රීතිවූවෝය."

"රැ දවල් දෙදහස් තුන්සියයක් පසුවන තුරුය. එකල ශුද්ධස්ථානය පවිත්‍ර කරනු ලබන්නේය" යන දානියෙල් 8:14 හි අනාවැකියත් "දෙවියන්වහන්සේට භය වී උන්වහන්සේට ගෞරව දෙන්න; මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය" යන එළිදරව් 14:7 හි පළමුවන දේවදූතයාගේ පණිවිඩයත් පෙන්නුම් කළේ ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීය ශුද්ධස්ථානයේ අති ශුද්ධ මණ්ඩපයේ කරන්නාවූ මෙහෙවරය පිළිබඳවය. මෙම විනිශ්චය නම් සෝදිසි කිරීමේ විනිශ්චයයි. මේ අනුව පසන් වූයේ ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යන්න ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟට මිදීම ලබාදෙන පිණිසද, දුෂ්ටයන් විනාශ කරන පිණිසද උන්වහන්සේ දෙවෙනි වරට මෙලොවට පැමිණීම නොවූ බවය. දිවැසි ප්‍රකාශන කාල පරිච්ඡේදයේ අවසානය පිළිබඳව වූ නිගමනයෙහි කිසිම වරදක් සිදුවී නොතිබුණි. එහෙත් අර්ථකථනය සැපයීමේදී දවස් දෙදහස් තුන්සියයේ අවසානයේදී භූමිකාවක් මවන්නාවූ සංසිද්ධිය පිළිබඳව වැරදි නිගමනයක් ඇතිවී තිබුණි. මේ වරද නිසා බැතිමතුන් විශාල බලාපොරොත්තු භංගත්වයකට පැමිණියෝය, පීඩා වින්දෝය, අසහනයට පත් වූවෝය. එසේ වුවද දිවැසි ප්‍රකාශනයෙහි අඩංගු සියල්ල නියමාකාරයෙන් ඉටු විය, ශුද්ධ ලියවිල්ලෙන් බලාපොරොත්තුව දනුවත් කිරීම් ද නිවැරැදිව ඉටුවී තිබිණ. තමන්ගේ බලාපොරොත්තු සුන්වී යයි දෙවෙනි ඊම අපේක්ෂා කළ බැතිමත්හු සෝ සුසුම් හෙලමින් ලතවූ අතර, පණිවිඩයෙන් ප්‍රකාශ කළ සිද්ධිය ඉටුවී තිබුණි. ක්‍රිස්තු සමිඳාණන් පැමිණ තම දාසයන්ට තිළිණ ප්‍රදානය කිරීමට පෙරාතුව විනිශ්චය සිදුවීම අනිවාර්ය විය.

ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ ඔවුන් බලාපොරොත්තු වූ පරිදි පොළොව වෙත නොව සගයේ දේව මාළිගයෙහි අති ශුද්ධස්ථානය වෙතටය. දානියෙල් මෙසේ පවසයි: "මම රාත්‍රී දර්ශනවලදී දුටිමි: බලව අහසේ වළාකුල් සහිත මනුෂ්‍ය පුත්‍රයෙකුට සමාන කෙනෙක් ඇවිත් පුරාතන තැනැන්වහන්සේ වෙතට පැමින්නේය." (දානියෙල් 7:13). මෙහි පවසා ඇත්තේ මනුෂ්‍ය පුත්‍රයාණෝ මේ ලොව වෙත නොව පුරාතන තැනැන්වහන්සේ වෙත පැමිණෙනවා ඇතැයි කියාය.

මෙම පැමිණීම පිළිබඳව මලාකි දිවැසිවරයාද මෙසේ සඳහනක් කර තිබේ. "නුඹලා සොයන ස්වාමින්වහන්සේ හදිසියෙන් තමන් මාළිගාවට එනසේක. එසේය, නුඹලා ආශාවන ගිවිසුමේ දූතයා එන්නේ යයි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක." (මලාකි 3:1). ස්වාමින්වහන්සේ තමන් මාළිගාවට පැමිණීම හදිසියේ, බලාපොරොත්තු නොවූ දවසක සිදුවිය. ඔවුන් උන්වහන්සේ එතැන

සිටිනවා දකීමට බලාපොරොත්තු නොවූහ. ඔවුන් බලාපොරොත්තු වුණේ "යේසුස්වහන්සේ තමන්ගේ පරාක්‍රමයේ දූතයන් සමග ඇවිලෙන්නාවූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එළිදරව් වී .... ශුභාරංචියට කීකරු නොවන්නන්ටත් ප්‍රතිඵල" දීමට පැමිණෙන බවය. (2 තෙසලෝනික 1: 6, 7)

කෙසේ වුවද, තම ස්වාමින්වහන්සේව මුණගැසීමට ජනතාව සූදානමින් නොසිටියෝය. සූදානම් වීම් වස් ඉටු කළ යුතු තවත් වැඩකොටසක් තිබිණ. ඔවුන්ගේ මනස් සගයේ පිහිටි දෙවියන්වහන්සේගේ මාළිගාව වෙත යොමු කිරීමට ආලෝකය ලබා දිය යුතුව තිබුණේය. එහි මෙහෙවර කරන්නාවූ තමන්ගේ උත්තම පූජකයාණන් සමග ජනතාවද ඇදහිල්ලෙන් එහි යන අතර ඔවුන් විසින් කළ යුතුවූ අළුත් රාජකාර්යයන් ඔවුන්ට පවරා දෙනු ලැබිය යුතු විය. අවවාද කිරීමේ තවත් පණිවිඩයක්ද අළුත් උපදෙස් මාලාවක්ද සභාවට ලබාදීම අවශ්‍යතාවක් විය.

දිවැසිවරයා මෙසේ ප්‍රකාශ කරයි: "උන්වහන්සේගේ ඊමේ දවස දරන්ට පුළුවන් කාටද? උන්වහන්සේ පෙනෙන කළ සිටින්ට පුළුවන් කාටද? මක්නිසාද උන්වහන්සේ රන්කරුවෙකුගේ ගින්නද අපුල්ලන්නන්ගේ සබන්ද මෙන්ය. උන්වහන්සේ රිදී උණු කර පිරිසිදු කරන කෙනෙක් මෙන් සිට, ලෙවී පුත්‍රයන් ධර්මිෂ්ඨකමෙන් ස්වාමින්-වහන්සේට පූජා ඔප්පු කරන්නන්ව සිටින පිණිස ඔවුන් පිරිසිදු කර රන් රිදී මෙන් ඔවුන් පවිත්‍ර කරන සේක." (මලාකි 3: 2, 3). සගයේදී ක්‍රිස්තුස්වහන්සේ විසින් ඉටුකරන්නාවූ මෙහෙවරය අවසාන වීමෙන් පසුව පවතින්නාවූ කෙටි කාලයේදී මිහිතලය මත දිවි ගෙවන්නාවූ අය මැදහත්කාරයාණන් කෙනෙකු නැතිව ශුද්ධවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි කල් ගෙවිය යුතුය. ඔවුන්ගේ සළු කැළැල් රහිත විය යුතුය. ලේ ඉසීමක් තුළින් ඔවුන්ගේ චරිත පාපයෙන් පාරිශුද්ධ කර තිබිය යුතුය. දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය කරණකොටගෙනද ඔවුන්ගේම උත්සාහවන්ත කඩිසර වැයම් කිරීම කරණකොටගෙනද නපුර සමග කරන සටනේදී ඔවුන් ජයග්‍රාහක විය යුතුය. සෝදිසි කිරීමේ විනිශ්චය හෙවත් පූර්ව ආගමන විනිශ්චය සගයේ සිදුවෙමින් තිබියදී, පසුතැවෙන්නාවූ බැතිමතුන්ගේ පාප සගයේ වාර්තා වලින් ඉවත් කෙරෙමින් පවතින අතරේදී, පවිත්‍ර කිරීමේ විශේෂාකාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක විය යුතුය. එමගින් මිහිපිට ජීවත් වන්නාවූ දේව සෙනඟගේ ජීවිත තුළින් පාපය සම්පූර්ණයෙන්ම බැහැර කිරීම අනිවාර්ය වන්නේය. මෙම ක්‍රියාදාමය වඩා පැහැදිලි ලෙස එළිදරව් 14 හි පණිවිඩ මගින් ඉදිරිපත් කර ඇත.

මෙම ක්‍රියාදාමය නිමවූ විට ක්‍රිස්තු අනුගාමිකයෝ උන්වහන්සේගේ පැමිණීමට සූදානම්ව සිටිනවා ඇත. "එකල යුදාහිද යෙරුසලමේද



පූජාව පුරාණ දවස්වලදීත් පළමු අවුරුදුවලදීත් මෙන් ස්වාමින්වහන්සේට ප්‍රසන්නව තිබෙන්නේය." (මලාකි 3:4). තමන්වහන්සේගේ පැමිණීමේදී සභාව "ශුද්ධව, කැලැලක් හෝ රැළි හෝ එබඳු යමක් නැතුව" පවතිනවා ඇත. (එපීස 5:26). එවිට ඇයගේ බල මහිමය මෙසේ වර්ණනා කළ හැකිය. එය "අරුණාලෝකය මෙන් නැගී එන්නාවූ, සඳ මෙන් රුව ඇත්තාවූ, ඉර මෙන් දිළෙන්නාවූ කොඩි ගත් සේනාවක් මෙන් බලසම්පන්න" වනවා ඇත. (සාලමොන්ගේ ගීතිකා 6: 10).

ස්වාමින්වහන්සේ තමන්ගේ දේව මාළිගාවට පැමිණීම ගැන විස්තර කිරීමට පසුව මලාකි දිවැසිවරයා උන්වහන්සේගේ දෙවන පැමිණීම ගැනද, එසේ පැමිණෙන්නේ විනිශ්චය ප්‍රකාර දඬුවම් පැමිණවීමට බවද මෙසේ විස්තර කරයි. "තවද මම විනිශ්චය පිණිස නුඹලා ළඟට ඇවිත් මන්ත්‍රකාරයන්ටද, කාමමිථ්‍යාචාරිකයන්ටද, බොරු දිවුරන්නන්ටද මට භය නොවී කුලී ගැන කුලීකාරයාටත්, වැන්දඹුවටත්, පියා නැත්තාටත්, ප්‍රයෝග කරන්නන්ටද, විදේශියාගේ යුක්තිය පෙරලන්නන්ටද විරුද්ධව ශීඝ්‍ර සාක්ෂිකාරයෙක් වන්නෙමියි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක" (මලාකි 3:5). යූදස් මේ දසුන විස්තර කරන්නේ මෙසේය. "බලව, සියල්ලන් කෙරෙහි යුක්තිය ඉෂ්ට කරන්ටද, සියලු අභක්තීන් විසින් අභක්තිවන්ත ලෙස කළාවූ ඔවුන්ගේ සියලු අභක්තික ක්‍රියා ගැනත් .... ඔවුන් වරදට පත්කරන්ටද ස්වාමින්වහන්සේ ස්වකීය දස දහස් ගණන් ශුද්ධවන්තයන් සමග" පැමිණෙන බව දක්වීය. (යූදස් 14,15). මෙම පැමිණීමත් සමිඳාණන් ස්වකීය මාළිගය වෙත පැමිණීමත් ප්‍රත්‍යක්ෂවූද, වෙන්වූ ද සිදුවීම් දෙකක් විය.

අපගේ උත්තම පූජකයාණන් වූ ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීය ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම සඳහා අති ශුද්ධස්ථානයට පැමිණීම පිළිබඳව දානියෙල් 8:14 වාර්තා කරයි. පුරාතන තැනැන්වහන්සේ වෙත මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පැමිණීම දානියෙල් 7:13 ඉදිරිපත් කරයි. දෙවි සමිඳාණන් තමන්ගේ දේව මාළිගාවට පැමිණීම ගැන මලාකිගේ වාර්තාව මෙම සිද්ධිය ගැනවූ තවත් සඳහන් කිරීමකි. මතෙව් 25 හි දක්වෙන අන්දමට කන්‍යාවන් දසදෙනා පිළිබඳ උපමාවද මංගල්‍යය උදෙසා මනාලයාගේ පැමිණීම පිළිබඳව ක්‍රිස්තුස්වහන්සේම ලබාදුන් තවත් විස්තරයක්ය.

"අන්න මනමාලයා එනවා" යයි මහත් හඬින් වූ ප්‍රකාශයක් 1844 ගිම්හාන හා සරත් ඍතුවලදී ගුවනට මුසු විය. එහි විස්තර වන පරිදි බුද්ධිමත් සහ අඥාණ යන කණ්ඩායම් දෙකක් පිළිබඳ විග්‍රහයක් ගොඩ නැගිණ. එක් පාර්ශ්වයක් ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය මහත් උපේක්ෂාවෙන් යුතුව අපේක්ෂා කරමින් ඒ සඳහා මහත් උනන්දුවකින් සූදානම් වූවන්ගෙන් සමන්විත විය. අනෙක්

පාර්ශ්වය බියෙන් පොළඹවනු ලැබ හැඟීම් වලට බරව ක්‍රියාකරමින්, සත්‍යතාව ඉදිරිපත් කළ සිද්ධාන්ත පිළිගත් නමුත් ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය ක්‍රියාත්මකව නොතිබුණි. උපමාව අනුව මනාලයා පැමිණි විට "සැදී සිටියෝ ඔහු සමග සරණ මංගල්‍යයට ඇතුල් වූවෝය. දොරද වසන ලද්දේය." මෙම උපමාවෙහි අන්තර්ගත විස්තරය අනුව මනමාලයා පැමිණෙන්නේ මංගල්‍යයට පෙරාතුවය. මංගල්‍යයෙන් පෙන්නුම් කරන්නේ තමන්-වහන්සේගේ රාජ්‍යය ක්‍රිස්තුස්වහන්සේ විසින් පිළිගැනීමය. ශුද්ධවූ නගරය එනම් අළුත් යෙරුසලම රාජ්‍යයේ අගනුවර වන්නේය. එය වනාහි මනාලිය, එසේය, බැටළු පෝතකයාණන්ගේ මනමාලිය ලෙස හඳුන්වා දීමක් කර තිබේ. දේව දූතයා යොහන්ට මෙසේ පවසයි, "එන්න, බැටළු පැටවාණන්ගේ භාර්යාව වන මනමාලි නුඹට පෙන්වන්නෙමියි කීවේය. ඔහු මහත්වූ උස්වූ කන්දකට ආත්මයාණන්-වහන්සේගේ ආනුභාවයෙන් මා ගෙන ගොස් ශුද්ධ නුවර වූ යෙරුසලම.... දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බසිනවා මට පෙන්නුවේය." (එළිදරව් 21: 9,10). මනාලියගෙන් නියෝජනය වන්නේ ශුද්ධ නගරය බව මෙයින් පැහැදිලිය. මනාලයා හමුවීමට පෙරමඟට යන්නාවූ කන්‍යාවන්ගෙන් නියෝජනය වන්නේ සභාවය. එළිදරව් පොත විස්තර කරන ආකාරයට, දේව ජනතාව හඳුන්වා දී ඇත්තේ සරණ මංගල්‍යයේ රාත්‍රී භෝජනයට ඇරයුම් ලද්දවුන් හැටියටය. ඇරයුම් ලද්දවුන් නම් ඔවුන් මනාලිය ලෙසත් නියෝජනය විය නොහැකිය. (එළිදරව් 19:9). සගයේ වැඩවසන පුරාතන තැනැන්වහන්සේ වෙත එන්නාවූ ක්‍රිස්තුස්-වහන්සේට "ආණ්ඩු බලයද, ගෞරවයද, රාජ්‍යයක්ද" පවරා දෙනු ලබන්නේය. (දානියෙල් 7:14). එම රාජ්‍යයේ අගනුවර අළුත් යෙරුසලමය. එම නුවර වනාහි "තමාගේ පුරුෂයාට සරසන ලද මනමාලියක්" වන්නේය. (එළිදරව් 21:2). රාජ්‍යය හිමි වීමෙන් අනතුරුව තම ජනතාවගේ මිදීම සලසා දීම සඳහා රාජාති රාජාණන් ලෙසද ස්වාමින්ගේ ස්වාමින්ද්‍රයාණන් ලෙසද ක්‍රිස්තුස්වහන්සේ තේජස්ශ්‍රීයෙන් යුතුව පැමිණෙන සේක. ඉක්බිතිව රාජ්‍යයේ පුරවැසියන් වීමට සුදුසුකම් ලැබූ මිදීම ලැබූ දේව සෙනඟ "ආබ්‍රහම්ද, ඊසාක්ද, යාකොබ්ද" සමගින් උන්වහන්සේගේ රාජ්‍යයෙහි උන්වහන්සේ හා එක මේසයේ වාඩි වී ස්වර්ගයේ පැවැත්වෙන බැටළු පෝතකයාණන්ගේ සරණ මංගල්‍ය ප්‍රිය සාදයට එක්වී රාත්‍රී ආහාරය භුක්ති විඳින්නාහ. (මතෙව් 8:11; ලූක් 22:30).

"අන්න මනමාලයා එනවා" යයි 1844 හි ගිම්හානයේදී ප්‍රකාශයට පත්වූ ආත්මික නවෝදයේ ඉගැන්වීමට සමගාමීව ක්‍රිස්තු සමිදාණෝ මෙලොව වඩිනවා ඇතැයි දහස් ගණන් බැතිමත්හු සංඛ්‍යාවක් බලා සිටියෝය. දිගු කාලීන අනාවැකිය අවසාන වූ නියමිත දවසෙහිදී උන්වහන්සේ පැමිණි සේක. එහෙත් ඒ මනුෂ්‍යයන් බලාපොරොත්තු වූ



ලෙස උන්වහන්සේ පොළොවට පැමිණියේ නැත. එදින උන්වහන්සේ සගයෙහි වැඩවසනා පුරාතනයාණන්වහන්සේ වෙතට පැමිණ ස්වකීය රාජ්‍යය ලබාගෙන සරණ මංගල්‍යයට සහභාගි වූසේක. ඒ උපමාව අනුව "සැදී සිටියෝ සරණ මංගල්‍යයට ඇතුල් වූවෝය. දොරද වසන ලද්දේය" (මතෙව් 25:10). දේව ජනතාවට සරණ මංගල්‍යයට සහභාගි වීමේ වරප්‍රසාදය හිමි නොවීය. මක්නිසාදයත් එය සිදුවූයේ සගයෙහිදීය, සෙනඟ සිටියේ පොළොවෙහිය. ක්‍රිස්තු අනුගාමිකයෝ විවාහ උත්සවයෙන් පසු තම ස්වාමියාණන් පෙරලා පැමිණෙන තෙක් උපේක්ෂාවෙන් යුතුව බලා සිටිය යුත්තාහ. ඒ අතර ඔවුහු ඇදහිල්ලෙන් උන්වහන්සේ අනුව යමින් දෙවියන්වහන්සේගේ අභිමුඛයට යා යුත්තේය. ඔවුන්ට සරණ මංගල්‍යයට සහභාගි වීමට හැකිවන්නේ මෙයාකාරයෙනි, එසේය, ඇදහිල්ලෙනි.

පහන් රැගෙන පෙරමඟට ගිය අය අතර, පහන් සමග තෙල් රැගෙන ගිය අය පමණක් මඟුල් සාදයට සහභාගි වූ බව උපමාව පෙන්වා දෙයි. ශුද්ධ ලියවිල්ලෙන් ලබාගත් සත්‍යතාව පිළිබඳ දැනුම අතැතිව ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහයෙන් සුවඳවත්ව අඳුරු කටුක පැයේදී එයට මුහුණ දෙමින් මෙම පිරිස සත්‍යතා දහම් මගහැර පියා නොගියෝය. ඔවුහු තවත් පැහැදිලි දසුනක් සොයා ශුද්ධ බයිබලය හදාරන්නට වූහ. එසේ කිරීමේදී ඔවුන්ට සගයේ පිහිටුවා තිබූ ශුද්ධස්ථානය පිළිබඳව දහම් අවබෝධයක් ලබාගත හැකි විය. ඒ සමගම ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙවරෙහි වෙනස් වීමක්ද ඔවුන්ට දකගත හැකි විය. ඉහළ පිහිටි ශුද්ධස්ථානයෙහි ක්‍රිස්තුස්වහන්සේ ඉටු කරන්නාවූ සේවා භාරයේදී ඔවුහු ඇදහිල්ලෙන් උන්වහන්සේව අනුගමනය කරමින් සගයේ දේව මාළිගයට ඇතුළු වූහ. ශුභාරංචියෙහි සාක්ෂීන් හා එම සත්‍යතාවන් පිළිගෙන, මැදහත්කාරකම් කිරීමේ තමන්වහන්සේගේ අන්තිම වැඩ කොටස ක්‍රියාත්මක කිරීමට ක්‍රිස්තුස්වහන්සේ සගයේ වැඩ සිටින්නාවූ දෙවියන්වහන්සේ ඉදිරියට පැමිණි ආකාරයෙන් කිතුණුවෝද ඇදහිල්ලෙන් සගයට පැමිණීම යන සියල්ල මංගල්‍යයට යෑමෙන් නියෝජනය වෙයි.

මතෙව් 22 හි උපමාවෙහිද මංගල්‍යය පිළිබඳ එම රූපකයම ඉදිරිපත් කර තිබේ. සෝදිසි කිරීමේ විනිශ්චය සිදුවන්නේ මංගල්‍යයට පෙරාතුව බව එහි පැහැදිලි ලෙසම ඉදිරිපත් කෙරේ. මඟුල් චාරිත්‍ර ආරම්භ කිරීමට පෙර අමුත්තන් බැහැදකීමට රජතුමා පැමිණේ. (මතෙව් 22:11) සෑම අයෙක්ම රජතුමා විසින් සපයා දුන් මඟුල් ඇඳුම ඇඟලා සිටින්නේදයි විමර්ශනය කිරීම රජතුමාගේ අභිප්‍රාය විය. එම ඇඳුම නම් බැටළු පෝතකයාණන්ගේ රුධිරයෙන් සෝදා සුදු කරගත් කැළැල් රහිත චරිත සළුවයි. එවන් ඇඳුමක් පැළඳ නොසිටි තැනැත්තා

ශාලාවෙන් පිටතට දමනු ලැබේ. සෝදිසි කිරීමේදී නියමිත මහල් සළු පැළඳ සිටින තැනැත්තන් දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලැබේ. තවද, එම තැනැත්තන්ට රාජ්‍යයේ කොටසක්ද උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳ ගැනීමට වරමක්ද පවරා දෙනු ලැබේ. සගයෙහි පිහිටි ශුද්ධස්ථානයේ අවසන් වැඩකොටස වන්නේ සෝදිසි කිරීමේ විනිශ්චයයි. මෙම විනිශ්චයේදී කිතුණුවන්ගේ චරිත සෝදිසියකට ලක් කෙරේ. එහි ගුණාගුණ අනුව දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුමක්කාරයන් වීමේ භාග්‍යය ඇති අය තෝරා ගනු ලැබේ. එය ශුද්ධස්ථාන සේවයේ අවසාන ක්‍රියාවය.

සෝදිසි කිරීමේ කාර්ය භාරය අවසන් වී තමා ක්‍රිස්තු අනුගාමිකයන් යයි පැවසූ සියල්ලන්ගේ තත්ත්වය සෝදිසි කරනු ලැබූ විට, පරිවාස කාලය නිමාව දකින්නේය. මෛත්‍රී-කරුණාවේ දොරද වසනු ලබන්නේය. සූදානම්ව සිටි කන්‍යාවෝ පස්දෙනා මනමාලයා සමග මංගල සාදයට පිවිසියෝය. දොරද වසන ලදී. ගැළවුම්කාරයාණන්ගේ අන්තිම මෙහෙවරය සමග මිනිසා උදෙසා වූ ගැළවීමේ දේව සැලැස්මද නිමාව දකින්නේය.

සගයේ ශුද්ධස්ථානයේ සේවාවන් පිළිබඳ සංකේත සේවාවක් වූ භෞමික පූජ්‍ය-ස්ථානයේ සමගි කිරීමේ සේවාවන් සිදුවූ දිනයේදී උත්තම පූජක තැන අති-ශුද්ධස්ථානයට ඇතුළු වත්ම මුල් මණ්ඩපයේ මෙහෙ කිරීම නිමාවට පත්විය. උත්තම පූජකයා ශුද්ධස්ථානයෙහි සමගිකමක් කරන්ට ඇතුල් වන අවස්ථාවේ සිට සමගිකමක් කොට පිටතට එන තුරු කිසිවෙක් සම්මුඛ වීමේ කූඩාරමෙහි නොසිටිය යුතු විය. (ලෙවී කථාව 16:17). එසේම, සමගි කිරීමේ තේවාවන් ඉටුකිරීම සඳහා ක්‍රිස්තුස්වහන්සේ අති ශුද්ධස්ථානයට ඇතුළු වීමත් සමගම මුල් මණ්ඩපයේ මෙහෙවර සේවා නිමාවට පැමිණියේය. මුල් මණ්ඩපයේ මෙහෙවර සේවාව අවසාන වත්ම දෙවන මණ්ඩපයේ මෙහෙවර සේවාව ආරම්භ විය. සමගි කිරීමෙහි දවසේදී උත්තම පූජකයා මුල් මණ්ඩපය පසුකොට දෙවන මණ්ඩපයට ඇතුළු වුණේ පසුතැවිලිවූ ඊශ්‍රායෙලිතයන් උදෙසා ඉදිරිපත් වීමටය. එම පූජාවෙහි ලේ රැගෙන ඔහු දෙවියන්වහන්සේ ඉදිරියට ගොස් එය ඔප්පු කළේය. අපගේ මැදහත්කාරයාණන් ලෙස ක්‍රිස්තුස්වහන්සේ නිමකර තිබුණේ සැලැස්මෙහි එක කොටසක් පමණකි. පියාණන්වහන්සේ ඉදිරියෙහි පව්කාරයන් උදෙසා කමාව ඉල්ලා ආයාචනා කරන්නට උන්වහන්සේට තවත් වැඩකොටසක් ඉතිරිව තිබුණේය.

1844 දී ඇඩ්වෙන්ටිස්තවරුන් හට මෙම විෂය පිළිබඳව මනා වැටහීමක් නොවීය. ගැළවුම්කාරයාණන් පැමිණෙතැයි බලාපොරොත්තු වූ දිනය ඉකුත් වූ පසුද උන්වහන්සේ ඉතා ආසන්න දවසක පැමිණෙතැයි



ඇඩ්වෙන්ටිස්තවරු තවදුරටත් බලාපොරොත්තු වූහ. පව්කාරයන් වෙනුවෙන් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි කරන්නාවූ මැදහත්කාරකමේ මෙහෙය නිමාවට පත්ව ඇතැයි ඔවුහු විශ්වාස කළෝය. සගයේ වළාකුළු මත වැඩ හිඳිමින් ක්‍රිස්තු සමිඳාණන් පැමිණීමේ දවසට ටික කලට පෙර මිනිසාගේ පරිවාසය නිමවන බව බයිබලය උගන්වන්නේය යනු ඔවුන්ගේ මතය විය. මෛත්‍රී-කරුණාවෙහි දොරටුව අභියස සිටිමින් මනුෂ්‍යයෝ දොරටුව විවෘත කරන්නැයි හඬති, තට්ටු කරති, ආයාචනා කරති, එහෙත් දොරටුව නම් විවෘත වන්නේ නැත. මෙවන් දවසක් පැමිණෙන බව ශුද්ධ ලියවිල්ලෙහි දක්වා ඇත යනු ඔවුන්ගේ චින්තනය විය. ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනය නිශ්චිතව සිදුවන්නේය යන්න ඔවුන්ගේ විශ්වාසය විය. ආගමනය නොව වෙනත් සිද්ධියක් එදින සිදුවීමට නියමිතව තිබුණ බවද සෝදිසි කිරීමේ විනිශ්චය එම සිද්ධිය විය හැකි බවද ඔවුන්ගේ කල්පනාවට යොමු විය. තමා විනිශ්චයේ පණිවිඩය ලෝකයාට ලබාදුන් නිසා තමන්ගේ කාර්ය භාරය ඉටුවී ඇතැයි ඔවුහු කල්පනා කළෝය. එම නිසා පව්කරුවන්ගේ ගැළවීම උදෙසා ඔවුන් තුළ තිබූ වගකීමේ බර ඔවුන්ගෙන් තුනී වී ගියේය. ඒ අතර ගරහන්නන්ගේ එඩිතර සහ දේව අපහාසාත්මක වදන් අධික වීම යන්න පෙන්වන්නේ දෙවියන්වහන්සේගේ ආත්මය, උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව ඔවුන්ගෙන් ඉවත් කරගෙන ඇති බව යයි ඔවුහු කල්පනා කළෝය. මෙම කරුණු සැලකිල්ලට ගෙන ඔවුන් තීරණය කළේ පරිවාසය හමාර වී ඇත, එසේත් නැතිනම් මෛත්‍රී-කරුණාවේ දොර වසනු ලැබ ඇත යන්නය.

නමුත් ශුද්ධස්ථානය පිළිබඳව ප්‍රශ්නය වැඩිදුරටත් විමර්ශනය කිරීමත් සමගම වඩා පැහැදිලි ආලෝකයක් උදා විය. දවස් 2300 දිගුකාලීන අනාවැකිය 1844 දී නිමාවට පත්වූ බවත් එය වැදගත් සිද්ධියක් දක්වූ බවත් ඔවුන්ට පෙනී ගියේය. වසර එක්දහස් අටසියයක කාලයක් පුරා දෙවියන්වහන්සේ වෙතට ළඟාවීමේ බලාපොරොත්තුවේ සහ මෛත්‍රී-කරුණාවේ දොරටුව මේ අවස්ථාවේදී වසා දමනු ලැබූ බව සත්‍යයක් වූ නමුත් මිනිසාට කමාව ලබාගැනීමට වෙනත් දොරටුවක් විවෘත කරනු ලැබිණ. එම ක්‍රමවේදය අනුව පව් කමාව ලබාදීම සිදුවන්නේ ක්‍රිස්තුස්වහන්සේ අතිශුද්ධස්ථානයේ කරන්නාවූ මැදහත්කම් කිරීමේ තේවාව කරණකොටගෙනය. ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙවරයෙහි දෙවන ක්‍රමවේදය සඳහා පළමු සේවය නිමාව දක්කේය. ස්වර්ගීය ශුද්ධස්ථානය වෙත ළඟාවීමට වෙනත් "විවෘත දොරක්" ක්‍රියාත්මකව තිබිණ. එහි ක්‍රිස්තුස්වහන්සේ මනුෂ්‍යයා උදෙසා සේවය කරමින් සිටින සේක.

මේ කාලයේ පවතින්නාවූ සභාවට ක්‍රිස්තුස්වහන්සේ යොමු කළ වචන එළිදරව් පොතෙහි මෙසේ සඳහන් වේ: "ශුද්ධවූ, සැබෑවූ, දාවිත්ගේ

යතුර ඇත්තාවූ, කිසිවෙක් නොපියන ලෙස අරින්නාවූ, කිසිවෙක් නාරින ලෙස පියන්නාවූ තැනැන්වහන්සේ මේ කාරණා කියන සේක. එනම්, මම නුඹේ ක්‍රියා දනිමි. (මෙන්න කිසිවෙකුට පියන්ට බැරිවූ ඇරපු දොරක් නුඹ ඉදිරියෙහි මා විසින් තබා තිබේ.)" (එළිදරව් 3:7,8).

අද කිතු සමිඳාණෝ සමගි කිරීමේ විශිෂ්ඨතම වූ මෙහෙවරයක් සිදුකරමින් සිටින සේක. උන්වහන්සේව අනුගමනය කරමින් සගයේ අති ශුද්ධස්ථානයට ඇදහිල්ලෙන් ඇතුළු වන්නාවූ අයට එම සේවයේ ප්‍රයෝජන ලැබෙන්නේය. ඔවුන් වෙනුවෙන් ක්‍රිස්තු සමිඳාණෝ සගයේ අති ශුද්ධස්ථානයෙහි කරන්නාවූ සමගි කිරීමේ මෙහෙයේ ප්‍රතිඵල ඔවුන් සතු වන්නේය. උන්වහන්සේ කරන්නාවූ මෙහෙයෙන් එන්නාවූ ආලෝකය ප්‍රතික්ෂේප කරන අයට එහි ප්‍රයෝජන අත්වන්නේ නැත. ක්‍රිස්තු සමිඳාණන් මෙලෝ වැඩි අවස්ථාවේදී ලබාදුන් සහන් එළිය යුදෙව්වෝ ප්‍රතික්ෂේප කළෝය. තවද, උන්වහන්සේ ලෝකයේ ගැළවුම්කාරයාණන් ලෙස පිළිගැනීමද ඔවුහු ප්‍රතික්ෂේප කළෝය. එම නිසා ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පව් කමාව ලැබෙන්නේ නැත. ස්වර්ගාරෝහණයේදී ක්‍රිස්තුස්වහන්සේ තමන් වහන්සේගේම ශ්‍රී රුධිරය රැගෙන එහි කුසලතාවෙහි ආනිසංසය කරණකොටගෙන සගයේ ශුද්ධස්ථානයට ඇතුළු වූසේක. එසේ කළේ තමන්වහන්සේගේ මැදහත්වීමේ ආශිර්වාද තමන් ගෝලයන්ට ලබාදීමටය. එවිට යුදෙව්වෝ තම ඵල රහිත පූජාවන් සහ වතාවත්හි යෙදෙමින් අඳුරේ සිටියහ. ආදර්ශයක් ලෙසද, ඡායාවක් මෙන්ද වූ පූජා සහ වත්පිළිවෙත් නිමාවට පත්වී තිබුණි. දෙවියන්වහන්සේ වෙතට ළඟා වීම සඳහා එතෙක් විවෘතව තිබූ දොරටුව එවිට වැසී ගියේය. උන්වහන්සේව හමුවීමට තිබූ එකම දොරටුව තුළින් පිවිසීමට යුදෙව්වෝ ප්‍රතික්ෂේප කළෝය. එසේ කළ හැකිවූ එකම මාර්ගය නම් සග ශුද්ධස්ථානයේ කළ මෙහෙවරය කරණකොටගෙන පමණකි. එම නිසා යුදෙව්වන්ට දෙවියන්වහන්සේ සමග සන්නිවේදන මාර්ගයක් නැති විය. ඔවුන්ට දොරටුව වැසී ගියේය. ක්‍රිස්තුස්වහන්සේ වනාහි අව්‍යාජ පූජාව ලෙසින්ද දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිටින එකම මැදහත්කාරයාණන් ලෙසින්ද වූ දැනුම යුදෙව්වන් සතු නොවීය. එම නිසා උන්වහන්සේගේ මැදහත්කාරකමෙහි ප්‍රතිලාභ ඔවුන්ට ලබාගත නොහැකි විය.

අපගේ කරුණාභරිත උත්තම පූජකයාණන්ගේ මැදහත්කාරකමෙහි සේවාව යුදෙව්වන් විසින් ප්‍රතික්ෂේප කළ නිසා ඔවුන්ගේ තත්ත්වය ශෝචනීය විය, භයානක විය. අපගේ උත්තම පූජකයාණන්ගේ සේවය ගැන නොසැලකිලිමත්ව සිටිමින් ඒ බව විශ්වාස නොකරන්නාවූද,



නොසැලකිලිමත් ලෙස තමා කිතුණුවන් යයි කියාගන්නාවූද අයගේ තත්ත්වය යුදෙව්වන්ගේ තත්ත්වයට සමානය.

භෞමික දේව මාළිගයේ සේවා කටයුතු සඳහා උත්තම පූජකයා අති ශුද්ධස්ථානයට ඇතුළුවූ අවස්ථාවේදී මුළු ඊශ්‍රායෙලිත ජනතාවම ශුද්ධ ස්ථානය වටා රැස්ව සිටින්න යයි විධාන විය. දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිහතමානීව සිටිමින් තම තමාගේ පාප ගැන පසුතැවිලි වෙමින් හෘදයාංගම ලෙස පව් කියාදීම සැමගෙන් බලාපොරොත්තු විය. එසේ නොකරන්නාවූ අයව සාමාජිකයන් අතරෙන් කපා හරිනු ලැබීය. සගයේ සිදුවන්නාවූ ප්‍රතිදර්ශන සේවාවෙහිදී සමගි කිරීමේ සේවා කටයුතු සිදුවෙමින් පවතින අතරවාරයේදී අපගේ උත්තම පූජකයාණන්ගේ මෙහෙවරය ගැන මනා අවබෝධයකින් යුතුව සිටීම කෙතරම් වැදගත් වන්නේද? අපගෙන් බලාපොරොත්තු වන්නාවූ වගකීම් ගැන අවධියෙන් සිටීම කෙතරම් වැදගත්ද?

දෙවියන්වහන්සේ ස්වකීය මෛත්‍රී-කරුණාව නිසාම දෙවා වදා-රන්නාවූ අනතුරු ඇඟවීමේ අනුශාසනා යම් අයෙකු එපා කරන්නේ නම් ඔහුට දඬුවම් නොලබා එසේ කරන්නට හැකි නොවේ. නෝවාගේ දවස්වලදී සගයේ සිට පණිවිඩයක් මෙලෝ ජනතාවට ලබාදෙන ලදී. එම පණිවිඩයට ප්‍රතිචාරය දැක්වූ ආකාරය මත ඔවුන්ගේ ගැළවීම රඳා පැවතුණි. ඔවුන් එම අනතුරු ඇඟවීමේ පණිවිඩය ප්‍රතික්ෂේප කළ නිසා ඒ පව්කාරයන්ගෙන් ශුද්ධාත්මයාණන් ඉවත් කර ගනු ලැබිණි. ඔවුහු ගලා ආ ජලස්කන්ධයට හසු වී විනාශ වූහ. ආබ්‍රහම්ගේ කාලයේදී සොදොම් දේශයේ ජනතාව මෛත්‍රී-කරුණාවේ අනුශාසනාව පිළිනොගත් නිසා ලොත්ද, ඔහුගේ බිරිඳ සහ දියණියන් දෙදෙනාද හැරෙන්නට අනෙක් සැවොම අග්නි ජාලයට මැදිවී විනාශ වූවෝය. ක්‍රිස්තුස්වහන්සේගේ දවස්වලදී යුදෙව් ජනතාවට තිබුණාවූ අවිශ්වාස ආකල්පය ගැන දේව පුත්‍රයාණෝම ඔවුන්ට මෙසේ පැවසූ සේක. "බලව! නුඹලාගේ ගෘහය පාළුකොට අත්හරිනු ලැබේ." (මතෙව් 23:38). අන්තිම කාලයේ පවතින්නාවූ තත්ත්වය ගැන එම අනන්ත බලයම මෙසේ පැවසූ සේක. එකල වසන්නාවූ ජනතාව "ගැළවෙන පිණිස ඔවුහු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය. මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස, බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියා කිරීමක් ඔවුන්ට එවන සේක." (2 තෙසලෝනික 2:10-12). මිනිසුන් උන්වහන්සේගේ ඉගැන්වීම ප්‍රතික්ෂේප කරන අතරේදී දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ආත්මයාණන්ව ඉවත් කරගැනීම කරණකොටගෙන ඔවුන් ප්‍රේම කරන මුළාවන්ට ගොදුරු වීමට ඔවුන්ට ඉඩ හරින සේක.

එසේ වුවද, ක්‍රිස්තුස්වහන්සේ තවදුරටත් මිනිසා වෙනුවෙන් මැදිහත්කාරකම් කරන සේක. සොයන්නාවූ අයට උන්වහන්සේ ආලෝකය ලබාදෙන සේක. මුල් කාලයේදීම මෙම කාරණය අවබෝධ කරගැනීමට ඇඩ්වෙන්ටිස්තවරු අසමත් වූහ. නමුත් පසුව ඔවුන්ට කරුණු පැහැදිලි කරදෙන ලදී. ඔවුන්ගේ සත්‍ය තත්ත්වය ශුභාරංචිය තුළින් හෙළිදරව් වීමත් සමගම යථාර්ථය පැහැදිලි විය.

වසර 1844 ගෙවී ගිය විට, දෙවෙනි ඊම කෙරෙහි තවදුරටත් විශ්වාසය රඳවා ගෙන සිටි අයට මහත් පීඩාවන්ට සහ පරීක්ෂාවන්ට මුහුණ දීමට සිදුවිය. සියලු පීඩා මධ්‍යයේ ඔවුන්ට සැනසීම ලබාදීමට ආලෝක දහරාවක් වූයේ සගයේ ශුද්ධස්ථානය පිළිබඳව වූ එම දසුනින් ඔවුන්ගේ යථා තත්ත්වය ස්ථාපිත වීමය. සමහර අය සියලු විශ්වාසයන් හැර දමා එහි මහත් අනුබලයක් වූයේ ශුද්ධාත්මයාණන් වහන්සේ නොව මානුෂික හෝ සාතනික බලවේගයන් යයි පැවසූහ. තවත් කණ්ඩායමක් තම විශ්වාසය පාවා නුදුන්නෝය. අතීතයේදී වූ සිද්ධීන් තුළ දෙවි සමිඳාණන් ඔවුන්ට මගපෙන්වූ බව ඔව්හු විශ්වාස කළෝය. ඔවුන් බලා හිඳිමින්, යාච්ඤා කරමින් දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට උපේක්ෂාවෙන් සිටි කල්හි ඔවුන්ගේ අති උත්තම නායක පූජකයාණන් තමන් මෙහෙයෙහි තවත් සේවාවක් ආරම්භ කළ බව ඔවුන්ට දැකගත හැකි විය. ඇදහිල්ලෙන් උන්වහන්සේව අනුගමනය කිරීමෙහිදී සභාවෙහි අන්තිම වැඩකොටස ඔවුන්ගේ දර්ශනයට හසු විය. පළමුවන හා දෙවන දූතයන්ගේ පණිවිඩ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔවුන් සතු විය. එළිදරව් 14 හි තුන්වන දූතයාගේ ගාම්භීර පණිවිඩය ලැබීමට සහ එය ලෝකයාට දීමටද ඔවුහු සූදානමින් සිටියහ.



# 25

# වෙනස් නොවන වෙනස් කළ නොහැකි දේව නීතිය

"එවිට ස්වර්ගයෙහි තිබෙන දෙවියන්වහන්සේගේ මාළිගාව අරින ලද්දේය. උන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටියද උන්වහන්සේගේ මාළිගාවෙහි පෙනුණේය." (එළිදරව් 11:19). දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව බහාලූ ගිවිසුම් පෙට්ටිය පූජ්‍ය ස්ථානයේ දෙවන මණ්ඩපය වූ අති ශුද්ධස්ථානයේ තැන්පත් කර තිබුණේය. භූමික පූජ්‍ය ස්ථානයේ සිදුකරන ලද ස්වර්ගීය දේවල සටහනක්වූ තේවා කටයුතුවලදී මෙම මණ්ඩපය විවෘත කරන ලද්දේ සමගි කිරීමේ දවසෙහිදී පමණක්ය. එය පූජ්‍ය-ස්ථානය පවිත්‍ර කිරීම සඳහා විය. එහෙයින් දෙවියන්වහන්සේගේ දේව මාළිගය විවෘත කරන ලද්දේය, ගිවිසුම් පෙට්ටියද දේව මාළිගය තුළ දකගන්නට ලැබුණේය යන පණිවිඩය දක්වන්නේ 1844 දී සගයේ පූජ්‍ය-ස්ථානයේ අති ශුද්ධස්ථානයට පිවිසෙන දොරටුව විවර කරනු ලැබීමය. සමගි කිරීමේ මෙහෙයේ අවසන් සේවාවන් ඉටුකිරීමට ක්‍රිස්තුස්වහන්සේ එහි සැපත්වූ සේක. ඇදහිල්ල මගින් තම උත්තම පූජකයාණන් අනුව යමින් සගයේ අති ශුද්ධස්ථානයට පිවිසි අයට එහි තැන්පත් කර තිබූ ගිවිසුම් පෙට්ටිය දකගන්නට ලැබිණි. පූජ්‍ය-ස්ථානය පිළිබඳව විෂය ඔවුන් බොහෝසේ ඉගනගෙන තිබූ නිසා ගැළවුම්කාරයාණන්ගේ මෙහෙවරයෙහි වෙනස ඔවුන්ට අවබෝධ කරගත හැකිවිය. එහිදී ඔවුන්ගේ නෙත් ගැටුණේ උන්වහන්සේ ගිවිසුම් පෙට්ටිය ඉදිරියෙහිදී තමන්වහන්සේගේ ශ්‍රී රුධිරය පව්කරුවන්ගේ පාප උදෙසා පිළිගන්නැයි අයදින ආකාරයයි.

භෞමික පූජ්‍ය-ස්ථානයේ තිබූ ගිවිසුම් පෙට්ටිය තුළ දස පනත කෙටූ ගල් පුවරු දෙක තැන්පත් කර තිබුණේය. එම ගල්ලැලි මත දෙවියන්වහන්සේගේ දසපනත මුද්‍රාකර තිබුණේය. ගිවිසුම් පෙට්ටිය සාදා තිබුණේ දස පනත රැගත් ගල්ලැලි දෙක බහාලීම සඳහාය. එය තුළ දස පනත තැන්පත් කර තිබූ නිසා එයට විශේෂ වටිනාකමක්ද, පාරිශුද්ධකමක්ද හිමි විය. සගයෙහි වූ දෙවියන්වහන්සේගේ දේව මාළිගය විවරවූ අවස්ථාවේදී එහි තුළ තිබුණාවූ ගිවිසුම් පෙට්ටිය දකගත හැකි විය. සගයේවූ පූජ්‍ය-ස්ථානයේ ඇති අති ශුද්ධස්ථානයෙහි දිව්‍ය ව්‍යවස්ථාව අතිශුද්ධ අයුරින් නිදන් කොට (තැන්පත් කොට) තිබේ. එම ව්‍යවස්ථාව වනාහි සීනයි කඳු මස්තකයේ සිට ගිගුරුම් හඬ මැද දෙවියන්වහන්සේ විසින්ම ප්‍රකාශ කළ දස පනතය. තවද උන්වහන්සේ එම වදන් වාක්‍ය ගල් පුවරු මත ස්වකීය ශ්‍රී ඇඟිල්ලෙන් ලේඛණගත කළසේක.

සගයේ පිහිටි දේව මාළිගාවේ තැන්පත් කර ඇති ව්‍යවස්ථාව නීතිමය මුල් ශ්‍රේෂ්ඨ පිටපත වන්නේය. ගල් පුවරු මත ලියා ඇති, මෝසෙස් විසින් බයිබලයෙහි ලේඛණගත කර ඇති ව්‍යවස්ථාව වනාහි එහි, වෙනසකින් තොර ප්‍රත්‍යක්ෂ පිටපතකි. මෙම වැදගත් කරුණු පිළිබඳව අවබෝධයකට පැමිණි අය දිව්‍ය ව්‍යවස්ථාවේ ශුද්ධවූ ප්‍රත්‍යක්ෂ ගුණාංග දකගත්තෝය. පෙර නොවූ විරූ ආකාරයෙන් විමුක්තිදායක-යාණන්ගේ වදන් බලවත් ලෙස ඔවුන්ගේ හදවත් තුළට කිඳා බැස්සේය. උන්වහන්සේ මෙසේ පැවසූසේක. "සැබවක් නුඹලාට කියමි: අහසත්, පොළොවත් පහව යනතෙක්, සියල්ල සිදුවන තුරු ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය." (මතෙව් 5:18). දෙවි සමිඳාණන්ගේ කැමැත්ත එළිදරව් කරන මේ නීති සංග්‍රහය උන්වහන්සේගේ චරිතයෙහි ලිඛිත පිටපතකි. එය සගයෙහි ඇති සත්‍යවාදී සාක්ෂියක් ලෙස සදහටම පැවතීම අනිවාර්ය වන්නේය. නීති සංග්‍රහයෙහි එක් වගන්තියක් හෝ අවලංගු කර නැත, එක් අකුරක් හෝ පිල්ලක් හෝ වෙනස් කර නැත. ගීත රචකයා මෙසේ පවසා තිබේ: "ස්වාමිනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ." (ගීතාවලිය 119:89). "උන්වහන්සේගේ පනත් සියල්ල නියතය, ඒවා .... සදාකාලයටම පිහිටුවා තිබේ." (ගීතාවලිය 111:7,8).

දස පනතෙහි කේන්ද්‍රස්ථානය වන්නේ හතර වැනි ආඥාවය. එම ආඥාව මුල්වරට ප්‍රකාශනයට පත්වූයේ මෙලෙසය. "සබත් දවස ශුද්ධ කොට පවත්වන්ට සිහි කරගනුව. සදවසක් වැඩ කරමින් නුඹේ සියලු වැඩ කර්මාන්ත කරගනුව. එහෙත් සත්වෙනි දවස නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට පවත්වන සබතක්ය. ඒ දවසේ නුඹවත්, නුඹේ පුත්‍රයාවත්, නුඹේ දුවවත්, නුඹේ වැඩකාරයාවත්, නුඹේ වැඩකාරීවත්, නුඹේ සිව්පාවෝවත් නුඹේ දොරටු ඇතුළත සිටින ආගන්තුකයාවත් කිසි වැඩක් නොකරව්. කුමක් හෙයින්ද ස්වාමින්වහන්සේ අහසත් පොළොවත් මුහුදත් එහි ඇත්තාවූ සියල්ලත්, සදවසින් සාදා සත්වෙනි දවසෙහි නිවාඩු ගත්සේක. එහෙයින් ස්වාමින්වහන්සේ සබත් දවසට ආශිර්වාද කොට එය විශුද්ධ කළසේක." (නික්මයාම 20:8-11).

දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනය හදාරමින් සිටි සිසුන්ගේ හදවත්වලට උන්වහන්සේගේ ආත්මයාණෝ සත්‍යයේ ආලෝක දහරා කාවැද්දූ සේක. මැවුම්කාරයාණන්ගේ නිවාඩු දවස නොසලකා හරිමින් නොදනුවත්කමින් මේ ශික්ෂාව කඩකර ඇතැයි යන හැඟීමෙන් ඔවුන්ගේ හෘදය සාක්ෂිය දැඩි හැඟුම්බර චින්තනයක් අවදි කළේය. දෙවියන්-වහන්සේ විසින් පාරිශුද්ධ කළ දවස වෙනුවට සතියේ පළමු වැනිදා පැවැත්වීමට හේතු කාරණා සොයා දනගැනීමට ඔවුහු පෙළඹුණෝය. දස පනතේ හතරවෙනි ආඥාව වෙනස් කර ඇතැයි යන්න පිළිබඳව සාක්ෂීන් ශුද්ධ ලියවිලි තුළ ඔවුන්ට හමු නොවීය. සබත් දවස වෙනස් කිරීමක් ගැන කිසිම හෝඩුවාවක් හෝ ශුද්ධ බයිබලයේ නොවීය.



සබත් දවස ශුද්ධ කරමින් ඒ දවසට දුන්නාවූ ආශිර්වාද කිසිම දිනක වෙනස්කර නැති බව ඔවුන්ට ඒත්තු ගියේය. දෙවියන්වහන්සේගේ කැමැත්ත දනගැනීමත් එය තම ජීවිත තුළ ක්‍රියාත්මක කිරීමත් සැදැහැවතුන්ගේ අභිමතාර්ථය විය. තමන්ගේ ක්‍රියාකලාපය තුළදී තමන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව පෙනී යාමෙන් ඔවුන්ගේ සිත් සංතාපයෙන් වෙළී ගියේය. ඔවුහු තම පක්ෂපාතිකම පෙන්නුම් කරමින් සබත් දවස නිසියාකාරව පැවැත්වීමට පටන් ගත්හ.

ඔවුන්ගේ ඇදහිල්ල පරාජය කිරීමට බොහෝ ක්‍රමවේදයන් ක්‍රියාත්මක විය. භෞමික පූජ්‍ය-ස්ථානය සගයේ තිබෙන්නාවූ දේව-මාළිගයේ ආදර්ශයක් නොහොත් අඩියාලමක් නම්, භෞමික පූජ්‍ය-ස්ථානයේ වූ ගිවිසුම් පෙට්ටියේ තැන්පත් කර තිබූ ව්‍යවස්ථා නීති සංග්‍රහය සගයේ ගිවිසුම් පෙට්ටියෙහි තිබූ දශ පනතෙහි සත්‍යවූ පිටපතක් වීම අනිවාර්ය වන්නේය. ස්වර්ගයේ දේව මාළිගාවෙහි පැවැත්ම පිළිගන්නේ නම්, දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය ඉල්ලා සිටින්නාවූ කීකරුකම අවිවාදයෙන් ඉටු කළ යුතුය යන සිද්ධාන්තය මුල්කරගෙන හතරවෙනි ආඥාවේ සඳහන් සබත පැවැත්වීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ. එය ඔවුන්ට සැකයකින් තොරව ඒත්තු ගියේය. ක්‍රිස්තුස්-වහන්සේගේ ස්වර්ගික දේව මාළිගයෙහි මෙහෙය හා සමගාමීව සබත් දවස පිළිබඳව වසත්‍යතාවද ඉස්මතු වීමත්, එය සුරැකීමේ අවශ්‍යතාවත් පෙනී යාම, ඉතා කටුක වූ විරුද්ධතාවන් පැන නැගීමට හේතු විය. හිංසා පීඩා ක්‍රියාත්මක වීමට හේතු කාරක වූ රහස මෙයයි. දෙවියන්වහන්සේ විවෘත කළ දොර වසාලීමට මනුෂ්‍යයෝ වෑයම් කළෝය. ඒ අතරම ඔවුහු දෙවියන්වහන්සේ වසා දමූ දොර විවර කිරීමට වෑයමක්ද දැරූහ. තමන්වහන්සේ විවර කරන දේ කිසිවෙකුටත් වසා දමිය නොහැකි බවත්, වසා දමන දේ කිසිවෙකුටත් විවර කළ නොහැකි බවත් පවසන තැනැන්වහන්සේ මෙසේ වදාළ සේක. "මෙන්න, කිසිවෙකුට පියන්ට බැරිවූ ඇරපු දොරක් නුඹ ඉදිරියෙහි මා විසින් තබා තිබේ"යි උන්වහන්සේ පැවසූ සේක. ක්‍රිස්තුස්වහන්සේ තමන් ක්‍රියාකාරී මෙහෙය, අති ශුද්ධස්ථානයේ විවර කළසේක. සගයේ දේව මාළිගාවේ විවරවූ දොරින් ආලෝකය බැබළෙන්නට විය. එහි තැන්පත් කර ඇති නීති සංග්‍රහයෙහි, හතරවන ආඥාවද අන්තර්ගත බව පැහැදිලිව දිස්වන්නට විය. දෙවියන්වහන්සේ ස්ථාපිත කළ දෙයක් මනුෂ්‍යයන්ට ඉවත දමන්නට හැකියාවක් නැත.

ක්‍රිස්තුස්වහන්සේ දෙව් මැදුරේ කරන්නාවූ මෙහෙවරය පිළිබඳ ආලෝකයත්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ස්ථිරතාවයත් පිළිගත් අයට ප්‍රත්‍යක්ෂ වූයේ මෙම සත්‍යතාවන් දෙක එළිදරව් 14 හි ඉදිරිපත් කර ඇති කාලීන සත්‍යතාවන් බවය. මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් දේව දූතයන් තිදෙනාගේ පණිවිඩයන්හි අන්තර්ගතය වන්නේ ක්‍රිස්තු

සමිදාණන්ගේ ආගමනය සඳහා මෙලොව වසන්නාවූ අයව සූදානම් කිරීම් වස් දෙනු ලැබූ තුන් ප්‍රකාර අනතුරු ඇඟවීමේ අනුශාසනාවන්ය. "උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය" යන ප්‍රකාශය මගින් අවධානය යොමු කරන්නේ මිනිසාගේ ගැළවීම සඳහාවූ ක්‍රිස්තුස්-වහන්සේගේ මෙහෙවරයෙහි අවසාන ක්‍රියාදාමයටයි. උන්වහන්සේගේ මැදහත්කාර මෙහෙය අවසාන වන තෙක්, තමන්ගේ ජනතාව සගයට ගෙන යාම සඳහා උන්වහන්සේ මෙලොවට පැමිණෙන තෙක්, මෙම පණිවිඩය පතුරුවා හැරිය යුතුය. 1844දී ආරම්භ වූ විනිශ්චය කිරීමේ ක්‍රියාදාමය, ජීවත් වන්නාවූද, මිය ගියාවූ ද සෑම පුද්ගලයෙකුම විනිශ්චයට පමුණුවා තීරණයක් දෙන තාක් කල් ක්‍රියාත්මක විය යුතුය. එම නිසා මෙම ක්‍රියදාමය මානව පරිවාසය අවසන් වන තෙක් කෙරීගෙන යා යුතුය. විනිශ්වාසනය ඉදිරියෙහි පෙනී සිටීමට මිනිසුන්ව සූදානම් කිරීමේ අභිලාෂයෙන් පණිවිඩය ආඥා කරන්නේ "දෙවියන්වහන්සේට භය වී, උන්වහන්සේට ගෞරව දෙන්න;" "අහසත් පොළොවත්, මුහුදත්, ජල උල්පතුත් මැවූ තැනැන්වහන්සේට නමස්කාර කරන්න" කියාය. මෙම පණිවිඩයන්ට ප්‍රතිචාර දක්වමින් එය පිළිගන්නාවූ අයව හඳුන්වා ඇත්තේ මෙලෙසය. "මෙහි දෙවියන්-වහන්සේගේ ආඥාද, යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලද, රක්ෂා කරන්නාවූ ශුද්ධවන්තයන්ගේ ඉවසීම ඇත්තේය" යන අයුරින්ය. විනිශ්චය සඳහා සූදානම් වීම් වස් මිනිසුන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට ගරු කරමින් එයට කීකරු වෙමින් ජීවිත රටාවක් හැඩගස්වා ගත යුතුය. විනිශ්චයේදී චරිතය තීරණය කරන්නාවූ ප්‍රමිතිය වන්නේ එම ව්‍යවස්ථාවය. මේ පිළිබඳව අපෝස්තුළු පාවුල් මෙසේ පවසයි, "දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා මනුෂ්‍යයන්ගේ රහස් විනිශ්චය කරවන දවසේදී .... ව්‍යවස්ථාවක් ඇතුව පව්කළාවූ සියල්ලෝ ව්‍යවස්ථාව කරණකොටගෙන විනිශ්චය කරනු ලබන්නෝය." ඔහු මෙසේද කියයි: "ව්‍යවස්ථාව පවත්වන්නෝ ධර්මිෂ්ඨ කොට ගණන් ගනු ලබන්නෝය." (රෝම 2:12-16). "ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන." (හෙබ්‍රෙව් 11:6) "ඇදහිල්ලෙන් නොවූ සියල්ල පාපයය." (රෝම 14:23).

පළමුවන දේව දූතයා මිනිසුන්ව කැඳවන්නේ දෙවියන්වහන්සේට භය වී උන්වහන්සේට ගෞරවය දීමටය, අහසත්, පොළොවත් මැවූ තැනැන්වහන්සේ ලෙසට උන්වහන්සේට නමස්කාර කිරීමටය. මෙසේ කිරීමට නම් ඔවුන් උන්වහන්සේගේ නීති සංග්‍රහ ව්‍යවස්ථාවට කීකරු වීම අනිවාර්ය වන්නේය. ප්‍රඥාවන්තයා මෙසේ කියයි: "දෙවියන් වහන්සේට භයව උන්වහන්සේගේ ආඥා පවත්වන්න. මේ වනාහි සියලු මනුෂ්‍යයන්ගේ යුතුකමය." (දේශනාකාරයා 12:13). උන්වහන්සේගේ ආඥා නොපවත්වා කරන්නාවූ නමස්කාරය දෙවියන්-වහන්සේට ප්‍රසන්න නොවන්නේය. "දෙවියන්වහන්සේට ප්‍රේමවීම නම් අප විසින් උන්වහන්සේගේ ආඥා පැවැත්වීමය." "ව්‍යවස්ථාව ඇසීමෙන්



තමාගේ කන් ඉවත හරවා ගන්නාගේ යාච්ඤාව පවා පිළිකුලක්ය." (1 යොහන් 5:3; හිතෝපදේශ 28:9).

දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට ඇති යුතුකමේ පදනම වන්නේ උන්වහන්සේ මැවුම්කාරයාණන් වීමය. මිනිසා ඇතුළු සෑම සත්වයෙකුගේම පැවැත්මක් ගැන සියලුදෙනාම උන්වහන්සේට ණය-ගැති බව මතක තබාගැනීම වැදගත්ය. ශුද්ධවූ බයිබලයේ සඳහන්ව ඇති පරිදි, දේව භක්තියක් නැති මිනිසුන්ගේ දෙවිවරුන්ට වඩා තමන්වහන්සේට ගෞරවය හා නමස්කාරය පුද කරන්නැයි දෙවියන්-වහන්සේ ඉල්ලන්නාවූ සෑම අවස්ථාවකදීම උන්වහන්සේ ඉදිරිපත් කරන්නාවූ සාධකය නම් තමන්වහන්සේගේ මැවීමේ ආධිපත්‍යයයි. "මනුෂ්‍ය වර්ගයන්ගේ සියලු දෙවිවරු පිළිම පමණක්ය. නුමුත් ස්වාමින්වහන්සේ ආකාශ මණ්ඩලය සෑදූ සේක." (ගීතාවලිය 96:5) "ඉතින් නුඹලා මා කාට සමාන කරනවාද? මා එක සමානව සිටින්නේ කාටදැයි ශුද්ධ තැනැන්වහන්සේ අසන සේක. නුඹලාගේ ඇස් ඉහළ ඔසවා බලන්න. මේවා මැව්වේත් මේවායේ සේනාව ගණන් වශයෙන් පිටතට පමුණුවන්නෙත් කව්ද?" "ස්වර්ගයන් මැව්වාවූ, පොළොව මවා සාදා එය පිහිටෙව්වාවූ ... ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. මම ස්වාමින්වහන්සේය. වෙන කෙනෙක් නැත" (යෙසායා 40: 25, 26; 45:18) ගීත රචකයා මෙසේ පද මාලා සපයයි. "ස්වාමින්වහන්සේ දෙවියන්වහන්සේ බව දැනගනිව්. උන්වහන්සේ අප මැවූ සේක. අපි උන්වහන්සේගේ සෙනඟය." "එව්, නමස්කාර කරමින් වැඳ වැටෙමු. අපේ මැවුම්කාර ස්වාමීන් ඉදිරියේ දණගසමු." (ගීතාවලිය 100: 3; 95: 6). දෙවි සමිඳාණන් හට ගෞරව භක්තිය පුද කිරීමට හේතු කාරකය වශයෙන් සගයේ දේව දූතයන් පවසන්නේ මෙවන් ප්‍රශස්ති ගැයුමක්ය: "අපගේ ස්වාමින්වහන්ස, අපගේ දෙවියන්වහන්ස, ඔබ ප්‍රශංසාවත්, ගෞරවයත්, බලයත් ලබන්ට වටින තැනැන්වහන්සේය. මක්නිසාද, ඔබ සියලු දේ මැවූ සේක." (එළිදරව් 4:11).

මැවුම්කාරයාණන්ට නමස්කාර කිරීමට මිනිසුන්ට ඇරයුමක් එළිදරව් 14 හි අන්තර්ගතය. එහි සඳහන්වූ කොටස් තුනකින් යුත් පණිවිඩයෙහි ප්‍රතිඵලයක් ලෙසින් දෙවියන්වහන්සේගේ ආඥා පවත්වන්නාවූ ජන කොටසක් පිළිබඳව දිවැසි වැකිය සඳහනක් කරයි. මේ ආඥාවන්ගෙන් එකක් දෙවියන්වහන්සේ මැවුම්කාරයාණන් බව කෙළින්ම ප්‍රකාශ කරයි. දිව්‍ය නීති සංග්‍රහයෙහි හතරවෙනි ආඥාව මෙසේ පවසයි: "සත්වෙනි දවස නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට පවත්වන සබතක්ය.... කුමක් හෙයින්ද ස්වාමින්වහන්සේ අහසත් පොළොවත් මුහුදත් එහි ඇත්තාවූ සියල්ලත් සදවසින් සාදා සත්වෙනි දවසෙහි නිවාඩු ගත්සේක. එහෙයින් ස්වාමින්වහන්සේ සබත් දවසට ආශීර්වාද කොට එය විශුද්ධ කළසේක." (නික්මයාම 20:10,11). සබත ගැන තවදුරටත් පවසන ස්වාමින්වහන්සේ මෙසේ ප්‍රකාශ කරන

සේක. "මාගේ සබත් ශුද්ධ ලෙස පවත්වන්න. එවිට මා නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ බව නුඹලා දනගන්න පිණිස ඒවා මා සහ නුඹලා අතරේ සලකුණක් වන්නේය." (එසකියෙල් 20:20). එසේ වීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ "ස්වාමින්වහන්සේ අහසත්, පොළොවත් සදවසකින් සාදා සත්වෙනි දින නැවතී නිවාඩු ගත්සේක" යන කරුණය. (නික්මයාම 31:17).

මැවීමේ සිහිවීමක් වශයෙන් සබත් දවස වැදගත් වන්නේ අප විසින් දෙවියන්වහන්සේට නමස්කාර කළ යුත්තේ මොන නිත්‍ය හේතුවක් නිසාදයි එය දක්වන බැවිනි; එනම්, උන්වහන්සේ මැවුම්කාරයාණන් වහන්සේද අප උන්වහන්සේගේ මැවිල්ලද වන නිසාය. එම නිසා දිව්‍ය නමස්කාරයෙහි පදනම ලෙස සබත වැදගත් ස්ථානයක් දරන්නේය. එය මෙම සත්‍යතාව සිතට කාවැද්දිය හැකි අන්දමට උගන්වන අතර වෙනත් කිසිම ක්‍රමවේදයක් ඒ දෙය කරන්නේ නැත. දිව්‍ය නමස්කාරය උදෙසාවූ පදනම නම් මැවුම්කාරයාණන් සහ මැවිල්ලෙහි ජීවීන් අතර ඇති වෙනසයි. එය සබත් දවසේ නමස්කාරයේ පමණක් නොව සියලු නමස්කාරයන්හිම විශිෂ්ඨ පදනමය. මෙම සත්‍යය කිසිදිනක හෝ යල් පැන ගිය සිද්ධාන්තයක් නොවන්නේය. එය කිසිවිටෙක අමතක නොකළ යුතු සත්‍යයකි. (Andrews, J. N. "History of the Sabbath" Ch. 27). මෙම විශිෂ්ඨතාව මිනිස් මනසෙහි සිතුවිලි අතර නිරතුරුවම රඳවා තැබීම සඳහා දෙවියන්වහන්සේ ඒදන් උයනේදී සබත පිහිටුවා ලූසේක. උන්වහන්සේ අපගේ මැවුම්කාරයාණන් ලෙස සිටින තාක් කල් අප උන්වහන්සේට නමස්කාර කිරීම අනිවාර්ය වන්නේය. එසේම සබත් දවස සැමවිටම මැවීමේ සලකුණක් හා සිහිවීමක්ද වන්නේය. මනුෂ්‍යයෝ විශ්වීය වශයෙන් සබත රැකගෙන පවත්වා ගෙන ගියෝ නම් ඔවුන්ගේ සිතුවිලි සහ ප්‍රේමය මැවුම්කාරයාණන්ට ගෞරව කිරීමට සහ නමස්කාර කිරීමට නියත වශයෙන්ම යොමු වනවා ඇත. එසේ වූයේ නම් ලෝකයේ කිසිම තැනෙක රූප වඳින්නෙක් හෝ, දෙවි කෙනෙක් නැතැයි පවසන්නෙක් නොසිටිනවා ඇත. සබත සුරැකීම වනාහි සත්‍යවූ දෙවියන්වහන්සේට පක්ෂපාතීත්වය දක්වීමකි. සත්‍යවූ දෙවියන්වහන්සේ වනාහි 'අහසත් පොළොවත් මුහුදත් ජල උල්පතුත් මැවූ තැනැන්වහන්සේය.' දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටත්, උන්වහන්සේගේ ආඥා පැවැත්වීමටත් අණ කරමින් දෙන ලද පණිවිඩය තුළ විශේෂයෙන්ම හතරවෙනි ආඥාව රක්ෂා කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව පිළිගත යුතුය.

දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින් යේසුස්වහන්සේට විශ්වාසීව සිටින්නාවූ ජන කොටසට අසමානව තවත් ජන කොටසක්ද ලෝකයේ සිටින බව තුන්වන දේව දූතයා පෙන්වා දෙන්නේය. ඒ ජන කොටසට විරුද්ධව, ඔවුන්ගේ වැරදි නිගමනයන් ගැන දරුණුවූද, බිහිසුණුවූ ද අනතුරු ඇඟවීමක් මෙසේ ප්‍රකාශයට පත්කර තිබේ:



"යමෙක් මෘගයාටත් උගේ රූපයටත් නමස්කාරකර, ඔහුගේ නළලේවත් අතේවත් ලකුණක් ලබන්නේද ඔහුත් දෙවියන්වහන්සේගේ කෝපය නැමති කුසලානට අමිශ්‍රව වත්කරනලද උන්වහන්සේගේ උදහස නැමති මුද්‍රිකපානය බොන්නේය." (එළිදරව් 14:9,10). මෙම පණිවිඩය අවබෝධ කරගැනීමට නම් මෙහි ඇති සංකේත නියම අයුරින් අර්ථකථන ගැන්වීමක් අවශ්‍ය වන්නේය. මෘගයා, උගේ රූපය, උගේ සලකුණ යන සංකේතයන් මගින් පෙන්නුම් කරනු ලබන්නේ මොනවාද?

මෙම සංකේත අන්තර්ගත දිවැසි වැකි ප්‍රකාශන ආරම්භ වන්නේ එළිදරව් 12 වන පරිච්ඡේදයත් සමගය. ක්‍රිස්තුස්වහන්සේගේ උපතෙහිදී උන්වහන්සේව විනාශ කරදැමීමට මහා සර්පයා දරූ උත්සාහයත් සමග අනාවැකි මාලාව දිග හැරේ. මහා සර්පයා වනාහි සාතන් යයි පවසා තිබේ: (එළිදරව් 12:9) ක්‍රිස්තුස්වහන්සේගේ උපතේදී උන්වහන්සේව මරා දැමීමට හෙරෝද් තුළින් ක්‍රියා කළේ ඔහුය. කිතුණු මුල් යුගයේදී ක්‍රිස්තුස්වහන්සේට සහ උන්වහන්සේගේ සෙනඟට විරුද්ධව යුද්ධ වැදූණු සාතන්ගේ ප්‍රධාන සෙන්පතියා වූයේ ඔහුගේ අණසක යටතේ දේව ජනතාවට ප්‍රහාර එල්ල කළ රෝම අධිරාජ්‍යයයි. රෝමයේ ප්‍රධාන ආගම වූයේ මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රමයයි. මහා සර්පයාගෙන් ප්‍රාථමික ලෙස සාතන් නියෝජනය වූ අතර දෙවනුව එය මිසදෙටු රෝමයද නිරූපණය කළේය.

දිවියෙකුට සමාන මෘගයෙකු පිළිබඳව එළිදරව් 13 විස්තර කරයි. මෘගයා විසින් ඒ සතාට තම බලයත්, තම සිහසුනත්, මහා ආධිපත්‍යයත් පවරා දුන්නේය. මෙම මෘගයා සංකේතවත් කරන්නේ පාප් බල අධිකාරිය බව බහුතර ප්‍රොතැස්තන්ත දේව ධර්මාචාර්යවරුන්ගේ අදහසයි. පුරාණ කාලයේදී රෝම අධිරාජ්‍යය දරූ සිහසුනට සහ ආධිපත්‍යයට ඇයගෙන් පසුව පත්වූයේ රෝමානු පාප් බලයයි. දිවියෙකු වැනිවූ මෘගයා පිළිබඳව මෙවන් විස්තර කිරීමක් කර ඇත. "ඌ දෙවියන්වහන්සේට විරුද්ධව අපහාස කරන පිණිසද උන්වහන්සේගේ නාමයට සහ උන්වහන්සේගේ මණ්ඩපයටත්, එනම් ස්වර්ගයෙහි වාසය කරන්නන්ටත් අපහාස කරන පිණිසද මුඛය ඇරියේය. තවද ශුද්ධවන්තයන්ට විරුද්ධව යුද්ධ කරන්ටද ඔවුන්ගෙන් ජයගන්ටද ඌට ඉඩ දෙන ලද්දේය. සියලු ගෝත්‍රයන්ද සෙනඟද භාෂාවන්ද ජාතීන්ද කෙරෙහි ඌට බලය දෙන ලද්දේය." (එළිදරව් 13:6,7) දානියෙල් 7 හි සඳහන් කුඩා අඟ පිළිබඳ දිවැසි ප්‍රකාශනයද සඳහන් කරන්නේ එම බල අධිකාරියමයි; එනම් පාප් බල අධිකාරියයි.

"මාස සතළිස් දෙකක් පවතින්ට ඌට බලය දෙන ලද්දේය." දිවැසිවර තෙමේ මෘගයා ගැන මෙවන් ප්‍රකාශයක්ද කරයි. "මැරෙන තරමට උගේ හිස්වලින් එකකට තුවාල වී තිබෙන්නාක් මෙන් පෙනුණේය." තවදුරටත් මෙසේද පවසා තිබේ: "යමෙක් වහල්කමට නියම නම්, ඔහු

වහල්කමට යන්නේය. යමෙක් කඩුවෙන් මරන්නේ නම් ඔහු කඩුවෙන් මරනු ලබන්ට ඕනෑය." (එළිදරව් 13:3,10) මෙම මාස හතළිස් දෙකෙන් පෙන්වනු ලබන කාල පරාසය දානියෙල් 7 හි සඳහන් "කාලයද, කාලවල්ද, කාල බාගයද" යන්න හා "අවුරුදු තුනහමාරද" මෙන්ම "දවස් එක්දහස් දෙසීය හැටද" එකම කාල පරිච්ඡේදය විය. එම කාලය තුළදී පාප් බලය දෙවියන්වහන්සේගේ සෙනඟට පීඩා කරන්නේය. මෙම කාලවකවානුවේ ආරම්භය පාප් බලය උච්ඡ අවස්ථාවකට පැමිණි ක්‍රි. ව. 538 වසරයි. එම බල අධිකාරිය 1798 දී නිමාව දක්කේය. එම කාලවකවානුව අවසානයේදී ප්‍රංශ හමුදාව විසින් පාප්ව අත්අඩංගුවට ගැනීමත් සමගම පාප් බලයට මරණීය පහරක් එල්ල වුණි. "යමෙක් වහල්කමට නියම නම්, ඔහු වහල්කමට යන්නේය" යන අනාවැකිය මෙසේ ඉටු විය.

මේ අවස්ථාවේ තවත් සංකේතයක් හඳුන්වා දෙනු ලැබේ. දිවැසිවරයා මෙසේ ප්‍රකාශ කරයි. "තවත් මෘගයෙක් පොළොවෙන් නැගී එනවා දුටිමි. බැටළු පැටවෙකුට මෙන් අං දෙකක්, ඌට තිබුණේය. (එළිදරව් 13:11). මෙම මෘගයාගේ මතුවී ඒමත්, දැකගන්නට ලැබීමත් අනුව පෙනී යන්නේ මෙම මෘගයාගෙන් පෙන්නුම් කරනු ලබන රාජ්‍යය කලින්වූ රාජ්‍යයන්ට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා බවය. ලොව පාලනය කළ ශ්‍රේෂ්ඨ රාජ්‍යයන් දානියෙල් දිවැසිවරයාට ඉදිරිපත් කරන ලද්දේ මාංශ භක්ෂක මෘගයන්ගේ ස්වරූපයෙනි. "ආකාශයේ හුළං සතර මහා මුහුදට සැරෙන් ගැසුවේය. එකිනෙකාට වෙනස්වූ, මහා මෘගයන් සතරදෙනෙක් මුහුදෙන් නැගී ආවෝය"යි පවසන ලදී. (දානියෙල් 7:2). අනාවැකි තුළ භාවිතා කර ඇති සංකේතයක් වන "ජලය" යන වදනින් හඳුන්වන්නේ "මනුෂ්‍ය වර්ගයෝද සමූහයෝද ජාතීහුද භාෂාවෝද" වන බව දේව දූතයා විස්තර කර දී ඇත. (එළිදරව් 17:15). සුළඟින් පෙන්නුම් කරන්නේ ගැටුම් සහ ආරාවුල්ය. ආකාශයේ සුළං සතර මුහුදට ගැසීමෙන් පෙන්නුම් කරන්නේ බලය ලබාගැනීම සඳහා රාජ්‍යයන් ගෙනයන්නාවූ ආක්‍රමණයන් සහ විප්ලවයන්ගේ බිහිසුණු අරගලයන්ය.

එහෙත් බැටළු පැටවෙකුගේ වැනි අං දෙකක් ඇති මෘගයා පොළොවෙන් මතු වී ආවේය. තම ස්ථාවරය ස්ථාපිත කරගැනීමට අනෙකුත් රාජ්‍යයන් පෙරළා දමා, ආක්‍රමණය නොකර, මෙම ජාතිය පිහිටුවනු ලබන්නේ මෙතෙක් ජනාවාස නොතිබූ බිම් පෙදෙසකය. එසේ ආරම්භ වන එම රාජධානිය ක්‍රමයෙන් වර්ධනය වී බලවත් වන්නේය. එම නිසා මෙම රාජ්‍යය පරණ ලෝකයේ එකල පැවති මිනිසුන්ගෙන් පිරී ගිය පොර බඳින්නාවූ ජාතීන් අතරින් පැන නැගීමට නුපුළුවන. එම රාජ්‍යය බටහිර මහාද්වීපයෙන් සොයාගත යුතුය.



1798 වසරේදී බලයට පත්වෙමින් තිබූ අළුත් ලෝකයේ ජාතිය කුමක්ද? ඉතා ශක්තිමත්වූ ද, ශ්‍රේෂ්ඨවූ ද රාජ්‍යයක් ස්ථාපිත කරන බවට පොරොන්දු දෙමින් ලෝකයේම අවධානය දිනාගත් එම රාජ්‍යය කුමක්ද? සංකේතය අදාළ කරගැනීමෙන් එම රාජ්‍යය කුමක්දැයි තීරණය කරගැනීම අපහසුවක් නොවන්නේය. මෙම අනාවැකියෙහි සඳහන් කර ඇති ගුණාංග අනුව මෙම මෘගයාගෙන් පෙන්නුම් කරන්නේ අමෙරිකා එක්සත් ජනපදය මිස වෙනත් රාජ්‍යයක් නොවන්නේය. මෙම ජාතියෙහි නැගීම සහ වැඩීම විස්තර කරන්නාවූ කවීකයන් මෙන්ම ඉතිහාසඥයන්ද දැනුවත්ව හෝ නොදැනුවත්ව ශුද්ධ ලියවිල්ලෙහි අන්තර්ගත වචනම නැවත නැවතත් භාවිතා කර තිබේ. මෙම මෘගයා "පොළොවෙන් මතු වී එනවා" දැකගත හැකි විය. මෙහි යොදා ඇති "මතුවී එනවා" යන පද යුගල, පරිවර්තනය කර ඇත්තේ, "පැළෑටියක් මෙන් පැන නැගී වැඩීම" ලෙසය. අප කලින් දුටු ආකාරයෙන් මෙම ජන වර්ගයාගේ නිජභූමිය බවට පත්වන්නේ කලින් වාස භූමියක්ව නොතිබූ බිම් පෙදෙසකය. අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රභවය පිළිබඳව ලේඛණයක් ඉදිරිපත් කළ ප්‍රවීන රචකයෙක් මෙවන් විස්තරයක් අප හමුවේ තබයි: "මිනිස් වාසයක් නොතිබූ භූමියක් පසුබිම් කරගෙන ඇය නැඟීම අභිරහසක් බඳුය. නිශ්ශබ්ද බීජයක් ලෙස පැන නැගී අපි අධිරාජ්‍යයක් බවට පත්ව සිටිමු." :Townsend G. A. "The New World Compared with the Old," p. 462). 1850 දී පළවූ යුරෝපීය සඟරාවක එක්සත් ජනපදය විශ්මපත් අධිරාජ්‍යයක් ලෙස හඳුන්වා දී තිබේ. "පොළොවේ නිහඬතාව තුළින් මතුවෙමින් ඇය දිනපතාම තම බලයට සහ අභිමානයට තව තවත් එකතු කරගත්තාය"යි පවසා තිබේ. The Dublin Nation). මෙම ජාතියේ නිර්මාතෘ වන්දනාකාර පීතෘවරුන් යන මැයෙන් ප්‍රසිද්ධ දේශනයක් කළ එඩ්වර්ඩ් එවරට් නමැත්තා මෙවන් ප්‍රකාශයක් කළේය. "ඔවුහු විශ්‍රාමික සුවයෙන් ජීවිතය ගතකිරීමට තැනක් සොයා ගියෝද? වැඩි ප්‍රසිද්ධියක් නැති තැනක් නිසා පිටස්තරිකයන්ගෙන් කරදරයක් නැතිව ජීවත් වීමට එම ස්ථානය සුදුසු තැන්නක් වීද? හුදෙකලා තැනක් වූ නිසා ආරක්ෂාව සහතික වීද? ලේඩන්හි කුඩා දේවස්ථානය ඔවුන්ට හෘදය සාක්ෂිය අනුව ජීවත් වීමට ක්ෂේම භූමියක් වීද? ඇස් ඇර බලන්න. කුරුසියේ ධජය දරමින් ඔවුන් සාමකාමී ආක්‍රමණයන් මගින් දිනාගෙන තිබෙන විශාල භූමි භාගය දෙස බලන්න." (Speech Delivered at Plymouth, Mass, Dec. 22, 1824).

"බැටළු පැටවෙකුගේ වැනි අං දෙකක්, ඌට තිබුණේය." බැටළු පැටවෙකුගේ අං මගින් පෙන්නුම් කරන්නේ තාරුණ්‍යයයි, අහිංසකතාවයි, ගුණවත් භාවයයි. "මතුවී එන්නාවූ" ලෙසින් දිවැසිවරයාට පෙන්නුම් කළ එක්සත් ජනපදය 1798 දී නිර්මාණය වීමේදී ඇය තුළ තිබුණාවූ ගුණාංග බැටළු පැටවකුගේ ගුණාංගවලට සමාන විය. අමෙරිකාවේ

රැකවරණය පතා තම රටවලින් පලා ගිය කිතුණු ජනතාව අළුත් රටක් සොයා ගෙන ගියේ එහි රාජ්‍ය පාලනය, සිවිල් සහ ආගමික නිදහස මත ගොඩනගා ගැනීමෙහි චින්තනයක් ඇතිවය. ඔවුන් තම රටවලින් ඉවත්ව ගියේ රාජකීය අධිපතීන්ගෙන් සහ ආගමික බලධරයන්ගෙන් එල්ලවූ විරුද්ධවාදිකම් වලින් ගැළවෙන පිණිසය. ජීවිතය, නිදහස හා සතුට භුක්ති විඳීමේ අයිතියට කිසිම අයුරකින් හෝ බාධා එල්ලවීමක් සිදුනොවන ආණ්ඩුවක් පිහිටුවීමද දේශීය හා ආගමික නිදහස එහි පදනම කරගැනීමද ඔවුන්ගේ අධිෂ්ඨානය විය. "සෑම පුද්ගලයෙකුම එක හා සමානව මවනු ලැබ ඇත යන පූජනීය ප්‍රඥප්තිය රටෙහි ව්‍යවස්ථාවට ඇතුළු කර තිබේ. ඒ අතරම මිනිසුන්ට ස්වයං-පාලනයක් සඳහා අයිතියක් ව්‍යවස්ථාවෙන් සහතික කර තිබේ. මහජන ඡන්දයෙන් තෝරාගනු ලබන්නාවූ නියෝජිතයන් විසින් නීති සම්පාදනය කර ඒවා ක්‍රියාවට නැංවීමද කළ යුතු විය. ආගමික නිදහසද මිනිසෙකුගේ අයිතියක් ලෙස සහතික කර ඇත. තම තමාගේ හෘදය සාක්ෂියේ තීරණයන් මත දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට නිදහස ස්ථාපිත කරන ලදී. සමූහ ආණ්ඩු ක්‍රමය සහ ප්‍රොතැස්තන්ත ප්‍රතිපත්ති ජාතියේ මූලික ප්‍රඥප්ති බවට පිළිගන්නා ලදී. ඇයගේ බලයෙහි සහ සමෘද්ධියෙහි රහස වන්නේ මෙම ප්‍රඥප්තීන් මත ජීවත්වීමය. කිතුණු රාජ්‍යයේ ජීවත්වූ පාගා දමනු ලැබූ පීඩිත ජනතාව මෙම අළුත් ජනපදය වෙත උනන්දුවෙන් සහ බලාපොරොත්තුවෙන් යුතුව බැල්ම හෙලුවෝය. ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍යයෝ ඇයගේ වෙරල කරා ඇදී ආවෝය. ඒ අතර එක්සත් ජනපදයද පොළොවේ ඉතා බලගතු ජාතීන් අතරට එක්වූවාය.

නමුත් බැටළු පැටවෙකුට සමාන අං තිබුණාවූ මෘගයා "මහා සර්පයෙකු මෙන් කථා කළේය. ඌ පළමුවෙනි මෘගයාගේ මුළු බලය ඌ ඉදිරියෙහි පවත්වමින් තමාගේ මරණීයවූ තුවාලයෙන් සුවවුණ පළමුවෙනි මෘගයාට නමස්කාර කරන්ට පොළොවටද, එහි වැසියන්ටද සලස්වන්නේය.... කඩු පහර ලැබත් ජීවත්වූ මෘගයාට රූපයක් සාදන්ට ඕනෑ යයි.... පොළොවේ වැසියන් මුළා කරන්නේය." (එළිදරව් 13:11-14).

බැටළු පැටවෙකුගේ වැනි අං තිබීමත් සර්පයෙකු මෙන් කථා කිරීමත් මගින් සංකේතවත් වන්නේ එම ජාතිය කියන්නාවූ දෙයත්, කරන්නාවූ දෙයත් අතර විශාල වෙනස්කමක් පවතින බවය. ජාතියේ "කථා කිරීම" වනාහි ව්‍යවස්ථාදායකත්වය සහ අධිකරණ බල අධිකාරිත්වයයි. ව්‍යවස්ථාවේ ප්‍රතිපත්තිමය පදනම වන්නේ නිදහස්වාදී සාමකාමී ජීවිත පිළිවෙලය. එසේ වුවද, එයට පටහැනිව නීති සම්පාදනය කරමින් ඒවා ක්‍රියාවට නංවමින් පිළිගත් ප්‍රඥප්තීන්ට එරෙහිව පාලනය ගෙන යනු ලබයි. එම රාජ්‍යය "සර්පයෙකු මෙන් කථා කරන්නේය" සහ "පළමු මෘගයාගේ සියලු බලය" ක්‍රියාත්මක



කරන්නේය යන අනාවැකි මගින් ප්‍රකාශ වන්නේ ඉදිරියෙහිදී නුරුස්නාවෙහි සහ වධහිංසා පැමිණවීමෙහි ආත්මය එම ජාතිය තුළ වර්ධනය වීමේ ප්‍රවීනතාවකි. මෙම ක්‍රියා පටිපාටිය දිවියෙකු වැනි මෘගයා සහ මහත් සර්පයා යන සතුන්ගෙන් නිරූපණය වූ ජාතීන් විසින් ක්‍රියාත්මක කළ බව නොරහසකි. අං දෙකක් සහිත මෘගයා විසින් "පළමුවෙනි මෘගයාට නමස්කාර කරන්ට පොළොවටද, එහි වැසියන්ටද සලස්වන්නේය" යන ප්‍රකාශය මගින් හෙළිදරව් වන්නේ මෙම ජාතියෙහි බල අධිකාරිය යම්කිසි ආගමික වතාවත් පිළිපැදීමට අණපනත් පැනවීමක් ක්‍රියාත්මක කරන බවයි. එය පාප් බලයට ප්‍රණාමය පුද කිරීමක් වනවා ඇත.

එවන් අණසක නිකුත් කිරීමක් නියත වශයෙන්ම මෙම රජයේ ප්‍රඥප්තියට පටහැනිය. තවද, එවන් ක්‍රියා පටිපාටියක් ව්‍යවස්ථාවටද නිදහස් ප්‍රකාශනයටද විරුද්ධය. සභාවෙහි ක්‍රියාකාරිත්වය සඳහා රාජ්‍ය බලය යෙදවීමක් නොකළ යුතු බවට ජාතියේ නිර්මාතෘවරයන් ආරක්ෂා පියවර ගෙන තිබිණ. අමෙරිකානු ව්‍යවස්ථාවෙහි මෙසේ සඳහන් වේ. 'රාජ්‍ය බලය අයිති කොන්ග්‍රසය විසින් යම්කිසි ආගමික ආයතනයක් පිහිටුවීම නොකළ යුතුය. තවද, ආගමික අභ්‍යාසයන්හි නිදහස්ව යෙදීමේදී එයට තහංචි පැනවීමද නොකළ යුතුය. තවද, එක්සත් ජනපදයේ රාජ්‍ය සේවයේ තනතුරක් දැරීමට සුදුසුකමක් සේ ආගමික පරීක්ෂණයකට මුහුණ දීම කිසිවෙකුගෙන් හෝ අපේක්ෂා නොකළ යුතුය' යන කරුණුය. ජාතියේ නිදහස පතා යොදවා ඇති මෙම ආරක්ෂිත විධිවිධාන හිතාමතාම උල්ලංඝනය කරන්නේ නම් විනා යම්කිසි ආගමික වතාවත් පිළිපදින්නැයි නියම කිරීමට කිසිම සිවිල් ආධිපත්‍යයකට බලපෑම් කළ නොහැකි විය. ව්‍යවස්ථාවට පිටුපා ක්‍රියා කරන්නාවූ මෙවන් ක්‍රියාදාමයන් සංකේතනයෙන් නිශ්චය වශයෙන්ම නියෝජනය වී තිබේ. බැටළු පැටවකුගේ වැනි අං දෙකක් ඇති මෘගයා අහිංසක, මුදු මොළොක් බවක් පෙන්නුම් කළද, ඌ සර්පයෙකු මෙන් කථා කරන්නේය.

"කඩු පහර ලැබත් ජීවත්වූ මෘගයාට රූපයක් සාදන්ට ඕනෑ" යයි මෙම මෘගයා පොළොවේ වැසියන්ට කියන්නේය. "ව්‍යවස්ථාදායක බලය ජනතාව සතුව ඇති පාලන ක්‍රමයක් පිළිබඳව මෙහි සඳහන් වන්නේය. මේ අනුව අනාවැකියෙහි හඳුන්වා දෙන්නේ අමෙරිකා එක්සත් ජනපදය බව කිසිම තර්කයකින් තොරව වටහාගත හැකි වේ."

"මෘගයාට රූපයක්" යනුවෙන් කුමක් අදහස් වන්නේද? රූපය සාදන්නේ අං දෙකක් ඇති මෘගයාය. එය පළමු මෘගයාට වූ රූපයකි. මෘගයාට රූපයක් ලෙස එය නම් කර තිබේ. ඒ රූපය කුමන

හැඩරුවක් දරයිද, එය සාදන්නේ කෙසේද කියා පැහැදිලි කරගැනීමට නම් එම මෘගයාගේ චරිත ගුණාංග ගැන අධ්‍යයනයක යෙදීම වැදගත්ය. ඒ මෘගයා නම් පාප් බල අධිකාරියයි.

මුල් කාලීන සභාව ශුභාරංචියෙහි සරලතාවෙන් ඉවත් වී මිසදෙටු වන්දනා ක්‍රම සහ චත්පිළිවෙත් වැළඳ ගැනීමෙන් දූෂ්‍ය වූ කල්හි ඇයට දෙවියන්වහන්සේගේ බලය සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පහසද නැති විය. බැතිමතුන්ගේ හෘදය සාක්ෂිය පාලනය කිරීම් වස් සභා තොමෝ රාජ්‍ය බලයේ ආධාර සහ අනුග්‍රහය පැතුවාය. එහි ප්‍රතිඵලය වූයේ පාප් බල අධිකාරිය උපත ලැබීමය. දේශයෙහි සිවිල් බල අධිකාරිය සියතට ගෙන තමන්ගේ අභිමතය ඉටු කරගැනීමට රාජ්‍ය බලය යොදවන්නාවූ සභාවක්වූ පාප් සමය වාදය වැඩි වශයෙන් අවධානය යොමු කළේ "සභාවෙහි ස්ථාපිත ක්‍රමවේදයන්ට විරුද්ධ වූවන්ට දඬුවම් ලබාදීමටය. අමෙරිකා එක්සත් ජනපදය විසින් මෘගයාට රූපයක් ඉදි කිරීමට නම්, සිවිල් රාජ්‍ය බල අධිකාරිය සභාව විසින් පාලනය කළ යුතුය. එමගින් රාජ්‍ය බලය යොදවා තමන්ගේ අභිරුචියන් ඉටුකරවා ගැනීමට සභාවට හැකියාව උදා වන්නේය.

සභාව විසින් රාජ්‍ය-අනුග්‍රහය ලබාගත් අවස්ථාවලදී ඇය එම අනුග්‍රහය ප්‍රයෝජනයට ගත්තේ තමන්ගේ දහමට විරුද්ධ වන්නාවූ අයව මර්දනය කිරීමටය. රෝමයේ අඩිපාරේ ගමන් ගත් ප්‍රොතැස්තන්ත සභාවන්ද ලෞකික රාජ්‍ය බලඅධිකාරීන් සමග සන්ධාන ගතවීමෙන් ප්‍රාර්ථනා කළේ හෘදය සාක්ෂියෙහි නිදහස සීමා කිරීමටය. එංගලන්ත සභාවෙහි සමහර ධර්මතාවන්ට එකඟ නොවී ඒවාට විරුද්ධව නැගී සිටියවුන්ට හිංසා පීඩා පැමිණවීමේ සභාවේ දිගුකාලීන ක්‍රියාදාමය මෙයට කදිම නිදසුනකි. දහසය වන සහ දහහත් වන සියවස් වලදී දහස් ගණන් එංගලන්ත සභා දේවගැතිවරුන්ට තමන්ගේ දේවස්ථාන හැර දමා යාමට බල කරන ලදී. බයිබලීය විරෝධී ඉගැන්වීම්වලට එකඟ නොවූ බොහෝ දේවගැතිවරුන්ට මෙන්ම ගිහියන්ටද දඬුවම් වශයෙන් දඩ ගැසීම්, සිරගෙයි ලෑම්, වධ හිංසාවලට ගොදුරු වීම් සහ වේද-සාක්ෂික මරණයන් යනාදියට මුහුණ දීමට සිදුවිය.

මුල් දහම් හැර දමා ක්‍රියාකිරීම නිසා පැරණි සභාවට සිවිල් රජයේ ආධාර පැතීමට සිදුවිය. මෙම ක්‍රියාවේදය මගින් පාප් බල අධිකාරිය වර්ධනය විය. "ඇදහිල්ලෙන් වැටී යාමත් විනාශයේ පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා එළිදරව් වීමත්" පළමුවෙන් සිදුවන බව පාවුල් පැවසුවේය. ඇදහිල්ලෙන් වැටී යාම හෙවත් භක්තිය හැර පියා යාම නිසා මෘගයාට රූපයක් ඉදිකිරීමක් සඳහා මාර්ගය විවෘත වන්නේය. ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊමට පෙරාතුව ආගමික පිරිහීමක් හෙවත් පසුබෑමක තත්ත්වයක් සභාව තුළ පවතින බව



ශුද්ධ බයිබලය ප්‍රකාශ කරයි. මෙය ක්‍රිස්තියානි ආගමේ මුල් යුගයේදී සිදුවූ තත්ත්වයට සමාන වෙනවා ඇත. එය මෙසේ දක්වා තිබේ: "අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දනගන්න. මක්නිසාද මනුෂ්‍යයෝ තමුන්ටම ප්‍රේම කරන්නෝව, මුදලට ප්‍රේම කරන්නෝව, පාරට්ටු කරගන්නෝව, උදාරම්කාරයෝව, අපහාස කරන්නෝව, මව්පියන්ට අකීකරුවන්නෝව, ස්තූතිවන්ත නොවන්නෝව, අභක්තිකයෝව, ජන්ම ස්නේහය නැත්තෝව, සමාදාන නොවන්නෝව, කේලාම් කියන්නෝව, තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව, කෲරයෝව, යහපතට ප්‍රේම නොකරන්නෝව, ද්‍රෝහියෝව, හිතුවක්-කාරයෝව, අහංකාරයෝව, දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේම කරන්නෝව, දේව භක්තියේ වේසය දරන නුමුත්, එහි බලය එපා කළ අයව සිටින්නෝය." (2 තිමෝති 3:1-5). "පසු කාලවලදී සමහරු මුළා කරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියනසේක." (1 තිමෝති 4:1). සාතන්ගේ ක්‍රියා කිරීම මෙයාකාර වන්නේය. "බොරු වූ සියලු ආකාර ආශ්චර්ය වලින්ද ලකුණු වලින්ද, පුදුම වලින්ද .... අධර්මිෂ්ඨකමේ සියලු රැවටීම් වලින්ද යුක්ත වේ." ගැළවෙන පිණිස සැබෑකමට ප්‍රේම වීම පිළිනොගත් සියලු දෙනාම විනිශ්චය කරනු ලබන පිණිස "බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියා කිරීමක් ඔවුන්ට එවන සේක." (2 තෙසලෝනික 2:9-12). මේ දේව අභක්තිකකම ඇතිවී දෙවියන්-වහන්සේව ප්‍රතික්ෂේප කිරීමේ තත්ත්වයට මිනිසුන් පැමිණි විට මුල් සියවස් වලදී උදාවූ ප්‍රතිඵලම ක්‍රියාත්මක වනවා නියතය.

ප්‍රොතැස්තන්ත සභාවන් අතර පවතින්නාවූ විවිධ ඇදහිලි විශ්වාසයන් නිසා මෙම නිකායන් සියල්ලම ඒකාකාරත්වයකට ගෙන ඊමට නුපුළුවනැයි බොහෝ අය කල්පනා කරති. නුමුත් ප්‍රොතැස්තන්ත ඇදහිලි ක්‍රමයේ ඒකත්වයක් වීම පිළිබඳව සභාවන්හි ප්‍රබලවූ ද, වර්ධනය වන්නාවූද, චින්තනයක් වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක වෙමින් පවතින බව සභා පාලකයෝ දනිති. එවන් සාමූහික එකඟතාවකට එළඹීමට නම් ඔවුන් සියලුදෙනාම එකඟත්වයකට නොපැමිණෙන සමහර දහම් කෙතරම් වැදගත් වුවත්, එම දහම් නොසලකා හැරීමට සිදුවේ.

ප්‍රොතැස්තන්ත සභාවන්හි දහම් ප්‍රචාරක දේව සේවය ගැන දහම් දෙසුමක් කළ චාර්ල්ස් බීචර් 1846 දී මෙසේ ප්‍රකාශයක් කළේය: "මිනිස් සිත් තුළ පවතින්නාවූ භීතිය පෙරදැරි කරගෙන මෙම නිකායන් පිහිටුවා ගන්නා ලද්දේ දැඩි පීඩනයන්ට මුහුණ දෙමින්ය. එහෙත් ඔවුන් දිවි ගෙවන්නේ, තැනින් තැන යන්නේ, ආශ්වාස කරන්නේ සම්පූර්ණ ලෙසින්ම ඉතා දූෂ්‍ය වූ වටාපිටාවක් තුළය. ඔවුන්ගේ

ශොභාව තුළ පිහිටි පහත් ධාතූන්ට ඔවුන් අයැදින්නේ සත්‍යතාව නිහඬකර දමන්නැයි ඉල්ලමින්ය, ධර්මයට පිටුපා ක්‍රියා කිරීමේ බලයට නමස්කාර කරමින්ය. මෙවන් ක්‍රියා මාලාවක් රෝමයේදී සිදුවූණා නොවේද? රෝමයේදී සිදුවූ දෙයම අප අතරත් අද සිදුවෙනවා නොවේද? අප ඉදිරියෙහි ඇත්තාවූ කුමක් අපගේ දසුනට හසුවේද? තවත් ආගමික විද්වතුන්ගේ සමුළුවක්ද? සකල ලෝකයම කිතුණු දහම පිළිගැනීමක්ද? පොදු දහම් එකඟතාවක් මගින් විශ්වීය ඇදහිලි ප්‍රකාශනයක්ද?" (Sermon on the Bible, a Sufficient Creed " delivered at Fort Wayne, Ind. Feb. 22, 1846). මෙම එකඟතා සම්මුතියක් දිනාගැනීමෙන් පසුව, සම්පූර්ණ ඒකීයතාවක් පවත්වා ගෙන යාම සඳහා බලය පාවිච්චි කිරීමට තවත් ඇත්තේ එක පියවරක් පමණකි.

අමෙරිකා එක්සත් ජනපදයේ සභාවන්ට පොදුවේ ඇත්තාවූ ධර්මයන් ගැන ඔවුන් එක්සත් වූ විට, ඔවුන් රාජ්‍ය බලයට ඔවුන්ගේ නීති පැනවීමටද ඔවුන්ගේ ආයතන ස්ථිර ලෙස පිහිටුවීමටද බලපෑමක් ඇතිකරනවා ඇත. එවිට ප්‍රොතැස්තන්ත අමෙරිකාව රෝම බලයට රූපයක් සෑදුවා වන්නේය. එවිට ඔවුන්ගේ ක්‍රියා පිළිවෙලට එකඟ නොවන්නන්ට දේශපාලනික දඬුවම් දීම ඒ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වෙනවා ඇත.

අං දෙකක් ඇති මෘගයා "ලොකු, කුඩා, පොහොසත්, දිළිඳු, දාස, නිර්දාස යන සියල්ලන්ට තමුන්ගේ දකුණතේ හෝ නළලේ හෝ සලකුණක් ලබන්ටත් ඒ සලකුණ ... හෝ උගේ නාමයේ ගණන හෝ ඇත්තාට මිස අන් කිසිවෙකුට මිලේට ගන්ටවත් විකුණන්ටවත් නුපුළුවන් වන හැටියටත් සලස්වන්නේය." (එළිදරව් 13:16,17) සකල ලෝ වැසියන්ට අනතුරු ඇඟවීමේ නිවේදනයක් නිකුත් කරන්නාවූ තුන්වන දූතයා මෙසේ ප්‍රකාශ කළේය: "යමෙක් මෘගයාටත් උගේ රූපයටත් නමස්කාරකර, ඔහුගේ නළලේවත් අතේවත් ලකුණක් ලබන්නේද, ඔහුත් දෙවියන්වහන්සේගේ කෝපය නැමති කුසලානට අමිශ්‍රව වත්කරන ලද උන්වහන්සේගේ උදහස නැමති මුද්‍රිකපානය බොන්නේය." (එළිදරව් 14:9,10) අං දෙකක් ඇති මෘගයා විසින් බලහත්කාර අන්දමින් නමස්කාර කිරීමට යොමු කරන්නාවූ මෙම පණිවිඩයෙහි සඳහන් මෘගයා වනාහි එළිදරව් 13 හි සඳහන් දිවියෙකු සමාන මෘගයාය. උගෙන් නියෝජනය වන්නේ පාප් බලඅධිකාරියයි. ස්වකීය ධර්මතාවන්ට අනුගත වීමට බල කරමින් සිවිල් බලය උපකාර කරගැනීමට ප්‍රොතැස්තන්ත නිකායන් ඉදිරිපත් වන විට ඔවුන් "මෘගයාට රූපයක් සාදති. මේ අතර "මෘගයාගේ ලකුණ" විස්තර කර දීමට තවදුරටත් අධ්‍යයනයෙහි යෙදීම අවශ්‍ය වේ.



මෘගයාටත්, උගේ රූපයටත් නමස්කාර කිරීමට එරෙහි වූ අනතුරු ඇඟවීමෙන් පසුව දිවැසි ප්‍රකාශනය මෙසේ කියයි: "මෙහි දෙවියන්-වහන්සේගේ ආඥාද යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලද රක්ෂා කරන්නාවූ ශුද්ධවන්තයන්ගේ ඉවසීම ඇත්තේය." දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින් යේසුස්වහන්සේට විශ්වාසීව සිටින්නාවූ ශුද්ධවන්තයන් පිළිබඳව මෙයින් විස්තර කෙරේ. කණ්ඩායම් දෙකක අනන්‍යතාව මෙහි සංසන්දනය කර තිබේ. දෙවියන්වහන්සේගේ ආඥා පවත්වමින් උන්වහන්සේට නමස්කාර කරන්නාවූ අය එක් පසෙකද මෘගයාට සහ උගේ රූපයට නමස්කාර කරන්නාවූ අය අනෙක් පසෙහිද සිටින සේ බෙදා වෙන් කිරීමක් ඉදිරිපත් කර තිබේ. මෙයින් ගම්‍ය වන්නේ ආඥා පැවැත්වීම සහ එම ආඥා කඩ කිරීම අනුව මේ කොටස් දෙක වෙන් කරනු ලබන බවය.

මෘගයාද උගේ රූපයද සතු කැපී පෙනෙන ගති ගුණය සහ ක්‍රියාකාරී ලක්ෂණය වන්නේ දෙවියන්වහන්සේගේ ආඥා කඩකිරීමය. කුඩා අඟින් පෙන්නුම් කළ පාප් අධිකාරී බලය ගැන දානියෙල් මෙසේ පවසයි: "ඔහු කාලවල්ද, ව්‍යවස්ථාවද වෙනස් කරන්ට සිතන්නේය" (දානියෙල් 7: 25). පාවුල් මෙම පුද්ගලයා "නොපනත්කමේ මිනිසා" ලෙස හඳුන්වා දී තිබේ. ඔහු දෙවියන්වහන්සේට ඉහළින් තමාව උසස් කරගනියි. එක අනාවැකියක් අනෙක් අනාවැකි ප්‍රකාශයෙහි ඌන පූර්ණයක් ලෙස සඳහන් කළ හැකිය. දෙවියන්වහන්සේගේ ආඥා වෙනස් කිරීමෙන් පමණක් පාප් බලඅධිකාරියට තමා දෙවියන්වහන්සේට වඩා උසස් වූවා සේ පෙන්විය හැකිය. යමෙක් යම්කිසි බලවේගයක් විසින් වෙනස් කරන ලද එම ආඥා පිළිගනිමින් ඒවාට අනුගත වන්නේ නම් එකී තැනැත්තා ඇත්ත වශයෙන්ම ගෞරවය පුදන්නේ වෙනස් කළ ආඥාවන්ගේ නිර්මාතෘ බල අධිකාරියටය. පාප් බල අධිකාරි ආගමික නායකයන් විසින් වෙනස් කළ ආඥාවන්ට කීකරුකම දක්වීම වනාහි දෙවියන්වහන්සේට හිමි විය යුතු ස්ථානය පාප්ට පිරිනැමීමය.

පාප් බල අධිකාරිය විසින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් වෙනස් කිරීමට උත්සාහ කර තිබේ. දශපනතෙහි, රූප සහ පිළිම (සුරුවම්) වැඳීම තහනම් කරන්නාවූ දෙවන ආඥාව සැබෑ දසපනතින් ඉවත් කර තිබේ. එසේම හතරවන ආඥාවද එම බලඅධිකාරිය විසින් වෙනස් කර ඇත. එනම් සබත සත්වන දවසේ නොව පළමු වන දවසේ පැවැත්වීමට බලය ලබා දී ඇත. දෙවන ආඥාව ඉවත් කිරීම පිළිබඳව ඔවුන් ඉදිරිපත් කර තිබෙන තර්කය නම්, නමස්කාර කිරීම පිළිබඳව වූ නියමය පළමු ආඥාවෙහි අන්තර්ගත නිසා නැවත වරක් එයට අවධාරණය කිරීමේ අවශ්‍යතාවක් නැති බවය. එය වෙනස් කිරීම මගින් ඔවුන් බැතිමතුන්ට අවස්ථාව සලසා දෙන්නේ දෙවියන්-වහන්සේ අදහස් කළ ආකාරයට දසපනත දර්ශනය කිරීමට යයි

ඔව්හු පවසති. ඒ නිසා මෙම ක්‍රමවේදය මගින් ආඥා වෙනස් කිරීමක් සිදුකර නැතැයි ඔවුහු තර්ක කරති. එම නිසා දිව්‍යසිවරයා ප්‍රකාශ කළ ව්‍යවස්ථාව වෙනස් කිරීමට දෙවන ආඥාව ඉවත් කිරීම අදාළ කරගත නොහැකි යයි ඔව්හු දක්වති. අනාවැකියෙහි ප්‍රකාශ වන්නේ හිතාමතාම ඕනෑකමින්ම කරන්නාවූ වෙනස් කිරීමක් ගැනය. "ඔහු කාලවල්ද, ව්‍යවස්ථාවද වෙනස් කරන්ට සිතන්නේය." අනාවැකියෙහි අවධාරණය කර ඇති ආකාරයට හතරවන ආඥාවට කර ඇති වෙනස් කිරීම් මගින් මේ ප්‍රකාශනය අකුරටම ඉටුවී ඇත. මෙම වෙනස් කිරීමට ඇති අයිතිය සභාව සතුව ඇතැයි රෝමානු කතෝලික සභාව ප්‍රකාශ කර සිටින්නීය. මෙහිදී පාප් බලඅධිකාරිය විවෘත ලෙස දෙවියන්වහන්සේගේ බල ආධිපත්‍යයට වඩා ඉහළින් වැජඹීමට තැත් කර තිබේ.

දෙවියන්වහන්සේට නමස්කාර කරන්නාවූ අය අනිවාර්යයෙන්ම හතරවන ආඥාවට අවනත වෙමින් සත්වන දිනය ශුද්ධ කොට පැවැත්වීමෙන් හඳුනාගනු ලැබේ. කුමක්හෙයින්ද මෙම දවස උන්වහන්සේගේ මැවීමේ කර්තව්‍යයෙහි බලය පෙන්නුම් කරන්නාවූ සලකුණකි. මෙම සිද්ධාන්තය මත උන්වහන්සේ මිනිසාගේ නමස්කාරයටත් ගෞරවයටත් අයිතිවාසිකම දක්වන සේක. දෙවියන්වහන්සේගේ මැවීමේ ස්මාරකය කඩා බිඳ දැමීමට දරන්නාවූ උත්සාහය මගින් මෘගයාට නමස්කාරය පුදන්නාවූ අයව හඳුනාගත හැකිය. ඔවුහු රෝමයේ අණසක දෙවියන්වහන්සේට වඩා ඉහළින් පුද පූජාවට පාත්‍ර කරති. ඉරිදා නමස්කාරය ගැන පාප්වාදීහූ තමන්ගේ අහංකාර දැඩි අයිතිවාසිකම් ඉදිරිපත් කළහ. ඔවුහු "ස්වාමින්වහන්සේගේ දවස" ලෙස ඉරිදා දවස පවත්වන්නැයි ජනතාවට නීතියෙන් බලකිරීමට රාජ්‍ය බලය යොදා ගැනීමට ක්‍රියා කළෝය. නමුත් ස්වාමින්වහන්සේගේ දවස ලෙස ශුද්ධ බයිබලයෙන් පෙන්නුම් කරන්නේ සතියේ සත්වන දවස මිස සතියේ පළමුවන දවස නොවන්නේය. "මනුෂ්‍යපුත්‍රයා සබත් දවසේ පවා ස්වාමියා"යි ක්‍රිස්තු සමිඳාණෝ පැවැසූ සේක. "සත්වෙනි දවස නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට පවත්වන සබතක්ය" යි හතරවන ආඥාව පවසයි. යෙසායා දිව්‍යසි ප්‍රසාදීන් මගින් දෙවි සමිඳාණෝ සබත් දවස පිළිබඳව ප්‍රකාශ කරන්නේ "මාගේ ශුද්ධ දවස" කියාය. (මාර්ක් 2:28; යෙසායා 58:13).

ක්‍රිස්තු සමිඳාණන් සබත වෙනස් කළසේකැයි ඉදිරිපත් කරන්නාවූ තර්කය උන්වහන්සේම සිය ප්‍රකාශය මගින් බිඳ දමා ඇත. කන්ද උඩදී කළ දේශනාවෙන් උන්වහන්සේ මෙසේ වදාළ සේක: "ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගු කරන පිණිස මම ආවෙමියි නොසිතන්න. සම්පූර්ණ කරන්ට මිස අවලංගු කරන්ට නාවෙමි. සැබවක් නුඹලාට කියමි: අහසත් පොළොවත් පහව යනතෙක්, සියල්ල සිදුවන



තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. එබැවින් මේ ආඥාවලින් ඉතා සුළු එකක්වත් කඩකරන්නාවූ, කඩකරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නුමුත් ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු යයි කියනු ලබන්නේය. නුමුත් ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නුමුත් ස්වර්ග රාජ්‍යයෙහි උතුම් යයි කියනු ලබන්නේය." (මතෙව් 5:17-19).

ප්‍රොතැස්තන්ත කිතුණුවන් පොදුවේ පිළිගන්නාවූ සිද්ධාන්තයක් වන්නේ සබත වෙනස් කිරීමට ශුද්ධ ලියවිල්ලෙහි කිසිම අවසරයක් ලබා දී නැති බවය. අමෙරිකානු සදහම් පත්‍රිකා ප්‍රචාරක සංගමය විසින් නිකුත් කරන ලද්දාවූ පත්‍රිකා මගින් මෙන්ම අමෙරිකානු හිරු දින දහම් පාසැල් ප්‍රකාශන මගින්ද මේ බව පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබේ. ඔවුන්ගේ එක්තරා ප්‍රකාශනයක මෙසේ සඳහන් වේ: "සතියේ පළමුවන දින වන ඉරිදා සබත වශයෙන් පැවැත්වීම පිළිබඳව ශුද්ධ ලියවිල්ල නිහඬය. ඒ පිළිබඳව නිශ්චිත නීති රීතිද කිසිවක් ශුද්ධ ලියවිල්ලෙහි අන්තර්ගත නොවේ." (Elliott, George, "The Abiding Sabbath," p. 184).

තවත් ප්‍රකාශනයක මෙසේ පවසා ඇත: "ක්‍රිස්තුස්වහන්සේගේ අපවත්වීමේ දවස දක්වා (සබත්) දවසෙහි වෙනස් කිරීමක් සිදුවූ බවට සාක්ෂි කිසිවක් නැත. ඔවුහු (අපෝස්තුළුවරු) එවැන්නක් කළ බවක්ද වාර්තාවන්හි සඳහන් නොවේ. සත්වන දින වූ සබත අත්හැර දමූ බවට ඔවුන් විසින් කිසිම අනඥවක් නිකුත් කර ඇති බවක් හෝ සතියේ පළමුවන දින ශුද්ධ ලෙස පැවැත්විය යුතු යයි කියා විධාන කළ බවට කිසිම වාර්තාගත සාක්ෂියක් නැත." (Waffie, A. E., "The Lord's Day," p. 186, 187).

තම සභාව විසින් සබත් දවස වෙනස් කළ බව රෝමානු කතෝලික සභාව පිළිගනී. එම දවස (ඉරිදා) පැවැත්වීමෙන් ප්‍රොතැස්තන්ත සභාවන් රෝම සභාවෙහි බලය පිළිගන්නා බව ඔව්හු පවසති. "ක්‍රිස්තියානි ආගමේ කතෝලික ප්‍රශ්නෝත්තර පාඨයෙහි (කතිකිස්මයෙහි) මෙවන් ප්‍රශ්නයක් අඩංගු වී ඇත. "සතරවන ආඥාවට අනුකූලව සබත් දින පැවැත්විය යුත්තේ කවදාද?" ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එහි මෙසේ සඳහන් වේ. "පැරණි නීතිය පැවැති යුගයේදී ශුද්ධ භාවයට පත්කරනු ලැබූ දවස සෙනසුරාදාය. එසේ වූ නමුත් යේසුස්වහන්සේ විසින් කරනු ලැබූ අනුශාසනා මෙන්ම දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීමද මත පදනම්ව සභාව විසින් සෙනසුරාදා වෙනුවට ඉරිදා ආදේශ කරන ලදී. ඒ නිසා දැන් අපි සතියේ පළමුවන දිනය ශුද්ධ කොට පවත්වන්නෙමු. සෙනසුරාදා තවදුරටත් ශුද්ධවූ දවස නොවන්නේය. දැන් ඉරිදා ස්වාමින්වහන්සේගේ දවසය."

කතෝලික සභාව සතු බල අධිකාරීත්වයෙහි සලකුණක් ලෙස පාප් සමයවාදී ලේඛකයෝ මෙවන් අදහස් දක්වති: සබත ඉරිදා දවසට මාරු කිරීම රෝමානු කතෝලික සභාව විසින් සිදුකරන ලද්දකි. ප්‍රොතැස්තන්ත සභාවන් විසින්ද ඉරිදා සබත පැවැත්වීමෙන් කතෝලික සභාවේ අධිකාරී බලය පිළිගනිති. එසේම මංගල්‍ය දවස් නියම කිරීමද සභාව සතු අයිතියක් බව ඔව්හු එමගින් දක්වති. අප සභා පිළිවෙත් අනුගමනය නොකරන්නාවූ තැනැත්තන් පව්කාරයන් ලෙස නියම කිරීමද රෝමානු සභාව සතු අයිතියක් බව ඔව්හු පවසති. (Tuber ville, H. "An Abridement of the Christion Doctrine" p. 58). එසේ නම් ශුද්ධවූ සබත් දවස වෙනස් කිරීම යනු කුමක්ද? එය වනාහි රෝමානු කතෝලික සභාවේ බල අධිකාරියෙහි ලකුණ හෙවත් ලාංඡනය වන්නේය. එය "මෘගයාගේ ලකුණ" වන්නේය.

රෝමානු කතෝලික සභාව තමා සතුව ඇතැයි පවසන ආධිපත්‍යය කිසිසේත් අත්හැර දමා නැත. ඔවුන්ගේ නිර්මාණයක් වන ව්‍යාජ සබත ලෝක ජනතාව මෙන්ම ප්‍රොතැස්තන්ත සභාවන්ද පිළිගෙන බයිබලීය සබත ප්‍රතික්ෂේප කරන විට ඔව්හු ඇයගේ අයිතිවාසිකම පිළිගන්නා බවට සාක්ෂි දරති. එම වෙනස් කිරීමේ අයිතිය ඔවුන් සම්ප්‍රදායන්ට මෙන්ම සභාවේ පියවරුන්ටද යොමු කරන්නට පුළුවන. එහෙත් එසේ කිරීමෙන් ඔවුහු තමන්ගේ උත්තරීතර ප්‍රඥප්තියක් පාවා දෙති. ප්‍රොතැස්තන්ත බැතිමතුන් රෝම සභාවෙන් ඉවත් වීමේදී පිරිසිදු චේතනාවන්ගෙන් යුතුව "බයිබලය සහ බයිබලය පමණක්" ඔවුන්ගේ ආගමෙහි එකම පදනම වන්නේය යන සිද්ධාන්තය මත නැගී සිටියෝය. සබත් විෂය සම්බන්ධයෙන් ප්‍රොතැස්තන්ත බැතිමතුන් තමන්වම රවටා ගනිමින් මෙම විෂය සම්බන්ධව සත්‍යයවූ කරුණු වලට කැමැත්තෙන්ම ඇස් වසාගෙන ක්‍රියා කරන බව පාප් අනුගාමිකයන්ට දර්ශනය කළ හැකිය. ඉරිදා නමස්කාරය කෙරෙහි වැඩි ජනතාවක් ප්‍රසන්නතාව දක්වීම පිළිබඳව පාප් බලය සතුටින් සතුටට පත්වේ. වැඩි කලක් ගතවීමට පෙර මුළු මහත් ප්‍රොතැස්තන්ත ලෝකයම රෝමයේ ධජය යටතට පත්වන බවට ඇති ඔහුගේ විශ්වාසය ප්‍රගුණ වීමට පටන් ගනී.

"ප්‍රොතැස්තන්ත නිකායන් ඉරිදා නමස්කාරය පිළිගැනීම (කතෝලික) සභාවේ ආධිපත්‍යය පිළිගෙන එයට ගෞරවය දක්වීමකැයි" රෝමානුවෝ ප්‍රකාශ කරති. (Plain Talk about Protestanism," p. 213). ප්‍රොතැස්තන්ත සභාවන් විසින් ඉරිදා නමස්කාරය "නිත්‍යානුකූල කිරීම" යනු පාප් අධිකාරියට නමස්කාර කිරීම නිත්‍යානුකූල කිරීමකි. එය වනාහි මෘගයාට නමස්කාර කිරීමකි. සතරවන ආඥාව ඉදිරිපත් කර ඇති අයිතිවාසිකම ගැන මනා අවබෝධයක් ඇතිව සිටින අය සත්‍ය



සබත වෙනුවට ව්‍යාජ දවසක් නමස්කාර කිරීමට තෝරා ගැනීම එම ව්‍යාජ දවස ඉදිරිපත් කළ බලවේගයට නමස්කාර කිරීමක් වන්නේය. රාජ්‍ය බලයක් විසින් ආගමික යුතුකම් ඉටුකරන්නැයි අණසක පැනවීම වනාහි එම සභාවන් විසින් මෘගයාට රූපයක් නිර්මාණය කරගැනීමක් වන්නේය. එම නිසා එක්සත් ජනපදයේ ඉරිදා ආගමික නමස්කාර දිනය ලෙස රාජ්‍ය පරිපාලන තන්ත්‍රය විසින් නීති පැනවීම වූකලී මෘගයාට සහ උගේ රූපයට නමස්කාර කිරීමකි.

පෙර පරම්පරාවන්හි දිවි ගෙවූ කිතුණුවෝ ඉරිදා ශුද්ධ දවස යයි සිතා ඒ දවසේ නමස්කාර කළෝය. එදින වූකලී නියම බයිබලීය සබත යයි ඔවුහු විශ්වාස කළෝය. එසේම වත්මන්හිදීද සෑම සභාවකම සමහර ක්‍රිස්තු භක්තිකයෝ හා සමහර රෝමානු කතෝලික භක්තිකයෝ පවා දිව්‍ය අනුමැතිය අනුව සබත් දවස ඉරිදා යයි අවංකවම විශ්වාස කරති. දෙවියන්වහන්සේ ඔවුන්ගේ අරමුණෙහි අවංක භාවයද උන්වහන්සේට දක්වන ගෞරවයද පිළිගන්නා සේක. එහෙත් ඉරිදා ගරු කටයුතු ලෙස පැවැත්වීමට නීතියෙන් නියම කරනු ලැබ සත්‍ය සබත පිළිබඳව ලෝක වාසීන් දැනුවත් කිරීමක් සිදුවූ විටෙකදී දෙවියන්වහන්සේගේ ආඥා කඩකරමින් රෝම බල අධිකාරීත්වය යටතේ නිර්දේශ කරනු ලැබූ ව්‍යාජ සබත් දවසට ගෞරවය දක්වන්නාවූ කවරෙක් නමුත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි වරදකාරයෙකු වන්නේය. එමගින් ඔවුන් දෙවියන්වහන්සේට වඩා ඉහළින් පාප් බලවේගයට ගෞරවය දක්වනවා වෙයි. ඔවුහු රෝමයට ගරු බුහුමන් දක්වමින් ඉරු දින නමස්කාරය එළි දක්වූ රෝමයට ප්‍රණාමය පුද කරන්නන් වෙති. එසේ කිරීමෙන් ඔව්හු මෘගයාටත් උගේ රූපයටත් නමස්කාර කරති. තමන්වහන්සේගේ පරමාධිපත්‍යය පෙන්නුම් කරන ලකුණක් ලෙස සබත පිහිටවූ දෙවියන්වහන්සේ එම දවස නමස්කාරය සඳහා වෙන් කළසේක. මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේගේ සබත ප්‍රතික්ෂේප කරමින් රෝමයේ ආධිපත්‍යය පෙන්නුම් කරන්නාවූ ඉරුදින, නමස්කාරය සඳහා යොදා ගන්නේ නම් ඔහු රෝමයට පක්ෂපාතීත්වය දක්වන්නේය. ඔහු මෘගයාට හා උගේ රූපයට නමස්කාර කරන්නේය. දෙවියන්-වහන්සේ තමන්වහන්සේගේ ආධිපත්‍යයේ සලකුණක් වශයෙන් දී තිබෙන සබත් දවස එපා කරමින් රෝමය තමාගේ ආධිපත්‍යයේ සලකුණක් වශයෙන් දෙන දෙය පිළිගන්නා අතර ඔව්හු රෝමයට, මෘගයාගේ ලකුණට පක්ෂපාතකම දක්වති. මෙම විෂය පිළිබඳව කරුණු සරල ලෙස මනුෂ්‍යයා ඉදිරියෙහි තබා ඔහු තෝරා ගන්නේ දෙවියන්වහන්සේගේ ආඥාද නැතහොත් මිනිසාගේ ආඥාද කියා තීරණයක් ගැනීමට ඉඩ සලසා දෙනු ලබන්නේය. එවන් තත්ත්වයක් යටතේ දෙවියන්වහන්සේගේ ආඥා කඩකරන්නාවූ කවරෙක් වුවද "මෘගයාගේ ලකුණ" ලබන්නේය.

මිනිස් වර්ගයාට විරුද්ධව එල්ල කර ඇත්තාවූ ඉතා දරුණු තර්ජනය තුන්වන දේව දූතයාගේ පණිවිඩයෙහි අන්තර්ගතව ඇත. මෙවන් තර්ජනයක් මින් පෙර කිසිම දවසක හෝ මිනිසාට එල්ල වී නැත. මෛත්‍රී කරුණාව බිඳක් හෝ මුසු නොවූ දේව උදහසේ භීෂණත්වය වගුරුවනු ලැබීමට නම් මෙම පාපය ඉතා දරුණු එකක්ම විය යුතුය. අති මහත් වැදගත්කමකින් යුක්ත මෙම විෂය සම්බන්ධව මිනිසාව අඳුරේ තබා නැත. දෙවියන්වහන්සේගේ විනිශ්චයන් ලෝ වාසීන් වෙත පතිත කිරීමට පෙර මෙම පාපය ගැන අනතුරු ඇඟවීමක් සැමටම ලබාදෙනු ලැබිය යුතුය. තුන්වන දේව දූතයාගේ පණිවිඩය ලෝ පුරා දැනුම් දිය යුතුය. එසේ සිදුවන බවට සහතිකයක් ලබාදී ඇත. තමන් මත එම උදහසේ විපාක පතිත වන්නේ ඇයි දැයි මිනිසා දැනගත යුතුය. එයින් මිදීමට ඔහුට අවස්ථාවක් ලබාදෙනු ලබනවා ඇත. පොළොවේ වසන්නන්ටත්, සියලු ජාතීන්ටත් ගෝත්‍රයන්ටත් භාෂාවන්ටත් සෙනඟටත් පළමුවන දූතයාගේ පණිවිඩය ප්‍රකාශයට පත්විය යුතුයයි අනාවැකිය කියා පායි. එම දූතයන් තිදෙනාගේ පණිවිඩයේම කොටසක් වන තුන්වන දූතයාගේ පණිවිඩයද එසේම සකල ලෝවාසීන්ට ලබාදිය යුතුය. එම පණිවිඩය අහස මැද පියාසර කරන දේව දූතයෙක් විසින් මහත් හඬකින් ප්‍රකාශ කරන බව අනාවැකිය පවසයි. ලෝ වාසී සැමගේ අවධානය ඒ පණිවිඩය වෙත යොමු කරගැනීමක් මෙයින් ගම්‍ය වන්නේය.

සබත පිළිබඳ විෂය ධාරාවේ තරඟයේදී මුළු කිතුණු ජනතාවම පිල් දෙකකට බෙදා වෙන් කරනු ලැබේ. එක් පාර්ශ්වයක් දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂා කරන්නාවූ, යේසුස්වහන්සේගේ ඇදහිල්ල කෙරෙහි විශ්වාසය රඳවන්නාවූ අයගෙන් සැදී ඇත. අනෙක් පාර්ශ්වයේ අය මෘගයාට නමස්කාර කරමින් උගේ ලකුණ ලබාගන්නවුන්ගෙන් සමන්විතය. "ලොකු, කුඩා, පොහොසත්, දිළිඳ, දාස, නිර්දාස," යන සියල්ලන්ට තමුන්ගේ දකුණතේ හෝ නළලේ හෝ මෘගයාගේ සලකුණක් ලබන්ට සභාව සහ රාජ්‍ය බලය ඒකාබද්ධව අණ කරනවා ඇත. එසේ වුවද දෙවියන්වහන්සේගේ සෙනඟ එම ලකුණ ලබා නොගනිති. පත්මොස්හි සිටි දිවැසිවරයා මෙම ජන සමූහයා මෙසේ දර්ශනය කළේය: "ගින්නෙන් මිශ්‍රවූ වීදුරු සාගරයක් වැනි දෙයක් සහ මෘගයාගෙනුත් උගේ රූපයෙනුත් උගේ නමේ ගණනෙනුත් ජයගෙන එන්නන් දෙවියන්වහන්සේගේ වීණා රැගෙන වීදුරු සාගරය ළඟ සිටිනවාත් මම දුටිමි. ඔව්හු දෙවියන්වහන්සේගේ මෙහෙකරුවාවූ මෝසෙස්ගේ ගීතිකාවද බැටළු පැටවාණන්ගේ ගීතිකාවද ගායනා කරමින් ...." සිටි බව ඔහු පවසයි. (එළිදරව් 15:2,3).



# 26

# ප්‍රතිසංස්කරණ ක්‍රියාවේදයක්

සබත ශුද්ධව පැවැත්වීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීමක් ලොව අවසන් කාලයේදී සිදුවන බව යෙසායාගේ අනාවැකියෙහි පවසා ඇත. ඒ මෙසේය: "ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක: නුඹලා යුක්තිය පවත්වා ධර්මිෂ්ඨකම් කරන්න. මක්නිසාද මාගේ ගැළවීම පැමිණෙන්ටත් මාගේ ධර්මිෂ්ඨකම එළිදරව් වෙන්ටත් ළඟය. මෙය කරන මනුෂ්‍යයාද මෙය අල්ලාගන සිටිමින්, සබත් දවස කඩ නොකර එය පවත්වන්නාවූ, කිසි නපුරක් නොකරන ලෙස තමාගේ අත වළක්වා ගන්නාවූ මනුෂ්‍ය පුත්‍රයාද වාසනාවන්තය." "ස්වාමින්වහන්සේට මෙහෙකරන්ටත්, උන්වහන්සේගේ නාමයට ප්‍රේම කරන්ටත්, උන්වහන්සේගේ සේවකයන්ව සිටින්ටත් ස්වාමින්වහන්සේට එකතු වන්නාවූ, සබත් දවස කඩ නොකර ඒක රක්ෂා කරන්නාවූ, මාගේ ගිවිසුම ස්ථිර ලෙස පවත්වන්නාවූ විදේශීන්ද, මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ඔවුන් ප්‍රීතිවන්ට සලස්වන්නෙමි." (යෙසායා 56:1,2,6,7).

මෙම වදන් අදාළ වන්නේ ක්‍රිස්තියානි යුගයට බව යෙසායා දිවැසිවරයා මෙසේ පවසා ඇත. "පිට කරනු ලැබූ ඊශ්‍රායෙල්වරුන් එකතු කරන ස්වාමිවූ දෙවියන්වහන්සේ: ඔවුන් වෙතට එකතු වී සිටින්නන් හැර මම තවත් අය ඔවුන්ට එකතු කර දෙන්නෙමියි කියන සේක." (යෙසායා 56:8). ශුභාරංචිය කරණකොටගෙන අන්‍යජාතිකයන් සභා රැළට එකතු වීම පිළිබඳ අනාගත දැක්මක් එහි සඳහන්ව ඇත්තේය. ඔවුන් අතරෙහි සිටින්නාවූ සබතට ගරු කරන්නාවූ අයට ආශිර්වාද දානය කරනු ලබනවා ඇත. ඒ අනුව සතරවන ආඥාවට අනුගතවීම, ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිපත් වීම, උත්ථානය සහ ස්වර්ගාරෝහණය පසු කරමින් අනාගතය පුරා විහිදී යන්නේය. මේ සුපුවත් පණිවිඩය ලෝ පුරා දේශනා කරනු ලබන තෙක් දේව සේවකයන් මෙම සබත අඩංගු පණිවිඩය ප්‍රචාරය කිරීම අනිවාර්ය වන්නේය.

එම දිවැසිවරයා තුළින්ම ස්වාමින්වහන්සේ මෙසේද පවසන සේක. "නුඹ සාක්ෂිය බැඳ, ව්‍යවස්ථාව මුද්‍රා කර, මාගේ ගෝලයන් අතරේ තබන්න." (යෙසායා 8:16). දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ මුද්‍රාව සතර වන ආඥාවේ අන්තර්ගතය. පනත් දසය අතරෙන් මෙම පනතෙහි පමණක් නීති සම්පාදකයාණන්ගේ ශ්‍රී නාමය සහ තනතුර අඩංගුව ඇත්තේය. උන්වහන්සේ අහසත්, පොළොවත් මැවූ තැනැන්වහන්සේ

බව එහි දක්වා ඇත. එම සිද්ධාන්තය මුල් කරගෙන, අනෙකුත් සියලුම අයට වඩා ඉහළින් උන්වහන්සේට ගෞරවය සහ නමස්කාරය හිමි විය යුතු බව උන්වහන්සේ දක්වනසේක. මෙම මූලාශ්‍රය හැරෙන්නට මෙම දස පනත දෙවා වදාරන්නේ කවරෙකුගේ බල අධිකාරිය යටතේ දැයි හඳුන්වා දෙන වෙනත් සටහනක් නැත. පාප් බල අධිකාරිය විසින් සබත වෙනස් කරනු ලැබූ කල්හි එහි බලය අඩංගු මුද්‍රාව ඉවත් කරනු ලැබිණි. එම බලය අඩංගු මුද්‍රාව නැවතත් එම ආඥාවට ඇතුළු කරන්නැයි යේසුස්වහන්සේගේ ගෝලයන්ට විධාන කරනු ලැබ ඇත. උන්වහන්සේගේ බල ආධිපත්‍යයේ සලකුණත් මැවීමේ ස්මාරකයත් ලෙස සතරවන ආඥාව එහි නියමිත ස්ථානයට නැවත පිහිටුවා ලන්නට යේසුස්වහන්සේගේ ගෝලයෝ බැඳී සිටිති.

"ව්‍යවස්ථාවද සාක්ෂියද වෙතට යමු!" විවිධ මතවාදී ගැටුම් සහිත දහම් සහ සිද්ධාන්ත ඉදිරිපත් වීමට සෑම කල්හිම හැකියාව ඇත. ඒ අතර සෑම මනඃකල්පිතයක්ම, දහමක්ම, සිද්ධාන්තයක්ම උරගා තීරණය කරගත හැකි ප්‍රමිතිය නම්, කිසි කලෙක වෙනස් නොවන සුළු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පමණකි. දිවැසිවරයා මෙසේ පවසයි "ඒ වචනයේ හැටියට ඔවුන් නොකීවොත් ඔවුන්ට පහන් වීමක් නැත." (යෙසායා 8:20).

නියෝගය නැවත වරක් මෙසේ නිකුත් වේ. "නොනැවතී හයියෙන් මොර ගසා, හොරණෑවක් මෙන් නුඹේ හඬ නඟා, මාගේ සෙනඟට ඔවුන්ගේ වරදවල්ද, යාකොබ්ගේ වංශයට ඔවුන්ගේ පව්ද දන්වන්න." "මාගේ සෙනඟ" යනුවෙන් දෙවියන්වහන්සේ හඳුන්වන්නේ අදමිටු ලෝකයා නොව ඉශ්‍රායෙල් ජාතියයි. පාප සහ වරද ගැන තරවටුවට යොමු වන්නේ උන්වහන්සේම තෝරාගත් ජනතාවමය. "ඔව්හු දවස්පතා මා සොයති; මාගේ මාර්ගයන් දැනගන්ට ප්‍රසන්න වෙති. ධර්මිෂ්ඨකම් කොට තමුන්ගේ දෙවියන්වහන්සේගේ නියෝගය අත්හැර සිටින ජාතියක් මෙන් ඔව්හු ධර්මිෂ්ඨ නියෝග මාගෙන් ඉල්ලති"යි දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන සේක. (යෙසායා 58:1,2) තමන් දැහැමි අය යයිද දෙවියන්වහන්සේගේ සේවයෙහි යෙදෙන්නන් යයිද කියන්නාවූ බැතිමතුන් කොටසක් කෙරෙහි අවධානයක් මෙහි යොදවා ඇත. එහෙත් හදවතේ අභ්‍යන්තරය විමසා බලන්නාවූ තැනැන්වහන්සේ ඔවුන් පිළිබඳව දරන්නේ වෙනත් ආකල්පයකි. ඔවුහු දිව්‍ය ආඥාවන් පාගා දමමින් ක්‍රියාකිරීම ගැන උන්වහන්සේ ඔවුන්ට දැඩි ලෙස චෝදනා කරන සේක.

අත්හැර දමා ඇත්තේ කිනම් ආඥාව දැයි දිවැසිවරයා පෙන්වා දෙයි. "නුඹෙන් පැවතඑන්නෝ පරණ නටබුන් තැන් ගොඩ නඟන්නෝය. නුඹ බොහෝ පරම්පරාවල අත්තිවාරම් ගොඩ නඟන්නෙහිය; කැඩුම් හරිගස්සන්නාය, වාසය පිණිස මාවත් අළුත්වැඩියා කරන්නා යයි



නුඹට කියනු ලැබේ. නුඹ මාගේ ශුද්ධ දවසේදී නුඹේම කැමැත්ත නොකරන හැටියට නුඹේ පාද සබත් දවසේදී නවත්වාගන, සබත් දවස ප්‍රිය එකක්ය කියාද ස්වාමින්වහන්සේගේ ශුද්ධ දවස ගෞරවණීය එකක්ය කියාද කියන්නෙහි නම්, නුඹේම මාර්ගවල නොහැසිර නුඹේම කැමැත්ත නොසොයා හිස් වචන කථා නොකර, ඊට ගෞරව කරන්නෙහි නම් නුඹ ස්වාමින්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත්වන්නෙහිය." (යෙසායා 58:12,13). මෙම අනාවැකිය අපගේ දවස්වලටද, එකසේ බලපාන්නේය, එදාට මෙන්ම අදටද අදාළය. රෝම බල අධිකාරිය විසින් දෙවියන්-වහන්සේගේ දස පනතෙහි සබත් ආඥාව වෙනස් කිරීම නිසා බිඳීමක් ඇති විය. නමුත් එම දිව්‍ය නියමය, සබත් පැවැත්වීම, නියම ප්‍රමිතිය කරා ගෙන යාමට කාලය පැමිණ ඇත. මෙම බිඳ වැටීම අළුත් වැඩියා කළ යුතුය. බොහෝ පරම්පරාවන්හි අත්තිවාරම නැවත නඟා සිටුවීම අත්‍යාවශ්‍යය.

මැවුම්කාරයාණන්ගේ නිවාඩු ගැනීමත් සමගම, ආශිර්වාද කර ශුද්ධ දවසක් බවට තීන්දු කරනු ලැබූ සබත ඒදන් උයනෙහිදී අහිංසක තත්ත්වයේ සිටි ආදම් විසින් ශුද්ධ කොට පවත්වන ලදී. ආදම් පාපයට වැටී පසුතැවිලි වී කමා කරනු ලැබූවාට පසුවද ඔහු සබත ගෞරවණීය ලෙස පැවැත්වීය. ආදි පියවරු සැවොම සබත පැවැත් වූවෝය. ආබෙල්ගේ දවස පටන් දමිටු නෝවාගේ දවස දක්වාද, ආබ්‍රහම්ගේ දවස සිට යාකොබ්ගේ දවස දක්වාද ආදි පියවරු සබත නිසියාකාරව පැවැත්වූහ. දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟ මිසර දේශයෙහි වහළුන් බවට පත්වූ විට ඔවුන්ගේ වටපිටාවේ පැවති බලපෑම් නිසා බොහෝ අයගේ චින්තනයෙන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඇකී මැකී ගියේය. එහෙත් තමන් ජනතාවගේ අයැදුම් මධ්‍යයේ දෙවියන්වහන්සේ ඔවුන්ව වහල් බැමි වලින් මුදාගෙන පොරොන්දු දේශය කරා ගෙන ගියසේක. ඔවුන් සීනයි කඳු පෙදෙසෙහි කඳවුරු බැඳ සිටියදී උන්වහන්සේ ස්වකීය ව්‍යවස්ථාව මහත් ගාම්භීරයෙන් සහ තේජසින් යුතුව රැස්ව සිටි සැවොම ඉදිරියෙහි ප්‍රකාශයට පත් කළසේක. රැස්ව සිටි ජනතාව දෙවියන්වහන්සේගේ චින්තනය දැන හැඳින ගෙන උන්වහන්සේ ඉදිරියෙහි ගෞරවය මුසු බියෙන් යුතුව හැසිරෙමින් උන්වහන්සේට සදහටම කීකරුවීම උන්වහන්සේ අපේක්ෂා කළසේක.

එදින පටන් අද දක්වාම දෙවියන්වහන්සේගේ ආඥා කෙටුම්පත් ව්‍යවස්ථාව පිළිබඳ දැනුමක් මනුෂ්‍යයා තුළ පවතින්නේය. එසේම හතර වෙනි ආඥාවට අනුගතව සබත් දවස පැවැත්වීම අඛණ්ඩව දියත පුරා සිදු විය. දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ දවස පයින් පාගා දැමීමට "නොපනත්කමේ මනුෂ්‍යයා" සාර්ථක ලෙස ක්‍රියාත්මක වුවද, විශ්වාසවන්ත බැතිමත්හු රහසේ සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වූහ. දෙවියන්වහන්සේගේ ශුද්ධවූ දවසට විරුද්ධව මහා කැරැල්ලක් මෙහෙය

වූ විනාශයේ පුත්‍රයා අධිපතිකම් දරූ කාලයේදී පවා සබත ශුද්ධ කොට පැවැත්වූ බැතිමත්හු විවිධ තැන්හි රැස්ව සබත පැවැත්වූහ. ප්‍රතිසංස්කරණයට පසු කාලයන්හිද සබත ශුද්ධ කොට පැවැත්වූ බැතිමත්හු සෑම පරම්පරාවකම ජීවත් වූහ. එවන් අය අවලාද සහ ගැරහීම් වලට මුහුණ පෑවෝය. එහෙත් හිංසා පීඩා මධ්‍යයේ වුවද ඔවුහු විශ්වාසය කඩ නොකොට දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කිසිම කලෙක වෙනස් නොවන බවට ප්‍රබල සාක්ෂියක් වූහ. මැවීමෙහි සබත සතුව ඇති පාරිශුද්ධ වූ යුතුකම් ඔවුහු නොපිරිහෙලා ඉටු කළෝය.

එළිදරව් 14 හි ප්‍රකාශයට පත් කර ඇති "සදාතන ශුභාරංචියෙහි" මෙම සත්‍යතාවන් අඩංගුව තිබේ. ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙන විට උන්වහන්සේගේ සභාවෙහි අනන්‍යතා ලක්ෂණයක් වශයෙන් මැවීමේ ස්මාරකයක් වන සබත පැවැත්වීමද ඇතුළත් වෙයි. දේව දූතුන් තිදෙනාගේ පණිවිඩයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධවන්තයන් කණ්ඩායමක බිහි වීමක් ගැන පණිවිඩයෙහි සඳහන්ය. ඔවුහු වනාහි "දෙවියන්වහන්සේගේ ආඥාද, යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලද රක්ෂා කරන්නාවූ ශුද්ධවන්තයන්" වන්නාහ. ක්‍රිස්තු සමිඳාණන්ගේ පැමිණීමට පෙරාතුව ලෝ වාසීන්ට දිය යුතු අන්තිම පණිවිඩය මෙය වන්නේය. මෙම පණිවිඩය ප්‍රකාශයට පත්කිරීම සමගම දිවැසිවරයාගේ දසුනට හසු වූයේ මනුෂ්‍ය පුත්‍රයාණන් අස්වැන්න නෙළා ගැනීමට තේජසින් යුතුව පැමිණීමේ සංසිද්ධියයි.

ස්වර්ගීය ශුද්ධස්ථානය පිළිබඳවත් ව්‍යවස්ථාවෙහි නොවෙනස් වන ස්වභාවය පිළිබඳවත් ආලෝකය ලැබූ අය ප්‍රීතියෙන් පිනා ගියෝය. තමන්ගේ දැනුමට එක්වූ සත්‍යතා සංග්‍රහයේ අලංකාරය හා අන්‍යෝන්‍ය එකඟතාවය දැකීමෙන් ඔවුහු විස්මයටත් සන්තෘෂ්ටියටත් පත්වූහ. තමන්ට ලැබී ඇති අමිල ආලෝකය මිල කළ නොහැකි අගනා සම්පතක් ලෙස සැලකූ ඔවුහු එම සත්‍යතා මාලාව කිතුණු ලෝකයේ අනෙකුත් අයටද දෙනු ලබනවාට ආශා වූහ. අසන්නාවූ සැවොම ඉතා ප්‍රීතියෙන් මෙම සත්‍යතාවන් පිළිගනීවී යයි ඔවුහු කල්පනා නොකළෝය, හද පත්ලෙන් විශ්වාස කරාවි යයි නොසිතුවෝය. තමන් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් යැයි ප්‍රකාශ කළ බොහෝ අය තමාට පැමිණි ආලෝකය සත්‍ය යයි පිළිගත්තද, එම දහම් බහුතර බැතිමතුන්ගේ චින්තාවලියට පටහැනි වන නිසා එම සත්‍යතාවන්ට අනුගතවීමට කැපවන්ට ඔව්හු කැමති නොවූහ. සතරවන ආඥාව පැවැත්වීමට පූජාවීමක් අවශ්‍ය බැවින් එම කැපවීම කිරීමට බොහෝ අය අකමැති වූහ.

සබතෙහි ඉල්ලීම් ඉදිරිපත් වූ විට බොහෝ අය ලෝක බහුතරයේ තර්ක ඉදිරිපත් කරමින් සත්‍යයට මුහුණ දීම මගහැර සිටියහ. ඔවුහු



මෙසේ තර්ක කරන්නට වූහ. "අපි සැමදාම, උපතේ සිටි ඉරිදා දවස ගරු කටයුතු ලෙස පැවැත්වූවා. අපේ පියවරුද ඉරිදා ගරු ලෙස පැවැත් වූවා. ඒ අතර සභාවේ සිටි භක්තිධරයන් සෑම දෙනාම වාගේ තමන්ගේ මරණය දක්වාම පැවැත්වූයේ ඉරිදා දවසයි. ඔවුන් එසේ කිරීමෙන් හරි දේ කළා නම් එම දවස අපටත් හරි දවසයි. මේ අළුත් සබත පවත්වන්නට ගියොත් අපට ලෝක මතයෙන් සහ පැවැත්මෙන් කොන් වන්නට වේවි. ඔවුන් කෙරෙහි බලපෑමක් දැරීමට අපට බැරි වේවි. ඉරිදා දවස ගරු කොට පවත්වන්නාවූ ලෝක බහුතරයක් ඉදිරියේ සත්වෙනි දවස ශුද්ධ කොට පවත්වන්නාවූ කොටසකට ඉටු කළ හැකිවන්නේ කුමක්ද?" ක්‍රිස්තුස්වහන්සේව මෙසියස්වහන්සේ ලෙස පිළිනොගනිමින් ප්‍රතික්ෂේප කිරීමට යුදෙව්වන්ද ඉදිරිපත් කළේ මෙවැනිම තර්කයන්ය. තමන්ගේ පියවරු පුද පූජා බිලි පූජා ඔප්පු කිරීමේදී දෙවියන්වහන්සේ ඔවුන්ව පිළිගත් සේක. එසේ නම් දරුවන් විසින් එසේ කිරීමෙන් තමන්ට ගැළවීම ලබාගන්නට බැරි වන්නේ මන්දැයි යුදෙව් තරුණ පරපුර තර්ක ඉදිරිපත් කළෝය. සත්‍යවාදී කිතුණුවෝ කතෝලික ඇදහිල්ල තුළ මරණයට පත් වූවෝ යයි ලූතර්ගේ දවස්වලදී කතෝලික බැතිමත්හු තර්ක ඉදිරිපත් කරමින් තමන්ගේ ගැළවීම සඳහාද එම ආගමික දහම් තුළ විශ්වාසය ප්‍රමාණවත් යයි සැනසිලි බස් දෙඩූහ. දේව ධර්මයේ දක්වන ඇදහිල්ල හෝ ක්‍රියාදාමයන් හෝ ඉදිරිපත් කිරීමේදී ද මෙවන් තර්ක මගින් සත්‍යතාවේ සියලු ප්‍රවර්ධනයන්ට බාධා එල්ල වේ.

ඉරු දින නමස්කාරය වනාහි ශත වර්ෂ ගණනාවක් පුරා ස්ථාපිත වූ ධර්මතාවක් බවත් එය ඉතා පුළුල් ලෙස සභාව තුළ ව්‍යාප්ත වූ පුරුද්දක් බවත් බොහෝ අය කියා සිටියෝය. එහෙත් මෙම මතවේදයට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ තර්කයන් මගින් දක්වනු ලැබුවේ සබත සහ එහි පැවැත්ම බොහෝ ඈතට විහිදී යන බවත්, ඇත්ත වශයෙන්ම එය ලෝකයේ ආරම්භයේ සිටම පවතින බවත්ය. තවද, එම දවස දෙවියන්වහන්සේගේ මෙන්ම දේව දූතයන්ගේද අනුමැතිය ලැබූ දිනය බවත් ප්‍රකාශ කරන ලදී. 'පොළෝ තලය සඳහා අත්තිවාරම යොදනු ලැබූ අවස්ථාවේදී පහන් තාරකාවන් ගීත ගයද්දී දෙවියන්වහන්සේගේ සියලු පුත්‍රයන් ප්‍රීති ඝෝෂා පවත්වද්දී' එම අවස්ථාවේදීම සබතෙහි අත්තිවාරම්ද දමන ලදී. (යෝබ් 38:6,7; උත්පත්ති 2:1-3). පනතෙහි ඇත්තාවූ මේ සබතට අපගේ ගෞරවාදරය යොමු කළ යුතුය. එය මිනිස් බල අධිකාරියක් විසින් පනවන ලද්දක් නොවේ. එය කිසිම මිනිස් සම්ප්‍රදායික පුරුද්දක් මත තීරණය වූ දවසක් නොවේ. එම නියමය පුරාතන තැනැන්වහන්සේ විසින් ස්ථාපිත කරන ලදී. උන්වහන්සේගේ සදාතන වචනය මගින් එය විධාන කරන ලදී.

සබත නැවත යථා තත්ත්වයට පමුණුවා ලීම පිළිබඳව එය මහජන අවධානයට යොමු වූ කල්හි ජනප්‍රිය දේවගැතිවරු දෙවියන්වහන්සේගේ වචනය විකෘති කරමින් විමර්ශනශීලී මිනිස් මනසට විවිධ තර්ක සහ මතවේද ඉදිරිපත් කළෝය. තමන්ගේ සිතැඟි පරිදි ඉරුදින නමස්කාරයෙහි යෙදීමට කැමැත්ත පළ කළ අය ශුද්ධ ලියවිලි සොයා බැලීමකින් තොරව, තම චින්තනයට ඉඩ දෙමින් ඉරිදා නමස්කාරයෙහි යෙදෙමින් කල් ගෙවන්නට වූහ. තර්ක කරමින් කුතර්ක ඉදිරිපත් කරමින් පියවරුන්ගේ සම්ප්‍රදායන් ගෙන හැර පාමින් සභාවේ ආධිපත්‍ය ඉදිරිපත් කරමින් සත්‍යය පිටුදැකීමට බොහෝ අය වෑයම් කළෝය. සත්‍ය සබත පිළිගන්නාවූ අය සතර වන ආඥාවෙහි වලංගු භාවය ඉදිරිපත් කරමින් විරුද්ධවාදීන්ට එරෙහිව නැඟී සිටියහ. සත්‍යතාවයේ වචනය පමණක් අතැතිව සාමාන්‍ය ගිහියෝ උගත් ප්‍රභූන් සහ වියතුන් ඉදිරියෙහි සත්‍යය උදෙසා නැඟී සිටියෝය. තේරුම් ගත නොහැකි තදබල තර්ක ගෙන හැර පාමින් ඉරිදා සම්මතය මත නැඟී සිටි අය ශුද්ධ ලියවිල්ලෙහි සත්‍යය මත නැඟී සිටි අය ඉදිරියෙහි පසුබා සිටියෝය. ඔවුන්ගේ තර්ක බිඳ හෙලමින් සෘජුව තර්ක ඉදිරිපත් කළ සාමාන්‍ය වැඩි උගත්කමක් නොතිබූ බැතිමතුන් ඉදිරියෙහි තමාගේ තර්ක ඵල රහිත බව ඔවුන්ට පෙනී ගියේය.

බයිබලීය සබත වෙනුවට ව්‍යාජ දිනයක් නියම කරගත් අය තමන්ගේ ස්ථාවරය සපථ කරන පිණිස ශුද්ධ වූ බයිබලයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකිව වෙනත් තර්කයන් කෙරේ තම අවධානය යොමු කළෝය. ඔවුහු මෙසේ තර්ක කළහ. "අප සභාවන්හි වියත් අයට මෙම සබත් ප්‍රශ්නය ගැන හරියාකාර වටහා ගැනීමක් නැත්තේ ඇයි? ඔබලා මෙන් සත්වෙනි දවස සබත යයි පිළිගන්නේ ඉතා ස්වල්ප සංඛ්‍යාවක් පමණයි. අනික් සියළු දෙනාම වැරදි වන්නටත් ඔබලා පමණක් හරි වන්නටත් පුළුවන්කමක් නැහැ නොවේද? ක්‍රිස්තුස්වහන්සේටත්, උන්වහන්සේගේ ගෝලයන්ටත් මෙවැනිම තර්ක ඉදිරිපත් වූ බව ඔවුන්ට අමතක වී ගියේය.

එවන් තර්ක විතර්ක බිඳ හෙලීමට අවශ්‍ය වූ එකම පිළිතුර වූයේ ශුද්ධ ලියවිල්ලෙහි ඉගැන්වීම් ඉදිරිපත් කිරීමත්, ගෙවී ගිය යුගයන් පුරා ස්වාමීන්වහන්සේ තමන් ජනතාව සමග ක්‍රියා කර ඇති ආකාරය ගෙන හැර පෑමත් පමණකි. දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් දෙමින් එයට කීකරු වන්නන් කරණකොටගෙන උන්වහන්සේ ක්‍රියාත්මක වන සේක. අනෙකුත් අයට පවසන්නැයි දෙවියන්වහන්සේ පවසන්නාවූ දෑ ජනප්‍රිය නොවුවද එම සත්‍යතාවන් ප්‍රකාශ කිරීමට ඔවුහු මැළි නොවෙති. මනුෂ්‍යයන් අතර සිදුවන ජනප්‍රිය පාපයන් පවා පෙන්වා දීමට ඔවුහු බිය නොවෙති. ප්‍රතිසංස්කරණ වැඩ කටයුතුවලට නායකත්වය දීමට බොහෝ අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ තෝරා ගත්තේ උගතුන්,



ප්‍රවීනයන් සහ ප්‍රභූන් නොවේ. එයට හේතුව නම් එවන් අය තමන් පිළිගත් ධර්මයකට, මතයකට සහ දහම් පද්ධතීන් පිළිබඳව අධි තක්සේරුවක් දරන නිසාත්, දෙවියන්වහන්සේගෙන් ඉගෙනීමට තරම් උවමනාකමක්, අවශ්‍යතාවක් ඔවුන්ට නොමැති නිසාත්ය. ප්‍රඥාවේ උල්පත සමග පුද්ගලික සම්බන්ධතාවක් ඇති අයට පමණක් ශුද්ධ ලියවිලි තේරුම් ගැනීමට හෝ තේරුම් කරදීමට හැකියාවක් ඇත්තේය. අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඉහළ තලයන් කරා නොපැමිණි අයව සත්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා දෙවියන්වහන්සේ විසින් තෝරා ගනු ලැබේ. උන්වහන්සේ එසේ කරන්නේ ඔවුන් නූගත් අය නිසා නොව දෙවියන්වහන්සේගෙන් ඉගෙනීමට නුපුළුවන් තත්ත්වයකට ඔවුන් පමුණුවන්නාවූ අහංකාරය ඔවුන් තුළ නොවන නිසාය. ඔවුහු දෙවියන්වහන්සේගේ පාසැලෙහි අධ්‍යාපනය ලබා ගනිති. ඔවුන්ගේ යටහත් පහත් නිහතමානීකම සහ කීකරුවීමේ ගුණාංග නිසා ඔවුහු ශ්‍රේෂ්ඨත්වයට පත්වෙති. තමන්වහන්සේගේ සත්‍යතාව පිළිබඳ දැනුම ඔවුන්ට පවරා දීමෙන් දෙවියන්වහන්සේ ඔවුන්ට ගෞරවය පුද කරන සේක. එම ප්‍රදානය ඉදිරියෙහි භූමික ගෞරවය සහ මිනිස් උදාරත්වය වැදගත් කමක් නැති තත්ත්වයකට පත් වෙයි.

බොහෝ ඇඩ්වෙන්ටිස්තවරු ස්වර්ගීය දේව මාළිගාව සහ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පිළිබඳ සත්‍යතාවන් ප්‍රතික්ෂේප කළෝය. ඒ අතර බොහෝ දෙනෙක් ඇඩ්වෙන්ටිස්ත මෙහෙයුම කෙරෙහි විශ්වාසයද අත හැර දමූහ. එම ව්‍යාපාරය හා බැඳි අනාවැකි පිළිබඳව විසංවාද අර්ථකථනයන් හා සත්‍ය නොවූ නිර්වචන ගෙන හැර පාමින් ඔවුහු සත්‍යයට පිටුපා ක්‍රියා කරන්නට වූහ. ඒ අතර සමහර අය ක්‍රිස්තු සමිඳාණන්ගේ ආගමනය ගැන තවදුරටත් විවිධ දින වකවානු ඉදිරිපත් කරමින් සත්‍යයෙන් බැහැරව කටයුතු කරන්නට වූහ. ශුද්ධස්ථානය පිළිබඳව එළිදරව් වෙමින් තිබූ ආලෝකය කියාපෑවේ දෙවන ඊම දක්වා අනාවැකි දින වකවානුවක් ලබා දී නැති බවය, දෙවන ඊමේ ආශිර්වාදලත් බලාපොරොත්තුව ඉටුවන දිනය නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත්කර නැති බවය. එහෙත් ආලෝක කදම්බයෙන් ඉවතට හැරී ක්‍රියා කළ ඔවුහු දෙවන ඊමේ දවස යයි කියමින් නා නා ප්‍රකාර දින වකවානු ප්‍රකාශයට පත් කළ අතර ඒ සෑම දිනකම ඔව්හු බලාපොරොත්තු භංගත්වයට පත් වූහ.

මෙම සාවද්‍ය මත වාදයන් තෙසලෝනික බැතිමතුන් වෙත පැමිණි අවස්ථාවේදී ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම පිළිබඳව වූ එකී මතවාදයන් ගැන අපෝස්තුළු පාවුල් ඔවුන්ට අනුශාසනා කළේය. දෙවියන්වහන්සේගේ වචනය මත ඔවුන්ගේ බලාපොරොත්තු සහ අභිලාෂයන් රඳවා වචනය පරීක්ෂා කර බලා නිවැරැදි තීරණයකට පැමිණෙන ලෙස පාවුල් එම බැතිමතුන් දිරිමත් කළේය. ක්‍රිස්තුස්වහන්සේගේ පුනරාගමනයට මත්තෙන් ඉටුවිය යුතු සිද්ධීන් පිළිබඳ අනාවැකි

පාදක කරගෙන, ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම ඔවුන්ගේ දවස්වලදී සිදුවන්නේ නැති බව ඔහු ඔවුන්ට පෙන්වා දුන්නේය. ඔහුගේ උපදේශාත්මක වදන් මෙසේය: "කිසිවෙකුට කිසිසේත් නුඹලා රවටන්ට ඉඩ නාරින්න" කියා ඔහු පැවසුවේය." (2 තෙසලෝනික 2:3). ශුද්ධ ලියවිල්ලෙහි අනුමැතිය නොලද බලාපොරොත්තු කෙරෙහි ඔවුන් අපේක්ෂාවන් රඳවන්නේ නම් වැරදි ක්‍රියාදාමයක නිරත වීමට ඔවුන් පෙළඹෙනවා නොඅනුමානය. එසේ වූ කල්හි ඔවුන් නො-ඇදහිලිවතුන්ගේ ගැරහීමට ලක්වෙනවා නියතය. ඔවුන් පසුබෑමකට යොමු වීමේ අනතුරක්ද, එයට සාපේක්ෂව උදාවනු නොඅනුමානය. ඒ අතර ගැළවීම උදෙසා අවශ්‍ය වන්නාවූ සත්‍යතාවන් අනුමාන කිරීමටද ඔවුන් යොමු වෙනවා නියතය. වත්මන් ලෝකයේ අවසන් යුගයේ දිවි ගෙවන්නාවූ අයට පාවුල් විසින් තෙසලෝනික සභාවට ලබාදුන් අනුශාසනා වැදගත් පාඩමක් කියා දෙයි. ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනය පිළිබඳව නිශ්චිත කාලවකවානුවක් (දින නියමයක්) මත ඇදහිල්ල රැඳවීමට අවස්ථාවක් ලැබෙන්නේ නැති නම් එම පැමිණීම උදෙසා සූදානම් වීමට ජ්වලිතතාවක් හෝ දැඩි උනන්දුවක් ඇතිව ක්‍රියාත්මක වීමට තමාට හැකියාවක් නැත්තේ යයි බොහෝ ඇඩ්වෙන්ටිස්තවරු කල්පනා කළහ. එහෙත් නැවත නැවතත් ඔවුන්ගේ බලාපොරොත්තු උද්දීපනය කරමින් කෙරෙන්නාවූ දින නියමයන්ද, ඒ සමගම ඇති වෙන්නාවූ බලාපොරොත්තු කඩවීම්ද නිසා වන කම්පනයන්ද මගින් ඔවුන්ගේ සිත්වලට අනාවැකි සත්‍යතාවන් කරණකොටගෙන පැහැදීමක් උදාකර දීමට බාධාවන් ඇති විය.

දිව්‍ය විනිශ්චය ආරම්භ වන්නාවූ නිශ්චිත දින වකවානුව දෙවියන්වහන්සේ විසින්ම නිර්දේශ කොට පළමුවන දූතයාගේ පණිවිඩය මාර්ගයෙන් මිනිස් අවධානය වෙත යොමු කරන ලදී. අනාවැකි කාල පරාස අන්තර්ගත දවස් 2300 දිගු කාලයේ අවසානය 1844 හි සරත් සෘතුව බව විවිධ ගණන් කිරීමේ ක්‍රම භාවිතය මගින් සනාථ කරන ලදී. එම තීරණයෙහි දොසක් සොයාගත නොහැකිය. මෙකී අනාවැකි කාල පරාසය පිළිබඳව එහි ආරම්භය සහ නිමාව සඳහා නොයෙක් නොයෙක් කාල වකවානු ඉදිරිපත් වුවද, එම දින නියමයන් සඳහා පැහැදිලි නොවූ, සනාථ කළ නොහැකි සාධක ඉදිරිපත් වුවද, එමගින් සිදුවූයේ වත්මන් සත්‍යයෙන් මිනිස් අවධානය ඉවත් කිරීමය. ඒ අතරම අනාවැකි පහදා දීමේදී ද එය බාධාවක් විය. දෙවෙනි පැමිණීමේ දිනය ලෙස නිතර නිතර නිශ්චිත දවසක් නියම කරනු ලැබීමද, එම ඉගැන්වීම වැඩි වැඩියෙන් ප්‍රචාරය කිරීම සහ ව්‍යාප්ත වීමද, සාතන්ගේ ක්‍රමෝපායනට මහත් රුකුලක් වන්නේය. ප්‍රකාශ කරනු ලැබූ නිශ්චිත දවස කිසිම සුවිශේෂී සිදුවීමකින් තොරව ගෙවී යාමත් සමගම එම ප්‍රකාශය කළ අයට ගැරහීම් සහ අවමාන කිරීම් ඇරඹේ. 1843 සහ 1844 වසරවලදී පැවති ඇඩ්වෙන්ටිස්ත මෙහෙවරයටද, මෙය අවමානය ඇති කරයි. දෙවන ඊමේ දින වකවානු ගැන නිත්‍ය කාලසටහන්



ප්‍රචාරය කරන්නාවූ සමහර අය උන්වහන්සේගේ පැමිණීමේ වකවානුව ඉතා ඈත අනාගතයකට නිර්ණය කිරිමට යොමු වෙති. මෙසේ ඔවුහු ව්‍යාජ ආරක්ෂිත සංකල්පයක නියැලී කල් ගෙවීමට යෙදෙති. ඔවුන්ගෙන් බොහෝ අයට යථාර්ථය අවබෝධ වන විට පමා වූවා වැඩි වෙනවා ඇත.

ඇඩ්වෙන්ටිස්ත බැතිමතුන්ගේ අතීත අත්දැකීම් වනාහි ආදි ඊශ්‍රායෙලිතයන්ගේ ඉතිහාසය නැවත පණ ගැන්වීමකි. ඊශ්‍රායෙලිත ජනතාව මිසරයේ සිට කානාන් දේශය කරා යන ගමනේද, දෙවියන්-වහන්සේගේ මගපෙන්වීම අනුව ඔවුහු ක්‍රියා කළෝය. එසේම දෙවියන්-වහන්සේ ඇඩ්වෙන්ටිස්ත මෙහෙවරයෙහිදී ද මගපෙන්වමින් ක්‍රියාත්මක වූසේක. රතු මුහුදින් එතෙර වීමේදී ඊශ්‍රායෙල් ජනතාව මුහුණ පෑ අත්දැකීමට සමාන සංසිද්ධියකට මුහුණ පෑමට ඇඩ්වෙන්ටිස්තවරුන්ට සිදුවිය. එහිදී ඔවුහු තමන්ට මෙතෙක් මගපෙන්වූ දේව හස්තය කෙරෙහි විශ්වාසය තබමින් ක්‍රියා කළෝ නම් "දෙවියන්වහන්සේ ලබාදුන්නාවූ ගැළවීම" දකගැනීමට හැකියාවක් ඔවුන්ට උදාවනවා නියතය. 1844 හි මෙහෙවරයට සහභාගීවූ සැවොම තුන්වන දූතයාගේ පණිවිඩය ලැබ ශුද්ධාත්මයාණන්ගේ බලය මුසුව එය ප්‍රචාරය කිරීමට එක්සත්ව ක්‍රියා කළෝ නම්, දෙවි සමිඳාණෝ ඔවුන්ගේ වෑයමට උදාර ප්‍රතිඵල ලබා දෙනවා නොඅනුමානය. දීප්තියෙන් අනූන වූ ආලෝක කදම්බයක් ලොව මත පතිත වෙනවා ඒකාන්තය. මීට වසර ගණනාවකට පෙර පොළොවෙහි වසන්නාවූ සැමට අනතුරු ඇඟවීමේ පණිවිඩය ලබාදී ඔවුන් දැනුවත් කර අන්තිම වැඩ කටයුතු හමාර වී නම් තමන්වහන්සේගේ සෙනඟ මුදාගැනීම සඳහා ක්‍රිස්තු සමිඳාණන් මෙලොව  කරා පැමිණීම සිදුවී හමාර වන්නට ඉඩ තිබිණ.

ඊශ්‍රායෙල් ජනතාව වසර හතළිහක් පුරා පාළුකරයේ ඔබ මොබ යෑම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවීය. උන්වහන්සේගේ සැලැස්මව තිබුණේ ඔවුන් කෙළින්ම කානාන් දේශය කරා ගෙන ගොස් ඔවුන් ශුද්ධවූ ද, ප්‍රීතිමත්වූ ද ජනතාවක් ලෙස එරටෙහි ස්ථාපිත කිරීමය. එහෙත් ඔවුන්ගේ "නොඇදහිලිකාරකම නිසා ඔවුන්ට ඇතුල් වෙන්ට නුපුළුවන්" විය. (හෙබ්‍රෙව් 3:19). කැරලි ගසමින් පසුබටවීම් වලට අනුගත වූ නිසා ඔව්හු වනාන්තරයෙහිදී විනාශයට පත් වූහ. පොරොන්දු දේශයට ඇතුළු වීමට වෙනත් අයට වාසනාව උදා විය. ක්‍රිස්තු සමිඳාණන්ගේ පැමිණීම මෙපමණ කලක් පමා වීමද උන්වහන්සේගේ සෙනඟ මෙතරම් දිගු කලක් පාපයෙන් පිරී ශෝකයෙන් පිරී මේ ලෝකයේ  රැඳී සිටීමද දෙවියන්වහන්සේගේ අභිමනාපය නොවීය. නමුත් අවිශ්වාසය දෙවියන්වහන්සේගෙන් මිනිසා වෙන් කරවීය. ඇඩ්වෙන්ටිස්ත මෙහෙවරයෙහි පුරෝගාමීන් වූ බොහෝ අය ඔවුන්ට දෙවියන්වහන්සේ භාර කළ කර්තව්‍යය ඉටු නොකළ නිසා දේව දූතුන් තිදෙනාගේ පණිවිඩය ප්‍රකාශ කිරීමට උන්වහන්සේ වෙනත් මනුෂ්‍යයන්

තෝරා ගත්සේක. ලෝකය කෙරෙහි වූ කරුණා-මෛත්‍රිය නිසා යේසුස් සමිඳාණෝ තමන්වහන්සේගේ ආගමනය පමා කරනසේක. දෙවියන්වහන්සේගේ උදහස මිනිස් සත මත්තෙහි වගුරුවා ලීමට පෙර පව්කාරයාට උන්වහන්සේගේ අනතුරු ඇඟවීමේ පණිවිඩය අසන්නට ඉඩ ප්‍රස්ථාවක් ලබාදී උන්වහන්සේ තුළ රැකවරණය ලබාගැනීමේ අවස්ථාව උදා කරන පිණිස උන්වහන්සේ දෙවෙනි ඊමේ දවස පමා කරනසේක.

සෑම යුගයකදීම එකල පවතින්නාවූ වැරදිවලට සහ පාපයන්ට එදිරිව කථා කිරීමේදී, විරුද්ධතාවන් සහ බාධක එල්ල වීම අරුමයක් නොවන්නේය. "නපුරුකම් කරන සෑමදෙනම ආලෝකයට වෛර වී, තමුන්ගේ ක්‍රියා වැරදි බව ඔප්පු නොවන පිණිස ආලෝකයට නොඑති." (යොහන් 3: 20). තමන්ගේ විශ්වාසය රඳවන්නාවූ යම්කිසි විෂයක් ශුද්ධ ලියවිලි මගින් ඔප්පු කිරීමට නොහැකිවූ අවස්ථාවන්හිදී කුමන ආකාරයකින් හෝ තම මති මතාන්තරය රැකගැනීමට මනුෂ්‍යයෝ වෙර දරති. ඒ සඳහා ඔවුන් යොමු වන්නේ එම විෂය පිළිබඳව ජනප්‍රිය නොවූ එකී සත්‍යතාව රකින්නාවූ අයගේ චරිත සහ ඇදහිල්ල ඝාතනය කිරීමටය. සෑම යුගයකම මෙම කර්තව්‍යය එකසේ ක්‍රියාත්මක විය. ඊශ්‍රායෙල් රාජ්‍යය කළඹවන්නෙකු ලෙස එලියා නම් කරන ලදී. රාජ ද්‍රෝහියෙකු ලෙස යෙරෙමියාව නම් කරන ලදී. දේවස්ථානය කිළිටි කරන්නෙකු ලෙස පාවුල් දෝෂාභියෝගයකට ලක් කරන ලදී. එදා පටන් අද දක්වාම සත්‍යතාවට පක්ෂපාතීව සිටින්නාවූ අය මිනිසුන් නොමඟ යවන්නන් ලෙසද මිථ්‍යාමත දරන්නාවූ දුර්ලබ්ධිකයන් ලෙසද නැතහොත් ආගමික අසමගිය වපුරන්නවුන් ලෙසද දෝෂාරෝපණයට ලක් කර තිබේ. දිවැසි ප්‍රසාදි ප්‍රකාශන පිළිගැනීමට හෝ විශ්වාස කරන්ට අකමැති වූ විශාල සංඛ්‍යාත ජනතාවක්, පොදුවේ කරන්නාවූ පාපයන්ට එරෙහිව දොස් පවරන්නාවූ අයට විරුද්ධව කෙරෙන්නාවූ චෝදනා දොහොත් මුදුණින් පිළිගනිති. ජනප්‍රිය විලාසිතාවක් වූ පාප රැල්ලට එරෙහිව හඬ නඟන්නන් අවමානයට ලක් කරන, උපහාසයට පත්කරන මෙම රැල්ල තව තවත් වැඩි වෙනවා ඒකාන්තය. ඉදිරියෙහිදී පැමිණෙන්නාවූ එක්තරා කාල-පරිච්ඡේදයක් ගැන ශුද්ධ බයිබලය මෙසේ විස්තර කරදී ඇත. එම කාලයේදී රජයේ නීති රීති දෙවියන්වහන්සේගේ ආඥාවන්ට විරුද්ධව දියත් වෙනවා ඇත. දිව්‍ය ආඥාවන්ට පූර්ණාකාරයෙන් කීකරු වන්නන්ට නපුර කරන්නන් ලෙස චෝදනා එල්ල කරමින් දඬුවම් පමුණුවනු ලබනවා ඇත. දඬුවම් ඉදිරියේ මෙන්ම අවලාද සහ අපකීර්තිය ඉදිරියෙහිද නැඟී සිටීමට ඔවුහු නිර්භීත විය යුත්තාහ.

මෙවන් සිදුවීම් මධ්‍යයේ සත්‍යතාවෙහි පණිවිඩකරුවාගේ වගකීම කුමක්ද? සත්‍යතාව ඉදිරිපත් කළ යුතුය, නැතහොත් එසේ නොකර සිටිය යුතුය යන්න ගැන තීරණයකට එළඹීමකට ඔහුට හැකියාවක් තිබේද? සත්‍යතාව ඉදිරිපත් කිරීමේදී සිදුවන්නාවූ ප්‍රතිඵලය වන්නේ මිනිසුන් එයට ඇහුම්කන් නොදී, මගහැර යාම වුවද තවදුරටත් සත්‍යතා අනාවැකි ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටීමට අපට කිසිම අයිතියක් නැත. මක්නිසාදයත් පෙර සිටි ප්‍රතිසංස්කාරකයන්ද බාධක සහ විරෝධතා ඉදිරියෙහි තම වගකීම් භාරය ඉටු කිරීමෙන් නොවැලකී සිටි ලෙසම නූතන පණිවිඩකරුවෝද, ඔවුන් මෙන්ම ඉදිරියට ගමන් කළ යුත්තාහ. පෙර සිටි ශුද්ධවන්තයන් සහ වේද සාක්ෂිකයන් කරන ලද ඇදහිල්ලෙහි ප්‍රකාශන වාර්තාගතව ඇත්තේ මතු පරම්පරාවන්ගේ අභිවෘද්ධිය උදෙසාය. ශුද්ධවන්තකමේ සහ විශ්වාසවන්තකමේ අභිමානයෙහි ජීවමාන ආදර්ශයන් වූ ඔවුන්ගේ කියුම් කෙරුම් වත්මන් යුගයේ පණිවිඩකරුවන් දිරිමත් කරමින් ඔවුන්ට ආනුභාවය ලබාදීමේ චේතනාවෙන් මෙම සිද්ධීන් වාර්තාගත කර ඇත. ඔවුන් සත්‍යතාව සහ කරුණා අනුග්‍රහය ලැබුවේ දෙවියන්වහන්සේ පිළිබඳ දැනුම සකල ලෝ වාසීන්ටම දෙමින් මුළු පොළෝ තලයම ඒකාලෝක කරවන පිණිසය. වත්මන් පරපුරක දිවි ගෙවන්නාවූ තමන්වහන්සේගේ සේවකයන්ට දෙවියන්වහන්සේ එවන් ආලෝකය දානය කර තිබේද? එසේ ලබාදී තිබේ නම් ඔවුහු එම ආලෝකය ලෝ පුරා බැබළවීමට ක්‍රියා කළ යුත්තාහ.

පුරාණයේදී තමන්වහන්සේගේ නාමයෙන් කථා කළ එක් පුද්ගලයෙකුට ස්වාමින්වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක. "නමුත් ඊශ්‍රායෙල් වංශය මට ඇහුම්කන් දෙන්ට කැමති නැති බැවින් ඔවුහු නුඹට ඇහුම්කන් දෙන්ට කැමති නොවෙති." එසේ වුවද, උන්වහන්සේ මෙසේ පවසන සේක."ඔවුන් ඉතා කැරලිකාර බැවින් ඔවුන් අසතත්, නොඅසතත් මාගේ වචන ඔවුන්ට කියන්න." (එසකියෙල් 3:7; 2:7) මේ කාලයේ සේවයේ යෙදී සිටින සෑම දේව සේවකයෙකුටම මෙසේ නියම වී තිබේ. "නොනැවතී හයියෙන් මොර ගසා හොරණෑවක් මෙන් ඔබේ හඬ නගා, මාගේ සෙනඟට ඔවුන්ගේ වරදවල්ද, යාකොබ්ගේ වංශයට ඔවුන්ගේ පව්ද දන්වන්න."

"මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඊශ්‍රායෙල් වංශයට මුරකාරයෙකු කළෙමි. නුඹද මාගේ මුඛයෙන් වචනය අසා, මාගේ නාමයෙන් ඔවුන්ට අවවාද කරන්න. එම්බා දුෂ්ටය, නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාද කිරීමට නුඹ කථා නොකර සිටිතොත්, දුෂ්ටවූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි. එසේ වී නුමුත් තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ ගැන දුෂ්ටයාට අවවාද කළ කල්හි ඔහු තමාගේ මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. නුඹ නුඹේ ප්‍රාණය ගළවා ගත්තෙහිය." (එසකියෙල් 33:7-9). ඊශ්‍රායෙල්හි දිවැසිවරයාට දෙවියන්වහන්සේ මෙයාකාරයෙන් ප්‍රකාශ කළසේක.

මෙම භාරදූර සහ බියමුසු වගකීම, ආලෝකය ලැබූ සෑම අයෙකුටම, අවස්ථාව ලැබෙන ආකාරයෙන් ඉටු කිරීමේ වගකීම බලපවත්වන්නේය.

සත්‍යතාව පිළිගැනීමට සහ එය ප්‍රකාශයට පත්කිරීමට ඉදිරිපත් වීම හා බැඳි ප්‍රබල බාධකයක් වන්නේ පිටස්තරියයන්ගෙන් එල්ල වන්නාවූ පරිභව සහ අවලාද මෙන්ම අවමන් සහ හිංසා පීඩාවන්ය. සත්‍යතා පණිවිඩය ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වන්නාවූ අය එයින් බැහැර වීම සඳහා ඉදිරිපත් කළ හැකි එකම තර්කය නම් එම බාධාවන්ය. එහෙත් අවංක කිතුණු අනුගාමිකයන්ට මෙය බාධාවක් නොවන්නේය. ඔවුහු තමන් ප්‍රකාශ කරන සත්‍යතාව ජනප්‍රිය වන තෙක් බලා නොසිටිති. තමන්ගේ වගකීම පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව ඔවුහු කැමැත්තෙන්ම කුරුසිය තෝරා ගනිති. ඔවුහු අපෝස්තුළු පාවුල් සමග එක්වෙමින් මෙවන් ස්ථාවරයක පසු වෙති: "මොහොතකට පවතින අපේ සැහැල්ලු දුක, පෙනෙන දේ නොව නෙපෙනෙන දේ බලා සිටින්නාවූ අපට ඉතාමත් වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදා දෙන්නේය" මෙය ඔවුන්ගේ පැතුමය. (2 කොරින්ති 4:17) "කලකට පාපයේ සැප භුක්ති විඳීමට වඩා දෙවියන්වහන්සේගේ සෙනඟ සමග දුක් විඳීම" තෝරා ගනිමින් ඔව්හු මෙසේ මෝසෙස්ගේ චින්තනය හා එකඟ වෙති. (හෙබ්‍රෙව් 11:26)

යමෙකුගේ වෘත්තීමය තානාන්තරය කුමක් වුවද, ආගමික ප්‍රශ්නයකදී ප්‍රඥප්ති මත නොපිහිටා නීති රීති අනුව ක්‍රියා කරන්නෝ හදවතින් සේවය කරන්නේ ස්වර්ගීය පිළිවෙත අනුව නොව ලෝක ක්‍රමවේදය අනුවය. නිවරැදි දේ නිවැරැදි නිසාම අප විසින් එය තෝරාගත යුත්තෙමු. එහි ප්‍රතිවිපාක දෙවියන්වහන්සේගේ භාරයට පත්කළ යුතු වෙමු. ප්‍රඥප්ති පාවා නොදී ඇදහිල්ලෙන් යුතුව අභීතව ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්හි යෙදුනු වීරෝධාර භවතුන්ට ලෝකයා ණය ගැතිය. එවන් පුද්ගලයන් විසින් වර්තමාන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්ද ඉදිරියට ගෙන යා යුතුය.

දෙවි සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කරන සේක: "ධර්මිෂ්ඨකම දන්නාවූ මාගේ ව්‍යවස්ථාව තමුන්ගේ සිත්වල ඇත්තාවූ සෙනඟෙනි මට කන්දෙන්න; මනුෂ්‍යයන්ගේ නින්දා කිරීමට භය නොවෙන්න. ඔවුන්ගේ අපහාසවලට නොකැළඹෙන්න. මක්නිසාද කාවා ඔවුන් වස්ත්‍රයක් මෙන් කා දමන්නේය. පණුවාද ඔවුන් ලෝම මෙන් කන්නේය. නුමුත් මාගේ ධර්මිෂ්ඨකම සදාකාලයටත් මාගේ ගැළවීම සියලු පරම්පරාවලටත් පවත්නේය." (යෙසායා 51:7, 8).



# 27

## වත්මන් නව ජීවන පිබිදීම්

යම්කිසි පෙදෙසක ශුභාරංචිය විශ්වාසවන්ත ලෙස දේශනා කරනු ලැබීද, එතැන ඇතිවූ ප්‍රතිඵල මගින් සාක්ෂාත් වූයේ එම දහම් ප්‍රචාරක ක්‍රියා පිළිවෙත පසුපස දිව්‍ය මගපෙන්වීම පැවැති බවය. තමන්වහන්සේගේ දේව පණිවිඩකරුවන් සමග දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ බලය ක්‍රියාත්මක වූයෙන් දේව වචනය මහත් බලයකින් යුතුව විකාශනය විය. තමන්ගේ හෘදය සාක්ෂියට එම පණිවිඩ තදින් කාවැදී ගිය බව පව්කාරයන්ට හැඟී ගියේය. "ලොවට බිහි වන්නාවූ සෑම අයෙකුම ආලෝකමත් කරන්නාවූ එළිය" ඔවුන්ගේ හදවත්හි රහස් කුටි තුළට කිඳා බැස, සැඟවී තිබුණ අඳුරු කාරණා පෙන්වා දුන්නේය, එළිදරව් කළේය. ඔවුන්ගේ මනස් හා හදවත් ඔවුන් පව්කරුවන් බව සාක්ෂි දරන්නට විය. ඔවුන්ගේ සිත් සතන් තැවුලට පත් විය. පාපය ගැනත්, දැහැමිතාව ගැනත්, විනිශ්චය ගැනත් ඔවුන්ගේ සිත් අවබෝධයකින් වෙළී ගියේය. යෙහෝවාඃවහන්සේගේ ශුද්ධවූ ධර්මිෂ්ඨතාව පිළිබඳව හැඟීමක් ඔවුන් තුළ උදා විය. හදවත් සෝදිසි කරන්නාවූ මහෝත්තමයාණන් ඉදිරියෙහි වරදකරුවන් සහ පාපයෙන් කිළිටි වූ අය වශයෙන් පෙනී සිටීමේ භයංකාර තත්ත්වය ගැන ඔවුන් තුළ බියක් ඇතිවිය. "මරණයේ මෙම ශරීරයෙන් මාව ගළවා ගන්නේ කවුද"යි ඔවුහු සන්තාපයෙන් යුතුව මොර ගසමින් විචාරන්නට වූහ. ඔවුන්ගේ නෙත් කල්වාරි කුරුසිය දෙසට යොමු විය. මිනිසාගේ පාප උදෙසා කුරුසිය මත ඔප්පු කළ ඉමහත් පූජාව එළිදරව් වීමෙන් ඔවුන්ගේ සිත් තුළට සැනසීමක් සහ සාමයක් උදා විය. ක්‍රිස්තුස්වහන්සේගේ කුසලතාවන් හැරෙන්නට, වෙනත් කිසිවෙකුගේ සුදුසුකමකට තමන්ගේ පව් වලට කමාව දීමේ බලයක් නොමැති බව ඔවුන්ට සක් සුදක්සේ ප්‍රත්‍යක්ෂ විය. ඇදහිල්ලෙන් සහ යටහත් පහත් කමින් යුතුව ඔවුහු දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාණන්ව පිළිගත්තෝය. ලෝකයේ පාපය දුරු කරන්නාවූ එකම තැනැන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව පිළිගනිමින් ඔවුහු තම විශ්වාසය උන්වහන්සේ මත රැඳ වූහ. ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය කරණකොටගෙන "අතීතයේ කළ සියලු පව් වලට කමාව" ඔවුන්ට ලැබුණේය.

ඔවුහු පශ්චාත්තාපය පෙන්නුම් කරන ඵල දැරූහ. ඔවුහු දෙවියන්වහන්සේගේ පව් කමාව විශ්වාස කොට බව්තීස්මය ලබා අළුත් ජීවිතයක් ගත කිරීමේ අධිෂ්ඨානයෙන් යුතුව ලෝකයට පිවිසියහ.

ක්‍රිස්තුස්වහන්සේ තුළ අළුත් මැවීමක් ලද ඔවුහු තවදුරටත් තම තෘෂ්ණාවන් අනුව ගමන් කිරීමේ විලාසිතාව අතහැර දමා දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි ඇදහිල්ලෙන් යුතුව අළුත් ජීවිත ගමනක් ඇරඹූහ. ක්‍රිස්තුස්වහන්සේගේ අඩිපාරේ ගමන් කරමින් උන්වහන්සේගේ චරිත ගුණාංග පරාවර්තනය කිරීමටත් දෙවියන්වහන්සේ පරිශුද්ධව සිටින්නාක් මෙන් ශුද්ධත්වයට පත්වීමටත් වූ අධිෂ්ඨානයෙන් යුතුව ඔවුහු ගමන් කරන්නට වූහ. ඔවුහු දැන් කලින් ද්වේෂ කළ දේවල් ඇලුම් කරන්නට වූහ, පෙරදී ආශා කළ දේවල් දැන් එපා කළෝය. ආත්ම අභිමානයෙන් ඔද වැඩී ප්‍රෞඪ ලෙස තම අයිතිවාසිකම් රැකගැනීම සඳහා දැඩි ස්ථාවරයක පිහිටා සිටි අය හදපත්ලෙන්ම මුදු මොළොක් නිහතමානී බැතිමතුන් බවට පත් වූහ. තමන්ගේ තරාතිරම් නිසා අන්‍යයන් පහත් කොට සැලකූ අය හිතවාදී සහයෝගීතාවෙන් කටයුතු කරන්නට වූහ. ආගමික පිළිවෙත් පිළිබඳව ගරු සැලකිලි නොදැක්වූ අය ආගමික වතාවන්ට ගෞරව කරන්නට වූහ. මද්‍යසාරයට ලොල් වූ අය පමණ දන ක්‍රියා කරන්නට වූහ. දුරාචාරයන්ට ගැති වූ අය සාර ධර්මයන්හි පිහිටා සිටියහ. ඔවුහු අනර්ථකාරී ලෞකික විලාසිතා වලට වූ ගැතිකම් අත්හැර දැමුවෝය. කිතුණු බැතිමතුන්ගේ ආකල්පය මෙසේ විය. ඔවුන්ට දේව වචනය මෙසේ ඔවදන් දුන්නේය: "නුඹලාගේ අලංකාරවීම හිසකේ ගෙතීමද ස්වර්ණාභරණ පැළඳීමද නොහොත් වස්ත්‍ර හැඳීමද යන පිටත අලංකාරය නොව දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා අනර්ඝව තිබෙන මෘදුවූ නිශ්චල වූ ගතියක් නමැති දිරා නොයන සැරසීමෙන් යුක්තවූ සිතේ ඇතුල් මනුෂ්‍යයා වේවා."  (1 පේතෘස් 3: 3, 4)

නව ජීවන පිබිදීම් මගින් ඇතුළාන්තයේ හදවත් තුළ ගැඹුරු සෝදිසි කර ගැනීමක් සිදුවිය. බැතිමතුන් අතර නිහතමානිකම රජ කරන්නට විය. පව්කාරයාට තම ජීවිතය වෙනස් කරගැනීමට කරන ලද අවංක වූද, හෘදයාංගම වූද, ආයාචනා මගින් හදවත් පවිත්‍ර විය. ක්‍රිස්තු සමිඳාණන්ගේ උත්තරීතර රුධිරයෙන් මිලට ගනු ලැබූ පව්කරුවන්ට නොකඩවා පව් කමාව ලබාගන්නැයි කරන ලද ඉල්ලීම්වල අඩුවක් නොවීය. ආත්මයන්ට ගැළවීම ළඟා කරදීමට ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයම දෙවියන්වහන්සේ සමග පොර බැදූහ. එවන් ආත්ම පුබුදුවා ලීමෙහි රැස්වීම් වල ඵල පව්කරුවන්ගේ ජීවිත තුළ විද්‍යාමාන විය. ඔවුහු ආත්ම පරිත්‍යාගයන්ට සහ පූජාවන්ට නොපැකිළී ඇලුම් වූහ. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ගැරහීම්වලට සහ වධ වේදනාවන්ට මුහුණ දෙමින් ඒවා විඳ දරාගැනීමට තමන්ට ලැබුණු අවස්ථාවන් ගැන ඔවුහු ප්‍රීතියට පත් වූහ. යේසුස් සමිඳාණන්ගේ නාමය දරන්නන් යයි පැවැසූ අයගේ ජීවිත තුළ ඇති වූ වෙනස ඔවුන් ඇසුරු කළ අයට දැකගත හැකි විය. එවන් අයගේ අනුබලය සමාජයට



සෙතක් විය. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ සමග එකමුතුව ශුද්ධාත්මයාණන්ට වැපුරුවෝය. එමගින් ඔවුන්ට සදාතන ජීවිතය නෙළාගත හැකි විය.

ඔවුන් ගැන මෙසේ පවසන්නට පුළුවන් විය: "පසුතැවිලිවීම සඳහා නුඹලා ශෝකයට පමුණුවනු ලැබූ බැවින් දැන් ප්‍රීතිවෙමි ... මක්නිසාද දේව කැමැත්තට එකඟවූ ශෝකයෙන් තැවෙන්ට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය. නුමුත් ලෞකික ශෝකය මරණය උපදවන්නේය. එසේය, මෙන්න, දේව-කැමැත්තේ හැටියට ශෝක වීම යන කාරණයෙන් නුඹලා තුළ කොපමණ උනන්දුකමත් කොපමණ නිදොස් කරගැනීමත් කොපමණ අමනාපවීමත් කොපමණ භයත්, කොපමණ ආශාවත් කොපමණ ජ්වලිතකමත් කොපමණ යුක්තිය සිදුකිරීමේ අදහසත් හටගත්තා නොවේද! මේ කාරණය සම්බන්ධව නුඹලා නිදොස් බව නුඹලා සියලු ආකාරයෙන්ම ඔප්පු කළහුය." (2 කොරින්ති 7:9-11).

මෙවන් ප්‍රතිඵල ඇතිවීමට හේතුව නම් ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයයි. පුද්ගලයෙකුගේ ජීවිතය තුළ දේව මගපෙන්වීමට අනුකූල, ගුණාත්මක වෙනස් වීමක් ඇති නොවන්නේ නම් අවංක පසුතැවීමක් සිදුවී යයි පැවසිය නොහැකිය. යම් අයෙක් යමක් සොරා ගෙන තිබෙන්නේ නම් ඒ දෙය ආපසු අයිතිකරුට භාර දිය යුතුය, ඔහු පොරොන්දු ඉටුකළ යුතුය. තම පාපය කියාදී දෙවියන්-වහන්සේට සහ සහෝදර ජනතාවට ආදරය කිරීමද අනිවාර්ය වන්නේය. පව්කාරයා මෙසේ කරන්නේ නම් දෙවියන්වහන්සේ සමග සමාදානය ඔහුට ඇති බව සහතික විය හැකිය. පසුගිය යුගයන්හිදී ආගමික පිබිදීමේ රැස්වීම් ක්‍රියාත්මක වූ අවස්ථාවන්හිදී මෙවන් සිදුවීම් අනන්තව පැවතුණි. එවන් දැය සුලභ විය. එම රැස්වීම් මාලාවන්හි ප්‍රතිඵල අනුව විනිශ්චය කරන විට පෙනී ගියේ මිනිසාගේ ගැළවීම උදෙසාත් මානව වර්ගයා නගා සිටුවීම සඳහාත් ඔවුන්ට ඒ රැස්වීම් මගින් දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබුණු බවය.

දෙවියන්වහන්සේගේ සේවකයන් විසින් මෙහෙය වූ ආත්ම පුබුදුවාලීමේ, නව ජීවනයක් ලබාදීමේ රැස්වීම් මාලාවන්හිදී එයට සහභාගී වූ බොහෝ අය සර්ව ප්‍රකාරයෙන්ම දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු ලැබ ගැළවීමේ මාර්ගයට පිවිසියහ. එසේ වුවද, වත්මන් ආත්ම පිබිදීමේ රැස්වීම් මාලාවන් එයට වඩා හාත්පසින්ම වෙනස්වූ ප්‍රතිඵල වලින් ගහණය. මෙවන් රැස්වීම් මාලාවන් කරණකොටගෙන පුළුල් උනන්දුවක් ජනිත වී බොහෝ අය හැරීමකට භාජන වූයේ යයි ප්‍රකාශ කර තිබේ. බොහෝ දෙනෙක් සභාවන් තුළ

සාමාජිකත්වය ලැබූහ. එසේ වුවද, ඒ හා සමානුපාතිව නියම ආත්මික ජීවිතයේ වර්ධනයක්, ප්‍රගතියක් ඇති වී යයි කීමට තරම් ප්‍රතිඵල සාක්ෂි මගින් ඉදිරිපත් නොවේ. බොහෝ අයගේ ජීවිත තුළ පහන් වීමක් ඇති කළ ආලෝක දහරා වැඩි දිනක් යාමට කලින් නිවී යන්නේය. එහිදී ඇති වන අඳුර ඊට පෙර තිබූ අන්ධකාරයටත් වඩා ඝනත්වයක් දරන්නේය.

ජනප්‍රිය ආත්ම පිබිදීමේ රැස්වීම් මාලාවන්හිදී නිතරම චිත්තාවේග හා සංකල්පනාවන් පුබුදුවා අළුත් යමක් කෙරෙහි, එසේය, පුදුමාකාර යමක් කෙරෙහි ඇලුම් වීමත්, ආදරය කිරීමත් ජනිත කෙරේ. එසේ හැරීම ලද්දෝ බයිබලීය සත්‍යතාවන්ට ඇහුම්කන් දීමට මනාපයක් නොදක්වති. දිවැසිවරුන්ගේ සහ අපෝස්තුළුවරුන්ගේ සාක්ෂි වලට ඇහුම්කන් දීමට ඔවුන් තුළ ආශාවක් නැත. නමස්කාර මෙහෙය තුළ යම් ආකාර සංවේගාත්මක නොහොත් හැඟීම් ඇවිස්සීමේ චින්තනයක්, ක්‍රියාවේදයක් නොපවතී නම් ඔවුන්ට එහි කිසිම වින්දනයක් නැත. දේව වචනයෙහි සරල ඉගැන්වීම් සහ අනුශාසනා වලින් ඔවුන්ට වැදගත්කමක් නැත. ඔවුන්ගේ සදාතන ශුභ සිද්ධිය පිළිබඳව වූ දෙසුම් කෙරෙහි ඔවුන්ගේ සිත් ඇදී නොයයි.

සත්‍යවාදී ලෙසින් ආගමට හැරුණාවූ සෑම බැතිමතෙකුගේම ජීවිතයෙහි මූලික ආශාව වන්නේ දෙවියන්වහන්සේ සමග සමීප ඇසුරක් පවත්වා ගෙන යෑමත් සදාතනික දේවල් පිළිබඳව මහත් ඇල්මක් දක්වීමත්ය. එහෙත් දෙවියන්වහන්සේට කැපවූ ආත්මයක් අද ඇත්තේ කිනම් ජනප්‍රිය සභාවකද? ආගමට හැරී සභාවට ඇතුළු වන්නාවූ බොහෝ අය තමන්ගේ අභිමානය අත්හැර දමා නිහතමානී වීමට කැමැත්තක් නොදක්වති. ඔවුහු ලෝකයට ඇති ආශාව අත්හැර දැමීමට මනාප නොවෙති. මමත්වය එපා කර මුදු මොලොක් ගුණයෙන් යුත් යේසු සමිඳාණන්ගේ කුරුසිය දරමින් උන්වහන්සේ අනුව යාමට, පෙර තිබුණාට වැඩි රුචියක්, හැරීමෙන් පසුවද, ඔවුන් තුළ දැකගත නොහැකිය. මිථ්‍යාදෘෂ්ඨිකයන්ගේ සහ නොඇදහිලිවන්ත මිනිසුන්ගේ ක්‍රීඩාවක් බවට ආගම් පත්වී තිබේ. මක්නිසාදයත්, යේසු සමිඳාණන්ගේ අනුගාමිකයන් යයි කියාගන්නාවූ බොහෝ අය තුළ ආගමික ප්‍රතිපත්ති ගැන කිසිම අවබෝධයක් නොමැත. දේව භක්තිකමේ බලය බොහෝ දෙව් මැදුරු තුළින් ඉවත්ව ගොස් ඇත. විනෝද සවාරි, ආගමික නාට්‍යයන්, සභා සල්පිල්, සුඛෝපභෝගී නිවෙස්, ස්වාභිමානය විදහා පෙන්වීම් යනාදිය මගින් දෙවියන්වහන්සේ පිළිබඳ චින්තනය මිනිසා තම සිතින් පළවා හැර තිබේ. ඉඩකඩම්, ද්‍රව්‍යමය භාණ්ඩ, සහ ලෝක වෘත්තීන් සහ රැකී රක්ෂා යන විෂයන් විසින් මිනිස් කල්පනාවන්



ගිලගෙන ඇත. සදාකාලික දේවල් පිළිබඳව සිතීමට තරම්වත් එබඳු මිනිසුන් තුළ උනන්දුවක් නොමැත.

ඇදහිල්ලෙහි සහ ශ්‍රද්ධාවෙහි වැටීයාමක් බොහෝ සභාවන් තුළ දැකගත හැකි වුවද, එම සභාවන්හි පවා සත්‍යවාදී කිතුණු අනුගාමිකයෝ සිටිති. දෙවියන්වහන්සේගේ විනිශ්චයන් ලෝකය මත අවසන් වරට පතිත වීමට පෙර දෙවි සමිඳාණන්ගේ සෙනඟ අතර මහා පරිමාණයේ ආත්ම පිබිදීමේ ක්‍රියාදාමයක් සිදුවීමට නියමිතව ඇත. එය වනාහි පුරාතනයේ තිබූ දේව-මනුෂ්‍ය සබඳතා නැවත වරක් ක්‍රියාත්මක වීමේ සංසිද්ධියයි. අපෝස්තුළුවරුන්ගේ කාලයෙන් මෙපිට එවන් නව ජීවන පිබිදීමක් මෙතෙක් සිදුවී නැත්තේය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් සහ බලය උන්වහන්සේගේ දරුවන් මත පතිත කරනු ලබන්නේය. දෙවියන්වහන්සේට සහ උන්වහන්සේගේ වචනයට වූ ආදරයට වඩා ලෝකයට සහ එහි ඇති දේවලට ඇල්ම දක්වූ සභාවන් වෙතින් බොහෝ අය ඉවත්ව එනවා ඇත. ක්‍රිස්තු සමිඳාණන්ගේ දෙවෙනි ඊම සඳහා ජනතාවක් සූදානම් කිරීම අරභයා ඔවුන්ට ලැබිය යුතු අගනා සත්‍යතාවන් පිළිගනිමින් ඒවා අනුගමනය කිරීමට දේවගැතිවරුන් මෙන්ම බැතිමතුන්ද බොහෝ දෙනෙක් යොමු වෙනවා ඇත. කිතුණුවන්ගේ සතුරා මෙම කර්තව්‍යයට බාධා පමුණුවනවා ඇත. විවිධ සභාවන්හි එබඳු තත්ත්වයක් ඇතිවීම වළක්වාලන පිණිස සාතන් ව්‍යාජ ක්‍රියාවේදයන් ඉදිරිපත් කරනවා ඇත. තමන්ගේ මුළා කිරීමේ බලයට අවනත කරගත හැකි සභාවන්ට දෙවියන්වහන්සේගේ විශේෂිත ප්‍රබල ආශිර්වාද වගුරුවා ඇතැයි යන්න දක්වීමට ඔහු මහත් සේ ක්‍රියාත්මක වෙනවා ඇත. ඒ අනුව ඉතා ප්‍රබල වූ ආගමික උනන්දුවක්, උද්‍යෝගයක් ක්‍රියාත්මක වන්නේ යයි පෙන්වා දීමට ඔහු ක්‍රියා කරනවා ඇත. දෙවියන්වහන්සේ තමන්ට පුදුමාකාර ආකාරයෙන් ආශිර්වාද කරන්නේ යයි මහත් සංඛ්‍යාත ජනකායක් ප්‍රීතියෙන් ඔල්වරසන් නඟනවා ඇත. එහෙත් මෙම කාර්යයෙහි නායකයා වෙනත් ආත්මයක් වන්නේය. ආගමික රාමුවක මුවාවෙන් සාතන් ව්‍යාජ මවාපෑමක් රඟ දක්වමින් කිතුණු ලෝකය තමාගේ ආනුභාවය යටතට පත්කර ගැනීමට තියුණු වෙහෙසක් දරන්නේය.

පසුගිය අඩ සියවස් කාලය පුරා පැවති ආත්මික පිබිදීමේ රැස්වීම් මාලා බොහොමයක මෙම අනුබලය ක්‍රියාත්මකව පැවැති බව නොරහසකි. අනාගත රැස්වීම් මාලාවන්හිදීද මෙම කර්තව්‍යය ඉතා ප්‍රබල ආකාරයකින් බලපෑම් කරනවා ඇත. මෙහි ව්‍යාප්තියද ඉතා පුළුල්ය. සිතෙහි ආවේගයන් ඇවිස්සීමක් මෙම රැස්වීම් තුළින් බහුලව ක්‍රියාත්මක වේ. සත්‍යතාව සමග මිශ්‍රිත ප්‍රබල උද්වේගයක් මෙම රැස්වීම් තුළ බහුලව පවතින්නේය. බැතිමතුන් නොමඟ යැවීම

සඳහා මෙම සුසංයෝගය ප්‍රබල අවියක් වනවා ඇත. එසේ වුවද, සත්‍යය වටහාගෙන සිටින්නාවූ අය මුළාවට පත් නොවිය යුතුය. දේව වචනය තුළ නිධන්ගතව ඇති ආලෝකය මගින් මෙම ව්‍යාපාරයන් හඳුනා ගැනීම අපහසු නොවෙනවා ඇත. බයිබලයෙහි අඩංගු සාක්ෂි නොසලකා හරිමින්, හෘදය සාක්ෂියට කථා කරන සරල සත්‍යතා හඬට ඇහුම්කන් නොදෙන්නාවූ අය ආත්ම-පරිත්‍යාගය සහ ලෞකික සම්පත් අත්හැර දැමීමට වෑයම් කිරීමක් නොකරන්නේ නම් ඔවුන්ට දෙවියන්වහන්සේගේ ආශිර්වාද නොලැබෙන බව නියතය. "ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් ඇඳින ගන්නහුය"යි ක්‍රිස්තුස්වහන්සේම ප්‍රකාශ කළ නියමය අනුව, මෙම ආත්ම-පුබුදුවා ලීමේ රැස්වීම් මාලා දෙවියන්වහන්සේගේ ආනුභාවය ලද ක්‍රියා කිරීම් නොවන බව පැහැදිලි වෙයි.

තමන්වහන්සේගේ වචනයෙහි අඩංගු සත්‍යතාවන් තුළ දෙවියන්-වහන්සේ තමා පිළිබඳව හෙළිදරව් කිරීමක් මනුෂ්‍යයා හට ලබාදී ඇතිසේක. එම වදන් පිළිගන්නාවූ අයට එය සාතන්ගේ මුළා කිරීම්වලට එරෙහිව නැගී සිටීමට පළිහක් වෙනවා ඇත. ආගමික ලෝකයේ මුල් බැසගෙන ඇති අධම ක්‍රියාදාමයන්ට දොරටු විවෘත වන්නේ දේව වචනයේ ඇත්තාවූ මේ සත්‍යතාවන් නොසලකා හැරීම නිසාය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි වැදගත්කම සහ එහි ස්වභාවය අද විශාල වශයෙන් මිනිස් අවධානයෙන් බැහැරව ගොස් ඇත. දිව්‍ය නීති පද්ධතියෙහි සදාතනික පැවැත්ම සහ එයට අපගේ වගකීම් සම්භාරය පිළිබඳව වූ වැරැදි ආකල්ප බොහෝය. ඒ නිසාම ජීවිත වෙනස්වීම හා ශුද්ධත්වය කරා යොමු වීම පිළිබඳව වූ ප්‍රමිති පහත් මට්ටමක් කරා කිඳා බැස ඇත. වත්මන් කාලයේ ඇත්තාවූ ආත්ම පිබිදවීමේ රැස්වීම්වල ආත්මයාණන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය සහ දෙවි සමිඳාණන්ගේ බලයේ ප්‍රදර්ශණය දකගැනීමට නොහැකි වීමේ රහස මෙම කරුණ වන්නේය.

ශ්‍රද්ධාව සහ භක්තිය පිළිබඳව නමක් දරන්නාවූ බැතිමතුන් විවිධ නිකායන්හි සිටින බව නොරහසකි. සභාවෙහි පවත්නා ශ්‍රද්ධාව ගැන ඔවුහු සංවේගාත්මක ලෙස වැළපෙති. මෙම මහත් අනතුරුදායක පහත් මට්ටමකට බැස තිබීම උපද්‍රවය පිළිබඳව එඩ්වර්ඩ් ඒ. පාර්ක් මහාචාර්යා වරයා මෙසේ පවසයි. "දිව්‍ය ව්‍යවස්ථාව සෑම කල්හිම බලපැවැත්වෙන බව දේශනා කුඩුවෙන් ප්‍රකාශයට පත් නොකිරීම මෙම අනතුරුදායක තත්ත්වයට එක් සාධකයකි. පසුගිය වකවානුවන්හිදී දේශනා කුඩුව වනාහි මිනිස් හෘදයසාක්ෂිය ප්‍රතිරාවය කළ මාධ්‍යයක් විය..... අපගේ සත්කීර්තිමත් දේශනා වේදීහු තමන්ගේ සමිඳාණන් අනුගමනය කරමින් තම දෙසුම්වලින් සත්‍යතාවයට මහත් වටිනාකමක්



දැක්වූහ. සමිඳාණන් අනුගමනය කරමින් ඔවුහු ව්‍යවස්ථාවට, එහි ආඥාවන්ට සහ එම ආඥා හා බැඳි ඉගැන්වීම් වලට ප්‍රමුඛත්වයක් ලබා දුන්නෝය. දහම හා බැඳි විශිෂ්ඨ වූ සිද්ධාන්ත යුගල ඔවුහු නැවත නැවත ප්‍රකාශ කළෝය. එනම්, ව්‍යවස්ථාව වූකලී දිව්‍යත්වයේ පරිපූර්ණ පිටපතක් බවද ව්‍යවස්ථාවට ආදරය නොදක්වන තැනැත්තේ ශුභාරංචියට ආදරය නොකරන්නේය යන්නද මේ සිද්ධාන්තයන්ය. මක්නිසාදයත් ව්‍යවස්ථාව මෙන්ම ශුභාරංචියද දෙවියන්වහන්සේගේ සත්‍යවාදී චරිත ගුණාංග පිළිබිඹු කරන කැඩපතක් වන්නේය. මෙම සිද්ධාන්ත යුගලය නොසලකා හැරීම තවත් උපද්‍රවයකට මගපෙන්වන්නේය, එනම්, පාපයේ භයානක නපුරට අඩු තක්සේරුවක් ලබාදීමය. එමගින් උදාවන්නාවූ තත්ත්වය නම් පාපයේ පුළුල්තාව අවම කරමින් පාපයේ බරපතලතාව සැහැල්ලුවට ලක්කිරීමය. ව්‍යවස්ථාවන්හි දැහැමිතාවට අනුකූලවම, ඒ ආඥාවන්ට අකීකරු වීමේ පව්ටුතාවද සමානතාවක් දරයි."

"කලින් සඳහන් කළ අවදානම් හා බැඳි තවත් අවදානමක් නම්, දෙවියන්වහන්සේගේ සාධාරණකම පහත් කිරීමය. දේශනා කුඩු මගින් වත්මනදී නික්මෙන්නාවූ දෙසුම් තුළින් දකගන්නට ඇත්තේ දිව්‍ය ත්‍යාගශීලීත්වයෙන් දිව්‍ය සාධාරණකම පෙරා ඉවත් කිරීමය; දේව ත්‍යාගවන්ත ගුණය හැඟුම්බර චින්තනයකට බැර කොට එය ප්‍රතිපත්තියක් ලෙස නොසැලකීමය. දෙවියන්වහන්සේ විසින් එක් කර ඇති මේ දේවල් නව දේව ධර්ම සංකල්ප මගින් වෙන් කර ඇත. දිව්‍ය ව්‍යවස්ථාව යහපතක්ද නැතිනම් නපුරක්ද? එය යහපත් දෙයකි. එසේ නම් යුක්ති සහගත සාධාරණයද යහපත් දෙයකි. එමගින් ව්‍යවස්ථා පනත අනුව වරදට විනිශ්චයක් තීන්දු කළ හැකි වේ. දිව්‍ය ව්‍යවස්ථාවද යුක්ති සාධාරණත්වයද අව තක්සේරුවකට පත්කිරීමක් මගින් අකීකරුකමෙහි විශාලත්වය සහ අවගුණය සැහැල්ලුවට පත් කර ඇත. මෙම චින්තනය නිසා මිනිසාගේ පාප උදෙසා කමාව ලබාදීමෙහි ලා ක්‍රියාත්මක වන්නාවූ දිව්‍ය කරුණා-මෛත්‍රිය අඩු තක්සේරුවකට ලක්කර සිතීමට මිනිසා පෙළඹී ඇත." මෙම චින්තන ක්‍රියාවේදය කරණකොටගෙන ශුභාරංචිය සතු වටිනාකම සහ වැදගත්කම මිනිස් මනසෙන් ඉවත්වී ගිලිහී යන්නේය. මෙහි ප්‍රතිඵලය වන්නේ ශුද්ධවූ බයිබලය ඉවත ලෑමට පවා මිනිසා යොමු වීමය.

ක්‍රිස්තුස් දෙවි සමිඳාණෝ තමන්වහන්සේගේ මරණය මගින් දස පනත අහෝසි කළ බවට බහුතර ආගමික ගුරුවරු සහතික වෙති. එමගින් දස පනතින් අපේක්ෂා කරන්නාවූ ඉල්ලීම් වලින් මිනිසා නිදහස් බවට ඔවුහු දහම් දෙසති. තවද දස පනතට කීකරුව ජීවිතය හැඩගස්වා ගැනීම හිංසාවාදී වියදණ්ඩක් ලෙස හැඳින්වීමටද සමහරු

පසුබට නොවෙති. ව්‍යවස්ථාවට කීකරුවීමෙහි වහල් භාවයෙන් මිදී ශුභාරංචිය උදාකර දෙන්නාවූ නිදහස භුක්ති විඳින්නැයි ඔවුහු බැතිමතුන් දිරි ගන්වති.

එසේ වුවද, දෙවියන්වහන්සේ විසින් එවනු ලැබූ දිවැසිවරු සහ අපෝස්තුළුවරු එසේ කල්පනා නොකළෝය. දාවිත් මෙසේ පවසා ඇත. "මම නිදහස් ලෙස හැසිරෙන්නෙමි. මක්නිසාද ඔබගේ නියෝග සෙවීමි." (ගීතාවලිය 119: 45). ඒ අතර අපෝස්තුළු යාකොබ් ක්‍රිස්තුස්-වහන්සේගේ මරණයෙන් පසුකලෙක තම ලිපියෙහි දස පනත හඳුන්වා දෙන්නේ "රාජකීය ව්‍යවස්ථාව" ලෙසටය, "නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව" හැටියටය. (යාකොබ් 2:8; 1:25) ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිපත් වීමෙන් අඩ සියවසකට පසුව දස පනත පවත්වන්නාවූ අයට මෙවන් ආශිර්වාදයක් හිමි වන බව එළිදරව් පොත ප්‍රකාශ කරයි. එනම් "ජීවන වෘක්ෂයට පැමිණෙන්ට අයිතිවාසිකම ලැබෙන පිණිසත්, දොරටු වලින් නුවරට ඇතුල්වන්ට පුළුවන් වන පිණිසත් තමුන්ගේ සළු සෝදාගන්නාවූ තැනැත්තෝ (එනම් දස පනත රකින්නෝ) ආශිර්වාද ලද්දෝය යන්නය. (එළිදරව් 22:14).

තමන්වහන්සේගේ මරණය මගින් ක්‍රිස්තුස්වහන්සේ ස්වකීය පියාණන්වහන්සේගේ රාජකීය ව්‍යවස්ථාව අවලංගු කළ සේකැයි යන ඉගැන්වීම පදනම් විරහිතය. දස පනත වෙනස් කිරීමට හෝ කටුගා දැමීමට හැකියාවක් වී නම් පාපයේ දඬුවමින් මිනිසාව මුදවාලීමට ක්‍රිස්තුස්වහන්සේ මරණයට පත්වීමේ අවශ්‍යතාවක් උදා නොවන්නේය. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය මගින් සනාථ වූයේ ව්‍යවස්ථාව අවලංගු කළ හැකි දෙයක් නොවන බවය. එය වෙනස් කළ නොහැකි බව උන්වහන්සේගේ මරණය ස්ථිර කළේය. දේව පුත්‍රයාණන් මෙලොවට වැඩියේ, "ව්‍යවස්ථාව උතුම් කොට ඊට ගෞරව කරන" පිණිසය. (යෙසායා 42:21) උන්වහන්සේ මෙසේ පැවැසූ සේක. "ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගු කරන පිණිස මම ආවෙමි යි නොසිතන්න. සම්පූර්ණ කරන්ට මිස අවලංගු කරන්ට නාවෙමි. සැබවක් නුඹලාට කියමි. අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවේ එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය." (මතෙව් 5:17,18). ගීතිකාකාරයා මෙසේ ප්‍රකාශ කළේය: "මාගේ දෙවියන්වහන්ස, ඔබගේ කැමැත්ත කරන්ට ප්‍රිය වෙමි. එසේය, ඔබගේ ව්‍යවස්ථාව මාගේ සිත තුළෙහි යයි කීමී." (ගීතාවලිය 40:8).

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව වෙනස් කළ නොහැකිය. ඒවායේ කෙටුම්පත වනාහි ඒවායේ කතුවරයාණන්ගේ කැමැත්ත (චින්තනය)



සහ චරිතය එළිදරව් කරන්නකි. දෙවියන්වහන්සේ ප්‍රේමය වනසේක. එසේම උන්වහන්සේගේ ව්‍යවස්ථාවද ප්‍රේමය වන්නේය. එහි ප්‍රධානතම ප්‍රතිපත්ති යුගල වන්නේ දෙවියන්වහන්සේට ආදරය පුද කිරීමත්, සහෝදර ජනතාවට ආදරය කිරීමත්ය. "ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීමය" (රෝම 13:10). දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග වනාහි දැහැමිතාව සහ සත්‍යතාව වන්නේය. උන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ගුණාත්මක ස්වභාවයද එසේම වන්නේය. ගීත රචකයා තම සිතුවිලි මෙසේ ගැයුමට යොමු කරයි. "ඔබගේ ධර්මිෂ්ඨකම සදාකාලික ධර්මිෂ්ඨකමක්ය. ඔබගේ ව්‍යවස්ථාවද සත්‍යයය." "ඔබගේ සියලු ආඥා ධර්මිෂ්ඨකම" වන්නේය. (ගීතාවලිය 119:142,172). අපෝස්තුළු පාවුල් ව්‍යවස්ථාව ගැන මෙවන් ඇගයීමක් කරයි. "ව්‍යවස්ථාව ශුද්ධය, ආඥාවද ශුද්ධය, ධර්මිෂ්ඨය, යහපත්ය." (රෝම 7:12). දෙවියන්-වහන්සේගේ චින්තනය සහ කැමැත්ත ප්‍රකාශ කරන්නාවූ එවන් ව්‍යවස්ථාවක් එහි කතුවරයාණන් මෙන්ම, සදාතනය පුරා පවත්නේය.

සංවර්තනය (දෙවියන්වහන්සේ වෙතට හැරීම) සහ ශුද්ධතාවයට පත්වීම යන කාර්යයන්හි මූලික අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ප්‍රතිපත්ති අනුගමනය කරමින් එය ජීවිත රටාවෙහි අංගය කරගැනීමට මගපෙන්වීමය. ආරම්භයේදී මිනිසා මවන ලද්දේ දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුවය. හෙතෙම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව හා එහි ස්වභාවය සමග පූර්ණ එකඟතා සහයෝගයකින් යුක්ත විය. දැහැමිතාවෙහි ප්‍රතිපත්ති ඔහුගේ හදවතෙහි කෙටුම්පත් කර තිබිණ. එහෙත් මිනිසා පාපයට ගොදුරු වීමත් සමගම ඔහුට තම මැවුම්කාරයාණන් සමග තිබූ සබැඳියාව බිඳී ගියේය. තවදුරටත් ඔහු තුළින් දිව්‍ය ප්‍රතිරූපය එළිදරව් වීම අහෝසි වී ගියේය. ඔහුගේ සිතුවිල්ල දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළේය. "මාංසයේ ඇල්ම දෙවියන්වහන්සේට සතුරුකමය; ඒක දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් නැත. යටත්වෙන්ටත් බැරිය." (රෝම 8:7). කරුණු මෙසේ සිදුවෙද්දී "දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක." උන්වහන්සේ එසේ කළේ ලෝකයා තමන්වහන්සේට සමගි කරවා ගැනීමටය. ක්‍රිස්තුස්වහන්සේගේ කුසලතාවන් හෙවත් යහ ගුණය කරණකොටගෙන මිනිසාව තම මැවුම්කාරයාණන් සමග සංගතියකට හෙවත් ඒකත්වයකට පමුණුවා ලීමට දොරටු විවෘත විය. ඔහුගේ හදවත දිව්‍ය කරුණා-අනුග්‍රහයෙන් නව ජීවිතයක් කරා යොමු විය යුතුය. ඔහු අළුත් ජීවිතයක් ඉහළින් ලබා ගත යුතුය. මෙම වෙනස නම් අළුත් ජීවිතයක් ආරම්භ වීමය. මෙම වෙනස නොමැතිව එනම්, අලුතෙන් නූපන්නොත් මිනිසාට "දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට අවස්ථාව ලැබෙන්නේ නැතැ"යි යේසුස්වහන්සේ පවා ප්‍රකාශ කළසේක.

දෙවියන්වහන්සේ හා සමගි වීමේදී උන්වහන්සේට සම්බන්ධ වීමේ මුල් පියවර නම් පාපය ඒත්තු ගැනීමයි. සැබවින්ම පාපය යනු දේව නීතිය එනම් ව්‍යවස්ථාව කඩකිරීමයි. "ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය දැනගැනීම වේ." (1 යොහන් 3:4; රෝම 3:20). තමාගේ වරද (පාපය) පිළිබඳව නිවැරැදි අවබෝධයක් ලබගැනීමට නම්, පව්කාරයා තමාගේ චරිතය, තමාගේ ක්‍රියාදාමය දෙවියන්වහන්සේගේ දැහැමිතාවේ මිනුම් දණ්ඩ ඉදිරියෙහි පිරික්සා බැලීම අනිවාර්ය වේ. ව්‍යවස්ථාව වනාහි දැහැමි චරිතයක පරිපූර්ණතාවය විදහා පෙන්වන්නාවූ කැඩපතකි. එමගින් පව්කාරයාට තමාගේ ජීවිතයෙහි අඩුපාඩුකම් දකගැනීමට, විමර්ශනය කරගැනීමට අවස්ථාව උදා වන්නේය.

පුද්ගලයෙකුගේ පාප මොනවාදැයි හෙළිදරව් කිරීමට ව්‍යවස්ථාව සමත් වේ. එහෙත් එම පාපයන්ට පිළියමක් ලබාදීමට එම ව්‍යවස්ථාව සමත් නොවේ. කීකරුවන්නා හට ජීවිතය ලබාදීමට ව්‍යවස්ථාව මගින් පොරොන්දුවක් තිබෙන නමුත් එය උල්ලංඝනය කරන්නාගේ කොටස වන්නේ මරණය බවද එය පවසයි. පව්කාරයාව වරදට පත්කිරීමෙන් හෝ දූෂ්‍ය වීමෙන් මුදවාගත හැක්කේ ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට පමණක්මය. පව්කාරයා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇත. එහි දඬුවමින් මිදීම සඳහා හෙතෙම දෙවියන්වහන්සේ ඉදිරියෙහි පසුතැවීමට භාජනය විය යුතුය. ඒ අතර ඔහු තම පාප උදෙසා වන්දි ගෙවීමේ, සමගි කිරීමේ පූජාවක් කළ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල ක්‍රියාත්මක කළ යුතුය. එම ක්‍රියාවේදය තුළින් පූර්වයෙහි කරන ලද සියළු පාපයන්ට සමාවත් එම පව් සෝදා හැරීමත් සිදුවන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස පව්කාරයා දිව්‍ය ස්වභාවයෙහි කොටස් කාරයෙකු වෙනවා ඇත. දැන් ඔහු දෙවියන්වහන්සේගේ දරුවෙකි, උන්වහන්සේ ඔහුව දරුකමට භාරගෙන ඇති සේක. "අබ්බා පියාණෙනි," කියා දෙව් සමිඳාණන් ඇමතීමේ භාග්‍යය ඔහුට උදා වේ, ඔහුට ඒ වරම ලැබේ.

ඉදින් ඔහුට දැන් ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ නිදහස අත්වන්නේද? පාවුල් මෙම පැනයට පිළිතුරු සපයයි. "එසේවී නම් අපි ඇදහිල්ල කරණකොටගෙන ව්‍යවස්ථාව අවලංගු කරමුද? එසේ නොවේවා. අපි ව්‍යවස්ථාව ස්ථිර කරමුව." "පාපයට මළාවූ අපි තවත් එහි කෙසේ ජීවත්වමුද?" (රෝම 3:31;6:2). මේ පිළිබඳව යොහන්ද මෙසේ ප්‍රකාශ කරයි, "දෙවියන්වහන්සේට ප්‍රේමවීම නම් අප විසින් උන්වහන්සේගේ ආඥා පැවැත්වීමය. උන්වහන්සේගේ ආඥා බර නැත." (1 යොහන් 5:3). අළුත් උපත උදාවීමත් සමගම දෙවියන්වහන්සේ හා සමග එකඟතාවයකට හදවත ගෙන එනු ලබන්නේය, දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවීම නිසා එසේ වන්නේය. මේ බලවත්



ප්‍රබල වෙනස්වීම තුළින් පව්කාරයා මරණින් ජීවනයට පත්කරනු ලබන්නේය, පාපයෙන් ශුද්ධතාවයට පත්කරනු ලබන්නේය, ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමෙන් සහ කැරැළි ගැසීමෙන් ඉවත්වී කීකරුකමට සහ පක්ෂපාතීකමට පත්කරනු ලබන්නේය. දෙවියන්වහන්සේගෙන් ඈත්වී තිබූ පරණ ජීවිතය නිමාවට පත්වෙයි. ඇදහිල්ලෙහි සහ ආදරයෙහි ස්ථාපිතවූ සමගි කරනු ලැබූ ජීවිතය ආරම්භ වෙයි. එවිට මිනිස් ස්වභාවයේ පෙළඹවීමෙන් ලෞකික ලෙස නොව ආත්මයාණන්-වහන්සේගේ මගපෙන්වීමෙන් අධ්‍යාත්මික ලෙස දිවි ගෙවන අප තුළ ව්‍යවස්ථාවේ දැහැමි අරමුණු සපුරාම ඉටුවනවා ඇත. එවිට ජීවිතය පුරා ඒකනාද වන්නාවූ ගීතය වන්නේ, "ඔබගේ ව්‍යවස්ථාවට මම කොපමණ ප්‍රේම කරම්ද! දවස මුළුල්ලේම ඒක මගේ භාවනාවය." යන්නය (ගීතාවලිය 119:97).

"ස්වාමීන්ගේ ව්‍යවස්ථාව සම්පූර්ණය, ආත්මය ප්‍රාණවත් කරන්නේය." (ගීතාවලිය 19:7). දෙව් සමිඳාණන්ගේ ධර්මිෂ්ඨ ව්‍යවස්ථාව නොමැතිව දෙවියන්වහන්සේගේ පාරිශුද්ධතාවය සහ උත්තමභාවය පිළිබඳව සංකල්පනයක් ඇති කරගැනීමට මිනිසාට හැකියාවක් ඇති නොවේ; තමන්ගේ වරද සහ අපවිත්‍රකම පිළිබඳව දැනගැනීමටද මිනිසාට හැකියාවක් උදා නොවේ. ව්‍යවස්ථාවක් නැති කල්හි තමා පව්කාරයෙක්ය යන හදපත්ලෙන් නැගී එන්නාවූ චින්තනයක් මිනිසාට උපදින්නේ නැත. ඒ නිසාම ඔහුට පසුතැවිලි වීමට උවමනා බව නොවැටහෙන්නේය. තමා දෙවියන්වහන්සේගේ විශ්වීය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ වරදකරුවන්ය යන ඒත්තු ගැනීමක් මිනිසා තුළ ජනිත නොවන නිසාම පාපයට වන්දි ගෙවීම සඳහා වූ ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ පූජාවේ අවශ්‍යතාවය ගැන ඔවුන්ට හැඟීමක් උදා නොවේ. ඔවුන් ගැළවීමේ බලාපොරොත්තුව පිළිගන්නා නමුත් ඔවුන් තුළ හෘදයාංගම ජීවිත වෙනස් වීමක් සිදුවී නැත, ජීවිත ප්‍රතිසංස්කරණයක් සිදු වී නැත. මෙසේ මතුපිටින් පමණක් වූ නොගැඹුරු ආගමික හැරීමක් ඇතිව විශාල ජනකායක් සභාවට එකතු වෙයි. එහෙත් ඔවුන්ගෙන් බහුතරයක් ක්‍රිස්තුස්වහන්සේ සමග කිසිම දිනක සම්බන්ධ වී නොමැත. උන්වහන්සේ සමග ඒකත්වයකට පැමිණ නැත.

දිව්‍ය ව්‍යවස්ථාව එපා කිරීම හෝ නොසලකා හැරීම මගින් ශුද්ධවූ ජීවිතයක් ගතකිරීම පිළිබඳ වැරැදි සිද්ධාන්ත බහුල ලෙස පැතිරෙමින් පවතී. වත්මන් දවසෙහි වූ බොහෝ ආගමික නිකායන් අතර මෙම වැරදි ඉගැන්වීම් ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇත. මෙම මත වේදයන් කිතුණු මූල ධර්මයන්ට පටහැනිවනවා පමණක් නොව ප්‍රායෝගිකව භයානක ප්‍රතිඵලද උදාකර දෙනවා නියතය. මෙම

මතවේදයන් මූලධර්ම හා එකඟය යන සිතුවිල්ලෙන් බොහෝ දෙනා මෙම මතවේදයන් පිළිගනිති. එහෙයින් මෙම විෂය පිළිබඳව සැවොම පැහැදිලි අවබෝධයක් ලබාගැනීම අනිවාර්යයෙන්ම සිදුවිය යුතු දෙයකි.

අප ශුද්ධවූ ජීවිත ගතකිරීම බයිබලීය ධර්මයකි. තෙසලෝනික සභාවට අපෝස්තුළු පාවුල් යැවූ හසුනෙහි මෙවන් ප්‍රකාශනයක් ඇත. "දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය." ඔහුගේ යාච්ඤාව නම්, "සමාදානයේ දෙවියන්වහන්සේ නුඹලා සහමුලින්ම පවිත්‍ර කරන සේක්වා!" යන්නය. ශුද්ධවූ ජීවිතයක් ගතකිරීම යනු කුමක්ද කියාත් එය අත්පත් කරගත හැක්කේ කෙසේද කියාත් ශුද්ධවූ බයිබලය පැහැදිලිව විස්තර කරයි. "සත්‍යතාවෙන් ඔවුන් පවිත්‍ර කළ මැනව, ඔබගේ වචනය සත්‍යතාවය" යනුවෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන් ගෝලයින් උදෙසා යාච්ඤා කළසේක. (යොහන් 17:17). සැදැහැවතුන් "ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ශුද්ධ කරනු" ලබන්නේ යයි පාවුල් උගන්වන්නේය (රෝම 15:15). ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාදාමය කුමක්ද? යේසුස්වහන්සේ තම ගෝලයන්ට මෙසේ පැවැසූ සේක. "උන්වහන්සේ එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කළ, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වන සේක." (යොහන් 16:13). ගීත විශාරදයාද මෙසේ අත්වැල සපයයි. "ඔබගේ ව්‍යවස්ථාවද සත්‍යය." දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි අන්තර්ගතව ඇති ධර්මිෂ්ඨකමේ ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්ති දේව වචනය තුළින් සහ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මගින් මිනිස් දසුනට විවෘත කර ඇත. දෙවියන්වහන්සේගේ "ව්‍යවස්ථාව ශුද්ධය, ආඥාවද ශුද්ධය, ධර්මිෂ්ඨය, යහපත්ය." එය දිව්‍ය පරිපූර්ණත්වයේ විවෘතවූ පිටපතකි. එම නිසා එම ව්‍යවස්ථාවට අනුකූලව, කීකරුව ගොඩ නගා ගන්නාවූ චරිතයද ශුද්ධවූ එකක් බවට පත්වීම අනිවාර්යය. ක්‍රිස්තු චරිතය එවන් පරිපූර්ණතාවයේ ආදර්ශයකි. උන්වහන්සේ මෙසේ පවසන සේක. "මම මාගේ පියාණන්වහන්සේගේ ආඥා රක්ෂා" කළෙමි, "උන්වහන්සේට ප්‍රසන්න වූ දේවල් මම නිතරම කරමි." (යොහන් 15:10; 8:29). ක්‍රිස්තු අනුගාමිකයෝ උන්වහන්සේ මෙන් විය යුත්තාහ. ඔවුහු දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ව්‍යවස්ථාවට අනුකූල චරිතයන් ගොඩ නගා ගත යුත්තෝය. එය දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය මගින් පමණක්ම කළ හැකිය. බයිබලීය ධර්මය අනුව ශුද්ධවූ ජීවිතයක් ගතකිරීම මෙයින් අදහස් වෙයි.

මේ දෙය ඉටුකර ගැනීමේ මාධ්‍යය වන්නේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල පමණක්ය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් අප තුළ වාසය කිරීමේ භාග්‍යය මගින් පමණක් එය කළ හැකිය. පාවුල් බැතිමතුන් හට මෙසේ අනුශාසනා කරයි: "භයෙනුත්, වෙවුලුමෙනුත්



නුඹලාගේම ගැළවීම ඉෂ්ට කරගන්න. මක්නිසාද තමන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා, කැමැති වෙන්ටත්, වැඩ කරන්ටත් නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමය." (පිලිප්පි 2:12,13). නිරන්තරයෙන්ම පාපයට පෙළඹවීම් කිතුණු බැතිමතාට ඇති වෙයි; එහෙත් හෙතෙම එයට විරුද්ධව සටන් කිරීමේ නිරතුරුවම යෙදී සිටින්නේය. ක්‍රිස්තුස්වහන්සේගේ සහාය අවශ්‍ය වන්නේ මෙවන් අවස්ථාවන්හිදීය. මෙහිදී මිනිස් දුබලතාව දිව්‍ය ශක්තිය සමග අත්වැල් බැඳ ගන්නේය. එවිට ඔහු ඇදහිල්ලෙන් මෙසේ පවසයි: "අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තූති වේවා." (1 කොරින්ති 15:57).

ශුද්ධ වූ ජීවිත ගතකිරීම වනාහි පියවරෙන් පියවර දියුණු වන්නාවූ ප්‍රගතිශීලී වැඩ පිළිවෙලක් බව ශුද්ධ ලියවිල්ල පැහැදිලි ලෙස පෙන්වා දෙයි. ජීවිතය වෙනස් වීමේදී ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ රුධිරය මගින් පව්කාරයාට දෙවියන්වහන්සේ සමග සමාදානය හිමි වේ. කිතුණු ජීවිතය මේ සමගම පටන් ගැනේ. ඊටපසු හෙතෙම "සම්පූර්ණත්වය කරා" ගමන් කළ යුතුය. ක්‍රිස්තුස්වහන්සේගේ පරිපූර්ණත්වය අංග සම්පූර්ණව අත්කර ගනිමින් අප සැමත් එම තත්ත්වයට පැමිණෙන තෙක්, වර්ධනය වීම අත්‍යාවශ්‍යය. අපෝස්තුළු පාවුල් මෙසේ පවසයි, "නුමුත් එකක් කරමි. එනම්, පස්සෙන් තිබෙන දේ මතක නැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගන යමින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පල කරා දුවමි." (පිලිප්පි 3:13,14). ශුද්ධවූ බයිබලය ඉදිරිපත් කරන මේ ශුද්ධ භාවය කරා පැමිණීම පිණිස අනුගමනය කළ යුතු පියවරවල් පේතෘස් මෙසේ අප ඉදිරියෙහි දිග හැර පා ඇත: "එසේය, මේ කාරණය නිසාම මුළු උත්සාහයෙන් නුඹලාගේ ඇදහිල්ල සමග ගුණයද, ගුණය සමග දැනගැන්මද, දැනගැන්ම සමග පමණ දැන ක්‍රියාකිරීමද, පමණ දැන ක්‍රියාකිරීම සමග ඉවසිල්ලද, ඉවසිල්ල සමග දේවභක්තියද, දේව භක්තිය සමග සහෝදර ස්නේහයද, සහෝදර ස්නේහය සමග ප්‍රේමයද සපයාගන්න. ... මක්නිසාද නුඹලා මේ දේ කරනවා නම් කිසි කලෙකත් පැකිලෙන්නේ නැත." (2 පේතෘස් 1:5-10).

බයිබලීය පාරිශුද්ධිකරණය අත්දකින්නාවූ අය නිහතමානී කමෙහි ආත්මයක් පෙන්නුම් කරනවා ඇත. මෝසෙස් මෙන් ඔවුන්ද ශුද්ධත්වයේ ගාම්භීර තේජස්ශ්‍රීය අත්දක ඇත. අද්විතීය සර්ව බලධාරී තැනැන්වහන්සේගේ පාරිශුද්ධතාවත්, පරිපූර්ණතාවත් ඉදිරියෙහි තමන්ගේ නොවටිනාකම ඔවුන්ට දකගැනීමට හැකි වනවා ඇත.

නිර්මල පාරිශුද්ධිකරණයට භාජනය වූ තැනැත්තෙකු පිළිබඳව දිවැසිවර දානියෙල් ආදර්ශයක් විය. ඔහුගේ දිගුකාලීන ජීවිතය තමන්ගේ

ස්වාමින්වහන්සේගේ උදාර සේවය වෙනුවෙන් කැපවූ දිවියක් විය. හෙතෙම සගයෙහි "බොහෝ ප්‍රේම ලත් මනුෂ්‍යයෙක්" විය. එහෙත් ගෞරවයට භාජනය වූ මෙම දිවැසිවරයා තමා පවිත්‍රවූද, ශුද්ධවූ ද තැනැත්තෙකු යයි උදාරම් බස් පැවසුවේ නැත. ඊශ්‍රායෙල්හි පව්කාර ජනතාව සමග ඔහු තමාව හඳුන්වා ගත්තේය. තම ජනතාව වෙනුවෙන් දෙවියන්වහන්සේගේ දයාව ඉල්ලා සිටි හෙතෙම තම යාච්ඤාව ඔප්පු කළේ මෙසේය: "අපේ කන්නලව් අප විසින් ඔබ ඉදිරියෙහි ඔප්පු කරන්නේ අපේ ධර්මිෂ්ඨකම් නිසා නොව, ඔබගේ මහත් අනුකම්පාවල් නිසාය." "අපි පව් කළෙමුව, දුෂ්ටකම් කළෙමුව." ඉක්බිතිව ඔහු මෙසේද ප්‍රකාශ කළේය. "මා කථාකර යාච්ඤා කරමින්ද, මාගේ පාපය සහ මාගේ සෙනඟ වූ ඉශ්‍රායෙල්වරුන්ගේ පාපයත් කියා දෙමින්ද" සිටියෙමි. (දානියෙල් 9:18,15,20). පසු දවසක දේව පුත්‍රයාණන්වහන්සේ ඔහුට උපදෙස් දීමට පැමිණි විට ඔහුගේ පැවැත්ම මෙසේ විය. "මා කෙරෙහි මාගේ ශෝභනකමද අජීවකමට හැරුණේය. කිසි ශක්තියක්ද මා තුළ නොපැවතුණේය." (දානියෙල් 10:8).

සුළි සුළඟේ සිට ස්වාමින්වහන්සේ යෝබ්ට කථා කළ අවස්ථාවේදී ඔහු මෙසේ පැවසුවේය. "එබැවින් මම මටම පිළිකුල් කොට, දූවිල්ලෙත් අළුවලත් හිඳ පශ්චාත්තාප වෙමි." (යෝබ් 42:6). යෙසායාට දෙවියන්-වහන්සේගේ තේජස්ශ්‍රීයේ මහිමාලංකාරය දකගන්නට අවස්ථාවක් උදා විය. එහි සිටි කෙරුබ්වරු හඬ නඟමින්, "සේනාවල ස්වාමින්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය" කියමින් දෙව් සමිඳාණන් නමදිනවා දුටු විට ඔහු මෙසේ මොර ගැසීය. "අහෝ! මට දුක්වේ! මක්නිසාද මට විනාශය වී ය"යි ඔහු කියා ගත්තේය. (යෙසායා 6:3,5) පාවුල්ව තුන්වන ස්වර්ගය දක්වා ඔසවා ගනු ලැබීය. ස්වර්ගීය පාරාදීසයට ඔසවා ගනු ලැබූ ඔහුට එහිදී මිනිස් මුවින් පැවසීමට වරම් නැති, මිනිස් බසින් පැවැසිය නොහැකි දෑ අසන්නට ලැබුණේය. එවන් අත්දකීම් ලද හෙතෙම තමා ගැනම හඳුන්වා දෙන්නේ දෙවියන්වහන්සේගේ ජනතාව වන "සියළු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තා" වශයෙන්ය. (2 කොරින්ති 12:2-4; එපීස 3:8). යේසුස්වහන්සේගේ ළපැත්තට හේත්තු වී උන්වහන්සේගේ තේජස් මහිමාලංකාරයේ දර්ශනය ලැබූ යොහන්, දේව දූතයාගේ දෙපා ඉදිරියෙහි මළාක් මෙන් ඇද වැටුණේය. (එළිදරව් 1:17).

කල්වාරි කුරුසියෙහි සෙවනැල්ල තුළ ජීවිත ගමන ගෙන යන්නාවූ අයට ස්ව-ආත්ම වර්ණනාවට ඉඩක් නැත. පාපයෙන් ලැබූ ගැළවීම පිළිබඳව උදම් අනිමින් පාරම් බෑමට ඔවුන්ට අවස්ථාවක් උදා නොවේ. දේව පුත්‍රයාණන්ගේ හදවත බිඳ දැමීමට හේතුවූ වේදනා සන්තාපයට මූලික වූයේ තමන්ගේ පාපය බව ඔවුන්ට හැඟී යන්නේය. මෙම



චින්තනය ඔවුන්ව ස්වයං අවමානයක් කරා යොමු කරන්නේය. මානව වර්ගයාගේ පාපිෂ්ඨ ස්වභාවයත් දුර්වලතාවත් පිළිබඳව මනා පැහැදිලි අවබෝධයක් සහ දැනුමක් යේසුස්වහන්සේ හා ඉතා සමීපව ජීවත් වන්නාවූ අයට ඇත්තේය. ඔවුන්ගේ එකම බලාපොරොත්තුව රඳා පවතින්නේ කුරුසිපත් කළ එහෙත් මළවුන්ගෙන් නැගිටි ගැළවුම්කරු-වාණන්ගේ යහ ගුණය හෙවත් කුසලතාව මත පමණක්ය.

වත්මන් ආගමික ලෝකයේ පාරිශුද්ධිකරණයට ඉහළ තැනක් ලැබෙමින් පවතී. එකී ක්‍රියාවේදය තුළ ස්ව ආත්ම වර්ණනාව ප්‍රබල ලෙස ඉස්මතුව උසස් ස්ථානයක් දරන්නේය. ඒ අතරම දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවද නොසලකා හරිනු ලැබේ. මෙම ක්‍රියාවේදය බයිබලීය දහමට විරුද්ධය. මෙකී පාක්ෂිකයන්ගේ ඉගැන්වීම වන්නේ ශුද්ධතාවය එක මොහොතකින් ලබාගත හැකි බවය. ඇදහිල්ල මගින් කවර අයෙකුට හෝ සර්ව සම්පූර්ණ පරිපූර්ණත්වයට හිමිකම් කිව හැකි බව ඔවුන්ගේ චින්තනය හා ඉගැන්වීම වන්නේය. "විශ්වාස කරන්න. එම පාරිශුද්ධතාවේ අසිරිය ඔබ සතු වන්නේය"යි ඔව්හු පවසති. එම ආශිර්වාදයට හිමිකම් කියන්නා විසින් කළ යුතු තවත් කිසිම කාර්ය භාරයක් නැත. ඒ අතරම ඔවුහු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ බල අධිකාරිත්වය ප්‍රතික්ෂේප කරති. දස පනතට කීකරු වීමේ අවනත භාවයෙන් සැමට නිදහස ලැබී ඇතැයි ඔවුහු අවධාරණය කරති. ව්‍යවස්ථාවෙහි ප්‍රතිපත්ති වනාහි දෙවියන්වහන්සේගේ ස්වභාවයෙහි සහ කැමැත්තෙහි ප්‍රකාශනයකි, කැඩපතකි. උන්වහන්සේගේ ප්‍රසන්නතාවට, ප්‍රසාදයට ලක්වන්නාවූ දේ එය තුළින් පෙන්නුම් කෙරේ. දෙවියන්වහන්සේගේ චින්තනයට සහ චරිත ගුණාංගයන්ට අනුකූල වූ එම ව්‍යවස්ථාවට ඒකමතික නොවී මිනිසාට ශුද්ධතාවට පැමිණීමට හැකියාවක් වේද?

ඇදහිල්ල සහ ඇදහිල්ල කරණකොටගෙන පමණක් ගැළවීමට හිමිකම් කීමට හැකියාවක් ඇත යන්න අද ජනප්‍රිය කිතුණු ප්‍රචාරයක් වී ඇත. එම ඉගැන්වීම පිළිගැනීමෙහිදී කිසිම වෑයම් කිරීමක් අපේක්ෂා නොකෙරේ. කිසිම ආත්ම පරිත්‍යාගයක් ඉල්ලා නොසිටී, ලෝකයේ තෘෂ්ණාවන්ගෙන් ඉවත් වීමක් අවශ්‍ය නොවේ. එම නිසාම එකී ක්‍රමවේද ඉතා ජනප්‍රිය ලෙහෙසි පහසු ගැළවීමේ මඟක් ලෙස පිළිගැනීමට මනුෂ්‍යයෝ යොමු වෙති. එහෙත් දේව වචනය පවසන්නේ කුමක්ද? අපෝස්තුළු යාකොබ් මෙසේ පවසයි: "මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැයි යමෙක් කියන නුමුත් ක්‍රියාවල් නැත්නම් මොන ප්‍රයෝජනයක්ද? ඒ ඇදහිල්ල නිසා ඔහුට ගැළවෙන්ට පුළුවන්ද? ... නුමුත් හිස්වූ, මනුෂ්‍යය, ක්‍රියා නැති ඇදහිල්ල නිෂ්ඵල බව නුඹ දැනගන්ට කැමතිද? අපේ පියවූ ආබ්‍රහම් තමාගේ පුත්‍රවූ ඊසාක් පූජාසනය

පිට ඔප්පු කළ විට ක්‍රියාවලින් ධර්මිෂ්ඨ කොට ගණන් ගනු ලැබුවා නොවේද? ඇදහිල්ල ඔහුගේ ක්‍රියාවල් සමග ක්‍රියාකළ බවත් ඇදහිල්ල ක්‍රියාවලින් සම්පූර්ණ වූ බවත් නුඹට පෙනේ ... මනුෂ්‍යයෙක් ඇදහිල්ල පමණක් නොව ක්‍රියාවලිනුත් ධර්මිෂ්ඨ කරනු ලබන බව නුඹලාට පෙනෙන්නේය." (යාකොබ් 2: 14-24).

ක්‍රියාවලින් තොර ඇදහිල්ල නම් වූ මෙම මුළාකාරී දහම දෙවියන්වහන්සේගේ වචනයෙහි සාක්ෂීන්ට එක හෙළාම විරුද්ධය. කරුණාව දානය කරනු ලැබීමට නම් ඒ සඳහා ඉටු විය යුතු කොන්දේසි සමග අනුගත නොවී, ඇදහිල්ල මගින් පමණක් සගයේ වරප්‍රසාද ඉල්ලා සිටින්නේ නම් එය එඩිතරව පව්කිරීමක් වන්නේය. මක්නිසාදයත් සැබෑ ඇදහිල්ල පදනම් වී ඇත්තේ ශුද්ධ ලියවිල්ලෙහි අන්තර්ගත පොරොන්දු හා සැපයීම මතය.

දෙවියන්වහන්සේගේ එක් අවශ්‍යතාවයක් වුවද හිතාමතාම උල්ලංඝනය කරමින් තමන්ට ශුද්ධත්වය හිමි කරගැනීමට හැකිවෙතැයි සිතමින් කිසිවෙක් තමාව රවටා නොගනීවා. පාපයක් බව දන දනම යම්කිසි ක්‍රියාදාමයක යෙදෙමින් දිවි ගෙවීම මගින් ආත්මයාණන්-වහන්සේගේ සාක්ෂි දරීමේ හඬ නිශ්ශබ්ද වෙයි. අවසානයේදී එකී තැනැත්තා දෙවියන්වහන්සේගෙන් ඉවත් වෙයි. සැබවින්ම පාපය යනු දේව නීතිය කැඩීමය. "පව්කරන තැනැත්තේ උන්වහන්සේ දුටුවේවත් උන්වහන්සේ ඇඳින ගත්තේවත් නැත." (1 යොහන් 3:6). යොහන් තම ලිපියෙහි තේමාව ලෙස යොදා ගන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව යථාර්ථය හෙළිදරව් කිරීමය. එහෙත් දෙවියන්වහන්සේගේ ආඥා කඩ කරමින්, දිවි ගෙවන්නාවූ, තමා පාරිශුද්ධතාවට පත්වී ඇතැයි කියා ගන්නා අයගේ නියම චරිතය හා දිවිය පිළිබඳව අදහස් දක්වීමටද ඔහු තම ලිපියේ අවධාරණය යොමු නොකර සිටින්නේද නැත. "උන්වහන්සේ අඳුනමියි කියා උන්වහන්සේගේ ආඥාවන් නොපවත්වන තැනැත්තේ බොරුකාරයෙක්ය, සැබෑවද ඔහු තුළ නැත. නුමුත් යමෙක් උන්වහන්සේගේ වචනය පවත්වන්නේද, ඔහු තුළ සැබෑවටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී තිබේ." (1 යොහන් 2:4,5). මෙය සෑම ආකාර ඇදහිලිවන්තයෙකුගේම ඇදහිලි ප්‍රකාශය පිරික්සා බැලිය හැකි මිනුම් දණ්ඩකි. සගයෙහි හෝ වේවා, පොළොවෙහි හෝ වේවා මිනිසෙකුගේ ශුද්ධතාව මිණිය හැකි එකම ප්‍රමිතිය වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවයි. යම් පාර්ශ්වයකට අයත් ජනතාවකට සදාචාර නීතියෙහි බැරෑරුම්තාව පිළිබඳව තක්සේරු කිරීමක් නැති නම්, ඔවුන් දෙවියන්වහන්සේගේ අණ පනත් සැහැල්ලු කොට සලකනවා නම්, මෙකී ආඥාවන්හි කුඩා ආඥාවක් හෝ කඩ කරනවා නම්, එසේ කරන්ට බැතිමතුන් හට උගන්වනවා නම්, ඔවුන් ස්වර්ගයෙහි පිළිගනු



ලබන්නේ නැත. ඒ අනුව ඔවුන් තමා ශුද්ධවන්තයන් යයි කියා ගන්නේ නම් ඔවුන්ට ඒ සඳහා කිසිම පදනමක් නැත.

ඒ අතරම සමහරෙක් තමන් තුළ පාපයක් නැතැයි කියා ගනිති. මෙසේ කියාගන්නා තැනැත්තේ ශුද්ධතාවේ සමීපයටවත් පැමිණ නැති බවට එම ප්‍රකාශයම කදිම සාක්ෂියකි. එවන් තැනැත්තන් එසේ පවසන්නේ දෙවියන්වහන්සේගේ අනන්ත පවිත්‍රතාවත් අසීමිත පාරිශුද්ධතාවත් පිළිබඳව නිවැරැදි අවබෝධයක් නැති නිසාය; දෙවියන්වහන්සේගේ නිර්මල චරිතය සමග අනුගත වෙමින් ශුද්ධව ජීවත් වන්නේ කෙසේ දැයි ඔවුන් දන්නේ නැති නිසාය. යේසුස්-වහන්සේගේ අති ශුද්ධ පවිත්‍රතාවත් උන්වහන්සේගේ අති උත්කෘෂ්ට ආදරයත් ගැන එවන් අය තුළ ඇත්තේ ඉතා පටු අවබෝධයකි. පාපයේ නපුරු ස්වභාවය මෙන්ම පාපයේ මාරක ස්වභාවය ගැනද ඔවුහු කරුණු හරි හැටි නොදනිති. මෙම කරුණු පිළිබඳව යමෙකුට නිවැරැදි අවබෝධයක් තිබේ නම් කිසිම පුද්ගලයෙක් තමා ශුද්ධ යයි කියාගැනීමට තරම් අභීත වන්නේ නැත. ක්‍රිස්තුස්වහන්සේ හා එවැනි පුද්ගලයෙකු අතර පවත්නා සබැඳියාව දුරස්ථවූ තරමට දෙවියන්-වහන්සේගේ දිව්‍ය චරිත ගුණ සොබාව සහ උන්වහන්සේ ඉල්ලා සිටින්නාවූ සුදුසුකම් පිළිබඳව ඔහු තුළ පවත්නා සංකල්පය අල්ප වන්නේය. එම තැනැත්තා තමා සුවිශේෂී දහැමි අයෙක්ය යන චින්තනයෙහි රැඳී සිටී.

ශුද්ධ ලියවිල්ලෙහි ඉදිරිපත් කරන්නාවූ පාරිශුද්ධකරණයට මිනිසාගේ ආත්මය, ප්‍රාණය සහ ශරීරය යන කොටස් තුනම ඇතුළත් වේ. තෙසලෝනික බැතිමතුන් උදෙසා පාවුල් මෙසේ යාච්ඤාවක් ඔප්පු කළේය. "සමාදානයේ දෙවියන්වහන්සේම .... නුඹලාගේ මුළු ආත්මයත් ප්‍රාණයත් ශරීරයත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේගේ ඊමේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා." (1 තෙසලෝනික 5:23). හෙතෙම නැවත වරක් බැතිමතුන්ට මෙසේ ලිවීය. "එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි." (රෝම 12:1) ඈත අතීතයේදී විසූ ඊශ්‍රායෙලිතයන්ගේ කාලයේදී දෙවියන්වහන්සේට පූජා කිරීම සඳහා එකී ජනතාව සත්වයන් රැගෙන ආවෝය. ඒ සෑම පූජාවක්ම ඉතා සුපරීක්ෂාකාරී ලෙස සෝදිසි කරනු ලැබීය. යාගය සඳහා ඉදිරිපත් කරනු ලැබූ සත්වයෙකු තුළ යම් අඩුපාඩුවක් දිස් වී නම්, පූජාව සඳහා එම සතා පිළිනොගන්නා ලදී. කුමක්හෙයින්ද පුද කරන්නාවූ යාගය "කැළැල් රහිත" විය යුතුය යනු දෙවියන්වහන්සේගේ නියමය විය. එසේම

කිතුණු බැතිමතුන්ගෙන් දෙවියන්වහන්සේ ඉල්ලා සිටින්නේද තමන්ගේ ශරීර දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ, ජීවමානවූ, ශුද්ධවූ යාගයක් කොට ඔප්පු කරන ලෙසය. මෙවැන්නක් ඉටුකිරීමට නම් එම සියළු බලශක්තීන් හැකි තරම් උපරිම යහපත් තත්ත්වයෙන් ආරක්ෂා කරගත යුතු වේ. යම්කිසි මනුෂ්‍යයෙකුගේ ශාරීරික හෝ මානසික ශක්තීන් දුබල කරන්නාවූ යම්කිසි පුරුදු ඔහු තුළ තිබේ නම් තම මැවුම්කරුවාණන්ගේ සේවය සඳහා හෙතෙම නුසුදුස්සෙකු බවට පත්වන්නේය. අප විසින් දානය කළ හැකි ඉතා අගනාම දේ දෙවියන්වහන්සේට පූජා නොකරන්නේ නම්, උන්වහන්සේ එබඳු යාගයක් ගැන ප්‍රසන්න වන සේක්ද? "ඔබගේ මුළු හදවතින්ම දෙවියන්වහන්සේට ආදරය" කරන්නැයි ක්‍රිස්තුස්වහන්සේ වදාළ සේක. තමන්ගේ මුළු හදවතින් දෙවියන්වහන්සේට ආදරය කරන්නාවූ අය තමන්ගේ ජීවිතයෙහි ඉතාම අගනාවූ ද උසස්වූ ද සේවය උන්වහන්සේට ලබාදීමට ආශාවෙති. ඔවුන් තුළ පවතින සියලු හැකියාවන් මගින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීමට පුළුවන් වන පිණිස ඒවා වර්ධනය කරගැනීමට ඔවුහු නිරතුරුවම, අඛණ්ඩව වෙහෙස දරති. ඒවා වර්ධනය කරගැනීමේදී දෙවියන්වහන්සේගේ අණ පනත් හා එකඟතාවෙන් යුතුව එසේ කිරීමට ඔවුහු සියළු අයුරින් වෑයම් කරති. තමන් පියාණන් වූ ස්වර්ගීය දෙවියන්වහන්සේට පුද කරන්නාවූ පූජාව කිළිටි වීමට හෝ කැළැල් සහිත වීමට හෝ හේතු වන්නාවූ තෘෂ්ණාවන්ට සහ අභිරුචියාවන්ට අවස්ථාවන් ලබා නොදෙමින් ඒවායින් වැළකී සිටීමට ඔවුහු අධිෂ්ඨාන පූර්වකව තීරණය කරගෙන දිවි ගතකරති.

පේතෘස් මෙසේ අනුශාසනා කරයි: "ආත්මයට විරුද්ධව යුද්ධ කරන මාංසික තෘෂ්ණාවලින් වැලකී සිටින ලෙස නුඹලාගෙන් ඉල්ලමි." (1 පේතෘස් 2:11). සියළු ආකාර තෘෂ්ණාවක් හා ආශාවක්ම පිනවීමට යාමේදී එමගින් ඉන්ද්‍රියයන් බෙලහීන තාවයට පත්වේ, මනස හිරී වැටීමකට පත් වේ. ඒ සමගම මානසික මෙන්ම ආත්මික සත්‍යයන් අවබෝධ කරගැනීමේ හැකියාවද අඩ පණ වන්නේය. එවන් පසුතලයක් තුළ දේව වචනයට හෝ ශුද්ධාත්මයාණන්ට අනුබලයක් දැක්විය හැක්කේ ඉතා දුබල අයුරකින් පමණකි. කොරින්තියේ බැතිමතුන්ට හසුනක් යවන්නාවූ පාවුල් මෙසේ පවසන්නේය. "මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපම පවිත්‍ර කරගනිමින් දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව ශුද්ධකම සම්පූර්ණ කරගනිමු." (2 කොරින්ති 7:1). එසේ කරමින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධනය කරගනිමු. එම ඵල නම් "ප්‍රේමය, ප්‍රීතිය සමාදානය, ඉවසිලිවන්තකම, කරුණා -වන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය." (ගලාති 5: 22, 23 බලන්න).



දේවානුභාවයෙන් ලබාදී ඇති මෙවන් ප්‍රකාශන තිබියදී පවා කිතුණුවන් යයි කියාගන්නාවූ කොපමණ පිරිසක් ධන සම්පත්ති සොයමින් විලාසිතාවන්ට යොමු වෙමින් තමන්ගේ ශක්තීන් හීන කර ගනිත්ද? ඒ අතරම බොහෝ අය කෑදරකම, මුද්‍රික පානය සහ වෙනත් තහනම් සැප සෙල්ලම්හි නිරත වෙමින් දේව ස්වරූපයට සමාන මිනිස්කම දූෂ්‍ය කර ගනිති. ඒ අතර තමන්ගේ භාණ්ඩාගාරය තර කරගැනීමේ අරමුණින් දේව සභාවද දේව අපහාසයට භාජන වන්නාවූ ක්‍රියාදාමයන්ට තරවටු කරනු වෙනුවට එම දේවල් කිරීමට දිරි ගන්වති. අභිරුචිය පිනවන ක්‍රියාවන්ට, ලාභ ලබාගැනීමේ හෝ සැප සෙල්ලමෙහි යෙදීමේ ක්‍රියාදාමයන්ට යොමු වීමට සභාව දිරි දෙන්නීය. ක්‍රිස්තුස්-වහන්සේ උදෙසා වූ ආදරය මගින් භාණ්ඩාගාරය පිරවීමේ හැකියාවක් නැති තරම්ය. යේසුස්වහන්සේ අද දේවස්ථානයන්ට පැමිණ ආගමේ මුවාවෙන් එවන් තැන්හි සිදු කෙරෙන්නාවූ මංගල්‍ය උත්සවයන් හා ශුද්ධ නොවූ වෙළහෙළඳාම් දුටුවහොත් උන්වහන්සේ කෙසේ ක්‍රියාකරනවා ඇද්ද? උන්වහන්සේ මෙලොව වැඩ විසූ සමයෙහි දේව මාළිගාවේ මුදල් මාරු කරන්නන් දේව මාළිගයෙන් පිටතට පන්නා දැමූ ආකාරයෙන්ම අදත් දේව මාළිගාවන් කෙළෙසන්නන්ව පන්නා දමනවා ඇති නොවේද?

ඉහළින් පැමිණෙන්නාවූ එනම් ස්වර්ගයෙන් එන්නාවූ ප්‍රඥාව අන් සැමට පළමුවෙන් "පිරිසිදුව" තිබෙන බව යාකොබ් ප්‍රකාශ කර තිබේ. තමන්ගේ තොල් අග යේසුස්වහන්සේගේ අනගි ශ්‍රී නාමය දරමින් දුම්වැටි මගින් එම තොල් අපවිත්‍ර කරන්නාවූ අය දුටුව හොත් යාකොබ් කුමක් කියයිද? දුම් වැටියෙන් පිටවන්නාවූ දුගඳ ශරීරය මෙන්ම හුස්මද අපවිත්‍ර කරමින් පරිසරයේ වාතය දූෂණය කරයි. අවට සිටින්නාවූ අය මෙම විෂ වායුව ආශ්වාස කිරීමට බල කරනු ලබති. යාකොබ්ට ඔවුන් හමුවූයේ නම් ඔවුන් ලෞකිකත්වයට බර වූ, ඉන්ද්‍රියන් පිනවීමට බර වූ යක්ෂයාගේ දරුවන් යයි ඔහු නොපවසා සිටීවීද? සම්පූර්ණ විශුද්ධකරණයේ ආශිර්වාදයන්ට අයිතිවාසිකම් කියමින් ස්වර්ගය කෙරෙහි තමාට ඇති බලාපොරොත්තුව ගැන නිතරම කථා කරන්නාවූ දුම්වැටියට වහළුන් වී සිටින්නාවූ අය පිළිබඳව දෙවියන්වහන්සේගේ වචනය පැහැදිලිවද සරලවද මෙසේ පවසයි: "අපවිත්‍ර දෙයක්වත්, පිළිකුල් වූ බොරුවූ දෙයක් කරන්නෙක්වත් කිසිසේත් එහි (ස්වර්ගයට) ඇතුළු නොවන්නේය" යන්නය (එළිදරව් 21: 27).

"නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත; මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය.

එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරන්න. (1 කොරින්ති 6:19,20). ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ වාසය කරන්නාවූ සිරුරක් හිමි තැනැත්තේ විනාශකාරී පුරුද්දකට වහලෙක් නොවනවා ඇත. ඔහු සතු සියළු හැකියාවන් ක්‍රිස්තුස්වහන්සේට අයිතිය, මක්නිසාද යත්, උන්වහන්සේ සිය ශ්‍රී රුධිරයෙන් වන්දි මිලක් ගෙවා ඔහුව මිලේට ගෙන ඇත. හෙතෙම ස්වාමීන්වහන්සේ සන්තක වස්තුවක් වන්නේය. ඔහු සතු සම්පත්ද, දෙවියන්වහන්සේ සතුය. එම පුද්ගලයා වෙනුවෙන් යෙදවූ මිලය නාස්ති කිරීමෙන් ඔහුට නිවැරැදි කරුවෙකු විය හැකිද? නාමික කිතුණු බැතිමත්හු අවැඩදායී වූද, අහිතකර වූද ක්‍රියාදාමයන්හි යෙදෙමින් වාර්ෂිකව විශාල ධන සම්භාරයක් වියදම් කරති. විනෝදකාමී ජීවිත වින්දනය සඳහා මෙසේ මුදල් වැය කරන අතරේදී වෙනත් අය ජීවනයේ වචන නොලැබ ආත්ම විනාශයේ දොරටුව කරා පා නගති. දිළිඳුන්ට සරණ වීමට මුදලක් වැය කිරීමට අකැමැති වන්නාවූ අයද, ශුභාරංචි සේවයට ආධාර නොකරන්නාවූ අයද බොහෝ අවස්ථාවන්හිදී තම ධනයෙන් විශාල කොටසක් තෘෂ්ණාවන් පිනවීමේ පූජාසනය මත පූජා කරති. ඔව්හු දේව සේවය සඳහා දිය යුතු දසයෙන් කොටස හා සම්මාදම් දෙවියන්වහන්සේගෙන් සොරා ගනිති. ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරනවා යයි පවසන්නාවූ අය සත්‍ය වශයෙන් පාරිශුද්ධතාවට පැමිණ සිටිත් නම් ඔව්හු තම ධන සම්පත් නිරර්ථක ලෙස හෝ අහිතකර දෑ සඳහා වැය නොකර, දෙවියන්වහන්සේගේ ගබඩා ගෙට ගෙනෙනවා ඇත. ආත්ම දමනයේ, ආත්ම පූජාවීමේ සහ ආත්ම පරිත්‍යාගයේ ආදර්ශයක් වීමට ක්‍රිස්තු භක්තිකයන්ට පුළුවන් වෙනවා ඇත. එවන් ජීවිත රටාවක් යටතේ ඔවුහු ලෝකයේ ආලෝකය බවට පත්වන්නාහුය.

ස්ව-ආත්මය පිනවීමේ අරමුණ ලෝකයාගේ මූලික පරමාර්ථය බවට පත්ව තිබේ. "මාංසයේ තාෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරයත්" අද ලෝක ජනතාවගේ බහුතරයක් පාලනය කරමින් සිටී. එසේ වුවද, කිතුණු අනුගාමිකයන්ට උසස් කැඳවීමක් ලබා දී ඇත. "ඔවුන් අතරෙන් පිටතට ඇවිත් වෙන්ව සිටින්න.... අපවිත්‍ර දෙයකට අත නොගසා සිටින්න'' යනු ස්වාමීන්වහන්සේගේ අනුශාසනාව වන්නේය. පව්කාරවූ ක්‍රියාදාමයන්හි යෙදීමත්, තෘෂ්ණාවන් පිනවීම සඳහා ක්‍රියා කිරීමත් සම්පූර්ණාකාරයෙන් අත් හැරීමක් නොකරන්නේ නම්, කිසියම් ආකාරයකින් හෝ එවන් දෑයෙහි නිරත වන තැනැත්තා අවංකවූ ද, සත්‍යවූ ද විශුද්ධිකරණයට භාජනය වී නැති බව දෙවියන්වහන්සේගේ වචනයේ ආලෝකය අනුව පැවසීම යුක්ති සහගත වන්නේය.

ඔවුන් වෙතින් පිටතට විත් වෙන්ව සිටින්න. කිසි අපවිත්‍ර දෙයකට අත නොතබන්න" යන ඉල්ලීමට අවනත වන්නාවූ අයට දෙවියන්වහන්සේ



දෙන්නාවූ පොරොන්දුව මෙසේය: "එවිට මම නුඹලා පිළිගෙන, නුඹලාට පියෙක් වන්නෙමි. නුඹලාද මට පුත්‍රයොත් දූවරුත් වන්නහුය යි සර්ව පරාක්‍රමවූ ස්වාමින්වහන්සේ කියනසේක." (2 කොරින්ති 6:17,18). දෙවියන්වහන්සේගේ දේවල් පිළිබඳව සාරවත්වූ ද, පුළුල් හා බහුලවූ ද අත්දැකීමක් තිබීම සෑම කිතුණුවෙකුගේම භාග්‍යය හා යුතුකම වන්නේය. ''මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා, අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය''යි යේසුස්වහන්සේ පැවසූසේක. (යොහන් 8:12). "ධර්මිෂ්ඨයන්ගේ මාවත ඉර මුදුන් වේලාව දක්වා වඩ වඩා ආලෝක වෙගෙන යන්නාවූ අලුයම් ආලෝකය මෙන්ය." (හිතෝපදේශ 4:18). "අන්ධකාරයක් කොහෙත්ම නැති" ලෝකයේ ආලෝකයාණන්වහන්සේ සමග කෙනෙකුගේ ජීවිතය ඉතා සමීප සබඳතාවකට පමුණුවා ලීමට ඇදහිල්ලේ හා කීකරුකමෙහි සෑම පියවරක්ම හේතුකාරක වන්නේය. දහැමිතාවෙහි සූර්යයාගේ දීප්තිමත් ආලෝක දහරා දෙවියන්වහන්සේගේ සේවකයන් මත දිස්නය පතුරුවන්නේය. උන්වහන්සේගේ එම ආලෝක දහරා පරාවර්තනය කිරීම ඔවුන් සතු වගකීමයි, කාර්ය භාරයයි. තමන් දීප්තිමත්ව බැබළෙන්නේ සගයෙහි පවතින්නාවූ ශ්‍රේෂ්ඨ වූ ආලෝකයෙහි තේජසින් බව තාරකා අපට දක්වයි. විශ්වයේ සිංහාසනය මත දෙවියන්වහන්සේ වැඩවසන සේක. එම තැනැන්වහන්සේගේ චරිතයට ප්‍රශංසා කිරීමද එය අනුකරණය කිරීමද සුදුසු යයිද, වටිනාකමින් යුතු යයිද කිතුණු බැතිමත්හු ප්‍රකාශයට පත් කළ යුත්තෝය. දෙවියන්වහන්සේගේ සාක්ෂිකරුවන් තුළ උන්වහන්සේගේ ආත්ම-යාණන්ගේ කරුණා-අනුග්‍රහයන්ද, උන්වහන්සේගේ චරිතයෙහි පවිත්‍රවූද, පාරිශුද්ධවූ ද ගුණාංගද දැකගැනීමට හැකියාව තිබිය යුතුය.

කොලොස්සිවරුන්ට තමා යැවූ හසුනෙහි පාවුල් පවසන්නේ දෙවියන්වහන්සේගේ දරුවන්ට සාරවත් වූ ආශිර්වාද ලබාදී ඇති බවයි. හෙතෙම මෙසේ පවසයි: "එබැවින් අපිත් ඒ ඇසූ දා පටන් නුඹලා උදෙසා නොකඩවම යාච්ඤා කරමින්, නුඹලා සියලු ආකාර ප්‍රඥාවද ආත්මික නුවණද ලබන ලෙස උන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමෙන් පූර්ණවී සියලු යහපත් ක්‍රියාවලින් ඵල දරමින්ද, දෙවියන්වහන්සේ දැනගැන්මෙහි වර්ධනය වෙමින්ද, ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත් ඉවසිලිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද, ... නුඹලා ස්වාමින්වහන්සේට ඔබින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන ලෙස ඉල්ලමුව" (කොලොස්සි 1:9-12).

කිතුණුවන්ට හිමි වන්නාවූ වරප්‍රසාදයන්හි ඉතා උසස් තත්ත්වය පිළිබඳව එපීසයේ සහෝදරයන් දැනගෙන සිටීම අවශ්‍ය යයි පාවුල්

නැවත වරක් අවධාරණය කරයි. සර්ව බල පරාක්‍රම සමිඳුන්ගේ දූ පුතුන් ලෙස ඔවුන්ට අත්පත් කරගත හැකි විශිෂ්ඨ බලය සහ දැනුම පිළිබඳව ඔවුන් ඉදිරියේ පරිපූර්ණ විස්තරයක් පාවුල් ඉදිරිපත් කරයි. දෙවියන්වහන්සේ තම ආත්මයාණන්වහන්සේ මගින් ස්වකීය තේජෝ-මහිමවත් සමෘද්ධියෙන් ඇතුළාන්ත-මිනිසා බලයෙන් සවිමත් කිරීමේ වරප්‍රසාදය ඔවුන්ට හිමි වන බව පාවුල් මෙසේ පවසයි. "ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට, දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමග ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි." දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණ වීමට පුළුවන්කම ඔවුන්ට ලබාදෙන්නයි" යාච්ඤා කිරීමේදී ඔහුගේ යාච්ඤාව වරප්‍රසාදයේ ඉහළම ස්ථානය කරා ළඟාවීමට ඉල්ලයි. (එපීස 3:17-19).

අපි අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේ විසින් ඉදිරිපත් කර ඇති කොන්දේසි ඉටුකරන්නෙමු නම් අපට අත්වන්නාවූ වරප්‍රසාද වල උත්තම භාවය මෙහි එළිදරව් කර තිබේ. මේ වරප්‍රසාද සහ ආශීර්වාද භුක්ති විඳීමේ භාග්‍යය හිමි කරගත හැක්කේ ක්‍රිස්තුස්වහන්සේගේ යහගුණ කුසලතා කරණකොටගෙන ලබාදෙන්නාවූ අනන්ත බලපරාක්‍රම උල්පතින්ය. "තමන්වහන්සේගේම පුත්‍රයා ඉතුරු කර නොගෙන අප සියල්ලන් උදෙසා පාවා දුන්නාවූ තැනැන්වහන්සේ පුත්‍රයා ඇතුළුව අනිකුත් සියල්ල අපට නොදෙන්නේ කෙසේද?" (රෝම 8:32). පියාණන්වහන්සේ තමන් ආත්මයාණන්වහන්සේව නොමසුරු ලෙස ස්වකීය පුත්‍රයාණන්වහන්සේට ලබාදුන් සේක. ඒ භාග්‍යයට පූර්ණ ලෙසින් සහභාගී වීමට අපටද පුළුවන. යේසුස්වහන්සේ මෙසේ පවසන සේක "නපුරුවූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දනිව් නම්, කොපමණ වැඩියෙන් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙනසේක්දැයි කීසේක." (ලූක් 11:13) "නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්លුවත් මම ඒක ඉෂ්ට කරන්නෙමි." "නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලන්න. එවිට නුඹලාට ලැබෙන්නේය" (යොහන් 14:14; 16:24).

ක්‍රිස්තු භක්තිකයා තුළ නිහතමානී ගුණාංග ප්‍රබල තැනක් දරන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙසින් හෙතෙම දුකින් බර ස්වභාවයක් නොදැරිය යුතුය. තමාගේ ජීවිතය දෙවියන්වහන්සේගේ අනුමැතියට භාජනය කර උන්වහන්සේට ආශිර්වාද කළ හැකි අයුරින් ජීවිත රටාවක් පෙළ ගස්වා ගැනීම සෑම කිතුණුවෙකුටම ලැබෙන්නාවූ වරප්‍රසාදයකි. දෝෂාරෝපණයට ලක්ව දණ්ඩනයට නියම කරනු



ලැබූ අයෙකුගේ චින්තනයෙන් යුතුව අප ජීවත් වනවා දැකීම අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේගේ කැමැත්ත නොවේ. යමෙකුගේ මනස තමා ගැනම වූ සිතුවිලි වලින් පිරී, තමා අභාග්‍යවන්තයෙකු යයි සිතමින් හිස බිමට යොමු කොට කල් ගෙවීම සත්‍යවාදී නිහතමානීකම නොවන්නේය. එය නිහතමානී ජීවිතයක සාක්ෂියක් නොවන්නේය. යේසුස්වහන්සේ වෙත ගොස් පව් සෝදා පවිත්‍රවී ලැජ්ජාවෙන් සහ පසුබෑමකින් තොරව දේව ව්‍යවස්ථාව ඉදිරියෙහි නැඟී සිටීමට අපට පුළුවන. "එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය" (රෝම 8:1,2).

දේව අභිමුඛයෙන් වැටී ගියාවූ ආදම්ගේ දරුවන්ට යේසුස්වහන්සේ කරණකොටගෙන "දෙවියන්වහන්සේගේ පුත්‍රයන් සහ දියණියන් වීමේ" භාග්‍යය ලැබෙන්නේය. "මක්නිසාද පිරිසිදු කරන්නාද පිරිසිදු කරනු ලබන්නෝද යන සියල්ලෝම එක්කෙනෙකුගෙන්ය. ඒ කාරණය නිසා උන්වහන්සේ ඔවුන්ට සහෝදරයෝ යයි කියන්ට ලජ්ජා නොවී" සිටින සේක. (හෙබ්‍රෙව් 2:11). කිතුණුවෙකුගේ ජීවිත පැවැත්ම දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ලෙහි, ජයග්‍රහණයෙහි, සහ ප්‍රීතියෙහි වූ එකක්ම විය යුත්තේය. "මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද එය ලෝකයෙන් ජය ගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය." (1 යොහන් 5:4). දෙවියන්වහන්සේගේ මෙහෙකරුවා වූ නෙහෙමියා සැබවින්ම මෙසේ පැවැසීය: "ස්වාමින්වහන්සේ කෙරෙහි ප්‍රීතිවීම නුඹලාගේ ශක්තියය" (නෙහෙමියා 8:10). පාවුල්ද මෙසේ පවසයි: "ස්වාමින්වහන්සේ තුළ නිතරම ප්‍රීතී වෙන්න. ප්‍රීතිවෙන්නැයි නැවතත් කියමි." (පිලිප්පි 4:4) "නිතරම ප්‍රීතිවෙන්න; නොකඩව යාච්ඤා කරන්න; සියල්ලේදී ස්තූති කරන්න; මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය." (1 තෙසලෝනික 5:16-18).

බයිබලයෙහි දැක්වෙන සමයානුකූල හැරීමෙහි සහ විශුද්ධි-කරණයෙහි ඵල එයාකාරය. දේව ව්‍යවස්ථා සංග්‍රහයෙහි ධර්මිෂ්ඨකම ගැන ඇත්තාවූ මේ උතුම් ප්‍රතිපත්ති කදිමට එළි දක්වා ඇත. කිතුණු ලෝකයාගේ බොහෝ අය මෙම ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්ති කෙරෙහි සැලකිල්ල දක්වන්නේ නියම තැකීමක් නොමැතිවය. එම නිසාම එකී ක්‍රියාදාමයන්හි ඵල දැකගැනීම විරලය. ආදි යුගයන්හිදී දෙවියන්වහන්සේගේ ආත්ම-යාණන්වහන්සේගේ ගැඹුරුවූ, රඳා පවතින්නාවූ ක්‍රියාන්විතය නව පිබිදීමක් ඇතිවූ විට නිරතුරුවම විශේෂාකාරයෙන් දැකගැනීමට හැකි

විය. එහෙත් වත්මනදී ආත්ම පිබිදීමේ රැස්වීම තුළ එම සාධකය දක ගන්නටවත් නොහැකි තරමිය.

නිරතුරුවම දර්ශනය කිරීමෙන් අපි වෙනස් කරනු ලබන්නෙමුව. දෙවියන්වහන්සේගේ චරිතයෙහි ශුද්ධත්වය සහ පරිපූර්ණත්වය නිර්මල වූ දහම්-ව්‍යවස්ථාව තුළින් උන්වහන්සේ මිනිස් දර්ශනයට විවෘත කර ඇත. ඒ අතර මිනිසා එම දහම් අණ පනත් තමාගේ සැලකිල්ලෙන් බැහැර කර ඇත. මිනිස් අවධානය, මිනිස් ඉගැන්වීම් සහ මතවාද කෙරෙහි මිනිසා ආකර්ෂණය වී ඇත. මෙහි ප්‍රතිඵල වශයෙන් විශ්වාස-වන්තයන්ගේ ශ්‍රද්ධාව ඉතා පහත් ප්‍රවේශයක් කරා පැමිණ තිබීම පුදුමයක් නොවේ. ස්වාමීන්වහන්සේ මෙසේ පවසන සේක: "මාගේ සෙනඟ නපුරු දේවල් දෙකක් කළෝය; ඔව්හු ජීවන වතුර උල්පත වූ මා අත්හැර, කටාරම් එනම් වතුර නාල්ලන්නාවූ බිඳුණාවූ කටාරම් තමුන්ට කපාගත්තෝය." (යෙරෙමියා 2:13).

"දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ ... ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහි කරන්නාවූ මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය. ඔහු දිය ඇළවල් ළඟ හිඳුවූ නියම කළට ඵල දෙන නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය; ඔහු කරන සියල්ල සඵල වෙයි." (ගීතාවලිය 1:1-3). දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එයට හිමි විය යුතු නියම ස්ථානය වෙත නැවත පිහිටුවන තෙක් උන්වහන්සේගේ සෙනඟ අතර ආත්ම නවෝදයක්, ආත්ම පිබිදීමක්, ක්‍රියාත්මක නොවන්නේය. ආදි කල්පිත ඇදහිල්ලක් සහ දේව භක්තික පැවැත්මක් සිදුවීමට නම් ව්‍යවස්ථාවට නිසි තැන ලැබිය යුතුය. "නුඹලා මාර්ගවල නැවතී සිට බලා, හොඳවූ මාර්ගය කොයි එකද කියා පුරාණ මාවත් ගැන අසාගන එහි යන්න. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබේ යයි ස්වාමින්වහන්සේ කියන සේක." (යෙරෙමියා 6:16).



# 28

# සෝදිසි කිරීමේ විනිශ්චය

අනාගතවක්තෘ දානියෙල් මෙසේ පවසයි: "මා බලා සිටින අතර සිංහාසන පිහිටුවා, පුරාතන කෙනෙක් වාඩි වුණේය. උන්වහන්සේගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය, උන්වහන්සේගේ හිසකේ පිරිසිදු ලොම් මෙන්ය; උන්වහන්සේගේ සිංහාසනය ගිනි දළුවක්ය, ඒකේ චක්‍ර ඇවිලෙන ගිනිය. ගිනිමය ගංගාවක් උන්වහන්සේ ඉදිරියෙන් ගලා ගියේය. දහසක් වර දහස් දෙනෙක් උන්වහන්සේට සේවය කළෝය. දස දහසක් වර දස දහස් දෙනෙක්ද උන්වහන්සේ ඉදිරියේ සිටියෝය. විනිශ්චයකාර සභාව හිඳ ගත්තාය. පොත්ද දිග අරිනලද්දේය." (දානියෙල් 7:9,10).

අනාගතවක්තෘවරයා ඉදිරියෙහි මෙම විනිශ්චය සැසි වාරය දිගහරිනු ලැබීය. මෙය උත්කෘෂ්ටවූ ද, ගාම්භීර වූ ද දර්ශනයක් විය. සකල ලෝ වාසී සැමගේ ඉරණම තීරණය කිරීමේ විනිශ්චය පිළිබඳව අනාගතවක්තෘට දක්වන ලදී. අති උත්තම විනිශ්චයකාරයාණන් ඉදිරියෙහි සකලවාසීන්ගේ චරිත විමර්ශනයට භාජන කරනු ලබන්නේය. "එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ හැටියට" තීරණයක් ලබා දෙනවා ඇත. පුරාතන තැනැන්වහන්සේ නම් දෙවියන්වහන්සේ වන පියාණන්-වහන්සේය. ගීත රචකයා මෙසේ පවසයි: "කඳුවල උත්පත්තියටත් ඔබ විසින් පොළොව හා ලෝකය සෑදීමටත් පළමුවෙන්, සදාකාලයෙන් සදාකාලයටම ඔබ දෙවියන්වහන්සේය." (ගීතාවලිය 90:2). සැම ප්‍රාණයකම උල්පතවූද සැම නීති සංග්‍රහයකම මූලාශ්‍රයවූ ද තැනැන්-වහන්සේ මෙම විනිශ්චයෙහි සැසියේදී මූලාසුනාරූඪව ක්‍රියාකරන සේක. මෙම විනිශ්චය මඩුල්ල ඉදිරියෙහිදී දහසක් වර දහසක්ද, දස දහසක් වර දස දහසක්ද වන ශුද්ධ වූ දේව දූතයෝ සාක්ෂිකරුවන් සහ උපකාරකයන් ලෙස සැසියට සහභාගී වන්නාහ.

"බලව, අහසේ වළාකුල් සහිත මනුෂ්‍ය පුත්‍රයෙකුට සමාන කෙනෙක් ඇවිත් පුරාතන තැනැන්වහන්සේ වෙතට පැමින්නේය. ඒ තැනැන්-වහන්සේ ඉදිරියට උන්වහන්සේ පමුණුවනු ලැබූසේක. සියලු ජනයන්ද ජාතීන්ද භාෂාවන්ද උන්වහන්සේට සේවය කරන පිණිස ආණ්ඩු බලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්වහන්සේට දෙන ලද්දේය. උන් වහන්සේගේ ආණ්ඩුව පහ නොවන සදාකාල ආණ්ඩුවක්ය. උන්වහන්සේගේ රාජ්‍යයද නැති නොවන්නේය." (දානියෙල් 7:13, 14). මෙහි ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම වුවද, එය අපගේ පොළොව

කරා පැමිණෙන්නාවූ උන්වහන්සේගේ දෙවන ඊම නොවන්නේය. මෙහි සඳහන් පැමිණීමේ නිමිත්ත නම් සගයේ වැඩවසන්නාවූ පුරාතන තැනැන්වහන්සේ ඉදිරියට ක්‍රිස්තුස්වහන්සේ වැඩම කිරීමය. උන්වහන්සේ එහි පැමිණෙන්නේ රාජ්‍යයක්ද, ගෞරවයද, පාලන බලයද පිළි-ගැනීමටය. මෙය සිදුවන්නේ උන්වහන්සේගේ මැදහත්කාරකම් කිරීමේ මෙහෙවරය අවසානයේදීය. උන්වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳව නොව සගයෙහි වන්නාවූ මෙම සිද්ධිය පිළිබඳව අනාවැකියෙහි සඳහන්ව ඇත. අනාවැකියෙන් දක්වන ලද දවස් 2300 නිම වූ විට සිදුවූයේ මෙම පැමිණීමය. එය 1844 දී සිදුවූ බව පිළිගැනේ. දේව දූතයන් මහත් සමූහයක් පිරිවරාගෙන අපගේ මහා කාරුණිකයාණන් වූ ක්‍රිස්තුස් නම් උත්තම පූජකයාණන්වහන්සේ පිය වූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි පෙනී සිටිසේක. මිනිස් සත වෙනුවෙන් වූ අවසන් ක්‍රියාවේදය ඉටුකිරීම් වස් උන්වහන්සේ ස්වර්ගයේ දේව මාළිගයෙහි අති ශුද්ධස්ථානයට පිවිසි සේක. මෙසේ ප්‍රවිෂ්ඨ වූයේ සෝදිසි කිරීමේ විනිශ්චය පවත්වා ගෙන යාමටය. සමගි කිරීමේ කර්තව්‍යයෙහි යහපත් ඵල විපාක ලැබීමට සුදුසුකම් දක්වන්නාවූ අය සඳහා සමගි කිරීමේ කාර්යය ඉටු කිරීමට ක්‍රිස්තුස්වහන්සේ මෙසේ දෙවිපියාණන්වහන්සේගේ අභිමුඛයට වැඩම කළසේක.

ඊශ්‍රායෙල්වරුන්ට නියමයක් වූ, පව් කමාව ස්ථිර කිරීම සඳහා වූ සමගි කිරීමේ ශුද්ධවූ මෙහෙයේදී, එයට සහභාගී වීමට වරම් ලැබුණේ තමන්ගේ පාප ගැන පසුතැවිලි වී, පව් කියාදෙමින් දෙවියන්-වහන්සේ ඉදිරියට පැමිණි අයටය. ඔවුන්ගේ පාප පූජාවේ රුධිරය මගින් ඔවුන්ගේ පාප ශුද්ධස්ථානයට යොමු කිරීමේ ක්‍රියාවලියට ඔව්හු පංගුකාරයන් වූහ. එලෙසින්ම සගයේ දේව මාළිගයෙහි සිදුවන්නාවූ ශ්‍රේෂ්ඨ වූ අවසන් සමගි කිරීමෙහි හා සෝදිසි කිරීමේ විභාගයට ඉදිරිපත් කරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ දරුවන් යයි කියාගන්නාවූ අයව පමණකි. දුදනන් පිළිබඳව වූ විනිශ්චය වෙනත් කර්තව්‍යයකි. එය පසු දවසක සිදුවන්නේය. "දෙවියන්වහන්සේගේ ගෘහයේ සිට විනිශ්චය පටන්ගන්ට කාලය පැමිණ තිබේ. එය පළමුකොට අප ළඟ සිට පටන්ගත්තොත් දෙවියන්වහන්සේගේ ශුභාරංචියට කීකරු නොවන්නන්ගේ අන්තිමය කුමක් වන්නේද?" (1 පේතෘස් 4:17).

මිනිසුන්ගේ නම්, සහ ක්‍රියාදාමයන් වාර්තාගතව සගයේ ඇත්තාවූ පොත්, මෙම විනිශ්චයේදී විමර්ශනයට ලක් කරනු ලැබේ. ඒ වාර්තා අනුව විනිශ්චයෙහි තීන්දුව ප්‍රකාශයට පත් කෙරේ. මෙම විෂය පිළිබඳව දානියෙල් අනාගතවක්තෘවරයා මෙසේ පවසයි. "විනිශ්චයකාර සභාව හිඳ ගත්තාය. පොත්ද දිග අරින ලද්දේය." මෙම දසුන පිළිබඳව තවදුරටත් විස්තර කරමින් එළිදරව්කාරයා මෙසේ පවසයි. "ජීවන



පොත වන තවත් පොතක් දිගහරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය." (එළිදරව් 20:12).

යම්කිසි වකවානුවක දේව සේවයට ඇතුළු වූ සෑම අයෙකුගේම නම් මෙම ජීවන පොතෙහි ඇතුළත්ය. "නුඹලාගේ නාම ස්වර්ගයේ ලියා තිබෙන නිසා ප්‍රීතිවන්න"යි යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන්ට පැවසූ සේක. (ලූක් 10:20). තමන්ගේ විශ්වාසවන්ත අනුගාමිකයන්ගේ 'නාම ස්වර්ගයේ ජීවන පොතෙහි' ලියැවී ඇති බව පාවුල් පවසන්නේය. (පිලිප්පි 4:3). "මනුෂ්‍ය ජාතියක් පැවති තැන් සිට මේ දක්වා කිසි කලෙක නොවූ විරූ විපත්ති කාලයක්" පිළිබඳව මිනිස් අවධානය යොමු කරන්නාවූ දානියෙල් පවසා සිටින්නේ "නුඹේ සෙනඟගෙන් පොතේ නම් ලියා තිබෙන සියල්ලෝ ගැළවෙන්නෝය" යන්නය. "බැටළු පැටවාණන්ගේ ජීවන පොතෙහි ලියන ලද්දවුන්" පමණක් දෙවියන්වහන්සේගේ නගරයට ඇතුල් වීමට හිමිකම් ලබාගන්නවා ඇතැයි එළිදරව් කරුවා පවසයි. (එළිදරව් 21:27).

"ස්වාමින්වහන්සේ කෙරෙහි භය ඇත්තාවූ, උන්වහන්සේගේ නාමය සැලකුවාවූ අය ගැන උන්වහන්සේ ඉදිරියෙහි සිහිවීමේ පොතක්" ලියා තිබේ. ඔවුන්ගේ යහපත් ක්‍රියා සියල්ලක්ම එහි අඩංගුය. (මලාකි 3:16). එම අයගේ ඇදහිල්ල මුසු වදන්ද, ඔවුන්ගේ ප්‍රේමණීය ක්‍රියාදාමයන්ද සගයේ වාර්තාගතව ඇත. නෙහෙමියා මෙම විෂය පිළිබඳව මෙසේ පවසයි: "මාගේ දෙවියන්වහන්ස, මේ ගැන මා සිහි කළ මැනව. මාගේ දෙවියන්වහන්සේගේ ගෘහයද, ඒකේ නියම පිළිවෙත්ද උදෙසා මා විසින් කළ යහපත් ක්‍රියා නොමැකුව මැනව" (නෙහෙමියා 13:14). දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඇති සිහිවීමේ සටහන් පොතේ යමෙකු විසින් සිදුකරන ලද සෑම යහපත් දැහැමි ක්‍රියාවක්ම මකා දැමිය නොහැකි ලෙස ලේඛණගත කර තිබේ. යමෙකුගේ ජීවිත කාලය පුරා මුහුණ දී ජයගත් සෑම පරීක්ෂාවක්ම, නොවැටී අභිබවා ජය ලද සෑම නපුරක්ම, කාරුණික වදනින් යමෙකු සැනසූ සෑම අවස්ථාවක්ම එම පොතෙහි විශ්වාසවන්ත ලෙස වාර්තා කර තිබේ. ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ඉටු කළාවූ සෑම පූජාවීමක්ම, උන්වහන්සේ උදෙසා විඳ දරාගත් සෑම ඛේදවාචකයක්ම, එහි වාර්තා ගත කර තිබේ. ගීත රචකයා මෙසේ පවසයි: "ඔබ මාගේ මුළාවයාම් ගණින සේක. මාගේ කඳුළු ඔබගේ භාජනයෙහි තැබුව මැනව. ඒවා ඔබගේ පොතෙහි ලියන ලද්දේ නොවේද?" (ගීතාවලිය 56:8).

මිනිසුන් විසින් සිදු කළ සෑම පාපයක්ම ලියා ඇති පොතක්ද සගයේ ඇත. "මක්නිසාද යහපත් වේවා, නපුරු වේවා, සියලු ක්‍රියාද

සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවන සේක." (දේශනාකාරයා 12:14). "තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිෂ්ඵල වචන ගැන විනිශ්චය දවසේදී උත්තරදෙන්ට වෙන්නේයයි නුඹලාට කියමි. මක්නිසාද නුඹේ වචනවලින් නුඹ නිදොස් කරනු ලබන්නෙහිය. නුඹේ වචන වලින් නුඹ වරදට පත්කරනු ලබන්නෙහිය"යි යේසුස්-වහන්සේ කීසේක. (මතෙව් 12:36, 37). නිවැරැදි විස්තර අඩංගු එම සටහන් පොතෙහි සෑම රහසිගත අරමුණක්ම, සෑම රහසිගත චින්තනයක්ම වාර්තාගතව තිබේ. මක්නිසාදයත් ශුද්ධවූ වචනය මෙසේ පවසයි, "උන්වහන්සේ අන්ධකාරයේ සැඟවුණු දේ එළිදරව් කොට, සිත්වල අදහස් ප්‍රකාශ කරන සේක." (1 කොරින්ති 4:5). "බලව, ඒක මා ඉදිරියෙහි ලියා තිබේ ... නුඹලාගේ අයුතුකම්ද ... නුඹලාගේ පියවරුන්ගේ අයුතුකම්ද" ලියා තිබෙන්නේ යයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙසායා 65:6,7).

මිනිසෙක් කරන්නාවූ සෑම ක්‍රියාදාමයක්ම දෙවියන් වහන්සේගේ නිරීක්ෂණයට භාජනය වේ. එම දය යහපත් හෝ අයහපත් ලෙස වාර්තා පොත්වල සනිටුහන් වේ. සෑම වැරදි වදනක්ම, සෑම ආත්මාර්ථකාමී ක්‍රියාදාමයක්ම, ඉටු නොකළ සෑම වගකීමක් සහ යුතුකමක්ම, සෑම කපටිකමක් හා රැවටීමක්ම, සෑම රහසිගත පාපයක්ම සගයේ පොත්වල වාර්තාගතව තිබේ. සගයෙන් එවනු ලැබූ අනතුරු ඇඟවීම් සුළු කොට හැරීම්, වරද පෙන්වා දීම නොසලකා හැරීම් යන මේ සියල්ල ඒ තැනැත්තාගේ රැකවල් දූතයා විසින් නොඅඩුවම වාර්තා පොත්වල සනිටුහන් කර ඇත. වර්ධනය කර නොගත් සෑම ඵලදායී අවස්ථාවක්ද හොඳට හෝ නරකට හෝ පැවති සෑම බලපෑමක්මද එයින් ඇතිවූ දීර්ඝ කාලීන ප්‍රතිඵලද දේවදූතයා සටහන් කරන වාර්තාවන්ට ඇතුළත් වේ.

විනිශ්චයේදී මිනිසුන්ගේ ජීවිත හා චරිත තීරණය කිරීමේ ප්‍රමිතිය වන්නේ දෙවියන්වහන්සේගේ දහම් ව්‍යවස්ථාවය. ප්‍රඥාවන්ත මනුෂ්‍යයා මෙසේ පවසන්නේය: "දෙවියන්වහන්සේට භයව උන්වහන්සේගේ ආඥා පවත්වන්න. මේ වනාහි සියලු මනුෂ්‍යයන්ගේ යුතුකමය. මක්නිසාද ...සියලු ක්‍රියාද සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවනසේක." (දේශනාකාරයා 12:13,14). අපෝස්තුළු යාකොබ් සිය සහෝදරයන්ට මෙසේ අනුශාසනා කරන්නේය. "නිදහස්කමේ ව්‍යවස්ථාවකින් විනිශ්චය කරනු ලබන්ට සිටින තැනැත්තන් මෙන් කථාකරන්න, ක්‍රියා කරන්න." (යාකොබ් 2:12).

විනිශ්චයේදී "වටිනාකමක්'ඇතැයි" තීරණය කරනු ලැබූ අයට ධර්මිෂ්ඨයන්ගේ මළවුන්ගෙන් නැගිටීමට පංගුකාරයන් වීමේ භාග්‍යය



උදා වන්නේය. යේසුස්වහන්සේ මෙසේ වදාළ සේක: "ඒ ලෝකයටත් නැවත නැගිටීමටත් පැමිණෙන්ට සුදුස්සෝ යයි ගණන් ගනු ලබන අය ... දේවදූතයන් හා සමාන වෙති; නැවත නැගිටීමේ පුත්‍රයන් බැවින් ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය" (ලූක් 20:35,36) උන්වහන්සේ මෙසේද කීසේක: "යහපත්කම් කළාහු ජීවනයේ නැවත නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත නැගිටීමටත් පිටත්ව එන්නෝය." (යොහන් 5:29) මළාවූ ධර්මිෂ්ඨ අය මළවුන්ගෙන් නැගිටුවනු ලබන්නේ විනිශ්චය නිම වූවාට පසුවය. එවිට ඔවුන් 'ජීවනයේ නැවත නැගිටීමට' සුදුස්සන් බව තීරණය කරනු ලබනවා ඇත. එහෙයින් ඔවුන්ගේ කාරණා විනිශ්චය කරනු ලබන ඒ විනිශ්චයේදී ඔවුන් සගයෙහි සිටින්නේ නැත.

එම අය වෙනුවෙන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි අයැදීමට යේසුස් වහන්සේ පෙනී සිටින සේක. "යමෙක් පව් කළොත් ධර්මිෂ්ඨවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මැදහත්කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටිනසේක." (1 යොහන් 2:1) "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සැබෑ ශුද්ධ ස්ථානයේ ආදෘශවන, අතින් සෑදූ ශුද්ධස්ථානයකට නොව අප උදෙසා දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි දැන් පෙනී සිටින පිණිස ස්වර්ගයටම ඇතුල්වූසේක." "එබැවින් උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන." (හෙබ්‍රෙව් 9:24; 7:25)

විනිශ්චයේදී සටහන් පොත් විවෘත කරමින් විභාග කරන්නාවූ අතරේදී, යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය රැඳවූ සෑම අයෙකුගේම ජීවිත දෙවියන්වහන්සේ ඉදිරියට පත්කරනු ලැබේ. මෙම පිරික්සුම ආරම්භ වන්නේ ලෝකාරම්භයේ සිටි පුද්ගලයන්ගෙනි. භූ තලය මත දිවි ගෙවූ ඊළඟ පරම්පරාවන්ද, එතැන් සිට වත්මන් පරම්පරාවෙහි ජීවත් වන්නාවූ සැමගේ ජීවිත වාර්තාද අපගේ නීති වේදියාණන් විසින් විභාගය සඳහා ඉදිරිපත් කෙරේ. සැමගේ නම් සඳහන් කර ඉතා ගැඹුරින් විභාග කෙරේ, සමහර නම් තෝරා ගැනේ. තවත් සමහර නම් ප්‍රතික්ෂේප කෙරේ. යම් අයෙකුගේ නමක් විභාගය සඳහා ඉදිරිපත් වූ විට, ඔහු විසින් පසුතැවිලි නොවූ, කමාව නොලැබූ පාප වාර්තා පොත්වල සම්බ වී නම් ඔහුගේ නම ජීවනයේ පොතෙන් ඉවත් කරනු ලැබේ. තවද ඔහු විසින් කර ඇති යහ ගුණ ක්‍රියාදාමයන්ද සටහන් පොතෙන් ඉවත් කරනු ලැබේ. දෙවියන්වහන්සේ මෝසෙස්ට මෙසේ ප්‍රකාශ කළසේක. "මට විරුද්ධව පව් කළ කවරෙක් නුමුත් මාගේ පොතෙන් මකා දමන්නෙමි." (නික්මයාම 32: 33). එසකියෙල් අනාගතවක්තෘද මෙසේ පවසයි: "ධර්මිෂ්ඨයෙක් තමාගේ ධර්මිෂ්ඨකමෙන්

හැරී අධර්මිෂ්ඨ කම්කොට ... පිළිකුල් ක්‍රියාවල හැටියට කළොත්... ඔහු කළ ඔහුගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලින් කිසිවක් සිහි කරනු නොලැබේ." (එසකියෙල් 18:24).

තමන්ගේ පාප ගැන අවංකවම පසුතැවිලි වී ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය පාප සමගි කිරීමේ පූජාව ලෙස පිළිගන්නාවූ සැමගේ නම් ඉදිරියෙහි පාපවලට කමාව දානය කරනු ලැබූ බව සගයෙහි පොත්වල සටහන් කරනු ලබන්නේය. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේගේ දැහැමිතාවට පංගුකාරයන් ලෙස ගණනය කරනු ලබන්නෝය. තවද, ඔවුන්ගේ චරිත දෙවියන්වහන්සේගේ දහම් ව්‍යවස්ථාව සමග අනුකූලතාවක් දක්වන්නේ නම් ඔවුන්ගේ පාපද මකා හරිනු ලැබ ඔවුන් සදාතනික අමරණීය ජීවිතය ලැබීමට සුදුස්සන් සේ සලකනු ලබනවා ඇත. යෙසායා ප්‍රොපේතවරයා තුළින් දෙවි සමිඳාණෝ මෙසේ පවසන සේක. "මම, මමම, මා නිසා නුඹේ පාපවල් සිහිනොකොට නුඹේ වරද මකා දමන තැනැන්වහන්සේය." (යෙසායා 43:25). යේසුස්වහන්සේ මෙසේ වදාළ සේක: "ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ; ඔහුගේ නම ජීවන පොතෙන් කිසිසේත් මකා නොහැර, මාගේ පියාණන්වහන්සේද උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි." "එබැවින් මනුෂ්‍යයන් ඉදිරියෙහිදී: ඔහු අඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී මමත්: ඔහු අඳුනමියි කියන්නෙමි. නුමුත් මනුෂ්‍යයන් ඉදිරියෙහිදී: ඔහු නාඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී මමත් ඔහු නාඳුනමියි කියන්නෙමි." (එළිදරව් 3:5; මතෙව් 10:32,33).

ලෞකික ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ලක් මගින් දෙනු ලබන්නාවූ තීරණයන් ගැන මනුෂ්‍යයෝ මහත් සැලකිල්ලක් දක්වති. එහෙත් ජීවන පොතෙහි නම් ලියා ඇත්තාවූ අය පිළිබඳව වූ ඉරණම තීන්දු කරන විශ්වයේ විනිශ්චයකාරයාණන් ඉදිරියෙහි සගයෙහි පවත්නා නඩු විභාගය ගැන මිනිසුන් දක්වන්නාවූ අල්ප මාත්‍ර උනන්දුව මවිතයට කරුණකි. තමන්වහන්සේගේ ශ්‍රී රුධිරය කෙරෙහි වූ ඇදහිල්ල කරණකොටගෙන ජයගත් අයට ඔවුන්ගේ සියලු පාපවලට කමාව දෙන්නැයි දිව්‍ය මැදහත්කාරයාණෝ තම ආයාචනය ඉදිරිපත් කරන සේක. එම අයව තමන්වහන්සේ සමග "පළමු ආණ්ඩුවෙහි" සම උරුමක්කාරයන් ලෙස ඔටුණු පළඳවා ඒදන් උයනෙහි නැවතත් පදිංචි කරවන්නැයි ඉල්ලීමක්ද උන්වහන්සේගෙන් ඉදිරිපත් වේ. මිනිසා මැවීමේ අභිප්‍රාය තුළ දිව්‍ය සැලැස්මක් ක්‍රියාත්මක විය. මිනිසාව මුළා කරමින්, ඔහුව පරීක්ෂාවට හෙළමින් මෙම සැලැස්ම විනාශ කිරීමට සාතන්



අදහස් කර තිබේ. එහෙත් ක්‍රිස්තුස්වහන්සේ නඩු විභාගයේදී ඉල්ලා සිටින්නේ මිනිසා කිසිම දවසක පාපයට නොවැටුණාක් මෙන් සලකා දිව්‍ය සැලැස්ම ක්‍රියාත්මක කරන්නැයි කියාය. මහා කාරුණික මැදහත්කාරයාණෝ තමන්ගේ සෙනඟ උදෙසා ඉල්ලා සිටින්නේ පරිපූර්ණවූද අඩුවක් නැතිවූද පව් කමාව පමණක් නොව තමන්-වහන්සේගේ තේජෝමහිමාලංකාරය බෙදා ගැනීමක්ද තමන්ගේම සිංහාසනයෙහි හිඳ ගැනීමට වරප්‍රසාදයක්ද ඔවුන්ට දෙන ලෙසය.

තමන්ගේ අනුග්‍රහය යටතේ වූ සැදැහැවතුන් වෙනුවෙන් යේසුස්-වහන්සේ ආයාචනා ඉදිරිපත් කරන්නාවූ ක්‍රියාදාමයට සමගාමීව සාතන්ද දෙවියන්වහන්සේ ඉදිරියෙහි, එකී සැදැහැවතුන් ව්‍යවස්ථාව උල්ලංඝනය කළාවුන් යයි චෝදනා ඉදිරිපත් කරයි. මහා වංචාකාරයා මෙම පුද්ගලයන්ව දෙවියන්වහන්සේ වෙතින් බිඳුවා ලන්නටද, උන්වහන්සේගේ පොරොන්දු අනුමාන කරවන්ටද, දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔවුන් ඈත් කරන්නට සහ ව්‍යවස්ථාව කඩවන්ටද බලපෑම් ඇති කර තිබේ. දන් සාතන් සැදැහැවතුන්ගේ ජීවන වාර්තා දෙසට අවධානය යොමු කරවමින් ඔවුන්ගේ චරිත තුළ දක්නට ඇති අවකල් ක්‍රියාදාමයන්ද එම ක්‍රියාවන් මගින් ඔවුන් ගැළවුම්කාරයාණන්ව අවමානයට පත්කර ඇති ආකාරයද ඔහු විසින් ක්‍රියාත්මක කළ පරීක්ෂාවන් මගින් ඔවුන් ඒවාට ගොදුරු වූ ආකාරයද හුවා දක්වමින් එම සැදැහැවත් ජනතාව තමාගේ යටත්වැසියන් යයි පවසයි.

පාපයට වැටි සැදැහැවතුන්ගේ ක්‍රියාදාමයන් ගැන යේසුස්වහන්සේ නිදහසට කරුණු ඉදිරිපත් නොකරන නමුත් එම අයගේ පසුතැවීම හා ඇදහිල්ල පෙන්වා දෙමින් ඔවුන්ට කමාව දෙන්නැයි උන්වහන්සේ ඉල්ලා සිටින සේක. පියාණන්වහන්සේද, ශුද්ධවූ දේව දූතයන්ද ඉදිරියෙහි තමන්වහන්සේගේ සිදුරු කරනු ලැබූ ශ්‍රී හස්ත ඔසවා පෙන්වමින් උන්වහන්සේ මෙසේ පවසන සේක: මේ එක් එක් පුද්ගලයා ඔවුන්ගේ නමින් මම හඳුනමි. ඔවුන්ගේ නාම මාගේ අත්වල අල්ලෙහි කොටා ගෙන ඇත. "දෙවියන්වහන්සේට කළ යුතු පූජාව නම් බිඳුණාවූ සිතක්ය. දෙවියන්වහන්ස, බිඳුණාවූ තැළුණා වූ සිතක් ඔබ සුළුකොට නොසිතනසේක." (ගීතාවලිය 51:17). තමන් සෙනඟට වරද තබන්නාවූ චෝදකයා දෙසට හැරෙන්නාවූ ක්‍රිස්තුස්වහන්සේ ඔහුට මෙසේ තරවටු කරන සේක, "සාතන් ස්වාමීන්වහන්සේ නුඹට තරවටුකරන සේක්වාග එසේය, යෙරුසලම තෝරාගත් ස්වාමීන්වහන්සේ නුඹට තරවටු කරන සේක්වා! මොහු ගින්නෙන් ඇදලාගත් පෙනෙල්ලක් නොවේද?" (සෙකරියා 3:2). ක්‍රිස්තුස්වහන්සේ තම විශ්වාසවන්ත අයව තමන්ගේම දැහැමිතාවෙන් පළඳවනසේක. උන්වහන්සේ "සභාව ශුද්ධව, කැළලක් හෝ රැළි හෝ එබඳු යමක් නැතුව තේජවත් සභාවක් කොට" පියාණන්වහන්සේට

පිළිගන්වන සේක. (එපීස 5:26,27). ඔවුන්ගේ නම් ජීවන පොතෙහි නිත්‍ය ලෙස ලියා තිබේ. ඔවුන් පිළිබඳව මෙසේ පැවසේ: "ඔවුන් වටින්නන් නිසා සුදු ඇඳුමෙන් මා සමඟ ඇවිදිනවා ඇත." (එළිදරව් 3:4).

අළුත් ගිවිසුමෙහි පොරොන්දු මෙසේ සම්පූර්ණ යථාර්ථයක් බවට පත්වන්නේය. "මම ඔවුන්ගේ අපරාධය ක්ෂමා කරන්නෙමි. ඔවුන්ගේ පාපයද තවත් සිහි නොකරන්නෙමියි. ස්වාමීන්වහන්සේ කියනසේක." "ඒ දවස්වල හා ඒ කාලයේදී ඉශ්‍රායෙල්ගේ අයුතුකම සොයන නමුත් එය නොතිබෙයි. යුදාගේ පාපයන් සොයන නමුත් ඒවා සම්බ නොවෙයි." (යෙරෙමියා 31:34; 50:20). "ගැළවුණු ඉශ්‍රායල්වරුන්ට ඒ දවසේ ස්වාමීන්වහන්සේගේ පැලැටියද අලංකාරව දීප්තිමත් වන්නේය. දේශයේ එල උතුම්ව ශෝභන වන්නේය." "සියොන්හි ගැළවී සිටින්නාද යෙරුසලමෙහි ඉතුරුවෙන්නාද, එනම් යෙරුසලමෙහි ජීවනය පිණිස ලියවී සිටින සියල්ලෝ ශුද්ධය යයි කියනු ලබන්නෝය." (යෙසායා 4:2,4).

සෝදිසි කිරීමේ නඩු විභාගයත්, පාප මකා හරිනු ලැබීමත් ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනයට පෙරාතුව නිම විය යුතුය. පොත්වල ලියා තිබෙන වාර්තා අනුව මිය ගියවුන් විනිශ්චය කිරීමකට භාජන කළ යුතුය. ඔවුන් සැමගේ නඩු නිමිති හමාර කර තීන්දුවක් නිකුත් කරන තෙක් ඔවුන්ගේ පව් මකා හැරීමේ හැකියාවක් නොවේ. ඇදහිලිවතුන්ගේ පව් මකා දමීම පිළිබඳව පේතෘස් මෙවන් පැහැදිලි ප්‍රකාශයක් කරයි: "එබැවින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද, නුඹලා උදෙසා නියම කරන ලද්දාවූ ක්‍රිස්තුස්වහන්සේ, එනම් යේසුස්වහන්සේ, එවන පිණිසද, නුඹලාගේ පාපයන් මකා දමනු ලබන පිණිසද, පශ්චාත්තාපව හැරෙන්න" (ක්‍රියා 3:19,20). සෝදිසි කිරීමේ විනිශ්චය නිමවූ පසු ක්‍රිස්තුස්-වහන්සේ මෙලොවට වැඩම කරනවා ඇත. එකිනෙකාට තම තමාගේ ක්‍රියාවන් අනුව ප්‍රදානය කරන පිණිස විපාකද උන්වහන්සේම රැගෙන එන සේක.

ඊශ්‍රායෙල්වරුන්ගේ යුගයේදී, ඊශ්‍රායෙල්වරුන් උදෙසා සමගි කිරීමේ මෙහෙයේ අවසානයේදී උත්තම පූජකයා දේව මාළිගාවේ දොරකඩ ළඟට ඇවිත් සමූහයාට ආශිර්වාද කළේය. එසේම, මැදහත්කාරයාණන් ලෙස තම සේවය නිම කළ විට ක්‍රිස්තුස්වහන්සේද එතුමාණන් ගැන බලාපොරොත්තු සහගතව සිටින්නවුන්ට "ගැළවීම පිණිස පාපය නැතුව දෙවෙනිවර ප්‍රකාශවන සේක" (හෙබ්‍රෙව් 9:28). සදාතන ජීවනය දානය කිරීමෙන් උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරන සේක.



දේවස්ථානයෙන් පාපය ඉවත් කරන්නාවූ උත්තම පූජකයා එම පාප සියල්ල අශාශෙල්ට කැපවූ එළුවාගේ හිස මත පැවරූ ආකාරයෙන්ම ක්‍රිස්තුස්වහන්සේද පාපයේ නිර්මාතෘවරයාද එය පොළඹවන්නාදවූ සාතන් මත පව් සියල්ලම පවරා දෙනසේක. ඉක්බිතිව එම එළුවා "ජනවාසයක් නැති පාළුකරයට" යවනු ලැබීය. (ලෙවී කථාව 16:22). දෙවියන්වහන්සේගේ සෙනඟ පාපයට ඇද දැමූ සාතන්ද වසර දහසක කාලයකට මෙලොව සිරකර තබනවා ඇත. එකල පොළොව ශූන්‍ය භූමියක් බවට පත්ව තිබෙන්නේය. එයින් පසුව සියළු පව්කාරයන් විනාශ කර දමන්නාවූ ගිනි විලෙහි සාතන්ද තම ජීවිතයෙන් වන්දි ගෙවන්නේය. නපුර අත්හැර දැමීමට කැමැත්ත දක්වූ අයට පොරොන්දු වූ ගැළවීමේ සැලැස්ම මෙසේ නිම වන්නේය. පාපය අත්හැරීමට කැමති වූ සියල්ලන්ට සදාතන ජීවනය හිමි වේ.

දවස් 2300 ක දීර්ඝ කාලීන අනාවැකිය ක්‍රි. ව. 1844 දී නිමාවට පත්වූ විට, නියමිත අවස්ථාවේදී සෝදිසි කිරීමේ විනිශ්චයද පාප මකා දැමීමේ කාර්යද ආරම්භ විය. යේසුස්වහන්සේව පිළිගත් සියලු-දෙනාගේම ජීවිත පූර්ණ නිරීක්ෂණයට භාජන කරනු ලැබිය යුතුය. මරණයට පත්ව සිටින අයද ජීවත් වන්නාවූ අයද විනිශ්චය කරනු ලැබිය යුතුය. විනිශ්චයේ තීන්දුව නියම වන්නේ එකිනෙක්කෙනාගේ ක්‍රියාවන් පිළිබඳ වාර්තා සටහන් අඩංගු වූ පොත්හි සනිටුහන් වූ කරුණු අනුවය.

පසුතැවිලි නොවුනාවූ ද, අත්හැර නොදැම්මාවූ ද පාපවලට කමාව නොලැබෙන්නේය. වාර්තා පොත්වලින් එම පාප මකාහරිනු නොලැබේ. දෙවියන්වහන්සේගේ දවසේදී එම පාප පව්කරුවාට විරුද්ධ සාක්ෂි ලෙස ඉදිරිපත් වන්නේය. එකී පුද්ගලයා එම පාප සිදුකර ඇත්තේ මහා දවාලේ හෝ රාත්‍රී අන්ධකාරයේ විය හැකිය. එසේ වුවද, අප විනිශ්චය කරන්නාවූ තැනැන්වහන්සේ ඉදිරියෙහි සියලු දේ විවෘතව පවතින්නේය. සැම පාපයක්ම සිදුකරනවා දේව දූතයන් දක ඇත. ඔවුහු එම සිදුවීම් නොවරදින ලෙස වාර්තා කර ඇත. පියාගෙන්ද, මවගෙන්ද, බිරිඳගෙන්ද, දරුවන්ගෙන්ද සමාගම්කරුවන්ගෙන්ද පව් සඟවා ගෙන තබාගත හැක, කළේ නැතැයි කියා ප්‍රතික්ෂේප කළ හැක. වැරැදි ක්‍රියාව දන්නේ එය කළ තැනැත්තාම පමණක් විය හැකිය. එසේ වුවද, සිදුවීම් සියල්ල ස්වර්ගීය ප්‍රඥාව ඉදිරියෙහි විවෘතව පවතී. මධ්‍යම රාත්‍රියේ ඝන අඳුර වේවා, වංචාකාර ක්‍රියාවන් ඉතා රහසිගත ලෙස සඟවා ගෙන සිටිනවා වේවා, එම සිද්ධීන් සර්වඥ තැනැන්වහන්සේගෙන් සඟවා තබාගැනීමේ හැකියාවක් කාහටත් නැත්තේය. සැම අදමිටු ක්‍රියාවක් පිළිබඳවද සැම අසාධාරණ ගණුදෙනුවක් පිළිබඳවද දෙවියන්වහන්සේ සතුව සත්‍ය වාර්තාවක්

ඇත්තේය. අන්ධකාරය නැමැති කඩතුරාව මගින් උන්වහන්සේව රැවටිය නොහැකිය. චරිතයක් විනිශ්චය කිරීමේදී උන්වහන්සේ කිසිම වැරැද්දක් නොකරන සේක. හදවත දූෂ්‍ය වූ අයගේ වදන් සහ ක්‍රියාවලින් බොහෝ අය රැවටිල්ලට භාජන කළ හැකිය. නමුත් දෙවියන්වහන්සේ සියළු කඩතුරාවන් ඉවත්කර අභ්‍යන්තර ජීවිතය විමසා බලන සේක.

මේ සිතුවිල්ල කෙතරම් ගාම්භීරද! මොහොතින් මොහොත දවසින් දවස සකල ලෝ දනන් විසින් කරන්නාවූ සියළු දය සගයේ පොත්වල වාර්තා කරනු ලබන්නේය. වදන් පැවසූවාට හෝ ක්‍රියාදාමයක් කරනු ලැබුවාට පසුව ඒවා ආපසු හරවා ගත නොහැකිය. යහපත් වේවා අයහපත් වේවා සෑම දෙයක්ම දේව දූතයන් විසින් වාර්තා ගතකරනු ලැබේ. භූමි තලයෙහි රජ කළ ඉතා ප්‍රබල යුද්ධකාමී අධිරාජ්‍යයා හට වුවද, ගෙවී ගිය දවසක සටහන ආපසු ලබාගත නොහැකිය. අපගේ ක්‍රියාදාමයන් හෝ අපගේ වචන වේවා අපගේ ඉතා රහසිගත ආකල්ප වේවා මේ සියල්ල අපගේ ඉරණම තීන්දු කිරීමෙහිදී පාදක වන්නේය. එකී කරුණු අපගේ මතකයෙන් සම්පූර්ණයෙන් ගිලිහී ගියද විනිශ්චයේදී අපව නිදොස් කිරීමට හෝ අපව වරදකරුවන් කිරීමට එම දේවල් සාක්ෂි දරනවා ඇත.

චිත්‍රශිල්පියෙක් මිනිස් මුහුණක් සිතුවමට නැගීමේදී මුහුණේ ඇති සෑම විශේෂාංගයක් ගැනම සැලකිලිමත් වන්නාක් මෙන්ම චරිතයේ සෑම කරුණක්ම විස්තරාත්මකව සගයේ පොත්වල වාර්තා ගත කර තිබේ. එහෙත් ස්වර්ගීය වාසීන්ගේ දර්ශනයට යොමුවන මේ සටහන් ගැන දක්වනු ලබන්නේ කොපමණ අඩු සැලකිල්ලක්ද. අදෘශ්‍යමාන දේවල් හා මිනිස් දර්ශනයට යොමුවන දේවල් අතරේ පවතින කඩතුරාව ඉවත් කරනු ලබන්නේ නම් මිනිස් දරුවන්ට දකගත හැකි වන්නේ දේව දූතයන් සෑම වචනයක්ම සෑම ක්‍රියාදාමයක්ම වාර්තා කරන බවය. ඉදිරි විනිශ්චයේදී මෙම ක්‍රියා සහ වදන් තමන්ගේ ඉරණම තීරණය කිරීමට දායක වන බව මිනිසුන්ට වැටහී යන්නේ නම් ඔවුන් දිනපතා තෙපලන්නාවූ වදන් මෙන්ම කරන්නාවූ ක්‍රියාවන්ද බොහො-මයක් නොකර සිටිනවා නොඅනුමානය.

උපතින් ලද කුසලතාවන් භාවිතයට ගෙන ඇත්තේ කෙසේදැයි විනිශ්චයේදී ඉතා සමීපව විමර්ශනයට ලක් කරනු ලැබේ. සගයෙන් ලබාදුන්නාවූ හැකියාවන් අප භාවිතා කළේ කෙසේද? ස්වාමීන්-වහන්සේ පැමිණෙන විට උන්වහන්සේට තම කොටස පොළියත් සමග ලබාගත හැකිවේද? අපට ලබාදෙන ලද හස්තයේ, හදවතේ සහ මනසේ බලශක්තීන් දෙවියන්වහන්සේගේ මහිමය සඳහාත් ලෝකයාට ආශිර්වාදයක් වීම සඳහාත් අපි වර්ධනය කර ගත්තෙමුද? අපගේ



කාලය අපගේ පෑන, අපගේ හඬ, අපගේ මුදල්, අපගේ අනුබලය අප භාවිතා කර ඇත්තේ කොයි ආකාරයෙන්ද? දුප්පත් අයට, පීඩාවට පත් අයට අනාථ අයට නැතහොත් වැන්දඹුවන්ට ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අප කර ඇත්තේ මොනවාද? දෙවියන්වහන්සේ තමන්-වහන්සේගේ ශුද්ධ වචනයේ ගබඩාකරුවන් ලෙස අපව පත් කර ඇති සේක. මිනිසුන්ට ගැළවීම උදාකර දීමට, ඒ ගැන ඔවුන්ව බුද්ධිමත් කිරීමට, දනුවත් කිරීමට අප ලද ආලෝකයෙන් සහ සත්‍යතාවෙන් අපි කුමක් කර ඇත්තෙමුද? ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තිබේ යයි කියා ගැනීමේ පමණක් කිසිම වටිනාකමක් නැත. අවංක ලෙස ගණන් ගනු ලබන්නේ ප්‍රේමයේ සේවය ලැබූ ක්‍රියාවන් පමණකි. යම්කිසි ක්‍රියාදාමයක් වටිනාකමකින් යුත් එකකැයි සගය විසින් තීරණය කරනු ලබන්නේ ඒ හා මුසුවී ඇති ප්‍රේමය පදනම් කරගෙනය. ප්‍රේමය මුසුව කරන්නාවූ යම්කිසි ක්‍රියාවක් මිනිසුන් විසින් ඉතා අඩු තක්සේරුවකින් ඇගයීමකට ලක් කළද එය, දෙවියන්වහන්සේගේ පිළිගැනීමට භාජන වී එයට විපාකද දානය කෙරේ.

මිනිසුන්ගේ ඇතුළාන්තයෙහි සැඟවී පවත්නා ආත්මාර්ථකාමීත්වය සගයේ පොත්වල එළිදරව් කර ඇත. සහෝදර ජනතාව උදෙසා ඉටු නොකළ යුතුකම්ද ගැළවුම්කාරයාණන්ගේ ඉල්ලීම් සහ අයිතිවාසිකම් අමතක වීම්ද අඩංගු වාර්තාවක් සගයේ ඇත. ක්‍රිස්තුස්වහන්සේට ලබා දිය යුතු ශක්තිය, සැලකිල්ල හා කාලය යමෙකු විසින් සාතන්ට කොපමණ වාරයක් කැප කළේද යන්න ගැන වූ වාර්තා සටහන් ඔවුන්ට එහිදී දකගැනීමට අවස්ථාව ඇත. දේව දූතුන් විසින් සගයේ තබන්නාවූ සටහන් ඉතා කණගාටුදායක වන්නේය. බුද්ධිමතුන්ද, ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් යයි කියාගන්නාවූ අයද ලෞකික වස්තු සම්පත් රැස්කිරීමෙහි නිරතව සිටිති. එසේත් නැතිනම් ඔවුහු ලෞකික සැප සම්පත්වල යෙදෙමින්, විනෝදාස්වාදයෙහි යෙදෙමින් කල් ගෙවති. බොහෝ අය තම කාලය, ධනය හා ශක්තිය ස්වකීය ආශාවන් සංසිඳුවා ගැනීම සඳහා හෝ ස්වකීය අභිමානය සහ සඵලත්වය ප්‍රදර්ශනය කිරීම සඳහා හෝ වැය කරමින් කල් ගෙවති. එහෙත් යාච්ඤා කිරීම උදෙසා, ශුද්ධ ලියවිලි අධ්‍යයනය සඳහා, තමාගේ ආත්මය යටහත් කරගැනීම සඳහා හා පව් කියාදීම සඳහා ඔවුන් කාලය මිඩංගු කරන්නේ ඉතා සුළු වශයෙන්ය.

අපගේ මනස සහ කාලය යෙදවීම සඳහා සාතන් අප්‍රමාණ යෝජනා ක්‍රම ඉදිරිපත් කරයි. අපගේ ගැළවීම උදෙසා වැඩදායක වන්නාවූ විෂය මාලාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකර වෙනත් ලෞකික දය කෙරෙහි කාලය යෙදවීමට මනස යොමු කරවීමට පෙළඹවීම සාතන්ගේ උපායකි. සියල්ලෙන් බලවත් වූ මැදහත්-

කාරයාණන් හා සම්බන්ධිත සමගි කිරීමේ යාගය ගැන වූ සත්‍යතාවයට මිනිසාගේ මනස යොමු කිරීම, හා මිනිසාගේ අවධානයට එය හසු වීම මහා රුවටිලි කාරයාගේ ද්වේෂයට ලක් වේ. යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සත්‍යතාවන් වෙතින් මිනිස් මනස බැහැරට යොමු කිරීම මත තමාගේ සාර්ථකත්වය රැඳී පිහිටන බව සාතන් හොඳාකාරව දන සිටින්නේය.

ගැළවුම්කාරයාණන්ගේ මැදහත්කාර සේවයෙහි ප්‍රතිලාභ සහ වරප්‍රසාදයන්ට පංගුකාරයන් වීමට අපේක්ෂා කරන්නාවූ අය සතුව ඇත්තේ විශාල කාර්ය භාරයකි. දෙවියන්වහන්සේට භයව පරිපූර්ණ ශුද්ධත්වය සාදාගැනීම ඔවුන්ගේ පරම යුතුකම වන්නේය. එයට බාධා පැමිණ වීමට කිසිම දෙයකට ඉඩ දීම ඔවුන් විසින් නොකළ යුතුය. සැප-සෙල්ලම් සඳහා, සමාජ තලයෙහි කැපී පෙනීම සඳහා, හා වස්තු සම්පත් රැස් කරගැනීම සඳහා යොදවන්නාවූ වටිනා කාලය යාච්ඤාවෙන් යුතුව, අවංක භාවයෙන් යුතුව සත්‍යතාවයේ වචනය ඉගෙනීම සඳහා යොදවනු ලැබිය යුතුය. ස්වර්ගීය ශුද්ධස්ථානය සහ සෝදිසි කිරීමේ විනිශ්චය පිළිබඳව මනා අවබෝධයක්, පැහැදිලි විස්තරාත්මක දනගැනීමක් දේව සෙනඟ සතුවීම අනිවාර්ය වන්නේය. තමන්ගේ අති උත්තම වූ පූජකයාණන්ගේ ස්වර්ගීය දෙව් මැදුරු සේවාව සහ උන්වහන්සේ එහි දරන්නාවූ විශිෂ්ට ස්ථානය පිළිබඳව දනුමක් සැම පුද්ගලයෙක්ම ලබා සිටීම වැදගත්ය. එවන් දනුමක් නොමැත්තේ නම් මෙම කාලයට අතිශයින් අවශ්‍ය වන්නාවූ ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට හැකියාවක් ඇති නොවන්නේය. තවද, දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට නියම කර ඇති ස්ථානයෙහි සේවය කරමින් ජයෙන් ජයට පිවිසීමට ඔවුන්ට නොහැකි වනවා ඇත. ගළවා ගැනීමට හෝ විනාශ කරගැනීමට සැම පුද්ගලයෙකුටම ජීවිතයක් සතුව ඇත. දෙවියන්වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි සැම අයෙකුටම නඩු විභාගයක් නියම වී ඇත. සැම පුද්ගලයෙක්ම අති උතුම් නඩුකාරයාණන් මුහුණට මුහුණ ලා මුණගැසීම අනිවාර්ය වන්නේය. යුගාන්තයේදී සැම පුද්ගලයෙක්ම දානියෙල්ද සමගින් විනිශ්චය මඩුල්ල ඉදිරියෙහි තමාගේ ස්ථානයෙහි නැගී සිටීමට නියමිතව ඇත. මෙම සිද්ධීන් පිළිබඳව රෑ දාවල් මෙනෙහි කිරීම කෙතරම් වැදගත්ද.

මෙම විෂයන් පිළිබඳව ආලෝකය ලබා ඇති සියලුදෙනාම දෙවියන්වහන්සේ තමන්ගේ භාරයට ලබා දී ඇති මෙම දේවල් පිළිබඳව සාක්ෂි දරීම නිශ්චිත වශයෙන්ම ඉටු කළ යුතුය. මනුෂ්‍යයා වෙනුවෙන් වූ ක්‍රිස්තුස්වහන්සේගේ කාර්ය භාරයෙහි කේන්ද්‍රය වන්නේ සගයේ පිහිටි ශුද්ධස්ථානයයි. පොළොවෙහි දිවි ගෙවන්නාවූ සැම ප්‍රාණයක්ම



එහි සේවාවන් හා බැඳී සිටී. ගැළවීමේ සැලැස්ම පිළිබඳව විස්තර එමගින් අපගේ දර්ශනයට විවෘත වන්නේය. එමගින් අපව කල්පයේ අවසන් කාලය කරා ගෙනු යනු ලබන්නේය, දැහැමිතාව සහ නපුර අතරෙහි වූ අරගලයෙහිදී දැහැමිකමෙහි විශිෂ්ඨ ජයග්‍රහණය කරා එය තුළින් අපව ගෙන යනු ලබන්නේය. මෙම විෂයන් ගැඹුරු ලෙසින් හැදෑරීම සැම අයෙකුටම අති විශිෂ්ඨ වැදගත්කමක් වන්නේය. එකිනෙකා සතුව ඇත්තාවූ බලාපොරොත්තුවට අදාළ හේතු සාධක ඉල්ලා සිටින්නාවූ අයට ප්‍රතිචාරය දක්වීමට මෙම විෂයන් පිළිබඳව සුවිශේෂ අවබෝධයක් තිබීම අපේක්ෂා කෙරේ.

මිනිස් සත හට ගැළවීම සලසා දීමේ සැලැස්මෙහි ඉතාමත් විශේෂිත අවැසියාවක් ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ කල්වාරි යාගය ප්‍රමුඛ ස්ථානයක් දරන්නේය. එසේම මිනිසාට ගැළවීම සපයා දීම් වස් උන්වහන්සේ ඔහු උදෙසා සගයේ දේව මාළිගයෙහි සිදුකරන්නාවූ මැදහත්කාරකමෙහි මෙහෙවරයටද ඊට නොදෙවෙනි ස්ථානයක් හිමි වන්නේය. එම මෙහෙය උන්වහන්සේගේ මරණයත් සමගම මෙලොව ආරම්භ කරනු ලැබිණ. එය සම්පූර්ණ කරන පිණිස උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමට පසුව සගය කරා වැඩිය සේක. පසුව උන්වහන්සේ වැසුම් තිරය පසුකොට ස්වර්ගීය අති ශුද්ධස්ථානයට පිවිසි සේක. "උන්වහන්සේ අපට පෙරටුව" එහි පැමිණිසේක. අපිද උන්වහන්සේ අනුව යමින් එකී ස්ථානයට ඇදහිල්ලෙන් ඇතුළු විය යුතු වෙමු. (හෙබ්‍රෙව් 6:20) කල්වාරි කුරුසියෙන් විහිදී ගිය ආලෝකය එහි පරාවර්තනය වෙමින් බැබළේ. ගැළවීමේ සැලැස්මේ අභිරහස් දය පිළිබඳ පැහැදිලි ප්‍රතිවේදනයක්, එහිදී අපට දකගැනීමට පුළුවන. මිනිසාට ගැළවීම උදාකර දීම් වස් සගයට අති විශාල වියදමක් දරීමට සිදු විය. උල්ලංඝනය කරනු ලැබූ ව්‍යවස්ථාවෙහි අති මහත් ඉල්ලීම්වලට සමානුපාත වටිනාකමක් දේව පුත්‍රයාණන්ගේ යාගයෙන් ලබාදී තිබේ. පියාණන්වහන්සේගේ සිහසුන වෙත ළඟාවීමට යේසුස්වහන්සේ විසින් දොරටුව විවෘත කරදී ඇත. ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ වෙත පැමිණෙන්නාවූ සැමගේ අවංක ආශාවන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිළිගැන්වීම ක්‍රිස්තු සමිඳාණන්ගේ මැදහත්කාරකමෙහි සේවාව මගින් ඉටු විය හැකිය.

"තමාගේ වරද සඟවන්නා සඵල නොවන්නේය. එහෙත් ඒවා කියා දී අත්හරින්නාට කරුණාව ලැබේ." (හිතෝපදේශ 28:13). තමන්ගේ වරද සඟවා ගෙන ඒ සඳහා නිදහසට කරුණු ඉදිරිපත් කරන්නාවූ අය ගැන සාතන් ජයෙන් මත් වෙමින් ප්‍රීතියෙන් කුල්මත් වන්නේය. එයින් නොනවතින්නාවූ හෙතෙම එවන් අයගේ වරද පිළිබඳව ක්‍රිස්තුස්වහන්සේට මෙන්ම ශුද්ධ වූ දේව දූතයන්ටද ඇනුම් පද කියමින්

ගරහන්නේය. සිදුවන්නාවූ මේ දේවල් දකගැනීමට ඒ අයට හැකියාවක් උදා වන්නේ නම් ඔවුහු තවත් පමා නොවී කඩිනමින් තමන්ගේ පව් කියා දෙමින් ඒවා අත්හැර දැමීමට මැළි නොවෙනවා ඇත. යමෙකුගේ චරිතයෙහි අඩුපාඩුකම් සහ දොස් තිබෙන අතරේදී සාතන් ඒවා මගින් එම තැනැත්තාගේ සම්පූර්ණ මනස ස්වකීය පාලනය යටතට ගැනීමට වෑයම් කරන්නේය. යමෙක් මෙම අඩුපාඩුකම්හි ඇලී ගැලී සිටින්නේ නම් ඔහුව පරාජය කොට ජයගැනීමට තමාට හැකි බව සාතන් මනාව දන සිටින්නේය. මිනිසෙකුට තම ජීවිතයෙහි සහ චරිතයෙහි ඇති අඩු ලුහුඬුකම්වලින් ජය ගත නොහැකි යයි කියමින් සාතන් තමාගේ මරණීය බොරු තර්කයන් ලොව ඉදිරියෙහි තබයි. නමුත් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ තුවාල ලකුණු සහිත ශ්‍රී දැත් සහ තමන්ගේ සිරුර පෙන්වා දෙමින් පියාණන්වහන්සේගෙන් ඔවුන්ට කමාව ඉල්ලා සිටිනසේක. උන්වහන්සේ පසු තැවෙන්නාවූ පව්කරුවන් දිරිමත් කරමින්, "මාගේ කරුණාව නුඹට සෑහේය"යි පවසනසේක. (2 කොරින්ති 12:9). සෑම අයෙකුටම උන්වහන්සේ මෙසේ අනුශාසනා කරන සේක: "මා වෙතට එන්න මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන මාගෙන් ඉගෙන ගන්න. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද, මාගේ වියගහ පහසුය, මාගේ බරද සැහැල්ලුය." (මතෙව් 11:28-30). එම නිසා තමන්ගේ ඇති අඩු ලුහුඬුකම සහ වැරදි හරිගස්වා ගන්නට නොහැකි යයි කිසිවෙක් හෝ නොසිතාවා. එම වැරදිවලින් ජයගැනීමට ඇදහිල්ල සහ කරුණා-අනුග්‍රහය දෙවි පියාණන්වහන්සේ සැමට නොඅඩුව ලබාදෙන සේක.

සගයෙහි සිදුවන්නාවූ සමගි කිරීමේ දවස ඉදිරියෙහි අපි දන් ජීවත් වන්නෙමු. ඊශ්‍රායෙල් ජනතාව වෙනුවෙන් භූමික දේව මාළිගයෙහි අති ශුද්ධස්ථානයේ සමගි කිරීමේ මෙහෙය උත්තම පූජක තැන විසින් සිදු කරගෙන ගිය අවස්ථාවේදී සෑම අයෙක්ම තම තමන්ගේ ප්‍රාණවලට පීඩා කරගත යුතු විය. ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි පාප ගැන පසුතැවිලි වෙමින්, යටහත් කමින් යුතුව කමාව ඉල්ලමින් සමගි කිරීමේ මෙහෙය හා සම්බන්ධ වීම අපේක්ෂා කරන ලදී. එසේ නොකළේ නම් එවන් අය ජනතාව අතරෙන් කපා හරිනු ලැබුවේය. එසේම යමෙක් තමාගේ නම ජීවනයේ පොතෙහි රඳවා ගැනීමට කැමැති නම් ඔවුන් තමන්ගේ ප්‍රාණවලට දෙවියන්වහන්සේ ඉදිරියෙහි පීඩා කරගනිමින් සමගි කිරීමට භාජන විය යුතුය. පරිවාස කාලයෙන් ඉතිරිව ඇත්තේ තව ඉතාම කෙටි කාලයක් නිසා තමන්ගේ පාප ගැන දුක් වෙමින් සැවොම සත්‍ය වශයෙන්ම පසුතැවිලි විය යුත්තෝය. විශ්වාසකමින් යුතුව ගැඹුරින්ම ආත්ම සෝදිසි කරගැනීමක් සිදුවිය යුතුය. නිස්සාර වගකීමෙන් තොර කිතුණු ජීවිත රටාව සහ එම



සංකල්පය සහමුලින්ම බැහැර කර දැමිය යුතුය. පාපයේ අණසක යටතේ මඩිනු ලැබ නපුරෙහි පෙළඹවීම් පරාජය කිරීම සඳහා අවංකවූ හරඹයක නිරත වීමක් සිදුවිය යුතුය. දිව්‍ය නඩු විභාගය සඳහා සූදානම් වීම පුද්ගලිකව කළ යුත්තකි. අප කණ්ඩායම් වශයෙන් ගළවනු නොලැබේ. යමෙකු තුළ තිබෙන්නාවූ පාරිශුද්ධතාවය සහ කැපවීම තවත් අයෙකු වෙනුවෙන් ආදේශ කළ නොහැක. සෑම ජාතියක්ම දෙවියන්වහන්සේ ඉදිරියෙහි විනිශ්චය සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ. එසේ වුවද, මනුෂ්‍යයන් විනිශ්චය සඳහා වග උත්තරකරුවන් වන්නේ පුද්ගලික ලෙසය. එකිනෙක්කෙනා පිළිබඳ තොරතුරු ඉතා සමීපව සම්පූර්ණ නිරීක්ෂණයකට භාජනය කෙරේ. සෑම අයෙකුම පරීක්ෂා කර බැලිය යුතුය. කිසිවෙකු තුළ කැළැලක් හෝ රැල්ලක් හෝ නොතිබිය යුතුය.

සමගි කිරීමේ කර්තව්‍යයේ අවසන් කොටස ඉතා ගාම්භීර වන්නේය. එම ක්‍රියාදාමය හා බැඳි සිද්ධීන් පිළිබඳව පිරික්සීම භාරදූර වන්නේය. ඉහළ පිහිටි ශුද්ධස්ථානයේ දන් විනිශ්චය සිදුවෙමින් පවතින්නේය. වසර ගණනාවක් පුරා මෙම කර්තව්‍යය ක්‍රියාත්මක වෙමින් කෙරීගෙන යන්නේය. වැඩි කලක් ගතවීමට පෙර විනිශ්චයෙහි අවසන් කොටස විභාගය සඳහා පිවිසෙන්නේය. එය කෙතරම් කඩිනමින් සිදුවේ දැයි කිසිවෙකුට හෝ දනීමක් නැත. එකල, මිය ගිය අයගේ නඩු විභාග හමාර වී ජීවත් වන්නාවූ අයගේ විනිශ්චය විභාගයට ගනු ලබන්නේය. අතිගරු දෙවියන්වහන්සේ ඉදිරියෙහි අපගේ ජීවිත වාර්තාවන්ද විභාගයට ගැනේ. වෙනත් කිසිම කාලයකට වඩා දන් අප අපගේ ගැළවුම්-කාරයාණන්ගේ අනුශාසනාවට සවන් දීම මැනවි. "ඒ කාලය කවදා වේදැයි නුඹලා නොදන්න බැවින් ප්‍රවේසම්වී, අවදිව ඉඳ යාච්ඤා කරන්න. (මාර්ක් 13:33). "මෙසේ නුඹ අවදිව නොසිටින්නෙහි නම්, සොරෙකු මෙන් එන්නෙමි. මා නුඹ කරා කොයි පැයේ එනවා ඇද්ද කියා නුඹ නොදනම සිටිනවා ඇත."යි (එළිදරව් 3:3), ගැළවුම් - කාරයාණන්වහන්සේ අවවාද කළසේක.

සෝදිසි කිරීමේ විනිශ්චය හෙවත් පූර්වාගමන නඩු විභාගය අවසන් වන විට මෙලොව බිහි වූ සෑම අයෙකුගේම ඉරණම ලෙස සදාකාල ජීවනය හෝ සදාකාල මරණය වශයෙන් තීන්දුව වදාරා හමාර වෙයි. සගයේ වළාකුළු මධ්‍යයේ දේවදූත සමූහයා පිරිවරා ගෙන යේසු සමිඳාණන් මෙලොව බලා පැමිණීමට ඉතා කෙටි කලකට පෙර විනිශ්චය අවසන් වනවා ඇත. මෙම කාලය දෙස බලමින් එළිදරව් පොතෙහි ක්‍රිස්තුස්වහන්සේ මෙසේ වදාරණ සේක: "අධර්මිෂ්ඨ තැනැත්තා මතුත් අධර්මිෂ්ඨකම් කරාවා. අපවිත්‍ර තැනැත්තා මතුත් අපවිත්‍ර කරනු ලබාවා. ධර්මිෂ්ඨ තැනැත්තා මතුත් ධර්මිෂ්ඨකම් කරාවා.

ශුද්ධ තැනැත්තා මතුත් ශුද්ධ කරනු ලබාවා. මෙන්න ඉක්මණින් එමි. එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ හැටියට දෙන පිණිස මා සමග විපාක තිබේ" (එළිදරව් 22:11,12).

මෙම කාලවකවානුව තුළදී දමිටුවන් හා පවිටුන්ද පොළෝ තලයෙහි ජීවත් වෙමින් සිටිති. ඔවුන් පසුවන්නේ මරණයට පත්වීමේ හැකියාවද ඇතිවය. මිනිසුන් වතුපිටි වගා කරමින් සහ ගොඩනැගිලි ඉදි කරමින්ද කමින් සහ බොමින්ද කාලය ගත කරනවා ඇත. ඔවුන් සම්බන්ධව වෙනස් කළ නොහැකි ඉරණම් තීන්දුවක් සගයේ ශුද්ධස්ථානයේ සිට දෙවා වදාරා ඇති බව ඔවුන් කිසිසේත්ම දන නොගන්නවා ඇත. ලෝ ව්‍යාප්ත ජලගැල්ම සිදුවූ අවස්ථාවේදී දෙවියන්වහන්සේ නෝවා නැව ඇතුළට දමා අදේව භක්තිකයන් පිටතට දමා නැවෙහි තිබූ එකම දොරටුව වසා දමූසේක, තමන්ගේ ඉරණම තීරණය කර ඇති බව නොදත් අවශේෂ ජනතාව දවස් හතක් පුරා වගකීමක් නැති සැප සෙල්ලම්හි නියැළෙමින් පැමිණෙන්නාවූ විනිශ්චය ගැන වූ නිවේදනය පිළිබඳව ගරහමින් අවලාද නගමින් ප්‍රීතියෙන් පිනා යමින් කල් ගෙවූහ. ජලගැල්ම විත් ඔවුන්ව ගසාගෙන යන තුරු ඔවුහු නොදන සිටියෝය. "මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එලෙසම වන්නේය"යි ගැළවුම්කාර සමිඳාණෝ පවසන සේක. (මතෙව් 24:39). නිශ්ශබ්දව, දනුම් දීමකින් තොරව, මැදියම් රැයේ පැමිණෙන්නාවූ සොරෙකු මෙන්, ඉරණම තීන්දු කිරීමේ තීරණාත්මක පැය උදාවන්නේය. සෑම මිනිසෙකුගේම ඉරණම ඒ සමගම තීන්දු වී හමාරය. වරදකාර මිනිසුන්ට පිළිගන්වා තිබූ මෛත්‍රී-කරුණාව තවදුරටත් ක්‍රියාත්මක වන්නේ නැත. එම දීමනාව සගය විසින් ආපසු ඇද ගනු ලබන්නේය.

"එබැවින් ගෙදර ස්වාමියා හදිසියෙන් ඇවිත් නුඹලා නිදා ඉන්නවා නොදක්නා පිණිස අවදිව සිටින්න" (මාර්ක් 13:35,36). සෝදිසියෙන් යුතුව බලා සිටීමෙන් විඩාවට පත්වන සමහරෙක් අවදිව බලා සිටීමෙන් ඉවතට හැරී ලෝකයේ ආකර්ෂණීය දේවලට නැඹුරු වෙති. ඔවුන්ගේ තත්ත්වය ඉතා කණගාටුදායක වන්නේය. ව්‍යාපාරිකයා තව තවත් ලාභ සෙවීමේ වෙළඳාමෙහි නියැළී සිටියදී, සැප සෙල්ලම් සොයා ගිය තැනැත්තේ සතුටු සාගරයේ ගිලී සිටියදී, විලාසිතාවන්හි නියැළී දූවරුන් ඔවුන්ගේ ආයිත්තම් සහ සැරසිලි සකසමින් සිටියදී, සමහර විට එම පැයෙහිදී පොළොවේ විනිශ්චයකාරයාණෝ තීන්දුව ප්‍රකාශයට පත් කරනසේක. එම තීන්දුව සමග නිකුත් වන්නාවූ ප්‍රකාශනය නම්, "ඔබ තරාදියේ කිරනු ලැබ අඩු බව පෙනුණේය" යන්නය. (දානියෙල් 5: 27).



# 29

# නපුරෙහි උපත

නපුරෙහි ආරම්භය මෙන්ම එහි පැවැත්ම පිළිබඳවත් බොහෝ අයට ඇත්තේ වියවුල් සහිත සංකල්පයකි. නපුරෙහි ක්‍රියාකාරිත්වයත් එහි විපාක ලෙස පැතිර යන්නාවූ බලවත් ශෝකය හා කම්පනයත් ඔව්හු දකිති. ප්‍රේමයෙහි, බල අධිකාරිත්වයෙහි සහ ප්‍රඥවෙහි අසීමිත වූ බලතල හිමි තැනැන්වහන්සේගේ පරමාධිපත්‍යය යටතේ මෙවන් දෑ පැවතිය හැක්කේ කෙසේ ද යන්න බොහෝ අයට ගැටළුවකි. මෙහි පවතින්නේ අභිරහසකි. එයට විස්තර සැපයීමට ඔවුන්ට නුපුළුවන. අවිනිශ්චිතතාවෙන් සහ අනුමානයෙන් පිරී සිටින ඔව්හු දෙවියන්-වහන්සේගේ වචනයෙහි සරලව එළිදරව් කර ඇත්තාවූද, ගැළවීම සඳහාවූ අවශ්‍ය වන්නාවූද සත්‍යතාවන්ට අන්ධව සිටිති. පාපයෙහි පැවැත්ම ගැන විමර්ශනයෙහි යෙදෙන්නාවූ සමහර අය දෙවියන්වහන්සේ විසින් එළිදරව් කර නොමැති දේ පවා සොයා යාමට වෙර දරති. ඔවුන්ට එහිදී මුහුණ පාන්නට සිදුවන්නාවූ ගැටළුවලට විසඳුමක් සොයාගැනීමට නුපුළුවන. මෙම අසාර්ථක වෑයමින් හටගන්නාවූ කළකිරීම කරණකොටගෙන ඇතිවන හැඟීම් නිසා ඔව්හු ශුද්ධ ලියවිලි ප්‍රතික්ෂේප කිරීමට යොමු වෙති. ඒ අතර තවත් අය නපුරෙහි පැවැත්ම පිළිබඳ විශාල ගැටළුවට සතුටුදායක පිළිතුරක් ලබාගත නොහැකිව ලත වෙති. දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග, උන්වහන්සේගේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ස්වභාවය, සහ උන්වහන්සේ පාපය ගැන ක්‍රියා කරන්නාවූ ප්‍රතිපත්තිමය ආකාරය පිළිබඳව වූ සම්ප්‍රදායික මති මතාන්තර මගින් විකෘති වන ඉගැන්වීම් නිසා ඔවුන්ට මේ ගැන සැබෑ අවබෝධයක් ලබා ගැනීම අපහසු වී ඇත.

පාපයෙහි උපත විස්තර කරදීමට අපහසු නිසාම එහි පැවැත්ම ගැන හේතු දක්වීමද පහසු කාර්යයක් නොවන්නේය. එසේ වුවද, පාපයේ උපත සහ අවසානයේදී එය විනාශ කරනු ලැබීම ගැන යම් ප්‍රමාණ දනුමක් ශුද්ධවූ ලියවිල්ල තුළින් ලබාගැනීමේ හැකියාවක් ඇත. නපුර ගැන දෙවියන්වහන්සේ ක්‍රියාකරන අන්දම දේව වචනයෙහි දක්වා තිබේ. ශුද්ධ ලියවිල්ලෙහි අවධාරණය කෙරෙන මූලික ඉත්තු ගැන්වීමක් වන්නේ පාපය මෙලොවට ඇතුළු වීම ගැන දෙවියන්වහන්සේ කිසිසේත්ම වග කිය යුතු නැති බවය. පාපය ලෝකයට පැමිණි නමුත් උන්වහන්සේ ඒ නිසා වුවද මිනිසා කෙරෙහි දක්වූ දිව්‍ය-කරුණා අනුග්‍රහය අත්තනෝමතික ලෙස ඉවත් කර නොගත් සේක. කැරැල්ල ඇතිවුයේ දිව්‍ය රාජ්‍ය පාලන යන්ත්‍රයෙහි අඩුපාඩුවක් නිසා

නොවන බව පැහැදිලිව පෙනී යන්නේය. පාපය වනාහි බලහත්කාරයෙන් මෙලොවට ඇතුළු වූවකි. මේ ලෝකයෙහි පාපයේ පැවැත්ම ගැන හේතු සාධක ඉදිරිපත් කළ නොහැකිය. එය අභිරහස් ගත ක්‍රියාකාරිත්වයකි, එහි පැවැත්මට හේතු දක්විය නොහැක. පාපයේ උපත සහ පැවැත්ම පිළිබඳව නිදහසට හේතු කාරණා ඉදිරිපත් කළ හැකි වේ නම්, එය තවදුරටත් පාපයක් නොවනවා ඇත. එහි නිදහසට සාධක ඉදිරිපත් කිරීම වනාහි පාපය ආරක්ෂා කරගැනීමක් වන්නේය. පාපය කුමක්දැයි කියා දෙවියන්වහන්සේගේ වචනයෙහි සඳහන් වන විස්තරය පමණක් අපට තිබේ. ඒ මෙසේය: "පාපය නම් නොපනත්කමය," එනම් දේව නීතිය කැඩීමය. දිව්‍ය පරිපාලන කේන්ද්‍රයේ පදනම ප්‍රේමයයි. එම පාලනයේ ව්‍යවස්ථාව වන්නේ ප්‍රේමයේ ප්‍රතිපත්ති මාලාවය. එයට විරුද්ධව වෙනත් ප්‍රතිපත්ති මාලාවක් යුධ වැදී ඇත. එහි ක්‍රියාකාරිත්වය පාපය ලෙස හැඳින්වේ.

නපුර විශ්වයට ඇතුළු වීමට පෙර විශ්වය පුරාම සාමය සහ ප්‍රීතිය පැතිර තිබිණ. සෑම දෙයක්ම මැවුම්කාරයාණන්ගේ කැමැත්ත අනුව පැවැතුණේය. සියල්ලක්ම දේව කැමැත්තට අනුකූලව සිදුවිය. දෙවියන්වහන්සේ කෙරෙහිවූ ප්‍රේමය උත්තරීතර වූ අතර ඔවුනොවුන් කෙරෙහි වූ ප්‍රේමය අපක්ෂපාතී විය. වාක්‍යාණන් වූ ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් වූසේක. ක්‍රිස්තුස්වහන්සේද පියවූ දෙවියන්වහන්සේ සමග එකම ස්වභාවයකින්ද, එක හා සමාන චරිතයෙන්ද, එකම අරමුණකින්ද සිටිනසේක. විශ්වයේ සිටි අය අතුරෙන් දෙවියන්වහන්සේගේ අරමුණුවලට හා මන්ත්‍රණයට සහභාගි වීමට සුදුසුකම් තිබූ එකම තැනැන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ පමණක්ම විය. දෙව් පියාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළින් සියලු ස්වර්ගීය සේනාවන් මැවූසේක. සෑම සියළු දෙයක්ම මවන ලද්දේ ක්‍රිස්තුස්වහන්සේ තුළිනි. "මක්නිසාද සිංහාසනවේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය" (කොලොස්සි 1:16). සකල ස්වර්ගයම දෙව් පියාණන්වහන්සේටද ක්‍රිස්තුස්වහන්සේටද පක්ෂපාතීත්වය පුද කළේය.

ප්‍රේමයේ ව්‍යවස්ථාව දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි පදනම වන්නේය. එම ව්‍යවස්ථාවෙහි අන්තර්ගත ධර්මිෂ්ඨ විශිෂ්ඨ ප්‍රතිපත්ති හා බැඳි පරිපූර්ණ ඒකමතිය මත්තෙහි, මවනු ලැබූ සෑම පුද්ගලයෙකුගේම ප්‍රීතිය රඳා පැවතුණේය. මවනු ලැබූ සෑම පුද්ගල යෙකුගෙන්ම ප්‍රේමයේ සේවාවක් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වනසේක. එය උන්වහන්සේගේ චරිතය ගැන වූ බුද්ධිමත් පැහැදීමකින් යුතුව හද



පත්ලෙන් පැන නගින්නක් විය යුතුය. බලහත්කාරයෙන් ලබාගන්නාවූ පක්ෂපාතිකමක් කෙරෙහි උන්වහන්සේගේ ප්‍රසන්නතාවක් නොමැත්තේය. උන්වහන්සේ සැමටමත් තෝරා ගැනීමේ නිදහස දානය කරන සේක. උන්වහන්සේ, ස්වේච්ඡාවෙන්ම දෙනු ලබන්නාවූ සේවය කිරීමක් බලාපොරොත්තු වනසේක.

නමුත් මෙම නිදහස නොනිසි ලෙස යොදා ගත් එක් තැනැත්තෙක් විය. ක්‍රිස්තුස්වහන්සේට සමීපව සිටි එම තැනැත්තා තුළින් පාපය ජනිත විය. හෙතෙම දෙවියන්වහන්සේගේ ගෞරවයට පවා පාත්‍ර වූ අයෙක් විය. සගයේ සිටි සියල්ලන් අතුරෙන් එම පුද්ගලයා ඉහළම ස්ථානයේ වැජඹිණ. අනික් සැමට වඩා ඔහු තේජසින් බැබළුණේය. මවනු ලැබූ අය අතුරෙන් ඔහුට ඉහළම ස්ථානය හිමිව තිබුණේය. ලුසිෆර් නැමැති මෙම දූතයා අභිෂේක ලත් කෙරුබයෙක් වූයේය. ඔහු පාරිශුද්ධ වූද, සම්පූර්ණ වූද, කිසිම කෙලසීමකට පාත්‍ර නොවූවාවූ ද අයෙක් විය. ස්වාමීන්වහන්සේ ඔහු ගැන මෙසේ කියන සේක: "නුඹ සම්පූර්ණකම මුද්‍රාකරන්නාව ප්‍රඥාවෙන් පිරී, අලංකාරකමෙන් සම්පූර්ණව සිටිනෙහිය. නුඹ දෙවියන්වහන්සේගේ උයන වන ඒදන්හි සිටියෙහිය. සියලු අනර්ඝ ගල්.... නුඹේ වැස්මව තිබුණේය.... නුඹ පියාපත් විදහාගෙන සිටින අභිෂේකලත් කෙරුබයෙක් වූයෙහිය. මම නුඹ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කන්දෙහි සිටෙවුවෙමි. නුඹ ගිනි ඇවිලෙන ගල් අතරෙහි ඇවිද්දෙහිය. නුඹ මවනු ලැබූදා පටන් නුඹ තුළ අධර්මිෂ්ඨකම සම්බවෙන තුරු නුඹේ මාර්ගවල නුඹ සම්පූර්ණව සිටියෙහිය." (එසකියෙල් 28: 12-15).

දෙවියන්වහන්සේගේ කරුණාව සහ සැලකිල්ල ලබමින් උන්වහන්සේගේ ප්‍රසන්නතාව දිනා ගනිමින් සදාතනය පුරා සගයෙහි රැඳී සිටීමට ලුසිෆර්ට හැකියාව තිබුණේය. දේවදූත සමූහයාගේ ආදරයට භාජන වෙමින් ඔවුන්ගේ ගෞරවය ලබමින් ජීවත්ව සිටීමේ හැකියාව ඔහුට තිබිණ. ඔහුට ලැබී තිබූ බලතල මගින් අනෙකුත් අයට ආශිර්වාදයක් වීමටද තම මැවුම්කාරයාණන්ව ගෞරවයට පත් කිරීමටද ඔහුට අවස්ථාව තිබුණේය. නමුත් ඔහු ගැන අනාගතවක්තෘ මෙසේ පවසයි: "නුඹේ රූව නිසා නුඹේ සිත උඩඟු වී තිබේ. නුඹේ දීප්තිමත්කම නිසා නුඹේ ප්‍රඥාව නරක් කරගත්තෙහිය." (එසකියෙල් 28:17). ඔහු කෙමෙන් තමාම උසස් කරගැනීමට වූ ආශාව මුදුන් පමුණුවා ගැනීමට නැඹුරු විය. "නුඹේ සිත දෙව් කෙනෙකුගේ සිත මෙන්" සලකන්නට නුඹ පටන් ගත්තෙහිය. "මම ස්වර්ගයට නැගී මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකාවලට උඩින් තබා ..... රැස්වීමේ කන්ද පිට හිඳ ගන්නෙමි. මම වළාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි. මහෝත්තමයාණන්ට සමාන වන්නෙමි." යනුවෙන් ඔහු පවසා තිබේ.

(එසකියෙල් 28: 6; යෙසායා 14:13,14). දෙවියන්වහන්සේ විසින් මවනු ලැබූ ප්‍රාණය ඇති සියල්ලන්ගේ හද බැඳි උත්තරීතර ප්‍රණාමය සහ පක්ෂපාතිත්වය දෙවියන්වහන්සේට ලබාදීමට ක්‍රියා කරනවා වෙනුවට ඔවුන්ගේ සේවය සහ ප්‍රණාමය තමන්ට දිනාගැනීමට ඔහු උත්සාහ කළේය. සර්ව බලධාරී දෙවි පියාණන්වහන්සේ ස්වකීය පුත්‍රයාණන්වහන්සේට ලබා දුන් ගෞරවයට ලෝභ කළ මේ ලුසිෆර් ක්‍රිස්තුස්වහන්සේට හිමිව තිබූ බලය සහ ගෞරවය තමාට ලබාගැනීමට වැයම් කළේය. එහෙත් එය භාවිතා කිරීමේ අයිතිය ක්‍රිස්තුස්වහන්සේගේ පරමාධිකාරයක් පමණක් විය.

මැවුම්කාරයාණන්ගේ තේජස පරාවර්තනය කිරීමත් උන්වහන්සේට ප්‍රශංසා ගීත ගායනා කිරීමත් සග වාසී සැමගේ ප්‍රීති ප්‍රමෝධය විය. දෙවියන්වහන්සේට මෙසේ ගෞරවය පුද කිරීමේදී සියල්ලන් තුළ ප්‍රීතිය සහ සාමය රජ කළේය. එහෙත් දැන් ස්වර්ගීය සුහදකාමී සාමයේ වාතාවරණය පලුදු කිරීමට වෙනස් හඬක් මතුවෙමින් තිබිණ. දෙවියන්-වහන්සේට ගෞරවය සහ නමස්කාරය පුද කිරීම ස්වර්ගීය මැවිල්ලෙහි අති ශ්‍රේෂ්ඨ ක්‍රියාදාමය විය. එහෙත් ස්ව-ආත්මය මහේශාක්‍ය බවට පත්කර ගැනීමටත් අන්‍යයන්ගේ සේවය තමාට ලබාගැනීමටත් මොහු වැයම් කිරීම මැවුම්කාරයාණන්ගේ සැලැස්මට පටහැනි විය. ස්වර්ගීය මණ්ඩලයේ සභිකයෝ ඔහුගේ ක්‍රියා පටිපාටිය අත්හැර දමන්නැයි ලුසිෆර්ට ආයාචනා කළෝය. මැවිල්ලෙහි කතුවරයාණන්ගේ බලවත්කම, යහපත්කම සහ යුක්ති සාධාරණත්වය පිළිබඳව දේව පුත්‍රයාණන්වහන්සේ ලුසිෆර්ට කරුණු ඉදිරිපත් කළසේක. උන්වහන්සේගේ වෙනස් නොවන ව්‍යවස්ථාවෙහි ශුද්ධ භාවය ගැනද පුත්‍රයාණෝ ඔහුට පැහැදිලි කළසේක. සගයේ පරිපාලන ව්‍යුහය ස්ථාපිත කළේ දෙවියන්වහන්සේමය. එම මාර්ගයෙන් ඉවත්ව යාමෙන් ලුසිෆර් තම මැවුම්කාරයාණන්ට නිගා ගෙන දෙවන්නේය, අන්තිමේදී ඔහු එමගින් තමාගේ විනාශයද මුද්‍රාකර ගන්නේය. නමුත් ප්‍රේමය මුසු මෛත්‍රී කරුණාවෙන් දෙන ලද අනතුරු ඇඟවීමට ලුසිෆර් ප්‍රතිචාරය දැක්වූයේ විරුද්ධතාවයේ ආත්මික වික්‍රමය පාමින්ය. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඊර්ෂ්‍යාව දළුලා වැඩීමට ලුසිෆර් ඉඩ හැරියේය. ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව සටනක් දියත් කිරීමට ඔහු අධිෂ්ඨාන කරගත්තේය.

තමාගේම තේජස ගැන ඔහු තුළ වූ අහංකාරය මගින් ආධිපත්‍යය උදෙසා වූ අභිලාෂය පෝෂණය කරනු ලැබීය. ලුසිෆර් තමාට දානය කරන ලද අති මහත් ගෞරවය දෙවියන්වහන්සේගෙන් ලද දීමනාවක් ලෙස පිළිනොගත්තේය. මැවුම්කාරයාණන්ට කෘතඥතාව දැක්වීමට ආශාවක් ඔහු තුළ නොවීය. තමාගේ දීප්තිමත් රුව ගැන ඔහු උඩඟුව සිටියේය. තමාගේ ප්‍රඥාව නිසා ඔහු උදම් විය. දෙවියන්-



වහන්සේ හා සම වීම ඔහුගේ අභිරුචිය විය. ස්වර්ගීය දූත සමූහයාගේ ආදරයත්, ගෞරවයත් ඔහුට ලැබුණි. ඔහුගේ අණසක ක්‍රියාත්මක කිරීමට දේව දූතයෝ සැදී පැහැදී සිටියහ. අනෙකුත් දූතයන්ට වඩා ඉහළින් ඔහු ප්‍රඥාවෙන් සහ තේජස්ශ්‍රීයෙන් පළඳවනු ලැබ සිටියේය. මේ සියල්ල මධ්‍යයේ, දේව පුත්‍රයාණෝ ස්වර්ගයේ රාජාති රාජෝත්ත-මයාණන් ලෙස සියල්ලන් විසින් පිළිගන්නා ලදී. උන්වහන්සේට පියාණන්වහන්සේ සමග ආධිපත්‍යයටද, බලතලවලටද හිමිකම් පැවතුණි. දිව්‍ය සභා මණ්ඩල රැස්වීම් සැම එකකටම ක්‍රිස්තුස්වහන්සේ සහභාගී වූසේක. එසේ වුවද, එම රැස්වීම් වලට සහභාගී වීමට ලුසිෆර්ට අවසරයක් නොවීය. බලවත් දේවදූතයා මෙසේ ප්‍රශ්න කරන්නට විය. "ඇයි ක්‍රිස්තුස්වහන්සේට පමණක් පරමාධිපත්‍යය ලබාදෙන්නේ? ලුසිෆර්ට ඉහළින් උන්වහන්සේව මෙසේ ගෞරවයට පාත්‍ර කරන්නේ ඇයි?"

දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් ඉවත්ව ගියාවූ ලුසිෆර් තමාගේ සෑහීමට පත්නොවීමේ ආත්මය අනෙකුත් දූතයන් අතරේ පතුරුවා හරින්නට පටන් ගත්තේය. දෙවියන්වහන්සේට ගෞරවය හා නමස්කාරය පුද කරන බවට බාහිරව පෙන්වමින් ඔහු ඉතා රහසිගතව අභිරහස් ලෙස දෙවියන්වහන්සේට එරෙහිව දූතයන් බිඳවීමේ කුමන්ත්‍රණය ඉදිරියටම කරගෙන ගියේය. ස්වර්ගීය වැසියන් පාලනය කළ අණ පනත් පිළිබඳව සග වැසියන්ගේ සිත් බලවත් කලකිරීමට පත් කරමින් ඒ පාලනයට විරුද්ධව නැගී සිටින්නට ලුසිෆර් ඔවුන් පෙළඹවීය. ඒ අණ පනත් ඔවුන්ගේ නිදහසට බාධකයක් යයිද ඔවුන්ගේ නිදහස සීමා කිරීමක් යයිද පෙන්වීමට ඔහු උත්සුක විය. තමන්ගේ ජීවිත අති ශුද්ධ වූ නිසා තම තමාගේ කැමැත්ත අනුව කටයුතු කිරීමට නිදහස තිබීම තම අයිතියකැයි ඔහු අනෙකුත් දේව දූතයන් හට පැහැදිලි කර දුන්නේය. ක්‍රිස්තුස්වහන්සේට උත්තරීතර ගෞරවය පවරා දීමෙන් දෙවියන්වහන්සේ කර ඇත්තේ තමාට අහිතකර ලෙස සැලකීමක් යයි කියමින් ඔහු දේව දූතයන්ගේ අනුකම්පාව දිනාගැනීමට මහත් වැයමක් දැරීය. වඩා ප්‍රබල බලය සහ ගෞරවය ලබාගැනීමට වූ තමාගේ ප්‍රයත්නය හුදෙක් ස්ව-ආත්ම මහේශාක්‍ය පදවි ප්‍රාප්තියක් සඳහා නොව සගයේ සැම වැසියෙකුගේම නිදහස දිනාගැනීමේ සත් ක්‍රියාවක් බව පෙන්වා දෙන්නට ඔහු වැයම් කළේය. මෙම වැයම සාර්ථක වුවහොත් සමහර විට ඔවුන්ට දැනට ඇති පැවැත්මට වඩා ඉහළ තලයක පැවැත්මක් පවා ලැබිය හැකි වේ යයි ඔහු ඔවුන්ට කියා සිටියේය.

තමන්වහන්සේගේ මෛත්‍රී කරුණාව නිසාම දෙවියන්වහන්සේ ලුසිෆර්ගේ වැඩ සැලැස්ම ඉවසා දරාගෙන සිටිසේක. ලුසිෆර් දැරූ උසස් ස්ථානයෙන් ඔහුව වහාම ඉවත් කිරීමට දෙවියන්වහන්සේ ක්‍රියාත්මක

නොවූ සේක. සෑහීමට පත්නොවීමේ ආත්මය ක්‍රියාත්මක වූ මොහොතේදීම හෝ පක්ෂපාති දේව දූතයන් ඉදිරියෙහි හෙතෙම ව්‍යාජ අයිතිවාසිකම් පතුරුවන්නට ක්‍රියා කළ වහාම හෝ දෙවියන්වහන්සේ ඔහුව තමන්වහන්සේ ඉදිරියෙන් නෙරපා හරින්නට ක්‍රියා නොකළ සේක. බොහෝ කාලයක් ගතවන තුරුම උන්වහන්සේ ඔහුව සගයේම රඳවා ගෙන සිටිසේක. පසුතැවීම හා යටත්වීම යන කොන්දේසි මත ඔහුට නැවත නැවතත් කමාව පුද කරන ලදී. එවන් වෑයමක යෙදීමට හැකියාවක් ඇත්තේ අනන්ත වූ ප්‍රේමයකට සහ ප්‍රඥවකට පමණක්ය. ලූසිෆර්ගේ වරද ඔහුට ඒත්තු ගැන්වීමට සැලැස්වීම මෙසේ ඉවසා දරා සිටීමේ ඒකායන පරමාර්ථය විය. මෙවන් සෑහීමකට පත්නොවීමේ ආත්මයක් මෙතෙක් සගයේ ක්‍රියාත්මක වී නොතිබිණ. තමා ගසාගෙන යන්නාවූ රළ පහර ගැන ලූසිෆර්ට මුලින්ම අවබෝධයක් නොවීය. තමාගේ හැඟීම්වල යථා ස්වභාවය පිළිබඳව දැනුමක් ඔහු සතු නොවීය. ඔහුගේ සෑහීමට පත්නොවීමට, නොසතුටට හේතුව පදනම් රහිත බව ඔප්පු කරනු ලැබීමෙන් පසුව තමා නිවැරදි නොවන බව ඔහුට මනා ලෙස වැටහී ගියේය. දිව්‍ය අයිතිවාසිකම් සියල්ල සාධාරණ බව ඔහුට පැහැදිලි විය. තමාට අසාධාරණයක් වී නැතැයි සග සමූහයා ඉදිරියෙහි පිළිගත යුතු බව ඔහුගේ සිත ඔහුට බල කරන්නට විය. මේ අනුව ඔහු ක්‍රියා කළේ නම් ඔහු තමාද තව විශාල දේව දූතයන් පිරිසක්ද විනාශ මුඛයෙන් ගළවා ගැනීමට සමත් වනවා සහතිකය. හෙතෙම මෙතුවක් කල් දෙවියන්වහන්සේට වූ පක්ෂපාතිත්වය සම්පූර්ණයෙන්ම ඉවත දමා නොතිබුණේය. ඔහු වනාහි මහේශාක්‍ය මහෝත්තමයාණන්ගේ සිහසුන අසල සිටිමින් පියාපත් විහිදා සිහසුනට ඉහළින් එය ආවරණය කළ කෙරුබ්වරුන්ගෙන් එක් අයෙකු වූයේය. එහෙත් මේ වන විට ඔහු එම තනතුර අත්හැර දමා සිටියේය. නමුත් හෙතෙම දෙවියන්වහන්සේගේ ප්‍රඥව පිළිගෙන, දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි ඔහුට ලබාදෙන ස්ථානය පිරවීමට කැමැත්ත පළකොට ආපසු දෙවියන්වහන්සේ වෙතට පැමිණියේ නම් ඔහුට කලින් හිමිව තිබූ තනතුර නැවත දැරීමට හැකියාවක්ද විවෘතව තිබුණේය. එහෙත් යටත් වීමට ඔහුගේ ස්ව අභිමානි අහංකාරය ඉඩ නොදුන්නේය. තමාගේ සැලැස්ම ඉදිරියටම කරගෙන යාමට හෙතෙම දැඩි ස්ථාවරයක පිහිටා සිටියේය. පසුතැවීමට ආශාවක් නැතැයි යන්න ඔහුගේ චින්තනය විය. තම මැවුම්කාරයාණන්ට එරෙහිව අරගලයක යෙදී සිටීමට ඔහු සම්පූර්ණයෙන්ම ගිවිස ගත්තේය.

තමාගේ අණසක යටතේ සිටියාවූ දේව දූතයන්ගේ අනුකම්පාව දිනාගැනීමටත්, තමාගේ තීක්ෂණ බුද්ධිය සතු සෑම හැකියාවක්ම යොදා අනෙකුත් අය මුළා කිරීමටත් සෑම උත්සාහයක්ම ගැනීමට ලූසිෆර් අධිෂ්ඨාන කර ගත්තේය. ක්‍රිස්තුස්වහන්සේ ඔහුට අවවාද



කළසේක, අනුශාසනා කළසේක. මේ සියල්ල තමාගේ වාසියට හරවා ගෙන තමාගේ දේව ද්‍රෝහී සැලැස්ම ඉදිරියටත් කරගෙන යාමට හෙතෙම ස්ථිර ස්ථාවරයක පිහිටා සිටියේය. ඔහුට ඉතා ආදරයෙන් බැඳී සිටි, ඔහුව දැඩිව විශ්වාස කළ දේව දූතයන් කොටසක්ද සිටියේය. තමාව වැරැදි ආකාරයකින් විනිශ්චය කර ඇතැයිද, තමා දරන්නාවූ තනතුර පිළිබඳව කිසියම් ආකාරයක තැකීමක් හෝ කර නැතැයිද, තමාගේ නිදහසට සීමා පනවා ඇතැයිද කියමින් හෙතෙම ඒ හිතෛෂිවන්ත දූතයන් ඉදිරියේ දෙවියන්වහන්සේට දෝෂාරෝපණය එල්ල කළේය. ක්‍රිස්තුස්වහන්සේ ඔහුට ආදරයෙන් දුන් ඔවා බස්වලට වැරැදි අර්ථකථනයක් ගෙන දෙමින් බොරු කියමින් තමාව සගයේ වැසියන් ඉදිරියෙහි අපකීර්තියට පත්කිරීම දේව පුත්‍රයාණන්ගේ සූක්ෂ්ම සැලැස්ම යයි ඔහු වහසි බස් දොඩන්නට විය. දෙවියන්වහන්සේට පක්ෂපාතව විසූ දේව දූතයන් සහ තමා අතරේ ව්‍යාජ මත භේදයක් ඇතැයිද ඔහු පැවසුවේය. තමාගේ පක්ෂයට සම්පූර්ණයෙන් නම්මවා ගත නොහැකි වූ දේව දූතයන් කඩාකප්පල්කාරීන් යයි ඔහු ඔවුන්ට චෝදනා කළේය. ස්වර්ගීය ජනතාවගේ ශුභ සිද්ධිය තකා තමා දියත් කළ වෑයමට ඔවුන් අනුගත නොවීම හෙතෙම තරයේ හෙළා දුටුවේය. තමා නිරතව සිටි කර්තව්‍යයෙහි වගකීම ඔහු දෙවියන්වහන්සේට පක්ෂපාතීව සිටි දූතයන් පිට පැවැරුවේය. තමාට දෙවියන්වහන්සේගෙන් අසාධාරණයක් වී ඇතැයි යන චෝදනාව ශක්තිමත් කරන පිණිස ඔහු මැවුම්-කාරයාණන්ගේ ප්‍රකාශන සහ ක්‍රියාවේදයන් නොපිටට පෙරළා ඉදිරිපත් කරන්ට විය. දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් සහ අරමුණු පිළිබඳව කපටිකමින් විශේෂ වූ, සූක්ෂ්ම තර්ක විතර්ක භාවිතයෙන් දේව දූතයන් වියවුලට පත්කිරීම ඔහුගේ වෑයම විය. සරල වූ සෑම දෙයක්ම හෙතෙම ගුප්ත කඩතුරාවකින් ආවරණය කළේය. යෙහෝවඃ-වහන්සේගේ සරල පැහැදිලි ප්‍රකාශන කෙරෙහි විකෘති අදහස් ගෙන දෙවන ලෙස, ඔහු කපටි කමින් යුතුව ඒවා විග්‍රහ කරමින් අනුමානය සහ සැකය ඇති කරවන්නට ක්‍රියා කළේය. ඔහු දැරූ ඉහළ නිල තනතුරත් දිව්‍ය පරිපාලන ඒකකය සමග තිබූ සමීප සම්බන්ධතාවත් ඔහු පල කළ අදහස් වලට විශාල බලයක් ලබා දුන්නේය. ස්වර්ගීය ආධිපත්‍යයට එරෙහිව ඔහු සමග එකතුව කැරැළි ගැසීමට බොහෝ දෙනෙක් නැඹුරු විය.

ලූසිෆර් තුළ තිබූ කළකිරීමේ ආත්මය වර්ධනය කරගනිමින් විවෘත කැරැළි ගැසීමකට යොමු වන තෙක් එයට ඉඩ හැරීමට දෙවියන්වහන්සේ තම ප්‍රඥව තුළින් ඉවසා දරා සිටිසේක. ඔහුගේ සැලසුම් වල ඵල දැරීමට කාලය ලබාදීම සුදුසු විය. එකී සැලසුම්වල නියම ස්වභාවයත් එහි ප්‍රතිඵලත් සැමට දකගැනීමට ඉඩ දිය යුතු විය. අභිෂේක ලත් කෙරුබ්වරයා ලෙසින් ඔහු දැරූ ස්ථානය ඉතා

ඉහළ මට්ටමක පැවතියේය. සග සේනාව ඔහුට දැඩිව ආදරය කළේය. ඔවුන් කෙරෙහි වූ ලුසිෆර්ගේ බලපැවැත්ම ඉතා ශක්තිමත් එකක් විය. සගයේ නිවැසියන් පමණක් නොව දෙවියන්වහන්සේ විසින් මවන ලද අනෙක් ලෝකවල වැසියෝද උන්වහන්සේගේ රජයට අයිති වූහ. සගයේ දේව දූතුන් තමාගේ කැරැල්ලට එකතු කරගත හැකි වේ නම් අනෙක් ලෝක කරාද තම කැරැල්ල ව්‍යාප්ත කළ හැකි වේ යයි ඔහු කල්පනා කළේය. ඔහු තම කාරණා ඉතා කපටි අන්දමින් ඉදිරිපත් කළේය. තමාගේ අරමුණ ඉටුකරගැනීම සඳහා හෙතෙම කපටිකම සහ වංචාව උපරිම ලෙසින් භාවිතයට යොදා ගත්තේය. වෙනත් අය මුළා කිරීමට හෙතෙම අති දක්ෂයෙක් විය. ස්වකීය යටි අරමුණු විවෘතව ප්‍රකාශ නොකර අනෙකුත් දූතයන්ගේ ශුභ සිද්ධිය තකා තමන් අයිතිවාසිකම් ඉල්ලා සිටින බව දක්වමින් ඔහු තම වෑයම සාර්ථකවම ඉදිරියටම ගෙන ගියේය. දෙවියන්වහන්සේට පක්ෂපාතිත්වය ප්‍රකාශ කළ දූතයන්ට පවා ඔහුගේ නියම චරිතය වටහා ගැනීමට නොහැකි විය. ඔහු කුමක් කරන්ට අදහස් කරන්නේදැයි අවබෝධ කරගැනීමට ඔවුන්ට නුපුළුවන් විය.

සාතන්ට සැමගේ ප්‍රණාමය ඉතා ඉහළින් හිමිව තිබූ නිසාද ඔහු තම වැඩ කොටස අභිරහස් කඩතුරාවකින් ආවරණය කරගෙන සිටි නිසාද ඔහුගේ ක්‍රියාදාමයන්හි සත්‍යවූ ස්වභාවය දේව දූතයන්ට එළිදරව් කිරීම පවා අසීරු කරුණක් විය. පාපය සම්පූර්ණ වශයෙන් වර්ධනය වන තුරු එහි නියම ස්වභාවය තේරුම් ගැනීම අපහසුය. මෙතුවක් කල් දෙවියන්වහන්සේගේ විශ්වයේ පාපයට තැනක් හිමිව නොතිබිණ. පාපයෙහි ස්වභාවය සහ එහි මාරක දුෂ්ටකම ගැනද ශුද්ධවූ දූතයන්ට කිසිම අවබෝධයක් නොවීය. දිව්‍ය ව්‍යවස්ථාව නොලසකා හැරීම නිසා සිදුවිය හැකි භයානක ප්‍රතිඵල පිළිබඳව ඔවුන්ට පැහැදීමක් නොවීය. තමා දෙවියන්වහන්සේට පක්ෂපාතී බවට බොරුවක් මවාපාමින් සාතන් මුල් කාලයේදී තමාගේ ව්‍යාපාරය කරගෙන ගියේය. ඇත්ත වසන් කරමින් පක්ෂපාතී වෙසක් මවා ගෙන ඔහු ඉදිරියටම ගමන් කළේය. තමාගේ වෑයම වන්නේ දෙවියන්වහන්සේට ගෞරවය ලබාදීම ව්‍යාප්ත කිරීම බවත්, උන්වහන්සේගේ රාජ්‍යයෙහි ස්ථාවරය ශක්තිමත් කිරීම බවත් සග වැසියන්ගේ ශුභ සිද්ධිය රැකගැනීම බවත් ඔහු සැමට දැක්වීය. තමා යටතේ සිටි දේව දූතයන් තුළ සෑහීමට පත් නොවීමක් ඇති කිරීමට ක්‍රියා කළ නමුත් ඔහු දැක්වූයේ තමා සහ ඔවුන් අතරේ පවතින්නාවූ සෑහීමට පත්නොවීමේ ස්වභාවය දුරු කිරීම තමාගේ වෑයම බවයි. දෙවියන්වහන්සේගේ රාජ්‍ය තන්ත්‍රයෙහි පටිපාටිය සහ නීති රීති වෙනස් කරන්නැයි ඔහු ඉල්ලා සිටියේ සගයේ එකඟතාව රැකගැනීමේ අභිලාෂයෙන් යයි ඔහු තරයේ ප්‍රකාශ කළේය.



පාපය සමග ක්‍රියා කිරීමේදී දැහැමිතාව සහ සත්‍යතාව මත පමණක් නියැළී කටයුතු කිරීම දෙවියන්වහන්සේගේ පිළිවෙත විය. චාටු බස් දෙඩීම සහ කපටි හඬින් මුළා කිරීම සාතන්ට කළ හැකි වුවද දෙවියන්වහන්සේට එසේ කළ නොහැකි විය. ඔහු දෙවියන්වහන්සේගේ වචනය බොරුවෙන් වසා දැමීමට තැත් කළේය; දේව දූත කැළ කෙරෙහි තිබූ පරිපාලන සැලැස්ම විකෘති කර පෙන්වා දෙමින් සගයේ වැසියන් කෙරෙහි නීති රීති සහ අණ පනත් පැනවීම තුළින් දෙවියන්වහන්සේ යුක්ති ගරුක ලෙස ක්‍රියා කර නැතැයි ඔහු තර්ක ඉදිරිපත් කළේය. මවනු ලැබූ පණ ඇති අයගේ යටත්වීම සහ කීකරුකම ඉල්ලා සිටීමෙන් උන්වහන්සේගේ අපේක්ෂාව සහ අරමුණ වන්නේ තමාවම උසස් කරගැනීම බව ඔහු දැක්වීය. දෙවියන්වහන්සේගේ රජය සාධාරණ බවද, උන්වහන්සේගේ ව්‍යවස්ථාව සර්ව සම්පූර්ණ බවද සගයේ වැසියන්ට මෙන්ම අනෙකුත් ලෝකවල වැසියන්ටද ප්‍රදර්ශනය කිරීම වැදගත් විය. තමාගේ වෑයම විශ්වයේ යහපත උදෙසාය කියා පෙන්වා දීමට සාතන් වෑයම් කළේය. කරුණු මෙසේ පැවැති නිසා, අයුතු ලෙස බලය පැහැර ගැනීමට තැත් කළ මේ දූතයාගේ නියම චරිත ස්වභාවය සැවොම දැනගත යුතු විය. ඔහුගේ නියම පරමාර්ථයද සැවොම දැනගත යුතු විය. ඔහුගේ නපුරු ද්වේෂ සහගත ක්‍රියාදාමයන් මගින් ඔහුගේ නියම ස්වභාවය දැක්වීමට සාතන්ට කාලය ලබා දිය යුතු විය.

ඔහුගේ ක්‍රියාවේදය නිසා සගය තුළ හටගත් විසම්මුතියට සහ වියවුලට හේතු කාරකය දෙවියන්වහන්සේගේ රජය සහ ව්‍යවස්ථාව බව සාතන් පැවසුවේය. දිව්‍ය පරිපාලනය නිසා සෑම නපුරක්ම හටගෙන ඇතැයි ඔහු ප්‍රකාශ කළේය. යෙහෝවඃවහන්සේ විසින් කෙටුම්පත් කර ඇති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා තවත් පුළුල් කර දැක්වීම සඳහා සංශෝධන එකතු කිරීම තමාගේ කර්තව්‍යයෙහි අදහස බව ඔහු දැක්වීය. ඒ නිසා ඔහු ඉදිරිපත් කරන්නාවූ අදහස් ක්‍රියාත්මක කර පෙන්වාදීම අවශ්‍ය විය. ඔහුගේ ක්‍රමවේදයන් විසින්ම ඔහු වරදට පත් කරනු ලැබිය යුතු විය. තමා කැරැල්ලක් මෙහෙය වන්නේ නැතැයි සාතන් මුල පටන්ම කියා සිටියේය. එම නිසා මේ රැවටිලිකාරයාගේ වෙස් මුහුණ ඉවත් කරනු ලැබ සකල විශ්වයම ඔහුව දර්ශනය කළ යුතු විය.

සාතන්ට තවදුරටත් සගයේ විසීමට ඉඩ දිය යුතු නැතැයි දේව මණ්ඩලය තීරණය කළද, දිව්‍ය ප්‍රඥාවන්තයාණෝ ඔහුව එකවිටම විනාශ කර නොදැමූ සේක. දෙවියන්වහන්සේ පිළිගන්නාවූ එකම සේවාව වන්නේ ප්‍රේමය මුසු සේවාව පමණකි. යමෙක් දෙවියන්වහන්සේට පක්ෂපාතිත්වය දක්වන්නේ නම් එය උන්වහන්සේගේ

සාධාරණත්වය සහ ත්‍යාගශීලීත්වය මත පදනම් විය යුතුය. පාපය ඉස්මතු වූ අවස්ථාවේදීම දෙවියන්වහන්සේ සාතන්ව විනාශ කර දමූ සේක් නම්, සගවාසීන්ට මෙන්ම අනෙකුත් ලෝක වාසීන්ටද උන්වහන්සේගේ යුක්තියේ සාධාරණත්වයත්, මෛත්‍රී කරුණාවත් දකගැනීමට හැකියාවක් උදා වන්නේ නැත. මන්ද යත්, ඔවුන්ට පාපයේ ස්වභාවයත් එහි විපාකත් එතෙක් ග්‍රහණය කරගැනීමට, අවබෝධ කරගැනීමට නුපුළුවන් විය. සාතන්ව ඒ මොහොත්දීම විනාශ කරනු ලැබුවේ නම් ඔවුන් උන්වහන්සේට සේවය කිරීමට පෙළඹෙන්නේ ප්‍රේමය නිසා නොව බියකින්ය. සාතන්ව විනාශ කර දමීමෙන් ඔහු විසින් දක්වූ බලපෑම සම්පූර්ණයෙන්ම විනාශ කර දමීමට පුළුවන් වන්නේ නැත. තවද කැරැළි ගැසීමේ ආත්මයද සහමුලින්ම උපුටා දමීමට එමගින් පුළුවන් වන්නේ නැත. එහි එල දරීමට නපුරට අවස්ථාවක් ලබා දිය යුතු විය. නිමක් නැති අනන්ත යුගයන් පුරා සකල විශ්වයේ යහපත උදෙසා සාතන්ට තමාගේ ප්‍රතිපත්ති වර්ධනය කරමින් ඒවා ක්‍රියාවට නංවා සැමට ඒවා දකගන්නට අවස්ථාව සලසා දීමට දේව කරුණාව ඉඩ හැරිය සේක. දිව්‍ය රජයට විරුද්ධව ඔහු ඉදිරිපත් කළ චෝදනාවල සැබෑ ස්වභාවය සැමට දක ගැනීමට ඉඩ සලසා දීමට, දෙවියන්වහන්සේ කාලයක් ඉඩ හළ සේක. එසේ කිරීමෙන් දෙවියන් වහන්සේගේ යුක්ති-සාධාරණයත්, මෛත්‍රී -කරුණාවත් පිළිබඳව සැකයකින් තොරව, ප්‍රශ්න කිරීමකින් තොරව සැමටම සදහටම තීරණය කරගැනීමට හැකි වෙනවා ඇත. එවිට උන්වහන්සේගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි වෙනස් නොවන සුළු නිත්‍යතාව ගැන ප්‍රශ්නයක් පැන නැගෙන්නේද නැත.

සාතන්ගේ කැරැල්ල සෑම කල්පයක් පුරාම විශ්වයට පාඩමක් වනවා ඇත. එය පාපයේ ස්වභාවයත් එහි භයානක ප්‍රති විපාකත් ගැනවූ නිරන්තර සාක්ෂියක් වන්නට තිබුණි. සාතන්ගේ චින්තනය ක්‍රියාත්මක වීම මගින් මිනිසුන්ට මෙන්ම දේව දූතයන්ටද, එයින් අත්වන්නාවූ විපාක තුළින් පෙන්නුම් කර දෙන්නේ, දිව්‍ය බල අධිකාරී ආධිපත්‍යය නොසලකා හැරීමෙන් වන්නාවූ අනර්ථකාරී විනාශයයි. දේව රාජ්‍යයෙහි පැවැත්මත් උන්වහන්සේගේ ව්‍යවස්ථාව නිසි සේ ක්‍රියාත්මක වීමත් මගින් දක්වන්නේ මවනු ලැබූ සියල්ලන්ගේ යහපතට එය රැකුලක් හා සාක්ෂියක් බවය. මෙම විනාශකාරී කැරැල්ලක වැයම නිරන්තර ආරක්ෂාවක් ලෙස සැමට හඬ ගා පවසා කියන්නේ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ ස්වභාවය ගැන නොරැවටෙන ලෙසත්, බුද්ධිමත් සැවොම පව් කිරීමෙන් වැලකී සිටින ලෙසත් එහි දඬුවම් විඳීමෙන් ඉවත්ව සිටින ලෙසත්ය.

සගයේ ඇති වූ මේ මහත් අරගලය අවසාන වන තුරු, බල ලෝභීයා සෑම අවස්ථාවකදීම තමාගේ මතය නිවැරැදි බව කියා



සිටියේය. ලුසිෆර්ට සහ ඔහුගේ කැරැල්ල සමග එක්වූ අයට තවදුරටත් දිව්‍ය ලෝකයේ ඉඩක් නැති බව ප්‍රකාශයට පත්කිරීමත් සමගම කැරැළි නායකයා මැවුම්කාරයාණන්ගේ ව්‍යවස්ථාවට වූ පිළිකුල සහ අනාදරය හඬ නගා ප්‍රකාශ කළේය. දේව දූතයන්ට පාලන නීති රීති තිබීම අනවශ්‍ය බව පවසමින් සෑම විටෙකම නිවැරැදි මාර්ගයේ යෑමට මගපෙන්වන ඔවුන්ගේ නිදහස් කැමැත්තට බාධක පැමිණවීම තරයේ හෙළා දකිමින් සාතන් ඒ පිළිබඳව ඔහුගේ අයිතිය ප්‍රකාශ කර සිටියේය. දිව්‍ය අණ පනත් වනාහි තමන්ගේ නිදහසට තහංචි පැනවීමක් බව ඔහු අවධාරණය කළේය, ඒවා හෙළා දක්කේය. තමාගේ ව්‍යායාමයෙහි අරමුණ ව්‍යවස්ථාව අවලංගු කර දමීමට වැයම් කිරීමක් බවද ඔහු පවසා සිටියේය. මෙම නිදහස සීමා කිරීමේ පනතින් නිදහස් කරනු ලැබීම මගින් ස්වර්ගීය ජනතාවට වඩාත් උත්කෘෂ්ට වූද වඩාත් තේජස්ශ්‍රීය වූද ජීවත් වීමේ පැවැත්මක් උදාවෙනවා සහතික බව ඔහු නැවතත් අවධාරණය කළේය.

සාතන් සහ ඔහුගේ පාර්ශ්වයේ සමූහයා තමන්ගේ කැරැල්ලෙහි සම්පූර්ණ වගකීම ක්‍රිස්තුස්වහන්සේ පිට පැවරූහ. උන්වහන්සේ තමාට තරවටු නොකළ සේක් නම් තමන් කවරදාකවත් කැරැළි නොගසන බව ඔවුහු දැඩිව අවධාරණය කළෝය. දෙවියන්වහන්සේගේ රාජ්‍ය බලය පෙරළා දමීමට නිරර්ථක උත්සාහයක යෙදුනු මහා කැරළිකරුවා සහ ඔහුගේ පරිවාර ජනතාව දැඩිව ප්‍රකාශ කළේ තමා පීඩාකාරී බල ලෝභී පාලකයෙකුගේ හිංසාවන්ට ගොදුරු වූ අහිංසකයන් බවය. ඔවුහු හිතුවක්කාර ලෙස හා කලහකාරී ලෙස දෙවියන්වහන්සේගේ තීන්දුවට විරුද්ධව පෙළ ගැසුණෝය. අවසානයේදී ඔවුන් සියල්ලෝම සගයෙන් නෙරපා දමනු ලැබුවෝය.

සගයේ කැරැල්ලට තුඩු දුන් එකී ආත්මයම අද පොළොව මතදී ද දෙවියන්වහන්සේට විරුද්ධව කැරැළි ගසන්නට ජනතාව පොළඹ වන්නේය. සගයේ දේව දූතයන් හා සමග සාතන් ගෙන ගිය ප්‍රතිපත්ති ඔහු මෙලොවදී ද මිනිසුන් සමග ක්‍රියාත්මක කරමින් සිටින්නේය. අකීකරුකමේ පුත්‍රයන් සමග ඔහුගේ ආත්මය දැන් රජකම් කරන්නේය. ඔහු මෙන්ම මොවුන්ද දෙවියන්වහන්සේගේ නීති මගින් වූ ප්‍රතිබාධකයන්ට එරෙහිව ක්‍රියා කරන්නට සූදානම් වෙමින් සිටිති. එකී දහම් ව්‍යවස්ථා ප්‍රතිපත්ති කඩකිරීම තුළින් ඔහු මිනිසුන්ට නිදහස ලබාගැනීමේ පොරොන්දුවක් ලබා දී ඇත. පාපයට තරවටු කිරීමේදී එයට ප්‍රතිචාරය වන්නේ ද්වේෂය, වෛරය, සහ විරුද්ධතාවය දක්වීමය. දෙවියන්-වහන්සේගේ අවවාදාත්මක පණිවිඩය පව්කාරයාගේ හෘදය සාක්ෂියට යොමු කරනු ලැබූ විට තමා නිවැරැදි යයි පවසමින් එකී වරදට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට සාතන් එම තැනැත්තන්ට මග-

පෙන්වන්නේය. තවද, එම පාපයෙහි යෙදෙන්නාවූ තැනැත්තාට අනෙකුත් අයගේ අනුකම්පාව සොයා යාමටද සාතන් පව්කාරයාව දිරිමත් කරන්නේය. තමන්ගේ වරද නිවැරැදි කරගන්නවා වෙනුවට ඔවුන් පාපය පෙන්වා දුන් තැනැත්තාට කෝපාවිෂ්ට ලෙස සලකන්නේ ඔවුන්ගේ එම පාපයට සම්පූර්ණයෙන්ම වග කිව යුතු වන්නේ වරද පෙන්වා දුන් තැනැත්තා පමණක් වූවා සේය. පාපයට වරද තබන්නාටද, පාපය පෙන්වා දෙන්නාටද, වරද පැටවීමේ ආත්මය ධර්මිෂ්ඨ ආබෙල්ගේ දවස පටන් අද දක්වාම එලෙසින්ම පවතී.

සගයෙහි සිටියදී සාතන් දෙවියන්වහන්සේගේ චරිතය සාතනය කරමින් උන්වහන්සේ වනාහි දරදඬු පාලකයෙකු යැයිද අනුකම්පා විරහිත වූ පාලිතයන් තලා පෙළා මර්දනය කරන්නාවූ අයෙකු යයිද සග වැසියන් අතර පතුරුවා හැරියේය. එම තර්කයන්ම ඉදිරිපත් කරමින් ඔහු මෙලොව වැසියන්වද පව්කරන්නට පොළඹවයි. මෙම ක්‍රමවේදය මගින් ඔහු මෙතෙක් ජයග්‍රහණය කර තිබේ. මනුෂ්‍යයාගේ පාපයට වැටීමට හේතුව වන්නේ දෙවියන්වහන්සේගේ අසාධාරණ තහංචි බවද තමාව කැරැල්ලකට තල්ලු කරනු ලැබුවේද මෙම කාරණය නිසාම බවද හෙතෙම නොපැකිළ පවසයි.

එහෙත්, සදාතනික තැනැන්වහන්සේම තමන්වහන්සේගේ චරිත ගුණාංග පිළිබඳව මෙසේ ප්‍රකාශ කරන සේක: "ස්වාමීන්වහන්සේය, උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණ වූ දයාවන්ත වූ උදහස්වීමට ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවිකෙනෙක්ය. උන්වහන්සේ දහස් ගණනකට කරුණාව පවත්වන සේක. අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමාකරන සේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරනසේක." (නික්මයාම 34:6,7).

සාතන්ව සගයෙන් නෙරපා හැරීමෙන් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ යුක්තිසහගත සාධාරණත්වය පෙන්නුම් කළසේක, තමන්වහන්සේගේ සිංහාසනයෙහි ගෞරවය රැකගත් සේක. විරුද්ධවාදී ආත්මයක් තිබූ සාතන් විසින් ඉදිරිපත් කළ මුළා කිරීම්වලට අවනත වීමෙන් මිනිසා පාපයට වැටුණෝය. ඒ මොහොතේදීම පාපයට බිලි වූ මිනිසා උදෙසා තමන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් යාගයක් ලෙස පුදකරමින් උන්වහන්සේ තමන් ප්‍රේමය පිළිබඳව සාක්ෂියක් ලබා දුන්සේක. මේ සමගි කිරිම තුළින් දෙවියන්වහන්සේගේ චරිතය එළිදරව් කරනු ලබන්නේය. ලුසිෆර්, පාපයේ මාර්ගය සිය කැමැත්තෙන්ම තෝරා ගත්තේය. ඔහු තම ක්‍රියා මාර්ගයට හේතුව දෙවියන්වහන්සේගේ රාජ්‍ය පරිපාලනය බවට චෝදනා කළේය. එහෙත්



කුරුසියේ පූජාවෙහි ප්‍රබල තර්කය මුළු විශ්වයටම හඬගා කියන්නේ සාතන්ගේ චෝදනාවන්ට කිසිම පදනමක් නැති බවය.

ක්‍රිස්තුස්වහන්සේ සහ සාතන් අතර ඇති මහත් අරගලයේදී උන්වහන්සේ මිනිස් ලෝකයට පැමිණ මහා රැවටිලිකාරයා වූ සාතන්ගේ වෙස් මුහුණ ගළවා දමූසේක. දේවදූත සමූහයාගේ මෙන්ම අනෙකුත් ලෝක වාසීන්ගේද යම් ප්‍රමාණයක අනුකම්පාවක් සාතන් කෙරෙහි තිබුණේ නම් ක්‍රිස්තුස්වහන්සේ මෙලොව මිනිස් වෙසින් ජීවත්වූ කාලයේදී සාතන් උන්වහන්සේට විරුද්ධව දියත් කළ කුරිරු සංග්‍රාමයේ සිද්ධීන් දුටු ඔවුන් තුළ සාතන් කෙරෙවූ සියළු දයානුකම්පාව සහමුලින්ම ඉවත් කරනු ලැබීය. සාතන් විසින් උන්වහන්සේට කිසිම ගරු සරු කිරීමකින් තොරව තමන්ට වැඳ වැටී නමස්කාර කරන්නැයි කීම දේව අපහාසාත්මක ක්‍රියාවක් බව විශ්වාසී ජනතාවගේ තීරණය විය. තවද, සාතන් යේසුස්වහන්සේව උස් කඳු මුදුනක් මත්තටද දේව මාළිගයෙහි කොත මුදුනට පමුණුවා ලීමට තරම් අභීත වීම සියල්ලන්ගේ කෝපයට හේතු විය. එවන් උස් ස්ථානයක සිට බිමට පනින්නැයි කීම ඔහු තුළ තිබූ ද්වේෂය පෙන්නුම් කිරීමක් බව ඔවුහු දුටුවෝය. ක්‍රිස්තුස්වහන්සේව පරික්ෂාවකට හසුකර ගැනීමට වෑයම් කරමින් උන්වහන්සේ යන එන තැන්වලට යමින් උන්වහන්සේව පරික්ෂාවට යොමු කිරීමද ඔහු තුළ පැවති ද්වේෂය පෙන්නුම් කරන්නක් බව සියළු දෙනාම තීරණය කළෝය. එපමණක් නොවේ, උන්වහන්සේ මිනිස් සත හට දක්වූ ආදර බර කරුණාව එපා කිරීමට පූජකයන්ගේ සහ යුදෙව් ජනතාවගේ හදවත් තුළට වෛරය ඇතුළු කොට අන්තිමේදී උන්වහන්සේව "කුරුසියෙහි ඇණ ගැසුව මැනව! කුරුසියෙහි ඇණ ගැසුව මැනව" යනුවෙන් පැවසීමට ජනතාව පෙළඹවීම යන සිද්ධීන් විශ්වීය ජනතාව මවිතයට පත් කරමින් ඔවුන්ගේ උදහස සාතන්ට විරුද්ධව ඇවිළී යන්නට පසුබිම සකස් කළේය.

ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කිරීමට ලෝක වාසීන්ව පෙළඹවූයේ සාතන්ය. ගැළවුම්කාර සමිඳාණන්ගේ මෛත්‍රී කරුණාව සහ ප්‍රේමයද, අනුකම්පාව සහ දයාබර මුදු මොළොක් කමද මගින් දෙවියන්වහන්සේගේ චරිතය ලෝකයාට ප්‍රකාශ වන බව සාතන් දුටුවේය. එම නිසාම යේසුස්වහන්සේව විනාශ කර දැමීමට නපුරේ කුමාරයා ඔහු සතු සියළු බලය සහ උපායන් ආයුධ කර ගත්තේය. මනුෂ්‍ය-පුත්‍රයාණන්ට අයිතිවූ සෑම උරුමයකටම අභියෝග කළ සාතන් යේසුස්වහන්සේගේ ජීවිතය දුකෙන් සහ වේදනාවෙන් පීඩනයට පත්කිරීමට මිනිස් නියෝජිතයන් සහාය කර ගත්තේය. යේසුස්වහන්සේගේ කර්තව්‍යය සුළු කිරීමටද වැඩ කටයුතුවලට බාධා කිරීමටද සාතන් විසින් ඉදිරිපත් කළ කුතර්ක සහ අසත්‍ය ප්‍රචාරද, අකීකරුකමේ

පුත්‍රයන් කරණකොටගෙන පෙන්නුම් කළ ද්වේෂයද ඔහු තුළ තිබූ පලිගැනීමේ චේතනාව පෙන්නුම් කරන්නක් විය. ආදර්ශමත්වූ යහපත් ගුණාංගයන්ගෙන් පිරි තැනැන්වහන්සේට විරුද්ධව විවිධ කුරිරු චෝදනා එල්ල කරමින් උන්වහන්සේව වේදනාවට පත්කිරීම ඔහුගේ පලිගැනීමට තිබූ ආශාව පෙන්නුම් කළේය. දේව පුත්‍රයාණන්වහන්සේට එරෙහිව සාතන්ගේ සිත තුළ තදකරගෙන තිබූ වෛරය සහ ඊර්ෂ්‍යාවද, ද්වේෂය සහ පලිගැනීමද කල්වරියේ කුරුසිය වටා වූ සිද්ධීන් මගින් ඔහු ප්‍රකාශ කළේය. සියලු සග වාසීහූ නිශ්ශබ්ද තැති ගැනීමකින් සහ විශ්මයකින් යුතුව දේව පුත්‍රයාණන්වහන්සේට විරුද්ධව පැවති මේ සිදුවීම් දෙස මහත් අප්‍රසන්නතාවයෙන් බලා සිටියහ.

"පියාණෙනි,.... මා සිටින තැන ඔවුනුත් මා සමග සිටිනවාට කැමැත්තෙමි"යි (යොහන් 17:24), යන ඉල්ලීම පිළිගැන්වීමට පෙර, තම ජීවිත පූජාව ඔප්පු කිරීමෙන් පසුව සගයට ගියාවූ ක්‍රිස්තුස්වහන්සේ දේව දූතයන්ගේ ප්‍රණාමය පවා පිළිගැනීමට උනන්දුවක් නොදක්වූසේක. එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කිව නොහැකි තරම් ප්‍රේමයෙන් සහ බලයෙන් යුතුව පියාණන්වහන්සේගේ සිංහාසනයෙන් නික්ම ආ පිළිතුර වූයේ "දෙවියන්වහන්සේගේ සියළු දූතයෝ උන්වහන්සේට නමස්කාර කරත්වා!" යනුවෙනි. (හෙබ්‍රෙව් 1:6). යේසුස්වහන්සේගේ ජීවිතයෙහි කිසියම් කැළලක් නොතිබුණි. උන්වහන්සේගේ ජීවිතය නිමවී උන්වහන්සේගේ පූජාව සම්පූර්ණ වූ විට සෑම නාමයකට වඩා ඉහළින් වැජඹෙන්නාවූ ශ්‍රී නාමයක් උන්වහන්සේට ප්‍රදානය කරන ලදී.

සාතන්ගේ වරද දන් විවෘතව ප්‍රකාශයට පත් විණ. නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔහුට නොතිබිණ. බොරු කාරයෙකු සහ මිනී මරන්නෙකු ලෙස ඔහු තමාගේ නියම චරිතය එළිදරව් කර තිබුණේය. සගයේද ඔහුට බලය හිමි වූයේ නම් ඔහුගේ අධිකාරී බලය යටතේ සිටි මනුෂ්‍ය පුත්‍රයන් පාලනය කළ ආකාරයටම, ඔහු ස්වර්ගීය වාසීන්ද පාලනය කරනවා ඇත යන්න පැහැදිලි විය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ලැබීමෙන් නිදහස හා ඉහළ තලයක පැවැත්මක් හිමි වන්නේ යයි ඔහු ප්‍රකාශ කර තිබුණේය. නමුත් එසේ කිරීමෙන් හිමි වන්නේ වහල්කම සහ අවමානයට පත්වීම බව සැමට පෙනී ගියේය.

දිව්‍ය චරිතය හා දිව්‍ය රාජ්‍ය පාලනය පිළිබඳව සාතන් එල්ල කළ බොරු චෝදනා ඒවායේ නියම ස්වභාවයෙන් සැමට දකගැනීමට පුළුවන් විය. දෙවියන්වහන්සේ විසින් මවනු ලැබූවන්ගෙන් යටත්වීම



සහ කීකරුකම ඉල්ලා සිටීමෙන් උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ තමන්වහන්සේට පමණක් යසස්ශ්‍රීය සහ මහිමාන්විතය ලබාගැනීමට බවට සාතන් දෙවියන්වහන්සේට චෝදනා කළේය. මැවුම්කාරයාණන්වහන්සේ ස්වකීය මැවිල්ලෙන් ආත්ම-පරිත්‍යාගය ඉල්ලා සිටි නමුත් උන්වහන්සේ කිසිම ආත්ම-පරිත්‍යාගයක් සිදු නොකළ බවටත්, කිසිම පූජා කිරීමක් නොකළ බවටත් ඔහු චෝදනා එල්ල කළේය. වැටී ගියාවූද, පව්කාරවූද ජන සමූහයකගේ ගැළවීම උදෙසා විශ්වයේ රාජාති රජාණන්වහන්සේ ප්‍රේමයෙන් කළ හැකි ඉතාමත් උතුම්වූ පූජාව සිදුකර ඇති බව ඔවුන්ට දකගත හැකි විය. "දෙවියන්වහන්සේ... ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ලෝකය තමන්වහන්සේට සමගි කරගනිමින් සිටිසේක." (2 කොරින්ති 5:19). ගෞරවය සහ උත්තරීතර ආධිපත්‍යය සොයා යමින් ලුසිෆර් පාපයේ දොරටුව විවෘත කළ බවත්, ඒ අතර ක්‍රිස්තුස්වහන්සේ යටහත්කමින් යුක්තව පාපය විනාශ කර දැමීමට මරණය දක්වා කීකරු වූ බවත් ඔවුන්ට පෙනී ගියේය.

කැරැල්ලක් දියත් කිරීමෙහි ලා වූ ප්‍රතිපත්ති තමන් පිළිකුල් කරන බව දෙවියන්වහන්සේ පැහැදිලි ලෙස දැක්වූසේක. සාතන්ව වරදට පත් කිරීමෙහිදීත්, මිනිසාට ගැළවීම සාදා දීමෙහිදීත් දෙවියන්වහන්සේගේ යුක්ති-සාධාරණ ගුණාංගය මුළු සගයම දක ගත්තේය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව වෙනස් නොවන සුළු වන්නේ නම්, එය උල්ලංඝනය කිරීම සඳහාවූ දඬුවම තවත් අයෙකු විසින් ගෙවා දැමිය නොහැකි නම් සෑම පව්කාරයෙකුම දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහයෙන් ඉවත්කරනු ලැබිය යුතු යයි ලුසිෆර් ප්‍රකාශ කර තිබුණේය. පව්කාර මිනිස් ජනතාව ගැළවීම ලබාගැනීමේ වරප්‍රසාදයෙන් ඈත් කර ඇති නිසා ඔවුන් තමන්ගේ නිත්‍යානුකූල ගොදුර බවට සාතන් අයිතිවාසිකම් කීවේය. එසේ වුවද, මනුෂ්‍යයා උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ මරණයට පත්වීම වනාහි යටපත් කළ නොහැකි තර්කයක්ය. දෙවියන්වහන්සේ හා සම වූ තැනැන්වහන්සේ වන ක්‍රිස්තුස්වහන්සේ මත පාපයේ දඬුවම නියම වී උන්වහන්සේ පාපයේ ශාපය ගෙවා දැමූසේක. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා ක්‍රිස්තුස්වහන්සේගේ දැහැමිතාව පිළිගෙන තමන්ගේ පාපයන් ගැන පසුතැවිලි වී යටහත් පහත්කමින් යුත් දිවි පැවැත්මක් පවත්වා ගෙන යන්නේ නම්, ඔවුන්ට ජයග්‍රාහක ජීවිත හිමි වන්නේය. සාතන්ගේ බලය බිඳ දමා දේව පුත්‍රයාණන් විජයග්‍රහණය කළ ආකාරයෙන්ම මිනිසාටද පාපයේ ශාපයෙන් ජය ගත හැකිවන්නේය. මෙසේ දෙවියන්වහන්සේගේ දැහැමි සාධාරණතාව පිළිබඳව සාතන් නැගූ චෝදනාව නිෂ්ඵල බවට පත්වන්නේය. උන්වහන්සේ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නාවූ සැවොම ධර්මිෂ්ඨයන් හැටියට පිළිගන්නාසේක.

ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණ වධ විඳ මරණය වින්දේ මිනිසාට ගැළවීම ලබාදීමේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා පමණක් නොවේය. උන්වහන්සේගේ තවත් කාර්ය භාරයක් වූයේ, "ව්‍යවස්ථාව උතුම් කොට ඊට ගෞරවය" කිරීමය. මෙලෝ වාසීන් විසින් දැහැමි ව්‍යවස්ථාව නිසි ආකාරයෙන් සැලකීම සඳහා අවධානය යොමු කිරීම පමණක් නොව, විශ්වයේ වූ වෙනත් ලෝකවල වාසීන්ටද දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාව වෙනස් නොවන බව ප්‍රදර්ශනය කිරීමද ක්‍රිස්තුස්වහන්සේගේ මෙලෝ පැමිණීමේ තවත් කාර්යයක් විය. ව්‍යවස්ථාවට හිමි අයිතිවාසිකම් මඟහැර ක්‍රියාකිරීමේ හැකියාවක් පැවැතියේ නම් ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ වරද සඳහා සමගි කමක් කිරීමට, වන්දියක් ගෙවීමට දේව පුත්‍රයාණන්ට තම ජීවිතය පූජා කිරීමේ අවශ්‍යතාවයක් උදා වන්නේ නැත. ව්‍යවස්ථාව කිසිම ආකාරයකින් හෝ වෙනස් කළ නොහැකි බව ක්‍රිස්තුස්වහන්සේගේ මරණය ඔප්පු කරන්නේය. පව්කාරයන්ට ගැළවීම ලබාදීම සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ යාග පූජාව හැර සමගි කිරීමේ කර්තව්‍යය ඉටු කිරීමට වෙනත් විකල්පයක් නැත. ජීවිත පූජාව සඳහා පියාණන්-වහන්සේව, මෙන්ම පුත්‍රයාණන්වහන්සේවද පෙළඹ වූයේ අනන්ත ප්‍රේමයයි. මෙම පූජාව මුළු ලොවටම හඬ ගා ප්‍රකාශ කරන්නේ යුක්ති සහගත සාධාරණය සහ මෛත්‍රී-කරුණාව දෙවියන්වහන්සේගේ රාජ්‍ය පරිපාලනයෙහි සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි පදනම බවය.

පාපයේ පැවැත්ම සඳහා හේතුවක් නැති බව විනිශ්චයෙන් පසුව ඇති වන අන්තිම දඬුවම් ලබාදීමේදී දකගැනීමට හැකි වන්නේය. මුළු මහත් පොළොවේ විනිශ්චයකාරයාණෝ සාතන්ගෙන් මෙසේ ප්‍රශ්න කරන සේක. "නුඹ මට විරුද්ධව කැරළි ගසා මාගේ රාජ්‍යයේ යටත් වැසියන් මාගෙන් සොරා ගත්තේ ඇයි?" නපුරේ නිර්මාතෘවරයාට කිසිම ආකාරයකින් නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට නුපුළුවන් වන්නේය. කැරැල්ලෙහි නිරත වූ මහත් ජන සමූහයා නිහඬව සිටිනවා ඇත. ඔවුන්ගේ කටවල් වැසී තිබෙන බවක් පෙනී යන්නේය.

ව්‍යවස්ථාව කිසිසේත් වෙනස් කළ නොහැකි බවත්, පාපයේ කුළිය මරණය බවත් කුරුසියේ පූජාව මුළු විශ්වයටම හඬ ගා පවසන්නේය. "තීන්දුවුණේය" යනුවෙන් ගැළවුම්කාරයාණන් පැවසූ අවසන් වදන් සාතන්ගේ මළ බෙරය හඬ නැංවීමට සමත් විය. දිගු කාලයක් පුරා අඛණ්ඩව පැවති මහා අරගලයට තීන්දුවක් දෙනු ලැබිණ. අවසානයේදී නපුර අතුගා දැමීමේ කාර්යය සපිරි කරන ලදී. දේව පුත්‍රයාණෝ සොහොන් ගෙයි දොරටු තුළින් ගමන් කළේ "මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව" විනාශ කරන පිණිසය. (හෙබ්‍රෙව් 2:14). ලුසිෆර් තමාවම උසස් කරගැනීමට ආශාව දැක්වීය.



එහෙයින් ඔහු මෙසේ පැවසුවේය. "මම ස්වර්ගයට නැගී මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකා වලට උඩින් තබා.... රැස්වීමේ කන්ද පිට හිඳ ගන්නෙමි.... මහෝත්තමයාණන්ට සමාන වන්නෙමි." ලුසිෆර්ගේ මෙම අභියෝගාත්මක වදනට දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක, "පොළොව පිට නුඹ අළු කළෙමි... තවත් කවදාවත් නුඹ නොවන්නෙහිය" (යෙසායා 14:13,14; එසකියෙල් 28:18,19). "උඳුනක් මෙන් ඇවිළෙන දවස පැමිණෙන්නේය. එවිට සියලු උඩඟු අයද දුෂ්ටකම් කරන සියල්ලන්ද ඉපනැලි වී ඔවුන්ට මුලක්වත් අත්තක්වත් ඉතුරු නොවෙන හැටියට පැමිණෙන ඒ දවසේදී දාලා යනවා ඇතැයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක." (මලාකි 4:1).

පාපයේ ස්වභාවය ගැනද එහි ප්‍රති විපාක ගැනද මුළු විශ්වයම සාක්ෂිකාරයන් බවට පත්වෙනවා ඇත. පාපය සදහටම විනාශ කර දමනු ලැබෙයි. පාපයේ ආරම්භයේදී එවන් දෙයක් සිදුකරනු ලැබුවේ නම් එයින් දේව දූතයන්ගේ සිත්වලට බියක් ඇතිවනවා නියතය. එවැන්නකින් දෙවියන්වහන්සේටද අගෞරවයක් හිමි වන්නේය. එහෙත් අවසානයේදී එසේ කිරීමෙන් උන්වහන්සේගේ ප්‍රේමය පැහැදිලි ලෙස පෙනී යන්නේය, දොස් නැඟීමක් නොපවතින්නේය. තම හදවත්හි දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මුද්‍රා කරන ලදුව උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට ප්‍රසන්නතාවක් දක්වන විශ්වීය දනන් ඉදිරියෙහිදී යේසුස්වහන්සේගේ ගෞරවය ස්ථාපිත කොට පිහිටුවනු ලබන්නේය. නපුර තවත් කිසිම කලෙක හිස ඔසවන්නේ නැත. "විපත්තිය දෙවරක් නොපැමිණෙන්නේය"යි (නාහුම් 1:9) දේව වචනය ස්ථිර කර ඇත. වහල්කමෙහි වියදණ්ඩක් ලෙස සාතන් විසින් අවමානයට ලක් කරන ලද දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව නිදහස් කමෙහි ව්‍යවස්ථාව ලෙස එකල ගෞරවයට පත් වන්නේය. දෙවියන්වහන්සේගේ චරිත ස්වභාවය වනාහි අනන්ත වූ නිමක් නැති ප්‍රේමයෙන් පිරී ඉතිරී යන්නාවූ ද අසීමිත ප්‍රඥුවකින් අනූන වූද එකක් බව සක් සුදක් සේ විද්‍යාමානව දක ගන්නට සියල්ලන්ට හැකිවෙයි. දෙවියන්වහන්සේට හිමි විය යුතු පක්ෂපාතීත්වයෙන් ඉවතට හැරී යාමට ඔවුන් කිසිකලෙක වෑයම් නොකරනවා ඇත. උන්වහන්සේගේ ස්වභාවය පරීක්ෂාවට භාජනය කරන ලදුව එය ගැඹුරු ප්‍රේමයෙන්ද අසීමිත ප්‍රඥාවෙන්ද පූර්ණ බව ඔප්පු වෙනවා ඇත.

# 30

## මිනිස් වර්ගයා සහ සාතන් අතර සතුරුකම

"මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නේය, තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහිය." (උත්පත්ති 3:15) මිනිසා පාපයට ගොදුරු වීමෙන් පසුව දෙවියන්වහන්සේ සාතන්ට විරුද්ධව තීන්දුවක් ප්‍රකාශයට පත් කළසේක. එම ප්‍රකාශය අනාගතවාක්‍යයක්ද විය. කාලයේ අවසානය දක්වා වූ සෑම යුගයකටම එය බල පැවැත්වෙන බවත් එහි අඩංගුව ඇත. මිහිතලය මතු පිට ජීවත් වන්නාවූ සෑම ජාතියකටම අයිති මනුෂ්‍යයන් මුහුණ දිය යුතු මහත් අරගලය එමගින් දක්වෙයි.

"මම සතුරුකම තබන්නෙමි"යි දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන සේක. මෙම සතුරුකම ස්වභාවයෙන්ම පවතින විෂයක් නොවේ. මිනිසා දිව්‍ය ආඥාවන් කඩ කළ අවස්ථාවේදී ඔහුගේ ස්වභාවය දුෂ්ටකම බවට පත් විය. එම ජීවිත රටාව සාතන්ගේ ක්‍රියා කලාපයට අනුකූල වූවා මිස වෙනස්කමක් පැවතුණා නොවීය. පව්කාර මනුෂ්‍යයා හා පාපයේ නිර්මාතෘවරයා අතර ස්වභාවික සතුරුකමක් නොපවතී. දෙවියන්වහන්සේගේ සැලැස්මට විරුද්ධව ක්‍රියා කිරීමෙන් දෙදෙනාම නපුරේ සාමාජිකයන් වූහ. දිව්‍ය සැලැස්මෙන් ඉවත්ව කටයුතු කරන්නාට විවේකයක් නැත, සැනසුමක් නැත. ඔහුට සැනසීමක් හා තෘප්තියක් ලැබෙන්නේ තමා සමග එකඟ වීමට සහාය දක්වන්නාවූ අයගේ අනුකම්පාව සහ සහයෝගය ලැබෙන විට පමණක්ය. මෙම හේතුව නිසා වැටී ගියාවූ දේව දූතයෝ සහ දුෂ්ට මිනිස්සු බලාපොරොත්තු සුන්වූ කණ්ඩායමක් ලෙස එකමුතු වෙති. දෙවියන්වහන්සේ විශේෂ ආකාරයකින් මැදිහත් නොවූසේක්නම් සාතන් සහ මිනිස් වර්ගයා සගයට විරුද්ධව සන්ධාන ගතවී, මිතුරු ගිවිසුමකට එළඹී ක්‍රියා කරනවා ඇත. එසේ වූයේ නම් සමස්ත මිනිස් වර්ගයාම සාතන්ට සතුරුකම් පානවා වෙනුවට දෙවියන්වහන්සේට විරුද්ධව නැගී සිටීමට ඔහු සමග එකතු වන්නට පුළුවන්කම තිබුණි.

දෙවියන්වහන්සේට විරුද්ධව කැරැළි ගැසීමට දේව දූතයන් පෙළඹවූ ආකාරයෙන්ම සාතන් මිනිසාටද පව් කරන්නට පරීක්ෂා ගෙන ආවේය. සගයට විරුද්ධව ඔහු ගෙන ගිය යුද්ධයට සෑමගේ සහයෝගය ලබාගැනීම ඔහුගේ අභිමතාන්තරය විය. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි වූ වෛරය පිළිබඳව සාතන් සහ වැටී ගියාවූ දූතයන් අතරේ ආකල්ප



වෙනස්කමක් තිබුණේ නැත. වෙනත් කරුණු පිළිබඳව ඔවුන් අතරේ එකඟතාවක් නොතිබුණද විශ්වයේ පාලක බලධාරියාණන්ගේ ආධිපත්‍යයට ඔවුන් සැවොම විරෝධය පළ කිරීමට එකඟ වූහ. තමා සහ ස්ත්‍රිය අතරේද තමාගේ වංශය හා ස්ත්‍රියගේ වංශය අතරේද සතුරුකමක් පවතින්ට යන බවට වූ ප්‍රකාශය ඇසූ සාතන් තමාගේ වෑයම කඩාකප්පල් වන බවට එම ප්‍රකාශයෙහි අනතුරු ඇඟවීමක් අන්තර්ගත බව දැනගත්තේය. මිනිස් ස්වභාවය පාපිෂ්ඨත්වයෙන් කෙලසා දැමීමට වූ තමාගේ උත්සාහයට බාධා පමුණුවනු ලබන බව ඔහුට ප්‍රත්‍යක්ෂ විය. තමාගේ බලය යෙදවීමේදී එයට විරුද්ධව නැගී සිටීමට මිනිසාට උපකාර වීමට යම්කිසි ක්‍රමවේදයක් ඉදිරිපත් වන බව ඔහුට පෙනී ගියේය.

ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ආදරයත් මෛත්‍රී කරුණාවත් මිනිසාට හිමි වන බව පෙනී ගිය විට සාතන්ගේ සතුරුකම ප්‍රබෝධමත් විය. මිනිසාගේ ගැළවීම සඳහා වූ දිව්‍ය සැලැස්ම කඩාකප්පල් කිරීමට ඔහුට උවමනා විය. දෙවියන්වහන්සේගේ හස්ත කර්මාන්තය විරූපී කරමින්ද කෙලෙසා දමමින්ද උන්වහන්සේට අගෞරවය පමුණුවා ලීමට ඔහු ආශා කරන්නට විය. එම ක්‍රියාදාමය මගින් සගයේ දොම්නස ඇති කිරීමත් පොළොවෙහි දුක සහ බලවත් ශෝකය ඇති කරමින් අසරණ බව ව්‍යාප්ත කිරීමත් ඔහුගේ අරමුණ විය. දෙවියන්වහන්සේ විසින් මිනිසා මැවීම නිසා මේ සියළු විපත් සිදුව ඇතැයි ඔහු පවසයි.

දෙවියන්වහන්සේ මිනිසා තුළ තැන්පත් කරන්නාවූ කරුණා-අනුග්‍රහය මගින් සාතන්ට එරෙහිව මෙම සතුරුකම නිර්මාණය වන්නේය. මෙම සිත් හරවන්නාවූ කරුණා-අනුග්‍රහය සහ එමගින් ලැබෙන්නාවූ නව බල ශක්තිය නොලැබෙන්නේ නම් මිනිසා තවදුරටත් සාතන්ගේ දාසයෙකු ලෙස ක්‍රියා කරනවා ඇත, ඔහුගේ අණ ක්‍රියාත්මක කිරීමට සෑම විටෙකම සැදී පැහැදී සිටින සේවකයෙකු බවට පත්වෙනවා ඇත. නමුත් පුද්ගලයෙකුගේ සිතේ පවතින අලුත් ප්‍රතිපත්තිය ඔහු තුළ සාමය වෙනුවට අරගලයක් ඇති කරයි. ක්‍රිස්තුස්වහන්සේ දෙන්නාවූ මෙම බලය මගින් මිනිසාට තමා ආණ්ඩු කරන්නාවූ මේ සාතනික බලයට විරුද්ධව නැගී සිටීමට ශක්තිය ලැබෙන්නේය. පාපයට ඇලුම් නොවී එය පිළිකුල් කරන්නාවූ තැනැත්තාද, තමාව ග්‍රහණය කරගෙන තිබූ මාංශික තෘෂ්ණාවන්ගෙන් ජය ගන්නාවූ තැනැත්තාද ඒවා මගින් දක්වන්නේ, ඉහළින් පැමිණෙන්නාවූ බලයක් ක්‍රියාත්මක වන බවය.

ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය සහ සාතන්ගේ ආත්මය අතරේ පවතින්නාවූ බලවත් එදිරිවාදිකම, ලෝකයා විසින් ක්‍රිස්තුස්වහන්සේව

පිළිගත් ආකාරයෙන් මනාව විද්‍යාමාන වන්නේය. යුදෙව්වන් විසින් උන්වහන්සේව පිළිනොගැනීමට හේතු කාරක වූයේ උන්වහන්සේට ලෞකික ධන සම්පත්, මහිමය හා තේජස නොතිබූ නිසා නොවීය. බාහිරින් දිස්වෙන මේ දේවල් නොතිබුණද උන්වහන්සේට ඉමහත් බලයක් තිබෙන බව ඔවුන්ට පෙනී ගියේය. නමුත් උන්වහන්සේ තුළ පැවති පවිත්‍රතාවය හා පරිශුද්ධතාවය නිසා අදේව භක්තිකයන්ගේ ඊර්ෂ්‍යාවට සහ වෛරයට ක්‍රිස්තුස්වහන්සේ ගොදුරු වූසේක. උඩඟුකමින් මත් වූ ඉඳුරන් පිනවීමෙහි ඇලී ගැලී කටයුතු කළ මේ ජනතාවට ආත්ම පරිත්‍යාගයෙන් පූර්ණවූ උන්වහන්සේගේ පාප රහිත නොකැළැල් ජීවිතය නිරන්තර තරවටුවක් බවට පත් විය. දේව පුත්‍රයාණන්ට විරුද්ධව සතුරුකමක් නිර්මාණය කිරීමෙහි ලා මිනිසුන්ගේ සිත් සතන් ප්‍රකෝපවත් කළේ මෙම ආකල්පයයි. මෙම සතුරුකම උන්වහන්සේට විරුද්ධව මෙහෙය වීමට සාතන් සහ ඔහුගේ දුෂ්ට දූතයෝ නපුරු මිනිසුන් සමග අත්වැල් බැඳ ගත්තෝය. සත්‍ය දහමට විරුද්ධව ක්‍රියා කළ සෑම බලවේගයක්ම සැබෑකමෙහි වීරවරයාණන්ට එරෙහිව ක්‍රියාත්මක විය.

තම ස්වාමියාණන් වූ ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව දියත් කළ සතුරුකමම උන්වහන්සේගේ අනුගාමිකයන්ට විරුද්ධවද එලෙසින්ම ක්‍රියාත්මක වෙයි. පාපයෙහි පිළිකුල් උපදවන්නාවූ ස්වභාවය දකින්නාවූ තැනැත්තෙක් ඉහළින් ලැබෙන්නාවූ ශාන්තිය උපකාර කරගෙන පරීක්ෂාවන්ට එරෙහි වීමට වෙර දරන්නේ නම්, ඔහුට විරුද්ධව සාතන්ගේ සහ ඔහුගේ යටත්වාසීන්ගේ උදහස අනිවාර්ය-යෙන්ම එල්ල වන බව නියතය. පාපය සහ පව්කාරයන් ජීවත්වන තාක් කල් සත්‍යතාවෙහි පාරිශුද්ධ ප්‍රතිපත්ති පිළිපදිමින් ඒවා අන්‍යයන්ට කියා දෙන්නාවූ අයට එරෙහිව ඔවුන්ගේ ද්වේෂය ඇවිලෙමින් ප්‍රහාර පවා එල්ල වන්නේය. ඔවුන්ට අවලාද නැගීමටද, අපහාස එල්ල කිරිමටද වධ හිංසා පැමිණවීමටද සාතන්ගේ අනුගාමිකයෝ නිරතුරුවම සූදානමින් සිටිති. ක්‍රිස්තු අනුගාමිකයන්ට සහ සාතන්ගේ සේවකයන්ට, එකඟතාවකින් යුතුව කටයුතු කිරීමට හැකියාවක් නැත. කුරුසියේ පූජාවට විරුද්ධව පවතින අමනාපය නිමාවට පත්වී ඇති බවක් නොපෙනේ. "එසේය, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත් වන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය." (2 තිමෝති 3:12)

සාතන්ගේ රාජ්‍යය ගොඩ නැගීමටත්, ඔහුගේ බල අධිකාරිය ස්ථාපිත කිරීමටත් ඔහුගේ නියෝජිතයෝ නිරතුරුවම ඔහුගේ අණසක යටතේ ක්‍රියා කරමින් සිටිති. දෙවියන්වහන්සේගේ රාජ්‍යයට විරුද්ධව තමන්ගේ රාජ්‍යය පිහිටුවීම සාතන්ගේ වෑයම වන්නේය. මෙම උත්සාහය සාර්ථක කරගනිමින් ක්‍රිස්තු අනුගාමිකයන් මුළා කිරීමට ඔව්හු වෙර



දරති. තමන්ගේ අරමුණු ඉටු කරගැනීම් වස් සාතන් මෙන්ම ඔහුගේ සේවක ජනතාවද ශුද්ධ ලියවිලි විකෘති කරමින් ඒවාට අසත්‍යවූ ද අපැහැදිලිවූ ද අර්ථකථන ගෙන දෙමින් බැතිමතුන්ව මුළා කිරීමට ප්‍රබල උත්සාහයක යෙදෙති. සාතන් දෙවියන්වහන්සේට විරුද්ධව නින්දාත්මක අවලාද එල්ල කළාක් මෙන්ම ඔහුගේ නියෝජිතයන්ද දේව ජනතාව අපකීර්තියට පත් කිරීමට සෑම අවස්ථාවකදීම මහත් ප්‍රයත්නයක යෙදෙති. ක්‍රිස්තුස්වහන්සේව මරා දැමීමට ක්‍රියාත්මක වූ ආත්මයම උන්වහන්සේගේ බැතිමතුන්ව විනාශ කර දැමීමට දුෂ්ටයන් මෙහෙයවයි. මෙකී කාරණා සියල්ල "මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි" යනුවෙන් ඒ මුලින් දෙන ලද අනාවැකියෙහි (උත්පත්ති 3:15) ඇතුළත් විය. කාලයේ අවසානය දක්වාම මෙම සතුරුකම නිරතුරුවම පවතිනවා ඇත.

සාතන් තෙමේ තම හමුදාවන් කැඳවමින් තමාගේ සියළු බලය මේ සටන සඳහා යොදවන්නේය. ඔහුගේ ක්‍රියාදාමයන්ට විරුද්ධව නැගී සිටීමට කිසිම කණ්ඩායමක් ඉදිරිපත් වන්නේ නැත්තේ මන්ද? ක්‍රිස්තුස්වහන්සේගේ සොල්දාදුවන් නිදිබරව කිසිම තැකීමක් නැතිව උදාසීනව සිටින්නේ මන්ද? එයට හේතුව වන්නේ ක්‍රිස්තුස්වහන්සේ සමග ඔවුන්ට ඇත්තාවූ සබැඳියාව ඉතා අල්පව තිබීමය. ඔවුන් උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ සබඳතාවයෙන් ඈත්ව ගොස් සිටින නිසා ක්‍රිස්තුස්වහන්සේ මෙන් ඔවුන් පාපයේ පිළිකුල් භාවයද, නීච භාවයද ඒත්තු ගන්නේ නැත. පාපයට විරුද්ධව ක්‍රිස්තුස්වහන්සේ තීරණාත්මක සහ අධිෂ්ඨානශීලී විරුද්ධතාවයකින් යුතුව නැගී සිටි නමුත් උන්වහන්සේගේ අනුගාමිකයන් හට එවන් චින්තනයක් නැත. පාපයේ ඇත්තාවූ අති දරුණු දුෂ්ටකමත් උග්‍ර මරණීය භාවයත් ගැන හැඟීමක් ඔවුන්ට නැත. තවද අන්ධකාරයේ කුමාරයාගේ චරිත සොබාව සහ ඔහුගේ විපුල බලය ගැන බොහෝ කිතුණුවන්ට නිසියාකාර අවබෝධයක් නැත. ඒ පිළිබඳව ඔවුහු අන්ධව සිටිති. සාතන් සහ ඔහුගේ ක්‍රියාකාරකම් ගැන ඔවුන්ට ඇත්තේ ඉතා සුළු සතුරුකමකි. සාතන්ගේ බලය සහ දුෂ්ට නපුරු අභ්‍යාස ගැන ඔවුන්ගේ දැනුවත්කම ඉතා අල්පය. ක්‍රිස්තුස්වහන්සේට මෙන්ම උන්වහන්සේගේ සභාවටද විරුද්ධව ඔහු ක්‍රියාත්මක කර ඇති විශාල යුද්ධ ක්‍රමෝපායන් ගැන ඔවුන්ට වැඩි වැටහීමක් නැත. විශාල ජන සමූහයක් මේ මගින් මුළාවට පත්ව සිටිති. තමන්ගේ සතුරා ප්‍රබල සෙන්පතියෙකු බව ඔවුහු නොදනිති. හෙතෙම තම දුෂ්ට දූතයන්ගේ මනස් පාලනය කරයි. පරිණත වූ සැලසුම් මගින්ද නිපුණ වූ මෙහෙයුම් මගින්ද මිනිසුන්ගේ ගැළවීම උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ වැඩ පිළිවෙත කඩාකප්පල් කිරීමට සාතන් ඔවුන්ව මෙහෙයවයි. ඔහුගේ වෑයම

පිළිබඳව බොහෝ ජනයාට වැඩි දැනුමක් නැත්තේය. කිතුණු බැතිමතුන් යයි කියාගන්නාවූ අය අතරත්, සමහර අවස්ථාවන්හිදී දේවගැති වරුන් අතරත් සාතන් ගැන සඳහන් වන්නේ පවා ඉතාම අඩු වශයෙනි. දේශනා කුඩුවෙන් පවා ඔහුගේ නම කියැවෙන්නේ ඉතා කලාතුරකිනි. සාතන්ගේ නිරන්තර උපායශීලී ක්‍රියාකාරකම් සහ ඔහු ලබන්නාවූ ජයග්‍රහණයන් කිතුණුවන්ගේ දැසට හමු නොවේ. ඔහුගේ දක්ෂ කපටිකම් පිළිබඳ අනතුරු ඇඟවීම් පිළිබඳව වඩාත් සැලකිල්ලක් දැක්වීම අවශ්‍යය යන්නට බැතිමත්හු තමන් අවධානය යොමු නොකරති. බොහෝ කිතුණුවෝ සාතන්ගේ පැවැත්ම නොතකා හරින බවක් පෙනෙයි.

සාතන්ගේ සූක්ෂ්ම ක්‍රියාකාරකම් පිළිබඳව මනුෂ්‍යයන් නොදැනුවත්ව සිටින අතර ඉතා පරික්ෂාකාරීව සිටින්නාවූ මෙම සතුරා මිනිසුන්ට සමීප වී ඔවුන්ව තම දලේ අසුකර ගනී. හෙතෙම සෑම ගෘහයක හා සෑම වීථියකද, සෑම දෙව් මැදුරක, ජාතික මන්ත්‍රණ සභාවන්හි සහ අධිකරණ නඩු ශාලාවන්හිද පවතිමින් සෑම දෙපාර්තමේන්තුවකටද ඇතුල් වෙමින් එම ස්ථානයන්හි වැඩ කටයුතු අවුල් කරයි. සෑම තැනකම වියවුල ඇති කරමින්, මුළා කරමින් මිනිසුන් නොමඟ යවමින් ක්‍රියා කරන්නාවූ සාතන්, පුරුෂයන්ගේ, ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ ආත්ම සහ ශරීර විනාශය කරා යොමු කරයි. තවද පවුල් කඩා ඉහිරවමින් ද්වේෂය වපුරමින් පවුල්වල සාමාජිකයන් අතර තරඟකාරී අවස්ථාවන් ඇති කරමින්, ගැටුම් පවා නිර්මාණය කරමින්, කැරලි ගැසීම් වලට පොළඹවමින් මිනී මැරුමට පවා ඔහු අත්වැල් සපයයි. මෙම ක්‍රියාදාමයන් දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුව සිදුවන්නේ යයි උපකල්පනය කරන්නාවූ කිතුණු ලෝකය ඒ අනුව මෙම දේවල් පැවතිය යුතු යයි නිගමනය කරයි.

ලෝකයා සහ කිතුණුවා වෙන් කරන්නාවූ බාධක බිඳ හෙළමින් දේව ජනතාව පරාජය කිරීමට සාතන් නිරතුරුවම මාන බලමින් සිටින්නේය. මිසදෙටු ජනතාව සමග සමාගම් පැවැත්වීම දෙවියන්වහන්සේ විසින් තහනම් කරනු ලැබ තිබියදී එවන් සබඳතා ඇතිකරගැනීම නිසා පුරාණ ඊශ්‍රායෙලිත ජනතාව පාපයට පොළඹවනු ලැබිණ. "නොඇදහිලිකාර වූ ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපයවූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබලෙන පිණිස මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධ කළේය. (2 කොරින්ති 4:4). ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට තීරණාත්මක ලෙස එකඟතාවක් නොදක්වන්නාවූ සැවොම සාතන්ගේ සේවකයෝ වන්නෝය. නැවත උත්පාදනය නොලැබූ හදවතෙහි පාපයට යොමුවීමක් ඇත, ඇලුම්කමක් ඇත. පව්කාර ක්‍රියාවන් වෙනුවෙන් නිදහසට හේතු දක්වමින් එයට ඉඩ දීමට ආශාවක් පව්කාරයාට ඇත. නැවත උත්පාදනය



ලැබූ හදවතෙහි පාපයට ද්වේෂයක් ඇත. එයට විරුද්ධව නැඟී සිටීමේ තීරණාත්මක අධිෂ්ඨානයක්ද ඔහු සතුව පවතී. අදේව භක්තීන්ගේ සහ නොඇදහිලිවන්තයන්ගේ සමාගම තෝරා ගන්නාවූ ක්‍රිස්තු භක්තිකයෝ පරික්ෂාවන්ට දොර විවෘත කර ගනිති. රහසිගතව ක්‍රියාත්මක වන්නාවූ සාතන් ඔවුන්ගේ ඇස් හමුවෙහි රැවටිලිකාර වැස්මක් යොදන්නේය. මෙවන් මිතුරු කණ්ඩායමක් තමන්ට අනතුරු කිරීමට පෙළ ගැසී සිටිතැයි ඔවුහු කල්පනා නොකරති. තම චරිතයෙන්, වදනින් සහ ක්‍රියාවන්ගෙන් ලෝකය හා බද්ධ වන්නාවූ ඔවුහු ක්‍රම ක්‍රමයෙන් ආත්මික අන්ධ භාවයට පත්වෙති.

ලෝකයේ සිරිත් විරිත් හා සමග අනුකූලතාව දක්වන්නාවූ කිතුණු සභාව ලෝකයේ කොටස්කරුවෙකු බවට පත්වන්නීය. මෙවන් අනුකූලතාවයක් මගින් ලෝකය කිසිම දිනක ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගනු නොලබන්නේය. පාපය සමග සබඳතාවයක් පැවැත්වීම නිසා එයට පිළිකුලක් ඇතිවීමේ හැකියාව අනිවාර්යයෙන්ම හීන වී යන්නේය. සාතන්ගේ සේවකයන් සමග සබඳතා ඇති කරගැනීමට තෝරා ගන්නාවූ අය තුළ තමන්ගේ ස්වාමියා කෙරෙහිවූ බිය ක්‍රම ක්‍රමයෙන් පහවී යන්නේය. රජ මැදුරේදී දානියෙල්ට, තම වගකීම් සහ යුතුකම් ඉටුකිරීම නිසා, අධිකරණ නියෝගයකට මුහුණ දී දඬුවමක් අත්විඳින්නට පවා සිදුවිය. එහෙත් දෙවියන්වහන්සේ මැදිහත් වී ඔහුට සරණ වූසේක. ආගමික වගකීම් ඉටු කිරීමේදී සමහර විටෙක අපටද අනතුරුවලට මුහුණ පෑමට සිදුවිය හැකිය. එවන් අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ අපව රැකබලා ගන්නා බව නියතය. එහෙත් අපි උවමනාවෙන්ම පරික්ෂාවන් පිරි මාර්ගයන්හි ගමන් කරන්නෙමු නම් අපද යම්කිසි දවසක වැටෙනවා නියතය.

තමා සාතන්ගේ පාර්ශ්ව කරුවන් යයි කිසිවිටෙක නොසිතන්නාවූ අය කරණකොටගෙන සාතන් ඉතා සාර්ථක ලෙස ක්‍රියා කරන්නේය. කුසලතා සහ උගත්කම ඇති අය නිරතුරුවම ගෞරවයට සහ ප්‍රණාමයට භාජනය වන්නේ දෙවියන්වහන්සේට භය වීම නොමැති වුවද ඒවා උන්වහන්සේ ඉදිරිපිට පිළිගනු ලබමින් ඔවුන්ට උන්වහන්සේගේ කරුණාව ලබාදෙන ගුණාංග වූවා සේය. කුසලතා සහ සාරධර්ම වනාහි දෙවියන්වහන්සේ දෙන්නාවූ දීමනාවන්ය. එහෙත් මෙම තිළිණ යමෙකුගේ භක්තිය සහ ශ්‍රද්ධාව වෙනුවට යොදාගනු ලබන්නේ නම්, එම ගුණාංග මගින් ඔහුව දෙව් සමිඳාණන් වෙතට සමීප කරනවා වෙනුවට උන්වහන්සේගේ මාර්ගයෙන් ඉවත්ව යෑමට ක්‍රියාකාරී වන්නේ නම් එකී තෑගි එම තැනැත්තාට ශාපයක් සහ මළපතක් බවට පත්වීම වැළැක්විය නොහැකිය. ආචාරශීලීත්වය සහ ශිෂ්ට ලාලිත්‍යය ප්‍රගුණව පෙන්නුම් කරන්නාවූ සැවොම එක්තරා ආකාරයකින් ක්‍රිස්තුස්වහන්සේගේ

පාර්ශ්වකරුවන් යයි බොහෝ අය කල්පනා කරති. මෙයට වඩා බිහිසුණු මුසාවක් තවත් නැත. මෙම චරිත ගුණාංග සෑම කිතුණුවෙකුම තුළම තිබිය යුතුය; මක්නිසාදයත් එම ගුණාංග සත්‍යය වූ ආගම වෙනුවෙන් ප්‍රබල අනුබලයක් දරන්නේය. එසේ වුවද එම ගුණාංග දෙවියන්වහන්සේට කැප කළ යුතු වේ. එසේ නොවන්නේ නම් එම ගුණාංග නපුරෙහි බලයන් බවට පත්වන්නේය. සාමාන්‍ය ලෙස පෙනෙන්නාවූ අයුරින් දුරාචාරයට ගැති නොවූද, ආචාරශීලීවූද, පාපී ක්‍රියාවන්හි නොයෙදෙන්නාවූ බුද්ධිමත්වූ ද බොහෝ අය වනාහි සාතන්ගේ හස්තයෙහි ඔප දැමූ ආයුධ වන්නේය. එවන් අයගේ සැඟවුණු චරිත ස්වභාවය මගින් දරන්නාවූ අනුබලයද ඔවුන්ගේ ආදර්ශයද ක්‍රිස්තුස්වහන්සේගේ වැඩ සැලැස්මට භයානක සතුරෙකු බවට නිතැතින්ම පත්වන්නේය. ඔවුන්ගේ අනුබලය, වඩා උගත්කමක් නොමැති දියුණු සභ්‍යත්වයකට හිමිකම් නොකියන්නාවූ අයගේ අනුබලයට වඩා භයානක විය හැකිය.

අවංක යාච්ඤාවෙන් යුතුව දෙවියන්වහන්සේ කෙරෙහි ගැති වෙමින් සාලමොන් ලබාගත් විශිෂ්ට බුද්ධි ප්‍රඥාව ලෝකයාගේ විශ්මයටත් ප්‍රණාමයටත් හේතු කාරක විය. එසේ වුවද ඔහු තම ශක්තියේ මූලාශ්‍රයෙන් ඉවතට හැරී ස්වකීය අභිමානය කෙරෙහි විශ්වාසය රඳවමින් ක්‍රියාත්මක වීමත් සමගම ඔහු බලවත් පරීක්ෂාවන්ට ගොදුරු විය. ලොව දිවි ගෙවූ ඉතාමත් ප්‍රඥාවන්ත රජතුමා වූ මොහු මත දානය කරන ලද විශ්මිත බලමහිමය, මිනිසුන්ගේ විරුද්ධවාදියාගේ කාර්යක්ෂම නියෝජිතයෙකුගේ බලශක්තීන් බවට පත්විය.

යථාර්ථය අවබෝධ කරගැනීමෙන් ක්‍රිස්තියානි බැතිමතුන්ගේ මනස් අඳුරෙහි නිමග්න කර තැබීමට සාතන් නිරතුරුවම ක්‍රියා කරන්නාවූ අතර ඔවුන් මෙම කරුණ අමතක කළ යුතු නොවේ: "මක්නිසාද අපේ පොර බැදීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත්, පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය." (එපීස 6:12). දේව ආනුභාවයෙන් දෙන ලද අනතුරු ඇඟවීමේ ලියවිලි අද දක්වාම අපටද වලංගුය. ඒ මෙසේය: "සිහි ඇතිව, අවදිව ඉන්න. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය." (1 පේතෘස් 5:8). "යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න." (එපීස 6:11).

ජනතාව හිංසා පීඩනයන්ට භාජනය කරමින් ඔවුන්ව විනාශ මුඛය කරා තල්ලු කිරීමට අපගේ ප්‍රබල සතුරා ආදම්ගේ දිනවල



පටන් අද දක්වාම තමන්ගේ බලශක්තිය විහිදුවමින් ක්‍රියාත්මකව සිටී. සභාවට විරුද්ධවූ තම තීරණාත්මක අවසන් සටන මෙහෙයවීම සඳහා ඔහු දැන් සූදානම් වෙමින් සිටී. යේසුස්වහන්සේව අනුගමනය කිරීමට සොයන්නාවූ සෑම බැතිමතෙකුටම මේ කුරිරු සතුරා සමග ගැටුමකට මුහුණ දීමට සිදුවන්නේය. යම් අයෙකු දිව්‍ය ආකෘතිය අනුකරණය කිරීමට කෙතරම් සමීප වන්නේද ඔහු එවන් ආකාරයෙන්ම සාතන්ගේ ප්‍රහාරයන්ට ඉලක්කය වන්නේය. ක්‍රියාත්මක ලෙස දෙවියන්වහන්සේගේ සේවයෙහි යෙදෙන්නාවූ අය සාතන්ගේ උදහසට ලක් වන්නෝය. ඔවුහු අනිවාර්යයෙන්ම නපුරාගේ මුළා කිරීම් සහ රැවටිලිකාරකම් හෙළිදරව් කරනු නියතය. එසේ කරමින්ම ඔවුහු ක්‍රිස්තුස්වහන්සේව ජනතාව ඉදිරියෙහි ඔසවා තබන්නෝය. පාවුල්ගේ සාක්ෂි දැරීමට පංගුකාරයන් වීමට ඔවුන්ටද පුළුවන. මනසෙහි යටහත් පහත්කමින් යුතුවද බොහෝ කඳුළින් යුතුවද පරීක්ෂාවන්ට මුහුණ දෙමින්ද තමා දෙවියන්වහන්සේගේ සේවයෙහි යෙදෙන බවට ඔවුහු සාක්ෂි දරති.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව සාතන් තමාගේ ඉතා දරුණුවූ ද ඉතා කපටිවූ ද ප්‍රහාරයන් ක්‍රියාත්මක කළේය. එහෙත් ඒ සියලු ප්‍රහාරයන්හිදී සාතන් අසාර්ථක විය. උන්වහන්සේ එම ප්‍රහාරයන්ට මුහුණ දුන්නේ අප උදෙසාය. උන්වහන්සේ එම සතුරු ප්‍රහාරයන්ගෙන් ලබාගත් ජය තුළින් අපටද ජයග්‍රහණය උදාකර ගැනීමට හැකියාව ලැබෙන්නේය. ජයගැනීම සඳහා ශක්තිය සහ ආධාර ඉල්ලන්නාවූ සැමට ක්‍රිස්තුස්වහන්සේ එය ලබා දෙනසේක. තමන්ගේ කැමැත්ත දීමෙන් එකඟතාව ප්‍රකාශ නොකරන්නාවූ කිසිම මනුෂ්‍යයෙකුගෙන් ජයගැනීමට සාතන්ට හැකියාවක් නැත. පව් කරන්ට එකඟ වෙමින් අනුමැතිය දීමෙන් පමණක් කෙනෙක් පරීක්ෂාවට වැටෙන්නේය. යමෙකුගේ කැමැත්ත පාලනය කිරීමටත් බලහත්කාරයෙන් පව් කරන්ට සැලැස්වීමටත් සාතන්ට කිසිම බල අයිතියක් නැත. කෙනෙකුව පීඩාවට පත්කරන්ට, විපතට පත්කරන්ට සාතන්ට හැකියාව ඇත. එහෙත් කෙනෙකුව කිළිටි කරන්නට, අපවිත්‍ර කරන්නට ඔහුට අවසර නැත. කෙනෙකුව දුක් වේදනාවට පත් කරන්නට ඔහුට හැකියාව ඇත. එහෙත් එවන් තැනැත්තෙකු කෙලසීමට ඔහුට හැකියාවක් නැත. ක්‍රිස්තුස්වහන්සේ යක්ෂයාව අන්ත පරාජයට පත්කර විජයග්‍රහණය කර ඇති සේක. එහි ආනුභාවය කරණකොටගෙන කිතුණු අනුගාමිකයන්ට පාපයටත් සාතන්ටත් එරෙහිව නිර්භීත ලෙස සටන් කිරීමට දිරියක් ලැබෙනවා ඇත.

# 31

# දුෂ්ට ආත්මයන්ගේ ක්‍රියාකාරකම්

දෘශ්‍යමාන ලෝකය හා අදෘශ්‍යමාන ලෝකය අතර ඇති සම්බන්ධකමද, දේව දූතයන්ගේ කටයුතු කිරීම් සහ නපුරේ ආත්මයන්ගේ මෙහෙවරයන්ද ගැන ශුද්ධ ලියවිල්ලෙහි පැහැදිලි ලෙස එළිදරව් කර ඇත. මෙම විෂයන් මිනිස් ඉතිහාසය හා බැඳී පවතී. දුෂ්ටාත්ම බලවේගයන්ගේ පැවැත්ම අනුමාන කිරීමටත්, ඒ පිළිබඳව සැකයෙන් යුතුව සිටීමටත් වූ කල්පිතය අද වර්ධනය වෙමින් පවතී. ඒ අතර "ගැළවීම උරුමකරගන්ට සිටින්නන් උදෙසා සේවය කරන පිණිස එවනු ලබන සේවක ආත්මයන්" වන දේව දූතයන් (හෙබ්‍රෙව් 1:14) වනාහි මිය ගිය පුද්ගලයන්ගේ ආත්ම බව බොහෝ අයගේ විශ්වාසය වන්නේය. දෙවියන්වහන්සේගේ දූතයන් මෙන්ම වැටී ගියාවූ දූතයන්ද සිටින බව ශුද්ධ ලියවිල්ල පැහැදිලිව උගන්වන්නේය. තවද මෙම දූත කැළ මිය ගියවුන්ගේ ශරීර රහිත ආත්ම නොවන බවද දේව වචනය පැහැදිලිව ප්‍රකාශ කරයි.

මිනිසා මවනු ලැබීමට පෙර දේව දූතයන් ජීවත්ව සිටි බව දේව වචනය ප්‍රකාශ කරයි. අපගේ භූමියේ අත්තිවාරම දමන්නාවූ අතරේදී, "පහන් තාරකා එක්ව ගීතිකා කරමින් දෙවියන්වහන්සේගේ සියලු පුත්‍රයන් ප්‍රීති ඝෝෂා" පැවැත්වූ බව යෝබ් 38:6,7 වාර්තා කරයි. මිනිසා පාපයට වැටී ගියාට පසුව ජීවනයේ ගස ආරක්ෂා කිරීමට දේව දූතයන් එවූ බව ශුද්ධ බයිබලය පවසන අතර එම සිද්ධියේදී දූතයන්ගේ පැමිණීම සිදුවූයේ කිසිම මනුෂ්‍යයෙකු මරණයට පත්වීමට පෙර බවද දේව වචනය සාක්ෂි දරයි. දේව දූතයන්ගේ රූපකාරය සහ ස්වභාවය මිනිසාට වඩා ඉහළ තලයක පවතින බව දේව වචනය පවසයි. 'මනුෂ්‍යයා දේව දූතයන්ට මඳක් පමණක් පහත් කොට' සාදන ලදී, (හෙබ්‍රෙව් 2:7)

ස්වර්ගික දේව දූතයන්ගේ සංඛ්‍යාව ගැනද ඔවුන් සතු බලය සහ තේජස්ශ්‍රීය ගැනද ශුද්ධ බයිබලයෙහි වාර්තා වී ඇත. දෙවියන්-වහන්සේගේ රාජ්‍ය තන්ත්‍රයට ඔවුන්ගේ ඇති සම්බන්ධතාව මෙන්ම ගැළවීමෙහි කර්තව්‍යය වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය පිළිබඳවද දේව වචනය විස්තර සපයා දී තිබේ. "ස්වාමින්වහන්සේ තමන් සිංහාසනය ස්වර්ගයෙහි පිහිටෙවූ සේක; උන්වහන්සේගේ රාජ්‍යයද සියල්ල කෙරෙහි බලපවත්වයි." දිවැසිවර තෙමේ මෙසේද පවසයි. "තවද මම බැලීම්, එවිට සිංහාසනයද ... වටකර බොහෝ දේවදූතයන්



සිටිනවා දුටිමි." රාජාති රාජයාණන් වහන්සේගේ සිහසුන් මන්දිරයෙහි සිටින්නාවූ දේව දූතයෝ 'ශක්තියෙන් බලවන්තයෝ' වෙති. ඔවුහු 'උන්වහන්සේගේ කැමැත්ත ඉෂ්ට කරන්නාවූ සේවකයෝ' වෙති. (ගීතාවලිය 103: 19-21; එළිදරව් 5:11). දානියෙල් දිවැසිවරයා දුටු දේවදූත කැළ වනාහි "දහසක්වර දහස් දෙනෙක් ... දස දහසක් වර දස දහස් දෙනෙක්" විය. (දානියෙල් 7:10). එම දූත සමූහයා ගණන් කළ නොහැකි විශාල සංඛ්‍යාවක් බව පාවුල් ප්‍රකාශ කරයි. (හෙබ්‍රෙව් 12:22) දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් ලෙස ඔවුහු "විදුලි කෙටීමක පෙනීම මෙන්" ක්‍රියා කරති. (එසකියෙල් 1:14). ඔවුන්ගේ තේජස අතිශයින් දීප්තිමත් විය, ඔවුන්ගේ ගමන බිමන ඉතා කඩිනම් විය, වේගවත් විය. ගැළවුම්කාරයාණන්ගේ සොහොන් ගෙය රැකවල් කරමින් සිටි දේව දූතයාගේ "පෙනීම විදුලිය මෙන් වූය. ඔහුගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය. රැකවල්ලු ඔහුට භයින් වෙවුලා මළවුන් සේ වූහ." (මතෙව් 28:3,4). අසිරියානු රජ වූ සෙනකෙරිබ් උඩඟු වෙසින් දෙවියන්වහන්සේට නින්දාත්මක අවලාද නගමින් දේව අපහාසාත්මක දෝෂාරෝපණය එල්ල කරමින් ඊශ්‍රායෙලිතයන් සමූල ඝාතනය කරන බවට තරවටු කළ කල්හි "ඒ රාත්‍රියේ ස්වාමින්වහන්සේගේ දූතයා පිටත්ව ගොස් අෂූර්වරුන්ගේ කඳවුරෙහි එක් ලක්ෂ අසූ පන්දහසකට පහර දුන්නේය." (2 රාජාවලිය 19:35). දූතයා "අෂූර්හි රජුගේ කඳවුරේ සියලු බලවන්ත යුද්ධකාරයන්ද, ප්‍රධානීන්ද, අධිපතීන්ද සිඳ දැමුවේය. මෙසේ ඔහු ලැජ්ජා මුහුණින් යුක්තව තමාගේ දේශයට හැරී ගියේය." (2 ලේකම් 32:21).

මෛත්‍රී - කරුණාවේ සේවය සඳහා සුබසුන් පණිවිඩ රැගත් දේව දූතයෝ දෙවියන් වහන්සේගේ දරුවන්ට පිහිට වීමට සගයේ සිට එවනු ලබති. සෑම යුගයකදීම ශුද්ධවූ දේව දූතයෝ දෙවියන්වහන්සේගේ ජනතාවට සේවය ලබාදී ඇත. ආබ්‍රහම්ට ආශිර්වාදාත්මක පොරොන්දු දීමටද, සොදොම්හි දිව්ගෙවූ ලොත්ව ගින්නට ඉරණම් වූ එම නගරයෙන් බේරා ගැනීමටද, කාන්තාරයේ තනිව සිටි දැඩි වෙහෙසට සහ බඩගින්නට පත්වූ එළියාව මුදා ගැනීමටද දේව දූතයෝ මැදහත් වූහ. සතුරන් විසින් වට කරනු ලැබ කුඩා නගරයක සිටි එලිෂාව බේරා ගැනීමට ගිනිමය වූ රථ සහ අශ්වයන් එවමින්ද, මිසදෙටු රජතුමෙකුගේ රජවාසලෙහි සේවය කළ දානියෙල් දිව්‍ය ප්‍රඥාව ඉල්ලා සිටි අවස්ථාවෙහිද, සිංහයන්ට ගොදුරුවීමට සිංහ ගුහාවට දමනු ලැබූ දානියෙල්ව බේරා ගැනීමටද, හෙරොද්ගේ තීරණයක් මත ඒ අඳුරු දහ ගෙයින් පේතෘස්ව ගළවා ගැනීමටද, පිලිප්පියේ සිටි සිරකරුවන්ට පිහිට වීමටද දේවදූතයෝ මැදහත් වූහ. මුහුදු කුණාටුවකට මැදී වී සිටි පාවුල් සහ ඔහුගේ සහචරයන් මුදවා ගැනීමටද, සුබසුන් පණිවිඩය පිළිගැනීමට කොර්නේලියස්ගේ මනස විවෘත කිරීමටද, අන්‍යජාතික වූ

ඔහු වෙත ගැළවීමේ පණිවිඩය සමග පේතෘස්ව යැවීමටද ශුද්ධවූ දූතයෝ මෙසේ මෛත්‍රී-කරුණා සේවයේ යෙදී ඇත්තාහ.

ක්‍රිස්තුස්වහන්සේගේ සෑම අනුගාමිකයෙකු සඳහාම ආරක්ෂක දූතයෙක් පත්කර සිටී. මෙම ස්වර්ගීය ආරක්ෂක දූතයෝ දැහැමි බැතිමතුන්ව නපුරාගේ බලයෙන් රැකවරණය කරති. සාතන් පවා මේ බව පිළිගෙන මෙසේ පැවසුවේය: "යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි හයවන්නේ නිකමටද? ඔබවහන්සේ ඔහු වටකරත්, ඔහුගේ ගෙදර වටකරත් ඔහුට ඇති සියල්ල වටකරත්, හැම අතින්ම වැට බැඳ තිබෙනවා නොවේද?" (යෝබ් 1:9,10). දෙවියන්වහන්සේ විසින් තමන් ජනතාව ආරක්ෂා කරන ක්‍රමවේදය පිළිබඳව ගීත රචකයා මෙසේ පවසයි, "ස්වාමින්ගේ දූතයා උන්වහන්සේට හය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි." (ගීතාවලිය 34:7). තමන්වහන්සේ කෙරෙහි විශ්වාසය රඳවන්නවුන් ගැන කථා කරමින් ගැළවුම්කාරයාණෝ මෙසේ පැවසූ සේක, "මේ බාලයන්ගෙන් එකෙකුටවත් හෙළා නොදක්නා ලෙස බලාගන්න. මක්නිසාද ස්වර්ගයේදී ඔවුන්ගේ දූතයෝ ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ මුහුණ නිතරම දකිතියි නුඹලාට කියමි." (මතෙව් 18:10) දෙවියන්වහන්සේගේ දරුවන්ට සේවය කිරීමට පත්කොට ඇති දේව දූතයන්ට පියාණන්වහන්සේගේ අභිමුඛය වෙත යෑමට සෑමවිටෙකම වරම් ඇත.

දෙවියන්වහන්සේගේ දරුවන්ට නොනිවෙන ද්වේෂයකින් යුතුව ක්‍රියා කරමින් සිටින්නාවූ අන්ධකාරයේ කුමාරයාගේ මුළා කිරීමේ බලය ඉදිරියෙහි නොසැලී සිටින්ට පුළුවන් වන පිණිසද නපුරෙහි බලවේගයන් සමග සටන් කිරිමේදී පසු නොබසින පිණිසද දේව දූතයන්ගේ නිරන්තර සහාය ලැබෙන බවට අපට සහතිකයක් ලබාදී ඇත. එවන් සහතිකයක් ලබාදී ඇත්තේ එවැන්නක අවශ්‍යතාවක් ඇති නිසාය. දෙවියන්වහන්සේ විසින් තම දරුවන්ට කරුණා-අනුග්‍රහයේ සහ ආරක්ෂණයේ පොරොන්දු ලබාදී ඇත්තේ බලසම්පන්න සතුරු බලවේගයන්ට මුහුණ දීමට ඔවුන්ට සිදුවන බව දන්නා නිසාය. මහත් සංඛ්‍යාවක් වන මෙම නපුරේ බලවේගයන් දැඩි අධිෂ්ඨානයකින් යුතුව වෙහෙස නොබලා ක්‍රියාත්මකව සිටිති. ඔවුන්ගේ මහත් ක්‍රෝධය, දුෂ්ටකම් සහ බලය පිළිබඳව අවතක්සේරුවක් කිරීමට කිසිවෙකුටත් හැකියාවක් නැත.

වර්තමානයෙහි දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් ලෙස සේවය කරන ශුද්ධ දේව දූතයන් හා සමාන බලයක්, ස්වභාවයක් සහ තේජසක්, පවින් තොරව මවනු ලැබූ නපුරේ ආත්මයන්ද සතුව තිබිණ. නමුත් පාපය කරණකොටගෙන තමා සිටියාවූ තත්ත්වයෙන් වැටී



ගියාවූ මෙම දූතයෝ දෙවියන්වහන්සේට අගෞරවය ගෙන දීමටත්, මිනිස් වර්ගයා විනාශ කර දැමීමටත්, සන්ධානගත වී සිටිති. කැරැල්ලෙහිදී සාතන් සමග එක්වූ ඔවුහු සගයෙන් නෙරපා හරිනු ලැබූහ. ඔවුහු ගතවූ යුගයන් පුරා දිව්‍ය බලඅධිකාරියට විරුද්ධව සටන් වැදීමට සාතන් හා එක්ව ක්‍රියා කරති. ශුද්ධ ලියවිලි ප්‍රකාශ කරන අන්දමට ඔවුන් සතුව රාජ්‍ය සන්ධානයක් සහ පරිපාලන ව්‍යුහයක්ද ඇත. විවිධ තරාතිරමේ දේව දූතයෝ එම රාජ්‍යය තුළ සේවය කරති. ඔවුන්ගේ බුද්ධිය ගැනත් ඉතා සියුම් දක්ෂ කපටි හාවය ගැනත් අපව දැනුවත් කර තිබේ. ඒ අතරම මිනිසාගේ ප්‍රීතිය සහ සමාදානය බිඳ දැමීමට ඔවුන් ක්‍රියාත්මක කරන්නාවූ ද්වේෂ සහගත සැලසුම් ගැනද ශුද්ධ ලියවිලි එළිදරව් කර ඇත.

නපුරේ ආත්මයන්ගේ පැවැත්ම සහ ක්‍රියාකාරකම පිළිබඳව පරණ තෙස්තමේන්තු ඉතිහාසය සඳහන් කරන්නේ ස්වල්ප වශයෙන්ය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ මෙලොව දිවි ගෙවූ සමයේදී දුෂ්ට ආත්මයෝ තමන්ගේ බලය විශේෂ අන්දමින් ප්‍රදර්ශනය කළෝය. මිනිසාට ගැළවීම සාදා දීමට වූ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණිසේක. එවිට, ලෝකය පාලනය කිරීමට තමාට ඇති අයිතිය තිරසාරව පෙන්වා දීමට සාතන් තීරණය කරගෙන සිටියේය. පලස්තීනයෙහි හැරෙන්නට ලෝකයේ අනෙකුත් සෑම ස්ථානයකම රූප වන්දනාව ස්ථාපිත කිරීමේදී ඔහු සාර්ථකත්වය අත්පත් කරගෙන තිබුණේය. සාතන්ගේ පාලනයට සම්පූර්ණයෙන් වසහ නොවූ ඒ එකම දේශයට සගයේ ආලෝකය උදාකිරීමට ක්‍රිස්තුස්වහන්සේ පැමිණිසේක. මෙහිදී විරුද්ධවාදී බලවේගයන් දෙක ආධිපත්‍යයට හිමිකම් කියා සිටියේය. තමන්ගේ ප්‍රේමයේ හස්තය විදහා පාමින් තමා තුළ පව් කමාව සහ සාමය ලබාගන්නැයි යේසුස්වහන්සේ සෑමට ඇරයුම් කරමින් සිටිසේක. තමන්ට සීමා රහිත බලයක් අත්ව නොතිබූ බව අන්ධකාරයේ සේනාව දන සිටියේය. ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙවරය සාර්ථක වුවහොත් තමන්ගේ බලය ඉක්මණින්ම නිමාවට පත්වන බව ඔවුහු දන සිටියෝය. යදමින් බැඳ දමනු ලැබූ සිංහයෙකු මෙන් සාතන් වියරුවෙන් මෙන් හැසිරෙන්නට විය. මිනිසුන්ගේ ශරීර සහ ආත්ම කෙරෙහි තමාගේ බලය ප්‍රදර්ශනය කිරීමට සාතන් ක්‍රියාත්මක විය.

මිනිසුන් තුළ යක්ෂ ආත්ම අරක් ගෙන සිටි බව අළුත් තෙස්තමේන්තුවේ පැහැදිලිවම ප්‍රකාශ කර ඇත. යක්ෂ ආත්ම වැසුණු මිනිසුන් දුක් විදිමින් සිටියේ ස්වභාවික ලෙඩ රෝගවලින් පමණක් නොවේය. එම රෝගීන්ගේ යථා තත්ත්වය ගැන මනා අවබෝධයක්

ක්‍රිස්තුස්වහන්සේ සතුව තිබුණේය. දුෂ්ට ආත්ම බලවේගයන්ගේ සෘජු ක්‍රියාකාරීත්වයක් එම රෝගීන් තුළ තිබූ බව උන්වහන්සේට රහසක් නොවීය.

ගෙරසේනයේදී යක්ෂ හමුදාවන් පළවා හැරීම පිළිබඳව වාර්තාවක් ශුද්ධ ලියවිල්ලෙහි සඳහන්ව ඇත. යක්ෂාවේශ වූ මිනිසෙකු සුවපත් කිරීම ගැන එහි විස්තර සැපයේ. ඒ යක්ෂාත්ම සංඛ්‍යාව ගැනත්, ඔවුන්ගේ බලය ගැනත්, ඔවුන්ගේ දුෂ්ට ද්වේෂය ගැන හා ක්‍රිස්තුස්-වහන්සේගේ මෛත්‍රී-කරුණාව ගැනත් එහි සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. උමතුව සිටි මෙම කාලකණ්ණි මිනිසා තමන් බැඳ දැමීමට උපයෝගී කරගත් යදම් කඩාගනිමින්, වේදනාවෙන් ඇඹරෙමින්, කටින් සෙම දමමින්, උමතුවෙන් කෑ ගසමින් ගුවන දෙදරවමින් මොර ගසමින් ගල් පතුරුවලින් තමාව කපා ගනිමින් තමන් අසලට පැමිණි අයටද අනතුරු කිරීමට සූදානමින් සිටියේය. ලේ වැගිරෙන්නාවූ විරූපී කරගනු ලැබූ ඔහුගේ සොබාව මෙන්ම උමතු කරනු ලැබූ මනසද සාතන්ට පියකරු දසුනක් වූවාට නම් සැකයක් නැත. තමන් වැහී සිටි පුද්ගලයා තුළින් එක් යක්ෂයෙක් මෙසේ කථා කළේය: "මගේ නම ලෙගියොන්ය. මක්නිසාද අපි බොහෝ දෙනෙක් වෙමු"යි ඔහු කීය. (මාර්ක් 5:9). රෝම හමුදාවේ ලෙගියොන් නැමැති අනුබණ්ඩයට තුන් දහසේ සිට පන්දහස දක්වා භට කණ්ඩායමක් අනුයුක්ත විය. සාතන්ගේ භට පිරිස්ද, කණ්ඩායම් වශයෙන් සැදී පැහැදී ඇත. එයින් එක් කණ්ඩායමකට අයත්වූ යක්ෂාත්ම පිරිස ලෙගියොනයකට අඩු නොවීය.

යේසුස්වහන්සේ අණ කළ විගසම යක්ෂ ආත්ම ඔවුන් වැහී සිටි මිනිස් සිරුරින් ඉවත්ව ගියෝය. සුවය ලැබූ රෝගියා ගැළවුම්-කාරයාණන්ගේ පාමුල හිඳගෙන, සන්සුන්ව, බුද්ධිමත්ව, සාමකාමීව සිටියේය. මේ යක්ෂාත්මයන්ගේ ඉල්ලීම පරිදි, අසල ආහාර බුදිමින් සිටි ඌරු රැළකට වැහෙන්නට යේසුස්වහන්සේ ඔවුන්ට අවසර දුන්සේක. ඌරු රැළට ආවේශ වූ යක්ෂාත්මයෝ ඌරු රැළ කඳු බෑවුමෙන් පහළට එක පිම්මට දිවගොස්, විලට වැටී ගිලී මැරීයාමට සැලසූහ. ගෙරසේන වැසියන්ට ඌරන් නැතිවීමෙන් වූ පාඩුව ක්‍රිස්තුස්වහන්සේ ලබාදුන් ආශිර්වාද වලට වඩා වටිනාකමින් අධික විය. තමන්ගේ ගමින් ඉවත්ව යන ලෙස ගම්වාසීහු දිව්‍ය වෙද තුමාණන්වූ උන්වහන්සේට කන්නලව් කළෝය. සාතන් අත්පත් කරගන්නට බලාපොරොත්තු වූ ප්‍රතිඵලය මෙය විය. සිදුවූ පාඩුව යේසුස්වහන්සේ මත පටවා උන්වහන්සේට විරුද්ධව මතයක් ගොඩනගා උන්වහන්සේට තම ග්‍රාමයෙන් පිටතට යෑමට ඉල්ලා සිටීමට සාතන් ජනතාව පෙළ ගැස්වූයේ දේව වචනයට ඇහුම්කන් දීමෙන් ඔවුන්ව වළක්වාලන



පිණිසය. සිදුවන්නාවූ පාඩු, අභාග්‍ය සම්පන්න ඉරණම්, සහ දුක් වේදනා විඳීම් සිදුවීමේ මූලික හේතුව කිතුණුවන් යයි සාතන් නිරතුරුවම චෝදනා එල්ල කරයි. එහෙත් එම චෝදනාවන් එල්ල විය යුතු නියම පුද්ගලයන් නම් සාතන් සහ ඔහුගේ සහචරයන්ය.

අහිතකර පසුතලයක් නිර්මාණය වුවද, ක්‍රිස්තුස්වහන්සේගේ අරමුණ පසුබෑමකට ලක් කිරීමට එය සමත් නොවීය. අපිරිසිදු සතුන් වන ඌරන් ඇතිකිරීම, යුදෙව්වන්ට තහනම් විය. එහෙත් ඌරු ගොවිපළවල් පවත්වා ගෙන යාම ආදායම් ලබාදෙන්නාවූ මාර්ගයක් විය. යක්ෂාත්මයන්ට ඌරන් වැහී ඒ සතුන්ව විනාශ වන්නට ඉඩ දීමෙන් යේසුස්වහන්සේ යුදෙව්වන්ට තරවටුවක්ද එල්ල කළසේක. ක්‍රිස්තුස්-වහන්සේගේ සීමා පැනවීම් නොවූයේ නම්, මෙම යක්ෂාත්ම විසින් සූකරයන් පමණක් නොව ඌරු රැකවළුන් මෙන්ම ඌරන්ගේ අයිතිකරුවන්ද මුහුදට ඇද දමා විනාශ කර දමනවා නියතය. ඌරු රැකවලුන්ගේ සහ උන්ගේ අයිතිකරුවන්ගේ ජීවිත රැකුණේ ක්‍රිස්තුස්-වහන්සේගේ බලය කරණකොටගෙන පමණකි. ඔවුන්ගේ ගැළවීම උදෙසා උන්වහන්සේ තම මෛත්‍රී-කරුණාව පෙරදැරි කරගෙන සිය බලය පාවිච්චි කළසේක. මෙම සංසිද්ධිය ඇතිවීමට උන්වහන්සේ ඉඩ හැරියේ සාතන් විසින් මිනිසුන් කෙරෙහි පමණක් නොව සතුන් කෙරෙහිද තම කුරිරු බලය යොදා ගන්නා අන්දම පිළිබඳව තම ගෝලයන්ට දැනුමක් ලබාදෙන පිණිසය. තමන් අනුගාමිකයන්ට මුහුණ දෙන්නට සිදුවන්නාවූ විරුද්ධකාර සතුරා පිළිබඳවත්, ඔහුගේ උපක්‍රමයන්ට හසු නොවන පිණිසත් ඔහුගේ මළපත්වලින් ජයගැනීම පිළිබඳවත් එම ජනතාව දැනුවත් කිරීමට ගැළවුම්කාරයාණෝ මෙම සිද්ධිය උපකාර කරගත් සේක. මෙම ප්‍රදේශයේ ජනතාවට තමන්-වහන්සේගේ බලය දැකබලා ගැනීමට අවස්ථාවක් ලබාදීමටත් එමගින් ඔවුන්ව සාතන්ගේ වහල්කමින් මුදවා ඔහුගේ ග්‍රහණයෙන් ඔවුන්ට නිදහස ලබාදීමටත් එම බලයට හැකියාව ඇති බව ජනතාවට ප්‍රදර්ශනය කිරීම යේසුස්වහන්සේගේ අභිමතාර්ථය විය. උන්වහන්සේ එම පෙදෙසින් ඉවත්ව ගියද, පුදුමාකාර ලෙසින් සාතන්ගේ ග්‍රහණයෙන් මිදීම ලැබූ මනුෂ්‍යයෝ ඒ පෙදෙසෙහිම රැදෙමින් තමන්ට උපකාර කළ මහත් පරිත්‍යාගශීලී තැනැන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව පතුරුවා හරින්නට දායක වූහ.

මෙම සංසිද්ධිය හා සමාන තවත් සිද්ධීන් ශුද්ධ ලියවිල්ලෙහි වාර්තා වී තිබේ. අශුද්ධාත්මයක් ආවේශ වූ දියණියක් සිටි මවක් උන්වහන්සේගේ උපකාර ඉල්លුවාය. තමන් වචනයෙන් උන්වහන්සේ එම දැරියව සුවපත් කළසේක. (මාර්ක් 7:26-30). තවත් වරෙක උන්වහන්සේ යක්ෂාවේශ වූ අන්ධ ගොළුවෙකු සුව කළසේක. (මතෙව්

12:22). ගොළු බිහිරි ආත්මයක් ආවේශ වූ තරුණයෙක්ද උන්වහන්සේගෙන් සුවය ලැබීය. එම තරුණයාට වැහී තිබූ ආත්මය තරුණයාව විනාශ කරන පිණිස ඔහුව ගින්නෙහිද, වතුරෙහිද හෙළීය. යේසුස්වහන්සේ ඔහුව සුව කළසේක. (මාර්ක් 9:17-27). සබත් දවසෙහිදී 'අශුද්ධ යක්ෂ ආත්මයක්" ආවේශ වූ මනුෂ්‍යයෙක්' කපර්ණවුමේ සිනගෝගයෙහි සිටියේය. දයාවන්තවූ උන්වහන්සේ එහිදී ඔහු සුවපත් කළසේක. (ලූක් 4:32-36). කරුණාවේ ආත්මයෙන් පිරී සිටි උන්වහන්සේ මේ සියලු සුවවීම් කළසේක. මේ සෑම අවස්ථාවකදීම ක්‍රිස්තුස්වහන්සේ අශුද්ධ ආත්මයන්ට ඇමතුවේ බුද්ධිමත් ප්‍රාණ වස්තූන් ලෙසය. උන්වහන්සේ අශුද්ධ ආත්මයන්ට අණ දුන්නේ තවදුරටත් ඒ තැනැත්තාට හිරිහැර නොකොට ඔහුගෙන් පිටතට එන ලෙසය. කපර්ණවුමේ සිනගෝගයෙහි නමස්කාරයේ යෙදී සිටි බැතිමත්හු උන්වහන්සේගේ බලය පිළිබඳව විස්මයට පත්ව "මේ වචනය කිමෙක්ද? මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද ආනුභාවයෙන්ද අශුද්ධාත්මයන්ට අණදෙන සේක. ඔවුහු පිට වෙතියි ඔවුනොවුන් අතරෙහි කථා කරගත්තෝය." (ලූක් 4:36).

යක්ෂයෙකු ආවේශ වූ පුද්ගලයෙක් මහත් වේදනාවෙන් දුක් විඳිමින් සිටින්නේය යන මතයක් එකල පැවැතුණේය. එහෙත් සෑම අවස්ථාවකදීම එය එසේ නොවීය. ලෝකෝත්තර බල මහිමයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් සමහරෙක් සාතනික බලපෑමේ සහ මැදිහත් වීම් පිළිගත්හ. ඔවුන් සහ යක්ෂයන් අතරෙහි කිසිම ආකාරයක ගැටුම් ඇති නොවීය. මෙම පාර්ශ්වයේ අය පේන කීමෙහි ආත්මය මගින් ක්‍රියා කළහ. මායාකාර සීමොන්ද මන්ත්‍ර-ගුරුකම් කරන්නෙක් වූ එලිමස්ද, පිලිප්පියේදී පාවුල් සහ සීලස් පසුපස ගිය තරුණියද මෙම කණ්ඩායමට අයත් වෙති.

ශුභාරංචියෙහි සඳහන් සාක්ෂි සෘජු ලෙසින් සහ සරල බසින් කියාපාන්නේ යක්ෂයා (සාතන්) සමග අනුගාමික ආත්මයන්ද සිටින බවයි. එහෙත් ඔවුන්ගේ පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය නැතැයි සමහර අය පවසති. වෙනත් කිසිම අයෙකුට වඩා මෙම පිරිස සාතන්ගේ බලපෑම්වලට ඉතා පහසුවෙන් ගොදුරු වෙති. ඔවුන් සිටින්නේ අනතුරුදායක පසුබිමකය. යක්ෂයින්ගේ ප්‍රයෝගකාර කපටි ක්‍රියාකිරීම් පිළිබඳව අප අනවබෝධයෙන් සිටින තාක් කල් සිතාගත නොහැකි මවිත කරවන වාසියක් ඔවුන්ට හිමි වන්නේය. තමන්ගේ ප්‍රඥාව තමා හසුරුවන බව විශ්වාස කරමින් බොහෝ අය අනුගමනය කරන්නේ යක්ෂයා විසින් යෝජනා කරන්නාවූ සැලසුම්ය. අප ලෝකාන්තිම දවස කරා ළඟාවත්ම සාතන් තමාගේ උපරිම බලය යොදා ගනිමින් මිනිසුන්ව මුළා කිරීමටත්, විනාශ කිරීමටත් මහත්



පරිශ්‍රමයක යෙදෙන්නේය. යක්ෂයා කියා කෙනෙක් නැත යන විශ්වාසය සෑම තැනකම පතුරුවා හැරීමට ඔහු ක්‍රියාත්මක වේ. තමාව සහ තමාගේ ක්‍රියාවේදයන් සඟවා ගෙන කටයුතු කිරීම ඔහුගේ ප්‍රතිපත්තිය වන්නේය.

යක්ෂයාගේ ක්‍රමවේදයන් සහ ක්‍රියාදාමයන් පිළිබඳව අප යථා අවබෝධයක් ඇතුව සිටිනවා දකීමට වඩා සාතන් බිය වන්නාවූ තවත් දෙයක් නැත. ඔහු තමාගේ චරිත සොබාව සහ ක්‍රියාකාරකම්ද, අරමුණුද සඟවා තබාගෙන ක්‍රියා කරන්නේය. යක්ෂයා ගැන සඳහන් කරන විට ඇතිවන්නාවූ හැඟීම් සහ චින්තනය වන්නේ ඔහුව ගැරහිල්ලට සහ පරිහාසයටද, අපහාසයට සහ අවඥාවටද පත්කළ යුතු අයෙකු ලෙසටය. මිනිසුන් තුළ ඔහු පිළිබඳව දැඩි චිත්තාවේගයක් ඇති වෙනවාට ඔහු තුළ කැමැත්තක් නැත්තේය. ඉතා අප්‍රසන්න පිළිකුල් උපදවන කෙනෙකු ලෙස චිත්‍ර මගින් ඔහුව පෙන්වා දෙනවාට ඔහු කැමැතිය. අඩ මිනිස් ස්වරූපයක් සහිත අඩ සත්ව රූපයක් ලෙසද ඔහුව චිත්‍රයට නැඟෙනවාට ඔහු මහත් සතුටක් පළ කරයි. බුද්ධිමත්වූ ද හොඳ දැනුමක් ඇත්තේ යයි පවසන්නාවූද අය විසින් ක්‍රීඩාවලදී ද නිෂ්ඵල ක්‍රියා කලාපයන්හිදී ද ඔහුගේ නම භාවිතා කරනු ලබනවාට සාතන් ඉතා කැමැති වන්නේය.

සාතන් වෙස් මුහුණක් පැළඳ ගෙන දක්ෂ ලෙස තමාව සම්පූර්ණයෙන්ම ආවරණය කරගෙන සිටින නිසා මෙවැන්නෙකු ඇත්තටම සිටිනවාද යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගින්නේය. සාතන් පිළිබඳව ශුද්ධ ලියවිල්ලෙහි වූ විස්තරාත්මක හෙළිදරව් කිරීම්වලට පටහැනි බොරු මතයන් ආගමික ලෝකය තුළ පතුරුවා හැරීමට සමත්ව තිබීම ඔහුගේ රැවටිලිකාර වැයමෙහි සාර්ථකත්වයකි. යක්ෂයාගේ බලපෑම් පිළිබඳව නොදැනුවත්ව සිටින්නාවූ අයගේ මනස් පාලනය කිරීමට ඔහු සමත් වන්නේය. ඔහුගේ මෙම දුෂ්ට ක්‍රියාකාරකම් පිළිබඳව ශුද්ධ ලියවිල්ලෙහි උදාහරණ ගණනාවක්ම අපට ඉදිරිපත් කර ඇත. ඔහුගේ රහසිගත බලවේගයන් ගැන එහි අපව දැනුවත් කර ඇත. සතුරාගේ පහරදීම්වලට එරෙහිව ආරක්ෂාකාරීව සිටීමට අවශ්‍ය අවවාද ශුද්ධ බයිබලයේ සඳහන් කර ඇත්තේ බොරු ප්‍රචාරයන් මගින් අප මුළා නොවන පිණිසය.

අපගේ ගැළවුම්කාරයාණන්ගේ සුපිරි බලමහිමය තුළ රැකවරණය සහ මිදීම නොමැත්තේ නම් සාතන් සහ ඔහුගේ සහචරයන්ගේ බලය සහ ද්වේෂය ඉදිරියෙහි අප ඇත්ත වශයෙන්ම භීතියට සහ මවිතයට පත්වනවාට සැකයක් නැත. සොර සතුරන්ගෙන් අපේ ගෙදර දොර බඩු මුට්ටු සහ ජීවිත ආරක්ෂා කරගැනීමට අපි දොරගුළු ලා ගෙවල්

ආරක්ෂා කරගන්නෙමු. එහෙත් අප වෙත ළඟා වී අපගේ විනාශය සැලසුම් කරන්නාවූ දුෂ්ට දූතයන්ගෙන් අපගේ ආත්ම ආරක්ෂා කරගැනීමට අපි වැඩිපුර සැලකිල්ලක් නොදක්වන්නෙමු. ඔහුගේ ආක්‍රමණශීලී පහර දීම්වලට විරුද්ධව නැගී සිටීමේ හැකියාවක් ස්වභාවයෙන්ම අප සතුව නැත. දිව්‍ය බලවේගයේ මැදිහත් වීමක් නොවන්නට එම ආක්‍රමණ මගින් අපගේ මනස් වෙනතකට යොමු කරනු ලබනවා ඇත. එසේ වන්නට අපගේ කැමැත්ත සහ අවසර දීම අවශ්‍ය වන්නේය. සතුරාට ඉඩ දුනහොත් ඔහු අපගේ ශරීරයන්ට වද දෙවන්නේය, ශරීර පද්ධති ව්‍යාකූල කරන්නේය; අපගේ සම්පත් සහ ජීවිත පවා විනාශ කර දැමීමටද වැයම් කරන්නේය. සාතන් සහ ඔහුගේ සහචරයන්ගේ මූලික අභිප්‍රාය වන්නේ මිනිසාට කාලකණ්ණිකම සහ දුක්ඛිතකම උදාකර දෙමින් ඔවුන් විනාශ කර දැමීමය. දිව්‍ය අයිතිවාසිකම් වලට විරුද්ධව සිටිමින් සාතන්ගේ පරීක්ෂාවන්ට ගොදුරු වන්නන්ගේ තත්ත්වය ශෝචනීය වන්නේය, බියකරු වන්නේය. එයාකාරයෙන් ක්‍රියා කරන්නාවූ අයව දෙවියන්වහන්සේ නපුරු ආත්මයන්ගේ පාලනය යටතට අත්හරින සේක. එහෙත් ක්‍රිස්තු සමිඳාණන් අනුගමනය කරන්නාවූ අය උන්වහන්සේගේ රැකවරණය යටතේ ආරක්ෂිතව සිටිනවා ඇත. ශක්තියෙන් වඩාත් බලසම්පන්න වූ දේව දූතයන් ඔවුන්ගේ ආරක්ෂාව පිණිස සගයෙන් එවනු ලබනවා ඇත. තමන්වහන්සේගේ සෙනඟ වටා දෙවියන්වහන්සේ යොදා ඇති ආරක්ෂා වළල්ල බිඳගෙන යාමට සතුරාට කිසිම හැකියාවක් නැත.



# 32

# සාතන්ගේ මළපත්

වසර සදහසක් පුරා ක්‍රිස්තුස්වහන්සේ සහ සාතන් අතර පවත්නා මහා අරගලය ඉතා කඩිනමින් අවසානය කරා ඇදෙමින් පවතී. ඒ අතර මේ දුෂ්ටයා ක්‍රිස්තුස්වහන්සේ මිනිසා උදෙසා කරන්නාවූ මෙහෙවරය පරාජය කිරීමටත් මිනිස් ආත්ම තමාගේ ග්‍රහණය යටතේ සුරක්ෂිතව තබාගැනීමටත් තම වැයම දෙගුණ තෙගුණ කරගනිමින් සටනින් ජය ගැනීමට වැයම් කරමින් සිටී. ඔහුගේ ඉලක්කය වන්නේ ක්‍රිස්තුස්-වහන්සේගේ මැදහත්කාරකමේ සේවාව නිමවී පාපය උදෙසා පූජාවක් තවත් නොපවතින තෙක් ජනතාව අඳුරේ තබමින් පසුතැවිලි වීමෙන් ඔවුන් වළකාලීමය.

සාතන්ගේ බලයට විරුද්ධව නැගී සිටීමක් නැති කල, ලෝකයේ සහ සභාවේ උදාසීන භාවයක් පවත්නා කල, ඒ ගැන ඔහු සැලකිලිමත් නොවේ. මක්නිසාදයත් එවිට, තමාගේ කැමැත්ත යටතේ මගපෙන්වීම ලබන්නාවූ ආත්ම තමාට අහිමි වේ යයි යන බියක් ඔහු තුළ ඇති නොවන්නේය. ඒ අතර "ගැළවීම ලබන පිණිස මා විසින් කුමක් කළ යුතුද" යන හඬ යම්කිසි තැනකින් ගුවනට මුසුවේද ඔහු වහාම එම ස්ථානය කරා පැමිණේ. එතැනදී හෙතෙම ක්‍රිස්තුස්වහන්සේගේ බල මහිමයට ඉහළින් තමාගේ බලය යෙදවීමටද ගැළවීම සොයන්නාවූ පුද්ගලයන් තුළ ක්‍රියාත්මක වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලපෑමට විරුද්ධව ක්‍රියා කිරීමටද මහත් වැයමක් දරයි.

එක් දවසක් දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ ස්වාමීන්ද්‍රයාණන් ඉදිරියෙහි පෙනී සිටින්නට පැමිණි විට සාතන්ද ඔවුන් අතරට පැමිණ බව ශුද්ධ ලියවිල්ල පවසයි. ඔහු පැමිණියේ සදාතන රාජාති රාජෝත්තමයාණන්වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී නමස්කාර කිරීමට නොවේය. ඔහුගේ පරමාර්ථය වුණේ දැහැමි අයට විරුද්ධව තම ද්වේෂ සහගත ක්‍රියාවේදයන් ප්‍රගුණ කරගැනීමය. දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට බැතිමතුන් රැස්වන්නාවූ අතරද සාතන් එම ස්ථාන කරා පැමිණ තම අරමුණු ඉටුකරගැනීමට උත්සාහයක යෙදෙන්නේය. අදෘශ්‍යමානව සිටිමින් ඔහු බැතිමතුන්ගේ මනස් තම පාලනය යටතට ගැනීමට නොපසුබස්නා වීර්යෙන් යුතුව ක්‍රියා කරයි. දක්ෂ යුද්ධ සෙන්පතියෙකු ලෙස ඔහු තම සැලසුම් කලින් සිටම සූදානම් කර ගනී. දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවා තම දේශනාව උදෙසා ශුද්ධ ලියවිලි පාඨ සොයන්නාවූ අතරවාරයේදී සාතන් එම දෙසුමෙහි

මාතෘකාව පිළිබඳව සැලකිලිමත් වේ. එම මාතෘකාව පිළිබඳව තමා මුළා කරමින් සිටින්නවුන්ට එම දෙසුම යොමු නොවන පිණිස හෙතෙම තම කපටිකමද ප්‍රයෝගයන්ද යොදාගෙන පරිසරය පාලනය කිරීමට වෙහෙස දරන්නේය. මෙම මාතෘකාව පිළිබඳ කරුණු ඉතාම අවශ්‍ය අයෙක් සිටින්නේ නම්, එම තැනැත්තාව එම දවසෙහිදී දෙසුම ඇසීමෙන් වළකාලීමට ඔහු කාරණා යොදන්නේය. එම පුද්ගලයාට එම දෙසුම කරණකොටගෙන සදාතන ජීවනය ලැබීමේ ආශාවක් ඇතිවිය හැකි නම් එය වළකාලීමට යක්ෂයා උපරිම වෙහෙසක් දරයි.

බැතිමතුන් වටා පැතිර පවතින්නාවූ ආත්මික අන්ධකාරය නිසා විඩාවට පත්ව සිටින්නාවූ දේව දාසයන් කෙරෙහිද සාතන්ගේ අවධානය යොමු වේ. බැතිමතුන් තුළ තිබෙන්නාවූ උපේක්ෂාව, නොසැලකිල්ල සහ උදාසීනකම පහකර අරින්නැයි දේව දාසයන් දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය සහ බලය ඉල්ලා උන්වහන්සේට පුද කරන්නාවූ අවංක යාච්ඤාවන් ඔහුගේ සවනට පතිත වේ. එවිට නව ප්‍රබෝධිත ජ්වලිත කමින් යුතුව ඔහු තම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරයි. ආහාර තෘෂ්ණාවන් අනුව යෑමට ඔහු බැතිමතුන් පොළඹවයි. නැතිනම් ස්ව-ආත්ම ආශාවන් සංසිඳුවා ගැනීමට හෙතෙම බැතිමතුන්ට පරික්ෂා ගෙන දෙවයි. මෙම තෘෂ්ණාවන් සංසිඳුවා ගැනීමේ ක්‍රියාවලියේදී සාතන් ඔවුන්ගේ සිහිය නිදිබර කොට, තීරණය ගැනීමේ හැකියාව උදාසීන කරන්නේය. එමඟින් එවන් අය ඉගෙන ගත යුතු පාඩම් අසා දැනගැනීමේ අවස්ථාව ඔවුන්ගෙන් ගිලිහී යන්නේය.

යාච්ඤා කිරීම අතපසු කිරීමට සහ ශුද්ධ ලියවිලි ඉගෙනීමට ලැදියාවක් නොදැක්වීමට යම් කෙනෙකු පොළඹවා ගැනීමට හැකිවන්නේ නම් ඔවුන්ව තමාගේ ග්‍රහණයට හසුකර ගත හැකි බව සාතන් හොඳාකාරව දන්නේය. එම නිසා මනස සම්පූර්ණයෙන්ම වෙනතකට යොමු කරවා ලීමට හැකි සෑම උපායක්ම ඔහු භාවිතා කරන්නේය. සමහර අය තමා දේව භක්තිකයන් යයි කියාගනිති. එහෙත් සත්‍යතාව දැනගෙන එය පැවැත්වීමට ඔවුන් තුළ කැමැත්තක් නැත. ඔවුන්ගේ ආගම වන්නේ තමන් හා එකඟ නොවන්නාවූ අයගේ චරිතයන්හි යම්කිසි වැරැද්දක් සොයා ගැනීම හෝ ඔවුන්ගේ ඇදහිල්ලෙහි යම්කිසි දොසක් සොයා ගැනීමය. මෙවන් අය සාතන්ගේ ඉතා කුළුපග උදව්කාරයෝ වෙති. තම සහෝදරයන්ට වරද පටවන්නන්ගේ සංඛ්‍යාව ස්වල්පයක් නොවෙයි. දෙවියන්වහන්සේ ක්‍රියාත්මකව සිටින්නාවූ සෑම තැනකම එවන් අය ඉතා කඩිසරව ක්‍රියා කරති. සත්‍ය ප්‍රණාමය පුද කරමින් දේව සේවයේ යෙදෙන්නාවූ සෑමට විරුද්ධව ඔවුහු වරද පටවති; සත්‍යතාවට ආදරය කරමින් ඒවාට කීකරුව සිටින්නන්ගේ වචන සහ ක්‍රියාවන්ට වැරැදි අර්ථකථන සපයමින් ඔවුන්ට වරද



තබමින් සත්‍යතාව විකෘති කරති. අවංකවූ ද, ඉතා ශ්‍රද්ධාවන්තවූ ද ආත්ම-පරිත්‍යාගයෙන් යුතුව කටයුතු කරන්නාවූ ද ක්‍රිස්තු සේවකයන්, රැවටිල්ලකට ගොදුරු වී ඇතැයි ඔවුහු අවලාද නඟති; එවන් අය කරන්නේ රැවටිල්ලක් නැති නම් මුළා කිරීමක් කියාද ඔවුහු ඔවුන්ව හෙළා දකිති. බැතිමතුන්ගේ සෑම ක්‍රියාදාමයකම, සත්‍යවූ පරිත්‍යාගයකම අරමුණු විකෘති කරමින් ඔවුන්ට චක්‍ර අන්දමින් වරද පටවමින් වැඩි අත්දැකීමක් නැති අය ඉදිරියෙහි බැතිමතුන් පිළිබඳව සැකය උපදවන ආකාර තත්ත්වයක් ඇතිකරනු ලැබේ. විශුද්ධවූ ද, දැහැමිවූ ද සෑම දෙයක්ම නින්දිත යයිද වංචාකාරී යයිද තදින්ම ඉදිරිපත් කිරීමට, වරද තබන්නෝ නිරතුරුවම ක්‍රියාත්මකව සිටිති.

මෙම දේවල් පිළිබඳව අපි මුළාවට පත්විය යුතු නොවෙමු. දේව දරුවන්ට විරුද්ධව මෙම ක්‍රියාදාමයන් මෙහෙය වන්නෝ කාගේ දරුවන් දැයි ඉතා පහසුවෙන් හඳුනාගත හැකි වේ. ඔවුන් අනුගමනය කරන්නේ කාගේ ආදර්ශයක්ද ඔවුන් සහයෝගය දක්වන්නේ කුමන නායකයාට දැයි තීරණය කරගැනීම අපහසු නොවේ. "ඔවුන්ගේ එල වලින් නුඹලා ඔවුන් ඇඳින ගන්නහුය." (මතෙව් 7:16). විෂ සහිත හී එවීමෙන් අන්‍යයන්ට අවලාද, අපවාද එල්ල කරන්නාවූ "රෑ දාවල් අපගේ සහෝදරයන්ට වරද තබන්නා" වන (එළිදරව් 12:10) සාතන්ගේ ක්‍රමවේදයන්ට මෙවන් අයගේ ක්‍රියාදාමයන්ද සමාන වන්නේය.

බැතිමතුන් විනාශය කරා යොමු කරවීම බලවත් වංචාකාරයාගේ සහ ඔහුගේ විවිධ නියෝජිතයන්ගේ වෑයම වන්නේය. ඕනෑම ආකාරයක බොරු ඉදිරිපත් කිරීමට ඔවුහු නිතරම සූදානමින් සිටිති. ඔහු විසින් විනාශ කර දැමීම සඳහා තෝරාගත් අයගේ රුචිකත්වය පිනවීම උදෙසා එයට ගැළපෙන ආකාර දුර්මත පිළිගැන්වීමට සාතන්ගේ නියෝජිතයෝ, හැකි සෑම අවස්ථාවෙන්ම උපරිම ප්‍රයෝජන ලබා ගනිති. දෙවියන්වහන්සේගේ ගැළවීමේ සේවාව වර්ධනය වෙනවා දැකීමටත් ඒ සමගම තමාද ඉදිරියට යෑමටත් රුචිකත්වය දක්වන්නාවූ කිතුණු බැතිමත්හු විශාල ප්‍රමාණයක් වෙසෙති. අවංක නොවූ නවෝත්පාදනය නොලැබූ අයව මෙම සභා සාමාජිකයන් අතරට එවමින් සැකය, අනුමානය සහ අවිශ්වාසය ඔවුන් අතරෙහි වැපිරවීම සාතන්ගේ සැලැස්ම හා උපක්‍රමය වන්නේය. දෙවියන්වහන්සේ කෙරෙහි සත්‍යවූ ඇදහිල්ලක් නැති අය, උන්වහන්සේගේ ශ්‍රී වචනය කෙරෙහි සම්පූර්ණ විශ්වාසයක් නැති අය, සත්‍යතාවෙහි සමහර ඇදහිලි විශ්වාසයන් පමණක් පිළිගනිමින් ක්‍රිස්තු භක්තිකයන් ලෙස සභා සාමාජිකත්වයට හිමිකම් කියති. මොවුහු ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු ධර්මයන් ලෙස ඔවුන්ගේ ව්‍යාජ දහම් සත්‍යවූ බැතිමතුන් අතර ප්‍රචාරය කරති.

සාතන්ගේ ඉතා සාර්ථක මුළාවක් වන්නේ මිනිසුන් කුමක් විශ්වාස කළත් එයින් හානියක් නැති බව විශ්වාස කිරීමට ඔවුන්ට සැලැස්වීමය. යම් අයෙක් සත්‍යතාවය ආදරයෙන් යුතුව පිළිගන්නේ නම්, එමගින් ඔහුගේ ප්‍රාණය සහ ජීවිතය ශුද්ධත්වය කරා යොමු වන බව සාතන් හොඳාකාරව දන්නේය. එම නිසා සත්‍යතාව වෙනුවට ව්‍යාජ මතයන්, උපමා කථා සහ ව්‍යාජ දහම් අඩංගු බොරු ශුභාරංචි පතුරුවනු ලැබීමට ඔහු වෑයම් කරන්නේය. පටන්ගැන්මේ සිටම බොරු දේවල් උගන්වන්නාවූ ගුරුවරුන් සමග නිරතුරුවම වාද විවාද කිරීමට දේව සේවකයන්ට සිදුවී ඇත. බොරු ගුරුවරුන්ට විරුද්ධව දේව සේවකයන් නැඟී සිටින්නේ ඔවුන් දුෂ්ට නපුරු අය නිසාම නොවේ. එසේ කරන්නේ ඔවුන් මිනිසුන්ගේ ආත්ම විනාශ කර දමන්නාවූ මාධ්‍යයන් වන නිසාය. ඔවුන් වපුරන්නාවූ දහම් මරණය උදා කරන නිසාය.. දෙවියන්වහන්සේගේ වචනය තුළ පැවැතීමෙන් බැතිමතුන් වෙනත් මඟකට යොමු කරන්නාවූ ගුරුවරුන්ට විරුද්ධව එලියා, යෙරෙමියා සහ පාවුල්ද අභීතව නැඟී සිටියෝය. සත්‍යවූ ආගමික ඇදහිලි ක්‍රමයක් අවශ්‍ය නැතැයි කියමින් නිදහස් මතවාදී දහම් උගන්වන්නාවූ අයට සත්‍යය ආරක්ෂා කරන්නාවූ සභා නායකයන්ගෙන් කිසිම බුරුලක් ලැබුණේ නැත.

සත්‍යවූ ධර්මය නිසියාකාරව අවබෝධ කරගැනීමෙන් අප වළක්වා ලීමට අපගේ විරුද්ධවාදී ත්‍රස්තවාදියා නොකරන්නාවූ දෙයක් නැත. නොපැහැදිලි වූද නියමයක් නැතිවූ ද කාල්පනික අටුවාවක් මගින් ශුද්ධ ලියවිල්ලට අරුත් සපයමින්, කිතුණු ලෝකයේ ධර්මයන් අතරට භේදකාරී ඉගැන්වීම් ලබාදීමට සාතන් දැඩි උත්සාහයක නිරත වෙමින් ක්‍රියා කරයි. එසේ කරන්නේ සත්‍යය පිළිබඳව නිශ්චිතයකට එළඹීමෙන් බැතිමතුන් වළකාලීමට හා ඔවුන්ගේ මනස් අවුල් කිරීම සඳහාය. ක්‍රිස්තියානි ලෝකයේ සභාවන් අතර විසම්මුතිය නැතහොත් එකඟතාවක් නැතිවීම මෙන්ම විවිධාකාර වූ බෙදීම්ද ඇතිව තිබෙන්නේ යම්කිසි ආකාර ජනප්‍රිය ඉගැන්වීමක් පිළිගැනීමට බැතිමතුන්ට මගපෙන්වන පිණිස ශුද්ධ ලියවිල්ලට ඒ අදහස ස්ථිර කිරීමට හැකිවන අන්දමට සකසා ගැනීම නිසාය. හදවතෙහි යටහත් පහත්කමින් යුතුව දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්දැයි කියා සොයා දනගැනීමට ශුද්ධ  ලියවිල්ල අධ්‍යයනය කරනවා වෙනුවට බොහෝ අය කරන්නේ ශුද්ධ ලියවිල්ලෙහි තමා කළින් දන නොසිටි අළුත් කියමනක් හෝ යම් නුහුරු දෙයක් සොයා ගැනීමට වෙහෙසීමය.

තමන්ගේ වරද සහිත ධර්මතාවන් හෝ කිතුණු දහමට එකඟ නැති අදහස් නිවැරැදි යයි ඔප්පු කිරීමට සමහර අය යම් බයිබලීය පාඨ ඒවායේ පෙළ ගැස්මෙන් ඉවතට ගෙන තර්ක ගොඩ නගති.



තවත් අය බයිබලීය පාඨයකින් කොටසක් පමණක් ගෙන එමගින් තම ඉගැන්වීම් ස්ථාපිත කරගැනීමට වෑයම් කරති. එහෙත් එම පදයේ ඉතිරි කොටස් එවන් ඉගැන්වීමකට විරුද්ධව කරුණු දක්වන බව ඔවුන් උවමනාවෙන්ම නොතකා හරිති. බොරු ගුරුවරු සර්පයාගේ කපටිකම් අනුව ක්‍රියාකරමින් සම්බන්ධයක් නැති පාඨ පිටුපස රැකවරණය පතමින් බොරුව සත්‍යයක් සේ ගෙන හැර පාති. මෙසේ බොහෝ අය දන දනම දේව වචනය විකෘති කොට ඉදිරිපත් කරති. ඒ අතර ක්‍රියානුවේගී පරිකල්පනය ඇති තවත් අය ශුද්ධ ලියවිල්ලෙහි ඇති විවිධ රූප සහ සංකේත භාවිතා කරමින් තමන්ගේ අදහස්වලට ගැළපෙන ආකාර අර්ථ ගෙන දෙමින් මතවාදයන් ගොඩ නගා ගනිමින් ඒවා එසේ උගන්වති. ශුද්ධ ලියවිලි පද යෙදීම් සඳහා ශුද්ධ ලියවිල්ලම අර්ථකථනය ලබා දෙන බව දක්වා තිබෙන නමුත් එම සිද්ධාන්තයට කිසිම ගරු සරුවක් දක්වන්නේ නැති මොවුහු තමන්ගේ සිතේ ඇති අදහස් ශුද්ධ බයිබලයේ දහම් ලෙස ඉගැන්වීමෙහි යෙදෙති.

ශුද්ධ ලියවිල්ල අධ්‍යයනයෙහි යෙදීමේදී යටහත් පහත් ආත්මයක්ද, ඉගෙන ගැනීමට පෙළ ගැසුණු මනසක්ද පෙරදැරිව, යාච්ඤාවෙන් යුක්තව එය ඉගෙනගත යුතුය. එසේ නොවන්නේ නම් ඉතා සරලවූ මෙන්ම දුෂ්කර වූද ශුද්ධ ලියවිලි කොටස් ඒවායේ නියම අර්ථයෙන් බැහැර වූ වෙනත් අර්ථකථනයට යොමු වන්නේය. තමන් විසින්ම ශුද්ධ බයිබලය හදාරා එහි ශුද්ධවූ සත්‍යතාවන් අවබෝධ කරගැනීමට බැතිමතුන්ට අයිතිය තිබීම වැදගත්ය. මෙසේ නිදහස් චින්තනයකින් ශුද්ධ බයිබලය කියවීමේ අවස්ථාව පැහැර ගන්නාවූ පාප් සමයවාදී නායකයෝ තමන්ගේ අරමුණුවලට අත්වැලක් සපයන්නාවූ බයිබලීය කොටස් පමණක් තෝරාගෙන තම චින්තනයට ගැළපෙන අර්ථකථනයක යෙදෙමින් බැතිමතුන්ට එම ඉගැන්වීම් පමණක් පිළිගන්නැයි විධාන කරති. සම්පූර්ණ ශුද්ධ බයිබලයේ පවසා ඇති ආකාරයෙන්ම එය බැතිමතුන්ට ලබා දිය යුතුය. විශාල ලෙස වැරැදි ආකාරයෙන් බයිබලීය ඉගැන්වීම් ලබාදීමට වඩා බයිබල් උපදෙස් ලබා නොදී සිටීම වඩාත් ඵලදායකය.

තම මැවුම්කාරයාණන්ගේ කැමැත්ත පිළිබඳව වඩාත් ගැඹුරු අවබෝධයක් ලැබීමට ආශා කරන සැමට එවැන්නක් ලබා දීම සඳහා ශුද්ධ බයිබලය මිනිසා හට ලබා දෙන ලදී. දෙවියන්වහන්සේ මිනිසාට ස්ථිර අනාවැකි වදන් ලබා දුන්සේක. ඉදිරි කාලයේදී හටගන්නාවූ සිද්ධීන් සම්බන්ධව කරුණු කියා දීමට දේව දූතයන් මෙන්ම ක්‍රිස්තුස්වහන්සේද පැමිණ දානියෙල්ට සහ යොහන්ටද කරුණු පහදා දුන්සේක. අපගේ ගැළවීමට අවශ්‍ය දෑ රහසක් ලෙස වසන් කර තැබීම දේව අභිප්‍රාය නොවීය. සත්‍යතාව සොයා යන්නාවූ අවංක

අයව වියවුලට පත්කිරීමත්, නොමඟ යැවීමත් එම වදන් එළිදරව් කිරීමේ අරමුණ නොවීය. හබක්කුක් තුළින් ස්වාමීන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළසේක. "දර්ශනය කියවන්නා ඉක්මණින් කියවන්ට පුළුවන් වන පිණිස.... පැහැදිලි ලෙස ලියන්න." (හබක්කුක් 2:2). හදවතෙහි යාච්ඤාවකින් යුතුව දේව වචනය හදාරන්නාට එය පැහැදිලිව වටහාගත හැකිවනවා ඇත. සෑම අවංක සත්‍යවාදී තැනැත්තෙක්ම සත්‍යතාවේ ආලෝකයට පැමිණෙනවා ඇත. "ධර්මිෂ්ඨයන්ට එළියත්, අවංක සිත් ඇත්තන්ට ප්‍රීතියත් වපුරන ලද්දේය." (ගීතාවලිය 97:11). සභාවක බැතිමතුන් අවංකව සැඟවුණු නිධානයක් ලෙස සත්‍යතාව සොයා යන්නේ නැතිනම් එවන් සභාවකට ශුද්ධවන්ත භාවයෙහි දියුණුවක් ලබාගන්නට නොහැකිය.

නිදහස් මතවාදී ස්ව තන්ත්‍රවාදී පුවරුව යටතේ හඬ නගන්නාවූ අය ඇත්ත වශයෙන්ම මුළා කිරීමේ මහා සතුරාගේ මායම් මගින් අන්ධව සිටිති. ඔව්හු විචාරාත්මක මානව කල්පිතයන් මගින් බයිබලයට අමතර වූ දහම් උගන්වමින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව නොතකා හරිති. මෙවන් සභාවන් තමා වර්ධනය කරා යන්නේ යයිද තමා නිදහස් වාදීන් යයි ද කියාගන්නාවූ නමුත් ඇත්ත වශයෙන්ම ඔවුහු පාපයේ වහල්කමෙහි වර්ධනය වෙමින් සිටිති.

බොහෝ අයට විද්‍යා පර්යේෂණ ශාපයක් බවට පත්ව ඇත. විද්‍යාව සහ කලා ශිල්ප ක්ෂේත්‍රයන් මත දෙවියන්වහන්සේ ඉතා විශාල ආලෝක කන්දරාවක් වගුරුවා ඇති සේක. නමුත් ඔවුන්ගේ පර්යේෂණයන් දෙවියන්වහන්සේගේ වචනය මගින් හසුරුවනු ලැබිය යුතුමය. එසේත් නැතිනම් එම ක්ෂේත්‍ර දෙක අතරෙහි වූ සබඳතාව සෙවීමෙහිදී ඔවුන් වියවුල් වනවා නියතය.

ආත්මිකවූද, ද්‍රව්‍යමයවූද දැය සම්බන්ධ වූ මිනිස් දැනුම සම්පූර්ණ නැත. එම නිසා විද්‍යාත්මකව ඉදිරිපත් කරන්නාවූ මතවේදයන් හා ශුද්ධ ලියවිල්ලෙහි අඩංගු නිශ්චිතයන් අතර අනුකූලතාවක් ගොඩනගා ගැනීම බොහෝ අයට අපහසුතාවයක්ව පවතී. අනුමාන වශයෙන් පවසා ඇති දේ මෙන්ම හිතළු මතයන් ලෙසින් ඉදිරිපත් කර ඇති කරුණුද විද්‍යාත්මක සත්‍යතාවන් ලෙස බොහෝ අය පිළිගනිති. දැනගැන්මෙහි ප්‍රති විරෝධී මත සහ අදහස්" භාවිතා කරමින් දේව වචනය 'වැරදි ලෙස විද්‍යාව යයි හඳුන්වනු ලබන' මේ අදහස් මගින් සෝදිසිකර බැලිය යුතු යයි ඔව්හු කල්පනා කරති. මැවුම්කාරයාණන්වහන්සේ මෙන්ම උන්වහන්සේගේ ක්‍රියාවේදයන්ද ඔවුන්ගේ දැනුමට හසු නොවේ. මෙම දේවල් ස්වභාවික සිද්ධාන්ත මගින් තේරුම් කරදීම අපහසු නිසා බයිබලීය ඉතිහාසය විශ්වාස කළ නොහැකි



යයි ඔවුහු පවසති. පරණ ගිවිසුමෙහි සහ අළුත් ගිවිසුමෙහි අන්තර්ගත වාර්තා කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි යයි පවසන්නාවූ අය එතැනින් නොනැවතී තවත් පියවර කිහිපයක් ඉදිරියට ගමන් කරති. ඔවුහු දෙවියන්වහන්සේගේ පැවැත්ම කෙරෙහි සැක පහළ කරමින් සොබා දහමට අසීමිත අනන්ත බලයක් පවරා දෙති. අත්තිවාරමෙන් ලිස්සා ඉවතට යන්නාවූ ඔවුහු අවිශ්වාසයේ පර්වත මත හැප්පෙති.

මෙසේ ඇදහිල්ලෙහි ශුද්ධ මාර්ගයෙන් ඉවතට යන්නාවූ මෙවන් අය රවටනු ලැබ සාතන්ගේ ග්‍රහණයේ දැඩිව හිර වෙති. මනුෂ්‍යයෝ තමන්ගේ මැවුම්කරුවාණන්ට වඩා ප්‍රඥාවන්ත වීමට වෙර දරා ක්‍රියා කර ඇත්තාහ. ඉදිරි සදාතනය පුරා වුවද, එළිදරව් කරනු නොලබන අභිරහස් දේ සොයමින් එම දේවල් විස්තර කරදීමට මිනිස් දර්ශනවාදය වෑයම් කර ඇත. දෙවියන්වහන්සේ විසින් තමන්වහන්සේ පිළිබඳවද, තමන් අභිමතාර්ථයන් සහ අරමුණු පිළිබඳවද එළිදරව් කර ඇති කරුණු සොයමින් ඒවා අවබෝධ කරගන්නේ නම්, මිනිසුන්ට යෙහෝවඃ වහන්සේගේ තේජසත්, මහානුභාව සම්පන්න ආශ්චර්යයත් බල මහිමයත් පිළිබඳව අනගි දර්ශනයක් ලබාගැනීමට හැකිවනවා නියතය. එසේ කිරීමේදී ඔවුන්ට තමන්ගේ සුළු භාවය පිළිබඳ අවබෝධයක් ඇති වී තමා උදෙසාද තම දරුවන් උදෙසාද එළිදරව් කර ඇති දැයින් සෑහීමකට පත්වනවා නියතය.

අපට වටහා ගැනීමට නොහැකි දේ පිළිබඳව සර්වඥ දැනුම දෙවියන්වහන්සේ සතුය. උන්වහන්සේ විසින් එළිදරව් කර නොමැති කාරණා පිළිබඳව සිතැඟියාවේ මගපෙන්වීම අනුව අදහස් ඇතිකර ගැනීමට මිනිසාව පෙළඹවීම සාතන්ගේ මුළාවන්ගේ අති ප්‍රබල ක්‍රමවේදයකි. ලුසිෆර්ට සගයේ හිමිව තිබූ ස්ථානය ඔහුට අහිමි වුණේ මෙසේ ක්‍රියා කරන්නට තැත් කිරීමෙනි. දෙවියන්වහන්සේගේ අභිරහස්ගත අරමුණු ඔහුට ප්‍රකාශ නොකළ නිසා ලුසිෆර් අසතුටට පත් විය. ඔහුට ලබාදී තිබූ ඉහළ තනතුර හා කාර්ය භාරයන් තුළ ඔහුට එළිදරව් කර දී තිබූ ප්‍රමාණයෙන් ඔහු සෑහීමට පත් නොවීය. එම උදාර ප්‍රකාශන නොසලකා හැරීමට වූ තීරණයක ඔහු පිහිටා සිටියේය. ඔහු යටතේ සිටි දේව දූතයන්ගේ තෘප්තිය කැළඹූ හෙතෙම අතෘප්තිය ඔවුන්ගේ මනස් තුළට කාවද්දා විශාල දේව දූතයන් සංඛ්‍යාවක් ඔවුන් සිටි ස්ථානවලින් ඇද දැමීමට ලූසිෆර් සමත් විය. මිනිසුන්ගේ මනස්ද එම චින්තනය තුළට ඇදගැනීමට සාතන් දැනට ක්‍රියා කරමින් සිටින්නේය. එසේ ක්‍රියා කරන්නාවූ හෙතෙම මිනිසුන්ටද, දෙවියන්වහන්සේගේ සෘජු ආඥාවන් නොසලකා හැරීමට පෙළඹවීමක් කරන්නේය.

ශුද්ධ බයිබලයේ අන්තර්ගත සරලවූ ද, සිතට කාවැදී යන්නාවූද සත්‍යතාවන් පිළිගැනීමට කැමැත්තක් නොදක්වන්නාවූ අය තම හෘදය සාක්ෂියේ හඬනැගීම් නිශ්ශබ්ද කිරීමට සිත සනසන්නාවූ මිථ්‍යා ප්‍රබන්ධ සොයමින් වෙහෙසෙති. ආත්මික භාවයෙන් අඩු, ආත්ම පරිත්‍යාගයක් ඉල්ලා නොසිටින්නාවූ, නිහතමානී ආත්මයක් අපේක්ෂා නොකරන්නාවූ ධර්මතාවන් ඉදිරිපත්වේද, එම දහම් තදින් අල්ලා ගැනීමට ඔවුහු දැඩි උත්සාහයක යෙදෙති, එවන් දහමින් ඔවුහු සෑහීමකට පත් වන්නෝය. මාංශික ආශාවන් සංසිඳුවා ගැනීමට ක්‍රියා කරන්නාවූ ඔවුහු තමන් තුළ ඇති ප්‍රඥා බුද්ධි බල මහිමය පහත් කරගනිති. දිව්‍ය මගපෙන්වීම උදෙසා අවංක යාච්ඤාවෙන් සහ ආත්මයේ බලවත් පසුතැවිල්ලකින් යුතුව ශුද්ධ ලියවිලි සොයනවා වෙනුවට තමන්ගේම මත සහ ප්‍රඥාව කෙරෙහි විශ්වාසය රැඳවීම නිසා ඔවුන්ට සතුරාගේ රැවටිලි වලින් බේරීමට කිසිම රැකවරණයක් නැත. යම් අය ඉල්ලා සිටින්නාවූ, ආත්මික යයි කියන්නාවූ ආශාවන් සපුරාලීමට සාතන් සූදානමින් සිටී. සත්‍යතාව වෙනුවට ඔහු තමාගේ කූට ව්‍යාජ ඉගැන්වීම් ඔවුන්ගේ සිත් තුළට ඇතුල් කරයි. සත්‍යයට අනුගත වීමට කුරුසියක්ද ඇතුළත් වෙයි. සත්‍යය වෙනුවට සිතට සැනසීමක් ලබාදෙන ව්‍යාජ ඉගැන්වීම් තුළින් මනස ග්‍රහණය කරගැනීම සාතන්ගේ අති විශිෂ්ට උපාය මාර්ගයයි. පාප් බලධාරීහූ බැතිමතුන් තම වසභයට ගත්තේ මෙම උපාය මාර්ග අනුගමනය කරමින්ය. ප්‍රොතැස්තන්ත කිතුණුවෝද මෙම මාර්ගයම අනුගමනය කරති. තමා ලෝක ස්වභාවයට විරුද්ධ නොවන පිණිස පහසු ක්‍රමවේදයන් සහ ප්‍රතිපත්ති ඉගෙනීමට කාලය මිඩංගු කරමින් දෙවියන්වහන්සේගේ වචනය අධ්‍යයනය කිරීම පැහැර හරින්නෝ, සත්‍යවූ ආගමික දහම් වෙනුවට අතිදුෂ්ට නින්දනීය ධර්ම විරෝධී මිථ්‍යා විශ්වාස වැළඳ ගැනීමට පසුබට නොවෙති. ලෝකයේ ආගමික ඇවතුම් පැවතුම්වලට වෙනස්වූ මත දැරීමට ඔවුන් අකැමැතිය. සත්‍යතාව කැමැත්තෙන්ම ප්‍රතික්ෂේප කරන්නාවූ අය සෑම ආකාරයකම වැරැදි ඉගැන්වීම් වැළඳ ගනිති. එක් රැවටිලිකාර මිථ්‍යා ඉගැන්වීමක් දෙස මහා භයකින් සහ තැති ගැනීමකින් යුතුව බලන්නාවූ සමහර අය වෙනත් මිථ්‍යා ඉගැන්වීමක් ආදරයෙන් යුතුව වැළඳ ගනිති. 'ගැළවීම ලබන පිණිස වූ ශුභාරංචියේ සත්‍යයට ප්‍රේම කිරීම' ප්‍රතික්ෂේප කළ බැතිමතුන් ගැන පාවුල් මෙසේ කථා කරයි. "ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය. මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුලාවේ ක්‍රියාකිරීමක් ඔවුන්ට එවන සේක." (2 තෙසලෝනික 2:10-12) මෙවන් අනතුරු ඇඟවීමේ අනුශාසනාවක් අප ඉදිරියෙහි තබා ඇති බැවින් අප පිළිගන්නේ කිනම් ආකාර දහම් ඉගැන්වීම් දැයි



කියා පරික්ෂාකාරීවීම, විමසිලිමත්වීම අප සතු කාර්ය භාරය වන්නේය, වගකීම වන්නේය.

අපව විනාශය කරා යොමු කරවන, ඒ මහත් රැවටිලිකාරයාගේ තවත් සාර්ථක මුළාවක් නම් භූත විද්‍යාවයි. එහි ඉතා සියුම් රැවටිලිකාර ඉගැන්වීම් සහ ව්‍යාජ හාස්කම් බැතිමතුන් හට විශාල තර්ජනයක් වී ඇත. ආලෝකයේ දේව දූතයෙකු ලෙස වෙස් වළාගන්නාවූ සාතන් ඔහු විසින් කිසිසේත්ම ආක්‍රමණය නොකරතැයි සිතන්නා වූ ස්ථානවල තමාගේ දැළ හෙළන්නේය. සත්‍යතාව තේරුම් ගැනීමේ අභිමතාර්ථයෙන් යුතුව යාච්ඤාව පෙරදැරිව යමෙක් දෙවියන්වහන්සේගේ වචනය හදාරන්නේ නම් බොරු දහම් පිළිගැනීම පිණිස ඔවුන්ට අන්ධකාරයේ සිටීම අවශ්‍ය වන්නේ නැත. එහෙත් මිනිසුන් සත්‍යතාවේ ආලෝකය ප්‍රතික්ෂේප කරන්නෝ නම් ඔවුන් මුළාවට හසුවනවා ඒකාන්තය.

තවත් භයානක වූ සාවද්‍ය ඉගැන්වීමක් නම් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යත්වය පිළිබඳව ඇති ඉගැන්වීමය. මෙලොව ඉපදීමට පෙර උන්වහන්සේගේ පැවැත්මක් නොතිබූණ බව එම ඉගැන්වීමෙහි ප්‍රබල සාධකයකි. ශුද්ධ බයිබලය විශ්වාස කරන බව පවසන්නාවූ බොහෝ අය මෙම මතය පිළිගනිති. එසේ වුවද, අපගේ ශුද්ධ බයිබලයේ සනිටුහන් වී ඇති ඉතා සරල ප්‍රකාශනයන්ට එම ඉගැන්වීම් සම්පූර්ණයෙන්ම විරෝධීය. අපගේ ගැළවුම්කාරයාණන් හා ස්වර්ගීය පියාණන්වහන්සේ අතර තිබූ සබැඳියාව ගැනද, උන්වහන්සේගේ දිව්‍ය චරිත ගුණාංග ගැනද උන්වහන්සේ සදාතනයේ පටන් ජීවත් වන්නාවූ කෙනෙකු බවටද අපගේ ගැළවුම්කාරයාණන්වහන්සේ පැවසූ පැහැදිලි සත්‍යයන්ට මේ ඉගැන්වීම් විරුද්ධව පවතියි. ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් ප්‍රකාශන අනුව එම මතය ඉගැන්වීමක් ලෙස ඉදිරිපත් කළ නොහැකිය. මිනිසාගේ ගැළවීම සඳහා වූ ඒ ක්‍රියාව පිළිබඳව බැතිමතුන්ගේ ආකල්පය එම ඉගැන්වීම මඟින් ඉතා පහත් මට්ටමකට ඇද දමනු ලැබේ. එපමණක් නොව දෙවියන්වහන්සේ විසින් එළිදරව් කරන ලද පුස්තකයක් ලෙස ශුද්ධවූ බයිබලය කෙරෙහි වූ ඇදහිල්ලද එමගින් අවතක්සේරුවට ලක් කෙරේ. ශුද්ධ බයිබලයට විරුද්ධව ඉදිරිපත් කරන්නාවූ ඉහත කී ඉගැන්වීම ඉතා භයානකය. දේව වචනය ප්‍රතික්ෂේප කරන්නාට එකී ඉගැන්වීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමටද අපහසුය. ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය පිළිබඳව දේවානුභාවයෙන් දෙන ලද ශුද්ධ ලියවිල්ලෙහි සාක්ෂි ප්‍රතික්ෂේප කරන අය සමග මේ කරුණු පිළිබඳව තර්ක කිරීමෙන් ප්‍රයෝජනයක් අත්වන්නේ නැත. කුමන ආකාර හෝ නිශ්චිතවූ ද, තීරණාත්මකවූ ද තර්කයක් ඉදිරිපත් කළද ඔවුන් එය පිළිගන්නේ නැත. "ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ

ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය; ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දනගන්ට ඔහුට බැරිය." (1 කොරින්ති 2:14). මෙලොවට පැමිණීමට පෙර ක්‍රිස්තුස්වහන්සේට පැවැත්මක් තිබුණේ නැතැයි කියන්නාවූ වැරැදි ඉගැන්වීම පිළිගන්නාවූ කවරෙකු හට හෝ ක්‍රිස්තුස්වහන්සේගේ චරිත සොබාවත්, උන්වහන්සේගේ මෙහෙය පිළිබඳවත් සත්‍යවූ අවබෝධයක් නොමැත. මිනිසාට ගැළවීම උදාකර දීම් වස් දෙවියන්වහන්සේගේ වූ අති විශාල සැලැස්ම පිළිබඳවත් ඔවුන්ට කිසිම දැනුමක් ලබාගැනීමට නුපුළුවන.

තවත් ඉතා සියුම් වූ, උපායශීලී ඉගැන්වීමක් වන්නේ සාතන් කියා පුද්ගලයෙක් නොමැති බවය. මෙම අදහස ඉතා ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. මෙවන් අයෙකු ගැන ශුද්ධ ලියවිල්ලෙහි භාවිතා කර ඇත්තේ මිනිසාගේ දුෂ්ට සිතුවිලි හා අභිප්‍රායන් පෙන්නුම් කිරීමට පමණක් බව එම ඉගැන්වීමෙහි අඩංගුය.

දේශනා කුඩුවෙන් දෝංකාරය දෙන්නාවූ තවත් ප්‍රබල මුසාවක් තිබේ. ජනප්‍රිය දේව ධර්මාචාර්යවරුන් මෙම මුසාවට මුල්තැන ගෙන දෙති. එම ඉගැන්වීම නම් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊම වනාහි යමෙකුගේ මරණයේදී උන්වහන්සේ ඔහු වෙත පැමිණීමය යන්නය. වළාකුළු මත වැඩ හිඳිමින් ක්‍රිස්තුස්වහන්සේ පුද්ගලීකවම මෙලොව කරා පැමිණීමේ විශ්වාසය හා බැඳි සංසිද්ධියෙන් මිනිස් මනස වෙනතකට හරවන පිණිස මෙය සාතන්ගේ තවත් ප්‍රබල මුසාවක් වෙයි. "බලව, උන්වහන්සේ ඇතුල් ගෙවල සිටින සේක" යන්න සාතන් වසර ගණනාවක් පුරා ප්‍රචාරය කර ඇත. මෙම මුළාව පිළිගැනීම නිසා ආත්ම විශාල ගණනාවක් සදාතන විනාශය හිමි කරගෙන ඇත්තාහ.

යාච්ඥා කිරීම අනවශ්‍ය යයි ලෞකික ආනුබුද්ධිය උගන්වයි. යාච්ඥාවන්ට සත්‍ය වශයෙන්ම පිළිතුරු ලබාගත නොහැකි යයි විද්‍යාඥයෝ ප්‍රකාශ කරති. එය ලෝක පැවැත්මෙහි නීතිවලට පටහැනිය; එවැන්නක් වේ නම් එය හාස්කමකි; ප්‍රාතිහාර්යන්ට නූතන විද්‍යාවේ තැනක් නැත; විශ්වයේ පාලනය නිශ්චිත නීති මගින් සිදුවන්නේ යයි ඔවුහු පවසති. මෙම නීතිවලට පටහැනිව දෙවියන්වහන්සේ කිසිවක් නොකරනසේක යනු ඔවුන්ගේ නිගමනය වන්නේය. උන්වහන්සේ තමන්වහන්සේගේම අණ පනත් සහ නීති රීති මගින් සීමා කරනු ලැබ ඇතැයි යන්න විද්‍යාඥයන්ගේ කල්පිතය වන්නේය. දිව්‍ය අණසක ක්‍රියාත්මක කිරීමේදී දෙවියන්වහන්සේගේ නිදහස සීමා කළ හැකිවේද? ශුද්ධ ලියවිල්ලෙහි සාක්ෂි දැරීම්වලට මෙවන් ඉගැන්වීමක් කිසිසේත්ම



ගැළපෙන්නේ නැත. ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයෝ හාස්කම් සිදුකළේ නැද්ද? අසීමිත කරුණාවෙන් සහ දයාවෙන් අනූනවූ ගැළවුම්කාරයාණෝ අදත් ජීවත්ව සිටින සේක. උන්වහන්සේ මිනිසුන් අතර දෘශ්‍යමානව එදා ගමන් කළ කාලයේදී මෙන්ම අදත් ඇදහිල්ලේ යාච්ඥාවන්ට ඇහුම්කන් දීමට කැමැත්තෙන් සිටින සේක. ස්වභාවික දැය ලෝකෝත්තර දැය සමග අත්වැල් බැඳ ගනී. ඇදහිල්ල පදනම්ව යාච්ඥාවෙන් ඉල්ලා සිටින්නාවූ දැයට පිළිතුරු වශයෙන් එකී ඉල්ලීම් ලබාදීම දෙවියන්වහන්සේගේ සැලැස්ම වන්නේය. අප ඉල්ලන්නේ නැති නම් උන්වහන්සේ එම ආශිර්වාද සහ දීමනා දානය කරන්නේ නැත.

කිතුණු ලෝකයේ සභාවන් තුළට ඇතුළු වී ඇති සාවද්‍ය දහම් සහ කාල්පනික මායාකාරී ඉගැන්වීම්ද සුළු පටු නොවේ. දේව වචනය මගින් ස්ථාපිත කරන ලද මාර්ග සලකුණු එකක් හෝ උදුරා දැමීමෙහි විපාකය සහ ආදීනව ගණනය කිරීම අපහසුය. එක සත්‍යතාවක් පමණක් සුළු ප්‍රමාණයකින් පවා ප්‍රතික්ෂේප කරන අය එතැනින් නවතින්නේ නැත. බහුතරයක් සත්‍යතාවන් එකින් එක ඉවත දමමින් අන්තිමේදී සත්‍ය වශයෙන්ම භක්තියක් නැති මිසදෙටුවන්ගේ තත්ත්වය උදා කර ගනිති.

ජනප්‍රිය දේව දහම් පිළිබඳව ඇත්තාවූ වැරදි ඉගැන්වීම් නිසා අදේවදෘෂ්ඨිකයන් බවට පත්ව සිටින අය ස්වල්ප දෙනෙක් නොවන්නේය. එවැනි ඉගැන්වීම් නොවන්නට ඔවුන් ශුද්ධ ලියවිල්ලේ අනුගාමිකයන්ව සිටිනවා නියතය. යුක්ති සාධාරණත්වය, කරුණාව සහ පරිත්‍යාගශීලීතාවය පිළිබඳව තමන් තුළ ඇත්තාවූ චින්තනයට නිගා දෙන්නාවූ දහම් පිළිගැනීමට ඔවුහු කැමැති නොවෙති. මෙම දහම් බයිබලයේ උගන්වන්නාවූ ධර්මතාවන් ලෙස හඳුන්වා දී ඇති නිසා එම දහම් දේව වදන් ලෙස පිළිගැනීම ඔවුහු ප්‍රතික්ෂේප කරති.

සාතන්ගේ අරමුණ වන්නේ දෙවියන්වහන්සේ කෙරෙහිත්, උන්-වහන්සේගේ වචනය තුළත් විශ්වාසය රැඳවීම විනාශ කර දැමීමය. ඔහු ඉතාම වැඩියෙන් ආශා කරන්නේ මේ දෙය කිරීමටය. අනුමාන කරන්නවූ මහත් ප්‍රජාවෙහි පළමුවෙනි තැන ගන්නේ සාතන්ය. උපරිම ආත්ම ගණනාවක් තමන්ගේ පාර්ශ්වයට හිමි කරගැනීමට හෙතෙම උපරිම බලය යොදා ක්‍රියා කරන්නේය. අනුමාන කිරීම අද විලාසිතාවක් බවට පත් වී ඇත. දෙවියන්වහන්සේගේ වචනය පාපයට තරවටු කරමින් එය වරදට පත්කරයි. අවිශ්වාසයෙහි සහ සැකයෙහි නිර්මාතෘවරයා සාතන්ය. බොහෝ අය ඔහු මෙන්ම තමුන්ගේ පව් ගැන වරදට පත්කරනු ලබන නිසා දේව වචනය අනුමාන කිරීමටද,

සැකමුසු සිතින් එයට සැලකීමටද පෙළ ගැසී සිටිති. ශුද්ධ බයිබලයෙන් ඉල්ලා සිටින්නාවූ සුදුසුකම් වලට කීකරු වීමට නොකැමැති ජනතාව එහි බලඅධිකාරිය අවතක්සේරුවට පත් කරති. ඔවුහු ශුද්ධ බයිබලය කියවන්නේ හෝ එහි අඩංගු ඉගැන්වීම්වලට ඇහුම්කන් දෙන්නේ ශුද්ධ ලියවිල්ලේ වැරදි සොයා ගැනීමට හෝ දේශනාවෙහි අඩුපාඩු සොයා ගැනීමටය. තමන්ගේ අහංකාරකම නිසා හෝ අලසකම නිසා හෝ ඔව්හු අනුමානවූද සැක සහිතවූද ප්‍රඥප්ති අනුගමනය කරමින් අදේවදෘෂ්ටීන් බවට පත්වෙති. තමන්ගේ වගකීම් පැහැර හැරීම නිසා පච්කාර ක්‍රියාවන් යුක්ති සහගත යයි පෙන්වා දීමට හෝ නිවැරැදි යයි කරුණු ඉදිරිපත් කිරීමට හෝ සමහරෙක් වෑයම් කරති. එම නිසාම ශුද්ධ ලියවිලිවල ස්ථිරතාවය අනුමාන කරන්නන්ගේ සංඛ්‍යාව සුළු පටු නොවේ. ගරු බුහුමන් ලබමින් සමාජයේ ඉහළම ස්ථරයක සිටීමට විශාල පරිශ්‍රමයක් සහ ආත්ම-පූජාවක්ද අවශ්‍යය. ඒ වෙනුවට ශුද්ධ බයිබලය විවේචනය කරමින් එමගින් තමන් සතුව සුපිරි ප්‍රඥවක් ඇතැයි පෙන්වා දීමට ඔව්හු උත්සාහ කරති. දිව්‍ය ආනුභාවය නැති සීමිත මනසකට වටහාගත නොහැකි කරුණු බොහෝ ඇත. ඒවා පිළිබඳව ඔව්හු ශුද්ධ ලියවිලි විවේචනය කරන්නට පටන් ගනිති. දේව වචනය විශ්වාස නොකරන්නාවූ, සත්‍යය අවබෝධ කරගැනීමේ බුද්ධි මහිමයක් නැති අදේව දෘෂ්ටිකයන්ගේ පාර්ශ්වයේ හවුල්කරුවන් වීම භාග්‍යයකැයි බොහෝ අය කල්පනා කරති. තමා අවංකකම නැමති වැස්මක් පැළඳගෙන සිටින බව දක්වන්නාවූ ඔවුන්ගේ අභ්‍යන්තරයෙහි ඇත්තේ රැවටිලිකාර ආත්ම විශ්වාසයක් සහ අහංකාරකමක් පමණකි. තවත් අයට, තම සිතුවිලි සහ මනස් ව්‍යාකූල භාවයට ඇද දමන්නට හැකිවන්නාවූ දෙයක් ශුද්ධ ලියවිල්ලෙන් සොයා ගැනීමට වෑයම් කිරීම ප්‍රීතියක් වී තිබේ. මෙසේ කිරීමෙන් තමා දඩයක්කාරයාගේ මළපතට අසුවන බව ඔවුන්ට වැටහෙන්නේ නැත. ආරම්භයේදීම යම් යම් විරුද්ධවාදී මත දැරීම නිසා, අවිශ්වාසය ප්‍රකාශ කරන ඔව්හු එම පදනම දිගටම රැකගැනීම තම යුතුකම යයි කල්පනා කරති. මෙසේ අදේව භක්තීන් සමග අත්වැල් බැඳගන්නා ඔවුහු පාරාදීසයේ දොරටු තමන්ට වසා ගනිති.

ශුද්ධ ලියවිල්ලෙහි දිව්‍ය ස්වභාවය පිළිබඳව දෙවියන්වහන්සේ තමන් වචනය මගින් ප්‍රමාණවත් සාක්ෂි ලබාදී තිබේ. අපගේ ගැළවීම පිළිබඳව වූ උදාර සත්‍යතාවන් ඉතා පැහැදිලි ලෙස එහි ඉදිරිපත් කර ඇත. සත්‍යය අවංකවම තේරුම් ගැනීමට උදව් කරන බවට පොරොන්දු වී ඇති ශුද්ධාත්මයාණන්ගේ සහාය ඇතිව සෑම අයෙකුටම මෙම සත්‍යතාවන් පුද්ගලිකව තේරුම් ගැනීමට පුළුවන. තමන්ගේ ඇදහිල්ල රඳවා ගැනීමට දෙවියන්වහන්සේ විසින් සෑම අයෙකුටම ශක්තිමත් අත්තිවාරමක් ලබා දී ඇත.



එහෙත් අසීමිත අනන්ත බුද්ධි මහිමයක් ඇති තැනැන්වහන්සේගේ සැලසුම් සහ අභිප්‍රායන් අවබෝධ කරගැනීමට සීමිත මනසක් ඇති මිනිසාට හැකියාවක් නැත. අපගේම උත්සාහයෙන් අපගේ දෙවියන්-වහන්සේව සොයා ගැනීමට අපට කිසිසේත්ම හැකියාවක් නැත. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේගේ තේජස්ශ්‍රීය මහිමය ආවරණය කරන පිණිස යොදා ඇති කඩතුරාව ඉවත් කිරීමට අපගේ අනුමානයෙන් පිරි දැත් කිසිකලෙක හෝ එසවීමට අප වෑයම් නොකළ යුතුය. අපෝස්තුළුවරයා මෙසේ ප්‍රකාශ කරයි. "අහෝ! දෙවියන්- වහන්සේගේ ප්‍රඥාවෙත් දනගැන්මෙත් බහුලත්වය කොපමණ ගැඹුරුද! උන්වහන්සේගේ විනිශ්චයන් සොයා දනගැන්මත් උන්වහන්සේගේ මාර්ගයන් තේරුම් ගැනීමත් කොපමණ අමාරුද!" (රෝම 11:33) උන්වහන්සේ අප සමග ක්‍රියාකරන ආකාරය ගැන යම් ප්‍රමාණයක දැනුමක් ලබාගැනීමටද උන්වහන්සේට ක්‍රියාත්මක වීමට පොළඹවන්නාවූ අරමුණු පිළිබඳව දනගැනීමටද යම් ප්‍රමාණයක එළිදරව් කිරීම් අපට ලබා දී තිබේ. එම දේවල් තුළින් දෙවියන්වහන්සේගේ අසීමිත අනන්ත බලපරාක්‍රමය සමග අත්වැල් බැඳ ගත් සීමා රහිත ප්‍රේමයත් කරුණාවත් අපට දකගැනීමට පුළුවන. සගයේ සිටින්නාවූ අපගේ පියාණන්වහන්සේ ප්‍රඥාවෙන් සහ දැහැමිතාවෙන් යුතුව සෑම දෙයක්ම ක්‍රියාත්මක කරන සේක. සිදුවන්නාවූ දෑ පිළිබඳව අප අතෘප්තියටත්, අවිශ්වාසයටත් පත් නොවිය යුතුය. අප විසින් දේව බිය ඇතිව උන්වහන්සේට යටත් වෙමින් නමස්කාර කළ යුතුය. අපගේ යහපත සඳහා වූ උන්වහන්සේගේ අරමුණු පිළිබඳව අවශ්‍ය ප්‍රමාණයක දැනුමක් උන්වහන්සේ අපට එළිදරව් කරනසේක. ඊට අමතරව අප විසින් උන්වහන්සේගේ සර්ව බලධාරී හස්තය කෙරෙහිත් ප්‍රේමයෙන් පිරී ඉතිරී යන්නාවූ ශ්‍රී හදවත කෙරෙහිත් විශ්වාසය රැඳවිය යුතු වෙමු.

ඇදහිල්ල උදෙසා සාක්ෂීන් විශාල ප්‍රමාණයක් අපට ලබාදී ඇති නමුත් දෙවියන්වහන්සේ අවිශ්වාසය සඳහා වන නිදහසට කාරණා සෑම දෙයක්ම ඉවත් නොකරන සේක. තමන්ගේ සැකය හා අවිශ්වාසය සඳහා කරුණු සොයා ගැනීමට ආශාවන අයට එම දෑ අප්‍රමාණව සොයා ගත හැකිවේ. දේව වචනය පිළිගනිමින් එයට කීකරු වීමට නම් තමන් තුළ දේව වචනය පිළිබඳව ඇති සෑම නොපිළිගැනීමක්ම නිසියාකාරව ඉවත් වන තුරු බලා සිටින්නෝ කවර දිනක හෝ ආලෝකයට නොපැමිණෙති; සෑම බාධකයක්ම පහ වී යන තුරු බලා සිටින්නාවූ අයට ආලෝකයේ පිටුවහලක් ලැබෙන්නේ නැත.

නවෝත්පාදය නොලැබූ හදවතක ස්වභාවික තත්ත්වය වන්නේ දෙවියන්වහන්සේව විශ්වාස නොකිරීමය. එවන් හදවතක් දෙවියන්-වහන්සේට සතුරුකමින් පිරී පවතී. ඇදහිල්ල වනාහි ශුද්ධාත්මයාණන්-

වහන්සේගේ ආනුභාවයේ ප්‍රතිඵලයකි. එය වර්ධනය වන්නේ එම ඇදහිල්ලට ඇලුම් කරන ප්‍රමාණය අනුවය. ස්ථිරසාර අධිෂ්ඨානයකින් තොරව කිසිවෙකු හට හෝ ඇදහිල්ල තුළ ශක්තිමත් අයෙකු බවට පත්වීමට නොහැකිය. අවිශ්වාසයට දිරි දුන් විට එය ශක්තිමත් වෙයි. තමන් තුළ වූ ඇදහිල්ල රක්ෂා කොට පවත්වා ගෙන යැමටත් එය පෝෂණය කරගැනීමටත් දෙවියන්වහන්සේ විසින් ලබා දී ඇති සාක්ෂි මත මනුෂ්‍යයන් යැපෙන්නේ නැති නම්, ඒවා ප්‍රශ්න කරමින් බොරු වැරැදි සොයා යමින් ක්‍රියා කරත් නම් ඔවුන්ගේ අනුමාන කිරීම් වඩ වඩාත් තහවුරු වන බව ඔවුන්ට පෙනී යනවා ඇත.

දෙවියන්වහන්සේගේ පොරොන්දු සැක කිරීමත් උන්වහන්සේගේ කරුණා-අනුග්‍රහය සහතික වීම අවිශ්වාස කිරීමත් උන්වහන්සේට කරන්නාවූ අගෞරවයකි. එවන් අයගේ අනුබලය හා ක්‍රියාකාරිත්වය මගින් තවත් අයව ක්‍රිස්තුස්වහන්සේ වෙත ඇදගන්නවා වෙනුවට සිදුවන්නේ ඔවුන්ව උන්වහන්සේ වෙතින් පළවා හැරීමය. ඔව්හු තම අඳුරු අතු ශාඛා සෑම අතටම විහිදු වන්නාවූ ඵල දරන්නේ නැති ගස්වලට සමාන කරනු ලැබේ. එකී ගස් නිසා අවට ඇති වෙනත් පැලවලට පවා අව් රශ්මිය ලැබෙන්නේ නැත. එකී කුඩා ගස් සහ පැළැටි හිරු එළිය නොමැතිව, ශීත සෙවනැලි නිසා මැරී යන්නේය. මෙම පුද්ගලයන්ගේ ජීවිත පුරාම කරනු ලබන්නාවූ ක්‍රියාදාමයන් නොනිම් සාක්ෂියක් ලෙස ඔවුන්ට විරුද්ධව පවතිනවා ඇත. සැකය හා අනුමානය නමැති බීජ වපුරන්නාවූ ඔවුන් අනුමානයේ හා අදේවදෘෂ්ටියේ අස්වැන්නක් බිහි කරනවා ඇත.

අනුමාන කිරීම් නොමැතිව දිවිය සාර්ථක කරගැනීමට අභිප්‍රාය දක්වන්නාවූ අයට අනුගමනය කිරීමට ඇත්තේ එකම එක මාර්ගයක් පමණකි. තමන්ට තේරුම්ගත නොහැකි කරුණු පිළිබඳව ප්‍රශ්න කරන්නේ නැතිව, අනවශ්‍ය බොරු වැරැදි සොයන්නේ නැතිව ඔවුන් කළ යුතුව ඇත්තේ තමන්ට ලැබී ඇති ආලෝකය අනුව ජීවත් වීමය. එසේ කරන්නේ නම් ඔවුන්ට තව තවත් ආලෝක දහරා උදාවනවා ඇත. ඔවුන්ගේ දැනුම ප්‍රභාවත් කර ඇති සෑම සරල වගකීමක්ම ඔවුන් විසින් අනුගමනය කළ යුතුය. එවිට ඔවුන් දැන් අනුමාන කරන්නාවූ සැක සහිත කරුණු තේරුම් ගැනීමටද ඒවා අනුව ජීවත් වීමටද ඔවුන්ට පුළුවන් වෙනවා ඇත.

යථාර්ථයට ඉතා සමීපව නිශ්චිතයට කිසිම අඩුවක් නැතැයි පෙනී යන්නාවූ අයුරින් ව්‍යාජ දෑ ඉදිරිපත් කිරීමට සාතන් අති දක්ෂයෙක් වන්නේය. මුළා කරනු ලබන්නට කැමැති අයව එමගින් රැවටීමට ඔහු සමත් වන්නේය. සත්‍යතාව මගින් ඉල්ලුම් කරනු ලබන්නාවූ



ආත්ම-පරිත්‍යාගය සහ පූජාවීම් කෙරෙන් ඈත්ව සිටීමටද, එම දෑ කිරීමෙන් වැළකී සිටීමටද කැමැත්ත දක්වන්නාවූ අය පහසුවෙන්ම මුළා කරනු ලබන්ට පුළුවන. එහෙත් කුමන මිලක් හෝ ගෙවා සත්‍යතාව දැනගැනීමට අවංකවම ක්‍රියා කරන්නාවූ අයව තම ආධිපත්‍යය යටතේ තබාගැනීමට සාතන්ට කිසිසේත්ම හැකියාවක් නැත. ක්‍රිස්තුස්වහන්සේ සත්‍යතාවය වනසේක. තවද, ජීවනයේ උල්පත එතුමාණෝය. "ලෝකයට එන්නාවූ සියලු මනුෂ්‍යයන් ආලෝක කරන්නාවූ ආලෝකය" උන්වහන්සේය. (යොහන් 1:9). සියළු මිනිසුන් සියළු සත්‍යතාවන් කරා මගපෙන්වනු ලබන පිණිස සත්‍යතාවේ ආත්මයාණෝ අප වෙත එවනු ලැබ ඇති සේක. මේ පිළිබඳව දේව පුත්‍රයාණන්ගේ අධිකාරී බලය යටතේ මෙසේ ප්‍රකාශ කර ඇත. "සොයන්න, එවිට නුඹලාට සම්බ වේ." "යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම්" ඔහු එය දැනගන්නවා ඇත. (මතෙව් 7:7; යොහන් 7:17).

දෙවියන්වහන්සේගේ අනුගාමිකයන්ට එරෙහිව සාතන් සහ ඔහුගේ බල සේනාව අටවමින් සිටින්නාවූ උගුල් පිළිබඳව එම ජනතාවට ප්‍රමාණවත් දැනුමක් නොමැත. නමුත් තමන්වහන්සේගේ ගැඹුරු අභිප්‍රායන් සාර්ථකත්වය කරා මෙහෙයවීම ස්වර්ගයෙහි සිටින්නාවූ දෙවියන් වහන්සේගේ අරමුණ වන්නේය. උන්වහන්සේ තම අරමුණ ඉටුකරගැනීම සඳහා සාතන්ගේ සෑම මායාකාරී ක්‍රියාවේදයක්ම ව්‍යර්ථ කරන සේක. එසේම පරීක්ෂාවේ කුරිරු දැල් මධ්‍යයෙන් යැමට උන්වහන්සේ තමන්ගේ යටත්වැසියන්ට ඉඩ හරින සේක. උන්වහන්සේ එවැන්නකට අවසර දෙන්නේ ඔවුන්ගේ දුක් විඳීමෙන් සහ විපත්තියන්ට පත්වීමෙන් උන්වහන්සේ ප්‍රීතියක්, මියුරු වින්දනයක් ලබන නිසා නොවේ. මෙවන් පරීක්ෂාවන්ට මුහුණ දීම ඔවුන්ගේ ජයග්‍රහණය උදෙසා අත්‍යවශ්‍ය නිසාම උන්වහන්සේ එවැන්නට ඉඩ හරින සේක. තමන්වහන්සේගේ තේජෝ බල මහිමය මගින් නිරතුරුවම තම අනුගාමිකයන් ආවරණය කර ආරක්ෂා කරගැනීම උන්වහන්සේගේ අදහස නොවේ. පරීක්ෂාවන්ගේ මූලික අරමුණ වන්නේ නපුරෙහි සියළු ආකර්ෂණයන් සහ පෙළඹවීම් වලට මුහුණ දී ජයගැනීමට බැතිමතුන්ට අවස්ථාවක් ලබාදීමය.

දුෂ්ට සහ නපුරු මිනිසුන්ටද, යක්ෂයන්ටද දෙවියන්වහන්සේගේ වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණවිය නොහැක. උන්වහන්සේගේ සෙනහ කෙරෙහි උන්වහන්සේගේ වැඩසිටීම සහ අභිමුඛය වසා දැමීමට ඔවුහු අසමත් වෙති. උන්වහන්සේගේ සෙනහ යටහත් පහත් ආත්මයකින් යුතුව, බලවත් පසුතැවීමකින් යුතුව ඔවුන්ගේ පාප කියාදී ඒවා අත්හැර දමන්නේ නම් ඇදහිල්ලෙන් යුතුව ඔවුන්ට උන්වහන්සේගේ පොරොන්දු වලට අයිතිවාසිකම් කීමට හැකියාවක්

ඇත. රහසිගත වේවා, විවෘත වේවා සෑම පරීක්ෂාවක්ම, සෑම විරුද්ධවාදී බලපෑමක්ම සාර්ථක ලෙස මැඩ පවත්වා ගත හැකි වන්නේය. එසේ කළ හැකිවන්නේ "බලයෙන්වත් ශක්තියෙන්වත් නොව, මාගේ ආත්මයෙන් යයි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක." (සෙකරියා 4:6).

"ස්වාමින්වහන්සේගේ ඇස් ධර්මිෂ්ඨයන් කෙරෙහිත් උන්වහන්සේගේ කන් ඔවුන්ගේ කන්නලව්ව දෙසටත් යොමා තිබේ... තවද නුඹලා යහපත් දෙය ගැන ජ්වලිතව සිටිහු නම් නුඹලාට අනතුරු කරන්නේ කවුද?" (1 පේතෘස් 3:12,13). විශාල පරිමාණයේ තෑගි භෝග ලබාදී ඊශ්‍රායෙල් ජනතාවට ශාප කිරීමට බාලාම්ව පොළඹවා ගන්නා ලදී. ඔහු ඒ ගැන ස්වාමින්වහන්සේට පුද පූජා පවත්වා ශාපයක් පැවසීමට වෑයම් කළ අවස්ථාවේදී දෙවියන්වහන්සේ එසේ නොකරන ලෙස ඔහුට අණ කළසේක. එයින් බාලාම් මෙවන් ප්‍රකාශයක් කිරීමට බලකරනු ලැබීය. "දෙවියන්වහන්සේ ශාප නොකළ අයට මම කෙලෙස ශාප කරම්ද? ස්වාමින්වහන්සේ දෙස් නොකිවූ අයට කෙලෙස දෙස් කියම්ද?.... "මාගේ මරණය ධර්මිෂ්ඨයන්ගේ මරණය මෙන් වේවා. මාගේ අන්තිමය ඔවුන්ගේ අන්තිමය මෙන් වේවා." මීට පසුව නැවත වරක් පුද පූජා ඔප්පු කර මේ අදේව භක්ති දිවැසිවරයා මෙසේද ප්‍රකාශ කළේය. "බලව, ආශිර්වාද කරන්ට අණ ලැබීමි. උන්වහන්සේ ආශිර්වාද කළසේක, මට එය වෙනස් කරන්ට නොහැක්කේය. උන්වහන්සේ යාකොබ් කෙරෙහි අයුතුකමවත් ඉශ්‍රායෙල් කෙරෙහි දූෂ්‍යකමවත් නුදුටු සේක. ඔහුගේ දෙවිවූ ස්වාමින්වහන්සේ ඔහු සමග සිටින සේක. ඔවුන් අතරේ රජෙකුගේ ජය ඝෝෂාව ඇත්තේය." "සැබවින් යාකොබ්ට විරුද්ධව ශාස්ත්‍ර කීමක්වත් ඉශ්‍රායෙල්ට විරුද්ධව පේන කීමක්වත් නැත.... දෙවියන්වහන්සේ කොපමණ දේ ඉෂ්ට කර තිබේද!" (ගණන් කථාව 23: 8, 10, 20, 21, 23). තුන්වන වරටත් පූජාසනයක් ඉදි කරනු ලැබිණි. බාලාම් නැවත වරක් ශාපයක් පැවසීමට වෑයමක් දැරීය. එහෙත් ප්‍රොපේතවරයාගේ අකැමැති දෙතොල් පාලනය කළ දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ තමන් තෝරාගත් සෙනඟගේ අභිවෘද්ධිය ප්‍රකාශයට පත්කරමින් සතුරන්ගේ අනුවණ ක්‍රියාවන් සහ ද්‍රෝහිකම් ගැන තරවටු කළසේක. "නුඹට ආශිර්වාද කරන සියල්ලෝ ආශිර්වාද කරනු ලබත්වා, නුඹට ශාප කරන සියල්ලෝ ශාප කරනු ලබත්වා" (ගණන් කථාව 24:9) යි පවසන ලදී.

මෙම වකවානුවේදී ඊශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේට පක්ෂපාතීව දිවි ගෙවූහ. ඔවුන් උන්වහන්සේගේ ආඥාවන්ට සහ ව්‍යවස්ථාවට කීකරුව සිටින තාක් කල් ඔවුන්ට විරුද්ධව නැඟී සිටීමට පොළොවේ හෝ නිරයේ හෝ කිසිම බලවේගයකට නුපුළුවන් විය. දෙවියන්වහන්සේගේ සෙනඟට ශාප කිරීමට බාලාම්ට අවසර



ලැබුණේ නැත. එහෙත් ඔහු වංචාකාරී අන්දමින් ඊශ්‍රායෙල් සෙනඟව පාපයට ඇද දැමීමට සමත් විය. එකී ජනතාව දෙවියන්වහන්සේගේ ආඥා කඩ කළ අවස්ථාවන්හිදී ඔවුහු දෙවියන්වහන්සේගෙන් වෙන් වූහ. එවිට විනාශකාරයාගේ බලය යටතට පත්වීමට ඔවුන්ව යොමු කරවනු ලැබීය.

ක්‍රිස්තුස්වහන්සේ තුළ වසන්නාවූ ඉතා දුර්වල වූ තැනැත්තා වුවද අන්ධකාරයෙහි බල සේනාවන්ට විරුද්ධව නැඟී සිටීමට සමත් බවද සාතන් එළිපිටම ඉදිරිපත් වන්නේ නම් ඔහුට එරෙහිව නැඟී සිටීමට බැතිමතා සමත් වන බවද ඔහු දනියි. එම නිසා කුරුසියෙහි හේවායන්, ඔවුන් රැඳී සිටින්නාවූ ආරක්ෂිත බලකොටුවෙන් ඉවතට ගෙන යාමට සාතන් වෑයම් කරන්නේය. එසේ පිටතට එන්නාවූ බැතිමතුන්ව තම ග්‍රහණයට ගැනීමට සාතන් සහ ඔහුගේ සේනා බලකාය සැඟවී බලා සිටින්නෝය. තමන්ගේ භූමි ප්‍රදේශයට ඇතුළු වන්නාවූ සෑම අයෙකුම විනාශ කර දැමීමට ඔහු සූදානමින් සිටී. දෙවියන්වහන්සේ කෙරෙහි නිහතමානීව රැඳී සිටීමෙන්ද, උන්වහන්සේගේ සියළුම ආඥාවන්ට කීකරු වීමෙන්ද පමණක් අපට රැකවරණය ලබාගත හැකි වේ.

කිසිම අයෙකුට දවසක් හෝ පැයක් හෝ යාච්ඤාවෙන් තොරව ආරක්ෂිත වීමට නොහැකිය. විශේෂයෙන්ම අප විසින්, උන්වහන්සේගේ වචනය නිසියාකාරව අවබෝධ කරගැනීමට අවශ්‍ය ප්‍රඥාව ඉල්ලා යාච්ඤා කළ යුතුය. පරීක්ෂකයාගේ උපක්‍රමශීලී ප්‍රයෝගයන් උන්-වහන්සේගේ වචනයෙහි ඉදිරිපත් කර තිබේ. සාර්ථක ආකාරයෙන් ජය ගැනීමේ උපදෙස්ද එහි අපගේ අවධානයට යොමු කර තිබේ. ශුද්ධ ලියවිලි පාඨ ගෙනහැර පෑමට සාතන් සමත්ය. මේ පිළිබඳව ඔහු විශේෂඥයෙකි. එහෙත් එම උපුටා ගැනීම්වලට ස්වකීය අර්ථ කථනයක් සපයමින් ඔහු ශුද්ධ ලියවිලි පාඨ නිදහසේ ඉදිරිපත් කරයි. එමගින් අපව වැටීමට සැලැස්වීම ඔහුගේ පරමාර්ථයයි. නිහතමානී හදවතකින් යුතුව අප ශුද්ධ බයිබලය හැදෑරීම නිර්දේශිත වේ. එහිදී දෙවියන්වහන්සේ කෙරෙහි රැඳී සිටීමට අප අමතක නොකළ යුතුය. සාතන්ගේ උපක්‍රමශීලී මායාවන් පිළිබඳව අප නිතරම අවධියෙන් සිටීම වැදගත්ය. "අපව පරීක්ෂාවට නොපමුණුවන්න"යි අප ඇදහිල්ලෙන් යුතුව නිරතුරුවම යාච්ඤා කළ යුතු වෙමු.

# 33

# ප්‍රථම මහා මුළාව

මානව ඉතිහාසයේ ආරම්භයේ පටන් මිනිසාව මුළා කිරීමට සාතන් තම උපක්‍රමශීලී වැඩසටහන දියත් කළේය. ස්වර්ගයෙහිදී තම කැරැල්ල ක්‍රියාවට නැංවූ හෙතෙම දෙවියන්වහන්සේගේ රාජ්‍ය පාලනයට එරෙහිව තමා සමග එකතු වීමට පොළෝ වාසී ජනතාව එක් කරගැනීමට තීරණය කර ගත්තේය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු කමින් යුතුව දිවි ගෙවමින් ආදම් සහ ඒව ඉතා ප්‍රීතියෙන් යුතුව වාසය කළෝය. සාතන් සගයේදී කළ චෝදනාවට මෙම දිවි පැවැත්ම තර්ජනයක් විය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පීඩාකාරී බවටත් එය උන්වහන්සේගේ මැවිල්ලේ ප්‍රාණීන්ගේ යහපතට විරුද්ධව නැඟී සිටින බවටත් සාතන් සගයෙහිදී චෝදනා එල්ල කළේය. තවද, පවින් තොරවූ යුවළ උදෙසා සූදානම් කරන ලද අලංකාර නිවෙස දකීමෙන් සාතන්ගේ ද්වේෂය අධික විය. ඔවුන්ගේ වැටීම සිදුකරන්නට ඔහු අධිෂ්ඨාන කර ගත්තේය. ඔවුන් පාපයට යොමු කරගැනීමෙන් පසුව ඔවුන්ව තමාගේ ග්‍රහණය යටතට ගැනීමෙන් පොළොවේ අයිතිය සතු කරගන්නට ඔහු අදහස් කළේය. එසේ කර සගයේ වැඩ වසන්නාවූ අති උතුම් තැනැන්වහන්සේගේ රාජ්‍යයට එරෙහිව මෙලොව භූමියෙහි තමාගේ රාජධානියක් පිහිටුවා ගැනීම ඔහුගේ චින්තනය විය.

මිනිස් වර්ගයාගේ මේ භයානක සතුරා පිළිබඳව ආදම් සහ ඒව දැනුවත් කර තිබිණ. සාතන් තමාගේ යථා ස්වභාවයෙන් මිනිස් යුවළ ඉදිරියෙහි පෙනී සිටියේ නම්, ඔහුව එම මොහොතේදීම පළවා හරිනු ලබනවා ඇත. නමුත් තමාගේ නියම අරමුණ වසන් කරගනිමින් ඔහු සැබවී ක්‍රියාත්මක වූයේ තම අපේක්ෂාව සාර්ථක ලෙස ඉටු කරගැනීමටය. ඉතාමත් මනහර පෙනුමක් තිබුණාවූ සර්පයෙකු තම මාධ්‍යය ලෙස යොදා ගත් සාතන් ඒවව කථාවට පොළඹවා ගත්තේය. "ඇත්තටම උයනේ කොයි ගසකින්වත් කන්ට එපාය කියා දෙවියන්වහන්සේ කීවාද"යි ඔහු ඒවගෙන් ඇසුවේය. පරීක්ෂකයාගේ ප්‍රශ්නයට උත්තර සැපයීමෙන් ඒව වැළකී සිටියා නම්, ඇය සුරක්ෂිතව සිටිනවා නොඅනුමානය. එහෙත් ඇය ඔහු සමග කථාබහට යොමුවීමෙන් ඔහුගේ උගුලට අසු වූවාය. අද පවා බොහෝ අය සාතන්ගේ ගොදුරක් බවට පත්වන්නේ මෙයාකාරයෙන්මය. දෙවියන්-වහන්සේගේ ඉල්ලීම් පිළිබඳව සැක පහළ කරමින් මෙම අය වාද විවාද කරති. දෙවියන්වහන්සේගේ දිව්‍ය ආඥාවන්ට කීකරුවීම පසෙක ලා ඔවුහු මිනිස් කාල්පනික මත පිළිගනිති. එම මතයන් වනාහි සාතන්ගේ රැවටිලිකාර මතවාදයන් ඇතුළත් ඉගැන්වීම්ය.



මිනිසා පාපයට වැටීම පිළිබඳව වූ සංසිද්ධිය හා බැඳි ඒවගේ කථාබහ මෙසේ ඉදිරියටම කෙරී ගෙන ගියේය. ස්ත්‍රියද සර්පයාට මෙසේ පැවැසුවාය. "උයනේ ගස්වල ගෙඩි කන්ට අපට පුළුවන; එහෙත් දෙවියන්වහන්සේ - නුඹලා නොනසින පිණිස උයන මැද තිබෙන ගහේ ගෙඩි කන්ටවත් ඊට අත ගසන්ටවත් එපා යයි කීසේකැයි සර්පයාට කීවාය. සර්පයාද: නුඹලා ඇත්තටම නසින්නේ නැත. මක්නිසාද නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහපත හා නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නා සේකැයි ස්ත්‍රීට කීය." (උත්පත්ති 3:2-5). ඔවුන් දෙවියන්වහන්සේට සමාන වන බව සාතන් ඇයට පැවසුවේය. ඔවුන්ට මෙතෙක් තිබූ ප්‍රඥාවට වඩා අධික බුද්ධියක් ලැබෙන බවත් එය කරණකොටගෙන ඔවුන්ට වඩා ඉහළ තලයක පැවැත්මක් ලබාගත හැකි බව සාතන් ඇයට පැවසුවේය. ඒව පරීක්ෂාවට ගොදුරු වූවාය. ඇගේ බලපෑම යටතේ ආදම්වද පාපයට පොළඹවනු ලැබීය. දෙවියන්වහන්සේ පැවැසූ වදන් ඇත්ත වශයෙන්ම, එම ආකාරයෙන්ම උන්වහන්සේ අදහස් නොකළ බව කල්පනා කළ ආදී මව් පිය යුවළ සර්පයාගේ වචන විශ්වාස කළහ. තමන්ගේ නිදහසට සීමා පනවා ඇතැයි සිතූ ඔවුහු තමන්ගේ මැවුම්කාරයාණන්ව අවිශ්වාස කළෝය. උන්වහන්සේගේ අණඥාව කඩ කිරීමෙන් තමන්ට අධි ප්‍රඥාවක් ලබාගත හැකි යයිද උසස් පැවැත්මකට පත්විය හැකි යයිද ඔවුහු කල්පනා කළෝය.

"එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහිය" යන පැවැසුමෙහි නියම අර්ථය පව් කිරීමෙන් පසුව ආදම්ට වැටහී ගියේ කිනම් ආකාරයකටද? ආදම් ඇත්ත වශයෙන්ම සාතන් පැවැසූ ආකාරයේ ඉහළ තලයක පැවැත්මක භාග්‍යය ලැබුවේද? එසේනම් අණ පනත් කඩකිරීමෙන් වඩාත් යහපතක් සිදුවන්නේය; මිනිස් වර්ගයාගේ හිතකාමියෙක් ලෙස සාතන්ව හඳුන්වා දීමට එවිට අවකාශයක් උදා වන්නේය. එහෙත් දිව්‍ය ප්‍රකාශයෙහි අර්ථය මෙය නොවන බව ආදම්ට වැටහී ගියේය. පාපයට දඬුවමක් ලෙස, දූවිල්ලෙන් තනනු ලැබූ ඔහු නැවතත් දූවිල්ලට එකතු වන බව දෙවියන්වහන්සේ අවධාරණය කළසේක. "මක්නිසාද නුඹ දූවිලිය; දූවිල්ලට හැරී යන්නෙහිය,"යි උන්වහන්සේ පැවසූ සේක (උත්පත්ති 3:19). 'නුඹලාගේ ඇස් ඇරෙන්නේය'යි සාතන් පැවැසූ වදන් සත්‍යය වූයේ මේ කාරණය අනුව පමණය, එනම් ආදම් සහ ඒව දෙවියන්වහන්සේට අකීකරු වීමෙන් පසුව තමන්ගේ මෝඩකම පිළිබඳව දකගැනීමට ඔවුන්ගේ ඇස් විවෘත වූ බව සැබෑවකි. ඔවුන්ට නපුර ගැන අවබෝධයක් ඇති විය. අණපනත් කඩකිරීමේ කටුක තික්ත අත්දැකීමක් විඳීමට ඔවුන්ට සිදුවිය.

ඒදන් උයන මධ්‍යයේ ජීවනයේ ගස පිහිටියේය. එහි ඵල අනුභවය මගින් ජීවිතය දිගටම පවත්වා ගෙන යෑමේ බලය ලබාගත හැකි විය. ආදම් දෙවියන්වහන්සේට කීකරුව සිටියේ නම් එම ගසෙහි ඵල නිදහසේ භුක්ති විඳීමේ වාසනාව ඔහුට තවදුරටත් හිමිවන්නේය. එසේවී නම් ඔහු සදහටම ජීවත් වීමට භාග්‍යය උදා කරගන්නේය. එහෙත් ඔහු පව් කළ විගසින් ජීවනයේ ගස ළඟට යෑම ඔහුගෙන් වළක්වනු ලැබීය. තවද ඔහුට මරණය තීන්දු විය. "නුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහිය"යි වූ දිව්‍ය ප්‍රකාශය ජීවිතය පූර්ණ ලෙස විනාශයට පත්වන බවට වූ තීන්දුවක් විය.

අමරණීය ජීවිතය මිනිසාට දෙන ලද්දේ කීකරුව සිටීමේ කොන්දේසිය මතය. එහෙත් දේව අණ කඩකිරීම නිසා එම භාග්‍යය මිනිසාට අහිමි විය. ඔහු එම වාසනාව නැති කරගත්තේය. තමාට හිමිව නොතිබූ දයක් ඉදිරි පරම්පරාවන්ට ජන්ම කරදීමට ආදම්ට නොහැකි විය. පාපයට ගොදුරු වීම නිසා ඔවුන්ට කිසිම අනාගත බලාපොරොත්තුවක් නොවීය. එහෙත් දෙවි පියාණන්වහන්සේ තමන්ගේම පුත්‍රයාණන් පූජාවක් ලෙස දානය කිරීමෙන් මිනිසාව අමරණය වෙත ළඟා කළසේක. "සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය" (රෝම 5:12) ඒ අතර ක්‍රිස්තුස්වහන්සේ මරණය බිඳ දමා ජීවනයත්, අමරණීයත්වයත් ප්‍රකාශයට පත් කළේ ශුභාරංචිය තුළිනි. (2 තිමෝති 1:10) අමරණීයත්වය ලබාගත හැකිවන්නේ ක්‍රිස්තුස්වහන්සේ මගින් පමණකි. යේසුස්වහන්සේ මෙසේ පැවැසූ සේක. "පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත. නුමුත් පුත්‍රයාණන්ට කීකරු නොවෙන්නා ජීවනය නොදක්නේය." (යොහන් 3: 36). කොන්දේසිවලට කීකරු වන්නේ නම් සෑම අයෙකුටම මෙම සම්පතෙහි හිමිකාරයෙක් වීමට භාග්‍යය ඇත. "උන්වහන්සේ .... ඉවසීම ඇතුව යහපත්කම් කිරීමෙන් මහිමයද ගෞරවයද අමරණභාවයද සොයන්නට සාදාකල ජීවනය දෙනසේක." (රෝම 2:6,7).

අකීකරුවීම තුළ ජීවනය ඇතැයි ආදම්ට පැවැසූ එකම තැනැත්තා ඒ මහත් රැවටිලිකාරයාය. "නුඹලා ඇත්තටම නසින්නේ නැත"යි කියා සර්පයා ඒවට පැවැසීය. එය අමරණීයත්වය ගැන පවසන ලද පළමුවෙනි දේශනාව විය. සාතන්ගේ අධිකාරී බලය යටතේ කළ මෙම ප්‍රකාශය අද දේශනා කුඩු විශාල ප්‍රමාණයක් මගින් රැව් පිළි-රැව් දෙමින් ජනතාව මුළා කරන්නේය. මුල් මාපිය යුවළ ඔහුගේ ප්‍රකාශය පිළිගත්තාක් මෙන්ම අද බොහෝ කිතුණු බැතිමතුන් පවා එම ඉගෙනුම මුළු සිතින් පිළිගනිති. ලෝක ජනගහණයේ බහුතරයක්, එසේය, විශාල ප්‍රතිශතයක් මෙම ඉගැන්වීම සත්‍යයක් ලෙස විශ්වාස කරති. "පව්කරන ආත්මය නසින්නේය" යන දිව්‍ය ප්‍රකාශයට අද අරුත් සපයා ඇත්තේ පව්කරන ආත්මය නසින්නේ නැත, එය සදහටම



ජීවත් වන්නේය යනුවෙන්ය. දෙවියන්වහන්සේගේ වචන නොතකා හරිමින් එම වදන් කෙරෙහි විශ්වාසය රඳවන්නේ නැතිව මිනිසුන් සාතන්ගේ ප්‍රකාශය එපමණ සතුටින් පිළිගැනීම අපගේ විමතියට පවා හේතු වන්නේය.

පාපයට ගොදුරු වීමෙන් පසුව මනුෂ්‍යයාට ජීවනයේ ගස ළඟට යෑමට නිදහස් මාර්ගයක් විවෘතව තිබුණේ නම් ඔහු එහි ගෙඩි අනුභව කරමින් සදහටම ජීවත් වීමේ වරම උදා කරගන්නවා ඇත. මෙයාකාරයෙන් පාපය අමරණ භාවයට පැමිණෙනවා ඇත. එහෙත් එම ගස වෙතට වූ මාර්ගය වසා දමමින්, ආදම් සහ ඒව ඒදන් උයනෙන් ඉවත්කර උයනට යන මාර්ගය රැකවල් කරන පිණිස කෙරුබ්වරුන්ද සෑම අතටම කරකැවෙන්නාවූ ගිනිමය වූ කඩුවක්ද දෙවි සමිඳාණෝ පිහිටෙවූ සේක. මාර්ග බාධකය පසු කරමින් ආදම්ගේ පවුලෙහි කිසිවෙකුට හෝ ජීවනය දෙන්නාවූ එම ගසෙහි ගෙඩි කෑමට යාමෙහි වරම් ලැබුණේ නැත. එම නිසා මෙලොව කිසිම අමරණීය පව්කරුවෙක් නැත්තේය.

මිනිසා පාපයට වැටුණාට පසුව ඔහුට ස්වභාවයෙන්ම අමරණ භාවය පිහිටා ඇත යන අදහස මිනිසා තුළට කාවැද්දීමට විශේෂ වෑයමක් දරන්නැයි සාතන් ස්වකීය දූතයන්ට ඔවා බස් දී තිබේ. මිනිසාගේ මනස තුළට මෙම සාවද්‍ය මතය ඇතුළු කිරීමෙන් පසුව, පව්කාරයා සදහටම කාලකණ්ණි දිවි පැවැත්මකට භාජන වේයයි යන සංකල්පය මිනිසා තුළ තැන්පත් කිරීමට ඔහුගේ දූතයන්ට අණ ලැබුණේය. අන්ධකාරයෙහි කුමාරයා තම දූතයන් මගින් ක්‍රියා කරමින් දෙවියන්වහන්සේ පළිගන්නාවූ සැහැසි පීඩිතයෙක් යයි පෙන්වා දීමට උත්සාහ කරයි. උන්වහන්සේව සතුටට පත්කරන්නේ නැති සැවොම සදාතන නිරයට යවන බව සාතන් මිනිසාට පවසයි. පව්කාරයා සදාතනය පුරා දෙවියන්වහන්සේගේ උදහසට, කෝපයට පාත්‍ර වන්නේය; ඔහු කිව නොහැකි තරම් වේදනාවෙන් මඩිනු ලබන්නේය, සංතාපයට පත්වන්නේය; ඔහු සදාතන ගිනි විලෙහි දැවෙමින් වේදනා විඳින්නේය; දෙවියන්වහන්සේ සතුටු සිතින් මේ සියල්ල බලාසිටින සේක යන අදහස් සාතනික දූතයෝ මිනිසුන්ගේ සිත්වලට ඇතුල් කරති.

මිනිසාගේ මැවුම්කාරයාණන් වන පරිත්‍යාගශීලීත්වයෙන් යුක්ත තැනැත්වහන්සේගේ චරිත ගුණාංග ලෙස සාතන් ලොවට කියා පාන්නේ තමන්ගේම චරිතාංගයන්ය. කුරිරු චරිතය සාතනිකය. දෙවියන්වහන්සේ ප්‍රේමය වනසේක. උන්වහන්සේ මැවූ සියල්ල පිරිසිදුය, ශුද්ධය, මනහරය. මහා ත්‍රස්තවාදියා විසින් පාපය ලොවට ඇතුළු කරන තෙක් සියල්ල රමණීය විය. මිනිසාව පව්කිරීමට පොළඹවන සතුරා සාතන්ය. හැකිනම් තම ගොදුරු විනාශ කරදැමීමට ඔහු මහත් පරිශ්‍රමයක යෙදෙන්නේය. තමාගේ ගොදුර සම්පූර්ණයෙන්ම තමා සතුවූ පසු

තමා සිදු කළ විනාශය ගැන හෙතෙම ප්‍රීතියට පත්වන්නේය. අවසර ලැබෙන්නේ නම් ඔහු මුළු මිනිස් වර්ගයාම තමාගේ දළට හසු කරගන්නවා ඇත. මෙම ක්‍රියාවලියෙහිදී දිව්‍ය බල මහිමය ක්‍රියාත්මක වී මැදිහත් නොවී නම් ආදම්ගේ එකම පුතණුවක් හෝ දෝණියක් සාතන්ගෙන් ගැළවෙන්නේ නැත.

අපගේ මුල් දෙමාපියන් පාපයට ඇද දමා ජයගත් ආකාරයෙන්ම සාතන් අද ද මිනිසුන්ගෙන් ජය ගැනීමට මාන බලමින් සිටී. සාතන්ගේ සැලසුම් සහගත ක්‍රමවේදය එදා මෙන්ම අදත් ක්‍රියාත්මක වන්නේ එකම ආකාරයකටය. මුලින්ම ඔහු මැවුම්කාරයාණන් තුළ ඇත්තාවූ මිනිසාගේ විශ්වාසය අනුමාන කිරීමකට යොමු කරයි, එය සෙලවීමකට භාජන කරයි. ඉක්බිතිව දෙවියන්වහන්සේගේ රාජ්‍ය පාලනයෙහි බුද්ධිමත් ස්වභාවයත් උන්වහන්සේගේ ව්‍යවස්ථාවේ යුක්තිය සහ සාධාරණත්වයත් ප්‍රශ්න කිරිමට සාතන් මිනිසාව යොමු කරයි. තමන්ට සහ තම දූතයන්ට වඩා දෙවියන්වහන්සේ ඉතා අයහපත් යයි, නරක යයි සිතීමට සාතන් මිනිසුන්ව පොළඹවයි. තමන් තුළ ඇත්තාවූ වෛරය සහ තමාගේ කැරැළි ගැසීම සාධාරණය කිරීමට ඔහු මෙසේ ක්‍රියා කරයි. තමාගේ කුරිරුවූද, දරුණුවූද චරිත ගුණාංග ස්වර්ගීය පියාණන්වහන්සේට පැවරීමට ඔහු මහත් වෑයමක් දරයි. එවන් අදමිටු ආණ්ඩුකාරයෙකුට යටත් වීමට තමා අකැමැති වූ නිසා තමාව සගයෙන් නෙරපා හැරීම මගින් තමාට මහත් අසාධාරණයන් සිදුව ඇතැයි කියමින් සාතන් තමාව ශුද්ධවන්තයෙකු ලෙස හඳුන්වා දීමට සෑම අවස්ථාවකදීම කටයුතු කරයි. තමාගේ පරිපාලනය යටතේ ලෝවාසී ජනතාවට නිදහස් ජීවිත රටාවක් ඇති කර ගත හැකි බව ඔහු අවධාරණය කරයි. එහෙත් දෙවියන්වහන්සේ පනවා ඇති දරදඬු නීති නිසා මිනිසා වහල් භාවයට පත්ව ඇතැයි ඔහු තර්ක කරයි. මෙසේ කිරීමෙන් දෙවියන්වහන්සේට පක්ෂපාති වූ ආත්ම එම තත්ත්වයෙන් ඉවතට හැරවීමට ඔහු සමත් වෙයි.

සදාතනය පුරා ගිනිගෙන දැවෙන්නාවූ නොනිවෙන නරකාදියක දුෂ්ටයෝ ගින්නෙන් සහ ගෙන්දගමින් දුක්විඳිතියි කියා ඉගැන්වීමක් කිතුණු සභාවන් අතර පවතී. මෙම දහම ප්‍රේමයේ හා කරුණාවේ සෑම චිත්තාවේගයකටම මෙන්ම යුක්ති සහගත ධර්මිෂ්ඨකම පිළිබඳව පවතින අපගේ සිතුවිලි වලට පවා පිළිකුලකි. මෙම ලොවෙහි ජීවත් වෙමින් ගතකළ ඉතා කෙටි කාලීන ජීවිතයක් තුළ සිදුකළ පාප සඳහා වන්දි ගෙවීමක් වශයෙන් මිනිසා ජීවත්වන තාක් කල් ගින්නෙන් දැවෙමින් සිටින්නට වේය යන සිතුවිල්ල පවා සිතට මහත් අප්‍රසන්නතාවක් උදාකරනවා ඇත. එහෙත් මෙම දහම කිතුණු ලොවෙහි ඉතා පුළුල්ව උගන්වනවා පමණක් නොව බොහෝ නිකායන්හි ඇදහිලි ප්‍රකාශනයන්වලටද ඇතුළත්ව තිබේ. දේව ධර්මාචාර්යවරයෙක් මෙසේ පවසා ඇත. "නරකාදියෙහි වූ ගිනි විලෙහි පව්කාරයන් දුක් විඳිනු



දැකීමෙන් ශුද්ධවන්තයන්ගේ ප්‍රීති ප්‍රමෝදය සදාතනික උත්කෘෂ්ටතාවකට පත්වන්නේය. තමන් මෙන්ම වූ පරිසරයක ඉපිද තමා හා සමාන ස්වභාවයකින් යුතුව දිවි ගෙවූ සමහර අය එවන් කාලකණ්ණි භාවයකට පත්ව නිරයෙහි දුක් විඳීම අත්පත් කරගැනීම දකින්නාවූ ශුද්ධවන්තයෝ තමන්ගේ භාග්‍යය ගැන, තමන්ට අත්ව තිබෙන්නාවූ ප්‍රීතිය ගැන සංවේද්‍යය වනවා ඇත, සියුම් හැඟීමෙන් යුතු වනවා ඇත." තවත් අයෙක් මෙසේ පවසා තිබේ. "උදහසෙහි භාජන මත ශාපයෙහි දඬුවම සදාතනය පුරා ක්‍රියාත්මක වන අතර, ඔවුන්ගේ වධ වේදනා දුමාරය මෛත්‍රී-කරුණාවෙහි භාජන ඉදිරියෙහි ඉහළට නගින්නාවූ අතර ශුද්ධවන්තයන්ගේ මුවින් මෙවන් පැසසුමක් අවට සිසාරා විහිද යන්නේය; ආමෙන්, හලේලූයා! ස්වාමීන්ද්‍රයාණන්වහන්සේට ප්‍රශංසා වේවා."

දෙවියන්වහන්සේගේ වචනයෙහි කිනම් පිටුවල එවන් ඉගැන්වීම් අන්තර්ගතද? ගැළවීම ලැබූ බැතිමත්හු සගයේ දිවි ගෙවන විට අනුකම්පාවේ සහ දයාවේ සෑම චිත්තාවේගයක්ම ඔවුන්ගෙන් නැති වී යන්නේද? මිනිස් භාවයට පොදු වූ හැඟීම් සියල්ල ඔවුන්ගෙන් ඉවත් කරනු ලබන්නේද? මෙවන් හැඟීම් සහ චිත්තාවේග ඉන්ද්‍රියයන් දමනය කිරිම් මගින් උදාසීන කරනු ලැබේද? එසේත් නැතිනම් ඒවා ම්ලේච්ඡයන්ගේ කුරිරුකම් වලට හුවමාරු කරනු ලබන්නේද? එවන් ඉගැන්වීමක් දෙවියන්වහන්සේගේ දහම් පුස්තකයෙහි සඳහන් වී නැත. ඉහත සඳහන් ඡේදයෙහි ඇතුළත් උපුටා ගැනීම් තුළ අන්තර්ගත අදහස් ප්‍රකාශ කළ හවතුන් උසස් උගතුන් විය හැකිය. ඔවුන් අවංක පුද්ගලයන්ද විය හැක. එහෙත් ඔවුන් සාතන්ගේ කුතර්ක මගින් නොමඟ යවනු ලැබ ඇති බව පෙනී යයි. ශුද්ධ ලියවිලිවල අඩංගු ප්‍රබල ප්‍රකාශනයන්ට ව්‍යාජ අර්ථකථන දීමට මනුෂ්‍යයන් නොමඟ යවන්නාවූ සාතන් එම ප්‍රකාශන තමන් තුළ ඇත්තාවූ ද්වේෂය සහ තික්තකම සමග මිශ්‍ර කර ඉදිරිපත් කරයි. එවන් කුතර්ක තුළ අඩංගු අදහස් සහ තීරණ මැවුම්කාරයාණන්ට කිසිසේත්ම අදාළ වන්නේ නැත. දෙවියන්වහන්සේගේ චින්තනය මෙසේය: "මා ජීවමාන බව සැබෑවා සේම දුෂ්ටයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත් වෙනවාට මිස, දුෂ්ටයා නසිනවාට මම ප්‍රසන්න නොවෙමියි ස්වාමි වූ දෙවියන්වහන්සේ කියන සේක. ඉශ්‍රායෙල් වංශය හැරෙන්න, නුඹලාගේ නපුරු මාර්ගවලින් හැරෙන්න; නුඹලා නසින්නේ මක්නිසාදැයි ඔවුන්ට කියන්න." (එසකියෙල් 33:11).

අවසානයක් නැති වේදනාවෙහි ඇලී ගැලී දුෂ්ටයා පීඩාවට පත්වෙමින් සිටිනවා යයි දැකීමෙන් දෙවියන්වහන්සේට කිනම් ලාභ ප්‍රයෝජනයක් අත්වේද? ගිනි දැල් අතරෙහි වේදනාවෙන් ඇඹරෙමින් සිටින්නාවූ, උන්වහන්සේ විසින් මවන ලද්දාවූ පුත්‍රයන්ගේ කෙඳිරිගෑම්, යටි උගුරෙන් කෑගැසීම් සහ ශාප කිරීම් ඇසීමෙන් දෙවියන්වහන්සේගේ

ඉන්ද්‍රියයන් පිනායනවා යයි අපට සිතිය හැකිද? මෙම අදෝනාවන්ගේ හඬ අසීමිත ප්‍රේමයේ තැනැන්වහන්සේගේ සවනට ප්‍රසන්න ගී රාවයක් වීමට හැකිවේද? දුෂ්ටයන්ව නිමක් නැතිව මෙවන් කාලකණ්ණි වධ හිංසාවන්ට පාත්‍ර කිරීමෙන් පෙන්නුම් කරන්නේ පාපයට වූ දෙවියන්වහන්සේගේ ද්වේෂයයි කියාද, ඔවුන්ගේ කැරළි ගැසීම විශ්වයේ සාමයට බාධාවක් වූ බවද, එහි පැවැත්ම විනාශකාරී වූ බවද, එම නිසා දෙවියන්වහන්සේ ඔවුන්ව නරකාදියේ ගිනි ජාලාවට නියම කර ඇති බවද, මේ විනාශකාරී ඉගැන්වීමෙහි ඇතුළත්ය. අහෝ විනාශකාරී දේව අපහාසයක තරම! පාපය තවමත් පැවැතෙමින් තිබෙන්නේ දෙවියන්වහන්සේ එයට ද්වේෂ කරන නිසාමද? දේව ධර්මවාදීන්ගේ ඉගැන්වීම් අනුව, කරුණා දයාවේ හා අනුකම්පාවේ බිඳක් හෝ විරහිතව පව්කාරයන්ට විඳින්නට සිදුවන වධහිංසා නිසා ඔවුහු වියරු වැටී දෙවියන්වහන්සේට ශාප කිරීමෙන් සහ අපහාස කිරීමෙන් ඔවුන්ගේ කෝපය පිට කරන බවද මෙසේ කිරීමෙන් ඔවුන්ගේ අපරාධයට තවත් අපරාධ එකතු වන බවද දක්වනු ලැබේ. නිමක් නැති කාලයක් පුරා අපරාධ සහ ශාපය දිගටම පැවැතීමෙන් දෙවියන්වහන්සේගේ මහිමය තව තවත් වැඩි වන්නේ නැත.

නිමක් නැති කාලයක් පුරා නිරයෙහි දුක්විඳීම තේමා කරගත් ඉගැන්වීම මගින් සිදුවී ඇති විනාශය සහ නපුර කෙතරම් විශාල දැයි තේරුම් ගැනීමට මිනිස් මනස අපොහොසත්ය. බයිබලීය ධර්මය ප්‍රේමයෙන් සහ යහපත් කමින් අනූනය. එහි අඩංගු ප්‍රේමය හා කරුණාවද අනුකම්පාවද මිථ්‍යාදෘෂ්ටික ඉගැන්වීම් වලින් කළු පැහැගැන්වී බිය ඇතිකරන වස්ත්‍රයකින් සරසනු ලැබ තිබේ. දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග සාතන් විසින් ව්‍යාජ පාටැති සායම් මගින් පින්තූරයට නහා ඇත. එම නිසාම අපගේ කරුණාවෙන් පූර්ණ වන මැවුම්කරුවාණන්ට මහත් භීතියකින් යුතුව සැලකීමට, උන්වහන්සේට ද්වේෂ කිරීමට සහ වෛර කිරීමට මනුෂ්‍යයන් යොමුවීම පුදුමයක් නොවේ. දේශනා කූඩුවේ සිට ඉදිරිපත් කර ඇති දෙවියන්වහන්සේගේ රූපය ඉතා භයංකාරය, අශෝභනය. මෙවන් ඉගැන්වීම් අසන්නාවූ ලක්ෂ සංඛ්‍යාත ශ්‍රාවකයෝ අන්තිමේදී දේව භක්තියෙන් ඉවතට හැරී දේව විරෝධී පුද්ගලයන් බවට පත්වෙති!

සෑම ජාතීන් හටම තමාගේ වේශ්‍යාකම නැමැති මුද්‍රික පානය බීමට පෙළඹෙවුවාවූ බබිලෝනියේ පිළිකුල් සහගත මුද්‍රික පානයෙහි එක් ව්‍යාජ ඉගැන්වීමක් වන්නේ සදාතන වධ වේදනාවට ලක්වීමේ මතවේදයයි. (එළිදරව් 14:8; 17:2). ක්‍රිස්තුස්වහන්සේගේ දේව දාසයන් මෙම ව්‍යාජ ඉගැන්වීම පිළිගෙන එම මතවේදයන් ශුද්ධ දේශනා කූඩුවලින් ප්‍රකාශ කිරීම ඇත්තටම අභිරහසකි. ව්‍යාජ සබතක් ලබාගත් ආකාරයෙන්ම මෙම ඉගැන්වීමද ඔවුන් ලබාගෙන තිබෙන්නේ



රෝමයෙන්ය. එම දහම ප්‍රබල සහ ජනප්‍රිය වූ යහපත් පුද්ගලයන් විසින් උගන්වනු ලබන බව සැබැවකි. මෙම දහම පිළිබඳව අපට ලැබී ඇති ආලෝකය ඔවුන්ට තවමත් ලැබී නැත. ඔව්හු තමන්ගේ සේවා කාලයේදී ලැබුවාවූ ආලෝකය පිළිබඳව වගකිව යුතු වූහ. අපගේ දවස්වලදී බැබළෙන්නාවූ ආලෝකය ගැන වගකීම අප සතුය. දේව වචනයෙහි සාක්ෂි වෙතින් ඉවතට හැරී, අප අපගේ පියවරුන් ඉගැන්වූ ව්‍යාජ දහම් පිළිගන්නෙමු නම් බබිලෝනියට විරුද්ධව ප්‍රකාශ කර ඇති ශාපයන්ට අපිද පංගුකාරයන් වෙමු. ඇයගේ වේශ්‍යාකමෙහි මිදි යුෂ අපද පානය කරන්නන් වෙමු.

සදාතන වධ වේදනාවට ලක් කරනු ලැබීමේ දහම් පිළිබඳව පිළිකුල් සහගත ලෙසද බලවත් අමනාපයකින් යුතුවද දර්ශනය කරන්නාවූ පුද්ගලයන් ඊට විරුද්ධ වන වෙනත් දහමක් වෙත යොමු කරනු ලැබේ. දෙවියන්වහන්සේ වනාහි දයානුකම්පාවෙන් පූර්ණ වූ ආදරයෙන් අනූන තැනැන්වහන්සේ යයි ශුද්ධ ලියවිලි මගින් හඳුන්වා දෙනු ලබන බව මෙම අය දකිති. එම නිසා උන්වහන්සේ විසින් මවනු ලැබූ කිසිම පුද්ගලයෙකු හෝ, සදාතනය පුරා ගිනිගෙන දැවෙන්නාවූ ගිනි විලට තීන්දු කරන්නේ නැතැයි මොවුහු විශ්වාස කරති. අමරණීය ආත්මයක් (ප්‍රාණයක්) ස්වභාවයෙන්ම මිනිසා සතුව ඇතැයිද එම නිසා අන්තිමේදී සෑම අයෙක්ම ගැළවීම ලබන්නේ යයි විශ්වාස කිරීම හැර වෙනත් තීරණයක් ගැනීමට නුපුළුවනැයිද ඔවුහු කල්පනා කරති. ශුද්ධ බයිබලයෙහි අඩංගු තර්ජනය කිරීම මිනිසාට කීකරුකමට බලකිරීමක් සඳහා දී ඇති බිය ගැන්වීම් මිස වචනාර්ථයෙන්ම ඉටු වන්නක් නොවේ යයි බොහෝ අය කල්පනා කරති. මෙම මතවේදය අනුව පව්කාරයාට ආත්මාර්ථකාමී ලෙස ජීවත් වීමට පුළුවන; ඔහු දෙවියන්වහන්සේගේ ඉල්ලීම් වලට අවනත වීම අවශ්‍ය නොවේ. කුමන ආකාර දිවි පැවැත්මක් ගත කළද අන්තිමේදී ඔහු දේව වරප්‍රසාදයට භාජනය වනවා ඇත යන දහම මගින් සිදුවන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා කරුණාව සැහැල්ලුවට ලක් කිරීමකි. එමගින් උන්වහන්සේගේ සාධාරණීයත්වය ගැන නොසලකා දුෂ්ටයාට තමාගේ තෘෂ්ණාධික ආශාවන් පිනවා ගනිමින් තමන්ගේ පාපිෂ්ඨ ක්‍රියාදාමයන්හි එඩිතර ලෙස යෙදීම පහසු වෙයි.

විශ්වීය ගැළවීම කේන්ද්‍ර කරගත් දහම උගන්වන්නාවූ අය තමන්ගේ ආත්ම - විනාශකර ඉගැන්වීම සාධාරණීයකරණය කිරීම පිණිස ශුද්ධ ලියවිලි පාඨ වලින් බැහැරව වෙනත් උපුටා දක්වීම් ඉදිරිපත් කර ඇත. එම ගුරුවරුන්ගේ ප්‍රකාශන කිහිපයක් ඉදිරිපත් කිරීම උචිත වේ. කිසිම ආගමික භක්තියක් නොතිබූ තරුණයෙකුගේ අවමංගල්‍යයකදී විශ්වීය ගැළවීම උගන්වන්නාවූ දේවගැතිවරයෙක්

දාවිත් පිළිබඳව පවසමින් "අම්නොන්ගේ මරණයෙන් පසු දාවිත් රජ සැනසී" සිටියේය, යන ශුද්ධ ලියවිලි පාඨය තෝරා ගෙන දෙසුමක් කළේය. (2 සාමුවෙල් 13:39). මෙම තරුණයා හදිසි අනතුරකට භාජන වී මිය ගොස් තිබුණි. දේශකයා මෙසේ රුස්වූවන් ඇමතීය:

"සමහර විටෙක මරණය නිසා මේ පව්කාර ලෝකය හැර දමා යෑමට සිදුවන්නාවූ අයගේ ඉරණම කුමක් දැයි බොහෝ දෙනෙක් මාගෙන් ප්‍රශ්න කරනවා. සමහර විට එවන් පුද්ගලයෙක් බේබද්දෙකු ලෙසින් මරණයට පත්වූවා විය හැකිය. තමන්ගේ සළු වලින් අපරාධවල රතුපාට පැල්ලම් සෝදා ගන්නේ නැතිව එවන් අයෙක් මරණයට පත්වූවා විය හැකිය. එසේත් නැතිනම් මේ තරුණයා ලෙස හදිසියේ මියැදෙන්නට සිදුවූවා විය හැකිය. ඔහු කිසිම දිනක ආගමක් අදහන බවක් නොපැවසුවා විය හැකිය; ආගමික අත්දැකීමක් ඔහුට තිබුණේ නැතුවාද විය හැකිය. මේ ගැටළුවට පිළිතුරු ශුද්ධ ලියවිල්ලෙහි තිබෙනවා. එයින් අප සෑහීමට පත්වෙනවා. අම්නොන් ඉතා දරුණු පව්කාරයෙක් විය. ඔහු කිසිදිනක පසුතැවිලි වුණේ නැහැ. ඔහුට මත්පැන් බොන්නට දී වෙරිවූ තත්ත්වයේ සිටියදීම, ඔහුව මරා දමනු ලැබුවා. දාවිත් දෙවියන්වහන්සේගේ දිවැසිවරයෙක්. මතු පැමිණෙන්නාවූ ලෝකයේදී අම්නොන්ට සුගතියක් වේවිද විපත්තියක් වේවිද කියා දාවිත් දනගෙන සිටින්නට ඇති. දාවිත් ඒ පිළිබඳව කළ හෘදයාංගම ප්‍රකාශය කුමක්ද? "අම්නොන්ගේ මරණයෙන් පසු දාවිත් රජ සැනසී සිටි බැවින් ඔහු අබ්සලොම් ළඟට යන්ට ඉතා ආශා විය"යි සටහන් වෙයි.

"මෙම ප්‍රකාශයෙහි ඇති වචන වලින් අපට කුමන තීරණයකට එළඹෙන්නට පුළුවන්ද? රජතුමාගේ ආගමික ඇදහිලි හා විශ්වාසයන් තුළ නිමක් නැති දඬුවම් විඳීම ගැන අල්ප මාත්‍ර විශ්වාසයක් හෝ නොතිබූ බව මෙයින් හැඟී යන්නේ නැද්ද? අපිත් මෙසේම තේරුම් ගන්නෙමු. වඩාත් ප්‍රසන්නවූද, බුද්ධිමත්වූ ද, ගුණවත්කමින් පිරී යන්නාවූ ද කල්පනයක් ගොඩනගා ගත හැකි මෙම කල්පිතය විශ්වීය පාරිශුද්ධතාව සහ සාමය උදාකර දෙන්නාවූ ඉගැන්වීමකි. තමාගේ පුත්‍රයා මිය ගිය බව දැකීමෙන් රජතුමා සැනසීමට පත්වූ බව ශුද්ධ ලියවිලි පාඨය තහවුරු කරයි. එසේ වීමට හේතුව කුමක්ද? දාවිත් රජතුමා දිවැසිවරයෙක් නිසා ඔහුට අනාගතයට එබී බැලීමේ භාග්‍යය හිමිව තිබුණේය. දීප්තිමත් තේජානුභාවයෙන් යුත් අනාගතය දකගැනීමට ඔහුට හැකි විය. ඔහු දුටුවේ ස්වකීය පුත්‍රයා සියළුම පරීක්ෂාවන්ගෙන් මිදී පාපයේ බැම්මෙන් මුදා හරිනු ලැබ, පාපයේ දූෂිත කමින් පවිත්‍ර කරනු ලැබ සිටින බවය; ඔහු ප්‍රමාණවත් ලෙස ශුද්ධ භාවයක් ලබාගෙන ඇති බව ඔහු දුටුවේය. ඉක්බිතිව ඔහු ස්වර්ගයට ඔසවා ගනු ලැබූ සමූහයාගේ සංගමයට සහ ප්‍රීතියෙන් පිනා යන්නාවූ



ආත්මයන්ගේ සමූහයටද ඇතුලත් කරනු ලැබූ බව රජතුමාට දක ගත හැකි විය. වත්මන් ජීවිතයේ පාප සහ දුක්විඳීම් වලින් තම පුත්‍රයා මිදීම ලබා ඇති බව දැකීම රජතුමාට සැනසීමක් විය. පුත්‍රයා දැන් සිටින්නාවූ ස්ථානයේදී ඔහුගේ අඳුරු ආත්මයට ශුද්ධාත්මයාණන්ගේ උදාර ප්‍රේමය ලැබෙන්නේය. එම ක්‍රියාදාමය කරණකොටගෙන ඔහුගේ මනස ස්වර්ගීය ප්‍රඥාවට විවෘත කරනු ලබන්නේය. අමරණීය ප්‍රේමයෙන් ඔහුව පුරවනු ලබන්නේය. ඔහු මෙසේ පාරිශුද්ධතා ස්වභාවයකට පත්කරනු ලැබ ස්වර්ගීය වාසී සමූහයා සමග විවේකය සහ සමාගමය භුක්ති විඳීමට වාසනාව ලබනවා ඇත."

"මෙම කරුණු මගින් අපට පෙනී යන්නේ අපට ගැළවීම ලැබ, අප ස්වර්ගයට ගෙනයනු ලබන්නේ අප මේ ජීවිතයේදී කරන්නාවූ කිසිම දෙයක් නිසා හෝ හදවත වෙනස් කරගැනීමක් නිසා හෝ නොවන බවය; වත්මන් ඇදහිලි විශ්වාසයන් මත හෝ වත්මනදී යම්කිසි ආකාර ආගමක් ඇදහීම මත හෝ අපගේ ගැළවීම රඳා පවතින්නේ නැති බවය."

"නුඹලා ඇත්තටම නසින්නේ නැතැ"යි යක්ෂයා ඒදන් උයනේදී පැවැසූ මුසා වදන් ඒ දේවගැතිවරයා විසින් තවදුරටත් මෙසේ ප්‍රකාශ කර ඇත. 'ඒ ගසේ ගෙඩි කන දවසේදී නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා දෙවියන්වහන්සේට සමාන වන බවත්' පවසමින් සර්පයා වහසි බස් කීවේය. ඉතා අන්ත දුෂ්ට පව්කරුවා පවා තමාගේ මරණින් පසු සදාතන දිව්‍ය සැපතට හිමිකම් කියනවා ඇත. එවන් අයෙක් මිනීමරුවෙකු වුවද කම් නැත, ඔහු සොරෙක් හෝ කම්සැපෙහි වරදවා හැසිර ඇති අයෙක් විය හැකිය. කෙසේ වුවද, සෑම අයෙකුටම සදාතන දිව්‍ය සැපත හිමි වන්නේයයි දේවගැතිවරයෙකු හැටියට පෙනී සිටි මේ තැනැත්තා දක්වූයේය.

ශුද්ධ ලියවිල්ල විකෘති කරමින් කළ දේශනාවට ඔහු යොදාගත්තේ කිනම් බයිබල් පාඨයක්ද? තමා දේව අණසකට යටත් වන බව පවසමින් දාවිත් ප්‍රකාශ කළ එක් වගන්තියක් පදනම් කරගෙන දේශකයා තම කථාව නිර්මාණය කර ඇත. "අම්නොන්ගේ මරණයෙන් පසු දාවිත් රජ සැනසී සිටි බැවින් ඔහු අබ්සලොම් ළඟට යන්ට ඉතා ආශා විය." කාලය ඉකුත් වී යත්ම දාවිත් තුළ තිබූ දැඩි දුක් සන්තාපය ක්‍රමයෙන් තුනී වී ගියේය. තමා සිදු කළ අපරාධයෙහි යුක්ති සහගත දඬුවම ඔහුට ලැබුණු බැවින් ඔහුගේ අවධානය මිය ගිය තැනැත්තාගෙන් ඉවත්වී ජීවත්ව සිටින්නාවූ පුත්‍රයා කෙරෙහි යොමු විය. දාවිත්ගේ යට කී ප්‍රකාශය පාදක කරගෙන එම දේශකයා වැරදි තීරණයකට එළඹ පැවැසුවේ බේබදු අම්නොන් මළවුන් අතරට පත්වූ වහාම දිව්‍ය සැපත භුක්ති විඳින්නන්ගේ භවනය වෙත ප්‍රවාහනය කළ බවය; එහිදී ඔහු පාරිශුද්ධතාවට පත්කරනු ලැබ පව් නොකළ දේව

දූතයන් සමග එක්ව ජීවත් වීමට සූදානම් කරනු ලබන බවය. මෙය සිත් පිනා යන්නාවූ ප්‍රබන්ධයකි, තෘෂ්ණා පිරි හදවතකට සැනසුම් බස් දෙඩවීමකි. මෙය සාතන්ගේම ධර්මතාවකි. ඔහුගේ මේ සැලැස්ම ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙවන් උපදෙස් තිබියදී දුෂ්ටකම තව තවත් ප්‍රචලිත වීම ගැන අපි පුදුම වෙමුද?

මෙම ව්‍යාජ ගුරුවරයාගේ ක්‍රියාව, එබඳු ඉගැන්වීම් ඉදිරිපත් කරන්නාවූ වෙනත් අය පිළිබඳව නිදසුනකි. යම්කිසි ශුද්ධ ලියවිලි පාඨයක වූ ප්‍රකාශයෙන් වචන කිහිපයක් පමණක් ගෙන එයට තමා කැමති අර්ථකථනයක් ගෙන දෙමින් එමගින් යම්කිසි ඉගැන්වීමක් ඉදිරිපත් කරනු ලැබේ. සෑම අවස්ථාවකදීම පාහේ මෙම නවක අර්ථකථන පාඨයට ඇතුළත් වන කොටසේ අර්ථයට සහමුලින්ම පටහැනිය. පාඨයේ පද කිහිපයක් පමණක් උපයෝගී කරගෙන ගොඩ නගන්නාවූ දහමට දෙවියන්වහන්සේගේ වචනය තුළ පදනමක් නොමැත්තේය. පාඨයෙන් වෙන්කර ගත් පද ස්වල්පයකින් ගොඩ නගන්නාවූ ඉගැන්වීම සඳහා එවන් ගුරුවරු පද විකෘති කිරීමක් යොදා ගනිති. බේබදුකාර අම්නොන් සගයෙහි සිටිතැයි යන්න සනාථ කිරීම් වස් යොදා ගෙන තිබූ ශුද්ධ ලියවිලි සාක්ෂිය නිශ්චිතයක් ලෙස භාවිතා කර ඇති අතර එම මතවේදය ශුද්ධ ලියවිල්ලෙහි සරලවූ ද සෘජුවූද ඉගැන්වීම් වලට සම්පූර්ණයෙන්ම පටහැනිය. ශුද්ධ ලියවිල්ල පවසන්නේ කිසිම බේබද්දෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුම කරගන්නේ නැති බවය. (1 කොරින්ති 6:10). අනුමාන කරන්නෝ, අවිශ්වාස කරන්නෝ සහ සැක කරන්නෝ සත්‍යතාව බොරු ඉගැන්වීමකට හරවන්නේ මෙයාකාරයෙන්ය. ඔවුන්ගේ බොරු තර්ක මගින් බොහෝ මනුෂ්‍යයෝ මුළාවට පත්කරනු ලැබ සිටිති. මාංසික තෘෂ්ණාවන් නැමැති තොටිල්ලේ නිරුපද්‍රිතව පැද්දෙමින් කල් ගෙවමින් නින්දට යෑමට බොහෝ අය පුරුදු වී සිටිති.

මරණ මංචකයේ අන්තිම හුස්ම පිටවීමත් සමගම යම් පුද්ගලයෙකුගේ ආත්මය එක එල්ලේම ස්වර්ගය කරා යවනු ලබන්නේ නම් ජීවත් වීමට වඩා මරණයට පත්වීම අප විසින් ආශා කළ යුතුය, අගය කළ යුතුය. මෙම විශ්වාසය නිසා බොහෝ අය තම ජීවිතවලින් සමුගෙන ඇත. කරදර, හිරිහැර, ව්‍යාකූල භාවය සහ බලාපොරොත්තු කඩවීම් යනාදියට මුහුණ දීමෙන් අසරණ භාවයට පත්වූ අය සහ අනාථ භාවයට පත්වූ අය ජීවිතය එල්ලී ඇති සිහින් නූල සිඳ දමා සදාතන ලෝකයේ සම්පත් අයිති කරගැනීමට කටයුතු කිරීම පහසු කෙටි මාර්ගයක් බව නිගමනය කරති.

තමන්වහන්සේගේ දේව නීති සංග්‍රහය බිඳ දමන්නාවූ අයට දඬුවම් කරන බවට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය තුළ තීරණාත්මක සාක්ෂි ඉදිරිපත් කර තිබේ. යුක්තිය ඉටුකිරීම පිණිස පව්කාරයාට



විනිශ්චයක් ලබාදීමට, දඬුවම් කිරීමට, උන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව ඉඩ දෙන්නේ නැතැයි උගන්වන්නාවූ අය කල්වාරි කුරුසිය දෙස නෙත් යොමු කළ යුතුය. පාපයෙන් අපවිත්‍ර නොවූ දේව පුත්‍රයාණන්ගේ මරණය සාක්ෂි දරන්නේ "පාපයේ කුළිය නම් මරණය බවය." දෙවියන්වහන්සේගේ දහම් නීති සංග්‍රහය කඩ කරන්නාවූ සෑම අවස්ථාවකටම යුක්ති සහගත දඬුවමක් ලැබීම අනිවාර්ය බව එය දක්වයි. පාප රහිත ක්‍රිස්තුස්වහන්සේ මිනිසා උදෙසා පාපයේ වන්දිය බවට පත්වූ සේක. දිව්‍ය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ දඬුවම උන්වහන්සේ දරූ සේක. පියාණන්වහන්සේගේ ශ්‍රී මුහුණ උන්වහන්සේ වෙතින් සඟවා ගැනීම උන්වහන්සේට දරා ගැනීමට සිදුවිය. අන්තිමේදී යේසුස්වහන්සේගේ ශ්‍රී හදවත පැලී උන්වහන්සේගේ ජීවිතය නිමාවට පත් විය. පව්කරුවන්ට ගැළවීම ලබාදීම උදෙසා උන්වහන්සේ මෙසේ පූජා වූසේක. පාපයේ ශාපයෙන් සහ දඬුවමින් මිනිසාට නිදහස ලබාදීමට වෙන කළ හැකි කිසිවක් නොවීය. මෙවන් විශාල වන්දියක් ගෙවා සපයනු ලබන්නාවූ සමගි කිරීමේ තිළිණයෙහි පංගුකාරයෙකු වීම ප්‍රතික්ෂේප කරන්නාවූ සෑම පුද්ගලයෙක්ම තමන් විසින් කරන ලද්දාවූ පාපවලට හිමි දඬුවම සහ වරද තමා විසින්ම දැරිය යුතුය.

මෙබඳු ව්‍යාජ අදහස් දරන්නාවූ ගුරුවරුන් උගන්වන්නේ සෑම මිනිස් පුද්ගලයෙකුම සගයට ගෙන යනු ලැබ ශුද්ධවූ දේව දූතයන් ලෙස ප්‍රීතියෙන් සිටින බවය. නමුත් අදේවභක්තිකව පසුතැවිලි නො වන්නාවූ මිනිසුන්ගේ ඉරණම පිළිබඳව ශුද්ධ බයිබලය උගන්වන්නේ කිමෙක්දැයි විමසා බලමු.

"පිපාසය ඇත්තාට මම ජීවන-වතුර උල්පතෙන් නොමිළයේ බොන්ට දෙන්නෙමි." (එළිදරව් 21:6,). පිපාසා ඇති අයට පමණක් මේ පොරොන්දු දෙවා වදාරා ඇත. ජීවනයේ වතුර ලැබීමේ අවශ්‍යතාව ගැන හැඟීමෙන් යුතුව එය සොයන්නාවූ අයට හැරෙන්නට වෙනත් අයට මේ දීමනාව ලැබෙන්නේ නැත. එය ලැබීම සඳහා තමන් සතු සියල්ල අහිමි වුවද, එය තමාට අවශ්‍ය යයි හැඟෙන අයට පමණක් එය දෙනු ලැබේ. "ජයගන්නා මේ දේවල් උරුම කරගන්නේය, මම ඔහුගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔහු මාගේ පුත්‍රයා වන්නේය" (එළිදරව් 21:7) යන ස්ථිරසාර කොන්දේසිය ඉදිරිපත් කර තිබේ. සියල්ල හිමි කරගැනීම අපගේ අපේක්ෂාව වන්නේ නම් අපි පාපයට විරුද්ධව නැඟී සිට ජයගත යුතු වෙමු.

යෙසායා දිවැසිවරයා තුළින් දෙවි සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කරන සේක. "ධර්මිෂ්ඨයන්ට යහපත වන්නේ යයි කියන්න." "අහෝ දුෂ්ටයාට දුක්වේ. ඔහුට විපත පැමිණේ. මක්නිසාද ඔහුගේ අත්වල විපාකය ඔහුට ලැබෙන්නේය." (යෙසායා 3:10,11). ප්‍රඥාවන්තයා මෙසේ පවසයි. "පව්කාරයෙක් සිය වරක් නපුර කර බොහෝ කල්

ජීවත් වුණත්, දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට එනම් උන්වහන්සේ ඉදිරියෙහි භය වෙන්නන්ට යහපත සිද්ධවෙන බව සැබවින් දනිමි. නුමුත් දුෂ්ටයා දෙවියන්වහන්සේ ඉදිරියෙහි භය නොවන බැවින් ඔහුට යහපත සිද්ධ වෙන්නේවත් සෙවනැල්ලක් වැනි ඔහුගේ දවස් දීර්ඝ වන්නේවත් නැත." (දේශනාකාරයා 8:12,13). පසුතැවිලි නොවන දුෂ්ටයා දේව උදහසේ දවසේදී දේව උදහසට ඉලක්ක වන හේතු ගොඩගසා ගන්නා බව පාවුල් මෙසේ පවසයි. ඒ දවසෙහිදී "උන්වහන්සේ සියලු මනුෂ්‍යයන්ට තම තමුන්ගේ ක්‍රියා ලෙස විපාක දී ඉවසීම ඇතුව යහපත්කම් කිරීමෙන් මහිමයද ගෞරවයද අමරණභාවයද සොයන්නන්ට සදාකාල ජීවනය දෙනසේක. ... නපුරුකම් කරන සියලු මනුෂ්‍ය ආත්මවලට .... සිත් වේදනාවක් පැමිණෙන්නේය." (රෝම 2: 5, 6, 9).

"මක්නිසාද වේශ්‍යාකම් කරන්නෙකුටවත් අපවිත්‍ර තැනැත්තෙකුට-වත් රූප වඳින්නෙක්වූ ලෝභයෙකුටවත් ක්‍රිස්තුස්වහන්සේගේද දෙවියන්වහන්සේගේද රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන බව නුඹලා සත්තක ලෙස දනසිටින්නහුය" (එපීස 5:5). "සියල්ලන් සමග සමාදානයෙන් සිටින්ටත් ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමින්වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුව යන්ටත් උත්සාහ කරන්න." (හෙබ්‍රෙව් 12:14). "ජීවන වෘක්ෂයට පැමිණෙන්ට අයිතිවාසිකම ලැබෙන පිණිසත්, දොරටුවලින් නුවරට ඇතුල් වන්ට පුළුවන්වන පිණිසත් තමුන්ගේ සළු සෝදා ගන්නාවූ තැනැත්තෝ (උන්වහන්සේගේ ආඥා පවත්වන්නෝ) ආශිර්වාද ලද්දෝය. පිටත සිටින්නෝ නම් බල්ලෝද, මායම් කරන්නෝද... රූප වඳින්නෝද, බොරුවකට ප්‍රිය වන්නාවූ, එය කරන්නාවූ සියල්ලෝද වෙති. (එළිදරව් 22:14,15).

තමන්වහන්සේගේ චරිත ගුණාංග පිළිබඳවත් පාපය පිළිබඳව උන්වහන්සේ ක්‍රියාකරන ආකාරය ගැනත් දෙවියන්වහන්සේ මිනිසුන්ට පැහැදිලි ප්‍රකාශනයක් මෙසේ ලබා දී ඇත. උන්වහන්සේ "ස්වාමීන්-වහන්සේය. උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණ වූ දයාවන්ත වූ උදහස් වීමට ප්‍රමාද වන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවි කෙනෙක්ය. උන්වහන්සේ දහස් ගණනකට කරුණාව පවත්වන සේක. අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමාකරනසේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරන සේක." (නික්මයාම 34:6,7) දෙවියන්වහන්සේ "සියලු දුෂ්ටයන් විනාශ කරන සේක." (ගීතාවලිය 145:20). "අපරාධකාරයෝ එකට විනාශ කරනු ලබන්නෝය. දුෂ්ටයන්ගේ දිවි කෙළවර සිඳිනු ලබන්නේය." (ගීතාවලිය 37:38). කැරලි ගැසීම මැඩපැවැත්වීම සඳහා දිව්‍ය ආණ්ඩුවේ බල ශක්තිය සහ අධිකාරි බලය යොදවනු ලබනවා ඇත. දඬුවම් පැමිණවීමේ



සෑම ක්‍රමවේදයක්ම දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග වන මෛත්‍රී-කරුණාව, ඉවසීම සහ ත්‍යාගශීලීතාව සමග හොඳාකාරව ගැළපෙන්නේය.

දෙවියන්වහන්සේ කිසිවෙකුගේ කැමැත්තට හෝ විනිශ්චයට හෝ බලපෑමක් නොකරන සේක. යමෙක් වහලෙකු ලෙස කීකරුවීම ගැන උන්වහන්සේ ප්‍රසන්න නොවනසේක. උන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මවනු ලැබූ ජීවනය ඇති සැවොම, ඔවුන්ගේ ආදරය ලැබීමට උන්වහන්සේ සුදුසු වන නිසාම තමන්වහන්සේට ප්‍රේම කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තය. උන්වහන්සේගේ ප්‍රඥා මහිමය, යුක්ති ගරුකතාව සහ පරිත්‍යාගශීලීතාව කෙරෙහි වූ බුද්ධිමත් ඇගයීමක් නිසාම සෑම අයෙක්ම තමන්වහන්සේට කීකරු වනවා දකීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේය. මෙකී ගුණාංග කෙරෙහි යුක්ති සහගත ආකල්පයක් ඇති සැවොම උන්වහන්සේට ප්‍රේම කරනවා නොඅනුමානය. මක්නිසාදයත්, උන්වහන්සේගේ ගුණාංගවලට ප්‍රණාමය දක්වීම් වස් ඔවුන් උන්වහන්සේ වෙතට නිතැතින්ම ආකර්ෂණය කරනු ලබනවා ඇත, ඇදී යනවා ඇත.

අපගේ ගැළවුම්කාරයාණන් වන යේසු සමිඳාණන් විසින් උගන්වනු ලැබ උන්වහන්සේගේ ජීවිතය තුළින් ආදර්ශමත් ලෙස පෙන්වා දෙනු ලැබූ කරුණාවන්තකම දයාව සහ ප්‍රේමය දෙවියන්වහන්සේගේ චරිත ගුණාංගයන්හි සහ කැමැත්තෙහි සැබෑ පිටපතක් වන්නේය, අනුරූපයක් වන්නේය. තම පියාණන්වහන්සේගෙන් ලැබූ දේ මිස වෙන කිසිම දෙයක් තමන් උගන්වන්නේ නැතැයි ක්‍රිස්තුස්වහන්සේ පැවැසූ සේක. "ඔබේ සතුරාට ප්‍රේම කරන්නැ"යි ගැළවුම්කාරයාණෝ දෙවා වදාළ ශික්ෂා පදය හෙවත් උපදේශය දිව්‍ය රජයේ ප්‍රතිපත්ති සමගම සම්පූර්ණයෙන්ම එකඟ වන්නේය. විශ්වයේ යහපත සඳහා දෙවියන්-වහන්සේ විනිශ්චය ක්‍රියාවට නංවන සේක. එසේම දඬුවම් ලබන්නාගේ ශුභ සිද්ධිය උදෙසාද එය ඉවහල් වන්නේය. තම රජයේ නීති සංග්‍රහය අනුව දඬුවම් ලබන්නාගේ ප්‍රීතියට උපරිම වශයෙන් උදව් කිරීමට දෙවියන්වහන්සේ කැමැති වනසේක. තමන්වහන්සේගේ ප්‍රේමයේ සලකුණුවලින් උන්වහන්සේ ඔවුන් වට කරනසේක; තමන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පිළිබඳව ඔවුන් දැනුවත් කරනසේක. එහෙත් ඔවුහු උන්වහන්සේගේ ප්‍රේමය එපා කරමින් උන්වහන්සේගේ ව්‍යවස්ථාව නොපවත්වමින් උන්වහන්සේගේ කරුණාව ප්‍රතික්ෂේප කරති. දෙවියන්වහන්සේගේ දීමනාවන් ලබන්නාවූ අතරවාරයේදීම ඔවුහු ඒ තිළිණ ලබාදෙන්නාවූ තැනැත්වහන්සේට අගෞරව කරති. උන්වහන්සේ තමන්ගේ පාප පිළිකුල් කරන බව දන්නා නිසා ඔවුහු උන්වහන්සේට වෛර කරති. ඔවුන්ගේ මුරණ්ඩු හිතුවක්කාරකම පිළිබඳව

ස්වාමින්වහන්සේ බොහෝ කල් ඉවසා දරාගෙන සිටිනසේක. එසේ වුවද, අන්තිමේදී තීරණාත්මක පැය පැමිණෙන්නේය. එකල ඔවුන්ගේ ඉරණම තීරණය කරනු ලබනවා ඇත. එවිට උන්වහන්සේ මෙම කැරැලි කරුවන් තමන්වහන්සේගේ පාර්ශ්වයට සම්බන්ධ කරගන්නවා ඇද්ද? තමන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට උන්වහන්සේ ඔවුන්ට බලකරනවා ඇද්ද?

තමන්ගේ නායකයා ලෙස සාතන්ව තෝරා ගත් අය, ඔහුගේ බලය යටතේ පාලනය කරනු ලැබූ අය, දෙවියන්වහන්සේගේ අභිමුඛය වෙත යාමට සූදානම් නැත. අහංකාරකම, වංචා කිරීම, සල්ලාලකම, කුරිරුකම යන ගුණාංග මොවුන්ගේ චරිත තුළ ස්ථාපිත වී ඇත. තමන් මේ ලෝකයේ සිටියදී අවමානයට ලක් කළ, වෛර කළ අය සමග සදාතනය පුරා එක්ව ජීවත් වීමට ඔවුන්ට ස්වර්ගයට ඇතුළු විය හැකි වේද? බොරුකාරයෙකුට සත්‍යතාව සමග එකඟතාවකට පැමිණිය නොහැක. මුදු මොළොක් කමට ඔවුන්ගේ ආත්ම විශ්වාසය හා අහංකාරකම සෑහීමට පත් කළ නොහැක. දූෂිතයෙකුට පාරිශුද්ධතාවය පිළිගත නොහැක. ආත්මාර්ථකාමී අයෙකුට, පරාර්ථකාමී ආදරය අගය කළ යුතු ගුණාංගයක් නොවන්නේය. සම්පූර්ණ වශයෙන්ම ලෞකික දය කෙරෙහිද ස්ව-ආත්ම විභූතිය කෙරෙහිද උනන්දුව දක්වන අයගේ ප්‍රීති ප්‍රමෝදය සඳහා සගය විසින් කුමක් දිය යුතුද?

දෙවියන්වහන්සේට විරුද්ධව කැරැළි ගසමින් ජීවිතය ගෙවූ අය එක්වරම සගය වෙත ප්‍රවාහනය කළහොත් ඔවුන්ට සගයේ හිඳීම ප්‍රීතිමත් අත්දකීමක් විය හැකිද? සගයේ දකගත හැකි උසස්වූ ද ශුද්ධවූ ද පරිපූර්ණ සදාතන පැවැත්ම සමග කැරැළිකරුවන්ට අනුගත වීමේ හැකියාවක් තිබේද? සගයේ ජීවත් වන්නාවූ සෑම ආත්මයක්ම ප්‍රේමයෙන් පිරි සිටිනවා ඇත; ඔවුන්ගේ මුහුණු වලින් ප්‍රීතිය උතුරා යයි; දෙව් සමිඳාණන්ට සහ බැටළු පෝතක සමිඳාණන්ට ගෞරවය පුද කරමින් නැඟෙන්නාවූ මිහිරි ගීත රාවය සගය පුරා දවස මුළුල්ලේ පවතින්නේය. සිහසුන් මත වැඩ වාසය කරන්නාවූ තැනැන්වහන්සේගේ මුහුණින් නික්ම එන්නාවූ නිමක් නැති ආලෝක දහරාවන් මිදීම ලැබූවන් මත පතිත වන්නේය. දෙවියන්වහන්සේට වූ වෛරයෙන් හදවත් පිරී ගිය අයට සත්‍යතාවයට සහ ශුද්ධකමට ද්වේෂ කළ අයට, සගයේ ශුද්ධ සමූහයා සමග එකතු වී පැසසුම් ගී ගැයීමට හැකියාවක් තිබේද? දෙව් පියාණන්ගේ සහ බැටළු පෝතකයාණන්ගේ තේජස් මහිමය ඉදිරියෙහි නැඟී සිටීමට දුෂ්ටයන්ට පුළුවන්කමක් තිබේද? එසේ නොවේ; සගයට ගැළපෙන්නාවූ චරිත ගොඩනගා ගැනීමට ඔවුන්ට පරිවාසයෙහි වසර ගණනාවක් ලබාදී තිබිණ. නමුත් ශුද්ධවන්ත භාවයට පත්වීමට මනස පුහුණු කරගැනීමට දුෂ්ටයෝ කිසිදිනක වෑයම් නොකළෝය. ඔවුන් සගයේ භාෂාව ඉගෙන ගෙන තිබුණේ



නැත. එසේ කිරීමට දන් ප්‍රමාද වූවා වැඩිය. දෙවියන්වහන්සේට විරුද්ධව කැරැළි ගැසීමේ ජීවිත ගත කළ ඔවුන්ට ස්වර්ගයේ ජීවිතයට සුදුසුකමක් නැත. සගයේ පවතින්නාවූ ශුද්ධත්වය නිර්මලතාව සහ සමාදානය එහි යන්නාවූ පව්කරුවන්ට වධ හිංසාවක් වනවා ඇත. දෙවියන්වහන්සේගේ තේජස් මහිමාලංකාරය ඔවුන්ව විනාශ කර දමනවා ඇත. පසුතැවිලි නොවූ පව්කාරයන් එහි ගියහොත් ඔවුන් එම ස්ථානයෙන් පලා යෑමට කැමැත්තක් දක්වනවා ඇත. තමන්ට ගැළවීම උදාකර දීමට ස්වකීය ජීවිතය පූජා කළ තැනැන්වහන්සේගේ ශ්‍රී මුහුණත ඉදිරියෙහි සැඟවී සිටීමේ අභිලාෂයෙන් ඔවුන් විනාශය පතනවා ඇත; විනාශය කැඳවනවා ඇත. තම තමාගේ තෝරා ගැනීම මගින් දුෂ්ටයෝ සිය ඉරණම තීරණය කරගෙන ඇත. සගයෙන් පිටත සිටීම ඔවුන්ගේම තෝරාගැනීමෙන් සිදුවෙයි. සගයෙන් පිටත සිටීමට ඔවුන්ට ඉඩදීම දෙවියන්වහන්සේගේ යුක්ති සහගතවූ ද මෛත්‍රී කරුණාවෙන් යුතු වූ ද ක්‍රියාවක් වනවා ඇත.

ලෝ ව්‍යාප්ත ජලගැල්මෙහි ජලස්කන්ධය මෙන්ම, ඒ මහත් දවසේදී ඇතිවන ගිනි ජාලාව මගින් පව්කාරයන්ගේ ව්‍යාධිය සුවපත් කළ නොහැකි බව දක්වන දේව තීන්දුව ප්‍රකාශයට පත්කරනු ලබන්නේය. දිව්‍ය අධිකාරී බලයට යටත්වීමට දුෂ්ටයන් තුළ අභිප්‍රායක් නැත. ඔවුන්ගේ කැමැත්ත කැරැළි ගැසීම මගින් එළිදක්වා ඇත. ජීවිතය නිමවූවාට පසුව, ඔවුන් තුළ පැවැති කල්පනා පිළිවෙල අනෙක් අතට හැරවීමට තවත් කාලයක් ඉතිරි වන්නේ නැත. නීති උල්ලංඝනය කිරීමෙන් කීකරුකමට හැරීමටවත්, වෛරයෙන් ආදරය කිරීමට හැරීමටවත් ඔවුන් පමා වූවා වැඩිය. පව්කරුවන්ට දෙවියන්වහන්සේ සමග සබඳතාවක් පවතින්නේ නැත.

පව්කාරයාට සදහටම ජීවත් වීමට ඉඩ ලබාදුනහොත්, ඔවුන්ගේ මාර්ගයේම නිදහස් ලෙස ගමන් කිරීමට ප්‍රස්ථාව ලබාදුන හොත් එයින් සිදුවිය හැකි අනිටු විපාක පෙන්නුම් කිරීම් වස් කායින්ගේ ජීවිතය පව් කළ විගස විනාශ නොකිරීමෙන් දෙවියන්වහන්සේ ලෝකයාට ආදර්ශයක් ලබා දුන්සේක. කායින්ගේ ඉගැන්වීම් සහ ආදර්ශයෙහි අනුබලය මගින් ඔහුගෙන් පැවැත එන්නෝ විශාල වශයෙන් පාපයට යොමු කරවන ලදී. එය කෙතෙක් දුරට වර්ධනය වීද යත් මිහිපිට මිනිසාගේ දුෂ්ටකම ඉතා ඉහළ මට්ටමක පැවැතියේය. "මනුෂ්‍යයාගේ දුෂ්ටකම පොළොවෙහි මහත් බවද ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණත් නිරන්තරයෙන්ම නපුරුවම තිබෙන බවද ස්වාමින්වහන්සේ දුටුසේක." "පොළොව දෙවියන්වහන්සේ ඉදිරියෙහි දුෂ්‍ය වූවාය. පොළොව බලහත්කාරයෙන් පිරී තිබුණාය." (උත්පත්ති 6:5,11). මිනිසාගේ සිතුවිලි නිතරම නපුරෙන් පිරී තිබිණ.

ලෝකය වෙත වූ මෛත්‍රී-කරුණාව නිසා දෙවියන්වහන්සේ නෝවාගේ දවස්වලදී සිටියාවූ දුෂ්ට ලෝවාසීන් විනාශ කර දමූ සේක. සොදොම්හි දිවි ගෙවූ දූෂිත වැසියන් උන්වහන්සේ තම මෛත්‍රී-කරුණාව නිසා විනාශයට ලක් කළසේක. සාතන්ගේ මුළා කිරීමෙහි බලය කරණකොටගෙන, දුෂ්ටකම් කිරීමෙහි ක්‍රියාකාරී වන්නාවූ අය වෙනත් අයගේ අනුකම්පාව සහ පැසසුම දිනා ගනිති. එමගින් ඔවුහු අනෙකුත් අයව නිරතුරුවම කැරලි ගැසීමට යොමු කරති. කායින්ගේ සහ නෝවාගේ දවස්වලදී එසේම සිදුවිය, ආබ්‍රහම්ගේ සහ ලොත්ගේ දවස්වලදී ද එසේම සිදුවිය. අපගේ දවස්වලදී ද එසේම සිදුවන්නේය. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ කරුණා අනුග්‍රහය එපා කරන අයව විනාශ කර දමන්නේ විශ්වය කෙරෙහි ඇත්තාවූ මෛත්‍රී-කරුණාව නිසාය.

"පාපයේ කුළී නම් මරණයය; නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය." (රෝම 6:23). දමිටුවන්ගේ උරුමය සදාතන ජීවනය වන අතර පවිටුන්ගේ කොටස මරණයයි. මෝසෙස් ඊශ්‍රායෙලියතයන්ට මෙසේ පැවැසීය. "මෙන්න, මම අද ජීවනය සහ යහපතද මරණය හා විපතද නුඹ ඉදිරියෙහි තැබීමි." (ද්විතීය කථාව 30:15). මෙහි සඳහන් වන මරණය වනාහි ආදම් විසින් ව්‍යවස්ථාව කඩකිරීම නිසා මිනිස් වර්ගයාට නියම වූ මරණය නොවන්නේය. ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වන මේ මරණය වනාහි "දෙවන මරණය" වන්නේය. එය සදාකාල ජීවනයට පටහැනිව පවතියි.

ආදම්ගේ පාපයෙහි විපාකය ලෙස සකල මිනිස් වර්ගයාට මරණය තීන්දු විය. සැම අයෙක්ම මිනී වල වෙත පැමිණෙයි. ගැළවීමේ දීමනාව තුළින් සැම අයෙක්ම මිනී වලෙන් පිටතට ගෙන එනු ලබති. "ධර්මිෂ්ඨයන්ගේද අධර්මිෂ්ඨයන්ගේද නැවත නැගිටීමක් වන්නේය." (ක්‍රියා 24:15). "මක්නිසාද ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය." (1 කොරින්ති 15:22). නමුත් නැගිටුවනු ලබන කාණ්ඩ දෙක අතර වෙනසක් පවතින්නේය. "සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ, යහපත්කම් කළාහු ජීවනයේ නැවත නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත නැගිටීමටත් පිටත්ව එන්නෝය." (යොහන් 5:28,29). ජීවනයේ නැවත නැගිටීමට "සුදුසුකම්" ලබන අය භාග්‍යවත්ය, ශුද්ධවත්ය. ඔවුන් කෙරෙහි දෙවෙනි මරණයට බලය නැත්තේය. එහෙත් පසුතැවිලි වීමෙන් සහ ඇදහිල්ලෙන් පව් කමාව ලබා නොගත් සියල්ලෝම ව්‍යවස්ථාව කඩකිරීමේ වරදට දඬුවම් ලැබිය යුත්තෝය. "පාපයේ කුළිය නම් මරණයයි." ඔවුන් එකිනෙක්කෙනා තම තමන්ගේ ක්‍රියාවන් ලෙස උෂ්ණත්වයේ සැරකම සහ දැවෙන්නාවූ කාලය අනුව දඬුවමට ගොදුරු වෙති. දඬුවම නිම



වන්නේ දෙවන මරණයත් සමගය. දෙවියන්වහන්සේගේ යුක්ති-සාධාරණත්වයත් මෛත්‍රී-කරුණාවත් ක්‍රියාත්මක කිරීමේදී පාපය තුළ පව්කාරයාට ගැළවීම ලබාදීමට උන්වහන්සේට හැකියාවක් නැත. පව්කරුවා දේව දහම් ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමෙන් සදාතන ජීවිතය අහිමි කරගත් නිසා, දෙවියන්වහන්සේ ඔහුගේ ජීවත් වීමේ අයිතිය ඔහුට අහිමි කරන සේක. දේවානුභාවය ලැබූ ලේඛකයෙක් මෙසේ පවසා ඇත. "මද කලකින් දුෂ්ටයා නැතිවන්නේය. එසේය, නුඹ ඔහුගේ ස්ථානය පරික්ෂාකර බලන්නෙහිය, ඔහු සම්බ නොවන්නේය." (ගීතාවලිය 37:10) "ඔහු නොසිටියාක්මෙන් වෙනවා ඇත" යි තව තැනැත්තෙක් පවසා තිබේ. (ඔබදියා16). පාපතර භාවයෙන් පිරී යන ඔව්හු බලාපොරොත්තු රහිත ලෙස, සදාකාලික නැතිවී යාමකට යොමු වෙති.

පාපයේ ප්‍රතිඵලයක් ලෙස පැතිර ගිය සැම දුක් අඳෝනාවක් හා සැම ආකාර විනාශයක් සමග පාපය නිමාවට පත්වන්නේය. ගීත රචකයා මෙසේ පවසයි: "ඔබ ජාතීන්ට තරවටු කොට දුෂ්ටයන් විනාශ කළසේක. සදාකාලේටම ඔවුන්ගේ නාමය මැකූ සේක. සතුරෝ කෙළවරකට පැමිණියෝය; ඔවුහුද ඔබ විසින් පෙරළා දමූ නුවරවල්ද සදාකාලේටම නාස්ති වූය; ඒවා ගැන සිහිවීම පවා නැතිවිය. (ගීතාවලිය 9:5,6) අනාගත ස්ථාවරය ගැන දිවසින් දකින්නාවූ යොහන් දිවැසිවරයාට එහි සිට නැග එන්නාවූ විශ්වීය ජාතික ගීයට සවන් දීමේ වාසනාව හිමි විය. එම දේශාභිමාන ගීතයෙහි එකම වැරැදි ස්වරයක් හෝ නොවීය. සගයේ මෙන්ම පොළොවෙහිද ජීවත් වන්නාවූ සැවොම දෙවියන්වහන්සේට මිහිරි ගීතයක් ගැයීමට එක්සිත්ව පෙළ ගැසී සිටියහ. දෙවි සමිඳාණන්ට අපහාස කිරීමට එහි එකම ප්‍රාණයක්වත් නොසිටිනවා ඇත. නිමක් නොදකින්නාවූ බලවත් වේදනාවෙන් පීඩා විඳිමින් නිරයේ ගිනි දල් අතරින් දෙවියන්වහන්සේට අපහාස කිරීමට කිසිවෙක් නොසිටිනවා ඇත. නිරයෙහි දුක් විඳින්නාවූ අයගේ විලාප ගීතය ගැළවීම ලැබූවන්ගේ ප්‍රශස්ත ගී ගැයුමට එක්කිරීමට කිසිවෙක් එහි නොසිටිනවා ඇත.

අමරණ භාවය ස්වභාවයෙන්ම මිනිසා සතුව ඇතැයි ප්‍රකාශ කරන්නාවූ මූලික බොරුව මත පදනම්ව මරණයෙහිදී මිනිසාට සිහිය ඇතැයි යන ඉගැන්වීමද පෙරමඟ ගනී. මනුෂ්‍යයා සදාතනය පුරා නිරයේ ගින්නෙහි දැවෙමින් සිටිතැයි යන දහම මෙන්ම මෙම ඉගැන්වීමද ශුද්ධ ලියවිලි මත පදනම් වූ දහමක් නොවන්නේය. එවන් ඉගැන්වීමක් අපගේ තර්ක කිරීම් වලින් පවා සනාථ නොවේ. මානව දයාවේ හැඟීම් වලට පවා එම ඉගැන්වීම පටහැනිය. අද පවතින්නාවූ ජනප්‍රිය විශ්වාස කිරීමක් අනුව ගැළවීම ලැබූ සගයේ වාසය කරන්නන් හට මෙම භූමි තලයේ සිදුවන්නාවූ සැම දෙයක් පිළිබඳව දැනීම ඇත. එහෙත් තමන් මෙලොව දමා ගිය හිතවතුන්ගේ සහ නෑදෑයින්ගේ

ක්‍රියාකාරකම්ද දුක් වේදනාවන්, බලාපොරොත්තු සුන්වීම් සහ සන්තාපයද ඔවුන්ගේ කරදරද දකිමින් අසමින් සංවේදීව සිටින්නාවූ මිය පරලොව ගියා යයි සිතන්නාවූ අයට සගයේ සැපත සහ වින්දනය ප්‍රීතියක් විය හැකිද? ඒ අතරම, පසුතැවිලි නොවූ තැනැත්තෙකුගේ ආත්මය අන්තිම හුස්ම පිටවීමත් සමගම නරකාදිය වෙත ගෙන යනු ලැබ නිරයේ ගිනි සිළු අතරට දමනු ලැබේ යැයි යන විශ්වාසය ජීවත්ව ඉන්නාවූ අයෙකුට කෙතරම් පිළිකුලක් ඇති කරන ඉගැන්වීමක්ද! සූදානම් වීමකින් තොරව තම මිතුරන් මිනී වල කරා යනවා දකීමෙන් ජීවත්ව සිටින්නන්ට කොයි ආකාර සංවේගයක් සන්තාපයක් හට නොගනීද! සිත් වියවුල් කරන මහත් බයක් සහ තැති ගැන්වීමක් ඇති කරන මෙම ඉගැන්වීම නිසා බොහෝ අය උමතුවට පත්වෙති

මෙම කරුණු සම්බන්ධව ශුද්ධ ලියවිලි කුමක් පවසන්නේද? මරණයට පත්වූ මිනිසෙකුට සිහි බුද්ධිය නැතැයි කියා දාවිත් මෙසේ පවසයි. "ඔහුගේ හුස්ම නික්ම යයි. ඔහු ස්වකීය භූමියට හැරී යයි. එදාම ඔහුගේ කල්පනා නැති වේ." (ගීතාවලිය 146:4). සාලමොන්ද මෙවැනිම සාක්ෂියක් දරයි. "ජීවත් වන්නෝ තමුන් නසින්ට ඕනෑ බව දනිති. මළාහු කිසිවක් නොදනිති." "ඔවුන්ගේ ප්‍රේමයද, වෛරයද, ඊර්ෂ්‍යාවද දැන් නැති වී තිබේ. ඉර යට කෙරෙන සියල්ලෙන් තවත් සදාකාලයටම ඔවුන්ට කොටසක් නැත." "නුඹ යන මිනී වලෙහි වැඩක්වත් යෝජනාවක්වත්, දැනගැන්මවත් ප්‍රඥාවවත් නැත." (දේශනාකාරයා 9: 5, 6, 10).

යාච්ඤාවට පිළිතුරක් වශයෙන් හෙසකියාගේ ජීවිතය අවුරුදු පහළොවකින් දික් කරනු ලැබීය. දෙවියන්වහන්සේගේ මෛත්‍රී-කරුණාව කෙරෙහි කෘතඥතාව පළකරමින් රජතුමා උන්වහන්සේට ප්‍රශංසා ගීයක් ඔප්පු කළේය. තමන් මෙයාකාරයෙන් ප්‍රීති ප්‍රමෝදයෙන් ගී ගයන්නේ මන්දැයි ඔහු මේ ගීතයෙන් මෙසේ ප්‍රකාශ කළේය: "මක්නිසාද ඔබට ප්‍රශංසා කරන්ට මිනී වලටවත්, ඔබ වර්ණනාකරන්ට මරණයටත් බැරිය. වළට බසින්නෝ ඔබගේ විශ්වාසකම ගැන බලා නොසිටින්නෝය. ජීවත්ව සිටින්නා-ජීවත්ව සිටින්නාම-අද මා වාගේ ඔබට ස්තුති කරන්නේය." (යෙසායා 38:18,19). ජන ප්‍රසාදය දිනා ගත් ඉගැන්වීම පවසන්නේ මිය ගිය දැහැමි අය දැන් සගයේ සිටින බවය; ඔවුහු සග සම්පත් භුක්ති විඳිමින් අමරණීය දිව් වලින් දෙව් සමිඳුන් පසසන බවය. මරණයේදී එවන් මහිමවත් භාග්‍යයක් අත් නොවන බව හෙසකියා දැනගෙන සිටියේය. හෙසකියා රජතුමාගේ වචන සමග ගීත රචක රජතුමාද එකඟ වෙමින් මෙසේ පවසා තිබේ. "මක්නිසාද මරණයේදී ඔබ සිහි කිරීමක් නැත. ෂෙයෝල්දී ඔබට ස්තුති කරන්නේ කවරෙක්ද?" "මළාහුවත් නිශ්ශබ්ද ස්ථානයට යන්නාහුවත් ස්වාමින්ට ප්‍රශංසා නොකෙරෙති." (ගීතාවලිය 6:5;115:17).



දාවිත් රජතුමා පිළිබඳව පේතෘස් පෙන්තකොස්ත දවසේදී මෙසේ පැවසුවේය. "කුලජ්‍යෙෂ්ඨවූ දාවිත් මැරී තැන්පත් කරනු ලැබූ බව භය නැතුව කියන්ට පුළුවන. ඔහුගේ සොහොන් ගෙය අද දක්වා අප අතරේ තිබේ." "මක්නිසාද දාවිත් ස්වර්ගයට නැගුණේ නැත." (ක්‍රියා 2:29, 34). මළවුන් නැගිටුවන දවස තෙක් දාවිත් සොහොන් ගෙයි සැතපී සිටින බව පෙන්වා දීමෙන් ඔප්පු වන්නේ මරණයේදී දැමිටුවන් සගයට යන්නේ නැත යන සත්‍යයයි. ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූසේක යන කරුණ පදනම් වූ සත්‍යතාව මත සිදුවන්නාවූ දැහැමි වූවන්ගේ මළවුන්ගෙන් නැගිටීමේදී දාවිත්ට අන්තිමේදී දෙවියන්වහන්සේගේ දකුණු පසෙහි නැගී සිටීමේ අයිතිය උදා වන්නේය.

පාවුල් මෙම විෂය පිළිබඳව මෙවන් ප්‍රකාශනයක් ඉදිරිපත් කරයි. "මක්නිසාද මළාහු නැගිටුවනු නොලබත් නම් ක්‍රිස්තුස්වහන්සේත් නොනැගුටුණු සේක. ඉදින් ක්‍රිස්තුස්වහන්සේ නොනැගුටුණු සේක් නම්, නුඹලාගේ ඇදහීම නිෂ්ඵලය; නුඹලා මේ දක්වා නුඹලාගේ පාපවල සිටින්නහුය. එපමණක් නොව, ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සැතපුණු අයද විනාශ වුණෝ වෙති." (1 කොරින්ති 15:16-18). වසර හාර දහසක් පුරා මරණයට පත්වූ දැමිටුවන් සෘජුවම සගයට ගියේ නම්, මළවුන්ගෙන් නැගිටීමක් සිදුවන්නේ නැතිනම් ක්‍රිස්තුස්වහන්සේ තුළ අදහා සමාදානයේ සැතපුණු අය විනාශ වී සිටිනවා යයි පාවුල් පැවසුවේ කෙසේද? එසේනම් මළවුන්ගෙන් නැගිටුවීමක් අවශ්‍ය වන්නේ නැත.

වේදසාක්ෂිකයෙක් වූ ටින්ඩේල්, මළාහු සැතපී සිටීම ගැන ඇත්තාවූ ඉගැන්වීම ආරක්ෂා කරමින් පාප් සභාවට අයිතිවූ ඔහුගේ විරුද්ධ කරුවෙකුට මෙසේ පවසා තිබේ: "ඔවුන් (මළාවූ ආත්මයන්) ස්වර්ගයට, නිරයට හෝ නරකාදියට ගිය බව පැවසීමෙන් නුඹලා ක්‍රිස්තුස්වහන්සේද පාවුල්ද මළවුන්ගෙන් නැගිටීම ගැන ඉදිරිපත් කළාවූ තර්කය විනාශ කරති. ඒ ආත්මයෝ ස්වර්ගයෙහි සිටින්නෝ නම් ඔවුන් දේවදූතයන්ගේ තත්ත්වයෙන් නොසිටින්නේ ඇයි දැයි මට දක්වන්න. එසේනම් මළවුන්ගෙන් නැගිටීමක් ඇතිවිය යුත්තේ කුමටද?" Tyndale, Wm, Preface to "New Testament" (ed 1534)

මරණයට පත්වන්නාවූ මොහොතේදීම දැමිටුවන්ට සදාතන ස්වර්ගීය සැපත හිමි වන්නේය යන ඉගැන්වීම වත්මන් ලෝකයෙහි ඉතා ජනප්‍රිය දහමක් බවට පත්වී තිබේ. මෙම ජනප්‍රිය ඉගැන්වීම නිසා මළවුන්ගෙන් නැගිටුවාලීමේ බයිබලීය දහම පිළිබඳව උනන්දුවක් දැක්වීම හීන වී ඇත. බයිබලීය දහමට විරුද්ධවූ මේ දහම පිළිබඳව වර්තමාන ශතවර්ෂයේ මුල්භාගයේදී ආචාර්ය ඇඩම් ක්ලාර්ක් මෙසේ පැවසුවේය. "වර්තමානයේ පවතිනවාට වඩා ප්‍රබල ලෙස නැවත

නැගුටුවනු ලැබීමේ දහම පෙර කාලීන කිතුණුවන් අතරේ දැඩි ලෙස පැවැතියේය. මේ කෙසේද? එහි විපාකය ගැන ඔවුන් විපුල ලෙස දැනුවත් කර තිබුණෝය. නැවත නැගිටීම පිළිබඳව අපෝස්තුළුවරු අඛණ්ඩව ජනතාව දැනුවත් කළෝය. එම දහමෙහි පෙළඹවීම මගින් කිතුණුවන් උනන්දුවට පත්කිරීමටත් කීකරුකම කරා යොමු කිරීමට සහ සිත් සතන්හි සොම්නස උදා කිරීමටත් ගෝලයෝ සමත් වූහ. එහෙත් ඔවුන්ගෙන් පැවත එන්නාවූ වර්තමාන දේශනාකාරයෝ නැවත නැගිටීම ගැන සඳහන් කරන්නේ කලාතුරකිනි. මළවුන්ගෙන් නැගුටුවනු ලැබීම අනිවාර්ය සංසිද්ධියක් බව අපෝස්තුළුවරු දේශනා කළෝය. ආදි කාලීන ක්‍රිස්තු භක්තිකයෝ එය විශ්වාස කළෝය. අපිද එසේ දේශනා කරන්නෙමු. අපගේ ශ්‍රාවකයෝද එය විශ්වාස කරති. මෙම විෂය පිළිබඳව දැඩි ලෙස අවධාරණය කරමින් වූ ඉගැන්වීමට ශුභාරංචියෙහි ප්‍රමුඛ ස්ථානයක් හිමිවී තිබේ. මේ හා සමාන අවධානයක් යොමු කළාවූ වෙනත් විෂයක්ද නැත. එසේම, වත්මන් දහම් පද්ධතිය තුළ මෙතරම් අතපසු කරනු ලැබූ තවත් දහමක්ද නැත." (Commentary on the New Testament on 1 Corinthians 15, Para 3).

මරණය වූ සැණෙන් ආත්මය ස්වර්ගයට යන්නේය යන දහම කිතුණුවන් අතර ප්‍රබල පිළිගැනීමකට භාජන වීමත් සමගම එයට සමගාමීව නැවත නැගිටීම පිළිබඳවවූ තේජස්ශ්‍රීය ඉගැන්වීම ක්‍රමයෙන් අභාවයට පත්වීමක් සිදුවිය. පාවුල් විසින් 1 තෙසලෝනික 4:13-18හි ලේඛණ ගත කර ඇති දෙය ගැන අටුවාවක් සපයන්නාවූ ප්‍රවේනි ආගමික ලේඛකයෙක් මෙසේ පවසන්නේය: "යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳ දහම අප බොහෝ දෙනෙකුට අනුමාන ඉගැන්වීමකි. ඒ අතර අප සිතට ඉමහත් සැනසිල්ලක් ගෙන දෙන්නාවූ නූතන ඉගැන්වීමක් ඉදිරිපත් කර තිබේ. එනම්, දමිටුවන් මළ සැණින් ආශිර්වාද ලත් අමරණය අත්පත් කරගන්නවා ඇත යන දහමය. මරණ මංචකයේදී අපගේ සමිදාණෝ අප වෙත පැමිණෙනසේක. අපි එම සිදුවීම ගැන බලා සිටිය යුතු වෙමු. මරණයට පත්වූවන් දැනටමත් තේජස කරා ගොස් සිටිති. විනිශ්චයේ සහ ආශිර්වාද ලත් සම්පතෙහි හොරණෑ නාදය නික්මෙන තුරු ඔවුහු බලා නොසිටින්නෝය."

තමන්වහන්සේගේ ගෝලයන් හැරදමා සගයට යැමට මත්තෙන්, ඔවුන් ඉතා ඉක්මණින් තමන් ළඟට පැමිණෙනවා ඇතැයි කියා යේසුස්වහන්සේ ගෝලයන්ට පැවැසුවේ නැත. ඔවුන් තමන්වහන්සේ වෙත පැමිණෙනවා වෙනුවට උන්වහන්සේ ඇවිත් ඔවුන්ව තමන්වහන්සේ ළඟට ගැනීමට කටයුතු කරන බවට උන්වහන්සේ ඔවුන් දැනුවත් කළසේක. උන්වහන්සේ මෙසේ කීසේක: "නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල



කරමි නම් ... මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි." (යොහන් 14:2, 3). පාවුල් මේ පිළිබඳව තවදුරටත් මෙසේ අදහස් දක්වයි. "මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව." (1 තෙසලෝනික 4:16-18). ඔහු තවදුරටත් මෙසේද කියයි. "ඉන්නිසා මේ වචනවලින් එකිනෙකා සනසාගන්න." කළින් උපුටා දැක්වූ දේශනාකරුවාගේ වදන් සහ පාවුල්ගේ සැනසීම උදාකරන්නාවූ මේ වදන් අතර ඇත්තේ කෙතරම් මහත් වෙනසක්ද? විශ්වීය සර්ව ජනතාව ගැළවීමට හිමිකම් කියතියි යන දර්ශනය ඉගැන්වූ පෙර සඳහන් කළ දේශනාකරුවා මිය ගිය තැනැත්තාගේ නෑදෑ හිත මිතුරන් සැනසීම් වස් බයිබල් විරෝධී දහමක් ඉදිරිපත් කළේය. ඒ අනුව මිය ගිය තැනැත්තා කෙතරම් පාපිෂ්ඨයෙකු වුවද, තම අන්තිම හුස්ම හෙලත්ම ඔහු දේව දූතයන්ගේ පිළිගැනීමට ඔසවා ගනු ලබන්නේ යයි ඔහු පැවසුවේය. මතු සිදුවන්නාවූ ස්වාමින්වහන්සේගේ දෙවනවර පැමිණීම ගැන පාවුල් තම සහෝදරයන් දැනුවත් කළේය. එකල මිනී වලෙහි බැමි දෙදරා ගොස් "ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාහු" සදාතන ජීවිතයට නැගිටුවනු ලබන බව ඔහු පැවසුවේය.

යම්කිසි අයෙක් ආශිර්වාද ලත් වාසස්ථානයකට ඇතුළු කරගැනීමට පෙර ඔහු පිළිබඳව සෝදිසි කිරීමේ විභාගයක් පැවැත්වීම අනිවාර්ය වන්නේය. ඔවුන්ගේ චරිත හා ක්‍රියාදාමයන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ආවර්ජනය වෙමින් තීරණයක් කරා යොමු විය යුතුය. සගයේ ඇති පොත්වල ලියා ඇති කරුණු විමර්ශනය කරමින් සියල්ලෝම විනිශ්චයකට ලක් කෙරෙති. ඔවුන් විසින් සිදු කර ඇති ක්‍රියාදාමයන් අනුව ඔවුන්ට විපාක දෙනු ලැබේ. මේ විනිශ්චය මරණ මංචකයේදී සිදු නොවන්නේය. පාවුල්ගේ මේ වදන් ගැන සලකන්න: "තමන්වහන්සේ විසින් පත්කළ මනුෂ්‍යයා ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරවන්ට එක් දවසක් නියමකර තිබේ; උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් නැගිටවීමෙන් සියල්ලන්ට ඒ ගැන සහතිකයක් දී තිබේ." (ක්‍රියා 17:31). මෙහිදී අපෝස්තුළු වරයා පෙන්වා දී ඇති පරිදි අනාගතයේදී යම්කිසි නිශ්චිත දිනයකදී ලෝකයේ විනිශ්චය සිදුවනවා නියතය.

මෙම කාල පරිච්ඡේදය ගැනම යූදස්ද තම අදහස් මෙසේ දක්වයි. "තමුන්ගේම අධිපතිකමෙහි නොපැවත ස්වකීය වාසස්ථානය අත්හැරියාවූ

දේවදූතයන්ද උන්වහන්සේ මහත් දවසේ විනිශ්චය පිණිස අන්ධකාරය යට සදාකාල බැඳුම්වලින් බැඳ තැබූසේක." ඔහු නැවත ඒනොක්ගේ වචන අනුව මෙසේද පවසයි. "බලව, සියල්ලන් කෙරෙහි යුක්තිය ඉෂ්ට කරන්ටද.... ස්වාමින්වහන්සේ ස්වකීය දස දහස් ගණන් ශුද්ධවන්තයන් සමග" එන බව ඔහු දක්වීය. (යූදස් 6,14,15). යොහන් මෙසේ පැවසුවේය: "මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි. පොත්ද දිගහරිනු ලැබුවේය... මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය." (එළිදරව් 20:12).

මියගිය ඇත්තෝ දැනටමත් ස්වර්ගීය සැප සම්පත් භුක්ති විඳිමින් සිටිත් නම්, නැතහොත් නිරයේ ගිනි දල් අතර ඇඹරෙමින් සිටිත් නම්, අනාගත විනිශ්චයක ඇති ඵලය කුමක්ද? මෙම වැදගත් විෂයන් පිළිබඳව දේව වචනයේ අඩංගු දහම් පැහැදිලිය; ඒවා එකිනෙකට විරුද්ධවූ ඉගැන්වීම් නොවන්නේය, සාමාන්‍ය මනසකට වුවද, එම ඉගැන්වීම් තේරුම් ගත හැකි වේ. එහෙත් වර්තමාන ඉගැන්වීම් අනුව ඉදිරිපත් කෙරෙන්නාවූ කාරණාවල ප්‍රඥවක් හෝ යුක්ති සහගත බවක් දැකගන්නට අවංක මනසකට හැකියාවක් තිබේද? අවුරුදු මහත් ගණනාවක් දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි කල් ගත කළ දමිටුවන්ට ප්‍රණාමය පුද කරන්නේ සෝදිසි කිරීමේ විනිශ්චයේදී ඔවුන්ගේ කාරණා සෝදිසි කරනු ලැබුවාට පසුවද? ඔවුන්ට තිළිණ ප්‍රදානය කරමින් මෙසේ පවසනු ලබන්නේද? "යහපත්වූ විශ්වාස වූ දාසය, ඒ යහපත... නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙන්න." (මතෙව් 25:21). ඒ අතර, නිරයේ ශාපයට යට වී දුක් විඳිමින් සිටින්නාවූ අභක්තිකයන්ද ලෝකයේ විනිශ්චයකාරයාගේ දඬුවමෙහි නඩු තීන්දුව ලැබීමට නිරයේ සිට විනිශ්චාසනය ඉදිරියට පමුණුවනු ලැබේද? එහිදී ඔවුන්ට ලැබෙන්නාවූ නඩු තීන්දුව වන්නේ, "ශාපලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්න," (මතෙව් 25:41) යන්නද? අහෝ කෙතරම් අවමානනීය නින්දා කිරීමක්ද! දෙවියන්වහන්සේගේ ප්‍රඥා මහිමයත් යුක්ති සාධාරණත්වයත් කෙතරම් සැහැල්ලුවට පත්කිරීමක්ද!

ආත්මයෙහි අමරණීයත්වය සහ නිබන්ධනය වනාහි රෝමය විසින් මිසදෙටු ආගම් වලින් ලබාගෙන කිතුණු දහමට කාවද්දා ඇති ව්‍යාජ දහමකි. මාටින් ලූතර් විසින් එය වර්ගීකරණය කරනු ලබන්නේ පාප්ගේ ආඥා පාදක කරගෙන ගොඩ නගා ඇති රෝමානු මතයන්හි ඇති අති දුෂ්ටවූ ද අති විශාලවූ ද මුසා දහමක් ලෙසය, මිථ්‍යා ඉගැන්වීමක් ලෙසය. මියගිය ඇත්තෝ කිසිවක් නොදනිතියි යනුවෙන් සාලමොන් නමැති දේශනාකාරයාගේ ප්‍රකාශිතය පදනම් කරගෙන



ප්‍රතිසංස්කාරකයා මෙසේ පවසා ඇත. "මෙය මියගිය අයට හැඟීම් කිසිවක් නැතැයි ඔප්පු කරන්නාවූ තවත් බයිබල් පදයකි. මියගිය අය සම්පූර්ණයෙන්ම නිදා සිටිති. ඔවුන්ට කිසි කල්පනාවක් නොමැත. දවස් හා වසර ගණන් නොගෙන ඔවුහු නිදා සිටිති. ඔවුන් අවදි කරනු ලැබූ විට, තමා ස්වල්ප මොහොතක් පමණක් නිදා සිටි බවක් ඔවුන්ට හැඟී යනවා ඇත." (Luther's Exposition of Solomon's Book Called Ecclesiastes", p. 152).

මරණයට පත්වීමත් සමගම දැහැමියා තමාගේ විපාක ලැබීමටත් පාපතරයා තමාගේ දඬුවම ලැබීමටත් හිමිකම් කියන බවක් ශුද්ධවූ ලියවිල්ලෙහි කිසිම තැනක හමු නොවේ. කුල දෙටු පියවරුන් සහ දිවැසි ප්‍රසාදිවරුන් එවන් සහතිකයක් ලබා දී නැත. එවන් සිදුවීමක ඉඟියක් ක්‍රිස්තුස්වහන්සේ හෝ ගෝලයන්ද ලබා දී නැත. මියගිය මොහොතේදීම දමිටුවන් සගය වෙත නොයන බව ශුද්ධ බයිබලය පැහැදිලිවම උගන්වයි. ඔවුන් මළවුන්ගෙන් නැගිටුවනු ලබන තෙක් සිහිසුන්ව සැතපී සිටින බව ශුද්ධ බයිබලය උගන්වයි. (1 තෙසලෝනික 4:14; යෝබ් 14:10-12). 'රිදී ලණුව ලිහී රන් භාජනය බිඳී යන්නාවූ' දවසෙහිදීම මරණයට පත්වූ තැනැත්තාගේ සියළු කල්පනාවන් නැති වී යන්නේය. (දේශනාකාරයා 12:6). මිනී වළට යන සියල්ලෝම නිහඬව සිටිති. ඉර යට කෙරෙන්නාවූ කිසිම දැයක් ගැන ඔවුන්ට දැනුමක් නැත. (යෝබ් 14:21). වෙහෙසට පත්වූ දැහැමි ජනතාවට ආශිර්වාද ලත් විවේකයක් ලැබෙන්නේය. ඔවුන් නිදා සිටින කාලය දික් වුවද, කෙටි වුවද ඔවුන්ට ඒ ගැන දැනීමක් නැත. මළවුන්ගෙන් නැගිටුවනු ලැබීමේදී තමන් නිදා සිටියේ එක කෙටි මොහොතක් පමණක් බව ඔවුන්ගේ හැඟීම වන්නේය. ඔවුහු නිදා සිටිති. දෙවියන්වහන්සේගේ හොරණෑ හඬ ඇසීමත් සමගම දමිටුවෝ අමරණය පැළඳ තේජසින් යුතුව මිනී වළෙන් පිටතට පැමිණෙන්නෝය. "හොරණෑව පිඹිනු ලබන්නේය. එකල මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය... දිරන සුළු වූ මේක නොදිරන භාවයටත් මරණීය වූ මේක අමරණීය භාවයටත් පැමිණි කල්හි: මරණය ජයෙන් ගිලිනා ලද්දේ යයි ලියා තිබෙන වචන සම්පූර්ණ වේ." (1 කොරින්ති 15:52-55). ඔවුන් නින්දෙන් පුබුදුවනු ලැබූ කල්හි ඔව්හු අවසානයේදී තමාට තිබුණාවූ සිතුවිලි අනුව සිතන්නට පටන් ගනිති. ඔවුන්ට ඇතිවූ අවසාන හැඟීම නම් තමා මරණයට පත්වන බවය. ඔවුන්ගේ අවසාන සිතුවිල්ල වූයේ තමා මරණයේ බලයට යටත් වන බවය. ඔවුන් මිනී වළෙන් එළියට පැමිණි මොහොතේදීම "එම්බා මරණය නුඹේ ජය කොයිද? එම්බා මරණය නුඹේ කටුව කොයිද" යනුවෙන් ඔවුන්ගේ පළමුවන ප්‍රීතිමත් සිතුවිල්ල දෝංකාරය කරනු ලබනවා ඇත.

# 34

## භූත විද්‍යාව

බයිබලයේ දක්වන්නාවූ ශුද්ධවූ දේව දූතයන්ගේ මෙහෙවරය වනාහි සෑම ක්‍රිස්තු අනුගාමිකයෙකුටම ඇත්තාවූ ඉතා අගනාවූද සිත් සතන් සනසන්නාවූ ද සත්‍යතාවකි. එහෙත් බයිබලයේ ඇත්තාවූ මෙම ඉගැන්වීම ජනප්‍රිය දහම් මගින් අඳුරට ඇද දමා, එහි යථාර්ථය විකෘති කර වෙනත් ව්‍යාජ ඉගැන්වීමක් ඒ වෙනුවට ඉදිරිපත් කර ඇත. "මළාහු කිසිවක් නොදනිති"යි යන්න ශුද්ධ බයිබලයේ අඩංගු සරල ඉගැන්වීමකි. එම සත්‍යතාවට විරුද්ධව මිසදෙටු ආගම් උගන්වන්නේ 'මිනිසා සතුව අමරණය ඇත' යන දර්ශනයකි. ඒ අතර සත්‍ය කිතුණු දහම යටපත් කරමින් පැන නැගී අන්ත-ක්‍රිස්තු වේදය විසින් සත්‍යයෙන් මුළාව ගියාවූ ඒ අඳුරු යුගයේදී මේ වැරදි ඉගැන්වීම කිතුණු දහම හා ඒකාබද්ධ කරන ලදී. 'දේව දූතයන් වනාහි ගැළවීම උරුම කරගනු ලබන්නන් හට සේවය කරන්නට සිටින සේවක ආත්මයන්' බව ශුද්ධ ලියවිල්ල පෙන්නුම් කරයි. එහෙත් අද පවතින ජනප්‍රිය ඉගැන්වීම් අනුව මෙම දේව දූතයෝ වනාහි මියගියවුන්ගේ ආත්ම වන්නෝය. බොහෝ දෙනෙක් මෙම ඉගැන්වීම ඉතා ආදරයෙන් පිළිගනිති. මෙම ලෝකය මැවීමටත් පෙර දේව දූතයන් ජීවත්ව සිටි බව ශුද්ධ බයිබලය පැහැදිලිව උගන්වන්නේය. මිනිසා මරණයට පත්වීමටත් පෙර දේවදූත-මිනිස් සම්බන්ධතා පැවැති බවට ශුද්ධ බයිබලය සාක්ෂි දරන්නේය.

මරණයට පත් මිනිසාට සිහි කල්පනාව ඇත යන ඉගැන්වීම මූල ධර්මයක් බවට පත්ව ඇත. මියගිය අයගේ ආත්ම ජීවත්ව සිටින්නාවූ අයට උපකාර කිරීමට, සේවය කිරීමට පැමිණෙතැයි යන දහම මළවුන් සමග කථා කිරීමට හැකිය යන නවීන භූත විද්‍යාවට මාර්ගය සකසා තිබේ. මිය ගිය අය දෙවියන්වහන්සේගේ අභිමුඛය වෙත පිළිගනු ලබන්නේ නම්, ඔවුන් දේව දූතයන්ගේ සමාගමට ඇතුළු කරගනු ලබන්නේ නම්, පෙර නොතිබූ විරූ දැනගැන්මක් ලැබීමට අවස්ථාවක් ඔවුන්ට අත් වන්නේ නම් ඔවුන් මේ ලෝකයට පැමිණ ජීවත්ව සිටින්නවුන් ප්‍රබුද්ධ කරමින් ඔවුන්ට ගුරු හරුකම් ලබා නොදිය යුත්තේ මන්ද? ජනප්‍රිය දේව ධර්ම ගුරුවරුන් උගන්වන්නේ මියගිය අයගේ ආත්ම මෙලොව සිටින්නාවූ ඔවුන්ගේ මිතුරන් වසන්නාවූ තැන්හි ඉහළින් සැරි සරමින් සිටින බවට වූ දහමකි. එසේ නම් එම ආත්මයන්ට තම මිතුරන් සමග කථා බස් කිරීමටද, නපුරට විරුද්ධව හඬක් නැගීමටද, ඔවුන්ට දුකක් ඇති වූ විට ඔවුන් සනසන්නටද



අවසර නොදිය යුතු මන්ද? මරණයට පත්වුවද, කෙනෙකුගේ ආත්මයට සිහි බුද්ධිය ඇතැයි බොහෝ අය විශ්වාස කරති. එසේ නම් තේජස් මහිමයෙන් සරසනු ලැබූ ආත්ම විසින් ගෙන එනු ලබන දිව්‍ය ආලෝකය ජීවත්ව සිටින්නාවූ අයට ප්‍රතික්ෂේප කළහැක්කේ කෙසේද? තමාගේ අරමුණු සපුරා ගැනීම් වස් සාතන් මේ ඉගැන්වීම භාවිතා කරයි. සාතන්ගේ අණසකට යටත්ව ක්‍රියා කරන්නාවූ වැටී ගිය දූතයෝ ජීවත්ව සිටින්නාවූ මිනිසා ඉදිරියෙහි පෙනී සිටිමින් තමා ආත්ම ලෝකයෙන් පැමිණි අය බව කියා සිටිති. මිය ගිය අය සමග කථා බස් කරමින්, ඔවුන් සමග සම්බන්ධතාවන් ගොඩනගා ගැනීමට මනුෂ්‍යයන්ට උපකාර කරමින් නපුරෙහි කුමාරයා තමාගේ වශී කිරීමේ අනුබලයෙන් ඔවුන්ගේ මනස් මත ක්‍රියා කරයි.

මිය ගිය මිතුරන්ගේ පෙනුම රැගෙන ජීවත්ව සිටින්නවුන් ඉදිරියෙහි පෙනී සිටීමට සාතන්ට පුළුවන. මෙම ව්‍යාජ පෙනුම සම්පූර්ණය. මිය ගිය තැනැත්තාගේ හුරු පුරුදු පෙනුම, ඔහුගේ වචන ලීලාව, කටහඬ, පුදුමාකාර ලෙස නිරූපණය කරනු ලැබේ. මිය ගිය තමන්ගේ මිතුරන් ලෙසින් පෙනී සිටින්නාවූ යක්ෂාත්ම පවසන්නාවූ බසින් ජීවත්ව සිටින්නාවූ අය සැනසුම් සුවයක් ලබති. තමන් සගයේ සැප සම්පත් විඳිමින් ජීවත්ව සිටින බව මෙම ආත්මයෝ පෙන්නුම් කරති. තම මිතුරන් සගයේ ප්‍රීතියෙන් කල් හරින බව ස්ථිර ලෙස කල්පනා කරමින් ජීවත්ව සිටින්නාවූ අය සොම්නසට පත් වෙති, සැනසුම් සුසුම් හෙළති. අන්තරාදායක තත්ත්වයක් උදා වී ඇති බව අනුමාන නොකර ඔවුහු "රැවටිලිකාර ආත්මයන්ට හා යක්ෂ භූත ඉගැන්වීම්වලට" ඇහුම් කන් දෙති.

ජීවත්ව සිටින්නාවූ අය සමග කථා බස් කිරීමට මිය ගිය අය පැමිණෙතැයි යන නිශ්චිතය විශ්වාස කිරීමට පොළඹවා ගැනීමෙන් පසුව, ස්වර්ගය සඳහා සූදානම් වීමකින් තොරව මිය ගිය දුෂ්ටයන්, ජීවත්ව සිටින්නාවූ අය ඉදිරියට පමුණුවනු ලැබේ. තමන් ස්වර්ගයෙහි ප්‍රීතියෙන් යුතුව කල්ගත කරන බවටද තමා සගයේ ඉහළ තනතුරු දරන බවටද මෙම භූත ආත්ම සහතික වෙති. මෙයාකාරයෙන් දැහැමි අය සහ පව්කාර අය අතර වෙනසක් නැත යන ජනප්‍රිය සාවද්‍ය ඉගැන්වීම තහවුරු කරනු ලැබේ. ආත්ම ලෝකයේ සිට පැමිණියේයයි කියමින් පෙනී සිටින්නාවූ මෙම ව්‍යාජ අමුත්තෝ සමහර විටෙක ඉදිරි දවසක සිදුවන්නාවූ උපද්‍රව ගැන අනතුරු අඟවති, පරෙස්සම් වීමට උපදෙස් දෙති. මෙම අනාගත උපද්‍රව ගැන කියූ සමහර දේ සත්‍ය වශයෙන්ම ඉටු වෙයි. මෙසේ මහජන විශ්වාසය දිනාගැනීමෙන් පසුව ඔවුහු ශුද්ධ ලියවිලි කෙරෙහි ඇති විශ්වාසය සහ ඇදහිල්ල නැතිකර දැමීම අරභයා ව්‍යාජ දහම් ඉදිරිපත් කරති. පොළොවෙහි ජීවත් වන්නාවූ

තම මිතුරන්ගේ ශුභ සිද්ධිය උදෙසා මහත් උනන්දුවක් ඇතැයි කියන්නාවූ මෙම භූත-ආත්ම අති භයානක ව්‍යාජ ධර්මතාවන් ඔවුන්ගේ සිත් තුළට කාවද්දති. ව්‍යාජ-ආත්මයෝ සමහර අවස්ථාවන්හිදී යම්කිසි සත්‍යතාවන් ප්‍රකාශ කරති, සමහර අවස්ථාවන්හිදී ඉටුවන්නාවූ අනාවැකි පවසති. මෙම සාක්ෂි දැරීම් මගින් තමන්ගේ ප්‍රකාශන කෙරෙහි විශ්වාසය තැබිය හැකිය යන නිශ්චිතයක් ගොඩ නගාගැනීමට මෙම ආත්මයෝ උපක්‍රමශීලී වෙති. ඔවුන් ඉදිරිපත් කරන්නාවූ බොරු ඉගැන්වීම් පිළිගැනීමට විශාල ජන සංඛ්‍යාවක් සූදානමින් සිටිති; ඔවුහු විචාරයකින් තොරව බයිබලයේ ශුද්ධ දහම් ලෙසින් ඒවා පිළිගනිති. දෙවියන්-වහන්සේගේ ධර්මිෂ්ඨ ව්‍යවස්ථාව ඉවත දමනු ලැබේ; කරුණා අනුග්‍රහයේ ආත්මය එපා කරනු ලැබේ; ගිවිසුමෙහි රුධිරය අශුද්ධ දෑයක් ලෙස ගණන් ගනු ලැබේ. මෙම භූතාත්ම ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යත්වය ප්‍රතික්ෂේප කරති; මැවුම්කාරයාණන් තමන්ගේ මට්ටමේ අයෙකු බවත් දක්වති. මෙසේ අළුත් මුහුණුවරක් යටතේ ක්‍රියාත්මක වන්නාවූ මහා ත්‍රස්තවාදියා සගයේ ආරම්භ කළ තම සටන ඉදිරියටම මෙහෙයවයි. මෙම සටන අපගේ භූමියෙහි වසර සය දහසක් පුරා ක්‍රියාත්මකව පවතී.

භූතාත්ම ප්‍රදර්ශනය වීම් වංචාකාර ප්‍රයෝගයන් ලෙස හෝ අතින් සිදුකරන ඉන්ද්‍රජාල ඇස් බැන්දුම් ක්‍රියාවන් ලෙස හෝ වර්ගීකරණය කිරීමට බොහෝ අය උත්සාහ කරති. ඉන්ද්‍රජාල ක්‍රියාවෙහි ප්‍රතිඵලය අව්‍යාජ එකක් බව කියා පෑවද ඒ හා සමගම සුපිරි බලවේගයක ප්‍රදර්ශනය වීම්ද සිදුව ඇති බව රහසක් නොවේ. වර්තමාන භූතාත්ම වාදයට අඩිතාලම දැමූ අභිරහස් තට්ටු කිරීම ව්‍යාජ වූ හෝ කපටි වූ සිදුවීමක් නොවීය. එය යක්ෂාත්මයන්ගේ ඍජු ක්‍රියාදාමයක් විය. මෙම ක්‍රමවේදය මගින් ආත්ම විනාශ කිරීමේ මහා පරිමාණයේ සාර්ථක මූළා කිරීම් ආරම්භ විය. භූතාත්ම ප්‍රදර්ශනය වීම් වනාහි මිනිස් ප්‍රයෝගකාරී වංචාවක් පමණක් යයි පවසන්නාවූ බොහෝ දෙනෙක් සාතන්ගේ උගුලෙහි පැටලෙනවා නොඅනුමානය. යම්කිසි අවස්ථාවකදී තමන් ඉදිරිපිටදීම අන්ධකාර බලවේගයේ අද්භූත ප්‍රදර්ශනය වීමක් සිදුවූ විට ඔවුහු මුළාවට පත්කරනු ලැබෙති. එවන් අද්භූත ක්‍රියාවන් දෙවියන්වහන්සේගේ සුපිරි බලයෙන් සිදු වූවා යයි නිගමනය කිරීමට ඔවුහු පෙළඹෙති.

මේ මනුෂ්‍යයෝ සාතන් සහ ඔහුගේ දූතයන් විසින් සිදුකරන්නාවූ පුදුමාකාර ක්‍රියාදාමයන් පිළිබඳව ශුද්ධ ලියවිල්ලෙහි ඇති සාක්ෂීන් නොතකා හරිති. දෙවියන්වහන්සේ විසින් ඵාරාවෝ ඉදිරියෙහි මෝසෙස් ලවා කළ හාස්කම් ව්‍යාජානුකරණයෙන් කිරීමට ඵාරාවෝගේ මායාකාරයන් සමත් වූයේ සාතන්ගේ බලය මගින්ය. මිසරයේ සිදුවූ



සාතනික බලය ප්‍රදර්ශනය කිරීම් වැනි හාස්කම් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමට පෙර ඇති දවස්වලදී සිදුවන බව පාවුල් පවසයි. ස්වාමීන්වහන්සේගේ පැමිණීමට පෙරාතුව සාතන් "සියළු ආකාර ආශ්චර්යවලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද .... සියලු රැවටිලිවලින්ද යුක්ත වේ." (2 තෙසලෝනික 2:9). අන්තිම දවස්වලදී ප්‍රදර්ශනය වන්නාවූ හාස්කම් සිදු කරන්නාවූ බලවේගය ගැන විස්තර කරන්නාවූ යොහන් මෙසේ පවසයි: "ඌ මනුෂ්‍යයන් ඉදිරියෙහි අහසින් පොළොවට ගිනි බස්වන තරමට මහත් හාස්කම් කරන්නේය. ... හාස්කම් කරණකොටගෙන ඌ පොළොවේ වැසියන් මුළා කරන්නේය." (එළිදරව් 13:13,14). ව්‍යාජ ලෙස පෙනී සිටීම් පිළිබඳව මෙහි කථා නොකෙරේ. හාස්කම් සිදුකිරීමට සාතන්ගේ දූතයන්ට බලය තිබෙන අතර ඔව්හු ව්‍යාජ පෙන්නුම් කිරීමක් නොකරති. බොහෝ දෙනෙක් මෙම හාස්කම් දැකීමෙන් මුළාවට පත්වනවා ඇත.

විශාල කාලයක් තුළ තම බලය මිනිසුන්ව මුළා කිරීමේ ක්‍රියාදාමයන්ට යොමු කළ මෙම අන්ධකාරයේ කුමාරයා සෑම තරාතිරකම මිනිසුන් තම පරීක්ෂාවන්ට හසුකර ගැනීමට කාර්යක්ෂම ලෙස ක්‍රියා කරන්නේය. උසස් තත්ත්වයක සිටින්නාවූ අයටද බුද්ධිමත් පඬිවරුන්ටද සාතන් භූත වාදය එනම් මළවුන්ට කථාකිරීම ඉදිරිපත් කරන්නේ සංස්කෘතික ලාලිත්‍යයක් වශයෙනි. මෙසේ ඔව්හු ඔහුගේ උගුලට අසුවෙති. භූතාත්ම වාදය මගින් උදාවන්නාවූ ප්‍රඥාව පිළිබඳව යාකොබ්ගේ ප්‍රකාශයකට අවධානය යොමු කරමු. "ඒ ප්‍රඥාව ඉහළින් පැමිණෙන එකක් නොව භූමිකව මාංසිකව යක්ෂාකාරව තිබේ." (යාකොබ් 3:15). මුළා කරන්නා මෙම සත්‍යතාව වසන් කරගෙන ක්‍රියා කරන්නේ තමාගේ අරමුණ ඉටුකරගැනීම සඳහා වසන් කිරීමක් අවශ්‍ය බව ඔහුට පෙනී යන විටය. ක්‍රිස්තුස්වහන්සේ වනාන්තරගතව යක්ෂයා විසින් පරීක්ෂාවන්ට පොළඹවනු ලැබූ අවස්ථාවෙහිදී ඔහු ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියේ ස්වර්ගීය දූතයෙකුගේ දීප්තිමත් තේජසින් යුතුවය. ඔහු මිනිසුන් ඉදිරියෙහි පෙනී සිටින්නේද ඉතා ආකර්ෂණීය රූප සොබාවකින් යුතුවය. ඔහු ආලෝකයේ දූතයෙකු ලෙස පෙනී සිටිමින් මිනිසුන්ගේ බුද්ධියට කරුණු ඉදිරිපත් කරමින් ඔවුන්ට ඉහල තලයක පැවැත්මක් දිනාගත හැකි බව දක්වයි. මිනිසුන්ගේ කුතුහලය පුබුදු කරමින් ඔහු ඔවුන් ඉදිරියෙහි සිහින මාළිගා නිර්මාණය කරයි. ආදරය සහ ත්‍යාගශීලීතාව පිළිබඳව උසස් අන්දමට කථාකරමින් සාතන් මිනිසුන් රවටමින් ඔවුන්ගේ ලැදියාව තමා වෙත දිනාගැනීමට උපක්‍රමශීලී වන්නේය. සිහින මාළිගා සහ මනෝ සංකල්පනා ඉතා ඉහළ වූ තලයක් කරා යොමු කරන්නාවූ හෙතෙම මිනිසාට තමාගේ ප්‍රඥාව ගැන ආඩම්බර වීමට සලස්වයි. එමගින් ඔහු සදාතනික තැනැන්වහන්සේගේ උත්තරීතර ස්ථානය සැහැල්ලුවට පත් කිරීමට

ඔවුන් යොමු කරයි. ඒ බලවත් කුමාරයා, ලෝකයේ මිදුම්කරුවාණන්ව ඉතා උස්වූ කඳු මුදුනක් කරා රැගෙන ගියේය. ලෝකයේ සෑම රාජ්‍යයක් සහ එහි විභූතියත් උන්වහන්සේ ඉදිරියෙහි පෙන්නුම් කිරීමට තරම් සාතන් ක්‍රියාත්මක විය. එසේම ඔහු මිනිසුන්ගේ හැඟීම් විකෘති කිරීමට අනේක තේමාවන් ඉදිරිපත් කරනවා ඇත. දිව්‍ය බලයෙන් ආරක්ෂාව නොලැබූ සැවොම ඔහුගේ මුළාවන්ට ගොදුරු වෙනවා ඇත.

අධි ප්‍රශංසාවෙන් යුත් චාටු බස් පැවසීමෙන්, තහනම් දැනුම ලබාගැනීමට ආශාවක් සිත් තුළ ඇති කිරීමෙන් හා තමාගේම උන්නතිය උදෙසා ආශාවන් හඹා යෑමට සැලැස්වීමෙන් සාතන් එදා ඒවව හසුකරගත්තා සේම අදත් මිනිසුන්ව ස්වකීය ග්‍රහණයට නතු කරගැනීමට සෑම ආකාර උපායක්ම භාවිතා කරයි. මෙවන් අභිලාෂයන් කරා යෑමට වෑයම් කිරීමෙහිදී ඔහුගේ වැටීම සිදුවිය. මිනිසාගේ විනාශය ළඟා කරදීමට ඔහු යොදා ගන්නේද එවැනිම ක්‍රමවේදයන්ය. ඔවුන් "යහපත සහ නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බව" ඔහු ප්‍රකාශ කළේය. (උත්පත්ති 3:5). 'දියුණු වෙමින් ඉදිරියටම යෑම මිනිසාගේ ජන්ම උරුමයකි; උපතෙහි පටන්ම ප්‍රගතියට යොමුවීම මිනිසාගේ ඉරණම වන්නේය; සදාතනය කරා ඔහු ප්‍රගතිය ලැබිය යුතුය; දේවත්වය කරා එළඹීමට ඔහු ඉදිරියටම දියුණු විය යුතුය' යනාදිය භූත වාදයෙහි මූලධර්මයන්ය. තවද, එම දහම මෙසේද ප්‍රකාශ කරන්නේය: 'සෑම මනසක්ම, වෙනත් අයෙකුගේ මනස නොව, තමාගේම මනස විනිශ්චය කළ යුතුය.' එය ස්වයං විනිශ්චය කිරීමක් නිසා එය නිවැරැදි තීරණයක් වන්නේය .... සිහසුන ඇත්තේ ඔබ තුළමය. එක්තරා භූතවාදී ගුරුවරයෙක් තමාගේ භූතාත්මික හෘදය සාක්ෂිය පිබිදීමට පත් කළ ප්‍රකාශනයක් මගින් මෙවැන්නක් පැවසීය. 'මාගේ සහෝදර ජනතාවෙනි, අපි සියල්ලෝම වැටී නොගියාවූ දේවතාවුන් වන්නෙමු.' තවත් එවන් පුද්ගලයෙක් මෙසේ පවසයි. 'යම්කිසි ධාර්මිකවූ ද, පරිපූර්ණවූ ද පුද්ගලයෙක් සිටින්නේ නම් ඔහු ක්‍රිස්තුස්-වහන්සේම වන්නේය.'

අමරණීය වූ දෙවියන්වහන්සේ දැහැමිතාවෙන් සහ පාරිශුද්ධතාවෙන් පරිපූර්ණය. උන්වහන්සේට පමණක් නමස්කාරය හිමිය. උන්වහන්සේගේ ව්‍යවස්ථාව පරිපූර්ණ ධර්මිෂ්ඨකමින් යුක්තය. මනුෂ්‍යයාට ළඟා විය හැකි ප්‍රමිතිය එයයි. මෙම ගුණ කථනයට අභියෝග කරමින් සාතන් පව්කාරවූ, වරද කරන්නාවූ මිනිසාව දෙවියන්වහන්සේ හා සමානතාවකට ඔසවා තබමින් මිනිසා වනාහි නමස්කාරයෙහි ප්‍රස්තූතය ලෙස ආදේශ කරන්නේය. මිනිස් ස්වභාවය විනිශ්චයේ ප්‍රමිතිය බව සඳහන් කරන්නාවූ හෙතෙම විනිශ්චයේ මිණුම් දණ්ඩ වන්නේ පව්කාර



මිනිසාගේ චරිතය බව ප්‍රකාශ කරන්නේය. මෙය ඉහළ තලයක් කරා වූ ප්‍රගතියක් නොව පහළ ආගාධය කරා යොමු කරන්නාවූ පසුබෑමකි.

යමක් දර්ශනය කිරීමෙන් අප වෙනස් වන බව ආත්මික ස්වභාවයේ හා බුද්ධිමය ස්වභාවයේ නීතියකි. යම් යම් විෂයන් කෙරෙහි කල්පනා කිරීමට මනසට අවසර ලැබේද එම විෂයන් පිළිබඳව හැඩගැසීමක් කරා යොමු වීමට මනස නැඹුරු වන්නේය. මනසෙහි ආදරයට සහ ගෞරවයට භාජනය වූ දේවල් උරාගැනීමට මනස හැඩගැස්වේ. පාරිශුද්ධත්වය, යහපත්කම හෝ සත්‍යතාව පිළිබඳව මිනිසා සතු ප්‍රමිතියට හෝ ප්‍රමාණයට ඉහළ තලයකට යෑමට මිනිසාට හැකියාවක් නොවේ. යම් අයෙකුගේ පරමාදර්ශය තමා කෙරෙහි වූ ආත්මාර්ථය මත පදනම් වූවක් නම් එයට වඩා ඉහළ ස්ථරයක් කරා යෑමට ඔහුට හැකිවන්නේ නැත. ඔහු තමාගේ ස්ථරයේ තව තවත් පහළට වැටී යනවා විනා ඉහළ තලයක් කරා දියුණු වන්නේම නැත. මිනිසාව උසස් බවට හෝ උතුම් බවට හෝ පත්කිරීමට බලයක් ඇත්තේ දෙවියන්වහන්සේගේ කරුණා-අනුග්‍රහයට පමණක්ය. එම වරප්‍රසාදය නොමැතිව මිනිසාගේ ගමන් මඟ පහතටමය.

සැප ජීවිතයක ඇලී ගැලී සිටින්නාවූ, විනෝදාස්වාද සොයමින් සැප සෙල්ලමින් යුත් ජීවිතයකට ලොල් වන්නාවූ අයට, ඉන්ද්‍රියන් පිනවීමෙහි අනුරාගී ඇල්මක් ඇති අයට, භූතවාදය ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රඥාවන්ත අයට ඉදිරිපත් කරනු ලැබුවාට වඩා වෙනස් අන්දමකින්ය. එය වඩාත් මන බන්ධනීය ලෙස ඔවුන්ගේ සිතුම් පැතුම්වලට තෘප්තියක් උදාකර දෙන අන්දමට ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ. භූත වාදයෙහි ගැඹුරු ප්‍රකාශන සහ ප්‍රකාශවීම් එම වාදය පිළිගත්තවුන්ගේ හැඟීම් සහ අපේක්ෂා සමග එකඟතාවක් දරන්නේය. මිනිස් ස්වභාවයෙහි පෙනෙන්නාවූ සෑම දුර්වලතාවක් ගැනම සාතන් මනා අධ්‍යයනයක යෙදෙයි. යම්කිසි පුද්ගලයෙක් කිරීමට ලොල් වන්නාවූ පාප ගැන හෙතෙම සැලකිලිමත් වෙයි. එම ලොල් වූ පාපයෙහි නියැලීමට වූ අවස්ථාවන් අඩු නැතිව උදාකර දෙන්නට ඔහු වග බලා ගනී. යහපත් වූ මෙන්ම නීතියට අනුකූල වූ දේවල් සිදුකිරීමේදී පවා එවන් දෑ පමණට වඩා වැඩියෙන් කිරීමට ඔහු මිනිසාව පොළඹ වන්නේය. පමණ දැන ක්‍රියා නොකිරීමෙන් මිනිසාගේ ශාරීරික, මානසික සහ අධ්‍යාත්මික බලය හීන වන්නේය. මිනිස් තෘෂ්ණාවන්ට වහල් වීමට සලස්වමින් සාතන් දස දහස් ගණන් මිනිසුන්ව විනාශ කර ඇත. තවත් දස දහස් ගණන් මිනිසුන්ව විනාශය කරා ගෙන යෑමට ඔහු ක්‍රියාත්මකව සිටියි. මෙයාකාරයෙන් ඔහු සම්පූර්ණ මිනිස් ස්වභාවයම තිරිසන් බවට පත්කර තිබේ. තමාගේ මුළා කිරීමේ කර්තව්‍යය තවත් පුළුල් කරගැනීම් වස් ඔහු ප්‍රකාශ

කරන්නේ, "සත්‍යවූ දැනුම මගින් මිනිසා දහම් ව්‍යවස්ථාවට වඩා ඉහළින් සිටී"යන මතයයි; "යමක් පවතින්නේද ඒ සියල්ලම සත්‍යය වන්නේය, දෙවියන්වහන්සේ මිනිසාව වරදට පත්කරන්නේ නැත;" "යමෙකු කර ඇති සෑම පාපයක්ම අහිංසකය, වරද තැබීමකට සුදුසු නොවන්නේය," යනාදිය ඔහු දක්වයි. මිනිසෙකුගේ තෘෂ්ණාව උත්තරීතර ව්‍යවස්ථාව වන්නේ යයි විශ්වාස කිරීමටද මිනිස් නිදහස ඕනෑම දයක් කිරීමට වලංගු පත්‍රයකැයිද, මිනිසා විසින් ගණන් දිය යුත්තේ තමාටම පමණක් යයිද විශ්වාස කිරීමටද මිනිසුන්ට මගපෙන්වනු ලබන අතර රටේ සාර ධර්ම අගතිය කරා යෑම පුදුමයක්ද? තෘෂ්ණාධික හදවතෙහි හටගන්නා හැඟීම් සපුරා ගැනීමට මිනිසාට නීත්‍යානුකූල නිදහසක් ඇතැයි යන ඉගැන්වීම උද්‍යෝගයෙන් යුතුව පිළිගැනීමට මහත් සංඛ්‍යාත ජනතාවක් සැදී පැහැදී සිටිති. ආත්ම දමනයෙහි ශිෂ්ට සම්පන්න පාලනය කැඩී බිඳී යයි. මනසෙහි සහ ආත්මයෙහි බලය තිරිසන් තෘෂ්ණාවන්ට යොමු වෙයි. මෙම ක්‍රමෝපායන් මගින් සාතන් කිතුණු අනුගාමිකයන් යයි කියන්නාවූ අය දහස් ගණනින් තම මලපතට හසු කර ගනී.

එහෙත් භූත වාදයෙහි අයිතීන් මගින් කිසිවෙකු හෝ මුළා විය යුතු නොවේ. මළපත් මොනවාදැයි නිරීක්ෂණය කර තෝරා බේරා ගැනීමට දෙවියන්වහන්සේ ලෝකයාට ප්‍රමාණවත් ආලෝකයක් ලබා දී ඇති සේක. මෙතෙක් පෙන්වා දී ඇති ආකාරයට අනුව, භූත වාදයේ පදනම වන කල්පිතය ශුද්ධ ලියවිල්ලෙහි සරල ප්‍රකාශනවලට සම්පූර්ණයෙන්ම පටහැනිය. මළාහූ කිසිවක් නොදනිතියි ශුද්ධ වූ බයිබලය ප්‍රකාශ කරයි. ඔවුන්ගේ සිතුවිලි කල්පනාවන් එදිනම විනාශ වී යන්නේය. ඉර යට කෙරෙන්නාවූ කිසිම දෙයක් සමග ඔවුන්ගේ සහභාගිත්වයක් නැත. පොළොවේ සිටියදී ඔවුන් ළඟින්ම ඇසුරු කළ අයගේ ප්‍රීතිය හෝ දුක පිළිබඳව මිය ගිය අය කිසිවක්ම නොදනිති. මිය ගිය අය පිළිබඳව වූ බයිබලීය සිද්ධාන්තය මෙයයි.

තවද, මිය ගිය අයගේ ආත්ම යයි කියාගන්නාවූ මාධ්‍යය සමග කිසිම ආකාරයක හෝ සන්නිවේදනයක් තබාගැනීම දෙවියන්වහන්සේ විසින් තරයේ තහනම් කර ඇත. හෙබ්‍රෙව් වරුන් මෙලොව විසූ දවස්වලදීද මිය ගිය අය සමග සන්නිවේදන හුවමාරු කරගැනීමේ බලය ඇතැයි පැවැසූ කණ්ඩායමක් සිටියේය. අදත්, භූතාත්ම වාදීහු සමහරෙක් තමන්ටද එම හැකියාව ඇතැයි පවසති. වෙනත් ලෝක වලින් පැමිණියා යයි පවසන්නාවූ "සුපුරුදු ආත්ම" වනාහි "යක්ෂ ආත්ම" යයි ශුද්ධ බයිබලය පවසා ඇත. (මේ පාඨයන් බලන්න. ගණන් කථාව 25:1-3; ගීතාවලිය 106:28; 1 කොරින්ති 10:20; එළිදරව් 16:14). මිය ගිය අයගේ ආත්ම යයි කියන්නාවූ අය සමග සම්බන්ධකම්



පැවැත්වීම දෙවියන්වහන්සේගේ පිළිකුලට භාජන වන්නාවූ කරුණක් බවත් ඒවා තහනම් කරන ලද බවත් එවන් සමාගම් පවත්වන්නන් ගල් ගසා මැරිය යුතු බවත් බයිබල් නියමයකි. බලි තොවිල් භූතියම් යනාදිය බොහෝ අයගේ පිළිකුලට භාජනය වී තිබේ. නපුරු ආත්ම සමග මිනිසුන්ට සමාගම් පැවැත්විය හැකිය යන්න අඳුරු යුගයේදී පැවති මිථ්‍යාවක් ලෙස හැඳින්වෙයි. නමුත් වර්තමානයෙහි භූත වාදය වැළඳ ගත් අනුගාමික සංඛ්‍යාව දශ ලක්ෂ ගණනාවක් වෙයි. එය විද්‍යා කේන්ද්‍රයෙහි ඉහළ තනතුරුවලටද සභාවන් තුළටද නීතිවේදීන්ගේ සංගම් තුළටද ඇතුල් වී තිබේ. එසේය, එය රජවරුන්ගේ සභාවන් තුළද ක්‍රියාත්මකය. පැරණි කාලයේදී තහනමට ලක්වූ වරදට පත්කරනු ලැබූ ඒ භූත බන්ධන ක්‍රමවේදය නව මුහුණුවරකින් අදත් මිනිස් සත මුළාවට පත් කරයි.

භූත වාදයෙහි නියම චරිතාංග වටහා ගැනීමට නම්, මෙහි සඳහන් සාක්ෂි හැරෙන්නට කිතුණු බැතිමතාට තවත් සහතික කිරීම් අවශ්‍ය නැත. එනම්, මිය ගිය අයගේ ආත්ම යයි පවසන්නාවූ භූත මාධ්‍යයන් දැහැමිතාව සහ පාපය අතර වෙනස්කමක් දක්වන්නේ නැත; ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් අතරද සාතන්ගේ සේවකයන් අතරද වෙනස්කමක් පෙන්වන්නේ නැත. මේ කාරණා පමණක් ඔවුන් හඳුනා ගැනීමට ප්‍රමාණවත් විය යුතුය. පහත් අන්දමේ දුරාචාර ජීවිතයක් ගත කළ පවිටුවන් ස්වර්ගයේ ඉතා ඉහළ තානාන්තරවල සිටින්නේ යයි භූත වාදය පවසයි. ඒ අනුව සාතන් ලෝකයාට මෙසේ පවසයි: 'ඔබ කෙතරම් නපුරු වුවද, එයින් කම් නැත. ඔබ දෙවියන්වහන්සේව සහ ශුද්ධ බයිබලය විශ්වාස කළද විශ්වාස නොකළද කමක් නැත. ඔබට කැමැති ආකාරයෙන් ජීවත් වන්න. ඔබගේ අනාගත වාසස්ථානය ස්වර්ගයයි.' භූත වාදය පතුරුවන්නාවූ ගුරුවරු මෙයාකාර දේ පවසති. "නපුර කරන සියල්ලෝම ස්වාමීන්වහන්සේ ඉදිරියේ යහපත්ය; උන්වහන්සේ ඔවුන් කෙරෙහි ප්‍රසන්නය; නැතහොත් යුක්තියේ දෙවියන්වහන්සේ කොතැනද?" (මලාකි 2:17) දෙවියන්වහන්සේ මෙසේ වදාරණ සේක. "නපුරට යහපතය කියාද යහපතට නපුරය කියාද කියන්නාවූ, එළිය වෙනුවට අඳුරත්, අඳුර වෙනුවට එළියත් තබන්නාවූ ... අයට දුක්වේ!" (යෙසායා 5:20).

මේ බොරුකාර ආත්ම අපෝස්තුළුවරුන් හැටියට පෙනී සිටිති. අපෝස්තුළුවරුන් පොළොව මත සිටියදී ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ ඔවුන් ලියන්ට යෙදුණාවූ දේවලට විරුද්ධව මේ යක්ෂාත්මයන් කාරණා දක්වන්නේ අපෝස්තුළුවරුන්ම තමා එසේ ලියන ලද දේවලට විරුද්ධව කථාකරන බව දක්වමිනි. බයිබලයේ දිව්‍ය සම්භවයක් නැතැයි එම ආත්ම පවසති. මෙම ප්‍රකාශයන් මගින්

කිතුණුවන්ගේ බලාපොරොත්තුවේ පදනම දෙදරා බිඳ දමේ. එසේම සගයට යන්නාවූ මාර්ගය හෙළිදරව් කරන ආලෝක කදම්බය එමගින් නිවා දමනු ලැබේ. බයිබලය වනාහි කල්පිත රචනාවක්, මිථ්‍යා ප්‍රබන්ධයක් ලෙස ලෝකයා විසින් විශ්වාස කරන්නට සැලැස්වීම සාතන්ගේ වෑයම වන්නේය. ජාතියක ප්‍රභවයේ හෙවත් පටන්ගැනීමේ ළදරු කාලය සඳහා අත්වැලක් සැපයීමට සුදුසු ග්‍රන්ථයක් ලෙස සාතන් බයිබලය හඳුන්වා දෙන්නේය. එහෙත් දැන් එය යල් පැන ගිය පොතක් ලෙස ඉවත ලෑම යෝග්‍ය යයි සාතන් සාධක ඉදිරිපත් කරයි. දෙවියන්වහන්සේගේ වචනයෙහි ස්ථානය ගැනීමට හෙතෙම භූතවාදී පහළවීම් මිනිසා ඉදිරියෙහි ප්‍රදර්ශනය කරන්නේය. මෙම මාධ්‍යය සම්පූර්ණ වශයෙන්ම ඔහුගේ පාලනය යටතේ පවතින්නේය. මෙම ක්‍රමවේදය තුළින් තමන්ගේ කැමැත්ත සකල ලෝ වාසීන්ට ඉදිරිපත් කර ඔවුන්ව නම්මවා ගැනීම ඔහුගේ ප්‍රයත්නය වන්නේය. ඔහු සහ ඔහුගේ සහචරයන්ව විනිශ්චය කරන්නාවූ ශ්‍රී පුස්තකය ඔහු තමාට රිසි තැන තැන්පත් කරන්නේය. ලෝකයේ ගැළවුම්කාරයාණන්ව සාමාන්‍ය මිනිසෙකුගේ තලයට දැමීම ඔහුගේ වෑයම වන්නේය. ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම පිළිබඳව යුදෙව් නායකයන් සහ පූජකයන් බොරු වාර්තාවක් සැකසූහ. එහි අඩංගු කරුණු සොහොන් ගෙය රැක බලාගත් රෝම සොල්දාදුවන්ට උගන්වන ලදී. සොල්දාදුවෝ යුදෙව් නායකයන් ලබා දුන් බොරු වාර්තා ප්‍රචාරය කර හැරියෝය. උන්වහන්සේගේ නැවත නැගිටීම බොරුවකැයි මෙසේ ප්‍රචලිතව ගියේය. ගැළවුම්කාරයාණන්ගේ ජීවිත සිදුවීම් තුළ කිසිම ආකාරයක හාස්කමක් නැතැයි අවධාරණය කිරීමට භූතවාදී බැතිමත්හු වෑයම් කරති. මෙසේ යේසුස්වහන්සේව පසෙකට තල්ලු කර දමන්නාවූ භූතවාදීහු තමන් විසින් සිදුකරන හාස්කම් ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාදාමයන්ට වඩා ශ්‍රේෂ්ඨ යයි අවධාරණය කරවීමට වෙහෙස දරති.

පෙර කාලවලදී විවිධාකාර ක්‍රියාදාමයන් මගින් මිනිස් අවධානය යොමු කරවා ගැනීමට ක්‍රියා කළ භූත වාදය මෙම සිය වසරේ නව මුහුණුවරකින් ජනතාව ඉදිරියෙහි පෙනී සිටී. දැන් එය ක්‍රිස්තියානි පෙනුමකින් ඉදිරිපත් කරනු ලැබේ. වේදිකා මගින් ප්‍රකාශ කෙරෙන්නාවූ කියමන් මෙන්ම ඔවුන්ගේ පුවත් පත් ප්‍රකාශනද පිළිබඳව ජනතාව කාලයක් පුරා දැනුවත්ව සිටිති. මේ ප්‍රකාශන නැතැයි කියනු ලබන්ට හෝ සඟවනු ලබන්ට නුපුළුවන.

පෙරදී ඉදිරිපත්වූ ස්වභාවයට වඩා වර්තමාන පිළිවෙල තරමක් දුරට දරාගත හැකි වුවද, වත්මන් ඉගැන්වීම් ඉතා ප්‍රයෝගකාර වන බැවින් ඒවා වඩාත් භයානක වන්නේය. පෙරදී භූත වාදීහු ශුද්ධ බයිබලය සහ ක්‍රිස්තුස්වහන්සේව එක හෙළා ප්‍රතික්ෂේප කළ නමුත්



නූතන භූත වාදීහු මෙම ඉගැන්වීම් දෙකම පිළිගන්නා බව කියා පාති. නමුත් ඔවුන් බයිබලය විග්‍රහ කරන්නේ අළුතින් උපත නොලැබූ හදවත් වලට රුචිය ළඟා කර දෙන්නාවූ අයුරින්ය; එහි අඩංගු ගාම්භීර වූ ද, ජීවනය උදාකර දෙන්නාවූ ද සත්‍යතාවන් කිසියම් බලපෑමක් නොමැති තත්ත්වයකට පමුණුවති. දෙවියන්වහන්සේගේ ප්‍රධානතම චරිත ගුණාංගය ලෙස ප්‍රේමයට මුල් තැනක් ලබා දෙමින් ඉගැන්වීම් මාලාව ඇරඹෙයි. එහෙත් එම ගුණාංගය හැඟීම් වලින් පහසුවෙන් පෙළඹෙන දුර්වල වූ ගුණයක් ලෙස නොහොබිනා තත්ත්වයකට ඇද දැමීමට ඔවුහු පසුබට නොවෙති. වත්මන් භූතවාදය යහපත සහ නපුර අතර වෙනසක් නැති බව උගන්වයි. දෙවියන්-වහන්සේගේ සාධාරණත්වය, උන්වහන්සේ විසින් පාපය හෙළා දැකීම, උන්වහන්සේගේ ශුද්ධ ව්‍යවස්ථාවෙහි ඉල්ලීම් යන මේ සියල්ල ගැන අවධානයක් යොමු නොකෙරේ. දස පනත මිය ගිය ධවල පත්‍රිකාවක් ලෙසට සලකන්නැයි මහජනතාවට උගන්වනු ලැබේ. සාමාන්‍ය සිත පිනවන මනෝහර ප්‍රබන්ධ මගින් මනස මෝහනයට පත් කෙරේ. තමන්ගේ ඇදහිල්ලෙහි පදනම වූ බයිබලය කෙරේ විශ්වාසය නැති කිරීමට මෙම ප්‍රබන්ධ සහ කථාන්තර උපරිම ලෙස භාවිතා කරමින් ශුද්ධ බයිබලය එපා කිරීමටද මගපෙන්වනු ලැබේ. පෙර සේම ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් සාතන් කෙතරම් සූක්ෂ්ම අන්දමින් මිනිසුන්ගේ ඇස් අන්ධ කර තිබෙන්නේද යත් ඔහුගේ මුළාවන් තේරුම් ගැනීමට සාමාන්‍ය මිනිසාට හැකි නොවේ.

භූත වාදයෙහි රැවටිලිකාර ස්වභාවය යථාර්ථය ලෙස අවබෝධ කරගැනීමේ හැකියාව ඇත්තේ ස්වල්ප දෙනෙකුට පමණක්ය. එහි අනුබලය යටතට පත්වීමෙහි ප්‍රවණතාව ගැන පැහැදිලි අවබෝධයක් බොහෝ අයට නැති තරම්ය. බොහෝ අය කුතුහලය සංසිඳුවා ගැනීම් වස් භූත වාදයෙහි ක්‍රියාකාරිකම්වලට නුසුදුසු ලෙස මැදිහත් වෙති. එම ඉගැන්වීම් කෙරෙහි ඔවුන් තුළ සත්‍යවාදී විශ්වාසයක් නැත. භූත බන්ධනයෙහි පාලනය යටතට තමන් පත්වෙතැයි යන සිතුවිල්ල ගැන පවා ඔවුහු මහත් සන්ත්‍රාසයකට, මහත් භීතියකට පත් වෙති. එහෙත් එවන් අය තම ක්‍රියාවන් මගින් තහනම් පෙදෙසකට ඇතුළු වෙති. ඒ අතර බලගතු විනාශකාරයා ඔවුන්ගේ කැමැත්තට විරුද්ධව ඔවුන් මත ස්වකීය බලය යොදා ඔවුන්ව වසඟ කර ගනී. එම පුද්ගලයන් එක් වතාවකදී පමණක්වත් සාතන්ගේ බලයට අවනත වුවහොත් ඔහු එම අයව තමන්ගේ ග්‍රහණය යටතට අසු කර ගන්නේය. යක්ෂයාගේ වසඟයටද මෝහනයේ ග්‍රහණයටද අසු වූ අයෙකුට, එම වසඟ බලය බිඳ දැමීම තමාගේම බලයෙන් කළ හැකි දෙයක් නොවන්නේය. උනන්දුවෙන් ඔප්පු කරන ඇදහිල්ලෙහි යාච්ඤාවන්ට පිළිතුරු වශයෙන් දානය කරන්නාවූ දෙවියන්වහන්සේගේ බලයෙන් මිස වෙනත් කිසිම

අයුරකින් සාතන්ගේ වසඟ බලයෙන් ගැලවී යාමට කිසිම අයෙකුට හැකියාවක් නැත.

චරිතයෙහි පාපිෂ්ඨ ගුණාංග පවත්වාගෙන සිටින්නාවූ අයද අතහැර දමන්නට අකැමැති පාපයක් සිත්හි රඳවාගෙන සිටින අයද සාතන්ගේ පරීක්ෂාවන්ට ඇරයුම් කරති. ඔවුහු දෙවියන්වහන්සේගෙන් සහ උන්වහන්සේගේ දූතයන්ගේ රැකවරණයෙන් ඈත්ව සිටිති. නපුරේ කුමාරයා ඔවුන්ට තම මුළාවන් ඉදිරිපත් කළ විට එකී පුද්ගලයන්ට ආරක්ෂාව ගෙන දීමට කිසිම හවිහරණයක් නැත. ඒ නිසාම ඔවුහු ඉතා පහසුවෙන් සාතන්ගේ ගොදුරු බවට පත් වෙති. සාතන්ගේ බල අධිකාරිය යටතේ සිටින්නට කැමැත්තෙන්ම යොමු වන්නාවූ අයට තමන්ගේ මාර්ගයෙහි අවසානය ගැන වැඩි අවබෝධයක් නැත. එම අය යටපත් කරගත්තාට පසුව තවත් අයව තමාගේ දැලට ඇතුල් කර ගැනීමට සාතන් ඔවුන්ව සිය නියෝජිතයන් ලෙස යොදා ගනියි.

දිවැසිවර යෙසායා මෙසේ පවසයි. "ඔවුහු කෙඳිරි ගාන්නාවූ තොල් මතුරන්නාවූ ආත්ම බන්ධනකාරයන්ගෙන්ද, අණවින කාරයන්ගෙන්ද විභාග කරන්නැයි නුඹලාට කියන විට සෙනඟක් විසින් ස්වකීය දෙවියන්වහන්සේගෙන් විභාග කරන්නට යුතු නොවේද? ජීවතුන් උදෙසා මළවුන්ගෙන් විචාරන්ට යුතු දැයි අසන්න. ව්‍යවස්ථාවද සාක්ෂියද වෙතට යමු! ඒ වචනයේ හැටියට ඔවුන් නොකීවොත් ඔවුන්ට පහන් වීමක් නැත." (යෙසායා 8:19,20). මනුෂ්‍යයාගේ ස්වභාවයත්, මරණයට පත්වීමෙන් පසුව ඔහුගේ ස්වභාවයත් ගැන ශුද්ධ ලියවිල්ලෙහි ඉතා සරලව පැහැදිලි කර දී ඇත. මෙම සත්‍ය ඉගැන්වීම් පිළිගන්නට මිනිසුන් කැමති වන්නේ නම්, භූත වාදය ඉදිරිපත් කරන්නාවූ හාස්කම් දැක්වීම් වනාහි සාතන්ගේ බලය කරණකොටගෙන කරන්නාවූ ලකුණු හා ඉන්ද්‍ර ජාලයන් බව ඔවුන්ට ඉතා පැහැදිලිව පෙනී යනවා ඇත. නිදහස අගය කරන්නාවූ ලෞකික මනස තමන් ඇලුම් කරන්නාවූ පාප අතහැර දැමීමේ අවශ්‍යතාවක් දකින්නේ නැත. එවන් පාපවල නියැලී සිටින්නාවූ බොහෝ අය ආලෝකයට තම ඇස් වසාගෙන, දේව අනුශාසනා කුමක් පැවැසුවද එය නොතකා තමන් ගමන් කරන්නාවූ මාර්ගයේම ඉදිරියට ඇදෙති. ඔවුන් වටා තම දැල හෙළන්නාවූ සාතන් ඔවුන්ව තම ගොදුර බවට පත් කර ගනී. "මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය." එහෙයින් "බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියා කිරීමක් ඔවුන්ට එවනසේක." (2 තෙසලෝනික 2:10,11,12)

භූත වාදයට එරෙහිව නැඟී සිටින්නෝ විරුද්ධ වන්නේ මිනිසුන්ට පමණක් නොව සාතන්ට සහ ඔහුගේ දූතයන්ටත්ය. ඔවුන් සටන් වැදී



සිටින්නේ අධිපතිකම් වලටත්, පරාක්‍රමධාරීන්ටත් ස්වර්ග බල මණ්ඩලයන්හි දුෂ්ටාත්ම සේනාවන්ටත් එරෙහිවය. ස්වර්ගීය පණිවිඩකරුවන්ගේ බල ශක්තියෙන් සාතන්ව පළවා හරින තෙක් ඔවුහු තමා අයිති කරගත් බිම් පෙදෙසින් එක අඟලකුදු හෝ අත්හැර දමන්නේ නැත. අපගේ ගැළවුම්කාරයාණෝ ආලෝකයේ දූතයෙකු ලෙසින් පැමිණ සාතන්ට මුහුණ දුන්නේ "මෙසේ ලියා තිබේ" යයි පවසමින් දේව වචන උපුටා දක්වමින්ය. එයාකාරයෙන්ම දේව ජනතාවද සාතන්ට මුහුණ දීමට දේව වචනය නැමැති අවිය භාවිතා කළ යුතුය. ක්‍රිස්තුස්වහන්සේ මෙලොව ජීවත්ව සිටි කාලයේදී මෙන්ම අදත් ශුද්ධ ලියවිලි පාඨ ගෙනහැර දැක්වීමට සාතන්ට හැකියාව ඇත. ඔහු තමාගේම ඉගැන්වීම් සම්මත කරගැනීමට පුළුවන් වන අන්දමට ඒවා යොදා ගනියි. මෙම වත්මන් උපද්‍රව සහිත කාලයේදී ජීවත්ව සිටින්නාවූ අය ශුද්ධ ලියවිල්ලෙහි සාක්ෂි තමන්ම උදෙසා හොඳාකාරව දැන සිටීම වැදගත්ය.

තමන්ගේ නෑදෑයන් හෝ මිතුරන් ලෙස පෙනී සිටිමින් යක්ෂ ආත්මයෝ බොහෝ දෙනෙකු ඉදිරියෙහි ඉතා භයානක මිථ්‍යාදෘෂ්ඨික දහම් ප්‍රකාශ කරන්නට පුළුවන. මෙසේ පැමිණෙන අමුත්තෝ අපගේ හදවත්හි අනුකම්පාව පුබුදු කරමින් ඔවුන්ගේ ප්‍රකාශයන්ට පණ දෙමින් හාස්කම්ද ඉටුකරනවා ඇත. බයිබලීය සත්‍යතාවන් මගින් ඔවුන්ට එරෙහිව නැඟී සිටීමට අපි සූදානමින් සිටිය යුතු වෙමු. මළාහු කිසිවක් හෝ නොදන්නා බවත් අප ඉදිරියෙහි පෙනී සිටින්නේ යක්ෂ ආත්ම බවත් අප මනාව දැන සිටිය යුතු වෙමු.

"පොළොවේ වසන්නන් පරීක්ෂා කිරීමට මුළු ලෝකය පිටට පැමිණෙන්ට තිබෙන්නාවූ පරීක්ෂාවේ පැය" අප ඉදිරියට පැමිණෙයි. දෙවියන්වහන්සේගේ ශුද්ධ වචනය මත තම ඇදහිල්ල දැඩිව සවිමත්ව ස්ථාපිත කරගෙන නැති අය මුළා කරනු ලැබ ඔවුන් පරාජය කරනු ලබනවා ඇත. මිනිස් දරුවන්ව තම ග්‍රහණයට නතු කරගන්නා පිණිස සාතන් ක්‍රියාකරනවා ඇත. "අධර්මිෂ්ඨකමෙහි අනේකාකාර මුළා කිරීම්" මගින් ඔහුගේ මුළා කිරීමේ ක්‍රියාකාරකම් නිරතුරුවම වර්ධනය වනවා ඇත. එහෙත් ඔහුගේ අරමුණු සාර්ථක කරගත හැක්කේ මිනිසුන් තම කැමැත්තෙන්ම ස්වේච්ඡාවෙන්ම ඔහුගේ පරීක්ෂාවන්ට යටත් වන්නේ නම් පමණකි. සත්‍යතාව පිළිබඳව දැනුමක් ලබාගැනීමට අවංකවම වෙහෙසෙමින් කීකරුකම තුළින් තම ජීවිත පවිත්‍ර කරගැනීමට වෑයම් කරන්නාවූ අය තමන්ට හැකි අයුරින් අරගලය සඳහා සූදානම් වන්නාවූ අතර සත්‍යතාවේ දෙවියන්වහන්සේ තුළ ස්ථිරසාර රැකවරණයක් ලබාගන්නවා ඇත. "මාගේ ඉවසීමේ වචනය නුඹ රක්ෂා කළ හෙයින් .... මමත් නුඹ ආරක්ෂා කරන්නෙමි"

යන්න ගැළවුම්කාරයාණන්ගේ පොරොන්දුව වන්නේය. උන්වහන්සේ කෙරෙහි විශ්වාසය රැඳවූ කිසිම අයෙකු සාතන්ගේ ග්‍රහණයට අසුවන පිණිස අත්හරිනවා වෙනුවට, උන්වහන්සේ ඔවුන් රැකවරණය කරන පිණිස ප්‍රමාදයකින් තොරව සගයේ සෑම දූතයෙකුම එවීමට සූදානම්ව සිටිනසේක.

දුෂ්ටයන් කෙරෙහි ඉමහත් බලපෑමක් දරන්නාවූ මායාවක් පිළිබඳව යෙසායා දිවැසිවරයා අපව දැනුවත් කර ඇත. දෙවියන්වහන්සේගේ විනිශ්චයන් කෙරෙන් තමා සුරක්ෂිතව සිටිතැයි අදම්ටුවෝ විශ්වාස කරති. ඒ මෙසේය: "අපි මරණය සමග ගිවිසුමක් කොට පාතාලය සමග පොරොන්දුවකට බැඳී සිටිමුව; ගලාඑන විපත පැමිණෙන විට එය අප වෙතට නොඑන්නේය. මක්නිසාද අපි බොරුව අපේ රක්ෂාස්ථානය කරගෙන වංචාකමෙහි සැඟවී" සිටිමුව. (යෙසායා 28:15). මෙසේ විස්තර කර ඇති කණ්ඩායමට අයත් අය පවසන්නේ පව්කාරයාට දඬුවමක් ලැබෙන්නේ නැතැයි කියාය. ඔවුහු වරද කළ බව දන දනත් හිතුවක්කාර ලෙස පසුතැවිලි නොවී තමන්ව සනසාගන්නා අය වන්නාහුය. ඔවුන්ගේ ඉගැන්වීම් අනුව සෑම මනුෂ්‍යයෙක්ම කෙතරම් දුශ්ශීල අදම්ටුවෙකු වුවද ඔහු මරණින් පසුව ස්වර්ගය වෙත ඔසවා ගනු ලැබ දෙවියන්වහන්සේගේ දේව දූතයන් හා සමාන වෙනවා ඇත. පීඩාවන් ගංගාවක් සේ ගලා එන්නාවූ අතරේදී බැතිමතුන්ගේ රැකවරණය සඳහා සගයෙන් සත්‍යතා පොරොන්දු විශාල සංඛ්‍යාවක් ඔවුන්ට ලබා දී ඇත. එහෙත් මරණය සමග ගිවිසුමකට පිවිස පාතාලය සමග පොරොන්දුවට බැඳී සිටින්නාවූ දුෂ්ටයෝ මෙම රැකවරණ පොරොන්දු එපා කරති. ඔවුහු සාතන් විසින් රැකවරණය පිළිබඳව ඉදිරිපත් කරන්නාවූ මුසා වදන් මුළු සිතින් පිළිගෙන භූත වාදයට යොමු වෙති.

මෙම පරම්පරාව පත්ව ඇති අන්ධ භාවය වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි තරමටම විස්මිතය. දහස් ගණන් මනුෂ්‍යයෝ දෙවියන්-වහන්සේගේ වචනය, විශ්වාස කිරීමට නුසුදුසු වන තරම් වටිනාකමින් තොර වූවක් ලෙස ප්‍රතික්ෂේප කරමින් සාතන්ගේ මුසාවන් දැඩි විශ්වාසයකින් යුතුව පිළිගනිති. ප්‍රොපේතවරුන්ගේ සහ අපෝස්තුළු-වරුන්ගේ ඇදහිල්ල පිළිබඳව වහසි බස් කියන්නාවූ ද, ශුද්ධ ලියවිලි වල ගාම්භීරතාවය හෙළා දකින්නාවූද අදේවදෘෂ්ටිකයන් කොටසක් ලෝකයේ වෙසෙති. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ඇත්තාවූ ශුද්ධ ලියවිල්ලේ ප්‍රකාශන ප්‍රතික්ෂේප කරති, ගැළවීමේ සැලැස්ම පිළි-නොගනිති, සත්‍යය එපා කරන්නාවූ අය මත පැමිණෙන දේව දඬුවම් ප්‍රතික්ෂේප කරති. දෙවියන්වහන්සේගේ ඉල්ලීම් පිළිගෙන උන්වහන්සේගේ ශුද්ධවූ ව්‍යවස්ථාවට කීකරු වන්නාවූ අය දුබල වූ, පටුවූ අන්ධ



විශ්වාසයක් ඇත්තවුන් ලෙස සලකමින් ඔවුහු ඔවුන් කෙරෙහි තම සාතිශය කණගාටුව පළ කරති, ඔවුන්ට අනුකම්පාව දක්වති. දේව වචනයේ සත්‍යතාවන් අනුමාන කරමින් එම ප්‍රකාශන ගැරහීමට පත්කරන්නාවූ මෙම සංශයවාදීහු තමන් දරන්නාවූ ස්ථාවරය ගැන දැඩිව විශ්වාස කරති. මරණය සමග ගිවිසුමක්ද නිරය සමග සම්මුතියක්ද ඔවුන් සතුව ඇත යනු එම අයගේ චින්තනය වන්නේය. දෙවියන්වහන්සේගේ පළිගැනීමේ උදහස සහ තමන් අතර පවුරක් බැඳ ඇති බව ඔවුන් විශ්වාස කරන විලාශයක් පෙන්නුම් කෙරේ. එම පවුර බිඳගෙන යාමට හෝ එය තුළින් යාමට හැකියාවක් නැත යන්න ඔවුන්ගේ විශ්වාසයයි. ඔවුන් තුළ බියක් නිර්මාණය කිරීමට කිසිවක්ම නැත. ඔවුහු මහා පරීක්ෂකයාගේ වාටු බස්වලට සම්පූර්ණයෙන්ම අවනතව සිටිති. ඔවුහු නපුරේ කුමාරයා සමග ඉතා සමීපව බද්ධව සිටිති. යක්ෂයාගේ ආත්මය සමග ඔවුහු සම්පූර්ණ ලෙසින් අන්තර්ග්‍රහණය වී සිටිති. ඔහුගේ ග්‍රහණයෙන් මිදීමට හෝ ඉවත් වීමට එයට ලක්වූවන්ට කිසිම බලයක් නැත, කිසිම ආශාවක්ද නැත.

ලෝකය මුළා කරමින් මනුෂ්‍යයන් රැවටිල්ලකට හසුකර ගැනීමට සාතන් කාලයක් පුරා සූදානම් වෙමින් සිටී. ඔහුගේ උපක්‍රම වේදය සඳහා අත්තිවාරම යොදන ලද්දේ ඒදන් උයන තුළදීමය. "නුඹලා ඇත්තටම නසින්නේ නැත"යි කියමින් ඒවව රවටා මිනිස් හදවත් තුළට දේව විරෝධී චින්තනයක් ඇතුළු කිරීමට සාතන් සමත් විය. එම චින්තනය ශක්තිමත් කිරීමට ඔහු තවත් මුසාවක්ද එයට එක් කළේය. "නුඹලා එයින් (ගසෙහි ගෙඩි) කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහපත සහ නපුර දනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත්" ඔහු මුල් මාපිය යුවළට පැවසුවේය. (උත්පත්ති 3:4,5) මුළා කිරීමේ ක්‍රමවේදයේ ශ්‍රේෂ්ඨ කෘතිය වූ භූතවාදය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය කරමින් ඉතා ඉහළ ස්ථානයක් කරා ගෙන එමින් ඔහු එය කළමනාකරණය කර තිබේ. ස්වකීය සැලැස්මෙහි මුදුන් මල්කඩ කරා ඔහු තව පැමිණ නැත. එහෙත් ඉතිරිව ඇත්තාවූ ඉදිරි කාලයේදී ඔහු තම ඉලක්කය කරා ළඟා වනවා සහතිකය. දිවැසි ප්‍රසාදිවරයා මෙසේ පවසයි: "මැඩියන් වැනි වූ අශුද්ධාත්මයන් තුන්දෙනෙක් නික්ම එනවා දුටිමි. මක්නිසාද ඔව්හු සර්වපරාක්‍රම වූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස් කරන පිණිස ඔවුන් ළඟට යන්නාවූ හාස්කම් කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝ ය." (එළිදරව් 16:13,14). දෙවියන්වහන්සේගේ වචනය කරණකොටගෙන උන්වහන්සේගේ බලය තුළ රැකවරණය ලබාගන්නා අය හැරෙන්නට අනෙකුත් සියල්ලෝම මෙම මහත් රැවටිල්ලෙහි පංගුකාරයන් වන්නෝය. අද ජනතාව මරණීය රැකවලකට නැඹුරු

වෙමින් සිටිති, නින්දකට පත්වෙමින් සිටිති. ඔවුන් එම නින්දෙන් අවදි වන්නේ දෙවියන්වහන්සේගේ උදහස වැගිර වීමත් සමගය.

ස්වාමි වූ දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක: "මම විනිශ්චය ලණුවද ධර්මිෂ්ඨකම ලඹයද කොට පාවිච්චි කරන්නෙමි. බොරුවේ රක්ෂස්ථානය ගල් වරුෂාවට පහ වන්නේය. සැඟවෙන ඉඩමද වතුරට යට වන්නේය. මරණය සමග තිබෙන නුඹලාගේ ගිවිසුම අවලංගු වන්නේය. පාතාලය සමග තිබෙන නුඹලාගේ පොරොන්දුව පවතින්නේ නැත; ගලා එන විපත පැමිණෙන විට නුඹලා එයින් පාගා දමනු ලබන්නහුය." (යෙසායා 28:17,18).



# 35

## පාප් බලයේ ස්වභාවය හා අරමුණු

වර්තමානයේදී ප්‍රොතැස්තන්තවරු රෝම සභාව සලකන්නේ ඉහත අවුරුදුවලදී සැලකුවාට වඩා මහත් ප්‍රසන්නතාවයෙන්ය. කතෝලික සභාව දියුණුව නොපතින්නාවූ රටවල පාප් සභිකයෝ අනුබලයක් ලබාගැනීමට උනන්දුවෙන් ක්‍රියාකරති. ඒ රටවල, නවෝත්පාදය අනුව පිහිටුවන ලද සභාවල් පාප් සභාවේ ඉගැන්වීම් වලින් ඉවත්වූ නමුත් දැන් ඒ ඉගැන්වීම් ගැන ඔවුන් එපමණ උනන්දුවෙන් සැලකිලිමත් නොවෙති. ඔවුන් සිතූ තරමට, වැදගත් ධර්මයන් පිළිබඳව වැඩි වෙනසක් නැත යන්න දැන් දැන් වැඩි වැඩියෙන් පිළිගනු ලබයි. තමා මඳ වශයෙන් යටහත් වුවහොත් තමාට රෝම සභාව සමග වඩා හොඳ සබඳතාවයක් පවත්වාගත හැකිය යන අදහස දැන් පවතියි. හෘදය සාක්ෂියේ නිදහස සඳහා අධික මිලයක් ගෙවා එය ලබාගනු ලැබූ අතර එය බොහෝසේ අගය කරනු ලැබූ කාලයක් තිබුණි. ඔවුන් තමාගේ දරුවන්ට ඉගැන්වූයේද පාප් සභාව එපා කිරීමටය, රෝම සභාව සමග ඒකත්වයක් ඇතිකරගැනීම වනාහි දෙවියන්වහන්සේට අපක්ෂපාත වීමක් බවය. නමුත් දැන් පවතින අදහස ඊට වඩා කොපමණ වෙනස්ද.

පාප් සභාව රැකවරණය කරන අය පවසන්නේ ඒ සභාවට අකරුණාවන්ත ලෙස සලකා තිබෙන බවය; ප්‍රොතැස්තන්ත ලෝකය මේ කියමන පිළිගැනීමට යොමු වෙති. නොදැනුවත්කමේ හා අන්ධකාරයේ කාලයේදී ඒ බලය විසින් කරන්ට යෙදුණාවූ නුසුදුසුවූද අප්‍රසන්නවූද ක්‍රියාවන් අනුව දැන් ඒ සභාව විනිශ්චය කිරීම අසාධාරණ යයි බොහෝ අය පවසති. සභාවේ භයානක කෲරත්වය පැවතුණේ ඒ කාලයේ පැවති රළු ශිෂ්ටාචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් යයි පවසමින් ඒ ක්‍රියාවන් නොතකා හරිනු ලැබේ. නවීන ශිෂ්ටාචාරයේ බලපෑම ඒ සභාවේ ක්‍රියා පිළිවෙල වෙනස්කර ඇත්තේ යයි ඔව්හු කියා සිටිති.

තමා වරද කිරීමෙන් තොරව සිටින්නන් යයි මේ උඩඟු බලය වසර අටසියයක් මුළුල්ලේ පැවසූ බව ඔවුන්ට අමතක වී තිබෙන්නේද? මේ තත්ත්වය නැතිවී යනවා වෙනුවට, දහනම වන ශත වර්ෂයේදී පෙරටත් වඩා මහත් අවධානයෙන් ඔවුන් මේ බව කියා සිටිති. ඔවුන් කිසිවිටෙක වරද නොකළ බවත්, ඔවුන්ට වරදක් කිරීමට නුපුළුවන් බවත් ඔවුන් කියා සිටින බැවින්, අතීතයේදී ඔවුන්ගේ ක්‍රියාවන්ට මගපෙන්වූ ප්‍රතිපත්ති වැරදි යයි සැලකීමට ඔවුන්ට පුළුවන් වන්නේ කෙසේද?

පාප් සභාව තමාට කිසිවිටෙක වැරදි කිරීමට නුපුළුවන යන ප්‍රකාශනය ඉවත් කරගන්නේ නැත. ඇගේ ඉගැන්වීම් එපා කළ අයට පීඩා කිරීම වරදක් නොවුණු බව සභාව තවදුරටත් පවසයි. ඒ ක්‍රියාවන් නැවත කිරීමට අවශ්‍යතාවයක් ඇතිවුවහොත් ඔවුන් එසේ නොකරනවා ඇද්ද? දේශපාලනික නීති මගින් ඉදිරිපත් කර ඇති තහනම ඉවත් කරනු ලැබ රෝම සභාවට අතීතයේදී තිබුණාවූ බලය නැවත දෙනු ලැබුව හොත් ඇගේ පීඩාකිරීම හා ප්‍රචණ්ඩකාරිත්වය නැවත ප්‍රබෝධමත් වෙනවා ඇත.

"හෘදය සාක්ෂියේ නිදහස ගැන පාප් බලයේ ආකල්පය පිළිබඳවද ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වුවහොත් එමගින් අමෙරිකා එක්සත් ජනපදයට ඇතිවිය හැකි තර්ජනය ගැනද සුප්‍රකට ලේඛකයෙක් මෙසේ ලියා තිබේ: 'අමෙරිකා එක්සත් ජනපදයේ රෝමානු කතෝලික සභාව ඇතිවීම ගැන සමහර අය තුළ බියක් ඇතිවීම ළමා අදහසක් හා තමාගේම ධර්මයන්ට එල්බගෙන සිටීමක්ය.' රෝම සභාවේ ආකල්පය හා ස්වභාවය අපගේ නිදහස් සංවිධානයන්ට සතුරුකමක් විය හැකි බවක් හෝ එහි වර්ධනයෙන් කරදරයක් ඇතිවිය හැකි බවක් එබඳු අයට පෙනෙන්නේ නැත. එහෙයින් අපි දන් අපගේ ආණ්ඩුවේ ප්‍රමුඛ ප්‍රතිපත්ති කතෝලික සභාවේ ප්‍රතිපත්ති සමග සමානකර බලමු.

"එක්සත් ජනපදයේ ආණ්ඩු ක්‍රමය අනුව හෘදය සාක්ෂියේ නිදහස සම්පූර්ණ ලෙස මනුෂ්‍යයාට දෙනු ලබන බවට ස්ථිර පොරොන්දුවක් තිබේ. මෙය ඉතාම අගනේය, ප්‍රමුඛය. ix පියස් පාප් තුමා 1854 අගෝස්තු 15 දින යවන ලද ලිපියක මෙසේ කියා තිබේ: 'හෘදය සාක්ෂියේ නිදහස ගැන තිබෙන්නාවූ නුසුදුසු වැරදි ඉගැන්වීම ඉතාම කරදරකාර වරදකි, අනික් සියල්ලට වඩා අප්‍රසන්න දෙයකි. එය දේශයක ඇත්තාවූ ඉතාම වැඩියෙන් බියගන්වන එපා කරනු ලැබිය යුතු දෙයකි." එම පාප්වරයාම 1864 දෙසැම්බර් 8 දින යවන ලද ලිපියකින් 'ආගමික නමස්කාරය පිළිබඳවද හෘදය සාක්ෂිය පිළිබඳවද නිදහස තිබිය යුතු යයි පවසන අයටද' 'සභාවට බලහත්කාරයෙන් ක්‍රියා කිරීමට නුපුළුවනැයි පවසන අයටද' විරුද්ධව කරුණු ඉදිරිපත් කළේය.

'අමෙරිකා එක්සත් ජනපදයෙහි රෝම සභාව දක්වන සාමකාමී ස්වභාවය මගින් සිත වෙනස්වීමක් දක්වනු ලබන්නේ නැත. තමාට උපකාර රහිත තත්ත්වයක් පවතින විට ඒ සභාව එම තත්ත්වය ගැන ඉවසිලිවන්තව ක්‍රියා කරයි. බිෂොප් ඔකොනොර් මෙසේ පවසයි: "ආගමික නිදහස ඉවසනු ලබන්නේ කතෝලික සභාවට කරදරයක් නොමැතිව, එහි විරුද්ධ පැත්ත ක්‍රියාත්මක කිරීමට පුළුවන් වන තුරු



පමණය. සෙන්ට් ලුවී යන ස්ථානයේ නායක බිෂොප්වරයා වරක් මෙසේ පැවසුවේය: 'ධර්මයන්ට විරුද්ධව ක්‍රියාකිරීම හා අවිශ්වාසය, අපරාධයන්ය. සියළු දෙනාම කතෝලික සභාවට අයිති වන ඉතාලිය හා ස්පාඤ්ඤය වැනි රටවල, කතෝලික ආගම දේශයේ අණපනත් වලද වැදගත් ස්ථානයක් ගන්නා බැවින් මේ වැරදිවලට වෙනත් අපරාධයන්ට මෙන්ම දඬුවම් කරනු ලැබිය යුතුය."

"කතෝලික සභාවේ සෑම කාදිනල් වරයෙක් හා නායක බිෂොප්වරයෙක්ම තමා පාප්ට පක්ෂපාත වන බවට පොරොන්දුවකට ඇතුල් වෙයි. ඒ පොරොන්දුවට මේ වචන ඇතුළත්ය: 'අපගේ පාප් ස්වාමින්ගේ හෝ ඔහුට පසුව ඔහුගේ ස්ථානය ගන්නවා යයි පවසන ලද තැනැත්තාගේ ඉගැන්වීම්වලට විරුද්ධ වන්නාවූ, ඒවා අනුව ක්‍රියා නොකරන්නාවූ, කැරළි ගසන්නාවූ අයට විරුද්ධව ක්‍රියාකිරීමට හා ඔවුන්ට පීඩා කිරීමට මම මට හැකි පමණ දුරට ක්‍රියාකරමි."
(Josiah Strong D. D. In Our Country p. 46-48)

රෝමානු කතෝලික සාමාජිකයන් අතර නියම ක්‍රිස්තු භක්තිකයන් සිටින බව සැබෑය. ඒ සභාවේ සිටින දහස් ගණන් ජනයා තමාට ලැබී තිබෙන ආලෝකය අනුව තමාට හැකි පමණ හොඳින් දෙවියන්-වහන්සේට සේවය කරති. ඔවුන්ට දේව වචනය ලබාගැනීමට නුපුළුවන; එහෙයින් ඔවුන්ට සත්‍යය වටහාගැනීමට නුපුළුවන. ප්‍රබෝධමත් හදවතකින් කරන සේවයද, වත් පිළිවෙත් හා උත්සවයන් පැවැත්වීමද අතර වෙනස ඔවුන් කිසිවිටෙක දක නැත. දෙවියන්වහන්සේ සානුකම්පික මෘදුකමින් මේ අය දෙස බලන සේක. ඔවුන් ඉගනගෙන තිබෙන්නේ සෑහීමක් ලබා නොදෙන රැවටිලිකාර ඇදහිල්ලක්ය. ඔවුන් අවට පවතින තද අන්ධකාරය පසාකරන පිණිස උන්වහන්සේ ඔවුන්ට අලෝක ධාරාවක් දෙනවා ඇත. උන්වහන්සේ ඔවුන්ට යේසුස්වහන්සේ තුළ ඇත්තාවූ සත්‍යයන් එළිදරව් කරනවා ඇත. එවිට බොහෝ අය උන්වහන්සේගේ සෙනහගේ පක්ෂයට පැමිණෙනවා ඇත.

එහෙත්, සංවිධානයක් හැටියට, රෝම සභාව එහි ඉතිහාසයේ සියලු කාලවලදී පැවතුණාවූ අන්දමට මෙන්ම දන්ද ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සමග එකඟත්වයක් වන්නේ නැත. ප්‍රොතැස්තන්ත සභාවෝ මහත් අන්ධකාරයකින් වැසී සිටිති; නැතහොත් ඔවුන්ට කාලයාගේ ලකුණු වටහාගැනීමට පුළුවන් වෙනවා ඇත. රෝම සභාව එහි සැකසුම් හා ක්‍රියා පිළිවෙල යොදවන්නේ දූරදර්ශී ලෙසය. ඇගේ අනුබලය පතුරුවමින් ඇගේ බලය වර්ධනය කරගන්නා පිණිස ඈ තමාට හැකි සෑම උපක්‍රමයක්ම යොදවයි. ඈ එසේ කරන්නේ නැවත ලෝකයේ බලය ලබාගැනීමට, පීඩා කිරීම නැවත ක්‍රියාත්මක කිරීමට

හා ප්‍රොතැස්න්ත සභාව විසින් කරන්ට යෙදුණාවූ සියල්ල නැතිකර දැමීමටය. කතෝලික සභාව සෑම පැත්තකින්ම දියුණු වෙමින් පවතියි. ප්‍රොතැස්තන්ත රටවල අදට තිබෙන්නාවූ දේවස්ථාන හා නමස්කාර ස්ථාන කොපමණදැයි බලන්න. ප්‍රොතැස්තන්ත ආගම් බොහෝ සේ පවතින අමෙරිකාවේ ඇයට තිබෙන විදුහල් හා සෙමනේරිවල ජනප්‍රියතාවය දෙස බලන්න. එංගලන්තයේ එහි චාරිත්‍ර වාරිත්‍ර වර්ධනය වීම දෙසද කතෝලික සභාව වෙත ඇතිවන යොමුවීම් දෙසද බලන්න. ශුභාරංචියේ පිරිසිදු ප්‍රතිපත්ති අගය කරන සියල්ලන් තුළ මේ කාරණා ගැන කනස්සල්ලක් පුබුදුවනු ලැබිය යුතුය.

ප්‍රොතැස්තන්ත සභාවන් පාප් සභාව සමග ගැටෙමින් එයට සම්බන්ධවීද තිබේ. ඔවුන් යම් කාරණා ගැන එකඟතාවයකට පැමිණෙමින් යම් දේවල් පිළිගෙන තිබේ. පාප් සභිකයන් පවා මේ දේවල් ගැන විශ්මයට පත්වෙති; ඔවුන්ට ඒ දේවල් වටහාගැනීමට පවා නුපුළුවන. මනුෂ්‍යයෝ රෝම සභාවේ නියම තත්ත්වයටද ඇගේ දියුණුවෙන් ඇතිවිය හැකි අන්තරාවන්ටද ඇස් පියාගනිති. දේශපාලනික හා ආගමික නිදහසට ඉතා මහත් අන්තරාවක් විය හැකි මේ සතුරාගේ වර්ධනයට විරුද්ධව සිටීමට මනුෂ්‍යයන් පුබුදුවනු ලැබිය යුතුය.

බොහෝ ප්‍රොතැස්තන්තවරු කල්පනා කරන්නේ කතෝලික ආගම සිත් ගන්නා එකක් නොවන බවය, එහි නමස්කාරය උනන්දුවක් හෝ අර්ථයක් නැති චාරිත්‍ර පිළිවෙලක් බවය. මෙය වරදකි. රෝම සභාව රැවටීම් මත පදනම් වී තිබෙන නමුත් එය රළු අශෝභන ක්‍රියා පිළවෙලක් නොවේ. රෝම සභාවේ ආගමික මෙහෙයන් වනාහි සිත්ගන්නා පිළිවෙතක්ය. එහි අලංකාර දර්ශනද, ගාම්භීර චාරිත්‍ර වාරිත්‍රද මනුෂ්‍යයන් ප්‍රීතියට පමුණුවමින්, කරුණු බේරාගැනීමේ හැකියාවද, හෘද සාක්ෂියද නිශ්චල කරයි. ඇසට ඉමහත් ප්‍රසන්න-තාවයක් ඇතිවෙයි. ඉතා අලංකාර දේවස්ථාන, හොඳාකාර සකසන ලද පෙරහැරවල්, රන් පූජාසන, ආභරණ වලින් සරසන ලද රූප, අලංකාර චිත්‍ර හා ඉතා අලංකාර කැටයම් යන සියල්ල අලංකාරයට ආශාවන සිතට කථා කරයි; සවනද ප්‍රසන්න කරනු ලබයි. ඒ තූර්යවාදනය අන්කිසිවකින් පරදවනු ලැබීමට නුපුළුවන. ගැඹුරු රාවයක් ඇත්තාවූ සංගීත භාණ්ඩවල රාවය බොහෝ අයවලුන්ගේ ගීත නාදය හා එක්වෙමින් ඒ ඉතා අලංකාර ගොඩනැගිලි තුළ පැතිරී යයි. ඒවා මගින් මනසට ගරුසම්පන්නතාවයක් හා බියමුසු ගරුත්වයක් ඇතිවන බව ස්ථිරය.

පිටතින් පවතින්නාවූ මේ අනර්ඝත්වය, අලංකාරය හා උත්සවාකාරය වනාහි පාපයෙන් ලෙඩවූ ආත්මයන්ට සරදම් කරන්නක් හා



සමාන තත්ත්වයකි. එය අභ්‍යන්තරික දූෂණත්වයක් ප්‍රත්‍යක්ෂ කරන්නකි. ක්‍රිස්තුස්වහන්සේගේ ආගම පිළිගනු ලබන පිණිස එය එපමණ සිත් ඇදගන්නා අන්දමින් පැවතීම අවශ්‍ය නොවේ. කුරුසියේ පූජාවෙන් නිකුත් වන ආලෝකය අනුව, ක්‍රිස්තියානි ආගම කොපමණ පවිත්‍රව, අලංකාරව දර්ශනය වන්නේද යත් පිටස්තර සැරසිලි මගින් එහි සැබෑ වටිනාකම වැඩි කරනු ලබන්නේ නැත. දෙවියන්වහන්සේ ඉදිරිපිට වටිනාකම ඇත්තේ ශුද්ධකමේ අලංකාරයටය, මොළොක් ගුණයෙන් යුත් සන්සුන් ආත්මයකටය.

දීප්තිමත් ස්වභාවයක් මගින් පවිත්‍ර උතුම් සිතුවිලි පවතින බවක් නිශ්චය වශයෙන්ම දක්වනු ලබන්නේ නැත. උසස් කලාත්මක අදහස්ද, සියුම් උතුම් ආශාවන්ද නිතර පවතින්නේ ලෞකිකවූද තෘෂ්ණාවන්ගෙන් යුක්තද වූ මනසකය. නිතරම සාතන් ඒවා පාවිච්චි කරන්නේ ආත්මයේ අවශ්‍යතාවයන් අමතක කිරීමටද, අනාගත සදාකාල ජීවනය දර්ශනය කිරීමෙන් වැලකීමටද, ඔවුන්ගේ සදාකාලික සහායකයාණන් අමතක කිරීමටද මනුෂ්‍යයන්ට මගපෙන්වමින් මේ ලෝකය උදෙසා පමණක්ම ජීවත්වීමට ඔවුන් යොමු කිරීමටය.

පිටස්තර අලංකාරයෙන් යුත් ආගමක් ගැන ආශාවක් ඇතිවන්නේ අලුත් කරන ලද හදවත් නොමැති අයටය. කතෝලික සභාවේ උද්‍යෝගිත්වය හා චාරිත්‍රානුකූල ස්වභාවය තුළ සිත් ඇදගන්නා බලයක් තිබෙන බැවින් බොහෝ අය එමගින් රවටනු ලබති. රෝමානු සභාව වනාහි ස්වර්ගයට යොමුකරන දොරටුව යයි කල්පනා කිරීමට ඔව්හු පෙළඹෙති. එහි අනුබලයෙන් බේරී සිටිය හැක්කේ සත්‍යයේ පදනම මත ස්ථිර ලෙස පිහිටා සිටින්නාවූද දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන සිත් අලුත් කරනු ලැබුවාවූද අයට පමණය. ක්‍රිස්තුස්වහන්සේ ගැන අත්දකීමෙන් යුත් දැනගැන්මක් නොමැති දහස් ගණන් ජනයා බලයෙන් තොරවූ දේවභක්තිකකමේ ස්වභාවය පිළිගැනීමට මගපෙන්වනු ලබනවා ඇත. බොහෝ දෙනා ආශා වන්නේ එබඳු ආගමකටය.

පව් කමාව දීමට සභාවට පුළුවන්කම තිබෙන බවට ඇති ප්‍රකාශනය මගින් රෝම සභිකයෝ තමාට පව්කිරීමට නිදහස තිබෙන බවක් කල්පනා කරති. පව් කියාදීමෙන් තොරව පව් කමාව දෙනු නොලැබීමද නපුර කිරීමට අවසර දීමක් වෙයි. පාපයට වැටුණාවූ මනුෂ්‍යයෙකු ඉදිරිපිට දණගසා තමාගේ රහස් සිතුවිලිද හදවතේ සිතැඟියාවන්ද විවෘත ලෙස කියාදීම වනාහි ඔහුගේ පුරුෂත්වය පහත් කිරීමකි, ඔහුගේ ආත්මයේ ඇත්තාවූ සෑම උසස් පෙළඹීමක්ම පහත් කිරීමකි. තමාගේ ජීවිතයේ පාපයන් පූජකයෙකුට විවෘත කිරීම

- එනම් වැරදි කරන්නාවූ, පාපිෂ්ට මනුෂ්‍යයෙකුට, නිතර මිදියුෂින් හා දුසිරිතෙන් නරක් වන්නාවූ තැනැත්තෙකුට විවෘත කිරීම වනාහි ඔහුගේ චරිතය පහත් කිරීමකි; ඒ අනුව ඔහුගේ ජීවිතය අපවිත්‍ර කරනු ලැබේ. දෙවියන්වහන්සේ ගැන ඔහුට ඇත්තාවූ සිතුවිලි පාපයට වැටුණාවූ මනුෂ්‍යයාගේ සමානත්වයටය පමුණුවනු ලැබේ. කුමක්හෙයින්ද පූජකයා දෙවියන්වහන්සේ වෙනුවට පෙනී සිටියි. මනුෂ්‍යයෙක් මනුෂ්‍යයෙකුට මේ අන්දමට පව් කියාදීම ලෝකය අපවිත්‍ර කරන්නාවූ නපුර ගලාඑන්ට සලස්වන රහස් උල්පතක් වී තිබේ. එමගින් ලෝකය ඒ අවසාන විනාශයට සූදානම් කරනු ලැබේ. එහෙත් ආත්මාර්ථකාමිත්වයට ආශාවන කෙනෙකුට තමාගේ ආත්මය දෙවියන්වහන්සේට විවෘත කිරීමට වැඩියෙන් සහකාර මනුෂ්‍යයෙකුට පව්කියා දීම ප්‍රසන්නය. පාපය අත්හැරීමට වැඩියෙන් පාපය උදෙසා දඬුවම් විඳීම මනුෂ්‍ය ස්වභාවයට ප්‍රසන්නය; මානුෂික තෘෂ්ණාවන් කුරුසිපත් කිරීමට වැඩියෙන් ගෝනි රෙදි ඇඳගෙන කටු හා දම්වැල් වලින් මාංසය යටත් කරගැනීම මනුෂ්‍යයාට ප්‍රසන්නය. ක්‍රිස්තුස්වහන්සේගේ වියගහ ඉදිරිපිට නැමෙනවාට වැඩියෙන් මාංසික හදවත කැමති වන්නේ බරින් වැඩි වියගහක් දැරීමටය.

ක්‍රිස්තුස්වහන්සේ පළමුවරට මේ ලෝකයට පැමිණි විට පැවති යුදෙව් සභාවද රෝම සභාවද බොහෝ දුරට එක හා සමානය. යුදෙව්වරු රහසින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ සෑම ප්‍රතිපත්තියක්ම පෑගූ අතර, ඔව්හු පිටස්තරින් එහි ප්‍රතිපත්ති පැවැත්වීමේදී උනන්දුවෙන් ක්‍රියා කළහ. ඔව්හු වෙනත් අවශ්‍යතාවයන් හා මනුෂ්‍යයන්ගේ නියෝග මගින් ඒවා පුරවමින් ඒවා පැවැත්වීම වේදනාත්මක බරක් වෙන්ට සැලැස්වූහ. තමා ව්‍යවස්ථාවට ගරු කරනවා යයි යුදෙව්වරුන් පැවසූ අන්දමටම රෝම සභාව තමා කුරුසියට ගරුත්වය දක්වන බව පවසයි. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විඳීමේ සංකේතය නභාලන අතර එයින් දක්වනු ලබන තැනැන්වහන්සේව ඔවුන්ගේ ජීවිතවලින් එපා කරති.

පාප් සභිකයෝ ඔවුන්ගේ දේවස්ථාන වලද, ඔවුන්ගේ පූජාසන මතද ඔවුන්ගේ ඇඳුම් වලද කුරුසි තබති. කුරුසියේ සලකුණ සෑමතැනම දකින්නට පුළුවන. පිටස්තරින්, සෑමතැනදීම එයට ගරුකර එය නභාලනු ලැබේ. නමුත්, අර්ථ රහිත නියෝග මගින්ද, තදබල නියමයන් මගින්ද ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් වළලා දමනු ලැබේ. ඔවුන්ගේ ප්‍රතිපත්ති-වලට ස්ථිරව සිටි යුදෙව්වරුන්ට ගැළවුම්කාරයාණන්වහන්සේ පැවසූ වචන වඩාත් බලවත් ලෙස රෝම සභාවේ නායකයන්ට අදාළ වේ. උන්වහන්සේ මෙසේ පැවසූ සේක: "එසේය ඔව්හු උසුලන්ට අමාරු මහත් බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති; නුමුත් තමුන්ගේ ඇඟිල්ලවත්



ඒවාට තබන්ට කැමති නොවෙති." (මතෙව් 23:4) අවංකව හෘද සාක්ෂිය අනුව ක්‍රියාකරන අය තමා දෙවියන්වහන්සේව අප්‍රසන්න-තාවයට පැමිණවූ බැවින් උන්වහන්සේගේ උදහස තමා පිටට පැමිණෙනවා ඇතැයි නිතරම මහත් බියකින් පසුවෙති; ඒ අතර, සභාවේ නායකයෝ සෞභාග්‍යය හා ශාරීරික විනෝදත්වය ඇතිව ජීවත් වෙති.

රූපවලට වන්දනා කිරීමද, ශුද්ධවන්තයන්ට යාච්ඤා කිරීමද, පාප්ව නගාලීමද සාතන් සකසා තිබෙන උපක්‍රමයන්ය. ඒවා මගින් මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ කෙරෙන්ද උන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙන්ද ඉවතට යොමු කිරීමට ඔහු ක්‍රියා කරයි. ඔවුන් විනාශ කරන පිණිස සාතන් ඔවුන්ගේ අවධානය දෙවියන්වහන්සේ කෙරෙන් ඉවතට යොමු කිරීමට ක්‍රියා කරයි. එහෙත් ඔවුන්ට ගැළවීම ලබාගත හැක්කේ උන්වහන්සේ තුළින් පමණය. "වෙහෙස වන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි" (මතෙව් 11:28) යනුවෙන් පැවසූ තැනැන්වහන්සේ කෙරෙන් ඔවුන්ගේ අවධානය ඉවත්කර උන්වහන්සේ වෙනුවට ඉදිරිපත් කළ හැකි ඕනෑම දෙයකට ඔහු ඔවුන් යොමු කරයි.

සාතන් නිතරම උත්සාහ කරන්නේ දෙවියන්වහන්සේගේ චරිතයද, පාපයේ ස්වභාවයද, මහා අරගලයේ පවතින වැදගත් කාරණාද වරදවා දැක්වීමටය. ඔහුගේ ඉගැන්වීම් අනුව දිව්‍ය ව්‍යවස්ථාව කෙරෙහි මනුෂ්‍යයාට ඇති වගකීම අඩුකරනු ලබන අතර පව් කිරීමට ඔහුට අවසර දෙනු ලැබේ. ඒ අතරම ඔහු මනුෂ්‍යයන්ට මගපෙන්වන්නේ දෙවියන්වහන්සේ ගැන වැරදි අදහස් ඇතිකර ගැනීමටය. මෙසේ ඔවුන් උන්වහන්සේට ප්‍රේම කරනවා වෙනුවට උන්වහන්සේ ගැන බියෙන් හා ද්වේෂයෙන් සැලකීම ඔහුගේ අදහසය. ඔහුගේම චරිතයේ ඇත්තාවූ කෲරභාවය මැවුම්කාරයාණන්වහන්සේගේ ගුණාංගයක් බව ඔහු දක්වයි. එය ආගමික ක්‍රියාකාරිත්වයෙන් දක්වනු ලබන අතර නමස්කාර කිරීමේ ක්‍රමයන්හිදී එය ප්‍රකාශ කරනු ලැබේ. මෙසේ මනුෂ්‍යයන්ගේ සිත් අන්ධ කරනු ලැබ සාතන් ඔවුන් යොමු කරන්නේ දෙවියන්වහන්සේට විරුද්ධව සටන් කරන පිණිස ඔහුගේ ඒජන්තතවරුන් වීමටය. දිව්‍ය ගුණාංග වැරදි අන්දමට දක්වනු ලැබීම මගින් අන්‍ය-ජාතිකයන් විශ්වාස කරන්ට යෙදුණේ දිව්‍යත්වයේ කරුණාව දිනාගන්නා පිණිස මානුෂික පූජාවන් ඔප්පු කරනු ලැබිය යුතු බවය. රූප වන්දනාවේ අනේකාකාර පිළිවෙලවල් මගින් භයානක කෲරකම් කරනු ලැබේ. රෝම සභාව අන්‍යජාතිකත්වයේ හා ක්‍රිස්තියානි සභාවේ පිළිවෙත් එක්කරයි. මෙසේ, එය අන්‍යජාතිකයන් මෙන් දෙවියන්වහන්සේගේ චරිතය වරදවා දක්වමින් එයාකාරවම කෲර කැරළිකාර පළපුරුදු

ක්‍රියාත්මක කරන්ට යොමු වෙයි. රෝම සභාව උසස් තත්ත්වයෙන් සිටියදී, ඇගේ ධර්මයන් අනුව ක්‍රියාකිරීමට මනුෂ්‍යයන්ට බලකරන පිණිස පීඩා කිරීමේ අවි ආයුධ පාවිච්චි කරනු ලැබීය. ඇගේ නියමයන්ට කීකරු නොවන අය කණුවකට බැඳ පිච්චීමේ පිළිවෙත පැවතුණි. විනිශ්චය දවසේදී එළිදරව් කරනු ලබන තුරු ප්‍රකාශ කරනු නොලබන සමූල ඝාතන පැවතුණි. සභාවේ නායකයෝ ඔවුන්ගේ ස්වාමියාවූ සාතන් යටතේ ඉගෙන ගත්තේ තමාගේ ගොදුරේ ජීවිතය විනාශ නොකර ඔවුන්ට හැකි පමණ මහත් වධ වේදනා පැමිණවීමටය. මෙසේ පීඩා කිරීම ඉමහත් ප්‍රමාණයකින් මනුෂ්‍ය ශරීරයට දරාගැනීමට දෙනු ලැබීය. අවසානයේදී මනුෂ්‍ය ස්වභාවය ඒ පොරබැදීම අත්හැර දමා මරණය පිළිගත්තේ සුමිහිරි නිදහසක් හැටියටය.

රෝම සභාවට විරුද්ධ වූවන්ගේ තත්ත්වය මෙයාකාර විය. ඇගේ අනුගාමිකයන් හික්මවීම සඳහා කස පහරවල් දීම, සාගින්නේ තැබීම, ඉතා අප්‍රසන්න අන්දමට ශාරීරික පීඩාවන් දීම යනාදිය මෙහෙයවන ලදී. ස්වර්ගයේ කරුණාව දිනාගන්නා පිණිස, සොබාදහමේ නීති කඩකිරීමෙන් දෙවියන්වහන්සේගේ නීති කඩකළ අය පසුතැවිලි වීමට පමුණුවනු ලැබිය යුතු විය. මනුෂ්‍යයාගේ මෙලෝ ගමන ප්‍රීතියට පමුණුවන්නාවූද ඔවුන්ට ආශිර්වාදයක් වන්නාවූද සියලු සබඳතාවයන් බිඳ දැමීමට ඔවුන්ට උගන්වන ලදී. තමාගේ ස්වභාවික ප්‍රේමය යටපත් කිරීමටද සහකාර මනුෂ්‍යයන් කෙරෙහි තමා තුළ ඇති හැඟීම් දෙවියන්වහන්සේට අප්‍රසන්නය කියා ඒවා යටපත් කිරීමටද උත්සාහ කරමින් තම ජීවිත කාලය ගතකළ ලක්ෂ සංඛ්‍යාත ජනයාගේ සිරුරුවලින් පල්ලිවල වතු පිරී තිබේ.

වසර සිය ගණනක් මුළුල්ලේ සාතන් දෙවියන්වහන්සේ ගැන කිසිවිටෙක අසා නොමැති අයවලුන් තුළ නොව, ක්‍රිස්තියානි රටවල් මුළුල්ලේ සිටින මිනිස් හදවත් තුළ ක්‍රියාත්මක කරන ස්ථිර කෲරතාවය වටහාගැනීමට කැමති වෙමු නම් අප විසින් බැලිය යුත්තේ රෝම සභාවේ ඉතිහාසය දෙසය. රැවටිලිකාරකමෙහි මේ විශාල ක්‍රියාපිළිවෙල මගින් නපුරේ කුමාරයා දෙවියන්වහන්සේ අගෞරවයට පත්කිරීමටද මිනිසා කාලකණ්ණිකමට පත්කිරීමටද ක්‍රියා කරයි. ඔහු තමාගේ නියම ස්වභාවය සඟවාගෙන, සභාවේ නායකයන් තුළින් තමාගේ අභිලාෂය ඉටුකරගන්නවා අප දකින විට, ඔහු බයිබලයට මෙපමණ ද්වේෂ කරන්නේ ඇයි දැයි අපට වටහාගැනීමට පුළුවන. ඒ පොත කියවනු ලබන්නේ නම්, දෙවියන්වහන්සේගේ දයාව හා ප්‍රේමය ප්‍රකාශ වෙනවා ඇත; උන්වහන්සේ මෙබඳු බර මනුෂ්‍යයන් පිට තබන්නේ නැති බව පෙනී යනවා ඇත. උන්වහන්සේ ඉල්ලන්නේ තැළුණු බිඳුණු හදවතක් හා යටහත් කීකරු ආත්මයක් පමණය.



ස්වර්ගයට යාමට සුදුස්සන් වන පිණිස ස්ත්‍රී පුරුෂයන් ආරාමයකට ඇතුල් විය යුතු බවට කිසි ආදර්ශයක් යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ජීවිතයෙන් ඉදිරිපත් නොකළ සේක. ප්‍රේමය හා දයාව යටපත් කරනු ලැබිය යුතු යයි උන්වහන්සේ කිසිවිටෙක ඉගැන්වූයේ නැත. ගැළවුම්-කාරයාණන්වහන්සේගේ හදවත ප්‍රේමයෙන් ඉතිරී ගියේය. මනුෂ්‍යයා සුචරිතානුකූල සම්පූර්ණත්වයට ආසන්න වන තරමට ඔහුගේ හැඟීම් ක්‍රියාත්මක වෙයි, ඔහු පාපය වඩාත් හොඳින් වටහා ගනියි, පීඩාවට පත්වූවන් කෙරෙහි ඔහු තුළ ඇති සානුකම්පාවද වඩා ගැඹුරු වෙයි. තමා ක්‍රිස්තුස්වහන්සේ වෙනුවට පෙනී සිටින්නේ යයි පාප් පවසයි. නමුත් ඔහුගේ චරිතය ක්‍රිස්තුස්වහන්සේගේ චරිතයට සමාන කළ විට ඇත්තේ කෙබඳු තත්ත්වයක්ද? තමා ස්වර්ගයේ රජතුමාණන් වන බැවින් තමන්වහන්සේට ගෞරවය නොදක්වීම ගැන උන්වහන්සේ කිසිවිටෙක මනුෂ්‍යයන් සිරගෙට හෝ වධ හිංසාවන්ට භාජනය කළසේක්ද? තමන්වහන්සේව පිළිනොගත් නිසා උන්වහන්සේ මනුෂ්‍යයන් මරනු ලැබිය යුතු යයි පැවසීමට කිසිවිටෙක තමන්වහන්සේගේ හඬ එසවූ සේක්ද? සමාරිය ගමක මනුෂ්‍යයන් උන්වහන්සේව පිළිනොගත් විට යොහන් අපෝස්තුළුවරයා බොහෝ සේ කෝප වී උන්වහන්සේගෙන් මෙසේ ඇසුවේය: "ස්වාමිනී ඔවුන් නාස්ති කරන පිණිස අහසින් ගිනි බසින්ට අප අණ කරනවාට ඔබ කැමති සේක්ද?" යේසුස්වහන්සේ අනුකම්පාවකින් තමන්වහන්සේගේ මේ ගෝලයා දෙස බලමින්, ඔහුගේ රළු ස්වභාවයට තරවටු කරමින් මෙසේ පැවසූ සේක. 'මනුෂ්‍ය පුත්‍රයා පැමිණ සිටින්නේ මනුෂ්‍යයන්ගේ ජීවිත විනාශ කිරීමට නොව, ඔවුන් ගැළවීමටය.' ක්‍රිස්තුස්වහන්සේ වෙනුවට තමා පෙනී සිටිනවා යයි පවසන තැනැත්තාගේ ස්වභාවය උන්වහන්සේ දක්වූ ආත්මයට වඩා කොපමණ වෙනස්ද.

රෝම සභාව දැන් ලෝකයට පෙන්නුම් කරන්නේ වඩා ප්‍රසන්න ස්වභාවයක්ය. අතීතයේ කරන ලද ක්‍රියාවන් ගැන ඇය දැන් සමාවට කරුණු ඉදිරිපත් කරයි. ඇය ක්‍රිස්තුස්වහන්සේගේ සමානකමින් යුත් වස්ත්‍රවලින් තමාව සරසාගෙන සිටින්නීය. නමුත් ඇය වෙනස් නොවී සිටින්නීය. අතීතයේදී පාප් සභාවේ පැවති සෑම ප්‍රතිපත්තියක්ම අද දවසේද පවතියි. ඉමහත් අන්ධකාරය පැවති සමයේදී යොදාගන්නා ලද ධර්මයන් තවමත් පවතී. කිසිවෙක් තමා රවටා නොගනීවා. දැන් ප්‍රොතැස්තන්ත සභාව ගරු කිරීමට සූදානම්ව සිටින පාප් සභාව ප්‍රතිසංස්කරණයේ කාලයේදී ලෝකය ආණ්ඩු කළාවූ සභාවමය. ඒ කාලයේදී මනුෂ්‍යයෝ ඇගේ වැරදි ක්‍රියාවන් එළිදරව් කරන පිණිස තමාගේ ජීවිත අන්තරා අභිමුඛයට පමුණුවමින් නැගී සිටියහ. රජවරුන් හා කුමාරයන් කෙරෙහි ඇය දක්වූ උදාරම හා ආඩම්බරයද තමාට දෙවියන්වහන්සේගේ ගුණාංගය තිබෙන බව පැවසීමේ ස්වභාවයද අද

දවසේත් පවතියි. ඇය මානුෂික නිදහස පොඩිකර දමමින් මහෝත්තම-යාණන්ගේ ශුද්ධවන්තයන් මැරුවාවූ කාලයේදී මෙන්ම දැන්ද ඇය තුළ බලය පැමේ කෲර ආත්මයක් පවතියි.

පාප් බලය වනාහි අනාවැකියෙන් පවසන ලද අන්දමටම, අන්තිම කාලයේදී සත්‍යයෙන් මුලාව යැමකි. (2 තෙසලෝනික 2:3,4) තම අභිලාෂයන් සම්පූර්ණ කිරීමට තමාට උපකාරයක් වන චරිතයක් ඇතිව සිටීම ඇගේ ක්‍රියා පිළිවෙලය; එහෙත් ඇගේ මේ වෙනස්වන කටුසු ස්වභාවය තුළ ඇය සහවාගෙන සිටින්නේ සර්පයාගේ වෙනස් නොවන විෂයයි. 'සත්‍යයෙන් ඉවත්ව සිටින්නාවූ අයට අපගේ ඇදහිල්ල හෝ පොරොන්දු ක්‍රියාත්මක කිරීමට අපි බැඳී නොසිටිමු' යි ඇය කියන්නීය. ශුද්ධවන්තයන්ගේ ලේ වලින් වසර දහසක් මුළුල්ලේ සටහන් කරනු ලැබූ මේ බලය දැන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ කොටසක් හැටියට පිළිගනු ලැබිය යුතුද?

කතෝලික සභාව දැන්, පෙර පැවැති තත්ත්වය තරමට, ප්‍රොතැස්තන්ත සභාවන්ට වඩා වෙනස් නොවෙන්නේය යනුවෙන් ප්‍රොතැස්තන්ත රටවල පවසනු ලබන්නේ හේතු සහගතවය. වෙනසක් ඇතිවී තිබේ. නමුත් මේ වෙනස ඇතිවී තිබෙන්නේ පාප් සභාවේ නොවේ. ඇත්තෙන්ම කතෝලික සභාව දැන් පවතින ප්‍රොතැස්තන්ත සභාවන්ට සමාන වන්නේ ප්‍රතිසංස්කරණයේ දවස්වලට පසුව දැන් ප්‍රොතැස්තන්ත සභාවන්හි තත්ත්වය බොහෝ සේ පහත බැස තිබෙන නිසාය.

ප්‍රොතැස්තන්ත සභාවන් ලෝකයාගේ කරුණාව ලබාගැනීමට සොයන අතර බොරුකාර ප්‍රේමයක් ඔවුන්ගේ ඇස් අන්ධකර තිබේ. සියලු නරක දේවල යහපතක් තිබෙන බව විශ්වාස කිරීම නිවැරදි යයි ඔව්හු දර්ශනය කරති. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් පිළිගන්ට යන්නේ සියලු යහපතෙහි නපුරක්ද තිබෙන බවය. ශුද්ධවන්තයන්ට දෙන ලද ඇදහිල්ල ආරක්ෂා කරගැනීමට නැඟී සිටිනවා වෙනුවට ඔව්හු දැන් රෝම සභාවට කියන්ට යෙදෙන්නේ ඇය පිළිබඳව ඔවුන් තුළ තිබුණාවූ අකරුණාවන්ත හැඟීම් ගැනද ඔවුන් කෙරෙන් ඉවත්වීම ගැනද, ඔවුන්ට කමාව දෙන ලෙස ඉල්ලන බව දක්වීමකි.

රෝම සභාව කාරුණික ලෙස නොසලකන්නාවූ අය පවා දකින්නේ ඇගේ අනුබලයෙන් හා බලයෙන් වැඩි අන්තරාවක් ඇති නොවිය හැකි බවය. මධ්‍යම යුගයේදී පැවති ප්‍රඥාවේ හා සුචරිතානුකූලත්වයේ අන්ධකාරය නිසා ඇගේ ඉගැන්වීම්, මිථ්‍යා මත හා පීඩා කිරීම් පැතිරී ගිය බව බව බොහෝ අය කියා සිටිති. නවීන කාලයේදී වඩා



මහත් ප්‍රඥාවක් පවතින බැවින්ද, ආගමික කාරණා නිදහස් ලෙස සැලකීම වැඩිවී තිබෙන බැවින්ද ඔවුනොවුන් ගැන නොඉවසිලිවන්ත භාවයක් හා ප්‍රචණ්ඩකාරීත්වයක් නැවත ඇති නොවන බව කල්පනා කරනු ලැබේ. වඩා මහත් ආලෝකයක් ඇත්තාවූ මේ යුගයේදී එබඳු තත්ත්වයක් ඇතිවිය හැකිය යන අදහසට පවා සරදම් කරනු ලැබේ. ආලෝකය, ප්‍රඥාව, සුචරිතය හා ආගමික භාවය මගින් මේ පරම්පරාවට දීප්තියක් ලැබී තිබෙන බව සැබෑය. දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනයේ විවෘත කරන ලද පිටු තුළින් ස්වර්ගයේ ආලෝකය ලෝකවාසීන් මත බබළයි. නමුත් මතක තබාගත යුතු කරුණ නම්, දෙන ලද ආලෝකය වැඩිවූ තරමට එය නරක් කරන හෝ එපා කරන අයගේ අන්ධකාරයද වැඩි වන බවය.

යාච්ඤාවෙන් යුක්තව බයිබලය ඉගෙන ගන්නේ නම් ප්‍රොතැස්තන්ත සභාවන්ට පාප් සභාවේ නියම ස්වභාවය ප්‍රකාශ වී එය පිළිකුල් කරමින් එය එපා කිරීමට ඔවුන් යොමු කරනු ලබනවා ඇත. නමුත් බොහෝ අය තමාගේම උදාරම් ප්‍රඥාවෙහි කොපමණ දුරට යොමුවී සිටින්නේදයත් තමා සත්‍යයට යොමු කරනු ලබන පිණිස තමා යටහත්කමින් දෙවියන්වහන්සේගේ මගපෙන්වීම සෙවිය යුතු බව ඔවුන්ට පෙනී යන්නේ නැත. තමාට ලැබී තිබෙන ආලෝකය ගැන ආඩම්බර වෙන ඔව්හු ශුද්ධ ලියවිල්ල ගැනද දෙවියන්වහන්සේගේ බලය ගැනද නොදැනුවත්ව සිටිති. ඔවුන්ට තමාගේ හෘදය සාක්ෂිය නිශ්චල කිරීමට මාර්ගයක් තිබිය යුතුය; එහෙයින් ඔව්හු ඉතාම අඩු ආත්මික භාවයකින් හා යටහත් කිරීමකින් යුක්ත දේවල් සොයති. ඔවුන් සොයන්නේ තමා දෙවියන්වහන්සේව මතක් කරගන්නවා යයි දක්වන නමුත්, දෙවියන්වහන්සේව අමතක කිරීමට තුඩු දෙන මාර්ගයක්ය. පාප් සභාව මේ අභිලාෂයන් සියල්ල සපුරාලීමට හැඩගැසී තිබේ: එය මුළු ලෝකයේම පවතින්නාවූ මනුෂ්‍ය ජාතීන් දෙකොටසක් සඳහා සූදානම් කරනු ලැබ තිබේ. එනම්, තමාගේ කුසලතාවයන් මගින් ගැළවීම ලැබීම බලාපොරොත්තු වෙන්නාවූ අය හා තමාගේ පාප තුළම පවතිමින් ගැළවීම ලබන්ට සොයන්නාවූ අයවල්ය. මෙය ඇගේ බලයේ රහසය.

ප්‍රඥාව අතින් අන්ධකාරය පවතින දිනය පාප් සභාවේ දියුණුවට උපකාරයක් වන බව දක්වා තිබේ. එසේම, ප්‍රඥාව අතින් මහත් ආලෝකයක් පවතින දවසද එහි දියුණුවට ඉතා හිතකර බව දක්වනු ලබනවා ඇත. මනුෂ්‍යයන්ට දෙවියන්වහන්සේගේ වචනය නොතිබුණාවූ ඒ අතීත කාලයේදී ඔවුන්ට සත්‍යය ගැන දැනගැන්මක්ද නොතිබුණි. ඔවුන්ගේ ඇස් අන්ධ කරනු ලැබ තිබුණි; තමාගේ පාමුල තිබෙන දැල නොදක දහස් ගණන් ජනයා උගුල්වලට අසුවූහ. මේ පරම්පරාවේදී

බොහෝ අයගේ ඇස් බැබලෙන්නේ 'වැරදි ලෙස විද්‍යාව යන නාමයෙන් හඳුන්වනු ලබන' මානුෂික අදහස්වලින්ය. ඒ දැල නොදකිමින් ඔව්හු එය තුළට ගමන් ගන්නේ ඔවුන්ගේ ඇස් අන්ධ කරනු ලැබුවාසේය. මනුෂ්‍යයාගේ ප්‍රඥාවේ බලයන් ඔහුගේ මැවුම්කාරයාණන් විසින් දෙන ලද දීමනාවක් හැටියට පිළිගනු ලැබ ඒවා සත්‍යයේ හා ධර්මිෂ්ඨකමේ සේවයන් සඳහා පාවිච්චි කරනු ලැබීම දෙවියන්වහන්සේගේ අදහස විය. නමුත් උඩඟුව හා අනාගතයේදී උසස්වීමේ ආශාවන් ඇලුම් කරනු ලැබූ විට මනුෂ්‍යයෝ තමාගේම අදහස් දෙවියන්වහන්සේගේ වචනයට වඩා උසස් ලෙස සලකති. එවිට ප්‍රඥාව මගින් ඇතිවන අනතුර නොදනුවත්කමින් ඇතිවන අනතුරට වඩා විශාලය. මෙසේ බයිබලය සුළුකොට සලකන දහනම වන ශතවර්ෂයේ වැරදි විද්‍යාව පාප් සභාව පිළිගැනීමට මාර්ගය සකසා දීමේදී ඒ තරමටම සාර්ථක වෙනවා ඇත. අඳුරු යුගයේදී පාප් සභාව දැනගැන්ම වලක්වාලීමෙ මගින් උසස් භාවය දක්වූවා සේම දැන් එහි ප්‍රසන්න ස්වභාවය මගින් එය පිළිගැනීම සාර්ථක වෙනවා ඇත.

අමෙරිකා එක්සත් ජනපදයෙහි, ඔවුන්ගේ සංවිධානයන්ගේ හා සභාවන්ගේ ප්‍රයෝජනය සඳහා ආණ්ඩුවේ සහාය ලබාගැනීමට සෙවීමෙන් ප්‍රොතැස්තන්ත සභාවන්ද දැන් පවතින ව්‍යාපාරයන් මගින් පාප් සභාව අනුව ක්‍රියා කෙරේ. එපමණක් නොව, ප්‍රොතැස්තන්ත අමෙරිකාවෙහි පාප් බලය නැවත පිහිටුවීමටද මෙසේ පුරාණ ලෝකයේදී ඇයට නැතිවී ගිය උතුම් භාවය නැවත පිහිටුවා ගැනීමටද ඔව්හු දොරටු විවෘත කරති. මේ ව්‍යාපාරය වඩාත් වැදගත් වන්නේ, මේ පිළිබඳව ප්‍රධාන අභිලාෂය වන්නේ ඉරිදා පැවැත්වීමට බලකිරීම වන නිසාය. රෝමයේදී ආරම්භ වූ මෙය ඇගේ ආධිපත්‍යයේ ලකුණක් යයි පවසනු ලැබේ. එය වනාහි ලෞකික චාරිත්‍ර වත්පිළිවෙත් වලට යොමුවීමේද දෙවියන්වහන්සේගේ ආඥාවන්ට වැඩියෙන් මානුෂික ශික්ෂාවන්ට ගරු කිරීමේද ආත්මයකි. මෙය ප්‍රොතැන්තන්ත සභාවන්ට ඇතුල් වෙමින්, පාප් සභාව මීට පෙර කළාවූ අන්දමට, ඉරිදා නභාලීමේ එම වැඩයම කරගෙන යාමට ඔවුන්ට මගපෙන්වයි.

මෙය කියවන්නාවූ තැනැත්තා, නුදුරු අනාගතයේදී පැමිණෙන්ට යන්නාවූ මෙබඳු අවස්ථාවන්හිදී පාවිච්චි කරනු ලබන්ට යන උපක්‍රම හරියාකාරව වටහාගැනීමට කැමති නම්, ඔහු රෝමය අතීතයේදී පාවිච්චි කළාවූ උපක්‍රම පිළිබඳව ඇති සටහන් සොයා බැලිය යුතුය. පාප් සභිකයන් හා ප්‍රොතැස්තන්තවරුන් එක්සත් වී, ඔවුන්ගේ ඉගැන්වීම්වලට විරුද්ධ වන අය පිළිබඳව කෙසේ ක්‍රියාකරනවා ඇද්දැයි දැනගැනීමට කැමති නම්, සබත් දවස ගැනද එය පැවැත්වීමට යෙදුණාවූ



අය ගැනද රෝමය දක්වූයේ කෙබඳු ආත්මයක් දැයි සොය බලනු ලැබිය යුතුය.

ක්‍රිස්තියානි ලෝකයෙහි අන්‍යජාතික උත්සව වලට ගරු සම්පන්න ස්ථානයක් දෙනු ලැබුවේ රාජකීය නියමයන්, සාමාන්‍ය මණ්ඩලයන් හා සභාවේ නියමයන් දේශීය බලයන් මගින් පාලනය කරනු ලැබීමෙන්ය. ඉරිදා පැවැත්වීම පළමුවරට ප්‍රසිද්ධ ලෙස පිහිටුවනු ලැබුවේ කොන්ස්තන්තීනු රජතුමා නිකුත් කළ නියෝගයක් මගින්ය. (ක්‍රි,ව. 321 දී) මේ නියෝගය මගින් නගරවාසීන් විසින් ඉරට නියමිත වූ ඒ වැදගත් දවසේදී නිවාඩු ගැනීමට බලකරනු ලැබූහ. නමුත් ගම්වාසීන්ට ඔවුන්ගේ ගොවිතැන්වල කටයුතු තවදුරටත් කරගෙන යාමට අවසර දෙන ලදී. මෙය නියම වශයෙන් මිථ්‍යාදෘෂ්ඨික පිළිවෙතක් වුවද රජතුමා මේ නියෝගය පැනවූයේ ඔහු ක්‍රිස්තු ධර්මය නාමික ලෙස පිළිගත්තාට පසුවය.

රාජකීය නියමය දිව්‍ය ආධිපත්‍යයේ බලය වෙනුවට පිළිගනු ලැබීමට නුපුළුවන් වූයෙන් එයුසිබියස් නමැති බිෂොප්වරයා ක්‍රියාත්මක විය. එවිට යුරෝපයේ සිටි කුමාරවරුන්ගේ පිළිගැනීම ලබාගැනීමට සෙවූ ඔහු කොන්ස්තන්තීනු රජතුමාගේ විශේෂ මිත්‍රයෙක් විය. ක්‍රිස්තුස්වහන්සේ සබත් දවස ඉරිදා බවට වෙනස් කළ සේකැයි ඔහු ප්‍රකාශ කළේය. මේ අලුත් ධර්මය ඔප්පු කිරීමට එක ශුද්ධ ලියවිලි පාඨයක්වත් දක්වනු ලැබුවේ නැත. අදහස් නොකරමම, එයුසිබියස් එය සත්‍යයක් නොවන බව දක්වමින් ඒ වෙනස ඇතිකිරීමේ නියම කර්තෘ වූයේ කවරෙක් දැයි දක්වූයේය. "අපි සබත් දවසේදී කළ යුතු සියල්ල ස්වාමින්වහන්සේගේ දවසට පැවරුවෙමු" යි ඔහු කියා තිබේ. ඉරිදා පැවැත්වීමට පදනමක් නොතිබුණ නමුත් ඒ නීතිය, මනුෂ්‍යයන්ට එඩිතර ලෙස ස්වාමින්වහන්සේගේ සබත් දවස පාගා දැමීමට උපකාරයක් විය. ලෝකයාගේ පිළිගැනීමෙන් ගරුකරනු ලැබීමට කැමති වූ සියලු දෙනාම මේ ජනප්‍රිය උත්සවය පිළිගත්හ.

පාප් බලය වඩාත් ස්ථිර ලෙස පිහිටුවනු ලැබූ විට ඉරිදා පැවැත්වීම නගාලීමේ වැඩය තවදුරටත් කරගෙන යන ලදී. ටික කලක් යන තුරු මනුෂ්‍යයෝ දේවස්ථානයට නොගිය වේලාවන්හිදී තමාගේ ගොවිපළවල්හි වැඩවල යෙදුණාහ. ඒ අතරම, සත්වන දවස සබත් දවස ලෙසද පවත්වන ලදී. නමුත් වෙනසක් ස්ථිර ලෙසම ඇතිවන්නට විය. උසස් සේවාවන්හි යෙදී සිටි අයට ඉරිදා දවසේදී කිසියම් දේශපාලනික අරගලයක් පිළිබඳව විනිශ්චයක් නිකුත් කිරීම තහනම් කරන ලදී. ඉක්මණින්ම, මොනයම් තත්ත්වයක සිටින්නේ

වුවද සියලු මනුෂ්‍යයන් විසින් ඒ දවසේදී සාමාන්‍ය වැඩවලින් වැලකී සිටිය යුතු යයි නියෝග කරන ලදී. එයට අකීකරු වන සාමාන්‍ය මනුෂ්‍යයන්ට දඩයක් නියම කරනු ලබන බවද, සේවකයන්ට තළනු ලබන බවද පවසන ලදී. ඊටපසුව, ධනවතුන්ට දඩුවමක් වශයෙන් ඔවුන්ගේ ඉඩකඩම්වලින් බාගයක් ඔවුන්ට නැතිවන බව නියම කරන ලදී. අවසානයේදී, මේ ගැන මුරණ්ඩු වන මනුෂ්‍යයන් වහලුන් කරනු ලබන බවද පහත් තත්ත්වයේ අය නිරන්තරයෙන්ම රටින් පිටුවහල් කරනු ලබන බවද පවසන ලදී.

මේ සඳහා හාස්කම් ද ඇතුළත් කරන ලදී. ඒ හාස්කම් අතර මෙය එකක් විය. එක් ගොවියෙක් ඉරිදා දවසක තම කෙත හාන්ට සූදානම් වී යකඩයකින් නගුල පිරිසිදු කරන විට ඒ යකඩය ඔහුගේ අතට තද වුණි. වසර දෙකක් මුළුල්ලේ ඔහු එය තමාගේ අතේ දරා සිටියේය. මෙය ඔහුට මහත් වේදනාවක් හා ලැජ්ජාවක් විය.

ඊටපසුව, ඉරිදා නොපවත්වන අයට කථා කරමින් තමාටමද තමාගේ අසල්වැසියන්ටද කිසියම් කරදරයක් පමුණුවා නොගන්නා පිණිස ඉරිදාට දේවස්ථානයට ගොස් යාච්ඤා කිරීමට ඔවුන්ට අවවාද කරන්නැයි පාප් පූජකයන්ට කියා දුන්නේය. ප්‍රොතැස්තන්තවරුන් ඇතුළු බොහෝ අය ආගමික මණ්ඩලයක් මෙසේ ඉදිරිපත් කළාවූ තර්කයන් පිළිගන්ට යෙදුණාහ. එනම්, සමහර අය ඉරිදා වැඩ කරමින් සිටියදී විදුලි කෙටීමෙන් ඔවුන්ට පහර දෙනු ලැබූ නිසා ඉරිදා සබත් දවස විය යුතුමය, යන්නය. "මේ දවස නොතකා හැරීම ගැන දෙවියන්වහන්සේ කොපමණ අප්‍රසන්න වනසේක් දැයි මෙය අපට පෙන්වන්නේය"යි උසස් පෙළේ පූජකවරු පැවසූහ. ඊටපසුව, සියලු පූජකයන්ටද, රජවරුන්ට හා කුමාරවරුන්ටද සියලු විශ්වාසවන්ත ජනයාටද මෙබඳු ආයාචනයක් කරන ලදී: 'ක්‍රිස්තු ධර්මයේ යහපත සඳහා මේ දවසට ගෞරව කර එය කැපවීමෙන් යුක්තව පවත්වන පිණිසද එයට නිසි ගෞරවය දෙන පිණිසද සියලු දෙනාම ඉතා සැලකිලිමත් විය යුතුය' යන්නය.

මේ මණ්ඩලවල නියෝගයන් ප්‍රමාණවත් නොවන බවක් පෙනී ගිය බැවින් මනුෂ්‍යයන්ගේ සිත් බියපත් කරමින් ඉරිදා වැඩකිරීම සම්පූර්ණයෙන්ම නැවැත්වීමට ඔවුන්ට උපකාර කරන පිණිස දේශපාලනික බලයන්ටද මේ ගැන නියෝගයක් නිකුත් කිරීමට දිරි ගන්වන ලදී. රෝමයේ පවත්වන ලද පූජකයන්ගේ හා නායකයන්ගේ සම්මේලනයකදී මේ ගැන ගන්නා ලද සියලු තීරණ නැවතත් වඩා මහත් බලයෙන් හා ගාම්භීරත්වයෙන් ස්ථිර කරන ලදී. ඒවා ආගමික



ව්‍යවස්ථාවන්ටද ඇතුළත් කරමින් සියලු ක්‍රිස්තියානි රටවල දේශීය ආධිපත්‍යයන් මගින්ද නියෝගයක් වශයෙන් ඉදිරිපත් කරන ලදී.

ඒ අතරද, ඉරිදා පැවැත්වීමට ශුද්ධ ලියවිල්ලේ ආධිපත්‍යයක් නොතිබීම ඔවුන්ට ලැජ්ජාවක් විය. "සත්වෙනි දවස නුඹේ ස්වාමින්-වහන්සේට පවත්වන සබතක්ය" යනුවෙන් යොහෝවඃවහන්සේ දී තිබෙන පැහැදිලි ප්‍රකාශනය ඉවත් කරමින් ඉරට ගෞරව කරන දවසක් නියම කිරීමට ඔවුන්ගේ ගුරුවරුන්ට අවසර තිබෙන්නේ දැයි මනුෂ්‍යයෝ ප්‍රශ්න කළහ. ඒ ගැන බයිබලයේ සාක්ෂියක් නොතිබුණ බැවින් වෙනයම් සාක්ෂි සොයාගැනීම අවශ්‍ය විය. ඉරිදා පැවැත්වීම උනන්දුවෙන් ප්‍රකාශ කළ තැනැත්තෙක් දොළොස්වන ශත වර්ෂයේ අග භාගයේදී එංගලන්තයේ සභාවන් බැහැදැකීමට ගිය විට සත්‍යයට විශ්වාසවන්ත වූ සාක්ෂිකරුවෝ ඔහුට විරුද්ධ වූහ. ඔහුගේ උත්සාහය කොපමණ ඵල රහිත වූයේද යත් ඔහු ටික කලකට ඒ රටින් පිටවී ඔහුගේ ඉගැන්වීම් ස්ථිර කිරීමට මාර්ගයක් සොයන්නට විය. ඔහු ආපසු පැමිණි විට ඒ අඩුව සම්පූර්ණ කරනු ලැබූයෙන් ඊටපසුව ඔහුගේ වැඩය ඉතා සාර්ථක විය. ඔහු අකුලන ලද ලියවිල්ලක් තමා සමග ගෙන ගියේය. දෙවියන්වහන්සේම එය දුන් බවද ඉරිදා පැවැත්වීමට අවශ්‍ය නීතියද, එය කඩකරන්නාවූ අයට තදබල දඬුවම් දෙනු ලබන බවට තර්ජනයක් ද එහි තිබෙන බවද පවසන ලදී. මේ ලියවිල්ල එයින් සභාය දෙනු ලැබූ කාරණය තරමටම නීච බොරු ප්‍රකාශනයක් වූ නමුත්, එය ස්වර්ගයෙන් වැටුණු බවද එය යෙරුසලමේ ගොල්ගොතාවේ ශුද්ධවූ සිමියොන්ගේ අල්තාරය මත තිබී සොයා ගන්නා ලද බවද පවසන ලදී. නමුත් එය නියම වශයෙන් නිකුත් කරනු ලැබුවේ රෝමයේ පාප්ගේ මාළිගයෙන්ය. රැවටිලිකාරකම් හා බොරු අත්සන් පාවිච්චි කරමින් සියලු කාලවලදීම ඒවා සභාවේ බලය හා සෞභාග්‍යය උදෙසා පාවිච්චි කිරීම නිත්‍යානුකූල යයි පාප් බලධාරීන් පවසන්ට යෙදුණි.

සෙනසුරාදා නව වෙනි පැයේ සිට එනම් සවස තුනේ සිට සඳුදා ඉර උදාවීම දක්වා වැඩවලින් වැලකී සිටීමට ඒ ලියවිල්ල නියම කළේය. බොහෝ හාස්කම් මගින් මෙහි බලය ස්ථිර කරනලද්දේ යයි පවසන ලදී. මේ නියමිත කාලය තුළ වැඩ කළාවූ අයට අංශභාග රෝගය වැළඳුන බව සටහන් කරන ලදී. තමාගේ මෝලෙහි ඉරිඟු ඇඹරීමට උත්සාහ කළ මනුෂ්‍යයෙකුට දකින්ට ලැබුණේ ඉරිඟු පිටි වෙනුවට ලේ ධාරාවක් ගලා එන බවය. ජලය වේගයෙන් ගලා එන්නට වූ නමුත් මෝලේ රෝදය නොසෙල් වුණේය. එක් ස්ත්‍රියක් පෝරණුව උණුසුම්ව තිබියදී, අනන ලද පිටි පෝරණුවට ඇතුල් කළ නමුත් එය එළියට ගත් විට පිටි අමුවටම තිබුණි. තව කෙනෙක් නව

වන පැයේදී පිටි අනා පෝරණුවට දැමීමට සූදානම් කළ නමුත් ඒවා සඳුදා උදය දක්වාම ඒ තත්ත්වයෙන්ම තිබෙන්ට අරින්ට බේරා ගත්තාය. ඊළඟ දවසේ ඇට දකින්ට ලැබුණේ දිව්‍ය බලයක් මගින් ඒ පිටි පාන් රාත්තල් හැටියට සකසනු ලැබ පුළුස්සනු ලැබ තිබෙන බවය. සෙනසුරාදා නව වන පැයට පසුව පාන් පුච්චන්ට යෙදුණාවූ මනුෂ්‍යයෙක් ඊළඟ උදෑසන ඒ පාන් කැපූ අතර එයින් ලේ ගලා එන බව ඔහුට පෙනුණි. මෙබඳු නුසුදුසු මිථ්‍යා අදහස් ගොතමින් ඉරිදා පැවැත්වූ අය ඒ දවසේ ශුද්ධ භාවය ස්ථිර කිරීමට උත්සාහ කළහ.

එංගලන්තයේ මෙන්ම ස්කොට්ලන්තයේද පැරණි සබත් දවසෙන් කොටසක් ඉරිදා පැවැත්වීමට සම්බන්ධකර ඉරු දිනට මහත් සැලකිල්ලක් පිහිටුවන ලදී. නමුත් එහිදී ශුද්ධ ලෙස පැවැත්විය යුතු වූ කාලය වෙනස් විය. ස්කොට්ලන්තයේ රජතුමා නිකුත් කළ නියෝගයකින් දක්වනු ලැබුවේ සෙනසුරාදා දාවල් දොළහේ සිට සඳුදා උදෑසන දක්වා කාලය ශුද්ධ ලෙස සලකනු ලැබිය යුතු බවත් ඒ කාලයේදී කිසිවෙක් ලෞකික ව්‍යාපාරයන්හි යෙදී නොසිටිය යුතු බවත්ය.

ඉරිදා ශුද්ධ දවසක් යයි ප්‍රකාශ කිරීමට මෙපමණ උත්සාහ කරනු ලැබූ නමුත්, පාප් බලධාරීන්ම ප්‍රසිද්ධියේම කියා සිටියේ නියම සබත් දවස දිව්‍ය බලධාරිත්වයෙන් පිහිටුවනු ලැබූ බවත් ඒ වෙනුවට නියම කරන ලද දවස මනුෂ්‍යයන් විසින් පිහිටුවනු ලැබූ බවත්ය. දහසය වන ශතවර්ෂයේදී පාප් සභා මණ්ඩලයක් පැහැදිලි ලෙස මෙසේ පැවසුවේය: 'සියලු ක්‍රිස්තු භක්තිකයන් විසින්ම මතක තබාගත යුතු දෙයක් නම් දෙවියන්වහන්සේ සත්වන දවස සබත් දවස හැටියට නියම කළ බවත්, එය පිළිගෙන එය පවත්වන්ට යෙදුණේ යුදෙව්වරුන් පමණක් නොව තමා දෙවියන්වහන්සේට නමස්කාර කරනවා යයි පවසන සියල්ලන් විසින්ද බවත්ය; එහෙත් ක්‍රිස්තු භක්තිකයන් වන අපි සබත් දවස ස්වාමින්වහන්සේගේ දවස බවට වෙනස් කළෙමුව.' දිව්‍ය ව්‍යවස්ථාව අවුල් කරමින් සිටියාවූ අය තමා කරන ක්‍රියාවේ ස්වභාවය දැන සිටියහ. ඔව්හු දැන දැනම තමාව දෙවියන්වහන්සේට වඩා ඉහළ තත්ත්වයකට පමුණුවා ගත්හ.

රෝම සභාවේ ඉගැන්වීම් වලට එකඟ නොවන්නාවූ අයට සලකන අන්දම පිළිබඳව නිදසුනක් අපට ලැබෙන්නේ ඔවුන් වෝල්ඩන්සි වරුන්ට දිගු කාලයක් මුළුල්ලේ, ලේ වැගිරීමෙන් යුත් පීඩාවන් කළාවූ අන්දමින්ය. ඔවුන්ගෙන් සමහරෙක් සබත් පවත්වන්නන් වූහ. වෙනත් අයද සතරවන ආඥාවට විශ්වාසවන්ත වීම ගැන ඒ අන්දමින්ම පීඩා කරනු ලැබූහ. එතියෝපියාවේ හා ඇබිසීනියාවේ සභාවන්හි ඉතිහාසයේද විශේෂත්වයක් තිබේ. අඳුරු යුගයේ අන්ධකාරයේදී මධ්‍යම අප්‍රිකාවේ



සිටියාවූ ක්‍රිස්තු භක්තිකයන් නොතකා හරින ලදී. ලෝකයා විසින් ඔවුන් අමතක කරන ලදී. ශතවර්ෂ කිහිපයක් මුළුල්ලේම ඔව්හු තමාගේ ඇදහිල්ල අනුව ජීවත්වීමේ නිදහස භුක්ති වින්දාහ. නමුත් අවසානයේදී රෝමය ඔවුන්ගේ පැවැත්ම ගැන දැනගෙන, රැවටිලිකාරකමින් ඇබිසීනියාවේ රජුව යොමු කරගත්තේ පාප්, ක්‍රිස්තුස්වහන්සේ වෙනුවට පෙනී සිටින්නා හැටියට පිළිගැනීමටය. වෙනත් කාරණාද සිදුවුණි. සබත් දවස පැවැත්වීම තහනම් කරමින්, එය පවත්වන අයට තදබල දඬුවම් දෙන බවට නියෝගයක් නිකුත් කරන ලදී. නමුත් පාප් බලයේ ප්‍රචණ්ඩකාරිත්වය කොපමණ මහත් බරකින් යුත් වියගහක් වූයේද යත් එය ඔවුන්ගේ බෙල්ලෙන් ඉවත්කර දැමීමට ඇබිසීනියන්වරු තීරණය කරගත්හ. ඉමහත් පොරයකට පසුව රෝමානු බලධාරීන් ඔවුන්ගේ රාජ්‍යයෙන් පළවා හරිමින් පැරණි ඇදහිල්ල නැවත පිහිටුවන ලදී. සභාවෝ ඔවුන්ගේ නිදහස ගැන බොහෝ සේ ප්‍රීතිවූහ. රෝමයේ රැවටිලිකාරකම ගැනද, සීමාව ඉක්මවා ක්‍රියාකිරීමේ පිළිවෙල ගැනද, එහි ඒකාධිපති බලය ගැනද ඔවුන් ඉගෙනගත්තාවූ පාඩම් ඔවුන්ට කිසිවිටෙක අමතක වූයේ නැත. ඔවුන් තමාගේ තනිවූ රාජ්‍යය තුළ පවතිමින් ක්‍රිස්තියානි ලෝකයට සම්බන්ධ නොවී සිටීම ගැන තෘප්තියට පත්වූහ.

අප්‍රිකාවේ සභාවන් සබත් පැවැත්වූයේ පාප් සභාව සම්පූර්ණයෙන් සත්‍යයෙන් ඈත්වීමට පෙර එය පැවැත්වූ අන්දමටය. දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුව ඔවුන් සත්වෙනි දවස පැවැත්වූ අතරම, සභාවේ පළපුරුද්ද අනුව ඔව්හු ඉරිදා දවසේදී වැඩ කිරීමෙන් වැලකුණාහ. රෝම සභාව සම්පූර්ණ ලෙස බලයට පත්වූවාට පසුව එය තමාගේ අදහස ඉටුකරගන්නා පිණිස දෙවියන්වහන්සේගේ සබත් දවස පාගා දැමුවේය. නමුත් වසර එක්දහසක් පමණ කාලයක් මුළුල්ලේ සැඟවී සිටියාවූ අප්‍රිකාවේ සභාවෝ මේ මුළාව යාමට සහභාගි නොවූහ. රෝමයේ බලයට යටත් කරනු ලැබූ විට, සැබෑ සබත් දවස පසෙක තබා බොරු සබත නගාලීමට ඔව්හු බල කරනු ලැබූහ. නමුත් ඔවුන්ට නැවත නිදහස ලැබුණ විගසම ඔව්හු නැවත සතරවන ආඥාවට කීකරුවීමට පටන්ගත්හ.

අතීතයේ සිට පවතින මේ සටහන්වලින් පෙනී යන්නේ රෝමය සබත් දවසට හා එය රක්ෂා කළාවූ අයට විරුද්ධව ක්‍රියා කළාවූ අන්දම හා ඔවුන් පිහිටුවාවූ සංවිධානයට ගරු කිරීමට යොමුවූ අන්දමත්ය. ඉරිදා දවස නගාලීමට පාප් බලධාරීන් හා ප්‍රොතැස්තන්ත සභාවන් එක්සත් වන විට මේ දර්ශන නැවත පවතින්ට යන බව දෙවියන්වහන්සේගේ වචනය අපට උගන්වයි.

එළිදරව් 13 හි අනාවැකිය දක්වන්නේ බැටළු පැටවෙකුට මෙන් අං ඇති මෘගයා පොළොව හා එහි වැසියන්ට පාප් බලයට නමස්කාර කිරීමට මගපෙන්වන බවය. ඒ බලය පෙන්නුම් කරනු ලබන්නේ අඳුන් දිවියෙකුට සමානවූ මෘගයාගෙන්ය. අං දෙකක් ඇති මෘගයා, "මෘගයාට රූපයක් සාදන්ට ඕනෑ යයි පොළොවේ වැසියන්ට" කියනවා ඇත. තවදුරටත්, 'ලොකු, කුඩා, පොහොසත් දිළිඳු, දාස නිර්දාස සියල්ලන්ට 'මෘගයාගේ ලකුණ' ලැබීමට නියම කරනවා ඇත. බැටළු පැටවකුට මෙන් අං ඇති මෘගයාගෙන් පෙන්නුම් කරන්නේ අමෙරිකා එක්සත් ජනපදය බව දක්වනු ලැබ තිබේ. අමෙරිකා එක්සත් ජනපදය ඉරිදා පැවැත්වීම බලහත්කාරයෙන් ඉදිරිපත් කරන විට මේ අනාවැකිය සම්පූර්ණ වෙනවා ඇත. මෙසේ ඉරිදා පැවැත්වීම තමාගේ බලය පිළිගැනීමේ විශේෂ ලක්ෂණයක් බව රෝමය දක්වයි. නුමුත් මෙසේ රෝමයට ගරුත්වය දැක්වීමේදී අමෙරිකා එක්සත් ජනපදය තනිව නොසිටිනවා ඇත. වතාවක් ඇගේ බලය පිළිගත් රටවල ඇගේ අනුබලය විනාශ වී නැත. මේ බලය නැවත පිහිටුවනු ලබන බව අනාවැකිය මෙසේ දක්වයි: "මැරෙන තරමට උගේ හිස්වලින් එකකට තුවාල වී තිබෙන්නාක් මෙන් පෙනුණේය. නුමුත් උගේ මරණීය තුවාලය සුව විය. මුළු ලෝකයා මෘගයා පස්සේ පුදුමව ගියෝය" (එළිදරව් 13:3). මේ මරණීය තුවාලය ඇතිවූයේ 1798 දී පාප් බලය ඉවත්කරනු ලැබූ විටය. ඊට පසුව, "උගේ මරණීය තුවාලය සුව විය. මුළු ලෝකය මෘගයා පස්සේ පුදුමව ගියෝය"යි අනාගතවක්තෘවරයා පවසයි. 'පාපයේ මනුෂ්‍යයා' යේසුස්වහන්සේගේ දෙවෙනි ඊම දක්වාම ක්‍රියාත්මක වන බව පාවුල් දක්වයි. (2 තෙසලෝනික 2:8). කාලයේ අවසානය දක්වාම ඔහු තමාගේ රැවටිලිකාර වැඩ කරනවා ඇත. පාප් බලය ගැන සඳහන් කරමින් එළිදරව්කාරයා මෙසේ පවසයි: "බැටළුපැටවාණන්ගේ ජීවන පොතෙහි නම් ලියවී නොතිබුණු පොළොවෙහි වසන සියල්ලෝ ඌට නමස්කාර කරන්නෝය" (එළිදරව් 13:8). ඉරිදා නමස්කාර දිනය හැටියට පිහිටුවීම සම්පූර්ණයෙන්ම රෝම සභාවේ ආධිපත්‍යය යටතේ සිදුවන බැවින් එයට ගරු කිරීමෙන්ද එය පැවැත්වීමෙන්ද ලෝකයා පාප් බලයට ගරුත්වය දක්වනවා ඇත.

දහ නමවන ශතවර්ෂයේ මැද භාගයේ සිටම, එක්සත් ජනපදයේ අනාවැකි ඉගෙනගත් අය මේ සාක්ෂිය ලෝකයාට ඉදිරිපත් කර තිබේ. දැන් සිදුවන්නාවූ සිද්ධීන්ගෙන් පෙනී යන්නේ මේ අනාවැකිය සම්පූර්ණ වීමට තත්ත්වය සකසනු ලබන බවය. ඉරිදා පැවැත්වීමට දිව්‍ය නියමයක් නොමැති බව ප්‍රොතැස්තන්ත ගුරුවරුද ඒත්තු ගනිති. මේ ගැන ශුද්ධ ලියවිල්ලේ නියමයක් නොමැති බැවින් පාප් නිලධාරීහු දෙවියන්වහන්සේගේ නියමයක් නොතිබීම වෙනුවට හාස්කම් ඇතිවූ



බවට සිද්ධීන් ගොතා දැක්වූහ. ඉරිදා සබත් දවස හැටියට නොපවත්වන අය මත දෙවියන්වහන්සේගේ විනිශ්චයන් පමුණුවනු ලබනවාය යන්න නැවත පවසනු ලබනවා ඇත. දැනටමත් එය ආරම්භ වී තිබේ. ඉරිදා පැවැත්වීම බලකිරීමේ ව්‍යාපාරයක් ඉක්මණින්ම ක්‍රියාත්මක වෙමින් පවතියි.

රෝම සභාව කපටිකමින් හා උපායශීලීත්වයෙන් පුදුමාකාරය. සිදුවන්ට යන්නේ කුමක්දැයි ඈ වටහා ගනියි. බොරු සබත් දවස පිළිගැනීමෙන් ප්‍රොතැස්තන්ත සභාවන් ඇයට ගරු කරන බව දකින ඇය අවස්ථාවක් එළඹෙන තුරු බලා සිටියි. එසේම ඇය ක්‍රියා කළාවූ අන්දමටම ප්‍රොතැස්තන්ත සභාවන් ඉරිදා පැවැත්වීම ගැන බලහත්කාරකම් කිරීමට සූදානම් වන බවද ඇයට පෙනෙයි. සත්‍යයේ ආලෝකය එපා කරන්නාවූ අය ඇය විසින් පිහිටුවන ලද මේ සංවිධානය නගාලන පිණිස ඇය විසින්ම සකසා ගන්නා ලද බලයේ උපකාර සොයනවා ඇත. මේ කාර්යයේදී ප්‍රොතැස්තන්ත සභාවන්ට උපකාර කිරීමට ඇය බොහෝ සේ සූදානම්ව සිටිනවා ඇතැයි සිතාගැනීම අපහසු නොවේ. සභාවට අකීකරු වන්නන් පිළිබඳව ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි ඇය දන්නා තරමට අන් කිසිවෙක් දන්නේ නැත.

ලොව පුරා ශාඛාවන් ඇත්තාවූ රෝම සභාව පාප් බලයේ පාලනය යටතේ, එක් මහා සංවිධානයක්ව පවතිමින් එහි අදහස් අනුව ක්‍රියාකිරීමට සකසනු ලැබ තිබේ. ලෝක ගෝලයේ සෑම රටකම ඇයට සම්බන්ධ ලක්ෂ සංඛ්‍යාත ජනයා සිටිති. පාප්ට පක්ෂපාතව බැඳී සිටීමට ඔවුන්ට මගපෙන්වනු ලැබ තිබේ. ඔවුන්ගේ ජාතිය හෝ ආණ්ඩුව කුමක් වුවද, සභාව ඒ සියල්ලට වඩා උසස් යයි ඔවුන් සැලකිය යුතුය. තම ආණ්ඩුවට පක්ෂපාත වන බවට පොරොන්දු වී තිබෙන විටද එහි පසුබිමෙහි ඇත්තේ ඔවුන් රෝමයට කීකරු වන බවට දුන් පොරොන්දුවය. එහෙයින් ඒ පක්ෂපාතකමට විරුද්ධව පවතින මොනම දෙයකින් වුවද ඔවුන් නිදහස් කරනු ලැබේ.

ඉරිදා පැවැත්වීම නගාලීමේදී රෝමයේ උපකාර ලබාගැනීමෙන් තමා කරන්නේ කුමක්දැයි ප්‍රොතැස්තන්ත සභාවන් දන්නේ නැත. ඔවුන් තමාගේ අභිලාෂය සම්පූර්ණ කරගැනීමට උත්සාහ කරන අතර රෝමය උත්සාහ කරන්නේ තමාගේ බලය නැවත පිහිටුවා ගැනීමටය, තමාට නැතිවූ උත්තම භාවය නැවත ලබාගැනීමටය. ජාතීන්ගේ කටයුතුවලදී ඇය තමාගේ බලය පිහිටුවීමට ගත් උත්සාහයන් ගැන ඉතිහාසයට සාක්ෂි දැරීමට ඉඩ දෙමු. ඒවාට ඇතුල්වීමේ අවස්ථාවක් ලැබුණ විට ඇය කුමාරයන් හා මනුෂ්‍යයන් විනාශ කරමින් වුවද

ඇගේ අභිලාෂය මුදුන් පමුණුවා ගැනීමට ක්‍රියා කළාය. 'ජාතීන්ගේ අයිතිවාසිකම්වලට විරුද්ධවද, දෙවියන්වහන්සේගේත් මනුෂ්‍යයාගේත් ව්‍යවස්ථාවන්ට විරුද්ධවද ප්‍රකාශනයක් හා විනිශ්චයක් නිකුත් කිරීමට පාප්ට පුළුවන්ය' යන්න රෝමය ප්‍රසිද්ධියේම ප්‍රකාශ කරයි.

තමා කිසිවිටෙක වෙනස් වන්නේ නැත යන්න රෝමය පාරට්ටු කරගැනීමෙන් යුතුව ප්‍රකාශ කරන බව මතක තබාගත යුතුය. vii ග්‍රෙගරිගේද iii ඉනසන්ට්ගේද ප්‍රතිපත්ති මේ වන තුරුත් රෝම සභාවේ ප්‍රතිපත්තීන්ව පවතියි. ඇට බලය තිබෙන්නේ නම් ඇය අතීතයේදී මෙන්ම දැන්ද ඉතා මහත් උනන්දුවෙන් ඒවා ක්‍රියාත්මක කරනවා ඇත. අමෙරිකා එක්සත් ජනපදයෙහිදී සභාවට පාලන බලය තිබෙන්නේය යන ප්‍රතිපත්තිය එක් වතාවක් පිහිටුවනු ලබන්නේ නම්ද, දේශීය නීති මගින් ආගමික ක්‍රියාවන් බලහත්කාර ලෙස පාලනය කරනු ලැබිය හැකි යයි පවසනු ලබන්නේ නම්ද, එනම් සභාවේ හා දේශයේ බලයට හෘදය සාක්ෂිය පාලනය කිරීමට පුළුවන් යයි කියනු ලබන්නේ නම් රෝම බලය නිශ්චය වශයෙන්ම ඒ රටේ ජයග්‍රාහක වෙනවා ඇත.

පැමිණෙන්ට තිබෙන්නාවූ අනතුර ගැන දෙවියන්වහන්සේගේ වචනය අපට අවවාද කර තිබේ. ඒ අවවාද නොතකා හරිනු ලබන්නේ නම්, රෝමයේ අභිලාෂයන් මොනවාදයි දැනගැනීමට ප්‍රොතැස්තන්ත ලෝකය ඉගෙන ගන්නා විට ප්‍රමාද වැඩිවෙනවා ඇත. එවිට ඇගේ උගුලෙන් ඉවත් වීමට ඔවුන්ට නුපුළුවන් වෙනවා ඇත. ඇය නිශ්චලව ඇගේ බලය වර්ධනය කරගන්නීය. ඇගේ ධර්මයන් ආඥාදායක ශාලාවන්හිද, සභාවන්හිද, මනුෂ්‍යයන්ගේ සිත් තුළද බලපෑමක් ඇති කරන්නේමය. ඇය තමාගේ උසස්, විශාල නිර්මාණයන් රහස් ස්ථානයන්හි ගොඩනගන අතර අතීතයේ පැවති පීඩාකිරීමේ කාර්යයන් නැවත කරනු ලබනවා ඇත. නියම කාලය පැමිණි විට ක්‍රියාත්මක වන පිණිස ඇය රහසිගත ලෙසද සැක කරනු නොලබන අන්දමටද ඇගේ බලකායන් ශක්තිමත් කරගන්නේ ඇගේ අභිලාෂයන් සම්පූර්ණ කරගන්නා පිණිසය. ඇයට උවමනා කරන්නේ සුදුසු අවස්ථාවක්ය; මෙය දැනටමත් ඇයට දෙනු ලැබේ. රෝමයේ අදහස කුමක්ද කියාත් අපට ඉක්මණින්ම හැඟී යනවා ඇත; එය අපට ඉක්මණින්ම දැකගැනීමටද පුළුවන් වෙනවා ඇත. එවිට, දෙවියන්වහන්සේගේ වචනය විශ්වාස කරමින් එයට කීකරුවන්නාවූ අයට නිග්‍රහයද පීඩාවන්ද දෙනු ලබනවා ඇත.



# 36

## එන්ට තිබෙන්නාවූ අරගලය හා එය ඇතිවීමට හේතූන්

ස්වර්ගයේ ඇතිවූ ඒ අරගලයේ ආරම්භයේ සිටම සාතන්ගේ අදහස වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව විනාශ කිරීමය. ඔහු මැවුම්කාරයාණන්වහන්සේ සමග අරගලයකට ඇතුල් වූයේද මේ දෙය කරන පිණිසය; ඔහුව ස්වර්ගයෙන් ඉවත් කරනු ලැබූ නමුත් ඔහු මේ පොළොව මත ඒ සටන තවදුරටත් කරගෙන යයි. ඔහු ස්ථිර වශයෙන්ම ක්‍රියාත්මක වන්නේ මනුෂ්‍යයන් රවටමින් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකිරීමට ඔවුන් යොමු කිරීමටය. මෙය සිදුකරන්නේ ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබන්ට සැලැස්වීමෙන් හෝ එහි එක ප්‍රතිපත්තියක් පමණක් ඉවත් කරවීමෙන් වුවද, එහි ප්‍රතිඵලය එකාකාර වන්නේය. යමෙක් 'එක අණක්' කඩ කරන්නේ නම් ඔහු මුළු ව්‍යවස්ථාව ගැනම අප්‍රසන්නතාවය දක්වයි. ඔහුගේ අනුබලය හා ආදර්ශය ව්‍යවස්ථාව කඩකිරීමේ තත්ත්වය දක්වයි. ඔහු 'සියල්ල ගැන වරදකාරයෙක් වී සිටී.' (යාකොබ් 2:10)

දිව්‍ය ව්‍යවස්ථාවන් අවමානයට පත්කිරීම මගින් සාතන් බයිබලයේ ධර්මයන් නරක් කර තිබේ. ඒ අනුව, තමා ශුද්ධ ලියවිලි විශ්වාස කරන බව පවසන්නාවූ දහස් ගණන් ජනයාගේ ඇදහිල්ලට වැරදි ධර්මයන් ඇතුල් වී තිබේ. සත්‍යය හා වරද අතර අවසාන පොරය පවතින්ට යන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පිළිබඳව ඇත්තාවූ ඒ දීර්ඝ අරගලය පිළිබඳවමය. අපි දැන් මේ පොරයට ඇතුල් වෙමින් සිටිමු. එය වනාහි මනුෂ්‍යයෙකුගේ ව්‍යවස්ථාවන් හා යෙහෝවඃ-වහන්සේගේ ප්‍රතිපත්ති අතර ඇති සටනය, බයිබලයේ ආගමද මානුෂික ප්‍රබන්ධයන් හා පරම්පරාගත නියෝග අනුව පවතින ආගම්ද අතර ඇති සටනය.

මේ අරගලයේදී සත්‍යයට හා ධර්මිෂ්ඨකමට විරුද්ධව එක්සත් වන්නාවූ කාර්යංශ දැනටමත් ක්‍රියාත්මකව සිටිති. පීඩාවන් හා ලේ ගැලීම් මගින් මිලයක් ගෙවමින් අපට දී තිබෙන දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනය අගය කරනු ලබන්නේ නැත. සියලු දෙනාටම බයිබලය ලබාගැනීමට පුළුවන; එහෙත් එය තමාගේ ජීවිතයේ මාර්ගෝපදේශකය හැටියට පිළිගන්නේ ස්වල්ප දෙනෙක් පමණය. අදේවදෘෂ්ටිය පුදුමාකාර ප්‍රමාණයකින් පවතින්නේ ලෝකයේ පමණක් නොවේ; සභාව තුළද එය පවතියි. බොහෝ අය ක්‍රිස්තියානි ඇදහිල්ලේ ප්‍රධාන ගුණාංග

වන දේව ධර්මයන් පිළිනොගන්නා තත්ත්වයකට පැමිණ සිටිති. ක්‍රිස්තියානි ලෝකයේ බොහෝ දෙනෙක් මැවීම ගැනද, මනුෂ්‍යයා පාපයට වැටීම ගැනද, සමගි කිරීම ගැනද දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ස්ථිරතාවය ගැනද ලේඛකයන් දේවානුභාවයෙන් ලියා තිබෙන කරුණු සම්පූර්ණ ලෙස හෝ අඩ වශයෙන් එපා කරති. තමාගේම ප්‍රඥාව හා නිදහස් ආකල්පයන් ගැන උදාරම් වන්නාවූ දහස් ගණන් ජනයා සලකන්නේ බයිබලය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම දුර්වල මනසක ප්‍රකාශනයක් බවය. ශුද්ධ ලියවිල්ලට විරුද්ධ වෙමින් එහි ඇත්තාවූ වැදගත් සත්‍යයන් වෙනස් අන්දමකට විස්තර කර දක්වීම උසස් හැකියාවන් දක්වීමක් වන්නේ යයි ඔව්හු කල්පනා කරති. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව වෙනස් කරනු ලැබ තිබෙන්නේ යයිද නැතහොත් එය අවලංගු කර තිබෙන්නේ යයිද බොහෝ දේවගැතිවරු තමාගේ සෙනහට උගන්වති; එසේම, බොහෝ ගුරුවරු තම සිසුන්ටද ඒ අන්දමට උගන්වති. ව්‍යවස්ථාවේ නියමයන් තවදුරටත් පවත්වනු ලැබිය යුතු යයිද අප විසින් ඒවාට කීකරු විය යුතු යයිද කල්පනා කරන්නාවූ අය අවමානයට හා අපහාසයට පමුණුවනු ලැබිය යුතු යයි ඔව්හු කල්පනා කරති.

සත්‍යය එපා කිරීමෙන් මනුෂ්‍යයෝ සත්‍යයේ කර්තෘවරයාණන් එපා කරති. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පාගා දැමීමෙන් ඔව්හු ව්‍යවස්ථාදායකයාණන්ගේ බලය එපා කරති. ලී වලින් හෝ ගල් වලින් රූපයක් සාදාගන්නා අන්දමටම, වැරදි මතයන් හා බොරු ධර්මයන් තමාට රූපයක් කරගැනීමද පහසුය. දෙවියන්වහන්සේගේ ගුණාංග වරදවා දක්වමින් සාතන් මනුෂ්‍යයන්ව යොමු කරන්නේ උන්වහන්සේගේ චරිතය වරදවා වටහා ගැනීමටය. බොහෝ අය තමාගේ අදහස් අනුව මවාගත් රූපයක් යොහෝවඃවහන්සේගේ ස්ථානයට පමුණුවා ගනිති. ඒ අතර, දෙවියන්වහන්සේගේ වචනයෙන්ද ක්‍රිස්තුස්වහන්සේ තුළින්ද, මවන ලද දේවලින්ද දක්වනු ලබන ජීවමාන දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේ ඉතා ස්වල්ප දෙනෙක් පමණය. දහස් ගණන් ජනයා දෙවියන්වහන්සේ විසින් මවන ලද දේවල් තමාගේ දෙවියන් කරගනිමින් ඒ සොබාදහම මැවූ උන්වහන්සේව එපා කරති. එළියාගේ කාලයේදී පැරණි ඉශ්‍රායෙල්වරුන් අතර රූප වන්දනාව පැවතුණාවූ අන්දමටම වර්තමානයේදීද, රූප වන්දනාව වෙනස් ආකාරයකින් වුවද ක්‍රිස්තියානි ලෝකයේ පවතියි. තමා ප්‍රඥාවන්තයන් යයි කියාගන්නාවූ අය අතරද, කාව්‍යක්කාරයන්, දේශපාලනඥයන් හා ලේඛකයන් අතරද, අනේක විලාසිතාවන්ට යොමුවූ උසස් පෙළේ මනුෂ්‍යයන් අතරද දෙවියන්වහන්සේගේ ස්ථානය ගන්නේ පිනීසියාවේ ඉරු දෙවියාවූ බාල්ට සමාන වන්නාවූ දේවල්ය.



දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව තවදුරටත් මනුෂ්‍යයන් කෙරේ බලපාන්නේ නැත යන අදහස බොහෝ වේගයෙන් පිළිගනු ලබන නවීන ධර්මයකි. ක්‍රිස්තියානි ලෝකය පිළිගන්නාවූ මේ අදහස ස්වර්ගීය බලයට කෙළින්ම විරුද්ධව පවතියි. එය මනුෂ්‍ය කල්පනාවේ මගපෙන්වීමටද විරුද්ධය; එයින් ඇතිවන විපාකද විනාශකාරීය. සෑම ජාතියකටම අණ පනත් තිබේ; ඒවාට ගරු කරමින් ඒවාට කීකරු වීම අවශ්‍යය. ඒවා නොමැතිව කිසිම රාජ්‍යයකට පවතින්නට නුපුළුවන. අහස පොළොව මැවූ තැනැන්වහන්සේ තමන්වහන්සේ විසින් මවන්ට යෙදුණාවූ මනුෂ්‍යයන් පාලනය කරන පිණිස අණ පනත් ක්‍රියාත්මක නොකරන සේකැයි සිතා ගැනීමට පමණවත් අපට පුළුවන්ද? දේශය පාලනය කරන පිණිසද ජනවාසීන්ගේ අයිතිවාසිකම් රැකවරණය කරන පිණිසද පිහිටුවන ලද අණ පනත් පැවැත්වීම අනවශ්‍ය යයි සුප්‍රකට ඇමතිවරුන් පවසනවා යයි සිතන්න. ඒවා මනුෂ්‍යයන්ගේ නිදහසට බාධා කරන බැවින් ඒවාට කීකරුවීම අනවශ්‍ය යයි ඔවුන් පවසනවා යයි සිතන්න. එබඳු අයට කොපමණ දුරට එසේ කිරීමට ඉඩ දෙනු ලබනවා ඇද්ද? එහෙත්, දේශයේ හා ජාතියේ අණ පනත් නොතකා හැරීම සියළු ආණ්ඩු ක්‍රමයන්හි පදනම වන්නාවූ දිව්‍ය ප්‍රතිපත්ති පාගා දැමීමට වඩා මහත් වරදක්ද?

ලෝකයේ ජාතීන්ගේ අණ පනත් අවලංගු කරනු ලැබ මනුෂ්‍යයන්ට තමා කැමති අන්දමට ක්‍රියාකරන්ට ඉඩදීම වැරදිය. එහෙත් මේ මුළු විශ්වයේම ආණ්ඩුකාරයාණන් වන තැනැන්වහන්සේට, වරදකරුවන් වරදට පත්කිරීමටද, කීකරු වන්නන් ධර්මිෂ්ඨ යයි ගණන් ගැනීමටද අණ පනත් නොදී ලෝකයා අත්හැර දැමීම ඊට වඩා කොපමණ නුසුදුසුද. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අවලංගු කිරීමේ ප්‍රතිඵල දැනගැනීමට අපි කැමැත්තෙමුද? මෙය අත්හදා බලා තිබේ. ප්‍රංශයෙහි අදේවදෘෂ්ටිය පාලන බලය ඇතිවූ විට පැවති දර්ශන ඉතා භයානක විය. දෙවියන්වහන්සේ අපට දී තිබෙන්නාවූ අණ පනත් ඉවත දැමීම වනාහි ඉතාම දරුණු කෲර නායකයන්ගේ පාලනය පිළිගැනීම බව එවිට ලෝකයට ප්‍රකාශ විය. ධර්මිෂ්ඨකමෙහි ප්‍රතිපත්ති ඉවත දැමූ විට නපුරේ කුමාරයාට තමාගේ බලය ලෝකයෙහි පිහිටුවීමට මාර්ගය විවෘත වෙයි.

දිව්‍ය ප්‍රතිපත්ති ඉවත දැමූ විට පාපයේ පාපතර භාවය තවදුරටත් පෙනී යන්නේ නැත; එවිට ධර්මිෂ්ඨකම ගැන ආශාවක් ඇතිවන්නේද නැත. දෙවියන්වහන්සේගේ පාලනයට යටත් වීමට කැමති නොවන්නාවූ අය තමාවම පාලනය කරගැනීමට සුදුස්සන් නොවෙති. ළමයි හා යෞවනයෝ ස්වභාවයෙන්ම, පාලනය කරනු ලැබීම ගැන නොඉවසිලිමත් වෙති; වැඩිහිටියන් විනාශකාරී ඉගැන්වීම් ඉදිරිපත්

කරන විට ඔවුන්ගේ සිත් තුළ යටත් නොවීමේ ස්වභාවයක් ඇතිවෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ දුසිරිතට යොමු සමාජයක් ඇතිවීමය. දෙවියන්වහන්සේගේ අණ පනත්වලට කීකරු වන්නාවූ අයට නිග්‍රහ කරමින් ජන සමූහයෝ සාතන්ගේ රැවටිලිකාරකම් උනන්දුවෙන් පිළිගනිති. ඔව්හු තෘෂ්ණාවන්ට ඉඩ දෙමින් අන්‍යජාතිකයන් මත දිව්‍ය විනිශ්චය පමුණුවනු ලැබූ පාපයන්හි යෙදී සිටිති.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් සුළු කිරීමට උගන්වන්නාවූ අය අකීකරුකම වපුරති. එසේම ඔවුන් අකීකරුකමේ අස්වැන්නක් නෙළා ගන්නවාද ඇත. දිව්‍ය ව්‍යවස්ථාවන් මගින් තහනම් කර ඇති දේවල් ගැන නොසැලකිලිමත් වූ විට මනුෂ්‍යයන්ගේ නීති ගැනද නොසැලකිල්ලක් දක්වනු ලබනවා ඇත. දෙවියන්වහන්සේ වංචාකාර පළපුරුදුද, අන් සතු දේවලට ආශාවීමද, බොරු කීමද, රැවටිලිකාරකමද තහනම් කරන බැවින් මනුෂ්‍යයෝ ඒ අණ පනත් පාගා දමන්නේ ඒවා තමාගේ සඵලත්වයට බාධාවක් වූවා සේය; නමුත් මේ ප්‍රතිපත්ති ඉවත් කිරීමෙන් ඇතිවන්නේ ඔවුන් බලාපොරොත්තු නොවන අන්දමේ ප්‍රතිඵලය. ව්‍යවස්ථාව මනුෂ්‍යයන් කෙරෙහි බලපාන්නේ නැත්නම් ඔවුන් ව්‍යවස්ථාවන් කඩකිරීමට බිය විය යුත්තේ මොන හේතුවක් නිසාද? එවිට ඉඩකඩම් ආරක්ෂා සහිත වන්නේ නැත; මනුෂ්‍යයන් ප්‍රචණ්ඩකාරිත්වයෙන් තම අසල්වාසීන්ගේ සම්පත්ති උදුරා ගන්නවා ඇත; එවිට වඩාත් ශක්තිමත් අය ඉතාම පොහොසත් අයවල් වෙනවා ඇත. ජීවිතයට පවා ගරු කරනු ලබන්නේ නැත. එවිට පවුල රැකවරණය කරන පිණිස විවාහයේ පොරොන්දු ආරක්ෂක පවුරක් නොවෙනවා ඇත. බලයට පත් තැනැත්තා කැමති වුවහොත් ඔහු ප්‍රචණ්ඩකාරිත්වයෙන් තම අසල්වැසියාගේ බිරිඳ පැහැර ගන්නවා ඇත. සතරවන ආඥාව සමග පස්වන ආඥාවද ඉවත දමනු ලබනවා ඇත. තම දෙමාපියන් මරා දැමීමෙන් තමාගේ අපවිත්‍ර සිත්වල ආශාවන් සපුරා ගැනීමට තමාට පුළුවන් වන්නේ නම් දරුවෝ එසේ කිරීමට පසුබට නොවෙනවා ඇත. හොඳ ශිෂ්ටාචාරයක් ඇත්තාවූ ලෝකය සොරුන්ගේද මිනී මරන්නන්ගේද ගුහාවක් වෙනවා ඇත. එවිට සාමය, විවේකය හා ප්‍රීතිය පොළොවෙන් ඉවත් වෙනවා ඇත.

මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට කීකරුවීමෙන් නිදහස් කරනු ලැබ සිටින්නේය යන අදහස මගින් සුචරිතානුකූළ යුතුකම් කිරීමේ බලය දැනටමත් දුර්වල වී තිබේ; එමගින් ලෝකය මත පාපයේ දොරටු විවෘත වී තිබේ. නීති විරෝධී භාවය, හික්මවීමෙන් තොර ජීවිත ගතකිරීම, අපිරිසිදු ජීවිත ගතකිරීම යනාදිය අප මත්තට පතිත වන්නේ ජලගැල්මක් හා සමානවය. සාතන් පවුල තුළ ක්‍රියා කරයි. නාමික ක්‍රිස්තියානි නිවෙස්වල පවා ඔහුගේ ධජය ළෙල දෙයි. ඊර්ෂ්‍යාව,



නරක අදහස්, වංචාකාරකම, ඔවුනොවුන්ගෙන් වෙන්වීම, අන්‍යයන් හා සමාන වීමට ඇති ආශාව, දබර, ශුද්ධවූ විශ්වාසයන් පාවා දීම, තෘෂ්ණාවන්ට ඇබ්බැහි වීම යනාදිය පවතියි. සමාජ ජීවිතයේ පදනම හා රාමුව විය යුතු ආගමික ප්‍රතිපත්ති හා ධර්මයන් ඉමහත් අස්ථිරතාවයකින් සලකනු ලබන බැවින් ඒවා ඉක්මණින් විනාශ කරනු ලබන බව පෙනී යයි. ඉතාම අධම අපරාධකරුවෝ ඔවුන්ගේ වැරදි ක්‍රියාවන් නිසා සිරගෙයි දමනු ලැබූ විට ඔවුන්ට දීමනාවන් හා සැලකීම් දෙනු ලබන්නේ ඔවුන් ඉමහත් ශ්‍රේෂ්ඨත්වයක් ලැබුවා සේය. ඔවුන්ගේ චරිතයන්ට හා අපරාධයන්ට සුප්‍රසිද්ධ භාවය දෙනු ලැබේ. මුද්‍රණාලයන් ඔවුන්ගේ වැරදි සවිස්තරව ඉදිරිපත් කිරීමෙන් රැවටිලිකාරකම්, සොරකම් හා මිනීමැරුම් යනාදියට යොමු වීමට අන්‍යයන් පොළඹවනු ලැබේ. සාතන් තමාගේ විනාශකාරී උපක්‍රමයන්ගේ සඵලත්වය ගැන ප්‍රීතියට පත්වෙයි. නපුර කිරීමට ඇදී යාමද, ජීවිත විනාශ කිරීමේ යොමුවද, පමණ දැන ක්‍රියාකිරීමෙන් තොරව ජීවත් වීමද, සෑම අන්දමකම වැරදි වලට අනේක ප්‍රමාණයන්ට යොමු වීමද ලෝකයෙහි බහුල වීම නිසා, නපුරේ වර්ධනය නැවැත්වීමට කුමක් කරනු ලැබිය යුතු දැයි විමසීමට දේවභය ඇති මනුෂ්‍යයන් තුළ පිබිදීමක් ඇති විය යුතුය.

යුක්තිය ඉටුකිරීමට නියමිත උසාවිද නරක් වී තිබේ. ආණ්ඩුකාරයෝ ලාභ ලබාගැනීමේ ආශාවෙන්ද ශාරීරික තෘෂ්ණාවන් සපුරා ගැනීමේ ආශාවෙන්ද පොළඹවනු ලබති. පමණ දැන ජීවත් නොවීම මගින් බොහෝ දෙනාගේ සිත් වියවුල් වී තිබේ. එහෙයින් ඔවුන් සම්පූර්ණයෙන්ම පාලනය කිරීමට සාතන්ට පුළුවන. ජූරි සභාවේ සභිකයෝ අල්ලසට අසුවී රැවටිලිකාරව නොනිසි අන්දමින් ක්‍රියා කරති. ව්‍යවස්ථාව මෙහෙය වන්නන් අතර බීමත්කම, විනෝදකාමිත්වය, තෘෂ්ණාව, ඊර්ෂ්‍යාව, අනේකාකාර වංචාකාරකම යනාදියද බහුලව පවතියි. "යුක්තිය පස්සට හරවා දමනු ලැබීය, ධර්මිෂ්ඨකමද දුරින් තිබේ. මක්නිසාද සැබෑකම වීථියේ වැටුණේය, අවංකකමට ඇතුල් වෙන්ට බැරිය." (යෙසායා 59:14)

රෝමයේ ආධිපත්‍යය යටතේ ආත්මික අන්ධකාරය හා පාපතර භාවය පැවතුණේ ඔවුන් ශුද්ධ ලියවිල්ල යටපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්ය. නමුත් ආගමික නිදහස පවතින මේ යුගයේදී අවිශ්වාසවන්තකම පැතිර යාමද දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එපා කිරීමද එමගින් ඇතිවන දූෂණයද ශුභාරංචි ආලෝකය බබළන්නාවූ ස්ථානවල පවතින්නේද? ශුභාරංචිය ලැබීම වැළැක්වීමෙන් ලෝකය තමාගේ පාලනයට යටත් කරගැනීමට සාතන්ට නුපුළුවන් බැවින් ඔහු තමාගේ අදහස සපුරාගන්නා පිණිස වෙනත් ක්‍රම භාවිතා කරයි.

බයිබලයම විනාශ කර දැමීමෙන් තරමටම, බයිබලය කෙරෙහි ඇති විශ්වාසය විනාශ කර දැමීමෙන්ද ඔහුගේ අදහස සම්පූර්ණ වෙයි. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පැවැත්වීම අනවශ්‍යය යන විශ්වාසය හඳුන්වාදීම කරණකොටගෙන ඔහු පව් කිරීමට මනුෂ්‍යයන් යොමු කරන්නේ ඔවුන් එහි ප්‍රතිපත්ති නොදන සිටියා සේය. අතීතයේදී මෙන්ම වර්තමානයේදී ද ඔහු තමාගේ අදහස් සම්පූර්ණ කරන පිණිස සභාවන් තුළින් ක්‍රියා කරයි. අද පවතින ආගමික සංවිධාන, ශුද්ධ ලියවිල්ලේ පැහැදිලි ලෙස ඉදිරිපත් කර තිබෙන ජනප්‍රිය නොවන්නාවූ සත්‍යයන්ට සවන් දීමට අකමැති වෙති. ඒවාට විරුද්ධව ක්‍රියාකරන පිණිස ඔව්හු ඒවාට වෙනත් අර්ථයන් පවරමින්, අදේවදෘෂ්ටියේ බීජ පතුරුවන්නාවූ තත්ත්වයක් ඉදිරිපත් කරති. මනුෂ්‍යයා ස්වභාවයෙන්ම අමරණීය බවටද මරණින් පසු මනුෂ්‍යයා සිහි කල්පනාවෙන් යුක්ත බවටද පාප් සභාව ඉදිරිපත් කරන්නාවූ වැරදි මතයට ඔව්හු එල්බ ගෙන සිටිති. මළාවූ මනුෂ්‍යයන් හා සබඳතාවය පැවැත්වීම පිළිබඳව ඇති රැවටිලිකාර ඉගැන්වීමට විරුද්ධව ඇති එකම රැකවරණය නොතකා හැරීමට ඔව්හු මෙසේ යොමු වෙති. සදාකාලික වද විඳීමක් ගැන ඇති අදහස නිසා බොහෝ අය බයිබලය විශ්වාස කිරීමෙන් වැලකී සිටිති. සතරවන ආඥාවේ අවශ්‍යතාවයන් මනුෂ්‍යයන්ට ඉදිරිපත් කරනු ලබන විට, සත්වන දින සබත් පැවැත්වීම එයට ඇතුළත් වන බව ඔව්හු දනිති. ඔවුන් සපුරාලීමට අකමැති වන්නාවූ මේ යුතුකමින් නිදහස් වන පිණිස ජනප්‍රිය ගුරුවරුන් ප්‍රකාශ කරන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව තවදුරටත් මනුෂ්‍යයන් කෙරෙහි බලපාන්නේ නැති බවය. මෙසේ ඔව්හු ව්‍යවස්ථාවද සබත් දවසද එපා කරති. සබත් දවස වෙනස් කරනු ලැබුවේය යන අදහස ප්‍රචාරය වන විට, සතරවන ආඥාවේ අවශ්‍යතාවයන් එපා කරන පිණිස දිව්‍ය ව්‍යවස්ථාව එපාකිරීම ලොව පුරා පැතිරී යනවා ඇත. ආගමික නායකයන්ගේ ඉගැන්වීම් මගින් අදේවදෘෂ්ටියටද, මළවුන් සමග සබඳතාවය පැවැත්වීමටද, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එපා කිරීමටද දොරවල් විවෘත වී තිබේ. ක්‍රිස්තියානි ලෝකයේ පවතින පාපතර භාවය පිළිබඳ වගකීම මේ නායකයන් සතුය.

ඒ අතරම, මේ නායකයන්ම පවසන්නේ ලෝකයේ පාපතර භාවය වේගයෙන් පැතිරෙන්නේ 'ක්‍රිස්තියානි සබත' යනුවෙන් හඳුන්වන සබත් දවස නොපැවැත්වීම නිසා බවය. ඉරිදා සබත් දවස වශයෙන් පැවැත්වීම කරණකොටගෙන සමාජයේ සුචරිතානුකූල තත්ත්වය දියුණු වෙනවා ඇතැයි ඔව්හු පවසති. සැබෑ සබත් දවස පිළිබඳ ධර්මය ඉතාම වැඩියෙන් ප්‍රචාරය කරනු ලැබ තිබෙන අමෙරිකාවෙහි මේ කාරණය බොහෝ සෙයින් ඉදිරිපත් කරනු ලැබේ. සුචරිතානුකූල ප්‍රතිසංස්කරණය පිළිබඳව ඉතාම වැදගත් ප්‍රසිද්ධ ඉගැන්වීමක් වන අමද්‍යප සේවය



නිතරම ඉරිදා සබත් දවස වශයෙන් පැවැත්වීමේ සංවිධානය සමග ඉතා කිට්ටුවෙන් ක්‍රියා කරයි. අමද්‍යප සේවය ගැන උගන්වන්නාවූ අය පවසන්නේ තමා සමාජයේ යහපත සඳහා ඉතාම වැඩියෙන් ක්‍රියාකරන බවය. ඔවුන් හා එක්සත් වීමට කැමති නොවන්නාවූ අය සලකනු ලබන්නේ අමද්‍යප සේවයේ හා ප්‍රතිසංස්කරණයේ සතුරන් හැටියටය. නමුත් වැරදි අදහසක් පිහිටුවීමට ක්‍රියාකරන්නාවූ සංවිධානයක් යහපත් සේවයකට සම්බන්ධවීම නිසා වුවද එය වැරදි අදහස ස්ථිර කිරීමට තර්කයක් වන්නේ නැත. යම් විෂ ද්‍රව්‍යයක් හොඳ ආහාරයක් හා සම්බන්ධ කිරීමෙන් අප ඒ විෂ ද්‍රව්‍යය සඟවනවා වන්නට පුළුවන. නමුත් එමගින් එහි ස්වභාවය වෙනස් කිරීමට අපට නුපුළුවන. අනික් අතට, මනුෂ්‍යයාගේ නොදැනුවත්කමින්ම එය පිළිගනු ලැබීමට පුළුවන් බැවින් එය වඩාත් අන්තරාදායක වෙයි. වැරදි ධර්මයක් පිළිගනු ලබන පිණිස එය සත්‍යයන් වන කාරණා සමග සැහෙන ප්‍රමාණයකට සම්බන්ධ කිරීම සාතන්ගේ උපක්‍රමයකි. ඉරිදා පැවැත්වීම ප්‍රචාරය කරන සංවිධානය, බයිබලයට එකඟ වන්නාවූද, මනුෂ්‍යයන්ට අවශ්‍ය වන්නාවූද ප්‍රතිසංස්කරණයන් ඉදිරිපත් කරන්නට පුළුවන. නමුත් ඒවා සමගම, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධ වන්නාවූ අවශ්‍යතාවයන් පවතින විට දෙවියන්වහන්සේගේ සේවකයන්ට ඔවුන් සමග එක්සත් වීමට නුපුළුවන. මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් පවත්වන පිණිස දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පසෙක දැමීම ගැන ඔවුන්ව කිසිසේත් ධර්මිෂ්ඨ කරනු ලැබීමට නුපුළුවන.

මනුෂ්‍යයා අමරණීයය යන ඉගැන්වීම හා ඉරිදා ශුද්ධ දවසය යන ඉගැන්වීම මගින් සාතන් මනුෂ්‍යයන්ව තමාගේ රැවටීම් වලට යටත් කරගන්නවා ඇත. මේ පළමුවන ඉගැන්වීම මගින් මළවුන් සමග සබඳතාවය පැවැත්වීමට පදනමක් ඇතිවන අතර, ඒ දෙවන ඉගැන්වීම මගින් මනුෂ්‍යයා රෝමානු ආධිපත්‍යයේ සානුකම්පාව සමග සබඳතාවයක් ඇති කරගනියි. අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රොතැස්තන්තවරු මළවුන් සමග සබඳතාවය පැවැත්වීම යන අදහස අල්වා ගැනීමට ඉතා උනන්දුවෙන් තම අත් දිගු කරනවා ඇත. රෝමානු බලධාරය සමග අත්වැල් බැඳගන්නා පිණිස ඔව්හු, ඔවුන්ද තමාද අතර ඇති විවරය හරහා තම අත් දිගු කරනවා ඇත. මෙයාකාරයෙන් ඇතිවන ත්‍රිවිධ සබඳතාවය අනුව මේ රට හෘදය සාක්ෂියේ අයිතිවාසිකම් පාගා දැමීමට රෝමය අනුගමනය කරනවා ඇත.

මළවුන් සමග සබඳතාවය පැවැත්වීම, අද දවසේ ඇත්තාවූ නාමික ක්‍රිස්තු භක්තියට බොහෝ සේ ඇතුළත්ව තිබෙන බැවින් මනුෂ්‍යයන් රවටමින් ඔවුන් තම උගුලට අසුකරගැනීමට සාතන්ට ඇති බලය

ඉමහත්ය. සාතන් මේ නවීන ක්‍රමයට හැඩ ගැසී සිටියි. ඔහු ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගෙන දර්ශනය වීමට සූදානම්ය. මළවුන් හා සබඳතාවය පැවැත්වීම මගින් හාස්කම් කරනු ලබනවා ඇත, රෝගීන් සුව කරනු ලබනවා ඇත, එපා කළ නොහැකි ආශ්චර්යයන් සිදුකරනු ලබනවා ඇත. තමා බයිබලය විශ්වාස කරන බව පවසමින් ඒ ආත්මයන් සභාවේ සංවිධානයන්ට ගරුත්වය දක්වන විට, ඔවුන් දිව්‍ය බලයෙන් ක්‍රියා කරන්නන් හැටියට පිළිගනු ලබනවා ඇත.

නාමික ක්‍රිස්තු භක්තිකයන් හා දේව භක්තිකමින් තොර අයවලුන් අතර වෙනස හඳුනාගැනීමට පවා නුපුළුවන් තරම්ය. සභා සාමාජිකයෝ ලෝකයා ආශාකරන දේවලට ආශා වෙමින් ඔවුන් හා සම්බන්ධ වීමට සූදානම්ව සිටිති. ඔවුන් සියල්ලන් ඒකත්වයකට පමුණුවමින් මළවුන් හා සබඳතාවය පැවැත්වීමට නොහොත් භූත බන්ධනය තුළට ඔවුන් සියල්ලන් ඇතුළත් කරගැනීම සාතන්ගේ තීරණයවෙයි. හාස්කම් කරනු ලැබීම සැබෑ සභාවක ලක්ෂණයක් යයි පවසන පාප් සභිකයෝ මේ හාස්කම් කිරීමේ බලයෙන් පහසුවෙන් රවටනු ලබනවා ඇත. සත්‍යතාවයේ පළිහ ඉවත් කරන ප්‍රොතැස්තන්තවරුද රවටනු ලබනවා ඇත. පාප් සභිකයෝ ද, ප්‍රොතැස්තන්තවරුද, ලෞකික ජීවිත ගතකරන මනුෂ්‍යයෝද බලයෙන් තොරවූ නාමික දේව භක්තිකමක් පිළිගන්නවා ඇත. මෙය ලෝකයාගේ හැරීමටද, බොහෝ කාලයක සිට බලාපොරොත්තු වන දහසක් අවුරුදු කාලයේ ආරම්භයටද ඉතා අනගි සංවිධානයක් වන්නේ යයි ඔවුන් කල්පනා කරනවා ඇත.

මේ භූත විද්‍යාව මගින් සාතන් දක්වන්ට යන්නේ ඔහු මනුෂ්‍ය ජාතියට උපකාරයක් වන බවය. එමගින් ඔහු රෝගීන් සුවකරමින්, අලුත්වූද වඩා උසස්වූද ආගමික ඇදහිල්ලක් ඉදිරිපත් කරන බව පෙන්වනවා ඇත. නමුත් ඒ අතරම ඔහු විනාශකයෙක් හැටියටද ක්‍රියාකරනවා ඇත. ඔහුගේ පරීක්ෂාවන් මගින් මහත් ජනකායක් විනාශයට යොමු කරනු ලබති. පමණ දන ක්‍රියානොකිරීම මගින් කල්පනාකාරිත්වය ඉවත් කරනු ලැබේ. ශාරීරික තෘෂ්ණාවන්ට යොමුවීම, දබරය, හා ලේ වැගිරීම ඇති වෙයි. යුද්ධ ඇතිවීම ගැන සාතන් ප්‍රීති වෙයි; කුමක්හෙයින්ද එමගින් මනුෂ්‍යයාගේ ඉතා අධම තෘෂ්ණාවන් පුබුදුවනු ලැබේ. එවිට, නපුරට හා ලේ වැගිරීමට යොමුවන ඔහුගේ ගොදුර සදාකාලික විනාශයට යොමු කරනු ලබයි. ජාතීන් තුළ, ඔවුනොවුන් සමග සටනේ යෙදීමට පෙළඹීමක් ඇතිකිරීම ඔහුගේ අදහසය; කුමක්හෙයින්ද එමගින් ඔහුට, මනුෂ්‍යයන් දෙවියන්වහන්සේගේ දවසට සූදානම් වීමෙන් ඉවත්කර ඔවුන්ගේ කල්පනාව වෙන අතකට යොමු කිරීමට පුළුවන.



සූදානම් රහිත මනුෂ්‍යයන් තමාගේ අස්වැන්න වන අතර ඔවුන් එක්කර ගන්නා පිණිස සාතන් ලෝකයේ අංගයන් තුළින් ක්‍රියා කරයි. සොබාදහමේ රසායනාගාරයන් හොඳාකාර වටහාගෙන තිබෙන්නාවූ ඔහු දෙවියන්වහන්සේ තමාට ඉඩදෙන ප්‍රමාණයට සොබාදහමේ බලයන් පාවිච්චි කරයි. යෝබ්ට පීඩා කිරීමට ඔහුට අවසර දෙනු ලැබූ විට ඔහු කරදරයක් පාසා කරදරයක් පමුණුවමින් ඔහුගේ ගවයන්ද, බැටළු රැළවල්ද, සේවකයන්ද, ගෙවල්ද, දරුවන්ද කොපමණ ඉක්මණින් විනාශ කරන්ට යෙදුණේද? තමාගේ දරුවන් ආරක්ෂා කරමින් විනාශකයාගේ බලයෙන් ඔවුන් මුදාලන පිණිස ඔවුන් අවට වැටක් බඳින්නේ දෙවියන්වහන්සේය. එහෙත් ක්‍රිස්තියානි ලෝකය යෙහෝවඃවහන්සේගේ ව්‍යවස්ථාවන් එපා කර තිබේ. එම නිසා ස්වාමීන්වහන්සේ තමන්වහන්සේ විසින්ම පවසා තිබෙන අන්දමටම ක්‍රියාකරනවා ඇත. උන්වහන්සේ ලෝකයෙන් තමන්වහන්සේගේ ආශිර්වාද ඉවත් කරනවා ඇත; තමන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට විරුද්ධව කැරළි ගසමින් එසේ කිරීමට අන්‍යයන්ටද බල කරමින් එසේ කිරීමට ඔවුන්ටද උගන්වන්නාවූ අය කෙරෙන් තමන්වහන්සේගේ රැකවරණය ඉවත් කරනවා ඇත. දෙවියන්වහන්සේ විශේෂ අන්දමට රැකවරණය නොකරන්නාවූ අය පාලනය කිරීමට සාතන් යොමු වෙයි. ඔහුගේම සැකසුම් සාර්ථක කරන පිණිස ඔහු සමහරෙකුට කරුණාව දක්වමින් ඔවුන්ට සෞභාග්‍යය ලබාදෙනවා ඇත. එසේම ඔහු අන්‍යයන්ට කරදර ඇතිකරමින් ඔවුන්ට එබඳු කරදර ඇතිකරන්නේ දෙවියන්වහන්සේ යයි විශ්වාස කිරීමට ඔහු මනුෂ්‍යයන්ට මගපෙන්වනවා ඇත.

තමාට සියලු ලෙඩ රෝග සුවකිරීමට පුළුවන් බවක් මනුෂ්‍යයන්ට දක්වමින් ඔහු ලෙඩ රෝග හා විපත්ති පමුණුවනවා ඇත. මේ අන්දමින්, ජනාකීර්ණ නගර විනාශවී පාළුවී යනවා ඇත. ඔහු දැන්ද ක්‍රියාත්මකව සිටියි. හදිසි අනතුරු හා මුහුදේද ගොඩ බිමද ඇතිවන විපත්ති මගින්ද, මහත් ගිනි ජාලාවන් ඇතිවීමෙන්ද, දරුණු සුළි සුළං හා භයානක හිම කුණාටු මගින්ද, කුණාටු හා ජල ගැලීම් මගින්ද, අනේක ස්ථානවල වඩදිය ගැලීම් හා භූමිකම්පා ඇතිකිරීමෙන්ද, මෙබඳු දහසක් මාර්ගවලින්ද සාතන් තමාගේ බලය ප්‍රකාශ කරයි. ඔහු පැසී ගිය අස්වැන්න විනාශ වෙන්ට සලස්වමින් සාගත ඇතිකර වාතයට මරණීය දුගඳක් එකතු කරමින් එමගින් වසංගත ඇති කරයි. මෙබඳු දේවල් වැඩි වැඩියෙන් පවතින්ට යන අතර ඒවා වඩාත් විනාශදායක වෙනවා ඇත. මනුෂ්‍යයාද මෘගයාද විනාශ වෙනවා ඇත. "පොළොව වැලපී මළානික වේ... පොළොවේ ජනයන්ගේ උත්තමයෝ ක්ලාන්ත වෙති. පොළොවත් එහි වැසියන් නිසා කිලුටුව

තිබේ. මක්නිසාද ඔව්හු ව්‍යවස්ථාවන් කඩ කොට නියෝගය වෙනස් කර, සදාකාල ගිවිසුම කඩ කළෝය." (යෙසායා 24:4,5)

එවිට, දෙවියන්වහන්සේට සේවය කරන්නාවූ අය මේ කරදර ඇති කරන්නෝ යයි ඒ මහත් රැවටිලිකාරයා මනුෂ්‍යයන්ට දක්වනවා ඇත. දෙවියන්වහන්සේගේ ආඥා පවත්වමින්, වරද කරන්නන්ට එමගින් තරවටුවක් ඉදිරිපත් කරන අය නිසා මේ කරදර සියල්ල ඇතිවන්නේ යයි ස්වර්ගයේ අප්‍රසන්නතාවය පෙළඹවූ අය විසින් පවසන්ට යෙදෙනවා ඇත. ඉරිදා සබත් දවස හැටියට නොපැවැත්වීම කරණකොටගෙන මනුෂ්‍යයන් දෙවියන්වහන්සේව අප්‍රසන්නතාවයට පමුණුවනවා යයි කියනු ලබනවා ඇත. ඉරිදා දවස නිසියාකාර පවත්වනු ලබන තෙක්, එය කඩකිරීම මගින් ඇතිවී තිබෙන විපත්ති කෙළවර නොවෙනවා ඇතැයි කියනු ලබනවා ඇත. සතරවන ආඥාව පැවැත්විය යුතු යයි කියමින් ඉරු දිනට ගරු නොකරන්නාවූ අය මනුෂ්‍යයන්ට කරදර ඇතිකරන බවද එමගින් ඔව්හු දිව්‍ය කරුණාව හා භෞතික සඵලත්වය නැවත ඇතිවීමට බාධා කරන බවද ඔවුන් පවසනවා ඇත. මෙසේ, පුරාණයේදී දෙවියන්වහන්සේගේ සේවකයන්ට විරුද්ධව පවසන ලද චෝදනාව පෙර පැවති අන්දමේම තත්ත්වයකදී පවසනු ලබනවා ඇත. ඒ චෝදනාව මෙසේ විය: "තවද ආහබ් එළියා දුටු විට ඔහුට කථාකොට: ඉශ්‍රායෙල් කලඹන තැනැත්තේ නුඹ දැයි ඔහුට කීවේය. ඔහුද මා නොව නුඹ සහ නුඹේ පියාගේ වංශය ස්වාමින්වහන්සේගේ ආඥා අත්හැර බාල් දේවතාවන් පස්සේ ගිය කාරණයෙන් නුඹලා ඉශ්‍රායෙල් කැළඹවහුය." (1 රාජාවලිය 18:17,18) වැරදි චෝදනා මගින් මනුෂ්‍යයන්ගේ කෝපය වැඩිවන අතර ඔවුන්ද ඒ වැරදි මාර්ගවලට යොමුවූ ඉශ්‍රායෙල්වරු එළියාට සැලකූ අන්දමට දෙවියන්වහන්සේගේ තානාපතියන්ට සලකනවා ඇත.

මළවුන්ට කථා කිරීමේ ක්‍රියා පිළිවෙලෙහි හාස්කම් කිරීමේ බලයද මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කීකරුවීමට තෝරා ගන්නාවූ අයවලුන් මත බලපානවා ඇත. ඒ සාතනික ආත්මයන්ගෙන් පැමිණෙන පණිවිඩ මගින් පවසනු ලබන්ට යන්නේ ඉරිදා පැවැත්වීම එපා කරන අයට ඔවුන්ගේ වරද පෙන්වා දීමට තමා එවනු ලැබූ බවය. මෙසේ ඔවුන් පෙන්නුම් කරන්ට යන්නේ දෙවියන්වහන්සේගේ ආඥාවන්ට මෙන්ම දේශයේ ආඥාවන්ටද කීකරු විය යුතු බවය. ලෝකයේ නපුරු තත්ත්වය ගැන ඔවුන් වැලපෙනවා ඇත. සුචරිතානුකූල තත්ත්වය පහළ බැස තිබෙන්නේ ඉරිදා දවසට ගරු නොකිරීම නිසාය යනුවෙන් ආගමික ගුරුවරුන් ඉදිරිපත් කරන ඉගැන්වීම් ඔවුන්ද සම්මත කරනවා ඇත. ඔවුන්ගේ සාක්ෂිය පිළිනොගන්නාවූ අයවලුන් කෙරෙහි මහත් උදහසක් දක්වනු ලබනවා ඇත.



සාතන් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් පිළිබඳව ක්‍රියාකරන අන්දම ඔහු ස්වර්ගයේ මේ මහා අරගලයේ පටන්ගැන්මේදී ක්‍රියා කළාවූ අන්දමට සමාන වෙනවා ඇත. ඔහු දක්වූයේ තමා දිව්‍ය රාජ්‍ය බලය ස්ථිර කිරීමට උපකාර කරන බවක්ය. එහෙත් ඔහු රහසිගතව සෑම උත්සාහයක්ම යෙදවූයේ ඒ බලය පහකර දැමීමටය. ඔහු මේ අන්දමින් රහසිගතව කළ ක්‍රියාව ගැන වරද තැබුවේ පක්ෂපාතව සිටියාවූ දූතයන්ටය. රෝම සභාවේ ඉතිහාසයේද මේ රැවටිලිකාරකමේ ප්‍රතිපත්තිය දක්නට ලැබේ. තමා දෙවියන්වහන්සේ වෙනුවට පෙනී සිටින බව පවසමින් ඔව්හු තමාව දෙවියන්වහන්සේට වඩා උසස් තත්ත්වයකට පමුණුවා ගනිමින් උන්වහන්සේගේ ව්‍යවස්ථාවන් වෙනස් කිරීමට උත්සාහ කරති. රෝමයේ බලය යටතේ, තමාගේ විශ්වාසවන්තකම ගැන මරණයට පත්කරනු ලැබූවන් ගැන පවසනු ලැබුවේ ඔවුන් නපුර කරන්නන් බවය. ඔවුන් සාතන් හා එක්සත්ව ක්‍රියා කරන්නන් යයි පවසන ලදී. ඔවුන්ට නිග්‍රහ කිරීමටද ඔවුන් ඉතාම අධම අපරාධකරුවන් යයි මනුෂ්‍යයන්ටද ඔවුන්ටමද දැක්වීමට හැකි සෑම ක්‍රියාදාමයක් උපයෝගී කරගන්නා ලදී. වර්තමානයේදීද එසේ සිදුවෙනවා ඇත. දෙවියන්වහන්සේගේ ආඥාවන්ට ගරු කරන්නාවූ අයවලුන් විනාශ කිරීමට සාතන් උත්සාහ කරනවා ඇත. ඒ අතරම, ඔවුන් ව්‍යවස්ථාව කඩ කරන්නන්ය කියාද ඔවුන් දෙවියන්වහන්සේට අගෞරව කරන්නන් කියාද, ඔවුන් නිසා ලෝකය මත විනිශ්චය පැමිණ තිබෙන්නේය කියාද ඔහු දක්වනවා ඇත.

දෙවියන්වහන්සේ කිසිවිටෙක හෘදය සාක්ෂියේ කැමැත්තට බලකරන්නේ නැත. නමුත් සාතන්ට වෙනයම් අන්දමකින් මනුෂ්‍යයන් පොළඹවා ගැනීමට නුපුළුවන් වූ විට ඔහු කෲරකම් මගින් ඔවුන්ට බලහත්කාරකම් කරයි. බිය ගැන්වීමෙන් හෝ බලහත්කාරකම් කිරීමෙන් හෘදය සාක්ෂිය පාලනය කරමින් තමාට නමස්කාරය යොමු කරවාගැනීමට සාතන් උත්සාහ කරයි. මේ අදහස සම්පූර්ණ කරගන්නා පිණිස ඔහු ආගමික හා ලෞකික නායකයන් තුළින් ක්‍රියා කරයි. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට විරුද්ධව මනුෂ්‍යයන්ගේ ව්‍යවස්ථාවන් ඉදිරිපත් කිරීමට ඔහු ඔවුන් යොමු කරයි.

බයිබලයේ දක්වන සබත් දවස පවත්වන්නාවූ අය අණ පනත්වලට හා ක්‍රමවත් භාවයට සතුරුකම් කරමින් සමාජයේ තහංචි කඩකරමින් දූෂණය ඇති කිරීමට හා අණ පනත්වලට විරුද්ධව ක්‍රියාකිරීමට මනුෂ්‍යයන් යොමු කරනවා යයිද ඔවුන් පොළොව මත දෙවියන්වහන්සේගේ විනිශ්චයන් පැමිණෙන්ට සලස්වනවා යයිද පවසනු ලබනවා ඇත. ඔවුන්ගේ විශ්වාසවන්තකම, මුරණ්ඩුකම හා හිතුවක්කාරකම හැටියටද, පාලන බලයට විරුද්ධව සිටීම හැටියටද දක්වනු ලබනවා

ඇත. ඔවුන් ආණ්ඩුවට ප්‍රේමයක් දක්වන්නේ නැතැයි ඔවුන්ට චෝදනා කරනු ලබනවා ඇත. දිව්‍ය ව්‍යවස්ථාවන්ට කීකරුවීම අනවශ්‍ය යයි පවසන ආගමික නායකයන් දේශනා කුඩුවේ සිටම පවසන්ට යෙදෙන්නේ දේශයේ නීති වනාහි දෙවියන්වහන්සේ විසින්ම පවසන ලද නීති හැටියට සලකමින් ඒවාට කීකරු විය යුතු බවය. නීතිදායක ශාලාවන්හිදීද, විනිශ්චය ශාලාවන්හිදීද, දිව්‍ය ව්‍යවස්ථාව පවත්වන්නන් වරදට පත්කරනු ලැබ ඔවුන් වැරදි අන්දමකට ඉදිරිපත් කරනු ලබනවා ඇත. ඔවුන්ගේ වචනවලට ව්‍යාජ වර්ණයක් දෙනු ලබනවා ඇත. ඔවුන්ගේ අභිප්‍රායන් වැරදි අන්දමට දක්වනු ලබනවා ඇත.

ප්‍රොතැස්තන්ත නිකායන්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ රැකවරණය සඳහා ඉදිරිපත් කරන පැහැදිලි තර්කයන් එපා කරන විට ඔවුන්, බයිබලය මගින් ඇදහිල්ල ඉවත් කිරීමට නුපුළුවන් වන අය නිශ්චල කිරීමට යත්න දරනවා ඇත. ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය මගින් පීඩාවන් පැමිණෙන්ට යන්නේ ක්‍රිස්තියානි ලෝකයේ වෙනත් අය කරන දේවල් කිරීමට අකමැති වෙමින් පාප් විසින් නියම කරන ලද සබත් පවත්වන්ට අකමැති වන්නාවූ අයටය යන කාරණයට ඔව්හු තමාගේ ඇස් අන්ධ කරගනිති.

සභාවේද දේශයේද නායකයන් එක්සත් වී සියළු මනුෂ්‍යයන් පොළඹවමින්, ඔවුන්ට බල කරමින් ඔවුන්ට ඒත්තු ගැන්වීමට උත්සාහ කරන්ට යන්නේ ඔවුන් ඉරිදා දවසට ගරු කළ යුතු බවය. ඒ සඳහා දිව්‍ය අනුමැතිය නොමැති බැවින් පීඩා කිරීම් ඒ සඳහා යොදවනු ලබනවා ඇත. යුක්තිය ගැනද සත්‍යය ගැනද ඇති ආශාව දේශපාලනික දූෂණය මගින් විනාශ කරනු ලබනවා ඇත. නිදහස් අමෙරිකාවේ පවා, නායකයන් හා නීතිදායකයන්, පොදු ජනයාගේ ජනප්‍රියතාවය දිනාගන්නා පිණිස ඉරිදා පැවැත්වීම පිළිබඳව නීතියක් සම්මත කිරීම ගැන ඇති ජනප්‍රිය ඉල්ලීමට එකඟ වෙනවා ඇත. එපමණ මහත් පූජාවීමකින් ලබාගන්නා ලද හෘදය සාක්ෂියේ නිදහසට තවදුරටත් ගරු කරනු ලබන්නේ නැත. ඉක්මණින් පැමිණෙන්ට තිබෙන්නාවූ මේ අරගලයේදී අපට අනාගතවක්තෘ මෙසේ පැවසූ වචන ක්‍රියාත්මක වෙනවා දකින්ට පුළුවන! "මහා සර්පයා ස්ත්‍රී කෙරෙහි උදහස් වී, දෙවියන්වහන්සේගේ ආඥා පවත්වන්නාවූ, යේසුස්වහන්සේගේ සාක්ෂිය දරන්නාවූ ඇගේ වංශයේ ඉතිරි අයට විරුද්ධව යුද්ධ කරන්ට ගියේය." (එළිදරව් 12:16 අග කොටස)



# 37

# ශුද්ධ ලියවිල්ල රැකවරණයකි

"ව්‍යවස්ථාවද සාක්ෂියද වෙතට යමු! ඒ වචනයේ හැටියට ඔවුන් නොකීවොත් ඔවුන්ට පහන්වීමක් නැත." (යෙසායා 8:20). බොරු ගුරුවරුන්ගේ බලපෑමෙන්ද අන්ධකාර ආත්මයේ බලයන්ගේ රැවටිලි කාරකම් වලින්ද රැකවරණය ලබන පිණිස ශුද්ධ ලියවිලි දෙසට හැරීමට දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට මගපෙන්වනු ලැබේ. මනුෂ්‍යයන් බයිබලයේ ඉගැන්වීම් දැනගැනීම වළක්වන පිණිස සාතන් තමාට හැකි සෑම උපක්‍රමයක්ම යොදවයි. කුමක්හෙයින්ද එහි පැහැදිලි ප්‍රකාශන මගින් ඔහුගේ රැවටිලිකාරකම් එළිදරව් කරනු ලැබේ. දෙවියන්වහන්සේගේ වැඩවල නවෝත්පාදයක් ඇතිවන සෑමවිටම නපුරේ කුමාරයා වඩාත් ක්‍රියාත්මක වන්නේ උනන්දුවෙන්ය. ඔහු දැන් ක්‍රිස්තුස්වහන්සේට හා උන්වහන්සේගේ අනුගාමිකයන්ට විරුද්ධව තමාට හැකි පමණ උනන්දුවෙන් ක්‍රියා කරන්නේ මෙය ඔහුගේ අවසාන පොරය නිසාය. ඒ ඉමහත් අවසාන රැවටීම ඉක්මණින්ම අප ඉදිරිපිට විවෘත වෙනවා ඇත. අන්ත ක්‍රිස්තු අප ඉදිරිපිට පුදුමාකාර ක්‍රියාවන් කරනවා ඇත. ඒ රැවටිලිකාර ක්‍රියාවන් සත්‍යතාවයේ ක්‍රියාවන්ට කොපමණ සමාන වෙනවා ඇද්ද යත් ශුද්ධ ලියවිල්ලේ මගපෙන්වීම නොමැතිව ඒවා හඳුනාගැනීමට අපට නුපුළුවන් වෙනවා ඇත. ඔවුන්ගේ සාක්ෂිවල සෑම ප්‍රකාශනයක් හා හාස්කමක්ම සෝදිසි කරනු ලැබිය යුතුය.

දෙවියන්වහන්සේගේ සියලු ආඥාවන් පවත්වන්නාවූ අයට නිග්‍රහ කරනු ලබනවා ඇත, ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරනු ලබනවාද ඇත. ඔවුන්ට ස්ථිරව සිටීමට පුළුවන් වන්නේ දෙවියන්වහන්සේ තුළ පමණය. තමා ඉදිරිපිට තිබෙන්නාවූ පීඩාවන් වටහාගැනීමට පුළුවන් වන පිණිස ඔවුන් විසින් බයිබලයෙන් දක්වා තිබෙන අන්දමට දෙවියන්-වහන්සේගේ වචනය වටහා ගත යුතුය. උන්වහන්සේගේ චරිතය, පාලන ස්වභාවය හා අභිප්‍රායන් හරියාකාරව වටහා ගනිමින් ඒවායෙන් දැක්වෙන ප්‍රතිපත්ති අනුව ක්‍රියාකිරීමෙන් පමණක්ම උන්වහන්සේට ගරු කිරීමට ඔවුන්ට පුළුවන. ඒ අවසාන මහා අරගලයේදී ස්ථිරව සිටීමට පුළුවන් වන්නේ බයිබලයේ සත්‍යයන් මගින් තමාගේ මනස ශක්තිමත් කරගැනීමට පුළුවන් වූ අයට පමණය. සෑම පුද්ගලයාවම සෝදිසි කරන පරීක්ෂණය වන්නේ: "මම මනුෂ්‍යයන්ට වැඩියෙන් දෙවියන්වහන්සේට කීකරු වන්නෙම්ද?" යන්නය. දැන්ද මේ තීරණාත්මක පැය ඉතා ආසන්නය. අපගේ පාද දෙවියන්වහන්සේගේ වෙනස්

නොවන්නාවූ වචනය වන පර්වතය මත පිහිටා තිබෙන්නේද? දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් හා යේසුස්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල උදෙසා ස්ථිරව සිටීමට අප සූදානම්ද?

තමන්වහන්සේව කුරුසිපත් කරනු ලැබීමට පෙර යේසුස්වහන්සේ, තමා මරනු ලබන්ට යන බවද තමා නැවත සොහොනින් නැගිටින බවද තමන්වහන්සේගේ ගෝලයන්ට විස්තර කළසේක. ඔවුන්ගේ සිත් හා හදවත් තුළට මේ වචන කාවද්දවන පිණිස දේවදූතයෝ එහි සිටියහ. නමුත් ගෝලයන් බලා සිටියේ රෝම වියගසින් භෞතික ලෙස මුදනු ලැබීම ගැනය. ඔවුන්ගේ මුළු බලාපොරොත්තුවේම මාධ්‍යය වූ යේසුස්වහන්සේට නින්දිත මරණයකට මුහුණ දීමට සිදුවන බවට වූ සිතුවිල්ල දරාගැනීමට ඔවුන්ට නුපුළුවන් විය. ඔවුන් විසින් මතක තබාගත යුතු වූ වචන ඔවුන්ගේ කල්පනාවෙන් ඉවත් විය. පීඩාවේ හා සෝදිසියේ අවස්ථාව පැමිණි විට ඔව්හු එයට සූදානම්ව නොසිටියහ. යේසුස්වහන්සේගේ මරණය ඔවුන්ගේ බලාපොරොත්තු විනාශ කළේ උන්වහන්සේ ඒ ගැන ඔවුන්ට කලින් අවවාද කර නොතිබුණා සේය. ක්‍රිස්තුස්වහන්සේගේ වචන මගින් උන්වහන්සේ ගෝලයන්ට තමන්-වහන්සේගේ මරණය ගැන දන්වා තිබුණ අන්දමටම අනාවැකි මගින් අප ඉදිරිපිටද අනාගතය විවෘත කර තිබේ. සෝදිසි කිරීමේ කාලයේ අවසානයටද පීඩා ඇතිවීමට සූදානම් වීමේ කාලයටද සම්බන්ධ වන කරුණු අපට පැහැදිලි ලෙස දක්වා තිබේ. නමුත් මේවා එළිදරව් කර නොතිබුණා සේ බොහෝ දෙනා මේ වැදගත් සත්‍යයන් ගැන කිසිත් නොදන සිටිති. ගැළවීම ලැබීම සඳහා ඔවුන් දැනගත යුතු කරුණු ඉවත් කිරීමට සාතන් බලා සිටියි; එහෙයින් පීඩාවන් ඇතිවන කාලය පැමිණෙන විට ඔවුන් එයට සූදානම් රහිතව සිටිනවා ඇත.

දෙවියන්වහන්සේ ඉතා වැදගත් අවවාදයන් මනුෂ්‍යයන්ට දෙන පිණිස අහස මැද පියාසර කරන දේවදූතයන්ගේ සංකේතයන් පාවිච්චි කරන විට උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ යම් වැටහීමක් ඇති සෑම මනුෂ්‍යයෙක්ම ඒ පණිවිඩ ගැන සැලකිලිමත් විය යුතු බවය. මෘගයාට හා උගේ රූපයට නමස්කාර කරන්නන් මත පමුණුවනු ලබන විනිශ්චයන් සියලු මනුෂ්‍යයන්ට මගපෙන්විය යුත්තේ මෘගයාගේ ලකුණ කුමක්ද කියාත් එය ලබා නොගැනීමට තමා සැලකිලිමත් විය යුත්තේ කෙසේද කියාත් දැනගන්නා පිණිස අනාවැකි ඉගෙනීමටය. (එළිදරව් 14:9-11). නමුත් බොහෝ මනුෂ්‍යයෝ සත්‍යය ඇසීමට නුපුළුවන් වන පිණිස තමාගේ කන් ඉවතට හරවා ගනිමින් ප්‍රබන්ධයන්ට සවන් දීමට යොමු වෙති. පාවුල් අපෝස්තුළු තුමා අවසාන කාලය දෙස බලමින් මෙසේ පැවසුවේය: මනුෂ්‍යයන් "සත්‍යයට කන් නොදී ප්‍රබන්ධවලට හැරී යන කාලය පැමිණෙන්නේය." (2 තිමෝති 4:4).



ඒ කාලය දැනටම පැමිණ තිබේ. තමාගේ පාපතර වූද ලෝකයේ ආශාවන්ගෙන් පූර්ණවූද හදවත්වල ආශාවන්ට බයිබලයේ සත්‍යයන් බාධාවක් වන බැවින් බොහෝ මනුෂ්‍යයෝ ඒවාට ආශා නොවෙති. සාතන් ඔවුන් ආශා කරන රැවටිලිකාරකම් ඔවුන්ට ලබාදෙයි.

නමුත් බයිබලය, එසේය බයිබලය පමණක්ම සියලු ධර්මයන්හි ප්‍රතිපත්තියද, සියලු නවෝත්පාදයන්හි පදනමද කරගන්නාවූ සෙනඟක් මේ ලෝකයේ සිටීම දෙවියන්වහන්සේගේ අදහසය. උගතුන්ගේ අදහස්ද, විද්‍යාවේ තීරණද, ලෝකයේ පවතින අනන්තවූ එක එකට විරුද්ධ වන්නාවූ සභාවන්හි විශ්වාසයන් හෝ තීරණයන්ද, බහුතරයකගේ හඬද යන මේ සියල්ල එසේය මේ කිසිවක් ආගමික ඇදහිල්ලේ කිසියම් කාරණයකට රුකුළක් හෝ බාධාවක් හැටියට පිළිගනු නොලැබිය යුතුය. කිසියම් ධර්මයක් හෝ ප්‍රතිපත්තියක් පිළිගැනීමට පෙර අප විසින් සෝදිසි කර බැලිය යුත්තේ: "ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක" යන්න ඒ ගැන පැවසිය හැකිද කියාය.

සාතන් නිරතුරුවම උත්සාහ කරන්නේ දෙවියන්වහන්සේට නොව මනුෂ්‍යයන්ට අවධානය යොමු කරවීමටය. තමාගේ යුතුකම් මොනවාදැයි දැනගන්නා පිණිස ශුද්ධ ලියවිලි සොයනවා වෙනුවට බිෂොප්වරුන් හා පූජකවරුන්ද ධර්මය උගන්වන්නන්ද තමාගේ මගපෙන්වන්නන් කරගන්ට මනුෂ්‍යයන් යොමු කිරීමට සාතන් උත්සාහ කරයි. ඊටපසුව, මේ නායකයන්ගේ මනස් පාලනය කරමින් ඔහුගේ කැමැත්ත කිරීමට මනුෂ්‍යයන් කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ඔහුට පුළුවන.

යේසුස්වහන්සේ ජීවනදායක වචන පැවසීමට පැමිණි විට පොදු ජනයා කැමැත්තෙන්ම උන්වහන්සේට සවන් දුන්හ, සමහර පූජකයෝ හා ආණ්ඩුකාරයෝද උන්වහන්සේව විශ්වාස කළහ. එහෙත්, නායක පූජකයන්ද ජාතියේ නායකයන්ද තීරණය කරගෙන තිබුණේ උන්වහන්සේගේ ඉගැන්වීම් වරදට පත්කරමින් ඒවා එපා කිරීමටය. උන්වහන්සේට විරුද්ධව චෝදනා සෙවීමේදී ඔව්හු වියවුලට පත්වූහ; උන්වහන්සේගේ වචනවල පැවති දිව්‍ය බලයේද ප්‍රඥාවේද අනුබලය ඔවුන්ට දැනුණි. එසේ වුවද ඔව්හු උන්වහන්සේ කෙරෙහි විරුද්ධවාදී අදහස් ඇතිව සිටියහ. උන්වහන්සේගේ ගෝලයන් වීමට ඔවුන් තුළ පෙළඹීමක් ඇති නොවන පිණිස ඔව්හු උන්වහන්සේ මෙසියස්වහන්සේ බව දක්වූ ඔප්පු සාක්ෂි එපා කළහ. යේසුස්වහන්සේට විරුද්ධව සිටියාවූ මේ මනුෂ්‍යයන් වනාහි බාල වියෙහි පටන්ම දිව්‍ය බලයට හිස නැමීමටද ගරු කිරීමටද උගන්වනු ලැබූවන් වූහ. ඔව්හු මෙසේ විමසූහ: "අපගේ නායකයන් හා උගත් ලියන්නන් යේසුස්වහන්සේව විශ්වාස නොකරන්නේ ඇයි? උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ වූසේක්

නම් මේ දේවභක්ති මනුෂ්‍යයන් උන්වහන්සේව පිළිගන්නවා නොවේද?" යුදෙව් ජාතිය ඔවුන්ගේ මිදුම්කාරයාණන්වහන්සේව එපා කරන්ට යෙදුණේ මෙබඳු ගුරුවරුන්ගේ අනුබලය නිසාය.

තමා තුළ උසස් දේව භක්ති භාවයක් තිබෙන බව දක්වන්නාවූ බොහෝ දෙනා තුළ මේ කාලයේදී ද ඒ පූජකයන් හා නායකයන් තුළ පැවති ආත්මය පවතියි. මේ කාලය සඳහා දී තිබෙන විශේෂ සත්‍යයන් පිළිබඳව ශුද්ධ ලියවිල්ලේ ඇත්තාවූ සාක්ෂිය සෝදිසි කර බැලීමට ඔව්හු අකමැති වෙති. ඔව්හු වස්තුව හා ජනප්‍රියතාවය ඇත්තාවූ විශාල ජන සංඛ්‍යාව දෙස බලති; සත්‍යය ප්‍රකාශ කරන්නාවූ අය දුලබව, දුගීව මහජනයාගේ අප්‍රසන්නතාවය ඇතිව සිටින අතර මනුෂ්‍යයන් ඔවුන් දෙස බලමින්, මනුෂ්‍යයා ලෝකයෙන් ඉවත් කරන්නාවූ ඇදහිල්ලක් ඔවුන්ට තිබෙන්නේ යයි පවසති.

යුදෙව්වරුන් විසුරුවා හරිනු ලැබීමේදී පවා ලියන්නන් හා ඵරිසිවරුන් නොනිසි ලෙස තමාගේ බලය කියාපෑම නොනවත්වන බව ක්‍රිස්තුස්වහන්සේ දුටුසේක. හෘදයසාක්ෂිය පාලනය කිරීමට මනුෂ්‍ය ආධිපත්‍යය ක්‍රියාකරන්ට යන බව උන්වහන්සේ කළින් දුටුසේක. මෙය සියලු කාලවලදීම සභාවට ඉමහත් ශාපයක් වී තිබේ. මේ අන්ධ නායකයන් අනුගමනය නොකිරීමට අවවාද කරමින් උන්වහන්සේ ඉතා තදින්ම මේ ලියන්නන්ට හා ඵරිසිවරුන්ට විරුද්ධව කථා කළ බව අනාගත පරම්පරාවන්ට අවවාදයක් වන පිණිස සටහන් කර තිබේ.

ශුද්ධ ලියවිලි තේරුම් කරදීම පූජක පක්ෂයේ කාර්යයක් බව රෝම සභාව දක්වයි. පැවිදි පක්ෂයට පමණක් දෙවියන්වහන්සේගේ වචනය විස්තර කරදීමට පුළුවන්ය යන අදහස අනුව ශුද්ධ ලියවිලි පොදු ජනයාට දෙනු ලබන්නේ නැත. ප්‍රතිසංස්කරණය මගින් දේව වචනය සියලු දෙනාටම දෙනු ලැබූ නමුත්, රෝම සභාවේ පවතින ඒ ප්‍රතිපත්තිය අනුවම, ප්‍රොතැස්තන්ත සභාවන්හි බොහෝ අයද තමා උදෙසාම බයිබලයේ වචන සොයා බැලීමෙන් වලක්වනු ලබති. සභාව දක්වන අන්දමට එහි ඉගැන්වීම් පිළිගැනීමට ඔවුන්ට උගන්වනු ලැබේ. ඒ අනුව, දහස් ගණන් ජනයා, ඔවුන්ගේ සභාවේ ඉගැන්වීම්වලට හෝ ඔවුන්ගේ ඇදහිල්ලේ ක්‍රමයට වෙනස් වන්නාවූ ඉගැන්වීම් බයිබලයේ පැහැදිලි ලෙස එළිදරව් කරනු ලබන නමුත් ඒවා පිළිගැනීමට ඉදිරිපත් නොවෙති.

බොරු ගුරුවරුන් ගැන බයිබලයේ බොහෝ අවවාද දී තිබේ. එසේ වුවද බොහෝ අය තමන්ගේ ආත්ම, පැවිදි පක්ෂයේ රැකවරණයට



භාර කිරීමට සූදානම්ව සිටිති. අද දවසේ, ආගමික නාමය දරන්නාවූ දහස් ගණන් ජනයාට තමාගේ ඇදහිල්ලට හේතූන් වශයෙන් දක්විය හැක්කේ ඔවුන් ඒවා අනුගමනය කරන්නේ ඔවුන්ගේ ආගමික නායකයන් ඒ දේවල් ඔවුන්ට ඉගැන්වූ නිසා බව පමණය. ඔව්හු ගැළවුම්-කාරයාණන්ගේ ඉගැන්වීම් නොතකා හරිමින් පූජකවරුන්ගේ වචන මත සම්පූර්ණ විශ්වාසය තබති. නමුත් පූජකවරු වැරදි නොකරන්නාවූ අයවල්ද? ඔවුන් ආලෝකය දරන්නන් බව දේව වචනයේ මගපෙන්වීම අනුව තීරණය කිරීමට නුපුළුවන් නම් ඔවුන්ගේ මගපෙන්වීමට භාරවීමට අපට පුළුවන් වන්නේ කෙසේද? ලෝකයේ පිළිගත් මාවතින් ඉවත්වීමට සුචරිතානුකූල ධෛර්යයක් නොමැති වීම නිසා බොහෝදෙනා උගතුන් අනුව යති. තමා උදෙසාම යම් යම් දේ සොයා බැලීමට පසුබටවීම නිසා ඔව්හු වැරදි ඉගැන්වීම් නමැති දම්වැල් වලට සවි වී සිටිති. මේ කාලයට නියමිත සත්‍යයන් බයිබලයේ පැහැදිලි ලෙස දක්වා තිබෙන බව ඔව්හු දකිති; එසේම, ඒ සත්‍යයන් ප්‍රකාශ කිරීමේදී ශුද්ධාත්ම-යාණන්ගේ බලය ක්‍රියාකරන බවද ඔව්හු දනිති. එසේ වුවද පූජක පැවිදි පක්ෂය දක්වන විරුද්ධවාදිකම් මගින් තමාව සත්‍යයෙන් ඉවත් කරනු ලැබීමට ඔව්හු ඉඩ දෙති. වටහාගැනීමද හෘදය සාක්ෂියද සත්‍යය ඒත්තු ගන්නේ වුවද, රැවටීමට අසුවූ මේ මනුෂ්‍යයෝ ඒ පූජකවරුන්ගේ අදහස්වලට වෙනස් වන අන්දමට කල්පනා කිරීමට කැමති නොවෙති. අන් අයෙකුගේ අවිශ්වාසයට, උඩඟුවට හා වැරදි අදහස්වලට ඔවුන්ගේ සදාකාලික තත්ත්වය පූජා කරනු ලැබේ.

තමාට අසුවූ අයවලුන් බැඳ තබාගන්නා පිණිස සාතන් මානුෂික බලපෑම් පාවිච්චි කරමින් අනේකාකාර අන්දම්වලින් ක්‍රියා කරයි. ඔහු බොහෝ අය තමාට සම්බන්ධ කරගන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියේ පූජාවට සතුරන් වන අයට ඔවුන්ව ප්‍රේමයේ රිදී නූල්වලින් සම්බන්ධ කරමිනි. මෙය දෙමාපිය දරු සබඳතාවය වුවද, විවාහයේ සබඳතාවයක් හෝ සමාජයීය සබඳතාවයක් වුවද, එයින් එකම අන්දමේ ප්‍රතිඵල ඇති වෙයි. සත්‍යයට විරුද්ධ වන්නාවූ අය හෘදය සාක්ෂිය පාලනය කිරීමට ඔවුන්ගේ අනුබලය යොදවති. ඔවුන්ගේ බලපෑමට යටත් වන අයට, යුතුකම් ගැන තමාට ඇත්තාවූ වැටහීම්වලට කීකරුවීමට ප්‍රමාණවත් නිදහස හෝ ධෛර්ය නොමැත.

සත්‍යය හා දෙවියන්වහන්සේගේ තේජස වෙන් කිරීමට නුපුළුවන. බයිබලය ලබාගැනීමට පුළුවන්කම තිබියදී, වැරදි අදහස් මගින් දෙවියන්වහන්සේට ගරු කිරීමට අපට කිසිසේත් නුපුළුවන. තමාගේ විශ්වාසය කුමක් වුවද තමාගේ ජීවිතය හරියාකාරව පවතින්නේ නම් එය ප්‍රමාණවත් යයි සමහර අය පවසති. නමුත් අපගේ ජීවිත හැඩගස්වනු ලබන්නේ අපගේ ඇදහිල්ල අනුවය. ආලෝකය හා

සත්‍යය ලබාගැනීමේ හැකියාව තිබෙන අතර අපි එය ඇසීමට හා දැකීමට ඇත්තාවූ අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන නොගනිමු නම්, අපි ඒවා එපා කරන්නන් වෙමු. එවිට අපි ආලෝකය වෙනුවට අන්ධකාරය පිළිගන්නන් වෙමු.

"මනුෂ්‍යයාට හරිව පෙනෙන මාර්ගයක් ඇත; එහෙත් එහි කෙළවර නම් මරණයේ මාර්ගය." (හිතෝපදේශ 16:25) දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට සෑම ඉඩ ප්‍රස්ථාවක්ම තිබෙන විට, නොදැනුවත්කම පාපයට හෝ වරද කිරීමට සමාවට කාරණයක් වන්නේ නැත. ගමනක යෙදෙන මනුෂ්‍යයෙක් මංසන්ධියකට පැමිණෙයි. එහි එක් එක් මාවත යොමු කරන්නේ කොතැනට දැයි දක්වන දැන්වීම් පුවරුවක්ද ඒ ස්ථානයේ තිබේ. ඔහු ඒ දැන්වීම් පුවරුව නොතකා හරිමින් තමාට සුදුසු යයි හැඟෙන මාවතක් ඔස්සේ යන්නට පුළුවන. ඔහු කොපමණ අවංක ලෙස ඒ මාවත තෝරා ගන්නේ වුවද, තමා වැරදි මාවතක සිටින බව අවසානයේදී ඔහුට පෙනී යනවා ඇත.

දෙවියන්වහන්සේ අපට උන්වහන්සේගේ වචනය දී තිබෙන්නේ අප එහි ඇත්තාවූ ඉගැන්වීම් දැනගෙන, උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි අප විසින්ම දැනගන්නා පිණිසය. ව්‍යවස්ථාව උගන්වන්නෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ මෙසේ විමසුවේය: "ආචාරිනී, සදාකාල ජීවනය උරුම කරගන්න පිණිස මා විසින් කුමක් කටයුතුද?" ගැළවුම්කාරයාණන්වහන්සේ ඔහුව ශුද්ධ ලියවිල්ලට යොමු කරමින් මෙසේ පැවසූ සේක: "ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන්නේ කිමෙක්ද? නුඹ කියවන්නේ කෙසේද?" (ලූක් 10:25,26) නොදැනුවත්කම බාල මහළු කිසිවෙකුට සමාවට කරුණක් වන්නේ නැත. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකිරීම ගැන දෙනු ලබන දඬුවමින් එය ඔවුන් නිදහස් කරන්නේද නැත. කුමක්හෙයින්ද, උන්වහන්සේගේ ව්‍යවස්ථාවද එහි අවශ්‍යතාවයන් හා ප්‍රතිපත්තිද විශ්වාසවන්ත ලෙස ප්‍රකාශ කර එය ඔවුන්ගේ අත්වලට පමුණුවා තිබේ. යහපත් අභිප්‍රායන් ඇතිව සිටීම පමණක් ප්‍රමාණවත් නොවේ; හරි යයි තමා සිතන දෙය කිරීම හෝ හරිදෙය යයි පූජකයා කියන දෙය කිරීම ප්‍රමාණවත් නොවේ. ඔහුගේ ආත්මයේ ගැළවීම විනාශ අභිමුඛයේ පවතින බැවින් ඔහු විසින් පුද්ගලික ලෙසම ශුද්ධ ලියවිලි සොයා බැලිය යුතුය. තමාගේ වැටහීම කොපමණ බලසම්පන්න වුවද, සත්‍යය කුමක්දැයි පූජකයා දන්නා බව ඔහු කොපමණ දුරට විශ්වාස කරන්නේ වුවද ඒවා ඔහුගේ ජීවිතයේ පදනම වන්නට නුපුළුවන. ස්වර්ගයට යන ගමනේදී සෑම මාර්ග ලක්ෂණයක්ම දක්වන සැලැස්මක් ඔහුට තිබේ. එහෙයින් ඔහු විසින් තමාගේම අදහස් අනුව ක්‍රියා නොකළ යුතුය.



කල්පනා ශක්තිය ඇත්තාවූ සෑම පුද්ගලයාම සත්‍යය කුමක්දැයි දැනගන්නා පිණිස ශුද්ධ ලියවිලි ඉගෙනීම ඔහුට ඇත්තාවූ ප්‍රමුඛ උතුම් වගකීමකි. ඊටපසුව ඔහු තමාට ලැබුණාවූ ආලෝකය අනුව ජීවත් වෙමින් තමාගේ ආදර්ශය අනුගමනය කිරීමට අන්‍යයන්ද දිරිගැන්විය යුතුය. අප විසින් දවස්පතාම උනන්දුවෙන් බයිබලය උගත යුතුය; ශුද්ධ ලියවිල්ලේ එක පාඨයක් තවත් එකක් සමග සසඳා බලමින් අප විසින් සෑම සිතුවිල්ලක්ම කිරා බැලිය යුතුය. අප විසින් පුද්ගලික ලෙස දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී සිටිමින් අප ගැන උන්වහන්සේට ගණන් දිය යුතු බැවින්, අප විසින්, දිව්‍ය උපකාරය ඇතිව පුද්ගලික ලෙස කාරණා තෝරා බේරාගත යුතුය.

උගත් මනුෂ්‍යයෝ බයිබලයේ පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබෙන සත්‍යයන් අනුමාන කරමින් ඒවා අන්ධකාරයට යොමුකර තිබේ. තමාට ඉමහත් ප්‍රඥාව තිබෙන්නේ යයි දක්වමින් ඔවුන් උගන්වන්නේ ශුද්ධ ලියවිල්ලේ අභිරහස්ගත, රහසිගත ආත්මික අර්ථයන් තිබෙන බවත්, ලියන ලද භාෂාවෙන් ඒවා ප්‍රකාශිත නොවන බවත්ය. මේ මනුෂ්‍යයෝ බොරු ගුරුවරුන් වෙති. මෙබඳු අයවලුන් ගැන යේසුස්වහන්සේ මෙසේ කීසේක: "නුඹලා වරද්දා ගන්නේ ශුද්ධ ලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදන්න නිසා නොවේද?" (මාර්ක් 12:24). බයිබලයේ භාෂාව, එමගින් පැහැදිලි වන අර්ථය අනුව වටහාගනු ලැබිය යුතුය. එය වෙනස් වන්නේ යම් සංකේතයක් හෝ රූපකයක් යොදනු ලැබූ විට පමණය. ක්‍රිස්තුස්වහන්සේ මෙයාකාර පොරොන්දුවක් දුන්සේක: "යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම් ඔහු ඒ ඉගැන්වීම දෙවියන්වහන්සේගෙන් වූ ඉගැන්වීමක්ද....යි දැනගන්නේය." (යොහන් 7:17). බොරු ගුරුවරුන්ගේ වියවුල් කිරීම හා වැරදි මගපෙන්වීම නොමැතිව මනුෂ්‍යයන් බයිබලය තමා කියවන අන්දමටම පිළිගන්නවා නම් ඔවුන් තුළ ඇතිවන ක්‍රියා පිළිවෙල ගැන දේවදූතයන් ප්‍රීතියට පත්වෙනවා ඇත. දැන් වැරදි මාර්ගවලට යොමුවී සිටින දහස් සංඛ්‍යාත ජනයා එමගින් ක්‍රිස්තුස්වහන්සේගේ රැළට එකතු කරනු ලබනවා ඇත.

ශුද්ධ ලියවිල්ල ඉගෙනීමට අප විසින් අපගේ සියලු බලයන් ක්‍රියාත්මක කළ යුතුය, මානුෂික තත්ත්වයෙන් හැකි පමණ දුරට දෙවියන්වහන්සේගේ ගැඹුරු සත්‍යයන් වටහාගැනීමට අපගේ කල්පනාව යොමු කළ යුතුය. ඒ අතරම, ඉගෙන ගන්නාවූ තැනැත්තා තුළ දරුවෙකුගේ යටහත් පහත් අවංක ආත්මයක් තිබිය යුතු බව අප විසින් අමතක නොකළ යුතුය. ප්‍රඥාව යොමු කර ගැටළු විසඳා ගන්නා අන්දමට ශුද්ධ ලියවිල්ලේ දුෂ්කරතාවයන් විසඳා ගැනීමට අපට නුපුළුවන. විද්‍යාවේ කරුණු වටහාගන්නා විට මෙන් නොව

බයිබලය ඉගෙනීමේදී අප විසින් ආත්ම විශ්වාසයකින් යුක්තව එයට යොමුවීමෙන් වැලකිය යුතුය. අප විසින් එය ඉගෙනගත යුත්තේ යාච්ඤාවෙන් යුක්තව, දෙවියන්වහන්සේ කෙරෙහි රඳා සිටිමින්, උන්වහන්සේගේ කැමැත්ත දනගැනීමට අවංක ආශාවකින් යුක්තවය. අති උතුම්වූ සිටිමියි නම් වූ තැනැත්වහන්සේගෙන් දනගැන්ම ලබාගන්නා පිණිස අප විසින් යටහත්වූද, උගන්වනු ලැබීමට පුළුවන් වන්නාවූද සිතකින් යුක්තව දේව වචනය වෙත පැමිණිය යුතුය; නැතහොත්, සත්‍යය අපගේ සිත් තුළට ඇතුල් නොවන පිණිස නපුරු දූතයන් අපගේ සිත් අන්ධ කරමින් අපගේ හදවත් තද කරනවා ඇත.

අභිරහසක්ය කියා හෝ වැදගත්කමක් නැතැයි කියා හෝ උගත් මනුෂ්‍යයන් සලකන ශුද්ධ ලියවිලි කොට්ඨාශ බොහොමයක් ක්‍රිස්තුස්-වහන්සේගේ පාසැලේ ඉගෙනුම ලබා තිබෙන අයට සැනසිලිදායක, අනුශාසනාත්මක වචනවලින් පූර්ණය. බොහෝ දේව ධර්මාචාරීන්ට දෙවියන්වහන්සේගේ වචනය ගැන පැහැදිලි වැටහීමක් නොමැත්තේ ඔවුන් තමා ක්‍රියාවේ යෙදවීමට කැමති නොවන්නාවූ සත්‍යයන්ට තමාගේ ඇස් වසාගන්නා නිසාය. බයිබලයේ සත්‍යයන් වටහාගැනීමේ හැකියාව රඳා පවතින්නේ එය සෙවීමට යොදවන ප්‍රඥාවේ බලය මත නොව පුද්ගලයාට ඒ ගැන ඇති අභිප්‍රායද, ධර්මිෂ්ඨකම ලබාගැනීමට ඔහු තුළ ඇති ආශාවද මතය.

යාච්ඤා නොකර බයිබලය ඉගෙන ගැනීමට යොමු නොවිය යුතුය. වටහාගැනීමට පහසු දේවල වැදගත්කම තේරුම් ගැනීමටද, වටහා ගැනීම අපහසුවන සත්‍යයන් සමග පොර බැදීමෙන් වැලකීමටද අපට උපකාර කළ හැක්කේ ශුද්ධාත්මයාණන්වහන්සේට පමණය. දෙවියන්වහන්සේගේ වචනයේ අලංකාරයෙන් ප්‍රීතිවීමටද, එහි ඇත්තාවූ අවවාදවලින් අනුශාසනා කරනු ලැබීමටද, එහි ඇත්තාවූ පොරොන්දු මගින් ප්‍රබෝධමත් කරනු ලැබීමට හා ශක්තිමත් කරනු ලැබීමටද අපගේ සිත් සූදානම් කිරීම ස්වර්ගීය දූතයන් සතු සේවයක්ය. ගීතිකාකාරයා මෙසේ පැවසුවේය: "ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යමත් දේ දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව." (ගීතාවලිය 119:18). අප විසින් මෙය අපගේද යාච්ඤාව කර ගත යුතුය. යාච්ඤාව හා බයිබලය ඉගෙනීම අතපසු කළ විට පරීක්ෂාවන්ට විරුද්ධව සිටීම ඉතා අපහසු වෙනවා ඇත. කුමක්හෙයින්ද, එවිට පරීක්ෂාවට පමුණුවනු ලැබූ තැනැත්තාට දෙවියන්වහන්සේගේ පොරොන්දු මතක් කරගෙන ශුද්ධ ලියවිල්ල නමැති ආයුධයෙන් සාතන්ට මුහුණ දීමට නුපුළුවන. නමුත් දිව්‍ය කාරණා ඉගෙනීමට ආශාවන අයවලුන් අවට දේවදූතයෝ සිටිති. අවශ්‍යතාවයක් ඇතිවූ විට ඔව්හු ඔවුන්ට අවශ්‍යවන සත්‍යයන්



ඔවුන්ගේ මතකයට යොමු කරනවා ඇත. 'සතුරා ජල ධාරාවක් මෙන් එන විට ස්වාමින්වහන්සේගේ ආත්මය ඊට විරුද්ධව නැගී සිටිනවා ඇත.'

යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන්ට මේ පොරොන්දුව දුන්සේක. "මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලි-කාරයාණන්වහන්සේ එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක." (යොහන් 14:26). නමුත්, කරදරයක් ඇති අවස්ථාවකදී උන්වහන්සේගේ වචන අපට මතක් කරදීමට දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේට පුළුවන් වන පිණිස ඊට පෙර, ක්‍රිස්තුස්-වහන්සේගේ ඉගැන්වීම් අපගේ සිත් තුළ නිදන් කරනු ලැබ තිබිය යුතුය. දාවිත් මෙසේ පැවසුවේය: "ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිධාන කරගතිමි." (ගීතාවලිය 119:11).

තමාගේ සදාකාලික කාරණා අගය කරන්නාවූ සියලුදෙනාම අදේවදෘෂ්ටියට තමා තුළට ඇතුල්වීමට නුපුළුවන් වන පිණිස රැකවලේ යෙදී සිටිය යුතුය. සත්‍යයේ ප්‍රමුඛ ස්ථම්භකයන්ට පවා පහර දෙනු ලබනවා ඇත. නවීන අදේවදෘෂ්ටියේ අපහාසාත්මක වචන වලින්ද, කූට උපායන්ගෙන්ද, අන්තරාදායක කරදරකාර ඉගැන්වීම්වලින්ද ඈත් වී සිටීම පහසු කාර්යයක් නොවේ. සාතන් අනේක තත්ත්වයන්හි මනුෂ්‍යයන්ට සුදුසු අන්දමට පරීක්ෂාවන් සකසයි. ඔහු නූගත් අයවලුන්ට නිග්‍රහයක් හෝ විහිළුවක් ඉදිරිපත් කරයි; ඒ අතර ඔහු උගත් අයවලුන්ට විද්‍යාත්මක විරුද්ධත්වයන් හා දර්ශනවාදීන්ගේ වටහාගැනීම් ඉදිරිපත් කරයි. ඒ සියල්ලම සකසනු ලබන්නේ ශුද්ධ ලියවිල්ල අනුමාන කරමින් එය කෙරෙහි අප්‍රසන්නතාවයක්ද ඇතිකරන පිණිසය. වැඩි අත්දැකීමක් නොමැති යෞවනයෝ පවා ක්‍රිස්තු ධර්මයේ ප්‍රමුඛ ප්‍රතිපත්ති අනුමාන කිරීමට යොමු කරනු ලබති. මේ යෞවනයන්ගේ අවිශ්වාස වන්තකම නොගැඹුරු වුවද එයින් බලපෑමක් ඇතිවෙයි. මේ අන්දමින් බොහෝ අය තම පියවරුන්ගේ ඇදහිල්ලට කවටකම් කිරීමටද අනුග්‍රහයේ ආත්මය සුළු කිරීමටද යොමු වෙති. දෙවියන්වහන්සේට ගෞරවයක් වීමටද ලෝකයට ආශිර්වාදයක් වීමටද හැකියාව පැවති බොහෝ ජීවිත අවිශ්වාසයේ දුගඳින් නරක් වී තිබේ. මනුෂ්‍යයන්ගේ පාරට්ටුවෙන් යුත් කල්පනාකාරිත්වය හා තීරණයන් කෙරෙහි විශ්වාසය තබමින්, තමාට දිව්‍ය අභිරහස් වටහාගැනීමට පුළුවනැයි කල්පනා කරමින් දෙවියන්වහන්සේගේ ප්‍රඥාවේ උපකාරය නොමැතිව යම් කාරණා සත්‍යයන් යයි තීරණය කරගන්නාවූ සියලු දෙනාම සාතන්ගේ උගුල්වල පැටලෙනවා ඇත.

අප ජීවත් වන්නේ ලෝක ඉතිහාසයේ ඉතාම බැරෑරුම් යුගයකය. ලෝකයේ ලක්ෂ සංඛ්‍යාත ජනයාගේ ඉරණම ඉක්මණින්ම තීරණය කරනු ලබනවා ඇත. අපගේම අනාගත සෞභාග්‍යයද වෙනත් අයගේ ගැළවීමද රඳා පවතින්නේ අප දැන් ක්‍රියාකරන්ට යන්නාවූ පිළිවෙල මතය. අප සත්‍යතාවයේ ආත්මයාණන් විසින් මගපෙන්වනු ලැබිය යුතුය. ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන සෑම කෙනෙක්ම "ස්වාමිනී මා කුමක් කරනවාට ඔබවහන්සේ කැමති වන සේක්ද?" යි උනන්දුවෙන් ඇසිය යුතුය. අප විසින් නිරාහාරව සිටීමෙන් හා යාච්ඤා කිරීමෙන් අපවම යටත් කරගෙන දෙවියන්වහන්සේගේ වචන ගැන, විශේෂයෙන්ම ඒ විනිශ්චයේ දර්ශන ගැන, මෙනෙහි කළ යුතුය. දෙවියන්වහන්සේගේ කාරණා පිළිබඳව ගැඹුරු ජීවමාන අත්දැකීමක් ලබාගැනීමට අප දැන් ආශා විය යුතුය. මොහොතක් පමණවත් අපතේ හැරීමට අපට නුපුළුවන. ඉතා වැදගත් දේවල් අප අවට සිදුවෙමින් පවතියි. අපි සාතන්ගේ රැවටිලිකාර භූමියේ සිටිමු. දෙවියන්වහන්සේගේ රැකවලුනි, නිදා නොගන්න. ඔබ මඳක් නොසැලකිලිමත්ව නිදිබර වුවහොත් ඔබ මත්තට පැන ඔබව තමාගේ ගොදුර කරගැනීමට සතුරා ඉතා ආසන්නව සැරිසරමින් සිටියි.

තමාට දෙවියන්වහන්සේ ඉදිරිපිට තිබෙන්නාවූ තත්ත්වය ගැන බොහෝ අය රැවටී සිටිති. තමා නොකරන්නාවූ වැරදි ක්‍රියාවන් ගැන ඔව්හු තමාටම ප්‍රශංසා කරගනිති. නමුත්, ඔවුන් කරනවා ඇතැයි දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන යහපත් උතුම් ක්‍රියාවන් කිරීම තමා අතපසු කරන බව ඔව්හු අමතක කරති. ඔවුන් දෙවියන්-වහන්සේගේ උයනේ වෘක්ෂයන් වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඵල දැරීමෙන් ඔවුන් උන්වහන්සේගේ බලාපොරොත්තු සම්පූර්ණ කළ යුතුය. උන්වහන්සේගේ අනුග්‍රහයේ ශක්තිය කරණකොටගෙන ඔවුන් විසින් කළ යුතු වූ නමුත් නොකරන්නාවූ යහපත් ක්‍රියාවන් ගැන ඔවුන් උන්වහන්සේට ගණන් දිය යුතුය. ස්වර්ගීය පොත්වල ඔවුන් ගැන වාර්තා වන්නේ ඔවුන් පොළොවට බරක් වන බවය. එහෙත් මේ අයගේ තත්ත්වය පවා සම්පූර්ණයෙන්ම බලාපොරොත්තු රහිත නොවේ. දෙවියන්වහන්සේගේ දයාව සුළු කරමින් උන්වහන්සේගේ අනුග්‍රහය නොනිසි ලෙස ක්‍රියාවේ යොදවන්නාවූ අයට පවා දෙවියන්වහන්සේගේ බොහෝ කල් ඉවසීමෙන් යුත් හදවතෙහි ප්‍රේමය මෙසේ කථාකරයි: "නිදන්නාවූ නුඹ පිබිද මළවුන්ගෙන් නැගිටින්න, එවිට ක්‍රිස්තුස්වහන්සේ නුඹ කෙරෙහි උදාවන සේකැයි උන්වහන්සේ කියන සේක ... ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින් ප්‍රස්තාව අල්ලාගන්න." (එපීස 5:14-16).



සෝදිසි කිරීමේ කාලය පැමිණි විට දෙවියන්වහන්සේගේ වචනය තමාගේ ජීවිතයේ ප්‍රතිපත්තිය කරගත්තාවූ අය එළිදරව් කරනු ලබනවා ඇත. ග්‍රීෂ්ම කාලයේදී සදාහරිත වෘක්ෂයන් හා වෙනත් වෘක්ෂයන් අතර වෙනසක් පෙනෙන්නේ නැත. එහෙත් තද ශීත සෘතුවක් ඇති රටවල්වල, වෙනත් වෘක්ෂයන්ගේ කොළ හැලී යන අතර සදාහරිත වෘක්ෂ නොවෙනස්ව පවතියි. එසේම බොරුකාර සිතක් ඇති තැනැත්තා දැන් සැබෑ ක්‍රිස්තු භක්තිකයා කෙරෙන් වෙන් කොට දක්වනු ලබන්නේ නැත. නමුත් ඒ වෙනස ප්‍රකාශ වන කාලය ඉතා ආසන්නය. විරුද්ධවාදිකම්ද, සත්‍යයෙන් ඈත්වීමද, නොඉවසිලිමත් භාවයද ඇතිවී පීඩා කිරීම නැවත පටන් ගනු ලබනවා ඇත. එවිට වංචාකාරව, අර්ධ හදවතකින් ක්‍රිස්තු භක්තිකව සිටින්නාවූ අය වැනෙමින් ඇදහිල්ල අත්හරිනවා ඇත. නමුත් සැබෑ ක්‍රිස්තු භක්තිකයා පර්වතයක් මෙන් ස්ථිරව සිටිනවා ඇත, ඔහුගේ ඇදහිල්ල ශක්තිමත් වෙනවා ඇත, සමෘද්ධිමත්වයේ කාලයේදී තිබුණාට වැඩියෙන් මෙවිට ඔහුගේ ඇදහිල්ල දීප්තිමත් වෙනවා ඇත.

ගීතිකාකාරයා මෙසේ කියා තිබේ: "මාගේ භාවනාව ඔබගේ ශික්ෂා ගැනය." "ඔබගේ නියෝගවලින් මට නුවණ ලැබේ. එබැවින් සියලු වංක මාර්ග නුරුස්සා හරිමි." (ගීතාවලිය 119:99,104).

"ප්‍රඥාව සොයාගන්නා මනුෂ්‍යයාද ඥානය ලබාගන්න මනුෂ්‍යයාද වාසනාවන්තයෝය." (හිතෝපදේශ 3:13). "මක්නිසාද ඔහු ජලය ළඟ හිටවා තිබෙන්නාවූ, ගඟ ළඟ මුල් අදින්නාවූ, ග්‍රීෂ්මය පැමිණෙන විට එය නොදැනෙන්නාවූ කොළ නොවේලෙන්නාවූ .... ඵල දැරීමෙන් නොර නොවන්නාවූ ගහකට සමාන වන්නේය." (යෙරෙමියා 17:8)

# 38

# අවසාන අවවාදය

"ඉන්පසු මහත් බලය ඇතුව වෙන දේවදූතයෙක් ස්වර්ගයෙන් බසිනවා දුටිමි. ඔහුගේ තේජසින් පොළොව ආලෝක විය. ඔහු බලවත් හඬකින් මොරගසා: මහා බබිලෝනිය වැටුණාය, වැටුණාය. ඈ යක්ෂයන්ගේ වාසස්ථානයක්ද සියලු අශුද්ධාත්මයන්ගේ හිරගෙයක්ද සියලු අපවිත්‍ර වූ පිළිකුල් වූ පක්ෂීන්ගේ හිරගෙයක්ද වූවාය." "තවද: මාගේ සෙනඟෙනි, ඇගේ පාපවලට හවුල් නොවන පිණිසත්, ඇගේ පීඩාවලට අසුනොවන පිණිසත්, ඇගෙන් ඉවත්ව එන්නැයි කියන වෙන හඬක් ස්වර්ගයෙන් මට ඇසුණේය." (එළිදරව් 18:1,2,4).

මේ ශුද්ධ ලියවිලි පාඨය දක්වන්නේ බබිලෝනියේ වැටීම ගැන එළිදරව් 14 හි සඳහන් වන අන්දමටම දෙවෙනි දූතයා කරන ප්‍රකාශනය නැවත ප්‍රකාශ කරනු ලැබීමක්ය. 1844 ග්‍රීෂ්ම කාලයේදී මේ පණිවිඩය දෙනු ලැබුවාට පසුව, බබිලෝනියට අයිති සංවිධානයන්ට ඇතුල් වී තිබුණාවූ දූෂණයන්ද මෙහි සඳහන් වෙයි. ආගමික ලෝකයේ පවතින්ට යන භයානක තත්ත්වයක් ගැන මෙහි විස්තර කර තිබේ. සත්‍යය එපා කරන සෑම අවස්ථාවේදීම මනුෂ්‍යයන්ගේ මනස වඩාත් අඳුරු වෙයි; ඔවුන්ගේ හදවත් වඩාත් මුරණ්ඩු වෙයි; මෙසේ ඔව්හු අදේව-දෘෂ්ටියෙහි තදවී යති. දෙවියන්වහන්සේ විසින් දී තිබෙන අවවාද වලට අකීකරුවෙමින් ඔවුන් ව්‍යවස්ථාවේ එක ප්‍රතිපත්තියක් පාගා දැමීමට යෙදෙති. ඊටපසුව, ඔව්හු ඒ ප්‍රතිපත්තියට ගරු කරන්නාවූ අයට පීඩා කිරීමට මගපෙන්වනු ලබති. ක්‍රිස්තුස්වහන්සේගේ වචනයටද උන්වහන්සේගේ මනුෂ්‍යයන්ටද විරුද්ධවීම කරණකොටගෙන ඔව්හු ක්‍රිස්තුස්වහන්සේව නොතකා හරිති. සභාවන් විසින් මළවුන් සමග සබඳතාවය පැවැත්වීමේ ඉගැන්වීම් පිළිගත් විට, මානසික හදවත මත බලපාන තහනම් නීති ඉවත් කරනු ලැබේ; එවිට නාමික ආගමිකත්වයක්, ඉතාම අධම පාපයන් ආවරණය කිරීමේ වැස්මක් වෙනවා ඇත. මළවුන් හා සබඳතාවය පැවැත්වීම විශ්වාස කිරීම මගින්, මනුෂ්‍යයන් පොළඹවන්නාවූ නපුරු ආත්මයන්ටද යක්ෂයන්ගේ ඉගැන්වීම්වලටද දොරටු විවෘත වෙයි. මෙසේ නපුරු දූතයන්ගේ අනුබලය සභාවන් තුළ පවතිනවා ඇත.

මේ අනාවැකියෙන් බබිලෝනිය ගැන ප්‍රකාශ කරන අවස්ථාවේදී මෙසේ පවසා තිබේ: "ඇගේ පව් ස්වර්ගය දක්වා නැංගේය; දෙවියන්වහන්සේ ඇගේ අපරාධ සිහිකළ සේක." (එළිදරව් 18:5).



මෙවිට ඇගේ වරදකාරකමේ තත්ත්වය සම්පූර්ණව පවතියි; එහෙයින් විනාශය ඉක්මණින්ම ඇය මත්තට පැමිණෙනවා ඇත. නමුත් තවදුරටත් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ගෙන් සමහරෙක් බබිලෝනියේ සිටිති. උන්වහන්සේගේ විනිශ්චයන් බබිලෝනිය මත පතිත වීමට පෙර, "ඇගේ පාපවලට හවුල් නොවන පිණිසත්, ඇගේ පීඩාවලට අසු නොවන පිණිසත්" මේ විශ්වාසවන්ත අය ඇය කෙරෙන් ඉවතට කැඳවාගත යුතුය. ඒ නිසා මේ ඉවත්වීම දක්වා තිබෙන්නේ ස්වර්ගයෙන් පහළට එන්නාවූ දේවදූතයෙකුගෙන්ය. ඔහු තමාගේ තේජසින් පොළොව ආලෝකමත් කරමින් මහත් හඬකින් මොර ගසමින් බබිලෝනියේ පාප ප්‍රකාශ කරයි. මේ පණිවිඩයට සම්බන්ධ කැඳවීම මෙසේය: "මාගේ සෙනඟෙනි, .... ඇගෙන් ඉවත්ව එන්න'.' දූතයන් තිදෙනාගේ පණිවිඩ සමග ඒකත්වයක්ව දෙනු ලබන මේ ප්‍රකාශනය වනාහි ලෝක වාසීන්ට දෙනු ලබන අවසාන අවවාදය වේ.

ලෝකය භයානක තත්ත්වයකට පැමිණෙයි. ලෝකයේ බලයන් දෙවියන්වහන්සේගේ ආඥාවන්ට විරුද්ධව එකතු වෙමින් "ලොකු කුඩා, පොහොසත්, දිළිඳු, දාස, නිර්දාස" (එළිදරව් 13:16) සියලුදෙනාම ඒ වැරදි සබත් දවස පවත්වමින් සභාවේ වත් පිළිවෙත් අනුව ක්‍රියාකරන ලෙස නියෝගයක් පනවනවා ඇත. එයට එකඟවීමට කැමති නොවන අයට දේශපාලනික දඬුවම් දෙනු ලබනවා ඇත; අවසානයේදී, ඔවුන් මරු මුවට පත්කිරීම සුදුසු යයි කියනු ලබනවා ඇත. අනික් අතට, මැවුම්කාරයාණන්වහන්සේගේ නිවාඩු දවස ඇතුළත් දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවීම අවශ්‍යය; එහි ප්‍රතිපත්ති කඩකරන සියල්ලන් දේව උදහසට මුහුණ දිය යුතුය.

මේ කාරණා පැහැදිලි ලෙස මනුෂ්‍යයන්ට ඉදිරිපත් කරනු ලැබූ, විට, මනුෂ්‍යයන්ගේ නියෝගයන්ට කීකරු වන පිණිස දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවන් පාගා දමන්නාවූ අයට මෘගයාගේ ලකුණ දෙනු ලැබේ. දෙවියන්වහන්සේට කීකරු වෙනවා වෙනුවට තමා කීකරු වෙන්ට තෝරාගන්නාවූ බලයේ ලකුණ ඔහු මෙසේ පිළිගනියි. ස්වර්ගයෙන් ලැබෙන අවවාද මෙසේය: "යමෙක් මෘගයාටත්, උගේ රූපයටත් නමස්කාරකර, ඔහුගේ නළලේවත් අතේවත් ලකුණක් ලබන්නේද, ඔහුත් දෙවියන්වහන්ගේ කෝපය නැමති කුසලානට අමිශ්‍රව වත්කරන ලද උන්වහන්සේගේ උදහස නැමති මුද්‍රිකපානය බොන්නේය." (එළිදරව් 14:9,10).

නමුත්, සිතට හා හෘදයසාක්ෂියට සත්‍යය ඉදිරිපත් කරනු ලැබ, එය එපාකරන තැනැත්තෙකුට පමණක්ම දෙවියන්වහන්සේගේ උදහසින් පීඩා විඳීමට සිදුවෙනවා ඇත. මේ කාලයට නියමිත සත්‍යයන් ඇසීමට

කිසිවිටෙක අවස්ථාවක් නොලැබූ බොහෝ අය සිටිති. සතරවන ආඥාව පිළිබඳව තමාට ඇති යුතුකම් එහි නියම ආලෝකයෙන් ඇසීමට අවස්ථාවක් කිසිවිටෙක ඔවුන්ට නොලැබී ඇත. සියලු හදවත්ද සියලු අභිප්‍රායන්ද කියවන තැනැන්වහන්සේ සත්‍යයන් දැනගැනීමට ආශාවන කිසිවෙකුට මේ අරගලය පිළිබඳව ඇත්තාවූ කරුණු ගැන රවටනු ලැබීමට ඉඩ නොදෙන සේක. නියෝගය අන්ධ ලෙස මනුෂ්‍යයන් පිට පවරනු ලබන්නේ නැත. ප්‍රඥාවන්ත ලෙස තීරණයන් ගැනීමට පුළුවන් වන පිණිස සියලු දෙනාටම ප්‍රමාණවත් ලෙස ආලෝකය දෙනු ලබනවා ඇත.

සබත් දවස, පක්ෂපාතකමේ මහත් සෝදිසිය වෙනවා ඇත; කුමක්හෙයින්ද විශේෂ අරගලයක් පවතින්නේ එහි සත්‍යතාවය පිළිබඳවය. මනුෂ්‍යයන් පිට ඒ අවසාන සෝදිසිය පමුණුවනු ලබන විට දෙවියන්වහන්සේට සේවය කරන්නන් හා උන්වහන්සේට සේවය නොකරන්නන් වෙන් කරනු ලබනවා ඇත. දේශයේ නීතිය අනුව, සතරවන ආඥාවට විරුද්ධව වැරදි සබත පැවැත්වීම දෙවියන්වහන්සේට විරුද්ධව සිටින බලයට පක්ෂපාතවීමක් වන අතර, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුව සැබෑ සබත් දවස පැවැත්වීම මැවුම්කාරයාණන්වහන්සේට පක්ෂපාතවීමේ සාක්ෂියක් වෙනවා ඇත. එක කාණ්ඩයක් ලෝක බලයන්ට පක්ෂපාතවීමේ සලකුණ වන මෘගයාගේ ලකුණ ලබාගන්නා අතර, අනික් කාණ්ඩය දිව්‍ය ආධිපත්‍යයට පක්ෂපාතවීමට තෝරාගෙන දෙවියන්වහන්සේගේ මුද්‍රාව ලබාගන්නවා ඇත.

මෙතෙක්, දූතයන් තිදෙනාගේ පණිවිඩය ප්‍රකාශ කළාවූ අය සලකනු ලබන්නේ තැති ගැන්මක් ඇති කරන්නාවූ අයවලුන් හැටියටය. අමෙරිකා එක්සත් ජනපදයේ ආගමික නිදහස නැතිවී යන බවටද දෙවියන්වහන්සේගේ ආඥාවන් පවත්වන්නාවූ අයට පීඩාකරන පිණිස සභාවන් හා දේශපාලනය එකමුතුවන බවටද පවසන ලද අනාවැකි වැරදි බවද ඒවාට කිසි පදනමක් නොමැති බවද පවසා තිබේ. මේ දේශය වරක් පැවති අන්දමට, ආගමික නිදහස රැකවරණය කරන දේශයක්ව පවතිනවාට වඩා වෙනස් තත්ත්වයකට පැමිණෙන්නේ නැතැයි සම්පූර්ණ විශ්වාසයකින් යුතුව පවසා තිබේ. නමුත් ඉරිදා පැවැත්වීම රට පුරා උනන්දුවෙන් පවසනු ලබන විට, සිදුවිය නොහැකි යයි විශ්වාස කරන ලද්දාවූද, අනුමාන නොකරන ලද්දාවූද දෙය ඇතිවෙන්ට යන බව පෙනී යයි. එවිට තුන්වන දූතයාගේ පණිවිඩයට ඇතිවන්ට යන්නේ ඊට පෙර කිසිවිටෙක නොපැවතුණාවූ තත්ත්වයකි.

සෑම පරම්පරාවකවදීම දෙවියන්වහන්සේ පාපයට තරවටු කරන පිණිස ලෝකයටද සභාවටද උන්වහන්සේගේ සේවකයන් යවා තිබේ.



නමුත් මනුෂ්‍යයන් කැමති වන්නේ තමාට සෞම්‍ය දේවල් පවසනු ලබනවාටය. ඔප නොදමූ පවිත්‍ර සත්‍යයන් පිළිගනු ලබන්නේ නැත. බොහෝ ප්‍රතිසංස්කාරකයෝ තමාගේ සේවයට ඇතුල්වීමේදී, සභාවේද දේශයේද පාපයන්ට විරුද්ධව ක්‍රියාකිරීමේදී බොහෝ ප්‍රඥාවන්ත ලෙස ක්‍රියාකිරීමට තීරණය කරගෙන සිටියහ. පිරිසිදු ක්‍රිස්තියානි ජීවිතවල ආදර්ශය මගින් මනුෂ්‍යයන් බයිබලයේ ධර්මයන්ට යොමු කිරීමට ඔව්හු බලාපොරොත්තු වූහ. නමුත් දෙවියන්වහන්සේගේ ආත්මය එලියා පිටට පැමිණ නපුරු රජුගේද සත්‍යයෙන් ඉවත්වූ මනුෂ්‍යයන්ගේද වැරදි වලට තරවටු කිරීමට ඔහු යොමුකරනු ලැබුවේය. ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කිරීමට යෙදුණාවූ අයටද, තමා ඉදිරිපත් කිරීමට පසුබටවූ ධර්මයන්, එනම් බයිබලයේ පැහැදිලි ප්‍රකාශනයන් ගැන දේශනා කිරීමෙන් වැලකී සිටීමට නුපුළුවන් විය. මනුෂ්‍යයන්ට තර්ජනයක් වූ අන්තරාවන් ගැනද සත්‍යයන් වූ ධර්මයන් ද උනන්දුවෙන් ප්‍රකාශ කිරීමට ඔව්හු යොමු කරනු ලැබූහ. සිදුවිය හැකි ප්‍රතිඵල ගැන බිය නොවී ඔව්හු තමාට දෙවියන්වහන්සේ දුන්නාවූ වචන ප්‍රකාශ කළහ. ඒ අවවාදයන්ට සවන් දීමට මනුෂ්‍යයෝ බල කරනු ලැබූහ.

තුන්වන දූතයාගේ පණිවිඩයද මෙසේ ප්‍රකාශ කරනු ලබනවා ඇත. එය බලයෙන් යුක්තව දිය යුතු කාලය පැමිණෙන විට, දෙවියන්වහන්සේ යටහත් පහත් අයවලුන් පාවිච්චි කරමින් උන්වහන්සේගේ සේවයට කැපවෙන්නාවූ අයට මගපෙන්වනවා ඇත. මෙසේ සේවය කිරීමට මනුෂ්‍යයන් සුදුස්සන් කරනු ලබන්නේ පුහුණු කිරීමේ සංවිධානයන් මගින් නොව, ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම අනුවය. ඇදහිල්ලෙන් හා යාච්ඤාවෙන් යුත් මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේ දෙන්නාවූ වචන ප්‍රකාශ කිරීමට ශුද්ධවූ උනන්දුවකින් යුතුව පිටත්ව යනවා ඇත. බබිලෝනියේ පාප විවෘත ලෙස දක්වනු ලබනවා ඇත. සභාවේ පිළිවෙත් පිළිපැදීමට දේශීය බලයන් පාවිච්චි කරනු ලැබීම නිසා ඇතිවන භයානක ප්‍රතිඵලද මළාවූ ආත්මයන්ට කථාකිරීම, රහසිගත ලෙස වුවද වේගයෙන් පාප් බලය පැතිරී යාම යනාදියද විවෘත ලෙස දක්වනු ලබනවා ඇත. මේ ගාම්භීර අවවාද මගින් මනුෂ්‍යයන් පුබුදුවනු ලබනවා ඇත. මෙබඳු වචන ඇසීමට අවස්ථාවක් නොලැබූ දස දහස් ගණන් ජනයා මේ අවවාදයන්ට සවන් දෙනවා ඇත. බබිලෝනිය වනාහි සභාව බවද, ඇගේ වැරදි ක්‍රියාවන් නිසාත්, ස්වර්ගයෙන් ඇය වෙත යවනු ලැබූ සත්‍යයන් පිළිනොගැනීම නිසාත් ඇය වැටී යන බව ඔවුන් අසන්ට යන්නේ මහත් පුදුමයෙන් යුක්තවය. මේ කාරණා ඇත්තදැයි මනුෂ්‍යයන් ඔවුන්ගේ ගුරුවරුන්ගෙන් විමසන අතර, ඔවුන්ගේ බිය දුරු කරමින්, ඔවුන් තුළ පුබුදුවන ලද හෘදය සාක්ෂිය නිශ්චල කරන පිණිස පූජකයන් උපමා කථාවන්ද සෞම්‍ය අනාවැකිද ඉදිරිපත් කරනවා ඇත. නමුත් බොහෝ දෙනෙක්

මනුෂ්‍යයන්ගේ අනුමැතිය එපා කරමින්, "ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක," යන වචන ඇසීමට ආශා වෙනවා ඇත. එවිට පැරණි ඵරිසිවරුන් මෙන් මේ ජනප්‍රිය පූජකයන්ද තමාගේ ප්‍රකාශන ගැන ප්‍රශ්න කිරීම ගැන කෝපාකූලවී, දෙනු ලබන්නාවූ මේ පණිවිඩ සාතන් වෙතින් පැමිණෙන බව පවසමින් ඒවා ප්‍රකාශ කරන අයට පීඩා කිරීමට හා නිග්‍රහ කිරීමට, පාපයට ඇලුම්වන පොදු ජනයා පොළඹවා ගන්නවා ඇත.

මේ අරගලය අලුත් ප්‍රදේශවලට පැතිරී ගොස්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සුළු කිරීමට මනුෂ්‍යයන් යොමු කරනු ලැබූ විට සාතන් ක්‍රියාත්මක වෙයි. මේ පණිවිඩයට ඇති බලය දකීමෙන් එයට විරුද්ධ වන්නාවූ අය වියරු වැටෙති. මේ ආලෝකය තමාගේ රැළ මත පතිත නොවන පිණිස එය වසා දැමීමට පූජකයන් ඉමහත් උත්සාහයක යෙදෙනවා ඇත. ඔවුන්ට හැකි සෑම අන්දමින්ම ඔවුන් උත්සාහ කරන්ට යන්නේ මේ වැදගත් ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම යටපත් කිරීමටය. සභාව දේශපාලන බලයේ සහාය ඉල්ලා සිටියි; මේ කාරණයේදී පාප්වාදීහුද ප්‍රොතැස්තන්ත අයද එක්සත් වෙති. ඉරිදා පැවැත්වීම පිළිබඳ නීතිය තීරණාත්මක ලෙස එඩිතරව ප්‍රකාශ කරනු ලබන විට ආඥා පවත්වන්නාවූ අයවලුන්ට විරුද්ධව නියෝග පණවනු ලබනවා ඇත. ඔවුන්ට දඩ නියම කරනු ලබන බවද ඔවුන් හිරගෙයි දමනු ලබන බවද පවසනු ලබනවා ඇත. ඔවුන්ගේ ඇදහිල්ල අත්හැර දමන්නේ නම් ඔවුන්ට බලවත් ධානාන්තර දෙනු ලබන බවද වෙනත් වාසි හා දීමනා දෙනු ලබන බවද පවසමින් ඔවුන් පොළඹවනු ලබනවා ඇත. නමුත් ඔවුන්ගේ ස්ථිර පිළිතුර වන්නේ: "දෙවියන්-වහන්සේගේ වචනයෙන් අපගේ වැරදි අපට පෙන්වා දෙන්න" යන්නය. මෙබඳු තත්ත්වයකදී ලූතර්ද පැවසුවේ මේ අන්දමටය. නඩු ශාලාවන් ඉදිරියට පමුණුවනු ලබන්නාවූ අය සත්‍යය උදෙසා බලවත් ප්‍රකාශන ඉදිරිපත් කරති; ඔවුන්ගේ බස් අසන සමහර අය දෙවියන්වහන්සේගේ ආඥා සියල්ල පැවැත්වීමට ඉදිරිපත් වෙති. මේ සත්‍යයන් නොදැන සිටින්නාවූ දහස් ගණන් ජනයාට මේ අන්දමින් ආලෝකය ඉදිරිපත් කරනු ලබනවා ඇත.

අවංකව දෙවියන්වහන්සේගේ වචනයට කීකරුවීම කැරලි ගැසීමක් ලෙස සලකනු ලබනවා ඇත. සාතන් විසින් අන්ධ කරනු ලබන දෙමාපියන් තමාගේ ඇදහිලිවන්ත දරුවාට රළු ලෙසද කර්කශ ලෙසද සලකනවා ඇත; ස්වාමියා හෝ ස්වාමි දුව ආඥා පවත්වන සේවකයාට පීඩා කරනවා ඇත. ප්‍රේමය දුරු වී යනවා ඇත; දරුවන්ව එපා කරමින් ඔවුන් තමන්ගේ නිවෙස්වලින් පළවා හරිනු ලබනවා ඇත. "ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වන්ට කැමති



සියල්ලෝම පීඩා විඳින්නෝය" (2 තිමෝති 3:12) යනුවෙන් පාවුල් පැවසූ වචන සම්පූර්ණ වෙනවා ඇත. සත්‍යය රැකවරණය කරන්නාවූ අය සබත් දවස හැටියට ඉරිදා දවසට ගරු නොකරන විට, ඔවුන්ගෙන් සමහරෙකු හිරගෙයි දමනු ලබනවා ඇත, සමහරෙකු රටින් පිටුවහල් කරනු ලබනවා ඇත, සමහරෙකු වහලුන් හැටියට සලකනු ලබනවා ඇත. මනුෂ්‍ය ප්‍රඥාව අනුව බලන විට මේ දේවල් සිදුවිය නොහැකි බවක් පෙනෙන්නට පුළුවන. නමුත් මනුෂ්‍යයන් පාලනය කරන්නාවූ දෙවියන්වහන්සේගේ බලය ඉවත් කරනු ලබනවා ඇත. එවිට මනුෂ්‍යයන් දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්තිවලට ද්වේෂ කරන සාතන්ගේ පාලන බලය යටතේ සිටිනවා ඇත. එවිට අමුතු දේවල් සිදුවෙනවා ඇත. දෙවියන්වහන්සේ කෙරෙහි බිය හා ප්‍රේමය නොමැති විට හදවත ඉතා කෲර වන්නට පුළුවන.

කුණාටුව ආසන්න වන විට, දූතයන් තිදෙනාගේ පණිවිඩය කෙරෙහි ඇදහිල්ලක් තමාට තිබෙන බව පැවසූ නමුත්, ඒ සත්‍යයන්ට කීකරුවීම කරණකොටගෙන තමාව පවිත්‍ර කර නොගත්තාවූ විශාල සංඛ්‍යාවක් සත්‍යය එපා කරමින් විරුද්ධ පක්ෂයට සම්බන්ධ වෙනවා ඇත. ලෝකයා හා සම්බන්ධ වෙමින් ලෝකයේ ස්වභාවයට පංගුකාරයන්වීම කරණකොටගෙන ඔවුන්ගේ ආලෝකය අනුව කාරණා දර්ශනය කිරීමට මේ අයද යොමුවෙනවා ඇත. සෝදිසිය ඇතිවූ විට ඔවුන් ජනප්‍රිය වන්නාවූ පහසු මාර්ගය තෝරාගන්නවා ඇත. වරක් සත්‍යය තුළ ප්‍රීති වූවාවූ, කථාවෙහි දක්ෂවූ, අනේක හැකියාවන් ඇත්තාවූ අය රැවටිලිකාරකම් කිරීමටද මනුෂ්‍යයන් වැරදි මාර්ගවලට යොමු කිරීමටද ක්‍රියා කරනවා ඇත. ඔවුන් මීට පෙර තමාගේ සහෝදරයන්ව සිටියාවූ අයවලුන්ගේ ඉතා තද සතුරන් බවට පත්වෙනවා ඇත. තමාගේ ඇදහිල්ල ගැන පිළිතුරු දෙන පිණිස සබත් පවත්වන්නාවූ අය නඩු ශාලාවන්ට පමුණුවනු ලබන විට සත්‍යයෙන් ඈත්වූ මේ අය සාතන්ගේ ඉතාම දක්ෂ නියෝජිතයන් වෙමින් බොරු වාර්තාවන් හා කපටි ක්‍රියාදාමයන් මගින් ඔවුන්ට වරද තබමින් ඔවුන් ගැන වැරදි පෙනුමක් දක්වමින් නායකයන් ඔවුන්ට විරුද්ධව උනන්දු කරවනවා ඇත.

පීඩා කිරීමේ මෙම කාලයේදී ස්වාමින්වහන්සේගේ සේවකයන්ගේ ඇදහිල්ල සෝදිසි කරනු ලබනවා ඇත. දෙවියන්වහන්සේ දෙසද උන්වහන්සේගේ වචනය දෙසද බලමින් ඔවුන් මේ අවවාදාත්මක ප්‍රකාශයන් පවසනවා ඇත. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔවුන් තුළ ක්‍රියාකරමින් දෙවියන්වහන්සේ උදෙසා කථා කිරීමට ඔවුන් පොළඹවන සේක. ස්වාමින්වහන්සේ ඔවුන්ට දුන්නාවූ වචනය ප්‍රකාශ කිරීම කරණකොටගෙන ඇතිවිය හැකි සීතල ප්‍රතිඵල ගැන නොසලකා

ඔව්හු ශුද්ධවූ උනන්දුවකින් යුක්තව, බලවත් දිව්‍ය මගපෙන්වීම යටතේ ඔවුන්ගේ යුතුකම් කිරීමට යෙදෙනවා ඇත. ඔව්හු තමාගේ භෞතික කාරණා ගැන කල්පනා නොකර තමාගේ කීර්තිය රැකගැනීමට උත්සාහ නොකරනවා ඇත. එහෙත්, විරුද්ධවාධිත්වයේ හා නිග්‍රහයේ කුණාටුව ඔවුන් මත පතිත වන විට, සමහර අය, අප්‍රසන්නතාවයට පත්වී මෙසේ පවසනවා ඇත: "අපගේ වචනවලින් ඇතිවන ප්‍රතිඵල මොනවා වෙනවා ඇද්දැයි කල්පනා කර තිබුණේ නම් අප නිශ්චලව සිටින්නට යෙදෙනවා ඇත." දසතින්ම ඔවුන්ට කරදර ඇති වෙයි. සාතන් මහත් පරීක්ෂාවන් මගින් ඔවුන්ට පහර දෙයි. ඔවුන් විසින් කරන්ට තෝරාගත් වැඩය කිරීමට පුළුවන්කමක් නොමැති බවක් ඔවුන්ට දැනී යනවා ඇත. විනාශ කරනු ලැබීමේ තර්ජනයක් ඔවුන් ඉදිරියෙහිය. ඔවුන්ට තිබුණාවූ උනන්දුව තවදුරටත් නොපවතියි; එහෙත් ආපසු හැරීමටද ඔවුන්ට නුපුළුවන. තමාගේ උපකාර රහිත භාවය වටහා ගනිමින් ශක්තිය ලබාගන්නා පිණිස ඔව්හු අති උත්තම තැනැන්වහන්සේ වෙතට හැරෙති. ඔවුන් විසින් පවසන්ට යෙදුණාවූ වචන ඔවුන්ගේම වචන නොවූ බවද ඒ අවවාද දීමට ඔවුන්ට අණ කළ තැනැන්වහන්සේ කෙරෙන් ඒ වචන පැමිණි බවද ඔවුන්ට මතක් වෙයි. දෙවියන්වහන්සේ ඔවුන්ගේ සිත් තුළට සත්‍යය ඇතුල් කරනසේක; එය ප්‍රකාශ නොකර සිටීමට ඔවුන්ට නුපුළුවන.

අතීත කාලයේදී ද දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට මෙයාකාර පරීක්ෂණවලට මුහුණ දීමට සිදුවී තිබුණි. වික්ලිෆ්, හස්, ලූතර්, ටින්ඩේල්, බැක්ස්ටර්, වෙස්ලි යන සියලු දෙනාම කියා සිටියේ සියලු ධර්මයන් බයිබලයෙන් සෝදිසි කරනු ලැබිය යුතු බවය. බයිබලය මගින් වැරදි බව පෙන්වනු ලබන සියල්ල අත්හැරීමට තමා සූදානම් බව ඔව්හු පැවසූහ. මේ මනුෂ්‍යයන්ට විරුද්ධවූ අය ඔවුන්ට ඉතා තදින් පීඩා කළහ; එහෙත් ඔවුන් සත්‍යය ප්‍රකාශ කිරීම අත්හැරියේ නැත. සභා ඉතිහාසයේ නා නා කාලයන්හිදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට සුදුසුවූ අන්දමට විශේෂ සත්‍යයන් ඉදිරිපත් කළසේක. සෑම අලුත් සත්‍යයක්ම ඉදිරියට යොමු කරනු ලැබුවේ ද්වේෂය හා විරුද්ධවාදිකම් අතරේය. එහි ආලෝකයේ ආශිර්වාද ලැබූ අයට පරීක්ෂාවන්ට හා පීඩාවන්ට මුහුණ දීමට සිදුවිය. හදිසි අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට විශේෂ සත්‍යයන් දෙන සේක. එය ප්‍රකාශ කිරීමට නුපුළුවනැයි පැවසිය හැක්කේ කවරෙකුටද? උන්වහන්සේ තමන්වහන්සේගේ සේවකයන්ට නියෝග කරන්නේ මේ දයාවේ අවසාන පණිවිඩය ලෝකයට ප්‍රකාශ කිරීමටය. එය ප්‍රකාශ නොකිරීම තමාගේම ආත්මයන්ට හානිකර ගැනීමකි. එහෙයින් එය ප්‍රකාශ නොකර සිටීමට ඔවුන්ට නුපුළුවන. ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතිවරුන්ට, එමගින්



ඇතිවන ප්‍රතිඵල ගැන සැලකීමට නුපුළුවන. ඔවුන් විසින් තමාගේ යුතුකම් ඉටුකරමින් එහි ප්‍රතිඵල දෙවියන්වහන්සේට භාර කළ යුතුය.

විරුද්ධවාදිකම් භයානක ලෙස වැඩිවන අතර දෙවියන්වහන්සේගේ සේවකයෝ නැවතත් වියවුල් වෙති; කුමක්හෙයින්ද තමාම මේ තත්ත්වය ඇති කළ බවක් ඔවුන්ට පෙනී යනවා ඇත. නමුත් ඔවුන්ගේ හෘදය සාක්ෂියද දෙවියන්වහන්සේගේ වචනයද ඔවුන්ට දක්වන්නේ ඔවුන් ක්‍රියාකළ අන්දම නිවැරදි බවය. පීඩාවන් තවදුරටත් ඇතිවන්නේ වුවද, ඒවා දරාගැනීමට ඔවුන් ශක්තිමත් කරනු ලබනවා ඇත. තත්ත්වය වඩාත් තියුණු වන්නේ වුවද, ඒ තත්ත්වයට අනුකූල ලෙසම ඔවුන්ගේ ඇදහිල්ල හා ධෛර්යය වර්ධනය වෙයි. ඔවුන් මෙසේ සාක්ෂි දරනවා ඇත. "දෙවියන්වහන්සේගේ වචන වෙනස් කරමින්, උන්වහන්සේගේ ශුද්ධවූ ව්‍යවස්ථාවේ එක් කොටසක් අවශ්‍යය කියාද තව කොටසක් අනවශ්‍ය කියාද කියමින් ලෝකයේ ප්‍රසන්නතාවය දිනාගන්නා පිණිස ක්‍රියාකිරීමට අපට නුපුළුවන. අප සේවය කරන ස්වාමීන්වහන්සේට අපව මුදාගැනීමට පුළුවන. ක්‍රිස්තුස්වහන්සේ ලෝකයේ බලයන් පරාජය කළසේක; උන්වහන්සේ පරාජය කළාවූ ලෝකය ගැන අප බියපත් විය යුතුද?"

නා නා ප්‍රකාරයන්ගෙන් ඇතිවන පීඩාකිරීම් වනාහි එක්තරා ප්‍රතිපත්තියක් අනුව ක්‍රියා කිරීමකි. සාතන් පවතින තුරුද ක්‍රිස්තු ධර්මය බලයෙන් යුක්ත වන තුරුද ඒ තත්ත්වය පවතිනවා ඇත. අන්ධකාරයේ හමුදාවේ විරුද්ධවාදිකම තමා කෙරෙහි යොමු කර නොගෙන දෙවියන්වහන්සේට සේවය කිරීමට කිසිවෙකුට නුපුළුවන. ඔවුන්ගේ අනුබලය කරණකොටගෙන තමාගේ ගොදුර තමාගේ අත්වලින් ඉවත් කරනු ලබන බව දකින නපුරු දූතයන් ඔවුන්ට පහර දෙනවා ඇත. ඔවුන්ගේ ආදර්ශය මගින් තරවටු කරනු ලබන නපුරු මනුෂ්‍යයන්ද ඒ දූතයන් සමග එක්සත්ව ඔවුන්ට සිත් ඇදගන්නා පරීක්ෂාවන් යොමු කරමින් ඒවා මගින් ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙන් වෙන් කිරීමට ක්‍රියාකරනවා ඇත. මේ උපක්‍රමද සාර්ථක නොවූ විට, හෘදය සාක්ෂියට බල කරන පිණිස වඩා මහත් බලයක් ඔවුන් කරා යොමු කරනු ලබනවා ඇත.

නමුත් යේසුස්වහන්සේ ස්වර්ගීය ශුද්ධස්ථානයෙහි අප උදෙසා මැදහත්කම් කරන තුරු, ශුද්ධාත්මයාණන්ගේ පාලනය කිරීමේ බලය මනුෂ්‍යයන්ටද නායකයන්ටද දැනී යනවා ඇත. ඒ බලය යම් ප්‍රමාණයකට තවදුරටත් දේශයේ අණ පනත් පාලනය කරනවා ඇත. මේ අණ පනත් නොපැවතියේ නම් ලෝකයේ තත්ත්වය දැන් පවතිනවාට වඩා බොහෝ සේ නරක් වෙනවා ඇත. අපගේ නායකයන් බොහෝ දෙනෙක්

සාතන්ගේ ඒජන්තවරුන් වන නමුත්, දේශයේ නායකයන් අතර දෙවියන්වහන්සේගේ ඒජන්තවරුද සිටිති. සතුරා තමාගේ සේවකයන් අතර ක්‍රියා කරමින්, දෙවියන්වහන්සේගේ වැඩවලට බාධාවක් ඇතිකරන උපක්‍රම යෝජනා කිරීමට ඔවුන් පොළඹවනවා ඇත; නමුත් දේව භය ඇත්තාවූ නායකයන් ශුද්ධවූ දූතයන්ගේ බලපෑම අනුව එබඳු යෝජනාවන්ට විරුද්ධ වන්නේ එපා කළ නොහැකි තර්කයන් ඉදිරිපත් කරමිනි. මේ අන්දමට, ස්වල්ප දෙනෙක් නපුරේ බලවත් ධාරාව ගලා ඒම පාලනය කිරීමට ක්‍රියාකරනවා ඇත. තුන්වන දූතයාගේ පණිවිඩය මගින් ඉටුවිය යුතු සේවය සම්පූර්ණ වන තුරු සත්‍යයට විරුද්ධව ක්‍රියාකරන සතුරන් පාලනය කරනු ලබනවා ඇත. අවසාන අවවාදය දෙනු ලබන විට එය ස්වාමින්වහන්සේ පාවිච්චි කළාවූ ඒ නායකයන්ට කථා කරනවා ඇත. ඔවුන්ගෙන් සමහරෙක් ඒ අවවාදය පිළිගෙන, කරදර කාලයේදී දෙවියන්වහන්සේගේ සෙනඟ සමග ස්ථිරව සිටිනවා ඇත.

තුන්වන දූතයාගේ පණිවිඩය ප්‍රකාශ කරන දූතයා ඔහුගේ ආලෝකය මගින් මුළු ලෝකයම ආලෝකමත් කරනවා ඇත. ඉමහත් බලයකින් යුක්තව ලොව පුරා කරනු ලබන සේවයක් ගැන මේ අනාවැකිය ප්‍රකාශ කරයි. 1840-44 දක්වා පැවති ඇඩ්වෙන්ටිස්ත සංවිධානය දෙවියන්වහන්සේගේ බලයේ තේජාන්විත ප්‍රකාශනයක් විය. පළමුවන දූතයාගේ පණිවිඩය ලෝකයේ සෑම මිෂනාරි සේවා කොටසකටම දෙනු ලැබීය. සමහර රටවල එමගින් මහත් ආගමික උනන්දුවක් ඇතිවිය. දහසය වන ශත වර්ෂයේදී පැවති ප්‍රතිසංස්කරණයට පසුව එබඳු ආගමික පිබිදීමක් ඒ කිසි රටක පැවතියේ නැත. නමුත් තුන්වන දූතයාගේ අවසාන පණිවිඩය ප්‍රකාශ කළ විට පවතින තත්ත්වය ඒ කාලයේදී පැවති තත්ත්වයට වඩා ඉතා බලසම්පන්න වෙනවා ඇත.

එවිට ඇතිවන සේවය පෙන්තකොස්ත දවසේදී ඇතිවූ සේවයට සමාන වෙනවා ඇත. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ආරම්භයේදී 'පළමුවන වර්ෂාව' දෙනු ලැබුවේ එමගින් ශුභාරංචි බීජය වර්ධනය වන පිණිසය. එසේම, ඒ සේවයේ අවසානයේදී 'අන්තිම වර්ෂාව' දෙනු ලබන්නේ අස්වැන්න සම්පූර්ණත්වයට පැමිණෙන පිණිසය. "එබැවින් ස්වාමින්-වහන්සේ ඇඳින ගනිමු, ඇඳිනගන්ට වීර්ය කරමු; උන්වහන්සේගේ උදාවීම පහන්වීම මෙන් ඒකාන්තමය. උන්වහන්සේ වාර්ෂාව මෙන්ද පොළොව තෙමන අන්තිම වර්ෂාව මෙන්ද අප ළඟට එනවා ඇත." (හොෂෙයා 6:3). "ඉතින් සියොන් පුත්‍රයෙනි, නුඹලාගේ දෙවිවූ ස්වාමින්-වහන්සේ කෙරෙහි ප්‍රීති සන්තෝෂවෙන්න. මක්නිසාද උන්වහන්සේ නුඹලාට පළමුවෙනි වර්ෂාව නිසිතරමට දුන්සේක. තද වැස්ස වන



පළමුවෙනි වර්ෂාවද පළමුවෙනි මාසයේ අන්තිම වර්ෂාවද උන්වහන්සේ නුඹලා උදෙසා වස්වනවා ඇත." (යෝවෙල් 2:23). "අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි." "ස්වාමින්-වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන කවරේත් ගළවනු ලබන්නේය." (ක්‍රියා 2:17,21). ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ මහත් සේවයේ අවසානයේදී, එය පටන්ගැන්මේදී පැවති තරමටම, දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කරනු ලබනවා ඇත. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ආරම්භයේදී පළමුවන වර්ෂාව දෙනු ලබන බව පැවසූ අනාවැකි සම්පූර්ණ වූ අන්දමට එහි අවසානයේදී අන්තිම වර්ෂාව දෙනු ලබන බව පවසන අනාවැකිද නැවත සම්පූර්ණ කරනු ලබනවා ඇත. පේතෘස් 'සැනසිලි කාලයන්' ගැන බලා සිටිමින් ඒ කාලය ගැන මෙසේ පැවසුවේය: "එබැවින් ස්වාමින්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද නුඹලා උදෙසා නියම කරන ලද්දාවූ ක්‍රිස්තුස්වහන්සේ, එනම් යේසුස්-වහන්සේ එවන පිණිසද, නුඹලාගේ පාපයන් මකා දමනු ලබන පිණිසද, පශ්චත්තාපව හැරෙන්න." (ක්‍රියා 3:19,20).

දෙවියන්වහන්සේගේ සේවකයන්, ශුද්ධවූ කැපවීමකින් ආලෝකමත්වූ, බබළන්නාවූ මුහුණුවලින් යුක්තව, ස්වර්ගීය පණිවිඩය ප්‍රකාශ කරන පිණිස එහා මෙහා යනවා ඇත. දහස් ගණන් කටහඬවල් මගින් ලෝකයේ සෑම තැනටම මේ අවවාදය ප්‍රකාශ කරනු ලබනවා ඇත. ආශ්චර්යමත් ක්‍රියාවන් සිදුකරනු ලබනවා ඇත; රෝගීන් සුව කරනු ලබනවා ඇත; ඇදහිලිවන්තයන් මගින් ලකුණුද පුදුමද දක්වනු ලබනවා ඇත. සාතන්ද "මනුෂ්‍යයන් ඉදිරියෙහි අහසින් පොළොවට ගිනි බස්වන තරමට මහත් හාස්කම් කරන්නේය." (එළිදරව් 13:13). එවිට ලෝකවාසීන් සත්‍යය උදෙසා ඉදිරිපත් වෙනවා ඇත.

පණිවිඩය ඉදිරිපත් කරනු ලබන්නේ තර්කවලින් නොව දෙවියන් වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ ගැඹුරු වටහා දීම මගින්ය. තර්ක ඉදිරිපත් කර තිබෙනවා ඇත. බීජය වපුරා තිබෙනවා ඇත. දැන් එය පැන නැගී ඵල දරනවා ඇත. මිෂනාරි සේවකයන් බෙදා දෙන්ට යෙදුණාවූ පොත්පත් මගින් බලපෑමක් පවතියි; එසේ වුවද, සත්‍යය වැටහී ගියාවූ බොහෝ අය එය සම්පූර්ණයෙන්ම පිළිගෙන එයට කීකරු වීමෙන් වැලකී සිටිති. දැන් ආලෝක ධාරාවන් දසත විහිදෙයි; සත්‍යය පැහැදිලි ලෙස දර්ශනය වෙයි; දෙවියන්වහන්සේගේ අවංක දරුවන් තමාට බාධා කළ බැඳුම් බිඳ දමනවා ඇත. පවුල්වල සබඳතාවයන්ට හෝ සභාවල සබඳතාවයන්ට ඔවුන්ට බාධා කිරීමට බලයක් නොමැත. අන් සියලු දේවලට වැඩියෙන් සත්‍යය අගනා දෙයක් බව පෙනී යනවා ඇත. සත්‍යයට විරුද්ධව යම් ඒජන්තවරුන් එක්වන්නේ වුවද විශාල සංඛ්‍යාවක් ස්වාමින්වහන්සේගේ පක්ෂයට පැමිණෙනවා ඇත.

# 39

# පීඩාවන් පවතින කාලය

"ඒ කාලයේදී නුඹේ සෙනඟගේ පුත්‍රයන් උදෙසා සිටින උතුම් අධිපතියා වූ මිකායෙල් නැගිටින්නේය. ඒ වනාහි මනුෂ්‍ය ජාතියක් පැවති තැන් සිට ඒ කාලය දක්වා නොවූ ආකාර විපත්ති කාලයක් වන්නේය. ඒ කාලයේදී නුඹේ සෙනඟගෙන් පොතේ නම් ලියා තිබෙන සියල්ලෝ ගැළවෙන්නෝය." (දානියෙල් 12:1)

තුන්වන දූතයාගේ පණිවිඩය ප්‍රකාශ කිරීම අවසාන වූ විට ලෝකයේ සිටින්නාවූ පාපිෂ්ඨ මනුෂ්‍යයන් උදෙසා දයාව තවදුරටත් ක්‍රියාත්මක නොවෙනවා ඇත. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් ඔවුන්ගේ මෙහෙය නිම කර හමාරය. ඔවුන්ට "අන්තිම වර්ෂාවද" "ස්වාමින්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන්ද" ලැබුණේය. දැන් ඔව්හු තමා ඉදිරිපිට ඇත්තාවූ පීඩා කාලයට සූදානම්ය. දේවදූතයෝ අහස මත එහා මෙහා ඉක්මණින් පියාසර කරති. පොළොවේ සිට පැමිණෙන්නාවූ දේවදූතයෙක් පවසන්නේ තමාගේ වැඩය හමාරවූ බවය. අවසාන පරීක්ෂණය ලෝකයට දෙනු ලැබූ විට, දිව්‍ය ප්‍රතිපත්තීන්ට විශ්වාසවන්ත වූ සියලු දෙනාටම ඒ වන විට දෙවියන්වහන්සේගේ මුද්‍රාව දී තිබේ. එවිට යේසුස්වහන්සේ ශුද්ධස්ථානයෙහි තමා කළාවූ මැදහත්කාරකමේ සේවය ඉවර කරන සේක. උන්වහන්සේ අත් ඔසවා, 'නිමවිය' යි මහත් හඬින් පවසනවා ඇත. ඊටපසුව උන්වහන්සේ මේ ගාම්භීර ප්‍රකාශනය කරන විට මුළු දේවදූත සේනාවම ඔවුන්ගේ ඔටුනු ඉවත් කරනවා ඇත. "අධර්මිෂ්ඨ තැනැත්තා මතුත් අධර්මිෂ්ඨකම් කරාවා. අපවිත්‍ර තැනැත්තා මතුත් අපවිත්‍ර කරනු ලබාවා. ධර්මිෂ්ඨ තැනැත්තා මතුත් ධර්මිෂ්ඨකම් කරාවා. ශුද්ධ තැනැත්තා මතුත් ශුද්ධ කරනු ලබාවා." (එළිදරව් 22:11). ජීවිතය හෝ මරණය උදෙසා සෑම කෙනෙක් ගැනම තීරණයක් ගෙන හමාරය. ක්‍රිස්තුස්වහන්සේ තමන්-වහන්සේගේ සෙනඟ උදෙසා සමගි කිරීම ඉටුකර ඔවුන්ගේ පාප මකා දමා ඉවරය. උන්වහන්සේගේ සේනාවේ ගණන තීරණය කර තිබේ. 'රාජ්‍යයද බලයද අහසින් යට තිබෙන රාජ්‍යයේ විශාලත්වයද' ගැළවීම උරුම කරගන්නාවූ අයට දෙනු ලබනවා ඇත; යේසුස්වහන්සේ රජවරුන්ගේ රජද ස්වාමිවරුන්ගේ ස්වාමින්වහන්සේද හැටියට රජකම් කරනවා ඇත.

උන්වහන්සේ ශුද්ධස්ථානයෙන් ඉවත්වන විට ලෝකවාසීන් අන්ධකාරයෙන් වැසී යනවා ඇත. ඒ භයානක කාලයේදී ධර්මිෂ්ඨයන්



ශුද්ධවූ දෙවියන්වහන්සේගේ ඇස් හමුයේ ජීවත්විය යුත්තේ මැදහත්-කාරයෙකු නොමැතිවය. දුෂ්ට අයවලුන් කෙරෙහි පැවති තහනම මෙවිට ඉවත් කරනු ලැබ තිබෙනවා ඇත. අවසානයේදී පසුතැවිලි නොවූ අය කෙරෙහි සම්පූර්ණ පාලන බලය සාතන්ට අයිති වෙනවා ඇත. දෙවියන්වහන්සේගේ බොහෝ කල් ඉවසීම දැන් හමාරය. ලෝකයා උන්වහන්සේගේ දයාව එපා කර, උන්වහන්සේගේ ප්‍රේමයට නිග්‍රහ කොට, උන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පාගා දමා තිබෙනවා ඇත. දුෂ්ටයන් ඒ සූදානම් කිරීමේ කාලයේ සීමාව පසුකර තිබේ. දිගටම එපා කරන ලද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔවුන් කෙරෙන් ඉවත් කරනු ලැබ තිබේ. දිව්‍ය දයාවේ රැකවරණය නොමැති වන ඔවුන්ට දුෂ්ටයාගෙන් ආරක්ෂාවක් නොමැත. එවිට සාතන් ලෝකවාසීන් මහා පීඩාවකට යොමු කරනවා ඇත. දෙවියන්වහන්සේගේ දූතයන් මනුෂ්‍යයන්ගේ දැඩි ආවේගයන් වන භයානක සුළං පාලනය නොකරන බැවින් ප්‍රචණ්ඩත්වය සෑම අන්දමින්ම නිදහසේ ක්‍රියාකරනවා ඇත. මුළු ලෝකයම යෙරුසලෙම මත පැමිණි විනාශයට වඩා භයානක විනාශයකට මැදි වෙනවා ඇත.

එක දූතයෙක් පමණක් මිසරයේ කුළුඳුල් දරුවන් විනාශ කරමින් දේශය විලාපයෙන් පිරවීය. දාවිත් දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව ක්‍රියා කරමින් සෙනඟ ගණන් කළාවූ අවස්ථාවේදී, ඒ වරදට දඬුවම් දීමක් වශයෙන් එක දූතයෙක් භයානක විනාශයක් කළේය. දෙවියන්වහන්සේගේ නියෝගය පරිදි විනාශකාරී ක්‍රියාවන්හි යෙදෙන්නාවූ දූතයන් මෙන්ම, උන්වහන්සේගෙන් අවසරයක් ලැබුණ විට, නපුරු දූතයන්ද එම ක්‍රියාවන්හි යෙදෙනවා ඇත. බලකායෝ දැන් සූදානම්ව සිටිති; දෙවියන්වහන්සේගේ අවසරය ලැබුණ විගසම ඔවුන් සෑමතැනම විනාශකාරී ක්‍රියාවන් කරනවා ඇත.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට ගරු කරන්නාවූ අය මේ ලෝකය මත විනිශ්චයන් පමුණුවා තිබෙන්නේ යයි ඔවුන්ට චෝදනා කරනු ලබනවා ඇත. සොබාදහමේ භයානක ක්‍රියාකාරිත්වයන්ටද, ලෝකය පීඩාවන්ගෙන් පුරවමින් මනුෂ්‍යයන් අතර පවතින ලේ වැගිරීම්වලටද හේතුව වන්නේ ඔවුන් යයි පවසනු ලබනවා ඇත. අවසාන අවවාදය ප්‍රකාශ කිරීමේදී ඇතිවන බලය දුෂ්ටයන් කෝපයට පත්කරයි. ඒ ව්‍යවස්ථාවන් පිළිබඳ පණිවිඩය පිළිගත්තාවූ සියල්ලන් කෙරෙහි ඔව්හු කෝපාකූල වෙති. සාතන් ද්වේෂ කිරීමේ හා පීඩා කිරීමේ ආත්මය වඩාත් ප්‍රබෝධමත් කරනවා ඇත.

දෙවියන්වහන්සේගේ පැවැත්ම යුදෙව් ජාතිය කෙරෙන් ඉවත් කරනු ලැබූ විට පූජකයන්ද ඒ යුදෙව් මනුෂ්‍යයන්ද ඒ බව දැන සිටියේ නැත.

සාතන්ගේ පාලනයට යටත්ව, ඉතාම භයානක ප්‍රචණ්ඩකාරී හැඟීම්වලින් පිරී සිටියද, ඔවුන් තවදුරටත් කල්පනා කළේ තමා දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟ බවය. දේවමාළිගයේ සේවය තවදුරටත් කරන ලදී. දූෂණය කරන ලද ඒ පූජාසන මත පූජා ඔප්පු කරන ලදී. දෙවියන්වහන්සේගේ ප්‍රේමවන්ත පුත්‍රයාණන්ගේ රුධිරය ගැන වරදකරුවන්ව, උන්වහන්සේගේ සේවකයන්ද ගෝලයන්ද මරා දැමීමට උත්සාහ කරමින් සිටියාවූ සෙනඟ මත දිව්‍ය ආශිර්වාද ඉල්ලා දිනපතාම යාච්ඤාවන් ඔප්පු කරන ලදී. එසේම, ශුද්ධස්ථානයේ ස්ථිර තීරණය ඉදිරිපත් කර ලෝකයේ ඉරණම සදහටම ස්ථිර කරනු ලබන විට ලෝකවාසීන් ඒ බව දැනගන්නේ නැත. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඉවත් කරනු ලැබුවාට පසුවද සෙනඟ නාමික ලෙස ආගම ඇදහීම කරගෙන යනවා ඇත. නපුරේ කුමාරයා ඔහුගේ භයංකාර සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී යොදවන උනන්දුව දෙවියන්- වහන්සේ ක්‍රියාවේ යොදවන්නාවූ උනන්දුවට සමාන වෙනවා ඇත.

ක්‍රිස්තියානි ලෝකය මුළුල්ලේම පවතින අරගලයට ප්‍රධාන හේතුව සබත් දවස වන බැවින්ද, ආගමික හා දේශපාලනික බලයන් එක්සත් වී ඉරිදා සබත් පැවැත්වීමට නියෝග නිකුත් කරන බැවින්ද, ඒ ජනප්‍රිය නියෝගයට අවනත නොවන්නාවූ කුඩා ජනකාය ජාත්‍යන්තර අපහාසයට යොමු කරනු ලබනවා ඇත. සභාවේ සංවිධානයකටද දේශයේ නීතියකටද විරුද්ධ වන්නාවූ අය ගැන ඉවසිලිවන්ත නොවිය යුතු යයි අවධානයෙන් යුක්තව පවසනු ලබනවා ඇත. මුළු ජාතියම නීති නිරෝධී භාවයට හා වියවුලට පත්වෙනවා වෙනුවට ඔවුන්ට පමණක් පීඩා කරනු ලැබීම සුදුසු යයි පවසනු ලබනවා ඇත. මනුෂ්‍යයන්ගේ නායකයන් වසර දෙදහසකට පමණ පෙර ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධව ඉදිරිපත් කළේද එම තර්කයමය. ප්‍රයෝගකාර කායාඵස් පැවසුවේ: "මුළු ජාතිය විනාශ නොවන පිණිස සෙනඟ උදෙසා එක මනුෂ්‍යයෙකුගේ මරණය" ප්‍රයෝජනවත් වන බවය. මේ තර්කය අවසාන තීරණය වෙනවා ඇත. සතරවන ආඥාව අනුව සබත් දවස පවත්වන අයට විරුද්ධව නියෝගයක් පවරමින්, ඔවුන්ට ඉතාම තද දඬුවමක් දෙනු ලැබිය යුතු යයි පවසනු ලබනවා ඇත. යම් කාලයකට පසුව, ඔවුන් මරා දැමීමට මනුෂ්‍යයන්ට අවසර දෙනු ලබනවා ඇත. පැරණි ලෝකයෙහිදී රෝම සභාව කළාක් මෙන් අනික් රටවල, සත්‍යයෙන් මුළාව ගිය ප්‍රොතැස්තන්ත සභාවන්ද දිව්‍ය ප්‍රතිපත්තිවලට ගරුකරන අයට මේ අන්දමට සලකනවා ඇත.

එවිට දෙවියන්වහන්සේගේ සෙනඟ 'යාකොබ්ගේ විපත්ති කාලය' යනුවෙන් අනාගතවක්තෘ හඳුන්වන විපත්ති කාලයට ඇතුල් වෙනවා ඇත. "ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක: වෙවුලවීමේ හඬක් අපට



ඇසුණේය. එය සාමදානයේ නොව භීතියේ හඬක්ය .... සියලු මුහුණු සුදුමැලිව තිබෙනවාත් මට පෙනෙන්නේ මක්නිසාද? අහෝ! ඒ දවස මහත්ය. ඊට සමානවූ දවසක් නැත. ඒක යාකොබ්ගේ විපත්ති කාලයය. එහෙත් ඔවුන් එයින් ගළවනු ලබනවා ඇත." (යෙරෙමියා 30:5-7).

ඒසව්ගේ හස්තයෙන් මුදනු ලබන පිණිස යාකොබ් රාත්‍රිය මුළුල්ලේ යාච්ඤාවේ යෙදී සිටියේය. මෙය පෙන්නුම් කරන්නේ පීඩා කාලයේදී දෙවියන්වහන්සේගේ සෙනඟට ඇතිවන අත්දැකීමය. ඒසව්ට දීමට අදහස් කරන ලද පියාගේ ආශිර්වාදය ලබාගැනීමට යාකොබ් රැවටිලිකාර ලෙස ක්‍රියාකළ බැවින්, ඔහුට තම ජීවිතය ගළවා ගන්නා පිණිස පලා යෑමට සිදුවූයේ තම සහෝදරයාගේ තර්ජන ගැන බියපත්වූ නිසාය. වසර කිහිපයක්ම තම දේශයෙන් පිටත සිටියාවූ ඔහු දෙවියන්වහන්සේගේ නියමය අනුව තම භාර්යාවන් හා දරුවන්ද එළු බැටළු රැළවල්ද සමග ගමනක් ආරම්භ කළේ ආපසු තමාගේ දේශයට යන පිණිසය. දේශයේ සීමාවට ආසන්න වූ විට ඔහු අතිශයින් බියපත් වූයේ ඒසව්, නොඅනුමානවම පළිගන්නා පිණිස, යුද්ධ භටයන් කාණ්ඩයක් සමග ඔවුන්ට ඉදිරි පසින් ගමන්කරමින් එන බවට ලැබුණාවූ ආරංචිය ගැනය. යාකොබ්ගේ සෙනඟ අවි ආයුධ හෝ ආරක්ෂාවක් නොමැතිව සිටි බැවින් ඔවුන් උපකාර රහිතව ඒ ප්‍රචණ්ඩකාරීත්වයට හා මරණයට ගොදුරු විය හැකි බව පෙනී ගියේය. කනස්සල්ලේ හා බියෙහි බරට එකතුවූ ඉමහත් බර වූයේ තමාවම වරදට පත්කරගැනීම අවශ්‍ය වීමය; කුමක්හෙයින්ද මේ අනතුර ඇතිවූයේ ඔහුගේම පාපය නිසාය. ඔහුට තිබුණාවූ එකම බලාපොරොත්තුව වූයේ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමය. ඔහුගේ එකම රැකවරණය වන්නට තිබුණේ යාච්ඤාවය. එහෙත් ඔහු තම සහෝදරයාට තමා කළ වරදට සමගි කිරීමක් ඉදිරිපත් කරමින් ඒ අන්තරාවේ තර්ජනය ඉවත් කරන පිණිස තමාට හැකි සියල්ල කළේය. ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නන්ද පීඩා විඳීමේ කාලයට ආසන්න වන විට, නිසි ආලෝකයකින් යුතුව මනුෂ්‍යයන් ඉදිරිපිට පෙනී සිටීමට ක්‍රියා කළ යුතුය. ඔවුන්ට විරුද්ධව පවතින අදහස් ඉවත් කිරීමටද, හෘදය සාක්ෂියේ නිදහසට විරුද්ධව ක්‍රියාකරන බවට ඇති තර්ජනය සමහන් කිරීමටද ඔවුන් ක්‍රියාත්මක විය යුතුය.

මේ පීඩාව නොදක්නා පිණිස යාකොබ් තමාගේ පවුල ඉදිරියට යවා තනිව සිටිමින් දෙවියන්වහන්සේට කන්නලව් කළේය. ඔහු තම පව් කියා දෙමින් තමාට දෙවියන්වහන්සේ දක්වූ දයානුකම්පාව ගැන කෘතඥ විය. ඒ සමගම ඔහු ඉතා යටහත්කමින්, දෙවියන්වහන්සේ තමාගේ පියවරුන් සමග කළාවූ ගිවිසුම සඳහන් කළේය. එසේම, ඔහු තම දේශයෙන් පිටවූ අවස්ථාවේ බෙතෙල්හිදී ඒ රාත්‍රි දර්ශනයෙන්

තමාට දෙනු ලැබූ පොරොන්දුද ඉදිරිපත් කළේය. ඔහුගේ ජීවිතය උග්‍ර අවස්ථාවකට පැමිණ තිබුණි. සෑම දෙයක්ම අන්තරා අභිමුඛයේ තිබෙන බවක් පෙනුණි. තනිව අන්ධකාරයේ සිටි ඔහු දෙවියන්වහන්සේ ඉදිරිපිට තමාව යටත් කරගනිමින් යාච්ඤා කරමින් සිටියේය. හදිසියේම එක් අතක් ඔහුගේ උරහිස මත තබනු ලැබීය. සතුරෙක් තමාගේ ජීවිතය නැති කරන්ට සොයනවා යයි සිතමින් ඔහු කනස්සල්ලට පත්ව මුළු ශක්තියෙන් යුක්තව මේ තැනැත්තා සමග පොර බැදුවේය. දින උදාවන්නට ආසන්නවූ විට මේ අමුත්තාණෝ තමාගේ උතුම් බලය දක්වූසේක. එතුමන්ගේ ස්පර්ශයෙන්ම යාකොබ් කොර විය. ඔහු උපකාර රහිතව බිම වැටුණි. ඔහු හඬමින් මේ පුදුමාකාර විරුද්ධකරුවාණන් වෙත යොමු විය. තමාට මේ පොරය ඇතිවූයේ ඒ ගිවිසුමේ දේවදූතයාණන් සමග බව යාකොබ් එවිට දැනගත්තේය. ආබාධිතව, අධික වේදනාවෙන් යුක්ත වුවද, ඔහු තමාගේ අභිප්‍රාය අත්හැරියේ නැත. ඔහු බොහෝ කාලයක්ම තමාගේ පාපය නිසා ඇතිවූ වියවුල, කණගාටුව හා කරදර දරාගත්තේය. දැන් තමාට කමාව දුන් බවට ස්ථිරතාවයක් ලබාගැනීම ඔහුගේ ආශාව විය. දිව්‍ය අමුත්තාණන් ඉවත්ව යන්ට සූදානම් වන බව ඔහුට පෙනුණි. නමුත් යාකොබ් ඒ දිව්‍ය තැනැත්තාණන්ට ඇලී සිටිමින් ආශිර්වාදයක් ඉල්ලා සිටියේය. දූතයාණන් පැවසුවේ මෙසේය: "පහන්වෙන බැවින් මා යන්ට හරින්න" නමුත් මේ පීතෘවරයා මෙසේ පැවසුවේය: "ඔබ මට ආශිර්වාද කළොත් මිස නැත්නම් යන්ට නොහරිමි." (උත්පත්ති 32:24-30) මෙහි දක්වෙන්නේ කොපමණ මහත් විශ්වාසයක්ද, ස්ථිරතාවයක් හා නොපසුබට වීර්යයක්ද! ඔහු පාරට්ටු කරගැනීමේ උඩඟු ප්‍රකාශනයක් කළේ නම් එවේලේම ඔහුව විනාශ කරනු ලැබීමට පුළුවන්කම තිබුණි; නමුත් ඔහු ඉදිරිපත් කළේ තමාගේ දුර්වලකම හා නුසුදුසුකම කියාදෙන්නාවූ ස්ථිරතාවයක්ය. ඒ සමගම ඔහු තමාගේ ගිවිසුම පවත්වන්නාවූ දෙවියන්වහන්සේගේ දයාව කෙරෙහි තමා තුළ ඇති විශ්වාසය දක්වීය.

"ඔහු දේවදූතයා කෙරෙහි බලපාමින් ජයගත්තේය." (හොෂෙයා 12:4) යටහත්කමින්, පසුතැවිලි වීමෙන් හා කැපවීමෙන් යුක්තව, මේ පව්කාර මනුෂ්‍යයා ස්වර්ගීය රාජකීයත්වය සමග ජය ගත්තේය. ඔහු තමාගේ වෙවුලන හස්තයෙන් දෙවියන්වහන්සේ දුන්නාවූ පොරොන්දු අල්ලා ගත්තේය. අසීමිත ප්‍රේමයෙන් යුක්ත හදවත මේ පව්කාරයාගේ බැගෑපත් ඉල්ලීම ඉවත දැමීමට කැමති වූයේ නැත. ඔහුගේ ජයග්‍රහණයේ සාක්ෂියක් වශයෙන්ද, ඔහුගේ ආදර්ශය අනුගමනය කිරීමට අන්‍යයන්ට දිරි දීමක් වන පිණිසද, ඔහුගේ නාමය වෙනස් කරන ලදී. ඔහුගේ නාමය වනාහි ඔහුගේ පාපය මතක් කරදීමක් විය. එය වෙනස්කර



දැන් ඔහුට දෙනු ලැබූ නාමය වනාහි ඔහුගේ ජයග්‍රහණය සිහිකර දීමක් විය. යාකොබ් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ජයග්‍රාහක වීමෙන් පෙන්නුම් කරනු ලැබුවේ ඔහු මනුෂ්‍යයන් සමගද ජයග්‍රාහක වන බවය. දැන් ඔහු තවදුරටත් තම සහෝදරයාගේ කෝපයට මුහුණ දීමට බියවූයේ නැත; කුමක්හෙයින්ද ස්වාමින්වහන්සේ තමා ආරක්ෂා කරන බව ඔහු දැනගත්තේය.

සාතන් දෙවියන්වහන්සේගේ දූතයන් ඉදිරිපිට යාකොබ්ට වරද තබමින් ඔහුගේ පාපයන් නිසා ඔහු විනාශ කිරීමට අයිතියක් තමාට ඇතැයි කියා සිටියේය. ඔහුට විරුද්ධව ක්‍රියා කිරීමට ඔහු ඒසව්ව පොළඹවා තිබුණි. ඔහු දිගු රාත්‍රියක් පොරබැදූ ඒ අවස්ථාවේදී, ඔහු අධෛර්යයට පත්කරමින් වරදකාරකමේ හැඟීමක් ඔහු තුළ වර්ධනය කිරීමට සාතන් උත්සාහ කළේය. යකොබ් මහත් කනස්සල්ලට පත්විය. ස්වර්ගයේ උපකාර නොමැති නම් තමා මරණයට පත්වන බව ඔහු දැන සිටියේය. ඔහු තමාගේ මහත් පාපය ගැන අවංක ලෙසම පසුතැවිලි වී දෙවියන්වහන්සේගේ දයාව ඉල්වා තිබුණි. ඔහු තම අදහස අත්හැර නොදමා දේවදූතයාව තදින් අල්ලාගෙන වේදනාත්මක හැඬීමකින් යුක්තව මහත් උනන්දුවෙන් තමාගේ ඉල්ලීම් ඉදිරිපත් කළේ ජය අත්පත් වන තුරුය.

යාකොබ්ට විරුද්ධව ඉදිරිපත් වීමට සාතන් ඒසව්ව පෙළඹුවාක් මෙන්ම, ඒ පීඩා කාලයේදී දෙවියන්වහන්සේගේ දරුවන් විනාශ කිරීමටද ඔහු දුෂ්ඨ මනුෂ්‍යයන් පොළඹවනවා ඇත. ඔහු යාකොබ්ට වරද තැබූ අන්දමටම දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට විරුද්ධවද චෝදනාවන් එල්ල කරනවා ඇත. ලෝකය තමාගේ අයිතිය යයි ඔහු සලකයි. නමුත් දෙවියන්වහන්සේගේ ආඥාවන් පවත්වන ඒ කුඩා කාණ්ඩය ඔහුගේ නායකත්වයට විරුද්ධව සිටියි. ඔවුන්ව ලෝකයෙන් තුරන් කිරීමට ඔහුට පුළුවන් නම් ඔහුගේ ජයග්‍රහණය සම්පූර්ණ යයි ඔහු කල්පනා කරයි. ශුද්ධවූ දූතයන් ඔවුන්ව රැකවරණය කරන බවද, ඔවුන්ගේ පාපවලට කමාව දී තිබෙන බවද ඔහු දකියි. නමුත් ස්වර්ගයේ ශුද්ධස්ථානයේදී ඔවුන් පිළිබඳ තීරණයන් ගෙන තිබෙන බව ඔහු දන්නේ නැත. තමා ඔවුන් ලවා කරවීමට උත්සාහ කළ පාපයන් ගැන ඔහු හොඳාකාරව දනියි. ඒවා විශාල කර දක්වන ආලෝකයකින් ඔහු මේ පාපයන් දෙවියන්වහන්සේට ඉදිරිපත් කරන්නේ තමා මෙන්ම ඔවුන්ද දෙවියන්වහන්සේගේ දයාවෙන් ඉවත් කරනු ලැබිය යුතු බව දක්වමිනි. දෙවියන්වහන්සේ ඔවුන්ගේ පාපවලට කමාව දෙමින් තමාවද තමාගේ දූතයන්වද විනාශ කිරීම සාධාරණ නැතැයි ඔහු දක්වයි. ඔවුන් තමාගේ ගොදුර වූ බව පවසමින් ඔවුන් විනාශ කරන පිණිස ඔවුන් තමාගේ හස්තයට භාර දිය යුතු යයි ඔහු තදින්ම පවසයි.

සාතන් දෙවියන්වහන්සේගේ දරුවන්ගේ පාපයන් ගැන ඔවුන්ට චෝදනා කරන අතර, ඔවුන් තදින්ම සෝදිසි කිරීමට දෙවියන්වහන්සේ ඔහුට අවසර දෙන සේක. දෙවියන්වහන්සේ කෙරෙහි ඔවුන් තුළ ඇති විශ්වාසයද, ඔවුන්ගේ ඇදහිල්ල හා ස්ථිරතාවයද තදින්ම සෝදිසි කරනු ලබනවා ඇත. තමාගේ අතීතය ගැන කල්පනා කරන අතර ඔවුන්ගේ බලාපොරොත්තුව ගිලී යයි. කුමක්හෙයින්ද තමාගේ ජීවිතවල වැඩි යහපතක් නොමැති බව ඔවුන්ට පෙනී යයි. තමාගේ දුර්වලකම් ගැන හා නුසුදුසු භාවය ගැන ඔවුන්ට හොඳ වැටහීමක් ඇතිවෙයි. ඔවුන්ගේ තත්ත්වය අනුව ඔවුන්ට බලාපොරොත්තුවක් නැති බවද ඔවුන්ගේ අපවිත්‍රතාවයේ කැළල කිසිවිටෙක ඉවත් කරනු නොලබන බවද ඔවුන්ගේ කල්පනාවට යොමු කරමින් ඔවුන් බිය ගැන්වීමට සාතන් උත්සාහ කරයි. ඔවුන් පරික්ෂාවන්ට අසුවී දෙවියන්වහන්සේට ඇති පක්ෂපාතකම අත්හැර දමන පිණිස ඔවුන්ගේ ඇදහිල්ල විනාශ කිරීමට ඔහු උත්සාහ කරයි.

දෙවියන්වහන්සේගේ දරුවන් විනාශ කිරීමට තීරණය කරගත් සතුරන්ගෙන් ඔවුන් වට කරනු ලබන නමුත්, ඔවුන්ට සිත් වේදනාව ඇතිවන්නේ සත්‍යය උදෙසා පීඩා විඳින්ට සිදුවීම ගැන ඇතිවන භය නිසා නොවේ. ඔවුන්ට භය ඇතිවන්නේ ඔවුන් තමාගේ සෑම පාපයක් ගැනම නිසි ලෙස පසුතැවිලි වී නැති නිසා ගැළවුම්කාරයාණන් වහන්සේගේ පොරොන්දුව ඔවුන් උදෙසා සම්පූර්ණ නොවෙනවා ඇත යන්න ගැනය. ඒ පොරොන්දුව මෙසේය: "මුළු ලෝකය පිටට පැමිණෙන්ට තිබෙන්නාවූ පරික්ෂාවේ පැයෙන් මමත් නුඹ ආරක්ෂා කරන්නෙමි" යන්නය. (එළිදරව් 3:10). ඔවුන්ට පාප කමාව ගැන ස්ථිරත්වයක් තිබෙන්නේ නම් පීඩා කරනු ලැබීම හා මරණය ගැන ඔවුන් පසුබට වන්නේ නැත. නමුත් ඔවුන් නුසුදුස්සන් බව ඔප්පුවී, ඔවුන්ගේම චරිතවල අඩුපාඩු නිසා ඔවුන්ගේ ජීවිත නැති වන්නේ නම් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ නාමයට එය අපහාසයක් වෙනවා ඇත.

සෑම පැත්තෙන්ම ඔවුන්ට දර්ශනය කළ හැක්කේ ද්‍රෝහි ක්‍රියාවන්ට උගුල් ඇටවීම හා ක්‍රියාත්මක කැරලි ගැසීමය. එවිට ඔවුන් තුළ පුබුදුවනු ලබන්නේ, සත්‍යයෙන් ඈත්වීම නැවතී දුෂ්ඨයන්ගේ නපුරු ක්‍රියාවන් නවත්වනු ලැබීම ගැන ඉමහත් ආශාවක්ය, ආත්මයේ උනන්දු උවමනාවක්ය. නමුත් කැරලි ගැසීමේ වැඩ නවත්වන ලෙස ඔවුන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින විටම ඔව්හු නපුරේ ගැලීම නවතාලීමටද, එයට විරුද්ධව සිටීමටද තමාට නුපුළුවන්වීම ගැන තමාටම දොස් පවරා ගනිති. තමන්ගේ සියලු හැකියාවන් ක්‍රිසතුස්-වහන්සේගේ සේවය සඳහා යොදවමින් ශක්තිමත් ලෙස ක්‍රියාකර



තිබුණේ නම්, ඔවුන්ට විරුද්ධව සිටීමට සාතන්ගේ බලකායට එපමණ බලය නොතිබෙනවා ඇතැයි ඔව්හු කල්පනා කරති.

ඔව්හු දෙවියන්වහන්සේ ඉදිරිපිට තමාගේ ආත්මයන්ට පීඩා කරගනිමින්, අතීතයේදී තමා කළාවූ අනේක පාපයන් ගැන තමා පසුතැවිලි වූ බව පෙන්වා දෙමින් ගැළවුම්කාරයාණන්වහන්සේගේ මේ පොරොන්දුව පෙන්නුම් කරති: "ඔහු මාගේ ශක්තිය අල්වා ගෙන මා සමග සමාදාන වේවා. එසේය, ඔහු මා සමග සමාදාන වේවා." (යෙසායා 27:5). ඔවුන්ගේ යාච්ඤාවලට ක්ෂණික පිළිතුරු නොලැබෙන බැවින් ඔවුන්ගේ ඇදහිල්ල නැතිවන්නේ නැත. ඉතාම තද කනස්සල්ලෙන්, බියෙන් හා සිත් තැවුලෙන් පීඩා විඳින නමුත් ඔවුන් තමාගේ මැදහත්වීමේ යාච්ඤාවන් නවත්වන්නේ නැත. යාකොබ් දේවදූතයාව අල්වා ගත්තාක් මෙන් ඔව්හු දෙවියන්වහන්සේගේ ශක්තිය අල්වා ගනිති; ඔවුන්ගේ ආත්මවල භාෂාව මෙසේ වන්නේය: "ඔබ මට ආශිර්වාද කළොත් මිස නැත්නම් යන්ට නොහරිමි" යන්නය.

යාකොබ්, වංචාවෙන් කුළුඳුල්කමේ ආශිර්වාදය ලබාගැනීමේ පාපය ගැන පළමුවෙන්ම පසුතැවිලි වී නොතිබුණේ නම් දෙවියන්වහන්සේ ඔහුගේ යාච්ඤාව අසා දයාන්විත ලෙස ඔහුගේ ජීවිතය ආරක්ෂා කර නොදෙනවා ඇත. එසේම, පීඩා කාලයේදී බියෙන් හා වේදනාවෙන් පසුවන දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් තුළ, කියාදී අත් නොහැරිය පාප තිබෙන්නේ නම් ඔවුන් වැටී යනවා ඇත; බලාපොරොත්තුව නැතිවීමෙන් ඔවුන්ගේ ඇදහිල්ල නැතිවී ගොස් තමා මුදාලන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමට ඔවුන් තුළ ස්ථිර විශ්වාසයක් නොපවතිනවා ඇත. නමුත් තමාගේ නොවටිනාකම ගැන ගැඹුරු හැඟීමක් තිබෙන අතර ඔවුන් තුළ ප්‍රකාශ කළ යුතු සඟවන ලද පාප නොතිබෙනවා ඇත. මීට පෙර, ඔවුන්ගේ පාප විනිශ්චයට ඉදිරිපත් කර මකා දමනු ලැබ තිබේ; ඒවා නැවත මතක් කරගැනීමට ඔවුන්ට නුපුළුවන.

ජීවිතයේ සුළු කාරණාවලදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ අවිශ්වාසවන්තකම නොතකා හරිනවා යයි විශ්වාස කිරීමට සාතන් බොහෝ අයට මගපෙන්වයි. නමුත් ස්වාමින්වහන්සේ යාකොබ් පිළිබඳව ක්‍රියාකළාවූ අන්දමින් අපට පෙනී යන්නේ උන්වහන්සේ කිසිසේත් නපුර සම්මත කරන්නේ හෝ එය නොතකා හරින්නේ නැති බවය. තමාගේ පාප ගැන සමාවට කරුණු ඉදිරිපත් කරමින් නැතහොත් ඒවා සඟවා ගනිමින්, ඒවා ස්වර්ගීය පොත්වල සටහන්වී, ඒ පාප කියා නොදී කමාව ඉල්ලා නොගෙන තිබෙන්නේ නම් සාතන් ඔවුන් යටපත් කරනවා ඇත. ඔවුන්ගේ වෘත්තියද ඔවුන්ට ඇත්තාවූ තනතුරද

උසස්වූ තරමට ඔවුන්ගේ තත්ත්වය දෙවියන්වහන්සේ ඉදිරිපිට වඩාත් කණගාටුදායක වෙනවා ඇත; එවිට සතුරාට ඔවුන් කෙරෙහි ඇති ජයග්‍රහණයද වඩාත් ස්ථිර වෙනවා ඇත. දෙවියන්වහන්සේගේ දවස සඳහා සූදානම්වීම ප්‍රමාද කරන්නාවූ අයට ඒ පීඩා කාලයේදී හෝ වෙනත් කාලයකදී එය කිරීමට නුපුළුවන; එබඳු අයගේ තත්ත්වය කණගාටුදායකය.

සූදානම් රහිතව ඒ භයානක පීඩා කාලයට මුහුණ දෙන්නාවූ නාමික ක්‍රිස්තු භක්තිකයන් මහත් කණගාටුවෙන් යුතුව, ඉමහත් වේදනාවෙන් යුත් වචන වලින් ඔවුන්ගේ පාප කියා දෙනවා ඇත; එවිට දුෂ්ඨයන් ඔවුන්ගේ කණගාටුව ගැන ප්‍රීතිවෙනවා ඇත. මේ කාලයේදී පව් කියාදීම ඒසව්ගේ හා යූදස්ගේ පව් කියාදීමට සමානය. ඔවුන් කණගාටු වන්නේ ඒ වැරදි ක්‍රියාවන් ගැන නොව ඒවායින් ඇතිවූ ප්‍රතිඵල ගැනය. ඔවුන් තුළ සැබෑ පසුතැවිලි වීමක් හෝ නපුරට ද්වේෂ කිරීමක් නොපවතියි. තමාට ලැබෙන දඬුවම ගැන බියෙන් ඔව්හු තමාගේ පාප පිළිගනිති. නමුත් පැරණි ඵාරාවෝ මෙන් ඔවුන්ද ඒ විනිශ්චයන් ඉවත් කරනු ලබන්නේ නම් නැවතත් ස්වර්ගයට විරුද්ධව ක්‍රියාකරනවා ඇත.

යකොබ්ගේ ඉතිහාසයෙන් අපට ඇත්තාවූ තවත් ස්ථිරතාවයක් නම්, රවටනු ලැබ, පරීක්ෂාවට අසුවී පාපයට වැටුණාවූ අය සැබෑ පසුතැවිල්ලෙන් ආපසු දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නේ නම් උන්වහන්සේ ඔවුන් එපා නොකරන බවය. මේ අයවලුන් විනාශ කිරීමට සාතන් උත්සාහ කරන අතර, පීඩාවන් ඇති අවස්ථාවන්හිදී ඔවුන් සනසමින් ඔවුන් රැකවරණය කරන පිණිස දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දූතයන් එවනවා ඇත. සාතන්ගේ පහරවල් භයංකාරය, තීරණාත්මකය, ඔහුගේ රැවටිලිකාරකම් භයානකය; නමුත් ස්වාමීන්-වහන්සේගේ නෙත් තමන්වහන්සේගේ සෙනඟ වෙත යොමුවී තිබේ; උන්වහන්සේගේ සවනට ඔවුන්ගේ හඬ ඇසෙයි. ඔවුන්ට ඇති පීඩාව මහත්ය; ගිනි මැලයේ ගිනි දළු ඔවුන් විනාශ කරන්ට යන බවක් පෙනෙයි. නමුත් ඔවුන් පවිත්‍ර කරන්නාවූ තැනැන්වහන්සේ ඔවුන්ව ගින්නෙන් පවිත්‍ර කරන ලද රත්රන්වල තත්ත්වයට පමුණුවනවා ඇත. පීඩා කාලයේදී දෙවියන්වහන්සේ තම දරුවන්ට දක්වන ප්‍රේමය, සෞභාග්‍යමත් කාලයේදී උන්වහන්සේ ඔවුන්ට දක්වූ ප්‍රේමය තරමටම ශක්තිමත්ව මෘදුව පවතිනවා ඇත. නමුත් ඔවුන් ගිනි උදුනට යොමු කරනු ලැබිය යුතුය; ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපය සම්පූර්ණ ලෙස ඔවුන් තුළින් පිළිබිඹු වන පිණිස ඔවුන්ගේ ලෞකික භාවය නැති කර දමනු ලැබිය යුතුය.



අප ඉදිරිපිට තිබෙන්නාවූ පීඩාවේ හා වේදනාවේ කාලයට මුහුණ දෙන පිණිස අප තුළ තිබිය යුත්තේ විඩාවද, ප්‍රමාදයද, සාගින්නද දරාගැනීමට පුළුවන් ඇදහිල්ලක්ය; ඉමහත් පරීක්ෂාවන්ට මුහුණ දෙන්ට සිදුවුවද මැලවී නොයන්නාවූ ඇදහිල්ලක්ය. මේ කාලයට සූදානම් වන පිණිස සියලු දෙනාටම සෝදිසි කිරීමේ කාලයක් දෙනු ලැබේ. යාකොබ් ජයාන්විත වූයේ ඔහු මහත් උත්සාහයෙන් හා තීරණාත්මක භාවයෙන් ක්‍රියා කළ නිසාය. ඔහුගේ ජයග්‍රහණයෙන් පෙනී යන්නේ නොකඩවා යාච්ඤා කිරීමේ ඇති බලයය. යාකොබ් මෙන් දෙවියන්-වහන්සේගේ පොරොන්දු පිළිගෙන, ඔහු මෙන් උනන්දුවෙන් නොපසුබට වීර්යයෙන් යාච්ඤා කරන අය ඔහු මෙන්ම සාර්ථක වෙනවා ඇත. ආත්මාර්ථය අත්හැරීමට අකමැතිව, උනන්දුවෙන් හා දීර්ඝ යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී සිටීමට කැමති නොවන්නාවූ අයට ඒ සඵලත්වය නොලැබෙනවා ඇත. දෙවියන්වහන්සේ සමග පොර බැදීම යනු කුමක්දැයි දන්නේ කීදෙනෙක්ද? සෑම බලයක්ම ක්‍රියාත්මක වන තුරු මහත් ආශාවෙන් තමාගේ ආත්මයන් දෙවියන්වහන්සේට යොමු කරන්නේ කොපමණ ස්වල්ප දෙනෙක්ද. භාෂාවෙන් විස්තර කළ නොහැකි කණගාටුවේ රළ ගලා එන විට දෙවියන්වහන්සේගේ පොරොන්දු වලට ස්ථිර ඇදහිල්ලෙන් එල්බ ගෙන සිටින්නේ කොපමණ ස්වල්ප දෙනෙක්ද.

දැන් වැඩි ඇදහිල්ලක් ක්‍රියාත්මක නොකරන්නාවූ අය සාතන්ගේ රැවටිලිකාරකම්වලට අසුවෙමින් යම් ප්‍රමාණයකට හෘදය සාක්ෂියට බලකරනු ලැබීමේ මහත් අන්තරාවට අසුවන්නට පුළුවන. ඔවුන් සෝදිසිය දරාගන්නේ වුවද, පීඩා කාලයේදී ඔවුන් වඩා මහත් කනස්සල්ලට හා පීඩාවන්ට අසුවන්නට පුළුවන; ඊට හේතුව ඔවුන් දෙවියන්වහන්සේව විශ්වාස කිරීම තමාගේ පුරුද්දක් කර නොගැනීමය. ඔවුන් විසින් අතපසු කරන්ට යෙදුණාවූ ඇදහිල්ලේ පාඩම් ඉගෙනගැනීමට ඔවුන්ට සිදුවන්නේ අධෛර්යමත් වීමේ මහත් පීඩනය පවතින විටය.

අප විසින් දැන් දෙවියන්වහන්සේගේ පොරොන්දුවල ඔප්පු සාක්ෂි ලබාගනිමින් උන්වහන්සේව හොඳින් හඳුනාගත යුතුය. දේවදූතයෝ සෑම අවංක උනන්දු යාච්ඤාවක්ම සටහන් කරති. දෙවියන්වහන්සේ සමග සබඳතාවය පැවැත්වීම අතපසු කරනවා වෙනුවට අප විසින් කළ යුත්තේ ආත්මාර්ථයේ ආශාවන් සපුරාගැනීම අත්හැරීමය. උන්වහන්සේගේ අනුමැතිය ඇතිව මුහුණ දෙන ගැඹුරුම දුගී භාවයද ආත්මාර්ථ ආශාවන් එපා කිරීමද උන්වහන්සේ නොමැතිව ලබාගන්නා ධනයට, ගෞරවයට, මිත්‍රත්වයන්ට හා පහසුවට වඩා හොඳය. අප විසින් යාච්ඤා කිරීමට කාලය ගැනීම ඉතාම අවශ්‍යය. අපි ලෝකයේ කාරණාවලින් අපගේ සිත් පිරී යාමට ඉඩ දෙමු නම්, දෙවියන්වහන්සේ

අප රූපයන් කරගන්නාවූ රත්රන්ද, ගෙවල්ද, සාරවත් බිම් කොටස්ද ඉවත් කරමින් අපට යාච්ඤාව සඳහා කාලය ලබාදෙනවා ඇත.

දෙවියන්වහන්සේගේ ආශිර්වාද ඉල්ලා සිටීමට පුළුවන් මාවත්වලට පමණක් ඇතුල්වීමට යෞවනයන් තෝරා ගන්නෝ නම් ඔවුන් පාපයට පහසුවෙන් පොළඹවනු ලබන්නේ නැත. ලෝකයට ඒ අවසාන ගාම්භීර පණිවිඩය ගෙනයන්නාවූ අය සීතල ලෙස හෝ නොසැලකිලිමත් ලෙස හෝ අලස ලෙස නොව, යාකොබ් මෙන් ඇදහිල්ලෙන් යුත් උනන්දුවෙන් දෙවියන්වහන්සේගේ ආශිර්වාද ඉල්ලා යාච්ඤා කරන්නේ නම් "මම මුහුණට මුහුණලා දෙවියන්වහන්සේ දුටිමි, එහෙත් මාගේ ප්‍රාණය ඉතුරුවීය" යි ඔවුන්ට බොහෝ ස්ථානවලදී කියන්ට පුළුවන් වෙනවා ඇත. ස්වර්ගය ඔවුන් ගණන් ගන්ට යන්නේ දෙවියන්වහන්සේ සමගද මනුෂ්‍යයන් සමගද ජයග්‍රාහක වන්නාවූ කුමාරයන් හැටියටය.

මීට පෙර කිසිකෙලක නොතිබුණාවූ අන්දමේ කාලයක් වන 'ඒ පීඩා කාලය' ඉක්මණින්ම අප ඉදිරිපිට විවෘත වෙනවා ඇත. අපට දන් නොමැත්තාවූද, ලබාගැනීමට බොහෝ දෙනා නොසැලකිලිමත් වන්නාවූද අත්දකීමක් අපට උවමනා වෙයි. කරදර මහත් වන්නේ ඒවායේ නියම තත්ත්වය නිසා නොව, ඒවා පැමිණෙන බව දනගෙන ඒවා ගැන බියෙන් පසුවන විටය. නමුත් අප ඉදිරිපිටට පැමිණෙන්ට යන ඒ පීඩා කාලය පිළිබඳ තත්ත්වය මෙසේ නොවේ. ඉතාම පැහැදිලි ප්‍රකාශනයකින් පවා එහි පරිමාණය ඉදිරිපත් කරනු ලැබීමට නුපුළුවන. පීඩා කාලයේදී සෑම පුද්ගලයාම දෙවියන්වහන්සේ ඉදිරිපිට තමාගේ ජීවිතය ගැන පුද්ගලික ලෙස ගණන් දිය යුතුය. "නෝවාද දානියෙල්ද යෝබ්ද එහි සිටියත්, මා ජීවමාන බව සැබෑවා සේම, ඔවුන් පුත්‍රයෙක්වත් දුවෙක්වත් ගළවා ගන්නේ නැත; ඔවුන් තමුන්ගේ ධර්මිෂ්ඨකමින් ස්වකීය ප්‍රාණය පමණක් ගළවාගන්නවා ඇතැයි ස්වාමිවූ දෙවියන්-වහන්සේ කියන සේක." (එසකියෙල් 14:20)

දන් අපගේ උතුම් උත්තම පූජකයාණන් අප උදෙසා සමගිකමක් කරන අතර අප විසින් ක්‍රිස්තුස්වහන්සේ තුළ සම්පූර්ණත්වයට පැමිණිය යුතුය. සිතුවිල්ලකින් පමණවත් අපගේ ගැළවුම්කාරයාණන්-වහන්සේව පරික්ෂාවේ බලයට යටත් කරනු ලැබීමට පුළුවන් වූයේ නැත. සාතන් මනුෂ්‍ය සිත් තුළට ඇතුල්වීමට පුළුවන්කම ලබාදෙන මාර්ගයක් සොයා ගනියි. යම් පාපතර ආශාවක් අගය කරනු ලැබූ විට සාතන් එමගින් ඔහුගේ පරික්ෂාවන්ගේ බලය ක්‍රියාත්මක කරයි. නමුත් ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේ ගැන මෙසේ පැවසූ සේක: "ලෝකයේ අධිපතියා එන්නේය. නුමුත් ඔහුට මා තුළ කිසිවක් නැත." (යොහන් 14:30) සාතන්ට දේව පුත්‍රයාණන් තුළ, තමාට ජයග්‍රහණය



ලබාදෙන කිසිවක් සොයා ගැනීමට නුපුළුවන් විය. උන්වහන්සේ තමන් පියාණන්වහන්සේගේ ආඥාවන් පැවැත්වූ සේක. උන්වහන්සේව අල්ලා ගැනීමට උපකාරයක් වන කිසි පාපයක් උන්වහන්සේ තුළ සොයා ගැනීමට සාතන්ට නුපුළුවන් විය. පීඩා කාලයේදී ස්ථිරව සිටින්නාවූ අයවලුන් තුළද මේ තත්ත්වය පැවතිය යුතුය.

ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ රුධිරය කෙරෙහි ඇදහිල්ල ඇතිව සිටිමින් අප විසින් මේ ජීවිත කාලයේදී, පාපය අප කෙරෙන් ඉවත් කරගත යුතුය. අපගේ ඉතා වටිනා ගැළවුම්කාරයාණන්වහන්සේ අපට ආරාධනා කරන්නේ උන්වහන්සේට සම්බන්ධ වීමටය, අපගේ දුර්වලකම උන්වහන්සේගේ ශක්තියට සම්බන්ධ කිරීමටය, අපගේ නොදන්නාකම උන්වහන්සේගේ ප්‍රඥාවට සම්බන්ධ කිරීමටය, අපගේ නොවටිනාකම උන්වහන්සේගේ කුසලතාවයට සම්බන්ධ කිරීමටය. දෙවියන්වහන්සේගේ සැපයුම නමැති පාසැලේදී අප විසින් යේසුස්වහන්සේගේ මුදු මොළොක් භාවය හා යටහත්කම ගැන ඉගෙනගත යුතුය. ස්වාමින්වහන්සේ සෑමවිටම අප ඉදිරිපිට තබන්නේ අප විසින් තෝරා ගන්නට යෙදෙන්නාවූද, වඩා පහසු, වඩා ප්‍රසන්න මාර්ගයක් ලෙස අපට පෙනෙන්නාවූද මාර්ගය නොවේ; උන්වහන්සේ අපට දක්වන්නේ ජීවිතයේ සැබෑ අභිප්‍රායන්ය. අපගේ චරිතයන් දිව්‍ය සැලැස්ම අනුව හැඩගස්වා ගැනීමට ස්වර්ගය පාවිච්චි කරන උපක්‍රමයන් හා එක්සත්ව ක්‍රියාකිරීම අප විසින් කළ යුතු කොටසය. කිසිවෙක් මේ වැඩය අතපසු නොකළ යුතුය; කුමක්හෙයින්ද එය අතපසු කිරීමෙන් ඔවුන්ගේ ආත්ම ඉතා භයානක විනාශයකට යොමු කරනු ලබනවා ඇත.

අපෝස්තුළු යොහන් තුමාට ස්වර්ගයෙන්වූ මහත් හඬක් මෙසේ පවසනවා ඇසුණේය: "ගොඩටත් මුහුදටත් දුක්වේ! මක්නිසාද යක්ෂයා තමාට ඇත්තේ ස්වල්ප කාලයක් බව දන්න බැවින්, මහත් උදහසින් යුක්තව නුඹලා වෙතට බැස ගියේය." (එළිදරව් 12:12) ස්වර්ගීය හඬින් මේ ප්‍රකාශනය කරනු ලබන්නේ භයානක දර්ශන ඇතිවන බැවිනි. සාතන්ගේ කාලය කෙටි වන විට ඔහුගේ උදහස වැඩිවෙයි; ඔහුගේ රැවටීමේ හා විනාශ කිරීමේ වැඩය පීඩා කිරීමේ කාලයේදී ඉතා උග්‍ර තත්ත්වයකට පැමිණෙයි.

සාමාන්‍යයෙන් නොපවතින අන්දමේ භයානක දර්ශන අහසේ පෙනෙන්නට යෙදෙනවා ඇත; ඒ හාස්කම් කිරීමට යක්ෂයන්ට ඇත්තාවූ බලයෙන්ය. යක්ෂයන්ගේ ආත්මයන් ලෝකයේ රජවරුන් වෙතටද මුළු ලෝකයටද යමින් තමාගේ රැවටිලිකාරකම්වලට ඔවුන්ද බැඳ ගනිමින් ස්වර්ගීය ආණ්ඩුවට විරුද්ධව සාතන් කරගෙන යන්නාවූ පොරයේදී

ඔහු හා එක්සත්වීමට ඔවුන්ට කියා සිටිනවා ඇත. මේ ක්‍රියාකාරකයන් මගින් ආණ්ඩුකාරයෝද යටත් වැසියෝද එකසේ රවටනු ලබන්නෝය. සමහර මනුෂ්‍යයන් තමා ක්‍රිස්තුස්වහන්සේ යයි පෙන්නුම් කරමින් ලෝකයේ මිදුම්කාරයාණන්ට අයිති නාමයට හා නමස්කාරයට අයිතිවාසිකම් කියනවා ඇත. ඔවුන් පුදුමාකාර ලෙස රෝගීන් සුව කරමින් ශුද්ධ ලියවිල්ලේ සාක්ෂියට විරුද්ධ වන්නාවූ දේවල් පිළිබඳ දර්ශන තමාට ලැබුණේ යයි කියනවා ඇත.

මේ රැවටිලිකාරකමේ නාට්‍යයෙහි ප්‍රමුඛ ක්‍රියාව වශයෙන් සාතන්ම ක්‍රිස්තුස්වහන්සේ හැටියට පෙනී සිටිනවා ඇත. සභාව ඉතා ආශාවෙන් බලා සිටින්නේ තමාගේ බලාපොරොත්තුවේ සම්පූර්ණවීම වශයෙන් අපගේ ගැළවුම්කාරයාණන්වහන්සේ මේ ලෝකයට පැමිණීම ගැනය. එවිට මේ මහත් රැවටිලිකාරයා දක්වන්ට යන්නේ යේසුස්වහන්සේ පැමිණ සිටින බවය. ලෝකයේ නා නා දිශාවන්හිදී සාතන් එළිදරව් පොතේ කියා තිබෙන අන්දමටම රාජකීයත්වයෙන් යුක්තවූ, දීප්තියෙන් දිළිසෙන්නාවූ තැනැත්තෙක් හැටියට (එළිදරව් 1:13-15) පෙනී සිටිනවා ඇත. ඔහු අවට පවතින තේජස මනුෂ්‍ය නෙත්වලින් දර්ශනය කර ඇත්තාවූ මොනම දෙයකට වුවද වඩා වැඩි වෙනවා ඇත. "ක්‍රිස්තුස්වහන්සේ පැමිණිසේක! ක්‍රිස්තුස්වහන්සේ පැමිණිසේක!" යන ජයාන්විත හඬ ගුවන පුරා පැතිරී යනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ මෙලොව සිටියදී තමන්වහන්සේගේ ගෝලයන්ට ආශිර්වාද කළාවූ අන්දමට ඔහු අත් ඔසවා මනුෂ්‍යයන් මත ආශිර්වාදයක් පවසනවා ඇත; එවිට මනුෂ්‍යයන් ඔහුට නමස්කාර කරමින් ඔහු ඉදිරිපිට වැඳ වැටෙනවා ඇත. ඔහුගේ හඬ මෑදුව යටහත්ව තිබෙන අතරම එය ගීත රාවයකින් පූර්ණව තිබෙනවා ඇත. සානුකම්පික මෘදු හඬකින් යුක්තව ඔහු ගැළවුම්කාරයාණන්වහන්සේ පවසන්ට යෙදුණාවූ සමහර දයාන්විත ස්වර්ගීය සත්‍යයන් පවසනවා ඇත. ඔහු රෝගීන් සුවකරනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ ස්වභාවයෙන් මෙසේ පෙනී සිටියදී ඔහු පවසන්ට යන්නේ තමා සබත් දවස ඉරිදා බවට වෙනස් කළ බවය. ඔහු විසින් ආශිර්වාද කළාවූ මේ දවසට ගරු කළ යුතු යයි ඔහු කියනවා ඇත. තවදුරටත් සත්වෙනි දවස ශුද්ධ කොට පවත්වන්නාවූ අය, ආලෝකය හා සත්‍යය රැගෙන එන්නාවූ ඔහුගේ දූතයන්ට ඇහුම්කන් නොදීමෙන් ඔහුගේ නාමයට අපහාස කරනවා යයි ඔහු පවසනවා ඇත. මෙය ඉතාම ශක්තිමත් වූද ඉතාම මහත් බලයෙන් යුක්තවූද රැවටීමක් වෙනවා ඇත. මායාකාර සීමොන් විසින් රවටන්ට යෙදුණාවූ සමාරියයන් මෙන්ම (ක්‍රියා 8:10) කුඩා අය පටන් ලොකු අය දක්වා බොහෝදෙනා මේ මායාවන් පිළිගනිමින්, 'මේ දෙවියන්වහන්සේගේ බලය' යයි පවසනවා ඇත.



නමුත් දෙවියන්වහන්සේගේ දරුවන් මුළා නොවෙනවා ඇත. මේ බොරු ක්‍රිස්තුස්ගේ ඉගැන්වීම් ශුද්ධ ලියවිල්ලට අනුකූල නොවේ. ඔහුගේ ආශිර්වාද පවසනු ලබන්නේ මෘගයාටද උගේ රූපයටද නමස්කාර කරන්නාවූ අයටය. නමුත් දෙවියන්වහන්සේගේ අමිශ්‍ර උදහස වගුරුවනු ලබන්ට යන්නේ මේ සෙනඟ මත්තටය.

තවදුරටත්, සාතන්ට ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමේ ස්වභාවය වංචාකාර ලෙස දක්වීමට අවසර නැත. ගැළවුම්කාරයාණන්වහන්සේ මේ කාරණය ගැන, මේ තත්ත්වය පිළිබඳව, තමාගේ සෙනඟට අවවාද කළසේක. උන්වහන්සේ තමන්වහන්සේගේ පැමිණීමේ ස්වභාවය පැහැදිලි ලෙස අනාවැකියෙන් මෙසේ ප්‍රකාශ කළසේක: "මක්නිසාද බොරු ක්‍රිස්තුවරුද බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන් නම් තෝරාගනු ලැබූවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය .... එබැවින් ඔව්හු නුඹලාට කථාකොට අන්න, උන්වහන්සේ වනාන්තරයේ සිටින සේකැයි කියත් නම්, පිටත්ව නොයන්න. උන්වහන්සේ ඇතුල් ගෙවල සිටින සේකැයි කියත් නම්, විශ්වාස නොකරන්න. මක්නිසාද යම්සේ විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා පෙනේද, මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එසේම වන්නේය." (මතෙව් 24:24-27,). මේ පැමිණීම බොරුකාර ලෙස පෙන්නුම් කිරීමට කිසිසේත් නුපුළුවන. එය ලොව මුළුල්ලේම සියලු දෙනාටම දර්ශනය වෙනවා ඇත. ලෝකයේ සිටින සියලු දෙනාම එය දකිනවා ඇත.

ලෝකයා අසුකරගන්නාවූ මේ රැවටීමේදී ආරක්ෂා කරනු ලබන්නේ උනන්දුවෙන් ශුද්ධ ලියවිලි ඉගෙන ගනිමින් සත්‍යයට ප්‍රේම කළාවූ අය පමණය. බයිබලයේ සාක්ෂිය අනුව මේ අය, අන් වෙසකින් පෙනී සිටින රැවටිලිකාරයා හඳුනාගන්නවා ඇත. සියලු දෙනාටම සෝදිසි කිරීමේ කාලය පැමිණෙනවා ඇත. පරීක්ෂාවන් මගින් පොලනු ලැබීම කරණකොටගෙන සැබෑ ක්‍රිස්තු භක්තිකයන් හඳුනාගනු ලබනවා ඇත. තමන්ගේ හැඟීම් මගින් ඔප්පු කරනු ලැබිය හැකි දේවලින් පවා රවටනු නොලබන පිණිස දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් සත්‍යයෙහි පිහිටා සිටිනවා ඇද්ද? එබඳු උග්‍ර අවස්ථාවකදී ඔවුන් බයිබලයට, එසේය බයිබලයට පමණක්ම සම්බන්ධවී සිටිනවා ඇද්ද? තමාට හැකි වුවහොත් සාතන් ඔවුන්ව ඒ දවස සඳහා සූදානම් වීමෙන් වළක්වනවා ඇත. ඔවුන්ගේ මාවතට බාධා පමුණුවමින්, ඔවුන්ව ලෞකික සම්පත්තිවලට පටලවා ගනිමින් ඔවුන්ට ඉමහත් බර දැරීමට සාතන් සලස්වනවා ඇත. එවිට ඔවුන්ගේ සිත් මේ ජීවිතයේ සැලකීම් වලින් පූර්ණ වන බැවින් පීඩාවේ දවස සොරෙකුගේ පැමිණීම මෙන් ඔවුන් මත්තට එනවා ඇත.

ක්‍රිස්තියානි සභාවේ අනේක නායකයන් ආඥාවන් පවත්වන්නන්ට විරුද්ධව නියෝග නිකුත් කරන බැවින් එමගින් ඔවුන්ට ආණ්ඩුවෙන් ලැබෙන රැකවරණය ඉවත් කරනු ලැබේ. එවිට ඔව්හු තමා විනාශ කිරීමට ආශාවන්නාවූ අයවලුන්ට අත්හරිනු ලැබේ. එවිට දෙවියන්වහන්සේගේ සෙනඟ කඳුවලට පලා ගොස් කුඩා කාණ්ඩ වශයෙන් එක්රැස් වෙමින් ඉතාම පාළුවූද වෙන්වූද ස්ථානවල ජීවත් වෙනවා ඇත. බොහෝදෙනා කඳුකරයේ ආරක්ෂා ස්ථාන සොයා ගන්නවා ඇත. පීඩ්මොන්ට් මිටියාවතෙහි සිටියාවූ ක්‍රිස්තු භක්තිකයන් මෙන්ම ඔවුන්ද පොළොවේ උස් බිම් තමාගේ අභය භූමීන් කරගනිමින් 'කඳුවල රැකවරණය' ගැන දෙවියන්වහන්සේට ස්තූති කරනවා ඇත. නමුත් සියලු ජාතීන් අතරින් බොහෝ දෙනා, එනම් උසස් හා පහත් අයද, ධනවත් හා දිළිඳු අයද, කළු හා සුදු වර්ණයන්ගෙන් යුත් අයද, ඉතාම අසාධාරණ කෲර වහල්කමට පමුණුවනු ලබනවා ඇත. දෙවියන්වහන්සේගේ ප්‍රේමවන්ත දරුවන් දම්වැල් වලින් බඳිනු ලැබ, සිරකූඩුවල වසා දමනු ලැබ, මරණීය දණ්ඩනයේ නියමයෙන් යුක්තව විඩාත්මක දවස් ගතකරනවා ඇත. සමහර අය දූෂිත අඳුරු සිරගෙවල සාගින්නෙන් මැරී යන්ට අත්හරිනු ලබනවා ඇත. ඔවුන්ගේ වැලපීමේ හඬ ඇසීමට කිසි මානුෂික සවනක් යොමු වන්නේ නැත. ඔවුන්ට උපකාර කිරීමට කිසි මනුෂ්‍ය හස්තයක් යොමු වන්නේද නැත.

මේ දුෂ්කර පැයේදී දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟව අමතක කරනවා ඇද්ද? ජලගැල්මට පෙර පැවති ලෝකයට විනිශ්චයන් පමුණුවනු ලැබූ විට දෙවියන්වහන්සේ විශ්වාසවන්ත නෝවා අමතක කළසේක්ද? මිටියාවතේ නගර විනාශ කිරීමට අහසින් ගිනි පමුණුවනු ලැබූ විට දෙවියන්වහන්සේ ලොත්ව අමතක කළසේක්ද? මිසරයේ රූප වන්දනා කරන්නන්ගෙන් වට වී සිටි යෝසෙප්ව උන්වහන්සේ අමතක කළසේක්ද? බාල්ගේ අනාගතවක්තෘන්ට හිමිවූ ඉරණම එලියාටත් ලැබේවායි යෙසබෙල් එලියාට තර්ජනය කළ විට උන්වහන්සේ එලියාව අමතක කළසේක්ද? යෙරෙමියා ඒ අඳුරු සිරගෙයි වළ ඇතුළේ සිටි විට උන්වහන්සේ යෙරෙමියා අමතක කළසේක්ද? උන්වහන්සේ ගිනි උදුනට දමනු ලැබූ ඒ විශ්වාසවන්තයන් තිදෙනාව හෝ සිංහ ගුහාවට දමනු ලැබූ දානියෙල්ව අමතක කළසේක්ද?

"නුමුත් සියොන්: යොහෝවඃවහන්සේ මා අත් හැරිය සේක; ස්වාමින්-වහන්සේ මා මතක නැති කළ සේකැයි කීවාය. ස්ත්‍රියෙක් ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතක නැති කරන්ට ඇට පුළුවන්ද? එසේය, මොවුන්ට මතකනැති වෙන්ට පුළුවන, එහෙත් මම නම් නුඹ මතක නැති නොකරන්නෙමි. බලව, මම මාගේ අතුල්වල නුඹ කොටා ගතිමි." (යෙසායා 49:14-16)



"නුඹලාට අත ගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අත ගසන්නේය"යි සේනාවල ස්වාමින්වහන්සේ කියා තිබේ. (සෙකරියා 2:8)

සතුරන් ඔවුන්ව සිරගෙට දමන්නේ වුවද ඔවුන්ගේ ආත්මයන් හා ක්‍රිස්තුස්වහන්සේ අතර ඇත්තාවූ සබඳතාවය බිඳ හෙළීමට සිරගෙයි බිත්තිවලට නුපුළුවන. ඔවුන්ගේ සෑම දුර්වලකමක්ම දකින්නාවූද, ඔවුන්ගේ සෑම පීඩාවක්ම දන්නාවූද තැනැන්වහන්සේ සියලු භෞතික බලයන්ට වඩා උසස්ය. දේවදූතයන් ඔවුන්ගේ ඒ පාළු සිර කූඩුවලට පැමිණ ස්වර්ගයේ සමාදානය හා අලෝකය ඔවුන් වෙත ගෙනඑනවා ඇත. එවිට සිරගෙය මාළිගයක් වෙනවා ඇත; කුමක්හෙයින්ද ඇදහිල්ලෙන් ධනවත්වූ අය එහි වාසය කරනවා ඇත. ඒ අඳුරු බිත්ති ස්වර්ගීය ආලෝකයෙන් දීප්තිමත් කරනු ලබනවා ඇත. එවිට, පාවුල් හා සීලස් පිලිප්පියේ සිරගෙයි සිටියදී මධ්‍යම රාත්‍රියේදී ඔවුන් යාච්ඤා කරමින් ප්‍රශංසා ගීත ගැයූ අවස්ථාවේදී පැවතියා වැනි තත්ත්වයක් පවතිනවා ඇත.

දෙවියන්වහන්සේගේ සෙනඟ විනාශ කිරීමට උත්සාහ කරන්නන් මත උන්වහන්සේගේ විනිශ්චයන් පමුණුවනු ලබනවා ඇත. උන්වහන්සේ දුෂ්ඨයන් ගැන බොහෝ කල් ඉවසන බැවින් මනුෂ්‍යයන් වරද කිරීමෙහි එඩිතර වෙනවා ඇත. නමුත් ප්‍රමාදව පැමිණෙන්නේ වුවද ඔවුන්ගේ දඬුවම වඩාත් ස්ථිරව භයානකව පවතිනවා ඇත. "එසේය, ස්වාමින්-වහන්සේ තමන්ගේ ක්‍රියාව වන තමන්ගේ අපූරු ක්‍රියාව කිරීමටත් තමන්ගේ වැඩය.... ඉෂ්ට කිරීමටත් පෙරාශිම් කන්දේදී මෙන් නැගිටින සේක. ගිබියොන් මිටියාවතේදී මෙන් කෝපවන සේක" (යොසාය 28:21) අපගේ දෙවියන්වහන්සේ දයාවන්ත බැවින් දඬුවම් දීම උන්වහන්සේ විසින් කරන්නාවූ අමුතුම ක්‍රියාවක් වෙයි. "මා ජීවමාන බව සැබෑවා සේම, දුෂ්ටයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත් වෙනවාට මිස, දුෂ්ටයා නසිනවාට මම ප්‍රසන්න නොවෙමියි ස්වාමිවූ දෙවියන්-වහන්සේ කියන සේක" (එසකියෙල් 33:11). "උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණවූ දයාවන්තවූ උදහස් වීමට ප්‍රමාද වන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවි කෙනෙක්ය. උන්වහන්සේ .... අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමාකරනසේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරන සේක." (නික්මයාම 34:6,7) "ස්වාමින්වහන්සේ ඉවසිලිවන්තව බලයෙන් මහත්ව සිටින සේක. වරදකාරයන් කොයි ප්‍රකාරයකින්වත් නිදොස් නොකරන සේක." (නාහුම් 1:3) ධර්මිෂ්ඨකමේ බලවත් ක්‍රියා මගින් උන්වහන්සේ ඒ පහත හෙලා තිබෙන උන්වහන්සේගේ ව්‍යවස්ථාව නඟාලන සේක. ස්වාමින්වහන්සේ යුක්ති සහගත ලෙස ක්‍රියා කරමින් දඬුවම් කිරීමට

ඉක්මන් නොවන බැවින්, පව්කාරයන්ට දෙනු ලබන්ට යන දඬුවම කොපමණ තද එකක් වෙනවා ඇද්දැයි අපට සිතාගැනීමට පුළුවන. උන්වහන්සේ යම් ජාතියක් ගැන බොහෝ කල් ඉවසමින් ඔවුන්ගේ අධර්මිෂ්ඨකමේ කුසලාන උන්වහන්සේගේ මිම්මට අනුව සම්පූර්ණ වන තුරු බලා සිටින සේක් නම් අවසානයේදී ඔවුන්ට දයාවෙන් මිශ්‍ර නොවූ උන්වහන්සේගේ උදහසේ කුසලානෙන් බොන්ට සිදුවෙනවා ඇත.

ක්‍රිස්තුස්වහන්සේ ශුද්ධස්ථානය තුළ උන්වහන්සේ කරන්නාවූ මැදහත්වීමේ සේවය නිම කළ විට, 'මෘගයාටත් උගේ රූපයටත් නමස්කාරකර ඔහුගේ ලකුණ ලබන්නාවූ අයට, උන්වහන්සේගේ කෝපය නමැති කුසලානට අමිශ්‍රව වත්කරන ලද උන්වහන්සේගේ උදහස දෙනු ලබනවා ඇත.' (එළිදරව් 14:9,10) දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන් මුදාගැනීමට සූදානම්වූ විට මිසරය මත පීඩාවන් පැමිණියේය. උන්වහන්සේ අවසානයේදී තමන්වහන්සේගේ සෙනඟ මුදා ගැනීමට පෙර, ලෝකය මත පැමිණෙන්ට යන පීඩාවන් ඒ පීඩාවන්ට සමානය. එළිදරව් පොත ලියූ තැනැත්තා මේ භයානක පීඩාවන් මෙසේ විස්තර කරයි: "එවිට මෘගයාගේ ලකුණ ඇත්තන්ද ඔහුගේ රූපයට නමස්කාර කරන්නන්ද කෙරෙහි වස අරිෂ්ට වණ හටගත්තේය. .... මුහුද මළ මිනිසෙකුගේ ලේ මෙන් ලේ වුණේය. මුහුදේ පණ ඇති සියලු සත්වයෝ මැරුණෝය." ගංගාවල්ද දිය උල්පත්ද ලේ වුණේය. මේ පීඩාවන් ඉතා භයානකය. දෙවියන්වහන්සේ යුක්ති සහගත බව ඒ සියල්ලෙන් පෙනී යයි. දෙවියන්වහන්සේගේ දූතයා මෙසේ කියා තිබේ. "ඔබ මෙසේ විනිශ්චය කළ බැවින් ඔබ ධර්මිෂ්ඨය. ඔවුන් ශුද්ධවන්තයන්ගේද අනාගතවක්තෘවරුන්ගේද ලේ වැගිරෙවූ බැවින් ඔබ ඔවුන්ට බොන්ට ලේ දුන්සේක. ඒක ඔවුන්ට සුදුසුය." (එළිදරව් 16:2-6) දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් වරදට පත්කිරීම මගින් ඔව්හු ඔවුන්ගේ ලේ ගැන වරදකරුවන් වූයේ එය ඔවුන්ගේම අත්වලින් වගුරුවනු ලැබුවාසේය. එසේම ක්‍රිස්තුස්වහන්සේ යුදෙව්වරුන්ට කථා කරමින් පැවසුවේද ආබෙල්ගේ කාලයේ පටන් සිටියාවූ ශුද්ධවූ මනුෂ්‍යයන්ගේ ලේ වැගිරීම ගැන ඔවුන් වරදකරුවන් වූ බවය. කුමක්හෙයින්ද ඔවුන් තුළ පැවතුණේද ඒ ස්වභාවයමය. අනාගතවක්තෘන් මැරුවාවූ අය කළාවූ දෙයම කිරීමට ඔව්හුද උත්සාහ කරමින් සිටියහ.

ඇතිවෙන්ට යන්නාවූ පීඩාවලදී මනුෂ්‍යයන් දවන්ට සූර්යයාට බලය තිබෙනවා ඇත. 'මහත් උෂ්ණයකින් මනුෂ්‍යයෝ දවනු ලබති' මේ කාලයේදී පවතින්ට යන තත්ත්වය ගැන අනාගතවක්තෘවරු මෙසේ පැවසූහ: "දේශය වැලපෙයි .... මක්නිසාද කෙතේ අස්වැන්න



නාස්ති විය .... කෙතේ සියලුම ගස් වියළී තිබේ. මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයන්ගේ ප්‍රීතිය පහව ගියේය" "බීජ ඒවායේ පිඩලි යට දිරා යයි. අටු පාළු වී, ගබඩා කඩා වැටී තිබේ. මක්නිසාද ගොයම් වියළී තිබේ. සිව්පාවුන් කෙඳිරිගාන හැටි! ගව රැළවලට තෘණ නැති නිසා උන් කැළඹී ඇවිදිති ..... වතුර ඔයවල් හිඳී ගියේය. කාන්තාරයේ පිට්ටනිද ගින්නෙන් නාස්ති විය." (යෝවෙල් 1:10-12; 17-20) "මාළිගාවේ ගීතිකා ඒ දවසේදී දුකෙන් කෑගැසීම් වන්නේය .... බොහෝ මළකඳන් තිබෙනවා ඇත. ඔවුන් සෑමතැනම ඒවා නිශ්ශබ්ද ලෙස පිටත දමනවා ඇත." (ආමොස් 8:3).

මේ පීඩාවන් මුළු ලෝකයටම එකම විට ඇතිවන්නේ නැත. එසේ වූයේ නම් මුළු ලෝකයම ඒවා මගින් විනාශ වෙනවා ඇත. එහෙත් ඒවා මනුෂ්‍යයන් පිට පැමිණ ඇත්තාවූ ඉතාම භයානක පීඩාවන්ය. සෝදිසි කිරීමේ කාලය අවසාන වීමට පෙර පැමිණෙන පීඩාවන් සියල්ලම දයාවෙන් මිශ්‍රව පවතිනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයේ ආයාචනය මගින් පව්කාරයා ඔහුගේ වරදකාරකමට දිය යුතු සම්පූර්ණ දඬුවම ලැබීමෙන් රැකවරණය වී තිබේ. නමුත් ඒ අවසාන විනිශ්චයේදී දිව්‍ය උදහස වගුරුවනු ලබන්නේ දයාව ඊට මිශ්‍ර නොකරය.

ඒ දවසේදී බොහෝ දෙනා, මෙපමණ කාලයක් තමා එපා කරන්ට යෙදුණාවූ දෙවියන්වහන්සේගේ දයාවේ රැකවරණය ලැබීමට ඉතා ආශා වෙනවා ඇත. "බලව හානියක්, එනම් කෑම හානියක්වත් වතුර පිපාසයක්වත් නොව ස්වාමින්වහන්සේගේ වචන ඇසීමේ හානියක් මා විසින් දේශයට එවන දවස පැමිණෙන්නේය. එවිට මනුෂ්‍යයෝ ස්වාමින්වහන්සේගේ වචනය සොයන පිණිස මුහුදෙන් මුහුදට ගමන් කරන්නෝය, උතුරේ සිට නැගෙනහිරටද ඔබ මොබ දුවනවා ඇත. නුමුත් ඔවුන්ට සම්බවෙන්නේ නැත." (ආමොස් 8:11,12).

දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් පීඩා විඳීමෙන් නිදහස් වන්නේ නැත. නමුත් පීඩා කරනු ලැබ කනස්සල්ලට පත්වී, දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින්, ආහාර නැති කමින් දුක් විඳින විටත්, ඔවුන් විනාශවන පිණිස අත්හරිනු ලබන්නේ නැත. එලියා ගැන සැලකූ ඒ දෙවියන්-වහන්සේ ආත්ම පූජාවෙන් යුක්තව ක්‍රියාකරන උන්වහන්සේගේ එක දරුවෙකුවත් නොතකා හරින්නේ නැත. ඔවුන්ගේ හිසකෙස් පවා ගණන් කරන උන්වහන්සේ ඔවුන් ගැන සලකනවා ඇත. සාගත කාලයේදී ඔවුන් සෑහීමට පත්වෙනවා ඇත. දුෂ්ටයන් සාගින්නෙන් හා වසංගත මගින් මිය යන අතර, දේවදූතයෝ ධර්මිෂ්ඨයන් රැකවරණය කරමින් ඔවුන්ගේ උවමනාවන් සපයා දෙනවා ඇත. "ධර්මිෂ්ඨකමින් හැසිරෙන්නාවූ අය" උදෙසා මේ පොරොන්දු සම්පූර්ණ

කරනු ලබනවා ඇත.: "ඔහුට කෑම දෙනු ලබන්නේය; ඔහුට වතුර ලැබීම වරදින්නේ නැත." "අසරණයන්ද දිළින්දන්ද වතුර සොයා නොලැබ ඔවුන්ගේ දිව් පිපාසයෙන් වේලෙන කළ, ස්වාමින්වහන්සේ වන මම ඔවුන්ට උත්තර දෙන්නෙමි, ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ වන මම ඔවුන් අත්නාරින්නෙමි." (යෙසායා 33:16; 41:17). "මක්නිසාද අත්තික්කා ගස දළු නොලෑවත්, මුද්‍රික වැල්වල පලදාවක් නොතිබුණත්, ඔලීව ගහේ එල හට නොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුණත්, ගාලෙන් එළු බැටළු රැළ සිඳ දමනු ලැබුවත්, පට්ටිවල ගවයන් නැතුව ගියත්" 'ස්වාමින්වහන්සේ කෙරෙහි භයවන්නන් ස්වාමින්වහන්සේ කෙරෙහි සන්තෝෂ වෙනවා ඇත. ඔවුන්ගේ ගැළවීමේ දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රීතිවෙනවා ඇත.' (හබක්කුක් 3:17,18).

"ස්වාමින්වහන්සේ නුඹ ආරක්ෂා කරන තැනැන්වහන්සේය. ස්වාමින් වහන්සේ දකුණතින් නුඹට සෙවණය. දවාලේ ඉරවත් රාත්‍රියේ සඳවත් නුඹට පහර නොදෙන්නේය. ස්වාමින්වහන්සේ සියලු නපුරෙන් නුඹ ආරක්ෂා කරන සේක. නුඹේ ප්‍රාණය ආරක්ෂා කරනසේක." (ගීතාවලිය 121:5-7) "මක්නිසාද උන්වහන්සේ පක්ෂි වැද්දාගේ මළපතින්ද විනාශ කරන වසංගතයෙන්ද නුඹ මුදාහරින සේක, උන්වහන්සේ ස්වකීය පියාපතින් නුඹ වසන සේක, නුඹ උන්වහන්සේගේ පියාපත් යට ආරක්ෂා වන්නෙහිය. උන්වහන්සේගේ සත්‍යවාදිකම පලිහක්ය, මහා පලිහක්ය. රාත්‍රියේ භීතියටවත් දවාලේ විදින ඊගසටවත්, අඳුරේ යන වසංගතයටවත්, ඉරමුදුන් වේලේ පාළුකරන විනාශයටවත් නුඹ භය නොවන්නෙහිය. නුඹේ පැත්තක දහසක්ද දකුණු පැත්තෙහි දස දහසක්ද වැටෙන්නෝය; එහෙත් එය නුඹට ළං නොවන්නේය. නුඹේ ඇස්වලින් බලා දුෂ්ටයාගේ විපාකය දකිනවා පමණක්ය. මක්නිසාද ස්වාමිනී, ඔබ මාගේ රක්ෂස්ථානයය. නුඹ මහෝත්තමයාණන් නුඹේ වාසස්ථානය කරගත්තෙහිය; නුඹට කිසි නපුරක් නොපැමිණෙන්නේය; නුඹේ කූඩාරමට වසංගතයක් ළං නොවන්නේය." (ගීතාවලිය 91:3-10)

එහෙත් මානුෂික නෙත්වලට පෙනී යන්නේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් විසින් ඔවුන්ට පෙර සිටියාවූ වේද සාක්ෂිකයන් මෙන් තමාගේ ලේ වලින් තමාගේ සාක්ෂිය මුද්‍රා කළ යුතු බවය. සතුරන්ගේ අත්වලට වැටෙන පිණිස ස්වාමින්වහන්සේ තමා අත්හැරිය සේකැයි ඔවුන් බියවෙනවා ඇත. එය ඉමහත් වේදනාවේ කාලයකි. දිවා රාත්‍රි දෙකෙහි ඔවුන් තමා මුදා දෙන ලෙස දෙවියන්වහන්සේට මොර ගසනවා ඇත. දුෂ්ටයෝ ඔවුන්ගේ තත්ත්වය ගැන ප්‍රීතිවෙමින් ඔවුන්ට නින්දා කිරීමේ හඬින් ඔවුන්ට මෙසේ පවසනවා ඇත: "දැන් නුඹලාගේ ඇදහිල්ල කොහේද? නුඹලා ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ දරුවන් නම් උන්වහන්සේ නුඹලාව අපගේ අත්වලින් මුදාගන්නේ නැත්තේ



ඇයි?" නමුත් උන්වහන්සේගේ මිදීම ගැන බලාසිටින අයට මතක් වන්නේ යේසුස්වහන්සේ කල්වරි කුරුසිය මත පූජාවූ අවස්ථාවය; උත්තම පූජකයන්ද සෙනඟගේ නායකයන්ද උන්වහන්සේට සරදම් කරමින් මෙසේ පැවසූ බවය: "ඔහු අනුන් ගැළවූවේය; තමාම ගළවාගන්ට නුපුළුවන. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ රජය; ඔහු දැන් කුරුසියෙන් බසීවා. එවිට අපි ඔහු අදහාගන්නෙමුව." (මතෙව් 27:42) යාකොබ් මෙන් සියලු දෙනාම දෙවියන්වහන්සේ සමග පොර බදනවා ඇත. ඔවුන්ගේ මුහුණුවලින්, ඇතුළාන්තයේ ඔවුන්ට ඇති පොරය දක්වෙයි. සෑම මුහුණක්ම මලානිකව තිබේ. එහෙත් ඔවුන් තමාගේ ඉල්ලීම නවත්වන්නේ නැත.

මනුෂ්‍යයන්ට ස්වර්ගීය දර්ශනය දකගැනීමට පුළුවන් වන්නේ නම්, ක්‍රිස්තුස්වහන්සේගේ ඉවසීමේ වචන අනුව ක්‍රියා කළාවූ අය අවට ඉතා ශක්තිමත් දේවදූතයන් රැකවලේ යෙදී සිටින බව ඔවුන්ට පෙනෙනවා ඇත. සානුකම්පිත මෘදුකමින් යුක්තව මේ දූතයෝ ඔවුන්ගේ පීඩාව සාක්ෂි දරමින් ඔවුන්ගේ යාච්ඤාවන්ට සවන් දී තිබේ. ඔවුන්ගේ පීඩාවෙන් ඔවුන් මුදාලන පිණිස ආඥාදායකයාණන්ගේ වචනය ප්‍රකාශ කරනු ලබන තුරු ඔව්හු බලා සිටිති. නමුත් ඔවුන් තව ස්වල්ප කාලයක් බලා සිටිය යුතුය. දෙවියන්වහන්සේගේ දරුවන් ඒ කුසලාන පානය කළ යුතුය. ඒ බව්තීස්මයෙන් බව්තීස්ම කරනු ලැබිය යුතුය. ඔවුන්ට වේදනාත්මක වන ප්‍රමාදයම ඔවුන්ගේ යාච්ඤාවලට ඇත්තාවූ ඉතාම හොඳ පිළිතුරය. ස්වාමින්වහන්සේ ක්‍රියාත්මක වන තුරු ඔව්හු විශ්වාසයෙන් බලා සිටීමට උත්සාහ කරති. ඔවුන්ගේ ආත්මික අත්දැකීමේදී ඔවුන් ඉතා ස්වල්ප වශයෙන් ක්‍රියාත්මක කළාවූ ඇදහිල්ල, බලාපොරොත්තුව හා ඉවසීම ක්‍රියාවේ යෙදවීමට ඔවුන්ට සිදුවෙයි. එහෙත්, තෝරාගන්නා ලද අයවලුන් නිසා මේ පීඩා කාලය කොට කරනු ලබනවා ඇත. "දෙවියන්වහන්සේ තමන්ට රෑ දාවල් හඬ ගසන්නාවූ තමන් තෝරා ගත්තවුන් ගැන යුක්තිය ඉෂ්ට නොකරන සේක්ද? ..... උන්වහන්සේ ඔවුන්ට වහාම යුක්තිය ඉෂ්ඨ කරන සේකැයි නුඹලාට කියමි." (ලූක් 18:7,8). මනුෂ්‍යයන් බලාපොරොත්තු වෙනවාට වඩා ඉක්මණින් අවසානය පැමිණෙනවා ඇත. තිරිඟු එකතු කර දෙවියන්වහන්සේගේ ගබඩාවට දමන පිණිස මිටි බඳිනු ලබනවා ඇත; කිරිඳි විනාශයේ ගින්නට දමනු ලබන දර කැබලි වෙනවා ඇත.

ස්වර්ගීය රැකවල්ලු, ඔවුන් කෙරෙහි තබා තිබෙන විශ්වාසය අනුව රැකවලේ යෙදී සිටින්නාහුය. ආඥා පවත්වන්නාවූ අයවලුන් මරණයට පත්කිරීමට නියෝගයක් පනවනු ලබනවා ඇත. ඔවුන්ගේ සතුරන් මේ නියෝගය පැමිණෙන තුරු බලා සිටින නමුත්, ඒ අනුව

නියමවන කාලයට පෙර ඔවුන් විනාශ කිරීමට සමහරෙක් ක්‍රියාකරනවා ඇත. නමුත්, විශ්වාසවන්ත අයවලුන් අවට සිටින්නාවූ බලසම්පන්න රැකවලුන් පසුකර යෑමට කිසිවෙකුට නුපුළුවන. සමහර අය නගරවලින් හා ගම්වලින් ඉවතට පැමිණෙන විට ඔවුන්ව අල්ලා ගනු ලැබේ; නමුත් ඔවුන්ට විරුද්ධව ඔසවනු ලබන කඩු කැඩී පිදුරු මෙන් බල රහිතව වැටී යනවා ඇත. තවත් අයව ආරක්ෂා කරනු ලබන්නේ යුද්ධ භටයන්ගේ ස්වරූපයෙන් පැමිණෙන දේවදූතයන් විසින්ය.

සියළු කාලවලදී දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟට උපකාර කරමින් ඔවුන් මුදාලන පිණිස ශුද්ධවූ දේවදූතයන් මගින් ක්‍රියාකර තිබේ. ස්වර්ගීය දූතයන් මනුෂ්‍යයන්ගේ කටයුතු වලදී ක්‍රියාත්මක වී තිබේ. ඔවුන් විදුලිය මෙන් දිළිසුණු වස්ත්‍රවලින් ප්‍රකාශ වී තිබේ. ඔවුන් ගමනේ යෙදී සිටින්නාවූ මනුෂ්‍යයන්ගේ වස්ත්‍රවලින්ද ප්‍රකාශ වී තිබේ. දේවදූතයෝ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට මනුෂ්‍යාකාරයෙන් ප්‍රකාශ වී තිබේ. විඩාවට පත්වූවන් සේ ඔවුන් දාවල් කාලයේදී ආලෝන ගස් යට විවේක ගන්නවා දර්ශනය වී තිබේ. ඔවුන් මනුෂ්‍යයන්ගේ ගෙවල ආගන්තුක සත්කාරය පිළිගෙන තිබේ. ඔවුන් මාර්ගය නොදත් මගීන්ට මාර්ගෝපදේශකයන් හැටියට ක්‍රියා කර තිබේ. ඔවුන් තමාගේම අත්වලින් පූජාසනයේ ගිනි දල්වා තිබේ. ඔවුන් සිරගෙයි දොරවල් විවෘත කර ස්වාමින්වහන්සේගේ සේවකයන් නිදහස් කර යවා තිබේ. අලංකාර ස්වර්ගීය වස්ත්‍රයෙන් සැරසී ඔව්හු ගැළවුම්කාරයාණන්ගේ සොහොන් ගෙයින් ගල ඉවතට පෙරලීමට පැමිණියහ.

දේවදූතයන් නිතරම මානුෂික ස්වභාවයෙන් ධර්මිෂ්ඨයන්ගේ රැස්වීම්වල සිටිති. සොදොමට ගියාවූ අන්දමට ඔව්හු දුෂ්ටයන්ගේ රැස්වීම් වලටද ගොස් ඔවුන්ගේ ක්‍රියාවන් සටහන් කරන්නේ ඔවුන් දෙවියන්වහන්සේගේ ඉවසීමේ සීමාව ඉක්මවා තිබෙනවාදැයි දැනගන්නා පිණිසය. ස්වාමින්වහන්සේ දයාවට ප්‍රිය වන සේක. නියම වශයෙන් තමන්වහන්සේට සේවය කරන්නාවූ ස්වල්ප දෙනෙක් උදෙසා උන්වහන්සේ විපත්ති පාලනය කරමින් බොහෝ දෙනාගේ සාමකාමිත්වය රැකවරණය කරන සේක. දෙවියන්වහන්සේට විරුද්ධව පව් කරන්නාවූ අය නොදන සිටින්නේ තමන්ගේ ජීවිත ගැන ඔවුන්, තමා පීඩා කිරීමට හා සරදම් කිරීමට ආශාවන අයට ණයගැති වන බවය.

ලෝකයේ නායකයන් නොදන්නේ වුවද, නිතරම ඔවුන්ගේ සභා රැස්වීම්වලදී දේවදූතයන් කථා කරන්නන් වී තිබේ. මනුෂ්‍යයන්ගේ නෙත් ඔවුන් දර්ශනය කර තිබේ. මනුෂ්‍යයන්ගේ සවන් ඔවුන්ගේ ආයාචනයන්ට සවන් දී තිබේ. මනුෂ්‍යයන්ගේ තොල් ඔවුන්ගේ



යෝජනාවන්ට විරුද්ධවී ඔවුන්ගේ අනුශාසනාවන්ට සරදම් කර තිබේ. මනුෂ්‍යයන්ගේ හස්තයන් ඔවුන් වෙතට යොමුවී තිබෙන්නේ ඔවුන්ට බැණ වදිමින් ඔවුන්ට නිග්‍රහ කරමින්ය. ඔවුන්ගේ සභා ශාලාවන්හි හා නඩු ශාලාවලදී ද මේ ස්වර්ගීය පණිවිඩකරුවන් දක්වා තිබෙන්නේ ඔවුන් මනුෂ්‍ය ඉතිහාසය ඉතා හොඳින් දන්නා බවය; පීඩාවට පත්වූවන් රැකවරණය කිරීමට ඉදිරිපත් වන ඉතාම දක්ෂවූද, කථාවෙහි සූරයන්වූද අයවලුන්ට වඩා හොඳින් තමාට ඔවුන් උදෙසා පෙනී සිටීමට පුළුවන් බව ඔවුන් පෙන්නුම් කර තිබේ. දෙවියන්වහන්සේගේ වැඩවලට බාධා කරමින් උන්වහන්සේගේ සෙනඟට පීඩාවන් ඇති කරන්නාවූ නරක දේවල් කිරීම වලක්වමින් ඔවුන් ඒ නායකයන්ගේ අභිප්‍රායන් පරාජයට පමුණුවා තිබේ. පීඩාවේ හා විපත්තියේ පැයේදී "ස්වාමින්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි." (ගීතාවලිය 34:7).

දෙවියන්වහන්සේගේ සෙනඟ ඉතා මහත් ආශාවකින් යුක්තව බලා සිටින්නේ තමාගේ රජතුමාණන්ගේ පැමිණීමේ සලකුණු දකගැනීමටය. "රාත්‍රියේ දැන් වේලාව කීයද?" යි මුරකාරයාගෙන් විමසනු ලබන විට ඔහු නොපසුබටව මෙසේ පිළිතුරු දෙයි: "පහන් වේලාව එන්නේය, රාත්‍රියත් එන්නේය." (යෙසායා 21:11,12) කඳු මුදුන් වලට ඉහළින් ඇති වළාකුළු මත ආලෝකය දිස්වෙයි. ඉක්මණින්ම උන්වහන්සේගේ තේජස ප්‍රකාශ වෙනවා ඇත. ධර්මිෂ්ඨකමේ සූර්යාණන්වහන්සේ ඉක්මණින් උදාවන සේක. උදෑසන හා රාත්‍රිය යන දෙකම ඉතා ආසන්නය - ධර්මිෂ්ඨයන්ට අවසානයක් නොමැති දවාල උදාවන අතර දුෂ්ටයන්ට එය සදාකාල රාත්‍රියේ පැමිණීම වෙයි.

පොර බදන්නාවූ අය ඔවුන්ගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට ඉදිරිපත් කරන විට, අදෘශ්‍යමාන සියල්ලෙන් ඔවුන් වෙන් කරන්නාවූ තිරය ඉවත් කරනු ලබන බවක් පෙනෙයි. සදාකාලික දිවා කාලයේ උදාවීමෙන් අහස බබළයි. දේවදූතයන්ගේ ගීතරාවයට සමාන වන මේ වචන සවනට යොමු වෙයි: "ඔබගේ පක්ෂපාතකමෙහි ස්ථිරව සිටින්න උපකාර ඉක්මණින් ලැබෙනවා ඇත." අති උත්තම ජයග්‍රාහකයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ විඩාවට පත් සොල්දාදුවන්ට අමරණීය තේජසේ ඔටුන්නක් පුදකරන සේක. විවෘත දොරටු තුළින් නික්මෙන උන්වහන්සේගේ හඬ මෙසේ පවසනවා ඇත: "බලන්න, මම නුඹ සමග සිටිමි. භය නොවන්න, මම නුඹට ඇති කණගාටුව දනිමි. මම නුඹගේ දුක් දරා ගතිමි. නුඹ සටන් කරන්නේ මුහුණ දෙනු නොලැබූ සතුරන් සමග නොවේ. මම නුඹලා උදෙසා මේ සටනෙහි යෙදුණෙමි. මාගේ නාමයෙන් නුඹලා බොහෝ සේ ජයග්‍රාහක වන්නහුය."

අපට උපකාර අවශ්‍ය වන විටම අපගේ අනර්ඝ ගැළවුම්කාරයාණන්වහන්සේ උපකාර එවන සේක. ස්වර්ගයට යන මාර්ගය උන්වහන්සේගේ පා සලකුණු වලින් කැප කර තිබේ. අපගේ පාද තුවාල කරන සෑම කටුවක්ම උන්වහන්සේගේ පාදවලට තුවාල කර තිබේ. අපට දරාගැනීමට තිබෙන සෑම කුරුසියක්ම උන්වහන්සේ විසින් දරාගනු ලැබ තිබේ. සමාදානය සඳහා අපගේ ආත්ම සූදානම් කරන පිණිස අරගලයන් ඇතිවීමට උන්වහන්සේ ඉඩ හරින සේක. පීඩා කාලය දෙවියන්වහන්සේගේ සෙනඟට ඉතා දුෂ්කර කාලයක් වෙනවා ඇත. නමුත් එය සෑම සැබෑ ඇදහිලිවන්තයා විසින්ම ඉහළ බැලිය යුතු කාලයක්ය. එවිට, ඇදහිල්ල කරණකොටගෙන ඔවුන්ට දර්ශනය කිරීමට පුළුවන් වන්නේ පොරොන්දුවේ දේදුන්න තමා අවට තිබෙන බවය.

"ස්වාමින්වහන්සේ විසින් මුදන ලද්දෝ ගී කියමින් සියොන්ට හැරී එන්නෝය; සදාකාල ප්‍රීතියද ඔවුන්ගේ ඉස් පිට තිබෙන්නේය. සන්තෝෂයද ප්‍රීතිමත්කමද ඔවුන් පිටට පැමිණෙන්නේය. දුකද සුසුම්ලෑමද පලා යන්නේය. නුඹලා සනසන්නේ මමමය. නැසී යන මනුෂ්‍යයාටත් තෘණ මෙන් පහව යන මනුෂ්‍ය පුත්‍රයාටත් භයවෙන්ටද නුඹේ මැවුම්කාරවූ .... ස්වාමින්වහන්සේ සිහි නැතිකොට, විනාශ කිරීමට පීඩාකාරයා සූදානම් වෙන විට, ඔහුගේ කෝපය නිසා නිතරම දවස මුළුල්ලෙහි වෙවුලන්ටද නුඹ කවුද? පීඩාකාරයාගේ කෝපය කොතැනද? රටින් පිට වහල්වී සිටින්නා ඉක්මණට මුදනු ලබන්නේය. ඔහු වළේදී නසින්නේවත් ඔහුගේ කෑම පිරිහෙන්නේවත් නැත. මම වනාහි මුහුදේ රැළ ගර්ජනා කරන ලෙස එය අවුස්සන්නාවූ, සේනාවල ස්වාමින්වහන්සේ යන නාමය ඇත්තාවූ නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේය. මා විසින් අහස පිහිටුවීමටත්, පොළොවේ පදනම් තැබීමටත් නුඹ මාගේ සෙනඟ යයි සියොන්ට කීමටත්, මාගේ වචනය නුඹේ මුඛයෙහි තබා මාගේ අතේ සෙවනෙහි නුඹ සැඟවුවෙමි." (යෙසායා 51:11-16)

"එබැවින් පීඩිතවූ මුද්‍රිකපානය නැතුව මත්වී සිටින්නාවූ තැනැත්තිය, මේක අසන්න. නුඹේ ස්වාමිවූ ස්වාමින්වහන්සේ වන තමන්ගේ සෙනඟ වෙනුවට මැදහත්වන්නාවූ නුඹේ දෙවියන්වහන්සේ මෙසේ කියනසේක: මෙන්න, වැනෙන්ට සලස්වන කුසලාන වන මාගේ කෝපය නමැති පාත්‍ර කුසලාන නුඹේ අතින් ගත්තෙමි; නුඹ තවත් එයින් නැවත නොබොන්නෙහිය. නුමුත්: අප විසින් නුඹ පාගා යන පිණිස වැටී ඉන්නැයි නුඹේ ආත්මයට කීවාවූ නුඹේ පීඩාකාරයන්ගේ අතට ඒක දෙන්නෙමි. එලෙස නුඹ නුඹේ පිට බිම මෙන්ද පාගායන්නන්ට වීථිය මෙන්ද තැබුවෙහිය." (යෙසායා 51:21-23)



අනාගත කාලය දෙස බැලූ දෙවියන්වහන්සේගේ ඇස් යොමු වූයේ ලෝක බලධාරීන් උන්වහන්සේගේ මනුෂ්‍යයන්ට විරුද්ධව ක්‍රියා කරන විට ඔවුන්ට මුහුණ දීමට සිදුවන්නාවූ උග්‍ර අවස්ථාවන්ටය. වහලුන් ලෙස රටින් පිට කරන ලද්දන් මෙන් තමාට සාගින්නෙන් හෝ ප්‍රචණ්ඩකාරීත්වයෙන් මරණයට පත්වෙන්ට සිදුවෙනවා ඇතැයි ඔව්හු බිය වෙති. නමුත් ඉශ්‍රායෙල් මනුෂ්‍යයන් ඉදිරිපිට රතු මුහුද වෙන්වන්ට සැලැස්වූ ශුද්ධවූ තැනැන්වහන්සේ තමන්වහන්සේගේ උතුම් බලය ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ වහල්කම ඉවත් කරන සේක. "ඔව්හු වනාහි මා විසින් පමුණුවන දවසේදී මාගේම සම්පතක් වන්නෝය; මමද මනුෂ්‍යයෙක් තමාට සේවය කරන තමාගේ පුත්‍රයාට කරුණා කරන්නාක් මෙන් ඔවුන්ට කරුණා කරන්නෙමියි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක." (මලාකි 3:17) මේ කාලයේදී ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාසවන්ත සේවකයන්ගේ ලේ වගුරුවනු ලබන්නේ නම්, එය වේද සාක්ෂිකයන් මරනු ලැබූ කාලයේදී මෙන්, දෙවියන්වහන්සේ උදෙසා අස්වැන්නක් ලබාදෙන පිණිස වපුරන ලද බීජයක් හා සමාන වන්නේ නැත. ඔවුන්ගේ විශ්වාසවන්තකම, අන්‍යයන්ට සත්‍යය වටහා දෙන්නාවූ සාක්ෂියක් වන්නේ නැත. කුමක්හෙයින්ද මුරණ්ඩු හදවත දයාවේ රැළි ආපසු යවා තිබෙන්නේ ඒවා නැවත ඔවුන් වෙතට නොඑන පිණිසය. මේ කාලයේදී ධර්මිෂ්ඨයන් ඔවුන්ගේ සතුරන්ට ගොදුරු වන පිණිස අත්හරිනු ලබන්නේ නම් එය අන්ධකාරයේ කුමාරයාට ජයග්‍රහණයක් වෙනවා ඇත. ගීතිකාකාරයා මෙසේ කියයි: "මක්නිසාද විපත්ති දවසේදී උන්වහන්සේ ස්වකීය විමානයෙහි මා වසා තබන සේක. ස්වකීය මණ්ඩපයෙහි වූ අප්‍රකාශ ස්ථානයෙහි මා සඟවන සේක." (ගීතාවලිය 27:5) ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පැවසූ සේක: "මාගේ සෙනඟ, එන්න, නුඹලාගේ ඇතුල් ගෙවලට ගොස් නුඹලාගේ දොරවල් වසාගන කෝපය පහවයන තුරු ස්වල්ප මොහොතක් සැඟවී ඉන්න. මක්නිසාද මෙන්න ස්වාමින්වහන්සේ පොළෝ වාසීන්ගේ අපරාධ ගැන ඔවුන්ට දඬුවම් කරන්ට තමන්ගේ ස්ථානයෙන් නික්ම එනසේක." (යෙසායා 26:20,21) උන්වහන්සේගේ පැමිණීම ගැන ඉවසිල්ලෙන් බලා සිටියාවූද ජීවන පොතෙහි නම් ලියා ඇත්තාවූද අයවලුන්ට ලැබෙන මිදීම තේජාන්විත එකක් වෙනවා ඇත.

# 40

# දෙවියන්වහන්සේගේ සෙනග මුදාගනු ලැබීම

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට ගරු කරන්නන්ට මනුෂ්‍යයන්ගේ අණ පනත්වලින් ලැබෙන රැකවරණය ඉවත් කරනු ලැබූ විට අනේක දේශයන්හි, ඔවුන් විනාශ කරන පිණිස, එකම කාලයේදී, යම් සංවිධානයක් ඉදිරිපත් වෙනවා ඇත. නියෝගය අනුව නියම කරන ලද කාලය ආසන්න වන විට, තමා ද්වේෂ කරන මේ සෙනඟ මුලිනුපුටා දැමීමට මනුෂ්‍යයන් ක්‍රියාකරනවා ඇත. තරවටු කිරීම්ද, වෙනස් අදහස්ද ඉදිරිපත් කරන්නාවූ කට හඬවල් සහමුලින්ම නිශ්චල කරන පිණිස එක රාත්‍රියකදී පහර දීමට තීරණය කරනු ලබනවා ඇත.

දෙවියන්වහන්සේගේ සෙනඟගෙන් සමහර අය සිරගෙවල සිටියදීද, තවත් අය වනාන්තරවල හා කඳු මත සිටියදීද, ඔවුන් දිව්‍ය ආරක්ෂාව ඉල්ලා සිටිනවා ඇත. ඒ අතර නපුරු දූතයන් විසින් පොළඹවනු ලැබූ අවි ආයුධ රැගත් මනුෂ්‍ය කාණ්ඩයන් සෑම අතින්ම ඔවුන් මරා දැමීමට සූදානම් වෙනවා ඇත. මේ අවස්ථාවේදී, මේ ඉතාම උපකාර රහිත අවස්ථාවේදී ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ තෝරාගත් සෙනඟට මිදීම ලබාදීමට ක්‍රියා කරනවා ඇත. ස්වාමීන්වහන්සේ මෙසේ පවසා තිබේ: "ශුද්ධ මංගල්‍යයක් පවත්වන රාත්‍රියේදී මෙන් ගීතිකාවක්ද ස්වාමීන්වහන්සේගේ කන්දටත් ඉශ්‍රායෙල්ගේ පර්වතයාණන් වෙතටත් පැමිණෙන්ට නළාවක් පිඹිමින් යන අයගේ ප්‍රීතිය මෙන් සිතේ ප්‍රීතියද නුඹලාට වන්නේය. ස්වාමීන්වහන්සේද තමන්වහන්සේගේ මහිමාන්විත හඬ අස්වනසේක. උන්වහන්සේ තමන් කෝපයේ උදහසත් දවාදමන ගිනි දළුවත් වාතවේගයත් කුණාටුවත් ගල් වර්ෂාවත් ඇතිව තමන් හස්තයේ පහළවීම පෙන්වන සේක." (යෙසායා 30:29,30)

නපුරු මනුෂ්‍යයෝ ජයග්‍රාහක නාදයෙන් සරදම් කිරීමෙන් හා ශාපයන් පැවසීමෙන් යුක්තව තමාගේ ගොදුර වෙත වේගයෙන් දුව යන්ට සූදානම් වෙති. එවිට, රාත්‍රියේ අන්ධකාරයට වඩා මහත් අන්ධකාරයක් පොළොව මත්තට පැමිණෙනවා ඇත. එවිටම, දෙවියන්වහන්සේගේ සිංහාසනයේ තේජසින් දිළිසෙන දේදුන්නක් අහසේ බබළමින් යාච්ඤා කරන සෑම කාණ්ඩයක්ම එයින් වටකරන බවක් පෙනී යයි. කෝපාකුල සමූහයෝ හදිසියේම අසුවෙති. ඔවුන්ගේ සරදම් කිරීමේ හඬ නැතිවී යයි. ඔවුන්ගේ මිනීමරු කෝපයට අසුවිය යුතුවූ



අයවලුන් අමතක කරනු ලැබේ. තමාට කරදර ඇතිවෙන්ට යනවා ඇත යන බියෙන් යුත් හැඟීමෙන් යුක්තව ඔව්හු දෙවියන්වහන්සේගේ ගිවිසුමේ සංකේතය දෙස බලති. එයින් නික්මෙන්නාවූ ඉතා බලසම්පන්න දීප්තියෙන් රැකවරණය ලැබීමට ඔව්හු ආශාවෙති.

දෙවියන්වහන්සේගේ සෙනඟ අතර පැහැදිලි සුමිහිරි ශබ්දයක් මෙසේ පවසයි: "ඉහළ බලන්න." ඔවුන් අහස දෙසට තමාගේ ඇස් යොමු කරන විට පොරොන්දුවේ දේදුන්න ඔවුන්ට දර්ශනය වෙයි. අහස වසාගත් කෝපාකුල කළු වළාකුල් ඉවත් වෙයි. ස්තේඵන් මෙන් ඔව්හු ස්ථිරසාර අයුරින් අහස දෙස බලමින් දෙවියන්වහන්සේගේ තේජසද මනුෂ්‍ය පුත්‍රයාණන් වළාකුල් මත වාඩි වී සිටිනවාද දකින්නෝය. උන්වහන්සේගේ දිව්‍ය ස්වභාවය තුළම උන්වහන්සේට පැමිණි නින්දාවේ ලකුණු දිස්වෙයි. ඒ සමගම උන්වහන්සේ තමන්වහන්සේගේ පියාණන්වහන්සේද ශුද්ධවූ දූතයන්ද ඉදිරියෙහි උන්වහන්සේගේම තොල් වලින් මේ ඉල්ලීම කරනවා ඔවුන්ට ඇසෙයි: "මා සිටින තැන ඔවුනුත් මා සමග සිටිනවාට කැමැත්තෙමි." (යොහන් 17:24) නැවතත් ඒ සුමිහිරි ජයග්‍රාහක හඬ මෙසේ පවසනවා ඇසෙයි: 'ඔව්හු පැමිණෙති! ඔව්හු පැමිණෙති! ඔව්හු ශුද්ධය, අහිංසකය, පවිත්‍රය. ඔවුන් මාගේ ඉවසීමේ වචන රක්ෂා කර තිබේ. ඔවුන්ට දේවදූතයන් අතර ඇවිදීමට පුළුවන.' එවිට, තමාගේ ඇදහිල්ලේ ස්ථිරව සිටියාවූ අය මළානික වූ වෙව්ලන්නාවූ තොල් වලින් යුක්තව ජයග්‍රාහක නාදයක් කරනවා ඇත.

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟගේ මිදීම උදෙසා තමන් බලය දක්වන්නේ මධ්‍යම රාත්‍රියේදීය. සූර්යයා එවිට දීප්තියෙන් බබළනවා ඇත. ඉක්මණින් ලකුණු හා ආශ්චර්යයන් සිදුවෙනවා ඇත. දුෂ්ට අය බියෙන් හා විශ්මයෙන් මේ දර්ශන දෙස බලනවා ඇත. ඒ අතර ධර්මිෂ්ඨයන් ගාම්භීර ප්‍රීතියෙන් යුක්තව, තමාට මිදීම ලැබෙන බව දක්වන මේ ලකුණු දෙස බලා සිටිනවා ඇත. සොබා දහමේ සෑම දෙයක්ම ඒවාට නියමිත ස්වභාවයෙන් ඉවත්වී සිටින බවක් පෙනී යයි. ගංගාවන්හි ගැලීම නවතියි. බැරැති අඳුරු වළාකුළු පතිත වී ඒවා එකිනෙකට ගැටෙයි. කෝපාකුල අහස මධ්‍යයෙහි විස්තර කළ නොහැකි තේජසින් යුත් එක් පැහැදිලි ස්ථානයක් තිබේ. එතැනින් නික්මෙන දෙවියන්වහන්සේගේ හඬ බොහෝ ජල ධාරාවන්ගේ ගැලීමට සමානය. "නිමවිය" යි ඒ හඬ පවසනවා ඇත.

ඒ හඬ අහසත් පොළොවත් සොලවනවා ඇත. "මහත් භූමි කම්පාවක්" පවතිනවා ඇත. "පොළොවේ මනුෂ්‍යයන් සිටි දා පටන් එපමණ බලවත්වූ මහත්වූ භූමි කම්පාවක් වුණේ නැත." (එළිදරව් 16:17,18) අහස් තලය විවෘත වෙමින්ද වැසී යමින්ද පවතින බවක් පෙනෙයි. දෙවියන්වහන්සේගේ සිංහාසනයෙන් පැමිණෙන තේජස

බබළමින් දිස්වෙන බවක් පෙනෙයි. සුළඟට සෙලවෙන ලීයක් මෙන් කඳු සෙලවෙයි. රළු පර්වත දසත විසිරී යයි. හමා එන්නාවූ කුණාටුවක ගර්ජනා ශබ්දයක් ඇසෙයි. මුහුද කෝපයෙන් පතිත වෙයි. සුළි සුළඟක ශබ්දය ඇසෙන්නේ විනාශ කිරීමේ මෙහෙයක යෙදී සිටින යක්ෂයින්ගේ හඬ මෙන්ය. මුළු පොළොවම, මුහුදේ රැල්ල මෙන් ඉහළටද පහළටද යමින් නෙරා යයි. එහි මතුපිට බිඳෙයි. එහි අත්තිවාරම් පවා බිඳී යන බවක් පෙනෙයි. කඳු රැළි ගිලී යයි. ජනාකීර්ණ දූපත් අතුරුදහන් වෙයි. සොදොම මෙන් නපුරුකමට යොමුවූ මුහුදු වරායවල් කෝපාකූල ජලය මගින් ගිල දමනු ලබනවා ඇත. "දෙවියන්වහන්සේගේ උදහසේ සැරකම නැමති මුද්‍රිකපාන කුසලාන මහත් බබිලෝනියට දෙන පිණිස ඈ දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිහි කරනු" ලබයි. (එළිදරව් 16:19,20) අහසෙන් මහත් ගල් වර්ෂාවක් පැමිණෙයි. "එක එක ගල තලෙන්තයක් පමණ බරය." ඒවා, විනාශ කිරීමේ වැඩ ඉටු කරයි. පොළොවේ ඉමහත් උදාරමින් යුත් නගර පහත් කරනු ලබනවා ඇත. තමාටම තේජස ලබාගන්නා පිණිස මනුෂ්‍යයන් තමාගේ ධනය යොදවමින් සකසාගත් ඉතා ශෝභන මාළිගාවල් ඔවුන්ගේ ඇස් ඉදිරිපිටම සුණු විසුණු වී යනවා ඇත. සිරගෙවල බිත්ති වෙන්වී යයි. තමාගේ ඇදහිල්ල උදෙසා ඒවායේ සිරකරනු ලැබූ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෝ නිදහස් වෙති.

සොහොන් ගෙවල් විවෘත කරනු ලැබේ. "පොළොවේ ධූලියේ සැතපෙන්නන්ගෙන් බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල ජීවනයටත් සමහරෙක් නින්දාව සහ සදාකාල නීචකමටත්, පිබිද එන්නෝය." (දානියෙල් 12:2) දූතයන් තිදෙනාගේ පණිවිඩය කෙරෙහි ඇදහිල්ලෙන් මරණයට පත්වූ අය තේජසින් යුක්තව ඔවුන්ගේ සොහොන් ගෙවලින් නික්ම එන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පැවැත්වූ අය උදෙසා පවසනු ලබන්නාවූ උන්වහන්සේගේ සාමයේ ගිවිසුමට සවන් දෙන පිණිසය. "උන්වහන්සේට ඇන්න අයද" (එළිදරව් 1:7) උන්වහන්සේගේ මරණීය වේදනාවේදී උන්වහන්සේට සරදම් කරමින් අපහාස කළාවූ අයද, උන්වහන්සේගේ සෙනඟට හා උන්වහන්සේගේ සත්‍යයන්ට තදින්ම විරුද්ධකම් දක්වූ අයද නැගිටුවනු ලබනවා ඇත. ඒ උන්වහන්සේගේ තේජසින් උන්වහන්සේව දැකීමටද, විශ්වාසවන්ත කීකරු අයට දෙනු ලබන ගෞරවය දැකීමටද ඔවුන්ට පුළුවන් වන පිණිසය.

ඝන වළාකුළුවලින් අහස වැසී යනවා ඇත. එහෙත් සූර්යයා විටින් විට පෙනී යන්නේ යෙහෝවඃවහන්සේගේ නෙත්වල බැල්ම ලෙසය. භයානක විදුලි කෙටීම් අහසින් නිකුත් වන්නේ පොළොව ගිනි ජාලාවකින් වසා ගනිමිනි. ගෙරවීමේ භයානක හඬට ඉහළින් ඇසෙන්නේ අභිරහස්ගත භයානක හඬවලින් දුෂ්ටයන්ගේ විනාශය පවසනු ලැබීමය.



මෙසේ පවසනු ලබන වචන වටහා ගැනීමට සියල්ලන්ට නුපුළුවන. නමුත් බොරුකාර ගුරුවරුන්ට ඒවා පැහැදිලි ලෙස වැටහී යනවා ඇත. මීට ස්වල්ප කාලයකට පෙර ඉතා නොසැලකිලිමත්ව, පාරට්ටු කරගැනීමෙන් යුක්තව, විරුද්ධවාදීව සිටිමින් දෙවියන්වහන්සේගේ ආඥා පැවැත්වූ අයට කෲර ලෙස සැලකීමේදී උනන්දු වූ අය මහත් කනස්සල්ලෙන් යටපත් කරනු ලැබ බියෙන් වෙව්ලති. ඔවුන්ගේ වැලපීමේ හඬ සොබාදහමේ ශබ්දයන්ට ඉහළින් ඇසෙයි. යක්ෂයෝ ක්‍රිස්තුස්-වහන්සේගේ දිව්‍යත්වය පිළිගනිමින් උන්වහන්සේගේ බලය ඉදිරිපිට වෙවුලා සිටිති. ඒ අතර මනුෂ්‍යයෝ දයාව ඉල්ලා ආයාචනා කරමින් ඉමහත් බියෙන් නැඹුරු වෙති.

දෙවියන්වහන්සේගේ දවසේ ශුද්ධවූ දර්ශනය දුටුවාවූ අනාගත-වක්තෘවරු මෙසේ පැවසූහ. "මොරගසා වැලපෙන්න. මක්නිසාද ස්වාමින්වහන්සේගේ දවස ළංව තිබේ. එය සර්වපරාක්‍රමයාණන් විසින් එවන විනාශයක් මෙන් පැමිණෙයි." (යෙසායා 13:6) "නුඹ පර්වතයට ඇතුල්වී ස්වාමින්වහන්සේගේ භයානකකමද උන්වහන්සේගේ මහත්තත්වයේ තේජසද ඉදිරියෙන් ධූලියෙහි සැඟවෙන්න. මනුෂ්‍යයාගේ උඩඟු ඇස් පහත්කරනු ලබන්නේය. ඒ දවසේ ස්වාමින්වහන්සේ පමණක් උසස් කරනු ලබන්නේය. මක්නිසාද උඩඟුවූ අහංකාරවූ සියල්ලට විරුද්ධවද උසස්ව තිබෙන සියල්ලට විරුද්ධවද ... සේනාවල ස්වාමින්වහන්සේගේ දවසක් පැමිණෙන්නේය." "පොළොව ත්‍රස්ත කරවන්ට ස්වාමින්වහන්සේ නැගිටින කළ, උන්වහන්සේගේ භයානකකමද උන්වහන්සේගේ මහත්තත්වයේ තේජසද ඉදිරියෙන් පර්වතවල ගුහාවලටත් කඳුවල විවරවලටත් ඇතුල්වන පිණිස, මනුෂ්‍යයෝ නමස්කාර කිරීමට සාදවාගත් තමුන්ගේ රිදී පිළිමද රන් පිළිමද මීයන්ටත් වවුලන්ටත් අත්හැර දමා යන්නෝය." (යෙසායා 2:10-12,16,20,21)

වළාකුළුවල වෙන්වීමකින් පෙනී යන තාරකාවේ දීප්තිය, එවිට පවතින අන්ධකාරය හා සන්සන්දනය කළ විට, එහි දීප්තිය සතර ගුණයකින් වැඩිය. එය විශ්වාසවන්ත අයවලුන්ට බලාපොරොත්තුව හා ප්‍රීතිය ප්‍රකාශ කරන අතර, දෙවියන්වහන්සේගේ ආඥාවන් කඩ-කරන්නන්ට තද පරුෂ භාවය හා උදහස දක්වයි. ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියල්ල පූජා කළාවූ අය දැන් උන්වහන්සේගේ මණ්ඩපයෙහි ඇත්තාවූ අප්‍රකාශ ස්ථානයෙහි සැඟවී ආරක්ෂා සහිතව සිටිනවා ඇත. ඔවුන් සෝදිසි කරන ලදී. ලෝකයාද සත්‍යය එපා කරන්නන්ද ඉදිරියෙහි ඔව්හු තමා උදෙසා මරණය වින්දාවූ තැනැන්වහන්සේට තමාගේ පක්ෂපාතකම දක්වා තිබේ. මරණයේ අභිමුඛයේ විශ්වාසවන්තව සිටියාවූ අය තුළ මහත් වෙනසක් ඇතිවී තිබේ. යක්ෂයන් බවට පත්වූ

මනුෂ්‍යයන්ගේ අඳුරු, භයානක ප්‍රචණ්ඩකාරිත්වයෙන් ඔවුන් හදිසියෙන්ම මුදනු ලැබ තිබේ. මැතදී මලානිකව, කනස්සල්ලෙන් පූර්ණව, වැහැරී ගිය පෙනුමකින් යුක්තවූ ඔවුන්ගේ මුහුණු දන් විශ්මයෙන්, ඇදහිල්ලෙන් හා ප්‍රේමයෙන් බබළයි. ජයග්‍රාහක ගීතයෙන් යුක්තව ඔවුන්ගේ කටහඬවල් මෙසේ ඔසවනු ලැබේ: "දෙවියන්වහන්සේ අපේ සරණ හා ශක්තියය, දුකේදී ඉතා ළංවූ පිහිටක්ය. එබැවින් පොළොව වෙනස්වෙතත්, මුහුද මැද පර්වත සැලෙතත්, එහි ජල ගුගුරා කැළඹෙතත්, එහි නගින රළ වේගයෙන් පර්වත කම්පා වෙතත් භය නොවන්නෙමුව." (ගීතාවලිය 46:1-3)

ශුද්ධවූ විශ්වාසයෙන් යුත් මේ වචන දෙවියන්වහන්සේ වෙතට නගින අතර, වලාකුළු ඉවත් වී තාරකාවන්ගෙන් පිරි අහස පෙනී යනවා ඇත. එහි දෙපසින් ඇත්තාවූ කළුවූ අඳුරු වූ අහස් තලයට අසමානව එය වචනවලින් පැවසිය නොහැකි තේජසින් යුක්ත වෙනවා ඇත. ස්වර්ගීය නගරයේ තේජස ඒ විවෘත දොරටු තුළින් ගලා එනවා ඇත. එවිට අහස ඉදිරිපිට, හස්තයක් එකට නමන ලද ගල්ලෑලි දෙකක් අල්ලාගෙන සිටිනවා පෙනී යනවා ඇත. අනාගතවක්තෘ මෙසේ පවසා තිබේ: "අහස උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ කරන්නේය. මක්නිසාද දෙවියන්වහන්සේම විනිශ්චයකාරයාණෝය." (ගීතාවලිය 50:6) දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දක්වන ඒ ශුද්ධ වූ ව්‍යවස්ථාව ගිනි හා ගර්ජනාවේ හඬ අතරින් සීනයි කන්දේ සිට ප්‍රකාශ කරනු ලැබුවේ ජීවිතවලට මාර්ගෝපදේශකයක් වන පිණිසය. දන් එය මනුෂ්‍යයන්ට ප්‍රකාශ කරනු ලබන්නේ විනිශ්චයේ නීති මාලාව හැටියටය. ඒ හස්තය ගල්ලෑලි විවෘත කරනවා ඇත. ඒ මත, ගිනිමය පෑනකින් මෙන් ලියන ලද ව්‍යවස්ථාවේ ප්‍රතිපත්ති දර්ශනය වෙනවා ඇත. ඒ වචන කොපමණ පැහැදිලිද යත් සියලු දෙනාටම ඒවා කියවීමට පුළුවන. මතකයක් පුබුදුවනු ලබයි. මිථ්‍යා මතවල හා වැරදි ඉගැන්වීම්වල අන්ධකාරය සෑම මනසකින්ම ඉවත් කරනු ලැබේ. දෙවියන්වහන්සේගේ වචන දහය ලුහුඬු ලෙස, වටහා ගැනීමට පුළුවන් අන්දමින්, බලයෙන් යුක්තව, ලෝකයේ වාසය කරන සියලු මනුෂ්‍යයන්ට දක්වනු ලබනවා ඇත.

දෙවියන්වහන්සේගේ ශුද්ධවූ නියමයන් පාගා දමූ අය තුළ පවතින්ට යන්නාවූ භීතිය හා කනස්සල්ල විස්තර කරන්ට නුපුළුවන් තරම්ය. ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ ව්‍යවස්ථාව ඔවුන්ට දුන්සේක. පසුතැවිලිවීමටද නවෝත්පාදයක් ඇතිකර ගැනීමටද අවස්ථාව තිබියදී තමාගේ චරිතයන් එය සමග සසඳා බලමින් තමාගේ අඩුපාඩු දනගැනීමට ඔවුන්ට පුළුවන්කම තිබුණි. නමුත් ලෝකයා විසින් පිළිගනු ලබන පිණිස ඔව්හු එහි ප්‍රතිපත්ති ඉවත දමා ඒවා කඩ



කිරීමට අන්‍යයන්ටද ඉගැන්වූහ. උන්වහන්සේගේ සබත කඩ කිරීමට ඔව්හු දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට බල කළහ. දන් ඔව්හු, තමන් විසින්ම එපා කරන්ට යෙදුණාවූ ව්‍යවස්ථාව මගින් වරදට පත්කරනු ලැබ සිටිති. තමාට සමාවට කාරණයක් නොමැති බව ඔවුන්ට පෙනී යන්නේ භයානක පැහැදිලිකමකින් යුක්තවය. තමා නමස්කාර කරන්නේද සේවය කරන්නේද කවරෙකුට දැයි ඔවුන් විසින්ම තෝරාගෙන තිබුණි. "එකල ධර්මිෂ්ඨයා සහ දුෂ්ටයා අතරේද දෙවියන්වහන්සේට සේවය කරන්නා සහ උන්වහන්සේට සේවය නොකරන්නා අතරේද ඇති වෙනස නුඹලා නැවත දකිනවා ඇත." (මලාකි 3:18).

පූජකයන් පටන් ඉතා කුඩා අයවලුන් දක්වාම, දෙවියන්-වහන්සේගේ ව්‍යවස්ථාවේ සතුරන් වන සියලු දෙනාටම සත්‍යය හා තමාගේ යුතුකම් පිළිබඳව අලුත් වැටහීමක් ලැබෙනවා ඇත. සතරවන ආඥාවේ දක්වන සබත් දවස ජීවමාන දෙවියන්වහන්සේගේ මුද්‍රාව බව ඔවුන් දනගන්නා විට ප්‍රමාද වැඩිය. ඒ වැරදි සබත් දවසේ නියම ස්වභාවයද, ඔවුන් ගොඩනගමින් සිටියේ වැලි සහිත පදනමක් මත බවද ඔවුන් දනගන්නා විට ප්‍රමාද වැඩිය. තමා දෙවියන්වහන්සේට විරුද්ධව සටන් කරමින් සිටි බව ඔවුන්ට පෙනී යනවා ඇත. තමා මනුෂ්‍යයන් පාරාදීසයේ දොරටු වෙතට යොමු කරනවා යයි පැවසූ ආගමික ගුරුවරුන් මනුෂ්‍යයන් යොමුකර ඇත්තේ විනාශයටය. ශුද්ධවූ සේවයන්හි යෙදී සිටින මනුෂ්‍යයන්ට ඇත්තාවූ වගකීම කොපමණ විශාලද කියාත් ඔවුන්ගේ අවිශ්වාසවන්තකමේ ප්‍රතිඵල කොපමණ භයානකද කියාත් පෙනී යන්නේ ඒ ගණන් බැලීමේ අවසාන දිනයේදීය. එක් ආත්මයක් නැතිවීමේ පාඩුව අපට පෙනී යන්නේ සදාකාලයේදීය. දුෂ්ට වූ දාසය ඉවත්ව යව, යනුවෙන් දෙවියන්වහන්සේ විසින් යම් අය ගැන පැවසිය යුතු වන්නේද, ඔවුන්ගේ අවසානය ඉතා කණගාටුදායක වන්නේය.

යේසුස්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟට ඒ සදාකාල ගිවිසුම සම්පූර්ණ කර දෙන පිණිස එන්නාවූ දවස හා පැය ප්‍රකාශ කරන්නාවූ දෙවියන්වහන්සේගේ හඬ ස්වර්ගයෙන් ඇසෙනවා ඇත. ඉමහත් ශබ්දයකින් යුත් ගෙරවීමේ නාදය මෙන් උන්වහන්සේගේ වචන ලොව පුරා පැතිරී යනවා ඇත. දෙවියන්වහන්සේගේ ඉශ්‍රායෙල්වරු ඉහළ දෙසට ඇස් යොමු කරගෙන ඇහුම්කන් දෙනවා ඇත. උන්වහන්සේගේ තේජසින් ආලෝකමත් වන ඔවුන්ගේ මුහුණු බබළන්ට යෙදෙන්නේ මෝසෙස් සීනයි කන්දෙන් බැස ගිය විට ඔහුගේ මුහුණ බැබළුණාවූ අන්දමටය. දුෂ්ටයන්ට ඔවුන් දෙස බැලීමට නුපුළුවන. උන්වහන්සේගේ සබත් දවස ශුද්ධ කොට පැවැත්වූ අයට ආශිර්වාද පවසනු ලබන විට ජයග්‍රහණයේ මහත් ශබ්දයක් ඇසෙනවා ඇත.

ඉක්මණින්ම, නැගෙනහිර දෙසින්, විශාලත්වයෙන් මනුෂ්‍යයෙකුගේ අතක් පමණ වන කුඩා කළු වලාකුළක් පෙනී යනවා ඇත. එය වනාහි ගැළවුම්කාරයාණන් වටා පවතින වළාකුලය. දුර සිට බලන විට එය අඳුරුව තිබෙන බව පෙනෙයි. මෙය මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ සලකුණ බව දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෝ දනිති. එය පොළොවට ළං වෙමින් වඩාත් ආලෝකමත්ව, තේජාන්විත වන විට ඔව්හු ගාම්භීර නිශ්චලතාවයකින් එදෙස බලා සිටිති. කෙමෙන් එය විශාල සුදු වළාකුලක් වෙයි. එහි පාදකය දවාලන්නාවූ ගින්නක් මෙන් තේජාන්විත වෙයි. එයට ඉහළින් ගිවිසුමේ දේදුන්න පවතියි. ජයග්‍රාහක යුද්ධ භටයෙකු මෙන් යේසුස්වහන්සේ ඒ වළාකුල මත එනසේක. දන් උන්වහන්සේ පැමිණෙන්නේ කණගාටුවේ හා තික්තකමේ කුසලාන පානය කරන පිණිස පැමිණි කණගාටුවේ මනුෂ්‍යයාණන් හැටියට නොවේ. අහසේද පොළොවේද ජයග්‍රාහකයාණන් හැටියට උන්වහන්සේ පැමිණෙන්නේ ජීවත් වන්නාවූ අයවලුන්ද මැරුණාවූ අයවලුන්ද විනිශ්චය කරන පිණිසය. "උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් විනිශ්චයත් යුද්ධයත් කරන සේක." "ස්වර්ගයෙහි සිටින සේනාවෝ .... උන්වහන්සේ පස්සේ ගියෝය." (එළිදරව් 19:11,14) ස්වර්ගීය රාවයෙන් යුත් තුති ගීත ගයමින් ගණන් කළ නොහැකි තරම් විශාල ශුද්ධවූ දූත සමූහයක් උන්වහන්සේ සමග පැමිණෙයි. ඔවුන්ගේ තේජාන්විත ශරීරවලින් අහස් තලය පිරී යයි. ඔව්හු 'දස දහසක්වර දස දහසක්ද දහසක් වර දහසක්ද' වෙති. කිසි මනුෂ්‍ය පෑනකින් ඒ දර්ශනය දක්වනු ලැබීමට නුපුළුවන. කිසි මානුෂික මනසකට එහි තේජස වටහා ගැනීමට නුපුළුවන. 'උන්වහන්සේගේ තේජසින් අහස වැසී යයි. පොළොව උන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන් පිරී යයි. උන්වහන්සේගේ දීප්තිය ආලෝකය මෙන්ය.' මේ ජීවමාන වලාකුල ළංවන විට සෑම ඇසක්ම ජීවනයේ කුමාරයාණන්ව දකියි. දන් උන්වහන්සේගේ ශුද්ධවූ හිස මත කටු ඔටුන්නක් නොමැත. නමුත් ශුද්ධවූ නළල් තලය මත තේජාන්විත ඔටුන්නක් තිබේ. උන්වහන්සේගේ මුහුණ දහවල් කාලයේ බබළන සූර්යාලෝකයට වඩා තේජාන්විතය. "උන්වහන්සේගේ වස්ත්‍රයෙහිද කලවයෙහිද රජවරුන්ගේ රජය, ස්වාමිවරුන්ගේ ස්වාමින්වන්සේය යන නාමය ලියා තිබේ." (එළිදරව් 19:16).

උන්වහන්සේ ඉදිරිපිට 'සියලු මුහුණු සුදුමැලි වෙයි. සදාකාල කණගාටුවේ භයානකත්වය දෙවියන්වහන්සේගේ දයාව එපා කරන්නන් පිට පැමිණෙයි. "සිත දියවීමද දණහිස් වෙවුලීමද .... තිබේ. ඔවුන් සියල්ලන්ගේ මුහුණුද සුදුමැලිව තිබේ." (යෙරෙමියා 30:6; නාහුම් 2:10) "සිටින්ට පුළුවන් වන්නේ කාටද?" යයි ධර්මිෂ්ඨයෝ වෙව්ලන බසින් පවසති. දේවදූතයන්ගේ ගීතය නිශ්චල වෙයි. භයංකාර නිශ්චලතාවයේ වේලාවක් පවතියි. එවිට, 'මාගේ කරුණාව නුඹට



සෑහේ' යනුවෙන් යේසුස්වහන්සේගේ හඬ පවසනවා ඇසෙයි. ධර්මිෂ්ඨයන්ගේ මුහුණු ආලෝකමත් වෙයි. ඔවුන්ගේ හදවත් සියල්ල ප්‍රීතියෙන් පිරී යයි. ඔවුන් තවදුරටත් පොළොවට ආසන්න වන විට දේවදූතයෝ වඩාත් මිහිරි නාදයෙන් නැවත ගීතිකා කරති.

රජවරුන්ගේ රජ වන තැනැන්වහන්සේ දල්වෙන ගින්නකින් ඔතනු ලැබ වළාකුලින් එනසේක. අහස අකුළන ලද පොතක් මෙන් පහව් යයි. පොළොව උන්වහන්සේ ඉදිරිපිට වෙවුලයි. සෑම කන්දක් හා දූපතක්ද ඒවාට නියමිත ස්ථානවලින් ඉවත් කරනු ලැබේ. "අපගේ දෙවියන්වහන්සේ වඩින සේක. නිශ්ශබ්ද නොවන සේක. උන්වහන්සේ ඉදිරියෙහි ගින්නක් විනාශ කරන්නේය. උන්වහන්සේ හාත්පසින්ද සැර කුණාටු අධික වන්නේය. උන්වහන්සේ තමන්ගේ සෙනඟ විනිශ්චය කරන පිණිස ඉහළ අහසටත් පෘථිවියටත් හඬගසනසේක." (ගීතාවලිය 50:3,4)

"පොළොවේ රජවරුද උත්තමයෝද සේනාපතියෝද ධනවන්තයෝද බලවන්තයෝද සියලු දාසයෝද නිර්දාසයෝද කඳුවල ගුහාවලත් පර්වතවලත් සැඟවුණෝය. ඔව්හු කඳුවලටත් පර්වතවලටත් කථාකොට: අප පිට වැටී සිංහාසනයෙහි වැඩඉන්න තැනැන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප සඟවාගන්න. මක්නිසාද උන්වහන්සේගේ උදහසේ මහත් දවස පැමුණුන බැවින් සිටින්ට පුළුවන් කාටදැයි කීවෝය." (එළිදරව් 6:15-17)

සරදම් කිරීමේ හඬ නැවතී තිබේ. බොරු කියන තොල් නිශ්චල කරනු ලැබ තිබේ. යුද්ධායුධ වල ගැටීමද යුද්ධ ඝෝෂාද කෝලාහලය හා "ලෙයෙහි පෙඟූ වස්ත්‍රද" නවතියි (යෙසායා 9:5) දන් සවනට යොමු වන්නේ යාච්ඤාවේද හැඬීමේද හා වැලපීමේද හඬය. මෑතදී සරදම් කළ තොල්වලින් මේ හඬ නිකුත් වෙනවා ඇත: "උන්වහන්සේගේ උදහසේ මහත් දවස පැමුණුන බැවින් සිටින්ට පුළුවන් කාටද?" තමා සුළු කළාවූද එපා කළාවූද තැනැන්වහන්සේට මුහුණ දෙන්නට නුපුළුවන් බැවින් තමා පර්වත හා කඳු යට සඟවනු ලබන ලෙස දුෂ්ටයන් යාච්ඤා කරනවා ඇත.

ඔව්හු මළවුන්ගේ සවන් වලට යොමු වන මේ හඬ දනිති. ඒ පැහැදිලි මෘදු හඬ නිතරම ඔවුන් පසුතැවිලි වීමට කැඳවා තිබේ. මිත්‍රයෙකුගේ සහෝදරයෙකුගේ හා මිදුම්කාරයාණන්ගේ කාරුණික ආයාචනයෙන් ඔවුන්ට මේ හඬ නිතර ඇසී තිබේ. උන්වහන්සේගේ දයාව එපා කරන්නන්ට අන් කිසි හඬක් එතරම් වරදට පත්කරන්නාවූද වරද පෙන්නුම් කිරීමේ බරකින් යුක්ත වූවක්ද විය නොහැකිය. "නුඹලාගේ

නපුරු මාර්ගවලින් හැරෙන්න; නුඹලා නසින්නේ මක්නිසාද?" යයි (එසකියෙල් 33:11) කියමින් ඒ හඬ ඔවුන්ට බොහෝ වේලාවක් ආයාචනය කර තිබුණි. අහෝ! එය අමුත්තෙකුගේ හඬක් වූවා නම් වඩා හොඳය. යේසුස්වහන්සේ මෙසේ කියනසේක. "මම අඬගැසීමි, නුඹලා අකමැතිවූහුය. මාගේ අත දිගු කළෙමි, කවරෙක්වත් සැලකුවේ නැත; නුඹලා මාගේ සියලු දනමුතුකම් සුළුකොට, මාගේ අවවාදය කොහෙත්ම පිළි නොගත්තාහුය." (හිතෝපදේශ 1:24,25) ඒ හඬින් මතකයන් පුබුදුවනු ලබයි. ඒවා මකා දමීමට ඔව්හු කැමති වෙති. අවවාද එපා කර තිබේ, ආරාධනා පිළිනොගෙන තිබේ, දී තිබෙන වරප්‍රසාදයන් එපා කර තිබේ.

ක්‍රිස්තුස්වහන්සේට නින්දා කරනු ලැබූ අවස්ථාවේදී සමහර අය උන්වහන්සේට සරදම් කළහ. ප්‍රමෝදයක් ඇතිකරන බලයකින් යුක්තව ඔවුන්ට මතක් වන්නේ, උත්තම පූජකයා විසින් අණකරනු ලැබූ විට, පීඩාවට පත්වූ උන්වහන්සේ සන්සුන් ලෙස මෙසේ පැවසූ වචනය: "මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයා පරාක්‍රමයේ දකුණු පැත්තේ වාඩිව හිඳිනවාත් අහසේ වළාකුල් පිට එනවාත් නුඹලා දකින්නහුය" යන්නය. (මතෙව් 26:64) උන්වහන්සේ තේජසින් එනවා ඔවුන්ට දකින්ට පුළුවන. උන්වහන්සේ පරාක්‍රමයේ දකුණු පැත්තේ වාඩිව හිඳිනවාද දකින්ට ඔවුන්ට පුළුවන් වෙනවා ඇත.

තමා දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව උන්වහන්සේ පැවසූ විට උන්වහන්සේට සරදම් කළාවූ අයට දැන් කථා කරගැනීමට පවා නුපුළුවන. උඩඟු හෙරෝද් උන්වහන්සේගේ රාජකීය නාමයට සරදම් කරමින් රජ කෙනෙකු හැටියට උන්වහන්සේට ඔටුණු පළඳවන්නැයි නිග්‍රහ කරමින් සිටි සොල්දාදුවන්ට පවසා තිබුණි. උන්වහන්සේ මත ඒ දම් පැහැති සළුව තබමින් උන්වහන්සේගේ ශුද්ධවූ නළල් තලය මත කටු ඔටුන්නක් තැබුවාවූද, සරදම් කිරීමේ බට දණ්ඩක් උන්වහන්සේගේ අතෙහි තබා, අපහාසාත්මක සරදමින් උන්වහන්සේ ඉදිරිපිට වැඳ වැටුණාවූද අය සිටිති. ජීවනයේ කුමාරයාණන්ගේ මුහුණට කෙළ ගැසූ අය උන්වහන්සේගේ ඒ තියුණු බැල්මෙන් ඉවතට හැරී, උන්වහන්සේගේ පැවැත්මේ බලවත් තේජසින් පැන දිවීමට උත්සාහ කරති. උන්වහන්සේගේ අත් හා කකුල්වලට ඇණ ගැසූ අයද උන්වහන්සේගේ ඇලයට ඇන්න සොල්දාදුවාද මහත් භීතියෙන් හා පසුතැවිල්ලෙන් මේ ක්‍රියාවන්හි ලකුණු දකිනවා ඇත.

පූජකයෝද නායකයෝද කල්වරියේදී වූ සිද්ධීන් ඉතා පැහැදිලි ලෙස මතක් කරනවා ඇත. තමාව වෙව්ලවන භීතියකින් ඔවුන්ට මතක් වන්නේ සාතනික උදාරමකින් යුතුව හිස් වනමින් තමා මෙසේ



පැවසූ බවය: "ඔහු අනුන් ගැළෙවුවේය; තමාම ගළවාගන්ට නුපුළුවන. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ රජය; ඔහු දැන් කුරුසියෙන් බසීවා, එවිට අපි ඔහු අදහාගන්නෙමුව. ඔහු දෙවියන්වහන්සේ කෙරේ විශ්වාස කරන්නේය, උන්වහන්සේ ඔහුට ප්‍රිය වනසේක් නම් දැන් ඔහු මුදාහරින සේක්වා." (මතෙව් 27:42,43)

යේසුස්වහන්සේ පැවසූ උපමාවක් ඔවුන්ට හොඳාකාරව මතක් වෙයි. එය තමාගේ ස්වාමියාට මිදි වත්තේ එල දීමට අකමැති වූ ගොවීන් ගැන විය. ඔව්හු ඔහුගේ දාසයන්ට කරදර කර ඔහුගේ පුත්‍රයා මැරුවෝය. ඒ දාසයන්ට දිය යුතු දඬුවම ගැන ඔවුන්ම පවසන්ට යෙදුණාවූ වචන ඔවුන්ට මතක් වෙයි. ඒ මෙසේ විය: 'ඒ මිදි වත්තේ ස්වාමියා ඒ නපුරු මනුෂ්‍යයන් විනාශ කරනවා ඇත.' ඒ නපුරු මනුෂ්‍යයන්ගේ පාපයෙන් හා දඬුවමින් මේ පූජකයන්ට හා වැඩිමහල්ලන්ට දර්ශනය කිරීමට පුළුවන් වූයේ තමාම ක්‍රියා කළාවූ අන්දම හා තමාට හිමි විය යුතුවූ දඬුවමය. ඊළඟට ඔවුන්ට ඇසෙන්නේ මානුෂික වේදනාවෙන් යුක්තව කරනු ලබන ශබ්දයකි. "මොහු කුරුසියෙහි ඇණ ගසුව මැනව, කුරුසියෙහි ඇණ ගසුව මැනව" යන ශබ්දය යෙරුසලමේ වීථි ඔස්සේ පැතිරී ගියේය. ඊටත් වඩා මහත් හඬකින් දැන් අසනු ලබන හඬක් මෙසේ පවසනවා ඇත: 'සැබවින්ම මුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය! මුන්වහන්සේ සැබෑ මෙසියස්වහන්සේය' යන්නය. දැන් ඔව්හු රජවරුන්ගේ රජ වූ මේ තැනැන්වහන්සේ ඉදිරියෙන් ඉවතට දුව යෑමට උත්සාහ කරති. පොළොවේ ධාතූන් සෙලවීමේදී පැලී ගැඹුරු ගුහාවන් බවට පත්වූ ස්ථානවල සැඟවීමට ඔව්හු නිෂ්ඵලයේ උත්සාහ කරති.

සත්‍යය එපා කරන සියලු දෙනාගේම ජීවිතවල ඔවුන්ගේ හෘදය සාක්ෂිය පිබිදෙන්නාවූ අවස්ථාවන් තිබේ, තමා වංචාකාර ජීවිතයක් ගත කළ බව සිහිකර දෙන්නාවූ අවස්ථාවන් තිබේ. එවිට ආත්මය මහත් කණගාටුවෙන් පිරී යයි. නමුත් "භීතිය කුණාටුවක් මෙන් පැමිණෙන විටද" "විනාශය සුළි සුළඟක් මෙන් එන විටද" (හිතෝපදේශ 1:27) ඇතිවන තත්ත්වය ඒවාට සමාන කිරීමට නුපුළුවන. ක්‍රිස්තුස්වහන්සේවද උන්වහන්සේගේ විශ්වාසවන්ත මනුෂ්‍යයන්වද විනාශ කළාවූ අය දැන් දකින්නේ උන්වහන්සේ මත පවතින්නාවූ තේජසය. ඔවුන්ට භීතිය පවතින අතර ඔවුන්ට ඇසෙන්නේ ශුද්ධවන්තයන් ප්‍රීතියෙන් මෙසේ පවසන බවය: "මේ අපේ දෙවියන්වහන්සේය. අපි උන්වහන්සේ ගැන බලා සිටියෙමුව, උන්වහන්සේ අප ගළවනසේක." (යෙසායා 25:9)

පොළොව කරකැවෙමින්, විදුලි කොටමින්, අහස ගොරවමින් තිබියදී දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේගේ හඬ, නිදා සිටින

ශුද්ධවන්තයන්ට හඬගසනවා ඇත. උන්වහන්සේ ශුද්ධවන්තයන්ගේ සොහොන් දෙස බලමින් ස්වර්ගය දෙසට අත් ඔසවා: 'දූවිල්ලෙහි නිදා සිටින්නෙනි නැගිටින්න, නැගිටින්න!' කියා පවසනවා ඇත. පොළොවේ දිගටද හරහටද සිටින මළාවූ අයට උන්වහන්සේගේ හඬ ඇසෙනවා ඇත, එය ඇසෙන්නාවූ අය ජීවත්වෙනවා ඇත. සෑම ජාතියකින්ද, භාෂාවකින්ද, සෙනඟකින්ද නැග එන්නාවූ ඒ මහත් හමුදාවේ ශබ්දය ලොව මුළුල්ලේ ඇසෙනවා ඇත. සදාකාලික තේජසින් සැරසුණාවූ අය මරණය නමැති සිර ගෙයින් පිටතට එන විට ඔවුන් මෙසේ පවසනවා ඇත. "එම්බා මරණය නුඹේ ජය කොයිද? එම්බා මරණය නුඹේ කටුව කොයිද?" (1 කොරින්ති 15:55) ජීවත්ව සිටින ධර්මිෂ්ඨයන්ද නැගිටුවනු ලැබූ ශුද්ධවන්තයන්ද ජයග්‍රහණයේ මහත් ශබ්දයකින් ඔවුන්ගේ කටහඬවල් එක්කරනවා ඇත.

සියලු දෙනාම ඔවුන්ගේ සොහොන් ගෙවලින් එළියට එන්නේ ඒවාට ඇතුල් වූ විට ඔවුන්ට තිබුණාවූ ශාරීරික ප්‍රමාණයෙන්ය. නැගිටියාවූ සෙනඟ අතර සිටින ආදම් මහත් උස ප්‍රමාණයකින් යුතුව රාජකීය පෙනුමක් දරනවා ඇත. නමුත් ඔහු දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේට වඩා මඳක් අඩු තත්ත්වයකින් සිටිනවා ඇත. ඔහු ඊට පසුව පැවති පරම්පරාවල අයවලුන්ට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ස්වභාවයක් දරනවා ඇත. මේ එක කාරණයෙන්ම, මනුෂ්‍ය ජාතිය පහතට බැස තිබෙන ප්‍රමාණය පෙනී යනවා ඇත. නමුත් සියලුදෙනාම නැගිටින්නේ යෞවන භාවයේ නවතම, උද්‍යෝගිමත් ස්වභාවයකිනි. පටන්ගැන්මේදී මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ සමානත්වයෙන් මවනු ලැබුවේ චරිතයෙන් පමණක් නොව ස්වභාවයෙන් හා හැඩහුරුකමින්ය. පාපය එය නරක් කරමින් එය මකා දමන තරම් තත්ත්වයක් ඇති කළේය, නමුත් ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ ඒ නැතිවූ ස්වභාවය නැවත පිහිටුවීමටය. උන්වහන්සේ මේ අපගේ නරක් වූ ශරීර වෙනස් කරමින් ඒවා උන්වහන්සේගේ තේජාන්විත ශරීරයේ සමානත්වයකට පමුණුවනවා ඇත. කුණු වෙන්නාවූ මේ මරණීය ශරීර අලංකාරයෙන් තොරව, වරක් පාපයෙන් නරක්වූ නමුත් ඒවා සම්පූර්ණ වූ අලංකාර වූ අමරණීය ශරීරයන් බවට පත්කරනු ලබනවා ඇත. ඒවායේ වැරදි තත්ත්වයන් හා අඩුපාඩුකම් සොහොනේම අත්හරිනු ලබනවා ඇත. ඈත කාලයේදී ඒදන් උයනේදී නැතිවී ගියාවූ ජීවන වෘක්ෂය නැවත ඒ මනුෂ්‍යයන්ට දෙනු ලබනවා ඇත. ගැළවීම ලැබූ අය, පටන්ගැන්මේදී අපගේ ජාතියට හිමිවූ සම්පූර්ණ තේජාන්විත ස්වභාවයට 'වැඩෙනවා' ඇත. පාපයේ ශාපයෙන් ඉතිරිවී තිබෙන අවසාන සලකුණුද පහකරනු ලබනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාසවන්ත සෙනඟ 'අපගේ දෙවිවූ' ස්වාමින්වහන්සේගේ අලංකාරයෙන්' දර්ශනය වෙනවා ඇත. මනසින්ද, ආත්මයෙන්ද ශරීරයෙන්ද ඔවුන්



තමාගේ ස්වාමින්වහන්සේගේ සම්පූර්ණ ස්වරූපය පිළිබිඹු කරනවා ඇත. අහෝ! වටිනා ගැළවීම! ඒ ගැන අපි බොහෝ සේ කථා කර ඇත්තෙමු, බොහෝ කල් බලාපොරොත්තුවෙන් සිටියෙමු, උනන්දු ආශාවෙන් ඒ ගැන කල්පනා කළෙමු; නමුත් අපි කිසිවිටෙක එය සම්පූර්ණ ලෙස වටහා නොගතිමු.

ජීවත්ව සිටින ධර්මිෂ්ඨ අය "මොහොතකින්, ඇසිපිය හෙළන ක්ෂණයකින්" වෙනස් කරනු ලබනවා ඇත. දෙවියන්වහන්සේගේ හඬ ඇසීමෙන් ඔව්හු තේජාන්විත කරනු ලැබ අමරණීයත්වය පැළඳගෙන සිටිති. මළවුන්ගෙන් නැගිටියාවූ ශුද්ධවන්තයන් සමග ඔවුන් අහසට ඔසවා ගනු ලබන්නේ ඔවුන්ගේ ස්වාමින්වහන්සේ හමුවන පිණිසය. දේවදූතයන් සුළං හමන දිශා සතරින්ම, අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වාම, තෝරා ගත්තාවූ අය රැස්කරනවා ඇත. දේවදූතයෝ කුඩා ළදරුවන් ඔවුන්ගේ මව්වරුන්ගේ අත්වලට භාරදෙනවා ඇත. බොහෝ කාලයක සිට වෙන් කරනු ලැබූ මිත්‍රයන් හමුවන්නේ නැවත කිසිවිටෙක වෙන් කරනු නොලබන පිණිසය. ප්‍රීති ගීතයෙන් යුතුව ඔවුන් සියලු දෙනාම දෙවියන්වහන්සේගේ නගරයට නගිනවා ඇත.

වළාකුල් සහිත වූ ඒ රථයේ එක් එක් පැත්තෙහි පියාපත් තිබෙන අතර එහි යටපැත්තේ ජීවමාන රෝද තිබේ. ඒ රථය ඉහළ දෙසට යන අතර 'ශුද්ධය' යන හඬ ඒ රෝදවලින් නික්මෙන්නේය. එසේම එහි පියාපත් සෙලවෙන විටද, 'ශුද්ධය' යන හඬ නික්මෙයි. දේවදූත සමූහයද 'අති උතුම් දෙවිවූ ස්වාමින්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය' යනුවෙන් හඬ නඟනවා ඇත. රථය අලුත් යෙරුසලම දෙසට යන විට ගැළවීම ලැබූ අය 'අලෙලූයා' කියා නාද කරනවා ඇත.

දෙවියන්වහන්සේගේ නගරයට ඇතුල්වීමට පෙර ගැළවුම්කාරයාණන්වහන්සේ තමාගේ අනුගාමිකයන්ට ජයග්‍රහණයේ සලකුණුද ඔවුන්ගේ රාජකීයත්වයේ සංකේතයන්ද දෙනවා ඇත. එහි තේජාන්විත තත්ත්වය කුහරයක් ඇත්තාවූ චතුරස්‍රයකින් රජතුමා අවට පවතින්නේය. ඒ ස්වභාවය ශුද්ධවන්තයන්ටද දූතයන්ටද ඉහළින්, තේජසින් යුක්තව නැගී සිටිනවා ඇත. උන්වහන්සේගේ මුහුණ කාරුණික ප්‍රේමයෙන් යුත් තේජසින් යුක්තව බබළනවා ඇත. ගැළවීම ලැබූ ඒ සේනාවේ සියලුදෙනාම උන්වහන්සේ දෙස තමාගේ නෙත් යොමා සිටිනවා ඇත. 'උන්වහන්සේගේ මුහුණ අන් කිසිවෙකුට නොතිබුණ අන්දමට පළුදු කර තිබුණි. උන්වහන්සේගේ ස්වභාවය කිසි මනුෂ්‍ය පුත්‍රයෙකුට නොතිබුණාවූ අන්දමට පළුදු කර තිබුණි. දැන් ඔව්හු තේජසින් පිරි උන්වහන්සේව දකිනවා ඇත. යේසුස්වහන්සේ තමන්වහන්සේගේම

දකුණතින්, ජය ගන්නාවූ සියලු දෙනාගේම හිස් මත තේජසේ ඔටුණු තබනවා ඇත. එක් එක්කෙනා උදෙසා, ඔවුන්ගේ 'අළුත් නාමය' ලියා ඇත්තාවූද, 'ස්වාමින්වහන්සේට ශුද්ධකමය' යන වචන ලියා ඇත්තාවූද ඔටුන්නක් තිබෙනවා ඇත. (එළිදරව් 2:17) ජයග්‍රාහකයාගේ තල් අත්තක්ද දිළිසෙන වීණාවක්ද සියලු දෙනාගේම අත්වල තබනු ලබනවා ඇත. එවිට අණ දෙන දූතයා තාලයක් නාද කරන විට සෑම හස්තයක්ම දක්ෂ අත්වලින් වීණාවේ රැහැන් මත යොමු වෙමින් ඉතා සාරවත් සුමිහිරි තූර්ය වාදනයක් නිකුත් කරනවා ඇත. කියා නිම කළ නොහැකි ප්‍රමෝදයකින් සෑම හදවතක්ම පිරී යනවා ඇත. සෑම කටහඬක්ම ස්තූති දීමේ ප්‍රශංසාවෙන් මෙසේ ඔසවනු ලබනවා ඇත. "අපට ප්‍රේම කරන්නාවූ, තමන්ගේ ලෙයින් අපේ පාපවලින් අප මිදුවාවූ, අපව රාජ්‍යයක්ද තමන් පියවූ දෙවියන්- වහන්සේගේ පූජකයන්ද කළාවූ තැනැන්වහන්සේට ගෞරවයද පරාක්‍රමයද සදාකාලේටම වේවා." (එළිදරව් 1:5,6)

ශුද්ධවූ නගරය ඒ මිදීම ලැබුවාවූ සමූහයා ඉදිරිපිටය. යේසුස්වහන්සේ ඒ මුතු දොරටු විවෘත කරන සේක. එවිට උන්වහන්සේගේ සත්‍යයන් අනුව ජීවත් වූ අය ඇතුල් වන්නෝය. එහිදී ඔවුන් දෙවියන්වහන්සේගේ පරාදීසය, ආදම්ගේ අහිංසක භාවයේදී ඔහුට තිබුණාවූ නිවස දකිනවා ඇත. එවිට, කිසි මානුෂික සවනට කිසිවිටෙක යොමු නොවූ තරම් සුමිහිරි නාදයකින් යුත් කටහඬ මෙසේ කියනවා ඇත: 'නුඹලාගේ අරගලය හමාරය.' "මාගේ පියාණන්ගෙන් ආශිර්වාද ලත්තෙනි එන්න, ලෝකයේ පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුම කරගන්න."

"ඔබවහන්සේ මට දුන්නාවූ අය මා සමග සිටිනවාට කැමැත්තෙමි" යනුවෙන් යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන් උදෙසා ඔප්පු කළාවූ යාච්ඤාව මෙවිට සම්පූර්ණ වෙයි. ඔවුන් "උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැලැල් රහිතව" (යූදස් 24) පෙනී සිටිනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේගේ ලේ කරණකොටගෙන මුදාගනු ලැබූ අයවලුන් මේ අන්දමට පියාණන්වහන්සේට ඉදිරිපත් කරනවා ඇත. 'මාද මට ඔබ දුන්නාවූ දරුවෝද මෙහි සිටිමු.' 'මම ඔවුන් ප්‍රවේසම් කළෙමි' අහෝ! ගැළවීම ලබාදෙන ප්‍රේමයේ පුදුමාකාර භාවය! සදාකාලික පියාණන්වහන්සේ ගැළවීම ලැබූවන් දෙස බලන විට ඇතිවන ප්‍රීතිය ඉමහත්ය. උන්වහන්සේ ඔවුන් තුළ තමන්වහන්සේගේ ස්වරූපය දකිනවා ඇත. පාපයේ විරුද්ධතාවයද එහි නරක බලපෑමද ඉවත් වී තිබේ. මනුෂ්‍යාත්වය නැවත වරක් දිව්‍යත්ව සමග ඒකත්වයක් වෙයි.



කියා නිම කළ නොහැකි ප්‍රේමයෙන් යුක්තව යේසුස්වහන්සේ තමන්වහන්සේගේ විශ්වාසවන්ත අයවලුන් 'ස්වාමින්වහන්සේගේ ප්‍රීතියට' පිළිගන්නාසේක. ගැළවුම්කාරයාණන්වහන්සේගේ ප්‍රීතිය වන්නේ තමන්- වහන්සේගේ වේදනාව හා නින්දාව මගින් ගැළවීම ලැබූ අය තේජසේ රාජ්‍යයේ සිටිනවා දැකීමය. ගැළවීම ලැබූ අය මේ ප්‍රීතියට හවුල්කරුවන් වන්නේ ඒ ආශිර්වාදලත් අයවලුන් අතර, තමාගේ යාච්ඤා මගින්ද, තමාගේ සේවය හා ප්‍රේමණීය පූජාවීම මගින්ද ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගනු ලැබූ අයවලුන් සිටිනවා දැකීමෙන්ය. ඔවුන් ඒ මහා සුදු සිංහාසනය අවට රැස්වන විට කියා නිම කළ නොහැකි ප්‍රීතියෙන් ඔවුන්ගේ සිත් පිරී යනවා ඇත. තමා ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙනාවාවූ අය දකින විටද, ඔවුන් වෙනත් අයවත්, ඒ අය තවත් අයවත් දිනාගනිමින් ඔවුන් සියලු දෙනාම නිවාඩුවේ ආරක්ෂක ස්ථානයට පැමිණ සිටින බව දකින විටද ඔවුන් තමාගේ ඔටුණු යේසුස්වහන්සේගේ පාමුල තබමින් සදාකාලයේ කවයන් මුළුල්ලේ උන්වහන්සේට ප්‍රශංසා කරනවා ඇත.

මිදීම ලැබූවන් දෙවියන්වහන්සේගේ නගරයට පිළිගනු ලබන විට ගුවන ගෞරව සම්පන්න නමස්කාරයේ උසස් හඬකින් පිරී යනවා ඇත. ආදම්ලා දෙදෙනා ඔවුනොවුන් සමග මුණගැසෙනවා ඇත. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ අත් දිගු කරගෙන, අපගේ ජාතියේ පියා පිළිගැනීමට බලා සිටිනවා ඇත. ඔහු වනාහි උන්වහන්සේ විසින් මවන ලද තැනැත්තාය ඔහු තමාගේ මැවුම්කාරයාණන්වහන්සේට විරුද්ධව පව් කළේය. ඔහුගේ පාපයන් නිසා කුරුසිපත් කරනු ලැබීමේදී ඇතිවූ සලකුණු අපගේ ගැළවුම්කාරයාණන්වහන්සේගේ සිරුර මත පවතියි. ආදම් ඒ කෲර ඇණවල සලකුණු දකින විට ඔහු තම ස්වාමින්වහන්සේගේ තුරුල්ලට යොමු නොවී, ඉතා යටහත්කමින් උන්වහන්සේගේ පාමුල වැටී, 'මරනු ලැබූ බැටළු පැටවාණෝ .... ප්‍රශංසාව ලබන්ට වටින තැනැන්වහන්සේය"යි පවසනවා ඇත. ගැළවුම්කාරයාණන්වහන්සේ මෘදු ලෙස ඔහුව ඔසවමින් මෙපමණ කාලයක් මුළුල්ලේ ඔහු කෙරෙන් ඉවත් කරනු ලැබූ ඒදන් නිවස දෙස බලන්නැයි ඔහුට කියනවා ඇත.

ඒදන් උයනෙන් ඉවත් කරනු ලැබූවාට පසුව ආදම්ගේ ජීවිතය කණගාටුවෙන් පිරී තිබුණි. මැරී ගිය සෑම කොළයක්ද, පූජාවට ගොදුරු වූ සෑම සතාද, සොබා දහමේ අලංකාර මුහුණ මත ඇතිවූ සෑම අප්‍රසන්නතාවයක්ද, මනුෂ්‍යයාගේ පවිත්‍රතාවය මත ඇතිවූ සෑම කැළලක්ද ඔහුට තමාගේ පාපය අලුතෙන් මතක් කර දුන්නේය. පාපය වර්ධනය වෙනවා දුටු විට ඔහු තුළ ඇතිවූ කණගාටුවේ වේදනාව ඉමහත් විය. එසේම ඔහු දුන්නාවූ අවවාදයන්ට ප්‍රතිචාරයක් වශයෙන් ඔහුටම නින්දා කරනු ලැබුවේ ඔහු මේ පාපයන් ඇතිවීමට

හේතුව වූ බව පවසමිනි. වසර දහසක් පමණ කාලයක් මුළුල්ලේ ඔහු තමාගේ පාපයේ දඬුවම විඳ දරාගත්තේය. ඔහු විශ්වාසවන්ත ලෙස තමාගේ පාප ගැන පසුතැවිලි වෙමින් ගැළවුම්කාරයාණන් ගැන දෙන ලද පොරොන්දු විශ්වාස කළේය. ඔහු මරණයට පත්වූයේ නැවත නැගිටීමේ බලාපොරොත්තුව ඇතිවය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ, මනුෂ්‍යයාගේ පරාජයෙන් හා පාපයට වැටීමෙන් ඔහු මුදාගත්සේක. දැන් සමගි කිරීමේ සේවය මගින් ආදම් නැවත ඔහුට මුලදී තිබුණාවූ තත්ත්වයට පමුණුවනු ලැබේ.

ප්‍රීතියෙන් එතැනට පැමිණෙන ඔහු වරක් තමාට ප්‍රීතිය ගෙන දුන්නාවූ වෘක්ෂයන් දෙස බලයි. ඔහුගේ අහිංසකකමේ හා ප්‍රීතියේ කාලයේදී ඔහුම ඒ ගස්වල එල එකතු කරගෙන තිබුණි. ඔහුගේම අත්වලින් හැඩ ගස්වන ලද මිදි වැල්ද ඔහු ආදරයෙන් සැලකූවාවූ මල් ගස්ද ඔහුට පෙනෙයි. මේ දර්ශනයේ නිත්‍යතාවය ඔහුගේ මනසට වැටහෙයි. මේ ඇත්තෙන්ම නැවත දෙනු ලැබූ ඒදන් උයන බවද ඔහු එයින් ඉවත් කරනු ලැබූ විට එහි පැවති අලංකාරයාට වැඩියෙන් දැන් එය අලංකාර බවද ඔහුට පෙනෙයි. ගැළවුම්කාරයාණන්වහන්සේ ඔහුව ජීවන වෘක්ෂය වෙත ගෙන ගොස් එහි ඇති තේජාන්විත පළතුරු නෙලා ඒවා කන්නැයි ඔහුට කියන සේක. ඔහු තමා අවට බලමින් ඔහුගේ පවුලේ මහත් සමූහයක් ගැළවීම ලබා දෙවියන්-වහන්සේගේ පාරාදීසයේ සිටින බව දකියි. එවිට ඔහු තමාගේ බබළන ඔටුන්න යේසුස්වහන්සේගේ පාමුල තබමින් උන්වහන්සේගේ පපුව මත්තට වැටී මිදුම්කාරයාණන්වහන්සේව බදා ගනියි. ඔහු ඒ රන් වීණාව ස්පර්ශ කරයි. 'මරන ලද බැටළු පැටවාණන්වහන්සේ ඉතා අගනේය. උන්වහන්සේ නැවත ජීවත්ව සිටින සේක' යන ඔහුගේ ගීතය ස්වර්ගයේ දෝංකාරය වෙයි. ආදම්ගේ පවුලට ඒ ගීතයට සම්බන්ධ වෙයි. නමස්කාරයෙන් වැඳ වැටෙමින් ඔව්හු ගැළවුම්-කාරයාණනවහන්සේගේ පාමුල ඔවුන්ගේ ඔටුණු තබති.

දේවදූතයෝ දැන් මේ එක්වීම සාක්ෂි දරති. ඔව්හු ආදම්ගේ පාපයට වැටීමේදී වැලපුණාහ. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට ස්වර්ගයට නැගී එමගින් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නා සියල්ලන්ගේ සොහොන් ගෙවල් විවෘත වීමේ මාර්ගය පිහිටුවීම ගැන ඔව්හු ප්‍රීතිවූහ. දැන් මිදීමේ සේවය සම්පූර්ණ වී තිබෙන බව දකින ඔව්හු ප්‍රශංසා ගීතයට තමාගේ කටහඬවල්ද එක් කරති.

සිංහාසනය ඉදිරිපිට පළිඟු වැනි මුහුද තිබේ. එය ගින්නෙන් මිශ්‍ර වූ වීදුරු සාගරයක් වැනිය. එය දෙවියන්වහන්සේගේ තේජසින් බබළයි. "මෘගයාගෙනුත් උගේ රූපයෙනුත් උගේ නමේ ගණනෙනුත් ජයගෙන



එන්නන් දෙවියන්වහන්සේගේ වීණා රැගෙන වීදුරු සාගරය ළඟ" එක්රැස්වෙති. (එළිදරව් 15:2) 'එක් ලක්ෂ සතළිස් හාරදහසක් වන සමූහය බැටළු පැටවාණන් සමග සියොන් කන්ද මත සිටිති. ඔවුන් වනාහි මනුෂ්‍යයන් අතරින් මුදනු ලැබූ අයවල්ය.' "බොහෝ ජල ඝෝෂාව මෙන්ද මහත් ගර්ජනාවක ශබ්දය මෙන්ද" වූ ශබ්දය වනාහි තමුන්ගේ වීණාවලින් ගායනා කරන්නන්ගේ ශබ්දයය. ඔව්හු "අලුත් ගීතිකාවක් ගායනා කළෝය. ඒ ගීතිකාව එක්ලක්ෂ සතළිස් සාර දහසට එනම් පොළොවෙන් මිලේටගනු ලැබූවාවූ අයින්ට මිස අන් කිසිවෙකුට ඉගෙනගන්ට නොහැකිවිය." එය මෝසෙස්ගේද බැටළු පැටවාණන්ගේද ගීතය විය. එය මුදනු ලැබීමේ ගීතයක් විය. ඒ ගීතය ඉගෙනගත හැක්කේ ඒ එක්ලක්ෂ සතළිස් සාර දහසට පමණය. කුමක්හෙයින්ද එය ඔවුන්ගේ අත්දැකීම පිළිබඳව වූ ගීතයකි. අන් කිසිවෙකුට එබඳු අත්දැකීමක් ලැබුණේ නැත. "බැටළු පැටවාණන් යන යන තැනට උන්වහන්සේ අනුව යන්නෝ මොව්හුය." පොළොව මත ජීවත් වන්නන් අතරින් අන් වෙසක් කරනු ලැබූ "මොවුහු දෙවියන්-වහන්සේටත් බැටළු පැටවාණන්ටත්  නාඹුල් එල" ය. ඔව්හු "මහත් පීඩා මැදින්" පැමිණියාවූ අයවල්ය. ලෝකය පටන්ගැන්මේ සිට නොතිබුණාවූ අන්දමේ පීඩා කාලයක් තුළින් ඔව්හු පැමිණ සිටිති. ඔව්හු යාකොබ්ගේ කරදර කාලය වැනිවූ පීඩා කාලයක වේදනාව ඉසුලූ අයවල්ය. දෙවියන්වහන්සේගේ අවසාන විනිශ්චයන් වගුරුවනු ලැබීමේදී ඔවුන් ජීවිතයට මුහුණ දුන්නේ මැදහත්කාරයාණන් නොමැතිවය. "ඔව්හු තමුන්ගේ සළු බැටළු පැටවාණන්ගේ ලෙයින් සෝදා සුදු කරගත්තෝය." "ඔවුන්ගේ මුඛයෙහි බොරුවක් සම්බ නොවීය. ඔව්හු නොකැළැල්ව සිටිති. "ඔව්හු දෙවියන්වහන්සේගේ සිංහාසනය ඉදිරියෙහි සිටිති. උන්වහන්සේගේ මාළිගාවේ රෑ දාවල් උන්වහන්සේට සේවය කරති. සිංහාසනයෙහි වැඩහිඳින තැනැන්වහන්සේ තමන්ගේ මණ්ඩපය ඔවුන්ට උඩින් විදහනසේක. සාගත හා වසංගත මගින්ද මනුෂ්‍යයන් මහත් උෂ්ණයකින් දැවීමට සූර්යයාට බලය තිබීම මගින්ද පොළොව විනාශ වී තිබෙනවා ඔවුන් දැක තිබුණි. ඔව්හුද පීඩාවන්, සාගින්න හා පිපාසය දරාගෙන තිබුණි. නමුත් "ඔවුන්ට තවත් බඩගිනි වන්නේවත් පිපාසා වන්නේවත් නැත. සූර්ය රශ්මියවත් කිසි රස්නයක්වත් ඔවුන්ට පහර දෙන්නේ නැත. මක්නිසාද සිංහාසනය මැද සිටින බැටළු පැටවාණෝ ඔවුන්ගේ එඬේරා වී ජීවන දිය උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. "දෙවියන්වහන්සේද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිස දමන සේක." (එළිදරව් 14:1-5; 15:3; 7:14-17)

සියළු කාලවලදීම ගැළවුම්කාරයාණන්ගේ තෝරාගන්නා ලද අය පීඩා විඳීමේ පාසැලෙන් ඉගෙනීම හා හික්මීම ලබා තිබේ. ඔව්හු

පොළොව මත පටු මාවත් ඔස්සේ ගමන් ගෙන තිබේ. ඔව්හු පීඩා විඳීමේ ගිනි උඳුනෙන් පවිත්‍ර කරනු ලැබ තිබේ. යේසුස්වහන්සේ උදෙසා ඔව්හු විරුද්ධවාදිකම්ද ද්වේෂ කරනු ලැබීමද නිග්‍රහයද දරාගත්හ. මහත් පීඩාවන් ඔස්සේ ඔව්හු උන්වහන්සේ පස්සේ ගියහ. ඔව්හු ආත්ම පූජාවීම ක්‍රියාත්මක කරමින් මහත් බලාපොරොත්තු කඩවීම්වලට මුහුණ දුන්හ. ඔවුන්ගේම වේදනාත්මක අත්දැකීම් මගින් ඔව්හු පාපයේ නපුරුකමද එහි බලය, එහි වරදකාරකම හා දුකද ඉගෙන ගත්හ. ඔවුන් පාපය දෙස බලන්නේ ඉමහත් අප්‍රසන්නතාවයකිනි. එයට පිළියමක් වශයෙන් අති උතුම් පූජාවක් ඔප්පු කරනු ලැබීම ගැන ඇති දැනගැන්ම මගින් ඔව්හු තමාගේම ඇස් හමුයෙහි යටත් කරනු ලබති. ඔවුන්ගේ සිත් කෘතඥතාවයෙන් හා ප්‍රශංසාවෙන් පිරී යයි. පාපයට නොවැටුණාවූ අයට ඒවා අගය කිරීමට නුපුළුවන. ඔවුන් බොහෝසේ ප්‍රේම කරන්නේ ඔවුන්ට බොහෝසේ කමාව දී තිබෙන නිසාය. ක්‍රිස්තුස්වහන්සේගේ වේදනාවන්ට සහභාගී වී තිබෙන ඔවුන්ට උන්වහන්සේගේ තේජසට පංගුකාරයන් වීමට පුළුවන.

දෙවියන්වහන්සේගේ උරුමක්කාරයන් වන අය කුඩා කාමරවලින්ද දුගී ගෙවලින්ද, සිර ගෙවලින්ද, පීඩා කිරීමේ මැසිවලින්ද, කඳුකරයෙන්ද, කාන්තාරවලින් හා පොළොවේ ගුහාවලින්ද, මුහුදේ ලොකු ගුහාවලින්ද පැමිණ සිටිති. ලෝකයේ සිටියදී ඔව්හු දුගීව, පීඩා කරනු ලැබ, වේදනාවට පත්ව සිටියහ. සාතන්ගේ රැවටිලිකාරකම් වලට යටත් වීමට ස්ථිර ලෙසම අකමැති වූ බැවින් ලක්ෂ සංඛ්‍යාත ජනයා බොහෝ සේ නිග්‍රහ කරනු ලැබ තම සොහොන් වලට ගියහ. ඔවුන් ඉතාම නරක අපරාධකරුවන් යයි විනිශ්චය මණ්ඩලයන් විසින් පවසා තිබුණි. නමුත් දැන් "දෙවියන්වහන්සේම විනිශ්චයකාරයාණෝය." (ගීතාවලිය 50:6) "ඔව්හු ශුද්ධ සෙනඟය කියාත් ස්වාමීන්වහන්සේගේ මුදාගත් අයය කියාත් කියනු ලබන්නෝය." (යෙසායා 62:12) උන්වහන්සේ "අළු වෙනුවට මාලාවකුත් වැලපීම වෙනුවට ප්‍රීතිය නැමති තෙලයත් ක්ලාන්ත සිතක් වෙනුවට ප්‍රශංසාව නැමති වස්ත්‍රයත් ඔවුන්ට" දෙන සේක. (යෙසායා 61:3) ඔවුන් තවදුරටත් දුර්වලව, පීඩාවට පත්ව, විසුරුවනු ලැබ, කරදරවලට අසුවී සිටින්නේ නැත. මෙතැන් පටන් ඔවුන් සෑම විටම දෙවියන්වහන්සේ සමග සිටිනවා ඇත. ඔවුන් සිංහාසනය ඉදිරිපිට සිටගන්නේ මේ ලෝකයේ ඉතාම ගරුසම්පන්න වූ අයවල් පැළඳ සිටියාට වඩා වටිනා ඇඳුම් පැළඳගෙනය. ඔවුන් පැළඳ සිටින ඔටුණු වනාහි ලෝකයේ රජවරුන්ගේ නළල් මත කිසිවිටෙක තබනු ලැබුවාට වඩා තේජාන්විත ඔටුණුය. වේදනාවේ හා වැලපීමේ දවස් හමාරය. තේජසේ රජතුමාණන් විසින් ඔවුන්ගේ සියලු කඳුළු පිස දමනු ලැබ තිබේ. කණගාටුව ඇතිකරන සෑම දෙයක්ම ඉවත්කර තිබේ. තල් අතු වනන අතර ඔව්හු පැහැදිලි සුමිහිරි ඒකමතික හඬින් ප්‍රශංසා ගීතයක් ගායනා කරති. සෑම කටහඬක්ම එහි රාවයට



එකතු වෙයි. "සිංහාසනයෙහි වැඩහිඳින අපේ දෙවියන්වහන්සේටත් බැටළු පැටවාණන්ටත් ගැළවීම අයිතිය" කියන ගීත නාදය ස්වර්ගය මුළුල්ලේ අසනු ලැබේ. මුළු ස්වර්ගීය සේනාවම එයට ප්‍රතිචාරය දෙමින් මෙසේ පවසති: "ආමෙන්. ප්‍රශංසාවද තේජසද ප්‍රඥාවද ස්තුතියද ගෞරවයද බලයද පරාක්‍රමයද සදාකාලේටම අපේ දෙවියන්වහන්සේට වේවා." (එළිදරව් 7:10,12).

මේ ජීවිතයේදී අපට ගැළවීම නමැති මේ පුදුමාකාර තේමාව වටහා ගන්ට පටන්ගැනීමට පමණක් පුළුවන. අපගේ සීමිත වැටහීම අනුව අපට, කුරුසියේදී එකට හමුවන නින්දාව හා තේජසද, ජීවිතය හා මරණයද, යුක්තිය හා දයාවද මහත් උනන්දුවෙන් සලකා බැලීමට පුළුවන. එහෙත් අපගේ මනස අපට හැකි පමණ පුළුල් කර සලකා බලන්නේ වුවද අපට ගැළවීම ලබාදෙන ප්‍රේමයේ සම්පූර්ණ අදහසද එහි දිග හා පළලද, එහි උස හා ගැඹුරද වටහාගත හැක්කේ යන්තමින් පමණය. ගැළවීම ලැබූ අය ඔවුන් දකිනු ලබන අන්දමට තමාව දර්ශනය කරන විටද ඔවුන්ව දැනගනු ලබන අන්දමට තමාව දැනගන්නා විටද ඔවුන්ට මිදීමේ සැලැස්ම සම්පූර්ණ ලෙස වටහා ගැනීමට නුපුළුවන. නුමුත් සදාකාලය මුළුල්ලේම ඔවුන්ගේ විස්මපත්වූ, ප්‍රීතියට පත්වූ කල්පනාවන්ට අලුත් සත්‍යයන් විවෘත කරනු ලබනවා ඇත. ලෝකයේදී ඇතිවූ කණගාටුව, වේදනාවන් හා පරීක්ෂාවන් හා ඒවා ඇති කළ හේතුන්ද ඉවත් කරනු ලබන්නේ වුවද, තමාගේ ගැළවීම සඳහා ගෙවිය යුතුවූ මිලය කුමක් වූයේද යන්න දෙවියන්-වහන්සේගේ මනුෂ්‍යයන් පැහැදිලි ලෙස, ප්‍රඥාවන්ත ලෙස දැනගන්නවා ඇත.

සදාකාලය මුළුල්ලේම ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත කළාවූ පූජාව, ගැළවීම ලැබූ අයගේ විද්‍යාව හා ගීතය වෙනවා ඇත. තේජාන්විත වූ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔවුන් කුරුසිපත් වූ ක්‍රිස්තුස්වහන්සේව දකිනවා ඇත. විශාල ගුවන තුළ ගණන් කළ නොහැකි තරම් ලෝකවල් මවා පාලනය කිරීමේ බලය ඇත්තාවූ ප්‍රේමණීය දෙවියන්වහන්සේ, ස්වර්ගයේ තේජාන්විත තැනැන්වහන්සේ, කෙරුබිම් හා සෙරපිම්වරුන් නමස්කාර කිරීමට ආශාවන තැනැන්වහන්සේ, පාපයට වැටුණාවූ මනුෂ්‍යයන් නහාලන පිණිස තමාම යටත් කරගත් සේක යන්න කිසිවිටෙක අමතක කරනු ලබන්නේ නැත. උන්වහන්සේ පාපයේ වරදකාරකම හා නින්දාව පිළිගෙන පාපයට වැටුණාවූ ලෝකයේ කණගාටුව තමාගේ හදවත බිඳින තුරුත් පියාණන්වහන්සේගේ මුහුණ තමා කෙරෙන් සඟවනු ලැබීම දරාගෙන, කල්වරි කුරුසිය මත තමාගේ ජීවිතය පූජා කළ බව අමතක කරනු ලබන්නේ නැත. සියලු ලෝකවල් මැවූ තැනැන්වහන්සේ, සියලු ජීවිත පාලනය කරන තැනැන්වහන්සේ, තමන්වහන්සේගේ තේජස පසෙක තබා, මනුෂ්‍යයා කෙරෙහි ඇත්තාවූ

ප්‍රේමය නිසා තමාම යටත් කරගත් බව මුළු විශ්වයේම පුදුමය හා නමස්කාරය පුබුදුවනවා ඇත. ගැළවීම ලැබූ ජාතීන් තමාගේ මිදුම්කාරයාණන් දෙස බලමින් සදාකාලික පියාණන්වහන්සේගේ තේජස උන්වහන්සේගේ මුහුණෙහි බබළන බව දකිනවා ඇත. උන්වහන්සේගේ සිංහාසනය සදාකාලයෙන් සදාකාලයටම පවතින බවත් උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නැති බවත් ඔවුන් දකින විට, ඔවුන් උද්‍යෝගිමත් ප්‍රශංසාවේ ගීතය මෙසේ ගායනා කරනවා ඇත: "මරන ලද බැටළු පැටවාණන්වහන්සේ ඉතා අගනේය. උන්වහන්සේ තමන්වහන්සේගේම වටිනා ලේ වලින් අප ගළවා අපව දෙවියන්වහන්සේට දුන්සේක" යන්නය.

කුරුසියේ පූජාවේ අභිරහස අනික් සියලු අභිරහස් විස්තර කරයි. අප බියෙන් හා විශ්මයෙන් පිරවූ දෙවියන්වහන්සේගේ ගුණාංග, කල්වරියෙන් ගලා එන ආලෝකය අනුව, අලංකාර බවද සිත් ඇදගන්නා ගුණාංග බවද අපට පෙනී යයි. දයාව, මෘදුකම හා දෙමාපිය ප්‍රේමය මිශ්‍රව පවතින්නේ පරිශුද්ධතාවය, යුක්තිය හා බලය සමගය. උන්වහන්සේගේ රාජකීය සිංහාසනය උසස්ව නගා දක්වා තිබෙන බව අප දකින අතරම, අපි උන්වහන්සේගේ චරිතයේ දයාබර ප්‍රකාශනය දකිමින් මීටපෙර කිසිවිටෙක වටහා නොගත් අන්දමට තේරුම් ගන්නවා ඇත්තේ 'අපගේ පියාණන්වහන්සේ' යන ප්‍රේමණීය නාමයේ අදහසය.

අසීමිත ප්‍රඥාවෙන් යුත් උන්වහන්සේ අපගේ ගැළවීම සඳහා යොදාගත් එකම සැකසුම වූයේ තමන්වහන්සේගේ පුත්‍රයාණන් පූජාකිරීම බව අපට පෙනී යනවා ඇත. මේ පූජාවෙන් උන්වහන්සේට ඇතිවන්නාවූ ප්‍රතිඵලය නම්, ශුද්ධවූ, ප්‍රීතියෙන් යුක්තවූ, අමරණීය ගුණාංගයෙන් යුත්, මිදීම ලැබූ මනුෂ්‍යයන්ගෙන් පොළොව ජනාකීර්ණ වීමය. අන්ධකාරයේ බලවේගය සමග ගැළවුම්කාරයාණන්වහන්සේට ඇතිවූ අරගලයේ ප්‍රතිඵලය වන්නේ මිදීම ලැබුවන්ට සදාකාලය මුළුල්ලේ ප්‍රීතියෙන්, දෙවියන්වහන්සේට මහිමය අත්වන අන්දමට ජීවත්වීමට පුළුවන් වීමය. ආත්මයක වටිනාකම කොපමණද යත් ඒ සඳහා ගෙවන ලද මිලය ගැන පියාණන්වහන්සේ සෑහීමට පත්වන සේක. ක්‍රිස්තුස්වහන්සේමද තමන්වහන්සේගේ ඉමහත් පූජාවේ ප්‍රතිඵල දෙස බලමින් සෑහීමට පත්වන සේක.



# 41

## පොළොව පාළු වී පවතියි

"ඇගේ පව් ස්වර්ගය දක්වා නැංගේය. දෙවියන්වහන්සේද ඇගේ අපරාධ සිහිකළ සේක. ඇ දුන් ලෙස ඇට ප්‍රතිඵල දී, ඇගේ ක්‍රියා හැටියට දෙගුණයක් ඇට දෙන්න. ඇ මිශ්‍ර කර දුන් කුසලානෙහි දෙපංගුවක් මිශ්‍ර කර ඇට දෙන්න. ඇ යම් පමණක් තමාම වර්ණනා කරගනිමින් සැප ජීවිකාවෙන් වැඩිවූවාද, එපමණටම ඇට ශෝකය හා වධ දෙන්න. මක්නිසාද: මම බිසවක්ව වැඩ හිඳිමි, මම වැන්දඹුවක් නොවෙමි. ශෝකයද කිසිසේත් නොදකිම්යි ඇ සිතින් කියා ගන්නීය. එබැවින් මරණයද ශෝකයද සාගතයද යන ඇගේ පීඩා එක දවසේම පැමිණෙන්නේය. ඇ සහමුලින් ගින්නෙන් දවනු ලබන්නීය. මක්නිසාද ඇ විනිශ්චය කළ ස්වාමිවූ දෙවියන්වහන්සේ බලවත්ව සිටින සේක. ඇ සමග වේශ්‍යාකම් කොට සැපජීවිකාවෙන් විසූ පොළොවේ රජවරු ඇගේ දැවීමේ දුම දකින කළ, ඇගේ වේදනාවට භයින් දුරින් සිට: අහෝ, අහෝ, මහත් නුවර, බබිලෝනිය, බලවත් නුවර! එක පැයකින් නුඹේ විනිශ්චය පැමුණුණේය කියමින් ඇ ගැන අඬා විලාප කියති." (එළිදරව් 18:5-10)

"ඇගේ සැප ජීවිකාවේ අධිකකමෙන් ධනවත්වූ" "බඩු වෙළෙන්දෝ ඇ විඳින වධයට භයව, අඬමින් වැලපෙමින්, දුරින් සිට: අහෝ, අහෝ, මහත් නුවර, සිහින් රෙදිද රත් නිල් සහ රක්ත වස්ත්‍රද පැළඳ රනින්ද අනර්ඝ මැණික් හා මුතුවලින්ද සැරසුණාවූ නුවර! එක පැයකින් එපමණ මහත් ධනය නැතිවී ගියේ යයි කියති." (එළිදරව් 18:3,15-17)

දෙවියන්වහන්සේගේ උදහස වගුරුවනු ලබන දවසේදී බබිලෝනිය මත මෙබඳු විනිශ්චයක් පමුණුවනු ලබනවා ඇත. ඇගේ අධර්මිෂ්ඨකමේ කුසලාන පුරවනු ලැබ තිබේ. ඇගේ කාලය පැමිණ තිබේ. ඇය විනාශ කරනු ලැබීමට සුදුසුය.

ජීවිතයේ මහා අරගලයේදී සමහර අයට සියල්ල නැති වී තිබෙන අතර දෙවියන්වහන්සේගේ කටහඬ උන්වහන්සේගේ සෙනඟගේ වහල්කම ඉවත් කරන විට මෙසේ සියල්ල නැතිවූ සෙනඟ අතර මහත් පිබිදීමක් ඇතිවන්නේය. සෝදිසි කිරීමේ කාලය පැවති විට ඔව්හු සාතන්ගේ රැවටීම් වලින් අන්ධ වී තමාගේ පාපතර ක්‍රියා පිළිවෙල යුක්ති සහගත යයි පැවසූහ. පොහොසත් අය තමා අඩු සම්පත්ති ඇති අයට

වඩා උසස් යයි කියමින් ආඩම්බර වූහ. නමුත් ඔවුන් තමාගේ සම්පත්ති ලබාගත්තේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් කඩ කරමිනි. ඔවුහු සාගින්නට පත්වූවන්ට ආහාර දීමද, නිර්වස්ත්‍ර වූවන්ට ඇඳුම් දීමද යුක්ති සහගත ලෙස ක්‍රියාකිරීමද දයාවට ප්‍රේම කිරීමද අතපසු කළහ. ඔව්හු තමාවම උසස් කරගැනීමටද සහකාර මනුෂ්‍යයන්ගේ ගෞරවය ලබාගැනීමටද ආශා වූහ. දැන් ඔවුන්ට උසස් භාවය ලබාදුන් සියල්ල ඔවුන්ගෙන් ඉවත්වී තිබේ. දැන් ඔව්හු අසරණව ආරක්ෂා රහිතව සිටිති. තම මැවුම්කාරයාණන්ට වැඩියෙන් උසස් කොට ඔවුන් සැලකූ රූප දැන් විනාශ වී තිබීම දෙස ඔව්හු බයාදුකමින් යුක්තව බලති. ලෞකික වස්තුව හා විනෝදයන් සඳහා ඔවුන් තමාගේ ආත්ම විකුණා තිබේ. නමුත් දෙවියන්වහන්සේ තුළ පොහොසත් වීමට ඔවුන් උත්සාහ කර නොමැත. එහි ප්‍රතිඵලය නම් ඔවුන්ගේ ජීවිත අසාර්ථක වීමය. දැන් ඔවුන්ගේ විනෝදයන් තිත්තකම බවට පත්වී තිබේ. ඔවුන්ගේ වස්තුව නරක්වී තිබේ. ජීවිත කාලයක් මුළුල්ලේ ලබාගත් සම්පත්ති මොහොතකින් අතු ගෑවී යයි. ධනවත් අය තමාගේ අලංකාර නිවෙස් විනාශ වීම ගැනද, තමාගේ රන් රිදී විසිරී යාම ගැනද වැලපෙති. නමුත් තමාද තමාගේ රූප සමග විනාශ වී යනවා ඇත යන අදහසේ බියෙන් ඔවුන්ගේ වැලපීම නිශ්චල වෙයි.

දුෂ්ටයන් කණගාටුවට පත්වන්නේ ඔවුන් පාපිෂ්ඨ ලෙස දෙවියන්වහන්සේවද තමාගේ සහකාර මනුෂ්‍යයන්ද නොතකා හැරිය නිසා නොවේ. ඔවුන් වැලපෙන්නේ දෙවියන්වහන්සේ ජයග්‍රාහක වූ නිසාය, ඔවුන්ට ඇතිවූ ප්‍රතිඵල ගැනය. ඔවුන් තමාගේ දුෂ්ට ක්‍රියාවන් ගැන පසුතැවිලි වන්නේ නැත. තමාට ජයග්‍රාහක වීමට පුළුවන් නම් ඒ සඳහා තමාට හැකි සියල්ල කිරීමට ඔවුන් සූදානම්ය.

ලෝකයා දකින්නේ තමා නිග්‍රහ කරමින් සරදම් කරමින් විනාශ කිරීමට කැමති වූ අය වසංගත, කුණාටු හා භූමි කම්පා ඇතිවූ විට පවා හිංසාවට පත්නොවූ බවය. ව්‍යවස්ථාව කඩ කරන්නාවූ අයට විනාශ කරන ගින්නක් වන්නාවූ තැනැන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟට ආරක්ෂිත බලකොටුවක් වනසේක.

මනුෂ්‍යයන්ගේ කරුණාව දිනාගන්නා පිණිස සත්‍යයට අවිශ්වාසවන්ත වූ පූජකයාට දැන් පෙනී යන්නේ ඔහුගේ ඉගැන්වීම් වල ස්වභාවය හා ඒවායේ අනුබලය කොයි ආකාරද යන්නය. ඔහු තම මේසය ඉදිරිපිට සිටි විටද, මාවත දිගේ ගමන්ගත් විටද, ජීවිතයේ අනේක තරාතිරම්වල මනුෂ්‍යයන් සමග ගැවසුණ අතරද සර්වබලධාරී ඇසක් තමා පසුපසින් පැමිණි බවක් ඔහුට දැන් පෙනී යයි. ඔහුගේ ආත්මයේ



සෑම හැඟීමක්ද, ඔහු ලියූ සෑම පේළියක්ද, පැවසූ සෑම වචනයක්ද, බොරුකාර රැකවරණයක් තුළ විවේක ගැනීමට මනුෂ්‍යයන්ට මගපෙන්වූ සෑම ක්‍රියාවක්ද බීජ වපුරන්නට යෙදුණ බව ඔහුට දැන් පෙනී යයි. දැන්, ඔහු අවට විනාශවී සිටින ආත්මයන් තුළින් ඔහුට එහි අස්වැන්න දර්ශනය කිරීමට පුළුවන.

ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක: "සමාදානය නැතුව තිබෙද්දී: සමාදානයය, සමාදානයය කියා මාගේ දියණිය වන සෙනඟගේ තුවාලය ඔව්හු මඳක් සුවකර තිබේ." (යෙරෙමියා 8:11) "මා විසින් ධර්මිෂ්ඨයාගේ සිතට කණගාටු නොකළ නුමුත් නුඹලා බොරුවෙන් එය ශෝක කළ නිසාද දුෂ්ටයා ජීවත්වෙන පිණිස ඔහු තමාගේ නපුරු මාර්ගයෙන් නොහැරෙන හැටියට නුඹලා ඔහුගේ අත් බලවත් කළ නිසාද නුඹලා තවත් නිෂ්ඵල දර්ශන නොදකින්නහුය." (එසකියෙල් 13:22)

"මාගේ ගොදුරු බිමේ බැටළුවන් නැති කරන්නාවූ විසුරුවා දමන්නාවූ එඬේරුන්ට දුක්වේ යයි ස්වාමින්වහන්සේ කියන සේක .... බලව නුඹලාගේ ක්‍රියාවල නපුරුකමට නුඹලාට දඬුවම් කරන්නෙමි." (යෙරෙමියා 23:1,2) "එඬේරුනි, කෑ මොර ගසා හඬන්න. රැළේ ප්‍රධානියෙනි, අළුවල පෙරළී ඉඳින්න. මක්නිසාද මැරුම්කෑමට නුඹලාගේ දවස් සම්පූර්ණ වී තිබේ. .... එඬේරුන්ට පලායන්ටවත් රැළේ ප්‍රධානීන්ට ගැළවීයන්ටවත් නොලැබෙන්නේය." (යෙරෙමියා 25:34,35)

තමා දෙවියන්වහන්සේ සමග සුදුසු සබඳතාවයක් පවත්වා නොගත් බව පූජකයන්ටද සෙනඟටද පෙනී යනවා ඇත. ධර්මිෂ්ඨකමේ හා සියලු සාධාරණත්වයේ ව්‍යවස්ථාවෙහි කර්තෘවරයාණන් වන තැනැන්වහන්සේට විරුද්ධව තමා කැරළි ගසා තිබෙන බව ඔවුන්ට පෙනී යයි. දිව්‍ය ප්‍රතිපත්ති ඉවත් කිරීම කරණකොටගෙන නපුරේ, කෝලාහල කිරීමේ, වෛරයේ හා වැරදි කිරීමේ උල්පත් දහසක් විවෘත කරනු ලැබ තිබෙනවා ඇත. එමගින් ලෝකය දූසිරිතෙන් හා කැරළි ගැසීමෙන් පිරී ගිය භූමියක් බවට පත්වී තිබේ. සත්‍යය එපා කරමින් වැරදි දේවලට ඇලුම්වීමට තෝරාගත් අයට මේ තත්ත්වය පෙනී යයි. තමාට සදාකාල ජීවනය සදහටම නැතිවූ බව පෙනී යන විට අකීකරු වූ අපක්ෂපාත වූ අයවල් තුළ ඇතිවන හැඟීම් වචනවලින් කියා නිම කරන්ට නුපුළුවන. ඔවුන්ගේ කථාවෙහි දක්ෂතාවය නිසාද ඔවුන්ගේ හැකියාවන් නිසාද ලෝකයාගේ ගරු බුහුමන් ලැබූ අයට දැන් සැබෑ ආලෝකයකින් කාරණා පෙනී යයි. පාපය කරණකොටගෙන තමාට නැතිවූයේ කුමක්දැයි ඔව්හු වටහා ගනිති. මෙතෙක් ඔවුන් මේ අයගේ

විශ්වාසවන්තකම එපා කරමින් එයට නිග්‍රහ කළ නමුත් දැන් ඔව්හු ඔවුන්ගේ පාමුල වැටෙමින් දෙවියන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කරන බව කියා සිටිති.

තමා රවටනු ලැබූ බව මනුෂ්‍යයෝ ඒත්තු ගනිති. තමා විනාශය කරා යොමු කිරීම ගැන ඔව්හු ඔවුනොවුන්ට දොස් පවරති. නමුත් සියලු දෙනාම එක්සත්ව ඔවුන්ගේ ඉතාම තික්ත චෝදනා ඉදිරිපත් කරන්නේ පූජක පක්ෂයටය. අවිශ්වාසවන්ත පූජකවරු ප්‍රසන්න දේවල් ගැන අනාවැකි පැවසූහ. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එපා කරමින් එය ශුද්ධ ලෙස පැවැත්වූ අයට පීඩා කිරීමට ඔව්හු තමාට සවන් දෙන්නාවූ අයට මගපෙන්වා තිබුණි. දැන් බලාපොරොත්තු කඩවීමට පත්වූ ඔව්හු තමාගේ රැවටිලිකාර ක්‍රියාවන් ගැන ලෝකයාට කියා දෙති. සමූහයා කෝපාකූල වෙති. "අපි නැතිවී සිටිමු. නුඹලා නිසා අපට මේ විනාශය ඇතිවී තිබේ" යයි ඔව්හු කෑගසා කියමින් මේ බොරුකාර එඬේරුන් සමග කෝප වෙති. ඔවුන්ව ඉතාම වැඩියෙන් අගය කළ අයම ඔවුන් පිට ඉතාම තද ශාපයන් පවසති. වරක් ඔවුන්ට ගෞරවය දැක්වීමට ඔසවනු ලැබූ අත්ම දැන් ඔවුන් විනාශ කිරීමට ඔසවනු ලබති. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් මරන පිණිස සූදානම් කරන ලද කඩු දැන් ඔවුන්ගේ සතුරන් විනාශ කිරීම සඳහා යොදවනු ලැබේ. සෑමතැනම පවතින්නේ දබරය හා ලේ වැගිරීමය.

"මහත් ශබ්දයක් පොළොවේ කෙළවර දක්වා පැමිණෙන්නේය. මක්නිසාද ස්වාමින්වහන්සේට ජාතීන් සමග නඩුවක් තිබේ. උන්වහන්සේ මාංසමය වූ සියල්ලන් සමග විනිශ්චයට පැමිණෙන සේක. දුෂ්ටයන් වනාහි කඩුවට පාවා දෙන සේකැයි ස්වාමින්වහන්සේ කියන සේක." (යෙරෙමියා 25:31). වසර හය දහසක් මුළුල්ලේ මේ අරගලය පැවතුණි. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝද උන්වහන්සේගේ ස්වර්ගීය පණිවිඩ-කරුවෝද නපුරාගේ බලය සමග අරගලයක නියුක්තව, මනුෂ්‍යයන්ට අවවාද කරමින්, ඔවුන් ආලෝකමත් කරමින් ඔවුන් ගැළවීමට ක්‍රියාකර තිබේ. දැන් සියලු දෙනාම තීරණය ගෙන හමාරය. සාතන් දෙවියන්-වහන්සේට විරුද්ධව කරන සටනේදී දුෂ්ටයෝ සම්පූර්ණයෙන්ම ඔහු හා එක්සත්වී සිටිති. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව එපා කර තිබෙන අතර, දැන් උන්වහන්සේ එහි බලය ප්‍රකාශ කළ යුතු කාලය පැමිණ තිබේ. දැන් අරගලය පවතින්නේ සාතන් සමග පමණක් නොව, මනුෂ්‍යයන්ද සමගය. "ස්වාමින්වහන්සේට ජාතීන් සමග නඩුවක් තිබේ." උන්වහන්සේ දුෂ්ටයන් කඩුවට පාවා දෙන සේක."

සිදුවෙන සියලු අපහාසයන් ගැන හඬා වැලපෙන්නාවූ සියල්ලන් මත මිදීමේ සලකුණක් තබනු ලබනවා ඇත. දැන් මරණය පමුණුවන



දේවදූතයා ඉදිරියට යයි. එසකියෙල්ගේ දර්ශනයෙහි ඔහුව පෙන්නුම් කරනු ලබන්නේ මරණායුධ අතේ ඇතිව යන්නාවූ මනුෂ්‍යයන්ගෙන්ය. ඔහුට දෙනු ලබන නියමය මෙසේය: "මාගේ ශුද්ධස්ථානයෙන් පටන්ගෙන මහල්ලන්ද, යෞවනයන්ද, කන්‍යාවන්ද, බාලයන්ද, ස්ත්‍රීන්ද මරා නාස්ති කර දමන්න. නුමුත් ලකුණ ඇති කිසිවෙකුට ළං නොවන්න" යන්නය. අනාගතවක්තෘ මෙසේද කියා තිබේ: "එවිට ඔව්හු ගෘහය ඉදිරියෙහි සිටි වැඩිමහල් මනුෂ්‍යයන්ගෙන් පටන් ගත්තෝය." (එසකියෙල් 9:6) විනාශ කිරීමේ වැඩය ආරම්භ කරනු ලබන්නේ තමා දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ගේ ආත්මික රැකවලුන් යයි කියා ගත්තාවූ මනුෂ්‍යයන්ගෙන්ය. බොරුකාර රැකවල්ලු පළමුවෙන්ම වැටෙනවා ඇත. ඔවුන් ගැන අනුකම්පා කරන්ට හෝ ඉතිරි කරනු ලබන්ට කිසිවෙක් නොමැත. ස්ත්‍රී පුරුෂයෝද, කාන්තාවෝද, දරුවෝද එකට මරණයට පත්වෙති.

"මක්නිසාද මෙන්න ස්වාමින්වහන්සේ පොළෝ වාසීන්ගේ අපරාධ ගැන ඔවුන්ට දඬුවම් කරන්ට තමන්ගේ ස්ථානයෙන් නික්මී එනසේක. පොළොවද එහි මැරුම්කෑවුන් තවත් වසා නොගෙන එහි වැගිරෙවූ ලේ ප්‍රකාශ කරනවා ඇත." (යෙසායා 26:21) "යෙරුසලමට විරුද්ධව යුද්ධයට ආවාවූ සියලුම ජනයන්ට ස්වාමින්වහන්සේ පමුණුවන්නාවූ පීඩාව මේය: ඔවුන් සිටගෙන සිටිද්දීම ඔවුන්ගේ මාංසය ක්ෂයවන්නේය, ඔවුන්ගේ ඇස් ඒවායේ සිදුරුවලම ක්ෂයවන්නේය, ඔවුන්ගේ දිවද ඔවුන්ගේ කටේම ක්ෂයවන්නේය. ඒ කාලයෙහි මහත් වියවුල්කමක් ස්වාමින්වහන්සේගෙන් ඔවුන් අතරට පැමිණ, ඔවුන් එකිනෙකාගේ අත අල්ලනවා ඇත. එක්කෙනෙකුගේ අත තවත් කෙනෙකුගේ අතට විරුද්ධව ඔසවනවා ඇත." (සෙකරියා 14:12,13) ඔවුන්ගේම භයානක තෘෂ්ණාවන්ගේ අරගලයේදී, දෙවියන්වහන්සේගේ උදහස භයානක ලෙස, දයාව හා අමිශ්‍රව ඔවුන් පිට වගුරුවනු ලබන විට ලෝකයේ දුෂ්ට මනුෂ්‍යයන් විනාශ වෙනවා ඇත. පූජකයෝද, නායකයෝද, දුප්පත්, පොහොසත්, උසස් පහත් සියලු මනුෂ්‍යයෝද මේ ගණනට ඇතුළත්ය. "ස්වාමින්වහන්සේගෙන් මැරුම් කන අය ඒ දවසේ පොළොවේ එක් කෙළවරක පටන් පොළොවේ අනික් කෙළවර දක්වා වැටී ඉන්නෝය. ඔවුන් ගැන විලාප කියන්ටවත් ඔවුන් එකතු කරන්ටවත් වළලන්ටවත් නොයෙදී ඔවුන් භූමිය මතුපිට කසල වෙනවා ඇත." (යෙරෙමියා 25:33)

ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමේදී දුෂ්ටයෝ පොළොවෙන් මකා දමනු ලබති. ඔව්හු උන්වහන්සේගේ මුඛයේ ආත්මයෙන්ද උන්වහන්සේගේ තේජසේ දීප්තියෙන්ද විනාශ කරනු ලබති. ක්‍රිස්තුස්වහන්සේ තමන්-වහන්සේගේ සෙනඟව දෙවියන්වහන්සේගේ නගරයට ගෙන යන සේක. පොළොව එහි ජනවාසීන්ගෙන් හිස්ව තිබෙනවා ඇත. "බලවු ස්වාමින්-

වහන්සේ පොළොව හිස් කොට පාළු කරනසේක. ඒක පෙරළා එහි වැසියන් විසුරුවා දමන සේක." "පොළොව සහමුලින්ම හිස්කරනු ලැබ සහමුලින්ම කොල්ලයක් වන්නේය. මක්නිසාද ස්වාමින්වහන්සේ මේ වචන වදාළ සේක." "පොළොවත් එහි වැසියන් නිසා කිලුටුව තිබේ. මක්නිසාද ඔව්හු ව්‍යවස්ථාවන් කඩකොට, නියෝග වෙනස් කර සදාකාල ගිවිසුම කඩ කළෝය. එබැවින් ශාපයෙන් පොළොව නාස්ති වී එහි වැසියෝ වරදකාරයෝව සිටිති. .... පොළෝ වැසියෝ දවනු ලැබ සිටිති." (යෙසායා 24:1,3,5,6)

මුළු පොළොවම පාළුවූ වනාන්තරයක පෙනුමක් දරයි. ගැළවී ගිය ගස්ද, භූමි කම්පාව මගින් විනාශ වූ නගර හා ගම්ද මුහුදෙන් විසිකරනු ලැබූ නැතහොත් පොළොවෙන්ම ඉරා දමනු ලැබූ රළු පර්වතද පොළොවේ මුහුණත මත දසත විසිරී පවතියි. කඳු ඒවායේ පර්වතවලින් ඉරාගනු ලැබූ ස්ථාන සලකුණු වන්නේ ඒ ස්ථානවල ඇතිවී තිබෙන ගුහාවල් වලින්ය.

දන් සමගි කිරීමේ අවසාන දවසෙහි කරනු ලබන අවසාන ගාම්භීර සේවයෙන් දක්වනු ලැබූ සිද්ධිය ඉටු වෙයි. එදින, අති ශුද්ධ ස්ථානයේ සේවය සම්පූර්ණ කරනු ලැබූ විට, පාප පූජාවේ ලේ කරණකොටගෙන ඉශ්‍රායෙල්වරුන්ගේ පාප ශුද්ධස්ථානයෙන් ඉවත් කරනු ලැබීය. එවිට අශාශෙල්ට වූ එළුවා ජීවත්ව සිටියදී ඒ සතාව ස්වාමින්වහන්සේට දක්වන ලදී. සමූහයා ඉදිරියේදීම උත්තම පූජකයා "ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු අයුතුකම්ද ඔවුන්ගේ සියලු අපරාධයන්ද එනම් ඔවුන්ගේ සියලු පව් කියාදෙමින් ඒවා එළුවාගේ හිස පිට" තැබුවේය. (ලෙවී කථාව 16:21) එසේම, ස්වර්ගීය ශුද්ධස්ථානයේදී සමගි කිරීමේ මෙහෙය අවසාන වූ විට දෙවියන්වහන්සේද, ශුද්ධවූ දූතයන්ද, ගැළවීම ලැබූ සමූහයාද ඉදිරිපිටම, දෙවියන්වහන්සේගේ සෙනඟගේ පාපයන් සාතන් පිට තබනු ලබනවා ඇත. ඔහු මනුෂ්‍යයන් ලවා කරවූ වැරදි ගැන වරදකාරයා බව කියනු ලබනවා ඇත. අශාශෙල්ගේ එළුවා ජනාවාසයක් නොතිබුණාවූ දේශයකට යවනු ලැබුවා සේම සාතන්ද පොළොවේ ජනාවාසයක් නොපවතින්නාවූ පාළු වී ගිය වනාන්තර පෙදෙසකට යවනු ලබනවා ඇත.

සාතන් මෙසේ යවනු ලැබීම ගැනද පොළොව මත පවතින්ට යන විනාශදායක අවුල් සහිත තත්ත්වය ගැනද එළිදරව්කාරයා අනාවැකියෙන් පවසයි. මේ තත්ත්වය වසර දහසක් මුළුල්ලේ පවතින බව ඔහු පවසා තිබේ. ස්වාමින්වහන්සේගේ දෙවෙනි ඊම පිළිබඳවද දුෂ්ටයන්ගේ විනාශය පිළිබඳවද පැවසුවාට පසුව, ඒ අනාවැකිය තවදුරටත් මෙසේ පවසයි: "තවද පාතාලයේ යතුරුද අතේ මහත් දම්වැලක්ද ඇතුව දේවදූතයෙක්



ස්වර්ගයෙන් බැස එනවා දුටිමි. ඔහු යක්ෂයාද සාතන්ද වූ පුරාණ සර්පයා වන ඒ මහා සර්පයා අල්ලා අවුරුදු දහසකට බැන්දේය, ඒ අවුරුදු දහස කෙළවර වන තුරු ඔහු විසින් ජාතීන් තවත් නොරවටන පිණිස ඔහු පාතාලයට හෙළා, ඒක වසා, ඔහු මතුයෙහි ඒක මුද්‍රාකළේය. මින්පසු ස්වල්ප කලකට ඔහු මුදනු ලබන්ට ඕනෑය." (එළිදරව් 20:1-3)

'පාතාලය' යනුවෙන් දක්වනු ලබන්නේ වියවුල හා අන්ධකාරය පවතින්ට යන ලෝකයේ ස්වභාවය බව වෙනත් ශුද්ධ ලියවිලි පාඨයන්ගෙන් ඔප්පු වෙයි. "පටන්ගැන්මේදී" ලෝකයේ පැවති තත්ත්වය ගැන බයිබලයේ මෙසේ සටහන් කර තිබේ: "පොළොව වනාහි පාළුව හිස්ව තිබුණාය. ගැඹුර පිට අන්ධකාරය විය." (උත්පත්ති 1:2) අනාවැකි පවසන්නේ එය අඩ වශයෙන් පමණවත් නැවත එවිට පැවති තත්ත්වයට පමුණුවනු ලබන බවය. එන්ට තිබෙන්නාවූ දෙවියන්-වහන්සේගේ ඒ මහත් දවස දෙස බලමින් යෙරෙමියා අනාගතවක්තෘ මෙසේ පවසා තිබේ: "මම පොළොව දෙස බැලූ විට ඒක පාළුව හිස්ව තිබෙන බවත් අහස දෙස බැලූ විට එහි එළිය නැති බවත් දුටිමි. කඳු දෙස බැලූ විට ඒවා සෙලවෙන බවත් සියලු හෙල් වැනෙන බවත් දුටිමි. මම බැලූ විට මනුෂ්‍යයෙක් නැති බවත් ආකාශයේ සියලු පක්ෂීන් පලා ගිය බවත් දුටිමි. මම බැලූ විට ස්වාමින්වහන්සේ ඉදිරියෙහි උන්වහන්සේගේ බලවත් උදහස නිසා සාරවත් දේශය කාන්තාරයක්වූ බවත් එහි සියලු නුවරවල් කඩා දමා තිබෙන බවත් දුටිමි." (යෙරෙමියා 4:23-26)

වසර දහසක් මුළුල්ලේ මේ ස්ථානය සාතන්ගේ හා නපුරු දූතයන්ගේ නිවස වෙනවා ඇත. මේ පොළොවට සීමිත වන ඔහුට අනික් ලෝකවලට ගොස් කිසිවිටෙක පාපයට නොවැටුණාවූ අය පරීක්ෂා කිරීමට හෝ ඔවුන්ට කරදර කිරීමට පුළුවන් වන්නේ නැත. ඔහු බැඳ දමනු ලබන්නේය යන්නෙන් අදහස් වන්නේ මේ තත්ත්වයය. ඔහුගේ බලය දක්වන පිණිස කිසිවෙක් නොසිටිනවා ඇත. මෙපමණ ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ ඔහුගේ ප්‍රීතියවූ රැවටීමේ හා විනාශ කිරීමේ වැඩය ඔහුගෙන් සම්පූර්ණයෙන්ම කපා දමනු ලබනවා ඇත.

සාතන් පරාජය කරනු ලබන කාලය දෙස බලමින් යෙසායා අනාගතවක්තෘ මෙසේ පැවසුවේය: "දීප්තිමත් පහන් තාරකාව, අලුයම් පුත්‍රය, නුඹ ස්වර්ගයෙන් වැටුණු හැටි! ජාතීන් හෙළා දැමූවාවූ නුඹ බිමට සිඳ දමනු ලැබූ හැටි! නුඹ සිත තුළ සිතාගෙන: මම ස්වර්ගයට නැගී මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකාවලට උඩින් තබා, උතුරේ ඉතා දුර සීමාවල තිබෙන රැස්වීමේ කන්ද පිට හිඳ

ගන්නෙමි. මම වලාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි; මහෝත්තමයාණන්ට සමාන වන්නෙමියි කීයෙහිය. එහෙත් නුඹ පාතාලය නම් වළේ ගැඹුරටම බසිනවා ඇත. නුඹ දකින්නෝ නුඹ දෙස ඕනෑකමින් බලමින් කල්පනා කොට: පොළොව වෙවුලවා රාජ්‍යයන් සෙලෙවූවාවූ, ලෝකය කාන්තාරයක් මෙන් කළාවූ, එහි නුවරවල් නාස්ති කළාවූ, තමාගේ හිරකාරයන් ගෙදරට යන්ට නෑරියාවූ මනුෂ්‍යයා මොහුදැයි කියන්නෝය." (යෙසායා 14:12-17)

අවුරුදු හය දහසක් මුළුල්ලේ සාතන් කළාවූ කැරළිගැසීමේ වැඩ මගින් "පොළොව වෙවුලවා .... ලෝකය කාන්තාරයක් මෙන් කළාවූ එහි නුවරවල් නාස්ති කළාවූ" තත්ත්වයක් පැවතුණි. ඔහු තමාගේ හිරකාරයන්ට ගෙදර යන පිණිස දොරවල් ඇරියේද නැත. වසර හය දහසක් මුළුල්ලේ, ඔහු දෙවියන්වහන්සේගේ සෙනඟ ඔහුගේ සිරගෙයට ඇතුල් කර ගත්තේය. ඔවුන් සැමදාටම, තමාගේ සිරකරුවන් වශයෙන් පවත්වා ගැනීම ඔහුගේ අදහස විය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ ඔහුගේ බැමි ඉවත්කර ඒ සිරකරුවන් මුදා හැරිය සේක.

දුෂ්ට අය පවා දැන් සාතන්ගේ බලයෙන් ඉවත් කරනු ලැබ සිටිති. තමාගේ නපුරු දූතයන් සමග තනිව සිටින ඔහු පාපයෙන් ඇතිවී තිබෙන ශාපයේ ප්‍රතිඵල දර්ශනය කරයි. "ජාතීන්ගේ රජවරු සියල්ලෝම ගෞරවය ඇතුව එකිනෙකා තම තමාගේ ගෘහයෙහි සැතපී හිඳිති. නුමුත් නුඹ පිළිකුල් අත්තක් මෙන් .... පිටත වීසි කරනු ලබන්නෙහිය. නුඹ නුඹේ දේශය නාස්ති කොට, නුඹේ සෙනඟ මරා දැමූ බැවින්, ඔවුන් සමග වළලනු නොලබන්නෙහිය." (යෙසායා 14:18-20)

අවුරුදු දහසක් මුළුල්ලේ සාතන් පාළු වූ පොළොව මත එහා මෙහා සක්මන් කරන්ට යන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධව තමා කළාවූ කැරැල්ලේ ප්‍රතිඵල දකින පිණිසය. මේ කාලයේදී ඔහුට ඇති පීඩාව ඉමහත්ය. ඔහු පාපයට වැටුණාට පසුව ඔහුට තිබුණාවූ නිමක් නැති ක්‍රියාශීලිත්වය නිසා ඔහුට ගැඹුරු ලෙස සිතා බැලීමට අවස්ථාවක් නොලැබුණි. නමුත් දැන් ඔහුගේ බලය ඉවත් කරනු ලැබ තිබේ; ස්වර්ගීය ආණ්ඩුවට විරුද්ධව තමා පළමුවෙන්ම කැරළි ගැසූ අවස්ථාවේ සිට තමා කළාවූ ක්‍රියාවන් ගැන දැන් ඔහුට කල්පනා කිරීමට පුළුවන. තමා කර තිබෙන සියලු දුෂ්ට ක්‍රියාවන් ගැන දුක් විඳිමින්, තමා කරන්ට සැලැස්වූ සියලු පාපයන් ගැන දඬුවම් කරනු ලබන කාලය ගැන, ඒ භයානක අනාගතය ගැන දැන් ඔහුට භයෙන් හා වෙවුලුමෙන් යුක්තව බලාසිටීමට සිදුවෙයි.



සාතන් මෙසේ සිරකරනු ලැබීම දෙවියන්වහන්සේගේ සෙනඟට ප්‍රීතිය හා සන්තෝෂය ලබාදෙනවා ඇත. අනාගතවක්තෘ ඒ ගැන මෙසේ පවසා තිබේ: "නුඹේ දුකෙනුත් නුඹේ කැළඹීමෙනුත් නුඹ ලවා කෙරෙවූ බර වැඩෙනුත් ස්වාමින්වහන්සේ නුඹට නිදහස දෙන දවසේදී, නුඹ බබිලෝනියේ රජුට විරුද්ධව මේ උපමාව කියන්නෙහි: අහෝ පීඩාකාරයා නැවතුණු හැටි!... ජනයන්ට නිරන්තර පහරකින් කෝපයෙන් ගැසුවාවූද, කිසිවෙකු විසින් නොවැළැක්වූ පීඩාවකින් උදහසින් ජාතීන් ආණ්ඩු කළාවූද දුෂ්ටයන්ගේ මුගුරත් ආණ්ඩු කාරයන්ගේ යෂ්ටියක් ස්වාමින්වහන්සේ බිඳ දැමූසේක." (යෙසායා 14:3-6)

පළමුවන මළවුන්ගෙන් නැගිටීම හා දෙවන මළවුන්ගෙන් නැගිටීම අතර පවතින දහසක් අවුරුදු කාලයේදී දුෂ්ටයන් විනිශ්චය කරනු ලබනවා ඇත. මේ විනිශ්චය වනාහි දෙවෙනි ඊමට පසුව සිදුවෙන්නක් හැටියට දක්වමින් පාවුල් මෙසේ පවසයි: "ස්වාමින්වහන්සේ එන තුරු කාලයට පළමුවෙන් කිසිවක් විනිශ්චය නොකරන්න. උන්වහන්සේ අන්ධකාරයේ සැඟවුණු දේ එළිදරව්කොට, සිත්වල අදහස් ප්‍රකාශකරනසේක. එවිට එකිනෙකාට තම තමාගේ ප්‍රශංසාව දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නේය." (1 කොරින්ති 4:5) "ඒ පුරාතන තැනැන්වහන්සේ ඇවිත් මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්තයන්ට යුක්තිය කරන" බව දානියෙල් පවසයි. (දානියෙල් 7:21) මේ කාලයේදී ධර්මිෂ්ඨ අය දෙවියන්වහන්සේ ඉදිරිපිට රජවරුන් හා පූජකයන් මෙන් සිටිනවා ඇත. එළිදරව්කාරයා වන යොහන් මෙසේ පවසයි: "තවද සිංහාසන දුටිමි. ඔව්හු එහි හිඳ ගත්තෝය. විනිශ්චයද ඔවුන්ට දෙන ලද්දේය." "ඔව්හු දෙවියන්වහන්සේගෙත් ක්‍රිස්තුස්වහන්සේගෙත් පූජකයෝව උන්වහන්සේ හා සමග අවුරුදු දහසක් රජකම් කරන්නෝය." (එළිදරව් 20:4,6) පාවුල් අනාවැකියෙන් කියා තිබෙන අන්දමට මේ කාලයේදී 'ශුද්ධවන්තයන් ලෝකය විනිශ්චය කරනවා ඇත.' (1 කොරින්ති 6:2,3) ක්‍රිස්තුස්වහන්සේ සමග එක්සත් වී ඔවුන් දුෂ්ටයන් විනිශ්චය කරනවා ඇත. ව්‍යවස්ථාවේ පොත වන බයිබලය සමග ඔවුන්ගේ ක්‍රියාවන් සමාන කර බලමින් ඔවුන් තම ශරීරයන් තුළින් කරන්ට යෙදුණාවූ ක්‍රියාවන් අනුව, ඔවුන් මේ සෑම කෙනෙක් ගැනම තීරණයක් ගන්නවා ඇත. ඊටපසුව, දුෂ්ටයන් කළාවූ ක්‍රියාවන් අනුව ඔවුන්ට ලැබිය යුතු පීඩාව තීරණය කරනු ලබනවා ඇත. එය මරණයේ පොතේ ඔවුන්ගේ නාමයන් ඉදිරිපිට සටහන් කරනු ලබනවා ඇත.

ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ සෙනඟ සාතන්ව හා ඔහුගේ දූතයන්වද විනිශ්චය කරනවා ඇත. පාවුල් මෙසේ කියා තිබේ: "අපි දේවදූතයන් විනිශ්චය කරන්නෙමු යයි නුඹලා දන්නේ නැද්ද?"

(1 කොරින්ති 6:3) යූද් මෙසේ කියා තිබේ: "තමුන්ගේ අධිපතිකමෙහි නොපැවත ස්වකීය වාසස්ථානය අත්හැරියාවූ දේවදූතයන්ද උන්වහන්සේ මහත් දවසේ විනිශ්චය පිණිස අන්ධකාරය යට සදාකාල බැඳුම්වලින් බැඳ තැබූසේක." (යූදස් 6)

දහසක් අවුරුදු කාලයේ අවසානයේදී දෙවන මළවුන්ගෙන් නැගිටීම සිදුවෙනවා ඇත. එවිට දුෂ්ටයෝ මළවුන්ගෙන් නැගිටුවනු ලැබ ලියන ලද විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන පිණිස දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී සිටිනවා ඇත. එළිදරව්කාරයා ධර්මිෂ්ඨයන්ගේ මළවුන්ගේ නැගිටීම විස්තර කළාට පසුව මෙසේ කියයි: "මළාවූ අනික් අය අවුරුදු දහස කෙළවර වන තුරු ජීවත් නූණෝය." (එළිදරව් 20:5) දුෂ්ටයන් ගැන යෙසායා මෙසේ පවසයි: "හිරකාරයන් වළක රැස්කර තබන්නාක් මෙන් ඔව්හු එකට හිරගෙයි වසාතබනු ලබන්නෝය, බොහෝ දවසකට පසු දඬුවම් ලබන්නෝය." (යෙසායා 24:22)



# 42

# අරගලය අවසාන වෙයි

දහසක් අවුරුදු කාලයේ අවසානයේදී යේසුස්වහන්සේ නැවත වරක් මේ ලෝකයට එනසේක. ගැළවීම ලැබූ මහා ජනකාය උන්වහන්සේ සමග එන අතර දේවදූත සමූහයක් උන්වහන්සේට සේවය කරනවා ඇත. ඒ ඉමහත් රාජකීයත්වයෙන් මේ ලෝකයට එන අතර උන්වහන්සේ මළාවූ දුෂ්ට අයට නැවත නැගිටීමට අණ කරන්නේ ඔවුන් තමාගේ විනාශයට මුහුණ දෙන පිණිසය. මෙසේ පැමිණෙන්නේ ඉතා මහත් සමූහයක්ය, මුහුදු වෙරළේ වැලි මෙන් ගණන් කළ නොහැකි ජනකායක්ය. ඔවුන් ඒ පළමුවන මළවුන්ගෙන් නැගිටීමේදී නැගිටියාවූ අයවලුන්ට වඩා කොපමණ වෙනස්ද! ධර්මිෂ්ඨ අය අමරණීය යෞවන භාවයෙන් හා අලංකාරයෙන් සැරසී නැගිටියහ. දුෂ්ටයෝ ලෙඩ රෝගවල හා මරණයේ ලක්ෂණ දරති.

ඒ මහා සමූහයේ සෑම ඇසක්ම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්-වහන්සේගේ තේජස දර්ශනය කිරීමට උත්සාහ කරනවා ඇත. "ස්වාමින්වහන්සේගේ නාමයෙන් එන තැනැන්වහන්සේ ආශිර්වාද ලද්දේ" යි දුෂ්ටයන් එක හඬින් පවසනවා ඇත. ඔවුන් මෙසේ පවසන්නේ යේසුස්වහන්සේ කෙරෙහි ඇත්තාවූ ආදරයකින් නොවේ. සත්‍යයේ ප්‍රබලතාවය ඔවුන්ගේ කැමැත්තෙන් තොර තොල්වලින් මෙසේ පැවසීමට ඔවුන්ට බල කරයි. දුෂ්ටයන් තමාගේ සොහොන් ගෙවලින් පිටත්ව එන්නේ ඔවුන් ඒවාට ගියාවූ අන්දමටමය, එනම් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සතුරුකමින් හා එවිට තිබුණාවූ කැරලිගැසීමේ ආත්මයෙන් යුක්තවය. තමාගේ අතීත ජීවිතවල වැරදි හරිගස්සා ගැනීමට ඔවුන්ට සූදානම් වීමේ කාලයක් දෙනු ලබන්නේ නැත. එයින් කිසි ප්‍රයෝජනයක් ඇතිවන්නේද නැත. පාපයේ ජීවිත කාලයකින් ඔවුන්ගේ සිත් මෘදු වූයේ නැත. දෙවන වරටත් සූදානම් වීමේ කාලයක් ඔවුන්ට දෙනු ලබන්නේ නම් එයද පාවිච්චි කරනු ලබන්නේ පෙරදී මෙන්ම දෙවියන්-වහන්සේගේ අවශ්‍යතාවයන්ගෙන් ඈත්වෙමින් උන්වහන්සේට විරුද්ධව කැරළි ගැසීමක් ඇතිකරන පිණිසය.

ක්‍රිස්තුස්වහන්සේ ඔලීව කන්ද මත්තට එනසේක. උන්වහන්සේ එතැනින් ස්වර්ගයට නැගුණ සේක. ඒ අවස්ථාවේදී දේවදූතයෝ උන්වහන්සේගේ දෙවෙනි ඊම පිළිබඳ පොරොන්දුව නැවත ප්‍රකාශ කළහ. 'ස්වාමින්වහන්සේ, මාගේ දෙවියන්වහන්සේ සියලු ශුද්ධවන්තයන්

සමග එනසේක්'යි අනාගතවක්තෘ කියා තිබේ. "ඒ කාලයේදී
උන්වහන්සේගේ පාද යෙරුසලමට ඉදිරිපිටින් නැගෙනහිරට තිබෙන
ඔලීව කන්ද පිට සිටිනවා ඇත. එවිට ඔලීව කන්ද .... මැදින් පැලී
ඉතා මහත් මිටියාවතක් වන්නේය." "ස්වාමින්වහන්සේ මුළු පොළොව
කෙරෙහි රජව සිටිනවා ඇත. ඒ කාලයෙහි ස්වාමින්වහන්සේ පමණක්ම
දෙවිව සිටිනවා ඇත. උන්වහන්සේගේ නාමය පමණක්ම ඇතිවන්නේය."
(සෙකරියා 14:5,4,9) අලුත් යෙරුසලම එහි දීප්තිමත් අලංකාරයෙන්
ස්වර්ගයෙන් පහළට බසින අතර එය පිළිගැනීමට සූදානම් කර පවිත්‍ර
කරන ලද ස්ථානයට එය බසිනවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ තමන්
වහන්සේගේ සෙනඟද දේවදූතයන්ද සමග එයට ඇතුල් වෙනවා ඇත.

දැන් සාතන් බලය ලබාගන්නා පිණිස අවසාන මහා පොර-
බැදීමට සූදානම් වෙයි. තමාගේ බලය නැතිවී, තමාගේ රැවටිලිකාර
ක්‍රියාවෙහි යෙදී සිටීමට නුපුළුවන් වූ විට නපුරේ කුමාරයා ඉතා
කාලකණ්ණි තාවයකින් යුක්තව, අධෛර්යසම්පන්නව සිටියේය. නමුත්
මළාවූ දුෂ්ටයන් නැගුටුවනු ලැබ, මහා සමූහයක් තමාගේ පක්ෂයට
සිටින බව ඔහු දකින විට, ඔහුගේ බලාපොරොත්තුව නැවත ප්‍රකෘතිමත්
වී, ඒ මහා අරගලයේදී යටත් නොවීමට ඔහු තීරණය කරගනියි. ඔහු,
නැතිවී ගිය මේ සේනාවේ සියලු හමුදාවන් තමාගේ ධජය යටතට
ගෙන ඔවුන්ගේ මාර්ගයෙන් තමාගේ සැකසුම් ක්‍රියාත්මක කරගැනීමට
උත්සාහ කරයි. දුෂ්ටයෝ සාතන්ගේ වහලුන් වෙති. ක්‍රිස්තුස්වහන්සේව
එපා කිරීමෙන් ඔව්හු කැරළිකාර නායකයාගේ බලය පිළිගත්හ.
ඔහුගේ යෝජනාවන් පිළිගැනීමටද ඔහුගේ අණසකට කීකරු වීමටද
ඔවුන් දැන් සූදානම්ය. නමුත් ඒ මුල් කාලයේදී ඔහුට තිබුණාවූ
රැවටිලිකාරකමේදී මෙන්ම ඔහු දැන්ද තමා සාතන් යයි පිළිගැනීමට
සූදානම් නැත. තමා ලෝකයේ නියම කුමාරයා බවද, තමාගේ
උරුමය නීති විරෝධී ලෙස තමා කෙරෙන් පැහැරගෙන තිබෙන්නේ
යයිද ඔහු පවසයි. රවටනු ලැබූ තමාගේ සෙනඟට ඔහු පෙන්නුම්
කරන්නේ තමා මිදුම්කාරයා බවය, ඔහුගේ බලය මගින් ඔවුන්
සොහොන් ගෙවලින් ඉවතට ගෙනඑනු ලැබූ බවය. දැන් තමා ඔවුන්
ඉතා මහත් ප්‍රචණ්ඩකාරිත්වයෙන් මුදා ගැනීමට සූදානම් බව ඔහු
පවසයි. මෙවිට ක්‍රිස්තුස්වහන්සේගේ පැවැත්ම එහි නොපවතින බැවින්
සාතන් තමාගේ ප්‍රකාශන ස්ථිර කරන පිණිස පුදුමාකාර දේවල්
කරයි. ඔහු දුර්වලයන් ශක්තිමත් කරයි, සියලු දෙනාටම ඔහුගේම
ආත්මය හා උද්‍යෝගීත්වය ලබාදෙයි. ඔවුන්ව ශුද්ධවන්තයන්ගේ කඳවුරට
විරුද්ධව ගෙනයාමට යෝජනා කරමින් එමගින් ඔවුන්ට දෙවියන්
වහන්සේගේ නගරය අයිති කරගැනීමට පුළුවන් වෙනවා ඇතැයි ඔහු
පවසයි. දුෂ්ටකමින් යුත් උදාරමකින් ඔහු දක්වන්නේ මළවුන්ගෙන්
නැගිටුවනු ලැබූ ඒ ගණන් කළ නොහැකි ලක්ෂ සංඛ්‍යාත සේනාවය.



ඔවුන්ගේ නායකයා හැටියට තමාට ඒ නගරය යටපත් කරගෙන
නැවත තමාගේ සිංහාසනයද රාජ්‍යයද ලබාගන්ට පුළුවනැයි ඔහු
පවසයි.

මේ මහා සේනාවෙහි ජල ගැල්මට පෙර දීර්ඝායුෂ ඇතිව ජීවත්වූ
සමූහයන්ද සිටිති. ඉමහත් උස මහතින් යුක්තවූද මහත් ප්‍රඥාවෙන්
යුක්තවූද මනුෂ්‍යයෝ ඔවුන් අතර සිටිති. ඔව්හු පාපයට වැටුණාවූ
දූතයන්ට කීකරු වී තමාගේ සියලු හැකියාවන් හා දැනගැන්ම පාවිච්චි
කර තිබුණේ තමාම උසස් කරගැනීමටය. ඔවුන්ගේ දක්ෂ චිත්‍ර ශිල්පීය
නිපුණතාවය නිසා මනුෂ්‍යයන් ඔවුන්ගේ හැකියාවන් රූපයක් කරගත්
නමුත් ඔවුන්ගේ දුෂ්ට කෲර නිෂ්පාදනයන් මගින් ඔව්හු දෙවියන්-
වහන්සේගේ ස්වරූපය නරක් කර ලෝකය දූෂණය කර තිබුණි.
එහෙයින් ඔවුන් තමන්වහන්සේගේ මැවිල්ලෙන් ඉවත් කිරීමට දෙවියන්-
වහන්සේට සිදුවී තිබුණි. ජාතීන් යටපත් කළ රජවරු හා නායකයෝ
එහි සිටිති; කිසි යුද්ධයකින් පරාජය නොවූ යුද්ධ දක්ෂකයෝ එහි
සිටිති. එහි සිටින උඩඟුවූද, අනාගතය ගැන මහත් ආශාවන් ඇතිව
සිටියාවූද රණවිරුවන්ගේ පැමිණීමෙන් ජාතීන් වෙවුලා සිටින්ට
යෙදුණාහ. මරණයේදී මේ අයවලුන් තුළ වෙනසක් ඇතිවූයේ නැත.
තමාගේ සොහොන් ගෙවලින් ඉවතට එන අතර ඔව්හු තමාට තිබුණාවූ
සිතුවිලි ඒ තත්ත්වයෙන්ම නැවත පුබුදුවා ගනිති. ඔවුන් මරණයට
යටත්වූ විට ඔවුන් පාලනය කළාවූ ඒ ජයග්‍රාහකවීමේ ආශාව නැවතත්
ඔවුන් තුළ ප්‍රබෝධමත් වෙයි.

සාතන් ඔහුගේ දූතයන් සමගද මේ රජවරුන්, රණවිරුවන් හා
උසස් මනුෂ්‍යයන් සමගද සාකච්ඡා කරයි. ඔව්හු තමාගේ පක්ෂයේ
සිටින සේනාවේ සංඛ්‍යාවද ශක්තියද දෙස බලමින්, නගරය තුළ
සිටින ජනකාය ඔවුන්ගේ ජනකාය සමග සමාන කළ විට ඔවුන්
කුඩා බවද ඔවුන් පරාජය කිරීමට තමාට පුළුවන් බවද ඔව්හු පවසති.
අලුත් යෙරුසලමේ ධනය හා තේජස අයිති කරගැනීමට ඔව්හු කරුණු
සකසා ගනිති. සියලු දෙනාම ඉක්මණින්ම සටනට සූදානම් වෙති.
දක්ෂ කර්මාන්ත ශිල්පීහු යුද්ධායුධ සකසති. යුද්ධයෙහි සාර්ථකත්වය
ගැන සුප්‍රකටවූ හමුදා නායකයෝ යුද්ධ භටයන්ගේ පෙනුම ඇත්තාවූ
මනුෂ්‍යයන් කාණ්ඩවලට හා කොටස්වලට බෙදති.

ඉදිරියට යෑමට අවසාන නියමය දෙනු ලැබ ගණන් කළ නොහැකි
ඒ සමූහයා ඉදිරියට ගමන් කරයි. ඒ හමුදාව වනාහි කිසිවිටෙක මේ
ලෝකයේ යුද්ධ හමුදා නායකයන් විසින් මෙහෙයවනු නොලැබූ අන්දමේ
හමුදාවක්ය. ඒ වනාහි සියලු කාලවල සිටියාවූ යුද්ධ දක්ෂකයන්
එකතු කරනු ලැබීමකි. ලෝකයෙහි යුද්ධ පටන්ගත් කාලයේ සිටම
එබඳු හමුදාවක් සිටියේ නැත. ඉතාම ප්‍රබල යුද්ධ දක්ෂකයා වන

සාතන් මේ හමුදාව මෙහෙයවන අතර ඔහුගේ දූතයෝ මේ අවසාන පොරයට සියල්ලන් රැස් කරති. රජවරු හා යුද්ධ හටයෝ මේ හමුදාවට ඇතුළත්ය. ජන සමූහය විශාල කාණ්ඩ වශයෙන් පිටත්ව යන්නේ ඒ ඒ කාණ්ඩ ඒ ඒ නායකයන් විසින් මෙහෙයවනු ලැබීම යටතේය. යුද්ධ හමුදාවක නිවැරදි ස්වභාවයෙන් මේ හට හමුදාව පොළොවේ කැඩී බිඳී ගිය මූණත මත යන්නේ දෙවියන්වහන්සේගේ නගරයටය. යේසුස්වහන්සේගේ නියමය අනුව අලුත් යෙරුසලමේ දොරටු වසා තිබේ. සාතන්ගේ හමුදාව නගරය වටා සැකසෙමින් ඊළඟ ක්‍රියාවට සූදානම් වෙයි.

දැන් යේසුස්වහන්සේ නැවත වරක් තමාගේ සතුරන්ට ප්‍රකාශ වනසේක. නගරයට බොහෝ ඉහළින්, රත්රන්වලින් ඔප කරනු ලැබූ අත්තිවාරමක් මත ඉහළට ඔසවන ලද සිංහාසනයක් තිබේ. දේව පුත්‍රයාණන්වහන්සේ ඒ සිංහාසනය මත වාඩිවී සිටින සේක. උන්වහන්සේගේ රාජ්‍යයට අයිති අය උන්වහන්සේ අවට සිටිති. ක්‍රිස්තුස්වහන්සේට ඇත්තාවූ බලය හා රාජකීයත්වය වචනවලින් කිසිසේත් විස්තර කිරීමට නුපුළුවන, කිසි පැනකින් ලියා දක්වීමටද නුපුළුවන. සදාකාලික පියාණන්වහන්සේගේ තේජස උන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේව වසාගෙන තිබේ. උන්වහන්සේගේ දීප්තියෙන් දෙවියන්වහන්සේගේ නගරය පිරී තිබේ. එය එහි දොරටු දෙසට ගලා යමින් මුළු ලෝකයම එහි දීප්තියෙන් පුරවයි.

සිංහාසනයට ඉතාම ආසන්නව සිටින අයවල් වනාහි වරක් සාතන්ගේ පක්ෂයෙහි උනන්දුව සිටි නමුත්, ගින්නෙන් ඇදගනු ලැබූ ගිනි පෙනලි මෙන් ඉතා මහත් කැපවීමෙන් හා උනන්දුවෙන් යුක්තව ගැළවුම්කාරයාණන් පසුපස ගියාවූ අයවල්ය. ඊළඟට සිටින්නාවූ අය වනාහි බොරුකාර, අවිශ්වාසවන්ත පරිසරයකදී සම්පූර්ණ ක්‍රිස්තියානි චරිතයන් ඇතිව සිටියාවූ අයවල්ය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් අවංලගු කර තිබෙන බව පවසනු ලැබූ විට ඔව්හු ඒ ව්‍යවස්ථාවට ගරු කළේ ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සියලු කාලවලදී ඔවුන්ගේ ඇදහිල්ල නිසා වේද සාක්ෂික මරණයන්ට යොමු කරනු ලැබූ විටය. ඊළඟට, "සියලු ජාතීන්ගෙනුත් ගෝත්‍රවලිනුත් සෙනඟගෙනුත් භාෂාවන්ගෙනුත් කිසිවෙකුට ගණන් කළ නොහැකි මහත් සමූහයක් සුදු සළු පැළඳ, තමුන්ගේ අත්වල තාලපත්‍ර ඇතුව, සිංහාසනය ඉදිරියෙහිත් බැටළු පැටවාණන් ඉදිරියෙහිත් සිටිනවා" ඇත. (එළිදරව් 7:9) ඔවුන්ගේ සටන අවසානය. ඔවුන්ට ජය ලැබී තිබේ. ඔව්හු තරඟ දිවීම අවසාන කරන විපාකය ලැබ සිටිති. ඔවුන්ගේ අත්වල තිබෙන තාල පත්‍රය වනාහි ඔවුන්ගේ ජයග්‍රහණයේ සංකේතයක්ය; සුදු සළු වනාහි දැන් ඔවුන්ට ලැබී තිබෙන ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ සලකුණක්ය.



ගැළවීම ලැබූ අය ගායනා කරන ප්‍රශංසාවේ ගීතය ස්වර්ගය මුළුල්ලේ දෝංකාරය වෙයි. "සිංහාසනයෙහි වැඩහිදින අපේ දෙවියන්වහන්සේටත් බැටළු පැටවාණන්ටත් ගැළවීම අයිතිය" යන්න ඔවුන්ගේ ගීතයයි. (එළිදරව් 7:10) දේවදූතයෝද සෙරපිම්වරුද මේ ප්‍රශංසාවට ඔවුන්ගේ කටහඬවල් ද එකතු කරති. ගැළවීම ලැබූ අය මීට පෙර කිසිවිටෙක දැක තිබෙනවාට වඩා හොදින් සාතන්ගේ බලය හා විරුද්ධත්වය දකින විට, තමාට ජයග්‍රහණය ලබා දුන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ බලය පමණක්ම බව ඔව්හු දනිති. ඒ මුළු සමූහය අතර කිසිවෙක් තමාට තමාගේම බලයෙන් හා යහපත්කමින් ජයග්‍රහණය ලැබුණ බව පවසමින් ගැළවීම ලැබුණේ තමාගේ හැකියාවෙන් යයි පවසන්නේ නැත. ඔවුන් කළාවූ කිසිදෙයක් ගැන හෝ ඔවුන් වින්දාවූ කිසි දුකක් ගැන කිසිවක් පවසනු ලබන්නේ නැත. නමුත් සෑම ගීතයකම සාරයද සෑම ජය නාදයකම රාවයද වන්නේ ගැළවීම දෙනු ලැබුවේ අපගේ දෙවියන්වහන්සේද බැටළු පැටවාණන්ද විසින්ය යන්නය.

ලෝකයේද ස්වර්ගයේද ජනවාසීන් රැස්ව සිටින විට දේව පුත්‍රයාණන්වහන්සේගේ ඔටුණු පැළඳවීම සිදුකරනු ලැබේ. දැන් අති උතුම් රාජකීයත්වයෙන් හා බලයෙන් පූර්ණවූ රජුන්ගේ රජ වූ තැනැන්වහන්සේ තමන්වහන්සේගේ ආණ්ඩුවට විරුද්ධව කැරලි ගැසූවන්ට විරුද්ධව විනිශ්චය නියම කරන සේක; තමන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩ කරමින් තමන්වහන්සේගේ සෙනඟට පීඩා කළාවූ අයට යුක්තිය ඉෂ්ට කරන සේක. දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘ මෙසේ කියයි: "තවද මහත් සුදු සිංහාසනයක්ද එහි වැඩහුන් තැනැන්වහන්සේද දුටිමි. උන්වහන්සේගේ අභිමුඛයෙන් අහසත් පොළොවත් පලා ගියේය. ඒවාට ස්ථානයක් සම්බනූණේය. මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි. පොත්ද දිගහරිනු ලැබුවේය. ජීවන පොත වන තවත් පොතක් දිගහරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය." (එළිදරව් 20:11,12)

සටහන් ලියා තිබෙන පොත් දිගහරිනු ලැබ, යේසුස්වහන්සේගේ ඇස් දුෂ්ටයන් දෙස යොමුවූ විට, තමා කර තිබෙන සෑම පාපයක් ගැනම ඔවුන්ට සිහි වෙයි. ඔවුන්ගේ පාද පවිත්‍රතාවයේ හා ශුද්ධ භාවයේ මාවතෙන් ඉවත් වූයේ කොතැනදී දැයි ඔවුන්ට පෙනෙයි. පාපය හා කැරලි ගැසීම කොපමණ දුරට ඔවුන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩ කිරීමට යොමු කළේ දැයි ඔවුන්ට පෙනෙයි. පෙළඹීමෙන් යුත් පරික්ෂාවන් ඇතිවූ විට පාපයට වැටීම කරණකොටගෙන ඔවුන් ඒ පරික්ෂාවන්ට දිරි දී තිබුණි. දෙවියන්වහන්සේගේ ආශිර්වාද වැරදි

අන්දමට පාවිච්චි කළ බවද, දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් එපා කළ බවද, අවවාද එපා කළ බවද, දයාවේ රළි මුරණ්ඩුකමින් හා පසුතැවිලි නොවන හදවතකින් එපා කළ බවද යන මේ සියල්ලම ගිනිමය අකුරුවලින් ප්‍රකාශ වෙයි.

සිංහාසනයට ඉහළින් කුරුසිය දක්වා තිබේ. ආදම්ට පරීක්ෂාව පැමිණීම හා ඔහු පාපයට වැටීමද මිදීමේ සැකසුම අනුව ඊළඟට ගනු ලැබූ පියවරවල්ද අඛණ්ඩ දර්ශනයකින් දක්වනු ලැබේ. ගැළවුම්කාරයාණන්වහන්සේගේ යටහත් උත්පත්තියද, උන්වහන්සේ ඒ ජීවිතයේ මුල් කාලයේදී ගතකළ කීකරුකමින් යුත් යටහත් ජීවිතයද, උන්වහන්සේව යොර්දානේදී බව්තීස්ම කරනු ලැබීමද, උන්වහන්සේ නිරාහරව සිටීම හා වනාන්තරයේදී උන්වහන්සේව පරීක්ෂා කරනු ලැබීමද දක්වනු ලැබේ. උන්වහන්සේගේ ප්‍රසිද්ධ සේවයද, ස්වර්ගයේ ඉතාම අගනා ආශිර්වාද මනුෂ්‍යයන්ට විවෘත කරදීමද, ප්‍රේමයේ හා දයාවේ සේවයෙන් පිරි දවස්ද, කඳුකරයේදී තනිවම ගතකළ යාච්ඤාවේ හා බලාසිටීමේ රාත්‍රි කාලයන්ද දක්වනු ලැබේ. උන්වහන්සේගේ යහපත් ක්‍රියාවන් වෙනුවට ඇතිවූ ඊර්ෂ්‍යාවේ, වෛරයේ හා අන්තරාවේ උගුල් අටවනු ලැබීමද දක්වනු ලැබේ. මුළු ලෝකයේම වැසියන්ගේ පාපයන්ගෙන් තමා පොඩි කළාවූ බර යටතේ ගෙත්සෙමනේදී ඇතිවූ භයානක අභිරහස්ගත වේදනාවද, මිනීමරු, ප්‍රචණ්ඩකාරී සමූහයකගේ අත්වලට පාවාදෙනු ලැබීමද, දක්වනු ලැබේ. ඒ භයානක රාත්‍රියේදී සිදුවූ භයානක සිද්ධීන් පිළිබඳවද, විරුද්ධකමක් නොදක්වූ සිරකරු ගැනද, තමාගේ ප්‍රේමණීය ගෝලයන් විසින් අත් හරිනු ලැබීමද, දක්වනු ලැබේ. උන්වහන්සේව රළු ලෙස යෙරුසලමේ වීථි ඔස්සේ ඉක්මන් ගමණින් ගෙනයනු ලැබීමද, උත්තම පූජකයාගේ මාළිගාවේදී මහත් ප්‍රීතියකින් යුක්තව අන්නස් ඉදිරියට පමුණුවනු ලැබීමද, විනිශ්චය ශාලාවේදී පිලාත් ඉදිරිපිට සිටීමද, දක්වනු ලැබේ. හරිදෙය කිරීමට බියවූ කෲර හෙරෝද් ඉදිරිපිට පෙනී සිට, නිග්‍රහකර අපහාසකර, වධ හිංසා කර මරණයට නියම කරනු ලැබීමද යන මේ සියල්ලම පැහැදිලි චිත්‍රයන්ගෙන් දක්වනු ලබනවා ඇත.

දන් වැනි වැනී සිටින්නාවූ ඒ සමූහයා ඉදිරිපිට ඒ අවසාන දර්ශන දක්වනු ලබනවා ඇත. ඉවසීමෙන් පීඩාවන් දරාගෙන සිටි තැනැන්වහන්සේව කල්වරියට ගෙනයනු ලැබීම, ස්වර්ගයේ කුමාරයාණන් කුරුසිය මත එල්ලනු ලැබ සිටීම, උඩඟු පූජකයන්ද සරදම් කරන සමූහයාද උන්වහන්සේගේ වේදනාවට නිග්‍රහ කිරීම, අස්වාභාවික අන්ධකාරය, භූමිය කම්පාවීම, පර්වත පැලී යාම, සොහොන් ගෙවල් විවෘත කරනු ලැබීම යන මේ සිද්ධීන්ගෙන් ලෝකයේ මිදුම්කාර-යාණන්වහන්සේ තමන්වහන්සේගේ ජීවිතය පූජා කළ අවස්ථාව දක්වෙයි.



මේ භයානක දර්ශනය ප්‍රකාශ වන්නේ එය සිදුවූ අන්දමටය. සාතන්ට හා ඔහුගේ දූතයන්ටද ඔහුට යටත්වූ මනුෂ්‍යයන්ටද ඔවුන්ගේම වැඩවලින් සිදුවූ ඒ දර්ශනයෙන් ඉවතට හැරීමට බලයක් නැත. එක් එක් තැනැත්තාට, මේ සිද්ධියන්හිදී තමා කළාවූ කොටස සිහිවෙයි. හෙරෝද් ඉශ්‍රායෙල්ගේ රජතුමා විනාශ කිරීමේ අභිලාෂයෙන් බෙත්ලෙහෙමේ සිටියාවූ අහිංසක දරුවන් මරන්ට යෙදුණි. යොහන් බව්තීස්තගේ මරණය පිළිබඳ වරදකාරකම නීච හෙරෝදියස් මත පවතියි. කාලයට අනුව ක්‍රියා කළ දුර්වලයෙක් වූ පිලාත්ද, සරදම් කරමින් සිටි සොල්දාදුවෝද, පූජකයෝ හා නායකයෝද 'ඔහුගේ ලේ අප පිටද, අපගේ දරුවන් පිටද වේවා' යි කෑගැසූ සමූහයාද යන මේ සියලු දෙනාම තමාගේ වරදේ විශාලත්වය දකිති. ඔවුන් නිෂ්ඵලයේ උත්සාහ කරන්නේ සූර්යයාගේ තේජසට වඩා මහත් තේජසකින් බබළන්නාවූ උන්වහන්සේගේ මුහුණේ පවතින දිව්‍ය රාජකීයත්වයෙන් සැඟවීමටය. ඒ අතර, මිදීම ලැබූවාවූ අය තමාගේ ඔටුණු ගැළවුම්කාරයාණන්ගේ පාමුල තබමින් 'උන්වහන්සේ මා උදෙසා මැරුණසේක' යයි පවසති.

මිදීම ලැබූ සේනාව අතර ක්‍රිස්තුස්වහන්සේගේ අපෝස්තුළුවරුද, නිර්භීත පාවුල්ද, උනන්දුවෙන් ක්‍රියා කළ පේතෘස්ද, ප්‍රේම කරන ලද්දාවූද ප්‍රේම කරන්නෙක්ද වූ යොහන්ද, ඔවුන්ගේ සත්‍යවාදී සිත්වලින් යුක්තවූ සහෝදරයෝද, වේද සාක්ෂිකයන් සමූහයක්ද ඔවුන් සමග සිටිති. බිත්ති වලින් පිටත සෑම නරක, පිළිකුල් සියල්ල අතර සිටින්නේ ඔවුන්ට පීඩා කරමින්, ඔවුන් සිරගෙවලට දමමින් ඔවුන් මැරුවාවූ අයවල්ය. කෲරකමේ හා නපුරු ක්‍රියාවන්හි රෞද්‍ර ලෙස නියුක්තවූ නීරෝද් එහි සිටියි. තමා පීඩා කළ අයට ඇත්තාවූ ප්‍රීතිය හා ප්‍රබෝධය ඔහුට දර්ශනය වෙයි. ඔවුන්ගේ ඉමහත් වේදනාවේදී ඔහු තුළ සාතනික ප්‍රීතියක් ඇතිවී තිබුණි. ඔහුගේ මවද එහි සිටිමින් ඇගේ වැඩවල ප්‍රතිඵල සාක්ෂි දරයි. නපුරු ගුණාංගයන්ගෙන් යුත් චරිතයක් ඔහුට උරුමවී තිබුණ බවද, ඇගේ ආදර්ශයෙන් හා බලපෑමෙන් ඔහු තුළ ඒ ප්‍රබල හැඟීම් වර්ධනය වීමට ඈ දිරි දුන් බවද, එමගින් ලෝකය වෙව්ලා සිටින අන්දමේ අපරාධ කිරීමේ ඵල ඇතිවී තිබෙන බවද ඈය දකියි.

පාප් සභාවේ පූජකයන් හා නායකයන් තමා ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතිවරයන් යයි පැවසූ නමුත් ඔව්හු මනුෂ්‍යයන්ගේ හෘදය සාක්ෂිය පාලනය කරන පිණිස මනුෂ්‍යයන් බැඳ තබා ඔවුන්ට වධ හිංසා කිරීමටද, ඔවුන්ව ගිනි තබා මැරීමටද ඔවුන් අඳුරු ගුහාවල දැමීමටද යොමුවී තිබුණි. තමාව දෙවියන්වහන්සේට වඩා උසස් කරගෙන මහෝත්තමයාණන්ගේ ව්‍යවස්ථාවන් වෙනස් කිරීමට පවා ඉදිරිපත් වූ උඩඟු පාප්වරුද එහි සිටිති. සභාවේ පියවරුන් හැටියට පෙනී සිටියාවූ

අය ඔවුන්ගේ ක්‍රියාවන් ගැන දෙවියන්වහන්සේට ගණන් දිය යුතුය; ඔවුන්ට එයින් නිදහස් වීමට නුපුළුවන. සර්වබලධාරී තැනැන්වහන්සේ තමන්වහන්සේගේ ව්‍යවස්ථාවන් ගැන ඊර්ෂ්‍යා වන බවද උන්වහන්සේ වරද කරන්නන් නිදහස් නොකරන බවද ඔවුන් දකින්නේ ප්‍රමාද වැඩි වෙලාය. ක්‍රිස්තුස්වහන්සේ තමාගේ දුක් විදින මනුෂ්‍යයන් ගැන සැලකිලිමත් වන බව ඔව්හු දැන් ඉගෙන ගනිති. "මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නුමුත් නුඹලා ඒක කළහුද ඒක කළේ මටය," (මතෙව් 25:40) යනුවෙන් උන්වහන්සේ පැවසූ වචනවල බලය ඔවුන්ට දැන් වැටහෙයි.

මුළු දුෂ්ට ලෝකයම දෙවියන්වහන්සේගේ නඩු ශාලාව ඉදිරියේ සිටින්නේ ස්වර්ගීය ආණ්ඩුවට විරුද්ධව ද්‍රෝහිව ක්‍රියා කිරීමේ චෝදනාව පිටය. ඔවුන් උදෙසා පෙනී සිටීමට ඔවුන්ට කිසිවෙක් නැත. ඔවුන්ට ඉදිරිපත් කළ හැකි සමාවට කාරණයක්ද නැත. සදාකාල මරණය නමැති නඩු තීන්දුව ඔවුන්ට විරුද්ධව පවසා තිබේ.

පාපයේ කුළිය නම් උසස් නිදහස හා සදාකාල ජීවිතය නොව, වහල්කම, විනාශය හා මරණය බව දැන් සියලු දෙනාටම පෙනී යයි. තමාගේ කැරළිකාර ජීවිත මගින් තමාට නැතිවී තිබෙන්නේ කුමක්දැයි දුෂ්ටයෝ දකිති. ඉතාමත් මහත් සදාකාල තේජස් භාරයක් ඔවුන්ට පුදකරනු ලැබූ විට ඔවුන් එය පිළිගත්තේ නැත. නමුත්, එය කොපමණ ප්‍රසන්නදැයි ඔවුන්ට දැන් පෙනෙයි. විනාශයට යොමුවූ ආත්මය මෙසේ පවසයි: "මට මේ සියල්ල ලබාගැනීමට පුළුවන්කම තිබුණි. නමුත් මම ඒවා මා කෙරෙන් ඉවත් කිරීමට තෝරා ගතිමි. අහෝ බොරුකාර විශ්මයජනක ක්‍රියාව! සමාදානය, ප්‍රීතිය හා ගෞරවය වෙනුවට මම කාලකණ්ණිකම, අගෞරවය හා බලාපොරොත්තු රහිත භාවය තෝරා ගතිමි." තමා ස්වර්ගයට ගනු නොලැබීම සාධාරණ බව සියල්ලන්ට පෙනෙයි. ඔවුන්ගේ ජීවිතවලින් ඔවුන් පෙන්වා තිබෙන්නේ 'අප කෙරෙහි රජකම් කිරීමට අපට යේසුස්වහන්සේව උවමනා නැත' යන්නය.

දුෂ්ටයෝ මහත් විශ්මයෙන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේට ඔටුණු පළඳවනු ලැබීම දර්ශනය කරති. ඔවුන් එපා කරමින් කඩ කළාවූ දිව්‍ය ව්‍යවස්ථාව අන්තර්ගත ගල් ලැලි උන්වහන්සේගේ අත්වල තිබෙනවා ඔව්හු දකිති. ගැළවීම ලැබූ අය විශ්මයෙන්, ඉමහත් ප්‍රීතියෙන් හා නමස්කාරයෙන් ප්‍රීති සෝෂා කරනවා ඔවුන්ට ඇසෙයි. නගරයෙන් පිටත සිටින්නන් මත ඒ ගීත රාවය ගලායන අතර ඔවුන් සියලු දෙනාම මෙසේ පවසනවා ඇත: "සර්ව පරාක්‍රමවූ ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ ක්‍රියා මහත්‍ය, විස්මපත්‍ය, ජාතීන්ගේ රජ්ජුරුවෙනි, ඔබගේ මාර්ග ධර්මිෂ්ඨය, සැබෑය." මුහුණින් වැටී ඔව්හු ජීවිතයේ කුමාරයාණන්වහන්සේට නමස්කාර කරති.



ක්‍රිස්තුස්වහන්සේගේ තේජස හා රාජකීයත්වය දකින අතර සාතන් ක්‍රියා විරහිත වෙයි. වරක් ආවරණය කරන්නාවූ කෙරුබ්වරයෙක්ව සිටි ඔහුට සිහිවන්නේ තමා වැටී ගියේ කොතැනින්ද යන්නය. බබළන සෙරපිම්වරයෙක්වූ, 'අලුයම් පුත්‍රයා' වූ ඔහු දැන් කොපමණ දුරට වෙනස්වී සිටියේද, ඔහු කොපමණ පහත් තත්ත්වයකට පැමිණ සිටියේද! ඔහුට වරක් ගරු කරනු ලැබූ ඒ මණ්ඩලයෙන් ඔහු සදහටම ඉවත් කරනු ලැබ සිටියි. වෙනත් කෙනෙක් තේජස වසාගෙන පියාණන්වහන්සේට ළංව සිටින බව ඔහුට පෙනෙයි. ශාරීරික විශාලත්වයකින් යුත් රාජකීය පෙනුමක් ඇති දේවදූතයෙක් ක්‍රිස්තුස්වහන්සේගේ හිස මත ඔටුන්නක් තබනවා ඔහුට පෙනෙයි. ඒ දේවදූතයාට හිමිවූ උසස් තත්ත්වය තමාගේ තත්ත්වය වීමට පුළුවන් වූ බව ඔහු දනියි.

මතකය ඔහුගේ කල්පනාවට යොමු කරන්නේ අහිංසක පවිත්‍රතාවයෙන් ඔහුට තිබුණාවූ, නිවසය. දෙවියන්වහන්සේට විරුද්ධව කෙදිරීමටද ක්‍රිස්තුස්වහන්සේට ඊර්ෂ්‍යා කිරීමටද පටන් ගන්නා තුරු ඔහුට තිබුණාවූ සමාදානය හා තෘප්තිය ඔහුට මතක් වෙයි. දේවදූතයන්ගේ සහාය හා සානුකම්පාව ලබාගන්නා පිණිස, වරදට පත්කිරීමටද, කැරළි ගැසීමටද, රැවටිලිකාරකම් කිරීමටද ඔහු යොමුවී තිබුණි. දෙවියන්වහන්සේ ඔහුට කමාව දීමට සූදානම්ව සිටි විට තමාව හරිගස්සා ගැනීමට කිසි උත්සාහයක් නොකර තමා මුරණ්ඩු ලෙස ක්‍රියා කළ බවද යන මේ සියල්ලම පැහැදිලි ලෙස ඔහු ඉදිරියෙහි දිස්වෙයි. තමා මනුෂ්‍යයන් අතර කළ දේවල්ද එහි ප්‍රතිඵල වශයෙන් මනුෂ්‍යයා තමාගේ සහකාර මනුෂ්‍යයන්ට සතුරුව සිටීම, භයානක ලෙස ජීවිත විනාශ වීම, රාජ්‍යයන්ගේ නැගිටීම හා වැටීම, සිංහාසන පෙරලනු ලැබීම, කෝලාහල අරගල හා විප්ලව ඇතිවීම ඔහුට පෙනෙයි. ක්‍රිස්තුස්වහන්සේගේ වැඩවලට විරුද්ධ වෙමින් මනුෂ්‍යයා වඩ වඩා පහත් තත්ත්වයකට පැමිණවීමට තමා ක්‍රියා කළ බවද ඔහුට මතක් වෙයි. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ අයවලුන් විනාශ කිරීමට ඔහු ගත්තාවූ ඉතා කූට උපායන් බල රහිත වූ බව ඔහුට පෙනෙයි. සාතන් තමාගේ රාජ්‍යය දෙසද තමාගේ වැඩවල ඵල දෙසද බලන අතර, ඔහුට පෙනෙන්නේ අසාර්ථකත්වය හා විනාශය පමණක්ම පවතින බවය. දෙවියන්වහන්සේගේ නගරය ඔවුන්ට පහසුවෙන් ලබාගත හැකි ස්ථානයක් බව විශ්වාස කිරීමට ඔහු සමූහයන්ට මගපෙන්වා තිබුණි. නමුත් මෙය අසත්‍යයක් බව ඔහු දනියි. ඔහු මේ මහා අරගලයේදී නැවත නැවතත් ඉදිරියටම ගිය විට ඔහු පරාජයට පත්වී යටත් වීමට බලකරනු ලැබුවේය. සදාකාලික තැනැන්වහන්සේගේ බලය හා රාජකීයත්වය ගැන ඔහු හොඳාකාර දනියි.

මේ මහා කැරළිකාරයාට සැමවිටම තිබුණාවූ අභිලාෂය නම් තමා තුළ කිසි වරදක් නැති බව කියා සිටිමින් මේ කැරැල්ල ගැන වගකිව යුත්තේ දිව්‍ය ආණ්ඩුවම බව ඔප්පු කිරීමය. මේ අදහස සම්පූර්ණ කරගැනීමට ඔහු තමාගේ ඉමහත් ප්‍රඥාව හා බලය පාවිච්චි කර තිබේ. ඔහු උනන්දුවෙන්ද ක්‍රමානුකූල ලෙසද වැඩ කර තිබේ. මෙපමණ දීර්ඝ කාලයක් පැවතුණාවූ මේ මහා අරගලය පිළිබඳව තමාගේ අදහස පිළිගැනීමට මහත් සමූහයන්ට මගපෙන්වීමේදී ඔහුට විශ්මයජනක සඵලත්වයක් ලැබී තිබේ. වසර දහස් ගණනක් මුළුල්ලේ මේ නායක ද්‍රෝහියා සත්‍යය වෙනුවට බොරුව ඉදිරිපත් කර තිබේ. නමුත් දැන් මේ කැරැල්ල සම්පූර්ණයෙන්ම පරාජයට පත්කරනු ලැබ, සාතන්ගේ ඉතිහාසය හා චරිතය විවෘත කරනු ලැබිය යුතු කාලය පැමිණ තිබේ. ක්‍රිස්තුස්වහන්සේව සිංහාසනයෙන් පහකරමින් උන්වහන්සේගේ සෙනඟ විනාශ කරමින් දෙවියන්වහන්සේගේ නගරය අයිති කරගැනීමට ඔහු ගන්නා මේ අවසාන උත්සාහයේදී මේ නායක රැවටිලිකාරයා සම්පූර්ණයෙන්ම විවෘත කර දක්වනු ලැබේ. ඔහු හා එක්සත්වූ අය දකින්නේ ඔහුගේ සටන සම්පූර්ණයෙන්ම අසාර්ථක වූ බවය. දෙවියන්වහන්සේගේ ආණ්ඩුවට විරුද්ධව ඔහු යොදා ඇති සියලු උපක්‍රම, ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන්ටද උන්වහන්සේගේ පක්ෂපාතවූ දේවදූතයන්ටද සම්පූර්ණයෙන්ම පෙනී යනවා ඇත. දැන් මුළු විශ්වයම ඔහුව පිළිකුල් කරයි.

තමා සිය කැමැත්තෙන්ම කළාවූ කැරැල්ල මගින් තමා ස්වර්ගයට නුසුදුස්සෙක් වූ බව සාතන්ට පෙනෙයි. ඔහු තමාගේ බලයන් පුහුණුකර තිබෙන්නේ දෙවියන්වහන්සේට විරුද්ධව සටන් කිරීමටය. ස්වර්ගයේ පවතින සාමය, ශුද්ධභාවය හා ඒකත්වය ඔහුට මහත් පීඩාවක් වෙනවා ඇත. දෙවියන්වහන්සේගේ දයාවට හා සාධාරණත්වයට විරුද්ධව ඔහු ඉදිරිපත් කළ චෝදනා දැන් නිශ්චල කරනු ලැබ තිබේ. යෙහෝවඃවහන්සේ මත තැබීමට ඔහු උත්සාහ කළ අවමානය දැන් සම්පූර්ණයෙන්ම ඔහු මතය. දැන් සාතන් හිස නමමින් ඔහුට දී තිබෙන විනිශ්චය සාධාරණ බව කියා සිටියි.

"ස්වාමිනී, ඔබගේ නාමයට භය නොවන්නෙත් ගෞරව නොකරන්නෙත් කවුද? මක්නිසාද ඔබ පමණක් ශුද්ධය, එබැවින් සියලු ජාතීන් පැමිණ ඔබ ඉදිරියෙහි නමස්කාර කරනවා ඇත. මක්නිසාද ඔබගේ ධර්මිෂ්ඨ ක්‍රියා ප්‍රකාශ කරන ලද්දේ යයි කීවෝය." (එළිදරව් 15:4) බොහෝ කල් පැවති මේ අරගලයේ සත්‍යයන් හා වැරදි දේවල් පිළිබඳ සෑම ප්‍රශ්නයක්ම දැන් පැහැදිලි කර තිබේ. කැරළි ගැසීමේ ප්‍රතිඵල, දිව්‍ය ව්‍යවස්ථාවන් ඉවත දැමීමේ ඵල දැන් ප්‍රඥාව ඇත්තාවූ සියල්ලන්ගේ දර්ශනයට විවෘත කර තිබේ. දෙවියන්වහන්සේගේ



ආණ්ඩුවට විරුද්ධව සාතන් ක්‍රියාකිරීම පිළිබඳව මුළු විශ්වයටම දක්වා තිබේ. සාතන්ගේ ක්‍රියාවලින්ම ඔහු වරදට පත්කරනු ලැබ තිබේ. දෙවියන්වහන්සේගේ ප්‍රඥාව, උන්වහන්සේගේ සාධාරණත්වය හා යහපත්කම දැන් පැහැදිලිව ප්‍රකාශ වී තිබේ. මේ මහා අරගලයේදී උන්වහන්සේ සියලු ක්‍රියාවන් කරන්ට යෙදුණේ තමන්වහන්සේගේ සෙනඟගේ යහපත සඳහාත් උන්වහන්සේ විසින් මවා ඇත්තාවූ සියලු ලෝකවල යහපත සඳහාත් බව පෙනී යනවා ඇත. "ස්වාමිනී, ඔබගේ සියලු කර්මාන්තයෝ ඔබට ස්තුති කරන්නෝය, ඔබගේ ශුද්ධවන්තයෝද ඔබට ප්‍රශංසා කරන්නෝය." (ගීතාවලිය 145:10) පාපය පිළිබඳ ඉතිහාසය සදාකාලය මුළුල්ලේ සාක්ෂියක් වන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ පැවැත්ම උන්වහන්සේ විසින් මවන ලද සියල්ලන්ගේ ප්‍රීතියට සම්බන්ධ වන බවටය. මේ මහා අරගලයේ සියලු කාරණා දර්ශනය වන විට මේ මුළු විශ්වයේම උන්වහන්සේට විශ්වාසවන්ත අයද උන්වහන්සේට විරුද්ධව කැරලි ගැසූ අයද ඒකත්වයෙන් මෙසේ කියනවා ඇත: "ජාතීන්ගේ රජ්ජුරුවෙනි, ඔබගේ මාර්ග ධර්මිෂ්ඨය, සැබෑය."

මනුෂ්‍යයන් උදෙසා පියාණන්වහන්සේද පුත්‍රයාණන්වහන්සේද කර තිබෙන්නාවූ ඉමහත් පූජාව මුළු විශ්වය ඉදිරිපිට පැහැදිලි ලෙස දක්වා තිබේ. ක්‍රිස්තුස්වහන්සේට නියමිත ස්ථානය උන්වහන්සේට දෙනු ලැබ සියලු අධිපතීන්ටත් බලධාරීන්ටත් ඉහළින්ද, පවසනු ලබන සෑම නාමයකටම ඉහළින්ද ක්‍රිස්තුස්වහන්සේ තේජසට පත්කරනු ලැබිය යුතු කාලය පැමිණ තිබේ. උන්වහන්සේ වනාහි තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය නිසා එනම්, බොහෝ පුත්‍රයන් මහිමයට පැමිණවීමට තමන්වහන්සේට පුළුවන් වන පිණිස කුරුසියද එහි ලැජ්ජාවද විඳ දරාගත්සේක. එහි කණගාටුව හා ලැජ්ජාව වටහාගත නොහැකි තරම් වුවද, එයින් උන්වහන්සේට ලැබෙන ප්‍රීතිය හා මහිමය වඩා විශාලය. උන්වහන්සේ තමන්වහන්සේගේ ස්වරූපයට අළුත් කරනු ලැබූ ගැළවීම ලැබූවන් දෙස බලන සේක. සෑම හදවතක්ම දිව්‍ය තැනැන්වහන්සේගේ ස්වභාවය දරයි. සෑම මුහුණක්ම තම රජ්ජුරුවන්වහන්සේගේ සමානත්වය පිළිබිඹු කරයි. උන්වහන්සේ ඔවුන් තුළ තමන්වහන්සේගේ ආත්ම පීඩාවේ ප්‍රතිඵල දකිමින් සෑහීමට පත්වන සේක. එවිට උන්වහන්සේ එහි රැස්ව සිටින ධර්මිෂ්ඨයන් හා දුෂ්ටයන් සමූහයටම ශ්‍රවණය කළ හැකි හඬකින් මෙසේ පවසනවා ඇත: "මේ මාගේ රුධිරයෙන් මිලයට ගනු ලැබූ අයවල්ය! මම ඔවුන් උදෙසා දුක් වින්දෙමි. මම ඔවුන් උදෙසා මැරුණෙමි. මා එසේ කළේ ඔවුන්ට සදාකාලය මුළුල්ලේ මා ඉදිරියෙහි වාසය කිරීමට පුළුවන් වන පිණිසය" යන්නය. සුදු සළු පැළඳගෙන සිංහාසනය අවට සිටින්නාවූ අය මේ ප්‍රශංසා ගීතය ගායනා කරති: "මරනු ලැබූ බැටළු පැටවාණෝ

බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රශංසාවත් ලබන්ට වටින තැනැන්වහන්සේය." (එළිදරව් 5:12)

සාතන් දෙවියන්වහන්සේගේ සාධාරණත්වය ඒත්තු ගනිමින් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තමභාවය ඉදිරියෙහි හිස නැමීමට බලකරනු ලැබ සිටින නමුත් ඔහුගේ චරිතය වෙනස් වන්නේ නැත. කැරළි ගැසීමේ ආත්මය වේගයෙන් ගලන මහත් ජල ධාරාවක් මෙන් නැවත බිඳ හැලෙයි. මහත් කෝපයෙන් පූර්ණව ඔහු ඒ මහත් අරගලයේදී යටපත් නොවීමට තීරණය කරගනියි. ස්වර්ගයේ රජතුමාණන්ට විරුද්ධව කරන පොරයේ අවසාන කොටස දැන් පවතියි. ඔහු තමාගේ යටත්වාසීන් වෙතට වේගයෙන් දුවමින්, ඔහුගේම කෝපයෙන් යුක්තව ඔවුන්ව පොළඹවමින් වහාම සටනේ යෙදීමට ඔවුන් පුබුදුවයි. නමුත් ඔහු කැරළි ගැසීමට පොළඹවා ගත් මේ ලක්ෂ සංඛ්‍යාත ජනයා අතරින් කිසිවෙක් දැන් ඔහුගේ උත්තම භාවය පිළිගන්නේ නැත. දැන් ඔහුගේ බලය අවසාන වී තිබේ. දුෂ්ටයෝද සාතන්ව පොළඹවනු ලැබූ අන්දමටම දෙවියන්වහන්සේට ද්වේෂ කිරීමේ හැඟීම් වලින් පිරී සිටිති. නමුත් තමා බලාපොරොත්තු රහිත තත්ත්වයක සිටින බවද යොහෝවඃවහන්සේට විරුද්ධව ජයග්‍රාහක වීමට තමාට නුපුළුවන් බවද ඔව්හු දකිති. සාතන්ටද, රැවටිලිකාරකමේදී ඔහුගේ ඒජන්තවරුන් වශයෙන් ක්‍රියා කළාවූ අයටද විරුද්ධව ඔව්හු බොහෝසේ කෝප වෙති. යක්ෂ කෝපයකින් ඔව්හු ඔවුන් වෙත හැරෙති.'

ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක: "නුඹේ සිත දෙවි කෙනෙකුගේ සිත මෙන් නුඹ සලකන බැවින්, බලව, මම ජාතීන් අතරෙන් ඉතා භයානක විදේශීන් නුඹට විරුද්ධව පමුණුවන්නෙමි. ඔව්හු නුඹේ ප්‍රඥාවේ ලක්ෂණකමට විරුද්ධව තමුන්ගේ කඩු ඇද, නුඹේ දීප්තිය කිලුටු කරන්නෝය. ඔව්හු නුඹ මිනී වළට පමුණුවන්නෝය." "පියාපත් විදහාගෙන සිටි කෙරුබ්නි, මම නුඹ ගිනි ඇවිලෙන ගල් අතරෙන් නැති කෙළෙමි .... මම නුඹ පොළොවට හෙළා, රජවරුන් විසින් නුඹ දකින පිණිස නුඹ ඔවුන් ඉදිරියෙහි තැබුවෙමි ..... නුඹ දකින සියල්ලන්ගේ ඇස් ඉදිරියෙහි පොළොව පිට නුඹ අළු කෙළෙමි. .... නුඹ භීතියක් වී සිටිනෙහිය. තවත් කවදාවත් නුඹ නොවන්නෙහිය." (එසකියෙල් 28:6-8, 16-19)

"තවද කෝලාහලයට පැමිණෙන යුද්ධකාරයාගේ සියලු යුද්ධ වහන්ද ලෙයෙහි පෙඟූ වස්ත්‍රද ගින්නෙහි දැවීමට දර පිණිස වන්නේය." "මක්නිසාද ස්වාමින්වහන්සේ සෑම ජාතීන් කෙරෙහි උදහසද ඔවුන්ගේ සියලු සේනාවල් කෙරෙහි කෝපයද ඇතුව සිටින සේක. උන්වහන්සේ ඔවුන් විනාශයට කැපකොට මැරුම්කෑමට භාරදී තිබේ." (යෙසායා



9:5; 34:2) "දුෂ්ටයන් පිට උන්වහන්සේ මළපත් වස්වන සේක; ගිනිද ගෙන්දගම්ද දවන සුළඟද ඔවුන්ගේ කුසලානට බෙදෙන කොටස වන්නේය." (ගීතාවලිය 11:6) ස්වර්ගයේ සිට දෙවියන්වහන්සේ වෙතින් ගින්දර එනවා ඇත. පොළොව කැඩී බිඳී තිබේ. එහි ගැඹුරෙහි සඟවා තිබෙන ආයුධ පිටතට ගනු ලබනවා ඇත. සෑම විවෘත ස්ථානයකින්ම විනාශදායක ගිනි දළු එනවා ඇත. පර්වත ගිනි ගෙන තිබේ. "මක්නිසාද උදුනක් මෙන් ඇවිලෙන දවස පැමිණෙන්නේය" "මහා භූතයෝද තද උෂ්ණයෙන් නාස්තිවී යන්නෝය. පොළොවද එහි තිබෙන කර්මාන්තද දාලා යන්නේය." (මලාකි 4:1; 2 පේතෘස් 3:10) පොළොවේ මතු පිට තලය ගින්නෙන් දියවී විශාල ගිනි විලක් වෙනවා ඇත. එය අභක්තික මනුෂ්‍යයන් විනිශ්චය කර ඔවුන් විනාශ කරන දවස වෙනවා ඇත. "මක්නිසාද මේක ස්වාමින්වහන්සේගේ පළිගන්න දවසය, සියොන්හි පැමිණිල්ල ගැන විපාක දෙන අවුරුද්දය." (යෙසායා 34:8)

දුෂ්ටයන්ට මේ පොළොව මත ඔවුන්ගේ විපාකය ලැබෙයි. 'ඔව්හු ඉපනැලි මෙන් වන්නෝය.' "උදුනක් මෙන් ඇවිළෙන දවස පැමිණෙන්නේය." (මලාකි 4:1) සමහර අය මොහොතකින් විනාශ වෙති. ඒ අතර වෙනත් අය දවස් කිහිපයක් පීඩා විඳිති. සියලු දෙනාම ඔවුන්ගේ ක්‍රියාවන් අනුව දඬුවම් කරනු ලබන්නෝය. ධර්මිෂ්ඨයන්ගේ පාප සාතන් පිටට පවරනු ලබන බැවින් ඔහු දුක් විඳිය යුතු වන්නේ ඔහුගේම කැරළි ගැසීම නිසා පමණක් නොවේ. දෙවියන්වහන්සේගේ සෙනඟ ලවා ඔහු කරවන්ට යෙදුණාවූ පාප ගැනද ඔහුට දුක් විඳීමට සිදුවෙනවා ඇත. ඔහුට ලැබෙන දඬුවම ඔහු විසින් රවටන්ට යෙදුණාවූ අයට ලැබෙන දඬුවමට වඩා බොහෝ විශාල වෙනවා ඇත. ඔහුගේ රැවටීම්වලට අසුවූ සියලු දෙනාම විනාශ වූවාට පසුව ඔහු තවදුරටත් ජීවත්ව දුක් විඳිනවා ඇත. දුෂ්ටයෝ ඒ පවිත්‍ර කරන ගිනි දැල් වලින් සම්පූර්ණ ලෙස විනාශ කරනු ලබන්නේ මුලක්වත් අත්තක්වත් ඉතිරි නොවන පිණිසය. සාතන් මුලය, ඔහුගේ අනුගාමිකයෝ අතුය. ව්‍යවස්ථාව කඩ කිරීමේ සම්පූර්ණ දඬුවම දෙනු ලබනවා ඇත. සාධාරණත්වයේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරනු ලැබේ. ස්වර්ගයත් පොළොවත් දෙස බලන අය යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨ බව පවසති.

සාතන්ගේ විනාශකාරී වැඩ සදහටම හමාරය. වසර හය දහසක් මුළුල්ලේ ඔහු තමාගේ කැමැත්ත කරමින් ලෝකය කණගාටුවෙන් පුරවමින් විශ්වය මුළුල්ලේ ශෝකය ඇතිකර තිබේ. 'මුළු මැවිල්ල මේ දක්වා එක්ව කෙඳිරිගාමින් ගාවිනා විඳිමින් සිටියි.' දැන් දෙවියන්වහන්සේගේ මැවිල්ල ඔහුගේ පැවැත්මෙන් හා ඔහුගේ පරීක්ෂාවලින් සදහටම මුදනු ලබයි. "මුළු පොළොව නිෂ්කලංකව නිශ්චලව තිබේ.

(ධර්මිෂ්ඨ) මනුෂ්‍යයෝ ගී කියමින් මොර ගසති." (යෙසායා 14:7) මුළු පක්ෂපාත විශ්වයෙන්ම ප්‍රශංසාවේ හා ජයග්‍රහණයේ ශබ්දයක් ඔසවනු ලැබේ. "මහත් සමූහයකගේ හඬ මෙන්ද බොහෝ ජල ඝෝෂාවක් මෙන්ද බලවත් ගර්ජනාවල ශබ්දය මෙන්ද" එන ශබ්දය මෙසේ කියනවා ඇත: 'හලෙලූයා, සර්වබලධාරී ස්වාමිවූ දෙවියන්වහන්සේ රජකම් කරන සේක.'

ලෝකය විනාශ කිරීමේ ගින්නෙන් ඔතනු ලැබූ විට ධර්මිෂ්ඨයෝ ශුද්ධවූ නුවර සුරක්ෂිතව සිටියහ. පළමුවෙනි නැවත නැගිටීමට පංගුකාරකම ලැබූ අය මත දෙවෙනි මරණයට බලයක් නැත. (එළිදරව් 20:6) උන්වහන්සේ දුෂ්ටයන්ට විනාශ කරන ගින්නක් වන අතර තමන්වහන්සේගේ සෙනඟට 'සූර්යයෙක්ය, පළිහක්' ය. (ගීතාවලිය 84:11).

"අලුත් අහසක්ද අලුත් පොළොවක්ද දුටිමි. මක්නිසාද පළමු අහසත් පළමු පොළොවත් පහව ගියේය." (එළිදරව් 21:1) දුෂ්ටයන් විනාශ කරන ගින්න මගින් මේ පොළොව පවිත්‍ර කරනු ලැබේ. ශාපයේ සෑම සලකුණක්ම ඉවත් කරනු ලැබේ. සදාකල් ඇවිලෙන ගින්නක් පාපයේ භයානක ප්‍රතිඵල දක්වමින් මිදීම ලැබූවන් ඉදිරියෙහි පවතින්නේ නැත.

එහෙත් එක සිහිවටනයක් පමණක් පවතිනවා ඇත. අපගේ මිදුම්කාරයාණන්වහන්සේ උන්වහන්සේව කුරුසිපත් කරනු ලැබීමේ සලකුණු දරනවා ඇත. තුවාල කරන ලද උන්වහන්සේගේ හිස මතද, උන්වහන්සේගේ ඇලයේද, අත් හා කකුල්වලද පමණක්ම පාපයෙන් සිදුවී තිබෙන කෲර වැඩවල සලකුණු පවතිනවා ඇත. ක්‍රිස්තුස්-වහන්සේගේ තේජසින් උන්වහන්සේව දර්ශනය කරමින් අනාගතවක්තෘ මෙසේ කියයි: "උන්වහන්සේගේ හස්තයෙන් රශ්මි නික්මුණේය. උන්වහන්සේගේ පරාක්‍රමයද එහි සැඟවී තිබුණේය." (හබක්කුක් 3:4) අනින ලද උන්වහන්සේගේ ඇලයෙන් ගලාගෙන ආවාවූ රතු ගංගාවක් මගින් මනුෂ්‍යයා දෙවියන්වහන්සේට සමගි කරනු ලැබුවේය. එය ගැළවුම්කාරයාණන්වහන්සේගේ තේජස විය. උන්වහන්සේගේ 'පරාක්‍රමය එහි සැඟවී තිබුණේය.' උන්වහන්සේ ගැළවීම ලබාදීමට බලසම්පන්නය. මිදීමේ පූජාව මගින් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දයාව එපා කළ අයට යුක්ති සහගත ලෙස ක්‍රියාකිරීමට බලවත් වූ සේක. උන්වහන්සේගේ නින්දාවේ සලකුණු මගින් උන්වහන්සේට ඉමහත් ගෞරවයක් තිබේ. සදාකාලය මුළුල්ලේම, කල්වරියේදී ඇතිවූ තුවාල උන්වහන්සේගේ ප්‍රශංසාව දක්වමින් උන්වහන්සේගේ බලය ප්‍රකාශ කරනවා ඇත.



"එම්බා රැළේ කොත, සියොන් දුවගේ හෙල, නුඹ වෙතට පළමු ආණ්ඩුව එන්නේය." (මීකා 4:8) ඒ පළමු යුවල ඒදන් උයනට ඇතුල්වීම ගිනිමය කඩුව මගින් වලක්වනු ලැබූදා සිටම ශුද්ධවූ මනුෂ්‍යයන් මහත් ආශාවෙන් බලා සිටි කාලය පැමිණ තිබේ. එය මුදනු ලැබූවන් උදෙසා මිලදී ගන්නා ලද අයිතියය. පටන්ගැන්මේදී ලෝකය මනුෂ්‍යයාට දෙනු ලැබුවේ ඔහුගේ රාජ්‍යය හැටියටය. ඔහු එය සාතන්ගේ අත්වලට පාවා දුන්නේය. මෙපමණ කාලයක් මේ මහා සතුරා විසින් අයිති කරගත් මේ රාජ්‍යය දන් මිදීමේ මහා සැලසුම මගින් ආපසු ලැබී තිබේ. පාපය මගින් නැතිවූ සියල්ල නැවත ලැබී තිබේ. "ස්වර්ගයත් මැවූවාවූ පොළොව මවා සාදා එය පිහිටෙවුවාවූ" ස්වාමීන්වහන්සේ "එය හිස්කමට නොමවා වාසය පිණිස" සෑදූ බව කියනසේක (යෙසායා 45:18). ලෝකය මිදීම ලැබූවන්ගේ සදාකාල වාසස්ථානය වන අතර ලෝකය මැවීමේදී උන්වහන්සේට තිබුණාවූ පරමාර්ථය සම්පූර්ණ වෙයි. "ධර්මිෂ්ඨයෝ දේශය උරුම කරගන්නෝය, එහි සදාකල් වාසය කරන්නෝය." (ගීතාවලිය 37:29)

අනාගත උරුමය ඉතා භෞතික දෙයක් හැටියට සලකනු ලැබීම ගැන බියෙන් බොහෝ අය, එය තමාගේ නිවස වන්ට යන බව දක්වන සත්‍යයන්ට ආත්මික අදහසක් දීමට යොමු වෙති. ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන්ට කථා කරමින් පියාණන්වහන්සේගේ ගෘහයෙහි ඔවුන් උදෙසා අලංකාර වාසස්ථාන සූදානම් කරන පිණිස තමා පිටත්ව යන බව ඔවුන්ට කියා දුන්සේක. දෙවියන්වහන්සේගේ වචනයේ ඇත්තාවූ ඉගැන්වීම් පිළිගන්නාවූ අය ඒ ස්වර්ගීය වාසස්ථාන ගැන සම්පූර්ණ නොදැනුවත්කමින් සිටින්නේ නැත. එසේ වුවද, "දෙවියන්-වහන්සේ විසින් තමන් ප්‍රේම කරන්නන්ට සූදානම් කළ යම් දෙයක් ඇද්ද ඒ දේ ඇසට නොපෙනුණේය; කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමිණියේය." (1 කොරින්ති 2:9) ධර්මිෂ්ඨයන්ට ලැබෙන්ට යන විපාකය විස්තර කිරීමට මනුෂ්‍ය භාෂාව ප්‍රමාණවත් නොවේ. එය දැනගත හැක්කේ එය දකින අයට පමණය. කිසි මානුෂික මනසකට දෙවියන්වහන්සේගේ පාරාදීසයේ තේජස වටහාගැනීමට නුපුළුවන.

බයිබලයෙහි, ගැළවීම ලබන්නන්ට ලැබෙන උරුමය 'රටක්' යන නමින් හඳුන්වා තිබේ. (හෙබ්‍රෙව් 11:14-16) එහිදී ස්වර්ගීය එඬේරාණෝ තමන්වහන්සේගේ රැළ ජීවනදායක වතුර ඇති උල්පත් වෙතට ගෙනයන සේක. ජීවනදායක වෘක්ෂය සෑම මාසයේම ඵල දෙනවා ඇත. ඒ ගහේ කොළ ජාතීන්ගේ සේවය උදෙසාය. පළිඟු මෙන් පැහැදිලි ගංගාවෝ සෑමවිටම ගලති. ඒවා අසල තිබෙන්නාවූ ගස්වල සෙවනැලි ස්වාමීන්වහන්සේගේ මිදීම ලැබූවන් උදෙසා සූදානම් කරන ලද මාවතට

වැටෙයි. එහි ඇත්තාවූ පුළුල් මිටියාවත් අලංකාර කඳු බවට විහිදී යයි. දෙවියන්වහන්සේගේ කඳු ඒවායේ උසස් ශිඛරයන් දක්වති. ඒ සාමකාමී මිටියාවත්වල, ඒ ජීවමාන දිය දහරාවන් අසල, මෙපමණ කාලයක් වන්දනාකාරයන් හා මුළාව යන්නන් වූ දෙවියන්වහන්සේගේ සෙනඟට නිවෙසක් ලැබෙනවා ඇත.

"මාගේ සෙනඟ සමාදාන නිවාසයකද සුරක්ෂිත වාසස්ථානවලද නිවාඩු ස්ථානවලද වසන්නෝය." "නුඹේ දේශයෙහි බලාත්කාරයද නුඹේ සීමා ඇතුළේ නාස්තිය හා විනාශයද ගැන තවත් අසන්ට නොලැබෙන්නේය. නුඹේ පවුරු ගැළවීමය කියාද නුඹේ දොරටු ප්‍රශංසාවය කියාද නුඹ කියන්නෙහිය." (යෙසායා 32:18; 60:18) "ඔව්හු ගෙවල් ගොඩනගාගන එහි වාසය කරන්නෝය. මිදිවතු වවා එහි ඵල කන්නෝය. ඔවුන් ගෙවල් ගොඩනැගුවාම වෙන කෙනෙක් වාසය කරන්නේවත් ඔවුන් වැවුවාම වෙන කෙනෙක් කන්නේවත් නැත. .... මාගේ තෝරාගත් අය තමුන්ගේ අත් වැඩ බොහෝ කල් භුක්ති විඳින්නෝය." (යෙසායා 65:21,22)

එහිදී "වනාන්තරයද වියළි දේශයද ප්‍රීති වන්නේය. කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේය." "කටුගස වෙනුවට දේවදාරු ගසද තිබොල් ගස වෙනුවට මරඳ ගසද අටගන්නේය." (යෙසායා 35:1; 55:13) "වෘකයා බැටළු පැටවා සමග වාසය කරන්නේය. දිවියාද එළු පැටවා සමග ලගින්නේය. .... කුඩා දරුවෙක් උන් ගෙන යන්නේය .... මාගේ ශුද්ධ කන්දේ සීමා තුළෙහි කිසි අනතුරු කිරීමක්වත් විනාශ කිරීමක්වත් නොවන්නේය" යි ස්වාමීන්-වහන්සේ කියන සේක. (යෙසායා 11:6,9)

ස්වර්ගීය පරිසරයෙහි වේදනාවක් පවතින්ට නුපුළුවන. එහි කඳුළු හෝ භූමදානය සඳහා යන කාණ්ඩ හෝ වැලපීමේ සලකුණු හෝ පවතින්නේ නැත. "මරණය තවත් නොවන්නේය. වැලපීමත් හැඬීමත් වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහය ගියේය." (එළිදරව් 21:4) "තමා ලෙඩින් යයි කිසි වැසියෙක් නොකියන්නේය. එහි වාසය කරන සෙනඟගේ අයුතුකම කමා කරනු ලබන්නේය." (යෙසායා 33:24)

තේජාන්විත කරනු ලබන අලුත් ලෝකයේ ප්‍රධාන නගරය වන අලුත් යෙරුසලම එහි තිබෙනවා ඇත. "නුඹ ස්වාමීන්වහන්සේගේ අතෙහි අලංකාර ඔටුන්නක්ද නුඹේ දෙවියන්වහන්සේගේ අතෙහි රාජ කිරීටයක්ද වන්නෙහිය." (යෙසායා 62:3) "ඇගේ ආලෝකය ඉතා අනර්ඝ වූ මාණික්‍යයකට සමානය; එනම් පළිඟු මෙන් පැහැදිලි වූ



සූර්යකාන්ති ගලක් වාගේය." (එළිදරව් 21:11) "ජාතීහු එහි එළියෙහි ඇවිදිති. පොළොවේ රජවරු තමුන්ගේ තේජස ඊට ගෙනෙති." (එළිදරව් 21:24) "මම යෙරුසලම කෙරේ ප්‍රීතිමත්ව. මාගේ සෙනඟ කෙරේ ප්‍රීතිවන්නෙමි" (යෙසායා 65:19) "තවද: මෙන්න, දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමගය, උන්වහන්සේ ඔවුන් සමග වාසය කරන සේක, ඔව්හු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය. දෙවියන්-වහන්සේම ඔවුන් සමග සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වනසේක." (එළිදරව් 21:3)

දෙවියන්වහන්සේගේ ඒ නගරයේ රාත්‍රියක් තවත් නොවන්නේය. කිසිවෙක් විවේක ගැනීමට ආශා වන්නේවත් කිසිවෙකුට විවේකය උවමනා කරන්නේවත් නැත. දෙවියන්වහන්සේගේ කැමැත්ත කරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරන අතර කිසිවෙක් විඩාවට පත්වන්නේ නැත. අප සෑමවිටම අලුයම් කාලයේ නවතම භාවය ඇතිව සිටිමින් ඒ ස්වභාවයේ අවසානයට නොපැමිණෙනවා ඇත. එහිදී "පහන් ආලෝකයවත් සූර්යාලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත; මක්නිසාද ස්වාමිවූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙන සේක." (එළිදරව් 22:5) වේදනාත්මක ස්වභාවයකින් තොරව බබළන තේජස සූර්යයාගේ ආලෝකයට වඩා දීප්තිමත් වෙනවා ඇත. ඒ ආලෝකය අපගේ දවල් කාලයේ ආලෝකයට වඩා බොහෝසේ දීප්තිමත් වෙනවා ඇත. දෙවියන්වහන්සේගේද බැටළු පැටවාණන්ගේද තේජස, නිවී නොයන ආලෝකයකින් ශුද්ධවූ නගරය පුරවනවා ඇත. මිදීම ලැබූ අය සූර්යයා නොමැති නිරන්තර දිවා කාලයෙහි ඇවිදිනවා ඇත.

"මම එහි දේව මාළිගාවක් නුදුටිමි. මක්නිසාද සර්ව පරාක්‍රමවූ ස්වාමිවූ දෙවියන්වහන්සේද බැටළු පැටවාණෝද එහි දේව මාළිගාවය." (එළිදරව් 21:22) දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට පියාණන්වහන්සේද පුත්‍රයාණන්වහන්සේද සමග විවෘත සබඳතාවයක් පවත්වා ගැනීමේ වරප්‍රසාදය ලැබේ. "දැන් අපට කැඩපතකින් අඳුරු ලෙස පෙනෙන්නේය." (1 කොරින්ති 13:12) අපි සොබා දහමේ ක්‍රියාවන් තුළින්ද මනුෂ්‍යයන් පිළිබඳව උන්වහන්සේ ක්‍රියාකරන අන්දමින්ද දෙවියන්වහන්සේගේ ස්වරූපය පිළිබිඹු කරනු ලබනවා දකිමු. නමුත් එහිදී අපි උන්වහන්සේව මුහුණට මුහුණලා දකින්නෙමු. උන්වහන්සේද අපද අතර ආලෝකය අඩු කරන තිරයක් නොපවතිනවා ඇත. අප උන්වහන්සේ ඉදිරිපිට සිටගෙන උන්වහන්සේගේ මුහුණේ තේජස දකින්නෙමු.

එහිදී මිදීම ලැබූ අය ඔවුන්ගේ නියම තත්ත්වයෙන් දැනගනු ලබනවා ඇත. දෙවියන්වහන්සේම මනුෂ්‍ය ආත්මයන් තුළ පැළ කර ඇත්තාවූ ප්‍රේමය හා සානුකම්පාව එහිදී ඉතා සත්‍යවාදී ලෙසද

සුමිහිරි ලෙසද ක්‍රියාත්මක වෙනවා ඇත; ශුද්ධවූ අයවලුන් සමග පවිත්‍ර සබඳතාවයක් පැවැත්වීමටද පුළුවන; ශුද්ධවූ දූතයන් සමගද, සියලු කාලවලදී විශ්වාසවන්තව සිටියාවූ අය සමගද සමාජ ජීවිත ගතකිරීමටද එහිදී පුළුවන. ඔව්හු තමාගේ වස්ත්‍ර සෝදා ගෙන බැටළු පැටවාණන්ගේ ලේ වලින් ඒවා සුදු කරගෙන තිබේ. "ස්වර්ගයේ හා පොළොවේ මුළු පවුලම" ශුද්ධවූ බැමිවලින් එකට බඳිනු ලැබ සිටිති. මේ දේවල් ගැළවීම ලැබූ අයට ප්‍රීතිය ලබාදෙනවා ඇත.

ඔවුන්ගේ අමරණීය කල්පනාව, කිසිවිටෙක නැති නොවන ප්‍රීතියකින් මිදීමේ අභිරහස් ගැනද මැවීමේ පුදුමාකාර බලය ගැනද කල්පනා කරනවා ඇත. දෙවියන්වහන්සේව අමතක කිරීමට පරික්ෂාවක් ගෙන එන්නාවූ කෲර රැවටිලිකාර සතුරෙක් එහි නොසිටිනවා ඇත. සියලු අංගයන් දියුණු වී තිබෙනවා ඇත. සියලු හැකියාවන් වර්ධනය වී තිබෙනවා ඇත. දැනගැන්ම ලබාගැනීමෙන් මනස විඩාවට පත්වන්නේ හෝ ශක්තිය නිමවන්නේ නැත. එහිදී ඉතාම උසස් ව්‍යාපාරයන් ඉදිරියට ගෙනයනු ලබන්නට පුළුවන, ඉතාම උතුම් ආශාවන් සම්පූර්ණ කරගැනීමට පුළුවන, ඉතාම උසස් එල්ලයන් කෙරේ ළඟාවීමට පුළුවන. ඊට පසුවද අලුත් උස් බිම් අප ඉදිරිපිට තිබෙනවා ඇත, අගය කළ හැකි පුදුමාකාර දේවල් තිබෙනවා ඇත. වටහාගත යුතු අලුත් සත්‍යයන් තිබෙනවා ඇත, මනසේ ආත්මයේ හා ශරීරයේ බලයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන්නාවූ අලුත් දේවල් ද තිබෙනවා ඇත.

දෙවියන්වහන්සේගේ මිදීම ලැබූ සෙනඟගේ ඉගෙනීම සඳහා විශ්වයේ සියලු සම්පත්ති විවෘත කරනු ලබනවා ඇත. මරණීයත්වයේ බැමිවලින් සීමා නොකරනු ලබන ඒ අය විඩාපත් නොවන පියාසර කිරීමෙන් දුර තිබෙන ලෝකයන් කරා ගමන් කරනවා ඇත. ඒ ලෝකවල අය මනුෂ්‍ය ශෝකයන් දැකීමෙන් කණගාටුවට පත්වූ අතර ගැළවීම ලැබූ එක මනුෂ්‍යයෙකු ගැන පවා ප්‍රීති ගීතවලින් පිරී ගියහ. පැවසිය නොහැකි ප්‍රීතියෙන් යුක්තව මේ ලෝකයේ මනුෂ්‍යයන්, පාපයට නොවැටුණාවූ අයවලුන්ගේ ප්‍රීතියට හා ප්‍රඥාවට ඇතුල් වෙනවා ඇත. දෙවියන්වහන්සේගේ හස්ත කර්මාන්තයන් ගැන මෙනෙහි කිරීමෙන් ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ ඔවුන්ට ලැබුණාවූ වැටහීම හා දැනගැන්ම ඔව්හු මේ අයවලුන් සමග බෙදා ගනිති. අඩුවී නොයන දැකීමේ හැකියාවෙන් ඔව්හු මැවීමේ තේජස දෙස බලති. ඉර, තාරකා හා ඒවායේ පද්ධති සියල්ලම ඒවාට නියමිත ආකාරයෙන් දිව්‍ය සිංහාසනය වටා කරකැවෙති. ඉතා කුඩා දේවල පටන් ලොකු දේවල් දක්වා සියලු දේවල් මත මැවුම්කාරයාණන්වහන්සේගේ නාමය ලියා තිබේ. ඒ සියල්ලෙන් උන්වහන්සේගේ බලයේ සම්පත ප්‍රකාශ කර තිබේ.



සදාකාලයේ අවුරුදු ගතකරන අතර දෙවියන්වහන්සේ ගැනද ක්‍රිස්තුස්වහන්සේ ගැනද වඩාත් තේජාන්විත ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබනවා ඇත. දැනගැන්ම දියුණු වන්නා සේම, ප්‍රේමය ගරුත්වය හා ප්‍රීතියද වර්ධනය වෙනවා ඇත. මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ ගැන ඉගෙන ගන්නා තරමට ඔවුන් උන්වහන්සේගේ චරිතය වැඩි වැඩියෙන් අගය කරනවා ඇත. යේසුස්වහන්සේ මිදීමේ සම්පත්තිද, සාතන් සමග පැවති අරගලයේදී ලබාගන්නා ලද පුදුමාකාර දේවල්ද මනුෂ්‍යයන්ට විවෘත කරනවා ඇත. එවිට මිදීම ලැබූවන්ගේ හදවත් වඩාත් උනන්දු කැපවීමකින් ප්‍රමෝදමත් වී ඔවුන්ගේ රන් වීණාවන් වාදනය කරනවා ඇත. දස දහස් වර දස දහස් දෙනාද, දහස් වර දහස් දෙනාද ප්‍රශංසා ගීතයකින් ඔවුන්ගේ කටහඬවල් එක් කරති.

"තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් පොළොවෙන් යට සහ මුහුද පිටත් ඇත්තාවූ සියලු මැවිලි වන එහි ඇති සියල්ලෝ සිංහාසනයෙහි වැඩඉන්න තැනැන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ප්‍රශංසාවද ගෞරවයද මහිමයද පරාක්‍රමයද සදාකාලේටම වේවයි කියනවා ඇසීමි." (එළිදරව් 5:13)

මහා අරගලය අවසානය. පාපය හා පව්කාරයන් තවත් නොමැත. මුළු විශ්වයම පවිත්‍රය. ඒකත්වයේ හා ප්‍රීතියේ එකම ස්පන්දනයක් මේ විශාල මැවිල්ල තුළ පවතියි. සියලු දේවල් මැවූ තැනැන්වහන්සේ කෙරෙන් අසීමිත මුළු රාජ්‍යයටම ජීවිතය, ආලෝකය හා ප්‍රීතිය ගලා එයි. ඉතාම කුඩා අංශුවේ පටන් ඉතාම විශාල ලෝකය දක්වා පවතින, පණ ඇති පණ නැති සියලු දේවල්, කිසි සෙවනැල්ලකින් ආවරණය කරනු නොලබන අලංකාරයෙන් හා සම්පූර්ණ ප්‍රීතියෙන් යුක්තව පවසන්නේ දෙවියන්වහන්සේ ප්‍රේමය බවය.